
තිලෝගුරු සම්මා සම්බුදු රජාණන් වහන්සේ

තායිවානයේ තායිපේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනමේ ප්‍රධාන අනුශාසක, තායිවානයේ තායිපේ ශ්‍රී රතනජෝති ථෙරවාද බෞද්ධ මධ්‍යස්ථානාධිපති, තායිවානයේ ප්‍රධාන සංඝනායක රත්මලාන ශ්‍රී විජයාරාමවාසී, බණ්ඩාරගම විදාගම ධර්ම චක්‍ර ළමා පදනමේ සහ ලියෙන් සිං ළදරු පාසලේ නිර්මාතෘ, ත්‍රිපිටකවේදී ධර්ම කීර්ති ශ්‍රී බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි මෙම දහම් පොත තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම මගින් මුද්‍රණය කරවා ශ්‍රී ලංකාවට පරිත්‍යාග කරන ලදී.



ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනම
විදාගම,
බණ්ඩාරගම

Printed for free distribution by
The Corporate Body of the Buddha Educational Foundation
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website:http://www.budaedu.org
Mobile Web: m.budaedu.org
This book is strictly for free distribution, it is not to be sold.
නොමිලයේ බෙදාදීම පිණිසයි.

සිංහල
විශුද්ධිමාගීය.

—□—

අටුඨකථාචාර්‍ය ශ්‍රීමත් බුඩඝෝෂ මහා ස්ථවිර ප්‍රණීත

විශුද්ධිමාගීය

ඇසුරුකොට

මාතර සිරිමඩගල පරිවෙණාධිපති පූජ්‍යාචාර්‍ය

මැදඋයන්ගොඩ සිරි සුමඩගලාභිධාන මහා ස්ථවිර

පාදයාණන් වහන්සේ ගේ

ශිෂ්‍ය වූ

පණ්ඩිත මාතර ශ්‍රී ධම්මවංශ

ස්ථවිර පාදයන් වහන්සේ

විසින්

ප්‍රනිපාදිත

සිංහලානුවාදය.

●

සිරිමඩගල පරිවෙණාධාර සමිතිය

මගින්

මුද්‍රණය කරවන ලදී.

●

මුද්‍රණය:

සීමාසහිත මාතර වෙළෙන්දෝ

බ්‍රෝඩ්වේ පාර – මාතර. 4530

●

බු: ව: 2503

නිවේදනය

ලෝක සාහිත්‍යයට අයත් ග්‍රන්ථ අතුරින් **විශුද්ධි මාර්ගයට** ද විශෙෂ ස්ථානයක් ලැබෙනුයේ එහි ත්‍රිපිටකයෙහි හා බුදුවරු කථාදියෙහි වූ විශෙෂ අර්ථයන් බෙහෙවින් ඇතුළත්ව තිබෙන හෙයිනි.

දුශ්චරිත- තෘෂ්ණා- දෘෂ්ටි යන ත්‍රිවිධ සංක්ලෙශයන් ගේ **ව්‍යතික්‍රම- පරියුත්ථාන- අනුශය** යන ත්‍රිවිධ ප්‍රහාණයට උපාය මාර්ගය වූ **ශීල- සමාධි- ප්‍රඥා** යන ත්‍රි ශික්ෂාවෙන් **ශීල- චිත්ත- දිට්ඨි- කඞ්ඛාවිතරණ- මග්ගාමග්ගඤාණදස්සන පටිපදඤාණ දස්සන- ඤාණදස්සන-** යන සප්ත විශුද්ධි පිළිවෙළින් පරම විශුද්ධිය වූ නිර්වාණය අවබොධ කිරීමේ ද්‍රුතිපදාව ඒකි වූ පරිදි විස්තාර වන හෙයින් **විශුද්ධිමාර්ග** යන නම මෙයට අර්ථානුගත ය.

සෝවාන් ආදී **සතරමාර්ග - ඵලාවබොධයෙන් නිවන්** අමාරය වළඳනු රිසියනට එහට උපයොගීවන ප්‍රතිපදා මාර්ගය මෙහි විස්තර කොට දක්වූ අයුරු සිත් ගන්නා සුලු ය. එහි නියම තතු මෙය පරිශීලනයෙන් ම මනා සේ වටහා ගත හැකි වේ.

මේ ග්‍රන්ථය හා ග්‍රන්ථ කර්තෘන් වහන්සේ පිළිබඳව ද පවත්නා මත හෙදයන් හා නිශ්චය ද මෙහි ඇතුළත් ප්‍රස්තාවනාවෙන් මනාව විස්තර වේ.

පස් මහා සභියේ **ධ්‍යාන-විදර්ශනාදී** ගාම්භීර ධර්මීය්‍යන් ඒ ඒ අටුවාවන්හි ඇතුළත් නොකොට ඒ සඳහා මේ ග්‍රන්ථය බලිය යුතුයැ යි අටුවාවන්හි ද සඳහන් කිරීමෙන් හා මෙය පරිශීලනය නොකොට ඒ නොදත හැකි වන හෙයින් එබඳු ධර්මීය්‍යන් අවබොධ සඳහා බෙහෙවින් මෙය භාවිත කළ යුතු ය. එහෙයින්ම අනික් අටුවාවන්ට වඩා මෙයට විශෙෂ ස්ථානයක් හිමි වේ.

එසේ ම **නිර්වාණ** විනිශ්චය වැනි විශෙෂ කරුණු විස්තර කිරීමේ දී ඒ පිළිබඳව නිකායාන්තරිකයන් අතර පමණක් නොව ථෙරවාදීන් අතර පවා පැවැති මතාන්තර දක්වා මනාසේ පහදා තිබීම ද **හෙතු-ඵල** ධර්ම විභාගයෙහි දී අන්‍ය අටුවාදියක නැති සේ **පටිච්චසමුප්පාද - පඤ්චාඞ්ගික** දෙකම එකට සංසන්දනය කොට ගලපා තිබීම ද මෙහි විශෙෂයෙකි.

මෙසේ යොගාවචරයනට ඉතා උපකාර වූ මෙයට නානාවිධ ටීකා-ගණ්ඨිපද-සන්‍යාදිය ධම්ධර පින්වතුන් විසින් සකස් කොට තිබේ. ඉන් **බදරතිත්ථ ධම්මපාල** සථවිර ප්‍රණීත **පරමත්ථ මඤ්ජූසා** නම් විසතර ටීකාව බෞද්ධ දර්ශනය පමණක් නොව අන්‍ය වූ දර්ශනයන් ද අළලා බෞද්ධ මතය මතාව සනුවට කිරීමෙන් මෙහි අගය ශත ගුණයෙන් වඩාලන ලදී. එය ඇසුරු කොට කලිකාල සාහිත්‍ය සම්භාවිත පණ්ඩිත **පරාක්‍රම්බාහු** මහරජාණන් විසින් කළ විසතර ව්‍යාඛ්‍යාව ද ධම්මීවේදින්ට මහත් ඵලදායක විය. පාලිභාෂාව නො දන්නා සාමාන්‍ය බෞද්ධ ජනයාට ඒ පාලි ග්‍රන්ථයන් ඵලදායී නො වූවාක් මෙන් ම මෙයට ශතවර්ෂ සහකට පමණ පෙර කෙසේවුවත් මෙකල සිංහලයනට ඒ ව්‍යාඛ්‍යානයේ ගාඪ - විසතර සිංහල භාෂාවෙන් මෙහි අර්ථවිවරණය ඉතා දුෂ්කර බව් සැලකූ මෑත යුගයේ ලක්දිව විසූ උසස් ධම්ධරයකු වූ ද විශෙෂයෙන් අභිධම් විශාරද වූ බුද්ධඝෝෂ මහාසූරසෙනාපති රාජදත්තයිය නාමොපලක්ෂිත **ඇම්. ධම්මරත්න** පණ්ඩිතුමා ඒ පුරාණ ව්‍යාඛ්‍යානය සංශොධනය කර භාවාර්ථයකින් ද සකසා මුද්‍රණය කරවන ලදුවත් අධික විසතරය නිසා ද ග්‍රන්ථයේ විශාලත්වය නිසා ද සාමාන්‍ය බෞද්ධ ජනයාට එයින් ද විශෙෂ අර්ථයක් නො විය.

මේ අතර පාසල් සිසුනට පවා අභිධර්මය පහසුවෙන් වටහා-ගත හැකි වන පරිදි අභිධම්ම් සංග්‍රහය ඇසුරු කොට **අභිධම්ම්-චන්ද්‍රිකා** නම් සිංහල අභිධම් ග්‍රන්ථය රචනා කිරීමෙන් සාමාන්‍ය සිංහල බෞද්ධයනට අභිධම්ඥානය වඩාලීමට මාර්ගය සලසා වදාළ **මාතර සිරිමංගල පරිවෙණාධිපතිව** වැඩ විසූ අප ගේ ආචාර්යෝත්තම **ත්‍රිපිටක වාගීශ්වර පූජ්‍ය පණ්ඩිත මාතර ශ්‍රී ධම්මවංශ ස්වාමීන්ද්‍රයන් වහන්සේ** මෙම විශුද්ධිමාර්ගය ද ධම්මීවේය හා සිංහල භාෂා ස්වරූපාදිය දැක්වෙමින් සාමාන්‍ය සිංහලයනට ද මනාව වැටහෙන ලිහිල් බසින් අනුවාදනය කොට 9 වැනි නිදේශය තෙක් මුද්‍රණය වන අතර සමසන්නලංකා බෞද්ධ සම්මේලනයේ සභාපති තැන්පත් මහාවාග්මී **ජී. පී. මලලසේකර** මහතා ගේ විශෙෂ ආරාධනයෙන් **විභඞ්ග ප්‍රකරණ නම්** අභිධම් පාලි ග්‍රන්ථය සිංහලට පරිවර්තනය කිරීමේ නිරත වීමෙන් මෙය තාවකාලිකව නවතින්නට සිදු විය.

ඒ අතර කලෙක සිට පැවැති අරණ්‍යගතව විදර්ශනා වැඩීමේ අනුලඳුනීය අපෙක්ෂාව සපුරාලීම සඳහා වැඩීමෙන් එහි වැඩ

සිටියදී වැළඳුණු රෝගාබාධය උත්සන්නව හදිසියේ අපවත් වූයෙන් **සිංහල විශුද්ධිමාර්ගය** ද එපමණින් අඩාලව අතර මං විය.

එහෙත් එය භාවිත කිරීමෙන් ධර්මාවබෝධය ලැබූ බොහෝ ගිහි පැවිදි පින්වතුන් ගේ හා විශේෂයෙන් එම **පණ්ඩිත** සවාමීන් වහන්සේ ගේ ශිෂ්‍යවර මෙම පිරිවෙනේ උප ප්‍රධානාචාර්‍ය **පණ්ඩිත මාතර වජිරවංස** සථවිරයන් වහන්සේ-ගේ ආරාධනයෙන් 10 වන නිදේශයේ පවත් එහි ඉතිරි කොටස අනුවාදනය ආරම්භ කොට 16 වැනි ඉන්ද්‍රිය සත්‍ය නිදේශය තෙක් මෙයට පෙර මුද්‍රණාරූඪයෙන් බිහිකරවනලදී.

මෙවර **ප්‍රඥා භූමි** නිදේශයේ පවත් අවසානය තෙක් ඉතිරි කොටස සම්පූර්ණ වේ මෙය පරිවර්තනය කිරීමේදී ප්‍රඥා භූමි නිදේශය වැනි ගාම්භීර ධර්ම කාණ්ඩයන්හිදී දුෂ්කරතාවයට මුහුණ පාන්නට සිදුවූව ද ආචාර්‍ය සවාමීන් වහන්සේ ගේ සටහන් හා අධ්‍යයනයෙන් ලත් අභ්‍යාසය ඉතා උපකාර විය. **පරමත්ථ-මඤ්ජූසා පීඨාව** හා, **පැරකුම්බා සන්නය** ද, **විසුද්ධිමග්ග ගණ්ඨිය, සමෙමාභවිනොදනී විනඩග අටුවාව, අභිධම්-ප්‍රදීපිකාව** ආදී ග්‍රන්ථයන් ද මෙහි ලා අපට උපකාර විය.

මෙහි ඇතැම් ගාම්භීර තැන් පිළිබඳව අප පිරිවෙනේ අධ්‍යක්ෂක ධුරාභිර ගරු **වෙහෙරගම්පිට සුමනසිරි** සවාමීන් වහන්සේ සමග කළ සාකච්ඡාදිය ප්‍රයෝජනවත් විය.

මෙහිලා ගාම්භීර්‍යයන් සාමාන්‍ය මහාජනයාට වැටහෙන සේ යොදලීමට ලිහිල් සිංහල වචන නොවීමෙන් පාලි වචනයම හෝ සංස්කෘත ච්ඡායාව හෝ බොහෝ සේ යොදන්නට සිදුවිය.

මෙහි මූල් කොටස මෙන් ම මේ කොටස ද වැල්ලෙවත්තේ ශ්‍රී ධර්මෝදය පරිවෙණාධිපති **විද්‍යා විශාරද පණ්ඩිත ඉඳුරුවේ උනනරානන්ද මහා සථවිරයන් වහන්සේ** අතින් සංශෝධනය වීම වැනියක් ග්‍රන්ථ ගෞරවයට ඉවහල් විය. ලෝක ශාසන සේවයෙහි නිරත උන්වහන්සේ දහසක් අවහිරතා මධ්‍යයෙහි අප විශෙෂ ආරාධනයෙන් මෙයට අගතා ප්‍රස්තාවනාව සම්පාදනය කිරීමෙන් ද ග්‍රන්ථ ගෞරවය ශත ගුණයෙන් වඩාලීම පිළිබඳ අප කෘතඥතාවය පිරිනැමේ.

මෙහි පිටපත් ලියාදීමෙන් හා ශුද්ධි පත්‍ර බැලීමාදියෙන් ද තත් අයුරින් උපකාර වූ පාරිවෙණික ආචාර්‍ය **පණ්ඩිත මල්දුව විමලවංස, පණ්ඩිත ගල්වැවේ සුමංගලතිලක, පණ්ඩිත**

නාරන්දෙනියේ පඤ්ඤාරතන්න, පණ්ඩිත බැරහම සිරිසිරි යන සථවිර භික්ෂුවරයන් හා **මලිදුව රතනවංස** සථවිරයන් ද, **කිරින්දේ අරවින්දවංස, ගිනිපැල්ලේ විමලධම්ම, පලපත පාලිත** යන ශිෂ්‍ය භික්ෂූන් ද මෙහි ලා සඳහන් කරමි.

මෙය මුද්‍රණය දුෂ්කරව පැවැති කල අප පරිවෙණාධාර සභාවේ සභාපති **ඒ. ඇම්. ඩබ්ලිව්. ජයසූරිය සාමදූන විනිශ්චයකාර තුමා** හා කොළඹ වෙළඳුමේ නියුක්ත **ඩී ජේ. සමරවීර මුදලාලි** මහතා ද දක්වන ලද අනුග්‍රහය ඉතා උපකාර වූ බව සඳහන් කරනුයේ පින් දීමෙනි.

මෙයට පෙර ප්‍රතිඥ කළ පරිදි මෙය ඉශාහතයේ මුද්‍රණය කිරීමෙන් උපකාර වූ **මාතර වෙළෙන්දෑ** මුද්‍රණාලයේ අධිකාරී සී. ඒ. **ඉස්මවන්ද්‍ර** මහතා හා සේවක පිරිස ද වෙසෙසින් සඳහන් කරමි.

මෙම **බුද්ධ ජයන්තිය** නිමිත්තෙන් මෙය මෙසේ අවසාන කොට බෞද්ධ මහජනයා අතට පැමිණවීමට ලැබීම අපට විශෙෂ ප්‍රීතියෙකි.

මෙහි යම් ප්‍රමාද භ්‍රමාදියක් වේ නම් අප වෙත දන්වා එවන මෙන් ධර්මධර පින්වතුන් වෙත වෙසෙසින් ආරාධනය කරමි. ඒ දෙවන මුද්‍රණයකදී ප්‍රයෝජනවත් වේ.

පණ්ඩිත බුදුවිට නන්දාරාම සථවිර

2500 වෙසක් පුරපසළොස්වක් දා
1957 මැයි 13 වැනි දා
මාතර සිරිමංගල පිරිවෙනේදී ය.

පිදුම

ඇදුරුවර ගරුතර
පියරුවන්නිස් හිමිසඳු
සිරිනම සිහිකර බැතින්
පුදනෙමි හෙළ විසුදුමඟ

ප්‍රස්තාවනා

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

ශ්‍රීමත් සම්බුදශාසනයෙහි අතිශයින් දුර්ලභ වූ පැවිද්ද ලත් කුලපුත්‍රයනට ක්ෂෙම වූ නිර්වාණප්‍රතිලාභයට සෘජු වූ ආයර්ය මාර්ග-සංඛ්‍යාත ප්‍රතිපත්තිය ඉවහල් වනබැවින් තත් ප්‍රතිපත්තිය **ශීල-සමාධි-ප්‍රඥා** මුඛයෙන් ප්‍රකාශනය කරනු පිණිස ඒ මේ විශුද්ධිමාර්ගය සම්පාදනය කරන ලද්දේ වෙයි එහි සංක්ෂේපයී පඤ්චකය ප්‍රමුඛ කොට ඇති මේ ප්‍රස්තාවනාව ශාස්තෘමාර්ගයන් ගේ විශුද්ධිමාර්ගාවතරණයෙහි ප්‍රයත්න දනවනු පිණිස අනෙක ග්‍රන්ථාශ්‍රයයෙන් ද ඉතිහාස ප්‍රවෘත්ති සංකලනයෙන් ද ආචාර්යමතානුසාරයෙන් ද කරුණු සම්පිණ්ඩනය කොට ගෙන විවෙචන පූර්වක වැ සපයනු ලැබේ.

"විසුද්ධිති සබ්බමලවිරහිතං අච්චන්තපරිසුද්ධං නිබ්බානං වෙදිතබ්බං, තස්සා විසුද්ධියා මග්ගෝති=විසුද්ධිමග්ගෝ"* යනු ග්‍රන්ථාගතව වූ අභිධෙයාර්ථ හෙයින් විශුද්ධි සංඛ්‍යාත **සංඥා** සර්වමලවිරහිත අත්‍යන්තාපරිශුද්ධ වූ නිර්වාණයට මාර්ගය **විසුද්ධිමග්ග** නම් වේ. ඒ මේ විශුද්ධිමාර්ගය සම්ප්‍රකාරයෙන් ප්‍රකාශනය කරන මේ ග්‍රන්ථය ද අනෙදෙපවාරයෙන් විසුද්ධිමග්ග නම් වන බව දත්යුතු. **"විසුද්ධියා මග්ගෝ=විසුද්ධිමග්ගෝ"** යන විග්‍රහය පූර්වෝක්ත ග්‍රන්ථාගත අභිධෙයාර්ථයෙන් ම සිද්ධ ය. මෙහි විසුද්ධි නම් නිර්වාණය යි. මග්ග නම් අධිගමෝපාය යි **"මග්ගෝති අධිගමූපායෝ වුච්චති"** යනු කී බැවින් අධිගම ලාභයට උපායභූත මග්ග **නම්** වන බව දනයුතු. 'නිවනට මග විසුද්ධිමග්ග නම් වේ' යනු මෙහි නිර්වාර්ථය යි.

"විශුද්ධිමාර්ග යි නිර්ප්‍රපඤ්චාර්ථයෙන් ලොකොත්තර මාර්ගය දනයුතු ය. තදුපාය භූතයින් වනාහි පූර්වභාග මාර්ගය ද තන්නිශ්‍රය කථා ප්‍රබන්ධය ද විශුද්ධිමාර්ග යි කියනු ලැබේ."† යන මේ පරාක්‍රමබාහු නරෙන්ද්‍රවචනයෙන් ද මේ ග්‍රන්ථයට විසුද්ධිමග්ග නාමය දීමෙහි සමීචීනත්වය ව්‍යක්ත වේ මැයි. ඒ මේ විශුද්ධිමාර්ගය වනාහි කිසිතැනෙක්හි **විදර්ශනාමාත්‍ර** වශයෙන් ද, කිසි

---

* විසුද්ධිමග්ග (බු: ව: 2463 මුද්‍රිත) 2 පිටුව;

† විශුද්ධිමාර්ග මහා සත්‍යය (බු: ව: 2493 මුද්‍රිත) 10 පිටුව

තැනෙක්හි **ධ්‍යාන-ප්‍රඥා** වශයෙන් ද, කිසි තැනෙක්හි **කර්මාදීන්** ගේ වශයෙන් ද, කිසිතැනෙක්හි **ශීලාදීන් ගේ** වශයෙන් ද, කිසිතැනෙක්හි **සමාහිත්‍රස්ථානාදීන් ගේ** වශයෙන් ද දෙසූහ. මේ ග්‍රන්ථයට වස්තු වූ **"ශීලෙ පතිට්ඨාය"** යනාදි ගාථාවෙන් ශීල-සමාධි-ප්‍රඥා මුඛයෙන් මෙහි විශුද්ධිමාර්ගය දක්වන ලද්දේ වෙයි. එහෙයින් මේ ග්‍රන්ථය දුශ්චරිත සංක්ලේශයා ගේ විශුද්ධියට මාර්ගය වූ ශීලය ද, **තෘෂ්ණා**සංක්ලේශයා ගේ විශුද්ධියට මාර්ගය වූ සමාධිය ද, දෘෂ්ටි සංක්ලේශයා ගේ විශුද්ධියට මාර්ගය වූ ප්‍රඥාව ද සම්‍යක් දෙශනානුසාරයෙන් ප්‍රකාශිත වන බැවින් **විශුද්ධිමග්ග** නම් වූ බව දත යුතු ය. අර්ථානුගතසංඥ හෙයින් අන්වර්ථසංඥ වියින් ද, මෙයින් විදර්ශනා මාත්‍රය ද ධ්‍යාන ප්‍රඥාවන් ද කර්මාදිය ද ශීලාදිය ද සමාහිත්‍රස්ථානාදිය ද අවිශෙෂයෙන් පවසනත් ශීල-සමාධි- ප්‍රඥා මුඛයෙන් මේ ග්‍රන්ථය ම **විශුද්ධිමග්ග** නාමයෙන් වක්තව්‍ය හෙයින් විශෙෂ සංඥ වියින් ද මෙහි සාර්ථය දත යුතු ය. සමුදය වියින් නිවනට මග විශුද්ධිමාර්ගයැ යි කිව ද මෙහි ශීලයත් සමාධියත් ප්‍රඥාවත් අවයව වියින් විශුද්ධියට කරුණු වන්නෙන් අවයවයක් පෑසෑ විශුද්ධිය පහළීම වියින් ලැබෙයි. එහෙයින් මේ විසුද්ධිමග්ග යන නාමය අවයවාර්ථයෙන් නො ගිලිහුණු ගුණයට නිමිත්තවන්නෙන් නෛමිත්තික වෙයි **"විශුද්ධිමාර්ගය යනු අවයවාර්ථාව්‍යුත ගුණ නිමිත්තක වැ සිදුවන බැවින් නෛමිත්තික නාම වෙයි"*** යන පරාක්‍රමබාහු නරපති වචනයෙන් ද තදර්ථප්‍රකාශනය වෙයි.

මේ ග්‍රන්ථකරණයෙහි නිමිත්තා වනාහි අනන්තර්නිමිත්තය යැ වාහ්‍ය නිමිත්තයැ යි දෙපරිද්දෙකින් දැක්විය හැකි ය. මෙහි අනන්තර්නිමිත්තය නම් විශුද්ධිය කැමැති කුලපුත්‍රයන් **නිමිත්තය** කෙරෙහි උපන් අනුකම්පාව යි. හේ වනාහි ග්‍රන්ථ-කාරකයන් විසින් ම **"විසුද්ධිකාමා සබ්බෙපි නිසාම-යථ සාධවෝ"** යන්නෙන් දක්වන ලද්දේ වෙයි. සත්පුරුෂ කුලපුත්‍රයන් කෙරෙහි පාළු වූ ග්‍රන්ථකාරකයන් ගේ කරුණාව මෙයින් හෙළිවන බැවිනි. සත්සාත්‍යශ්‍රවණයෙහි ඔවුන් යෙදවීමෙන් තුමන් ලෙහි උපන් කුලුණුගුණය මෙයින් ඇරැ දැක් වූ බව දත යුතු ය.

---

* විශුද්ධිමාර්ගමහාසත්‍යය 2 පිටුව

"ප්‍රතිපන්න යොගී ජනයන් අඤ්ඤාන දුර්ඤාන මූලක අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති හෙතුක සංසාර දුඃඛයෙන් මුදනු සඳහා මේ විශුද්ධිමාර්ගය කළ බැවින් යථොක්ත ප්‍රතිපද්-ජනයන් කෙරෙහි සමුත්පන්න අනුඝම්පාව අනන්තර් නිමිත්ත යැ"* යන මේ පරාක්‍රම්බාහුහූපතිවචනයෙන් හේ පැහැදිලි වෙයි. මෙසේ අන්තර්නිමිත්තය දැක්වුව ද වාහ්‍ය නිමිත්තය දෙපරිද්දෙකින් දක්වන ලද බව පැතෙයි.

විනජ්ජවාදිසඨ්ඨානං - ථෙරියානං යසස්සිනං
මහාවිහාරවාසිනං - වංසජස්ස විභාවිනෝ
හදන්ත සඞ්ඝපාලස්ස - සුවිසල්ලබවුතනිණෝ
විනයාචාරයුත්තස්ස - යුත්ත සාසපවිපත්තියං
ඛන්තිසොරච්චමෙත්තාදි - ගුණභූසිත චෙතසෝ
අජ්ඣෙසනං ගහෙත්වාන - කරොමෙතානි දීපනං මයා"†

යන මේ ග්‍රන්ථකාරකයන් ගේ සුගීතයෙන් මහාවිහාර වංශයෙහි උපන් පැණවත් වූ පිවිතුරු සලේ පැවැතුම් ඇති විනේ අසරෙහි යෙදුණු පිළිවෙත්හි ඇලුණු සැත්සුරත බැව් ඇ ගුණමුළුවෙන් සැරසුණු සිත් ඇති හදන්ත සඞ්ඝපාල මහාසාමීන් ගේ ආරාධනය මේ ග්‍රන්ථකරණයට වාහ්‍යනිමිත්තය බව හෙළි වෙයි. **"මේ විශුද්ධිමාර්ගකරණයෙහි බඩාදර පරම විශුද්ධාශය සඞ්ඝපාල ස්ථවිරපාදයෝ බාහ්‍ය නිමිත්ත වෙත්."‡** යන්නෙන් පරාක්‍රම්-බාහු නරදේවයෝ ආරාධකයා වාහ්‍යනිමිත්ත වියින් දක්වති ආරාධකයා කිමෙන් ආරාධනය ද ගැනෙන බැවින් හේ අසඹන නො වේ. මේ එක් වාහ්‍යනිමිත්තය යි. අනෙක් වාහ්‍ය නිමිත්තය ප්‍රතිපද්ජනයා යි.

"සුදුල්ලභං ලභිත්වාන - පබ්බජ්ජං ජිනසාසනෙ
සීලාදිසඞ්ගහං ඛෙමං - උජුමග්ගං විසුද්ධියා
යථාභූතං අජානන්තා - සුද්ධිකාමාපි යෙ ඉධ
විසුද්ධිං නාධිගච්ඡන්ති - වායමන්තාපි යොගිනො."ʔ

යන මේ ග්‍රන්ථකාරකයන් ගේ සදුක්තියෙන් එවිහු දැක්වෙති. සර්ව්ඥ ශාසනයෙහි අතිශයින් දුර්ලභ වූ පැවිද්ද ලැබ විශුද්ධියට සෘජුමාර්ගය වූ ශීලාදිසඞ්ග්‍රහය තතු සේ නො දන්නා වූ ශුද්ධිකාමීන් වැර වඩතුදු විශුද්ධිය නො ලබන බව මෙයින් පවසති. ඔවුන් ගේ තත්ත්වඥතයට විශුද්ධිමාර්ගය කරතබව් පැවැසීමෙන් ග්‍රන්ථ

---

* විශුද්ධිමාර්ගමහාසත්‍යය 2 පිටුව;
† විසුද්ධිමග්ග 535 පිටුව;
‡ විශුද්ධිමාර්ගමහාසත්‍යය 2 පිටුව;
ʔ විසුද්ධිමග්ග 534 පිටුව.

කාරකයෝ ප්‍රතිපද්යෝගීජනයා ද වාහ්‍යනිමිත්ත කොට දක්වති. මෙසේ මෙහි නිමිත්තනාමය දතයුතු. ග්‍රන්ථ සමාරම්භ පිණිස නිමිත්තකථනය සාධුසම්මත යි. එහෙයින් තුමත් කරන ගතට නිමිති දක්වමින් ග්‍රන්ථකාරකයෝ සම්බන්ධාශය පිළිබඳ නිර්ලක්ෂ්‍ය මැනැවින් හෙළිපෙහෙළි කරත්.

මෙහි කතීෘවරයෝ **අනුබුද්ධ බුද්ධඝෝෂ මහාඇචාර්ය්‍ය** වෙති. ලඞ්කාධිශ්වර පරාක්‍රමබාහූන් විසින් "බුද්ධඝෝෂාචාර්‍යපාදයෝ මේ විශුද්ධිමාර්ගයට කතීෘවයෙන් වෙදිතව්‍යයෝ යි" යනුවෙන් කතීෘ සවකීය විශුද්ධිමාර්ග මහා සත්‍යයෙහි දක්වන ලද බැවින් ද, **"විපුලවිසුදධබුද්ධිනා බුද්ධඝෝසෙන ගරුකිඛතිත නාමඛයෙන එථිරෙන මොරණඩවෙටකවාසිබෙඛන කතො විසුද්ධිමඟෙහා නාම"** යි විශුද්ධිමාර්ග ග්‍රන්ථාවසානයෙහි සඳහන් වන බැවින් ද මේ ගැන සැකයෙක් නැති. බුද්ධඝෝෂාචාර්‍යපාදයන් තම විශුද්ධිමාර්ගීය සම්පාදනය කළ බව පරම්පරායාත වාර්තාවලින් ද හෙළි වෙයි. එක් පරම්පරායාත වාර්තාවක් දක්වන **පරාක්‍රමබාහු නරේශ්වරයෝ** මෙසේ සඳහන් කෙරෙති.

"මේ ආචාර්‍යයෝ ජම්බුද්වීපවාසීන්ට්‍ය මහාස්ථවිරවරයන් විසින් සම්මාර්ගාධිත වූ හෙළු අටුවා පෙරළා සර්වජනීන මූලභාෂාවෙන් නොවළාංවට අටුවා ලියනු සඳහා මේ ලඞ්කාද්වීපයට වැඩ මහා විහාරයෙහි සඞ්ඝපාල මහාස්ථවිරයන් කෙරෙහි හෙළු අටුවා අසා සියලු ස්ථවිරවාද ඉගෙන මහා සඞ්ඝයා රැස් කොට අටුවා ලියන්නට පොත් දෙන්නේ යැ යි ඉල්වූහ. සඞ්ඝයා ද අර්ථකථා කරනුවට ශක්‍රති පරීක්ෂා සඳහා තොප ගේ සාමර්ථ්‍යය මිහි දක්වව, එ දැක පොත් දෙම්හ යි මේ ගාථා දෙක දුන්හ. එසඳ තදර්ථවර්ණනාචාරයෙන් එහි අටුවා සහිත පිටකත්‍රය සඞ්ග්‍රහ කොට මේ විශුද්ධිමාර්ගීය කළහ යනු පරම්පරායාත වාර්තා යි"*

මේ පරම්පරායාත වාර්තාව නිසැකයෙන් ම පිළිගත් විශුද්ධිමාර්ගී මහාසත්‍යකාරක පරාක්‍රමබාහු මහීශ්වරයෝ විශුද්ධිමාර්ගීය බුද්ධඝෝෂාචාර්‍යපාදයන් ගේ කෘතියක් බව සම්මතය කෙරෙති.

"සඞ්ඝා ගාථාමයං තස්සා – දුසි සාමඤ්ඤං තව
එකං දෙසෙහි තං දිස්වා – සබ්බෙ දෙමානි පොත්ථකෙ
සිංහතනුතයම්හෙ ච – සඞ්ඝමිත්තාකථාය සො
විසුද්ධිමඟහා නාමා'කා – සඞ්ඝහෙත්වා සමාසතො."†

---

* විශුද්ධිමාර්ගීමහාසත්‍යය 2 පිටුව;

† මහාවංස (37 පරි:) 235-236 ගාථා.

මේ මහාවංශොක්තියෙන් ද විශුද්ධිමාගීය බුද්ධඝොෂපාදයන් ගේ කෘතියක් බව හෙළි වෙයි. මෙහි අදහස යට කී පරමපරාගත වාර්තාවෙහි ම ඇතුළත් වන බැවින් අමුතුවෙන් කියයුතු නො වේ. **බුද්ධඝොසුප්පත්ති** නම් ග්‍රන්ථයෙහි ද **සාසනවංස** නම් ග්‍රන්ථයෙහි ද තවත් බොහෝ ග්‍රන්ථයන්හි ද බුද්ධඝොෂාචාර්යවරයන් විශුද්ධිමාගීය කළ බව සඳහන් වෙයි.

''ඉති පන සබ්බං යස්මා විසුද්ධිමග්ගෙ මයා සුපරිසුද්ධං වුත්තං තස්මා හියෝ න තං ඉධ විචාරයිස්සාමි''*

යන මේ ආගමාර්ථකථාවචනයෙන් ම විශුද්ධිමාගීය බුදුගොස් හිමියන් ගේ බව මැනැවින් හෙළි වන බැවින් මෙහි මුලින් දක්වන ලද කාරණය ද සම්පූර්ණය වෙති. මෙතෙකින් ඒ මේ විශුද්ධිමාගී නම් ග්‍රන්ථයෙහි කර්තෘවරයා විශුද්ධබුද්ධීන් ප්‍රසිද්ධ වූ බුද්ධඝොෂ මහාඅර්ථවාමීන් බව නිගමනය වෙයි. **''නිමිත්තෙන කත්තුනාමකථාවය ග්‍රන්ථ ගෞරවොත්පාදනාර්ථ වෙයි''** යනු පරාක්‍රමබාහු වචන හෙයින් නිමිත්තකථනය මෙන් ම කර්තෘකථනය ද ග්‍රන්ථ සම්භාවනා පිණිස වැටෙයි. **''විසුද්ධිමග්ගං භාසිස්සං''** යනාදී පිණ්ඩාර්ථනිර්දාරණයෙන් ම මෙහි කර්තෘ වාච්‍ය වෙයි.

පරිමාණ

යම් කිසි ග්‍රන්ථයෙක්හි පරිමාණකථනය ශිෂ්‍යලෝකයා ගේ ප්‍රවෘත්තියට කාරණ වෙයි. මෙහි පරිමාණය සමුදය-අවයව විසින් ම දැක්විය යුතු වෙයි. සමුදය පරිමාණ වීසින් සලකන විට මෙහි ග්‍රන්ථ ප්‍රමාණය ඛණවර විසින් අටපනසක් බව පැනෙයි. එතද්ග්‍රන්ථාවසානයෙහි පැනෙන:-

''විසුද්ධිමග්ගෙ එසොව - අනූනාරාය විනා ඉධ
නිට්ඨිතො අට්ඨපඤ්ඤාය - භාණවාරාය පාළියා''†

යන ගාථාවෙන් ඒ බව මැනැවින් හෙළි වෙයි. මෙය පරාක්‍රමබාහු මහීෂයන් විසින් දක්වන ලද්දේ **''මෙහි ග්‍රන්ථප්‍රමාණ තුදුස් දහස් දෙඛණවරෙකි''** යන්නෙනි. ග්‍රන්ථප්‍රමාණ තුදුස් දහස් දෙඛණ වරෙකැයි කීමත් අටපනස් ඛණවරෙකැයි කීමත් අර්ථ වශයින් සමාන ය. විචිත්‍රාවබොධය සඳහා කී හෙයින් පරාක්‍රමබාහුවචනය සාධ්‍යවශයෙන් පිළිගතයුතු ය. ඛණවර ගණිත විට ග්‍රන්ථයකට අකුරු දෙතිසක් ගනු ලබන බැවිනි. ග්‍රන්ථගත ක්‍රමයට විරුද්ධ වැ මෙහි ඛණවර එකුන්සැටක් බව මහොරථපූරණීනිගමනයෙන් පෙනේ.

---

* මහොරථපූරණී (බු: ව: 2480 මුද්‍රිත) 2 පිටුව;
† විසුද්ධිමග්ග 535 පිටුව.

"එකූනසට්ඨිමත්තෙනා විසුද්ධිමග්ගෙහාපි භාණවාරෙහි අප්පපඤ්ඤානඤ්ඤාය ආගමානං කතො යඤ්ඤා"*

යන ගාථාවෙන් ඒ බව පැහැදිලි වෙයි. මෙය ද බුදුගොස් හිමියන් විසින් ම කියන ලද බැවින් විවාදය යි. තුමන් ගේ ම කෘති දෙකෙකින් එකම ග්‍රන්ථයෙක්හි පරිමාණය දෙපරිද්දෙකින් කීම සැබවින් ම විවාරණය කවයුතු වෙයි. මේ ගැන විවාරණය කළ බෙන්තර භදන්ත ශ්‍රද්ධාතිෂ්ය මහාසඨවිරපාදයෝ:-

"විශුද්ධිමාර්ගීය බණවර අටපතසකට වැඩි ය. එකූන්සැටට අඩු ය. ඒ වැඩි ටික ගණන් නොගෙණ විශුද්ධිමාර්ගීකගමනයෙහි අටපතසෙකැ යි ද, වැඩිටික නිසා වතුරාගම වණීනාවන්හි 'එකූනසට්ඨිමත්තෙනා' යි 'මත්තෙනා' ශබ්දයෙන් ටිකක් අඩුබවත් හඟවා එකූන්සැටක් පමණැයි ද ලියනලදැ යි සැලකිය යුතු ය"† යනු සඛකිය ප්‍රස්තාවනාවෙහි දක්වති. මේ විවාරණය ශාස්ත්‍රීය පක්ෂයට බර නොවතුදු ගත් උත්සාහයට පැසසිය යුතු ය. බණවරකට අකුරු අටදහසෙකි. විශුද්ධිමාර්ගීයෙහි සම්පූර්ණ අක්ෂර සංඛ්‍යාව ගණන් එය අටදහසින් බෙදුවිට බණවර ගණන ලැබෙයි. එසේ ගැණ බලන විට බණවර එකූන්සැටක් නොලැබෙන බව ප්‍රත්‍යක්ෂයෙන් දත හැකි ය. අටපතසට වැඩිබවත් සැබෑ ය. එකූන්සැටට අඩුබවත් සැබෑ ය. එහෙත් "අපපකං ඌනමධිකං ගණනූපගං න හොති" යන නීතියට ගැළපෙන සේ අටපතසෙකැයි කීම වඩා සුදුසු ය. සැටට අඩුනම් එකූන්සැටෙකැ යි කීම ගැළපෙයි. එහෙත් මෙහි බණවර එකූන්සැටට අඩු බැවින් එකූන්සැටෙකැයි කීම කිසිසේත් ශාස්ත්‍රීය නොවේ. එක ම ග්‍රන්ථයෙක්හි සමුදයපරිමාණය මෙසේ දෙ පරිද්දෙකින් කීම ද ශාස්ත්‍රීය නොවේ. එක ම කතෘවරයා තමා කළ ග්‍රන්ථයෙහි සමුදයපරිමාණය අවී විසින් දෙපරිද්දෙකින් කීම අනවසීත දෙෂප්‍රසඞ්ගයෙන් ගර්හාවට පාත්‍රවීමට කරුණෙකි. එහෙයින් මේ විමසිය යුතු තැනෙකි. මෙහි "එකූනසට්ඨිමත්තෙනා" යන පදයෙන් අටපතසක් පමණ යැ යි ගන්නට යම්කිසි ශාස්ත්‍රයුක්තියෙක් වෙයි නම් මැනැවි. **"එකඤා ච එකඤා ච = එකා"** යි සරූපෙකශෙෂවාදීයෙන් **"එක"** යන්නෙන් දෙකක් ගතහැකි බව පෙනෙයි. එසේ ගැනීම ශාස්ත්‍රයුක්තියට උචිත වනබැවින් වරදෙක් නොවේ. එකල්හි "එකූනසට්ඨිමත්තෙනා" යන්නට දෙකකින් අඩු වූ සැවක් පමණයැ යි අරුත් කිය හැකි වෙයි. මෙසේ

---

* මනොරථපූරණී 855 පිටුව;

† විශුද්ධිමාර්ගී මහාසත්‍රයෙහි ප්‍රස්තාවනා xvii පිටුව.

ප්‍රයත්නයෙන් ශාස්ත්‍රයුක්ති දක්වා මෙය සිඹකර ගැනීමට අවශ්‍ය කමෙක් නැතැයි ඇතැම් විදග්ධ කෙනකුන් විසින් තකී කළ හැකි වෙයි. ප්‍රධාන සහිඅටුවා සතරෙහි ම මේ වචනය යොදා තිබෙන බැවින් වෙනස් කිරීම ද නො යෙදෙයි. විශුද්ධිමාර්ගයෙහි කී "අට්ඨපඤ්ඤත්තිං" යන වචනය ඉවතලීම ද නො යෙදෙයි. දෙක ම සාධුවයෙන් පිළිගතයුතු කල්හි ආශාශයෙන් වුව නීතියකට ගැනීම සාධුසම්මත විසින් සැලකිය යුතු ය. මෙහි නොයෙක් ප්‍රශ්න මතු විය හැකි ය. ඒ කිනම් ප්‍රශ්නයක් මතු වුවත් විශුද්ධිමාර්ගීය බණවර විසින් අවපතසෙකැයි යනු පිළිගත යුතු මැ යි. මෙහි අවයව පරිමාණය වකාහි සීල- ධුතඞග- කම්මට්ඨානගහණ- පථවිකසිණ- සෙසකසිණ- අසුභ කම්මට්ඨාන- ඡඅනුස්සති- අනුස්සතිසම්මට්ඨාන- බ්‍රහ්මවිහාර- ආරුප්ප- සමාධි- ඉද්ධිවිධ- අභිඤ්ඤා- බඞ්ග- ආයතනධාතු- ඉන්ද්‍රියසච්ච- පඤ්ඤා භූමි- දිට්ඨිවිසුද්ධි- කඞ්ඛාවිතරණ විසුද්ධි- මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධි- පටිපදඤාණදස්සන විසුද්ධි- ඤාණදස්සන විසුද්ධි- පඤ්ඤා භාවනානිසංස නිද්දෙස විසින් තෙවිසි නිර්දේශයෙකින් දක්වන ලද්දේ වෙයි. මෙසේ මෙහි සමුදය-අවයව පරිමාණ විසින් පරිමාණකථනය ග්‍රහණධාරණ ශක්‍තිමතුන් ගේ ග්‍රන්ථපරිශීලන- යට ඉවහල්වන බව දතයුතු ය.

"ප්‍රසූතග්‍රන්ථයෙහි අධ්‍යයනශ්‍රවණාදි වශයෙන් පවත්නා ශිෂ්‍යලෝකය හට ප්‍රොත්සාහොත්පාදන සඳහා පරිමාණ කථා කතීව්‍ය යි."*

යනු එහෙයින් කියන ලදි. ශිෂ්‍යයන් ගේ ශක්‍ති පරිද්දෙන් පිළිපැදීමට පරිමාණකථනය අවශ්‍ය බව දතයුතු

පරිමාණකථනය මෙන් ප්‍රයෝජනකථනය ද ශිෂ්‍යලෝකයා ගේ පැවැත්මට කාරණ වෙයි. **"පරිමාණ ප්‍රයෝජන කථා මය ශිෂ්‍යලෝකප්‍රවෘත්තත්‍වඞග වෙයි"†** යනු **ප්‍රයෝජන** පරාක්‍රමබාහු වචන හෙයින් ග්‍රන්ථයෙක්හි ප්‍රයෝජන කථනය ද අවශ්‍ය වෙයි. ප්‍රයෝජනය බලන් මුඛ්‍යානුෂඞ්ගික වශයෙන් දෙපරිදි වේ. මෙහි මේ ප්‍රයෝජන **ද්වය** ම දක්වන **පරාක්‍රමබාහු නරදෙවයෝ**:

"එහි ප්‍රියශීල ප්‍රතිපත්තිවත්සල සුඝිඤ්ඡිත මුමුක්ෂුයොගී ජනය- ඞට ප්‍රීත්‍යුත්පාදනය මුඛ්‍ය ප්‍රයෝජන ය. චතුෂ්පාරිශුද්ධිශීලයෙහි

---

* විශුද්ධිමාර්ගී මහා සන්නය 1 පිටුව;

† විශුද්ධිමාර්ගී මහා සන්නය 2 පිටුව.

සුප්‍රතිෂ්ඨිත වැ අධිශීලශික්ෂා සිඳ කොට සුචරිතානුකූල කම්-සථාන පරිග්‍රහාදික්‍රමයෙන් පැවැත භාවනාප්‍රකර්ෂයෞන්නත ජනමක ලොකොත්තරඥනසිඳින් අධිප්‍රඥශික්ෂායෙහි මසතකප්‍රාපත වැ පරමදක්ෂිණීයක්ෂිණාශ්‍රවභාවයට සමප්‍රාපත වැ සමාපත්තිසුඛානුභවයෙන් දවස් යවා නිරුපධිශෙෂ නිර්වාණධාත්වාභාපදප්‍රාපතවනු මෙහි ආනුෂඞ්ගික ප්‍රයොජනය සි දතයුතුයි.''*

යනු පවසති. පිළිවෙත් පිරුමෙහි ආදර ගෞරව සම්ප්‍රයුක්ත වූ සසරින් මිදෙනු කැමැති යොගීජනයනට ප්‍රීතිය පහළවීම මුඛ්‍ය ප්‍රයොජනය බව මෙයින් පැවැසෙයි. ඒ යොගී ජනයන්ට එතදග්‍රඥශ්‍රවණයෙන් ප්‍රීතිය පහළ වීමෙන් සසරින් මිදීමට යුක්තප්‍රයුක්ත වැ අධිප්‍රඥශික්ෂාවෙහි හික්මී අමාමහ නිවන්සැප ලැබිය හැකි බැවින් තත් ප්‍රතිලාභය ආනුෂඞ්ගික ප්‍රයොජනය බව ද පැවැසෙයි. මේ ප්‍රයොජනය **''තෙසං පාමොජ්ජකරණං''** යන්නෙන් ග්‍රන්ථකාරකයෝ ම දක්වූහ. මෙසේ සංඥ- නිමිත්ත- කත්‍රී- පරිමාණ- ප්‍රයොජන සංඛ්‍යාවා අථ්පදවකය මේ ග්‍රන්ථයෙහි දක්වන ලද බැවින් විශුද්ධ බුද්ධිමත් **බුද්ඝොෂාචාර්‍ය-පාදයෝ** ද ප්‍රාචීනාචාර්‍යයන් ගේ චාරිත්‍රය අනුගමනය කළහ.

ධම්මසංගණිනා කාරන ආචාර්‍යපාදයන් විසින් ඒ වණ්ණනා කරනු ලබන ධම්මයට නිදානය ආදියෙහි ම තබා තදකථනානර වැ ප්‍රයොජනය- පිණ්ඩාර්ථය- පදාර්ථය සම්බන්ධය- අධිප්‍රායය- චොදනාය- ප්‍රොධනාය යැ යන මේ හැම කියයුතු වෙයි. මේ වනාහි ධම්මසංගණිනා විෂයෙහි ආචාර්‍ය සම්මතය බව ටීකා-සන්‍ය දෙකින් ම පැහැදිය. මෙහි වනාහි **''භගවතතං කිර සාවත්ථියං විහරනතං රතනි භාගෙ අසීතිසහසසරා දෙවපුතතෙහා උපසඞකමිංසු,''** යනාදීන් නිදානය දක්වන ලදී. **''අඥඤාජාමා ඔඛිජාමා''** යනාදි ගාථාවෙන් දිව්‍ය පුත්‍රයා විසින් විචාරණය කරන ලද කාරණය හෙළි පෙහෙළි කරමින් භාග්‍යවතුන් වහන්සේ විසින් **''සීලෙ පතිට්ඨාය''** යනාදි ගාථාවෙන් වදාළ ධර්මය ඔහු ගේ සැක පසිදලීමට ඉවහල් වූ බව පැහැදිය හෙයින් ප්‍රයොජනය ද මෙහි නිදාන මුඛයෙන් ම දක්වන ලදී. සත්ථරා ගේ විශුද්ධත්ව ශීල-සමාධි- ප්‍රඥා සංඛ්‍යාවා මාහාත්ම්‍ය ඉවහල් වන්නෙන් එය **''විසුද්ධිමහතතං භාසිසසං''** යනාදීන් පිණ්ඩාර්ථය විසින් දක්වන ලදී. **''සීලෙ පතිට්ඨායාති = සීලෙ යත්වා''** යනාදීන් පදාර්ථය ද සම්බන්ධය ද අධිප්‍රායය ද විභාවනය කරන ලදී. **''කිංසීලං''** යනාදිය

---

* **විශුද්ධිමාර්ගමහාසන්නය** 3 පිටුව

වොදනා විසින් ද **"පාණාතිපාතාදිහි වා විරමණතඤ්ඤ වතත පච්චතතං වා පූරෙණතඤ්ඤ චෙතනාදයො ධම්මා"** යනාදිය ශොධනා විසින් ද දක්වන ලදි. සමාධි-ප්‍රඥකථායෙහි ද මේ ක්‍රමයෙන් ම දක්වන ලදි. මෙසේ මේ ග්‍රන්ථය ආචාර්‍යවාරිත්‍රානුගමනයෙන් සම්පාදනය කරන ලද බව පැනෙයි.

මේ ග්‍රන්ථය වනාහි දීඝනිකායාදි පාළියට කළ සුමඞ්ගල විලාසිත්‍යාදි අර්ථකථාවන් මෙන් වෙන සංවර්ණනාවක් වත් අභිධර්මාවතාරාදිය මෙන් අන්‍යප්‍රකරණයක් වත් නො වනබව ටීකාචාර්‍ය මතය බැවින් මෙහි විශෙෂත්වයක් ඇතිබව පිළිගත යුතු ය. මේ වනාහි ඒ සුමඞ්ගලවිලාසිත්‍යාදීන් ගේ ම ශෙෂය යි* ඒ විශෙෂත්වය ටීකායෙහි ම කියන ලදි. සත්‍යයෙහි ද මේ ටීකා මතය ම ඇරැ දක්වන ලදි. මෙය වෙන සංවර්ණනාවක් නො වන බැවින් ම වසතු පූර්‍ණක වැ විනා සතුති පූර්‍ණක වැ අසම්පාදිත බව නිගමනය කරන ලද්දේ වෙයි.

"දීඝනිකායාදීන්ට සුමඞ්ගලවිලාසිත්‍යාදීන් මෙන් වෙන සංවර්ණනාවක් නො වන බැඳිනුදු අභිධර්මාවතාර – සුමතාවතාරාදීන් මෙන් ප්‍රකරණාන්තරයක් නො වන බැවිනුදු සතුති පූර්‍ණක නො දක්වන ලදි මේ වනාහි සුමඞ්ගලවිලාසිත්‍යාදීන් ගේ ම ශෙෂය යි දත යුතු යි."†

යන මේ **පරාක්‍රමබාහු වචනයෙන් ද** එය පැහැදිලි වෙයි. විශුද්ධිමාර්ගය පිළිබැඳි මෙවැනි නිගමනයක් කිරීමට ඉවහල් වූයේ **බුද්ධඝොෂාචාර්‍යපාදයන්** විසින් ම සුමඞ්ගලවිලාසිත්‍යාදි අර්ථකථා නිගමනයන්හි විශුද්ධිමාර්ගයේ බණවර ගණන සමඟ ඒ අර්ථකථාවන්හි බණවර ගණන එක් කොට සලකන ලද බැවිනි. **සුමඞ්ගල විලාසිනියේ** විශුද්ධිමාර්ගයේ බණවර ගණන සමඟ බණවර එක්සිය සාලිසෙකි. **පපඤ්චසූදනියේ** එක්සිය සඟවෙකි. **සාරත්‍ථප්පකාසිනියේ** එක්සිය සත්තිසෙකි. **මනොරත්ථපූරණියේ** එක්සිය තොපනසෙකි‡ මෙසේ වතුරාගම සංවර්ණනානිගමනයෙහි විශුද්ධිමාර්ගයේ අර්ථපනස් බණවර සමඟ ඒ ඒ ආගම්‍යසංවර්ණනාවන්හි බණවර ගණන කැපි කොට දක්වන ලද්දේ ඒ මේ විශුද්ධි

---

* විසුද්ධිමග්ගටීකා (1928 මුද්‍රිත) 2 පිටුව;

† විශුද්ධිමාර්ගී මහා සත්‍යය 3 පිටුව;

‡ සුමඞ්ගලවිලාසිනී (1925 මුද්‍රිත) 780 පිටුව; පපඤ්චසූදනී (1926 මුද්‍රිත) 1030 පිටුව; සාරත්‍ථප්පකාසිනී iii (1930 මුද්‍රිත) 235 පිටුව; මනොරත්ථපූරණී (1936 මුද්‍රිත) 855 පිටුව.

මාගීය චතුරාගමසංවණ්ණනාශෙෂය වත බැවිනි. විශුද්ධිමාගීයෙහි සාමාන්‍යසංඥව **චතුරාගමසංවණ්ණනාශෙෂය** යනු මෙයින් ම සිද්ධ යැ සි හැගේ. **ප්‍රධාන** සහිඅටුවා සතරෙහි පැහැදිලි කළයුතු කරුණු රැසක් මේ විශුද්ධිමාගීයෙහි විසතර වශයෙන් දක්වන ලද බැවින් මේ ග්‍රන්ථයට ඒ සාමාන්‍ය නාමය මැනැවින් ගැළපෙයි ග්‍රන්ථනාමය දැනගැනීමට මේ කාරණය ම **පමණ** වෙයි. එහෙත් මේ ග්‍රන්ථය පිළිබඳ ඇතැම් විචාරකයන් ගේ අදහස් දැක්වීමෙන් පාඨකයනට යම්කිසි එළියක් ලැබිය හැකි වෙයි.

"උපතිස්ස ගේ ඇවසැකිල්ලක් හෝ රාමුවක් වැනි විමුත්ති මග්ගය තමන් ඉදිරියේ ඇතුව බුද්ධඝොෂ විසින් විසුද්ධිමග්ගය ලියූ බව ද තම ගසළ බුද්ධියෙන් හා පාණ්ඩිත්‍යයෙන් එහි අඩු තැන් පුරවා ශ්‍රෙෂ්ඨ කෘතියක් නිපැදවූ බව ද අප නිගමනය යි."*

මේ වනාහි **පූකානුවර** පර්ගූසන් විද්‍යාලයේ **පාළිභාෂාව** පිළිබඳ ආචාර්යවරයකු වූ **ඇම්. ඒ; පී එච්. ඩී. උපාධිධාරී පී. වී. බාපත්** මහතා ගේ **මතය** විශුද්ධිමාගී මහාඝන්‍ය ප්‍රස්තාවනාවෙහි දැක් වූ සැටි ය. මෙයින් විශුද්ධිමාගීය විමුක්තිමාගීය ළඟ තබා ගෙන එහි උෘනපූරණය කරමින් නිපදවන ලද ග්‍රන්ථයක් බව හෙළි වෙයි.

"ථෙරවාදීන්ට විශුද්ධිමාර්ගය යම්සේ ද? අභයගිරිකයන්ට විමුක්තිමාගීය ද එසේ ය. මහාවිහාරිකයන්ට විමුක්තිමාගීයේ එන ඇතැම් මත ඛණ්ඩනය කිරීම අවශ්‍යයෙන් ම උවමනා වී නිබෙන්ට ඇත. එමෙන් ම ඔවුන්ට එවැනි ග්‍රන්ථයෙක අවශ්‍යතාව බෙහෙවින් බලපවත්වන්ට ඇත. එසේ නම් බුද්ධඝොෂ හිමියන් ගෙන් ඒ කාර්‍ය්‍ය මැනැවින් ඉටුවී නිබෙන බව කිය හැකි ය."†

මේ වනාහි පින්වත්තේ සද්ධම්මාකර පිරිවෙන්හි ආචාර්ය **පණ්ඩිත පින්වත්තේ දෙවානඳ සඨවිරයන්** වහන්සේ ගේ මතය යි. මෙයින් විමුක්තිමාගීය අභයගිරිකයන් ගේ ග්‍රන්ථයක් බව ද විශුද්ධිමාගීය මහාවිහාරිකයන් ගේ ග්‍රන්ථයක් බව ද හෙළි කරන අතරු විමුක්තිමාගීයේ ඇතැම් මත ඛණ්ඩනය සඳහා විශුද්ධිමාගීය කරන්නට ඇති බව ද සැකසහිත වැ දැක්වෙයි. මෙයින් බාපත්මතය නිරස්ත වෙයි. විශුද්ධිමාගීය විමුක්තිමාගීයේ උෘනපූරණයක් කොට වැ එයට පටහැණි වැ සැපයූ ගතක් බව මෙයින් පැවැසෙන බැවිනි.

---

* විශුද්ධිමාගීමහාඝන්‍යයෙ ප්‍රස්තාවනා xxxviii පිටුව;

† විසුද්ධිමග්ගගණ්ඨි (1954 මුද්‍රිත) විඥප්තිය x පිටුව.

"මේ නිදසුන්වලින් අපට පෙනෙන්නේ තොයෙක් පොත් වලින් කරුණු උපුටා සඬ්ග්‍රහ කෙරෙමින් ලියා තිබුණු සිංහල විසුද්ධිමග්ග අට්ඨවාව බුදුගොස් තෙරණුවන් විසින් පාළියට පෙරළූ බව ය. විසුද්ධිමග්ගය සිංහල රටේ සිංහල භික්ෂුවක් අතින් නිපයුනක් බවට එහි පෙනෙන නානාවිධ කථාවන් සහ ප්‍රවෘත්තීනුත් නිදසුන් කළ හැකි ය. විසුද්ධිමග්ගය විමුතති මග්ගයේ පරිවර්තනයකැ යි ඇතැම් උගත්තු කල්පනා කෙරෙති. මේ දෙ පොතේ සමාන්‍ය දැඩි වශයෙන් පෙනෙනත් එකකින් එකක් පරිවර්තනය නො කළ බවට නිදසුන් බෙහෙවි."*

මේ වනාහි සරික්කාමුල්ලේ සිරිනන්දන පිරිවෙන් භික්ෂු **පණ්ඩිත මැදලයන්ගොඩ විමලකීර්ති සථවිරයන්** වහන්සේ ගේ මතය යි. මෙයින් සිංහල භික්ෂුවක් විසින් ලියා තැබූ සිංහල විශුද්ධිමාගීයක් බුදුගොස් භික්ෂුන් විසින් පාළියට පෙරළන ලද බවත් විශුද්ධිමාගීය විමුකතිමාගීයේ පරිවර්තනයක් නො වන බවත් දක්වෙයි. මුලින් සඳහන් කළ බාපත්මතය මෙයිනුදු නිරසා වෙයි. මෙසේ අපරට විචාරකයන් දෙපළක ගේ අදහස් මෙහි ලා දක්වන ලද්දේ බාපත්මතය එයින් ම බිඳවැටෙන බව දැක්වීමට නො වේ. බාපත්මතය අප ද නො පිළිගන්නා බැවින් එයට සාධක වශයෙන් ඒ විචාරකයන් ගේ අදහස් ඇද දැක්වීම වත් ඒ අදහස්හි සාරයක් ඇද්ද යි විමසිමටත් ය. පණ්ඩිත දෙවානන්ද සථවිරමතය ගැන යමක් පළමු කොට කියයුතු වෙයි. විමුකතිමාගීය අභයගිරිකයන් ගේ බව ඒ මතයෙහි සඳහන් වේ. විමුකතිමාගීය කළ **උපතිස්ස භික්ෂුන්** අභයගිරිකයකු බව මේනාක් ඔප්පු නො කළ බැවින් එහි වෙනස් මත ඇති පමණින් එය අභයගිරිකයන් ගේ ග්‍රන්ථයෙකැ යි නිගමනය කළ නො හැකි ය. මහාවිහාරිකයන් ගේ යැයි සම්මත ග්‍රන්ථයන්හිත් වෙනස් මතයන් ඇතැම්විට දක්නට ලැබෙන බැවිනි. මහා විහාරිකයන් විසින් ඛණ්ඩනය නො කළ හැකි මතයක් විමුකති මාගීයෙහි නැති බව දැනට පළවී තිබෙන කරුණු වලින් පෙනේ. එහෙයින් මහාවිහාරිකයන් විමුකතිමාගීමතයන් ඛණ්ඩනය කිරීමට බුදුගොස් මාහිමියන් යොදවන ලද බව පිළිගැනුමට කරුණු නැති. විශුද්ධිමාගීය කිරීමෙන් විමුක්තිමාගීයේ ඇතැම් මතයනට පහර වැදීම වූ බැවින් මහාවිහාරිකයන් ලඝුකොට සැලකිය යුතු නො වේ. අනතුරුව පණ්ඩිත විමලකීර්ති සථවිර මතය ගැන සලකා බැලිය යුතු වෙයි. සිංහල භික්ෂුවක් විසින්

---

* ශාසන වංශප්‍රදීපය (බු: ව: 2498 මුද්‍රිත) 81 පිටුව;

ලියන ලද සිංහල විශුද්ධිමාර්ගී අට්ඨවාව බුදුගොස් හිමිතුමන් විසින් පාළියට පෙරළන ලද බව තනමතය යි. විමුක්තිමාර්ගීයේ පරිවර්තනයක් නොවන බව ද උන්වහන්සේ ගේ පිළිගැනීම යි. මේ මතය විඥයන් විසින් ප්‍රශස්තාකාර යි පිළිගැනීමෙහි වරදෙක් නැති. සිංහල අට්ඨවා පාළියට පෙරැළීමට මෙහි පැමිණි බුදුගොස් හිමියනට පරිවර්තනශක්තිය ඇති දැයි විමසීම මහාවිහාරික ප්‍රාඥයනට අභිමතවනු පුදුමයක් නොවන බැවිනි. එහෙත් සිංහල විශුද්ධිමාර්ගී අට්ඨවාවක් තුබුණු බවට කිසිම සාධකයක් නැති බැවින් මේ මතය තවත් විචාරණයට තබිය යුතු වෙයි. එනම් අට්ඨවාවක් ගැන කිසිම දැනීමක් අපට මේ තාක් නුපත් බැවින් විචාරකයනට ඉඩ තබා මේ ග්‍රන්ථය පිළිබැඳි අප ගේ අදහස මෙසින් මතු දක්වම්හ.

ඒ මේ විශුද්ධිමාර්ගීය වනාහි හෙළඅට්ඨවා මැනැවින් ඉගෙන මහාවිහාරිකයන් ගේ සුවිශුද්ධචිත්තශ්‍රවය මැනැවින් දැන හෙළ බසින් පැවැති මහඅට්ඨවාහි ගැබ් වූ කරුණු උපයෝග කොට ගෙන ගුරුමුඛයෙන් හා මහවෙහෙර වැස් උගත් තෙරවරුන් ගෙත් අසා දැනගත් ඇතැම් මහතෙරවරුන් හා උවසු උවැසියන් පිළිබඳ කථාප්‍රවෘත්තියන් ඒ ඒ තැනට සාධක වශයෙන් ඇරැ පාමින් මහවෙහෙර වැසි සඞ්ඝයා ශක්තිවිමර්ශනු සඳහා ඉදිරිපත් කළ **"අණෙනාජවා බහිජවා"** යනාදි ගාථා දෙක මාතෘකා කොට ගෙන අනුබුදු බුදුගොස් මාහිමියන් විසින් සුබුද්ධ වෛභව්‍යය ද විදහා පාමින් සම්පාදනය කරනලද චතුරාගම-සංවර්ණනාශ්‍රේෂ්ඨග්‍රන්ථයෙකි. උන්වහන්සේ විසින් මේ ග්‍රන්ථය සම්පාදනය කිරීමෙහි දී හෙළමහඅට්ඨවාහි පැවැති ඇතැම් සංවර්ණනාවන් හා කථාවස්තූන් හෙළබසින් පාළියට පෙරළන ලද බව ද දඹදිව දී උන්වහන්සේ විසින් ම කරනලද ප්‍රඥප්ති-වර්ධනයට ඉවහල් වූ **ඤාණෝදය** ප්‍රකරණයෙහි ඇතුළත් ධර්මාර්ථ විවරණයන් මහාවිහාරිකයන් ගේ සුවිශුද්ධ චිත්තශ්‍රවයට ගැලපෙන සේ සකස් කොට මෙහි ඇතුළත් කළ බව ද අප අදහස යි. මෙසේ මේ ග්‍රන්ථය සැපයීමෙන් බුදුගොස් හිමියෝ තුමන් ගේ පරිවර්තන ශක්තිය ද පරමවා දූෂණයෙහි හා සවමත භූෂණයෙහි පොහොසත් බව දැක්වීමෙන් මහාවිහාරිකයන් ගේ මත මැනැවින් ඉගෙන එහි සථිර වැ පිහිටා සිටින බවට ප්‍රතිඥාප්‍රදානය ද හෙළ අට්ඨවා පාළියට පෙරැළීමෙන් මහාවිහාරිකමතය මැනැවින් සංරක්ෂණය වී දෙශාන්තරයෙහි පවා පැතිරී යන අයුරු ද හෙළි කළහ. කරුණු මෙසේ හෙයින් මහාවිහාරිකයන් ගේ සම්පූර්ණ

විශ්වාසය දිනාගැනීමට බුදුගොස් හිමිතුමන් සමර්ථවූයේ මේ විශුද්ධිමාර්ගයෙහි එයට සරිලන ශක්තිය අන්තර්ගත වැ පවත්නා බැවිනි.

බාපන් මහතා කියන්නා සේ **විමුක්තිමාර්ගය** ඉදිරියෙහි තබා ගෙන එහි උත්තරාර්ධය කරමින් මේ විශුද්ධිමාර්ගය කරන ලද්දේ තම් බුදුගොස් හිමියන් ගේ බුද්ධඝෝෂාචාර්යය පිළිබඳ පිළිනැනුමෙක් මහාවිහාරිකයනට නො වේ. එවැනි උත්තරාර්ධ බුද්ධඝෝෂ මහාවිහාරිකයන් ගේ චිත්තාරාධනය නො කළ හැකි බව බුදුගොස් හිමියන් හොඳින් ම දැන සිටි බව ඔවුන් පිළිබඳව වැ කළ වැඟුම්වලින් පෙනේ. විමුක්තිමාර්ගයත් විශුද්ධිමාර්ගයත් සංසන්දනය කරමින් තුලනාත්මක පරීක්ෂණයක් කළ **බාපන්** මහතා ගේ විශුද්ධිමාර්ග විවේචනය පිළිබඳ සිංහලානුවාදය හදන්න ශ්‍රද්ධාතිෂ්‍ය සථවිරයන් වහන්සේ විසින් ලියනලද ප්‍රස්තාවනාවෙහි සඳහන් වන බැවින් එගැන අමුතු ප්‍රස්තාවනාවක් නො දරමිහ. ඒ සිංහලානුවාදය කියවන විචාරකයනට හැඟෙන අදහස් කෙසේ වෙතත් අපට හැඟීගියේ මහත් පරිශ්‍රමයෙකින් ඒ විදේවනය කළ බව යි. එයින් අප අතරැ අභාවයට ගිය විමුක්තිමාර්ගය පිළිබඳ අගතා විවරණයක් අපට ලැබුණුබව නො මසුරු වැ කියමිහ. එහෙත් විශුද්ධිමාර්ගය පිළිබඳ වැ කළ විවේචනය අප සිත් නො ගත් බව ද කියයුතු වැ තිබේ. විශුද්ධිමාර්ගය විමුක්තිමාර්ගයේ උත්තරාර්ධයක් වත් පරිවර්තනයක් වත් නො වන බව අප ගේ හැඟීම යි. පිටකත්‍රය සහිත සිංහලාර්ථකථාවන් මැනැවින් උගත් බුදුගොස් හිමියන් විසින් විශුද්ධිමාර්ගය සම්පාදනය කිරීමෙහි දී පොවළා බුදුවදන් සහිත ගෙළටුවා ඇඹරි කළ බව තාද්ග්‍රන්ථයෙන් ම පැහැදෙන බැවින් විමුක්තිමාර්ගය එයට අමූලයක් වනු පැහැදෙයි. ශීල සමාධි- ප්‍රඥා සංඛ්‍යාත ත්‍රිවිධශාසනය පිළිබඳ කරුණු විස්තර කිරීමෙහි දී පිටකත්‍රයෙන් නොයෙක් කරුණු උපුටා ගැනීමට හැකි බව නො සලකා හුදු විමුක්තිමාර්ගය ම සංසන්දනය කොට කරන ලද විශුද්ධිමාර්ග විවේචනය අනුචිත බව අප ගේ හැඟීම යි. රොගනිදානය විමසා ලෙඩෙකුට පිළියම් කළ චිකිත්සකයකු ගේ බෙහෙත් සීට්ටු රැස් කොට මේ බෙහෙත් ද්‍රව්‍යයන් අසුවල් බෙහෙත් වට්ටෝරුව ඉදිරියේ තබාගෙන ලියනලද බව පැහැදෙයි නිගමනය කිරීම වැනි ප්‍රයත්නයක් **බාපන් මහතා** විසින් දරා තිබෙන බව පැහැදෙයි. විචාරණයට එය ද කරුණක් වුවත් වට්ටෝරුවට වඩා පැරැණි **චරක සුශ්‍රුතාදි** වෛද්‍යග්‍රන්ථයන්හිත් ඒ රොගයට ඒ බෙහෙත් ද්‍රව්‍යයෝ යොදා තිබෙද්දැ යි විමසීම ප්‍රඥාගොචර ය.

ග්‍රන්ථකර්තෘයාට අනතුරුව කච්චායනව්‍යාකරණය පිළිබඳව යම්කිසි මෙහිලා දැක්විය යුතු වැ තිබේ. මේ විශුද්ධිමාර්ගය **කච්චායනව්‍යාකරණය** විශුද්ධිකාමී බොහෝ දෙනාගේ ප්‍රයෝජනය සඳහා කරන ලද බව ග්‍රන්ථයෙහි ම සඳහන් වන බැවින් මෙහි කච්චායනවරයා ගේ කරුණාමහිමය පෙරැගැමි වැ පැනෙයි. අනුබුදු මිහිදුමාහිමියන් විසින් හෙළබසින් තැබූ අටුවාවන් පෙළබසට පෙරැළීමෙහි ශාක්‍යවංශික මහාවිහාරික මහතෙරවරුනට පැමෙහි අදහස ඉතිහාසප්‍රවෘත්තීන්ගෙන් පැනෙන බැවින් මේ කච්චායනවරයා ගේ ප්‍රඥාසම්පන්නතාය ද පෙරගැමි වැ පැනෙයි පිටකත්‍රයෙහි ද තදර්ථකථාවන්හි ද ව්‍යාකරණවිෂයයෙහි ද දර්ශනශාස්ත්‍රයෙහි ද වෛදිකග්‍රන්ථවිෂයයෙහි ද මානවධර්මශාස්ත්‍රවිෂයයෙහි ද ඉතිහාස පුරාවිද්‍යාවිෂයයෙහි ද කාව්‍යවිද්‍යාවෙහි ද ලක්ෂණශාස්ත්‍රයෙහි ද පැහිරී ගිය බුඩි මාහාත්ම්‍යයක් මෙහි කච්චායනවරයා කෙරෙහි පැවැති බව මොනවට පැනෙයි. පිටකත්‍රයෙහි හා තදර්ථකථාවන්හි පැහිරී ගිය බුඩියක් ඇතිබවට මේ විශුද්ධිමාර්ගය ම සාධක වශයෙන් දැක්වීම ප්‍රමාණවෙයි. ව්‍යාකරණශාස්ත්‍රය මැනැවින් දත් බවට තත්කෘතීහු ම සාධක වෙති. මේ විශුද්ධිමාර්ගයන් චතුරාගමාර්ථකථාවනුත් විමසීමෙන් බලන උගතුනට මෙහි කච්චායනයා වූ **බුදුඝොෂ හිමි තුමන් ගේ** ශාබ්දිකත්වය පිළිබඳ සැකයෙක් පහළ නොවෙයි. **ඇතැම් කෙනකුන්** විසින් උත්වහන්සේ ගේ ව්‍යාකරණ ඥානය ගැන ද සැක පහළ කර තිබෙන බැවින් මේ කාරණය ගැන විශෙෂයෙන් ප්‍රයත්නයක් දැරිය යුතු වැ තිබේ.

"ගහපතිදාරකා පන කච්චෙජහි සෙදං මුඤ්චනෙනහි පිට්ඨියා ලොණං පුප්ඵමානාය භූමිං කසිත්වා නිහතමානදප්පා හොන්ති"*

යන මේ පාඨය ව්‍යාකරණශාස්ත්‍රය පිළිබඳ සුනිශිතබුඩියක් නැතියකුට මෙසේ ලිය නොහැකි ය. මෙහි **"කච්චෙජහි සෙදං මුඤ්චනෙනහි"** යනු ද **"පිට්ඨියා ලොණං පුප්ඵමානාය"** යනු ද විශෙෂව්‍යාකරණ නීතියකට අනුවැ යොදා තිබෙන බැවිනි. විශුද්ධිමාර්ගයෙහි ඉන්ද්‍රියසත්‍යනිර්දේශයෙහි ඉන්ද්‍රියාර්ථ විවරණය කිරීමෙහිලා **"ඉන්ද්‍රියමිදං ලිඞ්ගමිදං දෘෂ්ටමිදං සෘෂ්ටමිදං ජුෂ්ටමිදං දත්තමිතිවා"** 5-2-93 යන පාණිනීය සූත්‍රය අනුගමනය කළ බව පෙනේ. මේ සූත්‍රය හා විශුද්ධිමාර්ගයෙහි එන **"කතමා පන තෙසං ඉන්ද්‍රියට්ඨා නාමාති? ඉන්ද්‍රලිඞ්ගට්ඨා ඉන්ද්‍රියට්ඨා,**

---

* පපඤ්චසූදනී (ක්‍රි: ව: 1917 මුද්‍රිත) 400 පිටුව

ඉඤ්ඤදෙසිතඤ්ඨෝ ඉන්ද්‍රියට්ඨෝ, ඉඤ්ඤදිට්ඨඤ්ඨෝ ඉන්ද්‍රියට්ඨෝ, ඉඤ්ඤසිට්ඨඤ්ඨෝ ඉන්ද්‍රියට්ඨෝ, ඉඤ්ඤප්පටිලාභට්ඨඤ්ඨෝ ඉන්ද්‍රියට්ඨෝ''* යනු සංසන්දනය කරනු මැනැවි. ප්‍රඥාභූමි නිර්දේශයෙහි ඉදම්ප්‍රත්‍යයතාවී විවරණය ද පාණිනීව්‍යාකරණානුගමනයෙන් කළ බව **''ඉදප්පච්චයා එව ඉදප්පච්චයතා, ඉදප්පච්චයානං වා සම්භවෝ ඉදප්පච්චයතා, ලක්ඛණං පනෙත්ථ සද්දසත්ථතෝ පරියෙසිතබ්බං''†** යන මෙයින් හෙළි වෙයි. මෙහි කී ශබ්දශාස්ත්‍රය පාණිනීව්‍යාකරණය බව පැහැදිලි ය. මෙසේ මේ කතීවරයා ව්‍යාකරණ ශාස්ත්‍රවිෂයෙහි ද පැතිරී ගිය බුද්ධියක් ඇතියකු බව මැනැවින් හෙළිපෙහෙළි වෙයි. දර්ශනශාස්ත්‍රයෙහි ව්‍යාප්ත බුද්ධි ප්‍රභාවයක් පැවැති බව විශුද්ධිමාර්ගීය කියවන දර්ශනශාස්ත්‍රය දතුවනට මැනැවින් වැටහෙයි. ප්‍රතීත්‍යසමුත්පාද නිර්දේශයෙහි දක්වෙන **''පුරිමෙනාකාරෙන පච්චයසාමඤ්ඤං පරිදීපෙතෙන පච්චවපදෙන පවත්තිධම්මානං පච්චයසාමඤ්ඤං ආයතනවුත්තිනත්තා සස්සතාදිහෙතු විසමහෙතුවාදවත්තිව්‍යාදිපහෙදනං සස්සතාදීනං අභාවෝ පරිදීපිතෝ හොති''‡** යන පාඨයෙහි ශාස්වතවාදය- අහෙතුවාදය- විෂමහෙතුවාදය- වශවර්තිවාදය සඳහන් වන බැවින් ද, **''පච්ඡිමෙන ච පදෙනාකාරෙන ධම්මානං උප්පාදපරිදීපිතෙන සමුප්පාදපදෙන පච්චය සාමඤ්ඤං ධම්මානං උප්පත්තිතෝ විභතා උච්ඡෙදනත්ථික අකිරියවාදාති උච්ඡෙදදිට්ඨාදිතෝ පරිදීපිතෝ හොති''ද** යන පාඨයෙහි උච්ඡෙදවාදය- නාස්තික වාදය- අක්‍රියවාදය සඳහන් වන බැවින් ද බුදුගොස් මාහිම්යන් නොයෙක් දර්ශනවාදයන් දත් බව පැනෙයි. දර්ශනශාස්ත්‍රයෙහි දක්වෙන **ප්‍රකෘති- පුරුෂ- ආත්ම- අණු- කාලාදි** පදාර්ථයන් දත් බවට මේ කරුණු සාධක වෙති.

ප්‍රකෘති- අණු- කාලාදීන් ගේ වශයෙන් ලොකප්‍රවෘත්තිය දක්වීම විෂමහෙතුවාදය බව ද, ඊශ්වර- පුරුෂ ප්‍රජාපතීන් ගේ වශයෙන් ලොක නිර්මාණය දක්වීම වශවර්තිවාදය බව ද, ආත්මය සදාකාලිකත්වයෙන් දක්වීම ශාස්වතවාදය බව ද, ආත්මය ඉහාත්මයෙහි ම ප්‍රවර්ත්‍යාවත්ව දක්වීම උච්ඡෙදවාදය බව ද, කර්මඵලාදීන් ගේ අභාවය දක්වීම නාස්තිකවාදය බව ද, පින් පව් කිරීමක් නැතැයි ගැනීම අක්‍රියවාදය බව ද දතයුතු ය.

---

* විසුද්ධිමග්ග 366 පිටුව; † විසුද්ධිමග්ග 387 පිටුව,
‡ ද විසුද්ධිමග්ග 389 පිටුව.

"පටිච්චසමුප්පන්නාධම්මෙසු විමූළ්හෝ අවිජ්ජාදීනං සඞ්ඛාරාදීනං පවත්තිං අගණ්හන්තෝ 'අත්තා ජානාති වා න ජානාති වා' සෝ එව කරොති කාරෙති ච යෝ පටිසන්ධියං උප්පජ්ජති තස්ස අණු ඉස්සාරාදයෝ කලලාදිභාවෙන සරීරං සණ්ඨපෙන්තා ඉන්ද්‍රියානි සම්පාදෙන්ති, සෝ ඉන්ද්‍රියසම්පන්නෝ ජූඣති වෙදියති තණ්හීයති උපාදියති ඝටීයති, සෝ පුන භවන්තරෙ භවතීති වා, සබ්බෙ සත්තා නියතිසඞ්ගති භාවපරිණතා' ති වා විකප්පෙති"* යන මේ පාඨයෙහි **'අත්තා ජානාති වා'** යන්නෙන් කපිලමතය ද **'න ජානාති වා'** යන්නෙන් කණාදමතය ද දක්වන ලද බව විශුද්ධිමාර්ගමහාසන්නය කියයි. එසේම මේ පාඨයෙන් සෙශ්වර වාදය ද නියතිවාදය ද සඞ්ගතිවාදය ද සභාවවාදය ද බුදුගොස් හිමියන් දන් බව පැනෙයි. පාතඤ්ජලමතය බුදුගොස් හිමි-- තුමන් දන් බව ප්‍රසිද්ධ කරුණෙකි. ඒ බව බුද්ධඝොෂප්‍රවෘත්ති යෙහි මැනැවින් සඳහන් වන බැවින් විශෙෂ ප්‍රයත්නයක් දැරිය යුතු නො වෙයි.

'බුද්ධඝොෂපාදයන් පතඤ්ජලික්‍රමයට ළැදි වැ සිටිබව එක් පරම්පරාගත කථාවෙක් අපට කියයි. එය උන්-වහන්සේ ගේ ම අර්ථකථාගත වචන වලින් මැනැවින් හෙළි වෙයි. පුරුෂ හා ප්‍රකෘති සංඛ්‍යාත මූලික යුගලය කෙරෙහි විශ්වාසය තබන සාංඛ්‍ය හා යොගක්‍රමයට, එතම් ප්‍රකෘතිවාදයට බුද්ධඝොෂපාදයෝ මුළුමනින් ම පහර දෙති. ලොකය පිළිබඳ මූලකාරණය කොට සලකන ප්‍රකෘතිවාදීන් ගේ ප්‍රකෘතිමතයට වඩා අවිද්‍යාව පිළිබඳ බෞද්ධමතය වෙනස් බව දැක්වීමට උන්වහන්සේ මහත් ප්‍රයත්නයක් දරා තිබෙන බව පෙනේ. බාහිරිකයන් ගේ පුරුෂ හා ප්‍රකෘතිමතයට වඩා නාමරූපය පිළිබඳ බෞද්ධමතය වෙනස් බව දැක්වීම ගැන ද එසේ මැයි. කොසඹෑවියෙන් නමුත් සාංඛ්‍ය හා යොගක්‍රමය ගැන පැවැති උන්වහන්සේ ගේ පූර්වකතිය පෙරට ම එන ලෙසකුදු පැනෙයි. උන්වහන්සේ ගේ නාමරූපය පිළිබැඳි මතය සාංඛ්‍ය දර්ශනයේ පුරුෂ-ප්‍රකෘතිමතයට බෙහෙවින් සමාන බව පැනේ. පුරුෂ-ප්‍රකෘතියුගලය පැහැදිලි කිරීමට යෙදූ අඬ පඬුතාත්‍රායය උන්වහන්සේ ද යොදනසේක. සුප්‍රසිද්ධ නාගසේන- අශ්වඝොෂපාදයන් වැනී බෞද්ධවිද්වතකයන් ගේ ප්‍රාමාණ්‍යයට අනුවැ බුද්ධඝොෂපාදයන් තම මතය ගොඩනඟා ගත් බවට තර්ක කරන්නට ද ඉඩකඩ තිබේ. එහෙත් බෞද්ධ

---

* විසුද්ධිමග්ග 407 පිටුව

චින්තකයන් සාංඛ්‍යදර්ශීනාගත චින්තාවන් පිළිබඳ ප්‍රභාවයක් නො ලත් බව කාට කිය හැකි ද? උපයොග කරගත හැකි හැම සාක්ෂියක් කෙරෙහි ම සැලකිල්ලක් දක්වන විට නාමරූපය පිළිබඳ වූ බෞද්ධ මතය සාංඛ්‍යදර්ශීනයෙහි පුරුෂ-ප්‍රකෘතියුගලයට සමීප ලෙස ම ගැළපෙන බව කියන M. Oltramare මහතා ගේ අදහසට අපට ද එකඟවන්නට සිදු වෙයි."*

මේ වනාහි **"බුද්ධඝෝෂ ජීවිතය හා කෘති"** නමැති ග්‍රන්ථය සම්පාදනය කළ ඇම්. ඒ., බී. ඇල්. උපාධිධාරී **විමල-චරණ ලෝ** මහතා ගේ ප්‍රකාශයෙකි. මෙයින් බුදුගොස් හිමියන් සාංඛ්‍ය-යොගදර්ශීනක්‍රමයන් දැනසිටිබව ප්‍රවීණ උගතුන් විසිනුදු පිළිගෙන තිබෙන සැටි හෙළි වෙයි. විශුද්ධිමාර්ගය විමසීමෙන් ඒකවන විට මෙය මැනැවින් පෙනෙයි. මේ කතෘවරයා වෛදික ග්‍රන්ථ විෂයෙහි පරතෙරට පැමිණියකු බවත් මානව-ධර්මශාස්ත්‍රාදීවිද්‍යාවිෂයෙහි ප්‍රවීණයකු බවත් සවිවාදවිෂයෙහි විශාරදයකු බවත් විද්‍යාශිල්පකලාවෙදියකු බවත් සුප්‍රසිද්ධ ය.

"බොධිමණ්ඩසමීපම්හි – ජාතො බ්‍රාහ්මණමාණවො
විජ්ජාසිප්පකලාවෙදී – තීසු වෙදෙසු පාරගො
සම්මාවිඤ්ඤුතසමයො – සබ්බවාදවිසාරදෙ,
වාදපථී ජම්බුදීපම්හි – ආහිණ්ඩනෙතා පවාදිකො"†

යනාදී මහාවංසාගත වචනයෙන් ඒ බව පැහැදිලි වෙයි. මේ මහාවංසාගත ප්‍රවෘත්තිය කෙරෙහි විශ්වාසය නො තබන ඇතැම් කෙනෙක් බුදුගොස් හිමිතුමා බ්‍රාහ්මණ ජාතිකයකු කොට ද නො සලකති. අම්බලම්ගොඩ අග්‍රාරාමාධිපති **පොල්-වත්තේ බුද්ධදත්ත මහාස්ථවිරපාදයන් වහන්සේ** මේ මතයෙහි පෙරැගැමි වන සේක.

'මෙහිදී මතුවෙන කාරණයක් නම් ඉතා වැඩිදෙනෙකුන් විසින් පිළිගෙන තිබෙන බුඩඝෝෂ තුමා බ්‍රාහ්මණයෙක යන අදහස බිඳවැටීම යි. එතුමා ගේ අටුවාවල බ්‍රාහ්මණයන්ට එල්ල කර තිබෙන උපහාසයන් බලනවිට ඒවා බ්‍රාහ්මණ ජාතියෙහි උපන්නකු විසින් කියහැකැයි පිළිගැනීම අපහසු ය. බමුණන් ගේ කැදරකම පෙන්වීම සඳහා ආහාරහත්ථක, අලංසාටක, භුත්තවමිතක, තත්‍රවට්ටකාදී වචනවලට වඩාත් දී තිබෙන

* The Life and work of Buddhaghosa, 135-136 පිටු
† මහාවංස (37 පරි:) 215-216 ගාථා.

සැටි දන්නෝ ඒ විස්තරය බ්‍රාහ්මණවංශිකයකු විසින් ලිය හැකි ය යි පිළි නො ගනිත්. එවැනි තැන් බොහෝ වෙති."*

මේ වනාහි උන්වහන්සේ ගේ ප්‍රකාශයෙකි. බුඩසොෂ හිමි තුමන් ගැන මෙවැනි ප්‍රකාශයක් කිරීමට හදනත බුද්ධදත්ත මහතෙරපාණන් ධෛර්‍යවත්වූයේ කරුණු දෙකක් මත බව පෙනේ. එකක් නම් බුදුගොස් හිමිතුමා ලෙඛනයෙහි දක්ෂයකු වන බැවින් කායසථ ගොත්‍රිකයකු බව පිළිගැනීම ය. අනෙක නම් බමුණකු විසින් බමුණන් උපහාසයට ලක්කිරීම නො පිළිගැනීම ය. මේ කරුණු දෙක ප්‍රබල සාධකයන් ලෙස විවෙචන බුද්ධිය ඇතියන් පිළිගනිති යි නො හැගේ. මෙයින් ප්‍රථම කාරණය සම්පීනය කිරීමට **බුධඝොෂ** නාමයෙහි සඳහන් **ඝොෂ** යන්න වඩාදෙශයෙහි බැවහර වන **අරවින්දඝොෂ්** නාමයෙහි **ඝොෂ්** යන්නට තුලනය කෙරෙති. එසේ තුලනය කොට ඝොෂ් වගීයා කායසථ ගොත්‍රයට අයත්ය යි අසා තිබෙන බව ද දක්වති. කායසථ යන්නට අවු දෙන **ඇල්. ආර්. වාඩියා** (ඇම්. ඒ., ඇල්. ඇල්. බී) මහතා ගේ පිණිව ද සොයති අපේ මහාවංශයෙහි පැතෙන බුද්ධඝොෂප්‍රවෘත්තිය ගැන සැකකරන මේ බුද්ධදත්ත මහතෙරපාණෝ තුලනානම්ක **ඝොෂ්** ව්‍යවහාරය ගැනත් කායසථගොත්‍රිකයන් ගේ **ලෙඛකත්වය** ගැනත් ඇදහීම නබා වැඩිදෙනා පිළිගත් මතයට පහර දෙති. උගතුන් හාස්‍යයට පත්කරන අගනා සපත්කමෙකි. සවජාතිකයකු **සවජාතිකයකුට** උපහාස කිරීම නො පිළිගන්නා බුදුදත් හිමියන් බමුණකු විසින් බමුණන් ගේ නොමනා පැවැත්මට පහරදීම නො පිළිගතහැකි යැ යි පවසමින් බුදුගොස් හිමියන් බ්‍රාහ්මණයකු නො වන බව තීරණය කිරීම තරම් සපත්කමෙක් තවත් වේ ද? මේ කරුණු දෙක්හි ප්‍රබලත්වයක් නැති බව නුවණැතියනට මේ අනුසරින් සිතාගත හැකි ය. තක්කීකරන්නන් මේ විෂයෙහි ලා යොදන සාධකයන් මෙහිලා දැක්වීමෙන් බුදුදත් හිමියනට නො හරසරක් පැමට මගේ අදහසෙක් නැත. උන්වහන්සේ බුදුගොස් හිමි තුමන් ගැන අන්කිසිවකු විසින් නො සෙවූ තරම් කරුණු සොයා තිබෙන බව පැතෙන බැවින් එයට හරසර දැක්විය යුතු ය. එහෙත් කාගේ නමුත් නො පිළිගතහැකි අදහස් හෙළි පෙහෙළි කොට ලීම උගතුන් විසින් කළයුතු වැඩෙකි. බ්‍රාහ්මණයන් අතුරෙහි ද ලෙඛනයෙහි දක්ෂයන් පහළ වියහැකි බැවින් ද, බ්‍රාහ්මණයකු විසින් ම බමුණන්ට උපහාස කරනු සිදු වියහැකි

---

* ථෙරවාදී බෞද්ධවාසීවරයෝ (ක්‍රි. ව: 1948 මුද්‍රිත) 14 පිටුව.

බැවින් ද බුදුදත් හිමියන් දැක් වූ කරුණු අනුවැ බුදුගොස් හිමි තුමා ගේ බ්‍රාහ්මණත්වය ප්‍රතික්ෂේප නො වෙයි. පෙළෙහි සඳහන් ඵාසුවිහාරාදි වචනවලට හෙළටුවාවෙහි සඳහන් විස්තරය පාළියට නො පෙරැළීමට තරම් ලාමක කුලමල අවුලක් බුදුගොස් හිමිතුමන් කෙරෙහි ආරොපණය කිරීම තම් මහාපරාධයක් බව කියයුතු වැ තිබේ.

බුඩඝොෂපාදයන් ගේ කායවිවෙඡදවිදර්ශවිෂයකබුඩිය විශුඩි මාගීයෙහි සඳහන් දෙතිස්කුණපයන් පිළිබඳ වැ කරනලද විවරණ යෙන් පැහෙන බව ද්‍රවීණයන් ගේ අදහස ය.* විශුඩිමාගීයෙහි සඳහන් මේ විවරණය හෙළටුවාහි නො තුබුණක් තම් මේ අදහස තරමක් දුරට පිළිගැනීමට ඉඩ තිබේ. බුදුගොස් හිමිතුමන් පතඤ්ජලියොගශාස්ත්‍රය මැනැවින් දැනසිටි බැවින් ශරීරය පිළිබඳ විවිධ අවයවයන් කෙරෙහි දැනීමක් පැවැති බව කිය හැකි ය. පුදුගලයන් ගේ චරිතවිභාගය පරමත දූෂණය කරමින් විශුඩි මාගීයෙහි දක්වන ලද බැවින් ද, යොගශාස්ත්‍රාභ්‍යාසය ලත් බැවින් ද ලක්ෂණශාස්ත්‍රවිෂයෙහි ද දැනීමක් උන්වහන්සේට පැවැති බව පැහෙයි මෙසේ මෙහි කතෘවරයා විවිධ ශාස්ත්‍රයන් පිළිබඳ පැහිරුගත් බුඩිප්‍රභාවයෙකින් බැබළුණු බව කිය යුතු ය.

මෙහි කතෘවරයා දඹදිවැ බෝමැඩට නුදුරු **ඝොෂ** නම් ග්‍රාමයෙහි බමුණු කුලයෙකැ උපන් බවත් වාදයෙහි දක්ෂ වූ **රෙවත** නම් මහතෙරපාණන් වෙත පැවිදි වූ බවත් ප්‍රසිද්ධ ය. "රෙවත නම් තෙරනමක් ගැන බුඩඝොෂාචාර්ය තුමා කිසි තැනක සඳහන් නොකරයි. එය එතුමා ගේ ගුරුවරයා ගේ නම යයි කියන්නේ මහාවංශය පමණයි. මහාවංශවාර්තාව ජනශ්‍රැතියෙන් ලියූ ඇතැම් අසත්‍ය කරුණුවලින් යුක්තබව පෙන්වීමට (තවත් කරුණු වලින් යුක්තබව පෙන්වීමට[1]) තවත් කරුණු ඇත්තාහ."† යනු පවසමින් **පොල්වත්තේ බුඩදත්ත** මහාස්ථවිරපාදයන් වහන්සේ **රෙවත** මහතෙරුන් බුඩඝොෂාචාර්යපාදයන් ගේ ගුරුවරයා බව නො පිළිගන්නා සේක. මහාවංශවාර්තාව ද අසත්‍ය බව පිළිගන්නා සේක. එහෙත් උන්වහන්සේ බුදුගොස් හිමිතුමන් ගේ ගුරුවරයා කවරෙක්දැ යි නො කියන සේක. මෙවැනි නිගමනයකට බැසගැනීමට බුදුදත් හිමියන් සාධක කොට ගත් කරුණු ද ප්‍රබල නො වෙති. ගුරුවරයා ගේ නම

---

* The Life and work of Buddhaghosa 124 පිටුව.

† පෙරවාදී බෞඩාචාර්යවරයෝ 16 පිටුව.

1 වරහන් කරනලද මේ වැකි කොටස අධිකයැ යි හැගේ.

අනාවැසියා විසින් ම කියයුතු යැ යි සම්මතයෙක් ලොවැ නැති. බුදුගොස් හිමිතුමන් සිය ගුරුවරයා ගේ තම නො කිපමණින් එය කී මහාවංශවාතීාව ද අසත්‍යයැ යි කීමට තරම් සැහැසිවීම කරුණු නො කරුණු දත් බුද්ධපුත්‍රයකුගෙට තරම් නො වේ. මේ බුද්ධඝොෂාචාර්යතුමා මූලින් සම්‍යක්සම්බුදු නිකායට අයත් වැ සිට මෙහි පැමිණියාට පසු ස්ථවිරවාදය ඉගෙන ථෙරවාදියකු වූ බව ඇතැම් විවෙචකයන් ගේ පිළිගැනීම යි. මේ ගැන යම් කිසි අදහසක් පැවසීමට තරම් කරුණු අපට නවම හමු නොවූ බැවින් නිහඬවමිහ. බුදුගොස් හිමිතුමන් ලොකොත්තරවාදියකු සේ හඟවන්නට තැත්කළ **ආචාර්ය ජ්. ඩබ්ලිව්. අදිකාරම්** මහතාට **කොමසේනේ ප්‍රඥාකීර්ති** ස්ථවිරපාදයන් වහන්සේ විසින් දී තිබෙන පිළිතුර* පමණ වත බැවින් ඒ ගැන ද යමක් මෙහි නො කියමිහ.

කාලතත්ත්වය

අනුබුද්ධ බුද්ධඝොෂාචාර්‍යපාදයන් වහන්සේ මෙහි පැමිණි වකවානුව **අනුරාධපුරය** රාජධානිය කොට ගත් **මහානාම** මහිපාලයන් ගේ රාජ්‍යසමයට අයත් බව මහාවංශාදි වංශකථාවන්ගෙන් ව්‍යක්ත වෙයි. මහාවංශයෙහි එන බුද්ධඝොෂප්‍රවෘත්තිය මූලපටන් ම දැක්වීම ප්‍රපඤ්චයට ඉවහල් වන බැවින් එහි එක් ගාථාවක් පමණක් මෙහි දක්වමිහ.

"එවං වුත්තෙන පඝනෙනා ඝොෂා - නික්ඛම්මිත්වා තතෝ ඉමං
දීපමාගා ඉමස්සේව - රඤ්ඤෝ කාලෙ මහාමතී"†

යන මේ ගාථාවෙන් පැවැසෙන පරිදි බුදුගොස් හිමියන් මෙහි පැමිණීමවට කිසිදු සැකයෙක් නැති. මෙහි **"පඝනෙනා ඝොෂා මහාමතී"** යන පදවලින් බුදුගොස් මාහිමියන් අදහස් කරන බව ද, **"ඉමස්සේව රඤ්ඤෝ කාලෙ"** යන පදවලින් මහානාමරාජසමය අදහස් කරනබව ද අමුතුවෙන් පැහැදිලිකළ යුතු වේ. කාරණය කොපැහැදිලි බැවිනි.

"ඔහු මල් මහානාම රජ දෙවිසි හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. එකල බුද්ධඝොෂ නම් අටුවා කතෘන්වහන්සේ දඹදිව සිට මේ ශ්‍රී ලඞ්කාවිපයට වැඩ බුදුන් වදාළ දෙලක්ෂ පන්සැත්තෑදහස් දෙසිය පනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයට

---

* ආගම හා සමාජය (1950 මුද්‍රිත) 203 පිටුව;

† මහාවංස (37 පරි:) 232 ගාථාව.

තුන්ලක්ෂ එක්සැවදහස් සත්සිය පනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණ අටුවා කථා ලියා ආගමයෙහි පහන් නැඟුසේකැයි දනයුතු"*

යන මේ **මයූරපාදපරිවෙණාධිපති බුද්ධපුත්‍රඝන් වහන්සේ** ගේ ප්‍රකාශනයෙන් ඒබව මැනැවින් හෙළි වෙයි.

'පාලඝනඝ්‍ය සඤ්ඤං - ලඞ්කාදීපං නිරබ්බුදං
රඤ්ඤෝ සිරිනිවාසස්ස - සිරිපාලයසඤ්ඤිනා
සම්වීසතිමේ වෙමේ - ජයසංවච්ඡරෙ අයං
ආරද්ධා එකවීසමහි - සම්පත්තෙන පරිනිට්ඨිතා"†

යන මේ අර්ථකථාචාර්යයී බුද්ධඝෝෂ වචනයෙන් යටකී මතයට විරුද්ධ අදහසක් පැවැසෙන බව කියති. මෙහි දැක්වුණු රජතුමා සිරිනිවාස නම් වන බව මෙයින් අදහස් කළ බැවිනි. මේ ගැන සවමතය පවසන **හඳුන්න බුද්ධදත්ත මහාස්ථවිරපාදයෝ**:-

"සිරිනිවාස නම් රාජනාමයක් සිංහල රාජවලියෙහි නො පැනේ. එබැවින් එය මහානාම රජුගේ ම අපර නාමයක් විය හැකැ යි මා විසින් 1914 දී විශුද්ධිමාර්ගී සංඥපතයෙහි කියන ලදි. නමුත් ඒ රජුට ඒ නාමය තිබුණේයැ යි ඔප්පු කිරීමට සාක්ෂ්‍යයක් ලැබෙනතුරු එය පිළිගත නො හැකිබව දැන් මට වැටහේ."‡

යන්නෙන් මහාවංශමතයත් පූජාවලීමතයත් සැකයට පාත්‍ර කෙරෙති. මෙයට හේතුව යටකී බුද්ධඝෝෂවචනයෙන් පැවැසුණු **"රඤ්ඤෝ සිරිනිවාසස්ස"** යන දෙපදය යි. මේ **සිරිනිවාස** නාමය **මහානාම** රජුට අපරනාමයක් කොට සැලකිය යුතු නො වේ. **සිරිපාල** යනු අපරනාමයක් කොට සැලකීම වඩා සුදුසු ය. විමතිවිනොදනී ටීකායෙහි:- **"සිරිනිවාසස්සාති සිරියා නිවාසනට්ඨාන භූතස්ස සිරිපාලනාමකස්ස රඤ්ඤෝ"**ʔ යනු සඳහන් වන බැවින් **සිරිනිවාසස්ස** යනු **සිරිපාල** යන්නට විශෙෂණ කොට ගතයුතු ය. **සිරිපාල** යනු මහානාම රජුගේ අපරනාමයක් බව මෙයින් හැඟෙයි. **"බුදුදස තරිපලි මහනාමික ජෙටතිස්ස"** යන තිස්සමහාරාමයේ මහඅකුරුගොඩ සෙල්ලිපිය

---

* පූජාවලිය (1953 මුද්‍රිත) 729 පිටුව;
† සමන්තපාසාදිකා (බු: ව: 2460) 427 පිටුව;
‡ ථෙරවාදී බෞද්ධවාසීවරයෝ 19 පිටුව;
ʔ විමතිවිනොදනීටීකා (බු: ව: 2478) 515 පිටුව.

ගෙන ඇරැඹුම්න් පණඹිත **මැදුලයන්ගොඩ විමලකිත්ති** මහා සථවිරපාදයෝ **තරිපලි** යනු **සිරිපාල** යන්න ම බව නිගමනය කෙරෙති.* එසේම **සිරිනිවාස** යනු මහානාම රජුට යෙදූ ගුණපදයක් බව ද උන්වහන්සේ ගේ අදහස යි. ඒ අදහස **විමතිවිනොදනී** වචනයෙන් සථිර වෙයි. කරුණු මෙසේ හෙයින් මහානාම රජුට **සිරිනිවාස** යනු අපරනාමයක් නොවැ ගුණපද යක් බවත් **සිරිපාල** යනු අපරනාමය බවත් සලකනු මැනැවි. **සිරිපාල > සරිපලි > තරිපලි** යනු විසින් වාග්විද්‍යානුසාරයෙන් සිදුවිය හැකි ය. මහානාම රජතුමා ගේ රාජ්‍යසමය බු: ව: 954 වැන්නෙන් පටන් ගෙන බු: ව: 976 වැන්නෙන් අවසන්වන බව ඇතැම් කෙනකුන් ගේ මතය වූවත් බු: ව: 953-975 තෙක් පැවැති කාලය බව **මහාවංශයෙහි** වර්ෂසංඛ්‍යාව හා සංසන්දනය කරන විට පෙනේ. බුරුමරටෙහි පවත්නා **සාසනවංස** නම් ග්‍රන්ථයෙහි හා **මහාරාජවංස** නම් ග්‍රන්ථයෙහි සඳහන් පරිදි බු: ව: 930 වැන්නෙහිදී බුද්ධඝෝෂ මාහිමියන් මෙහි පැමිණිබව පිළිගත හොත් මහානාමරාජ්‍යසමයෙහි පැමිණිබව පිළිගැනීමට ඉඩක් නැත. බු: ව: 915 වැන්නෙහි මහානාමරජතුමා රජයට පැමිණි බව බුරුමරට පවත්නා **වංසදිපනී** නම් ග්‍රන්ථයෙහි සඳහන් වන බැවින් ද ඒ රජහු ගේ රාජ්‍යයෙන් පසළොස්වසකට පසු බුදුගොස් මාහිමියන් මෙහි පැමිණිබව එහි ම සඳහන්වන බැවින් ද බු: ව: 930 වැන්න ම බුඩඝෝෂප්‍රාප්තියට සම්බන්ධ වෙයි. කල්‍යාණි ශිලාලිපියෙහි **බුරුමසන්නාසේ** සඳහන් වන බු: ව: 903 වැන්න බුඩඝෝෂප්‍රාප්තිය වූ වර්ෂය සේ පිළිගතහොත් මහානාමරාජ්‍ය සමයෙහි පැමිණි බව කියන කථාව බැහැරව ම යෙයි. බු: ව: 903 වැන්න බු: ව: 953 වැන්න වෙනුවට ලියැවුණු ප්‍රමාද ලිපියක් සේ පිළිගත හොත් මහාවංශමතය ම සම්පූර්ණය වෙයි. එය පිරික්සීමට අවසථාවක් අපට නොලැබුණුබැවින් පරිශෝධකයන් විසින් ඒ ගැන විමසීමක් කළයුතු බව කියමිහ. නිකායසංග්‍රහයෙහි එන බුඩවර්ෂ සංඛ්‍යාව හා සසඳා බලනවිට ද **මහාවංශමතය** ම සථිර වෙයි. ක්‍රි: ව: 468-490 තෙක් මහානාමරාජ්‍යසමය පැවැති බව පිළිගන්නා **වික්‍රමසිංහමතයට** හසිගර් පඬිතුමා තදින් පහර දී මහාවංශමතය ම තහවුරුවන සේ ක්‍රි: ව: 409-431 තෙක් පැවැති කාලය මහානාමසමය බව දක්වයි. එහෙත් විශුඬිමාර්

---

* ශාසනවංශප්‍රදීපය (බු: ව: 2498) 72-73 පිටු.

මහාසත්‍ය ප්‍රස්තාවනාවෙහි අඩොලිපියෙකැ එන **"ගයිගර් මතය නම්:- මහානාම කාලය ක්‍රි: ව: 458 සිට 480 දක්වා යි. බු: ව: 1001 සිට 1023 දක්වා යි."*** යන ප්‍රකාශනය කොතැනින් ලබාගත් කරුණු අනුවැ කරන ලද්දක්දැයි අපට කිය නොහැකි ය. මෙය ගයිගර්මතය නම් **චූලවංශ** සංඥුපනයෙන්† වික්‍රමසිංහමතයට පහර ගැසීමට කිසිසේත් අවශ්‍යකමෙක් නැති. ඉතා නවීනමතය නම් ක්‍රි: ව: 406-428 තෙක් පැවැති කාලය මහානාමසමය බව යි. මේ මතය දක්වන ලද්දේ **ටැම්ගොඩ විහාරටැම් ලිපියට** අනුවැ රාජවර්ෂසංඛ්‍යාව ගැන ප්‍රශස්ත විවෙචනයක් කළ ආචාර්‍ය **සෙනරත් පරණවිතාන** මහතා විසිනි.‡ මේ මතයේ හැටියට මහානාමකාලය බු: ව: 949-971 තෙක් පැවැති කාලය බව නෙළී වෙයි මෙය මහාවංශමතයට හවුරුදු හතරකින් අඩු කාලපරිච්ඡේදයෙකි. බු: ව: 953-975 තෙක් පැවැති කාලය මහාවංශමතය බව මූලදී කීම්හ. බොහෝ කරුණු පරීක්ෂා කොට දක්වන ලද පරණවිතානමතය මහාවංශමතයට එතරම් මහත් වෙනසක් නැති බැවින් මහානාමසමය පරණවිතාන මතය පරිදි පිළිගැනීමෙහි වරදෙක් අපට දැනට නම් නොපෙනේ. සුප්‍රකට චීනයාත්‍රික **එාහියන්තුමා** ක්‍රි: ව: 410 වැන්නෙහි මෙහි පැමිණි බව පිළිගත්මතය වන බැවින් එතුමා ද මහානාම රාජසමයෙහි ම පැමිණි බව පිළිගත යුතු ය. බුද්ධඝෝෂාචාර්‍ය තුමා මෙහි පැමිණි විෂය සඳහන් නැතත් එාහියන්තුමාට පසුවැ පැමිණිබව සිතාගත හැකි ය. **එාහියන් ගේ ගමන් විස්තර යෙහි** බුද්ධඝෝෂාචාර්‍යතුමන් ගැන කිසිවක් නොසඳහන් වන බැවිනි. පූර්‍වෝක්ත ශිලාලිපිපාඨයෙන් **සිර්පාල** යනු මහානාම රජු ගේ අපරනාමයක් බව දැක්වෙන බැවින් ද, විමතිවිනෝදනී පාඨයෙන් **සිරිපාල** යනු රජකු ගේ නමක් බව දැක්වෙන බැවින් ද, සමන්තපාසාදිකා නිගමනගාථාවෙහි **සිරිපාල** යනු බුදුගොස් මාහිමියන් විසින් ම සඳහන් කළ බැවින් ද උන්වහන්සේ මහානාම රාජ්‍යසමයෙහි මෙහි පැමිණිබව අප ගේ එකාන්ත නිගමනය යි. බුදුගොස් මාහිමියන් මෙහි පැමිණ හෙළටුවා පෙළබසට පෙරැළීමත් විශුද්ධිමාර්ගසමපාදනය කිරීමත් විනා උන්වහන්සේ ගේ ජීවනචරිතයක් හෝ භ්‍රමණවෘත්තාන්ත

---

* විශුද්ධිමාර්ග මහා සත්‍යයෑ ප්‍රස්තාවනා xvi පිටුව;

† The Culavamsa, II, Introduction V—VI;

‡ Epigraphia Zeylanica, Vol. V, P. 86-109;

යක් හෝ තමන් විසින් ම ලියනලද බවක් අපට දැනගන්නට නැත. එබැවින් සිය ගුරු දෙගුරු කෑ නොකෑ හිතමිතුරන් ගැන හෝ මෙහි එවකට පැවැති දළදා පෙරහැර වැනි කරුණු ගැන හෝ අටුවා පොත්වල හෝ විශුද්ධිමාර්ගයෙහි හෝ යමක් සඳහන් නොවීම විවෙචනයට කරුණු කොට ගැන්මට යාම ප්‍රඥාගොචර නොවේ. කරුණු මෙසේ හෙයින් මේ කාරණය ගැන **පොල්වත්තේ** බුද්ධදත්ත මහතෙරපාණන් විසින් **සියඟන්හි*** පවසනලද කරුණු අමුතු යමක් කීම පරම කොට ගෙන ලියනලද සේ අපට හැඟෙයි. එහෙයින් විමර්ශකයන් විසින් ඒ කරුණු නුවණින් විමසා ම පිළිගතයුතු බව කියමිහ.

පොත්පත්වල සඳහන් කරුණු අනුවැ බුදුගොස් මාහිමියන් ගේ වාසය කිපතැනෙක්හි වුබව පෙනේ. අපේ **වාසස්ථානය** මහාවංශයෙහි දැක්වෙන පරිදි දඹදිවැ **මහඹෝ** මැඬ සමීපයෙහි බුදුගොස් හිමිතුමන් උපන්බව කියහැකි ය. මහාබොධිමණ්ඩයට **දකුණුදිගැ** බමුණුඟමෙකැ උපන්බව **සද්ධම්මසඞ්ගහ** නම් ග්‍රන්ථයෙහි ද මහබෝමැඩට නුදුරෙහි වූ **ඝොෂ** නම් ග්‍රාමයෙහි බමුණුකුලයෙකැ උපන් බව **බුද්ධඝොසුප්පත්තිකථාවෙහි ද,** රාමඤ්ඤරට සුධම්මපුරය අසල **ඝෝල** නගරයෙහි උපන්බව **වංසදීපනියෙහි ද** සඳහන් වේ. මෙතෙක් කියන ලද්දේ උන්වහන්සේගේ ජන්මභූමිය ගැන කරුණු ය. උන්වහන්සේ බ්‍රාහ්මණජාතිකයකු වුවත් **කාඇසට** ගොත්‍රිකයකු වුවත් රාමඤ්ඤජාතිකයකු වුවත් ආන්ධ්‍රජාතිකයකු වුවත් ජන්මභූමිය දඹදිවට අයත් නගරයක් හෝ ගමක් හෝ විය හැකි ය. ගයාප්‍රදේශයත් වඩගජන්පදයත් රාමඤ්ඤදේශයත් ආන්ධ්‍රදේශයත් පුරාණ ජම්බුවීපයට ම අයත් වන බැවිනි. මෙවැනි විවාරණයක් කිරීම විවාරකයකු හට තරම් නොවන බැවින් මේ ගැන තවත් විමසිය යුතු වැ තිබේ. එසේ විමසීමේහි දී බුද්ධඝොෂජන්මභූමිය **මොරණ්ඩවෙටක** නම් ග්‍රාමය බව පිළිගැනීමට සිදු වෙයි. මේ විශුද්ධිමාර්ගයෙහි ම අවසන්හි දැක්වෙන **"විපුලවිසුද්ධබුද්ධිනා බුද්ධඝොසොති ගරුහි ගණිතනාම ථෙරෙන මොරණ්ඩවෙටකවත්ථුම්හි කතා විසුද්ධිමග්ගා නාම"** යන පාඨයෙහි සඳහන් **මොරණ්ඩ වෙටක** යන වචනය විවාරකයන් ගේ විමර්ශනයට ලක් වී තිබේ.

---

* ථෙරවාදීබෞද්ධාචාර්යවරයෝ 16 – 22 පිටු; පාළිසාහිත්‍යය (බු: ව: 2500 මුද්‍රිත) 165-170 පිටු. බලන්න.

මෙහි ලා හදන්ත **ශ්‍රද්ධාතිස්ස** මහාසඨවිරයන් වහන්සේ ගේ අදහස නම් **මොරණ්ඩවෙටකවත්ථුබෙඛන** යනු ද **මයූරරූපපටට නමඞ්ගි වසනොතන** යනු ද සමානාර්ථ ඇති බව යි.* මෙහි 'වෙටක' යනු වරද බවත් **බෙටක** යනු නිවරද බවත් පිළිගත් නවීන මතය යි. මේ මතයට අනුවැ 'මොරණ්ඩවෙටක' යනු **මොරණ්ඩ බෙටක** යැයි ශුද්ධ විය යුතු ය. මෙසේ ගත් කල්හි මේ 'මොරණ්ඩබෙටක' යන සථානය ආන්ධ්‍රදෙශයෙහි ගමක් බව පිළිගත යුතු ය. මේ ගැන පරීක්ෂණයක් කළ **ඇස්. පී. නාසිනාර්** (කී. ඒ.) මහතා ගේ ඉංග්‍රීසි ලිපියකට අනුවැ පොල්වත්තේ හදන්ත **බුද්ධදත්ත** මහාසඨවිරයන් වහන්සේ **පාළිසාහිත්‍යයෙහි** දක්වන ලද්දේ **මොරණ්ඩබෙටක** යනු ම ශුද්ධපාඨය බව යි. ආන්ධ්‍රදෙශයේ 'ගුන්ටූර්' දිස්ත්‍රික්කයේ 'පාල්නාඩ්තලුක්' පෙදෙසෙහි 'කෝවතේමලිපුරි' – 'ගුන්ඩ්ලපල්ලි' යන ළඟ පිහිටි ගම් දෙක පැරණි **මොරණ්ඩබෙටකය** බව එයින් පැවැසේ.† මෙහි ලා **ධම්මානන්ද කොසම්බි** පඬිතුමාගේ අදහසක් බලංගොඩ හදන්ත **ආනන්ද මෛත්‍රෙය** මහාසඨවිරයන් වහන්සේ ගේ සාහාය්‍ය යෙන් ඉදිරිපත් කිරීමට ලැබුණු බැවින් එය ද දක්වම්හ.

"තලෙයිං ජාතිකයෙක් වූ බුඛ්ඛොෂතුමා බුරුමයේ Thaton පෙදෙසින් ලක්දිවට පැමිණියේ යැයි බුරුමකාරයෝ කියත්. මෙහි කිසියම් සත්‍යයෙක් ද වෙයි. එතුමා බුරුමයේ තේලංගයකු නො ව දකුණු ඉන්දියාවේ තෙලුගුරටට අයත් තෙලංග ජාතික යෙකැ යි මම සිතමි. එතුමා උපන් පෙදෙස මොරණ්ඩබෙටක යැයි විසුද්ධිමග්ගයෙන් පෙනේ. **'මොරණ්ඩබෙටකවත්ථුබෙඛන'** යන්නෙන් එය හැඟේ. ..... **'බෙටක'** යනු සකුබසින් ගමට නමි. දකුණු ඉන්දියාවේ දෙසිය භාෂාවල අද් මෙය **බෙඩා** යැයි බැවහර වේ. මජ්ඣිමනිකායට්ඨකථාවේ අග කතීසසඳෂීක ගාථාවෙක **මයූරසුතනපටටන** හෝ **මයූරරූපපටටන** හෝ සඳහන් වන බැවින් එතුමා එහි වුසූ බව දැක් වේ."‡

මේ වනාහි ධම්මානන්ද කොසම්බිතුමා ගේ ලිපියෙකින් කොට සෙකි. මෙයිනුදු **මොරණ්ඩබෙටක** යන්න ම ශුද්ධපාඨය සේ පැනෙයි. **බෙටක** ශබ්දය ග්‍රාම්විශෙෂාර්ථයක් දෙන බව **ශබ්දශ්‍රී පාදිජාතයෙහි** සඳහන් වේ. **බෙට** යනු කෂීකග්‍රමයක් බව **"බෙටාඃ කෂීකග්‍රාමාඃ"** යන ශ්‍රීධරවචනයෙන් හෙළි වෙයි. 'බෙව'

---

* විශුද්ධිමාගීමහාසන්නයෑ-ප්‍රසන්නාවතාඃ, ix පිටුව;

† පාළිසාහිත්‍යය 173-174 පිටු;

‡ භාරතීයවිද්‍යා, I කාණ්ඩයේ 112 පිටුව.

යනු ම 'බෙවක' යැයි ගැනීම සුදුසු වන්නේ **බෙවක** ශබ්දයෙන් පොල්ල ද පැවැසෙන බැවිනි. කෂීකයන් ගේ ගම්වලට මේ **බෙව** නාමය අවිශෙෂයෙන් යෙදෙන බවත් **බෙවක** යන්නෙන් ග්‍රාමවිශෙෂයක් පැවැසෙන බවත් දතුවකු විසින් 'මොරණ්ඩ වෙවක' යනු **මොරණ්ඩබෙවක** යැයි ශොධනය කරනු විසමයෙක් නො වේ. මෙහි **වෙවක** ශබ්දයෙන් නායක විශෙෂ- දස- ඉන්ද්‍ර ජාලවිද්‍යාදි අර්ථයන් පැවැසීමට ශක්තිය ඇති බැවින් තවත් විදග්ධ කෙනකුන් විසින් මොණරබිජුවකින් ඉදුරුදැලියම් කළවුන් වූසු බැවින් හෝ මුරණ්ඩු තම් නායකයා වූසු බැවින් හෝ එගම **මොරණ්ඩවෙවක** නම් වී යැයි තර්කරනු නිසැක ය. කරුණු මෙසේ නෙයින් 'මොරණ්ඩවෙවක' වුවත් 'මොරණ්ඩබෙවක' වුවත් ඉන් ගමක් ම පැවැසෙන බව පිළිගත හැකි ය. **එහි** උපන් බව පිළිගැනුමට තුඩු දෙන **වස්ථබ්බ** ශබ්දය එහි වූසු බව පිළිගැනුමට ද ඉඩ දෙන බැවින් එසින් ම බුදුගොස් මාහිමියන් ගේ ජන්මභූමිය නිරණය නො කළ හැකි ය. උන්වහන්සේ ගේ ජන්මභූමිය කෙසේ වුවත් වසන ලද තැන් විසින් මෙහි දක්වන ලද මොරණ්ඩ වෙවකයන් මයූරරූපපට්ටනයන් පිළිගත යුතු ය. **මේ** දෙක එකක් නො වන බව නම් හැඟෙයි. **මනොරථපූරණියෙහි*** සඳහන් පරිදි භදන්ත **ජොතිපාල** මහතෙරපාණන් සමග කාඤ්චිපුරාදි- යෙහි ද ලක්දිව මහාවිහාරයෙහි ද වූසුබව පිළිගත යුතු ය. උන්වහන්සේගේ ග්‍රන්ථවලින් ම මෙතැන් පැවැසුණු බැවිනි.

මේ ග්‍රන්ථසම්පාදනයෙහි දී අනුබුදු බුදුගොස් මාහිමියන් පස් මහ සභිය ම ඇසිරි කළබව මැනැවින් පෙනේ. **ආශ්‍රිත ග්‍රන්ථ** හෙළටුවාවන් ද මිළින්දපඤ්හය ද විමුත්ති මග්ගය ද දර්‍ශනශාස්ත්‍රීය ග්‍රන්ථයන් ද ඇසිරිකළ බව හෙළිවන තැන් ද දක්නට ලැබේ. මෙහි **ශීලනිර්දේශය** සංයුත්තනිකාය ද බුද්දකනිකායට අයත් ධම්මපදය ද පටිසම්භිදා මග්ගය ද සුත්තනිපාතය ද පරිවාරපාළිය ද මහානිද්දෙසය ද ථෙරගාථාව ද අපදානය ද උදානය ද මජ්ඣිමනිකාය ද දීඝනිකාය ද අඞ්ගුත්තරනිකාය ද ඇසිරිකරමින් සම්පාදනය කළබව පෙනේ. මේ ශීලනිර්දේශයෙහි පැතෙන **"සීලෙපතිට්ඨාය"** යනාදි ගාථාව හා **"අනෙනාජටා බහිජටා"** යනාදි ගාථාව සංයුත්තනිකායාගත දෙවතාසංයුත්තකයෙහි ද, විශුද්ධිමාගීය නම් කිමෙක්ද යි විවරණය කිරීමට මෙහි දක්වන ලද **"සඞ්ඛා සඞ්ඛාරා අනිච්චාති"** යනාදි ගාථාව ධම්මපදපාළියෙහි මග්ගවග්ගයෙහි ද, ශීලය නම්

---

* මනොරථපූරණී 854 පිටුව;

කිමෙක්ද යි හෙළි කිරීමට මෙහි දක්වුණු **"කිං සීලනති චේතනා සීලං"** යනාදි විවරණය පටිසම්භිදාමග්ගපාළියෙහි ද ශීලයෙහි අනුසස් පැමට ඇරැ දක්වුණු පාළිප්‍රදේශයන් සංයුත්තනිකාය- අඞ්ගුත්තරනිකාය- මජ්ඣිමනිකාය යන පිටකග්‍රන්ථයන්හි ද, ඉන්‍ද්‍රියසංවරය කිමෙක්ද යි හෙළි කිරීමට පැවැසූ **"යානි සොතානි ලොකස්මිං"** යනාදි ගය සුත්තනිපාතපාළියෙහි ද, විනයෙහි ප්‍රයොජනය පැහැදිලි කිරීමට ඇරැ පැ **"විනයෝ සංවරත්ථාය"** යනාදි පාඨය පරිවාරපාළියෙහි ද, භික්ෂූන් ගේ කායික - වාචසික අනාචාරය හෙළි කිරීමට දක්වුණු **"දුච්චිණ්ණා අනාචාරා කායිකා වාචසිකා ච"** යනාදිය මහානිද්දෙසපාළියෙහි ද, ආහාරානුභවවිධිය පැමට ඇරැ දක්වූ **"චත්තාරෝ පඤ්ච ආලෝපේ"** යනාදි ගය ථෙරගාථාපාළියෙහි ද, සිල් රැකිය යුතු ක්‍රමය පැමට දක්වන ලද **"කිකීව අණ්ඩං චමරීව වාලධිං"** යනාදි ගය අපදානපාළියෙහි ද, වාග්විඤ්ඤත්තිවිභාවයෙන් උපන් මධුපායාසය ද ආජීවයට විපත්තිජනක ඇති ධම්සෙතෙවි සැරියුත් මාහිමියන් වදාළ **"වචීවිඤ්ඤත්තිං විපඨාරා"** යනාදි උදානය උදානපාළියෙහි ද, ධම්මතාසීලය පැහැදිලි කිරීමට ඇරැ දක්වුණු **"ධම්මතා එස ආනන්ද! යදා බොධිසත්තෝ"** යනාදිය දීඝ නිකායයෙහි ද දක්නට ලැබේ.

මෙහි ධුතාඞ්ග නිදේශයෙහි පැතෙන **"පංසුකූලචීවරං නිස්සාය පබ්බජ්ජා"** යනාදිය මහාවග්ගපාළියෙහි ද, අරණ්‍ය ලක්ඛණය පැහැදිලි කිරීමට දක්වුණු **"ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච සබ්බමෙතං අරඤ්ඤං"** යන පාඨය පාරාජිකපාළියෙහි ද, පංශුකූලචීවරාදියෙහි අනුසස් දක්වීම පිණිස ඇරැ දක්වූ **"අප්පානි චේව සුලභානි ච තානි ච අනවජ්ජානි"** යනාදි වාක්‍යප්‍රදේශයෝ අඞ්ගුත්තරනිකායවරයෙහි ද, අරණ්‍යවිහරණයෙහි අනුසස් පැමට පැවැසූ **"තේනාහං නාගිතස්ස භික්ඛුනෝ අත්තමනෝ හොමි අරඤ්ඤේ විහරෙන"** යනාදිය සංයුත්තනිකායවරයෙහි ද දක්නට ලැබෙති. **කමීසථානග්‍රහණ** නිදේශයෙහි පැතෙන සමාධි විවරණය සඳහා දක්වන ලද **"පඨමස්ස ඣානස්ස පරිකම්මං පඨමස්ස ඣානස්ස අනන්තර පච්චයේන පච්චයෝ"** යනාදිය පට්ඨානපාළියෙහි ද, කල්‍යාණමිත්‍රත්වයෙහි අගය හෙළි කිරීමට ඇරැ දක්වුණු **"මම්ං හි ආනන්ද කල්‍යාණමිත්තං ආගම්ම ජාතිධම්මා සත්තා ජාතියා පරිමුච්චන්ති"** යනාදිය සංයුත්ත නිකායවරයෙහි ද, අතැවැසියා විසින් ගුරුවරයාට කළයුතු වතාවත් හෙළි කිරීමට දක්වන ලද **"අනුනාවාසිකෙන භික්ඛවෙ**

ආචරියමකි සම්මාවතතිතබබං" යනාදි පාඨය මහාවගගපාළියෙහි ද දක්නට ලැබේ. පඨවිකසිණ නිදේශයෙහි **පැතෙත කාඤඤව භිකඛවෙ සෙනාසනං පඤඤවඩගසමනනාගතං හොති**" යනාදි විවරණය සංයුත්තනිකායයෙහි ද, ආභිධම්මික ගොදනත සථවිරමතප්‍රකාශනයට ඇරැ දක්වූ "**පුරිමා පුරිමා කුසලා ධමමා පචඡිමානං පචඡිමානං කුසලානං ධමමානං ආසෙවන පචචයෙන පචචයො**" යන පාළිය පඨඨානයෙහි ද, කෙලෙස කාමය විවරණය කිරීමට ඇරැ දක්වූ "**ඡයිදං, කාමො රාගො කාමො ඡඳරාගො කාමො**" යනාදිය විභඩගපාළියෙහි ද, උපෙඤඤාවිවරණයට ඇරැ දක්වූ පාඨසමූහය දීඝනිකාය- සංයුත්ත නිකාය- පටිසමභිදාමගග- අංගුත්තරනිකාය- ධමමසඩගණී යන පිටකග්‍රන්ථයන්හි ද දක්නට ලැබේ. සෙසකසිණ නිදේශයෙහි ද අසුභකමමට්ඨාන නිදේශයෙහි ද ඡඅනුසසති නිදේශයෙහි ද අනුසසතිකමමට්ඨාන නිදේශයෙහි ද අඩගුත්තරනිකාය- ධමම සඩගණී- සංයුත්තනිකාය- මජඣිමනිකායාදි පිටකග්‍රන්ථයන්ගෙන් උපුටාගත් පාළිප්‍රදෙශයෝ පැතෙත්.

බ්‍රහමවිහාර නිදේශයෙහි දක්වුණු "**දුවෙඛා බො ආවුසො දෙසෙන අභිභුතො පරියාදිනනචිතතො පාණමපි හනති**" යනාදිය අඩගුත්තරනිකායයෙහි ද, ඤාණකථයෙහි අනුසස් පැමිව ඇරැ දක්වුණු "**ඛනති පරමං තපො තිතිකඛා**" යනාදිය ධමමපදයෙහි හා සංයුත්තනිකායයෙහි ද, ක්‍රොධබහුල පුදගලයාට අවවාද වසින් දක්වන ලද ධර්මකාරණයෝ මජඣිමනිකාය- සංයුත්තනිකාය- අංගුත්තරනිකායාදි පිටකග්‍රන්ථයන්හි ද පැතෙති. ආරැපප නිදේශයෙහි දීඝනිකාය- විභඩගපාළි දෙකින් ද, සමාධි නිදේශයෙහි මජඣිමනිකාය- චුලලවගගපාළි දෙකින් ද, උපුටා දක්වන ලද පාඨයෝ පැතෙත්. ඉදධිවිධ නිදේශයෙහි කමීඤඤම විඤඤතතවය දක්වනු පිණිස අංගුත්තරනිකායයෙන් උපුටා දැකවුණු "**නාහං භිකඛවෙ අඤඤං එකධමමමපි සමනුපසසාමි යං එවං භාවිතං**" යනාදි ධර්මප්‍රදෙශය ද, ඉදධිවිභාගය හෙළි කිරීම සඳහා පටිසම්භිදාමගග පාළියෙන් ඇරැ දක්වුණු "**කතමා දස ඉදධියො**" යනාදි පාඨය ද, අපණණකපටිපදාව දක්වීමට අංගුත්තරාගමයෙන් ගෙන ඇරැ පෑ "**තීහි භිකඛවෙ ධමමෙහි සමනනාගතො භික්ඛු අපණණකං පටිපදං පටිපනනො හොති**" යනාදිය ද, බ්‍රහමපමීද්ධට සාඛ්‍යසිංහසකාරයක් බුදු

රජාණන් වහන්සේ විසින් කළ බව පෑමට මජ්ඣිමාගමයෙන් ඇරැ දැක්වූ "**අථඛ්වාහං භික්ඛවෙ තථාරූපං ඉඛාභිසඞ්ඛාරං අභිසඞ්ඛාසිං**" යනාදි සූත්‍රප්‍රදෙශය ද, සංයුත්තාගමයෙන් ඇරැ දැක්වූ ආයුෂ්මත් මහකප්පවෘත්තියි ද ඇතුළත් කොට ඇති බොහෝ පාළිප්‍රදෙශයෝ පැනෙත්.

අභිඤ්ඤා නිදේශයෙහි පටිසම්භිදාමග්ගපාළියෙන් ද අඞ්ගුත්තරාගමයෙන් ද මජ්ඣිමාගමයෙන් ද උපුටා දක්වන ලද පාඨයෝ වෙති. **ඤාණ** නිදේශයෙහි සංයුත්තාගමයෙන් ද විභඞ්ගපාළියෙන් ද මහානිදෙසපාළියෙන් ද මජ්ඣිමාගමයෙන් ද ගන්නා ලද පාඨයෝ වෙති. **ආයතනධාතු** නිදේශයෙහි සංයුත්ත නිකාය- විභඞ්ගපාළි යන පිටකග්‍රන්ථයන්ගෙන් ද, **ඉන්ද්‍රියසච්ච** නිදේශයෙහි සංයුත්තනිකාය- ධම්මපද- සුත්තනිපාත- විභඞ්ග- අංගුත්තරනිකාය- දීඝනිකාය- මජ්ඣිමනිකාය- ඉතිවුත්තක යන පිටකග්‍රන්ථයන්ගෙන් ද උපුටාගත් පාළිපාඨයෝ පැනෙත්. **ප්‍රඥා භූමි** නිදේශයෙහි පටිච්චසමුප්පාදවිවරණය සංයුත්තනිකායයෙන් ද, මහාවග්ගපාළියෙන් ද, දීඝනිකායයෙන් ද, මජ්ඣිමනිකායයෙන් ද ගත් ධර්මප්‍රදෙශනාන්ගෙන් සරසා තිබෙනු පැනෙයි. විභඞ්ගපාළියෙන් හා පට්ඨානපාළියෙන් ගත් ධර්මප්‍රදෙශයෝ සුලභ වැ පැනෙත්. මහානිදෙසපාළියෙන් ගත් කාමසූත්‍රාගත කරුණු ද මෙහි දක්නට ලැබෙත්. **දිට්ඨිවිසුද්ධි**- කඞ්ඛාවිතරණ විසුද්ධි- මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි- පටිපදාඤාණදස්සනවිසුද්ධි- ඤාණ දස්සනවිසුද්ධි- පඤ්ඤාභාවනානිසංස නිදේශෂට්ඨකයෙහි ද සංයුත්තනිකාය- මජ්ඣිමනිකාය- පට්ඨානපාළි- අංගුත්තරනිකාය- ධම්මපද- චූළනිදෙස- මහානිදෙස- විභඞ්ගපාළි යන පිටක ග්‍රන්ථයන්ගෙන් උපුටාගත් පාළිප්‍රදෙශයෝ පැනෙත්. මෙසේ මේ විශුද්ධිමාර්ගසම්පාදනය කිරීමෙහි දී අනුබුදු **බුදුගොස්** මාහිමියන් පිටකත්‍රයට අයත් ග්‍රන්ථයන්ගෙන් නොයෙක් කරුණු සාධක වශයෙන් උපුටා දක්වන ලද බව මැනැවින් හෙළි වෙයි. ඉක්බිති හෙළටුවා ඇසිරි කළ බවට නිදසුන් කිපයක් දැක්වීම අවශ්‍ය වෙයි. ධුතඞ්ග නිදේශයෙහි එන "**යො සමාදියති සො පුග්ගලෝ, යෙන සමාදියති චිත්තචෙතසිකා එතෙ ධම්මා, යා සමාදානචෙතනා තං ධුතඞ්ගං, යං පවත්තිපති තං වත්ථු**" යන පාඨය ද, පඨවිකසිණ නිදේශයෙහි එන "**මහාවාසං නවා වාසං**" යනාදි ගාථාත්‍රය ද, "**පඨවිකසිණං උග්ගණ්හන්තා පඨවියං නිමිත්තං ගණ්හාති**" යනාදි පාළිප්‍රදෙශයෝ ද,

"සති ච පන සබ්බත්ථිකා වුත්තා භගවතා, කිං කාරණා? චිත්තං හි සතිපටිසරණං, ආරක්ඛඋපට්ඨානා ච සති, න විනා සතියා චිත්තස්ස පගුණභාවනිමිත්තභාවා හොති" යන පාඨය ද, අසුභකම්මට්ඨාන නිර්දේශයෙහි එන **"උද්ධුමාතකං අසුභනිමිත්තං උග්ගණ්හනත්ථාය එකෝ අදුතියෝ ගච්ඡති"** යනාදී පාළිප්‍රදේශයෝ ද, අභිඤ්ඤා නිර්දේශයෙහි එන **"ආරුප්පෙ පරස්ස චිත්තං ජානිතුකාමෝ කස්ස හදයරූපං පස්සති"** යනාදී පාළිය ද හෙළ මහඅට්ඨවාවෙන් පෙළඹසට නඟා ගත්තෝ වෙති. මේ හැර තවත් තොයෙක් කරුණු හෙළඅට්ඨවාවෙන් ගෙන විශුද්ධිමාර්ගය සරසා ගත් සැටි පෙනෙයි. මෙහි කම්මට්ඨාන ග්‍රහණ නිර්දේශයෙහි දක්වෙන වර්ණවිභාගය හෙළට්ඨවා ඇදුරන් ගේ මතානුසාරයෙන් කරනලද බව බුදුගොස් හිමියෝ දක්වති. උපතිස්ස හිමිතුමන් විමුක්තිමාර්ගයෙහි දක්වන ලද වර්ණවිවරණයට රුචියක් නො දැක්වූ බුදුගොස් හිමියෝ එයට පහර දෙති * මෙහි මිළින්දප්‍රශ්නයෙන් ගත් කරුණු ද වෙති. සඤ්ඤා නිර්දේශයෙහි එන **"දුක්කරං මහාරාජ භගවතා කතන්ති කිංභන්තෙ නාගසෙන භගවතා දුක්කරං කතන්ති? දුක්කරං මහාරාජ භගවතා කතං යං අරූපීනං චිත්තචෙතසිකානං ධම්මානං එකාරම්මණෙ පවත්තමානානං ව්‍යත්තානං අක්ඛානං අයං එසෙසා අයං වෙදනා අයං සඤ්ඤා අයං චෙතනා ඉදං චිත්තං"** යන මේ පාඨය එයට එක් නිදර්ශනයෙකි. සාංඛ්‍ය-යොගදර්ශනය දිය පිළිබඳ කරුණු ද මෙහි ප්‍රඥාභූමිනිර්දේශයෙහි දක්නට ලැබෙන බැවින් තදීයග්‍රන්ථයන් ද ඇසිරි කළ බව සිතිය හැකි ය. මේ කාරණය ගැන ප්‍රමාණවත් සටහනක් මුලදී සඳහන් කරන ලද බැවින් මෙහිලා යමක් නො ලියමිහ. ඉතා සියුම් විමසීමක් කළහොත් විශුද්ධිමාර්ගසම්පාදකයට ඉවහල් වූ තවත් තොයෙක් ශාස්ත්‍රීය ග්‍රන්ථයන් පිළිබඳ සටහනක් තැබිය හැකි බව පෙනෙනත් මෙතෙකින් නවතුම්හ.

ඒ මේ **විසුද්ධිමග්ග නම්** ග්‍රන්ථරත්නය ථෙරවාදී බෞද්ධයන් ගේ ශාස්ත්‍රාරවසතුවක් සේ බෞද්ධලොකයා **පරිවාර ග්‍රන්ථ** අතරැ ප්‍රචලිත වූ බැවින් එයට තොයෙන් **සන්‍ය-ටීකාදිය** ඒ ඒ ආචාර්යවරයන් විසින් සම්පාදනය කරන ලද බව කියයුතු ය. මේ ග්‍රන්ථයට මුලින් ම

* විසුද්ධිමග්ග 76-77 පිටු බලනු මැනැවි.

ලියන ලද සත්‍ය දෙකක් ගැන පළමු කොට සඳහන් කළයුතු වැ තිබේ. දැනට අප හමුවෙහි පවත්නා **විසුද්ධිමග්ගපට්ඨානයෙහි** දැක්වෙන "තස්ස නිස්සාය පොරාණං – කථාමග්ගං අනාකුලං" යනාදි ගාථාවෙන් විශුද්ධිමාගීයට ලියනලද පැරණි සත්‍යයක් තුබුණු බව හෙළි වෙයි. **විශුද්ධිමාගීමහාසත්‍යය** නමින් හඳුන්වන පරාක්‍රමබාහුසන්නයෙහි **"සැත්කි මැඩිලි හෙළනුවා, යනු සිලි සත්‍යයි"** * යනු සඳහන් වන බැවින් විශුද්ධිමාගීයට ලියන ලද සිලිසත්‍යයක් පැවැති බව කියති. මේ **සිලිසත්‍යය** ඉපැරණි හෙළබසින් **ලියනලද්දක්** නොවන බව "යම් යම් කසිණාලම්බන යෙක ධ්‍යාන සමවදනා කැමැත්තහු නොලස්ව එ එ කිසුණු වහා ආවජ්ජනය ඉපැදවිය හෙනබව ද ධ්‍යානයෙන් නැගී ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යවෙක්ෂාකරන්නහු භවාඞ්ගයෙහි නොලස්ව භවාඞ්ගයෙන් නැගී විතර්කාදී ධ්‍යානාඞ්ගයෙහි වහා ආවජ්ජනා පැවැත්විය හෙනබව ද ආවජ්ජනාවසී නම්."† යනාදි වාක්‍ය ප්‍රදේශයෙන් ඇඟේ. මේ වාක්‍යය සිලිසත්‍යයෙහි ඇබව සැලකිය යුතු ය. මේ සිලිසත්‍යය විශුද්ධිමාගීයට ලියන ලද ව්‍යාඛ්‍යාන යෙක් ද? නැතහොත් අන්‍යග්‍රන්ථයකට ලියනලද්දෙක්ද යි නිගමනය කිරීමට තරම් මේ කරුණු ප්‍රමාණ නොවන බව අපගේ හැඟීම යි. විශුද්ධිමාගීමහාසත්‍යයෙහි දැක්වෙන "විරති ඇති හෙතු වෙතනා වෙන ම කර්මපථ බැවින් වෙතනාව ම කියා."‡ යනු ද, "ඉක්බිති ජාතියෙහි නොකළ අභියොග ඇත්තෙ ද"‡ යනු ද, **"පරිත්තාලොභතාභිභවනතෝ,** කම්වැජරි නම් මඬනා බැවින්; **මහග්ගතාලොභතාභාවනතෝ ච,** රුවැජරි නම් උපයන බැවින්‡" යනු ද පුරාණ සත්‍යාගතාවවන බැවින් ඉපැරණි විශුද්ධිමාගී සත්‍යයක් පැවැති බව නිසැකයෙන් කියහැකි ය. මේ පැරණි සත්‍යය **විල්ගම්මුල දඹානාගය** නම් මහතෙරපාණන් විසින් කරන ලද්දෙකැ යි සාමාන්‍යයෙන් පිළිගෙන තිබේ. එහැන විමසීමක් කිරීමට නොගොස් විශුද්ධිමාගීයට කරනලද පළමුවන පරිවාර ග්‍රන්ථය මේ පැරණි සත්‍යය බව සඳහන් කරම්හ. අපි-කථාවාසීවරයකුවූ ද ටීකාවාසීවරයකුවූ ද සඝසමය සමයාන්තර ප්‍රවීණ වූ ද බදරතීර්ථවිහාරාධිවාසී වූ ද **භදන්ත ධම්මපාල** මහා

---

* විශුද්ධිමාගීමහාසත්‍යය 344 පිටුව;

† විශුද්ධිමාගීමහාසත්‍යය 375 පිටුව.

‡ විශුද්ධිමාගීමහාසත්‍යය 24; 209; 331 පිටු.

සවාමීන් විසින් සම්පාදනය කරන ලද **පරමත්ථමඤ්ජූසා** නම් විසුද්ධිමග්ගටීකාව දෙවන පරිවාරග්‍රන්ථය යි. දඹදෙණිපුරය රාජධානිය කොට ගත් **කලිඤ්ගාල සාහිත්‍ය සම්භූතපණ්ඩිත පරාක්‍රමබාහු** තරදෙවයන් විසින් සත්‍ය - ටීකා ඇසිරි කරමින් සම්පාදනය කරන ලද **විශුද්ධිමාර්ගීමහාසන්නය** තෙවන පරිවාර ග්‍රන්ථය යි. මහින්දසෙන පිරිවෙන්හි වැඩ වසමින් පාළිත්‍රිපවංසය කළ **භදන්ත වාචිස්සර** මහාසවාමීන් **විසුද්ධිමග්ගසංඛේප** නම් ග්‍රන්ථය සිංහලභාෂාවෙන් සන්නයක් සම්පාදනය කළ බව ථූපවංසනිගමනයෙහි එන **"විසුද්ධිමග්ගසංඛේප-යෙන අත්ථප්ප කාසනා"** යනාදි ගයෙන් හෙළි වෙයි. මෙයින් පැවැසෙන විසුද්ධි මග්ගසංඛේපය බුදුගොස් හිමිතුමන් ගේ විසුද්ධිමග්ගයේ සංක්ෂේප යක්දැ යි කිය නො හැකි බැවින් එය විසුද්ධිමග්ග පරිවාරග්‍රන්ථ යක් ලෙස සඳහන් කළ නො හැකි ය. බුරුමරට තෙරකෙනකුන් විසින් සම්පාදනය කරන ලදැයි කියන **විසුද්ධිමග්ගපදයොජනාව ද, විසුද්ධිමග්ගචුල්ලටීකාව ද, විසුද්ධිමග්ගගණ්ඨිය ද** යොන්රට වැඩ වූසු භදන්ත **උත්තරාරාම** තෙරපාණන් විසින් සැපයුණෙකැ යි පවසන **විසුද්ධිමග්ගදීපනිය ද**, ලක්දිව සුප්‍රසිද්ධ අභිධම්මිකාරද යකු වූ **බුඩසාසනමහාසූරසෙනාපති** රාජදත්තයිය නාමොපලක්ෂිත **ධම්මරත්න** පණ්ඩිතප්‍රකාණ්ඩයන් විසින් ලියන ලද **විශුද්ධිමාර්ගී භාවසන්නය ද,** පූජ්‍ය පණ්ඩිත මාතර **ශ්‍රී ධම්මවංශ** මහාස්ථවිර ප්‍රණීත **සිංහලවිශුද්ධිමාර්ගීය ද** මේ විශුද්ධිමාර්ගීග්‍රන්ථයා ගේ පරිවාර ග්‍රන්ථයෝ ම වෙති. මෙහි ලා මේ සියලු පරිවාරග්‍රන්ථයන් පිළිබඳ වැ විවෙචන පූර්ණ විවරණයක් කරන්නට නො ගොස් අපගේ මේ ප්‍රස්තාවනා සම්පාදනයෙහි ප්‍රධාන අරමුණ වූ **සිංහලවිශුද්ධි මාර්ගීය** පිළිබඳි හැඳින්වීමට යොමුවම්හ.

භාෂා කිපයකට පරිවර්තනය කරනලද ඒ මේ විශුද්ධි මාර්ගීයට සත්‍ය-ටීකාදි විසින් නොයෙක් පරිවාර ග්‍රන්ථයන් ඇත ද සිංහල භාෂාවෙන් සම්පාදනය කරන ලද **සිංහල විශුද්ධි මාර්ගීය** සම්පූර්ණ විශුද්ධිමාර්ගීයෙක් මේ දක්වා නො වීය. මෙයට හවුරුදු අටවිස්සකට පෙරැ මාතර සිරිමඩගල පිරිවෙන්හි ප්‍රධානාචාර්ය පූජ්‍ය පණ්ඩිත මාතර ශ්‍රී ධම්මවංශ මහාස්ථවිරපාදයන් වහන්සේ විසින් හෙළබස දතුවන් ගේ ප්‍රයෝජනය සඳහා මේ **සිංහලවිශුද්ධිමාර්ගීය** සම්පාදනය කරන්නට ආරම්භ කරන ලදි. උන්වහන්සේ ගේ

සංඥපනයෙහි එන "විශුද්ධිමාර්ගීය ත්‍රිපිටක අර්ථකථාවන්ට ආලෝකය දෙන්නේ ය. ශ්‍රීමත් බුද්ධඝෝෂ මහාසථවිරයාණන් වහන්සේ විසින් ත්‍රිපිටක ධර්මය හා තදර්ථකථාවන් අළලා මෙය සම්පාදනය කරන ලදි."* යන මේ වැකියෙන් විශුද්ධිමාර්ගයෙහි තත්ත්වය ඉතා කොටින් ඉතා පැහැදිලි වැ පැවැසෙයි. තෙවළාඅටුවාවනට එළිය දෙන මේ විශුද්ධිමාර්ගය සියබසට පෙරැළීම එතරම් පහසු නැති බව උන්වහන්සේ ම "පැහැදිලි වූ අර්ථාවබෝධය ද දෙමින් සවභාෂාරීතිය ද උල්ලඝ්‍නය නො කරමින් භාෂාන්තර ග්‍රන්ථ සවභාෂාවට පරිවර්තනය කිරීම දුෂ්කර බව තත්ත්වඥෝ දනිති. අපි මේ උභයක්‍රමයෙහි ම හැකි තාක් ව්‍යාපෘත වූබව සතුටින් මෙහි සඳහන් කරමු."* යැයි සවකීය සංඥපනයෙහි දක්වන සේක. කාර්‍ය අපහසු වුවත් සාමාන්‍යබෞද්ධජනයා ගේ ධර්ම්‍ඥනයට රුකුල් දෙනු පිණිස මේ **සිංහලවිශුද්ධිමාර්ගය** උන්වහන්සේ විසින් කළ සැටි "පෙළින් හා පදගත සන්නයෙන් තොර ව මේ උතුම් ධර්ම්ප්‍රබන්ධයේ භාවසන්තය පමණක් ප්‍රසිද්ධ කළ හොත් සාමාන්‍යබෞද්ධයන් ගේ ධර්ම්ඥනයට විශෙෂාධාරයෙක් යැයි සැලකූ අප විසින් මින් හව්රුදු කීපයකට පෙරැ මේ සිංහලානුවාදය ලියන ලද්දේ ය."* යන සිය වැකියෙන් ම හෙළි වෙයි. මේ සිංහලවිශුද්ධිමාර්ගයෙන් සාමාන්‍යබෞද්ධයන් ගේ ධර්ම්ඥනයට ලැබෙන පිහිට එදා උන්වහන්සේ දුටු සැටියටත් වඩා මෙදා දක්නට ලැබී තිබෙන බව අපට නො මසුරු වැ කිය හැකි ය. මේ ග්‍රන්ථය සිංහලය උගත් සාමාන්‍යබෞද්ධයනට වැටහෙන ලෙස උගතුන්ට ප්‍රිය රචනශෛලියකින් අර්ථඝයන් ධර්ම්ඝයන් නො පිරිහෙළා ඉපැහැදිලි වැ සැපයීම සුලුපටු කාර්යෙක් නො වේ. උගත්කමට සරිලන පඬිකමත් පඬිකමට සරිලන උගත්කමත් ඒ දෙකට ම සරිලන වියත්කමත් එක්තැනෙක ම සැතැපුම් ගන්නා සේ භාෂාන්තර ග්‍රන්ථයක් සියබසට පෙරැළීම සැබවින් ම අගය කළයුතු වූ ද පැසසිය යුතු වූ ද ඍණිත්‍ය සේවයෙකි.

මේ පරිවර්තනය හුදු පදානුගතපරිවර්තනයක් වත් හුදු භාව පූර්ණ පරිවර්තනයක් වත් නො වනබව මේ ග්‍රන්ථය පරිශීලනය කරන විමර්ශකයනට වැටහෙයි. මෙහි බොහෝ තන්හි පදානුගත පරිවර්තනය ද, කිසියම් තැනෙක භාවපූර්ණ පරිවර්තනය ද,

---

* සිංහල විශුද්ධිමාර්ගය – සංඥපනය (බු: ව: 2473 මුද්‍රිත)

කිසියම් තැනෙක ටීකා-සන්‍යාගත විසතරය ද, කිසියම් තැනෙක අර්ථකථාසවරූපය ද පැනෙයි. කිසියම් තැනෙක පාළිගද්‍යපද්‍ය වාක්‍යප්‍රදෙශයෙන් සැරසූ සැටි ද, කිසියම් තැනෙක පාළි පද්‍ය යන් සියඛසැ පැදියට නඟාලූ සැටි ද පැනෙයි. කිසියම් තැනෙක මූලග්‍රන්ථයෙහි වාක්‍යප්‍රදෙශයන් අර්ථාවබොධයට හානි නොවන සේ බැහැර කළ සැටි ද දක්නට ලැබේ. මේ ග්‍රන්ථ සම්පාදනයෙහි දී සිංඛල භාෂාව පොෂණය වන පරිදි පාළි ශබ්දයන් තුබූ සැටියෙන් ද සංසකෘත්සවරූපයෙන් ද යොදා තිබෙන බව පෙනෙයි. **පහාණ-ප්‍රහාණ; සීල-ශීල; විරිය-වීර්‍ය්‍ය; දිට්ඨි-දෘෂ්ටි; පදට්ඨාන-පදස්ථාන; විසුද්ධ-විශුද්ධ; අනුසසති-අනුස්මෘති; සඞ්ඛාර-සංස්කාර; සද්ධා-ශ්‍රද්ධා; අසුභ-අශුභ** යනාදි ශබ්දයන් ඒ ඒ වාක්‍යසථලයන්හි යොදා තිබෙන බැවින් ඒ බව ව්‍යක්ත වේයි. මෙහි තවත් ඇති විශෙෂයෙක් නම් පාළි-සංසකෘත වචන මිශ්‍ර කොට යොදා තිබීම යි. එයට **නිදර්ශන** වශයෙන් **සමථවිදර්ශනා - පරියුට්ඨානප්‍රතිපක්ෂ-සීලනලක්ෂණ - ප්‍රණීත සීල - ඉෂ්ටානිෂ්ටාරම්මණ - ලජ්ජා කුපනාසථාන - ශීලවොදාන - ග්‍රාමාරණ්‍යසෙනාසන - කුශලනීවරණ අසුභසංඥා - අප්‍රමාණ කසිණ** යනාදිය දැක්විය හැකි ය.

ඒ මේ විශුද්ධිමාර්ගයෙහි ශීලනිදේශය පවත් බ්‍රහ්මවිහාර නිදේශය තෙක් පවත්නා **පරිච්ඡේද නවය** පරිවර්තනසවරූප යෙන් සම්පාදනය කරන ලද්දේ පූජෝකත්ත ක්‍රමයෙනි. මේ පරිවර්තනය කර වදාළ **පූජ්‍ය පණ්ඩිත මාතර ශ්‍රී ධම්මවංශ සෙනාමින්ද්‍රයෝ** වනාහි උගතුන් හා ගුණවතුන් එකසේ ප්‍රිය කළ අලාමක කීර්තිඝොෂයෙකින් සමුපලක්ෂිත ව්‍යක්ත බහුශ්‍රැත මහාසථවිර කෙනෙකි. උන්වහන්සේ ගේ අභිධර්මීය පිළිබඳ සුනිශිත බුද්ධිය තුමන් විසින් සැපයූ **අභිධර්මචන්ද්‍රිකාවෙන් ද,** සාහිත්‍යසම්පත්තිය සමඟ පරිවර්තනශක්තිය මේ **සිංහලවිශුද්ධි මාර්ගයෙන් ද,** ගැඹුරු විෂය ශ්‍රිහිල් වැ පැවැසීමෙහි අප්‍රතිහත ශක්තිය මේ උභයග්‍රන්ථයෙන් ද හෙළි වෙයි. මෙසේ පැසසිය යුතු ශාසනික සේවයක් හා සාහිත්‍ය සේවයක් කර වදාළ උන්වහන්සේ විසින් තවත් ග්‍රන්ථ රාශියක් සම්පාදනය කළ බව ද දනුම්හ. **සඟනිසුවංශීය සඞ්ඝසම්මතයෙන් ලත් ත්‍රිපිටකවාගීශ්වර** ගෞරවොපාධියෙන් ද **සඟනිකායවරයෙහි මහාලෙඛකාධිකාරී** පදවියෙන් ද සම්මානිත වූ උන්වහන්සේ ගේ පශ්චිම කාලය අරණ්‍ය

සෙනසුනෙකැ ගතකළ බව ද සුප්‍රසිද්ධ ය. සවනිකායවරයෙහි හිඤ්ඤන් අතරැ ප්‍රථම වරට සවණීමුද්‍රිකා සහිත **පණ්ඩිතොපාධිය** ලත් උන් වහන්සේගේ ශාන්ත **අකලපසමපත්තිය**- ප්‍රතිපත්තිගුරුත්වය- ප්‍රිය ශීලිත්වය- සෞශීල්‍යය- ගුණරුචිකත්වය කිසිවිටෙකත් පිරිහුණුබවක් අපි නො දනුම්හ. **අප** දන්නා විශෙෂ කරුණෙක් නම් උන්වහන්සේ අරණ්‍යයෙහි වැඩසිටිය දී ගිලන් වැ අපවත් වූ බවත් සිංහල විශුද්ධිමාගීපරිවර්තනය අඩාළ වූ බවත් ය. අඩාළ වූ සිංහල විශුද්ධි මාගීපරිවර්තනය වඩාලිමෙහි සමඒ **පණ්ඩිත** බවුවිට **නාඳුරාම** මහාස්ථවිරප්‍රමුඛ ශිෂ්‍යපිරිසක් ගුරුකුලය සතාථ කිරීමට තනා වැඩීම ද උන්වහන්සේ විසින් කළ ශාසනප්‍රතිඥාවෙකි.

මේ විශුද්ධිමාගීයෙහි ආරුප්‍ය නිදේශයෙහි පවත් ඉන්ද්‍රිය සත්‍ය නිදේශය නෙක් පවත්නා **පරිවෙජදඝපතකය** මෙයට දෙවෂීයකට පෙරැ මුද්‍රණයෙන් ප්‍රකාශනය විය. ප්‍රඥභූමිනිදේශ යෙහි පටන් ප්‍රඥභාවනානිසංස නිදේශය නෙක් පවත්නා **පරිවෙජදඝපතකය** මේ වෂීයෙහි මුද්‍රණයෙන් ප්‍රකාශනයට පත්වෙයි. මේ පරිවෙජදඝපතකවය ම පරිවර්තනසවරූපයෙන් සම්පාදනය කරන ලද්දේ මෙකල සිරිමඛගල පරිවෙණාධිපති ධුරය දරන **පණ්ඩිත** බවුවිට **නාඳුරාම මහාස්ථවිරයන් වහන්සේ** විසිනි. උන්වහන්සේ වීසින් මේ පරිවර්තනයෙහි දී අනුගමනය කරන ලද්දේ සිය ගුරුපාණන් හිය මහ මැයි. පදානුගතපරිවර්තනයත් භාවප්‍රකීක පරිවර්තනයත් ටිකා-සත්‍යාගත විස්තාරයන් අථකථාසවරූපයත් මේ කොවස්හිදු දක්නා ලැබෙන බව අමුතුවෙන් කියයුතු නො වේ. හෙළබස දත් සාමාන්‍ය බෞද්ධයන් ගේ පමණක් නො වැ ප්‍රවීණයන් ගේ පවා ධම්ඥන සංවර්ධනයට මේ සිංහලවිශුද්ධිමාගීය පොහොසත් බව පාඨක යනට මැනැවින් වැටහේ ඇයි අපට හැගේ. අඩාළ වූ **මේ සිංහලවිශුද්ධිමාගීය** වඩාලිමෙහි දිරිමත් වූ **පණ්ඩිත** බවුවිට **නාඳුරාම** මහාස්ථවිරපාදයන් වහන්සේ වනාහි අව්‍යාජ ගුරු භකතියෙන් ගුරුමඟ නො පියා මේ උත්තරණයට ඉදිරිපත් වූ බව:- "එහෙත් ඉන් ධම්ඥනය දියුණුකරගත් හිහි- පැවිදි පින්වතුන් එහි ඉතිරි කොටස් ද සිංහලට පරිවර්තනය කොට ප්‍රසිද්ධ කරවන සේ කළ ආරාධනයෙන් හා අපවත් වී වදාළ ධම්ඃචාරී සවාමීන්වහන්සේට උපහාර වශයෙන් ද එය සම්පාදනය කිරීමට අදහස් කෙළෙමි. මෙහි ලා උන්වහන්සේ වෙත විශුද්ධි

මාගීය හැදෑරීමෙන් ලැබූ අභ්‍යාසයෙන් හා උන්වහන්සේ ගේ සටහන් ද ඇසුරු කෙරෙමින් අවසානය තෙක් සම්පූර්ණ විශුද්ධි මාගීය අනුවාදය කරන ලදි.''*

යන මේ සඩකීය සංඥපනවචනයෙන් හෙළි කරන සේක. විශුද්ධිමාගීයෙහි ඉතා ගැඹුරු වූ ද ඉතා දුෂ්කර වූ ද ඉතා අධික වූ ද කොටස සිංහලයට නැගීමෙහි දී උන්වහන්සේ සත්පුරුෂ භූමියෙහි පිහිටා සිටි සැටි ද මෙයින් දැක්වෙයි. ගුරුපසාරයක් වශයෙන් සම්පාදනය කරන ලද මේ කෘතිය ගුරුභක්තියේ මූර්තිය කොට ද සැලකීමට මෙයින් ඉඩ ලැබෙයි. ධර්මශාස්ත්‍ර ප්‍රවීණ උගතකු වශයෙනුත් ප්‍රතිපත්තිගරුක භික්ෂුවක් වශයෙනුත් ප්‍රසිද්ධ වූ උන්වහන්සේ සිංහලවිශුද්ධිමාගීයේ මේ ඌනපූරණය ඉතා පරිශ්‍රමයෙන් කරනලද බව නො මසුරු වැ කියමිහ.

ඉඳුරුවේ ඤාණාරාමාදි සංඝරාජ

බුද්ධවර්ෂ 2501 වැන්නෙහි
ඇසළ මස පුරපසළොස්වක ලත් ගුරු දින
වැල්ලවත්තේ ශ්‍රී ධර්මෝදය පිරිවෙන්හි දී ය.

---

* සිංහල විශුද්ධිමාගීය – සංඥපනය (බු: ව: 2499 මුද්‍රිත i පිටුව)

අනුක්‍රමණිකාව

(1) කාණ්ඩය

1. ශීල නිර්දේශය

	පිටු
ප්‍රශ්න – විසර්ජන ගාථා	1-2
විශුද්ධිමාර්ගීය හැඳින්වීම	2-4
ගාථා විසතරාර්ථය	4-5
ත්‍රි ශික්ෂාව	5-8
සීලය නම් කිම	8-9
කවර අර්ථයෙන් සීල නම් වේ ද	9-10
ශීල ලක්ෂණාදිය	10 11
ශීල ආනිසංස	11-14
සීලය කී වැදෑරුම් ද? එකවිධ ශීලය	14-15
විවිධ ශීලය	15-19
ත්‍රිවිධ ,,	19-23
චතුර්විධ ,,	23-25
ප්‍රාතිමෝක්ෂ සංවර ,,	25-33
ඉන්ද්‍රිය සංවර ,,	33-36
ආජීව පාරිශුද්ධි ,,	36-48
ප්‍රත්‍යය සන්නිශ්‍රිත ,,	48-57
සතර සංවර සීලය කෙසේ රැක්ක යුතු ද	57
ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය ,, ,, ,,	57-58
ඉන්ද්‍රිය සංවර ,, ,, ,, ,,	58-63
ආජීවපාරිශුද්ධි ,, ,, ,, ,,	63 66
ප්‍රත්‍යය සන්නිශ්‍රිත ,, ,, ,, ,,	66-76
පඤ්චවිධ ශීල	76 80
සීල සංකිලෙස හා වොදාන	80-85
සීල විපත්තියෙහි ආදීනව	85-90
සීල සම්පත්තියෙහි ආනිසංස	90-91

2. ධුතාඞ්ග නිර්දේශය

පොළෙස් ධුතාඞ්ග	93
කවර අර්ථයෙන් ධුතාඞ්ග නම් වේ ද?	94-97

ධුතාඞ්ග ලක්ෂණාදිය 97
ධුතාඞ්ග සමාදානය 97-98
(ධුතාඞ්ග පිළිබඳ සාධාරණ විනිශ්චය)
පංසුකූලිකාඞ්ග සමාදානාදී විධානය 98-99
තෙවිසි වැදෑරුම් වස්ත්‍ර 99-100
පංසුකූලයට නුසුදුසු වස්ත්‍ර 101
පංසුකූල විධානය 101-102
පංසුකූල ප්‍රභෙද 10 -103
තෙචීවරිකාඞ්ග සමාදාන විධාන ප්‍රභෙදාදිය 103-105
පිණ්ඩපාතිකාඞ්ග ,, ,, ,, 105-108
සපදානචාරිකාඞ්ග ,, ,, ,, 108-110
එකාසනිකාඞ්ග ,, ,, ,, 110-112
පත්තපිණ්ඩිකාඞ්ග ,, ,, ,, 112-115
ඛලුපච්ඡාභත්තිකාඞ්ග ,, ,, ,, 115-118
ආරඤ්ඤිකාඞ්ග ,, ,, ,, 118-120
රුක්ඛමූලිකාඞ්ග ,, ,, ,, 120-122
අබ්භොකාසිකාඞ්ග ,, ,, ,, 122-124
සොසානිකාඞ්ග ,, ,, ,, 124-126
යථාසන්ථතිකාඞ්ග ,, ,, ,, 126-127
නෙසජ්ජිකාඞ්ග ,, ,, ,, 128-132
ධුතඞ්ග විභාගය ,, ,, ,,

3. කම්මට්ඨාන ග්‍රහණ නිර්දේශය

සමාධි නම් කිම 133
කවර අර්ථයෙන් සමාධි නම් වේ ද
සමාධි ලක්ෂණාදිය
සමාධි කී වැදෑරුම් ද 134
ත්‍රිවිධ සමාධි 135-136
ත්‍රිවිධ ,, 136-137
චතුර්විධ ,, 137-141
පඤ්චවිධ ,, 141
සමාධියෙහි කිළිටි බව හා පිරිසුදු බව 142
සමාධිය වැඩිය යුතු පරිදි 142-143
දශවිධ පලිබෝධ 143-152
කම්මට්ඨානදායක කල්‍යාණ මිත්‍රයා 152-157
චරිත භෙද 157-166
චරිතානුකූල කම්මට්ඨාන 166-169
කම්මට්ඨාන විනිශ්චය 170-180

4. පඨවිකසිණ නිදේශය

කම්මට්ඨානයට නුසුදුසු විහාර 181-186
,, සුදුසු ,, 186 187
පඨවිකසිණය උගතාමනා පරිදි 188-191
කසිණ නිමිති 191 192
පටිභාග නිමිත්ත රැකගත යුතු පරිදි 192-194
දශවිධ අසිණා කෞශලාය 195-206
පටිභාග නිමිත්ත 206-209
ත්‍රිවිධ භාවනා 209-210
මතානන්තරයක් 210-211
ප්‍රථමධ්‍යාන විභාගය 211-222
ත්‍රිවිධ කල්‍යාණය හා දශ ලක්ෂණය 222-226
ප්‍රථම ධ්‍යානය රැක්කමිනා පරිදි 226-232
පඤ්චවිධ වසිතා 232-235
විතීය ධ්‍යානය 235-239
තෘතීය ධ්‍යානය 239-247
(දශවිධ උපෙක්ෂා) 241-245
චතුර්ථ ධ්‍යානය 248-253
පඤ්චම ධ්‍යානය 253 254

5. සෙස කසිණ නිදේශය

ආපෝ කසිණය 255-256
තෙජෝ කසිණය 256-257
වායෝ කසිණය 257
නීල කසිණය, පීත කසිණය, ලෝහිත කසිණය,
ඔදාත කසිණය 258-259
ආලෝක කසිණය 260
ආකාස කසිණය 260-261
කසිණ ඵල 261-262
කසිණ භෙද, කසිණ භාවනා සම්බන්ධ නොවන්නෝ 262-263

6. අශුභ කම්මට්ඨාන නිදේශය

දශ අසුභය 265-266
(උබ්බුමාතක අශුභය වඩන ආකාර) ගමන් වත 266-270

නිමිති සලකන ආකාර 270-272
ෂඩ්විධ නිමිත්තග්‍රහණ විධි 272-273
පඤ්චවිධ ,, ,, 273 274
නිමිත්ත සුඤ්ඤතිත කරන පරිදි 274-275
නිමිති සලකුණු කර ගැන්මේ ආනිසංස 275-278
උද්ග්‍රහ ප්‍රතිභාග නිමිති වෙනස 278-279
විනීලකාදිය 279-282
අශුභ ප්‍රකීර්ණක කථා 282-283
අශුභ කම්මස්ථානයෙහි ලද හැකි ධ්‍යාන 284
අශුභ ලක්ෂණ 284-286

7. ඡ අනුස්සති නිද්දේශය

දශ අනුස්මෘති 287-288
බුද්ධානුස්මෘති භාවනා විධිය 288-319
අරහං 288-294
සම්මා සම්බුද්ධෝ 294-295
විජ්ජාචරණ සම්පන්නෝ 296
සුගතෝ 297-298
ලෝකවිදූ 298-305
අනුත්තරෝ 305 306
පුරිසදම්ම සාරථි 306 307
සත්ථාදේවමනුස්සානං 308-309
බුද්ධෝ 309-311
භගවා 311-318
බුද්ධානුස්මෘති භාවනා ආනිසංස 319
ධම්මානුස්මෘතිය 319-328
සවාක්ඛාත ගුණය 320 324
සන්දිට්ඨික ,, 325 326
අකාලික ,, ඒහිපස්සික ගුණය, ඔපනයික ගුණය 326 327
පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි 327
ධම්මානුස්මෘති ආනිසංස 327-328
සංඝානුස්මෘතිය
සුපටිපන්න ගුණය, උජුපටිපන්න ගුණය, ඤායපටිපන්න ගුණය, සාමීචිපටිපන්න ගුණය 328-330
ආහුණෙය්‍යෝ, පාහුණෙය්‍යෝ, දක්ඛිණෙය්‍යෝ, අඤ්ජලිකරණීයෝ අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස 330 332

සංඝානුස්මෘති ආනිසංස 332-333
ශීලානුස්මෘතිය
අඛණ්ඩ, අවිද්ද, අසබල 333
අකල්මාස, භුජිස්ස, විඤ්ඤුපසත්ථ, අපරාමට්ඨ, සමාධිසංවත්තනික 334
ශීලානුස්මෘති ආනිසංස 334-335
ත්‍යාගානුස්මෘතිය 335
මුත්තචාගො, පයතපාණී, වොස්සඝ්ඝරතො, යාවයොගො දාන සංවිභාගරතො 336
ත්‍යාගානුස්මෘති ආනිසංස 337
දෙවතානුස්මෘති 337-338
ඣානුස්සති පිළිබඳ විශෙෂ විභාග 338-341

8. අනුස්මෘති කර්මස්ථාන නිර්දේශය

මරණානුස්මෘතිය 343-358
(මරණය සිහි කළ යුතු අට ආකාරය)
වධක පච්චුපට්ඨානය 345-347
සම්පත්ති, විපත්ති 347-348
උපසංහරණය 348-351
බහු සාධාරණය 351-352
ආයු දුර්ලභතය 352
අනිමිත්තය 353-354
අද්ධාන පරිච්ඡේදය 354-356
ඛණ පරිත්තය 356-357
මරණානුස්මෘති ආනිසංස 357-358
කායගතාසති භාවනා විධි 358-361
සප්තවිධ උද්ග්‍රහ කෞශල්‍යය 361-365
දශවිධ මනසිකාර කෞශල්‍යය 365-372
කෙසයෙහි වර්ණාදී පඤ්චවිධ ව්‍යවස්ථා 372-373
ලොම, නඛ, දන්ත, ත්වච 373-376
මංස, නහාරු, අට්ඨි, අට්ඨිමිඤ්ජ, වක්ක 376-380
හදය, යකන, කිලොමක, පිහක, පප්ඵාස 380-382
අන්ත, අන්තගුණ, උදරිය, කරීස, මත්ථලුඞ්ග 382-384
පිත්ත, සෙම්හ, පුබ්බ, ලොහිත, සෙද 384-386
මෙද, අස්සු, වසා, ඛෙල, සිංඝානිකා, ලසික, මුත්ත 386-390
උග්ගහ - පටිභාග නිමිති හා අර්ථණා 390-391

ආනාපාණ සතිය
ආනාපාණ සතිය වැඩිය යුතු පරිදි 392-402
පටිසම්භිදා ක්‍රමය 402-410
පඤ්චවිධ සඤ්ඤා 410-411
(මෙතෙහි කළ යුතු අට ආකාරය)
ගණනා 412-413
අනුබන්ධනාදිය 413-416
(ආනාපාණ සති භාවනා විශෙෂ) ප්‍රථම චතුෂ්කය 416-421
විතීය චතුෂ්කය 422-424
තෘතීය ,, 424-425
චතුර්ථ ,, 425-427
ආනාපාණසති භාවනානිසංස 428-430
උපසමානුස්සතිය 430-432

9. බ්‍රහ්ම විහාර නිදේශය

මෛත්‍රී භාවනාව 433
පළමුව මෛත්‍රී නො කළ යුත්තෝ 433-434
මෛත්‍රී කළයුතු පරිදි 434-435
අනොධිසොඵරණ මෛත්‍රිය (මතභෙද) 435-436
ක්‍රොධය මැඩ පැවැත්විය යුතු අයුරු (උපමා) 437-440
කර්‍මසඞ්කතා මෙතෙහි කිරීම 441-442
ශාස්තෘ පූජාවරිත සැලකීම 442-444
අනමතග්ගිය සූත්‍ර සිහිකිරීම 444-445
මෛත්‍රී ආනිසංස සැලකීම 445
ධාතු විනිභෝග කිරීම 445-446
දෘනානිසංස සැලකීම 446
සීම සම්භෙද නො කිරීම 446-447
පඤ්චවිධ අනොධිසොඵරණ මෛත්‍රිය 448-449
සප්තවිධ ඔධිසෝ ඵරණ මෛත්‍රිය 450-451
දසවිධ දිශා ඵරණ මෛත්‍රිය 451
මෛත්‍රී ආනිසංස 452-454
කරුණා භාවනාව 454-455
මුදිතා භාවනාව 456
උපෙක්ඛා භාවනාව 457-458
(සතර බ්‍රහ්ම විහාරයෙහි ප්‍රකීර්ණක කථා)
අවි වශයෙන් 458

ලක්ෂණාදි වශයෙන්	459
සම්පත්ති-විපත්ති වශයෙන්	459
සාධාරණ අවෙණික ප්‍රයෝජන වශයෙන්	459-460
ආසන්න-දූර සතුරු වශයෙන්	460-462
ආදි මධ්‍ය-අවසාන වශයෙන්	462
ප්‍රඥප්ති ධර්ම වශයෙන්	462
අරම්මණ වැඩීම් වශයෙන්	462
නිස්සන්ද ඵල වශයෙන්	462-463
බ්‍රහ්ම විහාරාදි නම් ලැබීමේ හේතු	463-464
ධ්‍යාන වශයෙන්	465-467
ශුභ පරමාදී වශයෙන්	467-468
දුනාදී කල්‍යාණ ධර්ම පිරීම් වශයෙන්	469-470

(2) කාණ්ඩය

10. ආරුප්‍ය නිර්දේශය

ආකාසානඤ්චායතන ධ්‍යානයට සම්වදින පරිදි	1-4
ආකාසානඤ්චායතනය	4-9
විඤ්ඤාණඤ්චායතනය	10-11
ආකිඤ්චඤ්ඤායතනය	12-13
නෙවසඤ්ඤානාසඤ්ඤායතනය	13-22
ප්‍රකීර්ණක කථාව	23-24

11 සමාධි නිර්දේශය

ආහාරයෙහි ප්‍රතිකූල සංඥාව	25-27
ආහාර භෙද	27-28
දස ආකාර පිළිකුල් බව	28-33

ආහාරයෙහි පටික්කූල සඤ්ඤායෙහි ආනිසංස 33
චතුධාතු ව්‍යවස්ථානය 34-37
චතුධාතු විස්තාරය 37-38
අජ්ඣත්තික පඨවිධාතු 38-42
,, ආපෝධාතු, තෙජෝ ධාතු 42-43
,, වායෝ ධාතු 43-44
චතු ධාතු ව්‍යවස්ථානයේ ඇසපායය, අසපායය හෙද 44-45
,, ,, තවද ක්‍රමයෙකි 46
,, ,, විස්තර ක්‍රමය 46-47
දෙතිස් කොටස් වශයෙන් 48-55
තෙජෝ-වායෝ කොටස් වශයෙන් 56
සලක්ඛණ සඞ්ඛප වශයෙන් 56-57
තුදුස් ආකාරයෙන් 57-71
චතුධාතු ව්‍යවස්ථානානිසංස 71
සමාධි හෙද 72
සමාධි භාවනානිසංස 72-74

12. ඉද්ධිවිධ නිද්දේශය

ඉද්ධිවිධ ඤාණය 75
සිත දමනය කළයුතු තුදුස් ආකාරය 75-78
විකුර්ණ සෘද්ධි ගේ දුෂ්කර බව 78-79
ඛිප්ප නිසන්ති බව 79-80
ඉද්ධිවිධ ඤාණයා ගේ ලැබීම 81-83
දශවිධ ඉද්ධිහෙද 83-91
(සෘද්ධිය හටගැනීමේ) භූමි සතර 91-92
(සෘද්ධිය පිහිටීමට) සුදුසු පාද සතර 92-93
(සෘද්ධියට හේතුවූ) පද අට 93-94
සොළොස් මුල් (ප්‍රතිසම්භිදා ක්‍රමයෙනි) 94-96
මතහෙද 96
විකුර්ණ හෙද (එකෙක්ව බොහෝ වීම) 96-115
කාය වසයෙහි චිත්ත පරිනාමය 115-116
චිත්ත වශයෙහි කාය පරිනාමය 116-117
සෘද්ධි විකුර්ණය කරන පරිදි 118-119
මනොමය සෘද්ධිය 119

13. අභිඥා නිද්දේශය

දිබ්බසොත ඤාණය 120-122
චෙතොපරිය ඤාණය 123-126

පූජේනිවාසානුස්මෘති ඥානය 126-127
පූජේනිවාස සිහිකරන්නෝ 127-128
පූජේනිවාසානුස්මෘති ඥානය ලබන පරිදි 129-131
කල්ප විනාශය 132-138
චුතූපපාත ඤාණය 138-144
චුතූපපාත ඤාණය ලැබිය යුතු පරිදි 144-146
පඤ්චාභිඥාවන්ගේ ප්‍රකීර්ණක කථාව 147
ඉද්ධිවිධ ඤාණයේ සප්තාලම්බනය 147-148
දිව්‍යශ්‍රොත්‍රධාතුවේ සතර ආලම්බනය 149
චෙතොපරිය ඤාණයේ අෂ්ටාලම්බනය 149-153
පූජේනිවාසඤාණයේ අෂ්ටාලම්බනය 153-155
දිබ්බචක්ඛුඤාණයේ සතර ආලම්බනය 155
අනාගතංස ඤාණයේ අෂ්ටාලම්බනය 155-156
යථාකම්මූපග ඤාණයේ පඤ්චාලම්බනය 156

14 ඝනක නිර්දේශය

ප්‍රඥා භාවනාව 157-158
සංඥා, විඥාන, ප්‍රඥාවන්ගේ ප්‍රභේද 158-159
ප්‍රඥාවේ ලක්ෂණාදිය 159-160
ප්‍රඥාභේද 160-163
සතර ප්‍රතිසම්භිදා 163-166
පිළිසිඹියා විසඳවන කරුණු 166
ඒ පිළිබඳ ආචාර්‍යවාදී මත 167-168
විදර්ශනා ප්‍රඥාව වැඩිය යුතු පරිදි 168
ඝනක විභාගය 169
රූපඝනය 169
රූපභේද 169-170
ප්‍රසාදරූප පිළිබඳ මතභේද 170-177
ආලම්බන රූප 177-178
භාවරූප හා ඒ පිළිබඳ මතභේද 178-180
ජීවිත රූප 180-181
ශබ්ද රූපය හා මතභේද 181-184
විඤ්ඤත්ති රූපය 184-185
පරිවේදය හා විකාර රූප 185-187
ලක්ෂණ රූප 187-188
අහාර රූපය 188

අන්‍ය රූප (මතභෙද)	189-192
විඤ්ඤාණස්කන්ධය	193
සතර නාම ස්කන්ධ	193
විඤ්ඤාන ලක්ෂණ ද්‍රභෙද (ජාති වශයෙන්)	193
භූමි වශයෙන් විඤ්ඤාන භෙද	194-198
විපාක විඤ්ඤාණය	198-204
ක්‍රියා විඤ්ඤාණය	204-206
කෘත්‍ය වශයෙන් විඤ්ඤාන භෙදය	206-211
වෙදනා ස්කන්ධය	212
වෙදනා ලක්ෂණ	212
වෙදනා භෙද	212-213
සංඥා ස්කන්ධය	214
සංස්කාර ස්කන්ධය	214
සංස්කාර ලක්ෂණාදිය	215
සංස්කාර භෙද (කුසල සිත්හි යෙදෙන සංස්කාර)	215-223
,, ,, අකුසල ,, ,, ,,	223-227
,, ,, අව්‍යාකෘත ,, ,, ,,	227-228
අභිධර්මාදීන්හි රූපස්කන්ධය	228-231
,, ,, වෙදනා ස්කන්ධය	231-235
පඤ්චස්කන්ධය ක්‍රම වශයෙන්	235-236
,, භෙද වශයෙන්	236-237
,, අනූන අනධික වශයෙන්	238-239
උපමා වශයෙන්	239-240
සංක්ෂේප විස්තර වශයෙන්	240-241

15. ආයතන ධාතු නිර්දේශ

ආයතන භෙද	242
අර්ථ වශයෙන්	242-244
ලක්ෂණ වශයෙන්	244
තාවත් ප්‍රමාණ වශයෙන්	244-245
ක්‍රම වශයෙන්	245
විස්තර වශයෙන්	245-246
දතයුතු බව වශයෙන්	246-248
ධාතු කථාව	248
අවලෝස් ධාතු	248
අර්ථ වශයෙන්	248-250

ලක්ෂණාදි වශයෙන් හා ක්‍රම වශයෙන් 250
තාවත් ප්‍රමාණ වශයෙන් 250-252
සඞ්ඛ්‍යා වශයෙන් 253
ප්‍රත්‍යය වශයෙන් 253-255
දතයුතු බව වශයෙන් 255-256

16. ඉන්ද්‍රිය සත්‍ය නිද්දේශය

බාවීසතින්ද්‍රිය 257
ඉන්ද්‍රිය විභාග අර්ථ වශයෙන් 257-259
ලක්ෂණාදි වශයෙන් 259
ක්‍රම වශයෙන් 259-260
හෙදුභෙද වශයෙන් 260
කෘත්‍ය වශයෙන් 260-262
භූමි වශයෙන් 262 263
සත්‍ය විනිශ්චය හෙද 264
චතුරාර්‍ය සත්‍යය විභාග වශයෙන් 264-266
නිර්වචන වශයෙන් 266-268
ලක්ෂණාදී වශයෙන් 268
අර්ථ වශයෙන් හා අර්ථ උද්ධාර වශයෙන් 268 271
අනූනානධික වශයෙන් 271-272
ක්‍රම වශයෙන් 272
ජාත්‍යාදීන් ගේ නිශ්චය වශයෙන් 273-274
ජාත්‍යාදිය දුක්වන පරිදි 274-275
ජාති දුඃඛ විභාගය 275-278
ජරා ,, ,, 278-279
මරණ ,, ,, 279-280
සෝක ,, ,, 280
පරිදෙව ,, ,, 280-281
කායික දුඃඛ ,, 281
දෙමනස්ස ,, 281-282
උපායාස දුඃඛය 282
අප්‍රිය සම්ප්‍රයෝග දුඃඛය 283
ප්‍රිය විප්‍රයෝග ,, 283
ඉච්ඡාවිඝාත ,, 283-284
පඤ්චූපාදානස්කන්ධ ,, 284-285
සමුදය සත්‍යය 286-287
නිරෝධ ,, 287-289

නිරොධ ලක්ෂණාදිය 289
නිර්වාණවිවාදය 289-300
මාර්ග සත්‍යය 300
ආර්ය්‍ය මාර්ගාඞ්ග අට 301-302
ශූන්‍ය කෘත්‍ය වශයෙන් 302-305
අනාත්මභාවයන් ගේ ප්‍රභෙද වශයෙන් 306-308
උපමා වශයෙන් 308
චතුෂ්ක වශයෙන් 309-310
ශූන්‍යතා ,, 311-312
එකවිධාදි ,, 312-317
සභාග විසභාග ,, 317-318

---

3. කාණ්ඩය

17. පඤ්චස්කන්ධ නිර්දේශය

පටිච්ච සමුප්පාද - පටිච්ච සමුප්පන්න ධර්ම 319-324
පටිච්ච සමුප්පාදය පිළිබඳ මහානාර 324-327
සම්මතය ස්ථිර කිරීමේ සාධක 327-333
පටිච්ච සමුප්පාද විස්තාරය දෙශනා භෙදයෙන් 333-340
අර්ථ වශයෙන් 340-344
ලක්ෂණාදි වශයෙන් 344-345
එකවිධාදි ,, 345 348
අඞ්ගව්‍යවස්ථාන ,, 348-349
අවිද්‍යාව 349-350
සංස්කාර 350-354
සූචිසි ප්‍රත්‍යය:- හෙතු ප්‍රත්‍යය 355-358
ආලම්බන ප්‍රත්‍යය 358-359
අධිපති ප්‍රත්‍යය 359-360
අනන්තර-සමනන්තර ප්‍රත්‍යය 360-362
සහජාත ප්‍රත්‍යය 362-363
අන්‍යෝන්‍ය ,, 363-364

නිශ්‍රය	ප්‍රත්‍යය	364-365
උපනිශ්‍රය	,,	365-367
පුරෙජාත	,,	367-368
පශ්චාජ්ජාත	,,	368-369
ආසෙවන	,,	369
කම්ම	,,	369
විපාක	,,	370-371
ආහාර	,,	371-373
ඉන්ද්‍රිය	,,	373-375
ඣාන	,,	375
සම්ප්‍රයුක්ත	,,	376-377
විප්‍රයුක්ත	,,	377
අත්ථි	,,	377-379
නත්ථි	,,	379-380
විගත	,,	380
අවිගත	,,	380
ප්‍රත්‍යය විභාගය		380-381
ප්‍රත්‍යය විනිශ්චය		381
අවිද්‍යාව සංඝස්කාරයන්ට ප්‍රත්‍යය වන පරිදි		381-389
සංස්කාර විඤ්ඤාණයට	,, ,	389 414
විඤ්ඤාණ නාම-රූපයට	,, ,,	414 420
නාම-රූප ෂඩායතනයට	,, ,,	420-424
ෂඩායතන ස්පර්ශයට	,, ,,	424-427
ස්පර්ශය වේදනාවට	,, ,,	427-428
වේදනාව තෘෂ්ණාවට	, ,,	428-430
තෘෂ්ණාව උපාදානයට	,, ,,	430
උපාදාන හේද හා විස්තර		430-435
උපාදාන භවයට ප්‍රත්‍යය වන පරිදි		435-443
භවය ජාතියට	,, ,,	443-444
ජාතිය ජරා-මරණාදියට	,, ,,	444
ජාතිය අවිද්‍යාවට	,, ,,	444
තවද ක්‍රමයෙකි		445-447
භවචක්‍රයේ මූලධර්ම දෙක		447-448
,, අඩව තුන		448
,, සන්ධි තුන		449
,, සංක්ෂේප සතර		449
,, ආකාර විස්ස		449-453
,, වට්ට තුන		453

සත්‍ය ප්‍රභව වශයෙන් 454
කෘත්‍ය ,, 454-455
දෘෂ්ටිවාරණ ,, 455-456
උපමා ,, 456-457
ගම්භීර ,, 457 461
නයභෙද ,, 461-462
එවං ධම්මතා ,, 463-464

18. දිට්ඨි විශුද්ධි නිද්දේශය

දිට්ඨි විශුද්ධි විසර්ජනය 465
නාම-රූප විනිශ්චය චතුධාතු වවත්ථානයෙන් 466-467
,, ,, අවලෝස් ධාතු ,, 467-469
,, ,, ආදශ්‍යතන ,, 470
,, ,, පඤ්චස්කන්ධ ,, 470-471
රූපාරූප වශයෙන් 471
උපමා වශයෙන් 471-476
ශාස්වත-උච්ඡේද දෘෂ්ටි ප්‍රහාණයෙන් 476-482

19. කඞ්ඛාවිතරණ විශුද්ධිය

නාම-රූප ප්‍රත්‍යය සෙවීම 483-485
සොළොස් විචිකිච්ඡා ප්‍රහාණය 485-488
කම්මවට්ට-විපාකවට්ට වශයෙන් 488-490
වුති පටිසන්ධි වශයෙන් 490-492
(සොළොස්) අට වැදෑරුම් විචිකිච්ඡා ප්‍රහාණයෙන් 492-493
චූලසෝතාපත්ති 493-494

20 මග්ගාමග්ග ඤාණ දස්සන විසුද්ධිය

ත්‍රිවිධ පරිඤ්ඤා 495-497
කලාප සම්මර්ශනය 497 500
අනිඤ්ඤෙය්‍ය ධර්ම 500-501
ත්‍රිවිධ සම්මර්ශනය 501-503
අනුලෝම ඤාණක්ඛණය 503-507
නය විදර්ශනාව 507-508
නාම-රූප සම්මර්ශනය (භාවද ක්‍රමයක්) 508-510
රූප සම්මර්ශනය (කර්මාදී වශයෙන්) 510-514
අරූප සම්මර්ශනය 514-516

රූප සප්තක අරූප සප්තක සනම්ශීනය	516-517
ආදාන නික්ෂේප වශයෙන්	517
වයොවුද්ධාදී ගමන වශයෙන්	517-521
ආහාරමය ,,	521 522
ඍතුජරූප ,,	522
කර්මජ රූප ,,	522
චිත්ත සමුත්ථාන ,,	523 524
ධර්මතා රූප ,,	524 525
අරූප සප්තක කලාප ,,	525-526
යමක ,,	526
ක්ෂණික ,,	527
පටිපාටි ,,	
දිට්ඨි උග්ඝාටන ,,	
මාන උග්ඝාටන ,,	
තිකණ්ඩි පරියාදාන ,,	
අවලෝස් මහා විදර්ශනා	530 532
උදයව්‍යයානු දර්ශනය	532 539
දශ විදර්ශනොපක්ලේශ	540-546

21. ප්‍රතිපදා ඥාන දර්ශන විශුද්ධිය

නව මහා විදර්ශනා ඥානය	547
උදය ව්‍යය ඥානය	547-549
භඞ්ගානුපස්සනා ඤාණය	550 556
භයතුපට්ඨාන ඤාණය	556-558
ආදීනවානුපස්සනා ඤාණය	559 564
නිබ්බිදා ඤාණය	564-565
මුඤ්චිතුකම්‍යතා ඤාණය	565-566
පටිසඞ්ඛානුපස්සනා ඤාණය	566-568
සඞ්ඛාරුපෙක්ඛා ඤාණය	569
චතුකොටික සුඤ්ඤතා	569 570
සඳාකාර ,,	570
අට ආකාර ,,	570
දස ආකාර ,,	570-571
දෙළොස් ආකාර ,,	571
දෙසාළිස් ආකාර ,,	571
උපමා වශයෙන්	572-573
විමෝක්ෂමුඛ	573-576

සප්තාර්ය පුද්ගල භෙදය 577-578
නාම භෙද 578-582
උපමා 582-585
පතිලීනවරභාවය 586
ආර්යමාර්ගාදි නියමය 586-588
ප්‍රතිපද භෙදය 588-589
සවරසාදීන් නාම ලාභය 589-590
අනුලෝම ඤාණය 591-592
වුට්ඨානගාමිණී විදර්ශනාව පිළිබඳ විශෙෂ විභාග 592-594

22. ඥාන දර්ශන විශුද්ධිය

ප්‍රථම මාර්ග-ඵල ප්‍රත්‍යවෙක්ෂා ඥාන 595-600
ච්තීය ,, ,, ,, ,, 601-602
තෘතීය ,, ,, ,, ,, 602
චතුර්ථ ,, ,, ,, ,, 602-603
බොධිපාක්ෂික ධර්ම 603-608
වුට්ඨාන බල සමාසොභය 608-611
ක්ලෙශ ප්‍රහාණය 611-617
ක්ලෙශ ප්‍රහාණය පිළිබඳ මහාභෙද 617-623
මාර්ග ඥානයෙන් කරන කෘත්‍ය සතර 623 625
සොළසාකාර තථාර්ථය 625-628
ත්‍රිවිධ පරිඥ 628-629
ත්‍රිවිධ ප්‍රහාණ 629-630
අවලොස් මහා විදර්ශනා 631-633
සවර්ජ්කිරියා භෙද 633-634
භාවනා භෙද 635-636

23 ප්‍රඥා භාවනානිශංස නිර්දේශය

ක්ලෙශ ප්‍රහාණය ආර්යඵල රසය 637
මතානන්තර හා ප්‍රශ්න 638-639
ඵල සමාපත්තියට 639
ඵල සමාපත්තියට සමවදින්නෝ 639
,, ,, සම නොවදින්නෝ 639
මතානන්තර 639
සමවැදීමේ හේතු 640

සමවදින පරිදි (මතානන්තර)	640-641
සමවැද සිටින පරිදි	641
ඵල සමවතින් නැගිටින පරිදි	641
ඵලයට අනතුරුව පවතින සිත	641-642
නිරෝධ සමාපත්තිය	643
නිරෝධ සමාපත්තියට සමවදින්නෝ	643-644
,, ,, සම නොවදින්නෝ	644
විවිධ බලය	644 645
සොළොස් ඤාණචරියා	645-646
තව වැදෑරුම් සමාධිචරියා	646-647
පඤ්චවිධ වසිතා	
නිරෝධ සමාපත්තියට සම නොවැදීමේ හේතු	647-648
,, ,, සමවදින පරිදි	648
පූර්වකෘත්‍ය සතර	649-651
සමවැද සිටින පරිදි	652
නිරෝධ සමාපත්තියෙන් නැගෙන පරිදි	652
නිරෝධයට සමවැදුනහුගේ හා මළහුගේ වෙනස	652-653
නිරෝධ සමාපත්තියේ සවරූපය	653
ප්‍රඥා භාවනාවේ විශෙෂ ආනිසංස	653-654
ආර්‍ය්‍ය පුද්ගල භෙදය	654-656
නිගමනය	657-658

ශුද්ධි පත්‍රය

පිට	පෙළ	අශුද්ධ	ශුද්ධ
322	15	සයොග	සංයෝග
326	9	වණ්ණිණ්නය	වණ්ණිණ්හය
334	1	අවිජ්ජති	අවිජ්ජාති
339	5	අවිජ්ජූපසමා	අවිජ්ජූපසමා
342	15	නිරොධසමාපත්තියට	නිරොධසමාපත්තියට
359	2	පඤ්ඤත්ති	පඤ්ඤත්ති
374	5	සමථඨානං	සමුට්ඨානං
393	14	පවත්තතත්ති	පවත්තත්තති
396	25	අනරුව	අනතුරුව
396	33	කඝල	කුසල
398	31	සොත-ද්වාර	සොතද්වාර
401	34	සවභාවයෙනුදු	සභාවයෙනුදු
402	21-22	භාව-රූප	භාවරූප
403	36	වි ප: පටිච්චසමුප්පද විභඞග	වි: ප: ධම්මහදය විභඞග
416	10	වත්ථුදසක	වසතුදශක
421	13	ඡඩායතන	ඡළායතන
426	11	ශබ්දයෙන්	ශබ්දයන්
429	33	උත්පාද්‍යමානංහට	උත්පාද්‍යමානයාහට
457	17	පැමිණේ	පැමිණි
458	25	හෙතු-ඵලය	හෙතුඵලය
461	21	මරණයා ගේ- ක්ෂය ඛව ය	මරණයා ගේ ක්ෂය ඛවය
494	20	අහෙතුක විසමහෙතු	අහෙතු විසමහෙතු
500	13	ප්‍රත්‍යය-සමුත්පන්න	ප්‍රත්‍යයසමුත්පන්න
511	6	අරූපාවචර කුසල්ක්‍රියා	අරූපාවචර කුසල්-ක්‍රියා
521	2	ඕනට අනිකා මෙසේද කී	ඔහු මෙසේ ද කී
548	31	විනිභෝග- කොට	විනිභෝග කොට
578	22	සිඛාපත්තඨං	සිඛාපත්තං
581	14	රූපයෙහි පිවිස	අරූපයෙහි පිවිස
581	15	රූපයෙහි නැති සිටීමෙහි දු	අරූපයෙහි නැති සිටීමෙහි දු
593	24	වෙදනානුපස්සනා සතිපට්ඨාන- ය ද, සොළොස් ආකාරයෙන්, සරාග-සදෙස-	වෙදනානුපස්සනා සති- පට්ඨානය ද, සරාග- සදෙස-
611	4	යුගනඬ්ඩ හොවෙනීති	යුගනඬ්ඩං භාවෙනීති
616	21	සඟෘහීතය	සංගෘහීතය
625	34	සඟෘහීත	සංගෘහීත
644	11	මෙම සමපත්ති	මෙම් සමාපත්ති

පටුන

පඤ්ඤාභූමි නිද්දේශය	319	-	464
දිට්ඨිවිසුද්ධි නිද්දේශය	466	-	482
කඞ්ඛාවිතරණ විශුද්ධි නිද්දේශය	483	-	494
මග්ගාමග්ග ඤාණ දස්සන විශුද්ධි නිද්දේශය	495	-	546
ප්‍රතිපදා ඥාන දර්ශන විශුද්ධි නිද්දේශය	547	-	594
ඥාන දර්ශන විශුද්ධි නිද්දේශය	596	-	636
ප්‍රඥාභාවනානිසංස නිද්දේශය	637	-	656
නිගමනය ...	657	-	658

ග්‍රන්ථ සංකේත

බු: පා:	බුද්ධකපාඨ
වි: ම:	විසුද්ධිමග්ග
සං: නි:	සංයුත්තනිකාය
ප: ම:	පටිසම්භිදාමග්ග
ම: ව:	මහාවග්ග
දී: නි:	දීඝනිකාය
වි: අට්ඨකථා	විභඞ්ග අට්ඨකථා
අ: නි:	අඞ්ගුත්තර නිකාය
ස: පා:	සමන්තපාසාදිකා
ම: නි:	මජ්ඣිමනිකාය
වි: පා:	විභඞ්ගපාලි
ප. ප:	පට්ඨානප්පකරණ
ධ: ප:	ධම්මපදට්ඨකථා
පු: ප:	පුග්ගලපඤ්ඤත්තිප්පකරණ
ම: නිද්දෙස	මහානිද්දෙස
කථා: ප:	කථාවත්ථුප්පකරණ

ග්‍රන්ථ සංකේත

අට්ඨ: නි:	අට්ඨසාලිනී	1940	හේවාවිතාරණ
අ: නි:	අඞ්ගුත්තර නිකාය	1915	රෙවත සංස්කරණය
අ: නි: අට්ඨකථා	මනෝරථපූරණී	1923	හේවාවිතාරණ
ඉ: වු:	ඉතිවුත්තක පාළි	1926	සිරිධම්ම සංස්කරණය
උ: පා:	උදාන පාළි	,,	,, ,,
ඛු: පා:	ඛුද්දක පාඨ පාළි	,,	,, ,,
චු: ව:	චුල්ලවග්ග පාළි	1956	ශ්‍රීපාද ත්‍රිපිටක ග්‍රන්ථාවලී
ජා: පා:	ජාතක පාළි	1955	හේවාවිතාරණ සංස්කරණ
ථෙර: ගා:	ථෙරගාථා	1930	සුණිසසර සංස්කරණය
දී: නි:	දීඝනිකාය	1939	සුණාවාස ,,
ධ: ප:	ධම්මපද පාළි	1956	හේවාවිතාරණ ,,
ධ: ස:	ධම්මසඞ්ගණී පකරණ	1953	,, ,,
ධා: ක:	ධාතුකථාපපකරණ	1952	ශ්‍රීපාද ත්‍රිපිටක ග්‍රන්ථාවලී
ප: ජෝ:	පරමත්ථ ජෝතිකා	1920	හේවාවිතාරණ සංසකරණ
පටි: ම:	පටිසම්භිදා මග්ග		බුරුම ෂට්ඨ සංගායනා
පටි: අට්ඨකථා	සද්ධම්මපප්පකාසිනී	1927	හේවාවිතාරණ සංසකරණ
පඨා: ප:	පඨානපපකරණ	1953	ශ්‍රීපාද ත්‍රිපිටක ග්‍රන්ථාවලී
ප: දී:	පරමත්ථදීපනී	1920	හේවාවිතාරණ සංසකරණ
පාරා: පා:	පාරාජිකා පාළි	1950	හේවාවිතාරණ ,,
පෙ: ව:	පෙතවත්ථු පාළි	1930	සුණිසසර ,,
ම: නි:	මජ්ඣිම නිකාය	1937	සුණවිමල ,,
ම: ව:	මහාවග්ග පාළි	1956	ශ්‍රීපාද ත්‍රිපිටක ග්‍රන්ථාවලී
වි: අට්ඨකථා	සමන්තපාසාදිකා විනෝදනී	1932	හේවාවිතාරණ සංසකරණ
වි: ප:	විභඞ්ගපපකරණ	1952	ශ්‍රීපාද ත්‍රිපිටක ග්‍රන්ථාවලී
වි: ම:	විසුද්ධි මග්ග	1940	හේවාවිතාරණ සංසකරණ
වි: ම: ටී:	පරමත්ථ මඤ්ජුසා	1930	ධම්මානන්ද ,,
වි: ව:	විමානවත්ථු	1930	සුණිසසර ,,
ස: පකාසිනී	සද්ධම්මපපකාසිනී	1927	හේවාවිතාරණ ,,
ස: වි:	සමන්තපාසාදිකා විනෝදනී	1932	,, ,,
සා: ප:	සාරත්ථපපකාසිනී	1921	,, ,,
සං: නි:	සංයුත්තනිකාය	1925	අමරසීහතිස්ස ,,
සු: නි:	සුත්තනිපාත	1924	සිරිධම්ම සංසකරණය

ශුද්ධි පත්‍රය

පිට	පෙළ	වරද	නිවරද
6	15	කොවාදි	කොවාදී
16	23	අනිසමාවාරිකං	ආනිසමාවාරිකං
28	15	ජීවික	ජීවිකා
34	13	සංවරට	සංවරයට
39	5	පති භුඤ්ජති	පරිභුඤ්ජති
48	1	සුපිතං	සුපීතං
53	31	එසසසුඛං	පසසසුඛං
72	15	අපරියනත	අපරියනත්
73	17	තුබුණු	තුබුණු
83	27	මෙවුම්දම්	මෙවුන්දම්
96	26	කයනු	කියනු
102	33	ම: වි:	ම: ව:
102	34	අ: භි:	අ: නි:
107	34	අ: නි:	අ: නි:
116	26	ආරණ්‍යය	අරණ්‍යය
138	6	වත්තේය	වත්තේය
140	3	විවරාදීන්ගේ	චීවරාදීන්ගේ
148	2	සඵීප්‍රාකාරයෙන්	සඵීප්‍රකාරයෙන්
151	16	වහනස	වහන්ස
154	25	ඇවත්නි	ඇවැත්නි!
159	15	උතසසහනා	උතසහනා
162	16	සූසෙත්‍රාපනත්තියෙහි	සූත්‍රොතපත්තියෙහි
173	14	ඉදිමගිය	ඉදිමිගිය
179	15	ඇත්තේ	ඇත්තෝ
193	20	සඨානනතර	සඨානානතර
198	8	හබෙහා	හබෙබා
220	19	සාත්ඣාත්	සාඣාත්
228	36	ස: නි:	සං: නි:
250	2	උපවාරයෙහිදී	උපචාරයෙහිදී
287	27	මරණානුසමෘතිය	මරණානුසමෘතිය
288	8	ආණාපාණා සමෘතිය	ආණාපාණානුසමෘතිය

පිට	පෙළ	වරද	නිවරද
326	30	ජෝතිරංග මණ්ඩය	ජාතිරංගමණ්ඩය
361	35	දවතති සාකාර	දවතතිංසාකාර
367	26	විදුනු	විදිනු
368	13	හරන්නේය	හරින්නේය
372	20	පිහිටයේය	පිහිටියේය
383	18	අසවාදනය	ආසවාදනය
390	19	සත්කාර	සත්වාකාර
392	13	ඨනසො	ඨානසො
403	34	අශ්වාස	ආශ්වාස
404	4	ආශ්ව	ආශ්වාස
412	9	ගෙනිය	ගිනිය
429	18	ඡොඩෂ	ඡොඩශ
431	22	ධවංච	ධ්‍රුවංච
435	25	කැතැත්තෙම් ද	කැමැත්තෙම් ද
438	27	දඝ	දිය
439	11	සිතුරාගේ	සතුරාගේ
439	30	අතැමකුගේ	ඇතමකුගේ
441	14	නේනට	දෙන්නට

පටුන

1	ශීල නිදේශය	1—92
2	ධුතාඞග නිදේශය	93—132
3	කම්මට්ඨානග්‍රහණ නිදේශය	133—180
4	පඨවිකසිණ නිදේශය	181—254
5	සෙසකසිණ නිදේශය	255—264
6	අශුභ කම්මට්ඨාන නිදේශය	265—286
7	ඡ අනුස්සති නිදේශය	287—341
8	අනුසමෘති කම්මට්ඨාන නිදේශය	343—432
9	බ්‍රහ්ම විහාර නිදේශය	433—470

ග්‍රන්ථසංකේත

දී: නි:	දීඝනිකාය 1939 සද්ධාවාස සංස්කරණය
ම: නි:	මජ්ඣිමනිකාය 1937 සද්ධර්මාලංකාර සංස්කරණය
සං: නි:	සංයුත්තනිකාය 1925 අමරසිංහතිස්ස සංස්කරණය
අ: නි:	අඞ්ගුත්තරනිකාය 1915 රෙවත සංස්කරණය
ධ: ස: (ධ: ප:)	ධම්මසංගණිපපකරණ 1953 හෙළවිතාරණ සංස්කරණය
වි: ප:	විභඞ්ගපපකරණ 1952 සිරිපාද ත්‍රිපිටක ග්‍රන්ථාවලී
ධා: කා:	ධාතුකථාපපකරණ ,, ,, ,,
ප: ප: (පඨා: ප)	පඨානපපකරණ ,, ,, ,, ,,
ම: ව:	මහාවග්ගපාලි 1956 ,, ,, ,,
චූ: ව:	චූලවග්ගපාලි ,, ,, ,, ,,
ධ: ප:	ධම්මපද පාලි 1956 හෙළවිතාරණ සංස්කරණය
උ: පා:	උදානපාළි 1926 සිරිධම්මසංස්කරණය
ඉ: වු:	ඉතිවුත්තකපාලි ,, ,, ,,
සු: නි:	සුත්තනිපාත පාලි 1924 විමලඤාණතිස්ස ,,
මහා: නි:	මහානිද්දෙසපාලි 1933 සොරත සංස්කරණය
පෙ: ව:	පෙතවත්ථු ,, 1930 සද්ධර්මාලංකාර ,,
පටි: ම: (ප: ම:)	පටිසම්භිදාමග්ග බුරුම ජර්ට්සංගායනා
අට්ඨ: නී	අට්ඨසාලිනී 1940 හෙළවිතාරණ සංස්කරණය
ස: වි:	සමන්තපාසාදිකා 1932 හෙළවිතාරණ ,,
මි: ප:	මිලින්දප්‍රශ්න 1927 පියරතන සංස්කරණය
වි: ම:	විසුද්ධිමග්ග 1940 හේවාවිතාරණ ,,
සිං: වි:	සිංහල විශුද්ධිමාර්ගී {1956 සිරිධම්මවංස– {1959 නාතුරාම සංස්කරණය
අ: නි: අට්ඨකථා	මනෝරථපූරණී 1923 හෙළවිතාරණ ,,
ප: ටී: ,,	සද්ධම්මප්පකාසිනී 1927 හෙළවිතාරණ ,,
වි: ම: ටීකා	පරමත්ථමඤ්ජූසා 1930 ධම්මානන්දසංස්කරණය
වි: අට්ඨකථා	විභඞ්ගපපකරණ අට්ඨකථා 1922 පඤ්ඤානන්ද සංස්කරණය

පටුන.

		පිට
10.	ආරුප්‍යනිදේශය . .	471 - 494
11.	සමාධි නිදේශය ...	495 - 544
12.	ඉද්ධිවිධ නිදේශය ...	545 - 589
13.	අභිඥ නිදේශය ...	590 - 626
14.	සඤ්ඤ නිදේශය ...	627 - 711
15.	ආයතන-ධාතු නිදේශය ...	712 - 726
16	ඉන්ද්‍රිය-සත්‍යනිදේශය ...	727 - 788

ශුද්ධි පත්‍රය.

පිට	පෙළ	වැරදි	නිවැරදි
488	28	තෙරහුවෝ	තෙරණුවෝ
493	4	භවනන්තිමේ	භවනන්තිමා
,,	5	අඞ්ගාතික්කකම්මෙතෙසං	අඞ්ගාතික්කකම්මෙතාසං
498	21	බුදිධ	බුද්ධ
503	10	සකළ	සකල
509	20	යමකිසි	යම්කිසි
530	31	සණු	සුණු
556	6	මහමගලන්	මහමුගලන්
571	8	කරණුවෝ	කරහුවෝ
576	22	කසිතයට	කසිණයට
577	20	පොලොව	පොළොව
578	30	අදිඨාන	අධිඨාන
580	27	දව්‍ය	දිව්‍ය
591	5-14	ශොත්‍ර	ශ්‍රොත්‍ර
592	30	අවසන	අවසන්
605	28	මහෙසාක්‍ය	මහෙශාඛ්‍ය
606	23	පලය	ජලය
635	9	යමහා	යමහා
,,	17	අවඨාති	අඨොති
637	34	අශෙෂයන්	අශෙෂයන්
690	15	සුවණී	සුවණී
698	1	සන්නීරණන්හි	සන්නීරණයන්හි
703	1	විපයීාශ	විපයීාශ
711	33	වශයෙ න්නුවණින්	වශයෙන් නුවණින්
729	13	සතරෙක්	සතර දෙනෙක්
781	12	නිබබුති	නිබ්බුති
787	19	බට්ටපතෙක	බට්ටපකෙක

පිරිනැමීම

දහමැදුරු පඬිවර
සිරි දම්වස් ම හිමිසඳ
සිරි-නම සිහිකර බැතින්
පුදනෙමි හෙළ විසුදු මග

සංක්ෂිපනය

විශුද්ධි මාර්ගය බෞද්ධ ලොකයෙහි ප්‍රසිද්ධ ශ්‍රේෂ්ඨ ධර්ම ග්‍රන්ථයෙකි. **මාතර සිරිමංගල පරිවෙණාධිපතිව වැඩ විසූ ආචාර්ය්‍ය පූජ්‍ය පණ්ඩිත මාතර ශ්‍රී ධර්මවංශ ස්ථවිරයන් වහන්සේ** සිංහල බෞද්ධයන් ගේ ප්‍රයෝජනය තකා මෙයට අවුරුදු විසි-පහකට පමණ පෙර එය සිංහලට නඟා ප්‍රසිද්ධ කරවීමට ආරම්භ කළහ. එහි නිදේශ තවයක් පළකරවූ පසු උන්වහන්සේ හදිසියෙන් අපවත් වූයෙන් එපමණෙකින් එය නැවතීමෙන් ධර්මකාමීන් ගේ බලාපොරොත්තු සුන්වී ය.

එහෙත් ඉන් ධර්මඥතය දියුණු කරගත් ගිහි-පැවිදි පින්වතුන් එහි ඉතිරි කොටස් ද සිංහලට පරිවර්තනය කොට ප්‍රසිද්ධ කරවන සේ කළ ආරාධනයෙන් හා අපවත්වී වදාළ ධර්මාචාර්ය්‍ය සවාමීන් වහන්සේට උපකාර වශයෙන් ද එය සම්පාදනය කිරීමට අදහස් කෙළෙමි. මෙහිලා උන්වහන්සේ වෙත විශුද්ධිමාර්ගය හැදෑරීමෙන් ලැබූ අභ්‍යාසයෙන් හා උන්වහන්සේ ගේ සටහන් ද ඇසුරු කෙරෙමින් අවසානය තෙක් **සම්පූර්ණ විශුද්ධි මාර්ගය** අනුවාදය කරන ලදී.

මෙහි මුල් කොටස් මෙන්ම මෙය ද විශුද්ධිමාර්ගයේ ක්ෂුද්‍ර අනුවාදයෙක් නොවේ. එහි ටීකා සන්නයන්හි වූ විශෙෂ විස්තරයන් හා විභඞ්ග අට්ඨකථාදිය ද ඇසුරු කෙරෙමින් සකස් කළ මෙය වැල්ලෙවත්තේ **ශ්‍රී ධර්මෝදය පරිවෙණාධිපති විද්‍යා-විශාරද පණ්ඩිත ඉඳුරුවේ උත්තරානන්ද ස්ථවිරයන් වහන්සේ-ගේ** සංශොධනයෙන් වැඩියක් සකස් වූ බව ද සතුටින් සඳහන් කරමි.

මේවරද මෙය මුද්‍රණය කරවීමට මං සලසාලීමෙන් අනුග්‍රහ කළ අප පිරිවෙනේ උපප්‍රධානාචාර්ය්‍ය **පණ්ඩිත මාතර වජිරවංශ ස්ථවිරයන්** සඳහන් කරනුයේ කෘතඥතා පූර්වකව ය. ශුද්ධිපත්‍ර බැලීම් ආදියෙන් සහාය වූ පිරිවෙනේ ආචාර්ය්‍ය **පණ්ඩිත මලිදුව විමලවංශ** ආදි ස්ථවිර නිස්සූන් ද මෙහිලා සඳහන් කරමි.

මේ දෙවන සංස්කරණයේදී මුල් වාරයට වඩා විශෙෂ ස්ථාන නිහිපයක් සකස් කිරීමට හා මෙහි ඇතුළත් දෙශනා පාඨ සඳහන්වන ධම්ම ග්‍රන්ථයන්හි ඒ ඒ පිටුවල අඩංගු සඳහන් කළ හැකිවීම ද ග්‍රන්ථය පරිශීලනය කරන ධම්ම කාමීන්ට විශෙෂ ප්‍රයෝජනය පිණිස වේය යි සිතමි.

දසවැනි නිදේශයේ පටන් සොළොස්වැනි නිදේශය තෙක් වූ කොටස මෙහි ඇතුළත් වේ. මෙබඳු ගැඹුරු ධම්ම ග්‍රන්ථයක් සම්පාදනය කිරීමේදී ඒ ඒ කරුණු පිළිබඳව මුහුණ පෑමට සිදුවන දුෂ්කරතාවය නිසා යම් යම් ව්‍යාකුලත්වයන් සිදුවිය හැකි හෙයින් එබඳු තැන් වෙතොත් අප වෙත දන්වන මෙන් ධම්ධර උතුමන් වෙත ගෞරවයෙන් ආරාධනය කරමි.

මනාසේ මෙය මුද්‍රණය කිරීමෙහි ව්‍යාවෘත වූ 'සීමාසහිත මාතර වෙළෙන්දෝ' මුද්‍රණාලයේ අධිකාරී සී. ඒ. හෙමචන්ද්‍ර මහතා ඇතුළු පින්වතුන් ද වෙසෙසින් සඳහන් කරමි.

විශුද්ධිමාර්ගය පිළිබඳ විවෙචනාත්මක විස්තර ප්‍රස්තාවනාව හා අනුක්‍රමණිකාව අවසාන කොටසෙහි පළවී ඇත.

බටුවිට නන්දාරාම ස්ථවිර

ශ්‍රී: බු: ව. 2503 බිනර පුර පසළොස්වක් ලත් බුද දින
සිරිමඬගල පිරිවෙන
වල්පොළ – මාතර.

සිංහල
විශුද්ධිමාර්ගය.

නමො භගවතො සම්මා සම්බුධස්ස.

ශීල නිද්දේශය.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ **සැවැත්** නුවර **දෙවුරම්** වෙහෙර වැඩ වසන **කල්හි එක්තරා දෙවපුත්‍රයෙක්** එක් මධ්‍යම රාත්‍රියෙක උන්වහන්සේ කරා එළඹ වැඳ එකත්පස් වැ සිටැ මෙසේ විනාළේය.

"අනෙනාජටා බහිජටා – ජටාය ජටිතා පජා
තං තං ගොතම පුච්ඡාමි – කො ඉමං විජටයෙ ජටං.[1]"

"ඇතුලත ද අවුල ය. පිටත ද අවුල ය. මුළු සත්ත්ව වර්ගයා මේ අවුලෙන් අවුල් වැ සිටිති. **ගෞතම සර්වඥයන් වහන්ස!** එබැවින් මම ඔබගෙන් විනාරමි. මේ අවුල කවුරු නිරවුල් කෙරෙත් ද" යනු එහි භාවසි.

විසඳරය මෙසේ ය:—

හුණ ලැහැබෙක අතුපතර මුල පටන් අග දක්වා ද අග පටන් මුල දක්වා ද හැසී ගැවැසී සිටිනා සේ **තෘෂ්ණාව** රූපාලම්බනයෙහි පටන් ධර්මාලම්බනය දක්වා ද ධර්මාලම්බන යෙහි පටන් රූපාලම්බනය දක්වා ද හැසී ගැවසී පවත්නේ ය. එබැවින් තෘෂ්ණාවට මෙහි දී **ජටා** හෙවත් **අවුල** යයි කියන ලදී. ඒ තෘෂ්ණාව වනාහි සවකීය පරිෂ්කාර සවකීය ආත්ම භාව අධ්‍යාත්මික ආයතන පිළිබඳ වැ උපදනා කල අනෙනා ජටා – ඇතුල අවුල යයි ද, පරකීය පරිෂ්කාර පරකීය ආත්ම භාව බාහිර ආයතන පිළිබඳ වැ උපදනා කල බහිජටා– පිටත අවුල යයි ද කියනු ලැබේ. තුන්ලෝ වැසි සියලු සත්ත්වයෝ මේ අනෙනා ජටායෙන් හා බහිජටායෙන් අවුල් වැ

---

[1] සං: නි: දෙවතාසංයුත්ත 9 පිට.

සිටිති. යම් හෙයකින් අවුල් වැ සිටින් ද එහෙයින් **ගෞතම සර්වඥ දරුවාණෙනි!** මම ඔබවහන්සේගෙන් විචාරමි. මේ අවුල කපාලන්නට කවුරු සමර්ථ ද

මෙසේ පුළුවුත්තා ලද **සර්වඥ ශාසනයන්** වහන්සේ ඒ දෙව් පුත්හු ගේ ප්‍රශ්නය විසඳන සේක්

"සීලෙ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ,
චිත්තං පඤ්ඤඤ්ච භාවයං
ආතාපී නිපකෝ භික්ඛු
සෝ ඉමං විජටයෙ ජටං[1]"

යි වදළ සේක.

මේ ගාථාව **වර්ණිතා කිරීම** වශයෙන් අර්ථකථාචාර්ය **බුද්ධඝෝෂ මහා** ස්ථවිරයන් වහන්සේ සසුන් වැඳ පැවිදි වූ නිවන් කැමැති යෝගීන්ගේ ප්‍රමෝදය සඳහා **මහා විහාර** වාසීන්ගේ පරිශුද්ධ විනිශ්චයයෙන් හා නානාවිධ දෙශනා නයින් ප්‍රතිමණ්ඩිත වූ **විශුද්ධිමාර්ග** නම් උතුම් ධර්මග්‍රන්ථය පාළිභාෂා යෙන් රචනා කරන ලද්දේ ය. පාළි භාෂාව නොදත් ශ්‍රද්ධා සම්පන්න බෞද්ධ සාධූන්ගේ ප්‍රයෝජනය සඳහා මවිසින් එය සිංහල භාෂාවට පරිවර්තනය කරනු ලැබේ. ආදර උපදවා සියල්ලන් විසින් ශ්‍රවණ ධාරණ කළයුතු.

විශුද්ධිමාර්ග යනු කුමක්ද

කිසියම් කිලුටක් නැති බැවින් හා ඉතා පිරිසිදු බැවින් නිර්වාණයට විශුද්ධි යයි කියනු ලැබේ. ඒ විශුද්ධි සංඛ්‍යාත **නිර්වාණයට මාර්ගය — විශුද්ධි මාර්ගය** යි. මාර්ග නම් අධිගම උපාය. (නිර්වාණයට යා හැකි උපාය – විශුද්ධි මාර්ගය යි කී නියා මෙසින් දත යුතු.)

ඒ මේ විශුද්ධි මාර්ග සංඛ්‍යාත **නිර්වාණ** අධිගමෝපාය වනාහි ඇතැම් තැනෙක **විදර්ශනා මාත්‍ර** වශයෙන් ද, ඇතැම් තැනෙක **ධ්‍යාන – ප්‍රඥා** වශයෙන් ද, ඇතැම් තැනෙක **කර්මාදි** වශයෙන් ද, ඇතැම් තැනෙක **ශීලාදි** වශයෙන් ද, ඇතැම් තැනෙක **සතිපට්ඨානාදි** වශයෙන් ද, වදරන ලද්දේ ය. ඒ එසේ මැ යි.

"සබ්බෙ සංඛාරා අනිච්චාති – යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛෙ – එසමග්ගො විසුද්ධියා"[2]

---

[1] සං: නි: දෙවතාසංයුත්ත 8 පිට

[2] " " "

"සියලු සංඝකාර ධම්මෝ අනිත්‍යයහ'යි යම් විටෙක නුවණින් දක්නේ ද, එවිට දුඃඛයෙහි උකටලී වන්නේ ය" මෙහි **විදර්ශනා මාත්‍රය** විශුද්ධිමාර්ගය යි වදාළේ ය. **විදර්ශනා නම්,** සියලු සංඝකාර ධම්මයන් අනිත්‍යාදි වශයෙන් සැලකීමයි.

"යමනික්කානං ච පඤ්ඤා ච - සමෙ නිබ්බාණසන්තිකෙ"[1]

"යමෙක් කෙරෙහි ධ්‍යානය හා ප්‍රඥාව ඇත්තේ ද හෙතෙම **නිර්වාණය** අසල වන්නේ ය" මෙහි **ධ්‍යාන, ප්‍රඥා** දෙක විශුද්ධිමාර්ගය යි වදාළේ ය.

"කම්මං විජ්ජා ච ධම්මෝ ච - සීලං ජීවිතමුත්තමං
එතෙන මච්චා සුජ්ඣන්ති න - ගොත්තෙන ධනෙන වා"[2]

මෙහි **කර්ම, විද්‍යා, ධර්ම, ශීල** යන ධම්මයෝ විශුද්ධිමාර්ගය යි වදාළේ ය. "මාගේ චෙතනාය, මාගේ ප්‍රඥාය, සමාධිපාක්ෂික ධම්මය, සීලයෙහි පිහිටියහුගේ උත්තම ජීවිතය නොහොත් විජ්ජා සංඛ්‍යාත **සම්මාදිට්ඨි, සම්මාසංකප්පය.** ධම්මසංඛ්‍යාත **සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධිය. සීල** සංඛ්‍යාත **සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීවය** යන මේ **ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයෙන්** මනුෂ්‍යයෝ පිරිසිදු වෙති. ගොත්‍රයෙන් හෝ ධනයෙන් හෝ පිරිසිදු නොවෙත්' යනු ගාථාවෙහි අදහස ය.

"සබ්බදා සීලසම්පන්නා-පඤ්ඤවා සුසමාහිතා
ආරද්ධවීරියා පහිතත්තා-ඔඝං තරති දුත්තරං"[3]

මෙහි **ශීල, සමාධි, ප්‍රඥා, වීර්‍ය** යන මේ ධම්මයෝ විශුද්ධිමාර්ගය නිවනට මඟ යයි වදාළේ ය. "ඇමකල්හි සිල්වත් වූ සමාධිමත් වූ ප්‍රඥාවත් වූ පටන්ගත්තා ලද වීර්‍ය ඇති නිවන් පිණිස මෙහෙයන ලද සිත් ඇති මහණ එතර විය නොහැකි කර්මාදි චතුරෝඝය එතර කරන්නේ ය" යනු ගාථාවේ අදහස ය.

"එකායනෝ අයං භික්ඛවෙ මග්ගෝ සත්තානං විසුද්ධියා ... නිබ්බාණස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරෝ සතිපට්ඨානා"[4]

මෙහි **සතර සතිපට්ඨාන** ධම්මයෝ විශුද්ධිමාර්ගය – නිවනට මඟ යයි වදාළේ ය. මහණෙනි! යම් සතර සතිපට්ඨාන ධම් කෙනෙක් වෙත් ද ඔවුහු සත්ත්වයන් ගේ විසුද්ධිය පිණිස, නිවන් අවබෝධය පිණිස **එකායන** මාර්ගය වන්නේ ය" යනු අදහස යි.

---

[1]ධ: ප: භික්ඛුවග්ග 34, [2]සං: නි: දෙව සං: 31
[3]සං: නි: දෙවතා සං: 30, [4]දී: නි: මහාවග්ග 177

මෙසේ දක්වන ලද නානාවිධ විශුද්ධිමාර්ග – නිවන් මං අතුරෙන් මේ **"සීලෙ පතිට්ඨාය"** යනාදි ප්‍රශ්න ව්‍යාකරණයෙහි **සීල, සමාධි, ප්‍රඥා, වීරිය** යන මේ ධර්මයෝ විශුද්ධිමාර්ග – නිවනට මඟ යයි වදාළ සේක. (ඒ **විශුද්ධිමාර්ග ප්‍රකාශක ග්‍රන්ථය** ද **විශුද්ධිමාර්ග** නම් වේ.)

ගාථායෙහි පදපූර්ණ මෙසේ ය:-

සපඤ්ඤෝ- (ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි ප්‍රඥයෙන්) ප්‍රඥාවන් වූ, **නරෝ**- යම් සත්ත්වයෙක්; **සීලෙ පතිට්ඨාය**- සීලයෙහි පිහිටා; **චිත්තං ච**- සමාධිය ද; **පඤ්ඤං ච**- විදර්ශනාව ද; **භාවයං**- වඩන්නේ; **ආතාපී**- කෙලෙස් තවන වීර්‍ය ඇත්තේ; **නිපකෝ**- පාරිහාරිය- ප්‍රඥ ඇත්තේ වෙයි ද; **සෝ භික්ඛු**- ඒ මහණ; **ඉමං ජටං**- මේ නෘෂ්ණා නමැති අවුල; **විජටයෙ**- නිරවුල් කරන්නේ ය; සිඳලන්නේ ය, යූ සේසි.

ගාථායෙහි එක් එක් පදයෙහි විවරණය මෙසේ ය:-

සීලෙ පතිට්ඨාය= සීලයෙහි සිටැ සීලය පුරන්නා ම මෙහි සීලයෙහි සිටියේ යයි කියනු ලැබේ. එහෙයින් සිල් පිරීම් වශයෙන් සීලයෙහි පිහිටා යන අර්ථයි.

නරෝ= සත්ත්ව නෙමේ.

සපඤ්ඤෝ= කර්මජ ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි ප්‍රඥයෙන් ප්‍රඥ ඇත්තේ ය. (අහෙතුක හෝ ද්විහෙතුක ප්‍රතිසන්ධි චිත්තයෙන් උපන්නහුට ඒ අත්බැවිහි තෘෂ්ණා අවුල කැපිය නොහැක. ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි චිත්තයෙන් උපන්නේ මැ තෘෂ්ණා අවුල කපා. **තෘෂ්ණා** අවුල කැපීම, **නම්** රහත් වීම ය. අහෙතුක විහෙතුක- යනට රහත්වනු තබා ධ්‍යානවත් සෙසු මාර්ග ඵලවත් නොලද හැක.)

චිත්තං පඤ්ඤං ච භාවයං= සමාධියද, විදර්ශනාව ද, වඩන්නේ. මෙහි **චිත්ත** ශීර්ෂයෙන් සමාධිය ද, ප්‍රඥ නාමයෙන් විදර්ශනාව ද, දක්වන ලදී.

ආතාපී= වීර්‍ය ඇත්තේ. වීර්‍යය වනාහි **කෙලෙස්** තවන අර්ථයෙන් ආතාප යයි කියනු ලැබේ. ආතාප ඇත්තේ ආතාපී.

නිපකෝ= ප්‍රඥ ඇත්තේ. නෙපක්ක නම් ප්‍රඥ. එයින් යුක්ත වූයේ **නිපක**. මෙයින් පාරිහාරිය ප්‍රඥව දැක්වීණි.

මේ ගාථායෙහි **"1 සපඤ්ඤෝ, 2 පඤ්ඤංභාවයං, 3 නිපඤ්ඤෝ"** යි තෙවරක් ප්‍රඥාව සඳහන් විය. එයින් ප්‍රථමය **ජාති ප්‍රඥාව** ය. ච්තීය ය **විදර්ශනා ප්‍රඥා** ය. තෘතීය ය **සම්භාරතාසඞ්ඛාත පාරිහාරිය ප්‍රඥා** ය (පාරිහාරිය ප්‍රඥා නම්, "අයං කාලෝ උද්දෙසස්ස අයං කාලෝ පරිපුච්ඡායාති ආදිනා නයෙන සඞ්ඛල්පකාරාපිකා පරිහරිතබ්බපඤ්ඤා"[1] යි **සංයුත්තඅට්ඨකථා**යෙහි යූ බැවින් මේ උද්දෙසයට කාලය, මේ පරිපුච්ඡායට කාලයයි යනාදි නසින් සම්පාදිතසාධක වූ පරිහරණය කළයුතු ප්‍රඥාය. (උද්දෙස නම්, පාළිවාචනා. පරිපුච්ඡා නම්, අට්ඨ කථා.)

භික්ඛු = සසර බිය දක්නේ භික්ෂු.

සෝ ඉමං විජටයෙ ජටං = යට දැක්වුණු (ශීල, සමාධි, ත්‍රිවිධ ප්‍රඥා, වීර්‍ය්‍ය යන) සවැදෑරුම් ධර්මයන්ගෙන් යුක්ත වූ භික්ෂු තෙමේ ශක්ති සම්පන්න පිරිමියෙක් පොළොවෙහි සිටුවා ගෙන තියුණු ආයුධය ඔසවා මහ හුණ ලැහැබක් කපා හෙලන්නා සේ ශීලයෙහි පිහිටා සමාධි නමැති **නිකෂපාෂාණයෙහි** මුවහත් තබන ලද විදර්ශනා ප්‍රඥා නමැති ආයුධය වීර්‍ය්‍ය බලයෙන් රැකුල් දෙන ලද පාරිහාරිය ප්‍රඥා නමැති හස්තයෙන් ඔසවා සිය සතන්හි පවත්නා සකල තෘෂ්ණා ජටාව කපා හෙළන්නේ ය. මාගී ක්ෂණයෙහි හෙතෙමේ කපා හෙළන්නේ නම් වේ. එල ක්ෂණයෙහි කපා හෙළුයේ සකල ලොකයට අග්‍ර දක්ෂිණාහී වන්නේ ය. එහෙයින් **සම්බුදයන්** වහන්සේ

"සීලෙ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ
චිත්තං පඤ්ඤං ච භාවයං
ආතාපී නිපකෝ භික්ඛු
සෝ ඉමං විජටයෙ ජටං"

යි වදාළ සේක.

මෙහි දක්වන ලද ත්‍රිවිධ ප්‍රඥාවන් අතුරෙහි **"සපඤ්ඤෝ"** යි පළමු දැක්වුණු ප්‍රතිසඤ්ඤා ප්‍රඥාව සඳහා යොගාවචරයා විසින් මේ අත්බැව්හි කළ යුත්තෙක් නැත. එය පූර්වකර්මානුභාවයෙන් මැ සිඛ විය යුතු බැවිනි.

ඔහු විසින් **"ආතාපී-නිපකෝ"** යි මෙහි දක්වන ලද වීර්‍ය්‍ය යෙන් නිති උත්සාහවත් වැ ප්‍රඥයෙන් යහපත් විමසුම් ඇති වැ සීලයෙහි පිහිටා චිත්ත-පඤ්ඤා වශයෙන් වදාළ **සමථ-විදර්ශනා**

[1]සා: ප: අට්ඨකථා 39-40

වැඩිය යුතු වන්නේ ය. මෙසේ මෙහි ලා **භාග්‍යවතුන්** වහන්සේ ශීල, සමාධි, ප්‍රඥා මුඛයෙන් **විශුද්ධිමාර්ගය** හෙවත් **නිවනට** මග වදාළ සේකැ යි දත යුතු. එපමණෙක් ද නො වේ. මේ ත්‍රිවිධ ධර්මයෙන් උත්වහන්සේ **1 ත්‍රිවිධ ශික්ෂා, 2 ත්‍රිවිධකල්‍යාණ ශාසන, 3 තෙවිජ්ජතාදීන්ට උපනිශ්‍රය, 4 උභයානතය හැර මධ්‍යම ප්‍රතිපත්ති ඥෙවන, 5 අපායාදී සමතික්‍රමණ උපාය, 6 ත්‍රිවිධකෙලශප්‍රහාණ. 7 ව්‍යතික්‍රමාදි ප්‍රතිපක්ෂභාව, 8 ත්‍රිවිධ සංකෙලශ විශොධන, 9 සොතාපන්නතාදීන්ට හෙතු** යන ඥෙතෙක් ධර්ම ප්‍රකාශ කළ සේක.

1. ත්‍රිවිධ ශික්ෂා තම්:- අධිශීල ශික්ෂා, අධිචිත්ත ශික්ෂා, අධිප්‍රඥ ශික්ෂා යැ. එහි ශීලයෙන් අධිශීල **ශික්ෂා**වද, සමාධියෙන් අධිචිත්ත ශික්ෂාව ද, ප්‍රඥයෙන් අධිප්‍රඥ ශික්ෂාව ද දක්වන ලදී

2. ත්‍රිවිධ කල්‍යාණ ශාසන තම්:- ශාසනයාගේ **ආදි කල්‍යාණ, මධ්‍යෙ කල්‍යාණ, පරියොසාන කල්‍යාණ** ය. **ශීලයෙන්** ශාසනයාගේ ආදි කල්‍යාණත්වය දක්විණි.

ඒ එසේ මැ යි:- ශීලය ශාසනයාගේ ආදිය වේ. **"ඥොවාදි කුසලානං ධම්මානං සීලං ච සුවිසුධං"**[1] **"සබ්බ පාපස්ස අකරණං"** [2]යනාදීන් වදාළ ඥෙයිනි. ඒ ශාසනයාගේ ආදි සංඛ්‍යාත ශීලය අවිප්පටිසාරාදි ගුණ ඵලවත බැවින් කල්‍යාණ වේ. අවිප්පටිසාර තම් විඳිළිසර නොවීම. **"සීලං අවිප්පටිසාරාය"** [3]යනාදීන් වදාළ ඥෙයිනි.

සමාධියෙන් ශාසනයාගේ මධ්‍ය කල්‍යාණත්වය දක්විණි. ඒ එසේ මැ යි:- සමාධිය ශාසනයාගේ මධ්‍ය යැ. **"කුසලස්ස උපසම්පදා"** [2]යනාදීන් වදාළ ඥෙයිනි. ඥෙ ද ඍද්ධිවිධාදි ගුණ ඵලවත ඥෙයින් කල්‍යාණ වේ.

ප්‍රඥයෙන් පරියොසාන කල්‍යාණතා දක්විණි. ඒ එසේ මැ යි:- ප්‍රඥව ශාසනයාගේ අවසානය වේ. **"සච්චාන පරියොදපනං, එතං බුද්ධානසාසනං"** [2]යනු වදාළ ඥෙයින් හා ශ්‍රෙෂ්ඨ බැවිනි ගේ ඉෂ්ටානිෂ්ටාරම්මණයෙහි කොසැලෙන බව ගෙන දෙන බැවින් කල්‍යාණ වේ. වදාළේ මැ යි.

"සෙලො යථා එකඝනෝ - වාතෙන න සමීරති,
එවං නින්දාපසංසාසු - න සමිඤ්ජන්ති පණ්ඩිතා"[4]

"එකඝන ශෛල පර්වතයක් වාතයෙන් කම්පිත නොවන්නා සේ පණ්ඩිතයෝ නිඳා ප්‍රශංසා දෙකින් කම්පිත නොවෙත්" යනු භාවයි.

---

[1]සං: නි: මහාවග්ග 926- [2]දී: නි: මහාවග්ග 31
[3]පටි: ම: 44, [4]ධ: ප: පණ්ඩිතවග්ග 8

3. තෙවිජ්ජතාදින්ට උපනිඃශ්‍රය නම්:- ත්‍රිවිද්‍යා- ෂට්අභිඥා- චතුපටිසම්භිදා ලබා ගැන්මට හේතුවන බව ය.

ඒ එසේ මැ යි:- සීලයෙන් ත්‍රිවිද්‍යාවට උපනිඃශ්‍රය බව දක්‍ෂිත ය. සීලසමපත්තිය නිසා ත්‍රිවිද්‍යාව ලබයි. ඉන් වැඩියක් නො ලබයි. සමාධියෙන් ෂඩභිඥාවට උපනිඃශ්‍රය බව දක්‍ෂිත ය. සමාධිසමපත් නිසා ෂට් අභිඥා ලබයි. ඉන් වැඩියක් නො ලබයි. ප්‍රඥයෙන් මැ සිව්පිළිසිඹියා ලබයි. අනෙක් හෙතුවකින් නො ලබයි.

4. උභයාන්තය හැර මධ්‍යම ප්‍රතිපත්ති සෙවනය නම්:- කාමසුඛානුයොගය හා අත්තකිලමථානුයොගය දුරුකොට මධ්‍යම ප්‍රතිපදාවෙහි යෙදීම ය. ශීලයෙන් කාමසුඛානුයොගයෙන් දුරුවීම දක්‍ෂිත ය. ප්‍රඥයෙන් මධ්‍යම ප්‍රතිපදා සෙවනය දක්‍ෂිතයි.

5. අපායාදි සමතික්‍රමණ උපාය නම්:- අපායයෙන් ද, කාම භවයෙන් ද, සියලු භවයන්ගෙන් ද දුරුවීමේ උපායයි. ශීලයෙන් අපාය කෙරෙන් දුරුවීමේ උපායය ද, සමාධියෙන් කාමභවයන්ගෙන් දුරුවීමේ උපායය ද, ප්‍රඥයෙන් කාමරූප අරූප යන සියලු භවයන්ගෙන් දුරුවීමේ උපායය ද දක්වන ලදී.

6. ත්‍රිවිධ ක්ලේශප්‍රහාණ නම්:- තදඞ්ගප්‍රහාණ, වික්ඛම්භනප්‍ර-හාණ, සමුච්ඡේදප්‍රහාණයි. ශීලයෙන් තදඞ්ගප්‍රහාණ වශයෙන් ද, සමාධියෙන් වික්ඛම්භනප්‍රහාණ වශයෙන් ද, ප්‍රඥයෙන් සමුච්ඡේදප්‍රහාණ වශයෙන් ද ක්ලේස ප්‍රහාණය දක්වන ලදී.

7. ව්‍යතික්‍රමාදි ප්‍රතිපක්‍ෂභාව නම්:- ක්ලේශයන් ගේ ව්‍යතික්‍රම, පර්‍යුත්‍ථාන, අනුසයයන්ට විරුද්ධ භාවයයි. ව්‍යතික්‍රම නම් සමාදන්වූ ශික්‍ෂාපද බිඳපීම ය. පර්‍යුත්‍ථාන නම්, ක්ලේශයන් නැඟී සිටීම ය. අනුසය නම්, ක්ලේසුන් නිදි ගෙන මෙන් සිය සතන්හි ගුප්ත වැ සිටීම යි. ශීලයෙන් ක්ලේශයන්ගේ ව්‍යතික්‍රම ප්‍රතිපක්‍ෂ භාවය ද, සමාධියෙන් පර්‍යුත්‍ථාන ප්‍රතිපක්‍ෂභාවය ද, ප්‍රඥයෙන් අනුසය ප්‍රතිපක්‍ෂභාවය ද දක්වන ලදී.

8. ත්‍රිවිධ සංක්ලේශ විශෝධන නම්:- දුශ්චරිත, තෘෂ්ණා, දෘෂ්ටි යන තෙවැදෑරුම් සංක්ලේශයන්ගෙන් පිරිසිදු වීම ය. ශීලයෙන් දුශ්චරිත සංක්ලේශ විශෝධනය ද, සමාධියෙන් තෘෂ්ණා සංක්ලේශ විශෝධනය ද, ප්‍රඥයෙන් දෘෂ්ටි සංක්ලේශ විශෝධනය ද දක්වන ලදී.

9. සොතාපන්නතාදීන්ට හෙතු සි කී තන්හි ශීලයෙන් සෝවාන් බවට හා සකෘදාගාමි බවට ද, සමාධියෙන් අනාගාමි බවට ද, ප්‍රඥයෙන් අර්හත් බවට ද හෙතු දක්වන ලදී.

ඒ එසේමැ සි:- සෝවාන් සකෘදාගාමි පුද්ගලයෝ ශීලයෙහි පරිපූරකාරීහු ය. අනාගාමි පුද්ගලයා සමාධියෙහි පරිපූරකාරී ය. රහතන්වහන්සේ ප්‍රඥයෙහි පරිපූරකාරී සේක.

මෙසේ මේ ක්‍රමයෙන් **නිර්විධ ශික්ෂා, නිර්විධ කල්‍යාණ ශාසන, තෙවිජ්ජතාදීන්ට උපනිස්සය, උභයානනයහැර මධ්‍යම ප්‍රතිපත්ති සෙවන, අපායාදි සමතික්‍රමණ උපාය, නිර්විධ ක්ලේශප්‍රහාණ, ව්‍යතික්‍රමාදි ප්‍රතිපක්ෂභාව, නිර්විධ සංක්ලේශ විශෝධන, සොතාපන්නතාදීන්ට හෙතු** යන නවත්‍රිකයෝ ද මේබඳු අන්‍ය ගුණත්‍රිකයෝ ද දක්වන ලදැ සි දත යුතු.

මේ මෙහි අති සංක්ෂෙප ක්‍රමයසි.

ප්‍රශ්න-උත්තර ව්‍යාජයෙන් විස්තර මතු දක්වනු ලැබේ.

1. සීල නම් කිම? 2. කවර අර්ථයකින් "සීල" යසි කියනු ලැබේ ද 3. සීලයා ගේ ලක්ෂණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන කවරහු ද 4. සීලයෙහි ආනිසංස කිම? 5. සීලය කී වැදුරුම් ද 6. සීලය කිලිටිවන්නේ කෙසේ ද 7 සීලය පිරිසිදු වන්නේ කෙසේ ද යනු මෙහිලා ප්‍රශ්න සි.
එය එකක් පාසා ක්‍රමයෙන් විසඳනු ලැබේ.

1. සීල නම් කිම?

සීල නම්: ප්‍රාණඝාතයෙන් වැළකෙන්නහු ගේ හෝ වත් පිළිවෙත් පුරන්නහු ගේ හෝ **(1) චෙතනා, (2) චෛතසික, (3) සංවර, (4) අව්‍යතික්‍රම,** යන මේ ය.

වදාළේ මැ සි:- **පටිසම්භිදායෙහි "කිං සීලං නි? චෙතනා සීලං, චෛතසිකං සීලං, සංවරෝ සීලං, අවීතික්කමෝ සීලං"**[1] සි.

(1) චෙතනා සීල නම්:- ප්‍රාණඝාතයෙන් වැළකෙන්නහු ගේ හෝ වත්පිළිවෙත් පුරන්නහු ගේ හෝ චෙතනා ය. (එබන්දහු-ගේ ඒ වේලායෙහි සිත්හි යෙදෙන චෛතසිකයන් අතුරෙන් **චෙතනා චෛතසිකය සීල** නම් වෙසි ගැ සේසි.)

තවද ප්‍රාණඝාතාදිය හැර පියන්නාකු ගේ සප්ත **කර්මපථ** චෙතනා ද සීල නම් වෙසි. (**සප්ත කර්මපථ** නම්, **පාණාතිපාත, අදින්නාදාන, කාමේසුමිච්ඡාචාර, මුසාවාද, පිසුණාවාච, ඵරුසාවාච, සම්ඵප්පලාප** යන මේසි.

---

[1] ප: ම: සුත්තන්තකථා 43 බුරුම

(2) **චෙතසික ශීල** නම්:- ප්‍රාණඝාතාදියෙන් වැළකෙන්න හුගේ විරති ය. (එබන්දෙකුගේ ඒ වේලායෙහි සිත්හි යෙදෙන **සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව** යන විරති චෛතසිකත්‍රය **චෙතසික ශීල** නම් වෙයි. යූ සේසි) තව ද **අනභිධ්‍යා, අව්‍යාපාද, සම්මාදිට්ඨි** යන මේ ධර්මයෝ ද චෛතසික ශීල නම් වෙත්. **"අභිජ්ඣං පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති"**[1] යනාදීන් වදාළ හෙයිනි.

(3) **සංවර ශීලය** වනාහි, පාතිමොක්ඛසංවරය, සතිසංවරය ඤාණසංවරය, ඛන්තිසංවරය, විරියසංවරය යි පංචවිධ වේ. **"ඉමිනා පාතිමොක්ඛ සංවරෙන උපෙතො හොති සමුපෙතො"** [2]යනාදි දෙශනා පාළියෙහි පාතිමොක්ඛ සංවරය ද **"රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති"** [3]යනාදි දෙශනායෙහි සති සංවරය ද,

> **"යානි සොතානි ලොකස්මිං** (අජිතා'ති භගවා)
> **සති තෙසං නිවාරණං**
> **සොතානං සංවරං බ්‍රූමි**
> **පඤ්ඤායෙතෙ පිධීයරෙ"**[4]

යන දෙශනායෙහි ඤාණසංවරය ද, (පච්චයසන්නිස්සිතසීලය ද මෙහි මෑ ඇතුළති, **"ඛමොහොති සිතස්ස උණ්හස්ස"**[5] යනාදි දෙශනායෙහි ඛන්තිසංවරය ද, **"උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති"** [6]යනාදි තන්හි විරිය සංවරය ද, ආජීව පාරිසුද්ධි සීලය ද මෙහි මෑ ඇතුළති,) සීල වශයෙන් වදාළේ ය. මේ පංච විධ සංවරය හා පාපභීරුක කුලපුත්‍රයන්ගේ සමාදාන විරතිය ද යන මේ සියල්ල සංවර සීලය යි දතයුතු.

(4) **අව්‍යතික්‍රම ශීල** නම්:- සමාදන් වැ ගත් සීලය කයෙන් වචනයෙන් නොබිඳ රැකගැන්මයි.

"සීල නම් කුමක් ද" යනු මෙතෙකින් විසඳන ලද්දේය.

———//———

2. කවර අර්ථයෙකින් සීල යයි කියනු ලැබේද

සීලන අර්ථයෙන් සීල යයි කියනු ලැබේ. සීලන නම්, **සමාධානය** හෝ **උපධාරණය** යි. කුශල කායකර්මාදීන්ට විසිර යන්නට ඉඩ නොදීම සමාධානය. කුශල ධර්මයන් ප්‍රතිෂ්ඨා වශයෙන් ධැරීම උපධාරණය යි (සීලවන්තයා

---

[1]දී: නි: සීලක්ඛන්ධ ව: 55 [2]වි: ප: ඛ්‍රාන වි: 186
[3]වි: ප: ඛ්‍රාන වි: 188 [4]සු: නි: පාරායනව: 137
[5]ම: නි: මූලපණ්ණාසක 11 [6]ම: නි: මූලපණ්ණාසක 12

විපිළිසර නොවන්නේ ය. සීලයෙහි සමාධානාර්ථය ඇති හෙයිනි.) ධ්‍යාන-මාර්ග-ඵල සංඛ්‍යාත බීජයන් වැපිරීමට සීලය භූමිය වේ. (සීලයෙහි උපධාරණාර්ථය ඇති හෙයිනි.) ශබ්ද ලක්ෂණඥයෝ මේ අර්ථවය මෑ මෙහි ලා පිළිගනිති. ඇතැම්හු ශිරස් (හිස යන) අර්ථයෙන් සීලය වේ. ශීතලාර්ථයෙන් සීලය වේ. යනාදීන් ප්‍රපඤ්ච (විස්තර) කෙරෙත්.

කවර අර්ථයෙකින් සීල යයි කියනු ලැබේද
යනු මෙතෙකින් විසඳන ලද්දේ සි.

---

3. සීලයාගේ ලක්ෂණ- රස- පච්චුපට්ඨාන- පදට්ඨාන කවරහුද

සීලයාගේ ලක්ෂණය යට දැක්වූ සීලනය මෑ සි.

"සීලනං ලක්ඛණං තස්ස
භින්නස්සාපි අනෙකධා,
සනිදස්සනත්තං රූපස්ස
යථා භින්නස්ස නෙකධා"

'නීලාදි වශයෙන් නානාවිධ වූ ද රූපයාගේ ලක්ෂණය සනිදර්ශන භාවයයි. රූපය නීලාදි වශයෙන් නානා භෙද වුවද සනිදර්ශන භාවය නොහරන බැවිනි, එමෙන් චෙතනාදි වශයෙන් නානාවිධ වූද සීලයාගේ ලක්ෂණය **සමාධානය උපධාරණය** සි දෙවැදෑරුම් කොටැ දක්වන ලද සීලනය මෑ සි. එබඳු භෙද සහිත වුවත් සීලය සමාධානාර්ථ වූ හෝ උපධාරණාර්ථ වූ හෝ සීලනලක්ෂණය නොහරින බැවිනි. (ලක්ෂණ නම්, සාමාන්‍ය සවභාවයයි.)

"දුස්සීල්‍ය විඛංසනතා-අනවජ්ජගුණා තථා,
කිච්චසම්පත්තිති අත්ථන-රසො නාම පවුච්චති."

රස නම්:- කෘත්‍ය හෝ සම්පත්ති ය. සීලයාගේ කෘත්‍ය රසය නම්, දුශ්ශීල්‍යය විනාශ කිරීමයි. සම්පත්ති රසය නම්, නිරවද්‍ය ගුණයෝයි. (සීලයෙන් දුශ්ශීල්‍යය වනසනු ලැබේ. එසේ මෑ සීලයෙන් ධ්‍යානාදි ගුණ උපදවනු ලැබේ.

"සොචෙය්‍යපච්චුපට්ඨානං - තයිදං තස්ස විසෙසදෑහි
ඔත්තප්පං ච හිරිං චෙව - පදට්ඨානං'ති වණ්ණිතං."

පච්චුපට්ඨාන නම්:- වැටහෙන කාරණය, සීලයාගේ පච්චුපට්ඨානය නම්, කය - වචන - හිත යන ත්‍රිවිධ චාරයාගේ

පරිශුඛ භාවය යි. වදාළේ මෑ ය:- **"කායසොචෙය්‍යං වචී සොචෙය්‍යං මනොසොචෙය්‍යං"**[1] යි. සොචෙය්‍ය නම්, සුවිභාව හෙවත් පිරිසිදු බව.

පදට්ඨාන නම්:- ආසන්න කාරණය, සීලයාගේ පදට්ඨාන නම්, **හිරි - ඔතප්** දෙක ය.

ඒ එසේ මෑ යි:- හිරි ඔතප් ඇති කල්හි මෑ සීලය උපදනේත් වෙයි. පවත්නේත් වෙයි. හිරි ඔතප් නැති කල්හි සීලය කෙසේවත් නූපදනේ ය. නොපවත්නේ යි.

ශීලයාගේ ලක්ඛණ - රස - පච්චුපට්ඨාන - පදට්ඨාන කවරහුද? යනු මෙතෙකින් විසඳන ලද්දේ යි.

---

4. සීලයෙහි ආනිසංස කිම?

සීලයෙහි ආනිසංස නම්:- අවිප්පටිසාරාදි නොඑක් ගුණ ලැබීම ය. අවිප්පටිසාර නම්, විපිළිසර නොවීම ය.

වදාළේ මෑ යි:- **"අවිප්පටිසාරත්ථානි ඛො ආනන්ද කුසලානි සීලානි අවිප්පටි සාරානිසංසානි"** යි.[2]

ආදි ශබ්දයෙන් මතු දක්වන ආනිසංස පංචකය ද ගන්න.

1. **මහත් වූ භොගස්කන්ධ ලැබීම,**
2. **කල්‍යාණ කීර්තිශබ්ද නැගීම,**
3. **ක්ෂත්‍රියාදි පිරිස් කරා විසාරද වෑ එළඹීම,**
4. **අසම්මූළ්හ වෑ කාලක්‍රියා කිරීම,**
5. **මරණින් මතු දෙව් ලෝ උපදීම.**

වදාළේ මෑ යි.

"පඤ්චිමෙ ගහපතයො ආනිසංසා සීලවතො සීලසම්පදාය කතමෙ පඤ්ච? ඉධ ගහපතයො සීලවා සීලසම්පන්නො අප්පමාදාධිකරණං මහන්තං භොගක්ඛන්ධං අධිගච්ඡති අයං පඨමො ආනිසංසො සීලවතො සීලසම්පදාය

පුනචපරං ගහපතයො සීලවතො සීලසම්පන්නස්ස කල්‍යාණො කිත්ති සද්දො අබ්භුග්ගච්ඡති. අයං දුතියො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

පුනචපරං ගහපතයො සීලවා සීලසම්පන්නො යං යදෙව පරිසං උපසඞ්කමති. යදි ඛත්තිය පරිසං, යදි බ්‍රාහ්මණ පරිසං, යදි ගහපති පරිසං, යදි සමණ පරිසං විසාරදෙ උපසඞ්කමති අමංකුභූතො. අයං තතියො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

---

[1]අ: නි: තික නි: 166 [2]අ: නි: දසක නි: 896

පුනචපරං ගහපතයෝ සීලවා සීලසම්පන්නො අසම්මුළ්හො කාලං කරොති අයං චතුත්ථො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

පුනචපරං ගහපතයෝ සීලවා සීලසම්පන්නො භොගසස හෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජති. අයං පඤ්චමො ආනිසංසො සීලවතො සීලසම්පදාය. ඉමෙ ඛො ගහපතයෝ පඤ්චානිසංසා සීලවතො සීලසම්පදාය"[1] සි.

මෙහි සංක්ෂිප්ත භාවය මෙසේය:-

ගෘහපතිවරුනි! සිල්වත්හුගේ සීලසම්පත්තියෙහි ලා මේ ආනිසංස පසෙකි. ඒ කවරේද, ගෘහපතිවරුනි! සිල්වත් තෙමේ අප්‍රමාදයෙන් මහත් වූ භොගසඤ්චය ලැබ ගන්නේය. මේ පළමු වන ආනිසංසය සි. වැළිදු ගෘහපතිවරුනි! සිල්වත්හුගේ කල්‍යාණ කීර්ති ඝොෂයෙක් ලොව පැන නගින්නේය. මේ දෙවන ආනිසංසය සි. වැළිදු ගෘහපතිවරුනි! සිල්වත් තෙමේ ක්ෂත්‍රිය පිරිසකට වේවයි, බ්‍රාහ්මණ පිරිසකට වේවයි, ගෘහපති පිරිසකට වේවයි ශ්‍රමණ පිරිසකට වේවයි, විසාරද වැ නොමකු වැ එළඹෙන්නේ ය. මේ තෙවන ආනිසංසය. වැළිදු ගෘහපතිවරුනි! සිල්වත් තෙමේ අසම්මූළ වැ කලුරිය කරන්නේ ය. මේ සිව්වන ආනිසංසය. වැළිදු ගෘහපතිවරුනි! සිල්වත් තෙමේ මරණින් මතු සුගති සඞ්ගීලොකයෙහි උපදනේ ය. මේ පස්වන ආනිසංස යයි. ගෘහපතිවරුනි! සිල්වත්හුගේ සීලසම්පත් හි ලා මේ ආනිසංස පස වන්නේය.

තවද, **"ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු සබ්‍රහ්මචාරීනං පියොචස්සං මනාපො ගරු භාවනීයො සීලඤ්චෙවස්ස පරිපූරකාරී"[2]** යනාදීන් **මැදුම්සඟි ආකඞ්ඛෙය්‍ය** සූත්‍රයෙහි රහත් බැව් හිමිකොට සබ්රම්සරුන්ට ප්‍රියමනාප වන බැව් ආදි අනෙක ආනිසංසයෝ දක්වන ලදහ. "මහණෙනි! සබ්රම්සරුන්ට ප්‍රිය-මනාප - ගුරු - සම්භාවනීය වන්නට කැමැති නම් සිල් මැ පුරන්නේ ය." යනු ඒ දෙශනා පාළියේ භාවය සි.

1. **සාසනෙ කුලපුත්තානං - පතිට්ඨා නත්ථි යං විනා,**
   ආනිසංස පරිච්ඡෙදං - තසස සීලසස කො වදෙ.

2. **න ගඞ්ගා යමුනා චාපි - සරභූ සරසූ නදී,**
   නිනනගා වා විරවති - මහී චාපි මහානදී.

---

[1] දී: නි: මහාවග්ග 53 පිට

[2] ම: නි: මූලපණ්ණාසක 34 පිට

3. සඞ්කුණ්ණති විසොධෙතුං-තං මලං ඉධ පාණිනං,
විසොධයති සත්තානං-යං වෙ සීලජලං මලං.

4. න තං සජලදා වාතා-න චාපි හරිචන්දනං,
නෙව හාරා න මණයෝ-න චන්දකිරණඞ්කුරා.

5. සමයන්ති ඛ සත්තානං-පරිළාහං සුරක්ඛිතං,
යං සමෙති ඉදං අරියං-සීලං අච්චන්ත සීතලං.

6. සීලගන්ධ සමෝ ගන්ධෝ-කුතෝ නාම භවිස්සති,
යෝ සබ්බං අනුවාතෙ ච-පටිවාතෙ ච වායති.

7. සග්ගාරොහණසොපානං-අඤ්ඤං සීලසමං කුතෝ,
මාරං වා පන නිබ්බාන-නගරඤ්ච පවෙසනෙ.

8. සොභනෙනවං න රාජානෝ-මුත්තා මණිවිභූසිතා,
යථා සොභන්ති යතිනෝ-සීලභූසනභූසිතා.

9. අත්තානුවාදාදි භයං-විධංසයති සබ්බසෝ,
ජනෙති කිත්තිං හාසඤ්ච-සීලං සීලවතං සදා.

10. ගුණානං මූලභූතස්ස-දොසානං බලඝාතිනෝ,
ඉති සීලස්ස විඤ්ඤෙය්‍ය-ආනිසංසකථා මුඛන්ති.

භාවය:—

1. සසුන්වන් කුලදරු—වනට ඇමකල් එක් පිහිට,
සිල් ගුණ දහමැ අනුසස්—පිරිසිද කියන්නෙ කවුරු.

2-3. පස් මහගඟ දියෙන්—සිල්දියෙන් මෙන් සත්වග,
කිලිටිමල හැර සෝදා—පිරිසිදු කරත්හොත් බැරි.

4-5. මඳ මඳ මේ පවන්—සඳුන මිණිහර සඳකැන්,
පිරිසිදු සිහිල් සිල් සේ—නොපියා සත්වග තැවුලි.

6. උඩු යටි සුලඟ හා—එක සේ දුවන අනුබඳ,
සිල් සුවඳ බදු සුවඳෙක්—මුලු තුන්ලොව අන් කවර.

7. සගපහට එකහිණ—නිවන් පුරට මහදොර,
සීලගුණ බදු දහමෙක්—කියග ලොවතුර වෙන කවර,

8. සිල්බරණින් සැදුණු—බුදුපුත් යතිවරන් සේ,
සූසැට බරණ පැළඳි—නිරිඳෝ ද නො දිලෙත් මේ.

9. සිව් බිය නසා හැරැ—සිල්වත් දහගෙ සිල්කඳ,
යසකිත් ලොවෙහි පතුරා—සැපත් සිරිදෙයි නිතොරා.

10. ගුණ මූලට මුල් වූ—දෙස් බල සිඳි තුමුල් වූ,
සිල් ගුණෙහි අනුසස්—මෙලෙසින් දැන පුරන්නේ.

සීලයෙහි ආනිසංස කුමක් ද
යනු මෙතෙකින් විසඳන ලද්දේයි.

---

5. සීලය කී වැදෑරුම් ද

සීලය වනාහි සීලන **ලක්ෂණයෙන්** එක් වැදෑරුම් වේ. සීලන **ලක්ෂණ** යට විසතර කරන ලදී.

චාරිත්ත සීල, වාරිත්ත සීල වශයෙන් දෙවැදෑරුම් වේ. එසේ ම ආභිසමාචාරික සීල, ආදිබ්‍රහ්මචරියක සීල වශයෙන් ද; විරති සීල, අවිරති සීල වශයෙන් ද; නිස්සිත සීල, අනිස්සිත සීල වශයෙන් ද; කාලපරියන්ත සීල, ආපාණකොටික සීල වශයෙන් ද; සපරියන්ත සීල, අපරියන්ත සීල වශයෙන් ද; ලෞකික සීල, ලොකුත්තර සීල වශයෙන් ද දෙවැදෑරුම් දෙවැදෑරුම් වේ.

හීන සීල, මධ්‍යම සීල, ප්‍රණීත සීල වශයෙන් තෙවැදෑරුම් වේ. එසේ මැ, අත්තාධිපතෙය්‍ය සීල, ලොකාධිපතෙය්‍ය සීල, ධම්මාධිපතෙය්‍ය සීල වශයෙන් ද; පරාමට්ඨ සීල, අපරාමට්ඨ සීල, පටිප්පස්සද්ධි සීල වශයෙන් ද; විසුඬ සීල, අවිසුඬ සීල, වෙමතික සීල වශයෙන් ද; සෙඛ සීල, අසෙඛ සීල, නෙවසෙඛනාසෙඛ සීල වශයෙන් ද තෙවැදෑරුම් තෙවැදෑරුම් වේ.

භාජනභාගිය සීල, භිත්තිභාගිය සීල, විසෙසභාගිය සීල, නිබ්බෙධ භාගිය සීල වශයෙන් සිව්වැදෑරුම් වේ. එසේ මැ, භික්ඛු සීල, භික්ඛුණී සීල, අනුපසම්පන්න සීල, ගහට්ඨ සීල වශයෙන් ද, පකති සීල, ආචාර සීල, ධම්මතා සීල, පුබ්බහෙතුක සීල වශයෙන් ද; පාතිමොක්ඛ සංවර සීල, ඉන්ද්‍රිය සංවර සීල, ආජීවපාරිසුද්ධි සීල, පච්චයසන්නිස්සිත සීල වශයෙන් ද සිව්වැදෑරුම් වේ.

පරියන්ත පාරිසුද්ධි සීල, අපරියන්ත පාරිසුද්ධි සීල, පරිපුණ්ණ පාරිසුද්ධි සීල, අපරාමට්ඨ පාරිසුද්ධි සීල, පටිප්පස්සද්ධි පාරිසුද්ධි සීල වශයෙන් පස්වැදෑරුම් වේ. වදාළේ මැ සි:- **පටිසම්භිදායෙහි: "පඤ්චසීලානි පරියන්ත පාරිසුද්ධි සීලං, අපරියන්ත පාරිසුද්ධි සීලං, පරිපුණ්ණ පාරිසුද්ධි සීලං, අපරාමට්ඨ පාරිසුද්ධි සීලං,**

පවිපස්සද්ධි පාරිසුද්ධි සීලං"[1] යි එසේ මෑ, පහාන සීල, වෙරමණී සීල, චෙතනා සීල, සංවර සීල, අවීතික්කම සීල යයි පස්වැදෑරුම් වේ. මොවිහු ක්‍රමයෙන් මතු විස්තර කරනු ලැබෙත්. එකවිධ සීලය යට දක්වන ලද පරිදි දතයුතු.

විවිධ ශීල මෙසේයි:

ප්‍රථම වර්ගය

---

1. වාරිත්ත සීලය 2. වාරිත්ත සීලය.

1. "මේ දේ කළ යුතුය" යි බුදුන් විසින් පණවා වදාළ යම් ශික්ෂාපද කෙතෙක් වෙද් ද ඒ ශික්ෂාපදයන්හි නියමිත සේ කිරීම **වාරිත්ත සීලය. "වරණති තඤ්ඤං සීලෙ පරිපූර කාරිතාය පවත්තනතී'ති වාරිත්තං"** යනු එහි විග්‍රහ වාක්‍යයි.

2. "මේ දේ නොකළ යුතුය" යි බුදුන් විසින් යමක් ප්‍රතික්ෂේප කරන ලද්දේ ද ඒ ප්‍රතික්ෂිපතය නොකිරීම වාරිත්ත සීලය. **"වාරිතං තායනති රක්ඛනති තෙනාති වාරිත්තං"** යනු එහි විග්‍රහ වාක්‍යයි.

වාරිත්ත සීලය ශ්‍රද්ධායෙන් හා වීර්‍යයෙන් සිදුකළ යුතුය. වාරිත්ත සීලය ශ්‍රද්ධායෙන් මෑ සිදුකළ යුතුයි.

මේය වාරිත්ත - වාරිත්ත සීල නම්.

විතීය වර්ගය

---

1. අභිසමාචාරික සීලය හා 2. ආදිබ්‍රහ්මචරියක සීලය

1. අභිසමාචාර නම්:- උතුම් හැසිරීම ය. අභිසමාචාරය ම ආභිසමාචාරික ය. සවාඊයෙහි ප්‍රත්‍යය කිරීම් වශයෙනි. මෙයින් **උත්තම හැසිරීම** ආභිසමාචාරික සීලය යි කී නියා දතයුතු.

නොහොත් සෝවාන් ආදි මාර්ගඵල අභිසමාචාර ය. ඒ අභිසමාචාරය සඳහා පණවන ලද සීලය ආභිසමාචාරික ය. මෙයින් ආජීවඨමක සීලය හැර සෙසු සිල් ආභිසමාචාරික සීල යයි කී නියා දතයුතු.

---

[1] පටි: ම: මහාවග්ග 41

නොහොත් **ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ශික්ෂාපද ආභිසමාචාරික ය. මෙයින් පචිත්ති-දුක්කටට-දුබ්භාසිත** ශික්ෂාපද ව්‍යතික්‍රමණය නොකොට රැකීම ආභිසමාචාරික සීලය යි කී නියා දතයුතු.

නොහොත් **සුලුවග්ග, මහාවග්ග** දෙක්හි ආ කදුවත් පිරීම ආභිසමාචාරික සීලය යි.

2. මාගී බ්‍රහ්මචර්‍යාවට ආදියෙහි වූ, සීලය **ආදිබ්‍රහ්මචරියක සීලය. එකම්: ආජීවාෂ්ටමක ශීලය යි.** ආජීවාෂ්ටමක ශීලය නම්: කායද්වාරයෙන් සිඳුවන ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාර යන ත්‍රිවිධ අකුශලයෙන් ද; වාග්ද්වාරයෙන් සිඳුවන මුසාවාද, පිසුණාවාචා, ඵරුසවාචා, සම්ඵප්පලාප යන චතුර්විධ අකුශලයෙන් ද; මිථ්‍යාආජීවයෙන්ද වැළකීම සඳහා සමාදන් වැ ගත්තා ශීලය යි. මේ ශීලය මාගීයට පූර්වභාගයෙහි පිරිය යුතු මැ ය. එහෙයින් වදාළහ **"පුබ්බේව ඛෝ පනස්ස කායකම්මං වචීකම්මං ආජීවෝ සුපරිසුද්ධෝ හොති"**[1] යි.

නොහොත් **සඞ්ඝාදිසෙස, පාරාජික** යන මහා ශික්ෂාපද ව්‍යතික්‍රමණය නොකොට රැකීම ආදිබ්‍රහ්මචරියක ශීලය යි.

නොහොත් **භික්ඛු-භික්ඛුණී** උභය විභඞ්ගයන්හි ආ ශික්ෂාපද ව්‍යතික්‍රමණය නොකොටැ රැකීම් ආදිබ්‍රහ්මචරියක ශීලය යි.

කිව යුත්තෙක් ඇති. ආභිසමාචාරික සීලය නුපුරන්නේ ආදිබ්‍රහ්මචරියක ශීලය පුරන්නේය යනු කිසි කලෙක සිඳ නොවේ. ආභිසමාචාරික ශීලය පුරන්නේ මැ ආදිබ්‍රහ්මචරියක ශීලය ද පුරන්නේ ය.

වදාළේ මැ යි. **"යෝ වත භික්ඛවෙ භික්ඛු ආභිසමාචාරිකං ධම්මං අපරිපූරෙත්වා ආදිබ්‍රහ්මචරියකං ධම්මං පරිපූරෙස්සතී ති නෙතං ඨානං විජ්ජති"**[2] යි.

මේය ආභිසමාචාරික, ආදිබ්‍රහ්මචරියක සීල නම්.

තෘතීය විකල්ප.

1. විරති සීලය හා 2. අවිරති සීලය

1. ප්‍රාණඝාතාදියෙන් වැළකීම් මාත්‍රය විරති ශීලය හෙවත් එම කුශල චිත්ත වීථියෙහි උපදනා සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව යන විරති චෛතසිකත්‍රය **විරති ශීලය යි.**

2. එම කුශල චිත්ත වීථියෙහි මැ පහළ වන සෙසු චෛතසිකයෝ **අවිරති ශීලය යි.**

මේය විරති, අවිරති සීල නම්.

---

[1] අ: නි: පඤ්චකනිපාත 356

[2] ,, ,, ,,

චතුර්ථ විකය

1. නිඃසිත සීලය හා 2. අනිඃසිත සීලය

1. තණ්හා නිස්සය, **දිට්ඨි** නිස්සය' යි **නිස්සය** දෙවැදෑරුම් වේ. 'මම මේ සීල හෙතුයෙන් ප්‍රසිඛ දෙවියෙක් හෝ වන්නෙමි, අප්‍රසිඛ දෙවියෙක් හෝ වන්නෙමි' යි භව සම්පත් පැතීම් වශයෙන් පුරනු ලබන ශීලය **තණ්හා** නිස්සිත ය. 'ශීලයෙන් මෑ සුඛිය වන්නේය' යි දෘෂ්ටි වශයෙන් පුරනු ලබන ශීලය **දිට්ඨි** නිස්සිත ය. මේ ද්වීවිධ වූ ශීලය **නිඃසිත සීල** නම් වේ.

2. මේ දෙවැදෑරුම් නිස්සයයෙන් වෙන් වැ පුරනු ලබන **ලෞකික ලොකොත්තර සීල අනිඃසිත සීල** නම් වේ.

මේය නිඃසිතානිඃසිත සීල නම්.

පංචම විකය

1. කාලපරියන්න සීලය හා 2. ආපාණකොටික සීලය.

1. **කාලපරිච්ඡේද** ඇති ව (**අෂ්ටාඞ්ග සීලය** මෙන්) සමාදන් ව රක්නා ශීලය **කාලපරියන්න** සීලය.

2. දිවිහිම් කොට (**පංචසීලය** මෙන්) සමාදන්ව රක්නා ශීලය **ආපාණකොටික** සීලයි.

මේය කාලපරියන්න, ආපාණකොටික සීල නම්.

ෂෂ්ඨ විකය

1. සපරියන්න සීලය හා 2. අපරියන්න සීලය.

1. ලාභය, කීර්තිය, ඥාතිය, අඞ්ගය, ජීවිතය යන මොවුන් අතුරෙන් කිසිවක් සීමා කොට රක්නා සීලය **සපරියන්න** සීලය (ඒ එසේ මෑ යි. ඇතැම් කෙනෙක් 'ලාභයක් ලබම්'යි යන සිතින් සිල් සමාදන් වෙති. පසුව ඒ ලාභය ලත්කල සීලය බිඳැ ලත්. ඇතැම් කෙනෙක් 'කීර්තියක් ලබම්' යි යන සිතින් සිල් සමාදන් වෙති. පසුව ඒ කීර්තිය **ලත් කල** සීලය බිඳැ ලත්. ඇතැම් කෙනෙක් ඥාති, අංග, ජීවිත

අපෙක්ෂායෙන් සිල් සමාදන් ව පසු ව ඒ ඥති, අංග, ජීවිත ලත් කල සීලය බිඳ ලත්. මෙබඳු සිල් ඛණ්ඩය. ශිද්‍රය. සබලය. කල්මාෂය. භුජිස්‍ය නොවේ. විඤ්ඤූප්පසත්ථ නොවේ. පරාමට්ඨ වේ. සමාධිසංවත්තනික නොවේ. ...පෙ... නිවන් පිණිස නො පවතී.

වදාළේ මෑ සි. **පටිසම්භිදායෙහිඃ-**

"කතමං තං සීලං අපරියනනං? අත්ථි සීලං ලාභපරියනනං, අත්ථි සීලං යසපරියනනං, අත්ථි සීලං ඤාතිපරියනනං, අත්ථි සීලං අංගපරියනනං, අත්ථි සීලං ජීවිතපරියනනං, කතමං තං සීලං ලාභපරියනනං? ඉධෙකච්චෙවා ලාභහෙතු ලාභපච්චයා ලාභකාරණා යථා සමාදිනන සික්ඛාපදං වීතික්කමති ඉදං තං සීලං ලාභපරියනනං ...පෙ... එවරූපානි සීලානි ඛණ්ඩානි ජීදානි සබලානි කම්මාසානි න භුඤ්ජිස්සානි ...පෙ... න නිබ්බානාය සංවත්තනතී"[1] සි.

2. ලාභය, කීර්තිය, ඥතිය, අඩඟය, ජීවිතය යන මොවුන් අතුරෙන් කිසිවක් සීමා තොකොට රක්නා සීලය **අපරියනන සීලය.** (ඒ එසේ මෑ සිඃ- ඇතැම් කෙනෙක් සමාදන් ව ගත් ශික්ෂාපද ලාභයක් හෙතුකොට ගෙන බිඳ පිමෙහි සිතුවිල්ලකුදු නූපදවති. බිඳ නොපියත් යනු කියනු කිම? සමාදන්ව ගත් ශික්ෂාපද කීර්ති, ඥති, අඩඟ, ජීවිත හෙතුකොට ගෙන බිඳ පිමෙහි සිතුවිල්ලකුදු නූපදවති. බිඳ නොපියත් යනු කියනු කිම? මෙබඳු සිල් අඛණ්ඩය, අවශීද්‍රය, අසබලය, අකල්මාෂය, ...පෙ... නිවන් පිණිස පවති.) වදාළේ මෑ සි. **පටිසම්භිදායෙහිඃ-**

"කතමං තං සීලං අපරියනනං අත්ථි සීලං න ලාභ පරියනනං, අත්ථි සීලං න යසපරියනනං, අත්ථි සීලං න ඤාති පරියනනං අත්ථි සීලං න අඩඟපරියනනං අත්ථි සීලං න ජීවිත-පරියනනං, කතමං තං සීලං න ලාභපරියනනං ඉධෙකච්චෙවා ලාභහෙතු ලාභපච්චයා ලාභකාරණා යථා සමාදිනනං සික්ඛා-පදං වීතික්කමාය චිත්තම්පි න උප්පාදෙති ...පෙ... එව-රූපානි සීලානි අඛණ්ඩානි අවශීදානි ...පෙ... නිබ්බානාය සංවත්තනතී"[1] සි.

මෙය සපරියනන, අපරියනන සීල නම්.

---

[1]පටි: ම: මහාවග්ග 42

සප්තම විකය.

1. ලෞකික සීලය හා 2. ලොකොත්තර සීලය.

1. ආශ්‍රව සහිත වූ (පෘථග්ජනයන්ගේ) සියලු සීල **ලෞකික සීලය.** එය භවසම්පත් ඵලවයි. භවනිස්සරණයට ද ප්‍රත්‍යය වෙයි. වදාළේ මෙසේ.

"විනයෝ සංවරත්ථාය, සංවරෝ අවිප්පටිසාරත්ථාය, අවිප්පටිසාරෝ පාමොජ්ජත්ථාය, පාමොජ්ජං පීතත්ථාය, පීති පස්සඛත්ථාය, පස්සඛි සුඛත්ථාය, සුඛං සමාධත්ථාය, සමාධි යථාභූතඤාණදස්සනත්ථාය, යථාභූතඤාණදස්සනං නිබ්බිදත්ථාය, නිබ්බිදා විරාගත්ථාය, විරාගෝ විමුත්තත්ථාය, විමුත්ති විමුත්තිඤාණදස්සනත්ථාය, විමුත්තිඤාණදස්සනං අනුපාදා පරිනිබ්බානත්ථාය. එතදත්ථා කථා එතදත්ථා මන්තනා එතදත්ථා උපනිසා එතදත්ථං සොතාවධානං, යදිදං අනුපාදා චිත්තස්ස විමොක්ඛෝ"[1]

2. ආශ්‍රව රහිත වූ (සෝවාන් ආදි ආර්‍යයන්ගේ) සීල **ලොකොත්තර සීලය,** එය භවනිස්සරණය ඵලවයි ප්‍රත්‍යවෙක්ෂණ ඥානයට ද භූමි වෙයි.

මේය ලෞකික, ලොකොත්තර ශීල නම්.

විවිධ සීල නිමිත්තය.

ඉක්බිති ත්‍රිවිධ ශීල දක්වනු ලැබේ.

ප්‍රථම ත්‍රිකය.

1. හීන සීල, 2. මජ්ඣිම සීල, 3. පණීත සීල.

1. හීන වූ ඡන්දයෙන් හීන වූ චිත්තයෙන් හීන වූ වීර්‍යයෙන් හීන වූ ප්‍රඥයෙන් පවත්වන ලද ශීලය **හීන** ශීලය.

2. මධ්‍යම වූ ඡන්දයෙන් මධ්‍යම වූ චිත්තයෙන් මධ්‍යම වූ වීර්‍යයෙන් මධ්‍යම වූ ප්‍රඥයෙන් පවත්වන ලද ශීලය **මධ්‍යම** ශීලය.

3. ප්‍රණීත වූ ඡන්දයෙන් ප්‍රණීත වූ චිත්තයෙන් ප්‍රණීත වූ වීර්‍යයෙන් ප්‍රණීත වූ ප්‍රඥයෙන් පවත්වන ලද ශීලය **ප්‍රණීත** ශීලයි.

---

[1] පරි: පා: චූලසංගාම 220.

නොහොත් 1. කීර්ති ප්‍රශංසා කැමැති ව සමාදන් ව රක්නා ශීලය **හීන ශීලය**. 2. සිල් රැකීමෙන් මතු උසස් කුල, සැප ලැබෙන්නේ ය යි සලකා ඒ ආනිසංස පිණිස රක්නා ශීලය **මධ්‍යම ශීලය**. 3. මෙය මවිසින් කටයුතුමයයි සෝවාන් ආදි ආර්‍යභාවය අපෙක්ෂා කොට රක්නා ශීලය **ප්‍රණීත ශීලය** යි.

නොහොත් 1. 'සීලවන්ත නම් මම ය, මේ අනෙක් භික්ෂූහු දුශ්ශීලයෝ ය. පාප ධර්ම ඇත්තෝය'යි තමන් උසස් කර ගන්නා අදහසින් අනුන් හෙළා දක්නා අදහසින් කිලිටි වූ ශීලය **හීන ශීලය**. 2. එබඳු අතුකැකෑසන පරවම්හන අදහසින් නොකිලිටි වූ පෘථග්ජනයන්ගේ ශීලය **මධ්‍යම ශීලය**. 3. ලොකොත්තර ශීලය **ප්‍රණීත ශීල** යි

නොහොත් 1. තෘෂ්ණා වශයෙන් භවභොග සම්පත් පතා රකිනු ලබන ශීලය **හීනය**. 2 තමා පමණක් සසරින් මිදෙනු සඳහා රකිනු ලබන ශීලය මධ්‍යමය 3. සියලු සතුන් සසරින් එතර කරනු සඳහා රකිනු ලබන බෝසතුන්ගේ පාරමිතා ශීලය **ප්‍රණීතයි**.

මේය හීන, මධ්‍යම, ප්‍රණීත ශීල නම්.

චතුර්ථ නිකාය.

---

1. අත්තාධිපතෙය්‍ය, 2. ලෝකාධිපතෙය්‍ය, 3. ධම්මාධිපතෙය්‍ය සීල.

1. තමහට නුසුදුසු දේ හැරපියා තමා මැ ගුරුකොට තමා කෙරෙහි මැ ගෞරවයෙන් රක්නා ලද සීලය **අත්තාධිපතෙය්‍ය** සීලය. (මා වැන්නකු විසින් පව් කිරීම නුසුදුසු යයි **ආත්ම** ගෞරව උපදවා රක්නා ලද සීලය යි සේයි)

2. ලොකාපවාදයට බියෙන් ලොකයා ගරු කොට සමාදන්ව රක්නා සීලය **ලොකාධිපතෙය්‍ය** සීලය.

3. ධර්ම මහත්ත්වයට පුදනු කැමැත්තෙන් ධර්ම ගෞරවයෙන් රක්නා සීලය **ධම්මාධිපතෙය්‍ය** සීලයි. (ධර්ම මහත්ත්වයට පුදනු කැමැත්ත නම්: "ධර්මය මහානුභාව ඇත්තේය,

එකාන්ත නෛයර්‍යානිකය, ඒ ධර්‍මය ප්‍රතිපත්තීන් පිදිය යුතුය"යි සලකා ධර්‍මයට පුදනු කැමැති වීමයි.)

මේය අත්තාධිපතෙය්‍ය, ලොකාධිපතෙය්‍ය, ධම්මාධිපතෙය්‍ය සීල නම්

තෘතීය ත්‍රිකය

---

1. පරාමට්ඨ, 2. අපරාමට්ඨ, 3. පවිප්පස්සඬ සීල

1. පරාමට්ඨ සීල නම්:- දෘෂ්ටි ශීලයන්හි දක්වන ලද නිස්සිත සීල ම ය. ඒ වනාහි 'මම මේ ශීල හෙතුයෙන් ප්‍රසිඬ හෝ අප්‍රසිඬ දෙවියෙක් වන්නෙමි' යි තෘෂ්ණා වශයෙන් ද, 'ශීලයෙන් ශුඩිය වන්නේ ය' යි දෘෂ්ටි වශයෙන් ද, පරාමර්‍ශනය කරන (අල්වාගන්නා) ලද බැවින් **පරාමට්ඨ** සීල නම් වේ.

2. පුථුජ්ජන සීලවන්තයා විසින් සෝවාන් ආදි ආර්‍යඵල මාර්‍ග ලැබීම පිණිස පුරනු ලබන සීලය ද, සප්තශෛක්ෂයන්ගේ මාර්‍ග චිත්තයන්හි ලැබෙන විරති චෙතනාදිය ද, තෘෂ්ණා-දෘෂ්ටි විසින් පරාමර්‍ශනය නොකරන ලද බැවින් **අපරාමට්ඨ** සීල නම් වේ. (සප්ත ශෛක්ෂයෝ නම්:- සෝවාන් මාර්‍ගඵල, සකෘදාගාමි මාර්‍ගඵල, අනාගාමි මාර්‍ගඵල, අර්හත් මාර්‍ගඵල යන මොහුයි.)

3. ශෛක්ෂයන්ගේ හා අශෛක්ෂයන්ගේ ඵල චිත්තයන්හි ලැබෙන විරති චෙතනා ආදීහු කෙලෙස් විඛා සන්සිඳුවන බැවින් **පවිප්පස්සඬ** සීල නම් වෙත්. (අශෛක්ෂයා නම්: අර්හත් ඵලස්ථයා ය.)

මේය පරාමට්ඨ, අපරාමට්ඨ, පවිප්පස්සඬ සීල නම්:

චතුර්‍ථ ත්‍රිකය

---

1. විසුඬ, 2. අවිසුඬ, 3. වෙමතික සීල.

ඇවැත්වලට නොපැමිණ මැ රක්නා ලද ශීලය ද, ඇවැත්-වලට පැමිණ ඇවැත් දෙසා ගැනීම් ආදි වශයෙන් පිළියම් කර ගන්නා ලද ශීලය ද **විසුඬ** සීල නම් වේ.

2. ඇවැත්වලට පැමිණ ඇවැත් දෙසා ගැනීම් ආදි වශයෙන් පිළියම් කරා නො ගන්නා ලද ශීලය **අවිසුඬ සීල** නම් වේ.

3. වස්තුයෙහි හෝ ආපත්තියෙහි හෝ අජ්ඣාචාරයෙහි හෝ විමති ඇත්තහු ගේ සීලය **වෙමතික සීල** නම් වේ. (වස්තුයෙහි විමතිය නම්:- මස් වලඳන කල්හි "වලස් මස් දෝ හෝ ශූරාමස් දෝ හෝ" යි සැක සහිත වීම ය. (වලස් මස් වැළඳුව දුෂකෘත වේ. ශූරාමස් නම් ඇවැත් නැති.) මෙසේ වස්තුයෙහි සැක සහිතවීම වස්තුයෙහි විමතිය යි. ආපත්තියෙහි විමතිය නම්:- "තමා පැමිණි ඇවැත පව්තිය දෝ හෝ දුක්කටය දෝ හෝ" යි යනාදි වශයෙන් සැක සහිත වීමයි. අජ්ඣාචාරයෙහි විමතිය නම්:- "තමා ඇවැතට පැමිණියේ දෝ නො පැමිණියේ දෝ හෝ" යි සැක කිරීමයි. යොගාවචර භික්ෂුව විසින් සවකීය ශීලය අපිරිසිදු නම් - අවිසුඬ නම් ඇවැත් දෙසා ගැනීම් ආදි වශයෙන් පිරිසිදු කර ගත යුතු ය. වෙමතික නම් වස්තු අජ්ඣාචාර නො කොට චිතය ධරයන් විචාරා විමති දුරු කට යුතුයි. එසේ ඇති කල්හි ඒ භික්ෂු හට සුව පිණිස වේ.)

මෙය විසුඬ, අවිසුඬ, වෙමතික සීල නම්.

පංචම ත්‍රිකය

1. සෙඛ, 2. අසෙඛ, 3. නෙවසෙඛනාසෙඛ සීල

1. ශෛක්ෂයන් ගේ මාර්ග-ඵල චිත්තයන්හි යෙදුණු විරති වෙතනා ආදීහු **සෙඛ** සීල නම්.

2. අශෛක්ෂයා ගේ ඵල චිත්තයන්හි යෙදුණු විරති වෙතනා ආදීහු **අසෙඛ** සීල නම්.

3. පෘථග්ජනයන් ගේ ශීල **නෙවසෙඛනාසෙඛ** සීල නම් වේ.

මෙය සෙඛ, අසෙඛ, නෙවසෙඛනාසෙඛ සීල නම්.

සීලය යි සවභාවයට ද කියනු ලැබේ. සැපෑ සවභාව ඇත්තේ සුඛ සීලය. දුක් සවභාව ඇත්තේ **දුක්ඛ** සීලය. කලහ කරන සවභාව ඇත්තේ **කලහ** සීල යනාදි වශයෙනි. සීල ශබ්දයා ගේ

මේ සවභාවෝක්තිය සලකා **පටිසම්භිදා** නම් ධර්ම ග්‍රන්ථයෙහි:— **"තීණි සීලානි කුසලං සීලං අකුසලං සීලං අබ්‍යාකතං සීලං[1]"** යි 'කුසල සීලය, අකුසල සීලය, අබ්‍යාකෘත සීලය' යි අන්‍ය වූ ද ත්‍රිවිධ ශීලයෙක් දක්වන ලද්දේ ය. **අකුසල** සීල යනු යට දක්වන ලද ශීල ලක්ෂණයන් අතුරෙහි **එකකටවත්** අයත් නොවන බැවින් මේ ත්‍රිවිධ ශීලය **විශුද්ධිමාර්ගයෙහි** ඇතුළත් නොකරන ලද බව දත යුතුයි.

ත්‍රිවිධ ශීල නිමියේ ය.

චතුර්විධ ශීල මෙසේ ය.

ප්‍රථම චතුෂ්කය.

---

1. භානභාගිය, 2. ස්ථිතිභාගිය, 3. විශෙෂභාගිය, 4. නිර්වෙධභාගිය සීල.

1. පිරිහීමට නැමීගත් සීලය භානභාගිය සීලය.

ඒ එසේ මැ යි:- "යම් අඥතයෙක් දුස්සීලයන් සෙවනය කරමින් සීලවන්තයන් සෙවනය නොකරමින් වරද කිරීමෙහි දෙෂ නොදකිමින් බොහෝ මිථ්‍යා අදහස් උපදවමින් ඉන්ද්‍රිය සංවරයක් නැතිව වාසය කෙරේ ද, එබඳු වූවහුගේ සීලය **භානභාගිය** සීල වේ."

2. පිරිහීමටත් නොපැමිණ අභිවෘඩියටත් නොපැමිණ තුබූ සැටියේ මැ පවත්නා සීලය ස්ථිතිභාගිය සීලය.

ඒ එසේ මැ යි:- "යමෙක් තමා ලත් සීල සම්පත්හි මාත්‍රයෙන් සතුටුව **කර්මස්ථාන පිණිස** අදහස් මාත්‍රයකුදු නූපදවා වාසය කෙරේ ද, එබඳු වූවහුගේ සීලය **ස්ථිතිභාගිය** සීල වේ."

3. සමාධි සඞ්ඛ්‍යාත විශෙෂය පිණිස නැමීගත් සීලය විශෙෂභාගිය සීලය.

ඒ එසේ මැ යි:- යමෙක් සීල සම්පන්නා ව මතු සමාධි පිණිස උත්සාහ කෙරේ ද, එබඳු වූවහුගේ සීලය **විශෙෂභාගිය** සීල වේ.

4. නිර්වෙධ සංඛ්‍යාත විදර්ශනා පිණිස නැමීගත් සීලය **නිර්වෙධභාගිය** සීලය.

ඒ එසේ මැ යි:- යමෙක් තමා ලත් ශීල මාත්‍රයෙන් සතුටු නොව විවසුන් වඩා නිවන් දක්නා පිණිස උත්සාහ කෙරේ ද, එබඳු වූවහුගේ සීලය **නිර්වෙධභාගිය** සීල වේ.

මේය භානභාගිය, ස්ථිතිභාගිය, විශෙෂභාගිය, නිර්වෙධභාගිය සීල නම්.

---

[1] පටි: ම: **මහාවග්ග** 43

විනීය චතුෂ්කය.

1. භික්ඛු, 2. භික්ඛුණී, 3. අනුපසම්පන්න, 4. ගහට්ඨ සීල.

1. භික්ෂූන් උදෙසා පණවන ලද ශික්ෂාපද ද, භික්ඛුණීන් උදෙසා පණවන ලද ශික්ෂාපදයන් අතුරෙන් භික්ෂූන්ටත් සාධාරණ ශික්ෂාපද ද **භික්ඛු** ශීල නම් වේ.

2. භික්ෂුකීන් උදෙසා පණවන ලද ශික්ෂාපද ද, භික්ෂූන් උදෙසා පණවන ලද භික්ෂුකීන්ටත් සාධාරණ ශික්ෂාපද ද **භික්ඛුණී** සීල නම් වේ.

3. සාමණේරයන්ගේ හා සාමණේරීන්ගේ දස සීල **අනුපසම්පන්න** සීල නම් වේ.

4. උපාසක උපාසිකාවන්ට නිත්‍ය ශීල වශයෙන් පණවා වදාළ පංච ශික්ෂාපද ද, උත්සාහ ඇති කල්හි **රක්ඛ** යුතු යයි වදාළ දශ ශික්ෂාපද ද උපොසථාඞ්ග වශයෙන් පණවා වදාළ අෂ්ටශික්ෂාපද ද **ගහට්ඨ** (ගිහි) සීල නම් වේ.

මේය භික්ඛු, භික්ඛුණී, අනුපසම්පන්න, ගහට්ඨ සීල නම්.

තෘතීය චතුෂ්කය.

1. පකති, 2. ආචාර, 3. ධම්මතා, 4. පුබ්බහෙතුක සීල.

1. සභාවයෙන් රැකෙන සීලය පකති සීලය. උතුරුකුරු දිවයින් වැසි මනුෂ්‍යයන්ට පංචසීලය සභාවයෙන් මැ රැකෙයි එහෙයින් ඔවුන්ගේ සීලය **ප්‍රකෘති** ශීල නම් වේ.

2. කුල, දෙශ, තීර්ථක යන මොවුන් අතර පවත්නා යහපත් සිරිත් **ආචාර සීලය.**

ඒ එසේ මැ සි:- ඇතැම් කුලයන්හි රහමෙර පිම ඒ කුලවල ආදි පුරුෂයන් විසින් තහනම් කරන ලද්දේ වේ. ඇතැම් දෙශයන්හි ප්‍රාණඝාත කිරීම ඒ දෙශාධිපතීන් විසින් තහනම් ලද්දේ වේ. තීර්ථකයන් අතර යම-නියම ඇත්තේ ය. එයට අනුව යමෙක් හැසිරෙයි ද එය **ආචාර සීලයයි** සේසි.

3. බෝසත් මාතාවන්ගේ සීලය ධම්මතා සීලය.

වදාළේ මෑ යි:- **"ධම්මතා එසා ආනන්ද! යදා, බොධිසත්තෝ මාතු කුච්ඡිං ඔක්කමතෙතා හොති න බොධිසත්තමාතු පුරිසෙසු මානසං උප්පජ්ජති කාමගුණූපසංහිතං"**[1] යි.

"ආනන්දය! යම් දිනෙක බෝධිසත්ත්වයෝ මාතෘකුක්ෂියෙහි පිළිසිඳ ගනිද්ද, එ තැන් පටන් බෝසත් මාතාවන්ට පුරුෂයන් කෙරෙහි කාම කල්පනා පහළ නො වෙයි යන මෙය ධර්මතාවෙක" යනාදීන් දක්වන ලද්දේ **ධම්මතා** සීලය.

4. පූර්වහෙතුයෙන් මෑ ජනිත සීලය **පුබ්බහෙතුක සීලය. මහාකාශ්‍යපාදි** ශුද්ධසත්ත්වයන්ගේ ද, බෝධිසත්ත්වයන්ගේ ද ඒ ඒ ජාතීන්හි පැවැති සීලය පුබ්බහෙතුක සීලය යි කී නියාය. ඒ එසේ මෑ යි:- **පිප්පලිමානවඤ්ච භද්දකාපිලානී** සවකීය මධ්‍යරාත්‍රිය පවා වීතරාගයන් සේ ගත කළහ. බෝසත් **සීලව** රජතුමා පර පණ නොනසා තෙමේ ජීවග්‍රාහයෙන් අසුවූයේ ය.

මේය පකති, ආචාර, ධම්මතා, පුබ්බහෙතුක සීල නම්.

චතුර්ථ චතුෂ්කය.

1. පාතිමොක්ඛ සංවර, 2. ඉන්ද්‍රිය සංවර,
3. ආජීව පාරිසුද්ධි, 4. පච්චයසන්නිශ්‍රිත සීල.

1. ප්‍රාතිමොක්ෂයෙහි වදාළ ශික්ෂාපද ව්‍යතික්‍රම නොකොටැ රැකගැන්මාදිය **පාතිමොක්ඛසංවර** සීලය.

වදාළේ මෑ යි:- **"ඉධ භික්ඛු පාතිමොක්ඛසංවරසංවුතෝ විහරති, ආචාර ගොචර සම්පන්නෝ අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු"**[2] යි.

2. චක්ෂු, සොත, ඝාණ, ජිව්හා, කාය, මන යන ඡව් ඉන්ද්‍රියයන් සංවර කර ගැන්ම **ඉන්ද්‍රිය සංවර** සීලය.

වදාළේ මෑ යි:- **"සෙ චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණ මෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති සොතෙන සද්දං සුත්වා...පෙ...ඝාණෙන ගන්ධං ඝායිත්වා...පෙ...ජිව්හාය රසං සායිත්වා...පෙ...කායෙන ඵොට්ඨබ්බං**

---

[1] දී: නි: මහාවග්ග 8 – [2] වි: ප: ඛුද්දකවිභඞ්ග 185

චුසිත්වා මනඤ්ඤ ධම්මං විකප්පයං, න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමේනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති මනින්ද්‍රියං මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති"[1] යි.

3. ආජීවය හෙතු කොට ගෙන පණවා වදාළ සවැදෑරුම් ශික්ෂාපද ව්‍යති ක්‍රමණය කිරීම් වශයෙන් ද; කුහකතා, ලපනතා, නෙමිත්තිකතා, නිප්පෙසිකතා, ලාභෙන ලාභං නිජිගිංසනතාදී පාපධර්මයන්ගේ වශයෙන් ද පවත්නාවූ මිච්ඡාජීවයෙන් වැළකීම **ආජීවපාරිසුද්ධි සීලය.**

4. "පටිසංඛා යොනිසො චීවරං පටිසෙවාමි යාවදෙව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය"[2] යනාදීන් ප්‍රත්‍යවෙක්ෂා කොට සිව්පස පරිභෝග කිරීම **පච්චය සන්නිස්සිත සීලයි.**

මේ චතුපාරිසුද්ධි සීලය පිළිබඳ විස්තාර විනිශ්චය කථාව පිළිවෙළින් මතු දක්වනු ලැබේ.

1. ප්‍රාතිමොක්ෂ සංවර ශීලය.

"ඉධ භික්ඛු පාතිමොක්ඛ සංවර සංවුතො විහරති ආචාරගොචර සම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු"[3] යන ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය සඳහා විභඞ්ගප්‍රකරණයෙහි පුග්ගලාධිට්ඨාන වසයෙන් වදාළ පාළියයි. 'මේ ශාසනයෙහි භික්ෂු තෙමේ ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුක්ත වැ ආචාරයෙන් හා ගොචරයෙන් යුක්ත වැ සඵලප වරදෙහි පවා භය දක්නා සුළු වැ වාසය කරන්නේ ය. ශික්ෂාපදයන් සමාදන් වැ රකින්නේ ය' යනු එහි සංක්ෂිප්ත අදහස යි.

පදයක් පාසා විවරණය මෙසේ දතයුතු.

ඉධ= මේ ශාසනයෙහි.

භික්ඛු= **"සංසාරෙ භයං ඉක්ඛතී ති භික්ඛු"** සසර බිය දක්නේ නුසි භික්ෂු. **"ජිනන භිනන පටිධරනතා භික්ඛු"** කඩ කඩ කොට කැපූ වස්ත්‍රධරණ හෙයින් භික්ෂු යනාදී වශයෙන් නම් ලත් සැදැහැයෙන් සසුන් වත් කුලදරුවා

---

[1] ම: නි: මූලපණ්ණාසකා: 190 [2] ම: නි: මූලප: 11
[3] වි: ප: ඛුද්දකවි: 185

පාතිමොක්ඛසංවර සංවුතෝ= ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුක්ත වැ. මෙහි **පාතිමොක්ඛ** නම්, ශික්ෂාපද ශීලය. **"යෝ නං පාති රක්ඛති, තං මොක්ඛෙති මොචෙති අපායිකාදීහි දුක්ඛෙහි ති පාතිමොක්ඛං"**[1] යනු එහි විග්‍රහ වාක්‍යයි. 'යම් ශීලයක් තෙමේ තමා රක්නහු ආපායිකාදි දුඃඛයන්ගෙන් මුදා ගන්නේ ද, ඒ සීලය පාතිමොක්ඛ නම් වේ.' යනු එහි අදහසයි. **සංවර** නම් කයෙන් හෝ වචනයෙන් ශික්ෂාපද ව්‍යතික්‍රමණය නොකිරීමයි. හෙවත් නොබිඳීමයි. **සංවුත** නම් මෙහි යුක්ත යන අර්ථයි.

විහරති= වාසය කරයි.

ආචාර ගොචර සම්පන්නෝ= ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවැ. මෙය විභඞ්ගප්‍රකරණයෙහි මෙසේ විස්තර කරන ලදී. **"ආචාරගොචර සම්පන්නොති අත්ථි ආචාරෝ අත්ථි අනාචාරෝ. තත්ථ කතමෝ අනාචාරෝ? කායිකෝ වීතික්කමෝ වාචසිකෝ වීතික්කමෝ කායික වාචසිකෝ වීතික්කමෝ අයං වුච්චති අනාචාරෝ. සබ්බං පි දුස්සීල්‍යං අනාචාරෝ. ඉධෙකච්චෝ වෙළුදානෙන වා පත්තදානෙන වා පුප්ඵ- ඵල- සිනාන- දන්තකට්ඨදානෙන වා චාටුකම්‍යතාය වා මුග්ගසුප්පතාය වා පාරිභට්ටතාය වා ජීවිස- පෙසනිකෙන වා අඤ්ඤතරඤ්ඤතරෙනබුධපතිරූපෙන මිච්ඡාජීවෙන ජීවිතං කප්පෙති අයං වුච්චති අනාචාරෝ.**

තත්ථ කතමෝ ආචාරෝ? කායිකෝ අවීතික්කමෝ වාචසිකෝ අවීතික්කමෝ කායික වාචසිකෝ අවීතික්කමෝ අයං වුච්චති ආචාරෝ, සබ්බෝ පි සීලසංවරෝ ආචාරෝ. ඉධෙකච්චෝ න වෙළුදානෙන න පත්ත- න පුප්ඵ- න ඵල න සිනාන-න දන්තකට්ඨදානෙන න චාටුකම්‍යතාය න මුග්ග සුප්පතාය න පාරිභට්ටතාය න ජීවිසපෙසනිකෙන න අඤ්ඤතරඤ්ඤතරෙන බුධපතිරූපෙන මිච්ඡාජීවෙන ජීවිතං කප්පෙති අයං වුච්චති ආචාරෝ"[2] සි.

මෙහි භාවය මෙසේ ය.

'ආචාරගොචරසම්පන්නෝ යන මෙහි ආචාරයෙක් ද ඇත. අනාචාරයෙක් ද ඇත. එහි අනාචාරය යනු කිම? කයෙන් ශික්ෂාපද ව්‍යතික්‍රමණය කිරීම, වචනයෙන් ශික්ෂාපද ව්‍යතික්‍රමණය කිරීම, කයෙන් හා වචනයෙන් ශික්ෂාපද ව්‍යතික්‍රමණය කිරීම යන මේ අනාචාරයයි කියනු ලැබේ. තවද සියලු ම දුශ්ශීල කර්ම අනාචාරය.

---

[1] මෝ: කථා 1 [2] විසු: පෝ: ඛුද්දකවත්ථුවිභඞ්ග 186

ඒ එසේ මෑ යි:- මේ සසුන් වත් ඇතැම් පැවිද්දෙක් **හුණ, කොළ, මල්, ඵල, නහනු, දැවටු** ගිහියන් සිත් ගන්නා පිණිස දෙන්නේ ය. **චාටුකම්‍යතා, මුගසුප්පතා, පාරිභට්‍යතා, ජඞ්ඝ-පෙසනිකතා** යන මෙයින් හා අන්‍ය වූ ද බුදුන් විසින් පිළිකුල් කර වදාළ මිථ්‍යා ජීවිකායෙන් ජීවිකා පවත්වන්නේ ය. මෙය **අනාචාරය** යි කියනු ලැබේ.

ආචාරය යනු කිම? කයෙන් ශික්ෂාපද ව්‍යතික්‍රමණය නො කිරීම, වචනයෙන් ශික්ෂාපද ව්‍යතික්‍රමණය නො කිරීම, කයෙන් හා වචනයෙන් ශික්ෂාපද ව්‍යතික්‍රමණය නො කිරීම යන මෙය ආචාරය යි කියනු ලැබේ. තව ද සියලු ශීලසංවරය ආචාරය ඒ එසේ මෑ යි:- මේ සසුන් වත් ඇතැම් පැවිද්දෙක් **හුණ, කොළ, මල්, ඵල, නහනු, දැවටු** ගිහියන් සිත් ගන්නා පිණිස නො දෙන්නේ ය. **චාටුකම්‍යතා, මුගසුප්පතා, පාරිභට්‍යතා, ජඞ්ඝපෙසනිකතා** යන මෙයින් ද අන්‍යවූත් බුදුන් විසින් පිළිකුල් කොට වදාළ මිථ්‍යාජීවයෙන් ද ජීවික නො පවත්නේ ය. මෙය **ආචාරය** යි කියනු ලැබේ.

මෙහි **චාටුකම්‍යතා** නම්:- භික්ෂූන් විසින් ගිහියන්ගේ සිත් ගන්නා පිණිස ගිහියන් උසස් තන්හි තබා තමන් පහත් තන්හි තබා කථා කිරීම ය.

මුගසුප්පතා නම්:- මුඃ ඇට තැම්බූ කල වැඩි කොටස නො පැසී මද කොටසක් පැසී තිබෙන්නා සේ කථාකරන කල්හි වැඩි කොටස අසත්‍ය වීම හා මද කොටසක් මැ සත්‍ය වීම ය.

පාරිභට්‍යතා නම්:- කිරිමවුන් මෙන් කුඩා දරුවන් වඩා ගෙන ආදර දැක්වීම් ආදිය.

ජඞ්ඝපෙසනිකතා නම්:- ගිහියන්ගේ පණිවිඩ පණත් ගෙන යාමයි. අන්‍ය වූ බුඩපතිකුඨ මිච්ඡාජීව නම්, වෙදකම් කිරීම් නැකැත් කීම් ආදිය යි. (මෙය මතු ද විස්තර වශයෙන් දක්වනු ලැබේ.)

"ගොචරොති අත්ථි ගොචරෝ, අත්ථි අගොචරෝ. තත්ථ කතමෝ අගොචරෝ? ඉධෙකච්චෝ වෙසියා ගොචරොවා හොති, විධවා — කුලදූමාරිකා — පණ්ඩක භික්ඛුණී — පානාගාර ගොචරෝ වා හොති, සංසට්ඨෝ විහරති.

රාජූහි රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථිය සාවකෙහි අනනුලෝමිකෙන සංසග්ගෙන, යානි වා පන තානි-කූලානි අසඩ්ඩානි අප්පසන්නානි අකෙක්කාසඤ්ඤ පරිහාස-ඤ්ඤානි අනාසඩ්ඩාමානි අගිහිසඤ්ඤාමානි අඵාසුඤ්ඤාමානි අයොගක්ඛෙමසඤ්ඤාමානි භික්ඛූනං භික්ඛුණීනං උපාසඤ්ඤා-නං උපාසිකානං, තථාරූපානි කුලානි සෙවති භජති පයිරුපාසති. අයං වුච්චති අගොචරෝ.

තත්ථ කතමෝ ගොචරෝ? ඉධෙකච්චෙ න වෙසියා ගොචරෝ හොති පෙ න පානාගාර ගොචරෝ අසංසට්ඨෝ විහරති රාජූහි පෙ තිත්ථිය සාවකෙහි අනනුලෝමිකෙන සංසග්ගෙන, යානි වා පන තානි කුලානි සඩ්ඩානි පසන්නානි ඔපානභූතානි කාංසා-පජ්ජොතානි ඉඤ්ජිතා පවිට්ඨානි, අසඩ්ඩාමානි පෙ අයොගක්ඛෙමසඤ්ඤාමානි භික්ඛූනං පෙ උපාසිකානං තථාරූපානි කුලානි සෙවති භජති පයිරු-පාසති. අයං වුච්චති ගොචරෝ"[1]

මෙහි භාවය මෙසේ ය.

"ගොචරෝ" යි කියූ තන්හි ගොචරයෙක් ද ඇත. අගොචරයෙක් ද ඇති. එහි අගොචරය යනු කිම්? මේ සූත්‍රයන්හි ඇතැම් පැවිද්දෙක් වෙසඟතන්, වැන්දඹු ගැහැනුන්, වැඩිවිය පැමිණ සවාමි කුලයට නොගොස් ගෙහි වසන තරුණියන්, පණ්ඩකයන්, භික්ෂූකීන්, මත්පැන් සැල් ගොචර කොට වෙසෙයි. රජුන් හා රාජ මහාමාත්‍යයන් හා තීර්ථකයන් හා තීර්ථක ශ්‍රාවකයන් හා නුසුදුසු සංසර්ගයෙන් හැනී වෙසෙයි. භික්ෂූන්ට භික්ෂු-කීන්ට උපාසකයන්ට උපාසිකාවන්ට අකොසා පරිකොසා බණින ඔවුන්ට අනර්ථ කැමැති අහිත කැමැති අපහසු කැමැති භය කැමැති සැදැහැ පැහැදුම් නැති කුලගෙවල් සෙවනය කරයි. භජනය කරයි. පයිරුපාසනය කරයි. මෙය **අගොචරය** යි කියනු ලැබේ.

(මෙහි වෙසඟතන් පෙ භික්ෂූකීන් ඇසුරු කිරීම ඔවුන් රාගාධිකයන් බැවින් ශ්‍රමණ ධර්මයට අන්තරාය කර ය.

රාජරාජමාත්‍යයන් ඇසුරු කිරීම නුසුදුසු ලාභ සත්කාර උපදවන බැවින් සම්‍යක් ආජීවයට අන්තරාය කර ය.

තීර්ථක තීර්ථකශ්‍රාවකයන් ඇසුරු කිරීම දෘෂ්ටි විපත්තියට හෙතුවන බැවින් සම්‍යක් දෘෂ්ටියට අන්තරාය කර ය.

---

[1] වි: ප: ඛ්‍රාතවිභඞ්ග 187

සැදැහැ නැති කුලයන් සෙවනය කිරීම ශ්‍රද්ධා හානියට හා චිත්තභේදයට හේතු ය.)

ගොචර නම් කිම? මේ සසුන් වත් ඇතැම් පැවිද්දෙක් වෙසඟහන්, වැන්දඹු ගැහැනුන්, වැඩිවිය පැමිණෑ සවාමිකුලයට නොගොස් ගෙහි වසන තරුණියන්, පණ්ඩකයන්, භික්ෂූකීන්, මත්පැන් සැල් ගොවර කොට නො වෙසෙසි. රජුන් හා රජ-මැතියන් හා අන්තොටුවන් (අන්‍යතීර්ථකයන්) හා අන්තොටු සව්වන් හා නුසුදුසු සංසර්ගයෙන් හැනී නො වෙසෙසි. භික්ෂු ආදී සිවුපිරිසට නිති සිවුපසයෙන් උපස්ථාන කරන – භික්ෂු භික්ෂූකීන් ගේ කෂාය වස්ත්‍රයෙන් බැබලී ගත් – ඔවුන්ගෙන් නිතර ගැවසී ගත් – ඔවුන්ට හිත වැඩ කැමති – ඔවුන්ට පහසු හා නිහීය කාමැති – සැදැහැ පැහැදුම් ඇති කුලයන් සෙවනය කරයි. භජනය කරයි. පයිරුපාසනය කෙරෙයි. මෙය **ගොචරය යි** කියනු ලැබේ.

යට දැක්වූ ආචාරයෙන් හා මේ ගොචරයෙන් යුක්ත වූ යේ **ආචාර ගොචර සම්පන්නයි.**

මේ ආචාර ගොචර පිළිබඳ මතු දක්වනු ලබන ක්‍රමය ද දැනගත යුතු.

1. කායික අනාචාරය, 2. වාචසික අනාචාරය යි අනාචාර ම්විධ වේ.

1. කායික අනාචාරය:- මේ සසුන් වැද පැවිදි වූ ඇතැම් මහණ කෙනෙක් සඞ්ඝ සභාවට ද එළඹ සථවිර භික්ෂූන් කෙරෙහි ගරුසරු නැති වැ ඔවුන් සිවුරෙන් සිවුර හා ඇඟින් ඇඟ ගටමින් සිටිති. හිඳිති. ඔවුන් අභිමුඛයෙහි ද එසේ මැ සිටිති. හිඳිති. උසසුන්හි දු හිඳ ගනිති. හිස වසා පොරවා ගෙන ද හිඳිති. ගරු සරු නැති වැ සිට ගෙන ද අත් වනමින් ද කථා කෙරෙති. මහතෙරුන් පා වහන් නැති වැ සක්මන් කරන කල තුමූ වහන් නැගී ද, මහතෙරුන් පහත් වූ සක්මන්හි සක්මන් කරන කල තුමූ උස් වූ සක්මන්හි නැගී ද, මහතෙරුන් නිකම් බිම සක්මන් කරන කල තුමූ සක්මන් නැගී ද සක්මන් කෙරෙති. මහතෙරුන් හිඳිනා තන්හි වැද හිඳිති. නවක භික්ෂූන් අසුන්වලින් නෙරපති. ජනතාඃරයට වැද මහතෙරුන්

තොව්චාරා උදුනෙහි දර දමති. දෙරවල් ද වසති. පැන් නහනා තොටට ගොස් මහතෙරුන් ඇඟ ගැටෙමින් ඔවුන් ඉදිරියෙහි වෙමින් තොටට බසිති. නහති. තොටින් නැගෙති. ගමට වදනා කල්හි ද සඵවිර භික්ෂූන් ඇඟ ගටමින් යෙති. ඔවුන් ඉදිරියෙහි ද ගමන් කරති. කුලසත්‍රීන්, කුලකුමාරිකාවන් වසන පිළිසන් ගැබ් ගෙවලට ලා හෙළා වදිති. බාල දරුවන්ගේ හිස පිරිමදිත්. මේ **කායිකඅනාචාරය** යි දතයුතු.

2. වාචසිකඅනාචාරය:- මේ සසුන් වැද පැවිදි වූ ඇතැම් මහණ කෙනෙක් මහතෙරුන් තොව්චාරා බණ කියති. ප්‍රශ්න විසඳති. පාමොක් උදෙසති. සිට ගෙන ද අත් වනමින් ද කථා කෙරෙති. ඇතුල් ගෙවලට ද වැද ඒ ඒ කුලසත්‍රීන් ගේ කුල-කුමාරීන් ගේ නම් ගොත් කිය කියා ආමන්ත්‍රණය කෙරෙමින් "කුමක් තිබේ ද කෑද තිබේ ද බත් තිබේ ද කැවිලි තිබේ ද කුමක් කම් ද කුමක් බොම් ද කුමක් බුදිම්ද"යි ශ්‍රමණ සාරූප්‍ය නොවූ විකාර කථා කෙරෙත්. මේ **වාචසිකඅනාචාරය** යි දතයුතු.

මේ දැක්වූ කායික අනාචාර හා වාචසික **අනාචාර නොකිරීම ආචාරය** වන්නේ ය.

තවද යම් කිසි භික්ෂු කෙනෙක් සෙසු වැඩිමහලු භික්ෂූන් කෙරෙහි ගෞරව හා යටත් පැවැතුම් ඇති වැ - ලජ්ජා බියෙන් යුක්ත වැ - මනාකොට හැඳැ පෙරවැ - දුටුවන් පහදනා ගමනා-ගමනයෙන් ආලෝකන විලෝකනයෙන් අත් පා දිගුකිරීමෙන් හැකිලීමෙන් යුක්ත වැ, යට හෙළා ලූ ඇස් ඇති වැ මනා ඉරියව්වලින් රැඳී ඉඳුරන් රැකවල් කොට ගෙන, පමණ දැන වළඳමින් නින්දෙහි තත්පර නොවැ සිහි නුවණෙන් යෙදී අලෙපච්ඡ ව ලත් දෙයින් සතුටු ව අත් නොහළ වීර්‍ය්‍ය ඇති වැ ආනිසමාචාරික වත් පිළිවෙත් සකස් වැ පුරමින් ගරුසරු ඇති වැ වෙසෙත් නම් එය ද **ආචාරය** යි කියනු ලැබේ.

ගොචර වනාහි: **1. උපනිස්සය ගොචරය, 2. ආරක්ඛ ගොචරය, 3. උපනිබන්ධ ගොචරය** යි ත්‍රිවිධ වේ.

1. උපනිස්සය ගොචර නම්:- අලෙපච්ඡ කථා ආදි දහවිධ කථාවන්ට පිහිට වූ ගුණෙන් යුත් **කල්‍යාණ** මිත්‍රයාසි. හේ කෙබඳුවිය යුතු ද යත්? යම්බඳු කල්‍යාණ මිත්‍රයෙකුගේ

ආශ්‍රයෙන් පෙර නොඇසූ විරූ ධර්ම අසන්නේ ද, ඇසූවිරූ ධර්ම පිරිසිදු කර ගන්නේ ද, සැක තුබූ තන්හි සැක දුරු කර ගන්නේ ද, සකීය දෘෂ්ටිය ඍජු කර ගන්නේ ද, සිත ප්‍රසන්න වන්නේ ද, වැළිත් යම් කල්‍යාණ මිත්‍රයෙකු ගේ ආශ්‍රයෙන් ශ්‍රද්ධා ශීල-ශ්‍රැත-ත්‍යාග-ප්‍රඥා යන පංච ධර්මයෙන් තෙමේ වැඩෙන්නේ ද, එබඳු ආචාර්‍ය මෙහි කල්‍යාණමිත්‍ර-(**උපනිස්සය ගොචර**) නම් වේ යයි දතයුතු.

2. ආරක්ඛ ගොචර නම්:- ඉන්ද්‍රියයන් සංවර කර ගැන්මයි. ඒ එසේ මැයි:- මේ සසුන් වන් පැවිදි තෙමේ ගමට වේවයි, වීථියට වේවයි වන් කල යට හෙළා ලූ ඇස් ඇති වැ වියදඬු පමණ බලමින් සංවර යුක්ත ව ගමන් කරයි ද, ඇතුන්, අසුන්, රථ, පාබලසෙනඟ දිසා බලමින් සත්‍රීන් පුරුෂයන් දිසා බලමින් ගමන් නොකරයි ද, උඩ බලාගෙන හෝ පමණට වඩා බෙල්ල නවා බිම බලාගෙන ම හෝ ගමන් නොකරයි ද, දිසානුදිසාවන් (වටපිට) බල බලා හෝ ගමන් නොකරයි ද මේ **ආරක්ඛ ගොචර** යයි දතයුතු.

උපනිබන්ධ ගොචර නම්:- සිත බැඳ තැබීමට – (භාවනාවට) අරමුණු. එනම්:- **සතර සතිපට්ඨාන යි.**

වදාළේ මැ යැ. **"තස්මා ච භික්ඛවෙ භික්ඛුනෝ ගොචරෝ සකෝ පෙතිකෝ විසයෝ යදිදං චත්තාරෝ සතිපට්ඨානා"**[1] යි 'මහණෙනි, භික්ෂු හට සිය පිය සතු ගොචරය කුමක් ද මේ සතර සතිපට්ඨානයෝ ය' යනු එහි භාවයි. මේ **උපනිබන්ධ ගොචරය යි** දතයුතු.

මේ දැක්වූ ආචාරයෙන් හා ගොචරයෙන් යුක්ත වූයේ ද **ආචාරගොචර සම්පන්න** නම් වේ යයි දතයුතු.

අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී= පරමාණු තරම් වූ ඉතා සුළු වරදෙහි පවා භය දක්නා සුලු වැ (ඉතා සුළු වරද නම් නොදන්න මතක නැති වැ පැමිණෙන **සෙඛියා ශික්ෂාපද** ව්‍යතික්‍රම්ණ හා අකුසල සිත් ඉපදීම් ආදිය. එබඳු සුලු වරද පවා පාරාජිකාපත්තියක් තරම් කොට සලකමින් යූ සේයි.)

සමාදාය සික්ඛති සික්ඛාපදෙසු= භික්ෂූන් විසින් ශික්ෂාපදයන් අතුරෙන් යමක් සමාදන් ව ගෙන **රක්ක** යුතු ද ඒ සියල්ල රක්නේ ය යන අර්ථයි.

---

[1]සං: නි. මහාවග්ග 902

(මෙහි **"පාතිමොක්ඛ සංවරසංවුතෝ"** යන පදයෙන් මෑ පුග්ගලාධිට්ඨානදෙසනා වසයෙන් ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය වදාරන ලදී. සෙසු **"ආචාරගොචර සම්පන්නෝ"** යනාදිය ඒ ශීලය රක්නහුගේ ප්‍රතිපත්ති දක්වන පිණිස වදාරන ලදී. පුග්ගලාධිට්ඨානදෙසනා නම්, ශීලය දැක්වුවමනා තන්හි ඒ ශීලය ඇති පුද්ගලයා වණිනා කොට දැක්වීමයි.)

ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය නිමියේ ය.

---

2. ඉන්ද්‍රිය සංවර ශීලය.

"සෝ චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමේනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දෝමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියේ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා, ඝාණේන ගන්ධං ඝායිත්වා, ජිව්හාය රසං සායිත්වා, කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා, මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති...පෙ...මනින්ද්‍රියේ සංවරං ආපජ්ජති"[1] යනු ඉන්ද්‍රිය සංවර සඳහා විභඞ්ගයෙහි වදාළ පාළියි.

මෙහි අභිප්‍රාය පද පිළිවෙළින් දක්වනු ලැබේ.

සෝ= ඒ ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයෙන් යුක්ත වූ භික්ෂු.

චක්ඛුනා රූපං දිස්වා= චක්ෂුර්විඤ්ඤණයෙන් රූප දැක (මෙහි චක්ඛු ශබ්දයෙන් රූපදර්ශනයට සම්මත වූ චක්ෂුර්විඤ්ඤණය වදාළ බැව් දතයුතු.)

මේ පිළිබඳ පුරාණාචාර්‍යවරයන් ගේ මතය මෙසේ ය.

"ඇසට රූප නොදැක්ක හැකි ය. ඇස සිත නොවන හෙයිනි. සිතට ද රූප නො දැක්ක හැකි ය. සිත ඇස නොවන හෙයිනි. එසේ නම් 'ඇසින් රූප දක්නේ ය' යනු කෙසේ වන්නේ ද යත්? චක්ෂුර්ද්වාරයෙහි රූපාරම්මණය ගැටුණු විට ඒ චක්ෂුඃප්‍රසාදය වසතු කොට ඇති සිතින් රූප දක්නේ ය. 'දුන්නෙන් විදියි' කීකල දුන්න හෙතු කොට ගෙන ඊතලයෙන් විදින්නාක් මෙනි. එහෙයින් **"චක්ඛුනා රූපං දිස්වා"** යූ තැන චක්ෂුර්විඤ්ඤණයෙන් රූප දැකැ යන අර්ථය දත යුතු ය" යනුයි.

[1] වි: ප: ඤාණවිභඞ්ග 188

න නිමිත්තග්ගාහී= පියොවුරු ආදි සත්ත්‍ව නිමිති හෝ දැළි රැවුලු ආදි පුරුෂ නිමිති හෝ කෙලෙස් උපදීමට හෙතු වන අන්‍ය නිමිති හෝ නොගන්නේ ය. හුදෙක් දුටු දෙය දුටු සැටියෙකින් මැ සලකා ගන්නේ ය යි **සේසි.**

න අනුබ්‍යඤ්ජනග්ගාහී= අනුබ්‍යඤ්ජන නොගන්නේ ය. අනුබ්‍යඤ්ජන නම්, කෙලෙස් ප්‍රකට භාවයට පමුණුවන අත් පා සිනා කියුම් බැලුම් ආදිය පිළිබඳ ආකාරයි. එබඳු ආකාර ශුභ වශයෙන් නොගෙන ඇති සැටියේ අසුභ වශයෙන් මැ ගන්නේ යයි සේසි. **සැගිරියෙහි** විසූ **මහානිස්ස** තෙරුන්නාන්සේ මේනි.

මහානිස්ස තෙරුන්නාන්සේගේ කථාව.

සැගිරියෙහි (**මිහින්තලේ**) විසූ **මහානිස්ස** තෙරුන්නාන්සේ එක් දවසක් **අනුරාධපුරයට** පිඬු පිණිස වඩිමින් සිටියේක. **අනුරාධපුරයෙහි** විසූ එක් කුලහතක් සිය සැමියා සමඟ කලහ කොට ගෙන 'මේ වද විඳුවන දීගයට වඩා හුදකලාව ගෙයි රැඳුම යෙහෙකැ'යි සලකා ඇති මව්ටමින් හැඳ පැලඳ දෙවඟනක් මෙන් සැරසී උදැසන මැ **මිහින්තලේ** දිසාවට යනු පිණිස මඟට බැස්සා ය. මාගීයෙහි ගමන් ගත් ඕ තොමෝ සන්සුන් පියොවින් මඟ වඩින වඳනීය වූ තෙරුන් වහන්සේ දැක නිඳනීය අදහසක් උපදවා උන්වහන්සේ ලවා තමා දිසා බලවනු පිණිස ශබ්ද නගා කොමල සිනාවක් සීපුය. මූල කර්මස්ථානය මෙතෙහි කරමින් වඩින තෙරුන්වහන්සේ ඒ කුමක්දැයි බලන සේක් ඇයගේ විලිත්තු දත් ඇට පෙළ දැක සවකීය අසපික කර්මස්ථානය සිතට ආවිර්භූත වූයෙන් විවසුන් වඩා එහි දීම අර්හත් ඵලයට පැමිණි සේක.

ඇයගෙ දත් ඇට දැක-සිහිකෙළෙ මුල් කමටහන,
එහි මැ සිට ඒ තෙරණුවෝ-රහත්බවට පැමිණියෝ.[1]

ඇයගේ භිමියා ඇය සොයා එන්නේ තෙරුන්නාන්සේ දැක "**ස්වාමිනි!** මෙහි ගැහැණියක් ගියා දුටුදැ"යි විචාළේය.

---

[1] "තස්සා දන්තට්ඨිකං දිස්වා-පුබ්බසඤ්ඤං අනුස්සරී,
තත්ථෙව සෝ ඨිතෝ ථෙරෝ-අරහත්තමපාපුණී"

එවිට තෙරුන්නාන්සේ

ගැහැණි ද පිරිමිදැ සි – නො දනිමි දැන් මින් ගියේ
මහමග අැවි ගොඩක් නම්-ගමන් කරනු දුටුයෙමි[1]

යි කී සේක.

"යඤ්ඤදේව කරණ මෙතං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරතෝ අභිජ්ඣා දෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සු වෙය්‍යුං. තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති[2]**"**

'යම් චක්ෂුරින්ද්‍රියයක් සංවර කොට නො ගෙන වාසය කරන පුද්ගලයා කරා රාග දොෂාදී ලාමක අකුශල ධර්මයෝ ලුහුබැඳ එන් නම් ඒ චක්ෂුරින්ද්‍රියය සංවර කරගැන්ම පිණිස පිළිපදනේ ය. එසේ පිළිපදනේ මැ ඒ චක්ෂුරින්ද්‍රියය රැකගන්නේ ය. ඒ චක්ෂුරින්ද්‍රියයෙහි සංවර ට පැමිණෙන්නේ යි.'

සංවර අසංවර ස්ථාන විභාගය.

ප්‍රශ්න:– චක්ෂුඃප්‍රසාදය නිසා සමෘතියක් හෝ විසමෘතියක් හෝ නූපදනා බැවින් චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයෙක් හෝ අසංවරයෙක් හෝ නැත්තේ නොවේ ද කුමක් හෙයින් "චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙන්නේ ය"යි වදාළ සේක් ද

පරිහාර මෙසේ ය.

'චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයක් හෝ අසංවරයක් හෝ නැති බව සැබෑ ය. එතකුදු වුවත් රූපාරම්මණය චක්ෂුඃප්‍රසාදයෙහි ගැටුණු විට **භවාඞ්ග චිත්තය භවාඞ්ගචලන – භවාඞ්ග උපච්ඡේද** නමින් දෙවරක් ඉපදී නිරුඬ වූ කල්හි ඒ රූපය ම අරමුණු කරමින් **පංචද්වාරාවජ්ජන චිත්තය** එක වරක් උපදනේ ය. එය නිරුඬ වූ කල්හි දර්ශන කෘත්‍යය සිඬ කරමින් **චක්ඛුවිඤ්ඤාණ චිත්තය** උපදනේ ය. එය නිරුඬ වූ කල්හි සම්පටිච්ඡන කෘත්‍යය සිඬ කරමින් **සම්පටිච්ඡන** චිත්තය ද, එය නිරුඬ වූ කල්හි සන්තීරණ කෘත්‍යය සිඬ කරමින් **සන්තීරණ** චිත්තය ද, එය නිරුඬ වූ කල්හි ව්‍යවස්ථාපන කෘත්‍යය සිඬ කරමින් **වොට්ඨපන චිත්තය** ද උපදනේ ය. එය නිරුඬ වූ කල්හි **ජවන් සිත්** උපදනේ ය. මේ සිත් අතුරෙන් භවංග – පංචද්වාරාවජ්ජන චක්ඛුවිඤ්ඤාණ – සම්පටිච්ඡන – සන්තීරණ – වොට්ඨපන යන සිත්හි සංවරය හෝ අසංවරය හෝ නො වෙයි. ජවනක්ෂණයෙහි මැ දුස්සීල භාවය හෝ මූළාසිහිය හෝ අඥාන භාවය හෝ නොඉවසීම

---

[1] "නාභිජානාමි ඉත්ථිවා – පුරිසෝ වා ඉතෝ ගතෝ,
අපි ච අට්ඨිසඞ්ඝාටෝ – ගච්ඡතෙ ස මහාපථෙ"

[2] වි· ප: ඣානවිභඞ්ග 188

හෝ කුසීත භාවය හෝ වුණි නම් අසංවරය වෙයි. මෙසේ අසංවරය ජවන් අවස්ථාවෙහි වුව ද එය චක්ඛුන්ද්‍රිය අසංවර යයි කියනු ලැබේ. කුමක් හෙයින් ද ජවන් සිත්හි අසංවරය වූ කල්හි චක්ඛුද්වාරය ද, භවාඞ්ග ආවජ්ජනාදි වීථි සිත් ද, අසංවර වන බැවිනි. නගරයෙහි ප්‍රධාන දොර සතර නොපියූ කල්හි ඇතුල්හි සුලු දොර පියූවත් නගරය ආරක්ෂා සහිත නොවෙයි. ප්‍රධාන දොරයන්ගෙන් සොරු ඇතුල් වැ නුවර බඩු පැහැර ගන්නා බැවිනි. එමෙන් ජවන් අසංවර වූ කල්හි චක්ඛුර්ද්වාරය ද, භවාඞ්ග ආවජ්ජනාදි සිත් ද අසංවර මැ ය. ජවන් සංවර වූ කල්හි චක්ඛුද්වාර භවාංග ආවජ්ජනාදිය ද සංවර ය. ප්‍රධාන දොර සංවර කල්හි මුළු නගරය ම ආරක්ෂා සහිත වන්නාක් මෙනි. මෙසෙයින් ජවනක්ෂණයෙන් වන සංවරය **"චක්ඛුන්ද්‍රිය සංවර"** යයි වදාළ සේකැ සි දතයුතු.

'සොතෙන සද්දං සුත්වා" ——පෙ——'ශ්‍රොත විඤ්ඤාණයෙන් ශබ්ද අසා' යනාදිය ද යට කියන ලද පරිදි මැ වන්නේ ය.

මෙසේ රූපාදිය නිමිති කොට සිත්හි කෙලෙස් ඉපැදීම වළකන්නේ **ඉන්ද්‍රිය සංවර ශීලය** සි දතයුතු.

ඉන්ද්‍රිය සංවර ශීලය නිමියේ ය.

---

3. ආජීව පාරිසුද්ධි සීලය.

"ආජීවය හෙතු කොට ගෙන පණවා වදාළ **සවැදෑරුම් ශික්ෂාපදයන්** ව්‍යතික්‍රමණය කිරීම් වශයෙන් ද, **කුහනා- ලපනා- නෙමිත්තිකතා-නිප්පේසිකතා-ලාභෙන ලාභං නිජිගිංසනතාදි** පාප ධර්මයන් ගේ වශයෙන් ද පවත්නා වූ **මිච්ඡාජීවයෙන් වැළකීම** ආජීව පාරිසුද්ධි සීලය සි" යනු යට දක්වන ලදී.

මෙහි ආජීවය හෙතු කොට ගෙන පණවා වදාළ සවැදෑරුම් ශික්ෂාපද මෙසේ ය.

(1) පාරාජිකාව පාපෙච්ඡ වූ යම් උපසම්පන්න භික්ෂුවෙක් ආජීව හෙතුයෙන් තමා සතන්හි අවිද්‍යමාන වූ ධ්‍යාන- මාර්ග- ඵලාදි උත්තරි මනුෂ්‍ය ධර්මයෙක් තමා කෙරෙහි ඇතැයි කියා නම් ඒ භික්ෂු පාරාජිකාපත්තියට පැමිණෙයි.

(2) **සංඝාදිසෙසය:** යම් උපසම්පන්න භික්ෂුවෙක් ආජීව හෙතු යෙන් සත්‍රී පුරුෂ දෙදෙනෙකුන් පිළිබඳ එකෙනෙහි වන සංගමය පිණිස හෝ ඔවුනොවුන්ගේ පණිවිඩ කියා නම් ඒ භික්ෂු සඞ්ඝාදිසෙසාපත්තියට පැමිණෙයි.

(3) **ථුල්ලච්චය:** යම් උපසම්පන්න භික්ෂුවෙක් ආජීවය හෙතු කොට ගෙන දායකයා හට "නුඹගේ විහාරයෙහි වසන භික්ෂු රහතන් වහන්සේ නමෙකැ"යි තමා උදෙසා අනියමයෙන් කියා නම් ඒ භික්ෂු ථුල්ලච්චයාපත්තියට පැමිණෙයි.

(4) **පාචිත්තිය:** යම් උපසම්පන්න භික්ෂුවෙක් නොගිලන්වූයේ ම ආජීවය හෙතු කොට ගෙන කිරි ආදි ප්‍රණීත භොජන තමා පිණිස විනවා ගෙන වළඳ නම් ඒ භික්ෂු පාචිත්තියා පත්තියට පැමිණෙයි.

(5) **පාටිදෙසනීය:** යම් උපසම්පන්න භික්ෂුකියක් නොගිලන් වූවා මැ ප්‍රණීත භොජන තමා පිණිස විනවා ගෙන වළඳ නම් ඒ භික්ෂුකී පාටිදෙසනීයාපත්තියට පැමිණෙයි.

(6) **දුක්කටය:** යම් උපසම්පන්න භික්ෂුකියන් නොගිලන් වූවා ම සූප හෝ ඔදන හෝ තමා පිණිස විනවා ගෙන වළඳ නම් ඒ භික්ෂුකී දුකුළා ඇවැතට පැමිණෙයි.

මේය ආජීවය හෙතු කොට පණවා වදාළ ශික්ෂාපද සය නම්:

මේ අඛිවිධ ශික්ෂාපද ව්‍යතික්‍රමණය කරන්නහුගේ ආජීවය අපිරිසිදු වේ. එපමණෙක් ද නොවෙයි. කුහනාදි වශයෙන් ජීවත් වන්නහුගේ ද ආජීවය අපිරිසිදු වෙයි. ඒ කුහනාදීහු මතු දක්වනු ලැබෙත්.

කුහනා.

"තත්‍ථ කතමා කුහනා? ලාභසක්කාර සිලෝක සන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යා පච්චය පටිසෙවන සංඛාතෙන වා සාමන්තජප්පිතෙන වා ඉරියාපථස්ස වා අට්ඨපනා ඨපනා සණ්ඨපනා භාකුටිකා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං අයං වුච්චති කුහනා"[1] යනු මේ සඳහා වදාළ විනඹගයෙහි නිදේශ පාළියි.

එහි කුහනා නම් කිම?

'ලාභ සත්කාර කීර්ති පතන්නා වූ, පාපෙච්ඡ වූ හෙවත් නැති ගුණ දක්වනු කැමැති වූ, ලොභයෙන් මඩනා ලද්ද වූ, භික්ෂුවගේ පච්චයපටිසෙවන වශයෙන් හෝ සාමන්තජපපක

[1] වි: ප: බුද්ධකවත්ථුවිභඞ්ග 261

වශයෙන් හෝ ඉරියාපථසන්නිස්සිත වශයෙන් හෝ යම් මුහුණ හකුළුවන බවෙක් කුහක බවෙක් වෙයි ද එය **කුහනා** යයි කියනු ලැබේ. යනු එහි සංක්ෂිප්ත භාවයි.

මෙයින් මහා නිද්දේශයෙහි[1] දක්වන ලද **1. පච්චයපටිසෙවන, 2. සාමන්තජප්පන, 3. ඉරියාපථසන්නිස්සිත යන තුන්විධ කුහක වස්තු** ප්‍රකාශිත බව දතයුතුයි.

1. පච්චය පටිසෙවන කුහනාව

දායකයෙක් භික්ෂුවක් හට චීවරාදි ප්‍රත්‍යයන් අතුරෙන් යමක් පිළිගන්වයි. ඒ භික්ෂු එයින් ප්‍රයෝජන ඇත්තේ මැ ගනු කැමැත්තේ මැ "මට වුවමනා නැතැ"යි ප්‍රතික්ෂේප කරයි. එවිට දායකයා වඩා සතුටු වැ "අහෝ අපේ ස්වාමීන් වහන්සේ අලෙපේච්ඡය. කිසිවක් පිළිගන්නට නො කැමැති සේක. අපට වූයේ මහා ලාභයෙක. කෙසේ නමුත් උන්වහන්සේට ප්‍රත්‍යය සිහිත්තක් පිළිගන්වා ගත මැන වැ"යි නානාවිධ උපායයෙන් වටනා සිවුරු ආදිය පිළියෙළ කොට ගෙන අවුත් පෙරැත්ත කරයි. එවිට භික්ෂු ඔහුට ම අනුග්‍රහ සඳහා පිළිගන්නා සැටි අහවා ඒ සිවුරු ආදිය පිළිගනියි. එතැන් පටන් කරන්න බරට ගෙනවුත් පිළිගන්වන ආකාරයෙන් ජනයා විසමය පත් කරන මේ කුහක භාවය **පච්චය පටිසෙවන කුහන වස්තුය** යි දතයුතු වදුලේ මැ යි.

මහානිද්දේශයෙහි:—

> **"කතමං පච්චය පටිසෙවන සඞ්ඛාතං කුහනවත්තු? ඉධ ගහපතිකා භික්ඛුං නිමන්තෙන්ති චීවරපිණ්ඩපාත සෙනාසන ගිලාන පච්චය භෙසජ්ජපරික්ඛාරෙහි. පාපිච්ඡා ඉච්ඡාපකතෝ අත්තිකෝ චීවර ..... පෙ ..... පරික්ඛාරානං භියෝ කම්‍යතං උපාදාය චීවරං පච්චක්ඛාති. පිණ්ඩපාතං ..... පෙ ..... සෙනාසනං ..... පෙ ..... ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරං පච්චක්ඛාති. සෝ එවමාහ. කිං සමණස්ස මහඝෙඝන චීවරෙන? එතං සාරුප්පං යං සමණෝ සුසානා වා සඞ්කාරකුටා වා පාපණිකා වා නානත්තානි වා ලුච්චිනිකා සංඝාටිං කත්වා ධාරෙය්‍ය. කිං සමණස්ස මහඝෙඝන පිණ්ඩපාතෙන එතං සාරුප්පං යං සමණෝ උඤ්ඤාචරියාය පිණ්ඩියාලොපෙන ජීවිතං කප්පෙය්‍ය. කිං සමණස්ස මහඝෙඝන සෙනාසනෙන! එතං සාරුප්පං යං සමණෝ රුක්ඛමූලිකෝ වා අස්ස**

[1] මහා නි: 161

අබෙහාකාසිකො වා කිං සමණස්ස මහගෙසත්ත සීලං-පච්චය භෙසජ්ජපරික්ඛාරෙන! එතං සාරුප්පං යං සමණො පූතිමුත්තෙනත වා හරීටකඛණ්ඩත වා ඔසධං කරෙය්‍යාති. තදුපාදාය ලූඛං චීවරං ධාරෙති ලූඛං පිණ්ඩපාතං පතිභුඤ්ජති. ලූඛං සෙනාසනං තමෙනං පවිසෙවති. ලූඛං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පවිසෙවති. තමෙනං ගහපතිකා එවං ජානන්ති. අයං සමණො අපපිච්ඡො සන්තුට්ඨො පවිවිත්තො අසංසට්ඨො ආරබ්භවිරියො ධුත වාදො න ඉමස්‍යා නිමන්තනත්ති චීවර ...පෙ... පරික්ඛාරෙහි සො එවමාහ. තිණ්ණං සම්මුඛීභාවා සඩ්ඩො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති, සඩ්ඩාය සම්මුඛීභාවා සඩ්ඩො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති. දෙය්‍යධම්මස්ස ...පෙ... දක්ඛිණෙය්‍යානං සම්මුඛීභාවා සඩ්ඩො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති. තුම්හාකඤ්ඤෙව වායං සඩ්ඩා අත්ථි. දෙය්‍යධම්මො ච සංවිජ්ජති. අහං ච පටිග්ගණ්හකො. සචාහං න පටිග්ගහෙස්සාමි එවං තුමෙහ පුඤ්ඤෙන පරිබාහිරා භවිස්සථ. න මෙහං ඉමිනා අත්ථො අපි ච තුම්හාකං යෙව අනුකම්පාය පතිග්ගණ්හාමී'ති තදුපාදාය බහුං පි චීවරං පතිග්ගණ්හාති. බහුම්පි පිණ්ඩපාතං ...පෙ... භෙසජ්ජපරික්ඛාරං පතිග්ගණ්හාති. යා එවරූපා භාකුට්ටිකා භාකුට්ටියං කුහනා කුහායනා කුහිතත්තං ඉදං වුච්චති පච්චයපටිසෙවන සංඛාතං කුහනවත්ථූති.[1]

මෙහි සංක්ෂිප්ත භාවය මෙසේ ය

'පච්චයපටිසෙවන සංඛ්‍යාත කුහන වස්තුව කවරේ ද යත්? මේ සසුන්හි ගෘහපතියෝ භික්ෂුවකට චීවරාදි සිව්පසයෙන් නිමන්ත්‍රණය කෙරෙති. පාපෙච්ඡ වූ ඉච්ඡාපකත වූ භික්ෂු ඒ සිව්පසයෙන් ප්‍රයෝජන ඇත්තේ නමුදු වැඩියක් ගනු කැමැත්තේ ප්‍රතික්ෂෙප කෙරෙමින් මෙසේ කියයි. "මහණුන්ට මහාඝී සිවුරු කුමකට ද ඔවුන්ට වටනේ සොහොනින් හෝ කසල ගොඩෙන් හෝ රෙදි කැබලි අවුලා මසාගෙන පොරවන්නට ය. මහණුන්ට ප්‍රණීත පිණ්ඩපාත කුමට ද ඔවුන්ට වටනේ සිහා ගෙන වළඳන්නට ය. මහණුන්ට මාඇඟි සෙනසුන් කුමට ද ඔවුන්ට වටනේ රුක්ඛමූලික වැ හෝ අබ්භොකාසික වැ හෝ වසන්නට ය. මහණුන්ට අතඃ ගිලන්පස බෙහෙත් පිරිකර කුමට ද ඔවුන්ට වටනේ පූතිමුත්‍රයෙන් හෝ අරළුයෙන් හෝ

[1] මහා: නි: 162

බෙහෙත් කරන්නට ය." මෙසේ කියමින් එය මැ පෙන්වනු සඳහා රැකෙ වූ චීවර පිණ්ඩපාත සෙනාසන ගිලන්පස බෙහෙත් පිරිකර පරිභොග කරයි. ඒ දක්නා ගැහැවියෝ "මුන්වහන්සේ අලෝභය සන්තුට්ඨිය පවිවිත්තය අසංසට්ඨිය ආරබ්ධවිරිය ය ධුතවාදීය" යි වඩ වඩා ලා සතුටු වැ සිවුපසයෙන් පෙරැත්ත කෙරෙති. එවිට ඒ භික්ෂු "ශ්‍රද්ධා, දෙයධර්ම්, ප්‍රතිග්‍රාහක යන තුන් වස්තූන්ගේ සම්මූබ වීමෙන් සැදුහැවත් කුලපුත්‍රයෝ පින් රැස්කර ගනිති. තොපට ශ්‍රද්ධාව හා දෙයධර්ම් (දැනවසතුව) ඇත්තේ ය. මම වූ කලී ප්‍රතිග්‍රාහකයෙමි. ඉදින් මම නොපිළි ගත්තෙම් නම් තොපි පිනින් බැහැර වන්නහු ය. මට මේ පසයෙන් ප්‍රයොජන නැතත් තොපට අනුකම්පා සඳහා පිළිගනිමි" යි මෙසේ බණ දෙසමින් බොහෝ බොහෝ සිවුරු ආදිය පිළිගනියි. මෙබඳු භාකුටිකයෙක් කුහක භාවයෙක් වේ නම් එය පච්චය පටිසෙධන සංඛ්‍යාත කුහක කම වන්නේය. පච්චය පටිසෙධන නම්, ප්‍රත්‍යය ප්‍රතික්ෂෙප කිරීමයි.

2. සාමන්ත ජප්පන කුහනාව.

පාපෙච්ඡ වූ භික්ෂුවෙක් තමන් කෙරෙහි නැති උතුරු මිනිස් දම් ගුණ ඇති සේ කොට දක්වන කථායෙන් ජනයා විසමය පත් කෙරේ නම් එය **සාමන්ත ජප්පන කුහන වඝනුය** යි දතයුතු. (උතුරු මිනිස් දම් ගුණ නම්, ධ්‍යාන-මාර්ග-ඵල ය)

වදාළේ මැ යි:-

"කතමං සාමන්තජප්පනසංඛාතං කුහනවත්ථු? ඉධෙකච්චෙ පාපිච්ඡා ඉච්ඡාපකතා සම්භාවනාධිප්පායා යො එවං මං ජනෙ සම්භාවෙස්සති'ති අරියධම්ම-සන්නිස්සිතං වාචං භාසති. යෙ එවරූපං චීවරං ධාරෙති සෙ සමණෙ මහෙසක්ඛා'ති භණති යෙ එවරූපං පත්තං ලොහථාලකං ධම්මකරකං පරිස්සාවනං කුසදවිකං කායබන්ධනං උපාහනං ධාරෙති සෙ සමණෙ මහෙ-සක්ඛා'ති භණති. යස්ස එවරූපෙ උපජ්ඣායෙ ආචරියෙ සම්භාවනීයෙ සම්මානුපජ්ඣායකෙ සම්මානාචරියකෙ මිත්තෙ සන්දිට්ඨෙ සම්භත්තෙ සභායෙ. යො එවරූපෙ විහාරෙ වසති. අඩ්ඪයොගෙ පාසාදෙ හම්මියෙ ගුහාය ලෙණෙ කුටියා කූටාගාරෙ අට්ටෙ මාලෙ එදග්ගෙඩ උපට්ඨාන

සාලායං මණ්ඩපෙ රුක්ඛමූලෙ වසති. සෝ සමණෝ මහෙසක්ඛොති භණති. අථවා ඛොරකඤ්ඤ ඛොරකඤ්ඤො භාකුටිඤ භාකුටිඤ්ඤො කුහකුහෝ ලපලපෝ මුඛසම්භාවිතෝ අයං සමණෝ ඉමාසං එවරූපානං සන්නානං විහාරසමාපත්තීනං ලාභීති තාදිසං ගම්භීරං ගූළ්හං නිපුණං පටිච්ඡන්නං ලොකුත්තරං සුඤ්ඤතා පටිසංයුත්තං කථං කථෙති. යා එවරූපා භාකුටිතා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං ඉදං වුච්චති සාමඤ්ඤජ්ජපනා සංඛාතං කුහනවත්ථූති"[1]

මෙහි සංක්ෂිප්ත භාවය මෙසේ ය.

'සාමඤ්ඤජ්ජපන කුහන වස්තුව කවරේ ද යත්? මේ සසුන් වන් ඉච්ඡායෙන් මඬනා ලද බුහුමන් ලබනු කැමති පාපෙච්ඡ වූ-භික්ෂුවෙක් "මෙසේ කථාකළ කල්හි මට මහජනයා බුහුමන් කරති" යි සලකා ආර්‍යධර්ම නිශ්‍රිත කොට කථා කරයි. කෙසේ කථා කෙරේ ද යත්? "යමෙක් මේ නියා සිවුරු ධරා නම්, මේ නියා පාත්‍ර ලොහොතලු ඛබරා පෙරහන් යතුරුමුදු කාඛහන් වහන් ධරා නම් ඒ මහණ මහෙණාක්‍ය ය. යමෙකුට මෙබඳු උපාධ්‍යාය- ආචාර්‍ය්‍ය-සමානොපාධ්‍යාය-සමානාචාර්‍ය්‍යවරයෝ ඇත් නම්, යමෙකුට මෙබඳු සඳ්ධිවිහාරික - සමාන්‍යක මිත්‍රයෝ ඇත් නම් ඒ මහණ මහෙණාක්‍ය ය. යමෙක් මෙබඳු විහාරයෙක අඩ්ඩයොග පාසාද- හම්මිය - ගුහාලෙණ - කුටි - කූටාගාර - අට්ට - මාල උද්දණ්ඩ - උපට්ඨානසාලා - මණ්ඩප - රුක්ඛමූලයෙක වෙසේ නම් ඒ මහණ මහෙණාක්‍යය"යි කියයි. තව ද හැකිළෑ හැකිළෑ මුහුණ හකුළ හකුළා කුහක කුහක වැ ප්‍රලාප දෙඩ දෙඩා කථින් මෑ අනුන් විසින් සම්භාවනා කරන ලද්දේ මේ මහණ මෙබඳු ඥානන විහාර සමාපත්තීන් ලැබ සිටින්නේය යි හැඟෙන සේ ඊට සරිලන ගැඹුරු — ශූන්‍ය — සියුම් — ප්‍රතිච්ඡන්න — ශූන්‍යතාවයෙන් යුක්ත-ලොකොත්තර කථා කෙරෙයි. මෙබඳු කුහක බවෙක් වෙයි නම් එය **සාමඤ්ඤ ජ්ජපන** සඞ්ඛ්‍යාත **කුහක වස්තුය** යි කියනු ලැබේ.

3. ඉරියාපථසන්නිස්සිත කුහනාව.

'පාපෙච්ඡ වූ භික්ෂුවෙක් ලොකයාගෙන් බුහුමන් ලබන කැමැත්තෙන් යාම් ඉදිරීම් ආදි ඉරියව්වෙන් මහා ජනයා විස්මය පත් කෙරේ නම් එය **ඉරියාපථසන්නිස්සිත කුහන වස්තුව** යයි දනයුතු. වදුලේ මැයි.

---

[1]මහා: නි: 166

"කතමං ඉරියාපථසංඛාතං කුහනං වත්ථු? ඉධෙකච්චෙ පාපිච්ඡා ඉච්ඡාපකතො සම්භාවනාධිප්පායො එවං මං ජනො සම්භාවෙස්සතීති ගමනං සණ්ඨපෙති. සයනං සණ්ඨපෙති. පණිධාය ගච්ඡති. පණිධාය තිට්ඨති. පණිධාය නිසීදති. පණිධාය සෙය්‍යං කප්පෙති. සමාහිතො විය ගච්ඡති. සමාහිතො විය තිට්ඨති. නිසීදති. සෙය්‍යං කප්පෙති. ආපාථකජඣායී ච හොති. යා එවරූපස්ස ඉරියාපථස්ස අට්ඨපනා ඨපනා සණ්ඨපනා භාකුටිතා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං ඉදං වුච්චති ඉරියාපථ සංඛාතං කුහනවත්ථු"[1]ති.

මෙහි සංක්ෂිප්ත භාවය මෙසේ ය.

ඉරියාපථසංඛ්‍යාත කුහන වස්තුව කවරේ ද යත්? මේ සසුන්වන් – ඉච්ඡායෙන් මඩනාලද – බුහුමන් ලබනු කැමැති පාපෙච්ඡ භික්ෂු "මෙසේ කළ කල්හි මහා ජනයා මට බුහුමන් කරත්" යයි සලකා ගමන් කරයි. සයනය කරයි. තමා උතුරු මිනිස් දම් ඇතියෙකැයි දුටුවන්ට වැටහෙන සේ යයි. සිටියි. ඉඳියි. හොවියි. පැණෙන තැන සමාපත්තියට සමවත්නහු මෙන් හිඳියි. මෙසේ ඉරියව් පැවැත්වීම් වසයෙන් දක්වන කුහක බවෙක් වෙයි ද එය ඉරියාපථ සඞ්ඛ්‍යාත **කුහක බව** යයි කියනු ලැබේ.

කුහනා යන පදයෙහි විඤ්ඤාරයයි.

ලපනා

"තත්ථ කතමා ලපනා? ලාභසක්කාර සිලොක සන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යා පරෙසං ආලපනා ලපනා සල්ලපනා උල්ලපනා සමුල්ලපනා උන්නහනා සමුන්නහනා උක්කාචනා සමුක්කාචනා අනුප්පියභාණිතා චාටුකම්‍යතා මුඛසුප්පතා පාරිභට්ඨතා අයං වුච්චති ලපනා"[2]

එහි ලපනා නම් කිම?

'ලාභ සත්කාර කීර්ති පතන්නා වූ – පාපෙච්ඡ වූ – ලොභයෙන් මැඩගත් භික්ෂුවකගේ පරා (අනුන්) පිළිබඳ යම් ආලපනාවක්, ලපනාවක්, සල්ලපනාවක්, උල්ලපනාවක්, සමුල්ලපනාවක්, උන්නහනාවක්, සමුන්නහනාවක්, උක්කාචනාවක්, සමුක්කාචනාවක්, අනුප්පියභාණිතාවක්, චාටුකම්‍යතාවක්, මුඛසුප්පතාවක්, පාරිභට්ඨතාවක්, වේද එය **ලපනා** යයි කියනු ලැබේ' යනු භාවයි.

---

[1]මහා: නි: 164 [2]වි: ප: බුද්ධකවත්ථු විභඞ්ග 261

මෙහි ආලපනා ආදිය පිළිබඳ විවරණය මෙසේ දතයුතු.

1. **ආලපනාව**= විහාරසථානයට පැමිණි මිනිසුන් දැකැ පින්වතුනි! මේ කුමට අවු ද කිම! ආරාධනාවක් කරන්නට ද හෙද! එසේ නම් යන්න. මම පසු වැ එන්නම්" යි මෙසේ පළමු කොට මැ කථාවට පටන් ගැන්ම ආලපනාය, නොහොත් තමන් උසස් තැන තබා "මම තමා.....කියන්නේ. රජ්ජුරුවෝ මා ගැන බොහෝ ප්‍රසන්නය. අසවල් අසවල් රාජ මහා මන්ත්‍රීවරු මා කෙරෙහි ප්‍රසන්නයි"යි මෙසේ තමා උසස් තැන තබා කථා කිරීම හෝ **ආලපනාය.**

2. **ලපනාව**= විතාළ කෙනෙකුන්ට එසේ කීම **ලපනාය.**

3. **සල්ලපනාව**= දැයකයන් කළකිරීමෙහි හේතුයෙන් ඔවුන්ට ද අවකාශ තබ තබා කථා කිරීම **සල්ලපනාය.**

4. **උල්ලපනාව**= "මේ තමා මහා ධනවතා, මේ තමා මහා කාමිකයා, මේ තමා මහා දූනපතියා" යනාදීන් දැයකයා උසස් කොට තබා කථා කිරීම **උල්ලපනාය.**

5. **සමුල්ලපනාව**= සම්ප්‍රකාරයෙන් මැ දැයකයා උසස් කොටැ කථා කිරීම **සමුල්ලපනාය.**

6. **උනනහනාව**= උපාසකවරුනි! ඉස්සර නම් මේ කාලයේ අඳුන් දන් දුන්නහු ය. දැන් කුමක් හෙයින් නොදෙන්නහු දැ"යි විචාරා හෙතෙමේ "සවාමීනි! දැනුදු දෙන්නෙමි අවකාශ නැතියෙන් ප්‍රමාද වන්නෙමි" යි යම් තාක් කියයි ද, ඒ තාක් වෙළාලීම **උනනහනාය.** නොහොත් උක් දණ්ඩක් අතේ ඇති වැ පැමිණි උපාසකයකු දැකැ "උපාසකය! මේ කොයින් ගෙනෙන ලද දැ"යි විචාරා "සවාමීනි! කෙනින්" යයි කී කල්හි "කිමෙක උපාසකය! එහි උක් මිහිරි දැ" යි විචාරා "සවාමීනි! කාලා දැනැ ගත යුතුය"යි කී කල්හි "උපාසකය! "භික්ෂූන්ට උක් දියයුතුය' යි කියන්නට නොවටනේය" යි කියමින් මෙසේ නිරවුල් වැ කථා කරන දැයකයා අවුලේ ලා කථා කිරීම හෝ උන්නහනාය.

7. **සමුන්නනහනාව**= සම්ප්‍රකාරයෙන් අවුලේ ලා කථාකිරීම **සමුන්නනහනාය.**

8. **උක්කාචනාව**= "මෙ ගෙහි වැසියෝ ඉදින් මා හඳුනත් නම් මෙහි සියලු දෙය ධර්මය මට ම දෙති" යි උද්දීපනය **උක්කාචනාවය.**

තෙලඳුරිකා කථා වස්තුව මෙහි ලා නිදර්ශනයි.

9. **සමුත්තේජනාවචනතාව**= සම්ප්‍රකාරයෙන් මෙසේ උද්දීපනය **සමුත්තේජනාවචනතාවය.**

10. **අනුද්ධංසනාවණ්ණතාව**= සත්‍යානුකූලත්වය හෝ ධර්මානුකූලත්වය නොබලා නැවත නැවත ප්‍රිය කථා කිරීම **අනුද්ධංසනාවණ්ණතාවය.**

11. **චාටුකම්‍යතා**= නීවරණනිත්‍යයයි. හෙවත් තමා දැයකයාට වඩා පහත් වැ පැවැත්ම යි.

12. **මුගසුප්‍යතාව**= මුං ඇට තැම්බූ කල්හි කොටසක් පැසී කොටසක් නොපැසී තිබෙන්නා සේ යමෙක් කථා කරන කල්හි කොටසක් සත්‍ය වැ කොටසක් අසත්‍ය වැ තිබේ නම් ඒ පුද්ගලයා **මුගසුප්‍පය** යි කියනු ලැබේ. ඔහුගේ සුභාවය **මුගසුප්‍යතාය.**

13. **පාරිභට්‍යතාව**= කිරි මවුන් මෙන් කුලදරුවන් ඇකයෙන් කරින් වඩා ගැන්ම **පාරිභට්‍යතාය.**

ලපනා යන පදයෙහි විභාගය යි.

නෙමිත්තිකතා

"තත්‍ථ කතමා නෙමිත්තිකතා? ලාභ සක්කාර සිලෝක සන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යං පරෙසං නිමිත්තං නිමිත්තකම්මං ඔභාසෙ ඔභාසකම්මං සාමන්තජප්පා පරිකථා අයං වුච්චති නෙමිත්තිකතා."[1]

එහි නෙමිත්තිකතා නම් කිම?

ලාභ සත්කාර කීර්තිකාමී වූ – පාපෙච්ඡ වූ – ඉච්ඡාපකත වූ – භික්ෂුවගේ පරා පිළිබඳ යම් නිමිත්තයෙක් නිමිත්තකර්මයෙක් ඔභාසයෙක් ඔභාසකර්මයෙක් සාමන්තජල්පාවෙක් පරිකථාවෙක් වෙයි ද එය **නෙමිත්තිකතාය** යි කියනු ලැබේ.

නිමිත්තාදීන්ගේ විවරණය මෙසේ ය.

1. **නිමිත්ත** නම්, ප්‍රත්‍යය දීම සඳහා මෙරමා හට සිත් උපදවන කාය කර්ම හා වාක් කර්මය.

2. **නිමිත්තකර්ම** නම්, කැමක් ගෙන යන්නවුන් දැක "කිම කැමක් ලැබුවහු ද යනාදි නියායෙන් නිමිති කිරීමය.

3. **ඔභාස** නම්, ප්‍රත්‍යය පිළිබඳ කථා කිරීමය.

---

[1] වි: ප: බුද්ධකවත්ථුවිභඞ්ග 262

4. **ඔහාසකම්ම** නම්, වසුපල්ලන් දැකැ "කිම මොහු කිරි වස්සෝ ද වෙඬරු වස්සෝ දැ" යි විචාරා "සවාමීනි කිරි වස්සෝය"යි කී කල්හි "මොවුන් කිරිවස්සන් වුව නොහැක ඉදින් කිරිවස්සෝ නම් භික්ෂූහු ද කිරි ලබන්නාහුය"යි මේ ආදි නියායෙන් කියා කුඩා දරුවන් ලවා ඔවුන්ගේ මවු පියන්ට දන්වා කිරි දෙවවා ගැනීම් ආදිය යි.

5. **සාමණෙරපඤ්හා** නම්, කුළුපග භික්ෂු මෙන් ආසන්නා කොටැ කථා කිරීමය.

කුලුපග භික්ෂු.

එක් කුලුපග භික්ෂුවෙක් වළඳන රිස්සෙන් මැ ගෙයකට වැද අස්නෙක හුන්නේ ය. ගෙයි ඇත්තී උන්වහන්සේ දැක කිසිවක් නොදෙන අටියෙන් "අද ගෙදෙර සහල් නැතැ"යි කියා ගෙත සහල් ගෙනෙන්නට යන ලීලාව හඟවා අසල් ගෘහයකට ගියා ය. ඒ අතර භික්ෂු ඇතුල් ගැබට වැද වට පිට බලන්නේ දෙරමුල්ලේ උක්ගස ද, භාජනයෙක සකුරු ද, පැසෙක ලුණු මාලු ද, සැළියෙක සහල් ද, කළයෙක ගිතෙල් ද තිබෙනු දැක නික්මැ අවුත් කිසිවක් නොදන්නා කෙනෙකුන් මෙන් උන් තැනැ මැ උන්නේ ය. ගෙයි ඇත්තී "සහල් ලබා ගත නොහැකි වීය" යි කියා ගෙත ගෙට ආවා ය. භික්ෂූ කියන්නේ "උපාසිකාවෙනි! අද දන් නොලැබෙන බව මම එද්දී ලත් පූජා නිමිත්තයෙන් මැ දැන ගතිමි"යි කීවේ ය. "සවාමීනි! කවර පූජා නිමිත්තයෙක්ද" යි අසන ලද්දේ "උපාසිකාවනි! ගෙයි මුල්ලේ උක්ගස බදු සජියකු දුටුවෙමි. "එම ගසා එළවම්" යි අවට බලන්නේ භාජනයෙහි සකුරු කැට බදු ගල් කැට ද, පා පහර කැ සජියා විසින් පැසෙහි ලුණු මාලු පලුව මෙන් දැක්වූ පෙණය ද, කැට ගල් ඛහන්නට පැන ගත් සජියාගේ සැළියෙහි සහල් බදු දන් ද, කුපිත වූ සජියාගේ මුඛයෙන් ගිලිහුණු කළයෙහි ගිතෙල් බදු විෂ මිශ්‍ර කෙළ ද දුටුවෙමි" යි යළිත් කීවේ ය. ඕ "මේ මුඩු ශ්‍රමණයා වංචා කළ නොහැකිය" යි උක්ගස කපා පිළිගන්වා තැවත බත් පිසැ ගිතෙල් සකුරු හා මස් සමඟ පිළිගැන්වූවා ය.

මෙසේ ආසන්නා කොටැ බිණීම **සාමණෙරපඤ්හාය** යි දතයුතු.

6. **පරිකථා** නම්, යම් සේ කථා කළ විට ලැබේ නම් එසේ පෙරළ පෙරළා කථා කිරීම ය.

නෙමිත්තකතා යන පදයෙහි විස්තරය යි.

නිප්පෙසිකතා.

"තත්ථ කතමා නිප්පෙසිකතා? ලාභසක්කාර සිලෝක සන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යා පරෙසං අක්කොසනා වම්භනා ගරහණා උක්කෙඨපනා සම්මුක්කෙඨපනා ඛිපනා සංඛිපනා පාපනා සම්පාපනා අවණ්ණහාරිතා පරපිට්ඨිමංසිකතා අයං වුච්චති නිප්පෙසිකතා"[1]

'එහි **නිප්පෙසිකතා** නම් කිම? ලාභ සත්කාර කීර්තිකාමී වූ පාපෙච්ඡ වූ, ඉච්ඡාපකත වූ භික්ෂුවගේ පරහට යම් අක්කොසනා-වෙක් ගරහණාවෙක් උක්කෙඨපනාවෙක් සම්මුක්කෙඨපනාවෙක් ඛිපනාවෙක් සංඛිපනාවෙක් පාපනාවෙක් සම්පාපනාවෙක් අවණ්ණ-හාරිතාවෙක් පරපිට්ඨිමංසිකතාවෙක් වන්නේ ද එය **නිප්පෙසි-කතාය** සි කියනු ලැබේ.

අක්කොසනාදීන්ගේ විවරණය මෙසේ ය.

1. **අක්කොසනා**= දශ ආක්‍රෝශ වස්තුයෙන් ආක්‍රෝශ කිරීමය.
2. **වම්භනා**= බැණ දෙඩීම ය.
3. **ගරහණා**= "අස්සද්ධාවන්තයා, අප්‍රසන්නයා" යනාදි නයෙන් දෝෂාරෝපනය කිරීම ය.
4. **උක්කෙඨපනා**= "කට වහගනු" යනාදීන් වචනයෙන් ඔසවා දැමීම ය.
5. **සම්මුක්කෙඨපනා**= සවිප්‍රකාරයෙන් හෙතු සහිත වැ එසේ ඔසවා දැමීම නොහොත් නොදෙන්නෙකුට "අනේ දානපතිය!" යනාදීන් වචනයෙන් උසස් කිරීම උක්කෙඨපනාවය, මොනවට එසේ උසස් කිරීම **සම්මුක්කෙඨපනාව ය.**
6. **ඛිපනා**= "බිජුවට කන මොහුගේ ජීවිතය කිමදැ"සි කවට කම් කිරීම ය.
7. **සංඛිපනා**= "මොහුට නොදෙන්නා යයි කුමට කියත් ද ඇම කල්හි මෙතෙමේ තැන යනු දෙන්නේ ය"සි කියා වඩාලාත් කවටකම් කිරීම ය.
8. **පාපනා**= නොදෙන බව නොහොත් නුගුණ සැම තැන පැමිණවීම ය.
9. **සම්පාපනා**= සවිප්‍රකාරයෙන් එසේ පැමිණවීම ය.

---

[1] ම: ප: බුද්ධකවත්තු වි: 262

10. අවණ්ණහාරිතා = "දෙස් කීමට බියෙන් වත් දෙන්නේ ය" යි සිතා ගෙන් ගෙට ගම්න් ගමට දනව්වෙන් දනව්වට නුගුණ ගෙනයාම ය.

11. පරපිට්ඨිමංසිකතා= සම්මුඛයෙහි මිහිරි සේ ගුණ කියා අසම්මුඛයෙහි නුගුණ කීමයි. මේ වනාහි ඉදිරිපිටදී බැලීම් මාත්‍රයකුදු නොකොටැ පිටු පැවිට පිටු මස් කෑම වැනි එකෙක. එබැවින් **පරපිට්ඨිමංසිකතාය** යි කියනු ලැබේ.

මේ යට දැක්වුණු අක්කොසනාදි කථා වනාහි හුණ පතුරෙන් ඇඟ සූරා පිස දමන්නා සේ මෙරමාගේ ගුණ සූරා පිස දමන්නේ ය. නැතහොත් සුවඳ ද්‍රව්‍ය සුණු කොටැ සුවඳ ආඝ්‍රාණය කරන්නා සේ මෙරමා ගුණ සුණු කොටැ ලාභ සොයා ගන්නේ යි. එබැවින් **නිප්පේසිකතා** යයි කියනු ලැබේ.

නිප්පේසිකතා යන පදයෙහි විභාගය යි.

ලාභෙන ලාභං නිජිගිංසනතා.

"තත්‍ථ කතමා ලාභෙන ලාභං නිජිගිංසනතා? ලාභ සක්කාර සිලොකසන්නිස්සිතෝ පාපිච්ඡා ඉච්ඡාපකතෝ ඉතෝ ලද්ධං ආමිසං අමුත්‍ර හරති අමුත්‍ර වා ලද්ධං ආමිසං ඉධාහරති. යා එවරූපා ආමිසෙන ආමිසස්ස එට්ඨි ගවෙසි පරියෙට්ඨි එසනා ගවෙසනා පරියෙසනා අයං වුච්චති ලාභෙන ලාභං නිජිගිංසනතා"ති.[1]

එහි ලාභයෙන් ලාභය සෙවීම නම් කිම්?

ලාභ සත්කාර කීර්ත්තිකාමී - පාපෙච්ඡ - ඉච්ඡාපකත - භික්ෂු මේ ගෙයින් ලත් ආමිෂය අනෙක් ගෙයකට ගෙනයයි. ඒ ගෙයින් ලත් ආමිෂය මේ ගෙට ගෙන එයි. මෙ බඳු වූ ආමිෂ පිළිබඳ යම් කැමැත්තෙක් සෙවීමෙක් නැවැත නැවැත සෙවීමෙක් වේ ද, එය **ලාභයෙන් ලාභය සෙවීම** යයි කියනු ලැබේ. යනු භාවයි මූල පටන් ලක් භික්ෂාව ඒ ඒ ගෙවල දරුවන්ට දීලා අනතයෙහි **කිරිකැඳක් ලබා ගෙන ගිය භික්ෂුවගේ කථාව** මෙහි දැක්විය යුතුවේ.

ආදි ශබ්දයෙන් **"යථා වා පනෙකෙ මොඝනා සමණ බ්‍රාහමණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එව රූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති.**

---

[1] වි: ප: බුද්ධකවත්තුවිභඞ්ග 262

සෙය්‍යථිදං? අඞ්ගං නිමිත්තං උප්පාතං සුපිනං ලක්ඛණං මූසිකච්ඡින්නං අග්ගිහෝමං දබ්බිහෝමං"[1] යනාදි වශයෙන් **බ්‍රහ්මජාල සූත්‍රයෙහි** වදාළ අනෙකවිධ පාප ධර්ම ගත යුතුය. "මේ ලොකයෙහි ඇතැම් මහණ බමුණු කෙනෙක් සැදැහැවතුන් දුන් බොජුන් වළඳා මේබඳු වූ තිරශ්චීන විද්‍යායෙන් මිථ්‍යාජීවයෙන් ජීවත් වෙත්. කෙබඳු තිරශ්චීන විද්‍යාවෙන් ද යත්? අඞ්ගශාස්ත්‍රය, නිමිත්ත ශාස්ත්‍රය, අග්නි ආදි උත්පාත ශාස්ත්‍රය, සර්පප්‍රත ශාස්ත්‍රය, ලක්ෂණ ශාස්ත්‍රය, මීයන් වස්ත්‍රාදිය කෑ කල වන පල කීමය, මෙනම් ගින්නෙන් හොම කළ කල මෙපම් සැන්දෙන් හොම කළ කල මෙබඳු ඉෂ්ට විපාක වන්නේය යි දැක්වීම"ය යනු පාළියේ භාවය යි.

මෙසේ ආජීවය හෙතු කොට ගෙනැ පණවා වදාළ **සවැදුරුම් ශික්ෂාපද ව්‍යතික්‍රමණය** කිරීම් වශයෙන් ද, **කුහනා ලපනා නෙමිත්තිකතා නිප්පේසිකතා ලාභෙන ලාභං නිජිගිංසනතාදි** පාප ධර්මයන්ගේ වශයෙන් ද, දිවි පැවැත්වීම මිථ්‍යාජීවය යි. ඒ සඳහාකාර මිථ්‍යා ජීවයෙන් වෙන්වීම **ආජීව පාරිසුද්ධි සීලයයි. "එතං ආගම්ම ජීවන්ති හි ආජීවෝ—කෝ හෝ? පච්චය පරියේසන වායාමෝ. පාරිසුද්ධී'ති පරිසුද්ධතා ආජීවස්ස පාරිසුද්ධි ආජීවපාරිසුද්ධි"** යනු මෙහි වචනාර්ථයි.

ආජීව පාරිසුද්ධි සීලය නිමියේ ය.

---

4. ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය.

"පටිසංඛා යොනිසෝ චීවරං පටිසේවාමි යාවදේව සීතස්ස පටිඝාතාය" යනාදීන් ප්‍රත්‍යවේක්ෂා කොටැ සිව්පස පරිභෝග කිරීම **පච්චය සන්නිස්සිත සීලය** යි යට දක්වන ලදී. එහි විස්තරය මෙසේ ය.

"පටිසංඛා යොනිසෝ චීවරං පටිසේවාමි යාවදේව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය ඩංසමකස වාතාතප සිරිංසප සම්ඵස්සානං පටිඝාතාය යාවදේව හිරිකොපීන පටිච්ඡාදනත්ථං"[2] යි ප්‍රත්‍යවේක්ෂා කරමින් සිවුරු හැඳිය යුතු පෙරෙවිය යුතු. "නුවණින් සලකා මම සිවුරු වළඳමි. කුමක් පිණිස යයි සලකා සිවුරු වළඳිමි ද යත්? හුදෙක් සීතල නසනු පිණිස ය, උෂ්ණය නසනු පිණිසය, මැසි මදුරු අව් සුළං දීර්ඝජාතික සපී යන මොවුන්ගේ සැපෑ නසනු පිණිස ය. වැළි අනාවරණ පරිවේෂ්ටනයෙන් ලජ්ජා කුපපත ස්ථාන මූවහ කරගනු පිණිස යයි මෙසේ නුවණින් සලකා සිවුරු වළඳිමි" යනු එහි භාවයි.

---

[1] දී: නි: සීලක්ඛන්ධවග්ග 7. [2] ම: නි: මූලපණ්ණාසක 11

විවරණය මෙසේ ය.

පටිසංඛා යොනිසො= උපායයෙන් - නුවණින් දැනගෙන ප්‍රත්‍යවෙක්ෂා කොට යන අර්ථයි. මෙහි මතු කියනු ලබන "සීතස්ස පටිඝාතාය" යනාදීන් සැළකීම ම නුවණින් ප්‍රත්‍යවෙක්ෂා කිරීම යයි දතයුතු.

චීවර නම්: හඳන ආදීන් අතුරෙන් යමක්. (ආදි ශබ්දයෙන්) උත්තරාසංග-සංඝාටි ආදිය ගන්නේ යි.

පටිසෙවාමි= වළඳිමි, හඳිමි, පොරවමි යන අර්ථ යි.

යාවදෙව= යනු ප්‍රයෝජන සීමාව නියම කොට දක්වන වචන යි. "සීතස්ස පටිඝාතාය" යනාදීන් මතු දක්වනු ලබන දෙයම යොගීන්ගේ සිවුරු පරිභෝගයෙහි ප්‍රයෝජනය යි. එයින් වැඩි ප්‍රයෝජනයෙක් නැතැයි සේයි.

සීතස්ස= ශරීරයෙහි ධාතුක්ෂෝභයෙන් හෝ බාහිරයෙහි ඍතු පෙරළීමෙන් හෝ වන යම් කිසි සීත.

පටිඝාතාය= නැසීම පිණිස යම් සේ ශරීරයෙහි ආබාධයෙක් නොවේ ද එසේ දුරු කිරීම පිණිස.

ශරීරය සීතයෙන් පීඩිත වූ කල්හි සිත වික්ෂිප්ත වේ. නුවණින් වීර්‍ය්‍ය කරන්නට අසමර්ථ වේ. එබැවින් සීත දුරු කරනු පිණිස සිවුරු පරිභෝග කටයුතුය යි **බුදුන් වහන්සේ** අනුදත් සේක. මතුයෙහි ද මේසේ ය.

උණ්හස්ස= අග්නි සන්තාප, ඒ වනාහි වනදැහැදියෙහි ලැබෙන්නේ යයි දතයුතු. (ආතප යන්නෙහි සූර්‍ය්‍ය සන්තාප ගත් හෙයින් මෙහි අග්නි සන්තාප ගතයුතු.)

ඩංස මකස වාතා'තප සිරිංසප සම්ඵස්සානං

ඩංස - ඩහන මැසි. කණමැස්සෝ යයි ද කියත්; **මකස** - මදුරු **වාත** - ධූලි සහිත හෝ රහිත සුළං; **ආතප** - සූර්‍ය්‍ය සන්තාප; **සිරිංසප** - ඇදෙමින් යන දීඝ ජාතිස්ස සර්පාදි; ඔවුන්ගේ සපඝීය දෂ්ට සපඝීය, සප්‍රෂ්ට සපඝීයයි විවිධ වේ. ඒ විවිධ සපඝීය ම සිවුරු පොරවාගෙන උන්නහු කොපෙළයි. එබැවින් එබඳු තැන්හි ඒ සපඝී වළකනු සඳහා වළඳයි.

යාවදෙව= යි නැවැත යෙදීම නියත ප්‍රයෝජන සීමාව නියම කොටැ දක්වනු සඳහා ය. **හිරිකොපීන පටිඡාදනඤ** නියත ප්‍රයෝජනය යි. සීතාදිය වැළකීම සමහර විටෙක ම

වන්නේ ය. **හිරිකොපීන** නම් ඒ ඒ සම්බාධස්ථාන. යම් යම් ශරීරාඞ්ගයක් විවෘත කොටැ සිටුන් ම වීළි කිපේ ද, ඒ ඒ ශරීරාඞ්ග හිරිකොපීන යයි කියනු ලැබේ. හිරිකොපීන මුවහ කරනු පිණිස යනු අර්ථයි. "හිරිකොපිනං පටිච්ඡා "දනත්ථං" යීත් පාඨයෙක් ඇත්තේ ය.

විවර ප්‍රත්‍යවෙක්ෂා විධිය සි.

"පටිසංඛා යොනිසෝ පිණ්ඩපාතං පටිසෙවාමි නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්ම චරියානුග්ගහාය ඉති පුරාණං ච වෙදනං පටිහංඛාමි. නවං ච වෙදනං න උප්පාදෙස්සාමි යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරෝ ච"[1] යි ප්‍රත්‍යවෙක්ෂා කරමින් පිණ්ඩපාතය වැළඳිය යුතු. "නුවණින් සලකා මම පිණ්ඩපාතය වළඳමි, කුමක් පිණිස යයි සලකා ද යත්? කෙළි පිණිස නොවේ ය. මද පිණිස නොවේ ය, සැරසුම් පිණිස නොවේ ය, අලඞ්කාර පිණිස නොවේ ය. එසේ නම් කුමක් පිණිසය යත්? හුදෙක් මේ ශරීරයාගේ සථිතිය පිණිසය. පැවැත්ම පිණිසය, බඩසා වැළැක්ම පිණිසය, බඹසරට අනුග්‍රහ පිණිසය. මෙසේ මේ පිණ්ඩපාත පටිසෙවනයෙන් පැරණි බඩගිනි වෙදනාත් නසමි. අධික වැ වැළඳීමෙන් වන අහිතව වෙදනාත් නූපදවමි. එසේ මැ මෙයින් මගේ ජීවිත යාත්‍රාව ද, නිරවද්‍ය භාවය ද, පහසු විහරණය ද, වන්නේ ය" යනු එහි භාවයි.

විවරණය මෙසේය.

පටිසංඛා යොනිසෝ = යනු යට විසතර කරන ලදී.

පිණ්ඩපාතං = යම් කිසි ආහාරයක්; භික්ෂූන්ගේ පාත්‍රයෙහි භික්ෂා වය්‍යාජයෙන් – පතිත කෙසින් යම් කිසි ආහාරයෙක් පිණ්ඩ පාත යයි කියනු ලැබේ. නොහොත් පිණ්ඩයන්ගේ – ඒ ඒ තන්හි දී ලත් භික්ෂාවන්ගේ පාතය – සමූහය හෝ පිණ්ඩ පාතය සි කියනු ලැබේ. (පිණ්ඩොලේ‍යන පත්තෙ පතිතත්තා පිණ්ඩපාතො, පිණ්ඩානං වා පාතො පිණ්ඩ පාතො)

පටිසෙවාමි = වළඳමි.

නෙව දවාය = ගම් දරු ආදීන් මෙන් ක්‍රීඩා පිණිස නොවේ ය

---

[1]ම: නි: මූලපණ්ණාසක 11

න මදාය= මල්ලවාදීන් මෙන් බලමද පුරිසමද පිණිස නොවේය.

න මණ්ඩනාය= ඇතොවුරන්- (අන්තඃපුර ස්ත්‍රීන්) හා වෙසඟනන් ආදීන් මෙන් අඟ පසඟ පිණවන පිණිස නොවේ ය.

න විභූසනාය= තළු ආදීන් මෙන් විභූෂණය පිණිස – ප්‍රසන්න ජවි වණීය පිණිස නොවේ ය. කිව යුත්තෙක් ඇති. මෙහි **"නෙව දවාය"** යනු මොහොපනිඃශ්‍රය ප්‍රහාණය සඳහා ද, **"න මදාය"** යනු වෙඝොපනිඃශ්‍රය ප්‍රහාණය සඳහා ද, **"න මණ්ඩනාය න විභූසනාය"** යනු රාගොපනිඃශ්‍රය ප්‍රහාණය සඳහා ද වදාළේ ය. තව ද **"නෙවදවාය න මදාය"** යනු සවකීය කාමරාගාදි සංයොජනයන්ගේ උත්පත්තිය වැළකීම සඳහා ද **"න මදාය න මණ්ඩනාය"** යනු පරකීය කාමරාගාදි සංයෝජනයන්ගේ උත්පත්තිය වැලකීම සඳහා ද වදාළ බව හා මේ නෙව දවායාදි සතරින් නුනුවණින් පිළිපැදීමෙන් ඇතිවන කාමසුඛල්ලිකානුයොගයාගේ ප්‍රහාණය වදාළ බව ද දතයුතු.

යාවදෙව= යනු යට කියන ලද අර්ථ මැයි.

ඉමස්සකායස්ස= පඨවී, ආප, තේජ, වායු යන සතර මහා භූතමය වූ මේ රූපකායයාගේ.

ඨිතියා= ප්‍රබන්ධප්පවත්තිය පිණිස සන්නති අවිච්ඡේදය පිණිස.

යාපනාය= පැවැත්ම පිණිස – අවිච්ඡේදය පිණිස නොහොත් බොහෝ කල් පැවැත්ම පිණිස.

දිරාගිය ගෙයක මිනිහෙක් එ ගෙට රුකුල් දෙන්නා සේ රිය පදින්නෙක් අකුරෙහි තෙල් ලන්නා සේ ශරීරඨ්පත්තිය පිණිස, ශරීරයාපනය පිණිස මේ මහණ පිණ්ඩපාතය වළඳයි. දව – මද – මණ්ඩන – විභූසන පිණිස නොවළඳයි සේයි.

තව ද ඨිති යනු ජීවිතින්ද්‍රියයට නමෙකි. එබැවින් **"ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය"** යන මෙයින් මේ ශරීරය පිළිබඳ ජීවිතින්ද්‍රිය පවත්වා ගැන්ම පිණිස යන අර්ථය ද කියන ලද බව දතයුතු.

විහිංසූපරතියා= පීඩා කරන අර්ථයෙන් බඹගින්න විහිංසාය යි කියනු ලැබේ. ව්‍රණයෙහි බෙහෙත් ලන්නා සේ උණක

සීතාදිය ඇති වූ කල්හි එයට ප්‍රතිකාර කරන්නා සේ විහිංසා සංඛ්‍යාත බඩගිනි වළකා ගැන්ම පිණිස පිණ්ඩ පාතය වළඳයි.

බ්‍රහ්මචරියානුග්ගහාය= සියලු ශාසන බ්‍රහ්මචර්‍යාවට හා මාර්ග බ්‍රහ්මචර්‍යාවට අනුග්‍රහ පිණිස.

ඒ එසේ මෑ යි:- මේ මහණ පිණ්ඩපාතය වැළඳීමෙන් ලබන කාය බලය නිසා ත්‍රිවිධ ශික්ෂායෙහි යෙදී සසර කතරින් එතරවීම සඳහා පිළිපදනේ බ්‍රහ්මචර්‍යාවට අනුග්‍රහ පිණිස පිණ්ඩපාතය සෙවිනේ යි.

කවුරු කුමක් සෙවිනා මෙන් ද යත්? කාන්තාරයෙන් එතරවනු කැමැත්තෝ පුත්‍ර මාංසය සෙවිනා මෙන්, ගඟෙන් එතරවනු කැමැත්තෝ පසුර සෙවිනා මෙන්, මුහුදෙන් එතර වනු කැමැත්තෝ නැව සෙවිනා මෙනි.

ඉති පුරාණං ච වෙදනං පටිහංඛාමි, නවං ච වෙදනං න උප්පාදෙස්සාමි= මෙසේ මේ පිණ්ඩපාත පරිභෝජනයෙන් පැරණි බඩගිනි වෙදනාත් නසා පියන්නෙමි. 'ආහරහත්ථක- අලංසාටක - තන්‍රවට්ටක - කාකමාසක - භූතනවමිතක බමුණන් මෙන් පමණ ඉක්මැ වැළඳීමෙන් ලබන අලුත් වේදනාත් නූපදවන්නෙමි' යි සලකමින් ගිලනෙක් බෙහෙත් වළඳන්නා සේ පිණ්ඩපාත වළඳයි.

තව ද වර්තමානයෙහි අසප්පාය - අපරිමිත භොජන වැළඳීමෙන් ලැබෙන වෙදනා පුරාණ කර්ම හෙතුයෙන් උපදින හෙයින් පුරාණ වෙදනා යි කියනු ලැබේ. සප්පාය - පරිමිත - භොජන වැළඳීමෙන් ඒ පුරාණ වෙදනා උපදවන හෙතුව නැතිවන හෙයින් පැරණි වෙදනාත් නසා පියන්නෙමි යි. මෙකල අයුතු පරිභෝගයෙන් මතු උපදින වෙදනා නව වෙදනා යයි කියනු ලැබේ. 'යුතු පරිභෝගයෙන් ඒ නව වෙදනා උපදනා හෙතුව නැතිවන හෙයින් අලුත් වෙදනාත් නූපදවන්නෙමි' යි සලකා පිණ්ඩපාතය වළඳ යයි මෙසේත් මෙහි ලා අර්ථ දතයුතු ය.

මෙයින් සුදුසු වූ පරිභෝගයට අවසර ද, අත්‍යන්තකිලමථානුයෝගයෙන් බැහැර වීම ද, ධාර්මික සැපය නොහැරීම ද දක්වන ලද්දේය යි දතයුතු.

යාත්‍රා ච මේ භවිස්සති= හිස වූ මිත වූ භොජනානුභවය කරණකොට ගෙන ජීවිතෙන්ද්‍රිය සිඳ ලන්නාවූ ද, ඉරියවු බිඳ ලන්නාවූ ද උවදුරු දුරුවන හෙයින් මේ ශරීරයාගේ

බොහෝ කල් පැවතීම් සඞ්ඛ්‍යාත යාත්‍රාව ද වන්නේය සී රෝගියෙක් අහර අනුභව කරන්නා සේ පිණ්ඩපාතය වළඳයි.

අනවජ්ජතා ච ඵාසුවිහාරෝ ච= නිරවද්‍ය භාවය ද, පහසු විහරණය ද වන්නේ ය. (කෙසේ නිරවද්‍ය භාවය වන්නේ ද කෙසේ පහසු විහරණය වන්නේ ද යනු මෙහි දක්වනු ලැබේ.) අයුතු සෙවීම් පිළිගැනීම් පරිභෝග කිරීම් හැරීමෙන් නිරවද්‍ය භාවය වන්නේ ය. පමණ දැනැ වැළඳීමෙන් පහසු විහරණය වන්නේ ය. තව ද අසප්පාය හොජන වැළඳීමෙන් ද, පමණ ඉක්මැ වැළඳීමෙන් ද, අරති – තන්දි – විජම්භිකා – විඤ්ඤගරභාදි දෙස් උපදී. එබඳු දෙස් නූපදීමෙන් නිරවද්‍ය භාවය වන්නේ ය. සප්පාය හොජන වැළඳීමෙන් ද, පමණ දැන වැළඳීමෙන් ද කාය බල ලැබේ. එයින් පහසු විහරණය වන්නේ ය. (**අරති** නම් කුශල ධම්මාදියෙහි නො ඇලීම. **තන්දි** නම් අලස බව. **විජම්භිකා** නම් ඇඹුම් ඇරීම – ඇඟ මැළි කැඩීම. **විඤ්ඤගරභ** නම් නුවණැත්තන්ගේ ගැරහුම) තව ද ඇතිතාක් බඩ පුරා කෑමෙන් දුරැවීම හෙතු කොටැ සෙය්‍යසුඛ-ඵස්සසුඛ-මිඛසුඛ නො ලැබේ. ඒ නො ලැබීමෙන් නිරවද්‍ය භාවය වන්නේ ය. සතර පස් පිඬක් වළඳන්නට ඉඩ ඇති වැ අහර කිස නිම කිරීමෙන් ඉරියව් පැවැත්මට පහසු වේ. එසේ වීමෙන් පහසු විහරණය වන්නේ ය.

කියේ මැ සි.

"චතුආරෝ පඤ්ච ආලොපෙ-අභුනිත්වා උදකං පිවෙ,
අලං ඵාසු විහාරාය – යුඤ්ජතයොගඤ්ඤ භික්ඛුනො"[1]

'සතර පස් පිඬක් නො වළඳ, ජලය පානය කරනු. යොගාවචර භික්ෂුහුගේ පහසු විහරණයට එය ප්‍රමාණ වේ' යනු ගාථාවේ අදහසයි.

'යාත්‍රා ච මෙ භවිස්සති, අනවජ්ජතා ච ඵාසුවිහාරෝ ච' යන මෙයින් ප්‍රයෝජන විදීම හා මධ්‍යම ප්‍රතිපදාව දක්වන ලද්දේ යි දතයුතු. (**සෙය්‍ය සුඛ** නම් ශය්‍යාවෙන් ලැබෙන සැප ය. **ඵස්ස සුඛ** නම් ඒ අත මේ අත පෙරළීමෙන් ලැබෙන සැප ය. **මිඛ සුඛ** නම් නිදීමෙන් ලැබෙන සැප ය.)

පිණ්ඩපාත ප්‍රත්‍යවෙක්ෂා විධිය සී.

---

[1] ථෙරගා: තිංසක නිපාත 307

"පටිසංඛා යොනිසො සෙනාසනං පටිසෙවාමි. යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංස මකස වාතා තප සිරිංසප සම්ඵස්සානං පටිඝාතාය යාව දෙව උතුපරිස්සය විනොදනං පටිසල්ලානාරාමත්ථං"[1] යි ප්‍රත්‍යවෙක්ෂා කරමින් සෙනාසන පරිභොග කළ යුතුයි. "නුවණින් සලකා මම සෙනසුන් පරිභොග කරමි. (කුමක් පිණිසය යි සලකා සෙනසුන් පරිභොග කරමි ද යත්? මම සෙනසුන් පරිභොග කරන්නේ) හුදෙක් සීතල නසනු පිණිස ය. උෂ්ණය නසනු පිණිස ය. මැසි මදුරු අවි සුළං දීඝජාතික සප් යන මොවුන්ගේ සපශී නසනු පිණිස ය. (වැළි) හුදෙක් උතුපරිස්සය විනොදනය පිණිස හා පටිසල්ලානාරාමය පිණිස යි" යනු එහි භාවයි.

යම හෙ දැක්වුණු පදයන්ගේ විවරණය මෙසේ ය.

සෙනාසනං=සෙනසුන්; සයනය කරන තැන් **සෙන** ය. ඉඳ ගන්නා තැන් **ආසන** ය. සෙන ද ආසන ද = සෙනාසන. සෙනාසන නම් විහාර ඇඳ පුටු ආදිය යි.

උතුපරිස්සය විනොදනං පටිසල්ලානාරාමත්ථං = උතුපරිස්සය විනොදනය පිණිස හා පටිසල්ලානාරාමය පිණිස. **උතු** නම් ශීත උෂ්ණාදිය. **පරිස්සය** නම් පීඩාදායක – උපද්‍රවය පීඩාදායක ඍතු මෑ උතුපරිස්සය යි මෙහි කියන ලදී. එනම් ශරීරාබාධ හා චිත්ත වික්ෂෙප කර වූ අසපාය ඍතු යි. සෙනසුන්හි විසීමෙන් එය දුරු කර ගත හැකි වේ. එසේ දුරු කර ගන්නා පිණිස **පටිසල්ලාන** නම් සිත එකඟ කර ගැනීම ය ඒ පටිසල්ලානයෙහි ඇලීම **පටිසල්ලා-නාරාම ය.** ඒ පිණිස ද සෙනසුන් පරිභොග කරමි යි කී සේයි. සෙනසුන්හි විසීමෙන් සිත එකඟ කර ගත හැකි වේ.

මෙහි කියයුත්තෙක් ඇති. **"සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය"** යන මෙයින් උතුපරිස්සය විනොදනය කියවුණේ ය. නැවත එය කුමක් පිණිස කියන ලද්දේ ද චීවර පරිභොගයෙහි හා සෙනාසන පරිභොගයෙහි නියත ප්‍රයොජනය අනියත ප්‍රයොජනය යි ප්‍රයොජන දෙකෙකි. චීවර පරිභොගයෙහි **නියත ප්‍රයොජනය** හිරිකොපීන පටිච්ඡාදනය යි. සෙස්ස **අනියත ප්‍රයොජන** යි. කිසි විටෙක මෑ ලැබෙන බැවිනි. එමෙන් සෙනාසන පරිභොගයෙහි

[1] ම: නි: මූලපණ්ණාසක 11

නියත ප්‍රයොජනය උතුපරිස්සය විනොදනය යි. සෙස්ස **අනියත ප්‍රයොජන යි.** කිසි විටෙක මෑ ලැබෙන බැවිනි. ඒ බැවි ප්‍රකාශ වනු සඳහා මේ පදය තැවැත යොදන ලදැයි දත යුතු යි.

(මෙහි ලා අන්‍ය වූ ද අටී පක්‍ෂයෙක් කියනු ලැබේ.)

ඒ මෙසේ ය:- උතු **ඍතු** මෑ ය. පරිස්සය නම් **උපද්‍රව** ය. ඒ **උපද්‍රව** වනාහි **ප්‍රකට** උපද්‍රවය **ප්‍රතිච්ඡන්න** උපද්‍රවය යි විවිධ වේ. ප්‍රකට උපද්‍රව **සිංහ** ව්‍යාඝ්‍රාදිහු ය. ප්‍රතිච්ඡන්න උපද්‍රව **රාග** වෙෂාදිහු යි. යම් මේ විවිධ උපද්‍රවයෙක් සෙනාසනයෙක නො වසන්නවුන්ට ලැබේ ද, සෙනාසනයෙහි වසන්නවුන්ව ඒ ඒ විවිධ උපද්‍රව මෑ නො ලැබේ. එ බැවින් 'ඒ විවිධ වූ මෑ උපද්‍රව වළකනු සඳහා සෙනසුන් පරිභොග **කරමි**' යි ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නේ යයි කී සේයි.

ඒ එසේ මැයි:- අසෙනාසනයෙහි - විවෘතාඩ්ඛණ වෘක්‍ෂ මූලාදියෙහි වසන්නවුන්ට සිංහාදි ප්‍රකටඋපද්‍රව ද රාගවෙෂාදි ප්‍රතිච්ඡන්න උපද්‍රව ද පැමිණිය හැකි ය.

(මෙහි නො දැක්වුණු විවරණ චීවර ප්‍රත්‍යවෙක්‍ෂාගෙහි කී පරිදි දත යුතුයි.)

සෙනාසන ප්‍රත්‍යවෙක්‍ෂාවිධිය යි.

"පටිසංඛා යොනිසො ගිලාන පච්චය භෙසජ්ජ පරික්ඛාරං පටිසෙවාමි යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය අබ්‍යාපජ්ඣ පරමතාය" යි ප්‍රත්‍යවෙක්‍ෂා කරමින් ගිලන්පස බෙහෙත් පිරිකර වැළඳිය යුතුයි. "මම නුවණින් සලකා ගිලන් පස බෙහෙත් පිරිකර වළඳමි. (කුමක් පිණිස යයි සලකා වළඳමි ද යත්? මම ගිලන්පස බෙහෙත් පිරිකර වළඳන්නේ) හුදෙක් ව්‍යාබාධයන්ගෙන් උපන් වේදනා නසනු පිණිස ය, නිදුක පරම බව පිණිස ය" යනු භාවයි.

යට නො දැක්වුණු පදයන්ගේ විවරණය මෙසේ ය.

ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරං = ගිලන්පස බෙහෙත් පිරිකර **ගිලාන** නම් රොගය. **පච්චය** නම් ප්‍රතිපක්‍ෂ දේ ය. (පති අයන අටීයෙන්) **භෙසජ්ජ** නම් බෙහෙත් ය. භිෂජ්හු ගේ කර්මය භෙෂජ්‍ය. ඔහු විසින් (භිෂජ් සංඛ්‍යාත වෙදහු විසින්) අනුදන්නා ලද බැවිනි. එවිට

---

[1]ම: නි: මූ: 115

ගිලානයට – රෝගයට ප්‍රතිපක්ෂ වූ (සපායය වූ) හෙසජ්ජ-ගිලානපච්චය හෙසජ්ජ යි. රෝගයට සපායය වූ යම් කිසි තෙල් මීපැණි ආදියෙක් කියන ලදුයි දත යුතු **පරික්ඛාර** ශබ්දයෙන් පරිවාරය අලඞ්කාරය, සම්භාර යි, අවී තුනෙක් කියනු ලැබේ.

"සත්තහි නගරපරික්ඛාරෙහි සුපරික්ඛිතං හොති"[1] යනාදි පාළියෙහි පරික්ඛාර ශබ්දයෙන් **පරිවාරය** කියන ලදී. **"සුපතනගර පරිවාරයන්ගෙන් පරිස්සිත ය"** යනු එහි අර්ථ යි. (නගර පරිවාර සත නම් **කවාට, පරිඛා, උද්‌ධ, පාකාර, එසිකා, පලිඝ, පාකාරපඨණ්ඩිල** යන මෙහුයි.)

"රථෝ සීලපරික්ඛාරෝ – ක්‍ඛානකෙඛා චක්කවීරියෝ"[2] යනාදි පාළියෙහි පරික්ඛාර ශබ්දයෙන් **අලඞ්කාරය** කියනු ලැබේ. **"සීල නමැති අලඞ්කාර** ඇති, ධ්‍යාන නමැති අකුරු ඇති, වීර්‍ය්‍ය නමැති චක්‍ර ඇති ආර්‍ය්‍ය මාර්ග නමැති රථය" යනු එහි අර්ථ යි.

"යෙ විමෙ පබ්බජිතෙන ජීවිත පරික්ඛාරා සමුදානෙතබ්බා"[3] යනාදි පාළියෙහි පරික්ඛාර ශබ්දයෙන් **සම්භාරය** කියන ලදී. "පැවිද්දා විසින් යම් **ජීවිත සම්භාර කෙනෙක් එළවිය යුත්තාහු ද"** යනු එහි අර්ථ යි.

මෙහි වනාහි **පරිවාරය, සම්භාරය** යන අර්ථය කිය යුතු. ඒ ගිලානපච්චය හෙසජ්ජ ජීවිතයාගේ පරිවාර වෙයි. ජීවිත නාසක ආබාධ උපදීමට අවකාශ නොදී රැක ගන්නා හෙයිනි. ජීවිතයා ගේ සම්භාරත් වෙයි. බොහෝ කල් ජීවිත ප්‍රවෘත්තියට කාරණ වන හෙයිනි. ගිලාන පච්චය හෙසජ්ජ වූයේත් හේ මැ ය. පරික්ඛාර වූයේත් හේ මැ නුයි ගිලාන පච්චය හෙසජ්ජ පරික්ඛාර. ගිලන් බව දුරු කිරීමට සපායය වන වෙදුන් විසින් නියම කළ තෙල් මීපැණි ආදී ජීවිත පරිවාර ජීවිත සම්භාරය යි කී සේයි.

උපපන්නානං= උපන් – හටගත්.

වෙය්‍යාබාධිකානං = ව්‍යාබාධයෙන් නිපන්. "වේදනානං" යන්නට විශෙෂණ යි. "ව්‍යාබාධ" නම් ධාතුක්ෂොභ හා ඒ ධාතුක්ෂොභයෙන් නැගෙන කුෂ්ට ගඩු පිළිකාදි ය.

වෙදනානං = දුක් වෙදනාවන්ගේ – අකුශල විපාක වෙදනා වන්ගේ.

---

[1] අ: නි: සත්තකනි: 682 – [2] සං: නි: මහාවග්ග 808

[3] ම: නි: මූලපණ්ණාසක 117

අබ්‍යාපජ්ඣපරමතාය= නිදුක පරම බව පිණිස. යම් පමණෙකින් ඒ සියලු දුක් ප්‍රහීණ වේ ද, එපමණක් පිණිස (**ව්‍යාබාධෙ'ච — ව්‍යාපජ්ඣං = දුක්ඛං, නත්ථි එත්ථ බ්‍යාපජ්ඣංති-අබ්‍යාපජ්ඣං, නිද්දුක්ඛතා.**)

ගිලාන ප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාර ප්‍රත්‍යවෙක්ෂා විධිය සි.

මෙතෙකින් නුවණින් සලකා ප්‍රත්‍යය පරිභොග ලක්ෂණ වූ - **ප්‍රත්‍යයසන්නිඃශ්‍රිත ශීලය** දත යුතු. මෙහි **ප්‍රත්‍යය** නම් චීවරාදි සිව්පස ය. එය **ඇසුරු කෙළේ ප්‍රත්‍යයසන්නිඃශ්‍රිත සි.** (**'යෙ පවිවව=නිස්සාය පරිභුඤ්ජමානා පාණිනො යන්ති=ගච්ඡන්ති=පවත්තන්ති තෙ පවවයා'** යනු පවවය ශබ්දයාගේ නිර්වචන සි.)

ප්‍රත්‍යය සන්නිඃශ්‍රිත ශීලය නිමියේ ය.

මේ සතර සංවර ශීලය කෙසේ සමාදානය කළ යුතු ද

මේ සතර සංවර ශීල අතුරෙන් **ප්‍රාතිමොක්ෂ සංවර ශීලය ශ්‍රද්ධායෙන් සමාදානය කළයුතු.** එයට ශ්‍රද්ධාව මැ සාධක ය. ඒ එසේ මැ සි:- ශික්ෂාපද පැණවීම බුදුනට විනා ශ්‍රාවකයන්ට විෂය නො වේ. (**සැරියුත්** සවාමි ශික්ෂාපද පැණවීමට යාචිඤ්ඤ කළ කල්හි බුදුහු: **"ආගමෙහි තථං සාරිපුත්ත! තථාගතොව තත්ථ කාලං ජානිස්සති"**[1] සි **ශාරීපුත්‍රය!** නො නවතින්න, **තථාගතයෝ** මැ එයට කල් දනිත්'යයි ප්‍රතික්ෂෙප කළ සේක. එබැවින් ශ්‍රාවකයන් විසින් **තථාගතයන්** වහන්සේ පැණ වූ ශික්ෂාපද අඩු වැඩි නො කොටැ **සැදැහැයෙන්** සමාදන් වැ ජීවිතයෙහි දු ආශාව හැරැ පියා මනාවැ රැක්ක යුතු. කියේ මැ සි.

"කිසිව අණඩං චමරීව වාලධිං
පියංව පුත්තං නයනංව එකඛං
තථෙව සීලං අනුරක්ඛමානකා
සුපෙසලා හොථ සදා සගාරවා."

'කිරළ බිජුවට මෙන් ද, සෙමෙර වාලධිය මෙන්ද, මව් පියෝ එක මැ ප්‍රිය පුතු මෙන් ද, එකැස් ඇතියේ ඒ එකැස මෙන් ද ශීලය රක්නාහු ඇමකල්හි බුඩාදීන් කෙරෙහි ගෞරව ඇති වැ මනා වැ ප්‍රියශීලී වව්, යනු භාවයි.

---

[1] පාරා: පා: වෙරඤ්ජකණ්ඩ 9

ඒ සඳහා වදාළ අන්‍ය දෙශනාවක් ද මෙසේ ය.

"එව මෙව බො පහාරාද! යං මයා සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං තං මම සාවකා ජීවිතහෙතු පි නාතික්කමන්ති"[1] "පහාරාදය! මුහුදු වෙරළ ඉක්මැ නො යන්නා සේ මගේ ශ්‍රාවකයෝ මා විසින් පැණවූ ශික්ෂාපද ජීවිතය නිසාවත් ඉක්මැ නොයති' යනු එහි භාවයි. වනයෙහි සොරුන් විසින් **බැඳ තුබූ ස්ථවිරයන්ගේ කථා** මීට නිදර්ශන වශයෙන් දත යුතු.

මහාවත්තනි නම් වනයෙහි දී සොරු එක් තෙර කෙනෙ කුත් දැකැ කලවැලින් බැඳැ දැමූහ. උන්වහන්සේ වැල නො කඩා සත් දවසක් එහි හොත් සැටියේ ම හෙවැ විදර්ශනා භාවනා කරන්නෝ අනාගාමී වැ එහි ම කාලක්‍රියා කොට බඹලොව උපන් සේක.

එසේ මැ **ලක්දිව** සොරමුලෙක් එක් තෙර කෙනෙකුත් රසකිඳ වැලකින් බැඳ දැමූහ උන්වහන්සේ ළැව් ගින්නෙන් වනය දැ වැටෙන කල්හි දු වැල නො කඩා එහි ම හෙවැ භාවනා කරන සේක් ජීවිත සමසීසි වැ පිරිනිවි සේක. (ජීවිත සමසීසි නම් රහත් වූ කෙණෙහි මැ පිරිනිවන්නේ සි.) **දීඝභාණක අභය** තෙරුන්වහන්සේ ඒ දැකැ ශරීරය ආදහන කොටැ ධාතු ගෙන වෛත්‍යයක් කර වූ සේක. එබැවින් අන්‍ය වූ ද සැදැහැවත් කුලදරුවෝ:-

පාමොක් රකින්නේ - සිය දිවි හළ ද එ මැනෝ,
ලෝ ගිම් සඳුන් පැණවූ - සිඟපද නොමැ බිඳින්නේ*

ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය රැක්ක යුතු ආකාරය සි.

ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය ශ්‍රද්ධායෙන් සම්පාදනය කළ යුතු සේ මැ **ඉන්ද්‍රියසංවර ශීලය සිහියෙන් සම්පාදනය කළ යුතු.** එයට සිහිය සාධන ය. සිහියෙන් රැක ගත් ඉන්ද්‍රිය අභිජ්ඣාදි පාප ධර්මයෝ ලුහු නො බඳින්. එ බැවින් **"වරං භික්ඛවෙ තනුනාය අයොසලාකාය ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය චක්ඛුන්ද්‍රියං සම්පලිමට්ඨං, න ත්වෙව චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු**

---

*"පාතිමොක්ඛං විසොධෙත්වා - අපෙපව ජීවිතං ජහෙ,
පඤ්ඤත්තං ලොකනාථෙන - න භින්දෙ සීලසංවරං.

[1] අ: නි: අට්ඨකනිපාත 736

රූපෙසු අනුව්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො"[1] "මහණෙනි, රත් වූ ගිනි ගෙන දිලිහෙන යවුලකින් ඇස මදිනා ලද්දේ මැනව. චක්ෂුරීන්ද්‍රිය රූපයන්හි අනුව්‍යඤ්ජන වශයෙන් නිමිත්ත ග්‍රහණය නො මැනව"– යනාදීන් වදාළ **ආදිත්ත පරියාය දෙශනාව** සිහි–කරමින්, රූපාදි ආරම්මණයන්හි චක්ෂුර්වාරාදියෙහි පැවැති සිත් අභිජ්ඣාදීන් විසින් ලුහුබැඳ යන හැකි නිමිත්ත ග්‍රහණය නො නැසුණු සිහියෙන් වළක්වා ලමින් මේ ඉන්ද්‍රිය සංවර ශීලය මනාකොට **රැක** ගත යුතුයි. ඉදින් ඉන්ද්‍රිය සංවර ශීලය නො රැකුණේ නම් යට දැක්වුණු ප්‍රාතිමොක්ෂ සංවර ශීලය ද වැට නැති ගොයමක් මෙන් නො රැකුණේ වේ. චිරස්ථායී නො වේ. දෙරවිල් හැර දමා තිබෙන ගම සොරුන් විසින් පැහැර ගනු ලබන්නා සේ මෑ ඒ ප්‍රාතිමොක්ෂ සංවර ශීලය එවිට කෙලෙස් සොරුන් විසින් පැහැර ගනු ලැබේ. එ පමණෙක් ද මනාව සෙවෙණි නො කළ ගෙය වැසි දියෙන් මෙන් ඔහුගේ සිත රාගයෙන් තෙමෙන්නේ ය.

වදාළේ මැ සි.

"රූපෙසු සද්දෙසු අථො රසෙසු
ගන්ධෙසු එසෙසු ච රක්ඛ ඉන්ද්‍රියං
එතෙ හි චාරා විවටා අරක්ඛිතා
හනන්ති ගාමංව පරස්සහාරිනො"[2]

"රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ හෙතුවෙන් උපදනා කෙලෙසුන් කෙරෙන් සිත **රැක** ගනු. නො පියූ – නො රැකූ චක්ෂුරාදි ද්වාරයෝ ඒ අසංවරික පුද්ගලයා ගම් පහරන සොරු ගමක් මෙන් විනාශ කරත්" යනු එහි භාවයි.

"යථාගාරං දුච්ඡන්නං – වුට්ඨි සමතිවිජ්ඣති
එවං අභාවිතං චිත්තං – රාගො සමතිවිජ්ඣති"[3]

"වැස්ස මනා වැ සෙවෙණි **නො කළ** ගෙය තෙමන්නා සේ රාගය භාවනා රහිත සිත තෙමන්නේ ය" යනු භාවයි.

මේ ඉන්ද්‍රිය සංවර ශීලය **රැක** ගත් කල්හි වැට සහිත ගොයම මෙන් ප්‍රාතිමොක්ෂ සංවර ශීලය ද රැකුණේ වෙයි. චිරස්ථායී වෙයි. මනා වැ අගුල් ලූ ගම් පහරන සොරුන් විසින් නො පහරනු ලබන්නා සේ මෑ ඒ ප්‍රාතිමොක්ෂ සංවර ශීලය කෙලෙස් සොරුන් විසින් පැහැර ගනු නො ලැබේ. මනා වැ සෙවෙණි කළ ගෙය වැසි දියෙන් නො තෙමෙන්නා සේ ඔහුගේ සිත රාගයෙන් නො තෙමෙන්නේ ය.

---

[1]සං: නි: සළායතනවග්ග 653 [2]සු: නි: අ: වග්ග 131
[3]ධ: ප: යමක වග්ග 2

වදාළේ මෑ යි.

"රූපෙසු සද්දෙසු අථෝ රසෙසු
ගන්ධෙසු ඵොට්ඨබ්බෙසු ච රක්ඛ ඉන්ද්‍රියං
එතෙ හි මාරා පිහිතා සුසංවුතා
න හනන්ති ගාමංව පරිස්සභාරිනෝ."[1]

"රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ හෙතුවෙන් උපදනා කෙලෙසුන් කෙරෙන් සිත රැක ගනු. පියනලද – රක්නා ලද චක්ෂුරාදී ද්වාරයෝ ගම් පහරන සොරු ගමක් මෙන් පැහැරි නොගනිත්" යනු භාවයි.

"යථාගාරං සුච්ඡන්නං – වුට්ඨි න සමතිවිජ්ඣති
එවං සුභාවිතං චිත්තං – රාගො න සමතිවිජ්ඣති"[2]

"වැස්ස මනා වැ සෙවෙණි කළ ගෙය නො තෙමන්නා සේ රාගය භාවනා සහිත සිත නො තෙමන්නේ ය" යනු භාවයි.

සම්මාකාරයෙන් කෙලෙස් නූපදින්නේ යයි මේ වදාළ දෙශනා උතුකාණට දෙශනා ය. **සිත වනාහි වහා පෙරලෙන සුලු ය.** එබැවින් සිත පෙරළීම් වශයෙන් යම් විටෙක රාගය උපන්නේ ද එවිට අසුභ මෙනෙහි කිරීමෙන් ඒ රාගය දුරු කොටැ ගෙන ඉන්ද්‍රිය සංවරය රැක ගත යුතු ය. අලුත පැවිදි වූ **වංගීස** ස්වාමීන් මෙනි.

වංගීස ස්වාමි පැවිදි වූ අලුත **ආනන්ද** ස්ථවිරයන් වහන්සේ සමඟ පිඬු පිණිස වඩින්නේ එක් ස්ත්‍රියක දැක උපන් රාගයෙන් මෙසේ කීවේ ය.

"කාමරාගෙන ඩය්හාමි – චිත්තං මෙ පරිඩය්හති
සාධු නිබ්බාපනං ඵාදිං – අනුකම්පාය ගොතම!"[3]

"මම කාමරාගයෙන් දැවෙමි. මගේ සිත රාගයෙන් දැවේ. ගෞතම පුත්‍රයාණෙනි! එය නිවන උපායක් කරුණාවෙන් වදාළ මැනවි"

ඒ ඇසූ **ආනන්ද** ස්ථවිරයන් වහන්සේ මෙසේ වදාළ සේක.

"සඤ්ඤාය විපරියෙසා – චිත්තං තෙ පරිඩය්හති
නිමිත්තං පරිවජ්ජෙහි – සුභං රාගූපසංහිතං

අසුභාය චිත්තං භාවෙහි – එකග්ගං සුසමාහිතං
සන්තාරෙ පරතො පස්ස – දුක්ඛතො නො ච අත්තතො
නිබ්බාපෙහි මහාරාගං – මා ඩය්හිත්ථො පුනප්පුනං"[3]

---

[1]සු: නි: අට්ඨක ව: 131 [2]ධ: ප: යමකවගග 2
[3]සං: නි: වංගීසසංයුත්ත 117

"විපරීත සංඥාව හෙතු කොට තොපගේ සිත රාගයෙන් දූවේ. රාගොත්පත්තියට හෙතු වූ ශුභාරම්මණය සිතින් දුරු කරනු. අශුභාරම්මණයෙහි එකඟ කොට – සමාහිත කොට සිත වඩනු. සියලු සංස්කාරයන් පර වශයෙන් දුක් වශයෙන් බලනු. ආත්ම වශයෙන් නො බලනු. තොපගේ මහා රාගය නිවාලනු. එයින් නැවත නැවත නො පැලහෙනු" යනු භාවයි.

ඒ ඇසූ **වංගීස** සවාමි රාගය සිතින් දුරු කොට ගෙන මැ පිඬු පිණිස පිවිසියේ ය.

වැළඳූ ඉන්ද්‍රිය සංවරය පුරන්නහු විසින් **කරඬු මහලෙන චිත්තගුත්ත** තෙරුන් මෙන් ද **චොරක මහවෙහෙර මහාමිත්ත** තෙරුන් මෙන් ද විය යුතු.

කරඬුලෙන චිත්තගුත්ත තෙරුන්නාන්සේ

කරඬුලෙන විහාරයෙහි **විපස්සි** ආදි සත් බුදුවරයන්ගේ ගෘහනිෂ්ක්‍රමණ විසිතුරු ලෙස සිතියම් කරා තුබුණේ ය. එක් දවසෙක භික්ෂු සමූහයෙක් විහාර බලමින් වඩනා ගමන් එහි දු ආවෝ ය. ඔවුහු විහාරයෙහි සිතියම් දැක "සවාමීනි සිතියම් සිත්කලු ය"යි ගොස් **චිත්තගුත්ත** තෙරුන්ට කීවෝ ය. "ඇවැත්නි මම සැට වසකටත් පෙර සිට මේ ලෙනෙහි වසම්. එතෙක් මෙතෙක් මෙහි සිතියම් ඇති බවකුත් නො දැන සිටියෙමි. අද ඇස් ඇතියවුන් නිසා ඒ දැන ගතිමි" යි උන්වහන්සේ කී සේක. **චිත්තගුත්ත** සවාමි **කිසි** විටෙක ඇස දල්වා උඩ නො බලන ලද්දේ ය. එතෙක් ද ඒ ලෙන් දොර **මහ නා රුක්කක්** විය. අවුරුදු පතා බිම වැටී තිබෙන මල් රේනු දැක නා ගස පිපියේ වනැ'යි සිතනු විනා උන්වහන්සේ කිසි දවසෙක නා ගස උඩ නො බලන ලද්දේ ය.

මාගම විසූ රජ්ජුරුවෝ උන්වහන්සේගේ ගුණ සම්පත්තිය අසා පැහැදී වැඳ ගන්නා රිසියෙන් තුන් වරෙක පණිවුඩ යැවූහ. උන්වහන්සේ නො වැඩි සේක. එවිට රජතුමා "තෙරුන් වහන්සේ වඩනා තාක් දරුවන්ට කිරි බොන්නට නො දෙමැ"යි ඒ ගම කිරි බොන දරුවන් ඇති ගැහැණුන්ගේ තන පටින් බඳවා මුද්දර තැබුවේ ය. තෙරුන් වහන්සේ ද දරුවන් කෙරෙහි කරුණායෙන් **මාගමට** වැඩි සේක. රජ්ජුරුවෝ තෙරුන් වහන්සේ අන්තඃපුරයට පමුණුවා වැඳ වළඳවා "අද අවකාශ නැත. සෙට සිල් ගනිමි"යි උන්වහන්සේ ගේ පාත්‍රය ගෙන මද තැන් ගොස් දේවිය සමඟ වැඳ නැවතුණහ. තෙරුන් වහන්සේ

රජ්ජුරුවන් වඳනා කල්හි දු දෙව්ය වඳනා කල්හි දු "සුඛී හෝතු මහාරාජා"යි කියති. සතියක් මැ මේ ලෙසින් ගත විය. භික්ෂූහු "ස්වාමීනි! රජ්ජුරුවන් වඳනා කල්හි දු දේවිය වඳනා කල්හි දු කුමක් හෙයින් 'මහරජ සුවපත් වේවා'යි කියන සේක්ද"යි ඇසූහ. "මම් රජ්ජුරුවන් වඳනා බවක් හෝ දේවීන් වඳනා බවක් හෝ නියම නොකරමැ"යි උන්වහන්සේ කී සේක.

රජතුමා තෙරුන් වහන්සේට මෙහි වාසය අපහසු ය' යි කරඬු ලෙනට මැ යැවූයේ ය. උන්වහන්සේ එ දින රෑ සක්මන් මලුවට බටහ. නාග වෘක්ෂාධිගෘහීත දෙවතාවාණෝ දඬුවැට පහන් අල්වා සිට ගත්හ. උන්වහන්සේට කමටහන විසඳ විය – පිරිසිදු වැ වැටහුණේ ය. උන්වහන්සේ ඒ දැනැ ඉතා සතුටු වැ භාවනා කරන සේක් මැදියම ඉක්මෙන්නා ම මුළු වනය උන්නාද කරවමින් රහත් වූ සේක.

වන වඳුරු, නැතිගත් – මුව, බියපත් ළදරු සේ,
අත්වැඩ කැමැති කුලපුත් – සසල නෙත් යුත් නොවනේ;
යට හෙළා ලු ඇසින් – වියදඬු පමණ බලනේ,
වඳුරු ගති යුත් මනසට – වඟ නො මැ වන් කිසිවිට.*

මහාමිත්ත තෙරුන්නාන්සේ.

මහාමිත්ත තෙරුන්නාන්සේගේ මෑණියන්ට විසඟණඩ රෝගයෙක් වැළඳුණේ ය. ඇය ගේ දු ද භික්ෂුකී ශාසනයෙහි පැවිදි වැ වුසුවා ය. මෑණියෝ දුහිතෘ වූ භික්ෂුකීයට අමතා, "ආර්‍යාවනි! යන්න, සහෝදර සවාමීන්ට මගේ රොගය දන්වා සුදුසු බෙහෙතක් ඉල්ලා ගෙන එව" යි කීහ. ඕ ගොස් එ පවත් දැන්වූවා ය. ඒ අසා තෙරුන්නාන්සේ කියනසේක් 'මම බෙහෙත් සාදන්ට නො දනිමි. එසේ වුව ද මම නිට බෙහෙතක් කියමි. මම පැවිදි වූ තෙක් පටන් ලොභ සහගතා සිතින් ඉදුරන් බිඳ විසහාග රූපයක් දිසා නො බැලුයෙමි. "මේ සත්‍ය වචනයෙන් මගේ මෑණියන්ට සුව වේවා' යන මේ කියා උපාසිකාවන්ගේ ශරීරය පිරිමදින්නැ"යි කීහ. භික්ෂුකී එසේ කළා ය. එ කෙණෙහි මැ ගෙඩිය පෙණ පිඬක් මෙන්

මක්කටොව අරඤ්ඤමහි – වනෙ භන්තම්ගො විය,
බාලෝ විය ච උත්‍රසෙත්‍රා – න භවෙ ලොල ලොචනො;

අධෝ ඛීපෙය්‍ය චක්ඛූනි – යුගමත්තදසෝ සියා,
වතම්කකටලොලස්ස – න චිත්තස්ස වසං වජේ.*

වියලී ගියේ ය. මැණියෝ නැගිට "ඉදින් බුදු රජාණන් වහන්සේ අද ජීවමාන සේක් නම් මගේ පුත්‍රයා බදු භික්ෂුවකගේ ශීර්ෂය කුමක් හෙයින් නො පිරිමදිනා සේක්ද"යි ප්‍රීති වචන කීවෝ ය. එබැවින්:—

"'මම කුලපුත්මි' යන-මාන යුත් සෙසු මහණ ද,
මින් නෙරිඳු ලෙස සිවිනේ-ඉඳුරු සංවර සිල්හි."*

ඉන්ද්‍රියසංවර ශීලය රැක්ක යුතු ආකාරයයි.

ඉන්ද්‍රිය සංවර ශීලය සිහියෙන් සම්පාදනය **කළ** යුතුසේ මෑ **ආජීවපාරිශුද්ධි ශීලය වියයීයෙන්** සම්පාදනය කළ යුතු. එයට සාධනය වියයීය යි. **යහපත් වියයීය ඇත්තාහට මිථ්‍යාජීවය දුරු කළ හැකිය.** එ බැවින් නුසුදුසු ලෙස සිවිපස සෙවුම් දුරු කොට යහපත් වූ පිණ්ඩපාතචයයීාදි සෙවුම් වලින් වියයීයෙන් මේ ආජීවපාරිශුද්ධි ශීලය රැක ගත යුතු. **පිරිසිදු ලෙස උපන් ප්‍රත්‍යය මෑ වැළඳිය යුතු. අපිරිසිදු ලෙස උපන් ප්‍රත්‍යය විසඳකාර සඳියන් මෙන් දුරුකළ යුතු** ධුතාඞ්ගධර නො වූ භික්ෂුහට සඞ්ඝයාගෙන් ද, ගණයාගෙන් ද, ධර්මදේශනාදි සවකීය ගුණයෙහි පහන් වූ ගිහීන්ගෙන් ද උපන් ප්‍රත්‍යය පිරිසිදු ලෙස උපන් ප්‍රත්‍යය වේ. පිණ්ඩපාත චයයීාදියෙන් උපන් ප්‍රත්‍යය ඉතා පිරිසිදුලෙස උපන් ප්‍රත්‍යයයි. ධුතාඞ්ගධර භික්ෂු හට පිණ්ඩපාත චයයීාදියෙන් ද, ධුතගුණයෙහි පහන් ගිහීන්ගෙන් ධුතාඞ්ග නියමයට අනුලොම් වසයෙන් ද උපන් ප්‍රත්‍යය පිරිසිදු ලෙස උපන් ප්‍රත්‍යය නම් වේ. වැළි කිය යුත්තෙක් ඇති. ධුතාඞ්ග ධරයකු හට රොගයක් වැළඳුණේ යයි සිතමු. ඔහුගේ ඒ රොග ව්‍යපසමයට පූතිමූත්‍ර පරිභාවිත අරළු හා චතුමධුර ලැබෙන්නේ ය. යමෙක් වනාහි "චතුමධුර සෙසු භික්ෂූහු වළඳත්වා" යි සිතා අරළුව මෑ වළඳ ද එබදු භික්ෂු ධුතාඞ්ග සමාදානයට යොග්‍ය වන්නේ වේ. හෙ තෙමේ මෑ උතුම් ආර්‍යවංශිකයා යි කියනු ලැබේ.

නිමිත්තා, ඔභාසා, පරිකථා, විඤ්ඤත්තිති.

ධුතාඞ්ගධර වේවා, ධුතාඞ්ගධර නො වේවා. ආජීවය පිරිසිදු කරගන්නා භික්ෂු හට චීවර හා පිණ්ඩපාත පිළිබඳ වැ

---

* කුලපුත්තමානී අඤ්ඤසුපි – පබ්බජිත්වාන සාසනෙ,
මිත්තතෙජෙරෝ'ව නිට්ඨෙය්‍ය – වරෙ ඉන්ද්‍රිය සංවරෙ.

නිමිත්ත, ඔභාස, පරිකථා, විඤ්ඤත්ති නො වටනේ ය. සෙනාසන පිළිබඳ වැ (ධුතාඞ්ගධර නො වූ හට) **නිමිත්ත, ඔභාස, පරිකථා** පමණක් වටනේ ය. **විඤ්ඤත්ති** නො වටනේ ය.

නිමිත්ත—(භික්ෂු කෙනෙක් ගිහියන් එනු දැකැ) සෙනාසනයක් කරනු සඳහා භූමි පරිකර්මාදිය කරයි. ඔව්හු අවුත් "ස්වාමීන් වහන්සේ මේ කුමක් කරන සේක් ද මේ කරදෙන්නේ කවරෙක් දැ" යි විචාරත්. භික්ෂු "එබන්දෙක් නැතැ" යි කියයි (ඒ අසා ගිහියෝ එය අපි කර දෙමු යයි කරා දෙත්.) මේ හෝ මේ බඳු අනෙක් විධි හෝ **නිමිත්ත** යයි දත යුතු.

ඔභාස—භික්ෂු තමෙක් උපාසකයන් ගෙන් "උපාසකවරුනි! යුෂ්මත්හු කොහි වසන්නහු දැ" යි විචාරයි. එවිට ඔව්හු "අපි ප්‍රාසාදයන්හි වසමු" යයි කියති. එවිට භික්ෂු "හැයි උපාසකවරුනි! භික්ෂූන්ට ප්‍රාසාද නුසුදුසු දැ"යි විචාරයි. මේ හෝ මේ බඳු අනෙක් විධි හෝ **ඔභාස** යයි දත යුතු.

පරිකථා—(භික්ෂු තමෙක් උපාසකවරුන් දැකැ) "භික්ෂු සඞ්ඝයාට සෙනස්න සම්බාධය" යි කියයි. මේ හෝ මේ බඳු අනෙක් ක්‍රම හෝ **පරිකථා** යයි දත යුතු.

(මේ නිමිත්ත, ඔභාස, පරිකථාවන්ගෙන් නිපන් සෙනාසන අකැප නොවේ. එයින් නිපන් චීවර පිණ්ඩපාත අකැප වේ. විඤ්ඤත්තියෙන් නිපන් චීවර පිණ්ඩපාත සෙනාසන යන ප්‍රත්‍යය තුන මැ අකැප වේ.

විඤ්ඤත්ති කම්, නොනැ නොපැවරුවත් ගෙන් ඉල්ලීමය.

බෙහෙත් පිළිබඳ වැ වනාහි නිමිත්ත, ඔභාස, පරිකථා, විඤ්ඤත්ති යන සියල්ල වටනේ ය. එහෙත් රෝගය සන්සිඳුණු කල්හි එසේ ලද් දෙය වැළඳීම නො වටනේ ය. මෙහි ලා **විනයධරයෝ** "ඒ වැළඳීමට බුදුන් අවසර දුන් හෙයින් වටනේය" යි ද **සුත්‍රාන්තිකයෝ** "එය වැළඳීමෙන් ඇවැත් නො වුවත් ආජීවය කොප්‍ය වන බැවින් නො වටනේ ය" යි ද කියත්.

යමෙක් වනාහි **මහ සැරියුත් ස්වාමීන්** මෙන් යට දැක්වූණු සේ බුදුන් වහන්සේගෙන් අවසර ඇතත් ජීවිත විනාශයක් ලං වූ කල්හි දු කිසි ප්‍රත්‍යයක් පිළිබඳ වැ නිමිත්ත, ඔභාස, පරිකථා, විඤ්ඤත්ති නො කරන්නේ ලදදෙයෙකින් යැපේ ද හෙතෙම **"පරමසල්ලේඛවුත්තී"**= "අතිශයයෙන් කෙලෙස් නසන පැවතුම් ඇත්තේ" යයි කියනු ලැබේ.

ශාරිපුත්‍ර සඞ්ඝාමීන් වහන්සේ.

එක් කලෙක **සැරියුත්** සඞ්ඝ්‍රාම විවෙක සැප වඩන්නේ **මුගලන්** තෙරුන් සමඟ එක්තරා අරණ්‍යයෙක විසූවේ ය. එහි දී එක් දවසෙක උන්වහන්සේට උදරවාතාබාධයෙක්-(බඩරුජාවෙක්) විය. බලවත් වේදනා උපන්නේ ය. **මුගලන්** තෙරුන්නාන්සේ සවස එහි උපස්ථානයට ගිය සේක් එපවත් දැනැ "වෙනදා මේඛන්දක් සැදුණු කල කෙසේ සුව කරා ගත් සේක් දැ" යි විචාළහ. "මට ගිහි කාලයේ ද මේ ආබාධය සැදෙන්නේ ය. එවිට මැණියෝ ගිතෙල් මී සකුරු යොදා පැන් නුමුසු කිරිබතක් සාදා දෙති. එය වැළඳූ කල සුව වන්නේය" යි **සැරියුත්** සඞ්ඝ්‍රාම කිය. "හොඳ! එසේ වේවා. අපට හෝ ඔබ වහන්සේට හෝ පින් ඇත් නම් හෙට එබදු ආහාරයක් ලබන්-නෙමි"යි **මුගලන්** සඞ්ඝ්‍රාම කීයේ ය. දෙදෙනා වහන්සේ ගේ මේ කථාව අසා උන් සක්මන් කෙළවර වෘක්ෂයෙහි අධිගෘහීත වූ දෙවතාවාණෝ "හෙට **සැරියුත්** සඞ්ඝාමීන් වහන්සේට පිණ්ඩපාත දානය උපදවන්නෙමි" යි එකෙණෙහි මැ තෙරුන්නාන්සේගේ උපස්ථායක කුලයට ගොස් ඔහුගේ වැඩිමහලු පුතුට ආවෙශ වැ පීඩා ඉපදවූහ. පිළියම් පිණිස රැස් වූ නැයන්ට "ඉදින් හෙට **සැරියුත්** සඞ්ඝාමීන්ට කිරිබත් පූදන්නහු නම් මොහු හැරෙ යමි" යි ද කිහ. ඔවුහු "නොප නොකිවද අපි නිතර ඒ සඞ්ඝාමීන් වහන්සේට භික්ෂා දෙන්නෙමු" යි කියා දෙවන දිනයෙහි එබදු වූ මැ කිරිබත් පිළියෙල කළහ.

මුගලන් සඞ්ඝ්‍රාම උදැසන මැ ගොස් "මම පිණ්ඩපාතයේ යමි. එන තාක් වැඩ සිටින්නැ" යි කියා ගමට වැඩියේ ය. මිනිස්සු පැන අවුත් උන්වහන්සේගේ පාත්‍රය ගෙනැ කිරි බත් පුරවා දුන්හ. ආපසු වඩනට සූදානම් වූ කල "වැඩහිඳැ වළඳන්න සඞ්ඝාමීනි! පසු වැ තවත් දෙන්නෙමු" යි කියා උන්වහන්සේ වළඳවාලා පසු වැ කිරිබත් පාත්‍රය පුරා දුන්නෝ ය. "තෙරුන්වහන්සේ එය ගෙන ගොස් **සැරියුත්** සඞ්ඝාමීන්ට "වළඳනු මැනවැ"යි පිළිගැන්වූහ. **සැරියුත්** සඞ්ඝ්‍රාම ඒ දැකැ "මේ කිරිබත ඉතා හොඳය, කෙසේ ලැබුනේ දැ"යි බලන්නේ ලත් සැටි දැකැ "අහක දමන්න ආයුෂ්මත්නි! මේ වළඳන්නට නුසුදුසු ය" යි වදාළේ ය. "මා වැන්නකු ගෙනා පිණ්ඩපාතය ද මුන්වහන්සේ නොවළඳති"යි **මුගලන්** තෙරුන්නාන්සේ චිත්ත මාත්‍රයකු දු නුපදවා ඒ එක වචනයෙන් මැ පාත්‍රය මුවවිටෙහි

ගෙනැ එහි තුබූ කිරිබත එකත්පසෙක හළ සේක. එකෙණහි මැ උන්වහන්සේ ගේ ආබාධය අතුරුදහන් විය. එතැන් පටන් පන්සාළිස් වස මුළුල්ලෙහි ඒ රොගය නැවත නො උපන්නේ ය.

ඉක්බිති **සැරියුත්** සවාමි **මුගලන්** තෙරුන් අමතා **"ආයුෂ්මත්නි! අතුණු නික්මැ බිම වැතිරී ගිය ද වාග් විඤ්ඤත්තියෙන් නිපන් ආහාරය වළඳන්නට නුසුදුසුය"** යි වදාරා මෙසේ උදන් ඇණීය.

1. **"වචීවිඤ්ඤත්ති විපජ්ජාරා - උපපන්නං මඤ්ඤ පායසං**
   සචෙ භුඤ්ජා භවෙයාහං - ඝාජීවෝ ගරහිතෝ මම.
2. **යදිපි මෙ අන්නභූතං - නික්ඛමිත්වා ඛගී චරෙ,**
   නෙව භිඤ්ඤෙය්‍යමාජීවං - චජමානෝ'පි ජීවිතං.
3. **ආරාධෙමි සඤ්ඤං චිත්තං - විවජෙජමි අනෙසනං,**
   නාහං බුද්ධපතිකුට්ඨං - කාහාමි අනෙසනං."

1. "වාග් විඥප්ති පැවැත්මෙන් නිපන් කිරිබත ඉදින් මම් වැළඳුයෙමි නම් මගේ ආජීවය ගර්හිත වන්නේ ය.
2. ඉදින් මගේ අතුනු පිටත නික්මියේ නමුදු, දිවි හරනේ නමුදු මම මගේ ආජීවය නො බිඳින්නෙමි.
3. මම මගේ සිත වසඟ කරමි. අයුතු අන්වේෂණ-(ප්‍රත්‍යය) දුරැ කරමි. බුද්ධගර්හිත වූ අන්වේෂණයක්-(ප්‍රත්‍යය සෙවීමක්) කිසි විටෙක නො කරන්නෙමි" යනු එහි භාවයි.

විවරභුම්බක වාසි **අම්බඛාදක මහාතිස්ස** තෙරුන්ගේ කථාව ද මෙහි ලා දෘෂ්ටාන්ත වශයෙන් දැක්විය යුතු. මෙසේ සම්ප්‍රකාරයෙන් මැ—

සැදැහැයෙන් පැවිදි වූ-නැණැති යති අනෙසන වළ්,
සිතකුදු නො මැ උපදවා-දිවි පිරිසිදු කරන්නේ.*

ආජීවපාරිසුද්ධි සීලය රැකගත යුතු ආකාරය යි.

ආජීවපාරිසුද්ධිසීලය වීර්‍යයෙන් සම්පාදනය කළ යුතු සේ මැ **ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලය ප්‍රඥයෙන්** සම්පාදනය කළ යුතු. එයට සාධනය ප්‍රඥා ය. ප්‍රඥයා මැ ප්‍රත්‍යයයන්හි ආදීනව

---

* "අනෙසනාය චිත්තම්පි-අජනෙත්වා විචක්ඛණෝ,
ආජීවං පරිසොධෙය්‍ය-සඩ්ඪා පබ්බජිතෝ යති."

හා ආනිසංස දක්නට සමර්ථ ය. එබැවින් ප්‍රත්‍යයගෙඩය-(ප්‍රත්‍යයාශාව) හැරපියා දැහැමින් සෙමෙන් උපන් ප්‍රත්‍යය ඝට දැක්වුණු පරිදි **ප්‍රත්‍යවෙක්ෂා කොටැ වළඳමින්** ඒ පච්චය සන්නිසිතසීලය රැක ගත යුතුයි.

ප්‍රත්‍යවෙක්ෂා වනාහි ප්‍රත්‍යය ලත් කල කරනු ලබන ප්‍රත්‍යවෙක්ෂාය, ප්‍රත්‍යය පරිභොග කරන කල කරනු ලබන ප්‍රත්‍යවෙක්ෂාය යි දෙවිධ වේ. ලත් මොහොතෙහි ධාතු වශයෙන් හෝ පිළිකුල් වශයෙන් හෝ ප්‍රත්‍යවෙක්ෂා කොටැ තබනලද, විවරාදිය, එසින් මතු ඒ ඒ ප්‍රත්‍යයට නියම ප්‍රත්‍යවෙක්ෂා කොට වළඳන්නහුගේ පරිභොගය නිරවද්‍ය මැ පරිභොගය යි. ලත් මොහොතෙහි ප්‍රත්‍යවෙක්ෂා නො කළ ද පරිභොග කරන කල ප්‍රත්‍යවෙක්ෂා කරන්නහුගේ පරිභොගය ද නිරවද්‍ය යි.

පරිභොග කරන කල කරනු ලබන ප්‍රත්‍යවෙක්ෂාව පිළිබඳ විනිශ්චය මෙසේ දත යුතු.

චතුර්විධ පරිභොග

පරිභොග වනාහි:- **1. ථෙය්‍යපරිභොගය, 2. ඉණ පරිභොගය, 3. දායජ්ජපරිභොගය, 4. සාම්පරිභොගය** යි චතුර්විධ වේ.

1. ථෙය්‍යපරිභොගය.

දුශ්ශීලයා සඟ මැද හිඳැ ගෙනැ වළඳන්නේ නමුදු ඔහු ගේ පරිභොගය **ථෙය්‍යපරිභොග** යි. (බුදුන් විසින් සිල්වත්නට අනුදත් බැවිනු දු දායකයනු දු "සිල්වත් හට දෙම්හ"යි දෙන බැවිනු දු සිල්වතුන් අයති පසය දුශ්ශීලයා සඟ මැද හිඳැ වළඳතු දු ඔහුගෙ පරිභොගය ථෙය්‍යපරිභොග නම්") යනු **පරාක්‍රම බාහු රාජ සන්නයි.** (ථෙය්‍යපරිභොග නම් හොරා කෑම ය.)

2. ඉණපරිභොගය.

තෙමේ ශීලවත් වුව ද ප්‍රත්‍යවෙක්ෂා නො කොටැ වළඳන්නේ නම් ඔහුගේ පරිභොග **ඉණපරිභොග** යි. (ඉණපරිභොග නම් ණය කෑම ය.) එබැවින් සිවුරු (කයෙන් පහකොටැ **හඳනා පොරෝනා සියලු විටෙක මැ ප්‍රත්‍යවෙක්ෂා කළ යුතු. දානය වළඳන විට පිඬක් පිඬක් පාසා ප්‍රත්‍යවෙක්ෂා කළ යුතු.** එසේ නො කී නම් පෙරවරු, පස්වරු, පෙරයම, මැදියම, පසුයම

ප්‍රත්‍යවෙක්ෂා කළ යුතු ඉදින් එසේ ප්‍රත්‍යවෙක්ෂා **කරා** නො ගෙනැ සිවියදී මැ අරුණු නැංගේ නම් **ඉණ**පරිභොගයට අසුවුණේ වේ. සෙනාසන ද පරිභොග **කරන-කරන** විටෙක මැ ප්‍රත්‍යවෙක්ෂා **කළ** යුතු. බෙහෙත් වතාහි පිළිගන්නා **කල්හි** දු පරිභොග **කරන කල්හි** දු ප්‍රත්‍යවෙක්ෂා කළ යුතු. පිළිගන්නා **කල** ප්‍රත්‍ය-වෙක්ෂා කළ ද ඉදින් පරිභොග **කරන කල** ප්‍රත්‍යවෙක්ෂා **නො කෙළේ** නම් ආපත්ති වේ. පිළිගන්නා **කළ** ප්‍රත්‍යවෙක්ෂා නො කළ ද පරිභොග කාලයෙහි ප්‍රත්‍යවෙක්ෂා **කෙළේ** නම් ඇවැත් නො වේ. (මෙහි ලා සතර වැදූරුම් සුඛිය දතයුතු.)

චතුර්විධ ශුඛිය.

1. දෙශනා සුඛිය, 2. සංවර සුඛිය, 3. පරියෙට්ඨි සුඛිය, 4. පච්චවෙක්ඛණ සුඛිය යි සුඛි සතර වැදූරුම් වේ.

1. ඇවැත් දෙසා ගැනීමෙන් පිරිසිදු වන බැවින් ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය **දෙශනා ශුඛිය** යි කියනු ලැබේ. (පවිති ආදිය ඇවැත් **දෙසීම් මාත්‍රයෙන් ද සංඝාදිසෙස** සහ මැද දෙසා **පරිවාස, මානත්, අබ්භාන** ගැනීමෙන් ද පිරිසිදු වේ. **පාරාජිකා-පත්ති** මේ කවරකිනු දු **පිරිසිදු නො වේ.**

2. (හදිසියේ ඉඳුරන් බිඳුණු **කල**) නැවැත මෙබන්දක් **නො කරමැයි** චිත්තාධිෂ්ඨාන සංවරයෙන් පිරිසිදු **වන** බැවින් ඉන්ද්‍රියසංවරශීලය **සංවර සුඛිය** යි කියනු ලැබේ.

3. එක්විසි අන්වෙෂණයෙන් තොර වැ දූහැමින් සෙමෙන් ප්‍රත්‍යය උපදවන්නහුගේ ආජීවය **පයෙෂණ** විධියෙන් ශුඛ වන බැවින් ආජීවපාරිසුඛි සීලය **පරියෙෂ්ඨිසුඛිය** යි කියනු ලැබේ. (පරියෙට්ඨි **නම්** සෙවීම්. සෙවීමෙන් **ලැබෙන** සුඛි පරියෙට්ඨි සුඛි.)

4. යට දැක්වුණු ප්‍රත්‍යවෙක්ෂා විධියෙන් ශුඛි වන බැවින් ප්‍රත්‍යයසන්නිශ්‍රිත ශීලය **පච්චවෙක්ඛණ සුඛිය** යි කියනු ලැබේ.

"පිළිගන්නා කල ප්‍රත්‍යවේක්ෂා නො කළ ද පරිභොග **කාලයෙහි** ප්‍රත්‍යවෙක්ෂා **කෙළේ** නම් ඇවැත් නො වේ" යයි **කියන** ලද්දේ මේ නිසා ය.

3. දායජ්ජපරිභොගය.

සපත්න ශෛක්ෂයන්ගේ සිවිපස පරිභොගය **දායජ්ජපරි-භොගය** යි. සපත්න **ශෛක්ෂයෝ** වනාහි **බුදුන්ගේ** පුත්‍රයෝ ය. ඔවුහු බුදු පියාණන් සතු වූ සිවිපසයට දායාදයෝ වැ

වළඳන්නෝ ය. මෙහි ඇසිය යුත්තෙක් ඇති. ඔවුන් වළඳනු ලබන්නේ **බුදුන්ගේ** සිව්පසය ද ගිහින්ගේ සිව්පසය ද, ගිහින්ගේ සිව්පසය වුව ද ඔවුනට **බුදුන්** විසින් අනුදත් බැවින් එය **බුදුන්** සතු මෑ ය. එබැවින් **බුදුන්ගේ** සිව්පසය වළඳනු ලැබේ ය සි කියයුතු. **"ධම්මදායාදා මෙ භික්ඛවෙ සවථ මා ආමිසදායාදා"**[1] "මහණෙනි! මගේ ධර්මයට දායාදයෝ වව්. ආමිසයට දායාදයෝ නො වව්." යනාදීන් වදාළ **ධම්මදායාද සූත්‍රය** මීට සාධක වේ.

4. සාම්පරිභොගය.

රහතන්ගේ සිව්පස පරිභොගය **සාම්පරිභොගය සි.** රහත්හු වනාහි තෘෂ්ණාවට දැස වන සුවභාවය ඉක්මවූවෝ ය. එබැවින් උන්වහන්සේලා සිව්පසයට සාමියෝ ය. ("අවීතරාගයන්ට වනාහි තෘෂ්ණා පරවශ බැවින් ප්‍රත්‍යය පරිභෝගයෙහි සාමි බවෙක් නැති. වීතරාගයන්ට එහි සාමි භාවය රැවි වූ පරිද්දෙන් ප්‍රත්‍යය පරිභෝග සද්භාවයෙනෑ සි දත යුතු. එහෙයින් මෑ ඔහු ප්‍රතිකූලය අප්‍රතිකූලාකාරයෙන් ද, අප්‍රතිකූලය ප්‍රතිකූලාකාරයෙන් ද, එමෑ දෙක හැර උපෙක්ෂාකාරයෙනු දු ප්‍රත්‍යය පරිභෝග කෙරෙත්නු සි දත යුතු" යනු **පරාක්‍රමබාහු සන්න සි.**)

මේ දැක්වුණු චතුර්ධ පරිභෝගයන් අතුරෙන් සාම්පරිභෝගය හා දායජ්ජපරිභෝගය සියල්ලන්ට මෑ වටනේ ය. ඉණපරිභෝගය කිසිවෙකුට ද නොවටනේ ය. චෙය්‍යපරිභෝගය ගැනෑ කියනු කිම?

ඉදින් පෘථග්ජන සීලවන්තයෙක් ප්‍රත්‍යවෙක්ෂා කොටෑ සිව්පස පරිභෝග කෙරේ නම්, ඔහුගේ පරිභෝගය කවර පරිභෝගයෙක් ද, එය **ඉණ** පරිභෝගයට ප්‍රතිපක්ෂ බැවින් **ආනණ්‍ය පරිභෝගය** වේ. එබදු සීලවන්තයා ශෛක්ෂ සඛ්‍යායෙහි ඇතුළත් වන බැවින් **දායජ්ජ පරිභෝගය** හෝ වේ. හෙද වනාහි "මේ ශික්ෂායෙන් යුකත හෙයින් ශෛක්ෂය"සි කිය යුතු.

මේ චතුර්ධ පරිභෝගයන් අතුරෙන් සාම්පරිභෝගය මෑ අග්‍ර ය. එබැවින් ඒ සාම්පරිභෝගය ප්‍රාර්ථනා කරන නිසැඟු විසින් යට දැක්වුණු ප්‍රත්‍යවෙක්ෂා විධියෙන් පස්විකා වළඳමින් පච්චය සන්නිස්සිත සීලය සම්පාදනය කළ යුතු. එසේ කරනුයේ මෑ **ඛාදනයකාරී** වන්නේ සි.

---

[1]ම: නි: මූලපණ්ණාසක 13

වදාළේ මෑ යි.

"පිණ්ඩං විහාරං සයනාසනඤ්ච
ආපඤ්ච සංඝාවිරජ්ජුපවාහනං,
සුඤ්ඤා ධම්මං සුගතෙන දෙසිතං
සඛ්ඛාය සෙවෙ වරපඤ්ඤසාවකො"[1]

"බුඛශ්‍රාවක වූ භික්ෂු තෙමේ ඒ බුදුන් විසින් වදාළ **"පටිසංඛා යොනිසො චීවරං පටිසෙවෙති"** යනාදි ධර්මය අසා පිණ්ඩපාතය ද, විහාර, සෙනාසන, හා සිවුරු රජස් දුරු කරන ජලය ද **"යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය"** යනාදීන් ප්‍රත්‍යවෙක්ෂා කොට පරිභොග කරන්නේ ය. (මෙ ගාථායෙහි සිව්පසය මෑ ඇතුළත් ය. **'සංඝාටි'** යන්නෙන් චීවර ද, **'පිණ්ඩ'** යන්නෙන් පිණ්ඩපාත ද, **'විහාරසෙනාසන'** යන්නෙන් සෙනාසන ද, **'ආප'** යන්නෙන් ගිලානප්‍රත්‍යය ද ගෙ බැවිනි.)

තස්මාහිපිණ්ඩ සයනාසනෙ ච
ආපෙච සංඝාවිරජ්ජුපවාහනෙ,
එතෙසු ධම්මෙසු අනුපලිත්තො
භික්ඛු යථා පොක්ඛරෙ වාරිබින්දු."[1]

'යම් හෙයකින් ප්‍රත්‍යවෙක්ෂා කොටැ පරිභොග කරන්නේ ද එහෙයින් ඒ භික්ෂු පිණ්ඩපාත, සයනාසන, චීවර, රජස් දුරු කරන ජල යන මේ සිව්පසයෙහි පියුම් පතෙහි දිය බින්දු මෙන් නො ඇලෙන්නේ ය.

"කාලෙන ලද්ධා පරතො අනුග්ගහා
ඛජ්ජෙසු භොජ්ජෙසු ච සායනෙසු,
මත්තං ස ඤඤ්ඤ සතතං උපට්ඨිතො
වණස්ස ආලෙපනරූහණෙ යථා"[1]

'සුදුසු කාලයෙහි මෙරමාගෙන් අනුග්‍රහයෙන් ලත් ඛාද්‍ය භොජ්‍යයෙහි හා පැණි ආදි සායනීයයෙහි නිතර එළඹ සිටි සිහි ඇති ඒ භික්ෂු තෙමේ වණයට බෙහෙත් එලීමෙහි මෙන් පමණ දන්නේ ය' (යම් සේ ව්‍රණයෙහි බෙහෙත් එලන්නේ පමණ දැන එලා ද එසේ ආහාරය ද පමණ දැනැ වළඳන්නේ ය යූ සේයි.)

"ඛණනාරෙ පුත්තමංසංව – අක්ඛස්සබ්භඤ්ජනං යථා,
එවං ආහරි ආහාරං – යාපනත්ථාය'මුච්ඡිතො"[2]

කාන්තාරයෙහි පුත්‍ර මාංශ සේ, අක්ෂයෙහි තෙල් ලීම සේ තෘෂ්ණායෙන් අමූර්ච්ඡිත වැ යැපෙන පමණට අහර ගන්නේ ය'

[1]සු: නි: 51 [2]සු: නි: 52

මේ ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය පරිපූර්ණ කළ බැවිනි භාග්‍යවතුන් වහන්සේ **භාගිනෙය්‍ය සඞ්ඝරක්ඛිත** සාමණේරයන් වහන්සේගේ කථාව දක්විය යුතු. උන්වහන්සේ මැනවින් පස්විකා වැළඳූ සේක. (උන්වහන්සේගේ උදාන ගාථාවන්ගෙන් එය දක්ක හැකි ය. ඒ මෙසේ යි.)

"උපජ්ඣායෝ මං ඣාපයමානං-සාලිකූරං සුනිබ්බුතං
මා හෙව තවං සාමණේර!-ජීවහං ඣාපෙසි අසඤ්ඤතෝ.

උපජ්ඣායස්ස වචෝ සුත්වා-සංවේගමලභිං තදා,
එකාසනෙ නිසීදිත්වා-අරහත්තං අපාපුණිං.

සොහං පරිපුණ්ණ සංඝපේසා-වන්දෙ, පණාමරහි යථා,
සබ්බාසව පරික්ඛීණෝ-නත්ථි දානි පුනබ්භවෝ."

'එක් දවසෙක්හි මගේ උපාධ්‍යායයන් වහන්සේ ඉතා නිවුණු හැල්සාලේ බත් වළඳන මා අමතා, "සාමණේරය! අසංයත වැ වළඳා දිව පුළුස්සා නො ගනු" යි කී සේක.

එදා මම උපාධ්‍යායයන් වහන්සේගේ වචනය අසා සංවේගයට පැමිණියෙමි. කෙතෙක් සංවේගයට පැමිණියෙම් ද, ඒ ආසන යෙහි මැ හිඳ විවසුන් වඩා රහත් වීමි.

ඒ මම පුනුරුස් සඳ සේ පරිපූර්ණ මනොරථ ඇත්තෙමි. මගේ සියලු ආශ්‍රව ක්ෂය විණි. දැන් මට පුනරුත්පත්ති නැත,

"සෙසු මහණ ද මෙලෙස-බවදුක් දුරු කටැවියේ,
නුවණින් පස්විකා-සතරපස වළඳන්නේ"*

ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය සම්පාදනය කළ යුතු විධියයි.

සතර සංවර ශීල විභාගය නිමියේ ය.

චතුර්විධ ශීල විභාගය යි.

පඤ්චවිධ ශීල පිළිබඳ ප්‍රථම පඤ්චකයෙහි අවි අනුප සම්පන්න සීලාදි වශයෙන් දත යුතු.

---

* තස්මා අඤ්ඤම්පි දුක්ඛස්ස-පත්ථයනෙනා පරික්ඛයං,
යොනිසෝ පච්චවෙක්ඛිත්වා-පටිසෙවේථ පච්චයෙ.

ප්‍රථම පඤ්චකය.

1. පරියන්ත පාරිසුද්ධි, 2. අපරියන්ත පාරිසුද්ධි,
3. පරිපුණ්ණ පාරිසුද්ධි, 4. අපරාමට්ඨ පාරිසුද්ධි,
5. පටිප්පස්සද්ධි පාරිසුද්ධි සීල.

1. අනුපසම්පන්නයන්ගේ සීල ගණන් වශයෙන් මෙතෙකැ යි කෙළවර සහිත බැවින් **පරියන්ත පාරිසුද්ධි සීල** නම් වේ වදුලේ මැ සි:- **පටිසම්භිදායෙහි "කතමං පරියන්ත පාරිසුද්ධි සීලං? අනුපසම්පන්නානං පරියන්ත සික්ඛාපදානං ඉදං පරියන්ත පාරිසුද්ධි සීලං."**[1] සි 'පරියන්ත පාරිසුද්ධි සීලය කවරේ ද අනුපසම්පන්නයන්ගේ - සීමාසහිත ශික්ෂාපද ඇතියවුන්ගේ යම් ශීලයෙක් වේ ද, එය පරියන්ත පාරිසුද්ධි සීල නම් වේ, යනු භාවයි.

2. උපසම්පන්නයන්ගේ ශීල මෙතෙකැ යි කෙළවරක් නැති බැවින් **අපරියන්ත පාරිසුද්ධි සීල** නම් වේ.

වදුලේ මැ සි:- **පටිසම්භිදායෙහි "කතමං අපරියන්ත පාරිසුද්ධි සීලං? උපසම්පන්නානං අපරියන්ත සික්ඛාපදානං ඉදං අපරියන්ත පාරිසුද්ධි සීලං."**[1] සි. 'අපරියන්ත පාරිසුද්ධි සීලය කවරේ ද උපසම්පන්නයන්ගේ - සීමාරහිත ශික්ෂාපද ඇතියවුන්ගේ යම් ශීලයෙක් වේ ද එය අපරියන්ත පාරිසුද්ධි සීල නම් වේ' යනු භාවයි.

මෙහි ඇසිය යුත්තෙක් ඇති.

"නවකොටි සහස්සානි-අසීතිං සතකොටියෝ
පඤ්ඤාසං සතසහස්සානි-ඡතතිංසා ච පුනාපරෙ
එතෙ සංවරවිනයා-සම්බුද්ධෙන පකාසිතා
පෙය්‍යාලමුඛෙන නිද්දිට්ඨා-සික්ඛා විනයසංවරෙ"[2]

යනු කී හෙයින් උපසම්පන්න සීල මෙතෙකැ යි පර්‍යන්ත සහිත නො වේ ද කුමක් හෙයින් අපරියන්තය යි මෙහි දක්වන ලද්දේ ද ගණන් වශයෙන් එසේ පර්‍යන්ත සහිත වුව ද, නිරවශෙෂ වශයෙන් සමාදන් වන බව හා ලාභ, යස, සඳනි, අඩග, ජීවිත වශයෙන් පර්‍යන්ත රහිත බව ද සඳහා එසේ අපරියන්ත පාරිසුද්ධිය යි කී නියා දත යුතු.

(නව කෙළ දහස් එකසිය අසූ කොටි පනස් ලක්ෂ සතිසෙක් **විනය** පිටකයෙහි විස්තර වශයෙන් දක්වන ලද සංවර විනය සංඛ්‍යාත ශික්ෂාවෝ බුදුන් වහන්සේ විසින් වදාරන ලදහ යනු ගාථාවන්හි භාවයයි.)

---

[1] පටි: ම: සුත්තන්තට්ඨ 41
[2] සා: පකාසිනී 142

මේ අපරියන්ත පාරිසුද්ධි සීලයට **චීවරගුම්බකවාසි අම්බඛාදක මහාතිස්ස** තෙරුන්ගේ ශීලය සාධක කළ යුතු.

උන්වහන්සේ:-

"ධනං චජේ යො පන අඞ්ගහෙතු
අඞ්ගං චජේ ජීවිතං රක්ඛමානෝ
අඞ්ගං ධනං ජීවිතං චාපි සබ්බං
චජේ නරෝ ධම්ම මනුස්සරන්තෝ."

යන මහාපුරුෂ චින්තාව සිහිකරමින් ජීවිතශංසයෙහි වූ ශික්ෂාපද ව්‍යතික්‍රමණය නො කොටැ ඒ අපරියන්ත පාරිසුද්ධි සීලය මැ නිසා උපාසකයෙකුගේ පිට උඩ නංවා ගෙන යනු ලබන සේක් රහත් බවට පැමිණියහ.

(භක්‍ෂාපාදදි ශරීරාඞ්ග හෙතුයෙන් ධනය දෙන්නේ ය. ජීවිතය රක්නේ ශරීරාඞ්ග දෙන්නේ ය. ධර්මය සිහිකරන්නේ අඞ්ග ධන ජීවිත යන සියල්ල දෙන්නේ ය යනු ගාථාවේ භාවය සි.)

අම්බඛාදක මහාතිස්ස තෙරුන්වහන්සේ.

ලක්දිව චීවර ගුම්බකවාසි අම්බඛාදක මහාතිස්ස නම් සථවිර කෙනෙක් වූහ. උන්වහන්සේ එක් දුර්භික්ෂ කාලයෙක දීඝ මාගීයෙක වඩනා සේක් පිඬු පිණිස එක් ගමකට පිවිසි සේක. එහි දී උන්වහන්සේට භික්ෂාව නො ලැබුණේ ය. **කලාන්ත** වූ උන්වහන්සේ ඵලිත වූ එක් අඹ ගසක් යට සිහිල් සෙවනේ වැහිර හොත් සේක. වැටී තුබුණු අඹ පිළිගන්නට කෙනෙක් නො වූ හෙයින් වළඳන්නට අවකාශ නැත. නො පිළිගත් දේ වැළඳීම ආපත්තිකර බැවිනි.

මේ වේලායෙහි එක් උපාසකයෙක් එහි පැමිණ, **එසේ කලාන්ත** වැ වැටී හොත් තෙරුන්වහන්සේ දැකැ අඹ පැන් මිරිකා පෙවුයේ ය. එයිනු දු උන්වහන්සේ සුවපත් නො වූහ. **ඉක්බිති උපාසකයාණෝ** උන්වහන්සේ පිට උඩ නංවාගෙන සිය ගමට ගෙනැ ගියහ. අතරමඟ දී උන්වහන්සේ සිහිසන් ලැබැ තමහට මැ අවවාද දෙන සේක්.

"න පිතා නපි තෙ මාතා-න ඤාති නපි බන්ධවෝ,
කාරෙතෙතාදිසං කිච්චං-සීලවන්තස්ස කාරණා."

'මේ තගේ පියා ද නො වේ. මව් ද නො වේ. නෑ ද නො වේ. බන්ධු ද නො වේ. සීලවන් බව හෙතු කොට ගෙනැ මැ මේසා කෘත්‍යයක් කෙරේ' යයි සිතා එහි මැ යම්න් විදර්‍ශනා වඩා රහත් වූහ.

කියන ලද මැ සි.

"සංවෙගං ජනයිත්වාන-සම්මසිත්වාන යොනියෝ,
තස්ස පිට්ඨිගතෝ සත්තා-අරහත්තං අපාපුණි."

'සංවෙග උපදවා නුවණින් සනමශීනය කොටැ ඔහුගේ පිට උඩ යන්නේ මැ රහත් බවට පැමිණියේ ය, යනු භාවයි.

3. **කල්‍යාණ** පෘථග්ජනයන්ගේ යම් ශීලයෙක් ඔප නැඟූ දැ රඟ මිණි රුවනක් මෙන්, මනා වැ පිරියම් කළ සවණියක් මෙන් උපසම්පදයෙහි පටන් ඉතා පිරිසිදු ද, අකුසලයක් කරනු තබා සිතනු පමණ මලයකිනුදු විරහිත ද, රහත් බවට මැ කාරණ වේ ද ඒ එබඳු ශීලය **පරිපුණ්ණපාරිසුද්ධි සීලය** යි කියනු ලැබේ.

වදාළේ මැ යි:- **පටිසම්භිදායෙහි:- "කතමං පරිපුණ්ණ පාරිසුද්ධිසීලං? පුථුජ්ජන කල්‍යාණකානං කුසලධම්මෙ යුත්තානං සෙක්ඛ පරියත්තෙන පරිපූර කාරීනං කායෙ ච ජීවිතෙ ච අනපෙක්ඛානං පරිච්චත්ත-ජීවිතානං ඉදං පරිපුණ්ණ පාරිසුද්ධි සීලං"**[1] 'පරිපුණ්ණ පාරිසුද්ධි සීලය කවරේ ද කල්‍යාණ පෘථග්ජනයන්ගේ විදර්ශීනාචාරයෙහි යෙදී ගත් – සෙඛපරියත්තයෙහි පරපූරකාරී විශෙෂාධිගමයෙහි විතා කාය ජීවිත දෙක්හි අපෙක්ෂා රහිත – ඒ පිණිස මැ හළ ජීවිත ඇතියවුන්ගේ යම් ශීලයෙක් වේද එය **පරිපුණ්ණපාරිසුද්ධි සීල** නම් වේ, යනු භාව යි. ("කාමරූප පරිච්ඡේදයෙහි පටන් කුශල ධර්‍ම සමාදානයෙහි හෝ පටන් ගොත්‍රභුව දක්වා ප්‍රවෘත්ත කුශල ධර්‍ම ප්‍රබන්ධය ශෛක්ෂධර්‍මයෙහි පැහැර සිටි හෙයින් සෙඛපරියත්ත නම්. නොහොත් ශෛක්ෂ ධර්‍මයන් පශ්චිමාන්ත කොටැ ඇති වූ ශෛක්ෂකලාප වූ ලෞකික ත්‍රිවිධ ශික්ෂාවෝ සෙඛපරියත්ත නම් වෙත්" යනු **පැරකුම්බා සන්න** යි.)

මහාසඞ්ඝරක්ඛිත, භාගිනෙය්‍ය සඞ්ඝරක්ඛිත තෙරවරුන්ගේ සීල මෙහි ලා සාධක කළ යුතු යි.

මහාසඞ්ඝරක්ඛිත තෙරුන්වහන්සේ.

සැටවස් ඉක් මැ ගිය **මහාසඞ්ඝරක්ඛිත** සථවිරයන් වහන්සේ අවසාන කාලයෙහි මරණ මඤ්චකයෙහි හොත් සේක. භික්‍ෂු සඞ්ඝයා "ඔබවහන්සේ අධිගත ලොකොත්තර ධර්‍ම ඇති සේක් දැ" යි උන්වහන්සේගෙන් විවාළහ. "මට ලොකොත්තර ධර්‍ම නැතැ"යි උන්වහන්සේ පිළිතුරු දුන් සේක. ඒ ඇසූ උන්වහන්සේ ගේ උපස්ථායක ළදරු භික්‍ෂු කියන්නේ, 'සවාමීනි! නුඹවහන්සේ

[1] පටි: ම: ඤාණකථා 41

පිරිනිවී සේකැ'යි භාත්පස දෙලොස් යොත්තෙක මහාජනයා රැස්වූ හ. නුඹවහන්සේ ගේ පෘථග්ජන කාලක්‍රියායෙන් මහත් විපිළිසරයෙක් වන්නේ ය" යි කීයේ ය. "ඇවැත්නි! මම මෙතෙක් බුදුන් දැක්කැටියෙන් විදශීනා නො වැඩුයෙමි. එසේ නම් මා වඩා හිඳුවා අවකාශයක් දෙව්" යයි උන්වහන්සේ කීසේක. උපස්ථායක භික්ෂු උන්වහන්සේ වඩා හිඳුවා පිටත නික්මුණේ ය. නික්මෙන්නා මැ තෙරුන්වහන්සේ රහත් බවට පැමිණ අසුරු ගැසීමෙන් සංඥා කළ සේක. සංඝයා එහි රැස් වැ "සවාමීනි මේ සා මරණ මොහොතෙහි ලොකොත්තර ගුණ ඉපදවීමෙහි ඔබ වහන්සේ දුෂ්කරයක් කළ සේකැ"යි කීහ. "ඇවැත්නි! දුෂ්කර නම් මා මේ ඇසිල්ලෙහි රහත් වීම නො වේ. මම තොපට මා කළ දුෂ්කරය කියන්නෙමි. ඇවැත්නි! මම පැවිදි වූ කාලයෙහි පටන් මතක නැති වැ – නො දැනැ කළ දෙයක් සිහි නොකරමි. දුෂ්කර නම් ඒය" යි කී සේක.

භාගිනෙය්‍ය සංඝරක්ඛිත තෙරුන්වහන්සේ.

උන්වහන්සේගේ බැණෑණු වූ **සංඝරක්ඛිත** තෙරුන් වහන්සේ ද පණස් වස් කාලයෙහි එසේ මැ රහත් වූහු.

"අප්පස්සුතොපි වෙ හොති – සීලෙසු අසමාහිතෝ
උභයෙන නං ගරහන්ති – සීලතො ච සුතෙන ච."[1]

'යමෙක් ඉදින් අල්පශ්‍රැත ද – හෙවත් උගත් ධර්‍ම නැත්තේ ද, ශීලයෙහි දු මනා කොටැ නො පිහිටියේ ද ඔහුට ශීලයෙන් ද, ශ්‍රැතයෙන් ද යන දෙකින් මැ විඥයෝ ගර්‍හා කෙරෙත්.'

"අප්පස්සුතොපි වෙ හොති – සීලෙසු සුසමාහිතෝ;
සීලතෝ නං පසංසන්ති – නාස්ස සම්පජ්ජතෙ සුතං."[1]

'ඉදින් යමෙක් අල්පශ්‍රැත ද, ශීලයෙහි මනා වැ පිහිටියේ ද විඥයෝ ඔහුට ශීලයෙන් පසසත්. ශ්‍රැතයෙන් ඔහුට ප්‍රශංසාවෙක් නැත්.'

"බහුස්සුතොපි වෙ හොති – සීලෙසු අසමාහිතෝ;
සීලතෝ නං ගරහන්ති – නාස්ස සම්පජ්ජතෙ සුතං."[1]

'ඉදින් යමෙක් බහුශ්‍රැත ද, හෙවත් ඇසූ පිරූ බොහෝ ධර්‍ම ඇත්තේ ද, සීලයෙහි මනා වැ නො පිහිටියේ ද ඔහුට විඥයෝ ශීලයෙන් ගරහත්. ඔහුගේ ශ්‍රැතය ද තමහට හෝ අන්‍යයන්ට හෝ සැප නො එළවයි.

---

[1]අ: නි: චතුක්කනිපාත 190

"බහුස්සුතොපි වෙ හොති - සීලෙසු සුසමාහිතෝ;
උභයෙන නං පසංසන්ති - සීලතෝ ච සුතෙනව"

'ඉදින් යමෙක් බහුශ්‍රැත ද, ශීලයෙහි දු මනා වැ පිහිටියේ ද ඔහුට විඥයෝ ශීලයෙන් ද, ශ්‍රැතයෙන් ද යන දෙකින් ම පසසිත්.

බහුස්සුතං ධම්මධරං - සප්පඤ්ඤං බුද්ධසාවකං,
නෙක්ඛං ජම්බොනදස්සෙව - කෝ තං නින්දිතුමරහති
දෙවාපි නං පසංසන්ති - බ්‍රහ්මුනා පි පසංසිතෝ.[1]

'බහුශ්‍රැත වූ ධර්මධර වූ ප්‍රඥාසම්පන්න ඒ බුද්ධ ශ්‍රාවකයාට ජාම්බෝනද නම් රන් නිෂ්කකට මෙන් කවරෙක් නින්ද කරන්නට සමර්ථ ද, දෙවියෝ ද ඔහුට ප්‍රශංසා කරති. හෙතෙමේ බ්‍රහ්මයා විසිනුදු පසස්නා ලද්දේ වෙයි.

4. **ශෛක්ෂයන්ගේ** ශීලය දෘෂ්ටි වශයෙන් පරාමර්ශනය නො කරන ලද බැවින් **අපරාමට්ඨ පාරිශුද්ධිසීලය** යි කියනු ලැබේ.

පටිසම්භිදායෙහි:- "කතමං අපරාමට්ඨ පාරිසුද්ධිසීලං? සත්තන්නං සෙක්ඛානං ඉදං අපරාමට්ඨ පාරිසුද්ධිසීලං"[2]
'අපරාමට්ඨ පාරිසුද්ධි සීලය කවරේ ද සප්තශෛක්ෂයන්ගේ යම් ශීලයෙක් වේ ද එය අපරාමට්ඨ පාරිසුද්ධි සීල නම් වේ ය" යි ඇත.

පෘථග්ජනයන්ගේ හෝ භව වශයෙන් අපරාමට්ඨ සීලය **අපරාමට්ඨ පාරිසුද්ධි සීලය** යි දත යුතුයි.

කුටුම්බිය පුත්තනිස්ස තෙරුන්ගේ සීලය මෙනි.

කුටුම්බිය පුත්තනිස්ස තෙරුන්වහන්සේ.

සැවැත් නුවර **නිස්ස** නම් කෙළෙඹි පුත්‍රයෙක් සතළිස් කෙළක් ධනය හැරපියා පැවිදි වැ අරණ්‍යයෙහි විසි ය. උන්වහන්සේගේ සහෝදරයාගේ භාර්‍යාව උන්වහන්සේ මරනු සඳහා සොරුන් මෙහෙයුවා ය. සොරු ගොස් උන්වහන්සේ පිරිවරා ගත්හ. "තොපි කුමට අවුදැ" යි විචාරා "නුඹ වහන්සේ මරනු සඳහාය" යි කී කල්හි "කුමක් පිණිස දැ" යි අසා "ධනය සඳහාය"යි කී කල්හි "ඇපයක් ගෙන අද එක රැයට මා නොමරා හරනු හැකි දැ" යි ඇසූ සේක. "නුඹ වහන්සේට මේහි ඇප වන්නේ කවරෙක් දැ" යි ඔවුහු කීවෝ ය. තෙරුන්වහන්සේ මහත් ගලක් ගෙන තමන්වහන්සේගේ උගුරු ඇට බිඳ ගෙනැ "මේ ඇපය මඳ දැ" යි විවාළ සේක. සොරු නිසැක වැ සක්මන්

[1]අ: නි: චතුක්කනිපාත 190 [2]පටි: ම: ඤාණකථා 41

කෙළවර හිනිමැල ගසාගෙන හොත්ත. තෙරුන්වහන්සේ ඉවසීමෙන් වෙදනාව මැඩැ පවත්වා සවකීය පරිශුඛ ශීලය ප්‍රත්‍ය වෙක්ෂා කරනසේක් ප්‍රීති ප්‍රමොද්‍යය උපදවා විදශීනා වඩා අරුණෝදගමයෙහි රහත් බවට පැමිණිසේක. එබඳු ශීලය නිසා රහත් බවට පැමිණෙන්නට කැමැති සේක් තමා මරනු සඳහා පැමිණි වෛරීන්ට මෙසේ කීසේක.

"උහෝ පාදුනි හිඤ්ඡිඩා - සංයමිස්සාමි වෝ අහං,
අච්චියාමි හරායාමි - සරාගමරණං අහං."

"මම දෙපා බිඳැ ගෙනැ මද කලක් මා හරින්නට ගිවිස්වමි. මම මගේ සරාගමරණයට පිළිකුල් කරමි' ලජ්ජා කරමි' යනු ගාථාවේ භාවය යි.

තවද එක්තරා **මහතෙර කෙනෙක්** ඉතා ගිලන් වැ සියතින් අහර වළඳන්නට පවා අසමර්ථ වැ සිය මලමූයෙහි මැ ඔබ මොබ පෙරලෙන්නේ ය. ඒ දුටු ළදරු භික්ෂු තමෙක් "ඛෙදයෙනි! ජීවිතසංඛ්කාර දුක්ඛ"යි කීහ. එවිට මහතෙරුන් වහන්සේ ඇවැත්නි! මම දැන් මැරෙන්නෙමි සවශී සැප ලබමි' මට එහි සැකයෙක් නැත. එතකු දු වුවත් මේ ශීලය බිඳැ ගෙන ලබන සැප තමි ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය කොටැ ලබන නිහි බව බදුය"යි කියා "ශීලය සමඟ මැ මැරෙන්නෙමි"යි එහි මැ හොත් සේක් ඒ රොගය මැ සම්මශීනය කරමින් රහත් බවට පැමිණැ මෙසේ ප්‍රකාශ කළ සේක.

"පූටඞ්ගස්ස මෙ අඤ්ඤතරෙන ව්‍යාධිනා
රොගෙන බාළ්හං දුඛිතස්ස රූපතො,
පරිසුස්සති ඛිප්පමිදං කළෙබරං
පුපඵං යථා පංසුනි ආතපෙ කතං

අජඤ්ඤං ජඤ්ඤසංඛාතං - අසුචිං සුචිසම්මතං
නානාකුණපපරිපූරං - ජඤ්ඤරූපං අපස්සතො.

ධිරත්ථු මං ආතුරං පූතිකායං
දුගඝඤ්ඡියං අසුචිං ව්‍යාධි ධම්මං,
යත්ථප්පමත්තා අභිමුච්ඡිතා පජා
හාපෙන්ති මඝඤ්ච සුගතූපපත්තියා"

'එක්තරා ව්‍යාධියෙකින් වැටුණු වෙදනාව කරණ කොටැ අතිශයින් දුඃඛිත වූ විකාරයට පත් මාගේ මේ ශරීරය හිරු රැසින් තැවුණු - පස්හි ලූ මලක් මෙන් හාන්පසින් වියලෙන්නේ ය.

අමනොඥවූ අඥානයන් විසින් මනොඥය සි ගන්නා ලද, අපිරිසිදුවූ පිරිසිදුයයි සම්මත නොයෙක් කුණපයෙන් පිරුණු, නුවණැසින් නොබලන්නා හට මනොඥ රූපයක් සේ වැටහෙන—

ආතුර වූ, දුගන්ධ වූ, අසුචි වූ, ව්‍යාධි සභාව වූ මේ පූතිකායට නිදහු වේවා. (තවත් කෙබදු වූ පූතිකායකට ද යත්?) යම් පූතිකායයෙක්හි රාග වශයෙන් ප්‍රමාදයට පැමිණි විශෙෂයෙන් මුසපත් වූ, සත්‍වයෝ සවගෝතපතතියට හෙතු වූ මාර්ගය, (ශීලය) පිරිහෙළා ගනිත් ද, එබඳු පූතිකායට නිදහු වේවා" යනු ගාථාවන්ගේ භාවය සි.

5. **රහතන්ගේ පසේබුදුන්ගේ සම්මාසම්බුදුන්ගේ** ශීලය සියලු කෙලෙස් විඛා සංසිදීමෙන් පිරිසිදු වන බැවින් **පවිපස්සඬි පාරිසුද්ධි සීලය** සි කියනු ලැබේ.

වදාළේ මැ සි:- **පවිසම්භිදායෙහි: කතමං පවිපස්සඬි පාරිසුද්ධි සීලං? තථාගතසාවකානං බීණාසවානං පවෙකබුද්ධානං තථාගතානං අරහතානං සම්මාසම්බුද්ධානං ඉදං පවිපස්සඬි පාරිසුද්ධි සීලං"**[1] සි අට සුගම සි.

ප්‍රථම පඤ්චකය නිමියේ ය.

ද්විතීය පඤ්චකය.

---

1. පහාණ, 2. වෙරමණී, 3. වෙතනා, 4. සංවර, 5. අවීතික්කම සීල. 2.

1. "හිරි ඔත්තප්ප කරුණා අලොභාදි ප්‍රධාන වූ යම් කුශල චිත්තොත්පාදයෙකින් ප්‍රාණඝාත ප්‍රහාණය කරනු ලැබේ ද ඒ ප්‍රාණඝාත ප්‍රහාණය ශීලතාඒයෙන් **ප්‍රහාණ ශීල** නම් වේ." අදින්නාදානාදිය පිළිබඳ වැ ද මෙසේ ය. මෙහි වනාහි **ප්‍රහාණය** යි ප්‍රාණඝාතාදිය නොකරා හැරීම විනා (අමුතු) විශෙෂ ධර්මයෙක් නැත. ප්‍රාණඝාතාදිය නො කරා හැරීම ඒ ඒ කුශල ධර්මයන්ට පිහිටවන අඒයෙන් **උපධාරණ** වෙයි. (ඒ එසේ මැ සි:- ප්‍රාණඝාත ප්‍රහාණය මෛත්‍රී ආදි කුශල ධර්මයන්ට ප්‍රතිඝාය. අදත්තාදාන ප්‍රහාණය ත්‍යාගාදි කුශල ධර්මයන්ට ප්‍රතිඝායි.) ප්‍රාණඝාතාදිය කිරීම චිත්තසන්තානයාගේ කම්පනයට හේතු වේ. ඒ නොකිරීම් එසේ චිත්ත කම්පනය නොකරන හෙයින් **සමාධාන** නම් වෙයි. මෙසේ හෙයින් යට දැක්වුණු උපධාරණ - සමාධාන සංඛ්‍යාත ශීලතාඒයෙන් **ප්‍රහාණය ශීලය** සි කියන ලද බැව් සැලකිය යුතුයි.

---

[1]පටි: ම: ඛුද්දකථා 41 [2]පටි: ම: ඛුද්දකථා 44

2. එසේ මෑ ප්‍රාණඝාතාදියෙන් වැළැක්ම **වෙරමණ්** **සීල** නම් වේ.

3. ප්‍රාණඝාතාදියට ප්‍රතිපක්ෂ වූ වෙතනාව **චෙතනා** **සීල** නම් වේ.

4. ප්‍රාණඝාතාදියෙන් සංවර වීම — ප්‍රාණඝාතාදිය සිඳ වියහැකි මාගී වසාලීම **සංවරසීල** නම් වේ.

5. ප්‍රාණඝාතාදීන්ගේ අව්‍යතික්‍රමණය — සමාදන් වැ ගත් ශික්ෂාපද බිඳ නොලීම **අවීතික්කම** **සීල** නම් වේ. උපධාරණ-සමාධාන සංඛ්‍යාත ශීලනාමයෙන් මේ විරමණ, වෙතනා, සංවර, අවීතික්කම ද සීල වන සැටි යට කී නයෙන් දත යුතුයි.

මේ පහාණාදි පඤ්චවිධ සීලය **පටිසම්භිදායෙහි**[1] විස්තාර කරන ලදී. එහි සංක්ෂිප්ත භාවය මෙසේ ය.

"පාණාතිපාත පහාණය **පහාණ** **සීලය** යි. පාණාතිපාත විරමණය **වෙරමණ්** **සීලය** යි. පාණාතිපාතයට විරුඬ වූ චෙතනාව **චෙතනා** **සීලය** යි. පාණාතිපාත සංවරණය **සංවර** **සීලය** යි පාණාතිපාත අව්‍යතික්‍රමය **අවීතික්කම** **සීලය** යි.

අදින්නාදාන, කාමේසුමිච්ඡාචාර, මුසාවාද, පිසුණාවාචා ඵරුසවාචා, සම්ඵප්පලාප, අභිජ්ඣා, ව්‍යාපාද, මිච්ඡාදිට්ඨි යන මොවුන් පිළිබඳ පහාණ, විරමණ, වෙතනා, සංවර, අවීතික්කම පහාණාදි සීල යි.

තෙකඛම්මයෙන් කාමච්ඡන්දයාගේ ද, අව්‍යාපාදයෙන් ව්‍යාපාද-යාගේ ද, ආලොකසඤ්ඤායෙන් ථිනමිද්ධයාගේ ද, අවික්ඛේපයෙන් උද්ධච්චයාගේ ද, ධම්මවවත්ථානයෙන් විචිකිච්ඡාවගේ ද, ඤාණයෙන් අවිජ්ජාවගේ ද, පාමොජ්ජයෙන් අරතියගේ ද, ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන්ගේ ද, දුතියජ්ඣානයෙන් විතකී-විචාරයන්ගේ ද, තතියජ්ඣානයෙන් ප්‍රීතියගේ ද, චතුත්ථජ්ඣානයෙන් සුඛ-දුක්ඛයන්-ගේ ද, ආකාසානඤ්චායතන සමාපත්තියෙන් රූපසඤ්ඤා පටිඝ-සඤ්ඤා නානත්ත සඤ්ඤාවන්ගේ ද, විඤ්ඤාණඤ්චායතන සමාපත්ති-යෙන් ආකාසානඤ්චායතන සඤ්ඤාවගේ ද, ආකිඤ්චඤ්ඤායතන-සමාපත්තියෙන් විඤ්ඤාණඤ්චායතන සඤ්ඤාවගේ ද, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියෙන් ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤාව-ගේ ද, අනිච්චානුපස්සනායෙන් නිච්චසඤ්ඤාවගේ ද, දුක්ඛානු-

[1] පටි: ම: ඤාණකථා 45

පස්සනායෙන් සුඛසඤ්ඤුවගේ ද, **අනත්තානුපස්සනායෙන්** අත්තසඤ්ඤුවගේ ද, **නිබ්බිදානුපස්සනායෙන්** නන්දියගේ ද, **විරාගානුපස්සනායෙන්** රාගයාගේ ද, **නිරෝධානු පස්සනායෙන්** තෘෂ්ණාවගේ ද, **පටිනිස්සග්ගානුපස්සනායෙන්** ආදානයාගේ ද, **ඛයානුපස්සනායෙන්** ඝනසඤ්ඤුවගේ ද, **වයානුපස්සනායෙන්** ආයූහනයාගේ ද, **විපරිනාමානුපස්සනායෙන්** ධ්‍රුවසඤ්ඤුවගේ ද, **අනිමිත්තානුපස්සනායෙන්** නිමිත්තයාගේ ද, **අප්පණිහිතානුපස්සනා-යෙන්** පණිධියගේ ද, **සුඤ්ඤතානුපස්සනායෙන්** අභිනිවෙසයාගේ ද, **අධිපඤ්ඤාධම්මවිපස්සනායෙන්** සාරාදානාභිනිවෙසයාගේ ද, **යථා-භූතඤාණ දස්සනයෙන්** සම්මොහාභිනිවෙසයාගේ ද, **ආදීනවානු-පස්සනායෙන්** ආලයාභිනිවෙසයාගේ ද, **පටිසඞ්ඛාධම්මානුපස්සනා යෙන්** අප්පටිසඞ්ඛාවගේ ද, **විවට්ටානුපස්සනායෙන්** සංයෝගාභි-නිවෙසයාගේ ද, **සෝතාපත්තිමග්ගයෙන්** දෘෂ්ටිය හා සහජ වශයෙන් එක් වැ සිටි **කෙලෙසයන්ගේ** ද, **සකදාගාම්මග්ගයෙන්** ඕලාරික-**කෙලෙසයන්ගේ ද, අනාගාම් මාර්ගයෙන්** අණුසහගත **කෙලෙස-යන්ගේ** ද, **අර්හත් මාර්ගයෙන් සකල කෙලෙසයන්ගේ** ද **ප්‍රහාණය පහාණ සීලය** යි. **විරමණය වෙරමණී සීලය** යි. **චෙතනාව චෙතනා සීලය** යි. **සංවරණය සංවර සීලය** යි. **අව්‍යතික්‍රමය අවීතික්කම සීලය** යි.

මෙබඳු සිල් චිත්තයාගේ **අවිප්පටිසාරය** (විපිළිසර නො වන බව) පිණිස වන්නේ ය. **අවිප්පටිසාරය ප්‍රමොදය** පිණිස වන්නේ ය. **ප්‍රමොදය ප්‍රීතිය** පිණිස වන්නේ ය. **ප්‍රීතිය පස්සද්ධිය** (සංසිඳීම) **පිණිස** වන්නේ ය. **පස්සද්ධිය සොමනස්සය** පිණිස වන්නේ ය. **සොමනස්සය සමාධි ආසෙවනය** පිණිස — **සමාධි** වැඩිය පිණිස — **සමාධි** නැවත වැඩීම පිණිස — **සඞ්ඛාරයාදි නිමිත්තනි** පිණිස — **සමාධි පරිෂ්කාර** පිණිස — **සමාධි පරිවාර පිණිස** — **සමාධි පරිපූරණ** පිණිස වන්නේ ය. **එකාන්ත නිබ්බිදය** පිණිස — **විරාගය** පිණිස — **නිරෝධය** පිණිස — **ව්‍යුපසමය** පිණිස — **අනිඤ්ඤ** පිණිස — **සම්බෝධ** පිණිස — **නිබ්බාන පිණිස** වන්නේ යි.[1] (විස්තර කරන්නේ නොත් ඉතා අධික වෙයින් සංක්ෂෙප කරන ලදී.)

ශීලය පඤ්චකය නිමියේ ය.

සීල නම් කිම? කවර අර්ථයෙකින් "සීල" යයි කියනු ලැබේ ද? **සීලයාගේ ලක්ෂණ**, රස පච්චුපට්ඨාන, පදට්ඨාන කවරහු ද? **සීලයෙහි ආනිසංස කිම්?** ශීලය කීවැදෑරුම් ද? යන ප්‍රශ්න විසඳ **නිම කරන ලද්දේ යි.**

---

[1] පටි: ම: **සඤ්ඤාකථා** 44-45

සීලය කිලිටි වන්නේ කෙසේ ද සීලය පිරිසිදු වන්නේ කෙසේ ද? යන ප්‍රශ්න දැන් විසඳනු ලැබේ.

ශීලය ඛණ්ඩවීමෙන්, ඡිද්‍ර වීමෙන්, සබල වීමෙන්, කල්මාෂ වීමෙන් කිලිටි වේ. අඛණ්ඩ, අවඡිද්‍ර, අසබල, කල්මාෂයෙන් පිරිසිදු වේ.

ශීලය ඛණ්ඩ, ඡිද්‍ර, සබල, කල්මාෂ වන්නේ කවර හෙතුවලින් ද ලාභ, යස, ඤාති, අඩිග, ජීවිත අපෙක්ෂා කොට සීල සමාදානයෙන් හා සප්තවිධ මේථුන සංයෝගයෙන් ද යන මෙසිනි.

ඒ එසේ මැ සි:-

සප්තාපත්තිසඤ්ඤියන් අතුරෙන් යම් ආපත්තිසඤ්ඤියෙක ආදියෙහි හෝ අන්තයෙහි හෝ ශික්ෂාපදයෙක් යමකු විසින් බිඳැපියන ලද්දේ ද, ඔහුගේ ශීලය කෙළවර කැඩී ගිය වස්ත්‍රයක් මෙන් වූයේ **ඛණ්ඩශීල** නම් වේ. සප්තාපත්තිසඤ්ඤියන් අතුරෙන් යම් ආපත්තිසඤ්ඤියෙක මධ්‍යයෙහි ශික්ෂාපදයෙක් යමකු විසින් බිඳැපියන ලද්දේ ද, ඔහුගේ ශීලය මැද සිදුරු වූ වස්ත්‍රයක් මෙන් වූයේ **ඡිද්‍රශීල** නම් වේ. සප්තාපත්තිසඤ්ඤියන් අතුරෙන් යම් ආපත්තිසඤ්ඤියෙක පිළිවෙළින් ශික්ෂාපද දෙකක්-තුනක් යමකු විසින් බිඳැපියන ලද්දේ ද, ඔහුගේ ශීලය පිට හෝ කුස හෝ නැගි කලු රතු ආදි විසභාග වණ්ණයෙන් යුත් (කබර) දෙනක මෙන් වූයේ **සබල** - (කබර) **ශීල** නම් වේ. සප්තාපත්තිසඤ්ඤියන් අතුරෙන් යම් ආපත්තිසඤ්ඤියෙක අතර-අතර ශික්ෂාපද යමකු විසින් බිඳැපියන ලද්දේ ද, ඔහුගේ ශීලය අතර-අතර විසභාග පැහැ ඇති තිත් දෙනක් මෙන් වූයේ **කල්මාෂ ශීල** නම් වේ. මෙසේ ශීලය ඛණ්ඩාදි වන්නේ ලාභාදි හෙතුයෙන් ගත් ශීලය ඒ ලාභාදිය ලත් කල බිඳැ ලීමෙනි. (සප්තාපත්තිසඤ්ඤි නම්: **පාරාජික, සඞ්ඝාදිසෙස, ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදෙසනිය, දුක්කට, දුබ්භාසිත** යන මේ සි.

සප්තවිධ මේථුන සංයෝගයෙහු දු ශීලය ඛණ්ඩ, ඡිද්‍ර, සබල, කල්මාෂ වන බව ඉට කියන ලදී ඒ සඳහා **බුදුරජාණන්** වහන්සේ වදාළ **සූත්‍රය** මෙසේ ය.

1. "ඉධ බ්‍රාහ්මණ එකච්චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා සම්මා බ්‍රහ්මචාරී පටිජානමානෝ තහෙව බෝ මාතුගාමෙන සද්ධිං මයං මයසමාපත්තිං සමාපජ්ජති, අපිච බෝ මාතුගාමස්ස උච්ඡාදනං නහාපනං සම්බාහනං සාදියති,

සෝ තදස්සාදෙති, තනනිකාමෙති, තෙන ච චිත්තං ආපජ්ජති, ඉදම්පි බෝ බ්‍රාහ්මණ බ්‍රහ්මචරියස්ස බණ්ඩම්පි ජීදම්පි සබලම්පි කම්මාසම්පි. අයං වුච්චති බ්‍රාහ්මණ අපරිසුද්ධං බ්‍රහ්මචරියං චරති, සංයුත්තෝ මෙථුනෙන සංයොගෙන. න පරිමුච්චති ජාතියා ජරා මරණෙනා...පෙ...න පරිමුච්චති දුක්ඛස්මා ති වදාමි.

2. පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා...පෙ...න පි-සාදියති. අපි ච බෝ මාතුගාමෙන සද්ධිං සඤ්ජග්ඝති, සංකීලති, සංඵෙළායති, සෝ තදස්සාදෙති-වදාමි.

3. පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා...පෙ...න-සංඵෙළායති. අපි ච බෝ මාතුගාමස්ස චක්ඛුනා චක්ඛුං උපනිජ්ඣායති. පෙක්ඛති — සෝ — වදාමි.

4. පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා...පෙ...න-පෙක්ඛති. අපි ච බෝ මාතුගාමස්ස සද්දං සුණාති තිරොකුඩ්ඩා වා තිරොපාකාරා වා හසන්තියා වා භණන්තියා වා ගායන්තියා වා රොදන්තියා වා සෝ-වදාමි.

5. පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා...පෙ...න-රොදන්තියා වා අපිච බෝ යානිස්ස තානි පුබ්බෙ මාතුගාමෙන සද්ධිං හසිත ලපිත කීළිතානි, තානි අනුස්සරති. සෝ තදස්සා දෙති...පෙ... වදාමි.

6. පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා...පෙ...න-අනුස්සරති. අපි ච බෝ පස්සති ගහපතිං වා ගහපතිපුත්තං වා පඤ්චහි කාමගුණෙහි සමප්පිතං සමඞ්ගීභූතං පරිචාරයමානං. සෝ තදස්සාදෙති. ...පෙ...වදාමි.

7. පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චෝ සමණෝ වා. බ්‍රාහ්මණෝ වා...පෙ...න-පරිචාරයමානං අපි ච බෝ අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති. ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවෝ වා භවිස්සාමි දෙවඤ්ඤතරෝ වා ති. සෝ තදස්සා දෙති...පෙ...ඉදං පි බ්‍රාහ්මණ බ්‍රහ්මචරියස්ස බණ්ඩම්පි ජීදම්පි සබලම්පි කම්මාසම්පිති"[1]

[1] අ: නි: සත්තකනිපාත 651

මෙහි සංක්ෂිප්ත භාවය මෙසේ යි.

සප්තඅෙමථුනය

1. බ්‍රාහ්මණය! මේ ලොකයෙහි ඇතැම් මහණ බමුණු කෙනෙක් තුමූ සම්‍යක් බ්‍රහ්මචාරී යයි ප්‍රතිඥ කරන්නෝ මාගම්-(සත්‍රීන්) හා සමඟ මෙවුන්දම් සෙවනය නො කරති. එතකු දු වුවත් මාගම් විසින් කරනු ලබන ඇඟ ඉලීම්, නැහැවීම්, අත් පා මැඩීම් ඉවසති. ආස්වාදනය කරති. කැමැති වෙති. සතුටු වෙත්. බ්‍රාහ්මණය! මේ වනාහි බ්‍රහ්ම චර්‍යාවට ඛණ්ඩ ද, ඡිද්‍ර ද, සබල ද, කල්මාෂ ද වේ. බ්‍රාහ්මණය! ඔවුන් මෛථුන සංයොගයෙන් යුක්ත වෑ අපිරිසිදු බ්‍රහ්මචර්‍යායෙහි හැසිරෙතියි කිය යුතු. ඔවුන් ජාති ජරා මරණාදියෙන් - දුකින් නොමිදෙන්නාහ සි කියමි

2. බ්‍රාහ්මණය! වැළි දු මේ ලොකයෙහි ඇතැම් මහණ බමුණු කෙනෙක් එසේ මාගම් සමඟ මෙවුන්දම් නො සෙවති. ඔවුන් විසින් කරනු ලබන ඇඟ ඉලීම් ආදිය ද නො ඉවසති. එතකු දු වුවත් ඔවුන් සමඟ කෙලෙස් වශයෙන් සිතාසෙති. සෙල්ලම් කරති. මමත්වය කරත්. බ්‍රාහ්මණය! මේ ද වනාහි බ්‍රහ්මචර්‍යාවට ඛණ්ඩ ද, ඡිද්‍ර ද, සබල ද. කල්මාෂ ද වන්නේ ය.

3. බ්‍රාහ්මණය! වැළි දු මේ ලොකයෙහි ඇතැම් මහණ බමුණු කෙනෙක් එසේ මාගම් සමඟ මෙවුන්දම් සෙවුම්, ඇඟ ඉලුම් ඉවසීම්, සිතාසීම් නො කෙරෙති. එතකුදු වුවත් මාගමුන් ඇසින් ඇස පැහැර බලති. බ්‍රාහ්මණය! මේ ද වනාහි බ්‍රහ්මචර්‍යාවට ඛණ්ඩ ද, ඡිද්‍ර ද, සබල ද, කල්මාෂ ද වන්නේ ය.

4. බ්‍රාහ්මණය! වැළි දු මේ ලොකයෙහි ඇතැම් මහණ බමුණු කෙනෙක් එසේ මාගම් සමඟ මෙවුන්දම් සෙවුම්, ඇඟ ඉලුම් ඉවසීම්, සිතාසීම්, ඇසින් ඇස පැහැර බැලීම් නො කරති. එතකු දු වුවත් භිත්තියෙන් ප්‍රාකාරයෙන් පිටත සිටෑ සිතාසෙන - කථා කරන - ගායනා කරන - හඬන - මාගමගේ ශබ්දය අසත්. බ්‍රාහ්මණය! මේ ද වනාහි බ්‍රහ්මචර්‍යාවට ඛණ්ඩ ද, ඡිද්‍ර ද, සබල ද, කල්මාෂ ද වන්නේ ය.

5. බ්‍රාහ්මණය! වැළි දු මේ ලොකයෙහි ඇතැම් මහණ බමුණු කෙනෙක් එසේ මාගම් පිළිබඳ මෙවුම්දම් සෙවුම් ඇඟ ඉලුම්, සිතාසීම්, බැලීම්, හඬ ඇසීම් නො කරති. එතකු දු වුවත් පෙර මාගමුන් සමඟ කළ සිතා, කථා, ක්‍රීඩා,

සිහිකරති. බ්‍රාහ්මණය! මේ ද වනාහි බ්‍රහ්මචර්‍යාවට ඛණ්ඩද ජිද්‍ර ද සබල ද කල්මාෂ ද වන්නේ ය.

6. බ්‍රාහ්මණය! වැළි දූ මේ ලොකයෙහි ඇතැම් මහණ බමුණු කෙනෙක් එසේ මාගම් සමඟ මෙවුන්දම් ආදිය නො කරති. කථා ද සිහි නො කරති. එතකු දූ වුවත් පඤ්චකාමයෙන් සමර්පිත සමඞ්ගීභූත ගෘහපතීන් හෝ ගෘහපති පුත්‍රයන් හෝ දැක එය-(පඤ්චකාමය) කැමැති වෙති. බ්‍රාහ්මණය! මෙය ද වනාහි බ්‍රහ්මචර්‍යාවට ඛණ්ඩ ද, ජිද්‍ර ද, සබල ද, කල්මාෂ ද වන්නේය.

7. බ්‍රාහ්මණය! වැළි දූ මේ ලොකයෙහි ඇතැම් මහණ බමුණු කෙනෙක් එසේ මාගම් පිළිබඳ මෙවුන්දම් සෙවුම් ආදිය නො කරති. පස්කම් සැප විඳින ගෘහපතියකු හෝ ගෘහපති පුත්‍රයකු හෝ දැක එය කැමැති නො වෙති. එතකු දූ වුවත් එක්තරා දිව්‍යනිකායක් ප්‍රාර්ථනා කොටැ ගෙන "මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්‍යාවෙන් හෝ ප්‍රසිඛ දෙවියෙක් හෝ අප්‍රසිඛ දෙවියෙක් හෝ වෙම්වා" සි බ්‍රහ්මචර්‍යාවෙහි හැසිරෙති. බ්‍රාහ්මණය! මෙය ද වනාහි බ්‍රහ්මචර්‍යාවට ඛණ්ඩ ද, ජිද්‍ර ද, සබල ද, කල්මාෂ ද වන්නේ සි.

මෙසේ සප්තවිධ මෛථුනයෙන් ශීලයාගේ ඛණ්ඩාදි භාවය සඞ්ග්‍රහ කරන ලදැයි දත යුතු සි.

ශීලය අඛණ්ඩ, අවජිද්‍ර, අසබල, අකල්මාෂ වන්නේ කවර හෙතුවලින් ද

සඤ්ඤාරයෙන් ශික්ෂාපද බිඳ නො ගැන්ම ය; බිදුණු-ප්‍රතිකර්ම කරගත හැකි ශික්ෂාපදවලට ප්‍රතිකර්ම කර ගැන්ම ය; සප්තවිධ මෛථුනයෙන් වියුකත වීම ය; අන්‍යවූන් ක්‍රෝධ, උපනාහ, මක්ඛ, පලාස, ඉස්සා, මච්ඡරිය, මායා, සාඨෙය්‍ය, ථම්භ, සාරම්භ, මාන, අතිමාන, මද, පමාද යනාදි පාපධර්මයන් නො ඉපද-වීම ය; අප්පිච්ඡතා, සන්තුට්ඨිතා, සල්ලේඛතාදි ගුණ උපදවීම ය යන මේ හෙතු වලින් ශීලයාගේ අඛණ්ඩ, අවජිද්‍ර, අසබල, අකල්මාෂ භාවය වන්නේ ය.

යම් සීල කෙනෙක් ලාභ, යස, ඛන, ඤාති, අඞ්ග, ජීවිත පිණිස පවා නො බිඳ රැකැ ගන්නා ලද්දේ ද පමා වරදෙකින් බිදුණ ද යළි පිළියම් කරා ගන්නා ලද්දේ ද, මෛථුන සංයෝගයන්-ගෙන් හෝ ක්‍රෝධ උපනාහාදි පාපධර්මයන්ගෙන් අනුපහතයෝ ද

ඒ සීලයෝ සම්ප්‍රකාරයෙන් අඛණ්ඩ, අවිච්ඡිද්‍ර, අසබල, අකම්මාස සීලයෝ යයි කියනු ලැබෙත්. එබඳු සීලයෝ මෑ තෘෂ්ණාදාසව්‍යයෙන් මුදන බැවින් **භුජිස්‍ය** නම් වෙති. භුවණෑතියන් විසින් පසස්නා ලද බැවින් **විඤ්ඤුප්පසත්ථ** නම් වෙති. තෘෂ්ණා දෘෂ්ටි විසින් සපශී නො කළ බැවින් **අපරාමට්ඨ** නම් වෙති. උපචාර අර්පණා සමාධි උපදවන බැවින් **සමාධි-සංවත්තනික** නම් ද වෙත්. මෙසේ හෙයින් අඛණ්ඩාදි භාවය මෑ ශීලයා ගේ වොදනා—(පිරිසිදු බව) යයි දත යුතු සි.

විවිධ සීල වොදනා.

මේ සීල වොදනාය – (සීලයාගේ පිරිසිදු බව) වනාහි සීල විපත්තියෙහි ආදීනව දැක්ම ය. සීලසම්පත්තියෙහි ආනිසංස දැක්ම ය යන දෙයාකාරයෙන් සිඛ වේ.

සීලවිපත්තියෙහි ආදීනව දැක්ම.

"පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා දුස්සීලස්ස සීලවිපත්තියා"[1] යනාදීන් වදළ තයෙන් සීලවිපත්තියෙහි ආදීනව දත යුතුසි. "මහණෙනි! දුස්සීලයාගේ සීලවිපත්තියෙහි මේ ආදීනව පසෙකි.

1. "මහණෙනි! සීලවිපන්න දුස්සීලයා ප්‍රමාද හෙතුයෙන් මහත් වූ හොග **හානියට** පැමිණෙත්නේ ය. මේ දුශ්ශීලයා ගේ ශීල විපත්තියෙහි පළමුවන ආදීනවය සි.

2. මහණෙනි! සීලවිපන්න – දුශ්ශීලයා ගේ ලාමක කීර්ති ශබ්දයෙක් පැන නහින්නේ ය. මේ දුශ්ශීලයාගේ ශීලවිපත්තියෙහි දෙවන ආදීනවය සි.

3. මහණෙනි! සීලවිපන්න – දුශ්ශීලයා ක්ෂත්‍රිය පිරිසකට වේව සි, බ්‍රාහ්මණ පිරිසකට වේව සි, ගෘහපති පිරිසකට වේව සි, **ශ්‍රමණ** පිරිසකට වේව සි අවිසාරද වැ මකු වැ එළඹෙන්නේ ය. මේ දුශ්ශීලයාගේ ශීල විපත්තියෙහි තෙවන ආදීනවය සි.

4. මහණෙනි! සීලවිපන්න – දුශ්ශීලයා සම්මූළා වැ කලුරිය කරන්නේ ය. මේ දුශ්ශීලයාගේ ශීලවිපත්තියෙහි සිව් වන ආදීනවය සි.

5. මහණෙනි! සීලවිපන්න – දුශ්ශීලයා කාබුන් මරණින් මතු අපායෙහි උපදින්නේ ය. මේ දුශ්ශීලයාගේ ශීලවිපත්තියෙහි පස්වන ආදීනවය සි." (මේ වනාහි සූත්‍රයාගේ භාවය සි.)

---

[1]අ: නි: පඤ්චක නිපාත 497

තව ද දුශ්ශීලයා සමකීය දුශ්ශීල භාවය හෙතු කොටැ දෙව් මිනිසුන්ට අප්‍රිය වන්නේ ය. සබ්‍රහ්මචාරීන් විසින් පිළිකුල් බැවින් අනුශාසනා නො කළ යුතු වන්නේ ය. දුශ්ශීලයන්ට ගර්හා කරන කල්හි තෙමේ දුක් වන්නේ ය. ශීලවන්තයන්ට ප්‍රශංසා කරන කල්හි විපිළිසර වන්නේ ය. හණ වස්ත්‍රයක් මෙන් ගුණයෙන් හා ශරීරයෙන් දුර්ගන්ධ ද, දෘෂ්ටානුගතියට පැමිණෙන්නවුන්ට අපාය දුක් එළවන බැවින් දුස්සහ ද, දන් දෙන්නවුන්ට මහත් ඵල නො කරන හෙයින් අල්පාර්ථ ද වන්නේ ය. හව්රුදු ගණන් ඉක්මුණු අසුචි වළක් මෙන් දුර්ගන්ධ වන්නේ ය. දරට ද, වැඩට ද, නො ගත හැකි සොහොන් පෙතහෙල්ලක් මෙන් ගිහි කම්න් ද, මහණුවමින් ද බැහැර වන්නේ ය. "මමත් ගවයෙකිමි"යි ගොගණයා අනුවැ යන ගදුහයකු මෙන් තෙමේ "භික්ෂු" යයි ප්‍රතිඥා කරතත් භික්ෂුවෙක් නො වන්නේ ය. සියල්ලනට වෛරී පුරුෂයකු මෙන් නිති උවෙග වන්නේ ය. මළමිනියක් මෙන් සංවාසයට සුදුසු නො වන්නේ ය. බහුශ්‍රැතත්වාදියෙන් යුක්ත තමුදු බමුණන් විසින් සොහොන් ගින්න මෙන් සබ්‍රහ්මචාරීන් විසින් නො පිදිය යුතු වන්නේ ය. රූ දැක්මෙහි අන්ධයා මෙන් විශෙෂාධිගමයෙහි අභව්‍ය වන්නේ ය. රාජ්‍යයෙහි සැඩොල් කොටු මෙන් සඞ්ඝයෙහි නිරාසා වන්නේ ය. **අගාරිකඋපෝසථ සූත්‍රයෙහි** වදුළ දුකට හිමි වැ සිටින බැවින් තෙමේ සුඛිතයා යි සිතන්නේ තමුදු දුක්ඛිතමැ වන්නේ ය.

ඒ එසේ මැ යි:-

පඤ්චකාම ගුණ පරිභොගයෙහි හා වන්දනමානනාදිය ලැබීමෙහි සුඛාස්වාදයෙන් ගර්ධිත වූ සිත් ඇති දුස්සීලයනට ඒ හෙතුවෙන් ලැබෙන - සිහිවන පමණෙනු දු හෘදය තප්ත කොටැ උණු ලේ නැංවීමට තරම් වූ අති කටුක දුක් දක්වන - සංඝාරයෙන් ප්‍රත්‍යක්ෂ කම් විපාක ඇති - **"පස්සථ නෝ තුම්හෙ භික්ඛවෙ අමුං මහන්තං අගාරිකඋපෝසථං ආදිත්තං සම්පජ්ජලිතං සඞ්ඝෝතිභූතං නි. එවං භන්තෙ! තං කිං මඤ්ඤථ භික්ඛවෙ! කතමං නු ඛෝ වරං යං අමුං මහන්තං අගාරිකඋපෝසථං ආදිත්තං සම්පජ්ජලිතං සඞ්ඝෝතිභූතං ආලිංගිත්වා උපනිසීදෙය්‍ය වා? උපනිපජ්ජෙය්‍ය වා? යං ඛත්තියකඤ්ඤං වා බ්‍රාහ්මණකඤ්ඤං වා ගහපතිකඤ්ඤං වා මුදුතලුන හත්ථපාදං ආලිඞ්ගිත්වා උපනිසිදෙය්‍ය වා? උපනිපජ්ජෙය්‍ය වා? නි"**[1] යනාදීන් **අගාරිකඋපෝසථ සූත්‍රය** භගවත් බුදුරජාණන් වහන්සේ වදුළ සේක.

[1] අ: නි: සත්තකනිපාත 695

එහි සංක්ෂිප්ත භාවය මෙසේ ය.

'එක් කලෙක භගවත් බුදුරජාණන් වහන්සේ කොසොල් දනව්වෙහි සැරිසරන සේක් දිලි නැහෙන මහා ගිනිකඳක් දැකැ මාගීයෙන් ඉවත් වැ එක් රුක් මූලෙක පැණෙවූ අස්නෙහි වැඩැ හිඳැ භික්ෂූන් අමතා "මහණෙනි! තෙල මහා ගිනිකඳ දක්නහුදැ" යි වදාළසේක. භික්ෂූහු "එසේය සවාමීනි දකුම්හ" යි කීවාහු ය.

"මහණෙනි! තොපි කුමක් සිතව් ද තෙල මහා ගිනි කඳ වැළඳැ ගෙනැ හිඳීම හෝ නිදීම හොඳ ද මෘදු මොළොක් අත් පා ඇති ක්ෂත්‍රිය කන්‍යාවක් හෝ බ්‍රාහ්මණ කන්‍යාවක් හෝ ගෘහපති කන්‍යාවක් හෝ වැළඳැ ගෙනැ හිඳීම හෝ නිදීම සොඳ ද" "සවාමීනි! ක්ෂත්‍රියාදි කන්‍යාවක් වැළඳැ ගෙනැ හිඳීම හෝ නිදීම සොඳ ය. තෙල මහා ගිනිකඳ වැළඳැ ගෙනැ හිඳීම හෝ නිදීම දුක ය."

"මහණෙනි! මම තොපට දැනුම්දෙමි. අපිරිසිදු සැක කටයුතු හැසුරුම් වලින් යුත් - පිළිසන් කම්නන ඇති - අශ්‍රමණ වැ ශ්‍රමණයයි ප්‍රතිඥ කරන - අබ්‍රහ්මචාරී වැ බ්‍රහ්මචාරියයි ප්‍රතිඥ කරන - ඇතුළ කුණු වූ - කෙලෙස් වලින් තෙත් - හටගත් කෙලෙස් කසට ඇති දුස්සීලයකු තෙල මහා ගිනිකඳ වැළඳැ ගෙනැ හිඳීම හෝ කිදීම සොඳ ය. එසින් ඔහුට වන්නේ මරණය හෝ මරණය තරම් දුක ය. එසින් හේ අපායට තො යන්නේ ය. මහණෙනි! දුස්සීල වැ මෘදු මොළොක් අත් පා ඇති ක්ෂත්‍රියාදී-කන්‍යාවක් වැළඳැ ගෙනැ හිඳියේ නම් නිදියේ නම් එය උහුට අහිත පිණිස - දුක් පිණිස වන්නේ ය. එසින් හෙතෙමේ මරණින් මතු අපායට යන්නේ ය."

"මහණෙනි! තොපි කුමක් සිතව් ද කුමක් සොඳ ද බලසම්පන්න පුරුෂයකු විසින් ඔව් සම් මස් නහර ඇට සිඳැ ඇටමිදුලු දක්වා හැපී සිටින සේ දැස වූ වල් රුහැණෙකින් ජඩ්ඣා දෙක වෙළා ඇදීම සොඳ ද ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති මහාසාලයන්ගේ වැදුම ඉවසීම සොඳ ද" "සවාමීනි! වැදුම් ඉවසීම සොඳ ය. වල් රුහැණින් ජඩ්ඣා දෙක වෙළා ඇදීම දුක ය" මහණෙනි! මම තොපට දැනුම් දෙමි. වල් රුහැණින් එසේ ජඩ්ඣා දෙක වෙළා ඇදීම සොඳ ය. එසින් ඔහුට වන්නේ මරණය හෝ මරණය තරම් දුක ය. එසින් හේ අපායට

නො යන්නේ ය. මහණෙනි! දුශ්ශීල වූ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති මහාසාලයන්ගේ වැඳුම් ඉවසීම අහිත පිණිස - දුක් පිණිස වන්නේ ය. එසින් හෙතෙමේ අපායට යන්නේ ය."

"මහණෙනි! තොපි කුමක් සිතව් ද බලසම්පන්න පුරුෂයකු විසින් තෙල් සණ වූ තියුණු අඩයටියෙකින් ළමැද පැහැරීම සොඳ ද ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති මහාසාලයන්ගේ ඇඳිලි ඉවසීම සොඳ ද" සවාමීනි ඒ ඇඳිලි ඉවසීම සොඳ ය. තෙල් සණ වූ තියුණු අඩයටියෙන් ළමැද පැහැරීම දුක ය." මහණෙනි! මම තොපට දැනුම් දෙමි. එ බඳු අඩයටියෙන් ළමැද පැහැරීම සොඳ ය. එසින් ඔහුට වන්නේ මරණය හෝ මරණය තරම් දුක ය. එසින් හේ අපායට නො යන්නේ ය. මහණෙනි! දුස්සීල වූ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති මහාසාලයන්ගේ ඇඳිලි ඉවසීම අහිත පිණිස -- දුක් පිණිස වන්නේ ය. එසින් හෙතෙමේ අපායට යන්නේ ය."

"මහණෙනි! "තොපි කුමක් සිතව් ද බලවත් පුරුෂයකු විසින් ගිනි ගෙන දිලියෙන යපටකින් ඇඟ වෙළාලීම සොඳ ද ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති මහාසාලයන් සැදැහැයෙන් දෙන සිවුරු පරිභොග කිරීම සොඳ ද"-(සෙස්ස යට කී සේ ය.)

"මහණෙනි! තොපි කුමක් සිතව් ද" බලසම්පන්න පුරුෂයකු විසින් ගිනි ගෙන දිලියෙන යකඩ අඬුවකින් මුඛය විවෘත කොටැ තොල්, මුව, දිව, උගුර, පපු දවා අතුණු, අතුණුබහන්, බැහැර යන සේ ඇවිළ ගත් ලොහො ගුළි මුඛයෙහි දමා ලීම සොඳ ද ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති, මහාසාලයන් සැදැහැයෙන් දෙන පිණ්ඩපාතය වැළඳීම සොඳ ද" -- (සෙස්ස යට කී සේ ය.)

"මහණෙනි! තොපි කුමක් සිතව් ද බලසම්පන්න පුරුෂයකු විසින් හිස හෝ කඳ හෝ අල්වා ගෙන ගිනි ගෙන දිලියෙන ඇදෙක හෝ පුටුවෙක හොවාලීම හෝ හිඳුවීම සොඳ ද ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති මහාසාලයන් සැදැහැයෙන් දෙන ඇඳ පුටු පරිභරණය කිරීම සොඳ ද" (සෙස්ස යට කී සේ ය.)

"මහණෙනි! තොපි කුමක් සිතව් ද බලසම්පන්න පුරුෂයකු විසින් පා උඩු කොටැ හිස යටි කොටැ අල්වා ගෙතැ ගිනි ගෙන දිලියෙන ලොහකුම්භියක පෙණ නහමින් වරින් වර උඩ යට

සරස යන සේ හෙළාලීම සොඳ ද ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති මහාසාලයන් සැදැහැයෙන් දෙන විහාරයෙක විසීම සොඳ ද (සෙස්ස යට කී සේ ය.)

"මහණෙනි! තොප විසින් "අපි යම් කෙනෙකුන්ගේ චීවර පිණ්ඩපාත, සෙනාසන, ගිලන්පස බෙහෙත් පිරිකර වළඳමු ද, ඔවුන්ගේ ඒ උපකාර අප විසින් මහත් ඵල මහානිසංස කළ යුතු ය. අපගේ මහණුවම් ද වඳ නො කොට සඵලකර ගත යුතු ය'සි හික්මිය යුතු ය. මහණෙනි! ආත්මාර්ථය හෝ පරාර්ථය හෝ උභයාර්ථය නෝ බලත්තහු විසින් අප්‍රමාදයෙන් සම්පාදනය කර ගත යුතු සි." (මේ සූත්‍රය දෙශනා කරත් සැටක් පමණ භික්ෂූන්ගේ මුඛයෙන් උණු ලේ නැංගේ ය. සැටක් පමණ භික්ෂූහු "දුෂ්කරය සවාමීනි! අති දුෂ්කරය සවාමීනි!" සි ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කොටැ ගිහි වූහ. සැටක් පමණ භික්ෂූහු රහත් වූහ.)

මෙහි වල් රුහැන්, තියුණු අඩයටි, යපට, යගුළි, යකඩ-ඇඳපුටු, යකුළු උපමා වලින් අභිවාදන, අඤ්ජලිකම්, චීවර, පිණ්ඩපාත, ඇඳපුටු, විහාර පරිභොගයෙන් වන දුක් දක්වා වදාළ සේක.

එබැවින් මතු දැක්වෙන පරිදි ද **ශීලවිපත්තියෙහි** ආදීනව දැක්ක යුතු.

(ගාථාවන්ගේ භාවය.)

ගිනිකඳ වැළඳැ ගැන්මෙන් වන දුකට වඩා අධික දුක් දෙන කටුක විපාක ඇති කාමසුඛය නො භරත දුශ්ශීල මහණ හට සැපයෙක් කොසින් ද

දැඩ වූ වල් රුහැනින් ගැසීමෙන් වන දුකට වඩා අධික දුකට හෙතු වන වැදුම් ඉවසීමෙහි දුශ්ශීල හට කවර නම් සුවයෙක් ද

තියුණු අඩයටියෙන් පහරන දුකට වඩා අධික දුකට හෙතු වන සැදැහැවතුන්ගේ ඇඳිලි ඉවසීමෙහි දුශ්ශීල හට කවර සැපෙක් ද

යමකු විසින් බොහෝ කලක් නිරයෙහි ගිනි ගෙන දිලියෙන යවට පහස් විඳිය යුතු ද, ඒ දුශ්ශීල හට චීවර පරිභොග සුඛය කම් කිම

යමකු විසින් බොහෝ කලක් ගිනි ගෙන දිලියෙන යවට ගිළිය යුතු ද, ඒ දුශ්ශීල හට මධුර ද වූ පිණ්ඩපාතය හළා හළ විස වැන්නේ ය.

ගිනි ගෙන දිලියෙන අයොමඤ්ච දුඃඛයෝ යමකු පෙළත් ද, ඒ දුශ්ශීල හට සුඛ සම්මත ද මඤ්චපීඨපරිභොගය දුඃඛ මෑ වන්නේ ය.

යමකු විසින් ගිනි ගෙන දිලියෙන ලොහොකුඹු මැද විසිය යුතු ද, ඒ දුශ්ශීල හට ශ්‍රද්ධාදෙය වූ විහාරයෙහි කවර නම් නිවාස රතියෙක් ද

ලොකඤ්ඤාමින් වහන්සේ යමෙකුට නිදා කරන සේක් "සංකස්සරසමාචාරය, කසම්බුජාතකය, අවස්සුතය, පාපය, අනෙනඃපූතිය" යි වදාළ සේක් ද-

ඒ - ශ්‍රමණ නොවූ ශ්‍රමණවෙෂධාරී වූ - අභාග්‍යවත් වූ - ගුණ කැඩුණු - ගුණ තුවාළ වුණු ආත්මය ධරන්නා වූ - දුශ්ශීලයාගේ ජීවිතයට නිදා වේවා.

මණ්ඩනකාමීහු අසුචි මෙන් කුණප මෙන් ශීලවත් සත් පුරුෂයෝ යමකු දුරු කරත් ද, ඒ දුශ්ශීලයාගේ මෙලොව ජීවිතය කුමට ද

කිසි බියෙකින් නොමිදුණු - සියලු අධිගම සුඛවලින් මිදුණු - පියාලූ සුගතීවාර ඇති - අපාය මාර්ගයට ආරුඪ වූ කාරුණික ජනයාගේ කරුණාවට භාජන වූ - දුශ්ශීලයා බදු අනෙකෙක් නම් කවරේ ද

මෙසේ **දුශ්ශීලයාගේ දොෂ අනෙකවිධයි.**

මේ ආදිය සලකා **ශීලවිපත්තියෙහි ආදීනව** දැක්මෙන් ශීලවොදනය සිඩ වේ. මෙයට ප්‍රතිපක්ෂ වශයෙන් **ශීල සම්පත්තියෙහි ආනිසංස** දැක්මෙන් ද **ශීලවොදනය** සිඩ වේ.

තවද **ශීලසම්පත්තියෙහි ආනිසංස** මෙසේ ද දත යුතුයි.
(ගාථාවන්ගේ භාවය.)

යමෙකුගේ ශීලය නිමල වන්නේ ද, ඔහුගේ පා සිවුරු ධැරීම ප්‍රසාදජනක වන්නේ ය. ඔහුගේ ප්‍රව්‍රජ්‍යාව ද ඵලවත් ය.

'හිරු කරා අන්ධකාරය මෙන් ශුද්ධ ශීල භික්ෂුහුගේ හෘදය කරා අත්තානුවාදාදි භය නො එළඹෙන්නේ ය.'

'ශුවනෙහි චන්ද්‍රයා ප්‍රභා සම්පත්තියෙන් මෙන් තපො වෙතෙහි ශීලවත් භික්ෂු ශීලසම්පත්තියෙන් බබළන්නේ ය.'

'ශීලවත් භික්ෂුහුගේ කායගන්ධය ද දෙව්යන්ට ප්‍රියංකර වන්නේ ය. ශීලගන්ධය ගැන කියනු කිම?'

'තගර මල්ලිකාදි සියලු ගන්ධ ජාතීන්ගේ සුගන්ධය අනිත්‍යවතය කොටැ ශීලසුගන්ධය සියලු දිසාහි අප්‍රතිහත වැ හමන්නේ ය.'

'ශීලවන්හු කෙරෙහි කළ සඵලප ක්‍රියා ද මහත් ඵල වන්නේ ය. එහෙයින් සීලවන්තයා පූජාසත්කාරයන්ට භාජනයි.'

'මේ ආත්ම භාවයෙහි වන වධබන්ධනාදි උපද්‍රවයෝ සීලවන්තයා නො පෙළති. ඒ සීලවන්තයා පරලොව දුඃඛයන්ගේ මුල ද කණන්නේ ය.'

'මනුෂ්‍යයන් අතර ඇති තාක් සැප ද, දෙවියන් අතර ඇතිතාක් සැප ද කැමැතිවත් හොත් සීලවන්තයාට දුර්ලභ නො වේ.'

'අත්‍යන්ත ශාන්ත වූ යම් නිර්වාණ සම්පත්තියෙක් වේ ද, සීලවන්තයා ගේ සිත ඒ නිවන් සැප කරා මැ දිවන්නේ ය,'

'නුවණැත්තේ සියල් සැපතට මුල් වූ ශීලයෙහි මෙසේ අනෙකාකාර විස්තර වූ ආනිසංස ප්‍රකාශ කරන්නේ ය.'

මෙසේ සලකන්නහුගේ සිත ශීලවිපත්තියෙන් උද්විග්න වැ ශීලසම්පත්තියට නැමෙයි. එහෙයින් යථොක්ත ශීල විපත්තියෙහි ආදීනව ද ශීල සම්පත්තියෙහි ආනිසංස ද දැකැ සවී ප්‍රේමයෙන් ශීලවොදනය කර ගත යුතුයි.

"සීලෙ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ" යනාදි ගාථායෙහි **ශීල, සමාධි, ප්‍රඥා** මුඛයෙන් වදාළ **විශුද්ධිමාර්ගයෙහි ශීලය** මෙතෙකින් විස්තර කරන ලද්දේ ය.

සජ්ජන ප්‍රමෝදය පිණිස කළ විශුද්ධිමාර්ගයෙහි
ශීලනිද්දේශ නම් ප්‍රථම පරිච්ඡේද යි.

මාතර වල්පොළ සිරිමංගල පිරිවෙන් වැසි
සවණි මුද්‍රිකා සහිත රාජකීය පණ්ඩිත පදවි ලත්

ධම්මාචාය්‍ය

මාතර ශ්‍රී ධම්මවංශ සථවිර සවාමීන්

— කළ —

විශුඛිමාගී සිංහලානුවාදයේ

ප්‍රථම පරිච්ඡේදය යි.

●

සිංහල විශුද්ධිමාර්ගය.

ධුතාඞ්ග නිද්දේශය.

නමෝ භගවතෝ සම්මාසම්බුද්ධස්ස.

"**අප්පිච්ඡතා සන්තුට්ඨිතාදි** ගුණයෙන් ශීලය පිරිසුදු වන්නේය"යි යට **ශීලනිද්දේශයෙහි** දක්වන ලද්දේය. ශීල සමාදන් වැ ගත් යොගීහු විසින් **අප්පිච්ඡතා** දි ගුණයන් මැනෙවින් සම්පාදනය කරන්නට නම් **ධුතාඞ්ග** සමාදන් විය යුතුය. **ධුතාඞ්ග** සමාදන් වූ **කල** ම ඔහුගේ ශීලය **අප්පිච්ඡතා, සන්තුට්ඨිතා, සල්ලේඛ-පවිවේක-අපචය-විරියාරම්භ-සුභරතාදි** ගුණ තමැති ජලයෙන් මල සේදී ගොස් පිරිසුදු වන්නේය. වුත සම්පාදනය වන්නේ ත් ඔහුට ම ය. එසේ ශීලයෙන් හා වුතයෙන් පිරිසුදු හැසිරීම් ඇත්තේ ම **පුරාණ ආර්යවංශ තුනෙහි** පිහිටා භාවනා රාමතා සංඛ්‍යාත **සත්පුරුෂ ආර්යවංශයට** පැමිණීමට සුදුස්සෙක් වන්නේ ය. ඒ බැවින් දැන් **ධුතාඞ්ග කථාව** දක්වම්හ.

භගවත් **බුදුන් වහන්සේ** විසින් ලොකාමිශය හැර පියා කාය ජීවිත දෙක්හි නිරපෙක්ෂ වැ අනුලොම ප්‍රතිපදාව **ලබා** ගන්නට **කැමැති** කුලදරුවන් උදෙසා **ධුතාඞ්ග තෙළෙසක්** අනුදන්නා ලද්දේය. ඒ

තෙළෙස් ධුතාඞ්ග නම්

1. **පංසුකූලිකඞ්ගය,**	2. **තෙච්වරිකඞ්ගය,**
3. **පිණ්ඩපාතිකඞ්ගය,**	4. **සපදානචාරිකඞ්ගය,**
5. **එකාසනිකඞ්ගය,**	6. **පත්තපිණ්ඩිකඞ්ගය,**
7. **ඛලුපච්ඡාභත්තිකඞ්ගය,**	8. **ආරඤ්ඤිකඞ්ගය,**
9. **රුක්ඛමූලිකඞ්ගය,**	10. **අබ්භෝකාසිකඞ්ගය,**
11. **සොසානිකඞ්ගය,**	12. **යථාසන්ථතිකඞ්ගය,**

13. **නෙසජ්ජිකඞ්ගය** යන මොහු යි.

මේ ධුතාඞ්ග වනාහි අර්ථ වශයෙන් ද, **ලක්ෂණ**-රස-පච්චුපට්ඨාන-පදට්ඨාන වශයෙන් ද, සමාදාන වශයෙන් ද, විධාන වශයෙන් ද, ප්‍රභෙද වශයෙන් ද, භෙද වශයෙන් ද, ආනිසංස වශයෙන් ද,

මතු විනිශ්චය කරනු ලැබේ. එසේ ම **කුසලත්‍රික** වශයෙන් ද, ධුතාදි විභාග වශයෙන් ද, සමාස ව්‍යාස වශයෙන් ද, විනිශ්චය කරනු ලැබේ.

ධුතාඞ්ගයන්ගේ අර්ථ විනිශ්චය.

1. පංසුකූලිකාඞ්ගය:— පංසු නම් වීථි සොහොන් කසල ගොඩ ආදීන් අතුරෙන් යම් කිසි තැනෙක පස් ය. ඒ පංසුන්හි කූලයක්-ඉවුරක් මෙන් පවත්නේ පංසුකූලය මෙහි ඉවුරක් මෙන් පැවැත්ම නම් උස් වැ තිබීම ය. (පස් මතුයෙහි ඉවුරක් මෙන් වැටී තිබෙන දෙය පංසුකූලය සි කී සේ ය. "පංසුසු කූලම්ව-පංසුකූලං" යනු විග්‍රහ වාක්‍යයි.)

තව ද යමක් පස් මෙන් පිළිකුල් බවට පැමිණෙන්නේ ද, එ ද පංසුකූලය සි කියනු ලැබේ. (මේ අර්ථ පක්‍ෂයෙහි පංසු + කු + ඵල යයි පදවෙර්ජ්ද කළ යුතු. පංසු නම් පස්. කු නම් කුවර්ජිත-පිළිකුල්. ඵල නම් පැමිණීම. "පංසු විය කුවර්ජිත භාවං ඵලති ගවර්ජතීති පංසුකූලං" යනු එහි විග්‍රහ වාක්‍ය යි.)

පංසුකූල ධාරීම ද පංසුකූල ශබ්දයෙන් ම කියනු ලැබේ. (පංසුකූල ධාරණය සි කිය යුතු තැන ධාරණ ශබ්දය ලොප් විය.) යමෙක් පංසුකූල ධාරීම සවභාව කොට ඇත්තේ ද හෙතෙම පංසුකූලික නම් වේ. ඒ පංසුකූලිකයාගේ අඞ්ගය **පංසුකූලිකාඞ්ගය** සි. මෙහි අඞ්ග නම් කාරණය යි. යම් සමාදානයෙකින් නිෂ්ක්‍රමතෙම පංසුකූලික වේ ද ඔහුගේ ඒ සමාදාන ලක්‍ෂණ වෙතකාව **පංසුකූලිකාඞ්ග** නම් වීය යි දත යුතු සි.

2. තෙචීවරිකාඞ්ගය:— තෙචීවර නම් සංඝාටි, උත්තරාසඞ්ග, අන්තරවාසක යන සිවුරු තුන ය. ඒ තෙචීවර ධාරණය ද තෙචීවරය. යමෙක් තෙචීවර ධාරණය සවභාවකොට ඇත්තේ ද හෙතෙම තෙචීවරිකය. තෙචීවරිකයාගේ අඞ්ගය **තෙචීවරිකාඞ්ගය** සි.

3. පිණ්ඩපාතිකාඞ්ගය:—භික්‍ෂා සංඛ්‍යාත ආමිස පිණ්ඩයන්ගේ පාතය පිණ්ඩපාතය. එ නම් අනුන් විසින් දෙන ලද පිණ්ඩයන් පාත්‍රයෙහි හීමයි. ගෙයක් ගෙයක් කරා ගොස් ඒ පිණ්ඩපාතය සොයා ගන්නේ පිණ්ඩපාතිකය. පිණ්ඩපාතිකයා ගේ අඞ්ගය පිණ්ඩපාතිකාඞ්ගය සි. තොහොත් පිඬු පිණිස හැසිරීමේ ව්‍රතය යමෙකුට ඇත්තේ ද හෙතෙම පිණ්ඩපාතීය. පිණ්ඩපාතී ම පිණ්ඩපාතිකය. පිණ්ඩපාතිකයා ගේ අඞ්ගය **පිණ්ඩපාතිකාඞ්ගය** සි.

4. සපදානචාරිකඞ්ගයඃ- දාන නම් මෙහි කඩකිරීමය. දාන යෙන් අපෙත වූයේ අපදානය. හෙවත් **නො කඩකිරීම** ය. අපදාන හෙවත් නො කඩකිරීම සහිත වූයේ සපදානය. එවිට එහි අර්ථය ගෙපිළිවෙළින් යනුයි. සපදාන හෙවත් ගෙපිළිවෙළින් පිඬු සොයා හැසිරීම යමෙකුගේ ශීලය ද හෙතෙම සපදානචාරීය. සපදානචාරී ම සපදානචාරිකය. සපදානචාරිකයාගේ අඞ්ගය **සපදානචාරිකඞ්ගය** යි.

5. එකාසනිකඞ්ගයඃ- එක ආසනයෙක්හි ම හිඳ වැළඳීම එකාසනය. ඒ එකාසනය යමෙකුගේ සීලය ද හෙතෙම **එකාසනිකය**. එකාසනිකයාගේ අඞ්ගය **එකාසනිකඞ්ගය** යි.

6. පත්තපිණ්ඩිකඞ්ගයඃ- පත්තපිණ්ඩ නම් දෙවන භාජන ප්‍රතික්ෂේප කොට එක ම පාත්‍රයෙහි ගත්තා පිණ්ඩය යි. ඒ පත්තපිණ්ඩය හෙවත් එක ම පාත්‍රයෙහි පිඬු ගැන්ම-වැළඳීම යමෙකුගේ සීලය වේ ද හෙතෙම **පත්තපිණ්ඩිකය**. පත්තපිණ්ඩිකයාගේ අඞ්ගය **පත්තපිණ්ඩිකඞ්ගය** යි.

7. ඛලුපච්ඡාභත්තිකඞ්ගයඃ- ඛලු යනු ප්‍රතිෂේධාර්ථයෙහි නිපාතයෙකි. පච්ඡාභත්ත නම් **පවාරණ** වීමෙන් පසු ලැබෙන ඛතයි හෙවත් භොජනය යි. ඒ භොජනය වැළඳීම ද මෙහි පච්ඡාභත්ත ශබ්දයෙන් ම කියනු ලැබේ. පච්ඡාභත්තය හෙවත් **පවාරණ** වීමෙන් පසු වැළඳීම යමෙකුගේ ශීලය වේ ද හෙතෙම **පච්ඡාභත්තිකය**. එබඳු සභාවය නැත්තේ ඛලුපච්ඡාභත්තිකය. පවාරණ වීමෙන් පසු ලැබෙන භොජනය වැළඳීම සමාදන් වීම් වශයෙන් හැර පියූ භික්ෂුව මෙහි **ඛලුපච්ඡාභත්තිකය යි** කියන ලදැ යි දත යුතු යි.

මේ සඳහා අටුවායෙහි දැක්වුනේ අන්‍ය ක්‍රමයෙකි.

ඒ මෙසේ යි:- ඛලු යනු පක්ෂි විශෙෂයෙකි. ඒ පක්ෂියා මුඛයෙන් ගත් ඵලය ඉදින් බිම වැටී ගියේ නම් අන්‍ය ඵලයකු දු නො කන්නේ ය. එසේ මෑ යම් භික්ෂු කෙනෙක් **පවාරණ** වීමෙන් පසු ලැබෙන භොජනය නො වළඳන්නේ ද? හෙතෙම **ඛලුපච්ඡාභත්තිකය යි** කියනු ලැබේ යනු යි.

8. ආරඤ්ඤිකඞ්ගයඃ- (අරඤ්ඤ නම් ගම්මානයෙන් දුනු පන්සියයෙකින් ඇත වනය යි.) අරණ්‍යයෙහි විසීම යමෙකුගේ සභාවය ද හෙතෙම **ආරඤ්ඤිකය**. ආරඤ්ඤිකයාගේ අඞ්ගය **ආරඤ්ඤිකඞ්ගය** යි.

9. **රුක්ඛමූලිකඞ්ගය:-** වෘක්ෂමූලයෙහි වාසය රුක්ඛමූලය. රුක්ඛමූල වාසය යමෙකුගේ සුභාවය වේද හෙතෙම රුක්ඛමූලිකය රුක්ඛමූලිකයාගේ අඞ්ගය **රුක්ඛමූලිකඞ්ගය** යි.

10. **අබ්භොකාසිකඞ්ගය:-** අභ්‍යවකාශ වාසය අබ්භොකාසය. (අභ්‍යවකාශ නම් සෙවන නැති අහසයි.) අබ්භොකාස වාසය යමෙකුගේ සුභාවය වේ ද හෙතෙම අබ්භොකාසිකය. අබ්භොකාසිකයාගේ අඞ්ගය **අබ්භොකාසිකඞ්ගය** යි.

11. **සොසානිකඞ්ගය:-** සුසානයෙහි වාසය සුසානය. සුසාන නම් සොහොන. සුසාන වාසය යමෙකුගේ සුභාවය වේ ද හෙතෙම සොසානිකය. සොසානිකයාගේ අඞ්ගය **සොසානිකඞ්ගය** යි.

12. **යථාසන්ථතිකඞ්ගය:-** යථාසන්ථත නම් 'මෙය ඔබ වහන්සේ වෙනුවට පත් වුණේය' යි පළමු කොට නියම කරන ලද සෙනාසනය යි. එහි වාසය ද යථාසන්ථතය. යථාසන්ථත වාසය යමෙකුගේ ශීලය වේ ද හෙතෙම යථාසන්ථතිකය. ඔහුගේ අඞ්ගය **යථාසන්ථතිකඞ්ගය** යි.

13. **නෛසජ්ජිකඞ්ගය:-** නිසජ්ජා නම් සයනය (නිදාගැනීම) හැර පියා හිඳැගෙන ම කල් යැවීම ය. නිසජ්ජාව යමෙකුගේ සුභාවය වේ ද හෙතෙම නෛසජ්ජිකය. නෛසජ්ජිකයාගේ අඞ්ගය **නෛසජ්ජිකඞ්ගය** යි.

ධුතඞ්ග ශබ්දයාගේ අර්ථ.

"ධුතස්ස අඞ්ගානි-ධුතඞ්ගානි" ධුතයාගේ අඞ්ගයෝ ධුතඞ්ගයෝ ය. ධුතයා නම් ඒ ඒ අඞ්ග සමාදානයෙන් කෙලෙස් කම්පාකර හරින භික්ෂුය. කෙලෙස් කම්පාකර හරින භික්ෂුවගේ අඞ්ගයෝ ධුතඞ්ගයෝ නම් වෙති යි කී සේ යි.

නැතහොත් කෙලෙස් කම්පාකර හරින බැවින් ධුතය යි කියනු ලැබේ. ඒ ධුත සඞ්ඛ්‍යාත කඳුණය අඞ්ගවූයේ යම් ධර්ම කෙනෙකුන්ට ද ඒ ධර්මයෝ ධුතඞ්ගයෝ ය. ("ධුතං කඳුණං අඞ්ගං එතෙසං'ති-ධුතඞ්ගානි." මෙයින් ධුතාඞ්ග ප්‍රඥප්තිගත බව කීහ.)

නොහොත් ප්‍රතිපක්ෂ කෙලෙසුන් ධුනනය - කම්පනය කරන්නෝත් ඔහු ම ය. ප්‍රතිපත්තියට අඞ්ග වූවෝත් ඔහු ම කුසි ධුතාඞ්ගයෝ නම් වෙත්. ("ධුතානි ච තානි අඞ්ගානීච ති ධුතඞ්ගානි.")

ධුතාඞ්ගාඊ විනිශ්චය සි.

ධුතාඞ්ගයන්ගේ ලක්ෂණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන

සියලු ධුතාඞ්ග වතාහි සමාදාන වශයෙන් පැවැති චෙතනාව ලක්ෂණ කොට ඇත්තේ ය. කියන ලද මෑ සි. අටුවායෙහි- "**යො සමාදියති සො පුග්ගලො. යෙන සමාදියති චිත්ත චෙතසිකා එතෙ ධම්මා. යා සමාදාන චෙතනා තං ධුතඞ්ගං. යං පවිකඛිපති තං වත්ථු**" සි. යමෙක් සමාදන් වෑ ගන්නේ ද හෙතෙම පුද්ගලයා ය. යමක් කරණකොට ගෙන සමාදන් වේ ද ඔව්හු චිත්ත චෛතසික ධර්මයෝ ය. යම් සමාදාන චෙතනාවක් වේද එය ධුතඞ්ගය සි. යම් ගෘහපති චීවරාදියක් ප්‍රතික්ෂේප කරයි ද එය වස්තුයි යනු එහි භාව සි. (ලක්ෂණ නම් සවභාවය සි දත යුතු.)

සියලු ධුතාඞ්ග ලොලුපප්‍ර විධ්වංසනය රස කොට ඇත්තේ ය. (ලොලුපප්‍ර විධ්වංසනය නම් තෘෂ්ණාචාර නැති කිරීම ය. රස නම් කෘත්‍ය හා සම්පත් ය. එසේ ම සියලු ධුතඞ්ග නිලෙලොලුපප්‍ර භාවය පච්චුපට්ඨාන කොට ඇත්තේ ය. නිලෙලොලුපප්‍රභාව නම් තෘෂ්ණාචාර සඞ්ඛ්‍යාත ලොලුපප්‍ර භාවයක් නැති බව සි. පච්චුපට්ඨාන නම් වැටහෙන ආකාරය සි.)

එසේ ම සියලු ධුතාඞ්ග අලෙභේච්ඡතාදි ආර්‍ය්‍ය ධර්ම පදස්ථාන කොටැ ඇත්තේ ය. පදස්ථාන නම් ආසන්න කාරණය සි.

ධුතාඞ්ගයන්ගේ ලක්ෂණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන විනිශ්චය සි.

ධුතාඞ්ග සමාදානය.

සියලු ම ධුතාඞ්ග බුදුරජාණන් වහන්සේ ජීවමාන කල්හි උන්වහන්සේ වෙතින් ම සමාදන් විය යුතු. උන්වහන්සේ පිරිනිවි කල්හි මහාශ්‍රාවකයන් වෙතින් සමාදන් විය යුතු. මහා ශ්‍රාවකයන් පිරිනිවි කල රහතුන්ගෙන් ද, රහතුන් පිරිනිවි කල්හි

අනාගාමීන්ගෙන් ද, අනාගාමීන් නැති කල්හි සකෘදාගාමීන්-ගෙන් ද, සකෘදාගාමීන් නැති කල්හි සෝවාන් වෙතින් ද, සෝවාන්හු නැති කල්හි ත්‍රිපිටකධරයන් වෙතින් ද, ත්‍රිපිටකධරයන් නැති කල්හි ද්විපිටකධරයන් වෙතින් ද, ද්විපිටකධරයන් නැති කල්හි එක පිටකධරයන් වෙතින් ද, එක පිටකධරයන් නැති කල්හි එක සතියක් ධරන්නහු වෙතින් ද, එබන්දකු නැති කල්හි අර්ථකථාචාර්‍යයන් වෙතින් ද, අර්ථකථාචාර්‍යයන් නැති කල්හි ධුතඞ්ගධරයන් වෙතින් ද සමාදන් විය යුතු. ධුතඞ්ගධරයකු ද නැති කල්හි චෛත්‍ය මළුව හැමදෑ උක්කුටිකයෙන් හිඳ **බුදුරජාණන්** වහන්සේ ළඟ කියන්නාක් මෙන් කියමින් සමාදන් විය යුතුයි.

ධුතාඞ්ග වනාහි ඉබේම සමාදන් වුව ද වරද නැත. **මිහින්තලේ** සහොදර සථවිරයන් දෙනම අතුරෙන් වැඩි මහලු තෙරුන්ගේ ධුතඞ්ගප්පිච්ඡතා කථායෙන් එය පැහැදිලි වේ.

දෙ බෑ තෙරුන්ගෙ කථාව

(**මිහින්තලේ** විහාරයෙහි සහොදර සථවිර දෙනමක් මධ්‍යම රාත්‍රියෙහි සවකීය ආසනයන්හි කථා කරමින් හුන්හ. එයින් වැඩිමහලු තෙරුන්තාන්සේ තෙසත්තිකඞ්ගය සමාදන් වූ කෙනෙක. එබැවින් උන්වහන්සේ සිය අසුනෙහි පළඟ බැඳගෙන උන්හ. හදිසියෙන් ගැසූ විදුලි එළියෙන් බාල තෙරුන්නාන්සේ එය දැක, "කිම්? සවාමීනි! තෙසත්තිකද"යි විවාළෝ ය. වැඩි මහලු තෙරුන්නාන්සේ සවකීය ධුත ගුණය අහවන්නට අකැමැති සේක් වහා සැතපී ගත්හ. පසු වැ එහි දී ම එය යළිත් සමාදන් වූහ. මෙයින් ධුතාඞ්ගයන් ඉබේ සමාදන් වුව ද නිවරද බව ප්‍රකාශ වේ.)

ධුතාඞ්ග පිළිබඳ සාධාරණ විනිශ්චය සි.

මෙ තැන් පටන් එක එක ධුතාඞ්ගය පිළිබඳ වෙන් වෙන් වශයෙන් සමාදානය, විධානය, ප්‍රභෙදය, භෙදය, ආනිසංසය යන මොවුන් වර්ණනා කරමිහ.

පංසුකූලිකඞ්ග සමාදානය:-

පංසුකූලිකඞ්ගය සමාදන් වන්නහු විසින් **"ගහපතිදාන චීවරං පටික්ඛිපාමි. පංසුකූලිකඞ්ගං සමාදියාමි"** යන මේ වාක්‍ය දෙකින් අනිමත වාක්‍යයක් කියා සමාදන් විය යුතු. "ගෘහපතීන්

විසින් දෙන සිවුරු හැරපියමි. **පංසුකූලිකඞ්ගය** සමාදන් වෙමි" යනු එහි අර්ථ යි.

පංසුකූලිකඞ්ග විධානය:-

පංසුකූලිකඞ්ගය සමාදන්වූවහු විසින් සොසානිකය, පාපණිකය, රථියවොලය, සඞ්කාරවොලය, සොත්තිය, නහානවොලය, තිත්ථවොලය, ගතපච්චාගතය, අඤ්ඤතරඞ්ගය, ගොඛායිතය, උපවිකාඛායිතය, උසූරඛායිතය, අනන්තරඞ්ගතය, දසාවඞ්ගතය, ඛජාහටය, ථූපචීවරය, සමණචීවරය, ආනිසෙකිකය, ඉද්ධිමයය, පත්තිකය, වාතාහටය, දෙවදත්තිය, සාමුද්දිය යන මේ තෙවිසි වැදෑරුම් වස්ත්‍ර අතුරෙන් යම්කිසි වස්ත්‍රයක් ලබාගෙන කැබැලි කොට ඉරා අබල තැන් හැර සබල වූ කැබලි සෝදා සිවුර සාදා ගෙන පරණ ගෘහපති චීවරය හැර දමා පරිභොග කළ යුතු යි.

තෙවිසි (23) වැදෑරුම් වස්ත්‍රයන්ගේ ආකාර මෙසේ ය.

1. **සොසානිකය**- සිසිවක්හු විසින් සොහොන්හි දැමූ වස්ත්‍රය.
2. **පාපණිකය**- කඩ සාප්පු ඉදිරියෙහි දැමූ හෝ වැටුණු වස්ත්‍රය.
3. **රථියවොලය**- පින් කැමැත්තවුන් විසින් කවුළුදෙරින් වීථියෙහි ලූ වස්ත්‍රය.
4. **සඞ්කාරවොලය**- කසළගොඩ දැමූ වස්ත්‍රය.
5. **සොත්තිය**- සත්‍රීන්ගේ ගැබ්-මල පිසදමා ඉවත ලූ වස්ත්‍රය. (ඇතැම් පින් කැමැති සත්‍රීහු ධුතඞ්ගධරයන් උදෙසා ම එසේ එබඳු වස්ත්‍ර ඉවත දමත්.) **නිස්‍රා** නම් ඇමතියාගේ මව සියයක් අගනා වස්ත්‍රයකින් ගැබ්-මල පිසදමා පංසුකූලිකයෝ ගනිත්වා යි **කාලවෙලි** නම් වීථියෙහි ලාලූය. භික්ෂූන් එය ගත්තේ දිරාගිය තන්හි අණ්ඩා දැමීමට පමණ ය.
6. **නහානවොලය**- යකැදුරන් විසින් හිස පටන් නහවන ලද්දවුන් විසින් කාලකණ්ණිකඞ්ග යි හැර දැමූ වස්ත්‍රය.
7. **තිත්ථවොලය**- නහන තොට හැර දමා ලූ වස්ත්‍රය.

8. **ගතපච්චාගතය**- සොහොනට ගිය මිනිසුන් විසින් ජල ස්නානය කොටැ හැරැ දැමූ වස්ත්‍රය.

9. **අගහිදඬ්ඩය**- ගින්නෙන් පිලිස්සීම නිසා හැරැ දැමූ වස්ත්‍රය. (එබඳු වස්ත්‍ර මිනිස්සු නොහඳින්.)

10. **ගොබාසිතය**- හරකුන් කෑ වස්ත්‍රය.

11. **උපච්කාබාසිතය**- වේයන් කෑ වස්ත්‍රය.

12. **උන්දූරබාසිතය**- මියන් කෑ වස්ත්‍රය (මේ වස්ත්‍ර ද මිනිස්සු නොහඳින්.)

13. **අනතවජ්ජනතය**- අග කඩාගිය වස්ත්‍රය.

14. **දසාවජ්ජනතය**- දැවලූ කඩාගිය වස්ත්‍රය.

15. **ධජාහටය**- නැව් නගින්නවුන් විසින් බඳනා ලද ධවජ වස්ත්‍රය (ඔවුන් නොපෙණී ගිය කල්හි ඒ වස්ත්‍රය ගනුත් වටී. යුඬ භූමියෙහි බඳින ලද ධවජ වස්ත්‍රය ද දෙසෙනහ නිකුත් වැ ගිය කල ගනුත් වටී.)

16. **ථූපච්චරය**- තූඹස්වල බලි කම් පිණිස බැඳි වස්ත්‍රය.

17. **සමණචීවරය**- භික්ෂූන් සතු වස්ත්‍රය.

18. **අභිසෙකිකය**-රජුන් අභිෂෙක කළ තන්හි දමා ගිය වස්ත්‍රය.

19. **ඉඩ්ඩිමය**- ඒහි භික්ෂු චීවරය.

20. **පන්පිකය**- අතර මඟ වැටුණු වස්ත්‍රය (සාමීන් අතින් සිහිමුළාවෙන් වැටුණු වස්ත්‍රය ද මදක් බලාගත යුතුයි.)

21. **වානාහටය**- සුළඟින් ගෙන ගිය වස්ත්‍රය (හිමියන් නොදක්නා කල්හි ගනුත් වටී.)

22. **දෙවදනතිය**- අනුරුඬ තෙරුන්ට මෙන් දෙවියන් දුන් වස්ත්‍රය.

23. **සාමුද්දිය**- මුහුදු රළින් ගොඩ දැමූ වස්ත්‍රය.

(මේ තෙවිසි වස්ත්‍ර අතුරෙන් යම් වස්ත්‍රයකින් සිවුරු කොට පෙරවන්නට ධුතඞ්ගධරයන්ට වටනේ ය.

පංසුකූලිකයන්ට නුසුදුසු වස්ත්‍ර.

"සඞ්ඝයාට දෙමිහ" යි දෙන ලද වස්ත්‍ර ද, වොලකනිඤ්ඤාවෙන් හෙවත් රෙදි පිණ්ඩපාතයේ යෑමෙන් ලබනලද වස්ත්‍ර ද, පංසුකූලිකයන්ට නුසුදුසුය. හෙවත් ඒ බඳු වස්ත්‍ර පංසුකූල නොවේ.

සමණ චීවර හෙවත් භික්ෂූන් සතු චීවර පංසුකූලිකයන්ට වටනේ යයි යට කියන ලදී. එහි දු **වස්සඟඟයෙන්** ගෙන දුන් සිවුර ඔවුනට නොවටනේය. වස්සඟඟයෙන් ගෙන දුන් සිවුර නම් සංඝයාට හෝ ගණයාට හෝ දෙන්නවුන් වීසින් වස් පිළිවෙළින් දෙන ලද්ද යි.

සෙනාසන චීවරය ද පංසුකූලිකයන්ට නොවටනේය. සෙනාසන චීවර නම් සෙනසුන් කරවූවන් විසින් 'සෙනස්තෙහි වසනුවන් ම පරිභෝග කළ යුතු'ය යි දෙන ලද චීවරය යි. සඟින් නොපමුණුවා දෙන ලද්ද ම පංසුකූල වන බැව් දත යුතු යි එහි දු මේ පහත දැක්වෙන විශෙෂය සලකනු.

යම් වස්ත්‍රයෙක් දායකයන් විසින් යම් භික්ෂුවකගේ පාද මූලයෙහි තබන ලද්දේ ද, ඒ වස්ත්‍රය ඒ භික්ෂුව විසින් පංසුකූලික භික්ෂුවක ගේ අතෙහි තබා දෙන ලද්දේ නම් ඒ වස්ත්‍රය **"එකතෝ සුදධික වස්ත්‍රය"** වේ. (මෙහි එකතෝ සුදධිය නම් දායකයන් විසින් පාදමූලයෙහි තබා දීමෙන් ලද්ද යි. භික්ෂුව පංසුකූලිකයාගේ අතෙහි තිබීමෙන් දෙවන පක්ෂයෙන් සුදධිය නැති විය.)

යම් වස්ත්‍රයෙක් දායකයන් විසින් යම් භික්ෂුවක ගේ අතෙහි තබා දෙන ලද්දේ ද, ඒ භික්ෂුව විසින් ඒ වස්ත්‍රය ඉදින් පංසුකූලික භික්ෂුව ගේ පාදමූලයෙහි තබා දෙන ලද්දේ ද එවිට ද එය එකතෝ සුදධික වේ. (මෙහි එකතෝ සුදධිය නම් භික්ෂුව විසින් පංසුකූලිකයා ගේ පාදමූලයෙහි තබා දීමෙන් ලද්ද යි. දායකයා භික්ෂුව ගේ අතෙහි තබා දීමෙන් මුල පක්ෂයෙන් සුදධිය නැති විය.)

දායකයන් විසින් භික්ෂුවකගේ පාදමූලයෙහි තබා දෙන ලද වස්ත්‍රය ඉදින් ඒ භික්ෂුව විසිනුදු පංසුකූලිකයා ගේ පාදමූලයෙහි තබා දෙන ලද්දේ නම් එවිට **එය එකතෝ සුදධික වේ.**

දායකයන් විසිනුදු භික්ෂුව ගේ අතෙහි තබා දෙන ලද්ද ඒ භික්ෂුව විසින් පංසුකූලිකයාගේ ද අතෙහි තබා දෙන ලද්දේ නම් එවිට එය උභතෝ සුද්ධියෙන් ම බැහැර වූයේ වෙයි. එ බඳු වස්ත්‍රය උත්කෘෂ්ට නොවූ වස්ත්‍රය සි දත යුතු සි.

මෙසේ පංසුකූල හෙද දැනැ ම පංසුකූලිකයා විසින් චීවර පරිභෝග කළ යුතු සි.

පංසුකූල පිළිබඳ විධානය සි.

පංසුකූලික ප්‍රභෙද.

පංසුකූලිකයෝ වනාහි **උත්කෘෂ්ටය, මධ්‍යමය, මෘදුකය** සි තුන්වැදෑරුම් වෙත්. සොහොතෙහි ලූ වස්ත්‍ර ම ගෙන සිව්රු කොටැ ධරන්නේ **උත්කෘෂ්ටය**. 'පැවිද්දේ ගනිත්වා'සි යම් කිසිවකු විසින් තබන ලද්ද ගෙන ධරන්නේ **මධ්‍යමය.** පාමුල තබා දෙන ලද්ද ගෙන ධරන්නේ **මෘදුකසි.**

පංසුකූලික නෙද.

මේ ත්‍රිවිධ පංසුකූලිකයන් අතුරෙන් යම් කිසි පංසුකූලිකයෙක් ගිහින් විසින් දෙන ලද වස්ත්‍රය තමහට ඉවසුයේ නම් එකෙණෙහි ම ඔහුගේ පංසුකූලිකඞගය බිඳෙන්නේ ය.

පංසුකූලිකානිසංස.

"පංසුකූල චීවරං නිස්සාය පබ්බජ්ජා"[1] යනු වදාළ හෙයින් උපසම්පදා මාලකයෙහි දී තමා ප්‍රතිඥා කළ නිස්සය ධර්මයට අනු වැ පිළිපදින බවය, පළමුවන ආර්‍යවංශයෙහි පිහිටන බවය, චීවරය රැක ගැන්මෙන් වන දුකක් නැති බවය, අනුන් අයත් පැවැතුම් නැති බවය, සොර බියෙන් බිය නැති බවය, පරිභෝගයෙහි තෘෂ්ණා නැති බවය, ශ්‍රමණ සාරූප්‍ය පිරිකර ඇති බවය, **"අප්පඝඤ්ඤානිවෙව සුලභානි ච තානි ච අනවජ්ජානි"**[2] 'පංසුකූල නොඅගතේ ය. ඇමතන්හි ම ලද හැකි බැවින් සුලභය. හෙ ද නිරවද්‍යය'සි **බුදුරජාණන්** වහන්සේ පැසසූ ප්‍රත්‍යය ඇති බවය, ඇසුදුටුවන් පහදින බවය, අල්පෙච්ඡතාදි ගුණයන්ගේ ඵල නිපදන බවය, යහපත් ප්‍රතිපත්තියක් වඩන බවය, පශ්චිම ජනතා සංඛ්‍යාත ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව දෘෂ්ටානුගතියට පමුණුවන බවය යන මේ පංසුකූලිකඞග ධාරීමෙහි ආනිසංස වේ.

---

1 ම: වි: මහාඛන්ධක 104

2 අ: නි: චතුක්කනිපාත 203

"මාරසෙන විඝාතාය - පංසුකූල ධරෝ යති
සන්නද්ධ ඛත්තියෝ යුද්ධ - ඛත්තියෝ විය සොභති"

"කෙලෙස් මර සෙන් වනසනු පිණිස පංශුකූල චීවරධාරී භික්ෂු තෙම යුඩයෙහි සන්නාහ සන්නද්ධ ක්ෂත්‍රිය කුමාරයකු මෙන් බබළන්නේ ය."

"පහාය ඛාසිඛාදිනි - වරවත්ථානි ධාරිතං
යං ලොකගරුනා සත්ථා තං - පංසුකූලං න ධාරයෙ"

"කසි සළු ආදි අගනා පිළි හැරපියා **ත්‍රෛලෝක්‍යාචාර්‍යයන්** වහන්සේ විසින් යම් පවුල් සිවුරක් පොරෝනා ලද්දේ ද, ඒ පවුල් සිවුර කවරෙක් නම් නො ධරන්නේ ද" (පවුල් නම් පංසුකූලයි.)

"තස්මා හි අත්තනෝ භික්ඛු - පතිරූපං සමනුස්සරං
යොගාචාරානුකූලම්හි - පංසුකූලෙ රතෝ භිය"

"එහෙයින් ම උපසම්පදා මාලකයෙහි දී තමන් දුන් ප්‍රතිඥව සිහිකරන භික්ෂු තෙමේ යොගාචාරානුරූප වූ පංසුකූලයෙහි ඇලෙන්නේ ය."

පංසුකූලිකඞ්ගය පිළිබඳ සමාදාන-විධාන-ප්‍රභෙද-
භෙදානිසංස වර්ණනා යි.

තෙචීවරිකඞ්ග සමාදානය.

තෙචීවරිකඞ්ගය සමාදන් වන්නහු විසින් **"චතුත්ථක චීවරං පටික්ඛිපාමි. තෙචීවරිකඞ්ගං සමාදියාමි"** යන මේ වාක්‍ය දෙකින් අභිමත වාක්‍යයක් කියා සමාදන් විය යුතුයි. 'සතර වන සිවුර ප්‍රතික්ෂෙප කරමි. තෙචීවරිකඞ්ගය සමාදන් වෙමි' යනු එහි අර්ථ යි.

තෙචීවරිකඞ්ග විධානය.

තෙචීවරිකඞ්ගය සමාදන්වූවහු විසින් සිව්රෑ පිණිස වස්ත්‍ර ලත් කල්හි අපහස්‍ර නිසා හෝ සිව්රුකර දෙන්නකු නැති නිසා හෝ හිදි ආදි උපකරණ නො ලත් නිසා හෝ ඒ වස්ත්‍රය තැන්පත් කොට තැබිය යුතු යි. එසේ තැබීමෙන් දෙෂයෙක් නැති. සිවුර කොට පඬු ගැසූ කල් පටන් එසේ තබා ගන්නට නො වටනේ ය. ඉදින් තබා ගතහොත් **ධුතාඞ්ගචෝර** වන්නේ ය

තෙචීවරික ප්‍රභෙද

තෙචීවරික ද වනාහි **උත්තරාසඞ්ගය, මඩ්ඣිමය, සඞ්ඝාටිය** යි ත්‍රිවිධ වේ. **උත්තරාසඞ්ගය** විසින් සිවුරු පඬු පොවන කල අඳනය හෝ උත්තරාසඞ්ගය හෝ පළමු කොට පඬු පොවා ඉන් එකක් හැඳ ගෙන පසු ව අනෙක පඬු පෙවිය යුතු යි. ඉන් එකක් පොරවා ගෙන සංඝාටිය පඬු පෙවිය යුතු. සංඝාටිය හැඳගැන්ම නුසුදුසු යි. මේ දක්වූණේ ග්‍රාමාන්ත සෙනාසනයෙහි වසන තෙචීවරිකයා පිළිබඳ වත බව දත යුතු යි. අරණ්‍යයෙහි වසන තෙචීවරිකයා හට භඳනය හා උත්තරාසඞ්ගය යන දෙක ම එක විට පඬු පොවන හැකි ය. ඉදින් කිසිවෙක් හදිසියෙන් ආයේ නම් සිවුර හැඳ පෙරවා ගන්නට හැකි තරම් ආසන්නයෙහි සිටිය යුතු යි.

මඩ්ඣිමයාට වනාහි පඬු ශාලායෙහි තබා තිබෙන **රජන කාෂාවය** හැඳ ගෙන හෝ පෙරවූ ගෙන සිවුරු රඳන්නට වටනේ ය. (පඬුහල්හි පඬු පොවන්නන් ගේ ප්‍රයෝජනය සඳහා එ බඳු සිවුරු ඇති බැව් දත යුතුයි.)

මෘදුකයාට සභාග භික්ෂූන් ගේ සිවුරු හැඳ ගෙන හෝ පෙර වූ ගෙන සිවුරු රඳන්නට වටනේ ය. එහි තිබෙන පසතුරුණක් හෝ හැඳ ගත වටනේ ය. එහෙත් එබන්ද නිත්‍ය පරිභොගයට නුසුදුසු යි. මේ මෘදුකයා හට අතරින් පතර සභාග භික්ෂූන් ගේ සිවුරු ද පරිභොග කළ හැකියි.

තෙචීවරික භෙද

තෙචීවරික හට වටිනොත් වටින්නේ තුන් රියන් දික් එක් රියන් පුළුල් දන්කඩෙක් (අංසකඩක්) පමණෙකි. ඒ හැර අන් සතර වන සිවුරක් ඉවසූ කෙණෙහි ඔහුගේ අඩගය බිඳෙන්නේ ය.

තෙචීවරිකාණිසංස

තෙචීවරික භික්ෂු වනාහි භඳනා පොරෝනා චීවර මාත්‍රයෙකින් සතුටු වන බැවින් පක්ෂියකුට සේ තම සතු තුන් සිවුර ගෙන කැමැති දිසාවෙක යා හැකි බව ය, සුවල්ප කෘත්‍ය ඇති බව ය, වස්ත්‍ර සන්නිධි නැති බව ය, (වස්ත්‍ර සන්නිධි නම් පසුව ප්‍රයෝජන ගැන්ම සඳහා වස්ත්‍ර එකතු කොට තබා ගැන්මය.) සැහැල්ලු පැවැතුම් ඇති බව ය, අධික සිවුරු උදෙසා ලෝභ නො කරන

බව ය, කැප සිවුරු ද පමණ දැනැ ගන්නා බව ය, කෙලෙස් ලියාලන පැවතුම් ඇති බවය, අලොවජතාදීන් ගේ ඵල නිපදවන බවය, යනාදි ආනිසංස තෙවීවරිකඞ්ග ධැරීමෙහි වන්නේ ය.

"අතිරෙකවස්ස තණ්හා - පහාය සන්නිධිවිවජ්ජිතෝ ධීරෝ
සනෙනාස සුඛරසඤ්ඤු - තිවීවරධරෝ භවති යොගී".

"අතිරෙක වස්ත්‍රයන්හි තෘෂ්ණාව හැරපියා වස්ත්‍ර සන්නිධියෙන් තොර වූ ධීර යොගාවචර තෙම සනෙනාස සුඛයෙහි රස දන්නේ තෙවීවරිකඞ්ගය ධරන්නේ ය.

"තස්මා සපත්ත චරණෝ - පක්ඛිව සවීවරොව යොගිවරෝ
සුඛමනුවිවරිතුකාමෝ -- වීවර නියමේ රතිං කයිරා".

"එහෙයින් පියාපත් සහිත පක්ෂියකු මෙන් තුන්සිවුරු ධර යොගාවචර තෙම සැපසේ හැසිරෙනු කැමැත්තේ වීවර නියම-යෙහි ඇලුම් කරන්නේ සි."

තෙවීවරිකඞ්ගය පිළිබඳ සමාදාන-විධාන-ප්‍රභෙද-
භෙදානිසංස වණ්ණා සි.

පිණ්ඩපාතිකඞ්ග සමාදානය

පිණ්ඩපාතිකඞ්ගය සමාදන් වන්නහු විසින් **"අතිරෙක ලාභං පටික්ඛිපාමි. පිණ්ඩපාතිකඞ්ගං සමාදියාමි"** යන මේ වාක්‍ය දෙකින් අභිමත වාක්‍යයක් කියා සමාදන් විය යුතුසි. 'අතිරෙක ලාභ හැරපියමි. පිණ්ඩපාතිකඞ්ගය සමාදන් වෙමි' යනු එහි අර්ථයි.

පිණ්ඩපාතිකඞ්ග විධානය

පිණ්ඩපාතිකඞ්ගය සමාදන් වූවහු විසින් සංඝභත්තය, උද්දෙස භත්තය, නිමන්තනය, සලාක භත්තය, පක්ඛිකය, උපොසථිකය, පාටිපදිකය, ආගන්තුක භත්තය, ගමික භත්තය, ගිලාන භත්තය, ගිලානුපට්ඨාන භත්තය, විහාර භත්තය, ධුර භත්තය, වාර භත්තය යන **තුදුස් ඔන්** කොං ඉවසිය යුතු.

තුදුස් බත්

1. **සංඝභත්තය**— සංඝයාට දෙනු ලබන බත.
2. **උද්දෙසභත්තය**— භික්ෂූන් කිප දෙනෙකු උදෙසා දෙනු ලබන බත.
3. **නිමන්තනය**— සංඝයාට හෝ පුද්ගලයනට හෝ නිමන්ත්‍රණය කොට දෙනු ලබන බත.
4. **සලාකභත්තය**— සලාකාලීමෙන් දෙනු ලබන බත.
5. **පක්ඛිකභත්තය**— සැදැහැවතුන් විසින් පක්ෂයකට වරක් දෙනු ලබන බත.
6. **උපොසථිකය**— පොහොය පොහොය දෙනු ලබන බත.
7. **පාටිපදිකය**— පැළවියෙහි දෙනු ලබන බත.
8. **ආගන්තුකභත්තය**— ආගන්තුක භික්ෂූන්ට දෙනු ලබන බත.
9. **ගමිකභත්තය**— ගමන් යන්නට සූදානම් භික්ෂූන්ට දිය යුතු බත.
10. **ගිලානභත්තය**— ගිලනුන්ට දිය යුතු බත.
11. **ගිලානුපට්ඨානභත්තය**— ගිලනුන්ට උපස්ථාන කරනුවන්ට දිය යුතු බත.
12. **විහාරභත්තය**— සැදැහැතියන් විසින් ඔවුන් කළ වෙහෙර වසනුවන්ට දෙනු ලබන බත.
13. **ධුරභත්තය**— සංඝයාට හෝ පුද්ගලයනට හෝ 'ධුර බත් දෙමි' යි නිතර දෙන බත.
14. **වාරභත්තය**— ගම් වැසි ආදීන් වාරයෙන් වාරය දෙන බත.

"සඟ බත ගත මැනව" යනාදි වශයෙන් නො කියා "අපගේ ගෙයි සංඝයා දන් වළඳති. ඔබ වහන්සේ ද භික්ෂාව ගත මැන වැ"යි කියන ලද නම් ඉවසීම වටනේය. සංඝයා කෙරෙන් ලැබෙන නිරාමිස සලාකා ද විහාරයෙහි පිසන බත ද ගන්නට වටනේම ය. **නිරාමිස සලාකා** නම් යාවකාලිකය හැරැ සෙසු තුන් කාලික පිළිබඳ සලාකාහි.

පිණ්ඩපාතිකඞ්ග ප්‍රභේද

පිණ්ඩපාතික ද **උත්කෘෂ්ටය, මධ්‍යමය, මෘදුකය** යි ත්‍රිවිධ වේ. උත්කෘෂ්ට පිණ්ඩපාතික වනාහි ඉදිරියෙන් ද, පස්සෙන් ද ගෙනෙන පිණ්ඩපාතය ගන්නේ ය. සම්මුඛ වූ ගෘහද්වාරයෙහි

සිට ඉල්ලා ගන්නවුන්ට පාත්‍රය ද දෙන්නේ ය. පාත්‍රය බොජුන්හලට ගෙන ගොස් දෙන පිණ්ඩපාතය ද ගන්නේ ය. "ස්වාමීනි! අද පිණ්ඩපාතයේ නො වැඩිය මැනව. වෙහෙරට ම භික්ෂාව ගෙනෙම්හ" යි කියන උපාසකයන් ගේ බස් ඉවසා එ දවසේ හිඳ ආහාර නො ගන්නේ යි.

මධ්‍යම වනාහි එසේ එ දවසට දෙන පිණ්ඩපාතය විහාරයෙහි හිඳ ද ගන්නේ ය. සෙට දවසට එබන්ද නො ඉවසන්නේ ය.

මෘදුක වනාහි සෙට දවසට ද, මතු දවසට ද එබන්ද ඉවසන්නේ ය. මෙයින් මධ්‍යම-මෘදුක දෙදෙන රිසි සේ විහරණ සුවය නො ලබන බව ද, උත්කෘෂ්ටයා ම එය ලබන බව ද දත යුතු යි.

(ඒ සඳහා කථාවක් මෙසේ ය.)

එක් ගමෙක **මහා ආයුෂ්වංශ** සූත්‍රයෙන් ධර්මදේශනාවෙකි. "අපි දු බණ අසන්නට යම්හ"යි උත්කෘෂ්ට පිණ්ඩපාතික භික්ෂූන් වහන්සේ සෙසු දෙනමට ඇමතූ සේක. "ස්වාමීනි! අද භික්ෂාව පිණිස එක මිනිසකු විසින් මම හිඳුවන ලදිමි"යි එක නමෙක් කීය. අනෙක් නම ද "ස්වාමීනි! හෙට්ට පිළිගත් භික්ෂාවක් ඇතැ"යි කීයේ ය. මෙයින් ඒ දෙනම ම ධර්මරසයෙන් පිරිහුණේ ය. උත්කෘෂ්ට වනාහි උදැසනක්සේ ම පිඬු පිණිස හැසිරී ගොස් ධර්මරසය වින්දේ යි.

පිණ්ඩපාතිකඞ්ග භෙද.

සංඝභත්තාදි අතිරෙක ලාභ ඉවසූ කෙණෙහි මේ තුන් නමගේ ම පිණ්ඩපාතිකඞ්ගය බිඳෙන්නේ ය.

පිණ්ඩපාතිකඞ්ගානිසංස.

"පිණ්ඩියාලොපභොජනං නිස්සාය පබ්බජ්ජා"[1] යනු වදාළ හෙයින් උපසම්පදා මාලකයෙහි දී ප්‍රතිඥා කළ නිශ්‍රයානුකූල වූ ප්‍රතිපත්ති ඇති බවය, දෙවන ආයුෂ්වංශයෙහි පිහිටන බවය, අනුන් අයත් පැවැතුම් නැති බවය, **"අප්පඝාතානි චෙව සුලභානි ච තානි ච අනවජ්ජානි"**[2] යි **බුදුන්** වහන්සේ පසස්නා ලද ප්‍රත්‍යය ඇති බවය, කුසීත බව මැඩපියන බවය. පිරිසිදු දිවිපෙවෙත් ඇති බවය, සෙඛියාහි වදාළ පිළිවෙත් පිරෙන බවය,

[1] ම: ව: මහාඛන්ධක 104

[2] අ: නිවාතසූත්‍රනිපාත 203

අනුන් විසින් පොෂණය නො කරනු ලබන බවය, අනුනට අනුග්‍රහ කරන බවය, **"අනනමිදං භික්ඛවෙ ජීවිකානං යදිදං පිණ්ඩොලාල්‍යං"**[1] යනු වදළ හෙයින් අන්තිම ජීවිකායෙහි පිහිටි බැවින් මානය දුරුවන බවය, මිශ්‍රාහාරයෙන් යැපෙන බැවින් රසතෘෂ්ණාව වැළකෙන බවය, **ගණභොජන**[2] **පරම්පරභොජන**[3] **වාරිත්ත**[4] යන ශික්ෂාපදයන්ගෙන් ඇවැත් නොවන බවය, (මේ ශික්ෂාපදයන්ගේ භාවය ප්‍රාතිමොක්ෂයෙන් දැනගත යුතු.) අල්පෙච්ඡතාදි ගුණයන්ට අනුලොම් වැ පවතින බවය, යහපත් පිළිවෙත් වැඩෙන බවය, පශ්චිම ජනතාවට අනුකම්පා කරන බවය යනු පිණ්ඩපාතිකයාගේ ආනිසංස සි.

"පිණ්ඩියාලොප සනතුට්ඨො - අපරායත්ත ජීවිකො
පහීණාහාරලොලුප්පො - හොති වාතුද්දිසො යති,
විනොදයති කොසජ්ජං - ආජීවස්ස විසුජ්ඣති
තස්මාහි නාතිමඤ්ඤෙය්‍ය - භික්ඛාචරියං සුමෙධසො"

"පිණ්ඩපාත භොජනයෙන් සතුටු වූ අනුන් අයත් ජීවිකා නැත්තා වූ ප්‍රහීණ කළ ආහාර තෘෂ්ණා ඇත්තා වූ භික්ෂු තෙම සිව් දිසාවට ම සුදුස්සෙක් වන්නේ ය. හෙතෙම කුසීත බව දුරු කරයි. උහුගේ ආජීවය පිරිසිදු සි. එහෙයින් ප්‍රාඥ භික්ෂු පිණ්ඩපාතචර්‍යාව නො ඉක්මවන්නේ සි"

"මේ පිණ්ඩපාතික මහණ වනාහි ඉදින් ලාභ කීර්තිකාමී නො වේ නම් තමා ම පොෂණය කරන්නා වූ අන්‍යයන් පොෂණය නො කරන්නා වූ තාදී ගුණ ඇති ඒ භික්ෂු හට දෙවියෝ ද සතුටු වෙත්" වදළේ මැයි. උදානයෙහි:-

"පිණ්ඩපාතිකස්ස භික්ඛුනො
අනනභරස්ස අනඤ්ඤපොසිනො
දෙවා පිහයන්ති තාදිනො
නො වෙ ලාභසිලොක නිස්සිතො"[5] සි.

පිණ්ඩපාතිකඞ්ගය පිළිබඳ සමාදාන, විධාන, ප්‍රභෙද භෙදනිසංස වර්ණනා සි.

සපදානචාරිකඞ්ග සමාදානය.

සපදානචාරිකඞ්ගය සමාදන් වන්නහු විසින් **"ලොලුප්ප චාරං පටික්ඛිපාමි. සපදානචාරිකඞ්ගං සමාදියාමි."** යන මේ වාක්‍ය දෙකින් අභිමත වාක්‍යයක් කියා සමාදන් විය යුතු. 'තෘෂ්ණාදියෙන් ගෙපිළිවෙළ ඉක් මැ පිඬු සිඟීම හැර පියමි. සපදානචාරිකඞ්ගය සමාදන් වෙමි' යනු එහි අර්ථ සි.

---

[1] ඉ: පා: 189, [2] පාචි: පා: 86, [3] පාචි: පා: 90, [4] පාචි: පා: 114
[5] උ: පා: තණ්හාවග්ග 76

සපදානචාරිකඞ්ග විධානය

සපදානචාරිකාඞ්ගය සම්මදන් වූවහු විසින් පිණ්ඩපාතයේ යාම සඳහා ගම්දෙරට පැමිණ එහි සිට උපද්‍රව නැති බව සැලකිය යුතු. යම් ගමෙක හෝ වීථියෙක උපද්‍රව ඇත්නම් ඒ ගම හෝ වීථිය හැර අන් තැනෙක යා යුතු. යම් ගෙයෙක හෝ වීථියෙක හෝ ගමෙක හෝ කිසිවක් නො ලැබේ නම් එය ගම නො වේ ය යි සලකා යා යුතු. යම් තැනෙක ලැබේ නම් එය හැර නො යා යුතු. මෙසේ කෙසින් කල් ඇති වැ පිඬු පිණිස යා යුතු බව සැලකිය යුතුයි. කල් ඇති වැ නිය කල්හි අපහසු තැන් හැරපියා යා හැකි බැවිනි. ඉදින් විහාරයෙහි දන් දෙන්නෝ හෝ අතරමග මනුෂ්‍යයෝ හෝ පාත්‍රය ගෙන පිණ්ඩපාතය දෙත් නම් එය ගත යුතුයි. කියයුත්තෙක් ඇති. මහ යන සපදාන චාරික භික්ෂුව භික්ෂාචාර වේලාව පැමිණි කල්හි ඒ පැමිණි ගම නො යික් මැ පිඬු පිණිස හැසිරිය යුතු. ඒ ගමෙහි කිසිවක් නො ලද්දේ නම් ලද දේ යැපීමට මද නම් ගම් පිළිවෙළින් යා යුතුයි.

සපදානචාරිකාඞ්ග ප්‍රභේද

සපදානචාරික වතාහි **උත්කෘෂ්ටය, මධ්‍යමය, මෘදුකය** යි ත්‍රිවිධ වේ. **උත්කෘෂ්ට** වතාහි පෙරටුවෙන් හා පස්සෙන් ගෙනෙන ලද්දා වූ ද හොජනශාලාවට ගෙනවුත් දෙනු ලබන්නා වූ ද භික්ෂාව නො ගන්නේ ය. යම් ගෙදෙරකට පැමිණියේ නම් ඒ ගෙදර දී ඉල්ලාගන්නවුන්ට පාත්‍රය දෙන්නේය. මේ ධුතාඞ්ග පූරණයෙහි **මහා කාශ්‍යප** සවාමි සමානයෙක් නැත. උන්වහන්සේ පෙසකාර වීථියෙහි දී දුප්පත් වෙසින් සිටි **සක්දෙව්රජ** හට පාත්‍රය දුන්සේක.

මධ්‍යම වතාහි පෙරටුයෙන් හා පස්සෙන් ගෙනෙන ලද භික්ෂාව ද, හොජන ශාලාවට ගෙනවුත් දෙනු ලබන භික්ෂාව ද පිළිගන්නේ ය. පැමිණි ගෙදෙර දී ඉල්ලන්නවුන්ට පාත්‍රය ද දෙන්නේ ය. එතකුදු වුවත් භික්ෂාව බලාපොරොත්තු වෙමින් නො හිඳින්නේ ය. මෙයින් මේ මධ්‍යමයා ද උත්කෘෂ්ටයාට අනුලොම් වන බව දත යුතුයි.

මෘදුක වතාහි එ දවස වැඩ හිඳ භික්ෂාව බලාපොරොත්තු වන්නේ ය.

සපදානචාරිකඞ්ග භෙද

මේ තුන් කමගේ ම ලොලුපපචාරය ඉපිදූ ගෙපිළිවෙළ හැරපී ඇසිල්ලේ අඞ්ගය බිඳෙන්නේ ය.

සපදානචාරිකඞ්ගානිසංස

කිසි කුලයකටත් නිතර නො එළඹෙන බැවින් ඇමකල ම කුලයන්හි අලුත් බව ය, කිසි තැනෙකත් ලග්න නොවන බැවින් හා සෞම්‍ය බැවින් සඳ බඳු බවය, කුල මච්ඡරිය නැති බවය, සම අනුකම්පා ඇති බවය, කුලයන් කරා නො එළඹෙන බැවින් කුලූපක ආදීනව නැති බවය, ආරාධනා ලැබීමෙන් සතුටු නො වන බව ය. භික්ෂාව ගෙනත් දීමෙන් ප්‍රයෝජන නැති බවය. අල්පෙච්ඡතාදි ගුණයන්ට අනුලොම් වන බවය යන මේ ආනිසංස සපදානචාරිකයාට වන්නේ සි.

"චන්දූපමෝ නිච්චනවෝ කුලෙසු-අමච්ඡරී සඛ්ඛසමානු කම්පෝ
කුලූපකාදීනව විප්පමුත්තෝ-හොතීධ භික්ඛු සපදානචාරී.
ලොලුප්පචාරංච පහාය තත්ථා-ඔක්කිත්තචක්ඛු සුගමත්තගා දස්සි
ආඝංඛමානෝ භුවි සෙරි චාරං-චරෙය්‍ය ධීරෝ සපදානචාරී."

"මේ සාසනයෙහි සපදානචාරී භික්ෂු තෙම වන්දයා බඳු වූයේ කුලයෙහි ඇම කල්හි ම අලුත් ය. නො මසුරු ය. සියල්ලන් කෙරෙහි සම අනුකම්පා ඇත්තේ ය. කුලූපක ආදීනවයෙන් මිදුණේ ය.

එහෙයින් ලොල් බැවින් ගෙ පිළිවෙළ ඉක් මැ සිඟීම හැරපියා යට හෙළා ලූ ඇස් ඇති වැ - වියදඬු පමණ බලමින් ලොකයෙහි රිසි සේ විහරණ කැමැති ප්‍රාඥ තෙමේ සපදානචාරිකඞ්ගය පුරන්නේ සි."

සපදානචාරිකඞ්ගය පිළිබඳ සමාදාන-විධාන-ප්‍රභෙද-
භෙදානිසංස වර්ණනා සි.

එකාසනිකඞ්ග සමාදානය.

එකාසනිකඞ්ගය සමාදන් වන්නහු විසින් **"නානාසන භොජනං පටික්ඛිපාමි. එකාසනිකඞ්ගං සමාදියාමි"** යන මේ වාක්‍ය දෙකින් අභිමත වාක්‍යයක් කියා සමාදන් විය යුතු. "නොයෙක් අසුන්හි හිඳ වැළඳීම හැර පියමි. එකාසනිකඞ්ගය සමාදන් වෙමි" යනු එහි අර්ථයි.

එකාසනිකඞ්ග විධානය.

එකාසනිකඞ්ගය සමාදන් වූවහු විසින් වළඳනු සඳහා ආසන සාලායෙහි හිඳ ගන්නේ නම් ථෙරාසනයෙහි නොහිඳ තමහට සුදුසු ආසනයක් ගෙන හිඳ ගත යුතුයි. ඉදින් වළඳන අතර ආචාර්‍ය්‍ය උපාධ්‍යායන් වහන්සේ අවු නම් නැගිටැ වත් පිළිවෙත් කළ යුතු. ත්‍රිපිටක චූලාභය ස්ථවිරයෝ ද මේ මෙසේ ම සඳහන් කරත්.

එකාසනිකඞ්ග ප්‍රභෙද.

එකාසනිකඞ්ග ද **උත්කෘෂ්ටය, මධ්‍යමය, මෘදුකය** යි ත්‍රිවිධ වේ. **උත්කෘෂ්ට** වනාහි සුවල්ප වේවා බොහෝ වේවා යම් භොජනයකට අත ගැසුයේ නම්, එයින් අන්‍යයක් නො වළඳන්නේ ය. "සඞ්ඝාමීන් වහන්සේ කිසිවක් නො වැළඳුවෝ"යයි මිනිස්සු ගිතෙල් ආදිය දුන්හු නම් බෙහෙත් පිණිස විනා අනර පිණිස ඒ නො ගන්නේ ය.

මධ්‍යම වනාහි පාත්‍රයෙහි භොජන නිම නොවන තෙක් ලැබෙන දේ ගන්නේ ය. එහෙයින් හෙතෙමේ **භොජන පරියන්තිකය** යි කියනු ලැබේ. (වළඳ අවසන් වනතාක් ලැබෙන භොජන වළඳන බැවිනි.)

මෘදුක වනාහි ආසනයෙහි හිඳින තාක් ලැබෙන භොජන වළඳන්නේ ය. ඔහුට **උදකපරියන්තිකය** යි කියනු ලැබේ. පාත්‍රය සෝදන ජලය නො ගන්නා තාක් වළඳන බැවිනි. තව ද ඔහුට ම **ආසනාපරියන්තිකය** යි ද කියනු ලැබේ. ආසනයෙන් නො නැගිටින තාක් වළඳන බැවිනි.

එකාසනිකඞ්ග භෙද.

අන් ආඛ්‍යානයෙක හිඳැ වැළඳු ඇසිල්ලෙහි මේ තුන් නමගේ ම ධුතඞ්ගය බිඳෙන්නේ ය.

එකාසනිකඞ්ගානිසංස.

නිරොග බවය, ශරීර දුක් නැති බවය, සැහැල්ලු පැවැතුම් ඇති බවය, කාය බල ඇති බවය, සුවසේ වසන බවය, අතිරිත්ත විනය කර්‍මය නො කළ භොජන වැළඳීමෙන් වන ඇවැත් සිදු නො වන බවය, රස ගෙධ දුරු කරන බවය, අල්පෙච්ඡතාදි ගුණයන්ට අනුලොම් වන බවය යන මේ ආනිසංස ධුතඞ්ගධරයාට ලැබෙන්නේය.

"එකාසනභොජනෙ රතං - න යතිං භොජන පච්චයා රුජා
විසහන්ති රසෙ අලොලුපෝ-පරිභාපෙති න කම්මමත්තනෝ
ඉති එාසු විහාර කාරණෙ - සුවිසල්ලෙඛ රතූපසෙවිතෙ
ජනයෙථ විසුඛමානසෝ - රති මෙකාසන භොජනෙ සදා."

"භොජන හෙතුවෙන් වන රොග එකාසනිකඞ්ගයෙහි නියැලුණු මහණහු නො පෙළන්නේ ය. රසගෙධ රහිත වූ හෙතෙම සවකීය කර්මය නො පිරිහෙළා ගන්නේ ය.

එ බැවින් සැප විහරණයට හෙතු වූ, පිරිසුදු සැහැල්ලු ගුණෙහි ඇලුණවුන් විසින් සෙච්තා ලද්දා වූ, එකාසන භොජනයෙහි පිරිසුදු සිත් ඇති මහණ ඇමකල්හි ඇලුම් කරන්නේ යි"

එකාසනිකඞ්ගය පිළිබඳ සමාදාන-විධාන-ප්‍රභෙද-
භෙදනිසංස වණ්ණනා යි.

පත්තපිණ්ඩිකඞ්ග සමාදානය.

පත්තපිණ්ඩිකඞ්ගය සමාදන් වන්නහු විසින් **"දුතියඤ භාජනං පටික්ඛිපාමි. පත්තපිණ්ඩිකඞ්ගං සමාදියාමි"** යන වාක්‍ය දෙකින් අභිමත වාක්‍යයක් කියා සමාදන් විය යුතු. "දෙවන භාජන හැර පියමි. පත්තපිණ්ඩිකඞ්ගය සමාදන් වෙමි" යනු එහි අර්ථ යි.

පත්තපිණ්ඩිකඞ්ග විධානය.

පත්තපිණ්ඩිකඞ්ගය සමාදන් වූවහු විසින් කෑද වළඳන විට භාජනයෙක තබා යම් කිසි ව්‍යඤ්ජනයෙක් ලබන ලද්දේ නම් එය හෝ කෑද හෝ පළමු කොට වැළඳිය යුතුයි. මේ කියන ලද්දේ කැදෙහි වූ කල පිළිකුල් ඉපදෙන මස් ආදිය සඳහා ය. කැදෙහි වූ කල පිළිකුල් නො වන මී සකුරු ආදියෙක් නම් කැදෙහි බහා ලා ම වැළඳිය යුතු. එබන්දක් පිළිගන්නා කල්හි ද ප්‍රමාණයෙන් ම පිළිගත යුතු. (එක භාජනයෙහි ම ගනිමි යි බොහෝ කොට නො ගත යුතුයි.) මිරිස් ආදි අමු දෙයක් නම් අතින් ගෙන

වැළඳුවත් නො වටනේ කොං වේ. එතකුදු වුවත් එය ද පාත්‍රයෙහි ඛහාගත යුතු. දෙවන භාජන ප්‍රතික්ෂේප කළ බැවින් පත්කොළ ද නුසුදුසු බව දත යුතුයි.

පත්තපිණ්ඩිකාඞ්ග ප්‍රභෙද.

පත්තපිණ්ඩික ද වනාහි **උත්තරාෂ්ටය, මධ්‍යමය, මෘදුකය** යි ත්‍රිවිධ වේ. **උත්තරාෂ්ටහට** උක්සප විතා අත්කිසි රොඩුවකු දූ බැහැර ලන්නට නො වටනේය. බත්පිඬු, මත්ස්‍ය, මාංස හා කැවුම් පවා කඩා කන්නට නොවටනේය. (පළමු කොට ම ඒ සියල්ල වළඳන පමණට පිළියෙල කර ගත යුතු.) **මධ්‍යමහට** එක අතකින් කඩා කන්නට වටනේ ය. එහෙයින් ඔහුට **භක්ෂායොගි** යයි කියනු ලැබේ. **මෘදුකහට** පාත්‍රයෙහි බහා ගත හැකි කවර දෙයක් වුව ද අතින් හෝ දතින් හෝ කඩා කන්නට වටනේය. එහෙයින් ඔහුට **පාත්‍රයෝගි** යයි කියනු ලැබේ.

පත්තපිණ්ඩිකාඞ්ග භෙද.

දෙවන භාජනයක් ඉවසූ ඇසිල්ලෙහි මේ තුන් නමගේ ම ධුතඞ්ගය බිඳෙන්නේ සි.

පත්තපිණ්ඩිකාඞ්ගානිසංස.

නානා රස වැළඳීමෙහි තෘෂ්ණා දුරු කරන බවය, අත්‍රිච්ඡතා දුරු කරන බවය, ආහාර වැළඳීමෙන් දිවි රැක ගන්නා ප්‍රයෝජනය පමණක් සලකන බවය. ථාලකාදි (පිහන්) පරිහරණයෙන් කරදර නැති බවය, නානා භාජන ගත වූ ව්‍යඤ්ජනයෙහි එක භාජන ගත සංඥ ඇති බැවින් අවිඝ්ඝාපත වූ භෝජන ඇති බවය, අල්පෙච්ඡතාදි ගුණයන්ට අනුලොම් වන බවය, යනු මේ ධුතාඞ්ග ධාරණයෙහි ආනිසංස සි.

"නානා භාජනවික්කඛපං - හිත්වා ඔකඞ්ඛිතලොවනෝ
ඛණනෙනා විය මූලානි - රසතණ්හාය සුඛතෝ,
සරූපං විය සන්තුසිං - ධාරයනෙනා සුමානසෝ
පරිභුඤ්ජය්‍ය ආහාරං - එකා අඤ්ඤා පත්තපිණ්ඩිකා."

"නොයෙක් භාජන ගත වූ විඤ්ඤපය හැරි පියා පත්තසඤ්ඤායෙන් යට හෙළා ලූ ඇස් ඇති, රස තෘෂ්ණායෙහි මුල් සාරන්නක්හු මෙන් යහපත් වූත ඇති, මූතීනිමත් සන්තොෂය ධරන්නකු බදු යහපත් සිත් ඇති, පත්තපිණ්ඩිකයා මිස අන් කවරෙක් අහර වළඳන්නට සමර්ථ වන්නේ ද?"

පත්තපිණ්ඩිකාඞ්ගය පිළිබඳ සමාදාන-විධාන-ප්‍රභෙද-භෙදානිසංස වර්ණනා සි.

බලුපච්ඡාභත්තිකඞ්ග සමාදානය

බලුපච්ඡාභත්තිකඞ්ගය සමාදන් වන්නහු විසින් **"අතිරිත්ත භොජනං පටික්ඛිපාමි. බලුපච්ඡාභත්තිකඞ්ගං සමාදියාමි."** යන මේ වාක්‍ය දෙකින් අභිමත වාක්‍යයක් කියා සමාදන් විය යුතු. "පවාරණ වීමෙන් පසු වැළඳිය හැකි අතිරික්ත භොජනය හැර පියමි. බලුපච්ඡාභත්තිකඞ්ගය සමාදන් වෙමි" යනු එහි අර්ථයි.

බලුපච්ඡාභත්තිකඞ්ග විධානය

බලුපච්ඡාභත්තිකඞ්ගය සමාදන් වූවහු විසින් පවාරණය වූ විට නැවැත්ත භොජනය කැප කොට ගෙන නො වැළඳිය යුතුයි. (උපසපන් භික්ෂු වළඳමින් සිට අත්පසට ගෙනා බත් ආදිය ප්‍රතික්ෂේප කෙළේ නම් පවාරණය වේ. එහෙයින් ඒ ආසනයෙන් නැගිට නැවත වැළඳුව හොත් ආපත්ති සිඛ වේ. ඉදින් අන්‍ය භික්ෂුවක් විසින් ඉතිරි කොට දෙන ලද්දක් වැළඳුව හොත් ආපත්ති නොවේ. එසේ ඉතිරි කිරීම ද වාක්‍යයෙනින් කරනු ලැබේ. බලුපච්ඡාභත්තිකඞ්ගය සමාදන්ව ගත් භික්ෂුහට එසේ ඉතිරි කර දෙන ලද්ද ද වළඳන්නට නො වටනේ ය.)

බලුපච්ඡාභත්තිකඞ්ග ප්‍රභෙද

මේ ද **උත්තරාමටය, මධ්‍යමය, මෘදුකය** යි ත්‍රිවිධ වේ **උත්තරාෂ්ඨ** වනාහි දෙවන පිඬ වළඳන විට පවාරණ වී නම් එ ද නො වළඳන්නේ ය. පළමු වන පිඬෙහි පවාරණවීමෙක් නැති මධ්‍යම යම් භොජනයෙක පවාරණ වී නම් ඒ භොජනය මුත් අනෙක් භොජනයක් නො වළඳන්නේ ය. **මෘදුක** ආසනයෙන් නැගී සිටින තාක් වළඳන්නේ ය.

බලුපච්ඡාභත්තිකඞ්ග භෙද

මේ තුන් දෙන ම පවාරණ වීමෙන් පසු කැප කොට ගෙන වැළඳූ නම් ඒ ඇසිල්ලෙහි ධුතඞ්ගය බිඳෙන්නේ ය.

බලුපච්ඡාභත්තිකඞ්ගානිසංස

අනතිරික්ත භොජන වැළඳීමෙන් විය හැකි ඇවැත් සිදු නො වන බව ය, එක පිඬකිනුදු යැපෙන බැවින් බඞ්ගරිකම නො වන බවය, 'කැප කරගෙන වළඳිමි'යි පරෙස්සම් කොට තබන ආමිස නැති බව ය, නැවත අහර සෙවීමක් නැති බව ය, අල්පෙච්ඡතාදී ගුණයන්ට අනුලොම් වන බව ය යනු මේ ධුතාඞ්ගය ධාරීමේ ආනිසංස යි.

"පරියෙසනාය ලබ්භං - න යාති න කරොති සන්නිධිං ධීරො
ඔදරිකත්තං පජහති - බලුපජ්ජාහතනිච්චකො යොගී
තණ්හා සුගතපඤ්ඤත්තං - සත්තොඝ ගුණාදිවුඩ්ඪිසංජනනං
දෙසෙ විධුනිතු කාමෝ - භජේය්‍ය යොගී ධුතමිදං."

"නුවණැති බලුපජ්ජාහතනිත්‍ය ධුතාඞ්ගධරයා පවාරණය වූ විට යළි නො වළඳන බැවින් භොජනය සෙවීමෙන් වෙහෙසට නො පැමිණෙන්නේ ය. ආමිස සන්නිධිය ද නො කරන්නේ ය. (සන්නිධි කිරීම නම් මතු ප්‍රයෝජන ගන්නා පිණිස රැස්කොට තබා ගැන්ම යි.) ඔදරිකත්තය හෙවත් බඩ පුරවා ගැන්ම සවභාව කොට ඇති බව ද දුරු කරන්නේ ය.

මෙසේ හෙයින් **බුදුරජාණන් වහන්සේ** විසින් පසස්තා ලද්දා වූ ද, සත්තොඝාදි ගුණ වඩන්නා වූ ද, මේ ධුතාඞ්ගය දෙස් දුරුකර ගනු කැමැති යොගීන් විසින් සෙවනය කළ යුතුයි."

බලුපජ්ජාහතනිත්‍යඞ්ගය පිළිබඳ සමාදාන-විධාන-ප්‍රභෙද-
භෙදානිසංස වණ්ණනා යි.

ආරඤ්ඤකඞ්ග සමාදානය.

ආරඤ්ඤකඞ්ගය සමාදන් වන්නහු විසින් **"ගාමන්ත සෙනාසනං පටික්ඛිපාමි. ආරඤ්ඤකඞ්ගං සමාදියාමි."** යන මේ වාක්‍ය දෙකින් අභිමත වාක්‍යයක් කියා සමාදන් විය යුතු. "ග්‍රාමාන්ත සෙනාසනය හැරැ පියමි. ආරඤ්ඤකඞ්ගය සමාදන් වෙමි" යනු එහි අර්ථයි.

ආරඤ්ඤකඞ්ග විධානය

ආරඤ්ඤකඞ්ගය සමාදන් වූවහු විසින් ග්‍රාමාන්ත සෙනාසනය හැරැපියා අරණ්‍යයෙහි අරුණු නැංවිය යුතු. **ග්‍රාමාන්ත සෙනාසනය** නම් උපචාරයත් සමඟ ගමයි. ගම නම් එක කුටියක් හෝ කුටි බොහෝ ගණනක් ඇති වැට පවුරු ආදියෙන් පරික්ෂෙප කරන ලද හෝ නො කරනලද මිනිසුන් ඇති හෝ නැති ප්‍රදෙශයයි. යටත් පිරිසෙයින් සාත්තුවාහකයන් සාරමසක් විසූ තැන පවා ග්‍රාම සඞ්ඛ්‍යාවට ඇතුළත් වන බව දතයුතු. **ග්‍රාමොපචාරය** නම් වැට පවුරු ආදියෙන් පරික්ෂෙප කළ ගමෙහි **අනුරාධපුරයෙහි** මෙන් ඉන්ද්‍රඛීල දෙකක් ඇත්නම් එයින් අභ්‍යන්තර ඉන්ද්‍ර ඛීලයෙහි සිට මධ්‍යම බලාතී පුරුෂයකු විසින් ගැසූ කැටක්

වැටෙන තරම් ප්‍රදේශය යි. මෙයට ලෙඩ්ඩුපාතය යි කියනු ලැබේ. ලෙඩ්ඩුපාතය විනයධරයෝ එක් විධියකට ද, සූත්‍රධරයෝ අන්‍ය විධියකට ද තෝරති. තරුණ මිනිස්සු සවකීය වෙර දක්වා අත දිගු කොට ගල්කැට වීසි කරත්. එබඳු කැට වැටෙන තරම් අතර ප්‍රදේශය ලෙඩ්ඩුපාතය යනු **විනයධරයන් ගේ** මත ය. කවුඩන් එලවන නියායෙන් ගැසූ කැට වැටෙන තරම් අතර ප්‍රදේශය ලෙඩ්ඩුපාතය යනු **සූත්‍රධරයන් ගේ** මත යි. (මේ කීයේ පරික්ෂේප කළ ගමට උපචාරය ලැබෙන සැටියි.)

ඉදින් ගම වැට පවුරු ආදියෙන් පරික්ෂේප නො කරන ලද නම් එහි උපචාරය ලැබෙන සැටි මෙසේ ය: එබඳු ගමෙහි අරණ්‍යයට ආසන්න අන්තිම ගෘහයෙහි සිටි සත්‍රියක් භාජන සෝදා වතුර වීසි කරයි නම් ඒ වතුර වැටෙන තරම් ප්‍රදේශය ගෘහොපචාරයි. ඒ වතුර වැටුණු තැන සිට යට කීසේ ගැසූ ලෙඩ්ඩුපාතය ගම යි. ඒ ලෙඩ්ඩුපාතයේ සිට ගැසූ දෙ වන ලෙඩ්ඩුපාතය ග්‍රාමොපචාරය යි.

අරණ්‍යය ද **විනය** විධිය, **අභිධම්ම** විධිය, **සූත්‍ර** විධිය යි ත්‍රිවිධ වේ. යට දැක්වූ ග්‍රාමය හා ග්‍රාමොපචාරය හැර එයින් ඔබ සියලු වනය **විනය** විධියෙන් අරණ්‍යය යි. **"එපෙතඤ්ඤා ගාමංච ගාමූපචාරංච සබ්බමෙතං අරඤ්ඤං"**[1] යනු එහෙයින් කියන ලදී. බාහිර ඉන්ද්‍රඛීලය හැර එතැන් පටන් ඔබ සියලු වනය **අභිධම්ම** විධියෙන් අරණ්‍යය යි. **"නික්ඛම්මඤ්ච බහි ඉන්ද්‍රඛීලා සබ්බමෙතං අරඤ්ඤං"**[2] යනු එහෙයින් කියන ලදී. සූත්‍ර විධියෙන් අරණ්‍යය නම් දුනු පත්සියයෙකි. **"ආරඤ්ඤකං පන සෙනාසනං පඤ්චධනුසතිකං"** යනු එහෙයින් කියන ලදී. දුන්න තව වියතෙකි. ආරඤ්ඤකඔගය පිළිබඳ වැ ගතයුත්තේ මේ **සූත්‍රානතික** ආරණ්‍යය යි. එය මැණිය යුත්තේ වැට පවුරු ආදියෙන් පරික්ෂේප කළ ගමේ ඉන්ද්‍රඛීලයෙහි හා එසේ පරික්ෂේප නො කළ ගමේ යට දැක්වුණු පරිදි ලෙඩ්ඩුපාතයෙහි පටන් අරණ්‍ය විහාරයේ පරික්ෂේපය දක්වා ය. ඉදින් අරණ්‍ය විහාරය පරික්ෂේප නො කරන ලද්දක් නම් එහි සියල්ලට ඉදිරියෙහි තිබෙන සෙනාසනය හෝ භත්ත ශාලාව හෝ සංඝයා නිතර රැස්වන තැන හෝ බොධිය හෝ චෛත්‍යය හෝ දක්වා මැණිය යුතු. ඒ සථාන අරණ්‍ය සෙනාසනයෙන් දුර වුවද එම ගත යුතු. මේ දැක්වුණේ **විනය** අටුවාවේ මතය යි. **මැදුම්සඟි** අටුවායෙහි වනාහි ගමට මෙන් අරණ්‍ය

[1]පා: පා දුතියපාරාජිකා 49-2 [2]ඛු: ප: ඛ්‍යාත ව්: 190

විහාරයට ද, උපචාර හැර ලෙඩ්ඩුපාත දෙක අතර මැණිය යුතුය සි දක්වන ලදී. **සුත්‍රානතික** ක්‍රමය හෙයින් එය ම මෙහි ප්‍රමාණ වේ.

තව ද කියයුත්තෙක් ඇති. අරණ්‍යයට ආසන්න නමුදු අරණ්‍ය විහාරයෙහි සිටියවුන්ට ගමේ මිනිසුන් ගේ කථා ඇසෙත් නමුදු පළිත ගංගා ආදිය අතර බැවින් සෘජු වැ යන්නට නො හැකි වැ ප්‍රකෘති මාර්ගය ඔරු පාරුවලින් යා යුතු නම් ඒ මාර්ගයෙන් දුනු පන්සියය මැණිය යුතු. ආසන්න වූ ගමට අඩිය සම්පූර්ණ කර ගැන්ම පිණිස යමෙක් ප්‍රකෘති මාර්ගය වසමින් මණි ද ඔහු **ධුතාඞ්ග චෝරයකු** වන බව දත යුතුයි.

තව ද අරඤ්ඤකඞ්ගය සමාදන් වැ ගත් භික්ෂුවක ගේ ආචාර්‍යයන් වහන්සේ හෝ උපාධ්‍යායයන් වහන්සේ හෝ ගිලන් සේක් නම් අරණ්‍යය සප්පාය නො වේ නම් ග්‍රාමාන්ත සෙනාසනයට පමුණුවා උපස්ථාන කළ යුතු. කල් ඇති වැ ගමින් නික් මැ ගොස් අරණ්‍යයෙහි අරුණු නැංවිය යුතු. අරුණු නැඟෙන වේලෙහි රෝගය උත්සන්න වේ නම් ධුතඞ්ගය හැරැපියා උපස්ථාන කළ යුතුයි. ධුතාඞ්ග ශුඞ්ක නො විය යුතුයි.

ආරණ්‍යකාඞ්ග ප්‍රභෙද.

මේ ද **උත්කෘෂ්ටය, මධ්‍යමය, මෘදුකය** සි ත්‍රිවිධ වේ. **උත්කෘෂ්ටයා** විසින් සියලු කල්හි අරණ්‍යයෙහි අරුණු නැංවිය යුතු. **මධ්‍යමයා** වැසි සාරම්භ ග්‍රාමාන්ත සෙනාසනයෙහි විසිය හැකි. **මෘදුකයා** වසසික හෙමන්ත යන අට මස ම ග්‍රාමාන්තයෙහි විසිය හැකි සි.

ආරණ්‍යකාඞ්ග භෙද.

මේ තුන් දෙන ම ඒ ඒ කාල තුල අරණ්‍යයෙන් නික්ම අවුත් ග්‍රාමාන්ත සෙනාසනයෙහි බණ අසන කල්හි අරුණු නැංගත් බණ අසා යන විට අතරමඟ දී අරුණු නැංගත් ධුතාඞ්ගය නො බිඳෙන්නේ ය. ඉදින් ධම්මකථිකයා බණ කියා ආසනයෙන් නැඟී ගිය කල්හි "මොහොතක් නිදා යමි" සි නිදන කල අරුණු නැංගේ නම් එසේ ම සිය කැමැත්තෙන් ග්‍රාමාන්ත සෙනාසනයෙහි අරුණු නැංවී නම් ධුතාඞ්ගය බිඳෙන්නේය.

ආරඤ්ඤකඞ්ගානිසංස

ආරණ්‍යක භික්ෂු අරණ්‍ය සංඥාව මෙනෙහි කරන්නේ නො ලත් සමාධි ලැබෑ ගන්නට ද, ලත් සමාධි රැක ගන්නට ද සම්මා ය. **"තෙනාහං නාගිතනාසා භික්ඛුනෝ අනනමනෝ හොමි අරඤ්ඤේ විහාරෙන"**[1] නාගිතය ඒ අරණ්‍ය විහරණයෙන් මම ඒ භික්ෂුහට සතුටු ඇත්තෙමි" යනු (අංගුත්තර සඟියෙහි) වදාළ බැවින් අරණ්‍යවාසී භික්ෂුහට **ශාස්තෘන්** වහන්සේ සතුටු වන සේක. අසපුවාය රැපාදීහු වනවාසී භික්ෂුහු ගේ සිත වික්ෂිප්ත කළ නො හෙති. විවේකයෙහි පුරුදු බැවින් හෙතෙමේ කිහීය ය. ජීවිත තෘෂ්ණාව දුරු කරයි. විවේක සුඛයෙහි රස වළඳයි. පංසුකූලාදි භාවයට සුදුසු වේ.

"පවිවිත්තෙනා අසංසට්ඨා - පනනසෙනාසනෙ රතෝ
ආරාධයනෙනා නාථස්ස - වනවාසෙන මානසං

එකෝ අරඤ්ඤේ නිවසං - යං සුඛං ලභතෙ යති
රසං තස්ස න විඳනති - අපිදෙවා ස ඉඤ්ජකා

පංසුකූලං ච එසොව - කවචං විය ධාරයං
අරඤ්ඤසඞ්ගාමගතෝ - අවසෙසධුතායුධෝ

සමතෙථා න විරසෙසව - ජෙතුං මාරං සවාහිනිං
තසමා අරඤ්ඤවාසම්හි - රතිං කයිරාථ පණ්ඩිතෝ."

"කාය විවේක ඇති වැ කිසිවකු හා සංසර්ග නැති වැ ප්‍රාණත සෙනස්තෙහි ඇලෙමින් ඒ වනවාසයෙන් **තථාගතයන්** වහන්සේ ගේ චිත්තාරාධනය කරමින්; හුදෙකලා වැ අරණ්‍යයෙහි වසන භික්ෂු යම් සුවයක් වළඳන්නේ නම් **ශක්‍රයා** සහිත දෙවියෝ පවා ඒ සුවයෙහි රසය නො වළඳති. පංසුකූලය කවචයක් සේ ධරමින් සෙසු ධුතාඞ්ග නමැති ආයුධ ඇති වැ අරණ්‍යයෙහි කෙලෙස් යුද්ධයකට ගිය මේ මහණ සෙනා සහිත මාරයා දිනන්නට නොබෝ කලෙකින් සමර්ථ වන්නේ ය එ හෙයින් නුවණැත්තේ අරණ්‍ය වාසයෙහි ආලය කරන්නේ සි.'

ආරඤ්ඤිකඞ්ගය පිළිබඳ සමාදාන-විධාන-ප්‍රභෙද-භෙද ආනිසංස වර්ණනා සි.

---

[1] අ: නි: ඡක්කනිපාත 548

රුක්ඛමූලිකඞ්ග සමාදානය.

රුක්ඛමූලිකඞ්ගය සමාදන් වන්නහු විසින් **"ඡනානං පච්චක්ඛිපාමි. රුක්ඛමූලිකඞ්ගං සමාදියාමි."** යන මේ වාක්‍ය දෙකින් අනිමත වාක්‍යයක් කියා සමාදන් විය යුතු. 'සෙවෙණි කළ (පියසි ඇති) ගේ හැරිපියමි. වෘක්ෂමූලිකාඞ්ගය සමාදන් වෙමි' යනු එහි අර්ථ යි.

රුක්ඛමූලිකඞ්ග විධාන.

රුක්ඛමූලිකඞ්ගය සමාදන් වූවහු විසින් රාජ්‍ය සීමායෙහි පිහිටි රුක් ද, 'දෙවියන් වෙසෙති හි' මිනිසුන් විසින් පුද පවත්වන රුක් ද, ලාටු ගන්නා රුක් ද, පල ගන්නා රුක් ද, වවුලන් වසන රුක් ද, සිදුරු ඇති රුක් ද, විහාර මැද පිහිටි රුක් ද හැර විහාර කෙළවර පිහිටි රුකක් විසුම් පිණිස ගත යුතු.

රුක්ඛමූලිකඞ්ග ප්‍රභේද.

මේ ද වනාහි **උත්කෘෂ්ටය, මධ්‍යමය, මෘදුකය** යි ත්‍රිවිධ වේ. **උත්කෘෂ්ටයාහට,** අනිමත රුකක් ගෙන වැටුණු පරණල පසින් ඉවත් කොට වසන හැකි ය. **ඝකස්** කර වන්නට නො හැකිය. **මධ්‍යමයාහට** ඒ රුක ළඟට පැමිණි කෙනකුන් ලවා **සකස්** කරවා ගන්නට හැකි ය. **මෘදුකයාහට** වනාහි ආරාමිකයන් හා සාමණේරයන් කැඳවා ඔවුන් ලවා ශුද්ධ කරවා සම කරවා වැලි ඉස්සවා ප්‍රාකාරයෙන් වට කරවා දෙරවල් යොදවා ගෙන වසන හැකිය. පූජා දවස්හි එහි නො සිට අන්‍ය ප්‍රතිවිජ්ඤාන තැනෙක විසිය යුතු.

රුක්ඛමූලිකඞ්ග භෙද.

සෙවෙණි කළ ගෙයක වාසය කළ ඇසිල්ලෙහි මේ තුන් දෙනාගේ ම අඞ්ගය බිඳෙන්නේ ය. **අඞ්ගුත්තරභාණකයන** ගේ මතය නම් දැනැ ගෙන සෙවෙණියෙහි අරුණු නැංවූ කල අඞ්ගය බිඳෙන බව යි.

රුක්ඛමූලිකඞ්ගානිසංස.

"රුක්ඛමූලසෙනාසනං නිස්සාය පබ්බජ්ජා"[1] යනු වදාළ හෙයින් නිස්සයානුරූප ප්‍රතිපත්ති ඇති බව ය, **"අප්පානිවෙව සුලභානි ච කානි ච අනවජ්ජානි"**[2] රුක් මුල් සෙනසුන් සුවල්පය, එහෙත් සුලභය, නිරවද්‍ය යි බුදුන් වහන්සේ විසින් වර්ණනා කළ ප්‍රත්‍යයක් වන බව ය, නිතර පත්‍රවිකාර දැක්මෙන් අනිත්‍ය සංඥා පහළ වන බවය, ආවාස මච්ඡරිය හා නවකම්යෙහි යෙදුම්

[1] මි: ව: මහාකච්චායන 104 අ: නි: චතුක්කනිපාත 203

නැති බව ය, දෙවියන් හා එක් වැ වසන බව ය, අල්පෙච්ඡතාදි ගුණයන්ට අනුලෝම් පැවතුම් ඇති බවය යන මේ රුක්ඛ මූලිකඞ්ගානිසංස සි.

"වණ්ණිතො බුද්ධසෙට්ඨෙන – නිස්සයොති ච භාසිතො
නිවාසො පවිවිත්තස්ස – රුක්ඛමූලසමෝ කුතො.

ආවාසමච්ඡරහරෙ – දෙවතා පරිපාලිතෙ
පවිවිත්තෙන වසතෙනා හි – රුක්ඛමූලම්හි සුඛතො.

අහිරතානි නීලානි – පණ්ඩූනි පතිතානි ච
පස්සතෙනා තරුපණ්ණානි – නිච්චසඤ්ඤං පහීයති.

තස්මා හි බුද්ධජ්ජං – භාවනාභිරතාලයං
විවිත්තං නාතිමඤ්ඤෙය්‍ය – රුක්ඛමූලං විවකඛණෙ"

"උතුම් බුදුරජාණන් වහන්සේ විසින් **"අප්පානිවෙව සූලහානි ච"** යනාදීන් පසස්තා ලද්දාවූ ද, **"රුක්ඛමූල සෙනාසනං නිස්සාය පබ්බජ්ජා"**[1] යනුවෙන් වදාරන ලද්දා වූ ද, වෘක්ෂමූලය බදු වූ නිවාසයෙක් විවෙකකාමීන්ට වෙන කොයින් ද? ආවාස මාත්සර්‍යය දුරු කරන්නා වූ දෙවපාලිත විවෙක රුක් මූලැ වසන ව්‍රත සම්පන්න නිඝූ ඉතා රතුවූ ද, ඔද නිල් වූ ද, පඬුවන් වූ ද, බිම වගුල තුරු-පත් දැක්මෙන් නිත්‍ය සංඥව දුරු කරන්නේ ය. එ හෙයින් බුදුන් වහන්සේ ගේ දැවැඳිද වූ, භාවනාභිරතයන්ට වාසස්ථානය වූ, විවෙක රුක් මූල නුවණ ඇත්තේ ඉක්මැ නො සිතන්නේ ය."

රුක්ඛමූලිකඞ්ගය පිළිබඳ සමාදාන-විධාන-ප්‍රභෙද-
භෙදානිසංස වර්ණනා සි.

අබ්භොකාසිකඞ්ග සමාදානය

අබ්භොකාසිකඞ්ගය සමාදන් වන්නහු විසින් **"ජනනං ච රුක්ඛමූලංච පවිකිත්තිපාමි. අබ්භොකාසිකඞ්ගං සමාදියාමි"** යන මේ වාක්‍ය දෙකින් අභිමත වාක්‍යයක් කියා සමාදන් විය යුතු. 'සෙවෙණි කළ ගෙය ද, වෘක්ෂමූල ද හැරපියම්. අබ්භොකාසිකඞ්ගය සමාදන් වෙමි" යනු එහි අර්ථයි.

අබ්භොකාසිකඞ්ග විධානය

අබ්භොකාසිකඞ්ගය සමාදන් වූවහුට බණ අසනු පිණිස හා පොහෝ කරනු පිණිස උපොසථාගාරයට ඇතුළුවන්නට වටනේ ය. ඇතුළු වූ කල වැසි වස්නේ නම් වැසි පෑවූ

---

[1]ම: ව: මහාකඞ්ඛක 104

කල්හි නික්මෑ යා යුතු. වස්තු කල්හි මෑ නොයා යුතු. තව ද හොජන ශාලාවට හා ගිනිහල් ගෙට පැමිණ වත්පිළිවෙන් කරන්නට ද, හොජන ශාලායෙහි සථවිර භික්ෂූන් බතින් විචාරන්නට ද, ඉගෙනීම හෝ උගැන්වීම සඳහා ගෙවලට ඇතුළු වන්නට ද, පිටත දමා තිබෙන ඇඳ පුටු ආදිය ගෙ තුල ලා ලන්නට ද වටනේ ය. මහ යන කල අන් මිහණුන්ගේ පිරිකර අතේ ඇත් නම් වැස්සෙන් නොතෙම්ම සඳහා මාගේ මධ්‍යයෙහි පිහිටි ශාලාවකට ඇතුළු වන්නට ද වටනේ ය. අතේ කිසි පිරිකරක් නැත් නම් සාලාවට යාම සඳහා වේගයෙන් යන්නට නොවටියි. පියවි ගමනින් ගොස් ගෙට වැදූ වැසි නවතින තාක් සිටැ යා යුතුයි. මේ නියමය වෘක්ෂමූලිකයාට ද මෙසේ ම බැව් දත යුතුයි. ('මං මැද සිටි හල් නම් හෙළදිව මෙන් මහින් පහ නොවැ ඉදිවම වැද්ද යුතු හලයි' යනු **සාරකුම්බා** සත්තයි.)

අබ්භොකාසිකඞ්ග ප්‍රභෙද.

මෙ ද වනාහි **උත්තරාෂ්ටය, මධ්‍යමය, මෘදුකය** යි ත්‍රිවිධ වේ. **උත්තරාෂ්ටයාහට** වෘක්ෂයක් හෝ පර්වතයක් හෝ ගෙයක් හෝ ඇසුරු කොට වසන්නට නොවටනේ ය. ඔහු විසින් අභ්‍යවකාශයෙහි චීවර කුටියක් කොටගෙන එහි විසිය යුතු. **මධ්‍යමයාහට** වෘක්ෂ පර්වත ගෘහ ඇසුරු කොට එහි ඇතුළට නොවැද වසන්නට වටනේ ය. **මෘදුකාහට** කටාරම් තොකෙටු ලෙන් ද, තුනී කොට සෙවූ කොළ මඩු ද, ඉටි රෙදි ගෙවල් ද, කුඹුරු රක්නවුන් විසින් හැරැ දැමූ කුටි ද වටනේ සි.

අබ්භොකාසිකඞ්ග භෙද

වාසය පිණිස සෙවෙණි කළ ගෙයකට හෝ රුක් මූලකට හෝ පැමිණි ඇසිල්ලෙහි මේ තුන් දෙනගේ ම ධුතඞ්ගය බිඳෙන්නේ ය. **අඞ්ගුත්තරභාණකයන් ගේ** මතය නම් දූනගෙනා එහි අරුණු නැංවූ කල ධුතඞ්ග බිඳෙන බවයි.

අබ්භොකාසිකඞ්ගානිසංස

ආවාස පළිබොධ නැති වන බව ය, ජීන-මිඩ දුරුවන බව ය, **"මගඤ්ඤා විය අසඞ්ගචාරිනෝ – අනිකෙතා විහරන්ති භික්ඛවෝ"**[1] ගෙවල් නැති භික්ෂූහු මුවන් මෙන් නිස්සඞ්ග වැ (කිසි තැනෙක ඇල්මෙක් නැති වැ) වසති' සි වදාළ ප්‍රශංසාවට

[1]සං: නි: වනසංයුත්ත 124

සුදුසු වන බව ය, කිසි තැනෙක ඇලුම් නැති බව ය, සිව් දිනින් රෑ දිගකට යන හැකි බව ය, අල්පෙච්ඡාදි ගුණයන්ට අනුලොම් වන බව ය යනු මේ ධුතාඞ්ගයා ගේ ආනිසංස සි.

"අනාගාරිය භාවස්ස - අනුරූපෙ අදුල්ලභෙ
තාරාමණ්ඩ විතානමනි - වණ්ඩදිපපභාසිතෙ

අබ්භොකාසෙ වසං භික්ඛු - මිගභූතෙන චෙතසා
ඵීනමිද්ධං විනොදෙත්වා - භාවනාරාමතං සිතො

පවිවෙක රසස්සාදං - න චිරස්සෙව විඳති
යස්මා තස්මාභිසප්පෙය්‍යං - අබ්භොකාසෙ රතො සියා"

"ශ්‍රමණ ධර්මයට සුදුසු දුලීභ නො වන තරු නමැති බුබුළු ඇති, අහස් නමැති වියන් ඇති, සඳපහනින් ආලොක වූ අභ්‍යවකාශයෙහි (ඇලුම් නැති බැවින්) මුවන් ගේ සිත් බදු සිතින් වසන නිසැඟු ථීන-මිද්ධය දුරුකොට භාවනායෙහි ඇලුණේ **නිබ්බාණ** රසාස්වාදය යම් හෙයකින් නො බෝ කලෙකින් ලබන්නේ ද, එ හෙයින් නුවණැත්තේ අභ්‍යවකාශයෙහි ඇලෙන්නේ ය.

අබ්භොකාසිකඞ්ගයෙහි සමාදාන - විධාන - ප්‍රභෙද - භෙද ආනිසංස වණ්ණනාව සි.

සොසානිකඞ්ග සමාදානය

සොසානිකඞ්ගය සමාදන් වන්නහු විසින් **"න සුසානං පවික්කිපාමි. සොසානිකඞ්ගං සමාදියාමි"** යන මේ වාක්‍ය දෙකින් අභිමත වාක්‍යයක් කියා සමාදන් විය යුතු. 'නො සොහොන් හෙවත් සොහොන් ලකුණු නැති තැන් හැර පියමි. සොසානිකඞ්ගය සමාදන් වෙමි' යනු එහි අර්ථ සි.

සොසානිකඞ්ග විධානය

සොසානිකඞ්ගය සමාදන් වූවහු විසින් මිනිසුන් ගම් පිහිටුවා ගෙන සොහොනය සි සම්මත කර ගත් තන්හි නො විසිය යුතු. මළමිනී නො දැවූ තැන සොහොන නො වේ. පළමු මිනී දැවූ තැන වස්වා දෙලොස් වසක් නො දැවුව ද සොහොන ම වන්නේ ය. එහි වසන්නහු විසින් සක්මන් මඩු ආදිය තනවා ගෙනැ ඇඳ පුටු පණවා

ගෙනෑ පැන් දිය එළවා ගෙනෑ බණ කියමින් නො විසිය යුතු. මේ ධුතඞ්ගය දුකසේ පරිහරණය කටයුත්තක් බැවින් මතු ඇති වන උපද්‍රව වළකා ගැනීම සඳහා විහාරයෙහි සංඝසථවිරයන්ට කා ගමේ ගම්මුදලියාට දන්වා අප්‍රමාද වැ විසිය යුතු. සක්මන් කරන කල්හි යටැසින් ආදාහන සථානය බලමින් සක්මන් කළ යුතු. සොහොනට යන කල්හි මහ මගින් නො ගොස් තමා සොසානික බව නො හඟවන පිණිස කුඩා මගින් යා යුතු. රාත්‍රි කාලයෙහි අමනුෂ්‍යයෝවත් දැ සි භය නො සිතෙන පිණිස දවල් කාලයෙහි මඟ අසල තුඹස් රුක් ආදිය ව්‍යවසථා කර ගත යුතු. රාත්‍රි අමනුෂ්‍යයන් හඬ හඬා ඇවිදින බව දුටුව ද කැට කැබලිති ආදි කිසිවකින් ඔවුන්ට නෝ ගැසිය යුතු. සෑම රෑයෙක ම සොහොනට යා යුතු. එක දවසකු දු නො ගොස් නැවතීම නුසුදුසු ය. මැදියම සොහොනෙහි වැසැ අළුයම එයින් නික්මැ යන්නට වටනේ ය. යනු **අඞ්ගුත්තරභාණක** මත සි. අමනුෂ්‍යයන්ට ප්‍රිය වූ තල – මුරුවට – උදුඹත් – මස් – මාංශාදිය නො වැළඳිය යුතු. සොහොන් දුම් වැදගත් බැවින් හා පිශාචයන් විසින් ලුහුබඳිනා බැවින් කුල ගෙවලට නො වැද්ද යුතුසි.

සොසානිකඞ්ග ප්‍රභෙද.

මේ ද **උත්කෘෂ්ටය, මධ්‍යමය, මෘදුකය** සි ත්‍රිවිධ වේ. **උත්කෘෂ්ට** විසින් දිනපතා මිනී පළහන, දිනපතා මිනී වැටෙන, දිනපතා හැඬුම් ඇති සොහොන් ම සෙවිය යුතු. **මධ්‍යමයට** දැක්වුණු තුනින් එකක් ඇති සොහොන් වටනේ ය. **මෘදුකයට** ඒ එකකු දු නැතිවත් සොහොන් **ලක්ෂණ** ඇති තැන් වටනේ සි.

සොසානිකඞ්ග භෙද

සොහොන් නො වන තන්හි විසීමෙන් මේ තුන් තමගේ ම අඞ්ගය බිඳෙන්නේ ය. **අඞ්ගුත්තරභාණක** මතය නම් සොහොනට නො ගියද, බිඳෙන බව සි.

සොසානිකඞ්ගානිසංස

නිතර මිනී දැක්මෙන් මරණානුස්මරණය ලැබෙන බව ය, එ හෙයින් නො පමා වැ වසන බව ය, අශුභාරම්මණ ලැබෙන බව ය, කාමරාග දුරුවන බව ය, නිතර කාය සභාවය දක්නා බව ය, එයින් ම සංවෙග බහුල වන බව ය, ආරොග්‍යමද– යොබ්බනමද – ජීවිතමද නැති වන බව ය, කුඩා මහත් බිය

ඉවසන බව ය, අමනුෂ්‍යයන් විසින් ගරු සම්භාවනා කරනු ලබන බව ය, අල්පෙච්ඡතාදීන්ට අනුලෝම් වන බව ය යනාදිය මේ අඩහ සමාදානයේ ආනිසංස සි.

"සොසානිකං හි මරණානුසතිපභාවා
නිද්දුගතං පි න දූසනති පමාදදොසා
සම්පස්සතො ච කුණපානි බහූනි තස්ස
කාමානුරාගවසගංකි න හොති චිත්තං.

සංවෙගමෙති විපුලං න මදං උපෙති
සම්මා අථො සටති නිබ්බුති මෙසමානො
සොසානිකඩගමිති නෙක ගුණාවහත්තා
නිබ්බාණනින්න හදයෙන නිසෙවිතබ්බං"

"මරණානුසමෘති ආනුභාවය හෙතු කොට නිදි ගත්තා වූ ද සොසානිකයා කරා ප්‍රමාද දෙෂයෝ නො එළඹෙති. නිතර මිනී කුණු දක්නා ඔහුගේ සිත කාමරාගයට වසඟ නො වන්නේ ය.

හෙතෙමේ මහත් සංවෙගයට පැමිණේ. මදයට නො පැමිණේ. එසේ ම නිවන් සොයන්නේ මනා වැ උත්සාහ කෙරෙයි. මෙසේ නොයෙක් ගුණ ඇති බැවින් නිවනට නැමීගත් සිතැත්තහු විසින් සොසානිකඩගය සෙවනය කටයුතුසි."

සොසානිකඩගය පිළිබඳ සමාදාන-විධාන-ප්‍රභෙද-භෙද ආනිසංස වර්ණනා සි.

යථාසන්ථතිකඩග සමාදානය

යථාසන්ථතිකඩගය සමාදන් වන්නහු විසින් **"සෙනාසන ලොලුප්පං පටික්ඛිපාමි. යථාසන්ථතිකඩගං සමාදියාමි"** යන මේ වාක්‍ය දෙකින් අභිමත වාක්‍යයක් කියා සමාදන් විය යුතු. 'සෙනාසන ලොලභාවය හැරපියමි. යථා සන්ථතිකඩගය සමාදන් වෙමි' යනු එහි අර්ථ සි.

යථාසන්ථතිකඩග විධානය

යථාසන්ථතිකඩගය සමාදන් වූවහු විසින් "මෙය නුඹ වහන්සේටය" සි කියා යම් සෙනස්නක් තමාට දෙන ලද්දේ නම් එයින් සතුටු විය යුතු. අන්‍යයෙක් ඔහු උන් සෙනස්නෙන් නො නැගිටිවිය යුතු.

යථාසන්ථතිකඞ්ග ප්‍රභෙද.

මේ ද **උත්කෘෂ්ටය, මධ්‍යමය, මෘදුකය** යි ත්‍රිවිධ වේ. **උත්කෘෂ්ටභාව** වනාහි තමන්ට පැමිණි සෙනස්න දුර ද ළඟ ද යකුන් නයි පොළඟුන් විසින් උපද්‍රැත ද උෂ්ණ ද සීතල දැ යි විචාරන්නට නො වටනේ ය. **මධ්‍යමභාව** එසේ විචාරීමෙන් දෙඟ නැත. ගොස් බලන්නට නො වටනේ ය. **මෘදුකභාව** ගොසින් බලා ඉදින් අරුචි නම් අන් සෙනස්නක් ගන්නට වටනේ යි.

යථාසන්ථතිකඞ්ග භෙද.

තමහට පැමිණි සෙනස්න නො ගෙන "අසවලාගේ සෙනස්න මට දෙව" යි විඥප්තියට පමුණුවා සෙනසුන් ලොල් බව උපන් ඇසිල්ලෙහි මේ තුන්දෙනාගේ ම ධුතාඞ්ගය බිඳෙන්නේ ය.

යථාසන්ථතිකඞ්ගානිසංස.

"යං ලඛං තෙන තුෂ්ඨබ්බං" 'ලද දෙයින් සතුටු විය යුතුය' යි වදාළ අවවාදයට නැමුණු බවය, කිසිවකු උන් සෙනස්නෙන් නො නැඟිටුවන බැවින් සබ්‍රහ්මචාරීන්ට හිතෙසි වන බවය, (මෙයින් කරුණා විහරණය දැක්වේ.) ගිනය ප්‍රණීතය යන අදහස් දුරුවන බවය, (මෙයින් තාදිගුණය දැක්වේ.) ඇලුම්කම් හා විරුඬකම් දුරු වන බවය, අත්‍රිච්ඡතායෙහි දෙර පියාලන බවය, අල්පෙච්ඡතාදීන්ට අනුලොම් වන බවය යනාදිය මේ අංග සමාදානයේ ආනිසංස යි.

"යං ලඛං තෙන සන්තුට්ඨෝ – යථාසන්ථතිකෝ යති
නිබ්බිකප්පෝ සුඛං සෙති – තිණසන්ථරකෙසුපි

න සෝ රජ්ජති සෙට්ඨම්හි – ලීනං ලඛා න කුප්පති
සබ්‍රහ්මචාරී නවකෙ – හිතෙන අනුකම්පති

තස්මා අරියගතාකිණ්ණං – මුනිපුඞ්ගව වණ්ණිතං
අනුසුඤ්ඤථ මෙධාවී – යථාසන්ථතරාමතං"

"ලද දෙයින් සතුටු වන යථාසන්ථතික මහණ තණ ඇතිරියෙහි පවා නිර්විකල්ප වැ සයනය කරන්නේ ය. හෙතෙම උතුම් සෙනස්නෙහි නො ඇලෙන්නේ ය. පහත් සෙනසුන් ලැබැ කොප නො වන්නේ ය. නවක සබ්‍රහ්මචාරීන් කෙරෙහි හිතානුකම්පා

කරන්නේ ය. එබැවින් නුවණැත්තේ ආර්‍ය්‍ය ශතයන් විසින් පුරුදු කළ-මුනි උතුමා විසින් පසස්නා ලද යථාසන්ථතිකඛගයෙහි යෙදෙන්නේ සි.''

යථාසන්ථතිකඛගය පිළිබඳ සමාදාන-විධාන-ප්‍රභෙද-භෙදානිසංස වර්ණනා සි.

නෙසජ්ජිකඛග සමාදානය.

නෙසජ්ජිකඛගය සමාදන් වන්නහු විසින් **''සෙය්‍යං පවික්කිපාමි. නෙසජ්ජිකඛගං සමාදියාමි''** යන මේ වාක්‍ය දෙකින් අභිමත වාක්‍යයක් කියා සමාදන් විය යුතු. 'සයනය කරන ඉරියව්ව හැර පියමි. නෙසජ්ජිකඛගය සමාදන් වෙමි' යනු එහි අර්ථ සි.

නෙසජ්ජිකඛග විධානය.

නෙසජ්ජිකඛගය සමාදන් වූවහු විසින් හිඳැගෙනැ මැ නොහිඳැ - රැ තුන්යම අතුරෙන් එක් යාමයෙක නැගිට සක්මන් කළ යුතු. ඔහුට නුසුදුසු වන්නේ සයනය ඉරියව්ව පමණෙකි. යාම්-සිටීම්-ඉදීම් යන සෙසු තුන් ඉරියව්ව නොවටනේ නොවේ.

නෙසජ්ජිකඛග ප්‍රභෙද.

මේ ද **උත්ඛාෂ්ටය, මධ්‍යමය, මෘදුකය** සි ත්‍රිවිධ වේ. **උත්ඛාෂ්ටඛට** පිටාටුව ද, සිව්රැ අකවටු ද, අයොගපට්ට ද නොවටනේ ය. **මධ්‍යමඛට** මේ තුනින් එකක් වටනේ ය. **මෘදුකඛට** ඒ තුන හා බිමෙබාඛනය ද, පඤ්චාඛගය ද, සප්තාඛගය ද වටනේය. බිමෙබාඛන නම් කොට්ටය. පඤ්චාඛගය නම් පිටිපසට පමණක් ඇඳි ඇති පුටුව. සප්තඛගය නම් පිටිපසට හා දෑලයට ඇඳි ඇති පුටුව, (පා සතරත් සමඟ වූ විට මෙය පඤ්චාඛග හා සප්තාඛග වේ. මේ සප්තාඛගයක් **පිලාඛය** තෙරණුවන්ට කර දුන් බවද, එහි හිඳ උන්වහන්සේ අනාගාමි වූ බවද දක්වා තිබේ. (සයන විශෙෂයක් නොවන බැවින් එය නෙසජ්ජිකඛට අයොග්‍ය නොවන බව එයින් කී සේ සි.)

නෙසජ්ජිකඛග භෙද.

සයනය කළ ඇසිල්ලෙහි මේ තුන්දෙනාගේ ම ධුතාඛගය බිඳෙන්නේ ය.

නෛසද්ධිකඞ්ගානිසංස.

"සෙය්‍යසුඛං පස්සසුඛං මිඛසුඛං අනුයුත්තෙනා විහරති"[1] 'සයනයෙන් ලැබෙන සුවයෙහි ද, ඇලයෙන් ඇලයට පෙරළි පෙරළි නිදන්නහුට වන පාශ්‍රීව සුවයෙහි ද, නිද්‍රා සුවයෙහි ද, යෙදී වාසය කරන්නේය'යි **වෙතොඛිල** සූත්‍රයෙහි වදාළ චෙතොවිනිබන්ධ සිඳලන බවය, සියලු කෝසජ්ජානයන්හි ම යෙදීමට සප්පාය වන බවය, දුටුවන් පහදනා ඉරියව් ඇති වන බවය, වීර්‍යාරම්භයට සුදුසු වන බවය, යහපත් ප්‍රතිපත්ති වඩන බවය යනු මේ ධුතාඞ්ගයා ගේ ආනිසංස සි.

"ආතුජිඤ්ඤා පලලඞ්කං - පණිධාය උජුං තනුං
නිසීදනෙනා විහමෙපති - මාරස්ස හදයං යති.

සෙය්‍යසුඛං මිදධසුඛං - හිත්වා ආරද්ධ වීරියෝ
නිසජ්ජාභිරතෝ භික්ඛු - සොභයතෙනා තපොවනං.

නිරාමිසං පීතිසුඛං - යසමා සමධිගච්ඡති
තස්මා හමනුයුඤ්ජෙය්‍ය - ධීරෝ නෛසද්ධිකං වතං."

'පලඟ බැඳගෙන ශරීරය ඍජු වැ පිහිටුවා ගෙන ඉන්නා මහණ මාරයා ගේ හෘදය කම්පා කරන්නේ ය. හිඳීමෙහි ඇලුණු භික්ෂු සෙය්‍යසුඛ පස්සසුඛ හැර දමා ආරබ්ධ වීර්‍යයෙන් තපොවනය හොබවමින් නිරාමිස ප්‍රීති සුඛය විඳින හෙයින් ශ්‍රුතවත් තෙමේ ඒ නෛසද්ධිකඞ්ගයෙහි යෙදෙන්නේ ය."

නෛසද්ධිකඞ්ගය පිළිබඳ සමාදාන-විධාන-ප්‍රභෙද-භෙද-ආනිසංස වර්ණනා සි.

මෙසේ මේ තෙලෙස් ධුතාඞ්ග සම්බන්ධ **අර්ථ, ලක්ඛණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන, සමාදාන, විධාන, ප්‍රභෙද, භෙද, ආනිසංස** යන මොවුන් ගේ වශයෙන් විනිශ්චය දක්වා දැන් ඔවුන් පිළිබඳවූ ම **කුසලනිද්ධය, ධුතාදි විභාගය, සමාසය, ව්‍යාසය** යන මොවුන් ගේ වශයෙන් විනිශ්චය දක්වනු ලැබේ.

කුශලනිද්ධ වශයෙන්.

මේ සියලු ධුතාඞ්ග පෘථග්ජනයන් ගේ හා ශෛක්ෂ්‍යයන් ගේ වශයෙන් කුසල් ය. රහතන් ගේ වශයෙන් අව්‍යාකෘතය. අකුශල වන ධුතාඞ්ග නැති. (කුශලනිද්ධ නම් **"කුසලා ධම්මා - අකුසලා -**

---

[1]ම: නි: පඨමපණ්ණාසක 113

ධම්මා-අබ්‍යාකතා ධම්මා"[1] යනුවෙන් වදාළ **ධම්මසඞ්ගණී** පාළියයි. ධුතාඞ්ග ඒ වශයෙන් බලන් හොත් කුසල් හා අව්‍යාකෘත වේ. අකුසල් නො වේ යනු භාව යි.) **"පාපිච්ඡා ඉච්ඡාපකතෝ ආරඤ්ඤිකෝ හොති"** 'පාපෙච්ඡ වැ ඉච්ඡායෙන් මඬනා ලදු වැ ආරණ්‍යක වෙයි' යනාදීන් පැමිණෙන බැවින් අකුසල වූ ත් ධුතාඞ්ග ඇත්තේ නො වේ දැ යි යමෙක් විචාරන්නේ නම් එබන්දන් ගේ එ බඳු අරණ්‍යක වීම අවීම වශයෙන් ධුතාඞ්ග නම් නො වේ යයි කිය යුතු. එ බැවින් අකුසල් වන ධුතාඞ්ග නැත් මැ යි. (පාළියෙහි මේ සඳහා දක්වන ලද විසතරයේ නිගමනය මෙ පමණක් බැවින් මෙසේ සංක්ෂෙප කරන ලදී.)

ධුතාදීන් ගේ විභාග වශයෙන්.

මෙහි ලා **ධුතය, ධුත වාදය, ධුත ධර්මය, ධුතාඞ්ගය, කවරකුහට ධුතාඞ්ගසමාදාය වන්නේ ද** යන මේ කරුණු දත යුතු යි.

ධුත නම් මෙහි ධුතාඞ්ග සමාදාන වශයෙන් කෙලෙස් **කම්පා කළ ක්ෂීණාශ්‍රව පුද්ගලයා.** තව ද කෙලෙස් **කම්පා කරන** ධර්ම හෝ ධුතය යි කියනු ලැබේ. **එවිට** ධුත නම් නිෂ්පර්‍යායයෙන් සියලු ආර්‍යමාර්ග ද, පර්‍යායයෙන් විදර්ශනාඥානය ද, යටත් පිරිසෙයින් ධුතාඞ්ගචෙතනා සම්ප්‍රයුක්ත ඥානය ද වේ.

ධුතවාද නම් ධුතාඞ්ගයෙන් අනුනට අවවාද **කරන** පුද්ගලයා ය. එහි දු ධුතවාද නො වූ ධුත පුද්ගලයා ය, ධුතවාද වූ ධුත නො වන පුද්ගලයා ය, ධුතවාදත් නො වූ ධුතත් නො වූ පුද්ගලයා ය, ධුතවාදත් වූ ධුතත් වූ පුද්ගලයා යයි පුද්ගලයෝ සතර දෙනෙක් දත යුතු වෙත්.

බක්කුල තෙරුන් මෙන් යමෙක් තෙමේ ධුතාඞ්ගධර වැ අනුනට ධුතාඞ්ග සමාදානයට අවවාද නො **කරන්නේ** ද හෙතෙමේ ධුතවාද නො වූ ධුත පුද්ගලයා යි. කියන ලද මැ යි. **"තයිදං ආයස්මා බක්කුලෝ ධුතෝ න ධුතවාදෝ"** යි.

යමෙක් **උපනන්ද** තෙරුන් මෙන් තෙමේ ධුතාඞ්ගධර නො වැ අන්හට ධුතාඞ්ගයෙන් අවවාද කරන්නේ ද හෙතෙමේ ධුතවාද වූ ධුත නො වන පුද්ගලයා යි. **කියන** ලද මැ යි. **තයිදං ආයස්මා උපනන්දෝ සක්‍යපුත්තෝ න ධුතෝ ධුතවාදෝ"** යි,

---

[1] ධ: ස: **තිකමාතිකා** 1

යමෙක් **ලාලුදායී** තෙරුන් මෙන් එ දෙකින් ම වියුක්ත ද හෙතෙමේ ධුතවාදත් නො වූ ධුතත් නො වූ පුද්ගලයා යි. කියන ලද මැයි. **"තයිදං ආයස්මා ලාලුදායී නෙව ධුතෝ න ධුතවාදෙ"** යි.

යමෙක් **ශාරීපුත්‍ර** සවාමීන් මෙන් ඒ දෙකින් ම යුක්ත ද හෙතෙමේ ධුතවාදත් වූ ධුතත් වූ පුද්ගලයා යි. කියන ලද මැයි. **"තයිදං ආයස්මා සාරිපුත්තෝ ධුතෝ චෙව ධුතවාදෙ ච"** යි.

ධුතධර්ම නම්

"අප්පිච්ඡතං යෙව නිස්සාය" යනාදීන් වදාළ බැවින් **අප්පිච්ඡතා, සන්තුට්ඨිතා, සල්ලෙඛතා, පවිවෙකතා, ඉදමට්ඨිතා** යන මේ පසඳව ධර්මයෝ ධුතාඞ්ග චෙතනාවට පිරිවර වන බැවින් ධුත ධර්මයෝ යයි කියනු ලැබෙන්. (අප්පිච්ඡතා නම් අලෙපච්ඡ භාවය යි. සන්තුට්ඨිතා නම් ලද දෙයින් සතුටුවීම් සඞ්ඛ්‍යාත දෙලොස් වැදෑරුම් සන්තොෂය යි. සල්ලෙඛතා නම් කෙලෙස් ලියාලන බව යි. පවිවෙකතා නම් උතුම් විවෙක භාවය යි. ඉදමට්ඨිතා නම් යම් නුවණකින් දැවිද්දන් විසින් ධුතාඞ්ගයෙහි පිහිටිය යුතුය යි කියන ලද ද ධුතාඞ්ග සමාදන් වැ පරිහරණය කරනු ලැබේ ද ඒ නුවණ යි. **"ඉදමට්ඨිතා ඤාණමෙව"** යනු එයින් කීහ.) මොවුන් අතුරෙන් අප්පිච්ඡතාව හා සන්තුට්ඨිතාව අලොභයෙහි ද, සල්ලෙඛතාව හා පවිවෙකතාව අලොභ - අමොහ දෙක්හි ද, ඉදමට්ඨිතාව අමොහයෙහි ද ඇතුළත් වේ.

ඒ එසේ මැ යි:- මොවුන් අතුරෙන් **අලොභයෙන්** ගෘහපති විවරාදි ඒ ඒ ධුතාඞ්ගයෙන් ප්‍රතික්ෂෙප කටයුතු වස්තුවෙහි ලොභය ද, අමොහයෙන් ඒ ප්‍රතික්ෂෙප කටයුතු වස්තුවෙහි ම ආරක්ෂාදුඃඛ පරාධීනවෘත්ති චොර භය යන ආදීනව මුවහ කරන මොහය ද, කම්පාකොට හරින්නේ ය. (ආරක්ෂාදුඃඛ නම් රැක ගැනීමෙන් ලැබෙන දුක ය. පරාධීනවෘත්ති නම් අනුන් අයත් පැවතුම් ඇති බව ය.) තව ද අලොභයෙන් **බුදුරජාණන් වහන්සේ** විසින් නිවඝ්‍රරාග පරිභොග වශයෙන් අනුදන්නාලද සුවපහස් ඇති ඇතිරිළි ආදිය පරිභොග කිරීමෙන් පැවති කාමසුඛානු යොගය ද, අමොහයෙන් අතිසල්ලෙඛ වශයෙන් පැවති හෙවත් සුදුසු දෙය ද ප්‍රතික්ෂෙප කිරීම වශයෙන් පැවති අත්තාකිලමථානු යොගය ද කම්පාකොට හරින්නේ ය. එ හෙයින් මෙකී ධර්මයෝ ධුතධර්මයෝ යයි දත යුතු.

ධුතාඞ්ග නම්

යට දැක්වුණු තෙලෙස් ධුතාඞ්ගයෝ ය. ඔවුන්ගේ ලක්ෂණාදිය යට කියන ලද මැයි.

කවරකුහට ධුතාඞ්ග සප්පාය වන්නේ ද

ධුතාඞ්ග වනාහි රාග චරිතයනට හා මොහ චරිතයනට සප්පාය වන්නේ ය. කුමක්හෙයින් ද යත්? ධුතාඞ්ග සෙවනය දුඃඛප්‍රතිපදා වක් හා සල්ලෙඛ විහරණයක් වන බැවිනි. දුඃඛ ප්‍රතිපදාගෙන් රාගය සංසිඳෙන්නේ ය. රාගය සුඛොපකරණ සෙවනයෙන් ලැබෙන හෙයිනි. සල්ලෙඛ විහරණයෙන් අප්‍රමාද පුද්ගලයා ගේ මොහය සංසිඳෙන්නේ ය. සල්ලෙඛය ලැබෙන්නේ ප්‍රඥාවත්හට බැවිනි. ප්‍රඥාව ඇති කල්හි අප්‍රමාදය ලැබෙන හෙයින් මොහය නො පිහිටන්නේ ය. තවද ආරඤ්ඤිකඞ්ග – රුක්ඛමූලිකඞ්ගයෝ වෙෂ චරිතයනට ද සප්පාය වෙති යි කිය යුතු. අරණ්‍යයෙහි හා වෘක්ෂමූලයෙහි අනුන් සමඟ නො ගැවී සිටින්නහු ගේ වෙෂය සංසිඳෙන්නේ ය.

ධුතාඞ්ගයන්ගේ විභාග වශයෙන් වර්ණනා යි.

සමාස හෙවත් සංක්ෂෙප වශයෙන්

මේ ධුතාඞ්ග වනාහි උත්තමාඞ්ගතුනෙක අසම්මිශ්‍රාඞ්ග පසෙකැ යි සංක්ෂෙප වශයෙන් අටෙකි. උත්තමාඞ්ග තුන නම් **සපදානචාරිකඞ්ග, එකාසනිකඞ්ග, අඛොකාසිකඞ්ග** යන තුනයි. (උත්තමාඞ්ග නම් අනෙක් ධුතාඞ්ගයක් නැති වැ නො පවත්නා සුවසේ රැකගත හැකි සෙසු ධුතාඞ්ග ද සංග්‍රහ වන ධුතාඞ්ගයෝ ය.)

ඒ එසේ මැ යි:- සපදානචාරිකඞ්ගය රකින්නේ පිණ්ඩපාතිකඞ්ගය ද රකින්නේ ය. එකාසනිකඞ්ගය රක්නාහට පත්තපිණ්ඩිකඞ්ග - ඛලුපච්ඡාභත්තිකඞ්ග පහසුවෙන් ම රැක ගත හැක. අඛ්භොකාසිකඞ්ගය රක්නාහට රුක්ඛමූලිකඞ්ග-යථාසන්ථතිකඞ්ගයන් අතුරෙන් රැකිය යුතු කුමක් ඇත්තේ ද එහෙයින් මේ ධුතාඞ්ග තුන උත්තමාඞ්ගයෝ යයි කියනු ලැබෙත්.

ආරඤ්ඤිකඞ්ග, පංසුකූලිකඞ්ග, තෙචීවරිකඞ්ග, නෙසජ්ජිකඞ්ග, සොසානිකඞ්ග යන මේ පස අසම්මිශ්‍රාඞ්ගයෝ ය. (අසම්මිශ්‍රාඞ්ගයෝ නම් අන්‍ය ධුතාඞ්ගයන් හා අමිශ්‍ර ධුතාඞ්ගයෝ ය.)

තවද චීවර පිළිබඳ දෙකෙක, පිණ්ඩපාත පිළිබඳ පසෙක, සෙනාසන පිළිබඳ පසෙක, වීර්‍යය පිළිබඳ එකෙකැ යි ධුතාඞ්ග සතර වැදෑරුම් ද වේ. එහි පංසුකූලිකඞ්ගය හා තෙචීවරිකඞ්ගය චීවර පිළිබඳ ය. පිණ්ඩපාතිකඞ්ග, සපදාන චාරිකඞ්ග, එකාසනිකඞ්ග, පත්තපිණ්ඩිකඞ්ග, ඛලුපච්ඡාභත්තිකඞ්ග යන පස පිණ්ඩපාත, පිළිබඳ ය. ආරඤ්ඤිකඞ්ග, රුක්ඛමූලිකඞ්ග, අබ්භොකාසිකඞ්ග, සොසානිකඞ්ග, යථාසන්ථතිකඞ්ග යන පස සෙනාසන පිළිබඳ ය. තෙසජ්ජිකඞ්ගය වීර්‍යය පිළිබඳ යි.

තව ද පච්චයසන්නිස්සිත දෙළොසෙක, විරියසන්නිස්සිත එකෙකැ යි සියලු ධුතාඞ්ග නිස්සය වශයෙන් දෙවදෑරුම් ද වේ. විභාගය සුබෝධ යි.

තව ද සෙවනය කළ යුතු සෙවනය නො කළ යුතු වශයෙන් ද, ධුතාඞ්ග දෙවැදෑරුම් වේ. ධුතාඞ්ග සෙවුනා කල්හි කම්ඵස්ථාන වැඩෙන්නේ නම් ඔහු විසින් එය සෙවනය කළ යුතු. යමෙකුගේ කම්ඵස්ථාන පිරිහෙන්නේ නම් ඔහු විසින් සෙවනය නොකළ යුතු. ධුතාඞ්ග සෙවනය කළ ද නො කළ ද යමෙකුගේ කම්ඵස්ථාන වැඩෙන්නේ නම් නො පිරිහෙන්නේ නම් ඔහු විසින් පශ්චිම ජනතාවට අනුකම්පායෙන් සෙවනය කළ යුතු. ධුතාඞ්ග සෙවනය කළ ද නො කළ ද යමෙකුගේ කම්ඵස්ථාන නො වැඩෙන්නේ නම් ඔහු විසිනුදු මතු වාසනා පිණිස සෙවනය කළ යුතු.

මේ සියලු ධුතාඞ්ග වනාහි සමාදානචෙතනා වශයෙන් එක් වැදෑරුම්. **"යා චෙතනා තං ධුතඞ්ගං වදන්ති"** යනු අට්ඨකථාවෙහි දු කියන ලදී.

සමාස හෙවත් සංක්ෂෙප වශයෙන් වර්ණනා යි.

ව්‍යාස හෙවත් විස්තර වශයෙන්

භික්ෂූන්ට තෙලෙසෙක, භික්ෂුණීන්ට අටෙක, සාමණෙරයන්ට දෙළොසෙක, සික්ඛමානාවන්ට හා සාමණෙරීන්ට සතෙක, උපාසකයන්ට හා උපාසිකාවන්ට දෙකෙකැයි විස්තර වශයෙන් ධුතාඞ්ග දෙසාලිසෙකි. ඉදින් අභ්‍යවකාශයෙහි ආරඤ්ඤිකඞ්ගයට ද සුදුසු වූ සොහොනක් ලැබේ නම් එක භික්ෂුවකට එකවර සියලු ධුතාඞ්ග සමාදන් වැ රැක්ක හැකිය.

භික්ෂුණීන්ට වනාහි ආරඤ්ඤිකඞ්ගය හා ඛලුපච්ඡාභත්තිකඞ්ගය ශික්ෂාපදයෙන් ම තහනම් කරන ලද්දේ ය. අබ්භොකාසිකඞ්ගය, රුක්ඛමූලිකඞ්ගය, සොසානිකඞ්ගය යන තුන

ඔවුන්ට පුරාගත නො හැකිය. කුමක් හෙයින් ද දෙවැන්නකු නැති වැ විසීම නුසුදුසු බැවිනි. මෙබඳු තන්හි එක් වැ විසීමට සුදුසු සමාන අදහස් ඇති දෙවැන්නකු ලබා ගැනීම ද දුෂ්කරය. ඉදින් ලබා ගත්ත ද සංසටඨ විහරණයෙන් නො මිදෙන්නේ ය. සංසටඨ විහරණය ඇති වුවහොත් ධුතාඞග සමාදානයෙහි නියම ප්‍රයොජනය නො ලැබෙන්නේ ය. එබැවින් මේ ධුතාඞග තුන හා මූල කී ධුතාඞග දෙක හැර සෙසු අට භික්ෂූකීන්ට රැක්ක හැකිය යි දතයුතු.

තෙචීවරිකඞගය හැර සෙසු දෙලොස සාමණේරයන්ට රැක්ක හැකි ය.

සික්ඛාමානාවන්ට හා සාමණේරීන්ට තෙචීවරිකඞගය ද භික්ෂූකීන්ට තහනම් කළ පස ද යන සය හැර සෙසු ධුතාඞග සත රැක්ක හැකි ය.

උපාසක උපාසිකාවන්ට එකාසනිකඞගය, පත්තපිණ්ඩිකඞගය යන දෙක පමණක් සුදුසු ය. රැක්ක ද හැකි. මෙසේ විසතර වශයෙන් ධුතාඞග දෙසාලිසෙකි.

ව්‍යාඝ හෙවත් විසතර වශයෙන් වර්ණනා යි.

මෙතෙකින් **"සීලෙ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ"** යනාදි ගාථාව පිළිබඳ **ශීල, සමාධි, ප්‍රඥා** මුඛයෙන් විදුළු **විශුද්ධි මාර්ගයෙහි** අප්පිච්ඡතාදි යම් ගුණයෙකින් යට දැක්වුණු ශීලයාගේ පාරිශුද්ධිය වේ ද ඒ ගුණ සමාදානය පිණිස සමාදන් විය යුතු **ධුතාඞග** කථාව දක්වන ලද්දේ යි.

සජ්ජන ප්‍රමෝදය පිණිස කළ
විශුද්ධිමාර්ගයේ ධුතාඞග නිර්දේශ නම් ද්විතීය පරිච්ඡේදය යි.

මාතර වල්පොළ සිරිමංගල පිරිවෙන් වැසි
ධර්මාචාර්‍ය
පණ්ඩිත මාතර ශ්‍රී ධර්මවංශ ස්ථවිර සවාමීන්
කළ
විශුද්ධිමාර්ග සිංහලානුවාදයෙහි
ද්විතීය පරිච්ඡේදය යි.

---

3. කම්මට්ඨානග්‍රහණ නිද්දේශය

නමෝ භගවතෝ සම්මාසම්බුද්ධස්ස

ධුතාඞ්ග පරිහරණයෙන් අලෝභාදී ගුණ ලැබෙන්නේ ය. අල්පේච්ඡතාදි ගුණයෙන් **ශීලය** ඔප වැටෙන්නේ ය. යට දැක්වුණු ධුතාඞ්ග පරිහරණයෙන් ලත් අල්පේච්ඡතාදි ගුණයෙන් ඔප ලා ගත් ශීලයෙන් යුක්ත භික්ෂු විසින් මතු කුමක් කළ යුතු ද **"සීලෙ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ චිත්තං පඤ්ඤංච භාවයං"** යි චිත්ත ශික්ෂයෙන් වදාළ **සමාධි** වැඩිය යුතු ය. **"චිත්තං භාවයං"** යි ගාථායෙහි ඒ සඳහා වදාළ දෙශනාව **ඉතා** සංක්ෂිප්ත ය. එයින් සමාධි වඩනු තබා ඒ දැනැගැන්ම පවා දුෂ්කර ය. එබැවින් ඒ සමාධි පිළිබඳ විස්තරය ද, වඩන ක්‍රමය ද, ප්‍රශෙනෝත්තර වශයෙන් මෙහි දක්වනු ලැබේ.

ප්‍රශ්න මෙසේ ය.

1. සමාධි නම් කිම
2. කවර අර්ථයකින් සමාධිය යි කියනු ලැබේ ද
3. සමාධි පිළිබඳ ලක්ෂණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨාන කවරේ ද
4. සමාධි කී වැදෑරුම් ද
5. සමාධියෙහි කිලිටි බව කිමෙක් ද
6. සමාධියෙහි පිරිසිදු බව කිමෙක් ද
7. සමාධි වැඩිය යුතු කෙසේ ද
8. සමාධි භාවනායෙහි ආනිසංස කවරේ ද

උත්තර මෙසේ ය.

1. සමාධි නම් කිම

සමාධි නානාවිධ ය. ඒ සියල්ල විසඳන්නට ගියහොත් මෙහි අභිප්‍රෙතාර්ථය සිඳ නොවන්නේ ය. මතු වික්ෂෙප පිණිස ද වන්නේ ය. එ බැවින් මෙහි ලා අදහස් කරනු ලබන අර්ථය පමණක් කියමි. 'සමාධි නම් කුසල් සිත් පිළිබඳ එකාග්‍රතාව යි.'

2. භාවර අර්ථයකින් සමාධිය යි කියනු ලැබේ ද

සමාධානාර්ථයෙන් සමාධිය යි කියනු ලැබේ. සමාධාන නම් කිම? චිත්ත - චෛතසිකයන් ඔබ මොබ විසිර යා නොදී මනා කොටැ-අවික්ෂේප වශයෙන් එක අරමුණෙහි පිහිටුවා ලීම ය. එ බැවින් යම් ධර්මයෙක බලයෙන් චිත්ත - චෛතසික එක අරමුණෙහි සම වැ-මනා වැ-අවික්ෂේප වැ-අවිප්‍රකීර්ණ වැ පවත්නේද ඒ ධර්මය මෙහි සමාධානය යි කී නියා දත යුතු.

3. සමාධි පිළිබඳ ලක්ෂණ - රස - පච්චුපට්ඨාන - පදට්ඨාන කවරේ ද

සමාධියෙහි ලක්ෂණය අවික්ෂේපය යි හෙවත් නානා ලම්බනයෙහි නො විසිරෙන බව යි. (ලක්ෂණ නම් සාමාන්‍ය සවභාවය. **"ධම්මානං සාමඤ්ඤ සභාවෝ ලක්ඛණං"**) රසය වික්ෂේප විධ්වංසනය යි හෙවත් නො සන්සුන් බව නැති කිරීම යි. (රස නම් කෘත්‍ය හෝ සම්පත්ති ය. **"කිච්චසම්පත්තියොරසෝ"**) පච්චුපට්ඨානය අවිකම්පනය යි. හෙවත් උඩවිව හෙතුයෙන් කම්පා නැති බවයි. (පච්චුපට්ඨාන නම් වැටහෙන ආකාරය හෝ ඵලය **"උපට්ඨානාකාරෝ ඵලං ච පච්චුපට්ඨානං"**) **"සුඛිනෝ චිත්තං සමාධියති"**[1] යනු වදුළ හෙයින් සුඛය පදට්ඨානය යි (පදට්ඨාන නම් ආසන්න කාරණය යි. හෙවත් හෙතුව යි. **"කාරණං යං සම්මසනානං පදට්ඨානංති තා මතං"**).

4. සමාධි කී වැදෑරුම් ද

අවික්ෂේප ලක්ෂණයෙන් සමාධි එක් වැදෑරුම්. උපචාර සමාධි, අප්පණා සමාධි වශයෙන් ද; ලෞකික සමාධි, ලොකොත්තර සමාධි වශයෙන් ද; සප්පීතිකසමාධි, නිප්පීතිකසමාධි වශයෙන් ද; සුඛසහගතසමාධි, උපෙක්ඛාසහගතසමාධි වශයෙන් ද දෙ වැදෑරුම් වේ.

හීනසමාධි, මධ්‍යමසමාධි, ප්‍රණීතසමාධි වශයෙන් ද; සවිතක්කසවිචාරසමාධි, අවිතක්කාවිචාරමත්තසමාධි, අවිතක්ක-අවිචාර සමාධි වශයෙන් ද; පීතිසහගත සමාධි, සුඛසහගත සමාධි, උපෙක්ඛාසහගත සමාධි වශයෙන් ද; පරිත්තසමාධි, මහග්ගත-සමාධි, අප්පමාණ සමාධි වශයෙන් ද තෙවැදෑරුම් වේ.

දුක්ඛාපටිපදදන්ධාභිඤ්ඤා, දුක්ඛාපටිපදඛිප්පාභිඤ්ඤා සුඛාපටිපදදන්ධාභිඤ්ඤා, සුඛාපටිපදඛිප්පාභිඤ්ඤා වශයෙන් ද

[1] දී: නි: මහාවගග 148

පරිත්තපරිත්තාරම්මණ, පරිත්තඅප්පමාණාරම්මණ, අප්පමාණ-පරිත්තාරම්මණ, අප්පමාණඅප්පමාණාරම්මණ වශයෙන් ද චතුර්ධ්‍යානාඞ්ග වශයෙන් ද; හානභාගිය, ස්ථිතිභාගිය, විසෙසභාගිය, නිබ්බේධභාගිය වශයෙන් ද; කාමාවචර, රූපාවචර, අරූපාවචර, අපරියාපන්න වශයෙන් ද; ඡන්ද, චිත්ත, වීරිය, වීමංසා වශයෙන් ද සිව්වැදෑරුම් වේ.

පඤ්චධ්‍යානාඞ්ග වශයෙන් පස්වැදෑරුම් වේ. මේ සියල්ල පිළිබඳ විශෙෂ විභාග මතු දක්වනු ලැබේ. එයිනුදු **අව්කෙෂප** ලක්ෂණයෙන් සමාධි එක්වැදෑරුම්ය යි කී අර්ථය සුගම ය. විශෙෂ යෙන් වර්ණනා කළ යුත්තෙක් නැත.

ප්‍රථම භාණය.

උපචාරසමාධි හා අර්පණාසමාධි.

බුද්ධානුස්සති, ධම්මානුස්සති, සඞ්ඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දෙවතානුස්සති, උපසමානුස්සති, මරණස්සති, ආහාරෙ පටිකූලසඤ්ඤා, චතුධාතු වවත්ථාන යන දශකම්ස්ථානයන් ගේ වශයෙන් ලැබෙන එකග්ගතාව ද, අර්පණා සමාධියට පූර්වභාගයෙහි ලැබෙන එකග්ගතාව ද **උපචාර සමාධි** නම් වේ. **"පඨමස්ස ඣානස්ස පරිකම්මං පඨමස්ස ඣානස්ස අනන්තර පච්චයෙන පච්චයෝ"**[1] 'ප්‍රථම ධ්‍යානයාගේ පරිකර්මය ප්‍රථම ධ්‍යානයට අනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.' යනාදීන් වදාළ බැවින් ගොත්‍රභූ සංඛ්‍යාත පරිකර්මයට අනන්තරව ලැබෙන එකාග්‍රතාව **අර්පණා සමාධි** නම් වේ. (මේ පිළිබඳ විස්තරය මතු පළ වේ.)

ද්විතීය භාණය.

ලෞකිකසමාධි හා ලෝකොත්තරසමාධි.

කාම, රූප, අරූප යන භූමිත්‍රයෙහි කුසල චිත්ත එකග්ගතාව ලෞකික සමාධි ය. ආර්‍ය්‍ය මාර්ග සම්ප්‍රයුක්ත වූ එකග්ගතාව ලෝකොත්තර සමාධි යි. (ආර්‍ය්‍ය මාර්ග නම් සොවාන් ආදිය යි.)

තෘතීය භාණය.

සප්පීතිකසමාධි හා නිප්පීතිකසමාධි.

චතුෂ්කනය වශයෙන් ප්‍රථම – ද්විතීය ධ්‍යාන දෙක්හි ද, පඤ්චකනය වශයෙන් ප්‍රථම – ද්විතීය – තෘතීය ධ්‍යාන තුනෙහි ද, පවත්නා එකග්ගතාව සප්පීතික සමාධි ය. චතුෂ්කනය වශයෙන් තෘතීය – චතුර්ථ ධ්‍යාන දෙක්හි ද, පඤ්චකනය වශයෙන් චතුර්ථ – පඤ්චම ධ්‍යාන දෙක්හි ද පවත්නා සමාධි නිප්පීතික සමාධි යි උපචාර සමාධි වනාහි සප්පීතික ද නිප්පීතික ද වන්නේ ය.

---

[1] පඨා: ප: පඤ්හවාර

චතුර්ථ නිකාය.

සුඛසහගත හා උපෙක්ඛාසහගත සමාධි.

චතුෂ්කනය වශයෙන් ප්‍රථම – ද්විතීය – තෘතීය – ධ්‍යානයන්හි ද, පඤ්චකනය වශයෙන් ප්‍රථම-ද්විතීය-තෘතීය-චතුර්ථ ධ්‍යානයන්හි ද, එකඟතාව සුඛසහගත සමාධි ය. චතුෂ්කනය වශයෙන් චතුර්ථ ධ්‍යානයෙහි ද, පඤ්චකනය වශයෙන් පඤ්චම ධ්‍යානයෙහි ද, එකඟතාව සුඛසහගත සමාධි සි. උපචාර සමාධි වනාහි සුඛ-සහගත ද උපෙක්ෂාසහගත ද වන්නේ ය.

ප්‍රථම නිකාය.

හීන, මධ්‍යම, ප්‍රණීත සමාධි.

ආසෙවිත නො වූ ලද මාත්‍ර සමාධි හීන ය. අතිශය ප්‍රගුණ බවට නො පැමිණුවන ලද සමාධි මධ්‍යම ය. අතිශය ප්‍රගුණ බවට පැමිණුවන ලද සමාධි ප්‍රණීත සි.

ද්විතීය නිකාය.

සවිතක්කසවිචාර, අවිතක්ක විචාරමත්තා,
අවිතක්කඅවිචාර සමාධි.

උපචාරසමාධි හා සමග ප්‍රථම ධ්‍යානය සවිතක්කසවිචාර-සමාධි සි. පඤ්චකනයයෙහි ද්විතීය ධ්‍යානය අවිතක්ක විචාර මත්ත-සමාධි සි. එහි අදහස නම් යමෙක් විචාරයෙහි නො වැ විතර්කයෙහි පමණක් ආදීනව දැක හුදෙක් විතර්කය පමණක් ප්‍රහාණය කරනු කැමැති වැ ප්‍රථම ධ්‍යානය ඉක්මවා ද්විතීය ධ්‍යානය ලබන්නේ ද ඔහුගේ ඒ සමාධිය අවිතක්කවිචාරමත්තසමාධිය වන්නේ ය යනු සි. චතුෂ්කනය වශයෙන් තෘතීය ධ්‍යානාදියෙහි ද එකඟතාව අවිතක්කඅවිචාර සමාධි සි.

තෘතීය නිකාය.

ප්‍රීති, සුඛ, උපෙක්ඛා, සහගත සමාධි.

චතුෂ්කනය වශයෙන් ප්‍රථම-ද්විතීය ධ්‍යානයන්හි ද, පඤ්චකනය වශයෙන් ප්‍රථම-ද්විතීය-තෘතීය ධ්‍යානයන්හි ද, එකඟතාව ප්‍රීති සහගත සමාධි සි. චතුෂ්කනය වශයෙන් තෘතීය ධ්‍යානයෙහි ද, පඤ්චකනය වශයෙන් චතුර්ථ ධ්‍යානයෙහි ද, එකඟතාව සුඛ සහගත සමාධි සි. චතුෂ්කනය වශයෙන් චතුර්ථ ධ්‍යානයෙහි ද, පඤ්චකනය වශයෙන් පඤ්චම ධ්‍යානයෙහි ද එකඟතාව උපෙක්ඛා සහගත සමාධි සි. උපචාර සමාධි වනාහි ප්‍රීති සුඛ සහගත හෝ උපෙක්ෂා සහගත හෝ වන්නේ ය.

චතුර්ථ නිකාය

පරිත්ත, මහග්ගත, අප්පමාණ සමාධි

උපචාර භූමියෙහි **එකග්ගතාව** කාමාවචර බැවින් **පරිත්ත සමාධි නම්** වේ. රූපාවචර - අරූපාවචර කුසලයන් පිළිබඳ **එකග්ගතාව මහග්ගත සමාධි** නම් වේ. ආර්‍ය්‍ය මාර්ග සම්ප්‍රයුක්ත **එකග්ගතාව අප්‍රමාණ සමාධි** නම් වේ.

ප්‍රථම චතුෂ්කය

1 දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා, සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා, සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා සමාධි.

(1) දුඃඛ වූ ප්‍රතිපදා ඇති දන්ධ වූ අභිඥා ඇති සමාධියෙක් ද
(2) දුඃඛ වූ ප්‍රතිපදා ඇති ක්ෂිප්‍ර වූ අභිඥා ඇති සමාධියෙක් ද.
(3) සුඛ වූ ප්‍රතිපදා ඇති දන්ධ වූ අභිඥා ඇති සමාධියෙක් ද
(4) සුඛ වූ ප්‍රතිපදා ඇති ක්ෂිප්‍ර වූ අභිඥා ඇති සමාධියෙක් දැ යි සමාධි චතුෂ්කයෙක් ඇත්තේ ය.

එහි **ප්‍රතිපදා** නම් භාවනාවට පටන්ගන්නවුන් ගේ 'පඨවී පඨවී' යනාදීන් කරන ප්‍රථමාභිනිවේශයෙහි පටන් ඒ ඒ ධ්‍යාන පිළිබඳ උපචාරය උපදින තාක් පවත්නා සමාධි භාවනාව යි උපචාරයෙහි පටන් අර්පණාව තාක් පවත්නා ප්‍රඥාව **අභිඥා** යි කියනු ලැබේ. ඇතැම් කෙනෙකුන්ට ඒ ප්‍රතිපදාව දුක් සහගත වේ. නීවරණාදි විරුද්ධ ධර්මයන් ගේ පැවැත්මේ බලවත් බැවිනි. දුක්සහගතවීම නම් පහසුවෙන් නො පවත්නා බව යි. ඇතැම් කෙනෙකුන්ට සුඛසහගත වේ. නීවරණාදි විරුද්ධ ධර්මයන් ගේ බලවත් පැවැත්මක් නැති බැවිනි. සුඛසහගත නම් පහසුවෙන් පවත්නා බව යි. අභිඥාව ද ඇතැම් කෙනෙකුන්ට දන්ධ වේ දන්ධ නම් මඳ වැ පැවැත්ම-ශීඝ්‍ර වැ නො පැවැත්මය යි සේ යි. ඇතැම් කෙනෙකුන්ට ක්ෂිප්‍ර වේ. ක්ෂිප්‍ර නම් නො මඳ වැ පැවැත්ම-ශීඝ්‍ර ප්‍රවෘත්තිය යි සේ යි.

ප්‍රතිපදාව දුඃඛ සුඛ වීමේ ද,
අභිඥාව දන්ධ ක්ෂිප්‍ර වීමේ ද හේතු.

යම් කෙනෙක් මතු දුක්වෙන සප්පාය අසප්පායයන්හි ද, පළිබෝධ සිදලීම් ආදි පූර්ව කෘත්‍යයන්හි ද, අර්පණා කෞශල්‍යයන්හි ද, සප්පාය සෙවනය නො ලබද්ද, ඔවුන් ගේ ප්‍රතිපදාව දුඃඛ වේ; අභිඥාව දන්ධ වේ. එහි සප්පාය සෙවනය ලබන්නවුන්ගේ

ප්‍රතිපදාව ද සුඛ වේ; අභිඥා ක්ෂිප්‍ර වේ. යම් කෙනෙක් වනාහි පූර්භාගයෙහි සප්පාය නො ලැබෑ අපරභාගයෙහි සප්පාය ලබද්ද, පූර්භාගයෙහි හෝ සප්පාය ලැබෑ අපරභාගයෙහි සප්පාය නො ලබද්ද ඔවුන්ට මේ දෙක පිළිබඳ ව්‍යතිමිශ්‍රකත්වය වන්නේ ය. හෙවත් දුක්ඛාප්පටිපදාව හා ඛිප්පාභිඤ්ඤාව ද, සුඛාප්පටිපදාව හා දන්ධාභිඤ්ඤාව ද වන්නේ ය යි දත යුතුයි.

එසේ ම පළිබෝධ සිඳැලීම් ආදි පූර්වකෘත්‍ය සම්පාදනය කොටෑ නො ගෙනෑ භාවනායෙහි යෙදෙන්නවුන් ගේ ප්‍රතිපදාව දුක්ඛ වේ. එසේ සම්පාදනය කොටෑ ගෙනෑ භාවනායෙහි යෙදෙන්නවුන් ගේ ප්‍රතිපදාව සුඛ වේ. අපීණා කෞශල්‍යය සම්පාදනය කෑරූ නො ගන්නවුන් ගේ අභිඥාව දන්ධ වේ. අපීණා කෞශල්‍යය සම්පාදනය කෑරූ ගන්නවුන් ගේ අභිඥාව ක්ෂිප්‍ර වේ. (මෙහි දු ව්‍යතිමිශ්‍රකත්වය පෙර කී සේ සැලකිය යුතුයි.)

තවද තෘෂ්ණා වශයෙන් හා අවිද්‍යා වශයෙන් ද, සමථාධිකාර වශයෙන් හා විදර්ශනාධිකාර වශයෙන් ද, මොවුන් ගේ ප්‍රභේද දත යුතු ය.

ඒ එසේ මෑ යි:- තෘෂ්ණාව සමාධියට ඉදුරා විරුද්ධ බැවින් තෘෂ්ණාධිකයන් ගේ ප්‍රතිපදාව දුඃඛ ය. තෘෂ්ණාධික නො වූවන් ගේ ප්‍රතිපදාව සුඛ ය. අවිද්‍යාව ප්‍රඥාවට ඉදුරා විරුද්ධ බැවින් අවිද්‍යාධිකයන් ගේ අභිඥාව දන්ධ ය. අවිද්‍යාධික නො වූවන් ගේ අභිඥාව ක්ෂිප්‍ර යි. ජන්මාන්තරයෙහි සමථය පුරුදු නො කළවුන් ගේ ප්‍රතිපදාව දුඃඛ ය. ජන්මාන්තරයෙහි සමථය පුරුදු කළවුන් ගේ ප්‍රතිපදාව සුඛ ය. ජන්මාන්තරයෙහි විදර්ශනාව පුරුදු නො කළ වුන් ගේ අභිඥාව දන්ධ ය. පුරුදු කළවුන් ගේ ක්ෂිප්‍ර යි.

තවද ක්ලේශයන් ගේ හා ඉන්ද්‍රියයන් ගේ වශයෙන් ද මොවුන් ගේ ප්‍රභේදය දත යුතු ය. තියුණු වූ කාමච්ඡන්දාදි ක්ලේශයන් ඇති මෘදු වූ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් ඇත්තවුන් ගේ ප්‍රතිපදාව දුඃඛ ය. අභිඥාව දන්ධ ය. එබඳු වූ ම තීක්ෂණ වූ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් ඇත්තවුන් ගේ අභිඥාව ක්ෂිප්‍ර යි. මඳ වූ ක්ලේශ ඇති මෘදු වූ ඉදුරන් ඇත්තවුන් ගේ ප්‍රතිපදාව සුඛ ය. අභිඥාව දන්ධ ය. එ බඳු වූ ම තියුණු වූ ඉදුරන් ඇත්තවුන් ගේ අභිඥාව ක්ෂිප්‍ර යි.

මෙසේ මේ දැක්වුණු ප්‍රතිපදා - අභිඥා අතුරෙන් යම්කිසි දුඃඛ ප්‍රතිපදායෙන් හා දන්ධ අභිඥායෙන් සමාධි ලබන්නේ ද ඔහුගේ ඒ සමාධි **දුක්ඛාප්පටිපදා දන්ධාභිඤ්ඤා යි** කියනු ලැබේ. සෙස්සෙහි දු ක්‍රමය මෙසේ යි.

විතීය චතුෂ්කය

1 පරිත්ත පරිත්තාරම්මණ,
2 පරිත්ත අප්පමාණාරම්මණ,
3 අප්පමාණ පරිත්තාරම්මණ,
4 අප්පමාණ අප්පමාණාරම්මණ සමාධි

1. පරිත්ත වූ පරිත්තාරම්මණ සමාධිය, 2 පරිත්ත වූ අප්පමාණාරම්මණ සමාධිය, 3. අප්පමාණ වූ පරිත්තාරම්මණ සමාධිය. 4. අප්පමාණ වූ අප්පමාණාරම්මණ සමාධිය යි වැළිත් සමාධි චතුර්විධ වේ.

1 ප්‍රගුණ නො කළ වසඟ කැරැ නො ගත්, මතු ධ්‍යාන පිණිස ප්‍රත්‍යය වන්නට අසමර්ථ සමාධි පරිත්තය. හෙ මැ කොවඩන ලද කසිණාරම්මණයෙහි පැවැතියේ පරිත්තාරම්මණ ය.

2. ප්‍රගුණ කළ-වසඟ කැරැ ගත්-මතු ධ්‍යාන පිණිස ප්‍රත්‍යය වන්නට සමර්ථ සමාධි අප්පමාණය. හෙ මැ වඩන ලද අරමුණෙහි පැවතියේ අප්පමාණාරම්මණයි. සෙසු සමාධි දෙක මේ ගුණවයයෙන් මිශ්‍ර වූ පරිදි දත යුතු යි.

තෘතීය චතුෂ්කය

ධ්‍යානාඞ්ග සතර වශයෙන් සමාධි චතුර්විධ වේ.

1 පඤ්චනීවරණයන් විෂ්කම්භනය කැරැ ලත විතක්, විචාර, ප්‍රීති, සුඛ, එකාග්‍රතා යන අඞ්ග පඤ්චකයෙන් යුක්ත වූයේ ප්‍රථම ධ්‍යාන ය.

2 විතක්, විචාර, සංසිදුවීමෙන් ප්‍රීති, සුඛ, එකාග්‍රතා යන අඞ්ග ත්‍රිකයෙන් යුක්ත වූයේ විතීය ධ්‍යාන ය.

3 ප්‍රීතිය සංසිදුවීමෙන් සුඛ, එකාග්‍රතා යන අඞ්ගවයයෙන් යුක්ත වූයේ තෘතීය ධ්‍යාන ය.

4 සුඛ සංසිදුවීමෙන් උපෙක්ෂා, එකාග්‍රතා යන අඞ්ගවයයෙන් යුක්ත වූයේ චතුර්ථ ධ්‍යාන යි.

චතුර්ථ චතුෂ්කය.

1. හානභාගිය, 2. ඨිතිභාගිය, 3. විසෙසභාගිය, 4. නිබ්බෙධභාගිය සමාධි.

1. හානභාගිය සමාධි, 2. ඨිතිභාගිය සමාධි, 3. විසෙසභාගිය සමාධි, 4. නිබ්බෙධභාගිය සමාධිය යි සමාධි චතුර්විධ වේ.

1 භානභාගිය සමාධි නම් පිරිහීම සෙවුනා සමාධි යි. ඒ වනාහි ඒ ඒ ධ්‍යානයන්ට ප්‍රතිපක්ෂ වූ නීවරණ – විතර්ක – විචාරාදීන් ගේ පැවැත්මෙන් වන්නේ ය. **"පඨමස්ස ඣානස්ස ලාභිනො කාමසහගතසඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති භානභාගිනී පඤ්ඤා"**[1] 'ප්‍රථම ධ්‍යාන ලාභීහට කාමාස්වාදයෙන් කාමාලම්බන වූ සංඥාමනස්කාරයෝ පවතින් නම් පරිහානිය සෙවුනා ප්‍රඥාව යි' යනු එහෙයින් කීහ.

2 ඨිතිභාගිය සමාධි නම් (පිරිහීම් හෝ වැඩීම් නැති වැ) සථිතිය සෙවුනා සමාධි යි. ඒ වනාහි තදනුරූප සමාධියගේ පැවැත්මෙන් වන්නේ ය. **"තදනුධම්මා සති සණ්ඨිතත්තා ඨිතිභාගිනී පඤ්ඤා"**[1] යනු එ හෙයින් කීහ.

3 විසෙසභාගිය සමාධි නම් විශෙෂ (වැඩීම) සෙවුනා සමාධි යි ඒ වනාහි මතු විශෙෂාධිගමයට ප්‍රත්‍යය වශයෙන් වන්නේ ය. **"අවිතක්කසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විසෙසභාගිනී පඤ්ඤා"**[1] 'අවිතර්කාලම්බන වූ සංඥා මනස්කාරයෝ වෙත් නම් විශෙෂ සෙවුනා ප්‍රඥාව යි' යනු එ හෙයින් කීහ.

4 නිබ්බෙධභාගිය සමාධි නම් නිවන් සෙවුනා සමාධි යි. එ වනාහි ආදීනව දර්‍ශනය පුරා කොටැ ඇති නිබ්බිදාසහගත සංඥා මනස්කාරයන්ගේ වශයෙන් වන්නේ ය. **"නිබ්බිදාසහගතා සඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා නිබ්බෙධ භාගිනී පඤ්ඤා"**[1] යනු එයින් කීහ. යට දක්වුණු චතුර්ධ ප්‍රඥයෙන් යුක්ත බැවින් සමාධි ද චතුර්ධ ය යි දත යුතු යි.

පඤ්චම චතුෂ්කය

1 කාමාවචර, 2 රූපාවචර, 3 අරූපාවචර, 4 අපරියාපන්න සමාධි.

1 සියලු උපචාරයන්හි පවත්නා එකාග්‍රතා කාමාවචර සමාධි යි

2 රූපාවචර කුශල චිත්තයන්හි පවත්නා එකාග්‍රතා රූපාවචර සමාධි යි.

3 අරූපාවචර කුශල චිත්තයන්හි පවත්නා එකාග්‍රතා අරූපාවචර සමාධි යි.

4 ලොකොත්තර කුශල චිත්තයන්හි පවත්නා එකාග්‍රතා අපරියාපන්න සමාධි යි.

---

[1] වි: ප: සුත්තවිභඞ්ග 246

සඡඪ චතුෂ්කය

1 ඡන්ද 2 විරිය 3 චිත්ත 4 වීමංසා සමාධි.

1 භික්ෂු කෙනෙක් ඡන්දය අධිපති කොට සමාධියක් (විත්තෙකාග්‍රතාවක්) ලබද්ද එය **ඡන්ද සමාධිය** යි කියනු ලැබේ.

2 භික්ෂු කෙනෙක් වීර්‍යය අධිපති කොට සමාධියක් (විත්තෙකාග්‍රතාවක්) ලබද්ද එය **විරිය සමාධිය** යි කියනු ලැබේ.

3 භික්ෂු කෙනෙක් චිත්තය අධිපති කොට සමාධියක් (විත්තෙකාග්‍රතාවක්) ලබද්ද එය **චිත්ත සමාධිය** යි කියනු ලැබේ.

4 භික්ෂු කෙනෙක් ප්‍රඥව අධිපති කොට සමාධියක් (විත්තෙකාග්‍රතාවක්) ලබද්ද එය **වීමංසා සමාධිය** යි කියනු ලැබේ.

පඤ්චවිධ සමාධි

1 **විතර්ක - විචාර - ප්‍රීති - සුඛ - එකාග්‍රතා** යන අඟ පසඳකයෙන් යුක්ත වූයේ **ප්‍රථම-ධ්‍යාන** සමාධි යි.

2 විතර්කය පමණක් ඉක්මීමෙන් **විචාර - ප්‍රීති - සුඛ - එකාග්‍රතා** යන අඟ චතුෂ්කයෙන් යුක්ත වූයේ **ද්විතීය - ධ්‍යාන** සමාධි යි.

3 විචාරය ද ඉක්මීමෙන් **ප්‍රීති - සුඛ - එකාග්‍රතායෙන්** යුක්තවූයේ **තෘතීය-ධ්‍යාන** සමාධි යි.

4 ප්‍රීතිය ද ඉක්මීමෙන් **සුඛ - එකාග්‍රතායෙන්** යුක්ත වූයේ **චතුර්ථ-ධ්‍යාන** සමාධි යි.

5 සුඛ හැර ඒ සිලව්වට **උපෙක්ෂාව** ලැබ එයින් හා **එකාග්‍රතායෙන්** යුක්ත වූයේ **පඤ්චම-ධ්‍යාන** සමාධි යි.

චතුෂ්කනයයෙහි **විතර්ක-විචාර** දෙක ම එකවර ඉක්මීමෙන් **ද්විතීය ධ්‍යානය** වේ.

මෙහි විතර්කය පමණක් ඉක්මවීමෙන් **ද්විතීය ධ්‍යානය** ද, විතර්ක - විචාර දෙක ම ඉක්මවීමෙන් **තෘතීය ධ්‍යානය** ද වේ යි දත යුතු යි.

සමාධි භෙද නිමියේ ය.

5. සමාධියෙහි කිලිටි බව කිමෙක් ද
6. සමාධියෙහි පිරිසිදු බව කිමෙක් ද

යන මේ ප්‍රශ්න ඤාණවිභඞ්ගයෙහි විසඳන ලද්දේ ම ය. එහි විසඳූ ආකාරය මෙසේ ය. **"සංකිලෙසංති භාගභාගියෝ ධම්මෝ. වොදානංති විසෙසභාගියෝ ධම්මෝ"**[1] 'කිලිටි බව නම් භාගභාගිය ධර්ම යි. පිරිසිදු බව නම් විසෙසභාගිය ධර්ම යි.'

(එහි දු **"පඨමස්ස ඣානස්ස ලාභිං කාමසහගතාසඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති භාගභාගිනී පඤ්ඤා"**[2] යි කී නියායෙන් භාගභාගිය ධර්ම ද, **"අවිතක්කසහගතා සඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති විසෙසභාගිනී පඤ්ඤා"**[2] යි කී නියායෙන් විසෙසභාගිය ධර්ම ද දත යුතු යි.

පඨමස්ස ඣානස්ස ලාභිං = අප්‍රමාණ වූ ප්‍රථම ධ්‍යාන ලාභීහු; **කාමසහගතා** = ආලම්බන වශයෙන් කාම සහගත වූ; **සඤ්ඤා මනසිකාරා** = සංඥා-මනසිකාර යන මොහු; **සමුදාචරන්ති**=වොදනා කෙරෙද් ද, (ධ්‍යානයෙන් නැංගහු පෙළද් ද යන අර්ථ යි.) **භාගභාගිනී පඤ්ඤා** = කාමයෙහි පවත්නා සංඥා මනසිකාරයන් ගේ වශයෙන් ප්‍රථම ධ්‍යාන සංඥා තොමෝ පිරිහෙන්නේ ය.

අවිතක්කසහගතා = අවිතර්කී වූ විතීය ධ්‍යාන ආලම්බන වශයෙන් අවිතර්ක සහගත වූ; **සඤ්ඤා මනසිකාරා** = සංඥා මනසිකාරයෝ; **සමුදාචරන්ති** ප්‍රගුණ වූ ප්‍රථම ධ්‍යානයෙන් නැංගහු විතීය ධ්‍යානාධිගමය පිණිස වොදනා කරද් ද (පෙළද් ද); **විසෙසභාගිනී පඤ්ඤා**= විතීය ධ්‍යානයෙහි පවත්නා සංඥා මනසිකාර වශයෙන් ප්‍රථම ධ්‍යාන ප්‍රඥා තොමෝ විශෙෂ වූ දෙවන ධ්‍යානොත්පත්තියට පදස්ථාන බැවින් විශෙෂ භාගිනී නම් වේ." යනු (පරාක්‍රමබාහු සන්නය.)

7. සමාධි වැඩිය යුතු සෙසේ ද

ලෞකික – ලොකොත්තර වශයෙන් දෙවැදෑරුම් වූ සමාධි අතුරෙන් ලොකොත්තර සමාධි වඩන ක්‍රමය ප්‍රඥා භාවනායෙහි සඞ්ගෘහීත ය. ප්‍රඥාව දඩන කල්හි එද වැඩෙන බැවිනි එහෙයින් ඒ සඳහා කිසිවක් මෙහි නො දක්වමු.

ලෞකික සමාධි වනාහි යට ශීල පරිච්ඡේදයෙහි දැක්වුණු සේ සිල් පිරිසිදු කොටැ ගෙන, සුපරිශුද්ධ ශීලයෙහි පිහිටා- දශපලිබෝධ අතුරෙන් එක පලිබෝධයක් හෝ ඇත්නම් එ ද දුරුකොට, කර්මට්ඨාන දෙන කල්‍යාණ මිත්‍රයන් වහන්සේ නමක් කරා එළඹැ, සතලිස් කර්මස්ථාන අතුරෙන් සුදුසු ය

[1]සං: වි: විභඞ්ගඨ කථා 282 [2]වි: ප: ඤාණවිභඞ්ග 246

චරිතානුකූල වූ කම්ඨානයක් ලබාගෙනැ, සමාධි භාවනාවට අයොග්‍ය විහාරස්ථාන හැරැපියා යොග්‍ය විහාරස්ථානයෙහි වසමින්, සුළු පලිබෝධ ද දුරැකොටැ, භාවනාවට නියම විධි එකකුදු නොපිරිහෙලමින් භාවනා කළ යුතු. මේ මෙහි සංක්ෂේපය සි.

විස්තර මෙසේ දත යුතු සි.

"දශ පලිබෝධ අතුරෙන් එක පලිබෝධයෙක් හෝ ඇත්නම් ඒ ද දුරැ කොටැ" කී තන්හි

දස පලිබෝධ නම්:-

"ආවාසෝ ච කුලං ලාභෝ - ගණෝ කම්මංච පඤ්චමං,
අද්ධානං ඤාති ආබාධෝ - ගන්ථෝ ඉද්ධි කි තෙ දස"

1 ආවාස, 2 කුල, 3 ලාභ, 4 ගණ, 5 නවකම්, 6 අද්ධාන, 7 ඥාති, 8 ආබාධ, 9 ග්‍රන්ථ, 10 ඍද්ධි යන මොහු සි.

1. **ආවාස** යන්නෙන් එක කාමරයෙක් හෝ එක පිරිවෙනෙක් හෝ සියලු සංඝාරාමය හෝ කියවේ. ඒ ආවාස වනාහි සියල්ලන්ට පලිබෝධ වන්නේ නො වේ. යමෙක් ඒ ආවාසවල නවකම්දියෙහි යෙදී වසන්නේ ද, බොහෝ බඩු රැස්කොට තබන්නේ ද, සිහිල් සෙවන ඇත මිහිරි පැන් ඇත මැනව යනාදී යම්කිසි කාරණයෙකින් අපෙක්ෂාවත් වැ - පිළිබඳ සිත් ඇති වැ වසන්නේ ද, ඔහුට ම පලිබෝධ වේ. එසේ නැත්තකුට පලිබෝධ නො වේ. ඒ සඳහා දෘෂ්ටාන්ත කථාවෙක් මෙසේ ය.

අනුරාධපුරයෙන් නික් මැ කුලදරුවෝ දෙදෙනෙක් **ථූපාරාමයෙහි** පැවිදි වූහ. ඔවුන් අතුරෙන් **එක්** තමෙක් උභය ප්‍රාතිමෝක්ෂ ප්‍රගුණ කොටැ පස් වස් වීමෙන් පවාරණය කොටැ **පාචීනඛණ්ඩරාජි** නම් තැනට වාසය පිණිස ගියේ ය. අනෙක් තම ථූපාරාමයෙහි ම විසී ය. පාචීනඛණ්ඩරාජියට ගිය භික්ෂු එහි ම **කලක්** වැස ස්ථවිර භාවයට ද පැමිණැ "මේ ස්ථානය විවෙකයට සුදුසු ය. මගේ යහලුවන් වහන්සේට ඒ බව දන්වම්"යි සිතා ථූපාරාමයට ගියේ ය. එන්නාවූ ම උන්වහන්සේ දැකැ සමානවස්සික තෙරුන්වහන්සේ පෙර ගමන් හොස් පා සිව්රු පිළිගනිමින් වත් පිළිවෙත් කළ සේක. ආගන්තුක තෙරුන් වහන්සේ සෙනාසනයට ප්‍රවිෂ්ට වැ "මේ මෙහි බොහෝ කලක පටන් වස්නෙකි. මගේ මිත්‍රයා - මට දැන් ගිතෙල් හෝ පැණි හෝ වෙන පාන වර්ගයක් හෝ

එවනවා ඇතැයි"යි සිතුවේ ය. රාත්‍රි ඉක්මිණි. කිසිවක් නො ලැබුණේ ය. උදෑසන සිතන්නේ "දැන් උපස්ථායකයන් එවූ හඬු හා කැවුම් එවති"යි සිතුවේ ය. එවිට ද එවන්නෝ නො වූහ. "මෙහි නො එවූව ද ගමට ගිය කල ලබන්නෙමි වේ දැ"යි උදෑසන ම නෙවාසික භික්ෂු හා සමඟ ගමට පිවිසියේ ය. මුළු වීථියක හැසිරී කැඳිත්තක් ලදින් දෙදෙනා වහන්සේ ම එය ආසන ශාලාවේක හිඳ වැළඳුවාහු යැ. "පේරැ කැඳ නැතත් දහවල මනුෂ්‍යයන් ප්‍රණීත භොජන දෙති" යි හේ වැළිදු සිතුවේ ය. දහවල ද පිඬු පිණිස හැසිර ලද දෙයක් ම වළඳා "කිම සඟමිනි! ඇමදුම මෙසේ ද යැපෙන්නේ" ය යි ඇසුවේ ය. උන්වහන්සේ "එසේ ය" යි කී සේක. 'සඟමිනි! අප වසන ප්‍රාචීනඛණ්ඩරාජීය මෙයට වඩා පහසු ය. එහි වහිනු මැන වැ" යි ආගන්තුක භික්ෂු කීයේ ය. තෙරැන් වහන්සේ නුවර දකුණු දෙරින් නික්මැ ථූපාරාමයට යන මඟ හැරී කුඹල්ගම මාර්ගයට පිළිපන් සේක. "සඟමිනි කුමක්! හෙයින් මේ මඟට පිළිපන් සේක් දැ" යි විවාළ කල "හැයි ආයුෂ්මත්නි! පාචීනඛණ්ඩරාජිය වර්ණිතා කෙළේ නොවේ ද එහි යමු"යි කී සේක. "සඟමිනි මෙතෙක් කල් විසූ තැන කිම වැනි පිරිකරෙක් හේම නැද්දැ" යි ඇසූ කල ආයුෂ්මත්නි! ඇඳ පුටු සාඞ්ඝික ය. එය අපි එද්දී ම තැන්පත් කෙළෙමු. අන් කිසිවක් එහි නැතැ" යි කීයේ ය. "සඟමිනි! මගේ සැරයටිය ද, තෙල්ගුලාව ද, වහන්උරය ද එහි ය." "ආයුෂ්මත්නි! එක දවසක් විසූ තොප එතෙක් බඩු එහි තබන ලද්දේ දැ" යි ඇසූයේ "එසේ ය"යි කීයේ ය. ආගන්තුක භික්ෂු පැහැදුණේය. හෙතෙමේ තෙරැන් වහන්සේ වැඳ "සඟමිනි! නුඹ වහන්සේ වැන්නවුන්ට ඇම තැන අරණ්‍ය ම ය. ථූපාරාමය සතර බුදුවරුන් වහන්සේගේ ධාතු නිධාන සථානය යි. ලෝවාමහාපායෙහි පහසුවෙන් ධර්ම ශ්‍රවණය කළ හැකි ය. ඇම වේලේ රුවන්වැලි මහා චෛත්‍යය ද, සථවිර භික්ෂූන් ද, දක්නට ලැබෙයි. එ තැන බුදුරජාණන් වහන්සේගේ ධරමාන කාලය වැනි ය. සඟමිනි! නුඹ වහන්සේ මෙහි මැ වසනු මැනව අපි යම්හ" යි දෙවන දවසෙහි පා සිවුරු ගෙනැ තෙමේ ම පාචීනඛණ්ඩරාජියට ගියේ ය මේබන්දන්ට කෙබඳු ආවාසයෙකුත් පලිබොධ පිණිස නො වන්නේ යැ.

2. කුල නම් ඥති කුල හෝ උපස්ථාන කුල යි. ඇතැම් කෙනෙකුන්ට උපස්ථායක කුලය පවා පලිබොධ පිණිස වන්නේ ය.

"සුඛිතෙ සුඛිතො" 'සැපෙහි තුටු වේ. (දුකෙහි දුක් වේ') යනාදි ක්‍රමයෙන් ඔවුන් හා එක් වැ හැනී වසන බැවිනි. එබඳු භික්ෂුහු කුල මිනිසුන් නැති වැ අසල විහාරයකට බණ අසන්නට පවා නො යෙති. **කොරණ්ඩක** නම් වෙහෙර වැසි මහතෙරුන් වහන්සේගේ බැනණු වූ දහර භික්ෂුවට මෙන් ඇතැම් කෙනෙකුන්ට මව්-පියෝ ද පලිබොධ පිණිස නො වන්නාහ.

ගේ වනාහි ත්‍රිපිටක පාළිය පුහුණු කර ගත්තා පිණිස **රුහුණු** ජනපදයට ගියේ ය. තෙරුන් වහන්සේගේ සහෝදරී ඇම විට ම තෙරුන් වහන්සේගෙන් පුතණුවන් ගේ තොරතුරු විචාරන්නී ය. එක් දවසෙක තෙරුන් වහන්සේ දහරභික්ෂු කැඳවා ගෙන එනු පිණිස රුහුණට ගිය හ. දහරභික්ෂු ද "මට මෙහි විසිමෙන් බොහෝ කල් ගත විය. උපාධ්‍යායයන් වහන්සේ ද දැකැ මැණියන්ගේ ද තොරතුරු දැන එම්" යි රුහුණින් නික්මුණේ ය. දෙ දෙනා වහන්සේ ම මහවැලිගං ඉවුරෙහි දී සම්මුඛ වූහ. දහරභික්ෂු එක් රුක්මුලෙක දී තෙරුන්වහන්සේට වත් දක්වා, "කොයි යන්නේ දැ" යි විචාළ කල්හි තමන් ගමන් පවත් කීය. තෙරුන්නාන්සේ ද ඒ අසා "නා කෙළේ යහපතෙක. උපාසිකාවෝ ඇම විට තොපගේ සුව දුක් අසති. අපි එන්නමෝ ත් තොප එහි යවනු සඳහා ආයෙමු. තොපි එහි යව්. අපි මේහි වස්වසන්නමු" යි ශිෂ්‍ය නම යැවුසේක. දහරභික්ෂු වස්වසන දිනයෙහි ම **කොරණ්ඩක** විහාරයට සමප්‍රාප්ත විය. සඛකිය පියාණන් කරවූ සෙනාසනය උන්වහන්සේට වස් එළඹෙනු සඳහා ලැබුණේය. දෙවන දවසෙහි පියාණෝ විහාරයට අවුත් "අපගේ සෙනස්න කහට ලැබුණේ දැ"යි භික්ෂූන්ගෙන් විචාරා "ආගනාතුක දහරභික්ෂුහට ය" යි කී කල්හි උන්වහන්සේ කරා එළඹැ වැඳ "සාමීනි! අපගේ සෙනස්තෙහි වස් එළඹුණුවන් විසින් පිළිපැදිය යුතු වතෙක් ඇතැ" යි කීහ. "කවර වතෙක් දැ" යි විචාරන්නා "මේ තෙමස අපගේ ගෘහයෙන් ම භික්ෂාව ගත යුතු ය. පවරා වඩින දවස්හි අපට දන්වා වැඩිය යුතු"යි කීහ. උන්වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසූ සේක.

උපාසකයාණෝ ද ගෙට ගොස් "අපගේ ආවාසයෙහි එක් ආගනාතුක නමෙක් වස් විසී ය. සකසා උපසථාන කළ යුතු ය"යි කීහ. උපාසිකාවෝ මැනවැ යි පිළිගෙන ප්‍රණීත වූ

ඛාද්‍ය – භෝජ්‍ය සම්පාදනය කළහ. දහරහිසුණු පිණ්ඩපාත වේලෙහි එහි එළඹුණේ ය. කිසිවෙක් උන්වහන්සේ නො හැඳින්නේ ය. උන්වහන්සේ තුන්මස මුළුල්ලෙහි එහි පිණ්ඩපාතය ගෙනැ වස් අවසන්හි පවරා "මම යමි" යි කීහ. ඔව්හු ද අද ඉවසා හෙට වඩින්නැ" යි ආරාධනා කොටැ දෙවන දවසෙහි සිය ගෙදෙර දී ම දානය වළඳවා තෙල් තළ ද පුරවා සකුරු පිඩක් හා නවරියන් වස්ත්‍රයක් පූජා "වඩින්න සවාමීනි" යි කිවුය. උන්වහන්සේ අනුමෙවෙනි බණ වදාරා රැහුණ බලා වැඩි සේක.

උපාධ්‍යායයන් වහන්සේ ද වස්වසා පවාරණය කොටැ පෙරලා වඩින සේක් පෙර දුටු මහවැලිගං ඉවුරෙහි දී ම දහරතම දුටු සේක. හේ රුක්මූලෙක දී තෙරුන්වහන්සේට වත් දක්වා "කිම භද්‍රමුඛය! මැණියන් දුටු දැ"යි විචාරන්නා "එසේය දුටුම් හ සවාමීනි"යි සියලු පවත් දන්වා ඒ තෙලින් ම උන්වහන්සේ ගේ පා මැඩැ සකුරින් පානයක් සාදා වළඳවා ඒ සළුවත් උන්වහන්සේට ම පුදා වැඳ "සවාමීනි! මට රැහුණ සැපය"යි කියා ගියේ ය.

තෙරුන් වහන්සේ ද විහාරයට ගොස් දෙවන දින **කොරණක ගමට** වැඩි සේක. උපාසිකා තොමෝ "මගේ සහෝදරයන් වහන්සේ මගේ පුතණුවන් ගෙනැ දැන් දැන් එති"යි ඇම්දා, මිහ බලමින් ඉන්නී ය. එදා ද හුදෙකලා වැ වඩින තෙරුන් වහන්සේ දැකැ "මගේ පුතණුවන් වහන්සේ මිය ගිය සේකැ යි සිතම්. තෙරුන් වහන්සේ තනි වැ මැ වඩිති"යි උන් වහන්සේගේ පාමුල වැටී පෙරලී වලපමින් හැඬුවා ය. තෙරුන් වහන්සේ සිතන සේක් "එකානතයෙන් දහරතම සවකීය අලෙපච්ඡතාය හෙතු කොටැ තමා නො හඳුන්වා ම ගියේ වනැ"යි ඇය සතසා සියලු පුවත් දන්වා පාත්‍රථවිකයෙන් ඒ සළුව ද මැත් කොටැ පෙන්වූහ. උපාසිකාවෝ පැහැදී පුතු ගිය දිසාවට ළයෙන් හෙවැ වැඳැ ගෙනැ කියන්නී **"බුදුරජාණන් වහන්සේ රථවිනීත – නාලක – තුවටක ප්‍රතිපදා** ද, සිව්පස සන්තොෂ හා භාවනාරාමිතා දක්වන **මහා අායුර්වංශප්‍රතිපදා** ද, වදාරණ සේක් මාගේ පුතණුවන් වහන්සේ වැනි භික්ෂූන් ම කායශාක්ෂි කොටැ වදාළ සේක් විය යුතු ය. වැදූ මැණියන් ගේ ගෙයි තුන්මසක් වළඳමිනුත් 'මම මූඹගේ පුතණුවෝ ය. මූඹ මාගේ මැණියෝ' ය යි නො කී සේක

අහෝ! ආශ්චර්‍යයි මනුෂ්‍යයා" යි කිහ. මෙබන්දන්ට මව්පියෝ ද පළිබෝධ නො වෙති. අන්‍ය උපස්ථායක කුල කියනු ම කවරේ ද

3. ලාභ නම් සිව්පස යි. සිව්පස කෙසේ පලිබෝධ වේද් ද පින් ඇති භික්‍ෂූන්ට ගිය ගිය තැන මනුෂ්‍යයෝ මහා පිරිකරත් සමඟ ප්‍රත්‍යය පිළිගන්වති. ඔවුහු දායකයන්ට අනුමෙවෙනි කරමින් බණ වදුරමින් ශ්‍රමණ ධර්මය පුරා ගන්නට අවකාශ නො ලබති. අරුණෝදගමනෙහි පටන් පෙරයම දක්වා මිනිසුන් හා එක් වැ හැනීම නො නවති. දෙවන දින ද ඉතා උදැසන ප්‍රත්‍යය ලොල පිණ්ඩපාතික භික්‍ෂූහු අවුත් "සවාමීනි! අසවල් උපාසකයාණෝ අසවල් උපාසිකාවෝ අසවල් මැනිතුම්ාණෝ අසවල් මනාපීදියණියෝ ඔබවහන්සේ දැකැ ගන්නට කැමැත්තෙන් සිටිති"යි කියති. ඔව්හු ද "ගනිව් ඇවැත්නි! පා සිවුරැ"යි කියමින් ගමනට ම සැරසී ගනිති. එහි ම ව්‍යාපෘත වෙත්. මෙසේ ඇති කල්හි ඔවුනට ඒ ප්‍රත්‍යයයෝ පලිබෝධ වන්නාහ. එ බැවින් ගණයා හැරපියා කිසිවකු නො හඳුනන තැනකට වී හුදෙකලා වැ විසිය යුතු යි. එසේ වූ කල්හි ඒ ලාභ පලිබෝධ සිදී යන්නේ ය.

4. ගණ නම් සූත්‍රාදාන හෝ අභිධර්ම හදුරණ ගණයා ය. ඔවුන්ට උද්දෙස හෝ පරිපුච්ඡා දීමෙන් යම් කෙණෙක් මහණ දම් පිරීමට අවකාශ නො ලබද් ද එබන්දන්ට ගණයා පලිබෝධ වන්නේ ය.

ඒ ගණ පලිබෝධය සිදගන්නා ක්‍රමය මෙසේ ය. භික්‍ෂූහු උද්දෙසයෙන් හෝ පරිපුච්ඡායෙන් වැඩි කොටසක් උගත්හු නම් උගන්නට තිබෙන සෙසු කොටස සුවල්ප නම් එ ද නිම කර දී අරණ්‍ය ගත විය යුතු යි. ඉදින් උගත් කොටස සුවල්ප නම් වැඩි කොටසක් උගන්නට ඇත්නම් යොදුනක් අතුර වසන අන්‍ය ගණවාසික භික්‍ෂුවක් කරා එළඹැ "ආයුෂ්මතුන් වහන්සේ මේ නමලාට උද්දෙසාදියෙන් සංග්‍රහ කරන සේක්වා"යි කිය යුතු යි. එසේත් නො ලබත් නම් "ඇවැත්නි! මට කටයුත්තෙක් ඇත. තොපි පහසු තැන් බලා යව්" ය යි කියා ගණයා හැරදමා සවකීය මහණුවම කැරැ ගත යුතු යි. (**උද්දෙස** නම් පෙළ කියවා දීම ය. **පරිපුච්ඡා** නම් අර්ථ ඉගැන්වීම යි.)

5. කම් නම් නවකර්මාදාන ය. නවකර්මාදාන කරවන්නවුන් විසින් වඩු ආදි කම්කරුවන් විසින් ලද නො ලද දෙය දැකැ

සිටිය යුතු ය. කළ නො කළ කර්මාන්ත පිළිබඳ උත්සාහවත් විය යුතු ය. එබැවින් එය සර්ව්‍රාකාරයෙන් ම පලිබෝධ පිණිස වන්නේ ය.

තවකම් පලිබෝධය සිඳැලිය යුතු ක්‍රමය මෙසේ ය:- පටන් ගත් කර්මාන්තයෙන් හෙළ වැ පවත්නේ සුවල්පය නම් එය නිම කළ යුතු වැඩි කොටසෙක් හෙළ වැ ඇත්නම් කර්මාන්තය සංඝ සන්තක නම් සංඝයාට හෝ සංඝයා ගේ භාරකාරක භික්ෂූන්ට හෝ පාවාදිය යුතු ය. කර්මාන්තය තමා සතු නම් තමන්ගේ භාරකාරක භික්ෂූන්ට පාවාදිය යුතු ය. භාර ගන්නා කෙනෙක් නැත් නම් සංඝයාට පත්කොටැ යා යුතුයි.

6. අධ්වාන නම් මාර්ග ගමනය. හෙවත් යම් තැනෙක යාමෙහි අපෙක්ෂාව ඇ. අරණ්‍යයට වැඳ ශ්‍රමණ ධර්ම පුරන්න වුන්ට පවා උපන් ගම්ක සිත සංසිඳුවා ගැන්ම දුෂ්කර ය. එ බැවින් යම් තැනෙක ප්‍රව්‍රජ්‍යාපෙක්ෂකයෙක් හෝ ඇත් නම් ලබාගත යුතු ප්‍රත්‍යයයෙක් ඇත් නම් එය නො ලත් කල ඉවසා ධරා ගත නො හැකි නම් එහි ගොස් ඒ කෘත්‍යය නිම කොටැ ගෙනැ අවුත් ශ්‍රමණ ධර්මයෙහි උත්සුක විය යුතු යි.

7. ඥාති නම් විහාරයෙහි ආචාර්ය-උපාධ්‍යාය-සද්ධි විහාරික-අන්තෙවාසික - සමානොපාධ්‍යායක - සමානාචාර්යකයෝ ය. ගෘහයෙහි මව් - පිය - සහෝදරාදිහු යි. ඔවුහු ගිලන් වූහු නම් පළිබෝධ පිණිස වෙත්. ඒ පළිබෝධය සංසිඳුවා ගත යුත්තේ ඔවුන්ට උපස්ථාන කොටැ ඔවුන් නිරෝගීන් කිරීමෙනි.

එහි පිළිවෙළ මෙසේ ය:- ඉදින් උපාධ්‍යායයන් වහන්සේ ශීලවන්ත වූ සේක් නම් වහා සුව නො වත් හොත් දිවි හිමි කොටැ උපස්ථාන කළ යුතු ය. එසේ ම ප්‍රව්‍රජ්‍යාචාර්ය - උපසම්පදාචාර්ය සද්ධිවිහාරිකයෝ ද, තමන් විසින් කර්ම වාක්‍ය කියා උපසම්පදා කර ගන්නා ලද තමා විසින් පැවිදි කරවන ලද අන්තෙවාසිකයෝ ද, දිවි හිමි කොටැ උපස්ථාන කළ යුතු වෙත්. නිස්සයාචාර්යයෝ ද, උද්දෙසාචාර්යයෝ ද, නිස්සයාන්තෙවාසිකයෝ ද, උද්දෙසයාන්තෙවාසිකයෝ ද, සමානාචාර්යකයෝ ද, නිස්සයත්ත. උද්දෙස ගන්නා තාක් උපස්ථාන කළ යුතු ය. හැකි නම් ඉන් ඔබ්බෙහි ද උපස්ථාන කිරීම සුදුසු ම ය.

මව්පියන්ට ද උපාධ්‍යායයන් වහන්සේට මෙන් පිළිපැදිය යුතු ය. ඉදින් මව්පියවරු රාජ්‍යයෙහි පිහිටියෝ නමුදු තමන්ගෙන් උපස්ථාන ලැබියට වෙන් නම් එසේ උපස්ථාන කළ යුතු සි. ඔවුන් සතු බෙහෙත් නැත්නම් තමා සතු බෙහෙත් දිය යුතු සි. තමා සතු වූ ද බෙහෙත් නැත්නම් පිඬු සිහාවත් සොයා දිය යුතු ම ය. සහෝදර සහෝදරියන්ට වනාහි ඔවුන් සතු බෙහෙත් ම යොදා දිය යුතු සි. ඉදින් ඔවුන් සතු බෙහෙත් නැත්නම් තමන් සතු බෙහෙත් තාවකාලික වශයෙන් දී පසු වැ ලද හොත් ගත යුතු සි. නො ලද හොත් නො ඉල්විය යුතු සි. සහෝදරියකගේ සැමි පුරුෂයා ඉදින් සැකියි ඥතියෙක් නො වේ නම් බෙහෙත් කරන්නට ද දෙන්නට ද නො වටනේ ය. "තොපගේ සැමි පුරුෂයාට දෙව" සි කියා සහෝදරියට දීම වරද නො වේ. සහෝදරයාගේ බිරින්ද කෙරෙහි ද පැවතිය යුතු ක්‍රමය මෙසේම ය. ඔවුන්ගේ දරුවන් තම නැයන් බැවින් ඔවුන්ට බෙහෙත් කරන්නට වටනේ ය.

8. ආබාධ නම් මුල් වූ හෝ අනුබද්ධ වූ හෝ යම් කිසි රෝගයකි. එය තමන් පෙළන්නේ පළිබෝධ පිණිස වන්නේ ය. ආබාධ පළිබෝධය සිඳලිය යුතු ක්‍රමය නම් එය සුවකරා ගැන්ම සි. ඉදින් කීප දවසක් බෙහෙත් කරන කල්හිදු ආබාධය සුව නො වේ නම් "මම තගේ දාසයෙක් හෝ බැළලයෙක් හෝ නො වෙමි. අනාදිමත් සසර තා ම පොෂ්‍ය කිරීමෙන් මම දුක් වින්දෙමි" සි ආත්මභාවයට ගරහා ලා මහණුවම් පිරිය යුතු සි.

9. ග්‍රන්ථ නම් පඤ්ඤත්ති පරිහරණය සි. ඒ වනාහි සජ්ඣායන-ධාරණ – පරිචය – පරිපුච්ඡාදි වශයෙන් නිත්‍ය ව්‍යාපෘතයාට ම පළිබෝධ පිණිස වන්නේ ය. එසේ නො වන්නහුට පළිබෝධ පිණිස නො වන්නේ ය.

එයට දෘෂ්ටාන්ත කථා මෙසේ ය.

මැදුම් සඟිය වනපොත් කළ **දේව** නම් තෙරුන් තාන්සේ **ගල්වල** වසන **දේව** සථවිරයන් වහන්සේ කරා එළඹැ කමටහන් ඉල්ලූහ. උන්වහන්සේ "ඇවැත්නි! තොපගේ පඤ්ඤත්ති ඥතය කෙතරම් ද"සි විචාළ සේක. "සැමීනි! මට මැදුම් සඟිය ප්‍රගුණය" සි හේ පිළිතුරු දිනි. "ඇවැත්නි! මේ මැදුම්සඟි පරිහරණය දුෂ්කර ය. මූලපණ්ණාසකය සජ්ඣායනය

කරත් මජ්ඣිම පණ්ණාසකය ද, එය සජ්ඣායනය කරත් උපරිපණ්ණාසකය ද නැගී එන්නේ ය. තොපට කවර කම්මට්ඨානද්ද"යි උන්වහන්සේ කී සේක. "ස්වාමීනි නහමක් එසේ සිතන්න. ඔබවහන්සේගෙන් කම්මට්ඨාන ලබා ගෙන මැදුම් සඟිය දිසාවත් නො බලමි."යි කමටහන් ගෙනැ එකුන්විසි වසක් සජ්ඣායනය නො කොටැ විසිවන වසෙහි රහත් වැ සජ්ඣායනය පිණිස පැමිණි භික්ෂූන්ට කියන සේක් "ඇවැත්නි! පය්‍යාප්තිය නො බැලීමෙන් මට විසි වසෙක් ඉක්මුණේ ය. එහෙත් මට එහි පුරුදුකම් ඇත. ආරම්භ කරව"යි කියා මූල පටන් අග තෙක් එක ව්‍යඤ්ජනයෙක ද සැකයක් නො කළ සේක.

තවද කැරළිගිරි වෙහෙර විසූ නාග සථවිරයන්වහන්සේ අටලොස් වසක් පය්‍යාප්ති හැරැපියා භික්ෂූන්ට ධාතු කථා දෙසූහ අනුරාධපුර වැසි තෙරවරුන් හා සමග සංසන්දනය කරන ඔවුනට එක ප්‍රශ්නයෙකුදු උතුපරිපාටික නො වූයේ ය.

තවද මහවෙහෙර වැසි ත්‍රිපිටක චූලාභය තෙරුන් වහන්සේ අටුවා නො ඉගෙනැ ම "පස්මහසඟි උගත් පිරිසට ත්‍රිපිටකය වණ්ණනා කරම්" යි දවසෙක රන්බෙරය ගැස්වූසේක. භික්ෂූහු "ඔහු විසින් කවර ආචාර්‍ය්‍ය මතයෙක් වණ්නු ලබන්නේ ද, සවකීය ආචාර්‍ය්‍ය මතය විනා අනෙකක් කියන්නට නො දෙම්හ"යි කිවුය. උපාධ්‍යායයන් වහන්සේ ද සවකීය උපසථානය සඳහා පැමිණි ඔහු විචාරණ සේක් "ඇවැත්නි! රන් බෙරය ගැස්වූවෝ තොපි දැ" යි ඇසූසේක. "එසේය ස්වාමීනි" යි කී කල්හි "කුමක් සඳහා දැ" යි අසා "ස්වාමීනි! පය්‍යාප්තිය වණ්නා කරනු සඳහා ය" යි කී කල්හි "**ඇවැත්නි! අනය!** මේ සථානය පිළිබඳ ආචාර්‍ය්‍යයෝ කෙසේ කියත් දැ" යි එක් ධම් පදයක් දක්වූසේක. හෙතෙමේ "ස්වාමීනි! මෙසේ කියති"යි කිය. තෙරුන්වහන්සේ "හුම්" යන ශබ්දයෙන් එය වරද ලීලාව හැඟවූහ. ඉක්බිති හෙතෙමේ "ස්වාමීනි! මෙසේත් කියති මෙසේත් කියති"යි අනෙක් අනෙක් සැටියෙන් තුන්වරක් කිය. තෙරුන්වහන්සේ එ සියල්ල "හුම්" කාරයෙන් ප්‍රතික්ෂෙප කොටැ "ඇවැත! තොප විසින් පළමු වැ කියන ලද්දේ ආචාර්‍ය්‍ය මාර්ගය යි. එය ආචාර්‍ය්‍ය මුඛයෙන් නො උගන්නා ලද බැවින් එහි සථිර වැ සිට ගන්නට නො හැකි විය. යව, සුදුසු ආචාර්‍ය්‍ය වරයකු සමීපයෙන් අසා උගනුව"යි කී සේක. "ස්වාමීනි! මම

කොසි යම් දෑ" යි හේ විචාළේ ය. "ගඟින් ඔබ **රුහුණු රට තුලාධාර පව්ත** විහාරයෙහි සම්පයත්‍යාප්තිධර **ධම්මරක්ඛිත** නම් සථවිර **කෙනෙක්** වෙසෙති. ඔවුන් කරා යව"යි කීහ. උන්වහන්සේ ද "මැනව සවාමිනි"යි කියා තෙරුන්වහන්සේ වැඳ පන්සියයක් භික්ෂූන් සමඟ **ධම්මරක්ඛිත** සථවිරයන් වහන්සේ කරා එළඹ වැඳ එකත්පස් වූ උන්හ. තෙරුන් වහන්සේ විසින් "කුමක් පිණිස ආයේ දැ"යි පුළුවුත්තා ලද්දේ ඔණ අසනු පිණිස ය" යි කීයේ ය. "**ඇවැත්! අභය!** දීඝනිකායයෙහි හා මධ්‍යම නිකායයෙහි කලින් කල මා විචාරති. සෙසු ධර්‍ම නො බැලූ මට නිස් වසෙක් ගත විය. එසේ වුව ද තෙපි රාත්‍රි කාලයෙහි මා වෙත පිරිවහව. මම තට දහවල් කියමි" යි කී කල්හි "එසේය සවාමිනි"යි කියා කී සේ ම **කළේය**. පිරිවෙන ඉදිරි පස මහ මඬුවක් කරවා ගම් වැස්සෝ දිනපතා ඔණ අසනු පිණිස එහි රැස් වෙති. තෙරුන් වහන්සේ රෑ පිරිවැහූ තැන් දහවල් කියමින් පිළිවෙළින් ම දෙශනාව නිම කොටැ **අභය** තෙරුන් ළඟ පත්කඩ අතුට වැඩහිඳ "ආයුෂ්මතුන් වහනැස! මට **කම්සථානයක්** වදාළ මැනවැ" යි කීහ. "සවාමීනි මේ කුමක් කියන සේක් ද මාත් ඔබ සමීපයෙන් ම අසා ගන්නා ලද්දේ නො වේද ඔබ නො දන්නා කුමක් මම කියම්දැ" යි කීය. එවිට තෙරුන්නාන්සේ "ඇවැත්නි! මේ අධිගතයන්ගේ මාගී අනෙකකැ" යි කීහ. **එකල අභය** සථවිර සෝවාන් වැ සිටියේ ය. හෙතෙමේ උන්වහන්සේට කමටහන් දී අවුත් **ලෝවාමහපායෙහි**, ධර්‍ම දෙශනා කරන්නේ "තෙරුන් වහන්සේ පිරිනිවි සේකැ"යි අසා "ඇවැත්නි මගේ සිව්ර ගෙනෙව"යි කියා සිවුර ගෙන්වා පොරවා ගෙනැ "ඇවැත්නි! අප ආචාර්‍යයන් වහන්සේගේ අර්හත් මාගීය ඉතා සුදුසුය. අපගේ ආචාර්‍යයන් වහන්සේ ඍජු වූ උත්තමයෙකි. උන්වහන්සේ සවකීය **ධර්‍මාන්තෙවාසිකයා** ළඟ පත්කඩ එලා හිඳ ගෙනැ "මට කමටහන් කිව මැනවැ"යි කී සේක. "ඇවැත්නි! අප ආචාර්‍යයන් වහන්සේගේ **අර්හත්** මාගීය ඉතා සුදුසුය"යි කීයේ ය. මෙබන්දන්ට ශ්‍රේෂ්ඨ පළිබෝධ පිණිස නො වන්නේ ය.

10. සෘද්ධි නම් පෘථග්ජන සෘද්ධි සි. ඒ වනාහි උඩු බැලි හෝනා ළදරුවකු මෙන් ද, පැල ගොයමක් මෙන් ද, බොහෝ උපද්‍රව **ඇති** බැවින් **ආයාසයෙන්** පරිහරණය කළ යුතු ය. සවල්ප ප්‍රමාදයකින් බිඳී යන්නේ ය. එහෙයින් **එය** විදර්‍ශනා

ලැබීමට පළිබෝධ පිණිස වේ. සමාධියට නම් පළිබෝධ පිණිස නො වේ. කුමක් හෙයින් ද සමාධි ලබා ඉක්බිති සෘද්ධි ලැබිය යුතු බැවිනි. එ හෙයින් විදර්ශනා භාවනා කටැයියන් විසින් සෘද්ධි පළිබෝධය සිඳැලිය යුතු ය. සමාධි භාවනා කටැයියන් විසින් සෙසු පළිබෝධ නවයද සිඳලිය යුතු සි.

පළිබෝධ කථා වර්ණනා නිමියේ ය.

කර්මස්ථානග්‍රහණ

"කවුරුහන් දෙන කල්‍යාණ මිත්‍රයන් වහන්සේ නමක් කරා එළඹෙ" සි කියූ තන්හි **කර්මස්ථාන** වනාහි **සබ්බත්ථක** - කම්මට්ඨානය, **පාරිහාරිය** කම්මට්ඨානය සි දෙ වැදෑරුම් වේ. (සබ්බත්ථක කම්මට්ඨාන නම් ඇම තන්හිදීම වැඩිය යුතු කම්ටහන් ය. පාරිහාරිය කම්මට්ඨාන නම් නියම වශයෙන් පරිහරණය කළ යුතු කම්ටහන් ය.) එසින් භික්ෂු සංඝාදීන් කෙරෙහි පතුරන මෛත්‍රිය හා මරණ සතිය සබ්බත්ථක ය. අසුභ සංඥාව ද සබ්බත්ථක ය සි ඇතැම්හු කියත්. ඒ වඩන ක්‍රමය මෙසේ ය.

කර්මස්ථාන ගන්නා යොගාවචරයා විසින් පළමු කොටැ පරිවෙණ්ද වශයෙන් සීමායෙහි වැසි භික්ෂු සංඝයා කෙරෙහි "සුවපත් වෙත්වා නිදුක් වෙත්වා" සි මෛත්‍රී වැඩිය යුතුය. ඉක්බිති සීමා වැසි දෙවියන් කෙරෙහි ද, ඉක්බිති ගොදුරු ගම් වැසි ප්‍රභූන් කෙරෙහි ද, ඉක්බිති එහි සාමාන්‍ය මහාජනයා කෙරෙහි ද, ඉක්බිති සකල සත්වයන් කෙරෙහි ද මෛත්‍රී වැඩිය යුතු. සීමා වැසි සංඝයා කෙරෙහි මෛත්‍රී වැඩීමෙන් සහවාසී භික්ෂූන්ගේ සිත්හි මෘදුත්වය ඇතිවන හෙයින් ඔහුට එහි සුවසේ විසිය හැකි වන්නේ ය. සීමාවැසි දෙවියන් කෙරෙහි මෛත්‍රී වැඩීමෙන් ඔවුන්ගේ සිත් මෘදු වැ ඔවුන් විසින් තමා ධාර්මික ආරක්ෂායෙන් ආරක්ෂා කරනු ලබන්නේ ය. ගොදුරු ගම් වැසි ප්‍රභූන් කෙරෙහි මෛත්‍රී වැඩීමෙන් ඔවුන්ගේ සිත් මෘදු වැ ඔවුන් විසින් ධාර්මිකාරක්ෂායෙන් සවකීය පරිෂ්කාර ආරක්ෂා කරනු ලබන්නේ ය. ගොදුරු ගම් වැසි මහාජනයා කෙරෙහි මෛත්‍රී වැඩීමෙන් ඔවුන්ගේ සිත් පැහැදී ඔවුන් විසින් හෙළා නො දකිනු ලැබැ සුවසේ විසිය හැකි වන්නේ ය. සකල සත්වයන් කෙරෙහි මෛත්‍රී වැඩීමෙන් කිසි තැනෙක ගැටුම් නො ලැබැ සතුටින් විසිය හැකි වන්නේ ය.

මරණ සති වැඩීමෙන් මැරෙන බව ඒකාන්තයෙන් සිදු වන්නක් බව සැලකෙන බැවින් අයොග්‍ය ප්‍රත්‍යය සෙවීම් හැරැපියා මතු මතු ද සංවෙග වඩන්නේ සුදුසු ප්‍රතිපත්තියෙහි පසු නො බස්නා පැවතුම් ඇත්තෙක් වන්නේ ය.

අසුභ සංඥ පුරුදු කළහුගේ සිත දිව්‍ය අරමුණු පවා, ලොභ වශයෙන් ඇදගන්නට සමර්ථ නො වන්නේ ය.

මේසේ මේ කම්මට්ඨානත්‍රය "යොගාවචරයනට බොහෝ උපකාර වන බැවින් සියලු කම්මට්ඨාන විෂයෙහි කැමැති විය යුතු බැවින් ද, අනිමිත්ත භාවනායෙහි යෙදීමට කාරණ වන බැවින් ද, **සබ්බත්ථක කම්මට්ඨාන** ය යි කියනු ලැබේ. (සබ්බත්ථ අත්ථයිතබ්බං ඉච්ඡිතබ්බන්ති ච අධිප්පෙතස්ස යොගානුයොග කම්මස්සට්ඨානන්තිවාති සබ්බත්ථක කම්මට්ඨානං)

සමසතලිස් කම්ටහන් අතුරෙන් යම් කම්ටහනෙක් යමකුගේ චරිතයට අනුකූල වන්නේ නම් එම ඔහු විසින් නිතර පරිහරණය කළ යුතු බැවින් ද, එම මතු මතු භාවනා කම්මයට පිහිට වන බැවින් ද, **පාරිහාරිය කම්මට්ඨාන** යයි කියනු ලැබේ.

මෙසේ මේ විවිධ වූ ම කම්මට්ඨාන දෙන තැනැත්තේ **"කම්මට්ඨාන දායකයා"** යි කියනු ලැබේ

කල්‍යාණ මිත්‍රයා.

කල්‍යාණ මිත්‍රයා නම්:

"පියො ච ගරුභාවනියො - වත්තා ච වචනක්ඛමො
ගම්භීරං ච කථං කත්තා - නොච 'ට්ඨානෙනියොජයෙ"

යනාදීන් දැක්වුණු ගුණවලින් යුත් එකාන්ත හිතෙෂී වූ අත වැස්සන්ගේ අනිවැඩි සාධන උත්තමයා ය.

යමෙක් සඛකීය ශීලසම්පත්තියෙන් ආශ්‍රිතයන්ට ප්‍රිය වන්නේ ද, පාෂාණචිත්‍රයක් මෙන් ගරු වන්නේ ද, ගුණ වශයෙන් සම්භාවනා කටයුතු වන්නේ ද, ආශ්‍රිතයන්ට අවවාද කියන්නේ ද, චොදනාවශයෙන් විවාළ ප්‍රශ්න ඉවසන සුලු වන්නේ ද, **සත්‍ය - ප්‍රතීත්‍යසමුත්පාදාදි** ගැඹුරු ධර්ම කියා දෙන්නේ ද, සඛකීය ආශ්‍රිතයන් අස්ථානයෙහි නො යොදන්නේ සුදුසු තන්හි මැ යොදන්නේ ද, හේ **කල්‍යාණමිත්‍ර** නම් වේ යනු ගාථායෙහි භාවය යි.

---

1 ප: දී: පකිණ්ණක කථා 225

"මමං හි ආනන්ද කල්‍යාණමිත්තං ආගම්ම ජාතිධම්මා සත්තා ජාතියා පරිමුච්චන්ති"[1] "ආනන්දය! **කල්‍යාණමිත්‍ර** මා කරා එළඹෑ ජාතිස්වභාව කොට ඇති සත්ත්වයෝ ජාතියෙන් මිදෙන්නාහ." යනාදීන් වදාළ බැවින් **සම්‍යක් සම්බුද්ධයන්-වහන්සේ** ම සර්‍වාකාර සම්පූර්ණ **කල්‍යාණමිත්‍ර** වන්සේක. එ බැවින් උන්වහන්සේ ධ්‍රියමාන කල්හි උන්වහන්සේ වෙතින් ගත් කර්මස්ථානය ම සුගෘහීත වන්නේ ය. උන්වහන්සේ පිරිනිවි කල්හි අසූමහ සව්වන් අතුරෙන් යම් කෙනෙකුන් වහන්සේ ගෙන් ගන්නට වටනේ ය. ඔවුන් වහන්සේ පිරිනිවි කල්හි තමා යම් කර්මස්ථානක් ගනු කැමැති නම් ඒ කර්මස්ථාන මැ ගෙන චතුෂ්ක - පඤ්චක ධ්‍යාන උපදවා ඒ ධ්‍යාන පදස්ථාන කොටැ විදර්‍ශනා වඩා රහත් වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේ වෙතින් ගත යුතු.

කිම? රහත් හු තමන් රහත් බව කියා පාන් ද, හැකි! භාවනා කරන්නකු බව දනැ ගත් කල්හි කියා පාති. **අස්සගුත්ත** තෙරුන්නාන්සේ "මේ භික්ෂූ කර්මස්ථාන වඩන්නෙකි. මේ කාරකයෙකැ" යි දනැ අහස සම්කඩ අතුට ඊම්ත්තේ පළඟින් හිඳැ කර්මස්ථාන වදාළසේක් නො වේද එ බැවින් ක්ෂීණාශ්‍රවයකු ලද නම් එ යහපති. ඉදින් නො ලද නම් අනාගාමීන් වෙතින් ද ඔවුන් නො ලද නම් සකෘදාගාමී, සෝවාන්, ධ්‍යාන ලාභී, පෘථග්ජන ත්‍රිපිටක ධර, ද්විපිටක ධර, එකපිටක ධරයන් වෙතින් ද, පිළිවෙළින් ගත යුතුය. එකපිටකධරයකුදු නැති කල්හි අටුවා සමග එක සඟියක් ධරන ලජ්ජීයකු වෙතින් ගත යුතු යි. එ බදු ලජ්ජී වූ තන්ත්‍රිධර වූ බුඩවංශාරක්ෂක වූ ආචාර්‍යයී ප්‍රවේණිය පාලක වූ ආචාර්‍යයී තෙමේ ආචාර්‍යයී මතයෙහි පිහිටි හෙයින් ආචරිය මතික වන්නේ ය. සවමත සංඛ්‍යාත අත්තනොමතයෙහි නො පිහිටි හෙයින් **අත්තනොමතික** නො වන්නේ ය. එ හෙයින් මැ පුරාතන තෙරවරු **"ලජ්ජිරක්ඛිස්සන්ති ලජ්ජිරක්ඛිස්සන්ති" "ලජ්ජියාම ශාසනය රක්ෂ ගන්නේ ය, ලජ්ජියා ම ශාසනය රක්ෂ ගන්නේ ය"** යි හඬ නැඟුහ.

තව ද සිය යුත්තෙක් ඇති. යට දක්වූණු රහතන් වහන්ස් ආදී ඇත්තෝ තමන් අධිගත ලෞකීය ම කියා දෙති. බහුශ්‍රුත භික්ෂූ එසේ නොවේ ගේ වනාහි ඒ ඒ ආචාර්‍යවරයන් කරා එළඹ කර්මස්ථානයන්ට යෝග්‍ය වූ පෙළ අටුවා ශුඛ කැරැ ගන් බැවින් සඟවලින් ඔබින් මෙබින් සූත්‍ර ද කරුණු ද

[1] සං: නි: කොසලසංයුක්ත 53

ගෙන හැරැ දක්වා සපපාය අසපපාය කියා දී සන වන ලැහැ බෙහි ගමන් ගත් ඇතකු මෙන් මහ මහ දක්වමින් කමටහන් කියන්නේ ය. එ බැවින් එ බඳු කම්සථාන දායක කල්‍යාණ මිත්‍රයා කරා එළඹැ උන්වහන්සේට වත පිළිවෙත කොටැ කමටහන ගත යුතු සි.

එ බඳු උත්තමයෙක් තමා වසන විහාරයෙහි මැ ඇත් නම් ඒ යහපති. ඉදින් නැත් නම් එබන්දකු වසන තැනට යා යුතු "එ බඳු තැනකට යම්" සි කියා පා සෝදා තෙල් ගල්වා වහන් පය ලා කුඩ අල්වා තෙල් නළ මීපැණි ගෙන්වා ගෙනැ අතවැස්සන් පිරිවරා නො යා යුතු. ගමික වත් පුරා සවකිය පා-සිවුරු තමා ම ගෙනැ අතරමඟ පැමිණි සියලු විහාර සථානයන්හි දී වත පිළිවෙත කරමින් සැහැල්ලු පිරිකර ධරා පරමසලෙඛ වෘත්තියෙන් යා යුතු. විහාරයට ඇතුල් වත්නහු විසින් අතර දී ම දැවටු කප්පියම් කරවා ගෙනැ යා යුතු. "මොහොතක් විඩා හැරැ පා සෝදා තෙල් ගල්වා ගෙනැ පසු වැ ආචාර්‍යයන් වහන්සේ සමීපයට යම්" සි පළමු වැ අන්‍ය පිරිවෙනකට ඇතුළු නො විය යුතු. කුමක් හෙයින් ද එහි ඒ ආචාර්‍යයන් වහන්සේට විසභාග භික්‍ෂූහු වෙසෙත් නම් ඔවුහු තමන් ආ කාරණය අසා උන්වහන්සේගේ අගුණ කියා පා "තෙපි එතනට අවුනම් නවුවහු ය" සි ආපසු යන පරිදි විපිළිසර උපදවිය හැකි බැවිනි. එහෙයින් ඒ ආචාර්‍යයන් වැඩ වසනා තැන් විචාරා ඉදුරා එහි ම යා යුතු. ආචාර්‍යයන් බාල වුවද පා සිවුරු ගැනීම් ආදිය නො ඉවසිය යුතු. වැඩිමහලු නම් ගොස් උන්වහන්සේ වැඳ සිටිය යුතු. පාසිව්රු තබන්න ඇවත්නි! සි කී කල තැබිය යුතු. "පැන් වළඳන්න" සි කී කල අභිමත නම් වැළඳිය යුතු. "පා සෝදා ගන්නැ"සි කී පමණින් නො සේදිය යුතු. ආචාර්‍යයන් වහන්සේ පෙරහා තුබූ දිය නම් එහට නො සුදුසු බැවිනි "ඇවැත්නි! පා සෝදනු ජලය මා ගෙනාපුයේ නො වේ, අන්‍යයන් විසින් ගෙනෙන ලද්ද"සි කී කල ආචාර්‍යයන්ට නො පෙනෙන මානයේ ප්‍රතිච්ඡන්න සථානයෙක හෝ අභ්‍යවකාශ විහාරයාගේ එකත් පසෙක හෝ භිඳා පා සේදිය යුතු. තෙල් නළ ගෙනවුත් දුන්නු නම් නැගිටැ දෙහොතින් සකසා පිළිගත යුතු. ඉදින් නො ගත්තේ නම් "මේ භික්‍ෂු දැන් ම පටන් සමෙභාග කොප්‍ය කරන්නේ ය" සි ආචාර්‍යයන්ට සිතිය හැකි බැවිනි. ගත් ගමන් ම තෙල් පාදයෙහි නො ගැල්විය යුතු. එය ආචාර්‍යයි

යන්ගේ ශරීරයෙහි අභ්‍යඞ්ග කරන තෙලක් නම් නුසුදුසු බැවිනි. එ බැවින් පළමු කොට, හිස ගල්වා පසුවැ පිටිකර ආදියෙහි ගැල්විය යුතු. "ඇවැත්නි! මෙය සියල්ලට පරිහරණය පිණිස තිබෙන තෙලෙකි. පාදයෙහි ද ගල්ව" යි කියන ලද නම් එසේ ගල්වා ගෙනැ "සඞ්ඝමීනි! මේ තෙල් තළ තබන්නදැ?" යි කියා ආචාර්‍යයන් ගන්නා කල දිය යුතු. ගිය දවසේ පටන් ම "සඞ්ඝමීනි! මට කර්‍මස්ථානයක් දී වදාරන්නැ" යි නො කිය යුතු. දෙවන දවස පටන් ආචාර්‍යයන්ට ප්‍රකෘති උපස්ථායකයෙක් ඇත් නම් ඔවුන්ගෙන් ඉල්වා ගෙනැ වත් කළ යුතු. ඉල්ලූ කල ද නො දෙත් නම් අවකාශ ලත් විටෙක කළ යුතු. වත් කරන්නහු විසින් කුඩා වූ ද මධ්‍යම වූ ද මහත් වූ දැ යි තුන් ආකාර වූ ම දැවටු පිරිකැමිය යුතු. සීත වූ ද උෂ්ණ වූ දැ යි දෙවැදෑරුම් මුව දෝනා ජලය හා නහන ජලය ද පිළියෙළ කළයුතු. ආචාර්‍ය්‍ය එයින් යමක් පරිභොග කළේ නම් නිතර එය ම එළවිය යුතු. නියම නැති වැ යම් යම් දෙයක් පරිභොග කරන් නම් ලද සැටියෙන් එළවිය යුතු. බොහෝ කොටැ කීමෙන් කිම? භගවන් බුදුන්වහන්සේ විසින් **"අනෙන වාසිකෙන භික්ඛවෙ ආචරියමඤ්ඤි සම්මා වත්තිතබ්බං. තත්‍රායං සම්මා වත්තනා, කාලසෙසව වුට්ඨාය උපාහනා ඔමුඤ්චිත්වා එකංසං උත්තරාසංගං කරිත්වා දන්තකට්ඨං දාතබ්බං. මුඛොදකං දාතබ්බං. ආසනං පඤ්ඤපෙතබ්බං. සචෙ යාගු හොති භාජනං ධොවිත්වා යාගු උපනාමෙතබ්බා"**[1] යනාදීන් ඛන්ධකයෙහි පණවා වදාළ සියලු වත් මැනෙවින් කළ යුතු. "මහණෙනි! අතවැස්සා විසින් ආචාර්‍යයන් කෙරෙහි මනා වැ පැවතිය යුතු. මේ ඒ මනා පැවැත්ම යි, උදෑසන්හි ම නැගිටැ වහන් ගළවා උත්තරාසංගය එකස් කොටැ පෙරවැ දෑවිටු දඬු දිය යුතු. මුව දෝනා ජලය දිය යුතු. අසුන් පැණවිය යුතු. කෑද ඇත් නම් භාජනය සෝදා කෑද පිළිගැන්විය යුතු." යනු එහි අදහස යි.

මෙසේ වත්තසම්පත්තියෙන් ආචාර්‍යයන්ගේ සිත් ගත්තහු විසින් සවස වැඳැ "යව" යි කී කල යා යුතු. යම් දවසෙක "කුමක් සඳහා ආයෙහි දැ" යි විචාරණ ලද්දේ නම් එදින ආ කාරණය කිය යුතු. එසේ නො විචාරන්නේ මැ වත් ඉවසා නම් දස දවසක් හෝ පසළොස් දවසක් හෝ ඉක්මූණු කල්හි දිනෙක "යව" යි කියද්දී ද නො ගොස් අවසරය ලබා ගෙනැ පැමිණි කාරණය දන්විය යුතු. අවේලාවෙක හෝ ගොස් කුමක් සඳහා ආයේදැ"යි

[1]ම: ව: මහාඛන්ධක 58

විචාළ කල දැන්විය යුතු. ඉදින් "උදෑසන ම එව" යි කීයේ නම් උදෑසන ම යා යුතු. ඒ නියමිත වේලායෙහි පිත් ලෙඩකින් කුස දැවේ නම් අග්නිය අඩු බැවින් අහර හෝ නො දිරා නම් අනෙක් රොගයකින් හෝ පෙළේ නම් ඒ බව තතු පරිදි දන්වා තමහට සපායය වේලාව සැල කොටැ ඒ වේලායෙහි එළඹිය යුතු. අසපායය වේලායෙහි කියා දෙනු ලබන කම්ඵස්ථානය මෙතෙහි කරන්නට නො හැකි බැවිනි.

"කමටහන් දෙන කල්‍යාණ මිත්‍රයා කරා එළඹෑ"
යන්නෙහි විස්තරය නිමියේ ය.

"සඵකිය චරිතානුකූල වූ කම්ඵස්ථානයක් ලබා ගෙනෑ" යන මෙහි චරිත වනාහි **රාගචරිත, ඵෙෂචරිත, මොහචරිත, ශ්‍රද්ධාචරිත, බුද්ධිචරිත, විතක්කචරිත** යයි සවැදෑරුම් වේ. ඇතැම්හු **රාගඵෙෂචරිත, රාගමොහචරිත, ඵෙෂමොහචරිත, රාගඵෙෂ-මොහචරිත** යයි සතරෙක් ද, **ශ්‍රද්ධාබුද්ධිචරිත, ශ්‍රද්ධාවිතක්කීචරිත, බුද්ධිවිතක්කීචරිත, ශ්‍රද්ධාබුද්ධිවිතක්කීචරිත** යන සතරෙක් ද යි සංසඳී සන්නිපාත වශයෙන් ලැබෙන අට සමිඟ චරිත තුදුසක් දක්වති. එසේ භෙද දක්වත් හොත් රාගාදිය ශ්‍රද්ධාදිය හා සමඟ එක් කිරීමෙන් අනෙක විධ චරිත කිය යුතු යි. එහෙයින් සැකෙවින් චරිත සය මැ යයි දත යුතු. චරියා ප්‍රකෘති උත්සන්නතා යනු දු අර්ථ වශයෙන් මේ මැ යි. ("රාගාදීහු මැ සන්තානයෙහි උත්සන්න භාවයෙහි පවත්නා හෙයින් **චරියා** නමුදු වෙති. ප්‍රතිපක්ෂ භාවනාවක් නැති කල්හි ඒ ඒ සතන්හි සවභාව හෙයින් **ප්‍රකෘති** නමුදු වෙති. අන්‍ය ධර්මයන්ට වඩා අධික විසින් **උත්සන්නතා** නමුදු වෙත්" යනු පැරකුම්බා සන්ත යි.)

මේ චරිතයන්ගේ වශයෙන් පුද්ගලයෝ ද රාගචරිතයා යයි, ඵෙෂචරිතයා යයි, මොහචරිතයා යයි, ශ්‍රද්ධාචරිතයා යයි, බුද්ධිචරිතයා යයි, විතක්කීචරිතයා යි සදෙනෙක් වෙත්.

ඔවුන් අතුරෙන් රාගචරිතයාහට වනාහි කුශල ප්‍රවෘත්ති සමයෙහි ශ්‍රද්ධාව බලවත් වේ. ශ්‍රද්ධාව රාගයට ආසන්න ගුණ ඇති බැවිනි.

ඒ එසේ මැ යි:- අකුශල පක්ෂයෙහි වූ රාගය සිනිදු යි. අතිරූක්ෂ නැත. එසේම කුශල පක්ෂයෙහි වූ ශ්‍රද්ධාව සිනිදු යි.

අහිරුක්ඛ නැත. රාගය වසඟකාම සොයන්නේ ය. ශ්‍රද්ධාව ශීලාදි ගුණ සොයන්නේ ය. රාගය තමහට අහිත දේ නො හරින්නේ ය. ශ්‍රද්ධාව හිත දේ නො හරින්නේ ය. මෙසේ බැවින් රාගචරිතයාහට ශ්‍රද්ධාචරිතයා සහාග ය.

මෙෂ චරිතයාහට කුශල ප්‍රවෘත්ති සමයෙහි බුද්ධිය බලවත් වේ. බුද්ධිය මෙෂයට ආසන්න ගුණ ඇති බැවිනි.

ඒ එසේ මැ යි:- අකුශල පක්ෂයෙහි වූ මෙෂය සෙනහ රහිත ය. අරමුණෙහි නො ඇලෙන්නේ ය. එසේ ම කුශල පක්ෂයෙහි බුද්ධිය සෙනහ රහිත ය. අරමුණෙහි නො ඇලෙන්නේ ය. මෙෂය තැතිවරද ද සොයන්නේ ය. බුද්ධිය ඇති වරද සොයන්නේ ය. මෙෂය සත්ත්වයන් දුරු කරන ආකාරයෙන් පවත්නේ ය. බුද්ධිය සංස්කාරයන් දුරු කරන ආකාරයෙන් පවත්නේ ය. මෙසේ බැවින් මෙෂ චරිතයාහට බුද්ධි චරිතයා සහාග යි.

මොහ චරිතයාහට නූපන් කුසල් උපදවන්නට ව්‍යායාම කරත් ම බොහෝ සෙයින් අන්‍යතරාර්ථකර විතක්ක උපදී. විතක්කය මොහයට ආසන්න ලක්ෂණ ඇති බැවිනි.

ඒ එසේ මැ යි:- මොහය අරමුණෙහි ව්‍යාකුල වැ පවත්නා බැවින් අනවස්ථිත ය. විතක්කය නා නා ප්‍රකාර විතක්ක කරන බැවින් අනවස්ථිත ය. මොහය සභාව අවබොධ වශයෙන් අරමුණෙහි නො බැසැ පවත්නා බැවින් වඤ්චල ය. විතක්කය ලඝු වූ කල්පනා ඇති බැවින් වඤ්චල ය. මෙසේ බැවින් මොහ චරිතයාහට විතක්ක චරිතයා සහාග යි.

තවද, ඇතැම් කෙනෙක් තෘෂ්ණාචරිත- මානචරිත- දෘෂ්ටි-චරිත වශයෙන් අන්‍ය වූත් චරිත තුනක් දක්වති. එහි තෘෂ්ණා නම් රාග ය. මානය රාගය හා සම්ප්‍රයුක්ත ය. එබැවින් ඒ තෘෂ්ණා- මාන දෙක රාග චරිතය ම අනුව යන්නේ ය. දෘෂ්ටිය මොහ නිදාන කොටැ ඇති බැවින් දෘෂ්ටිචරිතය මොහචරිතයෙහි ම වැටෙන්නේ ය.

චරිත නිදානාදිය.

1 මේ ස වැදෑරුම් චරිතයන්ගේ නිදාන කිමෙක් ද
2 මේ රාග චරිතයා ය මේ මෙෂ චරිතයාය යනාදිය කෙසේ දත හැකි ද
3 කවර චරිතයක් ඇති පුද්ගලයෙකුට කිමෙක් සප්පාය ද

1 රාගචරිත, දෙෂචරිත, මොහචරිත යන මූල දැක්වූණු චරිත තුන පූර්ජාතික පුරුද්ද නිදන කොට ඇත්තේ ය සි ද; පඨවි, ආප, තෙජෝ, වායු යන ධාතු හා වා, පිත්, සෙම් යන දෙස් නිදන කොට ඇත්තේ ය සි ද සමහරු කියත්. (සමහරු යන්නෙන් **විමුක්තිමාර්ග** කර්තෘ වූ **උපතිස්ස** ස්ථවිරයන් ගන්න.)

ඒ එසේ මැ සි:- පූර්ව ජන්මයෙහි ඉෂ්ට ක්‍රියා හා ශුභ ක්‍රියා බහුල කොටැ ඇත්තේ ද, දෙව් ලොවින් චුත වැ මෙහි උපන්නේ ද, රාගචරිතයෙක් වේ. පූර්ව ජන්මයෙහි අත් පා සිදුම් වධ බන්ධන වෛර ක්‍රියා බහුල කොටැ ඇත්තේ ද, නිරයෙන් හෝ නාග යොනියෙන් චුත වැ මෙහි උපන්නේ ද, දෙෂ චරිතයෙක් වේ. පූර්ව ජන්මයෙහි බහුල වැ මත්පැන් පානය කෙළේ ද, ධර්ම ශාස්ත්‍ර අභ්‍යාස නො කෙළේ ද, තිරිසන් යොනියෙන් චුත වැ මෙහි උපන්නේ ද, මොහචරිතයෙක් වෙයි. පෙර පුරුද්ද නිදන කොටැ ඇතැයි කීයේ මේ සඳහා ය.

පෘථිවි ධාතු හා අබ් ධාතු උනසසන්න පුද්ගලයා මොහ චරිතයෙක් වේ. තෙජෝ ධාතු හා වායෝ ධාතු උත්සන්න පුද්ගලයා දෙෂචරිතයෙක් වේ. මේ සිව් ධාතු සම වැ ඇති පුද්ගලයා රාගචරිතයෙක් වෙයි.

"සෙමින් ශුක්‍ර ප්‍රාබල්‍ය වන බැවින්" සෙම අධික කොට ඇත්තේ රාග චරිත වේ. "වාතය වියවුල් වැ පවත්නා බැවින්" වාතය අධික කොටැ ඇත්තේ මොහචරිත වේ. නැතහොත් සෙම අධික කොටැ ඇත්තේ මොහචරිත වේ. වාතය අධික කොට ඇත්තේ රාගචරිත වෙයි. ධාතු හා දෙෂ නිදන කොටැ ඇතැයි කීයේ මේ සඳහා ය.

(මෙසේ **විමුක්තිමාර්ග** මතය දක්වා ඉක්බිති එහි දෙස් කියති.)

පූර්ව ජන්මයෙහි ඉෂ්ට ක්‍රියා ශුභ ක්‍රියා බහුල කොටැ ඇති වූ ද, දෙව් ලොවින් චුත වැ මෙහි උපන්නා වූ ද, සියල්ලෝ රාගචරිතයෝ ම නො වෙති. එයින් අන්‍යයෝ හෝ දෙෂමොහචරිතයෝ නො වෙති. එසේ ම ධාතූන් පිළිබඳ යට දැක්වුණු උනසද නියම යෙක් ද නැත. දෙෂ නියම කළ තන්හි දු රාග මොහ දෙක ම කියන ලදී. හෙද පූර්වාපර විරුද්ධ ය. (සෙමහාධිකෝ රාග-

චරිතො" යි කියා නැවත "සෙම්හාධිකො මොහචරිතො" යි ද "වාතාධිකො මොහචරිතො" යි කියා නැවත "වාතාධිකො රාගචරිතො"යි කී බැවින් පූර්වාපර විරුද්ධ යි.) ශ්‍රද්ධාචරිතාදීන් පිළිබඳ එක නිදානයකු දු නො කියන ලද්දේ ය. එබැවින් ඒ සියල්ල නුවණින් විනිශ්චය කොටැ කියන ලද්දේ නො වේ යයි දත යුතු.

චරිත පිළිබඳ අර්ථ කථාචාර්ය මතානුසාර විනිශ්චය මෙසේ ය.

කියන ලද මැ යි **විභාවනීකථා** උතුසද කීර්තනයෙහි:

"ඉමෙ සත්තා පුබ්බහෙතු නියාමෙන ලොභුස්සද, දෙසුස්සද, මොහුස්සද, අලොභුස්සද, අදෙසුස්සද, අමොහුස්සද, ච හොන්ති." 'මේ සත්ත්වයෝ පූර්ව හෙතු නියමයෙන් ලොභොත්තන්න ද, දෙසොත්තන්න ද, මොහොත්තන්න ද, අලොභොත්තන්න ද, අදෙසොත්තන්න ද, අමොහොත්තන්න ද වෙති. එහි විස්තර මෙසේ ය.

කම් කරන කාලයෙහි යමකුගේ ලොභය බලවත් වැ අලොභය දුර්බල වේ ද, අදෙෂය හා අමෝහය බලවත් වැ දෙෂ- මෝහ දුර්බල වේ ද, ඔහුගේ දුර්බල වූ අලොභය ලොභය මැඩපියන්නට සමර්ථ නො වේ. බලවත් වූ අදෙෂ හා අමෝහ දෙෂ- මෝහ මැඩලන්නට සමර්ථ වේ. එසේ හෙයින් එබඳු කම් යෙන් උපන් පුද්ගලයා ලොභී වූ-ක්‍රොධ රහිත ස්වභාව ඇති විදුරු නුවණින් යුක්තයෙක් වන්නේ ය.

කම් කරන කාලයෙහි යමකුගේ ලොභ දෙෂ බලවත් වැ අලොභ හා අදෙෂ දුර්බල වේ ද, අමෝහය බලවත් වැ මෝහය දුර්බල වේ ද එබඳු කම්යෙන් උපන් පුද්ගලයා **දත්තාභය** තෙරුන් මෙන් ලොභී වූ ද, ක්‍රොධ කරන සුලු වූ ද, ඒදුරු නුවණැතියෙක් වන්නේ ය.

යමකු කම් කරන කාලයෙහි ලොභ- මෝහ බලවත් වැ අදෙෂ දුර්බල වේ ද, හෙතෙමේ ලොභී වූ ද මූඪ වූ ද, ක්‍රොධ නො කරන සුල්ලෙක් වන්නේ ය.

යමකු කම් කරන කල්හි ලොභ- දෙෂ- මෝහ යන තුන් හෙතුම බලවත් වැ අලොභ- අදෙෂ- අමෝහ දුර්බල වේ ද, හෙතෙමේ ලොභී වූ ද, ක්‍රොධ කරන සුලු වූ ද, මූඪයෙක් වන්නේ ය.

යමකු කම් කරන කල්හි අලොභ බලවත් වැ ලොභ දුර්බල වේ ද, වෙෂ - මොහ බලවත් වැ අවෙෂ - අමොහ දුර්බල වේ ද හෙතෙමේ නිලෝභ වූ දිව්‍ය අරමුණු දැක කම්පිත නො වන මද කෙලෙස් ඇතියෙක් වේ. එසේ වුව ද කිපෙනසුලු මිනිස් බුඩිකයෙක් වන්නේ ය.

යමකු කම් කරන කල්හි අලොභ - අවෙෂ බලවත් වැ ලොභ - වෙෂ දුර්බල වේ ද, මොහ බලවත් වැ අමොහ දුර්බල වේ ද, හෙතෙමේ යට දැක්වුණු සේ ම නිලෝභ - නො කිපෙන සුල්ලෙක් වේ. එහෙත් මූඩ වන්නේ ය.

යමකු කම් කරන කල්හි අලොභ - අමොහ බලවත් වැ ලොභ - මොහ දුර්බල වේ ද වෙෂ බලවත් වැ අවෙෂ දුර්බල වේ ද, හෙතෙමේ පෙර කී සේ නිලෝභ ප්‍රාඥයෙක් වේ. එහෙත් දුෂට වූ කිපෙන සුල්ලෙක් වන්නේ ය.

යමකු කම් කරන කල්හි අලොභාදී හෙතු ත්‍රය බලවත් වැ ලොභාදී හෙතු ත්‍රය දුර්බල වේ ද, හෙතෙමේ මහා සංඝරක්ඛිත තෙරුන් මෙන් නිලෝභ වූ ද අක්‍රොධත වූ ද ප්‍රාඥ වූ ද උතුමෙක් වන්නේ ය.

කිය යුත්තෙක් ඇති. මෙහි ලොභියා ය යි කියන ලද්දේ රාගචරිතයා ය, කිපෙන සුල්ලා ය යි කියන ලද්දේ වෙෂ චරිතයා ය, මූඩයාය යි කියන ලද්දේ මොහචරිතයා යි. ප්‍රාඥ තම් බුදුසිරිතයා ය. ලොභ - වෙෂ නැති තැනැත්තේ ප්‍රසන්න ප්‍රකෘතික බැවින් ශ්‍රඩාචරිතයා ය. තවද අමොහ පරිවාර කම් යෙන් උපන් තැනැත්තා බුඩිචරිතයා වන්නා සේ ම බලවත් ශ්‍රඩා පරිවාර කම්යෙන් උපන් තැනැත්තේ ශ්‍රඩාචරිතයා ය. කාමවිතර්කාදිය පිරිවර කොට ඇති කම්යෙන් උපන්නේ විතර්කචරිතයා ය. ලොභාදිය මිශ්‍ර කොට ඇති කම්යෙන් උපන්නේ මිශ්‍රචරිතයා යි.

මෙසේ ලොභාදීන් අතුරෙන් යම් කිසිවක් පිරිවර කොට ඇති ප්‍රතිසන්ධි ජනක කම්ය චරිත පිළිබඳ නිදාන ය යි දතයුතු යි.

2. මේ රාගචරිතයා ය, මේ වෙෂචරිතයා ය යනාදිය කෙසේ දත හැකි ද

"ඉරියාපථතෝ කිච්චා - හොජනා දස්සනාදිතෝ
ධම්මපවත්තනිතෝ චෙව - චරියායෝ විභාවයෙ"

'ඉරියව් වශයෙන් ද, කෘත්‍ය වශයෙන් ද, වැළඳීම් වශයෙන් ද, දර්‍ශනාදි වශයෙන් ද, ධර්‍ම ප්‍රවෘත්ති වශයෙන් ද, චරිත දැනැ ගන්නේ ය'

ඉරියව් වශයෙන් චරිත දැනැ ගන්නා ආකාරය.

ගමන.

රාගචරිතයා ප්‍රකෘති ගමනින් යන කල ලීලායෙන් යන්නේ ය. සෙමෙන් සම වැ පා තබා සමවැ ම පා තහන්නේ ය. ඔහුගේ පාද උක්කුටික ය. ("පය සම කොටැ හෙළතු දු පියවර වනාහි විලුඹින් හා අක්පයින් ගැලේ මැද නො ගැළෙන්නේ ය." යනු පැරකුම්බා සත්ත සි.)

ද්වේෂචරිතයා පතුල් අගින් බිම සාරන්නකු මෙන් යන්නේ ය. පාද වහා බිම තබා වහා ම තහන්නේ ය. ඔහුගේ පාද පස්සෙන් කයන ලද්දක් මෙන් වෙ සි.

මොහචරිතයා අවුල් ගමනින් යන්නේ ය. තැති ගත්තක්හු මෙන් පා බිම තබා තැති ගත්තක්හු මෙන් නගා යන්නේ ය. ඔහුගේ පාද විලුඹින් හා අක්පල්ලෙන් වහා එසවෙන්නේ ය.

කියේ මැ සි:- **මාගණ්ඩිය සූත්‍රොපනතනියෙහි :**

"රත්තඤ්ඤහි උක්කුටිකං පදං හවෙ
දුට්ඨස්ස හොති අනුකඩ්ඪිතං පදං
මූළ්හස්ස හොති සහසානුපීළිතං
විවත්තචිත්තදදඤ්ඤිදමිදිසං පදං"[1] සි.

'රාගීහුගේ පාද උක්කුටික ය. (විලුඹින් හා අක්පතුලින් ගැළේ.) ද්වේෂීහුගේ පාද පස්සෙන් අදනා ලද්දේ වේ. මූඪයාගේ පාද විලුඹින් හා අක්පතුලින් වහා ම එබෙසි. මේ බදු වන්නේ ප්‍රහීන කෙලෙස් ඇතියන්ගේ පාද සි' යනු එහි භාව සි.

සිටීම හා ඉඳීම

රාගචරිතයාගේ සිටීම හා ඉඳීම ප්‍රසාද ජනක ය, මිහිරි ය, ද්වේෂචරිතයාගේ සිටීම හා ඉඳීම තද ය, දැඩි ය. මොහචරිතයා ගේ සිටීම හා ඉඳීම අවුල් ය.

නිදීම

රාගචරිතයා සෙමෙන් සම කොටැ යහන පණවා ගෙකැ සෙමෙන් වැදැ හෙව අඹ ප්‍රත්‍යඹ ඔබමොබ නො විසිරෙන සේ

---

[1]ප: පෝ: අඨක ව: වණ්ණණ: 437

මැනෙවින් තබාගෙනැ ප්‍රසාද ජනකාකාරයෙන් නිදන්නේ ය. පුබුදුවනු ලබන කල්හි දු වහා නැගී සිටැ සැක ඇත්තකු මෙන් සෙමෙන් ප්‍රතිවචන දෙන්නේ ය.

වෙෂවරිතයා යුහු වැ කෙසේ කෙසේ හෝ යම්තම් දෙය කින් යහන පණවා ගෙනැ මුළු ඇඟ ම හෙළා ලත ලදු වැ මුහුණත් හකුළුවා ගෙනැ නිදන්නේ ය. පුබුදුවනු ලබන කල්හි දු වහා නැගී සිටැ කිපි එකකු මෙන් ප්‍රතිවචන දෙන්නේ ය.

මොහවරිතයා යහන අවුල් සේ පණවා ගෙනැ අත් පා එහි මෙහි දමාලන ලදු වැ බොහෝ සේ මූණින් හෙවැ නිදන්නේ ය. පුබුදුවනු ලබන කල්හි දු "හුම් හුම්" යි කියමින් මැලිකමින් නැගී සිටින්නේ ය.

සඩ්ඩාවරිතාදීන්ගේ චරිත ද පිළිවෙළින් රාගවරිතාදීන්ට සමාන බැවින් ඔවුන්ගේ ඉරියව් ද මෙබදු යයි දත යුතු සි.

කෘත්‍ය වශයෙන් චරිත දැනගන්නා ආකාරය.

කෘත්‍ය නම් කැමදීම් ආදිය සි. රාගවරිතයා හමදින කල්හි මූස්න මැනෙවින් ගෙනැ යුහුසුලු නො වී වැලි නො විසුරුවමින් නිකමල් ඇතිරියක් අතුරන්නා සේ පිරිසුදු වැ සම කොටැ හමදින්නේ ය. වෙෂවරිතයා මූස්න තර කොටැ ගෙනැ යුහු යුහු වැ දෙපස වැලි නහමින් රළු හඬින් පිරිසිදුකම් නො බලා පිසම කොටැ හමදින්නේ ය. මොහවරිතයා මූස්න බුරුලින් ගෙනැ වැලි පෙරලමින් කැලිකසල අලලමින් අපිරිසිදු වැ විසම කොටැ හමදින්නේ ය. සිව්රු සේදීම් පෑඹු පෙවීම් ආදි සියලු කෘත්‍යයන්හි ද පිළිවෙළ මෙසේ ය.

ඒ එසේ මැ සි:- රාගවරිතයා දක්ෂ වැ මිහිරි ලෙස සම කොටැ සකස් කොටැවැඩ කරන්නේ ය. වෙෂවරිතයා සථිර වැ දැඩි ලෙස විසමකොටැ වැඩ කරන්නේ ය. මොහවරිතයා අදක්ෂ වැ අවුල් ලෙස විසම කොටැ පරිවෙජ්ද රහිත වැ වැඩ කරන්නේ ය. රාගවරිතයාගේ සිවුරු පෙරවුම පවා ඉතා දැනිත් නො වේ, ඉතා සිපිලත් නො වේ. දුටුවන් පහදින සේ පරිමණ්ඩල කොටැ- හාත්පසින් වට කොටැ ය. වෙෂවරිතයා ගේ සිවුරු පෙරවුම ඉතා දැඩි වේ. පිරිමඬුලු නො වේ. (සිවුරු එහෙන් මෙහෙන් එල්ලෙන්නේ වේ.) මොහවරිතයාගේ සිවුරු පෙරවුම බුරුල් ය. අවුල් ය. ශ්‍රද්ධාවරිතාදීන් පිළිබඳ වැ ද මේසේ ම දත යුතු සි.

වැළඳීම් වශයෙන් චරිත දැනැ ගන්නා ආකාරය.

රාගචරිතයා සිනිඳු වූ මධුර භොජන ප්‍රිය කරන්නේ ය. වළඳන කල්හි ආලෝපය ඉතා මහත් කොටැ නො ගෙනැ වට කොටැ රසවිඳිමින් සෙමෙන් වළඳන්නේ ය. මිහිරි වූ දෙයක් ලැබුණු කල සොම්නස් වන්නේ සි. ද්වේෂචරිතයා රළු වූ ඇඹුල් ආහාර ප්‍රිය කරන්නේ ය. වළඳන කල්හි ආලෝපයෙන් කට පුරවා ගෙනැ රස බැල්මක් නැති වැ යුහු යුහු වැ වළඳන්නේ ය. අමිහිරි දෙයක් ලැබුණු විට දෙම්නස් වන්නේ සි. මොහචරිතයා අනියත රුචික ය- අසවල් රසයට ප්‍රිය යයි කිය නො හැකි ය. වළඳන කල්හි කුඩා ආලෝප ගෙනැ වට නො කොටැ බත්තුලු භාජනයෙහි ද හෙලමින් මුඛ යෙහි ද ගා ගනිමින් විසිප්ත වැ නොයෙක් දේ කල්පනා කරමින් වළඳන්නේ ය. ශ්‍රද්ධාචරිතාදි තුන් දෙනා ගේ පැවැත්ම ද පිළිවෙළින් යටකී බඳුය සි දත යුතු.

දර්ශනාදි වශයෙන් චරිත දැනැගන්නා ආකාරය.

රාගචරිතයා සුළු වූ හෝ සිත්කලු රූපයක් දුටු විට මවිත වූවකු මෙන් බොහෝ වේලා සිටින්නේය. සවලප ගුණ යෙහි ද ඇලෙන්නේ ඇති දෙඟ ගණනට නො ගන්නේ ය. යම් තැනෙක වැසැ යන විට වියොග නො කැමැති වැ අපෙක්ෂා සහිත වැ ම යන්නේ සි. ද්වේෂචරිතයා සවලප වූ ද අමනාප රූපයක් දුටු කල කලාණන වූවකු මෙන් මද වේලාවක් ම බලා සිටින්නේ ය. සවල්ප දෙඟයෙහි ද ගැටෙන්නේ ය. ඇති ගුණ පවා ගණනට නොගන්නේ ය. වුසු තැනින් යන කල මිදී යන රිස්සෙන් අපෙක්ෂා රහිත වැ ම යන්නේ ය. මොහ චරිතයා යම්කිසි රූපයක් දුටු කල එහි ගුණදෙඟ විවෙචනය පර ප්‍රත්‍යයෙන් කරන්නේ ය. අන්‍යයෝ නිඳා කෙරෙත් තම් තෙමේත් නිඳා කරන්නේ ය. අන්‍යයෝ ප්‍රශංසා කෙරෙත් තම් තෙමේත් ප්‍රශංසා කරන්නේ ය. හේ වනාහි අඥාන උපෙක්ෂායෙන් යුක්ත ය. ශබ්ද ශ්‍රවණාදියෙහි ද මේ නියා මැ සි. ශ්‍රද්ධාචරිතාදීහු ද මේ අනුසාරයෙන් දත යුතු. ඔවුන් මොවුන් හා සහාග බැවිනි.

ධම්ම ප්‍රවෘත්ති වශයෙන් චරිත දැනැ ගන්නා ආකාරය.

රාගචරිතයා කෙරෙහි, **මායා- සාඨෙය්‍ය- මාන- පාපිච්ඡතා- මහිච්ඡතා- අසන්තුට්ඨිතා- සිඳඟ- චාපල්‍ය** යනාදි කෙලඟ ධම් බහුල වැ ඇත්තේ ය. (**මායා** තම් තමා කෙරෙහි ඇති දෙස්

මුවහ කිරීම ය. **සාඨෙය්‍ය** නම් තැති ගුණ පහළ කිරීම ය. **මාන** නම් උඩඟු බව ය. **පාපිච්ඡතා** නම් නැති ගුණ පහළ කිරීම් මූඛයෙන් ප්‍රත්‍යය පිළිගැන්මෙහි පමණ නො දන්නා බව ය. **මහිච්ඡතා** නම් ඇති ගුණ පහළ කිරීම් මූඛයෙන් ප්‍රත්‍යය පිළිගැන්මෙහි පමණ නො දන්නා බව ය. **අසන්තුට්ඨිතා** නම් ලද දෙයින් සතුටු නො වන බව ය. **සිඛ** නම් අහක් මෙන් උත්සන්නා වූ කෙලෙස් ඇති බව ය. **චාපල්‍ය** නම් ශරීර හා පරිෂ්කාර හෙබවීම් වශයෙන් පවත්නා ලොලුපය. (ආදි ශබ්දයෙන් **අහිරික, අනොත්තප්ප, මද, පමාදාදිය** ගන්න.)

ද්වේෂචරිතයා කෙරෙහි, **කොධ- උපනාහ- මක්ඛ- පලාස- ඉස්සා- මච්ඡරියාදි** කෙලෙස බහුල වැ පවත්නේ ය. **කොධ** නම් කිපෙන බව ය. **උපනාහ** නම් බැඳ ගන්නා ක්‍රොධය- වෛරය. **මක්ඛ** නම් අනුන් ගේ ඇති ගුණ මැකීම ය. **පලාස** නම් ගුණ ඇත්තේ ඔහුට පමණ ද, මට ද ඒ ගුණ ඇතැයි ගන්නා යුගග්‍රාහය. **ඉස්සා** නම් පර සම්පත් නො ඉවසීම ය. **මච්ඡරිය** නම් සම සම්පත් නිගුහනය. (ආදි ශබ්දයෙන් **දෙවචස්සතා, පාපමිත්තතාදිය** ගන්න.)

මෝහචරිතයා කෙරෙහි – **ථීන - මිද්ධ – උද්ධච්ච – කුක්කුච්ච- විචිකිච්ඡා- ආඛානාගාහිතා- දුප්පටිනිස්සග්ගතාදි** තෙලෝ බහුල වැ පවත්නේ ය. **ථීන-මිද්ධ** නම් චිත්ත චෛතසිකයන්ගේ ගිලන් බව හෙවත් අලස බව ය. **උද්ධච්ච** නම් නොසන්සුන් බව ය. **කුක්කුච්ච** නම් විපිළිසර හෙවත් පසුතැවිල්ලය. **විචිකිච්ඡා** නම් සැකය. **ආඛානාගාහිතා** නම් නුනුවණින් දැඩිකොටැ ගන්නා බව ය. **දුප්පටිනිස්සග්ගතා** නම් ගත් මිථ්‍යා ග්‍රහණය ඉවත් කොටැ පිය නොහැකි බව ය (ආදි ශබ්දයෙන් **මුට්ඨස්සච්ච-අසම්පජඤ්ඤාදින්** ගන්න.)

ශ්‍රද්ධාචරිතයා කෙරෙහි-දෙන දෙයෙහි නො ඇලී දීම් සංඛ්‍යාත **මුත්තචාගිතාව** ද, බුද්ධාදි ආර්‍යයන් දක්නා කැමැති බව ද, බණ ඇසීයට් බව ද, ප්‍රීති බහුල බව ද, රජ ඇමැති ආදීන් හා එක්වැ හැනී නො වසන බව ද, ඇති දෙස් මුවහ කිරීම් සංඛ්‍යාත මායා රහිත බව ද, පැහැදිය යුතු තැන පහදින බව ද යනාදිය පවත්නේ ය.

බුද්ධිචරිතයා කෙරෙහි- කිකරු බව, කල්‍යාණ මිත්‍රයන් ඇති බව, හොජතයෙහි පමණ දන්නා බව, සිහි නුවණ ඇති බව, අප්‍රමාද බව, සංවෙග කටයුතු තන්හි සංවෙග කරන බව, සංවෙගයට පැමිණෙ නුවණින් භීයිකරන බව යනාදිය පවත්නේ ය.

විතකීචරිතයා කෙරෙහි - දෙඩමලු බව, ගණසඩගණිකා රාමය, කුශලානුයොගයෙහි අනභිරතිය, සපිර සිත් නැති බව, රාත්‍රියෙහි දුමන බව හෙවත් මෙසේ මෙසේ කරම් යි විතකී කරන බව, දහවල් දිලිසෙන බව හෙවත් ඒ විතර්කිතයන්හි යෙදෙන බව, අරමුණින් අරමුණට යන බව හෙවත් එකක් මදක් කොටෑ ඒ හැර නැවත අනෙකක් කරන බව යනාදිය බහුල වශයෙන් පවත්නේ ය.

යථොක්ත චරියාවිභාවනාවිධිය වනාහි සම්භාරයෙන් පෙළෙහි හෝ අටුවායෙහි ආයේ නො වේ. හුදෙක් ආචාර්‍ය්‍ය මතානුසාරයෙන් දැක්වුනේ ය. එබැවින් ඒ සාරවශයෙන් නො ගත යුතු.

ඒ එසේ මැයි.- රාගචරිතයා කෙරෙහි ඇතැ යි කියූ ඉරියව් ආදිය අප්‍රමාද වැ වසන වෙෂචරිතාදීන්ට ද කළ හැකි ය. මිශ්‍ර චරිතයෙන් යුත් එක පුද්ගලයෙකුහට දක්ෂ ගමන්, අදක්ෂ ගමන්, තුරිත ගමන්, ලැසි ගමන් ආදි නොයා ලක්ෂණ ඉරියව් ඇතිවිය නොහැකි ය. එබැවින් මෙහි ලා අටුවායෙහි කියූ විධිය ම සාර වශයෙන් සැලකිය යුතු.

ඒ මෙසේ ය:- **"චෙතොපරියඤාණස්ස ලාභී ආචරියෝ. චරියං ඤත්වා කම්මට්ඨානං කථෙස්සති ඉතරෙන අනෙනවා- සිකෝ පුච්ඡිතබ්බෝ"** "පරසිත් දන්නා නුවණ ඇති ආචාර්‍ය්‍ය-වරයෝ ඒ නුවණින් චරිත දැන කම්ඨාන කියති. එබඳු නුවණ නැති ආචාර්‍ය්‍යවරයන් විසින් අතවැස්සන් විචාළ යුතු." එසේ දැක්වුණු බැවින් පරසිත් දන්නා නුවණින් හෝ අතවැසියන් විචාරා හෝ මේ රාගචරිතයා ය මේ වෙෂචරිතයා ය යනාදිය දැනගත යුතු.

3 කවර චරිත ඇති පුදගලයකුහට කුමක් සප්පාය ද

රාගචරිතයාට සප්පාය

රාගචරිතයාහට වනාහි අපිරිසිදු වෙදිකා ඇති - උඩුමහල්හි නො වැ බිම පිහිටි - භිතතියෙහි හෝ භූමියෙහි පරිකම් නො කළ - තෘණ කුටි හෝ කොළ සෙවෙණි කළ පන්සල් ආදියට

ඇතුළත් ධූලි ගැසුණු වවුලන් ගැවසුණු කැඩී බිඳී ගිය ඉතා උස් හෝ ඉතා මිටි ඡායා උදක තැති එහෙයින් මැ රළු වූ සිංහ-ව්‍යාඝ්‍රාදීන්ගෙන් සැක සහිත අපිරිසුදු විසම මාඝී ඇති බලන්කවුන්ට පවා පිළිකුල් උපදවන මකුණුකැලෙන් පිරී ගිය විරූප දුර්ගන්ධ ඇඳ පුටු ඇති සෙනස්න සපාය වන්නේ ය. එසේම කොන් ඉරී ගිය ඔබින් මොබින් එල්ලෙන දික් ලුහුඬු නූලින් ගැවසුණු එහෙයින් ම ඉඩිපු බදු හණවසා මෙන් රළු පහස් ඇති කිලිටි බර දුකසේ පරිහරණය කටයුතු හඳනය හා පොරෝණය ද, දුර්ගන්ධ මැටිපාත්‍රය හෝ සිදුරු තැන ඇණ හා පෙකිලා ශොභා නැති කළ බර ඇති විරූප සටහනින් යුත් හිස්කබල සේ පිළිකුල් කටයුතු යකඩ පාත්‍රය හෝ සපාය වන්නේ ය.

පිඬු පිණිස යන මාර්ගය ද මන තෝ වඩන අසල ගම් තෝ පිහිටි විසමයෙක් ම සපාය වන්නේ ය. පිඬු පිණිස හැසිරෙන ගම ද නුදුවුවන් මෙන් හැසිරෙන එක ගෙදෙරක වත් පිණ්ඩපාතය නො ලැබෑ නික්මැ යන්නා දැකැ "එඬින්න සාමිනි"සි ආසන ශාලාවට පමුණුවා කැඳ බත් දී ගොවුදෙහි ගවයකු ඇතුළු කොටැ ඌ දෙස තෝ බලා ම යන්නා සේ ඉවත් වැ යන මිනිසුන් ඇත්තේ ම සපාය වන්නේ ය.

වළඳවන්නෝ ද දාසයෝ හෝ කම්කරුවෝ වෙත් නම් ඔව්හු ද දුර්ගන්ධ වැ, දුර්ගෝෂ වැ, කිලිටි හැඳ දුර්ගන්ධ වැ පිළිකුල් කටයුතු සිරුරු ඇති වැ ඉවත දමාලන සේ අගෞරවයෙන් වළඳවත් නම් එබන්දේ ම සපාය වෙති.

කැඳ බත් හා කැවිලි ද රැකෂදුර්ගන්ධ බොඩහමු කුරහන්-නිවුඩු සහල් ආදියෙන් කළ පිළුණු මොහොරු-කාඩි හා මේරු පලා-මාළු සහිත යම්කිසිවක් ම සපාය වන්නේ ය.

හෙද යම් තම් කුස පිරෙන පමණට ය. ඉරියව් වලින් සපාය වන්නේ සිටීම හෝ සක්මන් කිරීම ය. අරමුණු වනාහි නීලාදි වර්ණ කසිණයන් අතුරෙන් අපිරිසිදු පැහැති කිසිවක් ම සපාය වන්නේ සි.

චෛත්‍යචරිතයාට සපාය

චෛත්‍යචරිතයාට වනාහි ඉතා උස් ද නො වූ ඉතා මිටි ද නො වූ සෙවණින් හා ජලයෙන් යුත් මොනවට බෙදූ ලූ බිත්ති කණු හා හිණි ඇති මල්කමින් ලියකමින් සුසැදි නානාවිධ චිත්‍ර කර්මයෙන් විචිත්‍ර සම සිනිදු මෘදු භූමිතල ඇති ඔඹ විමනක් මෙන් මල් දමින් විසිතුරු කළ පිළිවියනින් සමලඬකෘත පිරිසිදු

සිත්කලු ඇතිරි අතුට මොනවට පැණෙවූ ඇඳ පුටු ඇති හත්හිතන්හි සුවඳ ගන්වන පිණිස තබන ලද මල් හා වත්සුණු සුවඳින් සුගන්ධවත් දුටු පමණින් ප්‍රීති ප්‍රමෝද්‍ය උපදවන සෙනස්සන ද, කිසි උවදුරු නැති පිරිසිදු සමතලා අලඬකාරවත් මාගී ද සප්පාය වන්නේ ය. සෙනාසන පරිෂ්කාර වශයෙන් පණු-මකුණු-සර්-මී ආදීන්ගේ ආශ්‍රය සිඳ ලන පිණිස එක ඇඳක් හා පුටුවක් වටනේය. ඉන් වැඩි නො වටනේ ය. භදන්ත පොරෝණා සිවුරු ද චීනපට සෝමාරපට කොසෙය්‍ය සියුම් කපුපිළි සියුම් කොමු පිළි ආදීන් අතුරෙන් ප්‍රණීත-ප්‍රණීත දෙයින් කළ එකපට හෝ දෙපට ඇති සැහැල්ලු ශ්‍රමණ සාරුප්‍ය සේ පඬු රැඳු ඉතා පිරිසිදු පැහැ ඇත්තේ ම වටනේ ය. පාත්‍රය ද දිය බුබුලක් මෙන් මනා සටහන් ඇති මැණිකක් මෙන් ඉතා මට වූ නිමිලි ශ්‍රමණ සාරූප්‍ය සේ පිරිසිදු පැහැ ඇති යකඩ පාත්‍රය ම වටනේ ය. පිඬු පිණිස වඩනා මහ ද උපද්‍රව රහිත සමතලා සිත්කලු ඉතා දුර ද නො වූ ඉතා ආසන්න ද නො වූ ගම් ඇත්තේ ම වටනේ ය. පිඬු පිණිස වඩනා ගම ද "ආයුෂ්මත්හු වහන්සේ දැන් දැන් එති"සි පැන් ඉසා ඇමදි තත්හි අසුන් පණවා ගෙනා වඩනා කල පෙර ගමන් ගොස් පාත්‍රය ගෙනා ගෙට පමුණුවා පැණෙවූ ආසනයෙහි වඩා හිඳුවා සකස් කොටා සියතින් වළඳවන මිනිසුන් ඇත්තේ ම වටනේ ය. වළඳවන්නේ ද විශිෂ්ට රා ඇති ප්‍රසාද ජනක මැනෙවින් සනානය කොටා සුවඳ විලවුන් ගල්වා ගත් සුවඳ දුම්හි හා වත්සුණු සුවඳින් සුගන්ධ ඇති නත්වන් පිරිසිදු සිත්කලු වස්ත්‍රාභරණයෙන් සැරසුණු සකසා වළඳවන්නේ ම සප්පාය වෙයි කැඳ බත් හා කැවිලි ද වර්ණයෙන් සුවඳින් හා රසයෙන් යුකත වූ ඕජා ඇති මනොරම්‍ය සංස්කාර ප්‍රණීතය ම වටනේ ය. එ ද රිසියෙන තාක් විය යුතු ය. ඉරියව් වශයෙන් සැතපීම හා හිඳීම ද අරමුණු වශයෙන් නීලාදි වර්ණ කසිණ අතුරෙන් පිරිසිදු පැහැ ඇති අරමුණු ද සප්පාය වන්නේ ය.

මොහචරිතයාට සප්පාය.

මෝහචරිතයාට වනාහි අභ්‍යවකාශයට අභිමුඛ වූ සම්බාධ රහිත වූ යම් තැනෙකැ සිටැ බලන්නවුන්ට කිසිවකින් මූවහ නො වැ දිශා පැනෙන් ද එබඳු වූ සෙනසුන සප්පාය වන්නේ ය.

ඉරියව් අතුරෙන් සප්පාය වන්නේ සක්මන් කිරීම ය. අරමුණු ද සුලු කුලු තරම්, සරාව තරම් කුඩා වී නම් නො වටනේ ය. සම්බාධ අවකාශයෙහි සිත වඩාලාත් මුළාවට පැමිණේ යි. එ බැවින් කුලු-සරාව තරමින් සතර පස් අඟලක් විශාල වැ කරන ලද මහත් වූ කසිණ මණ්ඩලය වටනේ ය. සෙස්ස වෙෂවරිතයාට කී බඳු යි

ශ්‍රද්ධාචරිතයාට සප්පාය

ශ්‍රද්ධාචරිතයාට වනාහි වෙෂවරිතය පිළිබඳ වැ කියූ විධි ම සප්පාය වන්නේ ය. විශෙෂයෙක් නම් ඔහුට බුද්ධානුස්සති ආදි අනුස්සති සය ද සප්පාය වන බව යි.

බුද්ධිචරිතයාට සප්පාය

බුද්ධිචරිතයාට සෙනාසනාදීන් අතුරෙන් මෙ නම් දෙයෙක් සප්පාය නො වන්නේය යි කිය යුතු නැති. කවරෙක් වුව ද සප්පාය වන්නේය යි කී සේ යි.

විතක්කීචරිතයාට සප්පාය

විතක්කීචරිතයාට වනාහි අභ්‍යවකාශයට අනිමුඛ වූ විවෘත සෙනාසනය සප්පාය මේ. යම් තැනෙක සිට බලන්නවුන්ට සිත් කලු ආරම්භ වන පොකුණු ද, පිළිවෙළින් ගම් නියම් ගම් ජනපද ද, නීල වණී පළිත ද, පැතෙත් නම් එබඳු තැන් සප්පාය නො වන්නේ ය. එබඳු තැන් විතක්ය දුවවන්ට ම හෙතු විය හැකි බැවිනි. එහෙයින් ඔහු විසින් ගැඹුරු පළිත විවරයෙහි ද, වනයෙන් මුවහ වූ හත්ථිකුවිජ් පබ්භාර-මහින්ද ගුහා බඳු සෙනාසන යෙහි ද විසිය යුතු. අරමුණු වශයෙන් ඔහුට මහත් අරමුණු නො වටනේ ය. එ ද විතක්ක වශයෙන් දුවන්නට හෙතු විය හැකි බැවිනි. වටනේ කුඩා අරමුණු ය. සෙස්ස රාගචරිතයාට කී බඳුයි.

"ඡබ්බිධ චරිතානුකූල වූ" යන මෙහි චරිතයන්ගේ ප්‍රභෙදපරිච්ඡේද, නිදානපරිච්ඡේද, විභාවනාපරිච්ඡේද, සප්පාය පරිච්ඡේද වශයෙන් විස්තර නිමිණි ය.

මෙතෙකිනු දු චරිතානුකූල **කම්මට්ඨාන** සඳීප්‍රකාරයෙන් ප්‍රකාශ කරන ලද්දේ නොවේ. මතු දැක්වෙන මාතෘකා පද විස්තර වන කල්හි එය සවයං ප්‍රකාශ වන්නේ ය.

දශවිධ කම්මට්ඨාන විනිශ්චය මාතෘකා මෙසේ ය.

1 සංඛ්‍යා නිදේශ වශයෙන්
2 උපචාර - අප්පිණාවහ වශයෙන්
3 ධ්‍යාන ප්‍රභෙද වශයෙන්
4 සමතික්‍රම වශයෙන්
5 වඩිත - අවඩිත වශයෙන්
6 ආරම්මණ වශයෙන්
7 භූමි වශයෙන්
8 ග්‍රහණ වශයෙන්
9 ප්‍රත්‍යය වශයෙන්
10 චරියානුකූල වශයෙන්

යන දශ ආකාරයෙන් **කම්මට්ඨාන** විනිශ්චය දත යුතු සි.

1 සංඛ්‍යා නිදේශ වශයෙන්.

කසිණ	10
අසුභ	10
අනුස්සති	10
බ්‍රහ්මවිහාර	4
ආරූප්‍ය	4
සංඥා	1
ව්වත්ථාන	1
	40

දස කසිණ නම්, පඨවිකසිණ, ආපොකසිණ, තෙජොකසිණ වායුකසිණ, නීලකසිණ, පීතකසිණ, ලොහිතකසිණ, ඔදාතකසිණ ආලොකකසිණ, පරිච්ඡන්නාකාසකසිණ යන මොහු ය.

දස අසුභ නම්, උද්‍ධුමාතක, විනීලක, විපුබ්බක, විච්ඡිද්දක, වික්ඛායිතක, වික්ඛිත්තක, හතවික්ඛිත්තක, ලොහිතක, පුළුවක, අට්ඨික යන මොහු සි.

දස අනුස්සති නම්, බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දෙවතානුස්සති, මරණානුස්සති, කායගතාසති, ආනාපානසති, උපසමානුස්සති යන මොහු ය.

චතුර් බ්‍රහ්මවිහාර නම්, මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන මොහු ය.

චතුරාරුප්‍ය නම්, ආකාසානඤ්චායතන. විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන යන මොනු ය.

එකසංඤ්ඤ නම්, ආහාරයෙහි ප්‍රතිකූල සංඥ ය.
එකවවත්ථාන, චතු ධාතු ව්‍යවත්ථාන යි.

මේ සංඛ්‍යානිද්දේශ වශයෙන් කම්සථාන විනිශ්චය යි.

---

2 උපචාරාවහ - අප්පණාවහ වශයෙන්

කායගතාසතිය හා ආනාපානසතිය හැර බුද්ධානුස්සති ආදි සෙසු අනුස්සති අට ද, ආහාරයෙහි ප්‍රතිකූල සංඥාව ද, චතුධාතු ව්‍යවත්ථානය ද යන දශ කම්සථාන උපචාරධ්‍යාන පමණක් ගෙනැ දෙන්නේ ය. අප්පණා ගෙනැ නො දෙන්නේ ය. සෙසු පඨවි කසිණාදි සමතිස් කම්සථාන අප්පණා ද ගෙනැ දෙන්නේ යි.

මේ උපචාරාප්පණාවහ වශයෙන් කම්සථාන විනිශ්චය යි.

---

3 ධ්‍යාන ප්‍රභෙද වශයෙන්

අප්පණාවහ කම්සථාන තිස අතුරෙන් ආනාපානසතිය හා කසිණ දසය චතුත්ථධ්‍යානිකය හෙවත් සතර රූපාවචර ධ්‍යාන ගෙනැ දෙන්නේ ය. කායගතාසතිය හා අශුභ දශය ප්‍රථමධ්‍යානිකය හෙවත් ප්‍රථමධ්‍යානය පමණක් ම ගෙනැ දෙන්නේ ය. මෙත්තා-කරුණා - මුදිතා යන ප්‍රථම බ්‍රහ්මවිහාරත්‍රය තිකධ්‍යානිකය හෙවත් ප්‍රථම-ද්විතීය-තෘතීය ධ්‍යාන ගෙනැ දෙන්නේ ය. උපෙක්ඛා බ්‍රහ්මවිහාරය හා අරූපාවචර සතර චතුර්ථධ්‍යානික ය හෙවත් චතුර්ථධ්‍යානය පමණක් ගෙන දෙන්නේ යි. (මේ කියන ලද්දේ චතුත්ථනය වශයෙනි.)

ධ්‍යාන ප්‍රභෙද වශයෙන් කම්සථාන විනිශ්චය යි.

---

4 සමතික්‍රම වශයෙන්

අඞ්ග සමතික්‍රමය, ආරම්මණ සමතික්‍රමය යි සමතික්‍රම දෙවිධ වේ. (සමතික්‍රම නම් ඉක්මවීම ය.) සියලු තික චතුත්ථධ්‍යානික කම්සථානයන්හි ඇත්තේ අඞ්ග සමතික්‍රමය යි. විතක්කාදි

අඛාගයන් ඉක්මැ ඒ අරමුණු කොටැ ම විතීයධ්‍යානාදිය ලැබිය යුතු බැවිනි. වතුර්ථ බ්‍රහ්මවිහාරය යි කියන ලද උපෙක්ඛායෙහි ඇත්තේ ත් අඛාගසමතික්‍රමය යි. ඒ වනාහි මෙතනාදීන් පිළිබඳ අරමුණෙහි සොම්නස ඉක්මැ ලැබිය යුතු බැවිනි. සතර අරූපාවචරයන් හි ඇත්තේ ආරම්මණ සමතික්‍රමය යි ආකාශ කසිණය හැර සෙසු පඨවී ආදි නව කසිණයන් අතුරෙන් කිසිවක් ඉක්මැ ආකාශානඤ්චායතනය ලැබිය යුතු වේ. ආකාශාදිය ඉක්මැ විඤ්ඤාණඤ්චායතනාදිය ලැබිය යුතු වේ. එබැවිනි. සෙස්සෙහි සමතික්‍රමයෙක් නැති. (මෙහි විසතර මතු පහළ වන්නේ ය.)

මේ සමතික්‍රම වශයෙන් කම්මට්ඨාන විනිශ්චය යි.

---

5 වඩන-අවඩන වශයෙන්

මේ කම්මට්ඨාන සතලිස අතුරෙන් වැඩිය යුතු වන්නේ (පැතිර විය යුතු වන්නේ) දසකසිණ පමණෙකි. කුමක් හෙයින් ද යම් තාක් තැන් ඒ කසිණ පතුරුවා ද ඒ තාක් තැන් ම දිව්‍යශ්‍රොත්‍ර ධාතුයෙන් ශබ්ද අසන්නට ද, දිව්‍ය චක්ෂුසින් රූප දකින්නට ද, චෙතොපරියඤ්ඤාණයෙන් පර සත්ත්වයන්ගේ සිත් දැනගන්නට ද හැකි වන බැවිනි. (කසිණ නො පතළ තැන ඒ ශබ්ද ඇසීම් ආදිය කළ නො හැක.

කායගතාසතිය හා අශුභ එසේ නො වැඩිය යුතු. (නො පැතිර විය යුතු යි සේසි.) කුමක් හෙයින් ද කායගතාසතිය සභාග පරිච්ඡේද වශයෙන් ද, අශුභ භාත්පස පාඨාණ නිමිත්තා දීන්ගේ වශයෙන් ද, පරිච්ඡේද කරන ලද බැවින් හා එසේ වැඩීමෙන් විශෙෂ ආනිසංස නැති බැවින් ය. අසුභ පිළිබඳ පරිචිත්තනාකාරය මතු අසුභ භාවනානයයෙහි ප්‍රකාශ වන්නේ ය. කායගතාසති හා අශුභ වඩත් හොත් වැඩෙන්නේ කුණපරාශි මැ ය. නො වැඩුව ද කාමරාග විෂකම්භනය වන බැවින් කිසි විශෙෂ ආනිසංසයෙක් ද නැත. එහෙයින් සොපාක ප්‍රශ්නයෙහි **"විභූතා භගවා රූපසඤ්ඤා, අවිභූතා අප්පිකසඤ්ඤා"** 'භාග්‍යවතුන් වහන්ස! රූපසංඥව (මහත් වැ වඩන ලද ද- අප්‍රමාණාලම්බනයෙහි පවත්නෙත්) විභූත ය- පරිව්‍යක්ත ය. අප්පිකසංඥව අවිභූත ය - අපරිව්‍යක්ත ය යි කියන ලදී. එහි රූපසංඥව විභූතය' යි කීයේ නිමිති වැඩීම් වශයෙනි. අප්පික සංඥව අවිභූතය යි කීයේ නිමිති නො වැඩීම් වශයෙනි.

එසේ නම් **"කෙවලං අට්ඨිකසඤ්ඤාය අළුවිං පඨවිං ඉමං"** 'මේ මුළු පොළොව අට්ඨික සංඥාවෙන් පැතුරුවෙමි'යි කියන ලද්දේ කුමක් නිසා ද, එසේ කියන ලද්දේ අට්ඨිකසංඥා ලාභීහට දැටහෙන ආකාර වශයෙනි. අසුභනිමිත්ත වැඩීම් වශයෙන් නො වේ. ධම්මාශොක. රජ්ජුරුවන් රාජ්‍යය කරන කල්හි රාජමන්දිරයට පැමිණ වූ කරවීක පක්ෂියා අවට පිහිටි කැටපත් බිත්තිවල සවකීය ඡායාරූපය දැක 'මෙහි තවත් කරවීක පක්ෂීහු ඇත' යි සිතා මිහිරි හඬින් හැඬී ය. එමෙන් ඒ තෙරුන්නාන්සේ ද අට්ඨික සංඥාව ලත් බැවින් සියලු දිසාවන්හි තමහට වැටහුණු අසුභනිමිත්ත දන්නාසේක් මුළු පොළොව ඇවින් පිරුණේය යි සිතූසේක.

වේදිය. එසේ නම් **ධම්මසංගණියෙහි**[1] වදාළ අශුභධ්‍යාන පිළිබඳ අප්‍රමාණාරම්මණ බව වරද ද, හෙද වරද නො වේ. ඇතැම්හු මහත් ඉදිම ගිය ශරීරයෙහි ද, මහත් අසුභයෙහි ද, නිමිත්ත ග්‍රහණය කරති. ඇතැම්හු කුඩා උද්ධුමාතකයෙහි ද, කුඩා අසුභයෙහි ද නිමිත්ත ග්‍රහණය කරති. එහෙයින් ඇතැමුන්ගේ ධ්‍යාන අප්පමාණාරම්මණ වේ. ඇතැමුන්ගේ ධ්‍යාන පරිත්තාරම්මණ වේ. (මෙසිනු දු අශුභය නො වඩන ලද බව දැක්වූහු.) තවද යමෙක් අශුභවැඩීමෙහි – පැතිරවීමෙහි ආදීනව නො සලකා ම වඩා ද, ඒ සඳහා අප්පමාණාරම්මණය යි කියන ලදී. ආනිසංසයක් නැති බැවින් එසේ නො වැඩිය යුතු. කායගතාසති හා අශුභමෙන් සෙසු ආනාපාණාදිය ද නො වැඩිය යුතු. කුමක් හෙයින් ද, ආනාපාණ නිමිති වඩතොත් වැඩෙන්නේ වාතරාශියෙක් ම ය. එතෙක් ද, එය නැහැ අග උඩුතොල යන අවකාශයෙන් පරිච්ඡින්න වූයේ ද වෙයි. එසේ ආදීනව සහිත බැවින් ද, අවකාශයෙන් පිරිසුන් බැවින් ද, ආනාපාණ නො වැඩිය යුතු.

මෛත්‍රී ආදි බ්‍රහ්මවිහාරයෝ සත්ත්වයන් අරමුණු කොටැ ඇත්තෝ ය. එ බැවින් ඒ බ්‍රහ්මවිහාරයන්ගේ නිමිති වඩතොත් වැඩෙන්නේ සත්ත්ව රාශි ම ය. ඒ වැඩීමෙන් කවර අර්ථයෙක් ද, එ බැවින් එ ද නො වැඩිය යුතු. එසේ නම් **"මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා"**[2] "මෛත්‍රී සහගත සිතින් එක් දිශාවක් වඩා" යනාදිය කුමක් හෙයින් වදාළසේක් ද ඒ වදාළේ පරිග්‍රහ වශයෙන් විනා වඩීන වශයෙන් නො වේ. ආවාස එකෙක දෙකෙක යනාදි පිළිවෙළින් එක් දිසාවෙක සියලු සතුන් පරිග්‍රහ කොටැ

[1]ධ: ස: චිත්තුප්පාදකාණ්ඩ 52 [2]දී: නි: මහාවග්ග 116

භාවනා කරන්නේ **"එකං දිසං එහිනවා"** යි වදාරන ලදි. එයින් නිමිති කැඩීමෙක් නො වදාරන ලදි. බ්‍රහ්ම විහාර පිළිබඳ ප්‍රතිභාග නිමිති කැල ම නැත. වඩනොත් වැඩියයුතු වන්නේ ප්‍රතිභාග නිමිති ය. ඒ නැති කල්හි කුමක් වඩනේ ද, මෙහි දු පරිත්තාරම්මණ හා අප්පමාණාරම්මණ පරිග්‍රහ වශයෙන් ම දත යුතු යි. (කතිපය සත්ත්වයන්ගේ පරිග්‍රහ වශයෙන් ප්‍රවෘත්ත වූයේ පරිත්තාරම්මණ වෙයි. බොහෝ සත්ත්වයන්ගේ පරිග්‍රහ වශයෙන් ප්‍රවෘත්ත වූයේ අප්‍රමාණාලම්බන වෙයි යනු පැරකුම්බා සත්තයි.)

ආරූපාවචර සමාපත්තීන් දු කිසුණු ඉගිළි නැත බැවින් **ආකාශය** නො වැඩිය යුතු. ඒ ආකාශය මෙනෙහි කළ යුතුවන්නේ **කසිණුග්ඝාටිමාකාස** වශයෙන් ය. එයින් ඔබ වඩතු දු කිසිවක් වැඩෙන්නේ නො වේ. **විඤ්ඤාණය** සවභාව ධර්ම බැවින් නො වැඩිය යුතු, සවභාව ධර්ම නො වැඩිය හැකි ය. **අකිඤ්චඤ්ඤායතන විඤ්ඤාණ**යාගේ අපගමය යි. හෙ ද අභාවමාත්‍ර බැවින් වැඩිය නො හැකි ය. **නෙවසඤ්ඤානාසඤ්ඤායතන** ද සවභාව ධර්ම බැවින් නො වැඩිය යුතු යි.

බුද්ධානුස්සති ආදි සෙසු දස කර්මස්ථාන ප්‍රතිභාග නිමිති නැති බැවින් වැඩිය යුතු නො වේ. වැඩිය යුත්තේ ප්‍රතිභාග නිමිති යි. **බුද්ධානුස්සති** ආදි කර්මස්ථානයන්ට ප්‍රතිභාග නිමිති නැත. එ බැවින් එ ද නො වැඩිය යුතු යි.

මේ වඩිනාවඩින වශයෙන් කර්මස්ථාන විනිශ්චය යි.

---

6 ආරම්මණ වශයෙන්

මේ සතලිස් කර්මස්ථාන අතුරෙන් **දසකසිණ** - **දස අසුභ** - **ආනාපානස්සති** - **කායගතාසති** යන දෙවිස්ස ප්‍රතිභාග නිමිති අරමුණු කොටැ පවත්නේ ය. සෙසු අටළොස ප්‍රතිභාග නිමිති අරමුණු කොටැ නොපවත්නේ ය.

ආනාපානස්සතිය හා කායගතාසතිය හැර සෙසු අනුස්සති අට ද, ආහාරයෙහි ප්‍රතිකූල සංඥා - චතුධාතු ව්‍යවස්ථාන - විඤ්ඤාණඤ්චායතන - නෙවසඤ්ඤානාසඤ්ඤායතන යන සතර ද සවභාව ධර්ම අරමුණු කොටැ පවත්නේ ය.

දස කසිණ - **දස අසුභ** - **ආනාපානස්සති** - **කායගතාසති** යන මේ දෙවිස්ස ප්‍රතිභාග නිමිති අරමුණු කොටැ පවත්නේ ය. **සතර බ්‍රහ්මවිහාර** - **ආකාසානඤ්චායතන** - **විඤ්ඤාණඤ්චා-යතන** යන මේ සය ප්‍රඥප්ති අරමුණු කොටැ පවත්නේ ය.

(විපුබ්බක – ලොහිතක – පුළුවක – ආනාපාණසති–ආපොකසිණ තෙජොකසිණ – වායුකසිණ හා සූයඃදීන්ගේ ආලොක මණ්ඩල අරමුණු කොටැ ඇති ආලොක කසිණ යන මේ අට වලිතාරම්මණ අරමුණු කොටැ පවත්නේ ය. හෙ ද ප්‍රතිභාග නිමිති උපදීමට පූර්ව භාගයෙහි ය. ප්‍රතිභාග නිමිති වනාහි අවලිත මැ සි. සෙස්ස අවලිත මැ අරමුණු කොටැ පවත්නේ ය. වැහෙන සැරව ඇති බැවින් විපුබ්බකය ද, වැහෙන ලේ ඇති බැවින් ලොහිතකය ද, පණුවන් සැලෙන බැවින් පුළුවකය ද, කවුළු සිදුරු ආදියෙන් ඇතුළු වූ සූයඃලොකාදිය සැලෙන බැවින් ආලොකය ද වලිතය සි දත යුතු. සෙස්සන්ගේ වලිතත්වය ප්‍රකට මැ සි.)

මේ ආරම්මණවශයෙන් කම්ඨාන විනිශ්චය සි.

---

7. භූමි වශයෙන්

දසඅශුභ, කායගතාසති, ආහාරයෙහි ප්‍රතිකූලසංඥ යන දෙලොස දෙවභූමියෙහි ද, ඒ දෙලොස හා ආනාපාණසතිය ද යන තෙලෙස බ්‍රහ්මභූමියෙහි ද නැත්තේ ය. සතර අරූප්‍ය හැර අන් කිසිවක් අරූපභූමියෙහි නැත්තේ ය. මනුෂ්‍ය භූමියෙහි වනාහි මේ සියල්ලම ඇත්තේ සි.

මේ භූමි වශයෙන් කම්ඨාන විනිශ්චය සි.

---

8 ග්‍රහණ වශයෙන්

දැකීමෙන්, සපර්‍ශකිරීමෙන්, ඇසීමෙන් යන ත්‍රිවිධාකාරයෙන් කමටහන් ගත යුතු වේ. එහි විනිශ්චය මෙසේ ය:– වායුකසිණය හැර සෙයු නව කසිණ ද, දස අසුභ ද, යන එකුන්විස්ස දැකීමෙන් හෙවත් ඇසින් දුටු වසතු කරණකොටැ ගෙන මැ උද්ග්‍රහ නිමිති උපදවිය යුතු. පූර්භාගයෙහි ඇසින් බල බලා ම ඔවුන්ගේ නිමිති ගතයුතු බව කී සේ සි.

කායගතාසතියෙහි තවපකඳුකය දැකීමෙන් ද, සෙස්ස ඇසීමෙන් ද ගතයුතු බැවින් එය දිටඨ – සුත වශයෙන් ගත යුත්තේ ය. ආනාපාණසතිය සපර්‍ශයෙන් ද, වායු කසිණය දැකීමෙන් හා සපර්‍ශකිරීමෙන් ද, සෙසු අටලොස ඇසීමෙන් ද ගත යුතු.

ආදි කාර්මිකයාට වනාහි උපෙක්ෂා බ්‍රහ්මවිහාරය ද, සතර ආරූප්‍ය ද නො ගත හැකි. යට තුන් බ්‍රහ්මවිහාරයට කිසුණෙහි රූපාවචර චතුර්ධ්‍යානයට ද, නො පැමිණ නො ඉපද විය හැකි බැවිනි. සෙසු පන්තිස ගත හැකි සි.

මේ ග්‍රහණ වශයෙන් කම්ඨාන විනිශ්චය සි.

9 ප්‍රත්‍යය වශයෙන්

මේ කමටහන් අතුරෙන් ආකාශ කසිණය හැර සෙසු කසිණ නවය ආරූප්‍යයන්ට ප්‍රත්‍ය ය. අනිඤ්ඤවන්ට දස කසිණ ම ප්‍රත්‍යය වේ. මෙත්තා – කරුණා – මුදිතා යන ප්‍රථම ධ්‍යාන්මවිහාර ත්‍රය චතුර්ථ ධ්‍යාන්මවිහාරයට ද, යට යට ආරූප්‍ය මතු මතු ආරූප්‍යයන්ට ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය නිරෝධ සමාපත්තියට ද ප්‍රත්‍යය වේ. සියලු දෘෂ්ට ධර්ම සුඛ විහාරයෝ විදර්ශනාවට හා සමාපත්තියට ප්‍රත්‍යය වෙත්.

මේ ප්‍රත්‍යය වශයෙන් කර්මස්ථාන විනිශ්චය යි.

---

10. චරියානුකූල වශයෙන්

දස අසුභ-කායගතාසති යන මේ එකොළොස රාගචරිතයාට ද. සතර ධ්‍යාන්මවිහාර – නීලාදි වර්ණ කසිණ සතර යන අට ලොභචරිත යාට ද, එක ම ආනාපාණසතිය මොහචරිතයාට හා විතර්කචරිතයාට ද අනුකූල වේ. ශ්‍රද්ධාචරිතයාට වනාහි බුද්ධානුස්සති ආදි ප්‍රථම අනුස්සති සය ද, බුද්ධිචරිතයා හට මරණ සති – උපසමානුස්සති – චතුධාතු ව්වත්ථාන – ආහාර ප්‍රතිකූල සංඥා සතර ද අනුකූල වේ. වර්ණ කසිණ සතර හැර සෙසු කසිණ ද, සතර ආරූප්‍ය ද සියල්ලන්ට අනුකූල වේ. කසිණයන්හි දු පරිත්ත කසිණය විතර්ක චරිතයාට ද, අප්‍රමාණ කසිණය මොහචරිතයාට ද අනුකූල වන්නේ ය.

මේ චරියානුකූල වශයෙන් කර්මස්ථාන විනිශ්චය යි.

රාගචරිතාදීන්ට අශුභාදි වශයෙන් ද, ශ්‍රද්ධාචරිතාදීන්ට බුද්ධානුස්සති ආදි වශයෙන් ද, යට දැක්වුණු මේ සියල්ල ඉදුරා ප්‍රතිපක්ෂ වශයෙන් හා අභිසපපාය වශයෙන් කියන ලද්දා සි දත යුතු. හුදෙක් රාගාදීන් ඔබා නොලන ශ්‍රද්ධාදීන්ට හෝ උපකාර නොවන, කුශල භාවනාවෙක් නැත.

වදාළේ මැ සි:- මෙඛිය සූත්‍රයෙහි, **"චතුන්නං ඛෝ ධම්මා උත්තරිං භාවෙතබ්බා අසුභා භාවෙතබ්බා රාගස්ස පහාණාය, මෙත්තා භාවෙතබ්බා ව්‍යාපාදස්ස පහාණාය, ආනාපානසති භාවෙතබ්බා විතක්කුපච්ඡේදාය, අනිච්චසඤ්ඤා භාවෙතබ්බා අස්මිමාන සමුග්ඝාතාය"**[1] ශීලසම්පත්, කල්‍යාණමිත්‍රත්ව, සප්පාය ධර්ම ශ්‍රවණ, වීර්‍ය්‍ය, ප්‍රඥ යන මේ පඤ්චධර්මයෙහි පිහිටීමෙන් මත්තෙහි ධර්ම සතරෙක් වැඩිය යුතු. එනම්- රාගප්‍රහාණය පිණිස අශුභ වැඩිය යුතු. ව්‍යාපාදප්‍රහාණය පිණිස මෛත්‍රී වැඩිය යුතු විතර්ක සිඳලීම පිණිස ආනාපාණසති වැඩිය යුතු. අස්මිමාන විනාශය පිණිස අනිත්‍යසංඥා වැඩිය යුතු. යනු එහි භාවය යි.

---

[1]අ: නි: නවකනිපාත 832

මෙසේ **එක**කුට සතර චරිතයක් නැත ද, සතර කමටහන් වැඩිය යුතුය යි වදාළ බැවින් සියලු **කම්ටහන්** සියලු කෙලෙස් විෂ්කම්භනය කරන්නේය යි ද, සියලු කුසල් වඩන්නේය යි ද දත යුතු.

තව ද, **"මෙත්තං රාහුල භාවනං භාවෙහි"**[1] යනාදීන් **රාහුල සූත්‍ර**යෙහි ඳු එක ම තෙරුන්ට සතර බ්‍රහ්මවිහාර, අශුභ, කායගතාසති, ආනාපාණසති යන කමටහන් සතක් වදාළ බැව්න් අසවල් කමටහන අසවලාට සප්පාය වේය යි දැක්වූ වචන-මාත්‍රයෙහි ම නොපිහිටා සියලු තැන අනිප්‍රාය සෙව්ය යුතු යි. එය යට දැක්විණි.

"කම්සථානයන් ගෙන" යන මෙහි
කම්සථාන කථා විනිශ්චය යි.

"කම්සථානයන් ගෙන" යන මෙහි **"ගෙන"** යන පදය පිළිබඳ අර්ථ ප්‍රකාශය මෙසේ දත යුතු යි. යට දැක්වූ පරිදි යොගාවචරයා විසින් කමටහන් දෙන **කල්‍යාණමිත්‍ර**යකු **කරා එළඹ**, **භගවන්** **බුදුන්වහන්සේ** වෙතැ හෝ ආචාර්‍යවරයාණන් වෙත ආත්මය පාවා දී පූර්ණාධ්‍යාශයයෙන් හා පූර්ණාධිමුක්තියෙන් යුක්ත වැ කමටහන් ඉල්විය යුතු යි **"ඉමාහං භගවා අත්තභාවං තුම්හාකං පරිච්චජාමි"** "භාග්‍යවතුන් වහන්ස! මම ඔබවහන්සේ වෙත මගේ ආත්මය පාවා දෙමි"යි කියා **බුදුරජාණන් වහන්සේට** ආත්මභාවය පාවාදිය යුතු. එසේ පාවාදෙන්නා ගැඹුරු වල් සෙනස්-නෙහි වසන කල බිහිසුණු අරමුණු එළඹියොත් සතිර වැ සිට ගන්නට නො හැකි වේ. එයින් හෙතෙමේ ග්‍රාමාන්තයට බැසැ පියා ගිහියන් හා හැණී අතෙසතයන්ට ද පැමිණැ මහා විනාශයට පැමිණෙන්නේ ය. ආත්මභාවය පාවා දුනහොත් එබඳු බිහිසුණු අරමුණු එළඹැ සිටියත්, බිය නොවන්නේ ය. "පණ්ඩිතය තොප විසින් නොපගේ ආත්මය පළමුකොට ම බුදුරජාණන් වහන්සේට පාවා දෙන ලද්දේ නො වේ ද"යි සැලකෙන විට සොම්නස්ම උපදින්නේ ය. උතුම් කසිසළුවක් ඇතියෙක් එය මියන් හෝ පණුවන් හෝ කෑ කල දෙම්නස් වන්නේ නමුදු එය අවිවරික නිෂ්ක්‍රූන් වහන්සේ නමකට දී උන්වහන්සේ එය කඩ කඩ කොට ඉරනකල්හි සොම්නස් ම වන්නේ ය. මේත් එබඳු යයි දත යුතු.

ආචාර්‍යයන්ට පාවා දෙතොත්, **"ඉමාහං භන්තෙ අත්තභාවං තුම්හාකං පරිච්චජාමි"** "ස්වාමීනි මම මගේ ආත්මභාවය

---

[1]ම: නි: මජ්ඣිමපණ්ණාසක 71

ඔබවහන්සේට පරිත්‍යාග කරම්"යි කියා පාවාදිය යුතු. එසේ පාවා නුදුන හොත් හෙතෙම ආචාර්‍යයන් විසින් තර්ජිතය කටයුත්තෙක් නො වේ. දුර්‍වච වේ. අවවාදක්‍ෂම නො වේ. ආචාර්‍යයන් නො විචාරා ම කැමති අතෙක යන්නෙක් වේ. එවිට එබන්දහුට ආචාර්‍යවරයෝ ආමිසයෙන් හෝ ධර්‍මයෙන් සංග්‍රහ නො කෙරෙති. ගැඹුරු ග්‍රන්ථ නො උගන්වති. එවිට හෙතෙමේ එකී දෙවැදෑරුම් සංග්‍රහ නො ලබන්නේ ශාසනයෙහි පිහිට නො ලබා නො බෝ කලකින් ම දුශ්ශීල බවට හෝ ගෘහස්ථ බවට පැමිණේ. ආත්මභාවය පාවා දුන හොත් තර්ජනීය නො කළයුත්තෙක් නො වේ. හිතු අත යන්නේ නො වේ. සුවව ව ආචාර්‍යයන් අයත් පැවතුම් ඇත්තෙක් වේ. එයින් හෙතෙමේ ආචාර්‍යවරයන්ගෙන් විවිධ වූ ම සංග්‍රහ ලබමින් චූලපිණ්ඩපාතික තිස්ස තෙරුන්ගේ අතවැසියන් මෙන් ශාසනයෙහි අභිවෘද්ධියට පැමිණෙයි.

චූලපිණ්ඩපාතික තිස්ස තෙරුන්ගේ අතවැසියෝ

උන්වහන්සේ කරා කර්මස්ථාන ගත්තා පිණිස ශිෂ්‍යවරයෝ තුන් දෙනෙක් එළඹියාහු ය. එක තමෙක්, "ස්වාමීනි! නුඹවහන්සේගේ ප්‍රයෝජනයකටය යි වදලොත් 'මම සියක් පුරුෂ ප්‍රමාණ ප්‍රපාතයකට පණින්නට' පසුබට නො වෙමි"යි කියේ ය. එක තමෙක් "ස්වාමීනි මම නුඹවහන්සේගේ ප්‍රයෝජනයකටය යි වදලොත්, විලුඹෙහි පටන් ගලක් පිට උලා මුළු සිරුර ගෙවා දමන්නට පසුබට නො වෙමි" යි කියේ ය. තුන්වැන්නා කියන්නේ "ස්වාමීනි! ස්වාමීන්වහන්සේගේ ප්‍රයෝජනයකටය යි වදලොත්, 'හුස්ම හිර කොටැ ගෙනැ මැරෙන්නට' පසුබට නො වෙමි"යි කියේය. තෙරුන්වහන්සේ, "එකාන්තයෙන් මොහු භව්‍යයෝ ය"යි ඔවුනට කර්මස්ථාන වදාළසේක. ඒ තුන් නම උන්වහන්සේගේ අවවාදයෙහි පිහිටා රහත් බවට පැමිණියාහු ය. ආත්මභාවය පාවා දීමෙහි ආනිසංස මේ ය. "භගවත් බුදුන්වහන්සේට හෝ ආචාර්‍යවරයනට ආත්මය පාවා දී" යනු එහෙයින් කියන ලදී.

"පූණ්‍යාධ්‍යාශයයෙන් - පූණ්‍යාභිමුකතියෙන් යුක්ත වෑ" යි කියේ ඒ යොගීහු විසින් අලොභාදි වශයෙන් පූණ්‍යාධ්‍යාශයයෙන් යුක්ත විය යුතු බව යි. පූණ්‍යාධ්‍යාශයයෙන් යුක්ත වූයේ ම තුන් බොධින් අතුරෙන් එක්තරා බොධියකට පැමිණෙන්නේ ය

වදලේ මැයි:-

"ඡ අජ්ඣාසයා බොධිසත්තා බොධි පරිපාකාය සංවත්තන්ති. අලොභජ්ඣාසයා ච බොධිසත්තා ලොභෙ දෙස-දස්සාවිනො. අදොසජ්ඣාසයා ච බොධිසත්තා දොසෙ දොස-දස්සාවිනො. අමොහජ්ඣාසයා ච බොධිසත්තා මොහෙ දොස-දස්සාවිනො. නෙක්ඛම්මජ්ඣාසයා ච බොධිසත්තා ඝරාවාසෙ දොසදස්සාවිනො. පවිවෙකජ්ඣාසයා ච බොධිසත්තා ගණ-සඞ්ගණිකාය දොස දස්සාවිනො. නිස්සරණජ්ඣාසයා ච බොධිසත්තා සබ්බභවගතීසු දොස දස්සාවිනො."[1] 'අදහස් සයක් ඇති බෝසත්වරයෝ බොධිඥානය මුහුකරනු පිණිස පවත්නාහ. ලොභයෙහි දොස දක්නා බෝසත්වරයෝ ආලොභා-ධ්‍යාශය ඇත්තෝ වෙති. (හැම තැන ම හැම දවස්හි ම කෙසේ නම් නිර්ලෝභ වමෝදැ යි සිතා ආදියෙහි ද, මධ්‍යයෙහි ද, අවසානයෙහි ද අලොභ අදහස් ඇත්තෝ වෙති යි කීසේ යි. සෙස්සෙහි දු මෙසේ යි.) වෙෂයෙහි දොෂ දක්නා බෝසත්වරයෝ අවෙෂා-ධ්‍යාශය ඇත්තේ වෙති. මොහයෙහි දොස දක්නා බෝසත්වරයෝ අමොහාධ්‍යාශය ඇත්තෝ වෙති. ගෘහවාසයෙහි දොස දක්නා බෝසත්වරයෝ නෛෂ්ක්‍රම්‍යාධ්‍යාශය ඇත්තෝ වෙති. (නෛෂ්-ක්‍රම්‍ය නම් පැවිදිවීමයි.) ගණසඞ්ගණිකායෙහි දොෂ දක්නා බෝසත්වරයෝ (කෙසේ නම් විවේක වන්නමෝ දැ යි) ප්‍රවිවෙකා-ධ්‍යාශය ඇත්තෝ වෙති. සියලු භව ගතීන්හි දොෂ දක්නා බෝසත්වරයෝ (නිවන් නම් කෙසේ දැ යි) නිශ්ශරණාධ්‍යාශය ඇත්තෝ වෙත්' යනු එහි භාව යි. අතීත හෝ අනාගත හෝ වර්තමාන හෝ යම් පමණ **සෝවාන් - සකෘදාගාමී - අනාගාමී-අර්හත් - පසේබුදු - සම්මාසම්බුදුවරයෝ** වූවාහු නම් ඒ සියල්ලෝම මේ සයාකාරයෙන් තම තමන් විසින් පැමිණිය යුතු විශෙෂයට පැමිණියාහු යි. එබැවින් යට දැක්වුණු සයාකාරයෙන් පූර්ණාධ්‍යාශය සම්පන්න විය යුතු.

එහි ම **"පූර්ණාධිමුක්තියෙන් යුක්ත වෑ"** යයි කී බැවින් අධිමුක්ති සම්පන්න ද විය යුතු යි. ("යමක් පිණිස භාවනානු යොගය කෙරේ ද, යමක් පිණිස ප්‍රව්‍රජ්‍යාව වේ ද, එහි ම අධිමුක්ති ඇත්තහු විය යුතු"යි කීසේ යි.) සමාධ්‍යධිමුක්ත-සමාධි ගුරුක-සමාධිප්‍රාග්භාර - නිර්වාණාධිමුක්ත-නිර්වාණගුරුක - නිර්වාණප්‍රාග්භාර විය යුතුය යන අර්ථයි. (ප්‍රාග්භාර නම් තැම්ම යි.)

පර සිත් දන්නා නුවණ ඇති ආචාර්‍යවරයන් විසින් යට දැක්වුණු පරිදි අධ්‍යාශයයෙන් හා අධිමුක්තියෙන් යුක්ත වූ කමටහන ඉල්වන අතවැස්සාගේ චිත්තාචාරය ඒ නුවණින් පිරිසිදැ බලා මේ කවර චරිත ඇත්තෙක් දැ යි දැනැ ගත යුතු යි.

[1] ප: පෞ: 34

පර සිත් දන්නා නුවණ නැති ආචාර්‍යවරයන් විසින් "ඔබ කවර චරිත ඇත්තෙක් දැ"යි විචාරා "නොදනිමි" යි කිවහොත් "ඔබ කෙරෙහි කවර ධර්‍ම බහුල වෑ පවතී ද අශුභාදීන් අතුරෙන් කවරක් මෙතෙහි කරන විට ඔබට පහසු දැනේ ද කෙබඳු කර්මට්ඨානකට ඔබ ගේ සිත නැමේ ද" යනාදි වශයෙන් විචාරා දතයුතු යි. එසේ දැනැ ගෙනැ චරිතයට සුදුසු කර්මට්ඨාන් භියයුතු යි.

කියන්නහු විසිනුදු තුන් ආකාරයකින් කිය යුතු. සප්පාය්‍යතා වශයෙන් හෝ මෙතෙහි කිරීම් වශයෙන් හෝ කර්මට්ඨාන් පුරුදු කළහුට හිදීම් එකක් දෙකක් සප්පාය්‍යතා කරවා දිය යුතු. ළඟ වසන්නහුට පැමිණි – පැමිණි ඇසිල්ලෙහි කිය යුතු. කර්මට්ඨාන ඉගෙනැ අන් තැනකට යනු කැමැත්තහුට ඉතා සංක්ෂේප ද නො කොටැ ඉතා විස්තර ද නො කොටැ කිය යුතු.

එහි දු පඨවිකසිණය කියන්නහු විසින් කසිණ දෙම සතර ද, කසිණ කරන සැටි ද, කරගත් කසිණය භාවනා කරන සැටි ද, දෙ වැදෑරුම් නිමිති ද, දෙ වැදෑරුම් සමාධි ද, සත් වැදෑරුම් සප්පාය හා අසප්පාය ද, දශවිධ අර්‍පණා කෞශල්‍යය ද, වීර්‍යසමතාව ය ද, අර්‍පණාවිධානය ද යන මේ තව ආකාර කිය යුතු. සෙසු කර්මට්ඨාන්හි දු සුදුසු පරිදි කිය යුතු. ඒ සියල්ල ඒ ඒ කර්මට්ඨාන් පිළිබඳ භාවනා විධානයෙහි දක්වනු ලැබේ.

ආචාර්‍යවරයන් එසේ කර්මට්ඨාන් දෙන කල්හි යොගාවචරයා **නිමිත්තග්‍රහණය** කොටැ ඇසිය යුතු. **නිමිත්තග්‍රහණය** නම් මේ යට පදය, මේ මතු පදය, මේ මෙහි අර්‍ථය, මේ අදහස, මේ උපමාවය යි ඒ ඒ ආකාර සිත්හි ධරා ගැන්ම යි. එසේ නිමිත්ත ග්‍රහණය කොටැ සකසා අසන්නේ මැ කර්මට්ඨාන් ගන්නේ නම් වේ. එසින් ඔහුට විශෙෂාධිගමය වන්නේ ය. එසේ නො ගන්නහුට විශෙෂාධිගම්ය නො වන්නේ ය.

මේ කර්මට්ඨාන් "ගෙනැ" යන මෙහි අර්‍ථ ප්‍රකාශය යි.

මෙතෙකින් "කල්‍යාණමිත්‍රයකු කරා එළඹැ සවකීය චරිතා නුකූල වූ සතලිස් කර්‍මස්ථාන අතුරෙන් එක්තරා කර්‍මස්ථානයක් ගෙනැ" යන මේ පද සංක්ෂිප්ත ආකාරයෙන් විස්තර කරන ලද්දේ ය.

ධර්‍මාචාර්‍ය පණ්ඩිත මාතර ශ්‍රී ධර්‍මවංශ ස්ථවිර මහාමින් කළ විශුද්ධිමාර්ග සිංහලානුවාදයෙහි කර්‍මස්ථාන ග්‍රහණ නිර්දේශ නම් තෘතීය පරිච්ඡේදය යි.

4–පඨවි කසිණ නිදේශය

නමො භගවතො සම්බුද්ධස්ස

"සමාධි භාවනාවට නුසුදුසු විහාර හැර සුදුසු විහාරයෙහි වසමින්" යනු මෙතැන් පටන් විස්තර කරනු ලැබේ. යම් කෙනෙකුන්ට ආචාර්‍යයන් හා සමග එක විහාරයෙහි විසීම පහසු වන්නේ නම් එබන්දන් විසින් කර්මස්ථානය පිරිසිදු කර ගනිමින් එසේ විසිය යුතු. ආචාර්‍යයන් වෙත එක් වැ විසීමට අපහසු ඇත්නන් විසින් ගව්වක් හෝ අඩයොදුනක් හෝ යොදුනක් හෝ දුරින් පිහිටි සප්පාය විහාරයෙක් වේ නම් එහි විසිය යුතු. එබඳු තැනෙක වසන්නවුන්ට කර්මස්ථානය පිළිබඳ කිසිතැනෙක සැක යෙක් හෝ විසමරණයෙක් හෝ විණි නම් උදැසන ම විහාරයෙහි වත පිළිවෙත කොටැ අතර මගදී පිණ්ඩපාත කැර ගෙනැ වළඳා වැළඳූ ඉක්බිති ම ආචාර්‍යයන් වසන තැනට ගොස් එ දවස ම ඔවුන්ගෙන් කර්මස්ථානය ශුඛකොටැ ගෙනැ පසු දා ඔවුන් වැඳ නික්මැ පෙරසේ අතර මග පිණ්ඩපාත කොටැ වළඳා විඩා නැතිවැ ම සවකිය වාසස්ථානයට පැමිණිය හැකි බැවිනි. යොදුනක් පමණ වත් ආසන්නයෙහි එ බඳු සප්පාය විහාරයක් නොලබන්නවුන් විසින් කර්මස්ථානය පිළිබඳ සියලු ග්‍රන්ථිස්ථාන විසඳා ආවර්ජන ප්‍රතිබඳ කොටැ ගෙනැ දුරකට හෝ ගොස් සමාධිභාවනාවට නුසුදුසු විහාර හැර සුදුසු විහාරයෙක විසිය යුතු. නුසුදුසු විහාර නම් වක්ෂ්‍යමාන අටලොස් දෙම අතුරෙන් එක දෙමයකින් හෝ යුක්ත විහාර සි.

ඒ අටලොස් දෙම නම්:

1 මහා විහාර වන බව,
2 අභිනව විහාර වන බව,
3 දිරාපත් විහාර වන බව,
4 මහා මාර්ගාසන්න විහාර වන බව,
5 පැන්කෙමි ඇති විහාර වන බව,
6 පලා කොළ ඇති විහාර වන බව,
7 මල් ඇති විහාර වන බව,
8 ඵල ඇති විහාර වන බව,
9 බොහෝ දෙන පතනු ලබන විහාර වන බව,
10 නගරාශ්‍රිත විහාර වන බව,
11 දැව ඇති විහාර වන බව,
12 ක්ෂේත්‍ර සීමා ඇසුරු කළ විහාර වන බව,
13 විසභාග පුද්ගලයන් ඇති විහාර වන බව,
14 සමුද්‍රතීර ඇසුරු කළ විහාර වන බව,
15 ප්‍රත්‍යන්ත ඇසුරු කළ විහාර වන බව,
16 රාජ්‍ය සීමා ඇසුරු කළ බව,
17 සප්පාය නැති බව,
18 කල්‍යාණ මිත්‍රයන් නැති බව යන මේසි.

මේ අටලෝස් දෙස අතුරෙන් එක දෙසකින් හෝ යුක්ත විහාර නුසුදුසු විහාරයි. එ බඳු තැනෙක නො වසිය යුතු.

1 මහා විහාරයෙහි දෝෂ

මහා විහාරයෙහි නොයෙක් අදහස් ඇති බොහෝ භික්ෂූහු රැස් වෙති. ඔව්හු අන්‍යෝන්‍යයන් හා විරුද්ධ වීමෙන් වත පිළිවෙත නො කරති. බෝමළු ආදිය නො හමදිති. බොන පැන් පරිභොග පැන් පෙරහා නො තබති. මේ යොගී භික්ෂු ගොදුරු ගම් පිඬු පිණිස යන්නට පා සිවුරු ගෙනැ, නික්මෙන් ම නො කළ වතක් හෝ පැන් නැති හිස් කළයක් හෝ දුටු නම් ඒ වත කළ යුතු වේ. පැන් පෙරහා තැබිය යුතු වේ. එසේ නො කළ හොත් වත්තා හෙදයෙහි දුකුලා වන්නේ ය. එසේ කරන්නට පටන් ගත් කල දහවල් වන්නේ ය. දහවල් වැ, පිඬු පිණිස ගිය කල කිසිවක් නො ලබන්නේ ය. එ තෙක් ද, හේ විවෙක ගත වූයේ ද හෙරණුන් ගේ හා දහර භික්ෂූන්ගේ හඬ නැලුමෙන් හා සංඝකර්මයෙන් වික්ෂිප්ත වන්නේ ය. යම් තැනෙක සියලු වත පිළිවෙත කැරැණේ නම් සෙසු ගැහැට ද නො වන්නේ නම් එබඳු මහා විහාරයෙහි වුවද වසිය යුතු.

2 අභින්ව විහාරයෙහි දෝෂ

අභිනව විහාරයෙහි නවකර්ම බොහෝ ය. ඒ නො කරන්නවුන්ට සෙස්සෝ කිපෙති. දෙස් නගති. "නුඹවහන්සේ සුව සේ මහණුවමෙහි යෙදෙන්න. අපි නවකර්ම කරම්හ"යි යම් තැනෙක භික්ෂූහු කියත් නම් එබඳු අභිනව විහාරයෙහි වුව ද වසිය යුතු.

3 දිරාපත් විහාරයෙහි දෝෂ

ජරපත් විහාරයෙහි හැරවිය යුතු කටු කොහොල් බොහෝ ය. යටත් පිරිසෙසින් තමන් වසන සෙනසුන පවා එ බන්ද නො කර වන කලට සෙස්සෝ කිපෙති. දෙස් නගති. ඒ කරවන්නට ගත් කල කම්ටහන පිරිහී යන්නේ ය.

4 මහා මාර්ගාසන්න විහාරයෙහි දෝෂ

මාවත් අසල විහාරයන්ට ආගන්තුක භික්ෂූහු රෑ දුවල් රැස් වෙති. නො කල්හි ආවාතට තමන්ගේ සෙනස්න දී රෑක් මුලෙක හෝ ගල්පොත්තෙක හෝ වසිය යුතු වේ. පළමු දවසෙහි මෙන් දෙ වන දවසෙහි ද විය හැකි බැවින් කර්මස්ථානයට අවකාශ නො ලැබෙයි. එබඳු ආගන්තුක සම්බාධ නැති මහා මාර්ගාසන්න විහාරයෙහි වුව ද වසිය යුතු.

5 පැන් කෙම් විහාරයෙහි දෙස

පැන් කෙම් තම් ගල් පොකුණු ය. එ බදු තැනට පැන් පිණිස මහා ජනයා රැස් වෙති. නුවර වැසි රාජකුලුපග තෙරවරුන්ගේ අතවැස්සෝ ද පඬු පෙවුම් ආදිය පිණිස එළඹෙති. ඔවුන් භාජන දර පඬුඔරු ආදිය කොතන දැයි විචාරන කල අසවල් අසවල් තැන යයි දැක්විය යුතු වේ. මුළු කාලය එ බන්දෙහි ව්‍යාපෘත වීමෙන් ගෙවී යන්නේ ය.

6 පලාපන් විහාරයෙහි දෙස

පලා කොළ ඇති විහාරයෙහි යෝගී භික්ෂූන් කමටහන් ගෙනැ දිවා විහරණයෙහි යෙදී සිටිය ද පලා නෙලන වනිතාවෝ ඔවුන් සමීපයෙහි ම ගී ගයමින් පලා නෙලන්නාහු විසභාග ශබ්ද ඝට්ටනයෙන් කම්මස්ථානයට අන්තරාය කරත්.

7 මල් ඇති විහාරයෙහි දෙස

පිපී ගිය නානාවිධ මල් ගස් ඇති විහාරයෙහි ද පලා පත් විහාරයෙහි මෙන් ම උපද්‍රව වන්නේ ය.

8 ඵල ඇති විහාරයෙහි දෙස

අඹ – දඹ – පනා ආදි නානාවිධ ඵලයන්ගෙන් යුක්ත වූ විහාරයෙහි වසන්නවුන්ගෙන් ඵල කැමැත්තෝ අවුත් ඵල ඉල්ලති. නුදුන් කල කිපෙති. බලාත්කාරයෙන් හෝ ඇරගනිති. සවස් කාලයෙහි විහාර මැද සක්මන් කරන්නවුන් විසින් එ බන්දන් දැක, "උපාසකවරුනි! කුමක් හෙයින් මෙසේ කරන්නහු දැ" යි විචාළ කල සිත් පුරා බැණ වදිති. එ තෙක් ද විහාරයෙන් නෙරතට ද උපක්‍රම යොදත්.

9 ජනප්‍රාර්ථනීය විහාරයෙහි දෙස

පැතිය යුතු – ලෝකයා විසින් සම්භාවනා කරනු ලබන දක්ෂිණගිරි, හත්ථිකුච්ඡි ලෙණ, සැඟිරි, සිතුල්පව් වැනි විහාරවල වසන්නවුන් "රහත්වරුන් වහන්සේ"යි සිතා වැඳියට් මනුෂ්‍යයෝ නොයෙක් දිගින් රැස් වෙති. යොගී භික්ෂූන්ට එය පහසු පිණිස නොවන්නේ ය. එබඳු තැන් සප්පාය ඇතියවුන් විසින් දහවල් අන් තැනෙක ගොස් රාත්‍රි එහි අවුත් විසිය යුතු.

10 නගරාශ්‍රිත විහාරයෙහි දෝෂ

නගර සන්නිශ්‍රිත විහාරයෙහි විසහාග අරමුණු හමුවන්නේ ය. කුම්භදාසීහු කලින් ඇඟ ගටමින් යන්නාහ. අසින් වැ මඟ පවා නො දෙන්නාහ. අධිපති මිනිස්සු විහාරය මැද තිර ඇදූ ගෙනැ හිඳින්.

11 දුව ඇති විහාරයෙහි දෝෂ

දර හෝ දුව උපකරණයට නිසි රුක් හෝ ඇති විහාරයෙහි දර ගෙන යන මාගම්මු පලා මල් ගෙන යන යට කී සත්‍රීන් මෙන් අපභසුතම් කරති. "විහාරයෙහි රුක් කපා ගෙන ගෙවල් කරම්හ"සි මිනිස්සු අවුත් රුක් කපති. සවස පධන් ගෙයින් නික්මැ වෙහෙර මැද සක්මන් කරන භික්ෂූන් එ බන්දන් දැකැ "උපාසකවරුනි! කුමක් කරවි ද"සි විවාළ කල රිසි සේ බැනැ වදිති. විහාරයෙන් නෙරනට ද උපක්‍රම යොදත්.

12 ක්ෂේත්‍රාශ්‍රිත විහාරයෙහි දෝෂ

විහාරය අවට කුඹුරු ඇති කල මිනිස්සු විහාර මැද ම කලවිටි සාදා ගෙනැ ගොයම් පාගති. ඉදිරි පස ම වී වියලති. අන්‍ය වූ ද බොහෝ අපභසුකම් කරති. තව ද ඇතැම් විහාරයන්හි බොහෝ සංඝ භොග ඇත්තේ ය. ඒ රක්නා ආරාමික කුල ද ඇත. ඔවුහු "අපගේ ගොයම් කැහ" සි ආරාමිකයන්ගේ ගෙරි බැඳැ සිටුවති. වී කරල් මුදුන් කඩා ගෙන අවුත් "නුඹ වහන්සේ ගේ ආරාමික කුලයන්ගේ වැඩවල සැටි බලන්නැ" සි සංඝයාට දක්වති. එසින් රාජරාජ මහාමාත්‍යයන්ගේ ගෙදොර වලට පවා යන්නට සිදු වේ. මේ ද කුඹුරු ලඟ විහාරයන්හි විසීමේ වරදට ඇතුළත් ය සි දත යුතු සි.

13 විසභාගයන් ඇති විහාරයෙහි දෝෂ

විසභාගයන් ඇති විහාරයෙහි භික්ෂූහු තුමූ අන්‍යොන්‍ය වෛරී වැ කලහ කරති. "කලහ නො කරන්න. සවාමීනි" සි වළකනු ලබන විට "මේ පංසුකූලිකයා ආ තැන් පටන් අපට මෙහි විසුමෙක් නැතැ" සි හඬ තලත්.

14 සමුද්‍රතීර ඇසුරු කළ විහාරයෙහි දෝෂ

මුහුදු පටුන් හෝ ගොඩ පටුන් අසල පිහිටි විහාරයන් කරා නැව්වලින් ද. ගැල්වලින් ද මනුෂ්‍යයෝ නිතර රැස්වෙති ඔවුහු "අපට ඉන්නට අවකාශ දෙන්න. පැන් දෙන්න. ලුණු දෙන්නැ"සි ගැහැට කරත්.

15 ප්‍රත්‍යනතයෙහි මනුෂ්‍යයෝ බුඩාදි රතනත්‍රයෙහි ප්‍රසන්න නැත්තෝ ය.

16 රාජ්‍ය සීමායෙහි පිහිටි විහාරයන්හි වසන්නවුන්ට රාජ භය පැමිණෙන්නේ ය. ඒ එසේ මැයි:- එක් පැත්තෙක රජ "මේ භික්ෂු මගේ වශයෙහි නො සිටින්නේ ය" යි පහර දෙයි. අනෙක් පැත්තේ රජ ද එසේ ම පහර දෙ යි. දෙපැත්තම සතුටු කරන භික්ෂු කලෙක එක රජෙකුගේ විජිතයෙහි ද, කලෙක අනෙක් රජුගේ විජිතයෙහි ද වසන්නේ ය. එවිට "මේ වරපුරුෂයෙකැ" යි දැල්ලා අනය ව්‍යසනයට පමුණුත්.

17 සප්පාය නැති බව විසභාග රූපාදි අරමුණු ලැබීම හෝ අමනුෂ්‍යාධිගෘහීත බව යි. එයට නිදර්ශනයෙක් මෙසේ ය. එක් තෙරුන් වහන්සේ කෙනෙක් අරණ්‍යයෙහි වසති. දවසෙක යක්ෂියක් පන්සල් දොර සිටැ ගීයක් කිවු ය. භික්ෂු පන්සලින් නික්ම දොරටුව ළඟට ආ ය. යක්ෂි ඉක්බිති සක්මන් මලුවේ කෙළවරට ගොස් ගායනා කළා ය. භික්ෂු එහි ගියේ ය. නැවත ඕ තොමෝ සියක් පුරුෂ ප්‍රමාණ ප්‍රපාතයෙක සිට ගායනා කරන්නට වූ ය. භික්ෂු ආපසු එන්නට හැරුණේ ය. යක්ෂි වෙගයෙන් දිවැ අවුත් උන්වහන්සේ අල්ලා ගෙනැ "වහන්සේ! මා විසින් කා දමන ලද්දේ නුඹවහන්සේ වැනි එක් කෙනකු දෙදෙනකු නොවෙති" යි කිවු ය.

18 කල්‍යාණ මිත්‍රයන් නැති බව නම් ආචාර්‍යයන් හෝ ආචාර්‍යසමයන් හෝ උපාධ්‍යායයන් හෝ උපාධ්‍යායසමයන් හෝ නො ලැබෙන බව යි. හෙද මහා දෙෂයෙක් මැයි.

මේ අටලොස් දෙෂ අතුරෙන් එකකින් හෝ යුක්ත වීණි නම් ඒ නුසුදුසු විහාර ය යි දතයුතු. මේ සඳහා අට්ඨාායෙහි ආ ගාථා මෙසේ යි.

"මහාවාසං නවාවාසං - ජරාවාසං ච පත්තනිං
සොණ්ඩිං පණ්ණං ච පුපඵං ච - ඵලං පත්තමෙව ච
නගරං දාරුනා බෙත්තං - විසභාගෙන පට්ටනං,
පච්චන්ත සීමා සප්පායං - යත්ථ මිත්තෙතා න ලබ්භති.
අට්ඨාරසෙතානි ඨානානි - ඉති විඤ්ඤාය පණ්ඩිතො,
ආරඤ්ඤා පරිවජ්ජෙය්‍ය - මග්ගං පටිභයං යථා"

මහාවාසං=මහ වෙහෙර; නවාවාසං=නව වෙහෙර; ජරාවාසං= ජරාවාස වෙහෙර; පත්තනිං=මහමං ඇසුරු කළ වෙහෙර; සොණ්ඩිං=

පැන් කෙමි ඇති වෙහෙර; **පණ්ණං** = පත්‍ර ඇති වෙහෙර; **පුප්ඵං** = මල් ඇති වෙහෙර; **ඵලං** = ඵල ඇති වෙහෙර; **පත්තිතම්බව** = පැතිය යුතු වෙහෙර;

නගරං = නුවර ඇසුරු කළ වෙහෙර; **දූරතා** = දර ඇති වෙහෙර හා සමග; **ඛෙත්තං** = කෙත් ඇසුරු කළ වෙහෙර; **විසභාගෙත** = විසභාගය ඇසුරු කළ වෙහෙර හා සමග; **පට්ටනං**= පටුන් ගම් ඇසුරු කළ වෙහෙර; **පච්චන්තං** = ප්‍රත්‍යන්ත ඇසුරු කළ වෙහෙර; **සීමා** = රජ සිමි ඇසුරු කළ වෙහෙර; **අසප්පායං** = නො සැප වෙහෙර; **යත්ථ** = යම් වෙහෙරක; **මිත්තා න ලබ්භන්ති** = කල්‍යාණ මිත්‍ර නො ලැබේ ද; **යන**

එතානි අට්ඨාරසට්ඨානානි = මේ අටලොස් සථානයන්; **පණ්ඩිතෝ** = නුවණැත්තේ; **ඉති විඤ්ඤාය** = මෙසේ දැනැ; **පටිභයං මග්ගං යථා** = භය ඇති මගක් මෙන්; **ආරකා** = දුරින් ම **පරිවජ්ජයය** = දුරුකරන්නේ සි යනු සන්න සි.

සුඳුස්‍ස විහාර නම් නාතිදූර නාත්‍යාසන්නාතාදි පඤ්චාඞ්ග යෙන් සමන්විත විහාර සි.
වදාළේ මැ සි:

"කථං ච භික්ඛවෙ සෙනාසනං පඤ්චඞ්ග සමන්නාගතං හොති? ඉධ භික්ඛවෙ සෙනාසනං නාතිදූරං හොති නාච්චා-සන්නං ගමනාගමන සම්පන්නං දිවා අප්පකිණ්ණං රත්තිං අප්පසද්දං අප්පනිග්ගෙසාසං අප්පඩංසමකසවාතාතපසිරිංසප සම්ඵස්සං හොති. තස්මිං ඛො පන සෙනාසනෙ විහරන්තස්ස අප්පකසිරෙනෙව උප්පජ්ජන්ති චීවර පිණ්ඩපාත සෙනාසන ගිලාන පච්චය භෙසජ්ජ පරික්ඛාරා. තස්මිං ඛො පන සෙනාසනෙ ථෙරා භික්ඛු විහරන්ති බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා. තෙ කාලෙන කාලං උපසඞ්කමිත්වා පරිපුච්ඡති පරිපඤ්හති ඉදං භන්තෙ කථං ඉමස්ස නො අත්ථොති. තස්ස තෙ ආයස්මන්තෙනා අවිවටං චෙව විවරන්ති අනුත්තානී කතා ච උත්තානී කරොන්ති අනෙක විහිතෙසු ච කංඛාඨානියෙසු ධම්මෙසු කංඛං පටිවිනොදෙන්ති. එවං ඛො භික්ඛවෙ සෙනාසනං පඤ්චඞ්ග සමන්නාගතං හොති"[1] සි.

'මහණෙනි! සෙනාසනය කෙසේ පඤ්චාඞ්ගයෙන් යුක්ත වන්නේ ද' මහණෙනි යම් සෙනාසනයෙක් ගමට ඉතා දුරත් නො වැ දුනු පන්සියකට වඩා ආසන්නත් නො වැ ගමනා ගමනයට පහසු වන්නේ ද; දහවල් ජනාකීර්ණ නො වැ රාත්‍රි

[1]අ: නි: දසක නි: 904

නිශ්ශබ්ද වැ මහාජන සන්නිපාතයෙන් වන ගිගුම් හඬ නැත්තේ වන්නේ ද, මැසි මදුරු අවු සුළං නසි පොළොං ආදීන්ගේ සපශී නැත්තේ වන්නේ ද, එසේ ම එම සෙනාසනයෙහි වසන්නවුන්ට විවර පිණ්ඩපාත සෙනාසන ගිලන්පස බෙහෙත් පිරිකර නිරායාස යෙන් ලැබෙන්නේ ද, බහුශ්‍රැත වූ ආගතාගම ධම්ධර විනයධර මාතෘකාධර සථවිර භික්ෂූහු ඒ වෙහෙර වෙසෙත් ද, ඔවිහු කලින් කල එළඹ "සවාමීන් වහන්ස මේ කෙසේ ද, මෙහි අර්ථ කෙසේ ද" යි පුළුවුත්තා ලද්දේ (ප්‍රදේශාන්තර පාලි දශීතයෙන්) අවිවෘත වූ අර්ථය විවෘත කෙරෙද් ද, ගැඹුරු වූ අර්ථය ලිහිල් කරද්ද, අනෙකවිධ ශඞ්කාසථානීය ධම්යන්හි ශඞ්කා දුරු කෙරෙත් ද, මහණෙනි! මේසේ සේනාසනය පඤ්චාඞ්ගයෙන් යුක්ත වන්නේ ය" යනු එහි සංක්ෂිපත භාවය යි.

"සමාධි භාවනාවට නුසුදුසු විහාර හැර සුදුසු විහාරයෙහ වසමින්" යන්නෙහි විස්තර නිමියේ ය.

"කුඩා පළිබොධ ද සිඳැ" යනු කී හෙයින් යම් යම් කුඩා පළිබොධ ඇත්තම් එ ද සිඳලිය යුතු. කුඩා පළිබොධ සිඳිය යුතු මෙසේ ය:- දික් වැ වැඩුණු කෙස් නිය කැපිය යුතු. දිරා ගිය සිවුරෙහි දැන්කම් හෝ ගෙත්තම් හෝ කළ යුතු. කිලිටු සිවුරු රද, ගත යුතු. පාත්‍රය මල බැඳී ඇත් නම් පිස ගත යුතු. ඇද - පුටු ආදිය සුඹ කළ යුතු යි. **මේ "කුඩා පළිබොධ සිඳැ" යන්නෙහි විස්තරය යි.**

"සියලු භාවනා විධි නො පිරිහෙලමින් භාවනා කළ යුතු" යනු කී හෙයින් පඨවී කසිණයෙහි පටන් සියලු කම්සථාන පිළිබඳ විස්තර කථාව මෙසේ දත යුතු.

යට දැක්වුණු සේ කුඩා පළිබොධ සිඳැ ලූ භික්ෂු විසින් පිණ්ඩපාත කොටැ දන් වැළදීමෙන් පසු භත්තසම්මදය ද දුරු කොටැ ගෙනැ විවෙක සථානයෙක සැප සේ හිඳැ අභිනවයෙන් කර ගන්නා ලද හෝ ප්‍රකෘතියෙන් තුබුණු හෝ පෘථිවියෙක නිමිත්ත ග්‍රහණය කළ යුතු. ඒ සඳහා පැරණි අටුවායෙහි මෙසේ දක්වා ඇත්තේ ය.

"පඨවි කසිණං උග්ගණ්හනෙනා පඨවියං නිමිත්තං ගණ්හාති කතෙ වා අකතෙ වා සානන්තකෙ නො අනන්තකෙ, සකොටියෙ නො අකොටියෙ, සවටුමෙ නො අවටුමෙ, සපරියන්තෙ නො

අපරියන්තෙන, සුපසමතෙනවා සරාවමතෙනවා, සොතං නිමිත්තං සුගහගීතං කරොති සූපධාරිතං උපධාරෙති සුවවත්ථිතං වවත්ථපෙති. සොතං නිමිත්තං, සුගහගීතං කත්වා සූපධාරිතං උපධාරෙත්වා සුවවත්ථිතං වවත්ථපෙත්වා ආනිසංසදස්සාවී රතනසඤ්ඤී හුත්වා විතතිකාරං උපට්ඨපෙත්වා සමථියායමානො තස්මිං ආරම්මණෙ චිත්තං උපනිබන්ධති. අදධා ඉමාය පටිපත්තියා ජරාමරණමහා මුඤ්චිස්සාමි'ති. සො විවිචෙවව කාමෙහි -පෙ- පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති'' යි.

"පඨවි කසිණය උගන්නා තැනැත්තේ මතු කියනු ලබන ආකාරයෙන් පිළියෙළ කරගන්නා ලද්දු වූ - හෝ එසේ පිළියෙළ කර නො ගත් බලමණ්ඩලාදි වශයෙන් ප්‍රකෘතියෙන් පිහිටි හෝ - අනන්ත සහිත - කෙළවර සහිත - කුඩා වට්ටියක් හෝ මලාවක් පමණ වූ - පෘථිවි මණ්ඩලයෙහි නිමිත්ත ග්‍රහණය කරන්නේ ය. හෙතෙමේ ඒ නිමිත්ත සුග්‍රහගීත සූපධාරිත සුවවත්ථිත කරන්නේ ය. එසේ සුග්‍රහගීත සූපධාරිත සුවවත්ථිත කොටැ එහි ආනිසංස දක්වමින් රත්න සංඥ ඇති වැ ගෞරව ඵළවා **'එසානනයෙන් මේ ප්‍රතිපත්තිය පුරා ජරා මරණයෙන් මිදී ගන්නෙමි'** යි සන්තොෂයෙන් යුක්ත වැ එහි සිත බැඳ ගන්නේ ය. එයින් ඒ යොගී වසතු කාම කෙලෙස කාමයෙන් වෙන් වැ - ප්‍රථම ධ්‍යානය ලැබ ගෙන වසන්නේ ය." යනු එහි සංක්ෂිප්ත භාවය යි.

මේ තැන් පටන් ඒ අටුවා පාඨයෙහි අර්ථ ප්‍රකාශ කිරීම සමග භාවනා විධිය දක්වනු ලැබේ.

යම් කෙනකුන් විසින් යට ජාතියෙහි දී බුඩ ශාසනයෙහි හෝ ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් හෝ පැවිදි වැ පඨවි කසිණයෙහි චතුත්ථක-පඤ්චක ධ්‍යාන උපදවන ලද ද, ඒ බදු උපනිඃශ්‍රය සම්පන්න පින්වතුන්ට **මල්ලක** තෙරුන්ට මෙන් පිළියෙළ කර නො ගත් පෘථිවියෙහි - එ නම් සීසෑ තැන හෝ කලවිටි මඩුල්ලෙහි හෝ නිමිත්ත උපදින්නේ ය.

ඒ එසේ මැ යි:- **මල්ලක** තෙරුන් වහන්සේ සීසෑ තැන බලන් ම එ තරම් ම වූ පටිභාග නිමිත්ත උපන්නේ ය. උන්වහන්සේ එය වඩාලා පඤ්චක ධ්‍යාන උපදවා ධ්‍යාන පදස්ථාන කොටැ විවසුන් ද වඩා රහත් වූ සේක.

එසේ කෘතාධිකාර තැතියවුන් විසින් ආචාර්‍යයන් වෙත උගත් කම්මට්ඨාන විධි නො වරද්දු චතුර්විධ කසිණ දෙස දුරු කොටැ කසිණ මණ්ඩලය සාධා ගත යුතු. චතුර්විධ කසිණ

දෙස තම් නීල- පීත- ලොහිත- අවදාත වණ්ණ මිශ්‍ර වීම සි. එ බැවින් නීලාදි වණ්ණවත් මැටි තොග ගෙනැ රාවණ ගඟ සැඩ පහරින් පහළ නිත්තියෙහි මැටි වැනි අරුණු වන් මැටියෙන් කසිණ මණ්ඩලය සාධා ගත යුතු. "කසිණ මණ්ඩලය සාධා ගනිමි"සි විහාර මැද සාමණේරාදීන් හැසිරෙන තැන තොග වැ විහාර කෙළවර පිළිසත් තැනෙක - තැම්සිටි ගල් යටෙක හෝ පත්සැලෙක හෝ සංහාරිම කොටැ හෝ තත්‍රසථක කොටැ හෝ සාධා ගත යුතු. (සංහාරිම නම් කැමැති තැනෙක ගෙනැ යා හැකි සේ සදා ගන්නා කසිණ මණ්ඩලය සි. තත්‍රසථක නම් එහි මැ තිබෙන සේ සදා ගන්නා කසිණ මණ්ඩලය සි.) සංහාරිම කසිණ මණ්ඩලය සාධාගත්නවුන් විසින් දඬු සතරෙක රෙදි කඩක් හෝ සමක් හෝ කළාල කඩක් හෝ බැඳ එහි තණ මුල් කැට ගල් වැලි නැති සිතට ඇඹරූ මැට්ටෙන් එක් වියත් සතරහුල් වන සේ වට කොටැ ලිම්පනය කැරැ ගත යුතු. එය නිමිත්ත ග්‍රහණයෙන් භාවනා කරන කල්හි බිම තබා ගෙනැ බැලිය යුතු. තත්‍රසථක කසිණ මණ්ඩලය සාධාගත්නවුන් විසින් බිම පියුම් කෙම්යෙක ආකාරයෙන් කණු ගසා වැලින් බැඳ සාධා ගත යුතු. අරුණු වන් මැටි මද නම් යට වෙන මැට්ටක් දමා ලා උඩ පිරිසුදු කළ අරුණුවන් මැටියෙන් ම එක් වියත් සතරහුල් වන සේ වට කොටැ සාධා ගත යුතු.

යට "කුඩා කුල්ලක් හෝ මලාවක් පමණ වූ" ය සි කීයේ මේ ප්‍රමාණය සඳහා ය. "අනන්ත සහිත - කෙළවර සහිත ය"සි කීයේ පරිවෙජ්දය සඳහා ය.

මෙසේ මේ දැක්වුණු ප්‍රමාණ විසභාග වණ්ණයකින් පරිවෙජ්ද කර ගත් කසිණ මණ්ඩලය "ගල්පෙණින් ගහා බෙර ඇසක් සේ සම කර ගත යුතු." ගල් පෙණින් ගහා සම කර ගත යුතුය සි කීයේ දඬු පෙණින් ගහා සමකරන කල අරුණුවන් පැහැයට විසභාග වණ්ණ උපදින බැවිනි. එසේ සම කොට ගෙනැ ඒ සථානය ද හැම දෑ පියා ජලසනානය කොටැ ගෙනැ අවුත් කසිණ මණ්ඩලයෙන් දෙරියන් වියත් අතර ඇති තැන පණවා ගත් එක් වියත් සතරහුල් පා ඇති මොළොක් ඇතිරි අතුල පුටුවෙකැ හිඳ ගත යුතු. කසිණ මණ්ඩලයෙන් දෙරියන් වියත කට වඩා දුර වැ උන් කල කසිණය තොග වැටහෙන්නේ ය. එයට වඩා ළං වූ කල කසිණයෙහි දෙඝ පැනෙන්නේ ය. කී ප්‍රමාණයෙන් උස් වූ පුටුවෙක උන් කල කර තමා තැඹුරු වැ බැලිය යුතු වන්නේ ය. කී ප්‍රමාණයෙන් පහත් පුටුවෙක උන් කල දෙ දන රිදෙන්නේ ය. එ බැවින් එතෙක් ම

දුර එතෙක් ම උස පුටුවෙහි හිඳ **"අප්පස්සාදකාමා"** 'කාමයෝ අල්පාස්වාදයෝ ය.' යනාදි නියායෙන් කාමයෙහි ආදීනව සලකා කාමනිස්සරණයෙහි සම්දුඃඛසමතික්‍රමයට උපාය වූ නෛෂ්ක්‍රම්‍ය සංඛ්‍යාත ධ්‍යාන ප්‍රතිලාභයෙහි අභිලාෂ ඇති වැ (**"සම්මාසම්බුද්ධෝ වත භගවා අච්පටිතධම්මදෙසනතෝ, සවාකඛාතෝ ධම්මෝ එකන්තනිය්‍යානිකතෝ, සුපටිපන්නොසංඝෝ යථානුසිට්ඨං පටිපජ්ජනතෝ"** යනාදීන්) බුද්ධ - ධර්ම - සංඝ යන රත්නත්‍රයෙහි ගුණානුස්මරණයෙන් ප්‍රීති-ප්‍රමෝද්‍ය උපදවා "මේ වූ කලී සියලු බුදු - පසේබුදු - බුදු-සව්වන් පිළිපන් නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිපදාව ය" යි ප්‍රතිපදායෙහි ගෞරව ඇති වැ "එකාන්තයෙන් මම මේ ප්‍රතිපත්තියෙන් පවිවෙක සුඛ රසයට භාගී වෙමි"යි ධෛර්‍ය්‍ය උපදවා සම ආකාර-යෙන් ඇස් දල්වා බලා ගෙන නිමිත්ත ග්‍රහණය කිරීමෙක් භාවනා කළ යුතු යි.

පමණට වඩා ඇස් දල්වා ලා බලන්නහුගේ ඇස් (ඉතා සියුම් රූපයක් හෝ ඉතා භාස්වර රූපයක් හෝ බලන විට මෙන්) වෙහෙසට පත් වන්නේ ය. කසිණ මණ්ඩලය ද ලක්ෂණ වශයෙන් හෝ වර්ණ වශයෙන් වැටහෙන්නෙන් අතිව්‍යක්ත වන්නේ ය. එයින් ඔහුට නිමිත්ත නූපදනේ ය. ඉතා මඳ වැ ඇස දල්වා බලන්නහුට කසිණ මණ්ඩලය විභූත නො වන්නේ ය. සිත ද කුසීත පක්ෂයෙහි වැටෙන්නේ ය. එයින් ද නිමිත්ත නූපදනේ ය. එ හෙයින් උත්මීලනය ද, අතිනිමීලනය ද නො කොටැ කැටපත්හි මුහුන බලන කල මෙන් සම වූ ආකාරයෙන් ඇස් දල්වා නිමිත්ත ග්‍රහණය කරමින් භාවනා කළ යුතු. වර්ණය හෝ ලක්ෂණය හෝ නො සැලකිය යුතු. එසේ වුව ද බල බලා භාවනා කටයුතු බැවින් වර්ණය නො හැරැ වර්ණය තමහට ආශ්‍රය වූ පෘථිවි ධාතුව හා සමාන ගතික කොටැ උත්සද වශයෙන් සසම්භාර පෘථිවියෙහි "පඨවි" යන මේ ලොක ව්‍යවහාරයෙක් ඇත් ද ඒ ප්‍රඥප්ති ධර්මයෙහි සිත පිහිටුවා මෙනෙහි කටයුතු. පඨවී, මෙදිනී, ඕණී, භූමි, වසුධා, වසුන්ධරා යනාදි පෘථිවියට කියන නම් අතුරෙන් තමහට රිසි යෙන-තමන් පූර්‍වයෙහි ගත්තා ලද සංඥා වශයෙන් අනුකූල වන-නම කිය යුතු. (මෙහි කිය යුතු ය යි කී හෙයින් ප්‍රථම සම්ප්‍රාහාරයෙහි කිසිවකු හට වාග්භෙද වන බව හෝ වාග්භෙද කළ යුතු බව හෝ කියන ලද්දැ යි සැලකිය යුතු.) පෘථිවියට නොයෙක් නම් ඇත ද "පඨවි" යන නාමය ප්‍රකට හෙයින් එ මෑ කියමින් භාවනා කළ යුතු. විටෙක ඇස

දල්වා ලා ද, විටෙක ඇස පියා ලා ද ආවජ්ජනය කටයුතු. **උද්ග්‍රහ නිමිත්ත** නූපදින තාක් මෙසේ කාල සියයකු දු, කාල දහසකු දු, ඉන් අධික වැ ද භාවනා කළයුතු. මෙසේ භාවනා කරන් කරන් ඇස පියා ලා ආවජ්ජනය කරන විට ද, ඇස දල්වා ලා ආවජ්ජනය කරන විට මෙන් කසිණය ආපාත ගත වේ ද එවිට **උද්ග්‍රහ නිමිත්ත** උපන්නේ නම් වන්නේ ය.

උද්ග්‍රහ නිමිත්ත උපන් කල පටන් එ තැන නො හින්ද යුතු. උද්ග්‍රහ නිමිත්ත උපන්නාට පසු වැ ද කසිණ මණ්ඩලය ම බල බලා භාවනා කළ හොත් **ප්‍රතිභාග නිමිත්ත** නූපදී. එහි උන්නොත් ඒ දිසාව නො බලා සිටින්නට ද නො හැකිය. එ බැවින් එය ලන් ඇසිල්ලෙහි එ තැනින් ඉවත් වැ තමන් වසන තැනට පැමිණ, එහි හිඳ ගෙන භාවනා කළ යුතු. පා දෙවු මෙන් වන ප්‍රමාද දුරු කර ගන්නා පිණිස එක පටේ වහන් සඟලක් ද, උපදුව දුරු කර ගන්නා පිණිස සැරයටියක් ද, පරිහරණය කළ යුතු. කිසියම් අසපපාය කාරණයකින් ඒ ලන් තරුණ සමාධිය (උග්ගහ නිමිත්ත) නැති වැ ගියේ නම් වහන් නැඟී සැරයටිය ගෙන ඒ කසිණ මණ්ඩලය තුබුණු තැනට ගොස් නැවත **උද්ග්‍රහ නිමිත්ත** උපදවා ගෙන ආ යුතු යි. එ සේ අවුත් සැපසේ හිඳ ගෙන භාවනා කළ යුතු. නැවත නැවත ආවජ්ජනා කළයුතු. තක්කාහත – විතක්කාහත කළයුතු. එසේ කරන් – කරන් අනුක්‍රමයෙන් ඔහුගේ නීවරණ විෂ්කම්භනය වන්නේ ය. කෙලෙස් සන්සිඳෙන්නේ ය. උපචාර සමාධියෙන් සිත සමාධි වන්නේ ය. **ප්‍රතිභාග නිමිත්ත උපදනේ යි.**

උද්ග්‍රහ නිමිත්තයේ හා ප්‍රතිභාග නිමිත්තයේ වෙනස

උද්ග්‍රහ නිමිත්තයෙහි පෙණපහර ආදි කසිණ දෙස පැණෙන්නේ ය. **ප්‍රතිභාග නිමිත්ත** වනාහි ඵවිඤ්ඤයකින් මැන් කොටැ ගත් ආදාස මණ්ඩලයක් මෙන් ද, මැතෙවින් පිරිසිදු කළ සඞ්ඛථාලයක් මෙන් ද, වලාගැබින් නික්මුණු චන්ද මණ්ඩලය මෙන් ද, මෙඝ මුඛයෙහි බලාකාවක් මෙන් ද, උද්ග්‍රහ නිමිත්ත පලාගෙනැ නික්මුණාක් මෙන් එයට වඩා සිය දහස් ගුණයෙන් සුපරිශුඛ වැ වැටහෙන්නේ ය. ඒ ප්‍රතිභාග නිමිත්තා වකාහි වණ් ඇත්තෙක් හෝ සණ්ඨාන ඇත්තෙක් හෝ නො වේ. එ බන්දෙක් නම් එය ඇසින් දැක්ක හැකි විය යුතු. ඔදාරික විය යුතු. සම්මශීනයට යොග්‍ය විය යුතු. අනිත්‍යාදි ලක්ෂණත්‍රයයෙන් අඞ්කිත විය යුතු. මෙය ඇසින් දැක්ක හැකි – ඔදාරික – සම්මශීනයොග්‍ය – ලක්ෂණත්‍රයයෙන් අඞ්කිත

වූවෙක් නො වේ. හුදෙක් සමාධි ලාභීන්ට වැටහෙන මාත්‍රයෙකි. භාවනා සංඥයෙන් හැඳිනෙන මාත්‍රයෙකි. ඒ උපන් කල පටන් ඔහුගේ නීවරණ විෂ්කම්භන වේ. ක්ලේශයෝ සන්සිඳෙති. උපචාර සමාධියෙන් සිත සමාහිත වූයේ වේ.

සමාධි වනාහි **උපචාර** සමාධි, **අර්පණා** සමාධි ය යි ද්විවිධ වේ. ඒ එසේ මෑ යි:- සිත උපචාර භූමියෙහි දී ද, සමාහිත වන්නේ ය. ප්‍රතිලාභ භූමියෙහි දී ද, සමාහිත වන්නේ ය. උපචාර භූමියෙහි දී සමාහිත වන්නේ නීවරණ ප්‍රහාණයෙනි. ප්‍රතිලාභ භූමියෙහි දී අඞ්ග පාතුභාවයෙනි. ඒ විවිධ සමාධීන්ගේ වෙනස මෙසේ දතයුතු උපචාර සමාධියෙහි දී ධ්‍යානාඞ්ගයෝ ශක්තිසම්පන්න නො වෙති. ඔවුන් ශක්තිසම්පන්න නො වන බැවින් ළදරුවකු නගා සිටි වූ කල නැවත නැවත බිම හෙන්නා සේ උපචාර ධ්‍යාන උපන් කල්හි සිත විටෙක නිමිත්තෙ අරමුණු කරන්නේ ය. විටෙක භවාඞ්ගයට බසින්නේ ය. අර්පණාධ්‍යානය උපන් කල්හි ධ්‍යානාඞ්ගයෝ ශක්තිසම්පන්න වෙති. ඔවුන් ශක්තිසම්පන්න බැවින් බලවත් පුරුෂයකු හුනස්නෙන් නැඟී දවස මුළුල්ලේ සිටිය හැකි සේ අර්පණා සමාධි උපන් කල්හි සිත එක් වරක් භවාඞ්ග වාරය සිදෑ අහොරාත්‍රයක් එසේ ම සිටින්නේ ය. කුශල ජවන පිළිවෙළින් ම පවත්නේ ය.

ඒ විවිධ සමාධි අතුරෙන් උපචාර සමාධි සමග යම් ප්‍රතිභාග නිමිත්තයෙක් උපදින්නේ නම් එය උපදවා ගැන්ම ඉතා දුෂ්කර ය. එ බැවින් ඒ පරිඛ්‍යායෙහි මෑ හිඳෑ ඉදින් නිමිත්තා වඩා අර්පණා ලැබෑ ගත්තට පොහොසත් නම් එසේ ලැබගත යුතු ය. ඉදින් අපොහොසත් නම් ඔහු විසින් ඒ නිමිත්තා චක්‍රවර්ති ගභීයක් මෙන් අප්‍රමත්ත වැ රැක ගත යුතු යි.

"නිමිත්තං රක්ඛතෝ ලද්ධං - පරිහාණි න විජ්ජති
ආරක්ඛමකි අසතෝ - ලද්ධං ලද්ධං විනස්සති."

'නිමිත්ත රැකගත්නහුට ලත් උපචාර ධ්‍යානයාගේ පිරිහීමෙක් නො වන්නේ ය. ආරක්ෂා නැති කල්හි ලත් ලත් ධ්‍යාන විනාශ වන්නේ ය.'

ප්‍රතිභාග නිමිත්ත රැකගත යුතු විධිය මෙසේ ය.

ප්‍රතිභාග නිමිත්ත රැක ගනු කැමැත්තහු විසින් අසප්පාය- ආවාස, අසප්පායගොදුරුගම, අසප්පායකථා, අසප්පාය-

පුද්ගල, අසප්පායගොචර, අසප්පායඋතු, අසප්පායඉරියව් යන මේ සත දුරු කළ යුතු ය.

එසේ ම සප්පායආවාස, සප්පායගොදුරුගම, සප්පායකථා, සප්පායපුද්ගල, සප්පායභොජන, සප්පායඋතු, සප්පායඉරියව් යන මේ සත සෙවනය කළ යුතු ය. එසේ සෙවූනා කවරකු හට වුව ද නොබෝ කලෙකින් ම අර්හත්ත්ව ලැබෙන්නේ ය.

"ආවාසෝ ගොචරෝ භස්සං - පුග්ගලෝ භොජනං උතු
ඉරියාපථෝති සත්තෙත - අසප්පායෙ විවජ්ජයෙ.
සප්පායෙ සත්ත සෙවෙථ - එවං හි පවිපජ්ජතෝ
න චිරෙනෙව කාලෙන - හොති කඝවව් අප්පණා."

අසප්පාය ආවාස හා සප්පාය ආවාස.

යම් ආවාසයෙක වසන්නහුට නූපන් නිමිත්ත නූපදින්නේ නම්, උපන් නිමිත්ත හෝ නැති වන්නේ නම්, නො එළඹි සිහිය නො එළඹෙන්නේ නම්, අසමාහිත සිත සමාහිත නො වන්නේ නම් එය **අසප්පාය ආවාස** ය. යම් ආවාසයෙක වසන්නහුට **නාග** පණිත වාසි **පධානියතිස්ස** තෙරුන්ට මෙන් නිමිත්ත උපදී නම්, උපන් නිමිත්ත ස්ථිර වේ නම්, සිහිය එළඹ සිටී නම්, සිත සමාධිමත් වේ නම් එය **සප්පාය ආවාස** යි. එ බැවින් යම් විහාරස්ථානයක බොහෝ ආවාස ඇත් නම් ඒ විහාරස්ථානයෙහි එක් එක් ආවාසයෙක තුන් තුන් දවස වැසැ සිත එකඟ වූ ආවාසයෙහි විසුම් ගත යුතුයි.

ආවාස සප්පාය ලැබීමෙන් ලක්දිව **සුළුන්ගා** ලෙන කම්ටහන් ගෙනැ විසූ පන්සියයක් භික්ෂුහු අර්හත්ත්වයට පැමිණියෝ ය. එහි දී සෝවාන් වූ ද, සකෘදනාගාමීන් ආර්ය භූමියට පැමිණැ එහි දී රහත් වූ ද, භික්ෂූන් ගණනෙක් නැත. එහි මතු ද **සිතුල්පව්** වෙහෙර ආදි අන්‍ය ස්ථානයන්හි ද මෙසේ රහත් වූ වන්ගේ ගණන් නැත.

අසප්පාය ගොදුරු ගම් හා සප්පාය ගොදුරු ගම්.

සෙනාසනයෙන් උතුරු දිග හෝ දකුණු දිග ඉතා නුදුරු තැන්හි - යෙළ කොෂයක් අතර පිහිටි සුලභ භික්ෂා සම්පන්න ගොදුරු ගම සප්පාය වන්නේ ය. එසේ නො වූයේ අසප්පාය වන්නේ ය. (උතුරු දිග හෝ දකුණු දිග පිහිටිය යුත්තේ ගමනාගමනයෙහි හිර මුහුණ නො කරන සඳහා ය. යෙළ කොෂ යෙක් නම් දුනු තුන් දහසෙකි.)

අසප්පාය කථා හා සප්පාය කථා

දෙතිස් තිරශ්චීන කථාවන්ට ඇතුළත් කථා අසප්පාය ය. ඒ බිඳු කථා වනාහි ලද නිමිත්ත ද අතුරුදහන් වීමට හෙතු වන්නේ ය. සප්පාය වන්නේ දශ කථාවස්තු නිශ්‍රිත කථා ය. හෙ ද පමණට වය යුතු ය.

අසප්පාය පුද්ගල හා සප්පාය පුද්ගල.

යම් පුද්ගලයකු ඇසුරු කිරීමෙන් අසමාහිත සිත සමාහිත වේ නම් සමාහිත සිත ස්ථිර වේ නම් ඒ බඳු වූ තිරිසන් කථා නො කරන ශීලාදි ගුණ යුක්ත පුද්ගලයා සප්පාය වන්නේ ය. තිරිසන් කථා කරන කායදඬ්ඩියා සප්පාය නො වන්නේ ය. (කාය දණ්ඩියා නම් ශරීර සන්තර්ජණයෙහි හා පොෂණයෙහි යෙදුණේකි) ඒ බන්දු වනාහි පහන් දිය කිලිටි කරන මඩ දිය මෙන් ඔහු කිලිටි කරන්නේ ය. ඒ බන්දහු කරා පැමිණීමෙන් කොවි පණිත වාසී දහර භික්ෂුහට මෙන් ලත් සමාපත්තිය පවා නැති වන්නේ ය. නිමිත්ත නැති වන්නේ යනු කියනුම කවරේ ද

අසප්පාය භොජන ඍතු හා සප්පාය භොජන ඍතු.

භොජන වනාහි, කිසිවකුහට මධුර රස සප්පාය වන්නේ ය. කිසිවකුහට ඇඹුල් රස සප්පාය වන්නේ ය. එ සේම ඍතුව ද කිසිවකුහට ශීත ද, කිසිවකුහට උෂණ ද සප්පාය වන්නේ ය. එ බැවින් යම් භොජනයක් හෝ ඍතුවක් සෙවූනහුට අසමාහිත සිත සමාහිත වේ නම් සමාහිත සිත ස්ථිර වේ නම් ඒ භොජන ඍතු සප්පාය යි ද, එයින් අන්‍ය වූයේ අසප්පාය යි ද දත යුතු යි.

අසප්පාය ඉරියව් හා සප්පාය ඉරියව්

කිසිවකුහට සක්මන් ද, කිසිවකුහට නිදීම් – සිටීම් – හිඳීම් අතුරෙන් කිසිවක් ද සප්පාය වන්නේ ය. එ හෙයින් ආවාසය මෙන් එ ද තුන් තුන් දවස පරීක්ෂා කොටැ යම් ඉරියව් වෙක අසමාහිත සිත සමාහිත වේ නම් සමාහිත සිත ස්ථිරතර වේ නම් ඒ ඉරියව්ව සප්පාය ය යි ද එයින් අන්‍ය වූයේ අසප්පාය යි ද දත යුතු යි.

මේ සප්තවිධ අසප්පාය දුරැ කොටැ සප්තවිධ සප්පාය සෙවිය යුතු ය. එසේ සප්පාය සොයන, නිමිත්තානුසාරී බහුලයාහට නොබෝ කලෙකින් ම අර්හත්ත්ව ඵල අවබෝධ වන්නේ ය.

මෙසේ සෙවුනා කල්හි දු යම්කුහට අපිණා නො ලැබෙන්නේ නම් ඔහු විසින් දශවිධ අපිණා කෞශල්‍යය සම්පාදනය කටයුතු දශවිධ අපිණා කෞශල්‍යය නම් :

1 වසතු විශද ක්‍රියාව
2 ඉන්ද්‍රිය සමතා ප්‍රතිපාදනය
3 නිමිත්ත කෞශල්‍යය
4 සිතට ප්‍රග්‍රහ දියයුතු කල ප්‍රග්‍රහ දීම
5 සිත නිග්‍රහ කලයුතු කල නිග්‍රහ කිරීම
6 සිත සතුටු කල යුතු විට සතුටු කිරීම
7 සිත උපෙක්ෂා කල යුතු විට උපෙක්ෂා කිරීම
8 අසමාහිත පුද්ගල පරිවර්ජනය
9 සමාහිත පුද්ගල සෙවනය
10 තදධිමුක්තිය යන මොහුයි.

1 වසතු විශද ක්‍රියාව නම් – අධ්‍යාත්මික බාහිර වසතු පිරිසිදුකර ගැන්ම ය, යම් විටෙක ඒ යොගාවචරයාගේ කෙස්-නිය- ලොම් දික්වැ වැඩිණි නම්, ශරීරය හෝ ඔහ මලින් ගැවසිණි නම් එවිට ආධ්‍යාත්මික වසතු අපිරිසිදු වූයේ වෙයි. යම් විටෙක සිවුර දිරුම් කඩට ගියේ නම්, කිලිටි වූයේ නම්, දුගඳ වහනය කෙරේ නම්, සෙනස්න හෝ කසලින් යුක්ත වුණි නම් එවිට බාහිර වසතු අපිරිසිදු වූයේ වෙයි. ආධ්‍යාත්මික-බාහිර වසතු අපිරිසිදු කල්හි චිත්ත – චෛතසික උපන් විට නුවණ ද අපිරිසිදු වේ. අපිරිසිදු පහන් කබල්, පහන් තිර, පහන් තෙල් නිසා නැගෙන පහන් සිල්ලේ එළිය ද අපිරිසිදු වන්නාක් මෙනි. අපිරිසිදු නුවණින් සංඝකාර සම්මර්ශනය කරන කල්හි සංඝකාරයෝ ද විභූත වැ පහළ නො වෙති. කම්ටහන යෙදෙතු දු එ අභිවෘද්ධියට නො පැමිණෙ යි. ආධ්‍යාත්මික බාහිර වසතු පිරිසිදු කල්හි චිත්ත – චෛතසික උපන් විට ඥානය ද පිරිසිදු වන්නේ ය. පිරිසිදු පහන් කබල් පහන් තිර පහන් තෙල් නිසා නැගෙන පහන් සිල්ලේ ආලෝකය ද පිරිසිදු වන්නාක් මෙනි. පිරිසිදු නුවණින් සංඝකාර සම්මර්ශනය කරන කල සංඝකාරයෝ ද විභූත වැ පහළ වෙති. කම්ටහන යෙදෙන විට එ ද අභිවෘද්ධියට පැමිණෙන්නේ ය.

2 ඉන්ද්‍රිය සමතා ප්‍රතිපාදනය නම් – ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් සම බවට පැමිණවීම ය. ඉදින් ඔහුගේ සද්ධින්ද්‍රිය බලවත් වැ සෙසු ඉන්ද්‍රිය දුබල වුණි නම් විරියින්ද්‍රියයෙන් ප්‍රග්‍රහ කෘත්‍යය ද, සතින්ද්‍රියයෙන් උපට්ඨාන කෘත්‍යය ද, සමාධින්ද්‍රියයෙන්

අවික්ඛෙප කෘත්‍යය ද, **පඤ්චේන්ද්‍රියයෙන්** දර්ශන කෘත්‍යය ද, කළ හැකි නො වේ. (ප්‍රග්‍රහ නම් සම්ප්‍රයුක්ත ධර්මයන්ට අනුබල දීම ය. උපස්ථාන නම් අරමුණ කරා එළඹ සිටීම ය. අවික්ඛෙප නම් සම්ප්‍රයුක්ත ධර්මයන් විසිර යා නො දී තැන්පත් කිරීම ය. දර්ශන නම් ඇති සැටියෙන් දැන ගැන්ම ය.) එ බැවින් ඒ ඉන්ද්‍රිය ධර්ම සවභාවය මෙනෙහි කිරීමෙන් හෝ යම් ආකාරයෙකින් මෙනෙහි කරන විට සද්ධින්ද්‍රිය බලවත් වූයේ ද ඒ ආකාරයෙන් මෙනෙහි නො කිරීමෙන් හෝ සද්ධින්ද්‍රිය අඩු කර ගත යුතු. **වක්කලි** තෙරුන් ගේ කථාව මෙහි ලා දෘෂ්ටාන්ත ය.

ඉදින් විරිසින්ද්‍රිය බලවත් වීණි නම් සද්ධින්ද්‍රියට අධිමෝක්ෂ කෘත්‍යය ද, සෙසු ඉන්ද්‍රියයන්ට තම තමා අයත් සෙසු කෘත්‍ය ද, කළ හැකි නො වේ. එ බැවින් ඒ විරිසින්ද්‍රිය පස්සද්ධාදි භාවනායෙන් අඩු කර ගත යුතු. **සොණ** තෙරුන්ගේ කථාව මෙහි දෘෂ්ටාන්ත ය. මෙසේ සෙසු ඉන්ද්‍රිය පිළිබඳ වැ ද එකක් බලවත් කල්හි සෙස්සන්ට තම තමා අයත් කෘත්‍ය කළ නො හැකි බව දත යුතුයි.

මෙහි කිය යුත්තෙක් ඇති. මේ සමථ සම්පාදනයෙන් විශෙෂයෙන් ප්‍රශස්ත වන්නේ ශ්‍රද්ධා - ප්‍රඥ දෙදෙනාගේ ද, වීර්‍ය්‍ය - ප්‍රඥ දෙදෙනාගේ ද සමථ සම්පාදනය යි. යමකු ගේ ශ්‍රද්ධාව බලවත් වැ ප්‍රඥව දුර්බල වීණි නම් හෙතෙමේ මූඪප්‍රඥ වේ. හේ අස්ථානයෙහි ද පහදින්නේ ය. යමකුගේ ප්‍රඥව බලවත් වැ ශ්‍රද්ධාව දුර්බල වීණි නම් හෙතෙමේ **කෙරාටික** පක්ෂය භජනය කරන්නේ ය. (සිත් උපන් පමණින් ම කුසල් වෙයි. දන් ආදිය දීමෙන් කටයුතු කිමැ යි.) බෙහෙදින් හටගත් රොගය මෙන් හෙතෙමේ අතෙකිච්ඡ වේ හෙවත් පිළියම් කට හැක්කේ නො වේ. ශ්‍රද්ධා - ප්‍රඥ දෙක සම කල්හි ස්ථානයෙහි ම පහදින්නේ ය.

යමකුගේ සමාධිය බලවත් වැ වීර්‍ය්‍ය දුර්බල වීනි නම් කුසීද භාවය ඔහු මැඩලන්නේ ය. කුමක් හෙයින් ද සමාධිය කුසීද භාවයට පක්ෂ බැවිනි. යමකුගේ වීර්‍ය්‍ය බලවත් වැ සමාධිය දුර්බල වීණි නම් උද්ධච්ච භාවය ඔහු මැඩ ලන්නේ ය. කුමක් හෙයින් ද වීර්‍ය්‍ය උද්ධච්ච පක්ෂයෙහි පවත්නා බැවිනි. එසේ හෙයින් සමාධිය වීර්‍ය්‍යයෙන් යුක්ත වූයේ කුසීද භාවයෙහි ද, වීර්‍ය්‍ය සමාධියෙන් යුක්ත වූයේ උඩච්ච භාවයෙහි ද, වැටෙන්නට ද ඉඩ නො දෙන්නේ ය. එ බැවින් මේ සමාධි-වීර්‍ය්‍ය දෙක සම කැරැ ගත යුතු ය. ඒ සම කැරැ ගැන්මෙන් අර්පණා ව වන්නේ ය.

තව ද කියයුත්තෙක් ඇති. සමාධි භාවනායෙහි නියුක්ත යෝගාවචරයාට බලවත් වූ ම ශ්‍රද්ධාව අවශ්‍ය ය. ශ්‍රද්ධාව මඳවිණි නම් "පඨවි පඨවි" කී පමණින් ධ්‍යාන නො ලත් කල උත්සාහය හැර පියන්නේ ය. බලවත් ශ්‍රද්ධා ඇත්තේ "බුදුන් වදාළ මේ විධි ඒකාන්තයෙන් සිද්ධ වන්නේ ය සි" අදහමින් පරිකම් කොටැ අර්පණාවට පැමිණෙන්නේ ය.

තව ද සමාධි - ප්‍රඥා දෙක අතුරෙන් සමාධි කම්මිකයාට බලවත් වැ අවශ්‍ය වන්නේ එකාග්‍රතාව ය. හේ එකාග්‍රතායෙන් අර්පණාවට පැමිණෙන්නේ ය. විදර්ශීතා කම්මිකයාට බලවත් වැ අවශ්‍ය වන්නේ ප්‍රඥාව ය. හෙතෙමේ එයින් ලක්ෂණ ප්‍රතිවේධයට පැමිණෙන්නේ ය. යට දැක්වුණු සේ මේ සමාධි ප්‍රඥාවන්ගේ සම්පත්තියෙන් ද අර්පණාව ලබාගත හැකි ය.

සතිය වනාහි ඇම තන්හි බලවත් වැ මැ අවශ්‍ය ය. කුමක් හෙයින් ද සතියෙන් සිත ඔජවත්ත්‍ය පාඨිහාරිය වූ ශ්‍රද්ධා - වීර්‍ය්‍ය - ප්‍රඥාවන්ගේ වශයෙන් උද්ධච්චයට වැටීමෙන් ද, කෞසීද්‍ය පාඨිහාරිය වූ සමාධියෙන් කොසජ්ජයට වැටීමෙන් ද, රැක ගනු ලබන බැවිනි. එ හෙයින් ම ඒ සතිය සකල ව්‍යඤ්ජනයන්හි ලුණු හා තෙල් මෙන් ද, සමස්ත රාජ කෘත්‍යයන්හි සර්ව කාර්‍ය්‍යික අමාත්‍යයා මෙන් ද සියලු තන්හි කැමැති විය යුතු ය. **"සතිපන සබ්බත්ථිකා වුත්තා භගවතා, කිංකාරණා? චිත්තංහි සති පවිසරණං ආරක්ඛ පවත්තුපට්ඨානා ච සති න විනා සතියා චිත්තස්ස පග්ගහ නිග්ගහා හොන්ති"** යනු එ හෙයින් කියන ලදී.

"සතිය වනාහි සියලු තන්හි කැමැති විය යුතුය සි භගවත් බුදුන් වහන්සේ විසින් වදාරන ලදී. කුමක් හෙයින් ද සිත සතිය පිහිට කොට ඇත්තේ ය. සතිය ආරක්ෂාව වැටහීම කොට ඇත්තේ ය. සතිය නැත්නම් සිතේ ප්‍රග්‍රහ නිග්‍රහ නො වන්නේ ය" යනු එහි අර්ථයි.

3 නිමිත්ත කෞශල්‍යය නම්:- සිත එකඟ කරා ගැන්මට කාරණ වන තනා නො ගත් පඨවි කසිණාදි නිමිති තනා ගැන්මෙහි ද, තනා ගත් පඨවිකසිණාදි නිමිති භාවනා කිරීමෙහි ද, භාවනා කිරීමෙන් ලැබ ගත් නිමිති රැකැ ගැන්මෙහි ද දක්ෂ බව ය. මෙහි ලා තෙවනු වැ කී භාවනා කිරීමෙන් ලැබැ ගත් නිමිති රැකැ ගැන්මෙහි දක්ෂ බව අදහස් කරන ලද්දැ සි දතයුතු.

4 සිත ප්‍රග්‍රහ කළ යුතු කල ප්‍රග්‍රහ කරන්නේ කෙසේද යම් විටෙක ඒ යොගාවචරයාගේ සිත ඉතා ලිහිල් වැ හිස

වීර්‍ය්‍ය ඇති වීම් ආදියෙන් හැකිළී ගියේ ද එවිට පස්සද්ධි ආදි බොජ්ඣඞ්ග තුන නො වඩා ධම්මවිචයාදි බොජ්ඣඞ්ග තුන වැඩිය යුතු ය. වදුලේ මැ යි භගවන් බුදුහු වදිසින්-

"සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො පරිත්තං අග්ගිං උජ්ජාලෙතු කාමො අස්ස. සො තතො අල්ලානි වෙව තිණානි පක්ඛිපෙය්‍ය, අල්ලානිවෙව ගොමයානි පක්ඛිපෙය්‍ය, අල්ලානිවෙව කට්ඨානි පක්ඛිපෙය්‍ය, උදකවාතං ච දදෙය්‍ය, පංසුඤ්ඣානි ච ඔකිරෙය්‍ය නඤ්ඣා නු ඛො සො භික්ඛවෙ පුරිසො තං පරිත්තං අග්ගිං උජ්ජාලෙතුං නි? නොහෙතං භන්තෙ එවමෙව ඛො භික්ඛවෙ යස්මිං සමයෙ ලීනං චිත්තං හොති අථාලෝ තස්මිං සමයෙ පස්සද්ධි සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය, අථාලෝ සමාධි - පෙ - අථාලෝ උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. තං කිස්ස හෙතු? ලීනං භික්ඛවෙ චිත්තං, තං එතෙහි ධම්මෙහි දුස්සමුට්ඨාපයං හොති. යස්මිං ච ඛො භික්ඛවෙ සමයෙ ලීනං චිත්තං හොති අථාලෝ තස්මිං සමයෙ ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය, අථාලෝ විරිය - පෙ - අථාලෝ පීති සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. තං කිස්ස හෙතු? ලීනං භික්ඛවෙ චිත්තං තං එතෙහි ධම්මෙහි සුසමුට්ඨාපයං හොති. සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො පරිත්තං අග්ගිං උජ්ජාලෙතු කාමො අස්ස, සො තතො සුක්ඛානි වෙව තිණානි පක්ඛිපෙය්‍ය, සුක්ඛානි වෙව ගොමයානි පක්ඛිපෙය්‍ය, සුක්ඛානි වෙව කට්ඨානි පක්ඛිපෙය්‍ය, මුඛවාතං ච දදෙය්‍ය, න ච පංසුඤ්ඣානි ඔකිරෙය්‍ය. නඤ්ඣා නු ඛො සො භික්ඛවෙ පුරිසො තං පරිත්තං අග්ගිං උජ්ජාලෙතුං නි? එවං භන්තෙ"ති[1].

'මහණෙනි! මිනිසෙක් මද ගින්නක් දල්වා ගනු කැමැති වැ එහි අමු තණපත් දමන්නේ නම් අමු ගොම දමන්නේ නම් අමු දර දමන්නේ නම් දිය මුසු සුළං දෙන්නේ නම් පස් හෝ ඔනේ නම් ඒ පුරුෂයා තෙලේ ගිනි ඇබිත්ත දල්වා ගන්නට පොහොසත් වේ ද, නැත ස්වාමීනි, මහණෙනි! එමෙන් යම් කලෙක සිත හැකිළී ගියේ නම් එ කල පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය සමාධිසම්බොජ්ඣඞ්ගය උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩන්නට කල් නො වන්නේ ය. කුමක් හෙයින් ද මහණෙනි! සිත හැකිළී ගියේ ය. හැකිළී ගිය සිත මේ ධර්මයන් ගෙන් නහාලිය නොහැක්කේ ය. මහණෙනි! යම් විටෙක සිත හැකිළී ගියේ නම් එවිට ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය, විරියසම්බොජ්ඣඞ්ගය, පීතිසම්බොජ්ඣඞ්ගය වඩන්නට කල් වන්නේ ය.

[1]සං: නි: මහාවග්ග 881

කුමක් හෙයින් ද, මහණෙනි! සිත හැසිළී ගියේ ය. හැසිළී ගිය සිත මේ ධර්මයන්ගෙන් නහා සිටුවිය හැක්කේ ය. මහණෙනි! පුරුෂයෙක් මද ගින්නක් දල්වා ගනු කැමැති වැ එහි වියලි තණ රොඩු දමන්නේ නම් වියලි ගොම වැරටි දමන්නෙ නම් වියලි දර කැලි දමන්නේ නම් මුඛ වාතය දෙන්නේ නම් පස් හෝ තෙ බහන්නේ නම් ඒ පුරුෂයා ඒ ගිනි ඇබින්න දල්වා ගන්නට පොහොසත් වේ ද එසේ ය සවාමීනි! යනු එහි අර්ථයි.

මේ වනාහි ධර්මවිචය සම්බොජ්ඣඞ්ගාදීන්ගේ වැඩීම ඔවුන් පිළිබඳ ආහාර (ප්‍රත්‍යය) වශයෙන් වන්නේ ය යි දත යුතු.

වදාළේ මේ ය.

"අත්ථි භික්ඛවෙ කුසලා'කුසලා ධම්මා. සාවජ්ජා'නවජ්ජා ධම්මා. හීනපණීතා ධම්මා. කණ්හසුක්කසප්පටිභාගා ධම්මා. තත්‍ර යොනිසොමනසිකාර බහුලීකාරෝ අයමාහාරෝ අනුප්පන්නස්ස වා ධම්මවිචයසම්බොජ්ඣංගස්ස උප්පාදාය උප්පන්නස්ස වා ධම්මවිචයසම්බොජ්ඣංගස්ස භියොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති"[1] යි.

'මහණෙනි! කුශල - අකුශල, සාවද්‍ය - අනවද්‍ය, හීන - ප්‍රණීත, කෘෂ්ණ - ශුක්ල, සප්‍රතිභාග ධර්ම විෂයයෙහි යොනිසොමනසිකාරය බහුල කර ගැන්ම නුපන් ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය උපදවා ගැන්මට, උපන් ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය වඩා ගැන්මට ආහාර (ප්‍රත්‍යය) වන්නේ ය' යනු එහි සංක්ෂිප්ත අදහස ය.

කුශලාදීන් විෂයෙහි යොනිසොමනසිකාරය නම් කුශලාදීන් ගේ අනවද්‍ය සුඛ විපාකාදිය සප්‍රීතාදීන් ගේ දුඃඛාදිය යන සභාව ලක්ෂණයාගේ ද, අනිත්‍යාදි සාමාන්‍ය ලක්ෂණයාගේ ද, ප්‍රතිවේධ වශයෙන් පැවැති මනසිකාරය යි. (කුශලාදීන්ගේ ඒ ඒ සභාව ලක්ෂණාදීන්ගේ තත්ත්වාවබෝධ වශයෙන් උපන් ජවන චිත්තොත්පාදම අවිපරීත මනසිකාර බැවින් **යොනිසො මනසිකාරය** යි කියන ලදී." යනු සත්‍යයි.)

"අත්ථි භික්ඛවෙ ආරම්භධාතු - නික්කමධාතු - පරක්කම ධාතු. තත්‍ර යොනිසොමනසිකාර බහුලීකාරෝ අයමාහාරෝ අනුප්පන්නස්ස වා විරියසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා විරියසම්බොජ්ඣඞ්ගස්ස භියෝභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති"[1] "මහණෙනි! ආරම්භ-ධාතු - නික්කමධාතු - පරක්කමධාතු විෂයයෙහි යොනිසො මනසිකාරය බහුල කර ගැන්ම නුපන් විරියසම්බොජ්ඣඞ්ගය

[1]සං: නි: මහාවග්ග 87ඊ

උපදවා ගැන්මට ද; උපන් විරියසම්බොජ්ඣඞ්ගය වඩා ගැන්මට ද ආහාර (ප්‍රත්‍යය) වන්නේ ය. මෙහි **ආරම්භ ධාතු නම්** ප්‍රථම වීර්‍යය යි. (කුශල ක්‍රියායෙහි මුල් ආරම්භ වශයෙන් පැවැති වීර්‍යය ධාතු සවභාව බැවින් ආරම්භ ධාතුය යි කී නියා යි.) **නික්කම ධාතු නම්** කුසීත කමින් නික්මුණු බැවින් ආරම්භ ධාතුවට වඩා අතිශයයෙන් බලවත් වීර්‍යය යි. **පරක්කම ධාතු නම්** මතු මත්තට යන හෙයින් නික්කම ධාතුවට ද වඩා අතිශයයෙන් බලවත් වූ වීර්‍යය යි.

"අජ්ඣි භික්ඛවෙ පීතිසම්බොජ්ඣඞ්ගට්ඨානියා ධම්මා තඤ්ච යොනිසොමනසිකාර බහුලීකාරෝ අයමාහාරෝ අනුප්පන්නස්ස වා පීතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය උප්පන්නස්ස වා පීතිසම්බොජ්ඣඞ්ගස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තනි"[1] 'මහණෙනි! පීතිසම්බොජ්ඣඞ්ගට්ඨානීය ධර්‍ම විෂයයෙහි යොනිසොමනසිකාරය බහුල කෙරෙ ගැන්ම නුපන් පීතිසම්බොජ්ඣඞ්ගය උපදවා ගැන්මට ද, උපන් පීතිසම්බොජ්ඣඞ්ගය වඩාගැන්මට ද ආහාර (ප්‍රත්‍යය) වන්නේ ය. පීතිසම්බොජ්ඣඞ්ගට්ඨානීය ධර්‍ම යන මේ ප්‍රීතියට ම නමෙකි. ඒ ප්‍රීතියුතපාදක මනසිකාර යොනිසොමනසිකාර යි.

තවද **පරිපුච්ඡකතා, වත්ථුවිසදකිරියතා, ඉන්ද්‍රියසමත්තපටිපාදනා, දුප්පඤ්ඤපුග්ගලපරිවජ්ජනා, පඤ්ඤවන්තපුග්ගලසෙවනා, ගම්භීරඤාණචරියපච්චවෙක්ඛණා, තදධිමුත්තතා** යන සපත්‍ත ධර්‍මයෝ ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය උපදවා ගැන්මට කරුණු වෙති.

පරිපුච්ඡකතා නම් පස්මහ සහි ඉගෙන ද ආචාර්‍යයන් සේවනය කොටැ ඒ ඒ පදයාගේ අර්‍ථ විචාරීම ය. අටුවා සහිත පස්මහ සහි හෝ ඉගෙන ඒ ඒ තන්හි ගැටලු තැන් විචාරා ගැන්ම ය.

වත්ථුවිසදකිරියතා නම් අධ්‍යාත්මික බාහිර වස්තු නිර්මල කරා ගැන්ම ය. උඩිව විරෙචන අධොවිරෙචන දික් කෙහෙරැවුල්-නිය කැපීම් ආදිය අධ්‍යාත්මික වස්තු නිර්මලකර ගැන්ම ය. හඳනා පොරෝනා සිවුරු සෝදා ගැනීම් ආසන සකස්කර ගැනීම් ආදිය බාහිර වස්තු නිර්මල කර ගැන්ම ය.

ඉන්ද්‍රියසමත්තපටිපාදනා නම් ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් සම්බවට පමුණුවා ගැන්ම ය.

දුප්පඤ්ඤපුග්ගලපරිවජ්ජනා නම් බත් දමන ලද කවුඩන් මෙන් මස් දමන ලද සුනඛයන් මෙන් මොහයෙන් මුළා වූ සත්ත්වයන් දුරුකිරීම ය.

පඤ්ඤවන්තපුග්ගලසෙවනා නම් ප්‍රඥව පිණිස කෘතාධිකාර ඇති සත්‍ය-ප්‍රතීත්‍ය සමුත්පාදාදියෙහි දක්ෂ ආචාර්‍යයන් හෝ විදර්‍ශිතා

[1] සං: නි: මහාවග්ග 875

භාවනා කරන මහා ප්‍රාඥයන් හෝ කලින් කල සෙවනය කිරීම ය.

ගම්භීර ඤාණචරිය පච්චවෙක්ඛණා නම් ගැඹුරු තැණැත්තන් විසින් අවබෝධ කටයුතු සතර - ධාතු ආයතන ප්‍රතීත්‍ය-සමුත්පාදාදිය ප්‍රකාශවන්නාවූ හෝ ශූන්‍යතා ප්‍රතිසංයුක්ත වූ හෝ සූත්‍රාන්තයන් ප්‍රත්‍යවෙක්ෂා කිරීම ය.

තදධිමුත්තතා නම් ඒ ධම්මච්චය සම්බොජ්ඣඞ්ග සංඛ්‍යාත ප්‍රඥයෙහි අදහස් ඇති බව ය. එහි නිමිත්ත ප්‍රවණ බව ය.

1. අපායාදි භය ප්‍රත්‍යවෙක්ෂාකරන බව, 2. වීර්‍යයට අයත් ලෞකික ලොකොත්තර විශෙෂාධිගමයන්ගේ ආනිසංස දක්නා බව, 3. "බුදු - පසේබුදු - මහා ශ්‍රාවකයන් ගිය මඟ මා විසින් යා යුතු ය. කුසීත වැ ඒ මඟ යා හැකි නො වන්නේ ය"යි මෙසේ ගමන් මාර්ගීය ප්‍රත්‍යවෙක්ෂා කරන බව, 4. ප්‍රත්‍යය දෙන දායකයන්ගේ ඒ ප්‍රත්‍යය දුනය මහත් ඵල කිරීමෙන් පිණ්ඩපාතයට බුහුමන් කරන බව, 5. "මාගේ ශාස්තෘන් වහන්සේ වීර්‍යාරම්භයෙහි ගුණ වර්ණනා කරන සේක. උන්වහන්සේ ඉක්මවා ලිය නො හැකි අනුශාසනා ඇතිසේක. අපට බොහෝ උපකාර සේක. ප්‍රතිපත්ති පූජායෙන් පුදන්නේ ම උන්වහන්සේ පිදුයෙ නම් වන්නේ ය. අන්‍යාකාරයකින් පිදුයේ නම් නො වන්නේ ය"යි මෙසේ ශාස්තෘන්වහන්සේ ගේ මම්මච්චය ප්‍රත්‍යවෙක්ෂා කරන බව, 6. උන්වහන්සේගෙන් සඳ්ධම් සංඛ්‍යාත මහා දායාදය මා විසින් ගත යුතු ය. එය කුසීත වැ ගත නො හැකි ය යි දායාද මහාත්‍වය ප්‍රත්‍යවෙක්ෂා කරන බව, 7. ආලොක සංඥාව මෙනෙහි කිරීම ය, ඉරියව් මාරුකිරීම ය, අභ්‍යවකාශ සෙවනය යනාදියෙන් ථීන - මිද්ධ දුරුකරන බව, 8. අලස වූ භාවනායෙහි කාම මාත්‍ර පවා නො දන්නා කායදඩ්ඩි බහුල වූ සෙය්‍යසුඛාදියෙහි යෙදෙන - තිරිසන් කථායෙහි නිරත - පුද්ගලයන් දුරු කරන බව, 9. භාවනාරම්භ වශයෙන් ආරබ්ධ වූ දැඩ වීර්‍ය ඇති පුද්ගලයන් කලින් කල සෙවුනා බව, 10. සතර වැදෑරුම් සම්‍යක් ප්‍රධාන වීර්‍යයාගේ ආනුභාව සිහි කරන බව, 11. ඒ වීර්‍ය සම්බොධ්‍යඞ්ගයෙහි ඇම තන්හි නිමිත්ත ප්‍රවණ බව යන මේ එකොළොස් ධම්මෝ විරිය සම්බොජ්ඣඞ්ගය උපදවා ගැන්මට කාරණ වෙත්.

බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දෙවතානුස්සති, උපසමානුස්සති යන මේ සප්ත විධ භාවනා වැඩීම ය, බුද්ධාදීන් කෙරෙහි ප්‍රසාද සෙනෙහ රහිත

පුද්ගලයන් දුරු කරන බව ය, බුද්ධාදීන් කෙරෙහි ප්‍රසාද සෙනහ සහිත සිනිදු සිත් ඇති පුද්ගලයන් සෙවනය බව ය, **පසාදනීය සූත්‍රාදිය** සිහිකරන බව ය. පීතිසම්බොජ්ඣඞ්ගය උපදවා ගැන්මෙහි නිමිත්ත ප්‍රවණ බවය යන මේ එකොළොස් ධර්මයෝ පීතිසම්බොජ්ඣඞ්ගය උපදවා ගැන්මට කාරණ වෙති.

මෙසේ මේ ආකාරයෙන් මේ ධර්ම උපදවා ගන්නේ ධම්ම විචය සම්බොජ්ඣඞ්ගාදිය වඩන්නේ නම් වන්නේ ය.

සිතට ප්‍රග්‍රහ දියයුතු කල ප්‍රග්‍රහ දෙන ආකාරය යි.

---

6 සිතට නිග්‍රහ කළ යුතු කල නිග්‍රහ කරන්නේ කෙසේද:- යම් කලෙක ඒ යෝගාවචරයාගේ සිත තරයේ පටන් ගත් වීර්‍යාදියෙන් නො සන්සුන් බවට පැමිණෙන්නේ වන්නේ ද, එකල ධම්මවිචයාදි සම්බොජ්ඣඞ්ග තුන නො වඩා පස්සද්ධි ආදි සම්බොජ්ඣඞ්ග තුන වඩනේ ය. විදැල්ලේ මෑ යි. **භගවත් බුදුහු**

"සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසෝ මහන්තං අග්ගික්ඛන්ධං නිබ්බාපෙතුකාමෝ අස්ස සෝ තත්ථ සුක්ඛානි චෙව තිණානි පක්ඛිපෙය්‍ය - පෙ - නව පංසුකෙන ඔකිරෙය්‍ය, හබ්බා නුඛ්වා සෝ භික්ඛවෙ පුරිසෝ මහන්තං අග්ගික්ඛන්ධං නිබ්බාපෙතුං නි? නෝ හෙතං භන්තෙ. එවමෙව ඛෝ භික්ඛවෙ යස්මිං සමයෙ උද්ධතං චිත්තං හොති. අකාලෝ තස්මිං සමයෙ ධම්මවිචය සම්බොජ්ඣංගස්ස භාවනාය, අකාලෝ විරිය -පෙ- අකාලෝ පීතිසම්බොජ්ඣංගස්සභාවනාය, තංකිස්ස හෙතු? උද්ධතං භික්ඛවෙ චිත්තං, තං එතෙහි ධම්මෙහි දුවූපසමං හොති. යස්මිං ච ඛෝ භික්ඛවෙ සමයෙ උද්ධතං චිත්තං හොති, කාලෝ තස්මිංසමයෙපස්සද්ධිසම්බොජ්ඣංගස්ස භාවනාය, කාලෝ සමාධි - පෙ - කාලෝ උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය, තංකිස්සහෙතු? උද්ධතං භික්ඛවෙ චිත්තං තං එතෙහි ධම්මෙහි සුවූපසමං හොති, සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසෝ මහන්තං අග්ගික්ඛන්ධං නිබ්බාපෙතුකාමෝ අස්ස. සෝ-තත්ථ අල්ලානි චෙව තිණානි පක්ඛිපෙය්‍ය පංසුකෙන ච ඔකිරෙය්‍ය, හබ්බා නුඛ්වොසෝ පුරිසෝ මහන්තං අග්ගික්ඛන්ධං නිබ්බාපෙතුනෙති? එවං භන්තෙන"[1] යි

'මහණෙනි! මිනිසෙක් මහා ගිනිකඳක් නිවාලනු කැමැති වැ එහි වියලි තණ රොඩු දමන්නේ නම් වියලි ගොමවැරටි දමන්නේ නම් වියලි දර දමන්නේ නම් දියමුසු සුළං නො දෙන්නේ

[1]සං: නි: මහාවග්ග 882

නම් පස් හෝ තෝ ඕනේ නම් ඒ මිනිසා මහා ගිනිකඳ නිවා ලන්නට සමර්ථවේ ද නැත ස්වාමීනි, මහණෙනි! එමෙන් ම යම් කලෙක සිත නො සන්සුන් බවට පැමිණියේ ද එ කල්හි ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය, විරිය සම්බොජ්ඣඞ්ගය, පීති සම්බොජ්ඣඞ්ගය වඩන්නට කල් නො වන්නේ ය. කුමක් හෙයින් ද මහණෙනි! සිත නො සන්සුන, නො සන්සුන් සිත මේ ධර්මයන්ගෙන් සන්සිඳුවා ගන්නට නො හැකි ය. මහණෙනි! යම් කලෙක සිත නො සන්සුන් බවට පැමිණියේ ද එකල්හි පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය, සමාධිසම්බොජ්ඣඞ්ගය, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩන්නට සුදුසු වන්නේ ය. කුමක් හෙයින් ද මහණෙනි! සිත නො සන්සුන. එය ඒ ධර්මයන්ගෙන් සන්සිඳුවා ගත හැක්කේ ය. මහණෙනි, මහා ගිනිකඳ නිව්යටියෙක් එහි අමු තෘණ දමන්නේ නම් අමු ගොම දමන්නේ නම් අමු දර දමන්නේ නම් දිය මුසු සුළං දෙන්නේ නම් පස් හෝ ඕනේ නම් ඒ මිනිසා ඒ ගිනිකඳ නිවාලන්නට සමර්ථ වේ ද එසේ ය ස්වාමීනි, යනු එහි අර්ථ සි.

මෙහි දී පස්සද්ධි සම්බොජ්ඣඞ්ගාදීන් ගේ වැඩීම ඔවුන් පිළිබඳ ආහාර (ප්‍රත්‍යය) වශයෙන් වන්නේ ය සි දත යුතු. වදාළේ මැ සි.

"අත්ථි භික්ඛවෙ කායපස්සද්ධි - චිත්තපස්සද්ධි, තඤ්ච යොනිසො මනසිකාර බහුලීකාරෝ අයමාහාරෝ අනුප්පන්නස්ස වා පස්සද්ධි සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස භියෝ භාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති"[1] 'මහණෙනි, කායපස්සද්ධි යෙක් ඇත්තේ ය. චිත්ත පස්සද්ධියෙක් ඇත්තේ ය. ඒ කාය පස්සද්ධි - චිත්තපස්සද්ධින්හි යොනිසො මනසිකාරය නූපන් පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය උපදවා ගැන්මට ද, උපන් පස්සද්ධි-සම්බොජ්ඣඞ්ගය වඩා ගැන්මට ද, මහත් බවට පමුණුවා ගැන්මට ද, සම්පූර්ණ කර ගැන්මට ද පවත්නේ ය.

"අත්ථි භික්ඛවෙ සමථනිමිත්තං අව්යග්ගනිමිත්තං තඤ්ච යොනිසො මනසිකාරබහුලීකාරෝ අයමාහාරෝ අනුප්පන්නස්ස වා සමාධි සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා සමාධි සම්බොජ්ඣඞ්ගස්ස භියෝ භාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති"[1] 'මහණෙනි! සමථ නිමිත්තයෙක් අව්යග්ග නිමිත්තයෙක් ඇත්තේ ය. එහි යොනිසො මනසිකාරය බහුල කැරැ ගැන්ම නූපන් සමාධි-

[1] සං: නි: මහාවග්ග 877

සම්බොජ්ඣඞ්ගය උපදවා ගැන්මට ද, උපන් සමාධි සම්බොජ්ඣඞ්ගය වඩා ගැන්මට ද, මහත් බවට පමුණුවා ගැන්මට ද, සම්පූර්ණ කොට ගැන්මට ද පවත්නේ ය. මෙහි සමථ නිමිත්ත යනු සමථයට ම (සමාධියට ම) තමෙකි. අව්‍යග්‍ර නිමිත්ත යනු දු අවික්ඛේපාර්ථයෙන් එයට ම (ඒ සමාධියට ම) නම් ය.

"අපි හිකඛවෙ උපෙකඛාසම්බොජ්ඣඞ්ගට්ඨානියා ධම්මා තත්‍ර යොනිසො මනසිකාරබහුලීකාරෝ අයමාහාරෝ අනුප්පන්නස්ස වා උපෙකඛා සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා උපෙකඛා සම්බොජ්ඣඞ්ගස්ස භියෝ භාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති"[1] 'මහණෙනි! උපෙකඛා සම්බොජ්ඣඞ්ගට්ඨානීය ධර්ම ඇත්තේ ය. එහි යොනිසෝ මනසිකාරය බහුල කොට ගැන්ම නුපන් උපෙකඛාසම්බොජ්ඣඞ්ගය උපදවා ගැන්මට ද, උපන් උපෙකඛා සම්බොජ්ඣඞ්ගය වඩා ගැන්මට ද, විපුලත්වයට පමුණුවා ගැන්මට ද, සම්පූර්ණ කොට ගැන්මට ද පවත්නේ ය.

මේ තුන් තන්හි මෙ **යොනිසෝ මනසිකාරය** නම් යම් යම් ආකාරයකින් ඒ යොනි හට පස්සද්ධි - සමාධි - උපෙකඛා උපන්නාහු ද, ඒ ඒ ආකාරය සලකා ඒ පස්සද්ධි ආදීන් උපදවා ගැනීම් වශයෙන් පවත්වන ලද මනසිකාරය යි.

තව ද 1. ප්‍රණීතාහාර සෙවුනා බව, 2. සැප ඍතු සෙවුනා බව, 3. සැප ඉරියව් සෙවුනා බව, 4. සම වූ කාය - චිත්ත ප්‍රයොග ඇති බව, 5. කෙලෙශ පරිදාහ ඇති නොසන්සුන් පුද්ගලයන් දුරු කරන බව, 6. කෙලෙශ පරිදාහ නැති සන්සුන් පුද්ගලයන් සෙවීනා බව, 7. පස්සද්ධි සම්බොජ්ඣඞ්ගයෙහි නැමී ගිය අදහස් ඇති බව යන සප්ත ධර්මයෝ **පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය උපදවා ගැන්මට** කරුණු වන්නාහ. 1. අධ්‍යාත්මික බාහිර වස්තූන්ගේ විසඳ බව, 2. පඨවි කසිණාදි චිත්තෛකග්ගතා නිමිත්තන්හි දක්ෂ බව, 3. සද්ධාදි ඉන්ද්‍රියයන් සමකර ගන්නා බව, 4. සුදුසු කාලයෙහි සිතට නිග්‍රහ කරන බව, 5. සුදුසු කාලයෙහි සිතට අනුබල දෙන බව, 6. භාවනාසඞ්ඛාත රහිත සිත ශ්‍රද්ධා වශයෙන් සංවේග වශයෙන් සතුටු කරන බව, 7. ලීනුද්ධච්චාදි රහිත වැ සිත මැකී වැ පවත්නා කල්හි එහි උපේක්ෂා කරන බව, 8. වික්ඛිප්ත පුද්ගලයන් දුරු කරන බව, 9. සමාහිත පුද්ගලයන් සෙවුනා බව, 10. ධ්‍යාන විමොක්ෂ ප්‍රත්‍යවේක්ෂා කරන බව, 11. සමාධි සම්බොජ්ඣඞ්ගයෙහි නැමී ගිය අදහස් ඇති බව,

[1]සං: නි: මහාවග්ග 877

යන එකොලොස් ධර්ම **සමාධිසමේඛාජඞ්ඝය උපදවා ගැන්මට** කරුණු වන්නේ ය.

1. ප්‍රිය අප්‍රිය සියලු සත්ත්වයන් කෙරෙහි මධ්‍යස්ථ බව, 2. වස්ත්‍රාදියෙහි හා පාත්‍ර චීවරාදියෙහි මධ්‍යස්ථ බව, 3. ප්‍රිය අප්‍රිය සත්ත්වයන් කෙරෙහි හා වස්ත්‍රාදි පාත්‍ර චීවරාදි සංස්කාර යන් කෙරෙහි මමත්වය කරන පුද්ගලයන් දුරු කරන බව, 4. සත්ත්වයන් කෙරෙහි හා සංස්කාරයන් කෙරෙහි මධ්‍යස්ථ පුද්ගලයන් සෙවූනා බව, 5. උපෙක්ඛා සම්බොධ්‍යඞ්ගයෙහි නිමිත්ත ප්‍රවණ බව යන මේ පසළොස් ධර්මයෝ **උපෙක්ඛා සමේඛාජඞ්ඝය උපදවා ගැන්මට** කරුණු වන්නේ ය.

මෙසේ මේ ආකාරයෙන් මේ ධර්ම උපදවා ගන්නේ **පස්සද්ධි-සමේඛාජඞ්ඝාදිය** උපදවා ගන්නේ නම් වේ.

සිතට නිග්‍රහ කළයුතු විට නිග්‍රහ කරන ආකාරය සි.

---

6. සිත සතුටු කළ යුතු විට සතුටු කරන ආකාරය මෙසේ සි.

යම් විටෙක ඒ යොගාවචරයාගේ සිත නුවණ මෙහෙයීමේ මිදු බැවින් හෝ **එකාග්‍රතා** සුඛය නො ලැබීමෙන් හෝ ආස්වාද රහිත වන්නේ ද, එ විට ඒ සිත අෂ්ට සංවෙග වස්තු මෙනෙහි කිරීමෙන් සංවෙගයට පමුණුවා ගන්නේ ය. ("යම් **වේලෙක** ප්‍රඥ ප්‍රයොග මඳ වේද එ වේලෙහි නො සකස් අහරක් පුරුෂයා හට රුචි නො එළවන්නාක් මෙන් භාවනා නොමෝ සිතට අභිරුචි නො එළවයි. එහෙයින් **නීරාස්වාද** වෙයි. යම් වේලෙක භාවනා නොමෝ මනා කොටැ වීථි ප්‍රතිපන්න නො වන බැවින් **මතු** මතුයෙහි විශෙෂාවහ නො වේ ද එ සමයෙහි **එකාග්‍රතා** සුඛයාගේ අලාභයෙන් චිත්තය නීරාස්වාද වෙයි." යනු පැරැකුම් සන්න සි.)

අෂ්ට සංවෙග වස්තු නම්:- ජාති, ජරා, ව්‍යාධි, මරණ යන සතර හා අපාය දුක හා අතීත සංසාර මූලක දුක හා අනාගත සංසාර මූලක දුක වත්මන්හි අහර සෙවුම් මූලක දුකයි. එතෙකින් ද බුඩ-ධර්ම-සංඝ යන තෙරුවන් ගුණ සිහි කිරීමෙන් ද ඔහුගේ සිතට ප්‍රසාද උපදවන්නේ ය.

සිත සතුටු කළ යුතු විට සතුටු කරන ආකාරය සි.

---

7 සිතට උපෙක්ෂා කළ යුතු විට උපෙක්ෂා කරන ආකාරය මෙසේය.

මෙසේ මැනෙවින් පිළිපදනා ඒ යොගාවචරයාගේ සිත අලීන වැ අනුද්ධත වැ අනිරාසවාද වැ ආරම්මණයෙහි සම්ප්‍රවෘත්ත වැ සමථ වීථියට පිළිපන්නේ වත්නේ ද, එවිට ඒ සිතට ප්‍රග්‍රහ (අනුබල) දීමෙහි හෝ නිග්‍රහ කිරීමෙහි හෝ සතුටු දැනවීමෙහි ව්‍යාපාරයකට හෙතෙමේ නො පැමිණෙන්නේ ය. අසුන් සම වැ යන කල්හි ප්‍රග්‍රහාදිය නො දෙන අශ්ව සාරථියකු මෙනැ යි දත යුතු යි.

සිතට උපෙක්ෂා කළ යුතු විට උපෙක්ෂා කරන ආකාරය යි.

---

8. අසමාහිත පුද්ගල පරිවර්ජනය නම්:- නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිපදාවට හෙවත් ධ්‍යානප්‍රතිපත්තියට නො නැංග – නොයෙක් කටයුතුවල යෙදුණු වික්ෂිප්ත සිත් ඇති පුද්ගලයන් දුරින් ම දුරු කිරීම ය.

9. සමාහිත පුද්ගල සෙවනය නම්:- නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිපදාවට හෙවත් ධ්‍යාන ප්‍රතිපත්තියට නැංග – සමාධිලාභී – පුද්ගලයන් කරා කලින් කල එළඹීම ය.

10. තදධිමුක්තතිය නම්:- සමාධියෙහි අදහස් ඇති බව-සමාධිය ම ගුරු කොට ඇති බව- සමාධියට නැමී ගත් බව- සමාධියට වෙසෙසින් නැමී ගත් බව – සමාධියට බර වැ සිටින බව යි.

මෙසේ මේ දශවිධ අර්පණා කෞශල්‍යය සම්පාදනය කට යුතු යි. 1, ලත් නිමිත්තෙහි එසේ අර්පණා කෞශල්‍යය සම්පාදනය කරන්නහුට අර්පණාව ලැබෙන්නේ ය 2, එසේ කොටැ ද ඉදින් අර්පණාව නො ලද්දේ නම් එතෙකිනු දු භාවනා යොගය නො හරින්නේ ය. මත්තෙහි දු ව්‍යායාම කරන්නේ ය. සම්‍යක් ව්‍යායාමය හැරපියා පුද්ගලයෙක් මද විශෙෂයකට හෝ පැමිණෙන්නේ ය, යන මෙය සිදු නො වන්නකි. එ බැවින් චිත්ත ප්‍රවෘත්තාකාරය සලකන්නා වූ ප්‍රාඥයොනී යළි යළි වීර්‍ය්‍ය සම්පාය යොදන්නේ ය. මඳකු දු ලීනත්වයට බස්නා සිත නණා සිටුවන්නේ ය. අත්‍යාරබ්ධ සිත වළකා සම සේ පිහිටුවන්නේ ය. මල් රොන්හි, මානිල් පෙත්තෙහි, මකුළු හුයෙහි, නැවෙහි, තෙල් නළෙහි, මීමැසි, සල්ලවෛද්‍යයන්ගේ පැවැත්ම අටුවායෙහි වර්ණිතා කළ පරිදි සිත ලීනත්වයෙන් හා උද්ධතත්වයෙන් සම්මාකාරයෙන් මුදුලා **ප්‍රතිභාගනිමිත්ත** කරා මෙහෙයන්නේ ය.

මේ අර්ථය දැක්වුණු ගාථා මෙසේ ය.

"එවං හි සම්පාදයතො - අප්පණාකොසල්ලං ඉමං
පවිලදෙධ නිමිත්තඤ්ච - අප්පණා සම්පවත්තති

එවම්පි පවිපන්නඤ්ච - සචෙ සා නප්පවත්තති
තථාපි නජ්ජෙ යොගං - වායමෙථෙව පණ්ඩිතො

කිච්චාහි සම්මා වායාමං - විසෙසං නාම ඣානතො
අධිගච්ඡ පරිත්තම්පි - ඣානමෙතං න විජ්ජති.

චින්තපපවත්තිං ආකාරං - තස්මා සල්ලකඛයං බුධො
සමථා විරියසෙවව - යොජයෙථ පුනප්පුනං

ඊසකං පි ලයං යන්තං - පඟහණෙහථෙව මානසං
අච්චාරද්ධං නිසෙධෙන්තා - සමමෙව පවත්තයෙ

රෙණුමහි උප්පලදලෙ - සුත්තෙන නාවාය නාළියා
යථා මධුකරාදිනං - පවත්තී සම්පවණ්ණිතා

ලීන උද්ධතභාවෙහි - මොචයිත්වාන සබ්බසො
එවං නිමිත්තාභිමුඛං - මානසං පවිපාදයෙ" ති.

මෙහි මල්රොන් ආදිය පිළිබඳ උපමාන උපමෙයාථී සංසන්දනය මෙසේ දත යුතු. **අති දක්ඛ** මීමැස්සා අසවල් රුකෙහි මල් පිපුණේ ය යි අසා තියුණු වේගයෙන් ගමන් කරන්නේ ඒ වෘක්ෂය ඉක්ම පියාසර කොටැ යළිත් හැරී එන්නේ රේණු වගුළ කල්හි එහි සම්ප්‍රාප්ත වන්නේ ය. මල පිපුණු ඇසිල්ලෙහි රේණු සුරසය. පසු වැ වාතාදියෙන් එය ගිලිනී වැටෙ යි. එවිට එහි එළඹෙන මීමැස්සාට සුරස මල් රේණු නො ලැබෙ යි. **අදක්ඛ** මීමැස්සා මඳ වේගයෙන් ගමන් කරන්නේ මල් රේණු වැටී ගිය කල්හි මැ එළඹෙන්නේ ය. අති දක්ෂත් නො වූ අදක්ෂත් නො වූ **සම දක්ඛ** මීමැසි වනාහි සම වේගයෙන් ගමන් කරන්නේ සුවසේ මල් ගොමුව කරා එළඹැ රිසියෙන තාක් මල් රේණු උකා ගෙන මීවද සාදු මධුරසය වළඳන්නේ ය.

පැන් තළියෙහි තුබූ මහතෙල් මල් පෙත්තෙහි ශිරාවෙධාදි ශස්ත්‍ර කර්ම උගත්තා ශල්‍ය වෛද්‍ය ශිෂ්‍යයන් අතුරෙන් ඉතා දක්ෂ තැනැත්තේ ශීඝ්‍ර වැ ශස්ත්‍රය හෙළා ලීමෙන් මහතෙල් පෙත්ත දෙකඩ කොටැ හෝ දලා ලන්නේ ය. දියෙහි හෝ ගලා ලන්නේ ය. අදක්ෂ තැනැත්තේ පෙත්ත කැපීයේ වේ දියෙහි ගැලී යේ වේ යන බියෙන් සැහින් සැහී කරන්නට ද අපොහොසත් වන්නේ ය. අති දක්ෂත් නො වූ අදක්ෂත්

නො වූ සම දක්ෂ ශිෂ්‍ය වනාහි සම ප්‍රයොගයෙන් පෙත්තෙහි සැත් පද දක්වා ශිල්ප පුහුණු කොටැ ගෙනැ එ බඳු ශාස්ත්‍ර කර්මයෙහි වැඩි කොටැ ලාභ ලබන්නේ ය.

"යමෙක් බඹ සතරක් සා මකුළු හුයක් ගොතාගේ නම් හේ සාරදහසක් කහවණු ලබන්නේ ය" යි රජු කී කල්හි අති දක්ෂ පුරුෂයෙක් වෙගයෙන් මකුළු හූ හයන්නේ ඒ ඒ තැන සිඳ ලන්නේ ය. අදක්ෂ පුරුෂ කැඩෙයි යන බියෙන් අතින් අල්ලන්නට ද අපොහොසත් වන්නේ ය. සම දක්ෂ පුරුෂ වනාහි කෙළවර පටන් ගෙනැ සම ප්‍රයොගයෙන් දණ්ඩයෙහා වෙළා ගෙනවුත් දී ලාභය ලබන්නේ ය.

අති දක්ෂ නියමුවා බලවත් වාතයෙහි රැවල පුරා පවත ගන්වන්නේ නැව තො දෙසට පමුණුවන්නේ ය. අදක්ෂ නියමුවා මන්දවාතයෙහි රැවල නහා නැව එ තැන ම තබන්නේ ය. සම දක්ෂ නියමු වනාහි මන්දවාතයෙහි රැවල පුරා බලවත් වාතයෙහි අඩ රැවල ඇද සුවසේ රිසි තැනට පැමිණෙන්නේ ය.

"යමෙක් තෙල් තො ඉහිරුවා බටය පිරෙව්වේ නම් හේ ලාභ ලබන්නේ ය" යි ආචාර්‍යයකු අතවැස්සනට කී කල්හි අති දක්ෂ තැනැත්තේ වේගයෙන් පුරවමින් තෙල ඉහිරුවන්නේ ය. අදක්ෂ තැනැත්තේ තෙල් ඉහිරෙයි යන බියෙන් වත්කරන්නට ද අපොහොසත් වන්නේ ය. සම දක්ෂ වනාහි සම ප්‍රයොගයෙන් තෙල් පුරවා ලාභ ලබන්නේ ය.

එ මෙන් ම ඇතැම් යොගාවචරයෙක් "ප්‍රතිභාග නිමිත්ත උපන් කල්හි වහා අර්පණාවට පැමිණෙන්නෙමි" යි වීර්‍යය දැඩි කරයි. ඔහුගේ සිත අත්‍යාරබ්ධ වීර්‍ය ඇති බැවින් උද්ධච්චයෙහි-තො සන්සුන් බවෙහි වැටීමෙන් අර්පණාව ලැබ ගන්නට අසමර්ථ වෙයි. ඇතැම් යොගාවචරයෙක් අත්‍යාරබ්ධ වීර්‍යයෙහි දොස් දැක "මට දැන් අර්පණායෙන් කවර ප්‍රයොජන ද යි වීර්‍යය පිරිහෙළ යි. ඉතා හැකුළුණු වීර්‍ය ඇති බැවින් එවිට ඔහු ගේ සිත කුසීත බැව්හි වැටෙයි. හේ ද අර්පණා ලබන්නට අසමර්ථ වේ. යමෙක් වනාහි මඳකු දු ලීන වූ සිත ලීන භාවයෙන් ද උද්ධත වූ සිත උද්ධත භාවයෙන් ද, මුදු සම ප්‍රයොගයෙන් නිමිත්තා-භිමුඛ කොටැ මෙහෙයා ද හේ අර්පණාවට පැමිණෙන්නේ ය එ බන්දකු විය යුතු.

"රෙණුමහි උපලදලෙ - සුතෙන නාවාය නාළියා
යථා මධුකරාදීනං - පවතති සමපවණ්ණිතා

ලීන උදධත භාවෙහි - මොචසිඤ්ඤාන සඞ්ඛසෝ
එවං නිමිත්තනාගිමුඛං - මානසං පවිපාදයෙ" යි

කියන ලද්දේ මේ අර්ථය සඳහා ය.

මෙසේ විරිය සම යෝජන වශයෙන් නිමිත්තාභිමුඛ කොටැ ඝිත යොදන ඒ යොගාවචරයාට "දැන් අප්පණා උපදිනි" යි භවඞ්ගුපච්ඡේද වැ ඉක්බිති "පඨවි පඨවි" යි භාවනානුයොග වශයෙන් එළඹ සිටි ඒ පඨවි **කසිණය** ම අරමුණු කොටැ මනොද්වාරාවජ්ජනය උපදනේ ය. ඉක්බිති ඒ පඨවි **කසිණය** ම අරමුණු කොටැ ජවන සතරෙක් හෝ පසෙක් දිවෙන්නේ ය. ඒ ජවන් අතුරෙන් කෙළවර ජවනය රූපාවචර ය. මුල් ජවන් තුන-හෝ සතර කාමාවචර ය. ඒ ජවන්හි විතක්ක-විචාර-පීති-සුඛ-එකග්ගතා යන චෙතසික ප්‍රකෘති කාමාවචර චිත්තයන්ගේ විතක්කාදීන්ට වඩා අතිශය බලවත් ය සි දත යුතු. යට දක්වූණු කාමාවචර ජවන් අප්පණාවට පරිකර්ම බැවින් **පරිකර්මය** සි ද, ග්‍රාම - නගරයන්ට ආසන්න ප්‍රදෙශය ගාමූපචාරය නගරූපචාරය සි කියන්නා සේ අප්පණාවට ආසන්න බැවින් හෝ සමීපයෙහි හැසිරෙන බැවින් උපචාරය සි ද, පූර්වයෙහි වූ පරිකර්මයන්ට හෝ මතු අප්පණාවට හෝ අනුලෝම් වන බැවින් **අනුලෝමය** සි ද, එහිම අන්තිම ජවනය පරිත්ත ගොත්‍රය මඩින බැවින් හා මහග්ගත ගොත්‍රය වඩින බැවින් **ගොත්‍රභූය** සි ද කියනු ලැබේ. (ජවන් උසෙක් දිවේ නම් පළමුවන දෙවන තුන්වන ජවන් එකක් එකක් පරිකර්ම - උපචාර - අනුලෝම නම්. සතර වන ජවනය ගොත්‍රභූ නම්. පස්වන ජවනය **අප්පණා'සි**. ජවන් සතරෙක් දිවේ නම් පළමු වන දෙවන ජවන් එකක් එකක් ම උපචාර - අනුලෝම නම්. තුන් වැන්න ගොත්‍රභූ ය. සතර වැන්න අප්පණා සි.) අවිශෙෂයෙන් සියල්ලට පරිකර්මාදි නම් ලැබුණු හෙයින් යට කී ක්‍රමය ගෘහීත ග්‍රහණ වශයෙනි. අගහීත ගහණ වශයෙන් ගනුත් හොත් පංචකනයයෙහි පළමුවන ජවනය පරිකර්ම නම්. දෙවැන්න උපචාර නම්. තෙවැන්න අනුලෝම නම්. සතර වැන්න ගොත්‍රභූ නම්. පස්වැන්න අප්පණා සි. චතුෂක නයයෙහි පළමුවැන්න උපචාර ය. (මෙහි පරිකර්ම නැත.) දෙවැන්න අනුලෝම ය. තෙවැන්න ගොත්‍රභූ ය. සතර වැන්න අප්පණා සි. අප්පණා වන්නේ සතර වන ජවනය හෝ පස්වන ජවනය මැ සි. එයින් සතර වැන්න

අජීණ වන්නේ ක්ෂිප්‍රාභිඥයන්ගේ වශයෙනි. පස්වැන්න අජීණ වන්නේ දන්ධාභිඥයන්ගේ වශයෙනි. එයින් ඔබ ජවන් පනතය වේ. භවාඞ්ගයට වාරය වෙයි. ("භවාඞ්ගාසන්න බැවින් මෑ පරික්ෂීණ ජවන හෙයින් හෙන්නක්හු මෙන් වෙයි සේ සි" යනු පැරකුම් ස්න්න සි.)

මතානන්තරයෙක්.

"පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං ආසෙවන පච්චයෙන පච්චයෝ"[1] 'පළමු පළමු කුශල ධර්මයෝ පසු පසු කුශල ධර්මයන්ට ආසෙවන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙති'සි **පට්ඨාන**යෙහි වදළ බැවින් ආසෙවන ප්‍රත්‍යය ලැබීමෙන් පසු පසු ධර්ම බලවත් වේ. එ බැවින් සවැන්නෙහි ද, සත්වැන්නෙහි ද අජීණ වන්නේ ය සි ආභිධර්මික **ගොදත්ත** ස්ථවිරයන්වහන්සේ කියනසේක. එය සූත්‍ර-සූත්‍රානුලෝම ආචාර්‍යවාදයන් හා නො සැසඳෙන බැවින් සවකීය මති මාත්‍රයෙකැ යි අට්ඨවාචාරීන් විසින් ප්‍රතික්ෂෙප කරන ලදී. අජීණ වන්නේ සතරවන පස්වන ජවන්හි ම ය. භවඞ්ගාසන්න බැවින් එයින් ඔබ්බෙහි ජවන් හුණුයේ නම් වෙයි යනු අට්ඨවා මත සි. මෙසේ විචාරණය කොට මෑ **ක්ෂූ** බැවින් අට්ඨවා මතය ප්‍රතික්ෂෙප කළ හැකි නො වේ

ඒ එසේ මෑ සි:- ඡින්නතටාභිමුඛ වැ දිවෙන පුරුෂයෙක් ඒ තට පර්‍යන්තයෙහි පය තබා සිට ගන්නට අසමර්ථ වැ තටයට ම වැටෙන්නා සේ භවාඞ්ගයට ආසන්න බැවින් සවැන්නෙහි හෝ සත්වැන්නෙහි නො වැ සතරවැන්නෙහි හෝ පස්වැන්නෙහි ම අජීණ වන්නේ ය සි දත යුතු. ඒ අජීණ වනාහි ඒක චිත්තක්ෂණික ම ය.

අඛාන පරිවෙජ්ද රහිත තැන් අජීණ පමණක් නො වේ. සපනසථානයෙක **කාලපරිවෙජ්ද** තැත. කවර සපනසථානයෙක ද 1 ප්‍රථම අජීණ, 2 ලෞකික අභිඥ, 3 සතර මාඟී, 4 මාඟීඵනන්තරඵල, 5 රූපාරූපභවයෙහි භවාඞ්ග සඞ්ඛ්‍යාත ධ්‍යාන, 6 නිරොධ-සමාපත්තියට හේතු වූ නෙවසඤ්ඤානාසඤ්ඤායතන, 7 නිරොධයෙන් නැගෙන්නහුගේ ඵල සමාපත්ති - යන සපන සථානයෙහි ය.

මෙහි සතර වැන්නට දැක්වුණු මාඟීඵනන්තර ඵල සිත් තුනකින් මතු නො වන්නේ ය. සවැන්නට දැක්වුණු නිරොධ සමාපත්තියට හෙතු වූ නෙවසඤ්ඤානාසඤ්ඤායතන සිත් දෙකෙකින්

[1]පඨා: ප: පඤ්ඨාන 110

මතු නො වන්නේ ය. පස්වැන්නට දැක්වුණු රූපා'රූප භවයෙහි භවාඞග සඞඛ්‍යාත ධ්‍යාන චිත්තයන්ගේ ප්‍රමාණයෙක් නැත. සෙසු සතර තන්හි ම ඇත්තේ එක චිත්තක්ෂණයෙකි. මෙසේ අතීණා ඒක චිත්තක්ෂණික බව දත යුතු

අතීණාවට අනතුරු වැ භවාඞග පාත වේ. ඉක්බිති භවාඞග සිදී ධ්‍යාන ප්‍රත්‍යවෙක්ෂා පිණිස මනොද්වාරාවජ්ජනය උපදී. ඉක්බිති ධ්‍යාන ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ ය. මෙතෙකින් ඒ යොගාවචරයා **"විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති"**[1] යි වදාළ පරිදි කාමයන්ගෙන් වෙන් වැ මැ අකුශල ධර්මයන්ගෙන් වෙන් වැ මැ විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් නොහොත් විවේකයෙහි උපන් ප්‍රීති-සුඛ ඇති ප්‍රථම ධ්‍යානය උපදවා වාසය කරන්නේ ය. මෙයින් ඒ යෝගී විසින් අඞග පඤ්චකයකින් විනිර්මුක්ත වූ අඞග පඤ්චකයකින් සමන්විත වූ ත්‍රිවිධ කල්‍යාණයෙන් හා දශ ලක්ෂණයෙන් යුක්ත **පඨවි කසිණ ප්‍රථම ධ්‍යානය** ලබන ලද්දේ ය යි කී නියා දත යුතු.

ප්‍රථම ධ්‍යාන විභාගය.

ප්‍රථම ධ්‍යාන සවභාවය ප්‍රකාශ කරා දක්වන **"විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි"** යනාදි දෙශනායෙහි **"විවිච්චෙව කාමෙහි"** යන්නෙහි අර්ථය 'කාමයෙන් වෙන් වැ-ප්‍රහාණ වශයෙන් කාමයෙන් ඉවත් වැ' යනු යි. මෙහි **"එව"** යන නිපාතය නියමාර්ථ යි. එය නියමාර්ථ බැවින් ප්‍රථම ධ්‍යානයට පැමිණ වසන සමයෙහි අවිද්‍යමාන වූ ද කාම එයට විරුඬ බව ද, කාම පරිත්‍යාගයෙන් ම එයට පැමිණෙන බව ද දක් වන්නේ යි. තවද පැහැදිලි කරන්නොත් අන්ධකාරය ඇති කල්හි පහන් ආලෝකය නො පවත්නා සේ යම් කාම කෙනෙකුන් ඇති කල්හි මේ ප්‍රථම ධ්‍යානය නො පවත්නේ ද, ඒ කාමයෝ මේ ප්‍රථම ධ්‍යානයට ප්‍රතිපක්ෂයෝ ය. මෙතෙර හැරපීමෙන් එතෙරට පැමිණීම සේ ඒ කාම පරිත්‍යාගයෙන් ම මේ ප්‍රථම ධ්‍යානයට පැමිණීම වන්නේ ය, යන නියමය මේ **"එව"** ශබ්දයෙන් භගවන්නේ ය යි දත යුතු.

මෙහිලා ප්‍රශ්නයෙහි:- එව ශබ්දය උත්තරපදයෙහි ද නො දක්වා කුමක් හෙයින් පූර්වපදයෙහි පමණක් දක්වන ලද්දේ ද, කිම? අකුශල ධර්මයන්ගෙන් නො වෙන් වැ ද ධ්‍යාන උපදවා විසිය හැකි ද

---

[1] වි: ප: ඤාතවිභඞග 185

එසේ නො සිතිය යුතු. කාම නිස්සරණ හෙයින් ම එය ප්‍රථම පදයෙහි යොදන ලදි. ධ්‍යාන වනාහි සියලු කාම නවයන්ගේ සමතික්‍රමණයට ප්‍රතිපත්ති බැවින් ද, කෙලෙස කාමයට ප්‍රතිපක්ෂ බැවින් ද, කාමයන්ගේ ම නිස්සරණය හි. **"කාමානමෙතං නිස්සරණං යදිදං නෙක්ඛම්මං"**[1] යි. බුදුරජාණන් වහන්සේ ද වදාළසේක. 'නෙක්ඛම්මය යන යමෙක් වේ ද එය කාමයන්ගේ නිස්සරණය යි' යනු එහි අර්ථ යි. මෙහි නෙක්ඛම්ම නම් ධ්‍යාන යි. (මෙයින් ව්‍යාපාදයට විරුද්ධ මෛත්‍රිය මෙන් ද, විහිංසාවට විරුද්ධ කරුණාව මෙන් ද ධ්‍යානයට කාමරාගය ඉදුරා විරුද්ධ ය යි කිතියා දත යුතු.)

තව ද **"ඉධෙව භික්ඛවෙ සමණෝ ඉධ දුතියෝ සමණෝ"**[2] යනාදි දෙශනා පාලියෙහි මෙන් මෙහි දු උත්තර පදයෙහින් "එව" ශබ්දය යොදා කිය යුතු. කාමයන්ගෙන් පමණක් නො වේ. අන්‍ය නීවරණ සංඛ්‍යාත අකුශලයන්ගෙන් ද නො වෙන් වැ ධ්‍යාන උපදවා වසන්නට නො හැක. එහෙයින් **"විවිච්චෙවට කාමෙහි විවිච්චෙව අකුසලෙහි ධම්මෙහි"** යි දෙපදයෙහි ම "එව" ශබ්දය යොදා ගත යුතුයි. එවිට කාමයන්ගෙන් වෙන්වැ ම අකුශල ධර්මයන්ගෙන් මෙන් වැ ම යන අර්ථය ලැබේ. (මහණෙනි, සෝවාන් මහණ ද මේ ශාසනයෙහි ම ය. දෙවන සකෘදාගාමි මහණ ද මේ ශාසනයෙහි ම ය යනු **"ඉධෙව භික්ඛවෙ සමණෝ"** යනාදි පාඨයෙහි අර්ථ යි.)

මේ දෙපදයෙහි දැක්වුණු **විවිච්ච** යන සාධාරණ වචනයෙන් තදඞ්ගවිවෙක-විෂ්කම්භනවිවෙක - සමුච්ඡේදවිවෙක - පටිප්පස්සද්ධි-විවෙක - නිස්සරණවිවෙක යන පඤ්චවිවෙක ද, චිත්තවිවෙක-කායවිවෙක-උපධිවිවෙක යන ත්‍රිවිධවිවෙක ද යන සියලු විවෙකයෝ සංග්‍රහ වෙති. එතකුදු වුවත් මේ ධ්‍යාන කථායෙහි කායවිවෙක-චිත්තවිවෙක - විෂ්කම්භනවිවෙක යන ත්‍රිවිධ විවෙක පමණක් ඇතුළත් වන බව දත යුතු යි.

කාමෙහි- යන මේ පදයෙන් **"කතමෙ වත්ථුකාමා මනාපියා රූපා"**[3] "චිත්තුකාම කවරේ ද මන වඩින රූප" යනාදීන් **නිර්දේශ පාලියෙහි** දැක්වුණු වත්තුකාම් ද

"ඡන්දෙ කාමෙ රාගෙ කාමෙ ඡන්දරාගෙ කාමෙ සඞ්කප්පෙ කාමෙ රාගෙ කාමෙ සඞ්කප්පරාගෙ කාමෙ ඉමෙ වුච්චන්ති කාමා"[4] යනාදීන් **නිර්දේශයෙහි** හා **විභඞ්ගයෙහි** දැක්වුණු **කෙලෙසකාම** ද යන සියල්ල සඞ්ග්‍රහ වන බව දත යුතු. "ඡන්දය කාමය, රාගය කාමය, ඡන්දරාගය කාමය, සඞ්කල්පය කාමය,

---

[1]සං: නි: මහාවගග 68, [2]ම: නි: මූලපණ්ණාසක 68,
[3]නි: පා: කාමසුත්ත 1, [4]වි: ප: ඤාණවි: 194

රාගය **කාමය**, සඞ්කල්ප රාගය **කාමය**. මොහු කාමයෝ යි කියනු ලැබෙත්, යනු පාළියෙහි අර්ථ යි. (ප්‍රාර්ථනාකාරයෙන් ප්‍රවෘත්ත වූ දුර්මල ලොභය ඡන්දනාර්ථයෙන් **ඡන්ද** නම් වූයේ කැමති වන අර්ථයෙන් **කාම** නම් වේ. සෙස්සෙහි ද මෙම නය යි. එයට වඩා බලවත් ලොභය රඤ්ජනාර්ථයෙන් **රාග** නම් වේ. එයට වඩා බලවත් බහල රාගය **ඡන්දරාග** නම් වේ. නිමිත්තානුව්‍යඤ්ජනයන්ගේ සඞ්කල්පයට හෙතු වූ ලොභය **සඞ්කල්පරාග** නම්. එයට වඩා බලවත් වූයේ රඤ්ජනාර්ථයෙන් **රාග** නම් වේ. සඞ්කල්ප වශයෙන් ප්‍රවෘත්ත වෙසෙසින් බලවත් වූ ලොභය **සඞ්කල්පරාග** නම් වේ යනු පැරකුම්බා සන්ත ය.)

මෙසේ ගත් කල්හි **"විවිචෙවව කාමෙහි"** යන්නෙන් "වසතුකාමයෙන් වෙන් වැ මැ" යන අර්ථය ලැබේ. එයින් කාය විවෙකය කියවේ. **"විවිචව අකුසලෙහි ධම්මෙහි"** යන්නෙන් "කෙලෙශ කාමයෙන් හා සියලු අකුශලයෙන් වෙන් වැ මැ" යන අර්ථය ලැබේ. එයින් චිත්ත විවෙකය කියවේ. පළමු දැක්වුණු වසතුකාම විවෙක වචනයෙන් කාම සුඛ හැර පීම ද, දෙවනු දැක්වුණු කෙලෙශ කාම විවෙක වචනයෙන් ධ්‍යාන සුඛ ලැබෑ ගැන්ම ද ප්‍රකාශ විණි.

මෙසේ වසතු කාම - කෙලෙශ කාම විවෙකය කියවෙන හෙයින් ම මේ දෙපද අතුරෙන් පළමු වැන්නෙන් තෘෂ්ණාදි සංකෙලෙශොතපත්තියට හෙතු වූ වසතු දුරු කිරීම ද, දෙවැන්නෙන් ඒ සංකෙලෙශ දුරු කිරීමද, එසේ ම පළමු වැන්නෙන් ලොල භාව හෙතු දුරු කිරීම ද, දෙවැන්නෙන් බාල භාව දුරු කිරීම ද, පළමු වැන්නෙන් කාම ගුණාධිගමයට හෙතු වූ ප්‍රාණඝාතාදිය අශුද්ධ ප්‍රයොග වන බැවින් එයින් වෙන් වීම් සංඛ්‍යාත ප්‍රයොග ශුද්ධිය ද, දෙවැන්නෙන් තෘෂ්ණා සංක්ලෙශ විශොධනයෙන් හා විවනෝපනිශ්‍රය ධ්‍යාන සංවර්ධනයෙන් වන ආශය පොෂණය ද, ප්‍රකාශ කරන ලද්දේ ය යි දත යුතු **"කාමෙහි"** යි වදාළ කාම අතුරෙන් වසතු කාම පක්ෂයෙහි ක්‍රමය මෙසේ ය.

ක්ලෙශකාම **පක්ෂයෙහි** ඡන්ද, රාග, **කාමාසව**, කාමරාග-සංයොජන, රූපතෘෂ්ණා යනාදි නොයෙක් හෙද ඇති කාමච්ඡන්දය කාමයයි කියන ලද්දේ ය. හෙ ද අකුසලයෙහි සංග්‍රහ වන නමුදු **"තත්‍ථ කතමෙ කාමා ඡන්දො කාමො"**[1] යනාදීන් විභඞ්ගයෙහි ධ්‍යානයට ප්‍රතිපක්ෂ වන බැවින් අකුශල සාමාන්‍යයෙන් නො ගෙතැ වෙන් කොටැ සවරූපයෙන් දක්වන ලදී. ක්ලෙශ කාම

[1] ඒ: ප: ඣානවිභඞ්ග 194

හෙයින් මූල පදයෙහි හෝ අකුශල පර්‍යාපන්න බැවින් දෙවෙනි පදයෙහි හෝ වදරන ලද්දේ ය යි ද කිය යුතු. ඒ කාමය නොයෙක් හෙද ඇති බැවින් "කාමසමා" යි එක වචනයෙන් නො දක්වා "කාමේහි" යි බහු වචනයෙන් දක්වූහ. දිට්ඨි-මානාදි වූ සෙසු අකුසල ඇත ද, විභඞ්ගයෙහි **"තත්‍ථ කතමෙ අකුසලා ධම්මා කාමච්ඡන්දෙ,"**[1] යනාදීන් නීවරණ ම අකුසල වශයෙන් දක්වන ලදී. ධ්‍යානාඞ්ගයන් තමන්ට විරුඬ වූවන්ට ප්‍රතිපක්ෂ බව දැක්වීම් වශයෙනි.

ඒ එසේ මෑ යි:- නීවරණයෝ ධ්‍යානාඞ්ගයන්ට ප්‍රතිපක්ෂයෝ ය. ධ්‍යානාඞ්ග විසින් නීවරණ වනසනු ලැබේ.

කියන ලද මෑ යි:- පෙටකයෙහි:- **"සමාධි කාමච්ඡන්දස්ස පටිපක්ඛො, පීති ව්‍යාපාදස්ස, විතක්කො ථීන-මිද්ධස්ස, සුඛං උද්ධච්ච-කුක්කුච්චස්ස, විචාරෙ විචිකිච්ඡාය"** යි 'සමාධි සංඛ්‍යාත එකග්ගතාව කාමච්ඡන්දයට ද, ප්‍රීතිය ව්‍යාපාදයට ද, විතර්කය ථීන - මිද්ධයට ද, සුඛය උද්ධච්ච - කුක්කුච්චයට ද, විචාරය විචිකිච්ඡාවට ද විරුද්ධ ය, යනු එහි අර්ථ යි.

මෙසේ මේ **"විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි"**[3] යන දෙ පද අතුරෙන් **"විවිච්චෙව කාමෙහි"** යන පදයෙන් කාමච්ඡන්දයාගේ විෂ්කම්භන විවේකය ද, **"විවිච්ච අකුසලෙහි ධම්මෙහි"** යන පදයෙන් පඤ්චනීවරණයන්ගේ ම විෂ්කම්භන විවේකය ද කියවිණි.

තව ද අගතිත ගහණ වශයෙන් ගතහොත් (අගතිත ගහණ නම් මූල පෙදෙන් නොගත් දේ පසු පෙදෙන් ගැන්මයි.) පළමු වන **"විවිච්චෙව කාමෙහි"** යන පදයෙන් කාමච්ඡන්ද නීවරණයාගේ ද, දෙවන **"විවිච්ච අකුසලෙහි ධම්මෙහි"** යන පදයෙන් කාමච්ඡන්දය හැර ව්‍යාපාදාදි සෙසු සතර නීවරණයන්ගේ ද, විෂ්කම්භන විවේකය කියන ලද්දේ ය. එසේම පළමු පෙදෙන් ත්‍රිවිධ අකුශල මූල අතුරෙහි පඤ්චකාම ගුණ හෙද විෂයක ලෝභයාගේ ද, දෙවන පෙදෙන් ආඝාත වස්තු හෙදාදි විෂයක ඉදිරි මොහයන්ගේ ද, එසේ ම ඔඝ අතුරෙහි පළමු පෙදෙන් කාමොඝයාගේ ද, දෙවන පෙදෙන් භවාදි සෙසු ත්‍රිවිධ ඔඝයන්ගේ ද, යොග අතුරෙහි පළමු පෙදෙන් කාම යොගයාගේ ද, දෙවන පෙදෙන් භවාදි සෙසු ත්‍රිවිධ යොගයන්ගේ ද, ආසව අතුරෙහි පළමු පෙදෙන් කාමාසවයාගේ ද, දෙවන පෙදෙන් භවාදි සෙසු ත්‍රිවිධ ආසවයන්ගේ ද, උපාදාන අතුරෙහි පළමු පෙදෙන් කාමුපාදානයාගේ ද, දෙවන

[1], [3] වි: ප: ඣානවිභඞ්ග 194

පෙදෙන් දිට්ඨාදි සෙසු ත්‍රිවිධ උපාදානයන් ගේ ද, **කායගන්ථ** අතුරෙහි පළමු පෙදෙන් අභිජ්ඣා කාය ග්‍රන්ථයාගේ ද, දෙවන පෙදෙන් ව්‍යාපාදාදි සෙසු ත්‍රිවිධ **කාය** ග්‍රන්ථයන්ගේ ද, සංයෝජන අතුරෙන් පළමු පෙදෙන් කාම රාග සංයෝජනයාගේ ද, දෙවන පෙදෙන් සෙසු රූපරාගාදි **තවවිධ** සංයෝජනයන්ගේ ද, භව මූල අතුරෙහි පළමු පෙදෙන් තෘෂ්ණාවගේ හා තත් සම්ප්‍රයුක්තයන්ගේ ද, දෙවන පෙදෙන් අවිද්‍යාවගේ හා තත් සම්ප්‍රයුක්තයන්ගේ ද, අකුසලයන් අතුරෙහි පළමු පෙදෙන් ලෝභ සම්ප්‍රයුක්ත අෂ්ටවිධ අකුසල චිත්තයන්ගේ ද, දෙවන පෙදෙන් දෝෂ – මෝහ සම්ප්‍රයුක්ත සෙසු චතුර්විධ අකුසල චිත්තයන්ගේ ද විෂකම්භන විවේකය කියන ලදැ යි දත යුතු යි.

"විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි"
යන මේ පදයන්ගේ අර්ථ ප්‍රකාශය යි.

මෙතෙකින් ප්‍රථම ධ්‍යානය පිළිබඳ ප්‍රහාණාඞග දක්වා ඉක්බිති සම්ප්‍රයොගාඞග දක්වන්නට **"සවිතක්කං සවිචාරං"** යනාදිය වදාළේ ය. 'විතර්ක සහිත වූ විචාර සහිත වූ' යනු එහි අර්ථ යි.

විතර්ක-විචාර විභාගය

විතර්ක නම් විතර්කනය-ඌහනය සිත අරමුණට එළවීම ය. එහි ලක්ෂණය සිත අරමුණට නැංවීම ය. රසය ආහනන පරියාහනනය හෙවත් සිත අරමුණෙහි පැහැරීම වෙසෙසින් පැහැරීම ය.

ඒ එසේ මැයි:- විතර්කය **කරණ** කොටැ යොගාවචරයා සිත **විතක්කාහත** - විතර්ක පරියාහත **කරන්නේ** ය යි කියනු ලැබේ. පච්චුපට්ඨානය අරමුණට සිත පැමිණීම ය. (විතර්කය නැති දෙපස් විඤ්ඤාණයෝ වසනු – ආලම්බනයන්ගේ සංඝට්ටන බලයෙන් ද, විතර්කධ්‍යානාදීහු යට යට භාවනා බලයෙන් ද අරමුණට නැඟෙති යි දත යුතු.)

විචාර නම් විචරණය හෙවත් විතර්කයට ඉක්බිති වැ අරමුණෙහි හැසිරීම යි. එහි ලක්ෂණය අරමුණ පිරිමදිනා බව ය. රසය සහජාත ධර්මයන් අරමුණෙහි අනුවිචරණ වශයෙන් යොදන බව යි. පච්චුපට්ඨානය අරමුණෙහි සිත නොසිඳීමක් මෙන් පවත්නා බව යි.

විතර්කය හා විචාරය ඇතැම් සිතෙක (සවිතක්ක – සවිචාර සිත්හි) නොවෙන් වැ එකවට ම යෙදෙන්නේ නමුදු විතර්කය

විචාරයට වඩා ඕදාරික බැවින් ද, සවකීය බලයෙන් සිත අරමුණට නැහෙන හෙයින් විචාරයට පූර්ඛගම බැවින් ද, ඝණ්ටාවට ගැසීමේ දී ආදි කොටැ නැහෙන රාවය මෙන් චිත්තයාගේ ප්‍රථමානිනිපාතය යි. විචාරය වනාහි සූක්ෂම භාවයෙන් හා අනුසඤ්චරණ භාවයෙන් ඝණ්ටාවගේ අනුරාවය මෙන් චිත්තයාගේ අනුප්‍රබන්ධය යි.

තවද චලනවත් විතකීය සිත උපදනා කල්හි ඒ සිතෙහි පළමු කොටැ මැ වන පොපියුමක් (සෙලවුමක්) බඳු ය. අහසට නැහෙනු කැමැති පක්ෂියාගේ පියාපත් ගැසීම මෙනැයි ද, සුවඳ අසා යන භ්‍රමරයාගේ පද්මානිමුඛපාතය මෙනැ යි ද සලකනු. ඝානන පැවතුම් ඇති විචාර වනාහි චිත්තයාගේ අතිශයයෙන් ම පොපියුම් (සෙලවුම්) නැති බව ය. අහසෙහි ගමන් ගත් පක්ෂියාගේ පියාපත් විදහීම මෙනැයි ද, පද්මානිමුඛයෙහි පතිත භ්‍රමරයාගේ ඒ පද්ම මතුයෙහි පරිභ්‍රමණය මෙනැ යි ද දත යුතු.

දුඛ නිපාත අටුවායෙහි මෙය මෙසේ දක්වති. අහසෙහි ගමන් ගත් ගිජුලිහිණි දෙපියා සහලින් සුළං අවුරා පියාපත් සංඝිදුවා ගෙන යන්නා සේ ආරම්මණයෙහි සිත අනිනිරොපන භාවයෙන් පැවැත්ම විතකීය යි. ඒ වනාහි එකඟ වැ පමුණු වන්නේ ය. ඒ ලිහිණි සුළං ගන්නා පිණිස පියාපත් පහරමින් යන්නා සේ අරමුණු පිරිමදිනා සවභාවයෙන් පැවැත්ම විචාරය යි. ඒ වනාහි අරමුණ පිරිමදින්නේ ය යනු යි. (කුඩා ලිහිණියාගේ පියා පෙළීම බඳුය යි පොපි ඇති හෙයින් විතර්ක ඕදාරික බව කීහු. මහ ලිහිණියාගේ පියා සන්සිදුවා යන ගමන බැවිනැ යි වෙග ඇති බැවින් විතකීය ඕදාරික සේ කීහු. කුඩා ලිහිණියාගේ පියා පැහැරීම බඳුය යි මඳ වෙග ඇති සෙයින් විචාරය ශානන සේ මැ කීහ. මහ ලිහිණියාගේ පියා පොළමින් යන ගමන මෙනැ යි මඳ පොපි ඇති සෙයින් විචාරයාගේ ශානන සේ මැ කීහු'' යනු පැරකුම්බා සන්න යි.)

ගිජුලිහිණි උපමාව උපචාරයෙහි වත් අර්ථයෙහි වත් සනතාන වශයෙන් පවත්නා කල්හි යෙදෙන්නේ ය. මේ විතර්ක - විචාරයන්ගේ වෙනස ප්‍රථම - දවිතීය ධ්‍යානයෙහි ප්‍රකට ය. විතකීයාගේ අනිනිරොපනාකාර සඞ්ඛ්‍යාත විශෙෂය ප්‍රථම ධ්‍යානයෙහි ප්‍රකට වෙයි. විතකීයාගේ අභාවයෙන් පඤ්චකකයෙහි දවිතීය ධ්‍යානයෙහි විචාරයාගේ අනුමජ්ජනාකාර විශෙෂය ප්‍රකට වේ.)

තවද මල බැඳුණු ලොහො වළඳ එක් අතකින් තරයේ හෙනැ අනික් අතින් සුණු තෙලින් යුත් ලොම්සුඹුළුයෙන්

(බුරුසුවෙන්) පිරිමදනාකල තරයේ ගත් අතු බඳු ය විතර්ක ය. පිරිමදනා අත බඳු ය විචාරය. එසේ මැ කුම්භකාරයා දණ්ඩපහරින් සක බමවා වළං කරන කල මැටි පිඬ පෙළා ගත් අත බඳු ය විතර්ය. ඔබ මොබ හසුරුවන අත බඳුය විචාරය. එසේ මැ ලොහො බඳුන් ආදියෙහි වට රෙඛා කරන්නහු මැද ඔබා ගෙනැ සිටින කටුව බඳු ය අභිනිරොපන ලක්ෂණ විතර්කය. පිටත්හි කව ගහන කටුව බඳුය අනුමජ්ජන ලක්ෂණ විචාරය. මෙසේ මෙබඳු විතර්කයෙන් හා විචරණයෙන් යුත් ධ්‍යානය පුෂ්පයෙන් හා ඵලයෙන් සැදුණු වෘක්ෂය මෙන් සවිතක්ක - සවිචාරය යි කියනු ලැබේ. ("යම් සේ පුෂ්ප ශාඛාදි අවයවයෙන් විනිර්මුක්ත වැ අවිද්‍යමාන ද වූ වෘක්ෂය සපුෂ්පඵල ය යි කියනු ලැබේ ද, මේසේ මැ විතර්කාදි අඩග විනිර්මුක්ත වැ අවිද්‍යමාන ද වූ ධ්‍යානය සවිතර්ක සවිචාරය යි ව්‍යවහාර කරනු ලැබෙයි භගවත පිණිස "වෘක්ෂය මෙන්" යනාදිය කථිතය යි දත යුතු." යනු පැරකුම් සන්න යි.)

විභඞ්ගයෙහි දී **"ඉමිනා ච විතක්කෙකන ඉමිනා ච විචාරෙන උපපෙතො හොති සමුපෙතො"**[1] 'මේ විතර්කයෙන් ද මේ විචාරයෙන් ද උපෙත වූයේ වේ, සමුපෙත වූයේ වේ' යනාදීන් ප්‍රඥාලාඩිඤ්ඤාන වශයෙන් මෙය දෙශනා කරන ලද්දේ ය. එහි දු අර්ථය මේ බඳු ම යැ යි දත යුතු.

"විවෙක ජං = විවෙකයෙන් නිපන් නොහොත් විවෙකයෙහි නිපන්" මෙහි විවෙක නම් නීවරණ පහවීම ය. එයින් (-ඒ නීවරණ පහවීමෙන්) නිපන්නේ විවෙකජ ය. නොහොත් විවෙක නම් නීවරණයන්ගෙන් පහවූයේ යැ - **එනම්** ධ්‍යාන - සම්ප්‍රයුක්ත ධර්මරාශිය යි. එහි (-නීවරණයන්ගෙන් පහවූ ධර්මරාශි සඞ්ඛ්‍යාත විවෙකයෙහි) නිපන්නේ හෝ විවෙකජ ය.

"ප්‍රීති සුඛං=ප්‍රීති හා සැප ඇති."

මෙහි කාය - විත්ත පිණවන්නේ ප්‍රීති ය. (පිණයතීති පීති.) එහි ලක්ෂණය අරමුණ ප්‍රිය වශයෙන් දක්නා බව ය. රසය විත්ත කාය පිණවන බව ය. නොහොත් පැතිරෙන බව ය. ("උපන් තැනින් කෙසගක් පමණ තැන් සඞ්ක්‍රමණයෙක් තැද්ද ආත්මජ රූප කිරීමෙන් තෙමේ ද පැතිරෙනු නම් වී" යනු පැරකුම් සන්න යි.) පච්චුපට්ඨානය ඔද වඩනා බව ය.

ප්‍රීති විභාගය

ඒ මේ ප්‍රීති වනාහි ඛුද්දික පීති, ඛණික පීති, ඔක්කන්තික පීති, උබ්බේග පීති, ඵරණ පීතිය යි පඤ්චවිධ වේ.

---

[1] වී: ප: ඤානවිභඞ්ග 194

මෙයින් බුදදික පීතිය:- ශරීරයෙහි ලොමුදහ ගැන්වීම් මාත්‍රයක් කරන්නට සමර්ථ ය. (බුදදිකා පීති නම් කුඩා ප්‍රීතිය ය.)

ඛණිකා ප්‍රීතිය:- ඛණ ඛණයෙහි විදුලි කෙටීමක් සේ ඛුද්‍ර ප්‍රීතියට වඩා බලවත් ව උපදී.

ඔකකනතිකා පීතිය:- මුහුදු වෙරළ පැතිරෙන මුහුදු රළ සෙයින් ශරීරය පිණවමින් පැතිරී බිඳෙයි. (මෙය ඔකදකෙළි කෙළවන ඛණිකා ප්‍රීතියට වඩා බලවත් එකෙකි.)

උබෙබගපීතිය:- එයටත් වඩා බලවත් ය. කය උඩ ගෙන ගොස් අහසෙහි නඟාපියන පමණට පමුණුවයි.

ඒ එසේ ම ය:- **පුණණගල්ල** (පණගල) නම් විහාරවාසී **මහානිඝ්ඝ** තෙරුන් වහන්සේ පසළොස්වක පොහෝදා සවස එහි චෛත්‍ය මළුවට පැමිණ සඳ එලිය දැක **රුවන් වැලි සෑ** දිශාවට හැරී "එකානනයෙන් මේ වේලායෙහි සිව් පිරිස මහ සෑය වඳිති" සි පෙර මහා සෑයෙහි පූජා දුටු විරූ හෙයින් බුද්ධාරම්මණ උබෙබග පීති උපදවා සුණුබිම ගැසූ චිසිතුරු පත්දුවක් සේ අහසට නැගී මහ සෑ මළුයෙහි පිහිටිසේක.

එසේ ම **ගිරිහණ්ඩුමහවෙහෙරට** සමීප **වනකඝාල** නම් ගම්වැසි **එක්** කුලදුහිතාවක් බලවත් වූ බුද්ධාලම්බන උබෙබග පීතියෙන් අහස නැංගා ය. ඒ මෙසේ ය.

කුලදුවකගේ උදෙවග ප්‍රීතිය.

ඇයගේ මව්පියෝ **එක්** දවසෙක සවස බණ අසනු සඳහා විහාරයට යන්නට සැරසී "දුවණියනි! ඔබ ගර්හිණීය. අවේලායෙහි ඇවිදීම නුසුදුසු ය. අපි ඔබ ද සිනිපත් කොටැ බණ අසමිහ" සි කියා නැගී ගියාහ. ඕ තොමෝත් යායැටි වූව ද මව්පියන්ගේ වචනය ඉක්මවන්නට අසමර්ථ වැ ගෙදොර රඳා මිදුලේ සිටැ සඳ පහනින් **ගිරිහණ්ඩුයෙහි** ආකාශ චෛත්‍ය මළුව බලන්නී එහි පහන් පූජාව දුටුවා ය. සිව් පිරිස සුවඳ මලින් සෑය පුදා පැදකුණු කරති. හික්ඛුසංඝයාගේ ගණසජ්ඣායනා ශබ්දය ද ඇසේ. "විහාරයට ගොස් මෙබඳු සෑ මළුවෙක ඇවිදින්නට මේ බඳු මධුර ධම්මකථා අසන්නට ලැබුවෝ අහෝ **එකානනයෙන්** මහා පිනැත්තෝ ය" සි මුතු රැසක් බඳු චෛත්‍යය බලත් ම ඇයට උබෙබග පීතිය උපන. ඕ අහස නැගී මව්පියන්ට පෙරැතුවම ආකාශ චෛත්‍යාඩ්ඝණයෙහි බැස සෑය වැදැ බණ අසමින් සිටියා ය. මව්පියෝ අවුත් විස්මිත වැ "දරුව උඩ කවර මඟකින් අවුදැ" සි විචාළහ. "මම අහසින් ආමි. මඟකින් නො ආමි" සි

ඕ කීවා ය. "දරුව අහසින් යන්නෝ රහතන්වහන්සේ ය. උඹ කෙසේ අවුදැ" යි නැවත කීකල "සඳපහනින් වෛත්‍යය දිහාව බලාගෙනැ සිටි මට බලවත් වූ බුද්ධාරම්මණ ප්‍රීතියක් පහළ විය. එයින් මම මා උන් සිටි බව නො දන්නෙමි. ගත් අරමුණින් ම අහස නැඟැ සෑ මළුයෙහි පිහිටියෙමි" යි ඕ කීවා ය. මෙසේ උඛෙඛග පීතිය අහස තඟා පියන තරම් යැ.

එරණ ප්‍රීතිය:- උපන් කල සකල ශරීරය පිඹ පිරූ විතක් මෙන් ද, මහා ජල ප්‍රවාහයකින් පිරුණු පළිත කුඩියක් මෙන් ද, හාත්පසින් සපශී කරන ලද්දේ වේ.

මේ පංචවිධ ප්‍රීති ගැබ් ගැනීමෙන් - මිහිකිරීමෙන් කාය පස්සද්ධි - චිත්තපස්සද්ධි යන විවිධ පස්සද්ධි පුරන්නේ ය. පස්සද්ධි ගැබ් ගැනීමෙන් - මිහිකිරීමෙන් කායික වෛතසික විවිධ සුඛ පුරන්නේ ය. ඒ සුඛ ගැබ් ගැනීමෙන් - මිහිකිරීමෙන් **ඛණිකසමාධි, උපචාරසමාධි, අප්පණාසමාධි,** යන ත්‍රිවිධ සමාධි ද පුරන්නේ ය. ඒ ත්‍රිවිධසමාධි අතුරෙන් අප්පණාසමාධියට මුල් වැ වැඩෙන සමාධි සම්ප්‍රයුක්ත යම් එරණ ප්‍රීතියෙක් වේ ද එය **"ප්‍රීති - සුඛං"** යන මෙහි ලා ප්‍රීතිය යි අදහස් කරන ලදී.

'සුඛං' සුඛ නම් සුවය. **"සුටඨු වා ඛාදති ඛණති ච කායචිත්තා ඛාධනති සුඛං"** යනු එහි විග්‍රහ ය. "යම් ධර්මයෙක් කාය චිත්තා-බාධ මනා වැ කා දමන්නේ ද සාරුදමන්නේ ද එය සුඛ නම් වේ" යනු එහි අර්ථ යි. එහි **ලක්ෂණය** සාත බව ය - හෙවත් ශීතල මධුර සභාව ය. රසය සම්ප්‍රයුක්ත ධර්මයන් වඩනා බව ය. පච්චුපට්ඨානය සම්ප්‍රයුක්ත ධර්මයන්ට අනුග්‍රහ කරන බව යි.

මේ ප්‍රීති හා සුඛ ප්‍රථමධ්‍යානාදි කිසියම් සිතෙක නො වෙන්ව එකවට යෙදෙන්නේ තමුදු ඉෂ්ටාලම්බන ප්‍රතිලාභ වශයෙන් උපදනා තුෂ්ටිය ප්‍රීති නම්. ලත් ආලම්බන රසානුභවය සුඛ නම්. ප්‍රීති ඇති තැනැ සුඛය ද ඇත්තේ ය. එහෙත් සුඛ ඇති තැනැ නියමයෙන් ප්‍රීති ඇතැ යි නො කිය යුතු. ප්‍රීතිය සංඛාර ස්කන්ධයට ඇතුළත් ධර්මයෙක. සුඛය වෙදනා ස්කන්ධයට ඇතුළත් ධර්මයෙක. ප්‍රීතිය වනාහි කාන්තාර ගමනින් විඩාවට පත් පුරුෂයකුගට වනය හෝ ජලය දැකීමෙහි දී ද ඇසීමෙහි දී ද ඇති වන සභාවය බඳු ය. සුඛය ඒ වන සෙවනට පැමිණීමෙහි දී හා ජලය පරිභොග කිරීමෙහි දී ඇති වන සභාවය බඳු ය. ඒ ඒ අවස්ථාවෙහි ප්‍රකට වැවින් මෙසේ දැක්වය යුතු.

මේ ප්‍රීතිය ද මේ සුඛය ද යම් ධ්‍යානයකට හෝ යම් ධ්‍යානයෙක ඇත්නම් ඒ ධ්‍යානය "පීති-සුඛ" ය සි කියනු ලැබේ නොඑහෙත් ධර්මය ද චිතය ද ධර්මචිතය වූ සේ ප්‍රීතියත් සුඛයත් ප්‍රීතිසුඛය. විවෙකයෙන් ජනිත ප්‍රීති - සුඛ යම් ධ්‍යානයකට හෝ යම් ධ්‍යානයෙක හෝ ඇත්නම් ඒ ධ්‍යානය විභක්තාලෝප වශයෙන් "විවෙකජ - පීතිසුඛ" වේ. මෙසේ ගත් කල්හි ධ්‍යානය සේ ම ප්‍රීති-සුඛ ත් විවේකයෙන් ජනිත වූයේ වේ. ආදියෙහි 'විවෙකජං පීතිසුඛං'යි දෙපදයක් කොටැ ගත් සේ ම මේ අර්ථයෙන් "විවෙකජං-පීතිසුඛං"ය සි එක පදයක් වශයෙන් ගත ද වරද නො වේ. විභඞ්ගයෙහි දී වනාහි **"ඉදං සුඛං ඉමාය පීතියා සහගතං"**[1] 'මේ සුඛය මේ ප්‍රීතියෙන් යුක්ත ය' යනාදි ක්‍රමයෙන් වදාළේ ය. එහි දු අර්ථය මෙයේ මැ දත යුතු සි.

පඨමං ඣානං = ප්‍රථම වූ ධ්‍යානය. මෙය මතු ප්‍රකාශ වේ.

උපසම්පජ්ජ = ළබ්ධ්වා - පැමිණ. තව ද උපසම්පදාදියන්හට ලබා ගෙනැ - නිපදවා ගෙනැ යන අර්ථය ද කිය හැකි ය. විභඞ්ග යෙහි **"උපසම්පජ්ජා'ති පඨමස්ස ඣානස්ස ලාභො පටිලාභො පත්ති සම්පත්ති පස්සනා සච්ඡිකිරියා උපසම්පදා"**[2] සි වදරන ලදි. උපසම්පජ්ජ යනු ප්‍රථම ධ්‍යානය ලැබීම - මතා වැ ලැබීම - පැමිණීම - මනා වැ පැමිණීම නුවණින් දැක්ම - සාක්ෂාත් කිරීම - උපදවීම යනු එහි අර්ථ සි.

විහරති = වාසය කර සි - ධ්‍යානයට සුදුසු ඉරියව්වෙන් යට දැක්වූ පරිදි ධ්‍යානයෙන් යුක්ත වැ ආත්මභාවයාගේ පැවැත්ම කෙරෙ සි කී නියා ය. **"විහරතී'ති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති චරති විහරති තෙන වුච්චති විහරති."**[2] යනු විභඞ්ග සි.

"පඤ්චාඞ්ග ප්‍රහීණ පඤ්චාඞ්ග සමන්නාගත වූ" සි කියූ තන්හි ප්‍රහීණ වන පඤ්චාඞ්ග නම් කාමච්ඡන්ද, ව්‍යාපාද, ථින-මිද්ධ, උද්ධච්ච-කුක්කුච්ච, විචිකිච්ඡා යන මොහු ය. මොවුන් ප්‍රහීණ නො වූව හොත් ධ්‍යානයෙක් නම් කැල ම නූපදනේ ය. එ බැවින් මේ පස ධ්‍යාන පිළිබඳ ප්‍රහීණාඞ්ගය සි කියනු ලැබේ. ධ්‍යාන ක්ෂණයෙහි ප්‍රහීණ වන්නේ මේ පස පමණෙක් ද නැත. අන්‍ය වූ ද අකුශල ධර්මයෝ ප්‍රහීණ වෙති. එතකු දු වුව ද මේ පස විශෙෂයෙන් ම ධ්‍යානයට අනන්තරායකර ය.

---

[1] වි: ප: ඣානවි: 194 [2] වි: ප: ඣාන වි: 193

ඒ එසේ මැ යි:- කාමච්ඡන්දයෙන් නොයෙක් අරමුණෙහි පෙළඹී ගිය සිත එකාග්‍රතාරම්මණයෙහි සමාහිත නොවේ. එසේ ම කාමච්ඡන්දාභිභූත සිත කාමධාතු ප්‍රහාණ ප්‍රතිපත්තිය පිණිස ද නොපවත්නේ ය. ව්‍යාපාදයෙන් අරමුණෙහි ගැටෙන සිත නිරන්තරාවැ නොපවත්නේ ය. ථීනමිද්ධයෙන් අභිභූත වූ සිත කර්මණ්‍ය නොවන්නේ ය. 'භාවනා කර්මයට යෝග්‍ය නොවේ, ය යි සේ යි. උද්ධච්චකුක්කුච්චයෙන් පීඩිත වූ සිත නොසන්හුන් බැවින් ම අරමුණෙහි භ්‍රමණය කරන්නේ ය. විචිකිච්ඡායෙන් උපහත වූ සිත ධ්‍යානාධිගම සාධක ප්‍රතිපත්තියට නොනැමෙන්නේ ය. මෙසේ විශෙෂයෙන් ධ්‍යානානන්තරායකර බැවින් මේ පඤ්ච නීවරණයෝ ප්‍රහාණාඞ්ගයෝ ය යි කියන ලදුදු.

සමන්නාගත අඞ්ග.

විතර්කය සිත අරමුණට නඟන්නේ ය. විචාරය සිත අරමුණෙහි බඳින්නේ ය. මේ විතර්ක-විචාර යොගයෙන් සිතෙහි අව්ක්ෂෙප භාවය-තැන්පත් බව සිඳ වේ. අව්ක්ෂෙප සම්පත් ලැබීමෙන් ප්‍රීතිය සිත පිණවයි. සුඛය සිත සුවපත් කෙරේ. මෙසේ මේ විතර්ක - විචාර - ප්‍රීති - සුඛයන්ගෙන් අනුග්‍රහය ලත් එකග්ගතාව ඵස්සාදි සෙසු චෙතසික සහිත සිත එකතනා රම්මණයෙහි සම වැ මනා කොටැ පිහිටුවන්නේ ය. එ බැවින් මේ විතර්ක - විචාර - ප්‍රීති - සුඛ - එකග්ගතා යන පඤ්ච ධර්ම උපදීම් වශයෙන් පඤ්චාඞ්ග සමන්නාගතත්වය දත යුතු. මේ පස උපන් කල්හි ධ්‍යානය උපන්නේ නම් වේ. එ හෙයින් මේ පස සමන්නාගත අඞ්ගයයි කියනු ලැබේ මේ පසින් යුක්ත වූ ධ්‍යාන නම් අතෙකෙක් ඇතැ යි නොසිතිය යුතු. 'චතුරඞ්ගිනී සෙනා, පඤ්චාඞ්ගික තූර්‍ය්‍ය, 'අට්ඨාඞ්ගික මාර්ග්‍ය, යි කී කල්හි 'අඞ්ගයෙන් විනිර්මුක්ත සෙනාවෙක් හෝ තූර්‍ය්‍යයෙක් හෝ මාර්ගයෙක් හෝ නැත්තේ ය. අඞ්ග මාත්‍ර වශයෙන් ම එසේ කියන්නේ ය. මේ ද එ බඳුය යි දත යුතු.

මේ පඤ්චාඞ්ගයෝ උපචාර ක්ෂණයෙහි දු වෙති. එසේ වුව ද ඔවුහු එහි දී (උපචාරයෙහි දී) ප්‍රකෘති කාමාවචර චිත්තයෙහිදීට වඩා අතිශයයෙන් බලවත් ය. මෙහි දී වනාහි උපචාර යෙහි දී ට ත් වඩා අතිශයයෙන් බලවත් වැ රූපාවචර ලක්ෂණ-යට පැමිණෙති.

ඒ එසේ මැ යි:- මෙහි විතර්කය අනිවිෂද වශයෙන් ම සිත අරමුණට නඟමින් උපදින්නේ ය. විචාරය අතිශයයෙන් ම අරමුණ පිරිමදිමින් උපදින්නේ ය. ප්‍රීති හා සුඛ මුළු ශරීරය පතුරමින් උපදින්නේ ය. **"නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීති සුඛෙන අප්ඵුටං හොති"**[1] යි එ හෙයින්

[1] දී: නි: සීලක්ඛන්ධවග්ග 57

වදාළසේක. "ඔහුගේ ශරීරයෙහි විවේකජ ප්‍රීති සුඛයෙන් තෙත පහරන ලද කිසි තැනෙක් නැත" යනු එහි අර්ථ යි. එකග්ගතාව ද කරඬුවෙක උඩු පියන් පත යට පතෙහි මෙන් අරමුණෙහි සුඵසිත වැ උපදින්නේ ය. මේ කියේ මෙහි විතර්කාදිය පිළිබඳ අන්‍යසථානයන්ට වඩා ඇති විශෙෂය යි.

"සවිතක්කං සවිචාරං විවෙකජං පීති සුඛං පඨමං ඣානං"[1] යන පාඨයෙහි එකග්ගතාව සවරූප වශයෙන් අඞ්ගයක් කොටැ නො වදාරන ලදුව ත් **"ඣානං නි විතක්කො විචාරෙ පීති සුඛං චිත්තෙකග්ගතා"**[2] යි විභඞ්ගයෙහි වදාළ බැවින් අඞ්ගයෙක් ම ය. යම් අදහසකින් බුදුරජාණන් වහන්සේ උදෙසා කරන ලද්දේ ද ඒ අදහස ම විභඞ්ගයෙහි ප්‍රකාශ කරන ලද්දේ ය. ("සවිතක්කං සවිචාරං" යනාදි උදෙසයෙහි අභිප්‍රාය මැ "විතක්කො විචාරෙ" යනාදියෙන් ප්‍රකාශ කරන ලද. එසේ බැවින් උදෙසයෙහි නැතැ යි නො සැලකිය යුතු ය. විතක්ක-විචාර ඇත්තේ පීති-සුඛ ඇත්තේ යනුයෙහි මැ අභිප්‍රාය විසින් සමාධිය මැ කී වෙති" යි සැලකිය යුතු ය යනු සත්න යි.)

"ත්‍රිවිධ කල්‍යාණයෙන් හා දශ ලක්ෂණයෙන් සමන්විත වූ" යන මෙහි ආදි - මධ්‍ය - අවසාන වශයෙන් ත්‍රිවිධ කල්‍යාණ ද, ඒ ආදි-මධ්‍ය-අවසානයන්ගේ ම ලක්ෂණ වශයෙන් දශ ලක්ෂණ ද දතයුතු.

ඒ පිළිබඳ දෙශනා පාළිය මෙසේ ය.

"පඨමස්ස ඣානස්ස පරිපදාවිසුද්ධි ආදි, උපෙක්ඛානුබ්‍රූහණා මජ්ඣෙ, සම්පහංසනා පරියොසානං."

පඨමස්ස ඣානස්ස පරිපදා විසුද්ධි ආදි. ආදිස්ස කති ලක්ඛණානි? ආදිස්ස තීණි ලක්ඛණානි. යො තස්ස පරිපන්ථො තතො චිත්තං විසුජ්ඣති, විසුද්ධත්තා චිත්තං මජ්ඣිමං සමථ නිමිත්තං පරිපජ්ජති, පරිපන්නත්තා තත්‍ර චිත්තං පක්ඛන්දති. යඤ්ච පරිපන්ථතො චිත්තං විසුජ්ඣති, යඤ්ච විසුද්ධත්තා චිත්තං මජ්ඣිමං සමථ නිමිත්තං පරිපජ්ජති, යඤ්ච පරිපන්නත්තා තත්‍ර චිත්තං පක්ඛන්දති, පඨමස්ස ඣානස්ස පරිපදා විසුද්ධි ආදි ආදිස්ස ඉමානි තීණි ලක්ඛණානි, තෙන වුච්චති පඨමං ඣානං ආදිකල්‍යාණඤ්චෙව හොති ලක්ඛණ සම්පන්නං ච.

පඨමස්ස ඣානස්ස උපෙක්ඛානුබ්‍රූහණා මජ්ඣෙ. මජ්ඣස්ස කති ලක්ඛණානි? මජ්ඣස්ස තීණි ලක්ඛණානි-විසුද්ධං චිත්තං

[1]විභ: ප: ඣාන වි: 185 [2]විභ: ප: ඣාන වි: 194

අජ්ඣුපෙක්ඛති, සමථ පවිපන්නං අජ්ඣුපෙක්ඛති, එකත්තතු පටිඨානං අජ්ඣුපෙක්ඛති. යං ච විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති, යං ච සමථ පවිපන්නං අජ්ඣුපෙක්ඛති, යස්මඋ එකත්තුපටිඨානං අජ්ඣුපෙක්ඛති, පඨමස්ස ඣානස්ස උපෙක්ඛානුබ්‍රූහණා මජ්ඣෙ. මජ්ඣස්ස ඉමානි තීණි ලක්ඛණානි. තෙන වුච්චති පඨමංඣානං මජ්ඣෙකල්‍යාණං වෙව හොති තිලක්ඛණ සම්පන්නං ච.

පඨමස්ස ඣානස්ස සම්පහංසනා පරියොසානං. පරියොසානස්ස කති ලක්ඛණානි? පරියොසානස්ස චත්තාරි ලක්ඛණානි. තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන සම්පහංසනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන සම්පහංසනා, තදුපග විරිය වාහනට්ඨෙන සම්පහංසනා, ආසෙවනට්ඨෙන සම්පහංසනා, පඨමස්ස ඣානස්ස සම්පහංසනා පරියොසානං, පරියොසානස්ස ඉමානි චත්තාරි ලක්ඛණානි, තෙන වුච්චති පඨමං ඣානං පරියොසාන කල්‍යාණඤ්චෙව හොති චතු-ලක්ඛණසම්පන්නං චාති."

මෙහි සංක්ෂිපත අදහස මෙසේ ය.

ත්‍රිවිධ කල්‍යාණය

1. ප්‍රථම ධ්‍යානයාගේ ආදි කල්‍යාණය ප්‍රතිපදා විශුද්ධිය යි. (ගොත්‍රභූ අවසන් කොට ඇති භාවනා විෂය ප්‍රතිපදා නම් වේ. ඒ ප්‍රතිපදාව පිළිබඳ උපද්‍රවයන්ගෙන් විශුද්ධීම ප්‍රතිපදා විශුද්ධිය යි. එය ධ්‍යානයාගේ උත්පාදක්ෂණයෙහි ලැබෙන බැවින් ප්‍රතිපදා-විශුද්ධිය ආදි කල්‍යාණය යි කීහු.)
2. උපෙක්ෂානුබ්‍රූහණාව – උපෙක්ෂාව වැඩීම මධ්‍ය කල්‍යාණය යි.
3. සම්පහංසනාව – සතුටුවීම් පරියොසාන කල්‍යාණය යි.

දශ ලක්ෂණය

මෙය ත්‍රිවිධ කල්‍යාණ පිළිබඳ ම ය.

ප්‍රතිපදා විශුද්ධි සංඛ්‍යාත ආදි කල්‍යාණයාගේ ලක්ෂණ තුනෙකි.

1. ධ්‍යානය පිළිබඳ උපද්‍රවයන්ගෙන් සිත ශුද්ධවීම
2. ඒ ශුද්ධවීමෙන් ම සිත මධ්‍යම සමථ නිමිත්තට පැමිණීම
3. ඒ පැමිණීමෙන් ම සිත එහි වැඳ සිටීම

මේ ආදි කල්‍යාණයාගේ ත්‍රිවිධ ලක්ෂණ යි.

උපෙක්ඛානුබ්‍රූහණා සංඛ්‍යාත මධ්‍ය කල්‍යාණයාගේ ලක්ෂණ තුනෙහි.

1 ප්‍රතිපද බලයෙන් පිරිසිදු වූ සිත නැවත පිරිසිදු නො කට හැකි බැවින් විශෝධනයෙහි ව්‍යාපාර නො කොට උපෙක්ෂා වීම.

2 සමථ භාවයට පැමිණි හෙයින් නැවත සෝධනයෙහි ව්‍යාපාර නො කොටැ උපෙක්ෂාවීම.

3 සමථයට පැමිණි හෙයින් ම කෙලෙස සංසර්ගය හැර එකතු යෙන් වැටහුණු සමාධිහුගේ නැවැත එකත්තුපටධ්‍යානයෙහි ව්‍යාපාර නො කැරැ උපෙක්ෂාවීම.
මේ මධ්‍ය කල්‍යාණයාගේ ත්‍රිවිධ ලක්ෂණ යි.

සම්පහංසනා සංඛ්‍යාත පරියෝසානකල්‍යාණයාගේ ලක්ෂණ සතරෙකි.

1 එහි උපන් සමාධි-ප්‍රඥ සංඛ්‍යාත යුගනද්ධ ධර්ම නො ඉක්මෙන බැවින් සතුටුවීම.

2 ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් නානා කෙලෙසයන් කෙරෙන් මිදී විමුක්ති රසයෙන් එකරස වන බැවින් සතුටුවීම.

3 ඒ එකරස භාවයට අනුරූප වැ වීර්‍ය පවත්නා බැවින් සතුටුවීම.

4 ආසෙවන වශයෙන් සතුටුවීම.

මේ පරියෝසාන කල්‍යාණයා ගේ චතුර්විධ ලක්ෂණ යි. මෙය මතු ද පැහැදිලි කෙරේ.

යට දැක්වුණු ත්‍රිවිධ කල්‍යාණ අතුරෙන් **ප්‍රතිපද විශුද්ධි** නම් පරිකර්ම සහිත උපචාරය යි ද, **උපෙක්ඛානුබ්‍රූහණා නම්** අර්පණාය යි ද, **සම්පහංසනා නම්** ප්‍රත්‍යවෙක්ෂණය යි ද **අභයගිරි නිකායිකයෝ** කියති. අර්පණාප්‍රාප්ත චිත්තය ම **ප්‍රතිපද්විශුද්ධි-උපෙක්ඛානුබ්‍රූහණා ලක්ෂණසම්පහංසනා** යන ත්‍රිවිධ කල්‍යාණයෙන් යුක්ත බව පෙළෙහි වදාළ බැවින් ඔවුන්ගේ මතය සාධ්‍යය ඒ ත්‍රිවිධ කල්‍යාණය ම අර්පණා ප්‍රාප්තය බව දත යුතු. එහි දී **ප්‍රතිපද්විශුද්ධිය** ආගමන වශයෙන් ද, **උපෙක්ඛානුබ්‍රූහණාව** තත්‍රමජ්ඣත්තුපෙක්ඛාවගේ කෘත්‍ය වශයෙන් ද, **සම්පහංසනාව** ධර්මයන්ගේ අනතිවත්තනාදිය සිදුවීමෙන් පිරිසිදු වූ ඥානයාගේ කෘත්‍ය නිෂ්පත්ති වශයෙන් ද වන්නේ ය.

එහි විභාගය මෙසේ ය.

1. සතර පස් සිතක් ඇති යම් අභිණ්හ වාරයෙක අභිණ්හව උපන්නේ නම් එවිට ඒ ධ්‍යානයට උපද්‍රව වශයෙන් පවත්නා නීවරණ සංඛ්‍යාත කෙලෙස සමූහයාගෙන් සිත පිරිසිදු වන්නේ ය. 2. එසේ පිරිසිදු වීම හෙතු කොටැ ගෙන සිත නීවරණ රහිත වැ මධ්‍යම සමථ නිමිත්තට පැමිණෙන්නේ ය. මධ්‍යම සමථ නිමිත්ත නම් සම ප්‍රවෘත්ත අභිණ්හ සමාධි ම ය. (සම ප්‍රවෘත්ත අභිණ්හ සමාධිය ම ලීනෞද්ධත්‍ය සංඛ්‍යාත අනත්තඤ්ඤයට අනුපගමනයෙන් මධ්‍ය නමුදු සවිශෙෂයෙන් ප්‍රත්‍යනීක - විරුද්ධ ධර්මය ව්‍යුපශමය කරන හෙයින් ශමථ නමුදු යොගිහුගේ සුඛවිශෙෂයට කාරණ හෙයින් නිමිත්ත නමුදු වේ.'' යනු පැරකුම් සන්න සි.) මධ්‍යම සමථ නිමිත්තයට පැමිණීම නම් ඒ අභිණ්හචිත්තයට අනන්තර ප්‍රත්‍ය වූ පූර්වචිත්තය හෙවත් ගොත්‍රභූ චිත්තය 'කිරි ම දී නො වෙතත් එකඹ නසින්' කිරීම දී වන්නාසේ ගොත්‍රභූ චිත්තය ම අභිණ්හ නොවෙතත් එකසන්තති පරිණාම නයෙන් අභිණ්හ සමාධි බවට පැමිණීම සි.

3. එසේ පැමිණීම හෙතු කොටැ ගෙන එ කෙණෙහි අභිණ්හ සමාධින් සමාහිත භාවයට එළඹීමෙන් සෙස්සන් සෙයින් වදනා බවක් නැත ද එකඹ නසින් අභිණ්හ සමාධි බවට වැද සිටින්නේ ය.

> අභිණ්හ සිතට පූර්ව වූ ගොත්‍රභූචිත්තයෙහි විද්‍යමාන පරිපන්ථ විශුද්ධි, මධ්‍යම සමථ ප්‍රතිපත්ති, පකාසන්ත යන ආකාර යෙන් නිපන් ප්‍රථම ධ්‍යානයා ගේ උත්පත්ති ක්ෂණයෙහි ආගමන වශයෙන් පැවති **ප්‍රතිපදාවිශුද්ධි සංඛ්‍යාත ආදි කල්‍යාණයාගේ විභාගය සි.**

1. විසුද්ධ වූ සිතෙහි නැවත සුඛ කටයුතු නැති බැවින් විශොධකයෙහි ව්‍යාපාර නො කරන්නේ විශුද්ධ චිත්තයෙහි උපෙක්ෂා වන්නේ නම් වන්නේ ය.

සමථභාවයට පැමිණීමෙන් සමථයට පිළිපන්නහුට නැවත සමාධානයෙහි ව්‍යාපාර නො කරන්නේ සමථ පටිපන්න සිතෙහි උපෙක්ෂාවන්නේ නම් වන්නේ ය.

3. සමථ ප්‍රතිපන්න බැවින් ම ක්ලෙශ සංසර්ග නැති බැවින් එකඹයෙන් හුදෙකලා වැ පිහිටි ඒ ධ්‍යාන සිත නැවත එකඹයෙන් තැබීමෙන් ප්‍රයොග නො කරන්නේ එකන්තු පධ්‍යානයෙහි උපෙක්ෂා වන්නේ නම් වන්නේ ය.

උපෙක්ෂානුබ්‍රූහණා සංඛ්‍යාත මධ්‍ය කල්‍යාණයාගේ විභාගය සි.

මෙසේ උපෙක්ෂායෙන් වඩනා ලද ඒ සමාධි සිතෙහි 1. සමාධි-ප්‍රඥ සංඛ්‍යාත යුගනද්ධ ධර්මයෝ අන්‍යෝන්‍යයන් නො ඉක්මැ සම වැ පවත්නා හ.

2. ශ්‍රද්ධාදී වූ ඉන්ද්‍රියයෝ නානා කෙලෙසයන්ගෙන් මිදී විමුක්තිරසයෙන් එක රස වැ පවත්නාහ.

3. ඒ යොගාවචර සමාධිප්‍රඥවන්ගේ තෝ ඉක්මීමට හා ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන්ගේ එක රස භාවයට සුදුසු යම් වීර්‍යයක් වේ ද එ ද එහි වන්නේ ය. ඒ ඇසිල්ලෙහි පැවැති ආසෙවනාව ද එහි වන්නේ ය. මේ සියල්ල සංක්ලෙශකර ව්‍යවදානකර ධර්මයන්හි ඒ ඒ දෙශ හා ගුණ නුවණින් දැනැ අන්‍යොන්‍යයන් නෝ ඉක්මැ පැවැත්මී ආදිය වන පරිදි සම්පහංසිත බැවින් – විශොධිත බැවින් – නිර්මලීකෘත බැවින් යම් හෙයකින් නිපන්නේ ද එහෙයින් "සම්පහංසනාව ධර්මයන්ගේ අනතිවත්තනාදිය සිදු වීමෙන් පිරිසිදු වූ ශූනයාගේ කෘත්‍ය නිෂ්පත්ති වශයෙන් වන්නේ ය"යි කියන ලද්දේ ය. (ඒ ධ්‍යානක්ෂණයෙහි ඇති උපෙක්ෂානුබ්‍රූහණාව අවසානය යි නෝ කියා සම්පහංසනාව අවසානය යි කුමට කීයේ ද යත්:- එහි උපෙක්ෂා වශයෙන් ශූනය ප්‍රකට හෙයින් ශූනකෘත්‍ය වූ සම්පහංසනාව පරියොසානය යි කියන ලදැ යි දත යුතු.

කීයේම ය:- **"තථා පගණ්හිතං චිත්තං සාධූහං අජ්ඣුපෙක්ඛති උපෙක්ඛාවසෙන. පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති උපෙක්ඛාවසෙන. නානත්තකිලෙසෙහි චිත්තං විමුච්චති විමොක්ඛවසෙන පඤ්ඤා වසෙනෙව පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති. විමුත්තත්තා තෙ ධම්මා එකරසා හොන්ති එකරසට්ඨෙන භාවනා"** යි.

සම්පහංසනා සංඛ්‍යාත පරියොසාන කල්‍යාණයාගේ විභාගය යි.

(මෙසේ ත්‍රිවිධ ප්‍රතිපත්ති විශුද්ධියෙන් ලද විශෙෂ ඇති ත්‍රිවිධ වූ උපෙක්ෂානුබ්‍රූහණයෙන් සාතිශය ප්‍රඥෙන්ද්‍රියයා ගේ අධිමාත්‍ර බැවින් චතුර්විධ වූ සම්පහංසනා සිඛ වේනු යි ආගමන උපෙක්ෂා ශූනකෘත්‍ය වශයෙන් දශප්‍රකාර ආකාරයෝ ධ්‍යාන යෙහි ම වෙතියි" දත යුතු යි.)

"පඨමං ඣානං අධිගතං හොති පඨවි කසිණං"[1] "පඨවි කසිණ ප්‍රථම ධ්‍යානය ලබා ගත්තා ලද්දේ වේ." යන මෙහි **ප්‍රථම** නම් වූයේ දෙශනා ක්‍රමයෙන් ආ ගණන් පිළිවෙළිනි. නැත හොත් පළමු කොටැ අධිගත වූයේ හෝ **ප්‍රථම** ය.

අරමුණු උපනිජ්ඣානය කරන්නේ-බලන්නේ යන අර්ථයෙන් හෝ ප්‍රතිපක්ෂ නීවරණ ඣාපනය කරන්නේ – දවාලන්නේ යන අර්ථයෙන් හෝ **ඣානය** යි කියනු ලැබේ.

පෘථිවිමණ්ඩලය සකලාර්ථයෙන් පඨවිකසිණ නම්. **කසිණ** නම් කෘත්‍සනය – සියල්ල ය. එක දෙශයක් අරමුණු කොටැ

[1] වි: ප: ඣානවිභඞ්ග 199

සියල්ල අරමුණු කරන බැවිනි. ඒ පෘථිවි මණ්ඩලය නිසා ලත් නිමිත්ත ද පඨවි කසිණය. එනම් පඨවි කසිණ නිමිත්ත යි. ඒ නිමිති කොටැ ලත් ධ්‍යානය ද පඨවි කසිණය. මෙහිලා ධ්‍යානය පඨවි කසිණය යි දත යුතු. **"පඨමං ඣානං අධිගතං හොති පඨවි කසිණං"** යනු වදාළේ එ හෙයිනි.

මෙසේ ධ්‍යානය ලැබැ ගත් කල්හි ඒ යොගීහු විසින් වාළවෙධියකු මෙන් ද, සූදයකු මෙන් ද ආකාර සලකා ගත යුතු. අතිදක්ෂ ධනුර්ධරයා වාළවෙධය පිණිස අභියොගය කරනුයේ වාළය විදුපි වාරයෙහි තම පා තුබුණු සැටි ද, දුන්න හා දුනුදිය හා ශරය හා තුබුණු සැටි ද සලකා ගන්නේ ය. මෙසේ සිටි මෑ විසින් මෙසේ මෙසේ දුන්න හා දුනුදිය හා ශරය හා ගෙනැ මෙසේ වාළය විදුනා ලදැ යි සිතන්නේ ය. එසේ සලකා ගත් හෙ තෙමේ එතැන් පටන් ඒ ඒ ආකාරයෙහි ම සිහිටා කෙ, වරදවා වාළය විදු ලන්නේ ය. එසේ මෑ යොගීහු විසිනු දු "ම විසින් මේ මේ බොජුන් වළඳ, මෙ බදු පුද්ගලයන් ඇසුරැ කිරීමෙන් මෙ බදු සෙනස්තෙහි මේ මේ ඉරියව්වෙහි සිටැ මේ කාලයෙහි මේ ධ්‍යානය ලැබැ ගන්නා ලදැ යි" හොජන සප්පායාදි ආකාර සැලකිය යුතු. එවිට ඒ ධ්‍යානය නටඳ, පළමු කී විධි සම්පාදනය කොටැ නැවත උපදවා ගන්නට ද, අප්‍රගුණ ධ්‍යානය ප්‍රගුණ කැරැ ගනිමින් නැවත නැවත අධිෂ්ඨා ලැබැගන්නට ද සමර්ථ වන්නේ ය.

දක්ෂ වූ සූදයා සවාමියාට බොජුන් වළඳවන්නේ සවාමියා යම් යම් හොජනයක් රුචියෙන් වළඳ, නම් ඒ ඒ හොජනය සිතට ගෙනැ එතැන් පටන් එබන්ද ම පිළියෙළ කොටැ දී ලාභ ලබන්නේ ය. මේ යොගාවචර ද ධ්‍යාන ලැබැ ගත් ඇසිල්ලෙහි ඒ හොජනාදි ආකාර සලකා ගෙනැ එ තැන් පටන් එබන්ද ම සම්පාදනය කරන්නේ නැවත නැවත අධිෂ්ඨා ලැබැගන්නේ ය. යොගීහු විසින් වාළවෙධියකු මෙන් ද, සූදයකු මෙන් ද, ඒ ඒ ආකාර සලකා ගත යුතු ය යි කියන ලද්දේ එ හෙයිනි.

වදාළේ මෑ යි,

"සෙය්‍යථා පි භික්ඛවෙ පණ්ඩිතෝ වියත්තෝ කුසලෝ සූදෝ රාජානං වා රාජමහාමත්තානං වා නානාවඤ්ඤෙහි නානාගරසෙහි සූපෙහි පච්චුපට්ඨිතෝ අස්ස අම්බිලඤ්ඤෙනපි තිත්තකඤ්ඤෙනපි කටුකඤ්ඤෙනපි මධුරඤ්ඤෙනපි ඛාරිකෙනපි අඛාරිකෙනපි ලොණිකෙනපි අලොණිකෙනපි, සඛෝ සෝ භික්ඛවෙ පණ්ඩිතෝ වියත්තෝ කුසලෝ සූදෝ

සකස්ස භත්තු නිමිත්තං උග්ගණ්හාති. ඉදං වා මෙ අජ්ජ භත්තු සූපෙය්‍යං රුච්චති ඉමස්ස වා අභිහරති ඉමස්ස වා බහුං ගණ්හාති ඉමස්ස වා වණ්ණං භාසති අම්බිලග්ගං වා මෙ අජ්ජ භත්තු සූපෙය්‍යං රුච්චති අම්බිලග්ගස්ස වා අභිහරති අම්බිලග්ගස්ස වා බහුං ගණ්හාති අම්බිලග්ගස්ස වා වණ්ණං භාසති-පෙ-අලොණිකස්ස වා වණ්ණං භාසතීති. සබ්බා සෝ භික්ඛවෙ පණ්ඩිතෝ වියත්තෝ කුසලෝ සූදෙ, ලාභි වෙව හොති අච්ඡාදනස්ස ලාභි වෙතනස්ස ලාභි අභිහාරානං. තං කිස්ස හෙතු? තථා හි සෝ භික්ඛවෙ පණ්ඩිතෝ වියත්තෝ කුසලෝ සූදෙ, සකස්ස භත්තු නිමිත්තං උග්ගණ්හාති.

එවමෙව ඛෝ භික්ඛවෙ ඉධෙකච්චෙ පණ්ඩිතෝ වියත්තෝ කුසලෝ භික්ඛු කායෙ කායානුපස්සී විහරති පෙ-වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානෝ සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං. තස්ස ධම්මෙසු ධම්මානු පස්සිනෝ විහරතෝ චිත්තං සමාධියති උපක්කිලෙසා පහීයන්ති, සෝ තං නිමිත්තං උග්ගණ්හාති. සබ්බා සෝ භික්ඛවෙ පණ්ඩිතෝ වියත්තෝ කුසලෝ භික්ඛු ලාභි වෙව හොති දිට්ඨධම්මසුඛවිහාරස්ස ලාභි සතිසම්පජඤ්ඤස්ස, තං කිස්ස හෙතු? තථා හි සෝ භික්ඛවෙ පණ්ඩිතෝ වියත්තෝ කුසලෝ භික්ඛු සකස්ස චිත්තස්ස නිමිත්තං උග්ගණ්හාති"[1] යි.

මෙහි සංක්ෂිප්ත අර්ථය මෙසේ ය.

'මහණෙනි! නුවණැති දක්ෂ අරක්කැමියා ඇඹුල් රස වූ හෝ තික්ත රස වූ හෝ කුළු රස වූ හෝ ඔහිරි රස වූ හෝ ක්ෂාර ද්‍රව්‍ය මිශ්‍ර වූ හෝ ක්ෂාර ද්‍රව්‍ය මිශ්‍ර නුවූ හෝ ලුණු රස වූ හෝ ලුණු රස නු වූ හෝ නොයෙක් රස ඇති නොයෙක් අග්‍ර රස ඇති මාළුයෙන් රජකු හට හෝ රජ ඇමතියකු හට හෝ වළඳවන්නේ ය. මහණෙනි! ඒ නුවණැති දක්ෂ අරක්කැමියා "අද මාගේ ස්වාමියාට මේ මාළුව රිසි ය. මෙයට අත තබා මෙය වඩා ගනී. මෙහි ගුණ කියා ය යි" සිතකින ස්වාමියාගේ රුචියෙන් වළඳන ආකාරය සිතට ගන්නේ ය. මහණෙනි! එසින් ඒ නුවණැති දක්ෂ අරක්කැමියා හදනා පිළී ද වැටුප් ද අභිහාර ද ලබන්නේ ය. කුමක් හෙයින් ද? මහණෙනි! ඒ නුවණැති දක්ෂ අරක්කැමියා ස්වකීය ස්වාමියාගේ රුචි වැ වළඳන ආකාරය සිතට ගන්නේ ය. එහෙයිනි. එ මෙන් මැ

[1]ස: නි: මහාවග්ග 903

මහණෙනි! මේ ශාසනයෙහි නුවණැති දක්ෂ භික්ෂු කෙලෙස් තවන වීර්‍ය ඇති වැ සිහි නුවණ ඇති වැ ලොකයෙහි අනිධ්‍යා හා දෞර්මනස් මැඩ පවත්වා ගෙනැ කායයෙහි කායානුපස්සී වැ වෙදනාවන්හි වෙදනානුපස්සී වැ චිත්තයෙහි චිත්තානුපස්සී වැ ධර්මයන්හි ධම්මානුපස්සී වැ වාසය කරන්නේය. මහණෙනි! එසේ වසන ඒ භික්ෂුහුගේ සිත සමාධි වන්නේ ය. උපක්ලේශ ප්‍රහීණ වන්නේ ය මහණෙනි! ඒ භික්ෂු ඒ ආකාරය සිතට ගන්නේ ය. එයින් ඒ භික්ෂු මේ අත්බැවිහි සැප විහරණ ද සිහි නුවණ ද ලබන්නේ ය. කුමක් හෙයින් ද මහණෙනි! එසේ ඒ භික්ෂු ස්වකීය චිත්තයාගේ ආකාර සිතට ගත්තේ ය. එහෙයිනි.

ආකාර සිතට ගැන්මෙන් යළි ඔහු ඒ ආකාර එසේ සම්පාදනය කරත් ම ඔහුට අර්පණා මාත්‍රය ම සිද්ධ වන්නේ ය. අර්පණාවගේ විරසතියය සිඹ නො වන්නේ ය. අර්පණා විරසතියය වන්නේ සමාධියට ප්‍රතිපක්ෂ වූ නීවරණ ධර්ම මනාකොටැ සුද්ධ කැරැ ගැන්මෙනි.

ඒ එසේ මැ යි:- යම් මහණෙක් කාමයන්ගේ ආදීනව සැලකීම් ආදි වශයෙන් කාමච්ඡන්දය විෂ්කම්භනය කොටැ නො ගෙනැ, කායපස්සද්ධි වසයෙන් කායදරථය හෙවත් කාය චිත්තයන්ගේ සංරද්ධ භාවයට නිමිත්ත වූ ව්‍යාපාදය නො සංසිඳුවා ගෙනැ, ආරම්භ ධාතු ආලෝක සංඥාදිය මෙතෙහි කිරීම් වශයෙන් ථින - මිද්ධය දුරු කොටැ නො ගෙනැ, සමථ නිමිත්ත මෙතෙහි කිරීම් ආදි වශයෙන් උද්ධච්ච - කුක්කුච්චය නො නසා, අන්‍ය වූ ත් විචිකිච්ඡාවට කරුණු වූ මද - නිම්මදනාදි සමාධි ප්‍රතිපක්ෂ ධර්මයන් ශුද්ධ කොටැ නො ගෙනැ, ධ්‍යානයට සමවන්නේ නම් ඒ භික්ෂු අශුද්ධ සථානයකට වන් බමරකු සේ ද, අශුද්ධ උද්‍යානයකට වන් රජකු සේ ද වහා ඒ ධ්‍යානයෙන් නැහෙන්නේ ය. එසේ නො වැ යම් මහණෙක් සමාධි ප්‍රතිපක්ෂ ධර්ම මැනෙවින් පිරිසිදු කොටැ ගෙනැ සමාධියට සමවදනේ ද හේ සුවිශුද්ධ සථානයට වන් භ්‍රමරයා සේ ද, පරිශුද්ධ උද්‍යානයට වන් රාජයා සේ ද මුළු දවස සමාපත්තියෙහි ම සිටින්නේ ය. එහෙයින් කිහ පුරාතනයෝ.

"කාමෙසු ඡන්දං පටිඝං විනෝදයෙ
උද්ධච්ච මිද්ධං විචිකිච්ඡ පඤ්චමං
විවෙක පාමුජ්ජ බලෙන චෙතසා
රාජාව සුදධනන ඝතෝ තහිං රමෙ" යි.

'කාමච්ඡන්දය ද, ව්‍යාපාදය ද, උද්ධච්ච - කුක්කුච්චය ද, ථීන-මිද්ධය ද, පස්වනු වූ විචිකිච්ඡාව ද දුරුකරන්නේ ය. විවෙකජ ප්‍රීතිය උපදවන සිතින් සුඛනන්තගත රජකු මෙන් ඒ ධ්‍යාන යෙහි ඇලෙන්නේ ය, යනු එහි අර්ථ සි. එහෙයින් සමාධි විරහිතිය කැමැත්තහු විසින් ප්‍රතිපක්ෂ ධර්ම ශුද්ධ කොටැ ගෙනැ ධ්‍යානයට සම්වැදිය යුතු.

තවද සමාධි භාවනා අභිඥා වශයෙන් විපුල කැරැ ගැන්ම සඳහා ඌදු මහත් වශයෙන් හෝ උපචාරභූමි අර්පණාභූමි වශයෙන් හෝ ලද පරිදි ඒ පටිභාග නිමිත්ත වැඩිය යුතු. උපචාරභූමි අර්පණා භූමිය සි එහි වැඩුම් භූමි දෙකෙකි. උපචාරයට පැමිණෙ හෝ අර්පණාවට පැමිණෙ හෝ ප්‍රතිභාග නිමිත්ත වැඩිය යුතු. ඒ දෙතැනින් එක් තැනෙක දී අවශ්‍යයෙන් වැඩිය යුතු. "ලද පරිදි පටිභාග නිමිත්ත වැඩිය යුතු ය" ආදියෙහි කියේ එහෙයිනි.

පටිභාග නිමිත්ත වඩන ක්‍රමය මෙසේ ය.

ඒ යෝගීහු විසින් එය පාත්‍ර වඩන නියායෙන් හෝ පූ වඩන නියායෙන් හෝ ඔත් වඩන නියායෙන් හෝ ලිය වඩන නියා යෙන් හෝ පිළිවඩන නියායෙන් හෝ නොවඩා සීසානා ගොවි සෙ යුතු භූමිය නගුලින් පිරිසිදු ඒ පරිච්ඡේදභ්‍යන්තරයෙහි සානා සේ ද, සීමා බඳන භික්ෂූන් පළමු නිමිති සලකා ඒ නිමිති ඇතුළ සීමා බඳනා සේ ද ලද පරිදි ඒ නිමිත්ත පිළිවෙළින් අහුල්-දැහුල්- තෙ අහුල්-සිව් අහුල් සා තැන් සිනින් පිරිසිදු-පිරිසිදු ඒ පරිච්ඡේදය තාක් වැඩිය යුතු සි. පරිච්ඡේද නො කොටැ නො වැඩිය යුතු. ඉක්බිති වියත් - රියන් - පමුඛ - පිරිවෙන් - විහාර ඉම් දක්වා ද ඉක්බිති ගම් - නියම්ගම් - දනවු - රාජ්‍ය - සමුද්‍ර සීමා දක්වා ද වඩමින් ගොස් සක්වළගල දක්වා හෝ ඉනුදු ඔබ්බෙහි හෝ පිරිසිදු වැඩිය යුතු. භංස පැටවි පියා නැඟි තැන් පටන් මඳ මඳ තැන් පැනැ පැනැ පුරුදු කොටැ පිළිවෙලින් සඳහිරු කරා යති. එ මෙන් යොගි භික්ෂු යට කී නියායෙන් නිමිත්ත පිරිසිදු වඩන්නේ සක්වළගල තාක් ද, ඉන් ඔබ්බෙහි ද වඩන්නේ ය. නිමිත්ත වැඩුවැඩු තැන පොළොව ගොඩ - වළ - ගංගා - පළිත - විසම තන්හි සඬකු සතයෙන් හයා පහරන ලද වෘෂභ චර්මයක් මෙන් සම වන්නේ ය.

ඒ නිමිත්තයෙහි ප්‍රථම ධ්‍යානය ලත් ආදි කර්මිකයා විසින් එහි සම වැදීම බහුල කළ යුතු. ප්‍රත්‍යවෙක්ෂණය බහුල නො කළ යුතු. ප්‍රත්‍යවෙක්ෂණය බහුල කරන්නහුට ප්‍රත්‍යවෙක්ෂා

බලයෙන් විහත වන බැවින් ධ්‍යානාඞ්ග ඕදාරික වැ ද ප්‍රගුණ බලවත් භාවයට නො පැමිණෙන බැවින් දුර්බල වැ ද වැටහෙන් නේ ය. එසේ වැටහෙත් ම එය මතු දවිතීය ධ්‍යානය උපදවන්නට උත්සාහවත් වීම සඳහා ප්‍රත්‍යය වන්නේ ය. හේ අප්‍රගුණ වූ ධ්‍යානයෙහි උත්සාහවත් වන්නේ ප්‍රථම ධ්‍යානයෙන් ද පිරිහෙයි. දවිතීය ධ්‍යානයට පැමිණෙන්නට ද අසමර්ථ වෙයි.

වදාළෝම ය බුදුහු.

"සෙය්‍යථාපි භික්ඛවෙ ගාවී පබ්බතෙය්‍යා බාලා අබ්‍යත්තා අවෙත්තඤ්ඤු අකුසලා විසමෙ පබ්බතෙ චරිතුං. තස්සා-එවමස්ස "යන්නූනාහං අග්ගපුබ්බංවෙව දිසං ගච්ඡෙය්‍යං. අබාදිතපුබ්බානි වෙව තිණානි ඛාදෙය්‍යං. අපීතපුබ්බානි පානීයානි පිවෙය්‍යං"ති. සා පුරිමං පාදං න සුප්පතිට්ඨිතං පතිට්ඨාපෙත්වා පච්ඡිමං පාදං උද්ධරෙය්‍ය. සා න වෙව අග්ගපුබ්බං දිසං ගච්ඡෙය්‍ය. න ච අබාදිතපුබ්බානි තිණානි ඛාදෙය්‍ය. න ච අපීත පුබ්බානි පානීයානි පිවෙය්‍ය. යඤ්ඤං චස්සා පදෙසෙ ඨිතාය එවමස්ස යන්නූනාහං අග්ගපුබ්බං වෙව - පෙ - පිවෙය්‍යං ති. තං ච පදෙසං න සොත්ථිනා පච්චාගච්ඡෙය්‍ය තං කිස්ස හෙතු? තථාහි සා භික්ඛවෙ ගාවී පබ්බතෙය්‍යා බාලා අව්‍යත්තා අවෙත්තඤ්ඤු අකුසලා විසමෙ පබ්බතෙ චරිතුං.

එව මෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චෙ භික්ඛු බාලෙ අබ්‍යත්තෙ අවෙත්තඤ්ඤු අකුසලෙ විවිච්චෙවව කාමෙහි - පෙ - පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතුං. සො තං නිමිත්තං නාසෙවති. න භාවෙති. න බහුලීකරොති. න සඞ්ඛාදිට්ඨිතං අධිට්ඨාති. තස්ස එවං හොති "යන්නූනාහං විතක්ක-විචාරානං වූපසමා - පෙ - දුතියඣානං උපසම්පජ්ජ විහරෙය්‍ය"න්ති. සො නසක්ඛොතීති විතක්කවිචාරානං වූපසමා -පෙ-දුතියඣානං උපසම්පජ්ජ විහරිතුං, තස්ස එවං හොති "යන්නූනාහං විවිච්චෙවව කාමෙහි - පෙ - පඨමං ඣානං උපසම්පජ්ජ විහරෙය්‍ය"න්ති සො න සක්ඛොතීති විවිච්චෙවව කාමෙහි - පෙ - පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතුං. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු උභතො භට්ඨො උභතො පරිහීනො. සෙය්‍යථාපි භික්ඛවෙ සා ගාවී පබ්බතෙය්‍යා බාලා අව්‍යත්තා අවෙත්තඤ්ඤු අකුසලා විසමෙ පබ්බතෙ චරිතුං."[1] යි.

මෙහි සංක්ෂිප්ත අර්ථය මෙසේ ය.

'මහණෙනි! පර්‍වත වැසි - විසම පර්‍වතයෙහි හැසිරෙන්නට නො දත් - ගොදුරු බිම නොදන්නා බාල නො වියත් ගව

[1] අ: නි: අට්ඨකනි: 867

දෙනක් නො ගිය විරූ දිගකට යන්නට හෝ, නො කෑ විරූ තණ කන්නට හෝ, නුපුදූ විරූ පැන් බොන්නට හෝ සිතා ඉදිරි පසින් මනා වැ නො සිටූ පසු පා නගන්නී ය. ඕ එසින් නො ගිය විරූ දිගට ද නො යයි. නො කෑ විරූ තණ ද නො කයි. නුපුදූ විරූ පැන් ද නො බොයි. එ මතු ද ආදියෙහි උන් තැනට ද යන්නට අසමර්ථ වෙයි. කුමක් හෙයින් ද ඇය එතෙක් අඥාන හෙයිනි.

එ මෙන් ම මහණෙනි! මේ ශාසනයෙහි ප්‍රථම ධ්‍යානය ලැබ ගෙන වාසය කරන්නට අදක්ෂ – අකෞශල්‍යඥ – බාල – නො වියත් භික්ෂූ සමාධි නිමිත්ත සෙවනය නො කර යි. නො වඩ යි. බහුල නො කර යි. මනා වැ පිහිටුවා නො ගනී යි. එසේ වුව ද හේ දෙවැනි ධ්‍යානය ලැබූ ගෙනැ වාසය කරන්නට සිත යි. මහණෙනි! හේ දෙවැනි ධ්‍යානය ලැබූ ගන්නට අසමර්ථ වෙ යි. එ මතු ද මහණෙනි හේ ප්‍රථම ධ්‍යානය ද ලැබූ ගෙනැ වාසය කරන්නට අසමර්ථ වෙයි. මහණෙනි! අර ගව දෙන මෙන් මේ භික්ෂූ දෙ පසින් ම බටුයේ ය. දෙපසින් ම පිරිහුණේ ය යි කිය යුතු යි.

එසේ හෙයින් ඒ යොගි විසින් පළමු කොටැ ඒ ප්‍රථම ධ්‍යානයෙහි මැ පස් ආකාරයෙකින් චිණ්ණවශී විය යුතු.

පඤ්චවිධ වසි

ආවජ්ජන, සමාපජ්ජන, අධිට්ඨාන, වුට්ඨාන, පච්චවෙක්ඛණ ය යි වසී පසෙකි. (වසී නම් රිසි සේ යටත් කොටැ ගෙනැ පවත්වන්නට සමර්ථ බව යි.)

1. කැමැති යම් තැනෙක කැමැති යම් ධ්‍යානාඞ්ගයක් කැමැතිතාක් කල් ආවජ්ජනය කිරීමෙහි සමර්ථ බව – ආවජ්ජනයෙහි ලැසි නොවන බව **ආවජ්ජන** වසී ය.

2. කැමැති යම් තැනෙක කැමැති යම් ධ්‍යානාඞ්ගයකට කැමැති තාක් කල් සමවැදීමෙහි සමර්ථ බව – සමවැදීමෙහි ලැසි නො වන බව **සමාපජ්ජන** වසී ය.

3. කැමැති යම් තැනෙක කැමැති යම් ධ්‍යානාඞ්ගයක් කැමැතිතාක් කල් අධිෂ්ඨානයෙහි සමර්ථ බව – අධිෂ්ඨානයෙහි ලැසි නො වන බව **අධිෂ්ඨාන** වසී ය.

4. කැමැති යම් තැනෙක කැමැති යම් ධ්‍යානාඞ්ගයෙකින් කැමැති කාලයෙකැ නැඟී සිටීමෙහි සමර්ථ බව – නැඟී සිටීමෙහි ලැසි නො වන බව **වුට්ඨාන** වසී ය.

5 කැමැති යම් තැනෙක කැමැති යම් ධ්‍යානාඞ්ගයක් කැමැති යම් කලෙක ප්‍රත්‍යවෙක්ෂායෙහි සමර්ථ බව – ප්‍රත්‍යවෙක්ෂා යෙහි ලැසි නොවන බව **පච්චවෙක්ඛණ** වසි ය.

එහි අර්ථ ප්‍රකාශනය මෙසේ දත යුතු.

1. ප්‍රථම ධ්‍යානයෙන් නැඟී එහි ප්‍රථමාඞ්ගය වූ විතර්කය අරමුණු කරන්නහුට භවාඞ්ග සිඳැ ගෙන උපන් ආවර්ජනයට අනතුරු වැ එම අරමුණු කොටැ ඇති ජවන් සතරෙක් හෝ පසෙක් දිවෙන්නේ ය. තදනන්තර වැ භවාඞ්ග දෙකෙක් උපදී. යළි විචාරය අරමුණු කොටැ ආවර්ජනය ද, ඉට දැක්වුණු සේ ජවන් ද දිවෙසි. මෙසේ ධ්‍යානාඞ්ග පසෙහි නිරතුරු සිත මෙහෙයන්නට සමර්ථ වී කම් එවිට **ආවජ්ජන වසි** සිද්ධ වූයේ වේ. භවාඞ්ග සිත් දෙකකින් අතුරු ඇති සතර ජවන් සිත් ඇති මේ මසුනක ප්‍රාප්ත වසි වනාහි **බුදුරජාණන්** වහන්සේට **යමා මහ පෙළහර** දක්වන කල්හි ලැබෙන්නේ ය. සෙසු **සැරියුත්** සවාමි ආදීන්ට ද ලැබෙන්නේ එබඳු කලෙක ය. මෙයට වඩා සියුම් ආවජ්ජන වසියෙක් නැති. (**බුදුනට එක** භවාඞ්ගයෙකින් අතුරු නොවන බැවිනි. නිඃශ්‍රේයසයනට ජවන් සතර ය. නාතිනිඃශ්‍රේයසයනට ජවන් පස සි.)

2. **නන්දෝපනන්ද** දමනයෙහි ආයුෂ්මත් **මුගලන්** සවාමීන්ට මෙන් සීඝ්‍ර වැ සමවැදීමෙහි සමර්ථ බව **සමාපජ්ජන වසි ය.**

3. අසුරක් හෝ දස අසුරක් හෝ පහරන පමණ කාලයක් තබා ගන්නට සමර්ථ බව **අධිට්ඨාන වසි ය.**

4. එසේ ම වහා නැහෙන්නට සමර්ථ බව **වුට්ඨාන වසි** ය. අධිට්ඨාන වුට්ඨානවසී දක්වනු සඳහා **බුද්ධරක්ඛිත** සවාමීන්ගේ කථාව කිය යුතු. බුද්ධරක්ඛිත සවාමි උපසම්පදයෙන් අටවැසි වූයේ ම **ථෙරමඛාදුලයෙහි මහාරොහණගුත්තත්ථ** සථවිරයන් වහන්සේට ගිලන් උපසථාන සඳහා රැස් වූ තිස්දහසක් යෘද්ධිමතුන් මැද සිටියේ තෙරුන්වහන්සේට කැඳ පිළිගන්වමින් සිටි උපසථායක නාගරාජයා අල්වාගැනීම පිණිස අහසින් බස්නා ගුරුළු රජු දැකැ එකෙණෙහි ම පළිතයක් මවා නාරජ අතින් ගෙනැ ඒ පළිතයට වැදුණේ ය. ගුරුළා පළිතයට පහර දී පලාගියේ ය. ''ඇවැත්නි **බුද්ධරක්ඛිත** නොසිටින්නට අපි සියල්ලෝ නිසැ කටයුත්තෝ නොවම්හු දැ'' යි මහාසථවිරයන් වහන්සේ කීසේක.

5. **පච්චවෙක්ඛණවසිය** ආවජ්ජන = වසියෙහි ම කියන ලදී. ප්‍රත්‍යවෙක්ෂා ජවන් ම ඒ ආවජ්ජනයෙහි ආවර්ජනයට අනතුරු වැ වේ.

මේ සඳහා **පැරකුම්බා සන්නයෙහි** මෙසේ දක්වේ. 'මෙහි ආවජ්ජන වසියෙන් ම ප්‍රත්‍යවෙක්ෂා වශිය සිද්ධ වත් අධිට්ඨාන වසියෙන් ම වුට්ඨානවසිය සිද්ධ වත් **ආවජ්ජනවසිය** හා ප්‍රත්‍යවෙක්ෂා වශියෙහි ද, අධිට්ඨානවසිය හා වුට්ඨානවසියෙහි ද වෙසෙස් කිමෙක් ද යත්:- ජවනුන්ට ධ්‍යානාඞ්ගයන් සුපුට වැ නො වැටහෙතු වූ ධ්‍යානාඞ්ගයෙහි නිරන්තර කොට ආවජ්ජනය පැවැත්විය හෙන බව **ආවජ්ජනවසි** නම් වෙයි. ධ්‍යානාඞ්ගයන් සුභාව විසින් සුපුට වැ පස්විකනුකොට ජවන් පැවැත්විය හෙන බව **ප්‍රත්‍යවෙක්ෂාවශී** නම් වේ. සත් ජවනුන් දිවතුදු නිරන්තර කොටැ ආවජ්ජනය පැවැත්වියහෙන බැව් **ආවජ්ජන වසි** නම් වෙයි. වශිතා බලයෙන් සත් ජවනුන් නො වැදී සතර හෝ පස් හෝ ජවන් **කෙනකුන්** ප්‍රත්‍යවෙක්ෂා **කට**හෙන බව **ප්‍රත්‍යවෙක්ෂාවශිතා** නම්. නොහොත් ඥන විප්‍රයුක්ත චිත්තයෙන් ප්‍රත්‍යවෙක්ෂා නො කොට හෙතු දු ප්‍රත්‍යවෙක්ෂා කරම් යන ආවජ්ජන චීථියට ඉක්බිති වැ භවාඞ්ගයෙහි නො ලස් වැ වහා ධ්‍යානාඞ්ගයන් ආවජ්ජනා **කට** හෙන බව **ආවජ්ජනවසිතා** නම් වෙයි. වශිතා බලයෙන් ඥන විප්‍රයුක්ත සිතිනු දු පස්විකියහෙන බව **ප්‍රත්‍යවෙක්ෂාවශිතා** නම් වේ. තමා **කැමති** තෙක් **කල්** සමාපත්තිය පැවතෙන බව **අධිට්ඨානවසි** නම්. පරිච්ඡින්න **කාලය** නො ඉක්මවා ධ්‍යානයෙහි ආලය හැරිය හෙන බව **උට්ඨානවසි** නම්. නොහොත් තමා විසින් පරිච්ඡින්න **කාලය** නොසික්මැ පවතු දු පරිච්ඡින්න **කාලය** නො උන්නු **කොට**ැ පැවැත්විය හෙන බව **අධිට්ඨානවසි** නම් වෙයි. තමා පිරිසුන් කල් නො ඉක්මැ පිරිසුන් කල්හි මැ නැගෙන බව **වුට්ඨානවසි** නම්. **සිලිසන්‍යයෙහි** වනාහි යම් යම් **කසිණාලම්බනයෙක** ධ්‍යාන සමවදනා **කැමැත්තහු** නො ලස් වැ ඒ ඒ කසුණු වහා ආවජ්ජනය ඉපදවිය හෙන බව ද ධ්‍යානයෙන් නැගී ධ්‍යානාඞ්ග යන් ප්‍රත්‍යවෙක්ෂා **කරන්නහු** භවාඞ්ගයෙහි නො ලස් වැ භවාඞ්ග යෙන් නැගී චිතඋාදි ධ්‍යානාඞ්ගයෙහි වහා ආවජ්ජනා පැවැත්විය හෙන බව **ආවජ්ජනවසි** නම්. කසුණෙහි වහා ආවජ්ජන ඉපද වුව ද උපචාරයෙහි වහා ධ්‍යානයට සමවැද්දහෙන බව **සමාපජ්ජන වසි** නම. අසුරැ පහරතා පමණ මද **කලෙක්හි** දු ධ්‍යානයෙහි සිටිනු **කැමැත්තහු** නො උනු කොටැ එතෙක් **කල්** ම සිටිය හෙන බව **අධිට්ඨානවසි** නම. පරිච්ඡින්න **කාලය** නො ඉක්මවා තමා සමවත් සමාපත්තියෙන් තර වැ නැගෙන බව **වුට්ඨානවසි** නම්. ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නහු යටැ කී සෙසින් මැ ඉපද වූ ආවජ්ජනයට ඉක්බිති සැහැල්ලු කොටැ

වහා ප්‍රත්‍යවෙක්ෂා ජවන් පැවැත්විය හෙත බව **ප්‍රත්‍යවෙක්ෂා වශී නම්** වෙයි කිහු" සි.

මේ පංච වසීන්හි පුරුදු වූවහු විසින් පුහුණු වූ ප්‍රථමධ්‍යාන යෙන් නැගී "මේ සමාපත්තියෙහි ආසන්න වූ නීවරණ සංඛ්‍යාත සතුරෝ ඇත්තාහ. විතර්ක - විචාර ඖදාරික බැවින් අඞ්ගයෝ ද දුර්ලයහ" සි. එහි දෙස් දැකැ විතර්ක - විචාර නැති බැවින් ද්විතීය ධ්‍යාන ශාන්ත වශයෙන් සලකා ප්‍රථමධ්‍යානයෙහි නිකාන්ති දුරු කොටැ ද්විතීය ධ්‍යානය ලබාගන්නා පිණිස භාවනාරම්භ කළ යුතු.

එසේ ආරම්භ කරත් ම ප්‍රථම ධ්‍යානයෙන් නැගී සිටි නුවණ ඇති වැ ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ ඔහුට විතර්කය හා විචාරය ඖදාරික වශයෙන් වැටහෙයි. ප්‍රීතිය හා සුඛය හා චිත්තෛකාග්‍රතාව හා ශාන්ත වශයෙන් වැටහෙයි. එසේ වැටහෙන කල්හි හේ ඖදාරිකාඞ්ග දුරු කැරැ ගනු සඳහා ද ශාන්තාඞ්ග ලබාගනු සඳහා ද ඒ යට කී නිමිත්ත ම **'පඨවි-පඨවි'** සි නැවත නැවත මෙනෙහි කරයි. එසේ මෙනෙහි කරන්නා වූ ඔහුට මේ දැන් විතීය ධ්‍යානය ලැබෙන්නේ ය සි භවාඞ්ග උපච්ඡේද ව ඒ පඨවි කසිණය ම අරමුණු කොටැ මනොවාරාවජ්ජනය උපදී. ඉක්බිති ඒ අරමුණ මැ එල්බ ජවන් සතරෙක් හෝ පසෙක් දිවෙයි. ඒ ජවනයන්ගේ අවසානයෙහි එක රූපාවචර දුතියජ්ඣානික ය. මොබ සෙස්ස කාමාවචර සි. මෙතෙකින් ඒ යොගි විතර්ක - විචාර සංසිදීමෙන් සවසන්නානයෙහි උපන් සම්ප්‍රසාදනයෙන් යුක්තවූ, චිත්තයා ගේ එකොදි භාවය සි කියන ලද, විතර්ක - විචාර නැති, සමාධියෙන් නිපත් ප්‍රීති හා සුඛ ඇති, විතීය ධ්‍යානයට පැමිණැ වාසය කරයි. එසේ ඔහු විසින් විතර්ක - විචාර යන අඞ්ග වය-යෙන් වියුක්ත වූ ප්‍රීති - සුඛ - එකග්ගතා යන අඞ්ගත්‍රයයෙන් යුක්ත් වූ ත්‍රිවිධ කල්‍යාණයෙන් හා දශ ලක්ෂණයෙන් සම්න්විත පඨවි කසිණ **විතීය ධ්‍යානය** ලබා ගන්නා ලද්දේ වෙයි.

විතීය ධ්‍යානයෙහි ආකාර දක්වන පාළිය මෙසේ ය:-

"විතක්කස්ස විචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසෝ එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං ප්‍රීති-සුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති"[1] 'විතර්ක - විචාර සංසිදීමෙන්' යනාදීන් යට දක්වන ලද්දේ මෙහි අර්ථය සි. යළිදු එය පදානුක්‍රමයෙන් පැහැදිලි කරනු ලැබේ.

---

[1] මි: ප: ඣානවිභඞ්ග 185

විතක්ක විචාරානං වූපසමා = විතර්ක - විචාර යන මේ අඞ්ගද්වය සංසිදීමෙන් හෙවත් ප්‍රහාණ වශයෙන් ඉක්මීමෙන්- විතීය ධ්‍යාන ක්ෂණයෙහි පහළ නො වීමෙන් ය යි සේ යි. මෙහි කිය යුත්තෙක් ඇති. ප්‍රථම ධ්‍යානය පිළිබඳ කිසිම ධර්ම කෙනෙක් විතීය ධ්‍යානයෙහි නො වෙති. ප්‍රථම ධ්‍යානයෙහි එස්සාදීහු අන්‍ය යෝ ය. විතීය ධ්‍යානයෙහි එස්සාදීහු අන්‍යයෝ ය. එතකුදු වුවත් ඕළාරික අඞ්ග සමතික්‍රමයෙන් ප්‍රථම ධ්‍යානයෙන් අන්‍ය වූ විතීය ධ්‍යානයාගේ අධිගමය වන්නේ ය යි දක්වනු පිණිස **"විතක්ක විචාරානං වූපසමා"** යි වදාරණ ලදැ යි දත යුතු.

අජ්ඣත්තං = මෙයින් නියකජ්ඣත්තය කියන ලදී. **විභඞ්ගයෙහි අජ්ඣත්තංපච්චත්තං' යි** මෙතෙක්ම වදාළේ ය. මෙහි නියකජ්ඣත්තය අදහස් කරන ලද බැවින් තමාගෙන් උපන්- සව සන්තානයෙහි උපන් යන අර්ථය ගත යුතු.

සම්පසාදනං = මෙයින් ශ්‍රද්ධාව කියනු ලැබේ. නීලවණ්ණ යොග-යෙන් වස්ත්‍රය ද නීල වන්නා සේ සම්ප්‍රසාදන යොගයෙන් ධ්‍යානයද සම්පසාදන වේ. නොහොත් ඒ ධ්‍යානය සම්පසාදනයෙන් යුක්ත බැවින් විතර්ක - විචාරයන්ගෙන් වන කැලඹුම් සංසිඳීමෙන් සිත පහදවන බැවින් සම්පසාදනය යි කියනු ලැබේ. මෙසේ අර්ථ ගන්නා කල්හි "සම්පසාදන චෙතසෝ" යි පද සම්බන්ධ කටයුතු. මූල කී "සම්පසාදන යොගතෝ සම්පදානං" යන අර්ථ විකල්පන-යෙහි "චෙතසෝ" යනු "එකොදි භාවං" යනු හා යෙදිය යුතුයි. මේ එහි අර්ථ යොජනාව ය.

චෙතසෝ එකොදිභාවං = **එසෝ උදෙතීති එකොදි** ශ්‍රේෂ්ඨ වැ නැගෙන්නේ **එකොදි** ය. විතර්ක විචාරයන් විසින් අධ්‍යාරූඪ නො වන බැවින් ශ්‍රේෂ්ඨ වැ නැගෙන්නේ **එකොදි** ය යි කී සේ යි. ලොකයෙහි ශ්‍රේෂ්ඨ ද **එක** ය යි කියති. විතර්ක-විචාර රහිත වැ- හුදෙකලා වැ- අසහාය වැ නැගෙන්නේ හෝ **එකොදි** ය යි කියනු යෙදෙයි. නොහොත් **"සම්පයුත්ත ධම්මෙ උදයතීති උදි. එසෝ ච සෝ උදිවෙති එකොදි. එකොදිං භාවෙතීති එකොදිභාවං"**[1] 'එස්සාදි සම්ප්‍රයුක්ත ධර්ම නගන්නේ උදි යැ. එක - ශ්‍රේෂ්ඨ උදි එකොදී යැ. එනම් සමාධිය යි. මේ සමාධි සංඛ්‍යාත එකොදි වඩන්නේ එකොදි භාවය' එනම් විතීය ධ්‍යානය යි. යට දැක්වුණු එකොදිය සත්ත්වයකුගේ ජීවයකගේ නො වැ චිත්තයාගේ ය. එහෙයින් **"චෙතසෝ එකොදිභාවං"** යි කියනලදී.

---

[1] අ: සා: රූපාවචරකුසලකථා 162

ප්‍රශ්නයෙකි. මේ සද්ධා සංඛ්‍යාත සම්පසාදනය ද සමාධි සංඛ්‍යාත එකොදිය ද ප්‍රථම ධ්‍යානයෙහි දු ඇත්තේ නො වේ ද කුමක් හෙයින් ද්විතීය ධ්‍යානය ම **"සම්පසාදනං චෙතසෝ එකොදිභාවං"** යි කියන ලද ද

උත්තර මෙසේ ය:- විතර්ක - විචාරක්ෂොභයෙන් යුත් ප්‍රථම ධ්‍යානය රළපතරින් යුත් ජලය සේ සුප්‍රසන්න නො වෙ යි. එ බැවින් එහි ශ්‍රද්ධාව ඇත ද එය සම්පසාදනය යි නො කියන ලදී. සම්පසාදනය නැති බැවින් ම එහි සමාධිය අප්‍රකට ය. එ බැවින් එකොදිභාවය යි නො කියන ලදී. ද්විතීය ධ්‍යානයෙහි විතර්ක - විචාරක්ෂොභ නැති බැවින් ලද අවකාශ ඇති ශ්‍රද්ධාව බලවත් වැ පවතී. බලවත් ශ්‍රද්ධා ලාභයෙන් ම සමාධිය ද ප්‍රකට වැ පවතී. එ හෙයින් මේ ද්විතීය ධ්‍යානය ම **"සම්පසාදනං චෙතසෝ එකොදිභාවං"** යි කියන ලදී. **විභඞ්ගයෙහි 'සම්පසාදනංති යා සද්ධා සද්දහනා ඔකප්පනා අභිප්පසාදෝ"** යි ද **"චෙතසෝ එකොදිභාවංති යා චිත්තස්ස ඨිති සණ්ඨිති -පෙ- සම්මාසමාධි"**[1] යි ද මේ තෙක් ම වදුලේ ය. ඒ හා සමග මේ අර්ථ වර්ණනාව අවිරුද්ධ වැ එකාන්තයෙන් සංසන්දනය වන පරිදි සැලකිය යුතු.

අවිතක්කං අවිචාරං = භාවනායෙන් ප්‍රහාණය කරන ලද බැවින් විතර්කය නැත්තේ අවිතර්කය. එසේ ම විචාරය නැත්තේ අවිචාරය.

වදුලේ මෙ යි:- **විභඞ්ගයෙහි "ඉති අයං ච විතක්කෝ අයං ච විචාරෝ සන්නා හොන්ති සමිතා වූපසන්නා අත්ථංගතා අබ්භත්ථංගතා අප්පිතා ව්‍යප්පිතා සොසිතා විසොසිතා ව්‍යන්තීකතා. තෙන වුච්චති අවිතක්කං අවිචාරං"**[1] යි. 'මෙසේ මේ විතර්කය ද මේ විචාරය ද ශාන්තය, භාවනා බලයෙන් ශමථයට පමුණුවන ලද්දේ ය, විශෙෂයෙන් ශාන්තය, අස්තඞ්ගතය, විශෙෂයෙන් අස්තඞ්ගතය, විනාශයට පමුණුවන ලද්දේ ය, විශෙෂයෙන් විනාශයට පමුණුවන ලද්දේ ය, වියලවන ලදී, විගතාන්ත කරන ලදී. එහෙයින් අවිතක්ක - අවිචාරය යි කියනු ලැබේ' යනු එහි අර්ථ යි.

ප්‍රශ්නයෙකි:- **"විතක්ක විචාරානං වූපසමා"** යන්නෙන් ම **"අවිතක්කං අවිචාරං"** යනු සිද්ධ නො වේ ද යළි කුමක් හෙයින් කියන ලද ද

උත්තර මෙසේ ය:- සැබවැ, ඒ අර්ථය සිද්ධ ය. එහෙත් **"විතක්ක - විචාරානං වූපසමා"** යනු **"අවිතක්කං අවිචාරං"** යන්නෙහි අර්ථය නො දෙයි. (ද්විතීය ධ්‍යානාදීන්ගේ අධිගමයට

[1] වි: ප: ඤාණවිභඞ්ග 195

උපායදීපක වූ අප්‍රඛ්‍යාතසමපසාදනභාවයට හා **චෙතසෝ එකොදි** භාවයට හෙතු දීපක වූ අවිතක්ක - අවිචාර භාවයෙහි දු හෙතු **දීපක** වූ විතක්ක – විචාර වූපසම වචනයෙන් විතක්ක – විචාරයන්ගේ අභාවය දීපික නොවේ" යනු **පැරකුම්බා සන්න සි.**) "ඕඳාරික-ඕඳාරික අඞ්ග සමතික්‍රමයෙන් ප්‍රථම ධ්‍යානයෙන් අන්‍ය වූ දවිතීය ධ්‍යානාදීන්ගේ සම්ධිගමය වන්නේ ය. යනු දක්වනු සඳහා **"විතක්ක විචාරානං වූපසමා"** යනු කියන ලදැ සි ආදියෙහි ම අපි කියෙමෝ නො වමු ද

තවද අවියෙකි, මේ සමපසාදනය විතක්ක - විචාරයන්ගේ ව්‍යපශමයෙන් වන්නේ ය. ක්ලෙශ කාලුෂ්‍යයාගේ ව්‍යපශමයෙන් නො වන්නේ ය. මේ එකොදිභාවය ද විතක්ක – විචාරයන්ගේ ව්‍යපශමයෙන් වන්නේ ය. උපචාර ධ්‍යානය මෙන් නීවරණ ප්‍රහාණයෙන් හෝ ප්‍රථම ධ්‍යානය මෙන් අඞ්ග ප්‍රාදුර්භාවයෙන් හෝ නො වන්නේ ය. එහෙයින් **"විතක්ක විචාරානං වූපසමා"** යනු සමපසාදන එකොදිභාවයන්ට හෙතු දක්වන වචන සි. තවද මේ අවිතක්ක – අවිචාර වන්නේත් විතක්ක – විචාර ව්‍යපශම-යෙනි. තෘතීය ධ්‍යානය චක්ෂුර්විඥානාදිය මෙන් විතක්ක – විචාර අභාවයෙන් ම නො වේ. එබැවින් **"විතක්ක-විචාරානං වූපසමා"** යනු අවිතක්ක – අවිචාරභාවයට හෙතු දක්වයි. විතක්ක – විචාර අභාව මාත්‍රය නො දක්ව සි. **"අවිතක්කං – අවිචාරං"** යනු ම විතක්ක-විචාර අභාව මාත්‍රය දක්වයි. එ බැවින් **"විතක්ක විචාරානං වූපසමා"** යනු කිව ද **"අවිතක්කං අවිචාරං"** යනු ද කිය යුතු ම ය.

සමාධිජං = ප්‍රථම ධ්‍යාන සමාධියෙන් හෝ සම්ප්‍රයුක්ත සමාධියෙන් හෝ උපන් (ප්‍රථම ධ්‍යානය දවිතීය ධ්‍යානයට උපනිඃශ්‍රය ප්‍රත්‍ය වන බැවින් ප්‍රථම ධ්‍යාන සමාධියෙන් සි කීහ.) ප්‍රථම ධ්‍යානය ද **සම්ප්‍රයුක්ත** සමාධියෙන් උපන්නේ නො වේ ද මේ විතීය ධ්‍යානයම සමාධිජය සි. කවර හෙයින් කිහු ද විතක්ක විචාරඤ්ඤාහ රහිත වැ ඉතා නිශ්චල බැවින් ද, සුප්‍රසන්න බැවින් ද මේ විතීය ධ්‍යානය ම සමාධිය සි කිය යුතු ය. එ බැවින් එහි ම වණී කථනය සඳහා **"සමාධිජ"** ය සි කියන ලදී.

"ප්‍රීතිසුඛං" යට කී නියා මැ සි.

දුතියං = ගණන් පිළිවෙළින් හෝ දෙ වැනි වැ උපන් බැවින් හෝ දෙ වැනි වැ සම්වදින බැවින් හෝ දෙ වැනි.

"දුවඞ්ගවිප්පයුත්තං තිවඞ්ගසමන්නාගතං"[1] යන තන්හි චිතකී - විචාරයන්ගේ ප්‍රභාණ වශයෙන් ම ද්වඞ්ග විප්පයුත්තභාව දත යුතු. ප්‍රථම ධ්‍යානයාගේ උපචාර ක්ෂණයෙහි නීවරණ ප්‍රභාණ වන්නා සේ චිතීය ධ්‍යානයාගේ උපචාර ක්ෂණයෙහි චිතකී විචාරයෝ ප්‍රහීණ නො වෙති. අප්පිණා ක්ෂණයෙහි ම චිතීය ධ්‍යානය චිතකී - විචාර නැති වැ උපදී. එ හෙයින් චිතකී - විචාර චිතීය ධ්‍යානයාගේ ප්‍රභාණාඞ්ගය යි කියනු ලැබේ. පීති-සුඛ-එකග්ගතා වශයෙන් තිවඞ්ග සමන්නාගත වේ.

එහෙයින් විභඞ්ගයෙහි **"ඣානං නි සම්පසාදෙ පීති සුඛං චිත්තස්ස එකග්ගතා"**[1] යි වදාළේ ය. එ ද සපරිවාර ධ්‍යානය දක්වන්නට පර්‍යායයෙන් වදාරන ලද්දෙකි. සම්පසාදනය හැරැ නිප්පර්‍යාය වශයෙන් උපනිධ්‍යාන ලක්ෂණයට පැමිණ අඞ්ගයන්ගේ වශයෙන් මේ තිවඞ්ග මැ යි. **"තතියං තස්මිං සමයෙ තිවඞ්ගිකං ඣානං හොති පීති සුඛං චිත්තස්සෙකග්ගතා"**[1] යි එහෙයින් වදාළේ ය (රථයට පාණ්ඩුකම්බලය මෙන් සම්ප්‍රසාදනය ධ්‍යානයට පරිවාර වෙයි. ධ්‍යානාඞ්ග නො වෙ යි. කී සේ ය.) සෙස්ස ප්‍රථම ධ්‍යානයට කී නියා මැ යි.

තෘතීය ධ්‍යානය උපදවන ආකාරය.

මෙසේ ලැබැ ගත් චිතීය ධ්‍යානයෙහි සට කීසේ පස් ආකාර-යකින් චිණ්ණවශී වූවහු විසින් ප්‍රගුණ වූ ඒ චිතීය ධ්‍යානයෙන් නැගී "මේ සමාපත්තිය ආසන්න වූ චිතකී - විචාර සංඛ්‍යාත සතුරන් ඇත්තේ ය. එහි පවත්නා ප්‍රීතිය ද සිත උල්පවන්නෙකි. එ බැවින් එය ඔඳාරික සේ වැටහේ. එය ඔඳාරික බැවින් ම එහි අඞ්ග ද දුබ්බලය" යි චිතීය ධ්‍යානයෙහි දෝෂ දැක තෘතීය ධ්‍යානය ශාන්ත වශයෙන් සලකා ඒ චිතීය ධ්‍යානයෙහි ආශාව දුරැ කොටැ තෘතීය ධ්‍යානය ලබාගන්නා පිණිස භාවනා කටයුතු. එසේ භාවනාරම්භ කරන්නා චිතීය ධ්‍යානයෙන් නැගී සිහි නුවණ ඇති වැ ධ්‍යානාඞ්ග ප්‍රත්‍යවෙක්ෂා කරන් ම ඔහුට ප්‍රීතිය ඔඳාරික වශයෙන් වැටහෙයි. සුඛය හා එකග්ගතාව ශාන්ත වශයෙන් වැටහෙයි. එවිට හේ ඔඳාරිකාඞ්ගය දුරැ කරනු පිණිස ද, ශාන්තාඞ්ග ලබනු පිණිස ද ඒ නිමිත්තම **"පඨවි පඨවි"** යි තැවත තැවත මෙනෙහි කරයි. එසේ මෙනෙහි කරන් ම දැන් තෘතීය ධ්‍යානය උපදින්නේය යි භවාඞ්ග සිඳී ඒ පඨවි කසිණය ම අරමුණු කොටැ මනොවාරවජ්ජනය උපදී. ඉක්බිති එ ම අරමුණු කොටැ ජවන් සතරෙක් හෝ පසෙක් දිවෙයි. එහි අවසාන ජවනය රූපාවචර තෘතීය ධ්‍යානය යි. මොබ සෙස්ස සට කී සේ කාමාවචර ය. මෙතෙකින් ඒ යොගී

---

[1] වි: ප: ඣානවිභඞ්ග 195

"පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො සුඛං ච කායෙන පටිසංවෙදෙති. යං තං අරියා ආචික්ඛන්ති "උපෙක්ඛකො සතිමා සුඛවිහාරී"ති තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති"[1] යි දැක්වුණු පරිදි එකාඞ්ගයෙකින් අඩු වූ අඞ්ගඅටයකින් සමන්විත වූ නිවිධ කල්‍යාණයෙන් හා දශ ලක්ෂණයෙන් යුත් පඨවි කසිණ තෘතීය ධ්‍යානය ලැබූ ගත්තේ වෙයි.

"පීතියා ච විරාගා" යනාදියෙහි පදානුක්‍රම විවරණය මෙසේ ය.

පීතියා ච විරාගා = යට දැක්වුණු ආකාර ඇති ප්‍රීතිය පිළිබඳ පිළිකුල් කිරීමෙන් හෝ ඉක්මීමෙන්, මෙහි "ච" ශබ්ද සම්පිණ්ඩනාර්ථ යි. එයින් සම්පිණ්ඩණය කරන්නේ ප්‍රීතියේ හා චිතසික විචාරයන්ගේ ව්‍යුපශමය යි. ප්‍රීති ව්‍යුපශමය සම්පිණ්ඩනය කරන කල්හි ප්‍රීතියෙන් විරාගයෙන්, වැළි ප්‍රීති ව්‍යුපශමයෙන් යි පද යොජනා කටයුතු ය. මෙහි විරාග නම් ඡගුවජ්ජනය යි පිළිකුල් කිරීම යි. එ බැවින් ප්‍රීතියෙහි ජුගුප්සාවෙන් හා ප්‍රීතිය සමතික්‍රමයෙන් යන අර්ථය දත යුතු. චිතසික විචාරයන්ගේ ව්‍යුපශමය සම්පිණ්ඩනය කරන කල්හි ප්‍රීතියෙහි විරාගයෙන් වැළි 'චිතසික විචාරයන්ගේ ව්‍යුපශමයෙන්' යි පද යොජනා කට යුතු. මෙහි විරාගය සමතික්‍රමණාර්ථ යි. එහෙයින් ප්‍රීතිය සමතික්‍රමණය කිරීමෙන්, චිතසික විචාර ද ව්‍යුපශමනය කිරීමෙන් යි එවිට අර්ථ ගත යුතු.

චිතසික – විචාර චිතිය ධ්‍යානයෙහි දී සන්සිදුණේ නො වේ ද, මෙහි යළිදු කුමක් හෙයින් ගනු ලැබේ ද යනු මෙහි ලා ප්‍රශ්නයෙකි.

මේ ධ්‍යානයට මාගී දක්වනු පිණිස හා ගුණ කියනු පිණිසය යනු උත්තර යි. එහි විසඳුම මෙසේ දතයුතු.

චිතසික – විචාර ව්‍යුපශමය මේ ධ්‍යානයට එකාන්ත මාගීයෙකි. දෙවිනිය ධ්‍යානය නො ලද හොත් තෘතීය ධ්‍යානය නො ලද හැකි බැවින් චිතසික-විචාර සමතික්‍රමණය තෘතීය ධ්‍යාන ලාභයට මාගී යි. මේ පළමු වන උත්තරයේ විසඳුම යි. අනාගාමී මාගීය දක්වන තන්හි **"පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පහාණා"**[2] යි එයින් නො පහනු ලබන සක්කායදිට්ඨි ආදීන්ගේ ද ප්‍රහාණය දක්වනුයේ එහි ගුණ කිම ය. එය ලබාගනු සඳහා උත්සාහ උපදවීම සඳහා ය. එ මෙන් මෙහිදු මෙයින් නොසන්සිඳෙන චිතසික – විචාර ව්‍යුපශමය කිම එහි ගුණ කිම යි.

---

[1] වි: ප: ඤානවිභඞ්ග 186 [2] අ: නි: තිකනිපාත 141

උපෙක්ඛකෝ ච විහරති = උපපත්තිතෝ ඉක්ඛති ති උපෙක්ඛා-යුක්ති වශයෙන් බලන්නේ උපෙක්ෂා ය. **පක්ෂපාත** නො වැ සම වැ බලන්නේ ය යි සේ යි. ව්‍යක්ත වූ විපුල වූ සපිරුණු වූ යට පැමිණි ඒ උපෙක්ෂායෙන් යුත් බැවින් තෘතීය ධ්‍යාන සමංගී පුද්ගල උපෙක්ෂකය යි කියනු ලැබේ. (ව්‍යක්තත්වය සංක්ලේශ විගමනයෙනි. විපුලත්වය මහද්ගත භාවයට පැමිණීමෙනි. සපිරුණු වය ප්‍රීති විගමයෙනි.) උපෙක්ෂාව දස වැදෑරුම් වේ.

දශවිධ උපෙක්ෂා

1. ඡඩඞ්ගෝපෙක්ෂා, 2. බ්‍රහ්මවිහාරෝපෙක්ෂා, 3. බොධ්‍යඞ්ගෝපෙක්ෂා, 4. වීර්‍යෝපෙක්ෂා, 5. සංඝකාරෝපෙක්ෂා, 6. වේදනෝපෙක්ෂා. 7. විදර්ශනෝපෙක්ෂා, 8. තත්‍රමධ්‍යත්වෝපෙක්ෂා, 9. ධ්‍යානෝපෙක්ෂා, 10. පාරිශුද්ධ්‍යුපෙක්ෂා යනු ඒ දශය යි.

1 ඡඩඞ්ගෝපෙක්ෂාව

"ඉධ ඛීණාසවෝ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනෝ හොති න දුම්මනෝ උපෙක්ඛකෝ ච විහරති සතෝ සම්පජානෝ"[1] 'ක්ෂීණාශ්‍රව භික්ෂු ඇසින් රූප දැකැ සොම්නස් නො ද වෙ යි. දෙම්නස් නො ද වෙ යි. සිහි නුවණ ඇති වැ උපෙක්ෂක වැ වාසය කෙරෙයි' මෙහි දැක්වුණු සේ රහතන් ගේ චක්ෂුරාදි සදෙර ඉෂ්ට අනිෂ්ට අරමුණු වැටීමෙහි දී පිරිසිදු වූ ප්‍රකෘතිය නො වෙනස් වීම් ආකාරයෙන් පැවති යම් උපෙක්ෂාවෙක් වේ ද එය ඡඩඞ්ගෝපෙක්ෂාය යි කියනු ලැබේ. ඡළඞ්ගුපෙක්ඛා යනු පාළි යි.

2 බ්‍රහ්ම විහාරෝපෙක්ෂාව

"උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති"[2] 'උපෙක්ෂා සහගත සිතින් එක් දිශාවක් පතුරා වාසය කරයි.' මෙහි දැක්වුණු සත්ත්වයන් කෙරෙහි මධ්‍යස්ථකාරක වූ යම් උපෙක්ෂාවෙක් වේ ද එය බ්‍රහ්මවිහාරෝපෙක්ෂා යි.

3 බොධ්‍යඞ්ගෝපෙක්ෂාව

"උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙක නිස්සිතං"[3] 'විවෙක නිඃශ්‍රිත වූ උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය වඩයි' යන මෙහි දැක්වුණු සහජාත ධර්ම අතුරෙන් මධ්‍යස්ථකාරකවූ යම් උපෙක්ෂාවෙක් වේ ද එය බොධ්‍යඞ්ගෝපෙක්ෂා යි. ("භාවනාව වීථි ප්‍රතිපන්න-

[1] දී: නි: පාථෙය්‍යව 166 [2] වි: ප: අප්පමඤ්ඤා වි: 205
[3] සං: නි: මහාවග්ග 855

කල්හි අලීනානුඛත අනිරාඝවාද භාවයෙන් ප්‍රග්‍රහ නිග්‍රහ සම්ප්‍ර-හර්ෂණයෙහි ව්‍යාපාරයක් නැති හෙයින් සම්ප්‍රයුක්ත ධර්මයන් කෙරෙහි මධ්‍යස්ථාකාරයෙන් පවත්නා'' උපෙක්ෂාව බොජ්ඣඞ්ග-පෙක්ඛාය යි සේ යි.

4 වීරියේපෙක්ඛාව

''කාලෙන කාලං උපෙක්ඛා නිමිත්තං මනසිකරොති''[1] 'කලින් කල උපෙක්ඛා නිමිත්ත මෙනෙහි කරයි' යන මෙහි දැක්වුණු පමණ ඉක් මැ පටන් නො ගන්නා ලද පමණ ඉක් මැ ලිහිල් නො කරන ලද වීර්‍ය්‍ය සංඛ්‍යාත යම් උපෙක්ෂාවෙක් වේ ද එය වීරියේපෙක්ඛා යි. (''ලීනුඛවවපක්ඛපාතරහිතං මජ්ඣත්තභාවං විරියං උපෙක්ඛා'' යනු ටීකා යි.) මධ්‍යස්ථාකාරයෙන් පවත්නා වීර්‍ය්‍යය ම ආකාරය ගෙනැ පැවැත්විය යුතු වූ එබඳු වීර්‍ය්‍යයට නිමිත්ත වන බැවින් උපෙක්ෂා නිමිත්ත නම් වේ යනු සන්න යි.)

5 සංඛාරෝපෙක්ඛාව

''කති සඞ්ඛාරුපෙක්ඛා සමාධිවසෙන උප්පජ්ජන්ති. කති සඞ්ඛාරුපෙක්ඛා විපස්සනාවසෙන උප්පජ්ජන්ති. අට්ඨ සඞ්ඛාරුපෙක්ඛා සමාධිවසෙන උප්පජ්ජන්ති. දස සඞ්ඛාරුපෙක්ඛා විපස්සනාවසෙන උප්පජ්ජන්ති''[2] යන මෙහි දැක්වුණු නීවරණාදීන් පරීක්ෂාකොටැ සනිටුහන් වශයෙන් සිටිනාවූ ආදීනව දුටු හෙයින් නීවරණාදීන් ගැන්මෙහි මධ්‍යස්ථ වූ යම් උපෙක්ෂාවෙක් වේ ද එය සංඛාරෝපෙක්ඛා යි. 'සංඛාරෝපෙක්ඛා කීදෙනෙක් සමථ වශයෙන් උපදින් ද, සංඛාරෝපෙක්ඛා කීදෙනෙක් විදර්‍ශනා වශයෙන් උපදින් ද, සංස්කාරෝපෙක්ෂා අටදෙනෙක් සමථ වශයෙන් උපදිති. සංස්කාරෝපෙක්ෂා දස දෙනෙක් විදර්‍ශනා වශයෙන් උපදින්' යනු පෙළේ අර්ථ යි.

සමථ වශයෙන් ලැබෙන අෂ්ට සංඛාරෝපෙක්ෂා ප්‍රභාශක පාළිය මෙසේ ය:- පඨමජ්ඣානං පවිලාභත්ථාය නීවරණෙ පවිසඞ්ගාසන්නිට්ඨානා පඤ්ඤා සංඛාරුපෙක්ඛාසු ඤාණං දුතියජ්ඣානං පවිලාභත්ථාය විතක්කවිචාරෙ තතියජ්ඣානං පවිලාභත්ථාය පීතිං චතුත්ථජ්ඣානං පවිලාභත්ථාය සුඛදුක්ඛ ආකාසානඤ්චායතනං සඤ්ඤාසමාපත්තිං පවිලාභත්ථාය රූප සඤ්ඤා පටිඝසඤ්ඤා නානත්තසඤ්ඤා විඤ්ඤාණඤ්චායතනං සමාපත්තිං පවිලාභත්ථාය ආකාසානඤ්චායතනසඤ්ඤං ආකිඤ්චඤ්ඤායතනං සමාපත්තිං පවිලාභත්ථාය විඤ්ඤාණඤ්චා-යතනං සඤ්ඤං නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපත්තිං

[1]සං: නි: මහාවග්ග [2]ප: ම: මහාවග්ග 62 බුරුම්

පවිලොභනාය ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤං පවිසඛ්බා-සන්නිට්ඨානාපඤ්ඤ සඛ්බාරුපෙකඛාසු ඤාණං ඉමා අට්ඨ සඛ්බාරුපෙකඛා සමාධිවසෙන උපපජ්ජන්ති."[1]

විදර්ශනා වශයෙන් ලැබෙන දස සංස්කාරෝපෙක්ෂා ප්‍රකාශක පාළිය මෙසේ ය:- **සෝතාපත්ති මගඵ පවිලොභනාය උප්පාදං පවත්තිං නිමිත්තං ආයූහනං පටිසන්ධිං ගතිං නිබ්බත්තිං උපපත්තිං ජාතිං ජරං ව්‍යාධිං මරණං සෝක පරිදෙවං උපායාසං** -පෙ- **සෝතාපත්ති ඵලසමාපත්තාය උප්පාදං පවත්තිං** -පෙ- **අරහත්ත මගඵ පවිලොභනාය උප්පාදං** -පෙ- **උපායාසං** -පෙ- **අරහත්ත ඵලසමාපත්තාය සුඤ්ඤතා විහාර සමා-පත්තාය අනිමිත්ත විහාර සමාපත්තාය උප්පාදං පවත්තිං නිමිත්තං ආයූහනං පටිසන්ධිං ගතිං නිබ්බත්තිං උපපත්තිං ජාතිං ජරං ව්‍යාධිං මරණං සෝකං පරිදෙවං උපායාසං පවිසඛ්බා සන්නිට්ඨානා පඤ්ඤ සඛ්බාරුපෙකඛාසු ඤාණංති ඉමා දස විපස්සනා වසෙන උපපජ්ජන්ති."**[1]

6. වෙදනොපෙක්ඛාව

"යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උපපන්නං හොති උපෙකඛා සහගතං."[2] 'යම් කලෙක කාමාවචර උපෙක්ෂා සහගත කුසල සිත උපන්නේ ද' යන මෙහි දැක්වුණු යම් අදුකඛම සුඛ නම් උපෙක්ෂාවෙක් වේ ද එය වෙදනොපෙක්ෂාව යි.

7. විදර්ශනොපෙක්ෂාව

යදත්ථි යං භූතං තං පජහති උපෙකඛං පටිලභති"[3] 'යමෙක් වේ ද යමෙක් විණි ද එය දුරු කරයි. උපෙක්ෂාව ලබයි.' යන මෙහි දැක්වුණු අනිත්‍යාදි වශයෙන් සම්මර්ශනයෙන් මධ්‍යස්ථ වූ යම් උපෙක්ෂාවෙක් වේ ද එය විදර්ශනොපෙක්ෂාව යි.

8. තත්‍රමධ්‍යත්තොපෙක්ෂාව

ඡන්දාදි **"යෙවාපනක"** ධර්මයන් ඇතුළත් සහජාත ධර්ම සම වැ ඉසිලීමට කාරණ වූ යම් උපෙක්ෂාවෙක් වේ ද එය තත්‍රමජ්ඣත්තුපෙකඛා යි. ("යෙවාපනක" **ධම්මසඛඟණියෙහි**[4] බලනු)

9. ධ්‍යානොපෙක්ෂාව

"උපෙකඛකො ච විහරති"[5] උපෙක්ෂක වැ වෙසේ යන මෙහි දැක්වුණු අග්‍ර වූ ධ්‍යාන සුඛයෙහි පක්ෂපාත නො දනවන යම් උපෙක්ෂාවෙක් වේද එය ධ්‍යානොපෙක්ෂාව යි.

---

[1]ප: ම: මහාවගග 62 බුරුම, [2]ධ: ස: චිත්තුපාදක 13,
[3]සං: නි: මහාවගග [4]අ: සා: අඨකථා 134 [5]වි: ප: ඤාතවිභඞග 186

10 පාරිශුද්ධි උපෙක්ෂාව

"උපෙක්ඛා සතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං"[1] 'උපෙක්ෂා සමෘති පරිශුද්ධි ඇති චතුර්ථධ්‍යානය' යන මේහි දැක්වුණු නීවරණ- චිතසික- විචාරාදි සියලු ප්‍රතිපක්ෂ ධර්මයන්ගෙන් පිරිසිදු වූ ප්‍රතිපක්ෂ ධර්ම සංසිදුවීමේහි ද උත්සාහ රහිත වූ යම් උපෙක්ෂාවෙක් වේ ද එය පාරිශුද්ධි උපෙක්ෂාව යි.

මේ දශවිධ උපෙක්ෂා අතුරෙන් ෂඩඞ්ගෝපෙක්ෂා බ්‍රහ්ම විහාරෝපෙක්ෂා බොධ්‍යඞ්ගෝපෙක්ෂා තත්‍රමධ්‍යත්වෝපෙක්ෂා ධ්‍යානෝපෙක්ෂා පාරිශුද්ධ්‍යුපෙක්ෂා යන සය අවී වශයෙන් එක ම තත්‍රමජ්ඣත්තුපෙක්ෂාව ම ය. එක ම පුඥලයා කුමාර තරුණ- මහලු- සෙනෙවි- රජ ආදි වශයෙන් බෙදී යන්නා සේ මෙ ද ඒ ඒ අවස්ථා භෙදයෙන් බෙදී ගියේ ය. එ බැවින් ඡළඞ්ගුපෙක්ෂා ඇති තැනැ බොජ්ඣඞ්ගුපෙක්ඛාදිය ද බොජ්ඣඞ්ගුපෙක්ඛා ඇති තැනැ ඡළඞ්ගුපෙක්ඛාදිය ද නො වන බව දත යුතු.

යට දැක්වුණු උපෙක්ෂා අවී වශයෙන් **එකක්** වූ සේ ම සංඛාරෝපෙක්ෂාව හා විදර්ශනෝපෙක්ෂාව ද අවී වශයෙන් **එකෙක්ම** ය. ඒ වනාහි එකම ප්‍රඥාව කෘත්‍ය වශයෙන් ද්විවිධ වූ සැටි යි. පුරුෂයෙක් සවස ගෙට වන් සර්පයකු අජපද දණ්ඩ ගෙනැ සොයන්නේ බොල්ගොඩෙහි හොත්තා දැකැ සර්පයා දෝ නොවේ දෝ යි සැක ඇති වැ නැවත නැවත පිරික්සන්නේ සෝවැති තුන දැකැ සැකය දුරුවැ ඌ සෙවීමෙහි උපෙක්ෂා වන්නේ ද එමෙන් ආරබ්ධ විදර්ශක විදර්ශනා ඥනයෙන් තිලකුණු දුටු කල්හි නැවත සංඛාරයන්ගේ අනිත්‍යතාදිය සෙවීමෙහි උපෙක්ෂා වන්නේ ය. එය **විදර්ශනෝපෙක්ෂා ය.** වැළි ඒ පුරුෂයා අජ පද දණ්ඩන් සර්පයා දැනි වැ තද කොටැ ගෙනැ "මම කෙසේ මූට ද නොරිද වා මා ද දෂ්ට කරවා නො ගෙන මූගෙන් මිදී යෙම් දැ" යි ඌ මුදුලන ආකාරය සලකමින් ගැන්මෙහි මධ්‍යස්ථ වන්නේ ද එමෙන් ඒ විදර්ශක තිලකුණු දුටු බැවින් භවත්‍රය ගිනි ඇවිළ ගත්තා සේ සලකා සංඛාර ග්‍රහණයෙහි මධ්‍යස්ථ වන්නේ ය. එය **සංඛාරෝපෙක්ෂා යි.** මෙසේ විදර්ශනෝපෙක්ෂාව සිඛ කල්හි සංඛාරෝපෙක්ෂාව ද සිඛ ම ය. (සෝවැති තුන දුටුවහුට සර්ව ලක්ෂණ විචාරයෙහි මෙන් තුන් ලකුණු දුටුවහුට සංඛාරයන්ගේ අනිත්‍යාදි ලක්ෂණ දෘෂ්ට හෙයින් සංඛාර ලක්ෂණ විචාරයෙහි උපෙක්ෂා ම වෙයි. සංඛාරයන්ගේ

---

[1] ම: ප: ඤානවිභඞ්ග 186

මැදහත් වූ විදර්ශනොපෙක්ෂාව සිද්ධ කල්හි දෝෂාදීනව වූ ඒ සංස්කාරයන් ග්‍රහණයෙහි අධ්‍යාශය සවී සංස්කාර නිමිති හෙයින් උපෙක්ෂාව ද සිද්ධ වෙයි දත යුතු. යනු **පැරකුම්බා සන්නයි.**) සෙවීමෙහි හා ගැනීමෙහි මධ්‍යස්ථතා සංඛ්‍යාත කෘත්‍යයෙන් මේ උපෙක්ෂාප්‍රඥව මෙසේ විවිධ වියැ.

වීර්‍යොපෙක්ෂාව හා වෙදනොපෙක්ෂාව ඔවුනොවුන් හා ද සෙසු උපෙක්ෂාවන් හා ද අවී වශයෙන් හින්න මැ යි.

දශවිධ උපෙක්ෂා නෙද යි.

දශවිධ උපෙක්ෂා අතුරෙන් මෙහිලා ගත යුත්තේ ඛ්‍යානොපෙක්ෂා ය. ඛ්‍යානොපෙක්ෂායෙහි ලක්ෂණය මධ්‍යස්ථ භාවය යි. රසය අනාභොගය යි හෙවත් මෙතෙහි නො කරන බව යි. පච්චුපට්ඨානය අව්‍යාපාරය යි. හෙවත් ප්‍රහීණ ද වූ සුවෙහි ව්‍යාපාර නැති බව යි. පදට්ඨාන ප්‍රීතිවිරාගය යි.

ප්‍රශ්නයෙක් නගී. මෙහි දැක්වෙන උපෙක්ෂාව ද අවී වශයෙන් තත්‍රමජ්ඣත්තුපෙක්ඛාවම නො වේ ද එය ප්‍රථම විතීය ධ්‍යානයන්හිදු ඇති බැවින් එහිදු "උපෙක්ඛකො විහරති"යි වදාළ යුතු නො වේ ද කුමක් හෙයින් එසේ නො වදාළේ ද

උත්තර මෙසේ යි.

සැබෑවැ! එහිදු ඇත්තේ ය. එහෙත් එහි නො වදාළේ එහි පවත්නා උපෙක්ෂාව පරිව්‍යක්ත කෘත්‍ය රහිත බැවින්. [එහි පවත්නා උපෙක්ෂාවගේ කෘත්‍යය] විතර්කාදීන් අභිභූත බැවින් පරිව්‍යක්ත නො වේ. මෙහි එයින් අනභිභූත බැවින් හිස එසවූ සේ පරිව්‍යක්ත ය. එ හෙයින් මෙහි ම වදාරන ලද්දේ ය.

"උපෙක්ඛකො ච විහරති" යනුයෙහි අවී වර්ණනාව යි.

"සතො ච සම්පජානො"

'සරතීති සතො සමපජානාතී ති සමපජානො' යිහිකරත්තේ "සතො" ය මතා කොට දත්තේ "සම්පජානො" ය. පුද්ගලාධිෂ්ඨාන වශයෙන් සතිය හා සම්ප්‍රඥව කියූ නැති. සිහියෙන් යුක්ත වූයේ සම්‍යක් ප්‍රඥයෙන් යුක්ත වූයේ යනු අවී යි. මෙහි **සතිය** සිහිකිරීම **ලක්ෂණ** කොටැ ඇත්තේ ය. සිහිමුළා නො වීම කෘත්‍ය කොටැ ඇත්තේ ය. කෙලෙසුන් කෙරෙන් ආරක්ෂාව

පච්චුපට්ඨාන කොටැ ඇත්තේ ය. **සම්පජඤ්ඤය** මූලා නොවීම **ලක්ඛණ** කොටැ ඇත්තේ ය. *තීරණය* **කෘත්‍ය** කොටැ ඇත්තේ ය. **වීමංසාව** පච්චුපට්ඨාන කොටැ ඇත්තේ ය.

මෙහිදු ප්‍රශ්නයෙකි.

මේ සති-සම්පජඤ්ඤ යට ධ්‍යානයන්හි ඇත්තේ නො වේ ද සිහි-නුවණ නැතියාහට අවීණා තිබේ වා. උපචාර මාත්‍රයෙකු දු නො ලැබෙයි.

පිළිතුරු මෙසේ ය.

විතර්කාදි සප්තාඞ්ග ඇති බැවින් යට ධ්‍යාන ඖදාරික ය. එසේ ඒ ධ්‍යාන ඖදාරික බැවින් පුරුෂයකු හට පොළොවෙහි ගමන පහසු වන්නා සේ එහි චිත්තයාගේ ගමන පහසු වන්නේ ය. එහෙයින් එහි සති - සම්පජඤ්ඤ පිළිබඳ **කෘත්‍යය** ව්‍යක්ත නො වේ. මෙහි ඖදාරිකාඞ්ග නැති බැවින් මෙය සූක්ෂම ය. එබැවින් මෙහි පුරුෂයකුගේ කර මුවහතෙහි ගමන මෙන් සති - සම්පජඤ්ඤ කෘත්‍යයෙන් යුක්ත වූ ම චිත්තයාගේ ගමන **කැමැති** විය යුතු ය. එ බැවින් මෙහි ම "සතො සම්පජානො"යි දැක්විණි.

තවද කිරිවස්සා දෙනගෙන් ඉවත් කරන ලද්දේ නමුදු ඉදින් රැකැ නො ගන්නා ලද්දේ නම් නැවත දෙන කරාම දුවන්නේ ය. තෘතීය ධ්‍යාන සුඛය ද ප්‍රීතියෙන් ඉවත් කරන ලද්දේ ඉදින් සති - සම්පජඤ්ඤයෙන් නො රක්නා ලද්දේ නම් නැවත ප්‍රීතියට ම පැමිණෙන්නේ ය. (දවිතීය ධ්‍යානයට ම පැමිණෙන්නේ ය යි සේ යි.) ප්‍රීති සම්ප්‍රයුක්ත ම වන්නේ ය. සත්ත්වයෝ සුවයෙහි ඇලෙති මෙයට වඩා සුවයක් නැති බැවින් මෙය අති මධුර සුවය යි. සති-සම්පජඤ්ඤානුභාවයෙන් ම සුවයෙහි නො ඇල්ම විය යුතු ය. සුවයෙහි නො ඇල්මට වෙන හෙතු නැත. මෙ ද දක්වන්නට "සතො සම්පජානො" යනු මෙහි ම දක්වන ලදැ යි දත යුතු යි.

සුඛං ච කායෙන පටි සංවෙදෙති = කයෙන් සුව ද විඳින්නේ ය. තෘතීය ධ්‍යානයෙන් යුක්ත වූ යොගි හට "මම සුව විඳිමි" යන ආභොගයෙක් - කල්පනාවෙක් නැත. එතකුදු වුව ද හේ නාමකාය හා සම්ප්‍රයුක්ත වූ යම් සුවයෙක් ඇද්ද එය විඳින්නේ ය. තවද නාමකාය හා සම්ප්‍රයුක්ත වූ ඒ සුවයෙන් නිපන් අතිප්‍රණීත වූ රූපයෙන් ඔහුගේ රූපකාය සපශී වන්නේ ය. එසින් හේ ධ්‍යානයෙන් නැගී සිටියේ ද

කායික සුව අනුභව කෙරෙයි. "සුඛං ච කායෙන පටිසංවෙදෙති" යනු වදාළේ එහෙයිනි.) (නාම කායයෙන් චෛතසික සුඛය ද කායික සුඛ හෙතු වූ රූපය ඉපදවීමෙන් කායික සුඛය ද ධ්‍යාන සමන්විතයා අනුභව කෙරෙ යි කියනු ලැබෙ යි. මේ මේහි සංක්ෂේපාර්ථ යි යනු **පැරකුම්බා** සන්න යි.)

යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකෝ සතිමා සුඛවිහාරීති = යම් ධ්‍යානයක් හෙතු කොටැ ගෙනැ බුද්ධාදි ආර්‍යයෝ ඒ තෘතීයධ්‍යාන සමඞ්ගි පුද්ගලයා හට **"උපෙක්ඛකෝ සතිමා සුඛවිහාරී"** යි ප්‍රශංසා කරත් ද ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කර යි යනු එහි අර්ථ යි. කුමක් හෙයින් උන්වහන්සේ ඔහුට එසේ ප්‍රශංසා කරනසේක් ද ප්‍රශංසාවට සුදුසු බැවින්.

ඒ එසේ මැ යි:-

මේ තෙමේ ඉතා මිහිරි සුව ඇති- සුවයාගේ පරතෙරට පත් - තෘතීය ධ්‍යානයෙහි ද **"උපෙක්ඛකය"**ය යනු සුඛාභිලාෂයෙන් තො අදනු ලැබෙ යි. ප්‍රීතිය නුපදනා පරිදි සිහි එළවා සිටින බැවින් සතිමත් ය. ආර්‍යීකාන්තා වූ ආර්‍යී ජන නිසෙවිත වූ අසංකුලිෂ්ට වූ සුඛය නාමකායයෙන් විඳින බැවින් සුඛ විහාරී ය. එ හෙයින් එසේ ප්‍රශංසාර්හ ය, එ හෙයින් ම ආර්‍යීයෝ ඔහුට **"උපෙක්ඛකෝ සතිමා සුඛ විහාරී"** යයි ප්‍රශංසා කරති යි දනයුතු.

"තතියං" ගණන් පිළිවෙළින් ද තුන් වැනි වැ සම්වදින බැවින් ද මේ **"තතිය"** යි.

එකඞ්ග විප්පහීණං දුවඞ්ග සමන්නාගතං = එකාඞ්ගයෙකින් විප්‍රහීණ වූ, අඞ්ගද්වයයෙකින් සමන්විත වූ, මේහි **එකාඞ්ග** විප්‍රහීණත්වය ප්‍රීති ප්‍රහාණ වශයෙන් වූවෙකි. ප්‍රීතිය වනාහි දවිතීය ධ්‍යානයෙහි විතකී - විචාර මෙන් අප්‍රණාක්ෂණයෙහි ම ප්‍රහීණ වන්නේ ය. එ බැවින් එය ප්‍රහාණාඞ්ගය යි කියන ලදී. සුඛ-චිත්තෙකග්ගතා ඉන්‍ද්‍රීය වශයෙන් අඞ්ගවයයෙන් සමන්විත විය. එහෙයින් **විභඞ්ගයෙහි "ඣානංනි උපෙක්ඛා සතිසම්පජඤ්ඤං සුඛං චිත්තස්සෙකග්ගතා"**[1] යි වදාළේ ය. එසේ වදාළේ පර්‍යායය වශයෙන් සපරිවාර ධ්‍යානය දක්වනු සඳහා ය. උපෙක්ඛාව හා සතිසම්පජඤ්ඤ හැර නිෂ්පර්‍යාය වශයෙන් උපනිධ්‍යාන ලක්ෂණයට පැමිණි අඞ්ගයන්ගේ වශයෙන් මෙය දුවඞ්ගික යි.

වදාළේ මැ යි.

"කතමං තස්මිං සමයෙ දුවඞ්ගිකං ඣානං හොති සුඛං චිත්තස්සෙකග්ගතා"[2] යි. සෙස්ස ප්‍රථම ධ්‍යානයෙහි කී පරිදි මි ය.

තෘතීය ධ්‍යානය පිළිබඳ විස්තරය යි.

---

[1] වි: ප: ඣානවිභඞ්ග 186 [2] වි: ප: ඣානවිභඞ්ග 200

චතුර්ථධ්‍යානය ලබාගත යුතු ක්‍රමය

යට දැක්වුණු සේ ලැබෑ ගත් තෘතීය ධ්‍යානයෙහි ආවර්ජනාදි පස් ආකාරයෙන් වශීභාවය වැ ප්‍රගුණ වූ එයින් නැගී "මේ සමාපත්තිය ආසන්න වූ ප්‍රීති නමැති පසමිතුරෙක් ඇත්තේ ය. මෙහි පවත්නා සැපය යන ආභොගයෙන් මෙය ඖදාරික සේ ද වැටහෙ යි. එහෙයින් ම එය අඞ්ග දුර්වලය"යි එහි දෙස් දැකැ චතුර්ථ ධ්‍යානය ශාන්ත වශයෙන් සලකා තෘතීය ධ්‍යානයෙහි අපෙක්ෂාව හැරැ පියා චතුර්ථධ්‍යානය ලබාගන්නා පිණිස භාවනාරම්භ කට යුතු යි.

තෘතීය ධ්‍යානයෙන් නැගී සිහි නුවණ ඇති වැ ඒ යොගාවචර එසේ භාවනාරම්භ කොටැ ධ්‍යානාඞ්ග ප්‍රත්‍යවෙක්ෂාකරන්නේ ම ඔහුට චෛතසික සෞමනස්‍ය සඞ්ඛ්‍යාත සුඛය ඖදාරික වශයෙන් ද, උපෙක්ෂාවෙදනාව හා චිත්තෛකාග්‍රතාව ශාන්ත වශයෙන් ද වැටහෙයි. එවිට හේ ඖදාරිකාඞ්ග ප්‍රහාණය පිණිස හා ශාන්තාඞ්ග ප්‍රතිලාභය පිණිස ඒ කසිණ නිමිත්තය ම "පඨවි-පඨවි" යි කැවත කැවත මෙනෙහි කරන්නේ ය. එසේ මෙනෙහි කරන්නේ ම දැන් චතුර්ථ ධ්‍යානය උපදී ය යි භවාඞ්ග සිදී. ඒ පඨවි කසිණය ම අරමුණු කොටැ මනොද්වාරාවර්ජනය උපදී. ඉක්බිති එයම අරමුණු කොටැ ජවන් සතර හෝ පස දිවේ. එයින් අවසාන ජවනය රූපාවචර චතුර්ථධ්‍යානිකය. සෙස්ස යට කීසේ කාමාවචර යි.

මෙහි කිය යුතු විශෙෂයෙක් ඇති:- සුඛ වෙදනාව අදුක්ඛමසුඛ වෙදනාවට ආසෙවනප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය නො වේ. චතුර්ථ ධ්‍යානයෙහි ලැබිය යුත්තේ අදුක්ඛමසුඛ වෙදනාව ය. එ බැවින් ඒ සතර-පස් ජවන් උපෙක්ෂාවෙදනා සම්ප්‍රයුක්ත ය. එ බැවින් එහි ප්‍රීතිය නො වන්නේ ය.

මෙතෙකින් ඒ යොගාවචර **"සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති"**[1] යි වදළ පරිදි සුඛය ද ප්‍රහාණය කිරීමෙන් දුක්ඛය ද ප්‍රහාණය කිරීමෙන්, පූර්වයෙහි ම සෞමනස්‍ය හා දෞර්මනස්‍ය අස්තඞගම කිරීමෙන්, දුක් නො වූ, සුඛ නො වූ, උපෙක්ෂා සමෘතියෙන් පිරිසිදු වූ, චතුර්ථ ධ්‍යානය ලබා වාසය කරන්නේ ය. මෙසේ ඔහු විසින් එක් අඞ්ගයෙකින් විප්‍රහීණ වූ, අඞ්ගචතුෂ්කයෙකින් සමන්විත වූ, ත්‍රිවිධ කල්‍යාණ හා දශ ලක්ෂණ සම්පන්න පඨවිකසිණ චතුර්ථධ්‍යානය ලබා ගන්නා ලද්දේ වේ.

1වි: ප: ඣානවිභඞ්ග 186

"සුඛස්ස ච පහාණා" යනාදියෙහි විවරණය මෙසේ ය. **සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා** = කායික සුඛය ද, කායික දුඃඛය ද ප්‍රහාණය කිරීමෙන්.

පුබ්බේව = ඒ ප්‍රහාණය පූර්වයෙහි ය. චතුර්ථ ධ්‍යානලක්ෂණයෙහි නො වේ.

සොමනස්ස දෝමනස්සානං අත්ථඞ්ගමා = චෛතසික සුඛ චෛතසිකදුඃඛ යන මේ දෙක ද පූර්වයෙහි ම අස්තංගම කිරීමෙන් අස්තංගම නම් ප්‍රහාණය මැ යි. ඔවුන්ගේ ප්‍රහාණය කවරදැ යන්නේ ද චතුර්ධ්‍යානයන් ගේ උපචාරක්ෂණයෙහි ය.

ඒ එසේ මැ යි:-

සොමනස්සය චතුර්ථ ධ්‍යානයාගේ උපචාරක්ෂණයෙහි ද, දුක්ඛ-දෞමනස්ස-සුඛයෝ ප්‍රථම- ද්විතීය- තෘතීය ධ්‍යානයන්ගේ උපචාරක්ෂණයෙහි ද, ප්‍රහීණ වෙති. කිය යුත්තෙක් ඇති **'සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා පුබ්බේව සොමනස්ස දෝමනස්සානං අත්ථංගමා'** යි. මෙහි සුඛ- දුක්ඛ- සොමනස්ස- දෞමනස්ස වදාළේ ප්‍රහාණ ක්‍රමයෙන් නො වේ. **ඉන්ද්‍රිය විභඞ්ගයෙහි** ඉන්ද්‍රිය උදෙසා කළ ක්‍රමයෙනි. ප්‍රහාණ ක්‍රමයෙන් වදාළේ නම් 'දුක්ඛං-දෞමනස්සං-සුඛං-සොමනස්සං' විය යුතු ය.

ප්‍රශ්නයෙකි:- මේ සුඛ- දුක්ඛ- සොමනස්ස- දෞමනස්සයෝ ඒ ඒ ධ්‍යානයන්ගේ උපචාර ක්ෂණයෙහි ප්‍රහීණ වෙත් නම් **"කත්ථුප්පන්නා දුක්ඛින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති? ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව ච කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. එත්ථුප්පන්නං දුක්ඛින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති. කත්ථ ච ුප්පන්නං දෞමනස්සින්ද්‍රියං -පෙ- සුඛින්ද්‍රියං -පෙ- සොමනස්සින්ද්‍රියං -පෙ- අපරිසෙසං නිරුජ්ඣති. ඉධ භික්ඛවෙ භික්ඛු සුඛස්ස ච පහාණා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති එත්ථුප්පන්නා සොමනස්සින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති"**[1] යි. කුමක් හෙයින් ධ්‍යානයෙහි දී ම නිරෝධය වදාරන ලද්දේ ද (පෙළෙහි අර්ථ සුගම ය.)

උත්තර මෙසේ ය:- අතිශය නිරෝධ හෙයිනි. ප්‍රථම ධ්‍යානාදියෙහි ඒ දුඃඛාදීන්ගේ නිරෝධය අතිශය නිරෝධය. නිරෝධ මාත්‍ර නො වේ. උපචාර ක්ෂණයෙහි ඔවුන්ගේ නිරෝධය නිරෝධ මාත්‍රය අතිශය නිරෝධ නො වේ. එසේ මැ යි:- යම් ආවර්ජනයකින් අර්ථාවේ ද එයින් නිත්‍ය වූ ආවර්ජන ඇති ප්‍රථමධ්‍යානොපචාරයෙහි දී නිරුඬ වූ දුඃඛෙන්ද්‍රිය මැසි - මදුරු ආදීන්ගේ ඩැහැමෙන් හෝ විෂම වැ හිඳීමෙන් ලැබෙන පීඩායෙන් හෝ යළිදු උපදිය හැකිය. අර්ථායෙහිදී ඒ නැවත නූපදනේ ම ය.

[1] සං: නි: ඉන්ද්‍රියසං: 941

තවද උපචාරයෙහි දී නිරුඬ වූ ඒ දුඃඛෙන්ද්‍රිය ප්‍රතිපක්ෂ ධර්මය විසින් කොතෙක ලද බැවින් මනා වැ නිරුඬ වූයේ නොවේ. දුඃඛෙන්ද්‍රියයට ප්‍රතිපක්ෂ නම් ප්‍රීතිය යි. අර්හත්වයෙහිදී ප්‍රීතිය පැහිරීමෙන් සියලු කය සුඛයෙන් වදනා ලද්දේය. සුඛයෙන් වදනා ලද කය පිළිබඳ දුඃඛෙන්ද්‍රිය ප්‍රතිපක්ෂ ධර්මය විසින් නසනා ලද බැවින් මනාව නිරුඬ වූයේ වෙයි.

එසේ මෑ භින්න වූ ආවර්ජන ඇති දවිතීය ධ්‍යානොපචාරයෙහි ප්‍රහීණ වූ දෞමනස්සින්ද්‍රියය විතර්ක – විචාර ප්‍රත්‍යය කොටැ ඇති කායකර්මඵුවක් හෝ චිත්ත පීඩාවක් හෝ ඇති කල්හි නැවත උපදනේ ය. විතර්ක – විචාර නැති කල්හි නැවත නූපදනේ ය. යම් නැතෙක දෞමනස්සින්ද්‍රිය වේ නම් ඒ වන්නේ විතර්ක – විචාර ඇති බැවින් ය. විතීය ධ්‍යානොපචාරයෙහි විතර්ක – විචාර අප්‍රහීණ ය. එබැවින් එහි දෞමනස්සින්ද්‍රිය විය හැකිය. ප්‍රහීණ ප්‍රත්‍යය බැවින් විතීය ධ්‍යානයෙහි දෞමනස්සින්ද්‍රිය නො වන්නේ ය.

එසේම තෘතීය ධ්‍යානොපචාරයෙහි දී ප්‍රහීණ වූ සුඛින්ද්‍රිය ප්‍රීතියෙන් උපන් ප්‍රණීත රූපයෙන් පැතුරුණු සිරුරු ඇතියාහට නැවත උපදිය හැකි ය. තෘතීය ධ්‍යානයෙහි දී නම් නූපදිය හැකි ය. එහිදී සුඛයට ප්‍රත්‍යය වූ ප්‍රීතිය සඤ්ඤාරයෙන් නිරුඬ බැවිනි.

එසේම චතුර්ථධ්‍යානොපචාරයෙහි දී ප්‍රහීණ වූ සෞමනස්සින්ද්‍රියය ආසන්න බැවින් හා අර්හත්ඵල ප්‍රාපත උපෙක්ෂා නැති වැ මැනෙවින් නො ඉක්මුණු බැවින් නැවත උපදිය හැකි ය. චතුර්ථධ්‍යානයෙහිදී නම් නූපදිය හැකි ය. එහි අර්හත්ඵල ප්‍රාපත උපෙක්ෂා ඇති බැවිනි.

“එතේසු පඤ්ඤත්තං දුක්ඛින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති” යි අපරිසෙස ශබ්දය යොදන ලද්දේ මේ නිසා ය යි දත යුතු.

තවද ප්‍රශ්නයෙකි:- ප්‍රථමාදි ඒ ධ්‍යානයන්ගේ උපචාරයෙහි ප්‍රහීණ වූ මේ වෙදනා යම්දු කුමක් හෙයින් දක්වන ලද ද

උත්තරය මෙසේ ය:- සුවසේ ගැන්ම පිණිස ය. **“අදුක්ඛම-සුඛං”** යි මෙහි දුක්වුණු අදුක්ඛමසුඛ වෙදනාව හෙවත් උපෙක්ෂා වෙදනාව සියුම් ය. සුවසේ දැනගන්නට අපහසු ය. ළං වැ ගන්නට බැරි තරම් වණඹ වූ ගොනු අල්ලාගැන්ම පිණිස ගොපල්ලා ගාලෙහි සියලු ගෙරින් එක් කොටැ එක එකා බැහැර කරමින් පිළිවෙළින් ආ වණඹයා “මේ ඌය

උහු ගනිවු" ය සි උහු ද ගත්තේ ද, එ මෙන් **බුදුහු** සුව සේ ගැන්ම පිණිස මූල පටන් සියලු වෙදනා දුක්වූ සේක. එසේ දුක්වීමෙන් සුවත් නො වූ, දුකුත් නො වූ, සොම්නසුත් නො වූ, දෙම්නසුත් නො වූ යම් වේදනාවෙක් වේ ද එය අදුකඛාසුඛ වේදනාය සි ගත්වන්නට හැකි ය.

තව ද අදුකඛාසුඛ හෙවත් උපෙක්ෂා වෙතො විමුක්තියට ප්‍රත්‍යය දක්වනු සඳහා ද **මේ** වදළේ ය සි දත යුතු. අදුකඛා සුඛයට හෙවත් උපෙක්ෂාවට ප්‍රත්‍යය නම් – සුඛ දුඃඛ ප්‍රහාණාදිය සි. වදළේ මැ සි.

"චතූසාරෝ ඛො ආවුසො පච්චයා අදුකඛමසුඛාය වෙතො විමුත්තියා සමාපත්තියා, ඉධ ආවුසො භික්ඛු සුඛස්සච පහාණා – පෙ – චතුත්ථංඣානං උපසම්පජ්ජ විහරති. ඉමේ ඛො ආවුසො චතූසාරෝ පච්චයා අදුකඛමසුඛාය වෙතොවිමුත්තියා"[1] සි අවී සුගම සි.

තවද සෝවාන් මාගීයෙහි දී ප්‍රහීණ වූ සක්කායදිට්ඨි ආදිය අනාගාමි මාගීයට ප්‍රශංසා පිණිස එහි දී ද වදළා සේ මෙයට ප්‍රශංසා පිණිස සෙසු වෙදනා ද මෙහි දී වදළ සේකැයි දත යුතු.

තවද ප්‍රත්‍යය නාශයෙන් හෝ රාගවෙෂාදීන් කෙරෙන් ඉතා දුරු බව දක්වන්නට මෙය වදළේය සි දත යුතු.

එසේ මැ සි:–

මොවුන් අතුරෙන් සුඛය සොමනස්සයට ද, සොමනස්සය රාගයට ද, දුකඛය දෙමනස්සයට ද, දෙමනස්සය වෙෂයට ද, ප්‍රත්‍යය ය. සුඛ – දුකඛ නාශයෙන් ප්‍රත්‍යය සහිත රාග වෙෂයෝ නැසුණෝ වෙති. එයින් ඔව්හු ඉතා දුරුවූවෝ වෙත්.

අදුකඛමසුඛං = දුකඛ නැති බැවින් අදුකඛ වූ, සුඛ නැති බැවින් අසුඛ වූ, මේයින් දුක්වුණේ දුඃඛ – සුඛ දෙකට ප්‍රතිපක්ෂ වූ තෘතීය වේදනාව ය. දුඃඛ – සුඛයන්ගේ අභාව මාත්‍රය නො වේ. තෘතීය වේදනා නම් අදුකඛාසුඛ වෙදනා ය. උපෙක්ෂා ය යි සේ සි. උපෙක්ෂායෙහි ලක්ෂණය ඉෂ්ටානිෂ්ට දෙකට විපරීත වූ මධ්‍යස්ථාලම්බනානුභවනය සි. රසය හෙවත් කෘත්‍යය මධ්‍යස්ථ භාවය සි. පච්චුපට්ඨානය ගල් පිට මුවන් ගිය මං සේ සුව දුක් දෙකින් අනුමාන කටයුතු බැවින් අව්භූත භාවය යි හෙවත් නො පහළ බව සි. පදට්ඨානය සුඛ නිරොධය සි. (චතුර්ධ්‍යානොපචාරය සුඛ නිරොධ නම්. ඒ ආසන්න කාරණ කොටැ ඇත්තේය. යන අවී සි.)

---

[1] ම්: නි: මූලප: 299

උපෙක්ඛාසතිපාරිසුද්ධිං = උපෙක්ෂාගෙන් ජනිත සමෘති පාරිසුද්ධි ඇති. මේ ධ්‍යානයෙහි සමෘතිය පිරිසිදු ය. ඒ පිරිසිදු බව උපෙක්ෂාගෙන් කැරුණේ ය. අන්‍යයෙකින් කැරුණේ නො වෙයි. එහෙයින් එය උපෙක්ඛාසතිපාරිසුද්ධිය යි කියනු ලැබේ. **"අයං සති ඉමාය උපෙක්ඛාය විවටා හොති පරිසුද්ධා පරියොදාතා තෙන වුච්චති උපෙක්ඛා සති පාරිසුද්ධිං"**[1] යි **විභඞ්ගයෙහිදු** වදාළේ ය. මේ සමෘතිය මේ උපෙක්ෂාගෙන් විවෘත ය, පාරිශුද්ධ ය, නිර්මල ය. එහෙයින් උපෙක්ඛා – සතිපාරිසුද්ධිය යි කියනු ලැබේ. යනු එහි අර්ථ යි. සමෘතිය පිරිසිදු කරන මේ උපෙක්ෂාව අර්ථ වශයෙන් ගතහොත් තත්‍රමජ්ඣත්තතාවය යි දත යුතු. ඒ තත්‍රමජ්ඣත්තතාගෙන් පිරිසිදු වන්නේ සමෘතිය මතු නො වේ. සියලු සම්ප්‍රයුක්ත ධර්මයෝ ම පිරිසිදු වෙති. එහෙත් දෙසනාව සමෘති ශීර්ෂයෙන් වදාළේ ය.

වැළි කිය යුත්තෙක් ඇති, මේ උපෙක්ෂාව සට ධ්‍යානත්‍රය-යෙහි ද පවත්නේ ය. දහවල් සූර්‍ය්‍ය රශ්මියෙන් අභිභූත බැවින් ද, සෞම්‍යත්වයෙන් හා තමිහට උපකාරත්වයෙන් සහාග වූ රාත්‍රිය නො ලැබීමෙන් ද, දහවල් විද්‍යමාන වූ ද චන්ද්‍ර රෙඛාව අපරිසුද්ධ අපරියොදාත වන්නා සේ මේ තත්‍රමජ්ඣත්තුපෙක්ඛාව ද, චිත්තඋත්පාදි විරුද්ධ ධර්ම තෙජසින් මැඩුණු බැවින් ද, සහාග වූ උපෙක්ෂාව නො ලැබුණු බැවින් ද, ප්‍රථම ධ්‍යානාදියෙහි විද්‍යමාන වුවද, අපරිසුඛ අපරියොදාත වන්නේ ය. (නො නියුණු බැවින් චන්ද්‍ර රෙඛාව මෙන් රාත්‍රි ද සෞම්‍ය ය, රාත්‍රියෙහි ම චන්ද්‍ර රෙඛාව දිලියෙන බැවින් රාත්‍රිය චන්ද්‍ර රෙඛාවට උපකාර ය.) ඒ අපිරිසිදු කල්හි අපිරිසිදු වූ චන්ද්‍ර රෙඛායෙහි ප්‍රභාව මෙන් සහජාත වූ ද සමෘති ආදීහු අපිරිසිදු වෙති. එහෙයින් ඒ ප්‍රථම ධ්‍යානාදියෙහි එකෙකුදු "උපෙක්ඛා සති පාරිසුද්ධි" ය යි නො වදරන ලදි. මේ චතුර්ථ ධ්‍යානයෙහි වනාහි චිත්තඋත්පාදි විරුද්ධ ධර්ම සංඛ්‍යාත තෙජසින් නො මැඩුණු බැවින් ද, උපෙක්ෂා වෙදනා සංඛ්‍යාත රාත්‍රිය ලැබුණු බැවින් ද, මේ තත්‍රමජ්ඣත්තුපෙක්ඛා සංඛ්‍යාත චන්ද්‍ර රෙඛාව ඉතාම පිරිසිදු ය. එ බැවින් පිරිසිදු චන්ද්‍ර රෙඛායෙහි ප්‍රභාව මෙන් සහජාත වූ සමෘති ආදීහු ද පිරිසිදු ය. නිර්මල ය. එ බැවින් මේ ම උපෙක්ඛාසතිපාරිසුද්ධිය යි වදරන ලද්දේ ය යි දත යුතු.

චතුක්කං = ගණන් පිළිවෙළින් හෝ සතර වැනි වැ සම වදින බැවින් හෝ සතර වැනි වූ.

---

[1] වි: ප: ඣානවි: 197

"එකඞ්ග විප්පහීණං දුවඞ්ගසමන්නාගතං" යන මෙහි සෞමනස්‍ය ප්‍රහාණ වශයෙන් එකාඞ්ග විප්‍රහීණත්වය දත යුතු. ඒ සෞමනස්‍ය ප්‍රහාණය ද එක චිත්තයෙහි පූර්ව ජවන්හි ම වන්නේ ය. එහෙයින් එය ඒ ධ්‍යානය පිළිබඳ ප්‍රහාණාඞ්ගය යි කිය යුතු. උපෙක්ඛා - එකාග්‍රතා යන මොවුන්ගේ උත්පත්ති වශයෙන් දුවඞ්ගසමන්නාගතභාව දත යුතු. සෙස්ස ප්‍රථමධ්‍යාන යෙහි කී නියා මැ යි.

චතුෂ්කධ්‍යාන නය යි.

පඤ්චකධ්‍යාන ලබා ගත යුතු ක්‍රමය

පඤ්චකධ්‍යාන නිපදවන යොගී විසින් ප්‍රගුණ වූ ප්‍රථම ධ්‍යානයෙන් නැඟී "මේ සමාපත්ති ආසන්න වූ නීවරණ තමැනි සතුරන් ඇත්තේ ය. විතර්කය ඖදාරික බැවින් අඞ්ග වශයෙන් ද දුර්බලය"යි එහි දෙස් සලකා ද්වීතීය ධ්‍යානය ශාන්ත වශයෙන් ද ගෙන ප්‍රථමධ්‍යානයෙහි නිකන්තිය හැර පියා ද්වීතීයධ්‍යානය ලැබ ගන්නා පිණිස භාවනාරම්භ කළ යුතු. එසේ භාවනා කරන්නා වූ ඔහුට යම් කලෙක ප්‍රථමධ්‍යානයෙන් නැඟී සිහි නුවණ ඇති වැ ධ්‍යානාඞ්ග ප්‍රත්‍යවේක්ෂා කරත් ම විතර්ක මාත්‍රය ඖදාරික වශයෙන් හා විචාරාදිය ශාන්ත වශයෙන් හා වැටහේ ද එ කල්හි ඔහු විසින් ඖදාරිකාඞ්ග දුරුකිරීම සඳහා ද ශාන්තාඞ්ග ලබා ගැන්ම සඳහා ද ඒ නිමිත්තය ම "පඨවි-පඨවි"යි මෙනෙහි කළ යුතු. එවිට යට කී නියායෙන් ද්වීතීයධ්‍යානය උපදින්නේ ය. එහි ප්‍රහාණාඞ්ගය විතර්කය පමණෙකි. විචාරාදීහු සඞ්ඛ්‍යාගතාඞ්ග-යෝ ය. සෙස්ස යට කී සේමැ යි.

එසේ ලැබ ගත් ද්වීතීයධ්‍යානයෙහි ද යට කී නයින් පස් ආකාරයෙකින් චිණ්ණවසී වැ එයින් නැඟී "මේ ද ආසන්න වූ විතර්ක සංඛ්‍යාත සතුරෙක් ඇත්තේ ය. විචාරය ද ඖදාරික බැවින් අඞ්ග දුර්බලය" යි එහිදු දෙස් දැකැ තෘතීයධ්‍යානය ශාන්ත වශයෙන් ගෙන ද්වීතීයධ්‍යානයෙහි නිකන්තිය හැර පියා තෘතීයධ්‍යානය ලැබ ගන්නා පිණිස භාවනාරම්භ කළ යුතු.

එසේ භාවනා කරන්නහු ද්වීතීයධ්‍යානයෙන් නැඟී සිහි නුවණ ඇති වැ ධ්‍යානාඞ්ග ප්‍රත්‍යවේක්ෂා කරත් ම ඔහුට විචාර මාත්‍රය ඖදාරික වශයෙන් ද ප්‍රීති ආදිය ශාන්ත වශයෙන් ද වැටහෙන්නේ ය. එවිට ඔහු විසින් ඖදාරිකාඞ්ග ප්‍රහාණය සඳහා ද ශාන්තාඞ්ග ප්‍රතිලාභය සඳහා ද ඒ නිමිත්තය ම "පඨවි-

පඨවි" යි කැවත කැවත මෙනෙහි කළ යුතු ය. එවිට ඔහුට යට කී සේ තෘතීයධ්‍යානය උපදින්නේ ය. එහි ප්‍රභාණාඞ්ගය විචාරය පමණෙකි. චතුෂ්කනයයෙහි ද්විතීයධ්‍යානයට මෙන් ප්‍රීති ආදි තුන සම්භාගතාඞ්ගයෝ ය. සෙස්ස යට කී සේ ම ය. චතුෂ්කනය-යෙහි ද්විතීයධ්‍යානය දෙකඩ වැ පඤ්චකනයයෙහි ද්විතීය-තෘතීය ධ්‍යාන වෙයි. චතුෂ්කනයයෙහි තෘතීය-චතුර්ථ ධ්‍යාන පඤ්චකනය-යෙහි චතුර්ථ-පඤ්චම ධ්‍යාන වෙයි. චතුෂ්කනයයෙහි ප්‍රථම්ධ්‍යානය පඤ්චකනයයෙහි දු ප්‍රථමධ්‍යානය මෑ යි.

සජ්ජන ප්‍රමොදය පිණිස කළ විශුද්ධිමාර්ගයෙහි
සමාධිභාවනාධිකාරයට
ඇතුළත්
පඨවිකසිණ නිද්දේශ නම් සතරවන පරිවේජදය යි.

5. සෙස කසිණ නිද්දේශය

නමෝ භගවතෝ සම්මාසම්බුද්ධස්ස

දැන් පඨවි කසිණයට අනතුරු ව **ආපෝ කසිණයෙහි** විසතර කථාව වත්තේ ය.

පඨවි **කසිණය** සේ ම ආපෝ කසිණය ද වඩනු කැමැති යොගී විසින් සුවසේ හිඳ ගෙනැ සකස් කැරැ ගත් හෝ ප්‍රකෘති යෙන් පිහිටි හෝ ජලයෙහි නිමිත්තාග්‍රහණය කළ යුතු. මේ ආදි වශයෙන් මෙහි ද මත්තෙහි ද සියල්ල මෙසේ විසතර කරනු. මෙසේ මතු මෙ පමණකු දු නො දක්වා විශෙෂයක් ඇතහොත් එ ම දක්වන බව දත යුතු.

පූර්වයෙහි ආපොකසිණ භාවනා කළ පින්වතුනට **චුල්ල**සීව තෙරුන්ට මෙන් ප්‍රකෘතියෙන් පිහිටි ජලයෙහි – එනම් පොකුණෙක හෝ විලෙක හෝ කලපුවෙක හෝ මුහුදෙහි හෝ නිමිත්ත උපදින්නේ ය. ලාභසත්කාර නො තකා විවිකත වැ වසම් සි **මාවතුයෙහි** (මහාවීථියෙහි) තැවි තැගී දඹදිව වඩනා උන්වහන්සේට අතර මහමුහුද බලත් ම ඒ හා සමාන **කසිණ** නිමිත්ත පහළ විය. පෙර අනිෂ්‍යාග නො කළ පින්වතුන් විසින් සතර කිසුණු දෙස් හැරැ පියා නීල-පීත-ලෝහිත-ඔදාත යන සිව් පැහැ ඇති ජලය අතුරෙන් කිසියම් ජලයක් නො ගෙනැ බිම නො වැටුණු තාක් ශුඛ වස්ත්‍රයෙන් පෙරාගත් අහස් දියෙන් හෝ එබදු වූ ම අන්‍ය පිරිසිදු ජලයකින් හෝ පාත්‍රයක් වත් සැළියක් වත් මුවවිට දක්වා පුරා ගෙනැ විහාර කෙළවර යට කී සේ පිළිසන් තැනෙක තබා ගෙනැ සුවසේ හිඳැ අම්බු, උදක, වාරි, සලිල ආදි ජලවාචක නම් අතුරෙන් ප්‍රසිද්ධ නම වශයෙන් ගෙනැ **"ආපෝ-ආපෝ"** යි භාවනා කළ යුතු. එහි වණ්ණය නො සැලකිය යුතු. ද්‍රව **ලක්ඛණය** මෙතෙහි නො කට යුතු. වණ්ණය තමහට ආශ්‍රය වූ ජලය හා සමානගතික කොටැ උත්සන්න වශයෙන් ප්‍රඥප්ති ධර්මයෙහි සිත මෙහෙයා භාවනා කළ යුතු. (උත්සන්න වශයෙන් ප්‍රඥප්ති ධර්මයෙහි සිත මෙහෙයීම් නම් ආපොධාතුයේ උත්සන්නභාවයෙන් – ශක්ති හෙයින් – අධික බැවින් සසම්භාර ආපයෙහි ආපය යන යම් **ලොක** ව්‍යවහාරයෙක් ඇත් ද

ඒ උපාදාන ප්‍රඥප්තියෙහි සිත පිහිටුවීම යි. මෙසේ භාවනා කරන්නේ ම ඔහුට පිළිවෙළින් පෙර කී සේ **උද්ග්‍රහ - ප්‍රතිභාග** නිමිති උපදින්නේ ය. එහි උද්ග්‍රහනිමිත්ත සැලෙන්නා සේ වැටහෙයි. ඉදින් ඒ ජලය පෙණ බුබුලින් මිශ්‍ර නම් එසේ පෙණ බුබුලින් මිශ්‍ර වැ මැ වැටහෙයි. රැළ නැගීම් පෙණ මුසු බැව් **කසිණ** දෙස පෙනේ. ප්‍රතිභාගනිමිත්ත වනාහි නො සැලෙන **අභස** තුබූ මිණි තල්වැටක් සේ ද මිණිමුවා කැටපත් තලයක් සේ ද වැටහෙයි. එසේ වැටහෙන්නා හා ම ඒ යොගාවචර උපචාර-ධ්‍යානයට ද පෙර කී සේ චතුෂ්ක - පඤ්චකධ්‍යානයන්ට ද පැමිණෙන්නේ ය.

ආපොකසිණ වඩන ක්‍රමය යි.

තෙජෝ කසිණය.

තෙජෝ කසිණය වඩනු කැමැත්තහු විසින් තෙජසෙහි නිමිත්ත ගත යුතු. පූර්ව කෘත අනියොග **ඇති පින්වතුනට චිත්තගුත්ත** තෙරුන්ට මෙන් ප්‍රකෘති තෙජසෙහි නිමිති ගනුන් පහන් සිල්ලෙහි හෝ උදුනෙහි හෝ පාත්‍ර පිසන තැන හෝ ලැව් ගින්නෙහි හෝ යම් කිසි තැනෙක ගිනිසිලු බලත් නිමිත්ත උපදින්නේ ය. **චිත්තගුත්ත** තෙරුන්ට වනාහි ධම් ශ්‍රවණ දවසෙහි පොහෝ ගෙට පිවිසැ පහන් සිල්ල බලත් ම නිමිත්ත උපන්නේ ය. පූර්වයෙහි කෘතාභියොග නැත්තහු විසින් තෙජෝ **කසිණය** පිළියෙළ කරගත යුතු ය. එය පිළියෙළ කර ගන්නා ක්‍රමය මෙසේ ය. සිනිදු වූ හර ඇති දර පලා වියලා ගෙනැ එය කැබැලි කොටැ සුදුසු රුක් මූලකට හෝ මණ්ඩපයකට හෝ ගොස් පාත්‍ර පිසින ආකාරයෙන් රැස්කොටැ ගිනි දැල්විය යුතු ය. ඉක්බිති හුණ පැදුරෙක හෝ සමෙක හෝ වස්ත්‍රයෙක හෝ එක් වියත් සතරහුල් පමණ කොටැ සිදුරක් කර ගත යුතු ය. එය අර දැල්වෙන ගින්න අභිමුඛයේ තබා ගෙනැ යට දැක්වූ සේ හිඳැ ගෙනැ යට තණ - දර හෝ මතු දුම් සිල්ල හෝ මෙතෙහි නො කොටැ මැද විරල නො වැ ඝන වැ පවත්නා ගිනිදැල්ලෙහි නිමිත්ත ගත යුතු යි. නීල-පීතාදි වශයෙන් එහි පැහැය නො සිතිය යුතු ය. උෂ්ණත්ව වශයෙන් **ලක්ඛණ** මෙනෙහි නො කළ යුතු. වණ්ණය ද නිශ්‍රය ගතික කොටැ උතුසුන්නා වශයෙන් ප්‍රඥප්ති ධම්යෙහි සිත මෙහෙයා "පාවක, කණ්හවත්තනි, ජාත වේද, හුතාසනාදි අග්නි වාචක නම් අතුරෙන් ප්‍රකට නම වශයෙන් ම **"තෙජෝ-තෙජෝ"** යි භාවනා කටයුතුයි. මේසේ

භාවනා කරන්ම ඔහුට පිළිවෙළින් **උද්ග්‍රහ - ප්‍රතිභාග** නිමිති උපදනේ ය. එයින් **උද්ග්‍රහ නිමිත්ත** ගිනි දැල් කැඩි කැඩී වැටෙන්නා සේ වැටහෙයි. ප්‍රකෘති තෙජසෙහි නිමිති ගනුන් **කසිණ** දෙස පෙනේ. පෙනහෙලි කැබලි හෝ අහුරු පිඬු හෝ හළු හෝ දුම් හෝ වැටහෙයි. **ප්‍රතිභාග නිමිත්ත** වනාහි අහස්හි තුබූ රත් කම්බිලි කඩක් සේ ද, රත් තල් වැටක් සේ ද, රත් ටැඹක් සේ ද නිශ්චල වෑ වැටහෙයි. එසේ වැටහෙන්නා හා ම ඒ යොගාවචර උපචාර ධ්‍යානයට ද, යට කී සේ චතුෂ්ක - පඤ්චක ධ්‍යානයන්ට ද පැමිණෙන්නේ ය.

තෙජෝ කසිණ වඩන ක්‍රමය යි.

වායෝ කසිණය.

වායෝ කසිණය වඩනු කැමැති යොගී විසින් වායුයෙහි නිමිත්ත ගත යුතු. ඒ ගැන්ම ද සැලෙන තැන් බැලීමෙන් හෝ ඇඟ සපගීයෙන් හෝ විය යුතු. අටී කථායෙහි ඒ මෙසේ දක්වති. **"වායෝ කසිණං උග්ගණ්හන්තෝ වායුස්මිං නිමිත්තං ගණ්හාති උච්ඡඟඟං වා එරිතං සමෙරිතං උපලක්ඛෙති වෙළඟඟං වා - පෙ - රුක්ඛඟඟං වා ඛෙඤඟඟං වා එරිතං සමෙරිතං උපලක්ඛෙති කායස්මිං වා පුට්ඨං වා උපලක්ඛෙති"** යි 'වායු කසිණය උගන්නේ වායුවෙහි නිමිත්ත ගනී. සැලෙන උග්ගස් අගක් හෝ හුණගස් අගක් හෝ රුක් අගක් හෝ කෙසඟක් හෝ නිමිත්ත කොටැ බලයි. ශරීරයෙහි වැදී ගත් වාතය හෝ නිමිත්ත කොට බලයි' යනු එහි අටී යි. අටුවාහි එසේ කී බැවින් මුදුනෙහි පත්‍ර විසින් සම වූ හිස් ඇති වෑ සිටි ඝන පත්‍ර ඇති **උගක්** හෝ **උණක්** හෝ රුකක් හෝ සතරඟුල් ප්‍රමාණ ඝණ කෙස් ඇති පුරුෂයන්හු ගේ හිසක් හෝ වාතයෙන් සැලෙන්නා දැකැ මේ වාතය මෙ තැන වදනේය යි සිහි එළවා එසේ ම **කවුළු** දෙරින් හෝ හිතුනි සිදුරින් හෝ තම ඇඟ හැපෙන වාතයෙක් වේ නම් එහි හෝ සිහි එළවා වාත, මාළුත, අනිලාදි සුළං වාචක නම් වලින් ප්‍රකට වූ නම වශයෙන් **"වාතෝ-වාතෝ"** යි භාවනා කටයුතු. මෙනි උද්ග්‍රහ නිමිත්ත උදුනින් බා ගත් ඇසිල්ලේ කිරිබතක උණුසුම් වැටියක් බදු වෑ වල වෑ වැටෙනේ. පටිභාග නිමිත්ත එ ම සන්සුන් වෑ නිශ්චල වෑ වැටෙනේ. සෙස්ස යට කී සේ දත යුතු යි.

වායෝ කසිණ වඩන ක්‍රමය යි.

නීල කසිණය

"නීල කසිණං උග්ගණ්හනෙනා නීලකස්මිං නිමිත්තං ගණ්හාති පුප්ඵස්මිං වා වත්ථස්මිං වා වණ්ණධාතුයා වා" 'නීලකසිණය උගන්නේ නීල වර්ණයෙහි නිමිත්ත ගනී. මලෙක හෝ වස්ත්‍රයෙක හෝ වර්ණ ධාතුවෙහි හෝ, යි කී හෙයින් කෘතාධිකාර පින්වතුනට අවිරල වූ පිපුණු නිල් මලින් ගැවසී ගත් මල් ගසක් හෝ පූජා ස්ථානයෙහි මල් ඇතිරියක් හෝ නිල්පිළී නිල්මිණී අතුරෙන් කිසිවක් හෝ දැක්මෙන් ම නිමිත්ත උපදී. අකෘතාධිකාර විසින් නිලුපුල් නිල්කටරොළු ආදි මල් ගෙනැ රෙඹූ හෝ නැටි හෝ නො පෙනෙන පරිද්දෙන් වඩෙගාටකයක් හෝ කරඹුපටලයක් හෝ ඒ මල් පෙතියෙන් මුවවිට තාක් පුරා ඇතිරිය යුතු. නිල්වත් පිළියෙන් පොදියක් බැඳ එසින් හෝ පිරවිය යුතු. එහි මුවවිට බෙර ඇසක් මෙන් හෝ බැන්ද යුතු. ලොකොමලනිල් කොලනිල් අඳුන්නිල් අතුරෙන් යම් කිසිවකින් පඨවි කසිණයෙහි කී සේ ගෙනැ යා හැකි කොටැ හෝ භිත්තියෙක හෝ කසිණ මණ්ඩලයක් කොටැ වෙනත් වර්ණයකින් අවට පරිවේෂ්ද කට යුතු. ඉක්බිති පඨවි කසිණයෙහි කී පරිදි **"නීලං-නීලං"** යි මනසිකාර කළ යුතු. මෙහි දු උද්ග්‍රහ නිමිත්තයෙහි කසිණ දෙස පෙනෙන්නේ ය. රෙඹූ නැටි පෙති අතර ආදිය වැටහෙන්නේ ය. ප්‍රතිභාග නිමිත්ත කසිණ මණ්ඩලයෙන් මිදී අහස මිණි තල් වැටක් සේ වැටහෙන්නේ ය. සෙස්ස යට දැක්වුණු සේ දත යුතු.

නීල කසිණ වඩන ක්‍රමය යි.

පීත කසිණය.

පීත කසිණයෙහි දු විධි යට කී නියා ය. කීයේ මෑ යි **"පීත කසිණං උග්ගණ්හනෙනා පීතකස්මිං නිමිත්තං ගණ්හාති පුප්ඵස්මිං වා වත්ථස්මිං වා වණ්ණධාතුයා වා"** යි මෙහි දු කෘතාධිකාර පින්වතුනට අවිරල වැ පිපුණු කහ පැ මලින් ගැවසී ගත් මල් ගසක් හෝ මල් ඇතිරියක් හෝ කහ පිළී කසා පැහැ ධාතු අතුරින් කිසිවක් හෝ දැක්මෙන් චිත්තඟුත්ත තෙරුන්ට මෙන් නිමිත්ත උපදී. උන්වහන්සේට වනාහි සිතුල්පව්වෙහි පතගි මලින් කළ ආසන පූජාව බලන්නා හා ම ඒ ආසන ප්‍රමාණ නිමිත්ත උපන්නේ ය. අකෘතාධිකාර විසින් කිණිහිරි මල් ආදියෙන් හෝ කසාවන් පිළියෙන් හෝ

කසාවණී ධාතුවකින් හෝ නීල කසිණයෙහි කී සේ **කසිණ මණ්ඩලය** කොටැ **"පීතකං-පීතකං"** යි මතසකාර පැවැත්විය යුතු. සෙස්ස එබඳු මැයි.

පීත කසිණය වඩන ක්‍රමය යි.

ලොහිත කසිණය

ලොහිත කසිණයෙහිදු විධි යට කී නියා යැ. කී යේ මැ යි. **"ලොහිත කසිණං උග්ගණ්හනෙනා ලොහිතකස්මිං නිමිත්තං ගණ්හාති පුප්ඵස්මිං වා වත්ථස්මිං වා වණ්ණධාතුයා වා"** යි.

මෙහිදු කෘතාධිකාරී පින්වතුනට බදුවද ආදි අව්රල රත් මලින් ගැවසී ගත් මල් ගසක් හෝ, මල් ඇතිරියක් හෝ, රතුපිළි රතුමැණික් රතුධාතු අතුරෙන් කිසිවක් හෝ දැක්මෙන් ම නිමිත්ත උපදනේ ය. අකෘතාධිකාර විසින් ජයසුමන වද රත්-කරඬු ආදි මලින් හෝ රත් පිළියෙන් හෝ සුවහුරු, දුනිහුල් ආදි රක්ත වණී ධාතුවෙන් හෝ නීල කසිණයෙහි කී සේ ම **කසිණ මණ්ඩලය** කොටැ **"ලොහිතකං - ලොහිතකං"** යි මෙතෙහි කළ යුතු. සෙස්ස යට කී නියා මැ යි.

ලොහිත කසිණය වඩන ක්‍රමය යි.

ඔදාත කසිණය

ඔදාත කසිණයෙහිදු **"ඔදාත කසිණං උග්ගණ්හනෙනා ඔදාතස්මිං නිමිත්තං ගණ්හාති පුප්ඵස්මිං වා වත්ථස්මිං වා වණ්ණධාතුයා වා"** යි කී හෙයින් කෘතාධිකාර පින්වතුනට අව්රල සුදු මලින් ගැවසීගත් මල් ගසක් හෝ ඉද්ද දැතමන් ආදි මල් ඇතිරියක් හෝ හෙළඹුලු හෙළපියුම් රැසක් හෝ සුදුපිළි මකුළු ආදි ධාතූන්ගෙන් කිසිවක් හෝ දැක්මෙන් ම නිමිත්ත උපදනේ ය. ඒයම්මඬුලු රිදීමඬුලු සඳමඬුලුයෙහිදු එසේම නිමිති උපදිය හැකි ය. අකෘතාධිකාර විසින් යට දැක්වුණු පරිදි සුදුමලින් හෝ සුදුපිළියෙන් හෝ සුදුධාතුවකින් හෝ නීල කසිණයෙහි කී සේ කසිණ මණ්ඩලය කොටැ **"ඔදාත-ඔදාත"** යි මෙතෙහි කට යුතු. සෙස්ස යට කී නියා මැ යි.

ඔදාත කසිණය වඩන ක්‍රමය යි.

ආලෝක කසිණය

ආලෝක කසිණයෙහි වනාහි **"ආලෝකං උග්ගණ්හන්තෝ ආලෝකස්මිං නිමිත්තං ගණ්හාති භිත්තිවලඤ්ඤදෙ වා තාලවණ්ටදෙ වා චාතපානනදිකාය වා"** 'ආලෝක කසිණය උගන්නේ ආලෝකයෙහි එනම් භිත්ති සිදුරෙහි හෝ කෙසි සිදුරෙහි හෝ කවුළු අතරින් හෝ නිමිත්ත ගන්නේ ය' යි කී හෙයින් කෘතාධිකාර පින්වතුනට භිත්ති සිදුරු ආදීන් අතුරෙන් කිසිවකින් හිරු එළිය හෝ සඳපහන හෝ වැදී භිත්තියෙහි හෝ භූමියෙහි හෝ නැඟෙන මණ්ඩලය දැක්මෙන් නිමිත්ත උපදනේ ය. එසේ ම හැසුණු කොළ ඇති රුක් අතු අතරින් හෝ ඝන ශාඛා මඬුළු අතුරින් හෝ නික් මැ බිම නැඟෙන මඬුල්ල හෝ දැක්මෙන් නිමිත්ත උපදනේ ය. අකෘතාධිකාර විසිනුදු එබඳු වූ ම ආලෝක මණ්ඩලය **"ඔභාසො-ඔභාසො"** යි හෝ **"ආලොකො - ආලොකො"** යි හෝ භාවනා කට යුතු. එසේ නිමිත්ත උපදවා ගත්තට පසු හැකියා විසින් කළයෙක පහතක් දල්වා එහි කට වසා එහි පසෙක සිදුරක් කොටා භිත්තියට අභිමුඛ කොටා තැබිය යුතු. ඒ සිදුරින් පහත් එළිය නික්මැ භිත්තියෙහි මණ්ඩලයක් කෙරෙයි. ඒ බලා **"ආලොකො - ආලොකො"** යි භාවනා කළ යුතු මේ වනාහි මූල දැක්වූණු නිමිත්තයනට වඩා චිරස්ථායි ය. මෙහි **උද්ග්‍රහනිමිත්ත** භිත්තියෙහි හෝ භූමියෙහි හෝ නැගුණු මණ්ඩලය බඳු ය. ප්‍රතිභාග නිමිත්ත ඝන ප්‍රසන්න ආලෝක පුඤ්ජයක් බඳු සි. සෙස්ස යට කී නියා මැ සි.

ආලෝක කසිණ වඩන ක්‍රමය සි.

ආකාස කසිණය

පරිච්ඡින්නාකාස කසිණයෙහිදු **"ආකාසකසිණං උග්ගණ්හන්තෝ ආකාසස්මිං නිමිත්තං ගණ්හාති භිත්තිවලඤ්ඤදෙ වා තාලවණ්ටදෙ වා චාතපානනදිකාය වා"** යි කී හෙයින් කෘතාධිකාර පින්වතුනට භිත්ති සිදුරු ආදිය අතුරෙන් කිසිවක් දැක්මෙන් ම නිමිත්ත උපදනේ ය. අකෘතාධිකාර විසින් ඝන කොටා සෙවූ මඬුවෙක හෝ සම් - හුණපැදුරු ආදීන් අතුරෙන් කිසිවෙක හෝ එක් වියත් සතරගුල් සා සිදුරක් කොටා ඒ භිත්ති සිදුරු ආදි සිදුර **"ආකාසො - ආකාසො"** යි වැනිය යුතු. මෙහි උද්ග්‍රහ නිමිත්ත භිත්ති පරියන්ත කඩතැන් පැළඹුණු තැන් සමග සිදුර සමානම ය. වඩනු ලබන්නේ ද නො වැඩෙන්නේ ය.

ප්‍රතිභාග නිමිත්ත ආකාශමණ්ඩලය ම වැ වැටහෙන්නේ ය. වඩනු ලබන කල්හි වැඩෙන්නේ ය. සෙස්ස පඨවි කසිණයෙහි කී නියා මැ සි.

ආකාස කසිණය වඩන ක්‍රමය සි.

දශබලධර සම්බුදර්ශීන් වහන්සේ වදාළ රූපාවචර චතුෂ්ක පඤ්චකධ්‍යාන ලාභයට හෙතු වූ දස කසිණ ද ඒ කසිණ වඩන ක්‍රමය ද මෙසේ දක්වා ඉක්බිති ඔවුන් පිළිබඳ ප්‍රකීර්ණක කථාව දක්වනු ලැබේ.

කසිණ පිළිබඳ ප්‍රකීර්ණක කථාව

කසිණ ඵල

1. මේ දස කසිණ අතුරෙන් **පඨවි කසිණ වශයෙන්** වනාහි **"එකොපි හුත්වා බහුධා හොති"** 'තෙමේ එකෙක් වැ බොහෝ දෙන වෙයි' යනාදීන් වදාළ පරිදි වීම, අහසැ හෝ ජලයෙහි හෝ පොළෝ මවා එහි පසින් යාම් සිටීම් හිඳීම් ආදිය කිරීම, පරිත්ත - අප්පමාණ නයයෙන් අභිභායතන ලැබීම යනාදිය ද, ("ප්‍රතිභාගනිමිත්තෝත්පත්තීන් මතු දෙවන-තුන්වන ජවන චිත්තයෙහි හෝ සතරවන-පස්වන චිත්තයෙහි හෝ උපදවන ලද ධ්‍යානයට අභිභායතනසංඥා සි දතයුතු" සි යනු සත්ත සි.)

2. ආපෝ කසිණ වශයෙන් පොළොවෙහි තැගීම් කිම්දීම්, ජල වැසි උපදවීම, ගංගා මුහුදු මැවීම්, පෘථිවි පර්වත ප්‍රාසාදාදිය සෙලවීම් යනාදිය ද

3. තෙජෝ කසිණ වශයෙන් දුමීම, දිලීම, අඟුරු වැසි ඉපදවීම, තමාගේ තෙජසින් අන්‍යයාගේ තෙජස ක්ෂය කිරීම, කපුපුළුන් දර ආදිය එක්කොට රැස් වැ තුබූ කල කැමති දේ ම දවන්නට සමර්ථ වීම, දිවැසින් රූ දක්නා පිණිස ආලෝක කිරීම, පිරිනිවන් සමයෙහි තෙජෝධාතුයෙන් ශරීරය දවාලීම යනාදිය ද

4. වායෝ කසිණ වශයෙන් වායු සේ ශීඝ්‍ර වැ යාම, වාත වැසි උපදවීම යනාදිය ද

5 නීල කසිණ වශයෙන් නිල් රූප මැවීම, අඛකාර කිරීම, සුවණ්-දුර්වණ් නසින් අභිභායතන ලැබීම, ශුභවිමොක්ෂාධිගමය යනාදිය ද

6 පීත කසිණ වශයෙන් රන්වන් රූ මැවීම, රන් වේවා සි ඉරීම, සුවණ්-දුර්වණ් නසින් අභිභායතන ලැබීම, ශුභ විමොක්ෂාධිගමය යනාදිය ද

7 ලොහිත කසිණ වශයෙන් රතු රූප මැවීම, සුවණ්-දුර්වණ් අභිභායතන ලැබීම, ශුභ විමොක්ෂාධිගමය යනාදිය ද

8 ඔදාත කසිණ වශයෙන් සුදුවන් රූ මැවීම, පීත-මිදුධ දුරු කිරීම, අඛකාර නැසීම, දිවැසින් රූ දක්නා පිණිස ආලොක කිරීම යනාදිය ද

9 ආලොක කසිණ වශයෙන් ප්‍රභාස්වර රූප මැවීම, පීත-මිදුධ දුරු කිරීම, අඛකාර නැසීම, දිවැසින් රූ දක්නා පිණිස ආලොක කිරීම යනාදිය ද

10 ආකාස කසිණ වශයෙන් මුවහ වැ තුබුණු වසතු ප්‍රකාශ කිරීම, පෘථිවි පර්වතාදිය තුළ අහස් මවා එහි ඉරියව් පැවැත්වීම. හිතනි ආදියෙන් පිටත නො පැකිළ යාම යනාදියද සිදුධ වේ.

කසිණ භෙද.

"පඨවි කසිණමෙකො සඤ්ජානාති උදුධං අධො තිරියං අවයං අප්පමාණං" යනාදීන් වදාළ බැවින් සියලු කසිණ ම **උදුධ, අධො, තිරිය, අද්වය, අප්පමාණ** යන ප්‍රභෙදයට පැමිණේ.

උදුධ නම් උඩ ගුවන් තලයට අභිමුඛ වැ.

අධො නම් යට පොළෝ තලයට අභිමුඛ වැ.

තිරිය නම් ක්ෂෙත්‍ර මණ්ඩලයක් සේ හාත්පසින් පිරිසිදැ-සමහරු උඩට ද සමහරු යටට ද සමහරු හාත්පසට ද කසිණය වඩති. කුමක් හෙයින් මෙසේ වඩත් ද දිවැසින් රූ දක්නා

කැමැති අය ආලෝකය ඒ ඒ දිග වඩන්නා සේ මොහු ද ඒ ඒ කාරණයෙන් මෙසේ වඩනි. **"උඩ්ඩං, අධෝ, තිරියං"** යි කියන ලද්දේ එ හෙයිනි.

අවය නම් එකක් අනෙකක් නොවැ. දියෙහි ගැලුණුහුට සැම දිගින් ම දිය ය අනෙකක් නැත. එ මෙන් පඨවි කසිණය පඨවි කසිණය ම ය. ඒ අන්‍ය කසිණයක් හා මිශ්‍ර නො වේ (අද්වය නම් මේ යි.) සෙසු සියලු තන්හි දු මේ නියා ය.

අප්පමාණ නම් එරණ අප්‍රමාණ ය. කසිණය වනාහි සිතින් ආලම්බනය කරන්නේ මුළුල්ල ම ආලම්බනය කරයි. මේ මෙහි ආදිය මේ මෙහි මැදය යි ප්‍රමාණ නො ගනී.

කසිණ භාවනා සමෘද්ධ නො වන්නෝ.

"යෙ ච තෙ සත්තා කම්මාවරණෙන වා සමන්නාගතා කිලෙසාවරණෙන වා සමන්නාගතා විපාකාවරණෙන වා සමන්නාගතා අස්සද්ධා අච්ඡන්දිකා දුප්පඤ්ඤා අභබ්බා නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං" 'යම් සත්ත්වයෝ කෙතෙක් කර්මාවරණයෙන් හෝ කෙලසාවරණයෙන් හෝ විපාකාවරණයෙන් හෝ යුක්ත ද ශ්‍රද්ධා නැත්තෝ ද ඡන්ද නැත්තෝ ද ප්‍රඥ රහිතයෝ ද කුශල ධර්මයන්හි නියාමය යි සම්මත වූ සම්‍යක් භාවය යි සම්මත වූ ආර්‍ය්‍ය මාර්ගයට පැමිණෙන්නට අභව්‍යයෝ ද, මෙසේ කියන ලද්දවුන් අතුරෙන් එකකුට වත් එක කසිණයෙක හෝ භාවනාව සමෘද්ධ නො වේ. එහි,

කර්මාවරණයෙන් යුක්තයෝ නම් ආනන්තරිය කර්ම කළෝ ය.

කෙලසාවරණයෙන් යුක්තයෝ නම් නියත මිථ්‍යාදෘෂ්ටිකයන් හා උභතොව්‍යඤ්ජනක පණ්ඩකයෝ ය.

විපාකාවරණයෙන් යුක්තයෝ නම් අහෙතුක ද්විහෙතුක ප්‍රතිසන්ධිකයෝ ය.

ශ්‍රද්ධා නැත්තෝ නම් බුද්ධාදීන් කෙරෙහි ශ්‍රද්ධා විරහිත යෝ ය.

ඡන්ද නැත්තෝ නම් මාර්ගානුලෝම ප්‍රතිපත්තියෙහි කර්තු-කම්‍යතා ඡන්ද නැත්තෝ ය.

ප්‍රඥා රහිතයෝ නම් ලෞකික ලෝකොත්තර සම්‍යක්දෘෂ්ටි විරහිතයෝ ය.

මොවුන් අභව්‍ය වනුයේ **කසිණ**යෙහි පමණක් නො වේ. සෙසු **කර්මස්ථාන**යන්හි දු අභව්‍ය වෙති. මොවුන් අතුරෙන් එකකුටවත් භාවනා සමෘද්ධ නො වේ.

එබැවින් විපාකාවරණයෙන් විගත වූ හෙවත් ත්‍රිහෙතුක ප්‍රතිසන්ධියෙන් ජනිත කුල දරුවා විසින් **කර්මාවරණ** හා ක්ලේශාවරණ දුරින් දුරු කොට සද්ධර්ම ශ්‍රවණ සත්පුරුෂොපනිශ්‍රයාදියෙන් ශ්‍රද්ධාව හා ඡන්දය හා ප්‍රඥව හා වඩා කර්මස්ථානයන්හි නැවත නැවත යෙදිය යුතු සි.

සජ්ජන ප්‍රමොදය පිණිස කළ විශුද්ධිමාර්ගයෙහි
සමාධි භාවනාධිකාරයට අතුළත්
සෙස කසිණ නිර්දේශ නම් පස්වන පරිච්ඡේදය සි.

---

6 – අශුභ කම්ඨාන නිදේශය

නමො තස්ස භගවතො සම්මාසම්බුද්ධස්ස.

කසිණයන්ට අනතුරු වැ අශුභ දක්වන ලදී. අශුභ වනාහි **උද්ධුමාතක, විනීලක, විපුබ්බක, විච්ඡිද්දක, වික්ඛායිතක, වික්ඛිත්තක, හතවික්ඛිත්තක, ලොහිතක, පුළවක, අට්ඨික** යයි දශවිධ වේ.

1 සුළං පිරුණු සමක් මෙන් මරණින් පසු අනුක්‍රමයෙන් නැගුණු ඉදිමීමෙන් යුක්ත වූයේ **උද්ධුමාත** ය. උද්ධුමාතය ම **උද්ධුමාතක** ය. පිළිකුල් හෙයින් කුත්සිත වූ උද්ධුමාතය හෝ **උද්ධුමාතක** ය. මූල කියේ සවාර්ථයෙහි **ක** ප්‍රත්‍යය ය. දෙවැනි වැ කියේ කුත්සිතාර්ථයෙහි **ක** ප්‍රත්‍යය සි මෙයින් ඉදිමී ගිය මළ සිරුර කී නියා දත යුතු.

2 විනීල නම් විපරිහීන්‍ය වණි ඇත්තේ ය. හෙවත් සුදු-රත් ආදියෙන් මිශ්‍ර වණි ඇත්තේ සි. පූර්ව වණියෙන් පෙරලී ගිය වණි ඇත්තේ හෝ විනීල ය. විනීල ම හෝ කුත්සිත විනීල හෝ **විනීලක** ය. මෙයින් උස් මස් ඇති තන්හි රත් පැහැ වූ, පූයා රැස් වැ සිටි තන්හි සුදු පැහැ වූ, බොහෝ සෙයින් නිල් පැහැති තන්හි නිල් පව පෙරෙවියාක් බඳු වූ මළ සිරුර කී නියා දත යුතු.

3 බිඳී පැලී ගිය තන්හි වැහෙන පූයා ඇත්තේ විපුබ්බ ය. විපුබ්බ ම හෝ කුත්සිත විපුබ්බ හෝ **විපුබ්බක** ය. සැරව වැගිරෙන මළ සිරුරට මේ නම්.

4 දෙකඩ කොටැ කැපීමෙන් වෙන් කරන ලද්දේ විච්ඡිද්ද ය. විච්ඡිද්ද ම හෝ කුත්සිත විච්ඡිද්ද හෝ **විච්ඡිද්දක** ය. මැදින් කපා දැමූ මළ සිරුරට මේ නම්.

5 ඔබින් මොබින් බලු කැණහිල් ආදීන් විසින් නන් අයුරින් කඩා කන ලද්දේ විකඛායිත ය. විකඛායිත ම හෝ කුත්සිත විකඛායිත හෝ **වික්ඛායිතක** ය. එ බඳු මළ සිරුරට මේ නම්.

6 බලු **කැණහිල්** ආදීන් **විසින්** කන ලදු වැ තොයෙක් ආකාරයෙන් ඒ ඒ තැන විසුරුණේ **විකිර්ණ** ය. විකිර්ණ ම හෝ පිළිකුල් බැවින් කුත්සිත විකිර්ණ හෝ **විකිර්ණක** ය. අත් අත් **තැනෙක** පා අත් තැනෙක හිස අත් තැනෙකැ යි මෙසේ ඒ ඒ තැන විසිරී ගිය මළ සිරුරට මේ නම්.

7 අඞ්ග ප්‍රත්‍යඞ්ගයන්හි **කාක** පාද සේ **සිටින්නට** ආයුධයෙන් කොටා පෙර කී සේ ඒ ඒ තැන විසුරුවන **ලද්දේ** **හතවික්ඛිත්ත** ය. **හතවික්ඛිත්ත** ම **හෝ** පිළිකුල් බැවින් කුත්සිත **හතවික්ඛිත්ත** හෝ **හතවික්ඛිත්තක** ය. එ බදු මළ සිරුරට මේ නම්.

8 ඔබින් මොබින් ලේ වැගිරෙන්නේ **ලොහිතක** ය. වැගිරෙන ලෙහෙ වැකුණු මළ සිරුරට මේ නම්.

9 පුළුව **නම්** පණුවෝ ය. පණුවන් වගුරුවන්නේ **පුළුවක** ය. පණු කැලැ වැගිරෙන මළ සිරුරට මේ නම්.

10 ඇට ම **අට්ඨික** ය. පිළිකුල් බැවින් කුත්සිත ඇට හෝ **අට්ඨික** ය ඇටසැකිල්ලට ද එක ඇටයකට ද මේ නම්.

අමු සොහොන් ආදියෙහි දැමූ මේ උද්ධුමාතකාදීන් අරමුණු කොට උපදනා පටිභාග උග්ගහ නිමිත්තයට ද, ඒ **නිමිති** කොටැ උපදනා ධ්‍යානයට ද මේ උද්ධුමාතකාදි නාම ම යෙදෙන බව දත යුතු.

උද්ධුමාතක අසුභය වඩන ආකාර

උද්ධුමාතක සරීරයෙහි (විවිධ වූ) උද්ධුමාතක නිමිති උපදවා උද්ධුමාතක සංඛ්‍යාත ධ්‍යානය වඩනු **කැමැති** යොගී විසින් පඨවි කසිණයෙහි කී සේ ප්‍රිය ගුරුභාවනීයාදි ගුණ සම්පන්න ආචාර්යයන් කරා එළඹැ **කම්මට්ඨානය** උගත යුතු. **කම්මට්ඨාන** දෙන ආචාර්යයන් විසිනුදු ඒ යොගි හට අසුභ නිමිත්ත සඳහා යා යුතු සැටි ද, මලකුණ **හාත්පස** නිමිති සැලකිය යුතු සැටි ද, එකොළොස් ආකාරයෙන් නිමිති ගතයුතු සැටි ද, යන එන මඟ සැලකිය යුතු සැටි දැයි මෙසේ අපිණාවශ්‍යක කොටැ ඇති සියල්ල කියා දිය යුතු. යොගී විසිනු දු සියල්ල මනා වැ ඉගෙනැ නාතිදූරාදි පෙර කී ආකාර **සෙනාසනයක්** **කරා** එළඹැ උද්ධුමාතක නිමිත්තයක් සොයමින් විසිය යුතු ය. එසේ වසන්නනු විසිනු දු අසවල් ගම් දෙර හෝ වල්මුව හෝ මඟ හෝ පළිත පාදයෙහි හෝ රුක් මූල හෝ

සොහොනෙහි හෝ උද්ධුමාතක සරීරයෙක් ඇතැයි කියන්න වුන්ගේ බස් අසා පිරුණු නදී ආදියට නො තොවින් බස්නකු සේ ලභි ලභියේ නො යා යුතු. කුමක් හෙයින් ද මළ මිනියට වණ්ඩ මෘගයෝ හෝ අමනුෂ්‍යයෝ හෝ අරක් ගෙනැ සිටිති. එසින් ඔහුගේ ජීවිත විනාශය හෝ වන්නේ ය. තව ද ගමන් මඟ ගම් දෙරින් නහන නොවින් හෝ කුඹුර අද්දරින් හෝ විණි නම් හැල් ගෙවිලිය ආදි විසභාග රූප හෝ ආපාථයට එන්නේ ය. ඇතැම් විට ඒ සිරුර ම විසභාග වන්නේ ය. පුරුෂයා හට සත්‍රී ශරීරය ද සත්‍රීහට පුරුෂ ශරීරය ද විසභාග ය. එය අළුත මළ එකක් නම් ශුභ වශයෙන් වැටහී යාමෙන් බ්‍රහ්ම චරියන්තරාය හෝ වන්නේ ය. "මා වැන්නකුට මෙය බැරි නො වේ ය" යි ඉදින් තමා සැලකේ නම් ඒ වැන්නන් විසින් විසභාගා රම්මණය කරා ද යායුතු. එසේ යන්නහු විසින් සංඝසථවිරයන්ට හෝ අන්‍ය ප්‍රසිඛ භික්ෂුවකට හෝ දන්වා යා යුතු. කුමක් හෙයින් ද සොහොනෙහි අමනුෂ්‍යයන්ගේ හෝ සිංහ ව්‍යාඝ්‍රා-දීන්ගේ හෝ රූප ශබ්දාදි අනිෂටාරම්මණයකින් පිඩිත වූ ඒ යොගී භික්ෂුහුගේ අඟ පසඟ හෝ වෙවුලා නම් කැ අහර හෝ නැගී ඒ නම් අන්‍ය ආබාධයෙක් හෝ වේ නම් ඒ සංඝසථවිර හෝ අන්‍ය, ප්‍රසිඛ භික්ෂු හෝ ඔහු සතු විහාරයෙහි සිවුරු රැකැ ගනිති. දහර භික්ෂූන් හෝ සාමණේරයන් හෝ යවා පිළියම් කරවති. තවද සොහොන් භූමිය නම් නිසැක තැනෙකැ යි සිතා සොරකම් කළා වූ ද නො කළා වූ ද සොරු එහි රැස් වෙති. මිනිසුන් විසින් ලුහුබඳනා ලද සොරු භික්ෂු ළඟ බඩු දමා ලා පලා යෙති. මිනිස්සු බඩු සහිත සොරා දුටුම්හ සි ඔහු අල්ලා ගෙනැ පෙළා ලති. එබන්දෙක් විණි නම් ඒ තෙරහු "මේ භික්ෂුහට පීඩා නො කරවු, මේ අපට දන්වා මෙ බඳු වැඩක් සඳහා එහි නියේ ය"යි කියා මිනිසුන්ට දන්වා සැනසුම් ලබා දෙති. දන්වා යාමෙහි මේ අනුසසි. එබැවින් යට දැක්වුණු සේ භික්ෂු නමකට දන්වා අසුභ නිමිත්තක් දැකීමෙහි අනිලාෂ ඇත්තහු විසින් අභිඡෙක ශාලාවට යන ක්ෂත්‍රියකු සේ යාග ශාලාවට යන යාජකයකු සේ නිධි සථානයකට යන දූහියකු සේ ප්‍රීති සොම්නස් උපදවා අටුවාහි දැක්වුණු සැටියෙන් යා යුතු.

අටුවායෙහි මෙසේ දක්වන ලදි:-

"උද්ධුමාතකං අසුභනිමිත්තං උග්ගණ්හනෙනා එකා අදුතියෝ ගචඡති, උපඨිතාය සතියා අපම්මුට්ඨාය,

අනෙනාගතෙහි ඉන්ද්‍රියෙහි අබහිඟතෙන මානසෙන ගතාගත-මඟඟං පච්චවෙක්ඛමානො, යස්මිං පදෙසෙ උඛුමාතකං අසුභ නිමිත්තං නික්ඛිත්තං හොති. තස්මිං පදෙසෙ පාසාණං වා වම්මිකං වා රුක්ඛං වා ගච්ඡං වා ලතං වා සනිමිත්තං කරොති. සාරම්මණං කරොති. සනිමිත්තං කත්වා සාරම්මණං කත්වා උඛුමාතකං අසුභ නිමිත්තං සභාවභාවතො උප-ලක්ඛෙති. වණ්ණතො පි ලිඞ්ගතො පි සණ්ඨානතො පි දිසතො පි ඔකාසතො පි පරිච්ඡෙදතො පි සන්ධිතො පි විවරතො නිමිතතතො ඵලතො සමූහතතො. සො තං නිමිත්තං සුගහිතං කරොති. සුපධාරිතං උපධාරෙති. සුව්වත්ථිතං වවත්ථපෙති. සො තං නිමිත්තං සුගහිතං කත්වා සුපධාරිතං උපධාරෙත්වා සුව්වත්ථිතං වවත්ථපෙත්වා එකො අද්දුතියො ගච්ඡති උපට්ඨිතාය සතියා අපම්මුට්ඨාය අනෙනාගතෙහි ඉන්ද්‍රියෙහි අබහිඟතෙන මානසෙන ගතාගත මඟඟං පච්චවෙක්ඛමානො. සො චඞ්කමනෙපි තඛ්ඛ ගියඤ්ඤව චඞ්කමං අධිට්ඨාති. නිසීදනෙපි තඛ්ඛාගියඤ්ඤව ආසනං පඤ්ඤපෙති.

සමූහතා නිමිත්තුපලක්ඛණා කිමත්ථියා කිමානිසංසාති? සමූහතා නිමිත්තුපලක්ඛණා අසම්මොහත්ථා අසම්මොහානි සංසා.

එකාදසවිධෙන නිමිත්තගහණාහො කිමත්ථියො කිමානි සංසොති? එකාදසවිධෙන නිමිත්තගහණාහො උපනිබන්ධ නත්ථා උපනිබන්ධනානිසංසොති.

ගතාගතමඟඟ පච්චවෙක්ඛණා කිමත්ථියා කිමානි සංසාති? ගතාගතමඟඟ පච්චවෙක්ඛණා විපි සම්පවිපාදනත්ථා විපි සම්පවිපාදනානිසංසා.

සො ආනිසංස දස්සාවී රතනසඤ්ඤී හුත්වා විතර්කාරං උපට්ඨපෙත්වා සම්පියායමානො තස්මිං ආරම්මණෙ චිත්තං උපනිබන්ධති අද්ධා ඉමාය පටිපදාය ජරාමරණම්හා පරි මුච්චිස්සාමීති. සො විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති – තස්සාධිගතං හොති රූපාවචරං පඨමං ඣානං දිබ්බා ච විහාරො භාවනාමයං ච පුඤ්ඤකිරිය වත්තු" සි.

මෙහි සංක්ෂිප්තාර්ථය මෙසේ ය:-

"උද්ධුමාතක අසුභ නිමිත්ත උගත්තා යොගාවචර තො මුළා වැ එළඹැ සිටි සිහියෙන් යුක්ත වැ සංවර වූ ඉන්ද්‍රියයෙන්

යුක්ත වැ බැහැරැ නුවූ සිතින් යුක්ත වැ ගිය-ආ මග සලකමින් හුදෙකලා වැ යන්නේ ය. ඒ උද්ධුමාතක නිමිත්ත තිබුණු පෙදෙසෙහි පිහිටි ගල හෝ තුඹස හෝ රුක හෝ පඳුර හෝ වැල හෝ සනිමිත්ත කරන්නේ ය. සාරම්මණ කරන්නේ ය. සනිමිත්ත කොටැ සාරම්මණ කොටැ ඒ අසුභ නිමිත්ත සහාග හෙයින් සලකුණු කරන්නේ ය. හේ එය වණ්ණ, ලිඛිත, සණ්ඨාන, දිසා, ඔකාස, පරිච්ඡේද, සන්ධි, විවර, නිත්‍ය, ථල, සමන්ත යන ආකාරයෙන් සුග්‍රහීත-සුපධාරිත-සුවවත්ථිත කරන්නේ ය. එසේ සුග්‍රහීත - සුපධාරිත - සුවවත්ථිත කොටැ නො මුළා වැ එළඹ සිටි සිහියෙන් සංවර වූ ඉන්ද්‍රියයෙන් බැහැර නො වූ සිතින් ආ ගිය මග සලකමින් හුදෙකලා වැ යන්නේ ය. හේ සක්මන් කරන්නේ ද ඒ අසුභ නිමිත්ත මනසිකාර සහිත වැ ම සක්මන් කරන්නේ ය. හිඳින්නේ ද ඒ මනසිකාර සහිත වැ ම හිඳින්නේ ය.

හාත්පස නිමිති සලකුණු කැරැ ගැන්ම කවර අර්ථයක් ආනිසංසයක් පිණිස ද, අසම්මොහ පිණිස ය. අසම්මොහානිසංස පිණිස ය.

එකොලොස් ආකාරයෙන් නිමිති ගැන්ම කවර අර්ථයක් කවර ආනිසංසයක් පිණිස ද, අසුභාරම්මණයෙහි සිත එළවා බැඳීම පිණිස ය. ඒ ආනිසංස පිණිස ය.

ආ ගිය මග සැලකීම කවර අර්ථයක් කවර ආනිසංසයක් පිණිස ද, කම්මට්ඨාන විෂයට මනා කොටැ පිළිපැදීම පිණිස ය. එම ආනිසංස පිණිස ය.

ඒ යොගාවචර ආනිසංස දක්මින් රත්න සංඥ වැ ගෞරව උපදවා ප්‍රිය කරමින් "ඒකාන්තයෙන් මම මේ ප්‍රතිපදයෙන් ජරා මරණයෙන් මිදී ගන්නෙමි" යි ඒ අරමුණෙහි සිත බැඳ ලන්නේ ය. හේ වසතුකාම කෙලෙසකාමයෙන් වෙන් වැ - පෙ - ප්‍රථම ධ්‍යානය ලබා ගෙනැ වාසය කරන්නේ ය. ඔහු විසින් මෙසේ රූපාවචර ප්‍රථම ධ්‍යානය ලබා ගන්නා ලද්දේ වේ. දිව්‍ය විහරණය ද භාවනාමය පුණ්‍ය ක්‍රියා වස්තු ද ලබා ගන්නා ලද්දේ වෙයි."

මේ අර්ථය ම මතු විස්තර කරති.

අටුවායෙහි මෙසේ දැක්වුණු හෙයින් යමෙක් තමාගේ අසංයත වූ සිත දමනය කැරැ ගැන්ම සඳහා මළ සිරුරු

දක්නට යන්නේ නම් හේ ගෙඩිය ගසා ගණයා රැස් කරවා ගෙනැ ද යේවා. කර්මස්ථාන ශීර්ෂයෙන් යන්නහු විසින් එසේ නො කොටැ දෙවැන්නකු හෝ නො ගෙනැ එකලා වැ මූල කර්මස්ථානය සිතින් නො හැරැ එම සිහිකරමින් සොහොනෙහි සුනඛාදීන්ගෙන් වන උපද්‍රව වළකනු සඳහා සැරයටිය හෝ අන්කිසි යෂ්ටියක් හෝ ගෙනැ මූල කර්මස්ථානය මෙනෙහි කිරීමෙන් නුමුළා සිහි ඇති වැ චක්ෂුරාදි ඉන්ද්‍රියයන් මනා ව සංවර කොටැ ගෙනැ බැහැර නො ගිය සිහි ඇති වැ ගමන් කළ යුතු.

විහාරයෙන් නික්මෙන් ම අසුවල් දිගැ අසුවල් දෙරින් නික්මුණෙමි යි වාරය සිහියේ තබා ගත යුතු. ඉක්බිති යම් මඟකින් යන්නේ නම් ඒ මඟ "මෙය තැගෙනහිරට අභිමුඛව ගියේ ය, මෙය බස්නාහිරට අභිමුඛ වැ ගියේ ය, මෙය උතුරු දිගට – මෙය දකුණු දිගට – මෙය සතර අනු දිගට අභිමුඛ වැ ගියේ ය යි ව්‍යවස්ථා කැරැ ගත යුතු. තවද මේතැන දී වමට ගියේ ය, මේ තැන දී දකුණට ගියේ ය, මේ තැන ගල ය, මේ තැන තුඹස ය, මේ තැන රුක ය, මේ තැන ගස ය, මේ තැන වැල ය යි මේ සේ ගමන් මඟ ව්‍යවස්ථා කැරැ ගනිමින් නිමිත්තන ස්ථානයට යා යුතු. එසේ යන ද උඩු සුළඟට නො යා යුතු. කුමක් හෙයින් ද උඩු සුළඟට යන් ම කුණු ගඳ නැහැයේ වැදී හිස් මුල් හෝ අලලන්නේ ය. ආහාර හෝ නංවන්නේ ය. මේ නියා කුණප ස්ථානයකට ආසන්න යි විපිළිසර හෝ දනවන්නේ ය. එබැවින් උඩු සුළඟ හැරැ යටි සුළඟට යා යුතු. අතර ප්‍රපාතයෙක් හෝ පර්වතයෙක් හෝ පහණෙක් හෝ වැටෙක් හෝ කවුලැහැබෙක් හෝ දියකඩෙක් හෝ මඩ බිමෙක් හෝ වේ නම් එයින් උඩු සුළඟට යා නො හැකි නම් සිවුරු කනින් නැහැය වසා ගෙනැ යා යුතු.

මේ ඒ යෝගී හට ගමන් වත යි.

එසේ ගියහු විසින් ලා හෙලා අශුභ නිමිත්ත නො බලා දිසා ව්‍යවස්ථා කැරැ ගත යුතු. ඇතැම් දිසා භාගයෙක සිටීඇහුට අරමුණ විභූත වැ නො වැටහෙයි. සිත ද භාවනාවට යෝග්‍ය නො වෙයි. ඒ බඳු දිසාභාග හැරැ පියා අරමුණ විභූත වැ වැටහෙන සිත ද භාවනාවට යෝග්‍ය වන දිසාභාගයෙක සිටිය යුතු. එසේ ම වාතයට මුහුණ ලා ද පිටු පා ද නො සිටිය යුතු. වාතයට මුහුණ ලා සිටුත් ම කුණු ගඳින් පෙළීමෙන් සිත වික්ෂිප්ත වෙයි. වාතයට පිටුපා සිටුත් හොත් කුණපයට අධිගෘහීත අමනුෂ්‍යයෝ වූ නම්

ඔහු කිපී අනර්ථ කරති. එබැවින් මදක් අසින් වැ ඉතා අනුවාත-යෙහි නො සිටිය යුතු. එසේ සිටින්නහු විසිනුදු ඉතා දුර වැ ද ඉතා ළං වැ ද නො සිටිය යුතු. පා ළඟ හෝ හිස ළඟ හෝ නො සිටිය යුතු. කුමක් හෙයින් ද ඉතා දුර වැ සිටින කල්හි අරමුණ විභූත නො වේ. ඉතා ළං වැ සිටින කල්හි බිය උපද්දි. පා ළඟ හෝ ඉස ළඟ හෝ සිටි කල්හි අසුභය මුළුල්ල නො පෙනෙයි. එබැවින් ඉතා දුරත් නො වැ ඉතා ළඟත් නො වැ පහසුයෙන් බැලිය හැකි මැද හරියේ සිටිය යුතු. එසේ සිටැ **"තඤ්ච පදෙසෙ පාසාණං වා -පෙ- ලතං වා සනිමිත්තං කරොති"** යි අටුවායෙහි කී පරිදි නිමිති සැලකිය යුතු.

නිමිති සලකන ආකාර

නිමිත්ත අවට ඇස් හමුවේ ගලෙක් ඇත් නම් මේ ගල උසය කියා හෝ කුඩාය කියා හෝ මහත්ය කියා හෝ තඹ පැහැය කියා හෝ කළු පැහැය කියා හෝ සුදු පැහැය කියා හෝ දිගය කියා හෝ වටය කියා හෝ ව්‍යවසථා කැරැ ගත යුතු. එසේ ව්‍යවසථා කොටැ ගෙන "මේ ගල මෙ තැන ය, අසුභ නිමිත්ත මෙ තැන ය, මේ අසුභ නිමිත්ත ය, මේ ගල ය යි සැලකිය යුතු තුඹසෙක් නම් එ ද උස ය කියා හෝ මිටි ය කියා හෝ කුඩා ය කියා හෝ මහත්ය කියා හෝ තඹ පැහැය කියා හෝ කලු පැහැය කියා හෝ දිගය කියා හෝ වටය කියා හෝ ව්‍යවසථා කැරැ ගත යුතු. එසේ ව්‍යවසථා කොටැ ගෙන තුඹස මෙ තැන ය, අසුභ නිමිත්ත මෙ තැන ය, මේ තුඹස ය, මේ අසුභ නිමිත්ත ය යි සැලකිය යුතු. රුකෙක් නම් එ ද ඇසතුයෙක කියා හෝ නුගයෙක කියා හෝ කලුසුයෙක කියා හෝ ගිවුළුවෙක කියා හෝ උස, මිටි, කුඩා, මහත්, කලු, සුදු කියා හෝ ව්‍යවසථා කැරැ ගත යුතු. එසේ ව්‍යවසථා කොටැ මේ ගස මෙ තැන ය. අසුභ නිමිත්ත මෙ තැන ය, මේ ගස ය, මේ අසුභ නිමිත්ත ය යි සැලකිය යුතු. ඉදින් ගසෙක් නම් එ ද හිඳිය කියා හෝ කරඹය කියා හෝ කණේරුය කියා හෝ කටුකරඹුය කියා හෝ උස, මිටි, කුඩා, මහත්, කියා හෝ ව්‍යවසථා කැරැ ගත යුතු. එසේ ව්‍යවසථා කොටැ ගෙන මේ ගස මෙ තැන ය, මේ අසුභ නිමිත්ත මෙ තැන ය, මේ ගස ය, මේ අසුභ නිමිත්ත ය යි සැලකිය යුතු. ඉදින් වැලෙක් නම් එ ද ලබු කියා හෝ කොමඩු කියා හෝ පූඩා කියා හෝ කළු වැල් කියා හෝ රසකිඳ කියා හෝ ව්‍යවසථා කැරැ ගත යුතු. එසේ

ව්‍යවසථා කොටැ ගෙතැ මේ වැල මෙ තැන ය, අසුභ නිමිත්ත මෙ තැන ය, මේ අසුභ නිමිත්ත ය මේ වැල ය යි සැලකිය යුතු. **"සනිමිත්ත කරන්නේ ය, සාරම්මණ කරන්නේ ය"** යනුදු මෙහි ම ඇතුළති. කැවත කැවත ව්‍යවසථා කිරීම සනිමිත්ත කිරීම ය. මේ ගලය මේ අසුභ නිමිත්ත ය. මේ අසුභ නිමිත්ත ය මේ ගලය යි දෙක-දෙක එක් කොටැ ව්‍යවසථා කිරීම සාරම්මණ කිරීම ය. "මෙසේ සනිමිත්ත කොටැ සාරම්මණ කොට සහාග හෙයින් සලකුණු කරන්නේ ය" යි කී බැවින් එහි සහාග භාවය - අනන්‍ය සාධාරණ භාවය - ඒ නිමිත්ත පිළිබඳ උද්ඛුමාතභාවය මෙතෙහි කටයුතු. **වනිතය, උද්ඛුමාතය** යි මෙසේ සවභාවයෙන් සරසයෙන් ව්‍යවසථා කටයුතුය යි කී සේ යි. ("වනිතං" යනු උද්ඛුමාතකය යන අර්ථ ය. "වනිතං ති සූතා" යනු ටීකා යි. සවභාව යනු පිළිකුල් බැවින් රසය යි කියනු ලැබේ. "සභාවෝ එව තථා නිප්ඵජ්ජනතෝ රසෝ ති වුත්තෝ" යනු ටීකා යි.")

මෙසේ ව්‍යවසථා කොටැ **වණ්ණ, ලිඞ්ග, සණ්ඨාන, දිසා, ඔකාස, පරිච්ඡේද** යන සයාකාරයෙන් නිමිත්ත ග්‍රහණය කළ යුතු.

ෂට්විධ නිමිත්ත ග්‍රහණ විධි

ඒ යොගී විසින් මේ ශරීරය **කල්ලකුගේ** හෝ සුද්දකුගේ හෝ මහුරුපැහැඇත්තකුගේ හෝ යි **වණ්ණ වශයෙන්** ව්‍යවසථා **කළ** යුතු.

ලිඞ්ග වශයෙන් වනාහි සත්‍රී ලිඞ්ග - පුරුෂ ලිඞ්ගය යි ව්‍යවසථා නො කොටැ ප්‍රථම වයසෙහි හෝ මධ්‍යම වයසෙහි හෝ පශ්චිම වයසෙහි හෝ සිටියකු ගේ ය යි ව්‍යවසථා **කළ** යුතු.

සණ්ඨාන වශයෙන් උද්ඛුමාතක සටහන් වශයෙන් ම මේ මෙහි හිස් සටහන, මේ ග්‍රීවා සටහන, මේ අත් සටහන, මේ උදර සටහන, මේ කෙණ්ඩා සටහන, මේ පා සටහන ය යි. ව්‍යවසථා කළ යුතු.

දිශා වශයෙන් මේ ශරීරයෙහි දිශා දෙකෙක. කැබින් යට යට දිසාව ය. කැබින් උඩ උඩු දිසාය යි ව්‍යවසථා කළ යුතු. නොහොත් මම මේ දිශායෙහි ය. අසුභ නිමිත්ත මේ දිසායෙහි ය යි ව්‍යවසථා කළ යුතු.

අවයවාශ වශයෙන් මේ අවකාශයෙහි අත් ද, මේ අවකාශයෙහි පා ද, මේ අවකාශයෙහි මැදුම් කය ද, පිහිටියේ ය යි ව්‍යවස්ථා කළ යුතු. නොහොත් මම මේ අවකාශයෙහි ය, අශුභ නිමිත්ත මේ අවකාශයෙහි ය යි ව්‍යවස්ථා කළ යුතු.

පරිච්ඡේද වශයෙන් මේ සිරුර යට පතුලින් ද, උඩ කෙසගින් ද, සරස සිව්යෙන් ද පිරිසුන් ය. ඒ පිරිසුන් තන්හි දෙතිස් කුණපයෙන් පිරුණේ ය යි ව්‍යවස්ථා කළ යුතු. යම් පමණ සිරුරු පෙදෙසක් උද්ධුමාත වශයෙන් නුවණින් පිරිසිදු ගනී ද එ පමණක් ම මේ මෙ බදු උද්ධුමාතයෙකැ යි හෝ පරිච්ඡේද කළ යුතු.

පිරිමිහට සත්‍රී ශරීරය ද, සත්‍රීහට පිරිමි ශරීරය ද සපපාය නො වේ. විසභාගයෙහි අසුභාරම්මණය නො වැටහෙන බැවිනි. එයින් කිමෙක් වේ ද, **සෙලශොතපත්තියට** ම කාරණ වේ. **"උභයාණිනාපි හි ඉත්ථිපුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති"** 'ඉදිමී ගිය හෝ කුණු වැ ගිය සත්‍රී ද පිරිමින්ගේ සිත පොළඹවා ගෙන සිටින්නී ය'යි **මැදුම්සඟි අටුවායෙහි** දක්වීණි. එබැවින් සභාග සිරුරෙහි ම සවැදැරුම් නිමිති ගත යුතු.

පෙර බුදුවරයන් වෙත කමටහන් පුරුදු කළ සොඝානිකාදි ධුතාඞ්ග පරිහරණ කළ – මහාභූත පිරිමැදී – සංඝකාර පරිග්‍රහ කළ – නාම රූප ව්‍යවස්ථා කළ – සත්තවසංඥ උගුලාලූ – මහණුවම සිදු කළ – කුසල වාසනා වූසූ – කුසල භාවනා වැඩූ – කුශල බීජ සහිත ඥනොත්තර වූ – මද කෙලෙස් ඇති කුලපුත්‍රයාට බැලූ බැලූ තන්හි ප්‍රතිභාග නිමිත්ත වැටහෙන්නේ ය. ඉදින් එසේත් නො වැටහෙත් හොත් යට දැක්වුණු ඵඩාකාරයෙන් නිමිති ගන්නා කල වැටහෙන්නේ ය. එසේත් නො වැටහේ නම් **සඤ්ඤි වශයෙන්, විවර වශයෙන්, නිනන වශයෙන්, ඵල වශයෙන්, සමතන වශයෙන්** යන පස් ආකාරයෙන් නිමිත්ත ග්‍රහණය කළ යුතු.

පංචවිධ නිමිත්ත ග්‍රහණ විධි

සඤ්ඤි වශයෙන් නිමිත්ත ග්‍රහණය නම් එක්සිය අසුවක් සඤ්ඤි වශයෙන් නිමිති ගැන්ම ය. ඉදිම ගිය ශරීරයෙහි එතෙක් සඤ්ඤි වශයෙන් කෙලෙස නිමිත්ත ග්‍රහණය කරන්නේ ද, ඉදිමුණු ශරීරයෙහි බොහෝ සේ සඤ්ඤි නො පෙනී යෙයි. එබැවින් දසරු සඤ්ඤි වැලමිට සඤ්ඤි, මණිබන්ධ සඤ්ඤි යන දකුණත සඤ්ඤි තුන ය;

එසේම වමන සඤ්ඤා තුනය, කටි සඤ්ඤා, දණ සඤ්ඤා, බොලට සඤ්ඤා යන දකුණු පා සඤ්ඤා තුනය, එසේ ම වම් පා සඤ්ඤා වශයෙන් ව්‍යවසථාන කට යුතු.

විවර වශයෙන් යූ තන්හි විවර තම් දකුණත හා දකුණැල අතර ය, වමත හා වම් ඇල අතර ය, දෙපා අතර ය, බඩ හා පෙකණි අතර හෝ උදර අතර ය. කන් විවරය යි මෙසේ විවර වශයෙන් ව්‍යවසථාන කටයුතු. ඇස් පියවී- දැල්වී තුබූ බව හෝ මුව පියවී- හැරී තුබූ බව හෝ ව්‍යවසථාන කටයුතු.

නිමිත්ත වශයෙන් යූ තන්හි ශරීරයෙහි වළ තැන් – ඇස් වළ හෝ ඇතුළු මුව හෝ ගළවළුව හෝ ව්‍යවසථාන කට යුතු නොහොත් මම වළ තන්හි, ශරීරය ගොඩ තන්හි ය යි ව්‍යවසථාන කට යුතු.

ඵල වශයෙන් යූ තන්හි ශරීරයෙහි උස් තැන් – දණ හෝ ළය හෝ තළල හෝ ව්‍යවසථාන කටයුතු. නොහොත් මම ගොඩ, ශරීරය මිටි තැන ය යි ව්‍යවසථාන කට යුතු.

සමූහන වශයෙන් යූ තන්හි සිරුර මුළුල්ල හාත්පසින් ව්‍යවසථාන කට යුතු. මුළු සිරුරෙහි නුවණ මෙහෙයා විහුත වැ වැටහෙන තැන උද්ධුමාතකය යි සිත පිහිටවිය යුතු. ඉදින් එසේත් නිමිත්ත නො වැටහේ නම් උදරය අවසන් කොට ඇති උපරිම ශරීරය අධිකවැ ඉදිමෙන බැවින් එහි **"උද්ධුමාතකය උද්ධුමාතකය" යි** සිත පිහිටුවිය යුතු.

දැන් **"හේ ඒ නිමිත්ත සුගහගිත කරන්නේ ය"** යනාදියෙහි විනිශ්චය කථාව මෙසේ ය:-

ඒ යොගි විසින් ඒ ශරීරයෙහි **වණ්ණාදි** වශයෙන් හා **සඤ්ඤා විවරාදි** වශයෙන් හා යට කී සේ උද්ධුමාතක නිමිති ගැනීම් වශයෙන් මනා වැ නිමිති ගත යුතු. මනා වැ සිහි එළවා ආවජ්ජනය කළ යුතු. එසේ කිරීමෙන් මනා වැ උපධාරණය කළ යුතු. ව්‍යවසථාන කළ යුතු. ශරීරයට නුදුරු වැ නො ළං වැ සිට ගෙනැ හෝ හිඳ ගෙන ඇස දල්වා බලා ගෙනැ නිමිති ගත යුතු. **"උද්ධුමාතක අසුභය, උද්ධුමාතක අසුභය" යි** සිය දහස් වර ඇස දල්වා බැලිය යුතු. ඇස පියා ලා ආවජ්ජනය කළ යුතු. මෙසේ තැවත තැවත බලන්ම ආවජ්ජනය කරන්ම උග්ගහ නිමිත්ත සුග්ගහිත වෙයි. සුග්ගහිතය වන්නේ කවර විටෙක ද

ඇස දල්වා බලන විට ද ඇස පියා ලා සිතන විට ද එක සේ ආපාත ගත වේ නම් එවිට සුගහනීත වූයේ වෙයි. මෙසේ සුගහනීත – සුපධාරිත – සුවවත්‍ථිත කොටැ එහි දී ම භාවනාවශාන-යට යා නොහැකි නම්, එක කලට, කී සේ හුදෙකලා වැ ඒ නිමිත්ත ම මෙනෙහි කරමින් ඔනා වැ සිහි එළවා සංවර ඉන්‍ද්‍රිය ඇති වැ බැහැර නුවූ සිත් ඇති වැ සවකීය සෙනාසනයට ම ආ යුතු.

සොහොනින් නික් මැ එන්නහු විසිනුදු එන මඟ ව්‍යවසථා කළ යුතු. එන මඟ මේ නැගෙනහිරට අභිමුඛය, මේ බටහිරට අභිමුඛය, මේ උතුරට අභිමුඛය, මේ දකුණට අභිමුඛය, මේ අනුදිගට අභිමුඛය, මෙ තැන දී වමින් යෙයි, මෙ තැනින් දකුණින් යෙයි, මෙ තැන ගලය, මෙ තැන තුඹසය, මෙ තැන රුකය, මෙ තැන ගසය, මෙ තැන වැලය යි ව්‍යවසථා කරමින් අවුත් සක්මනට නැඟැ සක්මන් කරන විට ද තද්භාගික සක්මනකට ම නැංග යුතු. එයින් කීයේ අශුභ නිමිත්තයට අභිමුඛ භූමි ප්‍රදෙශයක ම සක්මන් කළ යුතු බව යි. භිඳැ ගන්නා විට ද තද්භාගික කොටැ මැ ආසනය පණවා ගත යුතු. ඉදින් ඒ දිගැ හෙබක් හෝ ප්‍රපාතයක් හෝ රුකක් හෝ වැටක් හෝ මඩක් හෝ ඇති හෙයින් තද්දිශාභිමුඛ භූමි ප්‍රදෙශයෙක සක්මන් කළ නොහැකි නම් අවකාශ නැති බැවින් ආසනය හෝ පණවා ගත නොහැකි නම් ඒ දිග නොබලමින් වුව ද අවකාශානුරූප නැනෙක සක්මන් කළ යුතු. භිඳ ගත යුතු. එහෙත් සිත නම් ඒ දිශාවට ම අභිමුඛ කැරැ ලිය යුතු යි.

"හාත්පස නිමිති සලකුණු කැරැ ගැන්ම කවර අර්‍ථයක් කවර ආනිසංසයක් පිණිස ද අසමෙමාහය පිණිස ය" යනාදි විසජ්නයෙහි අභිප්‍රාය මෙසේ ය.

සඛ්‍යාකාලාදි අවේලාවෙක උද්ධුමාතක නිමිත්ත ඇති නැනට ගොස් හාත්පස නිමිති සලකුණු කොටැ ගෙනැ නිමිති ගන්නා සඳහා ඇස් දල්වා බලන්නකුට ඒ මළ සිරුර නැඟී සිටියාක් මෙන් ද, මැඩ ගෙනැ එන්නාක් මෙන් ද, පසුපස්සේ ලුහුබැඳැ එන්නාක් මෙන් ද වැටහේ නම් ඒ යොගී වේතාලයක් බඳු බියකරු වූ ඒ අරමුණු දැකැ සිත විසිපත වැ උමතුවකු සේ වෙයි. බියට නැති ගැන්මට ලොමුදහ ගැන්මට පැමිණෙයි. පාළියෙහි දැක්වුණු අටතිස් අරමුණු අතුරෙන් මේසා බියකරු අරමුණෙක් නම් නැති. ඛ්‍රාතවිඛහනනක වන්නේ මේ අරමුණේ දී ය. මේ ඒ සා බියකරු ය. (ඛ්‍රාතවිඛහනනක නම් ශීලයෙන්

මනස්සයෙන් පිරිහුණුවකු සේ ධ්‍යානයෙන් පිරිහුණුවෙක.) එ හෙයින් ඒ යොගී සිත දැඩි කොටැ ගෙනැ මතා සිහිය එළවා ගෙනැ "මළ සිරුරු නැගිටැ ලුහුබැඳීමෙක් නම් නො වන්නෙකි. ඒ ළඟ තුබුණු ගල් කෝ වැල හෝ එත් නම් ඒ සිරුර ද එන්නේ වේ. ගල හෝ වැල හෝ නො ඒ නම් මළ සිරුර ද එසේ ම නො එන්නේ ම ය. මේ තොපට වැටහෙන ආකාරයෙකි. භාවනා සංඥයෙන් සිදුවූවෙකි. තොපට කර්මස්ථානය වැටහුණේ අද ය. මහණ බිය නො වන්නැ සි ත්‍රාසය විනොයා මාගේ පරිශ්‍රමය සඵල වීය සි භාසය දනවා ඒ නිමිත්තෙහි සිත මෙහෙයිය යුතු. එවිට විශෙෂයට පැමිණෙන්නේ ය. **"භාවනාය නිමිති සලකුණු කොටැ ගැන්ම අසමෙමාහය පිණිස ය"** සි කියේ මේ නිසා ය.

"එකොළොස් ආකාරයෙන් නිමිති ගන්නේ අසුභා රම්මණයෙහි සිත එළවා බඳින්නේ ය." ඒ යොගිහට ඇස දල්වා බැලීමෙන් උද්ග්‍රහ නිමිත්ත උපදනේ ය. උද්ග්‍රහ නිමිත්තෙහි සිත මෙහෙයීමෙන් ප්‍රතිභාග නිමිත්ත උපදනේ ය. එහි සිත මෙහෙයීමෙන් අර්පණාවට පැමිණේ. අර්පණායෙහි සිටැ විවසුන් වඩා රහත් වන්නේ ය. **"එකොළොස් ආකාරයෙන් නිමිති ගැන්ම අසුභාරම්මණයෙහි සිත එළවා බැඳීම පිණිස ය"** සි කීයේ එහෙයිනි.

"ගිය ආ මඟ ප්‍රත්‍යවෙක්ෂා කිරීම විපි ප්‍රතිපාදනය පිණිස ය" ගිය ආ මඟ ප්‍රත්‍යවෙක්ෂා කිරීම කර්මස්ථාන විපිය මනාව ප්‍රතිපාදනය කිරීම අර්ථ කොටැ ඇත්තේ ය. එහි විස්තරය මෙසේ දත යුතු.

කර්මස්ථානය ගෙනැ එන මේ භික්ෂු අතින් යමෙක් අතර මඟ දී "සවාමීනි අද කවරදැ දැ" සි දවස් විවාළ හොත් අන්‍ය ප්‍රශ්නයක් හෝ විවාළ හොත් පිළිසඳර හෝ කථා කළ හොත් "මම කර්මස්ථාන වඩන්නෙක්මි" සි තූෂ්ණීම්භූත වැ නො ආ යුතු ය. දවස කිය යුතු ය. ප්‍රශ්නය විසඳිය යුතු ය. නො දනී නම් නො දනිමි' ය සි කිය යුතු ය. දැහැමි පිළිසඳර කළ යුතු. එසේ කරන කල්හි ලැබගත් තරුණ නිමිත්ත නැසී යා හැකි ය. ඒ නැසී යන ද විවාළ කල දවස කිය යුතු ය. ප්‍රශ්නය නො දන්නේ නම් "නො දනිමි" සි කිය යුතු ය. දනිත් නම් එක දෙශයකින් හෝ කිය යුතු ය. පිළිසඳර ද කළ යුතු ය. තව ද ආගන්තුක භික්ෂූන් දැක ආගන්තුක පිළිසඳර කළ යුතු ය.

සෙසු සැමලු – බෝමලු – පොහෝගේ – බොජුන්හල් – ජනනාසර– ආචාරසී – උපාධ්‍යාය – ආගන්තුක – ගමික යන සියලු කදුවත් ද පිරිය යුතු ය. ඒ වත් පුරන කල්හි දු තරුණ නිමිත්ත නැති වැ යන්නේ ය. යළි ගොස් නිමිත්ත ගන්නෙමි සි යාගැටි වුව ද අමනුෂ්‍යයන්ගෙන් හෝ චණ්ඩමෘගයන්ගෙන් හෝ යුක්ත බැවින් සොහොනට යන්නට පවා නො හැකි වෙයි. නිමිත්ත හෝ නැති වැ යෙයි. උද්ධුමාතක නිමිත්ත දවසක් – දෙකක් තිබී විනිලකාදි බවට හැරෙන්නේ ය. කම්සථාන අතුරෙන් මේ සා දුර්ලභ කම්සථානයෙක් නැති. එ බැවින් නිමිත්ත නැති වැ ගිය කල්හි ඒ යොගී රාත්‍රිසථානයෙහි හෝ දිවාසථානයෙහි හෝ හිඳ ගෙන "මම මේ දෙරින් විහාරයෙන් නික්මැ අසුවල් දිගට අභිමුඛ වූ මඟට පැමිණැ අසුවල් තැන දී වමට හැරුණෙමි, අසුවල් තැන දී දකුණට හැරුණෙමි, ඒ මඟ අසුවල් තැන ගලය, අසුවල් තැන තුඹසය, රුකය, ගසය, වැලය, මම ඒ මහින් ගොස් අසුවල් තැන දී අසුභය දිටිමි. එහිදී අසුවල් දිගට අභිමුඛ වැ සිට මේ මේ ආකාරයෙන් හාත්පස නිමිති සලකා මෙසේ අසුභ නිමිත්ත උගෙනැ අසුවල් දිග සොහොනින් නික්මැ මෙබඳු මාගීයෙන් මේ මේ දේ කරමින් අවුත් මෙහි උන්නෙමි"සි පලඟ බැඳැ උන් තැන දක්වා ගිය ආ මඟ ප්‍රත්‍යවෙක්ෂා කළ යුතු ය. එසේ කරන කල්හි ඒ නිමිත්ත ප්‍රකට වන්නේ ය. ඉදිරියෙහි තිබෙන්නා සේ වැටහෙන්නේ ය. කම්සථානය පෙරසේ ම වීථියට බැස ගන්නේ ය. **"ගිය ආ මඟ ප්‍රත්‍යවෙක්ෂා කිරීම වීථිප්‍රතිපාදනය නිම්සි ය"**සි කියේ එහෙයිනි.

"ආනිසංස දක්වමින් රත්නසංඥ වැ ගෞරව උපදවා ප්‍රිය කෙරෙමින් ඒ අරමුණෙහි සිත බැඳ තබන්නේ ය."

උද්ධුමාතක අසුභයෙහි සිත මෙහෙයා ධ්‍යාන උපදවා ධ්‍යාන–පදසථාන විවසුන් වඩා එකාන්තයෙන් මේ ප්‍රතිපත්තියෙන් ජරා–මරණයෙන් මිදී ගන්නෙමි' යි මෙසේ **ආනිසංස දැක්ක යුතු ය.**

දුගී මිනිසකු මහඟු මිණිරුවනක් ලත් කල "ම විසින් දුර්ලභයෙක් ලබන ලදැ"යි එහි රත්නසංඥ වැ ගෞරව උපදවා, මහත් ප්‍රේමයෙන් එය රැකැ ගන්නේ ය. 'මවිසින් ද මේ ලබා ගන්නා ලද්දේ දුර්ලභ කම්සථානයෙකි. දුගියාට මහඟු මිණි රුවන බඳු ය. චතුධාතුකමමට්ඨානිකයා තමා පිළිබඳ වූ ම සතර

මහාභූත අරමුණු කරන්නේ ය. **ආණාපාණකම්මට්ඨානිකයා** තමාගේ ම කායසංඛාරය අරමුණු කරන්නේ ය. **කසිණකම්මට්ඨානිකයා කසිණමණ්ඩලය** කොටැ පහසු සේ භාවනා කරන්නේ ය. මෙසේ සෙසු **කම්මට්ඨාන** ගුලහ ය. **මේ** වතාහි දවසක් දෙකක් පමණක් පවත්නේ ය එයින් පසු විනීලකාදිභාවයට පෙරළෙන්නේ ය. "මෙයට වඩා දුර්ලභ කම්ටහනෙක් නැතැ"යි එහි රතනසංඥා වැ ගෞරව උපදවා ප්‍රිය වඩමින් ඒ නිමිත්ත රැකැ ගත යුතු. රාත්‍රි ස්ථානයෙහි ද දිවා ස්ථානයෙහි ද **"උද්ධුමාතක අසුභය, උද්ධුමාතක අසුභය"** යි පුන-පුනා සිත බැඳිය යුතු ය. පුන-පුනා ආවර්ජිතය කළ යුතු ය. මෙනෙහි **කළ** යුතු ය. **තක්කාහත-විතක්කාහත** කළ යුතු ය. මෙසේ කරත් ම ඔහුට ප්‍රතිභාග නිමිත්ත උපදින්නේ ය.

උද්ග්‍රහ නිමිත්තයේ හා ප්‍රතිභාග නිමිත්තයේ වෙනස

උද්ග්‍රහ නිමිත්ත විරූප වැ පිළිකුල් වැ භයානක වැ වැට හෙන්නේ ය. ප්‍රතිභාග නිමිත්ත කුස පුරා කා නිදන සප්ලාඞ්ග-ප්‍රත්‍යඞ්ග ඇති පුරුෂයකු සේ වැටහෙන්නේ ය.

ප්‍රතිභාග නිමිත්ත පහළවත් ම අශුභභාවනානුභාවයෙන් බාහිර වූ **කාමසංඥාව** දුරු වූ බැවින් විෂ්කම්භන වශයෙන් ඔහුගේ **කාමච්ඡන්දය** ප්‍රහීණ වන්නේ ය. ලේ තැති වීමෙන් ලේ මුල් කොටැ ඇති පූයාව ද නැති වන්නා සේ අනුනය (**කාමච්ඡන්දය**) ප්‍රහාණයෙන් ඒ මුල් කොට ඇති **ව්‍යාපාදය** ද ප්‍රහීණ වේ. එසේම ආරබ්ධ වීර්‍ය්‍ය ඇති බැවින් ථීන-මිද්ධය ද, විප්‍රක්ෂිප්තයට ප්‍රතිපක්ෂ වූ ශාන්තාධිමුක්තියෝගයෙන් **උද්ධච්ච-කුක්කුච්චය** ද අධිගත විශේෂය තමහට ප්‍රත්‍යක්ෂ වූ බැවින් ඒ ප්‍රතිපත්තිය නියම කොටැ වදාළ ශාස්තෘන් වහන්සේ **කෙරෙහිත්** ප්‍රතිපත්තිය **කෙරෙහිත්** ප්‍රතිපත්තිඵලය **කෙරෙහිත් විචිකිච්ඡාව** ද ප්‍රහීණ වේ. මෙසේ **පඤ්චනීවරණ** යන්ගේ විෂ්කම්භන ප්‍රහාණය කියන ලදී.

ඒ හා සමග ම ඔහුට ඒ ප්‍රතිභාග නිමිත්තෙහි සිත නැංවීම ලක්ෂණ කොටැ ඇති **විතර්කය** ද, ඒ නිමිත්ත පිරිමැදීම කෘත්‍ය කොට ඇති **විචාරය** ද ලත් විශේෂාධිගම ය හෙතුකොටැ වත **ප්‍රීතිය** ද, ප්‍රීතිමත්හට පස්සද්ධිය ලැබෙන බැවින් පස්සද්ධි නිමිත්ත කොටැ ඇති **සුඛය** ද, සුඛිතහට චිත්තසමාධි ලැබෙන බැවින් සුඛ නිමිති කොටැ ඇති **එකාග්‍රතාව** ද යන ධ්‍යානාඞ්ගයෝ පහළ වෙති. මෙසේ ඒ යොගිහට ප්‍රථම ධ්‍යානයාගේ

ප්‍රතිබිම්බය වූ උපචාර ධ්‍යානය ද ඒ ඇසිල්ලෙහි ම වන්නේ ය. අර්පණායෙහි පටන් සියල්ල පඨවිකසිණයට කී පරිදි මෑ සි.

උද්ධුමාතක අශුභ භාවනා විධිය සි.

විනීලකාදියෙහි ද "උද්ධුමාතක අසුභ නිමිත්ත උගන්නා යොගාවචර නො මුළා වැ එළඹ සිටි සිහියෙන් යුක්ත වැ -පෙ- හුදෙකලා වැ යන්නේ ය" යනාදීන් දැක්වුණු සේ "විනීලක අසුභ නිමිත්ත උගන්නා - විපුබ්බක අසුභ නිමිත්ත උගන්නා යොගාවචර නො මුළා වැ එළඹ සිටි සිහියෙන් යුක්ත වැ -පෙ- හුදෙකලා වැ යන්නේ ය." යනාදීන් උද්ධුමාතක පදය වෙනුවට විනීලකාදි පද යොදා යට කී සේ විනිශ්චය සහිත අභිප්‍රාය දත යුතු. එහි විශෙෂ මෙසේ ය.

2. විනීලකයෙහි:- "විනීලක පටික්කූලය, විනීලක පටික්කූලය" සි මෙතෙහි කළ යුතු. එහි උග්ගහ නිමිත්ත කබර-කබර වණ්ණ වැ ද, ප්‍රතිභාග නිමිත්ත රතා - නීල - ශෙවත වණ්ණ කෙරෙහි උත්සද වැ ද වැටහෙන්නේ ය. (පුරාණ සන්තයෙහි උත්සද වශයෙන් නීලවණ්ණ ම වඩනි සි කීහු.)

3. විපුබ්බකයෙහි:- "විපුබ්බක පටික්කූලය, විපුබ්බක පටික්කූලය" සි මෙතෙහි කළ යුතු. එහි උග්ගහ නිමිත්ත පූයා වැගිරෙන්නා සේ ද, ප්‍රතිභාග නිමිත්ත නිශ්චල වැ සන්සුන් සේ ද වැටහෙන්නේ ය.

4. විච්ඡිද්දකය:- යුඛභූමියෙහි හෝ සොරුන් වසන වනයෙහි හෝ රජදරුවන් සොරුන් සිඳ ලවන සොහොනෙහි හෝ සිංහ ව්‍යාඝ්‍රයන් විසින් මිනිසුන් කා දමන වනයෙහි හෝ ලැබෙයි. එබඳු තැනකට ගොස් නොයෙක් තැන වැටුණු කුණපය ඉදින් එකාවජ්ජනයෙන් ආපාතයට එන්නේ නම් එසේ ආවජ්ජනය කළ යුතු. එසේ ආවජ්ජනයට නො එන්නේ නම් කුණප සියතින් නො අල්ලා ආරම්භකයකු ලවා හෝ සාමණෙරයකු ලවා හෝ වෙන කිසිවකු ලවා හෝ එකතැන් කරවා ගත යුතු සි. **සියතින් අල්ලන කල විඥාණයට පැමිණෙන්නේ ය.** එබන්දෙක් නො ලැබේ නම් සැරයටියෙන් හෝ අත්කිසි දණ්ඩයකින් හෝ එය එකගුල් අතර ඇතිවන සේ එක් තැන් කොටැ **"විච්ඡිද්දක පටික්කූලය, විච්ඡිද්දක පටික්කූලය"** සි මෙතෙහි කළ යුතු. එහි උග්ගහ නිමිත්ත මැදින් කැපුවා සේ ද, පටිභාග නිමිත්ත පරිපූණ්ණ වැ ද වැටහෙන්නේ ය.

5. විකඛායිතකයෙහි – **"විකඛායිතක පටික්කූලය, විකඛායිතක පටික්කූලය"** යි මෙතෙහි කළ යුතු. එහි උග්ගහ නිමිත්ත ඒ ඒ තන්හි කඩා කන ලද්දක් සේ ද පටිභාග නිමිත්ත පරිපූර්ණ සේ ද වැටහෙන්නේ ය.

6. වික්ඛිත්තකය ද, විවර්ජකයෙහි කී සේ අහලක් අතර කරවා ගෙනැ හෝ කැරැ ගෙනැ හෝ **"වික්ඛිත්තක පටික්කූලය, වික්ඛිත්තක පටික්කූලය"** යි මෙතෙහි කළ යුතු. එහි උද්ග්‍රහ නිමිත්ත අතර ප්‍රකට වැ ද, ප්‍රතිභාග නිමිත්ත පරිපූර්ණ වැ ද වැටහෙයි.

7. හතවික්ඛිත්තකය ද, විවර්ජකයෙහි කී තන්හි ලැබෙයි. එබැවින් එහි ගොස් යට කී සේ අහලක් අතර කරවා ගෙනැ හෝ කැරැ ගෙනැ හෝ **"හතවික්ඛිත්තක පටික්කූලය, හතවික්ඛිත්තක පටික්කූලය"** යි මෙතෙහි කළ යුතු. එහි උද්ග්‍රහ නිමිත්ත ප්‍රහාරමුඛ පැනෙන සේ ද, ප්‍රතිභාග නිමිත්ත පරිපූර්ණ වැ ද වැටහෙයි.

8. ලොහිතකය, යුද්ධමණ්ඩලාදියෙහි දී වැදුණු පහරින් අත් පා ආදිය කැපුණු කල්හි ද, ගඩ පොළ ආදිය පැලුණු කල එහි මුඛයෙන් වැගිරෙන කල්හි ද ලැබෙන්නේ ය. එබන්දක් දැකැ **"ලොහිතක පටික්කූලය, ලොහිතක පටික්කූලය"** යි මෙතෙහි කළ යුතු. එහි උද්ග්‍රහ නිමිත්ත වාතයෙන් සැලෙන රකතවණී පතාකාවක් සේ සැලෙන්නක් වැ ද, ප්‍රතිභාග නිමිත්ත නො සැලෙන්නක් වැ ද වැටහෙයි.

9. පුළවකය, දෙතුන් දිනෙකින් පසු ව්‍රණ මුඛ නවයෙන් පණුකැලන් කඩා හැලෙන කල ලැබෙන්නේ ය. වැළින් එය බලු – කැණහිල් – මිනිස් – ගෙරි – මී – ඇත් – අස් – පිඹුරු ආදීන්ගේ ශරීර තරම් වැ ම හැල්බත් රැසක් සේ ද සිටියි. ඒ කෙබඳු තැනෙක හෝ **පුලවක පටික්කූලය, පුලවක පටික්කූලය"** යි මෙතෙහි කළ යුතු. **චුල්ලපිණ්ඩපාතිකතිස්ස** තෙරුණට වනාහි **කලුදිගා වැව්දී** ඇත්කුණපයෙක මේ නිමිත්ත වැටහුණේ ය. මෙහි උද්ග්‍රහ නිමිත්ත සැලෙන්නක් වැ ද, ප්‍රතිභාග නිමිත්ත හැලි බත් පිඬක් සේ නො සැලෙන්නක් වැ ද වැටහෙන්නේ ය.

10. අට්ඨිකය වනාහි **"සෙ පසෙසය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං අට්ඨිසංඛලිකං සමංසලොහිතං නහාරූ සම්බන්ධං"**[1] යනාදීන් නානාප්‍රකාරයෙන් දැක්වුණේ ය. එබැවින් එබන්දක් ඇති

[1]දී: නී: මහාවග්ග 181

තැනකට යට කී සේ ගොස් හාත්පස ගල් ආදි වශයෙන් සනිමිත්ත කොටැ සාරම්මණ කොටැ **"මේ අට්ඨිකය"** යි සවභාව වශයෙන් සලකා වණ්ණාදි එකොලොස් ආකාරයෙන් නිමිත්ත උගත යුතු. එය **වණ්ණ** වශයෙන් සුදු ය යි බලත්හොත් නිමිත්ත නො වැටෙන්නේ ය. යට දැක්වුණු ඔදාත කසිණය හා මිශ්‍ර වන බැවිනි. එසේ හෙයින් "අට්ඨික" ය යි පිළිකූල වශයෙන් ම බැලිය යුතු. **ලිඞ්ග** යනු මෙහි අත් ආදියට ලැබෙන නමෙකි. එබැවින් අත්, පා, හිස, බඩ, බාහු, **කවි, කලවා, කෙණ්ඩ** යන මේ වශයෙන් ලිඞ්ග හෙයින් ව්‍යවසථා කළ යුතු, දිග, කොට, වට, සතරැස්, කුඩා මහත් වශයෙන් **සණ්ඨාන** හෙයින් ව්‍යවසථා කළ යුතු. **දිසා** හා **ඔකාස** යට කී සේ ම ය. ඒ ඒ ඇටවල පසස්නන වශයෙන් **පරිච්ඡේද** හෙයින් ව්‍යවසථා කොටැ ප්‍රකට වැ වැටහෙන්නක් අරමුණු කොටැ ගෙනැ අභිණාවට පැමිණිය යුතු. ඒ ඒ ඇටවල මිටි තැන් උස් තැන් වශයෙන් **නිනන-ථල** හෙයින් ව්‍යවසථා කටයුතු. **ප්‍රදේශ** වශයෙනුදු "මම වළ තැන ය, ඇට ගොඩ තැන ය. මම හෝ ගොඩ තැන ය, ඇට වළ තැන ය" යි ව්‍යවසථා කටයුතු. දෙ ඇට දෙ ඇට ගැළපුණු තැන් වශයෙන් **සන්ධි** හෙයින් ව්‍යවසථා කටයුතු. ඇට අතර වශයෙන් විවර අවිවර හෙයින් ව්‍යවසථා කටයුතු. සියලු ඇටසැකිල්ලෙහි හෝ ඇටයෙහි හෝ නුවණ මෙහෙයා "මේ තැන මේ ඇටය" යි හාත්පසින් ව්‍යවසථා කටයුතු. මෙසේත් නො වැටහේ නම් තළල් ඇටයෙහි සිත යෙදිය යුතු යි.

මේ අට්ඨිකයෙහි සේ ම සෙසු පුලවකාදීහි ද එකොලොස් ආකාරයෙන් නිමිති ගැන්ම යෙදෙන යෙදෙන පරිද්දෙන් සැලකිය යුතු.

මේ කම්සථාන ඇටසැකිල්ලෙක සේ ම එක් ඇටයෙක ද ලැබෙයි. ඒ කවරෙක හෝ එකොලොස් ආකාරයෙන් නිමිති උගෙන **"අඞ්ගක පච්චක්කූලය, අඞ්ගක පච්චක්කූලය"** යි මෙනෙහි කළ යුතු. මෙහි උද්ග්‍රහ නිමිත්ත හා ප්‍රතිභාග නිමිත්ත හා එක් සමානය යි අටුවායෙහි කියා තිබේ. ඒ කිම එක ඇටයෙක නම් සුදුසු ය. ඇටසැකිල්ලෙහි උද්ග්‍රහ නිමිත්ත පෙණෙන විවර ඇති වැ ද, ප්‍රතිභාග නිමිත්ත පරිපූර්ණවැ ද විය යුතු. එක ඇටයෙහි වුව ද උද්ග්‍රහ නිමිත්ත භයජනක විය යුතු. ප්‍රතිභාග නිමිත්ත සෞමනස්‍යජනක විය යුතු. භාවනා විශෙෂයෙන් මටසිලුටු වැ වැටෙනී උපචාර ධ්‍යානය එළවන බැවිනි.

මෙහි ලා අටුවාවෙහි කියන ලද්ද මතහෙදයට අවකාශ තබා කියන ලද බැව් පෙනේ. ඒ එසේ මැ යි – අටුවාවෙහි සතර බ්‍රහ්මවිහාරයන්හි ද දශ අශුභයන්හි ප්‍රතිභාග නිමිති නැතැ යි ද, බ්‍රහ්මවිහාරයන්හි සීමාසම්භෙදය ම **නිමිත්තය** යි ද, දශ අශුභයන්හි විකල්ප රහිත කොටැ ප්‍රතිකූලත්වය දුටු කල්හි **නිමිත්ත** නම් වන්නේය යි ද දක්වා 'ඊට අනතුරු වැ ම උග්ගහ නිමිත්තය, ප්‍රතිභාග නිමිත්තය යි **නිමිත්ත** විවිධ වේ. ඉන් "උද්ග්‍රහ නිමිත්ත භයජනක වැ වැටහේය" යි දක්වන ලද්දේ ය. එ බැවින් අප විසින් විචාරණය කොටැ යට කියන ලද ක්‍රමය සුදුසුය යි දත යුතු. තවද **මහානිස්ස** තෙරුනට දන් ඇට දැකීම් පමණෙකින් මුළු සත්‍රී ශරීරය ඇට සැකිල්ලක් සේ වැටහීම ද මෙහි නිදර්ශනයට ගත යුතු

"ඉති අසුභානි සුභ ගුණා – දසසතලොචනෙන ථුතකිත්ති,
යානි අවොච දසබලො – එකෙකපක්කානහෙතූනි.
එවං තානි ච තෙසං ච – භාවනානයමිදං විදිත්වාන
තෙසඤ්ච අසං හියේ‍යා – පකිණ්ණක කථාපි විකේ‍රදයේ‍යා"

'සුනාශීර විසින් සංසුතත වූ කීර්ති ඇති – විශුද්ධ ගුණ යුත් දශබලධාරීන් වහන්සේ එකි එකි ධ්‍යානයට හෙතු වූ යම් අශුභ කෙනෙක් වදාළ සේක් ද, ඒ දශ අශුභ ද ඔවුන් පිළිබඳ භාවනා ක්‍රම ද යට කී පරිද්දෙන් දැනැ ඔවුන්ගේ ප්‍රකීර්ණක කථාව මතු කියන පරිද්දෙන් දත යුතු.'

අශුභ ප්‍රකීර්ණක කථා

අශුභ අතුරෙන් කවරක් හෝ අරමුණු කොටැ ධ්‍යාන ලැබැ ගත් යොගී වීතරාගයකු සේ නිලෙලාලුපපවාරී වන්නේ ය. හෙවත් අලොලභාවයෙන් හැසිරෙන්නේ ය.

එසේ නම් එය දශවිධ කොටැ කුමක් හෙයින් වදාළේ ද එසේ වදාළේ ශරීරය උද්ධුමාතකාදි ඒ ඒ සභාවයට පත්වීම් වශයෙන් හා රාගචරිත පුද්ගලයන්ගේ විභාග වශයෙනි.

ඒ එසේ මැ යි:– මළසිරුර පිළිකුල් බවට පැමිණෙන්නේ උඛ්ඛුමාතක භාවයට හෝ විනීලකාදීන් අතුරෙන් එක්තරා අවස්ථාවකට හෝ පත්වන්නේ ය. එයින් යම් යම් ආකාර අසුභයක් ලද හැකි නම් ඒ ඒ අශුභයෙහි **"උද්ධුමාතක පටික්කූලය, විනීලක පටික්කූලය"** යනාදීන් නිමිති ගත යුතු ම ය. ශරීරය ඒ ඒ සභාවයට පත්වීම් වශයෙන් දශවිධ කොටැ වදාළේය යි කීයේ එහෙයිනි.

රාගචරිත පුද්ගලයන්ගේ විභාග වශයෙන් දශවිධ කොට වදාළේ ය යන්නෙහි අර්ථ මෙසේ දත යුතු යි.

උද්ධුමාතකය විශෙෂයෙන් සරීරසණ්ඨානයාගේ විපතතිය ප්‍රකාශ කරන්නේ ය. එ බැවින් එය සණ්ඨානරාගීන්හට සපපාය වේ.

විනීලකය ඡවි වණීයාගේ විපතතිය ප්‍රකාශ කරන බැවින් ශරීර වණීයෙහි රාග ඇත්තවුනට සපපාය වේ.

විපුබබකය ශරීරය පිළිබඳ දුගීඤඡය ප්‍රකාශ කරන බැවින් මල් සුවඳ ආදිය ගැනීම් වශයෙන් නැඟුණු ශරීර ගඤඡරාගීන්හට සපපාය වේ.

විචඡිදදකය ඇතුළෙහි සිදුරු ඇති බව ප්‍රකාශ කරන බැවින් ශරීරයෙහි අඞග ප්‍රතයඞග පිළිබඳ ඝන භාවය පිණිස උපදනා රාග ඇත්තවුනට සපපාය වේ.

විකඛායිතකය මස් වැනි තන්හි සැපත විනාශ වන සැටි ප්‍රකාශ කරන බැවින් තන කලවා ආදි ශරීර ප්‍රදෙශයෙහි මස් වැඩීම නිසා උපදනා රාග ඇත්තවුනට සපපාය වේ.

විකඛිතතකය අඞග ප්‍රතයඞගයන්ගේ ඒ ඒ තැන වැටීම් වශයෙන් විකෙෂපය ප්‍රකාශ කරන බැවින් අඞගප්‍රතයඞග පිළිබඳ ලීලාරාගීන්හට සපපාය වේ.

හතවිකඛිතතකය ශරීරසඞඝාතයාගේ භෙදය ප්‍රකාශ කරන බැවින් සරීර සංඝාත සමපතතිරාගීන්හට සපපාය වේ. (ශරීර සංඝාත නම් අවයව එක් වැ බැඳී තිබෙන ශරීරය යි.)

ලොහිතකය ලෙයින් වැකීමෙන් පිළිකුල් බව ප්‍රකාශ කරන බැවින් අලඞකාරයෙන් ජනිත ශොභායෙහි රාග ඇත්තවුනට සපපාය වේ.

පුලවකය ශරීරය නොයෙක් කිමිකැලට සාධාරණ බව ප්‍රකාශ කරන බැවින් ශරීරය මමඞඛයෙන් ඇලුම් කරන්න වුනට සපපාය වේ.

අටඨිකය ශරීරයේ ඇට පිළිබඳ පිළිකුල ප්‍රකාශ කරන බැවින් දනනසමපතතියෙහි රාග ඇත්තවුනට සපපාය වේ.

මෙසේ රාගචරිත පුද්ගලයන්ගේ භෙද වශයෙන් අශුභය දශවිධ කොටැ වදරන ලදැ යි දත යුතු යි.

අශුභ කර්මස්ථානයෙන් ප්‍රථමධ්‍යානය පමණක් ලැබෙන හැකි ය.

දශවිධ වූ ම අශුභාරම්මණය පිළිකුල් ය. පිළිකුල් බැවින් ම එහි සිත පිහිටුවා ගැන්ම දුෂ්කර ය. සිත පිහිටුවා ගනුත් හොත් හැක්කේ විතර්ක බලයෙන් මැ ය. විතර්කය නැත්නම් සිත එහි නො පිහිටයි. නො සිටින දිය ඇති සැඩවතුරු ඇති ගඟෙහි නැව සිටුවාගත හැක්කේ රිටි බලයෙන් ය. රිටි නැතහොත් නැව එහි නො රඳ යි. මෙ ද එබඳුය යි දත යුතු. එබැවින් දශවිධ අශුභය ම අරමුණු කොටැ භාවනා කිරීමෙන් ලද හැක්කේ ප්‍රථම ධ්‍යානය පමණි. විතර්ක නැති බැවින් දවිතීය ධ්‍යානාදිය නො ලද හැකි ය.

ප්‍රථම ධ්‍යානයෙහි ප්‍රීතිය ඇත්තේ ය. පිළිකුල් වූ අශුභය අරමුණු කොටැ සප්‍රීතික ප්‍රථමධ්‍යානය කෙසේ ලැබිය හැකි ද

පිළිකුල් වූ ද ඒ අරමුණු කොටැ "එකාන්තයෙන් මම මේ ප්‍රතිපදායෙන් ජරාමරණයෙන් මිදී ගන්නෙමි"යි ආනිසංස දක්නා බැවින් ද, නීවරණ සන්තාප ප්‍රහාණ වන බැවින් ද ප්‍රීති සොම්නස් උපදනේ ය. "මම මෙයින් දැන් බොහෝ වැටුප් ලබමි"යි සිතන පුප්සඩ්වාට අශුභ රැස් අරමුණු කොට ප්‍රීති සොම්නස් උපදින්නාක් මෙන් ද, උපශාන්ත වූ ව්‍යාධි දුක් ඇති රොගියාහට වමන විරෙවන ප්‍රවෘත්තියෙහි ප්‍රීති සොම්නස් උපදින්නාක් මෙන් ද යි දත යුතු.

අශුභ ලක්ෂණ

දශවිධ වූ ද මේ අශුභය ලක්ෂණ වශයෙන් එකෙක් ම ය. දශවිධ වූ ද මේ අශුභයාගේ ලක්ෂණ අපිරිසිදු බව යි, දුගඳ බව යි, නින්දිත බව යි, පිළිකුල් බව යි. ඒ වනාහි මළ සිරුරෙහි මතු වැටහෙන්නේ නො වේ. සත්‍රියකගේ දත් ඇට දැක්මෙන් සැගිරි වැසි මහාතිස්ස තෙරුන්ට මෙන් ද, ඇතුපිට නැගී ගමන් ගත් රජු දැක්මෙන් සංඝරක්ඛිත සඨවිරයන්ට උපසථාන කළ සාමණේරයන්ට මෙන් ද, ජීවමානක ශරීරයෙහි ද වැටහෙන්නේ ය. මළ සිරුර සේ ම ජීවමාන ශරීරය ද අශුභ ය. ජීවමාන ශරීරයෙහි අශුභ ලක්ෂණය ආගන්තුක අලඞ්කාරයෙන් වැසී යන බැවින් නො පෙනේ. නිසඟයෙන් ම මේ ශරීරය දත් ඇට අධික කොටැ ඇති තුන්සියක් ඇටින් නැඟුණේ ය. එක්සිය අසූවක්

සඤ්ඤයෙන් ගැළපුණේ ය. නවසියක් නහරින් වෙළුණේ ය. නවසියක් මස් වැදලින් ඇලවුණේ ය. තෙත් මිනිස් සමින් වැළඳුණේ ය. සිවියෙකින් වැසුණේ ය. කුඩා මහත් සිදුරු ඇත්තේ ය. මේද තෙල් පිරුණු සැළියක් මෙන් උඩින් යටින් දිලියෙන්නේ ය. පණු කැලන් විසින් සෙවුණේ ය. රොගයනට සථාන ය. දුඃඛ ධම්මයනට වසතු ය. පැලී ගිය පරණ ගෙඩියක් මෙන් තව ව්‍රණද්වාරයෙන් නිතර කුණු වැගිරෙන්නේ ය. දෙ ඇසින් කඹ ගලයි. දෙකන්බිලින් කන්කැදුරු වැටෙයි. දෙ නාස් පුටයෙන් සොටු වැගිරෙයි. මුඛයෙන් ආහාර හා පිත හා සෙම හා ලෙහෙ හා නැගෙයි. අධො මාගී දෙකින් මළ – මූත්‍ර වැගිරෙයි. නවානූ දහසක් රොම කූපයෙන් අපවිත්‍ර ඔහදිය ගලයි. නිලමැසි ආදීහු පිරිවරා ගනිති. දැහැටි නොකා මුව නොදෙවා හිස තෙල් නොගා නොනා හැඳුමක් පෙරවුමක් නැති වැ නග්ක සවභාවයෙන් නොපිරූ අවුල් වූ කෙසින් යුකත වැ ගමින් ගමට ඇවිදින රජුගේ ද, පුස්සඩු සැඩොල් ආදීන් අතුරෙන් කිසිවකුගේ ද කිසි වෙනසක් නැත්තේ ය. අපිරිසිදු බැවින් දුගඳ බැවින් නිඳිත බැවින් පිළිකුල් බැවින් රජෙකුගේ ද, සැඩොලකුගේ ද වෙනසෙක් නැති. දැහැටි වළඳ, මුව සෝධා නන්වන් පිළියෙන් විළි තැන් වසා නන්වන් සුවඳ විලවුන් ගල්වා කුසුමාභරණාදියෙන් සැරසී "මම ය මාගේ ය" යි ගත යුතු ආකාරයට පත් කරා ගනිති. ආගන්තුක අලඞ්කාරයෙන් පිළිසන් වැ යන බැවින් මේ ශරීරය පිළිබඳ යථා සවභාව – අශුභ ලක්ඛණය නොදන් පුරුෂයෝ සත්‍රීන් කෙරෙහි ද, සත්‍රීහු පුරුෂයන් කෙරෙහි ද ප්‍රෙම කරති. පරමාර්ථ වශයෙන් බලන් හොත් මෙහි ඇළිම් කටයුතු සවලප මාත්‍ර වූ ද තැනෙක් නැති.

ඒ එසේ මැ යි:- කෙස්-ලොම්-නිය-දත්-කෙළ-සොටු මළ මූ ආදීන් අතුරෙන් ශරීරයෙන් බැහැරට වැටුණු කිසිවකුත් කිසි කෙනෙක් අතින් පවා සසඟී කරන්නට කැමැති නොවෙති. එබන්දක් දැකැ පෙළෙති. ලජ්ජා වෙති. පිළිකුල් කරත්. බැහැරට නොවැටී ශරීරයෙහි සෙස වූ දේත් වැටුණු දේ සේ මැ පිළිකුල් වුව ද මොහාන්ධකාරයෙන් වැසුණු ආතම සෙනහ රාගයෙන් රත් වූවෝ ඉෂ්ටය, කාන්තය, නිත්‍යය, සුඛය යි ගනිති. එසේ ගන්නා හා ඔව්හු කැලේ පිපි කැලි රැක, දැකැ 'එහි ගිලිනී නොවැටුණු මල් මේ එල්ලෙන්නේ මස් කැබලිය" යි වෙහෙසට පවත්වන ජර නරි සමාන ඔවට පත්වෙති.

ජර සිවලා කැලේ – මල් පිපි කැල රැක දැකැ
මම මස් ගසක් ලදිමි' යි – සතුටින් ලොබින් දිවැ ගොස්

වැටුණු වැටුණු මල – ඩැ ඩැ 'මෙය මස නොවේ තෙලෙ
ගස ලෙලෙන්නේ මස ය' යි – සිතමින් එහි ම ලගනේ.

නැණවත් දත එසේ – සිරුරින් වැටුණු කොටස ම
අසුබැ යි නොගෙකැ රඳනා – දෙය ද අසුබැ යි ගන්නේ.

නුනුවණ දත ලොවෙහි – මෙ සිරුර සුබ විසින් ගෙනැ
කෙරෙමින් නොයෙක් අකුසල් – සසර දුකින් නොමිදෙනේ

එ බැවින් නැණවතුනි! – මළ මිනිය හා දිවමන්
මෙ කුණු සිරුර පවතින – පිළිකුල් බව ම සලකවු

කියේ මැ යි:–

"දුගන්ධො අසුචි කායො – කුණපො උකුකරූපමෝ
නිද්ධතෝ චකුහුතෙහි – කායෝ බාලාභිනන්දිතෝ.

අල්ලවම්මපටිච්ඡන්නෝ – නවද්වාරෝ මහාවණෝ
සමන්තතෝ පග්ඝරති – අසුචි පූතිගන්ධියෝ.

සචෙ ඉමස්ස කායස්ස – අන්තෝ බාහිරතෝ සියා
දණ්ඩං නූන ගහෙත්වාන – කාකෙ සොණෙ ච වාරයෙ."

'මේ කය දුගඳය, අපවිත්‍රය, කුණුය, කසළ ගොඩක් හෝ වර්චස්කූපයක් බදු ය. නුවණැතියන් විසින් නින්දිත ය. මූඪයන් විසින් අභිනන්දිත යි.'

'මේ කය තෙත් සමකින් පිළිසන් ය. නව දොරක් ඇත්–තේ ය. මහාව්‍රණයෙකි. කුණු ගඳ ඇති අසුචි හාත්පසින් වැගිරෙයි.'

'මේ කයෙහි ඇතුළු පැත්ත ඉදින් පිට පැත්තට හැරුණේ නම් ඒකාන්තයෙන් දඬුමුගුරු ගෙන කවුඩන් බල්ලන් එළවන්–නට සිදුවන්නේ ය.'

එබැවින් පණ්ඩිත යොගාවචර විසින් දිවමන් සිරුර වේවා මළ සිරුර වේවා අශුභ ලක්ෂණය පෙණෙන කොට තැන හෝ නිමිති ගෙනැ කර්මස්ථානය අජීර්ණවට පමුණුවා ගත යුතු යි.

සජ්ජන ප්‍රමෝදය පිණිස කළ විශුද්ධිමාර්ගයෙහි
සමාධිභාවනාධිකාරයට ඇතුළත්
සවැනි අශුභ කර්මස්ථාන නිර්දේශය යි.

7. "ඉති අනුස්සති" නිද්දේශය

නමෝ භගවතෝ සම්මාසම්බුද්ධස්ස

දශ අශුභයට අනතුරු වැ දශ අනුස්මෘති දක්වනු ලැබේ. අනුස්මෘති නම් නැවත නැවත සිහි කිරීම ය. සමෘතිය ම නැවත නැවත උපදනා බැවින් අනුස්මෘතිය යි කියේ ය. තවද අනුරූප වූ යෝග්‍ය වූ සමෘතිය හෝ අනුස්මෘතිය. පැවතිය යුතු තන්හි ම පවත්නා බැවින් සැදැහැයෙන් සසුන් වන් කුලදරුවන් හට යෝග්‍ය වූ සමෘතිය අනුස්මෘතියයි කී සේකි.

ඒ දස වැදැරුම් ය.

1. බුදුන් අරබයා උපන් අනුස්මෘතිය **බුද්ධානුස්මෘතිය යි.** එනම් බුද්ධ ගුණ අරමුණු කොටැ ඇති සිහිය යි.

2. ධර්මය අරබයා උපන් අනුස්මෘතිය **ධර්මානුස්මෘතිය යි.** එනම් **"ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ"** යනාදීන් ධර්ම ගුණ අරමුණු කොටැ ඇති සිහිය යි.

3. සංඝයා අරබයා උපන් අනුස්මෘතිය **සංඝානුස්මෘතිය යි.** එනම් **"සුපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ"** යනාදීන් සංඝ ගුණ අරමුණු කොටැ ඇති සිහිය යි.

4. ශීලය අරබයා උපන් අනුස්මෘතිය **ශීලානුස්මෘතිය යි.** එනම් තමන්ගේ අඛණ්ඩ - අවිච්ඡිද්‍රතාදි ශීල ගුණ අරමුණු කොටැ ඇති සිහිය යි.

5. ත්‍යාගය අරබයා උපන් අනුස්මෘතිය **ත්‍යාගානුස්මෘතිය යි** තමන්ගේ **"මුත්තචාගෝ - පයතපාණී"** යනාදි ත්‍යාග ගුණ අරමුණු කොටැ ඇති සිහිය යි.

6. දෙවියන් අරබයා උපන් අනුස්මෘතිය **දෙවතානුස්මෘතිය යි.** එනම් දෙවියන් සාක්ෂ්‍ය කොටැ තබා තමන්ගේ ශ්‍රද්ධාදී ගුණ අරමුණු කොටැ ඇති සිහිය යි.

7. මරණය අරබයා උපන් සමෘතිය **මරණස්මෘතිය යි.** එනම් ජීවිතේන්ද්‍රියොපච්ඡේදය අරමුණු කොටැ ඇති සිහිය යි.

8 කෙසාදි හෙද ඇති රූපකාය කරා හෝ රූපකායයෙහි හෝ ගිය සමෘතිය **කායගතා සතිය** යි. "කායගත සති" ය යි කිය යුතු තන්හි හ්‍රස්ව කොට වැ කායගතා සතිය යි කියන ලදී. එ නම් කෙසාදි කාය කොට්ඨාස නිමිති (අරමුණු) කොටැ ඇති සිහිය යි.

ආශ්වාස-ප්‍රශ්වාස ආණාපාණ නම්. ඒ ආණාපාණ අරබයා උපන් සමෘතිය **ආණාපාණ සමෘතිය** යි. එනම් හුස්ම ඉහළට ගැනීම් පහළට හෙළීම් අරමුණු කොටැ ඇති සිහිය යි.

10 නිර්‍වාණය උපසම නම. ඒ නිර්‍වාණ සංඛ්‍යාත උපසමය අරබයා උපන් අනුස්මෘතිය **උපසමානුස්මෘතිය** යි. එ නම් සම්‍ක් දුඃඛොපසමය අරමුණු කොටැ ඇති සිහිය යි.

මේ දශවිධ අනුස්මෘති අතුරෙන් බුද්ධානුස්මෘතිය භාවනා කරනු කැමැති අවලප්‍රසාදයෙන් යුත් යොගී විසින් යට දැක්වුණු සේ සුදුසු සෙනසුනෙක වසුම් ගෙනැ රහසිගත වැ විවෙක වැ **"ඉති පි සො භගවා අරහං සම්මාසම්බුද්ධා විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධා භගවා"**[1] යි භගවත් බුදු රජුන්ගේ ගුණ සිහිකළ යුතු යි. එහි ක්‍රමය මෙසේ ය.

බුද්ධානුස්මෘති භාවනා ඛ්‍රිධිය.

සො භගවා ඉතිපි අරහං, ඉතිපි සම්මාසම්බුද්ධා, ඉතිපි විජ්ජාචරණසම්පන්නා, ඉතිපි සුගතො, ඉතිපි ලොකවිදූ, ඉතිපි අනුත්තරො පුරිසදම්මසාරථි, ඉතිපි සත්ථා දෙවමනුස්සානං, ඉතිපි බුද්ධා, ඉතිපි භගවා. 'ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කාරණයෙන් **අර්හත්** වන සේක. මේ මේ කාරණයෙන් **සම්‍යක් සම්බුද්ධ** වන සේක. මේ මේ කාරණයෙන් **විද්‍යාචරණසම්පන්න** වනසේක. මේ මේ කාරණයෙන් **සුගත** වනසේක. මේ මේ කාරණයෙන් **ලෝකවිදූ** වනසේක මේ මේ කාරණයෙන් **දෙව්මිනිසුන්ට ශාස්තෘ** වනසේක. මේ මේ කාරණයෙන් බුද්ධ වනසේක. මේ මේ කාරණයෙන් **භගවත්** වනසේකැ යි' සිහිකළ යුතු.

අරහං

ඒ භාග්‍යවතුන් වහන්සේ කවර-කවර කාරණයෙකින් **අර්හත්** වනසේක් ද, 1 ක්ලේශයන් කෙරෙන් ආරක වැ – දුරැ වැ සිටිනා

[1] අ: නි: ඡක්කනිපාත 516

බැවින්, කෙලෙස අරි – සතුරන් නොහොත් පුඤ්ඤාභිසංඛාරාදි අර – දුවි හත – නැසූ බැවින්, 3 ප්‍රත්‍යයාදියට අති – සුදුසු බැවින්, 4 පව් කිරීම පිළිබඳ රහ – රහස් නැති බැවින් යන මේ මේ කාරණයෙන් උන්වහන්සේ අරහ – අර්හත් වනසේක. ඒ එසේ මැ යි:–

1. උන්වහන්සේ සකල කෙලෙසයන් කෙරෙන් ආරක ය. (ඉතා දූරසථය) අර්හත්මාර්ගඥානයෙන් සවාසනා සකල කෙලෙස විධවංශනය කළ බැවිනි. එහෙයින් උන්වහන්සේ අරහ-අර්හත් ය. මේ අර්ථය ම ගාථායෙනුදු දක්වයි.

"සෝ තතෝ ආරකා නාම – යස්ස යෙනාසමඞ්ගිතා
අසමඞ්ගී ච දෝසෙහි – නාථෝ තෙනාරහං මතෝ" යි.

'යම්ක්‌හුගේ යම්ක්‌හු හා අසමඞ්ගිත්වය වේ ද, එහෙයින් හෙතෙමේ **ආරකා** නම. **භාග්‍යවතුන්** වහන්සේ **කෙලෙසුන් හා** අසමඞ්ගී ය. එහෙයින් උන්වහන්සේ අර්හත් ය යි දන්නා ලදි, යනු අර්ථ යි. ("ආරකා" යන මෙහි ආකාරයට හ්‍රස්ව ද **කකා**රයට හකාර ද, අනුස්වාර ද කොටැ නිරුක්‌ති නයයෙන් **"අරහං"** යි පදසිද්ධි දත යුතු යනු සත්ත යි.)

2. උන්වහන්සේ විසින් ඒ කෙලෙස අරීහු (කෙලෙස් සතුරෝ) මාර්ගඥානයෙන් නසා පියන ලදහ. එහෙයින් අරහං (අර්හත්) ය. මේ අර්ථය ම ගාථායෙනුදු දක්වයි.

"යස්මා රාගාදිසංඛාතා – සබ්බෙ'පි අරයෝ හතා
පඤ්ඤාසත්ථෙන නාථෙන – තස්මා පි අරහං මතෝ" යි.

'යම් හෙයකින් නාථයන් වහන්සේ විසින් ප්‍රඥා නමැති ශස්ත්‍රයෙන් රාගාදි සංඛ්‍යාත සියලු අරීහු නසන ලදිදෝ ද එහෙයින් ද උන්වහන්සේ **අරහං** (අර්හත්) ය, යනු අර්ථ යි. (අරිහත යනු නිරුක්‌ති නයයෙන් **අරහං** යි විණි.)

තවද සංසාරය රථ චක්‍රයක් වැන්න. අවිද්‍යාව හා භව තෘෂ්ණාව එහි නාභිය. පුඤ්ඤාදි අභිසංඛාර අර හෙවත් දැවිය ජරාමරණ නිම්වලල්ලය. ආශ්‍රව සමුදය නමැති අකුරින් විද්‍ධ ත්‍රිභව නමැති රථයෙහි යොදන ලදුව අනාදිමත් කාලයක් මුළුල්ලෙහි පවත්නේ ය. තථාගතයන් විසින් ඒ සංසාර නමැති චක්‍රයාගේ පුඤ්ඤාභි සංඛාරාදි නමැති අර බෝ මැඩ දී වීර්‍ය නමැති පාදයෙන් ශීල නමැති පෘථිවියෙහි පිහිටා ශ්‍රද්ධා නමැති

අතින් කම්ඝයකරඤ්ඤ නමැති පොරොව ගෙනැ කපා පියන ලද්දේ ය. එසේ හෙයින් (අර හත බැවින්) උත්වහන්සේ **අරහං** (අර්හත්) ය. (අර හත යන තන්හි නිරුක්ති තයයෙන් **අරහං** විය.)

තවද සංසාර චක්‍රය යනු නො පෙණෙන අක් - මුල් ඇති සංසාරවෘත්තය සි. ඒ සංසාර චක්‍රයාගේ මූල බැවින් අවිද්‍යාව නාභියය. අවශානය බැවින් ජරාමරණ නිම්වලල්ලය. සංඛාර, විඤ්ඤාණ, නාම-රූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, භව, ජාති යන සෙසු දශධර්මයෝ අර ය. අවිද්‍යාව මුල් කොටැ ඇති බැවින් හා ජරා-මරණ අවසාන කොටැ ඇති බැවින් ය.

(මෙසේ සංසාර චක්‍රයාගේ අවිද්‍යාව මූල බව ද, ජරා - මරණ අවශානය බව ද, සංඛාරාදි දශය මැද බව ද දක්වා භවත්‍රයයෙහි එකිනෙක එකිනෙකට පිළිවෙළින් ප්‍රත්‍යය වන සැටි සැකෙවින් දක්වයි.)

දුඃඛාදි චතුස්සත්‍යයෙහි නො දැන්ම හෙවත් මොහය අවිද්‍යා නම. කාමභවයෙහි අවිද්‍යාව කාමභවයෙහි සංස්කාරයන්ට ද, රූපභවයෙහි අවිද්‍යාව රූපභවයෙහි සංස්කාරයන්ට ද, අරූපභවයෙහි අවිද්‍යාව අරූප භවයෙහි සංස්කාරයන්ට ද ප්‍රත්‍යය වන්නේ ය.

(කාමාවචර - රූපාවචර - අරූපාවචර කුශලාකුශල චෙතනා සංස්කාර නම.) කාමභවයෙහි සංස්කාර කාමභවයෙහි ප්‍රතිසන්ධි විඤ්ඤාණයට ද, රූප භවයෙහි සංස්කාර රූපභවයෙහි ප්‍රතිසන්ධි විඤ්ඤාණයට ද, අරූපභවයෙහි සංස්කාර අරූපභවයෙහි ප්‍රතිසන්ධි විඤ්ඤාණයට ද ප්‍රත්‍යය වන්නේ ය.

කාමභවයෙහි ප්‍රතිසන්ධි විඤ්ඤාණය කාමභවයෙහි නාම - රූප යන්ට ද, රූප භවයෙහි ප්‍රතිසන්ධි විඤ්ඤාණය රූපභවයෙහි නාම-රූපයන්ට ද, අරූපභවයෙහි ප්‍රතිසන්ධි විඤ්ඤාණය අරූපභවයෙහි නාමයන්ට ද (එහි රූප නැති බැවිනි.) ප්‍රත්‍යය වන්නේ ය.

කාමභවයෙහි නාම-රූප කාමභවයෙහි ෂඩායතනයන්ට ද, රූපභවයෙහි නාම-රූප රූපභවයෙහි චක්ඛු, සොත, මන යන ආයතනත්‍රයට ද, (එහි ඝාණ, ජිව්හා, කාය ආයතන නැති බැවිනි.) අරූපභවයෙහි නාමය අරූපභවයෙහි එකම මනායතනයට ද ප්‍රත්‍යය වන්නේ ය.

කාමභවයෙහි ෂඩායතනය කාමභවයෙහි චක්ඛුසම්ඵස්සාදි ෂඩ්විධ සපශීයට ද, රූප භවයෙහි චක්ඛු, සොත, මන යන ආයතනත්‍රය රූපභවයෙහි චක්ඛුසම්ඵස්ස, සොතසම්ඵස්ස, මනොසම්ඵස්ස යන සපශීත්‍රයට ද, අරූපභවයෙහි මනායතනය අරූප භවයෙහි එක ම මනොසම්ඵස්සයට ද ප්‍රත්‍යය වන්නේ ය.

කාමභවයෙහි ෂඩ්විධ සපශී එහි චක්ඛුසම්ඵස්සජ වෙදනා ආදි ෂඩ්විධ වෙදනාවට ද, රූපභවයෙහි ත්‍රිවිධ සපශී එහි ත්‍රිවිධ වෙදනාවට ද, අරූපභවයෙහි එකම මනොසම්ඵස්සය එහි මනොසම්ඵස්සජවෙදනාවට ද ප්‍රත්‍යය වන්නේ ය.

කාමභවයෙහි ෂඩ්විධ වෙදනාව එහි රූපතණ්හාදි ෂඩ්විධ තෘෂ්ණාවට ද, රූප භවයෙහි ත්‍රිවිධ වෙදනාව එහි ත්‍රිවිධ තෘෂ්ණාවට ද, අරූපභවයෙහි එක ම මනොසම්ඵස්සජ වෙදනාව එහි ධම්මතණ්හාවට ද ප්‍රත්‍යය වන්නේ ය.

ඒ ඒ භවයෙහි ඒ ඒ තෘෂ්ණාව උපාදානයට ද, උපාදානය භවයට ද, භවය ජාතියට ද, ජාතිය ජරා-මරණාදියට ද මෙසේම ප්‍රත්‍යය වන්නේ යි.

එහි විසතරය මෙසේ ය.

ඇතැම් පුදුගලයෙක් "කාමසැප වළඳන්නෙමි" යි කාමූපාදාන හෙතුයෙන් කයින් වචනයෙන් සිතින් පව් කොටැ අපායයෙහි උපදියි. ඔහුට ඒ උපැද්මට හෙතු වූ කම්ය කම්භවය යි. කම්යෙන් උපන් සකඞ්ඛ උපපත්ති භවය යි. ඒ සකඞ්ඛයන්ගේ පහළවීම ජාතිය යි. ඔවුන්ගේ මේරීම ජරාව යි. ඔවුන් බිඳී යාම මරණය යි.

තව ද අනෙකෙක් 'සවඟී සැප විඳින්නෙමි' යි එසේ ම කුසල් කොටැ එයින් සවඟීයෙහි උපදියි. ඒ උපැද්මට හෙතු වූ කම්ය කම් භවය යි. කම්යෙන් උපන් සකඞ්ඛ උපපත්ති-භවය යි. ඒ සකඞ්ඛයන්ගේ පහළවීම ජාතිය යි. මේරීම ජරාව යි. බිඳීයාම මරණය යි

තවද කිසිවෙක් "බ්‍රහම සමපත් විඳින්නෙමැ" යි කාමූපාදාන හෙතුයෙන් ම මෛත්‍රී හෝ කරුණා හෝ මුදිතා හෝ උපෙක්ෂා හෝ වඩා ඒ භාවනා පාරිපූරියෙන් බඹලොව උපදියි. ඒ උපැද්මට හේතු වූ කම්ය කම්භවය යි. සෙස්ස යට කී සේ ය.

තවද කිසිවෙක් "අරූපභවයෙහි සමපත් විඳින්නෙමි" යි ආකාසානඤ්චායතනාදි සමාපත්ති වඩා එයින් එහි උපදියි.

ඒ උපැද්මට හෙතු වූ කර්මය කර්මභවය යි. කර්මයෙන් උපන් සකල උපපත්තිභවය යි. සකලයන්ගේ පහළවීම ජාතිය යි. මේරීම ජරාව යි. බිඳියාම මරණය යි.

දිට්ඨුපාදානාදි සෙසු උපාදානමූලකවර්ගයෙහි ද යෙදෙන පරිදි මෙසේ ම දත යුතු.

අවිද්‍යාව හෙතු ය, සංඛාර හෙතුසමුත්පන්න ය. මේ අවිද්‍යා-සංඛාර යන දෙක ම හෙතුසමුත්පන්නය යි මෙසේ ප්‍රත්‍යය පිරිසිඳැ දැන්ම ධර්මස්ථිතිඥානයි. (හෙවත් ප්‍රතීත්‍ය සමුත්පාදාවබෝධය යි.) (අවිද්‍යාව ආශ්‍රවසමුදය ය.) අතීතයෙහි ද, අනාගතයෙහි ද අවිද්‍යාව හෙතු ය, සංඛාර හෙතුසමුත්පන්නය. මේ දෙක ම හෙතුසමුත්පන්නය යි ප්‍රත්‍යය පිරිසිඳැ දැන්ම ධර්ම ස්ථිතිඥානය යි. සියලු පද මෙසේ විස්තාර කළ යුතු.

අවිද්‍යාව හා සංඛාර හා එක් සංක්ෂේපයෙක විඤ්ඤාණ, නාම - රූප, සළායතන, ඵස්ස, වේදනා එක් සංක්ෂේපයෙක. තණ්හා, උපාදාන, භව එක් සංක්ෂේපයෙක. ජාති, ජරා, මරණ එක් සංක්ෂේපයෙක. මෙයින් මූල දැක්වුණු සංක්ෂේපය අතීත කාලිකය. මැද දැක්වුණු සංක්ෂේප දෙක වර්තමානකාලිකය. අවසානයෙහි දැක්වුණු සංක්ෂේපය අනාගත කාලිකයි.

තවද මෙහි අවිද්‍යා, සංඛාර ගැන්මෙන් තණ්හා, උපාදාන, භව ගැනුණේ ම ය. එබැවින් ඒ පසඳව ධර්ම අතීත කර්මවෘත්ත ය. විඤ්ඤාණ, නාම-රූප, සළායතන, ඵස්ස, වේදනා යන පසඳව ධර්ම වර්තමාන විපාක වෘත්ත ය. තණ්හා, උපාදාන, භව ගැන්මෙන් අවිජ්ජා, සංඛාර ද ගැනුණේ ම ය. එබැවින් ඒ පසඳව ධර්ම වර්තමාන කර්ම වෘත්ත ය. ජාති - ජරා - මරණ වශයෙන් දැක්වෙන්නේ විඤ්ඤාණ, නාම-රූප, සළායතන, ඵස්ස, වේදනා ය. එබැවින් ඒ පසඳව ධර්ම අනාගත විපාක වෘත්ත යි. මෙසේ මෙය ආකාර වශයෙන් විසි වැදෑරුම් ය.

සංඛාර-විඤ්ඤාණ දෙක අතර එක් සන්ධියෙක. වේදනා-තණ්හා අතර එක් සන්ධියෙක. භව-ජාති අතර එක් සන්ධියෙක. (මෙහි විස්තාරය මතු **පටිච්චසමුප්පාද නිද්දේශඥයන් ද,**[1] **අභිධර්ම වර්ණනා පටිච්චසමුප්පාද-පාදඥයෙන් ද**[2] දත හැකි යි.)

මෙසේ භාග්‍යවතුන් වහන්සේ සංක්ෂේප සතරකින් හා අඛණ්ඩ තුනකින් හා ආකාර විස්සකින් හා සන්ධි තුනකින් හා යුක්ත වූ පටිච්චසමුප්පාදය සම්මාකාරයෙන් දන්නා සේක.

---

[1] 17 නිද්දේශය [2] 8 පාදඥ

දැන්ම ඥානාර්ථයෙන් ඥානය ප්‍රඥානාර්ථයෙන් ප්‍රඥය. **'ප්‍රත්‍යයාව-බොධයෙහි ප්‍රඥාව ධම්මසීති ඤාණය'** යි එහෙයින් කියනු ලැබේ. උත්වහන්සේ ඒ ධම්මසීති ඥානයෙන් ඒ ධම් තත්ත්වාකාරයෙන් දැනැ වදාරා ඒ ධම්මයන් කෙරෙහි කළකිරී එහි නො ඇලී ඒ සියල්ලෙන් මිදී යථොක්ත සංසාර චක්‍රයා ගේ අර විහත විධ්වංසනය කළසේක. මෙසේ අර හත බැවින් ද උත්වහන්සේ **අරහං** (අර්හත්) ය. මේ අර්ථය ම ගාථාවකින් දක්වයි.

"අරා සංසාරචක්කස්ස - හතා ඤාණාසිනා යතෝ
ලොකනාථේන තේනේස - අරහං ති පවුච්චති" යි.

'යම් හෙයකින් ලොක ස්වාමීන් විසින් සංසාර චක්‍රයාගේ අර ප්‍රඥාඛඩ්ගයෙන් කපා පියනලද ද, එහෙයින් ඒ ලොකස්වාමි **අරහං** යි කියනු ලැබේ' යනු අර්ථ යි.

3 බුදුරජාණන් වහන්සේ අග්‍රදක්ෂිණාවී බැවින් චීවරාදි සිව්පසට ද, සෙසු පූජා විශෙෂයන්ට ද අර්හ සේක. ඔවුන් උපන් කල්හි මහෙශාක්‍ය දෙවමනුෂ්‍යයෝ පවා අත් තන්හි නුපුදා උත්වහන්සේ ම පූදති.

ඒ එසේ මෑ යි:- සහමපති බ්‍රහ්ම මහමෙර සා රුවන් දමකින් පිදී ය. සෙසු දෙවියෝ ද, බිම්සර කොසොල් රජ ආදි මනුෂ්‍යයෝ ද, ශාන්ති පරිදි පිදූහ. අශොක රජතුමා පිරිනිවී බුදුන් උදෙසා සයානූ කෙළක් ධන විසදා දඹදිව මුළුල්ලෙහි සුඅසූ දහසක් විහාර කරවූයේ ය. සෙසු පූජා විශෙෂයන් පිළිබඳ කවර කථා ද මෙසේ ප්‍රත්‍යයාදීන්ට අර්හ බැවින් උත්වහන්සේ **අරහ** ය. මේ අර්ථය ගාථාවකිනුදු දක්වයි.

"පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථෝ
අඤ්ඤානුරූපං අරහනති ලොකෙ
තස්මා ජිනෝ අරහති නාම මෙතං" යි.

'පස්මරුන් දිනූ ලොකස්වාමි ප්‍රත්‍යය සහිත පූජා විශෙෂයන්ට අර්හ බැවින් ලොකයෙහි **අරහ** යන අර්ථ නාමයට සුදුසු වන්නේ ය' යනු අර්ථ යි.

4 ලොව පණ්ඩිතමමන්‍ය ඇතැම් මූඪයෝ අපහිතීනි නීනි යෙන් රහසිගත වැ පව් කරති. මුත්වහන්සේ කිසි කලෙක එසේ රහසිගතව ද පව් නො කරනසේක. එසේ පව් කිරීමෙහි රහස් නැති බැවින් ද උත්වහන්සේ **අරහ** ය.

"යස්මා නත්ථි රහො නාම – පාපකම්මෙසු තාදිනො
රහාභාවෙන තෙනෙස – අරහං ඉති විස්සුතො."

'යම් හෙයකින් තාදි බුදුන්හට පව් කිරීමෙහි රහස් නැත්තේ ද, එහෙයින් ඔව්හු රහස් නැති බැවින් **"අරහ"** යි ප්‍රසිද්ධ ය.' යනු ගාථායෙහි අර්ථ යි.

"ආරකත්තා හතත්තා ච – කිලෙසාරීන සො මුනි
හතසංසාර චක්කාරො – පච්චයාදීනවාරහො
න රහො කරොති පාපානි – අරහං තෙන පවුච්චති."

'මෙසේ බුදුරජාණන් වහන්සේ ක්ලේශයන්ගෙන් ආරක බැවින් ද, ක්ලේශාරි හත බැවින් ද, සංසාරචක්‍රයාගේ අර හත බැවින් ද, ප්‍රත්‍යයාදීන්ට අහී බැවින් ද, රහසවත් පව් නො කරන බැවින් ද **අරහ** නම් වන සේක.'

"සම්මා සම්බුදධා"

ඒ භාග්‍යවතුන් වහන්සේ අවිපරීත කොටැ සියලු ධර්මයන් පරොපදෙශ රහිත වැ තමන් වහන්සේ ම අවබොධ කළසේක. එහෙයින් උන්වහන්සේ **සම්මාසම්බුදධ ය.** ("සම්මා" යන්නෙන් අවිපරීත කොටැ යන අර්ථය ද, "සං" යන්නෙන් තමන් වහන්සේ ම යන අර්ථය ද, දැක්විණි. "සියලු ධර්මයන්" යි කර්මය ගත්තේ එක දෙශයක් නො දක්වන ලද බැවිනි. එක දෙශයක් නො දැක් වූ තැන නිෂ්ප්‍රදෙශය ගත යුතු ය.

ඒ එසේ මැ යි:– උන්වහන්සේ සියලු ධර්මයන් අවබොධ කළ සේක් ම ය. උන්වහන්සේ අභිඥෙය ධර්ම අභිඥෙය වශයෙන් අවබොධ කළ සේක. පරිඥෙය ධර්ම පරිඥෙය වශයෙන් ද, ප්‍රහාතව්‍ය ධර්ම ප්‍රහාතව්‍ය වශයෙන් ද, සාක්ෂාත් කරණීය ධර්ම සාක්ෂාත් කරණීය වශයෙන් ද, භාවිතව්‍ය ධර්ම භාවිතව්‍ය වශයෙන් ද අවබොධ කළසේක. (අභිඥෙය ධර්ම නම් විශිෂ්ට ඥානයෙන් දත යුතු චතුස්සත්‍ය ධර්ම යි. ලක්ඛණ – රස – පච්චුපට්ඨාන – පදට්ඨාන වශයෙන් දත යුතු ධර්ම හෝ, පරිඥෙය ධර්ම නම් හාන්පසින් දතයුතු දුඃඛ සත්‍ය යි. අනිත්‍යාදි ලක්ෂණ වශයෙන් පිරිසිඳැ දත යුතු ධර්ම හෝ, ප්‍රහාතව්‍ය ධර්ම නම් බැහැර කටයුතු තෘෂ්ණා සඞ්ඛ්‍යාත සමුදය සත්‍ය යි. සාක්ෂාත් කරණීය ධර්ම නම් ප්‍රත්‍යක්ෂ වශයෙන් දැක්ක යුතු නිර්‍වාණ සංඛ්‍යාත නිරොධ සත්‍ය යි. ඵල – නිර්‍වාණ හෝ. භාවිතව්‍ය ධර්ම නම් වැඩිය යුතු මාර්ග ධර්ම යි. වදාළේ මැ යි

''අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං - භාවෙතබ්බං ච භාවිතං,
පහාතබ්බං පහීනං මෙ - තස්මා බුද්ධා'ස්මි බ්‍රාහ්මණ''[1] **සි.**

'බමුණ! මා විසින්, 'අභිඥෙය ධර්ම අභිඥාත ය. ප්‍රහාතව්‍ය ධර්ම ප්‍රහීණ ය. භාවිතව්‍ය ධර්ම භාවිත ය. එ හෙයින් මම බුදුවෙමි. යනු අර්ථ සි.

තව ද භාග්‍යවතුන් වහන්සේ ඒ චතුස්සත්‍යය ආයතන-විඤ්ඤාණ ආදි වශයෙන් අවබෝධ කළ හෙයින් **සම්මාසම්බුද්ධ** වන සේක් සි දක්වති.

උන්වහන්සේ චක්ෂුරායතනය දුඃඛ සත්‍යය සි ද, ඒ චක්ෂුරායතනය උපදවීමට මූලකාරණ වූ තෘෂ්ණාව සමුදය සත්‍යය සි ද, ඒ චක්ෂුරායතන - තෘෂ්ණා යන දෙක්හි ම නො පැවැත්ම නිරෝධ සත්‍යය සි ද, නිරෝධ ප්‍රතිවෙධ කරන ප්‍රතිපදාව මාර්ග සත්‍යය සි ද, මෙසේ එක් එක් ධර්මය උද්ධරණය කිරීම් වශයෙන් සියලු ධර්මයන් මනා කොට තමන්වහන්සේ ම අවබෝධ කළ සේක. සොතායතන, ඝාණායතන, ජිව්හායතන, කායායතන, මනායතන මෙසේ යොදා දත යුතු. මෙසේ ම රූපාදි වූ බාහිරායතන සයද, චක්ඛු විඤ්ඤාණාදි විඤ්ඤාණ කාය සය ද, චක්ඛු සම්ඵස්සාදි ඵස්ස සය ද, චක්ඛු සම්ඵස්සජ වෙදනාදි වෙදනා සය ද, රූපසඤ්ඤාදි සඤ්ඤා සය ද, රූප සඤ්චේතනාදි චෙතනා සය ද, රූප තණ්හාදි තෘෂ්ණා සය ද, රූප විතක්කාදි විතක්ක සය ද, රූප විචාරාදි විචාර සය ද, රූපක්ඛන්ධාදි පඤ්චස්කන්ධ ද, දස කසිණ ද, දස අනුස්සති ද, උද්ධුමාතකාදි දස සංඥා ද, කෙසාදි දෙතිස් කුණප ද, දවාදස ආයතන ද, චක්ඛුධාතු ආදි අටළොස් ධාතු ද, කාම භවාදි නව භව ද, ප්‍රථමධ්‍යානාදි ධ්‍යාන සතර ද, මෛත්‍රාදි සතර අප්පමඤ්ඤා ද, ආකාසානඤ්චායතනාදි අරූපසමාපත්ති සතර ද, ප්‍රතිලෝම වශයෙන් ජරා-මරණාදි වූ ද, අනුලෝම වශයෙන් අවිජ්ජාදි වූ ද, පටිච්චසමුප්පාදාඞ්ග ද යොදා දත යුතු සි. එසින් අවසන්හි දැක්වුණු ජරා-මරණ යොදන සැටි මෙසේ ය. ජරා-මරණ දුඃඛ සත්‍යය, ජරා - මරණයට ප්‍රත්‍යය වන ජාතිය සමුදය සත්‍යය, ඒ ජරා - මරණ ජාති දෙක්හි ම නිස්සරණය නිරෝධ සත්‍යය, නිරෝධය ප්‍රතිවෙධ කරන ප්‍රතිපදාව මාර්ග සත්‍ය සි.

මෙසේ **එක් එක්** ධර්මය උද්ධරණය කිරීම් වශයෙන් ද, උන්වහන්සේ සියලු ධර්මයන් මනා කොට තමන් වහන්සේ ම අවබෝධ කළසේක. එ හෙයින් උන්වහන්සේ **''සම්මාසම්බුද්ධ''** වන සේක.

---

[1]සු: නි: සෙලසු: 79

"විජ්ජා - චරණ සම්පන්නෝ"

ඒ භාග්‍යවතුන් වහන්සේ විද්‍යාවෙන් ද, චරණයෙන් ද සම්පන්න බැවින් - යුක්ත බැවින් **විජ්ජා-චරණ සම්පන්න** වන සේක.

එහි විද්‍යා නම් ත්‍රි විද්‍යා සි. අෂ්ට විද්‍යා හෝ, ත්‍රි විද්‍යාව **භයභෙරව සූත්‍රයෙහි**[1] ද, අෂ්ට විද්‍යාව **අම්බට්ඨ සූත්‍රයෙහි**[2] ද, දැක්වුණු පරිදි දත යුතු. (පූර්වේ නිවාසානුස්මෘතිඥානය, දිව්‍යචක්ෂුරභිඥානය, ආශ්‍රවක්ෂයකරඥානය යන මේ ඥානත්‍රය ත්‍රි විද්‍යා සි.) විදර්ශනාඥානය, මනෝමය සෘද්ධිඥානය යන ඥානවය හා ෂට් අභිඥා හා අෂ්ට විද්‍යා සි. (ෂට් අභිඥා නම් ඉද්ධිවිධ, දිබ්බසෝත, පරචිත්තවිජානන, පුබ්බේ-නිවාසානුස්සති, දිබ්බචක්ඛු, ආසවක්ඛය යන ඥාන සය සි.)

චරණ නම් ශීල සංවරය, ඉන්ද්‍රිය සංවරය, භොජනයෙහි පමණ දන්නා බව ය, ජාගරියානුයෝගය හෙවත් නිදි වර්ජිත යෙහි යෙදීම ය, සද්ධා - හිරි - ඔත්තප්ප - බාහුසච්ච - විරිය - සති-පඤ්ඤා යන සප්ත ධර්මය, රූපාවචර ධ්‍යාන සතර ය යන මේ පසලොස් ධර්ම සි. මේ ධර්ම පසලොස කරන කොට ආර්‍ය්‍ය ශ්‍රාවක නිවන දෙසට චරණය කර සි - ගමන් කරසි. එහෙයින් ඒ ධර්ම පසලොස චරණ ධර්මය සි කියන ලදී.

ඒ එසේ මෑ සි:- භාග්‍යවතුන් වහන්සේ **මැදුම් සඟි මජ්ඣිම පණ්ණාසකයෙහි "ඉධ මහානාම අරියසාවකෝ සීලවා හොති"**[3] යනාදීන් දැක්වූ සේක.

උන්වහන්සේ මේ දැක්වුණු විජ්ජාවෙන් ද, චරණයෙන් ද යුක්ත සේක. එහෙයින් **විජ්ජා-චරණ සම්පන්න** වන සේක.

මේ විජ්ජා-චරණ අතුරෙන් විද්‍යාසම්පත්තිය උන්වහන්සේගේ සර්ව්ඥතාඥානය ද, චරණසම්පත්තිය මහාකාරුණිකත්වය ද, පුරා සිටියේ ය. උන්වහන්සේ සර්ව්ඥතාඥානයෙන් ලෝකයාගේ අර්ථානර්ථ දැනැ වදාරා මහාකාරුණිකත්වයෙන් අත්‍යර්ථ හැර පියා අර්ථයෙහි යොදන සේක. විජ්ජා-චරණ සම්පත්තියෙක් කරන්නේ එසේ මෑ ය. එසින් උන්වහන්සේගේ ශ්‍රාවකයෝ සුප්‍රටිපන්න වෙති. දුප්පටිපන්න නො වෙත්. විජ්ජාචරණසම්පන්න නො වූ ශාස්තෘ-වරයන්ගේ ශ්‍රාවකයෝ දුප්පටිපන්න වැ අත්තනාත්තප, පරනාත්තප, උභයනාත්තප වෙත්.

---

[1]ම: නි: මූලපණ්ණාසක 17, [2]දී: නි: සීලක්ඛන්ධව: 66
[3]ම: නි: මජ්ඣිමපණ්ණාසක 14

"සුගතෝ"

ඒ භාග්‍යවතුන් වහන්සේ 1 ශොභන ගමන් ඇති බැවින් ද 2 සුන්දර තැනට ගිය බැවින් ද 3 මනා කොටැ ගිය බැවින් ද 4 මනා තෙපුල් ඇති බැවින් ද **සුගත** වන සේක.

1 ගත නම් ගමන ය. භාග්‍යවතුන් වහන්සේගේ ගත-ගමන ශොභන ය, පරිශුද්ධ ය, නිරවද්‍ය සි. ඒ ගත නම් – ගමන නම් කිම? ආර්‍ය්‍ය මාර්ගය සි. උන්වහන්සේ ආර්‍ය්‍යමාර්ග සංඛ්‍යාත ගතයෙන් නො ලැගෙමින් නිවන්දිගට ගිය සේක. එබඳු ශොභන ගමන් ඇති බැවින් උන්වහන්සේ **සුගත** ය.

2 සුන්දර තැන නම් නිර්‍වාණය සි. ඒ නිර්‍වාණ සංඛ්‍යාත සුන්දර තැනට ගිය බැවින් ද උන්වහන්සේ සුගත ය.

3 උන්වහන්සේ මනා කොටැ ගිය සේක. ඒ ඒ මාර්ගයෙන් ප්‍රහීණ කෙලෙසයන් කරා පෙරලා නො ගිය සේක. එහෙයින් උන්වහන්සේ සුගත ය.

කියේ මැ සි:- **"සොතාපත්ති මග්ගෙන යෙ කිලෙසා පහීණා තෙ කිලෙසෙ න පුනෙති, න පවෙවති, න පවා-ගච්ඡතීති සුගතෝ. -පෙ- අරහත්ත මග්ගෙන යෙ කිලෙසා පහීණා තෙ කිලෙසෙ න පුනෙති, න පවෙවති, න පවා-ගච්ඡතීති සුගතෝ"** සි. අර්‍ථ සුගම සි.

තවද උන්වහන්සේ දීපංකරපාදමූලයෙහි පටන් බෝ මැඩ දක්වා සමන්‍ත්‍රිංශත් පාරමී සංඛ්‍යාත සම්‍යක් ප්‍රතිපත්තියෙන් මුළු ලොවට හිත සුව එළවමින් ශාස්වත-උච්ඡේද වශයෙන් හෝ කාමසුඛ – අත්තකිලමථ වශයෙන් හෝ අන්තද්වයයට නො පැමිණ ගිය සේක. එබැවින් ද උන්වහන්සේ **සුගත ය.**

4 උන්වහන්සේ මනා කොටැ ගදනය **කරන** සේක – කියන සේක. යුතු තැන්හි යුතු වූ ම තෙපුල් තෙපලන සේක. එහෙයින් ද උන්වහන්සේ සුගත ය. මේ අර්‍ථයට සාධක සූත්‍රයෙක් මෙසේ සි.

"යං තථාගතෝ වාචං ජානාති අභූතං අතච්ඡං අනත්ථ-සංහිතං ඤා ච පරෙසං අප්පියා අමනාපා, න තං තථාගතෝ වාචං භාසති.

යං පි තථාගතෝ වාචං ජානාති භූතං තච්ඡං අනත්ථ සංහිතං ඤා ච පරෙසං අප්පියා අමනාපා. න තං තථාගතෝ වාචං භාසති.

යං ච බ්‍රූ තථාගතෝ වාචං ජානාති භූතං තච්ඡං අපථසංකිතං සා ච පරෙසං අප්පියා අමනාපා. තත්‍ර කාලඤ්ඤූ තථාගතෝ හොති තස්සා වාචාය වෙය්‍යාකරණාය.

යං පි තථාගතෝ වාචං ජානාති අභූතං අතච්ඡං අනත්ථසංහිතං සා ච පරෙසං පියා මනාපා. න තං තථාගතෝ වාචං භාසති.

යං පි තථාගතෝ වාචං ජානාති භූතං තච්ඡං අනත්ථසංහිතං සා ච පරෙසං පියා මනාපා. තං පි තථාගතෝ වාචං නභාසති.

යං ච බ්‍රූ තථාගතෝ වාචං ජානාති භූතං තච්ඡං අනත්ථසංහිතං සා ච පරෙසං පියා මනාපා තත්‍ර කාලඤ්ඤූ තථාගතෝ හොති තස්සා වාචාය වෙය්‍යාකරණාය.''

මෙහි අර්ථ මෙසේ ය.

'තථාගතයන්වහන්සේ තමන්වහන්සේ දන්නා යම් වචනයෙක් අසත්‍ය ද, අනර්ථයෙන් යුක්ත ද, එද අනුනට අප්‍රිය ද, එබඳු වචන නො වදාරතසේක. එසේම උන්වහන්සේ තමන් දන්නා යම් වචනයෙක් සත්‍ය ද, අනර්ථයෙන් යුක්ත ද, එද අනුනට අප්‍රිය ද එබඳු වචන ද නො වදාරතසේක. එසේ ම උන්වහන්සේ යම් වචනයෙක් සත්‍ය ද, අර්ථයෙන් යුක්ත ද, එද අනුනට අප්‍රිය ද එබඳු වචන කිමෙහි කාලය දන්නාසේක. (අර්ථයෙක් වේ නම් අනුනට අප්‍රිය වුව ද සත්‍ය වචනය වදාරතසේකැ යි සේ යි.) උන්වහන්සේ යම් වචනයෙක් අසත්‍ය නම් අනර්ථයෙන් යුක්ත නම් එය අනුනට ප්‍රිය වුව ද නො වදාරතසේක. එසේම උන්වහන්සේ යම් වචනයෙක් සත්‍ය වුව ද අනර්ථයෙන් යුක්ත නම් එය අනුනට ප්‍රිය වුව ද නො වදාරතසේක එසේ ම උන්වහන්සේ යම් වචනයෙක් සත්‍ය ද අර්ථයෙන් යුක්ත ද එද අනුනට ප්‍රිය ද එබඳු වචන කිමෙහි කාලය දන්නාසේක. (කලානුරූප වැ එබඳු වචන වදාරතසේකැ යි සේ යි.)

මෙසේ මනා තෙපුල් ඇති බැවින් ද උන්වහන්සේ **සුගත ය.** (''සුගද'' ය යි කියයුතු තන්හි-නිරුක්ත නයයෙන් ''සුගත'' විය.)

''ලොකවිදූ''

ඒ භාග්‍යවතුන් වහන්සේ ඤාණප්‍රභාවයෙන් ලොකය දන්නා බැවින් **''ලොකවිදූ''** නම් වනසේක.

ඒ එසේ මෑ යි:- උත්වහන්සේ සවභාව වශයෙන් ද, සමුදය වශයෙන් ද, නිරොධ වශයෙන් ද, නිරොධොපාය වශයෙන් ද යන සඕකාරයෙන් ලොකය දත්සේක. (සවභාව වශයෙන් දුක්ම නම් දුඃඛ වශයෙන් දුක්ම ය. සමුදය වශයෙන් දුක්ම නම් ඒ දුඃඛය යමෙකින් වේ නම් ඒ තෘෂ්ණා වශයෙන් දුක්වීම ය. නිරොධ වශයෙන් දුක්වීම නම් යම් තැනෙක ඒ දුඃඛ සවභාවය නිරුද්ධ වේ ද ඒ නිර්‍වාණ වශයෙන් දුක්ම ය. නිරොධ උපාය වශයෙන් දුක්ම නම් ආර්‍යමාර්ගී වශයෙන් දුක්ම යි මෙහි ලොක නම් පඤ්චොපාදානස්කන්ධ ලොක යි.) "ලොක" යන්නෙන් පඤ්චොපාදානස්කන්ධලොකය වදාළ බවට දෙශනාවෙක් මෙසේ යි.

"යත්‍ථ බෝ ආවුසො න ජායති, න ජීයති, න මියති න චවති, න උප්පජ්ජති. නාහං තං ගමනෙන ලොකස්සන්තං පාපුණෙය්‍යං දිට්ඨෙය්‍යං පත්තෙය්‍යං නි වදාමි. න චාහං ආවුසො අප්පත්වාව ලොකස්සන්තං දුක්ඛස්ස අන්තකිරියං වදාමි. අපි චාහං ආවුසො ඉමස්මිංයෙව ව්‍යාමමත්තෙ සඤ්ඤිම්හි සමනඤ්ඤෙ ලොකං ච පඤ්ඤාපෙමි, ලොක සමුදයං ච, ලොක නිරොධං ච, ලොක නිරොධ ගාමිනී ච පටිපදං. පඤ්ඤාපෙමි."

ගමනෙන න පත්තබ්බා - ලොකස්සන්තා කුදාචනං,
න ච අප්පත්වා ලොකන්තං - දුක්ඛා අත්ථි පමොචනං.

තස්මා හවෙ ලොකවිදූ සුමෙධො
ලොකන්තගූ වුසිතබ්‍රහ්මචරියෝ
ලොකස්ස අන්තං සමිතාවි ඤත්වා
නාසිංසති ලොකමිමං පරං ච"[1] යි.

එක් කලෙක **රොහිතස්ස** නම් දෙවපුත්‍රයෙක් භගවත් බුදුන් කරා එළඹ "ස්වාමීනි! මම පෙර **රොහිතස්ස** නම් ඍෂියෙක් වැ සෘද්ධිබලයෙන් ලොකාන්තය දක්ම්' යි සිතා ගමන් කෙළෙම්. ඒ මම ලොකාන්තය දැකැ ගන්නට නො හැකි වැ අතර දීම කාලක්‍රියා කෙළෙම්. ස්වාමීනි! පාද ගමනින් ගොස් ලොකාන්තය දැකැ ගන්නට නො හැකි දැ" යි විචාළේ ය. එවිට බුදුහු මෙසේ වදාළහ.

ඇවැත්නි! යම් තැනෙක ජාති-ජරා-ව්‍යාධි-මරණ නැත්තේ ද, චුති-උපපත්ති නැත්තේ ද, ඒ නිර්‍වාණ සංඛ්‍යාත ලොකාන්තය ප්‍රකෘති පාද ගමනින් ගොස් දුක්ක හැකි ය යි මම නො කියමි (චුති-උපපත්ති නැවත ගන්නේ අපරාපර චුති උපපත්ති සඳහා ය.)

[1] අ: නි: චතුක්ක නිපාත 219

ඇවැත්නි! ඒ නිර්වාණ සංඛ්‍යාත ලෝකාන්තයට නො පැමිණ දුක් අවසාන කිරීම වන්නේ ය යි ද මම නො කියමි. තවද ඇවැත්නි! මේ සඤ්ඤ සහිත මනස් සහිත බඹයක් පමණ වූ ශරීරයෙහි ම මම ලෝකය ද, ලෝක සමුදය ද, ලෝක නිරෝධය ද, ලෝක නිරෝධගාමිනී ප්‍රතිපදාව ද පණවමි.

(මේ අර්ථය ම ගාථායෙන් ද සම්පිණ්ඩනය කරති.)

'කිසි කලෙක ලෝකාන්තයට පාද ගමනින් නො යා හැකි ය. ලෝකාන්තයට නො ගොස් දුකින් මිදීම ද නො කළ හැකි ය.

එබැවින් ලෝකය දන්නා ලෝකයෙහි අන්තයට පැමිණි, විසූ මාගී බ්‍රහ්මචර්‍යා ඇති, කෙලෙස් සන්සිඳු වූ සුප්‍රාඥ රහතන්වහන්සේ ලෝකාන්තය දැනැ මෙලොව ද පරලොව ද නො පතන සේක'

(මේ දෙශනායෙහි "ලෝක" යි වදාළේ පඤ්ච උපාදානස්කන්ධ ලෝක ය. කෙවල ඍතු සමුත්ථාන රූප ලෝකය නො වේ. එහි චතුස්සත්‍යය පැණවිය නො හැක. මෙයින් භාග්‍යවතුන් වහන්සේ පංච උපාදානස්කන්ධ සංඛ්‍යාත ලෝකය දන් හෙයින් ලෝකවිදූ නම් වූ සේකැ යි කී නියා දත යුතු යි. ලෝක නම් පංච උපාදාන-ස්කන්ධ ලෝකය පමණෙක් ද අන්‍ය ලෝක නැත්තේ ද ඇත් නම් ඒ ලෝක උන්වහන්සේ නො දත් සේක් ද යනු විසඳන්නට මෙහි දී ලෝක විභාගය දක්වා ඒ සියලු ලෝක ද දත් පරිදි විස්තර කරති.)

සංස්කාර ලෝක, සත්ත්ව ලෝක, අවකාශ ලෝක ය යි ලෝක ත්‍රිවිධ වේ.

"එකකා ලොකො සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා" යන මේ දෙශනා පාළියෙහි දැක්වුණේ සංස්කාර ලෝක ය. ('එක් ලෝකයෙකි. එනම් සියලු සත්ත්වයෝ ප්‍රත්‍යයයෙන් පවත්නෝ ය.' යනු එහි අර්ථ යි. මෙහි ආහාර ශබ්දයෙන් ප්‍රත්‍යය වදාළ බව දත යුතු යි. ප්‍රත්‍යයෙන් නිපදනා සියල්ල සංස්කාර ලෝක නම් වේ. ඉන්ද්‍රිය බද්ධ අනින්ද්‍රිය බද්ධ සියලු සකඞ්ගයෝ 'පච්චයෙහි සංවරියන්ති ලුජ්ජන්ති පලුජ්ජන්ති' යි කී බැවින් සංස්කාර ලෝක නම් වෙත්" යනු සත්‍ය යි. "සබ්බෙ සත්තා" යි වදාළේ පුද්ගලාධිෂ්ඨාන වශයෙනි.)

'සඞ්ඛතො ලොකො නි වා අසඞ්ඛතො ලොකො නි වා"[2] යන මේ දෙශනා පාළියෙහි දැක්වුණේ සත්ත්ව ලෝක ය.

[2]මි: ප: බුද්ධකනිපාත 589

("දෘෂ්ටිගතිකයන්ගේ ශාස්වතාදි වශයෙන් ආත්මය ලොකය යන කල්පනාව හුයෝ වෘත්තීන් සත්ත්ව විෂය වේ. සංස්කාර විෂය නො වේ, "ඉන්ද්‍රිය බද්ධ සකකියන්ගේ සමූහය ද සන්තානය ද සත්ත්වලොක නම්" යනු සත්ත සි, සත්ත්ව ලොක නම් සත්ත්වයෝ සි.)

"යාවතා චන්දිමසූරියා
පරිහරන්ති දිසා භන්ති විරොචනා
තාව සහස්සධා ලොකෝ
එත්ථ තෙ වත්තතෙ වසෝ."[1]

යන මේ දෙසනා පාළියෙහි දැක්වුණේ අවකාශ ලොක ය 'සඳ හිරු දෙදෙන යම් තාක් තැන් පරිහරණය කරන් ද, බබළ බබලා දිගුන් බබුළුවත් ද, ඒ තාක් තැන් එක් ලොකයෙකි. එබඳු දහස් ලොකයෙකි. ඒ දහස් ලොකයෙහි තාගේ වශය පවත්නේ ය' යනු එහි අර්ථ සි. ("අනින්ද්‍රිය බද්ධ රූපාදීන්ගේ සමූහය ද, සන්තානය ද අවකාශ ලොක නම්" යනු සත්ත සි. අවකාශ ලොකයට භාජන ලොක යනු දු නමෙකි.)

භාග්‍යවතුන් වහන්සේ සංඝකාර, සත්ත්ව, අවකාශ යන මේ ත්‍රිවිධ ලොක ම දන්සේක. එහෙයින් උන්වහන්සේ ලොකවිදූ ය.

(මේ ත්‍රිවිධ ලොක පිළිබඳ තව ද විස්තාරයක් කරති.)

සංඝකාර ලොකය

"ලොක එකෙකි – **එනම්** සියලු සත්ත්වයෝ ප්‍රත්‍යයෙන් පවත්නෝ ය.
ලොක දෙකෙකි – එනම් නාම – රූප ය.
ලොක තුනෙකි – එනම් සුඛ, දුඃඛ, උපෙක්ඛා යන ත්‍රිවේදනා ය.
ලොක සතරෙකි – එනම් කබළීකාර, ඵස්ස, මනෝ-සඤ්චේතනා, විඤ්ඤාණ යන සතර ය.
ලොක පසෙකි – එනම් පංච උපාදානස්කන්ධයෝ ය.
ලොක සයෙකි – එනම් ආධ්‍යාත්මික ආයතන සය ය.
ලොක සතෙකි – එනම් විඤ්ඤාණ ස්ථිති සත ය.
ලොක අටෙකි – එනම් අෂ්ට ලෝක ධර්ම ය.
ලොක නවයෙකි – එනම් සත්ත්වාවාස නව ය.
ලොක දසයෙකි – එනම් ආයතන දස ය.
ලොක දෙළොසෙකි – එනම් ආයතන දෙළොස ය.
ලොක අටළොසෙකි – එනම් ධාතු අටළොස ය."

---

[1]ම: නි: මූලප: 33

මේ සංස්කාර ලෝක සි. උන්වහන්සේ මේ සියල්ල දත් සේක. (නිර්වාණය ද, මාර්ග- ඵල ද සංස්කාර ලෝකයට ඇතුළත් නොවේ. නිර්වාණය ප්‍රත්‍යයෙන් නො පවත්නේ ය. මාර්ග- ඵල ප්‍රත්‍යයෙන් නිපන් ද ලොකොත්තර බැවින් සංස්කාර නො වන්නේ ය. සංස්කාර වනාහි අනිත්‍ය, දුඃඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණයෙන් යුක්ත සි.)

සත්ත්වලෝකය

භාග්‍යවතුන් වහන්සේ සියලු සත්ත්වයන්ගේ ආශය, අනුශය, චරිත, අධිමුක්ති දන්නා සේක. එසේ ම අපරජක්ඛ, මහාරජක්ඛ, තික්ඛින්ද්‍රිය, මුදින්ද්‍රිය, සවාකාර, ද්වාකාර, සුවිඤ්ඤාපය, දුවිඤ්ඤාපය, භව්‍ය, අභව්‍ය සත්ත්වයන් දන්නා සේක. එසේ උන්වහන්සේ සත්ත්ව ලෝකය ද දන්නා බැවින් **ලෝකවිදූ** වන සේක.

ආශය:- "යම් සේ මෘගයෝ ගොචරයට ගොස් නැවත අවුත් යම් තැනෙක හොවිද්ද හේ ඔහුට ආශය නම් වේ ද, එසේ ම සිත ද අන්‍යථා ප්‍රවෘත්ති වැ ද අවුත් යම් තැනෙක හොවී නම් හේ ඔහුට ආශය සි කියනු ලැබේ. හෙ ද ශාශ්වත දෘෂ්ට්‍යාදි දිසින් චතුර්විධ වේ.

කියේ මැ නු.

"සස්සතුච්ඡේද දිට්ඨි ච - ඛණති වෙවානුලොමිකී
යථාභූතං ච යං ඤාණං - එතං ආසය සඳ්දිතං" සි.

මෙහි ශාශ්වතය, උච්ඡේදය යන දෘෂ්ටීහු දෙදෙන වටටය ආශ්‍රය කළ පුහුදුන්ගේ ආශය. විවට්ටය ආශ්‍රය කළ ශුද්ධ සත්ත්වයනට වනාහි අනුලෝම ඤාණතිය, යථාභූත ඥනය යන ආශය" යනු සන්න සි.)

අනුශය:- මාර්ගයෙන් ප්‍රහීණ නො කළ බැවින් සන්තානයෙහි නිදි ගෙනැ මෙන් සිටින සුදුසු කරුණක් ලැබීමෙන් නැගී එන රාගාදි කෙලෙශයෝ සත්දෙන අනුශයයෝ ය.

චරිත:- සුවරිත, දුශ්චරිත. රාගාදි අට් චරිත හෝ

අධිමුක්ති:- ("අධිමුක්ති නම් අධ්‍යාශය ධාතු සි. හේ ද්විවිධ වේ. හීනාධිමුක්තිය, ප්‍රණීතාධිමුක්තිය සි" යනු සන්න සි.)

අපරජක්ඛ:- මඳ වූ කෙලෙස් රජස් ඇති ප්‍රඥා නෙත්‍ර ඇත්තා වූ නොහොත් උත්සන්න නො වූ රාගාදි රජස් ඇත්තා වූ.

මහාරජකුඛ:- මහත් වූ කෙලෙස් රජස් ඇති ප්‍රඥ තෙත්
ඇත්තා වූ නොහොත් උත්සන්න රාගාදි රජස් ඇත්තා වූ.

තික්ඛින්ද්‍රිය:- තීක්ෂණ වූ ශ්‍රද්ධාදි ඉන්ද්‍රිය ඇති.

මුදින්ද්‍රිය:- මෘදු වූ ශ්‍රද්ධාදි ඉන්ද්‍රිය ඇති.

සොකාර:- සුන්දර වූ ආකාර ඇති - කල්‍යාණ ප්‍රකෘති ඇති.

වාකාර:- අයහපත් ආකාර ඇති - නරක ප්‍රතිපත්ති ඇති.

සුවිඤ්ඤාපය:- පහසුවෙන් ධර්මය හැඟවිය හැකි.

දුවිඤ්ඤාපය:- පහසුවෙන් ධර්මය හැඟවිය නො හැකි.

භව්‍ය:- කර්මාවරණ, විපාකාවරණ, ක්ලේශාවරණ නැති.

අභව්‍ය:- කර්මාවරණ, විපාකාවරණ, ක්ලේශාවරණ ඇති.

(**කර්මාවරණ** නම් ආනන්තරිය **කර්ම** කළ. **විපාකාවරණ** නම් **අහේතුක** **ද්විහේතුක** ප්‍රතිසන්ධික. **ක්ලේශාවරණ** නම් නියත මිථ්‍යාදෘෂ්ටික.)

අවකාශලෝකය

තථාගතයන් වහන්සේ සත්ත්ව ලෝකය සේ ම අවකාශ ලෝකය ද දන්සේක. ලෝකයෙක් නම් එක් සක්වළෙකි. ("නෙම්මණ්ඩල සදෘශ වූ චක්‍රවාට පර්වතයෙන් භාත්පසින් පරික්ෂිප්ත වෙයින් ලෝකධාතුව චක්‍රවාළය යි කියනු ලැබේ." යනු සන්නසි.) සක්වළෙක් වනාහි අයම් - විතරින් දෙලොස් ලක්ෂ තුන්දහස් සාරසිය පණස් (1203450) යොදුනෙකි. වටින් සතිස් ලක්ෂ දසදහස් තුන්සිය පණස් (3610350) යොදුනෙකි. බොලින් (ගනකමින්) දෙලක්ෂ සතලිස් දහස් (240000) යොදුනෙකි. මෙතෙක් විශාල වූ මේ මහාපෘථිවිය සාරලක්ෂ අසූදහසක් (480000) යොදුන් ඝන ඇති ජලය පිට පිහිටියේ ය. පෘථිවි සන්ධාරක ජලය යනු මේ ය. ඒ ජලය ද නවලක්ෂ සැට්දහසක් (960000) යොදුන් ඝන ඇති වාතයෙහි පිහිටියේ ය. මේ ලෝක සංස්ථිතිය යි.

මෙසේ පිහිටි සක්වළ මැද **මහාමේරු** පර්වතය සූඅසූ දහසක් (84000) යොදුන් මහත්වයුරෙහි බැසැ පිහිටියේ ය. එතෙක්ම සයුරින් මතු නැඟී සිටියේ ය. එහි අයම් විතරද සූඅසූදහස් (84000) යොදුනි. නානාවිධ රත්නයෙන් විචිත්‍ර වූ **යුගන්ධර, ඊසධර, කරවීක, සුදස්සන, නේමින්ධර, විනතක, අස්සකණ්ණ** යන සත්කුට පර්වතයෝ ඒ මහමේරුවට අඩින් අඩ පමණින් මහාසාගරයෙහි බැසැ සිටියෝ ය. එසේ ම නැඟී ද සිටියෝ ය.

(**යුගන්ධරය** දෙසාළිස් දහසක් (42000) යොදුන් සමුද්‍රයෙහි බැස සිටියේ එපමණක් ම නැඟී සිටියේ ය. **ඊසධරය** එක්විසි දහසක් (21000) යොදුන් සමුද්‍රයෙහි බැසැ සිටියේ ය, එපණක් ම නැඟී සිටියේ ය, යනාදීන් කී නියා දත යුතු සි.) තවද මේ සප්තඛණ්ඩ මහාමේරුව පරික්ෂේප කොටැ සිටියේ ය. (**මේරුව** සිසාරා යුගන්ධරය ද, යුගන්ධරය සිසාරා ඊසධරය ද යනාදීන් පිහිටියේය සි දත යුතු.) සතර වරම් රජදරුවන්ගේ ද, දෙව යකෂයන්ගේ ද නිවාස එහි ය. මේ පර්‍වත අතර **සීදන්න** සාගර පිහිටියේ ය.

හිමාලය පර්‍වතය පන්සියක් (500) යොදුන් උස ය. තුන්සියක් (300) යොදුන් අයම් විතර ය. සුඅසූ දහස් (84000) කූටයන්ගෙන් ප්‍රතිමණ්ඩිත ය.

යම් දඹිගසක් නිසා මේ ද්වීපය ජම්බුද්වීපය සි ප්‍රකාශ වී ද, එහි පිහිටි ඒ දඹිගස වටින් පසළොස් (15) යොදුන් හා උසින් පණස් (50) යොදුන් හා කඳ ඇත්තේ ය. ශාඛා පණස් පණස් (50) යොදුන් දිග ඇත්තේ ය පුලුල සියක් (100) යොදුන, උස සියක් යොදුන. **අසුර භවනයෙහි චිත්‍රපාටලි රුක ද, ගරුඬ භවනයෙහි සිම්බලි රුක ද, අපරගොයානයෙහි කදම්බ රුක ද, උතුරුකුරුද්වීපයෙහි කප්රුක ද, පූර්‍වවිදෙහයෙහි මහදි රුක ද, තව්තිසා භවනයෙහි පරසතු රුක** ද ප්‍රමාණයෙන් මෙතෙක් ම වන්නේ ය.

මේ මුළු ලොක ධාතුව වටා පිහිටි සක්වළගල වනාහි දෙ අසූ දහසක් (82000) යොදුන් මහා සමුද්‍රයෙහි ගැලී සිටියේ ය. එතෙක් ම සමුදුරින් මතු නැඟී සිටියේ ය.

මේ ලොක ධාතුයෙහි පිහිටි **චන්ද්‍ර මණ්ඩලය** එකුන් පණස් (49) යොදුන. **සූය්‍ර මණ්ඩලය** පණස් (50) යොදුන. **තව්තිසා භවනය** දසදහසක් (10000) යොදුන. **අසුර භවනය** ද, **අවීචි මහ නිරය** ද, **ජම්බුද්වීපය** ද එසේ ම දසදහස් දසදහස් (10000) යොදුන. **අපරගොයානය** සත්දහස් (7000) යොදුන. **පූර්‍වවිදෙහය** ද සත්දහස් (7000) යොදුන. **උතුරුකුරු දිවසින** අටදහසක් (8000) යොදුනි. මේ එක එක මහාද්වීපයෙක් පන්සිය පන්සිය (500) කොදෙව් පිරිවර කොටැ ඇත්තේ ය. මේ සියල්ල එක් කොටැ ගත් කල්හි එක් සක්වළෙකැ සි කියනු ලැබේ. එය ම එක් ලොකධාතුවෙක් ද වන්නේ ය. ඒ සක්වළ තුනක් අතරෙහි **ලොකාන්තරිය නිරයෙකි.**

මෙසේ සක්වළ අනන්ත ය. **ලොකධාතු අනන්ත ය. භාග්‍යවන්** බුදුහු අනන්ත වූ බුද්ධඥානයෙන් මේ **සියලු අවකාශ ලොකය** ද දන් සේක. එබැවින් උන්වහන්සේ සකල ලොකය දන් බැවින් **ලොකවිදූ** නම් වන සේක.

"අනුත්තරෝ"

තථාගතයන් වහන්සේ ගුණයෙන් තමන්වහන්සේට වඩා විශිෂ්ටතර වූ කිසිවකු නැති බැවින් **අනුත්තර** වන සේක.

ඒ එසේ මෑ සි:- උන්වහන්සේ ශීල ගුණයෙන් ද, සමාධි ගුණයෙන් ද, ප්‍රඥා ගුණයෙන් ද, විමුක්ති ගුණයෙන් ද, විමුක්ති-ඥානදර්ශන ගුණයෙන් ද යන සියලු ගුණයෙන් සියලු ලොකය මැඩ සිටින සේක. උන්වහන්සේ ඒ ශීලාදි ගුණයෙන් තමන් හා සමයක්හු නැති බැවින් **අසම** සේක. අසම වූ අතීත බුදුවරයන් හා සම බැවින් **අසමසම සේක.** තමන් රුව බඳු ප්‍රතිමා ද නො කට හැකි බැවින් **අප්‍රතිම** සේක. වදාළ "සතිපට්ඨානාදි ධර්ම එසේ නො වේ ය" සි පෙරලා ප්‍රතිපක්ෂ විය හැකි පුද්ගලයකු **නැති** බැවින් **අප්‍රතිඝාග** සේක. "තො බුදු නො වෙසි මම බුදුමි" සි සිටිය **හැකි** ප්‍රතිපක්ෂ පුද්ගලයකු නැති බැවින් **අප්‍රතිපුද්ගල සේක.** (මෙහි ශීලාදී ගුණයෝ ලෞකික ලොකොත්තර මිශ්‍රයහ. විමුක්තිඥාන දර්ශනය වනාහි **ලෞකික** ම වේ. **කාමාවචර** ම **වේ. එසේ කල්හි** "සදෙවකං ලොකං අභිභවති" යනු කෙසේදයන්? අනුභාවයෙන් අසදෘශ බැවිනි. හෙතෙමේ විෂය හෙයින් ප්‍රවෘත්ති ආකාර හෙයින් උත්තරිතර වූයේ අන්‍ය සාධාරණ වූයේ තථාගතයන් ගේ විමුක්ති ගුණය අරමුණු කොටැ පවත්නි. පවත්නේ ද ප්‍රතිපක්ෂයන් සුප්‍රහීණ බැවින් අතක්කාවචර වූ **පරම** ගම්භීර වූ සූක්ෂම විෂය මනාකොට ප්‍රකට ම **කෙරෙමින්** පවත්නේ ය. මනාකොටැ වාසිතාවට පැමිණ වූ බැවිනුදු භවාඛ්‍ය පරිවාසය අපරිත්‍යක්ත බැවිනුදු ලඝු වැ පවත්නි යනු සත්ත සි.)

වදාළේ මෑ සි.

"න චෙ පනාහං පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙව මනුස්සාය අත්තනා සීලසම්පන්නතරං"[1] යනාදීන්.

'දෙවියන්-මරුන්-බඹුන් සහිත ලොකයෙහි ශ්‍රමණ - බ්‍රාහ්මණ-යන් - දෙවි - මිනිසුන් සහිත ප්‍රජායෙහි මට වඩා ශීල සම්පන්න තරයකු මම නො දක්නෙමි.' යනු එහි අර්ථ සි. සමාධි-ප්‍රඥා-විමුක්ති-විමුක්ති ඥානදර්ශන පිළිබඳව ද මෙසේ මෑ සි.

[1]අ: නි: චතුක්කනිපාත 199

අග්ගප්පසාද සූත්‍රාදියෙනුදු මේ අර්ථය දැක්විය යුතු. **"යාවතා භික්ඛවෙ සත්තා අපදා වා ද්විපදා වා චතුප්පදා වා බහුප්පදා වා රූපිනො වා අරූපිනො වා සඤ්ඤිනො වා අසඤ්ඤිනො වා නෙවසඤ්ඤිනාසඤ්ඤිනො වා තථාගතො තෙසං අග්ග මක්ඛායති අරහං සම්මා සම්බුද්ධා, යෙ භික්ඛවෙ බුද්ධෙ පසන්නා අග්ගෙ තෙ පසන්නා අග්ගෙ ඛොපන පසන්නානං අග්ගා විපාකො හොති"**[1] යනු **"අග්ගප්පසාද"** සූත්‍ර යි. 'මහණෙනි! අපාද වූ හෝ ද්විපාද වූ හෝ චතුෂ්පාද වූ හෝ බහුපාද වූ හෝ රූපී වූ හෝ අරූපී වූ හෝ සඤ්ඤී වූ හෝ අසඤ්ඤී වූ හෝ නෙවසඤ්ඤීනාසඤ්ඤී වූ හෝ යම් පමණ සත්ත්ව කෙනෙක් වෙද් ද තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයෝ ඒ සියලු සත්ත්වයනට අග්‍රයහ' යි කියනු ලැබෙති. මහණෙනි! යම් කෙනෙක් බුදුන් කෙරෙහි පහන් වූහු නම් ඔව්හු අග්‍රයෙහි පහන් වූවෝ ය. අග්‍රයෙහි පහන් වූවනට අග්‍ර වූ විපාක වන්නේ ය, යනු එහි අර්ථ යි.

"න මෙ ආචරියො අත්ථි – සදිසො මෙ න විජ්ජති
සදෙවකස්මිං ලොකස්මිං – නත්ථි මෙ පටිපුග්ගලො."[2]

යන ගාථායෙනුදු මේ අර්ථය දැක්විය යුතු ය. "මට ආචාර්‍යයෙක් නැත. මට සමානයෙක් ද නැත. දෙවියන් සහිත ලොකයෙහි මට ප්‍රතිවිරුද්ධයෙක් ද නැත." යනු එහි අර්ථ යි.

"පුරිසදම්මසාරථි"

"පුරිසදම්මෙ සාරෙතීති පුරිසදම්මසාරථි" පුරුෂ දම්‍යයන් -දමනය කට යුතු පුරුෂයන් මෙහෙයයි - දමනය - කරයි - හික්ම වයි. යන අර්ථයෙන් භාග්‍යවතුන් වහන්සේ **පුරිසදම්මසාරථි** වන සේක. පුරුෂදම්‍යයෝ නම් නො දැමුණු - දමනය කටයුතු තිරිසන් වූ හෝ මනුෂ්‍ය වූ හෝ අමනුෂ්‍ය වූ හෝ පුරුෂයෝ ය. පිරිමි ය. ("දැමිය යුතු මාගමුන් ඇත ද එතුම් හෙයින් පුරුෂයන් ම කිහ." මාගමුන් දමනය කිරීම කවර අරුමයෙක් ද උන්වහන්සේ පිරිමි දමනය කරන සේක.)

ඒ එසේ මැ යි:- උන්වහන්සේ විසින් **අපලාල** නාගරාජය, **චූළොදර - මහොදර** නාගරාජයෝ දෙදෙනා ය. **අග්ගිසිඛ-ධූමසිඛ** නාගරාජයෝ දෙදෙනා ය, **ආරවාල** නාගරාජය **ධනපාලක** හස්තිය යන මේ ආදි නිරශ්චීන පුරුෂයෝ දමනය කරන ලද්දේ ය. විෂ කැති කොටැ සරණයෙහි ද, ශීලයෙහි ද පිහිටුවන

[1]අ: නි: චතුක්කනි: 209 [2]ම: ව: අනිසමෙඛාධි කථා 7

ලද්දේ ය. (මෙහි **අපලාල** නම් නාරජ හිමවත වෙසෙ සි. **චූළෝදර-මහෝදර** දෙදෙනා නාදිව වෙසෙත්. **අඟුලිමාල - ධූමසිඛ** දෙදෙන හෙළදිව වෙසෙත් යනු සත්නසි.)

එසේම උත්වහන්සේ විසින් **සච්චක** නිගණ්ඨය, **අම්බට්ඨ** මානවකය, **පොක්ඛරසාති, සොණදණ්ඩ, කූටදන්ත බ්‍රාහ්මණ** යෝ ය යනාදි මනුෂ්‍ය පුරුෂයෝ ද, **ආලවක, සූචිරෝම, ඛරරෝම** යක්ෂයෝ ය, **සක්දෙව්** රජය, **බ්‍රහ්මය** යනාදි අමනුෂ්‍ය පුරුෂයෝ ද විචිත්‍ර වූ විනයන උපායයෙන් දමනය කරන ලද්දේ ය. **"අහං ඛෝ කෙසි! සණ්හෙන පි විනෙමි, ඵරුසෙන පි විනෙමි, සණ්හඵරුසෙන පි විනෙමි"**[1] යනාදි සූත්‍ර ඊට සාධක සි. 'කෙසි! මම සියුම් ක්‍රමයෙන් ද, පරුෂ ක්‍රමයෙන් ද, සියුම් වූ ද පරුෂ වූ ද ක්‍රමයෙන් ද ඔවුන් හික්මවමි' යනු එහි අර්ථ සි

තවද උත්වහන්සේ අදමිතයන් මතු දමනය කරතසේක් නොවෙති. **දමිතයන්** ද දමනය කරන සේක. විශුද්ධ ශීලාදි යෙන් යුකතයන්ට ප්‍රථමධ්‍යානාදිය දෙවාවදුරම්න් ද, සෝවාන් ආදීන්ට මතු මතු මාර්ගප්‍රතිපද දෙවාවදුරම්න් ද හික්මවන සේක.

"අනුත්තරෝ පුරිසදම්ම සාරථි"

අනුත්තරය, පුරිසදම්මසාරථිය සි යට අර්ථ දෙකක් වශයෙන් ගෙනැ විසතර කළහ. මේ පද දෙකින් එක ම අර්ථය ද දැක්විය හැකි ය. භාග්‍යවතුන් වහන්සේ "අනුත්තර-පුරිසදම්මසාරථි" වන සේක. යනු වශයෙනි. හත්‍ථිදම්ය සාරථිහු දමනය කටයුතු ඇතුන් **එක්** දිගකට ම දුවවති. එසින් ඒ ඇත්තු ඒ දිගට ම දුවති. ඒ හත්‍ථි දම්ය සාරථිහු අනුත්තර නොවෙති. භාග්‍යවතුන් වහන්සේ **එක** පය්‍යඞ්කයෙහි උත්ත පුරුෂදම්ය්‍යෝ යම් සේ අට දිගට ම නොලැගෙමින් දුවත් ද එසේ දුවවන සේක. හික්මවන සේක. එහෙයින් උත්වහන්සේ **අනුත්තර පුරිසදම්ම සාරථි** වන සේක. **"හත්‍ථිදම්මෙන භික්ඛවෙ හත්‍ථිදම්මෝ සාරිතෝ එකංයෙව දිසං ධාවති"**[2] යනාදි සූත්‍රය එයට සාධක සි. 'මහණෙනි! ඇතුන් දමනය කරත්නා විසින් මෙහෙයන ලද හත්‍ථිදම්ය්‍යා **එක** දිශාවකට ම දුවසි, යනු එහි අර්ථ සි මෙහි අට දිශා නම් අෂ්ට සමාපත්ති ය. (**"අට්ඨදිසා** යනුවු නිදර්ශන මාත්‍ර සි. **ලෞකිකයන්** විසින් අගත පුළුවු නිරොධ සමාපත්ති දිගට ද, **නිර්වාණ** දිගට ද දිවන හෙයින්" යනු සන්ත සි.) පය්‍යඞ්ක යන්නෙන් මෙහි ඉරියව් කියන ලදැයි දත යුතු.

[1] අ: නි: චතුක්කනිපාත 262 [2] ම: නි: සළායතනව: 231

"සත්ථා දෙවමනුස්සානං"

භාග්‍යවතුන් වහන්සේ දෙවිමිනිසුන්ට **ශාස්තෘ** වන සේක. කවර අර්ථයෙකින් ශාස්තෘ වන සේක් ද දිට්ඨධම්මික, සම්පරායික, පරමත්ථ යන මේ ත්‍රිවිධ අර්ථයෙන් සුදුසු පරිදි අනුශාසනා කරන්නාහ යන අර්ථයෙන්. දිට්ඨධම්මික නම් මේ ලොවින් වන අර්ථ ය. සම්පරායික නම් පරලොවින් වන අර්ථ ය. පරමත්ථ නම් නිර්වාණ ය. උන්වහන්සේ මේ ත්‍රිවිධ අර්ථයෙන් යොග්‍ය පරිදි දෙවි-මිනිසුන්ට අනුශාසනා කරන සේක. එහෙයින් උන්වහන්සේ (**සත්ථා** ය) ශාස්තෘ ය.

තවද සත්ථා යන මේ පදයෙන් සාර්වාහ ගැනීයනු ලැබේ. ("සත්ථවාහෝ යනු සත්ථා යනුයෙහි ම අර්ථ පහළ කරනු පිණිස කීහ. **'අනෙන සහවත්තනිති සත්ථා'** අර්ථය හා සමග පවත්නේ සත්ථ නම්. හේ කවරයත්? බඩු මිළ ගෙනැ වෙණ දහම් පිණිස දෙශාන්තරයට යන ජනසමූහ ය. **'නිත්‍රූපදෙසාදි වශෙන පරිපාලෙතබ්බා සාසිතබ්බා එතස්ස අත්ථි නි සත්ථා සත්ථවාහෝ'** නි හිතොපදෙශ වශයෙන් රක්ෂා කටයුතු අනුශාසනා කටයුතු වෙළඳ මිල මෝහට ඇත්තු ය සත්ථා නම් වේ. හේ කවර යත්? සාර්වාහය යන අර්ථ ය. භගවතුදු එබඳු ය ය දක්වනු පිණිස **"සත්ථා භගවා සත්ථවාහෝ"** ය කීහු යනු සත්ත ය.)

'යම් සේ සාර්වාහ සාර්ථයන් වෙඅරකාන්තාරයෙන්, ව්‍යාල කාන්තාරයෙන්, දුර්භික්ෂකාන්තාරයෙන්, නිරුදක කාන්තාරයෙන් එතෙර කරන්නේ ද, එමෙන් භාග්‍යවතුන් වහන්සේ සත්ත්වයන් ජාතිකාන්තාරාදියෙන් එතෙර කරනසේක. ක්ෂෙම භූමි සංඛ්‍යාත නිර්වාණයට පමුණුවන සේක. එහෙයින් උන්වහන්සේ සත්ථා ය, මෙය **නිද්දේශයෙකි**[1] ආ පරිදි දක්වන ලදැයි දත යුතු.

දෙවිමිනිසුන්ට යයි කීයේ උතකෘෂ්ට පරිවෙෂ්ද වශයෙනි. භව්‍ය පුද්ගල වශයෙනි. උන්වහන්සේ තිරිසන් ගිය සත්ත්වයන්ට ද අනුශාසනා කරනසේක් ම ය. තිරිසන් ගිය සත්ත්වයෝ ද උන්වහන්සේගේ ධර්මය අසා උපනිස්සය සම්පත් ලැබැ එයින් දෙවත තෙවත අත්බැව්හි මාර්ගඵල ප්‍රතිලාභය කරති. **මණ්ඩූක** දෙවපුත්‍රාදීහු එයට නිදර්ශන ය.

භාග්‍යවතුන් වහන්සේ **ගඟගරා** නම් පොකුණු තෙර **චම්පා** නගරවාසීන්ට ධර්ම දෙශනා කරන කල්හි එක් මැඩියෙක් උන්වහන්-සේගේ සවරයෙහි නිමිත්ත ග්‍රහණය කැරැ සිටියේ ය.

---

[1] මහා: නි: සාරිපුත්ත සූ: 335

එක් වසුපල්ලෙක් නො දැනැ දඬු කෙළවර උගේ හිස මත තබා එහි එල්බැ සිටියේ ය. එසින් මැඬියා කලුරිය කෙළේ ධර්‍ම සවරයෙහි ගත් ප්‍රසාදයෙන් තව්තිසා දෙව්ලොව දෙලොස් යොදුන් රන් විමනෙක උපන්නේ ය. දෙවඟනන් දහසෙක් පිරිවර විය. හේ තමා සිරි සම්පත් දැකැ "කොළ, මමත් මෙහි උපන්මි. කවර කර්‍මයක් කෙළෙම් ද" යි බලන්නේ ඒ කාරණය දැනැ සතුටු වැ එකෙණෙහි ම විමානය හා සමඟ එහි අවුත් බුදුන් පා වැන්දේ ය. බුදුහු මෙසේ විවාළෝ ය.

"කො මෙ වන්දති පාදානි – ඉද්ධියා යසසා ජලං
අභික්කන්තෙන වණ්ණෙන – සබ්බා ඔභාසයං දිසා"[1]

'සෘද්ධියෙන් යසසින් සියලු දිගුන් බබුළුවමින් විශිෂ්ට වර්‍ණයෙන් යුක්තවැ කවරෙක් මේ මාගේ පා වඳින්නේ ද'

එවිට මණ්ඩූක දෙවපුත්‍ර මෙසේ කිය සි.

"මණ්ඩූකොහං පුරෙ ආසිං – උදකෙ වාරි ගොචරෝ
තස්ස ධම්මං සුණන්තස්ස – අවධි වච්ඡපාලකො"[1]

'මම පෙර ජලය ගොදුරු කොටැ ඇති දිය මැසියෙක් වැ සිටියෙමි. ඔබගේ බණ අසන් ම පසුපල්ලෙක් මා මැරුයේ ය.'

උත්වහන්සේ ඔහුට බණ වදාළසේක. සුවාසුදහසක් ප්‍රාණීන්ට ධර්‍මාභිසමය විය. ඒ දෙව්පුත් ද සෝවාන් වැ සිතාසිසී හිඳේ ය.

"බුද්ධා"

දත යුතුය යන යමෙක් ඇත්නම් ඒ සියල්ල අවබෝධ කළ බැවින් භාග්‍යවතුන් වහන්සේ විමොක්ෂානන්තරිකඥන වශයෙන් බුද්ධ නම් වන සේක. ("සියලු කෙලෙසුන් කෙරෙන් මුක්ත වන හෙයින් රහත් ඵල විමොක්ෂ නම්. විමෝක්ෂාවශාන යෙහි උපදනා බැවින් රහත් ඵලය විමෝක්ෂානන්තර නම්. රහත් ඵලය ලද කල ලැබිය යුතු බැවින් සවිනේ දන්නා ඤාණ විමෝක්ෂානන්තරික ඤාණ නම්. ඒ ඤාණයින් බුද්ධ නම් විය යන අර්‍ථ සි." යනු සන්න සි.) සම්බුද්ධ – බුද්ධ යන දෙපදයාගේ අර්‍ථ විශෙෂය සන්තයෙහි මෙසේ දක්වනි. "සම්බුද්ධා යන මෙයින් සංක්ෂෙපයෙනුදු විස්තාරයෙනුදු ශාස්තෘහුගේ චතුස්සත්‍යාවබොධය උක්ත ය. බුද්ධා යන මෙයින් වනාහි තදනන්තෙයයාගේ අවබොධය උක්ත සි. දුර්‍ලභ වචනයෙන් ශෝ

[1]වි: ව: මහාවග්ග ව: 61

ශාස්තෘහුගේ ප්‍රතිවෙධ ඥානානුභාවය දර්ශිත ය. පශ්චිම පදයෙන් දෙශනා ඥානානුභාවය දර්ශිතය සි වක්ෂ්‍යමාන විශෙෂය ද්‍යොතිත වේ නු සි දත යුතු සි.

තවද උන්වහන්සේ චතුස්සත්‍යය තෙමේ ද අවබොධ කළ සේක. අන්‍යයන්ට ද අවබොධ කරවන සේක. එහෙයින් ද උන්වහන්සේ බුදුන ය. "බුජ්ඣිතා සත්තානී ති බුද්ධා බොධෙතා පජායා ති බුද්ධා" යනාදීන් නිර්දේශයෙහි ද, පටිසම්භිදා-යෙහි ද වදාළ ක්‍රමය මෙහි ලා විස්තර කළ යුතු සි.

කෙනට්ඨෙන බුද්ධා? බුජ්ඣිතා සත්තානීති බුද්ධා, බොධෙතා පජායාති බුද්ධා. සබ්බඤ්ඤුතාය බුද්ධා, සබ්බ-දස්සාවිතාය බුද්ධා, අනඤ්ඤනෙය්‍යතාය බුද්ධා, විස විතාය බුද්ධා, ඛීණාසව සංඛාතෙන බුද්ධා. නිරූපලෙප සංඛාතෙන බුද්ධා, එකන්තවීතරාගො ති බුද්ධා, එකන්තවීතදොසො ති බුද්ධා, එකන්තවීතමොහො'ති බුද්ධා, එකන්ත-නික්කිලෙසො'ති බුද්ධා, එකායනමග්ගං ගතො'ති බුද්ධා, එතො අනුත්තරං අභිසම්බොධිං අභිසම්බුද්ධොති බුද්ධා, අබුද්ධි විහතත්තා බුද්ධි පටිලාභා බුද්ධා, බුද්ධො'ති නෙ'තං නාමං මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තා මච්චෙහි ඤාති-සාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං, විමොක්ඛන්තිකමෙතං බුධානං භගවන්තා-නං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤාණස්ස පටිලාභා සච්ඡිකා පඤ්ඤත්ති යදිදං බුද්ධො'ති"[1]

'කවර අර්ථයෙකින් බුදු නම් වේ ද චතුස්සත්‍යය තමන් ම අවබොධ කළ බැවින්, අන්‍යයන් අවබොධ කරවූ බැවින්, සියල්ල දන්නා බැවින්, සියල්ල දක්නා බැවින්, අනෙකකු විසින් අවබොධ නො කරවන ලද බැවින්, කෙලෙස නිද්‍රායෙන් පිබිදි බැවින්, ආශ්‍රවක්ෂය කළ බැවින්, කෙලෙස ලෙප නැති බැවින්, එකාන්ත යෙන් වීතරාග, වීතදෙස, වීතමොහ බැවින්, එකාන්ත නිකෙලෙස බැවින්, එකායන මාර්ගයට ගිය බැවින්, හුදෙකලාව අනුත්තර සම්‍යක් සම්බොධි අවබොධ කළ බැවින්, අබුදුසු නැසූ බැවින්, බුදුසු ලැබූ බැවින් බුදු නම් වේ. උන්වහන්සේට බුදු යන මේ නාමය මව්පියන් විසින් සහෝදර - සහෝදරියන් විසින් මිත්‍රාමාත්‍යයන් විසින් සහලේ නැයන් විසින් මහණ

[1] මහා: නි: සාරිපුත්ත සුත්ත 344

බම්බුණන් විසින් දෙවියන් විසින් තබන ලද්දේ නො වේ. ඒ බුද්ධ යන ප්‍රඥප්ති නාමය වකාහි උත්වහන්සේට බෝමූල සවන් නැණ ලැබීම සමග විමොක්ෂානන්තරික වශයෙන් ලැබුණේ ය යනු එහි සංක්ෂේපාර්ථ සි.

"භගවා"

'භගවන්' යනු ගුණයෙන් විශිෂ්ට වූ සියලු සත්ත්වයන්ට උතුම් වූ ගෞරවාර්හ වූ ඒ තථාගතයන් වහන්සේට කිය යුතු ගෞරව නාමයෙකි.

කියේ මෑ සි.

"භගවාති වචනං සෙට්ඨං – භගවාති වචනමුත්තමං
ගරුගාරවයුත්තෝ සෝ – භගවා තේන වුච්චති" සි.

"භගවන්" යන මේ නාමය ශ්‍රේෂ්ඨ නාමයෙකි. **"භගවන්"** යන මේ නාමය උතුම් නාමයෙකි. ඒ තථාගතයන් වහන්සේ ගරු ය. ගෞරවයෙන් යුක්ත ය. එ බැවින් උත්වහන්සේ **"භගවන්"** සි කියනු ලැබේ. යනු එහි අර්ථ සි. **"භගවන්"** යන මෙසින් කියනු ලබන්නේ ශ්‍රේෂ්ඨයෙකි. **'භගවන්'** යන මෙසින් කියනු ලබන්නේ උත්තමයෙකි. ඒ තථාගතයන් වහන්සේ ශ්‍රේෂ්ඨ ය, උත්තම ය. ගෞරවයෙන් යුක්ත ය. එ බැවින් උන් වහන්සේ **භගවන්** සි කියනු ලැබේ, යන වශයෙන් ද මෙහි අර්ථ දිය හැකි ය. එවිට වචන ශබ්දයෙන් අර්ථය කියනු ලබන බව දත යුතු සි.

නාම වනාහි 1 ආවත්තික නාම, 2 ලිඛිතික නාම, 3 නෙමිත්තික නාම 4 අධිවච සමුප්පන්න නාම ය සි සිව් වැදෑරුම් වේ. අධිවච සමුප්පන්න නාමයට යදිච්ඡකය සි ද ලෝකයෙහි ව්‍යවහාර කරත්.

1 ගවයාගේ කුඩා අවස්ථාව ගෙන "වස්සා" ය සි ද, තරුණ අවස්ථාව ගෙන "දම්මයා" සි ද, මහලු අවස්ථාව ගෙන "ඛලිවද්දා" සි ද කියනු ලැබේ. මෙසේ ඒ ඒ අවස්ථා වශයෙන් ගෙන තබනු ලබන නාම **ආවත්තික** නාම සි.

2 දඬු ඇත්තේ "දණ්ඩී" ය සි ද, ඡත්‍ර ඇත්තේ "ඡත්තී" ය සි ද, සිඛා ඇත්තේ "සිඛී" ය සි ද, කර ඇත්තේ "කරී" ය සි ද කියනු ලැබේ. මෙසේ ඒ ලිඛන – ද්‍රව්‍ය ගෙන ඒ වශයෙන් තබනු ලබන නාම **ලිඛිතික** නාම සි.

3 ඍර්ද්ධි ඇත්තේ "තෙවිජ්ජ" සි ද ෂට් අභිඥ ඇත්තේ "ඡළභිඤ්ඤ" සි ද කියනු ලැබේ. මෙසේ ඒ ඒ **නිමිත්ත** වශයෙන් ගෙන තබනු ලබන නාම **නෙමිත්තික** නාම සි.

4 වචනාර්ථ නො සලකා ශ්‍රීවඩින, ධනවඩින ආදි වශයෙන් තබනු ලබන නාම **අධිච්චසමුප්පන්න** යි.

මේ සිව් වැදෑරුම් නාම අතුරෙන් "භගවත්" යනු නෙමිත්තක නාම යි. ඒ වනාහි උත්වහන්සේට මාහාමායා දෙවි විසින් හෝ සුදෙවුන් මහ රජතුමන් විසින් හෝ අසූ දහසක් නැකැතියන් විසින් හෝ ශක්‍ර - සන්තුෂිතාදි දෙවි කෙනෙකුන් විසින් හෝ තබන ලද්දේ නො වේ. හුදෙක් නෙමිත්තක වශයෙන් ලැබුණේ ය. කියේ මෙ සි:- **ධම්මසෙනාපතින්** විසින්:-

"භගවාති නෙතං නාමං මාතරා කතං-පෙ-විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්නානං බොධියාමූලේ සහ සබ්බඤ්ඤුතඤාණස්ස පටිලාභා සච්ඡිකා පඤ්ඤත්ති යදිදං භගවා"[1] සි අර්ථ පෙර කී සේ යි.

නෙමිත්තක නාම අතුරෙනුදු මේ ගුණ නෙමිත්ත ය. ඒ ගුණ මේ ගාථායෙන් දැක්වේ.

"භගී භජී භාගී විභත්තවා ඉති
අකාසි භගන්'ති ගරූහි භාග්‍යවා,
බහූහි ඤායෙහි සුභාවිතත්තනෝ
භවන්තගෝ සෝ භගවා ති වුච්චති."

සෝ ගරු භගී ඉති, භජී ඉති, භාගී ඉති, විභත්තවා ඉති, භග්ගං අකාසි ඉති, භාග්‍යවා ඉති, බහූහි ඤායෙහි සුභාවිතත්තනෝ ඉති, භවන්තගෝ ඉති "භගවා" ති වුච්චති යි සම්බන්ධ කරනු.

'ඒ තුන්ලෝ ගුරු වූ ශාස්තෘන් වහන්සේ ඓශ්වර්‍යාදි භෙද ඇති භග ධර්ම ඇත්තේ ය. යන අර්ථයෙන් ද, පන්න සෙතසෙනාදිය භජනය කෙළේ ය යන අර්ථයෙන් ද, අර්ථ - ධර්ම විමුක්ති - රස භාග ඇත්තේ යන අර්ථයෙන් ද, ලෞකික ලෝකොත්තර ධර්ම විභාග කෙළේ ය යන අර්ථයෙන් ද, රාගාදි භෙද කෙළේ ය යන අර්ථයෙන් ද, භාග්‍ය ඇත්තේ ය යන අර්ථයෙන් ද, කාය භාවනාදි අනෙක භාවනා ක්‍රමයෙන් වඩන ලද සිත් ඇත්තේ ය යන අර්ථයෙන් ද, භවයෙහි අන්තයට ගියේ ය යන අර්ථයෙන් ද **භගවත්** යි කියනු ලැබේ. යනු එහි අර්ථ යි. මේ එක් එක් පාදයාගේ අර්ථ **නිද්දේශයෙහි** හි පරිදි දත යුතු

[1] මහා: නි: නිස්සමෙත්තෙය්‍ය සුත්ත 108

තවිද භගවා (භගවත්) යනු මෙසේ ද වර්ණනා කරනු ලැබේ.

"භාග්‍යවා භග්ගවා යුත්තෝ - භග්ගේහි ච විහත්තවා,
භත්තවා වන්තගමනෝ - භවෙසු භගවා තතෝ."

1. භාග්‍යවා 2. භග්ගවා 3. භග්ගේහි යුත්තෝ, 4. විහත්තවා 5. භුත්තවා, 6. භවෙසු වන්ත ගමනෝ. තතෝ සෝ භගවා- යනු සම්බන්ධ යි.

1. **භාග්‍යවා ඉති භගවා** - භාග්‍ය ඇත්තේ නු යි භගවා (භගවත්) නම් වේ. මෙහි භාග්‍ය නම් ලෞකික - ලොකොත්තර සැප නිපදවන දන ශීලාදි පාරමී භාවයට පැමිණි කුසල් ය. (මෙහි භාග්‍ය නම් කුශල ය. එහි මාගී කුශලය ලෞකොත්තර සුඛ නිමිත්තික ය. සෙසු කුශලය ලෞකික සුඛ නිමිත්තික යි. නොහොත් සෙසු කුශලය ද විවතෝපනිශ්‍රය වූයේ පශ්චිමයෙන් ලොකොත්තර සුඛ නිමිත්තික ද වේ." යනු සත්ත යි.) "භාග්‍යං අස්ස අත්ථි" යන වාක්‍යයෙහි "භාග්‍යවා" යි විය යුතු තන්හි නිරුක්ත නයයෙන් හෝ ශබ්ද ශාස්ත්‍ර නයයෙන් "භගවා" යි. විය.

නිරුක්ත නය නම්:-

"වණ්ණාගමෝ වණ්ණ විපරියයෝ ච
දෙවෝ චාපරෝ වණ්ණ විකාර නාසෝ,
ධාත්වත්ථාතිසයෙන යෝග-
සාදුච්චතෙ පඤ්චවිධං නිරුක්තම්." යි

දැක්වුණු පඤ්චවිධ නිරුක්ත ක්‍රමය යි

ශබ්ද ශාස්ත්‍ර නය නම් **"පෘෂෝදරාදීනි යථොපදිෂ්ටම්"** යන පාණිනීය සූත්‍රයෙන් කියන ලද පරිදි වන ව්‍යාකරණ නිපාතන ක්‍රමය යි. (පෘෂත් + උදර යනු යම් සේ නිරුක්ත නයයෙන් හෝ ව්‍යාකරණ නයයෙන් හෝ "පෘෂෝදර" යි සිද්ධ. ද එසේ ම "භාග්‍යවා" යනු "භගවා" යි සිද්ධ යි සේ යි.)

2. **භග්ගවා ඉති භගවා** - බින්දේ නු යි භගවා නම් වේ. කුමක් බින්දේ නු යි ද කෙලෙස ශතසහස්‍රයන් බින්දේ නු යි. කෙලෙස වනාහි එකක - දෝකාදි වශයෙන් නානාවිධ ය.

එකක වශයෙන් - රාග, දෝස, මෝහ, නිත්‍ය මනසිකාර, සුඛ- මනසිකාර, ආත්ම මනසිකාර.

දුවිධ වශයෙන්:- **අහිරික** - අනොත්තප්ප, **කොධ** - **උපනාහ**, **මක්ඛ** - **පලාස**, **ඉස්සා** - **මච්ඡරිය**, **මායා** - **සාඨෙය්‍ය**, **ථම්භ** - **සාරම්භ**, **මාන** - අතිමාන, **මද** - **පමාද**, **තණ්හා** - අවිජ්ජා.

ත්‍රික වශයෙන්:- **ලොභාකුශල මූල** - **දොෂාකුශල මූල** - **මොහා කුශලමූල**; **කාය දුශ්චරිත** - **වාග් දුශ්චරිත** - **මනො දුශ්චරිත**; **තෘෂ්ණා සංක්ලෙශ** - **දෘෂ්ටි සංක්ලෙශ** - **මාන සංක්ලෙශ**; **රාගමල**- **දොෂමල** - **මොහමල**; **රාග විෂම** - **දොෂවිෂම** - **මොහවිෂම**; **කාම සංඥ** - **භව සංඥ** - **විභව සංඥ**; **කාම විතර්ක** - **ව්‍යාපාදවිතර්ක**- **විහිංසාවිතර්ක**; **තෘෂ්ණාප්‍රපඤ්ච** - **දෘෂ්ටිප්‍රපඤ්ච** - **මානප්‍රපඤ්ච**.

චතුෂ්ක වශයෙන්:- **නිත්‍ය සංඥ**- **සුඛ සංඥ**- **ආත්මසංඥ**- **ශුභසංඥ** යන **චතුර්විධ විපරීත**; **කාම**- **භව**- **දිට්ඨි**- **අවිජ්ජා** යන **චතුරාශ්‍රව**; **අභිජ්ජා**- **ව්‍යාපාද**- **සීලබ්බතපරාමාස**- **ඉදං සච්චාභිනිවෙස** යන **චතුර්** ග්‍රන්ථ; **කාමාදි චතුරොඝ**; **කාමාදි චතුයොග**; ඡන්දාදි **සතර අගති**; **චීවරාදි සිව්පස පිළිබඳ වූ සතර තෘෂ්ණොත්පාද**; **කාම**- **දිට්ඨි**- **සීලබ්බත**- **අත්තවාද** යන **සතර උපාදාන**.

පඤ්චක වශයෙන්:- බුද්ධ- ධර්ම- සංඝ- ශික්ෂා පිළිබඳ **සැක හා සබ්රහ්මචාරීන් කෙරෙහි කිපීම්** සංඛ්‍යාත පංච වෙතොඛිල; **කාමයෙහි අවීතරාග**- **කායයෙහි අවීතරාග**- **රූපයෙහි අවීතරාග**- ඛඩපූරා **කා** නිදිසුව විදීම්- දෙවි සිරි පතා බඹසර විසීම් සංඛ්‍යාත පංච චිනිඛන්ධ; **කාමච්ඡන්දාදි** පංච **නීවරණ**; **රූපාභිනන්දනාදි** පංච **අභිනන්දන**.

ෂට්ක වශයෙන්:- කොධ- මක්ඛ- ඉස්සා- සාඨෙය්‍ය- **පාපිච්ඡතා**- **සන්දිට්ඨිපරාමාස** යන **ෂට්** විවාද මූල; **රූප තෘෂ්ණාදි ෂට් තෘෂ්ණා කාය**.

සප්තක වශයෙන්:- **කාමරාග**- භවරාග- පටිඝ- මාන- දිට්ඨි- විචිකිච්ඡා- අවිජ්ජා යන **සප්ත අනුශය**.

අෂ්ටක වශයෙන් **මිථ්‍යාදෘෂ්ටි** ආදි අටයි **මිච්ඡත්ත**.

නවක වශයෙන්:- **තණ්හා**- පරියෙසන- ලාභ- විනිච්ඡය- ඡන්දරාග- අජ්ඣොසාන- පරිග්ගහ- මච්ඡරිය- ආරක්ඛාධිකරණ යන **නව තෘෂ්ණා මූලක**.

දශක වශයෙන්:- **දශ අකුශල**; දශ **කර්මපථ**

ද්වාෂෂ්ටික වශයෙන් – ද්වාෂෂ්ටි දෘෂ්ටි.

අෂ්ට ශත වශයෙන් – අෂ්ට ශත තෘෂ්ණා විචරිත.

මේ ආදි දරථ, පරිඩාහ, කෙලශ ශත සහස්‍රයන් බින්දේ නු සි භගවා නම් වේ. ("ඉතා බලවත් නු වූ හුණු බව දරථ නම. ඉතා බලවත් වූයේ පරිදාහ නම්" යනු සන්න සි.)

තවද සැකෙවින් කියත් හොත් කෙලශ, මාර, ස්කන්ධමාර, අභිසංස්කාර මාර, දෙවපුත්‍ර මාර, මෘත්‍යු මාර යන පස් මරුන් බින්දේ නු සි භගවා නම් වේ. භගවා සි කිය යුතු තන්හි පෙර කී සේ ම භගවා සි විය. ("සමුච්ඡේද ප්‍රහාණ වශයෙන් සමීකාරයෙන් අප්‍රවෘත්ත කරණයෙන් කෙලශ මාරයා ද, සමුදය ප්‍රහාණ පරිඥ වශයෙන් ස්කන්ධ මාරයා ද, සභාය වෛකල්‍ය කරණ වශයෙන්-සමීථා අප්‍රවෘත්ත කරණ වශයෙන් අභිසංස්කරණ මාරයා ද, බල විධමන විෂයාතික්‍රමණ වශයෙන් දෙවපුත්‍ර මෘත්‍යු මාරයන් ද භගන කෙළේ ය යනු අර්ථ සි" යන්න සන්න සි.)

කීයේ මෑ සි:-

"භගහරාගෝ භගහදෝසෝ – භගහමෝහෝ අභාසවෝ
භගහාඝ පාපකා ධම්මා – භගවා තෙන පවුච්චති" සි.

'යම් හෙයකින් ඒ ශාස්තෘන් වහන්සේ බුන් රාග – දෙස – මෝහ ඇති සේක් ද, ආශ්‍රව නැති සේක් ද, සියලු පව් බිඳැ පී සේක් ද එහෙයින් භගවා සි කියනු ලැබේ' යනු අර්ථ සි.

මෙසේ භාග්‍ය ඇත්තේ භගවා; භග්න කෙලශ ඇත්තේ භගවා සි අර්ථ දෙකෙක් දක්වන ලදී. එසින් "භාග්‍ය ඇත්තේ" භගවා යන්නෙන් ශතපුණ්‍යශ්‍රී ලක්ෂණ ධර වූ උත්වහන්සේ රූපකාය සම්පත්තිය ද, "භග්න කෙලශ ඇත්තේ" භගවා යන්නෙත් ධර්මකාය සම්පත්තිය ද දක්වන ලදැ සි දත යුතු. එසේම "භාග්‍ය ඇත්තේ භගවා" සි කීමෙන් සාමාන්‍ය ලෞකික මහාජනයා විසින් බුහුමන් කරනු ලබන බව ද, 'භග්න කෙලශ ඇත්තේ භගවා" සි කීමෙන් පරීක්ෂක ලොකයා විසින් බුහුමන් කරනු ලබන බව ද දැක්වුණේ ය. තවද මූල පෙදෙන් ක්ෂත්‍රියාදි ගෘහස්ථයන් විසින් එළඹිය යුතු බව ද, දෙවෙනි පෙදෙන් තාපසාදි ප්‍රව්‍රජිතයන් විසින් එළඹිය යුතු බව ද, මූල පෙදෙන් එළඹි ගෘහස්ථයන්ගේ කාය පීඩා දුරු කිරීමෙහි පොහොසත් බව ද, දෙවෙනි පෙදෙන් එළඹි පැවිද්දන්ගේ චිත්තපීඩා

දුරුකිරීමෙහි පොහොසත් බව ද, **මුල** පෙදෙන් **තමන්** කරා එළඹියනට ලෞකික සැප දීමෙහි සමර්ථ බව ද, දෙවෙන් පෙදෙන් තමන් කරා එළඹියනට ලොකොත්තර සැප දීමෙහි සමර්ථ බව ද දැක්වුණේ ය.

භගෙහි යුත්තෙතා ඉති භගවා = භග ධර්මයන්ගෙන් යුක්ත වූයේ භගවා (භගවත්) නම් වන්නේ ය. භග ධර්ම නම් භග ශබ්දයෙන් වාච්‍ය වන (අ) ඓශ්වර්‍ය්‍ය, (ආ) ධර්ම, (ඉ) **යශස්**, (ඊ) ශ්‍රී, (උ) **කාම**, (ඌ) ප්‍රයත්න යන ෂට් අර්ථ ය. එහෙයින් කීහ.

"ඓශ්වර්‍ය්‍යස්‍ය සමග්‍රස්‍ය - ධර්ම්‍ස්‍ය යශසඃ ශ්‍රියා
කාමස්‍යාථ ප්‍රයත්නස්‍ය - ෂණ්ණාං භග ඉති ස්මෘතා" යි.

(අ) උත්වහන්සේට සඝකිය චිත්තායෙහි පරම ඊශ්වරත්වය **ඇත්තේ ය.** ("තමා සිත්හු වශීභාවයට **පැමිණවීමෙන් ප්‍රතිකූල** අරමුණෙහි අප්‍රතිකූල සංඥී වැ **විහරණ** සිද්ධිය ද අධිෂ්ඨානාදි ඍද්ධි විධිය ද චිත්ත-භාවනාව ගේ වශීභාව ප්‍රාප්තීන් සිඛ වන බැවින් චිත්තෙශ්වර්‍ය්‍ය නම් භගතේ" යනු සන්නයි.) ලෞකික සම්මත අණිම-ලඝිම ආදි ඓශ්වර්‍ය්‍ය හෝ සම්භාරයෙන් පරිපූර්ණ වැ ඇත්තේ ය. ("ආදි ශබ්දයෙන් මහිම, පත්ති, ප්‍රාකම්‍ය, ඊසතා වසිතා, යත්‍රකාමාවසායිතා යන මේ සදෙන සංගෘහීතයෝ යි. (ඉහි කායයාගේ අනුභාව කිරීම අණිම නම් වේ. (අණු නම් කුඩා) ලඝු බව- සැහැල්ලු බව ලඝිම නම් වේ. ආකාශයෙහි **පදසාග**මනාදීන් මහත්බවය මහිම නම් වේ. ඒ මහිමයෙන් ඉෂ්ට දෙශයට ප්‍රාප්තිය පත්ති නම්. අධිෂ්ඨානාදි වශයෙන් ඊප්සිත **නිෂ්පාදනය ප්‍රාකම්‍ය** නම්. වසඟ බව - ඊශ්වරභාවය ඊප්සිත **නම්.** ඍද්ධිභාවය වශීභාවය වසිතා නම්. අහසින් යන්නහුගේ හෝ **අනෙක් කිසිවක් කරන්නහුගේ** හෝ යම්කිසි තැනෙක නිමාවට පැමිණීම යථාකාමාවසායිත නම්. කුමාර රූපාදි දර්‍ශනයසිදු කියත්. මේ අෂ්ටවිධ වූ ලෞකික සම්මත ඓශ්වර්‍ය්‍ය භගවත්හු ඍද්ධිවිධ ශ්‍රුතයෙහි ඇතුළත් වූයේ අනන්‍ය සාධාරණ නු යි 'සබ්බාකාරපරිපූරං' යි අර්ථ කිහු" යනු සන්නයි.) ශාසනික වූ හෝ බාහිරක වූ හෝ භග සංඛ්‍යාත ඓශ්වර්‍ය්‍ය ඇත්තේ **භගවා** යි කී නියා යි.

(ආ) ධර්ම නම් ලොකොත්තර ධර්ම ය.

(ඉ) යශස් නම් **විද්‍යමාන** වූ ම ගුණය **කරණ** කොටැ ලැබුණු තුන් ලෝ පතළ - **ඉතා පිරිසිදු** කීර්ති ය.

(ඒ) ශ්‍රී නම් රූපකාය දර්ශනයෙහි ව්‍යාපෘත වූවන්ගේ **මතානුවත් පිණවීමෙහි** සමර්ථ වූ සම්භාරය පරිපූර්ණ සියලු අඞ්ග-ප්‍රත්‍යඞ්ග ගත ශොභා ය.

(උ) කාම නම් සිතූ පැතූ **ආත්ම** හිත හෝ පරහිත හෝ සියල්ල සිදුවන බැවින් එසේ අභීෂ්ට සිද්ධි සංඛ්‍යාත කාම ය.

(ඌ) ප්‍රයත්න නම් සියලු **ලෝකයාගේ** ගෞරව ලැබීමට හේතු වූ සම්‍යක් ව්‍යායාම සංඛ්‍යාත උත්සාහය.

මෙ කී භග ධර්‍ම ඇත්තේ හෝ **භගවා** යි.

විභත්තවා ඉති භගවා = බෙදූ සේක් නු යි භගවා නම් වේ. කුමක් කෙසේ බෙදූසේක් නු යි ද සියලු ධර්‍මයන් කුශල ත්‍රිකාදි - දුකාදි භෙදයෙන් බෙදූසේක් නු යි; කුශලාදි ධර්‍මයන් ස්කන්ධ- ආයතන- ධාතු- සත්‍ය- ඉන්ද්‍රිය- පටිච්චසමුප්පාදාදි භෙද-යෙන් බෙදූ සේක් නු යි; දුඃඛාර්‍යයී සත්‍යය පීඩන- සංඛත- සන්තාප-විපරිනාම යන අර්‍ථ වශයෙන්; සමුදයාර්‍යයී සත්‍යය ආයූහන- නිදාන-සංයොග- පළිබෝධ යන අර්‍ථ වශයෙන් ද; නිරෝධාර්‍යයී **සත්‍යය නිස්සරණ**- විවේක- අසංඛත- අමත යන අර්‍ථ වශයෙන් ද; මාර්ගාර්‍යයීසත්‍යය නීර්‍යාණික- හෙතු- දස්සන- අධිපතෙය්‍ය යන අර්‍ථ වශයෙන් ද බෙදූසේක් නු යි - බෙදූ විභාග කොට වදාළසේක් නු යි භගවා නම් වේ. විභත්තවා යි කිය යුතු තන්හි පෙර සේ භගවා යි විය. (පීඩනාදි අර්‍ථයන්ගේ විස්තාර මතු **ඉන්ද්‍රිය සත්‍ය නිද්දේශයෙහි** ප්‍රකාශ වේ.)

5 **හත්තවා ඉති භගවා** = භජනය කළසේක් නු යි භගවා නම් වේ. කුමක් භජනය කළ සේක් නු යි ද දිව්‍ය විහරණ-බ්‍රහ්මවිහරණ- ආර්‍යවිහරණ යන ත්‍රිවිධ විහරණයෙන් භජනය කළ සේක් නු යි; (දිව්‍ය විහරණ නම් ධ්‍යාන; බ්‍රහ්මවිහරණ නම් මෛත්‍රී- කරුණා- මුදිතා- උපෙක්ෂා; ආර්‍යවිහරණ නම් ඵල-සමාපත්ති) කාය විවේක- චිත්තවිවේක- උපධිවිවේක- යන ත්‍රිවිධ විවේකයන් භජනය කළ සේක් නු යි; (කාමයන් කෙරෙන් වෙන් වූ කාය ඇති බව විසින් ඒකී භාවය කාය විවේක නම්; ප්‍රථම ධ්‍යානාදි වශයෙන් නීවරණාදීන් කෙරෙන් විවික්තාවිත්ත ඇති බව චිත්ත විවේක නම්; ස්කන්ධොපධි ආදි උපධීන් කෙරෙන් වෙන් වූ හෙයින් උපධි විවේක නම් නිවන) සුඤ්ඤත- අප්පණිහිත-අනිමිත්ත යන ත්‍රිවිධ විමොක්ෂයන් භජනය කළසේක් නු යි; අන්‍ය වූ ද ලෞකික- ලෝකොත්තර උත්තරී මනුෂ්‍ය ධර්‍ම හෝ භජනය කළ සේක් නු යි - බහුල කළ සේක් නු යි භගවා නම් වේ. "හත්තවා" යි විය යුතු තන්හි පෙරසේ භගවා යි විය.

6 **භවෙසු වනතගමනෝ හි භගවා** = භවත්‍රයෙහි වමාල තෘෂ්ණා ගමන් ඇත්තේ නු සි භගවා නම් වේ. ''මෙහතස්ස බස්ස මාලා'' යනු ''මේඛලා'' වූ සේ මෙ ද භගවා සි වූයේ ය.

අරහං යනාදි පදයන්ගේ අර්ථ විභාගය සි.

මෙසේ මේ මේ **කාරණයෙන්** ඒ භාග්‍යවතුන් වහන්සේ අතීත්ය, සම්‍යක්සම්බුද්ධ ය, විද්‍යාචරණසම්පන්න ය, සුගත ය, ලොකවිත් ය, අනුත්තර - පුරිෂදම්‍යසාරථි ය, දෙව්මිනිසුන්ට ශාස්තෘ ය, බුඬ ය, භගවත් ය සි බුඬ ගුණ සිහිකරන්ම ඒ යොගිහුගේ සිත රාගයෙන් දොෂයෙන් මොහයෙන් නො පෙළෙන්නේ ය. බුදුගුණ අරමුණු කොටැ ගත් ඔහුගේ සිත එ **කල්හි** ඍජු වැ ම පවත්නේ ය. රාගාදීන් පෙළුමක් නැති බැවින් ඔහුගේ සිතෙහි **කාමච්ඡන්දාදි** නීවරණයෝ විෂකම්භිත වෙති. **කර්මස්ථානය** අභිමුඛ වීමෙන් සිත ඍජු වූ බැවින් විතර්ක - විචාරයෝ බුදු ගුණයට මැ නැඹුරු වැ සිටිති. එසේ බුදු ගුණ විතර්කිතය **කරත්** ම විචාරණය **කරත්** ම උපචාර ධ්‍යානය ගෙනැ දෙනැ බලවත් ප්‍රීතිය උපදනේ ය. සිත ප්‍රීතිමත් බැවින් ප්‍රීතිය ආසන්න කොටැ ඇති පස්සද්ධියෙන් කාය චිත්ත දරථ සන්සිඳෙන්නේ ය. දරථ සන්සිඳීමෙන් **කායික** වූ ද, **චෛතසික** වූ ද සුඛය උපදනේ ය. සුඛිත වීමෙන් සිත බුඬ ගුණ අරමුණු කොටැ මැ සමාධිමත් වන්නේ ය. මෙසේ පිළිවෙළින් පැවැතැ එක් ඇසිල්ලෙහි ධ්‍යානාඞ්ග පහළ වන්නේ ය. (මේ අර්ථය සන්නයෙහි මෙසේ දක්වේ. ''යම් සමයෙක බුදු ගුණ අරමුණු කොට ඇති භාවනා තොමෝ මතු මතුයෙහි වෙසෙස් එළවමින් පවතී ද එසමයෙහි නීවරණයෝ විකම්භිත වෙති. **කිලෙස්හු** සන්සිඳෙත්. සඞ්ගදි ඉදුරෝ සුවිසඳ වෙති. භාවනා ප්‍රගුණ වීමෙන් විතක්ක - විචාරයෝ සාතිසය වැ පවතූ කෘත්‍ය ඇති වැ පවත්නාහු බලවත් ප්‍රීති උපද්දි. ප්‍රීති ආසන්න **කාරණ** කොට ඇති පස්සද්ධි තොමෝ සවිශෙෂ වැ පවත්නී. පස්සද්ධිකාය ඇත්තාහට සමාධිය ආසන්න **කාරණ**කොට ඇති සුඛය තර වැ පවත්නී. සුඛයෙන් අනුබ්‍රූහිත චිත්තය කම්ටහන පිහිටව සි. (මෙසේ අනුක්‍රමයෙන් සුඛභාගයෙහි විතර්කාදීහු මතුයෙහි පටු-පටුතර භාවයෙන් පැවැතැ භාවනාවගේ මධ්‍යම ශමථ ප්‍රතිපත්තීන් ඉදුරන්ගේ එකරස භාවයෙන් ද පටුතම වැ එක කෙණෙහි ධ්‍යානාඞ්ගයෝ උපදිනි දතයුතු සි.)

බුදු ගුණ අරමුණු කොටැ ගත් මේ ධ්‍යානය උපචාර ප්‍රාප්ත ම වේ. අර්පණාප්‍රාප්ත නො වේ. බුඬ ගුණයන්ගේ ගැඹුරු බව ද,

නානාවිධ වූ බුඩගුණ සිහි කිරීමේ අදහස් පහළ වන බව ද එයට හෙතු වශයෙන් සැලකිය යුතු.

("ගැඹුරු දියෙහි හුණු තැවක් මෙන් ගැඹුරු බුදු ගුණෙහි අපිණා විසින් පිහිට නො ලැබෙන බැවිනුදු නොයෙක් බුදු ගුණ සිහිකරනුවහු එක් ගුණයක් සිහි කොටැ අනෙක් ගුණයක් සිහි කිරීමෙහි අභිලාෂ ඇති වැ සිටි හෙයිනුදු අපිණාවට නො පැමිණැ උපචාර ප්‍රාප්ත ධ්‍යාන් වේ" යනු සන්න සි.)

බුදු ගුණ සිහිකිරීම නිසා උපදනා බැවින් මේ ධ්‍යානය **බුඩානුස්මෘතිය සි** ව්‍යවහාර කරනු ලැබේ.

බුඩානුස්මෘතියෙහි ආනිසංස

මේ බුඩානුසමෘතියෙහි යෙදුණු යොගාවචර බුදුන්වහන්සේ කෙරෙහි ගෞරව ඇත්තේ වේ. යටත් පැවතුම් ඇත්තේ වේ. ශ්‍රඩායෙන් ද, සමෘතියෙන් ද, ප්‍රඥයෙන් ද, පුණ්‍යයෙන් ද මහත් බවට පැමිණියේ වේ. නිතර ප්‍රීති – ප්‍රමොද්‍යයෙන් වසන්නේ වේ. කුඩා – මහත් බිය ඉවසන්නේ වේ. දුක් ඉවසීමට සමර්ථ වේ. "බුදුන් හා එක් වැ වසමි" යන අදහස් ඇතියේ වේ. බුඩානුසමෘතිය රඳූ සිටින ඔහුගේ ශරීරය පවා චෛත්‍යයක් මෙන් පිදිය යුතු වේ. ඔහුගේ සිත බුඩ භූමියට නැමුණේ වේ. පාපයක් කරම් යි සිතෙන්නා හා ම බුදුන් අනිමුඛයෙහි සිටිනා සේ පෙනී යන බැවින් පව් කිරීමෙහි ලජ්ජා භය ඇත්තේ වේ. ඉදින් මාගී-ඵල නො ලද්දේ නම් එකාන්තයෙන් මරණින් මතු සුගති ගාමී වේ.

"තසමා හවෙ අප්පමාදං – ඉඩිරාථ සුමෙධසො
එවං මහානුභාවාය – බුඩානුස්සතියා සඳ."

'එසේ හෙයින් මෙසේ මහානුභාව ඇති බුඩානුසමෘතිය සඳහා නුවණැත්තේ නිතර අප්‍රමාදය වඩන්නේ ය.'

බුඩානුස්මෘති භාවනා විධිය සි.

ධම්මානුස්මෘතිය

ධම්මානුසමෘතිය වඩනු කැමැති යොගි විසින් රහසිගත වැ විවෙක වැ හිඳැ ගෙනැ **"ස්වාකඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං**

වෙදිතබ්බා විඤ්ඤූහි"[1] යි පර්‍යාප්ති ධර්මයෙහි ද, නවවිධ ලෝකොත්තර ධර්මයෙහි ද ගුණ මෙනෙහි කළ යුතු. (පර්‍යාප්ති ධර්ම නම් ත්‍රිපිටක පාළි ය. නවවිධ ලෝකොත්තර ධර්ම නම් සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් මාර්ග - ඵල හා නිර්වාණ යි.) මින් **"ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ"** යන පෙදෙන් පර්‍යාප්ති-ලෝකොත්තර යන දෙවිධ ධර්මයන්ගේ ද **"සන්දිට්ඨිකෝ"** ආදි සෙසු පෙදෙන් ලෝකොත්තර ධර්මයන්ගේ ද ගුණ දක්වේ. (පර්‍යාය වශයෙන් පර්‍යාප්ති ගුණ ද දක්වේ ය යි කියත්.)

ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ"

භාග්‍යවතුන් වහන්සේ විසින් පර්‍යාප්ති-ලෝකොත්තර ධර්ම මනා කොටැ දෙශනා කරන ලද්දේ ය. පර්‍යාප්ති ධර්මය වනාහි ආදි කල්‍යාණ - මැදිබඩ කල්‍යාණ - පරියොසාන කල්‍යාණ බැවින් ද, සාර්ථ - සව්‍යඤ්ජන සර්ව සම්පූර්ණ පිරිසිදු බ්‍රහ්මචර්‍යාව ප්‍රකාශ වන බැවින් ද ස්වාක්ඛාතය - මනා කොටැ දෙශනා කරන ලද වනැ යි දත යුතු. ඒ එසේ මැ යි:- බුදුන් වදාළ එක ගාථාවෙකුදු ශාසන ධර්මය සමන්නාහර බැවින් මූල පෙදෙන් ආදි කල්‍යාණ ය. දෙවැනි තෙවැනි පෙදෙන් මධ්‍යේකල්‍යාණ ය. අවසන් පෙදෙන් පරියොසාන කල්‍යාණ යි. එසේ මැ එකානුසන්ධික සූත්‍රයෙක් නිදානයෙන් ආදි කල්‍යාණ ය. නිගමනයෙන් පරියොසාන කල්‍යාණ ය. සෙස්සෙන් මධ්‍යේකල්‍යාණ යි. නානානුසන්ධික සූත්‍රයෙන් ප්‍රථම අනුසන්ධියෙන් ආදි කල්‍යාණ ය. අවසාන අනුසන්ධියෙන් පරියොසාන කල්‍යාණ ය. සෙස්සෙන් මධ්‍යේ කල්‍යාණ යි. මේ දක්වූණු ත්‍රිවිධ කල්‍යාණතාය සූත්‍රපිටක වශයෙනි.

සූත්‍ර-විනය උභය පිටක වශයෙන් මෙසේ ය:- සූත්‍ර - විනය වනාහි සනිදාන-සඋප්පත්තික වශයෙන් ආදි කල්‍යාණ ය. විනෙය ජනයන්ට අනුරූප බැවින් හා දෙසනු ලබන ශීලාදි අර්ථය අවිපරීත බැවින් හා හෙතු උදාහරණ සහිත බැවින් හා මධ්‍ය වශයෙන් මධ්‍යේකල්‍යාණ ය. අසන්නවුන්ට ශ්‍රද්ධාව උපදවන බැවින් නිගමන වශයෙන් පරියොසාන කල්‍යාණ යි. (ත්‍රිපිටක වශයෙන් ත්‍රිවිධ කල්‍යාණතාය මෙසේ ය.)

සියලු පර්‍යාප්ති ශාසනය එහි අර්ථය වූ ශීල වශයෙන් ආදි කල්‍යාණ ය. සමථ- විදර්ශනා- මාර්ග- ඵල වශයෙන් මධ්‍යේ කල්‍යාණ ය. නිර්වාණ වශයෙන් පරියොසාන කල්‍යාණ යි. තවද ශීල-සමාධි වශයෙන් හෝ ආදි කල්‍යාණ ය. විදර්ශනා - මාර්ග වශයෙන් මධ්‍යේ කල්‍යාණ ය. ඵල - නිර්වාණ වශයෙන් පරියොසාන කල්‍යාණ යි.

---

[1]අ: නි: ඡක්කනිපාත 516

බුද්ධ සුබොධිතායෙන් හෝ ආදිකල්‍යාණ ය. (බුදුන් මහා නුවණ ඇති බැවින් ධර්මය තත් ප්‍රභව හෙයින් ආදි කල්‍යාණය යි කී සේ යි.) ධර්ම සුධර්මිතායෙන් මධ්‍යෙකල්‍යාණ ය. (ධර්ම සුධර්මිතා නම් සංක්ලේශයන්ගේ ප්‍රහාණත්වය හා ව්‍යවදානයාගේ පරිපූර්ණත්වය ගෙනැ දෙන බව යි.) සංඝ සුප්‍රතිපත්තියෙන් පරියෝසාන කල්‍යාණ යි.

ධර්මය අසා ඒ පිණිස පිළිපදනවුන් විසින් අවබොධ කටයුතු අනිසමෙබාධියෙන් හෝ ආදිකල්‍යාණ ය. ("බොධිය වනාහි අනිසමෙබාධිය, ප්‍රත්‍යෙකබොධිය, ශ්‍රාවක බොධිය යි ත්‍රිවිධ වේ. මෙයින් පිටත් අන්‍යථා නිර්වාණාධිගමයක් නැති බැවින්. එහි සියලු ගුණයෙන් අග්‍ර බැවිනුදු සෙසු බොධිවයට මූල බැවිනුදු අනිසමෙබාධිය ආදිකල්‍යාණය යි කිහු" යනු සන්ත යි.) ප්‍රත්‍යෙක බොධියෙන් මධ්‍යෙකල්‍යාණ ය. ශ්‍රාවක බොධියෙන් පරියෝසාන කල්‍යාණ යි. (ඒ බොධි දෙකට හීන බැවිනුදු ශාසන ධර්ම ශ්‍රාවක බොධිය අවසන් කොටැ ඇති බැවිනුදු ශ්‍රාවක බොධියෙන් පරියෝසාන කල්‍යාණය යි කී සේ යි.)

ධර්මය තෙමේ අසනු ලබන්නේ නීවරණ දුරු කිරීමෙන් ශ්‍රවණමාත්‍රයෙනුදු කල්‍යාණ ම ගෙන දෙන්නේ ය. එ බැවින් ආදිකල්‍යාණ ය. පිළිපදිනු ලබන්නේ – සමථ විදර්ශනා සැප ගෙනැ දීමෙන් ප්‍රතිපත්තියෙනුදු කල්‍යාණ ම ගෙනැ දෙන්නේ ය. එ බැවින් මධ්‍යෙකල්‍යාණ ය. පිළිපදනා ලද්දේ ප්‍රතිපත්ති – ඵල නිමි කල්හි අඩඬෙහාපෙක්‍ෂා වශයෙන් ඉෂ්ටාරම්මණාදියෙහි තාදී භාවය ගෙනැ දීමෙන් ප්‍රතිපත්ති ඵලයෙනුදු කල්‍යාණ ම ගෙනැ දෙන්නේ ය. එ බැවින් පරියෝසාන කල්‍යාණ යි.

මෙසේ ධර්මය ආදි මධ්‍යාවශාන කල්‍යාණ බැවින්

සඞාකඛාත යි

සාර්ථ- සබ්‍යඤ්ජන- සම් සම්පූර්ණ පිරිසිදු බ්‍රහ්මචර්‍යාව ප්‍රකාශ කරන බැවින් කෙසේ සඞාකඛාත වන්නේ ද

ත්‍රිවිධ කල්‍යාණ ධර්ම වදාරන බුදුහු යම් ශාසන බ්‍රහ්මචර්‍යාවක් – මාගී බ්‍රහ්මචර්‍යාවක් ප්‍රකාශ කෙරෙද් ද, නානා නයෙන් දක්වද් ද, ඒ උභය බ්‍රහ්මචර්‍යා ම තම තමාට යෙදෙන යෙදෙන පරිදි අර්ථ සම්පත්තියෙන් යුක්ත බැවින් සාර්ථ ය; ව්‍යඤ්ජන සම්පත්තියෙන් යුක්ත බැවින් සබ්‍යඤ්ජන ය. (ශාසන බ්‍රහ්මචර්‍යා නම් ත්‍රිවිධ ශික්‍ෂා හා සියලු පාළි ධර්මය යි. මාගී බ්‍රහ්මචර්‍යා නම් සියලු ශික්‍ෂාවන්ගේ සාරය වූ ශික්‍ෂාත්‍රය සඞ්ගෘහීත ආර්‍ය්‍ය

මාර්ගය යි. මෙයින් ත්‍රිවිධ ශික්ෂා සංඛ්‍යාත ශාසන බ්‍රහ්මචර්‍යාව ද, මාර්ග බ්‍රහ්මචර්‍යාව ද අර්ථ සම්පත්තියෙන් යුක්ත බැවින් සාර්ථ ය. පාළිධර්ම සංඛ්‍යාත ශාසන බ්‍රහ්මචර්‍යාව අර්ථ සම්පත්තියෙන් හා ව්‍යඤ්ජන සම්පත්තියෙන් හා යුක්ත බැවින් සාර්ථ ද, සව්‍යඤ්ජන ද වේ.

(ද්විවිධ බ්‍රහ්මචර්‍යාව **නෙතති** ක්‍රමයෙනුදු සාර්ථ – සව්‍යඤ්ජන පරිදි දක්වති) ඒ ද්විවිධ සාසන – මාර්ග බ්‍රහ්මචර්‍යාව වනාහි සංකාසන, **පකාසන**, විවරණ, විභජන, උත්තානීකරණ, පඤ්ඤත්ති යන සවැදෑරුම් අර්ථයෙන් යුක්ත බැවින් සාර්ථ ය. අක්ඛර, **පද**, ව්‍යඤ්ජන, ආකාර, නිරුත්ති, නිද්දෙස යන ෂඩ්විධ ශබ්ද සම්පත්තියෙන් යුක්ත බැවින් සව්‍යඤ්ජන ය. (සංක්ෂේපයෙන් අර්ථය හැඟවීම **සංකාසනය.** පළමුයෙන් අර්ථය හැඟවීම **පකාසනය** සංක්ෂේපයෙන් කියන ලද්ද විස්තර කිරීම **විවරණය.** පළමු කියන ලද්ද නැවත නැවත බෙදා දක්වීම **විභජනය.** විවරණය තවද ප්‍රකට කොටැ කීම **උත්තානී කරණය.** විභජනය දෘෂ්ටාන්ත දක්වීමෙන් ඇසුවන් සිත සතුටු වන සේ ප්‍රකාරයෙන් හැඟවීම **පඤ්ඤත්තිය.** මෙයින් සංකාසන – පකාසන දෙකින් උද්දෙසය ද, විවරණ – විභජන දෙකින් නිද්දෙසය ද, උත්තානීකරණ-පඤ්ඤත්ති දෙකින් පටිනිද්දෙසය ද දක්වන ලදී. උද්දෙසය උග්ඝටිතඤ්ඤු පුද්ගලයන් සඳහා ය. නිද්දෙසය විපචිතඤ්ඤු පුද්ගලයන් සඳහා ය. පටිනිද්දෙසය ඤෙය්‍ය පුද්ගලයන් සඳහා යි.

අක්ඛර නම් අකුරු යි. "යා-සා" ආදි එක් අකුරක් ඇති පද ද අක්ඛර වසයෙන් ම මෙහි සලකනු ලැබේ. එක් අකුරක් හෝ විභක්ත්‍යන්තවැ අර්ථ ප්‍රකාශ කෙරේ නම් ඒ **පද** යි. දෙවැනි මතයෙහි අකුරු දෙකකින් වැඩි වූයේ පද යි. **ව්‍යඤ්ජන** නම් පද කිපයක් එක් වීමෙන් සැදෙන වාක්‍ය යි. වාක්‍ය විභාග කිරීම **ආකාර** යි. **"පකාරතෝ වාක්‍යවිභාගෝ ආකාරෝ"** යනු එහෙයින් කිහ. නිරුක්ති නම් නිර්වචන ය. **"ඵුසති'න්ති එස්සෝ, වෙදයතීති වෙදනා** යනාදීන් විග්‍රහ දක්වීම නිරුක්ති ය යි සේ යි. නිර්වචනය තවද විස්තර කිරීම නිද්දේශ යි. **නිච්චන විත්ථාරෝපදෙශානනිද්දේශම්"** යි එහෙයින් කිහු. (මේ දෙළොස් වැදෑරුම් අර්ථ – ව්‍යඤ්ජනයන්ගේ විස්තර විභාගය **නෙතතිසඞ්ගහ** යෙහි බලනු

එසේ ම අර්ථගම්භීරත්වයෙන් **හා** ප්‍රතිවෙධ ගම්භීරත්වයෙන් යුක්ත **බැවින්** සාර්ථ ය. ධර්මගම්භීරත්වයෙන් හා දෙශනාගම්භීරත්ව **යෙන්** යුක්ත බැවින් සව්‍යඤ්ජන ය. ("මෙහි අර්ථ නම් පෙළ

අර්ථ ය. ප්‍රතිවෙධ නම් පෙළ හා පෙළ අර්ථයාගේ යථාවබෝධය යි ධර්ම නම් පාළි ය. දෙශනා නම් මනසින් නිශ්චය කළ පෙළ දෙසීම යි. යම් හෙයකින් මේ අර්හාදීහු ඉශාදීන් විසින් මහා සාගරය සේ මන්දබුද්ධීන් විසින් දුරවගාහයෝ ද – නො ලැබිය යුතු පිහිට ඇත්තාහු ද, එහෙයින් ගම්භීර නම් වෙත් " යනු සත්ත යි.) අත්ථපටිසම්භිදා, පටිභානපටිසම්භිදා විෂය බැවින් **සාර්ථ ය.** ධම්මපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා විෂය බැවින් **සව්‍යඤ්ජන යි.** ("මෙහි අර්ථයෙහි ප්‍රභෙද ගත ඥානය අත්ථපටිසම්භිදා නම්. අත්ථ, ධම්ම, නිරුත්ති, පටිසම්භිදාවන් කෙරෙහි ප්‍රභෙදගත ඥානය පටිභාන පටිසම්භිදා නම්. **මේ** පටිභාන පටිසම්භිදාව ද අර්ථ විෂය හෙයින් "අත්ථපටිසම්භිදාවිසයතෝ සාත්ථං" යූහු. අර්ථසම්පත්තිය නැතහොත් පටිභානපටිසම්භිදාව නො වන බැවින් ධර්ම නම් පෙළ ය. නිරුත්ති නම් පාළිපදයන් නිර්ධාරණය කොටැ වවතය යි. එහි ප්‍රභෙදගතඥානයෝ ධර්ම – නිරුක්ති ප්‍රතිසංවිත් නම් වෙත් නු යි. "ධම්ම-නිරුත්ති පටිසම්භිදාවිසයතෝ සව්‍යඤ්ජනං"යි කීහු. ව්‍යඤ්ජනසම්පත්තියක් නැත හොත් ධම්ම නිරුත්ති පටිසම්භිදාවන් නො වන බැවිනි" යනු සත්ත යි.)

පණ්ඩිතයන් විසින් දත යුතු බැවින් පරීක්ෂක ජනයාගේ චිත්තප්‍රසාදය එළවා නු යි **සාර්ථ ය.** ඇදහිය යුතු බැවින් ලෞකික ජනයාගේ චිත්තප්‍රසාදය එළවා නු යි **සව්‍යඤ්ජන යි.**

ගැඹුරු අදහස් ඇති බැවින් **සාර්ථ ය.** නො ගැඹුරු පද ඇති බැවින් **සව්‍යඤ්ජන යි.**

ඌනය යි ඇතුළු කළ යුත්තක් නැති වැ සියල්ලෙන් සම්පූර්ණ බැවින් **සකලපරිපූර්ණ ය.** අධිකය යි බැහැර කළ යුත්තක් නැති වැ සියල්ල නිර්දෝෂ බැවින් පිරිසිදු යි.

තව ද ශීලවිශුද්ධි ආදි සම්‍යක් ප්‍රතිපත්තියෙන් අධිගමය ව්‍යක්ත වන බැවින් සාර්ථ ය. පර්‍යාප්තියෙන් ආගමය ව්‍යක්ත වන බැවින් සව්‍යඤ්ජන ය. ශීලාදි පඤ්චධර්මස්කන්ධයෙන් යුක්ත බැවින් සකලපරිපූර්ණ ය. දෘෂ්ටි – මානාදි උපක්ලේශ නැති බැවින් ද, නිවන් පිණිස පවත්නා බැවින් ද, ලෞකවිෂයයෙහි අපෙක්ෂා නැති බැවින් ද පිරිසිදු යි.

මෙසේ සාර්ථ, සව්‍යඤ්ජන, සකල පරිපූර්ණ, පිරිසිදු බ්‍රහ්මචර්‍යාව ප්‍රකාශ කරන බැවින් ධර්මය **ස්වාඛ්‍යාත** වන්නේ ය.

ස්වාඛ්‍යාත යන්නෙහි තව ද අර්ථ **පක්ෂයෙක්** මෙසේ ය.

බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මයා ගේ අර්ථ විපර්‍යාසයෙක් කිසිකලෙකුදු නො වන්නේ ය. එ බැවින් "සුට්ඨු අක්ඛාත" මොනවට වදාළේ ය යන අර්ථයෙන් **සවාක්ඛාත** වේ.

ඒ එසේ මැ යි :-

අන්‍ය තීර්ථකයන් ගේ ධර්ම පිළිබඳ අර්ථ විපර්‍යාස වේ. ඔවුන් **අනන්තරායිකර** ය යි කී ධර්ම අනන්තරායිකර නොවේ. **නෛර්‍යාණික** ය යි කී ධර්ම නෛර්‍යාණික නො වේ. එයින් ඔවුන්ගේ ධර්ම දුරක්ඛාත ය. සවාක්ඛාත නො වේ. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මයා ගේ අර්ථ එසේ විපර්‍යාස නො වේ. අනන්තරායිකරය යි වදාළ ධර්ම අනන්තරායිකර ම ය. නෛර්‍යාණිකය යි වදාළ ධර්ම නෛර්‍යාණික ම ය. එය කිසි කලෙක වෙනස් නො වන්නේ යි.

මේ දැක්වුණේ පර්‍යාපන්න ධර්මය සවාක්ඛාත පරිදි යි.

ලොකොත්තර ධර්ම වනාහි නිර්‍වාණයට අනුරූප වූ ප්‍රතිපත්තිය ද, ප්‍රතිපත්තියට අනුරූප වූ නිර්‍වාණය ද වදාළ බැවින් සවාක්ඛාත ය. කියේ මැ යි:- **සුපඤ්ඤත්තා බෝ පන තෙන භගවතා සාවකානං නිබ්බාණගාමිනී පටිපදා, සංසන්දති නිබ්බාණං ච පටිපදා ච, සෙය්‍යථාපි නාම ගංගොදකං යමුනොදකෙන සංසන්දති සමෙති, එවමෙව සුපඤ්ඤත්තා බෝ පන තෙන භගවතා සාවකානං නිබ්බාණගාමිනී පටිපදා සංසන්දති නිබ්බාණං ච පටිපදා ච"** යි. 'ඒ භගවත්හු විසින් ශ්‍රාවකයන්ට නිර්‍වාණගාමී ප්‍රතිපදාව මනා කොටැ පණවන ලද්දේ ය. නිර්‍වාණය ද ප්‍රතිපදාව ද සංසන්දනය වේ. සම වේ. කෙසේ ද ගංගාජලය හා යමුනා ජලය හා සංසන්දනය වන්නාක් මෙනි. සම වන්නාක් මෙනි, යනු එහි භාව යි. (මෙයින් මාර්ගී හා නිර්‍වාණ අන්‍යෝන්‍ය අනුරූප බැවින් සවාක්ඛාත බව හැඟවූහ. ඉක්බිති ත්‍රිවිධ ලොකොත්තර ධර්මයන්ගේ සවාක්ඛාත බව දක්වත්.) ආර්‍යමාර්ගී අන්තවයයට නො පැමිණෙ මධ්‍යම ප්‍රතිපදා වූයේ ම මධ්‍යම ප්‍රතිපදා ය යි කියන ලද බැවින් සවාක්ඛාත ය. ආර්‍යඵල සංඝයා කිලෙස් ඇත්තේ ම සංඝයා කෙලෙස් ඇතැයි කියන ලද බැවින් සවාක්ඛාත ය. නිර්‍වාණය ශාස්වත-අමෘත-ත්‍රාණ-ලෙණාදි සවභාව ඇත්තේ ම ශාස්වත-ත්‍රාණ-ලෙණය යි වදාළ බැවින් සවාක්ඛාත යි.

මෙයින් ලොකොත්තර ධර්ම සවාක්ඛාත පරිදි දැක්වුණේ යි.

"සන්දිට්ඨිකෝ"

සන්දිට්ඨිකෝ - යන මෙයින් කිසි තැනෙක ආර්‍යශ්‍රාවකයා ද, කිසි තැනෙක නවලෝකොත්තර ධර්ම ද කියනු ලැබේ. ආර්‍යශ්‍රාවකයා සන්දිෂ්ටික වන්නේ මෙසේ ය. ආර්‍යශ්‍රාවකයා සවකීය සන්තානයෙහි රාගාදීන් නැති කරන බැවින් තමා විසින් ම දැක්ක යුතුය. යන අර්ථයෙන් සන්දිෂ්ටික ය.

වදාළේ මැ සි:- **"රත්තෝ ඛෝ බ්‍රාහ්මණ රාගෙන අභිභූතෝ පරියාදින්න චිත්තෝ අත්තව්‍යාබාධායපි චේතෙති. පරව්‍යාබාධායපි චේතෙති. උභයව්‍යාබාධායපි චේතෙති, චේතසිකංපි දුක්ඛං දෝමනස්සං පටිසංවේදෙති, රාගෙ පහීනෙ නේව අත්තව්‍යාබාධායපි චේතෙති, න පර, න උභයව්‍යාබාධායපි චේතෙති. න චේතසිකංපි දුක්ඛං දෝමනස්සං පටිසංවේදති. එවං පි ඛෝ බ්‍රාහ්මණ සන්දිට්ඨිකෝ ධම්මෝ හොති"**[1] සි. 'බ්‍රාහ්මණය! රාගයෙන් රත් වූ රාගයෙන් අභිභූත වූ රාගයෙන් වළඳනා ලද්දා වූ පුද්ගල තමහට වධ පිණිස ද, මෙරමාහට වධ පිණිස ද, තමා මෙරමා යන උභයපක්‍ෂයට වධ පිණිස ද සිතන්නේ ය. චෛතසික වූත් දුක් දෝමනස් විඳින්නේ ය. රාගය ප්‍රහීණ වූ කල්හි තමහට හෝ මෙරමාහට හෝ ඒ දෙපක්‍ෂයට ම හෝ වධ පිණිස නොසිතන්නේ ය. චෛතසික වූත් දුක් දෝමනස් නො විඳින්නේ ය. බ්‍රාහ්මණය! මෙසේ හෙයින් ධර්ම්ය සන්දිට්ඨික සි යනු එහි අර්ථ සි. මේහි ධර්ම් තම් මාගී ධර්ම් සි දත යුතුය.

නව විධ වූ ම ලොකොත්තර ධර්ම් සන්දිට්ඨික වන්නේ මෙසේ ය.

නව විධ ලොකොත්තර ධර්ම් යම් යම් කෙනෙකුන් විසින් අධිගත තම් ඔවුන් ඔවුන් විසින් පරශ්‍රද්ධායෙන් නො ගොස් ප්‍රත්‍යවෙක්‍ෂණඥානයෙන් තමා විසින් ම දැක්ක යුතු ය. ඒ බැවින් සන්දිෂ්ටික සි.

තව ද ප්‍රශස්ත වූ දෘෂ්ටිය සන්දෘෂ්ටිය සන්දෘෂ්ටියෙන් දිනන්නේ සාන්දෘෂ්ටික ය.

ඒ එසේ මැ සි:- ආර්‍යශ්‍රාවකයා සම්ප්‍රයුක්ත සන්දෘෂ්ටියෙන් ද, ආර්‍යඵල කාරණ වූ සන්දෘෂ්ටියෙන් ද, නිර්‍වාණය විෂය වූ සන්දෘෂ්ටියෙන් ද කෙලෙසුන් දිනන්නේ ය. රටින් දිනන්නා රටසි වන්නා සේ නවවිධ ලොකොත්තර ධර්ම් සන්දෘෂ්ටියෙන් දිනන හෙයින් සාන්දෘෂ්ටික වේ.

---

[1] අ: නි: තිකනිපාත 95

තව ද දෘෂ්ට යනු – දර්ශනය – දැක්ම ය. දෘෂ්ටය ම සංදෘෂ්ට – සංදර්ශනය. සංදෘෂ්ටයට හෙවත් සංදර්ශනයට සුදුසු වූයේ සාංදෘෂ්ටිකය. ලොකොත්තර ධර්ම වනාහි භාවනා ප්‍රතිවෙධ වශයෙන් ද, ප්‍රත්‍යක්ෂ ප්‍රතිවෙධ වශයෙන් ද දක්නා ලබන්නේ ම සසර භය නවත්වා ලයි. එහෙයින් වස්තුයට සුදුසු වූයේ වාස්තුික වන්නා සේ සාංදෘෂ්ටයට සුදුසු වූයේ සාංදෘෂ්ටික වෙයි.

"අකාලිකො"

කල් නො යවා විපාක දෙන්නේ **අකාලික** ය. මෙයින් මාර්ග ම කියනු ලබන බව දත යුතු එහි

විස්තරය මෙසේ ය:- තමාගේ ඵල දීමට කාලයක් නැත්තේ අකාල ය. අකාල ම අකාලික ය. ලෞකික කුශල උපපජ්ජ වශයෙන් හෝ අපරාපරිය වශයෙන් හෝ ඵල දෙයි. දිට්ඨධම්ම වශයෙන් ඵල දෙන්නේ ත් පස් දවස්, සත් දවස් ඉක්මැ ම ඵල දෙයි. ලොකොත්තර කුශල වනාහි එසේ නො වැ අනතුරු වැ ම ඵල දෙයි. මාර්ග චිත්තය ළඟට ම ඵල චිත්තය උපදින්නේ ය.

තව ද ඵල දීමට දුර කාල ඇත්තේ කාලික ය. එ නම් ලෞකික කුසලි. කාලික නො වන්නේ හෙවත් ඵල දීමට දුර කාල නැත්තේ අකාලිකය. මාර්ගයට අනතුරු වැ ම විපාක යි

"එහිපස්සිකො"

එවූ, බලවූ යන මේ විධියට සුදුස්සේ **එහිපස්සික** ය. එ නම් නවලොකොත්තර ධර්ම යි. නවලොකොත්තර ධර්ම වනාහි එකාන්ත යෙන් විද්‍යමාන බැවින් ද, පිරිසිදු බැවින් ද එසේ කීමට සුදුසු ය. කිසිවකුදු නැති හිස් මිට රත්රුවන් ඇතැයි දක්වා එවූ, බලවූ ය යි කීමට නුසුදුසු ය. එසේ ම මළ මූ ඇති මිට කිසිවක් ඇත ද, ඇත්තේ අසුචියක් බැවින් එවූ, බලවූ යි කීමට නුසුදුසුය, වස්තුලීමට නම් සුදුසු ය. ලොකොත්තර ධර්ම වනාහි වලාකුළු රහිත අහස පූර්ණචන්ද්‍රමණ්ඩලය සේ එකාන්තයෙන් විද්‍යමාන බැවින් ද, පඬුවන් පලසෙක ලූ ජෝතිරංගමණිය සේ එකාන්තයෙන් පිරිසිදු බැවින් ද එවූ, බලවූ යයි කීමට සුදුසු ය. එබැවින් ම ඒ **"එහිපස්සික"** යි.

"ඔපනයිකො"

සිත්හි උපනයනය කළ යුත්තේ – එළවිය යුත්තේ – උපදවා ගත යුත්තේ ඔපනයික ය. එ නම් මාර්ග – ඵල යි.

එහි විනිශ්චය මෙසේ ය:- උපනය නම් එළඹීම ය. ගිනි ගත් සිය සළුව හෝ හිස හෝ නොතකා භාවනා වශයෙන් සඤ්ඤානාන යෙහි උපනය කළ යුත්තේ ඔපනයික ය. ඒ කවරේ ද සෝවාන් ආදි මාගී - ඵල ධම් සි. නිබ්බාණය වනාහි තමාගේ සිතින් උපනයයට - ප්‍රත්‍යක්ෂ කිරීම් වශයෙන් ඇලීමට සුදුසු ය යන අර්ථයෙන් ඔපනයික වේ. නැතහොත් නිබ්බාණයට පමුණුවන හෙයින් මාගී ද ප්‍රත්‍යක්ෂ කටයුතු බවට පමුණුවන හෙයින් ඵල හා නිබ්බාණ ද උපනෙය්‍ය ය. උපනෙය්‍ය ම ඔපනයික ය. (මෙයින් නව ලොකොත්තර ම ඔපනයික පරිදි දක්වූහු.)

"පච්චත්තං වෙදිතබ්බෝ විඤ්ඤූහි"

උගසටිතඤ්ඤු ආදි සියලු විඥයන් විසින් තම තමා කෙරෙහි ම දත යුතු. කෙසේ දත යුතු ද මා විසින් මාගී වඩන ලද්දේ ය. ඵල ලබන ලද්දේ ය, නිබ්බාණ සාක්ෂාත් කරන ලද්දේ ය සි දත යුතු.

ඒ එසේ මැ සි:- උපාධ්‍යායයන් මාගී වැඩූ කල්හි ශිෂ්‍යයාගේ කෙලෙස් ප්‍රහීණ නො වේ. උපාධ්‍යායයන්ගේ ඵල සමාපත්තියෙන් ශිෂ්‍යයා සුවසේ නො වසසි. උපාධ්‍යායයන් විසින් සාක්ෂාත් කළ නිබ්බාණය ශිෂ්‍යයා සාක්ෂාත් කරන්නේ නො වෙයි. නව ලොකොත්තර ධම් වනාහි අන්‍යයන්ගේ හිස පැළඳි ආභරණ සේ දක්ක හැකි නො වේ. නුවණ ඇත්තන් විසින් තම තමා සිත්හි ම ලා දක්ක යුතු - චින්තනය කළ යුතු.

මේ ධම්ය අඥයන්ට අවිෂය ය. එතකුදු වුව ද **සඞ්ඝානුස්සති** ය. කුමක් හෙයින් සඞ්ඝානුස්සති ද සන්දිට්ඨික හෙයින් සඞ්ඝානුස්සති ය. අකාලික හෙයින් සන්දිට්ඨික ය. එහිපස්සික හෙයින් අකාලික ය. යමෙක් එහිපස්සික නම් ඒ ඔපනයික සි. මෙසේ ධම් ගුණ සිහිකරන්ත ම ඒ යොගිහුගේ සිත රාගයෙන් වෙෂයෙන් අභිභූත නො වේ. ඔහුගේ සිත එකල්හි ධම්ය අරමුණු කොටැ ම ඍජුත්වයට පැමිණේ. එයින් පෙර කී සේ ම නීවරණ විෂ්කම්භන වේ. ධ්‍යානාඞ්ග උපදී. ධම්ය පිළිබඳ වූ ගුණග්‍රාමය ගැඹුරු බැවින් ද, නානාවිධ ගුණ සිතෙහි නැඟෙන බැවින් ද අජ්ඣාප්‍රාපත නො වේ. උපාචාර ප්‍රාපත ම වේ. ඒ වූ කලී ධම් ගුණ සිහි කිරීමෙන් උපන් බැවින් **ධම්මානුස්සතිය** යන සංඛ්‍යාවට පැමිණේ.

ධම්මානුස්සතියෙහි ආනිසංස

මේ ධම්මානුස්සතියෙහි යෙදුණු යොගී "මෙ බඳු ඔපනයික ධම්යක් දෙශනා කරන්නා වූ ද, මෙ බඳු අඞ්ගයන්ගෙන් යුක්ත වූ ද ශාස්තෘවරයකු අතීතාංශයෙහි ද නො දකිමි. අනුදු නො දකිමි.

ඔවුන් හා සමයෙක් නැතැ"යි ධර්ම ගුණ දර්ශනයෙන් ම තත් දෙශක වූ ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව සහිත වේ. යටත් පැවතුම් ඇත්තේ වේ. ධර්මය කෙරෙහි ගරු බුහුමන් කරන්නේ ශ්‍රද්ධාදියෙන් විපුලත්වයට පැමිණේ. ප්‍රීති ප්‍රමෝද්‍ය බහුල කොටැ ඇත්තේ වේ. භය භෙරව ඉවසා. දුක් ඉවසීමෙහි සමර්ථ වේ. ධර්මය හා එක් වැ වසම් යි යන සිත් පහළ වේ. ධර්ම ගුණානුස්මරණයට සප්‍රාප්ත වූ ඔහුගේ ශරීරය ද චෛත්‍ය ගෘහයක් මෙන් පූජාර්හ වේ. නිරුත්තර වූ ධර්මාවබෝධයට සිත් නැමේ. ශික්ෂා වෘත්තිප්‍රතිලාභයට කාරණයක් පැමිණියේ ද ධර්ම සුධර්මත්වය සිහි වීමෙන් වහා හිරි-ඔතප් පහළ වේ. ඉදින් ලෞකෝත්තර ගුණ නො ලද ද සුගතිපරායන වේ.

"තස්මා හවෙ අප්පමාදං - කයිරාථ සුමෙධසෝ
එවං මහානුභාවාය - ධම්මානුස්සතියා සදා"

'එ බැවින් නුවණැත්තේ මේ සා මහානුභාව ඇති **ධර්මානුස්මෘතිය** සඳහා එකාන්තයෙන් නිතර අප්‍රමාද වඩන්නේ ය,

ධර්මානුස්මෘති භාවනා විධිය යි.

සංඝානුස්මෘතිය

සංඝානුස්මෘතිය වඩනු කැමැති යොගී විසින් යථා කීසේ රහසිගතව වැ විවෙක වැ හිඳ **"සුප්පටිපන්නෝ භගවතෝ සාවකසඞ්ඝෝ, උජුප්පටිපන්නෝ භගවතෝ සාවකසඞ්ඝෝ, ඤායප්පටිපන්නෝ භගවතෝ සාවකසඞ්ඝෝ, සාමීචිප්පටිපන්නෝ භගවතෝ සාවකසඞ්ඝෝ, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා එස භගවතෝ සාවකසඞ්ඝෝ, ආහුනෙය්‍යෝ, පාහුනෙය්‍යෝ, දක්ඛිණෙය්‍යෝ, අඤ්ජලිකරණීයෝ, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා"**[1] යි මෙසේ ආර්‍යසංඝයාගේ ගුණ මෙනෙහි කළ යුතු යි.

"සුප්පටිපන්නෝ භගවතෝ සාවකසඞ්ඝෝ"

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ සුප්‍රතිපන්න ය. සුප්‍රතිපන්න නම් සම්‍යක් ප්‍රතිපදාවට - අනිවර්තී ප්‍රතිපදාවට - අනුලෝම ප්‍රතිපදාවට - අවිරුද්ධ ප්‍රතිපදාවට - ධර්මානුධර්ම ප්‍රතිපදාවට මනාව පිළිපන්නේ ය. (සම්‍යක් ප්‍රතිපදා නම් යහපත් ආර්‍යමාර්ගී ප්‍රතිපත්තිය යි. ඒ යහපත් - ආර්‍යමාර්ගී ප්‍රතිපත්තිය ප්‍රතිපක්ෂ වූ ක්ලේශයන් නැවත නැඟී නො එන සේ දුරු කරන බැවින් අනිවර්තිප්‍රතිපදා නම් වේ. අවබෝධ කෙරී ගත යුතු වූ නිර්වාණයට එකාන්තයෙන් අනුලෝම වන බැවින් අනුලෝම ප්‍රතිපදා නම් වේ.

[1] අ: නි: ඡක්කනිපාත 516

අනුලෝම බැවින්ම විරුද්ධ නොවන බැවින් අවිරුද්ධ ප්‍රතිපදා නම් වේ. නිබ්බාණ ධම්මයට අනුරූප සභාව ප්‍රතිපත්ති බැවින් ධම්මානුධම්ම ප්‍රතිපදා නම් වේ. මෙසේ සම්‍යක් ප්‍රතිපත්තියට පිළිපන් බැවින් ශ්‍රාවක සංඝ සුප්‍රතිපන්න යි. ශ්‍රාවකයෝ නම් භාග්‍යවතුන්ගේ අවවාද අනුශාසනා සකසා අසන්නෝ ය. (කළ වරද දැකැ කරන ධම් දෙශනා අවවාද ය. කළවරද නොදැකැ ආදියෙහි ම කරන ධම් දෙශනා අනුශාසන යි. කළ වරද දැකැ හෝ ආදියෙහි කරන ධම් දෙශනා අවවාද ය. පසු පසු වැ කරන ධම් දෙශනා අනුශාසන යි. ඒ අවවාද අනුශාසනා පරිදි පිළිපැදීමෙන් කායික සිදුවන බැවින් ආර්‍ය භාවයට පමුණුවන ඇසිම සකසා ඇසීම යි. මෙයින් ආර්‍යයෝ ම නිඃශ්‍රේයසයෙන් ශ්‍රාවකයෝ වෙති යි දත යුතු යි) ශ්‍රාවකයන්ගේ සංඝ - සමූහ ශ්‍රාවක සංඝ ය. ආර්‍ය සීල සමානත්වයෙන් හා ආර්‍ය දෘෂ්ටි සමානත්වයෙන් සමූහ භාවයට පැමිණි පිරිස මෙයින් කියනු ලැබේ.

"උජුපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ"
"ඤායපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ"
"සාමීචිපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ"

'භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ උජුපටිපන්න ය'
'භග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ ඤායපටිපන්න ය'
'භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ සාමීචිපටිපන්න ය'

ඒ සම්‍යක් ප්‍රතිපදාව ඍජු ය, ගොමූත්‍ර වංක සේ හෝ වංක නැති බැවින් අවංක ය. චන්ද්‍ර රේඛා වංක සේ වංක නැති බැවින් අකුටිල ය. නගුල් අග වංක සේ වංක නැති බැවින් අජිම්හ ය. එ බඳු ඍජු - අවංක - අකුටිල - අජිම්හ ප්‍රතිපදාවට පිළිපන්නේ **උජුපටිපන්න** ය.

ඒ සම්‍යක් ප්‍රතිපදාව ඤාය ය. ඤාය නම් ආර්‍ය වූ - නිර්දෝෂ උපාය යි. ඒ සම්‍යක්ප්‍රතිපදා සංඛ්‍යාත ආර්‍ය වූ නිර්දෝෂ උපාය යට පිළිපන්නේ **ඤායපටිපන්න** ය. ("අපණ්ණක භාවෙන ඤාය මිති නිබ්බාණං තං වා ඤායති පටිවිජ්ඣති තෙනා ති ඤායෝ" අවිරුද්ධ බැවින් ඤාය යනු නිර්‍වාණය යි. ඒ නිර්‍වාණය යමකින් ප්‍රතිවෙධ කරනු ලැබේ ද එය හෝ ඤායය යි. එනම් සම්‍යක් ප්‍රතිපදාව යි. ආර්‍ය මාර්‍ග ය යි සේ යි.)

ඒ සම්‍යක් ප්‍රතිපදාව සාමීචි ය, සාමීචි නම් සසර දුකින් බැහැරලීමට සමර්ථ ය. සාමීචි සංඛ්‍යාත සසර දුකින් බැහැර ලීමට සමර්ථ ප්‍රතිපදාවට පිළිපන්නේ **සාමීචිපටිපන්න** ය.

මේ දැක්වුණු අර්ථ වශයෙන් මාර්ගස්ථයෝ ම **සුපටිපන්න ය.** ඵලස්ථයෝ වනාහි ඒ සම්‍යක් ප්‍රතිපත්තියෙන් **ලැබගත යුත්ත** ලැබැගත් බැවින් අනීත ප්‍රතිපදාව ගෙනැ **සුපටිපන්නයන සි** දත යුතු.

"මෙසේ ආදි පදයට අර්ථ නිර්දේශ භාවයෙන් සෙසු පදයන් ගේ ද අර්ථ කියා ඉක්බිති සතර පදයන්ගේ අර්ථ ශ්‍රී වූ අර්ථ දක්වති."

සඞ්ඝකම්මාන ධර්ම විනයයෙහි අනුශාසනා පරිදි පිළිපත් බැවින් ද, අවිරුද්ධ ප්‍රතිපදාවට පිළිපත් බැවින් ද **සුපටිපන්න ය.** උභයාන්තයට නො ගොස් මධ්‍යම ප්‍රතිපදාවට පිළිපත් බැවින් ද, කය- වචන- ඔත යන තුන් තන්හි ඇද-කුද දුරු කිරීම පිණිස පිළිපත් බැවින් ද **උජුපටිපන්න ය.** ඤාය නම් නිර්වාණය සි. ඒ ඤාය පිණිස පිළිපත් බැවින් **ඤායපටිපන්න ය.** යම් පරිදි පිළිපත් කෙනෙක් අනුන් විසින් කරනු ලබන උපස්ථානාදි සාමීචියට සුදුසු වෙද් ද එසේ පිළිපත් බැවින් **සාමීචිපටිපන්න සි.**

"යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො, ආහුණෙය්‍යො, පාහුණෙය්‍යො, දක්ඛිණෙය්‍යො, අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස."

'යම් මේ පුරිස යුග සතරෙක් වේ ද පුරුෂ පුද්ගලයෝ අටදෙනෙක් වෙද් ද, භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවක සංඝ ආහුනෙය්‍ය ය. පාහුනෙය්‍ය ය. දක්ඛිණෙය්‍ය ය. අඤ්ජලිකරණීය ය. ලොකයාගේ නිරුත්තර පුණ්‍යක්ෂේත්‍ර සි.

පුරිස යුග **සතර නම්** – **සෝතාපත්ති** මාර්ගස්ථ – ඵලස්ථ **එක්** පුරිස යුගයෙක. **සකෘදාගාමි** මාර්ගස්ථ – ඵලස්ථ **එක්** පුරිස යුගයෙක. අනාගාමි මාර්ගස්ථ – ඵලස්ථ **එක්** පුරිස යුගයෙක. අර්හත් මාර්ගස්ථ – ඵලස්ථ **එක්** පුරිස යුගයෙකි.

පුරුෂ පුද්ගලයෝ අටදෙන නම් තෙලේ සතර යුග වෙන් වෙන් වූවෝ සි. පුරුෂයන්දු පුද්ගලයන්දු එකාර්ථ සි. වෙනෙය්‍ය වශයෙන් මෙසේ එක් කොටැ දැක්වූ ලදි.

යුග වශයෙන් සතරෙක් ද, පුද්ගල වශයෙන් අටෙක් ද වූ මේ භාග්‍යවතුන්ගේ ශ්‍රාවක සංඝ **ආහුනෙය්‍ය ය.** ආහුත යනු ගෙනවුත් දිය යුත්ත ය. දුරින් හෝ ගෙනවුත් සිල්වතුන් කෙරෙහි දිය යුතු සිව්පස ආහුනය සි කී සේ සි. ඒ ආහුනයට

සුදුස්සේ **ආහුණෙය්‍ය** ය. පිළිගැන්වූවනට මහත් ඵල සිඳ කරන බැවිනි. තවද දුර සිටැ හෝ අවුත් සියලු වස්තුව යම් තැනෙක හෝම කළ යුතු ද - පිදිය යුතු ද, ඒ ආහවනීය ය. ශක්‍රාදීන් විසින් පවා හෝම කළ යුතු. පිදිය යුතු දෑතයට සුදුසු වූයේ හෝ ආහවනීය ය. බ්‍රාහ්මණයන්ගේ ආහවනීය නම් වූ ගින්න හෝම කරන ලද්දේ මහත් ඵල දෙන්නේ ය යි ඔව්හු විශ්වාස කරති. එසේ ම සංඝයා ද පූජා ලද්දේ මහත් ඵල දෙන්නේ ය. වදාළේ මෑ යි.

"යෝ ච වස්සසතං ජන්තු - අග්ගිං පරිචරේ වනෙ
එකං පි භාවිතත්තානං - මුහුත්තමපි පූජයෙ
සා යෙව පූජනා සෙය්‍යා - යං චෙ වස්සසතං හුතං"[1]

'යම් මනුෂ්‍යයෙක් ශත වර්ෂයක් මුළුල්ලෙහි වල්හි වසමින් ගිනි දෙවියා පූජා කරන්නේ ද, යම් මනුෂ්‍යයෙක් එක මොහොතකුදු භාවිතාත්මයන් පූජා කරන්නේ ද අර ශත වර්ෂ පූජාවට වඩා මේ මුහුර්ත පූජාව ශ්‍රේෂ්ඨ ය' යනු අර්ථ යි.

සර්වාස්තිවාදි නිකායිකයෝ ආහවනීය යනු ආහුනෙය්‍ය වී යයි කියති. ව්‍යඤ්ජන වශයෙන් එහි මද වෙනසෙක් ඇත ද අර්ථ වශයෙන් සමාන යි.

"පාහුනෙය්‍යෝ"

පාහුන නම් දිශානුදිශායෙන් පැමිණෙන ප්‍රිය මනාප ඥාති මිත්‍රයන් උදෙසා ගෞරවයෙන් පිළියෙළ කළ ආගන්තුක භෝජනය යි. එය ඔවුන්ට නො දී පවා සංඝයාට දිය යුතු ය. සංඝයාම එය පිළිගන්නට සුදුසු ය. සංඝයා බදු පාහුනකයන් නැති බැවිනි.

ඒ එසේ මෑ යි:- සංඝයා වනාහි එක් බුද්ධාන්තරයක් ඉක්ම ගිය කල්හි ම, අසංඛ්‍ය ගණන් කල්ප ඉක්ම ගිය කල්හි ම දැකැ ගන්නට ලැබේ. සෙසු පාහුනකයෝ මුළු දෑ දැක්ක හැකි ය. එසේ ම සංඝයා ප්‍රතිපක්ෂයන් විසින් අසම්මිශ්‍ර ය. ප්‍රිය මනාප බැව් වඩන ශීලාදි ධර්මයෙන් සම්පන්න ය. මෙසේ පාහුනය දෙන්නට සුදුසු ය, පාහුනය පිළිගන්නට සුදුසු ය. යන අර්ථයෙන් සංඝයා **පාහුණෙය්‍ය** වේ. ("ඥාති මිත්‍රයෝ විප්‍රවාසයට ගියාහුදු නොබෝ කලෙකින් ම එති. ඔවුන් කෙරෙහි ප්‍රිය මනාප බව ද අනවස්ථිත ය. ආර්‍ය සංඝයා කෙරෙහි වනාහි කො එසේ නු යි. සංඝ තෙමේ පාහුනෙය්‍ය නම් වේ." යන අභිප්‍රාය යි.

[1] ඛු: ප: සහස්සවග්ග 13

ඇතැම්හු "පාහුනෙයෙය්‍යා" යනු පාහවනීයෝ" යි කියති. සියල්ලට පළමු වැ ගෙන වුත් හොම කළ යුතු ය, පිදිය යුතු ය. යනු එහි අර්ථ යි. සංඝයා පූජාකාරයට සුදුස්සේ ය. සත්ප්‍රකාරයෙන් හෝ පිදිය යුත්තේ පාහවනීය ය. (මූල තන්හි ප කාරය ආදි කමාදී ය දෙවන තන්හි ප්‍රකාරාර්ථ යි.) **පාහුනෙයෙය්‍යා** යනුවු ඒ අර්ථයෙන් කියනු ලැබේ.

"දක්ඛිණෙයෙය්‍යා"

දක්ඛිණා නම් පරලොව සුව තකා දිය යුතු දානය යි. දක්ඛිණාවට සුදුසු වූයේ හෝ දක්ඛිණාවට හිත වූයේ හෝ **දක්ඛිණෙය්‍ය** ය. සංඝයා වනාහි මහත් ඵල කිරීම් වශයෙන් දායකයාව පිරිසිදු කරන්නේ යි.

"අඤ්ජලිකරණීයෝ"

දෙහොත් මුදුණෙහි තබා සියලු ලොකයා විසින් කරනු ලබන අඤ්ජලි කර්මයට සුදුසු වූයේ **අඤ්ජලිකරණීය යි.**

"අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස"

ලොකයාගේ නිරුත්තර පින් කෙත ය. අසදෘශ වූ පින් පල දෙන ස්ථානය යි සේ යි. රජ්ජුරුවන්ගේ හෝ ඇමැතියන්ගේ හෝ හැල් හෝ යව හෝ පැලවෙන තැන රජ්ජුරුවන්ගේ හැල් කෙත ය යව කෙත ය, ඇමැතියන්ගේ හැල්කෙත යව් කෙතය යි කියන්නා සේ සියලු ලොකයාගේ පින් පැලවෙන තැන ලොකයාගේ පින් කෙතය යි කියත්. සංඝයා නිසා ලොකයාගේ නානාවිධ හිතසුව ඵළවන පින් නැහෙන්නේ ය. එහෙයින් සංඝයා **ලොකයාගේ අනුත්තර පුණ්‍යක්ෂේත්‍රය යි.**

මෙසේ **සුපටිපන්නතාදි** සංඝ ගුණ සිහි කරන්නා ම ඒ යොගිහුගේ සිත රාගයෙන්, දෝෂයෙන් මෝහයෙන් අභිභූත නො වන්නේ ය. ඍජු ම වන්නේ ය. එසින් නීවරණ විෂ්කම්භනය වන්නේ ය. නීවරණ විෂ්කම්භනය වන්නා ම එවිට ම ධ්‍යානාඞ්ග උපදනේ ය. සංඝගුණ ගැඹුරු බැවින් ද, නානාවිධ සංඝ ගුණ සිහිවන බැවින් ද ධ්‍යානය අවිණා ප්‍රාප්ත නො වැ උපචාර ප්‍රාප්ත වන්නේ ය. සංඝ ගුණ සිහි කිරීමෙන් ලැබුණු බැවින් මෙය **සංඝානුස්සතිය යි** කියනු ලැබේ.

මේ සංඝානුස්සතිනි භාවනායෙහි යෙදුණු යොගාවචර සංඝයා කෙරෙහි සගෞරව, සප්පතිස්ස වන්නේ ය. ශ්‍රද්ධාදි–

යෙන් විපුලත්වයට පැමිණෙන්නේ ය. ප්‍රීති - ප්‍රමොද්‍ය බහුල වෑ භයභෙරවසහ වෑ දුක් ඉවසීමෙහි ද සමර්ථයෙක් වන්නේ ය. සංඝයා සමග සහවාස සංඥාව ලබන්නේ ය. සංඝානුස්මෘතියෙන් යුත් ඔහුගේ ශරීරය පවා සංඝයා රැස් වූ පොහෝ ගෙයක් මෙන් පූජාර්හ වන්නේ ය. සංඝගුණාධිගමය සඳහා ඔහුගේ සිත නැමෙන්නේ ය. ශික්ෂා ව්‍යතික්‍රමයක් සඳහා සිත නැඟෙන්ම සංඝයා සම්මුඛයෙහි පෙනී ගියා සේ හිරි-ඔතප් එළඹෑ සිටින්නේ ය. මතු ධ්‍යාන - මාර්ග - ඵල නො ලබන්නේ සුගතිගාමී වන්නේ සි.

"තස්මා හවෙ අප්පමාදං - කයිරාථ සුමෙධසෝ,
එවං මහානුභාවාය - සංඝානුස්සතියා සදා."

'මෙසේ හෙයින් මහානුභාව ඇති **සංඝානුස්මෘතිය** සඳහා සුප්‍රාඥ එකාන්තයෙන් අප්‍රමාද වන්නේ සි'

සංඝානුස්මෘති භාවනා විධිය සි.

ශීලානුස්මෘතිය

ශීලානුස්මෘතිය වඩනු කැමති යොගී විසින් රහසිගත වෑ විවෙක වෑ හිඳ **"අහෝ වත මෙ ඉමානි අඛණ්ඩානි, අවිද්දානි, අසබලානි, අකම්මාසානි, භුජිස්සානි, විඤ්ඤුප්පසත්ථානි, අපරාමට්ඨානි, සමාධි සංවත්තනිකානි."** "සාධු! සාධු!! මගේ සිල් අඛණ්ඩ ය, අවිද්ධ ය, අසබල ය, අකල්මාෂ ය, භුජිස්‍ය ය, විඤ්ඤුප්‍රසස්ථ ය, අපරාමට්ඨ ය, සමාධි සංවර්තනිකය'සි අඛණ්ඩතාදි ගුණ වශයෙන් සවකීය සිල් සිහි කළ යුතු. ගිහියා විසින් ගිහි සිල් සිහි කළ යුතු. පැවිද්දා විසින් පැවිදි සිල් සිහි කළ යුතු සි. (අනුන්ගේ සිල් සිහි කෙළේ ප්‍රිය මනාප භාවය එළවන බැවින් හුදෙක් මෛත්‍රියට පදස්ථාන වේ. වෙන වෙනම කම්ටහන් නො වේ. එ බැවින් තමාගේ සිල් සිහි කළ යුතු ය සි කීහ)

ගිහි වූ හෝ පැවිදි වූ හෝ යම්කුගේ ශීලයෙහි කොටස් කැඩුණු වස්ත්‍රයෙක මෙන් මුලින් හෝ අගින් හෝ එක ශික්ෂාපදයකු දු නො කැඩුණේ ද ඒ **අඛණ්ඩ** ය.

මැද සිදුරු වූ වස්ත්‍රයක් මෙන් මැද එක ශික්ෂාපදයකුදු නො බිඳුණේ ද එය **අවිද්ධ** ය.

පිටෙහි හෝ කුසෙහි හෝ නැඟි දික් - වට ආදි සටහන් ඇති කලු - රතු ආදි විසභාග වර්ණයෙන් යුත් ගව දෙනක මෙන් පිළිවෙළින් ශික්ෂාපද දෙක - තුන නො බිඳුනේ ද ඒ **අසබල** ය.

විසභාග බිහුයෙන් විසිතුරු වූ – නිත් ඉසුණු ගව දෙනක මෙන් අතර අතර ශික්ෂාපද නො බිඳුනේ ද එය **අඛණ්ඩ** ය.

තව ද සාමාන්‍ය වශයෙන් කියත් හොත් සප්තවිධ මෛථුනයෙන් හෝ ක්‍රෝධ – උපනාහ ආදි පාප ධර්මයෙන් හෝ අනුපහත වූ සියලු සීල **අඛණ්ඩ** ය, **අවිජිද්‍ර** ය, **අසබල** ය, **අකල්මාෂ** යි.

ඒ අඛණ්ඩාදි ශීල ම තෘෂ්ණා දාසත්වයෙන් මිදී සෛවරී භාවය කරන හෙයින් **භුජිස්‍ය** ය. තෘෂ්ණා දාසත්වයෙන් මිදීම නිවන් අරමුණු කිරීම යි.

බුද්ධාදි නුවණැත්තන් විසින් ප්‍රශංසා කරන ලද හෙයින් **විඤ්ඤුප්පසත්ථ** ය. "මම මේ ශීලයෙන් දෙවියෙක් වන්නෙමි." යනාදීන් තෘෂ්ණායෙන් හෝ "ශීලයෙන් ශුද්ධිය වන්නේ ය" යනාදීන් දෘෂ්ටියෙන් හෝ පරාමර්ශනය නො කරන ලද බැවින් **අපරාමට්ඨ ය.** නැතහොත් "තාගේ ශීලයෙහි මේ මේ දෙස් ඇතැ"යි කිසිවකු විසින් පරාමර්ශනය නො කළ හෙයි බැවින් **අපරාමට්ඨ ය.**

උපචාරසමාධි – අර්පණාසමාධි පිණිස හෝ මාර්ග සමාධි – ඵල සමාධි පිණිස හෝ පවත්නා බැවින් **සමාධිසංවත්තනිකා ය.**

මෙසේ අඛණ්ඩතාදි වශයෙන් සුවකිය සිල් සිහිකරන්නා ම ඒ යොගිහු ගේ සිත රාගයෙන් දෙවෂයෙන් මොහයෙන් අභිභූත නො වන්නේ ය. එවිට ඔහුගේ සිත ඒ අරමුණු කොටැ ඍජු ම වන්නේ ය. ඉක්බිති පෙර කී සේ ඔහුගේ සිතෙහි නීවරණ විෂ්කම්භනය වන්නේ ය. නීවරණ විෂ්කම්භනය වත් ම ධ්‍යානාඞ්ග උපදනේ ය. ශීල ගුණ ගැඹුරු බැවින් ද, නා නා ප්‍රකාර වශයෙන් ශීල ගුණ පිළිබඳ අදහස් පහළ වන බැවින් ද ධ්‍යානය අර්පණා ප්‍රාප්ත නො වැ උපචාර ප්‍රාප්ත ම වන්නේ ය. ශීල ගුණ සිහි කිරීමෙන් උපන් බැවින් එයට **ශීලානුස්මෘතිය** යි කියනු ලැබේ.

මේ ශීලානුසම්‍රතියෙහි යෙදෙන යොගාවචර ශික්ෂායෙහි ගෞරව කරන්නේ ය. සිල්වතුන් හා සහාග පැවතුම් ඇතියෙක් වන්නේ ය. ධර්මාමිෂ පරිත්‍යාගයෙහි නො පමා වන්නේ ය. අත්තානුවාදාදි බියෙන් මිදුණේ වන්නේ ය. සවලජ මාත්‍ර වරදෙහි ද බිය සුලු වන්නේ ය. ශ්‍රද්ධාදීන්ගේ විපුලත්වයට පැමිණෙන්නේ ය. ප්‍රීති – ප්‍රමොද්‍ය බහුල වන්නේ ය. මතු මාර්ග – ඵල නො ලබන්නේ සුගති පරායණ වන්නේ යි.

"තස්මා හවෙව අප්පමාදං - භාසිරාථ සුමේධසෝ
එවං මහානුභාවාය - සීලානුස්සතියා සදා."

'මෙසේ හෙයින් ශීලානුස්මෘතිය සඳහා සුප්‍රාඥ ඇම් කල්හි අප්‍රමාද වන්නේ සි'

ශීලානුස්මෘති භාවනා විධිය සි.

ත්‍යාගානුස්මෘතිය.

ත්‍යාගානුස්මෘතිය වඩනු කැමති යොගී විසින් සවභාවයෙන් ම දන් දීමෙහි සැදුණකු පැහැදුණකු විය යුතු. දන් දීමෙහි-දානසංවිභාගයෙහි නිතර යෙදුණකු විය යුතු.

තව ද ත්‍යාගානුස්මෘති භාවනාව වඩනු කැමැති යොගී විසින් ඒ භාවනාව ආරම්භ කරන දිනයෙහි "දැන් ඉතින් මෙ තැන් පටන් ප්‍රතිග්‍රාහකයකු ලදහොත් එක් පිඩකුදු නො දී නො වළඳමි"යි සමාදන් වැ ගෙනැ එ දින ම ගුණවත් ප්‍රතිග්‍රාහකයකු හට සවකීය ශක්‍යති පරිදි - සවකීය බල පරිදි දානයක් දී ඒ දුන් දානය නිමිති කොටැ ගෙනැ රහසිගත වැ විවේක වැ හිඳැ **"ලාභා වත මෙ! සුලද්ධං වත මෙ! සොහං මවෙජ්ජරමලපරියුට්ඨිතාය පජාය විගතමලමච්ඡේරෙන චෙතසා විහරාමි මුත්තචාගො පයත පාණී වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො[1]"**යි මෙසේ විගතමලමච්ඡරතාදි ගුණ වශයෙන් සවකීය ත්‍යාගය මෙනෙහි කළ යුතු සි.

ලාභා වත මෙ=මට එකාන්තයෙන් ලාභයෙක. **"ආයුං හෙ පන දත්වා ආයුස්ස භාගී හොති දිබ්බස්ස වා මානුසස්ස වා."**[2] 'ආයුෂ දී දිව්‍යමය වූ ද, මනුෂ්‍යමය වූ ද ආයුෂයට භාගී වන්නේ ය' යනාදි වශයෙන් ද **"දදං පියො හොති භජන්ති නං බහූ"**[3] 'දන්දෙන්නේ ලොවට ප්‍රිය වන්නේ ය, ඔහු බොහෝ දෙන භජනය කරන්නාහ' යනාදි වශයෙන් ද **"දදමානො පියො හොති සතං ධම්මමනුක්කමං"**[3] 'සත්පුරුෂයන්ගේ ධර්‍මය නො ඉක්මවන්නේ - දන් දෙන්නේ ලොවට ප්‍රිය වන්නේ ය' යනාදි වශයෙන් ද භගවත් බුදුන් විසින් දන් දෙන්නහු පිළිබඳ යම් ලාභ කෙනෙක් වර්ණනා කරන ලද නම් ඒ ලාභ මට එකාන්තයෙන් වන්නේ ය යන අදහස සි.

---

[1] අ: නි: ඡක්කනි: 517 [2] අ: නි: පඤ්චකනි: 371
[3] අ: නි: පඤ්චකනි 370

සලද්ධං වත මෙ= 'මා විසින් යම් බුදු සස්නෙක් හෝ මිනිසත් බවෙක් හෝ ලබන ලද නම් එය එසානන්තයෙන් මනා වැ ලබන ලද්දේ ය, කුමක් හෙයින් ද මසුරුමලින් අභිභූත සත්ත්වයන් අතුරෙහි මම මසුරුමලින් මිදී ගත් සිතින් වසම් මුත්තවාගයෙම්, පයතපාණියෙම්, වොස්සගහරතයෙම්, යාවයොග-යෙම්, දාන සංවිභාගරතයෙම්, එ හෙයිනි.

සො' හං = ඒ මම.

මච්ඡරමල පරියුට්ඨිතාය පජාය = මසුරුමලෙන් අභිභූත වූ සත්ත්වයන් අතුරෙහි (සවකීය සම්පත් අන්‍යයන් හා සාධාරණ බව නො ඉවසීම **ලක්ඛණ** කොටැ ඇති මසුරු බව සිතෙහි දීප්තිය දූෂ්‍ය කරන පාප ධර්ම අතුරෙන් එකක් බැවින් මලය යි කියනු ලැබේ.)

විගතමල මච්ඡරෙන චෙතසා විහරාමි = සෙසු රාගදෙසාදි මල ද මසුරු බව ද විගත වූ සිතින් යුතු වැ වාසය කරමි. **මහානාම සූත්‍රයෙහි** වනාහි, **"විගතමල මච්ඡරෙන චෙතසා අගාරං අජ්ඣාවසාමි"**[1] යි වදාළේ ය. එහි එසේ වදාළෙ **මහානාම** ශාක්‍යයා විසින් සෝවාන් වූවහුගේ නිශ්‍රය විහාර විවාළ බැවින් එයට අනුරූප වශයෙනි.

මුත්තචාගො = දෙන දෙය අල්ලා නො ගැනීම් වශයෙන් මුදා හරින ලද ත්‍යාග ඇත්තේ. යමෙක් කිසිවක් දෙන්නේ සාපෙක්ෂ වැ දේ නම් ඒ මුත්තචාග නො වේ.

පයතපාණි = පිරිසිදු කර ගත් අත් ඇත්තේ. සියතින් සකසා දන්දෙනු පිණිස ඇම දා සෝදා ගත් අත් ඇත්තේ ය යි සේ යි.

වොස්සගහරතො = වොස්සගහයෙහි ඇළෙණේ. වොස්සගහ නම් පරිත්‍යාගය යි. සතතාභියොග වශයෙන් පරිත්‍යාගයෙහි ඇළෙණේ ය යි සේ යි.

යාවයොගො = අන්‍යයන් විසින් ඉල්ලූ දෙය දෙන බැවින් යාවතයට යොග්‍ය ය "යාජයොග" යි ද මේ ලියති. යජනයෙන්-දීමෙන් යුක්ත වූ යේ ය. යනු අර්ථ යි.

දාන සංවිභාගරතො = දානයෙහි ද, සංවිභාගයෙහි ද ඇළෙණේ මම දන් ද දෙමි. මා විසින් පරිභොග කළ යුත්තෙන් කොටස් ද බෙදම් යි මෙසේ දෙක්හි මැ ඇළෙණේය යි සේ යි.

---

[1]අ: නි: ඡක්කනි 517

මෙසේ විගතමල මචේඡරතාදි වසයෙන් සවකීය ත්‍යාග ගුණය සිහි කරත් ම ඒ යොගිහුගේ සිත රාගයෙන් දොෂයෙන් මොහයෙන් අභිභූත නො වන්නේ ය. ත්‍යාගය අරමුණු කොටැ ඔහුගේ සිත එ කල්හි ඍජු වන්නේ ය. පෙර සේ නීවරණ විෂ්කම්භනය වත් ම ධ්‍යානාඞ්ග උපදනේ ය. ත්‍යාග ගුණ ගැඹුරු බැවින් ද 'නානාවිධ ත්‍යාග ගුණ සිහි වන බැවින් ද ධ්‍යානය අප්පණා ප්‍රාප්ත නො වැ උපචාර ප්‍රාප්ත ම වන්නේ ය. ත්‍යාග ගුණය සිහි කිරීමෙන් ලත් බැවින් එය ත්‍යාගානුස්සතිය යි කියනු ලැබේ.

මේ ත්‍යාගානුස්සතියෙහි යෙදුණු යොගාවචර බොහෝ සෙයින් ත්‍යාගාධිමුක්ත වේ. නිර්ලෝභ අදහස් ඇත්තේ වේ. මෛත්‍රියට අනුලොම් වැ හැසිරේ. විශාරද වේ. ප්‍රීති ප්‍රමොද්‍ය බහුල වේ. මතු ධ්‍යාන-මාර්ග-ඵල නො ලබන්නේ සුගති පරායන වේ.

"තස්මා හවෙ අප්පමාදං – කයිරාථ සුමෙධසො
එවං මහානුභාවාය – චාගානුස්සතියා සදා."

'එසේ හෙයින් මහත් අනුභාව ඇති ත්‍යාගානුස්සතිය සඳහා සුප්‍රාඥ එකාන්තයෙන් අප්‍රමාද වන්නේ ය'

ත්‍යාගානුස්සති භාවනා විධිය සි.

දෙවතානුස්සතිය.

දෙවතානුස්සතිය වඩනු කැමැති යොනි ආර්‍ය්‍ය මාර්ග වශයෙන් අධිගත ශ්‍රද්ධාදි ගුණයෙන් යුක්ත විය යුතු. එසේ වූ ඔහු විසින් රහසිගත වැ විවෙක වැ හිඳැ 'චාතුම්මහාරාජික නම් දෙවියෝ ඇත්තාහ. තාවතිංස නම් දෙවියෝ ඇත්තාහ. යාම – තුසිත – නිම්මාණරති – පරනිම්මිතවසවත්ති නම් දෙවියෝ ඇත්තාහ. බ්‍රහ්මකායික දෙවියෝ ඇත්තාහ. එයින් මතු පරිත්තාභාදි තව ද දෙවියෝ ඇත්තාහ. යම් බදු වූ ශ්‍රද්ධාවෙකින්, ශීලයෙකින්, ශ්‍රුතයෙකින්, ත්‍යාගයෙකින්, ප්‍රඥාවෙකින් සමන්විත වැ ඒ දෙවියෝ මෙයින් චුත වැ එහි උපත්තාහු ද මට ද එ බදු වූ ශ්‍රද්ධා-ශීල-ශ්‍රුත-ත්‍යාග-ප්‍රඥ ඇත්තේ ය' යි මෙසේ දෙවියන් ගෙහි සිත තබා තමන් ගේ ශ්‍රද්ධාදි ගුණ සිහි කළ යුතු සි.

සූත්‍රයෙහි.- **"යස්මිං මහානාම සමයෙ අරියසාවකො අත්තනො ච තාසං ච දෙවතානං සද්ධං ච සීලං ච සුතං ච**

චාගං ච සඤ්ඤං ච අනුස්සරති, නෙව තස්මිං සමයෙ රාග පරියුට්ඨිතං චිත්තං හොති"[1] 'මහානාමය! යම් කලෙක ආර්ය-ශ්‍රාවක තමාගේ ද, ඒ දෙවියන්ගේ ද ශ්‍රද්ධා - ශීල - ශ්‍රැත - ත්‍යාග-ප්‍රඥා සිහි කෙරේ ද එකල ඔහුගේ චිත්තය රාගාභිභූත නො වේ' ය යි වදාළ තමුදු දෙවියන්ගේ ඒ ශ්‍රද්ධාදි ගුණ ශාඨ්‍ය කොටැ ගත යුතු යි. සූත්‍රයෙහි එසේ වදාළේ දෙවියන්ගේ ශ්‍රද්ධාදි ගුණ තමාගේ ශ්‍රද්ධාදි ගුණ හා සම බව දක්වනු පිණිස ය **"දෙවතා සක්ඛිට්ඨානෙ ඨපෙත්වා අත්තනොා ගුණෙ අනුස්සරති."** 'දෙවියන් ශාඨ්‍ය තන්හි තබා තමා ගුණ සිහි කෙරේය' යි අට්ඨවාසයෙහි එය සංක්ෂිප්ත වශයෙන් කියන ලදී. එකෙසින් දෙවියන් ගේ ශ්‍රද්ධාදි ගුණ සිහි කොටැ පසු වැ තමාගේ ශ්‍රද්ධාදි ගුණ සිහි කළ යුතු යි. එසේ සිහි කරත් ම ඔහු ගේ සිත රාගයෙන්, ද්වේෂයෙන්, මෝහයෙන් අභිභූත නො වේ. එකල දෙවියන් අරබයා ඔහුගේ සිත සෘජු ම වේ. එසින් පෙර කී සේ නීවරණ විෂ්කම්භන වේ. එවිට ම ධ්‍යානාඞ්ග උපදී. ශ්‍රද්ධාදි ගුණ ගැඹුරු බැවින් ද, නානාවිධ ගුණ සිහිවන බැවින් ද ධ්‍යානය අර්පණා ප්‍රාප්ත නො වැ උපචාර ප්‍රාප්ත ම වන්නේ ය. එය වනාහි දෙවියන්ගේ බඳු තමන්ගේ ගුණ සිහි කරන බැවින් **දෙවතානුස්මෘතිය** යි කියනු ලැබේ.

දෙවතානුස්මෘතිය වඩන යොගාවචර දෙවියන්ට ප්‍රිය වේ. මනාප වේ. බොහෝ සෙයින් ශ්‍රද්ධාදීන්ගේ විපුලත්වයට පැමිණේ. ප්‍රීති - ප්‍රමොද්‍ය බහුල වැ වෙසේ. මතු ධ්‍යාන මාර්ග - ඵල නො ලබන්නේ-සුගති පරායන වේ.

"තස්මා හවෙ අප්පමාදං - කඞ්ඛිරාථ සුමෙධසො
එවං මහානුභාවාය - දෙවානුස්සතියා සදා."

'එසේ හෙයින් මහානුභාව ඇති දෙවතානුස්මෘතිය සඳහා සුප්‍රාඥ එකාන්තයෙන් අප්‍රමාද වන්නේ යි.'

දෙවතානුස්මෘති භාවනා විධිය යි.

ඡානුස්සතිය පිළිබඳ විශෙෂ විභාගයෙක්.

මේ ඡානුස්සතිය පිළිබඳ විස්තාරයක් මහානාම සූත්‍රයෙහි වදාළේ ය. එහි බුද්ධානුස්සතිය වදාළ තන්හි **"උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති තථාගතං ආරබ්භ"**[2] එකල ඔහුගේ සිත තථාගතයන් අරබයා සෘජු ම වන්නේ ය.

---

[1] අ: නි: ඡක්කනි: 517 [2] අ: නි: ඡක්කනි: 516

යනාදීන් වදාරා ඉක්බිති **"උජුගතචිත්තා බෝ පන මහානාම අරියසාවකෝ ලභති අත්ථවෙදං, ලභති ධම්මවෙදං, ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං, පමුදිතස්ස පීති ජායති"**[1] යනාදීන් වදාළේ ය. 'මහානාමය! සෘජු සිත් ඇති ඒ ආර්‍ය ශ්‍රාවක **අත්ථවෙදය** ලබන්නේ ය. **ධම්මවෙදය** ලබන්නේ ය. **ධම්මූපසංහිත පාමුජ්ජය** ලබන්නේ ය. පමුදිතයාහට **ප්‍රීතිය** උපදනේ ය' යනු එහි අර්ථ යි.

"අත්ථවෙදය" නම් **"ඉති පි සෝ භගවා"** යනාදියෙහි අර්ථය නිසා උපදින සන්තෝෂය යි.

"ධම්මවෙදය" නම් එහි පාළිය නිසා උපදින සන්තෝෂය යි.

"ධම්මූපසංහිත පාමුජ්ජය" නම් ඒ අර්ථ - ධර්ම දෙක ම නිසා උපදින සන්තෝෂය යි.

දෙවතානුස්මෘතියෙහි දෙවියන් අරභයා යි වදාළේ පළමු කොටැ දෙවියන් අරබයා පැවැති සිත් වශයෙනි. නොහොත් දෙවියන්ගේ ගුණ බඳු වූ හෝ දිව්‍යභාවය **නිපදවන්නා** වූ හෝ තමාගේ ගුණ අරභයා පැවැති සිත් වශයෙනි.

මේ ඡානුස්සති සමෘද්ධ වන්නේ ආර්‍ය ශ්‍රාවකයන්ට ම ය. කුමක් හෙයින් ද බුද්ධ - ධර්ම - සංඝ ගුණ ප්‍රකට වන්නේ ඔවුන්ට ම බැවිනි. අඛණ්ඩ - අවිච්ඡ්‍රාදි ගුණ ඇති ශීලයෙන් යුක්ත වන්නෝත් විගතමල මවෙඡර වූ ත්‍යාගයෙන් යුක්ත වන්නෝත් මහානුභාව ඇති දෙවියන්ගේ ගුණ බඳු ශ්‍රද්ධාදි ගුණයෙන් යුක්ත වන්නෝත් ඔවුහු ය **මහානාම සූත්‍රයෙහි** ද **ගෙධ සූත්‍ර** යෙහි ද **සම්බාධෝ-කාස සූත්‍ර**යෙහි ද **උපෝසථ සූත්‍ර**යෙහි ද **එකාදස නිපාත** යෙහි ද මේ වදාළේත් ඔවුන් අරභයා ය. එබැවින් ඡානුස්සති සමෘද්ධ වන්නේ ආර්‍ය ශ්‍රාවකයන්ට ම ය යි දත යුතු යි. **මහානාම සූත්‍ර**යෙහි සෝවාන් පුද්ගලයාගේ නිශ්‍රය විහාර කෙසේ ද යි විචාරන ලද **බුදුරජාණන්** විසින් ඒ දැක්වීම සඳහා ම මේ ඡානුස්සති විස්තර වශයෙන් වදාරන ලද්දේ ය.

ගෙධ සූත්‍රයෙහි:- **ඉධ භික්ඛවෙ අරියසාවකෝ තථාගතං අනුස්සරති, ඉති පි සෝ භගවා - පෙ - උජුගත මේ වස්ස තස්මිං සමයෙ චිත්තං හොති, නික්ඛන්තං මුත්තං වුට්ඨි-**

[1] අ. නි: ඡක්කනි: 516

තං ගෙඛමඤ්ඤා. ගෙඛො'නි ඛො භික්ඛවෙ පඤ්චන්නමෙතං කාමගුණානං අධිවචනං ඉදම්පි ඛො භික්ඛවෙ ආරම්මණං කරිත්වා එවම්ඵෙකච්චෙ සත්තා විසුජ්ඣන්ති"[1] යි අනුස්මෘති වශයෙන් ආර්‍ය්‍යශ්‍රාවකයාගේ සිත පිරිසිදු කොට මතු පරමාර්‍ථ විශුද්ධිය ලැබෑ ගන්නා පිණිස වදරන ලද්දේ ය. මහණෙනි! මේ සසුන්හි ආර්‍ය්‍ය ශ්‍රාවක **"ඉති පි සො භගවා"** යනාදීන් තථාගතයන් වහන්සේ සිහි කරන්නේ ය. එසේ සිහි කරන විට ඔහුගේ සිත සෘජු වන්නේ ය. ගෙඩයෙන් නික්මෙන්නේ ය. මිදෙන්නේ ය. තැති සිටින්නේ ය. මහණෙනි! ගෙඩ යනු පඤ්චකාම ගුණයන්ට නමෙකි. මහණෙනි! මේ අරමුණු කොටැ ද මෙලොව ඇතැම් සත්ත්වයෝ විශුද්ධ වෙති, යනු එහි අර්‍ථ යි.

සම්බාධොඛාස සූත්‍රය මහාකාත්‍යායන සවාමීන් විසින් වදරන ලද්දෙකි එහි **"අච්ඡරියං ආවුසො! අබ්භුතං ආවුසො! යාවඤ්චිදං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මා-සම්බුද්ධෙන සම්බාධෙ ඔකා සාධිගමො අනුබුද්ධා සත්තානං විසුද්ධියා - පෙ - නිබ්බාණස්ස සච්ඡිකිරියාය යදිදං ඉ අනුස්ස-තිට්ඨානානි. කතමානි ඉ? ඉධාවුසො අරියසාවකො තථාගතං අනුස්සරති - පෙ - එවම්ඵෙකච්චෙ සත්තා විසුද්ධිමමා භවන්ති**[2] යි ආර්‍ය්‍ය ශ්‍රාවකයා හට ම පරමාර්‍ථ විසුදුකි ධර්‍මය පිණිස ඔකාසාධිගම වසයෙන් කියන ලද්දේ ය. 'ඇවැත්නි ආශ්චර්‍ය්‍ය ය! ඇවැත්නි අද්භූත ය! සියල්ල දන්නා ඒ අර්‍හත් සම්මා සම්බුදුන් විසින් සත්ත්වයන්ගේ විශුද්ධිය පිණිස - නිර්‍වාණාවබෝධය පිණිස මේ අනුස්සතිට්ඨාන සය මැනැවින් වදරන ලද්දේ ය. කවර සයෙක් ද යත්? ඇවැත්නි! මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක **"ඉති පි සො"** යනාදීන් තථාගතයන් වහන්සේ සිහි කෙරෙයි. -පෙ- මෙසේ මේ ලොකයෙහි ඇතැම් සත්ත්වයෝ විශුද්ධ වෙති.' යනු එහි සංක්ෂිප්ත අර්‍ථ යි.

උපොසථ සූත්‍රයෙහි - "කථඤ්ච විසාඛෙ අරියූපොසථො හොති? උපක්කිලිට්ඨස්ස විසාඛෙ චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති. කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති? ඉධ විසාඛෙ අරිය සාවකො තථාගතං අනුස්සරති."[3] යනාදීන් පෙහෙව ගත් ආර්‍ය්‍ය ශ්‍රාවකයා හට ම චිත්ත විශොධන කර්‍මස්ථාන වශයෙන් පෙහෙවිස්සි මිහත් ඵල බව දක්වනු සඳහා වදරන ලද්දේ ය.

---

[1]අ: නි: ඡක්කනි: 531 -- [2]අ: නි: ඡක්කනි: 532.
[3]අ නි: තිකනිපාත 126.

විශාඛාවෙනි! ආර්‍ය්‍ය උපොසථය වන්නේ කෙසේ ද විශාඛාවෙනි! කිලිටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු වන්නේ ය. විශාඛාවෙනි! කිලිටි වූ සිත කෙසේ උපක්‍රමයෙන් පිරිසිදු වන්නේ ද විශාඛාවෙනි! මේ සසුන්හි ආර්‍ය්‍ය ශ්‍රාවක **"ඉතී පි සෝ භගවා"** යනාදීන් තථාගතයන් වහන්සේ සිහි කරන්නේ ය' යනු එහි අර්ථ යි.

එකාදස නිපාතයෙහි - "සද්ධා මහානාම ආරාධකෝ හොති නෝ අස්සද්ධා, ආරද්ධවිරියෝ, උපට්ඨිතසති, සමාහිතෝ, පඤ්ඤවා මහානාම ආරාධෙතා හොති නෝ දුප්පඤ්ඤෝ. ඉමෙසු ඛෝ තුවං මහානාම පඤ්චසු ධම්මෙසු පතිට්ඨාය ඡ ධම්මෙ උත්තරිං භාවෙය්‍යාසි. ඉධතුවං මහානාම තථාගතං අනුස්සරෙය්‍යාසි ඉතී පි සෝ භගවා"[1] යනාදීන් ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ ම විහරණ දක්වීම පිණිස වදාළේ ය.

"මහානාමය! ශ්‍රද්ධා ඇත්තේ ආරාධක වේ. ශ්‍රද්ධා නැත්තේ ආරාධක නො වේ. පටන් ගත් වීර්‍ය්‍ය ඇත්තේ, එළැඹ සිටි සිහි ඇත්තේ, සමාධිමත් වූයේ, ප්‍රඥ ඇත්තේ ආරාධක වේ. හළ වීර්‍ය්‍ය ඇත්තේ, මුළා සිහි ඇත්තේ, විභ්‍රාන්ත සිහි ඇත්තේ, ප්‍රඥ රහිත වූයේ ආරාධක වේ. මහානාමය! තෝ මේ පස් දහමෑ පිහිටා මතු සදහම් වඩ. මහානාමය! තෝ **"ඉතී පි සෝ භගවා"** යනාදීන් තථාගතයන් සිහි කර" යනු එහි අර්ථ යි. කාන්තා විහරණයෙන් වසන අප විසින් කෙබඳු විහරණයෙකින් විසිය යුතු ද යි විවාළ සෝවාන් වූ **මහානාම** ශාක්‍යයාගේ ප්‍රශ්නයට තථාගතයන් වහන්සේ දී වදාළ පිළිතුර යි.

මේ සියලු නිදර්ශනයන්ගෙන් දැක්වූයේ ආර්‍ය්‍ය ශ්‍රාවකයන් විසින් ම ඡ අනුස්සති වැඩිය යුතු බව යි. එසේ වුව ද පිරිසිදු ශීලාදි ගුණ ධර්මයෙහි පිහිටි පෘථග්ජනයන් විසින් ද එය වැඩිය යුතු යි. අනුශ්‍රව වශයෙන් වුව ද බුද්ධාදි ගුණ සිහි කරන්නවුන්ගේ සිත පහදින්නේ ය. එයින් නීවරණ මැඩ ලා **මහත්** ප්‍රමෝද ලබා ලා **කටකන්දර** වාසී **චූළසෙව** තෙරුන් මෙන් විවසුන් වඩා රහත් ද වන්නේ ය. **චූළසෙව** තෙරුන්වහන්සේ මාරයා මවා පෑ බුදු රුව දැකැ "රාග - දෙස - මොහ සහිත මාරයා මවා ගත් බුදුරුව මෙ සා ශොභා සම්පන්න නම් රාග - දෙස - මොහ රහිත උන්වහන්සේගේ රූපය කෙ සා ශොභා සම්පන්න නො වේ ද" යි බුද්ධාරම්මණ ප්‍රීති උපදවා විවසුන් වඩා එහි ම රහත්වූ සේක.

[1] අ: නි: එකාදසමනි: 1095

සජ්ජන ප්‍රමොදය පිණිස කළ විශුද්ධි මාර්ගයෙහි
සමාධි භාවනාධිකාරයට අතුලත් "ජ අනුස්සති"
නිර්දේශ නම් සත්වන පරිච්ඡේදය යි.

---

8. අනුස්සතිකම්මට්ඨාන නිද්දේශය

නමෝ භගවතෝ සම්මාසම්බුද්ධස්ස

මරණානුස්සතිය.

දෙවතානුස්සතියට අනතුරු වැ මරණානුස්සතිය දක්වනු ලැබේ. මරණ නම් එක් භවයකට ඇතුළත් ජීවිතෙන්ද්‍රිය සිදී යාම ය. එය **ජීවිතින්ද්‍රියොපච්ඡේද මරණය** යි කියනු ලැබේ. ඒ හැරැ **සමුච්ඡේද මරණය, ඛණික මරණය, සම්මුති මරණය** යි. තවද මරණ තුනෙක් ඇත්තේ ය. සමුච්ඡේද මරණ නම් රහතන් වහන්සේගේ සියලු සසර දුකින් මිදීම සංඛ්‍යාත මරණය යි. ඛණික මරණ නම් සංඝකාරයන්ගේ ඛණ භඞ්ගය යි සම්මුති මරණ නම් "ගස මැරුණේ ය. ලොනය මැරුණේ ය" යනාදි වශයෙන් පවත්නා ලොක සම්මත මරණය යි. මේ ත්‍රිවිධ මරණ මෙහි අදහස් නො කරන ලද බව ද මූල දැක්වුණු ජීවිතෙන්ද්‍රියොප-චේඡ්ද මරණය ම අදහස් කරණ ලද බව ද දත යුතු යි.

ඒ ජීවිතෙන්ද්‍රියොපච්ඡේද මරණය ද වනාහි **කාල මරණය, අකාල මරණය යි** යළි දෙවැදෑරුම් වේ. කාල මරණය පුණ්‍යක්ෂය යෙන් හෝ ආයුඃක්ෂයයෙන් වන්නේ ය. අකාල මරණය උපච්ඡේදක කර්මයෙන් වන්නේ ය.

එහි විස්තර මෙසේ ය:- උපන් භවයෙහි ආයුසන්තතිය පැවැතීමට හෙතු වූ ආහාරාදි ප්‍රත්‍යය සම්පත් ඇත ද ප්‍රතිසන්ධි ජනක කර්මය විපාක දී අවසන් වීමෙන් යමෙකුගේ මරණය වේ ද, ඒ **පුණ්‍යක්ෂය මරණය යි.** කාල ආහාරාදි සම්පත් නැති වීමෙන් මේ කල මිනිසුන්ට ශතවර්ෂ ප්‍රමාණ ආයුෂ ක්ෂය වීමෙන් සිදුවන මරණය මෙන් යමකුගේ මරණය වේ ද, එය **ආයුඃක්ෂය මරණය යි.** අකාල මරණය තත් ඛණික වශයෙන් ද පූර්වකෘත වශයෙන් ද යි දෙ ආකාරයෙක්හි සිදු වේ. **දූසිමාර - කලාබු** රාජාදීන්ට මෙන් ඒ ඇසිල්ලෙහි කළ බලවත් වූ අකුශල කර්මයෙන් උන්තැනින් චුතවීම් වශයෙන් සිදුවන මරණය **තත් ඛණික අකාල මරණය යි.** පූර්ව ජාතික උපච්ඡේද කර්මයෙන් අවියෙන් පැහැරැ සිය දිවි නසා ගැනීම් ආදි වශයෙන් සිදුවන මරණය **පූර්වකෘත අකාල මරණය යි.**

පුණ්‍යක්ෂය මරණය, **ආයුඃක්ෂය මරණය**, **උපක්‍රම මරණය** යන මේ ත්‍රිවිධ මරණය ම යට කී **ජීවිතෙන්ද්‍රියොපච්ඡේද** මරණයෙහි ඇතුළත් බව දත යුතු යි. ඒ මරණය පිළිබඳ වූ අනුස්මෘතිය මරණානුස්මෘතිය යි. (මෙහි **පුණ්‍යක්ෂය මරණය** යි කියේ ප්‍රසූත වශයෙනි. පාපක්ෂයයෙන් ද මරණය සිදු වේ. එ බැවින් එය **කර්මක්ෂය මරණය** යි ද කියනු ලැබේ. උපන් **ලොකයට** නියමිත ආයුෂ තව ශෙෂ වැ තිබියදීත් ප්‍රතිසන්ධි දුන් කර්මයේ ශක්තිය අවසන් වීමෙන් සිදුවන මරණය **කර්මක්ෂය මරණය** යි ද, ප්‍රතිසන්ධි දුන් කර්මයේ ශක්තිය තව ශෙෂ වැ තිබියදීත් උපන් ලොකයට නියමිත ආයුෂය අවසන් වීමෙන් සිදුවන මරණය **ආයුඃක්ෂය මරණය** යි ද, කර්ම - ආයු යන දෙක්හි ම ශක්තිය තව ශෙෂ වැ තිබියදීත් දෘෂ්ටධර්ම වශයෙන් හෝ අපරාපරිය වශයෙන් හෝ කළ බලවත් ම අන්‍ය කර්මයෙක ශක්තියෙන් සිදුවන මරණය **උපච්ඡේදක මරණය** යි ද කී නියා දත යුතු යි. මෙයින් මුල් දෙක කාල මරණය යි ද තෙ වැන්න අකාල මරණය යි ද කියනු ලැබේ. කර්ම - ආයු දෙක්හි ම ශක්තිය එකවට අවසන් වීමෙන් සිදුවන **උභයක්ෂය මරණය** ද කාල මරණයෙහි ම ඇතුළති.)

මරණානුස්මෘතිය වඩනු කැමැති යොගි විසින් රහසිගත වැ විවෙක වැ හිඳැ "**මරණං භවිස්සති ජීවිතින්ද්‍රියං උපච්ඡිජ්ජිස්සති**" මරණය වන්නේ ය, ජීවිතෙන්ද්‍රිය සිදී යන්නේ ය. කියා "**මරණං මරණං**" 'මරණය මරණය' කියා හෝ නුවණින් මෙනෙහි කළ යුතු. නො කොටැ නුනුවණින් මෙනෙහි කරත් හොත් ප්‍රිය පුත්‍රයාගේ මරණය සිහිකිරීමෙහි දී වැදූ මැණියන්ට මෙන් ප්‍රිය ඇත්තන්ගේ මරණය සිහි කිරීමෙහි ශොකය උපදින්නේ ය. වෛරීන්ගේ මරණය සිහි කිරීමේදී වෛරීන්ට මෙන් අප්‍රිය ඇත්තන්ගේ මරණය සිහි කිරීමේදී ප්‍රීතිය උපදින්නේ ය. මළ මිනී දැකීමෙහිදී මළ මිනී දවන්නවුන්ට මෙන් මධ්‍යස්ථයන්ගේ මරණය සිහි කිරීමෙහිදී සංවෙග නූපදින්නේ ය. තමා මරනු පිණිස කඩුව අමෝරා දිවැ එන වධකයා දැකීමෙහිදී බිය සුල්ලාට මෙන් තමාගේ මරණය සිහි කිරීමෙහිදී භය උපදින්නේ ය. ශොක ඉපදීම ය, ප්‍රීති ඉපදීම ය, සංවෙග නූපදීම ය, බිය ඉපදීමය යන මේ සියල්ල වන්නේ සති - සංවෙග - ඤාණ නැති බැවින් ය. එ බැවින් ඒ ඒ තන්හි මරා ලූ ද, මැරුණා වූ ද, සතුන් දැකීමෙන් ද, දැක පුරුදු සම්පත් විඳි සත්ත්වයන් මරණය සිහි කිරීමෙන් ද සති - සංවෙග - ඤාණ උපදවා මරණය වන්නේ ය. යනාදි නියා යෙන් මෙනෙහි කළ යුතු. නුවණින් මෙනෙහි කෙළේ වන්නේ

එසේ කළ විට ය. එසේ කරත් ම තියුණු ඥුවණැතියන්ගේ නීවරණ විෂකම්භන වේ. මරණානුසමෘති පිහිට යි. කම්සථාන උපචාර ප්‍රාප්ත ම වන්නේ ය.

මෙසේ භාවනා කරන කල්හි කම්සථාන උපචාර ප්‍රාප්ත නුණි තම් මඳු දැක්වෙන අට ආකාරයෙන් මරණය සිහි කළ යුතු.

මරණය සිහි කළ යුතු අට ආකාරය.

1 වධක පච්චුපට්ඨානය.
2 සම්පතති විපතතිය.
3 උපසංහරණය.
4 කායබහුසාධාරණය.
5 ආයු දුබ්බලය.
6 අනිමිතතය.
7 අද්ධානපරිච්ඡේදය.
8 ඛණපරිතතය

1 වධක පච්චුපට්ඨානය.

වධක පච්චුපට්ඨානය නම්:- වධකයකු එළඹි සිටි සේ මරණය එළඹැ සිටියේය යි සිහි කිරීම ය. "මුගේ හිස සිඳැ ලම්" යි කඩුව ගෙකැ පැමිණි ගෙල පහරනා වධක එකාන්තයෙන් එළැඹැ සිටි සේ ම මරණ ද එළඹැ සිටියේය යි සිහිකළ යුතු.

කුමක් හෙයින් ද මරණය උතපත්තිය සමග ම අවුත් එකාන්තයෙන් දිවි පැහැර ගන්නා බැවිනි. නයි හතු කැකුළු මුදුණින් පස් සුහක් ගෙනැ නහින්නා සේ ම සත්ත්වයෝ ජරා-මරණ ගෙනැ ම උපදිති.

ඒ එසේ මැ යි:- ඔවුන්ගේ ප්‍රතිසන්ධි විත්තය උතපාදයට අනතුරුවැ ම ජරාවට පැමිණැ පළිත ශිඛරයෙන් හිළිහුණු ගලක් මෙන් සමප්‍රයුකත ධර්ම සමග ම බිඳී යන්නේ ය. මේ ඛණික මරණය උතපත්තිය සමග ම පැමිණි ආකාරය යි. එසේ ම මෙහි දැක්වුණු ජීවිතෙන්ද්‍රියොපච්ඡේද මරණය ද උතපත්තිය සමග ම වන්නේ ය. උදය පළිතයෙන් නැගුණු සූර්යයා අසත පළිතයට යන්නේ ගිය ගිය තන්හි මඳකුදු නො නැවතී ගමන් කරන්නා සේ, පළිතයෙන් ගලා වැටෙන සැඩ වතුරු ඇති ගංගාව මඳකුදු නො සිටැ ගලා බස්නා සේ මේ සත්ත්වයා ද උපන් තැන් පටන් මඳකුදු නො නැවතී මරණයට අභිමුඛ වැ මැ ගමන් කරන්නේ ය.

කියේ මෑ සි:-

"යමෙකරතනීං පඨමං - ගබ්භෙ වසති මානවෝ
අඩ්ඪුට්ඨිතෝ ච සයති - ස ගච්ඡං න නිවත්තති"සි

'මේ මනුෂ්‍යයා යම් එක රැයෙක මව් කුස පිළිසිඳ ගන්නේ ද එසේ පිළිසිඳ ගත් කෙතෙමේ අහස නැඟි වළාකුළක් මෙන් මරණය කරා යන්නේ ය. එසේ යන්නේත් ඇසිල්ලකුදු නො නවතින්නේ ය.'

ග්‍රීෂ්ම කාලයෙහි සූර්‍යතාපයෙන් ඇළ - දෙළ සිඳී යන්නා සේ උදය කාලයෙහි ආපොරසානුගත බඹුන ඇති වෘක්ෂ ඵල තුවටුයෙන් ගිලිහී යන්නා සේ, මුගුරින් පහළ මැටි බඳුන් බිඳී යන්නා සේ, හිරු රැස් වගුළ පිනි බිඳු වැනසී යන්නා සේ එසේ යන සත්ත්වයා මරණයට ම ආසන්න වන්නේ ය.

එහෙයින් කියන ලදී:-

"අව්වයනති අහොරත්තා - ජීවිතං උපරුජ්ඣති,
ආයුඛීයති මච්චානං - කුන්නදීනං ව ඔදකං
එලානමිව පක්කානං - පාතෝ පතනතෝ භයං
එවං ජාතානමච්චානං - නිච්චං මරණතෝ භයං
යථා පි කුම්භකාරස්ස - කතා මත්තිකභාජනං,
සබ්බං භෙදනපරියන්තං - එවං මච්චාන ජීවිතං
උස්සාවොව නිම්ගහම්හි - සුරියස්සුග්ගමනං පති
එවමායු මනුස්සානං - මා මං අම්ම නිවාරය"සි.

"දව රෑ ඉක්මෑ යන්නේ ය. ජීවිතය නිරුඬ වන්නේ ය. ඇළ - දෙළවල ජලය සේ මනුෂ්‍යයන්ගේ ආයුක්ෂය වන්නේ ය. වැලිකුන් ඵල උදැසනක් සේ ගිමෙන් වන භය සේ උපන් සත්ත්වයන්ට එක්වන් මරණයෙන් භය පැමිණෙන්නේ ය. කුඹලා තැනූ සියලු මැටි බඳුන් බිඳී යන්නා සේ මිනිසුන්ගේ මුළු ජීවිත බිඳීමෙන් අවසන් වන්නේ ය. සූර්‍යෝදයයෙහි තණ අග පිනිබිඳක් සේ මිනිසුන්ගේ ආයු ක්ෂය වන්නේ ය. මැණියෙනි? පැවිදි වන්නට යන මා නොවළකන්න."

මෙසේ කඩුව අමෝරා ගත් වධක සේ උන්පත්තිය හා සමග ම පැමිණි මේ මරණය ගෙළ කපාලන ඒ වධක සේ එකාන්නායෙන් දිවි පැහැර ගන්නේ ය. දිවි පැහැරි නො ගෙන නම් නො නවතින්නේ ය. එසේ හෙයින් උත්පත්තිය සමගම පැමිණි බැවින් ද, දිවි පැහැර ගන්නා බැවින් ද, කඩුව අමෝරා

ගත් වධක සේ මරණය ළඟැ සිටියේ ම ය යි මෙසේ **වධක පච්චුපට්ඨාන** වශයෙන් මරණය සිහි කළ යුතු.

2 සම්පත්ති විපත්තිය.

සම්පත්ති විපත්ති වශයෙන් මරණය කෙසේ සිහි කළ යුතු ද, සම්පත්ති ශෝභමාන වන්නේ විපත්තියෙකින් නො මැඩෙන තැක් ය. විපත්තියෙකින් නො මැඩෙන සම්පත් නම් ලොව කැලෑ ම නැත්තේ ය. බලනු.

'මුළු පොළෝ වළඳ - කෙළ සිය ගණන් දන් දී
අඩැඹුල් මතෙක අවසනැ - ඉසුරු බවට පැමිණියේ
එ මෙ සිරුරු බෙදෙන් - කළ පින් ගෙවෙත ගොරතර
මරණ මුව වන් දම්සෝ - නිරිදු විඳියේ දළ සෝ.

**"සකලං මෙදිනිං භුඤ්ජා - දත්වා කොටිසතං සුබී,
අඳධාමලකමත්තස්ස - අත්තනෙ ඉස්සරතං ගතෝ.**

**තෙනෙව දෙහ බන්ධන - පුඤ්ඤඤ්ඣ ඛයමාගතෝ,
මරණාභිමුඛෝ සෝ පි - අසොකෝ සොකමාගතෝ."**

තවද සියලු නිරොගත්ව ව්‍යාධිය අවසාන කොටැ ඇත්තේ ය. සියලු යෞවන ජරාව අවසාන කොටැ ඇත්තේ ය. සියලු ජීවිත මරණය අවසාන කොට ඇත්තේ ය. මේ සියලු ම ලොකයා ජාතියෙන් අනු වැ යන ලද්දේ ය. ජරායෙන් වළඳනා ලද්දේ ය. ව්‍යාධියෙන් මඩනා ලද්දේ ය. මරණයෙන් පහරන ලද්දේ සි. කීයේ මැ සි:-

**"යථා පි සෙලා විපුලා - නභං ආහච්ච පබ්බතා
සමන්තා අනුපරියෙයය්‍යුං - නිප්පොළෙන්තා චතුද්දිසා
එවං ජරා ච මච්චු ච - අධිවත්තන්ති පාණිනො**

**ඛත්තියෙ බ්‍රාහ්මණෙ වෙස්සෙ - සුද්දෙ චණ්ඩාල පුක්කුසෙ
න කිඤ්චි පරිවජ්ජෙති - සබ්බමෙවාභිමද්දති**

**න තත්ථ හත්ථිනං භූමිං - න රථානං න පත්තියා
න වා'පි මන්තයුද්ධෙන - සක්කා ජෙතුං ධනෙන වා"**[1]

'අහස පැහැරැ සිටි විශාල ශෛල පර්වත සිව් දිගින් ඉඩිමින් හාත්පසින් පෙරළී පෙරළී එන්නා සේ ජරා- මරණ, ක්ෂත්‍රිය- බ්‍රාහ්මණ- වෛශ්‍ය- ශූද්‍ර- චණ්ඩාල- පුක්කුස යන සියලු සත්ත්වයන් මඩිමින් එන්නේ ය. කිසිවකුදු නො හරනේ ය. සියල්ල මැඩ

[1]සං: නි: කොසලසං: 62

ලන්නේ ය. (ඒ ජරාමරණයුඩයෙන් දිනිය හැකි ද නො හැකි ය.) එහි ඇතුන්ට යා හැකි නො වේ. රථයන්ට යා හැකි නො වේ. පදාතීන්ට යා හැකි නො වේ. මන්ත්‍ර යුඩයෙන් හෝ ඛනයෙන් හෝ දිනිය හැකි ද නො වේ.

මෙසේ ජීවිත සම්පත්තිය මරණ විපත්තියෙන් අවසාන බව ව්‍යවසථා කරන්නහු විසින් සම්පත් විපත් වශයෙන් මරණය සිහි කළ යුතු යි.

3 උපසංහරණය

අනුන් හා සමග තමන් එළවා බැලීමෙන් මරණය සිහිකළ යුතු. ඒ වනාහි සත් ආකාරයෙකින් කළ යුතු.

(1) යශස් මහත්ත්ව වශයෙන්
(2) පුණ්‍ය මහත්ත්ව වශයෙන්
(3) ඨාම මහත්ත්ව වශයෙන්
(4) ඍද්ධි මහත්ත්ව වශයෙන්
(5) ප්‍රඥා මහත්ත්ව වශයෙන්
(6) ප්‍රත්‍යෙක බුඩ වශයෙන්
(7) සම්‍යක් සම්බුද්ධ වශයෙන්

(1) යශස් මහත්ත්ව වශයෙන් කෙසේ සිහි කළ යුතු ද

මේ මරණය වනාහි මහඍසස් ඇති මහ පිරිවර ඇති ඛත වාහනයෙන් යුත් මහාසම්මත, මහාමඛාතු, මහාසුදස්සන, දළ්හනෙමි, නිමි ආදි මහරජවරුන් මතුයෙහි පවා නිසැක වැ ම වැටුණේ ය. මා මතුයෙහි වැටෙති යනු කවර කථා ද

"මහා යසා රාජවරා - මහාසම්මත ආදයෝ
තෙපි මච්චුවසං පත්තා - මාදිසෙසු කථාව කා."

'මහඍසස් ඇති මහාසම්මත ආදි ඒ රජදරුවෝ පවා මාර-වසයට ගියාහු ය. මා වැන්නවුන් කෙරෙහි කියනු ම කිම?'

මේ යශස් මහත්ත්ව වශයෙන් සිහි කළ යුතු ආකාරය යි.

(2) පුණ්‍ය මහත්ත්ව වශයෙන් කෙසේ සිහි කළ යුතු ද

"ජෝතියො ජටිලො උගහා - මෙණ්ඩකො අථ පුණ්ණකා
එතෙ චඤ්ඤෙ ච යෙ ලොකෙ - මහාපුඤ්ඤා ති විස්සුතා
සබ්බෙ මරණමාපන්නා - මාදිසෙසු කථාව කා"

'ජෝතිය, ජටිල, උගහ, මෙණ්ඩක, පුණ්ණක, යන මේ ලොක පින් ඇති ලොක ප්‍රසිඛි සිටුවරයෝ ද, තව එබඳු වූ

අන්‍යයෝ ද යන සියල්ලෝ මරණයට පැමිණියෝ ය. මා වැන්නන් කෙරෙහි කවර කථා ද,

මේ පුණ්‍ය මහත්ත්ව වශයෙන් සිහි කළ යුතු ආකාර යි.

---

(3) ථාම මහත්ත්ව වශයෙන් කෙසේ සිහිකළ යුතු ද

"වාසුදෙවෝ බලදෙවෝ - භීමසෙනෝ යුධිට්ඨිලෝ
චානුරෝ පියදුමල්ලෝ - අනන්තකස්ස වසං ගතා

එවං ථාමබලූපෙතා - ඉතිලොකම්හි විස්සුතා
එතෙපි මරණං යාතා - මාදිසෙසු කථාව කා."

'වාසුදෙව, බලදෙව, භීමසෙන, යුධිෂ්ඨිර, චානුර, පියදුමල්ල, යන මොවුහු ද, මාරවසයට ගියෝ ය. මෙසේ ථාම බලයෙන් යුත් ලොකප්‍රසිද්ධ මේ වීරයෝ පවා මරණයට ගියෝ ය. මා වැන්නන් කෙරෙහි කවර කථා ද,

මේ ථාම මහත්ත්ව වශයෙන් සිහි කළ යුතු ආකාර යි.

---

(4) සෘද්ධි මහත්ත්ව වශයෙන් කෙසේ සිහි කළ යුතු ද

"පාදඞ්ගුට්ඨකමත්තෙන - වෙජයන්තං අකම්පයි
යෝ නාම්ඳිමතං සෙට්ඨෝ - දුතියෝ අග්ගසාවකෝ

සොපි මච්චුමුඛං ඝොරං - මිගෝ සීහමුඛං විය
පවිට්ඨෝ සහ ඉද්ධියා - මාදිසෙසු කථාව කා."

'ඍද්ධිමතුන්ගෙන් අග්‍ර වූ යම් විනීය අග්‍රශ්‍රාවකයන් වහන්සේ කෙතෙක් පය මහපට ඇඟිලි පමණෙකින් වෛජයන්ත ප්‍රාසාදය කම්පා කළෝ ද' උන්වහන්සේ පවා ඒ සෘද්ධිය හා සමඟ මෘගයෙක් මෘගෙන්ද්‍ර මුඛයට මෙන් ඝොර වූ මාර මුඛයට පිවිසි සේක. මා වැන්නන් කෙරෙහි කවර කථා ද,

මේ ඍද්ධි මහත්ත්ව වශයෙන් සිහි කළ යුතු ආකාර යි.

---

(5) ප්‍රඥා මහත්ත්ව වශයෙන් කෙසේ සිහි කළ යුතු ද

"ලොකනාථං ඨපෙත්වාන - යෙ අඤ්ඤෙ අත්ථි පාණිනෝ
පඤ්ඤාය සාරිපුත්තස්ස - කලං නාග්ඝන්ති සොළසිං

එවං නාම මහාපඤ්ඤෝ - පඨවීමා අග්ගසාවකෝ
මරණස්ස වසං පත්තෝ - මාදිසෙසු කථාව කා."

'සම්බුද්ධයන් වහන්සේ හැර අන්‍ය සියලු ප්‍රාණීහු ම ප්‍රඥයෙන් සෑම්යුත් සර්වාමීන්ට සොළොස් වන කලාවට ද නො අගිති. ඒ සා මහා ප්‍රාඥ වූ ප්‍රථම අග්‍රශ්‍රාවකයන් වහන්සේ පවා මාර වශයට ගියසේක. මා වැන්නන් කෙරෙහි කවර කථා ද,

මේ ප්‍රඥ මහත්ත්ව වශයෙන් සිහි කළ යුතු ආකාරය යි.

---

(6) ප්‍රත්‍යේකබුද්ධ වශයෙන් කෙසේ සිහි කළ යුතු ද

සර්වකීය ප්‍රඥ – ස්වයම් බලයෙන් සියලු ක්ලේශ් සතුරන් සාධා පසේ බුදු බැව් ලත් කඟවෙහෙණ බදු සර්වයම්භූවරයෝ ද මරණයෙන් මිදී ගන්නට අසමර්ථ වූවෝ ය. මම කෙසේ මිදී ගන්නෙම් ද

"තං තං නිමිත්තමාගම්ම – විමංසනත්තා මහෙසයෝ
සයම්භූඤාණතෙජේන – යෙ පත්තා ආසවක්ඛයං
එකවරියනිවාසෙන – ඛග්ගසිඛ්ගසමූපමා
තෙපි නාතිගතා මච්චුං – මාදිසෙසු කථාව කා."

'අතේ රන්වලලු ගැටුම්, හුණ නිළිල් කිසි තැනෙක නො ලැගුම්' ආදි ඒ ඒ නිමිති ලැබ පරිකර්මකාරී වූ යම් මහර්ෂි කෙනෙක් සර්වයම්භූඥත්ව තේජසින් ආශ්‍රවක්ෂයට පැමිණියෝ ද, හුදෙකලා විසුමෙන් කඟවෙහෙණ බදු ඒ පසේ බුදුවරයෝ ද මාරයා ඉක්ම නො ගියෝ ය. මා වැනියන් කෙරෙහි කවර කථා ද,

මේ ප්‍රත්‍යේකබුද්ධ වශයෙන් සිහි කළ යුතු ආකාර යි.

---

(7) සම්‍යක් සම්බුද්ධ වශයෙන් කෙසේ සිහි කළ යුතු ද

අශීති අනුව්‍යඤ්ජනයෙන් හා දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් හා විචිත්‍ර රූපකාය ඇති, සම්භාර පරිශුද්ධ ශීලස්කන්ධාදි ගුණරත්නයෙන් සමෘද්ධ ධර්මකාය ඇති, යශෝ මහත්ත්ව, පුණ්‍ය මහත්ත්ව, ඥාන මහත්ත්ව, කෘපා මහත්ත්ව, ප්‍රඥ මහත්ත්ව යන මේ මහත්ත්වයන්ගේ පරතෙර පත්, අසම වූ අසමසම වූ අප්‍රතිපුද්ගල වූ, අහිත් – සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ පවා වැසි දිය හිමෙන් මහගිනි කඳක් සේ මරණ වැසි ගිමෙන් නිවිගියසේක.

"එවං මහානුභාවස්ස – යං නාමෙතං මහෙසිනෝ
න භයෙන න ලජ්ජාය – මරණං වසමාගතං
නිල්ලජ්ජං විතසාරජ්ජං – සබ්බසත්තභිමද්දනං
තඞ්දං මාදිසං සත්තං – කථා නාභිභවිස්සති."

'ඇම් මරණයෙක් ඒ සා මහානුභාව ඇති මහර්ෂින් වහන්සේට පවා බියෙන් ලජ්ජායෙන් වසයට නො ගියේ නම්

විළි-බිය නැති සියලු සතුන් මැඩැ පියනසුලු ඒ මරණය මා වැනි සතකු කෙසේ නම් නො මැඩැ පියා ද,

මේ සම්‍යක් සම්බුදධ වශයෙන් සිහි කළ යුතු ආකාර සි.

මෙසේ යශොමහත්ත්වාදියෙන් සමන්විත වූ අනායයන් කා සමග සමානභාවයෙන් මරණය තමා කෙරෙහි එළවා ඒ විශෙෂ සත්ත්වවරයන්ට සේ මට ද මරණය වන්නේ ය සි සිහි කරන් ම කම්සථානය උපචාර ප්‍රාප්ත වේ. මෙසේ උප සංහරණ වශයෙන් මරණය සිහි කළ යුතු.

4 කාය බහු සාධාරණය.

සවකීය ශරීරය අන්‍ය බොහෝ සත්ත්වයන්ට සාධාරණ බව සලකා බැලීමෙන් මරණය සිහි කළ යුතු.

ඒ මෙසේ ය:—

මේ ශරීරය බොහෝ දෙනාට සාධාරණ ය. අසූ කුලයෙක පණුවන්ට සාධාරණ ය. ඒ පණුවන් අතුරෙන් සිවිය ඇසුරු කළ පණුවෝ සිවිය කා දමති. සම ඇසුරු කළ පණුවෝ සම කා දමති. මස ඇසුරු කළ පණුවෝ මස කා දමති. නහර ඇසුරු කළ පණුවෝ නහර කා දමති. ඇට ඇසුරු කළ පණුවෝ ඇට කා දමති. මිදුලු ඇසුරු කළ පණුවෝ මිදුලු කා දමති. ඔවුහු එහි ම උපදිති එහි ම දිරති. එහි ම මියති. එහි ම මළ මූ කෙරෙති ඔවුන්ගේ නිබිරිගෙය ද, ගිලන් හල ද, සොහොන ද, වැසි කිළිය ද, කෙස කිළිය ද මේ ශරීරය ම ය. හෙ ද ඔවුන්ගේ ප්‍රකෝපයෙන් මරණයට පැමිණෙති. ඒ අසූකුලයේ පණුවන්ට සේ ම මේ ශරීරය මරණයට හේතු වන නොයෙක් සිය ගණන් ආධ්‍යාත්මික රෝගයන්ට ද, බාහිර නැති ගෝත්‍රසු ආදි සත්ත්වයන්ට ද සාධාරණය. සිව් මං සඬියෙහි කළ ඉලක්කයෙහි සියලු දිගින් හෙන ඊ-සැත්-තෝමර-පහණ ආදිය වැදහෙන්නා සේ මේ ශරීර යෙහි සියලු උපද්‍රවයෝ වැදහෙති. මේ ශරීරය ඒ උවදුරු වලින් ද මරණයට පැමිණෙයි.

වදාළේ මෑ සි:-

"ඉධ භික්ඛවෙ භික්ඛු දිවසෙ නික්ඛනෙන රත්තියා පනි ඨිතාය ඉති පටිසංචික්ඛති. බහුකා ඛෝ මෙ පච්චයා මරණස්ස – අහි වා මං ඩංසෙය්‍ය, විච්ඡිකෝ වා මං ඩංසෙය්‍ය, සතපදී වා මං ඩංසෙය්‍ය, තෙන මෙ අස්ස කාලකිරියා, සෝ මම'ස්ස අන්තරායෝ. උපක්ඛලිතෝ වා පපතෙය්‍යං, භත්තං වා මෙ භුත්තං ව්‍යාපජ්ජෙය්‍ය, පිත්තං වා මෙ කුප්පෙය්‍ය, සෙම්හං වා මෙ කුප්පෙය්‍ය, සත්ථකා වා මෙ වාතා

කුපෙපයය්‍යං තෙන මෙ අඤ්ඤා කාලකිරියා, අඤ්ඤා මම'ඤ්ඤ අනන්තරායො''[1]

'මහණෙනි! මේ සසුන්හි භික්ෂු දහවල් ගෙවෙත් ම රෑ වත් ම මෙසේ සලකයි. මාගේ මරණයට හෙතු බොහෝ ය. තයෙක් හෝ ගෝනුස්සෙක් හෝ පත්තැයෙක් හෝ මා දෂ්ට කෙළේ නම් එයින් මගේ මරණය වන්නේ ය. එසේ වත මරණය මට බුදුන් වදාළ අනුශාසනා කිරීමට අන්තරායකර වන්නේ ය. එසේ ම මම පය පැකිළ වැටුණෙම් නම් වැළඳූ ආහාර හෝ අජීණී වීණී නම් පිත හෝ සෙම හෝ ශස්ත්‍රක වාත හෝ කිපිණී නම් එයින් මගේ මරණය වන්නේ ය. ඒ මරණය මට බුදුන් වදාළ අනුශාසනාව කිරීමට අන්තරායකර වන්නේ ය, යනු එහි අර්ථ යි.

මෙසේ කාය බහුසාධාරණ වශයෙන් මරණය සිහි කළ යුතු.

5 ආයු දුර්බලතාව

ආයු දුර්බල වශයෙන් සලකා මරණය සිහි කළ යුතු කෙසේ ද

මේ ආයුෂ වනාහි අබලය, දුර්බලය. සත්ත්වයන්ගේ ජීවිත ආශ්වාස - ප්‍රශ්වාස පිළිබඳ ය, ශීත - උෂ්ණ පිළිබඳ ය, මහාභූත පිළිබඳ ය, ආහාර පිළිබඳ යි.

ඒ එසේ මැ යි:- මේ ජීවිතය ආශ්වාස-ප්‍රශ්වාස සම වැ පවත්නා තාක් පවත්නේ ය. පිටත නික්මුණු නාසිකා වාතය ඇතුළට නො පිවිසෙත් ම ඇතුළ පිවිසුණු නාසිකා වාතය පිටත නො නික්මෙත් ම සත්ත්වයා මෙලේ නම් වේ. එසේ ම මේ ජීවිතය සතර ඉරියව් සම වැ පවත්නා තාක් පවත්නේ ය, කොයෙකක් හෝ අධික වත් ම ආයුෂය සිදී යෙයි. ශීත - උෂ්ණ ද සම වැ පවත්නා තාක් පවත්නේ ය. අධික ශීතයෙන් හෝ අධික උෂ්ණයෙන් හෝ පීඩිත වත්ම වැනසී යෙයි. මහාභූත ද සම් වැ පවත්නා තාක් පවත්නේ ය. පෘථිවි ධාතු හෝ අප් ධාතු ආදීන් අතුරෙන් කිසිවක් හෝ කිපීමෙන් බලසම්පන්න පුද්ගලයෝ ද තද වැ ගත් ශරීර ඇත්තෝ වැ දනිසාරුදී වශයෙන් තෙත් වූ පුතිකාය ඇත්තෝ වැ මහදැහයෙන් පෙළුණෝ වැ සන්ධිබන්ධන හෝ සිදී ගියෝ වැ ජීවිතක්ෂයට පැමිණෙති. කබලිංකාරාහාරය ද සුදුසු අවස්ථාවෙහි ලදහොත් ජීවිතය පවති. නො ලදහොත් නො පවති.

මෙසේ ආයු දුර්බල වශයෙන් මරණය සිහි කළ යුතු.

---

[1] අ: නි: ඡක්කනි: 528

ඒ අනිමිත්තය.

අනිමිත්ත වශයෙන් සලකා මරණය සිහි කළ යුතු කෙසේ ද, අනිමිත්ත නම් කාලාදි වශයෙන් ව්‍යවච්ඡේද රහිත බව ය.

සත්ත්වයන්ගේ (1.) ජීවිතය, (2.) ව්‍යාධිය, (3.) කාලය, (4.) දෙහ නික්ඛේපය, (5.) ගතිය යන මේ පස ජීවලෝකයෙහි ව්‍යවච්ඡේද රහිත ය. දැනැ ගත නො හැකි ය.

"ජීවිතං ව්‍යාධි කාලෝ ච - දෙහනික්ඛෙපනං ගති
පඤ්චතෙ ජීවලොකස්මිං - අනිමිත්තා න ඤායරෙ."[1]

(1) 'මේ තෙක් කල්ම ජීවත් විය යුතු ය. මින් ඔබ්බෙහි ජීවත් විය යුතු නො වේ' ය යි ව්‍යවස්ථා රහිත බැවින් ජීවිතය අනිමිත්ත ය.

ඒ එසේ මැ යි:- සත්ත්වයෝ කලලාවස්ථායෙහි ද මැරෙති. අර්බුද - පෙසී - ඝන අවස්ථායෙහි ද මැරෙති. එක් මැසි - දෙ මැසි- තෙ මැසි - සිව් මැසි - පස් මැසි - දස මැසි කල ද මැරෙති. කුසින් සැහැල්ලූ වන කල ද මැරෙති. ඉන් පසු හව්රුදු සියයෙන් මොබ ද ඔබ ද මැරෙත්.

(2.) මේ ව්‍යාධියෙන් ම සත්ත්වයෝ මැරෙති, අන් ව්‍යාධියෙකින් නො මැරෙති යි ව්‍යවස්ථා නැති බැවින් අනිමිත්ත ය. සත්ත්වයෝ ඇස් රෝගයෙනුදු මැරෙති, සොත රොගාදීන් අතුරෙන් කිසිවකිනුදු මැරෙත්.

(3.) මේ කාලයෙහි ම මරණය විය යුතු ය, අන් කලෙක මරණය නො විය යුතු ය යි ව්‍යවස්ථා නැති බැවින් අනිමිත්ත ය. සත්ත්වයෝ පෙරවරු ද මැරෙති. පස්වරු ආදියෙහි ද මැරෙත්.

(4.) මැරෙන්නවුන් ගේ දෙහය මෙහි ම වැටිය යුතු ය, අන් තැනෙක නො වැටිය යුතුය යි ව්‍යවස්ථා රහිත බැවින් අනිමිත්ත ය. ඇතුළු ගම උපන්නවුන්ගේ දෙහය පිට ගම ද පිට ගම උපන්නවුන්ගේ දෙහය ඇතුළු ගම ද ගොඩ උපන්නවුන්ගේ දෙහය දියෙහි ද දියෙහි උපන්නවුන්ගේ දෙහය ගොඩ ද වැටිය හැකි ය.

(5.) මෙයින් චුත වූවන් අසුවල් තැන ඉපදිය යුතුය යි ව්‍යවස්ථා නැති බැවින් අනිමිත්ත ය. දෙව්ලොවින් සැවැ මිනිස් ලොව ද මිනිස් ලොවින් සැවැ දෙව්ලෝ ආදියෙහි ද උපදිත්.

[1]ජ්‍ය: පා: සම්බ්ජ්‍ය: 41

මෙසේ සත්ත්වයෝ යන්ත්‍රයෙහි යෙදූ ගොනුන් මෙන් ගති පැකිලකා ලොකයෙහි කැරකෙන්නාහ.

මෙසේ අනිමිත්ත වශයෙන් මරණය සිහි කළ යුතු.

7 අද්ධාන පරිච්ඡේදය.

අද්ධාන පරිච්ඡේද නම් කාල පරිච්ඡේද ය. මේකල මනුෂ්‍ය යන්ගේ ජීවිතය මෙතෙක් කල් විය යුතු ය යි කාල පරිච්ඡේද යෙක් නැත. යමෙක් වැඩි කල් ජීවත් වන්නේ නම් හේ අවිරුද්ධ සියයක් හෝ ඉන් සුවලපයක් වැඩි වැ හෝ ජීවත් වන්නේ ය. වදාළේ මැ යි.

"අප්පමිදං භික්ඛවෙ මනුස්සානං ආයු, ගමනීයො සම්පරායො, කත්තබ්බං කුසලං, චරිතබ්බං බ්‍රහ්මචරියං, නත්ථි ජාතස්ස අමරණං, යො භික්ඛවෙ චිරං ජීවති, සො වස්ස සතං අප්පං වා භියෙය්‍යා"[1] යි. 'මහණෙනි! මිනිසුන්ගේ ආයුෂය සුවල්ප ය. පරලෝ යා යුතු ය. කුශල කළ යුතු ය. බඹසර විසිය යුතු ය. උපන්නවුන්ගේ නො මැරී සිටීමෙක් නැත. මහණෙනි! යමෙක් වැඩි කල් ජීවත් වේ නම් හේ ශත වර්ෂයක් හෝ ඉන් සුවලප වැනියක් හෝ ජීවත් වේ.'

"අප්පමායු මනුස්සානං – ගිරළය්‍ය නං සුපොරිසො
චරෙය්‍යාදිත්තසීසොව – නත්ථි මච්චුස්ස නාගමො."[2]

'මිනිසුන්ගේ ආයුෂ සුවල්ප ය. සත්පුරුෂ ඒ සම්භාවනා නො කරන්නේ ය. හේ හිස ගිනි ගත්තකු සේ හැසිරෙන්නේ ය. මාරයාගේ අනාගමනයෙක් නැත. එකාන්තයෙන් මාරයා පැමිණෙන්නේ ය'

තවද,

"ඛූතපුබ්බං භික්ඛවෙ අරඤ්ඤා නාම සකුණා අහොසි"[3] යනාදීන් වදාළ සුපෙතාපමාවෙකින් ප්‍රතිමණ්ඩිත වූ **අරඤ්ඤ** සූත්‍රයෙන් ද මේ අර්ථය ප්‍රකාශ වන්නේ ය. යටගිය දවස **අරඤ්ඤ** නම් ශාසනාවරයාණකෙනෙක් වූහ. ඔවුහු උපමා සතකින් මරණානුස්මෘතිය ප්‍රකාශ කොටැ ලෝ සතුන් බිය ගන්වා සුචරිතයෙහි යෙදූහ. 'හිරු උදා වත්ම තණ්ඩුල පිණ්ඩිවිදු සේ, දියෙහි නැඟි බුබුලු සේ, දිය ඇදි ඉර සේ, පර්වතයෙන් ගලා බස්නා ගංගාව සේ, දිවග කෙළ පිඬ සේ, රත් යකඩබල මස් කැබැල්ල සේ, මස් ලොඹුව කරා ගෙනයන ගවයා සේ, මනුෂ්‍ය ජීවිතය ඇසිල්ලක් පාසා මරණයට ළං වන්නේ ය. එය

[1] සං: නි: මාරසං: 65 [2] අ: නි සත්තකනි: 700
[3] අ: නි: සත්තක නි: 700

සඵල්පය, විතශ්චරය, බහු දුඃඛය, බහූපායාසය, නුවණින් දත යුතු ය. කුසල් කටයුතු ය, බඹසර විසිය යුතු ය, උපන්නහුට නො මැරී විසීමෙක් නො වේ' යනු එහි සංක්ෂිප්තාර්ථ යි.

"යෝ පායං භික්ඛවෙ භික්ඛු එවං මරණසතිං භාවෙති, අහෝ වතාහං රත්තිං දිවං ජීවෙය්‍යං භගවතෝ සාසනං මනසිකරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සාති. යෝ 'පායං භික්ඛවෙ භික්ඛු එවං මරණසතිං භාවෙති, අහෝ වතාහං දිවසං ජීවෙය්‍යං – පෙ – අහෝ වතාහං තදනන්තරං ජීවෙය්‍යං යදනන්තරං එකං පිණ්ඩපාතං භුඤ්ජාමි – පෙ – අහෝ වතාහං තදනන්තරං ජීවෙය්‍යං යදනන්තරං චත්තාරෝ පඤ්ච ආලොපෙ සංඛාදිත්වා අජ්ඣොහරාමි – පෙ – ඉමෙ වුච්චන්ති භික්ඛවෙ භික්ඛු පමත්තා විහරන්ති දන්ධං මරණ සතිං භාවෙන්ති ආසවානං ඛයාය.

යොච ඛ්වායං භික්ඛවෙ භික්ඛු එවං මරණසතිං භාවෙති අහෝ වතාහං තදනන්තරං ජීවෙය්‍යං යදනන්තරං එකං ආලොපං සංඛාදිත්වා අජ්ඣොහරාමි භගවතෝ සාසනං මනසිකරෙය්‍යං බහුං වත මෙ කතං අස්සාති යෝ'පායං භික්ඛවෙ භික්ඛු එවං මරණසතිං භාවෙති අහෝ වතාහං තදනන්තරං ජීවෙය්‍යං යදනන්තරං අස්සසිත්වා වා පස්සසාමි පස්සසිත්වා වා අස්සසාමි, භගවතෝ සාසනං මනසිකරෙය්‍යං බහුං වත මෙ කතං අස්සාති. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ භික්ඛු අප්පමත්තා විහරන්ති තික්ඛං මරණසතිං භාවෙන්ති ආසවානං ඛයාය"[1] යි වදළ ධර්මය සලකනු. එහි සංක්ෂිප්තාර්ථ මෙසේ ය.

"අහෝ මම එක් රෑ දුවලක් ජීවත් වන්නෙමි නම් යහපති. ඒ කාලය තුළ මම බුඩ ශාසනය සිහි කැරැ ගන්නෙමි. එයින් ම විශිත් බොහෝ ආත්ම හිත කැරැ ගන්නා ලද්දේ වන්නේ ය. අහෝ මම එක් දුවලක් ජීවත් වන්නෙමි නම් යහපති – පෙ – අහෝ මම එක් පිණ්ඩපාතයක් වළඳන තාක් කල් ජීවත් වන්නෙමි නම් යහපති – පෙ – අහෝ මම බත් පිඬු සතරක් පසක් වළඳන තාක් කල් ජීවත් වන්නෙමි නම් යහපති. ඒ කාලය තුළ මම් බුඩ ශාසනය සිහි කැරැ ගන්නෙමි. එයින් ම විසින් බොහෝ ආත්ම හිත කැරැ ගන්නා ලද්දේ වන්නේ ය. මහණෙනි! යම් කෙනෙක් මෙසේ මරණ සති වඩද්ද ඔවිහු දඩි වැ මරණ සති වඩන්නෝ ය. ඔවිහු ආශ්‍රවක්ෂය පිණිස ප්‍රමත්ත වැ වසන්නෝ ය.

[1] අ: නි: අඨකනි: 809

'මහණෙනි! යම් කෙනෙක් "අහෝ මම එක් ආලෝපයක් මුව තබා ගිලින තාක් ජීවත් වන්නෙම් නම් යහපති. – පෙ – ආශ්වාස කොටැ ප්‍රශ්වාස කරන තාක් හෝ ප්‍රශ්වාස කොටැ ආශ්වාස කරන තාක් හෝ ජීවත් වන්නෙම් නම් යහපති. ඒ කාලය තුළ මම බුද්ධ ශාසනය සිහි කැරැ ගත්තෙමි. එසින් ම විසින් බොහෝ ආනිසංස ඇත කැරැ ගන්නා ලද්දේ වන්නේ ය සි මරණ සති වඩන් නම් ඔවුහු තීක්ෂණ වූ මරණ සති වඩන්නෝ ය. ඔවුහු ආශ්‍රවක්ෂය පිණිස අප්‍රමත්ත වැ වසන්නෝ ය.

මෙසේ පිඬු සතරක් පසක් කා ගිලින තරම් කාලයවිත් විශ්වාස නො තබා ජීවිත කාලය සවලපය සි අද්ධාන පරිවේඡද වශයෙන් මරණය සිහි කළ යුතු සි.

8 මරණපරිකල්පනය

ජීවිතය ඉතා සවල්ප ක්ෂණයක් පවත්නා වශයෙන් ද සලකා මරණය සිහි කළ යුතු. කෙසේ ද පරමාර්ථ වශයෙන් සත්ත්වයන්ගේ ජීවිත ක්ෂණය ඉතා සවල්ප ය. එක චිත්ත ක්ෂණයක් පමණ වූ ම කාලයක් වන්නේ ය. රථ චක්‍රය පෙරළෙන්නේ එක තෙම් ප්‍රදෙශයෙකින් ම පෙරළෙන්නා සේ සිටින්නේත් එක තෙම් ප්‍රදෙශයෙකින් ම සිටිනා සේ සත්ත්වයන්ගේ ජීවිතය ද එක චිත්ත ක්ෂණයෙකින් ම පවත්නේ ය. ඒ චිත්ත ක්ෂණය නිරුද්ධ කල්හි සත්ත්වයා මළේ ය, නිරුද්ධ වූයේ ය සි කියනු ලැබේ.

වදාළේ මැයි.

"අතීතෙ චිත්තක්ඛණෙ ජීවිතථ, න ජීවති, න ජීවිස්සති. අනාගතෙ චිත්තක්ඛණෙ න ජීවිතථ, න ජීවති, ජීවිස්සති. පච්චුප්පන්නෙ චිත්තක්ඛණෙ න ජීවිතථ, ජීවති, න ජීවිස්සති."

'අතීත භෙවත් නිරුද්ධ චිත්තක්ෂණයෙහි සත්ත්වයා ජීවත් වූයේ ය. ඒ නිරුද්ධ චිත්තක්ෂණයෙන් දැන් ජීවත් වෙමින් සිටිනේ නො වේ. මතු ජීවත් වන්නේ ද නො වේ. අනාගත චිත්තක්ෂණයෙහි සත්ත්වයා ජීවත් වූයේ නො වේ. දැන් ජීවත් වෙමින් සිටිනේ ද නො වේ. මතු ජීවත් වන්නේ ය. වර්තමාන චිත්තක්ෂණයෙහි සත්ත්වයා ජීවත් වූයේ නො වේ. දැන් ජීවත් වෙමින් සිටී. මතු ජීවත් වන්නේ නො වේ' යනු එහි අර්ථ සි.

"ජීවිතං අත්තභාවෝ ච - සුඛ දුක්ඛා ච කෙවලා,
එකචිත්තසමායුත්තා - ලහුසෝ වත්තතෙ ඛණෝ.

යෙ නිරුද්ධා මරන්තස්ස - තිට්ඨමානස්ස වා ඉධ,
සබ්බෙපි සදිසා ඛන්ධා - ගතා අප්පටිසන්ධියා.

අනිබ්බත්තෙන න ජාතෝ - පච්චුප්පන්නෙන ජීවති
චිත්තභඞ්ගා මතෝ ලෝකෝ - පඤ්ඤත්ති පරමට්ඨියා"

'ජීවිතය ද, ආත්ම භාවය ද, සුඛ දුඃඛ වෙදනාව ද යන මෙය නුදෙක් එක චිත්තක්ෂණයෙකින් යුක්ත ය. ජීවිත **ක්ෂණය** වහා පෙරලෙ යි' (ආත්ම භාව යන්නෙන් මෙහි ජීවිත - වෙදනා - **විඤ්ඤාණ** හැර සෙස්ස ගත යුතු ය.)

'මැරෙන පුද්ගලයාගේ **නිරුද්ධ** වූ **සඤ්ඤා**යෝ ද, දැන් මෙහි ජීවත් වන පුද්ගලයාගේ නිරුද්ධ වූ සඤ්ඤායෝ ද යන මේ සියල්ලෝ සමානයෝ ය. ඒ දෙපක්ෂයෙහි ම වූවෝ **ප්‍රතිසන්ධාන** (ඇළපිම්) රහිත වැ ම ඉක්ම ගියෝ ය' (ජීවිතය **එක චිත්ත - ක්ෂණික** ය.)

'මේ ලෝක **සත්ත්ව**යා නූපත් සිටින් නූපත්නේ ය. දැන් පවත්නා සිතින් ජීවත් වන්නේ ය. චිත්තයාගේ භඞ්ගයෙන් මැරුණේ ය' (ඒ ඒ ධරන සිත් නිසා තිස්සයා ජීවත් වන්නේ ය. යනාදි වචන ප්‍රවෘත්තියට විෂය වූ) **සන්තාන** ප්‍රඥප්තිය පරමාර්ථ යි.- නො තස්නේ යි.

මෙසේ **ඛණපරිත්ත** වසයෙන් මරණය සිහි කළ යුතු යි.

මෙසේ මේ දැක්වූ අට ආකාර අතුරෙන් කිසියම් ආකාර යෙකින් සිහි කරන්ම නැවත නැවත සිහිකිරීම් වශයෙන් සිත එකඟ වන්නේ ය. මරණාරම්මණ සතිය පිහිටන්නේ ය. නීවරණ විෂ්කම්භන වන්නේ ය. ධ්‍යානාඞ්ග පහළ වන්නේ ය. එසේ වුව ද මරණ අරමුණ සවිභාව ධර්මයක් හෙයින් ද, සංවෙග ජනක හෙයින් ද ධ්‍යානය අර්පණා ප්‍රාප්ත නො වැ උපචාර ප්‍රාප්ත ම වන්නේ ය.

ප්‍රශ්නයෙකි:- නිර්වාණය අරමුණු කොටැ ලොකොත්තර - ධ්‍යාන ද, ප්‍රථම - තෘතීය අරූපාවචර සිත් අරමුණු කොට ද්විතීය-චතුර්ථ අරූපාවචර ධ්‍යාන ද අර්පණා ප්‍රාප්ත වේ. එහි නිර්වාණය ද, ප්‍රථම - තෘතීය ධ්‍යාන සිත් ද සවිභාව ධර්ම නො වේ ද, මෙහි අර්පණා ප්‍රාප්ත නොවේ ද,

උත්තර මෙසේ යි:- ඔව්හු භාවනා විශෙෂ හෙයින් අර්ණා ප්‍රාප්ත වෙති. ලොකොත්තර ධ්‍යාන අර්ණා ප්‍රාප්ත වන්නේ විශුද්ධි භාවනාක්‍රම වශයෙනි. අරූපාවචර අර්ණා ප්‍රාප්ත වන්නේ ආරම්මණාතික්‍රම වශයෙනි. මෙහි ඒ දෙ විධිය ම නැති බැවින් අර්ණා ප්‍රාප්ත නො වේ. උපචාර ප්‍රාප්ත ම වේය යි දත යුතු යි.

ඒ මේ ධ්‍යානය සමෘති බලයෙන් උපන් බැවින් **මරණානුස්මෘතිය** යන සංඛ්‍යාවට පැමිණෙන්නේ ය.

මේ මරණානුස්මෘති භාවනායෙහි යෙදුණු භික්ෂු නිතර අප්‍රමාද වෑ වසන්නේ ය. සියලු භවයන්හි අනභිරති සංඥාව ලබන්නේ ය. ජීවිත තෘෂ්ණාව හැර පියන්නේ ය. පාපයට ගර්හා කරන්නේ ය. සන්නිධි බහුල නො වන්නේ ය. පරිෂ්කාරයෙහි මූසුරු මල නැතියෙක් වන්නේ ය. ඔහුට අනිත්‍ය සංඥාව පුරුදුදට යෙයි. ඒ අනුසාරයෙන් දුඃඛ සංඥා ද අනාත්ම සංඥා ද වැටහෙ යි. මරණසතිය භාවනා නො කොළෝ මරණාසන්න කාලයෙහි ව්‍යාලමෘග - යක්ෂ - සර්ප - වෙෂර - වධක යන මොවුන් විසින් අභිභූත වූවන් සේ වහා සන්ත්‍රාසයට - සම්මොහයට පැමිණෙති. එසේ නො වෑ මේ තෙමේ නිර්භය වෑ අසම්මූඪ වෑ කාලක්‍රියා කරන්නේ ය. මේ අත් බැවිහි ඉදින් නිවන් නො ලද්දේ නම් මරණයෙන් මතු සුගති පරායන වන්නේ ය.

"තස්මා හවෙ අප්පමාදං - භාසිරාථ සුමෙධසො
එවං මහානුභාවාය - මරණානුස්සතියා සදා."

'එසේ හෙයින් සුප්‍රාඥ මහානුභාව ඇති මරණානුස්මෘතිය සදහා එකාන්තයෙන් නිතර අප්‍රමාද වඩන්නේ යි'

මරණානුස්මෘතියෙහි විස්තර කථා නිමි.

කායගතා සතිය.

මරණානුස්මෘතියට අනතුරු වෑ කායගතාසතිය දක්වනු ලැබේ. මේ කායගතාසතිය වනාහි බුදොත්පාද කාලයෙක විනා අන් කලෙක නො ලැබෙන්නේ ය. කිසි අන්‍ය තීර්ථක කෙනෙකුන්ට විෂය නො වන්නේ ය.

"එකධම්මො භික්ඛවෙ භාවිතො බහුලීකතො මහතො සංවෙගාය සංවත්තති, මහතො අත්ථාය සංවත්තති. මහතො යොගක්ඛෙමාය සංවත්තති, මහතො සතිසම්පජඤ්ඤාය සංවත්තති, ඤාණදස්සනපටිලාභාය සංවත්තති, දිට්ඨධම්ම සුඛවිහාරාය සංවත්තති, විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියාය සංවත්තති. කතමො එකධම්මො? කායගතාසති."[1]

"අමතං තෙ භික්ඛවෙ පරිභුඤ්ජන්ති යෙ කායගතා සතිං පරිභුඤ්ජන්ති. අමතං තෙ භික්ඛවෙ න පරිභුඤ්ජන්ති යෙ කායගතා සතිං න පරිභුඤ්ජන්ති."

"අමතං තෙසං භික්ඛවෙ පරිභුත්තං - පෙ - අපරිභුත්තං - පෙ - පරිහීනං - පෙ - අපරිහීනං - පෙ - විරද්ධං - පෙ - ආරද්ධං යෙසං කායගතාසති ආරද්ධා."[2] යනාදීන් භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් සූත්‍රයන්හි දී නොයෙක් ආකාරයෙන් වර්ණනා කරන ලද්දේ ය. 'මහණෙනි! එක ධර්මයෙක් භාවිත බහුලීකෘත වූයේ මහත් සංවෙග පිණිස, මහත් අර්ථ පිණිස, මහත් යොගක්ෂෙම පිණිස, මහත් සම්‍යති සම්ප්‍රඥ පිණිස, ඥානදර්ශන ප්‍රතිලාභ පිණිස, මේ අත් බැවිහි සැප විහරණ පිණිස, විද්‍යා-විමුක්ති - ඵල ප්‍රතිවෙධ පිණිස වන්නේ ය. කවර එක ධර්මයෙක් ද, කායගතාසතිය යි'

'මහණෙනි යම් කෙනෙක් කායගතාසති වළඳත් නම් ඔහු නිවන් වළඳති යම් කෙනෙක් කායගතාසති නො වළඳත් නම් ඔහු නිවන් නො වළඳියි'

'මහණෙනි! යම් කෙනෙකුන් විසින් කායගතා සති වැළඳිණි නම් ඔවුන් විසින් නිවන් වැළඳිණි. - නො වැළඳිණි නම් නිවන් නො වැළඳිණි – පිරිහිණි නම් නිවන් පිරිහිණි – නො පිරිහිණ් නම් නිවන් නො පිරිහිණි.-වැරදිණි නම් නිවන් වැරදිණි -නො වැරදිණි නම් නිවන් නො වැරදිණි' යනු එහි අර්ථ යි.

මෙසේ වර්ණනා කොටැ වදාරා වැළැඳීත් **"කථං භාවිතා ච භික්ඛවෙ කායගතාසති කථං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා. ඉධ භික්ඛවෙ භික්ඛු අරඤ්ඤගතො වා."**[3] 'මහණෙනි! කෙසේ භාවිත බහුලීකෘත කායගතාසතිය මහත් ඵල මහානිසංස වන්නේ ද, මහණෙනි! මේ සසුන්හි මහණ අරණ්‍ය ගත වූයේ, යනාදීන් ආනාපාණපබ්බ – ඉරියාපථපබ්බ – චතුසම්පජඤ්ඤපබ්බ – පටික්කූලමනසිකාරපබ්බ – ධාතු-මනසිකාරපබ්බ – නවසීවථිකපබ්බ යන මේ තුදුස් පබ්බ වශයෙන් දක්වන ලද්දේ ය. ඒ තුදුස් පබ්බ අතුරෙන්

---

[1]අ: නි: එකක නි: 27 [2]අ: නි: එකක නි: 29

[3]ම: නි: උපරිප: 117

ඉරියාපථ – චතුසම්පජඤ්ඤ – ධාතු මනසිකාර යන පබෘ තුන වදුලේ විදර්ශනා වශයෙනි. නවසීවථිකපබ්බ වදුලේ විදර්ශනා ඤානයෙහි ම ආදීනවානුපස්සනා වශයෙනි. ඉන් උඩුමාතකාදියෙහි යම් සමාධි භාවනාවෙක් සිද්ධ වේ නම් එය අශුභ නිර්දේශයෙහි දක්වන ලද්දේ ය. එවිට මෙහි සමාධි වශයෙන් දැක්විය යුත්තේ ආනාපාණපබ්බය හා පටික්කූලමනසිකාරපබ්බය යි. ඉතුදු ආනාපාණපබ්බය ආනාපාණ සති වශයෙන් වෙන ම කම්මට්ඨානයෙකි.

"පුනචපරං භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති. අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො, මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං, හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං, අන්තං අන්තගුණං උදරියං කරීසං, (මත්ථලුඞ්ගං,) පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො, අස්සු වසා ඛෙලො සිඞ්ඝානිකා ලසිකා මුත්තං"[1] යි මත්ථලුඞ්ග ඇටමිදුලුයෙහි ඔහා පටික්කූලමනසිකාර වශයෙන් යම් ද්වාත්තිංසාකාර කම්මට්ඨානයක් වදුළ සේක් නම් එය මෙහි ලා **"කායගතාසති"** ය යි දතයුතු. එහි පාළි වර්ණනා ප්‍රථමික භාවනා විධිය දක්වනු ලැබේ.

ඉට දැක්වුණු පාළියෙහි අර්ථ මෙසේ ය.

'මහණෙනි වැළි දු හිඳුණු තෙමේ පතුලින් උඩ කෙසගින් යට සිවියෙන් පිරිසුන් මේ චාතුම්මහාභූතික ප්‍රතිකාය නානාවිධ අසුචි යෙන් පිරුණේය' යි ප්‍රත්‍යවෙක්ෂා කෙරෙ යි. කෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරේ ද, මේ කයෙහි කෙස් ඇත්තේ ය, මේ කයෙහි ලොම් ඇත්තේ ය, මේ කයෙහි නිය ඇත්තේ ය, මේ කයෙහි දත් ඇත්තේ ය, මේ කයෙහි සම ඇත්තේ ය, මේ කයෙහි මස් ඇත්තේ ය, නහර ඇත්තේ ය, ඇට ඇත්තේ ය, ඇට මිදුලු ඇත්තේ ය, වකුගඩු ඇත්තේ ය, හෘදය ඇත්තේ ය, යකන මංශ ඇත්තේ ය, බඩ දිව ඇත්තේ ය, පිහක මාංශ ඇත්තේ ය, පපුකැත් ඇත්තේ ය, අතුණු ඇත්තේ ය, අතුණුබහත් ඇත්තේ ය, උදරිය ඇත්තේ ය, මළ ඇත්තේ ය, පිත ඇත්තේ ය, සෙම් ඇත්තේ ය, සැරව ඇත්තේ ය, ලේ ඇත්තේ ය, ඩහදිය ඇත්තේ ය, මේද තෙල් ඇත්තේ ය, කඳුලු ඇත්තේ ය, වුරුණු තෙල් ඇත්තේ ය, කෙළ ඇත්තේ ය, සොටු ඇත්තේ ය, සඳමිදුළු ඇත්තේ ය, මූත්‍ර ඇත්තේ ය.

---

[1] දී: නි: මහාවග්ග 179

මෙහි කාය නම් ශරීරය යි. අශුචි රාශියෙක යන අර්ථයෙන් ද, කුත්සිත වූ – පිළිකුල් වූ කෙසාදීන්ට ද, චක්ඛුරොගාදි අනෙක රොග ශතයන්ට ද ආය හෙයින් – උත්පත්තිට්ඨාන හෙයින් ද ශරීරය කායය යි කියනු ලැබේ.

ඒ එසේ මෑ යි:- පතුලෙහි පටන් උඩ කෙසගෙහි පටන් යට සමෙහි පටන් සරස බඹයක් පමණ වූ මේ ශරීරයෙහි මුළු උත්සෘඤයෙන් සොයතු දු කිසිවෙක් කිසි මුත්තක් හෝ මැණිකක් හෝ වෛඩූර්යයක් හෝ අගිලක් හෝ කොකුමක් හෝ කපුරක් හෝ වත්සුණු ආදීන් අතුරෙන් සුවල්ප පවිත්‍රයක් හෝ නො දක්නේ ය. යළි කුමක් දක්නේ ද, පරම දුගන්ධ වූ ජුගුප්සා ජනක වූ දර්ශනයට පවා නීරාශ්‍රික වූ කෙස – ලොමාදි නානාවිධ අශුභ ම දක්නේ ය. "අස්මිං ඉමස්මිං කායෙ කෙසා ලොමා -පෙ- මුත්තං" යි එහෙයින් කියන ලදී. මේ මෙහි පදසම්බන්ධ වණ්ණනාව යි.

කායගතාසති භාවනා විධිය

මේ කම්මට්ඨානය වඩනු කැමැති ආදිකර්මික කුලදරුවා විසින් යට කී සේ කල්‍යාණ මිත්‍රයකු වෙත එළඹ මෙය ගත යුතු. කම්මට්ඨාන දායක ආචාර්‍ය විසිනුදු සත් වැදෑරුම් උද්ග්‍රහ කෞශල්‍යය හා දස වැදෑරුම් මනසිකාර කෞශල්‍යය හා කියා දිය යුතු යි.

සප්තවිධ උද්ග්‍රහ කෞශල්‍යය

1. වචනයෙන්, 2. සිතින්, 3. වණ්ණ වශයෙන්, 4 සණ්ඨාන වශයෙන්, 5. දිශා වශයෙන්, 6. අවකාශ වශයෙන්, 7. පරිච්ඡේද වශයෙන් යන සත් ආකාරයෙන් උද්ග්‍රහ කෞශල්‍යය කියා දිය යුතු.

1 වචනයෙන්

මේ ප්‍රතිකූල මනසිකාර කම්මට්ඨානය ත්‍රිපිටකධරයකු වුව ද මෙතෙහි කරන කල පළමු කොටැ වාග්භෙද කිරීමෙන් ම හෙවත් වචනයෙන් කීමෙන් ම සජ්ඣායනා කටයුතු. එසේ සජ්ඣායනා කරන කල්හි ම මූලය දනව් වැසි මහාදෙව තෙරුන් ළඟ කමටහන් ගත් සථවිර දෙනමට මෙන් ඇතැම් කෙනකුන්ට කම්මට්ඨානය ප්‍රකට වන්නේ ය. මහාදෙව තෙරුන්වහන්සේ ඒ දෙදෙනාවහන්සේ කමටහන් ඉල්ලූ කල "සාර මසක් මෙය ම සජ්ඣායනා කරව" යි දැනති සාකාර පාළිය කියවූහ. ඒ දෙදෙනා වහන්සේට සති දෙකක් තුනක් ප්‍රගුණ වැ තුබුණේ ය.

ඔව්හු ගෞරවයෙන් කම්ටහන ගෙන සාර මස සජ්ඣායනා කිරීමෙන් ම සෝවාන් වූහ. එබැවින් කම්ටහන දෙන ආචාර්‍ය්‍ය විසින් "පළමුකොට මෙය වචනයෙන් කියමින් ම සජ්ඣායනා කරව" යි අතවැස්සාට කිය යුතු ය. අතවැස්සා විසිනුදු තව පඤ්චකාදිය පරිවේෂ්ද කොටැ අනුලෝම ප්‍රතිලෝම වශයෙන් සජ්ඣායනා කට යුතු ය.

"කෙසා, ලොමා, නඛා, දන්තා, තචෝ" යි කියා යළි ප්‍රතිලෝම වශයෙන් **"තචෝ, දන්තා, නඛා, ලොමා, කෙසා"** යි කිය යුතු.

ඉක්බිති **වක්ක** පඤ්චකයෙහි **"මංසං, නහාරූ, අට්ඨී, අට්ඨිමිඤ්ජා, වක්කං"** යි කියා ප්‍රතිලෝම වශයෙන් **"වක්කං, අට්ඨිමිඤ්ජා, නහාරූ, අට්ඨී, මංසං, තචෝ, දන්තා, නඛා, ලොමා, කෙසා"** යි කිය යුතු.

ඉක්බිති **පප්ඵාස** පඤ්චකයෙහි **"හදයං, යකනං, කිලෝමකං, පිහකං, පප්ඵාසං"** යි කියා යළි ප්‍රතිලෝම වශයෙන් **"පප්ඵාසං, පිහකං, කිලෝමකං, යකනං, හදයං, වක්කං, අට්ඨිමිඤ්ජා, අට්ඨී, නහාරූ, මංසං, තචෝ, දන්තා, නඛා, ලොමා, කෙසා"** යි කිය යුතු.

ඉක්බිති **මත්ථලුඞ්ග** පඤ්චකයෙහි **අන්තං, අන්තගුණං, උදරියං, කරීසං මත්ථලුඞ්ගං"** යි කියා යළි ප්‍රතිලෝම වශයෙන් **"මත්ථලුඞ්ගං, කරීසං, උදරියං, අන්තගුණං, අන්තං, පප්ඵාසං, පිහකං, කිලෝමකං, යකනං, හදයං, වක්කං, අට්ඨිමිඤ්ජා, අට්ඨී, නහාරූ, මංසං, තචෝ, දන්තා, නඛා, ලොමා, කෙසා"** යි කිය යුතු.

ඉක්බිති **මේදච්ඡක්කයෙහි** **"පිත්තං, සෙම්හං, පුබ්බං, ලෝහිතං, සේදෝ, මේදෝ"** යි කියා යළි ප්‍රතිලෝම වශයෙන් **"මේදෝ, සේදෝ, ලෝහිතං, පුබ්බං, සෙම්හං, පිත්තං, මත්ථලුඞ්ගං, කරීසං, උදරියං, අන්තගුණං, අන්තං, පප්ඵාසං, පිහකං, කිලෝමකං, යකනං, හදයං, වක්කං අට්ඨිමිඤ්ජා, අට්ඨී, නහාරූ, මංසං, තචෝ, දන්තා, නඛා, ලොමා, කෙසා"** යි කිය යුතු.

ඉක්බිති **මුත්තාවච්ඡක්කයෙහි** **"අස්සු, වසා, ඛේළෝ, සිඞ්ඝාණිකා, ලසිකා, මුත්තං"** යි කියා යළි ප්‍රතිලෝම වශයෙන් **"මුත්තං, ලසිකා, සිඞ්ඝාණිකා, ඛේළෝ, වසා, අස්සු, මේදෝ,**

සෙදෙ, ලෝහිතං, පුබ්බෝ, සෙම්හං, පිත්තං, මත්ථලුඞ්ගං, කරීසං, උදරියං, අන්තගුණං, අන්තං, පත්තාසං, පිහකං, කිලෝමකං, යකනං, හදයං, වක්කං, අට්ඨිමිඤ්ජා, අට්ඨි, නහාරූ, මංසං, තචෝ, දන්තා, නඛා, ලෝමා, කෙසා" යි කීය යුතු යි.

(පෘථිවි ධාතු බහුල බැවින් **මත්ථලුඞ්ගය** – "**කරීසං, මත්ථ-ලුඞ්ගං**"යි කරීසය අවසන් කොට කීහ. මෙහි වනාහී "මංසං, නහාරූ, අට්ඨි, අට්ඨිමිඤ්ජා, වක්කං; වක්කං, අට්ඨිමිඤ්ජා, අට්ඨි, නහාරූ, මංසං, තචෝ, දන්තා, නඛා, ලෝමා, කෙසා" යි මෙසේ වක්ක පඤ්චකාදියෙහි අනුලෝම වශයෙන් සජ්ඣාය කියා ප්‍රතිලෝම සජ්ඣාය පූරීමයන් හා සම්බන්ධ කොටැ කියන ලද. මෙසේ සජ්ඣාය ක්‍රමය **සම්මාභවිනෝදනියෙහි** වෙන වෙන තුන් පඤ්චාහයෙක පූරීමයන් හා එක් කොටැ තුන් පඤ්චාහ-යෙකැයි පඤ්චාහ ෂට්කයක් සජ්ඣාය කටයුතුය යි යමක් කියන ලද ද, ඔහු ආදී අන්‍ය දක්වන පිණිස කියන ලදැ යි දත යුතු. **සම්මාභවිනෝදනියෙහි** තව පඤ්චකයෙහි යට කී නියමය අනුලෝමයෙන් ම පස් දවසෙක, පටිලෝමයෙන් පස් දවසෙක, අනුලෝම පටිලෝමයෙන් පස් දවසෙකැයි අඛණ්ඩ සජ්ඣාය කටයුතු ය. ඉක්බිති ආචාරීන් සමීපයට ගොස් **වක්කපඤ්චකය** ඉගෙනැ එසේ අඛණ්ඩ සජ්ඣාය කටයුතු ය. ඉක්බිත්තෙන් ඒ දස කොටසුන් එක් කොටැ ගෙනැ අඛණ්ඩ සෙකැ, නැවත **පත්තාසපඤ්චකාදියෙහි** දු එකී එකී පඤ්චකය ඉගෙනැ අඛ-අඛණ්ඩ සෙක, ඉක්බිත්තෙන් ඒ පසළොස් කොටසුන් එක් කොටැ ගෙනැ අඛණ්ඩ සෙක, **මත්ථලුඞ්ගපඤ්චකය** අඛණ්ඩ සෙක, ඒ විසි කොටසුන් එක් කොටැ ගෙනැ අඛණ්ඩ සෙක, **මේදවජ්ඣායය** අඛණ්ඩ සෙක, ඉක්බිති ඒ සවිසි කොටසුන් එක් කොටැ ගෙනැ අඛණ්ඩ සෙකැ, **මුත්තවජ්ඣායය** අඛණ්ඩ සෙක, ඉක්බිති සියලු දෙනාස් කොටසුන් එක් කොටැ ගෙනැ අඛණ්ඩ සෙකැ යි මෙසේ සමස්ත සජ්ඣාය කට යුතු ය යි කියන ලදී. එහි ආදි වූ අනුලෝම සජ්ඣාය ද, අනුලෝම – පටිලෝම සජ්ඣායයෙහි අන්ත වූ පටිලෝම සජ්ඣාය ද මෙහි දක්වන ලදැ යි දත යුතුයි. සජ්ඣාය කාල-යෙහි ම කෙසාදි කොට්ඨාසයන්ගේ වණ්ණ නිමිත්තය, සණ්ඨාන නිමිත්තය, දිසා නිමිත්තය, ඔකාසනිමිත්තය, පරිච්ඡේදනිමිත්තය යන මොවුන් තෙප්ලෙන් තෙප්ලෙන් පැහැරැ පැහැරැ එකී එකී කොටස්හි මෙ ම වැන්නැ යි තුන් පරිද්දෙකින් සජ්ඣාය කට යුතු යි" යනු සන්න යි.)

මෙසේ සියක් කල් දහස් කල් සියදහස් කල් වවතයෙන් කිය කියා සජ්ඣායනා කට යුතු. එහින් කම්ටහන් පෙළ පුහුණු වෙයි. සිත ඔබ මොබ නුදුව සි. කොටස් ප්‍රකට වෙයි. හත්ථ සංඛලිකාවක් සේ ද, වතිපාදපන්තියක් සේ ද වැටහෙයි. ("හත්ථ සංඛලිකා නම් දෙ අත එකමුඛ කොටැ ඔවුනොවුන් හා සම්බන්ධ කොටැ තබන ලද ඇඟිලි" සි. වතිපාදපන්ති නම් වැටෙහි ඉනී පෙළ සි.)

2 සිතින්

වවතයෙන් සේ ම සිතින් ද සජ්ඣායනා කට යුතු සි. වවත යෙන් කරන සජ්ඣායනාව සිතින් සජ්ඣායනා කිරීමට ද, සිතින් සජ්ඣායනාව අගුහ ලක්ඛණාවබොධයට ද උපකාර වන්නේ ය.

3 වණ්ණ වශයෙන්

කෙසාදීන්ගේ වණ්ණය ව්‍යවස්ථා කට යුතු සි.

4 සණ්ඨාන වශයෙන්

කෙශාදීන්ගේ සටහන් ව්‍යවස්ථා කට යුතු සි.

5 දිශා වශයෙන්

ශරීරයෙහි නාභියෙන් උඩ උඩදිසා ය. නාභියෙන් යට යට දිසා ය. මේ කෙසාදි කොටස් මේ මේ දිශායෙහි ය සි දිශා ව්‍යවස්ථා කට යුතු සි.

6 අවකාශ වශයෙන්

මේ කොටස් මේ මේ අවකාශයෙහි ය සි අවකාශ ව්‍යවස්ථා කට යුතුසි.

7 පරිච්ඡේද වශයෙන්

සභාගපරිච්ඡේදය, විසභාගපරිච්ඡේදය සි පරිච්ඡේද දෙකෙකි. මේ කෙසාදි කොටස් යට හා මතු හා සරස හා මෙ තම් දෙසින් පරිච්ඡින්නය සි සභාගපරිච්ඡේදය ද, මේ කෙස් ය, ලොම් නො වේ, මේ ලොම් ය, කෙස් නො වේ ය සි අමිශ්‍ර වශයෙන් විසභාග පරිච්ඡේද ය ද දත යුතු සි.

මෙසේ සප්තවිධ උද්ග්‍රහ කෞශල්‍යය කියා දීලා වැළි මේ කම්මට්ඨානය අසුවල් සූත්‍රයෙහි පිළිඹුල් වශයෙන් විදහල්ලේ ය. අසුවල් සූත්‍රයෙහි ධාතු වශයෙන් විදහලේ ය සි කියා දිය යුතු සි.

මේ වනාහී **සතිපට්ඨාන**[1] සූත්‍රයෙහි පිළිකුල් වශයෙන් ද, **මහා-හත්ථිපදෝපම**,[2] **මහාරාහුලෝවාද**,[3] **ධාතුවිභඞ්ග**[4] යන්හි ධාතු වශයෙන් ද වදාරන ලද්දේ ය. **කායගතාසති**[5] සූත්‍රයෙහි දී වණ්ණ වශයෙන් වැටහෙන්නවුන් සඳහා චතුර්ධ්‍යාන බෙදන ලද්දේ ය. එහි ධාතු වශයෙන් වදාළ කොටස විදර්ශනා **කර්මස්ථාන** ය. ප්‍රතිකූල වශයෙන් වදාළ කොටස සමථ **කර්මස්ථාන** ය. මෙහි සමථ **කර්මස්ථාන** මෑ යි.

සපනවිධ උද්ග්‍රහකෞශල්‍ය විධි යි.

මෙසේ උද්ග්‍රහ කෞශල්‍යය කියා දී ඉක්බිති **දශවිධමනස්කාර කෞශල්‍යය** කියා දිය යුතු යි.

දශවිධ මනස්කාර කෞශල්‍යය.

1 **අනුපූර්ව වශයෙන්**
2 **නානා ගිස්ස වශයෙන්**
3 **නානා සන්තක වශයෙන්**
4 **වික්ඛේප දුරුකිරීම් වශයෙන්**
5 **ප්‍රඥප්ති ඉක්මීම් වශයෙන්**
6 **අනුපූර්ව මුසුවන වශයෙන්**
7 **අජ්ඣාන වශයෙන්**
8 **අධිචිත්ත සූත්‍ර වශයෙන්**
9 **සීතිභාව සූත්‍ර වශයෙන්**
10 **බොජ්ඣඞ්ග කොසල්ල සූත්‍ර වශයෙන්**

1 අනුපූර්ව වශයෙන්

මේ **කර්මස්ථානය** පුනුණු කරන්නට ගත් තැන් පටන් කෙශාදි දෙතිස් **කොටස්** පිළිවෙළින් මෙතෙහි කළ යුතු ය. එකක් හැර එකක් මෙතෙහි නො කළ යුතු ය. පෙති දෙතිසකින් යුත් හිණිමහෙක තහිත අදහස පුරුෂ එක් එක් පෙත්ත හැර හැර තහුත් **කල්‍යානත** වැ වැටෙ යි. මත්තට නැඟ ගත නො හැකි වෙයි. එමෙන් එකක් හැර එකක් මෙතෙහි කරන යොගාව-චර ද භාවනා සම්පත්ති වශයෙන් ලබා ගත යුතු ආස්වාදය නො ලැබැ සිත කල්‍යානත වැ වැටෙයි. භාවනාව සම්පාදනය කර ගත නො හැකි වෙ යි. එ බැවින් පිළිවෙළින් ම මෙතෙහි **කළ** යුතු යි.

2 නානා ගිස්ස වශයෙන්

පිළිවෙළින් මෙතෙහි කරන්නහු විසින් දු ඉතා ගිස්ස වශයෙන් මෙතෙහි නො කළ යුතු. තුන් යොදුන් මහකට

---

[1] දී: නි: මහාව: 179 [2] ම: නි: මූලපණ්ණාසක 199
[3] ම: නි: මජ්ඣිම ප: 68 [4] ම: නි: උපරිපණ්ණාසක 245
[5] ම: නි: උපරිප: 117

පැමිණෙයා යුතු තොයා යුතු තැන් තො සලකා ලහි ලහියේ සිය වරක් හෝ ගමනා ගමනය කරන පුරුෂ හට ද යා යුතු මග අවසන් වුවත් යා යුතු තො යා යුතු තැන් විචාරා ම යා යුතු වන්නා සේ ශීඝ්‍ර වැ මෙතෙහි කරන්නහුට කර්මස්ථානය අවසන් වුවත් විභූත වශයෙන් තො වැටහෙන්නේ ය. විශෙෂ ගුණයක් ගෙනැ තො දෙන්නේ ය. එ බැවින් අතිශීඝ්‍ර වශයෙන් මෙතෙහි තො කළ යුතු සි.

3 නානා සඤ්ඤා වශයෙන්

ඉතා ශීඝ්‍රයෙන් මෙතෙහි තො කළ යුතු සේ ම ඉතා සෙමෙන් ද මෙතෙහි තො කළ යුතු ය. එක් දවසින් තුන් යොදුන් මඟක් ගෙවා යා යුතු පුරුෂයකු හට අතර මග ගස්-ගල්-විල් බලමින් ප්‍රමාද වෙමින් යන් ම දෙතුන් දිනකින් ඒ මඟ ගෙවා යා යුතු වන්නා සේ ඉතා සෙමෙන් මෙතෙහි කරන කල කර්මස්ථානයාගේ අවශානයෙක් තො වන්නේ ය. විශෙෂාධිගමයට ප්‍රත්‍යය ද තො වන්නේ ය.

4 වික්ෂෙප දුරුකිරීම් වශයෙන්

කර්මස්ථානය හැර පියා පිටත පුථුත්තාරම්මණයෙහි සිත තො හෙලිය යුතු ය. එකපදික ප්‍රජාත මාඝීයෙක ගමන් ගත් පුරුෂයා ඇක්මෙන පිය තො සලකා ඔබ මොබ බලමින් යන්නේ පදවාරය වැරදිණි නම් ශතපෙඅරුෂ ප්‍රජාතයෙහි හෙත්තා සේ චිත්ත වික්ෂෙපය ඇති කල කර්මස්ථානය පිරිහෙන්නේ ය – නැති වැ යන්නේ ය, එ බැවින් වික්ෂෙප දුරු කිරීම් වශයෙන් මෙතෙහි කට යුතු සි. (රූපාදීහු නීලාදි විසින් නානා සවභාව ඇති හෙයින් පුථුත්තාරම්මණ නම් වෙත්. අශුචිය, පිළිකුලු සි කෙශාදියෙහි පැවතිය යුතු වූ අශුභානුදර්ශීනාව කැර ශුභාදි විසින් ගන්නා ලබන කෙශාදීහු බහිද්ධා පුථුත්තාරම්මණ නම් වෙති සි දත යුතු" යනු සත්‍ය සි.)

5 ප්‍රඥප්ති ඉක්මීම් වශයෙන්

කෙස් ය, ලොම් ය යනාදි වශයෙන් පැවැති ප්‍රඥප්තිය ඉක්මැ පිළිකුල්ය සි සිත තැබිය යුතු සි. ජල දුර්ලභ නියං සමයෙහි මිනිස්සු වල්හි ළිඳක් දුටු නම් එහි තලපත් ආදි සලතුණු බැඳැ ඒ සලකුණින් අවුත් නහති. පැන් බොති. නිතර එහි ගමනාගමනයෙන් ගමන් මග ප්‍රකට වූ කල ඒ සලකුණින් ප්‍රයොජන නැත. රිසි රිසි ඇසිල්ලෙහි අවුත්

නහති. පැන් බොහි. එමෙන් පූර්වභාගයෙහි කෙස් ය, ලොම් ය යනාදි වශයෙන් ප්‍රඥප්තිය මෙනෙහි කරන කල පිළිකුල් බව ප්‍රකට ය. ඉක්බිති ඒ ප්‍රඥප්තිය ඉක්මැ පිළිකුල් බැව්හි ම සිත යෙදිය යුතු හි.

6 අනුපූර්ව මුඛවන වශයෙන්

දෙතිස් කොටස් අතුරෙන් යම් යම් කොටසෙක් නො වැටහේ නම් ඒ නො වැටහෙන කොටස් හැර පීමෙන් අනුපූර්ව මුඛවන වශයෙන් මෙනෙහි කළ යුතු. ඒ කළ යුතු මෙසේ ය.

ආදි කර්මිකයා **'කෙසා'** යි මෙනෙහි කරත් ම මනසිකාරය ගොස් "මුත්තං" යන අවශාන කොටසෙහි හැපී සිටින්නේ ය. **'මුත්තං'** යි මෙනෙහි කරත් ම **'කෙසා'** යන ප්‍රථම කොටසෙහි හැපී සිටින්නේ ය. මෙසේ මෙනෙහි කරත් - කරත් ඔහුට ඇතැම් කොටස් වැටහී සිටියි. ඇතැම් කොටස් නො වැටහී සිටියි. එවිට වැටහෙන කොටස් ගෙනැ එහි භාවනා කට යුතු ය. දෙකක් වැටහෙන කල ඉතිදු වඩා වැටහෙන කොටස ගෙනැ එ ම මෙනෙහි කිරීමෙන් අපිණා උපදවා ගත යුතු හි.

උපමාවෙක් වෙසේ ය:- තල් රුක් දෙතිසක් ඇති තල් වනයෙකි. එහි වදුරෙක් වසන්නේ ය. ඌ අල්වාගනු කැමැති වැද්දෙක් ඌ ලැගුම් ගෙනැ සිටි මුල් තල් රුකෙහි කොළයට ඊයෙන් විදැ ඔල්වර හඬ නගන්නේ ය. වදුරා පිළිවෙළින් ඒ ඒ තල් රුකට පැනැ පැනැ ගොස් අවශාන තල් රුකට යන්නේ ය. වැද්දා එහි දු ගොස් පෙර සේ ඊයෙන් විදැ හඬ නගන්නේ ය. එවිට වදුරා පෙර සේ රුකින් රුකට පැනැ පැනැ ගොස් මුල් තල් රුකට එන්නේ ය. මේසේ උන් උන් තැනින් උඟුළුවනු ලබන්නේ හඬ නැඟ නැඟ තන්හි නැගිටැ පසු වැ එක් තලකට පැනැ එහි මැද තල් ගොබ් දණ්ඩ අල්වා ගන්නේ ය. විදුනු ලැබුව ත් නො නැහෙන්නේ ය. එහි තල් වනයෙහි දෙතිස් තල් රුක් මෙනි මේ ශරීරයේ දෙතිස් කොටස්, වදුරා මෙනි සිත, වැද්දා මෙනි යොගාවචර, දෙතිස් තලක් ඇති තල් වනයෙහි වදුරාගේ විසීම මෙනි දෙතිස් කොටස් ඇති සිරුරෙහි චිත්තයා ගේ අරමුණු වශයෙන් හැසිරීම. වැද්දා මුල් තලෙහි කොළ හියෙන් විදැ හඬ නැඟ කල වදුරා තලින් තල පැනැ අවශාන තලට යාම මෙනි යොගි "කෙසා" යි මෙනෙහි කරත්තට වත් කල පිළිවෙළින් ගොස් සිත අවශාන කොටසෙහි හැපී සිටීම.

එහි දු හඬ තැලූ කල වදුරා පෙරලා ඊම මෙනි සිත පෙරලා මුල් කොටසට ඊම. නැවැත නැවැත උගුළුවනු ලබන වදුරා ශබ්ද කළ කළ තැනින් නැගී සිටීම මෙනි නැවැත නැවැත මෙතෙහි කරත් ම නො වැටහෙන කොටස් හැර වැටහෙන කොටස්හි පරිකර්මී කිරීම. අවශානයෙහි එක් තලෙක ගී ඊ මැද ගොබ් දණ්ඩ අල්වා ගෙනැ විදිනු ලැබුවත් නො නැගීම මෙනි අවසාන යෙනි වැටහෙන කොටස් දෙකක් ඇති කල්හි ඉනි දු එකක් හැර වඩා වැටහෙන කොටස ගෙනැ එ ම නැවැත නැවැත මෙතෙහි කොටැ අර්පණා උපදවීම.

තවද උපමාවෙකි.

දෙනිස් කුලයක් ඇති ගමෙකි. පිණ්ඩපාතික භික්ෂු නමෙක් ඒ ඇසුරු කොටැ වසන්නේ ය. භික්ෂු පිඬු පිණිස යන්නේ ආදි ම ගෙයි භික්ෂා දෙකක් ලද නම් ඔබ්බෙහි එක් ගෙයක් හරන්නේ ය. දෙවන දින භික්ෂා තුනක් ලද නම් ඔබ්බෙහි දෙ ගෙයක් හරන්නේ ය. තෙ වන දින ආදි ගෙයි ම පා පුරා ලද නම් ඔබ්බෙහි නො ගොස් අසුන් හලට වැදූ වළඳන්නේ ය. දෙනිස් කුලයක් ඇති ගම මෙනි ඇත්තිංසාකාරය. පිණ්ඩපාතික භික්ෂු මෙනි යොගී. භික්ෂු ඒ ගම නිසා විසුම මෙනි යොගි ඇත්තිංසාකාරයෙහි පරිකර්මී කිරීම. ආදි ම ගෙයි භික්ෂා දෙකක් ලැබැ ඔබ්බෙහි එකක් හැරීම ද, දෙ වැනි දින භික්ෂා තුනක් ලැබැ ඔබ්බෙහි දෙකක් හැරීම ද මෙනි මෙතෙහි කරත් කරත් නො වැටහෙන කොටස් හැර හැර වැටහෙන කොටස්හි දෙ කොටස දක්වා පරිකර්මී කිරීම. තුන් වැනි දින ආදි ගෙයි ම පා පුරා ලැබැ අසුන් හල භිදැ වැළඳීම මෙනි ඒ දෙකිනු දු වඩා වැටහෙන්න ගෙනැ එ මැ නැවත නැවත මෙතෙහි කොටැ අර්පණා උපදවීම.

7 අර්පණා වශයෙන්.

අර්පණා වන්නේ කොටස් වශයෙනි, කෙසාදීන් අතුරෙන් එක් එක් කොටසෙක ම අර්පණා වන්නේය යි කී සේ යි.

8 අධිචිත්ත සූත්‍ර වශයෙන්.

"අධිචිත්තමනුයුත්තෙන භික්ඛවෙ භික්ඛුනා තීණි නිමිත්තානි මනසිකාතබ්බානි. කාලෙන කාලං සමාධිනිමිත්තං මනසිකාතබ්බං, කාලෙන කාලං පග්ගහනිමිත්තං මනසිකාතබ්බං, කාලෙන කාලං උපෙක්ඛානිමිත්තං මනසිකාතබ්බං. සචෙ භික්ඛවෙ අධිචිත්තමනුයුත්තෙතා භික්ඛු

සමාධිනිමිත්තඤ්ඤේව මනසිකරෙය්‍ය ඨානං තං චිත්තං ඒකාසජ්ජාය සංවත්තෙනය්‍ය. සචෙ භික්ඛවෙ අධිච්චත්ත මනුයුත්තොභික්ඛු පග්ගහනිමිත්තඤ්ඤේව මනසිකරෙය්‍ය ඨානං තං චිත්තං උද්ධච්චාය සංවත්තෙනය්‍ය. සචෙ භික්ඛවෙ අධිච්චත්තමනුයුත්තොභික්ඛු උපෙක්ඛානිමිත්තඤ්ඤේව මනසිකරෙය්‍ය ඨානං තං චිත්තං න සම්මාසමාධියෙය්‍ය ආසවානං ඛයාය.

යතො ච ඛො භික්ඛවෙ අධිච්චත්තමනුයුත්තොභික්ඛු කාලෙන කාලං සමාධිනිමිත්තං – පෙ – පග්ගහනිමිත්තං – පෙ – උපෙක්ඛානිමිත්තං මනසිකරොති තං හොති චිත්තං මුදු ච, කම්මඤ්ඤඤ්ච, පභස්සරං ච, න ච පභඞ්ගු. සම්මා සමාධියති ආසවානං ඛයාය.

සෙය්‍යථාපි භික්ඛවෙ සුවණ්ණකාරෙ වා සුවණ්ණකාරන්තෙවාසි වා උක්කං බන්ධති, උක්කං බන්ධිත්වා උක්කා මුඛං ආලිම්පෙති, උක්කාමුඛං ආලිම්පෙත්වා සණ්ඩාසෙන ජාතරූපං ගහෙත්වා උක්කාමුඛෙ පක්ඛිපිත්වා කාලෙන කාලං අභිධමති, කාලෙන කාලං උදකෙන පරිප්පොසෙති, කාලෙන කාලං අජ්ඣුපෙක්ඛති, සචෙ භික්ඛවෙ සුවණ්ණකාරෙ වා සුවණ්ණකාරන්තෙවාසි වා තං ජාතරූපං එකන්තං අභිධමෙය්‍ය ඨානං තං ජාතරූපං ඩහෙය්‍ය. සචෙ භික්ඛවෙ සුවණ්ණකාරෙ වා සුවණ්ණකාරන්තෙවාසි වා තං ජාතරූපං එකන්තං උදකෙන පරිප්පොසෙය්‍ය, ඨානං තං ජාතරූපං නිබ්බායෙය්‍ය, සචෙ භික්ඛවෙ සුවණ්ණකාරෙ වා සුවණ්ණකාරන්තෙවාසි වා තං ජාතරූපං එකන්තං අජ්ඣුපෙක්ඛය්‍ය ඨානං තං ජාතරූපං න සම්මා පරිපාකං ගච්ඡෙය්‍ය. යතො ච ඛො භික්ඛවෙ සුවණ්ණකාරෙ වා සුවණ්ණකාරන්තෙවාසි වා තං ජාතරූපං කාලෙන කාලං අභිධමති, කාලෙන කාලං උදකෙන පරිප්පොසෙති, කාලෙන කාලං අජ්ඣුපෙක්ඛති තං හොති ජාතරූපං මුදු ච කම්මඤ්ඤඤ්ච පභස්සරං ච, න ච පභඞ්ගු, සම්මා උපෙති කම්මාය, යස්සා යස්සා ච පිළන්ධනවිකතියා ආකඞ්ඛති යදි පඨවිකාය, යදි කුණ්ඩලාය, යදි ගීවෙය්‍යකාය, යදි සුවණ්ණමාලාය තං තස්ස අත්ථං අනුභොති.

එවමෙව ඛො භික්ඛවෙ අධිච්චත්තමනුයුත්තොභික්ඛුනා – පෙ – සම්මා සමාධියති ආසවානං ඛයාය. යස්ස යස්ස ච අභිඤ්ඤාසච්ඡිකරණීයස්ස ධම්මස්ස චිත්තං අභිනින්නාමෙති

අභිඤ්ඤා, සවජ්ඣකිරියාය තත්‍රතත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ”[1] යනු අධිචිත්ත සූත්‍රය යි එහි සංක්ෂිප්තාර්ථ මෙසේ ය.

‘මහණෙනි! සමථ විදර්ශනා භාවනාවෙහි යෙදුණු භික්ෂු විසින් නිමිති තුනෙක් මෙනෙහි කළ යුතු ය. කලින් කල සමාධිනිමිත්ත මෙනෙහි කළ යුතු ය. කලින් කල පග්ගහනිමිත්ත මෙනෙහි කළ යුතු ය. කලින් කල උපෙක්ඛා නිමිත්ත මෙනෙහි කළ යුතු ය. මහණෙනි! ඉදින් ඒ භික්ෂු සමාධි නිමිත්ත ම මෙනෙහි කෙළේ නම් සිත කුසීත බවට වැටෙන්නේ ය. පග්ගහ නිමිත්තම මෙනෙහි කෙළේ නම් සිත නො සන්සුන් බවට වැටෙන්නේ ය. උපෙක්ඛානිමිත්ත ම මෙනෙහි කෙළේ නම් සිත ආශ්‍රවක්ෂය පිණිස සමාධිමත් නො වන්නේ ය. මහණෙනි! ඉදින් ඒ භික්ෂු කලින් කල සමාධිනිමිත්ත – කලින් කල පග්ගහ නිමිත්ත – කලින් කල උපෙක්ඛානිමිත්ත මෙනෙහි කෙළේ නම් ඔහුගේ ඒ සිත මෘදු ද, කර්මණ්‍ය ද, ප්‍රභාස්වර ද වන්නේ ය. නො බිඳෙන සුලු වන්නේ ය. ආශ්‍රවක්ෂය පිණිස මොනවට සමාධිමත් වන්නේ යි.

මහණෙනි! රන්කරු හෝ රන්කරු අතවැසි හෝ උදුන සඳ, උදුන් මුව ගිනි පත්තු කැරැ අඹුවෙකින් රත්රන් ගෙනැ එහිලා වරින් වර පිඹින්නේ ය. වරින් වර දිය ඉසින්නේ ය. වරින් වර උපෙක්ෂක වන්නේ යි. ඉදින් හේ පිම්බේ ම නම් රත්රන පැලිගි යන්නේ ය. දිය ම ඉස්සේ නම් නිවී යන්නේ ය. උපෙක්ෂක ම වූයේ නම් පරිපාකයට නො යන්නේ යි. මහණෙනි! ඉදින් හේ වරින් වර පිම්බේ නම් වරින් වර දිය ඉස්සේ නම් වරින් වර උපෙක්ෂක වූයේ නම් ඒ රත්රන මෘදු ද, කර්මණ්‍ය ද, ප්‍රභාස්වර ද වන්නේ ය. නො බිඳෙන සුලු වන්නේ ය. කර්මාන්ත පිණිස සුදුසු වන්නේ ය. ඉදින් එයින් නලල් පටක් හෝ කුණ්ඩලාභරණයක් හෝ ග්‍රීවාභරණයක් හෝ සුවර්ණමාලාවක් හෝ කරනු කැමති වූයේ නම් එය කළ හැකි වන්නේ ය.

මහණෙනි! එමෙන් සමථ විදර්ශනායෙහි යෙදුණු භික්ෂු විසින් – පෙ – ආශ්‍රවක්ෂය පිණිස සමාධිමත් වන්නේ ය. අභිඥායෙන් අවබෝධ කටයුතු – යුතු වූ යම් යම් ධර්මයක් එසේ අවබෝධ කර ගැනීම පිණිස සිත නැමිණි නම් පූර්ව හෙතු ආදි කරුණු ඇති කල්හි එය අවබෝධ කැරැ ගත හැකි වන්නේ ය.

---

[1] අ: නි: තිකනිපාත 156

9 සීතිභාව සූත්‍ර වශයෙන්

"ජානි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො අනුත්තරං සීතිභාවං සච්ඡිකාතුං. කතමෙහි ජානි? ඉධ භික්ඛවෙ භික්ඛු යස්මිං සමයෙ චිත්තං නිගණ්හිතබ්බං තස්මිං සමයෙ චිත්තං නිගණ්හාති, යස්මිං සමයෙ චිත්තං පග්ගහෙතබ්බං තස්මිං සමයෙ චිත්තං පග්ගණ්හාති, යස්මිං සමයෙ චිත්තං සම්පහංසිතබ්බං තස්මිං සමයෙ චිත්තං සම්පහංසෙති, යස්මිං සමයෙ චිත්තං අජ්ඣුපෙක්ඛිතබ්බං තස්මිං සමයෙ චිත්තං අජ්ඣුපෙක්ඛති, පණීතාධිමුත්තිකො ච හොති, නිබ්බාණාභිරතො. ඉමෙහි ඛො භික්ඛවෙ ජානි ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො අනුත්තරං සීතිභාවං සච්ඡිකාතුං"[1] යනු සීතිභාව සූත්‍රය යි. එහි සංක්ෂිප්තාර්ථය මෙසේ ය.

'මහණෙනි! ධර්ම සයෙකින් යුක්ත භික්ෂු නිරුත්තර ශීති භාවය – සිහිල් බව – නිර්වාණය අවබෝධ කැරැ ගන්නට සමර්ථ ය. කවර ධර්ම සයෙකින් ද, මහණෙනි! භික්ෂු ඉදින් සිතට නිග්‍රහ කටයුතු කල්හි නිග්‍රහ කෙරේ ද, සිතට ප්‍රග්‍රහ කටයුතු කල්හි ප්‍රග්‍රහ කෙරේ ද, සිත සතුටු කට යුතු කල්හි සතුටු කෙරේ ද, සිතට උපෙක්ෂා කට යුතු කල්හි උපෙක්ෂා කෙරේ ද, ප්‍රණීතාධිමුක්තික වේ ද හෙවත් මාගී ඵලයන්ට නැමුණු සිත් ඇති වේ ද, නිර්වාණයෙහි ඇළුණේ වේ ද, මහණෙනි! මේ ධර්මයෙන් යුක්ත භික්ෂු අනුත්තර ශීතිභාවය අවබෝධ කැරැ ගන්නට සමර්ථ ය.

10 බොජ්ඣංග සංයුත්ත සූත්‍ර වශයෙන්

බොජ්ඣංග සංයුත්තය වනාහි **"එවමෙව ඛො භික්ඛවෙ යස්මිං සමයෙ ලීනං චිත්තං හොති අකාලො තස්මිං සමයෙ පස්සද්ධි සම්බොජ්ඣංගස්ස භාවනාය"**[2] යනාදීන් අර්ථ කෞශල්‍ය කථායෙහි දැක්වුණේ ය.

මෙසේ යට දැක්වුණු සප්තවිධ උද්ග්‍රහ කෞශල්‍යය මනා වැ දැනැගෙන මේ දශවිධ මනසිකාර කෞශල්‍යය ද මනා වැ නිශ්චය කොටැ ගෙන ඒ යෝගී විසින් උභය කෞශල්‍ය වශයෙන් කම්මට්ඨානය උගත යුතු ය. ඉදින් උහුට ආවාර්‍යවරයාණන් සමඟ එක වෙහෙර විසීම පහසු නම් විස්තර වශයෙන් කියවා නොගෙන කම්මට්ඨානයෙහි යෙදෙමින් විශෙෂ ලැබ ගනිමින් මතු මතු කියවා ගත යුතු ය. අත් තැනෙකැ වසනු කැමැති නම් යට කීසේ විස්තර වශයෙන් කියවා ගෙන පුන-පුනා තෙප්ලෙනුදු සිහිනුදු පිරිවහා සියලු ගැට තැන් ශුද්ධ කොටැ ගෙන පඨවිකසිණයෙහි කී පරිදි නුසුදුසු සෙනසුන් හැරපියා සුදුසු

[1] අ: නි: ජකනි: 611 [2] සං: නි: බොජ්ඣඞ්ගසං 881

සෙනස්තෙක වසමින් කුඩා පළිබෝධ ද දුරු කොටැ ගෙනැ ප්‍රතිකූල මනසිකාරයෙහි පරිකර්ම කළ යුතු සි.

ඔහු විසින් පළමු කොටැ කෙශයෙහි නිමිති ගත යුතු. කෙසේ ගත යුතු ද, එක කෙස් ගසක් හෝ කෙස් ගස් දෙකක් හෝ කඩා අල්ලේ තබා ගෙනැ පළමු කොට එහි වර්ණය සැලකිය යුතු. කපා ලූ තැනෙක හෝ ජලපාත්‍රයෙක හෝ කෑඳ පාත්‍රයෙක හෝ තිබෙන කෙස් බැලුව ද නිස්සරණාධ්‍යාශයෙන් බලන බැවින් වරද නැති. කලු පැහැ කල්හි දුටු තම් කලු පැහැය සි ද, සුදු පැහැ කල්හි දුටු තම් සුදු පැහැය සි ද, ඒ දෙකින් මුසු කල්හි දුටු තම් අධිකයේ පැහැ වශයෙන් ද මෙතෙහි කට යුතු. කෙස් මෙන් ම සියලු තව පංචක ඇසින් ම දැකැ නිමිති ගත යුතු. එසේ නිමිති ගෙනැ සියලු කොටස් **වර්ණ, සණ්ඨාන, දිශා, අවකාශ, පරිච්ඡේද** වශයෙන් ව්‍යවස්ථා කළ යුතු. එසේ ව්‍යවස්ථා කොට ඉක්බිති **වර්ණ, සණ්ඨාන, ගන්ධ, ආසය, අවකාස** යන පස් ආකාරයෙන් පිළිකුල් බව ව්‍යවස්ථා කළ යුතු. ඒ සියලු කොටස් පිළිබඳ පිළිවෙළ කථාව මෙසේ ය.

කෙශයෙහි වර්ණාදි පංචවිධ ව්‍යවස්ථාව

1 කෙස

කෙස් වනාහි ප්‍රකෘති වර්ණ වශයෙන් අළුත් පෙතෙල ඇට මෙන් කලු පැහැ ය. **සණ්ඨාන** වශයෙන් දික් වට තරාදි දඬු බදු ය. **දිශා** වශයෙන් උඩ දිශායෙහි පිහිටයේ ය. දෙපස **කන් සිලින් ද, ඉදිරිපස නළල් කෙළවරින් ද, පසුපසැ ගල්වලුයෙන් ද** පරිච්ඡින්න වූ හිස් **කබල** වසා සිටිතාක් සම කෙස් **අවකාශය** ය. ඒ වනාහි පරිච්ඡේද වශයෙන් හිස වසා සිටි සමෙහි විසඟක් පමණ ඇතුළු වැ පිහිටා- යට ඒ කෙශයන්ගේ ම මූල් තලයෙන් ද, මතු අහසින් ද, සරස ඒ ඒ කෙස් ගසින් ද **පරිච්ඡින්න** ය. 'කෙස් ගස් දෙකෙන් එක් කොටසෙක් නො වෙයි' යනු සභාග පරිච්ඡේද ය. 'කෙස් ලෝම නො වේ. ලෝම කෙස් නො වේ' යනාදි වශයෙන් සෙසු එක්තිස් කොටස් අසම්මිශ්‍ර බව, කෙස් නම් වෙන ම කොටසෙක යන බව විසභාග පරිච්ඡේදය සි.

කෙශ පිළිබඳ වර්ණාදි වශයෙන් පංචවිධ ප්‍රතිකූල ව්‍යවස්ථාව.

මේ කෙස් නම් **වර්ණ** වශයෙනුදු පිළිකුලි. **සණ්ඨාන** වශයෙනුදු පිළිකුලි. **ගන්ධ** වශයෙනුදු පිළිකුලි. **ආසය** වශයෙනුදු පිළිකුලි. **අවකාශ** වශයෙනුදු පිළිකුලි.

සිත්කලු වූ ද කැද බදුනෙක වේවා බත් බදුනෙක වේවා කෙස් වැනි කිසිවක් දැකැ "මේ ආහාරය කෙස් ගසින් මිශ්‍ර ය. බැහැර දමවු ය" යි පිළිකුල් උපදවති. මෙසේ කෙස් වණ්ණ වශයෙන් පිළිකුලි. රැ කැම කන විට කෙස් සටහන් ඇති වරා කෙන්දක් හෝ නියඳ කෙන්දක් හෝ හැපුණ හොත් එසේ ම පිළිකුල් කරති. මෙසේ **සණ්ඨාන** වශයෙන් පිළිකුලි. තෙල් ගැල්වුම් සුවඳ දුම් කැවීම් ආදියෙන් සංසකරණය නො කළ කෙස්වල ගඳ ඉතා පිළිකුල් ය. ගින්නෙහි පැළහෙන කෙස්වල ගඳ එයට වඩා පිළිකුල් ය. වණ්ණ වශයෙන් සණ්ඨාන වශයෙන් කෙස් පිළිකුල් නැතැ යි යම්තමින් කිය හැකි වුව ද, **ගන්ධ** වශයෙන් නම් **එකාන්තයෙන්** පිළිකුල්ම ය.

ළදරුවන්ගේ වර්චස වණ්ණ වශයෙන් කසාය වණ්ණ ය, සණ්ඨාන වශයෙන් කසාය පිඬෙක සණ්ඨාන ය. කසළ ගොඩ ලූ ඉදිමී ගිය කලු බල්ලකුගේ මළකුණ වණ්ණ වශයෙන් පැසුණු තල්-ගෙඩියක වණ්ණ ය, සණ්ඨාන වශයෙන් වට කොටැ ලූ මිහිඟු බෙරක සණ්ඨාන ය, උගේ දත් ද සමන් කැකුළු බදු ය. ඒ මේ වර්චස් හා බලුකුණ හා වණ්ණ වශයෙන් සණ්ඨාන වශයෙන් පිළිකුල් නැතැ යි යම්තමින් කිය හැකි වුව ද ගන්ධ වශයෙන් නම් එකාන්තයෙන් පිළිකුල් ය. එමෙන් කෙසුත් වණ්ණ වශයෙන් සණ්ඨාන වශයෙන් පිළිකුල් නැතැ යි යම්තමින් කිය හැකි වුව ද ගන්ධ වශයෙන් නම් පිළිකුල්ම ය. අපිරිසුදු තන්හි ගම්වැසියන් ගේ මළ – මූ ආදිය වැහීමෙන් සැදුණු පලාපත් නාගරිකයන්ට පිළිකුල් ය. පරිභොග නො කළ හැකි ය. එමෙන් කෙස් ද ලේ-සැරව – මළ – මූ – පිත් – සෙම් ආදිය වැහීමෙන් සැදුණේ ය. ඉතා පිළිකුල් ය. මේ **ආශය** වශයෙන් පිළිකුල් පරිදි යි. තවද මේ කෙස් නම් අසුචි ගොඩෙක හටගත් පුස් මෙන් එක්තිසක් පිළිකුල් කොටසෙහි හටගත්තේ ය. සොහොනෙහි කසළගොඩෙහි හටගත් පලා සේ අගල් ආදියෙහි හටගත් පියුම් සේ මහනිල් සේ අශුචි තන්හි හටගත් බැවින් පිළිකුල් ය. මේ **අවකාශ** වශයෙන් පිළිකුල් පරිදි යි.

මෙසේ කෙස්හි මෙන් සෙසු කොටස්හි ද **වණ්ණ, සණ්ඨාන, ගන්ධ, ආශ්‍රය, අවකාශ** වශයෙන් පඤ්චවිධ ප්‍රාතිකූල්‍යය දත යුතු. වණ්ණ, සණ්ඨාන, දිශා, අවකාශ පරිච්ඡේද වශයෙන් සියල්ල වෙන් වෙන් කොටැ ව්‍යවස්ථා කළ යුතු යි.

2 ලෝම

ලෝම වනාහි ප්‍රකෘති වර්ණ වශයෙන් කෙස් මෙන් නුමුසු කලු පැහැ ඇත්තේ නො වේ. කලු පිහුවන් පැහැ ඇත්තේ ය. **සණ්ඨාන** වශයෙන් අග නැමී ගිය තලමල් බදු ය. **දිශා** වශයෙන් උඩ යට යන දෙ දිසායෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් කෙස් පිහිටි තැන් හා අතුල් පතුල් හා හැර බොහෝ සෙයින් සෙසු මුළු සිරුර වසා සිටි සමෙහි පිහිටියේ ය. **පරිච්ඡේද** වශයෙන් ශරීරය වෙලා සිටි සමෙහි ලේඛිත්තකු පමණ ඇතුළට පිවිසෑ ගෙනෑ යට තම තමාගේ ම මුල් තෙලෙන් ද, මතු අවකාශයෙන් ද, සරස අන්‍යෝන්‍ය රොමයෙන් ද පරිච්ඡින්න වැ සිටියේ ය. ලොම දෙකෙක් එකට පිහිටියේ නො වේ. මේ ලෝම පිළිබඳ සභාග පරිච්ඡේදය යි. විසභාග පරිච්ඡේදය කෙශයට කී නියා මැයි.

3 නඛ

නඛ යනු විසි නියපොතු ය. ඒ **වර්ණ** වශයෙන් ශ්වේත වර්ණ ය. **සණ්ඨාන** වශයෙන් මසුන්ගේ කොරපොතු බදු ය. **දිශා** වශයෙන් පා නියපොතු යට දිශායෙහි ද, අත් නියපොතු උඩ දිශායෙහි ද පිහිටියේ ය. **අවකාශ** වශයෙන් ඇඟිලි පිටි අග පිහිටියේ ය. **පරිච්ඡේද** වශයෙන් දෙපස හා මුල යන තුන් දිශායෙහි ඇඟිලි කෙළවර මසින් ද, පිට හා අග ආකාශයෙන් ද, සරස ඔවුනොවුන් විසින් ද, පරිච්ඡින්න ය. නියපොතු දෙකෙක් එක් වැ නැත්තේ ය. මේ නිය පිළිබඳ සභාග පරිච්ඡේදය ය. විසභාග පරිච්ඡේදය කෙශයට කී නියා යි.

4 දන්ත

දන්ත යනු සම්පූර්ණ දත් ඇතියවුන්ගේ වශයෙන් දෙතිස් දත් ය. එ ද **වර්ණ** වශයෙන් ශ්වේත වර්ණ ය. **සණ්ඨාන** වශයෙන් නොයෙක් සටහන් ය. යට දත් ඇත්දෙහි මැද දත් සතර මැටි පිඬෙක පිළිවෙළින් තුබූ ලබූ ඇට බදු ය. එහි දැලේ එක එක දත එක් මුලක් හා එක් අගක් ඇත්තේ ය. ඉද්ද මල් කැකුළු බදු ය. එයින් දැලේ එක එක දත මුල් දෙකක් හා අග් දෙකක් ඇත්තේ ය. ගැල් ධුරයෙහි ඇවිළ විය පොලු බදු ය. එයින් දැලේ දත් දෙක දෙක මුල් තුනක් හා අග් තුනක් ඇත්තේ ය. එයින් දැලේ දත් දෙක දෙක මුල් සතරක් හා අග් සතරක් ඇත්තේ ය. උඩු ඇත්දෙහි ද මෙසේ යි. **දිශා** වශයෙන් උඩ දිශායෙහි පිහිටියේ ය. **අවකාශ**

වශයෙන් දෙහණු ඇටෙහි පිහිටියේ ය. **පරිච්ඡේද** වශයෙන් යට හණු ඇටෙහි පිහිටි තමන්ගේ ම මුල් තලයෙන් ද, මතු අහසින් ද, සරස ඔවුනොවුන් විසින් ද පරිච්ඡින්න ය. දත් දෙකෙක් එක් වැ නැත්තේ ය. මේ දත් පිළිබඳ සභාග පරිච්ඡේදය සි. විසභාග පරිච්ඡේදය කෙශයට කී නියා සි.

5 තව.

තව නම් මුළු සිරුර වසා සිටි සම ය. ඒ සම මතුයෙහි **කාලවණ්ණී** වූ ද, ශ්‍යාමවණ්ණ වූ ද පීතවණ්ණී වූ ද, සිවියෙක් ඇත මුළු සිරුරෙහි පිහිටි සිවිය උලුප්පා ගනු ලැබුවොත් ඩෙබර. ගෙඩියක් තරම් වේ. මුල කී සම **වණ්ණ** වශයෙන් ශ්වෙත වණ්ණ ය. ඒ බව ප්‍රකට වන්නේ ගිනි දැල්ලකින් හෝ අවියෙනින් හෝ පිට සිවිය නට කල්හි ය. සම **සණ්ඨාන** වශයෙන් සැකෙවින් ශරීර සණ්ඨාන ම ය. විත්‍ථාර වශයෙන් මේසේ ය. පා ඇඟිලි සම පටපණු කොඟ බඳු ය. පිටපතුල් සම පුටබඳ්ධ උපාහන බඳු ය. පුටබඳ්ධ උපාහන නම් සියලු පිටපතුල වැසෙන සේ සැදු වහන් ය. ජංඝා සම ඔත් වැසූ තල්කොළ බඳු ය. කලවේ සම සාල් පිරැ දික් පසුම්බියක් බඳු ය. ආනිසද සම දිය පිරැ පෙරහන් පටක් බඳු ය. පිටෙහි සම පුවරුවක් වසා ලූ සමක් බඳු ය. බඩෙහි සම **වීණා** ඔරුවක් වසා ලූ සමක් බඳු ය. ළෙහි සම බොහෝ සෙයින් සතරැස් සටහන් ය. දැතෙහි සම හියවුරක් වසා ලූ සමක් බඳු ය. පිටි අල්ලෙහි සම කරකොපුවක් හෝ පණාවැස්මක් බඳු ය. අත් ඇඟිලි යම යතුරු ඵවිකයක් බඳු ය. ග්‍රීවා සම ග්‍රීවා සැට්ට යක් බඳු ය. මුහුණෙහි සම කුඩා මහත් සිදුරු ඇති පණුකුඩුවක් බඳු ය. හිසෙහි සම පාත්‍රථවිකයක් බඳු සි.

සම අරමුණු කොටැ ගෙනැ භාවනා කරන යොගී විසින් උඩුතොල පටන්, නුවණ උඩු අතට මෙහෙයා පළමු කොටැ මුහුණ වසා සිටි සම ව්‍යවසථා කටයුතු. ඉක්බිති නළල් ඇට සම ව්‍යවසථා කට යුතු. ඉක්බිති ඵවිකයෙහි ලූ පාත්‍රයට ද ඵවිකයට ද අතරින් අත යවන්නා සේ හිස ඇටයට ද, හිස සමට ද, අතරින් නුවණ යවා ඇට හා සමග සම එකට බැඳී පවත්නා, බව නො තකා හිසෙහි සම ව්‍යවසථා කට යුතු. ඉක්බිති පිටිකර සම ද, ඉක්බිති අනුලෝම වශයෙන් හා ප්‍රතිලෝම වශයෙන් දකුණත සම ද, එසේ ම අනුලෝම වශයෙන් හා ප්‍රතිලෝම වශයෙන් වමත සම ද, ව්‍යවසථා කටයුතු. (අංශ ප්‍රදෙශයෙහි පටන් අත්හි

පිටපසින් අවතරණය අනුලෝම නම්. මණිබන්ධයෙහි පටන් අත්හි පුරිමභාගයෙන් ආරොහණය ප්‍රතිලෝම නම්) ඉක්බිති පිටේ සම ද, ඉක්බිති අනුලෝම වශයෙන් හා ප්‍රතිලෝම වශයෙන් දකුණු පය සම ද, එසේ ම අනුලෝම වශයෙන් හා ප්‍රතිලෝම වශයෙන් වම් පය සම ද, ඉක්බිති පිළිවෙළින් ම වසන සම ද, උදර සම ද, හෘදය සම ද, ග්‍රීවා සම ද ව්‍යවසථා කට යුතු. ග්‍රීවා සමට අනතුරු වැ යට හණු සම ව්‍යවසථා කොටැ යටිතොල අවසානයට පමුණුවා නිම කළ යුතු සි. මෙසේ මහත් මහත් සම අරමුණු කොටැ භාවනා කරත් ම සියුම් සම ද ප්‍රකට වන්නේ ය.

දිශා වශයෙන් උඩ - යට යන දෙ දිශායෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් මුළු සිරුර වෙළා ගෙනැ සිටියේ ය. **පරිචෙඡද** වශයෙන් යටැ පිහිටි තලයෙන් ද, මතු අහසින් ද පරිවර්ජිතා ය. මේ මෙහි සභාග පරිචෙඡදය. විසභාග පරිචෙඡදය කෙශයට කී නියා සි.

6 මංස

මංස නම් නව සියයක් මස් පිඬු ය. ඒ වනාහි **වණ්ණ** වශයෙන් රත් පැහැ ය. කැල මල් බදු ය. **සණ්ඨාන** වශයෙන් කෙංඩා පිඬු මස තල්පත වැසූ බත් මුලක් බදු ය. කලවේ මස ඇඹරුම් ගලේ දූගල බදු ය. ආනිස ද මස මැටි පිඬින් කළ ලිප් කෙළවර බදු ය. පිටේ මස පැදුරේ වනා වියලා ගත් තල්ගුළි පටලයක් බදු ය. පරාල දෙකේ පිහිටි මස පෙතැලි රැ කුසෙක තුනී කොටැ ඇල්වූ මැටියක් බදු ය. තනෙහි මස සිටැ ගෙනැ බිම් හෙළු මැටි පිඬක් බදු ය. බාහු දෙකේ මස දෙගුණ කොටැ තුබූ සම ගැසූ මහමීයකු බදු ය. මෙසේ මහත්-මහත් මස් වැදලි අරමුණු කොටැ ගෙනැ භාවනා කරත් මැ සියුම් - සියුම් මස් වැදලි ද ප්‍රකට වැ වැටහෙන්නේ ය. **දිශා** වශයෙන් උඩ යට යන දෙ දිශායෙහි ම පිහිටියේ ය. **අවකාශ** වශයෙන් සාධික තුන් සියක් ඇට ලිම්පිත වැ සිටියේ ය. **පරිචෙඡද** වශයෙන් යට ඇට සැකිල්ලෙහි පිහිටි තලයෙන් ද, උඩ සමින් ද, සරස ඔවුනොවුන් විසින් පරිවර්ජිතා ය. මේ මෙහි සභාග පරිචෙඡදය සි. විසභාග පරිචෙඡදය කෙශයට කී නියා සි.

7 නහාරු

නහාරු නම් නව සියයක් නහර ය. ඒ වනාහි **වණ්ණ** වශයෙන් ශෙවත වණ් ය. **සණ්ඨාන** වශයෙන් නානා

සණ්ඨාන ය. මින් උගුරේ මතු භාගය පටන් මහ නහර පසෙක් ශරීරය වෙළමින් ඉදිරි පසින් බසි යි. පසෙක් පසු පසින් බසි යි. පසෙක් දකුණැලයෙන් ද, පසෙක් වමැලයෙන් ද බසි යි. පසෙක් දකුණත වෙළමින් එහි පෙර පසින් ද, පසෙක් වම් පසින් ද, එසේ ම පසෙක් වමත වෙළමින් එහි පෙර පසින් ද, පසෙක් වම් පසින් ද බසි යි. පසෙක් දකුණු පය වෙළමින් එහි පෙර පසින් ද, පසෙක් වම් පසින් ද, එසේ ම පසෙක් වම් පය වෙළමින් එහි පෙර පසින් ද, පසෙක් වම් පසින් ද බසි යි. මෙසේ ශරීරය ධරන මහ නහර සැට කය වෙළමින් බස්නා බව දත යුතු. **කණ්ඩර** යනු දු මේ මහා නහර වලට නම්. මේ සියලු නහර **කන්දල** මකුල බඳු ය. (**කන්දල** මකුල යනු කැණහිලිමල් කැකුළය යි සන්තය කිය සි.) මීට වඩා සියුම් වූ ඒ ඒ පෙදෙස්හි වැතිරි සිටින **ඇතැම්** නහර ඝූ රැහැන් බඳු ය. මීට ද වඩා සියුම් වූ ඇතැම් නහර කිඳි වැල් බඳු ය. මීට ද වඩා සියුම් වූ ඇතැම් නහර මහා වීණාවෙක නන් බඳු ය. ඇතැම් නහර දළ-නූල් බඳු ය. අත්-පා පිට යන මේ තැන්හි නහර කුරැලු පා බඳු ය. **හිසෙහි** නහර ළදරුවන්ගේ හිස්දැල් බඳු ය. පිටෙහි නහර අව්වේ ලූ තෙත් දැල් බඳු ය. සෙසු අඩග ප්‍රත්‍යඩගානු-ගත නහර ශරීරයෙහි ලූ දැල් සැට්ටයක් බඳු ය. **දිශා** වශයෙන් උඩ යට යන දෙ දිශායෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් මුළු ශරීරයෙහි ඇට වැළඳා ගෙනැ සිටියේ ය. **පරිච්ඡේද** වශයෙන් යට තුන් සියක් ඇට වල මතු පිහිටි තලයෙන් ද, උඩ මස්හි හා සම්හි හා හැපී සිටි ප්‍රදෙශයෙන් ද, සරස අන්‍යෝන්‍යයන්-ගෙන් ද පරිච්ඡින්න ය. මේ නහර පිළිබඳ සභාග පරිච්ඡේදය යි. විසභාග පරිච්ඡේදය වනාහි කෙශයන්ට කී නියා යි.

8 අස්ථි.

අටමි යනු දත් දෙ තිස හැර සෙසු තුන් සියක් පමණ ඇට ය.

ඒ මෙසේ ය:- අත් ඇට සූසැටෙකි. පා ඇට සූසැටෙකි. මස් ඇසුරු කළ මොළොක් ඇට සූසැටෙකි. විළුම් ඇට දෙකෙකි. එක් එක් පාදයෙහි ගොප් ඇට දෙකෙකි. කොංඩා ඇට දෙකෙකි. දණ ඇට එකෙකි. කලවේ ඇට එකෙකි. කට් ඇට දෙකෙකි. පිටකටු ඇට අටලොසෙකි. ඉල ඇට සූවිස්සෙකි. ලෙඟි ඇට තුදුසෙකි. හෘදය ඇට එකෙකි. අකු ඇට දෙකෙකි. පතු ඇට දෙකෙකි. බාහු ඇට දෙකෙකි. අග් බාහු ඇට දෙකෙකි උගුරු ඇට සතෙකි. හණු ඇට දෙකෙකි. නාසා ඇට එකෙකි. හිස් කබල් නවයෙකි. මෙසේ ඇට තුන් සියක් පමණ ඇතැ යි දත යුතු.

මේ සියලු ඇට ම **වර්ණ** වශයෙන් ශ්වේත වර්ණ ය. **සංස්ථාන** වශයෙන් නානා සංස්ථාන ය.

ඒ එසේ මෑ සිඃ-- පය ඇඟිල්ලෙහි අග පුරුකෙහි ඇට හිඟිනි ඇට බඳු ය. මැද පුරුකෙහි ඇට කොස් ඇට බඳු ය. මුල් පුරුකෙහි ඇට පණාබෙර බඳු ය. පිටි පතුලෙහි ඇට තැළ **කැණහිල්ල** අල රූසක් බඳු ය. (**කැණහිල්ල** නම් **කන්දල** ය.) විළම් ඇට එකාටි තල් ගෙඩියක ලොදු බඳු ය. ගොප් ඇට **එක**ට බැඳි ක්‍රීඩා ගෝලක බඳු ය. ජංඝා ඇට ගොප් ඇටෙහි පිහිටි තැන පොතු නො ගැළ වූ හිඳි බඩක් බඳු ය. කුඩා ජංඝා ඇට කුඩා දුනු දණ්ඩයක් බඳු ය. මහත් ජංඝා ඇට වැහැර නිය සපී පිටක් බඳු ය. දණ ඇට එක් අතකින් වීරුණු පෙණ පිඩක් බඳු ය. ඒ දණ ඇටෙහි ජංඝා ඇට පිහිටි තැන ඉතා උල් වූ අග් ඇති හරක් අහක් බඳු ය. කලවේ ඇට නපුරු කොටැ සැසි වැ පොරෝ දණ්ඩයන් බඳු ය. **කල**වේ ඇට **කට්** ඇටෙහි පිහිටි තැන ක්‍රීඩා ගෝලකයක් බඳු ය. ඒ **කල**වේ ඇටින් කට් ඇට පිහිටි තැන අග කැපූ මහ දෙඹ ගෙඩියක් බඳු ය. **එකා**බඳු වැ පිහිටි **කට්** ඇට දෙක කුඹල් උදුනක් බඳු ය. ඒ දෙක වෙන් වෙන් වැ කඹුරන්ගේ යකුළෙහි බැඳි වළලු බඳු ය. **කෙළ**වර පිහිටි ආනිසදයෙහි ඇට යටිමුව කොටැ ගත් සපී පෙණක් බඳු ය. සත් තැනෙකැ කුඩා මහත් සිදුරු ඇත්තේ ය. පිටකටු ඇට ඇතුළතින් මතු - මතුයෙහි හකුළුවා තිබූ ඊයම් පටක් බඳු ය. පිටතින් හිඳිපත් වැලක් බඳු ය. ඒ අතරතුර කියත් දත් බඳු කටු දෙකෙක් තුනෙක් ඇත්තේ ය. සූවිසි ඉල ඇට අතුරෙන් නො පිරිපුන් ඇට නො පිරිපුන් දහකැති බඳු ය. පිරිපුන් ඇට පිරිපුන් දහකැති බඳු ය. ඒ සියලු ඉල ඇට සුදු කුකුළකුගේ විදහා ගත් පියාපත් බඳු ය. තුදුස් ළෙහි ඇට දිරා ගිය රථ පඤ්ජරයක් බඳු ය. හෘදය ඇට හැඳි පොලොත්තක් බඳු ය. අකු ඇට කුඩා ලෝ වැයෙක අත් දඬු බඳු ය. පතු ඇට එක් අතෙකින් ගෙවුණු සිංහල උදැල්ලක් බඳු ය. බාහු ඇට කැට පත් මිට බඳු ය. අග්‍ර බාහුවෙහි ඇට ශ්‍රේෂ්ම වූ මුල් තල් කඳ බඳු ය. මිණිබහන් ඇට එක් කොටැ අලවා තුබූ හැකුළුණු ඊයම් පතක් බඳු ය. පිටි අල්ලේ ඇට තැළ කැණහිල්ල අල රූසක් බඳු ය. අත් ඇඟිල්ලෙහි මුල පුරුකේ ඇට පණා බෙර බඳු ය. මැද පුරුකේ ඇට නො පිරිපුන් කොස් ඇට බඳු ය. අන් පුරුකෙහි ඇට හිඟිනි ඇට බඳු ය. උගුර ඇට සත දංඩෙහි විදූ පිළිවෙළින් තුබූ හුණකිලිල් මද බඳු ය. යටි හණු ඇටය කඹුරන්ගේ යකුළක බැඳි වලල්ලක් බඳු ය. උඩු

නඛ ඇටය ලියත සෑතක් බඳු ය. ඇස්වළ ඇට හා නාස්වළ ඇට ලොඳ ඉවත් කළ ලා තල් ගෙඩි බඳු ය. තළල් ඇට යටි මුව කොටැ තුබූ සක්තල කපාල බඳු ය. කන්සිදුරු ඇට කරඬැ-වැමියන්ගේ කරකොපුව බඳු ය. තළලින් හා කන් සිලින් හා මතු පට බඳනා තන්හි ඇට සංකුපිත ඝතපූණි පටල ඛණ්ඩ යක් බඳු ය. (සංකුපිත ඝතපූණි පටල ඛණ්ඩය යනු තෙලැති පූකඩය නි සන්තය කිය සි. තෙල් පූ හැකිළුණු කඩ පටක් වැන්නයිදු යෙත්. ඝතපූණි යනු පිටෙකමයෙන් ම යනු දු සන්ත සි.) මුදුතෙහි ඇට මුහුණින් කැපූ ඇද පොල්ගෙඩියක් බඳු ය. හිසෙහි ඇට මසා තුබූ දිරා ගිය ලබු කබල් බඳු ය.

දිශා වශයෙන් උඩ - යට යන දෙ දිශායෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් සාමාන්‍යයෙන් සියලු සිරුරෙහි පිහිටියේ ය. විශෙෂයෙන් හිසෙහි ඇට උගුරු ඇටෙහි ද, උගුරු ඇට පිටකටු ඇටෙහි ද, පිටකටු ඇට කටි ඇටෙහි ද, කටි ඇට කලවා ඇටෙහි ද, කලවා ඇට දණ ඇටෙහි ද, දණ ඇට ඉකාඬා ඇටෙහි ද, කෙඬා ඇට ගොප් ඇටෙහි ද, ගොප් ඇට පිටිපතුල් ඇටෙහි ද පිහිටියේ ය. **පරිච්ඡේද** වශයෙන් ඇතුළ ඇට මිදුලින් ද, මතු මසින් ද, අග මූල ඔවුනොවුන් ගෙන් ද පරිච්ඡින්න ය. මේ ඇට පිළිබඳ සභාග පරිවෙජ්දය සි. විසභාග පරිවෙජ්දය වනාහි කෙශයන්ට කී නියා සි.

9 අට්ඨිමිඤ්ජ

අට්ඨිමිඤ්ජ නම් ඇට ඇතුලේ පිහිටි මිදුලු ය. එය වණ්ණ වශයෙන් ශෙවත වණ්ණ ය. **සණ්ඨාන** වශයෙන් මහත් මහත් ඇට ඇතුලේ මිදුලු උණ පුරැකෙක බහා ලූ හුයා පී මහ වේවැල් අග් බඳු ය. කුඩා කුඩා ඇට ඇතුලේ මිදුලු සිහින් හුණ පුරැකෙකා බහා ලූ හුයා පී තුනී වේවැල් අග් බඳු ය. **දිශා** වශයෙන් උඩ යට යන දෙ දිශායෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් ඇට ඇතුලේ පිහිටියේ ය. **පරිවෙජ්ද** වශයෙන් ඇට ඇතුළු තලයෙන් පරිච්ඡින්න ය. මේ මෙහි සභාග පරිවෙජ්දය සි, විසභාග පරිවෙජ්දය වනාහි කෙශයන්ට කී නියා සි.

10 වක්ක

වක්ක **නම්** එක්වැ බැඳි සිටි මස් පිඬු දෙකෙකි. එය **වණ්ණ** වශයෙන් මඳ රත් වණ්ණ ය. එරබදු ඇට පැහැය ය. **සණ්ඨාන** වශයෙන් ළමයින් ගේ එක් කොට බැඳි ක්‍රීඩාගෝල සඟලක් හෝ **එක** නටුයෙහි හට ගත් අඹගෙඩි දෙකක් බඳු ය. **දිශා** වශයෙන් උඩ දිශායෙහි ය. **අවකාශ** වශයෙන් ගළවළුයෙන්

නික්මැ එක් මූලක් ඇති වැ මඳක් ගොස් දෙකක් වැ බෙදී දළ නහරින් බැඳී හෘදය මාංශය පරික්ෂේප කොටැ සිටියේ ය. **පරිච්ඡේද** වශයෙන් සියලු අතින් ම වකුගඩු කෙළවරින් පරිච්ඡින්න ය. මේ වකුගඩුව පිළිබඳ සභාග පරිච්ඡේදය සි. විසභාග පරිච්ඡේදය වනාහි කෙශයන්ට කී නියා මැ සි.

11 හදය

හදය නම් හෘදය මාංසය සි. එය **වණ්ණ** වශයෙන් රත් පියුම් පෙත්තෙක පිට පැත්ත බඳු වණ්ණ ය. **සණ්ඨාන** වශයෙන් පිට පෙති හැරී යටි මුව කොටැ තුබූ පියුම් කැකුළක් බඳු ය. පිටත සිලුටු ය. ඇතුළත වැටකොළු ගහණියක ඇතුළ බඳු ය. ප්‍රාඥයන්ට මඳක් විකසිත වැ ද, මන්දප්‍රාඥයන්ට මුකුලිත වැ ද ඇත්තේ ය. ඒ ඇතුළෙහි අඩ පතක් පමණ ලෙහෙයෙන් යුත් දෙඹ ගෙඩියක් පමණ වූ වළෙකි. **මනොධාතුව හා මනොවිඤ්ඤාණධාතුව** පවත්නේ ඒ ලෙහෙය ඇසුරු කොටැ ය. ඒ ලෙහෙය රාගචරිතයාහට රතින වණ්ණ ය. දොෂ චරිතයාහට කාල-වණ්ණ ය. මොහචරිතයාහට මස් සේදූ දියත්තක් බඳු වණ්ණ ය. විතකී චරිතයාහට කොල්ලු යුස වණ්ණ ය. ශ්‍රද්ධා චරිතයාහට කිණිහිරිමල් වණ්ණ ය. ප්‍රඥාචරිතයාහට වතාහි ප්‍රසන්න ය, විප්‍රසන්නය, අනාවිල ය, පණ්ඩර ය, පරිශුද්ධ ය, ඔප ලූ දැරඟ මිණක් මෙන් ප්‍රභාසවර සි. **දිශා** වශයෙන් උඩ දිශායෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් ශරීරාභ්‍යන්තරයෙහි දෙ තන මැද පිහිටියේ ය. **පරිච්ඡේද** වශයෙන් හෘදය භාගයෙන් පරිච්ඡින්න ය. මේ හෘදය පිළිබඳ සභාග පරිච්ඡේදය සි. විසභාග පරිච්ඡේදය වනාහි කෙශයන්ට කී නියා මැ සි.

12 යකන

යකන නම් අක්මා ය. ඒ වනාහි එක්වැ බැඳි මස් පටල දෙකෙකි. **වණ්ණ** වශයෙන් රතින වණ්ණ ය. පඹුවත් සුභාව ඇත්තේ ය. ඉතා රත් පැහැ නොගත් කුමුදු මලෙක පිට පෙත්ත බඳු ය. **සණ්ඨාන** වශයෙන් මූලදී එක් වැ අගදී දෙකක් වැ ගියේ ය. කොබොල්ලි පතක් බඳු ය. එ ද වනාහි අඳුයන්ට එකක් වැ මහත් වැ පිහිටියේ ය. ප්‍රාඥයන්ට කුඩා වැ දෙකක් වැ හෝ තුනක් වැ පිහිටියේ ය. **දිශා** වශයෙන් උඩ දිශායෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් දෙ තන අතර දකුණු පැත්තේ පිහිටියේ ය. **පරිච්ඡේද** වශයෙන් යකෘත් භාගයෙන් පරිච්ඡින්න ය. මේ අක්මාව පිළිබඳ සභාග

පරිවෙජදය යි. විසභාග පරිවෙජදය වනාහි කෙශයන්ට කී නියා මැ යි.

13 කිලොමක.

කිලොමක නම් දලබුව යි. ඒ වනාහි ප්‍රතිවජ්ඣා දලබුව, අප්‍රතිවජ්ඣා දලබුව යි දෙ වැදෑරුම් වේ. වසා වැළඳ ගෙනැ සිටින මසක් දලබු තාමයෙන් කියවෙන බව දත යුතු. ඒ දෙ වැදෑරුම් වූ ද දලබුව **වණ්ණ** වශයෙන් දුහුල් කඩක් බඳු ශෙවල වණ්ණ වූවෙකි. **සණ්ඨාන** වශයෙන් සවකීය අවකාශ සථානය බඳු සටහන් ඇත්තේ ය. **දිශා** වශයෙන් ප්‍රතිවජ්ඣා දලබුව උඩ දිශායෙහි ද, අප්‍රතිවජ්ඣා දලබුව උඩ - යට යන දෙ දිශායෙහි ද පිහිටියේ ය. **අවකාශ** වශයෙන් ප්‍රතිවජ්ඣා දලබුව හෘදය හා වකුගඩුව වසා ගෙනැ ද, අප්‍රතිවජ්ඣා දලබුව මුළු ශරීරයෙහි සමට යටින් මස වසා වැළඳ ගෙනැ ද සිටියේ ය. **පරිවෙජද** වශයෙන් යට මසින් ද, උඩ සමින් ද, සරස කිලොමක භාගයෙන් ද පරිවජ්ඣා ය. මේ මෙහි සභාග පරිවෙජදය යි. විසභාග පරිවෙජදය කෙශයන්ට කී නියා යි.

14 පිහක.

පිහක නම් බඩදිව් මස යි. **වණ්ණ** වශයෙන් නික මලක් සේ නීලවණ්ණ ය. **සණ්ඨාන** වශයෙන් සත් අඟුල් පමණ වූ බැදුමක් නැති කලු වස්සකුගේ දිවක් බඳු දෙයෙකි. **දිශා** වශයෙන් උඩ දිශායෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් හදවතට වම් පස උදර පටලයේ මතු භාගය ඇසුරු කොටැ සිටියේ ය. මෙය ආයුධ පහරෙකින් පිටවූවහොත් මරණය **එකාන්ත** ය. **පරිවෙජද** වශයෙන් **පිහක** භාගයෙන් පරිවජ්ඣා ය. මේ මෙහි සභාග පරිවෙජදය යි. විසභාග පරිවෙජදය වනාහි කෙශයන්ට කී නියා යි

15 පප්ඵාස.

පප්ඵාස නම් දෙතුන් කඩක් වැ බෙදුණු පපුමස යි. එය **වණ්ණ** වශයෙන් දුඹුක් දිඹුල් ඵලයක් බඳු රතා වණ්ණ ය. **සණ්ඨාන** වශයෙන් නො සම කොටැ කැඩූ ඝන කැවුමක් බඳු ය. කැ - බිවූ කිසිවක් ඇතුළ නැති විට නැගෙන **කම්ජ** තෙජෝ ධාතුවෙන් මෙය පිදුරු සපක් මෙන් නීරස වේ. නිරොජසකා වේ. **දිශා** වශයෙන් උඩ දිශායෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් ශරීරය ඇතුළේ දෙතන අතර හදවත හා අක්මාව මත්තෙන් වසා ගෙනැ එල්ලෙමින් සිටියේ ය.

පරිච්ඡේද වශයෙන් පප්ඵාස භාගයෙන් පරිච්ඡින්න ය. මේ මෙහි සභාග පරිච්ඡේදය යි. විසභාග පරිච්ඡේදය වනාහි කෙශයන් ට කී නියා යි.

16 අන්න.

අන්න නම් පිරිමින්ට දෙතිස් රියන් පමණ වූ ද, සත්‍රීන්ට අටවිසි රියන් පමණ වූ ද එක් විසි තැනෙකින් නැමී සිටි අතුනු වැටිය යි. එය **වණ්ණ** වශයෙන් ශ්වේත වණ්ණ ය. වැලි මුසු කොටැ හන්නා ගත් සුදු හුණු බදුමක් බඳු ය. **සණ්ඨාන** වශයෙන් ලේ ඔරුවෙක තමා ලූ භික්ඛුන් සඳ සිරුරක් බඳු ය. **දිශා** වශයෙන් උඩ යට යන දෙ දිශායෙහි හට ගත්තේ ය. **අවභාශ** වශයෙන් උඩ ගලවළුයෙහි ද, යට මළ මාංශයෙහි ද, බැඳී සිටි බැවින් ගලවළු හා ගුද පියස කෙළවර කොටැ ඇති ශරීරාභ්‍යන්තර යෙහි පිහිටියේ ය, **පරිච්ඡේද** වශයෙන් අන්න භාගයෙන් පරිච්ඡින්න ය. මේ මෙහි සභාග පරිච්ඡේදය යි. විසභාග පරිච්ඡේදය කෙශයන්ට කී නියා යි.

17 අන්නගුණ.

අන්නගුණ නම් අතුනු බහන් ය. එනම් අතුනු තැමුණු තැන බැඳුම් ය. එය **වණ්ණ** වශයෙන් ශ්වේත ය. හෙල්මැලි මුලක් බඳු ය. **සණ්ඨාන** වශයෙන් ද හෙල්මැලි මුලක් බඳු ය. **දිශා** වශයෙන් උඩ යට යන දෙ දිශායෙහි පිහිටියේ ය. **අවභාශ** වශයෙන් උදලු පොරෝ ආදි කම්මන්ත කරන්නවුන්ගේ යන්ත්‍ර අඳන කල යන්ත්‍ර පෝරු බැඳ ගෙන සිටින යන්ත්‍ර සූත්‍ර මෙන් අතුනු වැටි හිලිය කොදී එක් කොට බැඳ ගෙන පා පිස්නා බිස්සෙහි දරන මඩුල්ල අතර මසා සිටින රැහැන් මෙන් එක් විසි අතුනු වැටි අතුරෙහි පිහිටියේ ය. **පරිච්ඡේද** වශයෙන් අන්නගුණ භාගයෙන් පරිච්ඡින්න ය. මේ මෙහි සභාග පරිච්ඡේද ය යි. විසභාග පරිච්ඡේද ය කෙශයන්ට කී නියා මැයි.

18 උදරිය.

උදරිය නම් උදරයෙහි වූ අසිත – පීත – ඛායිත – සායිත යි. අසිත නම් බත් ආදි අනුභව කළ දේ ය. පීත නම් අඹපැණි ආදි පූ දේ ය. ඛායිත නම් කැවුම් ආදි කඩා කැ දේ ය. සායිත නම් මීපැණි ආදි ලෝභා ලද දේ ය. ඒ **වණ්ණ** වශයෙන් වැළඳූ ආහාර ම් බඳු වණ්ණ ය. **සණ්ඨාන** වශයෙන් පෙරහනෙක සිපිල කොට බඳනා ලද සහල් බඳු ය. **දිශා** වශයෙන් උඩ

දිශායෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් උදරයෙහි පිහිටියේ ය. උදර නම් දෙ පසින් මිරිකන ලද තෙත් වස්ත්‍රයෙක මැද්ද නැගි බුබුලක් බඳු අන්ත්‍ර පටලය යි. එය පිටතින් සිලිටු ය. ඇතුළ කුණු මස් කසළ වෙළෑ පොරෝනා කඩෙක පුප් හෝ කුණු වූ කොස්කටුවෙක ඇතුළ හෝ බඳු ය. එහි **තකොකාමක-හණ්ඩුප්පා-දන්ත-තාලහිරක්ක - සුවිමුඛ - පමතනතුක්ක - සුන්නක්ක** ආදි දෙසිස් කුලෙක පණුවෝ ආකුල ව්‍යාකුල වැ මුළු මුළු වැ හැසිරෙති. ඔවුහු ආහාරපාන නො ලත් කල්හි පැනැ පැනැ ශබ්ද නගමින් හෘදය මාංසය කාලති. ආහාරපාන ලත් කල්හි කට අයා පළමු පළමු වැටෙන දෙ - තුන් පිඩ වෙලෙවි වෙලෙවි වැ පැහැර කති. ඔවුන්ගේ තිඹිරි ගෙය ද, වැසිකිළිය ද, ගිලන් හල ද, සොහොන් ගෙය ද එයම වන්නේ ය. සැඩොල් ගම් දෙර ගවර වලෙක නියං සමයෙහි මහ පොදෙ ඇති වැසි වස්නා කල ජලයෙන් ගෙනවුත් දැමූ මළ - මූ - ඇට - නහර - කෙළ - සොටු - ලේ ආදි නානාවිධ කුණු කන්දල් මඩ දියෙන් කැළඹී දෙ තුන් දිනෙකින් පණුකැලගෙන් සිලිසිලි වැ ඉර අව්රැස් වෙයින් කකියා මතුයෙහි පෙණ බුබුලු නගමින් ඉතා නීල්වන් වැ පරම දුගඳ වැ පරම ජුගුප්සා ජනක වැ හිඹා ගැන්ම තිබේවා, අසවාදනය කැරැ ගැන්ම තිබේවා, ළං වන්නට දැකැ ගන්නට පවා නුසුදුසු වැ තිබෙන්නා සේ නානාවිධ ආහාරපානාදිය දත් නමැති මොහොලින් කොටා දිව නමැති අතින් පෙරළා අග දිව තුනී කෙළින් හා මුල් දිව බොල් කෙළින් කලතා ඇසිල්ලෙකින් වණ් - ගඤ්ඣ - රස රහිත වැ රෙදි වියන්-නන්ගේ නානු සේ ද, බල්ලන් නහා ලූවක් සේ ද වැ වා-පිත්-සෙමින් වෙළන ලදු වැ ජඨරාග්නි සන්තාප වෙගයෙන් කකියන ලදු වැ පණුකැලෙන් අවුල් වැ මතු මතුයෙහි පෙණ බුබුලු නගමින් පරම දුගඳ ඔවට හා පිළිකුල් ඔවට පැමිණ සිටින්නේ ය. මෙය නුවණැසින් බලන කල ඇති වන අමනොඥප්තිය කියනු ම කවරේ ද, කියනු ඇසෙන විට ද ආහාරපානාදියෙහි අමනොඥප්තිය වන්නේ ය. මේ උදරයෙහි වැටෙන ආහාරපානාදිය පස් ආකාරයකට බෙදී යෙයි. එක් කොටසක් පණුවෝ කති. එක් කොටසෙක් ඔඬේ හින්නෙන් දලා ය යි. එක් කොටසෙක් මූත්‍ර ඔවට පැමිණෙයි. එක් කොටසෙක් වර්චස් ඔවට පැමිණෙයි. එක් කොටසෙක් රස ඔවට හැරී මස් - ලේ ආදිය වඩයි. **පරිච්ඡේද** වශයෙන් උදර පටලයෙන් ද, උදරිය භාගයෙන් ද පරිච්ඡින්න ය. මේ මෙහි සභාග පරිච්ඡේදය යි. විසභාග පරිච්ඡේදය කෙශයන්ට කී නියා යි.

19 කරීෂ.

කරීස නම් වර්චසි. එය **වණ්ණ** වශයෙන් බොහෝ සේ මේ වැළඳූ ආහාරයට බදු වණ්ණ ය. **ඝණ්ඨාන** වශයෙන් අවකාශ සථානය බදු ය. **දිශා** වශයෙන් යට දිශායෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් පක්වාශයෙහි පිහිටියේ ය. පක්වාශය නම් යට නාභියට හා පිටකටුමුලට අතර අතුනු කෙළවර පිහිටි අටහුල් පමණ උස් වූ හුණ නළයක් බදු කැනෙකි. උඩ බිම් පෙදෙසක වැටුණු වැසිදිය ගිලිනි යට බිම් පෙදෙසක් පුරා සිටින සේ ආමාශයෙහි වැටුණු ආහාරපානාදිය බඩ ගින්නෙන් පෙණ නහමින් පැසී ඇඹරුම් ගලකින් අඹරන ලද්දක් මෙන් සිලිටු වැ අතුණු සිදුරින් ගිලිනි අඹරා හුණ කලයෙක ලන පඬුවන් මැටි සේ රැස් වැ සිටිනේ ය. **පරිච්ඡේද** වශයෙන් පක්වාශය පටලයෙන් ද, කරීස භාගයෙන් ද පරිච්ඡින්න ය. මේ මෙහි සභාග පරිච්ඡේදය යි. විසභාග **පරිච්ඡේදය කෙශයන්ට** කී නියා යි.

20 මත්ථලුඞ්ග.

මත්ථලුඞ්ග නම් හිස්කබල අතර පිහිටි මිදුළු රැස යි. එය **වණ්ණ** වශයෙන් ශ්වේත වණ්ණ ය. නයිහතු පිඩක් බදු ය. දී බවට නො පැමිණි නරක් වුණු කිරිබදුය යි කිව **ද සුදුසු** ය. **ඝණ්ඨාන** වශයෙන් අවකාශ සථානයට බදු ය. **දිශා** වශයෙන් මතු දිශා-යෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් හිස්කබල තුළ මැසුම් සතර ඇසුරු කොටැ එක් කොටැ තුබූ පිටපිඬු සතරක් මෙන් එක් වැ පිහිටියේ ය. **පරිච්ඡේද** වශයෙන් හිස් කබල ඇතුළු තලයෙන් ද, හිස් මොළ භාගයෙන් ද පරිච්ඡින්න ය. මේ මෙහි සභාග පරිච්ඡේදය යි. විසභාග පරිච්ඡේදය කෙශයන්ට කී නියා යි.

21 පිත්ත.

පිත්ත නම් පිත යි. එය බද්ධපිත ය, අබද්ධපිතය යි දෙ වැදෑරුම්. බද්ධපිත **වණ්ණ** වශයෙන් ඝන මීතෙල් බදු වණ්ණ ය. අබද්ධ පිත මැළවුණු රණවරා මල් බදු වණ්ණ ය. **ඝණ්ඨාන** වශයෙන් ඒ දෙ පිත ම සවකීය අවකාශ සථානය බදු ය. **දිශා** වශයෙන් **අබද්ධපිත** කෙස් - ලොම් - නිය - දත් යන මෙහි මස් රහිත තැන් හා තද වියලි සම් හා හැරැ සෙසු සියලු සිරුර තෙල් බින්දුවක් දියෙහි මෙන් ව්‍යාපත වැ සිටියේ ය. ඒ කිපි කල ඇස් කහ පැහැ වේ. කරකැවිල්ල සැදේ. ශරීරය කම්පා වේ.

කැසීම ඇති වේ. **බද්ධපිත්ත** වනාහි හෘදයවස්තුව හා පපුව අතර අක්මාව නිසා පිහිටි මහ වැටකොළු සල්ලක් බදු පිත් කෝෂ-යෙහි පිහිටියේ ඒ කිපි කල සත්ත්වයෝ උමතු වෙති. සිහි විපර්යාස වෙති. විලි - බිය හැරපියා නොකට යුතු දේ කෙරෙති. නොකිය යුතු දේ කියති. නොසිනිය යුතු දේ සිතත්. **පරිච්ඡේද** වශයෙන් පිත්ත භාගයෙන් පරිච්ඡින්න ය. මේ මෙහි සභාග පරිච්ඡේදය යි. විසභාග පරිච්ඡේදය කෙශයන්ට කී නියා යි.

22 සෙම.

සෙම නම් සෙම ය. එය ශරීරය තුළ පාත්‍රයක් පුරා ලත තරම් ඇත්තේ ය. **වණ්ණ** වශයෙන් ශ්වේත වර්ණ ය. **සණ්ඨාන** වශයෙන් නම් **සිටින** අවකාශ සථානය බදු ය. **දිශා** වශයෙන් උඩ දිශාවෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් උදර පටලයෙහි පිහිටියේ ය. එය වනාහි ආහාරපාන වළඳනා කල්හි කැට කැබලිති වැටීමෙන් දියසෙවෙල දෙබේ වැ නැවත එක් වන්නා සේ නැවත **එක්** වන්නේ ය. මේ සෙම මැද වූ **කල්හි** පැසුණු ගඩ**ක්** මෙන් ද, කුණු වූ කිකිළි බිත්තරයක් මෙන් ද උදරය ඉතා **පිළිකුල්** කුණු ගඳින් යුකත වේ. එසින් නැගුණු ගඳින් උද්‍රේකය ද ඇති වේ. මුඛය ද කුණු ගඳ වැ **පිළිකුල්** කුණ**පයක්** වැනි වේ. ඒ නිසා පවා ''පහවා කුණු ගඳ ගසා'' ය යි කිය යුතු බවට පැමිණේ. මේ සෙම වනාහි වැඩී ඝන වූ **කල** පියන් පතින් වැසිකිළියේ ගඳ ඇතුළත ම අවුරා සිටින්නාක් මෙන් දුර්ගන්ධය උදරයෙහි ම අවුරා සිටින්නේ ය. පරිච්ඡේද වශයෙන් සෙම්හ භාගයෙන් පරිච්ඡින්න ය. මේ මෙහි සභාග පරිච්ඡේදය යි. විසභාග පරිච්ඡේදය කෙශයන්ට කී නියා යි.

23 පුබ්බ.

පුබ්බ නම් සැරව යි. එය ජීවමාන ශරීරයෙහි නම් **වණ්ණ** වශයෙන් ඉදුණු **කොළයකට** බදු **වණ්ණ** ය. මළසිරුරේ නම් කුණු වූ ඝන **කැඳක්** බදු **වණ්ණ** යි. **සණ්ඨාන** වශයෙන් පිහිටි **අවකාශ** සථානය බදු ය. **දිශා** වශයෙන් උඩ යට යන දෙ දිසා-යෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් අසුවල් **තැන** නිබඳ අවකාශය යි **කිය** යුතු තැනෙක් නැති. **කණු - කටු - අවි - ගිනි** ආදිය හැපී ලේ නැගී **පැසුණා** වූ ද, ගඩ පොළ ආදිය **නැගුණා** වූ ද **කොතැන** හෝ මෙයට අවකාශ යි. **පරිච්ඡේද** වශයෙන් පූයා

භාගයෙන් පරිච්ඡින්නා ය. මේ මෙහි සභාග **පරිච්ඡේදය** යි. විසභාග පරිච්ඡේදය කෙශයන්ට කී නියා යි.

24 ලොහිත.

ලොහිත නම් ලෙහෙ ය. එය සන්නිවිත ලොහිත ය, සංසරණ ලොහිතය යි දෙ වැදෑරුම් වේ. **සන්නිවිත** ලොහිත නම් **එක්** තැනෙක රැස් වැ සිටිනා ලෙහෙය යි. එය **කකාළ** ඝන ලතු දිය බදු **වණ්** ඇත්තේ ය. **සංසරණ** ලොහිත නම් මුළු සිරුරෙහි විසිරි පවත්නා ලෙහෙය යි. එය ප්‍රසන්න ලතු දිය බදු **වණ්** ඇත්තේ ය. **ඝණ්ඨාන** වශයෙන් ඒ දෙ වැදෑරුම් ලෙහෙම තමන් සිටින ස්ථානය බදු සටහන් ය. **දිශා** වශයෙන් මූල කී ලෙහෙ උඩ දිශායෙහි ද, යට කී ලෙහෙ උඩ – යට යන දෙ දිශායෙහි ද පිහිටියේ ය. **අවකාශ** වශයෙන් සංසරණ ලොහිත ය කෙස්– ලොම් – නිය – දන්හි මස් නැති **තැන්** හා **වියලුණු** සම හා හැර ධමනීජාලානුසාරයෙන් සියලු උපාදින්න ශරීරයෙහි පැතිරි පවත්නේ ය. සන්නිවිත ලොහිතය යකතය පිහිටි **තැන** යට කොටස පුරා පාත්‍රයක් පිරෙන තරම් වැ හදවත් – වකුගඩු – පපු යන මොවුන් මතුයෙහි ටික ටික වැස්සෙමින් වකුගඩු–හදවත් පපුමස් තෙමමින් පවත්නේ ය. ලෙහෙයෙන් එය තො තෙමෙන් හොත් පිපාසය උපදින්නේ ය. **පරිච්ඡේද** වශයෙන් ලොහිත භාගයෙන් පරිච්ඡින්නා ය. මේ මෙහි සභාග පරිච්ඡේදය යි. විසභාග පරිච්ඡේදය කෙශයන්ට කී නියා යි.

25 සෙද.

සෙද **නම්** ඔහදිය යි. එ නම් රොම කූපාදියෙන් වැගිරෙන අබ් ධාතු යි. **වණ්** වශයෙන් පහන් **තලතෙල්** බදු වණ් ඇත්තේ ය. **ඝණ්ඨාන** වශයෙන් පිහිටි තැන් බදු ය. **දිශා** වශයෙන් දෙ දිශායෙහි ම පිහිටියේ ය. **අවකාශ** වශයෙන් ලෙහෙයට මෙන් නිබඳ පිහිටි අවකාශ ස්ථානයෙක් නැති. ගිනි රශ්මියෙන් හෝ ඉර අව්වෙන් හෝ ඍතුවිකාරාදියෙකින් හෝ ශරීරය **තැවුණු** විට දියෙන් නහා ගත් ඇඹිල්ලෙහි තො සම **කොට කැඩූ** තෙළුම් දැලි කලඹෙකින් මෙන් සියලු කෙස් – ලොම් කූප විවරයෙන් වැගිරෙන්නේ ය. එසින් සෙවදයාගේ සටහන කෙශ=ලොම කූප විවර වශයෙන් ම කිය යුතු. සෙවදය ගෙනැ භාවනා **කරන** යොගී විසින් **කෙස්** – ලොමකූප විවර පුරා සිටි වශයෙන් ම මෙතෙහි කළ යුතු. **පරිච්ඡේද** වශයෙන් සෙවදභාගයෙන් පරිච්ඡින්නා ය.

මේ මෙහි සභාග පරිවෙජ්දය යි. විසභාග පරිවෙජ්දය කෙශයන්ට කී නියා යි.

26 මෙද.

මෙද නම් මිදුණු තෙල ය. එය **වණ්ණ** වශයෙන් පලන ලද කහ ගැටයක් බදු වණ්ණ ය. **සණ්ඨාන** වශයෙන් මහත් ශරීර ඇත්තවුන්ට සම හා මස හා අතුර තුබූ කසාවන් දුහුල් රෙදි කඩක් බදු සණ්ඨාන ය. කෘශ ශරීර ඇත්තවුන්ට **කොංඛා** මස හා කලවේ මස හා පිටකටුව ඇසිරූ කළ පිටු මස හා බඩ මස හා නිසා දෙතුන් පටක් කොටැ තුබූ කසාවන් දුහුල් කඩක් බදු සණ්ඨාන ය. **දිශා** වශයෙන් උඩ – යට යන දෙ දිශායෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් මහත් ශරීර ඇත්තවුන් ගේ මුළු සිරුරෙහි පැතිර ද, කෘශ ශරීර ඇත්තවුන් ගේ කොංඛා මස් ආදිය නිසා ද පිහිටියේ ය. මේ මේදය තෙල් වුව ද ඉතා පිළිකුල් ය. **එ** බැවින් නිස ගානා පිණිස හෝ නහය කිරීම් ආදියක් පිණිස හෝ නො යොදති. **පරිවෙජ්ද** වශයෙන් යට මසින් ද, මතු සමින් ද, සරස මෙද භාගයෙන් ද පරිවජ්ජනා ය. මේ මෙහි සභාග පරිවෙජ්දය යි. විසභාග පරිවෙජ්දය කෙශයන්ට කී නියා යි.

27 අස්සු.

අස්සු නම් කඳුළු ය. එනම් ඇසින් වැගිරෙන අබ් ධාතු ය. එය **වණ්ණ** වශයෙන් පහන් තලතෙල් බඳු ය. **සණ්ඨාන** වශයෙන් පිහිටි අවකාශ ස්ථානය බඳු ය. **දිශා** වශයෙන් උඩ දිශායෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් ඇස්වල පිහිටියේ ය. මේ කඳුළු පිත් කොෂයෙහි පිත මෙන් ඇස්වලෙහි නිතර රැස් වැ තුබුයේ නො වේ. සත්ත්වයන් සතුටින් සිනාසෙන කල්හි ද, දුකින් හඬනා වලප්නා කල්හි ද, විසම ආහාර වළඳනා කල්හි ද, ඇස්හි දුම් හෝ දූලි ආදියක් වැද ගන්නා කල්හි ද ඒ ඒ සොම්නස් ආදි හෙතුයෙන් නැඟී ඇස් වල පුරා හෝ සිටී. වැගිරී හෝ යෙහි. මේ ගෙනැ භාවනා කරන යොගි විසින් ඇස් වල පුරා සිටි වශයෙන් ම භාවනා කළ යුතු. **පරිවෙජ්ද** වශයෙන් අශ්‍රුභාග-යෙන් පරිවජ්ජනා ය. මේ මෙහි සභාග පරිවෙජ්දය යි. විසභාග පරිවෙජ්දය කෙශයන්ට කී නියා යි.

28 වසා.

වසා නම් වුරුණු යි. එ නම් දිය වී යන තෙල යි. එය **වණ්ණ** වශයෙන් පොල් තෙල් හෝ කැදෙහි ලූ තෙල් හෝ

බඳු වණී ය. **ඝණඨාන** වශයෙන් නහන කල පහන් දිය මතුයෙහි බහන තෙල් බිඳු බඳු ය. **දිශා** වශයෙන් උඩ - යට යන දෙ දිශායෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් බොහෝ සේ අතුල්-පතුල්-පිටිඅත්-පිටිපා-නාස්පුට-නළල-අංශකූට යන මෙහි පිහිටියේ ය. එසේත් ඒ තන්හි නිබඳ පිහිටියේ නො වේ. ගිනි උෂ්ණයෙන් හෝ ඉර අව්වෙන් හෝ විසභාග ඍතුයෙන් හෝ විසභාග ධාතුයෙන් හෝ ඒ තැන් උෂ්ණ වූ කල නහන කල පහන් දිය මතුයෙහි තෙල් බින්දු මෙන් පිහිටියේ ය. පරිවේඡද වශයෙන් වසා භාගයෙන් පරිච්ඡින්න ය. මේ මෙහි සභාග පරිවේඡදය යි. විසභාග පරිවේඡදය කෙශයන්ට කී නියා යි.

29 බෙල.

බෙල නම් කෙල ය. එ නම් මුව තුළ පෙණ මිශ්‍ර අබ් ධාතු යි. එය වණී වශයෙන් ශ්වෙත වණී ය. පෙණ බඳු ය. **ඝණඨාන** වශයෙන් අවකාශ ස්ථානයට බඳු සටහන් ය. පෙණ සටහන් ඇත්තේය යි ද කිය හැකි ය. **දිශා** වශයෙන් මතු දිශායෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් දෙ කපොල් පෙදෙසින් බැසැ දිවෙහි පිහිටියේ ය. එසේත් එහි නිබඳ පිහිටියේ නො වේ. ඇඹුල් ආදි ආහාරයක් දුටු විට හෝ සිහි කළ විට හෝ උෂ්ණ, තික්ත, කටුක, ලොණ, අම්බිල අතුරෙන් කිසිවක් මුව තුළ තුබූ විට හෝ හෘදය ක්ලාන්ත වූ විට හෝ කිසිවක් සඳහා පිළිකුල් උපන් විට හෝ ඉපිදූ දෙ කපොල් පෙදෙසින් බැසැ දිවෙහි පිහිට යි. එය දිව අග දී තුනී ය. මූල දී ඝන ය. මුවෙහි ලූ හබලපෙති - සහල් ආදි ආහාර ගංඉවුරේ කැණූ ලිඳෙක ජලය මෙන් අවසන් නො වැ ම තෙමා ලන්නට සමර්ථ ය. **පරිවේඡද** වශයෙන් බෙල භාගයෙන් පරිච්ඡින්න ය. මේ මෙහි සභාග පරිවේඡදය යි. විසභාග පරිවේඡදය කෙශයන්ට කී නියා යි.

30 සිඹඤාණිකා.

සිඹඤාණිකා නම් සොටු ය, එ නම් හිස් මූලින් වැගිරෙන අශුචි විශෙෂයෙක. එය වණී වශයෙන් ළා තල් ලොඳ බඳු වණී ය. **ඝණඨාන** වශයෙන් අවකාශ ස්ථානයට බඳු සටහන් ය. **දිශා** වශයෙන් මතු දිශායෙහි පිහිටියේ ය. **අවකාශ** වශයෙන් දෙ නාස්පුට පුරා සිටියේ ය. තෙළඹි කොළයෙක දී බැඳැ කටුවෙකින් තෙළඹි කොළය සිදුරු කළ විට ඒ සිදුරෙන් දී බැසැ යන්නා සේ සත්ත්වයන් හඬනා කල හෝ

විසභාග ආහාරයෙන් හෝ ඍතුයෙන් හෝ ධාතුක්ෂෝභ වූ කල හෝ හිස තුළින් කුණු සෙම් බවට පැමිණෙ හිස් මුල ගිලිනී තලු සිදුරින් බැසැ නාස්පුට පුරා හෝ සිටිතේ ය. වැගිරී හෝ යන්තේ ය. මෙය අරමුණු කොටැ භාවනා කරන යොගී විසින් නාස්පුටයෙහි පිරී සිටි දේ සලකා භාවනා කළ යුතු. **පරිච්ඡේද** වශයෙන් සිඛාඤ්ඤිකා භාගයෙන් පරිච්ඡින්න ය. මේ මෙහි සභාග පරිච්ඡේදය යි. විසභාග පරිච්ඡේදය කෙශයන්ට කී නියා යි.

21 ලසිකා.

ලසිකා නම් සඳමිදුළු යි. එ නම් ශරීරයෙහි සන්ධි අතර පවත්නා බෙලසුල් කුණප විශෙෂයෙකි. එය **වණ්ණ** වශයෙන් කිණිහිරි ලාටු බදු වණ් ය. **සණ්ඨාන** වශයෙන් අවකාශ ස්ථානයට බදු සටහන් ය **දිශා** වශයෙන් දෙ දිශායෙහි ම පිහිටියේ ය. **අවකාශ** වශයෙන් ඇට සන්ධිවල තෙල් ලීම් කෘත්‍යය සිදුකරමින් එකසිය අසූවක් සන්ධි අතරෙහි පිහිටියේ ය. සඳමිදුළු මඳ වූවන් තැගෙන විට ද හිඳින විට ද යන එන විට ද අත්-පා දිග අරින විට හා හකුලන විට ද ඇට කටු කට-කට ගායි. අසුරු ගසන්නා සේ වෙයි. යොදුනක් දෙකක් ගිය විට වාතය කිපෙයි. ශරීරයට වෙදනා උපදියි. වැඩි වූවන් එසේ ඉරියව් පවත්වන විට කට-කට ගැමෙක් හෝ වා කිපුමෙක් හෝ වෙදනා-වෙක් හෝ නො වෙයි. **පරිච්ඡේද** වශයෙන් ලසිකා භාගයෙන් පරිච්ඡින්න ය. මේ මෙහි සභාග පරිච්ඡේදය යි. විසභාග පරිච්ඡේදය කෙශයන්ට කී නියා යි.

22 මුත්‍රය.

මුත්‍රය නම් මූත්‍ර යි. එය **වණ්ණ** වශයෙන් උදු ගැරැ දියට බදු වණ් ය. **සණ්ඨාන** වශයෙන් යටිමුව කොටැ තුබූ කළයෙක දියට බදු සටහන් ය. **දිශා** වයෙන් යට දිශායෙහි වූයේ ය. **අවකාශ** වශයෙන් වස්තිය තුළ පිහිටියේ ය. වස්තිය නම් වස්ති-පුටය යි. ගවරවළෙක කට තැති සිලිදිය වදනා කළයක් වූ කල එහි ගවරවළ ජලය ඇතුළු වෙයි. **එහෙත්** එහි ඒ ජලය ඇතුළු වන මාගීය නො පෙනෙ යි. එ මෙන් ශරීරයෙන් මූත්‍ර වස්තිපුටයට ප්‍රවිෂ්ට වෙයි. ප්‍රවිෂ්ට වන මාගීය නො පෙනෙයි. නික්මෑ යන මාගීය පෙනෙයි. නික්මෑ යන මාගීයෙහි මූත්‍ර පිරුණු කල "මූත්‍ර කරමි" යි අදහස් පහළ වෙයි. **පරිච්ඡේද** වශයෙන් වස්ති අභ්‍යන්තරයෙන් ද, මූත්‍ර භාගයෙන් ද පරිච්ඡින්න ය.

මේ මෙහි සභාග පරිච්ඡේදය යි විසභාග පරිච්ඡේදය කෙශයන්ට කී නියා මැයි.

මෙසේ මේ කෙශාදි කොටස් **වණ්ණ** වශයෙන් **සණ්ඨාන** වශයෙන් **දිශා** වශයෙන් **අවකාශ** වශයෙන් **පරිච්ඡේද** වශයෙන් ව්‍යවසථා කොටැ යට දැක්වූ පරිදි අනුපූර්‍ව, නාති ශීඝ්‍රාදි නියායෙන් **වණ්ණ- සණ්ඨාන- ගන්ධ- ආසය- අවකාශ** යන පස් ආකාරයෙන් **පිළිකූල-පිළිකූල** යි මෙතෙහි කරත් ම කෙශාදි ප්‍රඥප්ති ඉක්මිමි වශයෙන් පවත්නා භාවනා කෙළවර ඒ සියලු කොටස් **එක**වර ම ප්‍රකට වෙයි. එක් නූලෙහි ඇවුණු දෙතිස් පැහැ-යෙකින් යුත් මල් දෙතිසක් ඇති මල් මාලාවක් දිසා බලන විට සියල්ල **එක**වර ප්‍රකට වන්නාක් මෙනි. යට මනසකාර **කෞශල්‍ය** කථායෙහි "කෙසා"යි මෙතෙහි කරත් ම ආදි කර්මිකයාගේ මනසකාරය ගොස් "මූත්‍රං" යන අවශාන කොටසෙහි හැපී සිටින්නේය යි කීයේ මේ නිසා යයි දත යුතු.

(මෙතෙක් කීයේ ආධ්‍යාත්මික ශරීරය පිළිබඳ මනසකාර විධිය යි.)

බාහිර ශරීරය පිළිබඳ මනස්කාර කරත් හොත් ඔහුට යට දැක්වුණු සේ ම සියලු කොටස් ප්‍රකට වැ ගිය කල්හි ගමනා-ගමනය කරන මනුෂ්‍ය, තිරශ්චීනාදීහු සත්ත්වාකාර වශයෙන් නො වැ කොට්ඨාස රාසි වශයෙන් වැටෙනත්. ඔවුන් විසින් අනුභව කරනු ලබන ආහාර පානාදිය ඒ කොට්ඨාස රාශි තුළ දමනු ලබන්නාක් මෙන් වැටහෙයි. ඉක්බිති යට කී සේ අනුපූර්‍ව මුඛත්වාදි වශයෙන් **"පිළිකූල-පිළිකූල"**යි නැවත නැවත මෙතෙහි කරත් ම අනුක්‍රමයෙන් අර්පණා උපදින්නේ ය.

උග්ගහනිමිත්ත හා පටිභාගනිමිත්ත

මෙසේ කෙශාදීන් පිළිබඳ වැ **වණ්ණ - සණ්ඨාන - දිශා - අවකාශ - පරිච්ඡේද** වශයෙන් වැටහීම උග්ගහනිමිත්ත ය. එ ම සම්ප්‍රකාරයෙන් පිළිකූලැ යි වැටහීම පටිභාගනිමිත්ත යි.

ඒ පටිභාගනිමිත්ත ආසෙවනය කරත් ම භාවනා කරත් ම යට කී සේ අඟුහ කම්මට්ඨානයෙහි මෙන් ප්‍රථමධ්‍යාන වශයෙන් ම අර්පණා උපදින්නේ ය.

යම් යොගියකුහට **එක** ම කොටසෙක් ප්‍රකට වීණි නම් යමෙක් **එක** කොටසෙක්හි අර්පණාවට පැමිණැ යළි අනෙක් කොටසෙක යොග කො කෙළේ නම් ඔහුට උපදින්නේ

එක ම අධිෂ්ඨාව ය. යමකුට නොයෙක් කොට්ස් ප්‍රකට විණි නම් යමෙක් එක කොටසෙක අධිෂ්ඨා ලබා පසු වැ අනෙක් කොටසෙහි ද යොග කෙළේ නම් ඔහුට **මල්ලක** තෙරුන්ට මෙන් කොටස් ගණනට ප්‍රථමධ්‍යාන උපදින්නේ ය. මල්ලක තෙරුන් වහන්සේ **දීඝභාණකඅභය** තෙරුන් වහන්සේගේ අත ගෙනැ "අභය ආයුෂ්මතුනි! මේ ප්‍රශ්නය උගන්නැ"යි කියා මේ කාරණය කී සේක. ඒ **මල්ලක** තෙරුන් වහන්සේ දෙනිස් කොට්සකි ප්‍රථමධ්‍යාන දෙනිසක් ලැබූ කෙනෙක. **රය** එකකට සම වැද්ද දවල් එකකට සම වදනේ නම් නැවත මුල් එකට සම වදනේ අඩමසක් ඉක්මීමෙන් ය. ඉදින් දවස් පතා එකකට සම්වදනේ නම් යළි එයට සමවදනේ මසක් ඉක්මීමෙන් ය.

මෙසේ **මේ කම්මට්ඨානය** ප්‍රථමධ්‍යානය වශයෙන් සමෘද්ධ වතු දු **වණ්ණ-සණ්ඨානාදියෙහි** සමානි බලයෙන් සමෘද්ධ වන බැවින් **කායගතාසතිය සි** කියනු ලැබේ.

මෙ **කායගතාසති** භාවනායෙහි යෙදෙන භික්ෂු අරති, රති මැඩැ ලන්නේ ය. අරති රතිහු ඔහු මැඩැ ලන්නට සමර්ථ නො වෙති. (අරති නම් අරණ්‍ය සෙනාසනාදියෙහි නො ඇල්ම ය. රති නම් පංචකාමයෙහි ඇල්ම සි.) හේ උපනුපන් අරති - රති මැඩැ ලමින් වසන්නේ ය. තවද හේ භයහෙරව මැඩැ ලන්නේ ය. භයහෙරවයෝ ඔහු නො මඬිති. උපනුපන් භයහෙරව මැඩැ ලමින් වසන්නේ ය. (පිළිකූල් භාවනායෙන් **ආහාරෙපටිකූලසඤ්ඤා** භාවනා වීම එයට හෙතු සි.) ශීතොෂ්ණාදිය ඉවසන්නේ ය. කෙශාදීන්ගේ වර්ණ හෙදය ගෙනැ භාවනා කිරීමෙන් චතුර්ධ්‍යාන ලබන්නේ ය. එසින් ම ඡව් අභිඥ ප්‍රතිවෙධය ද කරන්නේ සි.

තස්මා හවෙ අප්පමත්තෝ
අනුයුඤ්ජේථ පණ්ඩිතෝ
එවං අනෙකානිසංසං
ඉමං කායගතාසතිං."

'එසේ හෙයින් නුවණැත්තේ අප්‍රමාද වැ මෙ බඳු ආනිසංසයෙන් ප්‍රතිමණ්ඩිත වූ මේ **කායගතාසති** භාවනාව එකාන්තයෙන් වඩන්නේ සි.'

කායගතාසති භාවනාව පිළිබඳ විසතර කථා මාර්ගය මෙතෙකින් නිමියේ ය.

ආනාපාණසතිය.

"අයම්පි ඛෝ භික්ඛවෙ ආනාපාණසති සමාධි භාවිතො බහුලීකතො සන්තො චෙව පණීතො ච අසෙචනකො ච සුඛෝ ච විහාරෝ උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ ඨානසො අන්තරධාපෙති වූපසමෙති"[1] මහණෙනි! මේ ආනාපාණසති සමාධිය භාවිත බහුලීකෘත කෙළේ ශාන්ත ද- ප්‍රණීත ද - අසෙවනක ද - සුඛවිහරණ ද වන්නේ ය. උපනුපන් පාප අකුශල ධර්ම ඇසිල්ලෙකින් අතුරුදහන් කරන්නේ ය සන්සිඳුවන්නේ ය' යි බුදුරජාණන් වහන්සේ ආනාපාණසති සමාධියට ප්‍රශංසා කළ සේක.

ප්‍රශංසා කොටැ **"කථං භාවිතෝ ච භික්ඛවෙ ආනාපාණසති සමාධි භාවිතෝ බහුලීකතෝ සන්තෝ චෙව පණීතෝ ච අසෙචනකෝ ච සුඛෝ ච විහාරෝ උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ, ඨානසෝ අන්තරධාපෙති වූපසමෙති?**

ඉධ භික්ඛවෙ භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාරගතෝ වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා සෝ සතෝ'ව අස්සසති සතෝ පස්සසති.

දීඝං වා අස්සසන්තෝ දීඝං අස්සසාමීති පජානාති
දීඝං වා පස්සසන්තෝ දීඝං පස්සසාමීති පජානාති
රස්සං වා අස්සසන්තෝ - පෙ -
රස්සං වා පස්සසන්තෝ - පෙ -
සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති
සබ්බකායපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති
පස්සම්භයං කාය සංඛාරං අස්සසිස්සාමීති සික්ඛති
පස්සම්භයං කාය සංඛාරං පස්සසිස්සාමීති සික්ඛති
පීතිපටිසංවෙදී - පෙ -
පීතිපටිසංවෙදී - පෙ -
සුඛපටිසංවෙදී - පෙ -
සුඛපටිසංවෙදී - පෙ -
චිත්තසංඛාරපටිසංවෙදී - පෙ -
චිත්තසඞ්ඛාර පටිසංවේදී -පෙ-
පස්සම්භයං චිත්තසංඛාරං - පෙ -
පස්සම්භයං චිත්තසංඛාරං - පෙ -
චිත්තපටිසංවෙදී - පෙ -

---

[1] සං: නි: ආනාපාණසං: 1004

චිත්තපටිසංවෙදී – පෙ –
අභිප්පමොදයං චිත්තං – පෙ –
අභිප්පමොදයං චිත්තං – පෙ –
සමාදහං චිත්තං – පෙ –
සමාදහං චිත්තං – පෙ –
විමොචයං චිත්තං – පෙ –
විමොචයං චිත්තං – පෙ –
අනිච්චානුපස්සී – පෙ –
අනිච්චානුපස්සී – පෙ –
විරාගානුපස්සී – පෙ –
විරාගානුපස්සී – පෙ –
නිරොධානුපස්සී – පෙ –
නිරොධානුපස්සී – පෙ –
පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති
පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති''[1]

'මහණෙනි! කෙසේ භාවිත බහුලීකෘත කළ ආනාපාණසති සමාධිය ශාන්ත – ප්‍රණීත – අසෙවනක – සුඛවිහාර වන්නේ ද කෙසේ උපනුපන් පාප අකුශල ධර්ම ඇසිල්ලෙන් අතුරුදහන් කරමින් සන්සිඳුවන්නේ ද

'මහණෙනි! මේ සසුන් වැද පැවිදි වූ මහණ අරණ්‍යයකට හෝ වෘක්ෂමූලයකට හෝ ශූන්‍යාගාරයකට හෝ ගොස් පලග බැඳ, හිද, ගෙනැ කය ඍජුව වැ තබා සිහිය කම්මට්ඨානයට අභිමුඛ කොටැ පිහිටුවා සිහි ඇති වැ ම ආශ්වාස කරන්නේ ය. සිහි ඇතිවැ ම ප්‍රශ්වාස කරන්නේ ය. දීඝ් කොටැ ආශ්වාස කරමින් දීඝ් කොටැ ආශ්වාස කරමි යි දැනැ ගන්නේ ය. දීඝ් කොටැ ප්‍රශ්වාස කරමින් දීඝ් කොටැ ප්‍රශ්වාස කරමි යි දැනැ ගන්නේ ය. ලුහුඬු කොටැ ආශ්වාස කරමින් ලුහුඬු කොටැ ආශ්වාස කරමි යි දැනැ ගන්නේ ය. ලුහුඬු කොටැ ප්‍රශ්වාස කරමින් ලුහුඬු කොටැ ප්‍රශ්වාස කරමි යි දැනැ ගන්නේ ය. සබ්බකායපටිසංවෙදී වැ ආශ්වාස කරමි යි හික්මෙන්නේ ය. සබ්බකායපටිසංවෙදී වැ ප්‍රශ්වාස කරමි යි හික්මෙන්නේ ය. – පෙ – පටිනිස්සග්ගානුපස්සී වැ ආශ්වාස කරමි යි හික්මෙන්නේ ය. පටිනිස්සග්ගානුපස්සී වැ ප්‍රශ්වාස කරමි යි හික්මෙන්නේය' යි ඕඛශවස්තුක ආනාපාණසති කම්මට්ඨානය වදාළසේක. දැන් කළ යුත්තේ ඒ භාවනා කරන ක්‍රමය විස්තර කිරීම යි. පාළි අනුසාරයෙන් ම එය විස්තර කරන කල සමී සම්පූර්ණ වන බැවින් මෙතැන් පටන් එසේ විස්තර කරමු.

"කථං භාවිතො ච භික්ඛවෙ ආනාපාණසති සමාධි"-යන මෙහි **"කථං"** යනු ආනාපාණසතිසමාධි භාවනාව නානා ප්‍රකාරයෙන් විස්තර කරනු කැමැත්තෙන් කරන විචාරීම ය. "කෙසේ" යනු එහි අර්ථ යි. **"භාවිතොව භික්ඛවෙ ආනාපාණසති සමාධි"** යනු එසේ විචාරනු ලබන ඔමී ය **"කථං බහුලීකතො - පෙ - වූපසමෙති"** යනු දු ඒ මැ යි.

භාවිතො = උපදවන ලද හෝ වඩන ලද (ඉපදෑ ලබ්ධාසෙවන වූයේ භාවිත ය. ප්‍රගුණ භාවයට ගියේ වඩිත ය)

"ආනාපාණසති සමාධි = ආශ්වාස - ප්‍රශ්වාස පිරිසිඳෑ ගන්නා සිහිය හා යෙදුණු සමාධි ය. මෙයින් සති සමාධින්ගේ එකුප්පාදාදි ලක්ෂණ කිහ. නොහොත් ආනාපාණසතියෙහි වූ සමාධි කිහ.

බහුලීකතො = බොහෝ කොටැ පවත්වන ලද හෙවත් නැවත නැවත කරන ලද. මෙයින් ආවජ්ජනාදි වශිභාවය කිහ. (මේ පද තුනින් උපදවා ගත් - උපදවා ගෙනැ ආසෙවනය කැරැ ගත් - ආසෙවනය කැරැ ප්‍රගුණ කැරැ ගත් - ප්‍රගුණ කැරැ ගෙනැ ආවජ්ජන සමාපජ්ජනාදි පස් ආකාරයෙන් වශග කැරැ ගත් ආනාපාණසති සමාධිය කියවුණේය යි දත යුතු.)

සනෙනා චෙව පණීතො ච = "සනෙනා ච එව පණීතො ච එව"යි එව ශබ්දය දෙ තන්හි ම ලා ශාන්ත ම ද, ප්‍රණීත ම ද යි අර්ථ ගත යුතු.

එහි අදහස මෙසේ ය:- අශුභ කම්ඵස්ථාන ශාන්ත ප්‍රණීත වන්නේ හුදෙක් ප්‍රතිවෙධ වශයෙන් පමණෙකි. ආරම්මණ වශයෙන් ඒ ශාන්ත ප්‍රණීත නො වේ. කුමක් හෙයින් ද ඒ අශුභාරම්මණ ඔඳුරික ද, පිළිකුල් ද බැවිනි. මේ ආනාපාණසතිය ඒ කෙසේ හෝ අශාන්ත - අප්‍රණීත නො වේ. සියලු ආකාරයෙන් ම ශාන්ත - ප්‍රණීත වේ. ආරම්මණ ශාන්තත්වයෙන් ද ශාන්ත වේ. ව්‍යුපශාන්ත වේ. නීරීත වේ. ප්‍රතිවෙධ සංඛ්‍යාත අඞ්ග ශාන්තත්වයෙන් ද ශාන්ත වේ. ව්‍යුපශාන්ත වේ. නීරීත වේ. ආරම්මණ ප්‍රණීතත්වයෙන් ද ප්‍රණීත වේ. අතෘප්තිකර වේ. ප්‍රතිවෙධ සංඛ්‍යාත අඞ්ග ප්‍රණීතත්වයෙන් ද ප්‍රණීත වේ. අතෘප්තිකර වේ. එහෙයිනි කියන ලද්දේ **"සනෙනා චෙව පණීතො ච"** යි.

(අගුහාරම්මණ මහත් ය පිළිකුල් ය. එබැවින් ඒ ආරම්මණ වශයෙන් ශාන්ත ප්‍රණීත නො වේ. මේ ආශ්වාස - ප්‍රශ්වාසාරම්මණ සියුම් ය. ප්‍රණීත ය. එ බැවින් ඒ ආරම්මණ වශයෙන් ශාන්ත-ප්‍රණීත වේ යයි කී සේයි. ප්‍රතිවෙධ වශයෙන් දෙක ම ශාන්ත ප්‍රණීත යි.)

අසෙවනකෝ ච = (කාඃසඃ සෙවනාති අසෙවනකෝ) ශාන්ත-ප්‍රණීත කැරැ ගන්නා පිණිස අමුතුයෙන් යමක් වත් කළ යුතු නො වේ. එ හෙයින් ම අනාසිත්තක ය. අනාසිත්තක හෙයින් ම අව්‍යාකිණ්ණ ය හෙවත් අසම්මිශ්‍ර ය. අව්‍යාකිණ්ණ හෙයින් ම පාරි-සෙකක ය හෙවත් වෙන් ය. ආවෙනික ය මෙහි පරිකම්‍යෙන් හෝ උපචාරයෙන් හෝ ශාන්ත භාවයෙක් වූවමනා නො වේ. සභාවයෙන් ම ශාන්ත ය. ප්‍රණීතය යි සේ යි. (ඇතැම්හු "මේ "අසෙවනකෝ" යන්ට අනාසිත්තක ය, ඔජස්වී ය, සභාවයෙන් ම මිධුරය, යන අර්ථ දෙත්.)

සුඛෝ ච විහාරෝ = අර්පිත - අර්පිත ක්ෂණයෙහි හෙවත් සමවතට සමවන් - සමවන් ඇසිල්ලෙහි කායික-චෛතසික සුඛ ප්‍රතිලාභයට කරුණු වන බැවින් සුඛවිහාර ද වේ. (ත්‍රික-චතුෂ්ක-ධ්‍යාන වශයෙන් හෝ උපෙක්ෂාවගේ ශාන්ත බැවින් හෝ සුඛ-ගතික හෙයින් සියලු ධ්‍යානයන්ගේ වශයෙන් චෛතසික සුඛ ප්‍රතිලාභයට කාරණ වෙයි. ධ්‍යානසමුත්ථාන ප්‍රණීත රූප සපුට ශරීර ඇති බැවින් කායික සුඛ ප්‍රතිලාභයට කාරණ වේ. හේ ධ්‍යානයෙන් නැඟි සඳ වෙයි යනු සත්න යි.)

උපපන්නුපපන්නෙන පාපකෙ අකුසලෙ ධම්මෙ = උපනුපන් (විෂ්කම්භනය නො කළ) ලාමක අකුශල ධර්මයන් අකුශල ධර්ම නම් අකෞශල්‍ය සංඛ්‍යාත අවිද්‍යායෙන් නිපන් ධර්ම යි - පාප ධර්ම යි සේ යි.

ඨානසො අනන්තරධාපෙති = ඇසිල්ලෙකින් ම අතුරු දහන් කරයි - විෂ්කම්භනය කරයි.

වූපසමෙති = විශෙෂයෙන් සන්සිඳුව යි. ("යෙසු සමාධි ද තමාගේ ප්‍රවෘත්තික්ෂණයෙහි ප්‍රතිපක්ෂ ධර්මයන් වූපසමනය කෙරෙයි. කුමක් හෙයින් මේ සමාධි ය මෑ මෙසේ වෙසෙසා කියන ලද ද යත්:- පූර්භාගයෙහි පටන් ම නානා විතර්ක ව්‍යපශමනය කරන හෙයින.

එ හෙයින් ම කීහ:- **"ආනාපානසති භාවෙතබ්බා විතක්කූපච්ඡෙදය"** යි අනෙකෙකුදු ඇත. මේ කමටහන තීක්ෂ්ණ

ප්‍රඥා ඇති ශ්‍රුතොත්තරයාගෙ. ශ්‍රුතොත්තරයාගේ කෙලෙස් ප්‍රහාණය සෙස්සන්ගේ කෙලෙස් ප්‍රහාණයට වඩා සාතිශය වේ. ශ්‍රද්ධා විමුක්තියාගෙ වඩා දෘෂ්ටිප්‍රාප්තයාගේ කෙලෙස් ප්‍රහාණය මෙනි. එහෙයින් මේ ආනාපාණසති විශෙෂය සඳහා "යානසෝ අනන්තරධාපෙති වූපසමෙති" යි කිහු නොහොත් නිමිත්ත ප්‍රාදුර්භාවය ඇති කල්හි ඒ ක්ෂණයෙහි ම අඞ්ගප්‍රාදුර්භාවය වන හෙයින් මේ සමාධිය ම "යානසෝ අනන්තරධාපෙති වූපසමෙති" යි කියන ලදී" යනු සන්න යි.)

තවද මෙය නිඛෙඛධ භාගිය බැවින් පිළිවෙළින් ආයත්‍යිමාගී වාදියට පැමිණෙ කෙලෙස් සිදෙ ලයි - සන්සිදුවයි. (ශාසනිකයන්ගේ ධ්‍යාන භාවනාව බොහෝ සෙයින් ම නිබ්බෙධභාගිය ය. බුදුන්ට වනාහි එකාන්තයෙන් නිබ්බෙධභාගිය ම වේ. මේ කමටහන වඩා ම සියලු බුදුවරයෝ බුද්ධත්වයට පැමිණෙත්.)

"භාථං භාවිතො ච භික්ඛවෙ" යනාදියෙහි විසතරය යට දැක්වුණේ ය. එහි සංක්ෂෙපාර්ථය මෙසේ ය. 'මහණෙනි! කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද ආනාපාණසති සමාධිය ශාන්ත - ප්‍රණීත - අසෙවනක - සුඛවිහාර වන්නේ ද, කෙසේ උපනුපන් ලාමක අකුශල ධර්ම ඇසිල්ලෙන් අතුරුදහන් කරන්නේ ද සන්සිඳුවන්නේ ද'

මෙය විසඳනසේක් **"ඉධ භික්ඛවෙ භික්ඛු"** යනාදීන් වදාළසේක.

ඉධ භික්ඛවෙ භික්ඛු = මහණෙනි! මේ ශාසනයෙහි භික්ෂු. මේ ශාසනයෙහි යන්නෙන් සම්මාසම්බුද්ධ ආනාපාණසති සමාධි උපදවන යොගාවචරයාට ආධාර වූ බුද්ධශාසනය දක්වයි. එසේ නැති අන්‍ය ශාසන ප්‍රතිෂෙධ කරයි.

වදාළේ මැයි:- **"ඉධ භික්ඛවෙ සමණො - පෙ - සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙහි"**[1] යි. මහණෙනි! ප්‍රථම ශ්‍රමණ ද මේ ශාසනයෙහි ම ය. ද්විතීය ශ්‍රමණ ද මේ ශාසනයෙහි ම ය. තෘතීය ශ්‍රමණ ද මේ ශාසනයෙහි ම ය. චතුර්ථ ශ්‍රමණ ද මේ ශාසනයෙහිම ය. පරප්‍රවාද ශූන්‍යය ශ්‍රමණයන්ගෙන් හිස් ය.

අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා = මෙයින් ඒ භික්ෂුහට ආනාපාණසති සමාධි භාවනාවට සුදුසු සෙනසුන දක්වයි. බොහෝ කලක් රූපාදි

---

1 ම: නි: මූලපණ්ණාසක: 68

නානා අරමුණෙහි බැඳී ගිය සිත ආනාපාණසති සමාධි අරමුණට නැඟෙන්නට නො කැමැති වැ කුළු ගොනකු යෙදූ රථය මෙන් නො මඟට ම දුව යි. කුළු දෙනගේ කිරි මුළුල්ල බී වැඩුණු කුළු වසු හික්මවා ගනු කැමැති ගොපොල්ලා ඒ වසු දෙනගෙන් ඉවත් කොටැ අසල සවි ඇති ටැඹක් සිටුවා එහි යොතින් බැඳැ ලයි. වසු ඔබ මොබ දඟලා පැන යා නො හැකි වැ ඒ ටැම් මුල ම වැතිරී හිඳී. එක්කෝ එහි ම නිදයි. එමෙන් බොහෝ කලක් රූපාරම්මණාදි රස පානයෙන් වැඩුණු සවකිය දුෂ්ට වූ සිත දමනය කැරී ලනු කැමැති ඒ භික්ෂු ද ඒ සිත රූපාදි අරමුණෙන් ඉවත්කොටැ ලා වලකට හෝ රුක්මුලකට හෝ හිස් ගෙයකට හෝ එළඹැ ආනාපාණ ටැඹෙහි සති යොතින් බඳින්නේ ය. එවිට ඒ සිත ඔබ - මොබ දුවා ද පෙර පුරුදු අරමුණු නො ලැබැ සති යොත කඩා ගෙන පැනැ යා නො හැකි වැ එ අරමුණ මැ ගෙන උපචාර - අර්පණා වශයෙන් පවත්නේ ය. එ හෙයින් කීහු පෞරාණිකයෝ:-

"යථා ථම්භෙ නිබන්ධිත්‍ය - වච්ඡං දම්මං නරෝ ඉධ
බන්ධෙය්‍යෙවං සකං චිත්තං - සතියාරම්මණෙ දළහං[1]" යි.

'ගොපොල්ලා දමනය කැරී ගත යුතු වසු යොතින් ටැඹෙහි බැඳා ලන්නා සේ යෝගාවචර සවකිය සිත සිහියෙන් අරමුණෙහි දැඩි වැ බැඳා ලන්නේ ය.' මෙසේ හෙයින් ඔහුගේ ඒ සෙනසුන භාවනාවට යෝග්‍ය වන්නේ ය. "මෙයින් ඒ භික්ෂුහට ආනාපාණසති සමාධි භාවනාවට සුදුසු සෙනසුන දක්වයි" යනු යට දැක්වුණේ මේ නිසා ය.

තව ද මේ ආනාපාණසති කම්ඵස්ථානය සෙසු කම්ඵස්ථානයන්ට වඩා ප්‍රධාන ය. සියලු බුදු - පසේ බු - බුදුසව්වන්ගේ විශෙෂාධිගමයට හා මේ අත්බැව්හි සැප විහරණයට හා කාරණ ය. ස්ත්‍රී - පුරුෂ - ඇත් - අස් - ගව ආදීන්ගෙන් ගහණ වූ ග්‍රාම්‍යන්තය හැර නො පියා භාවනා කළ නො හැකි ය. එයට ශබ්දය කටු වන බැවිනි. අග්‍රාම අරණ්‍යයෙහි නම් භාවනා කළ හැකි ය. යොගාවචරයාට අග්‍රාම අරණ්‍යයෙහි දී මෙය වඩා ආනාපාණසති චතුර්ධ්‍යානය ලැබැ එ ම පාදක කොටැ සංඝාර සම්මර්ශනයෙන් අග්‍රඵල සංඛ්‍යාත අර්හත්ත්වය ලැබැ ගත හැකි ය. එ බැවින් එයට අනුරූප සෙනසුන් දක්වන බුදුරජාණන් වහන්සේ **"අරඤ්ඤගතො වා"** යනාදීන් වදාළසේක. බුදුරජාණන් වහන්සේ වාසනුවිද්‍යාව දන්නා ආචාර්‍යවරයකු බඳු ය. වාසනු

[1]ස: පකාසිනී ආනාපාණස: වණ්ණනා 33

විද්‍යුවාසී වනාහි නගර නිර්මාණයට සුදුසු භූමියක් දැක මැනෙවින් පරීක්ෂා කොටැ බලා "මෙහි නුවර නංවවු ය" යි උපදෙස් දී සුවසේ නුවර නිම් කල්හි රජකුලයෙන් මහත් සත්කාර ලබන්නේ ය. බුදුරජාණන් වහන්සේ ද යොගාවචරයාට යොග්‍ය වූ සෙනසුන සොයා "මෙහි කමටහන් වඩව" යි නියොග දී එහි කමටහන් වැඩූ යොගාවචර අර්හත්වයට පැමිණි කල්හි "එකාන්තයෙන් භාග්‍යවත්හු සම්‍යක් සම්බුද්ධයෝ ය" යන මහත් සත්කාරය ලබන සේක.

මේ යොගාවචර භික්ෂු දිවියකු බඳුය යි කිය යුතු. දිවි වනාහි වනාන්තරයෙහි වන ලැහැබෙක හෝ තෘණ ලැහැබෙක හෝ ගිරිදුර්ගයෙක හෝ සැඟවී සිටැ වල්මී – ගෝන – හූරු ආදීන් අල්වා ගන්නේ ය. අරණ්‍යාදියෙහි වැඳී කර්මස්ථාන වඩනා යොගාවචර භික්ෂු ද පිළිවෙළින් සෝවාන් – සකෘදාගාමි – අනාගාමි– අර්හත් මාර්ග-ඵල ලබා ගන්නේ ය.

කියේ මැ යි පෙරාණිකයන් විසින්:–

> **"යථා පි දීපිකො නාම – නිලීයිත්වා ගණ්හති මිගෙ**
> **තථෙවායං බුද්ධපුත්තො – යුත්තයොගො විපස්සකො**
> **අරඤ්ඤං පවිසිත්වාන –ගණ්හාති ඵලමුත්තමං[1]"** යි.

'යම් සේ දිවි සැඟවී සිටැ මුවන් අල්ලා ගන්නේ ද, එසේ මේ යුක්තයොග විදර්ශක බුද්ධපුත්‍ර ද අරණ්‍යයට වැද උතුම් මාර්ග-ඵල ලබා ගන්නේ ය.'

එසේ හෙයින් යොගිහුගේ පරාක්‍රම ජවයට යොග්‍ය භූමි වූ අරණ්‍ය සෙනසුන දක්වන භාග්‍යවතුන් වහන්සේ **"අරඤ්ඤ-ගතො වා"** යනාදීන් වදාළසේක.

අරඤ්ඤගතො වා = අරණ්‍යයකට ගියේ හෝ **"අරඤ්ඤං නාම නික්ඛමිත්වා බහි ඉන්දඛීලා සබ්බමෙතං අරඤ්ඤං"** යි අභිධර්මක්‍රමයෙන් ද, **"අරඤ්ඤං නාම සෙනාසනං පඤ්චධනු-සතිකං පච්ඡිමං"** යි සූත්‍රක්‍රමයෙන් ද කී ලක්ෂණ ඇති අරණ්‍ය අතුරෙන් විවෙකසුඛයෙන් යුත් යම්කිසි අරණ්‍යයකට ගියේ හෝ

රුක්ඛමූලගතො වා = වෘක්ෂ සමීපයකට ගියේ හෝ

සුඤ්ඤාගාරගතො වා = ජන ශූන්‍ය විවෙක ගෘහයකට යියේ හෝ අරණ්‍ය – වෘක්ෂමූල හැර සෙසු පර්වත – කන්දර –

---

[1]සං: පකාසිනී ආකාසාණ්සති කථාව 326

ගිරිගුහා – සුසාන – වනපත්ථ – අබ්භොකාස – පලාලපුඤ්ජ යන සප්තවිධ සෙනාසන ශූන්‍යාගාරය සි කිය යුතු.

මෙයින් සෘතු තුනට ද, ධාතු තුනට ද, චරියා තුනට ද, ගොග්‍ය වූ **ආනාපාණසති** භාවනානුකූල සෙනාසන දක්වන ලද්දේ ය. ("ගිම් කල්හි ශීතල බැවින් අරණ්‍යය අනුකූල වේ. ශරත් කල්හි විවරණ බැවින් රුක් මුල් අනුකූල වේ. වැසි කල්හි වැසි වරණ බැවින් ශූන්‍යාගාරය අනුකූල වේ. ශ්ලේෂ්ම ප්‍රකෘතිකට අරණ්‍යය, පිත්ත ප්‍රකෘතිකට වෘක්ෂමූල ය, වාත ප්‍රකෘතිකට ශූන්‍යාගාරය අනුකූල වේ. මොහචරිතයාගට අරණ්‍යය ද, දොෂචරිතයාගට වෘක්ෂමූලය ද, රාගචරිතයාගට ශූන්‍යාගාරය ද අනුකූල වෙයි" යනු සන්ත සි.) එසේ දක්වා සයනය කුසිත පක්ෂයෙහි ද සථාන චංක්‍රමණ ඔඝධාත්‍ය පක්ෂයෙහි ද වැටෙන බැවින් ඒ තුන හැර අලීන අනෙඝධාත්‍ය පාඨික වූ හිඳීම දක්වන්නේ **"නිසීදති"** සි කීහ.

නිසීදති = හිඳ ගන්නේ ය.

හිඳ ගැන්ම දැඩි වන සැටි ද, ආශ්වාස – ප්‍රශ්වාස සුව සේ පවත්නා සැටි ද, අරමුණු ගැන්මට සුදුසු වන සැටි ද දක්වන්නේ ඉක්බිති **"පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා"** සි කීහ.

පල්ලඞ්කං ආභුජිත්වා = හාත්පසින් ඌරුබද්ධාසනය බැඳ – අරම්භය ගොතා හිඳ ගෙන සි සේ සි. (මෙයින් හිඳ ගැන්ම දැඩි වන සැටි කීහ.)

උජුං කායං පණිධාය = උපරි ශරීරය සෘජු වැ තබා ගෙන – අටලොස් පිටකටු ඇට කොන් එකක් මතු එකක් තිබෙන සේ පිළිවෙළින් පිහිටුවා ගෙන මෙසේ උන් කල්හි සම් – මස් – නහර නො නැමෙන බැවින් විටින් විටවත් වෙදනා නූපදියි. වෙදනා නැති කල්හි සිත එකඟ වේ. කමටහන නො වැටෙ සි. එසින් භාවනා වෘද්ධිය වේ. (මෙයින් ආශ්වාස–ප්‍රශ්වාස සුවසේ පවත්නා සැටි කීහ.)

පරිමුඛං සතිං උපට්ඨපෙත්වා = කම්මට්ඨානාභිමුඛ කොටැ සිහිය එළවා (බාහිර අරමුණින් සිහිය ඉවත් කොටැ කම්මට්ඨානයට අභිමුඛ කොටැ පිහිටුවා යනු අර්ථ සි. මෙහි පරි යනු අභි යන්නෙහි අර්ථය දෙයි. තවද **"පරිග්ගහට්ඨෝ, මුඛන්ති නියාන්‍යානට්ඨෝ, සතීති උපට්ඨානට්ඨෝ** තෙන වුච්චති **පරිමුඛං සතිං"**[1] සි පටිසම්භිදා පාළියෙහි කී පරිදි ද

[1]පටි: ම: ආනාපාණසතිකථා 174 බුරුම

මෙහි ලා දත යුතු යි. පරි යනු පරිග්‍රහාර්ථ ය, මුඛ යනු නියය්‍යාණාර්ථ ය, සති යනු උපසථානාර්ථ යි. එහෙයින් පරිමුඛං සතිං යි කියනු ලැබේ. යනු එහි භාව යි. 'ගන්තා ලද නියය්‍යාණ ඇති සිහිය කොටැ' යනු එහි සංක්ෂිප්ත තේරුම යි. (නියය්‍යාණ නම් කෙලෙසුන්ගෙන් නික්මීම ය – නිස්සාණය – නිවන් අරමුණු කොටැ සිහිය උපදවා ගෙනැ)

සො සතොව අස්සසති සතො පස්සසති = ඒ භික්ෂූ යට කී පරිදි හිදැ ගෙනැ, යට කී පරිදි සිහි එළවා ගෙනැ ඒ සිහිය නො හරිමින් ම ආශ්වාස කරයි. සියලු තැන සතොකාරී වෙයි. සතොකාරී වැ කෙසේ ආශ්වාස කරන්නේ ද කෙසේ ප්‍රශ්වාස කරන්නේ ද යනු දක්වන්නට **"දීඝං වා අස්සසන්තො"** යනාදිය කීහ. **පටිසම්භිදායෙකිඳු "සතො ව අස්සසති සතො පස්සසති"**[1] යි ද එහිම විභඞ්ගයෙහි ද **"ඔතාරිංසාය ආනාපානසතිං සතොකාරී හොති. දීඝං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති. තාය සතියා තෙන ඤාණෙන සතොකාරී හොති. දීඝං පස්සාසවසෙන – පෙ – පවිනිස්සග්ගානුපස්සී අස්සාසවසෙන – පවිනිස්සග්ගානුපස්සී පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන සතොකාරී හොති"**[1] යි කියන ලද්දේ ය. දෙතිස් ආකාරයෙකින් සතොකාරී වෙයි. දීඝ කොටැ ආශ්වාස කිරීම් වශයෙන් සිත එකඟ වූ බව දනුත් ම සිහිය එළඹුණේ වේ. ඒ සිහියෙන් ඒ ඤාණයින් සතොකාරී වෙයි. දීඝ කොටැ ප්‍රශ්වාස කිරීම් වශයෙන් යනාදි සෙසු සතලොස් තන්හි ද මෙසේ ම අර්ථ දත යුතු. (මෙයින් සතොකාරී වැ ම ආශ්වාස-ප්‍රශ්වාස කළ යුතු බව කීහ.)

දීඝං වා අස්සසන්තො = දීඝ කොටැ හෝ ආශ්වාස කරන්නේ. ආශ්වාස නම් පිටවෙන වාතය යි ද, ප්‍රශ්වාස නම් ඇතුළු වන වාතය යි ද විතය අට්ඨකථාහි දැක්වේ. සූත්‍ර අට්ඨකථාහි වනාහි ආශ්වාස නම් ඇතුළු වන වාතය යි ද, ප්‍රශ්වාස නම් පිට වන වාතය යි ද දක්වා තිබේ. සියලුම ගණ්ඨාරූඪ සත්ත්වයන් මව් කුසින් බිහිවන කල පළමු කොටැ ඇතුළත තුබුණු වාතය පිටතට නික්මේ. පසු වැ පිටත වාතය සියුම් රජස් ගෙනැ ඇතුළට පිවිසැ තල්ලේ හැපී නිවී යයි. මේ ආශ්වාසය මේ ප්‍රශ්වාසය යි දතයුතු මෙසේ ය.

---

[1] පටි: ම: ආනාපාණසතිකථා 174 බුරුම

('මව් කුස උපන් සද නික්මෙනුවට අවකාශ නො ලද චිතය මව් කුසින් නික්මෙන් ම පිටතට නික්මෙන බැවින් උත්පත්ති ක්‍රම වශයෙන් චිතය අටුවායෙහි ඇතුළත්හි නාශාවාතය ගෙනැ "ආදෙඝශ්වාසය" ආශ්වාස නමැති කිවු. පළමු නාශාවාතය ඇතුළත ඉක්බිති බාහිර කරන බැවින් සූත්‍රානත අටුවායෙහි භාවනා ක්‍රමයෙන් ආදියෙහි නාශාවාතය ගෙනැ ආදෙඝශ්වාසය ආශ්වාසය යි වදනා නාශාවාතය ආශ්වාස නමැ යි කිහු. චිතය අටුවායෙහි උත්පත්ති ක්‍රමයෙන් කිවා සිටුවා ප්‍රවෘත්ති ක්‍රම භාවනා වට කැමැති විය යුතු බැවිනුදු **'අස්සාසාදිමජ්ඣපරියොසානං සතියා අනුගච්ඡතෝ අජ්ඣත්තං වික්ඛේපගතෙන චිත්තෙන"**[1] යන පෙළ ඇති බැවිනුදු සූත්‍ර අටුවායෙහි කී නියායෙන් ම වී යනු සත්ත යි. ටීකායෙහි වනාහි **"චිතය නයෙන අනෙනා උට්ඨිතඝාසඝනං අස්සාසො, ඔහි උට්ඨිතඝාසඝනං පස්සාසො. සුත්තනත නයෙන ඔහි උට්ඨහිත්වාපි අනෙනාඝාසඝනතො අස්සාසො, අනෙනා උට්ඨහිත්වාපි ඔහි ඝාසඝනතො පස්සාසො"** යි කිහු. යනු පැරකුම්බා සත්ත යි.)

මේ ආශ්වාස - ප්‍රශ්වාසයන්ගේ දීඝ බව හෝ හ්‍රස්ව බව හෝ දත යුත්තේ කාල වශයෙනි. දීඝ පෙදෙසක පැතිරී පවත්නා දිය දික්ඇල්ලය යි ද, වැලි දික්වැල්ලය යි ද, ලුහුඬු පෙදෙසක පැතිරී පවත්නා දිය කොට ඇල්ලය යි ද, වැලි කොටවැල්ලය යි ද, ව්‍යවහාර කරනු ලැබේ. එමෙන් කලාප වසයෙන් සුණු විසුණු වූ ද ආශ්වාස - ප්‍රශ්වාස කාල වශයෙන් ගෙනැ දීඝ ආශ්වාස-ප්‍රශ්වාසය, හ්‍රස්ව ආශ්වාස - ප්‍රශ්වාසය යි කියනු ලැබේ. ඇතුන්ගේ ද නයින්ගේ ද ශරීර දීඝ ය. ඔවුන්ගේ ආශ්වාස - ප්‍රශ්වාස දීඝ වැ සෙමෙන් පවත්නේ ය. එ බැවින් ඒ දීඝ ආශ්වාස දීඝ ප්‍රශ්වාසය යි කියනු ලැබේ. බලු - සා ආදීන්ගේ ශරීර ලුහුඬු ය. ඔවුන්ගේ ආශ්වාස-ප්‍රශ්වාස කොටින් - කොටින් ඉක්මන් වැ පවත්නේ ය. එ බැවින් එය හ්‍රස්ව ආශ්වාස - හ්‍රස්ව ප්‍රශ්වාසය යි කියනු ලැබේ. මිනිසුන්ගෙන් ඇතැම් කෙනෙක් හසති - සඳිදීන් මෙන් දීඝ කොටැ ආශ්වාස - ප්‍රශ්වාස කරති. ඇතැම් කෙනෙක් බලු - සා ආදීන් මෙන් ලුහුඬු කොටැ ආශ්වාස - ප්‍රශ්වාස කරති. දීඝ කොටැ ආශ්වාස - ප්‍රශ්වාස කරන කල්හි දීඝ ආශ්වාස - ප්‍රශ්වාසය යි ද, හ්‍රස්ව කොටැ ආශ්වාස - ප්‍රශ්වාස කරන කල්හි හ්‍රස්ව ආශ්වාස-ප්‍රශ්වාසය යි ද දත යුතු.

මේ යෝගී භික්ෂු නව ආකාරයෙකින් දීඝ කොටැ ආශ්වාස-ප්‍රශ්වාස කරන්නේ "මම දීඝ කොටැ ආශ්වාස - ප්‍රශ්වාස කරමි" යි

[1]පටි: ම: ආනාපාණකථා 165 (බුරුම)

දනැ ගන්නේ ය. එසේ දනැ ගත් ඔහුට දීඝ අස්සාස - පස්සාස රස්ස අස්සාස - පස්සාස යන සතරින් හෝ මේ කියනු ලබන තවයෙන් හෝ එක් ආකාරයෙකින් කායානුපස්සනා සතිපට්ඨාන භාවනාව සමෘද්ධ වේ.

පටිසම්භිදායෙහි:-

"කථං දීඝං අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති, දීඝං පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති. දීඝං අස්සාසං අද්ධානසඞ්ඛාතෙ අස්සසති. දීඝං පස්සාසං අද්ධානසඞ්ඛාතෙ පස්සසති. දීඝං අස්සාස-පස්සාසං අද්ධානසඞ්ඛාතෙ අස්සසතීති, පස්සසතීති. දීඝං අස්සාසපස්සාසං අද්ධානසඞ්ඛාතෙ අස්සසන්තොපි පස්සසන්තොපි ඡන්දෙ උප්පජ්ජති. ඡන්දවසෙන තතො සුඛුමතරං දීඝං අස්සාසං අද්ධානසංඛාතෙ අස්සසති, ඡන්දවසෙන තතො සුඛුමතරං දීඝං පස්සාසං අද්ධානසංඛාතෙ පස්සසති. ඡන්දවසෙන තතො සුඛුමතරං දීඝං අස්සාසපස්සාසං අද්ධානසඞ්ඛාතෙ අස්සසතීපි පස්සසතීපි ඡන්දවසෙන තතො සුඛුමතරං දීඝං අස්සාස-පස්සාසං අස්ස සන්තොපි පස්සසන්තොපි පාමොජ්ජං උප්පජ්ජති. පාමොජ්ජවසෙන තතො සුඛුමතරං දීඝං අස්සාසං අද්ධානසංඛාතෙ අස්සසති පාමොජ්ජවසෙන තතො සුඛුමතරං දීඝං පස්සාසං, -පෙ- දීඝං අස්සාස-පස්සාසං අද්ධානසංඛාතෙ අස්සසතීපි පස්සසතීපි. පාමොජ්ජවසෙන තතො සුඛුමතරං දීඝං අස්සාස-පස්සාසං අද්ධානසංඛාතෙ අස්සසන්තොඋපි පස්ස සන්තොඋපි දීඝං අස්සාසපස්සාසා චිත්තං විවට්ටති. උපෙක්ඛා සණ්ඨාති. ඉමෙහි නවහි ආකාරෙහි දීඝං අස්සාස-පස්සාසා කායො, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං කායො උපට්ඨානං නො සති, සති උපට්ඨානං වෙව සති ච, කායසතියා තෙන ඤාණෙන තං කායං අනුපස්සති. තෙන වුච්චති කායෙ කායානුපස්සනා සතිපට්ඨානභාවනා"[1] යි.

මෙහි අර්ථ මෙසේ ය:-

'දීඝ කොටැ ආශ්වාස කරන්නේ "දීඝ කොටැ ආශ්වාස කරමි" යි ද කෙසේ දන්නේ ද,

'දීඝ ආශ්වාසය දීඝ වේලාවක් ආශ්වාස කරයි' දීඝ ප්‍රශ්වාසය දීඝ වේලාවක් ප්‍රශ්වාස කරයි. දීඝ ආශ්වාස-ප්‍රශ්වාස දීඝ වේලාවක් ආශ්වාස - ප්‍රශ්වාස කරයි. එසේ දීඝ ආශ්වාස - ප්‍රශ්වාස දීඝ වේලාවක් ආශ්වාස - ප්‍රශ්වාස කරත් ම ඒ යොගිහට කත්‍යුකම්‍යතා කුශලච්ඡන්දය උපදින්නේ ය. (කත්‍යුකම්‍යතා කුශලච්ඡන්දය

[1]පටි: ම: ආනාපාණසතිකථා 175 බුරැම

නම් පෙරට වඩා අතිශයයෙන් භාවනා කරනු කැමැති බව යි.) ඉක්බිති ඒ කත්තුකම්‍යතා කුශලචිත්ත වශයෙන් පෙරට වඩා අතිශයයෙන් සියුම් වූ (භාවනා බලයෙන් කායප්‍රශ්‍රබ්ධ වූ දරථ පරිදාහ ඇති බැවින් ආශ්වාස – ප්‍රශ්වාස වාතයෝ සූක්ෂ්මතර වැ පවත්නාහු යි.” දීර්ඝ ආශ්වාසය දීර්ඝ වේලාවක් ආශ්වාස කරයි. කත්තුකම්‍යතා කුශලචිත්ත වශයෙන් පෙරට වඩා අතිශයයෙන් සියුම් වූ දීර්ඝ ප්‍රශ්වාසය දීර්ඝ වේලාවක් ප්‍රශ්වාස කරයි. කත්තුකම්‍යතා කුශලචිත්ත වශයෙන් පෙරට වඩා අතිශයයෙන් සියුම් වූ දීර්ඝ ආශ්වාස – ප්‍රශ්වාස දීර්ඝ වේලාවක් ආශ්වාස – ප්‍රශ්වාස කරයි. එසේ කත්තුකම්‍යතා කුශලචිත්ත වශයෙන් පෙරට වඩා අතිශයයෙන් සියුම් වූ දීර්ඝ ආශ්වාස – ප්‍රශ්වාස දීර්ඝ කොටැ අශ්වාස – ප්‍රශ්වාස කරත් ම ඒ යොගීහට ප්‍රමෝදය උපදනේ ය. (“ආශ්වාස-ප්‍රශ්වාසයන් සූක්ෂ්මතර බැවිනුදු ආලම්බනය ශාන්තිකර බැවිනුදු කම්මට්ඨානය වීපි ප්‍රතිපන්න බැවිනුදු භාවනා චිත්තසහගත වූ ප්‍රමෝදය හෙවත් ඝ්‍රාණාදි ප්‍රහෙද ඇති තරුණ ප්‍රීතිය උපදී” යනු සන්ත යි.) ඉක්බිති ප්‍රමෝද වශයෙන් පෙරටත් වඩා අතිශයයෙන් සියුම් වූ දීර්ඝ ආශ්වාස දීර්ඝ වේලාවක් ආශ්වාස කරයි. එසේ මැ දීර්ඝ ප්‍රශ්වාස දීර්ඝ වේලාවක් ප්‍රශ්වාස කරයි. දීර්ඝ ආශ්වාස-ප්‍රශ්වාස දීර්ඝ වේලාවක් ආශ්වාස – ප්‍රශ්වාස කරයි. එසේ ප්‍රමෝද වශයෙන් පෙරට වඩා අතිශයයෙන් සියුම් වූ දීර්ඝ ආශ්වාස-ප්‍රශ්වාස දීර්ඝ වශයෙන් ආශ්වාස – ප්‍රශ්වාස කරත් ම (“අනුක්‍රමයෙන් ආශ්වාස – ප්‍රශ්වාසයන් අතිශයයෙන් සූක්ෂ්මතර බවට පැමිණීමෙන් නො වැටහෙන කල්හි සෙවිය යුතු ආකාරයට පැමිණි”) ඒ ආශ්වාස – ප්‍රශ්වාසයන් කෙරෙන් සිත පෙරලෙයි. තත්‍ර මධ්‍යස්ථතා සංඛ්‍යාත උපෙක්ෂාව පිහිටයි. (භාවනා බෙලෙන් ආශ්වාස – ප්‍රශ්වාසයන් සූක්ෂ්මතර බවට පැමිණි කල්හි ඉහි ප්‍රතිභාග නිමිත්තය උපන් කල්හි ප්‍රකෘති ආශ්වාස – ප්‍රශ්වාසය කෙරෙන් සිත නවතී. ඒ ප්‍රතිභාග නිමිත්තයෙහි උපචාර – අර්පණා භේද සමාධිය උපන් කල්හි තැවත ධ්‍යානොත්පාදය පිණිස ව්‍යාපාරයක් නැති බැවින් අධ්‍යුපෙක්ෂණය වෙයි කියත්.” යනු සන්තයි.)

මේ නවාකාරයෙන් දීර්ඝ කොට පැවැති ආශ්වාස – ප්‍රශ්වාස කාය ය. (ආශ්වාස – ප්‍රශ්වාස නිසා උපන් ප්‍රතිභාග නිමිත්ත ද ආශ්වාස – ප්‍රශ්වාස නමින් ම ගැණෙන බව දත යුතු.) ඒ අශ්වාස – ප්‍රශ්වාස අරමුණ කරා එළඹ සිටින්නේ සතිය.

අනුපස්සනාව කැමැති ය. (අනුපස්සනා නම් සමථ වශයෙන් ද, විපස්සනා වශයෙන් ද යථාභූතඥානයෙහි බොධය යි.) කාය උපට්ඨාන ය. සති නොවේ. සතිය උපට්ඨාන හා සති වේ ඒ සතියෙන් ඒ කැමැත්තෙන් ඒ ආශාව – ප්‍රශ්වාස කාය ලබන්නේ ය. එහෙයින් කායානුපස්සනා සතිපට්ඨාන භාවනා ය යි කියනු ලැබේ. (''කුමක් කී නියාද යත්:- යථොක්ත වූ ආශ්වාස – ප්‍රශ්වාස කායයෙහි ද ඔහට නිශ්‍රය වූ කරජකායයෙහි ද කායයාගේ ම අනුපස්සනා ය. අනුදක වූ මරීචියෙහි උදකානුපස්සනාව මෙන් අනිත්‍යාදි සවභාවාකාරයෙහි නිත්‍යාදිභාවයෙන් අනුපස්සනාවක් නොවෙයි.

වැළි කිමෙක් ද යත්:- යථාඥීයෙන් අනිත්‍ය දුඃඛානාත්මාසුභ භාවයාගේ ම අනුපස්සනා ය. නොහොත් කායයෙහි මම ය, මාගේ ය, සත්‍රිය, පුරුෂය යි ගත යුතු කිසිවක්හු නැති බැවින් ඒ බදුවක්හු නො බලා කායමාත්‍රයාගේ ම අනුපස්සනාව කායානුපස්සනා නම්. ඒ කායානුපස්සනාව හා සම්ප්‍රයුක්ත සමෘති තොමෝ ම උපස්ථාන වී සතිපට්ඨාන නම් වෙයි. ඔහුගේ භාවනාව–විඝ්‍යනාව කායානුපස්සනා සතිපට්ඨාන භාවනාය යි කී නියා යි'' යනු සත්ත යි.)

''රස්සං වා අස්සසන්තෝ රස්සං අස්සසාමීති පජානාති'' යන්නෙහි දැ ක්‍රමය මෙසේ ය. **''දීඝං අස්සාසං අද්ධානසංඛාතෙ''** යනු වෙනුවට **''රස්සංඅස්සාසං ඛණතරසංඛාතෙ''**යි යොදනු. සෙස්ස පෙර කී සේ ම ය.

මෙසේ මේ යොගී දීඝී කාල වශයෙන් ද, සවල්ප කාල වශයෙන් ද යට කී පරිදි ආශ්වාස ප්‍රශ්වාස වන්නේ **''දීඝං වා අස්සසන්තෝ දීඝං අස්සසාමීති පජානාති – පෙ – රස්සං වා පස්සසන්තෝ රස්සං පස්සසාමීති පජානාති''** යි වන්නේ ය. එසේ දන්නා වූ ඒ යොගිහුගේ නැහැ අග–

''දීඝෝ රස්සෝ ච අස්සාසෝ – පස්සාසෝපි ච නාදිසෝ
චත්තාරෝ වණ්ණා චත්තනන්ති-නාසිකග්ගෙච භික්ඛුනෝ''යි

කී පරිදි දීඝී ආශ්වාස – හ්‍රස්ව ආශ්වාස දීඝී ප්‍රශ්වාස – හ්‍රස්ව ප්‍රශ්වාස යන සතර ආකාරය පවත්නේ ය යි දත යුතු.

''සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති
සබ්බකායපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති.''

'සියලු ආශ්වාසකායයාගේ ආදි – මධ්‍ය – අවශාන ප්‍රකට කොට දනිමින් ආශ්වාස කරන්නෙමි යි භික්මෙන්නේ ය'

සියලු ප්‍රශ්වාස කායයාගේ ආදි මධ්‍ය අවශානය ප්‍රකට කොට දනිමින් ප්‍රශ්වාස කරන්නෙමි යි භික්මෙන්නේ ය, ආශ්වාස-ප්‍රශ්වාස ප්‍රකට කොට දනිමින් ඥානසම්ප්‍රයුක්ත සිතින් ආශ්වාස-ප්‍රශ්වාස කළ යුතු ය යි කී සේ ය.

ඇතැම් යොගියකුට කලාප වශයෙන් සුණු විසුණු වූ ආශ්වාස – ප්‍රශ්වාස කායයෙහි ආදිය ප්‍රකට වේ. මධ්‍ය අවශාන ප්‍රකට නො වේ. ඒ යොගි ආදිය ම පිරිසිදු දැන ගන්නට සමර්ථ වේ. මධ්‍ය – අවශාන පිරිසිදු දැනගන්නට සමර්ථ නො වේ. හේ ඒ මධ්‍ය-අවශාන දෙක්හි වෙහෙසට පත් වේ. ඇතැම් යොගියකුට මධ්‍යය ප්‍රකට වේ. ආදි – අවශාන ප්‍රකට නො වේ. ඇතැම් යොගියකුට අවශානය ප්‍රකට වේ. ආදි – මධ්‍ය ප්‍රකට නො වේ. හේ ආදි - මධ්‍යයෙහි වෙහෙසට පත් වේ. ඇතැම් යොගියකුට ආදි – මධ්‍ය – අවශාන යන තුන් තැන ම ප්‍රකට වේ. හේ ඒ සියල්ල ම පිරිසිදු දන්මට සමර්ථ වේ. කිසි තැනෙකු දු වෙහෙසට පත් නො වේ. එබන්දකු විය යුතු ය යි දක්වන්නට ය. **"සබ්බ-කායපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති සබ්බකායපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති"** යි වදාළේ **"සික්ඛති"** යන්නෙහි තේරුම නම් 'භික්මෙන්නේ ය-ගැටෙන්නේ ය-වැයම් කරන්නේ ය' යනුයි.

මේ කී පරිදි තුන් තැන්හි ම භික්මෙන්නහුගේ යම් සංවර-යෙක් වේ ද එය **අධිසීල ශික්ෂා ය**. යම් සමාධියෙක් වේ ද එය **අධිචිත්තශික්ෂා ය.** යම් ප්‍රඥාවෙක් වේ ද එය **අධිප්‍රඥා ශික්ෂා ය.** මේ මෙහිලා ත්‍රිවිධ ශික්ෂා යි.

ඒ අරමුණෙහි එ කී සිහියෙන් එ කී මනසිකාරයෙන් භික්මෙන්නේ ය, සෙවිනේ ය, වඩන්නේ ය, බහුල කරන්නේ ය යි එහි අර්ථ දත යුතු යි.

"දීඝං වා අස්සසන්තෝ දීඝං අස්සසාමීති පජානාති -පෙ-රස්සං වා පස්සසන්තෝ රස්සං පස්සසාමීති පජානාති" යි කියූ තන්හි හුදෙක් ආශ්වාස – ප්‍රශ්වාස කටයුතු බව කිවා විනා අන් කිසි කටයුත්තක් නො කීයේ ය. මෙ තැන් පටන් ඥානොත්පාදදිය සඳහා උතුසාහ කටයුතු බව කියන්නේ ය. එහෙයින් එහි **"අස්සසාමි, පස්සසාමි"** යි වර්තමාන ක්‍රියායෙන් පාළිය දක්වා මෙ තැන් පටන් කටයුතු ඥානොත්පාදදි ආකාර දක්වන්නට **"සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමි"** යනාදීන් අනාගතකාල වශයෙන් පාළිය තබන ලද්දැ යි දතයුතු.

"පස්සම්භයං කායසංඛාරං අස්සසිස්සාමීති සික්ඛති
පස්සම්භයං කායසංඛාරං පස්සසිස්සාමීති සික්ඛති"

'ඔෞදාරික කාය සංස්කාර සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමි'යි හික්මෙන්නේ ය. 'ඔෞදාරික කාය සංස්කාර සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි' යි හික්මෙන්නේ ය. (කාය සංස්කාර නම් ආශ්වාස-ප්‍රශ්වාස යි. එය චිත්තසමුට්ඨාන වුව ද කය පිළිබඳ වැ පවත්නා බැවින් කායසංස්කාරය යි කියන ලදී.)

එහි ඔෞදාරික බව ද, සියුම් බව ද, සන්සිඳුවනා සැටි ද මෙසේ දත යුතු. කර්මස්ථානාරම්භයට පළමු ඒ යොගිහුගේ කය හා සිත සදරථ ය – ඔෞදාරික ය. කය හා සිත සදරථ – ඔෞදාරික කල්හි ඔහුගේ ආශ්වාස – ප්‍රශ්වාස ද ඔෞදාරික ය – බලවත් ය. නාසිකාව නො පොහොනේ මුඛයෙන් ද ආශ්වාස – ප්‍රශ්වාස කරන්නේ ය. **"නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය"** යන ක්‍රමයෙන් කය ද **"පරිමුඛං සතිං උපට්ඨපෙත්වා"** යන ක්‍රමයෙන් සිත ද පරිග්‍රහ කරන ලද කල්හි ඒ කය හා සිත ශාන්ත වන්නේ ය. කය හා සිත ශාන්ත කල්හි ආශ්වාස – ප්‍රශ්වාස ද ශාන්ත වැ සියුම් වැ පවත්නේ ය. ඇද්දේ හෝ නැද්දේ හෝ යි සෙවිය යුතු බවට පැමිණෙන්නේ ය. මිනිසකු වේගයෙන් දුවැ හෝ පරීතඅකින් බැසැ හෝ මහ බරක් හිසින් බහා සිටි කල්හි ඔහුගේ ආශ්වාස – ප්‍රශ්වාස ඔෞදාරිකය, නාසිකාව නො පොහොනේ මුඛයෙන් ද ආශ්වාස – ප්‍රශ්වාස කරන්නේ ය. ඒ විඛාව දුරැ කොටැ දිය නා පැන් බී තෙත් කඩක් ළය තබා ගෙනැ හිඟිල් සෙවනේ හුන් කල්හි ඒ ආශ්වාස – ප්‍රශ්වාස සියුම් වැ ඇද්දේ හෝ නැද්දේ හෝ යි සෙවිය යුතු බවට පැමිණෙන්නේ ය. මෙහිදීත් එ බදු ය යි දත යුතු. කුමක් හෙයින්ද, අපරිගෘහීත කාලයෙහි ඔහුට ඔෞදාරික ඔෞදාරික ආශ්වාස – ප්‍රශ්වාස සන්සිඳුවම් යි යන ආභොගයෙක් සමන්නාහාරයෙක්-මනස්කාරයෙක්-ප්‍රත්‍යවෙක්ෂණයෙක් නුවූයේ ය. පරිගෘහීතකාලයෙහි ම වූයේ ය. එ හෙයින් අපරිගෘහීත කාලයෙහි සියුම් නො වැ පරිගෘහීත කාලයෙහි ම සියුම් වන්නේ ය.

කියන ලද මෙ යි:–

"සාරද්ධෙ කායෙ චිත්තෙ ච – අධිමත්තං පවත්තති
අසාරද්ධම්හි කායම්හි – සුඛුමං සම්පවත්තති"[1] යි.

---

[1] ස: පකාසිනී ආකා: වණ්ණනා 338

'කාය චිත්ත සදරථ කල්හි කායසංඛාර අධික වෑ පවත්නේ ය. කාය චිත්ත අදරථ කල්හි සූක්ෂම වෑ පවත්නේ ය, යනු එහි අර්ථ යි.

"පරිගෘහීත කාලයෙහි ද ඕදාරික යි කිය යුතු, ප්‍රථම-ධ්‍යානයෙහි සියුම් ය. ප්‍රථමධ්‍යානොපචාරයෙහි ඕදාරික ය, ප්‍රථමධ්‍යානයෙහි සියුම් ය. ප්‍රථමධ්‍යානයෙහි ද, දුතියධ්‍යානොප-චාරයෙහි ද ඕදාරික ය, දුතියධ්‍යානයෙහි සියුම් ය. දුතිය-ධ්‍යානයෙහි ද තතියධ්‍යානොපචාරයෙහි ද ඕදාරික ය, තතිය-ධ්‍යානයෙහි සියුම් ය. තතියධ්‍යානයෙහි ද චතුත්ථධ්‍යානොප-චාරයෙහි ද ඕදාරික ය, චතුත්ථධ්‍යානයෙහි අති සියුම් වෑ-නැතැ යි කිය යුතු බවට පැමිණෙන්නේ ය" මේ කියන ලද්දේ **දීඝභාණක-සංයුත්තභාණකයන්ගේ** මතය යි. **මජ්ඣිමභාණකයෝ** "ප්‍රථම ධ්‍යානයෙහි ඕදාරික ය. දුතියධ්‍යානොපචාරයෙහි සියුම් ය" යනාදි වශයෙන් යට යට ධ්‍යානයෙහිදීට වඩා මතු මතු ධ්‍යානොපචාරයෙහි දී සියුම් ය යි කියති. දෙ පක්ෂයේ ම මතයෙන් අපරිගෘහීත කාලයෙහි පැවති කාය සංඛාර පරිගෘහීත කාලයෙහි සන්සිඳෙන බව ද, පරිගෘහීත කාලයෙහි පැවැති කායසංඛාර ප්‍රථම ධ්‍යානොපචාරයෙහි සන්සිඳෙන බව ද -පෙ-චතුර්ථ ධ්‍යානොපචාරයෙහි පැවැති කාය සංඛාර චතුර්ථ ධ්‍යානයෙහි දී සන්සිඳෙන බව ද කීයේ ය යි දත යුතු. මේ සමථයෙහි ක්‍රමය යි.

විදර්ශනායෙහි දී වනාහි අපරිගෘහීත කාලයෙහි හෙවත් කම්ටහන් නො ගත් කල්හි පැවැති කායසංඛාර ඕදාරික ය. සතර මහාභූත පරිගෘහීත කල්හි සුබුම ය. සතර මහාභූත පරිගෘහීත කල්හි දු ඕදාරික ය. උපාදාය රූප පරිගෘහීත කල්හි සුබුම ය. උපාදාය රූප පරිගෘහීත කල්හි දු ඕදාරික ය. සකල රූප පරිගෘහීත කල්හි සුබුම ය. සකල රූප පරිගෘහීත කල්හි දු ඕදාරික ය. අරූප පරිගෘහීත කල්හි සුබුම ය. අරූප පරිගෘහීත කල්හිදු ඕදාරික ය. රූපාරූප පරිගෘහීත කල්හි සුබුම ය. එ ද ඕදාරික ය. ප්‍රත්‍යය පරිගෘහීත කල්හි සුබුම ය. එ ද ඕදාරික ය. සප්‍රත්‍යය නාම-රූප පරිගෘහීත කල්හි සුබුම ය. එ ද ඕදාරික ය. ලක්ෂණාරම්මණික විදර්ශනායෙහි සුබුම ය. එ ද දුර්බල විදර්ශනායෙහි ඕදාරික ය. බලවත් විදර්ශනායෙහි සුබුම ය. (මෙහි රූපාරූප පරිග්‍රහය යි දෘෂ්ටි විශුද්ධි කීහු. සප්‍රත්‍යය නාම-රූප පරිග්‍රහය යි කාංක්ෂාවිතරණ විශුද්ධි කීහු.

ලක්ඛණාරම්මණික විපස්සනාය යි උදයව්‍යය දර්ශනයෙන් පෙරවූ කලාප සම්මර්ශනයෙහි පහරවා කීහු. බලව විපස්සනාය යි භඞ්ගානුදර්ශනායෙහි පහරවා හෝ නිර්වේදානුදර්ශනායෙහි පහරවා හෝ හිහ යනු සත්‍ය යි. ටීකායෙහි 'නිබ්බිදානු පස්සනතෝ පවත්තාය බලව විපස්සනා. තතෝ ඔරං දුබ්බල විපස්සනා' යි කීහු යනු පැරකුම් සත්‍ය යි.) සමථයෙහි කී සේ මෙහිදු පූර්ව-පූර්ව කායසංස්කාර ප්‍රශ්වීම – ප්‍රශ්වීමයෙන් සන්සිඳෙන්නේ ය. කාය-සංස්කාර පිළිබඳ ඔඥදුරික්‍යය හා සූක්ෂ්මත්වය ද, පටිපස්සද්ධිය ද මෙසේ මෙහි දක්වන ලදැයි දත යුතු.

සැරියුත් සඞ්ඝ පවිසමහිදුයෙහි දී මේ අර්ථය චොදනා පරිහාර සමඟින් මෙසේ දක්වයි.

"කථං පස්සම්භයං කායසංඛාරං අස්සසිස්සාමීති සික්ඛති-පස්සම්භයං කායසංඛාරං පස්සසිස්සාමීති සික්ඛති.

**කතමෙ කායසංඛාරා? දීඝං අස්සාසපස්සාසා – කායිකා එතෙ ධම්මා කායපටිබද්ධා – කායසංඛාරා තෙ කායසංඛාරෙ පස්සම්භයතෙනා නිරොධයතෙනා වූපසමෙතෙනා සික්ඛති. යථාරූපෙහි කායසංඛාරෙහි කායස්ස ආනමනා විනමනා සනනමනා පනමනා ඉඤ්ජනා එජනා චලනා කම්පනා. පස්සම්භයං කායසංඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං කායසංඛාරං පස්සසිස්සාමීති සික්ඛති යථාරූපෙහි කායසං ඛාරෙහි කායස්ස න ආනමනා, න විනමනා, න සනනමනා, න පනමනා, අනිඤ්ජනා අථෙජනා අචලනා අකම්පනා සනනං සුඛුමං පස්සම්භයං කායසංඛාරං අස්ස සිස්සාමි පස්ස සිස්සාමීති සික්ඛතීති. ඉති කිර පස්සම්භයං කායසංඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං කායසංඛාරං පස්ස සිස්සාමීති සික්ඛති. එවං සතෙන වාතුපලද්ධියා ච පභාවනා න හොති. අස්සාසපස්සාසානං ච පභාවනා න හොති. ආනාපාණසතියා ච පභාවනා න හොති. ආනාපාණසති සමාධිස්ස ච පභාවනා න හොති. න ච නං තං සමාපත්තිං පණ්ඩිතා සමාපජ්ජන්තීපි වුට්ඨහන්තීපි. ඉති කිර පස්සම්භයං කායසංඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං කාය සංඛාරං පස්සසිස්සාමීති සික්ඛති. එවං සතෙන වාතුපලද්ධියා ච පභාවනා හොති. අස්සාසපස්සාසානං ච පභාවනා න හොති. ආනාපාණසතියා ච පභාවනා න හොති.

ආනාපාණසතිසමාධිස්ස ච පභාවනා හොති. තං ච නං සමාපත්තිං පණ්ඩිතා සමාපජ්ජන්තිපි වුට්ඨහන්තිපි.

යථාකථං විය?

සෙය්‍යථාපි කංසෙ ආකොට්ටිතෙ පඨමං ඔළාරිකා සද්දා පවත්තන්ති. ඔළාරිකානං සද්දානං නිමිත්තං සුග්ගහිතත්තා සුමනසිකතත්තා සුපධාරිතත්තා නිරුද්ධෙපි ඔළාරිකෙ සද්දෙ අථ පච්ඡා සුඛුමකා සද්දා පවත්තන්ති. සුඛුමකානං සද්දානං නිමිත්තං සුග්ගහිතත්තා සුමනසිකතත්තා සුපධාරිතත්තා නිරුද්ධෙපි සුඛුමෙකෙ සද්දෙ අථ පච්ඡා සුඛුමසද්ද නිමිත්තාරම්මණතාපි චිත්තං පවත්තති. එවමෙවං පඨමං ඔළාරිකා අස්සාස-පස්සාසා පවත්තන්ති. ඔළාරිකානං අස්සාස පස්සාසානං නිමිත්තං සුග්ගහිතත්තා සුමනසිකතත්තා සුපධාරිතත්තා නිරුද්ධෙපි ඔළාරිකෙ අස්සාස පස්සාසෙ අථ පච්ඡා සුඛුමකා අස්සාසපස්සාසා පවත්තන්ති. සුඛුමකානං අස්සාසපස්සාසානං නිමිත්තං සුග්ගහිතත්තා සුමනසිකතත්තා සුපධාරිතත්තා නිරුද්ධෙපි සුඛුමෙකෙ අස්සාසපස්සාසෙ අථ පච්ඡා සුඛුමඅස්සාස-පස්සාසනිමිත්තාරම්මණතාපි චිත්තං න විකෙඛපං ගච්ඡති. එවං සමෙන වාතූපලද්ධියා ච පභාවනා හොති, අස්සාසපස්සාසානං ච පභාවනා හොති, ආනාපාණ සතියා ච පභාවනා හොති, ආනාපාණසතිසමාධිස්ස ච පභාවනා හොති. තං ච නං සමාපත්තිං පණ්ඩිතා සමා-පජ්ජන්තිපි වුට්ඨහන්තිපි. පස්සම්භයං කායසංඛාරං. අස්සාස පස්සාසා කායෝ උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, කායෝ, උපට්ඨානං නො සති, සති උපට්ඨානං චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං කායං අනුපස්සති. තෙන වුච්චති කායෙ කායානුපස්සනා සතිපට්ඨාන භාවනාති"[1]

මෙහි සංක්ෂෙපපාඨ මෙසේ ය:-

"පස්සම්භයං කායසංඛාරං අස්සසිස්සාමීති සික්ඛති පස්සම්භයං කායසංඛාරං පස්සසිස්සාමීති සික්ඛති" යනු කෙසේ වේ ද

'මෙහි කායසංඛාර නම් දීඝ ආශ්වාස - ප්‍රශ්වාසයෝ ය. ඔවුහු කායික බැවින් කායප්‍රතිබද්ධ බැවින් කායසංඛාරය යි කියනු ලැබෙත්. යම් කායසංඛාරයෙකින් ශරීරය ඉදිරියට නැමීම් දෙපසට නැමීම් සැලීම් ආදී ක්‍රියා කෙරේ ද ඒ කායසංඛාර ඖදාරික කායසංඝාර ය. ඒ ඖදාරික කායසංඝාර

[1] පටි: ම: ආනාපාණසති කථා 183 බුරුම

සන්සිඳුවමින් ආශ්වාස – ප්‍රශ්වාස කරමි සි භික්මෙන්නේ ය. යම් කායසංස්කාරයෙකින් ශරීරය ඉදිරියට නැමීම් දෙපසට නැමීම් සැලීම් ආදි ක්‍රියා නො කෙරේ ද, ඒ කායසංස්කාර සූක්ෂ්ම කාය-සංස්කාර ය. ඒ සූක්ෂ්මකායසංස්කාර සන්සිඳුවමින් ආශ්වාස-ප්‍රශ්වාස කරමි සි භික්මෙන්නේ ය'

(**චෝදනාවෙකි**) එසේ නම් ආශ්වාස – ප්‍රශ්වාස වාතය අරමුණු කොටැ ගත් සිතෙක පැවැත්ම නො වේ. ආශ්වාස – ප්‍රශ්වාසයන්ගේ පැවැත්ම ද නො වේ. ආනාපාණසතියේ පැවැත්ම ද නො වේ. ආනාපාණසතිසමාධියේ පැවැත්ම ද නො වේ. එ බඳු සමාපත්තියකට පණ්ඩිතයෝ සමවැදීම ද නො කරති. නැඟී සිටීම ද නො කරති.

(**පරිහාර.**) එසේ ඇති කල්හි වාතය අරමුණු කොටැ ගත් සිතේ පැවැත්ම ද වේ. ආශ්වාස – ප්‍රශ්වාසයන්ගේ පැවැත්ම ද වේ. ආනාපාණසතියේ පැවැත්ම ද වේ. ආනාපාණසති සමාධියේ පැවැත්ම ද වේ. පණ්ඩිතයෝ ඒ සමාපත්තියට සමවැදීම ද කෙරෙති. නැඟී සිටීම ද කරත්.

එයට උපමා මෙසේ ය:- ලොහොං බඳුනකට තව්ටු කළ කල්හි පළමු කොටැ ඖදාරික හඬ නගී. ඒ අනු වැ සිත පවතී. ඖදාරික හඬ අඩු වූ කල්හි සියුම් හඬ පවතී. ඒ අනු වැ සිත ද පවතී. ඒ සියුම් හඬ නැති වැ ගිය කල්හි ද එය අරමුණු කොටැ සිත පවතී. එමෙන් පළමු කොටැ ඖදාරික ආශ්වාස – ප්‍රශ්වාස සන්සිඳුණු කල්හි සූක්ෂ්ම ආශ්වාස – ප්‍රශ්වාස අරමුණු කොටැ සිත පවතී. ඒ සන්සිඳුණු කල්හි ද එය අරමුණු කොටැ සිත පවතී. සෙස්ස පෙර කී සේය.

කායානුපස්සනා වශයෙන් දැක්වූ ප්‍රථම චතුෂ්කයාගේ අනුපූර්ව පද වර්ණනාව සි.

ආදිකම්මිකයාට කම්මට්ඨාන වශයෙන් වදාළේ මේ දැක්වුණු චතුෂ්ක සතර පමණෙකි. මතු දැක්වෙන චතුෂ්ක ත්‍රිකය මෙයින් ධ්‍යාන ලත් පුද්ගලයාගට වෙදනානුපස්සනා චිත්තානුපස්සනා ධම්මානුපස්සනා වශයෙන් වදාළේය. එ බැවින් මේ කම්මට්ඨානය වඩා ආනාපාණ චතුර්ථධ්‍යානය පදකම්ටාන කොටැ ඇති විදර්ශනායෙන් සිව් පිළිසිඹියා සමඟ අර්හත්වය ලබනු කැමැති ආදිකම්මිකයා විසින් පෙර කී සේ සිල් පිරිසිදු කැරැ ගැනීම් ආදි සියල්ල කොටැ යට කියූ පරිදි ආචාර්යවරයකු කරා එළඹැ උග්ගහ-පරිපුච්ඡා – උපට්ඨාන – අප්පණා – ලක්ඛණ යන සැඩි පසින් යුත් කම්මට්ඨානය උගත යුතු.

එහි:-

ගණනා නම් කම්මට්ඨාන ග්‍රන්ථය ඉගැන්ම ය.

පරිපුච්ඡා නම් අර්ථ ඉගැන්ම ය. නොහොත් ග්‍රන්ථ වශයෙන් අර්ථ වශයෙන් කම්මට්ඨාන ඉගැන්ම **ගණනා** ය. එහි සැක තැන් විචාරීම **පරිපුච්ඡා** යි.

උපට්ඨාන නම් මේ භාවනායෙහි යෙදෙන්නහුට මෙසේ නිමිත්ත උපදී ය යි වටහා ගැන්ම ය.

අප්පණා නම් මෙයින් මෙසේ ධ්‍යාන උපදීය යි දැනැ ගැන්ම ය.

ලක්ඛණ නම් කම්මට්ඨානයාගේ ලක්ෂණය. මේ කම්මට්ඨානය මෙ බඳු ලක්ෂණ ඇත්තේය යි කම්මට්ඨානයාගේ සවභාව දැනැ ගැන්ම ය යි සේ යි. ("ගණනා - අනුබන්ධනා - ඵුසනා යන මොවුන්ගේ වශයෙන් භාවනා වඩා ඵපනාවට පැමිණීම ද එයින් මතුයෙහි දු සල්ලක්ඛණාදි වශයෙන් මසතක ප්‍රාප්තිය ද යන කමටහන්හුගේ සවභාව සැලකීම ය" යනු සන්ත යි.)

මෙසේ පඤ්ච සන්ධික කම්මට්ඨානය ඉගන්නේ නම් තෙමේත් වෙහෙසට පත් නො වන්නේ ය. ආචාර්‍යයන් ද වෙහෙසට පත් නො කරන්නේ ය. එ බැවින් සවල්පයක් කියවා ගෙනැ බොහෝ වේලා සජ්ඣායනා කොටැ පඤ්ච සන්ධික කම්මට්ඨානය ඉගෙනැ ආචාර්‍යයන් සමීපයෙහි ම හෝ වෙන තැනෙක හෝ යට කී ආකාර සෙනසුනෙක වෙසෙමින් කුඩා පළිබොධ ද දුරු කොටැ පියා දහවල් බත් කිස නිමවා භත්තමුර්ච්ඡාව ද දුරු කොටැ ගෙනැ තෙරුවන් ගුණ සැලකීමෙන් සිත සතුටු කොටැ ආචාර්‍යයන් ඉගැන්වූ ක්‍රමයෙන් එක පදයකුදු විසමරණය නො කොටැ මේ ආනාපාණසති කම්මට්ඨානය මෙනෙහි කළ යුතු. ඒ මෙනෙහි කරන ක්‍රමය මෙසේ ය.

> "ගණනා අනුබන්ධනා
> ඵුසනා ඵපනා සල්ලක්ඛණා,
> විවට්ටනා පාරිසුද්ධි
> තෙසං ච පතිපස්සනා."[1]

ගණනය, අනුබන්ධනය, ඵුසනය, ඵපනය, සල්ලක්ඛණය, විවට්ටනය, පාරිසුද්ධිය, පතිපස්සනය යන මේ අට මෙනෙහි කළ යුතු පිළිවෙළ යි.

---

1 ස: පකාසිනී ආනාපාණවණ්ණනා 340

ගණන නම් ගණන් කිරීම ය, **අනුබන්ධන නම්** සිහිය **ආශ්වාස**-ප්‍රශ්වාස අනුව පැවැත්වීම ය, **ඵුසන නම්** ස්පර්ශ **කරන** තැන ය, **ඨපන නම්** අවිච්ඡින්න ය, **සල්ලක්ඛණ** නම් විදර්ශනා ය, **විවට්ටන නම්** මාර්ග ය, **පාරිසුද්ධි නම්** ඵල ය, **පතිපස්සන නම්** ප්‍රත්‍යවේක්ෂණ යි.

ගණන.

ආදිකර්මිකයා විසින් පළමු කොට ආශ්වාස – ප්‍රශ්වාස ගණන් කිරීමෙන් මේ කර්මස්ථානය මෙතෙහි කළ යුතු. ගණන් කරන කල්හි දු පසින් යට නො නැවැත්විය යුතු. දසයෙන් මතු නො ගෙනිය යුතු. එක, තුන, පහ යනාදි වශයෙන් අතර නො කැඩිය යුතු. පසින් යට නැවැත්තුව හොත් ඉඩ මද ගාලෙහි ගෙරිමුල සේ සම්බාධ අවකාශයෙහි සිත කැලඹෙයි. දසයෙන් මතු ගෙනැ ගිය හොත් සිත ගණනෙහි ම බැඳෙයි. අතර කඩ කළ හොත් කර්මස්ථානය මුදුන් පැමිණියේ දෝ හෝ නො පැමිණියේ දෝ හෝ යි සිත වංචල ඛවට පත් වෙයි. එ බැවින් එසේ දෙස් නො වන පරිදි ගණන් කළ යුතු. ගණන් කරන කල පළමු කොට දකුණ ගණනින් – වී මනින ගණනින් ගණන් කළ යුතු. වී මින්නා වියෙන් කුරුණ්ණිය පුරා එ-කැ-යි කියා මල්ලට දමයි. නැවැත කුරුණ්ණිය පුරවන අතර රොඩුවක් ඇත් නම් ඒ ඉවත දමමින් එකයි – එකයි – එකයි කියයි. දෙකයි – දෙකයි යනාදි වශයෙන් කියන්නේත් එසේ ය. මේ යොගියා විසිනු දු ආශ්වාස – ප්‍රශ්වාස අතුරෙන් යමක් වැටහුණේ නම් එය අරමුණු කොට ගෙනැ එකයි – එකයි. දෙකයි – දෙකයි. තුනයි – තුනයි යනාදි වශයෙන් දසය දක්වා වැටෙන වැටෙන ආශ්වාස – ප්‍රශ්වාස අරමුණු කොට ගණන් කළ යුතු. එසේ ගණන් කරන කල්හි නික්මෙන්නා වූ ද ඇතුළු වන්නා වූ ද ආශ්වාස – ප්‍රශ්වාස ප්‍රකට වෙයි. එසේ ප්‍රකට වූ කල්හි ඔහු විසින් ඒ දකුණ ගණන – වී මනින ගණන හැරැපියා යීසු ගණනින් – ගොපලු ගණනින් ගණන් කළ යුතු. දක්ෂ ගොපොල්ලා කැට ගල් ඔඩොක්-කුවෙහි ලා ගෙනැ රැහැන් කෙව්ටි ගෙනැ උදැසනක් සේ ගාලට ගොස් කෙව්ටෙන් ගවයන් පිට පහර දී නඟා පියා හිදිවර ටැම් මතුයෙහි හිඳැ දෙරට එන එන ගවයා එකයි – දෙකයි යනාදීන් කැට ගල් දම දමා ගණන් කරයි. රැ මුළුල්ලේ හකයෙහි දුක සේ උන් ගවයෝ නික්මැ එන්නෝ උනුත් ඇඟ ගටමින් වෙළෙව් වෙළෙව් වැ මුළු මුළු වැ නික්මෙති. නොපල්ලා ද වෙළෙව් වෙළෙව් වැ තුනයි — හතරයි — පහයි යනාදි වශයෙන්

ගණන් කරයි. එසේ ම මේ යොගි ද පෙර සේ ගණන් කරන් ම ආශ්වාස – ප්‍රශ්වාස ප්‍රකට වෑ වහ වහා නැවත නැවත හැසිරෙයි. ඉක්බිති ඔහු විසින් ආශ්වාස – ප්‍රශ්වාස නැවත නැවත හැසිරේ යයි දැනැ ඇතුළ පිට වදනා ආශ්වාස – ප්‍රශ්වාස නො ගෙනැ දෙරට පත් පත් ආශ්වාස – ප්‍රශ්වාස ම ගෙනැ එකයි– දෙකයි – තුනයී – හතරයි – පහයි – හයයි, එකයි – දෙකයි – තුනයි – හතරයි – පහයි – හයයි – හතයි, එකයි – දෙකයි–තුනයි– හතරයි – පහයි – හයයි – හතයි – අටයි – නවයයි – දහයයි කියා වහ වහා ගණන් කළ යුතු. කර්මස්ථානය මෙසේ ගණන පිළිබඳ වූ කල්හි ඒ ගණන් බලයෙන් ම සිත එකඟ බවට පත් වේ. සෑඩ වතුරේ රිවේ බලයෙන් නැව රැඳවීම මෙනි. මෙසේ වහ වහා ගණන් කරන් ම කර්මස්ථානය අතර නැති වෑ පවතින බව ඔහුට වැටහෙයි. එවිට ඔහු විසින් කර්මස්ථානය නිරන්තර ප්‍රවෘත්තය යි දැනැ ඇතුළ පිට වදනා වාතය අරමුණු නො කොටැ පෙර සේ ම වහ වහා ගණන් කළ යුතු. ඉදින් ඇතුළට පිවිසෙන වාතය හා සමග සිත ද ඇතුළු කෙළේ නම් ඇතුළ වාතයෙන් පහරන ලද්දක් මෙන් ද මේද තෙලින් පිරුණාක් මෙන් ද වේ. පිටතට නික්මෙන වාතය හා සමග සිත බැහැර කෙළේ නම් බැහැර නොයෙක් අරමුණුවල සිත දිවෙන්නේ වේ. එසේ නො කොටැ සූපශී කරන ලද නාසිකා අග මැ සිහිය පිහිටුවා භාවනා කෙළේ නම් භාවනාව සමෘද්ධ වේ. "ඇතුළ පිට වදනා වාතය අරමුණු නො කොටැ පෙර සේ ම වහ වහා ගණන් කළ යුතු" ය යි කියේ මේ නිසා ය. මෙසේ මේ ගණන් කිරීම් කෙතෙක් කල් කළ යුතු ද යම්තාක් කලෙකින් ගණන් කිරීම් නැති වෑ ආශ්වාස – ප්‍රශ්වාසාරම්මණයෙහි සිහිය පිහිටා ද ඒ තාක් කල් කළ යුතු ය. මේ ගණන් කිරීම කළ යුත්තේ බැහැර අරමුණු වල දිවෙන චිතක්ෂය නවත්වා සිහිය ආශ්වාස – ප්‍රශ්වාසාරම්මණයෙහි ම පිහිටුවනු සඳහා ය. මෙසේ ගණන් කිරීම් වශයෙන් මෙනෙහි කොටැ ඉක්බිති අනුබන්ධන වශයෙන් මෙනෙහි කළ යුතු ය.

අනුබන්ධනය.

අනුබන්ධන නම් ගණන් කිරීම නවත්වා සිහියෙන් නිතොර ආශ්වාස – ප්‍රශ්වාස අනු වැ යාම ය. ඒ අනු වැ යාම ද ආශ්වාස – ප්‍රශ්වාසයන්ගේ ආදි – මධ්‍ය – අවශාන අනු වැ යාම් වශයෙන් නො කළ යුතු ය. පිටත නික්මෙන වාතයේ ආදිය නැබ ය. මධ්‍යය හෘදය ය. අවශානය නාසිකාව ය. ඇතුළු වන වාතයේ ආදිය නාසිකා අගය. මධ්‍යය හෘදය ය. අවශානය

තැබය. ඒ අනු වැ ගියහොත් සිත වික්ෂෙප වැ දරථ පිණිස ද චංචල පිණිස ද වේ.

කියන ලද මැ යි:- **"අස්සාසාදීමජ්ඣුපේක්ඛනතා සතියා අනුගවජ්ජනතා අජ්ඣුත්තං විකෙඛපගතෙන චිතෙතන කායොපි චිත්තංපි සාරද්ධා ච හොතෙති. ඉඤ්ජිතා ච එඤ්ජිතා ච පස්සාසාදීමජ්ඣු පරියොසානං සතියා අනුගවජ්ජනතා බහිද්ධා විකෙඛපගතෙන චිතෙතන කායොපි චිත්තංපි සාරද්ධා ච හොතෙති. ඉඤ්ජිතා ච එඤ්ජිතා ච"**[1] යි. එබැවින් අනුබන්ධනයෙන් මෙතෙහි කරන විට ආදි, මධ්‍ය, අවශාන වශයෙන් මෙතෙහි නො කළ යුතු. එසේ නම් කෙසේ මෙතෙහි කළ යුතු ද **ඵුසන** වශයෙන් ද **ඨපන** වශයෙන් ද මෙතෙහි කළ යුතු. ගණන වශයෙන් අනුබන්ධන වශයෙන් මෙතෙහි කරන්නා සේ ඵුසන වශයෙන් ඨපන වශයෙන් වෙන වෙන ම මෙතෙහි කිරීමෙක් නැති. ආශ්වාස - ප්‍රශ්වාස සපශී **කළ** කැන් ගණන් කරන විට ගණන වශයෙන් ද ඵුසන වශයෙන් ද මෙතෙහි කෙළේ වේ. එහි මැ ගණන් කිරීම නවත්වා සමෘතියෙන් අනුබන්ධනය කරමින් අඵණා වශයෙන් සිත ඨපනය කළ විට අනුබන්ධන වශයෙන් ද, ඵුසන වශයෙන් ද, ඨපන වශයෙන් ද මෙතෙහි කෙළේ වෙයි. මේ අර්ථය පැහැදිලි කරනු සඳහා අටුවායෙහි පඬුල දෙවාරික උපමා ද, පටිසම්භිදායෙහි කකචූපමාව ද දක්වන ලද්දේ ය.

පඬුලෝපමාව.

ක්‍රීඩාකාම් මව් - පුත් දෙ දෙන හෝවිල්ලෙක නැඟැ සිටිති. පිළෙක් හෝවිල්ල පදවයි. හෝවිල්ල වරෙක ඔබ යයි වරෙක මොබ එයි. හේ හෝවිල්ල පදවා හෝවිල්ල බැඳි ටැම් මූල හිඳ ඔබ මොබ යන හෝවිලි පෝරුවේ දෙකොණ හා මැද බලයි. ඔහුට එසේ බැලීම සඳහා විශෙෂ උත්සාහයෙක් අවශ්‍ය නො වේ. අනායාසයෙන් ම සිද්ධවන බැවිනි. එසේ ම මේ යොගි ද සිහියෙන් උපනිබන්ධන ටැම් මූල හිඳ ආශ්වාස - ප්‍රශ්වාස හෝවිල්ල මෙහෙයා ඒ නිමිත්ත ම ගෙනැ සිහියෙන් උන්නේ ක්‍රමයෙන් නැහෙන වැටෙන ආශ්වාස - ප්‍රශ්වාසයන්ගේ ආදි- මධ්‍ය- අවශානය සපශීය කළ තන්හි ම සිහිය පිහිටුවා බලයි. ඒ බැලීම සඳහා ඔහුට විශෙෂ උත්සාහයෙක් නැත.

දෙවාරිකොපමාව.

දෙරටුපාලයා නුවර ඇතුළ පිට සිටියවුන් වෙත ගොස් 'තෝ කවරෙක් ද, කොයි සිට ආයෙහි ද, කොයි යන්නෙහි ද,

[1] පටි: ම: ආනාපාණසතිකථා 165 (බුරුම)

නා අත කිමෙක් ද" යි පරීක්ෂා නොකරයි. එසේ පරීක්ෂා කිරීම ඔහුට අයත් නො වේ. දෙරටුව කරා පැමිණි පැමිණියන් ම පරීක්ෂා කිරීම ය ඔහුට අයත්. එසේ ම මේ යොගිහට ද ඇතුළ වන් වාත ද බැහැර නියා වාත ද අරමුණු කිරීම අයත් නො වේ. නාසිකාග්‍රයට වන් වන් වාත අරමුණු කිරීම ම ය අයත්.

කකචොපමාව.

කකචූපමාව උපමෙයයෙහි පටන් මෙසේ දත යුතු. කියේ මැ යි.

"නිමිත්තං අස්සාසපස්සාසා – අනාරම්මණමෙකචිත්තස්ස
අජානතෝ ච තයෝ ධම්මා – භාවනාඋපලබ්භති.

නිමිත්තං අස්සාසපස්සාසා – අනාරම්මණමෙකචිත්තස්ස
ජානතෝ ච තයෝ ධම්මා – භාවනා උපලබ්භති"[1] යි.

'උපනිබන්ධන නිමිත්ත සංඛ්‍යාත නාසිකාග්‍රය ද, ආශ්වාස–ප්‍රශ්වාස ද එක සිතකට අරමුණු නොවන්නේ ය. ඒ තුන අරමුණු කිරීම වශයෙන් නො දනුත් හොත් භාවනා සිද්ධ නො වන්නේ ය' මේ වොදනාව ය. පරිහාර මෙසේ ය.

උපනිබන්ධන සංඛ්‍යාත නාසිකාග්‍රය ද, ආශ්වාස – ප්‍රශ්වාස ද එක් සිතකට අරමුණු නො වන්නේ ය. ඒ තුන අරමුණු කිරීම් වශයෙන් දනුත් හොත් භාවනාව සිද්ධ වන්නේ ය, මේ ගාථා අර්ථ යි. එම පැහැදිලි කරති.

කෙසේ මේ ධර්ම තුන එක් සිතකට අරමුණු නො වේ ද, කෙසේ අවිදිත නො වේ ද, කෙසේ සිත වික්ෂෙප නො වේ ද, කෙසේ භාවනා නිෂ්පාදක වූ වීර්‍යය පැනේ ද, කෙසේ භාවනානුයොගය සිද්ධ වේ ද, කෙසේ ලෞකික ලොකොත්තර විශෙෂයට පැමිණේ ද යන මේ ප්‍රශ්න කකචොපමාවෙන් ක්‍රමයෙන් විසඳනු ලැබේ.

සම බිමෙක තුබූ රුක් කදෙකි. වඩුවෙක් එය කියතින් ඉරන්නේ ය. ඉරන කල වඩුවාගේ සිහිය රදා පවත්නේ කියත් දැනි වදිනා තැන ය. ඔබ මොබ යන කියත් දැනි පිළිබඳ ඔහුගේ මෙනෙහි කිරීමෙක් නැත. එහෙත් ඔහුට ඒ යන – එන කියත් දැනි පිළිබඳ දැනීම නැත්තේ නො වේ. හැම කියත් දැනි ම එහි සපගී කරමින් යන – එන බැවිනි. මෙසේ ඒ වඩුවාගේ රුක් කඳ ඉරීමේ වීර්‍යය ද පෙනේ. කඳ ඉරීම් ක්‍රියාව ද සිද්ධ වේ. කඳ දෙකඩව යාම ද වෙයි.

---

[1]පටි: ම: ආනාපාණසතිකථා 169 (බුරුම)

සම බිම තුබූ රුක් කඳ මෙනි උපනිබන්ධන නිමිත්ත. (උපනිබන්ධන නිමිත්ත නම් නැහැ අග හෝ මූල නිමිත්ත ය.) කියන් දැනි මෙනි ආශ්වාස – ප්‍රශ්වාස. ඉරන කල වඩුවාගේ සිහිය කියන් දැනි වදිනා තැන රඳ පැවැත්ම මෙනි යොගිහුගේ සිහිය නැහැ අග හෝ මූල නිමිත්තේ රඳ පැවැත්ම. ඔබ මොබ යන කියන් දැනි පිළිබඳ මෙතෙහි කිරීමක් නැත්තා මෙනි ආශ්වාස – ප්‍රශ්වාස මෙතෙහි නො කිරීම. යන – එන හැම කියන් දැනි පිළිබඳ දැනීම ඇත්තා මෙනි යන – එන හැම ආශ්වාස–ප්‍රශ්වාස පිළිබඳ ම දැනීම ඇති බව. රුක් කඳ ඉරීමේ වීර්‍යය ඇති බව මෙනි කාය – චිත්ත කර්මණ්‍ය ඇති බව. කඳ ඉරීම් ක්‍රියාව සිඳ වීම මෙනි යොගිහුගේ උපක්ලේශ ප්‍රහාණය හා චිතකී ව්‍යපසම ය කඳ දෙකඩ වැ යාම මෙනි සංයොජන ප්‍රහාණය හා අනුශය ව්‍යන්තීභාව ය.

මෙසේ බලන් උපනිබන්ධන – ආශ්වාස – ප්‍රශ්වාස යන ධර්ම තුන එක සිතට අරමුණු වන්නේ නො වේ. එහෙත් මේ ධර්ම තුන එක සිතින් නො දන්නේ ද නො වේ. සිත වික්ෂේපයට යන්නේ ද නො වේ. ප්‍රධාන සංඛ්‍යාත වීර්‍ය ද පෙනෙ සි. භාවනානුයොගය ද සිඳ වේ. ලෞකික – ලෝකොත්තර විශෙෂයට ද පැමිණේ.

"ආනාපාණසති යඤ්ඤ – පරිපුණ්ණා සුභාවිතා
අනුපුබ්බා පරිචිතා – යථා බුද්ධෙන දෙසිතා
සෝ ඉමං ලෝකං පභාසෙති – අබ්භාමුත්තෝ'ව චන්දිමා."[1]

'යමකු විසින් බුදුන් වදාළ පරිදි මේ ආනාපාණසතිය සම්පූර්ණ–යෙන් භාවනා කරන ලද්දේ ද, පිළිවෙළින් පුරුදු කරන ලද්දේ ද හේ මේ ගැබින් නිකුත් පුන්සඳ සේ මේ ලොව ආලෝක කරන්නේ ය.'

මේ ය කකචොපමාව. මෙයින් ගත යුත්තේ ආ – ගිය වශයෙන් ආශ්වාස – ප්‍රශ්වාස මෙතෙහි නො කිරීම පමණ සි.

මෙසේ මේ කර්මස්ථානය මෙනෙහි කරන්ම කිසිවකුහට නොබෝ කලෙකින් ප්‍රතිභාග නිමිත්ත උපදනේ ය. අවශෙෂ චිතකාදි ධ්‍යානාඞ්ගයන්ගෙන් යුක්ත වූ අර්පණා සංඛ්‍යාත ඵලකාව ද සිඳ වන්නේ ය. විඛාපන් වූවකු ඇදෙක හෝ පුටුවෙක හෝ භිදිනා කල්හි ඇඳ හෝ පුටුව හෝ නැමෙ සි. ශබ්ද කෙරෙසි. ඇතිරි රැලි ගැසෙසි. විඛාපන් නුවූවකු භිදිනා කල්හි එසේ නො නැමෙසි, ශබ්ද නො කෙරෙසි; ඇතිරි රැලි නො ගැසෙසි.

[1]පටි: ම: ආනාපාණසංකථා 166 (බුරුම)

පුළුන් පිරූ සේ ඇඳ පුටු නිශ්චල වූ තිබෙයි. එමෙන් කිසිවකු-හට ගණන වශයෙන් මෙනෙහි කරන කාලයෙහි පටන් ඖදාරික ආශ්වාස - ප්‍රශ්වාස නිරුද්ධවීම් වශයෙන් කාය දරථ සන්සිඳෙයි. එසේ සන්සුන් කල්හි කය ද සිත ද සැහැල්ලු වෙයි. ශරීරය අහසෙහි නැඟී යන ආකාරයට පැමිණෙයි. ඔහුගේ ඖදාරික ආශ්වාස - ප්‍රශ්වාස නිරුද්ධ කල්හි සිත සූක්ෂ්ම වූ ආශ්වාස - ප්‍රශ්වාස නිමිත්ත අරමුණු කොටැ පවතී යි. එ ද නිරුද්ධ කල්හි මතු මතු එයට ද වඩා සියුම් වූ පසු එයට ද වඩා අතිශයයෙන් සියුම් වූ ආශ්වාස - ප්‍රශ්වාස අරමුණු කොටැ පවතියි. ලොකො හිරවූයෙකින් කස්තලට ගැසූ කල එකවරින් ම සිත මහත් ශබ්දය අරමුණු කොටැ පවතියි. ඒ නිරුද්ධ කල්හි ක්‍රමයෙන් සියුම් - සියුම් ශබ්දය අරමුණු කොටැ පවතියි. මේත් එ බදු ය යි දත යුතුයි.

අන්‍ය කර්මස්ථාන වඩත් - වඩත් මතු මතු විභූත වේ. මේ වනාහි එසේ නො වේ. මේ වඩත් වඩත් ක්‍රමයෙන් සියුම් වේ. අනාමයේ දී ආශ්වාස - ප්‍රශ්වාස ඇතැ යි යන වැටහීම ද නැති වේ. එසේ වූ කල්හි ඒ යොගි හුනස්නෙන් නැගී සම්කඩ ගසා දමා ගෙනැ නෑ යා යුතු. කුම් කළ යුතු ද, 'ආචාර්යයන් විවාරමි' යි හෝ 'මගේ කර්මස්ථානය නැති විණි' යි සිතා හෝ හුන් තැනින් නො නැගිය යුතු. ඉරියව් වෙනස් කළහොත් කර්මස්ථානය අළුත් - අළුත් ම වේ. එ බැවින් හුන් තැනැ ම හිඳ ගෙනැ පියොවින් පවත්නා දෙය වශයෙන් කර්මස්ථානය ඇති බව සිතට එළවා ගත යුතු. ("පූජ්‍යයෙන් තමා ඵූසන විසින් සලකන ලද තැන් එළවිය යුතු ය යන අර්ථයි.") කර්මස්ථානය ඇති බව සිතට එළවා ගන්නා ආකාරය මෙසේ ය. කර්මස්ථානය හෙවත් ආශ්වාස - ප්‍රශ්වාස නො වැටහෙන බව දැනුණු ඒ යොගී විසින් මේ ආශ්වාස - ප්‍රශ්වාස ඇත්තේ කොහි ද නැත්තේ කොහි ද ඇත්තේ කාහට ද නැත්තේ කාහට දැයි සැලකිය යුතු ය. එසේ සලකන්නහු විසින් මේ ආශ්වාස - ප්‍රශ්වාස මිව් කුස වසන්නවුන්ට ද, දියෙහි ගිලුණුවුන්ට ද, අසංඥිතල වැසි-යන්ට ද, මළවුන්ට ද, චතුර්ධ්‍යානයට සමවැදුණුවුන්ට ද, රූපා-රූප භවසමඟගිත්ට ද, නිරොධසමාපත්තියට සමවැදුණුවුන්ට ද නැත්තේ ය යි දත යුතු ය. එසේ දැනැ තමා ම තමා පිළිවිසිය යුතු. 'පණ්ඩිතය, තෝ කිම් දැන් මව් කුස වසන්නෙහි ද, නැත. දියෙහි ගිලුණෙහි ද, නැත. අසංඥියෙහි ද, නැත. මෙළෙහි ද, නැත. චතුර්ධ්‍යානයට සමවැදුණෙහි ද, නැත. රූපා-රූපභව සමඟගියෙහි ද, නැත. නිරෝධ සමාපත්තියට සම-වැදුණෙහි ද, නැත. එසේ නම් තට ආශ්වාස - ප්‍රශ්වාස තිබිය

යුතුම ය. නුවණ මඳ බැවින් කට ඇත්තා වූ ම එය දැනැ ගත නො හැකිය' යි මෙසේ දැනැ ඔහු විසින් පියොවින් පහස්නා තැන වශයෙන් සිත පිහිටුවා මෙතෙහි කළ යුතු ය. මේ ආශ්වාස-ප්‍රශ්වාස දික් නැහැ ඇත්තවුන්ට කාස් පුටයෙහි ගැටී පවතී. කොට නැහැ ඇත්තවුන්ට උඩු තොල ගැටී පවතී. එ බැවින් ඔහු විසින් මේ තැනැ ගැටෙමින් පවතී ය යි නිමිති ඵලවිය යුතු යි. **"නාහං භික්ඛවෙ මුට්ඨස්සතිස්ස අසම්පජානස්ස ආනාපාණ සතිභාවනං වදාමි"**[1] = 'මහණෙනි! මම නුවණ නැති මුළා සිහි ඇත්තහුට ආනාපාණසතිය නො කියමි' යි බුදුහු වදාළේ මේ අවස්ථාව ගෙනැ ය. කවර කමටහනක් හෝ සම්පාදනය වන්නේ සිහි නුවණ ඇත්තහුට ම ය. මේ හැර සෙසු කමටහන් මෙනෙහි කරත් - කරත් ප්‍රකට වන්නේ ය. මේ ආනාපාණය ගරු ය. භාවනාව ද ගරු ය. බුදු - පසේබුදු - බුදු පුත් වූ මහාසත්ත්වයන්ට ම මෙතෙහි කිරීමට තැන් ය. මේ ලාමක නො වේ. ලාමකයන් විසින් සෙවුනා ලද්දේ ද නො වේ. මෙතෙහි කළ - කළ තරමින් ශාන්ත වේ. සියුම් වේ. එ බැවින් මෙහි ලා බලවත්වූ ම සිහි නුවණ තිබිය යුතු ය. පට සළු හිදියම් කරන කල සියුම් වූ ම හිදි තිබිය යුතු ය. හිදි විදිනා කටුව එයට ද වඩා සියුම් විය යුතු ය. පටසළුවක් වැනි වූ මේ කමටහන භාවනා කරන කල හිදි වැනි වූ සිහිය ද හිදි විදිනා කටුව වැනි වූ නුවණ ද බලවත් ම විය යුතු ය. එ බඳු සිහි නුවණින් යුක්ත යොගි ඒ ආශ්වාස-ප්‍රශ්වාස පියොවින් පහස්නා තැන විනා අන් තැනෙක නො සෙවිය යුතු ය. සී සානා ගොව් සී සාලා ගොනුන් මුදා පියා ගොදුරට යවා තෙමේ සිහිල් සෙවනේ හිඳා විශ්‍රාම කරන්නේ ය. ගොන්නු වේගයෙන් ගොස් කැලේ වදිනි. ගොවියා නුවණැත්තෙක් නම් උන් නැවත සී සැමෙහි යොදවනු කැමැති වැ උන්ගේ පියවර පසු ගොස් කැලේ නැවිදියි. රැහැන් කෙවිටි ගෙනැ කෙළින් ම උන් පැන් බොන තොටට ගොස් එහි හිඳියි. ගොන්නු දහවල් ගොදුරු කා සවස් වන්නා ම පැන් තොටට ගොස් පැන් නා බී ගොඩ නැඟී සිටිනි. ගොවි එසේ උන්, උන් දැකැ රැහැනින් බැඳැ කෙවිටින් අණිමින් ගෙනවුත් යළි සී සැමෙහි යොදව යි. මේ යොගි භික්ෂු විසින් ද පියොවින් පහස්නා තැනැ මිස අන්තැනෙක ආශ්වාස - ප්‍රශ්වාස නො සෙවිය යුතු. සී රැහැන ද නුවණ කෙවිට ද ගෙනැ පියොවින් පහස්නා තැන ම සිත ඵලවා මනස්කාරය පැවැත්විය යුතු. එසේ මනසිකාර පවත්වත් ම පැන් තොට ගවයන් මෙත් ආශ්වාස - ප්‍රශ්වාස නො බෝ

[1]සං: නි: ආනාපාණ සං: 1015

කලෙකින් ලැබෙයි. එ විට සී රැහැනින් බැඳ එහි ම යොදා නුවණ කෙවිටින් විදිමින් පුන පුනා කම්මට්ඨානයෙහි යෙදිය යුතු. එ සේ යෙදෙන්නා ම නො බෝ කලෙකින් උද්ග්‍රහනිමිති පටිභාග නිමිති වැටහෙන්නේ ය. නිමිති වනාහි සියල්ලවුන්ට ම එක සමාන වැ වැටහෙන්නේ නො වේ. 'කිසිවකු හට සුව පහස් උපදවමින් හිඹුල් පුලුන් පෙද සේ ද, කපු පුළුන් පෙද සේ ද, වාතධාරා සේ ද වැටහේ' යනු සමහර ආචාර්‍යවරයන්ගේ මතය. අටුවායෙහි ආ විනිශ්චය මෙසේ ය. කිසිවකුහට මේ නිමිති තරු රූ සේ ද, මිණි ගුළි සේ ද, මුතු ගුළි සේ ද වැටහෙයි. කිසිවකුහට රළු පහස් ඇති වැ කපු ඇට සේ ද, දඹුහර හිදි සේ ද වැටහෙයි. කිසිවකුහට දික් හවඩි හූ සේ ද, මල්දම් සේ ද, දුම්සිලු සේ ද වැටහෙයි. කිසිවකුහට පළල් මකුළු හූ සේ ද, වලා පටල සේ ද, තෙළුම් මල් සේ ද, රිය සක් සේ ද, සඳ මඬුලු - හිරු මඬුලු සේ ද වැටහෙයි.

කුමක් හෙයින් එසේ නානා විධ වැ වැටහේ ද යත්:- සංඥා නානාත්වයෙන් එසේ නානාවිධ වැ වැටහෙයි. භික්ෂූහු කිප දෙනෙක් එක් තැන් වැ සූත්‍රාන්තයක් හදාරා හිඳිති. ඔවුන් අතුරෙන් එක් තමෙක් 'මේ තොපට කෙබඳු වැ වැටහුණේ දැ යි' විචාරයි. 'පණිතයෙනින් ගලා බස්නා මහත් ගඟක් මෙන් මට වැටහුණේ ය' යි ගේ කියයි. අනෙකෙක් 'මට එය වතුරාජියක් මෙන් වැටහුණේ ය' යි ද අනෙකෙක් 'සිහිල් සෙවන ඇති අතුපතරින් රැඳි පලඟරින් නැමුණු තුරක් මෙන් වැටහුණේ ය' යි ද කියයි. එක ම සූත්‍රාන්තය ඔවුනොවුන්ට තමන්ගේ ප්‍රඥා නානාත්වයෙන් නානාවිධ වැ වැටහෙයි. එ පරිද්දෙන් එක ම කම්මට්ඨානය ඔවුනොවුන් ගේ සංඥා නානාත්වයෙන් නානාවිධ වැ වැටහෙයි. මේ නිමිත්ත සංඥයෙන් උපදින්නේ ය. එය සංඥාව නිමිති කොටැ ඇත්තේ ය. සංඥාව ම ප්‍රභව කොටැ ඇත්තේ ය. මෙසේ සංඥා නානාත්වයෙන් නානාවිධ වැ වැටහේ ය යි දත යුතු.

මෙහි වනාහි ආශ්වාස අරමුණු කොටැ ඇති සිත අනෙකෙකි. ප්‍රශ්වාස අරමුණු කොටැ ඇති සිත අනෙකෙකි. නිමිත්ත අරමුණු කොට ඇති සිත අනෙකෙකි. මේ ධර්ම තුන තැත්තහුගේ කම්මට්ඨානය අර්පණොපචාරයන්ට නො පැමිණේ. ඇත්තහුගේ ම අර්පණොපචාරයට පැමිණේ. කියේ මැ යි:-

"නිමිත්තං අස්සාසපස්සාසා - අනාරම්මණමේකචිත්තස්ස
අජානතෝ ච තයො ධම්ම - භාවනා නූපලබ්භති.
නිමිත්තං අස්සාසපස්සාසා - අනාරම්මණමේක චිත්තස්ස
ජානතෝව තයො ධම්ම - භාවනා උපලබ්භති"[1] යි.

අර්ථ යට කියන ලද මැ යි.

[1]පටි: ම: ආනාපාණසතිකථා 169 (බුරුම)

මෙසේ නිමිති ලත් යොගී විසින් ආවර්ජනීයත් කරා එළඹෑ "මට මේ බඳු නිමිත්තයෙක් පෙනේ" ය සි කිය යුතු. ආවර්ජනීයත් විසින් ද, මේ නිමිත්ත ය සි කියා හෝ නො නිමිත්තය"සි කියා හෝ නො කියා "ඇවැත්නි! එ බන්දෙක් වන්නේ ය" සි කියා "නැවත නැවත මෙතෙහි කරව" සි කිය යුතු. නිමිත්තය සි කීයේ නම් එසින් ම අවසානයට පැමිණෙන්නේ ය. ("උපදනුවට දුෂ්කර වූ නිමිත්ත ලබන ලද. එ බැවින් යම් යම් කලෙක විශෙෂය උපදවම් සි. සංකොචයට පැමිණේ") නිමිත්ත නො වේ ය සි කීයේ නම් එසින් ම ආසා කඩ වැ පසු බැසීමට පැමිණෙන්නේ ය. ("මෙ තෙක් කල් භාවනායෙහි යෙදෙනුවහට නිමිති පමණෙක් පවා නො උපන විශෙෂ ලාභයට අභව්‍ය වෙම් සි විෂාදයට පැමිණේ") මේ දීඝභාණකයන්ගේ මතය සි. මධ්‍යම භාණකයෝ "ඇවැත්නි! මේ නිමිත්ත සි. කමටහන පුන පුනා මෙතෙහි කරව සි කිය යුතුය"සි කියති. මේ විට ඔහු විසින් නිමිත්තයෙහි ම සිත පිහිටවිය යුතු. මෙ තැන් පටන් ඔහුට අනුබඳින වශයෙන් ඵුසන වශයෙන් මනසිකාරය හැර පියා ඵපන වශයෙන් භාවනාව වන්නේය. කීයේ මෑ සි පෙරාණිකයන් විසින්:-

"නිමිත්තෙ ඵපයං චිත්තං - නානාකාරං විභාවයං
ඨිතෙ අස්සාසපස්සාසෙ - සකං චිත්තං නිබන්ධති"[1] සි.

'ප්‍රතිභාග නිමිත්තයෙහි සිත පිහිටුවමින් ආශ්වාස-ප්‍රශ්වාසයෙහි නානාකාරය විභාවනා කරමින් නුවණැත්තේ සවකිය චිත්තය අර්හණාවට පමුණුවන්නේ ය, යනු එහි අර්ථ සි. මෙ සේ ද අර්ථ දිය හැකි ය.

'නුවණැති යොනි ආශ්වාස - ප්‍රශ්වාස නානාප්‍රකාරයෙන් ප්‍රකට කරමින් හෙවත් ඔඉදුරික සන්සිදුවමින් එහි ලත් ප්‍රතිභාග නිමිත්තෙහි සිත පිහිටුවමින් සිය සිත ක්‍රමයෙන් අර්හණාවට පමුණුවන්නේ ය.'

මෙසේ ප්‍රතිභාග නිමිති ලත් තැන් පටන් ඔහුගේ නීවරණ විෂ්කම්භිත වන්නේ ය. කෙලශ සන්සිදෙන්නේ ය. සිහිය එළඹ සිටින්නේ ය. සිත උපචාර සමාධියෙන් සමාහිත වන්නේ ය. එවිට ඔහු විසින් ඒ නිමිත්ත වණී වශයෙන් මෙනෙහි නො කට යුතු ය. ලක්ෂණ වශයෙන් ප්‍රත්‍යවෙක්ෂා නො කට යුතු ය. ක්ෂත්‍රිය මහිෂියක් සක්විති දරු ගැබ සේ ද, ගොවියකු හැල් - යව ගැබ සේ ද ආවාසාදි සත් අසපපාය දුරු කොට එම ආවාසාදි සත් සපපාය සෙවීමින් සකසා රක්ක යුතු ය. එසේ රැක නැවත නැවත මෙනෙහි

[1] ස: පකාසිනී ආනාපාණ: ව: 344

කිරීම් වශයෙන් වඩා දශවිධ අභිඤ්ඤා කෞශල්‍යය සැපයිය යුතු. වීර්‍ය්‍ය සමතිය යෙදිය යුතු. එසේ උත්සාහ කරන්නා ම යට පඨවි කසිණයෙහි කියේ එම නිමිති කොටැ චතුෂ්ක-පඤ්චක ධ්‍යාන උපදින්නේ ය.

චතුෂ්ක - පඤ්චක ධ්‍යාන උපදවා ගත් යොගි සලලකඛණ, විවට්ටන වශයෙන් කමටහන් වඩා පාරිශුද්ධියට පැමිණියැටියේ නම් ඒ ධ්‍යානය ම පඤ්ච වශීතායෙන් වශප්‍රාප්ත කොටැ ගෙතැ නාම - රූප ව්‍යවස්ථා කොටැ විදර්ශනා වඩන්නේ ය.

කෙසේද යත්:- ගේ සමවතින් නැගී ආශ්වාස - ප්‍රශ්වාස-යන්ගේ සමුදය කරජකය හා සිතය යි දැනැ ගන්නේ ය. කඹුරු හම සුළං ගන්වන කල්හි සම ද, පුරුෂොත්සාහය ද නිසා වාතය පවත්නා සේ කය හා සිත නිසා ආශ්වාස - ප්‍රශ්වාස පවත්නේය යි දත යුතු. ඉක්බිති ආශ්වාස - ප්‍රශ්වාස හා කය රූපය යි ද, සිත හා තත්සම්ප්‍රයුක්ත ධර්ම අරූපය යි ද ව්‍යවස්ථා කරන්නේ ය. මේ මෙහි සංක්ෂේපය යි. (විස්තර මතු දිට්ඨිවිසුද්ධි නිද්දේශයෙහි බලනු.) එසේ නාම - රූප ව්‍යවස්ථා කොටැ ඒ නාම - රූපයන්ගේ ප්‍රත්‍යය සොයන්නේ ය. සොයා ඒ ප්‍රත්‍යය දැනැ තුන් කල්හි ඒ පිළිබඳ පැවැත්මේ සැකය දුරු කරන්නේ යැ. එසේ සැක දුරු කොටැ කලාප සම්මර්ශන වශයෙන් තිලකුණු නහා උදයබ්බයානුපස්සනාවට පූර්භාගයෙහි උපන් ඔභාසාදි දශ විදර්ශනොපක්ලේශයන් දුරු කොටැ උපක්ලේශයෙන් මිදුණු පටිසම්භිදා මාර්ගඥානය මාර්ගය යි ව්‍යවස්ථා කොටැ උදය හැර පියා භඞ්ගානුපස්සනාවට පැමිණැ නිරතුරු භඞ්ගානුපස්සනායෙන් භය වශයෙන් වැටහී ගිය සියලු සංස්කාරයන් කෙරෙහි නිර්වේදයට පැමිණැ එයින් විරාගයට පැමිණැ කෙලෙසුන් කෙරෙන් මිදෙන්නේ පිළිවෙළින් සෝවාන් ආදි සතරමාගී - ඵලයන්ට පැමිණැ අතීත් ඵලයෙහි සිටැ එකුන්විසි ප්‍රත්‍යවෙක්ෂණ ඥානයන්ගේ පර්‍යන්ත ගත වැ සදෙවක ලොකයෙහි අග්‍ර දක්ෂිණාර්හ වන්නේය.

මෙතෙකින් ගණනා ආදි කොටැ ඇති පතිපස්සනා අවසන් කොටැ ඇති ආනාපාණසතිසමාධි භාවනා නිමියේ ය.

ප්‍රථම චතුෂ්ක වර්ණනාව ඉය.

සෙසු චතුෂ්කත්‍රිකයෙහි වෙන් වෙන් වශයෙන් කිය යුතු කම්මට්ඨාන භාවනා ක්‍රමයෙක් නැති. ප්‍රථම චතුෂ්ක වශයෙන් ලැබැ ගත් ධ්‍යාන ඇතියහට වේදනා - චිත්ත - ධම්මානුපස්සනා වශයෙන් එය ලැබෙන බැවිනි. එ බැවින් ඔවුන් පිළිබඳ අනුපද වර්ණනාමාත්‍රයෙක් මෙහි දක්වනු ලැබේ.

මිතිය චතුෂ්කය.

1 "පීතිපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති
පීතිපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති.

2 සුඛපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති
සුඛපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති

3 චිත්තසංඛාරපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති
චිත්තසංඛාරපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති

4 පස්සම්භයං චිත්තසංඛාරං අස්සසිස්සාමීති සික්ඛති
පස්සම්භයං චිත්තසංඛාරං පස්සසිස්සාමීති සික්ඛති"

1 ප්‍රීතිය දනිමින් – ප්‍රකට කැරැ ගනිමින් ආශ්වාස – ප්‍රශ්වාස කරන්නෙමි යි භික්ෂූන්නේ ය. එහි ප්‍රීතිය දැනීම ප්‍රකට කැරැ ගැනීම **ආරම්මණ** වශයෙන් ද, **අසම්මෝහ** වශයෙන් ද යන දෙ ආකාරයෙකින් සිදු වේ, ආරම්මණ වශයෙන් ප්‍රීතිය ප්‍රකට කැරැ ගන්නේ මෙසේ ය. යමෙක් ප්‍රීතිසහගත ධ්‍යානඥයට හෙවත් ප්‍රථම – දවිතීය ධ්‍යානයන්ට සමවදී ද, හේ සමාපත්ති ක්ෂණයෙහි ධ්‍යාන ලැබීමෙන් ආරම්මණ වශයෙන් ප්‍රීතිය දන්නේ – ප්‍රකට කැරැ ගන්නේ වේ. ආරම්මණය ප්‍රීති පටිසංවිදිත බැවිනි: ("යම් සේ සප්‍රී පයෝජන ක න්නහු විසින් ඒ සප්‍රීයා වසන තුඹස දුටු කල්හි සප්‍රී දක්නා ලදම නම් වේ ද, ගෘහීත නම් වේ ද, මනස්කාරද බලයෙන් ගන්නට පිළිවන් වන්නේ ද, එසේ ම ප්‍රීතියට ආසන්න වූ ආලම්බනය දත් කල්හි ප්‍රීතිය ද දන්නා ලදම නම් වේ. සවලක්ෂණ සාමාන්‍ය ලක්ෂණ වශයෙන් ප්‍රීතිය ගන්නට සුව බැවිනි" යනු සන්න යි.)

අසම්මෝහ වශයෙන් ප්‍රීතිය දන්නේ = ප්‍රකට කැරැ ගන්නේ මෙසේ ය:– ප්‍රීතිසහගත ධ්‍යාන ද්වයයට හෙවත් ප්‍රථම දවිතීය ධ්‍යානයන්ට සමවැදූ එයින් නැගී ධ්‍යාන සම්ප්‍රයුක්ත ප්‍රීතිය ක්ෂය – ව්‍යය වශයෙන් සම්මර්ශනය කෙරේ ද, එ විට විදර්ශනා ක්ෂණයෙහි ලක්ෂණ ප්‍රතිවේධයෙන් අසම්මෝහ වශයෙන් ප්‍රීතිය දන්නේ – ප්‍රකට කැරැ ගන්නේ වේ.

කියන ලදමැ යි:

පටිසම්භිදායෙ –

"දීඝං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතෝ සති උපට්ඨිතා හොති. තාය සතියා තෙන ඤාණෙන සා ප්‍රීති පටිසංවිදිතා හොති. දීඝං පස්සාසවසෙන –පෙ– රස්සං අස්සාසපස්සාසවසෙන සබ්බකායපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන පස්සම්භයං කායසංඛාරං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතෝ සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන සා

පීති පටිසංවිදිතා හොති. ආවජ්ජනතෝ සා පීති පටිසංවිදිතා හොති. ජානනතෝ, පස්සනතෝ, පච්චවෙක්ඛනතෝ, චිත්තං අධිට්ඨානතෝ, සද්ධාය අභිමුච්චනතෝ, විරියං පග්ගණ්හනතෝ, සතිං උපට්ඨාපයතෝ, චිත්තං සමාදහනතෝ, පඤ්ඤාය පජානනතෝ, අභිඤ්ඤෙය්‍යං පරිඤ්ඤෙය්‍යං පහාතබ්බං භාවෙතබ්බං සච්ඡිකාතබ්බං සච්ඡිකරොනතෝ, සා පීති පටිසංවිදිතා හොති. එවං සා පීති පටිසංවිදිතා හොතී''[1] යි.

'දීර්ඝ කොටැ ආශ්වාස කිරීම් වශයෙන්, ප්‍රශ්වාස කිරීම් වශයෙන්, ආශ්වාස-ප්‍රශ්වාස කිරීම් වශයෙන්; හ්‍රස්ව කොටැ, සඛ්ඛකාය පටිසංවෙදී වැ, කාය සංස්කාර සංසිඳුවමින් ආශ්වාස කිරීම් වශයෙන්, ප්‍රශ්වාස කිරීම් වශයෙන්, ආශ්වාස-ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තෙකාග්‍රතා සංඛ්‍යාත අවික්ෂේපය දක්නාහට සිහිය එළඹ සිටියේ වෙයි. ඒ සිහියෙන් ඒ ඥනයෙන් ප්‍රීතිය ප්‍රකට කොටැ දන්නේ වෙයි. ආවර්ජනය කරන්නාහට, විදර්ශනාඥනයෙන් තිලකුණු ආරොපණය කොටැ දන්නාහට, දක්නාහට, ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට ප්‍රීතියෙහි විදර්ශනා චිත්තය පිහිටුවන්නාහට, ශ්‍රද්ධායෙන් අදහන්නාහට, වීර්‍යය හුවන්නාහට, සිහිය එළවන්නාහට, සිත එකඟ කරන්නාහට, විදර්ශනා ඥනයෙන් මනාව දක්නාහට අභිඥෙය-පරිඥෙය-ප්‍රහාතව්‍ය - භාවිතව්‍ය - සාක්ෂාත් කරණීය, සාක්ෂාත් කරන්නාහට සිහිය එළඹ සිටියේ වෙයි. ඒ සිහියෙන් ඒ ඥනයෙන් ඒ ප්‍රීතිය ප්‍රකට කොට දන්නේ වෙයි. මෙසේ ඒ යොගී ප්‍රීතිය ප්‍රකට කොටැ දන්නේ නම් වෙයි' යනු එහි සංක්ෂිප්ත අර්ථ යි.

මේ ක්‍රමයෙන් සෙස්ස ද අර්ථ වශයෙන් දත යුතු යි. විශෙෂ පමණක් මතු දක්වනු ලැබේ.

2 - 3. ප්‍රථම - දවිතීය - තෘතීය ධ්‍යානයන්ගේ වශයෙන් සුඛ පටිසංවෙදී බව ද, චතුර් ධ්‍යානයන්ගේ වශයෙන් චිත්ත සංඛාර පටිසංවෙදී බව ද දත යුතු. මෙහි චිත්තසංඛාර නම් වෙදනා සඤ්ඤා හා සංඥසඤ්ඤි. **පටිසම්භිදායෙහි** වනාහි සුඛ පටිසංවෙදි යන පදයෙහි විදර්ශනා භූමි දක්වනු සඳහා **''සුඛං නි මෙ සුඛානි කායිකං ච සුඛං චෙතසිකං ච''**[2] යි වදාළේ යි.

4. **''පස්සම්භයං චිත්තසංඛාරං''** ඕළාරික- ඕළාරික චිත්තසංස්කාර සංසිඳුවන්නේ නිරුඬ කරන්නේ යනු අර්ථ යි. එහි විස්තර ඝට කාය සංස්කාරයෙහි කී පරිදි දත යුතු.

තවද මේ චතුෂ්කයෙහි **''පීතිපටිසංවෙදී''** යන පදයෙහි ප්‍රීති ශීර්ෂයෙන් වෙදනාව කියන ලද්දේ ය. **''සුඛපටිසංවෙදී''** යන පදයෙහි සවරූපයෙන් ම වෙදනාව කියන ලද්දේ ය. සෙසු චිත්තසංඛාර දෙ පදයෙහි **''සඤ්ඤා ච වෙදනා ච චෙතසිකා**

---

[1] පටි; ම: ආනාපාණසතිකථා 185 (බුරුම)

[2] ,, ,, ,, 186 ,,

එතෙ ධම්මා චිත්තපටිබද්ධා චිත්තසංඛාරා'' යි කී හෙයින් සංඥ සම්ප්‍රයුක්ත වූ වෙදනාව කියන ලද්දේ ය. මෙසේ වෙදනානුපස්සනා වශයෙන් මේ චතුෂ්කය වදාළ බැව් දත යුතු යි.

තෘතීය චතුෂ්කය

1.	**චිත්තපටිසංවෙදී**	**අස්සසිස්සාමීති**	**සික්ඛති**
	,,	**පස්සසිස්සාමීති**	,,
2.	**අභිප්පමොදයං චිත්තං**	**අස්සසිස්සාමීති**	,,
	,,	**පස්සසිස්සාමීති**	,,
3.	**සමාදහං චිත්තං**	**අස්සසිස්සාමීති**	,,
	,,	**පස්සසිස්සාමීති**	,,
4.	**විමොචයං චිත්තං**	**අස්සසිස්සාමීති**	,,
	,,	**පස්සසිස්සාමීති**	,,

1. මෙහි චිත්තපටිසංවෙදිතාව හෙවත් සිත මොනවට දන්නා බව සතර වැදෑරුම් ධ්‍යාන සිත් වශයෙන් දත යුතු.

2. සිත අභිප්‍රමෝද කරමින් හෙවත් ධ්‍යාන සම්ප්‍රයුක්ත චිත්තය තත් සම්ප්‍රයුක්ත ප්‍රීති සම්බොධ්‍යඞ්ග වූ ධ්‍යාන ප්‍රීතියෙන් සතුටු කරමින් ආශ්වාස – ප්‍රශ්වාස කරන්නෙමි යි භික්මෙන්නේ ය. මෙහි අභිප්‍රමෝද කිරීම සමාධි වශයෙන් ද, විදර්ශනා වශයෙන් ද යන දෙ ආකාරයෙකින් වේ. ප්‍රීතිසහගත ධ්‍යානඳුයට සමවැදී ඒ සමවන් ඇසිල්ලෙහි තත් සම්ප්‍රයුක්ත ප්‍රීතියෙන් සිත සතුටු කරන්නේ ධ්‍යාන වශයෙන් සිත අභිප්‍රමෝද කරන්නේ වේ. ප්‍රීතිසහගත ධ්‍යානඳුයට සමවැද එයින් නැගී ධ්‍යාන සම්ප්‍රයුක්ත ප්‍රීතිය ක්ෂය-ව්‍යය වශයෙන් සම්මර්ශනය කරන්නේ විදර්ශනා වශයෙන් චිත්තය අභිප්‍රමෝදය කරන්නේ වේ. මෙසේ දෙ ආකාරයෙන් සිත අභිප්‍රමෝදය කරමින් ආශ්වාස – ප්‍රශ්වාස කරමියි භික්මෙන්නේය යි කී සේ ය.

3. ප්‍රථම ධ්‍යානාදි වශයෙන් සිත අරමුණෙහි සම කොටැ පිහිටුවමින් ආශ්වාස කරන්නෙමි යි භික්මෙන්නේ ය. මේ සමාධි වශයෙනි. (යම් සේ මදකුදු ලීන පක්ෂයට – ඖද්ධත්‍ය පක්ෂයට නොගොස් අවනත උන්නාත නොවැ ඉන්ද්‍රියයන්ගේ සමත්වයට පැමිණීමෙන් විසම නොවේ ද, එසේ සම කොටැ තබන්නේ, සමාධිහුගේ හෝ උනකම්යට යාමෙන් අවල බවට පැමිණි හෙයින් මතා කොට සිටියේ ද, එසේ අවීණ වශයෙන් තබන්නේ යන අර්ථ යි'' යනු සන්නයි) නොහොත් ප්‍රථම ධ්‍යානාදියට සමවැද එයින් නැගී ධ්‍යාන සම්ප්‍රයුක්ත චිත්තය ක්ෂය ව්‍යය වශයෙන් බලත් ම විදර්ශනා ක්ෂණයෙහි අනිත්‍යාදි ලක්ෂණ

ප්‍රතිවේධ වශයෙන් යම් ක්ෂණික චිත්තෙකාග්‍රතාවෙක් උපදී ද ඒ වශයෙන් සිත අරමුණෙහි සම කොටැ පිහිටුවමින් ආශ්වාස-ප්‍රශ්වාස කරන්නෙමි සි භික්මෙන්නේ ය. මේ විදර්ශනා වශයෙනි. (ක්ෂණික සමාධිය ද අරමුණෙහි නිරන්තරයෙන් එකාකාරයෙන් පවත්නේ ප්‍රතිපක්ෂයන් විසින් අනභිභූත බැවින් අර්පිතයක්හු මෙන් සිත්හු නිශ්චල කොටැ සිටුවා" යනු සත්තසි.)

4. ප්‍රථම ධ්‍යානයෙන් නීවරණ කෙරෙන් සිත මුදමින්, දවිතීය ධ්‍යානයෙන් විතර්ක - විචාර කෙරෙන් සිත මුදමින්, තෘතීය ධ්‍යානයෙන් ප්‍රීතිය කෙරෙන් සිත මුදමින්, චතුර්ථ ධ්‍යානයෙන් සුඛ - දුඃඛ කෙරෙන් සිත මුදමින්, ආශ්වාස - ප්‍රශ්වාස කරන්නෙමි සි භික්මෙන්නේ ය. (මේ සමාධි වශයෙනි.) නොකොත් ඒ ප්‍රථම ධ්‍යානයන්ට සමවැදූ එසින් නැගී ධ්‍යාන සම්ප්‍රයුක්ත චිත්තය ක්ෂය-ව්‍යය වශයෙන් සම්මර්ශනය කරයි. එසේ සම්මර්ශනය කරන යොගි විදර්ශනාක්ෂණයෙහි අනිච්චානුපස්සනායෙන් නිත්‍ය සංඥයෙන් ද, දුක්ඛානුපස්සනායෙන් සුඛ සංඥයෙන් ද, අනත්තානුපස්සනායෙන් ආත්ම සංඥයෙන් ද, නිබ්බිදානුපස්සනායෙන් නන්දියෙන් ද, විරාගානුපස්සනායෙන් රාගයෙන් ද, නිරෝධානුපස්සනායෙන් සමුදයයෙන් ද, පටිනිස්සග්ගානුපස්සනායෙන් ආදානයෙන් ද සිත මුදමින් ආශ්වාස - ප්‍රශ්වාස කරන්නේ ය. "විමොචයං චිත්තං අස්සසිස්සාමි පස්සසිස්සාමීති සික්ඛති" සි. එ හෙයින් වදාළේ ය. මෙසේ හෙයින් චිත්තානුපස්සනා වශයෙන් මේ චතුෂ්කය වදාරන ලද්දේ ය සි දතයුතු සි.

චතුර්ථ චතුෂ්කය.

1.	"අනිච්චානුපස්සී	අස්සසිස්සාමීති	සික්ඛති
	,,	පස්සසිස්සාමීති	,,
2.	විරාගානුපස්සී	අස්සසිස්සාමීති	,,
	,,	පස්සසිස්සාමීති	,,
3.	නිරෝධානුපස්සී	අස්සසිස්සාමීති	,,
	,,	පස්සසිස්සාමීති	,,
4.	පටිනිස්සග්ගානුපස්සී	අස්සසිස්සාමීති	,,
	,,	පස්සසිස්සාමීති	,,

1. අනිත්‍යය සි දක්මින් ආශ්වාස කරන්නෙමි, ප්‍රශ්වාස කරන්නෙමි සි. භික්මෙන්නේ ය. මෙහි ලා අනිත්‍ය කිම? අනිත්‍යතාව කිම? අනිත්‍යය සි දැක්ම කිම? අනිත්‍යය සි

දක්ෂේ කවරේ ද, යනු දත යුතු. **එහි අනිත්‍ය නම් පඤ්චුපාදානක්ඛන්ධයි.** කුමක් හෙයින් ද උත්පාද, ව්‍යය, **අත්‍යථාභව** යන මෙයින් යුක්ත බැවිනි. ("එහි ප්‍රත්‍යයසමුත්පන්න ධර්මයන්ගේ හෙතු ප්‍රත්‍යයයෙන් උත්පත්තිය – අහුත්වා සම්භවය – **ආගම** ලාභය උත්පාද නම. උත්පන්න වූ ඒ ධර්මයන්ගේ නිරෝධය–විනාශය ව්‍යය නම. ජරායෙන් අන්‍යථාභාවය **අත්‍යථාභව** නම්. යම් සේ උත්පාදවස්ථායෙන් භින්න වූ භඞ්ගාවස්ථායෙහි වස්තු භෙදය නැද්ද, එසේ ම සජීවී සංඛ්‍යාත වූ භඞ්ගාභිමුඛාවස්ථායෙහි ද වස්තු භෙදය නැති. එහි ජරා ව්‍යවහාරය වෙයි දත්තේ" යනු සන්තයි.) **අනිත්‍යතා නම්** ඒ පඤ්චුපාදානස්කන්ධයන් ගේ ම උත්පාද ව්‍යය අන්‍යථාභවය යි. ("යම් **ලක්ෂණයන්** තුන් දෙනෙකුන්ගේ සද්භාවයෙන් සඤ්ඤයන් කෙරෙහි අනිත්‍ය සංඥාව වේ ද ඒ **ලක්ෂණත්‍රය** අනිත්‍ය නම් වේ" යනු සන්තයි.) ඉපිදෑ නැතිවීම, උපන් දේ ඒ උපන් ආකාරයෙන් නො තිබී **ක්ෂණ** භඞ්ගයෙන් බිඳී යාම් **අනිත්‍යතාව** යැ යි සේ යි. **අනිත්‍යය යි දක්ම නම්** ඒ ක්ෂණ භඞ්ග සංඛ්‍යාත අනිත්‍යතාවගේ වශයෙන් රූපාදි ධර්මයන් කෙරෙහි අනිත්‍යය යි බැලීම යි. **අනිත්‍යය යි දක්නේ නම්** එසේ බලන යොගාවචර යි. මෙසේ අනිත්‍යය යි දක්මින් ආශ්වාස – ප්‍රශ්වාස කරන්නේ **"අනිච්චානුපස්සී අස්සසිස්සාමී පස්සසිස්සාමීති සික්ඛති"** යි වේ.

2. විරාගය දක්මින් ආශ්වාස කරන්නෙමි, ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය. මෙහි ලා ක්ෂය විරාගය, අත්‍යන්ත විරාගය යි විරාග දෙවිධ ය. ක්ෂය විරාග නම් සංස්කාරයන්ගේ ක්ෂණ භඞ්ගය. අත්‍යන්ත විරාග නම් නිර්වාණ ය. **විරාගානුපස්සනා** නම් ඒ ක්ෂය විරාග, අත්‍යන්ත විරාග වශයෙන් පැවැති විදර්ශනාව හා මාර්ගය යි. ඒ දෙ වැදෑරුම් අනුපස්සනායෙන් යුක්ත වූ ආශ්වාස – ප්‍රශ්වාස කරන්නේ **"විරාගානුපස්සී – පෙ – සික්ඛති"** යි වේ. (ක්ෂය විරාගානුපස්සනා වශයෙන් විදර්ශනාවගේ ද අත්‍යන්ත විරාගානුපස්සනා වශයෙන් මාර්ගයාගේ ද ප්‍රවෘත්තිය යෙදිය යුතු" යනු සන්තයි.)

3. නිරෝධය දක්මින් ආශ්වාස – ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය. මෙහි අපි විරාගානුපස්සනායෙහි මෙනි. (ක්ෂය නිරෝධ, අත්‍යන්ත නිරෝධය යි නිරෝධ දෙවිධ ය. ක්ෂය නිරෝධ නම් සංස්කාරයන්ගේ **ක්ෂණ** භඞ්ගය. අත්‍යන්ත නිරෝධ නම් නිර්වාණය. ක්ෂය නිරෝධයෙන් විදර්ශනාව ද අත්‍යන්ත නිරෝධයෙන් මාර්ග ද කීය.)

4. පටිනිස්සඟඨය දක්මින් ආශ්වාස කරන්නෙමි ප්‍රශ්වාස කරන්නෙමි යි භික්මෙන්නේ ය. **පටිනිස්සඟඨ** වනාහි පරිච්චාග පටිනිස්සඟඨ, පක්ඛන්දන පටිනිස්සඟඨය යි දෙ වැදෑරුම් වේ. ඒ දෙ වැදෑරුම් පටිනිස්සඟඨ අනු වැ බැලීම **පටිනිස්සඟඨානුපස්සනා**ය. පටිනිස්සඟඨානුපස්සනා යනු විදශීනාවට හා මාගීයට නම් බව දත යුතු. **එහි විදශීනාව ද පරිච්චාග පටිනිස්සඟඨානුපස්සනා හා පක්ඛන්දන පටිනිස්සඟඨානුපස්සනා වේ.**

ඒ මෙසේ ය:- තදඞ්ග ප්‍රහාණ වශයෙන් ස්කන්ධාභිසංස්කාරයන් සමග කෙලෙස් දුරු කරන විට විදශීනාව පරිච්චාග පටිනිස්සඟඨානුපස්සනා වේ. (**අනිත්‍යානුදශීනා** තොමෝ තදඞ්ග ප්‍රහාණ වශයෙන් නිත්‍ය සංඥාව දුරු කරන්නී නිත්‍ය ග්‍රහණ වශයෙන් ප්‍රවෘත්ත **කෙලෙසයන් හා තන්මූලක** අභිසංස්කාරයනු දු තදුභය මූලක වූ අතාගතයෙහි උපදනා විපාක ස්කන්ධයන් ද දුරු කෙරේ. දුඃඛ සංඥාදිය ද එසේ ම දුරු කෙරේ. යනු සත්තයි.) සංස්කාරයන්ගේ අනිත්‍යාදි දෙෂ දැක්මෙන් එ බඳු දෙෂ නැති නිර්‍වාණයෙහි නිමන භාවයෙන් පැනැ වදින විට විදශීනාව පක්ඛන්දන පටිනිස්සඟඨානුපස්සනා වේ. **මාගීය ද පරිච්චාගපටිනිස්සඟඨානුපස්සනා හා පක්ඛන්දන පටිනිස්සඟඨානුපස්සනා වේ.**

ඒ මෙසේ ය:- සමුච්ඡේද ප්‍රහාණ වශයෙන් ස්කන්ධාභිසංස්කාරයන් සමග කෙලෙස් දුරුකරන විට මාගීය පරිච්චාග පටිනිස්සඟඨානුපස්සනා වේ. ("මාගීයෙන් කෙලෙසයන් පරිත්‍යාග කරන කල්හි විපාක ධර්මතාපාදනයෙන් අභිසංස්කාරයෝ ද, අනුත්පත්තියට අහී බැවින් තන්මූලක වූ විපාක ස්කන්ධයෝ ද පරිත්‍යක්ත නම් වෙත්" යනු සත්ත යි.) අරමුණු කිරීම් වශයෙන් නිර්‍වාණයෙහි පැනැ වදින විට මාගීය පක්ඛන්දන පටිනිස්සඟඨානුපස්සනා වේ. විදශීනා මාගී සංඛ්‍යාත මේ පටිනිස්සඟඨය අනුපස්සනා වන්නේ පූර්-පූර් ඥානයට අනු වැ බලන බැවිනි. ("මාගීඥානය ද, ගොත්‍රභූ ඥානයට පසු වැ නිර්‍වාණ දශීනය කරන හෙයින් අනුපස්සනා නම් වහනේ" යනු සත්ත යි) (පටිනිස්සඟඨ නම් හැරැ පීම යි. දුරු කිරීම් වශයෙන් ම හැරැපීම ය, පැනැ අරමුණු වශයෙන් අල්ලා ගැනීමෙන් හැරැ පීම ය යි ඒ හැරැ පීම දෙ වැදෑරුම් බව කී නියා දත යුතු. මෙයින් විදශීනා ඥාන හා මාගී ඥාන ගැනේ.) ඒ දෙ වැදෑරුම් හැරැ පීමෙන් යුක්ත වූ ආශ්වාස - ප්‍රශ්වාස කරමි යි භික්මෙන්නේ **"පටිනිස්සඟඨානුපස්සී අස්සසිස්සාමි පස්සසිස්සාමීති සික්ඛති"** යි කීයේ වේ.

මේ සතර වන චතුෂ්කය ශුද්ධ විදශීනා වශයෙන් ද - මුල් චතුෂ්ක තුන සමථ - විදශීනා වශයෙන් ද වදළ බැව් දත යුතු.

චතුෂ්ක වශයෙන් ෂොඩශ වස්තුක ආනාපාණඝති භාවනා නය නිමියේ යි.

ආනාපානසති භාවනානිසංසය.

මෙසේ ඡෝඩශ වස්තු වශයෙන් ද, ශාන්තභාවාදි වශයෙන් ද මේ ආනාපානසතිය මහත් ඵල වේ. මහානිසංස වේ. **"අයම්පි බො භික්ඛවෙ ආනාපානසති සමාධි භාවිතො බහුලීකතො සන්තො චෙව පණීතො ච"**[1] යනාදීන් ඒ ශාන්තභාවාදිය යට කියන ලද්දේ ය.

විතර්ක සිඳැ ලීම ද මෙහි එක් මහානිසංසයෙකි. මේ වනාහි යට දැක්වුණු සේ ශාන්ත ප්‍රණීත අසෙවනක සුඛවිහාර බැවින් සමාධියට අන්තරායකර වූ විතර්කයන්ගේ වශයෙන් සිත ඔබ-මොබ දිවීම නවත්වා ආනාපානාරම්මණයට ම අනිමුඛ කරන බැවිනි. **"ආනාපානසති භාවෙතබ්බා විතක්කූපච්ඡෙදාය"** යනු එහෙයින් වදාළේ සි. (විතර්ක සිඳැලීම සඳහා ආනාපානසති වැඩිය යුතු යනු එහි අර්ථ සි.)

මාර්ග-ඵල පිරීමට මූල් වන බව ද එක් මහානිසංසයෙකි. **"ආනාපානසති භික්ඛවෙ භාවිතා බහුලීකතා චත්තාරෝ සතිපට්ඨානෙ පරිපූරෙති. චත්තාරෝ සතිපට්ඨානා භාවිතා බහුලීකතා සත්ත බොජ්ඣඞ්ගෙ පරිපූරෙන්ති. සත්ත බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්ති."**[2] 'ආනාපාන සති වඩන ලද්දේ සිව් සිවටත් ද, සිව් සිවටත් වඩන ලද්දේ සත්ත බොජ්ඣඞ්ග ද, සත්ත බොජ්ඣඞ්ග වඩන ලද්දේ මාර්ග-ඵල ද පුරන්නේ ය' සි වදාළ බැවිනි.

චරිමක ආශ්වාස - ප්‍රශ්වාස දැනැ ගැන්ම ද එක් මහානිසංස යෙකි. **"එවං භාවිතාය බො රාහුල ආනාපානසතියා එවං බහුලීකතාය යෙපි තෙ චරිමකා අස්සාසපස්සාසා තෙපි විදිතා'ව නිරුජ්ඣන්ති නො අවිදිතා."**[3] 'රාහුලය, ආනාපාන සතිය මෙසේ භාවිත බහුලීකෘත කළ කල්හි චරිමක ආශ්වාස-ප්‍රශ්වාස පවා දැනී මැ නිරුද්ධ වේ. නො දැනී නිරුද්ධ නො වෙසි' යනු වදාළ බැවිනි. (චරිමක නම් අවශානය කෙළවර ය.)

ආශ්වාස - ප්‍රශ්වාස පිළිබඳ නිරුද්ධවීම් වශයෙන් චරිමක තුනෙකි. **භවචරිමක, ඣානචරිමක, චුතිචරිමකය** සි. භව අතුරෙන් කාම භවයෙහි ආශ්වාස - ප්‍රශ්වාස ඇති. රූපාරූප භවයෙහි නැති. ඒ බැවින් කාම භවයෙහි ආශ්වාස - ප්‍රශ්වාස

[1] සං: නි: අ: සං: 1004- [2] සං: නි: අ: සං: 1014
[3] ම: නි: මජ්ඣිමප: 72

භවචරිමකය. ධ්‍යාන අතුරෙන් ප්‍රථම දවිතීය තෘතීය ධ්‍යාන-යන්හි ආශ්වාස – ප්‍රශ්වාස ඇති. චතුර්ථ ධ්‍යානයෙහි නැති. එබැවින් ප්‍රථම ධ්‍යානත්‍රයයෙහි ආශ්වාස – ප්‍රශ්වාස **ධ්‍යාන චරිමක ය.** චුති චිත්තයට පෙරාතු වැ සොළොස් වන චිත්තය සමග උපන් යම් ආශ්වාස – ප්‍රශ්වාස **කෙනෙක් ඒ** චුති චිත්තය සමග **නිරුද්ධ** වේද් ද ඒ ආශ්වාස – ප්‍රශ්වාස **චුතිචරිමක ය.** මේහි චරිමක යන්නෙන් දැන්වූයේ මේ චුති චරිමක බව දත යුතු ("රහත්-නට වනාහි සිත්හු ඥානත ව වැටෙන බැවින් ආශ්වාස – ප්‍රශ්වාසයෝ චුති චිත්තයෙන් පෙරටවැ මැ නිරුද්ධ වෙත්" යනු සත්ත සි.) මේ චුති චරිමක ආශ්වාස – ප්‍රශ්වාස **මේ කමටහනෙහි** මනාව යෙදුණු යොගිහට ප්‍රකට වැ ම දැනෙයි.

ඒ එසේ මැයි:- චුති චිත්තයට පෙරාතු සොළොස් වන සිත උපදින විට ඒ උත්පාදය ආවජ්ජනය කරත් ම උත්පාදය ප්‍රකට වෙයි. සන්තිය ආවජ්ජනය කරත් ම සන්තිය ප්‍රකට වෙයි. භඞ්ගය ආවජ්ජනය කරත් ම භඞ්ගය ප්‍රකට වෙයි.

සෙසු කමටහන් වඩා රහත් වන භික්ෂූන්ගේ දිවි පවත්නා කාලය පරිච්ඡින්න ද විය හැකි ය. අපරිච්ඡින්න ද විය හැකි ය. මේ ශොඩශ වසතුක ආනාපාණසතිය වඩා රහත් වන භික්ෂූන්ගේ දිවි පවත්නා කාලය පරිච්ඡින්න ම ය මේ වනාහි 'මගේ ආයුඃ සංස්කාර මේතෙක් කල් පවත්නේ ය. මින් මතු නො පවත්නේ ය' යි දැනැ සවකීය ධර්මතා වශයෙන් ම සිරුරු පිළිදගුම් සිවුරු හැඳුම් පෙරවීම් ආදි සියලු කෘත්‍ය කොට නිමවා ඇස් පියා ලන්නේ ය. **කොළපවි** වෙහෙර විසූ **නිස්ස** තෙරණුවෝ ද, **මහකරද** වෙහෙර විසූ **මහා-නිස්ස** තෙරණුවෝ ද, **දෙව්මුන්** රට **පිණ්ඩපාතික** තෙරණුවෝ ද, **සිතුල්පවි** වෙහෙර විසූ **දෙ මහාහොයුරු තෙරහු** ද එසේ කොළෝ වෙති. අවසානයෙහි කථා ප්‍රවෘත්තිය මේසේ ය.

සිතුල්පවි වෙහෙර විසූ දෙ බැ තෙරුන් අතුරෙන් එක් තමේක් පුරපසලොස්වක පෝයක් දෙසා භික්ෂු සංඝයා පිරිවරා තමා වැඩ වසන වෙහෙරට එළැඹැ සක්මන් මලුවේ සිටැ සඳ පහන බලා සවකීය ආයුඃසංස්කාරය ද බලන්නේ ("පෙර අඩ මස සවස් වේලෙහි හාත්පසින් හමන ලද ක්ෂීර ධාරා බදු වූ ගගන-තලය ද, රිදී පට බදු වැලි තලා ඇති භූමි භාගය ද දැකැ මේ කල ද, ප්‍රදෙශය ද, රම්‍ය ය, මාගේ අදහස වැන්න. කෙතෙක් කල් මේ දුඃඛභාරය ඉසිලිය යුතු දෝ සි තමන ආයුඃ-සංස්කාරය සලකා යන අභිප්‍රාය සි" යනු සත්ත සි) "ඔබ කෙබඳු ඉරියව්වෙකින් පිරිනිවෙනා භික්ෂූන් දුටුහු දැයි" භික්ෂූන් විවාළේ ය. "අපි අසුන්හි හිඳැ ගෙනැ පිරිනිවෙනා භික්ෂූන් දුටුම්හ" යි

කෙනෙක් කීහ. "අපි අහස පලහ බැඳ පිරිනිවෙනා භික්ෂූන් දුටුම්හ" යි කෙනෙක් කීහ. "එසේ ද එසේ නම් මම ඔබට සක්මන් කරමින් පිරිනිවෙනා භික්ෂුවක් දක්වමි. බැලුව මැනවැ"යි කියා සක්මන සරස ඉරක් ඇඳ "මම මේ කෙළවරින් අනෙක් කෙළවරට ගොස් එයින් හැරී එන්නෙමි මේ ඉරට පැමිණ පිරිනිවෙන්නෙමි" යි කියා සක්මනට බැස අනෙක් කෙළවරට ගොස් හැරී එන්නේ ශ්‍රී පතුලින් ඉර ඇක්ම ගත්තේ ම පිරිනිවියේ ය.

"තස්මා හවේ අප්පමත්තෝ - අනුයුඤ්ජේථ පණ්ඩිතෝ
එවං අනේකානිසංසං - ආනාපාණ සතිං භජ."

මෙසේ හෙයින් නුවණැත්තේ අනේකානිසංස ඇති මේ ආනාපාණසතියෙහි සතතයෙන් එකාන්තයෙන් යෙදෙන්නේ ය.

ආනාපාණසති භාවනායෙහි විස්තර කථාමුඛය යි.

උපසමානුස්සතිය

ආනාපාණසතියට අනතුරු වැ උපසමානුස්සතිය දක්වන ලද්දේ ය. එය වඩනු කැමති යෝගී විසින් විවෙක ගත වැ නොයෙක් අරමුණු වලින් සිත ඉවත් කොටැ **"යාවතා භික්ඛවෙ ධම්මා සඞ්ඛතා වා අසඞ්ඛතා වා විරාගෝ තෙසං ධම්මානං අග්ගමක්ඛායති යදිදං මදනිම්මදනෝ පිපාසවිනයෝ ආලයසමුග්ඝාතෝ වට්ටුපච්ඡේදෝ තණ්හක්ඛයෝ විරාගෝ නිරෝධෝ නිබ්බාණං"**[1] යි මහණෙනි! සඞ්ඛත වූ හෝ අසංඛත වූ හෝ යම් නාක් ධර්ම ඇද්ද ඒ ධර්ම අතුරෙන් **විරාගය** අග්‍රය යි කියනු ලැබේ. ඒ වනාහි මදනිම්මදනය, පිපාස විනයය, ආලයසමුග්ඝාතය, වට්ටුපච්ඡේදය, තණ්හාක්ඛයය, විරාගය, නිරෝධය, නිර්‍වාණය යි වදාළ පරිදි සියලු දුක් නිවා ලන නිර්‍වාණයෙහි ගුණ සිහි කළ යුතු ය. එහි:

සඞ්ඛත නම් හෙතුයෙන් ප්‍රත්‍යයයෙන් නිපන්නේ ය.

අසඞ්ඛත නම් හෙතුයෙන් ප්‍රත්‍යයයෙන් නො නිපන්නේ ය.

ධර්ම නම් සභාව ධර්ම ය, (පඤ්ඤත්තිධම්මා යනාදියෙහි අසභාවය ද ධර්ම නම් වන බැවින් එයින් නිවෘත්තනය කරන්නේ "ධම්මානි සභාවා" යි කීහු යනු සත්ත යි")

විරාග නම් රාගාභාවය යි. නිර්‍වාණය යි. නිර්‍වාණය රාගාභාව මාත්‍ර ම නො වේ. මදනිම්මදනාදිය ද වන්නේය යි දක්වන්නට මදනිම්මදන යනාදිය වදාළේ ය.

---

[1] අ: නි: චතුක්කනිපාත 209

මදනිම්මදනය= නිර්‍වාණයට පැමිණීමෙන් සියලු මාන මද පුරුෂ මද ජාතිමදාදිය නිම්මදන වේ - විනාශ වේ. එ බැවින් නිර්‍වාණය මදනිම්මදන ය.

පිපාසවිනය= නිර්‍වාණයට පැමිණීමෙන් සියලු කාමපිපාසා-කාමතෘෂ්ණා, විනයයට - අස්තයට ය යි. එ බැවින් නිර්‍වාණය පිපාසවිනය.

ආලයසමුග්ඝාතය= නිර්‍වාණයට පැමිණීමෙන් පඤ්චකාම ගුණාලය සමුච්ඡේදයට - විනාශයට් ය යි. එ බැවින් නිර්‍වාණය ආලයසමුග්ඝාතය.

වට්ටුපච්ඡේදය= නිර්‍වාණයට පැමිණීමෙන් ත්‍රෛභූමක වෘත්ත ඡේදයට - සිදීමට ය යි. එ බැවින් නිර්‍වාණය වට්ටුපච්ඡේදය.

තණ්හක්ඛය, විරාගය, නිරෝධය= නිර්‍වාණයට පැමිණීමෙන් සියලු තෘෂ්ණා ක්ෂයට ය යි. නො ඇලීමට ය යි. නිරුද්ධ වෙයි. එ බැවින් නිර්‍වාණය **තණ්හක්ඛය** ය. විරාගය. නිරෝධයි.

නිස්සරණය= තෘෂ්ණාව වනාහි සතර යොනි - පස් ගති - සප්ත විඤ්ඤාණස්ථිති - නව සත්ත්වාවාස ය ත මේ මතු - මතු භව පිණිස බඳනා හෙයින් - හිරවන හෙයින් වාණය යි කියනු ලැබේ. ඒ වාණයෙන් නික්මුණේ - නො ඇළුණේ නිර්‍වාණ ය.

මෙසේ මදනිම්මදනතාදි ගුණ වශයෙන් නිර්‍වාණ සංඛ්‍යාත උපසමය සිහි කළ යුතු.

තවද භගවත් බුදුහු විසින් **"අසංඛතං ච වෝ භික්ඛවෙ දෙසිස්සාමි - සච්චං ච - පාරං ච - සුදුද්දසං ච - අජරං ච - ධ්‍රුවං ච - නිප්පපඤ්චං ච - අමතං ච - සිවං ච - ඛෙමං ච - අබ්භුතං ච - අනීතිකං ච - අබ්‍යාපජ්ඣා ච - විසුද්ධිං ච - දීපං ච - තාණංච වෝ භික්ඛවෙ දෙසිස්සාමි"**[1] යනාදීන් වදාළ උපසම ගුණ වශයෙන් ද සිහි කළ යුතු. එහි ප්‍රත්‍යයෙන් නො නිපන් බැවින් **අසංඛතය.** සැබෑ බැවින් **සච්චය.** ("නිවන් තෙමේ කිසි පය්‍යායකිනු දු අසත් නො වන බැවින් එකාන්තයෙන් සත් හෙයින් ම අවිපරීතාර්‍ථයෙන් සත්‍ය නම්." එ හෙයින් කීහ:- **"එකං හි සච්චං න දුතියමත්ථි"** යනු සන්ත සි.) සසර පරතෙර බැවින් පාර ය. පරම ගම්භීර බැවින් ද, ඉතා සියුම් ශාන්ත සභාව ඇති බැවින් ද නුමුහු කළ නුවණ ඇතියන් විසින් දක්නට දුෂ්කර ය. ජරා නැති බැවින් **අජර** ය. ජරාදීන් නො නස්නා හෙයින් - සදිර හෙයින් **ධ්‍රුව** ය. තෘෂ්ණා ප්‍රපඤ්ච රහිත බැවින් **නිප්පපඤ්ච** ය. මරණ නැති බැවින් **අමත** ය. අශිව බව කරන කෙලෙස්

[1] සං: නි: අසඞ්ඛතසං: 784

තැති බැවින් **සිව** ය. කාමාදීන් උපද්‍රව තැති බැවින් **බෙම** ය. ආශ්‍රවයන් බැවින් ද අභූතපූර්ව බැවින් ද **අබ්භූත** ය. රති සංඛ්‍යාත අතෘප්ති නැති බැවින් **අනීතික** ය. දුක් තැති බැවින් **අව්‍යාපජ්ඣ** ය. අත්‍යන්තයෙන් පිරිසිදු බැවින් **විසුද්ධි** ය. කාමාදි චතුරොඝයෙන් තෝ ඔඛන ලද බැවින් **දීප** ය. සසර දුකින් රක්නා බැවින් **තාණ** ය.

මෙසේ උපසමය සිහි කරන්නේ ම ඒ යොගිහුගේ සිත ඒ වේලෙහි රාග-ද්වේෂ-මොහාදියෙන් පරිපීඩිත නො වේ. උපසමය අරබයා ම සිත සෘජු වේ. එවිට බුද්ධානුස්සති ආදියෙහි කී පරිදි නීවරණ විෂ්කම්භන වේ. ධ්‍යානාඞ්ග උපදී. උපසම ගුණ ගැඹුරු බැවින් ද, නානාවිධ ගුණ සිහි කිරීමෙහි අදහස් ඇති බැවින් ද අර්පණා ප්‍රාප්ත නො වූ ධ්‍යානය උපචාර ප්‍රාප්ත ම වේ. උපසම ගුණ සිහි කරන බැවින් මෙයට උපසමානුස්සතිය යි කියනු ලැබේ. යට දැක්වුණු ඔඛානුසාසනී මෙන් මෙ ද සම්‍යක්සම්බුද්ධ වන්නේ ආර්‍යශ්‍රාවකයන්ට ම ය. එසේ වුව ද උපසමය ගරු කොටැ ගත් පුහුදුන් විසින් ද මෙතෙහි කට යුතු. ශ්‍රෙෂ්ඨ වශයෙනු දු උපසමයෙහි සිත පහදින බැවිනි.

මේ උපසමානුස්සතිය වඩනා යොගි සුව සේ සැතපෙන්නේ ය. සුව සේ පිබිදෙන්නේ ය සත්සුන් ඉඳුරන් ඇති වන්නේ ය. සන්සුන් සිත් ඇති වන්නේ ය. හිරි-ඔතප් දෙකින් යුක්ත වන්නේ ය. පසාද උපදවන්නේ ය. ප්‍රණීත අදහස් ඇති වන්නේ ය. සබ්‍රහ්මචාරීන්ගට ගරු සම්භාවනීය වන්නේ ය. ඒ හේතුයෙහි චතුස්සත්‍යාවබෝධය නුනි නම් සුගතීපරායන වන්නේ ය.

"තයිදං හවෙ අප්පමත්තෙනා
භාවෙයබ්බං විචක්ඛණේන
එවං අනෙකානිසංසං
අරියෙ උපසමෙ සතිං."

මේසේ හෙයින් නුවණැති යොගී එකාන්තයෙන් අප්‍රමාද වැ තොයෙක් ආනිසංස ඇති මේ උතුම් උපසමානුස්සතිය වඩන්නේ යි

උපසමානුස්සති භාවනායෙහි විසාර
කථා මුළුමය යි.

හුදී ජන පහන් පිණිස කළ විශුද්ධිමාර්ගයෙහි
සමාධිභාවනාධිකාරයට ඇතුලත් අනුස්සතිකම්මට්ඨාන
නිර්දේශ නම් අටවන පරිච්ඡේදය නිමි.

---

9. සතර බ්‍රහ්ම විහරණය

මෛත්‍රී භාවනාව

දස අනුස්සතියට අනතුරු වැ දක්වන ලද **මෛත්‍රී, කරුණා, මුදිතා, උපෙක්ෂා** යන සතර බ්‍රහ්ම විහරණ අතුරෙන් මෛත්‍රී බ්‍රහ්ම විහරණ වඩනු කැමැති ආදිකම්මික යොගීහු විසින් කුඩා-මහත් පළිබෝධයෙන් දුරු වැ කර්මස්ථානය ගෙනැ හකුත කෘත්‍යය නිමවා හකුත මූර්ඡාව ද සන්සිඳුවා ගෙනැ විවෙක ස්ථානයෙක පනවන ලද ආසනයෙහි සුවසේ හිඳැ පළමුකොට දොෂයෙහි ආදීනව ද ක්ෂාන්තියෙහි ආනිසංස ද සිහිකළ යුතු. කුමක් හෙයින් ද මේ භාවනායෙන් කළ යුත්තේ දොෂය දුරු කිරීම ය. ක්ෂාන්තිය ලැබ ගැනීම ය. ආදීනව නුදුටු කිසිවක් දුරුකරන්නට හෝ ආනිසංස නුදුටු කිසිවක් ලැබ ගන්නට බැරි ය. එ බැවින් **"දට්ඨා වෝ ආවුසෝ දොසෙන අභිභූතෝ පරියාදින්න චිත්තෝ පාණම්පි හනෙය්‍ය"**[1] යනාදීන් වදාළ සූත්‍රානුසාරයෙන් දොෂයෙහි ආදීනව දැක්ක යුතු ය.

'මහණෙනි! දොෂයෙන් දූෂිත වූ, අභිභූත වූ සිත් පැසින් අල්ලා ගන්නා ලද සිත් ඇත්තා වූ පුද්ගලයා ප්‍රාණඝාත ද කරන්නේ ය' යනු එහි අර්ථ යි.

"ඛන්තී පරමං තපෝ තිතික්ඛා
නිබ්බාණං පරමං වදන්ති බුද්ධා"[1]
"ඛන්තිබලං බලානීකං
තමහං බ්‍රූමි බ්‍රාහ්මණං"[2]
"ඛන්ත්‍යා ජියෝ න විජ්ජති"[3]

යනාදීන් වදාළ ධර්මානුසාරයෙන් ක්ෂාන්තියෙහි ආනිසංස දැක්ක යුතු ය 'ක්ෂාන්ති සංඛ්‍යාත තිතික්ෂාව – ඉවසීම පරම තපස ය, 'ක්ෂාන්තිය බල කොටැ ඇති ක්ෂාන්තිය බල ඇණි කොටැ ඇති ඔහු මම බ්‍රාහ්මණයා යි කියමි' 'ක්ෂාන්තියට වඩා උසස් ගුණයෙක් නැත' යනු එහි අර්ථ යි.

මෙසේ ආදීනව දැකැ වෙෂයෙන් සිත මුදනු සඳහා ද ආනිසංස දැකැ ක්ෂාන්තියෙහි සිත යොදනු සඳහා ද මෛත්‍රී භාවනාවට පටන් ගත යුතු ය. පටන් ගනුවන් විසින් පළමු කොටැ ම 'මේ මේ පුද්ගලයන් කෙරෙහි මෛත්‍රී වැඩිය යුතු ය. මේ මේ පුද්ගලයන් කෙරෙහි මෛත්‍රී නො වැඩිය යුතු ය' යි පුද්ගල දෙෂ දැනගත යුතුයි.

අප්‍රිය, අතිප්‍රියසහාය, මධ්‍යස්ථ, වෛරී යන මේ සතර පුද්ගලයන් කෙරෙහි පළමු කොටැ මෛත්‍රී නො වැඩිය යුතු ය. ලිඬිග විසභාගයන් කෙරෙහි සීමා වශයෙන් මෛත්‍රී නො වැඩිය යුතුය. මළවුන් කෙරෙහි ද මෛත්‍රී නො වැඩිය යුතු යි.

---

[1]අ: නි: සික්කනිපාත 132. [2]දී: නි: මහාවග්ග 31.
[3]ධ: ප: බ්‍රහ්මණවග්ග: 5/7

කුමක් හෙයින් ද අප්‍රිය පුද්ගලයා ප්‍රිය තන්හි තබා ගන්නට යාමෙන් සිත පීඩා වන්නේ ය. අති ප්‍රිය සහායයා මධ්‍යස්ථ තන්හි තබා ගන්නට යාමෙන් එසේ ම සිත පීඩා වන්නේ ය. ඔහුට සුළුපට වූ ද දුකක් වූ විට හඬන්නට පවා සිදු වේ. මධ්‍යස්ථ පුද්ගලයා ගරු තන්හි ප්‍රිය තන්හි තබා ගන්නට යාමෙන් ද සිත පීඩා වන්නේ ය. වෛරී පුද්ගලයා සිහිවන්නා කාම ක්‍රෝධය උපදින්නේය. එ බැවින් අප්‍රියාදි සතර දෙනා කෙරෙහි පළමු කොටැ මෛත්‍රී නො වැඩිය යුතු. **ලිඛිත විඝාතඝෝ** නම් සත්‍රීන්ට පුරුෂයෝ ය. පුරුෂයන්ට සත්‍රීහු ය. ඔවුන් කෙරෙහි සීමා වශයෙන් අසවලාට හෝ අසවලිට මෛත්‍රී කරමි යි මෛත්‍රී කරන්නට යාමෙන් මෛත්‍රිය නො වැ වැඩෙන්නේ රාගය යි.

පෙර එක් ඇමති දරුවෙක් "ස්වාමීනි! **කවුරුන් කෙරෙහි** මෛත්‍රී වඩම් ද" යි කුලූපග භික්ෂුවක් විවාළේ ය. හේ "ප්‍රියවතකු **කෙරෙහි** වඩව" යි කී ය. ඒ ඇමති දරුවාට සිය බිරිය ප්‍රිය ය. හේ ඇය කෙරෙහි මෛත්‍රී වඩන්නට යාමෙන් මුළු රැය ම භිතනි යුද්ධය කෙළේ යි*. එ බැවින් ප්‍රිය පුද්ගලයා කෙරෙහි සීමා වශයෙන් පළමු කොටැ මෛත්‍රී නො වැඩිය යුතු.

මළවුන් කෙරෙහි මෛත්‍රී වැඩීමෙන් **අජීණ** – උපචාර ලැබ ගත නො හැකි ය. එක් තවක භික්ෂු තමෙක් ආචාර්‍යයන් **කෙරෙහි** මෛත්‍රී වැඩුයේ ය. එහෙත් ඔහුගේ මෛත්‍රිය සඵල නො වෙයි. හේ මහ තෙරුන් **කරා** ගොස් "ස්වාමීනි! මට මෛත්‍රී ධ්‍යාන සමාපත්තිය මැනෙවින් ප්‍රගුණය. එහෙත් එයට සම වැදූ ගන්නට බැරි ය. **කරුණු කිම** දැ යි" විවාළේ ය. මහ තෙරුන් වහන්සේ "ඇවැත්නි! නිමිත්තා ජීවත් වැ ඇද්දැ යි පිරික්සව" යි, කී සේක. හේ පිරික්සනුයේ ආචාර්‍යයන් අපවත් වූ බැව් දැනැ අන් තැනෙක මෙන් වඩා අජීණ ලදැ. එ බැවින් මළවුන් කෙරෙහි ද මෛත්‍රී නො වැඩිය යුතු.

මෛත්‍රී වඩන්නා විසින් සියල්ලට පළමු වැ "මම සුවපත් මි, නිදුක්මි" කියා හෝ "මම වෛර නැත්තෙමි, ව්‍යාපාද නැත්තෙමි, උපද්‍රව නැත්තෙමි, සුව සේ ආත්මය පරිහරණය කරමි" කියා හෝ පුන පුනා තමන් කෙරෙහි ම මෛත්‍රී වැඩිය යුතු. මෙහි ලා ප්‍රශ්නයෙකි. එසේ පළමු කොට තමා කෙරෙහි ම මෛත්‍රී වැඩිය යුතු නම් විභඞ්ගයෙහි **"කථං ච භික්ඛවෙ භික්ඛු මෙත්තා සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. සෙය්‍යථාපි එකං පුග්ගලං පියං මනාපං දිස්වා මෙත්තායෙය්‍ය එවමෙව සබ්බසත්තෙසු මෙත්තාය ඵරති"**[1] 'මහණෙනි! භික්ෂු තෙමේ මෛත්‍රී

* මෙය සන්නයෙහි මෙසේ විස්තර කරයි. **"ඇමති පුත් තෙමේ සිල් පිහිටා පිහිත වූ දෙර ඇති ගෙයියෙහි යහන් පිට හිඳ මෛත්‍රී භවනුයේ මෛත්‍රී මුඛයෙන් උපන් රාගයෙන් කණ වූයේ භාර්‍යාව සම්පයට යනු කැමැත්තේ දෙර නො දුක හිත්තිය බිඳැ ගෙනැ යනු කැමැතිවැ හිත්තිය පහළයැයි දත යුතු."**

[1] වි: ප: අප්පමඤ්ඤා වි: 206

සහනත සිතින් කෙසේ එක් දිගක් පතුරුවා වෙසේ ද ප්‍රිය මනාප එක් පුද්ගලයකු දැකැ මෙත් කරන්නා සේ සියලු සතුන් කෙරෙහි මෙත් පතුරුවන්නේ ය යි ද **පටිසම්භිදායෙහි "කත-මෙහි පඤ්චහාකාරෙහි අනොධිසො ඵරණා මෙත්තා චෙතො-විමුත්ති භාවෙතබ්බා! සබ්බෙ සත්තා -පෙ- සබ්බෙපාණා -පෙ- සබ්බ භූතා -පෙ- සබ්බෙ පුග්ගලා -පෙ- සබ්බෙ අත්තභාව-පරියා පන්නා, අවෙරාහොන්තු අබ්‍යාපජ්ජා හොන්තු අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු."**[1] 'කවර පස් ආකාරයෙ-කින් අනොධිසෝ ඵරණ වශයෙන් මෛත්‍රී වැඩිය යුතු ද සියලු සත්ත්වයෝ සියලු ප්‍රාණීහු සියලු භූතයෝ, සියලු පුද්ගලයෝ, සියලු ආත්මභාව පර්‍යාපන්නයෝ, අවෛර, අව්‍යාපාද, අනීඝ-වෙත්වා, සුව සේ ආත්ම පරිහරණය කෙරෙත්වා ය යි ද, **කරණීය මෙත්ත සූත්‍රයෙහි "සුඛිනෝ වා බෙම්මිනෝ හොන්තු සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා"**[2] සියලු සත්ත්වයෝ සුඛිත වෙත්වා, ක්ෂෙමී වෙත්වා, සුව පත් වෙත්වා ය යි ද කුමක් හෙයින් සියලු සතුන් කෙරෙහි මෛත්‍රී වැඩිය යුතු ය යි වදාළ සේක් ද, එහි හා මෙහි විරොධයෙක් නැත්තේ ද, එහි තමා කෙරෙහි මෙත් වැඩු-මෙක් නො වදාරන ලද්දේ නො වේ ද,

උත්තර මෙසේ ය:- සැබව එහි තමා කෙරෙහි මෛත්‍රී භාවනා වෙක් නො වදාරන ලද්දේ ය. එහෙත් එහි හා මෙහි හා විරොධයෙක් ද නැත්තේ ය කුමක් හෙයින් ද, එහි මෛත්‍රී භාවනා විධි දක්වන ලද්දේ අප්‍රිණා වශයෙනි. මෙහි සාක්ෂ්‍ය වශයෙනි. අවුරුදු සියයක් දහසක් නමුදු "මම සුවපත්මි" යනාදි වශයෙන් තමා කෙරෙහි මෛත්‍රී වඩන්නහුට අප්‍රිණා නො ලැබේ. එසේ වැඩීමෙන් 'මම යම්සේ සුවපත් වනු කැමැත්තෙම් ද, දුකට සිළිකුල් කරම් ද, ජීවත්වනු කැමැත්තෙම් ද, නො මැරෙනු කැමැත්තෙම් ද එසේ අන්‍ය සත්ත්වයෝත් කැමැති වෙති' යි තමා සාක්ෂ්‍ය තන්හි තබා අනුන් කෙරෙහි හිත සුව කැමැති බව උපදින්නේ ය. භගවත් බුදුන් විසින් ද

"සබ්බා දිසා අනුපරිගම්ම චෙතසා
නෙවජ්ඣගා පියතර මත්තනා ක්වචි
එවං පියො පුථු අත්තා පරෙසං
තස්මා න හිංසෙ පරං අත්තකාමො"[3] යි.

"සිතින් සියලු දිග් සොයා බැලුව ද ඒ කිසි දිගෙක තමහට වඩා ප්‍රියතරයෙක් නො ලැබෙන්නේ ය. ඔවුනොවුනට තම තමන්ගේ ශරීර වෙන වෙන ම ප්‍රිය ය. එබැවින් තමහට හිත කැමැත්තේ අනුනට හිංසා නො කරන්නේ ය" යි තමා සාක්ෂි භාවයේ තබා සතුන් කෙරෙහි මෙත් වැඩිය යුතු ය. යන මේ ක්‍රමය වදාරන ලද්දේ ම ය. එ බැවින් සාක්ෂි පිණිස පළමු කොටැ තමා කෙරෙහි මෙත් වැඩිය යුතු ය. ඉක්බිති සුවසේ මෙත් පවත්වනු පිණිස තමහට ප්‍රිය මනාප ගරු භාවනීය ආචාර්‍යවරයෙක් හෝ ආචාර්‍ය සමානයෙක් හෝ

[1]පටි: ම: මෙත්තා කථා 316. [2]ඛු: පා: 8. [3]සං: නි: කොසල සං: 46

උපාධ්‍යායයෙක් හෝ උපාධ්‍යාය සමානයෙක් හෝ වේ නම් ඔහුගේ දැක - ප්‍රිය වචනාදි වූ ප්‍රිය මනාප කාරණ ද, ශීලශ්‍රැතාදි වූ ගරු භාවනීය කාරණ ද සලකා "ඒ සත් පුරුෂයාණෙනි, සුවපත් වෙත්වා නිදුක් වෙත්වා" යනාදි ක්‍රමයෙන් මෙත් වැඩිය යුතු ය. මෙබන්දන් කෙරෙහි මෙත් වැඩීමෙන් එකාන්තයෙන් අපිණා ලැබෑ ගත හැකි ය.

මේ යොගි විසින් එතෙකින් ම සතුටට නො පැමිණ, සීමා සම්භෙදය කරන කැමැත්තෙන් ඉක්බිති අතිප්‍රිය මිත්‍රයා කෙරෙහි මෙත් වැඩිය යුතු ය. අතිප්‍රිය මිත්‍රයා කෙරෙහි මෙත් වඩා ඉකබිති මධ්‍යස්ථයා කෙරෙහි මෙත් වැඩිය යුතු ය. මධ්‍යස්ථයා කෙරෙහි මෙත් වඩා ඉක්බිති වෙරී පුද්ගලයා කෙරෙහි මෙත් වැඩිය යුතු ය. මේ එක් එක් කොට්ඨාසයෙහි සිත මෘදු කොට, කර්මණ්‍ය කොට, ඉක්බිති අනතුරු කොට්ඨාශයෙහි මෙත් වැඩිය යුතු බව දත යුතු. ("පළමු කොට, ප්‍රිය ගරු ස්ථානයෙහි මෛත්‍රී භාවනාවට පැමිණ, වසී භාවයට පැමිණි සිත්හු කොට්ඨාසානන්තරයට පමුණුවනු පිණිස මෘදු කර්මණ්‍ය කොට, තදනන්තර වැ අති ප්‍රියයා කෙරෙහි මෙත් වැඩිය යුතු. අති ප්‍රියයා කෙරෙහි මෛත්‍රී භාවනාවට පැමිණ, වසී භාවයට පැමිණි සිත්හු කොට්ඨාසානන්තරයට පමුණුවන පිණිස මෘදු කර්මණ්‍ය කොට, තදනන්තරයෙහි මධ්‍යස්ථයා කෙරෙහි මෙත් වැඩිය යුතු. මධ්‍යස්ථයා කෙරෙහි උදාසීනභාවය විෂ්කම්භනය කොට, ප්‍රිය භාවය ද එළවා භාවනා කළ යුතු. නැවත ඒ භාවනාව ද වසී භාවාපාදනයෙන් මෘදු කර්මණ්‍ය කොට තදනන්තර වැ වෛරීන් කෙරෙහි වෛරී සංඥ විෂ්කම්භනය කොට, මධ්‍යස්ථයට පමුණුවන මුඛයෙන් ප්‍රිය භාවය ද උපදවන්නහු විසින් භාවනා එළවිය යුතු" යනු සන්න සි.)

ඉදින් යමකුහට වෛරී පුද්ගලයෝ හෝ නැත්නම් තමා මහා පුරුෂ ජාතික බැවින් අනාථ කරන්නහු කෙරෙහි ද වෛරී සංඥ හෝ නූපදී නම් ඔහු විසින් "දැන් මගේ භාවනාව මධ්‍යස්ථයා කෙරෙහි කර්මණ්‍ය විය වෛරී පුද්ගලයා කෙරෙහි ඉතින් භාවනා එළවම්" යි ව්‍යාපාර නො කළ යුතු සි. යම්කුට වෛරී පුද්ගලයෝ ඇත් නම් ඔහු සඳහා ය වෛරී පුද්ගලයා කෙරෙහි මෙත් වැඩිය යුතුය යි කියන ලද්දේ (මහා පුරුෂ ජාතිකයා විරකාල පරිචයයෙන් සමෘද්ධ වූ ක්ෂාන්ති මෛත්‍රී කරුණාදි ගුණ සමන්විත බැවින් උදර අදහස් ඇත්තේ ය. සියල්ල ඉවසන සුලු වූ හෙතෙමේ පරාපරාධය තණපතකට ද නො තකන්නේ ය.")

වෛරී පුද්ගලයා කෙරෙහි මෛත්‍රී එළවන්ත් ම ඉදින් ඔහු විසින් කරන ලද අපරාධ සිහි වීමෙන් ඔහු කෙරෙහි ක්‍රෝධ උපදී නම් එවිට පළමු කී වූන් අතුරෙන් යමකු කෙරෙහි මෛත්‍රී ධ්‍යාන ලබා එයින් නැගී නැවත ඔහු කෙරෙහි මෛත්‍රී සිතීමෙන් ක්‍රෝධය

දුරු කැරී ගත යුතු සි. ඉදින් එසේත් ක්‍රෝධය නො සන්සිඳේ නම් ඛන්ධවූපමොවාදාදි අනුසාරයෙන් ක්‍රෝධය දුරු කැරී ගන්නට නැවත නැවත උත්සාහ කළ යුතු. ඔහු විසින් තමහට මෙසේ අවවාද කැරිගත යුතු සි.

'කොළ! ක්‍රෝධ ශීලී පුද්ගල ය! බුදුරජාණන් වහන්සේ විසින් මෙසේ වදාළසේක් නො වේ ද,

(1) "උභතෝ දණ්ඩකෙන වෙපිහික්ඛවෙ ඛත්තියෙන චොරා ඔවරකා අඞ්ගමඞ්ගානි ඔකන්තනියාථ, තත්‍රාපි යො මනොපදූසෙය්‍ය න මෙ සො තෙන සාසනකරෙ"[1] සි.

(2) "තඤෙව තෙන පාපියෝ-යො කුද්ධං පටිකුජ්ඣති
කුද්ධං අප්පටිකුජ්ඣතෙනා-සංගාමං ජෙති දුජ්ජයං

උභින්නමත්ථං චරති-අත්තනොච පරස්ස ච
පරං සංකුපිතං ඤත්වා-යො සතො උපසම්මති"[2] සි

(3) 'සන්තීමෙ භික්ඛවෙ ධම්මා සපත්තඛන්තා සපත්ත කරණා කොධනං ආගච්ඡන්ති ඉත්ථිං වා පුරිසං වා. කතමෙ සත්ත?

ඉධ භික්ඛවෙ සපත්තෙනා සපත්තස්ස එවං ඉච්ඡති 'අහොව නාහං දුබ්බණ්ණා අස්සා' ති. තං කිස්ස හෙතු? න භික්ඛවෙ සපත්තෙනා සපත්තස්ස වණ්ණවත්තාය නන්දති. කොධනාහං භික්ඛවෙ පුරිසපුග්ගලා කොධාභිභූතෙ කොධපරෙතෙ කිසුව පි සෙ හොති සුනහාතෙ සුවිලිත්තෙ ඝසපිත කෙස මස්සු ඔදතවත්ථසනෙ. අථඛ්ඛා සෙ දුබ්බණ්ණාව හොති කොධාභිභූතෙ. අයං භික්ඛවෙ පඨමෙ ධම්මා සපත්ත ඛන්තනා සපත්තකරණෙ කොධනං ආගච්ඡති ඉත්ථිං වා පුරිසං වා.

පුන ච පරං භික්ඛවෙ සපත්තෙනා සපත්තස්ස එවං ඉච්ඡති 'අහොවත්තාහං දුක්ඛං සයෙය්‍යා' ති-පෙ- 'න පචුරත්ථා අස්සා' ති -පෙ- 'න ධෙනුවා අස්සා' ති -පෙ- 'න යඤවා අස්සා' ති පෙ- 'න මිත්තවා අස්සා' ති -පෙ- 'න ඤාතියස්ස හෙදා පරම්මරණා සුගතිං සගගං ලොකං උපපජ්ජෙය්‍යා' ති. තං කිස්ස හෙතු, න භික්ඛවෙ සපත්තෙනා සපත්තස්ස සුගති ගමනෙන නන්දති. ඉඛ ධනාහං භික්ඛවෙ පුරිසපුග්ගලා කොධාභිභූතෙ කොධපරෙතෙ ඤායෙන දුච්චරිතං චරති වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති. සො ඤායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා ඤායස්ස භෙදා පරම්මරණා අපායං දුගතිං විනිපාතං නිරයං උපපජ්ජති කොධාභිභූතෙ"[3] සි.

---

[1] ම: නි: මූලපණ්ණාසක 142 [2] සං: නි: සක්කසං: 140
[3] අ: නි: සත්තකනි: 674

(4) **''සෙය්‍යථාපි භික්ඛවෙ ඡ්‍වාලාතං උභතො පදිත්තං මජ්ඣෙ ගූථගතං නෙව ගාමෙ කට්ඨත්ථං එරති, න අරඤ්ඤෙ කට්ඨත්ථං එරති. තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගල පුග්ගලං වදාමි''**[1] යි.

'ඉදින් තෝ දැන් කිපුණෙක් වන්නෙහි නම් බුදුරජාණන් වහන්සේ ගේ ශාසනය නොකරන්නෙක් වන්නෙහි ය. කිපුණහුට පෙරළා කිපුණෙහි නම් ඒ කිපුණ පුද්ගලයාටත් වඩා තෝ පාපිෂ්ඨයෙක් වැ නො දිනිය හැකි සංග්‍රාමය නො දිනන්නෙහි ය. සපත්නකරණ ධර්‍ම තෙමේම තමා කෙරෙහි ඇති කැරැ ගන්නෙහි ය. සොහොන් පෙතෙල්ල බඳු ද වන්නෙහි ය'

වදාළ පාලියෙහි අර්‍ථ මෙසේ ය.

(1) 'මහණෙනි! ඉදින් දෙපස පොලු ලූ කියතෙකින් නපුරු වූ සොරු තම සිරුරු අවයව කපත් නම් එහිදී පවා යමෙක් සිත දූෂ්‍ය කැරැ ගත්තේ තම් හේ මාගේ ශාසනය කරන්නෙක් නො වන්නේ ය.'

(2) 'යමෙක් කිපුණහුට පෙරළා කිපේ නම් හේ පළමු කිපුණහුට ත් වඩා පාපිෂ්ඨයෙකි. කිපුණහුට පෙරළා නො කිපෙන්නේ නො දිනිය හැකි යුද්ධයක් දිනුයේ වන්නේ ය. අන්‍යයා කිපුණා දැකැ යමෙක් සිහි ඇති වැ ඉවසා නම් හේ තමහට ද අන් හට ද යන දෙපසට ම වැඩ සාධන්නේ ය.'

(3) 'මහණෙනි! සතුරකු විසින් තම සතුරාට කරනු කැමති වූ මේ ධර්‍ම සතෙක් ක්‍රොධ කරන සුලු සත්‍රිය කරා හෝ පුරුෂයා කරා හෝ ඉබේ ම පැමිණෙන්නාහ ය'

කවර ධර්‍ම සතෙක් ද,

1 'මහණෙනි! අහෝ! මේ දුර්‍මණ්‍ය වේ නම් මැනවැ' යි සතුරා සතුරා ගැනැ සිතන්නේ ය. කුමක් හෙයින් ද, මහණෙනි! සතුරා තම සතුරා ගේ වර්‍ණ සම්පත්තිය නුරුස්නේ ය. මහණෙනි! ක්‍රොධ ශීලී පුද්ගලයා ඉදින් දය නා පියා සුවඳ විලවුන් ගල්වා හිස රැවුල් අන්දම් තබා පිරිසුදු සුදු පිළි හැඳ සිටියේ නමුදු දුර්‍මණ්‍ය මැ වන්නේ ය. මහණෙනි! ක්‍රොධ ශීලී සත්‍රිය කරා හෝ පුරුෂයා කරා හෝ පැමිණෙන මේ පළමු වන සපත්න කරණ ධර්‍මය යි

2 'මහණෙනි! අහෝ! මේ දුකසේ වසන්නේ නම් මැනවැ' යි සතුරා, සතුරා ගැනැ සිතන්නේ ය. කුමක් හෙයින් ද, මහණෙනි! සතුරා තම සතුරාගේ සුඛ වාසය නුරුස්නේ ය.

3 'මහණෙනි! අහෝ! මේ ධනවත් නොවන්නේ නම් මැනවැ''යි සතුරා සතුරා ගැන සිතන්නේ ය. කුමක් හෙයින් ද, සතුරා තම සතුරාට ධනවත් බව නුරුස්නේ ය.

---

[1] අ: නි. චතුක්කනි: 249

4 'මහණෙනි! අහෝ මේ උපභොග පරිභොග වස්තු ඇත්තෙක් නො වන්නේ නම් මැනවැ' යි සතුරා සතුරා ගැන සිතන්නේ ය කුමක් හෙයින් ද, මහණෙනි! සතුරා තම සතුරාගේ උපභොග පරිභොග වස්තු ඇති බව නුරුස්නේ ය.

5 'මහණෙනි! අහෝ මේ යස පිරිවර ඇත්තෙක් නො වන්නේ නම් මැනවැ' යි සතුරා, සතුරා ගැනැ සිතන්නේ ය. කුමක් හෙයින් ද, මහණෙනි! සතුරා තම සතුරා හට යස පිරිවර ඇති බව නුරුස්නේ ය.

6 'මහණෙනි! අහෝ මේ මිත්‍රයන් ඇත්තෙක් නොවන්නේ නම් මැනවැ" යි සතුරා, සතුරා ගැනැ සිතන්නේ ය. කුමක් හෙයින් ද, මහණෙනි! සතුරා තම සතුරාගේ මිත්‍රයන් ඇති බව නුරුස්නේ ය.

7 'මහණෙනි' අහෝ මේ මරණින් මතු සුගතියෙහි නූපදනේ නම් මැනවැ' යි සතුරා සතුරා ගැනැ සිතන්නේ ය. කුමක් හෙයින් ද, සතුරා තම සතුරා ගේ සුගෝත්පත්තිය නුරුස්නේ ය. මහණෙනි! ක්‍රොධශීලී පුද්ගලයා කයින් වචනයෙන් සිතින් දුශ්චරිත කරන්නේ ය. කොටැ කා බුන් මරණින් මතු අපායෙහි උපදින්නේ ය.

(4) 'මහණෙනි! දෙ කොන ගිනි ඇවිළ ගත් මැද අසුචි වැකුණු සොහොන් පෙතෙල්ලෙ ගමේ දර වැඩක් හෝ කැලේ දර වැඩක් හෝ නො කරන්නේ ය. මහණෙනි! මේ ක්‍රොධ ශීලී පුද්ගලයා ද එ බඳු යැ' යි කියමි. (මේ යට දැක්වුණු දෙශනා පාලියේ අවසි.)

මෙසේ ගැටෙන් ම වැයම් කරන් ම ඉදින් ක්‍රොධය සන්සිඳේ නම් මැනව. නො සන්සිඳේ නම් ඔහුගේ ශාන්ත පිරිසුදු-ප්‍රසාදවත ගුණධර්ම ඇත නොත් ඒ සලකා සන්සිඳුවා ගත යුතු ය. ඇතැමකු ගේ කාය සමාචාර ශාන්ත ය. වත් පිළිවෙත් කරන කල ඒ බව සියල්ලන්ට දැන ගත හැකි ය. එහෙත් ඔහුගේ වාක්-මනස්සමාචාර අශාන්ත ය. අශාන්ත වූ ඒ වාක්-මනස්සමාචාර නො සිතා ශාන්ත වූ කායසමාචාර ම සිතිය යුතු ය. ඇතැමකු ගේ වාක් සමාචාර ශාන්ත ය. ඒ බව සියල්ලන් අතර ප්‍රසිද්ධ ය. හේ සුවභාවයෙන් ම පිළිසඳර කථායෙහි දක්ෂ ය. මෘදු ප්‍රිය වචන ඇත්තේ ය. මෙරමා සතුටු කරන්නේ ය. නිතර මුහුණ ප්‍රීති සහගත ය. කිසිවකු එළඹි විට තෙමේම පළමු වැ කථා උපදවයි. පරිපූර්ණ පද ව්‍යඤ්ජනයෙන් මධුර සුවර නඟා දහම් දෙසන්නේ ය. එහෙත් ඔහු ගේ කාය මනස්සමාචාර අශාන්ත ය. ඒ අශාන්ත කාය-මනස්සමාචාර නො සිතා ශාන්ත වාක් සමාචාර ම සිතිය යුතු ය. ඇතැමකුගේ මනස්සමාචාර ශාන්ත ය. ඒ බව ඔහුගේ සැ වැදුම් ආදියෙහි දී සියල්ලන්ට දැනැ ගත හැකි ය. නො සන්සුන් සිත් ඇතියකු සැ හෝ බෝ හෝ තෙරුන් හෝ වඳනා කල

සකස් වෑ නො වදින්නේ ය. බණ අසන කල ඒකාග්‍රතා වෑ හෝ නිදි කිරමින් හෝ ඉන්නේ ය. සන්සුන් සිත් ඇතියා වදනා කල කලපනා සහිත වූ සකසා වදින්නේ ය. කන් නමා අරුත් සලකා අනතර් ජනිත ප්‍රීතිය කයින් හෝ වචනයෙන් හෝ ප්‍රකාශ කරමින් අසන්නේ ය. එහෙත් ඔහු ගේ කායෙ – වාක් සමාචාර අශාන්ත ය. ඒ අශාන්ත කායෙ – වාක් සමාචාර නො සිතා ශාන්ත මනසමාචාරය ම සිතිය යුතු ය.

ඇතැමකුගේ මේ ත්‍රිවිධ සමාචාර ම අශාන්ත ය. එකකු දු ශාන්ත නැත. එබන්දු කෙරෙහි 'මේ අද මිනිස් වෙසින් හැසිරෙතත් සවලප දිනෙකින් අට මහ නිරා සොළොස් ඔසුපත් නිරා පුරන්නේ ය" යි කරුණා උපදවිය යුතු ය. **කරුණාව නිසා ක්‍රොධය සන්සිඳෙන්නේ ය.**

ඇතැමකු ගේ මේ ත්‍රිවිධ සමාචාර ම ශාන්ත ය. එයින් යමක්–යමක් තමහට රිසියේ නම් ඒ ඒ සලකා ක්‍රොධය සන්සිඳුවා ගත යුතු ය. එබන්දු කෙරෙහි මෛත්‍රී වැඩීම දුෂ්කර නො වේ. මේහි ලා **අඞ්ගුත්තර පඤ්චක නිපාතයෙහි "පඤ්චිමෙ ආවුසො ආඝාතපටිවිනයා යතෝ භික්ඛුනො උප්පන්නො ආඝාතො සබ්බසො පටිවිනෙතබ්බො,"**[1] යනාදීන් වදළ ආඝාතපටිවිනය සූත්‍රය විසතර කළ යුතු යි.

මෙසේ වැයම් කොටත් ඉදින් ක්‍රොධය නො සන්සිදේ නම් ඉක්බිති තමා ම මෙසේ අවවාද කැරැගත යුතු ය.

'සතුරා ඔහු අයත් – තගෙ සිරුරෙ දුක් දෙන්නේ,
තෝ ඔහු අයත් නැති – සිතෙහි කිම දුක් දියවී වන්නේ!

හිතවත් මව් – පිය – නෑ – මිතුරන් හැරැ පියා
තමහට අහිතට වැටෙන – කෝ සතුරු නො හරතෙ කිම?

රකින හැම සිල් මුල් – කපා ලත කෝ සතුරා
ලෙනි ලා නලවන්නෙහි – තා වැනි ජඩයෙක් කවර?

ඔහු විසින් තා හට – නපුරක් කෙළෙ ය යි කිපෙහි
තෝ තමහට එබදු – නපුරක් කරනු රිසියෙහි

තා රොස් කරන්නට – සතුරා ඒ නපුර කෙළෙ
රොස් වීමෙන් තමා – ඔහුගෙ මන දෙළ පුරණෙහි

කිපුමෙන් සතුරු හට – දුක් දිය හැකි වෙ නො හැකි වෙ
තෙමේ තමහට පළමු වූ – කෝ දුක් දී පෙළන්නේ

සතුරා කොවින් අද – අහිත මහට වැටුණේ
තොද ඔහුහට කිපීමෙන් – ඔහු අනුවැ යන්නේ වෙහි

---

[1] අ: නි: පඤ්චකනි: 157

යම් රොසෙකින් සතුරු – තා හට අවැඩ කෙළෙ තම්
ඒ රොස ම නසා ලව් – බලු මෙන් තෝ තැනැ තෝ වෙහෙස

යම් කදෙකින් සතුරු – තා හට තපුර කෙළෙ තම්
සැතෙකින් ඒ නැසී ගියෙ – දැන් කුමට රොස් කරනුයෙ

දුක් දෙන කෙතෙක් ඔහු – නැති වැ කා හට දුක් දෙති?
තෙමෙ ම දුකට හේතුවැ – කුමකට ඔහුට කිපෙනේ?''

මෙසේ තම හට අවවාද කැරැ ගැන්මෙනුත් කෝපය තොසන්සිඳේ නම් ඉක්බිති තමා ගේ ද, සතුරා ගේ ද කම්සවකතාව සලකා සන්සිඳුවා ගත යුතු ය. එසින් තමා ගේ කම්සවකතාව සලකන්නේ මෙසේ ය:- 'එම්බා! තෝ ඔහුට කිපී කුමක් කරන්නෙහි ද, තගේ මේ වෙෂ මූලක කම්ය තට ම අනථ පිණිස වන්නේ තෝ වේ ද, තෝ කම්ය සවකීය කොටැ ඇත්තෙකි, කම්ය දයාද කොටැ ඇත්තෙකි, කම්ය උපපත්තිසථාන කොටැ ඇත්තෙකි, කම්ය බන්ධු කොටැ ඇත්තෙකි, කම්ය පිළිසරණ කොටැ ඇත්තෙකි, තා කරන කම්යට තෝ ම දයාද වන්නෙහි, තගේ මේ කම්ය සම්‍යක් සම්බොධිය හෝ ප්‍රත්‍යෙක බොධිය හෝ ශ්‍රාවක භූමිය හෝ බ්‍රහ්ම භාවය හෝ ශක්‍ර භාවය හෝ චක්‍රවර්ති භාවය හෝ ප්‍රදෙශ රාජ්‍යාදි අතුරෙන් කිසි සම්පත්තියක් හෝ සිද්ධ කැරැ දෙන්නට සමර්ථ ද නැත. වැළි කුමක් කර දෙන්නට සමර්ථ ද, සස්නෙන් චුත කොටැ පියා විඝාසාදදි භාවය හෝ නරකාදි දුක් හෝ සිද්ධ කැරැ දෙන්නට සමර්ථ ය. මේ ක්‍රොධ කරන තෝ දැනින් ගිනි අඟුරු හෝ අසුචි හෝ ගෙනැ අනහට දමා ගසන්නකු වැන්න, පළමු කොටැ තමා ම පලහා ලන්නෙහි ය. දුගඳ කැරැ ලන්නෙහි ය මේසේ තමාගේ කම්සවකතාව සැලකිය යුතු ය. සලකා ඉක්බිති අන්‍යයාගේ කම්සවකතාව සැලකිය යුතු ය.

ඒ මෙසේ ය:- 'හේ කිපි තට කුමක් කරන්නේ ද, ඔහුගේ කිපුම ඔහුටම ය අනථ පිණිස වන්නේ, හෙ ද තා සේම කම්සවකය, කම්දයාදය, කම්යොනිය, කම්බන්ධු ය, ඔහුගේ කම්ය ඔහුට බුදු-පසේබුදු- බුදුසැව් පදවි හෝ බ්‍රහ්ම – ශක්‍ර – චක්‍රවර්ති – ප්‍රදෙශ රාජ්‍යාදි සම්පත් හෝ සිද්ධ කැරැ දෙන්නට සමර්ථ ද නැත. හුදෙක් ශාසනයෙන් බැහැරැ කොටැ පියා විඝාසාදදි භාවය හෝ නරකාදි දුක් හෝ සිද්ධ කැරැ දෙන්නට ය සමර්ථ. තට මේ නපුර කරන හේ උඩු සුළඟට දූලි ගසා ලන්නකු සේ තමාට ම දුක් පමුණුවා ගන්නේ ය. බුදුහු ද මේ වදලෝ ය.

''යො අපපදුට්ඨස්ස නරස්ස දුස්සති
සුද්ධස්ස පොසස්ස නිරඞ්ගණස්ස
තමෙව බාලං පචෙති පාපං
සුඛුමො රජො පටිවාතං ව ඛිත්තො''[1] යි.

---

[1]ධ: ප: පාපවගග 12

'යමෙක් තමහට හෝ අන්හට හෝ වෙෂ නො කරන නිකෙලෙස, නිරපරාධ පුරුෂයකු හට වෙෂ කෙරේ නම් උඩු සුළඟට ලූ සියුම් දූවිල්ල සේ පාපය අඥන වූ ඔහු කරා ම පෙරළා එන්නේ ය'

මෙසේ ක්ෂාන්තිකථා සැලකීමෙනුදු නො සන්සිඳේ නම් ඉක්බිති ශාස්තෘන්වහන්සේගේ පූර්ව චරිත ගුණ සැලකීමෙන් වත් සන්සිඳුවා ගත යුතු ය.

ඒ මෙසේ ය:- 'එම්බා තාගේ ශාස්තෘන් වහන්සේ බුදු වන්නට පෙර බොධිසත්ත්ව වැ ම සියුරාසැකි කප් සුවහසක් මුළුල්ලෙහි පාරමී පුරන සේක් ඒ ඒ ජාතීන්හි දී වධකයන් කෙරෙහිත් සතුරන් කෙරෙහිත් සිත දූෂ්‍ය නො කළ සේක් නො වේද්ද, බලව.

සීලව ජාතකයෙහි:- සිය දෙවියට වරද කළ දුෂ්ට ඇමැතියා විසින් ගෙන්වා ලූ සතුරු රජා තුන්සිය යොදුන් රාජ්‍යය පැහැරගනුත් ඒ වළකන්නට නැඟී ආ ඇමැතියනට ආයුධයක් අල්ලන්ට ද නුදුන් සේක. නො දී දහසක් ඇමැතියන් සමග අමුසොහොතේ කර වටක් බිම සිටුවා පස් ගසන ලද සේක් චිත්ත දූෂ්‍ය මාත්‍රයකුදු නො කොටැ කුණප කනු පිණිස පැමිණි සිවල් බල්ලන් ලවා පුරුෂොත්සාහයෙන් පස් බුරුල් කරවා ගෙනැ දිවි ලැබැ යක්ෂානුභාවයෙන් සවකීය සිරි යහන් ගබඩාවේ බැසැ සිරි යහනේ වැදගොත් සතුරු රජා දැක කොපයට නො පැමිණැ ඔවුනොවුන් දිවුට මිත්‍රත්වයේ පිහිටුවා මෙසේ කී සේක—

"ආසිංසෙථෙව පුරිසෝ - න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතෝ
පස්සාම වොහං අත්තානං - යථා ඉච්ඡිං තථා අහු."[1] යි.

'පිරිමියෙක් තම් අභිමතාර්ථ සිද්ධිය ආශංසා කරන්නේ ම ය. නුවණැත්තේ නම් (මෙසේ දුකට පැමිණි පසු සුවයෙක් කොයින් වේ දැ යි) නො කළකිරෙන්නේ ම ය යම් ආකාරයෙකින් කිසිවකුහට පීඩා නො කොටැ රජයෙහි පිහිටුවීමට මම් කැමැති වීම් ද ඒ ආකාරයෙන් ම මම් දකිමි' යනු අර්ථ යි.

ක්ෂාන්තිවාදී ජාතකයෙහි:- නුවණ නැති කසි රජ 'මහණ නො කිනම් වාදී දැ' යි පුළුවුත් කල 'මම ක්ෂාන්ති වාදීමි' යි කී කල කටු සැම්පියෙන් තලා අත් - පා කපතුදු කොප මාත්‍රයක් නො කළ සේක.

මහලු කවුසෙක් වැ එසේ කෙළේ ය. යනු ආශ්චර්‍යයෙක් ද, **චුල්ලධම්මපාල ජාතකයෙහි:**- උඩු බැලිවැ හෝනා ළදරුවා ද

'මුළු පොළොවට හිමි
දහම්පල් කුමරුගෙ මේ
සඳුනලෙව් අත් සිදැ ලති
මා පණ නැසෙයි නිරිඳුනි' යි

---

[1] ජා. පා: එකකනි: 10

ක්‍රියමින් සිය මැණියන් වලපිද්දී, **මහාප්‍රතාප** නම් පිය නිරිඳුන් හුණ කිළිල් සේ සිය අත් පා සිඳ ලවද්දී, එතෙකිනුදු සතුටු මඳ වැ 'මුගේ හිස සිඳුව' සි අණ දුන් කල **'ඛම්පාලය!** දැන් ය තාගේ සිත නිගන්නට කල. එම්බා! හිස සිඳින්නට අණ ලූ පියාණන් කෙරෙහි ද, **හිස** සිඳිනා වධකයා කෙරෙහි ද, වලප්නා මැණියන් කෙරෙහි ද, තා කෙරෙහි ද, සමසින් වව' සි දැනි වැ ඉටා ගෙනැ දූෂිත මාත්‍රයකුදු නො කළසේක.

මනුෂ්‍ය වැ සිට මෙසේ කෙළේ ය යනු ආශ්චය්‍යයෙක් ද, නිරිසන් කල **ජදදනන** නම් ඇත් රජ වැ විස පෙවූ ශරයෙන් නැඹ විදුතුදු එසා අනර්ථකාරී වැදි කෙරෙහි ද චිත්ත දූෂ්‍ය නො කළ සේක.

කීයේ මැ සි.

විස පෙවූ හියෙන් විදුනා ලද **සඳන්** ඇ තා
මදකුදු නො කිපි විදි වැදිගෙන් මෙ පිළිවි කා
'කුම්කට මිතුර විදියෙ ද, මට මෙ ලෙස මෙ තා
කවුරුන් දුන් ද මෙ නියෝ තට කුමක් ප තා'

සි ඇසූ කල 'හිම්! **කසී** රජ මෙහෙසි විසින් ඔබ දළ සඳහා එවන ලද්දෙමි' සි කී කල ඔහු ගේ මනදෙළ පුරමින් සවකක් රස් විහිදෙන--දිලි දිලී බබලන සිය දළ **කපා** දුන්සේක.

කපි ජාතකයෙහි:- වඳුරු රජ වැ තමන් විසින් ම පළිත ප්‍රපාතයෙන් නගාලූ පුරුෂයා

'වෙන වනමුවන් සේ – මෙද මිනිසුන්ගෙ බොජුන ය,
සසින් පෙළෙමි මෙ වඳුරු – මරා කෑයෙ නම් සොඳුරා,
මුගෙ මිසින් අසිත වැ – සෙසු මස් සම්බලට ගෙනැ
කතර එතර කරම් මම් – ඒ මට මං උවාරණ'

සි සිතා ගලින් ඇනැ හිස පැළැ කල **කදුලු** පිරැණු ඇසින් ඔහු දසා බලා

'පින්වත! ඔබ මගේ – හිම් වැ ද මට කෙළෙ මෙසේ
කල යුතු වූයෙ දිහා! – අනුන් මෙසින් වැලකුම ය'

සි කියා ඔහු කෙරෙහි සිත දූෂ්‍ය නො කොටැ තමන්ගේ ද දුක නො සලකා ඔහු ක්ෂෙම භූමියට පැමිණවූ සේක.

භූරිදත්ත ජාතකයෙහි:- භූරිදත්ත නම් තා රජ වැ පෙහෙවස් ඉටා **තුඹස** මත හෝතා කල කප් ගිනි බදු ඔසුයෙන් මුළු සිරුර ඉසිතුදු පේළායෙහි ලා මුළු දඹදිව කෙළවතුදු **ඒ ආලම්බන** නම් බමුණා කෙරෙහි චිත්ත දූෂ්‍ය මාත්‍රයකුදු නො කළ සේක.

කීයේ මැ සි:-

'පේළායෙහි ලතුදු – අතින් මුළු ඇඟ මඩුතුදු
සිල් කැඩෙතී යන බියෙන්-අලමුනු කෙරෙහි නොකිපෙමි' සි

චමෙපය්‍ය ජාතකයෙහිදී- චමෙපය්‍ය නම් තෘ රජ වැ අභිතුණ්ඩිකයා විසින් පෙළනු ලබන සේක් සවල්ප වූ ද චිත්ත දූෂ්‍යයකට නො පැමිණි සේක

කියේ මෑ සි:-

'එදු ද මා පෙහෙ වෑ - සිල් රක්නා කල නොසින්
අභිතුණ්ඩික මා ගෙකැ - රජ මැදුර මැද කෙළවා.
නිල් - රන් - රතු - සුදු - මදෙට ඇය පැහැයක්
හේ රිසි වූ යෙ ද එසේ - වන්නෙම් ඔහු සිතු ලෙසට
මම් කිපියෙම් නම් - ගෙඩ දිය, දිය ගෙඩ කරම්
මේ මුළු පොළොව සැණෙකින් - හළු කැරැ ලම් තෙදෙන් මගෙ
එසේ කෙළෙ නම් මම - සිලයෙන් පිරිහෙන්නේ
සිලයෙන් පිරිහුණු කල - බුදු බව නොම ලැබෙන්නේ'

සඞ්ඛපාල ජාතකයෙහිදී- සඞ්ඛපාල නම් නාග රජ වැ තියුණු තෙඛින් අට තැනෙක විද්ද පියා විද්ද පූ මුඛයෙහි කටු සහිත වේවැල් බහා ලා නැහැය විද්ද තද රැහැනක් දමා ලා නොජ පුතුන් සොළොස් දෙනා කද බැඳ ගෙනැ යන කල්හි බර වැඩි බැවින් සිරුර පොළොවේ ගැටෙන් ගැටෙන් තද වේදනා ඇති කල්හි කිපී බැලූ පමණෙකින් ඒ සියල්ලන් හළු කැරැ ලන්ට පොහොසත් වුව ද ඇස දල්වා බලා වෙෂ මාත්‍රයකුදු නො කළ සේක.

කියේ මෑ සි:-

'තුදුස් පසළොස් වක - පෙහෙවස් වසම් නිරතුරු
වැදි පුත්හු සොළොස් දෙන - රැහැන් ලෙ ගෙනැ ආවෝ
නැහැය විද්ද ලා මගෙ - රැහැන ලා ඇරැ ගෙනැ ගියෝ
එ සා දුක් මම ඉවසම් - ඉටා ගත් සිල් නො නසම්

මේතෙක් ද **මාතුපොසක** ජාතකයෙහි තව ද නොයෙක් අසිරිමත් දේ කළ සේක. දැන් සම්‍යක්නාඥනයට පැමිණ දෙවියන් සහිත ලොකයෙහි කිසිවකු හා අසමාන ක්ෂාන්ති ගුණ ඇති ඒ භගවත් ශාස්තෘන් වහන්සේ අදහන තා ඒසින් ක්‍රෝධ සිතක් ඉපදවීම ඉතා ම අයුතු ය, නුසුදුසු ය.

මේසේ ශාස්තෘන් වහන්සේ ගේ පූජ්‍ය චරිත ගුණ සිහි කරතුදු බොහෝ කලක් කෙලෙසුනට දාස වූ ඔහුගේ ක්‍රෝධය නො සන්සිඳේ නම් **ඉක්බිති අනමතග්ගිය** සූත්‍ර සිහ කළ යුතු.

ඒ මෙසේ ය:-

"න සො භික්ඛවෙ සත්තො සුලභරූපො යො න මාතා භූතපුබ්බො-යො න පිතා භූතපුබ්බො-යො න භාතා-යා න භගිනී-යො න පුත්තො-යො න ධීතා භූතපුබ්බා"[1] 'මහණෙනි! පෙර මේ පියන් නො වූ, සහෝදර සහෝදරී නො වූ පුත්‍ර දුහිතෘ නො වූ සත්ත්වයෙක් ලැබ ගත හැකි නොවේ' යයි බුදුහු වදාළහ. එ බැවින් මේ පෙර මට මේ වූ වැ දස මසක් කුසින් උපුලා මළ මූ

[1] සං: නි: අනමතග්ග සං: 266

සෙම්-සොටු ඇ සඳුන් සේ නො පිළිකුල් වැ පහ කරමින් ළෙහි ලා තටවමින් ඇකයෙන් වඩා ගෙතැ පොෂණය කෙළේ ය. පිය වැ අජපථ සංකුපථාදියෙහි ගොස් වෙළඳුම් කරමින්, මා නිසා දිවි ද නො තකා යුද බිම් වැද යුද කෙරෙමින්, නැවින් මුහුදු යමින්, තව ද නොයෙක් සිය ගණින් දුෂ්කර ක්‍රියා කරමින් 'පුතු රැක ගනිමි' සි නොයෙක් උපායයෙන් ධන රැස් කෙරෙමින් මා පොෂණය කෙළේ ය. සහෝදර-සහෝදරී වැ පුත්‍ර-දුහිතෘ වැ මේ සැටියෙන් උපකාර කෙළේ ය. ඔහු කෙරෙහි සිත දූෂ්‍ය කැරැ ගැන්ම නුසුදුසු ය සි සිතා ක්‍රොධ සන්සිඳුවා ගත යුතු.

එසේත් සිත නො නිවේ නම් මෙත්තානිසංස සිහි කළ යුතු ය. ඒ මෙසේ ය:- එම්බා! බුදුන් විසින් **"මෙත්තාය භික්ඛවෙ චෙතොවිමුත්තියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය එකාදසානිසංසා පාටිකංඛා, කතමෙ එකාදස? සුඛං සුපති, සුඛං පටිබුජ්ඣති, න පාපකං සුපිනං පස්සති, මනුස්සානං පියොහොති, අමනුස්සානං පියොහොති, දෙවතා රක්ඛන්ති, නාස්ස අග්ගිවා විසංවා සත්ථං වා කමති, තුවටං චිත්තං සමාධියති, මුඛවණ්ණා විප්පසීදති, අසම්මුළ්හො කාලං කරොති, උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගොහොති"**[1] සි මෛත්‍රියෙහි අනුසස් වදාළේ නො වේ ද, ඉදින් තෝ සිත නො සන්සිඳුවා ගන්නෙහි නම් මේ අනුසස් වලින් බැහැර වන්නෙහි ය.

මෙසේ මෙත්තානිසංස සිහි කොට ත් සිත නො නිවේ නම් ධාතු විනිර්භොගය කට යුතු ය. ඒ මෙසේ ය:- 'එම්බා! තෝ ඔහුට කිපෙමි' සි කියා කුමකට කිපෙන්නෙහි ද, කිම කෙසට කිපෙන්නෙහි ද, නැත. ලොමට කිපෙන්නෙහි ද, නියට කිපෙන්නෙහි ද, -පෙ- මූත්‍රයට කිපෙන්නෙහි ද, එසේ ත් නො වේ නම් ඒ කෙස් ආදියෙහි පවත්නා පෘථ්වීධාතුවට කිපෙන්නෙහිද, අබ්ධාතුවට කිපෙන්නෙහි ද. තෙජෝ ධාතුවට කිපෙන්නෙහි ද, වායු ධාතුවට කිපෙන්නෙහි ද සකාය පස ද, ආයතන දෙලොස ද. ධාතු අටලොස ද නිසා පවත්නා හට මේ නම් ඇත්තෙකැයි නියති. කිම? තෝ එයින් රූපස්කන්ධයට කිපෙන්නෙහි ද, නැත හොත් වේදනා සකන්ධයට කිපෙන්නෙහි ද, සංඥා - සංඝකාර - විඤ්ඤාන සකන්ධයට කිපෙන්නෙහි ද, කිම තෝ චක්ඛායතනයට කිපෙන්නෙහි ද, -පෙ- ධම්මායතනයට කිපෙන්නෙහි ද, කිම තෝ චක්ඛු ධාතුවට කිපෙන්නෙහි ද, -පෙ- මනො ධාතුවට - ධම්ම ධාතුවට - මනොවිඤ්ඤාණ ධාතුවට කිපෙන්නෙහි ද, මෙසේ ධාතු විනිර්භොගය කරත් හිදී අඟැ අබ සේ අහසැ සිත්තම සේ ක්‍රොධයට ප්‍රතිඝා සථානයෙක් නො වන්නේ ය.

---

[1] අ: නි: එකාදසමනි: 1103

ධාතු විනිර්භෝගය කරන්නට බැරියා විසින් දැන සංවිභාගය කට යුතු. තමා සතු දේ ඔහුට දිය යුතු. ඔහු සතු දේ තමා ගත යුතු. ඉදින් ඔහු ගේ ආජීවය අපිරිසිදු නම් ඔහු අයත් පිරිකර පරිභෝගයට නුසුදුසු ය සි සිතේ නම් තමා සතු දේ ම ඔහුට දිය යුතු. එසේ කරත් එකාන්තයෙන් ඔහු කෙරෙහි පැවති ක්‍රෝධය සන්සිඳෙන්නේ ය. ඔහුගේ ද ජාත්‍යන්තයේ පටන් පැවත එන ක්‍රෝධයක් වුව ද එකෙණෙහි ම සන්සිඳෙන්නේ ය.

'පෙර **සිතුල්පව්** වෙහෙර පිණ්ඩපාතික සථවිර කෙනෙක් වූහ. අන්‍ය සථවිර කෙනෙකුන් විසින් ඔහු තුන් වරක් සෙසසුනින් නෙරපන ලදහ. ඔහු කඹවනු අටක් වටනා පාත්‍රයක් ගෙනවුත් 'සවාමීනි! මෙය මගේ මෑණියන් විසින් මට දෙන ලද්දේ ය. ධාම්මික ලාභයෙකි. මෑණියන්ට පින් පිණිස මේ ගත මැනවැ' සි කියා ඒ අර සථවිරයන්ට දුන්හ. ඔවුන්ගේ ක්‍රෝධය එයින් සන්සිඳිණි. **දිමෙහි ආනුභාව මහති.**

වදාළේ මැ සි.

"අදණ්ඩදමනං දණ්ඩං - දණ්ඩං සබ්බත්ථ සාධකං
දණ්ඩෙන පියවාචාය - උත්තමත්තෙ නමත්තෙ ච" සි.

'දණ්ඩය නො දමුණුවන් දමනය කරන්නේ ය. සියලු අර්ථ සිද්ධ කරන්නේ ය. දණ්ඩයෙන් ද ප්‍රිය වචනයෙන් ද දැයකයෝ උසස් වෙති. ප්‍රතිග්‍රාහකයෝ යටත් වෙත්.

මේසේ ක්‍රෝධය සන්සිඳෙන් ප්‍රිය-අතිප්‍රිය-සහාය-මධ්‍යස්ථයන් කෙරෙහි මෙන් ඒ වෛරී පුද්ගලයා කෙරෙහි ද සිත මෛත්‍රී වශයෙන් පවතී. එවිට ඔහු පුන පුනා මෙත් කොටැ සීමසම්භෙදය කළ යුතු. තමා කෙරෙහි ද, ප්‍රියයා කෙරෙහි ද, මධ්‍යස්ථයා කෙරෙහි ද සම සිත් ඉපදවීම සීමසම්භෙදය සි.

එහි ලක්ඛණ මෙසේ ය:- තෙමේ ය, ප්‍රියයා ය, මධ්‍යස්ථයා ය, සතුරා ය යන සිව් දෙන එක් තැනෙක වසති. සොර මුලෙක් එහි අවුත් 'මෙයින් එකකු අපට දෙව' සි මෛත්‍රී භාවකයාගෙන් ඉල්ලති. 'කුමට දෑ' සි ඇසූ කල 'මරා ගෙල ලේ ගෙනැ බිල්ලට දීමට ය' සි කියති. එවිට ඔහුට 'අසුවලා ගෙනැ යෙත්වා' සි සිතුණේ නම් සීමසම්භෙදය කෙළේ නො වේ. 'මා ගෙනැ යෙත්වා මොවුන් ගෙනැ නො යෙත්වා' සි සිතුණේ නම් එවිට ද සීම සම්භෙදය කෙළේ නො වේ. කුම් හෙයින් ද, 'යමකු ගෙනැ යෙත්වා' සි සිතුණේ නම් ඔහු කෙරෙහි අභිතෙසී ය. සෙස්සන් කෙරෙහි හිතෙසී ය. ඉදින් සතර දෙනා අතරෙන් එකකුදු දිය නො හැකි ය සි සිතුණේ නම්, තමා ආදි සතර දෙනා කෙරෙහි ම සම සිත් නම් එවිට සීමසම්භෙදය කෙළේ වේ.

කියේ මෑ යි පෞරාණිකයන් විසින්:-

"අත්තනි හිත මජ්ඣත්තෙන - අහිතෙ ච චතුබ්බිධෙ
යදුපස්සති නානත්තං - හිතවිත්තෙනා ච පාණිනං
න නිකාමලාභී මෙත්තාය - කුසලීති පවුච්චති.

යදා චතස්සො සීමායො - සම්භින්නා හොන්ති භික්ඛුනෝ
සමං ඵරති මෙත්තාය - සබ්බං ලොකං සදෙවකං
මහාවිසෙසෝ පුරිමෙන - යස්ස සීමා න ඤායති" යි.

'යමෙක් යම් කලෙක තෙමේ ය, හිතවතා ය, මැදහත් වූයේ ය, සතුරා ය යන සතර දෙනා කෙරෙහි 'මේ මම ය, මේ හිතවත් ය' යනාදි වශයෙන් වෙසෙස දක්නේ ද, හේ එකල සත්ත්වයන් කෙරෙහි හිත සිත් ඇත්තෙකැ' යි කිය යුතු ය. නියම මෛත්‍රී ලාභියෙක සාතිශය කුසල් ඇතියෙකැයි නො කිය යුතු ය.

යම් කලෙක ඔහු විසින් යථොක්ත සතර සීමා බිඳින ලද ද, එකල හේ දෙවියන් සහිත ලොකයෙහි සමසේ මෙත් පතුරුවන්නේ ය. යමකුට මේ මමය මේ හිතවත් ය යනාදි වශයෙන් සීමා නො හැඟේ ද හේ පූර්වයාට වඩා මහත් භාවනා විශෙෂ ඇත්තෙක් වන්නේ ය, යනු අර්ථ යි.

මෙසේ සීමාසම්භෙදය ලබන්නා වූ ඒ යොගි නිමිත්තා ද උපචාර ද ලැබුයේ වේ. ('මිහි වනාහි තියුණු කමටහන් ආදියෙහි මෙන් උද්ග්‍රහ නිමිති වත්, ප්‍රතිභාග නිමිති වත් වැටහෙන්නේ නො වෙයි. යථොක්ත සීමාසම්භෙදය ම නිමිත් වැනි හුයි නිමිත්ත නම් වේ. ඒ සීමාසම්භෙදය නිමිත් ලද කල භාවනාව සානිසය වන බැවින් නීවරණයෝ ද විෂ්කම්භිත වෙති. ක්ලෙස්හු ද සන්සිඳෙන ලද්දාහු වෙති. උපචාර සමාධින් සිත ද සමාහිත වෙයි.' යනු සත්තයි.) සීමාසම්භෙදය ලත් කල ඒ නිමිත්තම සෙවුනේ වඩන්නේ බිහිලි කරන්නේ නිරායාසයෙන් පඨවිකසිණයෙහි කී පරිදි අර්පණාවට පැමිණෙන්නේ ය' මෙ තෙකින් ඒ යොගි පඤ්චාඞ්ග විප්‍රහීණ, පඤ්චාඞ්ග සමන්විත, ත්‍රිවිධ කල්‍යාණයෙන් හා දශ ලක්ෂණයෙන් යුක්ත මෛත්‍රී භාවනා ප්‍රථම ධ්‍යානය ලැබුයේ වේ. ලැබූ ඒ නිමිත්ත ම සෙව්මින් වඩමින් බිහිලි කරමින් පිළිවෙළින් චතුෂ්කනය පරිදි ද්විතීය - තෘතීය ධ්‍යානයන්ට ද, පඤ්චකනය පරිදි විතීය - තෘතීය - චතුර්ථ ධ්‍යානයන්ට ද පැමිණෙන්නේ ය. ප්‍රථම ධ්‍යානාදීන් අතුරෙන් කිසියම් ධ්‍යානයෙක සිටැ "මෛත්‍රී සහිත් එක් දිශාවක් පතුරුවා වසන්නේ ය. එසේම දෙවන - තෙවන - සතර වන දිශා ද උඩ යට සරස ද සියලු තන්හි සර්වාත්මතායෙන් සර්වත් ලොකය විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ අව්‍යාපජ්ජ වූ මෛත්‍රී සහගත සිතින් පතුරුවා වසන්නේ ය" මේ විකූර්ඛණය ලැබෙන්නේ ප්‍රථම ධ්‍යානාදි වශයෙන් අර්පණාප්‍රාප්තයාට ම ය. විකූර්ඛණ නම් මෙහි දැක්වූ ඔධිසෝ - අනොධිසෝ මෙන් පැතිරවීම ය.

එහි විස්තාරය මෙසේ ය.

මෛත්‍රී සහගත සිතින් = මෛත්‍රියෙන් යුක්ත වූ සිතින්

එක් දිශාවක් = එක් දිශාවෙක පළමු අරමුණු කළ සත්ත්වයා පටන් ඒ දිශාවෙහි ඇතුළත් සත්ත්වයන් ("තත්‍රසඨයෙහි තදුපචාරයෙන් ඒ ඒ දික්හි සිටි සත්හු යනු සත්තයි.)

පතුරුවා = අරමුණු කොටැ

වසන්නේ ය = බ්‍රහ්ම විහාරාධිෂ්ඨිත ඉරියව් පවත්නේ ය. මෛත්‍රී ධ්‍යානයට සම වැදූ ඉරියව් පවත්නේ ය සි සේ සි.

එසේ දෙවන - කෙවන - සතරවන දිශා ද = නැගෙනහිර ආදීන් අතුරෙන් යම් එක් දිශාවෙක යම් සේ පතුරුවා වසන්නේ ද, එසේ ඊට ඉක්බිති දෙවන දිශා ආදියෙහි ද පතුරුවා වසන්නේ ය.

උඩ ද = මෙයින් දෙව්ලොව, යම් කිසි තැනෙක හෝ තමිහට මතුයෙහි සත්ත්වයන් ගත්හු.

යට ද = මෙයින් නිරය නාගභවනාදි තමිහට යට දිග සත්ත්වයන් ගත්හ.

සරස ද = මෙයින් අනුදිසා ගත්හ. මේසේ අස්මඬුල්ලෙහි අසුමෙන් සියලු දිශාවන්හි මෛත්‍රී සහගත සිත පතුරුවන්නේ ය. මෙසේ එක් එක් දිශා ගැන්මෙන් **ඔඩිසොඵරණ** මෛත්‍රිය දක්වන ලදී. ඔඩිසොඵරණ නම් සීමා වෙන් කොටැ පැතිරවීම ය.

සියලු තන්හි සව්වාත්මතායෙන් සව්වත් ලොකය විපුල වූ මහග්ගත වූ අප්‍රමාණ වූ අවෙර වූ අව්‍යාපජ්ජ වූ මෛත්‍රී සහගත සිතින් පතුරා වසන්නේ ය = මෙයින් අනොඩිසොඵරණ මෛත්‍රිය දක්වන ලදී. එහි දු **'සියලු තන්හි'** යන්නෙන් දික්-දෙශ වශයෙන් ද **'සව්වාත්මතායෙන්'** යන්නෙන් සත්ත්ව වශයෙන් ද අනොඩිසොඵරණය දක්වන ලද සි දත යුතු. අනොඩිසොඵරණ නම් සීමා රහිත වැ පැතිරවීම සි. එහි.

සව්වාත්මතායෙන් යනු 'මේ සවකීය ය මේ පරකීය ය' යන භෙද නැති වැ හීන-මධ්‍යම-උත්කෘෂ්ට වූ ද, මිත්‍ර-වෛරී-මධ්‍යස්ථ වූ ද, සියලු සතුන් කෙරෙහි තමා හා සමත්වයෙන් යන අර්ථ සි. නොහොත් මූළු හිතින් - මදකුදු බැහැර නො ගිය සියලු චිත්ත භාගයෙන් යන අර්ථ සි.

සව්වත් ලොකය = සියලු සත්ත්වයන් ඇති ලොකය.

විපුල වූ = ඵරණ වශයෙන් හෙවත් පැතිරවීම වශයෙන් විපුල වූ

මහග්ගත වූ = භූමි වශයෙන් මේ මහද්ගත සි.

අප්‍රමාණ වූ = ප්‍රගුණ වශයෙන් ද, අප්‍රමාණ සත්ත්වයන් අරමුණු කිරීම් වශයෙන් ද අප්‍රමාණ වූ.

අවෙර වූ=ව්‍යාපාද නමැති සතුරා දුරු කිරීම් වශයෙන් අවෙර වූ.

අව්‍යාපජ්ජ වූ=දෙම්නස් ප්‍රහාණය කරන හෙයින් අව්‍යාපජ්ජ වූ නිදුක් වූ ය සි සේසි. (සිත්හු ව්‍යාපත්ති වශයෙන් ඇතතය කරන හෙයින් දෙම්නස් ව්‍යාපජ්ජ නම් වේ. යනු සත්ත සි.)

'**මෛත්‍රී සහගත සිතින්**' සි නැවත කීයේ 'විපුල වූ' යනාදි පයී‍්‍ය ව විශෙෂණ ගත් හෙයිනි, නොහොත් ඔධිසොඵරණ යෙහි මෙන් 'එසේ' යන පදයක් නො ගත් හෙයිනි. නිගමන වශයෙන් හෝ කියන ලදැ සි දන යුතු. (නිගමන නම් අවශ්‍යත නිශ්චය සි.)

මෙහි මෙන් ම **පවිසම්භිදායෙහි** දැක්වුණු විකුබ්බණාව ද ලැබෙන්නේ අර්හණ ප්‍රාප්තයාට ම ය. **පවිසම්භිදායෙහි** පස් ආකාරයෙකින් අනොධිසොඵරණ මෙත්තා චෙතො විමුත්තිය ද, සත් ආකාරයෙකින් ඔධිසොඵරණ මෙත්තා චෙතො විමුත්තිය ද, දශ ආකාරයෙකින් දිසා ඵරණ මෙත්තා චෙතො විමුත්තිය ද, දක්වන ලද්දේ ය. එසින්

පඤ්චවිධ අනොධිසො ඵරණ මෙත්තා චෙතො විමුත්තිය මෙසේ ය.

1 සියලු සත්ත්වයෝ අවෙර වෙත්වා අව්‍යාපජ්ඣ වෙත්වා අනීඝ වෙත්වා සුව සේ ආත්ම පරිහරණය කරත්වා

2 සියලු ප්‍රාණීහු —පෙ—

3 සියලු භූතයෝ —පෙ—

4 සියලු පුද්ගලයෝ —පෙ—

5 සියලු ආත්මභාව පයී‍්‍යාපන්නයෝ —පෙ— සුව සේ ආත්ම් පරිහරණය කරත්වා.

මෙහි සියලු යන්නෙන් එකඟු දු සේස නො කොටැ ගැන්ම කියා,

සත්ත්වයෝ නම්=රූපාදි සකාඛියන්හි ඡන්දරාග වශයෙන් සක්තයෝ ය විසක්තයෝ ය. ඇළුණෝ යනි සේ සි. "**රූපෙ ඛො රාධ යො ඡන්දො-යො රාගො-යා නන්දි-යා තණ්හා තත්‍ර සත්තො තත්‍ර විසත්තො තස්මා සත්තො ති වුච්චති. වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සංඛාරෙසු -පෙ- විඤ්ඤාණෙසු-වුච්චති**"[1] යනුවෙන් බුදුහු ද මේ වදළෝ ය. අර්ථ සුගම සි. එසේ නම් රහත්හු මෙහි ලා නො ගැනෙත් ද, හුණ පතුරින් කළ චීජනියෙහි ද තල්වැටය යන ව්‍යවහාරය සේ රූඪි වශයෙන් රහත්හු ද ගැනෙති. ව්‍යාකරණකාරයෝ යට කියූ සේ අර්ථ විචාරණ නො කොටැ සත්ත්ව යනු අව්‍යුත්පන්න නාම මාත්‍ර-යෙකැයි කියති. අර්ථ විචාරණය කරන්නෝ සත්ත්වගුණයොග යෙන් සත්ත්වයයි කියත්. සත්ත්ව ගුණ නම් බුද්ධි-වීර්‍ය්‍ය-තෙජස්ස ය.

ප්‍රාණීහු නම් = ජීවත් වන්නෝ ය. ජීවත් වීම නම් ආශ්වාස-ප්‍රශ්වාසයෙන් යුක්ත බව ය.

---

[1]සං: නි: රාධසංයුත්ත 478

කුනඛයෝ නම්=කමී – කෙලඝ දෙකින් උපන්නෝ ය.

පුද්ගලයෝ නම් = නිරයට යන්නෝ ය. 'පුංවුච්චති නිරයෝ තසම්ංගලනත්‍ථි ති-පුඝඛලා.' 'පුං' යි නිරය කියනු ලැබේ. එහි ගලන්නෝ-යන්නෝ පුද්ගලයෝ ය.

ආත්මභාව පඨීාපන්නයෝ = යන මෙහි ආත්මභාව නම් ශරීර යි හෙවත් සකඤ්ඤ පඤ්චක යි. පරමාර්ථ වශයෙන් අවිද්‍යමාන වුවද සම්මුති වසයෙන් විද්‍යමාන බැවින් ඒ ආත්ම භාවයෙහි ඇතුළත් වූවෝ ආත්මභාව පඨීාපන්නයෝ ය.

සත්ත්ව යන වචනය සේ ම සෙස්ස ද රූඪි වසයෙන් සලකා මේ සියලු වචන සියලු සත්ත්වයනට පඨීාය වචන ය යි දතයුතු. තව ද ජන්තු-ජීව ආදි අන්‍ය පඨීාය වචන ඇත ද ප්‍රකට වශයෙන් පවත්නා මේ පස ම ගෙනැ පස් ආකාරයෙකින් අනොධිසෝඵරණ මෙත්තා චෙතෝ විමුත්තිය දක්වන ලදී. ඉදින් යමෙක් සත්ත්ව-ප්‍රාණ යනාදියෙහි වචන මාත්‍ර වශයෙන් නොවැ අර්ථ වශයෙන් ද වෙනස ගන්නට කැමති නම් ඔහුට අනොධිසෝ ඵරණය නොලැබෙන බව දත යුතු. එහෙයින් එසේ වෙනස් අර්ථ නොගෙනැ මේ දැක්වුණු පස් ආකාරයෙන් එකක වසයෙන් අනොධිසෝ මෛත්‍රිය පැතිරවිය යුතු.

මෙහි දු 'සියලු සත්ත්වයෝ අවෛර වෙත්වා' යනු එක් අඛීණාවෙක. 'අබ්‍යාපජ්ඣවෙත්වා' යනු එක් අඛීණාවෙක. (අබ්‍යාපජ්ඣ නම් ව්‍යාබාධ රහිත බව යි.) 'අනීඝ වෙත්වා' යනු එක් අඛීණාවෙක. එබැවින් මේ පද අතුරෙන් යම් යම් පදයෙක් තමහට ප්‍රකට වේ ද, ඒ ඒ පද ගෙනැ මෛත්‍රී පැතිරවිය යුතු. මේ පස් ආකාරයෙහි අඛීණා සතර වශයෙන් අනොධිසෝ ඵරණයෙහි **අඛීණා විස්සෙකැයි** දත යුතු.

සප්තවිධ ඔධිසෝ ඵරණ මෙතතා චෙතෝ විමුත්තිය මෙසේ ය.

1 සියලු සත්‍රිහු අවෛර වෙත්වා. අබ්‍යාපජ්ඣ වෙත්වා. අනීඝ වෙත්වා සුව සේ ආත්ම පරිහරණය කෙරෙත්වා.
2 සියලු පුරුෂයෝ—පෙ—
3 සියලු ආර්‍යයෝ—පෙ—
4 සියලු අනාර්‍යයෝ—පෙ—
5 සියලු දෙවියෝ—පෙ—
6 සියලු මනුෂ්‍යයෝ—පෙ—
7 සියලු විනිපාතිකයෝ අවෛර වෙත්වා. අබ්‍යාපජ්ඣ වෙත්වා. අනීඝ වෙත්වා සුව සේ ආත්ම පරිහරණය කෙරෙත්වා.

මේ ඔධිසෝ ඵරණ පිළිබඳ සත් ආකාරයෙහි සතර සතර වසයෙන් **අඛීණා අට විස්සෙකි.** මෙහි සත්‍රිහු ය පුරුෂයෝ ය යනු

ලිඛිත වශයෙන් කියන ලදී. ආර්‍යයෝ ය අනාර්‍යයෝ ය යනු ආර්‍ය-පෘථග්ජන වශයෙන් කියන ලදී. දෙවියෝ ය මනුෂ්‍යයෝ ය යනු උත්පත්ති වශයෙන් කියන ලදී.

දශවිධ දිසා ඵරණ මෙත්තා චෙතෝ විමුත්තිය මෙසේ ය.

1 පෙර දිග සියලු සත්ත්වයෝ අවෛර වෙත්වා අව්‍යාපජ්ඣ වෙත්වා අනීඝ වෙත්වා සුව සේ ආත්ම පරිහරණය කෙරෙත්වා.

2 පැළදිග සියලු සත්ත්වයෝ -පෙ-
3 උතුරු දිග සියලු සත්ත්වයෝ -පෙ-
4 දකුණු දිග සියලු සත්ත්වයෝ -පෙ-
5 පෙර අනු දිග සියලු සත්ත්වයෝ -පෙ-
6 පැළ අනු දිග සියලු සත්ත්වයෝ -පෙ-
7 උතුරු අනු දිග සියලු සත්ත්වයෝ -පෙ-
8 දකුණු අනු දිග සියලු සත්ත්වයෝ -පෙ-
9 යට දිග සියලු සත්ත්වයෝ -පෙ-
10 උඩු දිග සියලු සත්ත්වයෝ -පෙ-

පෙරදිග සියලු ප්‍රාණීහු -පෙ- සියලු භූතයෝ -පෙ- සියලු පුද්ගලයෝ -පෙ- සියලු ආත්මභාව පර්‍යාපන්නයෝ -පෙ- පැළ දිග ආදිය ද මෙසේ ම ගන්නේ ය.

පෙරදිග සියලු ස්ත්‍රීහු 'සියලු පුරුෂයෝ' 'සියලු ආර්‍යයෝ' 'සියලු අනාර්‍යයෝ' 'සියලු දෙවියෝ' 'සියලු මනුෂ්‍යයෝ' 'සියලු විනිපාතිකයෝ'

පැළ දිග -පෙ-
උතුරු දිග -පෙ-
දකුණු දිග -පෙ-
පෙර අනු දිග -පෙ-
පැළ අනු දිග -පෙ-
උතුරු අනු දිග -පෙ-
දකුණු අනු දිග -පෙ-
යට දිග -පෙ-
උඩ දිග සියලු ස්ත්‍රීහු -පෙ- අවෛර වෙත්වා. අව්‍යාපජ්ඣ වෙත්වා. අනීඝ වෙත්වා සුව සේ ආත්ම පරිහරණය කෙරෙත්වා.

මේ දිසා ඵරණ මෛත්‍රියෙහි 'පෙර දිග සියලු සත්ත්වයෝ' යනාදි නයින් එක් එක් දිසාවෙක්ම විසි-විසි කොටැ **දෙසියයක් ද** 'පෙර දිග සියලු ස්ත්‍රීහු' යනාදි නයින් එක් එක් දිසාවක් අටවිස්ස බැගින් කොටැ **දෙසිය අසූවෙක් ද සි සාරසිය අසූවෙක් අප්‍රමාණ** වෙයි **පටිසම්භිදායෙහි** දක්වූ **සියලු අප්‍රමාණ පන්සිය අට විස්සෙකි.**

මෙ කී අප්‍රමාණ අතුරෙන් යම් කිසිවක වශයෙන් මෙත්තා චෙතෝ විමුත්තිය වඩන යොගී 'සුඛං සුපති' යනාදීන් දක්වන ලද **එකොළොස් ආනිසංස ලබන්නේ** ය.

මෛත්‍රී භාවනායෙහි එකොළොස් ආනිසංස

1 **සුඛං සුපති** = සුව සේ නිදා, ඇතැම් කෙනෙක් ඔබ - මොබ පෙරළෙමින් 'සුරු - සුරු' ගාමින් දුකසේ නිදති. මේ යෝගී එසේ නො වැ සුවසේ නිදා නිදන්නේත් සමවතකට සම වැදුණා සේ නිදයි.

2 **සුඛං පටිබුජ්ඣති** = සුවසේ පුබුදී, ඇතැම් කෙනෙක් තතනමින් හැඬෙමින් පෙරළෙමින් දුකසේ පුබුදිති. මේ යොගී එසේ නො වැ පිපී ගෙතැ එන පියුමක් සේ නිර්විකාර වැ සුවසේ පුබුදි සි.

3 **න පාපකං සුපිනං පස්සති** = නපුරු සිහින නො දකී. සිහිනයක් දක්නේ නම් සෑ වඳනා පුදනා සේ බණ අසනා සේ යහපත් සිහිනයක් ම දක්නේ ය. තවද ඇතැම් කෙනෙක් සොරුන් විසින් පිරිවරන ලද සේ වණ්ඩ සතුන් විසින් ලුහුබඳන ලද සේ ප්‍රපාතයෙහි වැටුණවුන් සේ සිහින දකිති. මේ යොගී එබඳු සිහින නො දකී.

4 **මනුස්සානං පියෝ හොති** = මිනිසුන්ට ප්‍රිය වෙයි. උරෙහි ලූ මුතුහරක් සේ ද, හිස පැළඳි මල් මාලාවක් සේ ද, මිනිසුනට ප්‍රිය මනාප වෙයි.

5 **අමනුස්සානං පියෝ හොති** = විසාඛ තෙරණුවන් මෙන් අමනුෂ්‍යයන්ට ප්‍රිය වෙයි. **විසාඛ** තෙරණුවෝ වනාහි පැළලුප් නුවර කෙළඹියාණ කෙනෙකි. එහි වසන ඔවුන් විසින් 'ලක්දිව සෑ මලින් අලංකෘත ය. කසාවතින් බබළා. රිසි රිසි තැනෙක හිඳා ගන්නට ද නිදන්නට ද හැකිය ඍතු සප්පාය, සේනාසන සප්පාය, පුග්ගල සප්පාය, ධම්ශ්‍රවණ සප්පාය යන සියල්ල මෙහි සුලභ ය' සි අසන ලද්දේ ය ඔහු සිය ඍතු වසතුව දූ දරුවනට පාවා දී එක් කහවණුවක් පමණක් රෙදි කොණ ගැට ගසා ගෙතැ ගෙයින් නික් මැ නැව් තොටට අවුත් නැව එන තාක් මසක් කල් එහි රැඳී උන්හ. තුමූ වෙළඳුමෙහි දක්ෂ බැවින් එක් දෙරෙක බඩු ගෙතැ තව දෙරෙක විකුණමින් ඒ තැනින් බඩු ගෙතැ තව තැනෙක විකුණමින් දැහැමි වෙළඳුමෙන් ම ඒ මස තුළ කහවණු දහසක් උපයා ගත්හ. ඔහු පිළිවෙළින් ලක්දිව් බැස මහා විහාරයට එළඹැ මකණුවම යැදියේ ය. භික්ෂූන් විසින් මහණ කරන පිණිස සීමාවට පමුණුවන ලදුවෝ ඒ දහස බැඳි පියල්ල එකවුරුතු අතුරෙන් බිම හෙළුහ. 'මේ කිමෙක් දෑ' සි ඇසූ කල 'කහවණු දහසෙකැයි' කීවූ හ. 'පින්වත! පැවිදි වූ කල මිළ මුදල් විචාරණය කරන්නට නො පිළිවන දැන් ම එයට කටයුතු දනුව' සි භික්ෂූහු කීවූ ය. ඔහු **"විසාඛයන්**

පැවිදිවන තැනට පැමිණියෝ හිස් අතින් නො යෙත්ව" යි කහවණු පොදිය සීමා මාලකයෙහි විසුරුවා පියා පැවිදි උපසපුව ලබා පස් වසක් නිස සමාදන් වැ වැසැ උභය මාතෘකා ප්‍රගුණ කොට පවරා තමන්ට සැප කමටිහනක් ගෙතැ එක්-එක් වෙහෙරැ සිව් සිව් දිසා සමවත් ප්‍රරම්භ් හාසුරුණෝ ය. එසේ හැසිරෙන උන්වහන්සේ එක්තරා රමණීය වන ලැහැබක් දැකැ ඊ රුක්මූලෙක සමවතට සමවැදැ සමවතින් නැගී සවකීය ගුණ ආවර්ජනයෙන් ලත් ප්‍රීති සෞමනස්‍යයෙන් මෙසේ උදන් ඇනුහ.

'උපසපුව ලද තැන් - පටන් මේ තැනට එන තෙක්
මා කළ කිසි වරද නැති - නිදුක! තට විය වාසිය'

ඔහු සිතුල්පව් වෙහෙර යන්නෝ දෙමං සන්ධියකට පැමිණැ 'ඔය මේ දෙ හෝ මේ දෙ හෝ' යි සිතමින් සිටියහ. පව්වෙහි වසන දෙවියා අත දිගු කොටැ 'හිමි මේ මග ය' යි දැක්වී ය. ඔහු ඒ මහින් සිතුල්පව් ගොස් සිවු මසක් ඊ වැසැ 'සෙට උදැසනක් සේ මින් බැහැර යෙමි' යි සිතා නිදි ගත්හ. සක්මන් කෙළවරැ මිණිල රුක වුසු දෙවියා හිණිපෙත මත්තෙහි හිඳැ හඬන්නට වන. තෙරණුවෝ මේ කවරෙක් දැ' යි ඇසූහ. 'හිමි මම මිණිලියා' යි කී ය. කුමට හඬන්නේ දැ' යි විවාළ කල 'ඔබ ගමන් නිසාය' යි කී ය මා මෙහි වසන්නා තොපට කවර ගුණ දැ යි ඇසූ කල 'හිමි! ඔබ මෙහි වසන් අමනුෂ්‍යයෝ ඔවු-නොවුන් කෙරෙහි මෛත්‍රී ලබති. දැන් ඉතින් ඔබ ගිය කලැ ඔවුහු කලහ කෙරෙති නපුරු බස් බෙණෙති' යි කී ය. ඒ අසා තෙරණුවෝ 'ඉදින් මා මෙහි විසීමෙන් තොපට පහසු විසුමෙක් වේ නම් ඒ මැනවැ' යි කියා තව ද සිවු මසක් එහි වැසැ යන්නට සැරසුණහ මිණිලියා තැවත ද හැඬුයේ ය. මේ නියා යෙන් විසාඛ තෙරණුවෝ සිතුල්පව් වෙහෙර මැ වැසැ එහි ම පිරිනිවියහ. මෙසේ මෙත් වඩන යොගී අමනුෂ්‍යයනට ප්‍රිය වන්නේ ය.

6 දෙවතා රක්ඛන්ති = මැණි කෙනෙක් පුතකු මෙන් දෙවියෝ ඔහු රකින්.

7 නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා කමති = මෙත් වඩන යොගීහුගේ සිරුරෙහි උත්තරී උපාසිකාවගේ සිරුරෙහි මෙන් ගිනි නො ගනී සංයුත්ත භාණක චූලලසීව තෙරුන්ට මෙන් විස නො කැවේ සංකිච්ච සාමණේරයන්ට මෙන් සැන් නො වදී. මෙහි ලා ධෙනු වසතුව ද කිය යුතු.

එක් ගව දෙනක් වසුට කිරි දෙමින් සිටියා ය. වැද්දෙක් ඇය දැකැ ඉදිමි යි සිතා, අතින් සරහා පියා දිග මිට ඇති තෙබින් ඇන්නේ ය. තෙබ දෙනගේ සිරුරේ වැදුණු තල් කොළයක්

මෙන් වකුටු විය. ඒ කලි උපචාර බලයෙකින් වූ යේ **නො වේ.** අප්‍පිණා බලයෙකින් වූයේ නො වේ. හුදෙක් වසු **කෙරෙහි** පැවති දැඩි ප්‍රිය සිත් බලයෙන් වූයේ ය. මෛත්‍රිය **මේ** සා මහානුභාව ඇතැ සි දත යුතු.

8 **තුවටං චිත්තං සමාධියති** = මෙත් වඩන්නහුගේ සිත චහා සමාහිත වේ. එහි ලැසි බවෙක් නම් නො වේ.

9 **මුඛවණ්ණා විප්පසීදති** = නැටිටෙන් ගිලිහුණු තල්-ගෙඩියක් සේ ඔහුගේ මුහුණ ඉතා පහන් වේ.

10 **අසම්මූළ්හෝ කාලං කරොති** = මෙත් වඩන්නහුට සිහි මුළා වැ වන මරණයෙක් නැති. නුමුළා වැ මැ නිදි ගත්තා සේ කලුරිය කෙරේ.

11 **උත්තරිං අප්පටිවිජ්ඣන්තෝ බ්‍රහ්මලොකූපගෝ හොති**= ඉදින් රහත් වැ ගන්නට නො හැකි වී නම් නිදා පිබිදියා සේ ගොස් බඹ ලොව උපදින්නේ ය.

මෛත්‍රී භාවනාවෙහි විසතර කථාව නිමියේ සි.

කරුණා භාවනාව

කරුණා බ්‍රහ්ම විහරණය වඩනු කැමති යොගියා විසින් **කරුණා** රහිත බවිනි ආදීනව හා **කරුණා** සහිත බව්හි ආනිසංස හා සලකා භාවනාවට පටන් ගත යුතු. පටන් ගන්නා විසිනුදු පළමු කොටැ ප්‍රිය පුද්ගලාදීන් කෙරෙහි **කරුණා** නො වැඩිය යුතු. කුමක් හෙයින් ද, ප්‍රියයා ප්‍රිය තන්හි ම ද, අනිප්‍රිය යහළුවා අති ප්‍රිය යහළු තන්හි ම ද, මධ්‍යස්ථයා මධ්‍යස්ථ තන්හි ම ද, අප්‍රියයා අප්‍රිය තන්හි ම ද, වෛරියා වෛරී තන්හි ම ද පිහිටන බැවිනි. ලිඛිත විසභාගයන් කෙරෙහි ද, කලුරිය කළවුන් කෙරෙහි ද එසේ ම **කරුණා** නො වැඩිය යුතු සි. අක්ෂේත්‍ර බැවිනි.

"කථඤ්හි භික්ඛවෙ භික්ඛු කරුණා සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. සෙය්‍යථාපි නාම එකං පුග්ගලං දුක්ඛිතං දුරූපෙතං දිස්වා කරුණායෙය්‍ය එවමෙව සබ්බෙ සත්තෙ කරුණායෙ ඵරති"[1] සි විභඞ්ගයෙහි වදළ බැවින් හැමට පළමු වැ මේ කරුණා කළ යුතු ආකාර ඇති ඉතා දුක්පත්-දිළිඳු-සිඳ ලූ අත් පා ඇති වැ කබලක් පෙරට්ටුයෙහි තබාගෙන අම්බලමේක වැද හොත්-අනිත් පසින් පණු කැලින් කා හැලෙන- එහෙයින් ම බැගෑ හඬින් හඬන - පව්කාර බැගෑ මිනිසකු දැකැ 'අහෝ! මේ මිනිසා දුකට පැමිණියේ ය. මොහු මේ දුකින් මුදා ගන්නෙම් ඉතා යෙහෙකැයි **කරුණා** වැඩිය යුතු.

ඉදින් එවැන්නකු නො ලද්දේ නම් සුව විඳින්නා වූ ද පව්කාර පුද්ගලයකු වධ්‍යයකු හා සම කොටැ සිතා **කරුණා** කළ යුතු. කෙසේ ද, බඩු සහිත සොරකු අසු වූ විට රජ 'මොහු මරව'යි

1 වි: ප: අප්පමඤ්ඤා වි: 206

නියෝග කරයි. රජුගෙන් නියෝග ලත් පුරුෂයෝ ඔහු බැඳ ගෙනැ සඬ්ගයෙහි – සඬ්ගයෙහි සිය ගණන් පහර දෙමින් වධ ස්ථානයට ගෙන යති. ඔහු දුටු මනුෂ්‍යයෝ කන – බොන දෑය ද මල්-ගඳ විලවුන් ද, බුලත් ද ඔහුට දෙති. හේ ඒ දුන් දේ කමින්-බොමින් සුව ඇත්තකු සේ හොග ඇත්තකු සේ ගමන් කරයි. එහෙත් කිසිකෙනෙක් මේ සුව ඇත්තෙක. මේ හොග ඇත්තෙකැයි නො සිතති. 'එකාන්නයෙන් මේ දීනයා දැන් මරණයට පැමිණේ. මොහු නගන පියෙන් පියට මොහුට මරණය ළං වන්නේ ය' යි මිනිස්සු ඔහු කෙරෙහි කරුණා කරති. එසේ ම කරුණා කම්ටහන් ගත් යෝගියා විසින් සුව ඇත්තා වූ ද පුද්ගලයා කෙරෙහි කරුණා වැඩිය යුතු. කෙසේ ද, මේ දීනයා දැන් සුවසේ සැදී පැහැදී පස් කම් සුව වළඳනත් තුන්දෙරින් එකෙකිනුදු කළ කුසලයක් නැති බැවින් මේ මතු අපායෙහි අනල්ප දුක් දෙම්-නස් විඳිය' යි මෙසේ ඔහු කෙරෙහි කරුණා වඩා ඉක්බිති ඒ ක්‍රමයෙන් ම ප්‍රිය පුද්ගලයා කෙරෙහි ද, ඉක්බිති මධ්‍යස්ථයා කෙරෙහි ද, ඉක්බිති වෛරියා කෙරෙහි ද, ක්‍රමයෙන් කරුණා වැඩිය යුතු. ඉදින් පෙර කී සේ වෛරියා කෙරෙහි ක්‍රෝධ උපදී නම් මෛත්‍රියෙන් ඒ සන්සිඳුවා ගත යුතු ය.

ඉදින් කළ කුසල් ඇත්තෙක් නම් ඥති – රෝග – භොග – ව්‍යසනාදීන් අතුරෙන් කිසිවකින් යුක්ත ය යි දැක හෝ අසා හෝ එසේත් නැත් නම් 'සසර දුක් නො ඉක්ම වූ බැවින් ඒකාන්නයෙන් දුඃඛිත ම ය' යි සඤ්ඤාකාරයෙන් ම කරුණා කොටැයට කියූ පරිදි තෙමේ ය, ප්‍රිය පුද්ගලය, මධ්‍යස්ථය, වෛරිය යන සිව් දෙනා කෙරෙහි සීමාසම්භේදය කොටැ ඒ නිමිත්ත ම සෙවිමින් බලමින් බිහිලි කෙරෙමින් මෛත්‍රියට කී සේ ත්‍රික-චතුෂ්ක ධ්‍යාන වශයෙන් අප්පණා ලැබිය යුතු.

අඩ්ගුත්තර අටුවායෙහි වනාහි පළමු කොට වෛරී පුද්ගලයා කෙරෙහි කරුණා කළ යුතු බව ද, ඔහු කෙරෙහි සිත මෘදු කොටැ ඉක්බිති දුක්පතා කෙරෙහි ද, ඉක්බිති ප්‍රිය පුද්ගලයා කෙරෙහි ද, ඉක්බිති තමා කෙරෙහි ද කරුණා කළ යුතු බව කියන ලද්දේ ය. ඒ මෙහි දැක්වූ **"දුග්ගතං දුරුපෙතං"** යනාදි පාළි නය හා සම නො වන බැවින් මෙහි කියූ සේ භාවනා කොට සීමාසම්භේදයෙන් අප්පණා වැඩිය යුතු.

මින් මතු ලැබිය යුතු පංචවිධ අනෝධිසෝ ඵරණ දසවිධ දිසා ඵරණ විකුබ්බන ද **"සුඛං සුපති"** යනාදි ආනිසංස ද යට මෛත්‍රියට කී පරිදි මය යි දත යුතු.

කරුණා භාවනායෙහි විභාග කථාවයි.

මුදිතා භාවනාව

මුදිතා බ්‍රහ්ම විහාරය වඩනු **කැමති** යොගීහු විසින් පළමු කොටැ ඒ මුදිතාව ප්‍රියයා කෙරෙහි **හෝ** මධ්‍යස්ථයා කෙරෙහි **හෝ** වෛරියා කෙරෙහි **හෝ** නො වැඩිය යුතු ය ප්‍රියයා ප්‍රිය වූ පමණින් ම මුදිතාවට කරුණු නො වේ. මධ්‍යස්ථ වෛරීන් ගැනැ කියනු ම කවරේ ද, එසේ ම ලිඬග විසභාගයෝ ද, **කාලක්‍රියා** කොළෝ ද මෙයට ක්ෂේත්‍ර නො වෙති. අටුවායෙහි වනාහි සොණඬ සභායයසි කියන ලද අතිප්‍රිය යහළුවා ම මුදිතාවට **කාරණ** වේ. ඒ අතිප්‍රිය යහළුවා මුදිත – මුදිත ම වේ. පළමු කොටැ සිතා සී පසුව කථාවට පටන් ගනී. එහෙයින් ඔහු කෙරෙහි ම පළමු කොටැ මුදිතා වැඩිය යුතු. සුඛිත – මුදිත වූ ප්‍රිය පුද්ගලයකු දැකැ හෝ අසා හෝ 'මේ පුද්ගලයා එකාන්ත යෙන් මුදිත ය. අහෝ ඉතා යෙහෙකැ' යි ඔහු කෙරෙහි හෝ මුදිතා වැඩිය යුතු. **විභඬගයෙහි "කථඤ්ච භික්ඛවෙ යිකඤ්ඤ මුදිතා සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති සෙය්‍යථාපි නාම එකං පුග්ගලං පියං මනාපං දිස්වා මුදිතෝ අස්ස එවමෙව සබ්බා සත්තෙන මුදිතාය ඵරති"**[1] යි වදළේ මේ දෙවනු කී ප්‍රිය පුද්ගලයා සඳහා ය.

ඉදින් ඒ අතිප්‍රිය යහළුවා හෝ ප්‍රිය පුද්ගලයා හෝ අතීතයෙහි සුඛිත වුව ද දැන් දුඃඛිත නම් දුරුපෙත නම් ඔහුගේ අතීත සුඛිත භාවය ම සලකා 'මේ අතීතයෙහි මහා හොග ඇත්තෙක් විය. මහා පරිවාර ඇත්තෙක් විය. නිති ප්‍රමුදිතයෙක් වී' ය යි ඔහු ගේ අතීත මුදිතාකාරය සලකා මුදිතා වැඩිය යුතු.

ඉදින් හේ අතීතයෙහි ද ප්‍රමුදිත නො වී නම් අනාගතයෙහි වත ප්‍රමුදිත තත්ත්වය සලකා 'මේ අනාගතයෙහි සම්පත් ලැබැ ඇතුත් – අසුන් පිට නැගී රන්සිවිගෙහි කැගී ඇවිදින්නෝ ය' යි අනාගත මුදිතාකාරය සලකා මුදිතා වැඩිය යුතු.

මෙසේ ප්‍රිය පුද්ගලයා කෙරෙහි මුදිතා වඩා ඉක්බිති මධ්‍යස්ථයා කෙරෙහි ද, ඉක්බිති වෛරියා කෙරෙහි ද මුදිතා වැඩිය යුතු. අප්‍රමාණ උපදවිය යුතු. ඉදින් වෛරියා කෙරෙහි ද ක්‍රෝධ උපදින්නේ නම් පෙර කී සේ මෙත් වඩා සිත සන්සිඳුවා ගත යුතු.

මෙසේ මේ තුන් දෙනා කෙරෙහි ද, තමා කෙරෙහි ද සම සිත් උපදවා සීමසම්භෙද කොටැ ඒ නිමිත්තා ම **සෙවිමින්** බිහිලි කෙරෙමින් මෛත්‍රියෙහි කී සේ ත්‍රික – චතුෂ්ක ධ්‍යාන වශයෙන් අප්‍රමාණ ලැබ ගත යුතු. එයින් මතු ලැබිය යුතු. පඤ්චවිධ අනොධිසොඵරණ, සප්තවිධ ඔධිසෝ ඵරණ, දසවිධ දිසා ඵරණ යන විකුබ්බණ ද **'සුඛං සුපති'** යනාදි ආනිසංස ද මෛත්‍රී භාවනාවෙහි කී පරිදි ම ය යි දත යුතු.

මුදිතා භාවනායෙහි විස්තර කථාව නිමියේ ය.

---

[1] වි: ප: අපමඤ්ඤා වි: 207

උපෙක්ඛා භාවනාව

උපෙක්ඛා බ්‍රහ්මවිහාරය වඩනු කැමැති යොගී පළමු මෛත්‍රී-කරුණා- මුදිතා යන තුන් තන්හි ලත් ත්‍රික හෝ චතුෂ්ක ධ්‍යාන ඇතියකු ඒය යුතු ය. එසේ ත්‍රික හෝ චතුෂ්ක ධ්‍යාන ලත් ඔහු විසින් ප්‍රගුණ වූ තෘතීය හෝ චතුර්ථ ධ්‍යානයෙන් නැගී "සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා" යි කරනු ලබන **මෛත්‍රීය** සතුන් කෙරෙහි මමත්ව වශයෙන් පවත්නා මෙනෙහි කිරීමක් බැවින් ද, **කරුණාව** දෙම්නසට ආසන්න බැවින් ද, **මුදිතාව** සොම්නස බැවින් ද, ඖදාරික හෙයින් එහි ආදීනව හා **උපෙක්ඛාව** ශාන්ත බැවින් එහි ආනිසංස හා සලකා යම් ප්‍රකෘති මධ්‍යස්ථ පුද්ගලයෙක් වේ නම් ඔහු කෙරෙහි උපෙක්ඛා කිරීම් වශයෙන් භාවනා වැඩිය යුතු. ("මේ සත්ත්ව තෙමේ තමා කළ කම් විසින් පරලොව්හි අය. දැනුදු පරලොවට යෙයි. තොද කළ කම් විසින් ම පරලොව්හි අය පරලොවට යෙයි. ඕ හට තාගේ ප්‍රයොගයෙන් සුවයක් එළවන්නට වත් දුකක් පහ කරන්නට වත් නො පිළිවන. මෛත්‍රී-කරුණාදි විසින් සතුන් කෙරෙහි මමත්වය කිරීම හුදෙක් චිත්තයා ගේ අනෘජු කම්ය වේ. සව් සත්ත්වයන් කෙරෙහි මැදහත් බව සියලු ආර්ය්‍යයන් විසින් ගත් මාගීයැ-අවිරුද්ධ ප්‍රතිපත්තියැ යි මෙසේ ප්‍රතිපක්ෂ ජුගුප්සා මුඛයෙන් මැදහත් බවෙහි වූ ගෞරව-බහුමාන-ආදර ඇත්තහු විසින් උපෙක්ඛා නොමෝ උපදවිය යුතු ය යි සේ යි. මෙසේ සවිශෙෂ කොටැ උපෙක්ඛා එළවා පිළිපදනාහු හට පියොවින් ම උදෑසීන බැවින් සාතිශයයෙන් ම උහු කෙරෙහි මැදහත් බව වෙයි. භාවනා බලයෙන් නීවරණයෝ විෂ්කම්භිත වෙති. කිලෙස්හු සන්සිඳෙනියි දත යුතු යි" යනු සන්න යි.)

ඉක්බිති ප්‍රිය පුද්ගලාදීන් කෙරෙහි ද උපෙක්ෂා වැඩිය යුතු.

"සාථකෙව භික්ඛවෙ භික්ඛු උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. සෙය්‍යථාපි නාම එකං පුග්ගලං නෙව මනාපං න අමනාපං දිස්වා උපෙක්ඛකො අස්ස එවමෙව සබ්බෙ සත්තෙ උපෙක්ඛාය ඵරති"[1] යි විභඞ්ගයෙහි වදාළ බැවින් යට කියූ සේ මධ්‍යස්ථ පුද්ගලයා කෙරෙහි උපෙක්ෂා උපදවා ඉක්බිති ප්‍රිය පුද්ගල, සොණ්ඩසහාය, වෛරී, තමා යන සියල්ලන් කෙරෙහි මධ්‍යස්ථ වශයෙන් සීමාසම්භෙද කොටැ ඒ නිමිත්ත ම සෙවිය යුතු. බැලිය යුතු බිහිලි කළ යුතු. එසේ කරත් - කරත් පඨවි කසිණයෙහි කියූ සේ චතුර්ථ ධ්‍යානය ලැබෙන්නේ ය. මෙහි ලා ප්‍රශ්නයෙකි පඨවි කසිණාදියෙහි තෘතීය ධ්‍යානය උපදවා ගත්තහුට මෙහි චතුර්ථධ්‍යානය උපදවා ගත හැකි ද, නො හැකි ය.

කුමක් හෙයින් ද, අරමුණ සහාග නොවන හෙයිනි.

මෛත්‍රී ආදියෙහි තෘතීය ධ්‍යානය උපදවා ගත්තහුට ම අරමුණු සහාග බැවින් චතුර්ථ ධ්‍යානය ලැබෙන්නේ ය.

---

[1] ම: ප: අපපණ්ණකසුත්ත වි: 208

ඉන් ඔබ්බෙහි ලැබිය යුතු විකුබ්බණ ද, ආනිසංස ද මෛත්‍රියට කී පරිදි ම ය යි දතයුතු.

උපෙක්ඛා භාවනායෙහි විසතර කථාව නිමියේ ය.

සතර බ්‍රහ්ම විහරණයෙහි ප්‍රකීර්ණක කථාව

බ්‍රහ්මොත්තම වූ භගවත් බුදුන් වදාළ මේ සතර බ්‍රහ්ම විහාර මෙසේ දැනැ ඒ පිළිබඳ ප්‍රකීර්ණක කථා ද මතු දැක්වෙන පරිදි දත යුතු.

අර්ථ වශයෙන්

මෙත්තා = "මිජ්ජතීති මෙත්තා-සිනියතීති නි අත්ථෝ" යම් ධර්මයක් සිත සෙනහ කෙරේ ද ඒ මෛත්‍රියයි, (පැරකුම්බා සන්තයෙහි මේ මෙසේ විසතර කෙරෙති. 'සත්ත්වයන් කෙරෙහි ව්‍යාපජ්ජන විසින් රැකෙ බවට ප්‍රතිපක්ෂ වූ හිතකර ප්‍රවෘත්තිය සෙනහ නම් වෙයි. තෘෂ්ණායක වශයෙන් සෙනහය නො වෙයි. හෙ තෙමේ මොහපූර්ඩංගම වූයේ ලොභසවරූප ය. මේ වනාහි අවෙෂ සවරූප වූයේ අලොභසම්ප්‍රයුක්ත වෙයි දත යුතු')

'මිත්තොවා භවා මිත්තසසවා එසා පවත්තීති පි මෙත්තා=මිත්‍රයා කෙරෙහි වූයේ හු යි හෝ මිත්‍රයාගේ මේ ප්‍රවෘත්තිය හු යි හෝ මෛත්‍රි ය (මිත්‍ර බව – මිත්‍ර ගුණය) මෛත්‍රිය යි සේ යි.

කරුණා = "පරදුක්ඛෙ සති සාධූනං හදය කම්පනං කරොතීති කරුණා." මෙරමා දුක් ඇති කල්හි සාධූන්ගේ හෘදය කම්පනය කරන්නේ කරුණා ය. කම්පනය නම් මෙරමා දුක් දැකැ එය බැහැර කරනු කැමැත්තෙන් නො ඉවසීම් වශයෙන් සිතෙහි ඇති වන අන්‍යථාත්වය යි. **"කිණාති වා පරදුක්ඛං හිංසති විනාසෙතීති කරුණා."** = මෙරමා දුක කිණනය කරන්නේ විනාශ කරන්නේ හෝ කරුණා ය. **"කිරයති වා දුක්ඛිතෙසු ඵරණවසෙන පසාරියතීති කරුණා"** = දුක්ඛිතයන් කෙරෙහි පැතිරීම් වශයෙන් කිරණය කරන්නේ – ප්‍රසාරණය කරන්නේ හෝ කරුණා යි.

මුදිතා = "මොදනතීතාය තා සම්පයුත්තෙ, සයං වා මොදති, මොදනමත්තමෙව වා මුදිතා" = යම් ධර්මයක් කරණ කොටැ ගෙන ඒ ධර්මයෙන් යුක්ත වූවෝ මෝදනය වෙත් ද – සතුටු වෙත් ද ඒ මුදිතා ය. තෙමේ හෝ මෝදනය වන්නේ – සතුටු වන්නේ මුදිතා ය. මෝදන මාත්‍රය – සතුටුවීම් මාත්‍රය හෝ මුදිතා ය. (කරණ කාරක, කර්තෘ කාරක, භාවකාරක වශයෙන් කළ විග්‍රහ යි.)

උපෙක්ඛා = "අවෙරා හොන්තූති ආදිව්‍යාපාරප්පහාණෙන මජ්ඣත්තභාවූපගමනෙන ච උපෙක්ඛතීති උපෙක්ඛා" අවෙර වෙත්වා යනාදි ව්‍යාපාර දුරු කිරීමෙන් ද, මධ්‍යස්ථභාවයට පැමිණීමෙන් ද උපෙක්ෂා කරන්නේ උපෙක්ෂා ය.

ලක්ෂණ - රස - පච්චුපට්ඨාන - පදට්ඨාන - සම්පත්ති, විපත්ති වශයෙන්

මෛත්‍රියෙහි **ලක්ෂණය** සත්ත්වයන් කෙරෙහි හිත ආකාරයෙන් පැවැත්ම ය. **රසය** සත්ත්වයන් කෙරෙහි හිත එළවීම ය. **පච්චුපට්ඨානය** වෛර දුරුකිරීම ය. **පදට්ඨානය** සත්ත්වයන් කෙරෙහි මනාපබවයෙන් දැක්ම ය. **සම්පත්තිය** ව්‍යාපාද සංසිඳීමය. **විපත්තිය** සෙනහ උපැද්ම ය.

කරුණායෙහි ලක්ෂණය දුඃඛිත සත්ත්වයන් ගේ දුක් දුරු කරන ආකාරයෙන් පැවැත්ම ය. (දුක් දුරු වේ වා නො වේ වා ඒ **කරුණු** නො වේ.) **රසය** මෙරමා දුක් නො ඉවසීම ය. **පච්චුපට්ඨානය** අවිහිංසාව ය. **පදට්ඨානය** දුකින් පෙළුණුවුන්ගේ අසරණ බව දැක්ම ය. **සම්පත්තිය** විහිංසා සංසිඳවීම ය. **විපත්තිය** ශොක උපැද්ම ය. (කරුණා මුඛයෙන් ශොකය වංචා කෙරේ.)

මුදිතායෙහි ලක්ෂණය ප්‍රමොදය හෙවත් පරසම්පත්තියෙහි සතුටු වීම ය **රසය** ඊර්ෂ්‍යා නොකිරීම ය. **පච්චුපට්ඨානය** පර-සම්පත් අධිකුශලධම්, පත්සෙනාසන යන මෙහි නො ඇලුම නැති කිරීම ය. **පදට්ඨානය** සත්ත්වයන්ගේ සම්පත්ති දැක්ම ය. **සම්පත්තිය** අරතිසංසිඳවාලීම ය. **විපත්තිය** ගෙහසිත පෙම වශයෙන් හමී උපැද්ම ය.

උපෙක්ෂායෙහි ලක්ෂණය සත්ත්වයන් කෙරෙහි මධ්‍යස්ථාකාර-යෙන් පැවැත්ම ය. **රසය** ප්‍රියාදි හෙද ඇති සත්ත්වයන් කෙරෙහි සමභාවයෙන් දැක්ම ය. **පච්චුපට්ඨානය** ප්‍රතිඝ, අනුනය සංසිඳවීම ය **පදට්ඨානය** 'සත්වයෝ කම්ස්සකයෝ ය. ඔව්හු කවරකුගේ රුචි-යෙන් සුඛිත හෝ වෙත් ද, දුකින් හෝ මිදෙත් ද, පැමිණි සැපතින් හෝ නො පිරිහෙත් ද' යි මෙසේ **කම්ස්සකතා** දැක්ම ය. **සම්පත්ති** ප්‍රතිඝ-අනුනය සංසිඳවීම ය. **විපත්තිය** ගෙහසිත වූ අඥාන උපෙක්ෂාව උපැද්ම ය. (උපෙක්ෂා සහගත මොහය අඥානොපෙක්ෂා නම)

සාධාරණ, ආවෙණික ප්‍රයෝජන වශයෙන්

විදර්ශනා සුඛය හා භව සම්පත්තිය මේ සතර බ්‍රහ්මවිහාරයන් ගේ **සාධාරණ** ප්‍රයෝජනය යි. ('මිහි දිටඨ ධම්මසුඛ විහාරෝ' යනුදු **සාධාරණ** ප්‍රයෝජන වකතව්‍ය යි. 'සුඛං සුපති' යනාදි එකාදසානි සංසයෝ වතාහි යට ගෘහිත බැවින් මේ කැන නො ගන්නා ලදහු යනු සන්නසි) ව්‍යාපාදාදිය දුරු කිරීම **ආවේනික** ප්‍රයොජනය යි.

ඒ එසේ මැසි:- මෛත්‍රියෙහි **ආවේනික** ප්‍රයොජනය ව්‍යාපාද දුරු කිරීම ය. කරුණායෙහි **ආවෙනික** ප්‍රයොජනය විහිංසා දුරු කිරීම ය. මුදිතායෙහි **ආවෙනික** ප්‍රයොජනය අරති දුරු කිරීම ය. උපෙක්ෂායෙහි **ආවෙනික** ප්‍රයොජනය අරති රාගය දුරු කිරීම යි. (**ආවේනික** ප්‍රයොජන නම් වෙන් වෙන් ප්‍රයොජන ය.)

වදලේ මැ යි.

"නිස්සරණං හෙතං ආවුසො ව්‍යාපාදස්ස යදිදං මෙත්තා චෙතො විමුත්ති, නිස්සරණං හෙතං ආවුසො විහෙසාය යදිදං

කරුණා චෙතෝ විමුත්තිං, නිස්සරණං හෙතං ආවුසෝ අරතියා යදිදං මුදිතා චෙතෝ විමුත්තිං, නිස්සරණං හෙතං ආවුසෝ රාගස්ස යදිදං උපෙක්ඛා චෙතෝ විමුත්තිං"[1] යි. අථ සුබෝධ යි.

ආසන්න - දූර සතුරු වශයෙන්

සතර බ්‍රහ්ම විහාර අතුරෙන් එක් එක් බ්‍රහ්ම විහරණයට ආසන්න සතුරු ය, දූර සතුරුය යි සතුරෝ දෙදෙනෙකි

කිසියම් පුරුෂයකු හට ආසන්නයෙහි හැසිරෙන සතුරු මෙන් මෛත්‍රී බ්‍රහ්ම විහරණයට රාගය ආසන්න සතුරු ය. මෛත්‍රීය හා රාගය ගුණ දැක්මෙහි ලා සමාන බැවිනි. ('එහි මෙත් තොමෝ දුත-ප්‍රිය වචන ආදි ශීල-ශ්‍රුතාදි ගුණග්‍රහණ වශයෙන් පවත්නී. රාගය ද යම්කිසි පරිද්දෙකින් ගුණග්‍රහණ මුඛයෙන් ම පවත්නි. එහෙයින් ගුණදර්ශනයෙන් සහාග බැවින් මිත්‍රමුඛ සතුරකු මෙන් තුල්‍යාකාරයෙන් දර්ශනය කෙරේ' යනු සත්‍ය යි) එ රාග සතුරු සවල්ප වූ ද සිහිමුළාවෙකින් මෛත්‍රීය දුරුකොටැ ඒ අරමුණ ගන්නට හිසි බැවින් ඒ රාග සතුරුගෙන් මෛත්‍රීය මනා කොටැ රැක ගත යුතු යි.

පුරුෂයාහට පළිතාදි දුර්ගී ඇසුරු කළ දූර සතුරු මෙන් මෛත්‍රී බ්‍රහ්ම විහරණයට ව්‍යාපාදය දූර සතුරු ය. මෛත්‍රීය හා ව්‍යාපාදය සවභාවයෙන් ම අසමාන බැවිනි. එහෙයින් ව්‍යාපාදයෙන් බිය නො වැ මෛත්‍රී ද වැඩිය යුතු යි. මෛත්‍රී ද කරන්නේ ය. කෝප ද කරන්නේ ය යන මේ දෙක කිසි කලෙක එක තැන නො ලබන්නෙකි.

කරුණා බ්‍රහ්ම විහරණයට ගෙහසිත දෞර්මනස්‍ය ආසන්න සතුරු ය. විපත් දැකීම් වශයෙන් සමාන බැවිනි. විහිංසාව දූර සතුරු ය. කරුණාව හා විහිංසාව සවභාවයෙන් අසමාන බැවිනි. එ හෙයින් විහිංසායෙන් බිය නො වැ කරුණා වැඩිය යුතු. කරුණාත් කරන්නේ ය. අත්-පා ආදියෙනුත් ගසන්නේ ය. යනු කිසිකලෙක එක තැන නො ලැබෙන්නෙකි. **එහි ගෙහසිත දෞර්මනස්‍ය නම් කිම? "චක්ඛු විඤ්ඤෙය්‍යානං රූපානං ඉට්ඨානං කන්තානං මනාපානං මනෝරමානං ලෝකාමිසපටිසංයුත්තානං අප්පටිලාභං වා අප්පටිලාභතෝ සමනුස්සරතෝ, පුබ්බේ වා පටිලද්ධපුබ්බං අතීතං නිරුද්ධං විපරිණතං සමනුස්සරතෝ උප්පජ්ජති දෞර්මනස්සං, යං එවරූපං දෞර්මනස්සං ඉදං වුච්චති ගෙහසිතං දෞර්මනස්සං"**[2] යනාදීන් වදාළ බැවින් 'ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ මනොරම්‍ය වූ ලෝකාමිෂ ප්‍රතිසංයුක්ත වූ වස්තුවිශේෂය වූ රූප නො ලදින් ඒ නො ලද්දෙමි' යි සිහි කරන්නා හට ද පෙරදී ලැබූ කැති වැ ගිය රූප සිහි කරන්නා හට ද, යම් දෞර්මනස්‍යක් උපදී නම් එය ගෙහසිත දෞර්මනස්‍යයි දත යුතු. (ගෙහසිත දෞර්මනස්‍ය නම් කාමගුණ නිශ්‍රිත දෞර්මනස්‍යයි)

---

[1] අ: නි: ඡක්කනි: 591 [2] ම: නි: සළායතනවග්ග 227

මුදිතා බ්‍රහ්ම විහරණයට ගෙහසිත සොම්නස ආසන්න සතුරු ය. සම්පත් දැකීම් වශයෙන් සමීප බැවිනි. අරතිය දුර සතුරු ය. සවභාවයෙන් අසමීප බැවිනි. (හොගාදි සම්පත්තීන් ප්‍රමුදිත සත්ත්වයන් කෙරෙහි මෝදනාකාර ප්‍රමුදිත සවභාවයට ඔවුන් කෙරෙහි අනභිරතාකාර අරති සවභාවය විසභාග බැවින්, යනු සන්න යි) එබැවින් ඒ අරතියෙන් බිය නො වැ මුදිතා වැඩිය යුතු. ප්‍රමුදිතත් වන්නේ ය, ප්‍රාන්ත සයනාසන අධි කුසල ධම් යන මේහි උකටළීන් වන්නේ ය, යනු ඇසි කලෙක එක් තැන නො ලැබෙන් නෙකි. **ගෙහසිත සොම්නස යනු කිම? "චක්ඛුවිඤ්ඤේය්‍යානං රූපානං ඉඤ්ඡානං කන්තානං මනාපානං මනොරමානං ලොකාමිස පටිසංයුත්තානං පටිලාභං වා පටිලාභතො සමනුපස්සතො, පුබ්බෙ වා පටිලද්ධපුබ්බං අනිත්තා නිරුද්ධං විපරිණතං සමනුස්ස රතො උප්පජ්ජති සොමනස්සං. යං එවරූපං සොමනස්සං ඉදං වුච්චති ගෙහසිතං සොමනස්සං"**[1] යනාදීන් වදාළ බැවින් 'ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ මනොරම්‍ය වූ ලොකාමිෂ ප්‍රතිසංයුක්ත වූ චක්ෂුර්විඥේය වූ රූප ලැබෙ එය ලදිම් යි සලකන්නාහට ද, පෙර ලැබ නැති වැ ගිය රූප සිහි කරන්නා හට ද යම් සොම්නසෙක් උපදී නම් එය ගෙහසිත සොම්නසැයි දත යුතු (ගෙහසිත සොම්නස නම් පස්කම් ගුණ ඇසුරු කළ සොම්නස ය.)

උපෙක්ෂා බ්‍රහ්ම විහාරයට වනාහි ගෙහසිත අඥාන උපෙක්ෂාව ආසන්න සතුරු ය. දෙෂ ගුණ අවිචාරණ වශයෙන් සමීප බැවිනි. ('යම් සේ බ්‍රහ්ම විහාරොපෙක්ෂා තොමෝ මෛත්‍රී ආදීන් මෙන් සත්ත්වයන් කෙරෙහි හිතොපසංහාර වශයෙන් ගුණ දෙෂ විචාරණය නො කරන්නී හුදෙක් අඥ්‍යුපෙක්ෂණ වශයෙන් පවතී ද, එසේ ම අඥානොපෙක්ෂාව ද සත්ත්වයන් කෙරෙහි විද්‍යමාන ගුණ - දෙෂ නො විචාරන්නී හුදෙක් අඥ්‍යුපෙක්ෂණ වශයෙන් පැතී' යනු සන්න යි) රාගය හා ප්‍රතිඝය දුර සතුරා ය. සවභාවයෙන් අසමීප බැවිනි. එබැවින් රාගයෙන් හා පටිඝයෙන් බිය නො වැ උපෙක්ෂා වැඩිය යුතු. 'උපෙක්ෂා ද කරන්නේ ය. රාග - ප්‍රතිඝ ද කරන්නේ ය' යනු කිසි කලෙක එක් තැන නො ලැබෙන්නෙකි. **ගෙහසිත උපෙක්ෂා නම් කිම? "චක්ඛුනා රූපං දිස්වා, උප්පජ්ජති උපෙක්ඛා බාලස්ස මූළ්හස්ස පුථුජ්ජනස්ස අනොධිජිනස්ස අවිපාකජිනස්ස අනාදීනව දස්සාවිනො, අසුතවතො පුථුජ්ජනස්ස යා එවරූපා උපෙක්ඛා රූපං සා නාතිවත්තති. තස්මා සා උපෙක්ඛා ගෙහසිතාති වුච්චති"**[2] යනාදීන් වදාළ බැවින් 'බාල වූ මූඪ වූ පුථුජ්ජන වූ අනොධිජින වූ අවිපාකජින වූ අනාදීනව දර්ශි වූ අශ්‍රුතවත් පෘථග්ජනයාහට ඇසින් රූප දැක්මෙන් උපෙක්ෂා උපදින්නේ ය. ඒ උපෙක්ෂාව රූප සම්නිශ්‍රිතියට කාරණ නො වන්නේ ය. එහෙයින් ඒ ගෙහසිත උපෙක්ෂායයි කියනු ලැබේ. (කෙලෙසුන් ඉක්ම නො පැවැත්ත හෙයින් ගෙහසිතය යි කියනු ලැබේ. යනු සන්න යි)

[1] ම: නි: සළායතනවග්ග 227 [2] ම: නි: සළායතනවග්ග 228

අනෙඤ්ජිත නම් කෙලෙස අවධින් මාගී අවධි වශයෙන් නො දිනුයේ ය. අනාගාමිය යි සේ යි. අවිපාකජ්ජන නම් සප්තම භවාදීන් මතුයෙහි පවත්නා විපාක සන්තතිය නො දිනුයේ යි. නැවත පුථුජ්ජනය යි කීයේ අනිකු පුථුජ්ජනයා ගනු සඳහා ය.

ආදි - මධ්‍ය - අවශාන වශයෙන්

මේ සතර බ්‍රහ්ම විහාරයන්ට ම **කත්තුකම්‍යතා** ඡන්දය ආදි යි. (සත්ත්වයන් කෙරෙහි හිතෙහි බවය, දුක් පහ කරනු කැමති බවය යනාදියෙන් අනවද්‍ය ප්‍රාර්ථනා වශයෙන් පවත්නා හෙයින් **කත්තු කම්‍යතා** ඡන්දය ආදිය යි කීහු. උපෙක්ෂා බ්‍රහ්ම විහාරය ද සත්ත්වයන් කෙරෙහි අනිරාකෘත ඡන්ද ඇත්තේ ම වෙයි. එහි අව්‍යාවෘත බව ම අවිරුද්ධ ප්‍රතිපත්තිනු යි සඛකෘත්‍යයෙහි නියුක්ත පුතු කෙරෙහි මව මෙන් අධ්‍යුපෙක්ෂණාකාරයෙන් පවතී යනු සත්ත යි.)

නීවරණාදිය මැඩ පැවැත්වීම මධ්‍යය යි. අර්පණාව අවසානය යි.

ප්‍රඥප්ති ධර්ම වශයෙන්, අරමුණු වැඩීම් වශයෙන්

මේ සතර බ්‍රහ්මවිහාරයන්ට **එක** සත්ත්වයෙක් හෝ බොහෝ සත්ත්ව යෝ හෝ අරමුණු වෙති (ප්‍රඥප්ති ධර්ම වශයෙන් යි කීයේ සත්ත්වයන් ගන්නා බැවිනි.) උපචාරයෙහි දී හෝ අර්පණාවට පැමිණි කල හෝ අරමුණ වැඩෙන්නේ ය. වැඩෙන ක්‍රමය මෙසේ ය. දක්ෂ ගොවියා කමා සැ යුතු තැන පිරිසිදු ගෙනැ සානා සේ මේ යෝගී ද පළමු **කොටැ එක්** ආවාසයක් පිරිසිදු එහි වසන සත්ත්වයන් කෙරෙහි "මේ ආවාසයෙහි සත්ත්වයෝ අවෛර වෙත්වා" යනාදීන් මෙත් වඩන්නේ ය. එහි සිත මෘදු කොටැ කර්මණ්‍ය කොටැ ඉක්බිති ආවාස **දෙකක්** පිරි සිදින්නේ ය. මෙසේ පිළිවෙළින් ආවාස **තුනක්** ද, **සතරක්ද, පසක් ද, සයක් ද,** සතක් ද, **අටක් ද, නවයක්ද, දසයක්ද, එකළුවිසක් ද,** ගම් අඩක් ද, මුළු ගමක් ද, **දනව්වක් ද, රාජ්‍යයක් ද, එක් දිසාවක් ද, එක් සක්වළක් තාක් ද, එසින් මතු ද,** පිරිසිදැ එහි සතුන් කෙරෙහි මෙත් වඩන්නේ ය. මෙන සේ ම **කරුණාදිය** ද වඩන්නේ ය. මේ අරමුණු වඩන ක්‍රමය යි.

නිස්සන්ද ඵල වශයෙන්

කසිණයන්ගේ නිස්සන්ද ඵලය අරූපධ්‍යාන යි. රූපධ්‍යාන සමාධීන්ගේ ද යට තුන් අරූපධ්‍යාන සමාධීන්ගේ ද **නිස්සන්ද ඵලය** නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය යි. **විදර්ශනා**යෙහි **නිස්සන්ද ඵලය ඵල** සමාපත්ති යි. සමථ-විදර්ශනා යෙහි **නිස්සන්ද ඵලය** නිරෝධ-

සම්පත්තියයි. එසේ ම මෛත්‍රී - **කරුණා** - **මුදිතා** යන බ්‍රහ්ම විහාර තුනෙහි නිසසඤ්ඤඵලය උපෙක්ඛා බ්‍රහ්ම විහාරය යි. **එම** නුස්සා තුලාසංඛාට නොදී **නිකම්** අහස කුළු ගොනැස් **තංවන්නට** බැරියා සේ ප්‍රථම තුන් ධ්‍යාන නො වඩා සතර වන ධ්‍යානය වඩන්නට බැරි ය.

ප්‍රශ්න

1. කුමක් හෙයින් **මේ** සතර බ්‍රහ්ම විහාර යි **කියනු** ලැබේ ද
2. **මේ** ගණන් වශයෙන් සතරෙක් ම වූයේ **කිම**
3. මෙහි මේ ක්‍රමය කිමෙක් ද
4. කුමක් **හෙයින්** අභිධර්මයෙහි දී මෙයට අප්පමඤ්ඤය යි කියනු ලැබේ ද

1. ශ්‍රේෂ්ඨය, නිර්දෝෂය යන අර්ථයෙන් මේ සතරට බ්‍රහ්ම විහාරය යි කියනු ලැබේ. (සත්ත්වයන් **කෙරෙහි** යහපත් **ප්‍රතිපත්ති** යක් බැවින් මේ විහාර සතර ශ්‍රේෂ්ඨ යි. සෙසු **කමටහන්හු ආත්ම** හිත ප්‍රතිපත්ති මාත්‍රය හ. මොහු වනාහි **'සබ්බෙ සත්තා සුඛිතා හොන්තු'** යනාදීන් පරහිතප්‍රතිපත්තිහු ය. යනු සත්‍ය යි.)

බ්‍රහ්මයෝ විනිවරණ බැවින් නිර්දෝෂ **යි**ත් ඇති වැ වෙසෙති. මේ සතරින් යුක්ත යොගිහු ද බ්‍රහ්මයන් මෙන් නිර්දෝෂ **යි**ත් ඇති වැ වෙසෙති. එ බැවින් මේ නිර්දෝෂ යි. මෙහි බ්‍රහ්ම ශබ්දයෙන් බඹලොව බ්‍රහ්මයෝ ද, මහාබෝධිසත්ත්වයෝ ද ගැනෙත්.

2. මේ ගණන් වශයෙන් සතරෙක් ම වූයේ **කිම**

2. **'විසුද්ධි මග්ගාදිවසා චතස්සෝ'** විශුද්ධි මාර්ගාදීන්ගේ වශයෙන් මේ සතරෙක් වූයේ ය. ආදි ශබ්දයෙන් මනසිකාර ගන්නේ යි. මේ සතර අතුරෙන් **මෛත්‍රිය** ව්‍යාපාද බහුලයා හට ද **කරුණාව** විහිංසා බහුලයා හට ද, **මුදිතාව** අරති බහුලයා හට ද, **උපෙක්ෂාව** රාග බහුලයා හට ද විශුද්ධිමාර්ගී යි. (ව්‍යාපාද සංකෙලේශාදීන් කෙරෙන් විශුද්ධියට උපාය වූයේ විශුද්ධිමාර්ගී නම් ග්‍රන්ථ සන්ත යි.) එ බැවින් මේ විශුද්ධිමාර්ගී වශයෙන් සතර වූයේ ය.

හිත එළවීම ය, අහිත දුරු කිරීම ය, සම්පත්තියෙහි සතුටු වීමය, උපෙක්ෂා වීම යයි සත්ත්වයන් කෙරෙහි මනසිකාරය සතර **ආකාර** වේ. මව වනාහි ළදරු, ගිලන්, **තරුණ, සිය කිසෙහි** යෙදුණු, **යන** සිව් පුතුන් අතුරෙන් ළදරු **පුතු** හට අභිවෘද්ධිය **කැමති** වෙයි. ගිලන් පුතු හට ගිලන් **කම්** මුදවා ගන්න **කැමති** වෙයි. **තරුණ** පුතු හට ඒ තරුණ සැපයින් යුතු වැ චිරස්ථිතිය **කැමති** වෙයි. **සිය කිසෙහි** යෙදුණු පුතුහට කිසි දෙයෙක නො යෙදී මධ්‍යස්ථ වනු **කැමති**

වෙයි. එසේම සතර බ්‍රහ්ම විහාර වඩන යොගී විසින් සියලු සතුන් කෙරෙහි මෛත්‍රී කළ යුතු ය. කරුණා කළ යුතු ය. මුදිතා කළ යුතු ය. උපෙක්ෂා කළ යුතු යි. එ බැවින් මෙය මනසිකාර වශයෙන් ද සතර ආකාර වේ ය.

3. මෙහි මේ ක්‍රමය කිමෙක් ද

3. "හිතාදි ආකාරවසා පනායං කථමා" හිතාදි ආකාර වසයෙනි මේ ක්‍රමය.

මේ සතර බ්‍රහ්ම විහරණ වඩනු කැමැති යොගීහු විසින් පළමු කොටැ සත්ත්වයන් කෙරෙහි හිතාකාර ප්‍රවෘත්ති වශයෙන් පිළිපැදිය යුතු. මෛත්‍රිය හිතාකාර ප්‍රවෘත්තිය ලක්ෂණ කොටැ ඇත්තේ ය. ඉක්බිති එසේ හිතවත් බව පැතූ සත්ත්වයන් දුකින් පෙළෙන බැව් දැක හෝ අසා හෝ සිතා හෝ දුක් දුරු කිරීම් ආකාරයෙන් පිළිපැදිය යුතු ය. කරුණාව දුක් දුරු කිරීම් ආකාරය ලක්ෂණ කොටැ ඇත්තේ ය. ඉක්බිති එසේ හිත පැතූ දුකින් දුරු කොටැ ගත් ඒ සත්ත්වයන් සැපසේ සිටිනු දැකැ එහි සතුටු වීම් වශයෙන් පිළිපැදිය යුතු මුදිතාව ප්‍රමෝදය ලක්ෂණ කොට ඇත්තේ ය.

ඉක්බිති එයින් මිතු කළ යුතු නැති බැවින් ඔවුන් කෙරෙහි මධ්‍යස්ථ වැ පිළිපැදිය යුතු උපෙක්ෂාව මධ්‍යස්ථාකාර ප්‍රවෘත්තිය ලක්ෂණ කොටැ ඇත්තේ ය. මෙසේ හිතාදි ආකාර වශයෙන් පළමු කොටැ මෛත්‍රිය ද, ඉක්බිති කරුණාව ද, ඉක්බිති මුදිතාව ද, ඉක්බිති උපෙක්ෂාව ද, දක්වන ලද්දේ ය. මේ ක්‍රමය යි.

4. කුමක් හෙයින් අභිධර්මයෙහි දී මෙයට අපමඤ්ඤය යි කියනු ලැබේ ද

4. "පවත්තනතෝ ච අප්පමාණෙ තා ගොචරෙ යෙන තදප්පමඤ්ඤා" මේ සියලු බ්‍රහ්ම විහරණ අප්‍රමාණ අරමුණෙහි පවතී. අප්‍රමාණ සත්ත්වයෝ මෙයට අරමුණු වෙති. උද්ධුමාතකාදි අසුභයෙහි ඒ ඒ ඉදිමී ගිය තැන් අරමුණු කරන්නා සේ එක සත්ත්වයකු ගේ වත් මෙතෙක් පෙදෙසෙහි මෛත්‍රී වැඩිය යුතුය යි ප්‍රමාණ කොටැ නො ගෙනැ මුළු සත්ත්වයා කෙරෙහි පැතිරවීම් වශයෙන් වැඩිය යුතු ය. එහෙයින් මෙයට අභිධර්මයෙහි දී අප්පමඤ්ඤය යි කියන ලදී.

යට දැක්වුණු ප්‍රශ්න සතරට ම උත්තර මේ ගාථායෙන් ප්‍රකාශ වේ.

"විසුද්ධි මගහාදිවසා චතසෝ
හිතාදි අ කාරවසා පනායං
කමෝ පවත්තනතෝ ච අප්පමාණෙ
තා ගොචරෙ යෙන තදප්පමඤ්ඤා"

අවි යට කියන ලදී.

ධ්‍යාන වශයෙන්

මේසේ අප්‍රමාණ සත්ත්වයන් අරමුණු කොටැ ඇති බැවින් එක ලක්ෂණ වූ ද මේ සතර බ්‍රහ්මවිහරණ අතුරෙන් මෛත්‍රී- කරුණා- මුදිතා යන තුන චතුෂ්ක පඤ්ච වශයෙන් ත්‍රිකධ්‍යානික ය පංචක නය වශයෙන් චතුෂ්ක ධ්‍යානික ය. කුමක් හෙයින් ද, සෞමනස්‍ය හා නො වෙන් හෙයිනි. කුමක් හෙයින් මේ තුන සෞමනස්‍ය හා නො වෙන් ද, සෞමනස්‍යයෙන් උපදනා ව්‍යාපාද- විහිංසා- අරතීන් ගේ නිස්සරණ හෙයිනි. (කාමාදීන්ට නිස්සරණ වූ නෙක්ඛම්මාදීන් මෙන් දෞර්මනස්‍ය සැපියුතු ව්‍යාපාදාදීන්ට නිස්සරණ වූ මෛත්‍රී ආදීහු සෞමනස්‍ය සහගතයා වෙති යන අර්ථයි. නිස්සරණ ග්‍රහණයෙන් ම පූජනීයාගත වූ මෛත්‍රාදීන් ගේ උපෙක්ෂා සම්ප්‍රයෝගය ද අනුඥාත ය යි දත යුතු. එහෙයින් ම ආදුරෝ අටවසි සිතෙක්හි කරුණා- මුදිතාවන් ගේ ප්‍රවෘත්තිය පඤ්ඤපේ සි දත යුතු' යනු සත්ත ය.)

උපෙක්ෂාව වනාහී අවශෙෂ එකධ්‍යානික ම ය. කුමක් හෙයින් ද, උපෙක්ෂාව වෙදනාව හා සම්ප්‍රයුක්ත හෙයිනි.

ඒ එසේ මැ යි:- සත්ත්වයන් කෙරෙහි මධ්‍යස්ථාකාරයෙන් පවත්නා බ්‍රහ්ම විහාරොපෙක්ෂාව උපෙක්ෂා වෙදනාව නැති වැ නො පවත්නේ ය.

විචාරණයෙකි.

භගවත් බුදුන් විසින් අඞ්ගුත්තර අෂ්ටක නිපාතයෙහි දී **"තතො ඛෝ භික්ඛු ඉමං සමාධිං සවිතක්කසවිචාරම්පි සච්චාරං භාවෙය්‍යාසි, අවිතක්කවිචාරම්පි විචාරමත්තං භාවෙය්‍යාසි, අවිතක්කඅවිචාරං භාවෙය්‍යාසි. සප්පීතිකම්පි භාවෙය්‍යාසි. නිප්පීතිකම්පි භාවෙය්‍යාසි, සාතසහගතම්පි භාවෙය්‍යාසි, උපෙක්ඛාසහගතම්පි භාවෙය්‍යාසි"**[1] යි ධ්‍යාන සතර - සතර බ්‍රහ්ම විහාර යහි ලා අවශෙෂයෙන් වදාරන ලද්දේ ය. එහෙයින් සතර බ්‍රහ්මවිහරණ ම චතුෂ්ක - පාංචක ධ්‍යානිකය යි ඇමෙක් කියා නම් ඔහුට 'එසේ නො කියව' යි කිය යුතු. ඉදින් එසේ කියා නම් කාය-නුපස්සනාදිය ද චතුෂ්ක පංචක ධ්‍යානිකය යි කියන්නට සිදු වේ. වෙදනානුපස්සනාදියෙහි ප්‍රථම ධ්‍යානය පවා නැති කල දවිතීයඣ්‍යානාදිය කොයින් ලැබේ ද. එහෙයින් ව්‍යඤ්ජනච්ඡායා මාත්‍රය ගෙනැ භගවත් බුදුන් හට අභිධර්මයක් නො කළ යුතු. බුඩවචනය ගැඹුරැ ය. ආචාර්යයන් ඇසුරැ කොට අධිප්‍රාය වශයෙන් ගත යුතු ය. මේ එහි අධිප්‍රාය යි.

'භගවත් බුදුනි! මම් බුදුන් ගේ යම් ධර්මයක් අසා හුදෙකලා වැ ගණයා කෙරෙන් වෙන් වැ අප්‍රමත්ත වැ කෙලෙස් තවන වීර්‍ය ඇති වැ නිවන් පිණිස මෙහෙයන ලද සිත් ඇති වැ වාසය කරම් ද එබඳු ධර්මයක් මට සැකෙවින් වදාළ මැනවැ' යි

---

[1] අ: නි: අට්ඨකනි: 798

එක් භික්ෂුනමෙක් ධර්මදෙශනාව පිණිස බුදුන් අයැදියේ ය. ඒ භික්ෂු පෙරත් බුදුන්ගේ ධර්මය අසා ඊම රැදේ. මහණුවම් කරන්නට කොහිත් නො යේ. එහෙයින් ඔහුට භගවත් බුදුහු 'එසේ යැ. මොඝපුරුෂය ඇතැම් කෙනෙක් මට ධර්ම දෙශනා පිණිස අයදිති. ධර්මය දෙසූ කල මා ම ලුහුබැඳිය යුතු කොටැ සිතති' සි නින්දා වදරා යළි රහත්බවට හෙතු සම්පත් ඇති ඒ භික්ෂු හට අවවාද කරන සේක් මෙසේ වදාළ සේක.

"තස්මාතිහ තෙ භික්ඛු එවං සික්ඛිතබ්බං අප්පකතතං මෙ චිතතං භීතං භවිස්සති, සුසණ්ඨිතං, නචුප්පතතා පාපකා අකුසලා ධම්මා චිතතං පරියාදාය ඨස්සතීති හි එවංහි තෙ භික්ඛු සික්ඛිතබ්බං"[1] සි. 'මහණ! එසේ නම් තා විසින් මෙසේ භික්ෂිය යුතු. මගේ සිත අධ්‍යාත්මයෙහි ම සථිත-සුසථිත වන්නේ ය. උපන් ලාමක අකුශල ධර්ම සිත අල්වා නො ගෙන සිටින්නේ ය මහණ! තා විසින් මෙසේ භික්ෂිය යුතු' යනු එහි අර්ථ සි. මේ අවවාදයෙන් ඒ භික්ෂුහට නියකර්ඣානත්ත වසයෙන් චිතෙතෙකාග්‍රතාමාත්‍ර වූ මූල සමාධිය වදාරන ලද්දේ ය. ඉක්බිති මේ මූල සමාධියෙන් ම සෑහීමට නො පැමිණ, ඒ සමාධිය මෙසේ මතු වැඩිය යුතු ය සි දක්වන්නට **"යතො බො තෙ භික්ඛු අප්පකතතං චිතතං ඨිතං හොති සුසණ්ඨිතං, නචුප්පතතා පාපකා අකුසලා ධම්මා චිතතං පරියාදාය තිට්ඨතති. තතො තෙ භික්ඛු එවං සික්ඛිතබ්බං මෙතතා මෙ චෙතොවිමුතති භාවිතා භවිස්සති බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරබ්ධා හි. එවං හි තෙ භික්ඛු සික්ඛිතබ්බං"**[1] සි මෛත්‍රී වශයෙන් භාවනාව වදාරන ලද්දේ ය. වදාරා යළි **"යතො බො තෙ භික්ඛු අයං සමාධි එවං භාවිතො හොති බහුලීකතො තතො තවං භික්ඛු ඉමං සමාධිං සවිතකකමපි සවිචාරං භාවෙය්‍යාසි - පෙ - අවිතකකා සහගතමපි භාවෙය්‍යාසි"**[1] සි වදාරන ලද්දේ ය.

එහි අදහස මෙසේ ය:- 'මහණ! යම් කලෙක තා විසින් මේ මූල සමාධිය මෙසේ මෛත්‍රී වශයෙන් වඩන ලද්දේ ද, එකල තෝ එ පමණෙකින් සතුටට නො පැමිණ, මේ මූල සමාධිය සෙසු පඨවී කසිණාදි අරමුණුවල චතුර්ථක - පඤ්චකධ්‍යානයන්ට පමුණුවමින් සවිතර්ක - සවිචාරාදි වශයෙන් වඩව' සි වදාරා යළි 'කරුණාදි සෙසු බ්‍රහ්ම විහාර පූර්ණතම වූ භාවනාව අන්‍ය අරමුණුවල චතුර්ථක පඤ්චකධ්‍යාන වශයෙන් වඩව' සි වදාරන්නට **"යතො බො තෙ භික්ඛු අයං සමාධි එවං භාවිතො හොති බහුලීකතො, තතො තෙ භික්ඛු එවමපි සික්ඛිතබ්බං කරුණා චෙතොවිමුතති"**[1] යනාදීන් වදාළේ ය.

---

[1] අ: නි: අට්ඨකනි: 798

මෙසේ මෛත්‍රාදි පුථුඛගම වූ භාවනාව චතුෂ්ක - පඤ්චක ධ්‍යාන වශයෙන් වැදෑරූ සළි කායානුපස්සනාදි පුථුඛගම වූ භාවනාව දක්වන්නට **"යතෝ ඛෝ තෙ භික්ඛු අයං සමාධි එවං භාවිතෝ හොති බහුලීකතෝ. තතෝ තෙ භික්ඛු එවං සික්ඛිතබ්බං කායෙ කායානුපස්සී විහරිස්සාමි"**[1] යනාදීන් වදාළේය. වදාරා **"යතෝ ඛෝ තෙ භික්ඛු අයං සමාධි එවං භාවිතෝ භවිස්සති සුභාවිතෝ, තතෝ තෙ භික්ඛු යෙන යෙනෙව ගමිස්සසි ඵාසුකෙඤ්ඤව ගමිස්සසි, යත්ථ යත්ථෙව ඨස්සසි ඵාසුකෙඤ්ඤව ඨස්සසි, යත්ථ යත්ථෙව නිසීදිස්සසි ඵාසුකෙඤ්ඤව නිසීදිස්සසි, යත්ථ යත්ථෙව සෙය්‍යං කප්පෙසසි ඵාසුකෙඤ්ඤව සෙය්‍යං කප්පෙසසි"**[1] යි අතීත් නිකුටයෙන් දෙශනාව නිමකළ සේක. එහෙයින් මෛත්‍රී ආදිය ත්‍රික - චතුෂ්ක ධ්‍යානික ය. උපෙක්ෂාව සෙසු **එකධ්‍යානික** ම ය යි දතයුතු අභිධම්මයෙහි ද මෙය මෙසේ ම දක්වන ලදී. (පාලි යෙහි අර්ථ සුගම හෙයින් නො දැක්විණි මෙත්තා - කරුණා - මුදිතා චතුෂ්ක නය වශයෙන් ත්‍රික ධ්‍යානික ය. පඤ්චක නය වශයෙන් චතුෂ්ක ධ්‍යානික ය. උපෙක්ෂාව චතුෂ්ක නය වශයෙන් චතුර්ථ ධ්‍යානික ය. පඤ්චක නය වශයෙන් පඤ්චම ධ්‍යානික ය. අංගුත්තර අට්ඨක නිපාතයෙහි සූත්‍රය වරදවා තේරුම් ගෙන මෙය වෙනස් කැරැ නො ගත යුතු ය යි කී සේ යි.)

ශුභ පරමාදි වශයෙන්

මෙසේ ත්‍රික - චතුෂ්ක ධ්‍යාන වශයෙන් ද, සෙසු **එක** ධ්‍යාන වශයෙන් ද යන දෙයාකාරයෙහින් බෙදී සිටි මේ සතර බ්‍රහ්ම විහරණ පිළිබඳ ශුභ පරමාදි වශයෙන් අන්‍යොන්‍ය විසදෘශ වූ අනුභාව විශෙෂය දතයුතු. **හලිද්දිවසන** සූත්‍රයෙහි දී මේ සතර ශුභපරමාදි වශයෙන් විශෙෂ කොටැ වදාළේ ය.

ඒ මෙසේ ය:-

"සුභපරමාහං භික්ඛවෙ මෙත්තා චෙතොවිමුත්තිං වදාමි. ආකාසානඤ්චායතනපරමාහං භික්ඛවෙ කරුණා චෙතොවිමුත්තිං වදාමි. විඤ්ඤාණඤ්චායතනපරමාහං භික්ඛවෙ මුදිතා චෙතොවිමුත්තිං වදාමි. ආකිඤ්චඤ්ඤායතන පරමාහං භික්ඛවෙ උපෙක්ඛා චෙතොවිමුත්තිං වදාමි"[2] මහණෙනි! මෛත්‍රී චෙතොවිමුක්තිය ශුභ විමොක්ෂය පරම කොටැ ඇතැයි කියමි. කරුණා චෙතොවිමුක්තිය ආකාසානඤ්චායතනය පරම කොටැ ඇතැයි කියමි. මුදිතා චෙතොවිමුක්තිය විඤ්ඤාණඤ්චායතනය පරම කොටැ ඇතැ යි කියමි. උපෙක්ෂා චෙතොවිමුක්තිය ආකිඤ්චඤ්ඤායතනය පරම කොටැ ඇතැයි කියමි, යනු එහි අර්ථ යි.

කුමක් හෙයින් මේ මෙසේ වදාළේ ද, මෛත්‍රී ආදි සතර ශුභ-විමොක්ෂාදි සතරට උපනිශ්‍රය වන හෙයිනි.

---

1 අ: නි: අට්ඨකනි: 798 2 සං: නි: බොජ්ඣඞ්ගසං: 885

ඒ එසේ මෑ සි:

මෛත්‍රී විහාරී පුද්ගලයා හට සත්ත්වයෝ පිළිකුල් නො වෙති. සත්ත්වයන් කෙරෙහි පිළිකුල් නැති පුරුද්දෙන් සඛාවයෙන් පිළිකුල් නුවූ නීලාදි පිරිසිදු වර්ණයෙහි දු සිත මෙහෙයන විට අනායාසයෙන් ම සිත එහි වැඳ ගෙනැ සිටී. එබැවින් මෛත්‍රිය ශුභ විමොක්ෂයට උපනිශ්‍රය වේ. එසින් මතු කිසි විමොක්ෂයකට උපනිශ්‍රය නො වේ. එහෙයින් මෛත්‍රිය ශුභ පරම ය සි වදාළේ ය. (මේහි ශුභ ශබ්දය **"සුභංතෙව අධිමුත්තෙනා හොති"** සි මේසේ කියන ලද ශුභ විමොක්ෂය සඳහා උත්තර පද ලොපයෙන් කියන ලද. පරම ශබ්ද උත්තමාර්ථ සි' යනු සන්ත සි)

කරුණා විහාරී පුද්ගලයා හට සත්ත්වයන් කෙරෙහි වැටෙන දඬු පහර ආදි රූප නිමිති දුක් දකින විට කරුණාව උපදින බැවින් රූපයෙහි ආදීනව ප්‍රකට වෙයි. රූපයෙහි ආදීනව ප්‍රකට බැවින් පඨවී කසිණාදීන් අතුරෙන් කිසිවක් උගුලා රූප රහිත ආකාශයෙහි සිත මෙහෙයන කල සිත අනායාසයෙන් ම එහි වැදගෙනැ සිටී. මේසේ කරුණාව ආකාසානඤ්චායතනයට උපනිශ්‍රය වේ. එසින් මතු කිසිවකට උපනිශ්‍රය නො වේ. එහෙයින් කරුණාව ආකාසානඤ්චායතනය පරම කොටැ ඇතැයි වදාළේ ය.

මුදිතා විහාරී පුද්ගලයා හට භොග සම්පත් ආදි ඒ ඒ ප්‍රමෝද්‍ය කාරණයෙන් සත්ත්වයන්ට උපන් ප්‍රමෝද්‍ය ඥානය දක්නා කල මුදිතාව උපදින බැවින් ඥාන ග්‍රහණයෙහි පුරුදු කරන ලද සිත ඇතිවන්නේ ය. ඉක්බිති අනුක්‍රමයෙන් ලැබෙගත් ආකාසානඤ්චායතනය ඉක්මැ ආකාශ නිමිත්ත ගොචර කොටැ ඇති ඥානයෙහි සිත මෙහෙයත් ම ඔහු ගේ ඒ සිත අනායාසයෙන් ම ඥානයෙහි වැදගෙනැ සිටී. මේසේ මුදිතාව විඤ්ඤාණඤ්චායතනයට උපනිශ්‍රය වේ. එසින් මතු කිසිවකට උපනිශ්‍රය නො වේ. එහෙයින් මුදිතාව විඤ්ඤාණඤ්චායතනය පරම කොටැ ඇතැයි වදාළේ ය.

උපෙක්ෂාවිහාරී පුද්ගලයා හට සත්ත්වයෝ සුවපත් වෙත්වා කියා හෝ දුකින් මිදෙත් වා කියා හෝ පැමිණි සැපයෙන් නො ගිලිහෙත් වා කියා හෝ ආනොග නැති බැවින් සුඛ-දුක්ඛාදී පරමාර්ථ ග්‍රහණයට විමුඛ හෙයින් අඞ්ගමාන ප්‍රඥප්තී ගැන්මේහි දක්ෂ වූ සිත ඇති වේ. පරමාර්ථ ග්‍රහණයෙන් විමුඛභාවය පුරුදු කළ පරමාර්ථ වශයෙන් අඞ්ගමාන ප්‍රඥප්තිය ගැනීමේහි සිත් ඇති ඔහුට අනුක්‍රමයෙන් ලැබ ගත් විඤ්ඤාණඤ්චායතනය ඉක්මැ සවභාවයෙන් අඞ්ගමාන වූ පරමාර්ථ වූ ඥානයාගේ අනාවයෙහි සිත මෙහෙයන කල ඔහු ගේ ඒ සිත අනායාසයෙන් ම ආකිඤ්චඤ්ඤායතනයෙහි වැදගෙනැ සිටී සි. මේසේ උපෙක්ෂාව ආකිඤ්චඤ්ඤායතනයට උපනිශ්‍රය වේ. එසින් මතු කිසිවකට උපනිශ්‍රය නො වේ. එබැවින් උපෙක්ෂාව ආකිඤ්චඤ්ඤායතනය පරම කොටැ ඇතැයි වදාළේ ය.

දානාදි සියලු කල්‍යාණ ධර්ම පිරීම වශයෙන්

යට කියූ පරිදි සුන පරමාදි වශයෙන් මේ සතර බ්‍රහ්ම විහරණයන් ගේ අනුභාව දැනැ ඉක්බිති ඒ සතර දානාදි සියලු කල්‍යාණ ධර්ම පුරාලන බව දත යුතු.

ඒ එසේ මැ යි:-

සතුන් කෙරෙහි හිත අදහස් ඇති බැවින් ද, සතුන් ගේ දුක් නො ඉවසන බැවින් ද, සතුන්ගේ සම්පත් පිළිබඳ චිරස්ථිතිය කැමැති බැවින් ද, සතුන් කෙරෙහි පක්ෂපාත නැති බැවින් ද, යන සතර කාරණයෙන් සියලු සතුන් කෙරෙහි සම සිත් ඇති මහා සත්ත්වයෝ 'මොහුට දිය යුතු ය. මොහුට නො දිය යුතුය' යන වෙනසක් නො සිතා සියලු සතුන් හට සුව නිදන් කොට ඇති දන් දෙති. ඒ සතුන් ගේ පීඩා වළකන්නාහු සිල් සමාදන් වෙති. සිල් පුරනු සඳහා නෛෂ්ක්‍රම්‍යය පුරති. සතුන් ගේ හිත - අහිත දෙක්හි නුමුළා වනු පිණිස ප්‍රඥව පිරිසිදු කෙරෙති. සතුන්ට හිත සුව පිණිස නිතර වීර්‍ය්‍ය වඩති උතුම් වීර්‍ය්‍ය වශයෙන් ධීර භාවයට පැමිණ ද සතුන්ගේ නානාවිධ අපරාධ ඉවසති. මේ 'නොපට දෙමු. මේ නොපට කරමු' යි කළ පිළිණ විසංවාද නො කෙරෙති. සතුන් කෙරෙහි අවල මෛත්‍රියෙන් යුෂ්කාරීහු වෙති. උපකාර කොටැ ප්‍රත්‍යුපකාර නො පතති. මෙසේ මේ දස පාරමීන් පුරා දෘඪ බල, චතුර් වෛශාරද්‍ය, ෂට් අසාධාරණඥාන, අෂ්ටාරස බුඬධර්ම යන ප්‍රභෙද ඇති සියලු කල්‍යාණ ධර්ම පුරත්. මෙසේ මේ සතර බ්‍රහ්ම විහරණ දානාදි සකල කල්‍යාණ ධර්ම පරිපූර්ණ කරත බව දත යුතු.

("ඨානාඨානං විපාකඤ්ච - මග්ගං සබ්බත්ථගාමිනං
අනෙකධාතුයෝ ලොකෙ - අධිමුත්තිඤ්ච පාණිනං
ජානාති ඉන්ද්‍රියානඤ්ච - පරොපරියතං මුනී
ඣානාදි සංකිලෙසාදි - ඤාණං විජ්ජාතනයං තථා
මේය දස බල නම්.

"වෙසාරජ්ජානි චත්තාරි - බුඬභොතා ආසවක්ඛයෙ
අන්තරායෙ ච නීයානෙ - යෙහි බුඬො විසාරදෙ"
මේය චතුර්වෛශාරද්‍ය නම්.

ඉන්ද්‍රිය පරොපරියත්ත ඤාණය
ආසයානුසය ඤාණය
යමක පාටිහීර ඤාණය
මහා කරුණා සමාපත්ති ඤාණය
සබ්බඤ්ඤුත ඤාණය
අනාවරණ ඤාණය
මේය අඩ අසාධාරණ ඥාන නම්.

"තිසඳ්ධමධාසු අතාගතාදිසු - තික්කම්මඤ්ඤං විගතං විසුද්ධං
අභාති ඤාදසස ච දෙසනාය - සමාධි පඥාභ විමුත්ති ධිතං

දවා රවා අපුනරමේව තත්ති - වෙගායිතව්‍යාවටචිත්තතා ච
නෙවත්ති තසසපපටිඝංචුපෙක්ඛා - තෙ හොනති අට්ඨාරස බුද්ධධම්මා"

"අනිතෙ බුධසස භගවතො අපපටිහතං ඤාණං" යනාදි තුන් සල්ලි නො පැකිළෙ පවත්නා තුන් නුවණ තුන් බුධ ධර්ම වෙයි. "ඉමෙහි තිහි ධම්මෙහි සමන්නාගතසස බුධසස භගවතො සබ්බං කායකම්මං ඤාණපුබ්බඞගමං ඤාණානුපරිවත්තති"[1] යනාදි නුවණ අනු වැ වැටෙන තුන් කර්මය තුන් බුධ ධර්මය වේ. **"ඉමෙහි ජහි ධම්මෙහි සමන්නාගතසස බුධසස භගවතො නත්ති ඡන්දසස හානි නත්ති ධම්ම දෙසනාය හානි, නත්ති සමාධිසස හානි, නත්ති විරියසස හානි, නත්ති විමුත්තියා හානි, නත්ති පඤ්ඤාය හානි"**[1] යනු ඡට් බුධ ධර්මවෙයි. මේ ඡට් බුධ ධර්මයෙන් සමන්විත වූ සර්ඥයන් වහන්සේට කෙළතා සේ ක්‍රියාවෙක් නැති. සහසා කරන ක්‍රියාවෙක් නැති-ඥානයෙන් අපරාධයෙක් නැති. වෙලෙවි ක්‍රියාවෙක් නැති. නිරර්ථක සිත්හසරෙක් නැති. අඥානොපෙක්ෂා කෘත්." මොහු ඡට් බුධ ධර්ම වෙත්. මොහු හැම එක් වැ **අවලෙස් බුධ ධර්ම** ය යි කියනු ලැබෙත්" යනු සන්තයි.)

බුදු ජන පහන් පිණිස කළ විශුද්ධි මාර්ගයෙහි සමාධි භාවනාධිකාරයට අතුලත් බ්‍රහ්ම විහාර නිර්දේශ නම් නව වන පරිච්ඡේදය සි.

පූජ්‍ය පණ්ඩිත මාතර ශ්‍රී ධර්මවංශ ස්ථවිර ස්වාමීන් හා ළ සිංහලානුවාදය සමාප්තයි.



---

[1] පටි: මෙ: මහාපඤ්ඤ සූ: 376 බුරුම්

සිංහල
විශුද්ධි මාර්ගය

10 ආරූප්‍ය නිද්දේශය

නමෝ භගවතෝ සම්මාසම්බුද්ධස්ස

සතර බ්‍රහ්ම විහාරයනට අනතුරුවැ දක්වන ලද සතර අරූප ධ්‍යානයන් අතුරෙන් පළමුවන **ආකාසානඤ්චායතන-ධ්‍යානය** වඩනු කැමැති යොගාවචර තෙමේ

"දිස්සනෙන ඛොපන රූපාධිකරණං දණ්ඩාදූන ඡේදාදූන කලහ විගහකථාවද, නත්ථි ඛෝ පනෙතං සඛ්ඛසෝ ආරූපෙසූ. සෝ ඉති පටිසංචික්ඛාය රූපානං යෙව නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නෝ හොති"[1]

"රූපය හේතුකොටගෙන මෙරමා පෙළීම පිණිස දඬු-මුගුරු ගැනීම ද, කඩු-දුනු ආදී ආයුධ ගැනීම ද, ඔවුනොවුන් හා කරන කලහ විගහ විවාදයෝ ද, පැනෙත්මය. ඒ සියල්ල සම්ප්‍රකාරයෙන් අරූපී භවයේ නැතැයි ද, මෙසේ නුවණින් සලකා ඉෂ්ටානිෂ්ට සියලු රූපයන්ගේ ම කලකිරීම පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේයැයි" වදාළ හෙයින් ඒ දඬු මුගුරු ගැනීම් ආදියේ ද, ඇස්-කන් ලෙඩ ඇ දහස් ගණන් රෝගයන්ගේ ද, වශයෙන් මේ කරජ රූපයෙහි දෙස් දැක එය බැහැර කිරීම පිණිස පරිච්ඡින්න ආකාස කසිණය හැර පඨවි ආදි නවවිධ කසිණයන් අතුරෙන් එක්තරා කසිණයක් වඩා රූපාවචර චතුර්ථධ්‍යානය උපදවයි.

හුදෙක් ඒ යෝගියා විසින් රූපාවචර චතුර්ථ ධ්‍යානයාගේ වශයෙන් කරජරූපය ඉක්මවන ලද්දේ වෙයි. එතෙකුදු වුවත් කසිණ රූපය ද කරජරූපය හා සදෘශවන බැවින් ඒ කසිණ රූපයවූ ප්‍රතිභාග නිමිත්ත ද ඉක්මවනු කැමති වේ.

කෙසේද?

---

[1] ම: නි: මජ්ඣිමපණ්ණාසක 59 පිට

සර්පයන්ට බියවූවෙක් අරණ්‍යයෙහි දී සර්පයකු විසින් ලුහු බඳින ලදුවෑ වේගයෙන් පලාගොස් ඒ පලාගිය තන්හිදී බිම ඇඳි සර්පාකාර රේඛාවක් හෝ තල්පතක් හෝ වැලක් හෝ රැහැනක් හෝ පොලොව පැළී විවරයක් හෝ දුරදී දැක බියවේමැ යෑ. තැති ගැනේමැ යෑ. ඒ දැක්මට පවා නොකැමැති වේ මැයි.

එසේ ම එක් ගමෙහි වසන විරෝධී අනර්ථකාරී පුරුෂයකු විසින් කළ වධ බන්ධන ගෙහර්ඛාපනාදි උපද්‍රවයෙන් පෙළුණු පුහුල් තෙමේ අන් ගමකට වාසය පිණිස ගොස් එහිදී ද එබඳු රෑ සටහන් කටහඬ ගමන-බිමන ඇති පුරුෂයකු දැක හෙතෙමේ මෑ යැයි බියවේමැ යෑ. තැතිගැනේ මැ යෑ. ඔහු දකිනු කැමැති නොවේ මැයි.

එහි මේ උපමාන උපමෙය සංසන්දනය යි.

ඒ පුරුෂයාහට සර්පයා හා විරෝධී පුරුෂයා විසින් පිඩා කළ කාලය මෙන් යොගාවචර භික්ෂුවගේ අරමුණු කිරීම් වශයෙන් කරජ රූපය හා එක්වූ කාලය ද, ඔවුන් වේගයෙන් පලායාම හා අන් ගමකට යාම මෙන් භික්ෂුවගේ රූපාවචර චතුර්ධ්‍යාන වශයෙන් කරජ රූපය ඉක්මවන කාලය ද, ඔවුන් පැන ගිය තැන බිම ඇඳි ඉරි තල්පත් ආදිය හා අන්ගමෙහි මේ සතුරා වැනි පුරුෂයා දැක බිය හා තැති ගැනුම් නො දක්නා කැමැති බව මෙන් භික්ෂුවගේ කසිණ රූපය ද කරජ රූපය වැනියෑ යි සලකා ඒ ප්‍රතිභාග නිමිත්ත ඉක්මවනු කැමැති බව ද ගළපා දත මැනැවි.

මෙහිලා ඝූරකු විසින් පහරන ලද බලුය, පිසාච භීරුක පුරුෂය යනාදි උපමා ද දතයුතුය. මෙසේ ඒ යොගාවචර තෙමේ චතුර්ථ ධ්‍යානයට අරමුණුවූ ඒ පටිභාග නිමිත්තවූ කසිණ රූපයෙන් කළකිරී ඒ රූපයෙන් පහවනු කැමැති වැ පස් ආකාරයෙකින් පුරුදු කළ වශග බැවි ඇතියේ පුහුණුවූ චතුර්ථ ධ්‍යානයෙන් නැගී මේ ධ්‍යානය මා කළකිරුණු රූපය අරමුණු කෙරේයැ යි ද, ළංවූ සොම්තස් නැමැති සතුරා ඇතැයි ද, අරූප ධ්‍යානයට වඩා ඕදාරික යැයි ද, ඒ චතුර්ථධ්‍යානයෙහි දෙස් දකී.

"යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා"[1] යනු හෙයින් රූපය ඉක්මවා ලැබූ මේ අරූපධ්‍යානය **සන්ත විමොක්ඛ** නම් වේ. අඩග වශයෙන් ඕදාරික බවෙක් නැති. රූපාවචර චතුර්ධ්‍යානයෙහි මෙන් මෙහි ද **උපෙක්ඛා - එකග්ගතා** යන අඩග දෙක ම යෙදෙන හෙයිනි. ඒ යොගී තෙමේ මෙසේ චතුර්ධ්‍යානයෙහි ආදීනව දැක ධ්‍යාන නිකාන්තිය දුරුකොට

---

[1] ම. නි: මජ්ඣිමපණ්ණාසක 112 පිට

ආකාසානඤ්චායතන ධ්‍යානය ශාන්ත වශයෙන් ද, අනන්ත වශයෙන් ද, මෙතෙනි කොට සක්වළ අවසන්කොට හෝ තමා කැමැති තාක් පෙදෙසකැ හෝ **කසිණාලෝකය** පතුරුවා එයින් පැතිරි පෙදෙස "අහස - අහස" යැයි හෝ "අනන්තාකාස" යැයි හෝ මෙනෙහි කරමින් ඒ **කසිණාලෝකය** උගුළුවයි. උගුළුවන්නේ ද වතාහි හුදෙක් පැදුරක් මෙන් නොද හකුළුවයි. කබල-කින් කැවුමක් මෙන් නොද උදුරයි.

හුදෙක් ඒ **කසිණාලෝකය** මෙනෙහි නොකොට එය පැතුරුණු අහස ගැන සිහිකරමින් "ආකාසය, ආකාසයැ" යි නැවත නැවත කියත් ම ඒ අවකාශ මාත්‍රය ම පැනේ. එසේ වන්නා හා මැ කසිණාලම්බනය පහව යේ. මේයැ කිසුණු ඉගිලීම නම්.

කසිණුග්ඝාටිමාකාසය, කසිණුප්පාටිකාකාසය, කසිණ-පරිච්ඡින්නාකාසය යන මේ සියල්ල **එක** මැයි. ඒ යොගාවචර තෙමේ කිසුණු ඉගුළු ආකාස නිමිත්ත ම "අහසය" "අහසයැ යි" නැවත නැවත ආවර්ජනා කෙරෙයි. තක්‍රීභත විතක්‍රීභත කෙරෙයි. මෙසේ කරන්නාවූ ඔහුගේ කාමච්ඡන්දාදී නීවරණයෝ විෂ්කම්භනය වෙත්. ආකාස නිමිත්ත අරමුණු කළ සිහිය මනාව පිහිටයි. උපචාර ධ්‍යානයෙන් සිත **එකඟ** වේ. **හෙතෙම ඒ ආකාස නිමිත්තම** නැවත නැවත ආසේවනය කෙරෙයි. වැඩීම කෙරෙයි. බහුල වශයෙන් කෙරෙයි. මෙසේ කරන්නාවූ ඒ යොගාවචරයාහට පඨවි **කසිණාදි** යෙහි රූපාවචර ධ්‍යාන චිත්තය මෙන් කිසුණු ඉගුළු **අහස්හි ආකාසානඤ්චායතන** ධ්‍යාන චිත්තය පිහිටයි.

මේ ධ්‍යානයෙහි ද පුථුජ්ජනයෙහි මන්ද පඤ්ඤයාගේ වශයෙන් පරිකර්මාදි කාමාවචර ජවන් සිත් සතරක් **හෝ** තික්ඛ පඤ්ඤයාගේ වශයෙන් උපචාරාදි තුනක් **හෝ උපෙක්ඛා** වෙදනා සම්ප්‍රයුක්තවැ ඉපිද පස්වනු වැ හෝ සිව්වනු වැ අරූපාවචර ධ්‍යාන චිත්තය වේ. සෙස්ස පඨවි **කසිණයෙහි** කීසේ යැ.

මේ විශෙෂයැ:- මෙසේ අරූපාවචර ධ්‍යානය උපන් කල්හි මුදුනෙහි පටන් වැසූ සිවිකාදි යානයෙක හෝ කුඩා දෙරටුවෙක හෝ කළයෙක හෝ මුඛයක් නිල්, රන්වන්, රතු, සුදු, ඇ පැහැ ඇති එක්තරා රෙදි කඩෙකින් බැඳ බලන පුරුෂයෙක් වාත වේගයෙන් හෝ වෙනයම් කිසිවකින් හෝ රෙදිකඩ පහව ගිය කලැ අහස මැ බලමින් යම්සේ සිටී ද? එසේ ඒ යොගී තෙමේ පෙර නීල-පීතාදි යම්කිසි **කසිණයකින්** උපදවා ගත් **කසිණ** මණ්ඩලය

උපචාර ධ්‍යාන නමැති ඇසින් බලමින් සිට "ආකාස කසිණ යෑ" 'ආකාස යෑ" යන මේ පරිකම්‍ම මනසකාරයෙන් වහා ඒ කසිණ නිමිත්තා පහව ගිය කල්හි අරූපාවචර ධ්‍යාන නමැති ඇසින් බලමින් වාසය කෙරේ.

මෙතෙකින් මේ ධ්‍යාන ලාභී තෙමේ **"සබ්බසො රූප සඤ්ඤානං සමතික්කමා පටිඝ සඤ්ඤානං අත්ථඛමා නානත්ත සඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසා-නඤ්චායතනං උපසම්පජ්ජ විහරති**[1]" යනු වදාළ හෙයින් "සම්පූර්ණ ප්‍රකාරයෙන් රූප සංඥ ඉක්මවීමෙන් ප්‍රතිඝ සංඥ අස්තාඛගමයෙන් නානත්වසංඥ මෙනෙහි කෙරීමෙන් ආකාසය අනන්තයෑ යි" මෙසේ ආකාසානඤ්චායතන ධ්‍යානයට පැමිණ වෙසේ යයි කියනු ලැබේ.

විසඳරාම් :

සබ්බසො = (රූප නිමිත්ත දණ්ඩාදනාදීන්ගේ වශයෙන් දෙස දශීනයෙන්) සම්පූර්ණයෙන් යන අර්ථයි.

රූපසඤ්ඤානං = සංඥ ශීර්ෂයෙන් වදාළ රූපාවචර ධ්‍යානයන්-ගේ ද, ඔවුනට අරමුණුවූ පඨවි කසිණාදි රූපාලම්බනයන්ගේ ද යනු අර්ථයි. (රූප සංඥාවන්ගේ)

(1) **"රූපී රූපානි පස්සති"**[2] (රූපාවචර ධ්‍යාන ලාභී තෙමේ ධ්‍යාන චක්ෂුසින් කසිණ රූපය බලයි. යනාදි තන්හි මෙන් මෙහි රූපාවචර ධ්‍යානය රූපයැයි ගැනේ. **"රූපාවචරකුසලානි"**යි කිවමනා තැන පරපද ලෝපයෙන් **"රූපානි"** යි කියේ ද

රූපූපපත්තියා මග්ගං භාවෙති"[3] යන්නෙහි **"රූපභවෝ"**යි කිවමනා තන්හි පරපද ලෝපයෙන් **"රූප"** යැයි කී සේ ද මෙහි ද රූපාවචර ධ්‍යානය **"රූප"** යැයි කියනලදී. එහෙයින් **රූපසඤ්ඤා, රූපසඤ්ඤා** යි රූපාවචර ධ්‍යානයෙහි සංඥාව රූප සංඥ යැයි මෙහි එක් අර්ථ පක්ෂයෙකි.

(2) **"බහිද්ධා රූපානි පස්සති සුවණ්ණ දුබ්බණ්ණානි"**[4] යනාදි තන්හි **කසිණ රූපානි** යි කිවමනා තන්හි **"කසිණ"** යන්න ලෝප්කොට **"රූපානි"** යි කියයි. **"දෙවදත්තෝ"** යි කිවමනා තන්හි පූර්වපද ලෝපයෙන් **"දත්තෝ"** යි දෙවදත්තයාම කීවා සේ **කසිණ රූපානි** යි කිවමනා තන්හි **රූපානි** යි කසිණරූපම කියන ලදී. මේසේ වන්නා පෙරකී **"සබ්බසො"** යන්න **රූපසඤ්ඤානං** යන්නට තුල්‍යාධිකරණ විශෙෂණ කොට **සබ්බාසං රූපසඤ්ඤානං** යි ගෙන නිරවශෙෂවූ රූපාවචර ධ්‍යානය හා එයට ආලම්බනවූ පඨවි ආදි කසිණාලම්බනය ද කීවා වේ.

---

[1] ඒ: ප්‍ර: ඛ්‍යානවිභඞ්ග 186 පිට. [3] 199 පිට
[2] අ: නි: අට්ඨකනිපාත 802 පිට. [4] 801 පිට

සමතික්කමා = නොඇලීමෙන් හා වැනසීමෙන් යනු අර්ථයි. (ඉක්මවීමෙන්); කුසල-විපාක-ක්‍රියා- වශයෙන් පස ළොස් වැදෑරුම් වූ රූපාවචර ධ්‍යාන සංඛ්‍යාතවූ ද, ආකාශ වර්ජිත නවවිධ කසිණ ලම්බන සංඛ්‍යාතවූ ද රූප සංඥාවන්ගේ සම්ප්‍රකාරයෙන් නිරවශෙෂ යෙන් නිරුද්ධ කිරීම කියන ලද්දේ වේ.

ඒ එසේ මැයි:- සම්ප්‍රකාරයෙන් රූපාවචර ධ්‍යානය නො ඉක්මවා ආකාසානඤ්චායතන ධ්‍යානයට පැමිණිය නො හැකි හෙයිනි.

ආකාසානඤ්චායතන ධ්‍යානය ආලම්බන සමතික්‍රමණයෙන්ම වන හෙයින් ආලම්බනසමතික්‍රමණය නොවූවහුට සංඥා සමතික්‍රමණය නොවේ හුදෙක් සංඥා සමතික්‍රමණය වූවහුට ම ආලම්බන සමතික්‍රමණය වන හෙයිනි.

විභඞ්ගයෙහි:- **තත්‍ථ කතමා රූපසඤ්ඤා, රූපාවචර සමාපත්තිං සමාපන්නස්සවා, උපපන්නස්සවා දිට්ඨධම්මසුඛවිහාරිස්සවා, සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං ඉමාවුච්චන්ති රූපසඤ්ඤා යෝ. ඉමා රූප සඤ්ඤා යෝ අතික්කමනොනාහොති වීතික්කමනොනා සමතික්කමනොනා තෙන වුච්චති සබ්බසෝ රූපසඤ්ඤානං සමතික්කමාති,**[1] යි සංඥා සමතික්‍රමණය වදාළහ.

එහි රූප සංඥා නම් කවරේ ද?

"රූපාවචර ධ්‍යාන ලාභියාගේ ධ්‍යානයට සමවැදීමෙන් කුශල සංඥා වශයෙන් ද, කාලක්‍රියා කොට බ්‍රහ්මලොකයෙහි උපන්නහුගේ විපාක සංඥා වශයෙන් ද, රහතුන්ගේ දිටඨ ධම්ම සුඛ විහරණයෙන් ක්‍රියා සංඥා වශයෙන් ද, හැඳිනීම රූප සංඥා නමුදු. එකී ත්‍රිවිධ සංඥාවන් ම ඉක්මවූයේ රූප සංඥා මනාකොට ඉක්මවූයේය යි කියනු ලැබේ." මෙසේ **විභඞ්ගයෙහි** ආරම්මණ සමතික්‍රමණය නො කියා සංඥා සමතික්‍රමණය ම කියන ලදී.

එකම අරමුණෙහි ප්‍රථම ධ්‍යානාදිය මෙන් නො පැමිණිය යුතු හෙයින් ද ආරම්මණ සමතික්‍රමණයෙන් මේ සමාපත්ති ලැබිය යුතු හෙයින් ද, මෙහි ආරම්මණ සමතික්‍රමණ වශයෙන් ද විස්තර කරන ලද බව දත යුතු.

පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා = ප්‍රතිඝ සංඥාවන්ගේ අස්තාඞ්ගමයෙන් චක්ඛුරාදී ප්‍රසාද රූප හා රූපාදී පඤ්චාලම්බනයන් ගැටීමෙන් උපන් සංඥා ප්‍රතිඝ සංඥා නමුදු. රූප සංඥාදියට මේ නමෙකි.

---

[1] වි: ප: ඛ්‍රානවිභඞ්ග 197 පිට

එහෙයින්ම:- **"තයෝ කතමා පටිඝසඤ්ඤා, රූපසඤ්ඤා, සද්ද සඤ්ඤා, ගන්ධසඤ්ඤා, රසසඤ්ඤා, ඵොට්ඨබ්බසඤ්ඤා, ඉමා වුච්චන්ති පටිඝ සඤ්ඤායෝ**[1]

රූප සංඥය, ශබ්ද සංඥය, ගන්ධ සංඥය, රස සංඥය, සප්‍රෂ්ටව්‍ය සංඥ යැයි මෙහු ප්‍රතිඝ සංඥ යැයි කියන ලදහ. චක්ඛු, සොත, ඝාණ, ජිවහා, කාය යන පඤ්ච ප්‍රසාද වස්තූන් හා රූප, ශබ්ද, ගන්ධ, රස සප්‍රෂ්ටව්‍ය යන පඤ්චාලම්බනයන් පිළිවෙළින් ගැටීමෙන් උපදනා පඤ්චවිධ කුසලවිපාක, අකුසලවිපාක, චක්ඛුවිඤ්ඤාණාදීන් ගේ වශයෙන් දස වැදෑරුම් විපාක චිත්තයන්ට හා ඒ සමග උපදනා චෛතසිකයන්ට ප්‍රතිඝ සංඥ යයි කියනු ලැබේ. ඕරයන්ට ආලම්බනවීම් වශයෙන් ගැටීමෙන් උපදනා හෙයිනි.

අරූපාවචර ධ්‍යානයෙහි හා එයින් උපදනා අරූප භවයෙහි ප්‍රතිඝ සංඥාවන් නොපවත්නා හෙයින් ප්‍රහාණයෙන් - නො ඉපද වීමෙන් ඔවුන්ගේ අභාවය කියනලදී.

යටකී විපඤ්ච විඤ්ඤාණ සංඛ්‍යාත ප්‍රතිඝ සංඥාවෝ ප්‍රථම ධ්‍යානාදියට සමවන්නහුට ද කැලම නැත්තාහ. එකල්හි පඤ්ච ඕරික වශයෙන් සිත නොපවත්නා හෙයිනි. එසේ ඇතිකල්හිදු ප්‍රථම ධ්‍යානාදියට සමවන්නහු විසින් ප්‍රහීණ කළ සුඛ දුක්ඛයන් **"සුඛස්සව පහාණා"** යනාදීන් චතුර්ථ ධ්‍යානයෙහි ද සෝවාන් මගින් ප්‍රහීණ කළ **"සක්කාය දිට්ඨි"** ආදි සංයොජනත්‍රය ද **"පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං"** යි අනාගාමි මාගීයෙහි ද ප්‍රශංසා වශයෙන් හා උත්සාහ දූනවීම පිණිස කීවා සේ අරූපාවචර ධ්‍යානයෙහි ප්‍රතිඝ සංඥාවන්ගේ කීම එයට ප්‍රශංසා වශයෙන් හා එහි උත්සාහ දූනවීම පිණිස යැ.

අන්‍යවූ ද අර්ථයෙකි:- ඒ ප්‍රතිඝ සංඥාවෝ රූපාවචර ධ්‍යානයට සමවැදුනහුට ද නැත්මැයි. ඒ නැත්තේ ප්‍රහීණ කිරීමෙන් නොවේ. ඒ එසේ මැයි:- රූපාවචර ධ්‍යානය රූප විරාගය පිණිස නො පවතී. මේ ප්‍රතිඝ සංඥාවන් අරූපධර්ම වුව ද ඔවුන්ගේ පැවැත්ම රූපායත්තමය. රූපාවචරධ්‍යානය රූප නො වුවත් රූපය අයත් කොටම පවතී. එහෙත් මේ අරූපාවචර ධ්‍යානය රූප විරාගය පිණිසම පවතී. එහෙයින් මෙහි ඒ රූප සංඥ ප්‍රහීණ යයි කීමට වටනේය: කීමට පමණක් නොව ඒකාන්තයෙන් මැ ධාරණය කිරීමට ද වටනේයි.

ඒ ප්‍රතිඝ සංඥාවන් මේ අරූප ධ්‍යානයෙන් පෙර ප්‍රහීණ නො කළ හෙයින් ම බුදුහු ප්‍රථම ධ්‍යානයට සමවැදුනහුට ශබ්දය කන හුණු කටුවක් මෙනැයි වදළහ.

---

[1] වී: ප: ඛ්‍යානවිභඞ්ග 197 පිට

ඒ එසේමැයි:- පරතොඝොෂ ප්‍රත්‍යයයෙන් ලැබියයුතු සෝවාන් මාගීයට අනන්තර ප්‍රත්‍යය වූ ගොත්‍රභූ ඥනයට හේතුවූ ශබ්දය ප්‍රථම ධ්‍යානයට කණ්ටකයෙකි. එහෙයින් බලවත් ශබ්දයාගේ ගැටීමෙන් ප්‍රථම ධ්‍යානයෙන් නැගිටීම වේ. අරූපධ්‍යානයෙහි ප්‍රතිඝ සංඥාව ප්‍රහීණ කළ හෙයින් අරූප සමාපත්තීහු **'ආනෙඤ්ජාභි සංඛාර-යහ'** යි ද, **'ශාන්ත විමොක්ෂයහ'** යි ද, කියන ලදුව. අරූපධ්‍යානයට සමවන් **ආළාර කාලාම** තෙමේ මහත්වූ චක්‍ර නාදයෙන් යුක්ත වැළගින් ම පෙළට ගිය පත්සියයක් ගැල් නොදිටී. ශබ්දය ද නො ඇසී. ශබ්දය අසා අරූපධ්‍යානයෙන් නො නැගිටින බවට මේ සාධකයි.

නානත්ත සඤ්ඤානං අමනසිකාරා = නානාවිධ අරමුණෙහි පැවති සංඥා හෝ නානාවිධ සංඥා මෙනෙහි නොකිරීමෙන්ය' යි කී සාමාන්‍යය විස්තර කරනුවෝ

තඤ්ච කතමා නානත්ත සඤ්ඤා අසමාපන්නස්ස මනොධාතු සම්ඵස්සෝ වා මනොවිඤ්ඤාණධාතු සම්ඵස්සෝ වා සඤ්ඤා, සඤ්ඤා-නානා සඤ්ජානිතත්තං ඉමා වුච්චන්ති නානත්තසඤ්ඤායො[1] යනු වදාළහ.

එහි නානාත්ව සංඥා නම් ධ්‍යානයට සම නො වැදුනහු ගේ මනොධාතු සංඛ්‍යාත පඤ්චද්වාරාවජ්ජන සිතින් හෝ, මනොවිඤ්ඤාණධාතු සංඛ්‍යාත මනොද්වාරාවජ්ජන සිතින් හෝ, යුක්තවූවහුගේ යම් සංඥාවක් හැඳිනීමක් හඳුනන බවෙක් වේ නම් ඒ නානාත්ව සංඥා යැ.

විභඞ්ගයෙහි මෙසේ දක්වන ලද සංඥාවෝ රූප ශබ්දාදී ප්‍රභේද ගත නොයෙක් සභාව ඇති ආලම්බනයෙහි පවත්නාහුය. ඒ සංඥාවෝ නම් කාමාවචර කුසල සංඥා අට යැ. (8) අකුසල සංඥා දෙළොස යැ (12) කාමාවචර කුසල විපාක සංඥා එකොළොසයැ (11) අකුසල විපාක සංඥා දෙක යැ (2) (දසපඤ්චවිඤ්ඤාණය (10) ප්‍රතිඝ සංඥා නාමයෙන් පෙර කී හෙයිනි.) කාමාවචර ක්‍රියා සංඥා එකොළොස යැ (11) යන සුසාලිස සංඥා වශයෙන් නොයෙක් ප්‍රභේද ඇත්තාහුය. ඔවුනොවුන්ට විසදෘශ හෙයින් ඔහු නානාත්ව සංඥා යයි කියන ලදහ.

ඒ නානාත්ව සංඥාවන් යම්තාක් කල් මෙනෙහි නො කෙරේ නම් ඒ තාක් සවීප්‍රකාරයෙන් මෙනෙහි නො කිරීම හේතුකොටගෙන මෙනෙහි නො කෙරේ යයි ද ආවජ්ජනා නො කිරීම හේතුකොටගෙන

---

[1] වි: ප: ඤාණවිභඞ්ග 197 පිට

ආවජ්ජනා නොකෙරේයයි ද කියන ලදී. පෙර කී සේ රූප සංඥා ප්‍රතිඝ සංඥා අරූපාවචර ධ්‍යානයෙන් උපදනා අරූප භවයෙහි කැලම නැත්. එහෙයින් මේ ධ්‍යානයට සමවැදී ඒ ආරූපප භවයෙහි වසනකල ඒ සංඥා නැතැයි කියනුම කවරේ ද? එහෙයින් ඔවුන්ගේ ඉක්ම-වීමෙන් ද, අසාඩගමයෙන් දැයි දෙයාකාරයෙන් ම අභාවය ම කියේ වෙයි. එහෙත් නානාත්ව සංඥාවන් අතුරෙන් කාමාවචර කුසල සංඥා අට ද මනොද්වාරාවජ්ජන එක ඟා මහා ක්‍රියා අට දැයි යන මේ ක්‍රියා සංඥා නවය ද ප්‍රතිඝද්වය හැර අකුසල සංඥා දසය දැයි මේ සත්විසි සංඥාවෝ අරූපාවචර ධ්‍යානයෙන් උපදනා හෙයින් විද්‍යමානයහ. එහෙත් මෙ ධ්‍යානයට සමවැද වසනකල ඔවුන්ගේ මෙනෙහි කිරීමක් නැති හෙයින් ම **"නානත්ත සඤ්ඤානං අමනසිකාරා"**යි කී නියාෑ දතයුතු. ඔවුන් මෙනෙහි කෙරේ නම් ධ්‍යානයට සම නොවදනේ මැයි.

මේ **"රූපසඤ්ඤානං සමතික්කමා"** යන්නෙන් සියලු රූපාවචර ධර්මයන්ගේ ද, **"පටිඝසඤ්ඤානං අත්ථඩගමා - නානත්ත සඤ්ඤානං අමනසිකාරා"** යන්නෙන් කාමාවචර චිත්ත-චෛතසික ධර්මයන්ගේ ද, ප්‍රහාණය ද, මෙනෙහි නොකිරීම ද සැකෙවින් කියන ලදී.

නිගමනය:- අරූපාවචර ධ්‍යානය නැති කල්හි චුතියෙන් මත්තෙහි ඉපදීමට සුදුසු රූපාවචර ධ්‍යානයන්ගේ හා විපඤ්ඤා විඤ්ඤාණයන්ගේ ද, විපාක ප්‍රවෘත්තිය ඇතිතාක් විපාක දීමට සමර්ථ වෙතත් මේ අරූපාවචර ධ්‍යාන ඉපදවීමෙන් එය පවතින තාක් ඔවුන්ගේ විපාක නොලැබෙන සභාවයට පැමිණවීමෙන් ද, රූප සංඥා ප්‍රතිඝ සංඥාවන්ගේ සමතික්‍රමණය හා අසාංගමය ද, කියන ලදි. (නානාත්ව සංඥාවන් අතුරින් රූපනිශ්‍රිතවැම පවත්නා සංඥාවෝ අනවකාශ හෙයින් නො උපදිති. අරූප ධ්‍යානයෙන් වළකන ලද හෙයින් නොවේ.) ආරූපභාවනාවෙන් නොවළකන ලද හෙයින් සමහර සංඥා උපදිති. එහෙයින් ඔවුන් මෙනෙහි කිරීම ජවනයන්ට හෝ භවාඩග සිතට ඇතුළත් නොකරන බව කියන ලදී.

මෙසේ **"රූප සඤ්ඤානං සමතික්කමා - පටිඝ සඤ්ඤානං අත්ථඩගමා - නානත්ත සඤ්ඤානං අමනසිකාරා"** යන මේ පද තුනෙන් ආකාසානඤ්චායතන සමාපත්ති වර්ණනය කියන ලදී.

තවද කිසි ආස්වාදයක් නැති අහසෙහි පැවති සංඥයෙහි කවර ආනිසංසයෙක්දැයි වරදවා ගත්තවුන්ගේ ඒ ගැනීම වළකාලීම සඳහා කී මේ ආනිසංස අසා මේ සමාපත්තිය ශාන්තය ප්‍රණීත යැයි,

එය ඉපදවීමට උත්සාහ කෙරෙමුයැ යි, මෙසේ උත්සාහ ඉපදවීම සඳහා ද මේ කියන ලදී.)

"අනන්තෝ ආකාසෝ" ති=අනන්ත අවකාශයැයි 'අවකාශය නම් පරිච්ඡේදයයි' එහි සවාභාවික ධර්මයන් ගේ මෙන් උත්පාදයා ගේ හෝ අභාවයා ගේ අන්තයක් නො පැතෙන හෙයින් අනන්තය. විශෙෂයෙන් මෙහි අභිප්‍රේත වූයේ **කසිණුග්ඝාටිම අවකාශය** යැ. එය අජටාකාශය හා පරිච්ඡින්නාකාශයයැ යි ද්විප්‍රකාර වූ අවකාශ යෙන් අන්‍ය ය. ඒ හා අමිශ්‍ර ය. ඉපදීමේ හෝ නැතිවීමේ හෝ අන්ත යක් නො පැතෙන හෙයින් අනන්ත ය.

විසෙසෙ:- සවාභාවික දෙය පෙර නො පැවැති උපදනා හෙයින් හා ඉපිද වැනසෙන හෙයින් ද, උදය - ව්‍යය දෙකින් පිරිසිදේ. අවකාශය වනාහි අසඞ්ඛාවික දෙයක් හෙයින් ඒ දෙකින් නො පිරිසිඳිනා ලදින් අනන්ත ය. මෙය පෙර කී සේ **කසිණය** (ආලෝකය) මෙනෙහි නො කොට උගුළුවා ඒ ආලෝකය පැවැති ආකාශ මාත්‍රය විනා පරිච්ඡේදය නො ගැනීමෙන් ද, පරිකම්ම භාවනා වශයෙන් අනන්තව ද පවත්නා හෙයින් අනන්තාකාස නම් වී.

එහෙයින් කීහ:- **තස්මිං ආකාසෙ චිත්තං ඨපෙති සණ්ඨපෙති අනන්තං එරති තෙන ඛුච්චති අනන්තෝ ආකාසෝති**[1] යි "ඒ කසිණුග්ඝාටිම ආකාශයෙහි උපචාරධ්‍යාන චිත්තය (මෙනෙහි කිරීම් වශයෙන්) පිහිටුවයි. අනන්ත වශයෙන් පතුරුවයි. එහෙයින් අනන්ත ආකාශය' යි කියන ලදී."

"ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති" ආකාසා-නඤ්චායතන ධ්‍යානය උපදවා වාසය කෙරේ. මෙහි වනාහි පෙර කී සේ ආකාශයා ගේ උත්පාදනාදිය හෝ ව්‍යයානාදිය නැති හෙයින් ආකාසානන්ත නම් වේ. (ඒ ආකාසානන්තය ම සවාර්ථයෙහි "ණ්‍ය" ප්‍රත්‍යය වැ යවන් වූ "ත්‍ය" යන්නට චකාරය හා නකාරයට "ඤ" කාරව ආකාසානඤ්ච නම් වේ.) ("හෙසජ්ජ මෙව හෙසජ්ජං" යි කීවා සේ)

තව ද දෙවියන්ට වාසස්ථානය වූ දෙවොළොස් දෙවායතනය වන්නා සේ අපරිච්ඡේදාකාශයම මේ ධ්‍යානය පිහිට කොට ඇති හෙයින් හෝ සම්ප්‍රයුක්ත ධර්මයන්ට ආධාර වූ හෙයින් මේ ධ්‍යාන චිත්තය ම ආකාසානඤ්ච නම් වේ.

මේ ධ්‍යානය උපදවා එයට සමවැද එයට සුදුසු ඉරියව්වෙන් වාසය කරන්නේ ය, යනු මෙහි අදහස යි.

මේ ආකාසානඤ්චායතන භූමිස්ථානයෙහි විස්තර කථාව යැ.

---

[1] වි: ප: ඛුද්ද විභඞ්ග 198 පිට

(2) විඤ්ඤාණඤ්චායතනය

විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය වඩනු කැමැති යෝගීහු විසින් ආවජ්ජනාදී පඤ්චවිධ වශීතාවයෙන් ආකාසානඤ්චායතන සමාපත්තිය පුරුදු කොට (වශී බවට පැමිණි පසු) මේ ආකාසානඤ්චායතන සමාපත්තිය රූපාවචර පඤ්චමධ්‍යාන සංඛ්‍යාත සතුරකු ළංවැ ඇත්තේ යයි ද, එය ඉක්මවීමෙන් ම ඒ විරුඬ ධර්මයන් ඉක්මවිය යුතු හෙයින් අත්‍යාසන්නවූ පස මිතුරන් ඇතැයි ද, ඒ කසිණාලෝකය පැතිරි අහසෙහි ලැබිය යුතු හෙයින් විඤ්ඤාණඤ්චායතනය මෙන් සංසුන් නොවේ යයි ද, මෙසේ ආකාසානඤ්චායතනයෙහි ආදීනව සලකා ඒ පිළිබඳ කැමැත්ත සිඳපියා විඤ්ඤාණඤ්චායතනය ශාන්ත වශයෙන් මෙනෙහි කොට ඒ කිසුණු ඉගුළු අහස පැවැති ආකාසානඤ්චායතන ධ්‍යාන චිත්තය (අනන්තං විඤ්ඤාණං) **'විඤ්ඤාණය අනන්ත යැ'** යි හෝ **'විඤ්ඤාණය, විඤ්ඤාණ යැ'** යි හෝ මෙනෙහි කළ යුතු. නැවත නැවත මෙනෙහි කළ යුතු. ආවජ්නා කළ යුතු. තකී කළ යුතු. විතකී කළ යුතු.

එහෙත් විඤ්ඤාණය නොගෙන 'අනන්ත යැ යි, පමණක් මෙනෙහි නො කළ යුතු.

ඒ ප්‍රථමාරූප්‍ය විඥානය උත්පාදනත්ත ව්‍යයානත්ත දෙකින් යුක්තවූව ද අනන්ත අවකාශය අරමුණුකොට පවත්නා හෙයින් පැතිරෙන ආකාරයෙන් අන්තරහිත හෙයින් අනන්ත යයි මෙසේ මෙනෙහි කරන ඒ යොගාවචරයාට පෙර කී සේ ආකාශයෙහි ආකාසානඤ්චායතනය සේ ඒ අහස සපගීකොට ගන්නාලද ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණය අරමුණුකොට **විඤ්ඤාණඤ්චායතන ධ්‍යාන චිත්තය** උපදී. (අපීණා චිත්තයා ගේ පැවැත්ම පෙරකී සේ මය. එනම් දෙවිතිය අපීණා චිත්තයෙහි මුලදී කාමාවචර උපෙක්ඛා වේදනා සම්ප්‍රයුක්ත ජවන සිත් තුනක් හෝ හතරක් ඉපිද සතරවැනි ව හෝ පස්වැනි ව විඤ්ඤාණඤ්චායතන ධ්‍යාන සිත අපීණා වශයෙන් උපදී.)

එහෙයින් ම:- **"සබ්බසෝ ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති"**[1] යි කියන ලදී.

සබ්බසෝ= පෙර කී සේයි. (හෙවත් ආසන්නවූ රූපධ්‍යාන සතුරන් ඇති බව යනාදීන් සවිප්‍රකාරයෙන් දෙස් දැක ඒ ධ්‍යානයෙහි නිකාන්තිය පහ කිරීමෙන් හෝ ආවජ්නා නොකිරීම් ආදීන් **කුසල - විපාක - ක්‍රියා** - වශයෙන් සියලු ආකාරයෙන්.)

---

1 වි· ප: ඛුද්ධ විභඞ්ග 186 පිට

ආකාසානඤ්චායතනං සමතික්කමම්= මෙහි පෙර කී සේ ධ්‍යානය ද ආකාසානඤ්චායතන නම් වේ. ආලම්බනය ද ආකාසානඤ්චායතන නම් වේ. (එහි ආකාසානඤ්චය ආයතන කොට ඇත්තේ යම් ධ්‍යානයකට නම් ඒ ආකාසානඤ්චය යි අන්‍යාර්‍ථ සමාස වශයෙන් ධ්‍යානය කී) ආලම්බනය ද ප්‍රථමාරූප්‍ය ධ්‍යානයට ආධාර වීම් වසයෙන් ආකාසානඤ්ච වූයේත් හේමය. ආයතන වූයේත් හේමය යි තුල්‍යාධිකරණ සමාස හෙයින් ආකාසානඤ්චායතන නම් වේ. දෙවියන්ට දෙවායතනය මෙනි.

එසේම සඤ්ඤාති දෙසාර්‍ථයෙන් ද ආකාසානඤ්චායතන නම් වේ. ඒ මෙසේ යි:- ආකාසානඤ්චායතන වූයේත් හේ ම ය. ඒ ධ්‍යානයාගේ හටහැනීමට සුදුසු දෙශය වූයේත් හේ ම නු යි ආකාසානඤ්චායතන නම් වේ. කාම්බෝජ ජනපදය අශ්වයන්ගේ ඉපදීමට ආයතන (සුදුසු දෙශය) වන්නාක් මෙනි. මෙසේ ධ්‍යානය අපවත් කිරීමෙන් ද, ආලම්බනය මෙනෙහි නො කිරීමෙන් ද, දෙක ම ඉක්මවා ම මේ විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයට පැමිණ විසිය යුතු වන හෙයින් ඒ දෙක ම එක්කොට ආකාසානඤ්චායතනය ඉක්මවා යයි කියන ලදැයි දත යුතු.

අනන්තං විඤ්ඤාණං = පෙර 'අනන්තො ආකාසෝ' යි කී ඒ අනන්ත අවකාසය පැතිර පැවති ඒ ප්‍රථමාරූප්‍ය විඥානය අනන්තං විඤ්ඤාණං කියා මෙසේ මෙනෙහි කෙරේ යයි කියන ලදී. ඒ යොගී තෙමේ ඒ ආකාසය ආලම්බනය කොට පැවති විඤ්ඤාණය සර්‍වප්‍රකාර යෙන් අනන්ත යැයි මෙනෙහි කෙරේ. මෙසේ මෙනෙහි කිරීම් වශයෙන් ද අනන්තය යි කියන ලදී.

එහෙයින් ම **අනන්තං විඤ්ඤාණන්ති තං යෙව ආකාසං විඤ්ඤාණෙන ඵුටං මනසිකරොති අනන්තං එරති තෙන වුච්චති අනන්තං විඤ්ඤාණන්ති**[1] මේ එහි අර්‍ථය යැ. "ඒ අනන්ත ආකාසයැයි මෙසේ ආකාසය සපරිශී කළ විඥානය විඤ්ඤාණඤ්චායතන චිත්ත යෙන්මෙනෙහි කරයි. **විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති**[2] මෙනෙහි කිරීම් වසයෙන් හා පැතිරවීම් වසයෙන් ද, අන්ත රහිත හෙයින් විඤ්ඤාණඤ්ච නම්වූ ඒ දවිතීයාරූප්‍ය චිත්තය දෙවියන්ට දෙවායතනය මෙන් සසම්ප්‍රයුක්ත ඒ ධ්‍යානයට පිහිටීමට ස්ථාන වන හෙයින් විඤ්ඤාණඤ්චායතන නම් වේ. සෙස්ස පෙර සේ මැසි.

විඤ්ඤාණඤ්චායතන කම්මට්ඨානයෙහි විභාග කථාව ය.

---

[1] වි: ප: ඛ්‍යානවිභඞ්ග 198 පිට

[2] වි: ප: ඛ්‍යානවිභඞ්ග 186 පිට

(3) ආකිඤ්චඤ්ඤායතනය

ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය වඩනු කැමති යොගාවචර තෙමේ පස් ආකාරයකින් විඤ්ඤාණඤ්චායතනයෙහි මනා පුරුදු බැවින් වසඟ බවට පැමිණ 'මේ විඤ්ඤාණඤ්චායතනය සමීපයෙහි පවත්නා ආකාසානඤ්චායතන නැමැති සතුරකු ඇත්තේ ය. ආකිඤ්චඤ්ඤායතනය සේ ශාන්ත ද නොවේය' යි විඤ්ඤාණඤ්චායතනයෙහි ආදීනව දැක එහි කැමැත්ත සිඳපියා ආකිඤ්චඤ්ඤායතනය ශාන්ත සේ මෙනෙහි කොට ඒ විඤ්ඤාණඤ්චායතනයට අරමුණුවූ ආකාසානඤ්චායතන විඤ්ඤාණයා ගේ අභාවය, ශූන්‍යභාවය, විවික්තාකාරය මෙනෙහි කළ යුතු. ඒ විඤ්ඤාණය මෙනෙහි නොකොට "නැත" "නැතැයි" හෝ "ශූන්‍යය" "ශූන්‍යය" යි හෝ "විවික්තයැ" "විවික්තයැ" යි හෝ සිහි කළ යුතුය. නැවත නැවත මෙනෙහි කළ යුතුයි. එසේ මෙනෙහි කරන ඒ යොගාවචරයාගේ සිතෙහි නීවරණයෝ පහවෙති සිහිය පිහිටයි. උපචාර වශයෙන් සිත සමාධි වෙයි. හෙතෙම ඒ නිමිත්ත නැවත නැවත වඩන්නේ වෙයි. එකල ඔහට පෙර ආකාශයෙහි පහළ වූ විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය මෙන් ඒ විඤ්ඤාණඤ්චායතනයාගේ ශූන්‍ය භාව සඞ්ඛ්‍යාත අරමුණෙහි ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන සිත පිහිටයි. මේහි ද පෙර කී සේ මැයි.

විශේෂ:- ඒ ආකාසානඤ්චායතන ධ්‍යාන චිත්තයා ගේ අභාව මාත්‍රාලම්බනයෙහි ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන සිත අවිණා වශයෙන් උපන් කල්හි ඒ යොගාවචරතෙමේ ප්‍රඥයෙහි අහසැ පැවැති විඤ්ඤාණයා ගේ අභාවමාත්‍රය මෙනෙහි කරයි.

ඒ මෙසේයි:- යම් කිසි පුරුෂයෙක් ධර්මසභාදියෙහි කිසි යම් වැඩක් සඳහා රැස්ව හුන් නිඝණු සඞ්ඝයා බලා කිසි කටයුත්තකට ගොස් නැවත පැමිණෙන විට පැමිණි කටයුත්ත අවසන් කොට එතැනින් නිඝණු සඞ්ඝයා නැති යාමෙන් හිස්ව තුබූ ශාලාව ම දකී. ඔහට ඒ නිඝණුන් අතුරින් මෙ තෙක් දෙන කලුරිය කළහ. මෙ තෙක් දෙන ඒ ඒ දිගට ගියහ යි කියා මෙනෙහි නො වේ මය. වැලි මේ මණ්ඩපය ශූන්‍යය හිස්ය යි මෙ පමණෙක් ම මෙනෙහි වෙයි.

මේ සේ ම පෙර අහස පැවැති විඤ්ඤාණය විඤ්ඤාණඤ්චායතන ධ්‍යාන නැමැති ඇසින් බලමින් වාසයකොට නැවත "නත්ථි නත්ථි= නැත නැත" යි පරිකම් භාවනා වශයෙන් මෙනෙහි කිරීමෙන් ඒ විඤ්ඤාණය පහව ගිය කල්හි හුදෙක් ඒ පහවීම් මාත්‍රය වූ අභාවය ම

බලමින් වාසය කරයි. එය කුමකින් පහව ගියේ දැයි හෝ නොතැන්හි ගියේ දැයි නොබලයි. මෙතෙකින් ඒ යොගාවචර තෙමේ– **සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති**[1] යි. ආලම්බනය හා ධ්‍යානය ඉක්මවීමෙන් "සම්පූර්ණයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්ම කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය උපදවා වාසය කෙරේ" ය යි කියනු ලැබේ. (විසතර විඤ්ඤාණඤ්චායතනයෙහි කියේ යි.)

පෙර කී සේ විඤ්ඤාණඤ්චායතනයට අරමුණුවූ ආකාසානඤ්චායතන ධ්‍යානය මෙනෙහි නොකිරීමෙන් අපවත් කොට හුදෙක් ඒ අභාවයම "කිසිවක් නැතැයි" මෙනෙහි කිරීමෙන් උපදවන ලද ධ්‍යානය ආකිඤ්චඤ්ඤායතන යයි කියනු ලැබේ.

ආකිඤ්චඤ්ඤායතනයෙහි විසතර කථාවය.

---

(4) නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය

නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානය වඩනු කැමති යොගාවචර තෙමේ පස් ආකාරයෙකින් ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙහි වසි බවට පැමිණීමෙන් මේ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට ළඟ වූ විඤ්ඤාණඤ්චායතන නමැති පසම්තුරා ඇත්තේ ය. නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය සංස්කාරයන් ගේ සියුම් බවට පැමිණීමෙන් විශෙෂයෙන් සන්හුන්කා සේ සන්හුන් බවට පැමිණියේත් නො වේ. ඒ සන්හුන් බව නැති හෙයින් ම (රූපාදිසඤ්ඤයෙහි) ප්‍රත්‍යයයෙන් යැපිය යුතු හෙයින් හා රෝගයට මුල් බැවින් ද රෝගයක් බඳුවේ. දුක් බැවින් හා රිදීම් ඇති කරන හෙයින් ගඩක් (පොළක්) බඳුවේ. පීඩා උපදවන හෙයින් හුලක් බඳු වේ. මේ සියල්ල සංඥාව ඇති කල්හිම වන හෙයින් **"සඤ්ඤා රොගො, සඤ්ඤා ගණ්ඩො, සඤ්ඤා සල්ලා"**[2] යි සංඥාව රෝගයෙක; ගඩෙක; හුලෙකැ'යි වදළහ. (මෙහි සංඥා නම් විඥානය යැ.)

(මේහි වනාහි පඤ්චවොකාර භවගත සංඥාව (විඥානය) අනිප්‍රෙතය. ප්‍රකට හෙයිනි. හුදෙක් එපමණක් නොව වෙදනා චෙතනාදිය ද සංග්‍රහ වේ.) මෙසේ ආකිඤ්චඤ්ඤායතනයෙහි දෙස් දැක එහි ඇසෑ දුරුකොට නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයෙහි ආනිසංස ද බලා එය ශාන්ත වශයෙන්, ප්‍රණීත වශයෙන්, මෙනෙහි

[1] වි: ප: ඣානවිභඞ්ග 186 පිට [2] ම: නි: උපරිම පණ්: 15

කොට ප්‍රථමාරූප්‍යවිඥානයා ගේ අභාවය අරමුණුකොට පැවැති ඒ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ම **"ශානන යෑ ශානන යෑ"** යි නැවත නැවත මෙනෙහි කරන, ආවජ්ජනා කරන, ප්‍රත්‍යවෙක්ෂා කරන, තක්‍කී කරන, විතක්‍කී කරන, (එහිම සිත) නැවත නැවත පිහිටුවන ඒ යෝගාවචරයා ගේ සිත්හි නීවරණයෝ පහවෙති. සිහිය පිහිටයි. උපචාරධ්‍යානයෙන් සිත එකඟ වේ. හෙතෙම ඒ ධ්‍යාන නිමිත්ත නැවත නැවත වඩයි. එසේ වඩන්නාහට විඤ්ඤාණඤ්චායතනය මෙන් ආකිඤ්චඤ්ඤායතන යයි කියන ලද සතර නාමඋකුණ්ඩ සංඛ්‍යාත අරමුණෙහි නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යාන සිත අනුක්‍රම වශයෙන් මනා ව උපදී. (මෙහි අනුක්‍රම ක්‍රමය ද යට කී සේ දතයුතු.)

මෙතෙකින් ඒ යොගාවචර තෙම:- **"සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤා නාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති"**[1] පෙර කී සේ සම්පූර්ණ ප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය ඉක්ම නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට පැමිණ වාසය කෙරේ.

විසතර පෙර කී සේ මැයි.

මෙහිද, ආලම්බනය ද, ධ්‍යානය ද, ආකිඤ්චඤ්ඤායතන නම් වේ. දෙවියන්ගේ වාසස්ථානය ආධාරාර්ථයෙන් දෙවායතන නම් වන්නා සේ තෘතීය අරූපධ්‍යානයට අරමුණු වන හෙයින් ආකිඤ්චඤ්ඤා වූයේම ආයතන නම් වේනු යි ආකිඤ්චඤ්ඤායතන නම් වේ.

ඒ ධ්‍යානයා ගේ ඉපදීමට හේතු වූ බැවින් කාමෙධාජ දෙශය අගවයන් ඉපදීමට සථාන සංඛ්‍යාත ආයතන වන්නා සේ ආකිඤ්චඤ්ඤවූයේ ම ආයතන වේනුයි ආකිඤ්චඤ්ඤායතන නම් වේ. මෙකී ආරම්මණය ද ධ්‍යානය දැයි දෙකම අපවත් කිරීමෙන් හා මෙනෙහි නො කිරීමෙන් ඉක්මවා මැ ව්‍යක්ත වූ සංඥාවක් නැති හෙයින් සංඥා යයි ද, සංඥා සවභාවය නො ඉක්ම වූ හෙයින් අසංඥා යයි ද නොකිය යුතු වූ යම් සංඥාවක් ඇති හෙයින් ඒ ධ්‍යානය නෙවසඤ්ඤා නාසඤ්ඤා නම් වේ.

එහෙයින් **"තඤ්ඤෙවඤ්ච ආකිඤ්චඤ්ඤායතනං සනන්තතො මනසිකරොති සබ්බාරාවසෙසසමාපත්තිං භාවෙති. තෙන වුච්චති නෙවසඤ්ඤී නාසඤ්ඤීති"**[2]

---

[1] මි: ප: ඣානවිභඞ්ග 186 පිට

[2] ,, ,, 198 පිට

"ඒ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ම ශාන්ත වශයෙන් මෙනෙහි කරයි. සංඝකාරාවශේෂ සමාපත්තිය වඩයි. එහෙයින් ඒ පුද්ගලතෙම **'නෙවසඤ්ඤීනාසඤ්ඤී'** යයි කියනු ලැබේ." මෙ සේ පුද්ගලාධිෂ්ඨාන ධර්මදේශනා වශයෙන් (සංඥාවත්වූ පුද්ගලයාගේ වශයෙන්) සංඥාව උද්ධරණය කොට දක්වා වදාළ සේක.

(ඒ අරමුණ හා පවත්නා ආකාරය ද දක්වනු පිණිස මේ වදාළසේක.)

ඒ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය ශාන්ත වශයෙන් මෙනෙහි කොට සංඝකාරාවශේෂ සමාපත්තිය වඩන ඒ පුද්ගලතෙම නෙවසඤ්ඤීනාසඤ්ඤී නම් වේ.

විභාග:- ප්‍රථම ආරුප්‍යයා ගේ අභාවය අරමුණුකොට උපදවන හෙයින් ඒ තෘතීයාරුප්‍ය ධ්‍යානය ද සත්ත්‍වයන් අරමුණු ඇතිහෙයින් කාරණූපචාර වශයෙන් ශාන්තය යි මෙනෙහි කෙරේ. අංග ශාන්ත භාවයෙන් මෙනෙහි කරත් හොත් වෙනසක් නැති හෙයින් (ඉක්මිම නො වන හෙයින් මේ හුදෙක්) ආරම්මණ ශාන්ත භාවයෙන් ම මෙනෙහි කරයි.

ශාන්ත වශයෙන් මෙනෙහි කරත් ම ආදීනව දැක්මෙක් කෙසේ වේද සි චෝදනාවට පරිහාර දක්වනුවෝ ධ්‍යානයට සමවදිනු නො කැමැති බැවින් ඉක්මවීම වන්නේය සි කීහ.

ඒ එසේමැ සි:- යම් ධ්‍යානයක් ශාන්ත වශයෙන් මෙනෙහි කෙරේනම් ඒ ධ්‍යානය ආවජ්ජන සමාපජ්ජනාදි ප්‍රතිපත්තියෙන් පුරුදු කරන්නේ වේ. එහෙත් තෘතීයාරුප්‍යයෙහි ඒ සවිප්‍රකාරයෙන් නැත්තේ ය. හුදෙක් අරමුණු කිරීම් මාත්‍රයෙකින් මෙනෙහි කිරීම වෙයි. ආකිඤ්චඤ්ඤායතනයට වඩා නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය අතිශයින් ශාන්ත බැවින් හා ප්‍රණීත බැවිනි.

කුමක් මෙන් ද යත්:- මහත් වූ රාජානුභාවයෙන් ඇතකු පිට නැගී නුවර වීථියෙහි හැසිරෙන මහරජ තෙමේ එක් කඩක් තරව හැඳ, එක් කඩක් හිසේ බැඳ ඇත්දත් සුනු ඇඟපුරා තවරා ගෙන නොයෙක් ඇත්දත් කැටයම් කරන්නාවූ ශිල්පියකු දැක "කොළ! මේ ඉතා දක්ෂ ශිල්පියෙක් වේය" යි ඔහුට තුටු පහටු වූව ද "මම ද රාජ්‍ය සමපත් හැරපියා මෙ බඳු ශිල්පියෙක් වෙමි"යි ඕහට අදහසෙක් නො වේ මය. ඒ රාජ්‍යශ්‍රියම මහානුභාව බැවිනි. එලි ඔහු ඉක්මවා ඔබ්බට යන්නේ ය. එ සේ ම ඒ යෝගාවචරයා ද ඒ තෘතීයාරුප්‍යය ශාන්ත වශයෙන් මෙනෙහි කොට එය ඉක්මවා සංඥාවශේෂ

සමාපත්ති නම් වූ යම් සමාපත්තියක් නිසා නෙවසඤ්ඤී නාසඤ්ඤියයි කීයේ නම් ඒ සමාපත්තිය වඩනේ වෙයි. මෙහි සංඥාශීර්ෂයෙන් දෙශනාව විය. මේ සංඝකාරයන් ගේ පරම සියුම් බවට පැමිණියාවූ ඒ චතුර්ථාරූප්‍ය සමාපත්තිය යි දතයුතු.

රූපාවචර ප්‍රථමධ්‍යානයා ගේ උපචාරයේ පටන් ධ්‍යාන පිළිවෙළින් කෙලෙසුන් සැස තුනී කරන්නාක් මෙන් පැවැති භාවනා පිළිවෙළින් සංඝකාරයන් තුනීකොට අනන්ත සියුම් බවට' පමුණුවන ලද සංඝකාර මේ ධ්‍යානයෙහි ඇති හෙයින් එයින් මත්තෙහි නිරෝධය මුත් සංඝකාරයන් ගේ පැවැත්මෙක් නැත්තේයි. එ හෙයින් ම චතුර්ථාරූප්‍ය සමාපත්තිය සංඝකාරාවශෙෂ සමාපත්ති යයි කියන ලදී.

මෙහි වූකලී පරමාර්ථ වශයෙන් චතුර්ථාරූප්‍ය ධ්‍යාන ලාභීහුගේ කුසල චිත්තය හෝ සතරවන අරූප තලයෙහි පහළවූ සතර (අරූපසඤ්ඤ) විපාක චිත්තය හෝ දෘෂ්ටධම්ම සුඛ විහරණය පිණිස ඒ ධ්‍යානයට සමවන් රහතන්ගේ ක්‍රියා චිත්තය හෝ නෙවසඤ්ඤා නාසඤ්ඤායතන නම් වේ. එහෙත් මෙහි විශෙෂයෙන් අධිප්‍රඥා ශික්ෂාය යි කියන ලද මාගීඵලාධිගමයට පූර්භාගයෙහි පැවැති ධ්‍යානයට සමවන් පෘථග්ජන - ශෛක්ෂයන්ගේ ඒ ධ්‍යානය පිළිබඳ චිත්ත-චෛතසික ධර්මයෝ ම කැමති වත ලදහ. ඖදාරික සංඥාවක් නැති හෙයින් ද, සියුම් සංඥාවක් ඇති හෙයින් ද, සම්ප්‍රයුක්ත ධර්ම සහිත ඒ ධ්‍යානයෙහි සංඥා ඇත්තී ද නො වෙයි. නැත්තී ද නො වේය යි නෙවසඤ්ඤා නාසඤ්ඤා නම් වේ.

විශෙෂ:- මෙහි සංඥාවන් ගේ ඖදාරික සුබුම භාවය ඒ ඒ භව වශයෙන් දතයුතු. පඤ්චවොකාර භවයෙහි සංඥාවට වඩා චතුවොකාර භවයෙහි සංඥාව සියුම් වේ. යට තුන් භූමියෙහි සංඥාවෝ ඖදාරිකයහ. එබදු ඖදාරික සංඥා නැති හෙයින් **නෙවසඤ්ඤායයි** ද ඉතා සියුම් සංඥා ඇති හෙයින් **නා අසඤ්ඤා යයි** ද ව්‍යවහාර වේ.

'නෙවසඤ්ඤා' යන පදයෙහි 'න' කාරය අභාවාර්ථයෙහි වේ. 'න අසඤ්ඤා' යන්නෙහි 'න' කාරය අන්‍යාර්ථයෙහි ය. අකාරය අභාවාර්ථයෙහි පවතී. එසේ වන්නා "අසඤ්ඤං + අනාසඤ්ඤං"යි සෙසු ධ්‍යානයන්හි මෙන් ඖදාරික සංඥා නැති හෙයින් අසඤ්ඤා ද, සූක්ෂ්මප්‍රකාරයෙන් සංඥාව ගේ අභාවය නුවූ හෙයින් අනාසඤ්ඤා ද, වන හෙයින් **'නෙවසඤ්ඤා නාසඤ්ඤා'** යයි කියන ලදී.

මනායතන ධම්මායතනයන්ට **එක** දෙශයකින් ඇතුළත් වන හෙයින් නෙවසඤ්ඤා- නාසඤ්ඤා වූයේ ද, ආයතන වූයේ ද, හේමනුයි **නෙවසඤ්ඤා නාසඤ්ඤායතන** නම් වේ. (මෙහි ආයතන භාවය ආධාර හෙයින් නිශ්‍රය වශයෙන් වේ.) එසේ ම සියුම් සංඥව විදශීනා කෘත්‍යයට අපොහොසත් බැවින් නෙවසඤ්ඤායයි ද, සංසකාරාව-ශෙෂ සූක්ෂම භාවයෙන් විද්‍යමාන හෙයින් නාසඤ්ඤායයි ද, ව්‍යවහාර හෙයින් ඒ දෙපදය ගළපා නෙවසඤ්ඤා නාසඤ්ඤාය යි කියන ලදී. එය ම අවශෙෂ ධම්යන්ට ආධාරවේනු යි **නෙවසඤ්ඤා නාසඤ්ඤා-යතන** නම් වේ.

තවද මෙහි **සංඥා** මාත්‍රය පමණක් නො වැ වෙදනාව ද ගෙන **'නෙව වෙදනා නා වෙදනා'** චිත්තය ද ගෙන **''නෙව චිත්තං නා චිත්තං''** සපශීය ගෙන **නෙව එසො නා එසො,** යතාදීන් ඒ ඒ සම්ප්‍රයුක්ත ධම්යෙහි ව්‍යවහාර කළහැකි වුව ද, මේ දෙශකාව සංඥා ශීර්ෂයෙන් (ප්‍රධාන කොට) ගෙන මෙසේ ව්‍යවහාර කරන ලදී. **නානත්තා කායා නානත්තා සඤ්ඤිදී,** යතාදියෙහි මෙනි.) (මෙහි සංඥා නම්, විඤ්ඤය) යම්කිසි අර්ථයක් නිසි සවභාවයෙන් ඇතැයි කිවයුතු ධම්යාගේ ම අන්කිසි අර්ථ විශෙෂයක් නැතැ යි කිවයුතු බැවින් මෙසේ කියන ලදී.

නිදශීනයෙකි:- හෙරණ නමක් පළමු දිනයෙහි පාත්‍රයෙහි තෙල් ගල්වා තුබුයේය. පසුදා උදය කෑද වළඳන පිණිස තෙරුන් නාන්සේ 'පාත්‍රය ගෙනෙව' යි කී කල සවාමීනි! 'පාත්‍රයෙහි තෙල්යැ'යි කිය. එසේ වන්නා 'ඒ තෙල් ගුලාවෙහි වැක්කිරීමට ගෙනෙව'යි තෙරුන් කී කල සවාමීනි! 'තෙල් නැතැ' යි හෙරණ කිය. මේ උපමායෙන් නිඝණ්ටු ලන්නා අකැප කිළියෙහි තෙල් සහිත පාත්‍රය තුබූ හෙයින් එහි කෑද වත්කළ කල කෑද සමග සන්නිධි වන හෙයින් තෙල් ඇතත් නලයක පුරාලන පමණ තෙල් නැති හෙයින් 'තෙල් නැතැයි' කී. එසේ ඒ සංඥාව ද ඖදාරික සංඥා කෘත්‍යය කිරීමට අසමර්ථ හෙයින් නෙවසඤ්ඤා නම් වුව ද, සංසකාරාවශෙෂ සූක්ෂම භාවයෙන් ඇති හෙයින් නාසඤ්ඤා නම් වේ.

විශෙෂ:- මෙහි සංඥා කෘත්‍ය නම් අරමුණු හැඳිනීම හා විදශීනා ගොචර භාවයට පැමිණ නාමරූපයන් ගේ කලකිරීම වූ නිර්විදාඥානය ඉපදවීම ය. 'මද උණුසුම් ජලය නහන්නාගේ ශරීරය තොදවා සුව එලවන සේ ය' මේ සංඥාව සංසකාරාවශෙෂ සූක්ෂම භාවයෙන් ප්‍රකට වැ සඤ්ඤානත්ත කෘත්‍යය කිරීමට අසමර්ථ හෙයින් යට තුන්ධ්‍යානයෙහි සංඥාව මෙන් විදශීනාඥානයා ගේ ගොචර බවට පැමිණ නිර්විදාඥානය ඉපදවීමට අසමර්ථ වේ. අරමුණෙහි ඉතා

සන්හුන්ව පවත්නා හෙයින් අරමුණු හැඳිනීම ද නොකට හැකි වෙයි. එහෙයින් ම අනිත්‍යාදි වශයෙන් මෙතෙහි කොට විදශීනාවට අරමුණු වැ නිර්‍වේදය ඉපදවිය නොහැකි වේ.

විඤ්ඤාණඃ- අන්‍ය වූ කාමාවචර රූපාවචරාදි චිත්ත-චෛතසික සඞ්ඛ්‍යාත සෙසු සකඞ්ගයන්හි විදශීනාභිනිවෙශ නො කළ (අනිත්‍යාදි වශයෙන් නො දත්) මහණ **නෙවසඤ්ඤානාසඤ්ඤායතන** මාත්‍රයක්ම සම්මශීනය කොට නිර්‍විද්‍යතයට පැමිණෙන්නට සමර්‍ථ නො වේ. **සම්බුදයන් වහන්සේ** හැර සියල්ලන් ගෙන් අගතැන් පත් **සැරියුත්** මහතෙරුන් වහන්සේ ද පවා නො පොහොසත් වේම ය. ප්‍රකෘතියෙන් විදශීනා වඩනා සැරියුත් තෙරුන් වහන්සේ වැනි මහා ප්‍රාඥ යොගාවචර තෙමේ සකඞ්ගාදීන් ගේ පටන් විදශීනාභිනිවෙශය කොට ඣානාලම්බනයන් නිසා පවත්නා ධර්‍මයන් ගේ වශයෙන් **මාදඤායතන-අට්ඨාරස ධාතූන්** විදශීනා කරනුයේ ඒ **නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය** අරමුණුකොට ඇති උදයව්‍යයඥානය උපදවන්නට සමර්‍ථ වේ.

කෙසේද යත්:- "මෙසේ මේ ධර්‍මයන් නො තිබී උපදිති" "තිබී වැනසෙති යි" කියා ය. චතුර්‍ථාරූප්‍ය ඣාන විත්තොත්පාදයට ඇතුළත් වූ සපශීාදී වූ ධර්‍මයන් වෙන් නො කොට (කලාප වශයෙන්) සම්මශීනය කෙරේ. එසඤාදි ධර්‍මයන් වෙන්කොට වෙන වෙන ම අනුපද ධර්‍ම වශයෙන් එක එක ධර්‍මය පිළිවෙළින් අනිත්‍යාදි වශයෙන් සම්මශීනය කරන්නා හට මේ සතරවන අරූප ඣාන විදශීනා කොට ඒ නිර්‍වේදඥානය නො ලැබේ.

(සපශීාදි ධර්‍මයන් වෙන් වෙන් කොට වෙන වෙන ම සවරූපයෙන් ගෙන අනිත්‍යාදි වශයෙන් සම්මශීනය කිරීම අනුපද ධර්‍ම විදශීනාව ය.)

එසේ චතුර්‍ථාරූප්‍ය ඣානයෙහි ඇතුළත් සපශීාදි එක එක ධර්‍මය ගෙන අනිත්‍යාදි වශයෙන් බැලීමට නුවණැත්තවුන් අතුරින් අග තැන්පත් **සැරියුත්** මහ තෙරනුවෝ ද අසමර්‍ථය හ. හුදෙක් එහි ඇතුළත් සපශීාදි ධර්‍ම එක්කොට කලාප වශයෙන් විදශීනාවට අරමුණු වේ. මාශී-උදකොපමායෙන් ද මේ අර්‍ථය දතයුතු.

මගට පිළිපන් තෙර කෙනකුත් ඉදිරියේ යන හෙරණ තම වහන් තෙමෙන පමණ දියත්තක් දැක සවාමීනි! වහන් ගැලවුව මැනව! 'ජලය ඇතැයි' කී. එකල තෙරුන් වහන්සේ සාමණේරය! දිය ඇත්තේ වී නම් 'නහන කඩ ගෙනෙව ජලය නහම්' යි කීහ. **එකල හෙරණ**, සවාමීනි! 'ජලය නැතැ'යි කී. එහිදු වහන් තෙමෙන **පමණ ජලය** ඇති හෙයින් ජලය ඇතැයි ද නහන පමණ ජලය

නැති හෙයින් ජලය නැතැයි ද කීයේ වේ. එසේ ම ව්‍යක්ත සංඥ නැති හෙයින් නෙවසඤ්ඤායයි ද, සංයඛාරාවශෙෂ සූක්ෂම භාවයෙන් විද්‍යමාන හෙයින් නාසඤ්ඤායයි ද, දතයුතු.

උපසම්පජ්ජ විහරති = මෙද පෙර කී සේම ය.

(මේ ටීකාගත විස්තාරයෙකි.)

ප්‍රශ්නයෙකි:- යට ධ්‍යානයන්හි **"අනන්තො ආකාසෝ, අනන්තං විඤ්ඤාණං, නත්ථි කිඤ්චි"** යි, ඒ ඒ තැන කීවා සේ මෙහි භාවනාකාරය නො කීවේ කවර හෙයින් ද?

පිළිතුර:- භාවනා ආකාරය නම් උපචාර සහිත ධ්‍යානයා ගේ නම්‍ය පිළිබඳ අරමුණෙහි පවත්නා ආකාරය යැ. මෙහි අරමුණ නම් **ආකිඤ්චඤ්ඤායතන ධම්** යැ. ඔවුන් ගන්නා කල පුරෝගාමී ධම්යන් ගේ වශයෙන් එකක් හෝ ගත යුතු ය.

වෙන වෙන ම සියල්ල හෝ ගතයුතු ය. එකක් ගන්නේ ප්‍රථම පක්ෂයේ විඤ්ඤාණය ගතයුතු වේ. එසේ වන්නා **විඤ්ඤාණං 'විඤ්ඤාණං'**යි මෙනෙහි කිරීමෙන් විඤ්ඤාණඤ්චායතනය ගැනීම වේ. මෙසේ ගනු ලබන්නේ චතුර්ථාරුප්‍යයට ආකිඤ්චඤ්ඤායතනය අරමුණු වන හෙයින් **ආකිඤ්චඤ්ඤං ආකිඤ්චඤ්ඤං** (කිසිවක් නැතැ යි) මෙනෙහි කළයුතු වේ. එසේ වන්නා ආකිඤ්චඤ්ඤායතනය හෝ අභාවය ආලම්බනය වේ.

නෙවසඤ්ඤා, නාසඤ්ඤායතන භාවය ආලම්බන නො වේ. මේ මෙහි අකාරණය. එසේ ධ්‍යානය නො පවත්නා හෙයිනි. (චතුර්ථාරුප්‍ය ධ්‍යානය විඤ්ඤාණඤ්චය හෝ ආකිඤ්චඤ්ඤය අරමුණු කොට නො පවත්නේ මය:)

තවද ප්‍රශ්නයෙකි:- චතුර්ථාරුප්‍ය ධ්‍යානයේ ඥාන බව කුමක් ද? එසේ නම් කුමක් හෙයින් පාළියෙහි එසේ නො කියන ලද ද?

පිළිතුර:- සූත්‍රයෙහි හුදෙක් එසේ නො ගන්නා ලදී. විභඞ්ගයෙහි වනාහි:-

"තඤ්ඤෙවාකිඤ්චඤ්ඤායතනං ඤාණතෝ මනසිකරොති. සඞ්ඛාරාවසෙසං සමාපත්තිං භාවෙති[1] හි" දක්නා ලැබේ.

---

[1] වි: ප: ඛ්‍රාන්තිවිභඞ්ග 198 පිට

ප්‍රශ්නය:- එසේ නම් කුමක් හෙයින් සූත්‍රයෙහි ද විභඞ්ගයෙහි මෙන් එසේ නොගත්තා ලදද?

පිළිතුර:- වෙනෙයාධ්‍යාශය වශයෙන් හෝ දෙශනා විලාශ හෙයිනි. ඒ මෙසේ යි:- යට තුන් ආරුප්‍යයෙහි **"අනන්තො ආකාසෝ, අනන්තං විඤ්ඤාණං, නත්ථිකිඤ්චී"** යි භාවනාකාරය ගත්තා ලදී. එහි එසේ ගත් කල්හි ම ඒ අර්ථය අවබෝධ වේ නම් ඔවුන් ගේ වශයෙන් සූත්‍රයෙහි එසේ වදාළහ.

විශෙෂ:- අභිධර්මයෙහි සූත්‍රානන්ත භාජනීය ද සූත්‍රානන්ත ගතික යැ. යම් වෙනෙයජන කෙනෙක් බෙදා වදාළ කල්හි ම ඒ අර්ථය අවබෝධ කෙරෙත් නම් ඔවුන් ගේ වශයෙන් විභඞ්ග භාවනාවාරය වදාළහ. ධර්මස්වාමී වූ **සම්‍යක් සම්බුද්ධයන්** වහන්සේ ද, ධර්මදේශනා ප්‍රකාරය දන්නා සේක් ඇතැම් තැනෙකැ භාවනා ආකාරය ගනිති. ඇතැම් තැනෙකැ නො ගනිති. ඒ ඒ දෙශනාව ම ඒ ඒ වෙනෙයයන් විනයනය සඳහා යැ. මේය දෙශනා විලාශය නම්.

තවද අර්ථයෙකි "සූත්‍රානන්ත දෙශනාව පර්‍යායය (අමුඛ්‍ය=අප්‍රධාන) කථාව හෙයින් එහි භාවනා ආකාරය නොගැනේ. එහෙත් අභිධර්ම දෙශනාව නිෂ්පර්‍යායය (ප්‍රධාන කථාව) හෙයින් එහි භාවනා ආකාරය ගන්නා ලදී.

මෙසේ මෙහි භාවනා ආකාරය ගැනීමේ හා නො ගැනීමේ හෙතු දතයුතු.

මතාන්තරයෙකි:- අභයගිරි – ජේතවන වැසි ඇදුරෝ **'චතුර්ථාරුප්‍යධ්‍යානයෙහි චෙතස දැක්වීම සඳහා සූත්‍රයෙහි දී භාවනා ආකාරය නො ගත්තා ලදැ යි, යෙති. ඒ විශෙෂ අනුපූර්ව භාවනාවෙන් ජනිත යැ. හෙද (ඒ අනුපූර්ව භාවනාව ද) ප්‍රහාතව්‍ය ධර්ම පහකිරීමෙන් සියලු ධ්‍යාන ලැබිය යුතු හෙයින් ප්‍රහාන ක්‍රමයෙන් ජනිත යැ.**

ඒ මෙසේ යි:- **කාමච්ඡන්දාදි විරාගයෙන් ප්‍රථමධ්‍යානය ද, විතර්ක – විචාර සංසිදවීමෙන් ද්විතීයධ්‍යානය ද, ප්‍රීති විරාගයෙන් තෘතීයධ්‍යානය ද, සෞමනස්ස** (සුඛ) **අස්තඞ්ගමයෙන් චතුර්ථ ධ්‍යානයද'** යි මෙ සේ රූපාවචර ධ්‍යාන වදාළහ. රූප සංඥා ඉක්මවීම මුල්කොට අරූපධ්‍යාන වදාළහ. හුදෙක් ධ්‍යාන පමණක් නො වේ. සියලු සීලය ද, සියලු ප්‍රඥාව ද, ප්‍රතිපක්ෂ ධර්ම ප්‍රහාණයෙන් ම සම්පාදනය කළයුතු හෙයින් ප්‍රහාතව්‍ය ධර්ම සමතික්‍රමණ මුඛයෙන් දෙශිත යැ.

ඒ මෙසේ සි:- 'ප්‍රාණඝාතය හැර ප්‍රාණඝාතයෙන් වැළකීමය' යනාදීන් **සීල සංවරය ද,** ඇසින් දැක නිමිති කුඩා නිමිති නො ගැනීම ය, යනාදීන් **ඉන්ද්‍රිය සංවරය ද,** (නෙව දවාය න මදුය) ක්‍රීඩා පිණිස මද වැඩීම පිණිස නො වේ, යනාදීන් **භොජනයෙහි පමණ දැනීම ද,** මිථ්‍යා ආජීවයෙන් වෙන් වැ සම්‍යක් ආජීවය කරන්නේ ය. යනාදීන් **ආජීවපාරිශුද්ධිය ද,** 'පඤ්චුපාදානක්ඛන්ධයෙහි අධික ලොභය හැර පහවූ අභිධ්‍යා ඇතිව විසිය යුතු ය.' යනාදීන් **ජාගරියානුයොගය ද,** 'අසම් මානය කැසීමෙන් **අනිත්‍ය සංඥාව** වැඩිය යුතු ය.' යනාදීන් **මෙත්තිය සුත්තාගත සේ**[1] ප්‍රඥා ප්‍රතිපක්ෂ ධර්මප්‍රහාණයෙන්, **විදර්ශනා ප්‍රඥාව වැඩීම ද,** දෙශනා කළහ. එහෙයින් ම ප්‍රහාතව්‍ය ධර්ම ඉක්මවීම් මුඛයෙන් ම ධ්‍යාන දෙශනා කරන බුදුහු **"විවිච්චෙව කාමෙහි"** යනාදීන් වදාළහ. එය යට කී සේ ය. තවද රූප සංඥාදීන් සමතික්‍රමණ මුඛයෙන් අරූපාවචරධ්‍යාන වදාළහ.

විභාග:- එහි (රූපාවචර ප්‍රථමධ්‍යානය) භාවනා විශෙෂයෙන් අධිගත වූ චිතකීාදීන් ගෙන් **හා නීක්ෂණ - විශ ද** - ශූරභාවය - ඇති ශ්‍රද්ධාදි පඤ්චෙන්ද්‍රිය ධර්මයන් ගෙන් **යුක්ත** හෙයින් **කාමච්ඡන්දදී** නීවරණයන් හා ඒ හා පවත්නා පාප ධර්මයන් **විකම්භණය** කිරීමෙන් උත්තරි මනුෂ්‍ය ධර්මතාවයට පැමිණි රූපාවචර ප්‍රථමධ්‍යානය කාමාවචර ධර්මයන්ට වඩා අතිශයින් සියුම් වේ. ශාන්ත වේ. ප්‍රණීත වේ. එසේ ම දවිතීය ධ්‍යානය භාවනා විශෙෂයෙන් චිතකී-විචාර සංඛ්‍යාත ඕඳාරිකාඞ්ගප්‍රහාණයෙන් ප්‍රථමධ්‍යානයට වඩා අතිශයින් සංසුන් වෙයි. එසේ ම තෘතීය චතුර්ථ ධ්‍යානයෝ ක්‍රමයෙන් පළමු පළමු ධ්‍යානඛයට වඩා ශාන්තතර ශාන්තතම වෙති. එසේ ම අරූපාවචර ප්‍රථමධ්‍යානය රූප විරාග භාවනා වශයෙන් පවත්නා හෙයින් ආරම්මණ ශාන්ත බැවින් හා අඞ්ගයන් ගේ සංසුන් බැවින් ප්‍රකෘති කාමාවචර ධර්මයන්ට වඩා ද, සියලු රූපාවචර ධ්‍යානයන්ට වඩා ද ශාන්ත වෙයි. සියුම් වෙයි. අරූපාවචර විතීයධ්‍යානාදිය පිළිවෙළින් ශාන්ත භාවයෙන් ඒ ආලම්බන කොට පවත්නා ධ්‍යාන ධර්මයෝ ද ශාන්ත සවභාවය ඇත්තෝ වෙති.

විශෙෂ:- ලොකොත්තර ධර්මාලම්බනික වූ සෝවාන් ආදි මාර්ග ඵල ධර්මයන් මතු මත්තෙහි ක්‍රමයෙන් සංසුන් වන්නා සේ ධර්මයන් ගේ වශයෙන් මහද්ගත භාවයෙන් භෙදයක් නැතත් රූපාවචර චතුර්ධ්‍යානයට වඩා අරූපාවචර ධ්‍යානය අඞ්ග වශයෙන් ද, සංසුන් වෙයි. එහෙයින් අරූපධ්‍යානයා ගේ ශාන්ත විමොක්ෂ බව වදාරන ලදී. එසේ ම විතීයාරූප්‍යාදීහු ද, ප්‍රථමාරූප්‍යයට වඩා අඞ්ග

[1] අ: නි: තවක නිපාත 832

වශයෙන් ද, ආලම්බන වශයෙන් ද, ශාන්ත, ශාන්තතර, ශාන්තතම, භාවයට පැමිණියාහු ය. එසේ ම ශාන්තාදි භාවයට පැමිණියා වූ භාවනා විශෙෂ සමායොගයෙන් (මේ භාවනා විශෙෂය වනාහි) ප්‍රථමධ්‍යාන උපචාරයෙහි පවත් ඒ ඒ ප්‍රහාතව්‍ය ධර්මයන් ඉක්ම-වීමෙන් ශාන්ත සූක්ෂම භාවයට පමුණු වමින් චතුර්ථාරූප්‍යයෙහි සංස්කාරාවශෙෂ සූක්ෂම භාවයට පමුණුවයි.

එහෙයින් චතුර්ථාරූප්‍යය අනුපදධර්ම විදර්ශනාවට අරමුණු බවට පැමිණ, ප්‍රකෘති විදර්ශකයාට ද, නිර්භේද ඉපදවීමට ප්‍රත්‍යය නො වේ. එසේ ම තෘතීයාරූප්‍යයෙහි පවත්නා වූම ඒ ධර්මයෝ ද, යම් පමණෙකින් ප්‍රකාශ කළ නො හැකි වෙති. අන්‍ය ධ්‍යානයෙන් තමා ගේ අරමුණ අරභයා පැවතීම් මාත්‍රයක් ඒ ධ්‍යානයෙහි වේ

චතුර්ථාරූප්‍යය වනාහි ආරම්මණ භාවයෙන් ද, නාමධර්මයන් ගේ විභූතාකාරයෙන් ද, සිටීමට නො පොහොසත් වී නම් අරමුණු කිරීමෙහි කෙසේ සමර්ථවේ ද? නො වේම ය. එහෙයින් ම ශාස්තෘන් වහන්සේ යට තුන් ධ්‍යානයෙහි භාවනා ආකාරය වදාරා මෙහි එබන්දක් නො ලැබෙන බැවි දක්වන්නට පර්‍යාය දෙශනා හෙයින් සූත්‍රයෙහි භාවනා ආකාරය නො දෙසූ සේක. එහෙත් අරමුණු සහිත ධර්මය අරමුණෙහි පවත්නා ආකාරය ඇත්තු සි අති සූක්ෂම භාවයට පැමිණියා වූ ඒ ධ්‍යානය දක්වනු පිණිස **"නත්ථිකිඤ්චි ආකිඤ්චඤ්ඤායතනං සන්තතෝ මනසි කරොති"** සි වදාළහ. යථාධර්ම ශාසන හෙයින් හෝ පූර්ණාගම ප්‍රතිපදා වශයෙන් හෝ **"සන්තතෝ මනසිකරොති"** සි වදාළහ. එකල යොගාවචරයා හට ඒ අරමුණ ප්‍රකට හෙයිනි. එහෙත් අර්‍ථණා වශයෙන් සූත්‍රයෙහි භාවනා ආකාරය අප්‍රකට හෙයින් නො ගන්නා ලදී.

ඒ එසේ මැ සි:-**කර්මස්ථානය බුද්ධානුස්සති** ආදි කිසි තැනෙකැ ආදියෙහි අප්‍රකට වේ. **ආනාපානස්සති** ආදි කිසිවෙකැ මධ්‍යයෙහි අප්‍රකට වේ. **උපසමානුස්සති** ආදිය සේ කිසිවිටෙකැ ආදි-මධ්‍ය දෙක්හි අප්‍රකට වේ. චතුර්ථාරූප්‍යයෙහි වනාහි අවසානයෙහි අප්‍රකට වේ. භාවනාව මුදුන් පැමිණි කල්හි ආලම්බනය ද, අප්‍රකට වන හෙයිනි. එහෙයින් මේ විශෙෂය දක්වනු පිණිස බුදුහු චතුර්ථාරූප්‍ය-යෙහි භාවනාකාරය නො ගත්හ. සම්ප්‍රකාරයෙන් නැති නිසා නො වේය සි මෙහි නිෂ්ඨාවට යා යුතු.

නෙවසඤ්ඤා නාසඤ්ඤායතන කර්මස්ථානයේ විස්තර කථාව ය.

ප්‍රකීර්ණක කථාව

මෙසේ අසදෘශ සවරූප වූ **ලොකඤ්ඤාමින්** වහන්සේ වදාළ පරිද්දෙන් සතර වැදෑරුම් අරූපධ්‍යානයන් දැන එයට අනතුරුව එහි ප්‍රකීර්ණක කථාව ද දතයුතු.

ආරම්මණානිකකමතෝ - චතසෝපි භවනතිමෙ
අඞ්ගාතිකකමමෙතෙසං - න ඉච්ඡනති විභාවිනෝ

"අරූප සමාපත්තීහු රූපාදී අරමුණු ඉක්මවීමෙන් සතරදෙනෙක් මැ වෙති. එහි රූපාවචර ධ්‍යානයෙහි මෙන් අඞ්ගාතික්‍රමණය නුවණැත්තෝ කැමැති නො වෙති."

විභාවිනී:- මේ සතර අතුරින් ප්‍රථමාරූප්‍යය **කසිණ** රූපය වූ ප්‍රතිභාග නිමිත්ත ඉක්මවීමෙන් ද, විතීයාරූප්‍යය **කසිණුග්ඝාටිමාකාශය** ඉක්මවීමෙන් ද, තෘතීය ය ඒ ආකාශයෙහි පැවැති විඤ්ඤාණය ඉක්මවීමෙන් ද, චතුර්ථය විඤ්ඤාණයා ගේ අපගම්ය ඉක්මවීමෙන්ද සි මෙසේ අරමුණු දැක්වීමෙන් වෙති.

රූපාවචර සමාපත්තීන්හි මෙන් අඞ්ගාතික්‍රමණය මෙහි නැති. මේ අරූප සමාපත්තීන්හි උපෙක්ඛා **එකග්ගතා** විසින් අඞ්ග දෙකෙකි. එහෙත් මොවුන් අතුරින් පසුව පසුව වූ සමාපත්තීහු අතිශයින් ප්‍රණීතතර වෙති. එය **ප්‍රාසාදතල, ඝාමිකා** උපමාවලින් දතයුතු.

ඒ මෙසේයි:- "සිවු මහල් පහයෙක යට තෙලෙහි දිව නැටුම්-වැයුම්, සුවඳ-මල්, අමා බොජුන්, අසුන්-වසත්‍ර-සුවඳ දුම්-විලවුන්-වත්සුණු-ආදි වශයෙන් උතුම් පස්කම් ගුණ වේ. දෙ වන මහලෙහි එයට වඩා ද, තුන් වන මහලෙහි එයටත් වඩා ද, **සතර** වන මහලෙහි එයටත් වඩා ද, උතුම් වූ පස්කම් සුව එළවයි. හුදෙක් ඒ සතර ම පාසාදතල වුව ද පස්කම් සුවයෙහි සමාධිබලයෙන් යට යට තලයනට වඩා මතු මතු තල අතිශයින් ප්‍රණීත වේ.

එසේ ම **එක** ම ගැහැණියක **කවිනා** ලද දල හූය, සිහින් හූය, අතිශයින් සිහින් හූය, **ඝාත්පසින්** අතිශයින් සිහින් හූය, **යත** සතරාකාර වූ හූ සතර පලම ය, තුන් පලම ය, දෙ පලම ය, **එක්** පලම යැ සි මෙසේ ඒ ඒ ගණනින් **වියත** ලද අයම් විතරින් සම පමණ වූ වසත්‍ර සතරෙක් වේ. ඒවා ප්‍රමාණයෙන් සම වුව ද සුපශී යෙන් හා සියුම් මහහු බැව් ආදීන් පළමු පළමු සළුවලට වඩා පසු පසු වූ සළු අතිශයින් **ප්‍රණීත** වන්නා සේ මේ ආරූප්‍යධ්‍යාන

සමාපත්තීහු අඞ්ග වශයෙන් සම වුව ද, භාවනා භෙදයෙන් ඒ අඞ්ගයන් ගේ ප්‍රණීත භාවයෙන් පසු පසු වූ සමාපත්ති විශෙෂයෙන් ප්‍රණීතතර වෙති.

තවද උපමාවෙකිः- අපවිත්‍ර ප්‍රදේශයෙක මණ්ඩපයෙක් වෙයි. එහි පැමිණි පුරුෂයෙක් අපවිත්‍රයට පිළිකුලින් ඒ මණ්ඩපයෙහි එල්බ සිටී. ඒ වෙත පැමිණි අන් පුරුෂයෙක් ඔහු නිසා එල්බ ගනී. තව ද පැමිණි තුන්වන පුරුෂයෙක් 'ඒ දෙදෙනා සිටුනා සේ නොයෙදේ'යැ යි සලකා ඉන් පිටත සිටී. එහි පැමිණි සිව්වැනි පුරුෂයෙක් ඒ පිටත සිටියහු ඇසුරින් සිටී.

සංසන්දනයः- අපවිත්‍ර ප්‍රදේශයේ මණ්ඩපය සේ කිසුණු ඉගුළු අහස ද, අසුචියෙහි පිළිකුලින් මණ්ඩපයෙහි එල්බ සිටියහු සේ, රූප නිමිත්තෙහි පිළිකුලින් ආකාශාලම්බන වූ **ආකාසානඤ්චායතන ධ්‍යානය** ද, එල්බ සිටියහු නිසා සිටි පුරුෂයා සේ (ඒ ආකාශාලම්බන) **විඤ්ඤාණඤ්චායතන ධ්‍යාන චිත්තය** ද, ඒ දෙදෙනා නො නිසා පිටත සිටියහු මෙන් ආකාසානඤ්චායතන ධ්‍යානයා ගේ අභාවය අරමුණු කොට උපදවන **ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය** ද, ඒ පිටත සිටියහු නිසා සිටි පුරුෂයා සේ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය අරමුණු කොට පැවති **නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යාන චිත්තය** ද, දතයුතු. තවද මේ නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයට ආසන්න වූ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය සතුරු වුව ද ඇසුරු කොට ගනී. වෙන ඇසුරු කළ යුත්තක් නැති හෙයිනි. යම් සේ චණ්ඩ පරුෂ රජකු වුව ද වෙන ඇසුරු කළයුතු මනා රජකු නැතිකල තමා වෘත්තිය සඳහා ඇසුරු කරන මහා ජනයා මෙනි.

එසේ ම භිණි මුදුනට නැඟි පුරුෂයෙක් අල්ලා ගත හැකි අනිකක් නැති කල එය ම අල්ලා සිටිනා සේ මේ චතුර්ථාරූප්‍ය ධ්‍යානය ද තෘතීයාරූප්‍ය ධ්‍යානය අරමුණු කොට පවත්නේ ය.

හුදී ජනයා ගේ ප්‍රසාදය පිණිස කළ
**සිංහල විශුද්ධි මාර්ගයේ සමාධි භාවනාධිකාරයට ඇතුලත්
ආරූප්‍ය නිදේශ නම් වූ දස වන පරිච්ඡේදය සි.**

---

11 සමාධි නිදේශය

ආහාරයෙහි ප්‍රතිකූල සංඥාව (1)

මෙසේ අරූපකථාවට අනතුරුව එක ම සංඥාව යයි උදෙසන ලද **'ආහාරයෙහි පිළිකුල් සංඥාව'** භාවනා කිරීමේ විස්තර වාරය පිළිවෙළින් පැමිණි හෙයින් මෙතැන් සිට ඒ දැක්වේ.

විශෙෂ:- (සංඥ ශබ්දය නාකාථියෙහි පවතී.)

(1) **"රූපසඤ්ඤා සද්දසඤ්ඤා"** යනාදියෙහි ඇදිනීමට කාරණ වූ **ලක්ෂණයෙහි** ද,

(2) **"අනිච්චසඤ්ඤා දුක්ඛසඤ්ඤා"** යනාදියෙහි **විදර්ශනායෙහි** ද,

(3) **"උද්ධුමාතකසඤ්ඤාති වා සොපාක, රූපසඤ්ඤාති වා, ඉමෙ ධම්මා එකට්ඨා උදාහු නානට්ඨා"** යනාදියෙහි **ශමථ-යෙහි** ද ආයේ ය. මෙහි ද ශමථ පරිකර්මයෙහි දතයුතු. (ආහාරයෙහි පිළිකුල් ආකාරය ගැනීම හා ඉන් උපදවන උපචාරධ්‍යානය ද මෙහි අදහස් කරන ලදී.)

තවද මේ භාවනා විධියෙහි ඒ පිළිකුල් කටයුතු ආහාරයෙහි ම කළකිරීම හා නො ඇලීම උපදවනු පිණිස මේ අවසරයෙන් සියලු ආහාරය:-

(1) කෘත්‍යය (2) ප්‍රභෙදය
(3) ආදීනවය (4) උපමාය

යන මොවුන්ගේ වශයෙන් ප්‍රකාශ කරනු ලැබේ.

(1) **"ආහරතීති ආහාරො"** = ඵලයක් ඵළවානුයි ආහාර නම්. ආහාරය තමා ප්‍රත්‍යය කොට (උපකාරයෙන්) ඉපදීමෙහි දී හෝ පැවතීමේ දී තමා අයත් ඵලය උපදවන්නා හෝ පවත්වන්නා යනු අදහසයි.

(2) (i) කබලිඞ්කාරාහාරය (ii) ඵස්සාහාරය
(iii) මනො සඤ්චෙතනාහාරය (iv) විඤ්ඤාණාහාරයැ' යි
ඒ සිවු වැදෑරුම් වේ.

(i) **"කබල** කොට ගිලිනා අර්ථයෙන් **කබලිකාරාහාරය** යි." මේ වූ කලී වසනුව (බත් ආදි ද්‍රව්‍යය) සහිත වැ කියන ලදී. ලක්ෂණ

වශයෙන් නම් ඕජාව යැ. මේ **කබලීකාරාහාර** සංඛ්‍යාත වස්තුව පෙර කී සේ මේ ශරීරය පවත්වන හෙයින් **කබලීකාරාහාරය** යි කියනු ලැබේ. (අනික් ආහාරයන්හි ද ආහාරාර්ථය මෙසේ ම දතයුතු.)

(ii) අරමුණ වැදගන්නා හෙයින් **ඵස්ස** නම් වේ.

(අරූප ධර්ම වූ මේ ඵස්සය අරමුණෙහි (සපර්ශ) වැදගන්නා ආකාරයෙන් පවත්නා හෙයින් සපර්ශන ලක්ෂණය යි කියනු ලැබේ.)

(iii) චෙතනය කරනුයේ **චේතනා** යි. තමා සමග යෙදුනා වූ ඵස්සාදි ධර්මයන් අරමුණෙහි ගලපන්නේය යන අර්ථ යි. මනස නම් වූ සිත ඇසුරු කොට පවත්නා චෙතනාව **මනෝසඤ්චේතනා** ය.

(iv) යුක්ති සැලකීම් වශයෙන් විශේෂයෙන් දැනගන්නා අර්ථයෙන් **විඤ්ඤාණ** යැ.

විශේෂාර්ථ:- මෙ සේ සාමාන්‍ය අර්ථයෙන් ද, විශේෂ අර්ථයෙන් ද, මෙහි ආහාර දතයුතු. ඵලයට උපකාරවූ අන්‍ය ධර්ම ඇත ද මේ සතර පමණක් ආහාරය යි කියන ලද්දේ උපකාර වශයෙන් ද, අතිරේක වශයෙන් ද, ප්‍රත්‍යය වන හෙයිනි.

ඒ මෙසේයි:- මොවුනතුරින් ප්‍රථමය වූ **කබලීකාරාහාරය** තමා පිහිටි රූප කලාපයෙහි ඇතුළත් වූ සෙසු රූපයන්ට ද සුදුසු සේ උපකාර වෙමින් ඔජට්ඨමක රූපය උපදවයි. දෙවැන්න වෙදනාව පවත්වයි. තුන්වැන්න ත්‍රිවිධ භවයෙහි ප්‍රතිසන්ධිය පවත්වයි. සිවුවැන්න ප්‍රතිසන්ධික්ෂණයෙහි නාම - රූප පවත්වයි.

විඤ්ඤාර:- (ටීකාගත) කර්මජාදි හෙද භින්න වූ ඕජාව ප්‍රත්‍යය ලාභය ඇති කල්හි රූපකලාප සන්තති දෙක තුනක් ගළපමින් ඔජට්ඨමක රූපය උපදවයි.

සුඛ වෙදනාදීන්ට ප්‍රත්‍යය වූ ඵස්ස ආහාරය සුදුසු පරිදි ත්‍රිවිධ වෙදනාව උපදවයි.

පුණ්‍යානිසංසකාරාදි හෙද භින්න වූ මනෝසඤ්චේතනාහාරය කාමාදි තුන්භවයෙහි සවිඤ්ඤාණකවූ ද, අවිඤ්ඤාණකවූ ද, ප්‍රතිසන්ධිය ඵළවයි.

විඤ්ඤාණාහාරය, ප්‍රත්‍යය වූ පරිදි ප්‍රතිසන්ධික්ෂණයෙහි අරූපලයන්හි නාමය හා අසංඥලයෙහි රූපය හා සෙසු භවයෙහි නාම-රූපයන් ද උපදවයි.

තවද උපකාරක (රැකුල්දෙන) අර්ථයෙන් ද මේ ධර්මයෝ ම ආහාර නම් වෙති. **කබලීකාරාහාරය** මේ රූපකායයට රැකුල් දෙයි.

එසේ ම අංශු සෙසු ආහාර තුන තම තමා එක්ව යෙදුණු ධර්මයන්ට හා තත්සමුට්ඨාන රූපයන්ට රුකුල් දෙයි.

තවද ක්‍රමයෙනි:- අධ්‍යාත්මික ධර්ම පරම්පරාවට විශෙෂ උපකාර හෙයින් **කබලීකාරාහාරය** ද, සපර්‍යාදි වූ ධර්මයෝ තුන් දෙන ද, ආහාර නම් වෙති.

ඒ එසේ මැයි. **කබලීකාරාහාරය** අනුභව කරන සත්ත්වයන් ගේ රූපකායයට විශෙෂ උපකාරය වේ. නාම කායයෙහි වූ වෙදනා-වට **සපර්‍යය** ද, ප්‍රතිසන්ධි විඤ්ඤාණයට **මනෝ සඤ්චේතනාව** ද, එක්ව යෙදුණු නාම - රූපයනට **විඤ්ඤාණය** ද, එසේ ම විශෙෂ උපකාරය වේ.

(3) කබලීකාරාහාරයෙහි රසතෘෂ්ණා මූලයෙන් සෙවීම වන හෙයින් **නිකන්ති** (තෘෂ්ණාව ම) භය වෙයි. සපර්‍යාහාරයෙහි අරමුණ හා එක්වීම මැ භය වෙයි. මනෝ සඤ්චේතනාහාරයෙහි භවයෙන් භවය ගැළපීම භය වෙයි. විඤ්ඤාණාහාරයෙහි ප්‍රතිසන්ධිය මැ භය වේ.

(4) **කබලීකාරාහාරය** පුත්‍රමාංස උපමායෙන් දත යුතු. (දුර්භික්ෂ කාන්තාරයක් එතර කරන පුරුෂයෙක් මළ පුතා ගේ මාංසය තෘෂ්ණාවෙන් තොර ව හුදෙක් කාන්තාරය එතර කිරීම පිණිස ම අනුභව කරන්නා සේ කබලීකාරාහාරය රස තෘෂ්ණාවෙන් තොර ව දෙහ යාත්‍රාව පිණිස ම අනුභව කරන කල රසතෘෂ්ණාව නො පවතී.)

සපර්‍යාහාරය හම් ගැසූ ගව දෙනක් සේ දතයුතු. හම් නැති දෙන ගිය ගිය තැන මැසි කවුඩු ආදී ප්‍රාණීන් කඩාකන්නා සේ සපර්‍යය නිසා වේදනාව වේ. හෙද දුක් වශයෙන් හුල් ආදි වශයෙන් දතයුතු.

මනෝ සඤ්චේතනාහාරය අඟුරු වළක් සේ දතයුතු. (එකොළොස් ගින්නෙන් ඇවිලගත් භවය කිහිරි අඟුරු වළක් සේ දක්නාහට උපපත්ති භය නො වන්නේ ය.)

විඤ්ඤාණාහාරය ආයුධ පහරක් බඳු වේ. විඤ්ඤාණය අතර්‍ථ පමුණුවන හෙයින් සොරකුසේ ද, වෙදනාව ශස්ත්‍රයෙන් පැහැරීම මෙන් ද දක්නහුට ප්‍රතිසන්ධි භය නො වේ.

මෙකී චතුර්විධ ආහාරයන් අතුරින් (ආහාරයෙහි) පටික්කූල සඤ්ඤාව ඉපදවීමට සුදුසු ආහාරය වූ ඛාද්‍ය-භොජ්‍ය-ලෙහ්‍ය-පෙය

යන සතර වැදෑරුම් ආහාර විකෘති වූ කබලීකාරාහාරය මැ මේ භාවනාචාරයෙහි ආහාරය යි ගැනේ.

විශේෂ:- උපාදාරූප කී තන්හි ආහාරය යි රූප දැක් වූ හෙයින් එයින් වෙන්කොට ගැනීම පිණිස මේ චතුර්විධ ආහාර විකෘතීන් දැක්වූහ. එහෙයින් මැ ඕජා ආහාරය නො ගෙන ගිලින ආහාරය ම මෙහි ලා "ආහාරය යි" ගැනේ. ඒ ආහාරයෙහි පිළිකූල් ආකාරය ගැනීම් වශයෙන් උපන් සංඥව ආහාරයෙහි පටික්කූල සංඥ නම්.

එය වඩනු කැමති යොගාවචර තෙමේ පාළියෙහි ආ පරිද්දෙන් කර්‍මස්ථානය මනාව ඉගෙන මෙනෙහි කොට අර්‍ථය වටහා ගෙන එක් පදයකුදු නො වරදවා රහසිගත වැ සිහි ඇති වැ හොජනාදි ප්‍රභෙදගත ඒ සිවු වැදෑරුම් ආහාරයෙහි දස ආකාරයකින් පිළිකූල් බව ප්‍රත්‍යවෙක්ෂා කළයුතු.

(1)	ගමනාගමන වශයෙන්	(6)	නො පැසීම් වශයෙන්
(2)	ගෙයක් පාසා සෙවීම් ,,	(7)	පැසීම් ,,
(3)	පරිභොග ,,	(8)	ප්‍රධාන ඵල ,,
(4)	පිත්තාදීන්ට ආශ්‍රය ,,	(9)	අප්‍රධාන ඵල ,,
(5)	තැන්පත් වන ස්ථාන ,,	(10)	ගැල්වීම් ,,

යන මේ දශ ආකාරයෙනි.

(1) මෙ සේ මහානුභාව ශාසනයෙහි පැවිදි වූ භික්‍ෂුව මුළු රැ බුද්ධ වචනය ඉගෙන සජ්ඣායනා කිරීමෙන් හෝ මහණදම් පිරීමෙන් ගතකොට, කල්ඇති වැ නැගිට සෑ මලු - බෝ මලු වත් සපයා, පියයුතු, පරිභොග කළයුතු, පැන් පෙරා තබා ලගිනා ගෙය හැමද සිරැර පිළිදගුම් කොට අසුනට නැග බොහෝ වේලා කමටහන් මෙනෙහි කොට ඉන් නැඟී, පා සිවුරු ගෙන ජන සම්බාධ රහිත උපධි විවෙක සැප යැ, සෙවණ හා ජල පහසුව යැ, පිවිතුරු සිහිල් මන වඩන බිම යැ, යන මෙසින් සිත්කලු තපොවනය කැරැ පියා ආයෂ්‍ මි විවෙක සුවය නො බලා, අඹු සොහොන වෙත මළකුණු සඳහා යන සිවලකු සේ ආහාර පිණිස ගමට මුව අයා යායුතු ය. මෙ සේ යන්නහු ඇදෙන් හෝ පුටුවෙන් හෝ නැගිටි තැන සිට පා දූවිලිය ද, සුහුණු - සිකතැල් මල ඇදියෙන් ගැවසුණු පාපිස්න ද, ඇක්මිය යුතු ය. ඇතැම් දිනෙක මී බෙටි වවුල් බෙටි ආදියෙන් ගැවසි හෙයින් ඇතුළු ගබටත් වඩා පිළිකූල් වූ ඉදිරි පෙදෙස ද, බඳ මුහුණු - පරෙවි - ආදීන් ගේ

වසුරෙන් අතිශය පිළිකුල් වූ යට මාලය ද, සුළඟින් හැලෙන පැරණි පත්‍ර ද, ගිලන් භික්ෂූන් ගේ හා ළදරු හෙරණුන් ගේ මළමූත්‍ර – සෙම් – සොටු ආදිය ඇති වැසිකිළ දිය – මඩ – කසළ ආදියෙන් වැඩියක් කිළිටු වූ හෙයින් අතිශයින් පිළිකුල් පිරිවෙන ද, එයටත් වඩා පිළිකුල් වෙහෙරට වදනා මාගීය ද, දැක්ක යුතු වෙයි. පිළිවෙළින් බොධිය හා චෛත්‍යය ද වැඳ විතකී මාළකයෙහි සිට මුතු රැසක් බඳු චෛත්‍යය ද, මොණර පිල් කලබක් බඳු බොධිය ද, බ්‍රහ්ම විමානයක් බඳු සෙනසුන ද, පෙරළා බලා මෙබඳු සිත්කලු ප්‍රදේශයට පිටුපා ආහාරය නිසා යා යුතු නො වේ දැ යි සලකා විහාරයෙන් නික්ම ගොදුරු ගමට යන මගට වන් භික්ෂුව කණුකටු ආදීන් ගැවසීගත් මග ද, වර්ෂා කාලය වුව ජල පහරින් බුන් විසම වූ මග ද, බලා අතතුරු වැ ගඩක් වසන්නා සේ අඳනා සිවුර ඇඳ, වණයක් වෙළා බඳනා සේ පටිය බැඳ, ඇටසැකිල්ලක් වසන්නා සේ සිවුර පෙරවා, බෙහෙත් කබලක් මැත් කරන්නා සේ පාත්‍රය ථවිකායෙන් මැත් කොට, ගම් දෙර සමීපයට වදනහු විසින් ඇත්– අස් – ගෙරි – සරක් – මළමිණි – නයි – බලු – කුණු දැක්ක යුතු වේ. හුදෙක් දැක්ක යුතුවා පමණක් නො ව නැහැය කඩා යන්නා සේ එවායේ දුගඳ ද විඳිය යුතු යැ.

අනතුරුවැ ගම්දෙර සිට දරුණු ඇත් – අස් උවදුරු බැහැර කරලීම සඳහා ග්‍රාම භීති බැලිය යුතු වේ. මේ සේ පාපිස්නායෙහි පටන් කුණප අවසන් කොට ඇති තොයෙක් පිළිකුල් දෑ ආහාරය නිසා මැඩිය යුතු ද, දැකිය යුතු ද, ආඝ්‍රාණය කළයුතු ද, වේ යයි මෙ සේ 'ඒකාන්තයෙන් ආහාරය පිළිකුලැ' යි ගමන වශයෙන් පිළිකුල් බව සැලකිය යුතු.

(2) එසේ ගමනෙහි පිළිකුල ඉවසා ගමට පිවිස සහල පොරවා කබලක් ගත් යාචකයකු සේ ගෙපිළිවෙළින් ගම් භීතියෙහි සැරිය යුතු. වැසිකිළ වුව පිය තුබූ තුබූ තැන කෙණඬ තෙක් ගොහොරු මඩෙහි පා එරෙයි. එක් අතකින් සිවුර ඔසවා එක් අතකින් පාත්‍රය ද ගෙන, ග්‍රීෂ්ම කාලය වුව සැඩ සුළඟින් නැඟි පස් – තණ – දුහුලියෙන් ගැවසීගත් සිරුරින් ද යුතු වැ සැරිය යුතු. ඒ ඒ ගෙදෙරට පැමිණ මාළු-මස්-වණ-පිළියල්-දෙවූ තැන් ද, කෙළ-සොටු-බලු-හූරු-මළ ආදීන් මිශ්‍ර පණු කැලත් ද, නිල මැස්සන් පිරි අසුචි වළ හා ගවර වළ දැක්ක යුතු ද, මැඩිය යුතු ද වේ. එ සේ වන්නා ඒ මැස්සෝ නැඟී පා සිවුරු හිස ආදි තන්හි වසති. ගෙට පිවිසියානට ද කිසි කෙනෙක් දෙති. කිසි කෙනෙක් නො දෙත්. දෙන්නාහු ද, ඇතැම්හු ඊයේ පිසූ පිළිණු

දැය ද කුණු වූ කෙමු ආදිය ද දෙනි. ඇතැම්හු නො දී ''අරුණු'' යැයි යෙති. ඇතැම්හු නො දක්නා සේ සිටිති. කිසිකෙනෙක් ඉවත බලති. කිසි කෙනෙක් 'මුඩු මහණ යව' යි, පරොස් බස් බෙණෙත්. මෙ සේ 'දුගියකු සේ ගමෙහි පිඩු සිහා නික්මුණ මනායැ' යි ගම් වැදීමෙහි සිට ඉන් බැහැරවීම තෙක් අහර නිසා මඩ ගොහොරු ආදිය දැකීම, මැඩීම, ඉවසීම ද කටයුතු ය. පින්වත! 'ඒකාන්තයෙන් ආහාරය පිළිකුලැ' යි මෙ සේ අහර සෙවීමේ පිළිකුල සැලකිය යුතු.

(3) එසේ අහර සොයා ගත් මහණ ගමින් පිටත පහසු තැනෙක සුව සේ හිඳ ඒ ආහාරයෙහි අත තබන්නට පෙර ගරු කටයුතු මහණක්හු හෝ සැලකිය යුතු මිනිසක්හු හෝ දැක ආරාධනා කිරීමට ද පිළිවන් වෙයි. පාත්‍රයෙහි වූ ආහාරයෙහි වළඳනු පිණිස අත එබූ කෙණෙහි 'පිඩු ගනුව' යි කියා තම් මෙ තෙමේ මට දෙන්නේ ඉදුල් ඒ හෝ යි සැක හා ලජ්ජා කටයුතු වේ. අහරෙහි අත බහා අණන්නහු ගේ ඇඟිලි දිගේ ඩහදිය ගලා වියළි නද බත ද මොළොක් කරයි. ඇනීමෙන් අහරෙහි පැවැති ශොභාව නැති වූවා වෙයි. නැවත පිඩු කොට මුවෙහි තුබූ කෙණෙහි යටි දත් වංගෙඩියකින් කළ යුතු කිස ද, උඩු දත් මොහොලින් කළ යුතු කිස ද, දිව අතින් කළයුතු කිස ද සිදුකෙරෙති. මෙ සේ ඒ ආහාර බලු ඔරුවෙක ලූ බත් පිඬක් සේ මුඛයෙහි දී දත් නමැති කුල්ලෙන් පොළමින් දිව අග තුබූ පහත් කෙළින් ද, දත් මළයෙන් ද, හනු එකෙණෙහි එහි වූ වණ් ගඬාදි ශොභාව මැඩී බලු කැඳ ඔරුවෙක ලූ බලු වමණයක් සේ අතිශය පිළිකුලට පැමිණේ. එ සේ වුව ද ඇසට නො පෙනෙන හෙයින් ගිළියි. මෙ සේ වැළඳීමේ පිළිකුල සැලකිය යුතු.

(4) මෙසේ වැළඳූ අහර ඇතුළත පිවිසි කල පිත අධික වුව උකු මී තෙළින් මිශ්‍ර කළාක් මෙන් ද, සෙම අධික වුව ඇත් බැබිල කොළ යුෂයෙන් හැනුවාක් මෙන් ද, සැරව අධික වුව කුණු වූ මොහොරු යෙන් මිශ්‍ර කළාක් මෙන් ද, ලෙහෙ අධික වුව පඬුයෙන් හැනුවාක් මෙන් ද, අතිශය පිළිකුලට පැමිණේ. මෙසේ ආසය වශයෙන් පිළිකුල මෙනෙහි කළයුතු.

විශෙෂ:- බුදු-පසේ බුදු-සක් විත්තනන්ට පින්-සෙම්-සැරව-ලේ ආසය අතුරින් එකෙක් ම වේ. ත්‍රිහෙතුක උතකෘෂ්ට කුශලයෙන් පිළිසිඳ ලද හෙයිනි. මද පින් ඇතියනට පෙර කී සේ මේ ආසය සතර මැ වේ. එහෙත් එකක් අධික වේ.

(5) එසේ යම් කිසිවකින් ආශ්‍රය ලැබ ඔඩ තුළට වදනා ඒ අහර රන්-රිදී-මැණික් ආදී බදුනෙක තැන්පත් නො වේ. හුදෙක් දසවස් වූවෙක් වළඳ, නම් දස වසකින් නො දෙවූ වැසිකිළි වළක් බඳු, විසි වස් වූවෙක් වළඳ, නම් විසි වසකින් නො දෙවූ වැසිකිළි වළක් බඳු, තිස්-සතලිස්-පනස්-සැට-සැත්තෑ-අසූ-අනූ-සියක්-වස් වූවෙක් වළඳ, නම්- සියක් වසෙකින් නො දෙවූ වැසිකිළි වළක් බඳු ආමාශයෙහි පිහිටයි. මෙ සේ තැන්පත් වන තැන වශයෙනුදු පිළිකුල වැඩිය යුතු.

(6) එ සේ මේ සථානගත ආහාරය නො පැසී සිටිනා කාක් එහි මැ ඝනාන්ධකාර වූ නා නා කුණප ගඳින් දුගඳ වූ සුළඟ ඇති පෙදෙසෙහි ග්‍රීෂ්ම කාලයෙහි නො කල් වැසි වට කල සැඩොල් ගම් දෙර, ගවර වළ හුණු තණපත් - පැදුරුමාළු - නසිකුණු - බලුකුණු - මිනිකුණු - ආදිය ඉර අව්වෙන් තැවී පෙණ බුබුළුයෙන් ගැවසී සිටුනා සේ ඝනාන්ධකාර වූ නා නා කුණු ගඳින් දුගඳ වූ ප්‍රදේශයෙහි (පක්වාසයෙහි) අද ද ඊයේ ද පෙරේදා ද අනුභව කළ සියල්ල එක් වැ සෙම් පටලයෙන් වෙළී කයෙහි ජඨරාග්නියෙන් තැවීමෙන් නැගුණු පෙණ බුබුලින් ගැවසී ඉතා පිළිකුල් බවට පැමිණ සිටියැ සි මෙ සේ නො පැසීම් වශයෙන් පිළිකුල් වැඩිය යුතු.

(7) එ සේ එහි කායාග්නියෙන් පැසුණු ඒ ආහාරය රන්-රිදී ධාතු ආදීන් සේ රන්-රිදී බවට නො පැමිණේ. හුදෙක් පෙණ බුබුළු නගමින් ඇඹරුම් ගලෙක අඹරා තළයෙක පිරූ පඬුවන් මැටි සේ මළ බවට පැමිණ පක්වාසය ද, මූත්‍ර බවට පැමිණ මූත්‍රාසය ද, පුරවයි. මෙසේ පැසීම් වශයෙන් පිළිකුල් බව මෙනෙහි කළයුතු.

(8) එ සේ පැසවනු ලබනුයේ ද, කෙස්-ලොම්-නිය-දත්-ආදි නොයෙක් කුණප නිපදවයි. නො පැසෙන්නේ දද-කැසිලි-කුෂ්ඨ-පාණ්ඩු - ක්ෂය - කාශ - අතීසාරාදි සිය ගණන් රෝග උපදවයි. මෙ සේ ආහාරයෙහි ඵල වශයෙන් පිළිකුල් සේ පස් විකියයුතු.

(9) මේ ආහාරය කන කල එක් දෙරකින් ඇතුළට වැද පිටත වැගිරෙන කල ඇසින් අසූ ගුථ නම් වූ කඹ ය, කනින් කණගුථ නම් මළ ය, යනාදි ප්‍රකාරයෙන් නොයෙක් දෙරින් අනෙකප්‍රකාර අසුචි භාවයෙන් වැගිරෙයි. වළඳනා කල බොහෝදෙනා පිරිවරා ද, අනුභව කෙරේ. වැගිරෙන කල මල - මූත්‍ර බවට පැමිණියේ හුදෙකලාව පහ කෙරේ. ඒ වළඳනා කල පළමු දවස තුටු පහටු වෙයි. ඔද වඩනේ ද වෙයි. ප්‍රීත වූයෙ ද වෙයි. දෙ වන දවස් පහකරනුයේ

අතින් වැසූ තැනැ ඇති වැ පිළිකුලින් මුහුණ හකුළුවා මකුවූයේ (අමතාප වූයේ) වෙයි. පළමු දිනයෙහි එහි ආශාවෙන් හිඳුණු වැ ගැට ගැසූ සේ ඇලී තෘෂ්ණාවෙන් මුසපත් වැ අනුභවකොට දෙ වන දවස්හි එක් රැයක් විසීමෙන් නො ඇලී දුක් වෙමින් පිළිකුල් කරමින් පහකරයි.

එ හෙයින් මෙ:-

"අහර පැන් කැවිලි ද - මෘඇඟි තන් බොජුන් හා
එක මුව දෙරින් පිවිසී - තව දෙරකින් බැහැර වේ."

"අහර පැන් කැවිලි ද - මා ඇඟි තන් බොජුන් හා
සපිරිවරින් වළඳ - සැඟවේ බැහැර කරනේ".

"අහර පැන් කැවිලි ද - මා ඇඟි තන් බොජුන් හා
සතුටු වැ හිඳ වළඳනේ- නික්මවනු පිළිකුල් වේ".

"අහර පැන් කැවිලි ද - මා ඇඟි තන් බොජුන් හා
එක මැ රැයක් ගෙවීමෙනි - කුණුවේ ඒ සියල්ල ම".

මෙ සේ බැහැර වන පරිදි පිළිකුල් වැඩිය යුතු.

(10) මේ අහර වළඳනා කල අත් - තොල් - දිව - තලු ආදි තන්හි තැවරී එයින් පිළිකුලට පැමිණ තැවත තැවත සෝධා ද ගඳ හරණා පිණිස තැවත තැවත දෙවිය යුතු වේ. වැළඳුයේ ද බත පැසෙන කල බොල්-ඇඟි-කුඩු ආදිය ඉතිරී සැළි මුව හා පියන් ගල්වන්නා සේ මුළු සිරුරෙහි පැතිරී පවත්නා ජඨරාග්නියෙන් පෙණ දමමින් පැසී උතුරා යන්නේ දතෙහි දත් මල බැවින් ද, දිව-තලු ආදියෙහි කෙළ-සෙම්-ආදි බැවින් ද, ඇස්-කන්-නාසා-අධොමාගාදියෙහි කඹ - කළාදුරු - සොටු - මළ - මූ බැවින් ද ගල්වයි. එයින් වැකුණු ඒ ඒ ද්වාරයෝ දිනපතා දෙවතු ලබන්නා-හු ද පිරිසිදු ද මනහර ද නො වෙති. ඉන් සමහර තැනක් දෙවා අත තැවත ද ජලයෙන් දෙවිය යුතු වේ. සමහර තැනක් දෙවා ගඳ හරතා පිණිස දෙතුන් වරක් ගොමින් හෝ මැටියෙන් හෝ සුවඳ සුන්නෙන් හෝ දෙවා ද පිළිකුල හැරිය යුතු වේ යයි (මෙ සේ) ගැල්වීමෙන් පිළිකුල මෙතෙහි කළ යුතු.

මෙ සේ දස ආකාරයෙන් පිළිකුල මෙතෙහි කරන්නාහට තණ්හායෙන් විතණ්හායෙන් පහරන ලද්දක් මෙන් කරන්නහුට පිළිකුල් වශයෙන් කබලිංකාරාහාරය ප්‍රකට වෙයි. හෙතෙමේ ඒ නිමිත්ත තැවත තැවත මෙතෙහි කරයි. වඩයි. බහුල වශයෙන් වඩයි.

එ සේ කරන්නා වූ ඒ යෝගාවචරයා ගේ නීවරණයෝ පහවෙති. කෙලෙස් මුවහ වේ. කබලීකාරාහාරය පිළිකුල් හෙයින් අපීණාවට නො පැමිණෙතුදු උපචාර සමාධියෙන් සිත එකඟ වෙයි. මෙහි පිළිකුල් බව ගැනීම් වශයෙන් සංඥව ප්‍රකට වෙයි. එහෙයින් ම මේ කමටහන **ආහාරයෙහි පටික්කූල සඤ්ඤා** නම් වේ.

මේ **ආහාරයෙහි පටික්කූල සඤ්ඤායෙන්** යුක්ත යොගාවචර භික්ෂුව ගේ සිත රස තෘෂ්ණාවෙන් හැකිලෙයි. පෙරලෙයි. (පෙරළී වැටෙයි.) හෙතෙම කාන්තාරය එතර කරනු සඳහා පුත්‍ර මාංස කන්නකු සේ මද තැතිවැ හුදෙක් දුක් ගෙවීම සඳහා ආහාරය වළඳ යි. එකළ කබලීකාරාහාරය පිරිසිඳ දැනීම් වශයෙන් අනායාස යෙන් මැ පඤ්චකාම ගුණික රාගය පිරිසිඳ දැනීම වෙයි. හෙතෙම පඤ්චකාම ගුණ පරිඥා මුඛයෙන් රූපසඤ්ඣය පිරිසිඳ දනී. අපරි-පක්වාදී ප්‍රතිකූල භාව වශයෙන් ඔහු ගේ කායගතාසති භාවනාව ද පිරීමට යෙයි. ඉන් පිළිකුල් බව සැලකීමෙන් අසුභ භාවනාවට අනුලොම් වූ ප්‍රතිපත්තියට පැමිණියේ වෙයි. මේ ප්‍රතිපත්තිය ඉහාත්ම යෙහි නිර්වාණය අවසන් කොට ඇත්තේ වෙයි. මේ භාවනාව වඩා ඉපද වූ උපචාරධ්‍යානය පාදකකොට විදර්ශනා වඩා සතර මාර්ග ඵලයන්ට පැමිණ නිවන් අවබෝධ කළ හැකි වේ. ඉහාත්මයෙහි එසේ නො වී නම් සුගති පරායණ වේ.

මේ ආහාරයෙහි පටික්කූල සඤ්ඤා භාවනාවේ විස්තර කථාව ය.

චතුර්ධාතු ව්‍යවස්ථානය (2)

"ආහාරයෙහි ප්‍රතිකූල සංඥාවට" අනතුරු වැ චතුර්ධාතු ව්‍යවස්ථානය පිළිබඳ භාවනා නිර්දේශය පැමිණියේ ය.

විශේෂ- **"එකං ව‍වත්ථානන්ති එවං උද්දිට්ඨස්ස චතුධාතු ව‍වත්ථානස්ස භාවනා නිද්දෙසො අනුපපන්නො"**යි මේ පාඨයෙහි "ඒකව්‍යවස්ථාන යයි කියා නැවත චතුර්ධාතු ව්‍යවස්ථානයයි ද, උද්දේශ යයි කියා නැවත නිර්දේශ ය" යි කීම ද, ව්‍යාකූල සේ පැනෙන කිහිප තැනක් ටීකාහි[1] ආ සේ පළමු වැ දැක්වීම සුඛාවබෝධය පිණිස වේ.

ඒ මෙසේ යි

(1) **ප්‍රශ්නය**:- **'එකං ව‍වත්ථානං'** යි කියා **'චතුධාතු ව‍වත්ථානස්ස'** යි කියේ කවර හෙයින් ද?

පිළිතුර:- **'චතුධාතු ව‍වත්ථානස්ස'** යි විෂය භෙදයෙන් පෘථිවි ආදී සතරක් වුව ද ව්‍යවස්ථානයෙන් භෙදයක් නැති වැ සාමාන්‍යයෙන් ගෙන **ඒක** ව්‍යවස්ථානයැ යි නො වෙනස් සේ කියන ලදී. තවද පූර්වභාගයෙහි (පරිකර්ම අවස්ථායෙහි) පඨවි ආදි විෂය භෙදය ඇත ද, අර්ථ සිද්ධියෙහි (උපචාර අවස්ථායෙහි) **එකක්** මැ විෂයකොට ඇති බැවින් ද **"එකං ව‍වත්ථානං"** යි කීහු.

විසඳුම:- දෙතිස් කුණප **කොට්ඨාස**යෙහි පිළිකුල් බව් සැලකීම් වශයෙන් පරිකර්ම භාවනා කරන යොගියා හට ඒ අවස්ථායෙහි වෙන වෙන මැ ඒ ඒ කොටස්හි මනසිකාරය පැවැතී අර්ථ සිද්ධි සංඛ්‍යාත උපචාර අවස්ථායෙහි **එක**වට **එක** මැ කොට්ඨාසයෙකැ මනසිකාරය පවත්නා සේ (මේ ධාතු මනසිකාරයෙහි ද) ධාතු වශයෙන් වෙන වෙන මැ පූර්වභාගයෙහි (පරිකර්ම අවස්ථායෙහි) මනසිකාරය පැවතී අර්ථ සිද්ධියෙහි (උපචාර අවස්ථායෙහි) **එක** ම ධාතුවෙකැ මනසිකාරය පවත්නා හෙයින් **"එකං ව‍වත්ථානං"**යි කීහු.

දවත්තිංසාකාරයෙහි 'කෙසා යැ' යනාදී ප්‍රඥප්තිය ඉක්ම වූ තැන් පටන් පිළිකුල් වශයෙන් සියලු කොට්ඨාසයෙහි මැ නො වෙනස් වැ මනසිකාරය පැවතිය යුතු· මෙහි වනාහි එ සේ නො ව පඨවි ආදි ප්‍රඥප්තිය ඉක්ම වූ තැන් සිට සභාව – කෘත්‍ය – ලක්ෂණ– වශයෙන් ධාතු මෙතෙහි කළ යුතු වේ. ධාතු භාව සාමාන්‍යයෙන් නොවේ.

---

1 වි: ම: ටී: කා: 344 පිට

එහෙයින් "වවත්ථානන්ති සභාවූපලක්ඛණ වසෙන සන්නිට්ඨානං" යි 'ව්‍යවස්ථානය නම් සභාව ලක්ෂණ වශයෙන් සනිටුහන් කිරීමය' යි කීහු. සතර මහා භූතයන් ගේ කැකුළු බව් ආදී සභාවීය ලක්ෂණය සැලකීම් වශයෙන් සනිටුහන් කිරීම ව්‍යවස්ථාන නම.

(මේ විසතරයෙන් කිම? මේ චතුර්ධාතු ව්‍යවස්ථානය සෙසු එකුන් සාලිස් (39) කම්ඨානයන් කෙරෙන් වෙන් වූ හුදු කම්ඨානයකැ යි දැක්වීම පිණිස "එකං වවත්ථානං" යි කීහු.)

(2) **ප්‍රශ්නය:-** **"උද්දිට්ඨස්ස-නිද්දෙසො"** යි කුමක් හෙයින් කියේ ද

පිළිතුර:- උද්දේසය මුඛ මාත්‍රයක් දැක්වීම ය. නිද්දේසය විසතර ක්‍රමය පිණිස පවත්නේ ය. පැමිණි බර අවශ්‍යයෙන් ඉසිලිය යුතු වාක් මෙන් උද්දේස වශයෙන් දැක් වූ අර්ථය අවශ්‍යයෙන් විසතර කටයුතු හෙයින් **"එකං වවත්ථානං"** යි නාම මාත්‍රයෙන් දැක්වුව විසතර කිරීමට මේ අවස්ථාව බව දැක්වීම සඳහා යැ. මෘදුවූ ද, මධ්‍යම වූ ද, ප්‍රාඥයන් ගේ බහුල බැවිනි.

(3) **ප්‍රශ්නය:-** **"චතුධාතු වවත්ථානස්ස භාවනා නිද්දෙසො"**යි 'චතුර්ධාතු ව්‍යවස්ථානයේ භාවනා නිර්දේශය'යි කුමක් හෙයින් කියේ ද චතුර්ධාතු ව්‍යවස්ථානය මැ භාවනා නොවේ ද

පිළිතුර:-සැබව. භාවනාවෙක් මැ යි. එහෙත් වරක් පැවැත්වීම ව්‍යවස්ථානය යැ. නැවත නැවත පැවැත්වීම භාවනා යැ. මේ සේ වාග් හෙදය සඳහා කියන ලදී.

(4) **ප්‍රශ්නය:-** භාවනාව වාක්ගොචරය ඉක්ම පවතී. එ හෙයින් භාවනා යි විසතර කිරීම කෙසේ යෙදේ ද

පිළිතුර:- භාවනාවීයෙහි මැ භාවනා ව්‍යවහාරය වන හෙයින් වරද නැති. කම්ඨානයන් ගේ පරිග්‍රහය භාවනාව නම් වන්නේ ය. එය මෙහිලා භාවනායි අහි ප්‍රේත යැ.

'සන්නිට්ඨානං' යනු ප්‍රඥාවෙන් විනිශ්චය කිරීම යි.

විශේෂ:- පඨවි ආදී සතර ධාතූන් ගේ යථොක්ත විනිශ්චය **"චතුධාතු වවත්ථාන"** නම් වේ. එය **ධම්මසඞ්ගණී පද භාජනියෙහි කී. 'චිතක්කාදී'** ධර්මයන් ගේ විනිශ්චයෙක් හෝ **'ඔවාපනික'** නාමයෙන් කී "ඡන්දාදී" ධර්මයන් ගේ විනිශ්චයෙක් හෝ නොවේ. පඨවි ආදි සතර ධාතූන් අරභයා පැවැති භාවනා මනසිකාරය ධාතු කම්ඨාන යැ, චතුර්ධාතු ව්‍යවස්ථාන යැ. යනු **එක** ම අර්ථවත්

පදයෝ සි. එහෙත් (යොගාවචරයන්ගේ) කටයුතු හෙයින් කර්මයයි ද, යොගාවචරයන් ගේ සුඛ විහරණයට කාරණ හෙයින් ස්ථානය යි ද, ගොන ඛර්මස්ථානය යි කීහු. එ හෙයින් සභාව ලක්ෂණ වශයෙන් පැවැති යොගකර්මය චතුර්ධාතු ව්‍යවස්ථාන කර්මස්ථානය යි දතයුතු.

මේ කර්මස්ථානය පඨවි කසිණාදිය මෙන් ප්‍රඥප්තිය (නාමමාත්‍රය) සැලකීම් වශයෙන් හෝ නීල කසිණාදිය මෙන් වර්ණමාත්‍රය සැලකීම් වශයෙන් හෝ විදර්ශනා කර්මස්ථානය මෙන් සංස්කාරයන් ගේ අනිත්‍ය බව ආදි සාමාන්‍ය ලක්ෂණ සැලකීම් වශයෙන් හෝ පවත්නේ නො වෙයි. කැකුළු බව ආදි සවකීය ලක්ෂණය සැලකීම් වශයෙන් පවත්නේ ය.

විභාග:– මේ චතුර්ධාතු ව්‍යවස්ථානය **මහා සතිපට්ඨානයෙහි**[1] සංක්ෂේපයෙන් ද, **මහා හත්ථිපදෝපම**[2] **මහා රාහුලෝවාද**[3] සූත්‍රයන්හි හා **ධාතු විභඞ්ග** සූත්‍රයෙහි[4] විභාග වශයෙන් ද ආයේ ය.

ධාතු විභඞ්ගාදියෙහි[5] නාති සංඛේප නාති විභාග ක්‍රමයෙන් ආහෙයින් නාති සංඛේප විභාග වශයෙන් තුන්වැනි ප්‍රකාරයක් ද, කිවමනා වුව ද, එහි ද අධ්‍යාත්මික ධාතූන් ප්‍රභේද වශයෙන් නිරවශේෂකොට ද, බාහිර ධාතූන් සාවශේෂ කොට ද දැක්වීමෙන් සංඛේප-විභාග ක්‍රම දෙක මැ එහි දක් වූ හෙයින් දෙවිධා යි කීහ.

මහා සතිපට්ඨානයෙහි තිකඛපඤ්ඤ ධාතුකම්මට්ඨානිකයා ගේ වශයෙන් විභාග වශයෙන් ද කීහ යි දතයුතු.

සතිපට්ඨානයෙහි අර්ථයෙන් උපමානය පිරිවරකොට දෙශනාව ආයේ ය. උපමානය ද උපමෙය යා ගේ අර්ථය ප්‍රකාශ කිරීම වන හෙයින් උපමානය දක්වා උපමෙය ය ප්‍රකාශ කරනු පිණිස–

සෙය්‍යථාපි භික්ඛවෙ දක්ඛෝ ගොඝාතකෝ වා ගොඝාතකන්තෙවාසී වා ගාවිං වධිත්වා චාතුම්මහාපථෙ බිලශෝ පවිභජිත්වා නිසින්නෝ අස්ස. එවමෙව ඛෝ භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං යථා ඨිතං යථා පණිහිතං ධාතුසෝ පච්චවෙක්ඛති. අත්ථි ඉමස්මිං කායෙ පඨවි ධාතු ආපො ධාතු තෙජෝ ධාතු වායෝ ධාතූති[6]

---

[1] දී: නි: මහාවග්ග 177 පිට, [2] ම: නි: මූලපණ්ණාසක 194 පිට
[3] ම: නි: මජ්ඣිමපණ්ණාසක 68 පිට, [4] ම: නි: උ: ප: 265 පිට,
[5] ඛු: ප: ධාතු විභඞ්ග 62 පිට, [6] දී: නි: මහාවග්ග 180 පිට
ම: නි: මූලපණ්ණාසක 59 පිට

'මහණෙනි! දඝ වූ ගොඝාතකයෙක් හෝ ගොඝාතක අතවැසියෙක් හෝ ගව ඇදනක මරා සතර මංසන්ධියෙක (විසිණීම පිණිස) කොටස් වශයෙන් බෙදා හුන්නාක් මෙන් යම්කිසි යොගාවචර භික්ෂුවෙක් සිටිවනම සිටි, පිහිටි සේ පිහිටි මේ ශරීරය, මෙහි පෘථිවි ධාතු ඇත, ආපොධාතු ඇත, තෙජෝ ධාතු ඇත, වායෝ ධාතු ඇතැ සි කියා ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ ය'

විශෙෂ:- මේ ධාතු මනසිකාරයෙහි සත්ත්ව ශූන්‍යත්වය දක්වනු පිණිස ධාතු වශයෙන් ප්‍රකාශ කරන ලදී.

මහා සතිපට්ඨානයෙහි ඖදාරික හෙයින් මනාව ප්‍රකට හෙයින් ද, සමහර විනෙය ජන කෙනෙකුන් ගේ චරිතානුකූල හෙයින් ද, මහාභූත වශයෙන් ද, කම්මට්ඨානය දක්වන ලදී.

විභාග:- පඨවි ධාතු කකීශ භාවය සභාව කොට ඇති හෙයින් පඨවි නම් වූයේ - තමා ගේ සභාව දරන්නේ ය, තමා ගේ සභාව උසුලන්නේ ය, ආත්මයෙන් ශූන්‍ය ය, සත්ත්වයෙක් නොවන්නේ ය, යන අර්ථයෙන් ධාතු නම් වී. මෙ සේ පඨවිය මෑ ධාතු වූවා පඨවි ධාතු නම. ආපාදිය ද මෙසේ මැසි.

තවද පඨවි ධාතු නම් එක් කලාපයක උපදනා සහජාත රූපයන් ගේ පිහිටීමට උපකාර වූ ද්‍රව්‍ය සි. එසේ ම එම රූපයන් ගේ වෙන් නොවීම හෝ සම්ප්‍රකාරයෙන් බැඳීම කරන්නා වූ ද්‍රව්‍ය ය **ආපෝ** ධාතුයැ. එම රූපයන් ගේ පරිපාකය (මිහිකිරීම) කරන්නා වූ ද්‍රව්‍යය **තෙජෝ** ධාතු යැ. එ ම ද්‍රව්‍යයන් ගේ පිරවීම කරන්නා වූ ද්‍රව්‍යය **වායෝ** ධාතු සි.

මෙ සේ සතර මහා භූතයන් ගේ සංක්ෂෙපයෙන් භාවාර්ථය දත යුතු. විත්‍තාරාර්ථය මතු පහළ වෙයි.

මෙ සේ මහාසතිපට්ඨානයෙහි තියුණු නුවණ ඇති ධාතු කම්මට්ඨානය වඩනු කැමති යොගාවචරයා ගේ වශයෙන් සංක්ෂෙපයෙන් ද, එහි නො තියුණු නුවණ ඇත්තහු ගේ වශයෙන් විත්‍තර ක්‍රමය ද වදාළ සේක.

විත්‍තර විභාගය:- තැල්ල - වලිග - මොල්ලි - කුර - අං - ආදි අවයවයන්ගෙන් යුක්ත වූ ගවදෙන ඇට-මස් ආදි අවයව නො බෙදූ කල්හි දෙන යැ යන සංඥාව ද, බෙදූ කල්හි ඇට-මස් ආදි අවයව සංඥාව ද වේය සි දන්නා දඝ වූ ගවයන් මරන්නකු හෝ ගවයන් මරන්නහු ගේ (බත් වැටුපින් ජීවත් වන) අතවැස්සකු හෝ ගවදෙන

මරා (විනිවිද සතර දිගට ගිය මහා මාගී සතරක් එක් වූ මධ්‍යස්ථානය යි කියන ලද) සතර මංසන්ධියෙක කොටස් වශයෙන් බෙදා විකිණීමට හුන්නා සේ මේ සස්නෙහි යම්කිසි මහණෙක් තෙමේ යාම්-ඉඳීම්-සිටීම්-නිදීම් යන සතර ඉරියව්වෙන් යම්කිසි ඉරියව්වකින් පිහිටි පරිද්දෙන් පිහිටියාවූ ද, නොහොත් කාය සංඛ්‍යාත රූප ධර්මයන් ගේ ඒ ඒ ක්ෂණයෙහි සවකීය කෘත්‍යය වශයෙන් සිටියාවූ ද, ප්‍රත්‍යය ධර්මයන් ගේ කෘත්‍ය වශයෙන් ඒ ඒ ප්‍රත්‍යයයන් විසින් නොයෙක් ප්‍රකාරයෙන් පිහිටුවන ලද්දා වූ හෝ මේ ශරීරය ධාතු වශයෙන් වෙන් වෙන්කොට ප්‍රඥා නමැති ඇසින් නැවත නැවත විනිවිද බලන්නේ ය.

කෙසේ ද යත්:- ''මාගේ මේ ශරීරයෙහි පඨවි ධාතු ය, ආපෝ ධාතු ය, තෙජෝ ධාතු ය, වායෝ ධාතු ය, යන සතර මහා භූතයන් ඇතැ යි'' මෙ සේ ධාතු වශයෙන් බලන්නේ ය.

මින් කුමක් කියේ ද යත්:- මස් වැඩීම සඳහා කුඩු-බත්, කපු ඇට, ආදිය දී ගවදෙන පොෂණය කරන්නාවූ ද, වධකස්ථානයට ගෙන යන්නාවූ ද, එහි බැඳ තබන්නාවූ ද, මරන්නාවූ ද, මැරූ දෙන දක්නාවූ ද, ඒ ගොඝාතකයාහට එතෙක් එකකිනුදු දෙන යැ යන සංඥාව අතුරුදහන් නො වේ. යම් යම් අඞ්ග ප්‍රත්‍යඞ්ගයන් නිසා දෙන යැ යන සංඥාව වේ ද එතෙකින් ගවදෙන යැ යන සංඥාව නො නැසුන හෙයිනි.

ඇට සැකිල්ලෙන් මස් වෙන් කොට කපා බෙදා දුන්නහුට 'ගවදෙන යැ' යන සංඥාව අතුරුදහන් වැ මාංස යැ යන සංඥාව පවතී ද එ කල 'මම ගවදෙන විකුණමි' ''මොවුන් ගව දෙන ගෙන යති''යි මෙ බඳු අදහසෙක් නො වේ. හුදෙක් ''මම මස් විකුණමි'' ''මොවුන් මස් ගෙනයති''යි මෙ බඳු අදහසෙක් වේ මැයි.

එසේ මැ පූර්වයෙහි ගිහි ව සිට පැවිදි වුව ද, සිටි පරිද්දෙන් සිටියාවූ ද, පිහිටි පරිදි පිහිටියා වූ ද, මේ ශරීරය රූප සන්තති සමූහ කෘත්‍යයන් ගේ ඝනය වෙන් කොට ධාතු වශයෙන් ප්‍රත්‍යවෙක්ෂා නො කරන්නා වූ ඒ යොගාවචර භික්ෂුවට ඒ තාක් සත්ත්ව යැ, පුද්ගල යැ, යන සංඥාව අතුරුදහන් නො වේ. ධාතු වශයෙන් වෙන්කොට ප්‍රත්‍යවෙක්ෂා කරන්නහුට තත් වූ පරිදි ඝන විනිර්භෝගය සම්පාදනය වන හෙයින් මම යැ, මාගේ යැ'යි පැවැති ආත්ම දෘෂ්ටි වශයෙන් ගන්නා ලද සත්ත්ව සංඥාව ද, අතුරුදහන් වන්නී ය. ව්‍යවහාර වශයෙන් පැවැති සත්ත්ව සංඥාව ද, අතුරුදහන් වන්නී ය.

මෙසේ උපමානාර්ථයෙන් උපමෙයාර්ථය ද ඒකාන්තයෙන් ගැලපෙන්නේ ය. ධාතු වශයෙන් සිත පිහිටන්නේ ය. එහෙයින් මෑ බුදුහු "සෙය්‍යථාපි" යනාදිය වදාළ හ

මෙසේ ධාතු කම්ඨස්ථානිකයා ගේ වශයෙන් සංක්ෂේපයෙන් ආ තැන් දක්වා දැන් විස්තර වශයෙන් ආ තැන් දක්වනු සඳහා **මහා හත්ථිපදෝපම** සූත්‍රයෙහි ආ-

(1) කතමාචාවුසෝ අජ්ඣත්තිකා පඨවී, ධාතු යං අජ්ඣත්තං පච්චත්තං කක්ඛළං ඛරිගතං උපාදින්නං සෙය්‍යථීදං කෙසා-පෙ-කරීසං, යංවා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං කක්ඛළං ඛරිගතං උපාදින්නං, අයං වුච්චති ආවුසෝ අජ්ඣත්තිකා පඨවී ධාතු[1]

"ඇවැත්නි! අජ්ඣත්තික පඨවි ධාතු කවරේ ද තමා සන්තක වූ තමා පිළිබඳ වූ යම් කැකුළු බවෙක් වේ ද රළු බවෙක් වේ ද මම යැ මාගේ යැ යි තෘෂ්ණාවෙන් ළංකොට ගත්තේ වේ ද නොහොත් තද බැවින් සෙසු සහජාත භූතයන්ට පිහිට වේ ද එය පඨවි ධාතුව ය. ඒ වූකලී කෙස්, ලොම්, නියය, දත්, සම්, මස්, නහර, ඇට, ඇට මිදුලු, වකුගඩු, හදවත, අක්මා, දලබු, බඩදිව, පපුව, අතුණු, අතුණු බහන්, නො පැසුණු අහර, පැසුණු අහර, (හා ඇට මිදුලුයෙන්, සංග්‍රහ වූ) හිස් මුල, සමග මේ විසිකොටස ද, සෙසු වූ ද, යම්කිසි තමා සතු වූ ද, තමා පිළිබඳ වූ ද, කැකුළු වූ රළු වූ මම යැ, මාගේ යැ' යි ගන්නා උඳ තද බවැ යි කියූ පෘථිවි ධාතුවක් හෝ සෙසු සසම්භාර ත්‍රිවිධ භූතයන්ට ඇතුළත් වූ පෘථිවි ධාතුවක් වේ ද මේ අධ්‍යාත්මික පෘථිවි ධාතු යැ."

(2) "කතමාචාවුසෝ අජ්ඣත්තිකා ආපොධාතු, යං අජ්ඣත්තං පච්චත්තං ආපෝ ආපොගතං උපාදින්නං, සෙය්‍යථීදං පිත්තං -පෙ- මුත්තං යං වාපනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං ආපොගතං උපාදින්නං, අයං වුච්චතාවුසෝ අජ්ඣත්තිකා ආපෝ ධාතු[2]

"ඇවැත්නි! අජ්ඣත්තික ආපෝ ධාතුව කිම? පිත, සෙම්, පූයා, ලේ, ඩහදිය, මේදතෙල, කදුළු, වුරුණු තෙල, කෙල, මුකුණු, සඳ මිදුලු, මූත්‍රය යන දෙළොස් කොටස් හා අනිකුදු යම්කිසි තමා සතු වූ ද, තමා පිළිබඳ වූ ද, නොයෙක් ප්‍රකාර ආපෝ ධාතුවෙහි ඇතුළත් වූ මම යැ මාගේ යැ යි තෘෂ්ණාවෙන් ළංකොට ගත්තා

---

[1] ම: නි: මූලපණ්ණාසක. 194 පිට
[2] ,, ,, ,, 196 ,,

ලද්දා වූ යම් ආපෝ ධාතු කෙනෙක් වේද? ඇවැත්නි! මේ අජ්ඣත්තික ආපෝ ධාතු යැ.

(3) කතමාචාවුසෝ අජ්ඣත්තිකා තේජෝ ධාතු, යං අජ්ඣත්තං පච්චත්තං තේජෝ තේජෝගතං උපාදින්නං, සෙය්‍යථිදං යේනච සන්තප්පති. යේනච ජීරියති. යේනච පරිඩය්හති. යේන ච අසිත පීත ඛායිත සායිතං සම්මා පරිණාමං ගච්ඡති. යං වා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං තේජෝ තේජෝගතං උපාදින්නං, අයං වුච්චතාවුසෝ අජ්ඣත්තිකා තේජෝධාතු[1]

"ඇවැත්නි! අජ්ඣත්තික තේජෝ ධාතු කවරේද තමා සතන්හිවූ ද, තමා පිළිබඳවූ ද, යම් තේජෝ ධාතුවෙක් නොයෙක් ප්‍රකාර තේජෝ ධාතුවෙහි ඇතුළත් වේ ද, මම යැ, මාගේ යැ,යි තෘෂ්ණාවෙන් ඇතුළත් කොට ගත්තා ලද්දේ ද, යමක් කරණ කොට ගෙන ජ්වරාදි වශයෙන් තැවේ ද, යමක් කරණ කොට ගෙන දිරීමට යේ ද, අනිශයින් දැහයට යේ ද. යමක් කරණ කොට කන ලද - බොන ලද - කඩා කන ලද - රස විඳින ලද- සියලු ආහාරය ඔනාව දිරීමට යේ ද, අනිකුදු නොයෙක් ප්‍රකාර තේජෝ ධාතුවෙහි ඇතුළත් වූ යම් තේජෝ ධාතුවක් වේ ද, මේ අධ්‍යාත්මික තේජෝ ධාතු යැ."

(4) "කතමාචාවුසෝ අජ්ඣත්තිකා වායෝධාතු, යං අජ්ඣත්තං පච්චත්තං වායෝ වායෝ ගතං උපාදින්නං, සෙය්‍යථිදං උද්ධඞ්ගමා වාතා, අධෝගමා වාතා, කුච්ඡිසයා වාතා, කොට්ඨාසයා වාතා, අඞ්ගමඞ්ගානු සාරිනෝ වාතා, අස්සාසෝ පස්සාසෝ, ඉතිවා යංවා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං වායෝ වායෝ ගතං උපාදින්නං, අයංවුච්චතාවුසෝ අජ්ඣත්තිකා වායෝධාතු[1]"

"ඇවැත්නි! අධ්‍යාත්මික වායෝ ධාතු කවරේද? තමා සතන්හිවූද තමා පිළිබඳ වූ ද, මමයැ, මගේ යැ'යි තෘෂ්ණාවෙන් ළං කොට ගත්තා ලද්දාවූ ද, නොයෙක් ප්‍රකාර වායෝ ධාතුවෙහි ඇතුළත් වූ යම් වායෝ ධාතුවෙක් වේ ද, ඒ වායෝ ධාතු නම් කවරද උඩට නගන වාතය, පහතට හෙළන වාතය, කුක්ෂිය ආශ්‍රය කරන වාතය, බඩවැලි ඇතුළ පවත්නා වාතය, අඞ්ග ප්‍රත්‍යඞ්ග අනු වැ යන වාතය, ආශ්වාස වාතය, ප්‍රශ්වාස වාතයැ, කියා හෝ අනිකුදු

[1] ම: නි: මූලපණ්ණාසක 197

යම්කිසි නොයෙක් ප්‍රකාර වායුවෙහි ඇතුළත් වූ වායෝ ධාතුවෙක් වේ ද? මේ යැ අධ්‍යාත්මික වායෝ ධාතු නම්"

මෙ සේ ඉතා තියුණු නොවූ නුවණ ඇති ධාතු කම්මට්ඨානිකයා ගේ වශයෙන් මෙහි විසතර විසින් ආයේ ය. **මහා රාහුලෝවාද-යෙහි** ද[1] **ධාතු විභඞ්ගයෙහි** ද[2] මෙසේ මැ විසතර විසින් ආයේ ය.

(පෙරකී දේශනා පාඨයන්හි ගැඹුරු තැන් මෙහි ලා වර්ණනා කෙරේ.)

(1) **අජ්ඣත්තං** (2) **පච්චත්තං**:- මේ දෙපදය මැ තමා ශරීරයට ඇතුළත් ධර්මයන් මැ කියා.

ඒ ඒ සත්ත්ව සන්තතියෙහි උපන් 'ආත්ම යැ'සි ගනු ලබන සව සන්තානයෙහි ඇතුළත් හෙයින් 'ආත්ම යැ'සි ගත යුතු බවට පැමිණී හෙයිනි.

නිදර්ශනය:- ලෙවිහි සත්‍රීන් කෙරෙහි පැවැති කථාව "අධිසත්‍රී යැ"සි කියන්නාසේ (1) තමා කෙරෙහි පැවැති දැය (අධි + අත්ත) අජ්ඣත්තයැ සි කීහ. (2) තමා කෙරෙහි පැවැති දෙය (පති + අත්ත) පච්චත්තං සි කීහ. මේ යැ විශෙෂ ය.

කක්ඛළං = තද වූ (සහජාත ධර්මයන්ගේ පිහිටීමට උපකාර වනුයේ තද හෙයිනි.)

ඛර්ගතං = රළු වූ (රළු බව ඇති දැයෙහි ඇතුළත් වූ.)

මෙහි **'කක්ඛළං'සි ලක්ෂණ** වශයෙන් ද, **'ඛරිගතං'** ආකාර වශයෙන් ද, කීහ. රළු බව ඇති දැය පරාමෘෂ්‍යාකාරයෙන් මැ වැටහේ. ටීකායෙහි **"ඛර්ගතංති ඵරුසං"** යි කියේ එ හෙයිනි.

උපාදිණ්ණං = තරකොට ගත්තා ලද (මම යැ, මාගේ යැ යි, තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් දැඩි කොට ගත්තා ලද්දේ ය. අල්වා ගත්තා ලද්දේ ය. මතු මත්තෙහි ආමර්ශනය කරන ලද්දේ යැ.)

විශෙෂ:- i කර්ම සමුට්ඨානය උපාදිණ්ණ යැ. එහෙත් මෙහි ලා කර්ම සමුට්ඨානය ද, කර්ම සමුට්ඨාන නොවූයේ ද, ඇති හෙයින් මෙහි උපාදිණ්ණ යැයි කීයේ තෘෂ්ණාදීන් අල්වා ගත්තා ලද්ද සඳහා යි.

ii පෙර කී සේ අජ්ඣත්තාදී **ලක්ෂණ** ඇති පෘථිවි ධාතු කොටස් නම් කෙසාදිය යි. මෙහි **මත්ථලුඞ්ගං** යි බහා විසි කොටසෙක් වේ.

[1] ම: නි. මජ්ඣිම පණ්ණාසක 68 පිට [2] විභ: පෘ: 62 පිට

(පටිසම්භිදා මාගීයෙහි **මජ්ඣිමකායං** යි පෙළෙහිම ආයේ ය.)

යංවාපනාසඤ්ඤමපි කිඤ්චි = ආපෝ ධාතු ආදී අවශෙෂ කොටස් වල ද, අවිනිභෝග වශයෙන් පවත්නා පඨවී ධාතු කොටස් ද, සංග්‍රහ කරනු සඳහා යැ.

ආපෝ ආදියෙහි ද "**අජඣත්තං, පච්චත්තං, උපාදින්නං**" යනාදිය පෙරසේ මැයි. විශෙෂස්ථාන මතු දැක්වේ.

ආපෝ = ඒ ඒ තැනට පැතිරෙන (ගලා බස්නා) බැවින් වැගිරෙන සවභාව ඇත්තේ **ආප** නම්. සසම්භාර ආප ය මෙසින් කියේ වේ.

එය මැ වැගිරීමෙන් 'සසම්භාර පඨවී සංඛ්‍යාත ඒ ඒ තැනට පැතිරීම් වශයෙන් පැමිණේ.

විශෙෂ:- එය ම **සහජාත අඤ්ඤමඤ්ඤ-නිස්සයාදී** ප්‍රත්‍යය වශයෙන් සෙසු භූතත්‍රය සංඛ්‍යාත ඒ ඒ තැනට ද්‍රවත්වයෙන් වැගිරෙමින් ඔවුනොවුන් සම්බන්ධ කරමින් පවත්නා හෙයින් මෙ සේ කිය යුතු බවට පමුණුවයි.

ආපොගතං = කම්ම සමුට්ඨානාදී ඒ ඒ කොටසෙහි ඇතුළත් වූ හෙයින් ආපොගත ය.

(මෙහි වූ කලි "**පිත්තං - මුත්තං**" යි කී දෙළොස් කොටසට ඇතුළත් වූ ආබන්ධන සවභාවය යි.)

තෙජෝ = තියුණු බැවින් තෙජෝ නම්.

තෙජොගතං = යට කී සේ කම්ජාදී වශයෙන් අනෙකප්‍රකාර යෙන් පැවැති තෙජෝ ධාතුවෙහි ඇතුළත් වූ උණුසුම් සවභාව යි.

යෙන ච සන්තප්පති = කිපිකල මේ ශරීරය තැවීම් කරන,

යෙන ච ජීරියති = දිරීමට පමුණුවන, ඉන්ද්‍රියයන් විකල බවට පමුණුවන, බල පිරිහීම්, ඇඟ රැලි නැගීම්, හිසකෙස් පැසීම්, ඇස් නොපෙනීම්, කන් නො ඇසීම් ආදියට පමුණුවන යම් සවභාවයක් වේ නම් එය ද

"**යෙනච පරිඩය්හති**" = යමකින් දැහයට පැමිණ "දැවෙමි. දැවෙමි" යි හඬමින් සියක් වරක් උණුකොට සිහිල් දියෙහි බහාගත් (ශතධෞත) ගිතෙල් හෙළ සඳුන් ආලෙප හා තල් වැට පවන් කැමති වේ ද

"**යෙන ච අසිත පීත ඛායිත සායිතං සම්මා පරිණාමං ගච්ඡති** = (එසේ ම) අනුභව කළ බාද්‍ය - භොජ්‍ය - ලෙහ්‍ය - පෙයා දිය මනා සේ පැසී, රස - මස් - මේද - නහර - ඇට - ඇට මිදුලු - ශුක්‍ර

යන සපත ධාතූන් ගේ වශයෙන් වෙනස් බවට යමක් නිසා පැමිණේ ද හෙ ද තෙජෝ ධාතු නම.

විසර්ජාර:- ආහාරය පැසුණු කල රසය ද, ඉන් රස ධාතුව ද, ඉන් ලෙය ද, ඉන් ලෙහෙ ධාතුව ද, යනාදි ක්‍රමයෙන් සියලු ධාතු උපදී.

මෙ කී තෙජෝ ධාතු අතුරින් සන්තාපන - ජීරණ - දහන - සංඛ්‍යාත තෙජෝ ධාතු තුන කර්‍ම - චිත්ත - ඍතු - ආහාර - යන සතරින් මෑ හට ගනී. පඤ්චම පාකාඛ්‍යනීය කර්‍මයෙන් මෑ හට ගනී.

වායෝ = සෙලවීම් වශයෙන් හෝ වේගවත් ගමන් වශයෙන් හෝ පවත්නා හෙයින් වායෝ නම් වේ. එසේ මෑ යට කී **කර්‍මාදි** අනෙකප්‍රකාර වායෝ ධාතුවෙහි ඇතුළත් හෙයින් **වායොගත** නම් වේ. පිපෙන සවභාවය එහි ලක්ෂණය යි.

උද්ධඞ්ගමාවාතා = තැලි නැගීම්-හික්කා පැවැත්වීම්-වමනය වීම්- කිවිසීම්- ආදි වශයෙන් පවත්නා උඩට නැගෙන වාතය.

අධොගමා වාතා = මල - මූත්‍ර - පිත් - සෙම් - සොටු - කෙළ - දුගඳ ඇති යන්ත් පිට කරන යටට බස්නා වාතය.

කුච්ඡිසයා වාතා = අතුණුයෙන් (බඩවැලින්) පිටත පවත්නා වාතය.

කොට්ඨාසයා වාතා = අතුණුබහත් ඇතුළත පවත්නා වාතය.

අඞ්ගමඞ්ගානුසාරිනෝ වාතා = ධමනි අනුසාරයෙන් සකල ශරීරයෙහි අඞ්ග ප්‍රත්‍යඞ්ග අනුසාරයෙන් පැතිරී අතපය දික්කිරීම්- චක්කිරීම් - ඉදිරි බැලීම් - අවට බැලීම් - නැගිටීම් - ආදිය පවත්වන වාතය.

අස්සාසෝ-පස්සාසෝ = ඇතුළට වදනා නාසිකා වාතය හා පිටතට නික්මෙන වාතය යන මේ ය. මෙහි මූල කී සතර කර්‍මාදී චතු සමුට්ඨානික ය.

ආශ්වාස-ප්‍රශ්වාස වාතය චිත්ත සමුට්ඨාන ය. එ හෙයින් ඒ ශරීරයෙන් පිටත නො පවතී.

ප්‍රශ්නයෙකි:- එසේ වන්නා ප්‍රශ්වාසය දික් නැහැ ඇත්තහු ගේ නැහැ අග ද ලුහුඬු නැහැ ඇත්තහු ගේ යටි තොල ද පහරිමින් පිටවන්නේ කෙසේ ද?

පිළිතුරු:- අධ්‍යාත්මික සන්තානයෙහි පැවැති චිත්ත සමුට්ඨාන-යාගේ ද, උතු සමුට්ඨානයාගේ ද වශයෙන් මේ කියන ලදී.

මෙයින් අන්‍ය වූ ද අවශෙෂ කොට්ඨාසයන්හි පවත්නා සහජාත වූ වායෝ ධාතුවෙක් වේ ද හෙ ද මෙහි ම සංග්‍රහ වේ. මේ යැ වායෝ ධාතු නම්.

මෙ සේ විසි ආකාර වූ පඨවි ධාතුව ද, දෙළොස් ආකාර වූ ආපෝ ධාතුව ද, සතර ආකාර වූ තෙජෝ ධාතුව ද, සයාකාර වූ වායෝ ධාතුව ද යි දෙසාළිස් ආකාරයෙකින් සතර ධාතු විස්තර කරන ලදහ.

විශෙෂ:- භාවනා විධියෙහි ලා ධාතුකම්ඨානය (තිකඛපඤ්ඤ) තියුණු නුවණ ඇත්තාහට ද, වඩා තියුණු නො වූ, නුවණ ඇත්තාහට ද, සප්පාය වන සේ මේ භාවනාව දෙ පරිද්දෙකින් වදුරන ලදී. එ හෙයින් කමටහන් ගැනීම ද, දෙ පරිද්දෙන් මැ වුව මැනව. ඉන් තියුණු නුවණ ඇත්තාහට (ධාතු විභඞ්ගයෙහි ආ පරිදි) කෙසයෝ පඨවි ධාතු යැ, ලෝමයෝ පඨවි ධාතු යැ, යනාදීන් දෙසාළිස් ආකාරයෙන් විස්තර කිරීමේ දී ධාතු පරිග්‍රහය ප්‍රමාද වැ සිදු වේ නුදෙක් කෙසාදි විසි කොටසෙහි පිහිටි තද ගතිය පෘථිවි ධාතු යැයි ද, ඒ භූතයන් බැඳ විසිර යා නො දී එක්කොට තබන ලද ලක්ෂණය ආපෝ ධාතු යැයි ද, ඒ භූතයන් ගේ පැසවන ලක්ෂණය තෙජෝ ධාතු යයි ද, ඔවුන් ගේ පිපෙන ලක්ෂණය වායෝ ධාතු යැයි ද, මෙ සේ වස්තූන් ආමශීනය නො කොට ලක්ෂණ මාත්‍රය පමණක් මෙනෙහි කරන්නා වූ තියුණු නුවණ ඇති යොගාවචරයාහට කම්ඨානය වහා ප්‍රකට වැ වැටහේ. ඉන්ද්‍රියයන් ගේ තියුණු බැවිනි.

මෙ සේ මෙනෙහි කරන ලද මන්දප්‍රාඥයාහට කමටහන එළඹ නො සිට මුවහ කරන හෙයින් අන්ධකාරයක් මෙන් වේ. ඕහට වනාහි පෙර කී සේ (කෙසයෝ පඨවි ධාතු යැ, යනාදි ක්‍රමයෙන්) වස්තු ආමශීනයෙන් විස්තර වශයෙන් මෙනෙහි කරන් මැ තියුණු නුවණ නැති බැවින් ද, විස්තර රුචික බැවින් ද, කමටහන ප්‍රකට වන්නේ ය.

එයට මේ **උපමාවෙකි**. "බොහෝ පෙය්‍යාල ඇති පාළියක් පාඩම් කරන භික්ෂූන් දෙදෙනකු අතුරින් තියුණු නුවණ ඇත්තේ පෙය්‍යාලයට දෙරටුව වැනි වූ මුල් කොටස වරක් හෝ දෙකක් සම්පූර්ණයෙන් කියා මතුයෙහි ඒ ඒ වාරයෙහි ආදි අන්තයන් පමණක් ගෙන පාඩම් කරමින් වහා කෙළවරට යේ."

එහෙත් එකල වඩා නො තියුණු නුවණ ඇත්තේ මේ කවර පාඩමෙක් ද, තොළ ගැවීමට ද ඉඩෙක් නො දෙතැයි ද, මෙ සේ පාඩම් කොට කෙසේ ප්‍රගුණ වේ දැ යි කියා ආ, ආ, තැන පෙය්‍යාලයන් ද කියමින් විසතර සේ පාඩම් කරයි. එ කල තියුණු නුවණ ඇත්තේ ආයුෂ්මතුනි! ඔබ මේ පාඩම් අවසන් කරන්නට නො දෙන්නේ කවර හෙයින් ද මෙ සේ පාඩම් කොට කවදා පෙළ අවසන් වේ දැයි ඕහට කියා.

එ හෙයින් තිකඛ පඤ්ඤයාහට මේ ධාතු මනසිකාරයේ සංක්ෂෙප ය ද, නාති තිකඛ පඤ්ඤයාහට විසතර ක්‍රමය ද සත්ප්‍රාය වේ. මේ දැක්වෙනුයේ තිකඛපඤ්ඤයාහට උපයොගී ක්‍රමය යැ. මේ කම්ටහන වඩනු කැමති තියුණු නුවණ ඇති යොගාවචර තෙමේ පෙර ශීල-නිදේශාදියෙහි කී සේ ශීලාදිය පිරිසිදු කොට සත්ප්‍රාය වූ භාවනානුකූල විවේක සෙනසුනකට ගොස් සිත කමීසථානයට යොමුකොට ගෙන පාදතලයෙන් උඩ ද, කේසයෙන් යට ද, සම්න් සරස ද, පිරිසිඳිනා ලද ශුක්‍ර ශ්‍රොණිතයෙන් හටගත් වාතුම්භාභූතික මේ ශරීරය ධාතු වශයෙන් මෙනෙහි කරයි.

එසේ මෙනෙහි කරනුයේ ධාතූන් ගේ **ලක්ෂණ** වශයෙන් හා ආකාර වශයෙන් ද මෙනෙහි කෙරේ. මේ දෙ ආකාරය දැක්වූයේ පුදගලාධ්‍යාශය වශයෙනි. ලක්ෂණ වශයෙන් මෙනෙහි කරන්නා ධාතූන් සභාව වශයෙන් ගනී.

ඒ මෙසේ සි:- මේ සිරුරෙහි තද ගතිය ලක්ෂණ කොට ඇති රළු ආකාරය පඨවි ධාතු ය. දියාරු ගතිය ලක්ෂණ කොට ඇති වැගිරෙන ආකාරය ආපො ධාතු ය. උණුසුම් ගතිය ලක්ෂණ කොට ඇති පැසවන ආකාරය තෙජො ධාතු ය. පිපෙන ගතිය ලක්ෂණ කොට ඇති සෙලවෙන ආකාරය වායො ධාතු යයි මෙ සේ සංක්ෂෙපයෙන් **ලක්ෂණ-රස** වශයෙන් හා ආකාර වශයෙන් ද, මෙනෙහි කරයි.

මෙ සේ නැවත නැවත සිය-දහස් වරක් ධාතු වශයෙන් නිස්සත්ත නිජීව වශයෙන් මෙනෙහි කළ යුතු. එසේ කරන්නාහට ලක්ෂණාදීන් යමක් ප්‍රකට වැ වැටහේ නම් එය මැ ගෙන සෙස්ස බැහැර කොට ඒ සමග මැ පඨවි ධාතු යැ, ආපො ධාතු යැ යනාදීන් මනසිකාරය පැවැත්විය යුතු. එසේ කරන්නාහට නො බෝ කලකින් ධාතු ප්‍රභෙදය වැටහෙන නුවණින් පරිගෘහිත වූ සභාව ධර්මයන් අරමුණු කොට පැවැති හෙයින් අර්පණාවට නො පැමිණ උපචාර සමාධිය උපදී.

තව ද ක්‍රමයෙකි:- **අට්ඨිඤ්ච පටිච්ච නහාරුඤ්ච පටිච්ච මංසඤ්ච පටිච්ච චම්මඤ්ච පටිච්ච ආකාසෝ පරිවාරිතෝ රූප-නෙට්ඨ සඞ්ඛං ගච්ඡති**[1]

"ඇට ද, නහර ද, මස් ද, සම ද, නිසා, අහස පුරා සිටි රූපයෙක් වේ ය"යි **දම් සෙනෙවි සැරියුත්** මහා සවාමීන් වදාළ පරිදි සතර මහා භූතයන් ගේ නිස්සත්ත්ව භාවය සඳහා සතර කොටසක් කොට ගෙන ඒ ඒ කොටසෙහි ඇතුළත පවත්නා තනු නුවණ මෙහෙයා බෙද බෙදා මොවුන් අතුරින් 'මේ පඨවි ධාතු යැ' යනාදීන් පෙර කී සේ ධාතු මාත්‍ර වශයෙන් මෙනෙහි කරන කල ද යට කී පරිදි උපචාර උපදී.

මේ සංක්ෂෙප වශයෙන් ධාතු ව්‍යවස්ථාන ක්‍රමය යි.

විස්තර ක්‍රමය:- මේ කමටහන වඩනු කැමති නොතියුණු නුවණ ඇති යොගාවචර තෙමේ ගුරුන් වෙතින් දෙසාළිස් ආකාර-යෙකින් විස්තර වශයෙන් ධාතූන් ඉගෙන පෙර කී පරිදි සෙනසුනෙක වසමින් සියලු පූර්‍වකෘත්‍ය සපුරා සිහිය එළවා

1. **සඝනාර සංඛෙප වශයෙන් ද,**
2. **සඝනාර විභතති වශයෙන් ද,**
3. **සලක්ඛණ සංඛෙප වශයෙන් ද,**
4. **සලක්ඛණ විභතති වශයෙන් ද යි**

මේ සතර ආකාරයෙන් කමටහන වැනිය යුතු.

විශෙෂ:- දවතතිංසාකාරයෙහි කී සේ දෙතිස් ආකාර හැර දෙසාලිස් ආකාරයෙහැ යි කීයේ වසතු වශයෙන් ධාතූන් ගැනීම සඳහා යැ. පෙර කී සෙනසුන නම් යට කම්මට්ඨාන නිදෙසයෙහි කී සේ ගොදුරු ගම්න් ඉතා නුදුරු නොළංවීම් ආදී පස් අඟින් යුතුවීම යි. සියලු පූර්‍වකෘත්‍ය සම්පූර්‍ණවීම නම් පළිබොධ සිදීම්, සිල විසුදධිය සම්පූර්‍ණ කිරීම්, කමටහන් ඉගෙනීම්, ආදියයි.

1. **සඝනාර නම්:-** සමූහය යැ කෙසාදි පඨවි ධාතු කොටස් විස්සෙහි එකක් පාසා පවත්නා තද බව නිමිත්තකොට පඨවි ධාතු යැයි දැනීම හා ව්‍යවහාර කිරීම වේ.

(කෙසාදි විසි කොටසෙහි පෘථිවි ධාතු යැ යන බුද්ධිය හා නාමය තද බව නිසා පවත්නා හෙයිනි)

---

[1] ම: නි: මූලපණ්ණාසක 199 පිට

ඒ **කෙසාදියෙහි** පෘථිවි ධාතුව විශේෂයෙන් ඇති හෙයින් කෙසාදීනු සසම්භාර නම් වෙති.

සංඛේප නම්:- ඒ කෙසාදි කොටස් විස්ස පිඬුකොට ගැනීම ය. ආපො ආදියෙහි ද මෙ සේ මැයි.

මෙ සේ **කෙසාදි** කොටස් විස්ස ද, **පිත්තාදි** කොටස් දෙළස ද, **සන්නාපනාදි** කොටස් සතර ද, **උදඛඔලාදි** කොටස් සය ද, සංක්ෂේප වශයෙන් පිඬුකොට පිළිවෙළින් පෘථිවි ආදි ධාතූන් පරිග්‍රහ කොට බෙදීම **සසම්භාර සංඛේප** වශයෙන් භාවනා කිරීම යි.

විභාග:- ඒ යොගාවචර තෙමේ හිස කෙස් ආදි විසිකොටසෙහි දැනි වූ ආකාරය **පඨවි ධාතුයෑ සි** නියම කෙරේ. දෙළොස් කොටස්හි වැගිරෙන්නා වූ (හාත්පසින් බඳිනා) ආකාරය **ආපො ධාතු යෑ සි** නියම කෙරේ. සතර කොටස්හි මුහුකුරු වන තෙජස යැ යි කියන ලද උණුසුම **තෙජෝ ධාතු යෑ සි** නියම කෙරේ. සය කොටස්හි පිපෙන (ගතිය) ආකාරය **වායො ධාතු යෑ සි** නියම කෙරේ. මෙ සේ සතර මහා භූතයන් නියම කරන්නා වූ ඒ යොගාවචරයාහට ධාතූහු ප්‍රකට වැ පහළ වන්නාහු ය. ඒ ධාතූන් නැවත නැවත මෙතෙහි කරත් ම මෙකී ක්‍රමයෙන් උපචාර ධ්‍යානය උපදී.

මෙ සේ භාවනා කොට කමටහන සිද්ධ නො වේ නම්-

2. **සසම්භාර විභාගයි** වශයෙන් වැඩිය යුතු. පෙර කායගතා සති කමටහනෙහි කී පරිදි මේ සප්තාඞ්ග උග්ගහ කොසල්ලය හා දසවිධ මනසිකාර කොසල්ලය දත යුතු.

සත් වැදෑරුම් උග්ගහ කොසල්ලය හා දස වැදෑරුම් මනසිකාර කොසල්ලය ද, කෙසාදි දෙතිස් කොටස් ද, ධාතු මනසිකාර වශයෙන් පළමුව සම්පූර්ණ කොට තවපසඳවකාදිය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් වචනයෙන් සජ්ඣායනා කිරීම් ආදී වූ සියලු විධාන නො වළහා කළමනා ය. ඒ කායගතාසතියෙහි එනාහි **වණ්ණ-සණ්ඨාන-දිසා-අවකාශ-පරිච්ඡේද**- යන මේ පස් ආකාරයෙන් හිසකේ ආදී දෙතිස් කුණපයන් මෙනෙහි කොට පිළිකුල් වශයෙන් සිත පිහිටුවිය යුතු ය.

මේ ධාතු මනසිකාරයෙහි වූ කලී පස් - පස් - ආකාරයෙන් මෙනෙහිකොට ධාතු වශයෙන් සිත පිහිටුවිය යුතු ය. මේ යැ මෙහි **වෙතස නම්**.

ඒ මෙසේ යි:-

(1) **කෙස්** – මේ කේසයෝ හිස් කබල වසා සිටි සම මතු පිට උපත් හ. තුඹසක් මතු පිට ඉදුලක් තණ හටගත් කල 'මා මුදුනෙහි ඉඳක් තණ හටගත්හ'යි තුඹස් මුදුන නොදනී. 'අපි තුඹස මතුයෙහි හටගතුම්හ'යි ඉඳක් තණ ද නො දනී. එසේ මැ 'මා මතුයෙහි කෙස් හටගත්හ'යි හිස් කබල වසා සිටි සම නොදනී. 'අපි හිස් කබල වසා සිටි සම මතුයෙහි වූම්හ' යි කේසයෝ නොදනිති. මෙ සේ හිස් කබල වසා සිටි සමය, කේසයෝය, යන භූත රූප හා උපාදා රූපයෝ ඔවුනොවුන්- 'මා කෙරෙහි කේසයෝ හට ගත්හ. අපි හිස් සම මතුයෙහි වූම්හ'යි මෙනෙහි කිරීමක් නැතැ'යි මේ සේ කේසයෝ නම් මේ ශරීරයෙහි වෙන මැ කොටසෙක සිතිවිලි රහිතය හ. අව්‍යාකෘතය හ. ආත්මයෙන් ශූන්‍යය හ. එහෙයින් මැ සත්ත්වයෙක් නොවන්නේ ය. තද බැව් අධික වූ පෘථිවි ධාතුය යි මෙතෙහි කළ යුතු.

(2) **ලොම්** – සිරුර වෙලා සිටි සමැ හට ගනී. යම් සේ පාළු ගම් පෙතෙකැ හිතණ හටගත් කල 'මා වෙත හිතණ හට ගත්හ'යි පාළු ගම් පෙත නො දනී ද 'අපි පාළු ගම්පෙත හටගතුම්හ'යි හිතණ නො දනිත් ද එසේ මැ සිරුර වෙළා සිටි සම ද 'මා කෙරෙහි ලොම් හටගත්හ'යි නොදනී. ලොම් ද 'අපි සිරුර සිටි සම හට ගතුම්හ'යි නො දනී. මෙ සේ පරමාර්ථයෙන් දුක් සැප විඳුනා ආත්ම සංඛ්‍යාත විඳින්නකු නැති හෙයින් පාළු ගම් පෙතක් බඳු වූ මේ සිරුර වෙළා සිටි සම ය එහි හටගත් හිතණ බඳු රෝමය යන මේ භූත උපාදය රූප ධර්මයෝ 'ඔවුනොවුන් මෙනෙහි කිරීමෙක් නැතැ' යි මෙ සේ ලෝමයෝ නම් වෙන ම කොටසෙක සිතිවිලි රහිතය හ. අව්‍යාකෘතය හ. ආත්මයෙන් ශූන්‍යය හ. සත්ත්වයකු නො වැ තද බව් අධික කොට ඇති පෘථිවි ධාතුහු යැයි මෙනෙහි කළ යුතු ය.

(3) **නිය** – අත් – පා ඇඟිලි කෙළවර හටගත් විසි නිය පොත්- තෝ ය. යම් සේ මී ඇට විද දඬු කැබලි අගෙහි අවුණාගෙන බාල දරුවන් කෙළනා කල 'අප අගෙහි මී ඇට අවුණා තිබේය'යි දඬු කැබලි නොදනී ද? අපි ලී කැබලි අග අවුණන ලදුම්හ'යි මී ඇට නොදනී ද? එසේ මැ 'අප අග නිය හට ගැනී ඇතැ'යි ඇඟිලි අක් නො දනී. 'අපි ඇඟිලි අග හට ගතුම්හ'යි නියපොතු නොදනී. මෙ සේ මේ ඇඟිලි නිය යන භූත රූප උපාදරූපයෝ ඔවුනොවුන් මෙනෙහි කිරීම නැත්තා හ. මෙ සේ නිය නම් මේ

ශරීරයෙහි වෙන මැ කොටසකැ යි ද, සිතිවිලි නැත්තාහ යි ද, අව්‍යාකෘත ධර්මයෙහි ඇතුළත් ආත්මයෙන් ශූන්‍ය තද බව් අධික පෘථිවි ධාතු යැ යි ද,

(4) **දත්** – උඩ යට දෙ හණු ඇටයෙහි හට ගත් දෙ තිස් දන්තයෝ ය. යම් සේ වඩුවන් ගල් වළවල යම්කිසි ලහටුවක් බහා ටැම් සිටුවා තුබු කල 'අප කෙරෙහි ටැම් සිටුවන ලදහ'යි ගල් වළවල් නො දනී ද, 'අපි ගල් වළවල පිහිටියම්හ'යි ටැම් නො දනී ද, එපරිද්දෙන් 'අප කෙරෙහි දත් හටගත්හ' යි දෙහණු ඇට ද, 'අපි දෙ හණු ඇටයෙහි හටගතුම්හ' යි දත් ද, නො දනී. මෙ සේ, දෙ හණු ඇට හා දත් ය යන භූත උපාදය රූප ඔවුනොවුන් චිත්තානොග නැති පෘථිවි ධාතුය යි ද

(5) **සම** -- සම සියල් සිරුර වසා සිටියේ ය. තෙත් වූ ගෙරි සමකින් වසනලද මහා වීණාවක් 'තමා තෙත්වූ ගෙරි සමින් වසන ලදැ'යි මහා වීණාව ද, 'මා විසින් මහා වීණාව වසන ලදැ'යි තෙත් ගෙරි සම ද, නො දන්නා සේ 'තමා සමින් වසන ලදැ'යි ශරීරය ද, 'මම ශරීරය වසා සිටිමැ'යි සම ද, නො දනී. දුගඳ භාවයෙන් තෙත් ගෙරි සමකට සමාන වූ මේ සම ද, ශරීරය ද, යන භූත උපාද, රූප ඔවුනොවුන් චිත්තානොග රහිත පෘථිවි ධාතුය යි ද

(6) **මස්පිඬු** – නව සියයක් මස්පිඬු ඇටසැකිල්ල වසා සිටියේ ය. කටු මැටි අවුළුවා සිටි භිතතියක් 'තමා කටුමැටි අවුළුවා සිටියැ'යි ද, කටු මැටිය ද 'මම භිතති අවුළුවා සිටිමැ'යි ද, නො දන්නා සේ "මම මස්පිඬු අවුළුවා සිටිමැ'යි ඇට සැකිල්ල ද, 'අපි ඇටසැකිල්ල අවුළුවා සිටුම්හ'යි මස් පිඬු ද; නො දනී. මෙ සේ ඇටසැකිල්ල යැ, මස් පිඬු යැ, යන භූත උපාද, රූප පෘථිවි ධාතුයැ යි ද

(7) **නහර** – ශරීරය ඇතුළත ඇටසැකිල්ල බැඳී සිටියේ ය. කුටි කිත්තියක සිටුවනලද වරිච්චි ද වැලින් වෙළන ලද්දේ, 'අපි වැලින් වෙළන ලදුම්හ'යි නො දනී. වැල් ද 'අපි වරිච්චි දඬු වෙළා සිටුම්හ'යි නො දනී. එසේ මැ ඇට ද 'අපි නහරුයෙන් වෙළී සිටුම්හ'යි නො දනී. නහර ද 'අපි ඇට වෙළා සිටුම්හ'යි නො දනී. මෙ සේ පෘථිවි ධාතුය යි ද

(8) **ඇට** – (අතුරින්) විළුම් ඇටය, ගොප් ඇටය ඔසවා සිටී. ගොප් ඇටය කෙණ්ඩා ඇටය ද, එය දණ ඇටය ද, එය කළවා ඇටය ද, එය උකුළු ඇටය ද, එය පිට කටුව ද, එය ගෙළ ඇටයද,

එය හිස් කබල ද, ඔසවා සිටී. එසේ මැ හිස් කබල ගෙළ ඇටයෙහි පිහිටියේ ය.—ගොප් ඇටය විළුම් ඇටයෙහි පිහිටියේ ය. උළු, දඬු, ගොමරිටි, ආදි ද්‍රව්‍ය සමූහයෙහි යට-යට වූ ද්‍රව්‍යය 'අපි උඩ-උඩ සිටි උළු ආදිය ඔසවා ගෙන සිටුම්හ'යි ද, මතු සිටි උළු ආදිය 'අපි යට සිටි දඬු ආදියෙහි පිහිටියම්හ'යි ද, නො දන්නා සේ විළුම් ඇටය ගොප් ඇටයෙහි පිහිටියේය යි ද, ගොප් ඇටය විළුම් ඇටය දරා සිටිමැයි ද නො දනී යැයි ද

(9) **ඇට මිදුලු** – ඒ ඒ ඇට ඇතුළෙහි පිහිටියේ ය. හුණ පුරුක් ආදිය ඇතුළත බහා ලූ හිවූ වේ බඩ ආදිය 'අපි හුණ පුරුක් ඇතුළත බහා ලන ලදුම්හ' යි ද, හුණ පුරුක් ආදිය 'අප කෙරෙහි හිවූ වේ බඩ ලූහ' යි ද නො දන්නා සේ 'අපි ඇට ඇතුළත වූම්හ'යි ඇට මිදුලු ද, අප ඇතුළත ඇට මිදුලු වීය යි ඇට ද නො දනී යැයි ද

(**10**) **වකුගඩුව** – ගළවලුයෙන් නික්මුණු එක් මුලකින් මදක් තැන් ගොස් දෙකක් වැ බෙදී ගිය මහ නහර වැලින් බැඳී හෘදය මාංසය වටා සිටියේ ය. එක නටුවෙක හට ගත් අඹපල දෙකක නටුව 'මා අඹපල දෙක බඳනා ලදැ'යි ද, අඹපල දෙක ද 'අපි නටුවෙන් බඳනා ලදුම්හ'යි ද, නො දන්නා සේ මහ නහරය ද 'මා වකුගඩුව බඳනා ලදැ' යි ද, වකුගඩුව ද 'මා නහරයෙන් බඳනා ලදැ' යි ද නො දනී යැයි ද

(**11**) **හෘදය** – ශරීරය තුළ ඇටසැකිල්ල මැද නිසා හෘදය සිටී. දිරා ගිය රිය මැදිරියක් මැද නිසා මස් වැදැල්ලක් එල්ලෙන කල රිය මැදිරිය මැද, 'මා නිසා මස් වැදැල්ලක් පවතී ය'යි ද, මස් වැදැල්ල ද, 'මම රිය මැදිරිය මැද නිසා පවතිමැ'යි ද නො දන්නා සේ හෘදය ඇටසැකිල්ල ඇතුළ ද 'මා නිසා හදවත පවතී ය'යි ද, හදවත ද 'මම් හෘදය අසපී පඤ්ජරය මැද නිසා පවතිමැ'යි ද නො දනී යැයි ද

(**12**) **අක්මාව** – ශරීරය ඇතුළත දෙතන (මැද) අතුරෙහි දකුණු පස නිසා පවතී. සැලිකබල් පසෙක ඇලී ගිය කලු මස් පිඬු යුවළක් 'මා කෙරෙහි මස්පිඬු ඇලී සිටිතැ'යි සැලිකබල් පස ද, 'මම සැලිකබල් පස නිසා පවතිමැ'යි මස්පිඬු යුවළ ද නොදන්නා සේ 'මම් දෙතන අතර දකුණු පස නිසා පවතිමැ'යි අක්මාව ද, 'මා නිසා අක්මාව සිටියැ'යි දෙතන මැද දකුණු පස ද නොදනී. යැයි ද

(**13**) **දලබුව** – පිළිසන් නො පිළිසන් යැ යි දලබු දෙකෙකි. පිළිසන් දලබුව හදවත හා වකුගඩුව පිරිවරා සිටී. නො පිළිසන්

දලබුව සියල් සිරුරු මසට යටව සිටී. රෙදි කඩකින් මාංසයක් වසා ලූ කල මාංසය 'මා රෙදිකඩින් වසන ලදී'යි ද, 'මා මාංසය වෙළන ලදී'යි රෙදිකඩ ද. නො දන්නා සේ වකුගඩු හෘදය මාංසය හා සියල් සිරුරු මස ද, 'තෙමේ දලබු වසා සිටීය'යි ද, දලබුව, 'මම් වකුගඩු හදවත් සියල් සිරුරු මසින් වසන ලද්දෙමි'යි ද නො දනී යැයි ද

(**14**) **බඩදිව** – හදවතට වම් පසැ උදර පටලයේ මතුපස නිසා සිටී. කොටුගුලක මතුපස නිසා අලවා තුබූ ගොම පිඩක් 'මම් කොටුගුල් මතුපස නිසා පවත්නෙමි'යි ගොම්පිඬ ද, 'මා නිසා ගොම පිඬ පවතීයැ'යි කොටුගුල් මතු පස ද, නො දන්නා සේ 'මම් හදවත වම්පස උදර පටලයේ මතු පස නිසා පවතිමි'යි බඩ දිව ද, 'මා නිසා බඩදිව සිටීයැ'යි හදවත වම්පසැ උදර පටලයේ මතුපස ද නො දනී යැයි ද

(**15**) **පපු කැනැත්ත** – හදවත හා අක්මාව මතු භාගයෙහි දෙතන මැද වසා ගෙන සිටී. දිරාගිය කොටුවක් තුළ ළිහිණි කැදැල්ලක් එල්බෙමින් පවත්නා කල 'මා නිසා ළිහිණි කැදැල්ලක් එල්බෙමින් පවතීය'යි කොටු ගුල ද, 'මම කොටු ගුල මතුයෙහි එල්බෙමින් පවතිමි'යි ළිහිණි කැදැල්ල ද, නො දන්නා සේ සිරුරු ඇතුළ ද, 'මා නිසා පපු කැනැත්ත එල්ලේයයි' ද 'මම් සිරුර ඇතුළ නිසා පවතිමි'යි පපු කැනැත්ත ද, නො දනී යැයි ද

(**16**) **අනනය** – (බඩවැල) ගෙළ මුල සිට ගුදය තෙක් මුළු සිරුර ඇතුළත පවතී. ලේ ඔරුවෙක හිස්සුන් ගැරවිල් සිරුරක් දරණ ගසා බහා ලූ කල 'මා තුළ හිස්සුන් ගැරවිල් කුණක් සිටීයැ'යි ලේ ඔරුව ද, 'මම් ලේ ඔරුවෙක සිටිමි' යි ගැරවිල් කුණ ද, නො දන්නා සේ 'මා තුළ බඩවැල පිහිටියේයැ'යි සිරුර ඇතුළ ද, 'මම සිරුර ඇතුළත සිටිමි'යි බඩවැල ද, නො දනී යැයි ද

(**17**) **අනන ගුණය** – (අතුණු බහන) බඩවැල අතරතුර දරණ එක් විස්සෙහි එක් විසි කැනකින් බැඳී සිටිනේ ය. පා පිස්තක් වෙළා සිටි රැහැනක් 'මම් පා පිස්ත වෙළා සිටිමි'යි රැහැන ද, 'මම් රැහැනින් වෙළන ලදිමි' යි පා පිස්ත ද, නො දන්නා සේ 'මම් බඩවැල වෙලා සිටිමි'යි අතුණු බහන ද, 'මම් අතුණු බහනින් වෙළන ලදිමි'යි බඩවැල ද, නො දනී යැයි ද

(18) **උදරිය** - ආමාසයෑ වූ නො පැසුණු අහරය, බලු ඔරුවෙක බහා ලූ බලු වමනය 'මම් බලු ඔරුවෙහි සිටිමි'යි ද, බලු ඔරුව ද, 'මා තුළ බලු වමනය බහාලන ලදැ'යි ද නො දන්නා සේ 'මම් ආමාසය නිසා පවතිමි'යි නො පැසුණු අහර ද, 'මා තුළ නො පැසුණු අහර සිටීය'යි ආමාසය ද නො දනියෑ යි ද,

(19) **කරීසය** - (මළ) පක්වාසයෙහි (අතුණු කෙළවර) සිටි-නේ ය. අඹරා හුණ පුරුකෙක බහා ලූ සිහින් පඬුවන් මැට්ටක් 'මම් හුණ පුරුකෙහි සිටිමි'යි ද, හුණ පුරුක 'මා තුළ සිහින් පඬුවන් මැටි පිණිටාය'යි ද, නො දන්නා සේ 'මම් පක්වාසයෙහි පවතිමි'යි පැසුණු අහර ද, 'මම් පැසුණු අහර දරමි'යි පක්වාසය ද නො දනී යෑ'යි ද,

(20) **හිස් මොළ** - (මත්ථලුඞග) හිස් කබල ඇතුළත පිහිටියේ ය පරණ ලබු කබලෙක බහා ලූ පිටි පිඬක් 'මම් ලබුකබල ඇතුළත පිහිටියෙමි'යි පිටි පිඬ ද, මා තුළ පිටි පිඬ වීයෑ'යි ලබු කබල ද නො දන්නා සේ, හිස් කබල ද, 'මා තුළ හිස් මොළ පිහිටියේය'යි ද, හිස් මොළ ද, 'මම හිස් කබල තුළ වීම්යෑ'යි ද නො දනී.

මෙසේ හිස් කබල තුළ යෑ. හිස් මොළ ය යන භූත උපාදාය රූප-යන් ඔවුහොවුන් **විඤ්ඤාණ නොවන** මනසිකාර නැත්තාහයි ද, මෙසේ හිස් මොළ නම් මේ සිරුරෙහි සිතුවිලි රහිත අව්‍යාකෘත ආතම ශූන්‍ය වෙන මැ කොටසකැයි ද, එහෙයින් මැ සත්ත්වයෙක් නො වේය යි ද, තද බව අධික කොට ඇති පෘථිවි ධාතුයයි ද, මෙනෙහි කරන්නේ ය. (මෙසේ විසි ආකාර වූ පෘථිවි ධාතු කොටස් එකක් පාසා මෙනෙහි කළ යුතු යි.)

අනතුරු වැ මෙසේ දෙළොස් ආකාර ආපො ධාතු කොටස් මෙනෙහි කරන්නේ ය.

(1) **පිත** - අබද්ධ පිත්ත යෑ, බද්ධ පිත්ත යෑ යි ඒ දෙවැදෑරුම් වේ. ඉන් **අබද්ධ පිත්තය** ජීවිතෙන්ද්‍රිය පිළිබඳ යෑ. කර්මජ තෙජෝ ධාතුව මෙන් කර්මජ රූප ඇසුරු කොට පවතින්නා සියලු සිරුර පැතිර සිටිනේ ය. **බද්ධ පිත්තය** පිත්ත කොෂයෙහි පිහිටියේ පූපයෙකැ පැතිර සිටි තෙලක් සේ පවතී. එහි පූපයෙකැ පැතිර සිටි තෙල 'මම පූපය නිසා පවතිමි'යි ද, පූපය ද, 'මම් පැතිරී සිටි තෙල් නිසා පවතිමි'යි ද නො දන්නා සේ, ශරීරය ද 'මා පතුරුවා අබද්ධ පිත්තය පවතීයෑ'යි ද, අබද්ධ පිත්තය ද, 'මම් සියලු සිරුර පවතිමෑ'යි ද නො දනී.

එසේ මෑ වැසි කලෙක ජලයෙන් පිරුණු වැටකොළු වහල්ල මා කෙරෙහි ජලය සිටිනැ'සි ද, වැසි ජලය ද, 'මම් වැටකොළු වහල්ලෙහි පිරී සිටිමි'සි ද, නොදන්නා සේ, පිත් කොෂය ද, 'මා කෙරෙහි පිත සිටිනැ'සි ද, බඳ්ධ පිත ද, මම් පිත්තාසය පිරී සිටිමැ'සි ද නො දනී.

මෙ සේ මේ පිත්තාසය යැ, පිතයැ, යන භූත උපාදුරූපයෝ ඔවුනොවුන් සැලකීමක් නැත්තාහ. එහෙයින් පිත නම් 'මේ ශරීරයෙහි පිහිටි සිතිවිලි නැති අව්‍යාකෘත ධර්මයෙහි ඇතුළත් ආත්මයෙන් ශූන්‍ය වූ සත්ත්වයෙක් නොවූ වැහිරෙන සවභාව ඇති බඳිනා ආකාරයෙන් පවත්නා එක් ආපො ධාතු කොටසකැ'සි ද.

(2) සෙම – පාත්‍රයක් පුරා ලන පමණ වූයේ උදර පටලය පුරා පවතී. ගම්දෙර ගවර වළෙහි ඇතුළත ඉඳුල් දිය ගැප් මළ ආදිය මතු පිට පෙණ පටලයෙන් පිරී පවත්නා කල පෙණ පටලය 'මම් ගවර වළ පවතිමැ'සි ද, ගවර වළද, 'මා මතුපිට පෙණ පටලය පවතීයැ'සිද නොදන්නා සේ 'මා කෙරෙහි සෙම පිහිටියේයැ'සි උදර පටලයද, 'මම උදර පටලයෙහි පිහිටි සෙමැ'සි සෙම් (පටලය)ද නො දනී. මෙසේ උදර පටල යැ, සෙම යැ යන භූත උපාදුරූපයෝ ඔවුනොවුන් චිත්තාභොග නැති. ශරීරයෙහි පිහිටි වෙන මැ කොටසෙක, සත්ත්වයෙක් නො වූ ද්‍රවවත් වූ බඳනා සවභාව ඇති ආපො ධාතු කොටසකැ සි ද

(3) සැරව – (පූයාව) නිතර පවත්නා තැනෙක් නැති. කණු කටු ආදියෙන් කැඩුණු ගිනි දැළින් පහළ තැන හෝ ගඩොළු ආදිය හටගත් තැන හෝ ලේ නැවති පැස වූ කල හට ගනී. පොරෝ ආදියෙන් කැපූකල වැහිරෙන ලහටු ඇති ගස් ආදියෙහි ඒ කැපූ තැන් ආදිය 'අප කෙරෙහි ලහටු පිහියේය'සි ද, ලහටුව ද, 'මම් ගස්වල කැපූතන්හි සිටිමිසි' ද, නො දන්නා සේ 'පූයාව ද 'ශරීරයෙහි ඒ ඒ තුවාල වූ තන්හි වේයැ,සිද' ඒ ඒ තුවාල වූ තැන්ද, 'පූයාව අප කෙරෙහි පිහිටියේ යසි' ද නොදනී. මෙසේ තුවාල වූ ශරීර ප්‍රදේශ යැ, පූයාවයැ, යන භූත උපාදුරූපයෝ ඔවුනොවුන් මෙතෙහි කිරීමක් නැති. මේ ශරීරයෙහි පිහිටි සිතිවිලි නැති අව්‍යාකෘතයතට අයත් ආත්මයෙන් ශූන්‍ය වූ සත්ත්වයෙක් නොවූ ආපො ධාතු කොටසකැයි ද.

(4) ලේ – සංසරණක අසංසරණක යැ යි දෙ පරිදි වේ. සංසරණකය අබඳ්ධ පිත්තය සේ ජීවිතේන්ද්‍රිය පවත්නා සියල් සිරුරෙහි පැතිර සිටියි. අසංසරණක ලොහිතය බඳ්ධපිත්තය සේ

අක්මාවෙහි යට භාගයෙහි තැළියක් පමණ වූයේ වකුගඩු, හදමස්, **අක්මා**, පපු **කැනති** තෙම්මින් පවතී. ඉන් **හැසිරෙන** ලෙය බඳ්ධ පිත මෙන් දන යුතු ය. නොහැසිරෙන ලෙය බිඳුනු සැලි **කඹලෙක** වැසි ජලය වට කල එහි යට වූ **කැට** කැබලිති ආදිය තෙමෙතත් ඒ **කැට කැබලිති** ආදිය 'අපි වැසි දියෙන් තෙමෙමු යැ'සි ද, වැසිදිය ද 'මම් **කැට** කැබලිති තෙම්මැ'සි ද, නො දන්නා සේ **අක්මා** යට පෙදෙස හෝ වකුගඩු ආදිය ද 'අප **කෙරෙහි** ලේ පිහිටියේ ය'සි හෝ 'අපි ලෙහෙයෙන් තෙමෙම්න් සිටිමු යැ'සි ද නොදනී. ලෙහෙය ද, 'මම අක්මා යට සිටිමැ සි ද, වකුගඩු ආදිය තෙම්මැ'සි ද, නො දනී. මෙසේ ලෙහෙ නම් ආපෝ ධාතුයැ සි ද

(**5**) **ඛහදිය** – ගින්නෙන් හෝ අව්වෙන් හෝ අන්කිසි උණුසුම කින් හෝ තැවුණු **කල** රෝම කූප හා කෙස් සිදුරු පුරා වැගිරේ. දියෙන් මතු පිටට නැගුණු තෙලුම් දඬු ආදියේ සිදුරු 'අප කෙරෙන් ජලය වැගිරේ ය'සි ද, ඒ ජලය ද 'තමා නෙලුම් දඬු ආදියෙන් වැගිරේ ය'සි ද නො දන්නා සේ කෙස – ලෝම කූප 'අප **කෙරෙන්** ඛහදය වැගිරේ ය'සි ද, ඛහදිය ද 'තමා රෝමකූප සිදුරු වලින් වැගිරේ ය'සි ද නො දනී. මෙසේ ආපෝ ධාතුයැ සි ද

(**6**) **මේද තෙල** – තරවූවහු ගේ සිරුර මුළුල්ලෙහි ද, **කෘශ** වූවහු ගේ සිරුර, **කෙණඬා** මස් ආදී මස් පිඩු ඇති තන්හි ද, වූ උකු මී තෙල් වැනි ද්‍රවයෙකි. **කහ** පෙවූ රෙදි කඩෙකින් වැසූ මස් පිඬක් 'මම් **කහ** රෙදි **කඩෙකින්** වැසූයෙමැ'සි ද, රෙදි කඩ ද 'මම් මස් වසා සිටිමැ'සි ද, නො දන්නා සේ ඒ ශරීර මාංසය 'මා නිසා **මේද** තෙල පවතී ය'සි ද, මේද තෙල 'මම් ශරීර මාංසයන් නිසා පවතිමැ'සි ද, නො දනී. මෙසේ ආපෝ ධාතුයැ සි ද

(**7**) **කඳුළු** – ඇස් සිදුරු පුරා වැගිරෙන ගති ඇත්තේ ය. නො මේරූ තල් ගෙඩියක ඇස්ස කැපූ කල ඒ සිදුරු 'අපගෙන් ජලය වැගිරේ ය' සි ද, ජලය 'මම් තල් ඇට සිදුරින් වැගිරෙමැසි ද, නො දන්නා සේ ඇස්වල ද 'අප වෙත **කඳුළු** පිහිටියේ ය'සි ද, **කඳුළු** ද, මම් ඇස්වලැ පිහිටියෙමැ'සි ද, නොදනී. මෙසේ ආපෝ ධාතුයැ සි ද

(**8**) **වුරුණු තෙල** – ගිනි, අවු රැස් ආදියෙන් තැවෙන කල පිටිඅලු – පිටිපතුල් – නාසාපුට – නළල්තල – උරහිස් – ආදියෙහි **හටගන්නා** කුරුලැ නම් වියළි තෙල ය. තෙල් ඛහාවූ නිවුඩු

කෑදක් 'මම් තෙල වතුරුවා සිටිමැසි' ද, තෙල ද 'මම් කෑද වතුරුවා සිටිමැසි' ද, නො දන්නා සේ අතුල් පතුල් 'අපි වුරුණු තෙල වතුරුවා සිටිමුයැ'සි ද, වුරුණු තෙල ද 'මම් අතුල් ආදිය වතුරුවා සිටිමැ'සි ද නො දනී. මෙසේ ආපො ධාතුයැ සි ද

(9) **කෙළ** – ඇඹුල් – මිහිරි ආදී, කෙළ ඉනීමට සුදුසු කරුණක් ඇති කලෙක දෙ කොපොලින් බැස දිව මත පිහිට සි. ගඟක් අසල කැනූ නිතර දිය උණන ළිදෙහි ළිං පතුල 'මා කෙරෙහි ජලය පිහිටියේය'සි ද, ජලය ද, 'මම් ළිං පතුලැ සිටිමැ'සි ද, නො දන්නා සේ, දිව මතු පිට ද, 'මා කෙරෙහි කෙළ සිටිතැ'සි ද, කෙළ ද 'මම් දිව මතුපිට සිටිමැ'සි ද, නො දනී. මෙසේ කෙළ නම් ආපො ධාතුයැ සි ද

(10) **සොඹ** – හටගැනීමට සුදුසු කරුණක් ඇතිවුව දෙ නාසා පුටය පිරී හෝ වැගිරෙමින් හෝ පවතී. කුණු වූ දී පිරූ බෙලි කටුව 'මා කෙරෙහි කුණු දී පිරී සිටින්නේය'සි ද, කුණු දී ද, 'මම් බෙලි කටුව පුරා සිටිමැසි' ද, නො දන්නා සේ, නාසා පුට ද 'මා කෙරෙහි සොටු පිරී සිටියැ'සි ද, සොටු ද, 'මම් නාසාපුට පුරා සිටිමැ'සි ද, නො දනී. මෙසේ සොටු නම් ආපො ධාතුයැ සි ද

(11) **ඇටමිදුලු** – ඇට සන්ධිවල (අබ්භඤ්ඤන) තෙල් ගැල්වීම්, සිදු කෙරෙමින් එකසිය අසූවක් ඇට සන්ධියෙහි පවතී. තෙල් ගැල් වූ කඩ ඇණය 'මා කෙරෙහි තෙල් ගල්වන ලදැ'සි ද, තෙල ද, 'මම් කඩ ඇණය ගැල්වීමැ'සි ද, නො දන්නා සේ, ඇට සන්ධි ද, 'ඇට මිදුලු අප ගල්වා සිටිතැ'සි ද, ඇට මිදුලු ද,, 'මම් ඇට සන්ධි ගල්වා සිටිමැ'සි ද, නො දනී. මෙසේ ඇට මිදුලු නම් ආපො ධාතුවෙකැ සි ද,

(12) **මූත්‍ර** – වස්තිකෝෂය තුළ පවතී. ගවර වලෙක මුණින් බහා ලූ යෝනකයන් ගේ බොර දිය පෙරා ගන්නා කළය යවන ඝටය) මා කෙරෙහි ගවර වළ දිය පිහිටියේය'සි ද, ජලය ද, 'මම් යවන ඝටයෙහි පිහිටිමැ'සි ද, නො දන්නා සේ වස්තිය ද, 'මා කෙරෙහි මූත්‍ර පිහිටියේයැ සි ද, මූත්‍රය ද, 'මම් වස්තියෙහි පිහිටියෙමැ'සි ද, නො දනී. මෙසේ මොහු ඔවුනොවුන් මෙනෙහි කිරීමක් නැති. මේ ශරීරයෙහි පිහිටි වැගිරෙන සවභාව ඇති එක්තරා ආපො ධාතු කොටසකැසි ද

මෙසේ **පඨවි සහ ආපො දෙකිස් කෝටස** මෙනෙහි කොට **අනතුරුවැ තෙජොධාතු** කොටස්හි මනසිකාරය ද (මෙසේ) පැවැත්විය යුතු.

(1) **මේ ශරීරය තැවෙන තෙජෝ ධාතුව** මෙහි ම පිහිටි සිනිවිලි නැති ආත්මයක් නැති. එහෙයින් මෑ සත්ත්වයකු නො වූ තවත සුභාව ඇති වෙන ම කොටසකැ යි මෙතෙහි කළ යුතු ය.

එසේ ම

(2) **ශරීරය දිරවන** තෙජෝ ධාතුව ද

(3) **දවන** තෙජෝ ධාතුව ද

(4) **කන - බොන දෑය දිරවන** තෙජෝ ධාතුව ද, මේ ශරීරයෙහි පිහිටි වෙන මැ කොටසෙකැ යි ද මෙතෙහි කළ යුතු.

තවද **වායෝ ධාතු** කොටස් ද, මෙසේ මැ මෙතෙහි කළ යුතු.

(1) **උඩට නැගෙන වාතයෙකි** ද, එසේ මැ නුවණ පිහිටුවිය යුතු ය.

(2) **යටට බස්නා වාතය,**

(3) **කුසෙහි පවත්නා වාතය,**

(4) **කොෂ්ඨයෙහි පවත්නා වාතය,**

(5) **ශරීරාවයවයන් අනුවැ පවත්නා වාතය,**

(6) **ආශ්වාස-ප්‍රශ්වාස වාතය ද සි,** මෙකී වාත කොටස් වෙන වෙන මැ ගෙන මෙසේ නුවණින් සලකා **උඩට නැගෙන වාතය නම්** මේ ශරීරයෙහි වෙන මැ පිහිටි සිනිවිලි නැති (අව්‍යාකෘත ආත්මයක් නැති, සත්ත්වයකු නොවූ) පිරෙන සුභාව ඇති වායෝ ධාතුව යැ යි මෙතෙහි කළ යුතු.

එසේ මැ **අධොගම, කුචජ්ඡය, කොට්ඨාසය, අඞ්ගමඞ්ගානුසාරී, අස්සාස, - පස්සාස,** වාත කොටස් පිළිබඳව ද සැලකිය යුතු.

මෙසේ මෙතෙහි කරන යොගාවචරයා හට ධාතු ප්‍රකට වේ මැයි. ඒ ධාතූන් මැ නැවත නැවත මෙතෙහි කරන්නාහට යට කී සේ **උපචාර සමාධිය** උපදනේ ය.

මෙසේ ද භාවනා කරන යොගාවචරයාහට කම්ටහන සම්‍යඤ්ඤ නො වූයේ නම් ඔහු විසින් **සලකණ සඞ්ඛෙප** වශයෙන් භාවනා කළ යුතු ය.

3. **ඒ මෙසේයි:-** **කෙස්** ආදී වීසි කොටසෙහි තද ගතිය **පඨවිධාතුයැ** යි ද, බැඳෙන ගතිය **ආපොධාතුයැ** යි ද, පැසවන ගතිය **තෙජෝධාතුයැ** යි ද, පිපෙන ගතිය **වායොධාතුයැ** යි ද, වෙන් කළ යුතු.

පිත්තාදී දෙළොස් කොටසෙහි බැඳෙන ගතිය **ආපොධාතුයැ** යි ද, පැසවන ගතිය **තෙජෝධාතුයැ** යි ද, පිපෙන ගතිය **වායොධාතුයැ** යි ද, තද ගතිය **පඨවිධාතුයැ** යි ද, වෙන් කළ යුතු.

සන්තාපනාදි සතර කොටසෙහි මුහුකුරුවන ගතිය **තෙජෝ-ධාතුයැ** සි ව්‍යවසථා කළ යුතු. එහි මැ පවත්නා පිපෙන ගතිය **වායොධාතුයැ** සි ද, තද ගතිය **පඨවි ධාතුයැ** සි ද, බැඳෙන ගතිය **ආපොධාතුයැ** සි ද, මෙනෙහි කළ යුතු ය.

උදඛඛමාදි සය කොටසෙහි පිපෙන ගතිය **වායො ධාතුයැ** සි ව්‍යවසථා කළ යුතු. එහි ම තද ගතිය **පඨවි ධාතුයැ** සි ද, බැඳෙන ගතිය **ආපො ධාතුයැ** සි ද, පැසවන ගතිය **තෙජෝ ධාතුයැ** සි ද, මෙනෙහි කළ යුතු.

මෙසේ **ධාතූන්** ලක්‍ෂණ වශයෙන් ව්‍යවසථා කරන්නා වූ ඒ යොගාවචරයා හට **ධාතුඝ්‍ර** ප්‍රකට වෙති. ඒවා නැවත මෙනෙහි කරන ඕහට පෙර කී සේ **උපචාර සමාධිය** උපදී.

යමකුට මෙසේත් කමටහන සමෘධ්‍ධ නො වේ නම් ඔහු විසින් **සඞ්ඛලක්‍ෂණ** බෙදීම් වශයෙන් මෙනෙහි කළ යුතු ය.

4. ඒ මෙසේයි:- පෙර කී සේ කෙසාදි දෙසාලිස් (42) කොටස් වෙන් කොට කේසයෙහි තද ගතිය **පඨවි ධාතු** යැ, දියාරු ගතිය **ආපොධාතු** යැ, පැසවන ගතිය **තෙජෝධාතු** යැ, සෙලවෙන ගතිය **වායොධාතුයැ** සි ද, සියලු කොටස්හි මැ එක එක කොට සක් පාසා **සතර ධාතූන්** විභාග කටයුතු වේ. මෙසේ විභාග කරන ඕහට **ධාතුඝ්‍ර** ප්‍රකට වෙති. ඒවා නැවත නැවත ආවජ්ජනා කරන්නා හට මෙනෙහි කරන්නා හට, පෙරකීසේ **උපචාර සමාධිය** උපදී. මෙසේ මෙහි **එක්සිය හැටඅටක්** (168) **ධාතු විභාගය** කීයේ වෙයි.

නවද ක්‍රමයෙකි:-

(1) වචනාර්ථ වශයෙන් ද,
(2) **කලාප** ,,
(3) සුඤ්ඤ ,,
(4) **ලක්‍ෂණාදි** ,,
(5) සමුට්ඨාන ,,
(6) නානත්ත - **එකත්ත** ,,
(7) විනිභෝග - අවිනිභෝග ,,
(8) සභාග - විසභාග ,,
(9) අජ්ඣත්තික - බාහිර ,,
(10) සංග්‍රහ ,,
(11) ප්‍රත්‍යය ,,
(12) අසමන්නාහාර ,,
(13) ප්‍රත්‍යය විභාග ,,

ධාතුඝ්‍ර වැනිය යුතු වෙති.

(1) සියල්ලට පළමු කමටහන උගෙනීම වචනයෙන් මෑ වන්නේය. එ මගින් මෑ අර්ථය ද, දතමනා හෙයින් **වචනාර්ථ වශයෙන්** පළමුව වැඩිය යුතු ය.

ඒ මෙසේයි:- **පඨවි** පතළා වූ අර්ථයෙන් පෘථුල බැවින් **පුථවි** නම් වේ. හේම නිරුක්තික්‍රමයෙන් "ථ" කාරයට "ය" කාරාදේශ වැ 'ඵ" කාරයට "අ" කාර වැ **"පඨවි"** යයි සිද්ධ වේ. අවශෙෂ භූතත්‍රයට ද ප්‍රතිෂ්ඨාධාර බැවින් වැටහේ යන අර්ථයි.

ආපො – පැතිරෙන්නේ ය' පැමිණෙන්නේ යැ. යන අර්ථයෙන් **ආප** නම්. මේ අර්ථද්වයය (ආපො ධාතු අධික ශුද්ධාෂ්ටක සංඛ්‍යාත) සසම්භාර ආපය වශයෙන් කියන ලදී. ඒ **සසම්භාර ආප** නම් වූ ජලය වැගිරෙන හෙයින් **සසම්භාරපෘථිවි** සඞ්ඛ්‍යාත පොළවේ ගලා බැසීම් වශයෙන් ඒ ඒ තැනට පැමිණෙන්නේ ය.

තවද වැගිරෙන සුභාව **ලක්ෂණය** යැ, එය සහජාත අන්‍යොන්‍ය **නිශ්‍රයාදී ප්‍රත්‍යය** භාවයෙන් ශෙෂ භූතත්‍රය නිස්‍යන්දන භාවයෙන් ඔවුනොවුන් බඳිමින් හුණුවී යා නොදී, විසිර යා නොදී, පැතිරෙන-පැමිණෙන හෙයින් **ආප** නම් වේ. එරැස ආකාරය, පැසවන ආකාරය, වියළවන ආකාරය, යන තුන් ආකාරයෙන් යුක්ත වූ සෙසු මහාභූතයන් විසින් බොහු ලබන්නාක් මෙන් පවතී. එහෙයින් මෑ 'වඩා වර්ධනය කෙරේනුයි' **ආප** නම් වේ.

තෙජෝ – තියුණු බැවින් අන්‍ය භූත ත්‍රය හුණු ගන්වන හෙයින් **තෙජ** නම් වේ.

වායෝ – කම්පාකරන (සොළවන) හෙයින් **වායු** නම් වේ.

සෙසු භූත ත්‍රය පිහිටි තැනින් අන් තැනෙක ඉපදීමට හේතු භාවයෙන් යවන හෙයින් **වායෝ** නම් වේ. මේ විශෙෂාර්ථ යැ.

සාමාන්‍ය අර්ථය මෙසේයි:- සතර මහා භූතයෝ **කැකුළු බව, වැගිරෙන බව, උණුසුම් බව, සැලෙන බව,** යන තම තමා අයත් **ලක්ෂණ** ධරන හෙයින් ද, දුක් දෙන හෙයින් ද **ධාතු** නම් වෙති.

විශෙෂ – තීර්ථකයන් විසින් කල්පනා කරන ලද **'ප්‍රකෘතිය' 'ආත්මය'** යනාදිය සුභාව වශයෙන් ඇත්තේ නොවෙයි. **මේ පෘථිවි** ආදිය ඒ විපරීත කල්පනා මාත්‍රයක් මෑ නොවැ, **සුභාව වශයෙන් තම තමා අයත් ලක්ෂණය** පෙර කී **සේ** ධරණ **යැ. එහෙයින් මෑ ධාතු නම්.**

එසේ මෑ අනේක ප්‍රකාර වූ ජාත්‍යාදි සංසාර දුක්ඛය විධානය කරන හෙයින් ද **ධාතු** නම් වේ.

නිදර්ශන - යකඩ ලොහ ආදී ධාතූන් නිසා (අයෝ) වානේ ලොහාදිය සාදන්නෙක් මෙනි.

අතල්ප වූ දුක ඇති කරන අර්ථයෙන් හා වශයෙහි නොපවත්නා අර්ථයෙන් ද, **ධාතු** නම් වේ.

ඒ මෙසේ යි:- සතර මහා භූතයන් කරණකොට ඇති සත්ත්වයා ඒ සංසාර දුක්ඛය නැවත නැවත ඇති කෙරේ. එසේ කරනුයේ ද, මේ ධාතූන් මනාව පිහිටන හෙයිනි.

එසේ ම නිර්ජීව අර්ථයෙන් ද **ධාතු** නම්.

"ඡද්ධාතුරොයං භික්ඛු පුරිසෝ,"[1] - යනාදීන්හි ජීවය යන සංඥාව උගුළුවනු පිණිස **ධාතු** දේශනාව වදාළ සේක.

මෙසේ අසාධාරණ - සාධාරණ වශයෙන් වචනාර්ථ මුඛයෙන් ධාතූන් ගේ සඩකීය ලක්ෂණය මෑ ප්‍රකාශ වේ.

එ හෙයින් පෙර කී සේ වචනාර්ථ මුඛයෙන් ධාතූන් නුවණින් මෙනෙහි කළ යුතු ය.

(2) (මෙසේ වචනාර්ථ වශයෙන් දත්තහු විසින්) **වණ්ණය, ගන්ධය, රසය, ඔජාය, පඨවිය, ආපය, තෙජස්ස, වාතය** යන මේ කරුණු අට එක්වීමෙන් ගැළපුණු **කලාප** වශයෙන් මෙනෙහි කළ යුතු ය.

එසේ කලාප වශයෙන් (කෙසාදී) ඒ ඒ කොටස් වෙන් කොට ගත් කල **කේසාදි** සම්මතය නො ලැබේ.

ලෝමාදිය ද මෙසේ මැසි.

ඒ කේසයෙහි කම්මසමුට්ඨාන විෂයෙහි **ජීවිතින්ද්‍රිය** හා **භාවය** ද, **ශුද්ධාෂ්ටකය** හා එක්කොට ගත් කල දස දෙනෙකුන් ගේ **කලාපය** වේ. (එය කෙසය මුල්කොට ඇත්තේ ය.) ලොමාදියෙහි ද මෙසේ යි.

නව ද අසිතාදි පරිපාචක **තෙජෝ** කොට්ඨාසය නව ධම්මකලාප ද වේ. එසේ ම කෙසාදි කොටස් අට-නව-දස-කලාප ඵශයෙන් සමූහ වේ. එසේ වන්නා මේවා **පඨවි ධාතු** කොටස් වශයෙන් කීයේ ඒ උසස ද (අධික) හෙයිනි.

ඒ එසේමැ යි:- මේ ධාතුමනසකාර කම්මට්ඨානය හුදෙක් සත්ත්ව සංඥාව සිඳීම පිණිස මෑ වදාරන ලදී. මෙසේ කලාප වශයෙන් ධම්ම විනිච්ඡයය එකාන්තයෙන් මෑ සත්ත්ව සංඥාව සිඳීමට හේතුවන හෙයින් මෑ **ඒ ඒ** කෙසාදියෙහි කලාප වශයෙන් ධම්ම විනිච්ඡයය දතයුතු මෑ වේ.

---

[1]ම: නි: උපරිපණ්ණාසක. 246 පිට

විඤ්ඤාණය - ඒ දෙසාලිස් (42) කොටස් අතුරින් **ආමාශය** ද, **මලය** ද, **සෑරව** ද, **මුත්‍රය** ද, **උතු** සමුට්ඨාන යැ.

ආහාරාදිය පැසවන **තෙජෝ ධාතුව** හුදු **කර්ම** සමුට්ඨාන ය.

ආශ්වාස-ප්‍රශ්වාස වාත **චිත්ත** සමුට්ඨාන යැ. මේ කොටස් සය එක එක කරුණින් උපදනේ සි.

ඛහදිය, කඳුලු, සෙළ, සොඟ, යන සතර **උතු - චිත්ත** - දෙකින් හටගන්නා හෙයින් **දවිසමුට්ඨාන යැ,** සෙසු දෙනිස් කලාප **චතුසමුට්ඨාන සි.**

මෙවුන් අතුරින් ආහාරාදිය පැසවන **තෙජෝධාතුවෙහි** එක මැ ජීවිත නවක කලාපයක් වේ. **ශුද්ධාෂ්ටකය** හා **ජීවිතේන්ද්‍රිය** ද වශයෙනි. සෙසු ඒක සමුට්ඨාන විෂයෙහි **උතු සමුට්ඨාන** හෝ **චිත්ත සමුට්ඨාන** හෝ **එක එක අෂ්ටකය.** දැව් සමුට්ඨාන විෂයෙහි **ඍතු - චිත්ත** සමුට්ඨාන වශයෙන් **අෂ්ටක දෙක දෙක** වෙති. වතු සමුට්ඨාන විෂයෙහි **ඍතු, චිත්ත, ආහාර** සමුට්ඨාන වූ **අෂ්ටක** තුන වෙති. **ඍතු-චිත්ත** සමුට්ඨාන විෂයෙහි **සද්දනවකය** ද වේ. **පරිපාචන තෙජෝ** ධාතුව හා **අස්සාස-පස්සාස වායෝ** ධාතුව හැර සෙසු **තෙජෝ වායෝ** කොටස් අටෙහි ජීවිතේන්ද්‍රිය **බහා ජීවිත නවකය** වේ. සෙසු සූචිසි කොටස්හි **කාය-භාව දසක** සහිත වෙති. වඤ්ඣාදි කොටස් පසෙහි **චක්ඛු-සොත-ඝාන-ජිව්හා-වත්ථු දසක** සහිත වෙති සි මෙසේ පරිච්ඡේදයතන රූප කායයෙහි හෙදය නො සලකා එකත්වයෙන් ගත්තා රූප **කලාප එක්සිය තෙසැත්තෑ** (173) **කෙනෙක්** වෙති. රූප විභාග වශයෙන් **එක් දහස් පන්සිය එක්** (1501) **රූපයක්** වේ.

කොට්ඨාසයන් ගේ අවයව විභාගයෙන් වූ කලී ඒ අවයවයන් ගේ කලාප හෙදය ගන්නා කල රූප ධර්මයන් ගේ අසඞ්ඛ්‍යය බව දත මනා ය.

මෙසේ ධර්ම විභාගයෙන් අනෙක හෙද භින්න වූ මේ **දෙසාලිස්** කොටස් **උත්සදග්‍රහණයෙන්** (වැඩි ධාතූන් ගේ වශයෙන්) ව්‍යවස්ථා කට යුතු ය.

මේ ධාතූන් ගේ කලාප වශයෙන් මෙතෙහි කළයුතු සේ සි.

(3) **සණ්ඨාන වශයෙන්** ආරොහ පරිණාහ විසින් මධ්‍යම ප්‍රමාණ වූ ශරීරයෙක ලැබෙන සුණු විසුණු වී පරමාණු බවට ගිය **පෘථිවී ධාතුහු ද්‍රොණයක්** පමණ වේ.

ඒ මෙසේ සි:- අඟලින් අටෙන් එකක් **යවයෙක්** වේ. යවයෙන් අටෙන් එකක් **ලෑන්නාවෙක්** වේ. ලෑන්නාවෙන් අටෙන් එකක් **ලිකඛාවෙකි.** ලිකඛාවෙන් අටෙන් එකක් **රථරෙණුවෙකි.** රථරෙණුවෙන් අටෙන් එකක් **තජ්ජාරියෙකි.** තජ්ජාරියෙන් අටෙන් එකක් **අණුවෙකි.** අණුවෙකින් අටෙන් එකක් **පරමාණුවෙකි.**

අටුවා මතය:- මධ්‍යම පුරුෂයාගේ අඟුලින් සතිසෙන් එකක් **ලෑන්නා එකක්** වේ. ලෑන්නාවෙන් සතිසෙන් එකක් **ලිකඛාවෙකි.** ලිකඛාවෙන් සතිසෙන් එකක් **රථරෙණුවෙකි.** රථරෙණුවෙන් සතිසෙන් එකක් **තජ්ජාරියෙකි.** තජ්ජාරියෙන් සතිසෙන් එකක් **අණුවෙකි.** අණුවෙන් සතිසෙන් එකක් එක් **පරමාණුවෙකි.** එය ආකාශ කොටසට මෑ ඇතුළත් වේ. මසැසට විෂය නොවේ. දිවැසට ගොවර වේ. මෙහි ගන්නා ලද්දේ ඒ පරමාණු මාත්‍රය යැ. එසේ සුණු වූ පෘථිවි ධාතු **ද්‍රෝණයක්** පමණ වේ. ද්‍රෝණයක් නම් **සොළොස් නැළියෙක්** වේ.

ඒ මෙසේයි:- ප්‍රකෘති පුරුෂයෙකු ගේ මිටු සතරෙක් **එක් පතෙකි.**
ඒ පත සතරෙක් **නැළියෙකි.**
ඒ නැළි සොළසෙක් **ද්‍රෝණයෙකි.**

ඒ ද්‍රෝණය, **මගධ නැළිය** පමණ වේ. ඒ මගධ නැළියෙන් දෙළොස් නැළියක් පමණ **පෘථිවි ධාතු** සුණු මේ සිරුරෙහි වේ. එයින් අඩක් පමණ වූ **ආපෝ ධාතුවෙන්** එය නොවිසිරී සිටිනා සේ හාත්පසින් බැඳී පිඬුකොට ගන්නා ලද්දේ වෙයි. ඒ ආපෝ ධාතු-වෙන් තෙත්වීමට හෝ වැගිරීමට නො යන සේ **තේජෝධාතුවෙන්** රක්නා ලද්දේ වෙයි. එය සංඝාත වාතයෙන් අතිශයින් පුරවන ලද්දේ වෙයි. මෙසේ ඒ සියුම්වූ රජස්වූ **පෘථිවි ධාතුව** නොවිසිරෙන සේ නො විහිදෙන සේ හාත්පසින් **බැඳීම ය, පැසීම ය, සෑලීම ය,** යන කෘත්‍යය ඇති **ආපෝ - තේජෝ - වායෝ** - ධාතූන්ගෙන් උපකාර ලැබ **සෙනහයෙන්** තෙමන ලද, **තේජසින්** මුහුකුරුවන ලද, **වාතයෙන්** හම්මනලද, පිටි සුන්නක් සේ පිඬු වී ඝන වී සත්‍රී-පුරුෂ ලිංගාදි විසින් නන් අයුරින් ගත යුතු බවට පැමිණේ. එසේ මෑ කූඩා-මහත්-දිග-කොට-ඝජීර-තද- යනාදි සවභාවය ද පහළ කරන්නේ ය.

මෙහි වූ කලී දියාරු බවට ගියා වූ **ආපෝ ධාතුව** ද **පෘථිවි ධාතු** සුණු හාත්පසින් එක්කොට බැඳ **පෘථිවි ධාතුවෙහි** පිහිටයි. **තේජසින්** රැකෙයි. **වායෙන්** හැම්මෙයි. ඇතුළතින් පිටතට

හෝ පිටතින් ඇතුළතට හෝ යා නොදී නවත්වයි. එ හෙයින් නො වැගිරී වහනය නො වී පිණ පිණා සිටින බව දක්වයි.

ආහාර පානාදිය පැසවන ප්‍රකෘති උෂ්ණය ද, ජඨරාග්නිය ද, හටගැනීමට හේතු වූ **කම්ම තෙජෝ ධාතුව** අනුභව කළ ආහාරය මනා සේ පැසවීමින් රස බවට පමුණුවමින් මේ සිරුර ද, පැසවීමින් තියුණු කෙරෙමින් වර්ණ සම්පත්තිය ද උපදවයි.

කර්මය උපසර්ගෝක කොට ඇති චිත්තප්‍රසාදය **කරණකොට** ශරීර වර්ණ **සම්පත්තියට තෙජෝ ධාතුව** විශෙෂ ප්‍රත්‍යය වේ. 'උතු ආහාර සමුට්ඨාන රූපයට එය විශෙෂ වේය'යි කියනු කිම?

එයින් මෑ පැසවන ලද මේ සිරුර කුණුවීමට නො පැමිණෙයි, මේ සිරුරෙහි සෙසු භූතත්‍රය ය සෙලවීමට හා හැම්මීමට පමුණුවන **වායෝ** ධාතුව, **පෘථිවී** ධාතුවෙහි පිහිටා **ආපෝ** ධාතුවෙන් සංග්‍රහ ලැබ **තෙජෝ** ධාතුවෙන් ආරක්ෂා ලැබ මේ සිරුර (විත්ථම්භනය) **හැම්මීම කරයි.**

එයින් හැම්මුණු මේ සිරුර බිම නො හෙයි. ඍජුව සිටී. අතෙක් **වායෝ ධාතුවෙකින්** පහරන ලද මේ කය **යාම්, ඉඳිම්, සිටීම්, නිදීම්,** යන ඉරියව්වල **විඤ්ඤත්තිය** දක්වයි. අත්-පා හකුළුවයි. දික් කෙරෙයි. ලෙළවයි.

මෙසේ ස්ත්‍රී-පුරුෂාදි භාවයෙන් බාලයන් රවටන මායා රූප-යක් වැනි මේ සිරුර සූත්‍ර බලයෙන් පවත්නා යන්ත්‍රයක් සේ චිත්ත බලයෙන් ධාතුමය යන්ත්‍රය පවත්නේම ය.

මෙසේ සුණු වශයෙන් මෙතෙහි කළ යුතු.

ලක්ෂණාදි වශයෙන්:- ලක්ඛණ, රස, පච්චුපට්ඨානයෝ කවරහු ද (සතර මහාභූතයන් ගේ ලක්ෂණාදිය පෙර කියේ නමුදු දැන් එය නිරවශෙෂයෙන් දක්වා කම්මට්ඨාන විනිශ්චය දැක්වීම පිණිස මේ ආරබ්ධ යැ.)

පඨවී ධාතුව තද ගතිය ලක්ෂණය යැ, සහජාත ධර්මයන්ට පිහිටවීම් කෘත්‍යය යැ, ඔවුන්ට පිහිටවීම නුවණට වැටහෙන ආකාරය යි.

ආපෝ ධාතුව වැගිරෙන ලක්ෂණය යැ, සහජාත ධර්ම වැඩීම එහි කෘත්‍යය යැ. (නහනසුන්කට ජලය සේ) එක්වැ උපදනා සෙසු ධර්ම පිඬු කිරීම වැටහෙන ආකාරය යි.

තෙජෝ ධාතුව උණුසුම් **ලක්ෂණය** යැ. එක්ව උපදනා සෙසු ධර්ම මිහිකිරීම **කෘත්‍යය** යැ. ලාකඩ ලොහාදියට ගින්න සේ එක්වැ උපදනා සෙසු ධර්ම මොළොක් කිරීම වැටහෙනආකාරය යි.

වායෝ ධාතුවේ පිරවීම **ලක්ෂණය** යැ. සෙලවීම **කෘත්‍යය** ය (බීජයෙන් අංකුරය සේ භූත සමූහය පිහිටි තැනින් අනික් තැනෙකැ ඉපදීමට හේතු වශයෙන්) සැලීම වැටහෙනආකාරය යි. මෙසේ **ලක්ෂණාදි** වශයෙන් මෙනෙහි කටයුතු යි.

විශෙෂ:- **ධම්මසඞගණී ධම්මුද්දෙසවාර** වණ්නාදියෙහි[1] රසාදීන්ගේ වශයෙන් අන්‍යයන්ට ප්‍රත්‍යය වන බව් දක්වා ඔවුනට ද ප්‍රත්‍යය ඇති බව් දක්වන පිණිස පදට්ඨානය දක්වන ලදී. මෙහි වනාහි ධාතූන් ගේ අනන්‍ය සාධාරණ වූ විශෙෂයා ගේ විභාවනය පරමකොට ඇති වොදනාවෙහි අන්‍ය ධර්ම වූ පදට්ඨානය උද්ධරණය නො කරන ලදී.

(5) **සමුට්ඨාන වශයෙන්**:- **පඨවි ධාතු** ආදීන් ගේ විසතර වශයෙන් දක්වූ **දෙසාලිස්** (42) කොටස් අතුරින් **නො පැසුණු ආහාර** (උදරියං) - **පැසුණු ආහාර** (කරීසං) **සැරව** - **මුත්‍ර** යන සිවු කොටස යෘතුවෙන් මැ හට ගනී. **කඳුළු** - **ඩහදිය** - **සෙඛ්මල** - **සොඹ** යන මේ සිවු කොටස (යෘතු-චිත්තා) දෙකින් කලෙක **ඍතුවෙන් ද, කලෙක චිත්තයෙන් ද,** උපදී.

ආහාරාදිය පැසවන **ජඨරාග්නිය කම්යෙන්** මැ උපදී. **ආශ්වාස-ප්‍රශ්වාස වාතයෝ** සිතින් මැ උපදනා හ. සෙසු සියලු **පඨවි කොටස් සොළස ය, ආපො කොටස් අට ය, තෙජෝ කොටස් තුන ය, වායෝ කොටස් පස ය,** යන **දෙතිස්** (32) කොටස කම්ජාදි සතරින් මැ උපදී.

විශෙෂ:- කෙසාදීන් ගේ මස් තුළ පිවිසි කොටස **කර්ම, ආහාර, චිත්ත** තුනින් උපදී.

(6) **නානත්ත-එකත්ත වශයෙන්** ප්‍රත්‍යවෙක්ෂා කරන අයුරු මෙහි ධාතූන් ගේ ඔවුනොවුන්ට විසදෘශ භාවය **නානාත්ත‍ය,** වේ. සමාන බව **එකත්ත‍ය** වේ.

ඒ මෙසේයි:- සියලු ධාතූන් ගේ තම තමන්ට මැ නියත වූ **ලක්ෂණ, කෘත්‍ය, ප්‍රත්‍යුපඨ්ඨානාදින් ගේ** වශයෙන් වෙනස් බව වේ.

පෘථිවි ධාතුහු ගේ ලක්ෂණාදිය අනිකෙක. **ආපො ධාතු, තෙජෝ ධාතු, වායෝ ධාතූන් ගේ ද, එක එකේ ලක්ෂණාදිය** අන්‍යය යැ, එසේ මැ කම් සමුට්ඨානාදී වශයෙන් ද වෙනස් වූ-

[1] අත්ථසාලිනී ධම්මුද්දෙසවාර 116-273

ඔවුන් ගේ **රූපය, මහාභූතය, ධාතුය, ධර්මය, අනිත්‍යය, දුක්ඛය, අනාත්මය,** යන ආකාර වශයෙන් සමානත්වය වේ. සියලු **ධාතූහු** ශීතාදි විරෝධ ප්‍රත්‍යයන් නිසා වෙනස් වන සුභාව ඇත්තාහු මැ සි. ඒ සුභාව නො ඉක්ම වූ හෙයින් මැ **රූප** නම් වන්නාහ.

මහත් වැ පහළවීම් ආදි කාරණයෙන් **මහා භූත** නම් වෙති

ඒ මෙසේසි:- මේ **පෘථිවි ධාතු** ආදිය

1	මහත් වැ පහළවන	හෙයින් ද,
2	මහා භූතයන් හා සමාන	,,
3	මහත් පෙරහැර ඇති	,,
4	මහත් විකාර ඇති	,,
5	මහත් භූත	,,

මහාභූත නම් වෙති.

1 මේ මහත් වැ පහළවීම **සසම්භාර ධාතු** වශයෙන් මේරු, සමුද්‍ර, පොළෝ, ආදි අනුපාදින්නාසන්නාතයෙහි ද, දිව්‍ය, මනුෂ්‍ය, යක්ෂ, රාක්ෂස ආදි උපාදින්නාසන්නාතයෙහි ද වේ.

එහි:- "දුවෙ සත සහස්සානි – චත්තාරි නහුතානිව
එත්තකං බහලත්තෙන – සඞ්ඛාතායං වසුන්ධරා"සි

"මේ මහ පොළොව බොල් බැවින් දෙලක්ෂ සතලිස් දහසක් යොදුන් වේ"යැයි කීසේ මහත් වැ පහළ වේ. මේ (බුද්ධානුස්සති නිද්දේශයේ විස්තර සේ කියන ලදී.[1]) උපාදින්න සිරුරෙහිදු මස්, කැසුබු, දෙව්, අසුර ආදීන් ගේ තුන් ගව් පමණ ශරීර වශයෙන් මහත් වැ පහළ වේ. එහෙයින් මැ:-

"සන්ති හත්තෙන මහා සමුද්දෙ යොජනසතිකාපි අත්ත-භාවා"[2]සි, මහ මුහුදෙහි සියක් යොදුන් අත් බැව් ඇති සත්ත්වයෝ ද ඇතැ'සි වදළහ.

2 මේ **සතර මහා භූතයෝ**

(i) මැණික් නො වූ මැ ජලය මැණිකක් මෙන් කොට ද, රුවන් නො වූ මැ කැට රන් මෙන් කොට ද, දක්වති. එසේ මැ යක්ෂ නො වූයේ ම යක්ෂිණී නො වූවා ම යක්ෂයකු යක්ෂිණියක කොට

[1]සිං: මි: 306 පිට [2]අ: නි: අට්ඨකනිපාත 735

දක්වනසේද **සතර මහා භූතයෝ** මෑ නිල්වන් නොවූ මෑ **උපාද රූපය** නිල්වන් කොට ද, රන්වන් – රතුවන් – සුදුවන් – නොවූ යේ ම රන්වන් – රතුවන් – සුදුවන් – කොට ද, දක්වන හෙයින් **මායාකාර මහාභූත** සමාන හෙයින් **මහාභූතයෝ** නම් වෙති.

(ii) යක්ෂාදී මහාභූතයන් අල්ලාගත්තවුන් ගේ ශරීරය ඇතුළත හෝ පිටත හෝ ඔවුන් ගේ සිටීම නො දත හැකි වේ. 'ඔවුන් නිසා නො සිටිතැ'යි ද නො දත හැකි වේ. එසේ ම මේ **මහාභූතයන් ද** 'ඔවුනොවුන් ඇතුළත හෝ පිටත හෝ සිටිතැ'යි නො දත හැකි වේ. 'ඔවුනොවුන් නිසා නො පවත්නවුන් නොවෙතැ'යි ද නො දත හැකි හෙයින් **යක්ෂාදී මහාභූතයන් සමාන බැවින් ද මහාභූතයෝ** නම් වෙති.

(iii) එසේ ම මනාප වණ්ණ සංසථානාදීන් තමාගේ බියකරු සවභාවය වසාගෙන යක්ෂිණීන් සත්ත්වයන් රවටන්නා සේ මේ **මහාභූතයෝ ද** සත්‍රී-පුරුෂ ශරීරාදියෙහි මනහර ශරීර වණ්ණයෙන්, **අත්** – පා – ඇඟිලි – බැම නැටවීම් ආදියෙන් තමාගේ දැඩි බැව් ආදි සවභාවය වසා සත්ත්වයන් රවටන හෙයින් ද, **මහාභූතයෝ** නම් වෙති.

3 මහත් වූ ප්‍රත්‍යයෙන් පරිහරණය කළයුතු හෙයින් **මහා පෙරහර ඇති හෙයින් ද මහාභූතයෝ** නම් වෙති. (මේ මහාභූතයෝ දිනපතා බොහෝ බත්පිළී ආදියෙන් පැවැත්විය යුත්තෝ ය.)

4 තෘෂ්ණා-දෘෂ්ටීන් යුත් කර්මයෙන් නිපත් හෙයින් උපාදින්න නම් වූ ද, එසේ නොනිපත් හෙයින් අනුපාදින්න නම් වූ ද, මේ **භූතයන් ගේ මහා විකාර ඇති හෙයින් ද, මහාභූත** නම. ඒ මෙසේ යි :- අනුපාදින්නකයන් ගේ කල්ප විනාශයෙහි විකාරය ප්‍රකට වේ.

කප් නැසුම ගින්නෙන් – දැවී වැනැසෙත මේ ලොව
පොළොවින් නැඟී ගිනි දැල් – බඹලොව තෙක් මැ පැතිරේ

ජලයෙන් ලොව නැසෙත – **කප** කෙළ රැදුරු වැස්සේ
කෙළ සුවහසක් සක්වළ – විලිහවැ යේ කරදියෙන්

සුළඟින් ලොව නැසෙත – **කෙළ සුවහසක් සක්වළ**
කප් කෙළ රැදුරු පවනින් – විලිනවැ කෙමෙන් වැනසේ

උපාදින්න භූතයන් ගේ ධාතුක්ෂෝභයෙන් විකාරය ප්‍රකට වේ.

සෑපුව කටමුව[1] සපු – **කය දරකඩෙව් තද වේ**
පස්දෑ[2] කිපි **කල** එසේ – සිරුර තද වේ දැඩි සේ

සෑපුව **කුණු මුව**[3] සපු – සියල් **කය** කුණුවන සේ
අප්දෑ[4] කිපි **කල** සිරුර – කුණු වෑ කුණු වැගිරෙන්නේ

සෑපුව **ගිනි මුව**[5] සපු – **කය** දැඩි වෑ හුණුවන සේ
තෙදෑ කිපි **කල** සිරුර – හුණු වේ ගිනි ඇවිලි සේ

සෑපුව **සෑනි මුව**[6] සපු – **කය කඩ කඩ** සිඳෙන මෙන්
හුළඟ කිපි **කල** සිරුරේ – සිදේ සෑනින් සිඳින සේ

මෙ සේ **මහා විකාර** ඇති හෙයින් මහාභූත යැ.

5 මහත් උත්සාහයෙන් පරිහරණය කළ යුතු හෙයින් ද, සියලු ලෝකයට ප්‍රකට වැ පවත්නා බැවින් **මහාභූත යැ.** මහත් බැවින් ද, විද්‍යමාන බැවින් ද, **මහාභූත** නම් වේ.

මෙ සේ සියලු **ධාතුහු** මහත් වැ පහළවීම් ආදී කරුණින් **මහාභූතයෝ** නම් වෙති.

විශෙෂ:– තවද මේ **ධාතුහු** මහාභූත **එක** දෙශත්වයෙන් ද, මහාභූත සාමාන්‍යයෙන් ද, මහාභූත සන්නිශ්‍රයෙන් ද, මහාභූත භාවයෙන් ද, මහාභූතයන් අවසන් කොට ඇති බැවින් ද, මහාභූත නම් වෙන් ය යි ථීකායෙහි දක්වූහ. විස්තර සන්නාදියෙන් දත හැක්ක.

මේ සතර **ධාතුහු තද බව ය, වැගිරෙන බව ය, උණුසුම් බව ය, සැලෙන බව ය,** යන ලක්ෂණයන් ධරන හෙයින් ද, දුක් දෙන හෙයින් ද, දුක් විධාන කරන හෙයින් ද, මෙකී **ධාතු ලක්ෂණ** නො ඉක්ම වූ හෙයින් ද, තමා අයත් ක්ෂණයට සුදුසු සේ සතලොස් චිත්තක්ෂණායුෂ්ක කාලයක් පැවැත බිඳෙන අර්ථයෙන් ද, **අනිත්‍යය** හ. උත්පාද විනාශ දෙකින් පෙළෙන අර්ථයෙන් **දුක්ඛය** හ. ආත්ම සාරයෙන් සිස් හෙයින් **අනාත්මය** හ යි මේසේ සියලු ආකාරයෙන් එක් වැනි වෙති.

මෙසේ **නානාත්ව – එකත්ව** වශයෙන් මෙතෙහි **කටයුත්තා** හ.

---

1 කාෂ්ඨමුඛ 2 පඨවිධාතු 3 පූතිමුඛ 4 ආපොධාතු
5 අග්නිමුඛ 6 ශස්ත්‍රමුඛ.

(6) **සතර ධාතු** එක් වෑ උපදනාවූ ද, එක් වෑ පවත්නාවූ ද, සමාන **කාලයෙහි** ලැබිය යුතු වූ ද, (යටත් පිරිසෙසින්) **ශුද්ධාෂ්ටක කලාපයෙහි** ද, වෙන මැ නො බෙදිය **හැකි** වේ. එසේ මැ **පෘථිවී ධාතුව** සෙසු **ධාතූන්ට** ප්‍රතිෂ්ඨා වශයෙන් යම් තැනෙක පවතී නම් එතන්හි මැ **භාන්පසින් බැඳීම ය, පැසවීම ය, සැලීම ය** යන කෘත්‍යයන් ගේ වශයෙන් සෙසු ධාතු ද ලක්ෂණ වශයෙන් බෙදූ දැක්විය හැකි වේ. මෙසේ **විනිභෝග – අවිනිභෝග වශයෙන් ද** මෙනෙහි කළ යුතු.

(7) මොවුනතුරිනුදු **පඨවී – ආපො** දෙක බර බැවින් 'ඔවුනොවුන් හා සහගය්. **තෙජෝ – වායො** දෙක සැහැල්ලු බැවින් 'ඔවුනොවුන් හා සහගය්' එසේ මැ 'පළමු දෙක පසු දෙක හා ද, ඔවුනොවුන් විසහගයැ'යි මෙසේ **සහාග–විසහාග හෙයින් ද,** මෙනෙහි කළ යුතු ය.

ප්‍රශ්නයෙකි:– කකීශය, සියුම් ය, රළු ය, බර ය, සැහැල්ලු යැ යි පඨවී ධාතුවෙහි ද, සැහැල්ලු බව ඇත්තේ නොවේ ද? ජලයෙහි ද එසේ ම සැහැල්ලු බව ඇත්ම ය. එසේ හෙයින් පෙර කී බර බව කෙසේ යෙදේද

පිළිතුර:– ඉතා බරවූ **පඨවී ධාතුව** සඳහා බර අඩු පෘථිවී ධාතුව අප්‍රධාන වශයෙන් **එසේ** කී.

නිදර්ශන:– උෂ්ණය අඩු වූ **තෙජෝ ධාතුවෙහි** සිහිලස මෙනි.

තවද **ප්‍රශ්නයෙකි:**– එසේ වත්නා **ලහුතා** රූපය කෙසේවේ ද?

පිළිතුර:– **ලහුතා රූපය** නම් නිෂ්පන්න රූපයේ අවස්ථා භෙදයෙකි. පරමාර්ථ වශයෙන් **පරිච්ඡේද, විකාර, ලක්ෂණ, රූප** නොලැබේ. එහි සැහැල්ලු වශයෙන් පවත්නා අවස්ථා භෙදය ගැනේ. පරමාර්ථ වශයෙන් පවත්නා බර බව ගෙන ප්‍රථම ඛය ය ගරු භාවයෙන් සහාග යයි කී.

(8) සත්ත්ව සන්තානයෙහි ඇතුළත් පඨවී ආදි **සතර ධාතූහු** 'චක්ෂුරාදි ෂඩ් විඥාන වස්තූන්ට හා **භාෂ – වාක්** විඥප්ති දෙකට ද, **ඉත්ථි–පුරිෂ ජීවිතින්ද්‍රියයන්ට ද** නිශ්‍රය වන හෙයින් අධ්‍යාත්මික ය හ. අනින්ද්‍රියබද්ධ සන්තානයෙහි පවත්නාහු බාහිරය හ'යි මෙසේ **අධ්‍යාත්මික – බාහිර වශයෙන්** මෙනෙහි කළ යුතු.

මතභෙදයෙකි:– 'විඥාන වස්තු යන්නෙන් හෘදය වස්තුව ද ගත්තා ලදැ යි, ඇතැමෙක් කියති. ඔවුන් ගේ ඉන්ද්‍රිය ග්‍රහණයෙන්

'අටවැදෑරුම් රූපී ඉන්ද්‍රිය ගන්නා ලදැ සි, දත යුතු. එසේ මෑ ඉරියව් සහිත වූවාහු ද, චතුසමුට්ඨානික වූවාහු ද වෙති.

(9) **කර්මයෙන්** හටගත් **පඨවි ධාතුව, කර්මයෙන්** හටගත් **ආපෝ-තේජෝ-වායෝ**-යන අන්‍ය **ධාතූන්ට කර්ම** වශයෙන් **සංග්‍රහ** වේ. එසේ මෑ **චිත්ත - ඍතු - ආහාරයන්ගෙන්** හටගත් **පඨවි ධාතුව ද**, එසේ මෑ ක්‍රමයෙන් හටගත් **ආපෝ ධාතු** ආදිය හා **සංග්‍රහ** වේයැ සි මෙසේ **සමුට්ඨාන වශයෙන් සංග්‍රහ** කොට මෙනෙහි කළ යුතු ය.

(10) **පඨවි ධාතුව, ආපෝ ධාතුවෙන්** සංගෘහීත වැ, **තේජෝ ධාතුවෙන්** රක්නා ලදු වැ, **වායෝ ධාතුවෙන්** එල්වන ලදු වැ, එක් වැ උපදනා සෙසු **ධාතූන්ට** පිහිටවීමෙන් උපකාර වේ

ආපෝ ධාතුව, පඨවි ධාතුවෙන් පිහිට ලැබ, **තේජසින්** රැකී, **වුළඟින්** එල්ලී, තමා හා උපදින අන්‍ය **මහා භූතයන්** හා බැඳීමෙන් උපකාර වේ.

තේජෝ ධාතුව, පඨවි ධාතුවෙහි පිහිටා **ආපෝ ධාතු-වෙන්** සංග්‍රහ ලැබ **වායෝ ධාතුවෙන්** එල්වන ලදු වැ එක් වැ උපන් සෙසු **මහා භූතයන් ගේ** පැසවීමෙන් උපකාර වේ.

වායෝ ධාතුව ද, පඨවි ධාතුවෙහි පිහිටා ආපයෙන් බැඳී **තේජසින්** පැසවා තමා හා උපන **සෙසු මහා භූතයන්** එල්වීමට උපකාර කෙරෙමින් පවතියැ යි මෙසේ **ඔවුනොවුන්ට ප්‍රත්‍යය වශයෙන්** මෙනෙහි කළ යුතු වේ.

(11) **සතර ධාතූන්** අතුරින් **පඨවි ධාතුව** 'මම **පඨවි ධාතුවෙමැ'යි ද**, සෙසු **තුන් ධාතූන්** 'මා පිහිට කොට පවතින් ය'යි ද නො දනී. සෙසු තුන්දෙන ද, 'අපට **පඨවි ධාතුව** පිහිට ව සිට උපකාර වේ යයි ද, නො දනිති'යි මෙසේ ඔවුනොවුන් මෙනෙහි නො කරන බව් දත යුතු යැ. මෙසේ **සතර භූතයන් ඔවුනොවුන් මෙනෙහි නොකරන බව්** සැලකීමෙන් මෙනෙහි කළ යුතු ය.

(12) **කර්ම ය, චිත්තය, ඍතු ය, ආහාර යැ සි** රූප උපද වන ප්‍රත්‍යය සතරෙකි. එහි කර්ම සමුත්ථාන රූපයන්ට **කර්මය මැ ජනක ප්‍රත්‍යය වේ.** ඔවුනට ජනක වශයෙන් චිත්තාදිය උපකාර කොවේ. චිත්තාදියෙන් හටගත් රූපාදියට මැ චිත්තාදිය **ජනක වශයෙන් උපකාර වේ.** සෙසු කර්මාදි ප්‍රත්‍යයයෝ ජනක වශයෙන් උපකාර නොවෙති.

නවද **කර්මයෙන්** උපදනා රූපයන්ට ඒ **කර්මය** ප්‍රධාන වශයෙන් **ජනකප්‍රත්‍යය වේ.** ඒ **කර්මය** තෙමේ **චිත්ත-ඍතු-ආහාර**-සමුට්ඨාන රූපයන්ට අප්‍රධාන වශයෙන් **උපනිශ්‍රය** ප්‍රත්‍යය වේ. නාමධර්මයන්ට **පඤ්ඤායෙති උපනිශ්‍රය ප්‍රත්‍යය** නොවදුළ හෙයිනි. චිත්ත සමුට්ඨාන ධාතූන්ට චිත්තය **ජනක ප්‍රත්‍යය වේ.** කර්මාදී සෙසු තුන් ප්‍රත්‍යයෙන් උපන් **ධාතූන්ට** ඒ චිත්තය **පච්ඡාජාත-අත්ථි-අවිගත**-වශයෙන් තුන් ආකාරයෙන් **ප්‍රත්‍යය වේ.** එසේ මෑ ආහාර සමුට්ඨාන ධාතූන්ට ඒ ආහාරය **ජනකප්‍රත්‍යය** වේ. සෙසු තුන් ප්‍රත්‍යයෙන් හටගන්නා ධාතූන්ට ඒ ආහාරය **ආහාර, අත්ථි, අවිගත** වශයෙන් **ප්‍රත්‍යය වේ.**

විශේෂ:- **ජනක ප්‍රත්‍යය** නම් ඉපැදවීමයි. (මේ වූකලි කර්ම ප්‍රත්‍යය මැයි.) මෙසේ **කර්මාදී** ප්‍රත්‍යය ධර්මයන් ගේ වශයෙන් ධාතූන් පිළිබඳ **ප්‍රත්‍යය විභාගකොට** දැන් ඒ සමුට්ඨානයන් ගේ වශයෙන් ද, **ප්‍රත්‍යය විභාගය** දක්වති.

කර්ම සමුට්ඨාන මහාභූතය, **කර්ම** සමුට්ඨානික **මහාභූතයනට** ද, ප්‍රත්‍යය වේ. එසේ මෑ චිත්ත සමුට්ඨාන **මහාභූතය,** ආහාර සමුට්ඨාන **මහාභූතය,** ඍතු සමුට්ඨාන **මහාභූතය,** යන තුන චිත්ත සමුට්ඨාන, ආහාර සමුට්ඨාන, ඍතු සමුට්ඨාන, **මහා භූතයනට** හා කර්මාදීන් හටගන්නා **මහා භූතයනට** හා ප්‍රත්‍යය වේ.

විභාග:- ඔවුනතුරින් කර්ම සමුට්ඨානික **පඨවිධාතුව** කර්ම සමුට්ඨානික **ආපෝ - තේජෝ - වායෝ -** ධාතූන්ට සහජාත **අඤ්ඤමඤ්ඤ, නිස්සය, අත්ථි, අවිගත,** වශයෙන් හා ආධාර වශයෙන් ද උපකාර වේ. ජනක වශයෙන් උපකාර නො වේ මැයි.

සෙසු චිත්තාදී තුන් ප්‍රත්‍යයයෙන් හටගන්නා නො සිද පවත්නා මහා භූතයන්ට **නිස්සය, අත්ථි, අවිගත,** යන තුන් ආකාරයෙන් ප්‍රත්‍යය වේ. ආධාර වශයෙන් හා ජනක වශයෙන් ප්‍රත්‍යය නො වේ. **ආපෝ ධාතුව ද,** සෙසු මහා භූතයන්ට, **සහජාත, අත්ථි, අවිගත,** යන තුන් ආකාරයෙන් හා ඖන්පසින් බැඳීම් වශයෙන් උපකාර වේ. **ජනක** වශයෙන් උපකාර නො වේ. අවශෙෂ තුන් ප්‍රත්‍යයයෙන් හටගන්නා මහා භූතයනට **නිස්සය, අත්ථි, අවිගත,** වශයෙන් **උපකාර** වේ. බැඳීම් වශයෙන් හෝ **ජනක** වශයෙන් හෝ උපකාර නො වේ.

තේජෝ ධාතුව ද, සෙසු තුන් මහාභූතයනට **සහජාත, අත්ථි, අවිගත,** වශයෙන් හා **පැසවීම්** වශයෙන් **උපකාර** වේ. **ජනක** වශයෙන් උපකාර නො වේ.

ඒ **තෙජෝ ධාතුව** ද සෙසු තුන් ප්‍රත්‍යයෙන් හටගන්නා මහා භූතයනට **නිස්සය, අත්ථි, අවිගත,** වශයෙන් **උපකාර** වේ. **පැසවීම්** වශයෙන් හෝ **ජනක** වශයෙන් හෝ උපකාර නො වේ. **වායෝ ධාතුව ද,** සෙසු තුන් මහා භූතයන්ට **සහජාත, අත්ථි, අවිගත,** වශයෙන් හා **හැම්මිම්** වශයෙන් **ප්‍රත්‍යය** වේ. **ජනක** වශයෙන් උපකාර නො වේ. සෙසු තුන් ප්‍රත්‍යයෙන් හටගන්නා මහා භූතයනට **නිස්සය, අත්ථි, අවිගත** වශයෙන් මෑ උපකාර වේ. **හැම්මිම්** වශයෙන් හෝ **ජනක** වශයෙන් උපකාර නො වේ. **චිත්ත-සෘතු-ආහාර**-යන තුන් සමුට්ඨානයන් ගෙන් හටගන්නා **මහා භූතයන්ගේ ද** මේ ක්‍රමය දතයුතු.

මෙසේ **සහජාත** වශයෙන් පැවැත්තා වූ මේ **ධාතූන්** කෙරෙහි මේ මතු දැක්වෙන සේ උපකාර වන පරිදි දත යුතු.

"එකං පටිච්ච තිස්සො - චතුධා තිස්සො පටිච්ච එකා ච
වේ ධාතුයෝ පටිච්ච - වේ ජදධා සම්පවත්තන්ති."

(එකං ධාතුං පටිච්ච තිස්සො ධාතුයෝ චතුධා සම්ප-
වත්තන්ති. තිස්සො ධාතුයෝ පටිච්ච එකා ච ධාතු චතුධා
සම්පවත්තන්ති. වේ ධාතුයෝ පටිච්ච වේ ධාතුයෝ ජදධා
පවත්තන්ති. යනු මෙහි අර්ථය යැ.)

පඨවී ආදී **ධාතූන්** අතුරින් එකෙකි **ධාතුවක්** නිසා සෙසු තුන් **ධාතුහු සතරාකාරයෙකින්** පවත්නාහ. එසේ මෑ තුන් **ධාතූන් නිසා එක් ධාතුවක් සතරාකාරයෙකින් පවති.**

ධාතූන් දෙකක් නිසා දෙකක් සය ආකාරයෙකින් පවති."

ඒ මෙසේ ය:- පළමුවන **පඨවී-ආපෝ** ධාතු දෙදෙන නිසා පසු වූ **තෙජෝ-වායෝ** දෙක ද, පසු වූ **තෙජෝ-වායෝ** දෙක නිසා පළ මු වන **පඨවී-ආපෝ** ධාතු දෙක ද, පළමුවන තුන් වන **පඨවී-තෙජෝ** දෙක නිසා දෙවන සතරවන **ආපෝ-වායෝ** දෙක ද, දෙවන සතරවන **ආපෝ - වායෝ** දෙක නිසා පළමුවන තුන්වන **පඨවී - තෙජෝ** දෙක ද, පළමුවන සතරවන **පඨවී - වායෝ** දෙක නිසා දෙවන තුන්වන **ආපෝ - තෙජෝ** දෙක ද, දෙවන තුන්වන **ආපෝ - තෙජෝ** දෙක නිසා පළමුවන සතරවන **පඨවී - වායෝ** දෙකද යි මෙසේ ධාතූන් දෙදෙනකුන් නිසා දෙදෙනෙක් සයාකාරයෙකින් පවත්නාහ.

ඒ සතර ධාතු අතුරින් **පඨවී ධාතුව** ඉදිරියට යාම් - ආපසු ඒම් - ආදි කාලයෙහි පෘථිවී ධාතුවෙන් උද්ධරණය වන හෙයින්.

ගැටීමට ද, **ආපෝ ධාතුවට** අනුගත වූ ඒ **පෘථිවි ධාතුව** මැ පය බිම තැබීමට ද, **පඨවී ධාතුවට** අනුගත **ආපෝ ධාතුව** පය යට හෙළීමට ද, **වායෝ ධාතුවෙන්** අනුගමනය කරන ලද **තේජෝ ධාතුව** පය එසවීමට ද, **තේජෝ ධාතුවට** අනුගත වූ **වායෝ ධාතුව** පය ඉදිරියට හා සරසට යැවීමට ද, **ප්‍රත්‍යය** වේ. මෙසේ **ප්‍රත්‍යය විභාග** වශයෙන් මෙතෙහි කළ යුතු ය.

වචනාදීදි වශයෙන් මෙසේ මෙතෙහි **කරන්නා** වූ යොගාවචරයාහට **තෙළෙස්** (13) **ආකාර** අතුරින් එකි එකි ආකාර-යෙන් **ධාතූහු** ප්‍රකට වෙත්.

ඒවා නැවත නැවත (ආවජ්ජනා කරන) මෙතෙහි කරන යොගාවචරයාහට පෙර කී පරිදිදෙන් මැ **උපචාර** සමාධි උපදනේ ය. ඒ **උපචාර** සමාධිය **සතර ධාතූන්** ව්‍යවස්ථා කරන ඥානයා ගේ අනුභාවයෙන් උපදනා හෙයින් **චතුධාතු ව්‍වත්ථාන** සංඛ්‍යාවට යේ

විශේෂ:- මේ **චතුධාතු ව්‍වත්ථාන කර්මස්ථානයෙහි** යෙදුණු යොගාවචර තෙමේ සත්ත්වාදීන්ගේ **ශූන්‍යබව** දකී. එහෙයින් මැ සත්ත්ව යනාදි **සංඥාව** නසයි. සත්ත්ව සංඥාව නැසූ හෙයින් අරණ්‍ය සෙනසුන් ආදියෙහි ව්‍යාලමෘග-යක්ෂ-රාක්ෂසාදි සත්ත්වයන් **දැක** ද 'ඔහු ව්‍යාල මෘගාදීහු නො වෙති. හුදෙක් සතර භූතයන් ගේ විශේෂයහ'යි **ධාතු මාත්‍ර** කෙරෙන් කුමට භයවෙම් දැයි, සිතා භය හෙරවයන් ඉවසන්නේ ය. ප්‍රාණන්ත සෙනාසනයන්හි හා අධිකුශල ධර්මයන්හි නො ඇලීම ද, පස්කම් ගුණයෙහි ඇලීම ද, මැඩ පවත්වන්නේ වේ. කැමැති රූපාදි අරමුණෙහි සිත බැඟැ බවට ද, කොපැමිණෙන්නේ ය.

"මෙසේ නේ සුවහස් - යෝගින් බවුන් පැළැඹුණු
සිවුදෑ විවිසූ මැ නිසින් - නුවණැතියෝ යෙදෙත්වා!"

මේ චතුධාතු ව්‍වත්ථාන භාවනා නිර්දේශය සි.

මෙතෙකින් '**සමාධි නම් කිමැ**' සි ප්‍රශ්නකොට ඇරඹූ සමාධි විස්තාරය හා **සමාධි භාවනා** ක්‍රමය ද, විස්තර වශයෙන් දක්වා නිමවන ලදී.

එහි ද කෙසේ වැඩිය යුතු ද? යන මේ පදයා ගේ අර්ථ වර්ණනාව සංක්ෂිප්ත්‍රකාරයෙන් නිමවන ලදී.

විශෙෂ:- මෙහි **උපචාර - අප්පණා** යන උභය සමාධිය මෑ අභිප්‍රෙත යෑ. ඔවුනතුරින් උපචාරාවහ **කම්මට්ඨාන** වූ **බුද්ධානුස්සති** ආදී **දශවිධ කම්මට්ඨානයන්හි** අප්පණාවට (අෂට සමාපත්තීන්ට) පූර්භාගයෙහි පැවැති විතෙනකාග්‍රතාවය **උපචාර සමාධි** නම්. සෙසු **සමතිස් කමටහන්හි** චිත්තය පිළිබඳ එකාග්‍රතාව **අප්පණා සමාධි** නම් වේ. ඒ ඒ **කම්මට්ඨාන** වැඩීමෙන් මෑ ඒ දෙයාකාරය මෑ වඩනා ලද්දේ වෙයි. කෙසේ වැඩිය යුතුදැ යි යන්නෙහි අර්ථ වණ්ණනාව සවිස්තරයෙන් නිමවන ලදැ යි කීයේ එ හෙයිනි.

සමාධි භාවනාවේ ආනිසංස කවරේ ද

සමාධි භාවනාවේ **දිට්ඨධම්ම සුඛ විහාරාදී** ආනිසංස පසෙක් වේ.

ඒ මෙසේයි:-

(1) **රහතුන්** 'සමාපත්තියට සමවැද එකඟ සිත් ඇති වැ දවස් යවම්හ'යි සමවදනා කල ඒ අප්පණා සමාධිය **ඉහාතම සැප විහරණය** පිණිස වේ.

එයින් වදළහ:-

න බො පනෙතෙ චුන්ද අරියස්ස විනයෙ සල්ලෙඛා වුච්චන්ති. දිට්ඨධම්ම සුඛ විහාර එතෙ අරියස්ස විනයෙ වුච්චන්ති[1] යි අදහස පෙර කී සේයි.

(2) **ශෛක්ෂයන්ගේ හා පෘථග්ජනයන්ගේ** ධ්‍යානය, විදර්ශනා-වට ආසන්න **කාරණ** වන හෙයින් **අප්පණා සමාධි** භාවනාවට ද, තෘෂ්ණා සංක්ලෙශාදීන් කිලිවි වන හෙයින් අනිශයින් සම්බාධ වූ සංසාර ප්‍රවෘත්තියෙහි අර්ථ ප්‍රතිලාභයට යොග්‍ය වූ දුර්ලභ වූ **නව වැනි ක්‍ෂණ** සංඛ්‍යාත අවකාශය ලැබීමෙන් **අප්පණාවට** ද, නො පැමිණ සංවෙග බහුල පුදුමල තෙමේ **උපචාර** සමාධියෙහි **පිහිටා** විදර්ශනා වඩා වහා සසර දුක් ගෙවා **නිවන් පසක්** කරන්නේ ය.

සමාධිං භික්ඛවෙ භාවෙථ. සමාහිතො භික්ඛවෙ භික්ඛු යථාභූතං පජානාති[2] යි "මහණෙනි! සමාධිය වඩව්, සමාධියෙන් සිත මැනැවැ එකඟ කළ මහණ තෙම සියලු ධර්මයන් තත්ත්වාකාර යෙන් දැනගනීය" යි එහෙයින් වදළහ.

---

[1] ම: නි: මූලපණ්ණාසක 42 පිට

[2] සං: නි: සච්චසංයුත්ත 1069 පිට

(3) අෂ්ට සමාපත්ති උපදවා අභිඥා පාදක ධ්‍යානයට සමවැද ඉන් නැගී **"එකොපි හුත්වා බහුධා හොති[1]"** 'තෙමේ එකෙක්ව ද බොහෝවෙයි' යනාදීන් කියන ලද පරිදි අභිඥා ප්‍රාප්තිය කරන්නා වූ මහණහට ඒ අෂ්ට සමාපත්තිය අභිඥා ලාභයට සුදුසු උපනිශ්‍රය ඇති කල්හි අභිඥාවට ආසන්න කාරණ හෙයින් **අභිඤ්ඤානිසංස** ඇත්තේ වේ.

"සො යස්ස යස්ස අභිඤ්ඤා සච්ඡි කරණීයස්ස ධම්මස්ස චිත්තං අභිනීහරතිමෙති. අභිඤ්ඤා සච්ඡිකිරියාය තත්‍ර තත්‍රෙව සක්ඛි භබ්බතං පාපුණාති සති ආයතනෙ[2]" යි මතු විස්තාර වන විශිෂ්ට ඥාන සංඛ්‍යාත 'පඤ්චාභිඥාවන්ගෙන් ප්‍රත්‍යක්ෂ කටයුතු යම් යම් ධර්මයකට සිත නැමේ නම් ඒ ඒ ධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීමට සුදුසු බවට පැමිණේය' යි එයින් වදාළහ.

(4) 'නො පිරිහුණු ධ්‍යාන ඇතිවැ බ්‍රහ්ම ලොකයෙහි උපදිම්හ'යි **බ්‍රහ්ම ලොකොපපත්තිය** පතමින් හෝ භවගාමී කර්ම අරභයා භව ප්‍රාප්තිය නො කළ ද, ඒ කර්ම කළ හෙයින් භව ප්‍රාප්තිය සිදුවන බැවින් බ්‍රහ්මලොකොපපත්තිය නො පතා හෝ පෘථග්ජනයන් සමාධියෙන් නො පිරිහී කාලක්‍රියා කරත් ම බ්‍රහ්මලොකයෙහි ඉපදීම නියත හෙයින් අප්‍රමාණ සමාධි භාවනාව හට **විශෙෂ ලාභීම ආනිසංස** කොට ඇත්තේ යි.

"පඨමජ්ඣානං පරිත්තං භාවෙත්වා කප්පං උපපජ්ජති. පඨමජ්ඣානං පරිත්තං භාවෙත්වා බ්‍රහ්මපාරිසජ්ජානං දෙවානං සහව්‍යතං උපපජ්ජති[3]" යි.

"පඨමජ්ඣානය පරිත්තකොට වඩා කොහි උපදිද් ද **බ්‍රහ්ම පාරිසද්‍යයෙහි උපදින් ය"යි** එයින් වදාළහ.

විශෙෂ:- උපචාර භාවනා සමාධිය ද, කාමාවචර සුගති භවයෙහි උපදවාය යි **ධම්ම හදය විභඞ්ගයෙහි[3]** වදාළහ.

(5) අෂ්ට සමාපත්ති උපදවා නිරොධ සමාපත්තියට සමවැද සත් දවසක් අවිත්තකව ද, 'ඉහාතම් චිත්ත නිරොධ සංඛ්‍යාත **නිර්වාණයට** පැමිණ සැපසේ වසම්හ'යි සමාධි වඩන්නාවූ **අනාගාමි-රහත් ආර්යයන්ගේ** ඒ අප්‍රමාණ භාවනාව **නිරොධ සමාපත්තිය ආනිසංස** කොට ඇත්තේ යි.

---

[1] අ: නි: තිකනිපාත 104 [2] ම: නි: උපරිපණ්ණාසක 52 පිට
[3] වි: ප: ධම්මහදයවිභඞ්ග 311

සොළසහි ඤාණචරියාහි නවහි සමාධි චරියාහි වසිභාවතො පඤ්ඤා, නිරොධ සමාපත්තියා ඤාණං[1] **(අනිච්ච-දුක්ඛ-අනත්ත - නිබ්බිදා - විරාග - නිරොධ - පටිනිස්සග්ග - විවට්ටානුපස්සනා** - යන **අනුපස්සනා අට** හා) **මාගී - ඵල** අට දැයි මෙ කී **සොළොස් ඤාණ චරියාවෙන්** හා **(රූපාවචර පඨය, අරූපාවචර සත්තරය** යන) නව සමාධි චරියාවෙන් ද, වශී භාවයට පැමිණීමෙන් හටගත් ප්‍රඥාව **නිරොධ සමාපත්තියේ නුවණයැ** යි වදාළ හ.

මෙසේ සමාධි භාවනායෙහි **දිට්ඨධම්මසුඛ** විහාරාදී **පඤ්චානිසංස** ඇත්තේ යි.

කෙලෙස් මල දෙවුමෙහි - නේ අනුසසින් හොබනා
සමවත් බවුන් වැඩුමෙහි - පඬිදෙනෙ පමා නොව නේ.

මෙතෙකින් **"සීලෙ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ"** යනාදි ගාථායෙහි **සීල - සමාධි - ප්‍රඥා** මුඛයෙන් වදහළ විශුද්ධි මාගීයෙහි **සමාධිය** ද, දක්වා නිමවන ලදී.

හුදී ජනයාගේ පහන් බව පිණිස කළ
සිංහල විශුද්ධි මාගීයෙහි සමාධි භාවනාධිකාරයට ඇතුලත් සමාධි නිද්දේශ නම් වූ එකොළොස්වන පරිච්ඡේදයයි.

---

[1]පටි: ම: නිරොධ සමාපත්ති ඤාණනිද්දෙස 94 පිට (බුරුම)

12 ඉද්ධිවිධ නිද්දේශය

මෙයට පළමු (එකොළොස් වැනි නිද්දේශයෙහි) කියා නිමි වූ ඒ **සමාධි භාවනාව "ලෞකික අභිඥා ආනිසංස කොට ඇත්තිය"** යි කියන ලද්දේ ඒ අභිඥා සම්පාදනයට **චතුත්ථධ්‍යාන-ලාභියා** උත්සාහවත් කරවනු සඳහා ය.

එහි විශෙෂ ප්‍රයොජන දැක්වීම පිණිස මෙසේ **"ඒ පඤ්චාභිඥාවන්** සම්පාදනය කර ගත් යෝගාවචර මහණහු ගේ **ඒ සමාධි භාවනාව** ලබන ලද අනුසස් ඇත්තී ද, මනාසේ තහවුරු වූවා ද, වෙයි. හෙතෙමේ එබඳු ඒ සමාධි භාවනාවෙන් යුක්ත වූයේ සුවසේ මැ ප්‍රඥා භාවනා සිද්ධි කෙරේ යැ" යි කියන ලදී. එහෙයින් පළමුකොට **අභිඥා කථාව** පටන් ගන්නෙමු.

භාග්‍යවතුන් වහන්සේ චතුර්ථ ධ්‍යාන ලාභී කුලපුත්‍රයන් ගේ **සමාධිභාවනානිසංස** දක්වනු පිණිස ද, මතු මත්තෙහි ප්‍රණීත ප්‍රණීත ධර්මදෙශනාව පිණිස ද,

"සො එවං සමාහිතෙ චිත්තෙ – පෙ – ඉද්ධිවිධාය චිත්තං අභිනිනාමෙති. සො අනෙක විහිතං ඉද්ධි විධං පච්චනුභොති. එකොපි හුත්වා බහුධාභොති.[1]"

"ඒ යොගාවචර මහණ තෙමේ සිත එකඟ වැ, පිරිසිදු වැ, සම්ප්‍රකාරයෙන් පාප ධර්මයන් ගෙන් මිදී, කෙලෙසුන් කෙරෙන් දුරු වැ, උපක්ලෙශයෙන් පහ වැ මොළොක් වැ, ඍද්ධිවිධ කර්මයට සුදුසු වැ, කෙලෙසුන් නිසා නො සැලෙන බවට පැමිණි කල්හි **ඉද්ධිවිධ ඥානය** පිණිස සිත මෙහෙයයි. හෙතෙමේ අනේකාකාර වූ **ඍද්ධිවිධ ඥානය** ලබයි. තෙමේ එකෙක්ව ද බොහෝ වේ යැ"යි:- මේ ආදීන්

1. **ඍද්ධිවිධ ඥානය**
2. **දිව්‍යශ්‍රොත ඥානය**
3. **පරචිත්තවිජානන ඥානය**
4. **පූර්වේනිවාසානුස්මෘති ඥානය**
5. **සත්ත්වයන් ගේ චුතූපපාත ඥානය යි.**

මේ **පඤ්චවිධ ලෞකික අභිඥාවන්** වදුළ සේක.

විභාවනය:- "මෙසේ එකෙක්ව ද, බොහෝ වෙයි" යනාදීන් දැක් වූ **ඍද්ධිවිකුර්ණය** කරනු කැමැති ආදිකර්මික යොගාවචරයා

---

[1] දී: නි: සීලක්ඛන්ධවග්ග 60 පිට

විසින් **පඨවි කසිණයේ** සිට **ඔදාත කසිණය** තෙක් ඇති **අෂ්ට කසිණයන්හි** ලෞකික සමාපත්ති අට අට උපදවා—

(1) **කසිණානුලෝමය**
(2) **කසිණ** පටිලෝමය
(3) **කසිණානුලෝම** පටිලෝමය
(4) ධ්‍යානානුලෝමය
(5) ධ්‍යාන පටිලෝමය
(6) ධ්‍යානානුලෝමපටිලෝමය
(7) ධ්‍යාන උල්ලඞ්ඝනය
(8) **කසිණ** උල්ලඞ්ඝනය
(9) ධ්‍යාන **කසිණ** උල්ලඞ්ඝනය
(10) අඞ්ග සඞ්ඛානනිකය
(11) ආලම්බන සඞ්ඛානනිකය
(12) අඞ්ග ආලම්බන සඞ්ඛානනිකය
(13) අඞ්ග ව්‍යවස්ථාපනය
(14) ආලම්බන ව්‍යවස්ථාපනය

යන මේ **තුදුස් ආකාරයෙන්** සිත දමනය කළ යුතු.

විශෙෂ:- **ආකාසකසිණයෙන්** අරූපාවචර සමාපත්ති නොලැබෙන හෙයින් ද, **ආලොක කසිණය අවදාත කසිණයෙහි** ඇතුළත් වන හෙයින් ද, **අට කසිණය සි** කියන ලදී. තවද **කසිණපටිලෝමය** දෙශනාක්‍රමයෙන් ද, **ධ්‍යානානුලෝමය** ප්‍රතිපත්ති වශයෙන් ද දත යුතු. සිත දමනය කිරීම මෙහිලා අනිමත හෙයින් ආකාශ නිර්මාණාදිය සඳහා **කසිණානුලෝමක්‍රමය** හා **කසිණපටිලෝම** ක්‍රමය ද, කැමති විය යුතු.

(1) පළමුකොට **පඨවි කසිණයෙන්** ධ්‍යානයට සමවැදී දෙවනු වැ **ආපො කසිණයෙන්** ද, යනාදි **පිළිවෙළින්** අට කසිණයෙන් සිය වරක් හෝ දහස් වරක් ධ්‍යානයට සමවදනේ ය **මේ සෑ කසිණානුලෝමය** නම්.

(2) අටවෙනි **අවදාත කසිණයෙහි** සිට ආපසු **පඨවි කසිණය** තෙක් **ප්‍රතිලෝම වශයෙන්** සිය දහස්වර ධ්‍යානයට සමවැදීම **කසිණපටිලෝමය** යැ.

(3) **පඨවිකසිණයේ** සිට **අවදාත කසිණය** තෙක් ද, **අවදාත කසිණයේ** සිට **පඨවි කසිණය** තෙක් දැයි මෙසේ **අනුලෝම-ප්‍රතිලෝම** වශයෙන් නැවත නැවත සිය දහස්වර ධ්‍යානයට සමවැදීම **කසිණානුලෝම පටිලෝම** යැ

(4) **ප්‍රථමධ්‍යානයේ** සිට පිළිවෙළින් **නෙවසඤ්ඤානාසඤ්ඤායතනය** තෙක් තැවත තැවත සිය දහස්වර සමවැදීම **ධ්‍යානානුලෝමය** යැ.

(5) **නෙවසඤ්ඤානාසඤ්ඤායතනයේ** පටන් **ප්‍රථමධ්‍යානය** තෙක් ආපසු සමවැදීම **ධ්‍යාන පටිලෝමය** යැ.

(6) **ප්‍රථමධ්‍යානයේ** පටන් **නෙවසඤ්ඤා - නාසඤ්ඤායතනය** තෙක් ද, **නෙවසඤ්ඤා - නාසඤ්ඤායතනයේ** පටන් **ප්‍රථමධ්‍යානය** තෙක් ද, **අනුලෝම - ප්‍රතිලෝම** වශයෙන් සමවැදීම **ඛ්‍යානානුලෝම - පටිලෝමය** නම් වේ.

(7) **පඨවි** කසිණයෙන් **ප්‍රථමධ්‍යාන-තෘතීයධ්‍යානයන්ට** ද, එය උගුළුවා **පඨවි කසිණයෙන්** මෑ උපදවන ලද අවකාශය අනන්ත වශයෙන් පතුරුවා එහි පරිකර්ම වඩා **ආකාසානඤ්චායතනයට** සමවැදීම ද, එයින් මෑ **ආකිඤ්චඤ්ඤායතනයට** සමවැදීම දැ සි, මෙසේ **කසිණය** නො ඉක්ම **ධ්‍යානය එකිනෙක** ඉක්ම වීමෙන් සමවැදීම **'(ඛ්‍යානුක්කන්තික) ධ්‍යාන උල්ලඞ්ඝනය'** නම් වේ.

(8) **පඨවි කසිණයෙන් ප්‍රථමධ්‍යානයට** සමවැද **ආපෝ කසිණය** හැර **තෙජෝ කසිණයෙන්** ද, **ප්‍රථමධ්‍යානයට** සමවැද මෙසේ **කසිණ** එකක් හැර එකක් අරමුණු කොට ගෙන එක මෑ **ධ්‍යානයට සමවැදීම** (කසිණුක්කන්තික) **කසිණ උල්ලඞ්ඝනය** නම් වේ.

(9) **පඨවි කසිණයෙන්** ප්‍රථම ධ්‍යානයට සමවැද (**ආපෝ-කසිණය** හැර) **තෙජෝ කසිණයෙන්** (විතීය ධ්‍යානය හැර) **තෘතීයධ්‍යානයට** සමවැද (**වායෝ** කසිණය හැර) **නීල කසිණය** උගුළුවා ලද අහස්හි **ආකාසානඤ්චායතනයට** ද, (**පීත** කසිණය හැර) **ලෝහිත කසිණය** ආදිජිනා කිරීමෙන් අභිමුඛකොට එය උගුළුවා ලැබුණු (**ආකාසය** මෙනෙහි නො කිරීමෙන් එහි පෙර පැවති) **විඤ්ඤාණය** ගේ අපගමනය අරමුණු කිරීමෙන් **ආකිඤ්චඤ්ඤායතනයට** දැ සි මේ ක්‍රමයෙන් **කසිණයන්** හා **ධ්‍යානයන්** අතරතුර ඉක්මවීමෙන් සමවැදීම **ධ්‍යාන කසිණ-උල්ලඞ්ඝනය** නම් වේ.

(10) **පඨවි කසිණයෙන් ප්‍රථමධ්‍යානයට** සමවැද එයින් ම **විතීයා** දී සෙසු රූපාවචර ධ්‍යානයන්ට අඞ්ග පිළිවෙළින් සමවැදීම **අඞ්ග සංකන්තිය** නම් වේ.

විශෙෂ:- අරූපාවචර ධ්‍යානයෙහි අංග සංක්‍රමණයෙක් නැති.

(11) **පඨවි කසිණයෙන් ප්‍රථමධ්‍යානයට** සමවදනා සේ **ආපො කසිණාදියෙනුදු ප්‍රථමධ්‍යානයට** මැ සමවැදීම යැ සි මෙසේ සියලු කසිණයන්හි එක මැ ධ්‍යානයකට සමවැදීම **ආලම්බන සංකන්තිය** නම් වේ.

(12) **පඨවි කසිණයෙන් ප්‍රථමධ්‍යානයට** ද, **ආපො කසිණයෙන් ද්විතීය ධ්‍යානයට** ද, **තෙජො කසිණයෙන් තෘතීය ධ්‍යානයට** ද, **වායො කසිණයෙන් චතුර්ථධ්‍යානයට** ද, **නීල කසිණය** උගුළුවා ලද අහස්හි **ආකාසානඤ්චායතනයට** ද, **පීත කසිණයෙන් විඤ්ඤාණඤ්චායතනයට** ද, **ලොහිත කසිණයෙන් ආකිඤ්චඤ්ඤායතනයට** ද, **අවදාත කසිණයෙන් නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනයට** ද සි මෙසේ අඞ්ගයන්ගේ ද, ආලම්බනයන්ගේ ද, එකිනෙක පැන සමවැදීම **අඞ්ග-ආලම්බන සංකන්තිය** නම් වේ.

(13) **ප්‍රථමධ්‍යානය** විතර්කාදී **පඤ්චඞ්ගිකයයි** ද, **ද්විතීය ධ්‍යානය තිවඞ්ගිකයයි** ද, **තෘතීයධ්‍යානය** සුඛාදි **දුවඞ්ගිකයයි** ද, **චතුර්ථධ්‍යානය** උපෙක්ඛාදි **දුවඞ්ගිකයයි** ද, **ආකාසානඤ්චා-යතනය** එසේ ම **දුවඞ්ගිකයයි** ද, **විඤ්ඤාණඤ්චායතනාදිය** ද එසේ ම අඞ්ග දෙකකින් යුක්ත යයි ද, මෙසේ ධ්‍යානාඞ්ග මාත්‍රය මැ ව්‍යවස්ථාපනය කිරීම **අඞ්ග ව්‍යවස්ථාපනය** නම් වේ.

(14) මේ **පඨවි කසිණය යැ** - පෙ - මේ **ඔදාත කසිණය** යි මෙසේ **ආලම්බන මාත්‍රය** නියම කිරීම **ආලම්බන ව්‍යවස්ථාපනය** නම් වේ.

විශෙෂ:- **අඞ්ග ආලම්බනයන් ගේ** ව්‍යවස්ථාපනය ද ඇතැම් ආචාර්‍යයී කෙනෙක් කැමති වෙති. අටුවාවෙහි නො එන හෙයින් එය ඒකාන්ත භාවනා මුඛයෙක් නො වේ.

'මේ තුදුස් ආකාරයෙන් සිත දමනය නො කොට පූර්‍ව ජන්මයෙහි ධ්‍යානාභිඥාවන්හි කරතලද අධිකාර නැති ධ්‍යාන නො වැඩූ **ආදිකම්මික** යොගාවචර තෙමේ විකුර්ණ සෘද්ධිය සම්පාදනය කරන්නේ ය, යන මේ කාරණය සිදු නො වේමැ

ඒ එසේ ම ය:- ආදිකර්මිකයාට **කසිණ පරිකර්මය** පවා අතිශයින් බැරෑරුම් වේ. සෘද්ධි විකුර්ණය කළ නො හැකි බව් කියනුම කිම? **කසිණ** පරිකර්ම වඩන සිය දහස් දෙනකුන් අතුරෙන් එකකු මැ එයට සමර්‍ථවන හෙයිනි.

(දෙස් බැහැර කිරීමෙහි පටන් උගහඟ නිමිත්ත උපදනා තෙක් **කසිණ** මණ්ඩලයෙහි පිළිපැදිය යුතු ප්‍රතිපත්තිය **කසිණ** පරිකර්මය යි.)

අනතුරු වැ **ප්‍රතිභාග නිමිත්ත** ඉපදවීම බැරැරුම් වේ. සිය දහස් දෙනකුත්ගෙන් **එකෙක්** මැ ලබන්නේ ය. (පඨවි **කසිණ** නිද්දේශයෙන් මේ විස්තර සේ දත හැකිවේ.[1]) **ප්‍රතිභාග** නිමිත්ත උපන් කල්හි ද, **උපචාර - අප්පණා** ලැබීම දුෂ්කර වන්නේ ය. සිය දහසෙකින් එකෙක් මැ ලබන්නේ ය. **අප්පණා** ලාභියාට ද තුදුස් ආකාරයකින් සිත දමනය කිරීම දුෂ්කර ය. සිය දහසෙකින් එකකුට මැ හැකි වේ. තුදුස් ආකාරයකින් සිත දමනය කිරීමෙහි පොහොසත් වූවහුට ද, **සෘද්ධිය විකුබ්බණය** අතිශයින් බැරැරුම් වන්නේ ය. සිය දහසෙකින් **එකෙක්** මැ සමර්ථ වේ. සෘද්ධි විකුබ්බණය ඇත්තාහට ද **ඛිප්ප නිසන්ති භාවය** (වහ වහා ධ්‍යානයට සමවැදීමේ සමර්ථ භාවය) හෝ ධ්‍යාන ඇසින් පඨවි **කසිණාදී** ධ්‍යානාලම්බනය බැලීම දුෂ්කර වන්නේ ය. සිය දහසෙකින් **එකෙක්** මැ සමර්ථ වේ.

නිදර්ශන:- මිහින්තලා පව්වේ අම්බස්ථලයෙහි **මහාරොහණ-ගුත්ත** ස්ථවිරයන්ට ගිලන් උපස්ථානයට ආවා වූ **තිස්දහසක් පමණ** සෘද්ධිමත් **භික්ෂූන්** අතුරින් උපසම්පදාවෙන් අටවස් වූ **බුද්ධරක්ඛිත තෙරුන්** මෙනි. උන්වහන්සේ ගේ අනුභාවය පඨවි **කසිණ** නිද්දේශයෙහි කියන ලදී.[2] ඒ ස්ථවිරයන් වහන්සේ ගේ අනුභාවය දැක **රොහණගුත්ත ස්ථවිරයන්** වහන්සේ ඇවැත්නි! 'අද අප ගේ සඞ්ඝ සභාවෙහි **රක්ඛිත ස්ථවිර නම** නො සිටියේ නම් නා රජු රැකගත නො හැක්කම් හ. අපි හැමදෙනමෝ ගඟාවට පත් වන්නමෝ යැ'යි කිහ.

එහෙයින් 'සතුරන් ජය ගැනීමට යුද්ධ කරන්නා වූ යොධා ජීවයන් මල නැති කඩු තෝමරාදිය ගෙන හැසිරෙන්නා සේ භික්ෂූන් විසින් ද කෙලෙස විජය පිණිස නිමිල වූ **ධ්‍යානාභිඥා** වලඤ්ඤනය කටයුතුයැ'යි ඒ භික්ෂූන්ට අවවාද කළහ. ඒ අවවාදයෙහි පිහිටා බොහෝ භික්ෂූහු **ඛිප්පනිසන්ති** වූහ.

වහා ධ්‍යානයට සමවැදීමට සමර්ථ වූයේ ද මෙරමාහට පැමිණි උපද්‍රවයේ දී ප්‍රතිඥා වන බව අතිශයින් බැරැරුම් වන්නේ ය. එබන්දත් සිය දහස් දෙනකුගෙන් **එක් කෙනෙක්** ම මෙරමාහට පැමිණි උපද්‍රවයක දී පිහිටීමට පොහොසත් වන්නා හ මෙරමාහට පැමිණි උපද්‍රවයෙහි දී පිහිටීම අතිශයින් යුහුසුළු වැ කටයුතු

[1] සිං: විශු: 191 පිට. [2] එහිම 233 පිට.

හෙයින් හා දුකසේ ලැබිය යුතු හෙයින් ද, ක්ෂිප්‍රනිශාමයනටත් වඩා එය බැරෑරුම් වන්නේ ය.

නිදර්ශනය:- ලක්දිව අවට යොදනක් තන්හි පහත් වැටින් පහත් තොරණින් ඒකාබද්ධ කොට කළ **ගිරිනගඩවාහන** නම් මහා ප්‍රදීප පූජායෙහිදී වසවත්තී මාරයා මහත් අහුරු වැස්සක් මවා ඒ පූජාව හා මනුෂ්‍යයන් ද දවා අළුකරන්නට ආරම්භ කළ කල්හි එක්තරා අභිඥලාභී **මහාතෙර** කෙනෙක් එක මැ ගිනිපුපුරකුදු මිනිසුන් කරා පැමිණෙන්නට පෙර අහසෙහි පොළොවක් මවා අහුරු වැස්ස නවතා දැහ.

වසවත් මර අහුරු වැස්ස වස්වන බව කලින් නො දැනම් එය අහසින් පහළට බස්නා බව දුටු කෙණෙහි ම ඇසිපිය හෙලීමටත් පෙර මඳ ඇසිල්ලකින් චතුර්ථධ්‍යානයෙන් විකුර්ණ සෘඩිය උපදවා පෘථිවියක් මවා අහුරු වැස්ස අහස්හි ම නවතාලීම ඉතා ආශ්චර්ය මෙසේ මෙරමා උපද්‍රව නවතාලීමට පිහිටවීම අනිශයින් ම බැරෑරුම් වේ.

විශෙෂ:- සෘඩිවිධඥානාදි ගුණධර්මයනට කාරණ වූ බලවත් පූර්ව ප්‍රාර්ථනා ඇති **බුදු - පසේබුදු - අගසවු - මහසවුවනට** මෙකී ක්‍රමයෙන් තොරව ද විදර්ශනා ක්‍රමයෙහි කියන ලද භාවනා පිළිවෙළින් අර්හත් ඵල ප්‍රතිලාභයෙන් මැ **මේ සෘඩිවිකුර්ණය** ද සෙසු **ප්‍රතිසම්භිදඥානාදිය** ද ආදි ශබ්දයෙන් ගත් **සථානාසථාන ඥානාදී** ප්‍රභෙද ගත ගුණයෝ ද සම්‍යක්ද්ධ වෙත් ම ය.

උපමාවෙකි:- පලඳනා විශෙෂයක් කරනු කැමති රන් කරුවෙක් ගිනි පිඹීම් ආදින් රන් මොළොක් කිරීමෙන් කර්මණ්‍යතාවට යොග්‍යකොට පලඳනා විශෙෂ කරන්නා සේ ද, ලාකඩ ශිල්පියෙක් ලාක්ෂාරසාදිය පළමු වැ මොළොක් කොට ලාකඩ කර්මාන්ත කරන්නා සේ ද, ආදිකර්මික යොගාවචරයා විසින් මේ තුදුස් ආකාරයෙන් සිත දමනය කොට (මට අභිඥ ඒකාන්තයෙන් මැ සම්‍යක්ද්ධ වන්නේ යැ යි) **ඡන්ද, චිත්ත, විර්ය, වීමංසා,** යන සතර ඍද්ධි පාදයන් එකිනෙක පෙරටු කොට ගෙන ධ්‍යානයට සමවැදීම් වශයෙන් **ආවජ්ජන, සමාපජ්ජන, අධිෂ්ඨාන, වුට්ඨාන, පචවෙක්ඛණ** යන පස් අකාරයෙන් වසඟ බවට පැමිණීමෙන් මොළොක් කොට සෘද්ධි විධ ඥානය ලබනු පිණිස භාවනා කළ යුතුය.

පූර්ව හේතු සම්පත්තියා විසින් යම් ධ්‍යානයක් පාදකකොට අභිඥ ඉපදවිය යුතු නම් ඒ ධ්‍යානයෙහි ද පුරුදු කළ වසීභාවය කැමති විය යුතු ය. **එය මෙසේ වදළහ.**

"සෝ එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති"[1]

(මේ දෙශනා පාළියෙහි පදයක් පාසා අර්ථ විවරණය මෙසේ යි.)

සෝ = ඒ අධිගමය කළ චතුර්ධ්‍යාන ඇති යෝගී තෙමේ;

එවං = ප්‍රථමධ්‍යානාදි ක්‍රමයෙන් මෙසේ (චතුර්ධ්‍යානය ලැබ);

චිත්තෙ = (රූපාවචර) චිත්තය;

සමාහිතෙ = (චතුර්ධ්‍යාන සමාධියෙන්) සමාධිමත් වූකල්හි;

පරිසුද්ධෙ = (උපෙක්ඛා සති පාරිසුද්ධියෙන්) පිරිසිදු වූ කල්හි;

පරියොදාතෙ = පිරිසිදු හෙයින් ම ප්‍රභාස්වර කල්හි;

අනඞ්ගණෙ = (පහ වූ රාගාදි) අඞ්ගණ ඇති කල්හි;

විගතූපක්කිලෙසෙ = (අනඞ්ගණ හෙයින් මැ) පහ වූ උපක්ලෙශ ඇති කල්හි;

මුදුභූතෙ = මෘදු කොට වඩන ලද කල්හි; (වසී භාවයට පැමිණියේ ය යි කී නියා යි.)

කම්මනියෙ ඨිතෙ = (මෘදු හෙයින් මැ) **ඍද්ධි විධඥාන කර්මයට යොග්‍ය වැ** සිටි කල්හි නොහොත්;

කම්මනියෙ = (ඍද්ධිවිධ ඥානකර්මයට) යොග්‍ය කල්හි;

ඨිතෙ = (මේ පිරිසිදු බව් ආදියෙහි පිහිටි හෙයින්) සිටි කල්හි;

ආනෙඤ්ජප්පත්තෙ = (ශ්‍රද්ධාදීන් පරිගෘහීත වන බැවින්) නිශ්චල බවට පැමිණි කල්හි;

විශෙෂ:– මෘදු වූ සිත මනා ව පිඹ තවාගන්නා ලද සුවණ්ණියක් සේ කර්මණ්‍ය වෙයි. මනාකොට වඩන ලද හෙයිනි.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි. යං එවං භාවිතං බහුලීකතං මුදුඤ්චෙව හොති. කම්මනියඤ්ච යථයිදං භික්ඛවෙ චිත්තං."[2]

---

[1] දී: නි: සීලක්ඛන්ධවග්ග 60 [2] අ: නි: එකකනිපාත 4

'මනාකොට වඩනා ලද සිත සේ මෘදු වූ කම්මණ්‍ය වූ අන්‍ය එක ම ධර්මයක් **සඞ්ඛතාඤාණයෙනුදු** නො ම දකිමි' යි එහෙයින් වදාළහ.

1. ශ්‍රද්ධා පරිගෘහීත වූයේ අශ්‍රද්ධායෙන් නො සැලේ.
2. වීර්‍ය්‍ය පරිගෘහීත වූයේ කුසීත බැවින් නො සැලේ.
3. සමෘති පරිගෘහීත වූයේ ප්‍රමාදයෙන් නො සැලේ.
4. සමාධි පරිගෘහීත වූයේ උද්ධච්චයෙන් නො සැලේ.
5. ප්‍රඥා පරිගෘහීත වූයේ අවිද්‍යාවෙන් නො සැලේ.
6. ප්‍රඥාලෝකයෙන් පරිගෘහීත වූයේ **ක්ලේශාන්ධකාරයෙන්** නො සැලේ.

මේ ධර්ම සයෙන් (යුක්ත වූ) රූකුල් දෙන ලද සිත නිශ්චල බවට පැමිණියේ වෙයි.

යටකී **අඞ්ග අටින්** යුක්ත වූ **චතුර්ථධ්‍යාන** චිත්තය **සාධි විධාදි අභිඥාවනට** නැමීමට හා එයට අභිමුඛ කිරීමට යොග්‍ය වේ. **තවද ක්‍රමයෙකි.**

1. චතුර්ථධ්‍යාන සමාධින් සමාහිත වීම ය;
2. නීවරණ විෂ්කම්භනයෙන් ප්‍රථමධ්‍යාන සමධිගමය වන හෙයින් පිරිසිදු බව ය.
3. විතර්කාදි ඖදාරිකාඞ්ග ප්‍රහාණයෙහි දෙවැනිය ධ්‍යානාදිය වන හෙයින් ප්‍රභාස්වර බව ය.
4. ධ්‍යාන ප්‍රතිලාභය නිසා වන ඉච්ඡා විඝාතාදීන් ගේ අභාවයෙන් අනඞ්ගණ බව ය.
5. අභිධ්‍යා මායාදීන් ගේ අභාවයෙන් පහ වූ උපක්ලේශ ඇති බවය. (මෙකී **අනඞ්ගණ** විගතූපක්ලේසාදි භාවය **අනඞ්ගණ සූත්‍ර**[1] **වත්ථ සූත්‍රාදීන්**[2] දත්තේයි.)
6. පඤ්චප්‍රකාර වසී භාවයට පැමිණීමෙන් මෘදු බව ය.
7. ඍද්ධිපාද භාවයට ආසන්න බවට පැමිණීමෙන් **කම්මණ්‍ය** බව ය.
8. භාවනා පරිපූර්ණ බවට පැමිණීමෙන් සුවිර බව යැ යි මෙසේ තවද ක්‍රම අටකින් යුක්ත වූ කල්හි චතුර්ථධ්‍යාන චිත්තය අනිනීහාරක්ෂම වේ.

---

[1] ම: නි: මූලපණ්ණාසක 37
[2] ,, ,, 25

අනිඤ්ඤෙන් ප්‍රත්‍යක්ෂ කටයුතු ධර්මය අනිඤ්ඤ ප්‍රත්‍යක්ෂ කරණය පිණිස ද පාදක ආසන්න කාරණ වේ.

ඉද්ධිවිධාය = ඍද්ධි විධඥනය ලබනු පිණිස;

චිත්තං = පරිකර්ම චිත්තය;

අභිනීහරති = එළවයි;

අභිනින්නාමෙති = නමයි;

කසිණාලම්බනයෙන් ධ්‍යාන සිත වෙත් කොට ඍද්ධිය පිණිස අභිඥා කොට ඉපදවිය යුතු ඍද්ධියට නැඹුරු කරන්නේය යනු භාව යි.

විශෙෂ:- අභිමතාර්ථය නිපදවන අර්ථයෙන් ද, ලැබීම් අර්ථයෙන් ද, **ඍද්ධි** නම්වේ.

"**කාමං කාමයමානස්ස තස්ස චෙතං සමිජ්ඣති**"[1] පඤ්චකාමය කැමතිවන්නා හට ඒ ලැබීමෙන් සමෘඩ වේ. යන තන්හි නිපදවීම් අර්ථයෙන් ඍද්ධි නම්.

"**නෙක්ඛම්මං ඉජ්ඣතීති ඉද්ධි**" යන තන්හි ලැබීම් අර්ථයෙන් **ඍද්ධි** නම්.

තඤ්ච ක්‍රමයෙකි:- උපායසම්පන්නව අර්ථයෙන් **ඍද්ධි** නම් වේ. ඒ එසේ මැති:- උපාය සම්පන්නිය අදහස් කරන ලද ඵලය ප්‍රසව කරන හෙයින් **ඍද්ධි** නම් වේ.

ප්‍රව්‍රජ්‍යා - මාගී - ඵල ධර්ම අවසන් කොට ඇති නෙක්ඛම්මය ලබානුයි **ඍද්ධි** නම්

අර්හත් මාගී - ඵල ලැබීම අර්ථයෙන් ද, **ඍද්ධි** නම්.

"**ඉජ්ඣතිස්සානි සීලවතො චෙතො පණිධි විසුද්ධත්තා.**[2]" 'සීලවන්තයා ගේ චිත්තප්‍රණිධිය සමෘඩ වේ. ඒ පිරිසිදු හෙයිනි.'

එතාය සත්තා ඉජ්ඣන්තීති ඉද්ධි. "මෙයින් සත්ත්වයෝ වැඩෙත්නු යි" **ඍද්ධි** නම් වේ. මෙහි වැඩීම් අර්ථයෙන් ඍද්ධි නම්. මේ **ඉද්ධි** ශබ්දයාගේ අර්ථ විවරණය යි.
ඒ **ඍද්ධිය** දස වැදෑරුම් වේ.

1. අධිට්ඨාන ඉද්ධිය.
2. විකුබ්බන ,,
3. මනොමය ,,
4. ඤාණ විප්ඵාර ,,
5. සමාධි විප්ඵාර ,,

---

[1]මහා: නි: 1, [2]අ: නි: අඤ්ඤනිපාතය 759

6. අරිය ඉඩිය
7. කම්මවිපාකජ ,,
8. පුඤ්ඤවතො ,,
9. විජ්ජාමය ,,
10. සම්මාපයොගපච්චය ඉඩිය කියා යි.

1 "සවභාවයෙන් එකලා වූ යේ සියයක් හෝ, දහසක් හෝ, දසදහසක් හෝ වෙමි යි" ආවජ්ජනා කොට "බොහෝ වෙම් වා යි නුවණින් අධිෂ්ඨාන කරයි." මෙසේ බෙදා දක්වූ ඍඩිය අධිෂ්ඨාන කිරීම් වශයෙන් නිපදෙන හෙයින් **අධිට්ඨාන ඉඩි** නම් වේ.

2. යම්කිසි ධ්‍යානලාභියෙක් තමා ප්‍රකෘති වේශය හැරපියා කුමාර වේශයක් හෝ නාග - සුපණ්ණි - යක්ෂ - රාක්ෂසාදි වේශයක් හෝ නිම්මිත කොට දක්වා නම්, එබඳු වූවහු ගේ ඍඩිය ප්‍රකෘති වර්ණය දුරුකරන විකාර විසින් පවත්නා බැවින් **විකුබ්බන ඉඩි** නම් වේ.

3. අභිඥාලාභී යම්කිසි මහණෙක් මේ ප්‍රකෘති ශරීරයෙන් රූපී වූ අභිඥ සිතින් නිපදවන ලද අඞග-ප්‍රත්‍යඞග සම්පූර්ණ වූ අන්‍ය ශරීරයක් මවා නම් ඒ මනොමය කාය නිර්මාණය කරන්නා වූ ඍඩිය **මනොමය ඉඩි** නම් වේ.

(සෙසු අධිෂ්ඨාන විකුර්ණයන්හි දු මෙම ක්‍රමය වත හෙයින් මෙය **මනොමය ඉඩි** නම් වනුගේ රූඪි හෙයිනි. ගමනාදීයෙන් සියලු සත්ත්වයින්ට සාධාරණ "ගො" ශබ්දය මොල්ලි ආදිය ඇති ගො පිණ්ඩයෙහි මෑ රූඪිවන්නා සේ යි. එසේ මෑ ඍඩිමතුන් ගේ අභ්‍යනන්තරයෙන් නිපත් ඔහු හා ඒකාන්තයෙන් සම වූ ඒ නිර්මාණය සිතින් මෑ නිපද වූ බව ප්‍රකට හෙයින් මෙනම් වී. ඒ ව්‍යවහාරය අතිශයවත් හෙයිනි.)

4. අර්හත්මාගීඥානලාභයට ප්‍රථම විදර්ශනා අවස්ථාවෙහි හෝ එයට පෙරැ පශ්චිම භවික සත්ත්වයා ගේ ප්‍රතිසන්ධි ගැනීමෙහි සිට හෝ මාගීප්‍රතිලාභයෙන් පසුව සකල පරිනිර්වාණය තෙක් හෝ අර්හත්මාගීඥානය ලබන කෙනෙහි හෝ ඒ ඥානානුභාවයෙන් ප්‍රහාතව්‍ය ධර්මප්‍රහාණය හා භාවිතව්‍ය ධර්ම භාවනායෙන් සම්පූර්ණ කිරීම් වශයෙන් උපදනා විශෙෂය **ඤාණවිප්ඵාර ඉඩි** නම් වේ.

උදාහරණ:- සූර්යයා උදාවන කල එය සිටි තැන හා අවට ආලෝක කිරීමට සමර්ථ වන්නාසේ යි. **බ්‍රහ්මලෝකවාසී,**

සංකිච්චසාමණේරයන්, භූතපාලදරුවාදීන්ගේ[1] ප්‍රවෘත්ති එයට නිදර්ශනයි.

ඔවුනතුරෙන් **බක්කුලසාමණේර** ඉතා ළදරු වූයේ මැ **නම්** තබන මගුල් දිනයෙහි ගංගාවෙහි නාවද්දී කිරිමව ගේ ප්‍රමාදයකින් ගඟේ වැටුණේ ය. ඔහු ගඟැ මත්ස්‍යයෙක් ගිල බරණැස් නොවට පැමිණියේ ය. එහිදී ඒ මත්ස්‍යයා දැල් දමන්නෙක් අල්ලා සිටු භාර්‍යාවට විකිණියේ ය. ඇය මැ මත්ස්‍යයා **කපද්දී** කුස වූ රන් පිළිමයක් බඳු කුමරුවා දැක "මම පුතකු ලදිමි"යි තුටු පහටු වූවා ය. මෙසේ **බක්කුල තෙරුන්** මත්ස්‍යයා ගේ කුසෙහි නීරෝග වීම පශ්චිම භවිකත්වය නිසා ඒ අත්බැවිහි ලැබිය යුතු අර්හත්-මාගීඥානානුභාවයෙන් නිපත් හෙයින් **ඥානවිප්ඵාර සෘද්ධි** නම්.

සංකිච්ච සාමණේරයන් මව් කුස වසද්දී මැ මව කළුරිය කළා ය. මළසිරුර දරුණෙහි හුලින් ඇන දවද්දී හුල්කොණ ඇසෙහි ඇනී ළදරුවා ශබ්ද කෙළේ ය. අනතුරුව මව් කුස පලා ළදරුවා ගෙන මිත්‍රාණියට දුන්නේ ය. ඇය පෝෂණය කරන ලදින් වැඩිවිය පැමිණ පැවිදි වූ සිවුපිළිසිඹියා පත් රහත් විය. මෙසේ චිතකයෙහි දවද්දී ද නො මැරී ජීවත්වීම යට කී සේ **ඥානවිප්ඵාර සෘද්ධි** නම්.

භූතපාල දරුවා ගේ පියා රජගහානුවර දර වෙළෙන්දෙකි. හෙ තෙමේ වතයෙන් ගැළින් දර ගෙන සවස නුවරට එනුයේ පිටිනුවර ගැළ සමීපයෙහි ළදරුවා හිඳුවා ගොනුන් සොයනු පිණිස නුවර වත් කල සවස නුවර දෙර වැසී ය. ළදරුවා සෑඩ පරාජය කුත් ගෙන් ගහන වූ පිටිනුවර හුදෙකලාව නිරූපද්‍රැතවූ ඒ රැයෙහි විසීම **ඥානවිප්ඵාර සෘද්ධියෙන්** වූ යේ ය.

5. ප්‍රථමධ්‍යානාදි සමධිගමයෙන් පළමු **උපචාර** අවස්ථායෙහි හෝ ආවජ්ජනාදි පඤ්චවිධ වශිතාවයන් පුරුදු කළ පසුව හෝ සමාධිය ලැබූ කෙණෙහි හෝ ඒ ඒ ධ්‍යාන තේජසින් වූ නීවරණ විෂ්කම්භනය. චිතකාදි ධ්‍යානාංග ඉක්මවීම ය. නිරෝධ සමාපත්ති කාලයෙහි උපද්‍රව නො පැමිණීම ය. යනාදි අනුභාව විශෙෂ **සමාධිවිප්ඵාර ඍද්ධි** නම් වේ.

ඒ මෙසේ සි:- "ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන් ගේ ප්‍රහාණාර්ථය සිදුකරන හෙයින් **සමාධිවිප්ඵාර ඍද්ධිය**" ය යනාදි ක්‍රමයෙන්-"නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයෙන් ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤාව ගේ ප්‍රහාණාර්ථය සම්බවන අර්ථයෙන් **සමාධිවිප්ඵාරඍද්ධි** නම් වේ. යනාදි ක්‍රමයෙන් අෂ්ට සමාපත්තිම **සමාධිවිප්ඵාර ඍද්ධි** නම් වේ.

[1]පටි: මු: අට්ඨකථා 491-494

(1) ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ගේ ද
(2) ,, සඤ්ජීව ,, ,,
(3) ,, කාණ්ඩකොණ්ඩඤ්ඤ ,,
(4) උත්තරා උපාසිකාව ගේ ද
(5) සාමාවතිය ගේ ද **සමාධිවිප්ඵාර ඍධිය** ය.[1]

(1) ආයුෂ්මත් **ශාරීපුත්‍ර** ස්ථවිරයන් වහන්සේ **මහමොග්ගල්ලාන** ස්ථවිරයන් වහන්සේ සමග **'කල්ලවාලමුත්තදාරා'** නම් අරණ්‍යයෙහි අලුත කෙස් බහනලද හිසින් යුක්ත ව අභ්‍යවකාශයෙහි වැඩ වෙසෙන කල දුෂ්ට වූ යක්ෂයෙක් යහළු යකු වළකද්දී හිසට පහරක් ඇන්නේ ය. එය මහා මේඝ ගර්ජනාවක් සේ විය. ස්ථවිරයන් වහන්සේ එකෙණෙහි ධ්‍යානයට සමවැදුණු හෙයින් මැ ඒ පහරින් කිසි පීඩාවක් නො වී ය. මෙය උන්වහන්සේ ගේ **සමාධිවිප්ඵාර ඍධිය සි.**

(2) නිරෝධ සමාපත්තියට සමවැදුණු **සඤ්ජීව** ස්ථවිරයන් වහන්සේ දැක **කළුරිය** කළහ සි, සිතා ගොපලු ආදීහු තණ රොඩු-ලී-ගොමරිටි ආදිය රැස් කොට ගිනි දැල් වූ තමුදු උන්වහන්සේ ගේ සිවුරෙහි අංශුමාත්‍රයකුදු නො දැවේ ය. මේ උන්වහන්සේ ගේ අනුපූර්ව සමාපත්ති වශයෙන් පැවැති ශමථානුභාවයෙන් නිපන් හෙයින් **සමාධිවිප්ඵාර ඍධි** ය සි.

(3) ප්‍රකෘතියෙන් සමාපත්ති බහුල වූ **කාණ්ඩකොණ්ඩඤ්ඤ** තෙරුන් වහන්සේ එක රැයෙක සමාධියට සමවැද වැඩහුන් සේක. පන්ෂියයක් සොරු බඩු සොරකම් කරගෙන යන ගමන් ''දැන් අප ලුහුබඳනාහු නැතැ''සි හිමින් හරිනු කැමති වැ බඩු බහා තබන්නාහු 'කණුවකැ'සි සිතා තෙරුන්වහන්සේ ගේ මතුයෙහි සියලු බඩු පොදි දැමූහ. හිමින් හැර යන්නට සූදානම් වූ ඔහු පළමු තුබූ බඩු ගන්නා කල පරිවේෂද වශයෙන් තෙරුන්වහන්සේ නැගිටි සේක. ඔහු තෙරුන් වහන්සේ සෙලවෙන කල 'යකෙකැ සි' බියවී කැගැසූහ.

උපාසකවරුනි! භය නොවව්. ''මම නිෂ්ක්‍රමණය කෙරෙමි'' සි කී කල ඔවුහු පැහැද තෙරුන් වහන්සේ වෙත පැවිදිව සිවුපිළිසිඹියාපත් රහත් වූහ.

මෙසේ බඩු පොදි පන්සියයකට යටවද පීඩාවක් නො වීම **සමාධිවිප්ඵාර ඍධි** ය සි.

උත්තරා උපාසිකාවෝ පුණ්ණ සිටුහු ගේ දියණියෝ ය. **සිරිමා** නම් ගණිකාව ඇය කෙරේ ඊර්ෂ්‍යාවෙන් කබලෙහි කකාල

[1]පරි: ම: අට්ඨකථා 494-500

තෙල් හිසෙහි වත්කළා ය. **උත්තරාවෝ** එතෙණෙහි සමාධියට සමවැදුණා හ පොකුරුපත දියන්තක් සේ තෙල් රැරා ගියේ ය. මේ ඇය ගේ **සමාධිවිප්ඵාරඉද්ධිය** සි

(ඊ) **සාමාවතිය උදෙන** රජු ගේ අග මෙහෙසිය යැ. **මාගණ්ඩිය** බමුණා තම දියණියට අග මෙහෙසුන් බව් පතනුයේ රජු ගේ වීණායෙහි නාගයකු බහා "මහරජ, **සාමාවතිය** ඔබ මරනු රිසියෙන් වීණායෙහි නයෙක් බහා ලත ලදැ"සි රජුට කීය. රජ ඒ දැක කිපි "සාමාවතිය මරම්"සි දුනුදිය නහා විෂ පෙවූ ගියකින් විද්දේ ය. සාමාවතිය පිරිවර සහිත වැ රජු වෙත ඔදිසක වසයෙන් මෙත්තා සමාපත්තියට සමවැදුණා ය.

රජු හිය විදින්නට හෝ බහන්නට හෝ නො හැකි වැ වෙවුලමින් සිටියේ ය. **එකල** දේවිය "මහරජ **කිම්**? පෙළෙන්නෙහිදැ සි" විචාළා ය. එසේ ය. පෙළෙමැ සි, රජු කිකල එසේනම් "දුන්න බහා නබව"සි දේවිය කීවෙන් ඊය පාමුල හිණි. එකල දේවිය "නො කිපියහට නො කිපෙව' සි අවවාද **කළා** ය. මෙසේ රජුට ඊය විදිනු නො හැකිවීම සාමාවතිය ගේ **සමාධිවිප්ඵාර ඉද්ධිය සි.**

(උ) පටික්කූලාදී අනිෂ්ට අරමුණෙහි අපටික්කූලතාදිය ඇතිවැ විසීම **ආයෂ්මා සෘද්ධි** නම්.

අන්‍ය සත්ත්වයනට පළමුව පටික්කූල අරමුණ අපටික්කූලව ද, අපටික්කූල අරමුණ පසුව පටික්කූලව ද වැට හේ. **ක්ෂීණාශ්‍රවයෝ කැමති** සේ පටික්කූල සඤ්ඤීව හෝ අපටික්කූල සඤ්ඤීව හෝ වාසය **කරන්නෝ** වෙති.

විසඳන:- ආයෂ්මා ඍද්ධිය කවරේ ද? "මේ ශාසනයෙහි ක්ෂීණාශ්‍රව තෙමේ පටික්කූලයෙහි අපටික්කූල සඤ්ඤීවැ වෙසෙම් නම් මැනවැයි සිතා ඒ ප්‍රතිකූල අරමුණෙහි අප්‍රතිකූල සඤ්ඤීවැ වෙසේ. එසේ මැ ඒ ප්‍රතිකූල අප්‍රතිකූල සියලු අරමුණෙහි අඩඬෙහාපෙක්ෂාවෙන් යුක්තවැ වාසය කරන්නේ ය." මෙම චිත්ත වශී භාවය රහතුන්ට සම්භව වන හෙයින් **ආයෂ්මා සෘද්ධි** නම්.

සඤ්ඤීපටික්කූලෙ අපටික්කූල සඤ්ඤී විහරති. අනිට්ඨස්මිං වත්ථුස්මිං මෙත්තාය වා එරති. ධාතුසෝ උපසංහරති[1]

මේ **ආයෂ්මා සෘද්ධියෙන්** යුක්ත වූ **ක්ෂීණාශ්‍රව** තෙමේ නො කැමැති වූ සතුරු අරමුණෙහි මෛත්‍රිය පතුරුවා වාසය කෙරේ.

[1]ප: ම: ඉදයි කථා 390 බුරුම්

අශුචි ආදි පිළිකුල් අරමුණෙහි ධාතුමනසිකාර විසින් අප්‍රතිකූල වැ වෙසේ. එසේ මැ අප්‍රතිකූල වූ ශ්‍රුතිමිත්‍රාදි ඉෂ්ට අරමුණෙහි දෙතිස් කුණප කොටස් වශයෙන් ගෙන අශුභ වශයෙන් හෝ බලමින් වෙසේ. අනිත්‍යාදි වශයෙන් පටික්කූල වශයෙන් හෝ මෙතෙහි කෙරේ. එසේ පටික්කූල අපටික්කූල සියලු අරමුණෙහි මෛත්‍රී වශයෙන් හෝ ධාතු මනසිකාර වශයෙන් හෝ අප්‍රතිකූල වශයෙන් බලන්නේ ය. තවද පටික්කූල අපටික්කූල සියලු අරමුණෙහි අශුභ වශයෙන් හෝ අනිත්‍යාදි වශයෙන් හෝ බලමින් ප්‍රතිකූල සංඥ ඇති වැ වසන්නේ ය.

ඡඩ්ඩෙත්වාපෙක්ඛාව "චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනෝ හොති"[1] යනාදීන් වදාළ පරිදි 'චක්ඛුවිඤ්ඤාණයෙන් හෝ චක්ඛුපසාදයෙන් හෝ රූපාලම්බනයක් දැක ගෙහසිත ප්‍රේම වශයෙන් සොම්නස් නො වැ ප්‍රතිඝවශයෙන් දෙම්නස් නො වැ ඉෂ්ටානිෂ්ට සියලු අරමුණෙහි පිරිසිදු ප්‍රකෘතිය නො හැරීම් **ලක්ෂණ** වූ ෂඩ්ද්වාරයෙහි පැවැති **ඡඩ්ඩෙත්වාපෙක්ඛාව යැ** යි කියන ලද තත්‍රමධ්‍යස්ථතායෙන් යුක්ත වැ හෝ වාසය කරන්නේ ය' මේ අනුභාවය වෙතො වසිප්පත්ත **රහතන්ව මැ** ලැබෙන හෙයින් **ආශ්‍රී ඝෘඩි** නම.

7. **කම්මවිපාකජ ඝෘඩිය**:- පක්ෂි ආදින් ගේ අහසින් යාම් ආදිය **කම්මවිපාකජ ඉඩි** නම් වේ.

විඤ්ඤාර:- සියලු පක්ෂීන්ගේ ද, සියලු දෙවියන් ගේ ද, ආදිකල්පිකාදි වශයෙන් දත යුතු ඇතැම් මනුෂ්‍යයන් ගේ ද, ඇතැම් **විනිපාතිකයන්** ගේ ද (කුශල **කම්**යෙන් ඉදිද අකුශල විපාකයෙන් දුක් විඳිනා ප්‍රෙත විශෙෂය විනිපාතික නම් වෙයි.) අහසින් යාම පිරිසිදු ඇස් ඇතිවීමාදිය **කම්මවිපාකජ ඝෘඩි** නම් වේ.

මේ ආදිය සඳහා ඉවහල් වූ අභිඥාපාදක ධ්‍යානයක් හෝ උදොග ප්‍රීති සහිත විදර්ශනාවක් හෝ නැති වැ මොවුන් ගේ අහසින් ගමන වේ. එසේ මැ **පියඞ්කරමාතා**[2] – **උත්තරමාතා**[3] **පුණ්ණත්ථෙරමාතාදි**[2] යකින්නන් ගේ හා වෙමානික ප්‍රෙතයන් ගේ ද අහසින් යාම දිවැසින් තොරවැ තියුණු ඇසින් බැලීම යනාදිය **කම්මවිපාකජඝෘඩි ය යි.**

---

[1]ප: ටි: ම: ඉදුකථා 390 බුරුම. [2]සං: නි: යක්ඛසං: 131 පිට
[3]පෙ: ව: 140

8 පුණ්‍යවන්හු ගේ සෘද්ධිය

"කතමා පුඤ්ඤවතො ඉද්ධි රාජාචක්කවත්තිං වෙහාසං ගච්ඡති සද්ධිං චතුරඞ්ගිනියා සෙනාය අත්තනමසෝ සද්ධිං අස්ස ඔඤ්ඤ ගොඔඤ්ඤ පුරිසෙ උපාදාය."[1]

'සක්විතිරජ සිවුරඟ සෙනඟ හා යටත් පිරිසෙසින් අස් ගොවිදින් ගොපල්ලන් ද ඇතුළු සියලු රජ පිරිස් සමග අහසින් යයි. මෙසේ සක්විති රජහු ගේ අහසින් යෑම පුණ්‍යවන්හු ගේ සෘද්ධිය බැවින් **පුඤ්ඤවතො ඉද්ධි** නම් වේ.

තවද - **ජෝතිය, ජටිල, මෙණ්ඩක ගෘහපති**[2] යන මොවුන් ගේ හා **මහාපිණෑතියන් පස්දෙනා**[2] ගේ සෘද්ධිය **පුණ්‍යවන් සෘද්ධිය** යි. මුහුකුරා ගිය පුණ්‍යසම්භාර ඇති කල්හි සම්‍යක්ව වන්නා වූ අනුභාව විශෙෂය සංක්ෂෙපයෙන් **පුණ්‍යවන් සෘද්ධි** නම් වෙයි.

ඉන් ජෝතිය ගෘහපතියාට මාණික්‍යමය ප්‍රාසාදය හා සූ සැටක් කලපවෘක්ෂ පොළොව පළාගෙන නැඟීම යැ.

ජටිල ගෘහපතියාට කොතෙක් ගත ද නො ගෙවෙන අසූ රියන් පමණ ඝන රන් පළඳනයක් පැන නැඟීම යැ.

මෙණ්ඩක සිටුහට එක් කිරියක් පමණ තැන සත් රුවන්මුවා එළුවන් පැන නැඟීම යැ යන මෙතෙක් ද **පුණ්‍යවන්** සෘද්ධිය යි.

මහ පිණෑති පස් දෙනා නම්

මෙණ්ඩක සිටුය, ඔහු භාර්‍යා **චන්ද්‍රපදුමශ්‍රීදෙවිය** ය, පුත්‍ර **ධනඤ්ජය සිටුය,** ලෙහෙලි **සුමනා දෙවිය,** දස **පූර්ණය** යන මොහු ය.

ඔවුනතුරින් සිටුතෙමේ ඉස්සෝධා නහා අහස බැලූ කල අහසින් බට රත්හැල් දෙලොස් දහස් පන්සියයක් කොටුගුල් පුරවා ලයි.

භාර්‍යාව සහල් නැලියකින් පිසූ බත් ගෙන සියලු දඹදිව වැස්සන් අනුභව කරවූව ද, නිමාවට නොයේ,

පුත්‍රයා දහසින් බැඳි පියල්ලක් ගෙන සියලු දඹදිව් වැස්සනට දුන ද, නිමාවට නො යේ,

ලෙහෙලිය එක් වී තිඹක් ගෙන සියලු දඹදිව් වැස්සනට දුන ද නො නිමේ,

---

[1] පටි: ම: ඉද්ධිකථා 391 බුරුම [2] පටි: ම: අඨකථා 502-509

දෘෂ්‍යය එක් නගුලක් ගෙන සෑ කල ඔබින් සතෙක මොබින් සතෙකැ යි සීවැල් තුදුසක් (14) පැනේ, මේ ප්‍රණ්‍යවතුන් පස්දෙනා ගේ ඍද්ධිය යි.

9 විඥ්ඤමය ඍද්ධිය

"ඛතෙම, විඤ්ඤාමයා, ඉද්ධි විඤ්ඤාධරා විඤ්ඤං පරිඤ්ඤපිත්වා වෙභාසං ගච්ඡන්තිපි ආගච්ඡන්තේ හත්ථම්පි දස්සෙන්ති. - පෙ - විද්ධම්පි සෙනාබ්‍යූහං දස්සෙන්ති"[1]

'විඥ්ඤධරාදීන් ගේ මන්ත්‍ර බලයෙන් අහසින් යාම් ආදිය **විඤ්ඤාමය ඉද්ධිය** යි. විඥ්ඤධරයෝ ගන්ධාරී විද්‍යාදී විද්‍යා ජපකොට මන්ත්‍ර කියා ඒ අනුභාවයෙන් අහසින් යෙති. අහස්හි ඇතුන් අසුන් ආදි සිවුරඟ සෙනඟ දක්වති.'

10 සම්මා පයොග පච්චය ඉද්ධිය

ඒ ඒ තන්හි සම්‍යක් ප්‍රයෝගයෙන් කැමැති දෑය සමෘද්ධි වීම (ඒ ඒ කටයුත්තෙහි මනාව යෙදීමට හේතුවන හෙයින්) **ඍද්ධි නම් වේ.**

"නෙක්ඛම්මෙන කාමච්ඡන්දස්ස පහානතෝ ඉජ්ඣතීති තස්ස තස්ස සම්මා පයොගපච්චයා ඉජ්ඣනතෝන ඉද්ධි - පෙ - අරහත්ත මග්ගෙන සබ්බ කිලෙසානං පහානතෝ ඉජ්ඣතීති තස්ස තස්ස සම්මා පයොගපච්චයා ඉජ්ඣනතෝන ඉද්ධි."[1]

'නෙක්ඛම්ම සඞ්ඛ්‍යාත ප්‍රථමධ්‍යානයෙන් කාමච්ඡන්ද නීවරණ ප්‍රහාණ කිරීම් සඞ්ඛ්‍යාත අර්ථය සිදුවන හෙයින් ඍද්ධි නම් වේ. යතාදීන් ඒ ඒ කටයුත්තෙහි ක්‍රමානුකූල වැ යෙදීමෙන් ඒ ඒ අර්ථය සමෘද්ධවන හෙයින් **ඍද්ධි** නම් වේ. - පෙ - රහත් මඟින් සියලු කෙලෙසුන් ගේ ප්‍රහාණාර්ථය සිදුවන හෙයින් ඍද්ධි නම් වේ යැ යි, දතයුතු.

මේ දසවන ඍද්ධියෙහි සම්‍යක් උපාය යෙදීම යැ යි කියනලද න්‍යායානුගත ප්‍රතිපත්තියෙන් සමෘද්ධ වන හෙයින් **ඍද්ධි නමැ යි** කීවා වේ.

විශෙෂ:- ප්‍රතිපත්ති සඞ්ඛ්‍යාත සම්‍යක් ප්‍රයෝග ප්‍රකාශ කිරීම් වශයෙන් පෙරැ **සමාධි විප්ඵාර ඉද්ධි** ආදීන් ගේ නිර්දේශයට සමාන වැ **පෙළ** ආයේ ය. එහෙත් **අඨ්ඨකථාවෙහි**[2] ශකට රචනාදි වශයෙන්

[1]පටි: ම: ඉද්ධි කථා 391 බුරුම. [2]පටි: ඒ: අඨකථා 510 පිට

යම්කිසි ශිල්පයක් හෝ **නිපිටකය** ඉගෙනීමක් හෝ **වෛද්‍ය කර්මාදියක්** හෝ **නිවෙදය** ඉගෙනීමක් හෝ යටත්පිරිසෙයින් **සිසුන්ම-වැපිරීම්** ආදිය පටන් ඒ ඒ කර්මාන්ත කොට හටගත් විශේෂය ඒ ඒ කටයුත්තෙහි සම්‍යක් ප්‍රයොග ප්‍රත්‍යයයෙන් සමෘද්ධි වන අයුරෙන් සෘද්ධිය යි ආයේ ය.

මෙසේ මේ දශවිධ සෘද්ධින් අතුරින් **"ඉද්ධිවිධාය"** යන මේ පදයෙහි **අධිෂ්ඨාන ඉද්ධිය** මෑ ආයේ ය. මෙහිලා **චිකුච්ඡණ-මන්ත්‍රමය සෘද්ධින්** ද කැමතිවිය යුතු.

"සෝ අනෙක විධිධං ඉද්ධිවිධං පච්චනුභොති. එකොපි හුත්වා බහුධා හොති"[1] මෙසේ සිත් නැමූ යොගී තෙමේ අනෙක විධ වූ සෘද්ධි කොට්ඨාසය නාම කයෙන් ප්‍රත්‍යක්ෂ කරයි. කෙසේදයත්:- තෙමේ පෙර හුදෙකලා වැ සිට පසු වැ බොහෝ වෙයි, මේ මෙසේ වන්නේ කෙසේදයත්:-

විසඳුම මෙහිලා 1 සෘද්ධිය හටගැනීමට සුදුසු භූමි සතර ය
2 පිහිටීමට සුදුසු පාද සතර ය
3 හේතු වූ පද (කාරණ) අට ය
4 මුල් සොළොස ය යන මෙතෙක් දෑ සම්පාදනය කොට නුවණින් අධිෂ්ඨාන කරන්නේ සිය දෙනෙක් දහස් දෙනෙක් වන්නේ ය.

1. මෙහි **ප්‍රථමධ්‍යානාදි** ධ්‍යාන සතර **භූමි සතර ය.** එම වදාළහ, දම් සෙනෙවි **සැරියුන්** සවාමීහු.

"ඉද්ධියා චතස්සො භූමියෝ. විවෙකජ භූමි පඨමජ්ඣානං, පීති සුඛ භූමි දුතියජ්ඣානං, උපෙක්ඛා සුඛ භූමි තතියජ්ඣානං, අදුක්ඛමසුඛ භූමි චතුත්ථජ්ඣානං, ඉද්ධියා ඉමා චතස්සො භූමියෝ."[2]

'පඤ්චනීවරණ විෂ්කම්භණයෙන් හටගත් හෙයින් **ප්‍රථම-ධ්‍යානය විවෙකජ භූමි** නම්, පීති සුඛ සහජාත හෙයින් **ද්විතීය ධ්‍යානය පීති සුඛ භූමි** නම්, උපෙක්ඛාසුඛ සහජාත හෙයින් **තෘතීයධ්‍යානය උපෙක්ඛාසුඛ භූමි** නම්, හුදු උපෙක්ඛා සහජාත හෙයින් **චතුර්ථධ්‍යානය අදුක්ඛමසුඛ භූමි** නම්, මේ සතර භූමිහු ය'. (මොවුන් සෘද්ධි නමැති වෘක්ෂයන් සිටුවීමට තෝතැනි බඳු හෙයිනි.)

---

[1] දී: නි: සීලක්ඛන්ධවග්ග 153 පිට [2] ප: ම: ඉඞ් කථා 383 බුරුම්

සෘද්ධි අධිගමය පිණිස ද, නැවත නැවත ලැබීම පිණිස ද, විවිධ රූප මැවීම් සඞ්ඛ්‍යාත විකුර්ණය පිණිස ද, නොයෙක් ආනිසංස පිණිස ද, වහා පැමිණීම් සඞ්ඛ්‍යාත වශී භාවය පිණිස ද, ප්‍රතිපක්ෂ ධර්ම දුරුකිරීමෙන් විසාරදබව පිණිස ද, මේ චතුර්ධ්‍යාන පිහිට වන බැවින් භූමි නම් වේ.

විශෙෂ:- **ප්‍රථමධ්‍යානාදි** තුන සෘඞ්යට **සමන්නාගත භූමිහු ය.** මේ තුන් ධ්‍යානයට සමවැදීමෙන් ක්‍රමයෙන් සැප බවට හා සැහැල්ලු බවට පැමිණි නාමකාය රූපකාය ඇත්තහු ගේ සිත හාත්පසින් දමනය වේ. **චතුර්ථධ්‍යානය** සුවසේ සෘඞ්ධි ප්‍රතිලාභය පිණිස පවතී. එහෙයින් **චතුර්ථධ්‍යානය** සෘඞ්ධි ප්‍රතිලාභය පිණිස **ප්‍රකෘති භූමිය යි.**

2. පාදනම්

(i) සමෘද්ධ වේනුයි, හෝ

(ii) 'මේ **කරණකොටගෙන** සත්ත්වයෝ උතුකෘෂ්ටත්ව බවට පැමිණෙත්නුයි' හෝ සෘඞ්ධි නම් වේ.

(i) (ප්‍රථම අර්ථයෙන්) සෘද්ධියම පාද වූයේ සෘඞ්ධි පාද ය. සෘඞ්ධි කොට්ඨාසය යන අර්ථ ය.

(ii) සෘඞ්යට පාද වූයේ සෘඞ්ධි පාද නම්. සෘඞ්ධි අධිගමන උපාය යන අර්ථ යි.

"ඉධියා කතමෙ චත්තාරෝ පාදා, ඉධ භික්ඛු ඡන්ද සමාධි පධාන සඞ්ඛාර සමන්නාගතං ඉද්ධි පාදං භාවෙති. විරිය-චිත්ත-වීමංසා සමාධිපධානසඞ්ඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉධියා ඉමෙ චත්තාරෝ පාදා - පෙ - ඉද්ධිවෙසාරජ්ජාය සංවත්තන්ති."[1]

සතර පාදයෝ නම් සෘඞ්ධි පාදයෝ යි. එයින් වදාළ හ.

'මේ සසුනෙහි යොගාවචර භික්ෂුතෙමේ ඡන්දය අධිකකොට ඇති එකාග්‍රතාව ප්‍රධානකොට පටන්ගන්නා සංස්කාරයෙන් යුක්ත වූ **ඍද්ධිපාදය** වඩන්නේ වෙයි. එබඳු වූ ම **වීර්‍ය, චිත්ත, ප්‍රඥා** යන තුනින් එකක් එකක් ප්‍රධානකොට ඇති සංස්කාරයෙන් යුක්ත ඍද්ධිපාදය වඩන්නේ වෙයි ද? මොහු යෑ සතර ඉද්ධිපාදයෝ නම් මොහු ඍද්ධි වෛශාරද්‍යය පිණිස පවතිත්'

පදයක් පාසා විස්තාරාර්ථ මෙසේ යි.

ඡන්ද සමාධි = පූර්වභාගයෙහි පැවැති **කර්තුකම්‍යතා** ඡන්දය හෙතුකොට ඇත්තා වූ එකාග්‍රතාව **ඡන්දසමාධි** නම්.

පධාන සඞ්ඛාර = ප්‍රධාන වූ හෝ ශ්‍රෙෂ්ඨ වූ චතුර්විධ වීර්‍යය ඒ ඒ කෘත්‍යය සිද්ධකරන හෙයින් **පධාන සඞ්ඛාර** නම්.

---

[1]පටි ම: ඉද්ධි කථා 383 බුරුම

සමන්නාගතං = ඡන්ද සමාධියෙන් හා ප්‍රධාන සඞ්ඛාරයෙන් යුක්ත වූ;

ඉඩ්පාදං = නිෂ්පත්තික්‍රමයෙන් හෝ අනිමත්තාර්ථය සමෘද්ධ වන අර්ථයෙන් හෝ ඍඩි නම් වූ **අභිඥා චිත්තයෙහි** යෙදුණු **ඡන්ද,- සමාධි,- ප්‍රධාන සංඛාරයන්ට** ආධාරාර්ථයෙන් 'සෙසු චිත්ත- චෛතසික රාශිය පාදයක් වූයේ නුසි, **ඉඩ්පාද** නම් වේ. මෙසේ ඡන්දාදි ධර්මයන් ලබමින් සිටියහු ගේ **වේදනා, සඤ්ඤා, සඞ්ඛාර, විඤ්ඤාණකඛන්ධ,** යන සතර නාම **සකන්ධයෝ ඍඩිපාද** නම් වන්නාහ යි වදරන ලදී.

තවද අර්ථයෙකි. = මේ කරණකොට ඍඩියට පැමිණේනුයි **පාද** නම්. ඍඩිහු ගේ පාදය ඍඩි පාදය යි. ඡන්දාදීන්ට මේ නමෙකි.

එහෙයින් වදළහ

"ඡන්දං වෙ භික්ඛවෙ භික්ඛු නිස්සාය ලභති සමාධිං ලභති චිත්තස්සෙකග්ගතං, අයං වුච්චති ඡන්ද සමාධි. සො අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං -පෙ- පදහති. ඉමෙ වුච්චන්ති පධාන සඞ්ඛාරා. ඉති අයඤ්ච ඡන්දෙ, අයඤ්ච සමාධි ඉමෙව පධානසඞ්ඛාරා අයං වුච්චති භික්ඛවෙ ඡන්දසමාධිපධානසඞ්ඛාර සමන්නාගතො ඉඩ්පාදොති."[1]

'ඒ භික්ෂුව ඡන්දය නිසා සමාධිය ලබන්නේ වේද **චිත්තයාගේ** එකඟ බව ලබන්නේ වේද එහෙයින් ඒ ධර්මය **ඡන්ද-සමාධි** නම් වේ. ඒ භික්ෂුව නූපන් අකුසල් නූපදීම පිණිස, උපන් අකුසල් ප්‍රහාණය පිණිස, නූපන් කුසල් ඉපදීම පිණිස උපන් කුසල් වැඩීම පිණිස වැයම් කරයි ද එහෙයින් ඒ ධර්මයෝ ප්‍රධාන සංස්කාරයෝ ය යි කියනු ලැබෙත්. මෙසේ මේ ඡන්දය ද මේ සමාධිය ද, මේ සඞ්ඛාරයෝ දෑ යි මෙතෙක් ධර්මයන් ගේ සමුදය ඡන්ද සමාධි ප්‍රධාන සඞ්ඛාර සමන්නාගත ඉද්ධිපාදය යි කියනු ලැබේ. මෙසේ සෙසු ඉඩ්පාදයන්ගේ ද අර්ථ දතයුතු.

3. පද අට නම් = ඍඩියට හේතු වූ **ඡන්දාදි** පද අට මෑ යි.

එසින් වදළහ.

"ඉධියා කතමානි අට්ඨපදානි ඡන්දසෙව භික්ඛු නිස්සාය ලභති සමාධිං ලභති චිත්තස්සෙකග්ගතං. ඡන්දෙ න සමාධි, සමාධි න ඡන්දෙ, අඤ්ඤං ඡන්දෙ අඤ්ඤං සමාධි, විරියං

[1]වි: ප: ඉඩ්පාද විභඞ්ග 166 පිට

වෙ භික්ඛු-පෙ-චිත්තසෙව-භික්ඛු වීමංසංවෙ භික්ඛු නිස්සාය ලභති සමාධිං ලභති චිත්තස්සෙකග්ගතන්ති. වීමංසා න සමාධි, සමාධි න වීමංසා. අඤ්ඤා වීමංසා. අඤ්ඤා සමාධි. ඉධිසා ඉමානි අධිට්ඨපදානි පවිලානාය - පෙ - ඉද්ධිවෙසාරජ්ජාය සංවත්තන්තීති''[1]

'මේ ශාසනයෙහි යොගාවචර භික්ෂුතෙම ඡන්දය නිශ්‍රය කොට (සමාධිය) චිත්තයා ගේ එකඟබව ලබන්නේ වේ ද ඒ **ඡන්දය** සමාධි නම් නො වේ සමාධිය ද ඡන්දය නො වේ. ඡන්දය අනිකෙක. සමාධිය අනිකෙක. එසේ ම **වීරියය ද, චිත්තය ද, ප්‍රඥාව ද,** නිශ්‍රය කොට (සමාධිය) චිත්තයා ගේ එකඟ බව ලබන්නේ වේ ද ඒ **වීරිය-චිත්ත-ප්‍රඥාවෝ,** සමාධි නම් නො වෙති. සමාධිහු ද වීරිය-චිත්ත-ප්‍රඥාවෝ නො වෙති. වීරිය-චිත්ත-ප්‍රඥාවෝ අනෙක් ධර්‍ම කෙනෙක. සමාධිහු අන්‍ය ධර්‍මයෝ යැ. මොහු අට දෙන සෘද්ධිහුගේ පදයෝ සි.'

ඡන්දාදි සතර තන්හි වූ සමාධිය සමාධිහුම ය. එහෙත් සෘද්ධිය උපදවනු කැමති ඡන්දාදිය සහිත වූ සමාධිය සෘද්ධි ප්‍රතිලාභය පිණිස හෙතුවේ. හුදකලා වූ යේ හේතු නො වේ. මෙසේ ඡන්දාදි සහිත වූ මේ සතර සමාධිය ද ඡන්දාදි සතර දැ සි අටදෙන "මොවුන් කරණ කොට සෘද්ධියට පැමිණෙත්නු සි" හෝ "තුමූ සෘද්ධි ප්‍රතිලාභය පිණිස පවතින්නු සි" හෝ ඉද්ධිපදයයි කියනු ලැබෙත්.

විභාවනය:- **ඡන්දාදි සතර හා ඒ සතරෙහි යෙදුණු ඒකාග්‍රතා** සතර ද යන අට **ඉද්ධිපද** නම් වේ. ඡන්දය සමාධියෙන් වෙන්ව ද, සමාධිය ඡන්දයෙන් වෙන්ව ද, ඉද්ධිය නිපදවීමට අසමර්ථ හෙයින් ඉද්ධිපද නො වේ. එහෙයින් මෙසේ එක්ව උපදනා ඡන්දාදි සතර හා එකාග්‍රතා සඞ්ඛ්‍යාත සමාධිය ද සෘද්ධිප්‍රතිලාභයට සමර්ථ හෙයින් **ඉද්ධිපද නම්** වෙති.

4. **සොළසමූල**[1] **නම්** ධ්‍යාන චිත්තය නො සැලෙන සේ පවත්නා **සොළොස්** ධර්‍මයෝ සි.

(1) වීරියයෙන් වඩනාලද සිත කුසීතභාවයෙන් නො නැමුණු හෙයින් ආනෙඤ්ජ නම් වේ.

(2) සන්සුන් වූ සිත ඖද්ධත්‍යයෙන් උඩට නො නගනලද හෙයින් ආනෙඤ්ජ නම් වේ.

(3) අරමුණෙහි නො ඇලුණු සිත රාගයෙන් නො සැලෙන හෙයින් ආනෙඤ්ජ නම් වේ.

(4) ක්‍රෝධයෙන් දූෂණය නො වූ සිත ව්‍යාපාදයෙන් නො සැලෙන හෙයින් ආනෙඤ්ජ නම් වේ.

---

[1] පටි: මෙ: ඉඩි කථා. 383 පිට බුරුම

(5) දෘෂ්ටියෙන් අල්වා නො ගන්නාලද සිත මිථ්‍යාදෘෂ්ටියෙන් නො සැලෙන හෙයින් ආනෙඤ්ජ නම් වේ.

(6) ඡන්ද රාගයෙන් නො බැඳුණු සිත ඡන්දරාගයෙන් නො සැලෙන හෙයින් ආනෙඤ්ජ නම් වේ.

(7) කාමරාගයෙන් මිදුණු සිත කාමරාග නිමිත්තෙන් නො සැලෙන හෙයින් ආනෙඤ්ජ නම් වේ.

(8) සතර යෝගයන්ගෙන් වෙන් වූ සිත කෙලෙස් නිමිත්තෙන් නො සැලෙන හෙයින් ආනෙඤ්ජ නම් වේ.

(9) සවලප වූ කෙලෙස් කොටසින් නො සැලෙන සිත කෙලෙස් සීමාවෙන් අකමප්‍ය හෙයින් ආනෙඤ්ජ නම් වේ.

(10) එකඟ බවට පැමිණි සිත නොයෙක් කෙලෙසුන්ගෙන් නො සැලෙන හෙයින් ආනෙඤ්ජ නම් වේ.

(11) ශ්‍රද්ධාවෙන් රැකුල් දෙනලද සිත අශ්‍රද්ධාවෙන් නො-සැලෙන හෙයින් ආනෙඤ්ජ නම් වේ.

(12) වීර්‍යයෙන් රැකුල් දෙනලද සිත කුසීත බැවින් නො සැලෙන හෙයින් ආනෙඤ්ජ නම් වේ.

(13) සමෘතියෙන් රැකුල් දෙන ලද සිත ප්‍රමාදයෙන් නො-සැලෙන හෙයින් ආනෙඤ්ජ නම් වේ.

(14) සමාධියෙන් රැකුල් දෙන ලද සිත ඖද්ධත්‍යයෙන් නො සැලෙන හෙයින් ආනෙඤ්ජ නම් වේ.

(15) ප්‍රඥාවෙන් රැකුල් දෙන ලද සිත දුර්‍ම්ල අවිද්‍යාවෙන් නො සැලෙන හෙයින් ආනෙඤ්ජ නම් වේ.

(16) ඔහාසඟත හිත (බලවත් අවිද්‍යාවෙන්) අවිද්‍යාන්ධකාරයෙන් නො සැලෙන හෙයින් ආනෙඤ්ජ නම් වේ. යන මේ ධර්‍මයෝ **සෘද්ධි මූලයෝ සි.** මේ ධර්‍මයෝ සොළොස් (16) දෙන ඍද්ධිහුගේ නො සැලීම පිණිස පවත්නාහ.

විශෙෂ:- රාගය- ආලය වශයෙන් බාහිරාලම්බනයෙහි උපදී.

ඡන්දරාගය- සම්බන්ධ විසින් සම්බන්ධයන් කෙරෙහි උපදනේ සි.

කාමරාගය- මෛථුන රාගය ය. මේ අර්‍ථය පෙර **"එවං සමාහිතෙ චිත්තෙ"** යනාදි පාඨයෙහි **"ආනෙඤ්ජප්පත්තෙ"** යන්නෙන් සිඛ නමුදු ප්‍රථමධ්‍යානාදීන් ගේ ඍද්ධියට **"භූමි-පාද-පද-මූල"** භාවයන් දක්වනු පිණිස නැවත කියන ලද බව් දතයුතු.

2. තවද "ශ්‍රඛාදීන් පරිගෘහීත බැවින්" යනාදීන් පෙර කී සයාකාරයෙන් දැක් වූ ක්‍රමය සූත්‍රයෙහි ආ පිළිවෙළ දක්වනු පිණිස කියනලදී .මේ සොළොස් (16) ක්‍රමය **ප්‍රතිසම්භිදා මාගීයෙහි** ආ ක්‍රමය දැක්වීම පිණිස කියන ලදී. එහෙයින් **සූත්‍ර-ප්‍රතිසම්භිදා** දෙක්හි මුලා නො වීම පිණිස තැවත කියන ලද බව දතයුතු.

ඤාණෙන අධිට්ඨහනෙනා = නුවණින් අධිෂ්ඨාන කරනුයේ, ඒ යෝගාවචර තෙමේ ඍඩිය පිළිබඳ මූලධම් මෙසේ සමපාදනය කොට **අභිඤ්ඤාපාදක චතුත්ථධ්‍යානයට** සමවැද එයින් නැගී සියයක් වනු කැමති නම් "සියයක් වෙමි සි" කාමාවචර සිතින් මෙනෙහි කිරීමෙන් පරිකම් කොට නැවත ආවජ්ජනාකොට **අභිඤ්ඤාපාදක චතුත්ථධ්‍යානයට** සමවැද එයින් නැගී "සියයක් වෙමිසි" ඉටසි. ඒ අධිඨාන චිත්තය සමග සියයෙක් වේ. "දහසෙක් වෙමි සි" යනාදීන්හි ද, පරිකම්ාදිය මෙසේමැ සි.

මෙසේ අභිඥාත්ථ සිඩිය නො වී නම් නැවත ද පිරියම් කොට දෙවෙනි තුන්වැනි ආදි වශයෙන් සිඩවනතාක් ඉටන්නේ ය.

මතභෙදඃ- සංයුත් අටුවායෙහි වනාහි "එක්වරක් දෙවරක් සමවැදිය යුතු"ය සි කියනලදී. ඒ අටුවාහි "පාදක ධ්‍යාන චිත්තය ප්‍රතිභාග නිමිත්ත නම් වූ කසිණාලෝකය අරමුණු කෙරේය සි ද, පරිකම් චිත්තයන් සිය දෙනෙකුත් හෝ දහස් දෙනෙකුත් හෝ අරමුණුකර පවතින්ය සි ද යෙති. ඒ පරිකම් සිත් ද තමන් විසින් කල්පනා කරනලද වණ් වශයෙන්මැ උපදී. දිව්‍ය මනුෂ්‍යාදි ප්‍රඥප්ති වශයෙන් නො වේ මැ සි. අධිඨාන චිත්තය ද එසේ ම සියයක් හෝ දහසක් අරමුණු කරන්නේ ය. **භෙද** පෙර කී **අභිණා** චිත්තය මෙන් **ගොත්‍රභූ** චිත්තයට අනතුරු වැ **චතුත්ථධ්‍යානික එක** ම සිතක් උපදනේ"යැ සි කියනු ලැබේ. එහෙත්- **ප්‍රතිසම්භිදායෙහි**:-

"පඤ්චන්නං එකෙකා බහුකං ආවජ්ජති. සතංවා සහස්සං වා සතසහස්සං වා ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති. බහුකෙනා හොමීති බහුකෙනා හොති. යථා ආයස්මතෝ චූලපන්ථකස්ස."[1]

'සවභාවයෙන් එකකු වැ 'සියයක් හෝ දහසක් හෝ ලක්ෂයක් හෝ වෙමි සි' ආවජ්ජනාකොට ඤාණයෙන් ඉටන්නේ ය. එසේ **කල** ආයුෂ්මත් **චූලපන්ථක** සථවිරයන් මෙන් බොහෝ දෙනෙක් වෙති.'

මේ ප්‍රතිසම්භිදාමාගීයෙහි ද 'ආවජ්ජනාකොට නුවණින් ඉටාය' සි කියේ පරිකම් සිතින් ආවජ්ජනා කොට අභිඥා ඥානයෙන් අධිඨාන කිරීම සඳහා මැ සි.

---

[1]පටි: ම: ඉඩ්ධිකථා 385 පිට

විසඛර:- එහෙයින් මෑ "බොහෝ වෙමි සි" ආවජ්ජනා කෙරේ. අනතුරු වැ ඒ පරිකම්ම චිත්තයා ගේ කෙළවර චතුර්ධ්‍යානයට සමවදනේ සි. ඒ සමවතින් නැඟිට නැවත 'බොහෝ වෙමි' සි ආවජ්ජනා කොට ඉන් මතු පැවැති **පරිකම්ම-උපචාර-අනුලෝම-ගොත්‍රභු** යන සතර පූර්භාග චිත්තයට හෝ **උපචාර-අනුලෝම-ගොත්‍රභු** යන ත්‍රිවිධ පූර්භාග චිත්තයට හෝ අනතුරු වැ නිෂ්පාදන වශයෙන් **අධිඨාන** නම් වූ **එක** මෑ අභිඥ ඥානයෙන් "අධිඨාන කෙරේ" ය සි දතයුතු සි. ආයුෂ්මත් **චූලපන්ථක** ස්ථවිරයන් මෙතැ සි බොහෝ ප්‍රකාර බවට කාය සාක්ෂි පිණිස කියන ලදී.

ඒ මෙසේ සි:- ඒ දෙබැයෝ පන්සයෙහි (මාගධයෙහි) උපන් බැවින් **පන්ථක** නම් වූවාහු ය. වැඩිමහලු **මහාපන්ථක** තෙමේ පැවිදි වැ සිවුපිළිසිඹියාපත් රහත් වී **චූලපන්ථක** ද පැවිදි කරවා

"පදුමං යථා කොඤ්චනදං සුගන්ධං
පාතෝ සියා ඵුල්ලමවීත ගන්ධං,
අඞ්ගීරසං පස්ස විරොචමානං
තපන්තමාදිච්චමිවන්තලික්ඛෙ"[1]

"උදේ පිපි මනා සුවඳ ඇති බොහෝ පෙති ඇති හෙළ පියුම් සුගන්ධයෙන් වියෝ නො වී පවතී ද? (එබඳු) හෙළ පියුමකට බඳු ශරීර සුගන්ධයෙන් හා තේජසින් යුතු අහසෙහි බබළන සූර්‍යයා වැනි **අඞ්ගීරස** නම් **සම්බුදුයන්** වහන්සේ බලව" සි මේ ගාථාව දුන්නේ ය.

චූලපන්ථක ස්ථවිරයන් සාරම්භකින් මේ ගාථාව ඉගෙනීමට අසමර්ථ වූ හෙයින් **මහාපන්ථක** ස්ථවිරයන් වහන්සේ ඇවැත්නි! 'මේ ශාසනයෙහි තා අහව්‍යයෙකැ' සි වෙහෙරින් බැහැර කර වූ සේක.

එකල **භත්තුද්දෙසක** තනතුර ලත් **මහාපන්ථක** ස්ථවිරයන් වෙත **ජීවකයා** පැමිණ 'හෙටට භික්ෂූහු කෙතෙක්දැ' සි විමසා කල **චූලපන්ථක** (තෙරුන්) හැර අනික් **බුදුපාමොක්** සඞ්ඝයාට ආරාධනය පිළිගත් හෙයින් තමා ගැන වැඩිමහලු සොහොයුරා **කලකිරණු** බව නියම වශයෙන් දැන 'මට දැන් මේ පැවිද්දෙන් කම් නැතැ' සි පසුදා උදැසන මෑ සිවුරු හැර යාමට පිටත්ව ගියේ ය.

ඒ බව දත් **බුදුහු** එයට පෙරාතුව වැඩ දෙරටුව සමීපයෙහි සක්මන් කරමින් සිටිනු දැක උන්වහන්සේ වෙත එළඹ වැඳ එකත් පස්ව සිටි **චූලපන්ථක තෙරුන්** අතින් 'මේ කොහි යන්නෙහිදැ' සි

---

[1] සං: නි: කොසල සංයුත්ත 49 පිට

විචාරා ඒ තතු කී කල **චූලපන්ථකයෙ!** 'මේ ශාසනය **මහාපන්ථකයා** ගේ නොව මාගේ ය' සොහොයුරාණෙ එසේ කී කල මා වෙත කොපැමිණියේ **කිම්** ද 'යන්තට එව' සි කැඳවා ගෙන ගොස් ගඳකිළි දොරටුවෙහි ඉර දෙස බලා සිටින සේ හිඳුවා සෘඩියෙන් මැවූ රෙදි කඩක් දී 'මේ පිරිමදිමින් ''රජොහරණං''සි කියව' සි වදාළහ.

උන්වහන්සේ එය නැවත නැවත පිරිමැදීමේ දී තමා අත වූ ඛහදිය ගැවීමෙන් කිලුටු වූ බව දැක 'මේ පිරිසුදු රෙදිකඩ මා ශරීරය නිසා කිලුටු වි ය.'

'මේ ශරීරයේ දෙෂයැ' සි **පඤ්චසඤ්ඤය** පිළිබඳ දෙස් දැකීමේ නුවණ උපදවා විදර්ශනාවට සිත නමා පිළිවෙළින් **අනුලොම-ගොත්‍රභූ** ඤාණය සමීපයට සිත පැමිණ වූ **කල බුදුහු** බුදුරස් විහිදුවා අනිමිඛයෙහි වැඩ සිටිනා සේ පෙනී

''රාගො රජෝ නවපන රෙණුවුච්චති
රාගස්සෙතං අධිවචනං රජෝනි,
එතං රජං විප්පජහිත්ව පණ්ඩිතා
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ''[1]

''රාගය රජස ය. මේ ආර්‍ය්‍ය විනයෙහි දූලි රජසැ සි නොකියසි. රාගයට රජස යැ සි විශිෂ්ට නමෙකි. සිත කිලුටු කරන හෙයින් මේ රාග රජස ආර්‍ය්‍ය මාර්ගඥානයෙන් පහකොට ආර්‍ය්‍යයන් වහන්සේලා වීතරජස්ක **සච්ඡ** ශාසනයෙහි සිත් අලවා වෙසෙති'' වෙෂ මොහයෝ ද එසේ මැ රජස් වෙති.

මේ ගාථා කෙළවර **චූලපන්ථක** සථවිරයන් වහන්සේ සිවු-පිළිසිඹියා හා ෂඩභිඥාලාභීව අර්හත්වයට පැමිණි සේක. **බුදුහු** (දෙවන දවස්) සංඝයා පිරිවරා ජීවකයා ගේ ගෘහයට වැඩි සේක් ජීවකයා වඩා හිඳුවා දක්ෂිණොදකය පිරිනැමූ කල අතින් පාත්‍රය වැසූ හ.

ඒ කිම්ද සි විචාළ කල උපාසකය! 'විහාරයෙහි භික්‍ෂුවක් ඇතැ' සි වදාළ හ. ජීවකයා 'විහාරයෙහි වූ භික්‍ෂුව කැඳවා එව' සි පුරුෂයකු යැවී ය. **බුදුන්** විහාරයෙන් වැඩි පසු **චූලපන්ථක** සථවිරයන් වහන්සේ තමා වැනි රූප දහසක් අභිඥා පාදක සිතින් මවාගෙන ඒ සිත්කලු අඹ වෙතෙහි කල් දන්වන තෙක් වැඩ සිටි සේක. ඒ විහාරයට පැමිණි පුරුෂයා කාෂාය වස්ත්‍රයෙන් බබලන

1 පටි: ම: අඨකථා 484 පිට

විහාරය දැක පෙරලා අවුත් ඒ බව් කියා 'ඒ භික්ෂුව කවරෙක්දැ යි නොදනිමි' යි කිය. එකල බුදුහු තෝ නැවත විහාරයට ගොස් පළමු දුටු භික්ෂුව ගේ සිවුරු කොණ අල්වා 'බුදුන් ඔබ වහන්සේ ඇමතූහ යි කියව' යි වදාළ හ. හේ වෙහෙරට ගොස් එසේ කළ කල සියල්ලෝ අතුරුදහන් වූ හ. තෙරුන් වහන්සේ ඔහු යවා මුව දෙවුම් ආදිය නිමවා ඔහුට පෙරාතුව වැඩ තමාට පැමිණි අසුන්හි වැඩ සිටි සේක.

මේ සඳහා යැ 'ආයුෂ්මත් චූලපන්ථක ස්ථවිරයන් මෙනැ' යි කියේ.

ඒ නිර්මිත භික්ෂූහු වණ්ණ – ශරීරාවයව – පරිෂ්කාර – ක්‍රියා විශෙෂාදීන් නියම නො කොට මැවූ හෙයින් සෘද්ධිමතුන් හා සමාන මැ වෙත්. යාම්-සිටීම් ආදී සෘද්ධිමතුන් කරන ක්‍රියාවම නිර්මිත භික්ෂූහු ද කෙරෙත් මැයි.

තවද වණ්ණාදි වශයෙන් ද, ක්‍රියා විශෙෂයෙන් ද, වයස් ආදීන් ද, නන් අයුරින් වෙනස් කරනු කැමැත්තේ නම්
කෙසේද යත්?

ඇතැම් කෙනකුන් ප්‍රථම වයස්හි වූවන් ද, ඇතැම් කෙනකුන් මධ්‍යම වයස්හි වූවන් ද, ඇතැම් කෙනකුන් පශ්චිම වයස්හි වූවන් ද, ඇතැම් කෙනකුන් දික් කෙස් ඇතියවුන් ද, ඇතැම් කෙනකුන් හිස මුඩුකළවුන් ද, ඇතැම් කෙනකුන් කළු කෙස් ඇතියවුන් ද, ඇතැම් කෙනකුන් මනාව රැඳූ සිවුරු ඇත්තවුන් ද, ඇතැම් කෙනකුන් මදක් රැඳූ සිවුරු ඇත්තවුන් ද, ඇතැම් කෙනකුන් පද කියන්නවුන් ද, ඇතැම් කෙනකුන් අර්ථ කියන්නවුන් ද, ඇතැම් කෙනකුන් උස් සවරයෙන් කියන්නවුන් ද, ඇතැම් කෙනකුන් පැන පුළුවුස්නවුන් ද, ඇතැම් කෙනකුන් පැන විසඳන්නවුන් ද, ඇතැම් කෙනකුන් පඬු පිසනවුන් ද, පඬු පොවන්නවුන් ද, සිවුරු මසන්නවුන් ද, යනාදී වශයෙනි.

ඒ භික්ෂුව පළමුවැ පාදකධ්‍යානයට සමවැද එයින් නැගී 'මෙතෙක් භික්ෂූන් මෙසේ මෙසේ වෙත්වා'යි පිරියම්කොට නැවත සමවතට සමවැදී එයින් නැගී අධිඨාන කළයුතු. අධිඨාන සිත සමග මැ කැමැති කැමැති ආකාර මැ වේ.

බොහෝ වැ එකකු වීමෙහි ද මෙසේ මැ යි. එහි විශෙෂය මෙසේ යි.

මෙසේ බොහෝ කොට නිර්මිත කළ භික්ෂුව එකකු වනු කැමැත්තේ නම්.– 'එකකු වැ සක්මන් කරමැ'යි කියා හෝ

'සඤ්ඤායතා කර මැ' යි කියා හෝ 'පැත විචාර මැ' යි කියා යි. 'මේ භික්ෂූන් සවලප දෙනකුන් ඇති විහාරයෙකැ කෙසේ බොහෝ වී ද' ඒකාන්තයෙන් මේ ආර්‍යයන් වහන්සේ ගේ අනුභාවයෙකැ යි කියා 'මිනිසුන් මා ගැන දැනගනිතැ යි' අලෙවිච්ඡ බැවින් හෝ එකෙක් වන්නෙමැ'යි කැමැත්තහු විසින් පාදක-ධ්‍යානයට සමවැද එයින් නැගී 'එකෙක් වෙමි' යි පිරියම් කොට නැවත ධ්‍යානයට සමවැදී එයින් නැගී 'එකෙක් වෙමි' යි අධිෂ්ඨාන කළයුතු. අධිෂ්ඨාන සිත හා සමග මැ එකෙක් වේ.

විශෙෂ:- මෙසේ නො කරන්නේ පරිච්ඡින්න කාල වශයෙන් තෙමේ ම (ඉඛේම) එකෙක් වේ.

ආවිභාවය, තිරොභාවය යන මෙහි අර්ථය නම් 'ප්‍රකට බව කිරීම ය, අප්‍රකට බව කිරීම ය, යනු යි.

මේ සඳහා මැ:-

"ආවිභාවනති, කෙනවි අනාවටං හොති අපච්ඡන්නං විවටං පාකටං." "තිරොභාවනති- කෙනවි ආවටං හොති පච්ඡන්නං පිහිතං පටිකුජ්ජිතනති"[1]

ආවිභාව නම්, නිතනි-පවුරු ආදි කිසිවකින් මුවහ නො වූයේ, පිළිසන් නො වූයේ, විවෘත වූයේ, ප්‍රකට වූයේ, යන අර්ථ යි.

තිරොභාව නම්, නිතනි පවුරු ආදි කිසිවකින් මුවහ වූයේ පිළිසන් වූයේ, වසන ලද්දේ, මුනින් වසන ලද්දේ, යන අර්ථ යි.

මෙහිලා සෘඞ්මත් තෙමේ ප්‍රකට කරනු කැමැත්තේ රාත්‍රි අන්ධකාරය හෝ ආලෝක කරයි. නිතනි ආදීන් පිළිසන් වූවක් හෝ විවෘත කරයි. දුරබව් ආදීන් හමු නො වූවක් හෝ හමු කරයි.

ඒ මෙසේ යි:- ඒ යොගාවචර තෙමේ පාදක ධ්‍යානයට සමවැද එයින් නැගී 'මේ අඳුරු තැන ආලෝක වේවා' යි කියා හෝ 'මේ මුවහ වූ දෘශ ප්‍රකට වේවා' යි කියා හෝ ආවජ්ජනාකොට පරිකර්ම භාවනා කර අධිෂ්ඨාන කරයි. ඒ අධිෂ්ඨානයට අනතුරුව මැ එසේ වන්නේ යි.

දුර වූ දෘශ ලං කළ පරිදි මෙසේ යි.

බුදුරජාණන් වහන්සේ **චූළසුභද්‍රාව ගේ** ආරාධනයෙන් සැවැත්නුවර සිට සාකෙත නුවරට වඩනට සූදානම් වූ කල සක් දෙව් රජු ගේ නියමයෙන් විස්කම් දෙවිපුතු මැවූ කුළුගෙවල වැඩ සිට සැවැත් නුවරින් සත් යොදුනක් ඇත වූ සාකෙත නුවරට වඩනා සේක් සැවැත් නුවර වැස්සන් විසින් සාකෙත නුවර

[1]පටි: මෝ: ඉඞ්ගිකථා 386 බුරුම

චැස්සන් ද, සාකෙත නුවර වැස්සන් විසින් සැවත වැස්සන් ද ඔවුනොවුන් දක්නා සේ අධිෂ්ඨාන කළ සේක. සාකෙත නුවර මධ්‍යයෙහි බැස පොළොව දෙබේකොට අවීචිමහ නිරය තෙක් දැක්වූ සේක. ආකාසය දෙබේකොට එහි වූ විමානයන් ද, බඹලොව තෙක් දැක්වූ සේක. දෙවෝරෝහණයෙහි ද මේ ප්‍රකට වේ.

බුදුහු යමාමහ පෙළහර කොට අසූහාර දහසක් ප්‍රාණීන් නිවන් දක්වා පෙර බුදුවරු යමාමහ පෙළහර දවස්හි පෙළහර කොට 'කොහි වැඩි සේක් ද'යි ආවජ්ජනා කරණුවෝ තවුතිසා භවනයට බව් දැන එක් පියවරක් පොළොවෙහි තබා දෙවන පියවර යුගඳුරු මුදුනෙහි තබා නැවත පළමු පියවර ගෙන මහමෙර මත තබා එහි වූ පණ්ඩුපුල්සලස්නෙහි වස් වැස රැස් වූ දස දහසක් සක්වළ දෙව් බඹුන්හට අභිධම්ම දෙශනාව අරඹා පිඬු සිඟන වේලාවෙහි නිමිත බුදු කෙනෙකුන් මවා 'ඒ බුදුහු මෙතෙක් දම් දෙසත්වා'යි අදිටන් කොට අනවතප්ත විලින් මුව දෙවා උතුරුකුරු දිවයිනට පිඬු සිඟා වැඩ අනවතප්ත විල් ඉවුරෙහි සඳුන් වෙතෙහි වැඩහිඳ දන් වලඳති.

සැරියුන් මහ තෙරණුවන් එතනට වැඩ බුදුන් වැඳි කල බුදුහු 'අද මෙතෙක් ධම්ම දෙසීම්' සි නය ක්‍රමය උන්වහන්සේට වදාරති. සැරියුන් මහ තෙරණුවෝ ඒ අනු වැ අභිධම්පිටකය වාචොදාත කළ හ. තෙමසක් මුළුල්ලෙහි මෙසේ වදහළ ඒ මේ අභිධම්පිටකය අසා අසූකෙළක් දෙවියෝ ධම්මාභිසමය කළ හ.

යමාමහ පෙළහරෙහි රැස් වූ දෙලොස් යොදුනක් තැන රැස්ව හුන් පිරිස 'බුදුන් නො දැක නො යම්හ' සි එහි මැ කඳවුරු බැඳ සිටියවුන්ට බත් බුලත් ආදියෙන් අනේපිඬු සිටාණන් ගේ මලණු වූ චුල්ල අනේපිඬු සිටාණන් විසින් උපසථාන කරන ලදී.

මහාජනයා බුදුහු 'කොහි වැනියෝ'ද සි දැනගනු සඳහා දිවැස් ඇත්තවුනට අග තැන්පත් අනුරුද්ධ තෙරුන් වෙත ගොස් අයැදි සඳ තෙරුන් වහන්සේ ඔදුත කසිණයට සමවැද ආලෝකය පතුරුවා තවුතිසා දෙවුලොව වැඩ සිටි බුදුන් දැක ඒ බව් ඔවුනට දැන්වූ සේක.

ඉක්බිති ජනයා සෘඩිමතුනට අග තැන්පත් මුගලන් මහ තෙරණුවන් වෙත පැමිණ අපට වදනා පිණිස 'බුදුන් දක්වා ලනු මැනවැ' සි අයැදි සඳ උන්වහන්සේ ඒ පිරිස මැද මහාපොළොව කිම්ද මහාජනයාට පෙනෙන සේ මහාමේරු පර්වතය විනිවිද ගෙන

බුදුන් පා වඳිමින් ම පාමුලින් නැගී එ පවත් සැලකළ සේක. **බුදුහු** ඒ තෙරුන්ට **'මොග්ගල්ලායනය! තොප දෙවු බැ දම්සෙතෙවි සැගියුන් කොහිදැ'** යි විචාරා **සක්‍රස්පුර යි** කී කල 'මා දක්නා කැමැත්තෝ හෙට දවස් සකස්පුර දෙරට රැස්වෙත් වා! එහි බස්නෙමි' යි වදාළ කල **මුගලන්** මහතෙරණුවෝ ආ මගින් මැ පෙරළා අවුත් මිනිසුන්හට ඒ බව් දැන්වූහ.

මෙසේ **මුගලන්** මහතෙරුන් වහන්සේ නො දැක්ක හැකි සේ පිළිසන් වූ ඒ ගමන දක්නා පරිද්දෙන් අදිටන් කිරීමෙන් **ආවිඤ්ඡාව ප්‍රාතිහාර්‍යය** පෑ සේක.

මෙසේ වැනි **මුගලන්** තෙරුන් වහන්සේ එපවත් දන්වා මහජනයාට 'දුරයයි නො සිතා පෙර බත් කිස නිමවා ම යව' යි වදාළ සේක.

බුදුන් 'සෙට දවස මිනිස් ලොවට යම්හ' යි සක්දෙවි රජහට වදාළකල ඔහු විස්කම් දෙවිපුතු දන්වා **රන් - රිදී - මිණිමුවා** හිණිපෙති තුනක් නිම්මිත කරවී. බුදුහු දෙවෙනි දවස් මහමේර මුදුනේ සිට පෙරදිග ලෝදැ බලා වදාළකල එදෙස නොයෙක් දහස් ගණන් චක්‍රවාටයෝ විවෘත වැ ඒකාඛ්‍යණ වූ සේ ප්‍රකාශ වූහ. එසේ මැ පැදුම්දිග ද, දකුණුදිග ද, උතුරුදිග ද, **ලොකධාතුහු** ප්‍රකාශ වූහ. එසේ මැ යටින් අවීචිය තෙක් ද උඩින් **අකනිටා** බඹලොව තෙක් ද, පෙනී ගියේ ය. මෙසේ **"ලොකවිවරණ"** නම් මහා ප්‍රාතිහාර්‍යය පෑ සේක. එහි වූ දෙවියෝ බිම නො බලා මැ රිසිසේ මිනිසුන් දකිති. මිනිස්සු ද උඩ නො බලාම රිසිසේ දෙවියන් දකිත්.

බුදුහු මැද මිණිමුවා හිණින් බස්නාහ.

දෙවියෝ වම්පස රන්මුවා හිණින් ද, සුද්ධාවාස දෙවියෝ ද, මහාබ්‍රහ්මයෝ ද, දකුණුපස රිදීමුවා හිණින් බස්නාහ. සක්දෙවි රජ **බුදුන්** පාසිවුරු ගත. මහබඹ තුන්යොදුන් සේසත **බුදුන්** මුදුනට දැරී. සුයාම දෙවිරද වල්විදුනා ගෙන පවන් සැලී. ගන්ධර්‍වයෝ පන්සියයක් දෙන තුන් යොදුන් බෙලුවපාණඬු වීණාව ගෙන **බුදුන්ට** වැයූහ. මෙසේ **බුදුරජාණන් වහන්සේ ම ආවිඤ්ඡාව ප්‍රාතිහාර්‍යය** කළසේක.

තව ද ලක්දිව **තලගුරු** විහාරවාසී **ධම්මදින්න** තෙරණුවෝ **නිස්‍ස** මහාවෙහෙර සෑ මලුවෙහි වැඩහිඳ **අපණ්ණකපටිපදා සූත්‍රය**[1] දෙසනුවෝ විජිතිපත යටිකුරුකළ කල අවීචිය තෙක් ප්‍රකාශ විය. උඩුකුරුකළ කල බඹලොව තෙක් ප්‍රකාශ වී ය.

---

[1] අ: නි: තිකනිපාත 68 පිට

මෙසේ පව් කළවුන් විඳුනා දුක ද, පින්කළවුන් විඳුනා සැප ද, දක්වා ධම්දෙශනා කළ කල එහි වූවෝ සෝවාන් ආදි මාගීඵල ලැබූහ. මේ **ආවිඤ්ඡාවප්‍රාතිහාය්‍ය ය.**

නිරොභාවය (මූවහ) **කරනු** කැමති සෘඩිමත්හු නීලකසිණයට සමවැද අඤ්ඣකාර කෙරෙති. පිළිසන් නො වූව පිළිසන් හෝ කෙරෙති. නිතනි ආදීන් මූවහ නො වූවක් මූවහ හෝ කරත්.

මෙසේ **කරනු** කැමැත්තෝ පාදකධ්‍යානයට සමවැද එයින් නැගී 'මේ ආලෝකය අඤ්ඣකාර වේ වා' යි යනාදීන් ආවජ්ජනා කොට පරිකම්ම කොට 'පෙර කී සේ අධිඨාන කෙරෙති. අධිඨාන සිත හා සමගම එසේ සිදුවේ. එසේ වන්නා ළඟ සිටියා වූ නො දක්වනු කැමැත්තා නො දකී. නෙමේ ද නො දක්නා කැමැත්තහු නො දකී.

ඒ මෙසේයි:- **භාග්‍යවතුන්** වහන්සේ තමන් සමීපයෙහි සිටි **යස** කුලපුත්‍රයා පියා විසින් නො දක්නා සේ අධිඨාන කළසේක. ඒ එසේ මැ වී ය. එසේ මැ එකසිය විසි යොදුනක් පෙර ගමන් කොට **මහාකප්පින** රජ අනාගාමී ඵලයෙහි ද, දහසක් අමාත්‍යයන් සෝවාන් ඵලයෙහි ද, පිහිටුවා ඔවුන් අනුවැ ගමන් **කළ** දහසක් සත්‍රීන් පිරිවැරූ **අනොජා** දෙවිය සමීපයෙහි සිටියා වූ ද ඒ රාජාදි පිරිස නො දක්නා සේ අදිටන් කොට, සඞ්ඝමිනි! රජු දුටුදැ යි විචාළවුන්ට 'කිම? තොපට රජු සෙවීම උතුම් ද, නැතහොත් තමා සෙවීම උතුම්දැ' යි විචාරා 'තමා සෙවීම මැනවැ' යි කී **කල** එසේ දම් දෙසා සත්‍රීන් සමග ඇය සෝවාන් පෙළෙහි ද, අමාත්‍යයන් අනාගාමි පෙළෙහි ද, රජු අරහත් පෙළෙහි ද, පිහිට වූ සේක.

තවද **මිණ්ඩු මහතෙරුන්** ලක්දිව වැඩි පළමු දිනයෙහි දෙවන පැතිස් රජහට තමා කැටිව පැමිණියවුන් නො පැතෙන සේ අධිඨාන කිරීම ද මේ ප්‍රාතිහාය්‍යය මැයි.

විශෙෂ:- **ආවිඤ්ඡාව** ප්‍රාතිහාය්‍යයෙහි බලාසිටිනවුනට සෘඩි ප්‍රාතිහාය්‍යය ද, ප්‍රාතිහාය්‍යය දක්වන්නා ද, පැතෙයි. එය **යමක** ප්‍රාතිහාය්‍යයෙන් ප්‍රකට වේ. ශ්‍රාවකයන් හා අසාධාරණ වූ ඒ ප්‍රාතිහාය්‍යයෙහි දී උඩුකයින් ගිනිකදක් හා යටි කයින් දිය කදක් ද, පවත්නේ යි. මේ දෙක මැ වෙන වෙන මැ පැනේ.

නිරොභාව ප්‍රාතිහාය්‍යයෙහි වූ කලි සෘඩි ප්‍රාතිහාය්‍යය පැනෙ යි. සෘඩිමත්හු නො පැනෙති. මෙය **මහක**[1] - **බ්‍රහ්මනිමන්තණික**[2] **සූත්‍රයන්** ගෙන් ප්‍රකාශ වේ. එකත් පසෙක හුන් **චිත්‍රගෘහපති**

[1] සං: නි: චිත්ත සං: 734 [2] ම: නි: මූලපණ්ණාසක 324

තෙමේ ආයුෂ්මත් **මහක** ස්ථවිරයන්ට සවාමීනි! යෑඩි ප්‍රාතිහාර්‍යයක් දැක්වූව හොත් මැනවැ යි සැළකළ කල

එසේතම් තෙපි නිසවත්තෙහි උතුරුසළුව අතුට **ඒ** මත **තණ** කැරැල්ලක් විසුරුව යි කීහ.

එසේ **කළ කල මහක** ස්ථවිරයන් වහන්සේ වෙහෙරට පිවිස, කෙසි සිදුරෙන් ගිනි සිළු නික්ම අවුත් පිටත වූ **තණ** කැරැල්ල දවා උතුරු සළුව නො දවා ද එපරිද්දෙන් **සෘඩි ප්‍රාතිහාර්‍යයක්** කළහ.

බ්‍රහ්මනිමන්තණික සූත්‍රයෙහි ද, මහණෙනි! යම්සේ **බකබ්‍රහ්මයා** ද, බ්‍රහ්ම පිරිස ද, මා නො දකිද් ද, මාගේ ශබ්දය පමණක් අසද් ද එබඳු වූ සෘඩි ප්‍රාතිහාර්‍යයක් කෙළෙමි' යි වදුළහ.

බ්‍රහ්ම ගණයා කෙරෙන් අතුරුදන්වනු කැමති බකබ්‍රහ්මයාට අතුරුදන් විය නො හැකි සේ කොට, බුදුහු ඔවුනට අතුරුදහන්ව සිට, 'ශ්‍රමණ භවත් ගෞතමයන් මෙහි ඇති බව හෝ නැති බව හෝ දැනගත නො හැකැ' යි කියන බ්‍රහ්මයනට එයට අවකාශ නො වේව' යි අධිෂ්ඨාන කොට මේ ගාථාව වදුළහ.

භවෙවාහං භයං දිස්වා – භවඤ්ච විභවෙසිනං
භවං නාභිවදිං කිඤ්චි – නන්දිඤ්ච න උපාගමිං

"මම මේ සංසාරයෙහි ජාති-ජරා-මරණ භය දැක මැ, විභව සඞ්ඛ්‍යාත **නිර්‍වාණය** සොයන්නෙම්! තෘෂ්ණා-දෘෂ්ටි වශයෙන් කිසි භවයක් ග්‍රහණය නො කෙළෙමි. භව තෘෂ්ණාවට ද නො පැමිණියෙමි" යනු භාව යි.

ගෙවල භිත්තියෙන් පිටතට ද, ගෙවල් – නගර – ගම් ආදිය පිරිකෙව් කළ ප්‍රාකාරවල පරභාගයට ද, වෘක්ෂ – පර්වතාදීන් ගේ පරභාගයට ද අහසෙහි යන්නා සේ නො හැපෙමින් යයි., **"තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරෝ පබ්බතං අසජ්ජමානෝ ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ"**[1]

මේ කරනු කැමති යොගියා විසින් ආකාස කසිණයට සමවැද, එසින් නැගී භිත්තියක් හෝ, පවුරක් හෝ, පර්වතයක් හෝ ආවර්ජනා කොට 'කිසිතැනෙක නො ලැගෙමි' යි කළ පරිකර්ම භාවනා ඇතිව 'අහස වේවා' යි ඉටිය යුතු (එහි වූ අහස එක්තැන් වීමෙන්) ආකාශයක් (විවරයක්) සැදේ. යට බසිනු කැමැත්තහුට හෝ උඩ නගිනු කැමැත්තහුට හෝ සිදුරෙක් වේ. ඒ සෘඩිමත් තෙමේ එහි නො හැපෙමින් යයි.

---

[1]පටි: ම: ඉඞ්ඝිඨ 386 බුරුම

මතඤ්ඤදයක්:- **තිපිටකා චූලාභය** සථවිරයෝ වදුළහ. "ඇවැත්නි! මෙතැන්හි ආකාස කසිණයට සමවැදීම අනවශ්‍ය ය. කිම හෙයි අශ්වාදීන් මැවීම පිණිස හෝ අශ්වාදී කසිණයට සමවදී ද එහෙයින් පථවි කසිණාදී යම්කිසි කසිණයක් වැඩුව මනා ය. අෂ්ට සමාපත්ති වශීභාවය ම මෙහිලා පමණි. යමක් යමක් කරනු කැමති නම් ඒ ඒ දෑයම වේව" යි කියා ය.

(පෘථිවියෙහි උම්මුජ්ජන-නිමුජ්ජනයෙහි ආපො කසිණයට සමවැදුම ද, උදකයෙහි ගමනාදියෙහි පෘථිවී නිමිත්තය සඳහා පථවී කසිණයට සමවැදීම ද, කැමති වන්නවුනට එසේ නොවිය යුතු බව් දැන්වීම් සඳහා පෙර කී මතය දැක් වී.)

එහෙත් **භික්ෂූහු** මෙසේ වදුළහ. සවාමිනි! 'පෙළෙහි මතු ආකාස කසිණය මැ දැක් වේ. එහෙයින් මෙහි ලා ආකාස කසිණයට මැ සමවැදුන මනා ය කියාසි.

ඒ මෙසේ සි:- **"පඨනියා ආකාස කසිණ සමාපත්තියා ලාභී හොති. තිරොකුඩ්ඩං, තිරොපාකාරං, තිරොපබ්බතං, ආවජ්ජති. ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති. ආකාසො හොතූ'ති ආකාසෝ හොති. තිරොකුඩ්ඩං තිරොපාකාරං, තිරොපබ්බතං අසජ්ජමානෝ ගච්ඡති. යථා පඨවියා මනුස්සා අනිබ්බිජ්ඣනෙනා කෙනචි අනාවාටෙ අපරික්ඛිත්තෙන අසජ්ජමානා ගච්ඡන්ති. එවමෙව සෝ ඉද්ධිමා චෙතොවසිප්පත්තෙනා තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානෝ ගච්ඡති"**[1]

"සවභාවයෙන් ආකාස කසිණ සමාපත්ති ලාභියෙක් වූයේ මැ නිත්තියෙන් පරභාගයට හෝ, ප්‍රාකාරයෙන් පරභාගයට හෝ, පර්වතයෙන් පරභාගයට හෝ, යාම් ආදී පෙළහර කරනු කැමැත්තේ අහස්කිසුණට ම සමවැද නිත්තියෙන් පරභාගය හෝ, ප්‍රාකාරයෙන් පරභාගය හෝ, පර්වතයෙන් පරභාගය හෝ, ආවර්ජනා කෙරෙ යි. ආවර්ජනා කොට 'ආකාශයෙක් වේව'යි අනිඥ ඥානයෙන් ඉටයි. එකල්හි අහසෙක් වෙයි. ඒ ඍද්ධිමත් තෙමේ නිත්ති-ප්‍රාකාර-පර්වත-අපරභාගයන්ට නො ලැගී නො ගැටී යයි. සෘඩි නැති මනුෂ්‍යයන් ද, කිසිවකින් මුවහ නො කළ වට නො කළ තන්හි නො ගැටෙමින් යන්නාක් මෙනි" යනු මෙහි භාව යි.

කරුණු මෙසේ හෙයින් තිරොකුඩ්ඩාදි ගමන පාටිහාරිය කරණයෙහි ආකාශ කසිණයට සමවැදීම අවශ්‍යයෙන් කිව යුතු ය.

විශෙෂ:-"ආකාස කසිණ වසෙන පවිජ්ඣනනං විවට කරණං, පථවි කසිණ වසෙන එකොපි ලුත්වා බහුධා හොති'ති ආදිභාවෙ

[1]පටි: ම: ඉඩ්ඩිකථා 386 පිට බුරුම

ආකාසෙවා උදකෙවා පඨවිං නිමිමිනිත්වා පදසා ගමනං ඉජ්ඣති"[1] 'ප්‍රතිඝඡ්ඣනය විවෘත කිරීම ආකාස **කසිණ** වසයෙන් ද, එකකු වැ බොහෝ වීම් ආදිය ද අහසෙහි හෝ, ජලයෙහි හෝ, පොළොව මවා පයින් යැම, පඨවි **කසිණ** වසයෙන් ද, සමෘඩ වේ, යන ප්‍රකීර්ණකයෙන් ද, එහෙයින් මෑ සමඨිතය වේ.

ප්‍රශ්නයෙකි:- අධිෂ්ඨානකොට යන්නා වූ ඒ භික්ෂුව අතුරෙහි පණිතයක් හෝ, වෘක්ෂයක් හෝ නැංගේවී නම්! නැවත ධ්‍යානයට සමවැද අධිෂ්ඨාන කළ යුත්තේ ද

පිළිතුර:- එසේ අධිෂ්ඨාන කළ ද දෙසෙක් නැත්තේ සි. දෙවිටක් බඳනා ලද්ද දළුනි **කරණය** වන බැවින් මනාව බඳනා ලද්දේ වෙසි. එහෙත් එයින් ප්‍රයෝජනයක් නැති.

කුමක් මෙන් ද ඒ වනාහි උපාධ්‍යායයන් ඉදිරියෙහි නිස සමාදන් වන්නාක් මෙනි. (උපාධ්‍යාය ග්‍රහණයෙන් මෑ නිස සමාදානය වන හෙයින් නිස සමාදන්වීම නිෂ්ඵල යැ.)

පළමු අධිෂ්ඨානයෙන් පණිත වෘක්ෂාදිය අහස්වන හෙයින් නැවත සමවැද ඉටිමෙන් ප්‍රයෝජන නැති.

විශෙෂ:- අන්‍ය ඍඩිමතකු ගේ නිර්මිතයට වඩා පළමු නිර්මිතය බලපවත්වන හෙයින් දෙවනු වැ ඍඩි ප්‍රාතිහාර්‍යය **කරන්නහු** විසින් පළමු ඍඩිමත් හට උඹින් හෝ, යටින් හෝ යා යුතුසි. **පඨවියාපි උම්මුජ්ජ නිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ.**[2] **"ජලයෙහි මෙන් පොළොවෙහි ද ඉල්පීම් - ගැලීම් කෙරේ."**

මෙසේ **කරනු** කැමැත්තෝ ආපො **කසිනයට** සමවැ ද එයින් නැඟී, 'මෙතෙක් තන්හි පොළොව දිය වේවා' සි පිරිසිඳ පරිකර්මකොට ඉටිය යුතු ජලය වෙසි. හෙතෙමේ ඒ ජලයෙහි ඉල්පීම් - ගැලීම් කෙරේ.

'පකතියා ආපොකසිණ සමාපත්තියා ලාභී හොති. පඨවිං ආවජ්ජති. ආවජ්ජිත්වා යථොත අධිට්ඨාති. උදකං හොතූ ති. උදකං හොති"[2]

"ප්‍රකෘතියෙන් (සවභාවයෙන්) ආපොකසිණ **සමාපත්ති** ලාභී ඍඩිමත් තෙමේ, පොළොව ආවර්ජනා කෙරෙ සි. එයට අනතුරු වැ අභිඥා ඥානයෙන් පිරිසිඳ, 'මෙතෙක් තන්හි ජලය වේවා සි අධිෂ්ඨාන කර සි. ඒ අධිෂ්ඨානය සමග මෑ ජලය වේ.' ඍඩිමත්

[1]වි: ම: ටීකා 392 පිට. [2]පටි: ම: ඉඩිකථා 386 පිට

නො වූ මිනිසුන් ප්‍රකෘතියෙන් දිය යට කිමිදීම, උඩ නැගීම කරන්නා සේ, ඒ සෘඞ්මත් තෙමේ, පොළොව යට කිමිදීම හා උඩ මතුවීම කෙරේ. ප්‍රකෘති ජලයෙහි ගැලීම- ඉල්පීම කරන්නාක් මෙනි.

(පිටත බලාසිටිනවුනට එහි පොළොව පැනෙනත්, සෘඞ්මත් ධ්‍යානලාභියාට ජලය වේ.)

හුදෙක් ගිලීම්- ඉල්පීම් මතු නොවෙ යි. නැම- බීම- මුව දෙවීම- බඩු දෙවීම- ආදි කැමැති යමක් කර යි. එසේ මැ, ජලය පමණක් නො ව, ඇපො අධික ගිතෙල්-- තෙල්- මී පැණි, ආදීන් කැමැති දෙයක් මැ මෙතෙක් වේවා' යි පිරිසිඳින ලද පමණක් අධිඨාන කළ පරිදි වේ.

ඉන් අධිඨානයසේ භාජනයකට ගන්නා ලද ගිතෙල්, ගිතෙල් මැ වෙ යි. තෙල් ආදිය, තෙල් ආදිය මැ වෙයි. ජලය ජලය මැ වේ. එහි තෙමෙනු කැමැත්තේ මැ තෙමෙ යි. නො තෙමෙනු කැමැත්තේ නො තෙමේ යි. ඒ සෘඞ්මත් හට මැ එය ජලය වෙයි. සෙස්සනට පොළොව මැ වෙයි. එහි මිනිස්සු පයින් හෝ, යාන වාහනාදීන් හෝ යති. කෘෂිකර්මාදිය හෝ කෙරෙත්. ඒ සෘද්ධිමත් තෙමේ අන්‍යයන්ට ද, 'ඒ ජලය වේවා' යි කැමැති වේනම් ඔවුන්ට ද ඒ ජලය වේ. පරිවෙජද කළ කාලය හැර, ප්‍රකෘතිඥයන් ඒ පෙදෙසෙහි වූ ජලය තිබිය දී, සෙස්ස පොළොව වේ.

"උදකෙපි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථාපි පඨවියං"[1]

"ජලයෙහි ද පොළොවෙහි මෙන් නො සැලෙමින් යයි"

මෙසේ යනු කැමති සෘඞ්මත් තෙමේ, පඨවි කසිණයට සමවැද, එයින් නැගී, මෙතෙක් තැන ජලය පොළොව වේවා'යි පරිවෙජද කොට අධිට්ඨාන කළ යුතු. අධිට්ඨානය සමග මැ පිරිසිඳි ප්‍රදේශයේ ජලය පොළොව වේ. හෙතෙමේ එහි නොබිඳෙන සේ යයි.

පකතියා පඨවි කසිණ සමාපත්තියා ලාභී හොති. උදඤං ආවජ්ජති. ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති, පඨවී හොතූ'ති. පඨවී හොති. සො අභිජ්ජමානෙ උදකෙ ගච්ඡති."[1]

'සවභාවයෙන් පඨවි කසිණ සමාපත්ති ලාභියෙක් ජලය ආවජ්ජා කොට අභිඥා ඥානයෙන් 'පොළොව වේවා' යි අධිෂ්ඨාන කර යි. ඒ පිරිසිඳිනා ලද ප්‍රදේශයෙහි පොළොව වේ හෙතෙමේ ඒ ජලයෙහි නො බිඳෙන සේ පොළොවෙහි මෙන් යයි. (සාමාන්‍ය මනුෂ්‍යයන් ප්‍රකෘති පොළොවෙහි යන්නාක් මෙනි.)

---

[1]පටි: ම: ඉඞ්ඛිකථා 386 පිට

යාම පමණක් නොව, ඊම්- සිටීම්- නිදීම් ආදී කැමැති හැම ඉරියව්වක් ම පවත්වයි. හුදෙක් පෘථිවිය පමණක් නොව, මැණික්- රන්- පළිඟු- වෘක්ෂ ආදීන් අතුරින්, කරනු කැමැති යමක් යමක් ඉටානම් ඒ සියල්ලක් වේ. සෙස්සන්ට වූකලි ජලය මෑවෙයි. මස්- කැසුබු- දියකා- ආදි ජලචර සතුන්ටයෝ ද, කැමැති සේ හැසිරෙති. ඒ සෘද්ධිමත් තෙමේ සෙසු ජනයාටත් එය පොළොවක් කරනු කැමැත්තේ නම් පොළොවක් ම කර යි. පරිච්ඡින්න කාලය අවසානයෙහි පෙරසේ ම ජලය වේ.

ආකාසෙපි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛිසකුණෝ[1]

"අහසෙහි ද පයඞ්කයෙන් යන්නේ වෙයි. පියාපත් ඇති පක්ෂියකු මෙන."

මෙසේ කරනු කැමැති සෘද්ධිමත් තෙමේ පඨවි කසිණයට සමවැදී එයින් නැඟී, (කුරුල්ලකු සේ) හිඳගෙන මෑ යනු කැමැත්තේ නම්, පයඞ්කයක් පමණ තැන පිරිසිඳ **පරිකම්ම** කොට පෙර සේ අධිට්ඨාන කළ යුතු. (එසේ වෙයි.) වැදහෙව යනු කැමැත්තේ නම්, ඇඳක් පමණ තැන පිරිසිඳ **පරිකම්ම** කළ යුතු. පයින් යනු කැමැත්තේ මාගී ප්‍රමාණ ප්‍රදේශයක් පරිච්ඡේද කොට **අධිට්ඨාන** කළ යුතු. අධිට්ඨානය සමග පොළොව ම වේ.

'සභාවයෙන් පෘථිවි කසිණ සමාපත්තිලාභී තෙමේ, ආකාසය ආවජ්ජනා කොට අනිඤ්ජ ඤානයෙන් 'පෘථිවිය වේවා' යි අධිට්ඨාන කෙරේ. එහි අහස පොළොව වේ. ප්‍රකෘති පොළොවෙහි සාමාන්‍ය මිනිසුන් සේ, ඒ සෘද්ධිමත් තෙමේ ආකාශයෙහි සක්මන් කරයි., හිඳියි., සිටියි., ශයනය ද කෙරේ.'

විශෙෂ:- මෙසේ අහසින් යන්නහු ප්‍රථමයෙන් දිවැස් ඇත්තකු ද වුව මැනව. කුමක් හෙයින් ද යත්:- ඒ අහසින් යා යුතු මාගීය අතර තුර ප්‍රකෘතියෙන් හටගත් වෘක්ෂාදිය හෝ වෙයි. දිව්‍ය නාග- සුපණ්ණාදීහු ඊෂ්‍යාපරවශවැ මවන්නාහු හෝ වෙති. එබඳු උපද්‍රවාදිය දක්නා පිණිස ය. එසේ වෘක්ෂාදියක් වුව පාදක ධ්‍යානයට සමවැද, එයින් නැගිට 'ආකාශයක් වේවා' යි **පරිකම්ම** කොට අධිට්ඨාන කළ යුතු.

මතභෙදයෙකි:- "එසේ අතරතුර සමවතට සමවදනේ කවර හෙයින් ද මොනවට සිත එකඟ කරන ලද හෙයින් ඒ ධ්‍යාන ලාභියා විසින් 'ආකාශය වේවා' යි ඉටන ලද තැන ආකාශය මෑ

[1]පටි: ම: ඉඞ්ඝථා 386 පිට

වන්නේ නො වේ දැ" යි **තිපිටක චූලාභය සථවිරයෝ** වදළහ. සැබව, එහෙත් තිරොකුඩ්ඩ ප්‍රාතිහාර්‍යයෙහි කී පරිදි පිළිපැදිය යුතු ය.

තවද අවකාශ ඇති තැනෙක බැසීම සඳහා මේ ධ්‍යාන ලාභියා විසින් දිව්‍යචක්ෂුරනි ඥනය ලැබිය යුතු ය. මොහු තහත තොට-ගම්දෙර ආදි මහාජනාකීර්ණ ස්ථානයෙක බැස්සේ වීනම් මහ ජනයාට ප්‍රකට වන හෙයිනි.

"ඉමෙපි චන්දිම සූරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරිමසති. පරිමජ්ජති"[1]

'මේසා මහත් සෘඩි ඇති මේසා මහත් අනුභාව ඇති, මේ සඳ හිරු දෙදෙනා ද අත්ලෙන් අල්ව සි පිරිමදි සි.

මහිද්ධිකෙ = දෙසාලිස් දහසක් යොදුන් මත්තෙහි හැසිරීමෙන් මහත් සෘඩි ඇති

මහානුභාවෙ = එකවට තුන් දිවසිනකට ආලෝක කිරීමෙන් මහානුභාව ඇති

පරිමසති = එක් ප්‍රදේශයක් හෝ, හාත්පසින් හෝ අල්ව සි.

පරිමජ්ජති = කැටපත් තලයක් සේ පිරිමදි සි.

(මෙසේ මත්තෙහි හැසිරීමෙන් හා, ආලෝක කිරීම් වශයෙන් මහත් සෘඩි ඇති, එහෙයින් මෑ මහත් අනුභාව ඇති සඳ-හිරු දෙදෙනා ය.)

විසඛර:- මේ සෘඩිමත්හු ගේ ධ්‍යානය **අභිඥා පාදක** වශයෙන් සමෘද්ධ වන්නේ ය. **කසිණ** සමාපත්ති වසයෙන් නියම නැති.

"ඉමෙ චන්දිම සූරියෙ - පරිමජ්ජති'ති. ඉධ සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො චන්දිම සූරියෙ ආවජ්ජති. ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති, හත්ථපාසෙ හොතූ'ති හත්ථපාසෙ හොති. සො නිසින්නකොවා' නිපන්නකොවා' චන්දිම සූරියෙ ආමසති. පරාමසති. පරිමජ්ජති."[1] 'මේ සත්තෙහි සෘඩිමත්වූ, චිත්ත වසඟයට පැමිණ වූ ධ්‍යාන ලාභී තෙමේ, සඳ-හිරු ආවර්ජනා කොට අභිඥා ඥනයෙන් 'චන්ද සූර්‍යයන් අත්පසෙහි වෙත්ව' යි අධිෂ්ඨාන කර සි. අධිෂ්ඨානය සමග මෑ අත්පසෙහි වෙති.'

---

[1]පටි: ම: ඉද්ධිකථා. 387 පිට.

ඉක්බිති හෙතෙමේ හිඳ හෝ, හෙව හෝ, සඳ-හිරු අතින් අල්ව සි. ඔබ-මොබ අත යවා පිරිමදි සි. සෘඩි නැති සාමාන්‍ය මනුෂ්‍යයකු සවභාවයෙන් අත් පස වූ රූපාදියක් අතින් අල්වන්නාක් මෙනි.

හෙතෙමේ සඳ-හිරු වෙතට ගොස් අල්වනු කැමැත්තේ නම් එසේත් කරන්නේ ය. මෙහි ම සිට අල්වනු කැමැත්තේ නම් 'අත්පස වේව සි' ඉටා අධිඨාන බලයෙන් තුවටුයෙන් ගිලිහුණු තල් ගෙඩියක් මෙන්, වෙතට පැමිණි සඳ-හිරු පරාමර්ශනය කෙරේ. තමා සිටි තැනැ මැ සිට, සඳ-හිරු එහි මැ තිබිය දී අත දික්කොට හෝ, පරාමර්ශනය කෙරේ.

ප්‍රශ්නයෙකි:- එසේ කල උපාදින්නකය (තෘෂ්ණා දෘෂ්ටි දෙකින් මමායනය කරන ලද ප්‍රකෘති හස්තාය.) වැඩේ ද නැතහොත් අනුපාදින්නකය (ධ්‍යාන බලයෙන් පහළ වූ හස්තාය) වැඩේ ද

පිළිතුර:- උපාදින්නකය නිසා අනුපාදින්නකය වැඩෙ සි.

ත්‍රිපිටක චූලනාග ස්ථවිර මතය:- ධ්‍යාන ලාභී **මහණ** කෙසි සිදුරු ආදියෙන් නික්මෙන කල උපාදින්නක ශරීරය කුඩාවන්නේ නොවේ ද **මුගලන්** මහතෙරුන් මෙන් ආත්මභාවය මහත් කරනු කැමැත්තේ නම් උපාදින්නකය මහත් වන්නේ නොවේ ද යනුසි. මින් ශරීරය කුඩා කිරීමේදී උපාදින්නකය කුඩා වන බව හා, මහත් කිරීමේදී ද එසේ ම උපාදින්නකය මහත් වන බව ද මේ ස්ථවිර වාදයෙන් කරුණු ගෙන පා සම්මීනය කෙරේ.

මුගලන් මහතෙරුන් නන්දෝපනන්දයා දමනු පරිදි එයට සාධක යැ.

'එක් දිනෙක බුදුහු පන්සියයක් භික්ෂූන් කැටිව තව්තිසා දෙව්ලොව වඩනාසේක්, මහාමේරු නිතම්බයෙහි නා රජුන් ගේ විමාන මතුයෙන් වැඩියහ. එදින නන්දෝපනන්ද නා රජු ගේ ආපාන භූමියෙකි. නානා රසමසවුලෙන් සැරසූ ආපාන මණ්ඩපයෙහි දිව්‍ය රතන පර්‍යඞ්කයෙහි දිව්‍ය ශෙවතවර්ණය යට කාන්තා- යුවති- කන්‍යා යන ත්‍රිවිධ නාටිකාවන් හා නාග පිරිස පිරිවරා දිව්‍ය භොජන එළවා උපස්ථාන කරන සේ බල බලා සිටියේ ය. එකල භික්ෂූන් කැටිව තම විමන් මතුයෙහි වඩනා බුදුන් දැක, ''මේ මුඩු මහණහු 'අප ගේ භවන මතුයෙන් දෙවුලොව යම්හ' සි නික්මියාහු ය. මොවුනට 'අප මස්සකයෙහි පා ධූලි විසුරුවමින් යා නො දෙම්හ සි' මහමෙර පතුළට ගොස් මහා නාග වෙශය මවා ගෙන, මහමෙර සත්වරක් දරණ වැලින් වෙළා මුදුනෙහි

පෙණය තබා තව්තිසා භවනය යටිකුරු කොට පෙණයෙන් වසා නො පෙනෙන සේ කෙළේ ය. **එකල රට්ඨපාල** තෙරහු සවාමීනි! පෙර මෙහි 'මහමෙර පැනෙයි' 'මහමෙර බඳ පැනෙයි' 'තව්තිසා භවනය පැනෙ යි.' 'වෛජයන්ත ප්‍රාසාදය පැනෙ යි.' යනාදීන් එහි පැනෙන දෑ කියා, 'අද ඒ කිසිවක් නො පැනෙනුයේ කිම්දැ' සි බුදුන් විවාළහ. **රඤ්ඤාලය!** 'අද නෙපුපන්නදයා නොපට කිපී, මහමෙර වෙළා ඒ මතුයෙහි පෙණය තබා අහිකාර කොට සිටිනැ' සි, වදාළහ.

සවාමීනි! 'ඔහු දමනය කරමැ' සි කිහ බුදුහු නො අනුදත්හ. අනතුරු වැ **භද්දිය, රාහුලාදී** පිළිවෙළින් සියලු භික්ෂූහු විවාළහ. බුදුහු නො අනුදත්හ. අවසන්හි **මුගලන්** මහතෙරුන්, සවාමීනි! ඔහු දමනය කරමැ සි විවාළ කල **මුගලන!** 'දමනය කරව' සි අනුදත්හ, **මුගලන්** මහතෙරහු අත්බැව හැර මහා නාග වෙශයක් මවා ගෙන මහමෙර පතුළට ගොස්, නාගයා මතුයෙහි තුදුස් වරක් දරණ වැලින් වෙළා ඔහු පෙණය මතුයෙහි තම පෙණය තබා ගෙන මහමෙරට තදකොට සිටියහ. නාරජු දුමන්නට වන. **තෙරහු** ද දුම් නැගුහ. නා රජු ගේ දුම තෙරුන් නො පෙළා, එහෙත් තෙරුන් ගේ දුම නා රජු පෙළයි. නැවත නා රජ ගිනි ගත. **තෙරහු ද** ගිනි ගත්හ. නා රජු ගිනි තෙරුන් නො දවා **තෙරුන් ගේ** ගිනි නා රජ දව සි.

අනතුරු වැ නා රජ'මේ තෙමේ මා මහමෙර හා පෙළා-දුම්මා දව සි' 'මේ කවරෙක්දැ' සි සිතා, පින්වත! 'නෝ කවරෙහිද' සි විවාළේ ය. 'මම වන්නා නෑයය! **මුගලන් නම්** වෙමි' සි වදාළහ. සවාමීනි! තමා 'භික්ෂු වෙශයෙන් සිටිනු මැනැවැ' සි කී. **තෙරහු** භික්ෂු වෙශය ගෙන ඔහුගේ දකුණු කනින් ඇතුළු වැ වම් කනින් නික්මෙති. වම් කනින් ඇතුළු වැ දකුණු කනින් පිටවෙති. දකුණු නාසා සිදුරින් ඇතුළු වැ වම් නාසා සිදුරින් පිටවෙති. වම් නාසා සිදුරින් ඇතුළු වැ දකුණු නාසා සිදුරින් පිටවෙත්. අනතුරු වැ නයා මුව විවර කෙළේ ය. **එකල තෙරහු** මුඛින් කුසට ඇතුළු වැ කුස තුළ නැගෙන හිරිත් බටහිර දිගට සක්මන් කරති. බටහිරින් නැගෙනහිර දිගට සක්මන් කෙරෙත්.

එකල බුදුහු මොගගල්ලානය! සිහි ඇත්තේ වව. 'නාගයා මහා අනුභාව ඇත්තේය' සි වදාළහ. එකල **තෙරහු** සවාමීනි! 'ම විසින් සතර සෘඩි පාදයෝ වඩන ලදහ. නැවත නැවත වඩන ලදහ. ගමනට යානාවක් මෙන් ද, සිටීමට දාස්තුවක් මෙන් ද කරන ලදහ. නැවත නැවත පිහිටුවන ලදහ. පුරුදු

කරතලදහ. මොහවට ආරම්භ කරන ලදහ. ''සවාමීනි! මේ එක නාගයෙක්සිටීවා! ''මෙබදු නාගයන් සියයක් හෝ, දහසක් හෝ දමනය කරම්''යි වදුළහ.

එකල නා රජ පළමුවෙන් ඇතුළත වදනා මොහු නො දක්නා ලදහ. දැන් පිටතට නික්මෙන් ම 'දළ ඇතුළට ගෙන සඟවා කම්' යි සිතා, සවාමීනි! 'පිටතට නික්මෙව' මෙසේ මා නො පෙළාව' යි කී. ඉක්බිති **තෙරහු** පිටතට නික්ම සිටියහ. එකල නාගයා නාසාවාත යෑවී ය. **තෙරුන්** වහන්සේ චතුර්ධ්‍යානයට සමවැදුණු සේක. රෝමකූපයකු දු දැවීමට නො හැකි වි ය.

(**විශෙෂ:**- **භද්දියාදි සථවිරයෝ** මේ තාක් සියල්ල කිරීමෙහි සමර්ථයහ. එහෙත් මේ **සථානයට** පැමිණ හෙවත් මේ නාසා වාතයෙන් නො පෙළීම සඳහා **ඛිපපනිසනති** භාවය යි කියන ලද වහා ධ්‍යානයට සමවැදීමෙන් අභිමතාර්ථ සාධනයට අසමර්ථයහ. එහෙයින් **බුදුහු** ඔවුනට අවසර නුදුන්හ.)

අනතුරු වැ මේ **තෙරිඳු** මහත් අනුභාව ඇත්තෙක. එහෙයින් මාගේ 'නාසා වාතයෙන් රෝමකූපයකු දු සොළවා ලිය නො හැකිවීය' යි සිතී. **මහතෙරහු** මිනිසත් බව පියා, මහත් ගුරුළු වෙසක් මවා යුගාන්ත වාතය බඳු ගුරුළු වාතය දනවා නා රජු ලුහුබැන්දහ. නා රජ නාගාත්මය පියා මාණවක වෙසක් මවාගෙන ''සවාමීනි! නුඹ වහන්සේ සරණ යෙමි'' මා ගැන්තහුට සරණවනු මැනවැ' යි'' තෙරුන් වැන්දේ ය. මහතෙරහු, **එම්බා** නා රජ! **බුදුහු** වැඩියහ. මෙසේ එව, 'උන්වහන්සේ වෙත යම්හ යි'' නාරජ දමා **බුදුන්** වෙත පැමිණ වූහ. නා රජ **බුදුන්** වැඳ උන්වහන්සේ **සරණ** යෙමි' යි කී.

බුදුහු ''සුවපත්වා නා රජ'' යි වදුළහ. **ඉක්බිති භික්ෂූන්** පිරිවරා **අනේපිඬු** සිටාණන් ගෙට වැඩියහ. සවාමීනි! 'ඉතා දවල් වූයේ **කිමැ**' යි විචාළ සිටාණන්ට **මුගලන්** තෙරුන් හා නන්දොපනන්දයා අතරේ යුඬයක් වීය යි වදුළහ. සවාමීනි! ජය පරාජය කවුරුන්ට වීදැ' යි විචාළහුට **මුගලන්** තෙරුන්ට ජය ය. නන්දොපනන්දයාට පරාජය වීය යි වදුළහ. සවාමීනි! එසේ වත්නා සතියක් තෙරුන් වහන්සේ ගේ 'ජය පූජා පවත්වම්' යි, සතියක් මාගේආරාධනය පිළිගත මැනවැ' යි කියා සතියක් මුළුල්ලෙහි **බුදුපාමොක්ෂ** පන්සියයක් **සඟනට** මහත් පූජා සත්කාර කෙළේ ය.

මෙසේ මහත් වූ නන්දොපනන්ද නාග දමනයෙහි ලා **මුගලන්** තෙරහු මහත් වූ ආත්ම භාවය මැවීම සඳහා ම **''සාධිමත් භික්ෂුව උපාදිනනක ශරීරය ඇසුරු කොට අනුපාදිනනක ශරීරය වඩනේය''** යි කී බව් දතමනා ය. මේය මෙහි යුකතිය නම්.

ඒ සෘද්ධිමත් තෙමේ සඳහිරු පරාමර්ශනය කිරීම පමණක් නොව කැමැත්තේ නම්! සඳ හිරු පාපුටුවක් හෝ කොට පා තබා. පුටුවක් කොට හෝ හිඳී. ඇඳක් කොට හෝ හොවී. එල්ලෙන පුටුවක් කොට හෝ එල්බ ගනී.

එක් භික්ෂුවක් පමණක් නොව, **සිය** දහස් ගණන් **භික්ෂූහු** එසේ කරතුදු ඒ ඒ **භික්ෂුවට** එකී සියල්ල සමෘද්ධ වේ. එසේ මැ සඳ හිරු දෙදෙනා ගේ ගමනාගමනාදිය ද සිදු වේ.

නිදර්ශනයෙකි:- තලි දහසෙක්හි දිය පුරවා තුබූ කල හැම තලියක ම සඳමඬල වෙන වෙන මැ පැනේ. සඳේ පියවි ගමන ද, එළිය පැතිරීම ද, එසේ ම සිදුවේ. මෙහි ප්‍රාතිහාර්‍යය ද එසේම ය. **"යාව බ්‍රහ්මලෝකාපි කායෙන වසං වත්තෙතී"**[1] **'ඒ සෘද්ධිමත් තෙමේ බඹලොව තෙක් කයින් වසයෙහි පවත්වා සී'** හුදෙක් මින් බඹලොව පමණක් අදහස් නො කෙරේ. අනික් සථාන පිළිබඳවද එසේම ය. ඉතා දුර දැක්වීම පිණිස බ්‍රහ්ම ලොකය මෙහි දැක් වී. ඒ චිත්ත වසයට පැමිණි සෘද්ධිමත් යෝගී තෙමේ බඹලොව යනු කැමැත්තේ නම්! දුර පවත්නා වස්තූහු 'ළං වෙත්වා' සි ඉට සි. ඒ හා සමග මැ සමීප වෙයි. 'සමීපයෙහි වසතු දුර වේ වා' සි දුරු කොට ඉටා නම් ඒ සමග ඔබ දුරුවෙ සි. බොහෝ වසතු 'සවල්ප වේවා සි' ඉටා නම් ඒ සමග මැ සවල්ප වෙ සි. සවල්ප දෙය 'බොහෝ වේවා සි' ඉටා නම් ඒ සමග මැ බොහෝ වෙ සි. දිවැසින් ඒ බඹුන් ගේ රූප දක්නා කැමැත්තේ නම් රූප දකි සි. ශබ්ද අසනු කැමැත්තේ නම් ශබ්ද අස සි. චෙතෝ පරිය ඤාණයෙන් සිත් බලනු කැමැත්තේ නම් සිත් බල සි. හෙතෙමේ දෘශ්‍යමාන කායයෙන් බඹ ලොව යනු කැමැත්තේ නම් ශරීරයා ගේ වශයෙන් සිත පිරිතමා, ශරීරයා ගේ වශයෙන් සිත අධිෂ්ඨාන කොට සුඛ සංඥාවට ද, ලඝු සංඥාවට ද, වැද දෘශ්‍යමාන ශරීරයෙන් බඹලොව යසි.

නො පැනී බඹලොව යනු කැමැත්තේ නම් චිත්ත වශයෙහි කය පිහිටුවා චිත්ත වශයෙහි කය අධිෂ්ඨාන කොට සුඛ සංඥාවට ද, ලඝු සංඥාවට ද වැද නො පැනෙන කයින් බඹලොව යසි. ඒ සෘද්ධිමත් තෙමේ බ්‍රහ්මයන් ඉදිරියෙහි මනොමය වූ සියලු අඞග-ප්‍රත්‍යඞගයෙන් සම්පූර්ණ වූ නො පිරිහුණු ඉඳුරන් ඇති රූපයක් නිර්මිත කරන්නේ ය. ඒ සෘද්ධිමත් තෙමේ සක්මන් කෙරේ නම් නිර්මිත රූපය ද සක්මන් කෙරේ. ඒ සෘද්ධිමත් තෙමේ සිටී නම්-හිදී නම්, හොවී නම් නිර්මිත රූපය ද සිටී, හිදී, හොවී,

[1]පටි: ම: ඉද්ධිකථා 387 පිට

ඒ සෘද්ධිමත් තෙමේ දුම්‌ නම්‌, දිළිහේ නම්‌, බණ කියා නම්‌, පැන විචාරා නම්‌, පැන විසඳූ නම්‌ නිර්මිත රූපය ද දුම යි, දිළිසෙ යි, බණ කිය යි, පැන විචාර යි, පැන විසඳ යි.

ඒ සෘද්ධිමත් තෙමේ ඒ බ්‍රහ්මයා සමග සිටී නම්‌,- කථාකෙරේ නම්‌,- සාකච්ඡා කෙරේ නම්‌,- යමක් යමක් කෙරේ නම්‌ නිර්මිතයා ද ඒ සියල්ල කෙරේ.

දුර වූ දෙය ද සම්‌පයෙහි වන සේ අධිෂ්ඨාන කෙරේ.

පාදකධ්‍යානයෙන්‌ නැගී දුර පිහිටි බ්‍රහ්ම ලොක - දිව්‍ය ලොකාදියක්‌ 'ලඟ වේවා' යි ආවර්ජනා කොට, අනතුරු වැ පිරියම්‌ කොට නැවත එම ධ්‍යානයට සමවැදී 'ළං වේවා'යි අභිඥා ඥානයෙන්‌ ඉට යි. ඒ සමග ම සම්‌පයෙහි වේ.

(මෙහි **"අපි"** යනු සමූචචයාර්ථයෙහි වන හෙයින්‌ මෙහි නොකී අධිෂ්ඨාන සෘද්ධියෙන්‌ නිපදවිය යුතු, සියල්ල සංග්‍රහ වේ. සෙසු පදයෙහි ද මේ ක්‍රමය මෑ යි.)

දුර වූ දැය ළංකොළේ මෙසේ සිඃ- බුදුහු යමක ප්‍රාතිහාර්‍යාව- සානයෙහි දෙව් ලොව වඩනා සේක්‌, මහමෙර ද, යුගන්ධරය ද, සම්‌පයෙහි කොට පෘථිවී තලයෙන්‌ එක්‌ පයක්‌ යුගන්ධරයෙහි තබා දෙවෙනි පය මහමෙර මතුයෙහි තුබූ සේක. දෙවෝරෝහණ- යේදී **මුගලන්‌ මහතෙර** සැවැත්‌ නුවරින්‌ දවල්‌ බත්‌ කා පිටත්‌ වූ දෙලොස්‌ යොදුනක්‌ පැතිර සිටි පිරිස, තිස්‌ යොදුනක්‌ දුරවූ සකස්‌ පුර මඟ ළඟට ක්ෂණයකින්‌ පැමිණ වී.

ලක්‌දිව චූලඝමුද්‍ද නම්‌ තෙරුන්‌ වහන්සේ දුර්භික්ෂ කාලයෙහි උදය තමා වෙත පැමිණි සත්‌ සියයක්‌ **භික්ෂූන්ට**, ලක්‌දිවින්‌ පිණ්ඩපාතය නො ලැබිය හැකි බව ද, දඹදිව පැළලුප්‌ නුවරින්‌ ලැබෙන බව ද, දිවැසින්‌ දැක පා සිවුරු ගන්වා ඇවැත්නි! 'පිඬු සිඟා වඩිමු යැ' යි අමතා පොළොව හකුළා පැළලුප්‌ නුවර වැඩිසේක.

භික්ෂූහු - සවාමීනි! මේ කිතම්‌ නගරයක්‌ ද
මහතෙර - ඇවැත්නි! පැළලුප්‌ නුවර ය.
භික්ෂූහු - පැළලුප්‌ නුවර දුර නො වේ ද
මහතෙර - ඇවැත්නි! **මහලු තෙරහු** දුරවූ දැය ද ළං කෙරෙති.
භික්ෂූහු - මහ මුහුදු කොහි ද
මහතෙර - අතර ඉක්‌ම වූ ඒ නිල්‌ කුඩා ඇල ය.
භික්ෂූහු - මුහුදු මහත්‌ නො වේ ද
මහතෙර - **මහලු තෙරහු** මහත්‌ දැය කුඩා ද කෙරෙති.

නිස්සඳනත තෙරණුවෝ ද සවස දිය නා උතුරු සඟළ පොරවා සිටියෝ, **මහා බෝධිය** වඳිනා කැමැත්තෝ දුරවූව ළං කළහ.

ළංවූ දෑය දුරු කිරීම, බුදුහු තමා ගේ හා අංගුලිමාලයා ගේ අතර ළංවුව ද දුරු කළ සේක.

බොහෝ දෑය ටික කිරීම, එක් දිනක් **මහසුප්** මහතෙරුන් වහන්සේ බුදුන් කැටිව වඩනා කල රජගහනුවර කුමාරිකාවෝ පන්සියයක් නැකැත් දිනයෙක වඳ පූජයන් ගෙන නැකැත් කෙළි පිණිස යන්නෝ බුදුහු දැක එය නුදුන්හ. පසුව වඩනා **මහසුප්** තෙරුන් දැක අපගේ ආර්‍යියන් වහන්සේ වඩනා සේක. 'කැවුම් පුදමුයැ සි' සියලු කැවුම් ගෙන එළඹුනාහ. තෙරුන් වහන්සේ පාත්‍රය මැත් කොට සියල්ල එක පාත්‍රයක් පිරෙන පමණ කළ සේක. බුදුහු තෙරුන් වඩනා පෙරමඟ බලමින් වැඩහුන්සේක. **තෙරහු** ගෙනවුත් බුදුනම පිරි නැමූහ.

ඉල්ලිස සිවු වසතුවෙහි ද, බොහෝ දෑය ටික කෙළේ ය. **මහසුප්** මහා ස්ථවිරයෝ ටික දෑය බොහෝ කළහ.

කාකවලිය වසතුවෙහි **මහසුප්** තෙරුන් වහන්සේ සත් දවසක් සමවත් සුවෙන් වැස එයින් නැගී දිළින්දන්ට සංග්‍රහ කරනු පිණිස කාකවලිය නම් දුගියා ගේ ගෙදොර වැඩ සිටියහ. ඔහු අඹුව තෙරුන් දැක හිමියාට පිළියෙළ කළ ලුණු නැති ඇඹුල් කැඳ පාත්‍රයෙහි බහා ලූ හ. **තෙරුන් වහන්සේ** එය ගෙන බුදුන් අත තැබූ සේක. බුදුහු එය මහා භික්ෂු සංඝයාට පොහෝනා සේ ඉටූහ. ඒ සියල්ල පොහෝනා පමණ විය. කාකවලිය තෙමේ ද, සත්වන දින සිටු තනතුර ලැබී.

එපමණක් නොව මිහිරි දෑ නො මිහිරි කිරීම්, නො මිහිරි දෑ මිහිරි කිරීම්, ඈ රිසියෙන තාක් කෙරෙති. **මහා අනුල** ස්ථවිරයෝ බොහෝ භික්ෂූන් පිඬු සිඟා වියළි බත් මැ ලැබ ගංතෙර හිඳ වළඳන්නවුන් දැක 'ගඟ දිය ගිතෙල් බඳුනක් වේවා සි' ඉටා **හෙරණුන්ට** හැඟවූහ. ඔහු ඒවා බඳුනින් ගෙනවුත් භික්ෂූන්ට පිළිගැන්වූහ. සියලු භික්ෂූහු මිහිරි ගිතෙල් හා බත් වැළඳුහ. **දිබ්බන චක්ඛුනා,** මෙහි මැ සිටැ කසිණාලෝකය වඩා, ඒ බ්‍රහ්මයා ගේ රූපය දකී. මෙහි ම සිට ඒ බ්‍රහ්මයා ගේ සියලු ශබ්දය අස සි. සිත ද පිරිසිඳ දනී.

කාය වසෙන චිත්තං පරිණාමෙති[1] ශරීරයා ගේ වශයෙන් සිත පිරිනමන්නේ ය' යනු චාතුර්භෞතික රූපකායයා ගේ වශයෙන් සිත පිරිනමන්නේ මෙසේ ය. පාදකධ්‍යාන චිත්තය ගෙන ශරීරයෙහි ආරොපණය කොට 'මේ සිත කය අනුව ලැසි වැ යන්නක් වේවා' සි චිත්ත ගතියවූ ශීඝ්‍ර ගමන වලකා, කාය ගතියවූ ලැසි ගමන පිහිටුව සි.

"උපෙක්ඛාව ඤාණ බැවින් සුඛය සි" කියනු ලැබේ. උපෙක්ඛා සහගත චතුර්ථධ්‍යාන සම්ප්‍රයුක්ත වූ සංඥව බර වූ නීවරණයන් ගෙන් ද, ඕදාරික වූ විතර්කාදියෙන් ද, විශෙෂයෙන් මිදුණු හෙයින් ලඝු සංඥය සි කියනු ලැබේ. ඒ සුඛ සංඥවට හා ලඝු සංඥවට බටුවා වූ මේ ධ්‍යාන ලාභියා ගේ චාතුර්භෞතික වූ ශරීරය පුළුන් පෙදක් මෙන් සැහැල්ලු වේ. එහෙයින් සුළහෙසි ලූ පුළුන් පෙදක් සේ සැහැල්ලු වැ, පෙනෙන සිරුරින් යුතු වැ බඹ ලොවට යසි. මෙසේ යනුයේ, රිසියේ නම් **පඨවි කසිණ වසයෙන්** අහසෙහි මහක් නිර්මිත කොට ගෙන එහි පයින් ම යසි. ඉදින් රිසියේ නම් **වායො කසිණයට** සමවැද වාතයක් නිර්මිත කොට ගෙන පුළුන් පෙදක් සේ වාතයෙන් යසි.

විශෙෂ :- මෙහි වූ කලී 'යනු කැමැත්ත මැ' පමණි. යනු කැමැත්ත ඇති කල මෙසේ කළ චිත්තාධිඨාන ඇතියේ ඒ අධිඨාන වේගයෙන් මැ උඩට නගන ලද්දේ, දුන්නෙන් නගන ලද ඊතලයක් සේ දැශ්‍යමානව මැ යන්නේ ය.

චිත්ත වසෙන කායං පරිණාමෙති[1] "කය ගෙන සිතෙහි නංව සි.

ඒ මෙසේ සි:- කය ගෙන සිතෙහි නැංවීමෙන්, සිත අනු වැ කය සීඝ්‍රව ගෙන ගමන් කරව සි. සිතෙහි ගමන සීඝ්‍ර හෙයිනි. පෙර කී සේ රූප කායාලම්බනික ව උපන් සෘද්ධි චිත්තය හා සම්ප්‍රයුක්ත වූ සුඛ සංඥවට ද, ලඝු සංඥවට ද, බසී. හේ චිත්ත ගතික මැ වේ.

මෙසේ සිත අනු වැ නො පෙනෙන සිරුරින් යනුයේ වෙසි.

ප්‍රශ්නයෙකි :- එසේ යනුයේ ඒ අධිඨාන චිත්තයා ගේ උත්පාදක්ෂණයෙහි යා ද, නොහොත් ස්ථිතික්ෂණයෙහි හෝ භඞ්ගක්ෂණයෙහි හෝ යා ද,

පිළිතුර :- ඒ ක්ෂණත්‍රයෙහි මැ යා යැයි එක් අටුවා ඇදුරු කෙනෙක් කියති. මේ වූ කලී ගමනාරම්භය සඳහා කියන ලදී. ගමනාවසානය නො වේ.

---

[1] පටි: ම: ඉද්ධිකථා 387 පිට

විභාවරඃ- කාය වශයෙන් සිත පැවැත්වීමේදී ලැසි වැ පවත්නා කය අනුව සිඝ්‍රව පවත්නා සිත සියලු තැන්හි එසේ නො පවතී 'මේ සිත මේ කය සේ පවතීවා' යි අධිඨානයෙන් ඒ කයට අනුවතීක වැ ඒ අධිඨාන කළ සථානයට පැමිණෙකතාක් කාය ගතියට අනුකූල වැ චිත්ත පරම්පරා වශයෙන් පැවතීම හේතු කොට සිත කාය ගතියට පිරිනැමීම වේ.

'මේ කය මේ සිත මෙන් පවතීවා'යි අධිඨානයෙන් පළමු කොට පෙර කී සේ සුඛ-ලඝු සංඥාවන් සම්පාදනය කළ හෙයින් නො වැඩූ ඉදධිපාද ඇතිඅවුනට සේ ලැසිවැ නො පැවතී, චිත්ත වාර කිපයකින් වහා අනිමිත සථානයට යම් සේ පැමිණේ ද, එසේ පවත්නා කය චිත්ත ගතියට පමුණුවන ලද්දේ ද වෙයි. **එක්** චිත්තක්ෂණයෙකින් කැමැති තැනට පැමිණීම නොවේ.

එහෙයින් මැ "ශක්තිමත් පුරුෂයකු වහා වක් කළ අතක් දික් කරන්නා සේ, දික් කළ අතක් වක් කරන්නා සේ දැ" යි මේ උපමා දැක්වීම නිෂ්පර්‍යාය වශයෙනි. (ටීකායෙහි මේ පිළිබඳ විසතරයෙක් වේ.[1])

මේ කියේ ගමන සඳහා යැ. ඉඳීම්, සිටීම් ආදිය ද මෙසේ මැ යි.

විශෙෂඃ- නිර්මිත රූපයෙහි වූ කලී ප්‍රසාද රූප-භාව රූපාදිය නැති. සෘඩිමත් තෙමේ සක්මන් කරනුයේ වී නම්, නිර්මිත ද සක්මන් කර යි' යනු **ශ්‍රාවක** නිර්මිතය සඳහා යැ. **බුදධ** නිර්මිතය වූකලී **භාග්‍යවතුන් වහන්සේ** යම්ක් යම්ක් කෙරෙත් නම් ඒ ඒ දෑය ද, උන්වහන්සේ යමක් යමක් කරවනු කැමැත්තෝ නම් ඒ ඒ දෑය ද කෙරේ.

ඒ 'සෘඩිමත් තෙමේ මිනිස් ලොව සිට **දිවැසින්** රූප දක්නේ ය' **දිව කනින්** ශබ්ද අසන්නේ ය' **'චෙතොපරියඤ්ඤණයෙන්** සිත දනගන්නේ ය' මෙ පමණෙකින් කයින් වසයෙහි පවත්නේ නො වෙයි. එසේ මැ 'ඒ යොගාවචරයා මිනිස් ලොව සිට, ඒ බ්‍රහ්මයා සමග සිටියි. කථා කරයි. සාකච්ඡා කරයි.' යන මෙ පමණකිනුදු කයින් වසයෙහි පවත්නේ නො වෙයි. එසේ මැ 'ඒ යෝගි තෙමේ දුර වූයේ ද ළං කොට අධිඨාන කරයි' යනාදීන් දැක් වූ පරිදි අධිඨාන කිරීමෙක් වෙයි ද, එපමණකිනුදු කයින් වසයෙහි පවත්නේ නො වෙයි. 'ඒ යෝගී තෙමේ දක්නා ලැබෙන කයින් බඹලොව යයි ද, එ පමණෙකිනුදු කයින් වසයෙහි පවත්නේ නො වෙයි. හෙතෙමේ ඒ බ්‍රහ්මයා ඉදිරියෙහි රූප නිර්මිත කෙරේ. යනාදීන් කී ආකාරයට පැමිණේ ද, එ පමණෙකින් කයින් වසයෙහි පවත්වාය' යි කියනු ලැබේ.

---

[1] වි: ම: ටීකා 397 පිට

'මේ සෘද්ධිමතා ය, මේ නිර්මිතයාගැ' යි දත නො හැකි පමණට සමත්වය නිසා ඇතැම් බ්‍රහ්මයින්ට සැක උපදවන හෙයින් එපමණෙකින් ම **මනොමය අධිෂ්ඨානය** නම් වේ.

පෙරකී සියල්ල එයට පූර්වභාග වශයෙන් කියන ලදි. මේය **අධිෂ්ඨාන ඍද්ධි** නම්.

විකුර්ණ ඍද්ධිය හා **මනොමය ඍද්ධිය** ද යි මේ දෙකම අධිෂ්ඨාන වශයෙන් සිද්ධ වේ. මේ එහි වෙනස යැ.

විකුර්ණ ඍද්ධිය කරන පරිදි:- "සො පකතිං වණ්ණං විජහිත්වා කුමාරවණ්ණං වා දස්සෙති, නාගවණ්ණං වා දස්සෙති. සුපණ්ණවණ්ණං වා දස්සෙති. අසුරවණ්ණං වා දස්සෙති. ඉන්දවණ්ණං වා, දෙවවණ්ණං වා, බ්‍රහ්මවණ්ණං වා. සමුද්දවණ්ණං වා, පබ්බතවණ්ණං වා, සීහවණ්ණං වා, වග්ඝවණ්ණං වා, දීපිවණ්ණං වා, දස්සෙති. හත්ථිම්පි දස්සෙති. අස්සම්පි, රථම්පි, පත්තිම්පි, විවිධම්පි සෙනාවූහං දස්සෙති."[1]

'ඒ ඍද්ධිමත් තෙමේ තමා ගේ ප්‍රකෘති වෙශය හැර කුමාර වෙශයක් දක්ව යි. නාග වෙශයක් හෝ, ගුරුළු වෙශයක් හෝ, අසුර වෙශයක් හෝ, ශක්‍ර වෙශයක් හෝ, දිව්‍ය වෙශයක් හෝ, බ්‍රහ්ම වෙශයක් හෝ, සමුද්‍ර වෙශයක් හෝ, පර්‍වත වෙශයක් හෝ, සිංහ වෙශයක් හෝ, ව්‍යාඝ්‍ර වෙශයක් හෝ, දීපි වෙශයක් හෝ මවා දක්වයි. තමා ඇතකු කොට හෝ, අන් ඇතකු මවා දක්ව යි. තමා අශ්වයකු කොට හෝ, අන්‍ය අශ්වයකු මවා දක්වයි. රථ සෙනඟක් හෝ මවා දක්වයි. පාබල සෙනඟක් හෝ මවා දක්ව යි. නානාවිධ සෙනා සන්නිවෙස හෝ මවා දක්වයි.'

මේ කුමාර වෙශාදීන් අතුරෙන් යමක් යමක් මවනු කැමැත්තේ නම් ඒ ඒ දෑය අධිෂ්ඨාන කිරීමෙන් එසේ කළ යුතු ය. මෙසේ අධිෂ්ඨාන කරනුයේ ද, පඨවි කසිණාදීන් අතුරින් යම් කිසි ආරම්මණයකින් අභිඥාපාදක ධ්‍යානයට සමවැද, එයින් නැඟී, තමා කුමාර වෙශයක් ආවර්ජනා කළ යුතු ය. එසේ ආවර්ජනා කොට පරිකර්මාවසානයෙහි තැවත සමවතට සමවැද එයින් නැඟී 'මෙබඳු කුමාරයෙක් වෙමි' යි අධිෂ්ඨාන කළ යුතු ය. ඒ අධිෂ්ඨාන සිත හා සමග කුමාරයෙක් වේ.

නිදර්ශන:- දෙව්දත් තෙර අජාසත් කුමරු පහදවා ගැනීමට මවාපෑන ලද කුමාර වෙශය මෙනි.[2] අන් සියලු තන්හි ද මෙසේ ය.

---

[1]පටි: ම: ඉද්ධිකථා 388 පිට. [2]චූ: ව: සංඝභෙදකඛන්ධකය 266

විශේෂඃ- "ඇතකු දක්වයි" යනාදිය තමා ඇතකු කොට දැක්වීම ද, පිටත ඇතකු මවා දැක්වීම ද සඳහා කියන ලදී. එහිලා ඇතෙක් වෙමි'යි නො ඉටා ඇතෙක් වේවා යි ඉටිය යුතු. අශ්වාදීන්හි ද, එසේම ය.

මේයැ විකුළිණ ඍද්ධි නම්.

මනොමය ඉද්ධිය

'මනොමය' කායයක් මවනු කැමැත්තේ පෙර කී සේ පාදකධ්‍යානයෙන් නැගී පළමුව තමා කය ආවජ්ජනා කොට යට කී සේ 'සිදුරක් වේවා' යි ඉටිය යුතු. එකල සිදුරක් වේ. නැවත සිදුර ඇතුළත අනෙක් කයක් ආවජ්ජනා කොට පෙර කී සේ මැ ඒ සිදුර ඇතුළෙහි එබදු 'කයක් වේවා'යි ඉටයි. ඒ යෝගී තෙමේ මුදු තණ ගසින් ඇද ගන්නා ගොබයක් මෙන් ද, කොපුවකින් ඇද ගන්නා කඩුවක් මෙන් ද, සැවයකින් පිටත නික්මෙන නයකු මෙන් ද, ඒ අනෙක් කය ඇද ගනී. එහෙයින් කියන ලදී.

"ඉධභික්ඛු ඉමමේකායා අඤ්ඤංකායං අභිනිම්මිණාති රූපිංමනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං. සෙය්‍යථාපි පුරිසොමුඤ්ජමහා ඊසිකංපවාහෙය්‍ය, තඤ්ඤේවමස්ස, අයං- මුඤ්ජා අයංඊසිකා අඤ්ඤංමුඤ්ජා අඤ්ඤංඊසිකා මුඤ්ජමහාඒව ඊසිකා පවාළහාති."[1]

"මේ ශාසනයෙහි ඒ ධ්‍යානලාභී භික්ෂු තෙමේ මේ කයින් සියලු අඞ්ග ප්‍රත්‍යඞ්ග ඇති, පරිපූර්ණ ඉන්ද්‍රිය ඇති, රූපවත් වූ සිතින් නිර්මාණය කරන ලද අනෙක් කයක් මවා දක්වයි. යම්කිසිවකු මුඤ්ජතෘණයෙන් ගොබයක් ඇදගන්නා මෙනි. ඕහට 'මේ මුඤ්ජතෘණ යැ' මේ ගොබයැ' මුඤ්ජතෘණය අනිකෙක. ගොබය අනිකෙක. 'මුඤ්ජතෘණයෙන් මැ ගොබය ඇදගන්නා ලද්දේය' යි මෙබඳු අදහසෙක් වේ" මේද එසේ මැයි.

මෙසේ මනොමය රූපය, ඍද්ධිමත්ත්‍ව හා සදෘශ මැ වේ ය යි, දක්වනු සඳහා මේ උපමා කියන ලදී.

මේයැ මනොමය ඍද්ධි නම්.

මෙතෙකින් හුදීජන ප්‍රමෝදය සඳහා කළ **විශුද්ධි මාර්ගයෙහි ඉද්ධිවිධ නිද්දේශ නම් දෙලොස්වන පරිච්ඡේදය සමාප්තයි.**

---

[1]පටි: ම: ඉද්ධිකථා 389 බුරුම

13. අභිඥා නිද්දේශය.

දිබ්බසොත කථාව (1)

'ඉඩ්විධ නිදේශයට අනතුරුවෑ අභිඥා උපදවන ක්‍රමය දැක්වීම් වශයෙන් **අභිඤ්ඤා පාළිය** දක්වන ලදී. එහිද ත්‍රිවිධ අභිඥා අතුරෙන් (එහි දක්වන ලද පරිදි) **දිබ්බසොත** ධාතුව පිළිබඳ දෙශනා ක්‍රමය ප්‍රථම කොට වදාරන ලදි.
ඒ මෙසේ ය.

"සො එවං සමාහිතෙ චිතෙන -පෙ- දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසකාය උභොසද්දෙ සුණාති, යෙ දූරෙ සන්තිකෙ චාති."[1] 'ඒ යොගාවචර භික්ෂුතෙමේ පෙර කී සේ සිත චතුර්ථධ්‍යාන සමාධීන් සමාධිමත් වූ කල්හි, -පෙ- පිරිසිදු වූ, මිනිස් කන්හි ශබ්ද ඇසීමේ ශක්තිය ඉක්ම සිටී, 'දෙවියන් ගේ සොතය වැනි හෙයින් දිබ්බසොතය'යි කියන ලද නුවණින් දිව්‍යමය වූ ද, මනුෂ්‍යමය වූ ද, උභය ශබ්දයන් අසා"යයි වදාරණ ලදී. (මෙහි පෙර කී අර්ථයන් හැර, විශෙෂ ස්ථාන මැ විස්තර කරනු ලැබේ.) එහි පදයක් පාසා විස්තර මෙසේ යි.

දිබ්බාය සොතධාතුයා= දෙව්ලොව වූවෝ දිව්‍යයෝ ය. ඒ දෙවියන් හට, ශ්‍රද්ධා බහුල භාවය, පරිශුද්ධ දෘෂ්ටිය, ආනිසංස ඇදහීම ය, යනාදි මනාව පැවැති පුණ්‍යකර්මයෙන් නිපන් හෙයින් ද, වා- පිත්- සෙම් ආදි පලිබෝධයන් ගෙන් මිදුණු හෙයින් ද, ඉතා දුරෙහි වූ ද, ඉතා සියුම් වූ ද, ශබ්ද ඇසීමට පවා සමර්ථ පසාද සොතධාතුව වෙයි.

එසේ මැ මේ **යෝගී භික්ෂුව ගේ** වීර්‍යාරම්භ වශයෙන් අභිමතාර්ථ සිද්ධ කරන හෙයින් වීර්‍ය්‍ය භාවනා නම් වූ කුශල භාවනාවෙන් නොහොත් ප්‍රධාන සංස්කාර සඞ්ඛ්‍යාත ඉඩ්පාද භාවනාවෙන් නිපන් ප්‍රකර්ෂය වූ උපක්ලෙශ විනිර්මුක්ත හෙයින් දුරයෙහි ද, සියුම් වූ ද, ආලම්බන පිළිගැනීමෙහි සමර්ථ හෙයින් දිව්‍ය ශ්‍රොතය වැනි වූයේ හෝ, දිව්‍ය විහාර සඞ්ඛ්‍යාත රූපාවචර සතර ධ්‍යානයට අන්තර්ගත වූ චතුර්ථධ්‍යානය නිසා ලබන ලද හෙයින් ද, දිව්‍යනම් වූ තතු සේ ශබ්ද සවභාවය අවබෝධ කරන හෙයින් සොත නම් වූ ද, ආත්මාදීන් ශූන්‍ය හෙයින්, හා සවලක්ෂණය දරන හෙයින් ද, ධාතු නම් වූ හෝ, හුදෙක් ඇසීම් මාත්‍රය කරන හෙයින් ශ්‍රොතය වැනි හෙයින් ශ්‍රොත ධාතු නම් වූ දිව්‍ය ඥානයෙන් (වැලි කෙබඳු දැ සි දක්වනු වස් මෙම වදාළහ.)

[1] දී: නි: සීලක්ඛන්ධ ව: 61 පිට

විසුද්ධාය= (ශබ්දයාගේ සන්තතිධාතයට පැමිණීම් වශයෙන් ද, ශ්‍රුතයා ගේ උපක්ලේශ විනිර්මුක්ත හෙයින් ද,) පිරිසුදු වූ,

අතික්කන්තමානුසකාය = (ශබ්ද ඇසීමෙහි ලා මිනිසුන් විසින් සවභාවයෙන් ලබන විෂය ප්‍රමාණය ඉක්ම, දෙවියන් ගේ කථා ශබ්දය ඇසීමෙහි දී දෙවියන් ගේ ශොත්‍රයට විෂය වූ ප්‍රමාණයෙහි පවත්නා හෙයින්) මනුෂ්‍ය විෂය ඉක්මවා සිටියා වූ (යම් ශ්‍රුත ශොත්‍රයකින්.)

උභෝ සද්දෙ සුණාති = දෙව්-මිනිස් දෙ පසෙහි වූ ශබ්දයන් අසයි. (මෙහි වූ කලී ඒක දෙශයක් කියන ලදි. එය නිරවශෙෂයෙන් දක්වනුවෝ,)

යෙ දූරෙ සන්තිකෙවා = අන්‍ය චක්‍රවාඨාදී බැහැර තන්හි හෝ, යටත්පිරිසෙයින් තම සිරුර පිළිබඳ වූ ද, උකුණු- මකුණු- ආදීන් ගේ ද, යම් ශබ්දයක්වේ ද (මේ සියලු සවිඥානක- අවිඥානක ශබ්ද ගැනීම සඳහා කියන ලදී.)

එය ඉපදවිය යුතු පරිදි මෙසේයි:- ඒ යෝගී **භික්ෂුව** අභිඥා පාදක චතුර්ධ්‍යානයට සමවැදී එයින් නැගී, පරිකර්ම වශයෙන් හටගත් සමාධි සිතින් පළමු කොට ප්‍රකෘති ශොත්‍රප්‍රසාදයට විෂය වූ අරණ්‍යාදී බැහැර තන්හි වූ සිංහාදීන් ගේ ඔෞදාරික ශබ්දය ආවර්ජනා කළ යුතුයි. මේ සියල්ලම ඔෞදාරික ශබ්දය ගැනීම සඳහා ය. (තුන් යොදුනකින් ද බැහැර වූ සොර සිංහ නාදය ඇසෙතැයි කියති)

මෙසේ ක්‍රමයෙන් ළං ළං වැ අවුත් විහාරයෙහි ගෙඩිය ගසන ශබ්දය, බෙර – සක් ශබ්ද පිළිවෙළින් අවුත් **භික්ෂු සාමණේරයන්-ගේ** වේගවත් වූ සජ්ඣායන ශබ්දය, "කිම සාමිනි! කිම ඇවැත්නි!, යනාදි ප්‍රකෘතියෙන් කථා කරන ශබ්දය, පක්ෂි – වාත – පාද යනාදියෙහි ශබ්දය, අව්වෙහි වියලෙන තල්පත් වල ශබ්දය, කුරු-කුහුඹු ආදීන් ගේ ශබ්දය දැ සි මෙසේ සියලු ශබ්දය ආවර්ජනා කටයුතු ය.

එසේ මැ දිශා සම්බන්ධයෙහි ශබ්ද මෙනෙහි කරන පරිදි දක්වති.

පූර්ව දිශාවෙහි වූ (දිව්‍ය ශොත්‍රය ඉපදවීමට හේතු වූ) ශබ්දය ද, පශ්චිම-උත්තර-දක්ෂිණ-හෙට්ඨිම-උපරිම- දිශාවන්හි වූ ශබ්ද ද, නිරිත-ඊසාන-වයඹ-ගිනිකොණ- යන අනුදිශාවන්හි වූ ශබ්ද ද,

මෙතෙහි කටයුතු ය. මෙසේ මෙතෙහි කරන යොගියා හට ඒ ශබ්ද ප්‍රකෘති සිතට ප්‍රකට වෙයි. **පරිකර්ම** සමාධි සිතට වූ කලි අනිශයින් ප්‍රකට වේ මැයි.

මෙසේ ශබ්ද නිමිත්ත මෙතෙහි කරන්නා හට 'දැන් දැන් දිව්‍ය ශොත්‍රය උපදනේ ය' යි කිය යුතු මොහොතෙහි කරන ලද යම් කිසි ශබ්දයක් අරමුණු කොට මනොද්වාරාවජ්ජන සිතක් ඉපිද නිරුද්ධ වූ කල **නිකන්තිපඤ්ඤ – මන්දපඤ්ඤයන් ගේ** වශයෙන් උපදනා ජවනයන් අතුරෙන් පුළුල් වූ තුනට හෝ සතරට හෝ (නිකන්ති පඤ්ඤ වශයෙන් පුළුල් වැ උපදනා **උපචාර, අනුලෝම, ගොත්‍රභූ** යන කාමාවචර ජවන තුනට) අනතුරු වැ, සතර වනුවැ හෝ (මන්දපඤ්ඤයා ගේ වශයෙන් **පරිකර්ම, උපචාර, අනුලෝම, ගොත්‍රභූ** යන කාමාවචර ජවන සතරට) අනතුරු වැ, පස්වනුව හෝ රූපාවචර චතුර්ථධ්‍යාන අවිණා චිත්තය උපදී. ඒ සිතෙහි උපදනා ඤණය **දිව්‍ය ශොත්‍රධාතු** නමැයි දතයුතු.

විභාවනා:- එය සවිර වැ පවත්නා සේ කරනුයේ පාදක ධ්‍යානයට අරමුණු වූ **කසිණ** නිමිත්ත 'මෙතෙක් තැන පැතිරේව' යි මෙතෙහි කරයි. එයට සමවදනහු ගේ **කසිණ** නිමිත්ත එතෙක් තැන පැතිරේ. **එකල** ඒ යෝගී තෙම පාදක ධ්‍යානයෙන් නැගී එහි වූ ශබ්දය ආවජ්ජනා කෙරේ. 'මෙතෙක් තැන ශබ්දය අසමි' යි එක් අගුල්තැන් පිරිසිඳ වැනිය යුතු. අනතුරුවැ දැගුල්-**සතරඟුල්**-අටඟුල්- **වියත්**- රියන්- ඇතුළු ගව්- **නිසවත්**- පහය- පිරිවෙන්- සඟරම්- ගොදුරුගම්- දනවු- ආදි වශයෙන් ක්‍රමයෙන් සක්වළ තෙක් ද, එයින් පිටත ද, පිරිසිඳ වැනිය යුතු. මෙසේ ලැබූ අභිඥා ඇති යෝගී තෙමේ පාදකධ්‍යානා'ලම්බනයෙන් සමමර්ශනය කරන ලදු වැ ශරීරය ඇතුළත්වූ, ශබ්ද ද, නැවත පාදක ධ්‍යානයට සම නො වැදී (අභිඥා ඥානයෙන්) **දිව්‍යශොත්‍රඥානයෙන්** අසාම ය.

මෙසේ අසන්නේ ද, බඹ ලොව තෙක් හෙරි-**පණවා'දි** ශබ්ද-යෙන් ඒක කෝලාහල වූයේ ද, වෙන වෙන වසතු වශයෙන් ඒ ශබ්දයක් අරහයා උපන් **මනොද්වාරාවජ්ජන** චිත්තයට අනතුරු වැ **ජවන** සතරක් හෝ පහක් හෝ උපදී. ඉන් අවසන ජවනය මේ **ඉද්ධිවිධ චිත්තය ය.**

බෙදා අසනු කැමැති වූයේ නම් ඒ එක එක ශබ්දයක් පාසා නැවත නැවත පාදක ධ්‍යානයට සමවැදිය යුතු. 'මේ බෙර හඬය'සි නියම වශයෙන් පිරිසිඳින හැකි වේ මැයි.

දිබ්බසොත ධාතුකථාව සමාප්ත සි.

චෙතොපරිය ඤාණය (2)

දිව්‍ය ශොත්‍රයට අනතුර වැ **චෙතොපරිය ඤාණය** දක්වනු ලැබේ. චිත්තයේ සරාගාදි සවභාවය පිරිසිඳ දැනීම **චෙතොපරිය** යි. මෙහි **පරිය** ශබ්දය (**"පරිපුබ්බ අය = ගතියං"** යි) ගමනාර්ථ 'අය, ධාතුවෙන් සිද්ධ ය. 'ගමනාර්ථ ධාතු අවබොධාර්ථයෙහි ද, වැටෙන හෙයින් **'පරිය'** ශබ්ද යෙන් පිරිසිදීම් මාත්‍රය පමණක් නො වැ 'දැනීම' ද කියැ වේ. එසේ තමා ගෙන් අන්‍ය සත්ත්වයන් ගේ සිතෙහි සවභාවය පිරිසිඳ දන්නා නුවණ මෙයින් අභිප්‍රේතයි.

විශෙෂ :- 'පර සත්තානං පර පුග්ගලානං.'[1] යි පෙළෙහි වචන දෙකක් වුව ද, අදහස් එකෙක් මැයි. චිනෙය ජනයන් ගේ අදහස් වශයෙන් හෝ, දෙශනා විලාශ වශයෙන් හෝ ව්‍යඤ්ජනයන් ගේ නානාත්වය කරන ලදි. තමා ගේ සිතින් අන්‍යයන් ගේ සරාගාදි සිත් එබඳු ලක්ෂණ අනුවැ ඇති සේ පිරිසිඳ දැනීම මෙහි අර්ථයි. ඒ ලැබෙනුයේ මෙසේයි.

මේ **චෙතොපරිය ඤාණය, දිව්‍යසෝතධාතුඤාණය** වශයෙන් සමාධි වේ. ඒ **දිව්‍යසෝතධාතුඤාණය, මේ චෙතොපරිය ඤාණය** ඉපද වීමට පරිකම් වේ. එහෙයින් **චෙතොපරියඤාණය** උපද වනු කැමැති, **දිව්‍යසෝතධාතුඤාණලාභී** නිඃක්ලෙශ වීසින් කසිණා ලොකය වඩා දිව ඇසින් මෙරමා හෘදය බැලිය යුතු යි. ඒ වූකලි යට කායගතාසතියෙහි දැක් වූ **හෘදය මාංස පිණ්ඩය යැ.** පිටතින් පියුම් කැකුළක සටහත් ඇති, ඇතුළත වැටකොලු කොස්සක් වැනි වූ එය ඇසුරු කොට මතු කියනු ලබන ලෙය පවතී. හෘදය වස්තුව ඒ ලෙය නිසා පවතී. චක්ෂුරාදි සෙසු වස්තු රූපයක් මෙනි.

දිව්‍යසෝතධාතුඤාණ ලාභී යොගාවචරයා විසින් ඒ හෘදය ඇසුරු කොට පවත්නා ලෙයෙහි වර්ණය බැලීමෙන් සරාගාදි සිත බැලිය යුතු වේ ලෙයෙහි වර්ණය බැලීමෙන් අරූප වූ සිත කෙසේ බැලිය හැකි වේ ද **සොමනස්සාදි** සිත් පවත්නා අවස්ථාවෙහි ඒ චතු සමුට්ඨානික රුධිරය ද, රත් පැහැවීම් ආදියට පැමිණෙන හෙයිනි.

ඒ එසේ මැයි :- සොම්නස් සිතක් පවත්නා කල ඒ ලෙය විලිකුන් නුග ඵලයක් සේ රතු වේ. දෙම්නස් සිතක් පවත්නා කල විලිකුන් දඹ ඵලයක් සේ කලු වේ. උපෙක්ෂා සිතක් පවත්නා කල පහන් තල තෙල් බඳු පැහැ වේ. එහෙයින් ඒ හේතූන් අනුව, මේ සිත **සොමනස්සින්ද්‍රිය** සහගත යැ. මේ සිත **උපෙක්ඛින්ද්‍රිය**

[1]පටි: ම: ඤාණ කථා 109 පිට බුරුම්

සහගත යැ යි දැනගනී. මෙසේ අනුමාන වශයෙන් දිව්‍යශ්‍රවඃශ්‍රෝත්‍රඥානයෙන් දැනගත් පසු නැවත නැවත **චුවණ** මෙහෙයා සෙවීමෙන් **චෙතොපරිය ඤාණය** ශක්තිමත් බවට පැමිණ විය යුතු.

විසඳුම :- මේ **චෙතොපරිය ඤාණය** උපදවනු කැමැති යොගාවචර තෙමේ රූපාවචර චතුර්ථ ධ්‍යානය උපදවා, එය සපිර බවට පමුණුවා, දිව්‍යශ්‍රවඃශ්‍රෝත්‍රඥාන වැ ආලෝකය වඩා දිවැසින් මෙරමා ගේ හෘදය වස්තුව ඇසුරු කොට පවත්නා රුධිර වර්ණය බලා ඒ වර්ණය අනුවැ පෙර කී සේ 'දැන් මොහු ගේ සිත සොම්නස් සහගත යැ, දැන් දෙම්නස් සහගත යැ' යනාදි ක්‍රමය ගැනීමෙන් ව්‍යවස්ථා කොට පාදක ධ්‍යානයට සමවැද එයින් නැඟී "මොහු ගේ සිත දනිමි. මොහු ගේ සිත දනිමි" යි මෙසේ පිරියම් කට යුතු. සිය දහස් වරකුදු මෙසේ බලන කල, 'දැන් **චෙතොපරිය ඤාණය** උපදනේයැ සි, කිය යුතු. **ක්ෂණයෙහි** එසේ උපදනා සිත අරමුණු කොට මනොද්වාරාවජ්ජන සිතක් උපදී. එයට අනතුරු වැ පෙර කී සේ ජවන් පසක් හෝ සතරක් උපදී. එයින් පස් වැන්න හෝ, සතර වැන්න රූපාවචර චතුර්ථධ්‍යාන සිත යැ. ඒ සිත හා යෙදුණු ප්‍රඥා චෛතසිකය **චෙතොපරිය ඤාණය** නම් වේ

ඒ අභිඥා ලාභී යොගාවචර තෙමේ මෙරමා ගේ සිත දැන ගැනීම පිණිස පරිකර්ම කොට ප්‍රත්‍යක්ෂ වශයෙන් දැනීමෙන් එය ප්‍රකට කෙරේ. එය නැවත නැවත සමවැදීමෙන් ශක්තිමත් වූ කල්හි, ක්‍රමයෙන් සූ පනස් කාමාවචර චිත්තය ද, සියලු රූපාවචර චිත්තය ද, අරූපාවචර චිත්තය ද, සරාගාදි ප්‍රභේද යෙන් දැන ගන්නේ ය.

තවද හෘදය වස්තු රූපය බැලීමෙන් තොරව ද, සිතින් සිතට සංක්‍රමණය වන්නා සේ දැන ගන්නේ ය.

ප්‍රශ්නයෙකි :- අරූප භූමියෙහි මෙරමා සිත දැන ගනු කැමති **චෙතොපරියඤාණ ලාභී** තෙමේ කවරකු ගේ හෘදය වස්තු රූපයක් බලා ද කවරකු ගේ ඉන්ද්‍රිය විකෘතියක් බලා ද

පිළිතුර :- එහි වස්තු රූප අවිද්‍යමාන හෙයින් කිසිවකු ගේ වස්තු රූපයක් නො බල සි. පෙර කී සේ හෘදය වස්තු රූපාදිය බැලීම සඳහා මෙහි උත්සාහ වැඩීම ආදිකර්මිකයා ගේ වශයෙන් කියන ලදි. එහෙත් කෘතාභිනිවේශ ඇති යෘද්ධිමත් තෙමේ, හෘදය වස්තු රූපය නො බැලුව ද, සිතින් සිතට සංක්‍රමණය වීම් වශයෙන් හෝ ආවර්ජිතා බලයෙන් හෝ දෙලොස් වැදෑරුම් අරූපාවචර සිත ද බලන්නේ ය.

විශේෂ:- මෙහි පෘථග්ජන අභිඥා ලාභීන් දැක් වූ හෙයින් **ලොකොත්තර සිත** මෙහි ලා නො දක්වන ලදි.

විසතර:- **"සරාගංවා චිත්තං"** යනාදි වශයෙන් සොළොස් වැදෑරුම් වූ සිත් (බලන්නේ ය.)

(1) **සරාගංවා චිත්තං** = අට වැදෑරුම් ලොභ සහගත සිත. (8)

(2) **විතරාගං** ,, = අන්‍ය වූ චාතුර්භූමික කුසල අව්‍යාකෘත සිත් එක් අසූව (81)
(දෙමනස්ස සිත් දෙක හා, මෝ මූහ සිත් දෙක මෙහි නො ගැනෙතැ යි යෙත්. ඇතැම් ආචාර්‍යයී කෙනෙක් එය ද යෙදෙතැයි ද යෙති.)

(3) **සදෙසං** ,, = දෙස මූලික දෙ සිත (2)

(4) **විත දෙසං** ,, = සෙසු කුසල අව්‍යාකෘත සත් අසූ සිත්. (87)
(මෙහි ද සෙසු දස අකුසල් නො යෙදෙතැයි ද යෙති.)

(5) **සමොහං** ,, = මෝ මූහ සිත් දෙක හෝ දෙළොස් අකුසල් සිත්. (12) මොහය සියලු අකුසල්හි යෙදෙන බැවිනි.

(6) **විත මොහං** ,, = සෙසු කුසල, අව්‍යාකෘත සත් සැත්තෑ සිත්. (77)

(7) **සංඛිත්තං** ,, = පින - මිඩ සහගත වූ සසඞ්ඛාරික අකුසල් සිත් පස. (5)
(අරමුණෙහි හැකිලෙන බැවිනි.)

(8) **විකඛිත්තං** ,, = උද්ධච්ච සම්පයුත්ත අකුසල චිත්තය.
(උද්ධච්චය දෙළොස් අකුසල සිත්හිමැ යෙදෙන හෙයින් අකුසල සිත් දෙළොසම හෝ මෙහි යෙදේ.)

(9) **මහගතං** ,, = රූපාවචර - අරූපාවචර සිත් සත්-විස්ස. (27)

(10) **අමහගතං** ,, = අන්‍ය වූ සියලු දෙ සැට සිත් (62)

(11) **සඋත්තරං** ,, = සියලු ත්‍රෛහුමික සිත් එක් අසූව (81)

(12) **අනුත්තරං** ,, = ලොකොත්තර සිත් අට (8)

(13) **සමාහිතං** ,, = උපචාර සමාධියට හෝ, අර්පණා සමාධියට පැමිණි සිත්.

(14) **අසමාහිතං වා චිත්තං**= එසේ සමාධියට නො පැමිණි සිත්.

(15) **විමුත්තං** ,, = **තදඞ්ග විමුක්ති** වශයෙන් කාමාවචර කුසල් සිත් ද,
වික්ඛම්භන විමුක්ති හෙයින් රූපාවචර, අරූපාවචර චිත්තය ද,
සමුච්ඡේද විමුක්ති හෙයින් මාර්ග චිත්තය ද,
පටිප්පස්සද්ධි විමුක්ති හෙයින් ඵල චිත්තය ද,
නිස්සරණ විමුක්ති හෙයින් මාර්ග-ඵල සිත් දෙ කොටස ම ද විමුක්ත සිත් නම.

(16) **අවිමුත්තං** ,, = මෙකී පඤ්චවිධ (5) විමුක්ති වශයෙන් කෙලෙසුන් කෙරෙන් නො මිදුණු සිත් ද, (මෙසේ සොළොස් ආකාරයෙන් පැවැති සිත් ඒ ඒ ආකාරයෙන් දැන ගන්නේ ය.)

විශෙෂ: පෘථග්ජන අභිඥ ලාභීන් සඳහා කියන ලද්දේ සිව ද, මෙහි **විතරාග, විතදෙස, විතමොහ, අනුත්තර** යන නම් වලින් ලොකොත්තර සිත ද ගැනෙන හෙයින් මතු මතු ආර්‍යයන් ගේ හා සමාන ආර්‍යයන් ගේ ද, ලොකොත්තර සිත් දැන ගැනීම් වශයෙන් මේ කී බව් සැලකුව මනා ය

චෙතො පරිය ඤාණ කථාව සමාප්ත යි.

පූර්වේනිවාසානුස්මෘතිඥානය (3)

චෙතො පරිය ඤාණ කථාවට අනතුරු වැ පූර්වේනිවාසානුස්මෘති ඥන කථාවට වාරය පැමිණියේ වෙයි.

'පූර්ව නිවාසය සිහි කෙරේනු යි' හෝ ඔහු ගේ සිහි කිරීම හෝ **පුබ්බෙනිවාසානුස්සති** නම. ඒ නිශ්‍රය කොට පැවැති ඥනය **පූර්වේනිවාසානුස්මෘති ඤාන** නම්. පෙර ජාතීන්හි කාම රූපා'රූප භවයන්හි පැවැති සකල පරම්පරාව සිහි කිරීමට සමර්ථ වූ' සම්‍රතිය හා එක්වැ පැවැති ඥනය මෙහි අභිප්‍රෙත යැ. මෙසේ සැකෙවින් දක්වන ලද්ද පදයක් පාසා විස්තර කරති.

පුබ්බෙනිවාසානුස්සති ඤාණාය = පෙර විසූ කඳ පිළිවෙල දක්නා ඤාණය පිණිස.

විඤ්ඤාණ:- අතීත ජාතීන්හි සඞ්ඝසන්තානයෙහි පැවැත්තා වූ ද, ඉපද නිරුද්ධ වූ ද, සඤ්ඤය අරමුණු කිරීම් වශයෙන් සවිඥාන ගොචර කිරීමෙන් ජාති-ගොත්‍ර-නාම-වර්ණාදීන් නුවණින් පිරිසිඳ ගන්නා ලද්දාහු ද, අතීත ජාතීන්හි බුඩාදි අන්‍යයන් ගේ ද නුවණින් පිරිසිඳිනා ලද්දාහු ද වෙති. ශික්ෂාප්‍රාප්තාපූර්වනිවාස දැක්වීම සඳහා මේ කීහ.

ඒ පූර්වේ නිවාසය සිහි කරන සතිය, **පූර්වේනිවාසානුස්සති** නම. ඒ සිහියෙන් යුත් ඤාණය, **පූර්වේනිවාසානුස්සති ඤාණය යි.** ඒ ඤාණයා ගේ අධිගමය පිණිස, (පැමිණීම පිණිස ය) ඔත අට්ඨ යි.

අනෙක විහිතං පුබ්බේ නිවාසං අනුස්සරති = නානා භව-යොනි- ගති- සත්ත්වාවාසාදි වශයෙන් අනෙක ප්‍රකාර වූ ජාති-ගොත්‍රාදී ආකාරයෙන් විස්තර කරන ලද අනතුරු අතීත භවය ආදි කොට ඒ ඒ භවයෙහිපැවැති ස්කන්ධ පටිපාටි වශයෙන් හෝ චුති පටිසන්ධි වශයෙන් හෝ පිළිවෙළින් නුවණින් අනුගමනය කොට සිහි කරයි.

පූර්වේ නිවාසය සිහි කරන්නෝ -

(1) තීර්ථිකය.
(2) ප්‍රකෘති ශ්‍රාවකය.
(3) අසූ මහා ශ්‍රාවකය.
(4) අග්‍රශ්‍රාවකය.
(5) ප්‍රත්‍යේක බුඩ ය.
(6) සම්‍යක් සම්බුද්ධ ය යි, ස දෙනෙක් වෙති.

(1) මේ ශාසනයෙන් පිටත් **ක්‍රියාවාදී-අක්‍රියවාදී-තාපසාදීහු ය.** ඔහු ඉකුත් සතලිස් කපක් කල් සිහි කෙරෙති. හේ ද සඤ්ඤ පටිපාටිය වසයෙන් ම ය. අඤ්ඤකු ගේ ගමන මෙනි. (සැරයටිය නැතිවැ අඤ්ඤාට ගිය තො හැක්කාක් මෙනි.) නාම-රූප පරිච්ඡේද ඥාන විදර්ශනා ඥානය නැති හෙයින් දුර්ල ප්‍රඥ ඇති හෙයිනි.

(2) **ප්‍රකෘති ශ්‍රාවකයෝ** කල්ප සියයක් දහසක් සිහි කෙරෙති. හේ ද සඤ්ඤ පිළිවෙළින් හෝ, **චුති පටිසන්ධි** පිළිවෙළිනි.

(3) **අසූ මහා ශ්‍රාවකයෝ** කල්ප ලක්ෂයක් චුති පටිසන්ධි ක්‍රමය අනුවැ සිහි කෙරෙති.

(4) **දූශසවුවෝ** එකාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් චුති- පටිසන්ධි පිළිවෙළින් සිහි කෙරෙති. (එක සත්ත්වයකු ගේ මේ අත්බවිහි පටිසන්ධිය බලා, දෙ වන අත්බවිහි චුතිය ද, එහි ප්‍රතිසන්ධිය දූ සි මෙසේ පිළිවෙළින්.

(5) **පසේ බුදුවරයෝ** දෙයාසඞ්ඛ්‍ය **කල්ප ලක්ෂයක්** චුති- පටිසන්ධි වශයෙන් සිහි කෙරෙති.

විශෙෂ:- මහා ශ්‍රාවක ද, අග්‍ර ශ්‍රාවක ද, ප්‍රත්‍යෙක බුද්ධ ද, අභිනීහාරය හා බොධිසම්භාරය පුරණ කාලය එපමණ හෙයිනි.

(6) **බුදුවරුන්ට** වූ **කලී සකල** පටිපාටියක් හෝ, චුති- පටිසන්ධි පටිපාටියක් හෝ, **කාල** නියමයක් හෝ නැති. එසේ මැ නොයෙක් කෝටි ගණන් කල්ප අතහැර යම් යම් තැනක් රිසියුණෝ නම් ඒ ඒ තැන ප්‍රකට වේ. පෙය්‍යාල මුඛයෙන් දෙසන පාළියක් සේ ය. එසේ බලන්නාහු ද, සිංහ ගතික වැ වාලවේධයෙහි සමර්ථ **සරභඞ්ගාදී** ධනුර්ධරයින් විදි හිය, අතර ගස්- වැල් ආදියෙකැ නො ගැටී, ඉලක්කය මැ විද පියන්නා සේ අතරතුර ජාතීන්හි නො ගැටී අනිමත ජාතියෙහි නුවණ හැපී සිටී. හේ ද කාල වශයෙන් ද අපරියන්ත යැ.

තවද **නිජ්ඣකයන්** ගේ පූර්වේනිවාසානුස්මරණය කණා මැදිරි එළියෙන් බැළීමක් මෙන් ද,

ප්‍රකෘති ශ්‍රාවකයන් ගේ පහන් එළියක් මෙන් ද,
මහා ශ්‍රාවකයන් ගේ ගිනි **සුලක්** මෙන් ද,
අග්‍ර ශ්‍රාවකයන් ගේ ඔසටි තාරකා මෙන් ද,
පසේ බුදුවරයන් ගේ සඳ එළිය මෙන් ද,
සම්‍යක් සම්බුදුවරයන් ගේ මධ්‍යාහ්න සූර්‍යයා මෙන් ද වැටහේ.

තවද **නිජ්ඣකයන්** ගේ පූර්වේනිවාසානුස්මෘති ඥානය අඞ්ගයා ගේ සැරයටි කොණ ගෙන යාම මෙන් ද,

ප්‍රකෘති ශ්‍රාවකයන් ගේ තනි ඒදණෙහි යාමක් මෙන් ද,
මහා ශ්‍රාවකගන් ගේ පුවරු හෙයකින් යන්නාක් මෙන් ද,
අග්‍ර ශ්‍රාවකයන් ගේ ගැළක් යා හැකි හෙයක යන්නාක් මෙන් ද,
පසේ බුදුවරයන් ගේ පා මඟෙක යන්නාක් මෙන් ද,
බුදුවරයින් ගේ මහා ශකට මාගීයෙකැ යන්නාක් මෙන් ද වේ.

(එහෙත් මේ විෂය යෙහි **ශ්‍රාවකයන් ගේ** පූර්වේනිවාසානුස්මෘතිය අදහස් කරන ලදි. එහෙයින් මැ '**සකණ්ඩ** පිළිවෙළින් හෝ, **චුති- පටිසන්ධි** පිළිවෙළින් හෝ අනුක්‍රමයෙන් සිහි කෙරේ ය' යි කිහු.)

විසඳුම:- මේ නුවණ ලබනු කැමැති ආදි කර්මික භික්ෂුව පසු බත (පිණ්ඩපාතයෙන් වැළකී) රහසි ගතවැ හුදෙකලා වැ එක් අරමුණෙක සිත පිහිටුවා පිළිවෙළින් **රූපාවචර** චතුර්ධ්‍යානයන්ට සමවැද අනතුරු වැ අභිඥා පාදක චතුර්ථධ්‍යානයෙන් නැඟී සියලු කටයුතු වලට පසුව වූ ඒ භිදීම මෙනෙහි කළයුතු. එතැන් සිට පිළිවෙළින් අසුන් පැනවීම ය, සෙනසුනට පිවිසීම ය, පා සිවුරු තැන්පත් කිරීම ය, දත් වැළඳීම ය, ගමන් පෙරළා ඒම ය, පිඬු සිඟීම ය, පිඬු පිණිස ගමට යෑම ය, විහාරයෙන් නික්මීම ය, දෙගැබ් මහ බෝ වැඳීම ය, පා දෙවීම ය, පාත්‍රය පිළිගැනීම ය, එයට පෙරටුව මුව දෙවීම තෙක් කළදෑ ද, උදැසන කාලයෙහි කළදෑ ද, මැදියම කළදෑ ද, පෙරයම කළදෑද'යි මෙසේ ප්‍රතිලෝම හෙයින් සියලු රැ දුවල් කළ දෑ මෙනෙහි කළ යුතු ය. මේ දෑ පියවි සිතට ද ප්‍රකට වේ. පරිකර්ම සමාධි චිත්තයට අභිඥාසින් ප්‍රකට වේ මැයි.

මෙහි ලා යම් කිසිවක් ප්‍රකට නො වේ නම් නැවත **පාදක** ධ්‍යානයට සමවැද එයින් නැඟී ආවර්ජනා කළ යුතු. මෙතෙකින් අඛ්‍යාකාර සථානයක පහනක් දැල් වූ කලෙක මෙන් ප්‍රකට වේ. (කරය මුවහත් කරන කරගල මෙන් **පාදක** ධ්‍යානය ද, **සමාධි-ප්‍රඥාවන්** තියුණු කෙරේ.)

මෙසේ **ප්‍රතිලෝම** වශයෙන් දෙවෙනි දවස ද, තුන් වැනි දවස ද, සතර වැනි දවස ද, පස් වැනි දවස ද, දස වැනි දවස ද, අඩ මසක් ද, මසක් ද, අවුරුද්දක් ද තෙක් කළ දෑ ආවර්ජනා කළ යුතු. එතැයින් ම දස වසක් ද, විසි වසක් දැ යි මේ අත් බැව්හි තමා පිළිඹඳ තෙක් මෙනෙහි කළ යුතු. නැවත මෙයට අනතුරු අත් බැව්හි චුතික්ෂණයෙහි පැවති නාම රූපයන් ආවර්ජනා කළ යුතු.

මේ **අභිඥා** විෂයෙහි පුරුදු කරන ලද ප්‍රඥා ඇති භික්ෂුව මුල් වාරයෙහි ම ප්‍රතිසන්ධිය උගුළුවා චුතික්ෂණයෙහි පැවැති නාම-රූප බැලීමට සමර්ථ වේ. එසේ පුරුදු නො කළහුට, **"පූර්ව භවයෙහි පැවැති නාම රූප නිරවශෙෂ වැ නිරුද්ධ විය. අනෙක් කර්මයකින් හටගත් නාම-රූප පහළ විය, එහෙයින් ඒ නාම-රූප නික්ෂෙප සථානය චතුරඛගයෙන් හාත්පසින් වැසුණු ඝනාන්ධකාරය මෙන් අප්‍රකට වේය"** යි 'මෙසේ ප්‍රතිසන්ධිය උගුළුවා චුති අවසථාවෙහි පැවැති නාම-රූප දැකීමට අසමර්ථය'යි වීර්‍යය බහා නො තැබිය යුතු. ඒ පාදක ධ්‍යානයට නැවත නැවත සමවැද එයින් නැඟී ඒ සථානය ආවර්ජනා කළයුතු.

උපමාවෙකි:- යම්සේ ශක්තිමත් පුරුෂයෙක් කූටාගාර කර්ණිකාවක් සඳහා මහා රුකක් සිඳින්නේ, අතු පතර සිඳීමෙන් ම පොරොව මොට වූයේ නම් එපමණකින් පසුබට නො වැ කඹුරුහලට ගොස් පොරොව මුවහත් කර ගෙන නැවත අවුත් සිඳින්නේ, නැවත මොට වූයේ නම් නැවත ද මුවහත් කරවා සිඳින්නේ, පළමු සිඳි තැන් නැවත නො සිඳිය යුතු හෙයින් හා නො සිඳුතැන් ම සිඳිය යුතු වන හෙයින් ඒ මහා වෘක්ෂය නො බෝ කලකින් ම බිම හෙලන්නේ ද, එසේ මැ පාදක ධ්‍යානයෙන් නැගී පළමු වැ ආවජ්ජනා කළ තැන් නැවත ආවජ්ජනා නො කළ යුතු හෙයින් ප්‍රතිසන්ධිය මැ ආවජ්ජනා කරන්නේ, නොබෝ කලකින් මැ ප්‍රතිසන්ධිය උගුළුවා චුතික්ෂණයෙහි පැවැති නාම-රූපය මැ ආවජ්ජනා කරන්නේ ය.

මෙහි උපමාන - උපමෙය සංසන්දනය

පුබ්බේනිවාසානුස්සතිඤාණය කූටාගාර කර්ණිකාව මෙනි. පූර්භාගයෙහි ප්‍රතිසන්ධි ක්ෂණයෙහි පැවැති නාම - රූප මහා රුක මෙනි. මේ බෙවෙහි ඒ හා සබඳ පිළිසඳ අතු-පතර මෙනි. **පරිකම්ම** භාවනාව පොරෝ මුවහත මෙනි. **පාදකධ්‍යානය** කඹුරුහල මෙනි. අන්‍යවූ ද දරපළන්නෙක, කෙස්ඛහන්නෙක, යන උපමාවන් ගෙන් ද මේ අර්ථය මැ ප්‍රකාශ කෙරේ.

පෙර කී සේ පශ්චිම නිස්සය්‍යයෙහි සිට ප්‍රතිසන්ධිය තෙක් පැවැති ඥානය, **පුබ්බේනිවාසානුස්සතිඤාණය** නො වේ. ඒ වූකලී **පුබ්බේනිවාසානුස්සතිඤාණයට** පිරියම් පිණිස පැවැති **සමාධිය** හා සම්ප්‍රයුක්ත ඥානය වේ. ඇතැම් **ආචාර්‍ය**යෝ කෙනෙක් **අතීතාංශ ඥානය** යි කියති. එය රූපාවචර අතීතාංශ ඥානය සඳහා නො යෙදේ. **පරිකම්ම සමාධි** ඥානය කාමාවචර හෙයිනි.

එහෙත් යම් කලෙක ඒ යෝගී භික්ෂුව ගේ ප්‍රතිසන්ධිය ඉක්ම චුති ක්ෂණයෙහි පැවැති නාම - රූප අරමුණු කොට **මනොද්වාරාවජ්ජන** සිත උපදී ද එය නිරුද්ධ වූ පසු එය මැ අරමුණු කොට **ජවන්** සතරක්-පසක් උපදී. ඔවුන් ගේ පූර්ව වූ **පරිකම්මාදිය** කාමාවචර සිත් ය. පශ්චිම ය රූපාවචර **අභිඥා** වේ. ඒ සිත හා සමග උපදනා ඥානය **'පුබ්බේනිවාසානුස්සතිඤාණ'** නම්. ඒ ඤාණය සමග යෙදුණු **සතිය** කරණකොට අනෙකවිධ වූ **පුබ්බේනිවාස අනුස්සරණය** කෙරේ.

"එක් ජාතියක් හෝ, දෙකක් හෝ තුනක් හෝ, ඒ ඒ ජාතීන් පිළිබඳ සංවර්ත සනන්තිය හෝ - ජාති දහයක් හෝ,

නොයෙක් සංවට්ට කල්ප හෝ නොයෙක් විවට්ට කල්ප, ආකාර සහිත වූ, උද්දෙස සහිත වූ, අනෙකප්‍රකාර වූ පූර්වේ නිවාසය සිහි කරයි.”

එක් ජාතියක් = එක කම්යෙන් නිපන් පටිසන්ධිය මුල්කොට ඇති චුතිය අවසන් කොට ඇති එක භවයක් පිළිබඳ සකල සන්තතිය මෙහි **‘ජාති’** යයි අභිප්‍රේතයෑ. සෙස්ස ද මෙසේ මැ යි.

නොයෙක් සංවට්ට කල්ප = පිරිහෙන්නා වූ කප සංවට්ට නම්.
නොයෙක් විවට්ට කල්ප = වැඩෙන්නා වූ කප විවට්ට නම්.
කපක් පිළිබඳ සංවට්ට සතරෙකි.
සංවට්ටය,
සංවට්ටඨායිය,
විවට්ටය,
විවට්ටඨායිය යි, හෙද
ආපෝ සංවට්ටය,
තේජෝ සංවට්ටය,
වායෝ සංවට්ටය යි තුනෙකි.

සංවට්ට සීමා ද තුනෙකි. **ගින්නෙන්** නස්නා කල **ආභස්සර-යෙන්** යට ද, **ජලයෙන්** නස්නා කල **සුභකිණ්හයෙන්** යට ද, **වාතයෙන්** නස්නා කල **වෙහප්ඵලයෙන්** යට ද නසී.

විභාවනය:- **ජාතික්ෂේත්‍රය, ආඥාක්ෂේත්‍රය, විෂයක්ෂේත්‍රය** යි ද තුනෙක් වේ. **තථාගතයන්** වහන්සේ ගේ ජාත්‍යාදීන්හි කමපා වන ප්‍රදේශය වූ **දස දහසක්** සක්වළ **ජාති ක්ෂේත්‍රය යෑ. රතන සූත්‍රාදීන් ගේ** අනුභාවය පැතිරෙන තරම් ප්‍රදේශය වූ **කෝටි ලක්ෂයක්** සක්වළ **ආඥාක්ෂේත්‍රය යෑ. බුද්ධඥාන** විෂය වූ අනන්තාපරිමාණ සක්වළ **විෂය ක්ෂේත්‍රය යි.**

මොවුනතුරෙන් කල්ප විනාශය වන **කල** ආඥා ක්ෂේත්‍රය මැ විනාශ වේ. ඒ සමග ජාති ක්ෂේත්‍රය ද, විනාශ වේ. ඒ ඇතුළත වන හෙයිනි. පිහිටන්නේ ද, එකවට මැ පිහිටා මැයි. විෂය ක්ෂේත්‍රය අනන්තාපරිමාණ ය. “තමා ශබ්දය පැතිරවීම්, රූප දැක්වීම් පිළිබඳ වැ **යාවතාපන ආකඞ්ඛෙය්‍ය**”[1] යි “යම් පමණ කැමැත්තේ නම් එපමණ තන්හිය”යි වදාළ හෙයිනි.

විභාවනය:- ගින්නෙන් කප නස්නා කල මුලදී මැ කල්ප විනාශක මහා වැසි වසී. හෙද **කෙළ ලක්ෂයක්** සක්වළට එකවට ය. මිනිස්සු තුටු පහටු වැ බීජ සියල්ල වපුරති. ශෂ්‍ය ගවයන් කන පමණ වැඩුණු පසු මේඝ ගර්ජනා විනා වැසි පොදකුදු නො වසී. එද, නැවතුණු වැසි නැවතුණේ මැ වේ.

[1]අ: නි: තිකනිපාත 139

"හොති බ්‍රා සෝ භික්ඛවෙ සමයෝ යං බහූනි වස්සසතානි, බහූනි වස්ස සහස්සානි, බහූනී වස්ස සත සහස්සානි දෙවෝ නවස්සති"[1] යි 'බොහෝ අවුරුදු සිය - දහස් - ලක්ෂ ගණන් වැසි නොවස්නා කලෙක් වේය" යි එසින් වදුළහ.

එකල වැස්සෙන් ජීවත් වන සත්ත්වයෝ කළුරිය කොට බඹලොව උපදිති. මල් පලයෙහි ඕජාවෙන් ජීවත් වන දෙවියෝ ද, බඹලොව උපදිති. මෙසේ දීඝ් කාලයක් ගතවත් ම ඒ ඒ තැන ජලය වියළී යයි. එකල-මස් කැසුබු ආදීහු මැරී බඹලොව උපදිති. නිරි සත්තුද මැරී බඹ ලොව උපදින්.

(තිරිසන් සතුන් බඹ ලොව උපදනේ සත් වැනි සූයම්‍යියා පහළ වූ පසුවය යි ඇතැම් කෙනෙක් කියති.)

ප්‍රශ්නයෙකි:- ධ්‍යාන නැතිව බඹ ලොව යා නොහේ මෙහි ඇතැම් කෙනෙක් දුර්නිඤ්ඤයෙන් පීඩිත වැ මැරෙති. ඇතැම් කෙනෙක් ධ්‍යාන වැඩීමට අභව්‍ය නො වේද්ද?

පිළිතුර:- දෙව්ලොව ඉපද එහිදී ලබන ධ්‍යාන වශයෙනි.

විස්තර:- එකල මින් හවුරුදු ලක්ෂයකින් කල්ප විනාශය වේ" යයි **"ලෝකබ්‍යූහ"** නම් දෙවියෝ කෙස් මුදු, විසුරුවා ගෙන හඬමින් අනින් කඳුළු පිසිමින් රතු වත් හැඳ ඉතා විරූප වෙස් දරා මිනිස් පියස හැසිරෙති.

මෙසේ ද කියත් "පින්වත්නි! මින් හවුරුදු ලක්ෂයකින් කල්ප විනාශ වේ. මේ ලෝකය වැනැසේ. මහ මුහුද පවා වියළේ. මේ මහා පොළොව ද, මහා මේරු පර්වතය ද, ද වැනැසේ. බඹ ලොව තෙක් සියල්ල වැනැසේ.

පින්වත්නි! 'මෙත් වඩව්, කරුණා- මුදිතා- උපෙක්ෂා වඩව්, මව්-පිය උවටැන් කරව්, කුල දෙටුවන් පුදව්" කියා යි.

මෙ බස් අසා මිනිස්සු ද, බූමාටු දෙවියෝ ද, මොළොක් සිත්වැ මෙත් වැඩීම් ආදී පින්කම් කොට දෙව් ලොව උපදිති. එහිදී දිව බොජුන් වලද, **වායො කසුණු** පිරියම් කොට **ධ්‍යාන** උපදවති. අන්‍යයෝ අපරාපරිය වෙද්‍ය කර්මයෙන් දෙව්ලොව උපදිති. 'අපරාපරිය කර්ම විරහිත සසර සැරිසරන සත්ත්වයෙක් නැති, ඔහු ද එසේමැ එහිදී ධ්‍යාන උපදවා බඹ ලොව යති. වැසි නැවතී බොහෝ කලක ගේ ඇවැමෙන් දෙවෙනි සූයම්‍යියෙක් උපදී. එකල රෑ දාවල් වෙනස නොපැනේ. එකක් උදා වූ කල එකක් බසී. ලෝකය සූයම්‍යාලෝකයෙන් නිරතුරු වෙයි.

---

[1] අ: නි: සත්තකනිපාත 678

විශේෂ:- ප්‍රකෘති සූර්‍ය්‍ය මණ්ඩලයෙහි සූර්‍ය්‍ය දිව්‍ය පුත්‍රයා ඇතත්, දෙවෙනි **කල්ප** විනාශක සූර්‍ය්‍ය මණ්ඩලයෙහි හේ නැති. එසේ ම පියවි **හිරු** පවත්නා කල වලාහක දුම් සිළු ඇතත් දෙවෙනි හිරු උදා වූ **කල** හේ ද නැති වේ. අහස ආදර්ශ මණ්ඩලයක් වේ නිමිල වේ **පස් මහා** ගංගාවන් හැර, සෙසු ගංගා, ඇළ, දෙළ වියළේ. ඉන් බොහෝ **කලක** ගේ ඇවැමෙන් තුන් වැනි හිරෙක් උදා වේ. **එකල** පස් මහා ගඟ වියළේ. එයින් බොහෝ **කලක** ගේ ඇවැමෙන් **සිවු වැනි හිරෙක්** පහළ වේ. **එකල හිමවත** මහා ගංගාව හටගන්නා **සිහ පාතඛය, හංස පාතඛය, කණ්ණමුණ්ඩඛය, රථකාරය, අනවතප්තය, ජදදනතය, කුණාලය,** යන සප්ත මහා විල් වියළේ.

ඉන් බොහෝ කලෙකින් **පස්වැනි හිරෙක්** උදා වේ. එකල පිළිවෙළින් මහා සාගරයෙහි සුළැඟිල්ල තෙමන පමණ වූ ද ජලය ඉතිරි නොව වියළේ. ඉන් බොහෝ කලෙකින් **සවැනි හිරෙක්** පහළ වේ. එකල සියලු කෝටි ලක්ෂයක් සක්වළ වියළන දුමින් එකට පිරී ගනී. ඉනුදු බොහෝ **කලෙකින් සත් වැනි හිරෙක්** පහළ වේ. **එකල** සියලු කෝටි ලක්ෂයක් සක්වළ එක මැ ගිනි ජාලාවක් වේ. **සියක්** යොදුන් පමණ මහත් ගිරි කුළු පැලී අහසෙහි ද විනාශ වේ. එහි ගිනි ජාලාව චාතුම්මහාරාජික දිව්‍ය ලෝකය තෙක් පැතිරේ. එහි රන්- රිදී- මැණික්- විමන් දවා තවුතිසා දෙව් ලොව තෙක් පැතිරේ. මේ ක්‍රමයෙන් සදිව්‍ය-ලෝකයන් දවා **ප්‍රථමධ්‍යාන** භූමිය තෙක් පැතිරේ. එහි ද බ්‍රහ්මතල තුන දවා **ආභස්සර** බ්‍රහ්ම ලෝකයෙහි හැපී සිටී. ඒ ගිනි ජාලාව අඟුවක් පමණ වූ ද, ද්‍රව්‍යයක් පවත්නා තුරු නො නිවේ. සියලු ද්‍රව්‍ය අවසන් වූ කල ගිතෙල් දැ තැන මෙන් අලු ද ඉතිරි නො කොට නිවී යයි. යට අහස හා උඩ අහස එක් වැ මහාන්ධකාර වේ. අනතුරු දීඝ කාලයක ගේ ඇවැමෙන් මහා මෙඝයක් නැගී පළමුව සියුම් **පොද** වැසි වසී. පිළිවෙළින් නෙලුම් දඬු- සැරයටි- මොහොල්- තල් කඳ පමණ වැසි ධාරා වැස කෙළ ලක්ෂයක් සක්වළ සියලු ද ගිය තැන් පිරී යයි. ඒ ජලය උඩ යට සරස වාතය නැගී ඝන කොට නො විසිරෙන සේ පිඬු කර සි. පියුම් පතෙක දියත්තක් මෙනි. ඒසා මහත් ජලසඤ්ඣය අතර වාතය ගමන් කළ හැකි සේ විවර දෙමින් ඝන කොට වට කර යි. මෙසේ ක්‍රමයෙන් ඝන වීමෙන් යටට බසී. එසේ ක්‍රමයෙන් බසිත් බසිත් මැ පෙර බඹ ලොව තුබූ තන්හි බඹ ලොව ද, මතුයෙහි යාම දෙව් ලොව තෙක් සතර කාමාවචර දෙව් ලොව පැවැති තන්හි දෙව් ලොව ද පහළ වේ. චාතුම්මහාරාජික, තාවතිංස, දිව්‍ය ලොක දෙක පොළොව

හා සම්බන්ධ හෙයින් එකල පහළ නො වේ. පෙර පොළොව පැවැති තැනට බට කල්හි බලවත් වාතය හට ගනී. ඒ වාතය ධම්කරකයෙහි සිදුර වැසූ කල ඇතුළත රදන ජලය මෙන් නිරුත්සාහයෙන් පවතී.

මිහිරි ජලය ක්‍රමයෙන් ක්ෂය වෙමින් මතු පිට **රස පඨවිය** උපදව සි. එය වණ්ණයෙන් ද, ගන්ධයෙන් ද, යුක්ත වේ. නිරුදක ක්ෂීරපායාසයෙහි මතු පිට තෙල් පටලය මෙනි. එකල ආභස්සර බඹ ලොවින් චුත වන බ්‍රහ්මයෝ එහි උපදිති. ඔහු තමා ගේ ශරීරාලෝකයෙන් ආලෝක කෙරෙමින් අහසෙහි හැසිරෙති. උපචාර ධ්‍යාන බලයෙන් එසේ හැසිරෙන ඔව්හු **අග්ගඤ්ඤසූත්‍රයේ**[1] කී සේ රස පොළොව ආස්වාදනය කොට රස තෘෂ්ණාවෙන් මිඩිනා ලද්දාහු අන් සතු දෙය පැහැර ගෙන අනුභව කිරීමට උපක්‍රම කෙරෙති. ඉන් ඔවුන් ගේ ශරීරා ලෝකය අතුරුදහන් වැ අන්ධකාරය වේ. බියට පැමිණි ඔවුන් සනසා පිරිපුන් පනස් යොදුන් ඇති සූයශ්‍රී මණ්ඩලය පහළ වේ. ඔහු ඒ දැක 'එළිය ලදුම්හ' සි තුටු පහටු වැ භය වූ අය සනසා 'සූර බව් උපදවමින් පහළ වූ යේ ය' සි **'සූයඤ්'** යැයි නම් කෙරෙති. සූයශ්‍රීයා දහවල් පැවැති අසනයට ගිය ඉක්බිති ලැබූ 'ආලෝකය දැන් නවුයේ ය' සි භය වූවාහු අනෙක් 'ආලෝකයක් ලදමෝ නම් මැනැවැ' සි සිතත් මැ ඔවුන් ගේ සිත දැනමෙන් එකුන් පනස් යොදුන් **සඳමඬල** පහළ වෙයි. ඒ දැක බොහෝ සෙයින් තුටු පහටු වූ ඔව්හු ඒ අරුත සලකා **'චන්ද්‍ර'** නම් කෙරෙති.

මෙසේ සඳ-හිරු පහළ වූ පසු නැකැත් තරු පහළ වේ. එතැන් පටන් රෑ දාවල් පැනෙයි. අනුක්‍රමයෙන් මාස- අර්ධමාස ඍතු- සංවත්සරයෝ පහළ වෙති. **සඳ - හිරු** උපන් ද, මෑ **මහ මෙර, සක්වළගල, හිමවන් පව්** පහළ වේ. ඔහු ද, ක්‍රමයෙන් මැදින් මස **පසළොස්වක් ද,** පහළ වෙත්. පැසෙන **තණ** බතක **එක** පැහැර බුබුළු නැගී ඇතැම් පෙදෙස් ථූපයන් සේ උස්ව ද, ඇතැම් පෙදෙස් ආවාටව ද, ඇතැම් පෙදෙස් සමව ද, පැසෙන්නාක් මෙනි. මෙසේ ථූප මෙන් වූ තැන් පර්වත වේ. ප්‍රපාත මෙන් වූ තැන් සමුද්‍ර වේ. සමතැන් ව්‍රප වේ.

රස පොළොව වළඳනා ඒ සත්ත්වයන් අතුරින් ඇතැම් කෙනෙක් වණ්ණවත් වෙති. ඇතැම් කෙනෙක් දුර්වණ්ණ වෙති. වණ්ණවත් වූවෝ දුර්වණ්ණ වූවන් හෙළා දකිති. ඔවුන් ගේ ඒ මානය

[1] දී: නි: පාටිකවගග 53 පිට

හේතු කොටගෙන රස පොළොව අතුරුදහන් වේ. **භූමිපප්පටක** පහළ වේ. ඒ නයින් හේද අතුරුදහන් වේ. **බදලතා නම්** ලතා විශෙෂයෙක් පහළ වේ. එසේ මෑ හේ ද අතුරුදහන් වේ. (සවයංපාක) දරින් නො පිසිය යුතු කුඩු නැති පිරිසිදු හැල් පහළ වේ. අනතුරු වැ බඳුන් පහළ වේ. ඔහු ඒ සහල් බඳුන්හි බහා ගල් මත තබති. ගිනි තමා ම නැගී එය පිස සි. දැසමන් කැකුළු සේ සුදු වූ ඒ බතට සූප ව්‍යඤ්ජනයෙන් කම් නැති. රිසියෙන තාක් රස ඉන් ලැබේ. ඒ රළු ආහාර බුදිනා ඔවුනට මළ මූත්‍ර හට ගනී. අනතුරු වැ ඒවා නික්මෙන ද්වාර පහළ වේ. **පිරිමිනට** පුරුෂ භාවය ද, **සඹුනට** සත්‍රී භාවය ද වේ. ඔවුනොවුන් බැලීමෙන් කාම තෘෂ්ණා හට ගැනීමෙන් මෙවුන්දම් සෙවිති. ඉක්බිති නුවණැත්තෝ ඔවුන් ගරහත්. ඒ සඳහා ආවරණ සථාන කෙරෙත්. ගෙහි වසන්නාහු අලස බැවින් කිහිප දිනකට යැපෙන සහල් රැස් කොට තබති. අනතුරු වැ කුඩු – පොතු හටගනී. පෙර සේ කපා ගත් තන්හි ශස්‍ය හට නො ගනී. ඔහු රැස් වැ සුසුම් හෙලමින් මෙසේ සාකච්ඡා කෙරෙති.

"පින්වත්නි! සත්ත්වයන් අතර පවිටු ගති පහළ වී, අපි පෙර **මනොමය ඍද්ධි** ඇත්තෝ වූම්හ." යනාදි ලෙසිනි. (විස්තර **අග්ගඤ්ඤ සූත්‍රයෙන්**[1] දන්නේ සි.) අනතුරු වැ හැල් කෙත් බෙදා මායිම් තබති. එකල එකෙක් අනෙකා අයත් කොටසින් නො දී ගත්තෙන් දෙවරක් පරිභව බැණ තුන් වැනි වාරයෙහි අත්-පා-කැට-කැබලිත්තෙන් ගැසී. මේසේ සොරකම්- අවමන්- බොරු- දඬු ගැනීම්- ආදිය උපන් පසු රැස් වැ 'තජ්ජනය කළ යුත්තන්ට තජ්ජනය කළ හැකි. ගර්හා කළ යුත්තන්ට ගර්හා කළ හැකි රටින් නෙරිය යුත්තන් නෙරිය හැකි. යම් කිසි සත්ත්වයකු සම්මත කෙරෙමුය' යි ද ඒ සඳහා 'මේ හැල් කොටස දෙමු' යි ද, කනිකා කොට එකල ඔවුනතුරෙහි සියල්ලන්ට වඩා මහා රු ඇති, දැකුම්කළු මහෙශාක්‍ය නුවණැති සංග්‍රහ- නිග්‍රහ කිරීමේහි සමත් වැ සිටි **බොධි සත්ත්වයන්** වෙත එළඹ යාඥා කොට එසේ සම්මත කළහ. එසේ මහජන සම්මත වූ හෙයින් හෙතෙමේ **'මහාසම්මත'** නම් ද, ක්ෂෙත්‍රාධිපති හෙයින් **'ක්ෂත්‍රිය'** නම් ද, දැහැමෙන් සෙමෙන් ජනයා රඤ්ජනය කළ හෙයින් **රජ** නම් ද වී. මෙසේ නාම ත්‍රයයෙකින් ප්‍රකට විය. මෙසේ ක්ෂත්‍රිය මණ්ඩලය පිහිටි පසු, පිළිවෙළින් බ්‍රාහ්මණාදී වර්ණයෝ පිහිටියාහු ය.

මෙසේ **කල්ප විනාශ** මේඝයේ පටන් **ජවාලොපච්ඡෙදය** දක්වා මේ **සංවට්ට අසඞ්ඛ්‍යය යෑ.**

---

[1] දී: නී: පාඨියවග්ග 30.

කල්ප විනාශක ජවාලොපවෙඡදයේ සිට සමපත්ති මහා මේඝය තෙක් **සංවට්ටඨායී නම්** දෙ වෙනි අසඞ්ඛ්‍යය යැ. සමපත්ති මහා මේඝයේ පටන් සඳ හිරු පහළවීම තෙක් **විවට්ට නම්** තුන් වැනි අසඞ්ඛ්‍යය යැ. සඳ හිරු පහළවීමේ සිට නැවත කල්ප විනාශක මහා මේඝය තෙක් **විවට්ටඨායී නම්** සිවු වැනි අසඞ්ඛ්‍යය යැ. මේ සතර අසඞ්ඛ්‍යය මහා කල්පයෙකි. මේ වූ කලී ගින්නෙන් නැසී නට ගන්නා පරිදි ය.

ජලයෙන් කල්ප විනාශය වන අයුරු:- යම් කලෙක කල්පය ජලයෙන් විනාශවේ නම් එකල පළමුව මැ කල්ප විනාශක මහා මේඝය වසී.

මේය වෙනස:- ගින්නෙන් නස්නා **කල** දෙවෙනි හිර නගින්නා සේ මෙහි කල්ප විනාශක කාරම් ජල වැසි වසී. මුලදී සියුම් සියුම් වැසි වැස පසුව පිළිවෙළින් මහා වැසි ධාරාවෝ කෙළ ලක්ෂයක් සක්වළ පුරා වසිති. ඒ කාරම් දියවට පෘථිවී, පර්වතාදිය විලීන වෙයි. ජලය භාත්පසින් සුළඟ දරයි. පොළවේ සිට **දුතියඣානභූමිය** තෙක් ජලය පිරෙයි. එහි **තුන් තලය** දිය වේ. සුභකිණ්ණක බඹලොව හැපී සිටී.

විශෙෂ:- මේ වූ කලී උතකෘෂ්ට පරිවෙඡදයෙන් **තතියඣානපරිත්ත** තලය වූ **පරිත්ත සුභයෙහි** හැපී සිටී. යට ආභස්සරයෙහි හැපී සිටිතැ යි කී තැන ද පරිත්තාභයෙහි හැපී සිටින හැකි ය. උතකෘෂ්ට වශයෙන් මෙසේ කියන ලදී. මෙසේ සුවල්පවූ ද ද්‍රව්‍යයක් පවත්නා තාක් ජලය නො සිදේ. සියල්ල දිය වූ පසු ජලය වියළී යයි. ඉක්බිති මතු අජටාකාශය එකට හැපී ඝනාඞ්කාරයෙන් පිරී ගනී. සෙස්ස පෙර සේ මැ සි.

මෙහි සුභකිණ්ණක බ්‍රහ්ම **ලෝකයෙන්** ද, චුත වැ ආභස්සර බඹ ලොව උපදිති. මෙසේ කල්ප විනාශක මේඝයේ සිට කාරම් ජලය සිදෙන තාක් එක් අසඞ්ඛ්‍යයෙකි. එතැන් සිට සමපත්තිකර මහා මේඝය තෙක් එක් අසඞ්ඛ්‍යයෙකි. සෙස්ස පෙර සේ මැයි. මෙසේ ජලයෙන් විනාශය ද, හටගැනීම ද වේ.

වාතයෙන් කල්ප විනාශය වන පරිදි:- වාතයෙන් විනාශ වන **කල** ද 'පළමුවෙන් **කල්ප** විනාශක මහා වැස්සෙක් වසී, යනාදි පෙර කී සේ විස්තර **කළ** යුතු.

විශෙෂ:- පෙර දෙවෙනි සූත්‍රීයා පහළ වූ සේ මෙහිදී **කල්ප** විනාශය පිණිස වාතය හටගනී. එය පළමුවෙන් මහා ධූලි නංවයි. අනතුරු වැ සියුම් ධූලි ය, සියුම් වැළි ය, මහා වැළි ය, කැට ගල් ය,

ගල් ය, යකාදිය ද නඟ යි. කුළු ගේ සා පළින ද, විසම තන්හි වූ මහා රුක් ද, උඩට නඟ යි. ඒවා පොළොවෙන් උඩ නැංගාහු නැවත බිම නො වැටෙති. එහි මැ සුණු විසුණු වී අභාවයට යෙත්.

අනතුරු වැ පිළිවෙළින් යට මහ පොළවින් වාතය නැඟී පොළොව පෙරළා මුල් උඩට නඟා අහසෙහි බහයි. සියක් යොදුන් පමණ වූ ද, දෙ සියක්- තුන් සියක්- සාර- පන් සියක් යොදුන් පමණ වූ ද, පොළෝ කොටස් සිද වාත වේගයෙන් අහසෙහි බහාලන ලද්දාහු එහි ම සුණු විසුණු වී වැනසෙති. **සක්වළ** පවිව ද, **මහමෙර** පවිව ද, වාතයෙන් ඔසවා අහසෙහි ලත ලදු වැ, ඒවා එකින් එක හැපී සුණු විසුණු වැ වැනසෙති. මෙසේ භූම්‍යසථ- ආකාශසථ විමානයන් ද, විනාශ කෙරෙමින්, ඡට් කාමාවචර දිව්‍ය ලෝකයන් වනසා කෙළ ලක්‍ෂයක් සක්වළ ගල්, සක්වළ ගල් හා ද; හිමවත් පව්, හිමවත් පව් හා ද; මහාමේරු, මහාමේරු හා ද; (ඔවුනොවුන් එක් වැ) හැපී සුණු විසුණු වැ විනාශ වේ. පොළොව සිට **තතියඣානභූමිය** තෙක් වාතයෙන් වැනසේ. එහි බඹ ලෝ තුන නසා **වෙහප්ඵලයෙහි** හැපී සිටී. මෙසේ සියලු දෙය නසා වාතය ද නැසේ. උඩ යට අජටාකාසය එක් වැ මහාඛකාර වේ. සෙස්ස පෙර කී සේ මැයි.

විශෙෂ:- මෙහිදී සුභකිණ්හකයෙන් ද සැව බ්‍රහ්මයෝ වෙහප්ඵලයෙහි උපදිති. කල්ප විනාශක මේඝයේ සිට, කල්ප විනාශක වාතය නැවතීම තෙක් එක් අසඞ්ඛ්‍යයෙකි. වාතය නැවතීමේ සිට සමපතතිකර මේඝය තෙක් එක් අසඞ්ඛ්‍යයෙකි. මේ සතර අසඞ්ඛ්‍යයෙක් එක් මහා කල්පයෙකි. මේ වාතයෙන් ලොව නස්නා පරිදි හා පිහිටන පරිදි ය.

'සත්ත්ව ලෝකය මෙන් අවකාශ ලෝකය ද වැනැසීමේ හේතුවක් ඇතමැනවැ යි සලකා ලෝකය මෙසේ වැනසෙන්නේ කවර හෙයින්දැයි, විචාරන්නවුනට, අකුසල මූල හේතුවෙන් යැ' යි පිළිතුරු දිය යුතු.

ඒ එසේමැ යි:- අකුසල මූලයන් උතසන්න වූ කල මේසේ ලොව වැනැසේ. හේද රාගය අධික වූ කල ගින්නෙන් ද, දොෂය අධික වූ කල ජලයෙන් ද වැනැසේ. ඇතැම් කෙනෙක් රාගය අධික වුව ජලයෙන් ද, දොෂය අධික වුව ගින්නෙන් ද නැසෙතැයි ද යෙති. මෝහය අධික වුව වාතයෙන් වැනැසේ.

මෙසේ වැනැසෙන්නේ ද පිළිවෙළින් **සත්** වරක් ගින්නෙන් නට කල ජලයෙන් අට වැනි වර වැනැසේ. නැවත ගින්නෙන් **සත්** වරකැ යි මෙසේ ජලයෙන් අට වැනි - අට වැනි වරයැ යි

(ගින්නෙන් ස පණස් වරෙක, ජලයෙන් සත් වරෙකැ සි) තෙ සැට වරක් පිරුණු පසු, **සැට සතර** වැනි වාරය වාතයෙන් වැනෑසේ. පෙර කී සේ පූර්වේනිවාසය සිහි කරන්නා වූ ද **කල්පයන් සිහි කරන භික්ෂුව** මෙසේ තොයෙක් **සංවට්ට කල්ප ද, විවට්ට කල්ප ද, සංවට්ට - විවට්ට** කල්ප ද සිහි කරයි.

ඒ මෙසේයි:- 'අසුවල් සංවට්ට කල්පයෙහි මම අසුවල් භවයෙහි, අසුවල් යෝනියෙහි හෝ, ගතියෙහි හෝ විඤ්ඤාණ ස්ථිතියෙහි හෝ, සත්ත්වාවාසයෙහි හෝ, සත්ත්ව නිකායයෙහි හෝ උපන්මි, මෙ නම් ඇත්තෙම් වීමි. මෙ නම් ගොත්‍ර ඇත්තෙම් වීමි. නාම ගොත්‍රාදිය මෙන් මැ, වණ්ණ- සම්පත්- රූපෂ- ප්‍රණීත- ජීවිකාව හෝ සැප-දුක් බහුල බව හෝ, අල්පායුෂක-දීර්ඝායුෂක බව හෝ සිහි කරනු කැමැත්තේ එය ද සිහි කරයි. 'ඒ මම එයින් චුත වැ නැවත නැවත අසුවල් අසුවල් තැන උපන්මි' සි කියා ය.

මෙ මැ කිහ **"එවං නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛ දුක්ඛ පටිසංවෙදී-සෝ-තතොචුතෝ ඉධූපපන්නොති"**[1]

මෙසේ එකිනෙක භවයෙන් භවය වණ්ණාදි ආකාර වශයෙන් ද, නාම-ගොත්‍රාදි උද්දෙශ වශයෙන් නානාවිධ වූ **පූර්වේනිවාසය** සිහි කෙරේ.

පූර්වේනිවාසානුස්සතිඤාණ කථාව සමාප්ත යි.

චුතූපපාත ඤාණය (4)

සත්ත්වයින් ගේ චුති උත්පත්ති දැන ගන්නා ඤාණය දිව්‍යචක්ෂුරභිඥානය යි. එය ඉපදවීම පිණිස පරිකර්ම ධ්‍යාන සිත අභිමුඛ කෙරේ. **"සෝ දිබ්බේන චක්ඛුනා"**[1] යනාදින් එය විස්තර කෙරෙති.

සෝ = ඒ පරිකර්ම ධ්‍යාන සිත ලද වූ යොගාවචර **භික්ෂු තෙමේ.**

දිබ්බේන = දෙවියන්ට කුශල කර්මානුභාවයෙන් නිපන් පිත්ත-සෙමහාදි පළිබෝධ රහිත, උපක්ලේශයෙන් විනිර්මුක්ත හෙයින් දුරෙහි ද වූ රූපාලම්බනය පිළිගැනීමට සමර්ථ වූ දිව්‍යමය ප්‍රසාද චක්ෂුෂ වන්නා සේ, මේ ඒයාදී භාවනා බලයෙන් නිපන් ප්‍රඥා චක්ෂුෂ ද, ඒ දිව්‍ය චක්ෂුෂ මෙන් බැහැර වූ ද රූපාලම්බනය දැකීමෙහි සමර්ථ හෙයින් හෝ දිව්‍ය විහාර වශයෙන් ලබන ලද හෙයින් හෝ

[1]දී: නි: සීලක්ඛන්ධවග්ග 62

දිව්‍ය විහාරය යි, කියන ලද **චතුත්ථ** ධ්‍යානයෙන් ලබන ලද හෙයින් හෝ, **කසිණාලෝකානුග්‍රහයෙන්** පැමිණිය යුතු බැවින් හෝ, පාදක ධ්‍යාන සඞ්ඛ්‍යාත දිව්‍ය විහාරය නිශ්‍රය කොට හටගත් බැවින් හෝ, දිව්‍ය විහාරයෙහි ඇතුළත් බැවින් හෝ දිව්‍ය නම් වේ. **ආලෝක කසිණ** භාවනා වෙන් පැමිණිය යුතු බැවින් තමා ගේ **ඤාණාලෝකය** පැතිරෙන බැවින් ද **දිව්‍ය** නම. නිතති ආදීන් පිටත වූ රූප බැලීමෙන් මහත් ගති ඇති බැවින් ද දිව්‍ය නම්.

(මෙහි ශබ්ද ශාස්ත්‍රඥයෝ **'දිවු ධාතුව' විභාර- විජයෙච්ඡා- ව්‍යවහාර-ජුති-ගති** අර්ථයන්හි යෙදීම් වශයෙන් මෙම **අභිඥා-ඤාණයා ගේ** දිව්‍ය චක්ෂුර්භාවය සිද්ධ කළහ. පෙර කී විස්තරයෙන් ඒ වැටහෙයි.)

චක්ඛුනා = රූප දැකීම් සාමර්ථ්‍ය යෙන් ද, (එහෙත් මාංස චක්ෂුෂ මෙන් විඥානාධිෂ්ඨිත වැ දක්නේ නො වේ.) මේ වූකලී තෙමේම දර්ශන කෘත්‍යය කෙරෙන හෙයින් ද, ඇසක් වැනිනු යි චක්ඛු නම්.

විසුද්ධන = චුති- උත්පත්ති දැකීම් වශයෙන් දිඹි විසුද්ධියට හේතු බැවින් විසුද්ධ වූ.

විසෙසර:- යමෙක් චුතිය පමණක් දක්නේ නම් හෙතෙම උවෙඡ්ද දිට්ඨියට වැටේ. යමෙක් චුතිය නො දැක උත්පත්ති මාත්‍රය දකී නම් හෙතෙම 'නව සත්ත්ව ප්‍රාදුර්භාවය වේය' යි දෘෂ්ටි ගනී. යමෙක් 'මේ දෙක මැ දක්නේ නම්' හෙතෙමේ ඒ උභය දෘෂ්ටින් ම විනිර්මුක්ත වේ. ඔහු ගේ ඒ දැක්ම **දෘෂ්ටි විශුද්ධියට** හේතු වේ. **බුද්ධ පුත්‍රයෝ** මේ දෙක මැ දකිති. එහෙයින් චුති-උත්පත්ති දැකීමෙන් **දිට්ඨි විසුද්ධි** හේතුවයෙන් විසුද්ධි වේය යි කීහ.

අතික්කමනමානුසකෙන = මනුෂ්‍ය උපචාරය ඉක්ම රූප දක්නා සුළු නොහොත් මිනිසුන් ගේ මසැස පිළිබඳ දර්ශනොපචාරය ඉක්ම සිටි, (මිනිස් ඇසින් නො දක්නා හැකි. සුඛුම රූපාදිය දක්නා හෙයිනි.)

චවමානෙ උපපජ්ජමානෙ = (විශුද්ධ වූ මිනිස් ඇස පිළිබඳ විෂය ඉක්ම සිටි දිව්‍යචක්ෂුර්ඥනයෙන්) චුතවන්නා වූ ද, උපදින්නා වූ ද

සත්තෙ පස්සති = සත්ත්වයන් දකී.

විශෙෂ:- රූපයක් පිළිබඳ සවිනි අවස්ථාව **ආලම්බන** ප්‍රත්‍යය වන හෙයින් ද, රූපයා ගේ චුති-උත්පත්ති ක්ෂණයන් සියුම් බැවින් ද,

'දිබ්බ චක්ඛු' ඤාණයට අරමුණු නොවේ. චුතියට ආසන්න වූ ද, එකෙණෙහි උපන්නා වූ ද, සත්ත්වයෝ මෙයින් අදහස් කරන ලදහ.

හීනෙ = (මොහසම්ප්‍රයුක්ත කර්මයෙන් නිපන් හෙයින්) ජාති-කුල- භොගාදීන් ගේ වශයෙන් නිහීන වූ (ගර්හා කරන ලද, ලාමක කොට දන්නා ලද.)

පණීතෙ = (අමොහ සම්ප්‍රයුක්ත කර්මයෙන් නිපන් සහේතුක ප්‍රතිසන්ධික හෙයින්) ප්‍රණීත වූ.

සුවණ්ණෙ = (අද්වේෂ සම්ප්‍රයුක්ත කර්මයෙන් නිපන් හෙයින්) ඉෂ්ටවර්ණාදීන් යුතු වූ.

දුබ්බණ්ණෙ = (ද්වේෂ සම්ප්‍රයුක්ත කර්මයෙන් නිපන් හෙයින්) අනිෂ්ට අකාන්ත අමනාප විරූප බැවින් යුතු වූ රූප ඇති.

සුගතෙ = සුගති ඇති. (අලෝභ සම්ප්‍රයුක්ත කර්මයෙන් නිපන් හෙයින්) ආර්ය්‍ය වූ මහද්ධන ඇති.

දුග්ගතෙ = දුගති ඇති, (ලෝභ සම්ප්‍රයුක්ත අකුශල කර්මයෙන් නිපන් හෙයින්) දිළිඳු වූ සුළුපට ආහාර පාන ඇති.

යථාකම්මූපගෙ = (තමා විසින් උපචිත පෙර කී සේ) කර්මානුරූප වැ නිපන්.

විශෙෂ:- පෙර කී **"දිබ්බෙන චක්ඛුනා"** යනාදි පදයන් ගෙන **දිබ්බ චක්ඛුඤාණ** කෘත්‍යය කියන ලදී මේ **"යථා කම්මූපගෙ"** යන පදයෙන් **යථා කම්මූපග ඤාණ** කෘත්‍යය කියන ලදී.

විස්තර:-ඒ ඤාණය උපදවනුයේ මෙසේ යි:- ඒ දිව්‍යචක්ෂුර්ඥාන-ලාභී **භික්ෂු තෙමේ** නිරයාභිමුඛ කොට ධ්‍යානාලෝකය පතුරුවා නෙරයිකසත්ත්වයන් දිව්‍යඥානයෙන් ප්‍රත්‍යක්ෂ සේ දැක, ඒ සත්ත්වයන් ගේ නිරයෙහි උපන් කර්මය බැලීමට- දැනීමට කැමැත්තේ පාදක ධ්‍යානයට සමවැද ඉන් නැගී 'මේ සත්ත්වයා කවර නම් කර්මයක් කොට නිරයෙහි ඉපිද මේසා දුක් අනුභව කෙරේද' යි මෙනෙහි කරයි. අනතුරු වැ 'මෙ තම් කර්මයකැ' යි කර්මාලම්බනික ඥානය උපදී.

එසේ මැ උඩ දිව්‍යලොකාභිමුඛ කොට ආලෝකය පතුරුවා නන්දන වන, මිශ්‍රක වන, පාරුසක වනාදීන්හි මහා සම්පත් අනුභව කරන සතුන් දකී. හෙද **දිබ්බ චක්ඛු ඤාණ** කෘත්‍යය මැයි. 'මේ සත්ත්වයන් කිනම් කර්මයක් කොට මෙහි උපන්නවුන් මහත්

සම්පත් අනුභව කෙරෙත් දැ' යි බලන්නාහට 'මෙනම් කම්යකැ' යි කම්මලබණිකවැ ඥානය උපදී. මෙය **යථාකම්මූපගඤාණය** මැයි. මෙයට වෙන මැ පරිකම් නැති. එසේ මැ **අනාගතංඤාණයට** ද වෙන මැ පරිකම් නැත්.

විශෙෂ:- මේ **යථාකම්මූපගඤාණය** හා **අනාගතංඤාණය** ද, **දිබ්බචක්ඛු ඤාණය** පාදක කොට ඇත්තහුට **දිබ්බචක්ඛු ඤාණයෙන් මැ** සමෘද්ධ වේ. යම් සත්ත්වයකු දැක නිපදවන ලද කම්යකින් මතු උපදනා අත්බව බලනු කැමැති දිව්‍යඥන ලාභී **භික්ෂුව ඒ යථාකම්මූපග ඤාණය** මැ පාදක කොට **අනාගතංඤ ඤාණය** උපදවයි. ෙ ඥන දවය මැ **'දිබ්බ චක්ඛු ඤාණය'** ඇති කල්හි මැ ලැබෙයි. නැති කල නො ලැබේ.

කාය දුච්චරිතෙන = කයින් කරන ලද දුෂ්ට චරිතයෙන් හෝ කයින් උපන් කෙලෂයෙන් දූෂණය වූ චරිතයෙන්.

විශෙෂ:- මේ කාය ද්වාරය මෙහෙයා කාය විඤ්ඤත්ති වශයෙන් පැවැත්තා වූ අකුශල කාය කම්ය යැ. (වචී දුච්චරිතාදිය ද මෙසේ මැයි.)

සමන්නාගතා = යම් සන්තානයෙකැ කරන ලදින් නො නැසී පැවැති, (එහෙයින් මැ විපාක දීමට යොග්‍ය බව පහවැ නො යාම හේතු කොට **'සමන්නාගත'** නම් වේ.

අරියානං උපවාදකා = බුදු- පසේ බුදු- බුදු සව් **ආයර්යතට** (යටත් පිරිසෙයින් **සෝවාන්** ගිහියකුට පවා) අනර්ථ කාමීවැ පරිජීවනින් හෝ ඛ්‍යාතාදී ගුණ නැසීමෙන් හෝ උපවාද කරන්නාහු, ආක්‍රොශ ගර්හා කරන්නාහු.

"නත්ථි එතෙසං සමණධම්මො අසසමණා එතෙ"[1] යි මොවුන්ට මහණකම් නැති මොහු අශ්‍රමණ යෝයි, සීලයෙන් උපවාද බෙණෙනුයේ අන්තිම වසතුවෙන් උපවාද බෙණේ.

"නත්ථි එතෙසං ඣානංවා විමොක්ඛාවා මග්ගොවා ඵලංවා"[1] යි 'මොවුන්ට ධ්‍යානයෙක් හෝ, විමොක්ෂයෙක් හෝ මාර්ගයෙක් හෝ, ඵලයෙක් හෝ නැතැයි' උපවාද කරන්නේ ගුණ නැසීමෙන් උපවාද කරන්නේ වෙයි.

විශෙෂ.- ඔහු දැන හෝ, නො දැන හෝ උපවාද කළ කල **ආයර්‍යාපවාද** කම්ය වේ. මෙය **ආනන්තර්‍ය්‍ය** සමාන වූ සවර්‍ගාවරණ වූ ද, මාර්ගාවරණ වූ ද, කම්යෙකි. එහෙත් හේ සතෙකිවජ්ජ ය. එයට මේ කථාවෙකි.

---

[1]පටි: ම: අඨකථා මහාවගග 260.

එක් ගමේක **එක් තෙර නමක්** හා නවක නමක් පිඬු සිඟයි. ඔහු පළමු ගෙහි මෑ උණු කැඳින්නක් ලැබූහ. තෙරුන් ගේ බඳ රිදෙයි. මේ උණු කැඳින්න උණුවෙන් මැ බීවොත් 'සප්පාය වේය'යි සිතා උළු අස්සක් පිණිස මිනිසුන් ගෙනවුත් දමා තුබූ කොටයක් මත හිඳ **තෙරුන් වහන්සේ** එය වැළඳූහ. 'මේ ඉතා බඩ සසින් පෙළුණු මහල්ලා අපට ලජ්ජා විය යුත්තක් **කෙළේය**' යි නවක **භික්ෂුව** කී. **තෙරුන්** වහන්සේ ගම පිඬු සෑරූ විහාරයට ගොස් ඇවැත්නි! තට මේ සසුනෙහි පිහිටක් ඇද්දැ යි විචාළහ. එසේය සෝවාන්මි' යි කී. 'එසේ නම් මතු මාගීයන් පිණිස උත්සාහ නො කරව. තා රහත් නමකට උපවාද කළහ' යි වදාළහ. හෙතෙමේ උත්වහන්සේ ක්ෂමා කරවී. එහෙයින් ඒ **කර්මය** බැහැර විය.

මෙසේ **අන්‍ය**යෙක් හෝ **ආයෙ**ප්‍යවාද **කළේ** නම් ඔහු ගොස් තමා වැඩි මහලු නම් උක්කුටුකයෙන් හිඳ 'මම ආයුෂ්මතුන්ට මේ මේ දෙය කීවෙමි' ඒ මට ක්ෂමා කෙරේවා' යි ද, තමා නවක නම් වැඳ උක්කුටුකයෙන් හිඳ ඇඳිලි බැඳ 'ස්වාමීනි! මම ඔබට මේ මේ දෙය කීවෙමි. ඒ මට ක්ෂමා කරනු මැනැවැ' යි ක්ෂමා කර විය යුතු. අන් දිසාවක ගියේ නම් තමා ගොස් හෝ, සඳකි විහාරිකයකු යවා හෝ ක්ෂමා කර විය යුතු. යන්නට හෝ යැවීමට නො හැකි නම් ඒ විහාරයෙහි වැඩ සිටින නවක හෝ, වැඩි මහලු වූ හෝ භික්ෂූන් වෙත එළඹ පෙර කී සේ 'මම අසුවල් ආයුෂ්මතුන්ට හෝ **ස්ථවිර**යන් වහන්සේට මෙ නම් දැ කීවෙමි. ඒ ආයුෂ්මත් හෝ, ස්ථවිරයන් වහන්සේ මට ක්ෂමා කෙරෙත්වා' යි ක්ෂමා කරවිය යුතු සම්මුඛයෙහි ක්ෂමා කළ නො හැකි නම් මෙසේ කළ යුතු. ඒ භික්ෂුව ආ ගිය අතක් නො දන හැක්කේ නම් (වසන තැනක් හෝ ආ ගිය තැනක් හෝ නො දනී නම්) එක් උගත් භික්ෂුවක් වෙත ගොස් ස්වාමීනි! මම අසුවල් ආයුෂ්මතුන්ට මෙනම් මෙනම් දැයක් කීවෙමි. එය සිහිවත් මැ විපිළිසර උපදී. එයට කුම් කෙරෙම්ද යි විචාළ කල ඔබ නො බව මැනව. තෙරුන් ඔබට ක්ෂමා කරනු ඇත. සිත සනසව යි, කියා නම් ඔහු විසිනුදු ගිය දිසාවට වැඳ 'ක්ෂමා කෙරෙත්වා' යි, කිය යුතු.

හේ පිරිනිවියේ නම් පිරිනිවි ඇඳ තුබූ තැනට හෝ සොහොන වෙත ගොස් හෝ ක්ෂමා කර විය යුතු. මෙසේ කළ කල **ඤේයාවරණ** හෝ, **ක්ලේශාවරණ** නො වේ. **කර්මය** සංසිඳේ.

මිච්ඡාදිට්ඨිකා = තුමූ විපරීත දෘෂ්ටික වූවෝ.

මිච්ඡාදිට්ඨි කම්මසමාදානා = (විපරීත දෘෂ්ටි වශයෙන් සමාදන් වූ නා නා විධ කර්ම ඇත්තෝ) මිථ්‍යා දෘෂ්ටික වූ කාය කර්මාදීන්හි අන්‍යයන් ද සමාදන් කරවන්නාහු ද.

විශේෂ:- මේ **ආයෙස්මාපවාදය** වාග් දුශ්චරිත ග්‍රහණයෙහි ද, **මිථ්‍යා දෘෂ්ටිය** මනෝ දුශ්චරිත ග්‍රහණ යෙහි ද, සංගෘහීත වුව ද, නැවත කිම මහා සාවද්‍ය බව දැක්වීම පිණිස ය.

ආයෙස්මාපවාදය පඤ්චානන්තර්‍යය මෙන් මහා සාවද්‍ය ය. එයින් වදාළහ.

"සෙය්‍යථාපි සාරිපුත්ත භික්ඛු සීල සම්පන්නෝ සමාධි සම්පන්නෝ පඤ්ඤාසම්පන්නෝ දිට්ඨෙවධම්මෙ අඤ්ඤං ආරාධෙය්‍ය. එවං සම්පදමිදං සාරිපුත්ත වදාමි. තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා යථාභතං නික්ඛිත්තෝ එවං නිරයෙ"[1]

'ශාරීපුත්‍රය! (මූනුකුරා ගිය ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ඇති) සම්පූර්ණ සිල් ඇති, සම්පූර්ණ සමාධි ඇති, සම්පූර්ණ මාගී ඥාන ඇති **භික්ෂුව අහින් ඵලයට** පැමිණෙන්නා සේ (**ඒ ආයෙස්මාපවාදක** තෙමේ) ඒ වචනය ද, ඒ චිත්තය ද, (**මිථ්‍යා දෘෂ්ටිකය**) ඒ දෘෂ්ටිය ද බැහැර නො කොට ගෙනවුත් බහාලන ලද්දකු මෙන් නරකයෙහි උපදී.

තවද **මිථ්‍යාදෘෂ්ටියට** වඩා මහා සාවද්‍ය වූ අනිකක් නැත්තේ ය. එයින් වදාළහ.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං මහා සාවජ්ජතරං යථ්‍යිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි පරමානි භික්ඛවෙ වජ්ජානි"[2]

"මහණෙනි! මිථ්‍යාදෘෂ්ටිය යම් පමණ මහා සාවද්‍ය ද එබඳු වූ අන්‍ය එක මැ ධර්මයකුදු නො දකිමි. මහණෙනි! අවද්‍යයෝ මිථ්‍යාදෘෂ්ටිය පරම කොට ඇත්තාහ.

කායස්සභෙදා = උපාදින්නස්කන්ධ භෙදයෙන්

පරම්මරණා = (මරණින් මතු උපන් සකඹ ලාභයෙන් හෝ ජීවිතින්ද්‍රියයා ගේ උපච්ඡේදයෙන්) චුති සිතෙන් මත්තෙහි.

---

[1]ම: නි: මූලපණ්ණාසක 277. [2]අ: නි: එකක නිපාත 20

අපායං දුගතිං විනිපාතං නිරයං උපපන්නා = (මේ සියල්ල නිරය පර්‍යාය වචන ය) අය සඞ්ඛ්‍යාත සැපයෙන් පහ වූ, දුකට ගති වූ, විවස වැ පතිත වන්නා වූ; (ආසවාදී නම් වූ අය නැති හෙයින් නොහොත් සවගී - මොක්ෂයට හේතු වූ ප්‍රත්‍යය සම්මත අය යෙන් පහ වූ බැවින් නොහොත් සැපයන් ගේ හටගැනීමක් නැති හෙයින්) නිරය නම් වූ, දෙස බහුලත්වයෙන් දුෂ්ට වූ කර්මයෙන් උපන් ගති ඇති හෙයින් **දුගතී** නම් වූ, මෙහි 'බිඳෙන අඩග ප්‍රත්‍යඩග ඇති වැ චිතාශ වෙමින් වැටෙත්නුයි' **විනිපාත** නම් වූ නිරයෙහි උපත්නාහු ය;

විශෙෂ:- මෙහි අපාය ගැනීමෙන් **තිරිසන් යෝනිය** ගැනේ. එය සුගතියෙන් වෙන් වූ හෙයින් අපාය ය (මහෙෂාක්‍ය නාගරාජාදීන් ගේ උත්පත්තිය ඇති හෙයින් **දුගතී** නො වේ.) දුගතී ග්‍රහණයෙන් **ප්‍රේත ලෝකය** ගැනේ. එය සුගතියෙන් පහ වූ හෙයින් ද, දුකට ගති වූ හෙයින් ද, අපාය ද දුගතී ද වේ. විනිපාත ග්‍රහණයෙන් **අසුරකාය ය** ගැනේ. එය එකී අර්ථයෙන් අපාය ද දුගතී ද සියලු සම්පත්තීන් පහ වූ හෙයින් විනිපාත ද වේ. නිරය ග්‍රහණයෙන් අවීචිය තෙක් සියලු **අපාය** ගැනේ. (මෙයට ප්‍රතිපක්ෂ වශයෙන් සොභන පක්ෂය දත්වයුතු යි.)

සුගතිං සගගං ලොකං උපපන්නා = සැපයට ගති වූ සුවයෙන් අග්‍ර වූ ලොකයෙහි උපත්නාහු ය.

විශෙෂ:- මෙහි සුගති ග්‍රහණයෙන් මනුෂ්‍යයෝ ද, සගග ග්‍රහණයෙන් දෙවියෝ ද ගැනෙති. සුන්දර ගති ඇති හෙයින් සුගති ද, රූපාදීන් මනාව අග්‍ර හෙයින් සවගී ද වේ. **මේ** සියල්ල ලුජ්ජන පලුජ්ජන අර්ථයෙන් **ලොක නම.**

විසතර:- මෙසේ දිවැසින් බලනු කැමැති ආදිකර්මික කුල පුත්‍රයා **අට කසිණයන්** අතුරින් යම් කිසි **කසිණයක්** අරමුණු කොට **අභිඤ්ඤාපාදක** ධ්‍යානය උපදවා යට කී සේ (තුදුස් ආකාර-යෙන් සිත දමනය කොට අඩග අටකින් සම්පූර්ණ කිරීමෙන් **භූමි-පාද- පද-** මූල සම්පාදනය කිරීම් වශයෙන්) සවී ප්‍රකාරයෙන් **දිව නුවණට** සිත මෙහෙයීමට සුදුසු කොට **තෙජොකසිණ-ඔදාත කසිණ- ආලොක කසිණ-** යන තුනින් එකක් **දිව්‍ය-චක්ඛුරභි ඤාණයට** ආසන්න කළ යුතු.

එකී කසිණයෙක්හි **උපචාර** ධ්‍යානය පහළු කොට අරමුණ ද වැඩිය යුතු. එහෙත් එසේ වැඩූ කසිණාලම්බනයෙහි ධ්‍යාන වශයෙන් අප්පණා නො ඉපදවිය යුතු.

කවර හෙයින්ද යත්:- පරිකම්‍ම නො කළ හුට **අභිඥා** වශයෙන් අවීණා නූපදනේ ය. අවීණා උපදවන්නේ තම් පාදක ධ්‍යාන හෝ අරමුණු වන්නේ ය. ඒ **කසිණාලම්බනය** පරිකම්‍මයට නිශ්‍රය නො වන්නේ ය. නිශ්‍රය නො වන **කල** රූප දර්‍ශනය නො වේ.

මේ තුන් කසිණයන් අතුරින් **ආලෝක කසිණය** ශ්‍රේෂ්ඨතරය. එහෙයින් එය හෝ, අනෙක් දෙකින් **එකක්** හෝ යට **කසිණ** නිර්දේශයෙහි කී පරිදි **උපචාර** ධ්‍යාන වශයෙන් උපදවා (උපචාර ධ්‍යානය සමඟ **ප්‍රතිභාග** නිමිත්ත උපදනා හෙයිනි.) ඒ **උපචාර** භූමියෙහි මැ සිට **ප්‍රතිභාග** නිමිත්ත වැනිය යුතු. (විස්තර යට **කසිණ නිර්දේශයෙහි**[1] කී සෙයින් දත යුතු.)

කසිණ ප්‍රතිභාග නිමිත්ත වඩන ලද ප්‍රදෙශයෙහි වූ රූපාලම්බනය මැ දැක්ක යුතු ය. ඉන් පිටත වූ රූපාලම්බන නො දැක්ක යුතු. එසේ පිටත වූ රූපාලම්බනය දක්නහු ගේ **පරිකම්‍ම** වාරය ඉක්මෙන හෙයිනි. එසේ (පරිකම්‍ම වාරය) ඉක්මීමෙන් **කසිණාලෝකය** අතුරුදහන් වේ. ඒ (ආලෝකය) අතුරුදහන් වූ කල්හි රූපාලම්බනය ද නො පැනෙ යි. අනතුරු වැ ඒ ධ්‍යාන ලාභීහු විසින් නැවත නැවත **පාදක** ධ්‍යානයට සමවැද එයින් නැගී **ආලෝකය** පැතිර විය යුතු. මෙසේ අනුක්‍රමයෙන් **කසිණාලෝකය** ශක්තිමත් වේ. එකල්හි යම් පමණ ප්‍රදෙශයෙක 'කසිණාලෝකය පැතිරේවා' යි (යම් පමණ ප්‍රදෙශයක්) පිරිසිඳින ලද්දේ තම් ඒ ප්‍රදේශයෙහි **කසිණාලෝකය** සිටිනේ මැ ය. දවසක් මුළුල්ලෙහි වුව ද එහි මැ හිඳ බලන්නහුට රූපාලම්බනය දැක්ම වන්නේ ය.

නිදර්‍ශන:-මෙයට රෑ ගිනි සුළක් ගෙන මඟට පිළිපන් මිනිසෙක් නිදර්‍ශන වේ. 'එක් මිනිසෙක් ගිනි සුළක් ගෙන රෑ මඟට පිළිපන්නේ ය. ඒ ගිනි සුළ නිවුණු කල්හි මාගීයෙහි සම විසම තැන් නො පැනේ. ඔහු ඒ ගිනි සුළ බිම ගසා නැවත ද දල්වා පෙරට ද වඩා එළිය වූයෙන් නැවත ද යන්නේ එය නැවත නැවත නිවී කල නැවත නැවත ද දල්වද්දී සූර්‍යයා උදාවූයෙන් එයින් කම් නැති හෙයින් එය හැර දමා දවස මැ ගියේ ය.

සංසන්දනය:- **පරිකම්‍ම** කළ කල **කසිණාලෝකය** ගිනි හුළු එළිය මෙන් ද, රූප දක්නා කල **පරිකම්‍ම** ධ්‍යාන වාරය ඉක්මී මෙන් **කසිණාලෝකය** අතුරුදහන් වීමෙන් රූප නො දැකීම ගිනිසුළ නිවීමෙන් සම-විසම නො දැකීම මෙන් ද, නැවත නැවත **පාදක** ධ්‍යානයට සමවැදීම ගිනිසුළ බිම ගැසීම මෙන් ද, නැවත පිරියම්

[1]සිං: මූ: 209 පිට

කරන කල පෙරට ද වඩා **ඝනිණාලෝකය** පැතිරීම ගිනිසුළ පෙරට වඩා ආලෝක වීම **මෙන්** ද, පිරිසිදි **පමණ තන්හි ඝනිණාලෝකය** දැඩිවැ පැතිරී සිටීම සූර්යයා ගේ උදුවීම **මෙන්** ද, ඒ දැඩි වූ ආලෝකයෙන් දවසකුදු රූප දැකීම, ගිනිසුළ හැරපියා සූර්යාලෝකයෙන් දහවල් **කාලයෙහි** යාම **මෙන්** ද දත යුතු.

ඒ යොගාවචරයා ගේ මැ ඇසට හමු නො වූ කුස තුළ වූ රූපය ද, හෘදය වස්තු ඇසුරු කොට පවත්නා රූපය ද, පොළොවයට භාගයෙහි වූ ද, හිතුනි පවුරු ආදියෙන් මුවා වූ ද, සක්වළින් බැහැර වූ ද, මෙකී රූපයන් යම් **කලෙක** නුවණැසට හමුවේ ද, මසැසින් දක්නාක් මෙන් ප්‍රකට වැ දක්නේ වේ ද, **එකල දිව්‍යචක්ෂු උපන්නේය සි** දත යුතු.

මේ රූපයන් අරමුණු කොට පවත්නා සිත් අතුරින් ඒ **දිව්‍යචක්ෂුරභිඥානය** මැ චක්ෂුර් විඥානය ප්‍රකෘති රූපය මනා කොට දක්නාක් මෙන් රූපාලම්බනය දැකීමට සමර්ථ වේ. එයට පූර්ව භාගයෙහි පැවැති **පරිකර්ම** සිත් රූපාලම්බනය ප්‍රකට කොට බැලීමට සමර්ථ නො වේ. **චක්ෂුර්විඥාන** සිතට පූර්වයෙහි පවත්නා **පඤ්චද්වාරාවජ්ජන සිත** හා පසු වැ උපදනා **සම්පටිච්ඡන - සන්තීරණ** සිත් මෙනි.

විශෙෂ:- එකී සිත් රූපාලම්බනය අරමුණු කොට පැවැත්තේ නමුදු එය තතු සේ දැකීමට සමර්ථ නො වේ.

(තවද ඒ **දිව්‍යචක්ෂුරභිඥානය** පෘථග්ජනයාට අන්‍යාරූයකර වේ. හෙතෙමේ යම් යම් තැන් 'ආලෝක වේවා' සි අධිෂ්ඨාන කෙළේ නම් ඒ ඒ පෘථිවි-සමුද්‍ර - පර්වතාදිය විනිවිද එකාලෝක වේ. එකල යක්ෂ - රාක්ෂසාදි රූප දර්ශනයෙන් භය ඉපිද චිත්ත වික්ෂෙපයට පැමිණ ධ්‍යානයෙන් පිරිහී උමතු බවට ද පැමිණිය හැකි හෙයිනි. එහෙයින් 'මා විසින් **දිවැස් ලබන ලදැ**' සි තෘප්තියට නො පැමිණ **විදර්ශනා** වඩා **සත්‍යප්‍රතිවෙධ** කිරීමෙහි උත්සාහවත් විය යුතු.)

දිව්‍යචක්ෂුරභිඥානය උපදින්නේ මෙසේයි:- 'යට කී පරිදි එකී රූපාලම්බනය අරමුණු කොට **මනොද්වාරාවජ්ජන සිත** ඉපිද නිරුද්ධ වූ කල, එය මැ අරමුණු කොට **ජවන් සතරක්-පහක්** උපදී.' යනාදි සියල්ල පෙර කී සේ ය. මෙහිදු පූර්වයෙහි කී ආවර්ජන චිත්තයෝ **සවිතර්ක- සවිචාරයහ. කාමාවචරයහ.** අවසානයෙහි වූ රූපාලම්බනය දැකීම සිද්ධ කරන චිත්තය **රූපාවචර චතුර්ථධ්‍යානික** යැ. ඒ හා එක්වැ යෙදුණු වූ ඥානය **චුතූපපාතඤාණය** සි ද, **දිව්‍යචක්ෂුරභිඥානය** සි ද, කියනු ලැබේ.

මෙතෙකින් චුතූපපාත ඤාණ කථාව නිමි.

පඤ්චාභිඥාවන් ගේ ප්‍රකීර්ණක කථාව

මේ පඤ්චාභිඥාවන් අතුරින් **චුතූපපාතඤාණ** නමින් කී **දිව්‍යචක්ෂුරභිඥානයට, අනාගතංසඤාණය** ද, **යථාකම්මූපග ඤාණය** ද පිරිවර වේ. මේ ඤාණ දෙක හා **ඉද්ධිවිධාදි** අභිඥා පසදුසි **සප්ත අභිඥා ඤාන** කෙනෙක් මෙහි දක්වන ලදහ. ඔවුන්ගේ ආලම්බන විභාගයෙහි නුමුළාවීම පිණිස, **සතර** වැදුරුම් **ආලම්බන නිකයෝ** වදුළහු ද, දැන් ඒ ආලම්බනයන් කෙරෙහ් **සත්වැදුරුම් අභිඥාවන්** ගේ පැවැත්ම දක්විය යුතු.

ආලම්බනත්‍රික සතර මෙසේ සි.

1 **පරිත්තාරම්මණ** නිකය
2 **මහග්ගාරම්මණ** ,,
3 **අතීතාරම්මණ** ,,
4 **අප්පමාණාරම්මණ** ,, යන මොහුසි.

ඒ **සප්තාභිඥාවන්** අතුරින්

1 ඉද්ධිවිධ ඤාණය

(1) පරිත්තාලම්බනය
(2) මහග්ගතාලම්බනය
(3) අතීතාලම්බනය
(4) අනාගතාලම්බනය
(5) පච්චුප්පන්නාලම්බනය
(6) අප්පමාණාලම්බනය
(7) බහිද්ධාලම්බනය සි **සප්තාලම්බන** යෙකැ පවසී.

ඒ මෙසේසි.

(1) **යම් කලෙක** කරජකායය පාදකධ්‍යාන නිශ්‍රයකොට අදෘශ්‍යමාන **කසින්** යනු කැමැතිව පාදකධ්‍යාන චිත්තයා ගේ වශයෙන් **මහද්ගත** චිත්තයෙහි කය සමාරොපණය කෙරේද එකල්හි **"කායං පරිණාමෙති"** 'කය පිරිනමාය' සි (චිත්තියා විභක්තියෙන් වාච්‍ය වූ කය අරමුණු වේය සි) **කියෙක්** රූප කායයාගේ වණ්ණායතනය ආලම්බන කොට පවත්නා හෙයින් **පරිත්තාලම්බනික** වේ.

(2) **යම් කලෙක පාදකධ්‍යාන සිත** රූපකාය නිශ්‍රය කොට ගෙන දෘශ්‍යමාන **කසින්** යනු කැමැති වැ (රූපකායයා ගේ වශයෙන්) පාදකධ්‍යාන චිත්තය රූපකායයෙහි මෙනවට පිහිටුවා නම් එකල **"චිත්තං පරිණාමෙති"** සි (චිත්තියා විභක්තියෙන් වාච්‍ය වූ) **ධ්‍යාන** චිත්තය අරමුණු කොට පවත්නා හෙයින් **මහග්ගතාලම්බනික** වේ.

(3) යම් **කලෙක** අතීත-නිරුද්ධ වූ ඒ **පාදකධ්‍යාන** චිත්තය මෑ අරමුණු කෙරේ නම් **එකල අතීතාලම්බනික** වේ.

(4) **සඞ්ඛාරීකික** ධාතු නිධානයෙහි අනාගත **කාලය** අධිට්ඨාන **කළා** වූ **මහාකාශ්‍යපා** දී සථවිරවරුන් **ගේ ඉද්ධිවිධ ඤාණය** මෙන් අනාගත කාලය අරමුණු කොට පවතී.

මහා කාශ්‍යප සථවිරයන් වහන්සේ **මහා ධාතු** නිධානය කරනසේක් අනාගතයෙහි දෙසිය අටළොස් (218) වැනි වස **දක්වා** මේ සුවඳ සඳුන් **කල්ක** නො වියළේවා! **මේ** මල් නො මැලවේවා! **මේ** පහන් නො නිවේවා! යි ඉටු සේක. සියල්ල එසේ වී.

අස්සගුත්ත මහතෙරුන් වහන්සේ වත්තනිය සෙනස්නෙහි වැසි නිෂ්ක්‍රමණ වහන්සේ වියළි ඔත් වළඳනු දැක එහි වූ ජලය දිනපතා පෙරබත දීරස වේවා යි ඉටු සේක. පෙරබත ගත් ජලය දීරස වී පසුබත ගත් ජලය පියවි දිය වී.

විශෙෂ:- මේ දෙ තැනම්ෑ ප්‍රත්‍යුත්පන්න සුගන්ධාදිය ගත ද අනාගත රූපය මෑ අධිට්ඨාන චිත්තයට අරමුණු වූ හෙයින් **අනාගතාලම්බනික** වේ.

(5) රූපකාය ය පාදකධ්‍යාන චිත්ත නිශ්‍රය කොට අදෘශ්‍යමාන-කායයෙන් යන **කල්හි ප්‍රත්‍යුත්පන්නාලම්බනික** වේ.

(පාදකධ්‍යාන චිත්තය ප්‍රකෘතියෙන් මෑ අදෘශ්‍යමානය, දෘශ්‍යමාන-රූපකාය ය ඒ ධ්‍යාන චිත්තය නිශ්‍රයකොට ගත් කල්හි රූපකාය ද අදෘශ්‍යමාන වේ.)

(6) කාය වශයෙන් **පාදකධ්‍යාන චිත්තය** හෝ, **පාදකධ්‍යාන චිත්ත** වශයෙන් කය හෝ පිරිනමන කල්හි ද, තමා ගේ කුමාර රූපාදිය මවාපාන කල්හි ද, තමා ගේ රූපකායය හෝ පාදකධ්‍යාන චිත්තය හෝ අරමුණු කරන හෙයින් **අධ්‍යාත්මිකාලම්බනික** වේ.

(7) බාහිර වූ ඇත්-අස් ආදීන් මවාපාන කල්හි **බහිද්ධා-ලම්බනික** වේ.

මෙසේ **ඉද්ධිවිධඤාණය සපනාලම්බන යෙකැ** පැවැත්ම දතයුතු.

2 දිව්‍ය ශ්‍රොත්‍ර ධාතු අභිඥාව

(1) **පරිත්තාලම්බනය**

(2) **ප්‍රත්‍යුත්පන්නාලම්බනය**

(3) **අධ්‍යාත්මාලම්බනය**

(4) **බහිර්ධාලම්බනය** යි සිව් වැදෑරුම් වූ අරමුණෙකැ පවතී. ඒ මෙසේ යි.

(1) **ඒ දිව්‍යශ්‍රොත්‍ර ධාතු ඥානය** ශබ්දය අරමුණු කෙරේ නම් සියලු ශබ්දය **කාමාවචර** හෙයින් **පරිත්තාලම්බනික ය.**

(2) විද්‍යමානවූ මෑ ශබ්දය අරමුණු කරන හෙයින් **ප්‍රත්‍යුත්පන්නා ලම්බනික ය.**

(3) ඒ දිව්‍ය ශ්‍රොත්‍ර ධාතු ඥානය තම කුක්ෂිගත ශබ්දය අරමුණු කොට පවත්නා කල්හි **අධ්‍යාත්මාලම්බනික ය.**

(4) අනුන් ගේ කථිත-- හසිතාදි ශබ්ද අසන කල්හි **බහිර්ධා-ලම්බනික ය.** මෙසේ **දිව්‍යශ්‍රොත්‍රධාතු අභිඥාව සතරාකාර ආලම්බනයෙහි** පවත්නා බව දත යුතු.

3. චෙතොපරිය ඤාණය

(1) **පරිත්තාලම්බනය**
(2) **මහද්ගතාලම්බනය**
(3) **අප්‍රමාණාලම්බනය**
(4) **මාර්ගාලම්බනය**
(5) **අතීතාලම්බනය**
(6) **අනාගතාලම්බනය**
(7) **ප්‍රත්‍යුත්පන්නාලම්බනය**
(8) **බහිර්ධාලම්බනය** යි අට අරමුණෙක පවතී.

ඒ මෙසේ යි.

(1) මෙරමා ගේ **කාමාවචර** සිත් දැනගන්නා කල **පරිත්තා-ලම්බනික ය.**

(2) රූපාවචර-අරූපාවචර සිත් දැනගන්නා කල **මහද්ගතා-ලම්බනික ය.**

(3) මාර්ග-ඵලයන් දැනගන්නා කල **අප්‍රමාණාලම්බනික ය.**

විශෙෂ:- 'පෘථග්ජන **චෙතොපරිය** ඤාණලාභී හට **සෝවාන්** පුද්ගලයා ගේ **මාර්ග-ඵල** සිත් නො දත හැක්කේ ය.' 'සෝවාන්

අභිඥාලාභී හට **ඝනාදිගාමික** මාර්ග-ඵල සිත් නො දත හැක්කේ ය, ඝනාදි ක්‍රමයෙන් **රහතුන් ගේ** මාර්ග-ඵල චිත්තයන් දක්වා එළවිය යුතු. **රහතන් වහන්සේ** සියලු ආර්‍යයන් ගේ සිත් දැනගන්නා සේක. අන්‍ය වූ මත්තෙහි වූ **ආර්‍යයෝ** යට ආර්‍යයන් ගේ සිත් දන්නාහ. එසේ මැ සම සම වූ **ආර්‍යයෝ** සම වූ **ආර්‍යයන් ගේ** සිත් දන්නාහ.

(4) මාර්ග චිත්තය අරමුණු කරන කල්හි **මාර්ගාලම්බනික ය.**

(5) අතීතයෙහි සත් දවසක් ඇතුළත අනුන් ගේ සිත් දැනගන්නා කල **අතීතාලම්බනික ය.**

(6) අනාගතයෙහි සත් දවසක් ඇතුළත සිත් දැනගන්නා කල **අනාගතාලම්බනික ය.**

(7) **ප්‍රත්‍යුත්පන්නාලම්බන** වන සැටි මෙසේ යි. ඒ වූ කලී

(අ) **ඛණ පච්චුප්පන්නය**

(ඉ) **සන්තති පච්චුප්පන්නය**

(උ) **අධ්වා පච්චුප්පන්නය** යි ත්‍රිවිධ වේ.

(අ) උත්පාද – ස්ථිති – භඞ්ග යන ලක්ෂණත්‍රයට පැමිණි ධර්මය **ඛණපච්චුප්පන්න නම්.**

(ඉ) රූපා‘රූපයන් ගේ වශයෙන් එක් සන්තති වාරයෙක හෝ දෙ සන්තති වාරයෙක හෝ ඇතුළත් වූ ධර්මය **සන්තති පච්චුප්පන්න** නම් වේ.

ඒ මෙසේයි:- අන්ධකාරයෙහි සිට ආලෝකයට ගියහුට රූප ප්‍රකට නො වේ. යම්තාක් ඒ ප්‍රකට වේ ද, **ඒ** අතර සන්තති වාර **එකක්** දෙකක් දතයුතු. ආලෝකයෙහි සිට අන්ධකාරයට ගියහුට ද, රූපාලම්බනය ප්‍රකට නො වේ. එය ප්‍රකටවන අතර සන්තති වාර එකක් දෙකක් වේ. දුර සිට රදවුන්ගේ රෙදිගසන හස්ත විකාරය ද, බෙර-ගෙඩි වයන හස්ත විකාරය ද, දැනීම හා ශබ්ද ඇසීම අතර සන්තති එකෙක් දෙකෙක් වේ. **මේ මධ්‍යම ඥාණය මතය යි.**

විශේෂ:- සංයුත්තභාණකයෝ රූප සන්තති, අරූප සන්තති යැයි සන්තති දෙකෙකැයි කියා එයට මෙසේ නිදසුන් දක්වති.

දියෙහි බැස ගියහුට ඉවුර සමීපයෙහි ඇක්මුණු ජලරේඛාව යම්තාක් වේලාවකින් නො පැහැදේ ද මේ අතරතුර කාලය රූප සන්තතියෙක් වේ. තවද දීඝ මාර්ගයෙහි අවුත් සෙවණට

පිවිසියහු ගේ ශරීරයෙහි උණුසුම යම්තාක් නො සන්සිඳේ ද අව්වේ සිට අවුත් ගබඩාවට පිවිසියහු ගේ අඳුරු බව යම්තාක් පහනොවේ ද ඇතුළගබ කමටහත් වඩා දහවල් කවුළුව හැර පිටත බලන්නහුගේ ඇස්හි වසඳවල බව යම්තාක් නො සන්සිඳේ ද මේ අතර කාලය **රූප සඤ්ඤති** නම. දෙතුන් (කාමාවචර) **ජවන වාර** අරූප සඤ්ඤති නමැ" යි කියා මේ දෙක මැ **සඤ්ඤති-පච්චුප්පන්නයෑ** යි කියත්.

(උ) ප්‍රතිසන්ධි - චුති දෙකින් පිරිසිදිනා ලද එක භවයක් ඇතුළත වූ නාම-රූප ධර්ම සමූහය **අඩා පච්චුප්පන්න ය.**

එයින් වදාළහ.

"යොවායං සෝ මනෝ යෙව ධම්මා උභයමෙපතං පච්චුප්පන්නං තස්මිං පච්චුප්පන්නෙ ඡන්දරාගපරිබන්ධං හොති විඤ්ඤාණං. ඡන්දරාගපරිබන්ධත්තා විඤ්ඤාණස්ස තදභිනන්දති. තදභිනන්දනෙනා පච්චුප්පන්නෙනාපි ධම්මෙසු සංහීරතීති"[1]

'ඇවැත්නි! සම්ප්‍රයුක්ත ධර්ම සහිත යම් සිතෙක් වේ ද, යම් ආලම්බන කෙනෙක් වේද් ද, නොහොත් **මනායතනයක්** හා වෙදනාදි **නාමඛන්ධ** වේද් ද, ඒ **මනායතන-ධම්මායතන** දෙක මැ **අඩාපච්චුප්පන්නයෙහි** ඇතුළත් වේ. ඒ **අඩාපච්චුප්පන්නයෙහි** නිකන්ති විඤ්ඤාණය ඡන්ද රාගයෙන් ප්‍රතිබද්ධ වූයේ වේ. ඒ නිකන්ති විඤ්ඤාණය ඡන්ද රාගයෙන් ප්‍රතිබද්ධ බැවින් ඒ **ප්‍රත්‍යුත්පන්න ධර්මයෙහි** තෘෂ්ණා - දෘෂ්ටි අභිනන්දන වශයෙන් ඇලෙන්නේ වෙයි. ඒ ප්‍රත්‍යුත්පන්න ධර්මයෙහි ඇලෙන්නා වූ සත්ත්වතෙමේ ඒ ධර්මයන්හි ඇතිලෙන්නේ වෙයි. (මොවුන් අතුරින් මෙහි **සඤ්ඤති පච්චුප්පන්නය** අටුවාචාර්‍යයෝ ය.)

විශේෂ:- මෙහි **ද්වාදශායතනය ප්‍රත්‍යුත්පන්නය** යි ගත් හෙයින් ඒ දොළොස් ආයතනයෙහි පැවැති ඡන්දරාගය, **'අඩා-පච්චුප්පන්නාලම්බනය, ඛණ පච්චුප්පන්නාලම්බන** නො වේ යයි' දක්වනු පිණිස මේ සූත්‍රය දැක් වී.

තවද, විදර්ශනා චිත්තය **ඛණපච්චුප්පන්නය,** විදර්ශනා කටයුතු ධර්මයෝ **අඩා පච්චුප්පන්නයහ** යි ගත යුතු ය. අන් පරිද්දෙකින් වේ නම් විදර්ශනා නො ලැබෙන්නේ ය.

'අඩා පච්චුප්පන්නය සූත්‍රයෙහි ආයේ ය. **ඛණ පච්චුප්පන්නය** පෙළෙහි ආයේය' යි නො කියන ලද්දේ ඒ වශයෙන් අරමුණු කිරීම අටුවාහි නො ආ හෙයිනි.

---

[1] ම: නි: උපරිපණ්ණාසක 208

මතඥෙදඃ- 'මේ තුන් වැදෑරුම් ප්‍රත්‍යුත්පන්නයන් අතුරින් **ඛණපච්චුප්පඤඤචිත්තය, චෙතොපරියඤඤණයට** අරමුණු වේ ය යි' **අභයගිරි වාසී ආචාය්‍යවරයෝ** කියති.

කවරහෙයින් ද යත්:- සෘඬිමත්හුගේ ද, මෙරමාගේ ද එකක්ෂණයෙහි සිත උපදනා හෙයිනැ යි කියත්. මේ එයට සාධකයෙකි "මල් මිටක් ගෙන අහසට දැමූ කල එසින් එක් මල් තටුවක් අනෙක් මල් තටුවක මුහුණට මුහුණ ලා වැටෙන්නාක් මෙනි. 'මෙරමා සිත් දැන ගනිමි යි' රාශි වශයෙන් මහාජනයා ගේ සිත් ආවජ්නා කරන කල්හි අවශ්‍යයෙන් එක්තරා කෙනෙකුත් ගේ සිතක් සෘඬිමත්හු ගේ සිතකින් උත්පාදක්ෂණයෙහි හෝ, ස්ථිති ක්ෂණයෙහි හෝ, භඞ්ග ක්ෂණයෙහි හෝ දැනගන්නේය" යි කියා යි

මේ වූකලි, 'හවුරුදු සියයක් මුළුල්ලෙහි හෝ දහසක් මුළුල්ලෙහි හෝ ආවජ්නා කරන්නහු ගේ යම් සිතකින් ආවජ්නා කෙරේ ද, යම් සිතකින් දැනගන්නේ ද, ඒ දෙ සිතේ එක්වැ පැවැත්මක් නැති හෙයින් හා ආවජ්නා ජවනයන් ගේ මාගී-ඵල වීථියෙන් අන්‍ය වූ නොකැමති විය යුතු සථානයෙක්හි නානාලම්බන අභාවප්‍රාප්ති දෙෂය ඇති බැවින් ද නොයෙදේ යයි, (**අභයගිරි** වාසීන් ගේ) වාදය අටුවාවන්හි ප්‍රතික්ෂිප්තයි.

එසේ වත්නා **චෙතොපරිය ඤණය** කෙසේ **පච්චුප්පන්නා-ලම්බනික** වේදයත්:- **චෙතොපරිය ඤණයට සන්තති පච්චුප්ප-න්නය** හා **අධා පච්චුප්පන්නය** ද යන දෙකමැ අරමුණු වන්නේ ය යි දත යුතු.

ඒ දෙවැදෑරුම් ආලම්බනයන් අතුරින් වර්තමාන ජවන වීථියෙන් අතීත-අනාගත වශයෙන් දෙතුන් ජවන වීථි ප්‍රමාණ කාලයෙහි මෙරමා හට යම් සිතෙක් පහළවේ ද, ඒ සියලු සිත **සන්තති-පච්චුප්පන්න** නම.

අධා පච්චුප්පන්නය වනාහි ජවන වාරයෙන් ප්‍රකාශ කටයුතුයැ යි **සංයුත්ත** අටුවාහි කී වචනය මොනවට කියන ලද්දේ මැ යි. (ජවන වාරයා ගේ **අධා පච්චුප්පන්න** භාවය ප්‍රකාශ කිරීම් මුඛයෙන් **සෘඬි චිත්තය** පවත්නා ආකාරය දක්වයි.) සෘඬිමත් තෙමේ මෙරමා සිත දැනගනු කැමති වැ ආවජ්නා කෙරේ ද, ඒ ආවජ්න චිත්තය **ඛණ පච්චුප්පන්නය** අරමුණු කොට ඒ (අරමුණු කළ) සිත හා නිරුඬ වේ. ඉන්පසු ජවන සතරෙක්-පසෙක් දිවේ. ඔවුනතුරින් අන්තිම ජවනය **සෘඬි** නම් වේ.

සෙසු ජවනයෝ කාමාවචරයෝ ය. ඒ සියලු ජවනයන්ට (නිරුඬ වූ ආවජ්ජනයන්ට) අරමුණු වූ ඒ මෙරමා ගේ චිත්තය මැ අරමුණු වේ, ඒ ආවජ්ජන ජවනයෝ නානාලම්බනික නො වෙත්. කාල වශයෙන් **ප්‍රත්‍යුත්පන්නාලම්බනික** හෙයිනි. එකාලම්බනික වූ ද යෘද්ධි චිත්තය ම මෙරමා ගේ සිත පිරිසිඳ දන්නේ මැයි.

යෘද්ධි චිත්තයෙන් අන්‍ය වූ **ආවජ්ජන – පරිකර්ම** චිත්තයෝ නො දනිති. චක්ෂුර්ද්වාර වීථියෙහි **චක්ෂුර් විඤ්ඤාන චිත්තය මැ** රූප දක්නේ ය. අන්‍ය වූ **පඤ්චද්වාරාවජ්ජන- සම්පටිච්ඡන- සන්තීරණ- වොට්ඨපන සිත්** රූප නො දක්නාක් මෙනි.

මෙසේ මේ **චෙතෝපරිය ඤාණය:- සන්තති පච්චුප්පන්නයා ගේ ද, අද්ධා පච්චුප්පන්නයා ගේ ද,** වශයෙන් **පච්චුප්පන්නා- ලම්බනික වේ. සන්තති පච්චුප්පන්නය ද, අද්ධා පච්චුප්පන්න- යෙහි** වැටෙන හෙයින් මැ **ඒ චෙතෝපරිය ඤාණය අද්ධා පච්චුප්පන්න** වශයෙන් මැ **පච්චුප්පන්නාලම්බනික වේ ය යි** දත යුතු.

(8) එසේ මැ මෙරමා ගේ චිත්තය ආලම්බන කොට ඇති හෙයින් **බහිද්ධාලම්බනික** වේ.

මෙසේ **චෙතෝපරියඤාණය** අට වැදෑරුම් අරමුණෙකැ පවත්නා බව දත යුතු.

4 පුබ්බේනිවාසානුස්සතිඤාණය ද පරිත්තාලම්බනාදි වශයෙන් ආලම්බන අටෙකැ පවතී.

කෙසේදයත්:- (1) ඒ **පුබ්බේනිවාසානුස්සතිඤාණය** කාමාවචර සඤ්ඤයන් සිහි කරන කාලයෙහි **පරිත්තාලම්බනික යැ.**

(2) රූපාවචර – අරූපාවචර ධ්‍යාන සිහි කරන කල්හි **මහද්ගතාලම්බනික යැ.**

(3) අතීත භවයෙහි තමා විසින් හෝ මෙරමා විසින් වඩනා ලද මාගී හා ප්‍රත්‍යක්ෂ කරන ලද ඵල සිහි කරන කල්හි **අප්පමාණා- ලම්බනික යැ.**

(4) වඩනා ලද මාගීය මැ සිහි කරන කල්හි **මාගීලම්බනික යැ.**

(5) නියමයෙන් මැ මේ **පුබ්බේනිවාසානුස්සතිඤාණය අතීතා- ලම්බනික මැ** වේ.

ඔවුනතුරෙන් හුදෙක් **චෙතෝපරියඤාණය- යථාකම්මූපග- ඤාණය** යන දෙදෙන අතීතාලම්බන වන්නාහ. එතෙකුදු

වුවත් ඔවුනතුරින් **චෙතොපරියඤාණයට** අතීතයෙහි සත් දවසක් තුළ ඉක්ම ගිය චිත්තය ම අරමුණු වේ. (එය එයින් අන්‍ය වූ සිතක් හෝ, සකඬප්‍රතිබද්ධ නාම-ගොත්‍රාදියක් හෝ නො දනී.)

මාර්ගය හා සම්ප්‍රයුක්ත චිත්තය අරමුණු කොට ඇති හෙයින් පර්‍යාය වශයෙන් **මාර්ගාලම්බනිකයැ** යි කියන ලදී. **යථාකම්මූපග ඤාණයට** ද, අතීත කුසලා'කුසල චේතනාව මැ අරමුණු වේ.

විශේෂ:- **පුබ්බේනිවාසානුස්සතිඤානයට** අතීත **සඬඛයන්** ද, සඬඛප්‍රතිබද්ධවූනාමගොත්‍රාදිය ද, යන මොවුන් අතුරින් අරමුණු නො වන කිසි ධර්‍මයෙක් නැත්තේ ය.

ඒ එසේ මැයි.

ඒ **පුබ්බේනිවාසානුස්සතිඤානය** අතීත වූ සඬඛය, සඬඛ-ප්‍රතිබද්ධ නාම ගොත්‍රාදිය, නිර්‍වාණය සහිත සියලු ධර්‍ම විෂයෙහි **සච්ඡිකිරියඤානයා ගේ** සවභාවය ඇත්තේ ය. මේ මෙහි අටුවා නය යි.[1]

"කුසලකම්මා ඉද්ධිවිධ ඤාණස්ස චෙතොපරිය ඤාණස්ස යථාකම්මූපග ඤාණස්ස අනාගතංස ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයෝ"[2]

"කුශලසඬඛ **ඉද්ධිවිධඤාණය, චෙතොපරියඤාණය, පුබ්බේනිවාසානුස්සතිඤාණය, යථාකම්මූපගඤාණය, අනා-ගතංසඤාණය** යන මොවුන්ට ආලම්බන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙති" යි වදාළ හෙයින් සතර නාම සඬඛයෝ මැ **චෙතොපරිය ඤාණයට හා යථාකම්මූපගඤාණයට** අරමුණු වෙති.

ඔවුනතුරින්ද **යථාකම්මූපග ඤාණයට** කුශලා'කුශල සඬඛ-යෝ මැ අරමුණු වෙති.

(6) තමා ගේ අතීත වූ සඬඛ සිහි කරන කල මේ **පුබ්බේ-නිවාසානුස්සතිඤානය ආඛ්‍යාතමාලම්බනිඤ ය.**

(7) මෙරමා සඬඛයන් සිහි කරන කල **ඛන්ධාලම්බනිඤ ය.**

(8) 'අතීතයෙහි **විපස්සී භාග්‍යවතුන් වහන්සේ** වූ සේක. උන්වහන්සේ ගේ මෑණියෝ **'බන්ධුමතී'** නමු. පියාණෝ **'බන්ධුමා'** නම්හ' යි යනාදීන් නාම-ගොත්‍ර පෘථිවී නිමිත්තාදිය සිහි කරන කල **නවඤත්ත්‍යාලම්බනිඤ යැ.**

---

[1]අත්‍ථසාලිනී අට්ඨකථා 347. [2]ප: පකරණ පඤ්හවාර 92 පිට.

මෙහි **නාම- ගොත්‍ර** යැ යි කියන ලද්දේ **සඤ්ඤා** ප්‍රතිබද්ධ සම්මුතියෙන් සිද්ධ ශබ්දාර්ථය යි. ශබ්දය නාම- ගොත්‍ර යැයි නො ගත යුතු. ව්‍යඤ්ජන සඤ්ඤාත **ශබ්දය** ශබ්දායතන සංගෘහීත වන බැවින් **කාමාවචර** ධර්මයෙක් වේ. එහෙයින් **"නිරුත්ති පටිසම්භිදාපරිත්තාලම්බනා"** ති[1] 'නිරුත්ති පටිසම්භිදාව **කාමාවචරාලම්බන** වේ' යැයි වදාළහ. **නාම-ගොත්‍රය** නම් සම්මුතියෙන් සිඳ ශබ්දාර්ථයැ යි යන විනිශ්චය වනාහි අප ගේ **අත්තනෝමතිය,** යි. මෙසේ **පූර්වේනිවාසානුස්මෘතිඥානය අරමුණු අටෙකැ** පැවැත් ම වේ.

5. දිබ්බචක්ඛු ඤාණය:- පරිත්ත-පච්චුප්පන්න-අජ්ඣත්ත-බාහිරාලම්බන වශයෙන් සිවු වැදෑරුම් ආලම්බනයෙහි පවත්නේ ය.

කෙසේද යත්:- (1) ඒ **දිව්‍යචක්ෂුරභිඥානය,** රූප අරමුණු කරන කල (රූපය කාමාවචර හෙයින්) **කාමාවචරාලම්බනික** යැ.

(2) විද්‍යමානවූ මැ රූපාලම්බනයෙහි පවත්නා හෙයින් **පච්චුප්පන්නාලම්බනික** යැ.

(3) තමා කුක්ෂිගත රූපාලම්බනාදියක් අරමුණු කරන කල **අජ්ඣත්තාලම්බනික** යැ.

(4) මෙරමා ගේ රූපායතනාදියක් අරමුණු කරන කල්හි **බහිද්ධාලම්බනික** යැ.

මෙසේ **දිව්‍යචක්ෂුරභිඥානය** සතර අරමුණෙකැ පවත්නේ ය.

6. අනාගතංසඤාණය:- පරිත්ත-මහග්ගත-අප්පමාණ-මග්ග-අනාගත-අජ්ඣත්ත-බහිද්ධා-නවත්තබ්බ වශයෙන් අට අරමුණෙකැ පවතී.

(1) 'මෙතෙමේ අනාගත ආත්මයෙහි කාමාවචර භූමියෙහි උපදනේ ය' යි දැනගන්නා කල **පරිත්තාලම්බනික යැ.**

(2) මතු 'රූපා'රූප භූමීන්හි උපදනේ ය' යි දැනගන්නා කල **මහග්ගතාලම්බනික යැ.**

(3) 'මාගීය වඩන්නේ ය. ඵලය ප්‍රත්‍යවේක්ෂා කරන්නේ යැ' යි දැනගන්නා කල **අප්පමාණාලම්බනික යැ.**

(4) 'මාගීය වඩන්නේය' යි දැනගන්නා කල **මග්ගාලම්බනික යැ.**

(5) ඒ **අනාගතාංශ ඥානය** එකාන්තයෙන් මැ **අනාගතාලම්බනික යැ.**

---

[1] වි: ප: පටිසම්භිදා වි: 230 පිට

විශෙෂ:- මොවුනතුරින් හුදෙක් **චෙතොපරියඤ්ඤය** ද අනාගතාලම්බනික සි. එතෙකුදු වුවත් එයට අනාගතයෙහි සත් දවසක් ඇතුළත පවත්නා චිත්තයමැ අරමුණු වේ. හෙද ඒ සිනින් අන්‍ය වූ රූපසන්ධ හෝ සන්ධ ප්‍රතිබද්ධ නාම-ගොත්‍රාදිය හෝ නො දන්නේ ය. අනාගතාංශ ඥානයට පූර්වේනිවාසානුස්මෘති ඥානයෙහි කී සෙයින් අරමුණු නොවන්නා වූ අනාගත කාලික ධර්මයෙක් නම් නැති.

(6) 'මම අනාගතයෙහි අසුවල් තැන උපදිනෙම්' යි දැනගන්නා කල **ආධ්‍යාත්මාලම්බනික යැ.**

(7) 'අසුවල් සත්ත්ව තෙමේ අනාගත භවයෙහි අසුවල් තැන උපදනේ ය' යි දැනගන්නා කල **බහිර්ධාලම්බනික යැ.**

(8) 'අනාගතයෙහි **මෙතේ බුදුහු** උපදනාහ. උන්වහන්සේ ගේ පිය තොමේ **"සුබ්‍රහ්මා"** නම් බ්‍රාහ්මණ යැ. මවු තොමෝ **"බ්‍රහ්මවතී"** නම් බැමිණිය' යැ. යනාදීන් නාම - ගොත්‍රාදීන් දැනගන්නා කල පූර්වේනිවාස ඥානයෙහි කී සෙයින් **නවත්තබ්බාලම්බණික යැ.**

මෙසේ **අනාගතාංස ඤාණය** අට වැදෑරුම් වේ.

7. යථාකම්මූපග ඤාණය:- පරිත්ත- මහග්ගත- අනීත-අප්පටිත්ත- බහිද්ධා- ආලම්බන වශයෙන් අරමුණු පසෙක පවතී. ඒ මෙසේ සි.

(1) කාමාවචර කර්ම දැනගන්නා කල **පරිත්තාලම්බනික යැ.**

(2) රූපා'රූප කර්ම දැනගන්නා කල **මහග්ගතාලම්බනික යැ.**

(3) අතීත කුශලාකුශල කර්ම දැනගන්නා කල **අතීතාලම්බනික යැ.**

(4) තමා ගේ කර්ම දැනගන්නා කල **ආධ්‍යාත්මාලම්බනිකයැ.**

(5) මෙරමා ගේ කර්ම දැනගන්නා කල **බහිර්ධාලම්බනික යැ.**

මෙසේ **යථාකම්මූපග ඤාණයා** ගේ පස් තැනෙකැ පැවැත්ම දතයුතු.

මෙහි **අධ්‍යාත්මාලම්බන- බාහිරාලම්බන** යැ සි කියේ, 'ඇතැම් කලෙක අධ්‍යාත්මාලම්බන දැනගැනීමේදී **අධ්‍යාත්මයෙහි** ද, ඇතැම් කලෙක බාහිරාලම්බන දැනගැනීමේදී **බහිර්ධාලම්බනයෙහි** ද වේ යැ' යි දැනගැනීම සඳහා යැ.

මෙතෙකින් සාධු ජනයා ගේ ප්‍රමොදය පිණිස කළ 'විශුද්ධි මාර්ගයෙහි' අභිඥා නිර්දේශ නම් තෙළෙස් වන පරිච්ඡේදය නිමි.

14. සකනිඩ නිදේශය

මෙසේ **පඤ්ඤාභිඤ්ඤා** වශයෙන් ලබන ලද අනුසස් ඇති අතිශයින් **සිර**වූ **සමාධි භාවනාවෙන්** යුක්තවූ යොගාවචර **භික්ෂුව** විසින් **'සීලෙපතිට්ඨාය නරෝ සපඤ්ඤෝ-චිත්තං පඤ්ඤඤ්ච භාවයං'**[1] යි මෙහි චිත්ත ශීර්ෂයෙන් දැක් වූ **සමාධිය** සවිකාරයෙන් වඩන ලද්දේ වේ. (දැන්) එයට අනතුරු මෑ **ප්‍රඥා භාවනාව** වැඩිය යුතුය.

එහෙත් එය **'පඤ්ඤං භාවයං'** යි ඉතා සැකෙවින් වදාරන ලද හෙයින් නො දත හැකි වේ. වැඩීමට අතිශයින් දුෂ්කර ද වේ. එහෙයින් ඒ **ප්‍රඥා භාවනාව** පිළිබඳ විසතර ක්‍රමය **දැක්වීම** සඳහා මේ ප්‍රශ්න (විචාරීම) වේ.

1. ප්‍රඥාව නම් කිම
2. **කවර** අර්ථයෙන් ප්‍රඥා නම් වේ ද
3. ඒ ප්‍රඥාව ගේ **ලක්ෂණ**, රස, ප්‍රත්‍යුපස්ථාන, පදස්ථානයෝ **කවරහු** ද
4. ප්‍රඥාව කී වැදෑරුම් ද
5. කෙසේ ප්‍රඥා භාවනා වැඩිය යුතු ද
6. ප්‍රඥා භාවනානිශංස **කවරේ** ද යනු යි.

විශේෂ:- i. මෙහි **සංකිලෙස - වොදානයෝ** කවරහෙයින් නො දැක්වූහු ද යත්

ලොකොත්තර ප්‍රඥාවේ කෙලෙසීමක් නැති හෙයින් හා ඒ නැති **කල** පිරිසිදු වීමක් කැලෑ මෑ නැති හෙයිනි. එය ලෞකික අවස්ථාවෙහි **" මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි"** වශයෙන් භාවනා-වෙහි මෑ ඇතුළත් වේ. 'ඒ **සමාධි** භාවනාවෙහි ඇතුළත් වූ හෙයින් හෝ මෙහි නො ගැනිණැ' යි ද යෙති.

ii. ප්‍රතිපත්තිය ද ආනිසංස දැක් වූ හෙයින් 'එහි මෑ ඇතුළත් වේ ය' යි නො දැක් වී.

මේ ප්‍රශ්නයක් පාසා පිළිතුරු ය.

1. **ප්‍රඥාව** නානා විධ ය. ඒ සියල්ල විසතර කිරීමට ඇරැඹි නම් **විදර්ශනාඥාණප්‍රඥාව** වශයෙන් අදහස් කළ අර්ථය සිදු නො වේ. හුදෙක් නොසන්සුන් බව පිණිස පවතී. එහෙයින් **කුසල් සිතෙහි යෙදුණු විදර්ශනා ඥානය** මෙහිලා **ප්‍රඥායැ** යි අභිප්‍රේත යැ.

---

[1] සං: නි: දෙවතා සං: 8 පිට

2. 'ප්‍රභෙද වශයෙන් දැනගැනීම් අර්ථයෙන්' **ප්‍රඥා** නම් වේ. අරමුණු **හැඳින** ගැනීම ය, විශෙෂ දැනගැනීම ය, නානාප්‍රකාරයෙන් ප්‍රභෙද වශයෙන් දැනගැනීම ය, යන මේ **ලක්‍ෂණ** වශයෙන් **සංඥා- විඥාන- ප්‍රඥාවන්** ගේ දැනීම සමාන වුව ද, මෙහිලා විශෙෂය නම්, **සංඥාව** නීල-පීතාදි වශයෙන් අරමුණ **හැඳිනීම්** මාත්‍රය මුත් අනිත්‍යාදි වශයෙන් **ලක්‍ෂණ** දැනීම නො **කෙරේ**. **විඥානය** නීලාදි වශයෙන් අරමුණ හැඳිනීම හා **අනිත්‍යාදි** වශයෙන් **ලක්‍ෂණ** ප්‍රතිවෙධය ද කෙරේ. එහෙත් උත්සාහ කොට **මාර්ග** ඉපදවීමට සමර්ථ නො වේ.

ප්‍රඥාව වනාහි නීල-පීතාදි වශයෙන් අරමුණ හැඳිනීමෙහි ද, අනිත්‍යාදි වශයෙන් ලක්‍ෂණ දැනීමෙහි ද **උදයව්‍යයඥානාදි** පිළිවෙළින් ව්‍යායාම කොට **මාර්ග** පහළ කිරීමෙහි ද සමර්ථ වේ.

නිදර්ශනයෙකි:- රන්කරුවා ගේ රන්පෝරුව මත තැබූ කහවණු රැසක් දැක (ගනු දෙනු කිරීම් ආදිය පිළිබඳ) හටගත් නුවණ තැති බාල දරුවෙක් ද, පිටිසර ගම් වැසි **පුරුෂයෙක් ද, රන්කරුවෙක් ද** යන තුන් දෙනා අතුරෙන් බාල දරුවා ඒ කහවණුයෙහි වර්ණය, සලකුණු ය, යන මේ වශයෙන් දැනගනී. එහෙත් ගනුදෙනු ආදිය පිණිස පාවිච්චි කරන මෙතෙක් අගනා වස්තුවෙකැ යි නො දනී.

පිටිසර වැසියා එහි වර්ණ-සටහන් ආදිය ද දැනගනී. 'මනුෂ්‍යයන් ගේ ගනුදෙනු පිණිස උපයෝගී වස්තුවකැ' යි ද දැනගනී. එහෙත් 'මේ කහවණුව දඹරන් ආදි ඒ ඒ රනින් කළ මා ඇති කහවණුවකැ' යි හෝ 'මෙය තඹ ආදියෙන් කළ බාළ කහවණුවකැ' යි හෝ යනාදි විසින් විශෙෂ විභාග නො දනී.

රන්කරු තෙමේ මේ සියලු ආකාරයෙන් හෙවත් ළදරුවා ගේ හැඳිනීම් ආකාරය ද, පිටිසර වැසියා ගේ හැඳිනීම් ආකාරය ද, දන්නේ වෙයි. එසේ දන්නේ ද කහවණු ඇසින් බැලීමෙන් ද, ගටා කනින් හඬ ඇසීමෙන් ද, සිඹ කැහැයෙන් ගඳ දැනීමෙන් ද, දිව ගා රස බැලීමෙන් ද, අතින් කිරා බරින් ද දැනගනී. 'අසුවල් ගම හෝ නියම්ගම හෝ නුවර හෝ කරන ලද' යි හෝ 'අසුවල් පළාතයෙහි උපතැ' යි හෝ 'අසුවල් ශිල්පියා විසින් කරන ලද' යි හෝ දැනගනී.

උපමාන-උපමෙය සංසන්දනය මෙසේ යි.

සංඥාව ව්‍යවහාරාදිය නො දත් ළදරුවා ගේ කහවණු හැඳිනීම මෙනි. නීලාදි වශයෙන් අරමුණ වැටහුණු ආකාර මාත්‍රයක් ගන්නා හෙයිනි.

විඤ්ඤාණය පිටිසර ගම් වැසියා ගේ කහවණු හැඳිනීම මෙනි. නීලාදි වශයෙන් **වණ්ණ** – සණ්ඨානාදිය හැඳිනීමට හා මත්තෙහි අනිත්‍යාදි වශයෙන් **ලක්ඛණ** ප්‍රතිවෙධයට ද පමුණුවන හෙයිනි.

ප්‍රඥාව රන් කරුවා ගේ කහවණු හැඳිනීම මෙනි. නීලාදි වශයෙන් අරමුණු ආකාර දැනීමට ද, අනිත්‍යාදි වශයෙන් ලක්ෂණ ප්‍රතිවෙධයට ද පමුණුවා මත්තෙහි ද **සෝවාන්** ආදි **මාර්ගඵලයන්ට** පමුණුවන හෙයිනි. **'පජානනඤෙන පඤ්ඤා'** යි විවිධාකාරයෙන් ප්‍රකට කොට දැනීම් අර්ථයෙන් **ප්‍රඥා** යි.

එහෙයින් අරමුණ හැඳිනීමය, විවිධාකාරයෙන් දැනගැනීම යයන මොවුන්ට වඩා විශිෂ්ට වූ විවිධාකාරයෙන් ප්‍රකට කොට දැනීම පජානනය යි. එසින් ම (**මේ** විවිධාකාරයෙන්) 'ප්‍රකෂ්‍යෙන් දැනීම් අර්ථයෙන් **ප්‍රඥා**' යි කිහ.

ඇතැම් චිත්තෝත්පාදයන්හි **සංඥා – විඤ්ඤාන** ඇත ද (එහි දුහෙතුක-අහෙතුක සිත්හි) **ප්‍රඥාව** නො යෙදේ. සියලු චිත්තයක් පාසා **සංඥා - විඤ්ඤාන** වේ. එහෙත් **ප්‍රඥාව** යෙදෙන සිත්හි **සංඥා – විඤ්ඤාන** යන්ගෙන් වෙන්වා නො යෙදේ. මෙසේ බෙදිය නො හැකි **ධර්ම** අතුරින් ඔවුනොවුන් ගේ වෙනස දැනීම ඉතා දුෂ්කර හෙයින් මොවුහු නො ලද හැකි වෙනස ඇති සියුම් වූ, දැකීමට දුෂ්කර වූ **ධර්මයෝ ය.**

එහෙයින් මැ **නාගසේන** ස්ථවිරයන් වහන්සේ
මහරජ! **නාගසේනවහන්සේ** දුෂ්කරයක් කළසේක.

මිලිඳු රජ – සවාමීනි! **නාගසේන** ස්ථවිරයන් වහන්ස! බුදුහු කවර දුෂ්කරයක් කළසේක් ද

නාගසේන ස්ථවිර – මහරජ! එක් අරමුණෙක පවත්නා අරූපී වූ **චිත්ත-චෛතසික** ධර්මයන් අතුරින් 'මේ **ඵස්සය**, මෝ **වේදනාය**, මෝ **සංඥාය**, මෝ **චේතනාය**, මේ **චිත්තයෑ** යි. මෙසේ වෙනස් ආකාර දෙශනා කිරීමෙන් අනෙකකු විසින් නො කටහැකි දුෂ්කරයක් කළසේකැ යි කී.[1]

3 එහි **ලක්ෂණ, රස, ප්‍රත්‍යුපස්ථාන, පදස්ථාන,** කවරේ ද **පෘථිවි** ආදි රූප ධර්මයන් ගේ තද බව් ආදිය හා, **ඵස්සාදි** අරූප ධර්මයන් ගේ අරමුණෙහි වැදගැනීම් සවභාවාදි **එකිනෙකෙහි** පවත්නා විශෙෂ සවභාවය හෝ අනිත්‍යාදි සියල්ලට සාධාරණ සවභාවය හෝ අවිපරීත සේ අවබොධ කිරීම **ප්‍රඥාවේ ලක්ෂණය යි.**

[1] මි: ප: 69 පිට

ඒ **නාම-රූප** ධර්මයන් ගේ සවාභාවික **ලක්ෂණය** මුවහ කරන්නා වූ මොහාන්ධකාරය දුරලීම **ප්‍රඥායෙහි කෘත්‍ය** සඞ්ඛ්‍යාත **රසය යි.** (ප්‍රඥාව උපදනේ ම හෘදයෙහි පවත්නා මොහාන්ධකාරය දුරු කෙරේ.)

ඒ ඒ **නාම - රූප** ධර්මයන්හි නොමුළාවීම් සඞ්ඛ්‍යාත ඵලය **පච්චුපට්ඨානය යි.** (මොහය ප්‍රහාණය වත් මැ ධර්ම සවභාවයෙහි මුළා නො වේ.)

සමාධිය ප්‍රඥාවේ ආසන්නකාරණය යි. (විදර්ශීනා ප්‍රඥාව මෙහිලා අභිප්‍රෙත හෙයිනි.)

4. **නාම-රූප** ධර්මයන් ගේ පෙර කී සේ සාමාන්‍ය විශෙෂ සවභාවය ප්‍රතිවෙධ කිරීම් වශයෙන් **ප්‍රඥාව** ආවෙණික සවභාවයෙන් හුදෙක් **එකවිධ ය.**

(2) **විභඞ්ග**:- i **කාමාවචර- රූපාවචර- අරූපාවචර**- කුසල චිත්තයෙහි හෝ විශෙෂයෙන් **දිට්ඨි** ආදි සතර **විසුද්ධීන්හි** හෝ යෙදෙන **ප්‍රඥා** වශයෙන් **ලෞකික ද, සෝවාන් ආදි මාගී සිත්හි** යෙදෙන **ප්‍රඥා** වශයෙන් **ලොකොත්තරද යි** දෙ වැදෑරුම් වේ.

එසේ මැ:- ii. කාමාදි ආශ්‍රවයනට හෝ තත් සම්ප්‍රයුක්තයනට අරමුණු වූ **ප්‍රඥාව සාශ්‍රව ද** කාමාදි ආශ්‍රවයන්ට අරමුණු නොවූ හෝ ආශ්‍රව සම්ප්‍රයුක්ත නොවූ **ප්‍රඥාව අනාශ්‍රවද යි** දෙ වැදෑරුම් වේ.

iii විදර්ශීනා වඩන්නහු ගේ **සතර නාම ධර්ම** විභාග කිරීම් වශයෙන් පැවැත්තේ **නාම ව්‍යවස්ථාපනප්‍රඥාය.** රූප විභාග කිරීම් වශයෙන් පැවැත්තේ **රූප ව්‍යවස්ථාපනප්‍රඥාය.**

iv සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත කුසල් දෙ සිතෙහි හා රූපාවචර **ප්‍රථම-ද්විතීය-තෘතීය-චතුර්ථ ධ්‍යානයන්** සම්බන්ධ වූ **සොළොස්** (16) **මාගී** චිත්තයෙහි යෙදුණු **ප්‍රඥාව සොමනස්ස-සහගතය.** උපෙක්ඛා සහගත ඤාණසම්පයුත්ත කාමාවචර කුසල් දෙ සිතෙහි හා **පඤ්චමධ්‍යානික** සතර මාගී චිත්තයෙහි ද යෙදුණු **ප්‍රඥාව උපෙක්ඛා සහගත ය.**

v **සෝවාන් මාගීය** හා යෙදුණු **ප්‍රඥාව** ප්‍රථම කොට **නිර්වාණය** දක්නා හෙයින් **දර්ශනභූමිකය.** අවශෙෂ **මාගීත්‍රය ය** හා යෙදුණු **ප්‍රඥාව භාවනා භූමිකය,** මේ දෙ ප්‍රකාර ප්‍රඥා භෙදයෝ ය.

(3) **නිභෙද** (1) ශ්‍රුතාදීන් තොරව තමා ම සිතා උපදවන **ලද්දේ චින්තාමය ය.**

අනුන් ගේ උපදෙසින් උපදවන ලද්දේ **ශ්‍රුතමය යැ.**

අසා හෝ නො අසා හෝ භාවනා වෙන් උපදවන **ලද** (අර්ථ) **ප්‍රඥාව භාවනාමය යැ.**

විඤ්ඤාණ:- එහි විඤ්ඤාණය **ප්‍රඥාව** කවර ද, ප්‍රඥයෙන් යොදන ලද ජීවනොපාය වූ **කර්මාන්ත**යෙහි ද, එබඳු වූ ම හීන-උත්කෘෂ්ට-ශිල්පයන්හි ද, තමා සවභාවයෙන් සිතා පණ්ඩිතයන් විසින් නිපදවන ලද විද්‍යාවන්හි ද, 'කර්මය සවකීය කොට ඇති බව දැනීමෙහි ද, **චතුස්සත්‍ය ප්‍රතිවෙධයට** නැඹීගත් විදර්ශනා ඥානයෙහි හෝ **රූපය අනිත්‍යය, දුඃඛය, අනාත්මය**, කියා ද, **වේදනා - සංඥා - සංස්කාර - විඥාන අනිත්‍යය, දුඃඛය, අනාත්මය** කියා හෝ මෙසේ හීන පිණිස නැමුණු මේ සියල්ල දැකිය හැකි හෙයින් ද, දක්නා හෙයින් ද, රුචිකරන හෙයින් ද, නුවණින් සලකන හෙයින් ද, **"තෙමේම සවභාවයෙන් වැටහේ. මෙරමා ගෙන් නො අසා ප්‍රතිවෙධ වේ, නුසි මේ විඤ්ඤාණය ප්‍රඥා නම්.** (මේ බෝසතුන්ට ම උපදනා ප්‍රඥ විශෙෂයෙකි)

එයින් වදාළහ.

"තත්‍ථ කතමා විඤ්ඤාණා පඤ්ඤා, යොග විකිතෙසුවා කම්මායතනෙසු, යොග විකිතෙසුවා සිප්පායතනෙසු, යොග විකිතෙසුවා විජ්ජාට්ඨානෙසු සමම්මසකතංවා, සවවානුලොම්කංවා, රූපං අනිවවතතිවා, වෙදනා - සඤ්ඤා - සංඛාරා - විඤ්ඤාණං අනිවවතතිවා, යං එවරූපිං අනුලොම්කං ඛනතිං-දිඝිං - රූවිං - මුතිං - පෙකඛං-ධම්මනිජ්ඣානකඛනතිං පරතෝ-අසුතවා පටිලභති අයං වුවවති විඤ්ඤාණා පඤ්ඤා[1]" යි.

මෙරමාගෙන් අසා ප්‍රතිලබධ වූයේ **ශ්‍රැතමය ප්‍රඥා යැ.** එයින් වදාළහ. **"පරතෝ සුතවා පටිලභති. අයං වුවවති සුතමයා පඤ්ඤා[1]" යි.**

'විදර්ශනාමාගී සම්ප්‍රයුක්ත ප්‍රඥව භාවනාමය ප්‍රඥායි' එයින් වදාළහ. **"සබබාපි සමාපනනසස පඤ්ඤා භාවනාමයා පඤ්ඤා"යි.** මෙසේ **විඤ්ඤා - ශ්‍රැත - භාවනාමය** වශයෙන් ත්‍රිවිධ යැ.

(ii) කාමාවචර ධර්මයන් අරභයා පැවති **ප්‍රඥාව, පරිත්තා-රම්මණ යැ.**

රූපාවචර - අරූපාවචර ධර්මයන් අරභයා පැවති **ප්‍රඥාව මහග්ගතාරම්මණ යැ.** ඕ වූ කලී ලෞකික විදර්ශනා ය.

නිබ්බානය අරභයා පැවැති **ප්‍රඥාව අප්පමාණාලම්බණ යැ.** ඕ ලොකොත්තර විදර්ශනා යි.

මෙසේ **පරිත්ත - මහග්ගත - අප්පමාණාලම්බන** වශයෙන් ත්‍රිවිධ යැ.

---

[1]ඉ: ප: ඤාණ විභඩග 242 පිට

(iii) ආය නම් වැඩීම ය. එය අනපී නැසීම ය, අපීය ඉපදවීම ය, යන මේ වශයෙන් දෙ වැදෑරුම් වේ. එහි කුසල භාවය **ආයකොසල්ල නම.**

එසින් වදාළහ. **"තත්‍ර කතමං ආයකොසල්ලං, ඉමෙ ධම්මෙ මනසි කරොතො අනුප්පන්නාවෙව අකුසලාධම්මා න උප්පජ්ජන්ති. උප්පන්නාච අකුසලාධම්මා පහීයන්ති. ඉමෙ වා පන ධම්මෙ මනසි කරොතො අනුප්පන්නා වෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති. උප්පන්නාච කුසලා ධම්මා භියොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තන්ති. යා තත්‍ර පඤ්ඤා පජානනා අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ඉදං වුච්චති ආයකොසල්ලන්ති."**[1]

'එහි ආයකොසල්ල නම් කිම' මේ ධර්මයන් මෙතෙහි කරන්නහුට නූපන් අකුසල් නූපදී නම්, උපන් අකුසල් ප්‍රහීන වේ නම්, නූපන් කුසල් උපදී නම්, උපන් කුසල් වැඩීමට - මහත් බවට - භාවනාවෙන් සම්පූර්ණ බවට යේ නම්, එහි ලා යම් දැනීමෙක් - ප්‍රකට කොට දැනීමෙක් - නිවුළා බවෙක් - ඒ ධර්ම විනිශ්චය කිරීමෙහි දක්ෂ බවෙක් - සම්‍යක් දෘෂ්ටියෙක් වේ නම්' ඒ ආයකොසල්ල නම.

අපාය නම් පිරිහීම ය, හෙද දෙ විධ ය. අපීය පිරිහීම ය, අනපීය ඉපදීම ය, යන මොවුන් ගේ වශයෙනි.
එසින් වදාළහ.

"තත්‍රකතමං අපාය කොසල්ලං ඉමෙ ධම්මෙ මනසිකරොතො අනුප්පන්නාවෙව කුසලා ධම්මා නුප්පජ්ජන්ති"[1]
'මේ ධර්මයන් මෙතෙහි කරන්නහුට නූපන් කුසල් නූපදී නම්-යනාදිය යි. මේ **අපායකොසල්ල** නම්.

සියලු හිතසුව නිපදවීමට හේතු වූ ඒ ඒ ධර්මයන් ගේ ඉපදවීමට හේතු කාරණයෙහි එකෙණෙහි පැවැති සථානොචිත සේ නිපැත්-මෙහි දක්ෂ නිපුණ බව **උපාය කෙෞශල්‍යය යි.**

එසින් වදාළහ. **"සබ්බාපි තත්‍රූපායාපඤ්ඤා උපායකොසල්ලන්ති"**[1] 'ඒ ඒ කටයුත්තෙහි උපාය කෙෞශල්‍ය වූ යම් ප්‍රඥාවක් වේ නම්, ඒ සියලු ප්‍රඥාව **උපාය කෙෞශල්‍යය නම.**

මෙසේ **ආය- අපාය- උපාය-** කොසල්ල වශයෙන් ත්‍රිවිධ ය. මේ තෘතීය ත්‍රිකය යැ.

---

[1] වි: ප: සුත්තවිභඞ්ග 243

(iv) තමා ගේ රූපාදී සකඛයන් නුවණින් ගෙන පටන්-ගන්නා ලද **විදඝීනාප්‍රඥාව- අජ්ඣත්තානාභිනිවෙසය** (තමා සතන්හි පිළිපැදීම කරන්නා වූ) ප්‍රඥ ය.

මෙරමා ගේ රූපාදී පඤ්චසකඛයෙහි හෝ බැහැර අනිඳ්‍රිය බද්ධ රූප හෝ නුවණින් මෙනෙහි කොට පටන් ගත් **විදඝීනා ප්‍රඥාව බහිබාභිනිවෙශ** (**බාහිර** සන්තානයෙහි නුවණ පිහිටු-වීමෙන් පිළිපදනා) **ප්‍රඥා** නම් වේ.

අධ්‍යාත්ම බාහිර දෙපක්ෂයම නුවණින් ගෙන පිහිටුවන ලද්දේ **අධ්‍යාත්ම – බාහිරාභිනිවෙශප්‍රඥාය සි.** මෙසේ අධ්‍යාත්මාභි-නිවෙශාදි වශයෙන් **ප්‍රඥාව** ත්‍රිවිධ වේ. මේ **ත්‍රිවිධ ප්‍රඥා** භෙදය සි.

(4) චතුෂකයන් අතුරින් ප්‍රථම චතුෂකයෙහි :

(i) **දුකඛ සත්‍යය** අරමුණු කොට පවත්නා **ප්‍රඥාව** දුඃඛ සත්‍යය දැනගන්නා ප්‍රඥව ය.

දුඃඛසමුදය අරභයා පවත්නා ප්‍රඥව දුඃඛසමුදය සත්‍යය දැනගන්නා **ප්‍රඥාව ය.**

දුඃඛ නිරොධය අරමුණු කොට පවත්නා ප්‍රඥව දුඃඛ නිරොධ සත්‍යය දැනගන්නා **ප්‍රඥාව ය.**

දුඃඛ නිරොධ ගාමිනී ප්‍රතිපදාව අරමුණු කොට පවත්නා ප්‍රඥව දුඃඛ නිරොධ ගාමිනී ප්‍රතිපදා සත්‍යය දැනගන්නා **ප්‍රඥාව** යැ යි මෙසේ චතුස්සත්‍ය විෂයෙහි පැවති ප්‍රඥව ගේ වශයෙන් **ප්‍රඥාව චතුර්විධ වේ.**

(ii) **අර්ථ- ධර්ම- නිරුක්ති- ප්‍රතිභාන** යන සතරෙහි ප්‍රභෙද-ගත ප්‍රඥව **සතරප්‍රතිසම්භිදා ප්‍රඥා** නම්.
එසින් වදාළහ.

"**අත්ථෙ ඤාණං අත්ථ පටිසම්භිදා, ධම්මෙඤාණං ධම්මපටි-සම්භිදා, ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්ති පටිසම්භිදා, ඤාණෙසු ඤාණං පටිභාන පටිසම්භිදා**"[1]

අර්ථයෙහි ඥනය **අර්ථ ප්‍රතිසම්භිදා යැ.**

ධර්මයෙහි ඥනය **ධර්මප්‍රතිසම්භිදා** යැ.

(අර්ථ ධර්ම දෙක්හිවූ) නිරුකතියෙහි ඥනය **නිරුක්ති ප්‍රතිසම්භිදා යැ.**

ඒ ත්‍රිවිධ ඥනයෙහි ඥනය **ප්‍රතිභානප්‍රතිසම්භිදා සි.**

මෙහි අර්ථ නම් සැකෙවින් හෙතුඵලයට නමි. ඒ එසේ මැයි. හෙතුඵලය 'හෙතු අනුසාරයෙන් පමුණුවන ලැබේනුයි' හෝ 'අධිගමනය කරනු ලැබේනුයි' හෝ **අර්ථය සි** කියනු ලැබේ.

ප්‍රභෙද වශයෙන් වනාහි ප්‍රත්‍යයෙන් නිපන් **ඵල ධර්ම ය.**

---

[1] ම: ප: ඤාණ විභඞග 247

නිබ්බානය, භාෂිත සඞ්ඛ්‍යාත වචනයා ගේ **අත්‍ථය, විපාකය, ක්‍රියාය** යන මේ පස **අත්‍ථ යෑ.** ඒ අත්‍ථ ප්‍රත්‍යවෙක්ෂා කරන්නහු ගේ එහි ප්‍රභෙද ගත ඥානය **අත්‍ථප්‍රතිසම්භිද** නම් වේ.

ධම්ම යනු සඞ්ක්ෂපයෙන් ප්‍රත්‍යයට නම්. යම් හෙයකින් ප්‍රත්‍යය ඒ ඒ දැය විධාන **කෙරේ** ද, පවත්වා ද, පමුණුවා ද, එහෙයින් **ධම්ම** යි කියනු ලැබේ. ප්‍රභෙද වශයෙන් වනාහි **ඵල නිපදවන්නා වූ හෙතුය, ආයතීමාගීය, භාෂිතය, කුශලය, අකුශලය,** යන පසඳව ධර්මය **හෙතු** නම් වේ.

විශෙෂ: **මාගීය** සම්ප්‍රාපක හෙතුවයෙන් ද
භාෂිතය ඥපක හෙතුවයෙන් ද
ඵලනිර්හීතකහෙතුය, කුශලය, අකුශලය, යන මොහු නිර්හීතකහෙතුවයෙන් ද ගනු ලැබෙති.

ඒ හෙතු සඞ්ඛ්‍යාත ධර්මය ප්‍රත්‍යවෙක්ෂා කරන්නහු ගේ එහි ප්‍රභෙද ගත ඥානය **ධම්ප්‍රතිසම්භිද නම.**

මේ **අත්‍ථ - ධම්ම** දෙක **අභිධම්මයෙහි** ද මෙසේ විභාග කොට වදාළහ. "දුක්ඛ සඞ්ඛ්‍යාත ඵලයෙහි ඤාණය **අත්‍ථප්‍රතිසම්භිද ය.** දුඃඛ සමුදය සඞ්ඛ්‍යාත දුක්ඛ හෙතුවෙහි ඤාණය **ධම්ප්‍රතිසම්භිද ය.** දුක්ඛ නිරොධයට කාරණ වූ නිර්‍ඝාණ සඞ්ඛ්‍යාත ඵලයෙහි ඤාණය **අත්‍ථ ප්‍රතිසම්භිද** නම. දුක්ඛ නිරොධ සඞ්ඛ්‍යාත **නිර්‍ඝාණයට** හෙතු වූ මාගීයෙහි ඤාණය **ධම්ම ප්‍රතිසම්භිද** නම. හෙතුවෙහි ඤාණය **ධම්ප්‍රතිසම්භිද** නම. හේතුහු ගේ ඵලයෙහි ඤාණය **අත්‍ථප්‍රතිසම්භිද** නම. යම් ධම්ම **කෙනෙක්** හටගත්තාහු ද, වූවාහු ද, හෙතුසමවායයෙන් හටගත්තාහු ද, උපන්නාහු ද, විශෙෂයෙන් උපන්නාහු ද, පහළ වූවාහු ද, මේ ඵලධම්මයෙහි ඥානය **අත්‍ථප්‍රතිසම්භිද ය.** යම් හෙතුධම්මයකින් ඒ ඵල ධම්මයෝ හටගත්තාහු නම්, නිපත්නාහු නම්, විශෙෂයෙන් නිපත්නාහු නම්, පහළ වූවාහු නම් ඒ හෙතුධම්මයෙහි ඥානය, **ධම්ප්‍රතිසම්භිද** නම. ජරා-මරණ දෙක්හි ඤාණය **අත්‍ථ-ප්‍රතිසම්භිද** නම. ජාතියෙහි ඤාණය **ධම්ප්‍රතිසම්භිද** නම. **කම්** භවයෙන් නිපත් ජාතියෙහි ඤාණය **අත්‍ථප්‍රතිසම්භිද** නම. ජාතියට හේතු වූ කම් භවයෙහි ඤාණය **ධම්ප්‍රතිසම්භිද** නම."

මෙසේ, උපාදාන, තෘෂ්ණා, වෙදනා, ඵස්ස, ෂඩායතන, නාම, රූප, විඥාන, සඞ්ඛාර යන මෙහි පැවැති ඤාණය **අත්‍ථප්‍රතිසම්භිද** නම. සඞ්ඛාර සමුදයයෙහි ඤාණය **ධම්ප්‍රතිසම්භිද** නම.

එසේම ජරාමරණ නිරොධයෙහි ඤාණය අත්‍ථප්‍රතිසම්භිද නම. ජරාමරණ නිරොධගාමිනී ප්‍රතිපදයෙහි ඤාණය ධම්ම්‍රතිසම්භිද යි.

මේ අනුවැ සංස්කාර නිරොධයෙහි ඤාණය අත්‍ථප්‍රතිසම්භිද නම. සංස්කාර නිරොධගාමිනී ප්‍රතිපදයෙහි ඤාණය ධම්ම්‍රතිසම්භිද නම.

එමැ වදළහ. "දුක්ඛෙ ඤාණං අත්‍ථපටිසම්භිදා, දුක්ඛ සමුදයෙ ඤාණං ධම්මපටිසම්භිදා, - හෙතුම්හි ඤාණං ධම්මපටිසම්භිදා, හෙතුඵලෙ ඤාණං අත්‍ථපටිසම්භිදා, යෙ ධම්මා ජාතා භූතා සඤ්ජාතා නිබ්බත්තා අභිනිබ්බත්තා පාතුභූතා ඉමෙසු ධම්මෙසු ඤාණං අත්‍ථපටිසම්භිදා, යමහා ධම්මා තෙ ධම්මා ජාතා භූතා සඤ්ජාතා නිබ්බත්තා අභිනිබ්බත්තා පාතුභූතා තෙසු ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා - පෙ - සඞ්ඛාර නිරොධෙ ඤාණං අත්‍ථ පටිසම්භිදා, සඞ්ඛාර නිරොධ ගාමිනියා පටිපදාය ඤාණං ධම්ම පටිසම්භිදා"[1] යි.

තවද "ඉධභික්ඛු ධම්මං පරියාපුණාති සුත්තං ගෙය්‍යං-පෙ-වෙදල්ලං අයං වුච්චති ධම්මපටිසම්භිදා, සො තස්සෙව භාසිතස්ස අත්‍ථං ජානාති අයං ඉමස්ස භාසිතස්ස අත්‍ථො අයං ඉමස්ස භාසිතස්ස අත්‍ථොති. අයං වුච්චති අත්‍ථපටිසම්භිදා, කතමෙ ධම්මා කුසලා. යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති. -පෙ-ඉමෙ ධම්මා කුසලා. ඉමෙසු ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා, තෙසං විපාකෙ ඤාණං අත්‍ථ පටිසම්භිදා"[2]

'මේ ශාසනයෙහි යම් භික්ෂුවක් සූත්‍ර - ගෙය්‍ය - පෙ - වෙදල්ල යන ධර්මය දනී ද, ඒ දැනීම ධම්ම්‍රතිසම්භිද නම, හෙතෙමේ මේ භාසිතයා ගේ අර්ථය මේය, මේ භාසිතයා ගේ අර්ථය මේ යැ යි ඒ ඒ භාසිතයා ගේ අර්ථය දන්නේ වේ නම් ඒ අත්‍ථප්‍රතිසම්භිද යි.

"එහි කුශල ධර්මයෝ කවරහු ද, යම් කලෙක කාමාවචර කුසල් සිතක් උපන්නේ වී නම් මේ ධර්‍ම කුසල් ය. ඒ කුශල ධර්මයන්හි ප්‍රභෙද ගත ඤාණය ධම්ම්‍රතිසම්භිද යැ. ඒ කුශල විපාකයන් ගේ ඤාණය අත්‍ථ ප්‍රතිසම්භිදයැ"යි මේ ආදී ක්‍රමයෙන් බෙදා දක්වී.

ඒ අර්ථයෙහි ද, ධර්මයෙහි ද, අවිපරීත සවභාවය වූ මාගධික භාෂා සඞ්ඛ්‍යාත සවභාව නිරුක්තිය යැ. ඒ ව්‍යවහාරානිලාපනයෙහිද, උදීරණයෙහි ද, ඒ ව්‍යවහාරය අසා 'මේ සවභාව නිරුක්තිය යැ.

---

1 වි: ප: පටිසම්භිදා විභඞ්ග 221

2 ,, ,, ,, 222

මේ සවභාව නිරුක්තිය නොවේ ය, යි මෙසේ ඒ සවභාව නිරුක්තිය වූ මාගධ භාෂායෙහි ප්‍රභෙද ගත ඤාණය **නිරුත්තිප්‍රතිසම්භිද** යැ.

නිරුක්තිප්‍රතිසම්භිදාවට පැමිණියේ **"එසෝ, වෙදනා"** යනාදි ශබ්ද අසා මේ අවිපරීත ව්‍යවහාරයයි ද, **"එසා, වෙදනා"** යනාදිය අසා 'මේ සවභාව නිරුක්තිය නොවේය යි ද දනගනී.

අවි-ධම්-නිරුක්ති යන මේ ඥානයන්හි ඥානය **ප්‍රතිභාන-ප්‍රතිසම්භිද යැ.** නොහොත් ඒ තුන් ආකාර ඥාන විෂයෙහි මේ ඤාණයට මෙ නම් ගොචර කෘත්‍යාදියක් ඇතැ යි, මෙසේ විස්තර වශයෙන් දනීම **ප්‍රතිභානප්‍රතිසම්භිද යි.**

මේ සිවුපිළිසිඹියාවෝ **ශෛක්ෂභූමිය** යි කියන ලද යෝවාන් ආදී මාගී සතරෙහි හා ඵල තුනෙහි ද **අශෛක්ෂභූමිය යි** කියන ලද අර්හත්ඵලයෙහි ද, යන සථාන දෙකෙහි ප්‍රභෙදගත වේ. ඔවුනතුරින් **අග්‍රශ්‍රාවක මහාශ්‍රාවකයන්** ගේ සිවුපිළිසිඹියාවෝ **අශෛක්ෂ-භූමියෙහි ම** ප්‍රභෙදගත වෙති. **ආනන්දසථවිර, චිත්තගහපති, ධම්මිකඋපාසක, බුජ්ජුත්තරාඋපාසිකා** ආදීන් ගේ සිවුපිළි-සිඹියාවෝ **ශෛක්ෂභූමියෙහි** ප්‍රභෙදගත වූහ.

මෙසේ මේ වි භූමියෙහි ප්‍රභෙදගත වන්නාහු ද

1 අධිගමය,
2 පයත්ති්තිය,
3 ශ්‍රවණය,
4 පරිපුච්ඡාය,
5 පුබ්බයෝගය, යන පස් ආකාරයෙන් මේ සිවුපිළිසිඹියාවෝ විසඳ වෙති.

1 මෙහි **අධිගම** නම් අර්හත්වයට පැමිණීම ය.

2 බුදුට වචනය ප්‍රගුණ කිරීම **පයත්ති්තිය** ය.

3 මනාව අර්ථත් කොට සඳහිම් **ශ්‍රවණය ශ්‍රවණ** නම්.

4 පෙළ අටුවාදීන්හි ගැටපද, අර්ථපද, ආදිය පිළිබඳ විනිශ්චය කථාව විචාරීම **පරිපුච්ඡා** ය.

5 පෙර **බුදුවරයන්** ගේ ශාසන යන්හි ගත-පච්චාගතාදි වශ-යෙන් භාවනා වඩා **අනුලෝම - ගොත්‍රභූ** ඤාණයන් සමීපයෙහි වූ; **මුඤ්චිතුකම්‍යතා - පටිසඞ්ඛාණ - සඞ්ඛාරුපෙක්ඛා ඤාණය** තෙක් විදර්ශනාවෙහි උත්සාහවත් වීම **පුබ්බයොග** නම්.

තවද ආචාර්‍ය්‍ය මතයෙකි

"පුබ්බයොගෝ බාහුසච්චං – දෙස භාසාව ආගමෝ
පරිපුච්ඡා අධිගමෝ – ගරුසන්නිස්සා යෝ තථා
මිත්තා සම්පත්තී මෙවාති – පවිසමඤ්ඤිද පච්චයා"[1]

(1) පූර්‍වයොගය,
(2) බහුශ්‍රැත භාවය,
(3) දෙශභාෂා දැනීමය,
(4) ත්‍රිපිටකය දැනීමය,
(5) ත්‍රිපිටකාර්‍ථ විචාරීමය,
(6) සතර ඵලය,
(7) බහුශ්‍රැත ගුරුවරුන් සෙවීමය,
(8) තියුණු ප්‍රතිභාන ඇති **කල්‍යාණ** මිත්‍රයන් ඇසුරු කිරීමය යන මේ කරුණු අට ප්‍රතිසම්පදාවට උපකාර ධර්‍මයෝ සි.

මෙහි **පූර්‍වයොගය** යට කී සේයැ.

හිත වැඩ පිණිස පවත්නා නිවරද ශාස්ත්‍රයන්හි හා ශිල්පයන්හි දක්ෂ බව **බහුශ්‍රැතභාවය සි.**

සාමාන්‍යයෙන් එකල දඹදිව පැවැති එක්සිය එකක් රාජ්‍යයන්හි ව්‍යවහාර වූ එපමණ දෙශභාෂා දැනීම ද, විශෙෂයෙන් මාගධී භාෂාවෙහි දක්ෂ බව ද, **දෙශභාෂා** නම.

යටත් පිරිසෙසින් **මැදුම් සඟිය මූලපණ්ණාසකයෙහි ඔපම්ම වග්ගය**[2] පමණවත් ධර්‍මය පිරවීම **ආගම යැ.**

එක ගාථාවකුදු අර්‍ථ විනිශ්චය පිළිවිසීම **පරිපුච්ඡා** නම,

සෝවාන් – සකෘදාගාමී – අනාගාමි – අර්‍හත් ඵලය **'අධිගමයැ.**

බහුශ්‍රැත ප්‍රතිභාන සම්පන්න ආචාර්‍යයන් වෙතින් දුෂ්කර තැන් විචාරමින් ඇසුරු කිරීම **ගුරුසන්නිශ්‍රය** නම,

එබඳුවූ ම කළණ මිතුරන් ඇසුරු කිරීම **මිත්‍රසම්පත්තිය සි.**

විශෙෂ:- පෙරකී **පස්** ආකාරයෙන් හෝ මේ **අට** ආකාරයන් අතුරින් **බුදුවරයෝ ද, පසේබුදුවරයෝ** ද පුබ්බයොග අධිගම–යන් නිසා සිවුපිළිසිඹියාවන්ට පැමිණෙති. **බුද්ධ ශ්‍රාවකයෝ** මේ සියලු කාරණයන් නිසාම පැමිණෙත්. සිවුපිළිසිඹියාවන්ට පැමිණීම සඳහා වෙනම කමටහන් වැඩීමෙක් නම් නැති. ශෛක්‍ෂයන්ගේ ශෛක්‍ෂඵල (**සෝවාන් – සකෘදාගාමී – අනාගාමී ඵල**) අවසානයෙහි ද, අශෛක්‍ෂයන් ගේ **අර්‍හත්ඵල** අවසානයෙහි ද පිළිසිඹියා පැමිණීම වේ.

---

[1]පටි: ම: අට්ඨකථා 5. [2]ම: නි: මූලපණ්ණාසක 135–213

ඒ එසේමැ සි:- බුදුවරයන්ට දශබල ඥානය අතීත්ඵලය නිසා සමෘද්ධවන්නා සේ සිව්පිළිසිඹියාවෝ ද සමෘඬ වෙති. ආචාර්යයන් ගේ ආචාර්ය්ඵලයන් මෙන්ම **පිළිසිඹියාවෝ ද සමෘද්ධ වෙන්** ය සි 'මේ සිවුපිළිසිඹියා වශයෙන් සතරාකාරවේ ය' සි කියන ලදී.

5. **විදර්ශනා ප්‍රඥාව වැඩිය යුතු පරිදි,** මෙහි ලා මේ විදර්ශනා ප්‍රඥාවට **ස්කන්ධ - ආයතන - ධාතු - ඉන්ද්‍රිය - සත්‍ය - ප්‍රතීත්‍ය සමුත්පාද** දී හෙද ඇති ධර්ම උපකාර හෙයින් **භූමි** වේ.

ප්‍රශ්නයෙකි:- මේ එක භූමිය සඳහා බොහෝ ධර්මයන් දැක්වූයේ කවර හෙයින් ද

පිළිතුර:- අරූපයෙහි මුළා වූ සත්ත්වයන් සඳහා අරූප ධර්මයන් සතර කොටසක් ඇති **ස්කන්ධ දෙශනයෙන් ද,**

රූපයෙහි මුළාවූවන් සඳහා අඩ එකොළොසක් රූප කොටස් ඇති **ආයතන දෙශනයෙන් ද**

උභය මුළාවූවන් සඳහා නාමය සප්ත විඤ්ඤාණ ධාතුවෙන් හා රූපය එකොළොස් ආකාරයක් වූ **ධාතු දෙශනයෙන් ද** බෙදා දැක්වූ හ.

එසේම **ඒකාදිඥේය, මධ්‍යමාදිඥේය, මූදිඥේය** වශයෙන් ද; **සංක්ෂෙපරුචික මධ්‍යමරුචික විස්තාර රුචිකයන්ගේ** වශයෙන්ද, පිළිවෙළින් **ස්කන්ධ, ආයතන, ධාතු** බෙදා දැක්වූහ.

ඉන්ද්‍රිය, දෙශනාව ද **ඊශ්වර නිර්මාණ** වාදයෙන් **ආත්ම දෘෂ්ටි යෙහි** මුළා වූවන් සඳහා ය. මේ ඉන්ද්‍රිය ධර්මයෝ සහජාත ධර්මයන් කෙරෙහි ඒ ඒ ධර්මයන් ගේ සවභාව වශයෙන් සිද්ධවන බව හා කිසිවකු ගේ ඊශ්වර (අධිපති) බවක් හෝ වශී භාවයක් හෝ නැති හෙයින් ඊශ්වරත්වයෙන් ශූන්‍යයහ යි **අනාත්ම ලක්ෂණය** සුවසේ ගැන්වීම සඳහා වදාරණ ලද්දේ ය.

මේ **ස්කන්ධ-ආයතන-ධාතු-ඉන්ද්‍රිය** යන සතර ධර්මයන් ගේ **පැවැත්ම ය, වැළැක්ම ය, පැවැත්මේ හේතුව ය, වැළැක්මේ හේතුව ය,** යන සතර ධර්මයන් ගේ වශයෙන් වදාරණ ලද හෙයින් මෙහිලා උපකාර වේනු සි, ඒ සඳහා අවසානයෙහි **සත්‍ය - ප්‍රතීත්‍ය සමුත්පාද** මය වදාරන ලදී. මේ ටීකාගත විස්තාරය සි.

සීල විසුද්ධි - චිත්තවිසුද්ධි - දෙක **මූලයෝ ය.** සෙසු **පඤ්ච විසුද්ධීන් ගේ** පිහිටීමට උපකාර (හෙතු) වන හෙයිනි.

දිට්ඨිවිසුද්ධි, කඞ්ඛාවිතරණවිසුද්ධි, මග්ගාමග්ගඤාණ-දස්සනවිසුද්ධි, පටිපදා ඤාණදස්සනවිසුද්ධි, ඤාණදස්සන-විසුද්ධි යන පස ශරීරය යැ. (භාවනා වශයෙන් වඩනලද මේ පස ප්‍රඥා පරම්පරාවෙන් පවත්වන කල **හත්ථ-පාද-ගීවාදීන්** වශයෙන් උපමා කොට අවයවයෙන් යුත් **ශරීරයැයි** හඳුන්වනු ලැබෙන හෙයිනි.

එහෙයින් **'භූමි වූ' සඞ්ඛාරාදි** ධර්මයන් ගේ අඩි හා පාළිය ඉගෙන නුවණින් පුරුදු කොට **'මූලවූ'** ධර්ම සම්පූර්ණ කොට **'ශරීරවූ'** පසඳ විශුද්ධින් වඩා **ප්‍රඥා භාවනාව** සිඹ කළයුතු වේ.

මේ වැඩිය යුත්තේ කෙසේ ද යන්නෙහි සංක්ෂේප කථාව යැ.

මේ විස්තාරය:- **'යට සඞ්ඛාර, ධාතු, ආයතන, ඉන්ද්‍රිය, සත්‍ය, ප්‍රතීත්‍යසමුත්පාදාදී ධර්ම භූමිය'** යි කී තන්හි **සඞ්ඛාර නම්:-**

1. **රූපඛන්ධය**
2. **වෙදනාඛන්ධය**
3. **සඤ්ඤාඛන්ධය**
4. **සඞ්ඛාරඛන්ධය**
5. **විඤ්ඤාණඛන්ධය** යන මේ පසයි.

1. රූපසඞ්ඛාරය, ශීත - උෂ්ණාදි විරුද්ධ ප්‍රත්‍යය නිසා විපරීත භාවයට පැමිණෙන යම් පමණ ධර්ම සමූහයක් වේ නම් ඒ සියල්ල එක්කොට **රූපසඞ්ඛාරය** යි දතයුතු යි. (විරුද්ධ ධර්ම-යන් නිසා විකාරවීම අරූප ධර්මයන්හි ද, ඇතත්, ප්‍රකටව විපරීත වීමක් එහි නැති හෙයින් රූප විෂයෙහි නො ගැනේ.)

එයින් වදාළහ:-**"රූපත්තීතිඛෝ භික්ඛු තඤ්ඤාරූපන්ති වුච්චති"**[1]

බ්‍රහ්ම ලෝකයෙහි ශීත-උෂ්ණාදි විරුද්ධ ප්‍රත්‍යය නැත ද අනුග්‍රාහක ශීතෝෂ්ණාදිය ඇති බැවින් එහිද **රූපන** භාවය ඇති හෙයින් රූප ව්‍යවහාර වේ. මෙසේ **රූපන** ලක්ෂණයෙන් සියලු රූපය **එකවිධ** වුව ද

i **භූත රූප**

ii **උපාදා රූප** වශයෙන් **විවිධ වේ.**

i එහි භූතරූප **පඨවි, ආපෝ, තේජෝ, වායෝ** වශයෙන් **සතර වැදෑරුම් වේ.**

ඒවායේ ලක්ඛණ, රස, පච්චුපට්ඨාන, චතුධාතුවවත්ථා-නයෙහි කී පරිදි දතයුතු. (එහි **පදට්ඨාන** නො කියන ලදී.) **පදට්ඨාන** වශයෙන් ඒ සියල්ලම අවශෙෂ ධාතු ත්‍රය පදට්ඨාන කොට ඇති. **පඨවි ධාතුව ආපෝ ධාතුවෙන්** සංගෘහීතවැ, **තේජෝ** ධාතුවෙන් පාලනය කරන ලදුවැ, **වායෝ** ධාතුවෙන් පුරන ලදුවැ,

[1]සං: නි: ඛන්ධසංයුක්ත 400 පිට

පවතී, මේසේ පඨවි ධාතුව සෙසු **භූත ත්‍රය ආසන්න කාරණකොට** පවතී. සෙසු ධාතූනු ද, අවසෙස භූතයන් **ආසන්න කාරණකොට** පවතින්.

ii **උපාදාරූප** (1) චකඛු (2) සොත (3) ඝාණ (4) ජිවහා (5) කාය (6) රූප (7) සද්ද (8) ගන්ධ (9) රස (10) ඉත්ථින්ද්‍රිය (11) පුරිසින්ද්‍රිය (12) ජීවිතින්ද්‍රිය (13) හදයවත්ථු (14) කාය විඤ්ඤත්ති (15) වචීවිඤ්ඤත්ති (16) ආකාසධාතු (17) (රූපයාගේ) ලහුතා (18) මුදුතා (19) කම්මඤ්ඤතා (20) උපචය (21) සන්තති (22) ජරතා (23) අනිච්චතා (24) **කබලීකාර ආහාරයයි සූ විස්සෙකි.** (24) මොවුන් ගේ එකක් පාසා ලක්ෂණාදිය මෙසේ සි.

(**1**) **චකඛුව**- මේ චක්ඛුප්‍රසාදය රූපාලම්බනයා ගේ ගැටීමට සුදුසු සේ මහා භූතයන් ගේ ප්‍රසාදය හෝ රූප දැකීමෙහි **කැමැත්ත** මුල් කොට ඇති තෘෂ්ණාවෙන් යුත් **කර්මයෙන්** නිපත් මහාභූතයන් ගේ ප්‍රසාදය **ලක්ෂණ** කොට ඇත්තේ ය. රූපාලම්බනයෙහි විඤ්ඤණය ඇද ගැනීම එහි **කෘත්‍යය ය.** චකඛු විඤ්ඤණයට ආධාර භාවය **වැටහෙන ආකාර ය.** දක්නා **කැමැත්ත** නිදන කොට ඇති **කර්මජභූත ආසන්න කාරණ සි.**

(**2**) **සොතය**- ශබ්දාලම්බනයේ ගැටීමට සුදුසු මහාභූතයන් ගේ ප්‍රසාදය හෝ ශබ්ද ඇසීමේ **කැමැත්ත** නිදන කොට පැවැති **කර්මජ** භූතයන් ගේ ප්‍රසාදය **ලක්ෂණ කොට** ඇත්තේ ය. ශබ්දාලම්බනයෙහි විඤ්ඤණය ඇදගැනීම **කෘත්‍යය ය.** ශ්‍රොත්‍ර විඤ්ඤයට ආධාර භාවය **වැටහෙන ආකාරය.** ශබ්ද අසනු **කැමැත්ත** නිදන කොට ඇති **කර්මජභූත ආසන්න කාරණ සි.**

(**3**) **ඝාණය**- ගන්ධාලම්බනයා ගේ ගැටීමට සුදුසු මහා භූතයන් ගේ ප්‍රසාදය හෝ ගන්ධාඝ්‍රාණය කිරීමේ **කැමැත්ත** නිදනකොට ඇති **කර්මජ** භූතයන් ගේ ප්‍රසාදය **ලක්ෂණ කොට** ඇත්තේ ය. ගන්ධාලම්බනයෙහි විඤ්ඤණය ඇදගැනීම **කෘත්‍යය ය.** ඝ්‍රාණ විඤ්ඤයට ආධාර භාවය **වැටහෙන ආකාරය.** ගන්ධ ආඝ්‍රාණය **කැමැත්ත** නිදන කොට ඇති **කර්මජ** භූත **ආසන්න කාරණයි.**

(**4**) **ජිවහාව**- රසාලම්බනයෙහි ගැටීමට යොග්‍ය මහාභූතයන් ගේ ප්‍රසාදය (රසය ආස්වාදනය කිරීමේ **කැමැත්ත** නිදන කොට ඇති **කර්මයෙන්** නිපත් භූතයන් ගේ ප්‍රසාදය) **ලක්ෂණ කොට** ඇත්තේ ය. රසාලම්බනයෙහි විඤ්ඤය ඇදගැනීම එහි **කෘත්‍යය ය.** ජිව්හා විඤ්ඤයට ආධාරවීම **වැටහෙන ආකාරය ය.** රසාස්වාදන **කැමැත්ත** නිදන කොට ඇති **කර්මජ** භූත **ආසන්න කාරණ සි.**

(5) **කායය**- සපශීාලම්බනයා ගේ ගැටීමට සුදුසු මහා භූත යන් ගේ පැහැදීම හෝ සපශී තෘෂ්ණාව නිදුන කොට ඇති කම්ජ භූතයන් ගේ ප්‍රසාදය **ලක්ඛණකොට** ඇත්තේ ය. සපශීාලම්බන යෙහි විඥුතය ඇදගැනීම එහි **කෘත්‍යය** ය. කාය විඥුතයට ආධාර බව **වැටහෙනආකාරය**. ස්පශීතෘෂ්ණාවෙන් යුත් කම්යෙන් නිපන් මහාභූත **ආසන්න කාරණයි.**

(විඥුතාධිසම්පතවැ රූපාලම්බනය ආස්වාදනය කරන්නාක්මෙන් වූයේ **චක්ඛු** නම්. මේ **කරණකොට** අසානු යි **සොත** නම්. මේ කරණකොට ආඝ්‍රාණය කෙරේනුයි **ඝ්‍රාණ** නම්. ජීවිත නිමිත්ත වූ ආහාරය (රසය) ජීවිතය යි එය කැඳවානු යි **ජිව්හා** නම්. තුතසිත (සාසව) ධම්යන්ට උත්පත්ති ස්ථාන වූයේ **කාය** නම්.)

මතභෙදඃ- (i) **මහාසඞ්ඝිකයෝඃ**- **චක්ඛුප්පසාදය තෙජෝ-ධාතුව** අධිකකොට ඇති භූතයන් ගේ ප්‍රසාදය **ලක්ඛණකොට** ඇත්තේයයි ද, **සොත - ඝාණ - ජිව්හා ප්‍රසාදයෝ** පිළිවෙළින් **වායු - පඨවි - ආපො** ධාතූන් අධිකකොට ඇති භූතයන් ගේ **ප්‍රසාදය ලක්ඛණකොට** ඇත්තාහයි ද, **කාය ප්‍රසාදය** සමව පැවති **සතර** මහාභූතයන් ගේ **ප්‍රසාදය ලක්ඛණකොට** ඇත්තේයයි ද කියති.

(මේ **සධම්ම**[1] තෙරුන් ගේ මතය අනුවැ **චක්ඛුවෙහි තෙජෝ** ධාතුව අධික යැයි ද, **සොත - ඝාණ - ජිව්හාවන්හි වායු - පඨවි - ආප** අධික යැයි ද, කාය ප්‍රසාදයේ **සතරම** අනූනාධික වැ පවතී යයි ද කියන ලද්දේ වේ.)

(ii) **අභයගිරිකයෝඃ**- **චක්ඛුඃප්‍රසාදය** තෙජෝධාතුව අධික කොට ඇති සෙසු ධාතූන් ගේ ප්‍රසාදය ලක්ඛණකොට ඇතැයි ද, **සොත- ඝාණ- ජිව්හා- කාය** ප්‍රසාදයෝ ක්‍රමයෙන් (විවර) **ආකාශ- වායු- ආප- පඨවි** අධික කොට ඇති භූතයන් ගේ **ප්‍රසාදය ලක්ඛණ** කොට ඇත්තාහයි ද, යෙති.

මෙසේ කියන ඔවුන්ට 'එයට **ඝාබක සූත්‍ර** (දෙශනා පාඨ) දැක්වුව මැනැවැ' යි කිය යුතු ය. එබඳු දෙශනයක් නැති හෙයින් ඔවුනට එබඳු නිදශීන දැක්විය නොහේ. එහෙත් ඔවුන් අතුරින් **ප්‍රථමවාදීහු** (පහන් සිළුවය යි කියන ලද) **තෙජෝ** ධාතු ගුණය වූ ආලෝකයෙන් **චක්ඛුඃප්‍රසාදයා ගේ** රූපාලම්බනය ගැනීමෙහි ද,

[1] වසුධම්ම සත්‍ය යි

වායොධාතු ගුණය වූ ශබ්දයෙන් **ශ්‍රොත්‍රයා ගේ** ශබ්දාලම්බනය ගැනීමෙහි ද, **පඨවි** ධාතු ගුණය වූ ගන්ධයෙන් **ඝ්‍රාණයා ගේ** ගන්ධාලම්බනය ගැනීමෙහි ද, බෙල නම් වූ **ආපෝ** ධාතු ගුණය වූ රසයෙන් **දිව්වේ** රසාලම්බනය ගැනීමෙහි ද, උපකාර කටයුතු බැවිනැයි ද යුකති දක්වති.

අපරවාදීහු ද සුදුසු පරිදි **චක්ඛු- සොත- ඝාණ- ජිව්හා- කායයන් ගේ, රූප- ශබ්ද- ගන්ධ- රස- ඵොට්ඨබ්බ** ගැනීමෙහි ද, **තෙජෝ- ආකාස- වායු- ආපෝ- පඨවි** ධාතූහු පිළිවෙළින් උපකාර කටයුතු බැවිනැයි ද යුකති දක්වති.

(ආලෝකය සහකාරී කාරණ කොට ඇත්තාවූ ම චක්ඛුඃ, රූපාලම්බන ගැනීමෙහි සමර්ථ වේ. කන්බිලයෙහි වූ විවරාවකාශය සහකාරී කාරණ කොට ඇති ශ්‍රොත්‍රය ශබ්දාලම්බනය ගැනීමෙහි ද, වායුව සහකාරී කාරණ කොට ඇති ඝ්‍රාණ ප්‍රසාදය ගන්ධාලම්බනය ගැනීමෙහි ද, ජලය සහකාරී කාරණ කොට ඇති ජිහ්වා ප්‍රසාදය රසාලම්බනය ගැනීමෙහි ද, පෘථිවිය සහකාරී කාරණ කොට ඇති කාය ප්‍රසාදය ඵොට්ඨබ්බනය ඉපදවීමෙහි ද සමර්ථවේ ය' යි මෙසේ ඒ ඒ භූත ගුණයන් ඇසුරු කොට චක්ඛුර්විඤ්ඤාදිය උපදීය යි, ඔවුන් ගේ මතය යි.)

ථෙරවාදීහු 'රූපාදීහු තෙජාදීන් ගේ ගුණයෝ යැ' යි කවුරුන් කියන ලද්දේ ද වෙන් වෙන්ව නො පවත්නා මහා භූතයන් අතුරින් මෙය මේ භූත ගුණය ය (මෙය මේ මහා භූතගුණය යි) කිව නොහෙන හෙයිනැයි යෙති.

කෙචිවාදීහු එතෙකුදුවුවත් ඒ චතුසමුට්ඨානික රූප පරම්පරාවෙහි ඒ ඒ භූතයා ගේ අධික බැවින් පඨවි ආදීන් ගේ සහජාත වස්තූන් ධරීම ය, බැඳීම ය, පැසවීම ය, සැලීම ය යන සතර කෘත්‍ය ය යුෂමතුන් කැමති වන්නා සේ තෙජාදීන් අධික කොට ඇති චතුසමුට්ඨානික රූප පරම්පරාවෙහි රූපාදීන් ගේ අධික බව දක්නා හෙයින් රූපාලම්බනාදිය තෙජාදීන් ගේ ගුණය යි යුෂමතුන් කැමති විය යුතුයැයි යෙති.

("ගින්නෙහි බබළන සුලු රූපය ද, සුළඟෙහි ඇසෙන සුලු ශබ්දය ද, පොළොවෙහි සුවඳ ද, දියෙහි මිහිරි රසයද යි මොවුන් ගේ ඒ ඒ ගුණයන් හා යෙදුණා වූ රූප ශබ්දාදිය ඇති හෙයින් ය" යනු ඔවුන් ගේ පිළිගැනීම ය.)

ථෙරවාදීහු 'ආපෝ අධික **ආසවයෙහි** ගන්ධයට වඩා පඨවි අධික **කපු පුළුනෙහි** ගන්ධය අධික වේ නම් හෝ, තෙජෝ අධික **උණු වතුරෙහි** වණ්ණයට වඩා **සිහිල් දියෙහි** වණ්ණය අඩු වේ නම්, රූපාදිය තෙජාදීන් ගේ ගුණය යි ඇපිදූ පිළිගනිමුයැ' යි මෙසේ ඒ විරුද්ධවාදීනට පිළිතුරු දුන්හ.

එහෙත් **කපු** පුළුනෙහි ගන්ධයට වඩා ආසවයෙහි ගන්ධය අධික හෙයින් ද, උණු දියෙහි වණ්ණයට වඩා සිහිල් දියෙහි වණ්ණය අඩු නො වන හෙයින් ද, හෙවත් ඒ උභය **කාරණයම** නැති හෙයින් ඒ මතය නො පිළිගනිති.

(රූප- ශබ්ද- ගන්ධ- රස- ඵොට්ඨබ්බ- විශෙෂ ගුණයන් ගෙන් යුත් තෙජෝ- **ආකාස**- පඨවි- ආප- වායූන් ගෙන් චක්ඛු- සොත- ඝාණ- ජිව්හා- කාය ප්‍රසාද සක්ඛාත්කරන ලදැයි කියන **කනාද වාදයට ද** මෙයින් ම නිග්‍රහ **කරන** ලදැයි ටීකාහි කී.

ඔවුන් ගේ වැළැක්මෙන්ම '**චක්ඛුප්පසාදාදිය රූපාලම්බනා-දීන්** ගේ හා **තෙජෝ ධාතු** ආදීන් ගේ විශෙෂ ගුණයෙකැ යි' යන වාදය වළක්වයි. එසේ වැළැක්වීමෙන් '**තෙජෝ ධාතු** ආදීන් ගේ ගුණ වූ රූපාදීන් විසින් අනුග්‍රහ **කළ** යුතු බැවිනැ' යි යන හෙතුව ද බිඳවැටේ. එහෙයින් "ආශ්‍රය වූ **මහාභූත**යන් ගේ විශෙෂයෙන් ප්‍රසාද වෙතියි" යන කල්පනාව බැහැර **කරවියැයි** යෙති.

එකම කලාපයෙහි වූ රූප ආදිය වෙනස් වේ නම් වෙන වෙන කලාපයෙහි වූ රූප- රසාදිය ඒකාන්තයෙන් වෙනස් වේමය. එසේම **චක්ඛුප්පසාදාදිය** අතික් විශෙෂ **කාරණයක්** නැතත් ඔවු-නොවුන් ගේ වෙනස වේ. **කර්මයම** එයට විශෙෂ **කාරණය** යි. එහෙයින් ඔවුන් ගේ විශෙෂය ට හේතුව **භූත** විශෙෂය නොව **කර්ම** විශෙෂය යි. හුදෙක් භූත විශෙෂය වී නම් ප්‍රසාද නූපදනේ මැයි.

පෝරාණයෝ:- **"සමානානංහි පසාදෙ, නො විසමානං"** 'සමානයන්ගේ ම ප්‍රසාදය වේ. විෂමයන් ගේ නොවේය' යි කීහ. ඒ එසේමැ යි:- **පඨවි ධාතු** අධිකවුව **කැකුළු** බව වේ. **අප්ධාතු** අධික වුව වැගිරේ. **තෙජෝධාතු** අධිකවුව දවයි. **වායෝධාතු** අධිකවුව විසිරේ. එහෙයින් ම ඒ ඒ ප්‍රසාද නූපදී.

විශෙෂ:- කාම භවයෙහි අණ්ඩජාදි යොනීන්හි කානා **සඤ්ඤික** හෙයින් **කර්ම** විශෙෂය වුව ද, **කාම**භවයෙහි ඔපපාතික යොනියෙහි ද, රූප භවයෙහි ද **එකම කර්මයෙන්** සියලු ඉන්ද්‍රිය-යන්ගේ ම පහළ වීම වේ. රූප භවයෙහි එය විශෙෂයෙන් ම වේ.

"පටිසන්ධික්ඛණෙ මහග්ගත චෙතනා කටත්තා රූපානං කම්ම-පච්චයෙන පච්චයො"[1] 'ප්‍රතිසන්ධි ක්ෂණයෙහි මහග්ගත චෙතනාව කර්මජ රූපයන්ට කර්ම ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ ය' යි කීහ.

ඔවුනතුරෙන් **චක්ඛු - සොත** දෙදෙන අසම්ප්‍රාප්ත විෂය ග්‍රාහකයෝ ය. අනල්ලීන විෂයයෙහි ම විඤ්ඤාණ උපදවන හෙයිනි. **ඝ්‍රාණ - ජිව්හා - කායයෝ** සම්ප්‍රාප්ත විෂය ග්‍රාහකයෝ ය. අල්ලීනවිෂය යෙහිම විඤ්ඤාණ ඉපදීමට හේතුවන හෙයිනි.

(**චක්ඛු - සොත** දෙදෙන අසම්ප්‍රාප්තාලම්බනය ම ගන්නා බවට තවද හේතු දක්වන ටීකා කාරයෝ යොදුන් දහස්ගණන් දුරෙහි වූ චන්ද්‍ර සූර්‍ය්‍ය තාරකාදි රූපාලම්බනය අරමුණු කරන හෙයින් ද, පළිඟු ඵිදුරු ආදීන් අතර සිටි කල්හි ඉන් පිටත වූ රූපාලම්බනය ද අරමුණු කරන හෙයින් ද, චක්ෂුඃ ප්‍රසාදය සම්ප්‍රාප්ත විෂය ග්‍රාහී නම් එහි ඇතුළත්විය හැකි පමණ ගතයුතු වේ. එහෙත් එයට වඩා විශාලවූ ද පර්වතාදිය අරමුණු කරන හෙයින් ද, ඇසෙහි ගෑ අඳුන් ආදිය හා ඇසෙහි හැපුණු දය නො දක්නා හෙයින් ද, **චක්ෂුඃ ප්‍රසාදය** අසම්ප්‍රාප්තාලම්බන-යෙහි විඥානොත්පාදකයට හේතුවන බව ද, **ශ්‍රොත්‍රප්‍රසාදය** ද සම්ප්‍රාප්ත ශබ්දායතනයන්ගේ ම ගැනීම වන්නේ නම් චිත්තජ **චිතක්ක** විප්ඵාර ශබ්දය අරමුණු විය නොහේ. චිත්ත සමුත්ථාන ශබ්දය පිටත නො උපදින හෙයිනි. එසේම ඒ ඒ දිශා දෙශයන්හි පවත්නා ශබ්දය අරමුණු වීමේදී ඒ දිශා දෙශයන්හි පවත්නා-සේම 'මේ ශබ්දය අසුවල් දෙශයෙහි පවත්නේය හි, දෙශාදිය ද, ව්‍යවස්ථානය වත හෙයින් ද, අහසෙහි වැහි වලාකුල් ආදිය අතර ඇත කල්හි මෙඝ ශබ්දය ඇසෙන හෙයින් ද, **ශ්‍රොත්‍ර ප්‍රසාදය** ද අසම්ප්‍රාප්ත ආලම්බනයෙහි විඥාන ඉපදවීමේ සමර්ථ බවද නිශ්චිත ය.

i **ප්‍රශ්නය:**- පිටත පවත්නා ශබ්දයක් හෙවත් ඇත යමකට ගැසීමේ දී උපදනා ශබ්දය ළඟ සිටියවුන්ට එ කෙතෙහිම ඇසෙතත් බැහැර වූවන්ට ප්‍රමාද වැ ඇසීමේ හේතුව කිම? සම්ප්‍රාප්ත විෂය ග්‍රහණය නිසා නොවේ ද

i **පිළිතුර:**- නොවේ. ශබ්දයද රූප කලාපයෙකි, එය සිහින් වූ කල රූපකලාප අඩු වශයෙන් ද, මහත් වූ කල කලාප වැනි වශයෙන් ද පවතී. කථා ශබ්දය මඳ වුව ද, ළඟ සිටිනවුන්ට ප්‍රකටව ද, බැහැර වූවන්ට අප්‍රකටව ද, ඇසෙනු යේ එහෙයිනි. එසේම ශබ්දයා ගේ උත්පත්ති ක්ෂණයෙහි ම ළඟ සිටිනවුන්ට

[1]පඨ: ප: පඤ්හවාර III

ඇසෙතත් දුරු වූවනට කලාප සන්නති වශයෙන් වැඩුණු ශබ්දයම ප්‍රවෘත්ති අවස්ථාවෙහි (මධ්‍යම-අවසාන-අවසථාවන් හි) ශොත්‍ර ප්‍රසාදයට අරමුණු වූ කල ශ්‍රොත්‍ර විඥාන චිත්තයෙන් ඔබ්බෙහි යම්තම් ඇසිණැයි ද, කලකින් ඇසිණැයි ද, හැඟීම උපදී.

ii **ප්‍රශ්නය**:- ශබ්දයා ගේ පරම්පරා වශයෙන් පැවැත්මක් නොවේ නම් පටිඝොසය (ඝෝංකාරය) උපදිනුයේ කෙසේ ද?

ii **පිළිතුර**:- කාන්දම බැහැර වූ යකඩය සෙලවීමට සමර්ථ වන්නා සේ දුර පවත්නා ශබ්දය ද, රූපයක් හෙයින් පටිඝොසය ඉපදවීමට ද, භාජනාදිය සෙලවීමට ද, සමර්ථ වේ. මේද ටීකාගත විස්තරය.

(පෙර ලක්ෂණාදීන් වශයෙන් විස්තර කරන ලද්දා වූ චක්ඛුරාදිය නැවත පිහිටීම් ආදීන් විස්තර කරනුවෝ ඒ පඤ්ච **උපාදා රූපයන්** අතුරින්

(1) **චක්ඛුඃප්‍රසාදය** නිල්වන් ඇසිපිය රෝමයෙන් අවටින් ගැවසීගත් කෘෂ්ණ - ශුක්ල මණ්ඩලයෙන් විසිතුරු වූ නිල් මඟතෙල් මල් පෙත්තක් බඳු වූ සම්භාර චක්ඛුස්හි (ඒ ඇස් ගඩුවෙහි) ශ්වේත මණ්ඩලයෙන් වට වූ කෘෂ්ණ මණ්ඩලය මධ්‍යයෙහි, ඉදිරියෙහි සිටියවුන් ගේ ශරීර සටහන උපදින තැන මතු මත්තෙහි තබන ලද පුළුන් පෙද සතක වත් කළ තෙල් බින්දුවක් ඒ පුළුන් පෙද සතෙහිම පැතිරී සිටුනා සේ ඇසෙහි වූ පටල සතෙහිම පැතිර වැඩීම ද, නැහැවීම ද, සැරසීම ද, පවන් සැලීම ද, කරන කිරිමවුන් සිවුදෙනක විසින් වඩන කැත් කුමරකු සේ දැරීමය, බැඳීමය, මිහිකිරීමය, සැලීමය, යන සතර කෘත්‍යයක් ඇති එහි පැතිර සිටි **සතර ධාතූන්** විසින් උපකාර කරන ලදුවා **උතු - චිත්ත - ආහාරයන්** විසින් උපස්තම්භ කරන ලදුවා **ජීවිතේන්ද්‍රිය** විසින් රක්නා ලදුවා **වර්ණ, ගන්ධ, රස, ඕජාවන්** විසින් පිරිවරන ලදුවා **උකුණු හිසක්** පමණ වූ ප්‍රදේශයෙහි පවත්නේ **චක්ඛුර් විඤ්ඤාණ** සිත් දෙකට **චක්ඛුර්ද්වාරාවජ්ජන භාවයද, ආවජ්ජන - සම්පටිච්ඡන - සන්තීරණ - ජවන - තදාලම්බනයනට මාරහාවය** ද සිදු කෙරෙමින් සිටුනේ සි.

එමැ කිහ.

"යෙන චක්ඛුප්පසාදෙන - රූපානි මනුපස්සති
පරිත්තං සුඛුමං එතං - ලෝකා සිරසමූපමං[1]

'රූපාලම්බනය දක්නා ඒ **චක්ඛුඃප්‍රසාදය** ඉතා කුඩා ය. උකුණු ඉසක් පමණ වේ.'

---

[1]අත්ථ: නී: රූපකණ්ඩ 267

විශෙෂ:- **ප්‍රසාදරූපය** වූ කලී මනොද්වාර ගොචර වූ ප්‍රසාද මාත්‍රයය. එය ප්‍රමාණත්වයෙන් ගිණිය නොහැකි වුවද, එයට නිශ්‍රය **අවිනිභෝග** රූප හා **ජීවිතින්ද්‍රිය** ද, ඇතුළු රූප **කලාපයන්** ගෙන මෙහි ප්‍රමාණය කීහයි ද, හෙද එහි අක්ෂි පටල සතේ පැතිරීමෙන් කුඩා දේ මහත් කොට පෙණෙන වීදුරු වලින් මෙන් එසේ මහත්ව පෙන්වතැ යි ද සිතිය හැක්ක.

("ඒ චක්ෂුස් තෙමේ අධිට්ඨාන හෙදයෙන්ද, එහිදු ප්‍රත්‍යෙකයෙන් අනෙක කලාපගත බැවිනුදු අනේකවූයේ ද, සාමාන්‍ය නිදේශයෙන් **එක ක්ෂණයක එකම කෘත්‍යයක් කරන** බැවිනුදු, **එකක්** කොට කියන ලදී" (යනු සත්‍යයි.)

(2) **ශ්‍රොත්‍රප්‍රසාදය** සමහාර සොත බිලය තුළ තුනී වූ තඹවන් රෝමයෙන් ගැවසීගත් ඇඟිලි මුදුවකට බදු සටහන් ඇති පෙදෙසෙහි යට චක්ෂුප්‍රසාදයෙහි කී පරිදි **ධාතූන්** විසින් කරන ලද උපකාර ඇතිවැ, **ඍතු-චිත්ත-ආහාරයන්** විසින් උවටැන් කරන ලදුවැ, වණ්ඩීන් පිරිවරන ලදුව **සොත විඤ්ඤණාදි** සිත්වලට සුදුසු **වසතු-චාර** භාවය සිදුකෙරෙමින් සිටී.

(3) **ඝ්‍රාණ ප්‍රසාදය** සසමහාර ඝ්‍රාණ බිලයෙහි ඇතුළත එළු කුරයක සටහන් ඇති පෙදෙසෙහි යට කී පරිදි උපකාරඋපස්ථාමහ-අනුපාලන-පරිවාර ලැබ **ඝ්‍රාණවිඤ්ඤාණාදියට වසතු-චාර**-භාවය සිදුකෙරෙමින් සිටී.

(4) **ජිව්හා ප්‍රසාදය** සමහාර ජිව්හායෙහි මැද මතුපිට උපුල් පතෙක අගට බදු සටහන් ඇති පෙදෙසෙහි යථොක්ත උපකාර-උපස්ථාමහ - අනුපාලන - පරිවාර - ලැබ **ජිව්හාවිඤ්ඤාණාදියට වසතු - චාර** - භාවය සිදු කෙරෙමින් සිටී.

(5) **කායප්‍රසාදය** මේ ශරීරයෙහි **කර්මජ** තෙජෝ ධාතුව (ජඨරාග්නිය) පැතිර පවත්නා සථානය හා **කෙස්-ලොම්-නිය-අක්** හා **විසළි** සම්දැසි මෙතෙක් දැ හැර **කර්මජ** රූප පවත්නා අනෙක් මුළු ශරීරයෙහි කපු පුළුන් පෙදක වත්කළ තල තෙලක් සේ **කාය**-විඤ්ඤාදියට **වසතු-චාර** භාවය සිදු කෙරෙමින් සිටී.

විශෙෂ:- චකඛුපසාදාදියෙහි ද මේ **කාය**පසාදය ඇත ද, ඒ ඒ ප්‍රසාදයන්ට නිශ්‍රය වූ භූත රූපයන් ගේ වෙනස් - වෙනස් **ලක්ෂණ** ඇති හෙයින් නො ගැනේ.

විඤ්ඤාර:- **සසම්භාර චක්ඛු** තම් ලද මස් ගඩුවෙහි උපකරණ වශයෙන් **සතර** මහා භූතය - **වණ්ණය, ගන්ධය, රසය, ඕජාය සම්භවය - සණ්ඨානය - ජීවිතය** - භාවය - **කායප්‍රසාදය - චක්ඛුප්‍රසාද** යන කොටස් තුදුසෙක් (14) වෙයි.

ශ්‍රොත්‍රාදියෙහි ද මේ **තුදුස්** ධර්මයෝ ම වෙත්. මේ සංක්ෂේපයෙහි **ලා අවිඤ්ඤත්ති රූප අට හා සමඤ්ඤ සණ්ඨාන** ද **චතුසමුට්ඨානික** වශයෙන් ගෙන **සතලිසෙක්** (40) වේ. **කර්මජ** වූ **කාය-භාව-ජීවිත රූප** හා ඒ ඒ ප්‍රසාද ද සමග සුසාලිසෙකි. (44) උපකරණ නම් මේ ය.

චක්ඛුමාරභාවය, චක්ඛුප්පසාදාදි පඤ්චප්පසාදයෝ **චක්ඛු-විඤ්ඤාණාදි ඔපඤ්ච විඤ්ඤාණයන්ට** පිහිටීමට උපකාර වීමෙන් **චක්ඛුභාවය** හා **සම්පටිච්ඡනාදි** සෙසු චිත්තනයන්ට ද නිශ්‍රය වීමෙන් **මාරභාවය** ද සිදු කෙරේ.

තවද **චක්ඛුප්පසාදය** විෂම අදහස් ඇති බැවින් තුඹස් සිදුරක ඇලුණු සර්පයකු මෙන් ද, **ශ්‍රොත්‍රප්‍රසාදය** බිලාධ්‍යාශය ඇති බැවින් ගැඹුරු ජලයෙහි බිලයක වෙසෙන කිඹුලකු මෙන් ද, **ඝ්‍රාණප්‍රසාදය** ආකාශාධ්‍යාශය ඇති බැවින් අජටාකාශයෙහි ඇලුණු උකුස්සකු මෙන් ද, **ජිහ්වාප්‍රසාදය** ග්‍රාම්‍යාධ්‍යාශය ඇති බැවින් ග්‍රාමයෙහි ඇලුණු සුනඛයකු මෙන් ද, **කායප්‍රසාදය** උපාදින්නක ශරීරයෙක සපශී ගැනීමේ අදහස් ඇති බැවින් අඹුසොහොනෙහි ඇලුණු ශෘගාලයකු මෙන්ද සි, මේ පඤ්චප්‍රසාද තම තමා අයත් ගොචරයට කැමුණු අයුරු සලකා මෙසේ **උපමා** වසින් දතයුතු.

විශෙෂ:- චක්ඛුප්පසාදාදි රූප ධර්මයෝ ඒවා අයත් පුද්ගල-යාගේ අදහස් වසින් විසම අදහස් ඇත්තෝ වෙති. ඥානූපචාර වසින් මෙසේ කී.

විෂයරූප

(6) **රූපාලම්බනය**:- චක්ඛුප්පසාද රූපයෙහි ගැටීම **ලක්ෂණ කොට** ඇත්තේ ය. චක්ඛුවිඤ්ඤනයට ආලම්බන වීම නොහොත් ආලම්බන වීමේ ගුණය කෘත්‍යය කොට ඇත්තේ ය. චක්ඛු-විඤ්ඤාණයට ගොචර භාවයෙන් **වැටහෙන සුභාව** ඇත්තේ ය. සතර මහාභූත **ආසන්න කාරණ** කොට ඇත්තේ ය. (මෙසේ සියලු උපාදා රූපයෝ සතර මහාභූත ආසන්න කාරණ කොට ඇත්තාහ. එසේ නො පවත්නා තන්හි ඒ වෙසෙසා කියනු ලැබේ. මේ රූපාලම්බනය නීල-පීතාදි වශයෙන් තත් වැදැරුම් වේ.)

(7) **ශබ්දාලම්බනය**:- ශ්‍රොත්‍රප්‍රසාදයෙහි ගැටීම **ලක්ෂණ යැ.** ශ්‍රොත්‍ර විඤ්ඤනයට විෂයවීම **කෘත්‍ය යැ.** එයට ගොදුරුවීම **වැටහෙන සුභාවය යැ.** බෙර හඬය, මිහිඟු බෙර හඬය ආදීන් ශබ්දය අනෙකාකාරයි.

(8) **ඝ්‍රාණාලම්බනය** ඝ්‍රාණප්‍රසාදයේ ගැටීම එහි **ලක්ෂණ යැ.** ඝ්‍රාණ විඥානයට විෂය වීම **කෘත්‍යය යැ.** එයට ගොදුරුවීම **වැටහෙන ආකාරය යැ. මූලගන්ධය – සාරගන්ධය** යනාදීන් ගන්ධය නානාවිධයි.

(9) **රසාලම්බනය** ජිහ්වා ප්‍රසාදයෙහි හැපීම **ලක්ෂණයෙ**ට ඇත්තේ ය. ජිහ්වා විඥානයට ගොචරවීම එහි **කෘත්‍යය යැ.** ජිහ්වා විඥානයා ගේ පැවැත්මට සථාන භාවය **වැටහෙන ආකාරය යැ.** මූලරසය – ඛණ්ඩරසය යනාදීන් රසය අනෙකවිධයි.

ඵෝට්ඨබ්බාලම්බනය:– කාය ප්‍රසාදයෙහි ගැටීම් **ලක්ෂණ යැ.** කාය විඥානයට විෂයවීම **කෘත්‍යය යැ.** කාය විඥානයට ගොදුරුවීම **වැටහෙන ආකාරය යැ.** ආපොවර්ජිත භූත ත්‍රය **ආසන්න කාරණ යැ.** (ආපෝ ධාතුව ශීතඵොට්ඨබ්බත්වයැ[1] යි මතාන්තරයෙකි. ඒ නො යෙදේ. තෙජෝ ධාතුව අඩුවූ කල සීතල සේ දැනෙන හෙයිනි. 'ඵොට්ඨබ්බ කරන්නහු ගේ ශරීරයේ උෂ්ණයට ඵොට්ඨබ්බ කරන දැයෙහි උෂ්ණය අධිකවූ කල උෂ්ණයයි ද, එයට අඩුවූ කල සීතයයි' ද දැනීම වේ. තවද සීත – උෂ්ණ දෙක එකවට නො දැනෙන හෙයින් **තෙජෝ ධාතූන්ගේ** ම ඵොට්ඨබ්බය සීතල බව පැහැදිළි ය.) මෙය පඨවි තෙජෝ වායෝ ධාතූන් හෙයින් විශෙෂයෙන් නො ගැනේ.

(10) **ඉත්ථින්ද්‍රිය,** 'මෝ සත්‍රීයැ' යි දැනීමට හා සත්‍රීය යන නාමය ඇතිවීමට හේතුවූ බව් **ලක්ෂණ කොට** ඇත්තේ ය. මෝ සත්‍රීයැ යි ප්‍රකාශවීම **කෘත්‍යය** යැ. i සත්‍රී ලිඬගය, ii නිමිත්තය, iii කෘත්‍යය, iv ආකල්පය යන මොවුන්ට හේතු භාවය **නුවණට වැටහෙන ආකාරය යි.** (මෙයම යට කී සේ සත්‍රීය යි දැනගත්තා නුවණට හා සත්‍රීය යන ශබ්දයට හේතුව වන බැවින් සත්‍රීභාව නමුදු වේ.)

i වටවූ උකුළු හා මෘදු අත් පා ආදිය ඇති බව හෝ සත්‍රීන් ගේ මූත්‍ර කරණය හෝ ලිඬග නම්.

ii සනකාදි සත්‍රී බව් දැක්වෙන ලකුණු හෝ අනුරාගාදි අදහස් සත්‍රී නිමිත්ත නම්.

iii ළදරු කල පටන් කුළු ආදියෙන් ක්‍රීඩා කිරීම් ආදිය හෝ කැම් බීම් ආදිය සත්‍රී කෘත්‍ය යැ.

vi අවිසඳ ගමන් බිමන් ආදි ආකාරය හෝ සවරූපය සත්‍රී ආකල්ප ය.

---

[1] ශීතඵොට්ඨබ්බත්‍යාපස (කණාද)

ප්‍රශ්න:- සත්‍රී ලිඞ්ගාදීහු **කම්මාදි** තම තමා අයත් ප්‍රත්‍යයයෙන් නටගන්නාහු නො වෙද්ද, කුමක් හෙයින් ලිඞ්ගාදියට **කාරණ** භාවය (පවිවුපථ්‍යාන) වැටහෙන ආකාර භාවයෙන් කීයේ ද

පිළිතුර:- කම්මයෙන් උපදිනත් සත්‍රීභාව සහිත සථ්‍යානයෙහි ම ඒ ඒ ආකාරයෙන් උපදනා හෙයින් සත්‍රීන්ද්‍රිය ඔවුනට නිමිති වේ. එහෙයින් ලිඞ්ගාදිය සත්‍රීන්ද්‍රියයා ගේ පවිවුපථ්‍යානය යි කියන ලදී.

ප්‍රශ්න:- කුමක් හෙයින් සත්‍රීභාවය සත්‍රීන්ද්‍රියයයි කියන ලදද

පිළිතුර:- සත්‍රී ලිඞ්ගාදීන් කෙරෙහි ම **කාරණ**භාව සඞ්ඛ්‍යාත අධිපති භාවයෙන් සත්‍රී භාවයා ගේ ඉන්ද්‍රිය භාවය කියන ලදී. හේද සත්‍රීන්ද්‍රිය සහිත සන්තානයෙහි සත්‍රී ලිඞ්ගාදී ආකාර වූ රූප ප්‍රත්‍යය-යත් අන් ආකාරයකින් නූපදනා හෙයින් හා සත්‍රියයි ගැනීමට ඒ රූපයන් ප්‍රත්‍යය වන බැවින්ද යි මෙසේ ඉන්ද්‍රිය භාවය වදාරන ලදී.

ප්‍රශ්න:- එහෙත් **පථ්‍යාන පාළියෙහි** එයට ඉන්ද්‍රියාදි ප්‍රත්‍යය භාවය කුමක් හෙයින් නො වදාළේ ද

පිළිතුර:- භාව දසක කලාපයෙහි වූ සත්‍රීන්ද්‍රියය ද, රූප නො උපදවන්නේ ය. පාලනය ද නො කරන්නේ ය. උපසථ්‍යම්භක ද නො වන්නේ ය. අන්‍ය කලාපගත රූපයන්ට ද, ජනක- පාලක- උපසථ්‍යම්භක නො වන්නේ ය. එහෙයින් කලාපගත රූපයන්ට ජීවිතින්ද්‍රියය මෙන් ද, අන්‍ය කලාපගත රූපයන්ට ආහාරය මෙන් ද, ඉන්ද්‍රිය- අත්‍ථි- අවිගත- ප්‍රත්‍යය වන්නේ ය" යි නො වදාරන ලදී.

(**11**) **පුරිසින්ද්‍රිය**, මේ පුරුෂයායැ යි ශබ්ද බුඞ්වට **කාරණ** බව **ලක්ඛණ යැ. පුරුෂයායැ** යි ප්‍රකාශවීම **කෘත්‍යය යැ.** පුරුෂ ලිඞ්ග-නිමිත්ත- කෘත්‍ය- වෙශය යන මොවුන්ට කාරණභාවය **වැටහෙන ආකාර ය.** (මෙහි විසතර සත්‍රීන්ද්‍රියයට විසදෘශ පක්ෂයෙහි වේ.)

විශෙෂ:- මේ රූපඛ්‍යය එකම සන්තානයෙහි එකවට නො පවත්නේ ය. **"යස්ස ඉත්ථින්ද්‍රියං උප්පජ්ජති තස්ස පුරිසින්ද්‍රියං උප්පජ්ජති නො" යි** සත්‍රීන්ද්‍රිය උපන්නහුට පුරිසින්ද්‍රිය නූපදනා බව් පැවසේ.

එහෙයින් උභතොබ්‍යඤ්ජනකයාට පවා **එක** ලිඞ්ගයක් අතුරු-දහන් වූ පසු අන්‍ය ලිඞ්ගය පහළ වේ.

මතභේදය:- ඇතැම් කෙනෙක් 'භාව රූප ශරීරයෙහි ඒක දේශයක පවතීය' යි කියත්. එය එ සේ නො වේ. ඒ 'දෙකම කාය ප්‍රසාදය මෙන් සකල ශරීරය පැතිර පවතී.' එහෙත් 'කාය ප්‍රසාදය සිටි තන්හි හෝ නො සිටි තන්හි හෝ පවතී ය' යි කිව නොහේ. හින්නානිශ්‍රය හෙයිනි.

කුමක් මෙන්දයත්

එකෙකී කලාපයෙහි පිහිටි රූප රසාදිය **ලක්ෂණ** වශයෙන් වෙනස් හෙයින් ඔවුනොවුන් මිශ්‍ර නො වන්නාක් මෙනි. (මෙසේ සමාන නිශ්‍රය හෙවත් එකම පෘථිවි ධාතුවක් ආශ්‍රය කොට පවත්නා රූප රසාදිය ද **ලක්ෂණ** වශයෙන් වෙනස් හෙයින් මිශ්‍ර නොවේ නම්, හින්න නිශ්‍රය හෙවත් ආධාර වූ පෘථිවි ධාතුව ද වෙනස් හෙයින් හින්න **ලක්ෂණ** වූ **කාය ප්‍රසාද, භාව රූපයන්** ගේ සංකරය (මිශ්‍රණය) නො වේම ය)

(**12**) **ජීවිතේන්ද්‍රිය,** තමා හා එක්වැ උපන් රූපයන් පාලනය කිරීම් **ලක්ෂණ යැ.** ඒ සහජාත රූප පැවැත්වීම **කෘත්‍යය යැ.** ඔවුන්ගේ ම සිටුවීම **වැටහෙන ආකාර යැ.** තමා විසින් පැවැත්විය යුතු භූතයන් ම **ආසන්න කාරණය යැ සි.**

(ජීවිතේන්ද්‍රිය කර්මජ හෙයින් සහජාත රූප ද කර්මජ ම ය. තමා ඇයත් ක්ෂණ මාත්‍රයක් සිටුනා කර්මජ රූපයන්ට ජීවත්වීමට හේතු-වීමෙන් ඒ පාලනය කිරීම ජීවිතේන්ද්‍රියයේ ලක්ෂණ යැ.)

ප්‍රශ්නය:- ආහාරජ රූපයනට ආහාරය මෙන් කර්මජ රූප-යනට කර්මය පැවැත්මට හේතුවිය යුතු නොවේද

පිළිතුර:- ආහාරාදීහු තම තමා ඇති ක්ෂණයෙහි රූප උපදවා ඒවායේ පැවැත්මට ද හේතුවෙත්. (පියා රැකීමට සිටුනා පුත්‍රයා සුළු පිය ආදීන් ගැන අපෙක්ෂා නො කරන්නාක් මෙනි.) ජලය උපුල් ආදිය රක්නාක් මෙන් අනුපාලනය කටයුතු රූප ඇතිකල්හි ම ජීවිතේන්ද්‍රිය සහජාත රූප පාලනය කරන්නේ ය. කිරි මවු, අන්‍යයන් ප්‍රසව කළ රජ කුමරුවකු රක්නා සේ තමා අයිති යම් යම් කර්මයෙන් ඇවතත් කර්මජ රූපයන් ජීවිතේන්ද්‍රිය ආරක්ෂා කරන්නේ ය.

ප්‍රශ්නය:- කර්මජ රූපයන් ගේ පැවැත්වීමට හේතු වූ ජීවිතේන්ද්‍රියය කර්මයෙන් තොරව කෙසේ පවත්නේද,

පිළිතුර:- තැව පදින්නා වූ නැවියා තමා විසින් පදින නැව හා සමඟම ම අභිමත ස්ථානයට පැමිණෙන්නා සේ, තමා විසින්ම රක්නා ලද සහජාත ධර්මයන් ගේ බලයෙන් පවත්නේ සි.

ප්‍රශ්න :- කර්මජ රූපයන්ගේ පැවැත්ම ජීවිතේන්ද්‍රිය ප්‍රතිබද්ධ-නම් සියලු කල්හි නො පවත්නේ කවර හෙයින් ද

පිළිතුර :- තමා ගේ හා පාලනය කළ යුත්තන් ගේ ද අභාව-යෙනි.

ප්‍රශ්න :- හඬගක්ෂණයෙහි නො පැවැත්විය හැක්කේ කුමක් හෙයින් ද

පිළිතුර :- අවසන් වූ පහන්වැටියට තෙල් ඇත්තාවූ ද, පහතෙහි සිළුව පැවැත්විය නො හැක්කා සේ, ජීවිතෙන්ද්‍රිය ය හඬගක්ෂණයෙහි බිඳෙන හෙයිනි. එසේ හඬගක්ෂණයෙන් මත්තෙහි නො යැපිය හැකි වුව ද, පරම්පරාව රැකීම ය, යැපීම ය, ජීවත්වීම ය, සිටුවීම ය, පිහිටුවීම ය, යන මොහු අනුභාවයෙන් තොර නො වන්නාහ. කියතලද යම් යම් ක්ෂණයෙක්හි ඒ ඒ රූප පරම්පරාව ආරක්ෂා කිරීම ය, යැපීම ය, ජීවත්කර වීම ය, යනාදි කෘත්‍ය සිද්ධ කරන හෙයිනි.

(ඉන්ද්‍රිය ප්‍රතිබද්ධ රූපයා ගේ හා මළවුන් ගේ රූපයේ චෙතස ද, ජීවිතේන්ද්‍රිය හා සම්බන්ධ වූ කර්මජ රූපයා ගේ හා උතුසමුට්ඨානාදි රූපයේ චෙතස ද, ජීවිතේන්ද්‍රිය විසින් කරන ලදී. හුදෙක් ජීවිතේන්ද්‍රිය ක්ෂණ සථිතියට ම හේතු නො වේ. රූප පරම්පරාව නො සිඳ පැවැත්මට ද හේතු වන්නේ ය. ක්ෂණ සථිතියට ම හේතු වේ නම් ආයුක්ෂය මරණය නො යෙදෙන්නේ ය. (ආයු නම් ජීවිතේන්ද්‍රිය ය) තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන් ජීවත්වීමට උපකාර වන හෙයින් ජීවිත නම් වේ. පියුම් දණ්ඩෙහි සිදුර වූ ජලය, ජලයෙන් මතු වූ පියුම විසළි යා නොදී රක්නා සේ කර්මජ රූප තමා පවත්නා කාලය තුළ ආරක්ෂා කරන හෙයින් හා රට වැස්සා කෙරෙහි ඊශ්වරත්වය පවත්වා ආරක්ෂා කරන පෘථිවීශ්වරයකු සේ කර්මජ රූපයන් ඊශ්වරත්වයෙන් රක්නා හෙයින් **ජීවිතෙන්ද්‍රිය** නමුදු වේ. මෙය ජඨරාග්නිය, හා කෙස්, ලොම්, නිය අක් හා විසළි සම් ය යන මේ සථාන හැර ඉතිරි මුළු සිරුර පැතිරී සිටී.)

(13) **හදයවත්ථු, මනොධාතු, මනොවිඤ්ඤාණධාතූන්ට** නිශ්‍රය වීම මෙහි **ලක්ෂණ** යැ. ඒ ධාතුත්‍රයට ආධාරවීම **කෘත්‍යය** යැ. එය ධැරීම **වැටහෙන ආකාරය** යි.

විඤාර:- සප්ත විඤ්ඤානයන් අතුරෙන් **දෙපස් විඤ්ඤාණ-යෝ** පඤ්චප්පසාද වත්ථූන් නිසා පවත්නාහ. **මනොධාතු-මනොවිඤ්ඤාණ ධාතුවය** හෘදය වස්තුව නිසා පවතී. ඒ **හෘදය වස්තුව**

වනාහි යට **කායගතාසති** නිදේශයෙහි කීසේ හෘදය මාංසය ඇතුළත පවත්නා ලෙය ඇසුරු කොට සතර මහා භූතයන් විසින් සඤ්ඤාරණාදි කෘත්‍යයෙන් කරන ලද උපකාර ඇතිවා, යෘතු, චිත්ත, ආහාරයන් විසින් උවතඹ කරන ලද්දාවූ, ජීවිතෙන්ද්‍රිය විසින් ආරක්ෂා කරන ලද්දාවූ මනොධාතු-මනොවිඤ්ඤාණ ධාතූන්ට හා ඒ හා සම්ප්‍රයුක්ත වෙතසිකයනට නිශ්‍රය වසතු බව සිද්ධ කරමින් පවතී. (මේ ටීකාගත විස්තරයෙකි.)

ප්‍රශ්නය:- ඒ බව කෙසේ දතහැකි වේ ද

පිළිතුර:- **ආගම** නයින් හා **යුක්ති** විසින් ද දතහැකි වේ.

'**යම් රූපයක් නිසා මනොධාතු - මනොවිඤ්ඤාණධාතු**' පවතී නම් ඒ රූපය ඒ ධාතුවයට ද, තත් සම්ප්‍රයුක්ත වෙතසිකයනට ද නිඃශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ'

"යං රූපං නිස්සාය මනොධාතු- මනොවිඤ්ඤාණධාතුව වත්තතනි තං රූපං මනොධාතුයා මනොවිඤ්ඤාණධාතුයාච තං සම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සය පච්චයෙන පච්චයෝ"[1] යි මේය **ආගම** නම්.

ප්‍රශ්නය:- **මනොධාතු - මනොවිඤ්ඤාණධාතූන්ට** නිශ්‍රය වූ හෘදය වස්තු රූපයෙක් වේ නම් කුමක් හෙයින් **දම්සඟුණු** පෙළෙහි නො වදාළසේක් ද?

පිළිතුර:- එහි නොවැදැරීම අන්‍ය කාරණයෙකිනි.

ප්‍රශ්නය:- ඒ කවරේ ද

පිළිතුර:- දේශනා භේදය හෙයිනි.

ඒ මෙසේයි:- **වසතු දුකාදි** දේශනාව නිඃශ්‍රිතයන් ගේ වශයෙන් පැවැත්තේ ය. මනොවිඤ්ඤාණධාතුව ඒකාන්තයෙන් හෘදය වසතු රූපය නිසාම නො පවතී. **"අත්ථි රූපං චක්ඛු විඤ්ඤාණස්ස වත්ථු, අත්ථි රූපං චක්ඛු විඤ්ඤාණස්ස න වත්ථු"**[2] 'චක්ඛු විඤ්ඤාණයට වසතු වූ රූපයක් ඇති, චක්ඛු විඤ්ඤාණයට වසතු නොවූ රූපයක් ද ඇති, යනාදි වීසිනි. මේ අනුව **'අත්ථි රූපං මනොවිඤ්ඤාණස්ස වත්ථු"** මනොවිඤ්ඤාණයට වසතු වූ රූපයක් ඇත, යනාදීන් වසතු දුකාදිය කියනු ලබන කල එයට අනුකූල සේ ආරම්මණ දුකාදිය නො යෙදේ. ඒ මෙසේයි. **"අත්ථි රූපං චක්ඛු විඤ්ඤාණස්ස ආරම්මණං අත්ථිරූපං චක්ඛු විඤ්ඤාණස්ස න ආරම්මණං**[2]**"** යි 'චක්ඛු විඤ්ඤාණයට ආරම්මණ වූ රූපයක් ද, චක්ඛු විඤ්ඤාණයට ආරම්මණ නොවූ රූපයක් ද ඇතැයි, මෙසේ

[1]ප: ප: පච්චය නිද්දෙස 4 [2]ධ: ප: රූපකාණ්ඩ 113 පිට

විපඤ්ච විඤ්ඤාණයට ආරම්මණ වූ ද, ආරම්මණ නො වූ ද, රූප වදුළ සේක. **'අත්ථි රූපං මනෝ විඤ්ඤාණස්ස ආරම්මණං අත්ථි රූපං න මනෝ විඤ්ඤාණස්ස ආරම්මණං'** යි 'මනෝ-විඤ්ඤාණයට ආලම්බණ වූ රූපයක් ඇති. මනෝවිඤ්ඤාණයට ආලම්බන නො වූ රූපයක් ඇතැයි ද, මෙසේ නො වදුළ හෙයින් **වඤ්ඣ - ආලම්බන** දුක වෙනස් සවිරූප වන හෙයින් නො වදුළහ. එසේ වන්නා දේශකාව භින්න ගතික වේ. මෙතන්හි වූකලී සදෘශ කෘත්‍යය ඇති දේශතාව වැදැරීම **ශාස්තෘවන්-වහන්සේ ගේ** අදහස යැ. එහෙයින් **'ධම්මසඞ්ගණී'** රූප කාණ්ඩයෙහි හෘදය වඤ්ඣ රූපය නො වදුළහ.

මේයැ යුක්තිය. **පඤ්ච වොකාර භවයෙහි මනොධාතු-මනොවිඤ්ඤාණ ධාතුමය** උපාදා රූප වූ **හෘදය වඤ්ඣ** රූපය නිසාම පවත්නේ ය.

චතුවොකාර (ආරූපප) භවයෙහි **මනොවිඤ්ඤාණ ධාතුව හෘදය වඤ්ඣ රූපය** නැතිව ම පවත්නේ සි. එහි රූප නැති හෙයින් **මනො ධාතුව** චතුවොකාර භවයෙහි නො පවත්නේ සි. එසිනුදු **වඤ්ඣ දුකයා ගේ** විසදෘශ භාවය ද වේ. චක්ඛු විඤ්ඤාණාදියට නිශ්‍රය වන හෙයින් **මනොධාතු - මනෝ-විඤ්ඤාණධාතු** මය චක්ඣුඃප්‍රසාදාදිය ඇසුරු කොට නො පවත්නේ සි. රූපාදි පඤ්චාලම්බනයන් බාහිරයෙහි ද පවත්නා හෙයින් ඔහු ද **මනොධාතු - මනොවිඤ්ඤාණධාතූන්ට** නිශ්‍රය නො වෙත්. ජීවිතෙන්ද්‍රිය ද, තමා හා සම්ප්‍රයුක්ත රූප කලාපයන් පාලනය කිරීමෙහි දී පවත්නා හෙයින් මේ ධාතු ත්‍රය **ජීවිතෙන්ද්‍රිය** නිශ්‍රය කොට ද නො පවත්නේ සි.

ස්ත්‍රීභාව - පුරුෂභාව රූප ද ආදිකල්පික බ්‍රහ්ම (අභාවක සත්ත්ව) යන් විෂයෙහි ද නො පවත්නා හෙයින් මේ ධාතු ත්‍රය භාව-රූපයන්හි ද නො පවත්නේ ය. මෙසේ වන්නා මෙකී සථානයන්-ගෙන් පිටත් යම්කිසි උපාදා රූපයක් ඇසුරින් මේ ධාතු ත්‍රය පැවැතිය මනා ය. එසේද වුවත් **ධම්මසඞ්ගණී රූප කාණ්ඩයෙහි 'වඤ්ඣ - ආලම්බන'** දුකයන් ගේ පෙර කී සේ විසදෘශත්වය හේතු-කොට නො වදුළහ. චිත්ත - චෛතසිකයන් වාසය කරන

අර්ථයෙන් ම මේ **හෘදය** රූපය **වස්තු** නම් වේම ය. වස්තු භාවය ලබනුවෝ සිතට ආශ්‍රය වන්නෝම ය.[1]

(**14**) **කාය විඤ්ඤත්ති රූපය**- ඉදිරියට යාම, ආපසු ඒම, අත් පා දිග හැරීම, හැකිළීමාදි **කායික** ක්‍රියාවන් පවත්වන්නා වූ සිත නිසා පැවැති වායෝ ධාතුව හා එක්වැ හටගන්නා වූ රූපකායයට් රූකුල් දීමෙන් සැලීම්-පිහිටුවීම් ආදී ඒ ඒ ක්‍රියාවන් උපදවන්නා වූ ආකාර විශෙෂය **කාය විඤ්ඤත්ති** නම. යාම් ආදි ක්‍රියාවකදී සැලෙන කාය ප්‍රදේශයක් දැකීමෙන් පිටත සිටින්නවුනට 'මේනම් දෙයක් **කරතැ**'සි දැනීමක් ඇතිවනුයේ කාය විඤ්ඤත්තිය නිසා ය. ඒ වූකලී වායෝ ධාතු අධික චිත්තජ මහාභූතයන් ගේ සාම්‍යතාය නිසා හට ගැනේ. අභිප්‍රාය ප්‍රකාශ කිරීම මෙහි **කෘත්‍යය යැ. කාය** විඤ්ඤත්තියට හේතුභාවය **වැටහෙන ආකාරය යැ.** චිත්ත සමුට්ඨාන වායෝ ධාතුව **ආඝන්න කාරණය යැ**. (කාය චලනය අදහස හැඟවීමට හේතුවන බැවින් ද, තමා ම ඒ **කාය**චලන සංඛ්‍යාත කයින් දතයුතු වන බැවින් ද **කායවිඤ්ඤත්තියැ** යි කියනු ලැබේ.)

(**15**) **වචී විඤ්ඤත්ති**- අර්ථයන් අවබෝධ කිරීමට සමර්ථවූ වාග් භේදය පවත්වන **චිත්ත සමුට්ඨාන පඨවි ධාතුව, කම්ම-**

---

[1]එහෙත් නූතන හැම විටතුන් ම පාඨේ **සිත** මොළය (මස්ථලුඞ්ගය) ඇසුරු **කොට** පවත්නා බව නත් අයුරින් පරීක්ෂණ පවත්වා **තීරණය** කොට තිබේ එය දැනට පිළිගෙන ඇතත්, සිත අරමුණු ගැනීමේදී පවත්නා, **චක්ඛුරාදි වස්තු** සතරක් හෝ පසක් හිසේම පිහිටා තිබෙන හෙයින් හා, අරමුණු ගැනීමේදී ඒ **වස්තූන්** ඇසුරින් සිත පැවැත්ම වන හෙයින් ද, එම **වස්තූන් හා හෘදය වස්තුව** අතර පවත්නා **මොළය,** ඉතා සියුම් සනායුන් ගෙන් සම්බන්ධව පවත්නා හෙයින් ද, ඒ චක්ඛුරාදි පඤ්ච වස්තූන් ගේ ආශ්‍රයයෙන් අරමුණු ගැනීමේදී සිත එසේ පැවැත්ම විය හැකි ය. තවද **හෘදය වස්තුව** මුළු ශරීරයේ ජීවරුධිරය පතුරුවන මූලස්ථානය බව සියල්ලන් ගේ පිළිගැනීම ය. ඒ ලෙය සියලු ශරීරයේ ගමන් **කරවන** සියුම් සනායුන් හෘදය හා සම්බන්ධව පවතී හෘදය වස්තුව ආශ්‍රය කරන ඒ ලෙයෙහි ඇති ප්‍රසාද ගතියක් වස්තුකොට පවත්නා **මනොධාතු - මනොවිඤ්ඤාණධාතු** සංඛ්‍යාත (දිව්පඤ්ච විඤ්ඤාණ හැර) සියලු චිත්ත සන්තතිය ඒ ඒ වස්තූන්හි පවත්වමින් ද්වාරයන් ඇසුරෙන් ආලම්බනයන් ගැනීමේදී හෘදය හා ඉන්ද්‍රියයන් අතර මධ්‍යස්ථානයේ (මොළයේ) ද ආශ්‍රය ලැබීම පෙර කී සේ ඉතා සියුම් සනායු සම්බන්ධය නිසා සිදුවන බව නිශ්චය කළ හැකි ය.

පඨවි ධාතුවෙහි (අක්ෂර උත්පත්තිස්ථානයෙහි) ගැටීමට සහකාරී **කාරණ** වූ ආකාර විශෙෂය **වාග් විඤ්ඤත්ති නම.**

අදහස ප්‍රකාශ කිරීම එහි **කෘත්‍යය යැ.** වාග් ඝොෂයට හේතු බව **වැටහෙන ආකාර යැ.** චිත්තජ පඨවි ධාතුව **ආසන්න කාරණ සි.**

මෙය වාග් ඝෝෂයෙන් අදහස හැඟවීමට හේතුවන නිසා ද, තමා ද ඒ වාග්ඝෝෂ සඞ්ඛ්‍යාත වචනයෙන් දතයුතු හෙයින් ද, වාග්විඤ්ඤත්ති යයි කියනු ලැබේ.

නිදර්ශන :- අරණ්‍යයෙහි ඔසවා බඳින ලද ගෝසිඝාදියක් දැක මෙහි ජලය ඇතැයි දුරදීම දතහැකි වන්නා සේ, කාය චලනය හා වාග් ඝෝෂය ද ගෙන කාය-වාග් විඤ්ඤත්තින් දැන ගනිති.

විශෙෂ :- **කාය විඤ්ඤත්තියෙහි** දී සැලෙන වණීය ගැනීමට අනතුරුවය සි ද, **වචී විඤ්ඤත්තියෙහි** දී ඇසෙන ශබ්ද ශ්‍රවණයට අනතුරුවය සි ද, කියන ලදී. **කාය විඤ්ඤත්තිය** 'තමා හා කැටිවූ උපන් රූපකායයා ගේ තදවීම ය, ධැරීම ය, සැලීම ය, යන මොවුනට හේතු වූ ආකාර විකාරය' සි කියන ලද හෙයින් **සප්තම ජවනයෙහි** හටගත් වායො ධාතුව **පූර්ව ජවනයන්** ගෙන් හටගත් වායෝ ධාතූහු ගේ උපඝාතමඞය ලැබ චිත්තජ රූප චලනය කෙරේ. (මූල් ගැල්වල යුගයෙහි බැඳි ගොනුන් ගේ ඇදීම් වේගයෙහි උපකාරය ලැබ සප්තම යුගයෙහි බැඳි ගොනුන් ම අදනා සේ යයි අටුවාහි කියේ එහෙයිනි.)

වාග් විඤ්ඤත්තිය, චිත්තජ පඨවිධාතු ඝට්ටනය හා සමගමැ ඍතුජ ශබ්දය උපදී. භෙද පර්‍යාය වශයෙන් චිත්තජය සි කියති. එය වූකලී ප්‍රථම ජවනයන් ගේ අනුබලය ලැබ සප්තම ජවන-යෙහිම වේ. තදවීම් - ධැරීම් ආදිය නැති හෙයිනි. එහෙයින් සුළඟින් ගස් කොළුන් සෙලවීමෙහි හා එබඳු ශබ්දයෙහි ද **විඤ්ඤත්ති විකාර** රහිත හෙයින් මෙය මෙබන්දක් කෙරේය සි නො ගැනේ. (කරුණු මෙසේ හෙයින් හස්තාදී අවයව චලනයට හා ශබ්දයට වඩා අධික වූ අදහස් ඇඟවීමේ ශක්ති විශෙෂයකුදු ඇති බව් නිශ්චිත යැ.)

(16) **ආකාශ ධාතුව-** චක්ෂුර්දශකාදී ඒ ඒ කලාපයෙහි රූප පිරිසිඳිනුයි හෝ ඔවුන් ගෙන් තමා මැ පිරිසිඳීම ලබානුයි හෝ රූපයන් ගේ පිරිසිඳීම් මාත්‍රය හෝ යි මෙසේ මෙය රූප පරිච්ඡේදය (රූප කෙළවර) **ලක්ෂණ කොට** ඇත්තේය. රූප කලාපයන් ගේ දැක්වීම එහි **කෘත්‍යය යැ.** රූපයන්ගේ පරිච්ඡේද මාත්‍රය (සීමාව) **වැටහෙන ආකාරය යැ.** ඒ ඒ කලාපයෙහි රූපයන් හා නො-ගැටීම හෝ, කන් සිදුරු ආදි විවර භාවය **ඵලකොට ඇත්තේ යැ.**

පිරිසිදින ලද රූපයන් **ආසන්න කාරණය සි.** (ආකාශ ධාතුවෙන් පිරිසිදින ලද ඒ ඒ රූපකලාප අන්‍ය **කලාප** හා සඛකර නො ව, මෙය මෙයින් උඩ ය, යට ය, සරස යැ යනාදීන් පිරිසිදීම මෙහි සවභාවය සි)

(**විකාර රූප**)

(**17**) **ලහුතා,** ලහුතා රූපය, රූපයා ගේ නො බර බව **ලක්‍ෂණ** කොට ඇත්තේ යැ. රූපයන් ගේ බර බව දුරු කිරීම එහි **කෘත්‍ය යැ.** වහා ක්‍රියා **කළ** හැකි බව **වැටහෙන ආකාරය යැ.** සැහැල්ලු රූපයම **ආසන්න කාරණය සි.**

විශෙෂ :- චිත්තජ- ඍතුජ- ආහාරජ සඛ්‍යාත තිසමුඵාන රූපයන් ගේ නො බර බව චිතා, රූපයන් ගේ බර බව **පහකිරීමෙක්** මෙයින් අදහස් නො **කෙරේ.** එහෙයින් **මේ** ඇතිකල උපදනා රූපයන් ගේ ද සැහැල්ලු බව වේ.

(**18**) **මුදුතා,** නො තදබව මෘදුතා රූපයා ගේ **ලක්‍ෂණය යැ.** රූපයන් ගේ තද බව දුරු කිරීම මෙහි **කෘත්‍යය යැ.** සියලු ක්‍රියා-වන්හි අවිරුද්ධ බව **වැටහෙන ආකාරය යැ.** මොළොක් රූප **ආසන්න කාරණය සි.**

(**19**) **කම්මඤ්ඤතා,** ශාරීරික සියලු ක්‍රියාවන්ට සුදුසු බවයැ සි කියන ලද **කර්මණ්‍ය** බව **ලක්‍ෂණය යැ.** ශාරීරික ක්‍රියාවන්හි අයහපත් බව දුරුකිරීම එහි **කෘත්‍යය යැ.** රූපයන් ගේ බලවත් බව **වැටහෙන ආකාරය යැ.** ශරීර ක්‍රියාවන්හි සුදුසු රූපම **ආසන්න කාරණය සි.**

විශෙෂ:- මේ ලහුතාදිය රූපයන් ගේ ආකාර විශේෂ සි. එබැවින් මේ විකාර රූප නම් වේ. ශාරීරික මහා භූතයන් ගේ වහා ක්‍රියා කරවිය හැකි සේ නො බර බව **ලහුතා යැ.** ලිහිල් බව **මුදුතා යැ.** රූපයන් තමා ක්‍රියාවෙහි යෝග්‍ය බව **කර්මණ්‍යතා සි.** **මේ** තුන එක්වැ පවතින ආකාර වුව ද ඒ ඒ අවස්ථාවන්හි ඒ ඒ ආකාර ප්‍රකට වේ. **එහෙත්** නො ගිලන් පුරුෂයකු ගේ අත්-පාදිය වහා ක්‍රියාකරවිය **හැක්කා** සේ, රූපයන් ගේ සැහැල්ලු බව වහා ක්‍රියා කරවිය හැකි බව් සංඛ්‍යාත සවරූපය **ලහුතා රූපය යැ** වා- පිත්- සෙම්- ආදී ධාතූන් කිපීමෙන් හෝ, රසාදි සප්තධාතු ක්‍ෂොභයෙන් හෝ වන **කැළඹීමට** ප්‍රතිපක්‍ෂ සවරූපය වූ මනාව මැඩගත්තා **ලද** චමීයක් සේ රූපයා ගේ දැඩි බව නසා සියලු

ක්‍රියාවන්හි මනාව පැවැත්විය හැකි බව **මුදුතා රූපය යැ.** මනා-කොට පිඹගත් සවණියක් සේ **කායික** ක්‍රියාවන්හි මනාව යෙදවිය හැකි සේ ශරීර ක්‍රියාවනට අනුකූල බව් **කරන** ධාතුක්ෂෝභාදියට ප්‍රතිපක්ෂ ප්‍රත්‍යයයෙන් සමුත්ථාපිත රූප විකාරය **කම්මඤ්ඤතා රූපය සි.**

මෙසේ මේවායේ චෙතස ද දතයුතු.

(ප්‍රත්‍යුත්පන්න ප්‍රත්‍යය අපෙක්ෂකත්වය නිසා කම්ජ රූපයන්හි මේ ලහුතාදිය විකාර නො වේ.)

(20) (**ලක්ඛණ රූප**)

උපචය රූපය නිෂ්පන්න රූපයන් ගේ ප්‍රථම හට ගැනීම (නොහොත් මත්තෙහි වඩිනය වීමට පළමුවන හටගැනීම) **ලක්ෂණය යැ.** පූර්‍වාන්තයෙන් රූපයන් මතුකර වීම **එහි කෘත්‍යය යැ.** ඒ රූප ධර්මයන් එළවන්නාක් මෙන් වීම නොහොත් පරිපූර්ණතාවය **වැටහෙන ආකාරය යැ.** වැඩී වඩිනය වූ රූපය ම **ආසන්න කාරණය සි.**

(21) **සන්තති රූපය** නිෂ්පන්න රූපයා ගේ පරම්පරාව පැවැත්ම **ලක්ෂණය යැ.** පරම්පරාව නො සිදීම **එහි කෘත්‍යය යැ.** රූප පරම්පරාව නො සිඳ පැවැත්ම **වැටහෙන ආකාරය යැ.** පරම්පරාව නො සිඳ හටගන්නා වූ රූපය **ආසන්න කාරණය සි.** (මේ **උපචය, සන්තති** යන නාම ද්වයය **ජාති රූපයට** ම් නම්. එහෙත් ප්‍රථම හටගැනීම **උපචය** නම්. ඊට අනතුරුව හටගැනීම **සන්තති** නම්. වෙනෙය අධ්‍යාශය පරිදි මෙසේ බෙදා වදාරන ලදී.)

මෙහි වෙතසක් නැති හෙයින් ම මොවුන් ගේ නිදේශයෙහි **"යො ආයතනානං ආචයො සො රූපස්ස උපචයො, යො රූපස්ස උපචයො සො රූපස්ස සන්තති"**[1] සි 'අඩේකාදශ රූප යන් ගේ යම් ආදියෙහි හටගැනීමක් වේ නම් එය ම ප්‍රථමෝත්පාදක බැවින් **උපචය** නම්. එසේම ඒ උපදනා රූපයන් ගේ මතු මත්තෙහි වැඩීමක් වේ ද, ගේ ප්‍රබන්ධය නො සිඳ පැවැත්ම වේ. නොහොත් ආයතනයන් ප්‍රථම වශයෙන් ගණන් ගත්නා ලද ඉපදීම එහි ම උපදනවුන් ගේ වැඩීම හෙයින් **උපචය** නම් වේ. එයම වැඩීම් වශයෙන් ගණන් ගත්නා ලද ඉපදීම **සන්තති** නම් වේ, **එම අට්ඨකථාහි**[2] **ආචය** නම් නිපැත්ම ය, **උපචය** නම් වැඩීම ය, **සන්තති** නම් පැවැත්ම ය සි කියා ගහක් සමීපයෙහි කැණී ළිඳක

[1] ධ: ස: රූපකණ්ඩ 140 පිට [2] අත්ථසාලිනී 282

පළමු ජලය උණුත කාලය මෙන් **ආචය** ද, පිරුණු කාලය මෙන් **උපචය** ද, උතුරා යන කාලය මෙන් **සන්තතිය** ද උපමා කොට දක්වන ලදී.

මෙසේ උපමායෙන් ආයතනයන් ගේ **ආචය, උපචය, සන්තතීන්** උපදනා සවභාවයෙන් **ආචයගාමුසි** ආයතනයන් ගේ ආචයාදිය කියේ **වේ** එසේම ආචය ශබ්දයෙන් ආයතන කියන ලදැ සි ලක්ෂණ විසින් උත්පාදය කියන ලදී.

(**22**) **ජරතා රූපය** රූප ධර්මයන් ගේ මේරීම **ලක්ෂණය යැ.** භඩ්ගය කරා පැමිණීම **කෘත්‍යය යැ.** කර්කශත්වාදි සවභාව වශයෙන් සමාන වුව ද, උත්පාදාදි අවස්ථාපගමනය **වැටහෙන ආකාරය යැ.** වීවල පැරණි බව මෙන් මුහුකළ රූප **ආසන්න කාරණය සි.**

ඛණ්ඩචවාදි වසයෙන් දන්නාදීන් ගේ විකාරය වූ ප්‍රකට ජරාව සැදහා මේ කියන ලදී. අරූප ධර්මයන්ගේ වනාහි පරිච්ඡන්න ජරාව වේ. එහි මේ විකාර නැති. එසේම රූප ධර්මයන් ගේ **එතම්** පෘථිවී-**උදක** පර්වතාදීන් ගේ **ක්ෂණික** ජරා නම් වූ අප්‍රකට ජරාව අවීචි ජරාව නමුදු වේ. එහිද පෙර කී සේ විකාර නැති.

(**23**) **අනිච්චතා රූපය:-** නිෂ්පන්න රූපයන් ගේ සර්ප්‍රකාර-යෙන් **විනාශය ලක්ෂණය යැ.** විනාශයට පැමිණීම වශයෙන් රූපයන් ගේ වැළැක්ම එහි **කෘත්‍යය යැ.** (ඒකාන්තයෙන් නො වළක්වතත් වළක්වන්නාක් මෙන් වන හෙයින් යටපත්වීම මෙහි අභිප්‍රේත සි.) රූපයන් ගේ බිඳීම් සවභාවයෙන් ගෙවියාම **වැටහෙන ආකාරය යැ.** භාත්පසින් බිඳෙන රූප ම **ආසන්න කාරණය සි.**

(**24**) **ආහාර රූපය:-** කබලීකාරාහාරය අඩ්ගමඩ්ගානුසාරී රස සඩ්ඛ්‍යාත සාරය වූ ඕජාව **ලක්ෂණය යැ.** පිඬු පිඬු කොට අනුභව කරන හෙයින් මෙනම් වේ. (ඕජඨමක රූපය උපදවන හෙයින් ආහාර නම්.) ඒ ඕජඨමක රූපය පැවැත්වීම **කෘත්‍යය යැ.** ඒ ඕජඨමක රූපය ඉපදීම් වශයෙන් රූපකායයට රැකුල්දීම **වැටහෙන ආකාරය යැ.** (කබල – කබල කොට) අනුභව කළයුතු වසතු **ආසන්න කාරණය සි.** සත්ත්වයන් යැපෙන ඕජාවට **'කබලීකාර'** යනු නමෙකි.

මේ පෙළෙහි ආ රූපමය[1] **අවුවාහි බලරූපය, සමඤ්ඤව රූපය, ජාති රූපය, රෝග රූපය** යන රූපයන් ද, **අභයගිරි ආචාර්‍යයෝ මතයෙහි මිද්ධ රූපය** දැයි පාළියෙහි ආ රූපයන් ගෙන් අන්‍ය වූ රූප ද දක්වා, **"අද්ධා මුනීසි සම්බුද්ධා - නත්ථි නීවරණෝ මම"**[2] යනාදීන්හි **මිද්ධස්ස** රූපය නො වේය යි හැඟෙන හෙයින් ප්‍රතික්ෂේප කරන ලදී. මිදුණිය රූපයක් නම් එය ප්‍රහාණය නොකළ හැකි හෙයිනි.

මේ පිළිබඳව ටීකාහි දීඝ විස්තරයක් ඇතත් එය රූප නො වන බව ප්‍රතීත හෙයින් මෙහි නො දැක් වේ.) අන්‍ය **රෝග** රූපාදිය **ජරතා අනිච්චතා** රූපයෙන් ද, **ජාති** රූපය **උපචය සන්තති** රූපයෙන් ද, **සමඤ්ඤව** රූපය **ආපෝ** ධාතුවෙන් ද, **බල** රූපය **වායෝ** ධාතුවෙන් ද, ගෘහීත යි. එහෙයින් ඉන් **එක**කුදු වෙනම නැතැ යි සනිටුහන් කරන ලදී.

මෙසේ **මේ සුඛුමි උපාදාරූපය,** පෙර කී **සතර භූත රූපදැයි** අඩු වැඩි නො වූ **අටවිසි වැදෑරුම් රූප වේ.**

ඒ සියල්ල මූලාර්‍ථයෙන් **හේතු** නම් වූ ලෝභාදිය මෙන් **හේතු නො වේ. හේතු** නො වන හෙයින් **අහේතුක ය.** හේතු භාවයෙන් වෙන් වූ හෙයින් **හේතු විප්පයුත්ත ය.** ප්‍රත්‍යය සමග පවත්නා හෙයින් **ප්‍රත්‍යය සහිත ය.** ලෝකයෙහි වන හෙයින් **ලෞකික ය.** භූමි වශයෙන් **භවාග්‍රය** තෙක් ද, ධර්ම වශයෙන් **ගොත්‍රභූ** චිත්තය තෙක් ද, පැතිර සිටුනා හෙයින් **ආසව ය.** ආශ්‍රවයන් විසින් අරමුණු කරන හෙයින් **සාසව ය.** යනාදී ක්‍රමයෙන් **එකවිධ** වේ.

'**මම** ය යන මාන ය, ඇති හෙයින් **ආත්මයෑ** යි ද, ඒ **ආත්ම**-ධීන හෙයින් **අධ්‍යාත්මයෑ** යි ද, (ඉන්ද්‍රිය ප්‍රතිබද්ධ ධර්මයෝ ය) ඔවුන් කෙරෙහි වූයේ **අධ්‍යාත්මකයෑ** යි ද, (චක්ෂුරාදි පස ය.) එයින් අන්‍ය **තෙවිසි** (23) **රූපය** ඉන් බැහැර හෙයින් **බාහිරයෑ** යි ද, විෂය විෂයීන් වශයෙන් අරමුණු කරන හෙයින් අධ්‍යාත්ම පස හා විෂය රූප සත ද **ඖදාරිකය** යි ද, එයින් අන්‍ය වූ සොළස (16) **සූක්ෂ්මය** යි ද, ආලම්බන-ආලම්බනික නො වන හෙයින් ඒ සොළස ම **දූරේ රූපය** යි ද, විෂය-විෂයී වශයෙන් අරමුණු කරන හෙයින් ඖදාරික දෙළස **සන්තිකේ රූපය** යි ද, කර්මාදි ප්‍රත්‍යයයෙන් නිපන් හෙයින් සතර මහාභූතය, චක්ෂුරාදි තෙළෙසය, **කබලීකාරාහාරය** යන අටළොස (18) **නිප්පන්නය** යි ද, අන්‍යවූයේ **අනිප්පන්නය** යි ද, මහාභූත ප්‍රසාද හෙයින් චක්ෂුරාදි පස **ප්‍රසාදය** යි ද, අන්‍යවූයේ **අප්‍රසාදය** යි ද, ඊශ්වර භාවය කරන හෙයින් **ප්‍රසාද රූප පසද.**

---

1 ධ: ස: රූපකණ්ඩ 112-162 2 අත්ථසාලිනී රූ: ක: 291

තුනදූ සි අට **ඉන්ද්‍රියයෑ සි ද**, අන්‍යවූයේ **අනින්ද්‍රියයෑ සි ද**, තෘෂ්ණා-දෘෂ්ටි සමහව කර්මයෙන් ගන්නා ලද හෙයින් **උපාදින්නය සි ද**, අන්‍යවූයේ **අනුපාදින්නය සි ද** යනාදි ක්‍රමයෙන් **ත්‍රිවිධ** වේ.

නැවත **සනිදස්සන ත්‍රිකය, කම්ම ත්‍රිකාදීන්** ගේ වශයෙන් ත්‍රිවිධ වේ.

ඒ මෙසේයි:- එහි ඔජදූරික රූප දෙළස අතුරෙන් රූපාලම්බනය **සනිදස්සන සප්‍රතිඝ ය.** සෙසු එකොළොස **අනිදස්සන සප්‍රතිඝ ය.** සියලු සුබුම රූප සොළස **අනිදස්සන අප්‍රතිඝ සි. මෙය සනිදස්සන ත්‍රිකය යෑ.**

කර්මයෙන් නිපන් ඉන්ද්‍රිය රූප අට හා හෘදය රූපය **කම්ම ය. අන්‍ය ඍතු-චිත්ත-ආහාර** ප්‍රත්‍යයත්‍රයයෙන් නිපන්නේ **අකම්ම ය.** කිසිවකින් නූපන් **ලක්ෂණ** රූප **නෙවකම්මනාකම්ම ය.**

චිත්තයෙන් නිපන් විඥප්තිවය ය, අවකාශ ධාතුව ය, ලහුතාදි තුන ය, **අවිනිභෝගය** යන පසළොස **චිත්තජ ය.** අන්‍ය ප්‍රත්‍යයයෙන් නිපන්නේ **අචිත්තජ ය.** කිසිවකින් නූපන්නේ **නෙව-චිත්තජනාචිත්තජ සි.**

ආහාරයෙන් නිපන් ආකාශධාතු විකාර රූප අවිනිභෝග යන දෙළස **ආහාරජ ය. අන්‍ය** ප්‍රත්‍යයයෙන් නිපන්නේ **අනාහාරජ ය.** කිසිවකින් නො නිපන්නේ **නෙවආහාරජනානාහාරජ සි.**

ඍතුයෙන් නිපන් යටකී දෙළස හා ශබ්දය ද **ඍතුජ ය.** අන්‍ය ප්‍රත්‍යයයෙන් නිපන්නේ **අනෘතුජ ය.** කිසිවකින් නො-නිපන්නේ **නෙවඍතුජනානෘතුජරූපයි. කර්මාදි ත්‍රික** වශයෙන් මෙසේ **ත්‍රිවිධ සි.**

නැවත දිට්ඨාදි - රූපරූපාදි - වත්ථාදි චතුක්ක වශයෙන් **චතුර්විධ** වේ.

ඒ මෙසේයි:- රූපායතනය දර්ශන විෂය හෙයින් **දිට්ඨම** ශබ්දායතනය ශ්‍රවණ විෂය හෙයින් **සුතනම. ගන්ධ-රස-ඝ්‍රාතව්‍ය-ස්පෘෂ්ටව්‍යා-යතන සම්ප්‍රාප්තග්‍රාහක** ඉන්ද්‍රිය විෂය හෙයින් **මුතනම.** සෙස්ස විඥානයට ම විෂය හෙයින් **විඤ්ඤාත නම. මෙසේ** දිට්ඨාදීන් චතුර්විධ ය.

(ආපෝ ධාතු වර්ජිත පෘථිවි ආදි භූත ත්‍රය ඝ්‍රාණායතනය යි කීහ. අප් ධාතුව සපඤ්ඤ නො වේ. (මේ පෙර විස්තර **කරන** ලදි.) **අවිසි රූපයන්** අතුරෙහි **අටළොස්** නිෂ්පන්න රූප රූප **ලක්ෂණ** වශයෙන් **රූප ද,** රූපාදන **ලක්ෂණ** වශයෙන් **රූප ද** වේනුයි **රූපරූප නම. "තිලතෙලං දුකඛදුකඛං"** යනුමෙනි.)

ආකාශ ධාතුව **පරිච්ඡේද** රූප නම. කාය- වාග් විඤ්ඤත්ති පටන් කම්මඤ්ඤතාව තෙක් **විකාර රූප නම** ජාති - ජරා - භඞ්ගරූප **ලක්ඛණ රූප නම්.** මෙසේ රූප-රූපාදි වශයෙන් **සිව් වැදෑරුම්වේ.**

හෘදය රූපය මනොධාතු මතො විඤ්ඤාණ ධාතූන්ට නිශ්‍රය වන හෙයින් **වස්තු වේ. මාර නොවේ.** විඤ්ඤත්ති වය කම්මාර හෙයින් **මාර වේ.** ඒ ඇසුරු කොට චිත්තොත්පාද නැති හෙයින් **වස්තු නොවේ.** ප්‍රසාද රූප තමා ඇසුරු කළ චක්ඛුර්විඤ්ඤාණාදියට **වස්තු ද,** අන්‍යයන් ඇසුරු කළ සම්පටිච්ඡනාදියට **මාරද** වේ. සෙසු රූප, කී ක්‍රමයට විපරීත හෙයින් **වස්තු ද** නො වේ. **මාර ද** නො වේ. මෙසේ වස්ත්වාදි වශයෙන් සිව්වැදෑරුම් වේ.

නැවත **එකජය, ද්විජය, තිජය, චතුජය, නකුතොවිජයයි** මොවුන් ගේ වශයෙන් **පඤ්චැදෑරුම්** වේ. ඉන් හෘදය වස්තුව හා ඉන්ද්‍රිය රූප **කම්යෙන්ම** නිපන් හෙයින් **කම්ජ** වේ. විඤ්ඤත්ති ඇවයඅ **චිත්තජ** ම වේ. මේ **එකජ නම්** වේ. **කලෙක සවිඤ්ඤාණක** විසයෙහි චිත්තයෙන් හා **අවිඤ්ඤාණක** විසයෙහි ඍතුවෙන් නිපන් ශබ්දය **ද්විජ** වේ. ඍතු-චිත්ත-ආහාරයෙන් නිපන් ලහුතාදි ත්‍රයය **තිජ** වේ. **කම්ාදි** සතරින් හටගත් **ලක්ඛණ** රූප වර්ජිත අවශෙෂ රූප **චතුජ** වේ.

විශෙෂ:- මේ රූප **එකක්** එකවට ප්‍රත්‍යය කිපයකින් උපදවන්නේ නො වේ. ඒ ඒ ප්‍රත්‍යයයන් **එක එක** රූපයක්ම වෙන වෙනම උපදවන්නේ ය.

ලක්ඛණ රූපය කිසි රූප ජනක ප්‍රත්‍යයයෙකින් උපදනේ නො වේ. මේ වනාහි **නකුතොවිජ** නම් වේ.

කවරහෙයින්දයත්:- උත්පාදයට උත්පාදයක් නැති හෙයිනි. උත්පන්නයා ගේ මේරීම හා භේදය ද **අනුත්පන්න ය.**

උත්පාද නැතිකල ජරා මරණ කෙසේ වේ ද **පරිපාකභෙද මත්තං'** යි **මත්ත** ශබ්දය ගැනීමෙන් **ජරා - මරණයන්** ගේ **උත්පාදභාවය** නො වේ.

(**ජාති** නම් ඉපදීම් මාත්‍රය ය. එයට අන්‍ය ජාතියක් නො විය හැකි ය. එසේ වන්නේ නම් ඒ ජාතිය ගේ ද අන්‍ය ජාතියක් විය යුතු ය. ඔහු ගේ ද අන්‍ය ජාතියෙකැයි මෙසේ එහි නැවැත්මෙක් නො වේ. එහෙයින් ජාති ආදිය කිසිවකින් හට නො ගන්නේ ය. කරුණු මෙසේ හෙයින් **"උත්පාදයා ගේ උත්පාදයෙක් නැත"** යි අට්ඨ1වචනය මනාව කියේ වේ. එසේම උත්පාදයා ගේ ම ඉහිකිරීම් මාත්‍රය වූ **ජරාවද,** බිඳීම් මාත්‍රය වූ **අනිත්‍යතාව ද**

1 අත්ථසාලිනී 282

ඉන්ද්‍රියාදී කිසි ප්‍රත්‍යයයෙකින් හට නො ගනී. 'එසේ වන්නා ජාතිය ගේ කිසිවකින් ජාත බව **කෙසේ** වේද' යනු සඳහා පෙළෙහි වදාළ **"රූපායතනං[1]"** යනාදිය කිහු.)

'රූපායතනය, සද්දායතනය, ගන්ධායතනය, රසායතනය, ඵොට්ඨබ්බායතනය, ආකාසධාතුව, ආපොධාතුව, රූපයා ගේ ලහුතාය, මෘදුතාය, **කම්මඤ්ඤතාය**, රූපයා ගේ උපචයය, සන්තතිය, **කබලිකාරාහාරය**, යන මේ ධර්ම **චිත්තසමුට්ඨාන** යැ, යනාදීන්හි රූපායතනාදි රූපයන්ට ජනක ප්‍රත්‍යය වූ චිත්තාදිය **කෘත්‍යානුභාව ක්ෂණයෙහි** දක්නාලද හෙයින් රූපොත්පාදනයෙහි අවියෝග වූ චිත්තාදීන් ගේ ප්‍රත්‍යයභාවය සි සැලකිය යුතු.

කෘත්‍යානුභාව ක්ෂණයෙහි උපදනා රූපායතනාදීන් ගේ විකාරත්වයෙන් ගැනීම සඳහා ජාතිය ගේ කිසි ප්‍රත්‍යයෙකින් උපන් බව විඥප්ති ආදීන් ගේ චිත්තසමුට්ඨාන බව මෙන් පාළියෙහි අනුදන්නා ලදී.

නිෂ්කර්ෂය:- යම්කිසි ප්‍රත්‍යයෙකින් උපදනා රූපාදිය ඔවුන් ප්‍රත්‍යය වන මොහොතෙහි විනා ඉන් පෙර හෝ පසුව නො ලැබෙන හෙයින් ඒ ප්‍රත්‍යයෙන් උපදිනැයි දැනගනී. **ජාතිය ද** එසේ මැයි.

මේ වනාහි රූපඝනඛණ්ඩයෙහි විස්තර කථා මුඛය සි.

---

[1] ධ: ස: රූපකණ්ඩ 135

විඤ්ඤාණ සඛන්ධය (2)

රූපස්කන්ධයෙන් අන්‍ය වූ සතර **නාමස්කන්ධයන්** අතුරින් 'ආලම්බන රසානුභවන ලක්ෂණ වූ' යම් සභාවයෙක් වේ නම් ඒ සියලු ධර්ම **එක්රැස්** කොට **වේදනාස්කන්ධය** යි ද,

නීලවර්ණාදී වශයෙන් හැඳිනීම **ලක්ෂණ** කොට ඇති යම් කිසි කෙනෙක් වෙත් නම් ඒ සියල්ල එක්රැස් කොට **සංඥා-ස්කන්ධය** යි ද,

සකස් කිරීම හෝ උත්සාහ කිරීම **ලක්ෂණ** කොට ඇති යම් ධර්ම කෙනෙක් වෙත් නම් ඒ සියලු ධර්ම සමූහය එක් රැස් කොට **සංස්කාරස්කන්ධය** යි ද,

අරමුණු ලැබීම සංඛ්‍යාත දැනීම **ලක්ෂණ** කොට ඇති සියල්ල නුවණින් එක්රැස් කොට **විඤ්ඤාණස්කන්ධය** යි ද, දතයුතු වේ.

මේ **සතර නාමස්කන්ධ** අතුරින් **විඤ්ඤාණස්කන්ධය** මනාව දැනගත් කල්හි ඉතිරි **ස්කන්ධ ත්‍රයය** සුවසේ දත හැකි වන හෙයින් මෙහිලා **විඤ්ඤාණස්කන්ධය** මුල් කොට වර්ණනා කරන්නෙමු.

පළමු කී **විඤ්ඤාණස්කන්ධයා** ගේ **ලක්ෂණ** සූත්‍ර දක්වා සම්මිතය කරනු පිණිස **"කිඤ්චි"** යනාදිය කීහු.

හුදු විජානන ලක්ෂණය **විඤ්ඤාණයැ.** එයින් වදුළහ. **"විජානාති විජානාති බො ආවුසො තස්මා විඤ්ඤාණන්ති වුච්චති"**[1] ඇවැත්නි! අරමුණු දැනගන්නා හෙයින් **විඤ්ඤාණය** යි කියනු ලැබේ. යම් සභාව ධර්මයෙක් විජානනාර්ථයෙන් විඥාන වේ නම් එය ම අරමුණු සිතීම් අර්ථයෙන් **'චිත්ත'** නමුදු වේ. අරමුණු භඟනා අර්ථයෙන් **'මනො'** නමුදු වේ. මෙසේ **විඤ්ඤාණ- චිත්ත- මනො-** යනු එ කාර්ථ ය.

මෙතෙකින් **සඛන්ධ** වශයෙන් ද, භේද වශයෙන් ද, පර්‍යාය වශයෙන් ද, **විඤ්ඤාණය** ප්‍රකාශ කරන ලදී. පෙර කී පද තුන ම අර්ථ වශයෙන් එකක් වුව ද **ජාති** වශයෙන්,

1 **කුශලය**
2 **අකුශලය**
3 **අව්‍යාකෘතයැ** යි ත්‍රිවිධ වේ.

---

1 ම: නි: මූලපණ්ණාසක 295 පිට

(ඔවුන් අතුරින්) **1 කුශලය**

(අ) භූමි භේදයෙන්

i **කාමාවචරය**

ii **රූපාවචරය**

iii **අරූපාවචරය**

iv **ලෝකෝත්තරයැ යි සතර** වැදෑරුම් වේ

(i) (ඔවුනතුරින්) **කාමාවචර කුශලය, සොමනස්ස-උපෙක්ඛා- ඤාණ- සඞ්ඛාර-** භේදයෙන් අටවැදෑරුම් වේ

ඒ මෙසේයි.

(1)	**සොමනස්ස**	**සහගත**	**ඤාණසම්පයුත්ත**	**අසඞ්ඛාරික**	**චිත්තය**
(2)	,,	,,	,,	**සසඞ්ඛාරික**	,,
(3)	,,	,,	**ඤාණවිප්පයුත්ත**	**අසඞ්ඛාරික**	,,
(4)	,,	,,	,,	**සසඞ්ඛාරික**	,,
(5)	**උපෙක්ඛා**	**සහගත**	**ඤාණසම්පයුත්ත**	**අසඞ්ඛාරික**	,,
(6)	,,	,,	,,	**සසඞ්ඛාරික**	,,
(7)	,,	,,	**ඤාණවිප්පයුත්ත**	**අසඞ්ඛාරික**	,,
(8)	,,	,,	,,	**සසඞ්ඛාරික**	,,

කියායි.

(1) **යම් කලෙක** 'දෙය ධර්ම- ප්‍රතිග්‍රාහක- දෙශ- **කාල- කල්‍යාණ** මිත්‍රාදි සම්පත් හෝ, අන්‍යවූ ද ශ්‍රද්ධා බහුලතාය, පරිශුද්ධ දෘෂ්ටිතාය, කුශල ක්‍රියාවෙහි ආනිසංස දැකීම ය, සොමනස්ස පටිසන්ධිය, යනාදි **සොමනස්ස හේතුවක්** ලැබ තුටු පහටුවෑ; **දෙන ලද්දෙහි විපාක ඇත.**' යනාදි ක්‍රමයෙන් පැවැති සම්‍යක් දෘෂ්ටිය පෙරටු කොට ගෙන; මුකුත වාගතාදි ගුණයෙන් යුකතවැ **පසුබට නොවැ** තමාම උත්සාහවත් වූයේ; දානාදි පින්කම් කෙරේ තම් එකල ඕහට **'සොමනස්සසහගත- ඤාණසම්පයුත්ත අසඞ්ඛාර'** යන පළමුවන **චිත්තය** උපදී.

(2) පෙර කී සේ තුටු පහටුව; සම්මාදිට්ඨිය පෙරටු කොට; අමුත්තාවාගතාදිය නිසා පසුබට වූයේ මෙරමාවිසින් උත්සාහවත් කරවන ලද්දේ; පින්කම් කෙරේ තම් ඕහට **දෙවන කුසල් සිත** උපදී.

(මෙහි තමා ගේ හෝ මෙරමා ගේ වශයෙන් පැවැති ප්‍රථම ප්‍රයෝගය **සසඞ්ඛාරය යි** කියේ වේ.)

(3) **යම් කලෙක** මවු පියාදීන් විසින් කරනු ලබන දන්දීම් ආදි ප්‍රතිපත්ති දැකීමෙන් පුරුදු වූ බාලයෙක් හිඤ්ඤන් දැක සතුටින් අතවූවක් වහා දේද; වදීද, **එකල** ඕහට **තුන්වන කුසල් සිත** උපදී.

(4) යම් කලෙක, 'දෙව, වඳුවයි' මවු පියාදින් විසින් මෙහෙයන ලද්දේ; ඒ සතුටින් කෙරේ නම්; එකල **සතරවන කුසල් සිත** උපදී.

(මෙහි බාලයා ගැනුණේ සම්මාදිඨි වශයෙන් නුවණ ඉපදවීමට (ආනිසංසය සැලකීමට) අසමර්ථ හෙයින් **ඤාණවිප්පයුත්ත** බව දැක්වීමට ය.)

(5, 6, 7, 8,) යම් කලෙක 'දෙය්‍යධම්- ප්‍රතිග්‍රාහකාදි සම්පත් නො ලැබීමෙන් හෝ, වෙන යම්කිසි 'සොමනස්ස' හේතුවක් නො වීමෙන් හෝ මධ්‍යස්ථ වූයේ, පෙර කී සේ දානාදී පිංකම් කෙරේ නම්; පිළිවෙළින් **උපෙක්ඛා සහගත කුසල් සිත් සතර** උපදී. මෙසේ **සොමනස්ස - උපෙක්ඛා - ඤාණසම්පයුත්ත - විප්පයුත්ත - අසඞ්ඛාර - සසඞ්ඛාර** භේදයෙන් කාමාවචර කුශලය **අට - වැදෑරුම් වේ.**

ii **රූපාවචර** කුශලය ද ධ්‍යානාඞ්ග භේදයෙන් **පස්වැදෑරුම්** වේ.

(1) විතක්ක- විචාර - පීති - සුඛ - ඒකග්ගතා සහිත පඨමජ්ඣාන කුසල චිත්තය.

(2) විචාර - පීති - සුඛ - ඒකග්ගතා සහිත දුතියජ්ඣාන කුසල චිත්තය,

(3) පීති - සුඛ - ඒකග්ගතා සහිත තතියජ්ඣාන කුසල චිත්තය,

(4) සුඛ - ඒකග්ගතා සහිත චතුත්ථජ්ඣාන කුසල චිත්තය,

(5) උපෙක්ඛා - ඒකග්ගතා සහිත පඤ්චමජ්ඣාන කුසල චිත්තය කියායි. විස්තර යට ධ්‍යාන කථාහි කී සෙයින් දතයුතු.

iii **අරූපාවචර** කුශලය ද **උපෙක්ඛා - ඒකග්ගතා** - සඞ්ඛ්‍යාත **සතර** අරූප ධ්‍යානයන් හා සම්‍යෝගයෙන් නොහොත් අරූප ධ්‍යානයන් ගේ ආලම්බන භේදයෙන් යට ආරූප්‍ය කථාවෙහි කී පරිදි,

(1) ආකාසානඤ්චායතන ධ්‍යානය හා සම්ප්‍රයුක්ත වූ ප්‍රථමාරූප්‍යය,

(2) විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය හා සම්ප්‍රයුක්ත වූ ද්විතීයාරූප්‍යය,

(3) ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය හා සම්ප්‍රයුක්ත වූ තෘතීයාරූප්‍යය,

(4) නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය හා සම්ප්‍රයුක්තවූ චතුර්ථාරූප්‍යය; යි මෙසේ **සිව්වැදෑරුම්** වේ.

iv **ලෝකෝත්තර කුශලය ද**

(1) සොතාපත්තිමග්ග
(2) සකදාගාමි මග්ග
(3) අනාගාමි මග්ග
(4) අරහත්ත මග්ග යන භේදයෙන් සතර මාර්ගයෙහි යෙදීම් වශයෙන් සතර වැදෑරුම් වේ. විස්තර මතු පහළ වේ. මෙසේ කුශල චිත්තය ප්‍රථම කොට එක්විසි වැදෑරුම් වේ. (මේ මධ්‍යම පුඩු වශයෙනි.)

2. **අකුශල කාමීය** භූමි වශයෙන් **එකවිධ** වේ. හේ **කාමාවචර** මැයි.

විශෙෂ:- අභයගිරි වැස්සෝ **'රූපාවචර' අරූපාවචර අකුසල් ද** ඇතැයි යෙති' එය වළකනු සඳහා **කාමාවචරයැයි** කිහ.

නිර්ණය:- **රූපා'රූප** භූමියෙහි ද, අකුසල් උපදිතත්, ප්‍රවෘත්ති විපාක දෙතත්, ප්‍රතිසන්ධි විපාක නො දෙන බැවින් හා, කාමතෘෂ්ණාවෙන් යුක්ත වීම **කාමාවචර** වීමේ එකම හේතුව හෙයින් **කාමාවචරය** යි කියන ලදී.

රූපා'රූප තෘෂ්ණා විෂයත්වය රූපා'රූප භාවයට කාරණ වන්නාක් මෙනි.

අකුශලය භූමි හෙයින් **එකවිධ** ය. **කාමාවචර ය.**

මූල හෙයින් (අ) **ලෝභ,** (ඉ) **ද්වෙෂ,** (උ) **මෝහයන්** ගේ වශයෙන් ත්‍රිවිධ වේ. සුප්‍රතිසිත භාවයට කාරණ හෙයිනි. එහි **ලෝභ** මූලය හා **ද්වෙෂ** මූලය අසාධාරණ මූල වශයෙන් (ඒ ඒ සිත්වලට ම නියත වශයෙන්) දක්වූහ. **මෝහය** වූ කලී ලෝභ මූලිකාදියෙහි ද යෙදෙතුදු හුදෙක් **මෝහ මූලික** සිත්හි ලෝභාදිය නො යෙදෙන හෙයින් හුදු **මෝහ මූලික** වේ. එහි **ලෝභ මූලය සොමනස්ස උපෙක්ඛා** භේදයෙන් ද, **දිට්ඨිගත සම්පයුත්ත විප්පයුත්ත** භේදයෙන් ද, **අසඞ්ඛාර සසඞ්ඛාර** භේදයෙන් ද, **අටවැදෑරුම්** වේ. ඒ මෙසේයි.

(අ) (1) **සොමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසඞ්ඛාරික** චිත්තය
(2) ,, ,, **සසඞ්ඛාරික** ,,
(3) ,, **දිට්ඨිගතවිප්පයුත්ත අසඞ්ඛාරික** ,,
(4) ,, ,, **සසඞ්ඛාරික** ,,
(5) **උපෙක්ඛාසහගත දිට්ඨිගත සම්පයුත්ත අසඞ්ඛාරික** ,,
(6) ,, ,, **සසඞ්ඛාරික** ,,
(7) ,, **දිට්ඨිගත විප්පයුත්ත අසඞ්ඛාරික** ,,
(8) ,, ,, **සසඞ්ඛාරික** ,,

කියාසි.

දිට්ඨගත, මෙහි දිට්ඨිය මෑ දිට්ඨිගත යැ. "**ගූථගත**" යනාදිය මෙනි. නොහොත් ගතයුතු වසතුවක් නො වූයෙන් විපරීත කොට ගත්නා ලද්ද හෝ, මෙය මෑ සත්‍ය ය, අනෙක අසත්‍යයැ යි අභිනිවෙශ වශයෙන් පැවැති දෘෂ්ටියෙන් ගන්නා ලද්දම හෝ දිට්ඨිගත නම්.

විඤ්ඤාර:- පස්කම් සැප විඳීමෙහි ආදීනව නැතැයි මිසදිටු පෙරටු කොට තුටු පහටුවැ **ලෝභයෙන්** යුතුවැ, තමා ගේ හෝ මෙරමා ගේ පූජා ප්‍රයෝග නැතිවැ, සඩ්ඛාර නිරුද්ධ වූ සිතින් **පස්කම්ශ්‍රය සෙවුනාහට** හෝ, 'දුන් දෙයෙහි විපාක නැතැයි' යනාදීන් **දශවස්තුක මිථ්‍යාදෘෂ්ටිය පෙරටු කොට ගන්නාහට** හෝ **දිට්ඨිමඩ්ඨලිඛාදිය** සාර වශයෙන් ගන්නාහට හෝ, කම් විපාකාදියට ඉඳුරා විරුඬ වූ **මිථ්‍යා ප්‍රතිපත්තින් සාරවශයෙන් ගන්නාහට හෝ පලමු වැනි අකුසල් සිත** උපදනේ සි.

(2) යම් කලෙක පූජා ප්‍රයෝගයෙන් පසුබට වූ හෝ, මෙරමා විසින් උත්සාහවත් කරන ලදුවැ පෙරකී සේ මිථ්‍යාදෘෂ්ටි සහිත වූ සිතින් යුක්තවූයේ ද එකල **දෙවැනි අකුසල් සිත** උපදී.

(3) යම්කලෙක මිථ්‍යාදෘෂ්ටියෙන් මිශ්‍ර නොවැ හුදෙක් තුටු පහටුවැ **කාම සේවනාදිය** හෝ කෙරේ ද, **පරසම්පත් තමහට අභිමුඛ කොට** හෝ සිතා ද, **මෙරමා සතු බඩු පැහැර ගන්නේ** හෝ වේද, එකල **තුන්වන අකුසල් සිත** උපදී.

(4) යම්කලෙක පෙර කීසේ මිථ්‍යාදෘෂ්ටිය පෙරටු කොට නො ගෙන හුදෙක් තුටු පහටුවැ පසුබට සිතින් **මෙවුන්දම් සෙවීම්** ආදිය හෝ කෙරේ ද, එකල **සතරවන අකුසල් සිත** උපදී.

යම්කලෙක පඤ්චකාම සම්පත් ආදියෙහි අසම්පූර්ණතාවයෙන් හෝ, සෙසු සෞමනස් හේතූන් නො වීමෙන් හෝ මැදහත්වැ යට-කීසේ අකුශල කම් කෙරේ ද? එකල පිළිවෙළින් 5-6-7-8 වැනි **අකුසල් සිත්** උපදී.

මෙසේ **සොමනස්ස-උපෙක්ඛා** වේදනා හෙයින් ද, **දිට්ඨිගත සම්පයුත්ත-විප්පයුත්ත** වශින් ද, **අසඬ්ඛාර - සසඬ්ඛාර** වශින් ද, **ලෝභ මූලික සිත් අටවැදෑරුම්** වේ.

(ඉ) **දෙස මූලික සිත්**:-

(1) **දෙමනස්සසහගත පටිඝ සම්පයුත්ත අසඬ්ඛාරික චිත්තය**

(2) ,, ,, **සසඬ්ඛාරික චිත්තයැ යි**

ද්විවිධ යැ.

විභාග:- (1) අසතුටට හේතු වූ කරුණු නිසා **දෙමනස්** වේදනාවෙන් හා එහෙයින් ම ක්‍රොධයෙන් ද යුක්තවූ සවභාව ලක්ෂණ වූකල **පළමුවැනි මෙම මූලික** අකුශලය වේ.

(2) එසේ මෑ මෙරමා ගේ හෝ තමා ගේ **පුථිප්‍රයෝග සහිත** වූයේ **දෙවැනි සිත** උපදී. ප්‍රාණඝාතාදියෙහි ලක්ෂණ මන්ද වශයෙන් පැවැත්මෙහි හෙද දතයුතු.

(ඵ) **මෝහ මූලික සිත් -**

(1) උපෙක්ෂා වේදනාවෙන් යුත් විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතය
(2) ,, ,, උද්ධච්ච සම්පයුත්ත සිතයැයි දෙකෙකි.

(මේ දෙසිත මෝහ මූලික හෙයින් 'අතිමූළහ චේතුසි' මෝමූහ යයි කීහ. අරමුණෙහි චඤ්චල බැවින් හා දමාගසන ලද්දක් මෙන් වන හෙයින් සවභාව ලක්ෂණ යුතු බවක් හෝ උත්සාහවත් කරවිය යුතු බවක් නැති හෙයින් මෙහි **සඛ්ඛාර** භේදයෙක් නැති.) **සැකය** හා **නොසන්සුන්** බව මේ දෙකෙහි සවභාවය යි.

3. අව්‍යාකෘත චිත්තය ද
(1) විපාකය
(2) ක්‍රියායැ යි දෙපරිදි වේ.
එහි විපාක චිත්තය භූමි වශයෙන්
(i) කාමාවචරය
(ii) රූපාවචරය
(iii) අරූපාවචරය
(iv) **ලෝකෝත්තරයැ යි සිවුවැදෑරුම් වේ.**
ඔවුනතුරින් (1) කාමාවචර විපාකය
(i) **කුසල විපාකය**
(ii) **අකුසල විපාකයැ යි දෙපරිදි වේ.**
i **කුසල විපාකය ද**
(අ) **අහේතුක විපාකය,**
(ආ) **සහේතුක විපාකයැ යි දෙපරිදි වේ.**
(1) (අ) අලෝභාදි හේතු රහිත වූයේ අහේතුක ය.
ඒ අහේතුක විපාක ද
(1) උපෙක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණය
(2) එසේම සොතවිඤ්ඤාණය
(3) එසේම ඝානවිඤ්ඤාණය
(4) එසේම ජිව්හා විඤ්ඤාණය
(5) සුඛ සහගත කාය විඤ්ඤාණය
(6) උපෙක්ඛා සහගත සම්පටිච්ඡන (මනොධාතු) ය

(7) **උපෙක්ඛා සහගත සන්තීරණය**
(8) **සොමනස්සසහගත සන්තීරණ** (මනොවිඤ්ඤාණධාතු දෙසිත) යැයි අටවැදෑරුම් වේ.

(අ) (i)**චක්ඛුවිඤ්ඤාණය** චක්ඛු ප්‍රසාදය ඇසුරු කොට රූපාලම්බනය දැකීම් **ලක්ඛණ** ය යැ. රූප මාත්‍රය අරමුණු කිරීම් **කෘත්‍යය** යැ. රූපාලම්බනය **වැටහෙන ආකාරය** යැ තමහට අනතුරුව උපදනා (චක්ඛු විඤ්ඤාණ චිත්තයට අනන්තර වීම් වශයෙන් උපකාර වන හෙයින්) **පඤ්චමාරා වජ්ජන** චිත්ත සංඛ්‍යාත ක්‍රියා මනොධාතුහු ගේ අපගමය **ආසන්න කාරණ** ය යි.

(**2-5**) **ශ්‍රොත්‍රවිඤ්ඤාණාදීහු ද**, ශ්‍රොත්‍රාදිය නිඃශ්‍රිත ශබ්දාදිය දැනීම් **ලක්ඛණය** හ. ශබ්දාදිය අරමුණු කිරීම් **කෘත්‍යය** හ. ශබ්දාදිය පිළිගැනීම **වැටහෙන ආකාරය** හ. ශබ්දාදිය අරමුණු කොට ඇති කිරිය **මනොධාතුහු ගේ** අපගමය **ආසන්න කාරණය** හ.

චක්ෂුර්විඤ්ඤාණාදියට අනතුරු වූ (6) (මනොධාතුව) **සම්පටිච්ඡන චිත්තය** රූපාදි ආලම්බන දැනගැනීම් **ලක්ෂණය යැ.** රූපාදිය පිළිගැනීම් **කෘත්‍යය යැ.** එබඳු වූ රූපාදිය පිළිගැනීම **වැටහෙන ආකාරය යැ.** චක්ඛු විඤ්ඤාණාදීන් ගේ අපගමය **ආසන්න කාරණය යි.** එයට අනතුරු වැ (7-8) (**අහේතුක විපාක මනොවිඤ්ඤාණ ධාතු දෙදෙන**) **සන්තීරණ සිත් දෙක** ශබ්දාලම්බනය දැනීම් **ලක්ෂණය හ.** සන්තීරණ තදාරම්මණාදි **කෘත්‍යය හ.** එබඳු රූපාදිය තීරණය කිරීම **වැටහෙන ආකාරය හ.** හෘදය වස්තුව මැ **ආසන්න කාරණය හ.**

මෙහි යටකීසේ **"තංතං අනන්තරාතීත විඤ්ඤාණාපගම පදට්ඨානා"** = ඒ ඒ සමීපයෙහි ඉක්ම ගිය සිත **ආසන්න කාරණය යි.** නො කියා හෘදය වස්තුව ආසන්න කාරණයැ යි කීයේ සන්තීරණ ස්ථානය නිබඳ නො වන බැවිනි.) යට කී නයින් වනාහි **"තංතං අනන්තරාතීත විඤ්ඤාණාපගම පදට්ඨානා"** කියනුවට වටී මැයි. සන්තීරණ පදට්ඨානය නිබඳ නො වන බැවින් යට සිතට මෙන් පදට්ඨාන නො කියා **හදයවත්ථු පදට්ඨාන යි'** කීහ. (යනු සන්නයි.)

සොමනස්ස – **උපෙක්ඛා** යෝගයෙන් ද, **විප්පයුත්ත** හා **පඤ්චද්වාරික** වශයෙන් ද ඒ **සන්තීරණයා ගේ** භේදය වේ.

ඒ එසේමැ යි:- මොවුනතුරින් (එකක්) **සොමනස්ස සන්තීරණය** ඒකාන්ත ඉෂ්ටාලම්බනයෙහි පවත්නා හෙයින් **සොමනස්ස** වේදනා සම්ප්‍රයුක්තවැ **සන්තීරණ** වශයෙන් **පඤ්චද්වාරයෙහි ද, තදාරම්මණ** වශයෙන් ජවනාවසානයෙහි **මනෝද්වාරයෙහි** ම ද, පවත්නා හෙයින් **ත්‍රිස්ථානික යැ.** (එකක්) **උපෙක්ඛා සහගත සන්තීරණය** ඉෂ්ටමධ්‍යස්ථාලම්බනයෙහි පවත්නා හෙයින් **උපෙක්ඛා සහගතවැ සන්තීරණ- තදාරම්මණ- පටිසන්ධි- භවාඞ්ග- චුති** වශයෙන් පවත්නා හෙයින් **පඤ්චස්ථානික සි.**

විභාග:- **සොමනස්ස සහගතසන්තීරණය**, පඤ්චවාරයෙහි **සම්පටිච්ඡන** - ව්‍යවස්ථාපනයන් ගේ අතරෙහි **සන්තීරණ** ස්ථාන වශයෙන් ද, මනෝ වාරයෙහි **ජවන-භවාඞ්ගයන්** අතරෙහි **තදාලම්බන ස්ථානයෙහි** දැයි ස්ථාන දෙකෙක ද,

උපෙක්ඛා සහගත සන්තීරණය ඉෂ්ට මධ්‍යස්ථාලම්බනයෙහිදී පෙරකී ස්ථාන වයෙහි හා ප්‍රතිසන්ධි ආදි කාලයෙහි **චුති-භවාඞ්ග** අතරෙහි **ප්‍රතිසන්ධිස්ථානයෙහි ද, ජවන** - **ආවර්ජනයන්** හෝ **තදාලම්බන ආවර්ජනයන්** හෝ, **ව්‍යවස්ථාපන ආවර්ජනයන්** හෝ, **ප්‍රතිසන්ධි ආවර්ජනයන්** හෝ අතරෙහි **භවාඞ්ග ස්ථානයෙහි ද** වේ. **තදාලම්බන - ප්‍රතිසන්ධීන් ගේ** හෝ **ජවන-ප්‍රතිසන්ධීන් ගේ** හෝ අතරෙහි **චුති ස්ථානයෙහි වේ.**

කායප්‍රසාදයට නිශ්‍රය වූ භූතයන්ගේ **අති ඉෂ්ටසප්‍රෂ්ටව්‍ය** නො වන්නාවූ භූතයන් ගේ ද සංඝටනය බලවත්වන හෙයින් **කාය විඤ්ඤාණ සුඛ සහගත** වේ. උපාදා රූපයන් ගේ සංඝටනය දුර්ලභ හෙයින් **චක්ඛු විඤ්ඤාණාදිය උපෙක්ඛා සහගත** මැ වේ.

මෙසේ අටවැදෑරුම් වූ **කුසල අහෙතුක-විපාක විඤ්ඤාණය-නියත-අනියත**- ආලම්බන වශයෙන් **ත්‍රිවිධ යැ. උපෙක්ඛා- සුඛ-සොමනස්ස** භේදයෙන් **ත්‍රිවිධයි.**

චක්ෂුරාදි **විඤ්ඤාණ පඤ්ච** නියතයෙන් මැ පිළිවෙළින් රූපාදි පඤ්චාලම්බනයෙහි මැ පවත්නා හෙයින් **නියතාලම්බනික යැ.** සෙසු තුන **අනියතාලම්බනිකයි.** ඔවුනතුරිනුදු **මනෝධාතුව** රූපාදි **පඤ්චාලම්බනිකයැ. මනෝ විඤ්ඤාණධාතු** මය **ෂඩාලම්බනිකයි. කාය විඤ්ඤාණය** සුඛ වේදනා යුක්ත යැ. **(සන්තීරණ- තදාරම්මණ** කෘත්‍ය සාධක) විසඨානික **මනෝ-විඤ්ඤාණ ධාතුව** (සොමනස්ස සහගත සන්තීරණය) සොමනස්ස යුක්ත යැ. සෙසු **සය** උපෙක්ඛා වේදනා යුක්තයි.

මෙසේ අහෙතුක - අෂ්ටකුශල විපාක දතයුතු.

(ඉ) **සහේතුක විපාක, අහේතුක** වශයෙන් **අලෝභ-අදෝස-අමෝහ** යන තුන හා, විහේතුක වශයෙන් **අලෝභ-අදෝස,** දෙක ද යන විපාක හේතූන් හා සම්ප්‍රයුක්ත වූවෝ **සහේතුක විපාකයෝ** යි. කාමාවචර කුශලයන් මෙන් විපාක ද **සොමනස්ස - උපෙක්ඛා - ඤාණ - සඞ්ඛාර** භේදයෙන් **අට - වැදෑරුම්.** ඒ මෙසේ යි.

(1)	**සොමනස්සසහගත**	**ඤාණසම්පයුත්ත**			**අසඞ්ඛාර**	**විත්තය**
(2)	,,	,,	,,	,,	**සසඞ්ඛාර**	,,
(3)	,,	**ඤාණවිප්පයුත්ත**			**අසඞ්ඛාර**	,,
(4)	,,	,,			**සසඞ්ඛාර**	,,
(5)	**උපෙක්ඛාසහගත**	**ඤාණසම්පයුත්ත**			**අසඞ්ඛාර**	,,
(6)	,,	,,	,,	,,	**සසඞ්ඛාර**	,,
(7)	,,	,,	**ඤාණවිප්පයුත්ත**		**අසඞ්ඛාර**	,,
(8)	,,	,,	,,	,,	**සසඞ්ඛාර**	,,

මෙය (i) සම්ප්‍රයුක්ත ධර්මයෙනුදු, (ii) අරමුණු හෙයිනුදු, (iii) ප්‍රවෘත්‍යාකාරයෙනුදු කුශලයට විසදෘස වේ.

(i) කුශලයෙහි **කරුණා-මුදිතා** සඞ්ඛ්‍යාත අප්‍රමාණ්‍යයන් හා, **සම්මාවාචා** දි විරති තුන ද ඇතත්, විපාකයන් හි ඒ දෙක මැනැති හෙයින් සම්ප්‍රයුක්ත වශයෙන් භේදය වේ.

(ii) **කුශලය** දානාදි වශයෙන් ඝඩාලම්බනයෙහි පවතී. විපාකය එසේ නොවැ **පටිසන්ධි, - භවඞ්ග, - චුති, - තදාරම්මණ** වශයෙන් කාමාවචර ධර්මයන්හි ඇතුළත් වූ ඝඩාලම්බනයෙහි පවතී.

(iii) ප්‍රවෘත්ති ආකාරයෙන් වනාහි **කුශලය, කම්මද්වාර** වශයෙන් **කායද්වාරාදියෙහි** පවතී. විපාකය අවිඥප්ති ජනක හෙයින් **කම්මද්වාරාදියෙහි** නො පවතී. **උපපත්තිභාර** වශයෙන් වනාහි **පඤ්චද්වාර - මනෝද්වාරයන්හි මහාවිපාකයන්** ගේ තදාලම්බන වශයෙන් පැවැත්ම වේ.

තවද කුශලය **ගති** වශයෙන් **පස් වැදෑරුම්** වේ. **විඤ්ඤාණ-ඨිති** වශයෙන් **සත් වැදෑරුම්** වේ. **විපාකය** තදේකදේසයෙක ම උපදනෙන් එසේ නො වේ.

තවද, **අසඞ්ඛාර-සසඞ්ඛාර** භේදය (i) **ආගමන** වශයෙන් ද, (ii) **ප්‍රත්‍යය** භේදයෙන් ද වේ.

(1) ආදාසතලයෙහි මුඛ නිමිත්ත මෙන් විපාකයා ගේ **අසඞ්ඛාර-සසඞ්ඛාර** භේදය කුශලයා ගේ වශයෙන් වේ. මුඛය චලනය වූකල මුඛ නිමිත්ත ද චලනය වන්නාක් මෙන් ද, මුඛය නිශ්චල වූකල මුඛ නිමිත්ත නිශ්චල වන්නාක් මෙනි. මේ **ආචාර්‍යයන් මතයෙකි.**

(ii) බලවත් වූ කම්‍මාදි ප්‍රත්‍යයෙන් උපදවන ලද්දේ **අසංඛාරිකය.** දුර්‍බල වූ කම්‍මාදි ප්‍රත්‍යයෙන් නිපදවන ලද්දේ **සසංඛාරිකයි.**

හීන - මධ්‍යම - ප්‍රණීත ජනූදීන් උපදවන ලද කුශලයා ගේ විපාකය ද එසේ වන්නාක් මෙනි.

(පෙළෙහි ඇ පරිදි අසඞ්ඛාර - සසඞ්ඛාර භේදයෙන් සම්ප්‍රයුක්ත ධර්‍මයන් ගේ විශෙෂයෙක් **කුශල - විපාක** පිළිබඳවැ නැති. එහෙත් විපාක ඉපදීමෙහි උත්සාහ සඞ්ඛ්‍යාත **අවිද්‍යා - තෘෂ්ණාදි** කෙලශ ඇති සන්තානයෙහි ම විපාක ඉපදවීමේ ශක්තිය කම්‍මයෙහි ඇතත් විපාකයෙහි නැති. එහෙයින් ම මුඛය මෙන් කම්‍මය ද, ආදාසතල-යෙහි මුඛ නිමිත්ත මෙන් විපාකය ද දතයුතු.)

ii **අකුශල විපාක,** හුදෙක් ලොභාදි **අකුශල හේතූන්** හා අලෝභා දි **කුශල හේතූන්** කැළඹ නැති හෙයින් අකුශල විපාක ද **අහේතුක මැයි.**

හේ ද වනාහි

(1) උපෙක්ඛා සහගත චක්ඛුවිඤ්ඤාණය
(2) ,, ,, **සොත** ,,
(3) ,, ,, **ඝාන** ,,
(4) ,, ,, **ජිවහා** ,,
(5) දුක්ඛ සහගත කායවිඤ්ඤාණය
(6) උපෙක්ඛා සහගත (සම්පටිච්ඡන කෘත්‍යය ඇති) **මනෝ-ධාතුය**

(7) උපෙක්ඛා සහගත (සන්තීරණ) **මනොවිඤ්ඤාණ ධාතුව** දැ සි **සත්වැදෑරුම් වේ.**

හෙද ලක්ෂණාදි වශයෙන් කුශල අහේතුක **විපාකයන්ට** කී ලක්ෂණ ඇති. හුදෙක් **කුශල විපාක** ඉෂ්ට - ඉෂ්ට මධ්‍යස්ථ ආලම්බනික යැ. මෙය අනිෂ්ට - අනිෂ්ට මධ්‍යස්ථ ආලම්බනික සි. එහෙයින් කුශල විපාක උපෙක්ඛා - සුඛ - සොමනස්‍ස භේදයෙන් **තිවිධ යැ.** මෙය උපෙක්ඛා, - දුක්ඛ භේදයෙන් **ද්විවිධ සි.**

කුශල විපාකයන්ගේ උපෙක්ෂාව ප්‍රණීත යැ. එහෙත් සැපය මෙන් ඉතා තීක්ෂ්ණ නොවේ. අකුශල විපාකයෙහි උපෙක්ෂාව හීන යැ. එහෙත් දුඃඛය මෙන් ඉතා තීක්ෂ්ණ නොවේ.

ඉතා ඉටු අරමුණෙහි හා, ඉටු මැදහත් අරමුණෙහි වේදනා භේදය ඇති හෙයින් **සොමනස්ස සහගත ය, උපෙක්ඛා සහගතය සි** කුශල විපාක අහේතුක මනොවිඤ්ඤාණ ධාතුව **දෙපරිදි වුව ද,** ඉතා අනිටු අරමුණෙහි හා, ඉටු මැදහත් අරමුණෙහි වේදනා භේදය නැති හෙයින් අකුශල විපාක අහේතුක මනොවිඤ්ඤාණ ධාතුව **එකඤ්ඣරූප** මැ වේ. එහෙයින් අකුශල විපාක **සපඤ්චවිධ** වේ.

එහි වේදනා භේදය වේතම් ඉතා අනිෂ්ට හෙයින් දෞමනස්සය විය යුතු. එසේ වන්නා හෙද ප්‍රතිඝය විනා නූපදනේ යි. මෙහි **ඝාය විඤ්ඤාණය දුක්ඛ** සහගත මැයි. එය කුශල විපාකයෙහි කියන ලද්දට විපර්‍යාසවැ වේ. මේ අකුශල විපාක විෂයෙහි උපෙක්ෂාව අකුශලයා ගේ විපාකය හෙයින් හීන යැ. එහෙත් දුඃඛය මෙන් ඉතා කටුක නොවූව ද, දුඃඛ ස්වභාවයෙන් පවතී එහි උපෙක්ෂා සහගත බව බලවත් පුරුෂයකු විසින් මැඩ ලන ලද දුර්මල පුරුෂයකු ගේ මැදහත් වීම මෙනි.

මෙසේ **අකුශල විපාක සත** හා, පෙර කී **කුශල විපාක සොළස ද සි කාමාවචර විපාක තෙවිසි** (23) වැදෑරුම් වේ.

(2) **රූපාවචර විපාක, රූපාවචර විපාකය ද කුශලය මෙනි.** ප්‍රථම ධ්‍යානාදීන් විසින් පඤ්චවිධ සි. එහෙත් **කුශලය** සමාපත්ති වශයෙන් ජවන වීථියෙහි පවතී. **විපාකය** උපපත්ති යෙහි පටිසන්ධි – භවාඞ්ග – චුති වශයෙන් පවතී. (එහෙත් පඤ්ච-මධ්‍යාත්ත අභිඥ චිත්තය. ධ්‍යානයා ගේ ආනිසංස මැ වන හෙයින් විපාකයක් නැත් මැයි.)

(3) **අරූපාවචර විපාක, අරූපාවචර විපාකය ද කුශලය මෙන් කසිණුග්ඝාටිමාකාසාදි** වසයෙන් ආලම්බන භේදයෙන් **චතුර්විධ** වේ. ප්‍රවෘත්ති භේදය ද රූපාවචරයෙහි කීසේ ය.

(4) **ලොකුත්තර, ලොකොත්තර විපාකය** ද චතුර්ධ්‍යාන-සම්ප්‍රයුක්ත වූ කුශල චිත්තයා ගේ ඵල හෙයින් **චතුර්විධ වේ.** හෙද **මාර්ග වීථි** වශයෙන් හා **ඵල සමාපත්ති** වීථි වශයෙන් **ත්‍රිවිධ** වේ. හෙද **මාර්ග වීථියෙහි** දෙතුන් වාක් හා **ඵල සමාපත්ති වීථියෙහි** අප්‍රමාණවැ පවතී.

මෙසේ **චතුර්විධ** භූමියෙහි **සතිස්** (36) **වැදෑරුම් විපාක විඤ්ඤාණය** වේ.

3. (2) **ක්‍රියා සිත්,** i **කාමාවචර**–ii **රූපාවචර**– iii **අරූපාවචර** යැයි (ලොකුත්තර ක්‍රියා නැති හෙයින්) **භූමි භේදයෙන් ත්‍රිවිධ වේ.**

(**එල චිත්තය** ඒකාන්තයෙන් අනන්තර එල බැවින් හා ලොකෝත්තර **මාර්ග චිත්තය** එක වරක් පමණක් උපදනා හෙයින් හා නැවත නැවත ඉපදීම නිෂ්ඵල හෙයින් **ලොකෝත්තර ක්‍රියා සිත්** කැලම නැති)

i **කාමාවචර ක්‍රියා සිත්** (අ) **අහේතුකය,** (ඉ) **සහේතුක** යයි **ත්‍රිවිධ ය.**

(අ) ලෝභාදී ක්‍රියා හේතු රහිත වූයේ **අහේතුකය.**

එය (1)(**මනොධාතු**) උපෙක්ඛා සහගත පඤ්චද්වාරාවජ්ජන ය. (2) (**මනොවිඤ්ඤාණ ධාතු**) එසේම මනොද්වාරාවජ්ජන යැයි **ත්‍රිවිධ ය.**

(1) චක්ඛුර්විඤ්ඤාණාදි විපඤ්ච විඤ්ඤාණයට පෙරටුවෑ රූපාදි පඤ්චාලම්බන විජානන **ලක්ෂණ** වූයේ **මනොධාතු ය.**

"මනනමත්තධාතු – මනොධාතු" යි (විශිෂ්ට මනන කෘත්‍යයක් නැති හෙයින්,) මනන මාත්‍රය හෙයින් මේ **මනොධාතුය.** එහෙයින් ම මෙය මනොවිඤ්ඤාණයට ප්‍රත්‍යය නොවේ. (විසතර ධාතුනිද්දේශයේ ය.)

එය චිත්තසන්තානය රූපාදී අරමුණට නැමීම හෝ, භවාඞ්ග අවස්ථාවෙන් පෙරළා අන් ආකාරයකට නැමීම් **කෘත්‍යය යැ.** රූපාදියට අභිමුඛ කිරීම **වැටහෙන ආකාරය යැ.** භවාඞ්ග සන්තතිය සිඳීම **ආසන්න කාරණය යි.** ඉෂ්ටාදි සියලු අරමුණෙහි (විෂය රස අනුභව නොකට හැකි හෙයින්) උපෙක්ඛා සහගත මැ වේ.

(2) **මනොවිඤ්ඤාණ ධාතුව** වනාහි (i) **සාධාරණය.**

(**ශෛක්ෂ**'**ශෛක්ෂ** සියල්ලනට උපදනා හෙයිනි.)

(**අශෛක්ෂයනට** පමණක් උපදනා හෙයිනි.) (ii) **අසාධාරණයැ** යි **ත්‍රිවිධය.**

එහි (i) සාධාරණ **මනොවිඤ්ඤාණ** ධාතුව (උපෙක්ඛා සහගත මනොද්වාරාවජ්ජනය, උපෙක්ඛා සහගත අහේතුක ක්‍රියා මනොවිඤ්ඤාණ ධාතුව) ඔබාලම්බන දැනගැනීම් **ලක්ෂණ ය** යැ.

පඤ්චද්වාරයෙහි **වොට්ඨපනය** හා, මනොද්වාරයෙහි **මනොද්වාරා-වජ්ජනකෘත්‍යය යැ.** පඤ්චද්වාරමනොද්වාරයන්හි වොට්ඨපන – මනොද්වාරාවජ්ජනයන් **වැටහෙන ආකාර** ඇත්තේ ය. පඤ්ච-ද්වාරයෙහි වොට්ඨපන කාලයෙහි සන්තීරණ කෘත්‍ය සාධක තුන් අහේතුක විපාක මනොවිඤ්ඤාණ ධාතූන් ගේ ද, මනොද්වාරයෙහි භවාඞ්ගයා ගේ ද, අපගමය **ආසන්න කාරණය යි.**

(ii) **අසාධාරණ මනොවිඤ්ඤාණ ධාතුව** (3) **සොමනස්ස සහගත හසිතුප්පාදය** (අහේතුක ක්‍රියා චිත්තය) ෂඩාලම්බනය දැනීම් **ලක්ෂණය යැ. රහතුන්ට** අතෛදැරිකාලම්බනයෙහි සිතහ ඉපදවීම **කෘත්‍යය යැ. එසේ** බව **වැටහෙන ආකාරය යැ. ඒකාන්තයෙන් හෘදය වස්තුව ආසන්න කාරණය යි.**

විශේෂ:- **රහතුන්ට** හැර අන්‍යයනට හසිතුප්පාද චිත්ත-යක් නැති හෙයින් මේ සිත එනම් වී. අන්‍ය වූ ද **කාමාවචර** සොමනස්ස සහගත **කුසල්** – **අකුසල්** – **ක්‍රියාසින්** පෘථග්ජනයන්ට හා **ශෛක්ෂ** – අශෛක්ෂයනට සිතහ ද උපදවතත් මේ සිත විචාරණ ප්‍රඥරහිත වැ **කාමාවචර** අප්‍රණීතාලම්බනයෙහි **අශෛක්ෂයනට** සිතහ මාත්‍රයක් පහළ කෙරෙමින් උපදී.

භාග්‍යවතුන් වහන්සේට ද පූර්වේනිවාසඥානය, අනාගතාං-ශඥානය, සච්ඡිකතාඥානය යන මොවුන්ට අනුව ම සිතහ පහළ වන හෙයින් මේ **ඥානානුපරිවර්තිය යි.** අට්ඨ කථාවන්හි **"තෙසං ඤාණානං විඤ්ඤාණපරියනෙන ඉදං චිත්තං භාසමානානං උප්පජ්ජති"**[1] යි කියන ලදී.

මෙසේ **කාමාවචර අහේතුක** ක්‍රියා චිත්තය **ත්‍රිවිධය.**

(ඉ) **සහේතුක** ක්‍රියා චිත්තය ද, කුශලය මෙන් සොමනස්සාදි භේදයෙන් **අට වැදැරුම් වේ.**

හුදෙක් කුශලය, **ශෛක්ෂයනට** හා **පුහුදුනට** උපදී. මේ ක්‍රියාසින් **රහතුන්ට පමණක්** උපදී. **ශෛක්ෂ – පෘථග්ජනයන්ට** උපන්කල විපාක ඉපදවීමට සමර්ථ වේ. **රහතුනට** උපන්කල එසේ සමර්ථ නොවන හෙයින් ක්‍රියා මාත්‍ර වේ. මේයැ වෙනස.

ඔන් ප්‍රත්‍යය විකල්පයෙන් අව්‍යාකතයට පැමිණි **කුශලා' කුශලයන් ගේ ද** ක්‍රියා බවට පැමිණීම වළකන ලදී. මෙසේ **කාමාවචර** ක්‍රියා චිත්තය **එකොළොස්** (11) වැදැරුම් වේ.

---

[1] අත්ථසාලිනී චිත්තුප්පාදවණ්ණනා 258

(i) **රූපාවචර ක්‍රියා චිත්තය** ද කුශලය මෙන් **පස් වැදෑරුම්** වේ.

(ii) **අරූපාවචර ක්‍රියා චිත්තය** ද කුශලය මෙන් **සතර වැදෑරුම්** වේ. මෙහිදු ක්‍රියායෙහි කුශලයට වෙනස **රහත්නට** උපදනා වශයෙනි.

මෙසේ **කාම - රූප - අරූප** භූමීන්හි **ක්‍රියා චිත්තය විසි** (20) **වැදෑරුම් වේ.**

මෙසේ **කුසල් (21) එක් විස්සයැ**
අකුසල් (12) දෙලොසයැ
විපාක (37) සතිසයැ
ක්‍රියා (20) විස්සයැ සි

සියලු සිත් (මධ්‍යම පුඩු වශයෙන්) (**89**) **එකුන් අනූවෙකි.** මොහු (**1**) **පටිසන්ධි** (**2**) **භවඞග** (**3**) **ආවජ්ජන** (**4**) **දස්සන** (**5**) **සවණ** (**6**) **ඝායන** (**7**) **සායන** (**8**) **ඵුසන** (**9**) **සම්පටිච්ඡන** (**10**) **සන්තීරණ** (**11**) **වොට්ඨපන** (**12**) **ජවන** (**13**) **තදාරම්මණ** (**14**) **චුති** යැ සි කෘත්‍ය වශයෙන් **තුදුස්** ආකාරයෙන් පවතිත්. මින් පිටත් අන්‍ය කෘත්‍යයෙක් නැත්.

කෙසේද යත්:- (1) අෂ්ට කාමාවචර කුශලයන් ගේ අනුභාවයෙන් (“කෘතොපචිත **කර්ම** වනාහි අවශෙෂ ප්‍රත්‍යය සමවායයෙහි විපාකය දෙන්නේ තමා ගේ අනුභාවය පවත්වන්නාක්හු මෙන් වේ” යනු සත්‍යයි. දිව්‍ය මනුෂ්‍ය ලෝකයන්හි සත්ත්වයෝ උපදිති. (එකල්හි) ඔවුන් ගේ මරණ **කා** ලයෙහි විපාක දීමට අවකාශ ලැබ එලඹ සිටි පෙර කී **කර්මය** ද, ඒ කර්මය කරන කාලයෙහි එයට ප්‍රත්‍යය වශයෙන් එළඹ සිටි දෙය්‍ය ධර්මාදි **කර්ම නිමිත්ත** ද, උපදින භවයෙහි යම් කිසි රූපාදියක් වශයෙන් පැවැති **ගති නිමිත්ත** ද, යන මොවුන් අතුරින් එක්තරා **එකක්** අරමුණු කොට **සහේතුක කාමාවචර විපාක සිත්** අට ද, මනුෂ්‍යයන් අතුරෙහි පණ්ඩක-ජාත්‍යන්ධ-බධිරාදි බවට පැමිණෙන්නවුනට දුර්ලභ ද්විහේතුක කර්මයට විපාක වූ උපෙක්ෂා සහගත අහේතුක විපාක මනොවිඤ්ඤාණ ධාතු නම් වූ **උපෙක්ඛාසහගත සන්තීරණය** ද **සි විපාක සිත් නවයෙක් ප්‍රතිසන්ධි කෘත්‍යය කෙරේ.**

යම් කලෙක රූපාවචර - අරූපාවචර කුශලයන් ගේ අනුභාවයෙන් රූපා'රූප භවයන්හි ප්‍රතිසන්ධියට පැමිණෙත් නම් **එකල්හි** ඔවුන් ගේ මරණ අවස්ථාවෙහි එළඹසිටි පඨවිකසිණාදි **කර්මනිමිත්ත මැ** අරමුණු කොට නව **රූපාවචර, අරූපාවචරවිපාක සිත් ප්‍රතිසන්ධි** වශයෙන් පවතී.

යම් කලෙක පෙර කී සේ ප්‍රතිසන්ධි දීමේ ශක්තිය ඇති වැ පැවැති අකුශල **කර්මය** අපායෙහි උපදවා ද, **එකල** ඔවුන් ගේ මරණාවසථාවෙහි එළඹසිටි **කර්ම, කර්මනිමිති, ගතිනිමිත්තන්** අතුරින් එක්තරා **එකක්** අරමුණු කොට **එකම අකුසලවිපාක අහේතුකමනොවිඤ්ඤාණධාතුව** (උපෙක්ඛාසහගත සන්තීරණ චිත්තය) ප්‍රතිසන්ධි වශයෙන් පවතී.

මේසේ **එකුන්විසි** විපාක විඤ්ඤාණයන් ගේ **ප්‍රතිසන්ධි කෘත්‍ය** වශයෙන් පැවැත්ම දත යුතු.

(2) **එම පටිසන්ධි විඤ්ඤාණයන්** අතුරින් **යම් සිතක්** ඉපිද නිරුද්ධ වූ කල එය ලුහු බඳිමින් **එම විපාක විඤ්ඤාණය මෑ** ඒ ප්‍රතිසන්ධිජනක අරමුණෙහි මෑ **භවාඞ්ගසිත** වශයෙන් පවතී. (**එම විඤ්ඤාණය** මෑ යැයි කී යේ **එබඳු** වූ ම **විඤ්ඤාණය** සඳහාය.) නැවත ද එසේ මෑ පවතී.

භවාඞ්ග සන්තතිය සිදීමට හේතු වූ ක්‍රියාමය චිත්තයෙන් සවජ්ජ දක්නා අවසථාව හැර, නිද්‍රොපගතයා **හට** ද, නදී ශ්‍රොත-යක් සේ **අප්‍රමාණ** භවාඞ්ග සන්තතිය **අවිච්ඡින්න** වැ පහළ වන්නේ ය. (එහෙයින් මෑ උපපත්ති භවයා ගේ නො සිදීමට අඞ්ග භාවයෙන් පවත්නා හෙයින් **භවාඞ්ග** යයි කියනු ලැබේ.)

මෙසේ **ඒ එකුන්විසි** ප්‍රතිසන්ධි විපාක විඤ්ඤාණයන් ගේ භවාඞ්ග වශයෙන් ද පැවැත්ම දත යුතු.

මෙසේ භවාඞ්ග සන්තතිය පවත්නාකල චක්ඛුරා දී ඉන්ද්‍රිය යෝ (මාතෘකුක්ෂිගත කාලයෙහි මෙන් බිහි වූ පසු ද සවකෘත්‍ය කිරීමට අසමර්ථ වුව ද, අනුක්‍රමයෙන් විශද බවට පැමිණ සවකෘත්‍ය කිරීමට සමර්ථ වූ කල්හි) රූපා දි ආලම්බන හමුවුව ඒ ආපාථගත වූ රූපාලම්බනය නිසා **චක්ඛුඃ ප්‍රසාදයා ගේ** ගැටීම වේ. එයට අනතුරු වැ ඒ ඝට්ටන බලයෙන් භවාඞ්ග චිත්තයා ගේ **චලනය** වේ. (මෙය චිත්තසන්තානයා ගේ පූර්ව අවසථාවෙන් නින්න අවසථාවකට හේතු වූ හෙයින් චලනය වැනි හෙයින් චලනය යි කීහ.)

ප්‍රශ්නයෙකි:- විෂය විෂයී භාවයෙන් **රූපාලම්බනයා ගේ චක්ඛුඃප්‍රසාදය** හා ගැටීම වේවා! එසේ කල අන්‍ය නිශ්‍රිත **භවාඞ්ග යාගේ** චලනය කෙසේ වේද?

පිළිතුර:- බෙර ඇසක තුබූ සකුරු කැබෙල්ලක වසා සිටි මැස්සා බෙර ඇසට නිය පිටින් ගැසූ කල (එකාබද්ධ හෙයින්) එය

දෙදරීමෙන් ඉගිළ යන්නා සේය. **චක්ඛුප්පසාදය** හා **භවාඞ්ග චිත්තය** නිශ්‍රිත හෘදය වස්තුව (සියුම් ධමනීන් ගෙන්) **එකාබද්ධ** වෙයිනි.

(3) නැවත එම **භවඞ්ග චලනයට** ප්‍රත්‍යය වූ ආපාථගත රූපාලම්බනය අරමුණු කොට භවඞ්ග සන්තතිය සිඳින්නාක් මෙන් ආවර්ජනකෘත්‍යය සිද්ධකරන්නා වූ අහේතුක **ක්‍රියාමනෝධාතුව** (පඤ්චද්වාරාවර්ජන චිත්තය) උපදී. සෝතද්වාරාදියෙහි ද මේ නයයි. **මනෝද්වාරයෙහි** වනාහි ෂඩ්විධාලම්බනය මැ ආපාථගත කල්හි **භවාඞ්ග චලනයට** අනන්තරවැ භවාඞ්ගය සිඳින්නාක් මෙන් ආවර්ජන කෘත්‍යය සිද්ධ කරන්නා වූ අහේතුක ක්‍රියා **මනෝවිඤ්ඤාණ ධාතුව** (මනෝද්වාරාවර්ජන චිත්තය) උපදී.

(පඤ්චද්වාරාවර්ජනයට අනන්තරවැ දර්ශනාදි කෘත්‍යය නො කියා මනෝද්වාරාවර්ජනය කියන ලද්දේ චතුර්ධ කෘත්‍ය විෂයයෙහිලා දෙකම ආවර්ජන නමින් ගන්නා ලද හෙයිනි.)

පඤ්චද්වාරාවර්ජනයට අනන්තරවැ චක්ෂුර්ද්වාරයෙහි දර්ශන කෘත්‍යය සිද්ධ කරන **චක්ඛුප්පසාද** වස්තුව වූ **චක්ඛුවිඤ්ඤාණ චිත්තය,** ශ්‍රෝත්‍රද්වාරාදියෙහි ශ්‍රවණ කෘත්‍යාදිය සිද්ධ කරන **සෝත - ඝාණ - ජිව්හා - කාය විඤ්ඤාණයෝ** පවතිත්. ඉෂ්ට - ඉෂ්ටමධ්‍යස්ථ විෂයයන්හි ඔහු කුශල විපාකයනයි මෙසේ **දශවිධ විපාක විඤ්ඤාණයන්** ගේ (4) **දස්සන** (5) **සවන** (6) **ඝායන** (7) **සායන** (8) **ඵුසන** වශයෙන් පැවැත්ම දත යුතු.

(4) **චක්ඛුවිඤ්ඤාණධාතුයා උප්පජ්ජිත්වා නිරුද්ධා සමනන්තරා උප්පජ්ජති චිත්තං, මනෝ, මානසං, - පෙ - තජ්ජාමනෝ විඤ්ඤාණ ධාතු''**[1]

'චක්ඛුවිඤ්ඤාණාදියට අනන්තරවැ ඔවුන්ගේ මැ අරමුණ පිළිගන්නා වූ (කුසල විපාක චක්ඛුවිඤ්ඤාණාදියට අනන්තරවැ කුසල විපාක ද, අකුසල විපාකයනට අනන්තරවැ අකුසල විපාක ද) මනෝධාතුව (සම්පටිච්ඡන චිත්තය) උපදී. මෙසේ මේ විපාක සිත් දෙදෙනා ගේ සම්පටිච්ඡන වශයෙන් පැවැත්ම දතයුතු ය.

(10) **මනෝධාතුයාපි උප්පජ්ජිත්වා නිරුද්ධා සමනන්තරා උප්පජ්ජති චිත්තං, මනෝ මානසං තජ්ජාමනෝ විඤ්ඤාණ ධාතු**[2] යි 'මනෝධාතුවෙන් පිළිගත් ආලම්බනය මැ තීරණය

[1]වි: ප: ධාතුවිභඞ්ග 67 පිට [2]වි: ප: ධාතුවිභඞ්ග 68 පිට

කරමින් (අකුසල විපාක මනොධාතුවට අනතුරුවැ අකුසල විපාක ද, කුසල විපාකයට අනතුරුවැ ඉෂ්ටාලම්බනයෙහි සොමනස්ස සහගතව ද, ඉෂ්ටමධ්‍යස්ථාලම්බනයෙහි උපෙක්ඛා සහගතව ද) **ත්‍රිවිධ විපාක මනොවිඤ්ඤාණ ධාතූන් ගේ** සන්තීරණ වශයෙන් පැවැත්ම දතයුතු.

(**11**) **"සන්තීරණානන්තරං පන තමෙව විසයං වවත්ථාපයමානා උප්පජ්ජති භූයාභෙතුඝ මනොවිඤ්ඤාණධාතු උපෙක්ඛා සහගතා"**[1] යි මෙසේ එකම ක්‍රියා මනොවිඤ්ඤාණයා ගේ **වොත්ථපන** වශයෙන් පැවැත්ම දතයුතු.

(**12**) වොත්ථපනයට අනතුරුවැ වනාහි **ජවන** පරියොසාන කොට ඇති චිත්තක්ඛණ තුදුසක් (14) ආයු ඇති, **මහන්තාලම්බන-වීථිමුඛ** එකල එම විෂයයෙහි **අටවැදෑරුම් කාමාවචර කුශලයන්** හෝ, **දෙලොස් අකුශලයන්** හෝ **නවවැදෑරුම් අවශෙෂ කාමාවචර ක්‍රියාවන්** හෝ, අතුරෙන් එකක ගේ වශයෙන් **ජවන් සයෙක් හෝ සතෙක්** හෝ උපදී. එකම සිත සවරක් හෝ, සත් වරක් දිවේ. මේ **පඤ්චවාරයෙහි** ක්‍රමය යි. (මූර්ඡාදි කාලවල පස්වරක් හෝ ඉපදිය හැකි ය.)

මනොද්වාරයෙහි වනාහි මනොවාරාවජ්ජනයට අනතුරුවැ පෙරකි **එකූන්විසි ජවනයන්** අතුරින් කිසි චිත්තයෙක්ම **ජවන** වේ.

අප්පිණාවිතින්ද්‍රියෙහි ඒ ඒ ධ්‍යානයන්ට හෝ, මාර්ගාදියට අනුරූප සේ ලබන ලද ප්‍රත්‍යය අනුවැ ත්‍රිහේතුක **කාමාවචර** කුසල හෝ, ක්‍රියා චිත්තයක් මනොවාරාවජ්ජනයට අනතුරුවැ **පරිකම්ම-උපචාර- අනුලොම- ගොත්‍රභූ** නාමයෙන් උපන් අනතුරුවැ **පෘථග්ජන-ශෛක්ෂයනට ප්‍රථමධ්‍යානාදි** රූපාවචර **කුශලධ්‍යාන පඤ්ච** හෝ, අරූපාවචර **කුශල ධ්‍යාන** හෝ, ලෝකොත්තර **මාර්ග සතර** හෝ ජවන වශයෙන් උපදී.

අශෛක්ෂයනට කාමාවචර ත්‍රිහේතුක ක්‍රියා සිත් සතරින් එකක් පරිකම්මාදි වශයෙන් උපන් කල, **රූපාවචර - අරූපාවචර** ක්‍රියා සිත් **ජවන** වශයෙන් උපදී. මේ ආදිකර්මිකයාට යැ. සෙස්සනට **පරිකම්ම** නැති. එසේම **චිතීය මාර්ගාදියෙහිදී "ගොත්‍රභූ"** වෙනුවට උපදනේ **"වොදනා"** යයි කියනු ලැබේ. **එල සමාපත්ති වීථියෙහි 'ගොත්‍රභූ'** හෝ **වොදනාය**ට හෝ අනතුරුවැ **එල සිත්** ජවන් වශයෙන් උපදී. (මෙහි තවද විස්තර බෙහෙවි.)

---

1 වි: ප: ධාතු විභඞ්ග 68

මෙසේ **කුසල - අකුසල - ක්‍රියා - විපාක** (ඵල) චිත්තයන් ගේ වශයෙන් **පඤ්චකෂ්** (55) **ජවනයෝ** දතයුතු වෙත්.

(13) ජවනාවසානයෙහි පඤ්චවාරයෙහි **අතිමහන්තාලම්බන** හෝ, (ඡොඩශ චිත්තක්ෂණායුෂක හෙයිනි.) මනොද්වාරයෙහි **විභූතා-ලම්බන** හෝ වේ ද, එකල **කාමාවචර** සත්ත්වයකට, කාමාවචර ජවනාවසානයෙහි, ඉෂ්ට, ඉෂ්ටමධ්‍යස්ථ, අනිෂ්ටාලම්බන වශයෙන් ද, පූර්වකර්මයන් ගේ වශයෙන් ද, ජවන චිත්ත වශයෙන් ද, පටිසන්ධි චිත්ත වශයෙන් ද, යම් යම් ප්‍රත්‍යයෙක් ලැබේ නම් ඒ ඒ ප්‍රත්‍යයන්-ගේ වශයෙන් **අටවැදෑරුම්** කාමාවචර කුශල විපාක චිත්තයන් හා ත්‍රිවිධ අහේතුක මනොවිඤ්ඤාණ ධාතූන් ද යන **එකොළොස්** චිත්තයන් අතුරින් එක්තරා **එක**ක්, උඩුගංබලා යන නැවක් ලුහුබැඳ මඳක් දුර යන ජලය මෙන් භවඞ්ග චිත්තයට අයත් අරමුණ හැර අන්‍ය (ජවන ගත්) ආලම්බනයෙහි දිවූ ජවනය ලුහුබැඳ දෙවරක් විපාක විඤ්ඤාණය උපදී. ඒ ජවනය ගත් ආලම්බනය මෑ ආලම්බන කොට පවත්නා හෙයින් **'තදුලම්බන'යැයි** කියනු ලැබේ.

මීත් රූපා'රූප භවයන්හි ද **අතිමහන්ත හා විභූතාලම්බන** ඇත ද, (අවඤ්චලභෙයින්) තදුලම්බන නූපදනා බව් කී නියාය.

කාම කෘෂ්ණ හෙතු කර්මයෙන් නිපන් ඒ තදුලම්බනය මහද්ගත, ලෝකෝත්තර ජවනයන් ලුහු නො බඳී.

නිදර්ශනයක්:- ගෙයින් පිටත යනු කැමැති ළදරුවා පියා හෝ, පියා සමාකයෙක් හෝ පස්සුපස්සේ යේ. එයට වෙනස් වූවකු ලුහු නො බඳින්නාක් මෙනි. (තමහට ජනක කර්මය හෝ, තත්සදෘශ ක්‍රියාව හෝ ලුහු බඳනේ සි.)

කාමාවචර ජවන් **එක්තිසෙකි.** (31) තදුලම්බන **එකොළොස්-සෙකි.** (11) සියලු ජවන් කෙරෙන් ඒ සියලු තදුලම්බන නූපදී.

ඒ නියමය මෙසේයි:-

සොමනස්ස සහගත ක්‍රියා ජවනයන් කෙරෙන් **සොමනස්ස සහගත** තදුලම්බනයෝ මෑ වෙති. **උපෙක්ඛා සහගත** ක්‍රියා ජවනයන් කෙරෙන් හා, **දෝසමූලික අකුසල්** කෙරෙන් **උපෙක්ඛා සහගත** තදුලම්බනයෝ මෑ වෙති.

කාමාවචර කුසල් කෙරෙන් ද, **ලෝභමූල, මෝහමූල අකුසල්** කෙරෙන් ද, **සොමනස්ස සහගත** තදුලම්බන ද, **උපෙක්ඛා සහගත** තදුලම්බන ද, ආලම්බනානුරූප වෑ වෙති. එහිදු අකුසල

ජවනයට අනතුරුවැ **අහේතුක තදුරමමණ ද,** (අහේතුක මනෝ-විඤ්ඤාණධාතු තුන ද) විහේතුක ජවනයට අනතුරුවැ **විහේතුක තදුරමමණ ද,** ත්‍රිහේතුක ජවනයට අනතුරුවැ **ත්‍රිහේතුක තදුරමමණ ද,** බොහෝ සෙයින් වෙති.

ඉෂ්ටාලම්බනයෙහි සොමනස්සසහගතවූ මෑ තදුලම්බනයෝ වෙති.

ඉෂ්ටමධ්‍යස්ථාලම්බනයෙහි කුසල විපාක උපෙක්ඛා සහගත **තදුලම්බනයෝ** වෙති.

අනිෂ්ටාලම්බනයෙහි අකුශල විපාක උපෙක්ඛා සහගත **තදුලම්බනයෝ** වෙත්.

ප්‍රතිසන්ධිජනක කර්මය පමණක් නොව **ප්‍රවෘත්ති විපාක ජනක** කර්මය ද, **තදුරමමණ** උපදවන්නේ ය. ඒ ප්‍රවෘත්ති විපාක ජනක කර්මය ප්‍රතිසන්ධි විපාක ජනක කර්මයෙන් උපදවන තදුරමමණයට වෙනස්වූ ද **තදුරමමණ** උපදවන්නේ ය.

තදුරමමණාවසානයෙන් නැවත ද **භවාඞ්ග වේ.** භවාඞ්ගය සිදුණු කල ආවර්ජනාදිය වේ. එයට අනතුරුවැ දර්ශනාදිය චිත්ත නියාමය වශයෙන් නැවත නැවත පවතී.

(**14**) **එක්** භවයෙක්හි හැමට පසුවැ උපදනා භවඞ්ග චිත්තය මෑ ඒ භවයෙන් චුතිය වන හෙයින් **චුතියයි** කියනු ලැබේ. හේද **එකූන්විසි** (19) වැදෑරුම් වේ.

මෙසේ **එකූන්විසි** වැදෑරුම් විපාක චිත්තයන්ගේ ම චුති වශයෙන් පැවැත්ම දතයුතු. චුතියෙන් මතු නැවත ප්‍රතිසන්ධිය ද ප්‍රතිසන්ධියෙන් මතු නැවත භවාඞ්ගය දැයි මෙසේ **ත්‍රිවිධ භවය, පඤ්චගතිය, සප්තවිඤ්ඤාණස්ථිතිය, නවසත්ත්වාවාසය** යන මෙතෙක් තන්හි සැරිසරන්නා වූ සත්ත්වයන් ගේ නො සිඳ චිත්ත සන්තතිය පවත්නේම ය. මේ ලෝකයෙහි යමෙක් අර්හත්වයට පැමිණියේ නම් **උත්වහන්සේ** ගේ චුති චිත්තය නිරුද්ධ වූ කල්හි නැවත නූපදනා සේ නිරුද්ධ වන්නේම ය.

මේ විඤ්ඤානඤ්ඣයෙහි විභාග කථාව යි.

වේදනා සඞ්ගහය (3)

"යංකිඤ්චි වෙදයිත ලක්ඛණං සබ්බන්තං එකතෝ සඞ්ගච්ඡ වෙදනාක්ඛන්ධෝ වෙදිතලක්ඛණෝ" යි 'යම්කිසි විදීම් ලක්ෂණයෙක් වේ නම් ඒ සියල්ල එක්කොට සැලකීමෙන් **වේදනාසඞ්ගහය** දකයුතුය' යි කී හෙයින් දැන් එය විසතර කරනු ලැබේ. **"වෙදියති වෙදියතීති ඛෝ ආවුසෝ තස්මා වෙදනාති වුච්චති"**[1] යි කී හෙයින් මෙහි වේදයිත ලක්ෂණය නම් වේදනාවම ය. (වේද නම්වූ අනුභවාකාරයෙන් පැවැත්තේ වේදයිත ය.)

ඒ ආලම්බන රස අනුභව කිරීම් ලක්ෂණයෙන් සවභාවයෙන් **එකවිධ** වුව ද,

(1) **කුසල**
(2) **අකුසල**

(3) **අබ්‍යාකතයයි** ජාති වශයෙන් ත්‍රිවිධ වේ. එහි **කාමාවචර කුසලය, සෝමනස්ස - උපෙක්ඛා - ඤාණ - සඞ්ඛාර** භේදයෙන් අටවැදෑරුම් වේ' යනාදි පෙර කී සේ (1) **කුසල විඤ්ඤාණය** හා සම්ප්‍රයුක්ත වූයේ **කුසල වේදනා ය.** (2) **අකුසල විඤ්ඤාණය** හා සම්ප්‍රයුක්තවූයේ **අකුසල වේදනා ය.** (3) **විපාක-ක්‍රියාවන්** හා සම්ප්‍රයුක්තවූයේ **අබ්‍යාකත වේදනා ය** යි දතයුතු. වේදනාව සවී චිත්ත සාධාරණ බැවින් **එකූන් අනූ** (89) වැදෑරුම් වේ. **සුඛ-දුක්ඛ-සෝමනස්ස - දෞමනස්ස - උපෙක්ඛා** භේදයෙන් සවභාව වශයෙන් **පස්වැදෑරුම්** වේ.

එහි කුසල විපාක කාය විඤ්ඤාණ සම්ප්‍රයුක්ත වූයේ **සුඛ** වේදනාය.

අකුසල විපාක කාය විඤ්ඤාණ සම්ප්‍රයුක්ත වූයේ **දුක්ඛ** වේදනා ය.

කාමාවචරයෙහි **කුසල් සතර ය**, සහේතුක **විපාක සතරය, එකම** අහේතුක විපාක **සනතීරණය**, සහේතුක ක්‍රියා **සතර ය, එකම** අහේතුක **ක්‍රියාව ය.** අකුසල **සතරය** යන මෙතෙක් සිත් හා ද, **රූපාවචරයෙහි** පඤ්චමධ්‍යාන චිත්තය හැර, සෙසු **දෙලොස් කුසල-විපාක-ක්‍රියා-** හා ද, (ධ්‍යානාඞ්ග සම්ප්‍රයුක්ත ලෝකෝත්තර චිත්තය ද) **මාඝී-එල** වශයෙන් අට වැදෑරුම් වූ ධ්‍යාන භේදයෙන් ගෙන **සම සතලිසක්** (40) වේ. (අධ්‍යාත්මික ලොකොත්තර නැති හෙයිනි.) එහි පඤ්චමධ්‍යානික අට හැර සෙසු **දෙනිස්** (කුසල-විපාක) **මාඝී-එල** චිත්තයන් හා ද යි මෙසේ **සොමනස්ස දෙසැට** (62) **විඤ්ඤාණයන්** හා සම්ප්‍රයුක්ත වේ.

දෞමනස්ස වේදනාව දෞමනස්ස සහගත අකුසල **විඤ්ඤාණ දෙක** හා සම්ප්‍රයුක්ත වේ.

---

[1]ම: නි: මූලපණ්ණාසක 296

උපෙක්ඛා වේදනාව; සෙසු කාමාවචර කුසල **සත්තරය**, සහේතුක විපාක **සත්තරය**, අහේතුක විපාක **දෙළොසය**, සහේතුක ක්‍රියා **සත්තරය**, අහේතුක ක්‍රියා **දෙකය**, අකුසල **සයය**, රූපාවචර පඤ්චමධ්‍යාන **තුනය**, (අරූපාවචරයද පඤ්චමධ්‍යානයෙහි ඇතුළත් හෙයින්) අරූපාවචර **දෙළසය**, ලෝකෝත්තර **අටයැයි පස්පන්ස** (55) විඤ්ඤණයන් හා සම්ප්‍රයුක්ත වේ.

ඔවුනතුරින් **සුඛ වේදනාව** ඉෂ්ට ඵොට්ඨබ්බය අනුභව කිරීම් **ලක්ෂණය යැ.** සම්ප්‍රයුක්ත ධර්මයන් ගේ උපබ්‍රූහණ (වැඩීම) **රසය යැ.** කය පිළිබඳවූ ආස්වාදය **වැටහෙන ආකාරය යැ.** කාය ඉන්ද්‍රියය **ආසන්න කාරණයයි. දුක්ඛ වේදනාව** අනිෂ්ට ඵොට්ඨබ්බය අනුභව කිරීම් **ලක්ෂණය යැ.** සම්ප්‍රයුක්ත ධර්මයන් මැලවීම් **කෘත්‍යය යැ.** කය පිළිබඳ පෙළීම් **වැටහෙන ආකාරය යැ.** කාය ඉන්ද්‍රියය **ආසන්න කාරණය සි.**

සෞමනස්ස වේදනාව ඉෂ්ටානුභවන **ලක්ෂණය යැ.** සුවභාවවූ, හෝ, පරිකල්පවූ හෝ ඉෂ්ටාකාරයෙන් අරමුණු රස විඳීම් **කෘත්‍යය යැ.** චෛතසික ආස්වාදය **වැටහෙන ආකාරය යැ.** පඤ්චදසිය **ආසන්න කාරණය සි.**

දෞමනස්ස අනිෂ්ටානුභවන **ලක්ෂණය යැ.** ලැබුණු පරිදි අනිෂ්ටාකාරයෙන් අරමුණු රස විඳීම් **කෘත්‍යය යැ.** චෛතසික පීඩනය **වැටහෙන ආකාරය යැ.** හෘදය වස්තුව **ආසන්න කාරණය සි.**

උපෙක්ඛා වේදනාව මධ්‍යස්ථානුභවන **ලක්ෂණය යැ.** සම්ප්‍රයුක්ත ධර්මයන් **නො** පිනවන- නො මලවන (සුවභාව) **කෘත්‍යය යැ.** ශාන්තභාවය **වැටහෙන ආකාරය යැ.** නිප්‍රීතික චිත්තය **ආසන්න කාරණය සි.**

මේ වේදනා සඤ්ඤයේ විභාග කථාවයි.

සංඥා සකන්ධය (4)

"යංකිඤ්චි සඤ්ජානනලක්ඛණං සබ්බංතං එකතෝ කත්වා සඤ්ඤාක්ඛන්ධෝ වෙදිතබ්බෝ" යි 'යම්කිසි හැඳිනීම් ලක්ෂණයෙක් වේ නම් ඒ සියල්ල පිඬු කොට **සංඥා සකන්ධය** දත යුතුයයි, කී හෙයින් දැන් වේදනා සකන්ධයට අනතුරුවැ **සංඥා සකන්ධය** කියනු ලැබේ.

"සඤ්ජානාතී සඤ්ජානාතී ඉති ඛෝ ආවුසෝ තස්මා සඤ්ඤන්ති වුච්චති"[1] යි 'නීල පීතාදි අරමුණ සලකුණු කොට **නැවත නැවත** හැඳිනීමෙක් වේ නම් එය සංඥා නමින් කියනු ලැබේය' යි එහෙයින් වදාළහ. ඒ සංඥාව **ද** හැඳිනීම් ලක්ෂණ (සවභාව) යෙන් **එකවිධ වුව ද,** ජාති වශයෙන් **කුශලය, අකුශලය, අව්‍යාකෘතය යයි ත්‍රිවිධ** වේ.

ඔවුනතුරින් **කුශල විඤ්ඤාන** සම්ප්‍රයුක්ත වූයේ **කුශල සංඥාය අකුශල විඤ්ඤාන** සම්ප්‍රයුක්ත වූයේ **අකුශල සංඥාය. අව්‍යාකෘත විඤ්ඤාන** සම්ප්‍රයුක්ත වූයේ **අව්‍යාකෘත සංඥායි.** 'සංඥයෙන් වෙන්වූ විඥානයක් නම් නැත්තේය' යි කී හෙයින් සංඥාව සියලු විඥාන-යෙහි මැ යෙදේ. එහෙයින් විඥාන භේද යම් පමණ **'නම්** සංඥා භේදය එපමණ මැ වේ.

විශෙෂ:- (වේදනාව සමීචිත්ත සාධාරණ වුව ද, 'මෙසේ **නොකියන** ලද්දේ' එය භේද විශයෙන් **තුනක්** හෝ **පසක්** වන හෙයින් ඒ එක එක භේදයෙන් යුක්ත වූ විඥානය අන්‍ය භේදයන් හා නොසැසඳෙන හෙයිනි.)

මේ සංඥාව, විඥානය හා සමාන ප්‍රභේද ඇත්තේ වුව ද, **ලක්ෂණාදි** වශයෙන් සියලු සංඥාම අරමුණ ලකුණු කිරීම් **ලක්ෂණ** ය යැ. පළමු කළ සලකුණෙන් පසුව හැඳින ගැනීමට නිමිත්ත වීම් **කෘත්‍යය** යැ. (දැව ආදිය සැසිය යුතු තැන් පළමු කළ ලකුණින් පසුව හැඳිනගන්නාක් මෙනි.) පළමු ගන්නාලද නිමිත්තගේ වශයෙන් දැනීකොට ගැනීම **වැටහෙන ආකාරය** යැ. (ඇතා ගේ ඒ ඒ අවයව ගත් අන්ධයන් **ඇතා** ඒ ඒ අවයව බදුය යි හැඳින ගත්තා සේ) එළඹ සිටි සේ අරමුණ ගැනීම **ආසන්න කාරණය** යි. තෘණ පුරුෂයන් (කුඹුරු රැකීමට කළ පඹයන්) දැක 'මුව ආදීහු' කුඹුරු රක්නා පුරුෂයන් මෙනැයි, ගන්නා සංඥාව මෙනි.

මේ සංඥා සකන්ධයේ විභාග කථාවයි.

---

[1] ම: නි: මූලපණ්ණාසක 296

සංඛාරඋපන්ධිය (5)

"යංකිඤ්චි අභිසඞ්ඛරණලක්ඛණං සඞ්ඛතං එකතෝ භාවා සඞ්ඛාරක්ඛන්ධෝ" යි සංඥාඋපන්ධියට අනතුරුවැ 'කුශලා-කුශල කර්මයන් රැස් කිරීම ලක්ෂණ කොට ඇති ධර්ම සමූහය එක්-කොට **සංස්කාර ස්කන්ධ** වේය'යි කී ඒ වචනයෙහි, **අභිසංස්කරණ** ලක්ෂණය නම් රැස්කිරීම් ලක්ෂණයයි. ඒ නම් **සංස්කාර** ධර්ම මැයි. එයින් වදාළහ.

"සඞ්ඛතමභිසඞ්ඛරොතීති ඛො භික්ඛවෙ තස්මා සඞ්ඛරොති වුච්චතීති"[1]යි 'මහණෙනි! තමන් ගේ හේතු ධර්මයෙන් සිදුකටයුතු ඵල ධර්මය සකස් කරන හෙයින් සංස්කාරයෝය'යි කියනු ලැබෙත්. ඔහු රැස්කිරීම් **ලක්ෂණ** ඇත්තාහ. එක්රැස් කොට ගැනීම් **කෘත්‍යය** ඇත්තාහ. ව්‍යාපාරවත් බව **වැටහෙන ආකාර** ඇත්තාහ. අවශෙෂ තාම සකඤ්චිත්‍රයය **ආසන්න කාරණ** ඇත්තාහ. මෙසේ ලක්ෂණාදීන් **එකවිධ** වුව ද ජාති වශයෙන් **කුශල, අකුශල, අව්‍යාකෘත** භේදයෙන් **ත්‍රිවිධ** යැ.

ඔවුනතුරින් කුශල විඥාන සම්ප්‍රයුක්ත වූයේ **කුශල** යැ. අකුශල සම්ප්‍රයුක්ත වූයේ **අකුශල** යැ. අව්‍යාකෘත සම්ප්‍රයුක්ත වූයේ **අව්‍යාකෘත** සි. එනි ද කාමාවචර ප්‍රථම කුශල විඥානයෙහි නියත වශයෙන් සවරූපයෙන් පෙළෙහි ආ **සත් විස්සය**, සවකිය නාමයෙන් නාවා වූ **සතරය**. අනියත **පසයැයි** වෙතසික සතිසෙක් වේ. එහි **ඵස්සය, චෙතනාය, චිත්තෙකග්ගය, විචාරය, පීතිය, විරියය, ජීවිතය, සමාධිය, සද්ධාය, සතිය, හිරිය, ඔත්තප්පය, අලොභය, අදොසය, අමොහය, කායපස්සද්ධිය, චිත්තපස්සද්ධිය, කාය-ලඝුතාය, චිත්තලඝුතාය, කායමුදුතාය, චිත්තමුදුතාය, කාය-කම්මඤ්ඤතාය, චිත්තකම්මඤ්ඤතාය, කායපාගුඤ්ඤතාය, චිත්තපාගුඤ්ඤතාය, කායුජ්ජුකතාය, චිත්තුජ්ජුකතාය** යන **සත්විසි** දෙන සවරූපයෙන් ආහ. **ඡන්දය, අධිමොක්ෂය, මනසිකාරය, තත්‍රමජ්ඣත්තතාය**, යන **සතර** දෙන **යේවාපනක** යෝසි. **කරුණා, මුදිතා, කාය දුශ්චරිත විරතිය, වචීදුශ්චරිත-විරතිය, මිථ්‍යාආජීව විරතිය** සි **මේ පස්දෙන අනියතයෝසි.**

(මොහු වනාහි කිසිවිටෙක උපදිති. උපදින්නෝ ද එක්ව නූපදිත්.)

1. **ඵස්සය** (1) අරමුණට වැදගන්නේ **ඵස්සයයි.** වැදගැනීම් ක්‍රියාව කතෘභාවයෙන් තොරවැ සිදු නොවන හෙයින් ඒ ධර්මය කර්තෘ වන බව හැඟවීමට මෙසේ **කර්තෘ සාධනයෙන්** දක්වූහ.

---

[1]සං: නි: බන්ධසංයුක්ත 401

(ii) 'මේ **කරණකොට** ගෙන සම්ප්‍රයුක්ත ධර්මයෝ සපර්‍ශී කෙරෙත්නුයි හෝ **එස්සය යැ.** එස්සය හා සම්ප්‍රයුක්ත සෙසු චිත්ත චෛතසික ධර්මයෝ, වැදගැනීම් ලක්‍ෂණ **සපර්‍ශය කරණ කොට** අරමුණ සපර්‍ශී කරන්නාහු මෙන් වෙත්යයි **කරණ සාධන** වශයෙන් වේ.

(iii) අරමුණු වැදගැනීම් මාත්‍රය හෝ **එස්සයයි.**

මෙසේ **කර්‍තෘ, කරණ,** සාධන වයය ආරෝපනය කිරීමෙන් පයර්‍යාය වශයෙන් හා **භාව සාධනය** නිෂ්පයර්‍යාය වශයෙන් වේ. (ධර්‍මස්වභාවය **නිසිසේ** හැගෙනුයේ භාවසාධනයෙනි.) සෙසු චෛතසික පිළිබඳව ද මේ ක්‍රමය මෙසේ මැයි. ඒ **එස්සය** අරමුණට වැදගැනීම **ලක්‍ෂණය යැ.** ආලම්බනය හා විඥානයා ගේ ගැටීම් **කෘත්‍යය යැ.** වස්තු - ආලම්බන - විඥානයන් ගේ එක්වීම (සන්නිපාතය) **වැටහෙන ආකාරය යැ.** හමුවූ අරමුණ මැ **ආසන්න කාරණය සි.**

විශෙෂ:- අරූප ධර්‍මයක්වූ ද මේ **එස්සය** ආලම්බනයෙහි වැදගන්නාක් මෙන් පවතී.

කෙසේදයත්:- දුර සිට ඇඹුල් කන්නකු දුටුවහු කටට කෙළ උණන්නාක් මෙන්, බැහැරවූ ද රූපාලම්බනය ආපාථගතවීම් මාත්‍රයෙන් චක්‍ෂුඃප්‍රසාදයෙහි ගැටෙන්නාක් මෙන් වේ. දඬු දෙකක් එකට ගැටීමක් මෙන් ඒක දෙශයෙනුදු නො ගැටෙන්නා වූ රූපය චක්‍ෂුර්විඥානය මෙන් ද, ශබ්දය සොතප්‍රසාදය මෙන් ද, **චිත්තය, ආලම්බනය** යන දෙදෙනා අන්‍යොන්‍ය ආපාථගමනයවීම දතයුතු. මේ **කෘත්‍යාර්‍ථය** වස්තු ආලම්බනයන් ගේ සන්නිපාතයෙන් ඝට්ටනය වේයයි සම්ප්‍රාප්ති අර්‍ථයෙන් **රූඪය කියේ** වේ.

(ආලම්බනයෙහි චිත්තයා ගේ ගැටීම චිත්තයා ගේ විශෙෂ වූ **එක්තරා** සවභාවයෙකි.) **වස්තු - ආලම්බන - විඥාන** තුනෙහි එක්වීම එස්සයා ගේ හේතු වශයෙන් භගවා වදාළ හෙයින් (එක්වීම) සන්නිපාතය ඵලකොට ඇත්තේ ය. මේ **ඵලාඥ්ඵ පර්‍යුපස්ථාන-ය සි.**

සපර්‍ශයට සුදුසු ආවර්‍ජන චිත්තයෙනුදු, චක්‍ෂුරාදි ඉන්‍ද්‍රියයෙනුදු සකස් කරන ලද අරමුණෙහි නිරූපදෘතවැ උපදනා හෙයින් හමුවූ ආලම්බනය **ආසන්න කාරණය සි** කියනු ලැබේ.

වේදනාවට ආධාර වීමෙන් සමගැසුණු ගවදෙනකට බඳු උපමා ඇත්තේ සි.

2. චෙතනාව, තමා හා සම්ප්‍රයුක්ත සෙසු **එස්සාදි** ධර්‍මයන් ඒ ඒ කෘත්‍යයෙහි මෙහෙයවන ධර්‍ම සවභාවය **චෙතනා සි.**

අරමුණෙහි මනාව පිහිටුවන්නේ ය.' යන අර්ථයි. එය උත්සාහවත් බව **ලක්ඛණය යැ.** සම්ප්‍රයුක්ත ධර්ම තම තමා අයත් කටයුත්තෙහි යෙදීම් **කෘත්‍යය යැ.** සෙසු සම්ප්‍රයුක්ත ධර්ම ඒ ඒ කෘත්‍යයෙහි විධාන කිරීම මැ **වැටහෙන ආකාරය යැ.** (තමා අයත් කෘත්‍ය කරමින් අන්‍යයන් ද ඒ ඒ කෘත්‍යයන්හි යොදවන්නා වූ දෙටු ශිෂ්‍යයා හා දෙටු වඩු ආදීන් මෙනි.)

චෙතනාව පවත්නා කල්හි මැ සෙසු සම්ප්‍රයුක්ත ධර්මයන් තම තමා අයත් කෘත්‍යයෙහි පවත්නා බැවිනි. මේ **චේතනාව** ඉක්මන් කර්මයන් සිහිකිරීම් ආදියෙහි දී සම්ප්‍රයුක්ත ධර්මයන්ට උත්සාහ උපදවන කල්හි ප්‍රකට වේ.

විශෙෂ:- මෙහි උත්සාහය ආයූහන (රැස්කිරීම්) වශයෙන් මුත් වීර්‍ය වශයෙන් නො වේ.

3 විතක්ක 4 විචාර- 5 පිතින් පිළිබඳ **ලක්ඛණාදිය පඨවි-කසිණ නිද්දෙශයෙහි** ප්‍රථමධ්‍යාන වර්ණනායෙහි කියේ මැයි.[1]

6 වීර්‍ය, වීරයා ගේ සවභාවය වීර්‍යය යි. එහි **ලක්ඛණය** උත්සාහවත් කිරීම ය. **රසය** සහජාතයන්ට උපස්තම්භක වීම ය. (රැකුල් දීම ය) පසුබට නො වීම **වැටහෙන ආකාරය ය.** "සංවේගයට පැමිණියේ නුවණින් උත්සාහවත් වේ" යයි කී හෙයින්, 'සංවේගඤ්ඤය **ආසන්න කාරණය යි.** නොහොත් වීර්‍යාරම්භ වස්තු ම **ආසන්න කාරණය යි.** පටන් ගත්නාලද වීර්‍යය සියලු සම්පත්තීන් ගේ මූල කාරණයයි දතයුතුයි.

7 ජීවිතින්ද්‍රිය, සම්ප්‍රයුක්ත ධර්මයෝ එයින් ජීවත්වෙත් නුයි හෝ, තෙමේ ජීවත්වේ නුයි හෝ, ජීවත මාත්‍රය නුයි හෝ **ජීවිත** නම්. (එහි ලක්ෂණාදිය රූපස්කන්ධ විභාගයෙහි **රූප ජීවිතින්ද්‍රිය-යෙහි**[2] කී නයින් ම දතයුතු.)

විශෙෂ:- ඒ **රූප ජීවිතින්ද්‍රිය** කර්මජ රූපයන් ජීවත්වීමට කාරණ වේ. මේ **නාම ජීවිතින්ද්‍රිය** අරූප ධර්මයන් ගේ ජීවත්වීමට කාරණ වේ. මේ ය මේ දෙකෙහි වෙනස.

8 සමාධි, ආරම්මණයෙහි සිත සම වැ පිහිටුවා නුයි හෝ, මනා ව පිහිටුවා නුයි හෝ, 'චිත්තයා ගේ මේ මනාව පිහිටුවීම මාත්‍රය නුයි' හෝ **සමාධි** නම් වේ. එහි තමා හා සම්ප්‍රයුක්තධර්ම-යන් ගේ නො විසිරීම හෝ, නන් අරමුණෙහි විසිර නො යාම **ලක්ෂණය ය. කෘත්‍යය** තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන් කැටිකිරීම යැ. (තහනසුණු දියෙන් කැටි කරන්නාක් මෙනි.)

---

[1] සි: වි: 215 පිට [2] සි: වි: 650 පිට

ප්‍රතිපක්ෂ ධර්ම සංසිඳවීම **වැටහෙන ආකාරය** ය. සුඛ වේදනාව **ආසන්න කාරණයයි.** 'සුළං නොහමන තැනෙක පහන් සිළුවක පැවැත්ම මෙන් චිත්තයා ගේ පැවැත්ම' යයි දතයුතු.

9. සද්ධා, මේ නිසා අදහන්නේ නුයි, හෝ 'තෙමේ අදහානුයි' හෝ 'ඇදහීම් මාත්‍රය' හෝ **ශ්‍රද්ධා ය.** එය ඇදහීම් **ලක්ෂණය ය.** අරමුණ කරා වැදගැනීම් **ලක්ෂණය** හෝ යි. (උදකප්‍රසාදක මාණික්‍යය මෙන්) පැහැදවීම හෝ, (සැඩ පහරක් එතර කරන්නකු සේ) පෙරදුරිවූ පැනීම හෝ **කෘත්‍යය ය.** නොකැළඹීම **වැටහෙන ආකාරය ය.** පැහැදිය යුතු වස්තුව පිළිබඳ නිශ්චය හෝ, ඇදහිය යුතු වස්තුව හෝ **ආසන්න කාරණය යි. සඛම් ශ්‍රවණාදි සතර සොතාපත්ති අඞ්ග පදට්ඨාන** හෝ වේ. භාජන-වස්තු-බීජයන් මෙනි.

10. සති, 'ඒ කරණකොට ශෙත සිහි **කෙරෙත්නුයි'** හෝ, 'තෙමේ සිහිකෙරේනුයි' හෝ, 'සිහිකිරීම් මාත්‍රය හෝ **සතිය යි.** ඒ අරමුණ සිහිකිරීම් **ලක්ෂණය ය.** සිහි නැති නො වීම **කෘත්‍යය ය.** සිත ආරක්ෂා කිරීම **වැටහෙන ආකාරය ය.** සතිර සංඥව හෝ, **කායානුපස්සනා සතිපට්ඨානාදිය ආසන්න කාරණය යි.** (අණ-මුණෙහි දැඩිවැ පිහිටන හෙයින් ඉන්ද්‍රිය බල සප්තබෝධ්‍යංගාදිය ආරක්ෂා කරන හෙයින් දෙරටුපාලකයකු මෙන් ද දතයුතු.)

11. හිරි 12. ඔත්තප්ප, 'කාය දුශ්චරිතාදීන් හැකිළේ නුයි' **හිරි** නම් වේ. **ලජ්ජාවට** නමෙකි. 'ඔවුන් කෙරෙන් මෑ තැති ගනී නුයි **ඔත්තප්ප** නම්. පාපයෙන් **උද්වේගයට** මේ නම්. ඔවු-නතුරින් පාපයෙන් පිළිකුල් එන ගතිය **හිරියෙහි ලක්ෂණය ය.** ඔත්තප්පය තැති ගන්නා **ලක්ෂණය ය. හිරියෙහි ලජ්ජා** සවභාවයෙන් පව් නො කිරීම **කෘත්‍යය ය. ඔත්තප්පයෙහි** භය සවභාවයෙන් පව් නො කිරීම **කෘත්‍යය ය. ක්‍රියාකාරයෙන් ලජ්ජා** සවභාවයෙන් හෝ, **භය** සවභාවයෙන් පාපයෙන් හැකිළීම **වැටහෙන ආකාරය ය.** මෙහු ආත්ම ගෞරවය හා පරගෞරවය **ආසන්න කාරණය හ.** කුලකාන්තාවක සේ **ආත්ම** ගෞරවයෙන් පව් නො කිරීම **හිරිය යි.** වේශ්‍යාවක් මෙන් මෙරමාහට භයින් පව් නො කිරීම **ඔත්තප්පය යි.** (මේ ධර්ම දෙක **ලෝක පාලකයෝ යි.**)

13. අලෝභ, 'ඉත් ලෝභ නොවෙත්නුයි හෝ, 'තෙමේ ලෝභ නො කෙරේනුයි, හෝ ලෝභ නො කිරීම් මාත්‍රය, හෝ **අලෝභය ය.** ආලම්බනයෙහි සිත ගිජු නො වීම අලෝභ **ලක්ෂණය ය.** සිත නො ලැගෙන බව හෝයි. (කමල පත්‍රයෙහි දිය බිඳ මෙනි.) මමත්වය

නො කිරීම **කෘත්‍යය යැ.** (**රහත් භික්ෂුව** මෙනි.) නො ඇලෙන බව **වැටහෙන ආකාරය යැ.** (අශුචියෙහි නුඹු පුරුෂයා මෙනි.)

14. අද්වේෂ, නො සැඩ බව හෝ, අවිරුද්ධ බව අද්වේෂයේ **ලක්ෂණය යැ.** අනුකූල මිත්‍රයකුට බදු උපමා ඇත්තේ යැ. **නව-වැදූරුම්** ආඝාත චිතයනය හෝ, දුහ සන්සිඳවීම **කෘත්‍යය යැ.** (සඳුන් මෙනි.) (පුන් සඳසේ) සෞම්‍ය බව **වැටහෙන ආකාරයයි.**

15. අමෝහ, ඒ ඒ වස්තූන් පිළිබඳ විශෙෂ **ලක්ෂණ** හා, **අනිත්‍යාදි** සාමාන්‍ය ලක්ෂණ පිළිබඳ දැනීම අමෝහයේ **ලක්ෂණය යැ.** ඒ ඒ දෑය පිළිබඳ නොපැකිල දැනීම **හෝ ලක්ෂණයයි.** (දක්ෂ දුනුවාවකු විදි ඊය නො වැරද විනිවිද යන්නා සේ යි.) (පහතක් මෙන්) විෂය වස්තූන් ප්‍රකාශ කිරීම **කෘත්‍යය යැ.** (වනයෙහි හැසිරෙන පලපුරුදු මාගී දේශකයා සේ) නො මුළා බව නුවණට **වැටහෙන ආකාරය යි.**

මේ **අලෝභ, අද්වේෂ, අමෝහ** තුනම ඝියලු **චාතුර්භූමික** කුශලයන් ගේ පිහිටීමට මුල්වන්නාහ යි දතයුතු.

16. කාය පස්සද්ධි 17. චිත්ත පස්සද්ධි, කාය සඞ්ඛ්‍යාත වේදනා, **සඤ්ඤා, සඞ්ඛාර** යන සකඞ්ඛත්‍රය පිළිබඳ කෙලෙශදුහ සංසිඳවීම **කායපස්සද්ධිය යැ.** චිත්තයා ගේ දුහ සංසිඳවීම **චිත්ත පස්සද්ධිය යැ.** එහෙයින් මේ දෙක එක්වැ උපදනා කාය-චිත්ත දරථ සංසිඳවීම **ලක්ෂණය යැ.** කාය චිත්තයන් පීඩාකරන්නා වූ **උද්ධච්චාදිය** මැඩපීම මොවුන්ගේ **කෘත්‍යය යැ.** කාය-චිත්තයන්ගේ විඩා සංසිඳුවා නිශ්චල බවට පමුණුවා සිතල කිරීම මෑ **වැටහෙන ආකාරය යැ.** කාය-චිත්ත දෙදෙන **ආසන්න කාරණය යි.** (කාය-චිත්ත දෙදෙනා නො සන්සුන් කරන **උද්ධච්චාදි** කෙලෙශයන්ට ප්‍රතිපක්ෂයන හෙයි දතයුතු.)

18. කාය ලඝුතා 19. චිත්ත ලඝුතා, පෙර කී සේ කාය-යාගේ සැහැල්ලු බව **කාය ලඝුතාය.** චිත්තයා ගේ සැහැල්ලුබව **චිත්ත ලඝුතායි.** ඔහු කායයා ගේ බරබව වූ **ථීනය ද,** චිත්තයා ගේ බරබව වූ **මිධය** ද සංසිඳවීම **ලක්ෂණය හ.** ඔවුන් මැඩීම **කෘත්‍යය හ.** කාය - චිත්ත දෙදෙනා ගේ බරබව වූ **කෙලෙසුන්ට** ප්‍රතිපක්ෂ බව **වැටහෙන ආකාරය හ. කාය - චිත්ත දෙදෙන ආසන්න කාරණය හ.** (කාය - චිත්තයන් ගේ බරබව් **කරන ථීන-මිධාදි** කෙලෙසයන්ට ප්‍රතිපක්ෂය හ.)

20. කාය මුදුතා 21. චිත්ත මුදුතා, (පෙර කී) **කායයා** ගේ මෘදු බව **කාය මුදුතාය.** චිත්තයා ගේ මෘදු බව **චිත්ත මුදුතායි.**

ඔහු කාය-චිත්තයන් ගේ තද බව හා කැකුළුබව වූ **දෘෂ්ටි-මානයන්** සන්සිඳවීම් **ලක්ෂණය හ.** කාය - චිත්තයන් ගේ දැනි බව් මැඩීම් **කෘත්‍යය** හ. අරමුණෙහි තො ගැටීම වැටහෙන **ආකාරය හ.** කාය-චිත්ත දෙදෙන **ආසන්න කාරණයහ.** (කාය-චිත්තයන් ගේ තද බව් කරන දිට්ඨි-මානාදි ක්ලේශයනට ප්‍රතිපක්ෂයහ.)

22. කායකම්මඤ්ඤතා- 23. චිත්තකම්මඤ්ඤතා, කාය-යා ගේ කුශල කර්මයන්හි යෝග්‍යතාව **කායකම්මඤ්ඤතාව ය.** චිත්ත-යා ගේ යෝග්‍ය බව **චිත්තකම්මඤ්ඤතාව සි.** ඔහු කාය චිත්ත අකර්මණ්‍ය භාවය සංසිඳීම් **ලක්ෂණයහ.** කාය-චිත්ත අකර්මණ්‍ය-භාවය මර්දනය කිරීම් **කෘත්‍යය හ.** කාය - චිත්ත දෙදෙනා ගේ **කර්මණ්‍යභාවයෙන්** අරමුණු ගැනීම් **ඵලය හ.** කාය-චිත්ත **ආසන්න කාරණය හ.** (කාය-චිත්ත දෙදෙනා ගේ අකර්මණ්‍ය භාවය කරන්නා වූ **කාමච්ඡන්දාදි** සෙසු නීවරණයනට ප්‍රතිපක්ෂ වූ, ප්‍රසාදනීය වස්තුවෙහි ප්‍රසාද ඵලවන්නාහ. හිත වූ ඒ ඒ ක්‍රියායෙහි යෙදීමට සමර්ථය හ. (සුවණි විශුද්ධිය මෙනැසි දතයුතු.)

24. කායපාගුඤ්ඤතා 25. චිත්තපාගුඤ්ඤතා, පෙරකී කායයා ගේ **පුහුණු** (තො ගිලන්) බව **කායපාගුඤ්ඤතා ය.** චිත්ත-යා ගේ **පුහුණු** (තො ගිලන්) බව **චිත්තපාගුඤ්ඤතා සි.** ඔහු කාය-චිත්තයන්ගේ තොගිලන් බව **ලක්ෂණයහ.** කාය-චිත්තයන් ගේ ගිලන් බව් මැඩීම් **කෘත්‍යය හ.** නීවරද බව් නුවණට **වැටහීම්-ආකාරයහ.** කාය-චිත්ත දෙදෙන **ආසන්න කාරණයහ.** (කාය චිත්තයන් ගිලන් බවට පමුණුවන අසද්ධ්‍යාදියට ප්‍රතිපක්ෂය හ)

26. කායුජ්ජුකතා 27. චිත්තුජ්ජුකතා, පෙරැකී කාය-යා ගේ ඍජු භාවය **කායුජ්ජුකතා ය.** චිත්තයා ගේ ඍජු භාවය **චිත්තුජ්ජුකතා සි.** ඔහු කාය - චිත්තයන් ගේ තො ඇද බව් **ලක්ෂණය හ.** කාය-චිත්තයන් ගේ වඤ්ඣභාවය මැඩීම **කෘත්‍යයහ.** කාය-චිත්ත වඤ්ඣ ඍජු කිරීම **වැටහෙන ආකාරය හ.** කාය-චිත්ත දෙදෙන **ආසන්න කාරණයහ.** (කාය - චිත්තයන් ගේ කුටිල භාවය කරන **මායා-සාඨෙය්‍යාදින්ට** ප්‍රතිපක්ෂය හ.)

විශෙෂ:- මේ **කායපස්සද්ධි** ආදියට ප්‍රතිපක්ෂ එක එක ධර්ම්ය වත හෙයින් කෙලෙස් වැඩීමාදි **එක එක කෘත්‍යයක්** ම කරන්නේසි. මෙහි ධර්ම් යුගලයක් මැ වදාළ හෙයින් **චිත්තපස්සද්ධි** ආදීන් චිත්තය සංසිඳීම ය, සැහැල්ලුවීම ය, මොළොක්වීම ය, **කර්මණ්‍යවීම ය,** පුහුණුවීම ය, තො ඇදවීම ය යන සවභාවයන් ගෙන් යුක්ත වේ.

(**කායපස්සද්ධි** ආදීන් **නාම කායයාගේ** පමණක් නොව **රූප-කායයා ගේ ද** සන්සිඳීම් ආදිය වේ. එහෙයින් මැ **භාග්‍යවතුන්** වහන්සේ මේ කාමාවචර චිත්තයෙහි මැ **පස්සද්ධි** ආදියේ දෙප්‍රකාරය වදාළසේක. අන්‍ය සමාධි ආදීන්හි දෙප්‍රකාරය නො වදාළසේක.)

28. ඡන්දය, අරමුණු ගැනීමේ කැමති බවට නමෙකි. එය කත්තුකම්‍යතාවය **ලක්ඛණය** කොට ඇත්තේ යැ. ආලම්බන සෙවීම **කෘත්‍යය යැ.** අරමුණු කැමති බව **වැටහෙන ආකාරය යැ.** ඒ කැමැති වන අරමුණ මැ **ආසන්න කාරණය සි.** (මෙය අරමුණු ගැනීමෙහි අත දිගුකිරීමක් මෙන් දතයුතු.)

29. අධිමොක්ඛය, අරමුණු සනිටුහන් කිරීම **අධිමොක්ඛය සි.** නො හැකිළ එළඹීම **කෘත්‍යය යැ.** නිශ්චය කිරීම නුවණට **වැටහෙන ආකාරය යැ.** නිශ්චය කළ ධර්මය මැ **ආසන්න කාරණයයි.** (ආලම්බනය නිශ්චය වීමෙන් ඉන්ද්‍රිය මෙන් දතයුතු.)

30. මනසිකාර, කිරීම. කාර නම්. අරමුණ සිතෙහි (ඇති) කිරීම **මනසිකාර** නම්. භවාඞ්ග මනසින් විසදෘශ.වීථි – ජවන මනස කෙරේනුයි හෝ **මනසිකාර** නම්.

(**මනසිකාරය,** අරමුණ පිළියෙළ කරන්නා වූ **මනසිකාරය,** වීථි චිත්තය පිළියෙළ කරන **පඤ්චද්වාරාවජ්ජන චිත්තය,** ජවනය පිළියෙළ කරන්නා වූ **මනෝද්වාරාවජ්ජන චිත්තයද සි** මනසිකාර **ත්‍රිවිධ ය.** මේ අරමුණ පිළියෙළ කරන මනසිකාර චෛතසිකය සි.) මෙය සම්ප්‍රයුක්ත ධර්ම අරමුණට අභිමුඛ කිරීම හා, අරමුණ කරා දිවවීම ද **ලක්ඛණය යැ.** සම්ප්‍රයුක්ත (චෛතසික) ධර්මයන් අරමුණෙහි යෙදවීම **කෘත්‍යය යැ.** අරමුණෙහි අභිමුඛවැ ඉපදීම **නුවණට වැටහෙන ආකාරය යැ.** ආරම්මණය **ආසන්න කාරණය සි.**

(සංඝකාර සඤ්ඤයෙහි ඇතුළත් මේ **මනසිකාරය** ආරම්මණ පිළියෙළ කරන හෙයින් සම්ප්‍රයුක්තයන්ට සාරථියකු මෙන් දතයුතු. වීථි පටිපාදකය, යනු **පඤ්චද්වාරාවජ්ජනයට** නමෙකි. ජවන පටිපාදකය යනු **මනෝද්වාරාවජ්ජනයට** නමෙකි. මේ දෙක මෙහි අදහස් නො කෙරේ.)

31. තත්‍රමජ්ඣත්තතා, සම්ප්‍රයුක්ත ධර්මයන්හි මැදහත්ව පවත්නා සභාවය, **තත්‍රමජ්ඣත්තතාව සි.** ඒ ඒ චිත්ත චෛත-සිකයන් මැදහත් වැ බැලීම මෙහි **ලක්ඛණය යැ.** ඔවුන්ගේ අඩු වැඩි බව වැළකීම හෝ, පක්ෂපාත බව වැළකීම **කෘත්‍යය යැ.** මැදහත්බව වැටහෙන **ආකාරය යැ.** සමවැ යන ආජානීය අසුන්-

කෙරෙහි මෑදහත්වන සාරථියකු සේ, චිත්ත – චෛතසිකයන් කෙරෙහි සමවැ පැවැත්ම **ආසන්න කාරණය යි.**

32. කරුණා – 33. මුදිතා, බ්‍රහ්මවිහාර නිර්දේශයෙහි කී සෙයින් දත්තේ යි.[1]

විශේෂ:- එහි කියේ අප්‍රමාණප්‍රාප්ත **රූපාවචරය යැ.** මෙහි ගැනෙනුයේ **කාමාවචරය යි.** මේ මෙහි චෛතස යි.

භේද :- ඇතැම් ආචාර්‍යයී කෙනෙක් **මෛත්‍රී – උපෙක්ෂා** දෙක ද, මේ අනියත චෛතසික විෂයෙහි කැමැති වෙති. ඒ නො ගතයුතු. අදොෂය මැ මෛත්‍රිය වන බැවින් හා, තත්‍රමධ්‍යත්තතාවය උපෙක්ෂා ද වන හෙයිනි.

34. කාය දුශ්චරිත විරති, ප්‍රාණඝාතාදි කාය දුශ්චරිතයෙන් වැළැක්ම **කාය විරති** නම.

35. වාක් දුශ්චරිතයෙන් විරතිය **වාක් විරති** නම.

36. මිථ්‍යා ආජීවයෙන් වැළැක්ම **මනොදුශ්චරිත විරති** නම්.

මේ තුන මැ කාය දුශ්චරිතාදීන් ව්‍යතික්‍රමණය නො කිරීම් **ලක්ෂණය යැ.** (කාය දුශ්චරිතාදීන් නො මඩනා ලක්ෂණය යි කියේ වේ.) කාය දුශ්චරිතාදි වස්තුවෙන් නො හැකිළීම **කෘත්‍යය යැ.** කාය දුශ්චරිතාදිය නො කිරීම **වැටහෙන ආකාර යැ. සද්ධා,-හිරි,-ඔත්තප්ප,- අප්පිච්ඡතාදි** ගුණ **ආසන්න කාරණය යි.** (පාප කර්‍මයන්ගෙන් භීත වීමුඛ බව් කිරීමය යි දතයුතු.)

මෙසේ මේ **සතිස්** (36) සංස්කාර **ප්‍රථම කාමාවචර කුශල චිත්තය** හා සම්ප්‍රයෝගයට යෙති'යි දතයුතු.

දෙවෙනි සිත සමග ද එසේමැ යෙදෙති. හුදෙක් එහි සඞ්ඛාර බව චෛතසි.

තුන්වන සිතෙහි, අමෝහය හැර සෙස්සෝ (35) යෙදෙති.

සතරවැන්නෙහි ද සඞ්ඛාර බව චෛතසි.

පස්වැන්නෙහි ප්‍රථමයෙහි කී **ප්‍රීතිය** හැර සෙස්සෝ (35) යෙදෙති.

සවැන්නෙහි ද සඞ්ඛාරය චෛතසි.

සත්වැන්නෙහි අමෝහ පිති හැර, සෙස්සෝ (34) යෙදෙති.

අටවැන්නෙහි චෛතස සඞ්ඛාරය පමණෙකි.

විරති තුන හැර පළමු සිතෙහි **කී සියල්ල** (35) **ප්‍රථම රූපාවචර** සිතේ යෙදේ.

දෙවැන්නෙහි ඉන් **විතර්කය** හැර සෙස්සෝ (34) ද

---

[1]සිං: පි: 454 – 456 පිටු.

තුන්වැන්නෙහි විචාරය හැර සෙස්සෝ (33) ද,
සිවුවැන්නෙහි (ඉනුදු) ප්‍රීතිය හැර සෙස්සෝ (32) ද,
පස්වැන්නෙහි (ඉනුදු) **කරුණා-මුදිතා** දෙක හැර සෙස්සෝ (30) ද යෙදෙති.

ආරුප්‍ය සතරෙහි එයට වෙනස්වනු යේ හුදෙක් **ආරුප්‍ය භාවය** පමණි.

ලෝකෝත්තර **ප්‍රථමධ්‍යානික මාර්ග චිත්තයෙහි,** පඨමජ්ඣානික රූපාවචර සිත්හි කීහේ මැයි.

විතීයධ්‍යානික **මාර්ග චිත්තයෙහි** ද දුතියජ්ඣානිකාදියෙහි කීසේ ම දතයුතු.

විශෙෂ:- **කරුණා** - **මුදිතා** නො යෙදීම හා, විරතීන් නියත යෙන් මැ යෙදීම ලෝකොත්තරයෙහි වෙනසි. මෙසේ **කුසල් විෂයෙහි සඞ්ඛාර** දතයුතු.

අකුසල් සිත් අතුරින් ලෝභ මූලික **පළමුවැනි අකුසල් සිතෙහි** නියතයෙන් ආ **තෙළෙසය,** යෙවාපනක වශයෙන් ආ **සතර** දැයි **සතළොස් ධර්ම** කෙනෙක් සම්ප්‍රයෝග වෙති. ඒ වනාහි **ඵස්ස, වෙතනා, චිත්තක්ක, විචාර, පීති, විරිය, ජීවිතින්ද්‍රිය, සමාධි, අහිරික, අනොත්තප්ප, ලොභ, මොහ, මිච්ඡාදිට්ඨි** යන නම් වශයෙන් නී තෙළෙසය. **ඡන්දය, අධිමොක්ඛය, උද්ධච්චය, මනසිකාරය** යන **යෙවාපනක** සතර දැයි යන මොහුයි.

ඔවුනතුරින් (පෙර නො කීවෝ විසතර වෙති)

37. අහිරිකය, කාය දුශ්චරිතාදීන් කෙරෙහි පිළිකුල් නො වීම හෝ, ලජ්ජා නො වීම **අහිරිකය යැ.** අහිරික ඔව හෝ අහිරිකය ය.

38. කාය දුශ්චරිතාදීන් භය නො වන්නා වූ සවභාවය **අනොත්තප්පය යැ.** ඉන් කායදුශ්චරිතාදීන් කෙරෙහි පිළිකුල් නො වීම හෝ, ලජ්ජා නො වීම අහිරික **ලක්ෂණය යැ.** ඔවුන්ගෙන්ම භය නො වීම හෝ, තැති නො ගැනීම අනොත්තප්ප **ලක්ෂණය සි.** මේ මෙහී සංක්ෂෙපය සි.

විසතරය හිරොත්තප්පයනට කී ක්‍රමයට ප්‍රතිපක්ෂ වශයෙන් දතයුතුයි.

39. ලෝභය, මේ කරණකොට ගෙන සම්ප්‍රයුක්ත ධර්ම ආලම්බනයෙහි ඇලේ නුයි හෝ, තෙමේත් ඇලේ නුයි හෝ ඇලීම් මාත්‍රය නුයි හෝ **ලෝභ** නම් වේ.

40. මෝහය, මේ කරණකොට සම්ප්‍රයුක්ත ධර්ම ආලම්බනයෙහි මුළාවේ නුයි හෝ, තෙමේත් මුළාවේ නුයි හෝ, මුළාවීම් මාත්‍රය නුයි හෝ **මෝහ** නම් වේ.

ඔවුනතුරින් වඳුරු **ලහටුවක්** සේ අරමුණ දැඩිව ගැනීම් **ලෝභයේ ලක්ෂණය යැ.** රත්වූ කබලෙහි මස් පිඩක් සේ අරමුණෙහි ඇලීම **කෘත්‍යය යැ.** තෙල් අඳුන්දැලි සේ අත නො හැරීම **වැටහෙන ආකාරය යැ.** 'කාමවේදනාදි සංයෝජන ධර්මයන්හි ආස්වාදයක් ඇතැයි' දැකීම **ආසන්න කාරණය යි.** (සවභාවයෙන් වැඩෙන සැඩ පහර ඇති ගඟක් මහාසමුද්‍රය කරා ගලා බසින්නා සේ, තෘෂ්ණාව තත් සම්ප්‍රයුක්ත පුද්ගලයා අපායට ම පමුණුවයි.)

චිත්තයා ගේ අඞ්ඛ බව හෝ, නො දැනීම හෝ, **මෝහයේ ලක්ෂණය යැ.** යථාර්ථ ප්‍රතිවේධ නො කිරීම හෝ, ආලම්බන සවභාවය වැසීම හෝ, **කෘත්‍යය යැ.** අයහපත් ප්‍රතිපත්ති හෝ, අඞ්කාර කිරීම හෝ, **වැටහෙන ආකාරය යැ.** අයෝනිසෝ-මනසිකාරය **ආසන්න කාරණය යි.** (මේ සියලු අකුශලයනට මූල කාරණය යි දතයුතු.)

41 මිච්ඡාදිට්ඨිය, මේ කරණ කොට **අනිත්‍යාදි** ධර්ම සවභාව-යට ප්‍රතිපක්ෂ සේ, **නිත්‍යාදි** වශයෙන් දකී නුයි' හෝ, 'නෙමේම වරදවා දකී නුයි' හෝ, වරදවා දැකීම් මාත්‍රය හෝ **මිච්ඡාදිට්ඨි** නම. එහි නුනුවණින් දැනිකොට ගැනීම **ලක්ෂණය යැ.** දැනිකොට අල්වා ගැනීම **කෘත්‍යය යැ.** අයථා ක්‍රමයෙන් මෙනෙහි කිරීම **වැටහෙන ආකාරය යැ.** බුධාදි **ආර්‍යයන්** නො දක්නා කැමැත්ත **ආසන්න කාරණය යි.** (මේ සියලු වරද අතුරින් මහාසාවද්‍යය යි දතයුතු.)

42. උඩවවය, නොසන්සුන් බව **උඩවවයයි.** එය වාතයෙන් **පහළ** ජලයක් සේ, නො සන්සුන් බව **ලක්ෂණය යැ.** වාතයෙන් පහළ ධජයක් සේ, චඤ්චල සවභාවය **කෘත්‍යය යැ.** ගලකින් පහරන ලදුවැ උඩ නැගි අළු ගොඩක් සේ තැති ගැනීම **වැටහෙන ආකාරය යැ.** (චිත්තයා ගේ නො සන්සුන් බැවිනි.) **අයෝනිසෝ-මනසිකාරය ආසන්න කාරණයයි.**

සෙස්ස කුශලයෙහි කී නයින් දතයුතු. මෙහි වෙනස **අකුශල බවයි. එහෙයින්** ම **ලාමක** බව වේ. මෙසේ **මේ සතළොස්** (17) සංස්කාරයෝ **ප්‍රථම අකුසල සිත හා** සම්ප්‍රයෝගයට යෙදියි දතයුතු.

යම්සේ පළමුවන අකුසල සිත හා යෙදේ ද, එසේම දෙවෙනි සිතෙහි ද යෙදේ. වෙනස සසඞ්ඛාර භාවය (**පෙන – මිඩයන් ගේ**) අනියත බවයි. එකුන්විස්සෙක් (19) **සම්ප්‍රයොග** වේ.

43. හැසුණු බව ජීනයයි.

44. කලකිරුණු බව **මිදුණය** යි. චිත්තයා ගේ අනුත්සාහිත බව හා, පසුබට බව **ශීනය** යි. වේදනාදි කාමස්කන්ධයන් ගේ අරමුණු ගැනීමෙහි අදක්ෂ බව හා, **අකම්මණ්‍ය** බව **මිදුණය** යි කී සේයි.

ඉන්, **ශීනය** චිත්තයා ගේ **අනුත්සාහය ලක්ඛණය** යැ. වීර්‍යය බැහැර කිරීම එහි **කෘත්‍යය** යැ. සම්ප්‍රයුක්ත ධර්මයන් පසුබට කිරීම හෝ **කෘත්‍යය** යැ. සම්ප්‍රයුක්ත ධර්මයන් හා ගැලෙන බව **වැටහෙන ආකාරය** යි.

මිදුණය වේදනාදි ස්කන්ධත්‍රයයා ගේ කටයුත්තෙහි අසමර්ථ බව **ලක්ඛණය** යැ. මුවහ කිරීම එහි **කෘත්‍යය** යැ. හැකිලීම හෝ, නිදුවැටීම හෝ වැටහෙන **ආකාරය** යැ. දෙකම අධිකුශලයන්හි තෝ ඇලීම ය, ඇඟමැලි ඇරීමය යනාදීන්හි අයෝනිසෝමනසිකාරය **ආසන්න කාරණය** යි.

තුන්වන සිතෙහි පළමු සිතෙහි කිවවුන් අතුරින් **මිථ්‍යාදෘෂ්ටිය** හැර සෙසු චෛතසිකයෝ යෙදෙති.

මෙහි **මානය** අනියතයෙන් වේ. (**මේයැ** වෙතස.) ඒ සමග සතලොසෙක් (17) වේ.

45. මානය උඩහු බව **ලක්ඛණ** කොට ඇත්තේ යැ. අනුග්‍රහය **කෘත්‍යය** කොට ඇත්තේ යැ. කොඳියක් සේ උසස් තන්හි තබා පෙන්වීම **වැටහෙන ආකාරය** යැ. මිථ්‍යාදෘෂ්ටියෙන් තොර ලෝභය, **ආසන්න කාරණය** යැ. (උපමාදයකට බඳු උපමා ඇත්තේ සි.)

සතරවැන්නෙහි මිථ්‍යාදෘෂ්ටිය හැර, **දෙවෙනි සිතේ කී** එකුන්විස්ස (19) දතයුතු. මෙහි ද **මානය** අනියතයෙන් වේ.

පස්වැන්නෙහි පළමුවැන්නෙහි කී චෛතසික්යන් අතුරින් **ප්‍රීතිය** හැර සෙසු සොළස (16) යෙදේ.

සවැන්නෙහි පස්වැන්නෙහි මෙන් වේ. සසඛ්කාර බැවින් **ශීන-මිඛයන්** ගේ අනියත බව වෙතසි. අටලොසෙක් (18) යෙදේ.

සත්වැන්නෙහි දිට්ඨිය හැර, පස්වැන්නෙහි කිවෝ යෙදෙති. මෙහි ද **මානය** අනියමයෙන් වේ. සොළසෙකි. (16)

අටවැන්නෙහි සවැන්නෙහි කිවවුන් ගෙන් **දිට්ඨිය** හැර සෙසු අටලොස (18) වෙයි. මෙහි ද **මානය** අනියමයෙන් වේය යි දතයුතු.

දෙස මූලික දෙසිතෙහි පෙර කී නියතයෙන් (සවරූපයෙන්) වූ **එකොලොස** හා, යෙවාපනක **සතර ද,** අනියත තුනද යි අටලොස (18) වෙයි. (**එසස-වෙතනා-චිත්තක්ක-විචාර-විරිය-ජීවිතින්ද්‍රිය-සමාධි-අභිරික්ඛ-අනොත්තප්ප-දෙස-මොහ** යනු සවරූපයෙන් කී **එකොලොසය.**)

(**ඡන්ද – අධිමොක්ඛ – උධච්ච – මනසිකාර** මේ යෙදුම්පහක සතර ය. **ඉස්සා – මච්ඡෙර – කුක්කුච්ච** යනු අනියත තුන යි.)

45. දෝස, ඒ කරුණෙන්ම ගෙන තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ දූෂණය වෙත් නුයි හෝ, තෙමේ දූෂණ වේ නුයි හෝ, දූෂණයම්ම මාත්‍රය නුයි හෝ **මෙෂ නම්.** එය දණ්ඩෙන් පහර ආශීවිෂයකු මෙන් කිපීම **ලක්ෂණය යැ.** සතු විෂය නසින්නාක් මෙන් විපරීත වැ පැතිරීම හෝ, ලැව් ගින්නක් මෙන් තමා ගේ නිශ්‍රය වූ හෘදය වස්තුව දැවීම **කෘත්‍යය යැ.** ලබන ලද අවකාශ ඇති සතුරකු මෙන් තමා හා අනුන් නැසීම **වැටහෙන ආකාරය යැ.** විෂ මිශ්‍ර පූතිමූත්‍රයක් සේ නවවිධ ආඝාත වස්තු **ආසන්න කාරණය යි.**

46. ඉස්සා, නො ඉවසීම **ඊර්ෂ්‍යාව යි.** ඕ පරසම්පත් නො ඉවසීම **ලක්ෂණය** කොට ඇත්තී ය. එහි මැ නො ඇල්ම **කෘත්‍යය යැ.** ඉන් මුහුණ හැකිළවීම **වැටහෙන ආකාරය යැ.** මෙරමා සම්පත්තිය **ආසන්න කාරණය යි.**

(**මේ සංයෝජනයැ** යි දතයුතු.)

47. මච්ඡරිය, මසුරු බව **මච්ඡරිය යැ.** එය ලැබූ හෝ, ලැබිය යුතු තම සම්පත් සැඟවීම **ලක්ෂණය යැ.** ඒ සම්පත්තීන්ගේ ම මෙරමා හා සාධාරණ බව නො ඉවසීම **එහි කෘත්‍යය යැ. හැකිලෙන බව වැටහෙන ආකාරය යැ,** නොහොත් **කටුකාකාර** පැවැත්ම **වැටහෙන ආකාරය යැ.** තමා ගේ සම්පත්තිය **ආසන්න කාරණය යි.** (චිත්තයා ගේ විපරීත සභාවය යි දතයුතු.)

48. කුක්කුච්ච, පිළිකුල් කටයුතු ක්‍රියාව **කුක්කත යැ.** කුකෘතයා ගේ සභාවය **කුක්කුච්ච යැ.** එහි පසුතැවිලිවීම **ලක්ෂණය යැ.** කළ දුශ්චරිතය හා නො කළ සුචරිතය අනුවැ සෝක කිරීම **කෘත්‍යය යැ.** විප්‍රතිසාර වීම **වැටහෙන ආකාරය යැ.** කරනලද දුශ්චරිත හා, නො කරන ලද සුචරිතය **ආසන්න කාරණය යි.** (දැසබව මෙනැයි දතයුතු.) සෙස්සෝ යට කී ආකාර ඇත්තෝ යි.

මෙසේ මේ **අටළොස්** (18) **සංස්කාරයෝ,** ප්‍රථම ද්වේෂ මූලික චිත්තය හා සම්ප්‍රයෝගයට යෙතියි දතයුතු.

ප්‍රථමමෙෂමූලික චිත්තය හා යෙදුණු සේ, **දෙවන චිත්තය** සමග ද චෛතසිකයෝ යෙදෙති. සසඞ්කාර භාවයෙන් අනියතයන් අතුරින් **ථීන-මිධයන් ගේ** වීම වෙනසි. විස්සෙකි. (20)

මෝහ මූලික දෙක අතුරින්, **විචිකිච්ඡා සම්ප්‍රයුක්ත** චිත්තය හා, **ඵස්ස- චේතනා- චිත්තක්ක- විචාර- විරිය- ජීවිත- චිත්තඨිතිසි-**

අහිරිකා – අනොත්තප්පා – මොහ – විචිකිච්ඡා යන සවරූපයෙන් වූ **එකොලොසඳ, උඛවව– මනසිකාර** යන යෙවාපනක දෙක දැයි තෙළෙස (13) වෙයි. (මෙහි අධිමොක්ඛ නො යෙදේ.)

විශෙෂ:– මෙහි **චිත්තඨයිනි** නම් චිත්තයා ගේ ප්‍රවෘත්ති සථිති මාත්‍රය යි. **දුඵ්ලසමාධිය යි. අධිමොක්ඛය** නැති හෙයින මෙසේ වී.

49. විචිකිච්ඡා, පිළිගැමීත් (නුවණීත්) පහ වූ හෙයින් **විචිකිච්ඡා** නම්. එය සැක කිරීම **ලක්ඛණය යැ.** කම්පාවීම එහි **කෘත්‍යය යැ.** නිශ්චය නොවීම **වැටහෙන ආකාරය යැ.** ඒකාන්ත වශයෙන් නො ගැනීම හෝ **වැටහෙන ආකාරය යැ.** අයොනිසො මනසිකාරය **ආසන්න කාරණය යි.** ප්‍රතිපත්තීන්ට අනන්තරායකර ධර්මයෙකැයි දතයුතු. **විචිකිච්ඡාව** හැර සෙසු චෛතසික කී ආකාර මැයි.

විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතෙහි කී චෛතසිකයන් අතුරින් **විචිකිච්ඡාව** හැර සෙසු **දෙළස** (12) **උඛවව සම්ප්‍රයුක්ත** සිතෙහි වෙයි. **විචිකිච්ඡාව** නැති හෙයින් මෙහි අධිමොක්ඛය උපදී. ඒ සමග **තෙළෙසෙක්** (13) වෙයි. **අධිමොක්ඛය** යෙදෙන හෙයින් බලවත් **සමාධිය** වේ. මෙහි **උඛවවය ද** සවරූපයෙන් ම යෙදේ. **අධිමොක්ඛ – මනසිකාර** දෙක යෙවාපනක වශයෙන් වේ.

අකුශල සංඝකාර මෙසේයි.

අව්‍යාකෘත

අව්‍යාකෘත අතුරින් **විපාක අව්‍යාකෘත** පළමුවැ වේ. **අහේතුක– සහේතුක** – භේදයෙන් ඒ දෙ පරිදි වේ. ඔවුනතුරින් **අහේතුක විපාකවිඤ්ඤාණ** සම්ප්‍රයුක්ත වූයේ **අහේතුක සංඝකාර යැ.** ඔවුනතුරිනිදු **කුසල – අකුශල – විපාක චක්ඛු විඤ්ඤාණය** හා සම්ප්‍රයුක්ත වූවෝ පළමුවැ කියනු ලැබෙති.

එහි ඵස්ස–චෙතනා–ජීවිත–චිත්තඨයිති යැ යි සවරූපයෙන් **ආ සතර යැ** යෙවාපනක වශයෙන් **ආ මනසිකාර** යැයි මෙසේ පසෙ (5) කි. **සොත – ඝාන – ජිවහා – කාය** – විඤ්ඤාණයන් හා සම්ප්‍රයුක්ත වූවෝ ද මොහුමැයි. **විපාක** මනොධාතු (සම්පටිච්ඡන) සිත් **දෙකෙහිද** මොවුන් හා, **විතක්ක–විචාර–අධිමොක්ඛ තුනදැයි අටෙක්** (8) වෙයි. ත්‍රිවිධ අහේතුක **මනොවිඤ්ඤාණ ධාතු–**

(සන්තීරණ) න් හිද එසේ මැයි. ඉන් **සොමනස්ස සහගත මනොවිඤ්ඤාණ ධාතුවෙහි** ඔවුන් හා, ප්‍රීතිය අධිකයැ යි දතයුතු.

සහේතුක විපාක විඤ්ඤාණ හා සම්ප්‍රයුක්ත වූවෝ **සහේතුක** යෝයි. ඔවුනතුරින් **සහේතුක විපාක විඤ්ඤාණ** අට හා සම්ප්‍රයුක්ත වූවෝ වනාහි **කාමාවචර කුසල්** අට හා **සම්ප්‍රයුක්ත** වූ **සංස්කාරයන්** හා සමාන මැයි.

වෙනස:- අනියතයන් අතුරින් **කරුණා - මුදිතා** දෙක සත්ත්වාලම්බන හෙයින් විපාකයන් හා **නො** යෙදේ.

කාමාවචර විපාකයෝ වනාහි හුදෙක් පරිත්තාලම්බනයෝයි. **කරුණා-මුදිතා** පමණක් නොව, **විරතිහුද විපාකයන්හි** නැති. (පඤ්ච ශික්ෂාපද කුසල් ම යැයි වදාළේ එහෙයිනි.)

රූපාවචර-අරූපාවචර-ලෝකෝත්තර-විපාක විඤ්ඤාණ සම්ප්‍රයුක්ත වූවෝ, ඔවුන් ගේ **කුසලවිඤ්ඤාණසම්ප්‍රයුක්ත සංස්කාර** හා සමානයෝ මැයි.

ක්‍රියා අව්‍යාකෘතද, අහේතුක-සහේතුක භේදයෙන් **ත්‍රිවිධ** යැ. ඉන් **අහේතුක ක්‍රියා විඤ්ඤාණ** සම්ප්‍රයුක්ත වූවෝ **අහේතුක-යෝයි.** ඔහුද, **කුසල විපාක මනොධාතු,** (සම්පටිච්ඡන) **අහේතුක මනොවිඤ්ඤාණ ධාතු** (සන්තීරණ) **චය** හා යුක්තවූවන් හා සමාන යැ. **ක්‍රියා මනොවිඤ්ඤාණ ධාතු** (මනොද්වාරාවජ්ජන-හසිතුප්පාද) දෙකෙහි **වීර්‍යය** අධික යැ. වීර්‍යය යුක්ත හෙයින් බලවත් බවට පැමිණියේ **සමාධිය** වේ. මේයැ මෙහි වෙනස.

සහේතුක ක්‍රියා විඤ්ඤාණ සම්ප්‍රයුක්ත වූ **සංස්කාරයෝ** සහේතුකයෝ යි. ඔවුනතුරින් අට **වැදූරුම් ක්‍රියා විඤ්ඤාණ සම්ප්‍රයුක්ත** වූවෝ, විරති තුන හැර අට **කාමාවචර** කුශල සම්ප්‍රයුක්ත වූ කුශල සංඝස්කාරයන් හා සමානයෝයි.

රූපාවචර - අරූපාවචර - ක්‍රියා සම්ප්‍රයුක්ත වූවෝ වනාහි, සවිප්‍රකාරයෙන් ඔවුන්ගේ කුශල විඥාන සම්ප්‍රයුක්ත වූවන් හා සමානය හ,යි මෙසේ **අව්‍යාකෘත සංස්කාරය** ද දතයුතු.

මේ සංස්කාරස්කන්ධයෙහි විස්තර කථාවයි.

මේ අභිධර්මභාජනියෙහි ආසේය.

භාග්‍යවතුන් වහන්සේ, "යංකිඤ්චිරූපං අතීතානාගත-පච්චුප්පන්නං අජ්ඣත්තංවා, බහිද්ධාවා, ඔළාරිකංවා, සුඛුමංවා, හීනංවා, පණීතංවා, යංදූරෙ, සන්තිකෙවා, තදෙකජ්ඣං

අභිසඞ්ඛතාභිසඞ්ඛරිතා අභිසඤ්චේතයිතා අයංවුච්චති රූපක්ඛන්ධෝ.[1] **යා කාචි වේදනා**[2] **යා කාචි සඤ්ඤා**[3] **යේ කේචි විඤ්ඤාණා. අතීතානාගත පච්චුප්පන්නා - පෙ - අභිසඞ්ඛතාභිසඤ්චේතයිතා අයංවුච්චති විඤ්ඤාණක්ඛන්ධෝ'**[4] **සි**

"අනාදිමත් අතීත භවයෙහි පැවැත්තාවූ ද, අනාගතයෙහි ඇතිවන්නාවූ ද, දැන් පවත්නා ආත්ම භාවයෙහිවූ ද, හේතු අභ්‍යන්තරයෙහි වූ ද, ඉන් පිටත් පරසන්තානයෙහි පවත්නාවූ ද, ඕලාරිකවූ ද, සූක්ෂ්මවූ ද, ලාමකවූ ද, ප්‍රණීතවූ ද, දුර පිහිටියාවූ ද, ළඟ පිහිටියාවූ ද, යම් රූපයෙක් වේ නම් ඒ සියලු ම රූපය එක්රැස් කොට (එක් සංක්ෂේපයක් කොට) **මේ රූපසඤ්ඤය** යි කියනු ලැබේ. මේ ක්‍රමයෙන් 'අතීතාදි යම්කිසි වේදනාවෙක් වේ ද, යම්කිසි සංඥාවෙක් - යම්කිසි සංස්කාරයෙක්- යම්කිසි විඥානයෙක් වේ ද, අතීතවූ ද, අනාගතවූ ද, ප්‍රත්‍යුත්පන්නා- වූ ද, ඒ සියල්ල එක්කොට -පෙ- විඥානස්කන්ධය යි කියනු ලැබේ' යයි" මෙසේ විස්තර කළ සේක.

ඒ විභඞ්ග පාඨයෙහි,

'යංකිඤ්චි' යනු නිරවශේෂ වශයෙන් ගැනීම සඳහා යි. **රූපං** යනු රූපය හැර අන්‍ය අර්ථයක පැමිණීම වැළැක්වීම සඳහායි.

මේ පද දෙකින් **අටවිසි** (28) රූපයාගේ ම අවිශේෂයෙන් ගැන්ම වේ. නැවත ඒ රූපයා ගේ විභාගය ආරම්භ කෙරෙති.

එහි ඇතැම් රූප කෙනෙක් **අතීතයහ.** ඇතැම් රූප කෙනෙක් **අනාගතාදී** භේදයහයි කියායි. වේදනාදියෙහි ද මේ ක්‍රමය මැයි.

එහි **රූපය අඛ්ව අතීතය, ඝනනති අතීතය, සමය අතීතය, ක්ෂණ අතීතය** යි මොවුන් ගේ වශයෙන් **සිව්වැදෑරුම්** වේ.

අනාගත - පච්චුප්පන්න රූප ද එසේම **සතර-සතර** ආකාරයි.

එහි **අඛ්ව වශයෙන් නම්** එක් සත්ත්වයකු ගේ එක් භවයෙක්හි ප්‍රතිසන්ධියෙන් පූර්වභාගයෙහි අතීතයි. චුතියෙන් මත්තෙහි **අනාගතයි.** ඒ දෙක අතර **පච්චුප්පන්නයි.**

ඝනනති වශයෙන් (පූර්ව - පශ්චිම පරම්පරා වශයෙන් ශීත වශයෙන් හෝ, උෂ්ණ වශයෙන් සභාග වූයේ සභාග ඍතුවයි.) ඒ සභාග (එක මෑ) **ඍතුවෙක්හි** හටගත් රූපය ද, එකම **ආහාර-** යෙන් සමුට්ඨාන රූපය ද. පූර්වාපරිය වශයෙන් පවත්නේ ද, **පච්චුප්පන්නයි.** ඉන් පෙර විසභාග ඍතු ආහාර සමුට්ඨාන වූයේ **අනාගතයි.** ඉන්පසුව වූයේ **අනාගතයි.**

චිත්තජය ද, එකම චිත්තයෙහි හෝ, **එකම** ජවනයෙහි හෝ, **එකම** සමාපත්තියෙහි හෝ හටගත්තේ **පච්චුප්පන්නයි.** ඉන් පෙර හටගත්තේ **අනාගතයි.** ඉන්පසුව හටගත්තේ **අනාගතයි.**

---

[1] වි: ප: ඛන්ධවිභඞ්ග 1 පිට
[2] ,, ,, ,, 2 පිට
[3] ,, ,, ,, 4 පිට
[4] ,, ,, ,, 9 පිට

කම්මසමුට්ඨාන රූපයා ගේ වෙනම පරම්පරා වශයෙන් අතීතාදි භේදයෙක් නැත්තේ ය.

ඒ ඍතු - ආහාර - සමුට්ඨානයන්ගේ ද, චිත්ත සමුට්ඨාන රූපයන්ගේ ද, උපසර්ගඹක වශයෙන් **කම්මසමුට්ඨාන** රූපයා ගේ **අතීතාදි** භාවය දතයුතු යැ.

සමය වශයෙන් වනාහි එකම **මොහොතය, පුච්ඡාත්තය, අපරාත්තය, රාත්‍රියය, දවාලය,** යනාදි **කාලයන්හි** පරම්පරා වශයෙන් පවත්නා ඒ ඒ සමයය **පච්චුප්පන්න** නම් වේ.

ඉන් පෙර **අතීතයැ** පසුව **අනාගතයි.**

ක්ෂණ වශයෙන් උත්පාදාදි **ක්ෂණ** ත්‍රයයට ඇතුළත් වූයේ **ඛණපච්චුප්පන්න** නම. ඉන් පෙර **අතීතයැ.** පසුවැ **අනාගතයි.**

තවද අතික්‍රාන්ත **හේතු කෘත්‍යය හා ප්‍රත්‍යය කෘත්‍යය** ඇත්තේ **අතීත යැ.** නිම වූ **හේතු කෘත්‍යය හා, නො නිමී ප්‍රත්‍යය කෘත්‍යය** ඇත්තේ **පච්චුප්පන්න යැ. හේතු-ප්‍රත්‍යය** කෘත්‍යය දෙක ම නො පැමිණියේ **අනාගත යි.** නොහොත් සවකීය කෘත්‍යක්ෂණයෙහි වූයේ **පච්චුප්පන්න යැ.** ඉන් පුළුයෙහි **අතීත යැ.** පසුවැ වූයේ **අනාගත යි.** මේ අතීතත්‍රිකයෙහි **ක්ෂණකථාව නිප්පර්‍යාය යැ** (ප්‍රධාන යැ.) මොවුන් කෙරෙන් අන්‍ය වූ **අද්ධා-සන්තති** ආදි කථාව **පර්‍යාය යැ.** (අප්‍රධාන යැ.)

අධ්‍යාත්ම - බාහිර භේදය යට කී ක්‍රමය මැයි. මෙහි වූකලී **සවඝනනානය ම අධ්‍යාත්ම ය, පරඝනනානය බහිර්ධා ය යි** දතයුතු.

ඕළාරික-සූක්ෂ්ම භේදය කී ක්‍රමය මැයි.

හීන-ප්‍රණීත භේදය, පර්‍යාය නිෂ්පර්‍යාය වශයෙන් **විවිධ යැ.** එහි **අකනිට්ඨකයන් ගේ** රූපයට වඩා **සුදස්සීන් ගේ** රූපය, හීනය. ඒ **සුදස්සයන් ගේ** රූපයට වඩා **ප්‍රණීත යැ.** මෙසේ යම්තාක් නිරිසතුන් ගේ රූපය තෙක් පර්‍යාය වශයෙන් **හීන-ප්‍රණීත** බව දතයුතු.

නිෂ්පර්‍යාය වශයෙන් වනාහි **යම් තැනෙක අකුශල විපාකය** උපදී නම් **එය හීන යැ.** යම් තැනෙක **කුශල විපාකය** උපදී නම් **එය ප්‍රණීත යි. දූරෙ-සන්තිකෙ,** යනු ද කී පරිදිම ය.

එතෙකුදු වුවත් අවකාශ වශයෙන් ඒ ඒ **කාරණයෙන්** ගෙන මෙහි **දූර-සන්තික** භාවය දත යුතු ය. ශ්‍රවණූපචාරය වූ දෙළොස් (12) රියනක් ඇතුළත වූවහු ගේ රූපය **සන්තිකෙ රූපය** ඉන් බැහැර වූයේ **දූරෙ රූපය** යනාදි විසිනි.

තදෙකජ්ඣං අභිසඤ්ඤූහිත්වා අභිසඤ්ඣිපිත්වා = ඒ අතීතාදි භේදයෙන් වෙන වෙන ම දැක් වූ රූපය, රූපපන ලක්ඛණ සඞ්ඛ්‍යාත ඒකවිධ භාවයෙන් ප්‍රඥවෙන් **රාස්කොට, සංඝෂ්පණකොට ද** රූපසඤ්ඤිය යි කියනු ලැබේ, යනු අර්ථ යි. මින් සියලු රූපය රූපපන ලක්ෂණයෙහි පිඬුවීමට පැමිණීමෙන් **රූපසඤ්ඤිය යි** දක්වන ලදි. 'රූපයෙන් බැහැර රූපස්කන්ධයක් නැතැ යි' මින් දැක්වූයේ වෙයි. රූපය මෙන් වේදනාදිය ද, වේදයිත ලක්ෂණාදීන්හි රාසිභාවයට යෑමෙන් **වෙදනාසඤ්ඤාදීහු** වෙති. වේදනාදියෙන් බැහැර, වේදනාස්කන්ධාදියෙක් කැලම නැති.

අතීතාදි විභාගයෙහි ලා (මෙහි ද,) **සමඤ්ඤති - ඛණාදීන් ගේ** වශයෙන් **වේදනාවගේ ද, අතීතානාගතපච්චුප්පන්න** භාවය දතයුතු යි.

එහි **සමඤ්ඤති** වශයෙන් එක මැ **විථියෙහි ද, එකම ජවන-යෙහි ද, එකමැ සමාපත්තියෙහි ද,** ඇතුළත් වූයේ ද, **එකම විෂයයෙහි** යෙදීමෙන් පැවැත්තේ **පච්චුප්පන්න යැ.** ඉන් පෙර වූයේ **අතීත ය.** පසුවැ වූයේ **අනාගත යි.**

අධ්‍යාත්ම - බාහිරභේදය නියකජ්ඣත්ත වශයෙන් දතයුතු ය.

ඔළාරික-සුඛුම භේදය:- 'අකුශල වේදනාව **ඕදාරික යැ.** කුශල-අව්‍යාකෘත වේදනාව **සුඛුම යැ.**'[1] යනාදි ක්‍රමයෙන් **විභඞ්ග-යෙහි** කියේ, **ජාති-සභාව-පුද්ගල-ලෞකික-ලෝකෝත්තර** වශයෙන් දතයුතු ය.

ජාති වශයෙන්:- **අකුශල වේදනාව** ප්‍රාණඝාතාදි සාවද්‍ය ක්‍රියාවනට හේතුවන බැවින් හා, කෙලෙශ වශයෙන් ද වත හෙයින් නො සන්සුන් පැවතුම් ඇත් හුසි **කුශල වේදනාවට** වඩා **ඕදාරික යැ.** කායකර්මාදි ව්‍යාපාර සහිත බැවින් ද, උත්සාහ සහිත බැවින් ද, විපාක සහිත බැවින් ද, කෙලෙශ සන්ත්‍රාස ඇති බැවින් ද, වරද සහිත බැවින් ද, **විපාක අව්‍යාකෘතයනට** වඩා **අකුශල වේදනාව ඕදාරික යැ.** විපාක සහිත බැවින් ද, කෙලෙශසන්තාප-යෙන් තැවෙන හෙයින් ද, දුක් සහිත බැවින් ද, සාවද්‍ය බැවින් ද, **ක්‍රියා අව්‍යාකෘතයනට වඩා ඕදාරික යි.**

කුශල වේදනා හා අව්‍යාකෘත වේදනාවෝ, කියන ලද ක්‍රමයට විපරීත වශයෙන් අකුශල වේදනාවට වඩා **සියුම් වෙති. කුශල අකුශල වේදනා** දෙක ම ව්‍යාපාර සහිත බැවින් ද, උත්සාහ

[1] වි: ප: ඛන්ධවිභඞ්ග 3

සහිත බැවින් ද, විපාක සහිත බැවින්ද යි යෙදෙන යෙදෙන පරිද්දෙන් **විපාක - ක්‍රියා** වශයෙන් දර්ශනකාර වූ අව්‍යාකෘත වේදනාවට වඩා **ඖදාරික යැ.**

කියන ලද ක්‍රමයට විපරීත වශයෙන් දෙවැදෑරුම්වූ ද, **අව්‍යාකෘත වේදනාව කුශලාකුශල වේදනාවට වඩා සියුම් යැ.**

මෙසේ පළමුව **ජාති වශයෙන් ඖදාරික සූක්ෂ්ම** භාවය දතයුතු ය.

තවද, **සභාව ලක්ෂණ වශයෙන් දුක්ඛවේදනාව,** ආස්වාද කටයුතු සභාවයක් නැති හෙයින් ද, ආස්වාදනය කටයුතු සැපත ප්‍රහාණය කිරීම් වශයෙන් විඳුවල වීම් සහිත බැවින් ද, කළඹන හෙයින් ද, කලකිරීම් සහිත බැවින් ද, මැඩ පවත්වන හෙයින් ද, සුඛ - උපෙක්ඛා වේදනාවනට වඩා **ඖදාරික ය.** ඒ දුඃඛ වේදනා-වෙන් අන්‍ය වූ **සුඛ-උපෙක්ඛා වේදනාවෝ** මිහිරි බැවින් ද, සන්හුන් බැවින් ද, ප්‍රණීත බැවින් ද, මන වඩන හෙයින් ද, මධ්‍යස්ථ බැවින් ද, සුදුසු පරිද්දෙන් **දුක් වේදනාවට** වඩා සූක්ෂම වන්නාහ

සුඛ-දුඃඛ වේදනා දෙක වනාහි පැතිරීම් සහිත බැවින් ද, කැළඹීම් කරන හෙයින් ද, ප්‍රකට බැවින් ද, උපෙක්ෂා වේදනාවට වඩා **ඖදාරික යැ.** ඒ **අදුඃඛමසුඛ වේදනාව** කියන ලද ක්‍රමයට විපරීත වශයෙන් ඒ සුඛ - දුඃඛ වේදනාවනට වඩා **සූක්ෂ්ම යැ.** මෙසේ සභාව වශයෙන් **ඖදාරික** බව හා, **සූක්ෂ්ම** බව දතයුතු යැ.

පුද්ගලයන් ගේ වශයෙන් :- සමාපත්තියට නො සමවන්නහු ගේ වේදනාව සමවන්නහු ගේ වේදනාවට වඩා **ඖදාරික යැ.** (නොයෙක් අරමුණෙහි වික්ෂිප්තව පවත්නා හෙයිනි.) එයට විපරීත හෙයින් නො සමවන්නහු ගේ වේදනාවට වඩා සමවන්නහු ගේ වේදනාව **සූක්ෂ්ම යැ.** මෙසේ පුද්ගල වශයෙන් **ඖදාරික-සූක්ෂ්ම** භාවය දත යුතු යැ. මෙයින් මෑ භූමි වශයෙන් ද **ඖදාරික-සූක්ෂ්ම** භාවය ගැනේ. **සමවන්-නොසමවන්නහු ගේ** ගැනීමෙනි.

ලෞකික - ලෝකෝත්තර වශයෙන් වනාහි, ආශ්‍රවයනට අරමුණු වන්නා වූ **වේදනාව ලෞකික යි.** එය **ආශ්‍රව** ඉපදීමට හේතු බැවින් ද, **ඕඝයනට** අරමුණු වන බැවින් ද, **යෝගයනට** අරමුණු වන බැවින් ද, **ග්‍රන්ථයනට** ආලම්බන වන හෙයින් ද, **නීවරණයනට** ආලම්බන වන හෙයින් ද, **උපාදානයනට** ආලම්බන වන හෙයින් ද, **ක්ලේශධර්මීයන් ගේ** උත්පත්තියට සුදුසු වන හෙයින් ද, **පරාමර්ශනයනට** සාධාරණ හෙයින් ද, **අනාශ්‍රව වේදනාවට** වඩා **ඖදාරික යි.** (අනාශ්‍රව නම් **ලෝකෝත්තර** යැ.)

ඒ අනාශ්‍රව වේදනාව ඊට විපර්‍යාශ හෙයින් **සූක්ෂ්ම** වේ. මෙහි **ජාති** ආදීන් ගේ වශයෙන් මිශ්‍ර බව දුරුකළ යුතු යැ.

කවරහෙයින්ද යත්:- **අකුසල විපාක කායවිඤ්ඤාණය** හා සම්ප්‍රයුක්ත වේදනාව අව්‍යාකෘත වත බැවින් ජාති වශයෙන් **සූක්ෂ්ම** වුව ද, සභාවාදි වශයෙන් **ඕදාරික** වත හෙයිනි.

එයින් වදාළහ. **"අබ්‍යාකතා වෙදනා සුඛුමා, දුක්ඛා වෙදනා ඔළාරිකා, - අසමාපන්නස්ස වෙදනා ඔළාරිකා සමාපන්නස්ස වෙදනා සඛුමා, අනාසවා වෙදනා සුඛුමා, සාසවා වෙදනා ඔළාරිකා"**[1] යි.

'අව්‍යාකෘත වෙදනාව **සූක්ෂ්ම** යැ. දුක්ඛවෙදනාව **ඕදාරික** යැ. අසමාපන්නාහු ගේ වෙදනාව **ඕදාරික** යැ. ධ්‍යානයට සමවන්නහු ගේ වෙදනාව **සූක්ෂ්ම** යැ. අනාශ්‍රව වේදනාව **සූක්ෂ්ම** යැ. ආශ්‍රව සහිත වේදනාව **ඕදාරික** යි' මෙසේමැ (දුඃඛ වේදනාව මෙන්) සුඛ වේදනාදියද ජාති වශයෙන් **ඕදාරික** යි. සභාවාදීන් ගේ වශයෙන් **සූක්ෂ්ම** යි. එහෙයින් යම් යම් ආකාරයෙකින් ජාති ආදි වශයෙන් වේදනාව මිශ්‍ර නොවේ නම් ඒ ඒ ආකාරයෙන් වේදනා **ඕදාරික-සූක්ෂ්ම** භේදය දතයුතු යි.

ඒ මෙසේයි:- **කුශලත්‍රිකයෙහි** සභාවාදිය අපෙක්ෂා නොකොට ජාති වශයෙන් ද, **වේදනාත්‍රිකයෙහි** ජාත්‍යාදිය අපෙක්ෂා නොකොට සභාව වශයෙන් ද, යනාදි ක්‍රමයෙන් **ඕදාරික-සූක්ෂ්ම** බව කී කල සංකර නොවන බව මෙයින් කියේ වෙයි.

'අව්‍යාකෘත වේදනාව ජාති වශයෙන් **කුශල - අකුශල** වේදනාවට වඩා **සියුම්** වේ, යනාදි මේ පෙර කී පාඨයෙහි, **අව්‍යාකෘත වේදනා කිම? දුඃඛ වේදනා කිම? සුඛ වේදනා කිම? නොසමවන්නහු ගේ වේදනා කිම? සමවන්නහු ගේ වේදනා කිම? ආශ්‍රව සහිත වේදනා කිම? අනාශ්‍රව වේදනා කිමැ** යි මෙසේ ජාතිවශයෙන් සූක්ෂ්ම වූ **අව්‍යාකෘත වේදනාව** පුද්ගල-ලෞකික වශයෙන් පරාමර්ශණය නොකටයුතුය. මින් **ජාති-පුද්ගල-සභාව-ලෞකික** වශයෙන් පැවැති සිවුකොටස ඔවුනොවුන් අමිශ්‍රව ගතයුතු යි. මේ ක්‍රමයෙන් මිශ්‍රීම දුරුවන්නේ ය. අන් පරිද්දකින් නොවේ. සියලු තන්හි මේ ක්‍රමය යැ. අව්‍යාකෘත මුඛයෙන් දක්වූවෝක් මෙන්, කුශලා'කුශල මුඛයෙන් ද, ජාති මුඛයෙන් දක්වූ සේ සභාවාදි මුඛයෙන්ද, දැක්විය යුතු බවි මේ කී නියායි)

---

[1] වි: ප: ඛන්ධ විභඞ්ග 3 පිට.

තවද, **"තංතංවූපන වෙදනං උපාදයුපාදය වෙදනා ඔළාමික සුඛුමා දට්ඨබ්බා"**[1] 'ඒ ඒ වේදනා හේතුවෙන් වේදනාව ඕදාරික- සූක්ෂ්ම බව දත යුත්තීය සි වදළ හෙයින් අකුශලාදි යෙහිද, ලෝභ සහගත වේදනාවට වඩා, දෝස සහගත වේදනාව **ඔදාරික යැ.** (ගින්න තමා ආශ්‍රය වූ දරුස්කඛාදිය දවන්නා සේ වෙෂය තමා නිශ්‍රය වූ හෘදය වසතුව දවන හෙයිනි.) දෝස සහගත වේදනාවට වඩා, ලෝභ සහගත වේදනාව **සුඛුමයි.** දෝස සහගත යන් අතුරිනුදු ආනන්තරිය භාවයට පැමිණි නියත වේදනාව **ඔදාරික යැ.** අනියතය **සුඛුම යි.** නියතයන් අතුරිනුදු **කල්පසථායි** වූවා **ඔදාරික යැ.** සෙසු වේදනාව **සුඛුම යි.** කල්පසථායි වූවන් අතුරිනුදු අසඛ්ඛාරික වේදනාව **ඔළාමික යැ.** සසඛ්ඛාරිකය **සුඛුම යි.**

ලෝභ සහගත වේදනාවන් අතුරිනුදු දෘෂ්ටි සම්ප්‍රයුක්ත වේදනාව **ඔදාරික යැ.** දෘෂ්ටි විප්‍රයුක්තවූවා **සුඛුම යි.** ඒ දෘෂ්ටි-සම්ප්‍රයුක්ත වේදනා අතුරිනුදු ආනන්තරිය වූවා **ඔදාරික යැ.** ඉනුදු **කල්පසථායි** වූවා **ඔදාරික යැ.** ඉනුදු අසඛ්ඛාරික වූවා **ඔදාරික යැ.** සෙසු ආනන්තරිය නො වූ, කල්පසථායි නොවූ, සසඛ්ඛාරිකය **සුඛුම යි.**

සාමාන්‍යයෙන් බොහෝ විපාක ඇති අකුශලය මහා සාවද්‍ය බැවින් **ඔදාරික යැ.** සුළුල විපාක ඇත්තේ අල්පසාවද්‍ය බැවින් **සුඛුමයි.** අල්ප විපාක කුශලය **ඔදාරික යැ.** බහු විපාක කුශලය **සුඛුමයි.**

තවද, **කාමාවචර** කුශලය **ඔදාරික යැ.** රූපාවචර කුශලය **සුඛුම යැ.** ඉනුදු අරූපාවචර කුශලය **සුඛුම යැ.** ඉනුදු ලෝකෝත්තර කුශලය **සුඛුමයි.** **කාමාවචරයන්** අතුරිනුදු දානමය කුශලය **ඔදාරික යැ.** ශීලමය කුශලය **සුඛුම යැ.** භාවනාමය කුශලය ද **සුඛුම යි.** ඉනුදු දුහේතුකය **ඔදාරික යැ.** ත්‍රිහේතුකය **සුඛුමයි.** ත්‍රිහේතුකයෙනුදු සසඛ්ඛාරිකය **ඔදාරික යැ.** අසඛ්ඛාරිකය **සුඛුමයි.** **රූපාවචරයන්** ගෙනුදු ප්‍රථම ධ්‍යානිකය **ඔදාරික යැ.** -පෙ- පඤ්චමධ්‍යානික වේදනාව **සුඛුමයි.** **අරූපාවචර** යෙනුදු ආකාසානඤ්චායතනික වේදනාව **ඔදාරික යැ.** -පෙ- නෙවසඤ්ඤා-නාසඤ්ඤායතන සම්ප්‍රයුක්ත වේදනාව **සුඛුමයි.**

ලෝකෝත්තර වූ, සොතාපත්ති මගඵ සම්පයුත්ත වේදනාව **ඔදාරික යැ.** -පෙ- අර්හත් මාර්ග සම්ප්‍රයුක්ත වූවා **සුඛුමයි.** ඒ ඒ භූමියෙහි වූ විපාක ක්‍රියා වේදනාවන් ගේ ද, සුඛ-දුඃඛාදි වේදනා වන්ගේ ද, අසමාපන්නාදි වේදනාවන්ගේ ද, සාශ්‍රවාදි වූ වේදනා වන්ගේ ද, වශයෙන් **කියක** ලද වේදනාවන්ගේ ද, **මේ** ක්‍රමයමැති.

---

[1] විභ: ප: ඛන්ධවිභඞ්ග 4

අවකාශ වශයෙන් නරකයෙහි වේදනාව **ඕදාරික යැ.** තිරිසන් අපායෙහි **සුඛුම යැ.** -පෙ- පරනිර්මිත වශවර්තියෙහි එයට වඩා **සුඛුම සි.** මෙසේ දුඃඛ වේදනාව මෙන් සුඛ වේදනාව ද එසේ ම සියලු භූමියෙහි සුදුසු පරිදි යෙදිය යුතුයි. චක්ෂුරාදි වස්තු වශයෙන් ද, හීන ප්‍රණීත බව දත යුතු ය. **ලාමක** වස්තුවක් අරමුණුකොට පවත්නා වේදනාව **ඕදාරික යැ.** ප්‍රණීත වස්තුක වේදනාව **සුඛුම සි.** හීන-ප්‍රණීත භේදයෙහි වනාහි යම් වේදනාවක් **ඕදාරික ද,** ඒ හීත යැ. යමක් **සූක්ෂම ද,** ඒ ප්‍රණීතය සි දත යුතුයි.

දූර පදයෙහි වනාහි අකුශල වේදනාව, කුශල අව්‍යාකෘත වේදනාවට **දුරෙහි යැ. සන්තික** -පදයෙහි අකුශල වේදනාව, අකුශල වේදනාව හා සම්පවේය සි, යනාදි ක්‍රමයෙන් **විභඞ්ගයෙහි**[1] බෙදන ලදී.

එහෙයින් අකුශල වේදනාව විසභාග වශයෙන් ද, අසම්මිශ්‍ර බැවින් ද, අසදෘශ බැවින් ද, කුශල - අව්‍යාකෘතයන් කෙරෙන් **දුර වේ.** එසේ ම කුශල අව්‍යාකෘතයෝ, අකුශලයන් කෙරෙන් **දුර වෙති.** සියලු වාරයන්හි ද මේ ක්‍රමය මැයි. අකුශල වේදනාව සභාග වශයෙන් ද, සදෘශ වශයෙන් ද, අකුශල වේදනාවට **සම්පවේය සි** දතයුතු.

මේ වේදනාස්කන්ධයෙහි අනිත්‍යාදි විභාගයෙහි විස්තර කථාවයි.

ඒ ඒ **වේදනාදිය** හා සම්ප්‍රයුක්ත වූ **සාඤ්ඤීන්ගේ ද** විභාගය මෙසේම දත යුතුයි. එසේ දැන නැවත ඒ **පඤ්චස්කන්ධයෙහි** ම මනාව දැනීම පිණිස (1) **ක්‍රම වශයෙන් ද,** (2) **භේද වශයෙන් ද,** (3) **අන්‍යූනඅනධික වශයෙන් ද,** (4) **උපමා වශයෙන් ද,** (5) **දෙපරිද්දෙකින් බැලියයුතු බැවින් ද,** (6) **බලන්නහුට අභිමතාර්ථ සිද්ධි වශයෙන් ද,** විනිශ්චය ක්‍රමය දතයුතුයි.

(1) **ක්‍රම වශයෙන්:-** මෙහි ක්‍රමය වනාහි **උත්පත්තික්‍රමය, ප්‍රහාණ ක්‍රමය, ප්‍රතිපත්ති ක්‍රමය, භූමි ක්‍රමය, දෙශනාක්‍රම** යැයි බොහෝ දාකාරයි. **"පඨමංඤාණලාභිංහොති"**[2] 'ප්‍රථම කොට **ඤාණ රූපය** වේ;' යනාදීන් **උත්පත්ති** ක්‍රමය වේ. 'දර්ශනයෙන් ප්‍රහාතව්‍ය ධර්මය, භාවනාවෙන් ප්‍රහාතව්‍ය ධර්මය, යනාදීන් **ප්‍රහාණ** ක්‍රමය ද, **සීල විසුද්ධි, චිත්ත විසුද්ධි,** ආදීන් **ප්‍රතිපත්ති** ක්‍රමය ද, **කාමාවචරය, රූපාවචරය** යනාදීන් **භූමි** ක්‍රමය ද, **සතර සතිපට්ඨානය, සතර සම්‍යක්ප්‍රධානය** යනාදීන් හෝ, **දුන කථා, ශීල කථා** යනාදීන් හෝ, **දෙශනා** ක්‍රමය ද, වේ.

---

[1]වි: ප: ඛන්ධවිභඞ්ග 3-4 [2]වි: අට්ඨකථා ඛන්ධ වි: 21

විශේෂ:- මෙවුනතුරින් මෙහිලා **උතුපත්තිකුමය** නොයෙදේ. **කලලාදීන් ගේ** මෙන් **ස්කන්ධාදීන් ගේ,** පෙර පසුවීම වශයෙන් විභාගයක් නොවන හෙයිනි.

ප්‍රහාණ ක්‍රමය ද නොයෙදේ. කුසල-අව්‍යාකෘතයන් ප්‍රහාතව්‍ය නොවන හෙයිනි.

ප්‍රතිපත්ති ක්‍රමය ද නොයෙදේ. අකුශලයන් පිළිපැදිය යුතු නොවන හෙයිනි

භූමි ක්‍රමය ද, නොයෙදේ. වේදනාදිය සිවු භූමියෙහි මැයෙදෙන හෙයිනි.

මෙහිලා **දෙශනා ක්‍රමය** යෙදේ.

රූපාදීන් විභාග නොකොට රූපාදි **පඤ්චස්කන්ධයෙහි ආත්ම-දෘෂ්ටි** වශයෙන් වරදවා ගත් **වෙනෙයජනයා, රූප - නාම - සමූහයෙහි** ඒක ඝනවූ ධර්ම සමූහය බෙදා දැක්වීමෙන් ආත්ම වශයෙන් ගැනීමෙන් මුදනු කැමති **ශාස්තෘවතුන් වහන්සේ** හිත කැමති වැ, ඒ ඒ ජනයන්ට වටහා ගැනීමේ පහසුව පිණිස, චක්ෂුරාදියට ද විෂය වූ ඖදාරික **රූපස්කන්ධය** පළමුව වදාළ සේක.

අනතුරුවැ ඉෂ්ට - අනිෂ්ට රූපාලම්බන රසය අනුභව කරන **වේදනාව** වදාළ සේක.

විඳින්නා වූ ඒ වේදනා ආකාරය ගැනීමෙන් හැඳිනගන්නාක් වැනි වූ **සංඥාව** වදාළසේක.

අනතුරුවැ සංඥා වශයෙන් සකස් කරන්නා වූ **සංස්කාර** වදාළ සේක.

ඒ වේදනාදීන් ගේ නිශ්‍රය වූ, වේදනාදියට අධිපති වූ **විඤ්ඤාණය** එයට අනතුරුවැ වදාළ සේක.

මේ ක්‍රම වශයෙන් විනිශ්චය යි

---

(2) නෙද වශයෙන්:- **ස්කන්ධයන් ගේ ද, උපාදාන ස්කන්ධයන්ගේ ද** භෙදයෙනි.

ඒ දෙකෙහි වෙනස කිම? පළමුකොට **පඤ්චස්කන්ධය** අවිශෙෂයෙන් (සාමාන්‍යයෙන්) වදාරන ලදී. **උපාදානස්කන්ධයෝ** චතුරාශ්‍රවයන් හා, චතුරුපාදානයන්ට අරමුණු වශයෙන් වෙසෙසා වදාරන ලදහ.

"පඤ්චවෙව වෝ භික්ඛවෙ ඛන්ධෙ දෙසිස්සාමි පඤ්චුපාදානක්ඛන්ධෙ, තංසුණාථ -පෙ- කතමෙව භික්ඛවෙ පඤ්චුපාදානක්ඛන්ධා, යංකිඤ්චි භික්ඛවෙ රූපං අතීතානාගත පච්චුප්පන්නං -පෙ- සන්තිකෙවා, අයංවුච්චති භික්ඛවෙ රූපක්ඛන්ධෝ. යාකාචි වේදනා -පෙ- යංකිඤ්චි විඤ්ඤාණං -පෙ- සන්තිකෙවා, අයංවුච්චති භික්ඛවෙ විඤ්ඤාණක්ඛන්ධෝ, ඉමෙවුච්චන්හි භික්ඛවෙ පඤ්චුපාදානක්ඛන්ධා."

කතමෙච භික්ඛවෙ පඤ්චුපාදානක්ඛන්ධා, යංකිඤ්චිභික්ඛවෙ රූපං-පෙ-සන්තිකෙවා, සාසවං, උපාදානියං, අයංවුච්චති භික්ඛවෙ රූපූපාදානක්ඛන්ධො, යාකාචිවෙදනා -පෙ- යංකිඤ්චි විඤ්ඤාණං -පෙ- සන්තිකෙවා, සාසවං උපාදානියං අයංවුච්චති භික්ඛවෙ විඤ්ඤාණූපාදානක්ඛන්ධො, ඉමෙ වුච්චන්ති භික්ඛවෙ පඤ්චුපාදානක්ඛන්ධා' සී[1]

'මහණෙනි! **ස්කන්ධ පසක්** හා, **උපාදානස්කන්ධ පසක්** දේශනා කරම්. එය මනාව අසවු. මහණෙනි! ඒ **පඤ්චස්කන්ධ** කවරේ ද? අතීත - අනාගත - වර්තමාන වූ; ඕඳාරික වූ හෝ සූක්ෂ්ම වූ; අධ්‍යාත්මික වූ හෝ බාහිර වූ, දුර හෝ ළඟ වූ; යම් රූප කෙනෙක් වෙද්ද, ඒ **එකොළොස්** ආකාර වූ සියල්ල විකාර වීම හා, විනාශවීම ලක්ෂණ කොට ඇති බැවින්, **රූපස්කන්ධ** යයි කියනු ලැබේ. යම්කිසි වේදනාවක් -පෙ- යම්කිසි විඤ්ඤානයක් වේ ද, ඒ සියලු විඤ්ඤාණය **විඤ්ඤාණස්කන්ධ** යයි කියනු ලැබේ. මහණෙනි! මේ **පඤ්චස්කන්ධය** යි කියනු ලැබේ.

මහණෙනි! **පඤ්චුපාදානස්කන්ධය** කවරේ ද? මහණෙනි! (යට කියේ) **එකොළොස්** අවස්ථාහි වූ යම් රූපයක් වේ නම්, **කාම - භව - දිට්ඨි - අවිජ්ජා** යන **සතර ආශ්‍රවයන්ට** හා, **කාම-දිට්ඨි-සීලබ්බත-අත්තවාද** යන **සතර උපාදානයන්ට** ද අරමුණු වන්නා වූ ඒ රූපය **රූපූපාදානක්ඛන්ධය** යි. යම්කිසි **වේදනාවක්**-යම්කිසි **සංඥාවක්** - යම්කිසි **සංස්කාරයෙක්** - යම්කිසි **විඤ්ඤානයෙක්** වේනම්, ආශ්‍රවයනට හා, උපාදානයනට අරමුණු වූ ඒ විඤ්ඤාණය **විඤ්ඤාණූපාදානස්කන්ධය** යි කියනු ලැබේ. මහණෙනි! මේයැ **පඤ්චුපාදානස්කන්ධ** ය.

මේ පෙළෙහි අනාශ්‍රවවූ ම **වේදනාදිය ස්කන්ධයන්හි ද**, සාශ්‍රවවූවාහු ම **උපාදානස්කන්ධයන්හි ද** වදුළහ. රූපය එසේ නො වේ. ඒ වූකලී රාශ්‍යර්ථයෙන් **ස්කන්ධ** බව යෙදෙයි. එහෙයින් **ස්කන්ධයන්හි** වදුළහ. යම්හෙයකින් රාශ්‍යර්ථයෙන් ද, සාශ්‍රවාර්ථයෙන් ද, **උපාදානස්කන්ධ** භාවය යෙදේ ද, එහෙයින් උපාදානස්කන්ධ විෂයයෙහි වදුළහ. අනාශ්‍රවවූ වේදනාදිය ස්කන්ධයන්හි වදුළහ. සාශ්‍රවයන් උපාදානස්කන්ධයන්හි වදුළහ. තවද මෙහි උපාදානයන්ට ගෝචරවූ **ස්කන්ධ, උපාදාන ස්කන්ධයැ** යි මෙසේ මේ අර්ථ දතයුතු.

මේ විශුද්ධිමාර්ගයෙහි මේ සියලු **ස්කන්ධ - උපාදානස්කන්ධ** එක්කොට **ස්කන්ධය** යි කියන ලදි. (පඤ්චුපාදානසන්ධය යි මෙහි වෙනම නො දක්වේ.)

---

[1]සං: නි: ඛන්ධසංයුත්තක 353

(3) **අඩුවැඩි නොවීම් වශයෙන්, බුදුහු** අඩු වැඩි නොව **ස්කන්ධ පසක්** ම වදාළේ කවර හෙයින් ද? සියලු සඞ්ඛත ධර්මයන් (කර්මාදි ප්‍රත්‍යයෙන් සකස්වන ධර්ම) සදෘශ වශයෙන් එක එක කොටසෙහි සංග්‍රහ කිරීම් වශයෙනි. **ආත්ම** වශයෙන් හා ආත්මීය (ආත්මය පිළිබඳ) වශයෙන් ගන්නා වස්තූන් මෙතෙක් වන හෙයිනි. අන්‍ය වූ ද **ශීලස්කන්ධාදිය** ද මෙයට ම ඇතුළත් වේ.

විස්තර:- නොයෙක් ප්‍රභේදවත් වූ සඞ්ඛත ධර්මයන් සභාග වශයෙන් සංග්‍රහ කරන කල විකාර වීම, සියලු රූපයන් ගේ එකම (සාමාන්‍ය) **ලක්ෂණය** වශයෙන් ගෙන **රූපය එකවට** සංග්‍රහ කිරීම් වශයෙන් **එකස්කන්ධයෙක්** (එක් ගොඩෙක්) වේ.

අරමුණු රස විඳීම් වශයෙන් සාධාරණ **ලක්ෂණය** ගෙන **වේදනාව** ද, සභාග සංග්‍රහ වශයෙන් **එකස්කන්ධයෙක්** වේ. **සංඥාදියේ** ද, **ස්කන්ධභාවය** මෙසේ මැයි එහෙයින් ලක්ෂණ වශයෙන් සදෘශ හෙයින් සියලු සඞ්ඛත ධර්මයන් සභාග ධර්ම වශයෙන් සංග්‍රහ කොට **පඤ්චස්කන්ධයක්** ම කියන ලදි. **ආත්ම-ආත්මීය** වශයෙන් ගන්නා වස්තූහු, රූපාදි මේ **පඤ්චස්කන්ධයට** ඇතුළත් වෙත්. මින් පිටත් කිසිවක් නැති.

විශෙෂ:- මෙහිලා කුශලාකුශල ධර්මයන් සංස්කරණය කිරීම හා, උත්සාහවත් කිරීම කෘත්‍යය කොට ඇති හෙයින් **'චේතනාව ම සංස්කාරස්කන්ධය'** යි මුඛ්‍යවයෙන් අභිප්‍රේත යැ. **එස්සාදිය** ද ඵුසනාදි ලක්ෂණයෙන්, කුශලාකුශල ධර්මයන් සකස් කිරීමට උපකාර වන හෙයින් එයට- (සංස්කාරස්කන්ධයට) ම ඇතුළත් වේ.

ප්‍රශ්නයෙකි:- එසේ වන්නා කුමක් හෙයින් **වේදනා - සංඥා** දෙක වෙන මැ **ස්කන්ධ දෙකක්** සේ වදාරන ලද්දේ ද?

(වේදනාදි සභාවයෙන් සංස්කාර **ලක්ෂණයෙන්** ගෙන සංස්කාර ස්කන්ධයෙහි ම කවර හෙයින් ඇතුළත් නොකෙළේ ද)

පිළිතුර:- **වේදනා-සංඥා** චෛතසිකයෝ සංස්කාර වූවාහු ද, **ආත්ම දෘෂ්ටි** ආදීන් ගැනීමට වස්තූන් වන හෙයිනි.

එයින් වදාළහ:- **"රූපෙ ඛොපන භික්ඛවෙ සති රූපං උපාදාය, රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති. එතං මම එසොහමස්මි එසො මෙ අත්තාති. වෙදනාය-සඤ්ඤාය-සංඛාරෙසු විඤ්ඤාණෙ සති, විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති. එතං මම එසොහමස්මි එසො මෙ අත්තාති"**[1]

---

[1]සං: නි: ඛන්ධසංයුත්තක 474

"මහණෙනි! **රූපය** ඇතිකල, රූපය නිසා, රූපය වරදවා ගැනීමෙන් 'මේ රූපය මාගේ යැ' 'මේ රූපය මම වෙමි.' මේ රූපය මාගේ **ආත්මය** වේ' (රූපයෙහි ආත්මය වේ) යයි විපරීත දෘෂ්ටි උපදී. **වේදනා – සංඥා – සංස්කාර – විඥාන** යන මොවුන් ඇති කල්හි මොවුන් නිසා, මොවුන් වරදවා ගැනීමෙන් **මේ වේදනා-සංඥා-සංස්කාර-විඥාන**- 'මා සතු යැ- මම වෙමි- මාගේ ආත්මය වේය'යි වේදනාදියෙහි ආත්මය යන විපරීත දෘෂ්ටිය උපදී."

මෙසේ මම යැ, මාගේයැ යි, වරදවා ගැනීමට මේ **පඤ්ච-ස්කන්ධය** වසතුවන හෙයින් ද, මේ පඤ්චප්‍රකාරය මැ පරම කොට ඇති හෙයින් ද, **පඤ්චස්කන්ධයක්** ම වදාළහ. අන්‍ය වූ **ශීලස්කන්ධාදි** වශයෙන් වදාළ පඤ්චස්කන්ධයෝ, සංස්කාර ස්කන්ධ-යෙහි ඇතුළත් වන හෙයින් පඤ්චස්කන්ධයට ම ඇතුළු වෙති. මේසේ සෙසු ස්කන්ධයන් ද එහි ම ඇතුළත් හෙයින් **පසක්** ම වදාළහ.

මෙසේ තො අඩු – තො වැනි වශයෙන් (පඤ්චස්කන්ධය) විනිශ්චය දත යුතුයි.

(4) උපමා වශයෙන්:- ගිලනකු වැනි විඥාන උපාදාන-ස්කන්ධයට වසතු- මාර ආලම්බන වන හෙයින් **රූපූපාදාන-ස්කන්ධය ගිලන්ගලකට** බඳු උපමා ඇත්තේ ය.

වේදනා-උපාදානස්කන්ධය ලෙඩකට බඳු උපමා ඇත්තේ ය. (**දුක්ඛදුක්ඛය, සංඛාරදුක්ඛය, විපරිණාමදුක්ඛය** යන මොවුන් ගේ වශයෙන් හිංසා කරන හෙයිනි.)

සංඥා උපාදානස්කන්ධය, කාම සංඥාදි වශයෙන් රාගාදීන් හා සම්ප්‍රයුක්ත වේදනා ඉපදීමට හේතුවන හෙයින් වා, පිත්, සෙම්, ආදි **රෝග හටගැනීම** බඳු ය.

සඞ්ඛාරූපාදානස්කන්ධය වෙදනා තමැති ගිලන් බවට නිදන හෙයින් **නොසැපදු සෙචුමක්** බඳු උපමා ඇත්තේ ය. වෙදනාව විඳීම් සවභාවය පිණිස අභිසංසකරණය කෙරෙතැයි එහෙයින් කියනලදී. ඒ මෙසේම, **"අකුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකං කායවිඤ්ඤත්තිං උප්පජ්ජනංහොති දුක්ඛ-සහගතං"**[1] 'අකුශල කර්මය කළහෙයින් රැස්කළ හෙයින්, දුක් සහගත කායවිඤ්ඤත්තිය උපන්නේ වෙයි.

වේදනා සඞ්ඛ්‍යාත රෝගාතුර බැවින් තො මිදුණ හෙයින් **විඥානොපාදානස්කන්ධය ගිලනකු** බඳු ය.

තවද, **පඤ්චොපාදානස්කන්ධය** පිළිවෙළින්, **බන්ධනාගාරය, දෙනිස් කම්කටොළුය, අපරාධය, වධකය, වධයට සුදුසු පුද්ගලය** යන මොවුන්ට බඳු ය. තවද, **භාජනය, භෝජනය,**

[1] ධ: ස: චිත්තුප්පාදකණ්ඩ 105

ව්‍යඤ්ජනය, වළදවන්නාය, අනුභවකරන්නාය යන මොවුන්ටද බඳුය. (ඒ සුගමයි)

මෙසේ **උපමා වශයෙන්** විනිශ්චය දතයුතු

(5) **දෙපරිද්දෙකින් දතයුතු බැවින් සංඛේප - විත්‍ථාර** වශයෙන් මේ **පඤ්චුපාදානක්ඛන්ධය** දෙපරිද්දකින් දතයුතු බැවින්ද **විනිශ්චය** දතයුතු.

සංඛේප වශයෙන් මේ **පඤ්චුපාදානක්ඛන්ධය, ආසීවිසොපම සූත්‍රයෙහි**[1] වදාළ සේ, අමෝරාගත් කඩු ඇති **වධකයකු** සේද, **භාරසූත්‍රානන**[2]**වශයෙන් මහත් බරක්** සෙයින්ද, **ඔජපනීය පරියාය**[3] **වශයෙන් කන්නකු** සේ ද, **යමකසූත්‍ර**[4]**වශයෙන්** අනිත්‍ය - දුඃඛ - අනාත්ම සංඛ්‍යාත **වධකයකු** සේද දතයුතුය.

විත්‍ථාර වශයෙන් වනාහි මැඩීම නො ඉවසන හෙයින් **රූප-ස්කන්ධය පෙණපිඬක්** සේද' මොහොතක් රමණීය බැවින් **වේදනාස්කන්ධය දියබුබුලක්** මෙන්ද, වැරදි සේ පොළඹවන හෙයින් **සංඥාස්කන්ධය මරීචියක්** මෙන්ද, අසාර හෙයින් **සංස්කාර ස්කන්ධය කෙසෙල් කඳක්** මෙන්ද, වඤ්චාකරන හෙයින් **විඥාන ස්කන්ධය මායාවක්** මෙන්ද, ගතයුතුයි.

විශෙෂ වශයෙන් වනාහි මනා රැමත්වූ ද **අධ්‍යාත්මික** රූපය අශුභ යයි දතයුතු. **වේදනා** ත්‍රිවිධ දුඃඛයෙන් නො මිදුන හෙයින් **දුක්** යයි ද, **සංඥා - සංස්කාර** - වශයෙහි නො පවත්නා හෙයින් **අනාත්මය සි ද, විඤ්ඤාණය** ඇතිව නැතිවන සභාව හෙයින් **අනිත්‍යය සි ද,** දතයුතු.

(6)**බලන්නහුට අළුසිඳි වශයෙන්** මෙසේ සංඛේප වශයෙන්ද, විත්‍ථාර වශයෙන්ද, දෙපරිද්දෙන් බලන්නාවූ යෝගාවචරයාහට යම් අනිමතාර්ථ ලාභයෙක් වේ නම් ඒ වශයෙන් විනිශ්චය දතයුතු

ඒ ඒ සේමැයි:-සංඛේපවශයෙන් පඤ්චුපාදානස්කන්ධය **අමෝරා ගත් කඩුව ඇති වධකයකු** සේ බලන්නේ ස්කන්ධයන් කෙරෙන් වෙහෙසට නො පැමිණේ. විත්‍ථාර වශයෙන් ස්කන්ධාදිය **පෙණපිඬු** ආදිය මෙන් දක්නේ අසාර වූ **පඤ්චස්කන්ධයෙහි** සාර වශයෙන් නො දක්නේය. විශෙෂයෙන් අධ්‍යාත්ම රූපය අශුභ වශයෙන් දක්නා යෝගාවචරතෙමේ **කබලීකාරාහාරය** පිරිසිඳ දැනගනී.

[1]සං: නි: සළායතන සං: 656 [2]සං: නි: ඛන්ධසංයුත්ත 338
[3]සං: නි: ඛන්ධසං: 401 [4]සං: නි: ඛන්ධක 412

විඤ්ඤාණ වශයෙන්:- ආහාරසමුදයා රූපසමුදයෝ 'ආහාර හටගැනීමෙන් රූප හටගනී'ය යි කී හෙයින්, අධ්‍යාත්ම රූප යෙහි ඡන්දරාග දුරුකළ හෙයින් එයට හේතු වූ කබළීකාරාහාර යෙහි ද, ඡන්දරාගය **පහකෙරේ.** මේ **පහාන පරිඤ්ඤය.**

අධ්‍යාත්ම රූපය පරිග්‍රහ කරන්නේ, අධ්‍යාත්ම රූපයට හේතුවූ කබළීකාරාහාරය ද, පිරිසිඳ දැනගනී. මේ **ඤාතපරිඤ්ඤය.**

ඒ **අධ්‍යාත්ම** රූපයාගේ උත්පාද - භඞ්ගයන් දකින්නේ එයට හේතුවූ කබළීකාරාහාරයා ගේ ද, උත්පාද - භඞ්ග දක්නේ ය. **මේ තීරණපරිඤ්ඤය.**

මේ ත්‍රිවිධ පරිඤ්ඤයෙන් යුක්ත වූයේ, අශුභයෙහි ශුභයයි **විපල්ලාසය** දුරු කෙරේ. **කාමෝඝය** එතර කෙරේ. **කාම-යෝගයෙන්** වෙන් වේ. **කාමාශ්‍රවයෙන්** නිරාශ්‍රව වේ. **අභිධ්‍යාකායගන්ථය** (විෂම ලෝභය) බිඳී. **කාමුපාදානය** ළංකොට නො ගනී.

වේදනාව දුක් වශයෙන් දක්නේ, **ඇපශීහාරය** පිරිසිඳ දනී. දුඃඛයෙහි සැපය යන **විපයර්‍යාශය** දුරු කෙරේ. **භවොඝය** එතර කෙරේ. **භවයෝගයෙහි** නො යෙදේ. **භවාශ්‍රවයෙන්** නිරාශ්‍රව වේ. **ව්‍යාපාද කාය ග්‍රන්ථය** සිඳී. සීලබ්බතොපාදානයන් නො ගනී.

සංඥා-සංස්කාරයන් ද අනාත්ම වශයෙන් දක්නේ **මනෝ-සඤ්චේතනාහාරය** (කුශලා'කුශල කර්ම සම්ඛ්‍යාත සංස්කාර ස්කන්ධය) පිරිසිඳ දනී. **අනාත්මයෙහි** ආත්මය යන විපයර්‍යාශය දුරු කෙරේ. **දෘෂ්ටි ඕඝය** පහ කෙරේ. **දෘෂ්ටි යෝගයෙන්** වෙන් වේ. **දෘෂ්ටි ආශ්‍රවයෙන්** නිරාශ්‍රව වේ. **ඉදංසච්චාභිනිවේස කාය ග්‍රන්ථය** බිඳී. **ආත්මවාදෝපාදානය** (මමයැ මාගේය යි දැඩි කොට) නො ගනී.

විඤ්ඤාණය අනිත්‍ය වශයෙන් දක්නේ **විඤ්ඤාණාහාරය** පිරිසිඳී. අනිත්‍යයෙහි නිත්‍යය යන **විපයර්‍යාශය** දුරු කෙරේ. **අවිද්‍යා ඕඝය** එතර කෙරේ. **අවිද්‍යායෝගයෙන්** නො බැඳේ. **අවිද්‍යාශ්‍රවයෙන්** අනාශ්‍රව වේ. **සීලබ්බතපරාමාසකායග්‍රන්ථය** බිඳී. **දිට්ඨිඋපාදා-නය** දැඩි කොට නො ගනී.

මෙසේ ධීරවූ යෝගි තෙමේ **පඤ්චඋපාදානස්කන්ධයෙහි** විපල්ලාසාදි සකල සංක්ලේශප්‍රභාණයෙන් විපුල ඵල ඇති දැකීම වූ වධකාදීන් වශයෙ න්නුවණින් දක්නේ යි.

සාධුජන ප්‍රමෝදය පිණිස කළ විශුද්ධි මාර්ගයෙහි ප්‍රඥාභාවනාධිකාරයෙහි ස්කන්ධ නිදේශ නම් වූ තුදුස්වැනි පරිච්ඡේදය මෙතෙකින් නිමියේ යි.

---

15. ආයතන-ධාතු නිද්දේශ

ආයතන (1)

ස්කන්ධයනට අතතුරෑ වෑ **ආයතනයෝ** දක්වනු ලැබෙති.

1	**චක්ඛායතනය,**	2	**රූපායතනය,**
3	**සොතායතනය,**	4	**සද්දායතනය,**
5	**ඝාණායතනය,**	6	**ගන්ධායතනය,**
7	**ජිව්හායතනය,**	8	**රසායතනය,**
9	**කායායතනය,**	10	**ඵොට්ඨබ්බායතනය,**
11	**මනායතනය,**	12	**ධම්මායතනයෑ යි**

ආයතන දෙලොසෙකි. එහි එකක් පාසා (1) **අර්ථය,** (2) **ලක්ෂණය,** (3) **අනූන - අනධික තාය,** (4) **ක්‍රමය,** (5) **සංක්ෂේපවිස්තාරය,** (6) **දතයුතු බව** ය යන මොවුන් ගේ වශයෙන් විනිශ්චය දත යුතුයි.

(1) මෙහි **අර්ථ** වශයෙන්

i **විශෙෂ අර්ථය,**

ii **සාමාන්‍ය අර්ථය** යි දෙකෙකි.

එහි i **විශෙෂ අර්ථ වශයෙන්,** රූපාලම්බනරසය ආස්වාදනය කරනුයේ **චක්ඛු නම්.** (සම-විෂමත්වය ප්‍රකාශ කෙරෙයි, යන අර්ථයි.) වණ්ණ විශෙෂ ප්‍රකාශ කෙරේනුයි **රූප නම්.** (වණ්ණයා ගේ විකාරයට පැමිණෙමින් සිත්හි පවත්නා කැමැත්ත ප්‍රකාශ කෙරෙයි යන අර්ථයි.)

අසනුයේ **ශ්‍රෝත්‍රයෑ.** උසුරුවනු ලබනුයේ **ශබ්දයෑ.** (ශ්‍රොත්‍ර-විඥානයෙන් දතයුතු වූයේ යන අර්ථයි.) ආඝ්‍රාණය කරනුයේ **ඝ්‍රාණයෑ.** ප්‍රකාශ කරනු ලබනුයේ **ගන්ධයයි.** (තමා පිහිටි වසතුව ප්‍රකාශ කෙරෙයි යන අර්ථයි.) ජීවිතය (පැවැත්මට උපකාරවූ රසය) කැඳවනුයි **ජිව්හා නම.** සත්ත්වයෝ ආස්වාදනය කෙරෙත්නුයි **රස නම්.** පාප ධර්මයන් ගේ ඉපදීමට සථාන වේනුයි **කාය නම්.** (ආය නම් උතපතති දේශය යි.) සපර්ශ කරනුයේ **ඵොට්ඨබ්බ නම්.** (අරමුණු) දැනගන්නේ **මන නම්.** තමා ගේ (සවභාව) ලක්ෂණය ධරානුයි **ධම්ම නම්.** මේ එකක් පාසා **විශෙෂාර්ථය** යි.

ii **අවිශෙෂයෙන් චිත්ත - චෙතසිකයන්** තම තමා අයත් කෘත්‍යය පිණිස **උත්සාහවත් කරවන** හෙයින් ද, චිත්ත-චෙතසිකයන් **විඥාන කරන** හෙයින් ද, දිස් වූ **සංසාර දුකඛයට පමුණුවන** හෙයින් ද, **ආයතනය** යි දත යුතු ය.

විඤ්ඤාර:- චක්ඛුරාදි ද්වාරයෙහි ද, **රූපාදි** ආලම්බනයෙහි ද, (ඒ ඒ ද්වාරාලම්බනයන්හි) උපදනා චිත්ත - චෛතසික ධර්මයෝ, තම තමා අයත් අනුභවනාදි කෘත්‍යයෙන් උත්සාහ කෙරෙති, නැඟී සිටිති. ගැටෙති. ව්‍යායාම කෙරෙන්ය සි කී නියාසි.

'ඒ ඒ වාර - ආලම්බනයෙහි උපදින්නා වූ චිත්ත - චෛතසික ධර්මයන්, මේ චක්ඛුරාදි 'ආයතනයෝ විඤ්ඤාර කෙරෙන්ය' සි කීසේ ය සි දතයුතු.

තවද, නො දත හැකි අක්-මුල් ඇති මේ සසර පැවැත්නා වූ, ඉතාම දික් වූ සසර දුක නො නවත්නා තාක් (නැවත නූපදනා සේ නිරුඬ නොවන තාක්) ගෙන යන්නවුන් මෙන් පවත්වත් නුසි කී නියාසි.

මේ සියලු ධර්මයෝ උත්සාහ කරන හෙයින් ද, චිත්ත - චෛතසික ධර්මයන් විඤ්ඤාර කරන හෙයින් ද, මතු මතු ගෙනයන හෙයින් ද, **ආයතනය, ආයතනය** සි කියනු ලැබෙති.

තවද, **නිවාසඨානය, පිහිටීමට ආධාරඨානය, රැස්වන-ඨානය, හටගන්නා ඨානය, කාරණය** යන අර්ථයෙන් ද **ආයතන** නම් වේය සි දතයුතු.

ඒ මෙසේසි:- **'ඊශ්වරායතනය' වාසුදේවායතනය,** යනාදීන්හි ලෙව්හි **වාසඨානය ආයතනය** සි කියසි. **සුවණ්ණායතනය, රජතායතනය** යනාදීන්හි **ආකරය** ආයතනය සි කියසි.

"මනොරමෙ ආයතනෙ - සෙවනතිතං විහඬගමා" සි **මහරහත්** නමැති පක්ෂීන් ගෙන් ගැවසී ගත් ශාලවනොද්‍යානයකට බඳු **සච්ඡ ශාසනයෙහි, ආයර්‍ය සංඝ** සඞ්ඛ්‍යාත පක්ෂිසමූහයා නථාගත නමැති වෘක්ෂරාජයා සෙවූනාහු ය' යන මෙහි **රැස්වන ඨානය,** ආයතනය සි කියනු ලැබේ.

"දක්ඛිණාපථය ගවයන් ගේ ආයතනය" යනාදීන්හි **හටගන් දේශය** ආයතනය සි කියනු ලැබේ. **"තන්තුතන්ත්‍රෙව සක්‍ක භබ්බතං පාපුණාති සනිසති ආයතනෙ"**[2] **"සෘද්ධිවිධඥානාදි අභිඥාවට සුදුසු (ප්‍රාර්ථනාවක්) අධිකාරයක් ඇතිකල්හි, ඒ ඒ සෘද්ධිවිධ-ඥානාදි වූ ඨානයෙහි මෑ සාක්ෂියට සුදුසු බවට පැමිණේ"** යනාදීන්හි **කාරණ ආයතනය** සි කියනු ලැබේ.

චක්ඛුරාදීන්හි පැවති ඒ ඒ චිත්ත-චෛතසික ධර්මයෝ, චක්ඛු-රාදීන් හා සම්බන්ධ පැවැතුම් ඇති හෙයින්, වාසය කරන්නවුන් මෙන් වෙත් නුසි, චක්ඛු ආදිය ඒ චිත්ත - චෛතසික ධර්මයන්ට **නිවාසඨානය වේ.** චක්ඛුරාදීන්හි ඒ චිත්ත - චෛතසික ආකීර්ණ හෙයින් ද, චක්ඛුරාදිය ඇසුරු කරන හෙයින් ද, ඒ රූපාදිය ආලම්බන කොට ඇති හෙයින් ද, චක්ඛුරාදිය ඒ චිත්ත - චෛතසික-යන්ට **ආකර** ද වේ.

---

[2] අ: නි: තිකනිපාත 154

චක්ෂුරාදිය ඒ ඒ චිත්ත- චෛතසිකයන් ගේ **සමෝසරණ ස්ථානය** ද වේ. ඒ ඒ එසතු- ද්වාර- ආලම්බන වශයෙන් රැස්වන සථාන හෙයින් චිත්ත- චෛතසික ධර්මයෝ, රැස්වන්නවුන් මෙන් හටගන්නාහු වෙති. ඒ චක්ෂුරාදීන් නිශ්‍රය බැවින් ද, රූපාදිය ආලම්බන බැවින් ද, ඔවුන් විෂයයෙහි මෑ උපදනා හෙයින් චක්ෂුරාදිය ඒ චිත්ත- චෛතසිකයනට **උත්පත්ති දේශයද** වේ. ඒ චක්ෂුරාදීන් නැති කල්හි ඒ චිත්ත- චෛතසික ධර්මයන් නූපදනා හෙයින් චක්ෂුරාදිය චිත්ත- චෛතසික ධර්මයනට **කාරණ** වේ.

මෙසේ **නිවාසසථානාර්ථයෙන්ද, ආකරාර්ථයෙන්ද, සමෝසරණසථානාර්ථයෙන් ද, හටගත් ප්‍රදේශාර්ථයෙන් ද,** (හෙවත් ර්ථයෙන් ද) **කාරණාර්ථයෙන් ද,** යන මෙතෙක් කරුණින් මේ ධර්මයෝ **ආයතනය, ආයතනය** යි කියනු ලැබෙත්. එහෙයින් කියනලද අර්ථයෙන් **චක්ඛු** නමුදු **ආයතන** නමුදු ඒ ම නුසි **චක්ඛායතනය** -පෙ- **ධම්ම නමුදු, ආයතන නමුදු** හේ ම නුසි **ධම්මායතනයයි** මෙසේ අර්ථ වශයෙන් විනිශ්චය දතයුතු.

(2) **ලක්ෂණ වශයෙන්,** චක්ෂුරාදීන්ගේ **ලක්ෂණ වශයෙන් ද** විනිශ්චය දතමනා යැ. එය **ඝඨන්ති නිද්දේශයෙහි** කී නයින් දතයුතු.

(3) **තාවන් ප්‍රමාණ වශයෙන්,** (එපමණ බැවින්) චක්ෂුරාදිය ද, ඔවුන් අයත් සභාව ධරන හෙයින් **ධම්ායතනය** යැ.

ප්‍රශ්නය:- එසේවන්නා **'ධම්ායතනයැයි'** නොවදුරා, **දවාදශායතනයැ** යි වදුලේ කවරහෙයින් ද.

පිළිතුර:- ෂඩ් විඤ්ඤනකායයන්ගේ හටගැනීමට කාරණ වූ **දවාර ආලම්බනයන්** පිරිසිඳ දැක්වීම සඳහා **දවාදශායතනයක්** වදුළහ.

ඒ එසේමැයි:- **චක්ඛුවිඤඤාණ** විපියෙහි ඇතුළත් වූ **විඤ්ඤනකාය** යාගේ හෙවත් **සඝම්ප්‍රයුක්ත චිත්තයාගේ** හටගැනීමට චක්ඛායතනය මෑ **ද්වාරය** වේ. රූපායතනය මෑ **ආලම්බනය** වේ. එසේම සෙසු ද්වාරාලම්බනයෝ ද, පිළිවෙළින් සොතවිඤඤාණාදියට **උත්පත්ති ද්වාර** හා, **ආලම්බන** වෙති.

සවැනි **මනොවිඤඤාණ ධාතුවට** ඇතුළත් වූ විඤ්ඤන කායයා ගේ හෙවත් **සඝම්ප්‍රයුක්ත භවාඞඟ චිත්තයා** ගේ **චලනය වි සිඳෙන මනායතනය** ගේ **ඒක** දේශයක් ම, මනොවිඤ්ඤයා ගේ හට ගැනීමට **ද්වාර** වේ. **චක්ඛුවිඤඤාණාදීන්** හා අසාධාරණ වූ ධම්ායතනය ම එයට **ආලම්බන** වන්නේය. භවාඞඟ චිත්තය චලනය වශයෙන් පැවැති කල්හි ආවජ්ජනය පවත්නා හෙයින්ද නොවූ කල නොපවත්නා හෙයින්ද මෙසේ කීයේ වේ.

මෙසේ ඔබ් විඤ්ඤත්ත කායයා ගේ උත්පත්තියට **මාර - ආලම්බන** බෙදූ දැක්වීම් වශයෙන් **දොළොස්** (12) **ආයතනයන්** දැක්වූහ.

මෙසේ මේ **ආයතන** කථාවෙහි (අනූන- අනධික භාවයෙන්) තාවත් ප්‍රමාණ වශයෙන් විභාග දතයුතු.

(4) **ක්‍රම වශයෙන්**:- මෙහිද පෙර **ස්කන්ධ** කථාවෙහි කී උත්පත්ති ක්‍රමාදීන් අතුරින් **දේශනා ක්‍රමය** මෑ යෙදෙන්නේය.

විශෙෂ:- **චක්ඛායතනාදීන්** ගේ **උත්පත්ති ක්‍රමාදියෙහි** විශෙෂ ඇති. අධ්‍යාත්මික ඔඛායතනයන් අතුරිනුදු දැකීම් හා හැපීම් සහිත **රූපාලම්බනය** අරමුණු කොට පවත්නා **චක්ඛායතනය** ප්‍රකට හෙයින් **පළමුවැ** වදුළහ. අනතුරුවැ දැකීම් රහිත ගැටීම් සහිත **ශබ්දායතනාදිය** අරමුණු කොට පවත්නා **සොතායතනාදිය** වදුළහ. **දක්ඛිණානුත්තරිය, ශ්‍රවණානුත්තරිය** ධර්මයනට හේතු භාවයෙන් බොහෝ උපකාර හෙයින්, **අධ්‍යාත්මිකායතන** අතුරින් **චක්ඛායතන - සොතායතන** දෙක **පළමුවැ** වදුළහ. එයට අනතුරුවැ **ඝාණාදි ආයතන තුන** වදුළහ. චක්ඛාදි පඤ්චායතනයන් මෑ ගෝචරයන් (ආලම්බනයන්) විෂය කොට ඇති හෙයින් **මනායතනය** අන්තයෙහි වදුළහ.

චක්ඛායතනාදීන්ට ගෝචර බැවින් වනාහි ඒ ඒ **අධ්‍යාත්මිකායතනයනට** අනතුරුවැ **බාහිරායතන** අතුරින් **රූපායතනාදිය** පිළිවෙළින් වදුළහ. වැලිදු **'චක්ඛුවිඤ්ඤාණාදීන් ගේ** හටගැනීම් හේතූන් නියම කිරීම් වශයෙන් මේ **ආයතනයන්** ගේ ක්‍රමය වදුළහයි, දතයුතුයි.

ඒ මෙසේයි:- **'චක්ඛුංචපටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං -පෙ- මනං පටිච්ච ධම්මෙච උප්පජ්ජති මනොවිඤ්ඤාණං'**[1] යි මෙසේ ක්‍රම වශයෙන් විනිශ්චය දතයුතුයි.

(5) **සංක්ෂෙප- විස්තර වශයෙන්:- සංක්ෂෙප** වශයෙන් වනාහි මනායතනය හා ධම්මායතන ඒකදේශයෙක් ද, **නාමයෙහි** සංග්‍රහ වේ. පිළිවෙළින් **අන්‍ය ආයතනයෝ රූපයෙහි** සංගෘහීත වෙත්. මෙසේ **ඒකාදශායතනය** මෑ **නාම - රූප** මාත්‍රයක් ම වේ.

විස්තාර වශයෙන් **අධ්‍යාත්මික ආයතන** අතුරින් ප්‍රථම වූ **චක්ඛායතනය** ජාති (සභාව) වශයෙන් **චක්ඛුඃප්‍රසාද** මාත්‍රය මැයි. **ප්‍රත්‍යය-ගති-නිකාය-පුද්ගල-** යන මොවුන් ගේ වශයෙන් අනන්ත භේද වේ.

---

1 ම: නි: උපරිපණ්ණාසකය 290

ප්‍රත්‍යය (ප්‍රත්‍යය නම්) කුශලා'කුශලාදි කම් හා ඒ ඒ කම්-යනට සහකාරී **කාරණ** වූ අභ්‍යන්තර- බාහිර ප්‍රත්‍යය යැ. ඔහු නානාවිධ වෙති.

ගති, නිරය ආදි පසඳව ගතින් ගේ වශයෙන් ද නානාවිධය.

නිකාය, ඇත්-අස්- ආදිවූ ද, ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදිවූ ද, ප්‍රභේදය නිකාය භේදයයි.

එක් එක් සත්ත්වයකු ගේ වශයෙන් **පුද්ගල** භේදය වේ.

සොතායතනාදි සතර දෙන ද (එසේම චක්ඛායතනය මෙන්මැ.) නානා භේද ඇත්තාහ. **මනායතනය,** කුශල- අකුශල-විපාක- ක්‍රියා වශයෙන් **එකුන් අනූවක්** (**89**) ප්‍රභේද ඇති. **එක්සිය එක්විස්සක්** (**121**) ප්‍රභේද ඇත්තේ හෝ වේ.

චක්ඛුවක්ඛු ආදි වසතු ප්‍රභේදයෙන් හා **දුක්ඛාපටිපදාදි** ප්‍රතිපදා ප්‍රභේදයෙන් ද අනන්ත ප්‍රභේද ඇත්තේ යි.

මෙහි **වසතු නම්** චක්ෂුර්ඝ්‍රාණාදිය ආදිය යැ. ඔවුන් ගේ වශයෙන් විඤ්ඤාණය අනන්ත ප්‍රභේද වේ.

ප්‍රතිපදා නම් දුක්ඛාපටිපදාදියයි. ආදි ශබ්දයෙන් **ධ්‍යාන, අධිපති, භූමි, ආලම්බන** ආදිය ගැනේ. ඔවුන් ගේ වශයෙන් ද **මනායතනය** අනේක විධයි.

රූප, ශබ්ද, ගන්ධ, රසායතනයෝ ද, සභාග, විසභාග ප්‍රත්‍යයාදීන් ගේ වශයෙන් නානා ප්‍රභේදයහ. නීලවර්ණය නීලවර්ණ-යට සභාග යැ. පීතාදිය එයට විසභාග යැ. කම්ාදිය ප්‍රත්‍යයයෝ යි. සෙසු භේද යට කී සේයි.

ඵොට්ඨබ්බායතනය, පඨවී, තෙජෝ, වායෝ ධාතූන් ගේ වශයෙන් ත්‍රිවිධ ය. **ප්‍රත්‍යයාදීන්** ගේ ප්‍රභේදයෙන් අනේකවිධයි.

ධම්මායතනය, වේදනා - සංඥා - සංස්කාර ස්කන්ධ ත්‍රයය, සූක්ෂ්ම රූප, නිර්වාණ යන **එකුන් සැත්තෑ** (69) **වක්** ධර්මයන් ගේ (i) **සභාව භේදයෙන්** හා (ii) **නානා ප්‍රභේද** කෙසින් අනේක විධයි.

(i) මෙහි **සුඛ-දුක්ඛ-උපෙක්ඛා** වේදනාදිය **සභාව භේදයයි.**

(ii) **චක්ඛු සම්ඵස්සජ වේදනා, සොතසම්ඵස්සජ වේදනාදිය නානාත්ව භේදය යි.**

මෙසේ සංක්ෂේප විස්තර විසින් ප්‍රභේද දත යුතුයි.

(6) **දතයුතු බව වශයෙන්** මෙසේයි:- සියලු සංස්කාරවූ **ආයතනයෝ** යමකින් නො ආ බැවින් හා, නො නික්මෙන බැවින් ද, **දතයුත්තාහ.** ඒ **ආයතනයෝ,** උත්පාදක්ෂණයෙන් යුතුයෙහි යම්කිසි තැනෙකින් එන්නාහු ද, නො වෙති. භඞ්ගක්ෂණයෙන්

මත්තෙහි යම්කිසි තැනකට යන්නාහු ද **නො** වෙත්. එහෙයින් මැ ඔවුහු උත්පාදක්ෂණයෙන් පූර්වයෙහි **නො** දත හැකි සවභාව ඇත්තාහු ය. විනාශයෙන් මතුයෙහි නැසෙන සවභාව ඇත්තාහ. එකී **පූර්වාන්ත- අපරාන්ත** දෙකට මධ්‍යයෙහි වූ දැන් පවත්නා ක්ෂණයෙහි හේතූන් හා සම්බන්ධ පැවැතුම් ඇති බැවින් කිසිවකු ගේ වශයට නො පැමිණ පවත්නාහ. එහෙයින් (විද්‍යමාන ක්ෂණයෙහි ද සුළුප කාලයක් පවත්නා බැවින් හා, අනිත්‍ය- දුඃඛ විපරිණාම සවභාව ඇති හෙයින්) කිසිවකු ගේ අදහසක් අනුවැ නො පවත්නාහ.

මෙසේ **කිසිවකින් නො එන** හෙයින් ද, **නො නික්මෙන** හෙයින් ද, විනිශ්චය දතයුතුයි.

අනතුරුව **නිරීහ** (චඤ්චල වීම් රහිත හටගැනීම් කෘත්‍ය) විශයෙන් හා, **අව්‍යාපාර** (නිරුත්සාහ) වශයෙන් මෙසේයි. **චක්ඛායතන – රූපාලම්බනාදියට** අප ගේ එක්වීමෙන්, විඥානය උපන්නේ නම් මැනැවැයි මෙබඳු අදහසෙක් නොවේ. ඒ **චක්ඛායතන-රූපාලම්බනාදීහු** විඥානය උපදවනු පිණිස **මාර** වශයෙන් හෝ, **වසතු** වශයෙන් හෝ, **ආලම්බන** වශයෙන් හෝ උත්සාහ නො කරන්නාහු ය. උත්සාහයට හෝ නො පැමිණෙති. චඤ්චල-වීම සමග හටගන්නාවූ කෘත්‍යයන් ගේ වශයෙන් ඊහ නම් වෙයි. මෙසේ වේවයි සිතීම් වශයෙන් ක්‍රියා කිරීම ව්‍යාපාර නම් වේ.

වැලි **චක්ඛායතන – රූපාලම්බනාදීන් ගේ** සමවායයෙන් **චක්ඛුවිඤ්ඤාණාදීන් ගේ** හටගැනීම සවභාව ධර්මයෙන් මැ වේ. එහෙයින් මැ **නිරුත්සාහයෙන් ද, අව්‍යාපාරයෙන් ද** මේ **ආදශ්‍යතනයෝ** දතයුත්තාහ. වැලිදු මේ **අධ්‍යාත්මිකායතන** සදෙන **නිත්‍ය, සුඛ, සුභ, ආත්මය** යන මෙයින් විරහිත හෙයින් මිනිසුන්ගෙන් **සිස්වූ ගමක්** මෙන් දතයුතු.

බාහිරායතන සදෙන අධ්‍යාත්මිකායතනයට අතිශයින් වෙහෙස කරන බැවින් **ගම්පහරන සොරුන් මෙන්** දතයුතු. **"චක්ඛු භික්ඛවෙ හඤ්ඤති මනාපා'මනාපෙහි රූපෙහි"**[1] 'මහණෙනි! චක්ඛායතන මනාප- අමනාප රූපයන් විසින් හිංසා කරනු ලැබේ' යනාදිය එසින් වදාළහ.

තවද, **අධ්‍යාත්මිකායතන** සදෙන **සර්පයා, කිඹුල්යා, උකුසු යා, සුනඛයා, ශෘගාල යා, වඳුරු යා,** යන ඉඳි ප්‍රාණීන් මෙන් දැක්ක යුත්තාහ. **බාහිරායතන** සදෙන ඒ ප්‍රාණීන් ගේ සිත් ඇලවීමට

[1]සං: නි: සළායතනසංයුත්තක 656

සුදුසු වූ- **තුඛසය, බිලය, ආකාසය, ඇතුළු ගමය, අමුසොහොනය, අරණ්‍යය** යන ෂට් ගෝචර ස්ථානයන් මෙන් පිළිවෙළින් දැක්ක යුත්තාහ.

මේ දතයුතු බව වශයෙන් විනිශ්චයයි.

මේ ආදශායතනයන් ගේ විස්තර කථාවයි.

ධාතු කථාව (2)

ආයතන කථාවට අනතුරු වැ **ධාතු කථාව** දක්වනු ලැබේ.

මෙහි **1 චක්ඛු ධාතු, 2 රූපධාතු, 3 චක්ඛු විඤ්ඤාණ ධාතු, 4 සොත ධාතු, 5 සද්ද ධාතු, 6 සොත විඤ්ඤාණධාතු, 7 ඝාණ ධාතු, 8 ගන්ධ ධාතු, 9 ඝාණ විඤ්ඤාණධාතු, 10 ජිව්හා ධාතු, 11 රසධාතු, 12 ජිව්හා විඤ්ඤාණධාතු, 13 කාය ධාතු, 14 ඵොට්ඨබ්බධාතු, 15 කායවිඤ්ඤාණධාතු, 16 මනො ධාතු, 17 ධම්ම ධාතු, 18 මනොවිඤ්ඤාණ ධාතු ය ය ධාතූහු අටලොසෙකි.**

මෙහි (1) **අර්ථ** වශයෙන් ද, (2) **ලක්ඛණාදීන්** වශයෙන් ද, (3) **ක්‍රම** වශයෙන් ද, (4) **තාවත් ප්‍රමාණ** වශයෙන් ද, (5) **සඞ්ඛ්‍යා** වශයෙන් ද, (6) **ප්‍රත්‍යය** වශයෙන් ද, (7) **දතයුතු** බැවින් ද විනිශ්චය දතයුතු ය.

1. **අර්ථ වශයෙන්** මෙසේයි:- අරමුණු රස විඳින්නේ, හෙවත් රූපාලම්බනය ප්‍රකට කොට දක්නේ **චක්ඛු නම.** (ලෙහි වත් බව) ප්‍රකට කරන්නේ **රූප නම.** ඒ චක්ඛුහු ගේ + විඤ්ඤාණය= **චක්ඛු විඤ්ඤාණය යැ.** මේ ආදි ක්‍රමයෙන් චක්ඛු ආදීන් ගේ **විශෙෂාර්ථ වශයෙන්** විනිශ්චය දත යුතු ය. (රූප, ආලෝක, මනසිකාරාදීහු චක්ඛුර්ඥානයා ගේ උපැත්මට හේතු වුව ද, **චක්ඛුව අසාධාරණ හේතු** වශයෙන් දක්වන ලදි. සෝතාදි සෙස්සෙහි ද මෙසේ මැයි.)

අවිශෙෂ අර්ථ (සාමාන්‍ය) වශයෙන් වනාහි:- (1) "මෙසේ මේසේ තා විසින් පැවැතිය යුතුය" යි විනියෝග කරන්නාක් මෙන් උපදවන්නේ නුයි හෝ (**කර්තෘකාරක** හෙයිනි.) (ii) (සත්ත්වයන් විසින්) ධරනු ලැබේනුයි හෝ (**කර්ම කාරක** හෙයිනි.) (iii) දුක්ඛයාගේ විධානය නුයි හෝ (**භාව කාරක** හෙයිනි.) iv **මේ කරණ** කොට ගෙන සංසාර දුක්ඛය විධාන කරනු ලැබේ නුයි හෝ, (**කරණ කාරක** හෙයිනි.) (v) **මෙහි** සංසාර දුක්ඛය පිහිටුවනු ලැබේනුයි හෝ (**ආධාර කාරක** හෙයිනි.) **ධාතු නම් වේ.**

විභාග:- (i) **සඛණී**- රජතාදීන්ට බීජය වූ ශෛලාදි ධාතූන් සුවණී රජතාදිය උපදවන්නාක් මෙන් **ලෞකික** වූ ධාතුහු, (**කාරණ** වීම් වශයෙන් පිරිසිඳින ලදු වැ) නොයෙක් ආකාර වූ සසර දුක උපදවති.

(ii) බර උසුලන්නවුන් විසින් උසුලනු ලබන බර මෙන්, සත්ත්වයන් විසින් චක්ෂුරාදි ධාතුහු උසුලනු ලබත් යැ යන අර්ථයි.

(iii) මේ ධාතූන් වශයෙහි නො පවත්නා හෙයින් දුක් ඉපයීම් මාත්‍රයෙක් මැයි.

(iv) (**කාරණවූ**) මේ චක්ඛාදීන් **කරණ** කොට ගෙන සත්ත්වයන් විසින් සසර දුක ගළපනු ලැබේ

(v) **එසේ** ගළපන ලද්දාවූ ඒ සසර දුක ඒ චක්ෂුරාදි විෂයයෙහි පිහිටුවනු ලැබේ. (මේ යට දැක්වූ සංක්ෂෙපයා ගේ ඒ ඒ කාරක සම්බන්ධ විස්තාරයයි.

මෙසේ **චක්ඛුරාදි ධාතූන්** අතුරින් එක් එක් සවභාව ධර්මයක් ලැබෙන- ලැබෙන පරිද්දෙන් විදධති= උපදවයි; ධියතෙ= ධරනු ලැබේ. යනාදි අර්ථ වශයෙන් ධාතු යයි කියනු ලැබේ.

තවද:- ජීවකයින් ගේ ආත්මය පරමාර්ථ වශයෙන් නැත්තාක් මෙන්, මේ ධාතුහු පරමාර්ථ වශයෙන් නැත්තාහු නොවෙති. මේ චක්ඛුරාදීහු තමා ගේ සවභාව ධරන හෙයින් **ධාතු** නම් වෙති.

තවද, ලෙව්හි විසිතුරු හිරියල්- මනොසිලාදි **ශෛලාවයව ධාතුයයි** කියන්නා සේ, මේ චක්ඛුරාදීහු ද ශෛලාවයව ධාතූන් වැනි හෙයින් **ධාතු** නම් වෙති. මේ **අටලොස් ධාතුහුම** කෂණ-ක්ෂෙයය ධර්මයන් ගේ අවයව වන හෙයින් විචිත්‍රයෝ යි.

යම්සේ ශරීරය යි කියන ලද මේ පුඤ්ජයා ගේ අවයව වූ ඔවුනොවුන්ට විසභාග **ලක්ඛණයෙන්** පිරිසිඳින ලද රස ශ්‍රොණිතාදි-යේ **ධාතු** යන නාමය වේද, **පඤ්චඛන්ධය** යි කියන ලද මේ **ආත්ම** භාවයා ගේ (කොටස් වූ) අවයවයන් ගේ ද **'ධාතු'** යන ව්‍යවහාරය දතයුතුයි.

මේ චක්ඛුරාදීන් **එකිනෙකට** අසමාන සවභාව විසින් පිරිසිඳින ලද්දාවුන් හෙයිනි. (රසාදි සපත ධාතූන්හි නිරුඬ වූ 'ධාතු, ශබ්දය චක්ඛුරාදීන්හි ද සදෘශොපචාර වශයෙන් යෙදේ.)

තවද අර්ථයෙකි:- මේ **ධාතු** යනු නිර්ජීව මාත්‍රයට මෑ නමෙකි. එහෙයින් "**ධාතුරෝ අයං භික්ඛු පුරිසෝ**"[1] **මහණ!** මේ පුරුෂ-තෙමේ ඔබ් ධාතු මාත්‍රයක් ඇත්තේය" යි යනාදීන්හි ජීව සංඥව (**අත්ත** සංඥව) සිදීම පිණිස **බුදුහු** ද ධාතු දේශනා වදාළහ. එහෙයින් මෑ **නිස්සත්තට- නිර්ජීවාර්ථයෙන්** (චක්ඛුව තං ධාතුව= චක්ඛුධාතු) 'චක්ඛු වූයේත්, ධාතු වූයේත් හේම නුසි චක්ඛු ධාතු නම්, සෙස්සෙහි ද මෙසේ මැයි. (මනොවිඤ්ඤාණඤ්චතං ධාතුව= මනෝ විඤ්ඤාණ ධාතු) 'මනෝ විඤ්ඤාණය වූයේත්, ධාතු වූයේත් හේම නුසි මනෝ විඤ්ඤාණ ධාතු නම්, මෙසේ මෙහි අර්ථ වශයෙන් විනිශ්චය දතයුතුයි.

(2) **ලක්ඛණාදි වශයෙන්,** ඒ චක්ඛු ආදීන් ගේ **ලක්ඛණාදිය ඛන්ධනිද්දේශයෙහි**[2] කී පරිද්දෙන් දතයුතු ය.

(3) **ක්‍රම වශයෙන්,** මේ ධාතු නිදේශයෙහි ද, පෙර **ආයතන නිද්දේශයෙහි**[3] කීසේ, උත්පත්ති ක්‍රමාදිය අතුරින් **දේශනා ක්‍රමයමැ** යෙදේ. හෙද වනාහි **හේතු- ඵල ධර්මයන්** ගේ පටිපාටිය නිශ්චය කිරීම් වශයෙන් වදාළ සේක.

ඒ මෙසේයි:- **චක්ඛුධාතු- රූපධාතු** යන මේ දෙකම **හේතු** නම්. චක්ඛුවිඤ්ඤාණ ධාතුව **ඵලයයි.** මේ නයින් ශ්‍රොත්‍රධාත්වාදි සියලු තන්හි ක්‍රම වශයෙන් විනිශ්චය දතයුතු ය.

(4) **තාවත් ප්‍රමාණ වශයෙන්.** ඒ ඒ **සූත්‍ර** - අභිධර්ම දේශනාවන්හි 'ආපෝ ධාතු ය, සුභා ධාතු ය, ආකාසානඤ්චා-යතන ධාතු ය, විඤ්ඤාණඤ්චායතන ධාතු ය, ආකිඤ්චඤ්ඤා-යතන ධාතු ය, නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධාතු ය, සඤ්ඤාවෙදයිත නිරොධධාතු ය, කාම ධාතු ය, නෙක්ඛම්ම ධාතු ය, ව්‍යාපාද ධාතු ය, විහිංසා ධාතු ය, අව්‍යාපාද ධාතු ය, අවිහිංසා ධාතු ය, සුඛ ධාතු ය, දුක්ඛ ධාතු ය, සෞමනස්ස ධාතු ය, දෞමනස්ස ධාතුය, උපෙක්ඛා ධාතුය, අවිජ්ජා ධාතුය, ආරම්භ ධාතු ය, නික්කම ධාතු ය, පරක්කම ධාතු ය, ඛීන ධාතු ය, මජ්ඣිම ධාතු ය, පණීත ධාතු ය, පඨවි ධාතු ය, ආපෝ ධාතු ය, තෙජෝ ධාතු ය, වායෝ ධාතු ය, ආකාස ධාතු ය, විඤ්ඤාණ ධාතු ය, සඞ්ඛත ධාතු ය, අනෙක ධාතු-නානා ධාතු ලෝකය,යි මේ ආදි අන්‍ය වූ ධාතුහුද දක්නා ලැබෙති.

ප්‍රශ්නයෙකි:- මෙසේ ඇති කල්හි මේ සියලු **පන්තිස්** (35) ධාතූන් ගේ වශයෙන් නො පිරිසිඳ, **අටළොස්** (18) ධාතුය යි මේ ප්‍රමාණය ම කරන ලද්දේ කවර හෙයින් ද?

---

[1]ම: නි: උපරිපණ්ණාසක 245 [2]සි: වි: 650 දවිතීය

[3]සි: වි: 725 පිට

පිළිතුර:- සභාවයෙන් (පරමාර්ථ වශයෙන්) පවත්නා **ආභාදි** සියලු ධාතු ඒ අටළොස් (18) ධාතූන්හි ඇතුළත් වන හෙයිනි.

විසඳුම:- චන්ද්‍රාභාදි **ආභා ධාතුව රූප ධාතුවක්** මැයි. (සුභ නිමිත්ත සඞ්ඛ්‍යාත) **සුභා** ධාතුව **රූපාදී ආලම්බන** පිළිබඳ යැ. කවර හෙයින්ද යත්:- සුභ නිමිත්ත වන හෙයිනි. **සුභාධාතු** තම් සුභ නිමිත්ත මැයි. හෙද රූපධාන්‍වාදීන් විනිර්මුක්තවූවක් නැත් මැයි.

තවද, කුශල විපාක චිත්තයට අරම්මණු වූ **රූපාලම්බනාදිය මැ සුභාධාතු** නම් වේ. ඒ කුශල විපාක චිත්තයට ආලම්බන වූ හෙයින් ම සුභාධාතුව රූපාදි ආලම්බන මාත්‍රයක් ම වේ. **ආභාසානඤ්චායතන ධාතු** ආදියෙහි චිත්තය **මනොවිඤ්ඤාණ ධාතුම ය.** සෙසු සහජාත ධර්ම **ධම්මධාතු** නම්. **සඤ්ඤා වෙදයිත නිරොධ ධාතුව** වනාහි (සභාව වශයෙන්) පරමාර්ථ වශයෙන් නැති. එය මනොවිඤ්ඤාණ ධාතු, ධම්ම ධාතූන් ගේ **නිරුද්ධකිරීම්** මාත්‍රයෙක් ම ය.

කාම ධාතුව, ධම්ම ධාතු මාත්‍රයෙක් ම වේ. එයින් කීහ. **"තත්ථ කතමා කාම ධාතු, කාම පටිසංයුත්තා තක්කෙකා-විතක්කෙකා- මිච්ඡාසංකප්පෝ"**[1] යි එහි කාම ධාතු නම් කාම-ප්‍රතිසංයුක්ත වූ තර්කය, විතර්කය, මිථ්‍යා සංකල්පය,

තවද:- **අටළොස් ධාතුම කාම ධාතු යැ.** යමින් අවීචිය හිමිකොට උඩින් පරනිම්මිත වසවර්තිය ඇතුළත් කොට මේ අතරෙහි පවත්නා, මේ අතර හැසිරෙන්නා වූ, මේ අතර ඇතුළත් වූ **සඤ්ඤා - ධාතු - ආයතන - රූප - වේදනා - සංඥා - සංඝාර-විඤ්ඤාණ** යන මේ **කාම ධාතු යැ.**

නෙක්ඛම්ම ධාතුව, ධම්මධාතුව මැයි. තවද **'සියලු කුශල ධර්ම නෙක්ඛම්ම ධාතු ම යැ'**[1] යි වදාළ හෙයින්, **මනොවිඤ්ඤාණ ධාතුව ද නෙක්ඛම්ම ධාතුව මැ යි.**

ව්‍යාපාද - විහිංසා, අව්‍යාපාද - අවිහිංසා, සුඛ - දුක්ඛ-සොමනස්ස - දොමනස්ස - උපෙක්ඛා, අවිජ්ජා - ආරම්භ-නික්කම පරක්කම ධාතු ද ධම්ම ධාතුවෙකි මැ ඇතුළත් වේ. **හීන - මධ්‍යම - ප්‍රණීත ධාතූහු අටළොස් ධාතු** මාත්‍රය මැයි.

ඒ මෙසේයි:- හීනවූ චක්ඛුරාදිය **හීන ධාතු** නම්. මධ්‍ය-ප්‍රණීත චක්ඛුරාදිය **මධ්‍යම - ප්‍රණීත ධාතු** නම් වේ. මුඛ්‍ය වශයෙන් **අකුශල මනොවිඤ්ඤාණ ධාතු-ධම්ම ධාතූහු හීන ධාතු** නම්ය.

[1]වි: ප: ධාතු විභඞ්ග 65

ලෞකික කුශල-අව්‍යාකෘත දෙක ද, චක්ඛුර් ධාතු ආදියද, **මධ්‍යම ධාතු** නම. **ලෝකෝත්තර ධර්ම ධාතු- මනොවිඤ්ඤාණ ධාතු, ප්‍රණීත ධාතු** නම.

පඨවි-තේජෝ වායෝ ධාතුහු **තොටැබඹ ධාතු මැයි.** ආකාස ධාත - ආපෝ ධාතු දෙක **ධම්ම ධාතු** මැයි. **විඤ්ඤාණ** ධාතුව. **චක්ඛු විඤ්ඤාණාදි සපත විඤ්ඤාන ධාතූන්** ගේ සංග්‍රහයෙක් මැයි. **සත්තලොස්** (17) **ධාතු ද** ධර්මධාතුහු ගේ ඒක දේශයක් ද, **සඞ්ඛත ධාතු** නම. **අසඞ්ඛත ධාතුව** වනාහි **ධර්ම ධාතුවේ** ඒක දේශයෙක් මැයි. **අනේඤ ධාතු- නානා ධාතු ලෝකය** වනාහි **අටලොස් ධාතූන්** ගේ ප්‍රභේද මාත්‍රයෙක් මැයි.

මෙසේ පරමාර්ථ වශයෙන් විද්‍යමාන වූ සියලු ධාතූන් **අටලොස්** ධාතූන්හි ඇතුළත් බැවින්, **අටලොසක්** ම වදුළහ.

තවද ක්‍රමයෙකිඃ- ආලම්බන විජානන ලක්ෂණ වූ විඤ්ඤාණයෙහි ජීව සංඥ ඇති පුද්ගලයන් ගේ සංඥ විපල්‍යාශය නැසීම පිණිස ද, **අටලොසක්** ම වදුළහ.

ඒ එසේමැයි:- විජානන සභාව වූ **විඤ්ඤාණයෙහි** ජීව සංඥ ඇති සත්ත්වයෝ ඇත්තාහ.ඒ සත්ත්වයනට **චක්ඛු-සොත-ඝාණ-ජිව්හා-කාය - මනෝ - මනොවිඤ්ඤාණ** යන ධාතූන්ගේ භේදයෙන් ඒ විඤ්ඤාණයාගේ **අනෙකත්වය ද, චක්ඛුඃප්‍රසාදය, රූපාලම්බනය,** ආදී වූ ප්‍රත්‍යයයන් අයත් පැවැතුම් ඇති බැවින් **අනිත්‍ය** බව ද, ප්‍රකාශ කොට දීර්ඝ කාලයක් මුළුල්ලේ සන්තානයෙහි පැවැති ජීව සංඥව සමූල ඝාතනය කරනු කැමති භාග්‍යවතුන් වහන්සේ **අටලොස් ධාතුහු** වදුළහ.

බෙහෙවින් කියනු කිම? චෛතේයයන් ගේ අදහස් වශයෙන් ද **අටලොසක්** ම වදුළහ.

නාති සංඛෙප නාති විත්‍ථාර වූ මේ දේශනාවෙන්, යම් සත්ත්වයෙක් විනයනය කරනු කැමතිවූහු නම්, ඔවුන් (විනයනය කරනු කැමැති ජනයන්) ගේ අදහස් වශයෙන් ද **අටලොසක්** ම වදුළහ.

"සඞ්ඛෙපවිත්ථාරනයෙන තථා තථා ඛි
ධම්මංපකාසයති එස යථා යථා'ස්ස
සඤ්ඤාමතෙජවිහතං විලයංඛණෙන
වෙනෙය්‍ය සන්තහදයෙසු තමෝ පයාති"

'ඒ බුදුහු යම් යම් පරිද්දෙකින් සදහම් තෙදින් වෙනෙය ජනයන් ගේ චිත්ත සන්තානයෙහි මෝහාන්ධකාරය ඇසිල්ලෙකින් විනාශයට පැමිණේ නම් ඔවුනට ඒ ඒ සංඛෙප- විත්‍ථාර තයින් ධර්මය දෙසන සේක.

මෙසේ තාවත් ප්‍රමාණයෙන් විනිශ්චය දතයුතු.

(5) **සඞ්ඛ්‍යා වශයෙන් චක්ඛුධාතුව** ශ්‍රෝත්‍ර ධාතු ආදියට පළමුවැ ජාති වශයෙන් චක්ඛුපසාද වශයෙන් **එකම ධර්මයෙකැයි** ව්‍යවහාරයට යේ. **ශ්‍රෝත්‍ර – ඝ්‍රාණ – ජිව්හා – කාය – රූප – ශබ්ද – ගන්ධ – රස ධාතූහු ද** එසේ ම ශ්‍රෝත්‍රප්‍රසාදාදි වශයෙන් **එකම ධර්මයෙකැයි** ව්‍යවහාරයට යෙති.

ඵොට්ඨබ්බධාතුව වනාහි **පෘථිවි – තේජස් – වායු** – වශයෙන් **ධර්ම තුනෙකැ යි** ව්‍යවහාරයට යේ.

චක්ඛුවිඤ්ඤාණධාතුව, කුසල විපාක – අකුශල විපාක වශයෙන් **ධර්ම දෙකෙකැ යි** ව්‍යවහාරයට යේ. **සොත – ඝාණ-ජිව්හා – කාය විඤ්ඤාණධාතු ද** එසේම කුසලා‘කුසල විපාක වශයෙන් **ධර්ම දෙකෙකැ යි** ගණනට යේ. **මනෝධාතුව** වනාහි, **පඤ්චද්වාරාවජ්ජනය,** කුසලා‘කුසල විපාක **සම්පටිච්ඡනය** යන මොවුන් ගේ වශයෙන් **ධර්ම තුනෙකැ යි** ව්‍යවහාරයට යේ.

ධර්ම ධාතුව වනාහි, **වෙදනා – සඤ්ඤා – සඞ්ඛාර** යන ත්‍රිවිධ අරූපසකන්ධ යැ, **ඕඩශවිධ (16) සූක්ෂ්ම රූපයැ, අසඞ්ඛත ධාතුයැ,** යන මොවුන් ගේ වශයෙන් **විංශති (20) ධර්මයෙකැයි** ව්‍යවහාරයට යේ.

මනෝවිඤ්ඤාණ ධාතුව කුශල යැ, අකුශල යැ, අව්‍යෙෂ අව්‍යාකෘත චිත්ත යැ, යන මොවුන් ගේ වශයෙන් **සත්තැ (7) ධර්මයෙකැ යි** ව්‍යවහාරයට යේ.

මෙසේ **අටළොස් ධාතූන් ගේ** සඞ්ඛ්‍යා වශයෙන් විනිශ්චය දතයුතු.

(6) **ප්‍රත්‍යය වශයෙන් මෙසේයි: චක්ඛුධාතුව** චක්ඛුවිඤ්ඤාණ ධාතුවට, **විපාකඋත්ත – පුරෙජාත – අත්ථි – අවිගත – නිස්සය – ඉන්ද්‍රිය** – යන **ෂට් ප්‍රත්‍යයයෙන්** ප්‍රත්‍යය වේ.

රූප ධාතුව, චක්ඛුවිඤ්ඤාණ ධාතුවට, **පුරෙජාත – අත්ථි – අවිගත – ආරම්මණ** යන ප්‍රත්‍යයන් ගේ වශයෙන් **සිවු ප්‍රත්‍යය-යෙන්** ප්‍රත්‍යය වේ.

සොතවිඤ්ඤාණ ධාතු ආදියට, **සෝතධාතු – සද්දධාතු –** ආදිය ද මෙසේ ම ප්‍රත්‍යය වේ. **මේ චක්ඛුවිඤ්ඤාණාදි පඤ්ච පඤ්චද්වාරාවජ්ජන සඞ්ඛ්‍යාත ආවජ්ජන මනෝධාතුව, අනන්තර-සමනන්තර – නත්ථි – විගත – අනන්තරූප නිස්සය** වශයෙන් **පස් ආකාරයෙකින්** ප්‍රත්‍යය වේ.

සම්පටිච්ඡන මනෝධාතුවට, චක්ඛුවිඤ්ඤාණාදි **මේ පස මෑ අනන්තරාදි පස්** ආකාරයෙන් ප්‍රත්‍යය වේ. **සම්පටිච්ඡන මනෝ-ධාතුව,** සන්තීරණ මනෝවිඤ්ඤාණ ධාතුවට ද, **සන්තීරණ මනෝ-විඤ්ඤාණධාතුව** වොට්ඨපන මනෝවිඤ්ඤාණ ධාතුවටද, **වොට්ඨපන**

මනොවිඤ්ඤාණ ධාතුව ජවන **මනොවිඤ්ඤාණ ධාතුවට ද,** පෙර කී **පඤ්ච ද්වාරයෙන්** ප්‍රත්‍යය වේ.

මුලින් වූ ජවන මනෝවිඤ්ඤාණ ධාතුව අනතුරු අනතුරු ජවන මනෝවිඤ්ඤාණ ධාතුවට යට කී **පඤ්ච ද්වාරයෙන්** හා **ආසෙවන** ප්‍රත්‍යයයෙන්ද යි යන **සය ආකාරයෙන්** ප්‍රත්‍යය වේ.

මේ පඤ්චවාරයෙහි ප්‍රත්‍යය ක්‍රමය යි.

මනොද්වාරයෙහි වනාහි භවඞ්ග මනොවිඤ්ඤාණ ධාතුව ආවජ්ජන මනොවිඤ්ඤාණ ධාතුවට ද, ආවජ්ජන මනොවිඤ්ඤාණ ධාතුව, ජවන මනොවිඤ්ඤාණ ධාතුවට ද පෙර කී **පඤ්චවිධ** ප්‍රත්‍යයෙන් මෑ ප්‍රත්‍යය වේ.

ධම්මධාතුව වනාහි, සපුනා විඤ්ඤාණ ධාතූන්ට මෑ **සහජාත-අඤ්ඤමඤ්ඤ - නිස්සය - සම්පයුත්ත - අත්ථි - අවිගත** ආදින්ගේ වශයෙන් **බහුප්‍රකාරයෙන්** ප්‍රත්‍යය වේ.

(ආදි ශබ්දයෙන් මනොවිඤ්ඤාණ ධාතුවම සුදුසු සේ **හේතු-අධිපති - කම්ම - විපාක - ආහාර - ඉන්ද්‍රිය - ඣාන - මාර්ග ප්‍රත්‍යයයන්ගෙන්** සංග්‍රහ වේ.)

විශෙෂ:- **චක්ඛුධාතු** ආදිය ද, ඇතැම් සූක්ෂම රූප-නිර්වාණ ධාතු ආදි **ධම්මධාතු ද,** ඇතැම් මනොවිඤ්ඤාණ ධාතූන්ට (දර්පණාදි විඤ්ඤාණ ධාතුව හැර) **ආරම්මණ ප්‍රත්‍යයාදියෙන්** ප්‍රත්‍යය වේ. චක්ඛුවිඤ්ඤාණ ධාතු ආදියට හුදෙක් චක්ඛු - රූපාදිය පමණක් ප්‍රත්‍යය නොවේ. වැලි **ආලෝක** ආදියද ප්‍රත්‍යය වේ.

එසින් කිහ, **පෙරැජරෝ, චක්ඛුප්පසාද, රූපාලම්බන, ආලෝක, මනසිකාරයන්** (පඤ්චද්වාරාවජ්ජන) නිසා **චක්ඛු විඤ්ඤාණ සිත** උපදියැ යි.

ශ්‍රෝත්‍ර, ශබ්ද, ශ්‍රෝත්‍රවිවර, (අවකාශ) **මනසිකාරයන් නිසා සොතවිඤ්ඤාණ සිත උපදී. ඝ්‍රාණ, ගන්ධ, ගන්ධ ඵලවන සුළඟ, මනසිකාරයන් නිසා ඝාණවිඤ්ඤාණ සිත** උපදී. **ජිව්හා රස,** (ආහාර තෙමන) **ආප, මනසිකාරයන් නිසා ජිව්හා, විඤ්ඤාණ සිත** උපදී. **කාය, සප්‍රතිඝ, කායප්‍රසාදයට නිශ්‍රය පඨවි, මනසිකාරයන් නිසා කායවිඤ්ඤාණ සිත** උපදී. **භවාඞ්ග චිත්ත, ධම්මාලම්බන, මනසිකාර** යන මොවුන් නිසා **මනොවිඤ්ඤාණ සිත** උපදී. මේ මෙහි සංක්ෂෙපයයි. විස්තර වශයෙන් ප්‍රත්‍යය විභාගය, මතු **පටිච්චසමුප්පාද** නිදේශයෙහි[1] පහළ වේ.

සී: ව්: 17 නිදේශය

මෙසේ **මේ ධාතු කථා නිදේශයෙහි ප්‍රත්‍යය වශයෙන් විනිශ්චය දතයුතු.**

(7) **දතයුතු බැව් වශයෙන්** සියලු ප්‍රත්‍යයොත්පන්න ධාතුහු, **පූර්වාන්ත – අපරාන්ත – සඞ්ඛ්‍යා – අතීත – අනාගත භාවයෙන්** සිස්වූ හෙයින් ද, **ධ්‍රුව– සුභ– සුඛ– ආත්ම භාව ශූන්‍යතායෙන්** ප්‍රත්‍යයන් අයත් පැවතුම් ඇති බැවින් ද, දැක්ක යුත්තාහ.

විශේෂ:– මේ අටලොස් **ධාතු** අතුරින් **චක්ඛු ධාතුව** බෙර ඇසක් මෙන්ද, **රූප ධාතුව** දණ්ඩක් මෙන්ද, **චක්ඛුවිඤ්ඤාණ** ධාතුව ශබ්දය මෙන්ද, දතයුතුයැ.

එසේම **චක්ඛු ධාතුව** ආදර්ශතලයක් මෙන්ද, **රූප** ධාතුව මුහුණක් මෙන්ද, **චක්ඛුවිඤ්ඤාණ** ධාතුව මුඛ නිමිත්ත මෙන්ද, දතයුතුයැ.

චක්ඛුධාතුව **උක්දඬු– තලඇට** මෙන් ද, රූප ධාතුව **යන්ත්‍ර– චක්‍ර යෂ්ටීන්** මෙන් ද, **චක්ඛුවිඤ්ඤාණ ධාතුව උක්පැණි තලතෙල්** සේ ද දතයුතු.

චක්ඛුධාතුව ගිනිගාතා දණ්ඩමෙන් ද, **රූපධාතුව** මිතුයෙහි වූ දණ්ඩ මෙන් ද, චක්ඛුවිඤ්ඤාණ ධාතුව ඉන් හටගන්නා ගිනි මෙන් ද දතයුතු.

සෝතධාතු ආදීන්හි ද, මේ ක්‍රමය මැයි.

මනෝධාතුව වනාහි ලැබෙන සැටියෙන් චක්ඛුවිඤ්ඤාණ ධාතු ආදීන්ට පසුවවාරුවජ්ජන **මනොධාතුව** පෙරටුව යන්නාක් මෙන්ද, සම්පටිච්ඡන **මනොධාතුව** පසුව යන්නාක් මෙන් ද, දැක්ක යුතු ය. **ඛම් ධාතුවෙහි වේදනාඛන්ධය** හුලක් මෙන් ද, රැජාවක් මෙන් ද, **සංඥා, සංඛාර ඛන්ධයෝ,** වේදනා සල්ලයෙන් හට ගත් රැජායෙන් ආතුර වූ **රෝගියෙකු මෙන්ද,** දත යුතුය.

තවද පෘථග්ජනයන් ගේ සංඥුව ආසා සඞ්ඛ්‍යාත දුක උපදවන හෙයින් **ඉස් මිටක් මෙන්ද,** විපරීත වූ ආලම්බන සඞ්ඛ්‍යාත නිමිත්ත ගන්නා හෙයින් **වල් මුවකු මෙන් ද,** (පඬියා මිනිසෙකැයි වරදවා ගන්නා හෙයිනි.) සංඛාරයන් ප්‍රතිසන්ධියෙහි ඇද බහාලන හෙයින් **අඟුරු වළෙහි හෙලාලන පුරුෂයන් මෙන් ද,** ජාති දුක ලුහුබඳනා හෙයින්, රාජ පුරුෂයන් විසින් ලුහුබඳනා ලද **සොරුන් මෙන් ද,** සියලු අතීත එළවන්නා වූ සඞ්ඛ පරම්පරාවට හේතුවන හෙයින් **විෂ වෘක්ෂ බීජයන් මෙන් ද,** රූපසඞ්ඛය නානාවිධ උපද්‍රවයට නිමිතිවන හෙයින් **උරච්ඡ්‍රමාලාවක් මෙන් ද** දත යුතු ය.

අසඞ්ඛත ධාතු සඞ්ඛ්‍යාත **නිබ්බාණය** වනාහි **අමෘත** වශයෙන් ද, **ශාන්ත** වශයෙන් ද, **නිත්‍ය** වශයෙන්ද දතයුතු සි.

කුමක් හෙයින්ද යත්? සියලු අනර්ථය එළවන්නා වූ ජාත්‍යාදි විෂය ධර්මයන්ට ප්‍රතිපක්ෂ හෙයිනි.

මනොවිඤ්ඤාණ ධාතුව, අරමුණෙහි නියමයක් නැති හෙයින් **වල්වඳුරකු** මෙන්ද, දමනය නො කළ හැකි හෙයින් **කුඵ අසකු** මෙන්ද, තමා කැමති අරමුණෙහි හෙන හෙයින් **අහසෙහි ලූ දඹු කඩක්** මෙන් ද, ලෝභ- ද්වේෂ- මෝහාදි නානාප්‍රකාර කෙලෙස තමැති වේෂයෙන් යෙදෙන හෙයින් **රඟමඬලෙක නළුවකු** මෙන් ද දැක්ක යුතු ය.

මේ ධාතූන් ගේ විස්තර කථාවයි.

සාධු ජනයන් ගේ ප්‍රමෝදය පිණිස කළ "විශුද්ධි මාර්ගයෙහි" ප්‍රඥාභාවනාධිකාරයෙහි, ආයතන- ධාතු නිද්දේශ නම් පඤ්චොස් වන පරිච්ඡේදය යි.

ඉන්ද්‍රිය - සත්‍ය නිර්දේශය

ඉන්ද්‍රිය නිර්දේශය (1)

ධාතූන්ට අනතුරු වැ දක්වනලද ඉන්ද්‍රියයෝ.

1 චක්ඛු	ඉන්ද්‍රිය	12 සොමනස්ස	ඉන්ද්‍රිය
2 සොත	,,	13 දොමනස්ස	,,
3 ඝාණ	,,	14 උපෙක්ඛා	,,
4 ජිවහා	,,	15 සද්ධා	,,
5 කාය	,,	16 විරිය	,,
6 ඉත්ථි	,,	17 සති	,,
7 පුරිස	,,	18 සමාධි	,,
8 ජීවිත	,,	19 පඤ්ඤා	,,
9 මන	,,	20 අනඤ්ඤතඤ්ඤස්සාමීතින්ද්‍රිය	
10 සුඛ	,,	21 අඤ්ඤින්ද්‍රිය	
11 දුක්ඛ	,,	22 අඤ්ඤතාවින්ද්‍රිය යැ යි	

මාවිසති (22) විධ ය.

එහි විභාගය

(1) අර්ථ වශයෙන් ද (4) භෙද-අභෙද වශයෙන් ද
(2) ලක්ඛණාදි වශයෙන් ද (5) කෘත්‍යය වශයෙන් ද
(3) ක්‍රම වශයෙන් ද (6) භූමි වශයෙන්ද යි
සය ආකාරයකින් දත යුතුයි.

(1) අර්ථ වශයෙන්-

චක්ෂුරාදීන් ගේ **අර්ථ** යට ධාතු නිර්දේශයෙහි[1] දැක්වී. පසුවැ කී තුනින් පළමුවන, (20) **අනඤ්ඤතඤ්ඤස්සාමීතින්ද්‍රිය** 'පෙර (මාගීඵබෝධයෙන්) **නො දත් අමෘත නිර්වාණ පදය හෝ චතුස්සත්‍ය ධර්මය දැනගන්නෙමි'** යි මෙසේ පිළිපන් යෝගාවචරයාහට උපදනා හෙයින් ද, **ඉන්ද්‍රියාර්ථ සම්භව** හෙයින් ද, සෝවාන් මාගී ඥනය, **අනඤ්ඤතඤ්ඤස්සාමීතින්ද්‍රිය** යි කියනු ලැබේ.

දෙවැනි (21) **අඤ්ඤින්ද්‍රිය,** පෙර **සෝවාන්** මගින් පිරිසිද දන්නා ලද සීමාව නො ඉක්ම **චතුස්සත්‍යය** නැවත දක්නා හෙයින් ද, **ඉන්ද්‍රියාර්ථ සම්භව හෙයින් ද,** සෝවාන් ඵලයේ පටන් අගින් මාගීය තෙක් **මාගී-ඵල** ඥන **අඤ්ඤින්ද්‍රිය** නම් වේ.

---

[1] සිං: වි: 728

තෙවැනි (22) **අඤ්ඤාතාවින්ද්‍රිය** චතුස්සත්‍යය පිළිබඳ කෙළවර කළ ඥානකෘත්‍යය ඇති ක්ෂීණාශ්‍රවයන් වහන්සේට උපදනා හෙයින් ද, **ඉන්ද්‍රියාර්ථ සමානව** හෙයින් ද, **අඟින්එල ඥානය අඤ්ඤාතාවින්ද්‍රිය** නම් වේ.

ඉන්ද්‍රිය ශබ්දයේ

(අ) **ඉන්ද්‍ර නම් වූ කර්මය** භගවන්තා වූ සවභාවය හෝ **ඉන්ද්‍රයෑ** සි කියන ලද කර්මය කැඟවීමට කරුණු වූයේ හෝ **ඉන්ද්‍රියාර්ථ යෑ.**

(ඉ) **ඉන්ද්‍ර නම් වූ භාග්‍යවතුන් වහන්සේ** විසින් දෙශනා කළ සවභාවය හෝ **ඉන්ද්‍රියාර්ථ යෑ.**

(උ) **ඉන්ද්‍ර නම් භාග්‍යවතුන් වහන්සේ** විසින් දන්නා ලද සවභාවය හෝ **ඉන්ද්‍රියාර්ථ යෑ.**

(එ) **ඉන්ද්‍ර නම් වූ කර්මය විසින්** නිපදවන ලද සවභාවය හෝ **ඉන්ද්‍රියාර්ථ යෑ.**

(ඔ) **ඉන්ද්‍ර නම් වූ භාග්‍යවතුන් වහන්සේ** විසින් සෙවූනා ලද සවභාවය හෝ **ඉන්ද්‍රියාර්ථයි. මේ** සියලු අර්ථයෝ මැ **ඉන්ද්‍රියාර්ථයෙහි** සුදුසු පරිදී යෙදෙති.

ඒ මෙසේයි:- (අ-එ) **අර්ථයන්හි කර්මජ** වූ චක්ෂුරාදී ඉන්ද්‍රියයනට **කාරණ** වූ **කුශලා'කුශල කර්ම** දක්වයි.

(ඉ. උ. ඔ.) යන තුන් තන්හි **ඉන්ද්‍ර** ශබ්දය **භාග්‍යවතුන් වහන්සේ** ඇරැ දක්වයි.

විස්තර:- කුශලා'කුශල කර්ම ද (ඒ කෙරෙහි කිසිවකු ගේ ඊශ්වරත්වයක් නැති හෙයින්) **ඉන්ද්‍ර** නම්. එහෙයින් මැ මෙහි 'කර්ම-යෙන් නිපන් චක්ෂුරාදී ඉන්ද්‍රියයෝ **'කුශලා'කුශල කර්මය** ප්‍රකාශ කෙරෙක් නුයි, හෝ 'ඒ කර්මය විසින් උපදවන ලද්දාහු නුයි' ඉන්ද්‍රලිඞ්ගාර්ථයෙන් හා **ඉන්ද්‍ර** ශිෂ්ටාර්ථයෙන් **ඉන්ද්‍රිය** නම් වෙති. **මේ** අර්ථයෙන් **චක්ෂුරාදී කර්මජ ඉන්ද්‍රියයෝ** මැ ගැනෙති. **සම්‍යක් සම්බුද්ධ** වූ **භාග්‍යවතුන් වහන්සේ** පරමෙශ්වර හෙයින් **ඉන්ද්‍ර නම් වන සේක.** මේ දෙවිසි ඉන්ද්‍රියයෝ මැ **භාග්‍යවතුන් වහන්සේ** විසින් තතු වූ පරිදි ප්‍රකාශ කරන ලද්දාහු ද වෙති. එහෙයින් මැ **ඉන්ද්‍ර දෙශිකාර්ථයෙන් හා ඉන්ද්‍ර දෘෂ්ටාර්ථයෙන් ද, ඉන්ද්‍රිය නම්** වෙති. **භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ** විසින් ඇතැම්

ඉන්ද්‍රිය කෙනෙක් (භාවනා වශයෙන් පුරුදු නො කොට) අරමුණු කිරීම් වශයෙන් ද, ප්‍රත්‍යවෙක්ෂා කිරීම් මාත්‍රයෙන් ද, ඇතැම් ශ්‍රද්ධාදි ඉන්ද්‍රිය කෙනෙක් (වැඩීම්) භාවනා වශයෙන් ද, පුරුදු කරන ලදහු නුයි **ඉන්ද්‍රිය නම් වෙති.**

තවද **ඒශ්වරාධිපත්‍යයෙන් ද** ඉන්ද්‍රිය නම් වේ. චක්ෂුර්ඥානාදීන් ගේ පැවැත්මෙහි චක්ෂුරාදීන් ගේ **අධිපති** බව සිද්ධ ය. ඒ චක්ෂුරෙන්ද්‍රියාදිය තීක්ෂ්ණ කල චක්ෂුර්ඥානාදිය ප්‍රසන්න හෙයින් ද, දුර්බල වූ කල අප්‍රසන්න හෙයින් ද, ඒශ්වරත්වය සිද්ධ ය. මේ **අර්ථ වශයෙන් විනිශ්චය යි.**

(2) **ලක්ෂණාදි වශයෙන්, ලක්ෂණ - රස - ප්‍රත්‍යුපස්ථාන - පදස්ථාන** වශයෙන් විනිශ්චය යට **සකල නිද්දේශයෙහි**[1] කී පරිදි දත යුතුයි.

විශෙෂ:- **පඤ්චේන්ද්‍රියාදි** සතර ඉන්ද්‍රියයෝ වසතු ධර්ම සතරෙක් නො වෙති. හුදෙක් **එකම අමොහය මැ යි.** එහෙයින් එහි **ලක්ෂණාදිය** සංසකාර **සකල**[1] වර්ණනාදියෙහි කීසේ දතයුතු. සෙසු **ඉන්ද්‍රියයෝද සකල නිද්දේශයෙහි**[2] සවරූපයෙන්මැ **ආවාහු** ය.

(3) **ක්‍රම වශයෙන්, මෙද දෙශනා ක්‍රමය** මැ යි. ඔවුනතුරින් සෙසු ඉන්ද්‍රියයනට වඩා විදර්ශනාවට අධ්‍යාත්ම ධර්මයන් මැ මූලික වන හෙයින් ආත්මභාව පර්‍යාපන්න වූ **"චක්ෂුරින්ද්‍රිය"** දිය පළමු කොට වදාළහ.

එයට අනතුරුවැ ස්ත්‍රිය, පුරුෂය යි ව්‍යවහාරයට හෙතු වන හෙයින් **ස්ත්‍රී-පුරුෂෙන්ද්‍රිය** වදාළහ.

එම ඉන්ද්‍රිය දෙකම ජීවිතෙන්ද්‍රියය ප්‍රතිබද්ධව හටගන්නා බව දක්වනු පිණිස එයට අනතුරුවැ **ජීවිතෙන්ද්‍රිය** වදාළහ.

ජීවිතෙන්ද්‍රිය පවත්නා තෙක්ම වෙදනාව පවත්නා හෙයින් ඒ සියලු වෙදනාව දුක බව් හැඟවීම සඳහා එයට අනතුරුව **සුඛෙන්ද්‍රියාදි වෙදනාව** වදාළහ.

ඒ වෙදනා ඉන්ද්‍රියයා ගේ නිරුඩ කිරීම පිණිස වැඩිය යුතු ප්‍රතිපත්ති ධර්මයන් දැක්වීම සඳහා එයට අනතුරුවැ **ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය** වදාළහ.

ඒ ප්‍රතිපත්තියෙන් ප්‍රථම කොට පහළ වන ධර්මය හා ප්‍රතිපත්තියේ නො සිස්බව් හැඟවීම සඳහා එයට අනතුරුවැ **අනඤ්ඤතඤ්ඤස්සාමීතින්ද්‍රිය** වදාළහ.

---

[1]සිං: වි: 699 [2]සිං: වි: 650

එහි මෑ ඵලය බැවින් හා එහි ද නො සිස්බව් හැඟවීම සඳහා එයට අනතුරුව අඤ්ඤින්ද්‍රිය වදළහ.

ඉත් මත්තෙහි භාවනාවෙන් අධිගමය වන ධර්මය හා ඉන්පසු සුවල්ප වූ ද විදර්ශනා කෘත්‍යයක් නැති බව් හැඟවීම සඳහා අවසානයෙහි උතුම් ආස්වාදය වූ **අඤ්ඤාතාවින්ද්‍රිය** වදළහ. මේයැ **දෙශනා ක්‍රමය.**

මේ ක්‍රම වශයෙන් විනිශ්චය යි.

(4) භෙදා'භෙද වශයෙන්, මේ දෙවිසි ඉන්ද්‍රියයන් අතුරින් **ජීවිතෙන්ද්‍රියය,** නාම-රූප වශයෙන් ද්විභේද වන්නේ යි. සෙසු ඉන්ද්‍රියයෝ භේද නැත්තාහ.

ප්‍රශ්නයෙකි:- මෙහි **වේදනා** සුඛාදි වශයෙන් ද, **ප්‍රඥාව** පඤ්ඤින්ද්‍රිය වශයෙන් ද, භින්න වැ වදාරන ලද්දේ නො වේද

පිළිතුර:- නොවේ. වදාරණ ලද දෙවිසි ඉන්ද්‍රියයන් ගේ **භෙද හා අභෙද** අදහස් කරන ලද හෙයිනි.

මේ භෙදා'භෙද වශයෙන් විනිශ්චය යි.

(5) කෘත්‍ය වශයෙන්, "චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසමුට්ඨානානං ච රූපානං ඉන්ද්‍රිය පච්චයෙන පච්චයෝ" [1]චක්ඛායතනය චක්ඛු විඤ්ඤාණ ධාතුවට හා තත් සමුත්ථාන රූපයනට ඉන්ද්‍රිය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ' යැයි වදළ හෙයින් මෙහි කෘත්‍යය වශයෙන් ගනු ලබන්නේ **ඉන්ද්‍රිය ප්‍රත්‍යයභාවය සිද්ධ වූ කෘත්‍යය මැයි.** ඒ කෘත්‍යයා ගේ අනත්‍ය සාධාරණ බව හා **ඉන්ද්‍රියාධීනයා ගේ** සථානය ද වූ හෙයිනි.

(**ජනකත්වය** හෝ **උපත්‍තම්භකත්වය** හෝ **අනුපාලකත්වය** හෝ ඇත්තාහු මෑ ප්‍රත්‍යයෝ යි.)

චක්ෂුඃප්‍රසාදාදීන් ගේ තීක්ෂණ මෘදුභාවය අනුව චක්ෂුර්විඥානාදිය තීක්ෂණ මෘදුභාවයට පැමිණවීම් වශයෙන් තමා ගේ ආකාරයට පමුණුවන සවභාවය **ඉන්ද්‍රිය ප්‍රත්‍යයභාවය යැ. මේය එහි කෘත්‍ය ය.**

එහෙයින් මෑ **චක්ෂුරින්ද්‍රියයා ගේ** රූපාලම්බනය හා ගැටීමට යෝග්‍යභාවය නැති කල **චක්ෂුර්විඥානයා** ගේ දර්ශන කෘත්‍යය සිද්ධ නො වේ.

---

[1] පට්ඨා: ප: පච්චයනිද්දෙස 6
('චක්ඛුන්ද්‍රියං" යනුය එහි වනුයේ)

ශ්‍රොත්‍ර - ඝ්‍රාණ - ජිහ්වා - කාය යන්ගේ **කෘත්‍යය ද, එසේ මැසි. මනෝඉන්ද්‍රියයා ගේ** වකාහි සහජාත ධර්මයන් තමා ගේ වශයෙහි පැවැත්වීමෙන් **ඊශ්වරත්වය** වේ. ඒ වූකලී ඛුද්ධගම වීම් වශයෙනි.

ජීවිතින්ද්‍රියයා ගේ සහජාත ධර්මයන් පාලනය කිරීම **කෘත්‍යය යැ. සහජාත නාම - රූප** ධර්මයන් පාලනය කිරීම ජීවිතෙන්ද්‍රියයා ගේ **ඊශ්වරත්වය** වේ.

ලිඛන - නිමිත්තන - කුත්තන - ආකප්පන යන ආකාර රචනා කිරීම **සත්‍රීන්ද්‍රිය - පුරුෂෙන්ද්‍රියයන් ගේ කෘත්‍යය යැ.**

(මේ **චාවීසති** ධර්මයන් ගේ ඉන්ද්‍රියත්වය නම් **ජනකත්වය හා උපත්‍රම්භකත්වය යැ.** ඒ ලක්ෂණයෙන් යුක්ත වූ **ඉන්ද්‍රියයෝ විස්සෙ** (20) කි. මේ **'භාවඉන්ද්‍රිය'** දෙක පෙර කී ලිඛනාදියට ජනකත්වයක් හෝ උපත්‍රම්භකත්වයක් නැත්තේ ය. එහෙත් කර්මාදි අන්‍ය ප්‍රත්‍යයයෙන් උපදනා රූපයනට **සත්‍රී - පුරුෂ** ආකාර ගැන්වීම මොවුන් ගේ **කෘත්‍යය** සි.)

සහජාත ධර්මයන් මැඩගෙන තම තමා අයත් ඖදාරිකාකාරයට පැමිණවීම **සුඛ - දුඃඛ - සෞමනස්‍ය - දෞමනස්‍ය - වේදනාවන් ගේ කෘත්‍යය සි.** සහජාත ධර්මයෝ ද, ඔවුන්ගේ වශයෙන් **සැප - දුක්** ආදි සවභාවයට පැමිණියාක් මෙන් වෙති.

උපෙක්ඛා ඉන්ද්‍රියය ශාන්ත ප්‍රණීත බවට හෝ මධ්‍යස්ත ආකාර-යට පැමිණවීම **කෘත්‍යය යැ.**

අස්සද්ධියාදි ප්‍රතිපක්ෂ ධර්ම මැඩපැවැත්වීම හා **සම්ප්‍රයුක්ත ධර්මයන් ශාන්ත ආකාරාදියට පැමිණවීම ය, උපත්‍රම්භ-කාරය, එළඹසිවි ආකාරය, මොනවට පිහිටි ආකාරය, සවභාව දක්නා ආකාරය,** යන මේවාට පැමිණවීම පිළිවෙළින් **ශ්‍රද්ධාදි** පඤ්චෙන්ද්‍රියයන් ගේ **කෘත්‍යය සි.**

සක්කාය දිට්ඨි ආදි ත්‍රිවිධ සංයොජනයන් ප්‍රහාණය කිරීම හා සම්ප්‍රයුක්ත ධර්මයන් ඒ ප්‍රහාණයට අභිමුඛ කිරීම ද, **අනඤ්ඤා-තඤ්ඤස්සාමීතින්ද්‍රියයා ගේ කෘත්‍යය සි.**

කාමරාග - ව්‍යාපාදාදි සංයොජනයන් ගේ තුනී කිරීම ද, ප්‍රහාණය කිරීම ද, සහජාත ධර්මයන් තමා ගේ වශයෙහි පැවැත්වීම ද, මාගී සම්ප්‍රයුක්ත **අඤ්ඤින්ද්‍රියයා ගේ කෘත්‍යය යැ.**

ඵලසම්ප්‍රයුක්ත **අඤ්ඤින්ද්‍රියය** ඒ ඒ සංයෝජනයන් **පවිප්පස්සද්ධි** වශයෙන් ප්‍රහාණය කිරීම **කෘත්‍යය සි.**

(**පරිඤ්ඤෙය්‍ය** - **පහාතබ්බ** - **භාවෙතබ්බ** - **සච්ඡිකාතබ්බ** - ධර්මයන් **පරිඤ්ඤා** - **පහාණ** - **භාවනා** - **සාක්ඡාත්කරණ** යන සියලු කෘත්‍යය ඇති හෙයින් අනෙක් කළමනා කෘත්‍ය නැති.)

අඤ්ඤතාවින්ද්‍රියය අමෘතාභිමුඛවීම හා සහජාත ධර්මයන්ගේ අමෘතාභිමුඛ භාවයට ප්‍රත්‍යයවීම ද, **කෘත්‍යය යැ.** සෙස්සවුන් මෙන් අනෙක් කෘත්‍යයෙහි නුපුරුදු බවද වේ.

මේ **කෘත්‍ය වශයෙන්** විනිශ්චය යි.

(6) **භූමි වශයෙන් චක්ඛු** - **සොත** - **ඝාණ** - **ජිව්හා** - **කාය** - **ඉත්ථි** - **පුරිස** - **සුඛ** - **දුක්ඛ** - **දෞමනස්ස** යන මේ ඉන්ද්‍රියයෝ **කාමාවචරයහ.**

මනින්ද්‍රිය - **ජීවිතින්ද්‍රිය** - **උපෙක්ඛා ඉන්ද්‍රියයෝ ද, සද්ධා**-**විරිය** - **සති** - **සමාධි** - **පඤ්ඤා ඉන්ද්‍රිය** යෝද **චාතුර්භූමිකයෝ ය.**

සොමනස්සින්ද්‍රිය ය කාම - **රූප** - **ලොකොත්තර භූමිත්‍රය** පර්‍යාපන්න යැ අවසන්හි කියූ **අනඤ්ඤතඤ්ඤස්සාමීතින්ද්‍රියාදි** තුන **ලොකොත්තර මැයි.**

මේ මෙහි **භූමි වශයෙන්** විනිශ්චය යි.

විකාරාගත විස්තරයෙකි.

ප්‍රශ්නය:- **ඉන්ද්‍රිය දෙ විස්සක්** වදාරන ලද්දේ කවර හෙයින්ද

නිදානුත්තර:- ඊශ්වරත්ව සඞ්ඛ්‍යාත **පරමාධිපත්‍ය භාවය කරන** ධර්ම මෙතෙක් හෙයිනි.

ප්‍රවෘත්තිය - **නිවෘත්තිනිත්ත** නිශ්‍රය දැක්වීම සඳහාද මොවුන්ම වදාළහ.

ඒ මෙසේයි:- **"ජඤ්ඤුලොකො සමුප්පත්තෙතා"**[1] යි වදාළ පරිදි පැවැත්මට (මූල) නිශ්‍රය වූ **අධ්‍යාත්මිකායතන** සය මුල්වේ.

එයට උත්පත්ති හේතු වූ (ස්ත්‍රී - **පුරුෂ** ඉන්ද්‍රියද්වය) විසභාග වස්තු සංරාගයෙන් බෙහෙවින් උපදනා හෙයින් අනතුරු වැ **භාවඉන්ද්‍රිය ද,** ඔවුන්ගේ පැවැත්ම ජීවිතින්ද්‍රියයෙන් වන හෙයින් **ආයු** - **සිති** - **යපනා** - **යාපනාදීන් ජීවිතින්ද්‍රියය ද,**

ඉෂ්ටාදි සියලු විෂය රස විඳීම වේදනා වශයෙන් වන හෙයින් අනතුරු වැ **වේදනාවදැයි** මෙසේ පැවැත්මට නිශ්‍රය - සමුත්පාද-

[1] සං: නි: දෙවතා සංයුත්ත 23

සඤ්ඤා – **සමෙක්ඛණ** දැක්වීම සඳහා **චක්ඛුන්ද්‍රිය** යෙහි සිට **උපෙක්ඛින්ද්‍රියය** තෙක් **තුදුස්** ඉන්ද්‍රිය වදාළහ. එසේම පැවැත්මට හේතු වූ **ශ්‍රද්ධාදි** සෙසු **ඉන්ද්‍රිය** වදාළහ. **නිබ්බාණ නිශ්‍රිත** කොට උපදවන ලද **ශ්‍රද්ධාදි** පඤ්චේන්ද්‍රියයෝ **නිවාතනීයට** නිශ්‍රයහ.

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය යෙන් විවට්ට වශයෙන් පළමුව ඉපැන්ම ද, විවට්ටයා ගේ අවසථානය **අඤ්ඤින්ද්‍රියෙන් ද,** උපභොගය **අඤ්ඤාතාවින්ද්‍රියයෙන්ද** යි මෙසේ මේ ඉන්ද්‍රියයන් මැ දෙසූහ.

මෙතෙකින් අභිප්‍රෙතාර්ථ සිද්ධිය වන හෙයින් අන්‍යයන් ගේ නො දැක්වීම වේ.

මෙසින් මැ මොවුන් ගේ **දේශනා ක්‍රමය ද** වණ්ණනා කරන ලදී.

"සංවේ බහුල යති – ඉඳුරෑ සංවරෑ පිහිමා
ඉඳුරන් සුපිරිසිද දැන – දුකු කෙළවර කරන්නේ"

මේ ඉන්ද්‍රියයන් ගේ විස්තර කථාව යැ.

ඉන්ද්‍රිය නිද්දේශය නිමියේ ය.

සත්‍ය නිද්දේශය (2)

(ධාතුවිභඞ්ගයෙහි දක්වන ලද **ධාතු නිද්දේශයට** අනතුරුවැ (**සත්‍ය විභඞ්ගයෙහි** ආ) **සත්‍ය නිද්දේශ** දක්වනු ලැබේ.

එහි අභිධම්ම භාජනියෙහි[1] හුදු **සත්‍ය** ශබ්දයෙන් **ආර්‍ය සත්‍යයම** දක්වන ලද හෙයින් **"සච්චානීති චත්තාරි අරිය-සච්චානි"**[2] යි කීහ. හේ

(1) දුඃඛාර්‍ය සත්‍යය
(2) දුඃඛසමුදයාර්‍ය සත්‍යය
(3) දුඃඛනිරෝධාර්‍ය සත්‍යය
(4) දුඃඛනිරෝධගාමිනී ප්‍රතිපදාර්‍ය සත්‍යයැ යි.
චතුර්විධ වේ.

(විදර්‍ශීනාවට භූමිවූ හෙයින් හෝ **ආර්‍යසත්‍ය** යැ යි කීහු.)

(1) සත්‍යාර්‍ථ විභාග වශයෙන් ද,
(2) නිර්වචන වශයෙන් ද
(3) ලක්‍ෂණාදීන් ගේ ප්‍රභෙද වශයෙන් ද
(4) සාමාන්‍ය අර්‍ථ වශයන් ද
(5) අර්‍ථ උදුරා දැක්වීම් වශයෙන් ද
(6) අඩු වැඩි නො වීම් වශයෙන් ද
(7) ක්‍රම වශයෙන් ද
(8) ජාති ආදීන් ගේ නියමය වශයෙන් ද
(9) ආර්‍ය සත්‍යාගත ඥාන කෘත්‍ය වශයෙන් ද
(10) ධර්‍මයන් ගේ ප්‍රභෙද වශයෙන් ද
(11) උපමා වශයෙන් ද
(12) චතුෂ්ක වශයෙන් ද
(13) ශූන්‍යතා වශයෙන් ද
(14) එකවිධාදීන් ගේ ප්‍රභෙද වශයෙන් ද
(15) සභාග වශයෙන් ද
(16) විසභාග වශයෙන්ද යි මෙසේ සොළොස් ආකාරයෙකින් එහි විනිශ්චය දතයුතු.

(1) විභාග වශයෙන් දුඃඛාදි චතුරාර්‍ය **සත්‍යය** පිළිබඳ අර්‍ථ **සතර - සතර** බැගින් බෙදන ලදි. ඔවුන් ගේ සත්‍ය ස්වභාවය **තථ, අවිතථ, අනඤ්ඤථ,** වශයෙන් ගැනේ.

දුඃඛාදීන් ඒ දුඃඛාදි ස්වභාවයෙන් මැ යුක්තවීම නොහොත් දුඃඛාදි ස්වභාවය නො ඉක්මවීම **තථ** (සත්‍ය) ස්වභාවය යි.

---

[1] ඛු: ප: සච්ච විභඞ්ග 82 [2] සමෙන්තපාසාදිකා 85

දුඃඛාදිය පිළිබඳ බාධකාදි **සභාවය** නො ඉක්මවීම නොහොත් (දුඃඛාදිය සුඛාදියක් නො වීම) **අවිතථ** නිබොරු භාවය යි.

දුඃඛාදිය අබාධකාදි අන්‍යාකාරයකට නො පැමිණීම නොහොත් දුඃඛාදිය සමුදයාදි අන්‍ය සත්‍යයකට නො පැමිණීම **අනඤ්ඤථ** (නොවෙනස්) භාවය යි. සමුදයාදියෙහිදු මෙසේමැයි.

මෙසේ ත්‍රිවිධ සත්‍ය සභාවයෙන් යුත් දුඃඛාදිය පිළිබඳ එසේ පවත්නා අර්ථයන් වෙන වෙනම බෙදූ වදුළ පරිදි මෙසේයි. **"දුක්ඛස්ස පීළනට්ඨෝ, සඞ්ඛතට්ඨෝ, සන්තාපට්ඨෝ, විපරිණාමට්ඨෝ, ඉමෙ චත්තාරෝ දුක්ඛස්ස දුක්ඛට්ඨා, තථා - අවිතථා - අනඤ්ඤථා"**[1] **දුඃඛ සත්‍යයා ගේ** දුඃඛ දුඃඛතා නිමිත්තෙන් පෙළීම් අර්ථය, ප්‍රත්‍යයන් විසින් සකස්කරන ලද අර්ථය, තවන අර්ථය, ජරාමරණ දෙකින් පෙළීම් අර්ථය දැයි, මේ සතර **දුඃඛයා ගේ තථ - අවිතථ - අනඤ්ඤථ** සභාවය වූ **දුඃඛාර්ථයෝ යි.**

"සමුදයස්ස ආයූහනට්ඨෝ, නිදානට්ඨෝ, සංයොගට්ඨෝ, පළිබොධට්ඨෝ, ඉමෙ චත්තාරෝ සමුදයස්ස සමුදයට්ඨා තථා - අවිතථා - අනඤ්ඤථා"[1] දුක් උපදවන (රැස්කරන) අර්ථය, මූලකාරණාර්ථය, සංසාර වෘත්ත දුඃඛයෙහි යොදවන අර්ථය, මාගී ඵලාධිගමය වලක්වන අර්ථය ද, **සමුදයයා ගේ සත්‍යාර්ථයෝ යි.**

"නිරොධස්ස නිස්සරණට්ඨෝ, විවෙකට්ඨෝ, අඛතට්ඨෝ, අමතට්ඨෝ-පෙ-ඉමෙ චත්තාරෝ නිරොධස්ස නිරොධට්ඨා තථා-අවිතථා-අනඤ්ඤථා"[2]

සෙලඝයන්ගෙන් හා වෘත්ත දුඃඛයෙන් පහවීම් අර්ථය, කෙලඝයන්ගෙන් හා දුඃඛයෙන් නිස් බව් සඞ්ඛ්‍යාත විවේකාර්ථය, කර්මාදි ප්‍රත්‍යයයෙන් හට නො ගත් බවය, මරණ රහිත බවය, යන මොහු **නිරොධයා ගේ සත්‍යාර්ථයෝයි.**

"මග්ගස්ස නියානට්ඨෝ හෙතට්ඨෝ දස්සනට්ඨෝ ආධිපතෙය්‍යට්ඨෝ ඉමෙ චත්තාරෝ මග්ගස්ස මග්ගට්ඨා තථා-අවිතථා - අනඤ්ඤථා" [2]සංසාරයෙන් එතර කරන බව ය, නිර්‍වාණාධිගමයට කාරණ බව ය, නිර්‍වාණය හෝ චතුස්සත්‍යය දැකීම ය, සම්ප්‍රයුක්ත ධර්මයනට ඒශ්වර බව හෝ ආරම්මණාධිපති බවය යන මොහු **මාගී සත්‍යයා ගේ සත්‍යාර්ථයෝ යි,**

විශෙෂ:- (තවද,) පීඩනාර්ථය, ප්‍රත්‍යයයෙන් කරනලද අර්ථ ය, තවන අර්ථ ය, ප්‍රකෘති සභාව ය හරණ අර්ථ ය, මාගීඥනයෙන්

---

[1] පටි: ම: සච්ච කථා 293 පිට

[2] ,, ,, ,, ,, 294 පිට

දතයුතු අර්ථය, යන මොහු දුඃඛ සත්‍යයා ගේ අර්ථ විශෙෂයෝ සි. මෙසේ මේ සතර-සතර අර්ථ වශයෙන් **දුඃඛාදි චතුස්සත්‍යය** දතයුතුසි.

මේ අර්ථ වශයෙන් විනිශ්චයසි.

---

(2) **නිර්වචන වශයෙන්:-** **"දුක්ඛ සච්චං"** යන්නෙහි **"දු"** යන ශබ්දය (පිළිකුල් කටයුතු පුත්‍රයාට "දු පුත්‍ර" යසි කියන්නා සේ) **පිළිකුල් කටයුතු අර්ථයෙහි** වැටේ.

"ඛ" යනු හිස් ය යන අර්ථයෙහි වේ. හිස් වූ අහසට **"ඛ"** යසි කියනු ලැබේ.

විස්තර:- මේ ප්‍රථම සත්‍යය අනේක උපද්‍රවයන් ගේ පිහිටීමට ස්ථාන වන හෙයින් **පිළිකුල් කටයුතු ය.** අඥානයන් විසින් සලකනලද ධ්‍රුව-සුඛ-සුභ-ආත්මයන්ගෙන් හිස් හෙයින් **තුච්ඡ ය.** මෙසේ පිළිකුල් කටයුතු හිස් බැවින් යුතු හෙයින් **'දුක්ඛ'** ය සි කියනු ලැබේ.

සමුදය = (සං + උ + අය) යන මෙහි **"සං"** යනු සමාගමය =(සං + ආගම) සමෙත = (සං + එත) යනාදීන්හි මෙන් **එක්කිරීම් අර්ථයෙහි වේ.**

උදය යන්නෙහි **"උ"** යනු උපජ්ජනා-උදිත යනාදීන්හි මෙන් **හටගැනීම කියසි.**

'අය' ශබ්දය **හෙතුව ප්‍රකාශ කෙරේ.**

මෙසේ **දෙවෙනි සත්‍යය** අන්‍ය ප්‍රත්‍යයයන් ගේ යෙදීමක් ඇති කල්හි **දුඃඛයා ගේ ඉපදීමට කාරණාවන** හෙයින් **දුඃඛ සමුදයසි** කියනු ලැබේ.

නිරොධ = (නි + රොධ) මෙහි **"නි"** ශබ්දය අභාවාර්ථය කියසි. **"රොධ"** ශබ්දය හැසිරීම ප්‍රකාශ කෙරේ. එබැවින් සංසාරයා ගේ හැසිරීම් සඞ්ඛ්‍යාත දුඃඛයා ගේ අනුත්පාද නිරොධ වශයෙන් **නිරවශෂයෙන්වැළැක්ම වේ.** එය අධිගත කල්හි ඒ පුද්ගලයා ගේ ප්‍රවෘත්තියට ප්‍රතිපක්ෂ බැවින් හෝ **දුඃඛ නිරොධයසි** කියනු ලැබේ.

මගඟ (දුක්ඛ නිරොධ ගාමිනී පටිපද) අරමුණු කිරීම් වශයෙන් ඒ නිරොධයට අභිමුඛවැ හටගැනීම හෝ දුඃඛයා ගේ නිරුද්ධ කිරීම වූ නිර්ණය කරා පැමිණීමේ **ප්‍රතිපත්තිය** වක හෙයින් **දුඃඛ නිරොධ ගාමිනී ප්‍රතිපදායැ සි** කියනු ලැබේ.

මොවුහු බුද්ධාදි ආර්‍යයන් ප්‍රතිවෙධ කරන හෙයින් **ආර්‍ය-සත්‍යයන් යි** කියනු ලැබේ.

එසින් වදාළහ.

"චත්තාරිමානි භික්ඛවෙ අරියසච්චානි. කතමානි චත්තාරි -පෙ- ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි අරිය සච්චානි. අරියා ඉමානි පටිවිජ්ඣන්ති. තස්මා අරියසච්චානීති වුච්චන්ති"[1]

'මහණෙනි, මේ ආර්‍ය්‍ය සත්‍ය සතරෙකි. -පෙ- මේ සතර ආර්‍ය්‍ය සත්‍යයෝ යැ. ආර්‍ය්‍යයෝ මේවා ප්‍රතිවෙධ කරති. එහෙයින් **ආර්‍ය්‍ය සත්‍යයන් යි** කියනු ලැබෙත්.

විශෙෂ:- (ප්‍රතිවෙධ කළ පසු ලැබෙන බුද්ධාදි ව්‍යවහාරය අනාගතාර්‍ථය අතීතයෙහි ආරෝපණය කොට උපචාර හෙයින් කී නියාසි.) එසේමැ **"අරියෙහි පටිවිජ්ඣිතබ්බානි සච්චානි අරිය-සච්චානි"** යි ආර්‍ය්‍යයන් විසින් ප්‍රතිවෙධ කටයුතු සත්‍යය ආර්‍ය්‍ය සත්‍යය යි මධ්‍යපද ලෝපයෙන් කීහ. තවද ආර්‍ය්‍ය වූ **තථාගතයන් වහන්සේ** විසින් අවබොධ කළ සත්‍ය නුසි හෝ **ආර්‍ය්‍ය සත්‍ය නම් වේ.**

එසින් වදාළහ.

"සදෙවකෙ භික්ඛවෙ ලොකෙ සමාරකෙ -පෙ- සදෙව මනුස්සාය පජාය තථාගතො අරියො. තස්මා අරිසච්චානීති වුච්චන්ති" [2]

"මහණෙනි! දෙවියන් සහිත මරුන් සහිත ලෝකයෙහි -පෙ- දෙවිමිනිසුන් සහිත ප්‍රජාවෙහි තථාගතයන් වහන්සේ ආර්‍ය්‍ය නම් වනසේක. එහෙයින් ආර්‍ය්‍ය සත්‍යයහයි කියනු ලැබෙත්."

තථාගතයන් වහන්සේ මේ ආර්‍ය්‍යසත්‍යයන් අවබොධ කළ හෙයින් හෝ ආර්‍ය්‍ය **නම් වන** සේක.

එසින් වදාළහ:- **"ඉමෙසං ඛො භික්ඛවෙ චතුන්නං අරිය සච්චානං අභිසම්බුද්ධත්තා තථාගතො අරහං සම්මා සම්බුද්ධොති වුච්චති"** [3]

'මහණෙනි, මේ චතුරාර්‍ය්‍ය සත්‍යයන් අවබොධ කළ හෙයින් තථාගතයන් වහන්සේ ආර්‍ය්‍යයයි කියනු ලැබෙත්,

තවද **තථ- අවිතථ- අනඤ්ඤථ** වන හෙයින් ආර්‍ය්‍යවූම සත්‍ය නුසි ආර්‍ය්‍ය සත්‍ය නම් වේ.

---

[1] සං: නි· සච්චසංයුත්තය 1082
[2] ,, ,, ,, 1083
[3] ,, ,, ,, 1082

එසින් වදාළහ. **"ඉමානි බෝ භික්ඛවෙ චත්තාරි අරිය සච්චානි තථානි අවිතථානි අනඤ්ඤථානි තස්මා අරියසච්චා-නීති වුච්චන්ති"**[1]

'මහණෙනි, මෙම චතුරාර්ය්‍ය සත්‍යයෝ දුඃඛාදි සභාව නොඉක්මවන හෙයින් **"තථයහ"** ඒ දුඃඛාදිය එයට විරුද්ධ අදුඃඛාදිය නො වන හෙයින් **"අවිතථය හ"** දුඃඛාදිය සමුදයාදි අන්‍ය සත්‍යයකට නො පෙරළෙන හෙයින් **"අනඤ්ඤථයහ"** යි මෙසේ මේ ලක්ෂණයෙන් යුක්ත හෙයින් මේ සතර සත්‍යයෝ **ආර්‍ය්‍ය සත්‍යයහයි** කියනු ලැබෙත්.

මෙය නිර්වචන නම්.

---

(3) ලක්ෂණාදිය.

දුඃඛසත්‍යය පෙළීම් **ලක්ෂණය යැ.** සහක්‍රියන් නැවීම එහි **කෘත්‍යය යැ.** සංසාර වෘත්තයෙහි පැවැත්ම එහි **වැටහෙන ආකාරය යි.**

සමුදයසත්‍යය දුඃඛ ප්‍රවෘත්ති **ලක්ෂණය යැ.** නිරන්තරයෙන් හටගැන්වීම එහි **කෘත්‍යය යැ.** සසරින් නික්ම යා නොදී වැළැක්වීම **වැටහෙන ආකාරයයි.**

නිරොධ සත්‍යය ශාන්ති **ලක්ෂණය යැ.** චුත නොවීම එහි **කෘත්‍යය යැ.** පඤ්චස්කන්ධාදි නිමිත්තරහිතබව **වැටහෙන ආකාරය යි.**

වෘත්ත දුඃඛයෙන් නික්මීම **මාර්ගසත්‍යයේ ලක්ෂණය.** ක්ලේශයන් අනුත්පාද නිරොධයෙන් ප්‍රහාණය කිරීම එහි **කෘත්‍යය යැ.** පඤ්චොපාදානස්කන්ධයෙන් නැඟී සිටීම **වැටහෙන ආකාරය යි.**

පැවැත්ම ය, පැවැත්වීම ය, නැවැත්ම ය, නැවැත්වීම ය යි ද, ප්‍රත්‍යයයන් විසින් රැස්කිරීම ය, අරමුණෙහි ඇලීම ය, ප්‍රත්‍යයන් විසින් රැස් නො කිරීම ය, නිර්‍වාණය දැකීම ය, යන අර්ථයෝ ද ලක්ෂණය හ.

මෙසේ ලක්ෂණාදීන් විනිශ්චය දතයුතු.

---

(4) අර්ථ වශයෙන්

යම් සභාවයක් ලංවැ නුවණින් (ඇතිසැටි) පරීක්ෂා කරන්නහුට පිත්තල සඟණි සේ පැහෙන්නාක් මෙන් ඇති වස්තුවක් අන්‍ය-

---

[1] සං: නි: සච්චසංයුක්ත 1083

වසතුවක් සේ විපරීතවැ වැටහෙන මායාවක් මෙන් ද නොවැ, මිරිඟු දියක් මෙන් නැති දෙයක් ඇති සේ වැටහෙන මුළාවීමක් ද නොවැ, තීර්ථකයන් ගේ ආත්මයසේ පරමාර්ථ වශයෙන් නොලැබෙන සවභාවයක් ද නොවැ, එකාන්තයෙන් **පෙළීම ය, එයට හෙතුව ය, සංසිඳීම ය, නිස්සීම ය,** යන ප්‍රකාර ඇති අවිපරීත වූ විද්‍යමාන සවභාවයෙන් **ආයර්‍ය මාර්ගඥානයට** හා **ප්‍රත්‍යවෙක්ෂාඥානයන්ට** ගොචර වනුයේ **සත්‍යාර්ථ** යි.

එය, කිසි තැනෙක කාෂ්ඨාදි (උපාදාන) දැල්වීමට ගන්නා ද්‍රව්‍ය හෙදය ඇත ද, ගින්නෙහි උෂ්ණත්වය සවාභාවික ලක්ෂණය වන්නාසේ ද, **ජාති-ජරා-මරණ** සවභාවය ලොකයෙහි ප්‍රකෘතිය වන්නාසේ ද, ඇත්තාවූ ම අවිපරීත සවභාවය **සත්‍යාර්ථය යි.**

එයින් වදාළහ.

"ඉදං දුක්ඛන්ති භික්ඛවෙ තථමෙතං අවිතථමෙතං අනඤ්ඤථමෙතං"[1]

'මහණෙනි මේ දුකය යනු සවභාව යැ. බොරු නො වේ. වෙනස් නො වේ.'

විභාවය:- දර - තණ - ගොම - ආදි දැල්වෙන ද්‍රව්‍ය කුමක් වුවත් ගින්නෙහි උෂ්ණත්වය සවාභාවිකව පවතින්නාක් මෙන් ද, ලෝකයා ගේ ඉපදීම, ජරා, මරණ, යන සවභාවයන් හා මනුෂ්‍යයන් ගේ කෙළින් යාම නිරිසනුන්ගේ හරහට යාම ආදි සවභාව **එකාන්තයෙන්** ලෝකයෙහි එසේ පවති ද, **සත්‍යාර්ථය ද එසේ මැ යි.**

(1) **නාබාධඤං යතොදුක්ඛං - දුක්ඛා අඤ්ඤං නබාධඤං**
බාධකත්තනියාමෙන - තතොසච්චමිදං මතං

(2) **තංවිනානාඤඤතො දුක්ඛං - නහොතිනව තං තතො**
දුක්ඛ හෙතු නියාමෙන - ඉතිසච්චං විසත්තිකා

(3) **නාඤඤනිබ්බාණ තො සන්ති - සන්තං නචනතංයතො**
සන්තභාව නියාමෙන - තතොසච්චමිදං මතං

(4) **මඟඟානාඤඤං න නියාන - අනියානෙ නවාසිසෙ**
තච්ඡනියාන භාවත්තා - ඉතිසෙ සච්චසම්මතෙ

(5) **ඉතිතච්ඡාඃවිපල්ලාස - භූතභාවං චතුඤ්ඨ්**
දුක්ඛාදිඤ්ඨවිසෙසෙන - සච්චඤං ආහුපණ්ඩිතා[2]

---

[1] සං: නි: සච්චසංයුත්තක 1080

[2] ඔ: වි: සච්චවි: වණ්ණනා 60

(1) නොපෙළනු නොවනුයෙන්-පෙළන අනෙකක් නැතියෙන්
එකතින් සත පෙළනුයෙන්-**මේ දුක් සස්** ඉන් දතුයේ

(2) එ විනා අනෙකකින්-දුක නොවැ, ඉන්ම වනුයෙන්
දුක් හෙය බැවින් එකතින්-**තණ්හස්**[1] නමැයි දතුයේ

(3) **නිවන** හැර සැනසුම්-නැති එමැ සවි සකර දම්
සංසිදුවනෙන් නියමින්-**නිරෝදස්**[2] යැයි දතුයේ

(4) මෙ මුත් පමුණන අන්-නැති, පමුණුවනු එමැ වේ
එකතින් පමුණුවනුයෙන්-**මග්ගස්**[3] විසින් දතුයේ

(5) මෙසේ **සත්**-**නොපෙරැළි-පැවැති**-සැබැවින් මේ සතර
දුක් ඇති නො වෙසෙස්තෙන්-පඬිහු **සස් අරූතැයි** යූ

මෙසේ චතුස්සත්‍යයෙහි මැ සත්‍ය ස්වභාවය හා **නො පෙරැළෙන ස්වභාවය සත්‍යාර්ථයැ යි** වදළහ.

මෙසේ විශෙෂාර්ථ විනිශ්චය දතයුතු.

---

(5) අර්ථ උදාහර වශයෙන්

මේ **සත්‍ය** ශබ්දය නොයෙක් අර්ථයන්හි දක්නා ලැබේ. **"සච්චං භණෙ න කුප්පෙය්‍ය"**[4] 'සැබෑ තෙපුලක් කියන්නේ ය. නොකිපෙන්නේ ය' යනාදි තන්හි **වාක් සත්‍යයෙහි යැ.**

"සච්චෙ ඨිතා සමණබ්‍රාහ්මණා" 'මහණ බමුණෝ මුසාවාදයෙන් වැළකී සිටියහ. මෙහි **මුසාවාදයෙන් වැළකීමෙහි යැ.**

කඞ්ඛානු සච්චානි වදන්ති නානා - පවාදියාසෙ කුසලා වදානං"[6] "අනෙක ප්‍රකාර ප්‍රවාදීන් ගේ මතයෙහි දක්ෂ ප්‍රාඥයෝ කුමක් හෙයින් මාගේ දෘෂ්ටිය සැබෑ යයි කියද්ද, මෙහි **නියත දෘෂ්ටි සත්‍යයෙහි** දක්නා ලැබේ.

"එකංහි සච්චං න දුතියමත්ථි"[5] සත්‍යය එකක්මය දෙ වැන්නෙක් නැති. මෙහි පරමාර්ථ සත්‍යය වූ **මාර්ගයෙහි හා නිර්වාණයෙහි යැ.**

---

[1]තෘෂ්ණාව [2]නිරෝධය [3]මාර්ගසත්‍යය [4]ධ: ප: කොධවග්ග 21
[5]සු: නි: අට්ඨකවග්ග

"චතුන්නං අරියසච්චානං කති කුසලා"[1] චතුරාර්ය සත්‍යය අතුරින් කුසල කොතෙක් ද, මේ ආර්ය සත්‍යයෙහි යැ. මෙසේ අර්ථයන් ගේ උද්ධරණ වශයෙන් දෙශනායෙහි ඒ ඒ තන්හි සත්‍ය ශබ්දයේ අර්ථ යෙදුණු පරිදි දතයුතු.

---

(6) අනූනාධික වශයෙන්.

මෙහි නොඅඩුවැ, නොවැඩිවැ ආර්ය සත්‍ය සතරක් මැ වදාළේ කවර හෙයින් ද

චතුරාර්ය සත්‍යයෙන් පිටත්හි පරමාර්ථ සත්‍යයන් නොලැබෙන බැවින් හා එක් සත්‍යයක්වත් පහ නොකළ හැකි බැවිනි. එසින් වදාළහ.

"ඉධ භික්ඛවෙ ආගච්ඡෙය්‍ය සමණෙ වා බ්‍රාහ්මණෙ වා නෙතං දුක්ඛං අරියසච්චං අහමෙතං දුක්ඛං අරියසච්චං ඨපෙත්වා අඤ්ඤං දුක්ඛං අරියසච්චං පඤ්ඤපෙස්සාමීති නෙතං ඨානං විජ්ජති"[2]

'මහණෙනි මේ ලොකයෙහි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ **'මේ ශ්‍රමණ භවත් ගෞතමයන්'** වදාළ දුඃඛාර්ය සත්‍යය දුඃඛාර්ය සත්‍යය නොවේ. දුඃඛාර්ය සත්‍යය අනෙකෙකි. මේ කියනලද දුඃඛාර්ය සත්‍යය හැර මම අන්‍ය වූ දුඃඛාර්ය සත්‍යයක් පනවමිසි, ප්‍රතිවිරුද්ධව එන්නේ යැ, යන මේ කාරණය අවිද්‍යමාන ය, යනාදිය හා

"යෙ හි කොචි භික්ඛවෙ සමණෙ වා බ්‍රාහ්මණෙ වා එවං වදෙය්‍ය. නෙතං දුක්ඛං පඨමං අරියසච්චං යං සමණෙන ගොතමෙන දෙසිතං අහමෙතං දුක්ඛං පඨමං අරියසච්චං පවත්තයිස්සාමි අඤ්ඤං දුක්ඛං පඨමං අරියසච්චං පඤ්ඤපෙස්සාමීති නෙතං ඨානං විජ්ජති."[2] මහණෙනි; යම් කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ශ්‍රමණ භවත් ගෞතමයන් විසින් වදාළ මේ දුඃඛාර්ය සත්‍යය ප්‍රථමාර්ය සත්‍යය නොවේ. මම මේ ප්‍රථම දුඃඛාර්ය සත්‍යය ප්‍රතික්ෂෙප කොට අනෙක් ප්‍රථම දුඃඛාර්ය සත්‍යයක් පනවමි සි' මෙසේ කියන්නේය, යන යමක් වේද එබන්දක් නොවේයයි, වදාළහ.

තවද වෘත්තදුඃඛයා ගේ පැවැත්ම වදාළ බුදුහු එයට හේතුවක් සමග ද (එසේම) වෘත්තදුඃඛයා ගේ නැවැත්ම එයට උපාය සමගද

---

1 ඛු: ප: සච්චවිභඞ්ග 87 [2] සං: නි: ධම්මචක්ක සංයුත්තක 1079

වදාළහ. මෙසේ මේ වෘත්තාදුඃඛයා ගේ පැවැත්ම හා එයට හෙතුව ද නැවැත්ම හා එයට උපාය ද යනු මෙපමණක්ම හෙයින් **සතරක් ම** වදාළහ.

එසේම පිරිසිඳ දතයුතු, ප්‍රහීණ කළයුතු, ප්‍රත්‍යක්ෂ කළයුතු, වැඩියයුතු, ධර්මයන් ගේ වශයෙන් ද, තෘෂ්ණාවට අරමුණ ය, ඒ අරමුණෙහි ඇලෙන තෘෂ්ණාවය, තෘෂ්ණාව වැළැක්මය, එයට උපායය යන මොවුන් ගේ වශයෙන් දැයි මෙසේ තත් අයුරින් සතරක් ම වදාළහ.

මේ අනුනාධික වශයෙන් විනිශ්චය යි.

---

(7) **ක්‍රම වශයෙන්**:- මේද දෙශනා ක්‍රමය මැයි.

විශෙෂ:- මෙහි ඕඳාරික හෙයින් ද, සියලු සත්ත්වයනට සාධාරණ හෙයින් ද, දැනීමට පහසු හෙයින් ද, **දුඃඛසත්‍යය පළමු** කොට වදාළහ. එම **දුඃඛසත්‍යයා ගේ ම** හේතු දැක්වීම සඳහා එයට අනතුරුවැ **සමුදය සත්‍යය** වදාළහ. 'හෙතු නිරොධයෙන් ඵල නිරොධය වේ ය' යි දැක්වීම් සඳහා සමුදය සත්‍යයට අනතුරුවැ **නිරොධ සත්‍යය** වදාළහ. නිරොධයට පැමිණීමේ උපාය දැක්වීම සඳහා එයට අනතුරුවැ **මාර්ග සත්‍යය** වදාළහ.

තවද භවසුඛාස්වාදයෙහි ගැලුණු සත්ත්වයනට කළකිරීම් උපදවනු සඳහා **දුඃඛසත්‍යය** වදාළහ.

ඒ දුක අනුන් විසින් කරන ලද්දක් නො වෙයි. ඊශ්වර නිර්මාණාදි හේතුවෙන් වූවක් ද නො වේ. වැලි මේ හේතුවෙන් මැ වේ යයි ඒ දුකට අනතුරුවැ **සමුදය සත්‍යය** වදාළහ.

සමුදය සහිත දුකින් මැඩ පැවැත්වුණු හෙයින් සංවේගයට පැමිණ දුකින් නික්මීම සොයන්නා වූ සත්පුරුෂයනට නිශ්ශරණ දැක්වීමෙන් අස්වැසිලි උපදවනු පිණිස සමුදය සත්‍යයට අනතුරුව **නිරොධ සත්‍යය** වදාළහ.

නිරොධයට පැමිණෙනු පිණිස මග සොයන්නවුනට එයට අනතුරුවැ **මාර්ග සත්‍යය** වදාළහ.

ක්‍රම වශයෙන් විනිශ්චය මෙසේයි.

---

(8) **ජාති ආදීන් ගේ නිශ්චය වශයෙන්:-** ආර්‍ය සත්‍යයන් වදාරන භාග්‍යවතුන් වහන්සේ **ඉපදීම දුකය, දිරීම දුකය, මරණය දුකය, සොක, පරිදෙව, කායික දුක, දෙම්නස, දැඩි ආයාසය, යන මොහු ද, අප්‍රියයන් හා එක්වීම ද, ප්‍රිය යන් ගෙන් වෙන්වීම ද, කැමැතිවන දෑය නො ලැබීම ද, සැකෙවින් පඤ්ච උපාදානස්කන්ධයෝම ද දුක්ඛ සි දුඃඛ නිර්දේශයෙහි**[1] දෙලොස් (12) ධර්මයක් ද,

පුනර්භවය ගෙන දෙන, සිත් අලවන, ඒ ඒ ස්ථානයෙහි ඇලෙන සුළු වූ යම් තෘෂ්ණාවක් වේ ද, ඒ වනාහි කාම-තෘෂ්ණා, භවතෘෂ්ණා, විභවතෘෂ්ණායැ සි සමුදය නිර්දේශ-යෙහි[1] **ත්‍රිවිධ තෘෂ්ණාවක් ද,**

ඒ තෘෂ්ණාව නිරවශෙෂයෙන් නිරුද්ධ කිරීම වූ, බැහැර කිරීම වූ, මුදහැරීම වූ, මිදීම වූ, ආලය නො කිරීම වූ, නිර්‍වාණ යැ සි මෙසේ නිරොධ සත්‍යනිර්දේශයෙහි[1] **අර්‍ථ වශයෙන් එකම නිර්‍වාණයක් ද,**

දුක්ඛ නිරොධගාමිනී ප්‍රතිපදාර්‍යසත්‍යය කවර ද 'සම්මා-දිට්ඨිය -පෙ- සම්මාසමාධිය සි' මාගී නිර්දේශයෙහි[1] **අෂ්ට (8) ධර්මයක් ද වදාළහ.**

මෙසේ **චතුස්සත්‍ය නිර්දේශයෙහි** ජාති ආදි ධර්ම වදාළසේක. මේ ජාති ආදීන් ගේ නිශ්චයෙන් ද මෙහි **විනිශ්චය දතයුතු.**

ඒ මෙසේ සි:- මේ ජාති ශබ්දය **"එකම්පිජාතිං මෙපි ජාතියෝ"**[2] 'එක ජාතියක් ද, ජාති දෙකක් ද' යන මෙහි **භවයෙහි** ආයේ ය. **"අත්ථි විසාඛෙ නිඝණ්ඨා නාම සමණජාති"**[3] 'විසාඛා-වෙනි, නිඝණ්ඨ නම් ශ්‍රමණ ජාතියෙක් ඇත' යන මෙහි **නිකාය යෙහි** යැ. **"ජාති මීහි ඛණ්ඩෙහි සංගහිතා"**[4] 'ජාතිය සතක්ඛ දෙකකින් සංග්‍රහීත ය' යන මෙහි **සංඛත ලක්ෂණයෙහි** යැ. **"යංමාතුකුච්ඡිම්හි පඨමං චිත්තං උප්පන්නං පඨමං විඤ්ඤාණං පාතුභූතං තදුපාදාය සාවස්ස ජාති"**[5] මවුකුස පළමුවැ යම් ප්‍රති-සන්ධි චිත්තයක් උපන්නේ නම් ප්‍රතිසන්ධි විඥානයක් පහළ වී නම් ඒම ඔහු ගේ ජාතිය වේ' යන මෙහි **ප්‍රතිසන්ධියෙහි** යැ. **"සම්පති ආනන්ද ජාතෝ බොධිසත්තෝති"**[6] 'ආනන්දය! මවු-කුසින් බිහි වූ බොධිසත්ත්ව තෙමේ' මෙහි **ප්‍රසූතියෙහි** යැ. **"අක්කිත්තෙනා අනුපක්කුට්ඨෝ ජාතිවාදෙන"**[7] 'කුල වාදයෙන් බැහැර නො කරන ලද්දේ අවමන් නො කරන ලද්දේ ය' මෙහි

---

[1]සං: නි: සච්චසං: 1074, [2]වි: ප: සුත්ත විභඞ්ග 258, [3]අ: නි: තික-නිපාත 125, [4]ධා: ක: සංගහාසංගහ: 11, [5]ම: ව: මහාතණ්හාසඞ්ඛය 85, [6]දී: නි: මහාවග්ග 17, [7]අ: නි: තිකනිපාත 99.

කුලයෙහි යැ. "යතොහං භගිනි අරියාය ජාතියා ජාතො"[1] 'නැගණියනි? මම යම් **කලෙක** පටන් ආර්‍ය්‍ය ශීලයෙහි පිහිටියෙම් ද, මෙහි **ආර්‍ය්‍ය ශීලයෙහි යැ.**

මෙසේ මේ **ජාති ශබ්දය** අනෙකාර්‍ථ වේ. මෙහි වනාහි මවු කුස උපදනා සත්ත්වයන් ගේ **පිළිසිඳීමෙහි** සිට මවුකුසින් බිහිවීම තෙක් පැවැති **ස්කන්ධයෙහි** වේ. එයින් අන්‍ය ආකාරයකින් උපදනා සත්ත්වයන් ගේ **ප්‍රතිසන්ධි ස්කන්ධයෙහි** මැ වේ යයි දතයුතු.

මේ වනාහි **පර්‍යාය** (සම්මුති) කථාය. **පරමාර්‍ථ** වශයෙන් වනාහි ඒ ඒ තන්හි උපදනා ස්කන්ධයන් ගේ ප්‍රථම පහළවීම **ජාති** නමු.

එය ඒ ඒ භවයෙහි හටගැනීම් **ලක්ෂණය යැ. එහි කෘත්‍යය** දුක් එළවීම යැ. අතීත භවයෙන් මේ භවයෙහි හිස් නැගීම **වැටහෙන ආකාරය යැ.** දුක විසිතුරු බව එළවීම හෝ (ඵල) **පච්චුපඨානය යි.**

කුමක් හෙයින් මේ **ජාතිය** දුක් වන්නී ද? කොයෙක් දුඃඛයකට වසතුවක බැවිනි.

ඒ මෙසේයි:- දුක් නානාප්‍රකාර යැ. **දුක්ඛ-දුක්ඛ ය, විපරිණාම-දුක්ඛය, සඞ්ඛාර දුක්ඛය, පටිච්ඡන්නදුක්ඛය, අපටිච්ඡන්න දුක්ඛය, පරියාය දුක්ඛ ය, නිප්පරියාය දුක්ඛ ය යි එය සත්වැදෑරුම් වේ.**

ඔවුනතුරින් **කායික - චෙතසික වෙදනාව** සවභාව වශයෙන් ද, කාම වශයෙන් ද දුක්වන බැවින් **දුක්ඛ-දුක්ඛ** නම් වේ.

සුඛවෙදනාව තමා ගේ පෙරැළීමෙන් දුක් ඉපදීමට හෙතුවන බැවින් **විපරිණාම දුක්ඛ** නම් වේ.

උපෙක්ඛා වෙදනාව ද සෙසු කාම-රූප-අරූප යන භවත්‍රයෙහි ප්‍රත්‍යයයෙන් සකස් වූ ධර්‍මයන් ඉපදීමෙහි හා විනාශයෙහි පෙළන බැවින් **සංස්කාර දුඃඛ** නම්.

කන්රැඳ, ඇස්රැඳ, රාගයෙන් හටගන්නා දුහය, කායික-චෙතසික ආබාධ, අසා දතමනා හෙයින් හා උපක්‍රම අප්‍රකට හෙයින් ද **ප්‍රතිච්ඡන්න දුඃඛ** නම්. (අප්‍රකට දුක්ඛය යි ද කියනු ලැබේ.)

දෙතිස් **කර්‍මකථාවෙහි** ආදියෙන් හටගත් **ආබාධ** තොවිචාරා මැ දතහැකි හෙයින් ද, උපක්‍රමය ප්‍රකට හෙයින් ද **අපටිච්ඡන්න දුඃඛ** නම්. (ප්‍රකට දුකයැයි ද කියනු ලැබේ.)

දුඃඛ-දුඃඛය හැර සෙසු **ජාත්‍යාදි** සියල්ල දුකට වසතුවන හෙයින් පර්‍යාය (අප්‍රධාන) **දුඃඛ නම් වේ.**

---

[1]ම: නි: මජ්ඣිම පණ්ණාසක 225

දුඃඛ – දුඃඛය යි කියන කායික චෛතසික දුඃඛ වෙදනාව නිස්සයත්‍රීය දුඃඛ නම් වේ.

විශේෂ:– ජාතිපි දුක්ඛා, යනාදින් **විභඞ්ගයෙහි**[1] ආ පරිදි **ජාත්‍යාදිය** විසතර කරනුවන් විසින් ඒ දුඃඛයන් අතුරින් ජාතිය, **බාල පණ්ඩිත සූත්‍රාදියෙහි**[2] අඞ්ගාර කාසූපමාදීන් වදාරන ලද්දේ **ආපායික දුඃඛයයි.**

සුගතියෙහි ද මනුෂ්‍යලෝකයෙහි **'ගබ්භොක්කන්තික මූලකාදි,** ක්‍රමයෙන් උපදනා දුක දුඃඛ වසතු බැවින් **දුකයයි** වදාළහ. ඒ මෙසේය:–

මේ සත්ත්වතෙමේ මවුකුස උපදනේ මහතෙල් පියුම් ආදියෙහි නූපදී. වැලි ආමාසයට යට පක්වාසයට උඩ උදරපටල – කොදු ඇට මැද ඉතා ගැහැට ඇති ඝනාන්ධකාර වූ පිත් – සෙම් – මල – මූත්‍රාදි කුණප ගඳින් පරිභාවිත වූ ඉතා දුගඳ වාතය හමන්නා වූ, මව විසි හැවිරිදි තම් එතෙක් පැරණි වැසිකිළියක් බදු වූ හෙයින් අතිශයින් පිළිකුල් වූ කුක්ෂි ප්‍රදේශයෙහි, කුණු මස්, කුණුකොමු, ගම්දෙර ගවරවළ ආදියෙහි පණුවකු මෙන් උපදී. හෙතෙමේ එහි ඉපිද දසමසක් මුළුල්ලෙහි මවුකුස හටගත් නෙජොධාතුවෙහි උෂ්ණයෙන් පත්‍රපුටයෙක (ඵණුවෙක) පිසන බෙහෙතක් සේ පැසෙන්නේ පිටි පිඬක් සේ හුයනු ලබන්නේ යටිහක්කෙහි තබා හකුළාගත් අත් හා උක්කුටුකයෙන් හිඳිනා හෙයින් හකුළා ගත් පා අතිවැ අධිමාත්‍ර දුකක් අනුභව කෙරේ.

මේ ගර්භාවක්‍රාන්ති මූලක දුඃඛය යැ.

මෙසේ මවුකුස වසන සත්ත්වයා මව පය පැකිල වැටීම ය, යාම ය, හිඳීම ය, නැගිටීම ය, පෙරැළීම ය, යනාදින් රාසොඬකු අතට පැමිණි දික් ලොම් ඇති එළුවකු සේ ද, අභිතුණ්ඩිකයකු අතට පත් නසි පැටවකු සේ ද, ඉදිරියට ඇදීම්, ඔබ්නොබ ඇදීම්, යටිමුව කොට සෙලවීම් ආදි උපක්‍රමයෙන් අධිමාත්‍ර දුඃඛයට පැමිණේ. මව සිහිල් පැන් බොහෝකල සීත නරකයෙහි උපන්නකු සේ ද, උණු කැඳ-බත් අනුභව කරන කල අඟුරු වැස්සෙන් වටවූවකු සේ ද, ලුණු-ඇඹුල් ආදිය අනුභව කරන කල කාරම්දිය ගැසීමක් සේ ද, තීව්‍ර වූ දුකක් අනුභව කෙරේ.

මේ ගර්භපරිහරණ මූලක දුඃඛය යැ.

මූස ගර්භ වූ මව ගේ, මිත්‍රාමාත්‍ය සුහෘද්ජනයා විසිනුදු නුදුටුව මනා රහස් පියෙස්හි සිදීම්-පැළීම් ආදීන් ඒ සත්ත්වයාහට යම් දුකෙක් (උපදිනම්) උපදවා තම් ඒ **ගර්භ විපත්ති මූලක දුඃඛය යැ.**

---

[1] වි: ප: සච්චවිභඞ්ග 77 [2] ම: නි: උපරිපණ්ණාසක 180

වදන්නා වූ මව ගේ **කම්ජවාතයෙන්** උඩ පාදවැ අධඃශිරස්වැ පෙරළා තරක ප්‍රපාතයක් බඳු වූ ඉතා භය **ජනක** යොනි මාර්ගයට පමුණුවන සත්ත්වයාට අතිශයින් සම්බාධ වූ යොනි මුඛයෙන් යතුරු සිදුරකින් දැදගන්නා හස්ති රාජයකුට සෙයින් ද, සඞ්ඝාත පීඩනයෙන් සුණුකරනු ලබන නිරිසතකුට සේ ද, **යම් දුකක් උපදී නම්**

ඒ විජායන මූලක දුඃඛය යැ.

උපන් කෙණෙහි **වණයක්** සේ මොළොක් සියුමැලි **සිරුරු ඇති** සත්ත්වයා ගේ **අත්ලත**, නහවත, දෙවත, වස්ත්‍රයෙන් පිරිමදින, කල්හි හිදි අගින් විදිනා සේ ද, කරකැති මුවහතින් පළන්නා සේ ද, **උපදිනදුක මවු කුසින් බහිවීම මුල්කොට උපදනා දුක යැ.**

ඉන්පසුවැ ශොක කිරීම් පරිදෙවනා කිරීම් ආදීන් තෙමේම තමහට වධබන්ධන කරගන්නා කල ද, අවෙලකව (නිවීසන්න) වුතා-දීන්හි ද, පඤ්චතාපාදි වුතසමාදානයෙන් පරිතාපනාදියෙහිදී මෙන් හෝ ක්‍රොධයෙන් ආහාර නො ගැනීම් ගෙල වැල් දැමීම් ආදීන් යම් **දුකෙක් උපදී නම් ඒ ආත්මොපක්‍රම මූලක දුඃඛය යැ.**

මෙරමා අතින් මැරීම්- බැඳීම් ආදි යම් දුකෙක් වේ නම් එය **පරොපක්‍රම මූලක දුඃඛය යැ.**

මෙසේ (ජාති) ඉපදීම මෙකී තාක් දුක්ඛයට මූලකාරණ වේ. එහෙයින් **කියන ලදී.**

(6) ජායෙථ නො වෙ තරකෙසු සත්තො
තත්ථග්ගිදුභාදිකමප්පසය්හං
ලහෙථ දුක්ඛන්නු කුහිං පනිඤ්ඤං
ඉච්චාහ දුක්ඛානි මුනීධ **ජාති.**

(7) දුක්ඛං තිරච්ඡෙසු කසාපතොද-
දණ්ඩාභිඝාතාදි භවං අනෙකං
යං තං කථං තත්ථ භවෙය්‍ය ජාතිං
විනා තහිං **ජාති** තතොපි දුක්ඛං

(8) පෙතෙසු දුක්ඛං පන බුප්පිපාසා
වාතාතපාදිපභවං විචිත්තං
යඤ්ච අජාතස්ස න තත්ථ අත්ථි
තඤ්ච දුක්ඛං මුනි **ජාතිමාහ.**

(9) නිබ්බත්තිකාරෙ ච අසය්හ සීතෙ
ලොකන්තරෙයං අසුරෙසු දුක්ඛං
නතං භවෙ තත්ථ න චත්ථි ජාති
යතො අයං **ජාති** තතොපි දුක්ඛං

(10) යඤ්චාපි ගූථ නරකෙවිය මාතු ගබ්භෙ
සත්තෝ වසං විරමථෝ බහිනික්ඛමඤ්ච
පපොති දුක්ඛ මතිඝෝර මිදමපි නත්ථි
ජාතිං විනා ඉතිපි **ජාති** අයං හි දුක්ඛං

(11) කිං භාසිතෙන බහුකා නනු යං කුහිඤ්චි
අත්ථීධ කිඤ්චි දපි දුක්ඛ මිදං කදාචි
නෙවත්ථි ජාති විරහෙ යදතෝ මහෙසි
දුක්ඛාති සබ්බපථමං ඉමමාහ **ජාතිං**,[1]

(6) **"ජාතිදුඛ - නිරය**

නිරේ උපැත්මක් නැතහොත් සතුන් ගේ
එතන්හි ගින්නෙන් තැවුමෙන් මහත් වූ
දුකෙක් ලබාදේ! පිහිටෙක් කොතැන්හි
උපැත්ම දුක්ඛ යැ සි මුනි ඉන් වදාළේ.

(7) **තිරිසන් ලොව**

නැතොත් උපැත්මක් **තිරිසන් අපායේ**
කසින් දඬින් ඇ පෙළුමින් නිපත් බෝ
දුකෙක් කොසින් වේද, ඉනුත් එතන්හි
උපැත්ම දුක් මැයි තිරිසන් අපායේ

(8) **පේත ලොව**

සසින්- පිපාසෙන්- වැසි- අවු- සුළං ඇ
නොයෙක් ලෙසින් **පේත ලොවේ** දුකක් යම්
නැතොත් උපැත්මක් එහි ඒ කෙසේ වේ
ඉනුත් වදාළේ **දුඛ මැයි උපැත්මේ**

(9) **ලෝඅඳිරිය**

ගතන්දකාරෙන් දැඩි සීතලෙන් හා
අපායෙ ලෝකන්තරිකැයි පසිද් වූ
දුකෙක් නොවේ මැයි උපතෙක් නොවේ නම්
ඉනුත් එතන්හිත් **උපතත් දුකෙක් මැයි.**

(10) **මිනිස් ලොව**

ඒ **මව් ගැබේ** අසුවි පුත් නිරයක් සදිස් වූ
බෝකල් සතෙක් විසුමෙකින් පිට නික්මුමෙන් හා
පත්වේ ද, යම් දැඩි දුකක් එතැනත් උපැත්මෙක්
නැත්නම් නොවේ මවු **කුසේ උපතත් දුකයි ඉන්**

[1]සැ: වි: සවව වි: වණ්ණනා 68

(11) කීවෙන් බොහෝ කිම! ලොවේ කොතනත් කිසිත් යම්
වේ නම් දුකෙක් සියලු ද, එසියල් එකැන්තෙන්[1]
නැත් මැසි නැතොත් **'ඉපදුමක්'** මුණ ඉන් වදාළේ
මේ **මුල් දුකැයි** සියලු දුක් අතුරින් මහත් වූ
මේ වනාහි ජාති දුඃඛ විනිශ්චය යි.

---

(2) ජරා දුක

ජරාව දුකයැ යි' වදාළ මෙහි ජරාව සඞ්ඛත ලක්ෂණය වූ **අප්‍රකට ජරාව ය,** දත් වැටීම්, කෙස් පැසීම් ආදී වශයෙන් සම්මත වූ සන්තතියෙහි හෙවත් රූපා'රූප ධර්ම පරම්පරායෙහි එක් භවයෙකැ ඇතුළත් සකඞ්ගයන් ගේ පුරාණ බව වූ **ප්‍රකට ජරාවයයි** දෙවැදෑරුම් වේ.

මේ **දුඃඛ නිර්දේශයෙහි** ඉන් **ප්‍රකට ජරාව** අභිප්‍රේත යැ. මේ ජරාව සකඞ්ගයන් ගේ පුරාණ බව **ලක්ෂණය යැ.** මරණය කරා පැමිණවීම එහි **කෘත්‍යය යැ. වැටහෙන ආකාරය** යෙදවනය නැසීමයි, සංස්කාර දුක් බැවින් හා දුකට කාරණ වන බැවින් ද **දුක්** වන්නේ යි.

ඒ මෙසේයි:- අඟ පසඟ ළිහිල් බව, ඉන්ද්‍රියයන් ගේ **විකාර** බව, **විරූප** බව, තරුණ බව නැසීම, බලය **බැසීම, සිහිනුවණ** නැසීම, අනුන් පරිභව කිරීම, යනාදී නොයෙක් **කරුණින්** කායික වෛතසික දුකක් උපදී නම් එයට හේතුව **ජරාවයි.**

එයින් වදාළහ.

(12) අඞ්ගානං සිථිලී භාවා - ඉන්ද්‍රියානං විකාරතෝ
යොබ්බනස්ස විනාසෙන - බලස්ස උපඝාතතෝ

(13) විපපවාසා සතාදීනං - පුත්තදාරෙහි අත්තනෝ
අපපසාදනියතොවෙව - ජීයොබ්බාලත්තපත්තියා

(14) පපෙපාති දුක්ඛං යං මචෙචා - කායිකං මානසං තථා
සබ්බමෙතං ජරාහෙතු - යසමා තසමා **ජරා දුඛා.**[2]

---

(12) අඟ පසඟ අවසඟ - බැවින් **ඉඳුරන් විකරින්**[3]
යොවුන් සිරිය නැසීමෙන් - සිරුරු බල වැනැසීමෙන්.

(13) සිහිනුවණ වියෝවීන් - සිය අඹු දරු නැසියන්
පිළිකුල් කරනුයෙන් හා - නිවට බවට පැමුණුමෙන්

---

[1] ඒකාන්තයෙන්

[2] ස: වි: සවව වි: 70

[3] විකාරයෙන්

(14) කයින් මනයින් යම් – **දුකක්** ලබතොත් මිනිසා
එ සියල් දිරුම් හේතෙන් – එබැවින් **ජරා දුක මැයි.**
මේ ජරායෙහි චිනිසයි.

---

(3) මරණ දුක

මරණය ද දුකයැයි වදාළ තන්හි සංඝකාරයන් ගේ විනාශය වූ **ක්ෂණික මරණය** ද

"ජරා මරණා චිහි ඛන්ධෙහි සංගහිතං"[1]යි

'රූපධර්මයන් ගේ ජරා මරණ දෙක **රූපස්කන්ධයෙහි** ද, නාම ධර්මයන් ගේ ජරා මරණ දෙක **සංස්කාරස්කන්ධයෙහි** ද, සංගෘහීත යයි' කියේ මේ **ක්ෂණික මරණය** පිළිබඳවයි.

"නිච්චං මරණතෝ භයං"[2] යි 'නිතර මරණයෙන් භය වේ' යයි කී තන්හි එක භවයකට ඇතුළත් ජීවිතින්ද්‍රියයා ගේ **උපච්ඡේද සංඛ්‍යාත මරණය යි.** මේ මරණ නිර්දේශයෙහි අදහස් කරණ ලද්දේ ඒයැ. 'ජාතිප්‍රත්‍යයෙන් මරණය වේ'[3] යයි **පටිච්ච සමුප්පාදයේ** වදාළේත් ඒ සඳහායි. ඒ ජාතිප්‍රත්‍යය මරණය, **කාල මරණය අකාල මරණය සරසමරණය, උපක්‍රම මරණයෑ** යි දෙ වැදෑරුම් වේ.

එහි සරස (සුභාව) මරණය, **ආයුඃක්ෂයමරණය, පුණ්‍යක්ෂය–මරණයෑ** යි දෙවැදෑරුම් වේ. මේ ජීවිතින්ද්‍රියොපච්ඡේදයට මැ **නම්** වේ.

මේ මරණය චුතිය **ලක්ෂණ** කොට ඇත්තේ යැ. **සත්ත්ව** සංඝකාර කෙරෙන් වෙන් කිරීම එහි **කෘත්‍යය යැ.** උපත් ගතියෙන් වෙන් කිරීම **වැටහෙන ආකාරය යැ.** මේ මරණය ද දුකට වස්තුවන බැවින් **දුකය යි.** දතයුතුයි.
එසින් වදාළහ.

(17) **පාපස්ස පාපකම්මාදි** – නිමිත්තමනුපස්සතෝ
භද්දස්සා'පසභස්සස්ස – වියොගං පිය වත්ථුකං.

(16) **මීයමානස්ස යං දුක්ඛං** – මානසං අවිසෙසතෝ
සඛේඛසං **ඛාපි යං සත්ති** – ඛන්ධතච්ඡේදනාදිකං

(17) විතුජ්ජමාන **මම්මානං** – **හොති** දුක්ඛං සරීරජං
මරණං වත්ථු තෙතෙතං - **දුක්ඛමිච්චව** භාසිතන්ති.[4]

---

(15) පච්ටා පච්චුකම් – ගත්තිමිති ඇ දක්නා
කලණකම්ද කලණ දත – පියවත් වියෝ නො සැහැමෙන්.

---

[1]ධා: ක: සංගහාසංගහ 11 [2]සු: නි: මහාවගග 81
[3]වි: ප: පච්චයාකාරවි: 104 ස: වි: සච්චවි: ව: 71

(16) මියනහු යම් දුකෙක් - සිත නො වෙනසින් එකසේ
සව් සත්තට සඳ බැඳුම්[1] - සිඳුමැ හා තත් ලෙසින්

(17) නිළතැන්[2] පෙළීමෙන් - සිරුරු බද දුක් වේ තම්
ඉවසුම්-පිළියම් ද නැති - මෙ සියල් දුකට නියතින්
මේ **මරණයම** වත් වේ - ඉන් **එදුකැයි** වදලේ
මේ මරණය පිළිබඳ විනිශ්චය යි.

සොකාදින් අතුරෙහි

(4) **සොකය නම්:-** ඤාතිව්‍යසනාදියෙන් සපගිවූවහු ගේ සිතෙහි තැවීම ය. එය හුදෙක් අවී වශයෙන් **දෙමිනස** මැයි. එසේ ඇත්තේ ද ඇතුළත සිතිවිලි සිතීම **ලක්ෂණය යැ.** සිත දැවීම එහි **කෘත්‍ය යැ.** අනුව සොක කිරීම **වැටහෙන ආකාරයයි.**

(කළ නො කළ දුශ්චරිත - සුචරිත විෂයක විපිළිසර බැවින් පවත්නා අනුශොචනය, **කුක්කුච්චය යි.** ඤාති ව්‍යසනාදි විෂයක වූ හුදෙකලා චිත්තයා ගේ තැවීම **ශොකය යි.** මේයැ දෙකෙහි වෙනස.) මෙද දුඃඛ වස්තුක හෙයින් **දුක යැ.**

එයින් වදලහ.

(18) සත්තානං හදයං **සොකො** - විසසල්ලංව තුජ්ජති
අගනිතත්තොව නාරුවෝ - භුසංව දහතෙ පුන

(19) සමාවහති ච ව්‍යාධි - ජරා මරණ හෙදනං
දුක්ඛමපි විවිධං යසමා - තසමා **දුක්ඛොති** වුච්චති[3]

(18) ලෝ සත සතන් සෝ - විසහුල් සෙයින් විදුනේ
ගින්නෙන් තැවූ ඕසේ - වැඩිව දෙතා[4] දවන්නේ

(19) ලෙඩ - ජරා මරණ ද - බෙයින් තත් අයුරින් හුදු
දුක් රැස් පමුණුවනුයෙන් - **සෝදුක්** යැයි වදලේ.

(දුර්‍මල ශොකයෙන් ජරාව ද, බලවත් ශොකයෙන් අතීසාරාදි ව්‍යාධි ද, විපුල ශෝකයෙන් මරණ ද පමුණුවයි.)

මේ ශොකයෙහි විනිශ්චයයි.

---

(5) **පරිදේවය**

නැයන් ගේ චිතාශාදීන් සපගීකළහු ගේ **වාක් ප්‍රලාපය පරිදේවය යි.**

---

[1]සඤ්ඤඤ්ඤ [2]මම්මීසථාන [3]ස: වි: සචව වි: වණණා 72.
[4]නැවත නැවත

එය වැලපීම **ලක්ඛණය යැ.** ගුණ දෙස් කීම එහි **කෘත්‍යය යැ.** විලාප කියන්නකු හා එක්වීම සවභාවය හෙයින් සඞ්ගමය **ඵලය යැ.** සංසාර දුක් වන බැවින් හා දුඃඛ වස්තුක බැවින් ද **දුක් වේ.** එහෙයින්ම මේ **පරිදෙවය දුක්ඛැ** සි කියනු ලැබේ.

එසින් කීහ.

(20) යං සොකසල්ලවිහතො පරිදෙවමානො
කණ්ඨොඨතාලුගලසොසජමපපඝඤ්ඤං
භීයොධිමත්තමධිගච්ඡති යෙව දුක්ඛං
දුක්ඛාති තෙන භගවා **පරිදෙවමාහ'**[1]

(20) සෝ හුල් හැනී පෙළී-පෙළී එදුකින් වලප්නේ
වේලී එසින් බොටුව- තොල්- මුව- ඇ තො සැඟී
පත් වේ බොහෝ පුන පුනා දැනී දුක් මහත් සේ
දුක්ඛැසි එසින් **වැලපුමක්** දෙසුවේ **තිලෝනා**

මේයැ පරිදේව නම්.

---

(6) කායික දුක

කයෙහි හටගන්නා දුක මෙහි **දුක්ඛයසි** කියයි. එය කය පෙළීම **ලක්ඛණය යැ.** දුඃප්‍රාඥයනට දෙම්නස් ඉපදවීම **කෘත්‍යඥයැ.** කායික ආබාධ **වැටහෙන ආකාරය යැ.** දුඃඛ-දුඃඛය නිසා ද, මානසික දුඃඛය එළවන හෙයින් ද, මේ **දුක්ඛැසි** කියනු ලැබේ.

එසින් කීහ.

(21) පීළෙති කායිකමිදං - **දුක්ඛං දුක්ඛංච** මානසං භීයෝ
ජනයති යසමා තසමා - **දුක්ඛන්ති** විසෙසතො වුත්තං.[1]

(21) "කය පෙළුම්න් නිපන් - දුක බෙහෙවින් සිතු පෙළා
දුකු දෙනුයෙන් වෙසෙස්තෙන් - හෙද **දුක්** යැයි **මුනි** දෙසි"

මේ දුඃඛ විනිශ්චයසි.

---

(7) දෙම්නස

මානසික දුක **දෙම්නසසි.** එය සිත පෙළීම **ලක්ඛණය යැ.** ව්‍යාපාදය හා සෙදීමෙන් සිත වෙහෙසීම **කෘත්‍යය යැ.** සිතට ව්‍යාධි එළවන බව **වැටහෙන ආකාරය සි.**

---

[1]සං: වි: විභඞ්ගඨකථා 73

දුඃඛ-දුඃඛය හෙයින් ද, කායික දුක් ඵලවත හෙයින් ද, **දුක්ය.** ඒ මෙසේ සි:- චෛතසික දුකින් යුක්ත වූවෝ හිසකෙස් විහිදා හඬති. ලෙහි අත් ගසති. අභිමුඛවැ පෙරළෙති. නැවත නැවත පෙරළෙති. පා උඩුකුරු කොට වැටෙති. තමා සිරුරට ආවුධවලින් ඇණගනිති. විෂ අනුභව කෙරෙති. ගෙළ රැහැන් බැඳ එල්ලෙති. ගින්නට පනිති. මෙසේ නන් වැදෑරුම් දුකට පැමිණෙත්.

එසින් කිහ.

(22) පීළෙති යතෝ චිත්තං - කායස්සව පීළනං සමංවහති
දුක්ඛනති දෙමනස්සං - විදෙමනස්සා තතෝ ආහූ[1]

(22) "දෙම්නස සිත පෙළා - ඉන් කයට ද මහත් දුක්
එළවා **හෙද දුක්කැයි** ඉන් - කිහු දෙම්නස් නැසුවෝ"
මේ දෙම්නසෙහි විනිශ්චය යි.

---

(8) **උපායාසය**

ඥති ව්‍යසනාදීන් සපගී කරන ලද්දහු ගේ අධිමාත්‍ර දුඃඛයෙහි උපදවන ලද දොම්නස මැ **උපායාසය යි.**

මතානතරයෙකි.

ඇතැම් ආචාර්‍ය්‍ය කෙනෙක් මෙය සංස්කාරස්කන්ධයට ඇතුළත් තුදුස් අකුශල චෛතසිකයන්ගෙන් අන්‍ය වූ **විශාද** නම් ධර්‍මයෙකැයි යෙති.

මෙය සිත දැවීම් **ලක්ෂණය යැ.** තැතැනුම එහි **කෘත්‍යය යැ.** බැගැපත් බව **වැටහෙන ආකාරය යි.** සංස්කාර දුක් බැවින් ද, සිත දවන හෙයින් ද, කය බැගැ වන හෙයින් ද, දුක් වේ.

එසින් මේ කියන ලදී.

(23) චිත්තස්සව පරිදහනා - කායස්ස විසාදනාව අධිමත්තං
යං **දුක්ඛමුපායාසෝ** - ජනෙති **දුක්ඛා** තතෝ වුත්තෝ

(23) "නැ වනසැ[3] නිපන් - දුක සිත දවා දැඩිසේ
කය ද දුබල කරනුයෙන් - **උවහස්[4] දුක්කැයි** පැවසි"
මේ උපායාසයෙහි විනිශ්චය යි.

විශෙෂ:- මෙහි මද ගින්නෙන් බදුනක් තුළ පැසීම මෙන් **ශොකය ද,** තද ගින්නෙහි පැසෙන දෙය භාජනයෙන් පිටත උතුරා යාම මෙන් **පරිදෙවය ද,** පිටත නික්මී ඉතිරි වූ දය බැහැර විය නොහි භාජනය තුළම අවසානය තෙක් පැසීම මෙන් **උපායාසය ද,** දතයුතු.

---

[1]සං: වි: විභඞ්ගඨකථා 73 [2]සං: වි: විභඞ්ගඨකථා 74 [3]ඤති ව්‍යසන
[4]උපායාස

(9) **අප්‍රිය සම්ප්‍රයොගය**

අමනාප සත්ත්ව සංඝකාර හා එක්වීම **අප්‍රිය සම්ප්‍රයොග** දුඃඛය යි.

එය සිත සතුටු නො වන එක්වීම් **ලක්ෂණය යැ.** සිත පෙළීම **කෘත්‍යය යැ.** අනර්ථ බව **වැටහෙන ආකාරය යි.** මෙද දුඃඛ වස්තු හෙයින් **දුක් වේ.**

එයින් කීය.

(24) දිසවාව අප්පියෙ දුක්ඛං – පඨමං හොති චෙතසි
තදුපඝාතකම්මසමඞ්ගත – මිථ කායෙ යතො ඉධ

(25) තතො දුක්ඛඤ්ඤයසඤ්ඤාපි – වත්ථුතො සෝ මහෙසිනා
දුක්ඛා වුත්තොනි විඤ්ඤුයෝ – **අප්පියෙහි සමාගමෝ**[1]

(24) "නො පිය වත් දැක්මෙන් – පළමුවැ සිත්හි දුක් වේ
එයට උවහම්[2] යෙදුමෙන් – කයෙහි ද දුක් උපදනේ"

(25) "මෙදුක් දෙකට ම ඒ – වත් වනුයෙන් **තිලෝනා**
නො **පියයන් හා සමහම්**[3] **දුකැයි,** වදහළෙ වෙසෙසින්"

අප්‍රිය සම්ප්‍රයොග දුඃඛ විනිශ්චය යි.

---

(10) **ප්‍රිය විප්‍රයොගය**

මනාප වස්තූන්ගෙන් හා සත්ත්වයන්ගෙන් වෙන්වීම **ප්‍රිය විප්‍රයොග දුක්ඛය යි.**

එය කැමැති වස්තූන්ගෙන් වෙන්වීම **ලක්ෂණ කොට ඇත්තේ යැ.** ශොක ඉපදීම එහි **කෘත්‍යය යැ.** ව්‍යසනය **ඵලයයි.** මෙය ශොක දුඃඛයට වස්තු හෙයින් දුක් තමි.

එයින් කීය.

(26) ඤාති-ධනාදි වියොගා – සොකඝරසමප්පිතා චිතුජ්ජනනි
බාලා යතො තතොයං – දුක්ඛොති මතො **පියවිප්පයොගො**[1]

(26) "කැ දත ඇ ඉපිය[5] – වත් වියොවින් නිපත් සෝ
සරපහර ලද අද බල්[5] – පෙළනෙන් **පිය වියෝදුකැ**"

මේ ප්‍රිය විප්‍රයොග දුඃඛ විනිශ්චය යි.

---

(11) **ඉච්ඡා විඝාතය.**

"ඇපි උපදනා සභාව ඇත්තමෝ නො වමුතම් මැනවැයි" යනාදි නො ලැබිය හැකි වස්තූන් කැමැති වීම මැ **ඉච්ඡා විඝාත දුඃඛයයි** වදරන ලදී.

---

[1]ස: වි: විභඞ්ගඨ කථා 75
[2]උපක්‍රම [3]එක්වීම [4]ඉතාප්‍රිය [5]අඬ බාල

එය නොලැබිය හැකි වත් කැමතිවීම **ලක්ෂණය යැ.** එය සෙවීම **කෘත්‍යය යැ.** එය නො ලැබීම **වැටහෙන ආකාරය යි.**

මෙද දුඃඛයට වසඟ හෙයින් **දුකය යි** කියනු ලැබේ. එසින් කීය.

(27) තං තං පත්ථයමානානං – තස්ස තස්ස අලාභතෝ
යං විඝාතමයං දුක්ඛං – සත්තානං ඉධ ජායති.

(28) අලබ්භතෙය්‍යවත්ථූනං – පත්ථනා තස්ස කාරණං
යස්මා තස්මා ජිනෝ **දුක්ඛං – ඉච්ඡිතාලාභමබ්‍රවී**[1]

(27) "ඒ ඒ පතන දෑය – නො ලැබෑ විපිළිසර බැවින්
පැහැරීමෙන් යම් දුකෙක් – වේනම් මෙලෝ සත්නට

(28) නො ලද හැකි නන් වත් – පැතුම එයට කරුණු වේ
සිසි දෑ නො ලැබුම ද ඉන් – දුක යැයි **මුනි** වදාළේ."

මේ ඉච්ඡාවිඝාත දුඃඛයෙහි විනිශ්චය යි.

---

(12) **පඤ්චූපාදානක්ඛන්ධ දුක්ඛය.**

(29) ජාතිපභුතිකං දුක්ඛං – යං වුත්තම්ඵ තාදිනා
අවුත්තං යං ච තං සබ්බං – විනා එතෙ න විජ්ජති.

(30) යස්මා තස්මා **උපාදානක්ඛන්ධා** සංඛෙපතෝ ඉමේ
දුක්ඛානි වුත්තා දුක්ඛඤත – දෙසකෙන **මහෙසිනා**[1]

(29) "ඉපැදුම පටන් යම් – මෙහි කී සියල් දුක් හා
නො කියනලදද එසියල් – මේ විනා නො පවතී මැයි

(30) එසින් "පස් උවදු – කඳු[2] සැකෙවින් මෙතන්හි
දුක යැයි දුකත් පිළිවිදි[3] – **ලෝකිම්යා** වදාළේ."

දරට ගින්න මෙන් ද, අව්පහරට ඉලක්කය මෙන් ද, මැසි මදුරු ආදීනට ගවයා මෙන් ද, ගොවියනට ගොයම් මෙන් ද, ගම්-පහරන්නවුනට ගම මෙන් ද, උපාදානසඞ්ඛ්‍යකය **ජාත්‍යාදි දුකට** වසඟ වෙයි. ඒ ජාත්‍යාදීහු තත් අයුරින් පෙළුම්හි භූමියෙහි තෘණ – ලතා මෙන් ද, වෘක්ෂයන්හි පුෂ්ප – ඵල – පල්ලවයන් මෙන් ද, **උපාදානස්කන්ධයන්හි** මෑ හටගනිත්.

---

[1] සං: නි: විභඞ්ගඨ කථා 76
[2] පඤ්චූපාදානඛන්ධ [3] දුඃඛානන්තය ප්‍රතිවෙධ කළ

උපාදානස්කන්ධයන් ගේ **ප්‍රථම දුක්ඛ ජාතිය යැ. ජරාව මධ්‍ය දුක්ඛ යැ. මරණය අවසාන දුක්ඛයි.** මාරණාන්තික දුකින් පෙළෙමින් සිත් තැවුලෙන් හටගන්නා **දුක්ඛ ශෝකය යි.**

එය ඉවසිය නොහැකි බැවින් හැඬීමෙන් වන්නාවූ දුක **පරිදෙවය යි.**

ධාතුක්ෂෝභාදි අනිෂ්ට සංඝීයෙන් ශරීරයේ පීඩා ඉපදීම **කායික දුක්ඛ යැ.**

එයින් පීඩිත වූ පෘථග්ජනයා ගේ එහි ක්‍රෝධ ඉපදීමෙන් සිත පෙළීම **දෞර්මනස්‍ය යැ.**

ශෝකාදිය වැඩීමෙන් උපන් චිත්ත කලාන්ත ඇත්තවුන් ගේ සිතිවිලි සිතීමෙන් උපදනා **දුක්ඛ උපායාස යැ.**

චිත්තාභිලාෂ විඝාතයට පැමිණියවුන් ගේ අනිමත වස්තු ප්‍රාප්තිනා කිරීමෙන් හටගන්නා දුක **ඉච්ඡාවිඝාතය යි.**

මෙසේ තන් අයුරින් පරීක්ෂාකරන්නවුන් ගේ **උපාදානස්කන්ධයෝම දුඃඛයෝ යි.**

එහි ජාත්‍යාදීන්ගේ ම එකක් එකක් ම **අසම රොග දුඃඛාදි** වශයෙන් දක්වා දේශනා කළහොත් බොහෝ කල්ප ගණනකිනුදු **මේ දුඃඛ සත්‍යය** නිරවශේෂයෙන් වදාළ නොහැක්කේ යි.

එහෙයින් එක් දිය බිඳකින් සියලු සමුද්‍ර ජලයෙහි රසය හකුළුවා දක්වන්නා සේ මේ **පඤ්චෝපාදානස්කන්ධයෙහි** හකුළුවා දක්වනු පිණිස **"සඞ්ඛිත්තේන පඤ්චූපාදානක්ඛන්ධා දුක්ඛා"**[1] **යි** 'සැකෙවින් පඤ්චූපාදානස්කන්ධය දුකය' යි වදාළහ.

මේ උපාදානස්කන්ධ දුඃඛයෙහි විනිශ්චය යි.

මේ දුඃඛ නිර්දේශය යි.

---

1 වි: ප: සච්චවිභඞ්ග 77

සමුදය සත්‍ය නිර්දේශය (2)

සමුදය සත්‍යය වදාරන **සම්බුදුයන් වහන්සේ** විසින් **"යායං තණ්හා පොනොභවිකා නන්දිරාග සහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී සෙය්‍යථිදං කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා"**[1] යි "පුනර්භවය කරන ඇලෙන රාගය හා ඒකී භාවයට පැමිණි ඒ ඒ **ආත්ම**භාවයෙහි හෝ ඒ ඒ රූපාදි ආලම්බනයෙහි හෝ අතිශයින් සතුටුවූ **කාමතෘෂ්ණා** යැ, **භවතෘෂ්ණා** යැ, **විභව තෘෂ්ණා** යැ යි සම්බන්ධ තෘෂ්ණාවක් වදාරන ලද්දේ ද, ඒ මේ **සමුදයාර්ය සත්‍ය**ය යි.

විස්තර :- **යායංතණ්හා** = යම් ඒ තෘෂ්ණාවක්

පොනොභවිකා = පුනර්භවය කරන සුභාවය ඇත්තී ය.

ප්‍රශ්න :- දෙවන භවයක් දෙන්නා වූ තෘෂ්ණාවක් ද, නො දෙන තෘෂ්ණාවක් ද ඇත. එහෙයින් මෙහි අවිශේෂයෙන් **"පොනොභවිකා"** යි කීයේ කුමක් හෙයින් ද

පිළිතුර:- විශෙෂ ප්‍රත්‍යයයන් ගේ සමවායයෙන් පුනර්භවය දෙන්නා වූ තෘෂ්ණාව පුනර්භවය දෙයි. පුනර්භවය නො දෙන තෘෂ්ණාව විශෙෂ ප්‍රත්‍යයයන් ගේ සමාගමය නැති කල්හි පුනර්භවය නො දෙයි. එහෙත් ඒ තෘෂ්ණාව ද පුනර්භව දුන සුභාවය නො ඉක්ම පවත්නා හෙයින් "පුනබ්භව දුන සීලා"යි තදධීන විසින් පුනර්භවය දෙන සුභාවයට සුදුසු හෙයින් හෝ "පොනොභවිකා"යි අවිශෙෂයෙන් කී බව දතයුතු.

නන්දිරාග සහගතා = චිත්තයා ගේ බැඳෙන බව හෝ ඉපිළෙන බව හෝ පොපියන බව නන්දි නම. වණීයකින් වසන්‍රයක් රඳන්නා සේ චිත්තය අන්‍ය වණීයකට (රාගයකට) පමුණුවනුයේ රාගයයි. තෘෂ්ණාව ද මේ අර්ථයෙන් ම එකඛයෙහි පවත්නා හෙයින් **නන්දි-රාග සහගතා නම.**

තත්‍ර තත්‍රාභිනන්දිනී = ඒ තෘෂ්ණාවෙන් මැ සත්ත්වයෝ ඒ ඒ පණු, පළඟැටි, කුහුඹු ආදි **ආත්ම**භාවයෙහි ද සතුටුව රූපාදීන් අභිනන්දනය වූ තෘෂ්ණාවෙන් ඇලෙත් හුයි තෘෂ්ණාවමැ **තත්‍ර-තත්‍රාභිනන්දිනී නම.** ඕ **කාම, භව, විභව** වශයෙන් **ත්‍රිවිධ** වේ. (එය මතු **පටිච්චසමුප්පාද නිර්දේශයෙහි** දක්වේ.)

ප්‍රශ්න:- මේ තෘෂ්ණාව මැ කුමක් හෙයින් **සමුදය සත්‍යය** යි කියන ලද ද

---

[1] වි: ප: සච්චවිභඞ්ග 78

පිළිතුර:- විශෙෂ හෙතු බැවිනි. අවිද්‍යාව බෙහෙවින් ආදීනව වසයි. දිගි උපාදානාදිය ඒ ඒ භවයෙහි අභිනිවිසමාන තෘෂ්ණාව වඩයි.

"දෙවෂාදීහු ද **කර්මයට කාරණ** වෙති. තෘෂ්ණාව වනාහි ඒ ඒ භව- යොනි- ගති- විඤ්ඤාණස්ථිති- සත්ත්වාවාස- සත්ත්වනිකාය- කුල- භොගෛශ්වර්‍යාදි විචිත්‍රතාව ප්‍රාර්ථනය කරන්නී කර්මවිචිත්‍රතාවයට උපනිශ්‍රය බවට ද, **කර්මයට** සහාය බවට ද, යන්නී භවාදීන්ගේ විචිත්‍රතාවය නියම කෙරේ.

මෙසේ දුඃඛයට විශෙෂ හේතු බැවින් **සූත්‍රයෙහි** වදාළ සෙසු අවිද්‍යා-උපාදාන-කර්මාදි හේතූන් ඇත ද, **අභිධර්මයෙහි** වදාළ-අශෙෂ කෙලෂ- කුශල මූලාදි හේතූන් ඇත ද, **තෘෂ්ණාවම සමුදය සත්‍ය යැයි කියනලදැ සි දතයුතු**" (යනු සත්‍යසි.)

මෙහි දැක්වෙන **ත්‍රිවිධ තෘෂ්ණාව ම දුඃඛ සත්‍යය** උපදවන අර්ථයෙන් **එකක්** සේ ගෙන **දුඃඛ සමුදයායයි සත්‍යය** සි කීහු.

මේ සමුදය සත්‍ය නිර්දේශයසි.

නිරොධ සත්‍යය (3)

දුඃඛ නිරොධ නිර්දේශයෙහි **"යෝ තස්සායෙව තණ්හාය"**[1] යනාදීන් **සමුදය නිරොධය** වදාළහ.

කවරහෙයිනයත්?

සමුදය නිරොධයෙන්ම දුඃඛ නිරොධය වේ. මේ අන් පරිදිදෙකින් නොවේ.

එම අර්ථයා ගේ එකාන්ත බව මෙසින් වදාළහ.

"යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ
ඡින්නොපි රුක්ඛො පුනදෙව රුහති
එවම්පි තණ්හානුසයෙ අනූහතෙ
උපපජ්ජති දුක්ඛමිදං පුනප්පුනං"[2]

"යම්සේ රුක්ක් සහමූලින් උදුරා නොලිහම්
සින්දත් මූලින් ලියලලා වඩතේ ද මත්තේ
තණ්හානු ශේ විදිලෙසින් එලෙසින් නුසුන් කල්
මේ දුක් සියල් පුන පුනා උපදී වෙසෙස්නෙන්

---

[1]සං· නි: විභඞ්ගඨකථා 80 [2]ධ: ප: තණ්හාවග්ග 40

(ගසෙක පස් මහා මූල්, සිදීම්- පැළීම්- **පණුවන් විදීම්**- ආදීන් උපද්‍රවයකට නොපැමිණ (එහෙයින්ම) සථිරවැ සිටි කල්හි අතුපතර සිදින ලදුව ද, (රුක) නැවත නැවත අතු රිකිලි පත් ආදියෙන් වැඩෙන්නාසේ **තෘෂ්ණානුශය** (කාමරාගානුසය - භවරාගානුසය) අනීනමාශීඤ්ඤයෙන් නොසිඳිනලද කල්හි ජාත්‍යාදි මේ දුක ඒ ඒ භවයෙහි නැවත - නැවත උපදනේය.)

මෙසේ **තෘෂ්ණා** නිරොධයෙන් මෑ දුඃඛ නිරොධය වන හෙයින් දුඃඛ නිරොධය දේශනා කරන බුදුහු **සමුදය නිරොධය** මෑ වදළහ.

විශෙෂඃ- **බුදුවරයෝ** සිංහ සමාන පැවැතුම් ඇත්තෝය. යමෙක් තමා වෙත හියක් විද්දේ නම් (සිංහයා) හෙතුව වූ ඒ විද්දහු විනා ඵලය වූ ඊය ඔහැ නොගනී. එසේම **බුදුවරයෝ** ද, දුඃඛ-නිරොධය දෙශනා කරන්නාහු දුඃඛ හේතුව වූ **තෘෂ්ණා නිරොධය** වදරති. ඵලය වූ දුඃඛය නොවදරත්.

සුනඛයා තමහට ගැසූ ගල සපයි. ගල ගැසුවහු ඔහැ නොගනී. එසේම අන්‍ය තීර්ථකයෝ දුක් නිරොධ කරන්නාහු අත්තකිල-මථානුයොගාදීන් දුක් විදීමෙන්ම දුක් නැතිකළ යුතුයැයි යෙති. **ක්ලෙශ** නිරොධය නොකියත්.

මෙසේ දුඃඛ නිරොධය සමුදය නිරොධය වශයෙන් දෙසීමේ ප්‍රයොජන දතයුතු.

එහෙයින්මෑ

තස්සායෙව තණ්හාය = පුනර්භවය කරන (කාම- භව- විභව-වශයෙන් බෙදූ) තෘෂ්ණාවගේ මෑ

අසෙසවිරාග නිරොධො = යම් **නිර්වාණයක්** අවබොධ කිරීමෙන් තෘෂ්ණාව ගේ නිරවශෙෂයෙන් ක්ෂයවීම් වශයෙන් පහවීම ද, නැවත නූපදනා සේ නිරුද්ධවීම ද වේනම් ඒ **නිර්වාණය** තෘෂ්ණාව-ගේ අසෙස විරාග නිරොධය සි.

විශෙෂඃ- මෙහි විරාග නම් **මාර්ගය සි.** ඒ විරාග නම් වූ මාර්ගයෙන් නිරුද්ධ කිරීම (නිරවශෙෂයෙන් ප්‍රහාණය කිරීම) අශෙෂ විරාග නිරොධය යැ. මාර්ගයෙන් අරමුණු කිරීම් වශයෙන් **නිර්වාණයට** පැමිණීමෙන් තෘෂ්ණාව නිරවශෙෂයෙන් ප්‍රහාණය වන හෙයින් **නිර්වාණය** තෘෂ්ණා විරාග-නිරොධය සි කියනු ලැබේ.

තවද කාමරාගාදි වශයෙන් පැවැති තෘෂ්ණාව අනුසය සහිතව ප්‍රහාණය වන හෙයින් අශෙෂ විරාග නිරොධය සි කියනු ලැබේ.

තවද අර්ථයෙකි:- විරාග කම් ප්‍රහාණය යැ. එහෙයින් නිරවශෙෂ විරාගය, නිරවශෙෂ නිරොධය සි මෙසේ මෙහිලා යෙදිය යුතුයි. අර්ථ වශයෙන් වනාහි මේ **විරාග - නිරොධාදි** පද සියල්ලම **නිර්‍වාණයට** පර්‍යාය නාමයෝයි.

පරමාර්ථවශයෙන් **දුඃඛනිරොධායර්‍ය සත්‍යයයි නිර්‍වාණය** කියනු ලැබේ. (දුඃඛ නිරොධ මාත්‍රය නො කියනු ලැබේ.)

ඒ **නිර්‍වාණයට** අරමුණු කිරීම් වශයෙන් පැමිණ තෘෂ්ණාව අත්‍යන්ත විරාගයෙන් ප්‍රහාණය වේ. අනුත්පාද නිරොධය වේ. එහෙයින් විරාග යැයි ද, නිරොධ යැයි ද කියනු ලැබේ.

එසේම නිර්‍වාණය අවබෝධ කිරීම හෙතුකොට ගෙන එම තෘෂ්ණාව **අත්හැරීම** ද, නො ඇලීම ද, මිදීම ද, වන හෙයින් ද, පසුවකාම ගුණික ආලයයන් අතුරින් එකකුදු නැති හෙයින් ද, **නිර්‍වාණය චාග - පටිනිස්සග්ග - මුත්ති - අනාලය** නම් වේ.

(**දුක්ඛනිරොධායර්‍ය සත්‍යය** වදාරන **බුදුහු** තෘෂ්ණා නිරොධය වශයෙන් දුඃඛනිරොධය වදාළහ. ඒ තෘෂ්ණා සඞ්ඛ්‍යාත දුඃඛොත්පාදක හෙතුව නිබ්‍බැදී ඵලය වූ දුඃඛය නැතිකළ නො හැකි හෙයින් දුක් නැති කළ හැකි ආකාරයත් සමගම වදාරනු සඳහා ය. තෘෂ්ණාව වූ දුඃඛ හෙතුව නිබ්‍බැදී කොතෙක් දුක් නැති කළ ද, නැවත උපදනා හෙයින් නැවත නූපදනා සේ දුක් නිරුද්ධ කිරීමේ නො වරදනා ක්‍රමය ද එය මැයි.)

ඒ **නිර්‍වාණය** ඥානති **ලක්ඛණ ය යැ.** නො ඇලිනෙන බව හෝ ආසවාදකර බව එහි **රසය යැ.** රාගාදි නිමිති නැති හෙයින් අනිමිත්ත බව හෝ ප්‍රපඤ්ච රහිත බව **වැටහෙන ආකාරය යැ.**

(මෙහිලා **පරවාදි-සකවාදි** සංවාද ද්වාරයෙන් **නිර්‍වාණයා ගේ අභාවය** හා **භාවය** පිළිබඳව විචාර පූර්‍වක විවරණයක් වේ.)

පරවාදී: මෙසේ ලක්ෂණාදිය කියා **නිර්‍වාණය** වර්ණනා කිරීමෙන් කවර ප්‍රයෝජන ද නාම මාත්‍රය මුත් **නිර්‍වාණය** නෙමේම නැත්මැයි. සස විසාණයක් (හා අඟක්) මෙන් අනුපලබ්ධි (සිතින් නො දත හැකි) වන හෙයිනි.

සකවාදී: "නිවන් නැති (සිතින්) නො දත හැකි හෙයිනැයි" යම් හෙතුවක් කියන ලද නම් ඒ එසේ නො වේ. **ශීල විශුද්ධි** ආදි එයට සුදුසු උපායයෙන් උපලබ්ධි (ප්‍රත්‍යක්ෂ) වන හෙයිනි.

(මෙහි "**නත්ථෙව නිබ්බාණං**"= **නිර්ාණය** නැත්මැයි, යනු සාමාන්‍ය-යෙන් ප්‍රතිඥ වීතම් තමා විසින් අභිප්‍රෙත **නිර්ාණයාගේ** ද අභාවය පැම්ණේ. එකල්හි ප්‍රතිඥ විරෝධය වේ. ඉදින් පරානිමත **නිර්ාණය** පිණිස වීතම් **එකල්හි** ධර්ම් අසිද්ධිය වේ. එහෙයින්ම හෙතුව ආශ්‍රයාසිද්ධ වේ.

"**අනුපලබ්භනියතෝ**" යනුයෙහි අනුපලබ්ධිය **ප්‍රත්‍යක්ෂ වශයෙන්** වීතම් චක්ෂුරාදීන් ගේ වශයෙන් හෙතුව **අනෙකාන්තික** වේ. අනුපලබ්ධිය **අනුමානයෙන්** වීතම් පරහට හෙතුව අසිද්ධ වේ. (මෙසේ **නිර්ාණය** අනුපලබ්ධි වනුයේ (නුවණට ගොවර නො වනුයේ) ප්‍රත්‍යක්ෂයෙන් ද, අනුමානයෙන්ද යි විචාරා ඒ දෙයාකාරයෙන් ම උපලබ්ධි වන බව් **දෂ්ටානනාදිය** දැක්වීමෙන් ව්‍යක්ත කෙරේ)

1. **නිර්ාණය** එයට සුදුසු **සීල - සමාධි - ප්‍රඥා** සඛ්‍යාත උපායයෙන් උපලබ්ධි (ප්‍රත්‍යක්ෂ) වේ.

2. **වෙතොපරිය** (පරචිත්ත විජානන) **ඥානය** ලද ආයර්යන් ඒ නුවණින් අනුන් ගේ ලොවුතුරා සිත දනගත්තා සේ ආයර්යන් ප්‍රත්‍යක්ෂයෙන් ම **නිර්ාණය** අවබොධ කරන හෙයින් **නිර්ාණය** නැතැයි නො කිය යුතු. (මේ ප්‍රත්‍යක්ෂයෙනි)

විශෙෂ:- ආයර්යයෝ වෙතොපරිය ඥාණය උපදවා එයින් අන්‍ය ආයර්යයන් ගේ ලොවුතුරා සිත් දකිති. (ඒ ඒ මාගී ලාභී ආයර්යයනට එබඳු වූ ම ආයර්යයන් ගේ හා එයට අඩු වූ ආයර්යයන් ගේ සිත් දත හැකි ය. **රහත්නට** සියලු ආයර්යයන් ගේ ලොවුතුරා සිත් දත හැකි වේ.) ඒ ලොවුතුරා සිතට අරමුණ **නිර්ාණය** වන හෙයින් **නිර්ාණය** නැත්තේ වීතම් ලොවුතුරා සිත් නො උපදී.

පුහුදුනට අනුන් ගේ ලොවුතුරා සිත් නො දත හැකි හෙයින් ඔවුන් ඒ නැතැයි කියනු නො යෙදේ.

3. **එසේම නිර්ාණය** ප්‍රත්‍යක්ෂ කොට වදාළ **බුදු - පසේබුදු - බුදුසව්වන් ගේ** දෙශනා ප්‍රදෙශයන් ගෙන් සිද්ධ වූ පූර්භාග ප්‍රතිපද, ඇති ආයර්‍ය මාගී - ඵල ඥානයට විෂය වූ **නිර්ාණය** ආගම - අධිගම නැති අඛ පෘථග්ජනයන් (**නිර්ාණය**) නැතැයි කරන ප්‍රතික්ෂෙපය "**හිරු ඇත්නම්** අපට ද පෙනුන මනා ය. අපට නො පෙනෙනුයේ **හිරු** නැති නිසාය" යි ජාත්‍යන්ධයන් සකල ලොකාලොක කරන සූර්‍යයා නැතැයි කියන්නා සේය.

4. තවද සසර කලකිරී ඉන් එතර වන සිත් ඇතිව **'ජාත්‍යාදි දුක** ඇති හෙයින් එය සංසිඳුවන නිවනක් ද ඇතමැනවැයි, බුදධ **ධර්මය** නොදන අනුමාන ඥනයෙන් සලකා උත්සාහ වැඩුවන් ඒ මතා ප්‍රතිපත්තීන් නිවන් පසක් කෙරෙති සි, මෙසේ තත් අයුරින් නිවන ඇති බව් **ව්‍යක්ත** කළහ.

5. තවද **ආයර්‍යමාර්ග – ප්‍රත්‍යවෙක්ෂාඥානයන්ට** ගොවර වූ **නිර්වාණය** නැතැයි' නො කිය යුතු කවර හෙයිනයත්? **ප්‍රතිපත්තිය වද වන** හෙයිනි.

නිර්වාණය නැත්තේ වීතම් **සම්‍යක් දෘෂ්ටිය** පෙරටු කොට ඇති **'ශීලාදි ස්කන්ධත්‍රයෙහි'** සංගෘහීත **සම්‍යක් ප්‍රතිපත්තිය** සිස් වේ.

(පෙර කී සේ) නිර්වාණයට පමුණුවන හෙයින් ඒ ප්‍රතිපත්තිය සිස් නො වේ. (එහෙයින් **අනාවවාදීන් ගේ** මතය අතාථ වේ.)

පරවාදී මේ ප්‍රතිපත්තිය වද නො වේ. එහෙත් ඒ වද නො වනුයේ නිවනට පමුණුවන හෙයින් නොව තෙලෙශ සමූචෙජද මූඛයෙන් අතීත – අනාගත ස්කන්ධයන් (ඇසුරු කළ කෙලෙස්) අභාවයට පමුණුවන හෙයිනි.

සභාවාදී එසේ 'අතීත – අනාගත) ස්කන්ධයන් (ඇසුරු කළ කෙලශයන්) ගේ අභාවය **නිර්වාණය සි'** කියා නම් ඒ නො යෙදේ. කවරහෙයිනයත්? අතීත (කෙලශ) ස්කන්ධයන් පෙර ම නැති වූ හෙයින් හා අනාගත (කෙලශ) ස්කන්ධයන් තවම නො වූ හෙයින් 'ඔවුන් ගේ අභාවයෙන් ප්‍රතිපත්තිය වද නො වෙයි' යනු නො වන හෙයිනි. වදවන හෙයිනි.)

පරවාදී හුදෙක් අතීත – අනාගතයන් ගේ නොව වර්‍තමාන ස්කන්ධ (ඇසුරු කළ ක්ලෙශ) යන් ගේ ද අභාවය **නිර්වාණය යැ.**

සභාවාදී වර්‍තමාන ස්කන්ධයන් (ඇසුරු කළ ක්ලෙශ) යන් ගේ අභාවය ද අසම්භව ය. වර්‍තමාන කම් නැත්තේ නො වේ. නැත්තේ වර්‍තමාන නො වේ. අභාවය ඇති කල්හි භාවය (වර්‍තමානය නො වන හෙයින් වර්‍තමානයන් ගේ අභාවය වි ප්‍රතිසිද්ධ ය.)

තවද වර්‍තමාන ස්කන්ධ (ඇසුරු කළ ක්ලෙශ) ක්ෂයකරන මාර්ග-ක්ෂණයෙහි **සොපාදිසෙස නිර්වාණ ධාතූහු ගේ** ප්‍රාප්තිය නො වන හෙයින් 'වර්‍තමාන (ක්ලෙශ) ස්කන්ධයන් ගේ අභාවයද **නිර්වාණය'** යනු නො යෙදේ. යම් කලෙක ආයර්‍ය මාර්ගය පවතී නම් එකල එයට නිශ්‍රය වූ ස්කන්ධ පවත්නා හෙයින් **නිර්වාණයා ගේ** අභාවය වේ.

පරවාදි ඇපි සියලු (ක්ලෙශ) ස්කන්ධයන් ගේ අභාවය නිවනැ යි නොකියම්හ 'මාගීඤ්ඤණයෙහි (ක්ලෙශ) ස්කන්ධයන් නො පවත්නා හෙයින් ඔවුන් ගේ අභාවය නිර්‍වාණයැ' යි කියම්හ. එහෙයින් යථොක්ත දෙෂය නො වේ.

සඞ්ඛවාදි (කෙෂ්ඨශ) ස්කන්ධයන් ගේ අවතීමානතාසඞ්ඛ්‍යාත අභාවය **නිර්‍වාණය** වේනම් මාගීයෙන් නො සිදින ලද කෙලෙස් ද මාගීඤ්ඤණයෙහි උත්සන්න නො වන බැවින් ද, මාගීඤ්ඤණයෙන් පෙරටුව ගොත්‍රභූ චිත්තයෙහි පටන් ක්ලෙශයන් ගේ සමුදාචාර නැති හෙයින් ද, නැත්තානුනුසි මාගීයෙන් කටයුතු නැති හෙයින් **ආයෂ්මා මාගීය** නිරර්‍ථක බවට පැමිණේ.

මෙසේ- **නිර්‍වාණය**

1 අනුපලබ්ධි නො වීම ද

2
- i අභාවමාත්‍රය නො වීම ද
- ii ප්‍රතිපත්තිය වඳ වීම ද
- iii අතීත-අනාගතාභාවයෙහි නිර්‍වාණාධිගම්‍ය නො වීම ද
- vi චතුර්‍විඥානයන් ගේ අභාවය සම්භව නො වීම ද

3 පළමුකොටම ක්ලෙශයන් අවතීමාන හෙයින් **ආයෂ්මා මාගීය** නිරර්‍ථක වීම ද

යන මේ හේතුකොටගෙන **නිර්‍වාණය ගේ** අභාවය පිළිබඳ සාධක කළ පෙරහි කරුණු නො යෙදේ. අයුකති හෙයිනි.

පරවාදි එසේවන්නා **"නිබ්බානං නිබ්බානන්ති ආවුසො සාරිපුත්ත! වුච්චති. කතමං නු ඛො ආවුසො නිබ්බානන්ති. යො ඛො ආවුසො රාගක්ඛයො, දෙසක්ඛයො, මොහක්ඛයො, ඉදං වුච්චති නිබ්බානන්ති'**[1] ආයුෂ්මත් ශාරීපුත්‍රය! **නිර්‍වාණය නිර්‍වාණයැ යි** කියයි. නිවණ නම් කිමැයි' විවාළ ජම්බුඛාදක පරිව්‍රාජකයාහට ආයුෂ්මත! 'යමක් රාගක්ෂය ද, දෙෂක්ෂය ද, මොහක්ෂය ද වේ නම් ඒ **නිවණැයි'** මෙසේ **ශාරීපුත්‍ර** සථවිරයන් වදාළ පරිදි රාගාදීන් ගේ ක්ෂය (අභාවමාත්‍ර) ය නිර්‍වාණය යැ. මෙයින් රාගාදීන් ගේ ක්ෂය මාත්‍රය **නිර්‍වාණය** බව පැහැදිළි නො වේ ද.

සඞ්ඛවාදි නො වේ. එයට අනතුරුවැ අගීත්වය විවාළ ඕහටම **"අරහත්තං අරහත්තන්ති ආවුසො සාරිපුත්ත! වුච්චති. කතමං නු ඛො අරහත්තන්ති. යො ඛො ආවුසො රාගක්ඛයො, දෙසක්ඛයො, මොහක්ඛයො ඉදං අරහත්තන්ති**[2] යි ආයුෂ්මත් ශාරීපුත්‍රය! අර්‍හත්වය අගීත්වය යි කියයි. අගීත්වය නම් කිමෙක් ද, ආයුෂ්මත! යමක් රාගක්ෂය ද, දෙෂක්ෂය ද, මොහක්ෂය ද වේ නම් ඒ අගීත්වයැ' යි වදාළ පරිදි අගීත්වය ද රාගාදීන් ගේ ක්ෂය මාත්‍රයැ යි.

---

[1] සං: නි: ජම්බුඛාදක සංයුත්ත 709

[2] ,, ,, ,, ,, 710

මෙසේ **නිර්වාණය** හා **අනිත්‍යය** දක්වූ පෙළ **ඒක** සවරූපය යැ. දෙකෙහි වෙනසක් නැති. එහෙත් ශ්‍රුත වශයෙන් **පාළියෙහි** අර්ථ ගැනීම නො යෙදේ.

ක වර හෙයින් ද

අව්‍යාකෘතයෙහි ඇතුළත් **අසඞ්ඛත ධාතු** සඞ්ඛ්‍යාව **නිර්වාණයට** අතතුරුවැ එහිමැ ඇතුළත් **සකෘත් සතරකින්** යුත් **අනිත්‍ය ඵල** චිත්තය ද, යන දෙකින් **අනිත්‍යය** රාගාදීන් ගේ ක්ෂයානන්තයෙහි උපදනා හෙයින් කාර්‍යයෙහි **කාරණොපචාර** වශයෙන් ගෙන **රාගාදීන් ගේ ක්ෂය** නාමයෙන් වදළහ.

රාගාදීන් ක්ෂය කරන අර්හත්මාර්ගඥනයට **ආලම්බන උපනිශ්‍රය** ස්ථානය වන **නිර්වාණය** ස්ථානයෙහි ස්ථානි උපචාරයෙන් ගෙන රාගක්ඛයාදි නාමයෙන් වදළහ. **නිර්වාණයෙහි** රාගාදීන් අනුත්පාද නිරොධය වන හෙයිනි.

මෙසේ රාගාදීන් ගේ ක්ෂයානන්තයෙහි උපදනා හෙයින් **අනිත්‍යය** රාගක්ඛයාදි නාමයෙන් ද, **නිර්වාණයෙහි** රාගාදිය ක්ෂයවන හෙයින් **නිර්වාණය රාගක්ඛයාදි නාමයෙන් ද,** වදළ හෙයින් **මේ සූත්‍ර දෙකම** නෙය්‍යාර්ථයයි දතයුතු. නො එසේ (**නිර්වාණය** රාගක්ෂයාදි මාත්‍රය) වුව බොහෝ දෙස් සිදුවන හෙයිනි.

ඒ මෙසේ යි:- රාගාදීන් ගේ භඞ්ගක්ෂය ක්ෂණමාත්‍ර **කාලයක්** පැවැත්ම ද,

එහෙයින් මැ අසඞ්ඛත ධාතු වූ **නිර්වාණය** සඞ්ඛත **ලක්ෂණ** වීම ද,

එහෙයින් මැ සම්‍යක් ව්‍යායාමයෙන් තොරවැ සවකෘතියෙන් මැ අධිගමය විය යුතු බව ද

එහෙයින් මැ රාගාදි ක්ලේශයන්ගෙන් නො මිදීම ද

එහෙයින් මැ රාගාදි එකොළොස් (11) ගින්නෙන් ඇවිල ගැනීම ද

එහෙයින් මැ දුක් බවට පැමිණීම ද
එහෙයින් මැ උපශාන්ත නො වීම ද
රාග-දෙෂ- මොහ ක්ෂයයෙන් **නිර්වාණ තුනක්** වීම ද
සතර උපාදාන ක්ෂයයෙන් **නිර්වාණ සතරක්** වීම ද
පඤ්චනීවරණ ක්ෂයයෙන් **නිර්වාණ පසක්** වීම ද
ෂට් තෘෂ්ණාක්ෂයයෙන් **නිර්වාණ සයක්** වීම ද
සප්තානුශයක්ෂයයෙන් **නිර්වාණ සතක්** වීම ද

අෂ්ට මිථ්‍යාත්වක්ෂයයෙන් **නිර්වාණ** අටක් වීම ද
නවතෘෂ්ණාමූලක්ෂයයෙන් **නිර්වාණ** නවයක් වීම ද
දස සංයොජනක්ෂයයෙන් **නිර්වාණ** දසයක් වීම ද

යෙළු දහසක් (1500) ක්ලේශක්ෂයයෙන් **නිර්වාණ** එපමණ වීම දැයි මෙසේ බොහෝ නිර්වාණ වේය යි ක්ෂය මාත්‍රය **නිර්වාණ** නො වේ.

(**එසේම** සෝන - සිගාලාදීන්ට උපදනා රාගාදිය ද ඒ ඒ ක්ෂණයෙහි ක්ෂයවන හෙයින් ඔවුන්ට ද නිවන් ලැබිය හැකි වන හෙයින් **නිර්වාණය** ඕඳාරික ද වේ.)

තවද, ගොත්‍රභූ ක්ෂණයෙහි ක්ලේශක්ෂය නොවන බැවින් ද මාර්ගක්ෂණයෙහි ක්ලේශ ක්ෂය නොවූ බැවින් ද, **නිර්වාණය** ආලම්බනය නො වේය යන මේ ආදි දෙෂයන් ගේ **පැමිණීම** ද වේ.

පරවාදී, යම් **ක්ෂයයක** පටන් නැවත ක්ලේශයන් ගේ නො පැවැත්ම වේ නම් ඒ පර්‍යවසානය වූ ක්ලේශක්ෂයය නිර්වාණය ය. (පළමු-පළමු වන්නා වූ ක්ෂය ය නො වේ.)

සකවාදී 'සියල්ලට අවසාන වූ ක්ෂය ය **නිර්වාණය** වේ ය' යි කියා' නම් එද නො යෙදේ. එසේ නියම කළ හැකි **මාර්ගඵලයනට** අරමුණු වන්නාවූ එබඳු **නිර්වාණයක්** නැති හෙයිනි.

(තවද පශ්චිම භවයෙන්, තුන්වන අත්බැවිහි රාගාදීන් ගේ ආදීනව දැක ධ්‍යාන භාවනාවෙන් ක්ලේශ විෂ්කම්භනය කොට නො පිරිහුණු ධ්‍යානයෙන් බඹලොව ඉපිද එහි ආයු ඇතිතාක් සිට ඉන් සැව මෙහි ඉපිද **කාමයෙහි** විතරාගීවැ පැවිදිවැ අර්හත්ත්වයට පැමිණි **සිපඵලි මානවකයා ද** ප්‍රථම වයසෙහි **කාමයෙහි** කළකිරී ධ්‍යානයෙන් ඒ ක්ලේශ විෂ්කම්භනය කොට පශ්චිම වයසෙහි අර්හත්ත්වයට පැමිණියේ ද, යන මොහු දෙදෙනම විෂ්කම්භනයෙහි පටන් නූපදනා හෙයින් පළමු ධ්‍යාන ලැබූ කලම කෙලෙස් නැසුවෝ වෙත්නම් (එසේ වන්නා) ආර්‍ය්‍ය මාර්ගයෙන් කවර ක්ලේශයක් ක්ෂය කරන්නාහු ද ඔවුන්ට ආර්‍ය්‍යමාර්ගය උපදනා කල ඉන් නැසීමට අනිතව කෙලෙස් උපදනාහුද නැත්මැයි. එසේ වුවද ඒ ක්ලේශ ක්ෂය සඞ්ඛ්‍යාත **නිර්වාණය ද,** පෙර කී සේ ඉත්තර කාල ප්‍රවෘත්ති ආදි දෙෂයෙන් නොමිදෙන හෙයින් ද, **ආර්‍යමාර්ගය** නිර්වාණය වන හෙයින් ද, එ සේ නො කිය යුතු.)

ඒ එසේමැයි:- **ආයතී මාඝීය කෙෑශයන් ක්‍ෂය කරයි. එහෙයින් එයම ක්‍ෂය යැයි** කියනු ලැබේ. ආයතී මාඝීයෙන් ක්ලේශයන් ක්‍ෂය කළ තැන් පටන් නැවත ක්ලේශයන් ගේ ප්‍රවෘත්තිය නො වේ. යම්සේ නිරුද්ධ වූවෝ නැත්තාහු ද 'එසේමැ අනුත්පන්නයෝ ද නැත්තාහුමයයි, අභාව සාමාන්‍යයෙන් නිරෝධ සදෘශ හෙයින් අනුත්පත්තියම නිරෝධය වූයේ අනුත්පාද නිරෝධය යැ. ඒ මාඝීයෙන් ක්ලේශ ක්‍ෂය කිරීම ඉපදීමට සුදුසු ක්ලේශයන් ගේ නූපදනා සභාවයට පැමිණවීමය. එහෙයින් මැ **ක්‍ෂය යයි** කියනු ලැබේ.

මෙසේ **අනුත්පාද නිරෝධය** කරන්නා වූ මාඝීයට ආලම්බනය වූ **නිර්‍වාණය** මුඛ්‍යාර්ථ හෙයින් ඒ, අනුත්පාදනිරෝධයට ඉදුරා උපනිශ්‍රය නොවනුයෙන් **සඨානොපචාර** හෙයින් **ක්‍ෂය යයි** කියනු ලැබේ.

අතීන්මාඝීය රාගාදිය ක්‍ෂය කෙරේ. **නිර්‍වාණය** එය නැවත නූපදනා සේ කෙරේ. ඒ දෙකටම ආලම්බනය **නිර්‍වාණය** ය මෙසේ **නිර්‍වාණය** ක්ලේශ ක්‍ෂයට අනන්තරොපනිශ්‍රය වේ. එහෙයින් එයට උපචාර වශයෙන් ක්‍ෂය යයි කියනු ලැබේ.

(ආයුෂයට හෙතු වූ ඖෂධයට ආයුෂයැ යි කියන්නා සේය. ඵලොපචාර හෙයිනි.)

අතීත්වය ක්ලේශයන් ගේ ක්‍ෂයානන්තරයෙහි උපදී. එබැවින් ක්‍ෂය නම් වී.

පරවාදී: නිර්‍වාණය (සවරූපයෙන්) ඇත්තේ වී නම් කවර හෙයින් එසේ නො වදුළ සේක් ද

සකවාදී: ඉතා සියුම් හෙයිනි. ඒ බව **"ඉදම්පි බ්‍හො ඨානං දුද්දසං"**[1] "මේ සථානය ද දැකීමට ඉතා දුෂ්කර ය" යනාදීන් ධර්‍ම ප්‍රත්‍යවෙක්‍ෂා කරන **භාග්‍යවතුන්** වහන්සේ ගේ සිතට ධර්‍ම දෙශනාවෙහි නිරුත්සාහ බව් දැනවීමෙන් මැ ප්‍රකට ය.

එසේම **"තංකි තෙ මාගන්දිය අදියං චක්‍ඛුං නාසි යෙනතවං අදියෙති නෙය්‍යාසි නිබ්බාණං පස්සෙය්‍යාසි"**[1]

"මාගන්දියය! යම් ආයතී ඇසකින් තෝ නිවන් දක්නෙහි නම් එබදු ආයතී ඇසක් තට නැත්තේ යැ"යි මෙසේ මාඝී නැමැති ඇසින් දැක්ක යුතු **නිර්‍වාණ** නම් සභාවයක් ඇති බව් වදුළහ. එහෙයින්ම **නිර්‍වාණය** ඇති බව ස්ථිර යැ.

---

[1]ම: ව: අනිසමෙබාධි කථා 4 [2]ම: නි: මජ්ඣිමපණ්ණාසක 137

තවද මේ **නිබ්බානය** මාගී ලාභී පුද්ගලයා විසින් මෑ පැමිණිය යුතු හෙයින් **අසාධාරණ යෑ.**

අසුවල් බුදුන්කල උපන්නේය යි මෙසේ පූර්ව කෙළවර නොදත හැකි හෙයින් **අප්‍රඥප්ති ය.**

පරවාදී: **මාගීය** ඇති කල්හි **නිවන** ඇතිවන හෙයින් ප්‍රභවයයි නො කිය හැකි ද

සකවාදී: **නිබ්බානය** මාගීයෙන් නො ඉපදවිය යුතු වෙයි හුදෙක් මාගීයෙන් පැමිණීම කටයුතු වේ. නිවනෙහි උත්පත්ති-යක් නැත් මැයි. එහෙයින් මෑ **අප්‍රභව ය.** අප්‍රභව හෙයින් ම ජරා – මරණ නැත් මැයි. උත්පාද ජරා – මරණ නැති හෙයින් ඒ නිත්‍ය යෑ.

පරවාදී: ඒ **නිබ්බානය** මෙන් අණු- ප්‍රකෘති- කාල- පුරුෂාදිය ද නිත්‍යයෑ යි නො කිය හැකි ද (මෙහි ශාස්වත භාවය නිත්‍යය යි ගැනේ.)[1]

සකවාදී: අසුවල් හේතුවින් නිත්‍යයෑ යි කිය හැකි හෙතුවක් නැති හෙයින් ඒ අණු ආදිය නිත්‍යය යි කිව නොහේ.

පරවාදී: **නිබ්බානය** නිත්‍ය හෙයින් අණු ආදිය ද නිත්‍යය යි නොකිය හැකි ද

සකවාදී: නොකිය හැකි ය. හෙතුලක්ෂණය නො යෙදෙන හෙයිනි.

විශෙෂ:- 'නිබ්බානය නිත්‍ය හෙයින් අණු ආදිය ද නිත්‍යයෑ'යි කිව පක්ෂධර්මතාව නැති හෙයින් හෙතු ලක්ෂණය නො යෙදේ. 'අණු ආදීහු නිත්‍යයහ. උත්පාද- සථිති- භඞග- නැති හෙයිනි' **නිබ්බානය** මෙනැයි, මෙසේ කියා නම් හෙද නැති අණු ආදිය අසිඛ හෙයිනි.

('අණු ආදීහු නිත්‍යයහ' යනු **ප්‍රතිඥා** යි.

'උත්පාදාදිය නැති හෙයිනි' යනු **හෙතු යි.**

'නිවණ මෙනි' යනු **දෘෂ්ටාන්ත යි.**) මේ ප්‍රතිඥාවෙහි ධර්මී අසිද්ධිය වේ. එහෙයින් හෙතුව ආශ්‍රයා සිද්ධ යි.

අප්‍රභවත්වාදීන් කියන ලද යුක්තීන් වනාහි නිවනම නිත්‍ය ය. අප්‍රභවත්වය ද අප්‍රත්‍යය බැවිනි. එහෙයින් මෑ පූර්වකොටිය ගේ අභාවය වේ. (මෙසේ **'නිබ්බානය** ප්‍රත්‍යය රහිත ය. එහෙයින් මෑ අප්‍රභව ය. අප්‍රභව හෙයින් මෑ පූර්වකොටි අභාවය වේය' යනු නිශ්චිත යි.

---

[1]සාඛ්‍යදර්ශන (කුටඨානිචතාහි ඉධ අධිප්පෙතා. ටීකා.)

තවද නිර්වාණය රූපසඞ්ගහභාවය නැති හෙයින් **අරූප ය.**

(**විකාරවීමය, අරමුණු** හා ගැටීමය, **කලාපවශයෙන්** පැවැත්-ම ය, **සප්‍රදේශ** බව ය, යනාදිය රූපසඞ්ගහභාවය යි.)

නිර්වාණය එසේ කිසිවක ගැටීමක් හෝ අසුවල් දිශායෙහි වේ යයි දිශා නියමයක් හෝ නැතැයි දක්වයි.

ඒ එසේ මැයි:- ප්‍රතිඝා රහිත හෙයින් **නිවන** අසුවල් දිසාහි හෝ අසුවල් දේශයෙහි හෝ වේය යි නො දක්වයි.

යටත්පිරිසෙයින් කල්ප ලක්‍ෂයක් වත් දැඩි වීර්‍ය්‍ය කොට (**ලොකොත්තර**) සම්‍යක් ප්‍රධන් වීර්‍ය්‍යයෙන් නිපදවන ලද ඥනයෙන් සාක්‍ෂාත් කළයුතු බැවින් ද, (නිර්වාණය ආර්‍ය්‍යයනට ප්‍රත්‍යක්‍ෂ සිද්ධ බව මින් දැක් වී.)

මතු සඳහන් පරිදි **සඞ්ඝ** වචනයෙන් ද, (මින් අනාර්‍ය්‍යයනට **ආගම සිද්ධ - අනුමාන සිද්ධ** බව දැක් වී.)

මේ දෙකින්ම **"අනුපලබ්භනීයතො"**යි පෙරකී හේතුව අසිද්ධ බව ප්‍රතීත කළහ.

මෙසේ පරමාර්‍ථ වශයෙන් **නිර්වාණයා ගේ** විද්‍යමානත්වයට හේතු යුකති දක්වා නිගමනය කොට එයට සාධක වූ **ආගම** දක්වති.

"අත්ථි භික්ඛවෙ අජාතං අභූතං අකතං අසඞ්ඛතං"[1] යි 'මහණෙනි; (1) අජාත, (2) අභූත, (3) අකෘත, (4) අසංස්කෘත **නිර්වාණය** ඇත්මැ යැ' සි වදාළහ. මේ සිවුපදය මැ **නිර්වාණයට** (පර්‍යාය) නාමයි.

විභාග:- (1) වේදනාදිය මෙන් හේතු ප්‍රත්‍යය සඞ්ඛ්‍යාත කාරණයන් ගේ එක්වීමෙන් නො නිපන් හෙයින් **අජාත යැ.**

(2) ප්‍රත්‍යය රහිත වැ (ඉඛේ) නො නිපන් හෙයින් **අභූත යැ.**

(3) මෙසේ (**අජාත - අභූත** හෙයින්) යම් කාරණයකින් නො කළ හෙයින් **අකෘත යැ.**

(රූපාදි සඞ්ඛත ධර්‍මයනට මෙන් ජාත - භූත - කෘත භාවය නැති හෙයින් මැ (**නිර්වාණය**) **අසංඛෘත යි.**

ප්‍රතිලොම වශයෙන් හෝ ප්‍රත්‍යයන් එක්වැ කරන ලද්දේ **සඞ්ඛත යැ. එසේ** සඞ්ඛත නො වූයේ හෝ සඞ්ඛත **ලක්‍ෂණ** රහිත වූයේ **අසඞ්ඛත යි.**

---

[1] ඉතිවුත්තක දුතිය නිපාත 163

මෙසේ නොයෙක් කාරණයෙන් නිපන් බව ප්‍රතිෂේධ කළ කල **'ප්‍රකෘතිවාදින් ගේ"**[1] ප්‍රකෘතිය සේ එකම කාරණයකින් කරන ලද්දේ දැයි' ආශඞ්කායෙහි ලා 'කිසිවකුත් නො කරන ලදැයි' දැක්වීම පිණිස **අකෘතයෑයි ද,** ප්‍රත්‍යය රහිත වූව ද, තෙමේ ම වූයේ මේ යි ආශඞ්කායෙහි ලා එය වළකනු පිණිස **අභූතයෑයි ද,** මෙහි 'මේ අසඞ්ඛත – අභූත භාවය සම්ප්‍රකාරයෙන් අජාත ධර්‍ම සවභාවය නිසාය යි' දැක්වීම සඳහා **අජාතයෑයි ද** වදළහ.

(මේ පිළිබඳ **විභාගත** විස්තාරය ද මෙහි ලා යථාර්‍හ වබොධයට ඉවහල් වන හෙයින් මෙතන්හි දැක්වේ.)

මෙසේ **බුදුහු පරමාර්‍ථ** වශයෙන් **නිර්‍වාණය** ඇති බැව් ප්‍රකාශ කෙරෙති. 'හෙද මම ධර්‍මේශ්වරවෙමි, ධර්‍මාධිපතිවෙමිසි, තමාගේ ආඥා මාත්‍රයෙන් නො දක්වති. හුදෙක් පදපරමයන් (මේ අත්බැව්හි **නිර්‍වාණය** අවබොධ කළ නො හැක්කවුන්) කෙරෙහි අනුකම්පාවෙන් යුක්තින් දක්වති.

ඒ මෙසේයි:- **"නො වෙතං භික්ඛවෙ අභවිස්ස අජාතං අභූතං, අකතං, අසඞ්ඛතං. න ත්‍වෙව ජාතස්ස, භූතස්ස, කතස්ස, සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායෙථ. යස්මාච ඛො භික්ඛවෙ අත්ථි අජාතං, අභූතං, අකතං. අසඞ්ඛතං, තස්මා ජාතස්ස, භූතස්ස, කතස්ස, සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායති**[2]

මහණෙනි; (පෙර කී සේ) **අජාතාදි** සවභාව ඇති **අසඞ්ඛත** ධාතුව නැත්තේ වී නම් මේ ලෝකයෙහි ජාතාදි සවභාවය ඇති රූපාදි ස්කන්ධ පඤ්චක සඞ්ඛ්‍යාත සංස්කාරයාගේ **නිස්සරණය** නො පැනේ, (සම්භව නොවේ.)

නිර්‍වාණය ආලම්බන කොට පවත්නා සම්‍යක් දෘෂ්ටි ආදි **ආර්‍ය මාර්‍ග ධර්‍මයන්** නිරවශෙෂයෙන් ක්ලෙශයන් සමුච්ඡේදය කරන හෙයින් මේ සියලු වෘත්ත දුඃඛයා ගේ (අපගමය) නිස්සරණය පැනේ. මෙසේ ව්‍යතිරෙක වශයෙන් **නිර්‍වාණයා ගේ** අස්තිත්වය දක්වා අන්වය වශයෙනුදු දක්වන සේක් **"යස්මාච ඛො"** යනාදිය වදළහ. 'අජාතාදි සවභාවය වූ අසඞ්ඛත ලක්ෂණ නිර්‍වාණය ඇති හෙයින් මෑ ජාතාදි සවභාවය වූ සඞ්ඛතයා ගේ නිස්සරණය පැනේ යැ' කියායි.

---

[1] කණාද [2] ඉතිවුත්තකදුතියනිපාත 163

(i) එසේම **අප්පච්චයා ධම්මා, අසඞ්ඛතා ධම්මා**[1]

(ii) **අත්ථි භික්ඛවෙ තදායතනං යත්ථ නෙව පඨවි**[2]

(iii) **ඉදම්පි ඛො ඨානං දුද්දසං යදිදං සඞ්ඛ සඞ්ඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො**[3]

iv **අසඞ්ඛතඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි අසඞ්ඛත ගාමිනිඤ්චපටිපදං**[4] යනාදි අනේක සූත්‍රයෙන් ද,

පෙර කී සේ

(v) "**අත්ථි භික්ඛවෙ අජාතං**" යනාදි සූත්‍රයෙන් ද, **නිබ්බාන** ධාතුහුගේ පරමාර්ථ වශයෙන් සත් (විද්‍යමාන) වස්තුව සියලු ලෝකයාට **අනුකම්පාකළ සම්‍යක් සම්බුදුරුවන් වහන්සේ** විසින් ප්‍රකාශ කරන ලදී.

එහෙයින් ශාසනයෙහි පහන් සිත් ඇති **නිවන්** ප්‍රත්‍යක්ෂ නොකළාවූ ද, නුවණ ඇත්තවුන්ට සැක නූපදී.

එහෙත් (කරුණු පිරිසිඳින බුද්ධි ඇති) පරීක්ෂණ බුද්ධිමත් පුද්ගලයින්ගේ විමති විනොදය පිණිස මෙහි අදහස් උදුරා දැක්වීමෙන් කළ යුතුයි විචාරණය මෙසේයි.

පරියෙසඤ්ඤය බැවින් සඞ්ඛත පර්‍යාපන්න වූ (ස - උත්තර) කාම-රූප ධර්මයන්ට ප්‍රතිපක්ෂ වූ එයට විරුද්ධ (භාවය) වූ නිඃසරණය පැතෙන හෙයින් එබඳු වූ **නිබ්බාන ධර්මයක්** විය යුතුය ඒ නිඃසරණය වූ අසඞ්ඛත ධාතුව ඇත්මැයි.

වැඩියක් කුමටයෑ. සඞ්ඛත ධර්මයන් අරමුණු කොට පවත්නා **විදර්ශනා ඤාණය සි** කියන ලද **අනුලොම ඤාණය** ක්ලේශයන් තදඞ්ග වශයෙන් ප්‍රහාණය කෙරේ. සමුච්ඡේද වශයෙන් ප්‍රහාණයට සමර්ථ නොවේ.

එසේමැ සම්මුති සත්‍යය ආලම්බන කොට ඇති ප්‍රථම ධ්‍යානාදීන්හි ඤානය විස්කම්භන වශයෙන්මැ ක්ලේශ ප්‍රහාණය කෙරේ. සමුච්ඡේද වශයෙන් ප්‍රහාණයට සමර්ථ නොවේ.

මෙසේ සඞ්ඛතධර්මාලම්බනවූ ද, සම්මුතිසත්‍යාලම්බනවූ ද, ඤානය ක්ලේශයන් සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය කිරීමට අසමර්ථ හෙයින් ඔවුන් සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය කරන ආලම්බනයක් විය යුතු ය. ඒ වූකලී **අසඞ්ඛත ධාතුව** මැයි. එහෙයින් "**අත්ථි භික්ඛවෙ අජාතං, අභූතං, අකතං, අසඞ්ඛතං**" යනාදීන්

---

[1] ඛ: ස: දුකමාතිකා 3 [2] උදුනපාටලිගාමිකවග්ග 129

[3] ම. ව: අනිසම්බොධි කථා 4 [4] සං: නි: අසඞ්ඛත සංයුත්තක 784

නිර්වාණයා ගේ පරමාර්ථ වශයෙන් විද්‍යමානත්වය **භාග්‍යවතුන් වහන්සේ** වදාළ සේක.

සම්බුදුයන් වහන්සේ යමක් වදාළ සේක් නම් ඒ අවිපරීතාර්ථ වචනයක්ම ය. ඒ වනාහි "**සබ්බෙ සඞ්ඛාරා අනිච්චා, සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා, සබ්බෙ ධම්මා අනත්තා**"[1] යි සියලු සංස්කාර ඇතිව නැතිවන හෙයින් **අනිත්‍ය** ය. උදය-ව්‍යය දෙක්හි පෙළන හෙයින් **දුක්** ය. වශයෙහි නො පවත්නා හෙයින් සියලු ධර්ම **අනාත්මයෝ** යි මෙසේ අනිත්‍ය-දුඃඛ **ලක්ෂණයට** සංස්කාරයන් ද, අනාත්ම ලක්ෂණයට (සඞ්ඛත පමණක් නොව) අසඞ්ඛත නම් වූ **නිර්වාණය** ද, ඇතුළත් වන හෙයින් '**සබ්බෙ ධම්මා**' යි වදාළහ.

එසේම **නිර්වාණ** ශබ්දය යථාර්ථවත් වන හෙයින් පරමාර්ථ විෂයෙහි ද, සිහ ශබ්දය මෙන් උපචාර හෙයින් අමූඛ්‍යාර්ථයෙහි ද පවතී.

මෙසේ යුක්ති විචාරණයෙන් අසඞ්ඛත ධාතුහු ගේ පරමාර්ථ වශයෙන් අස්තිත්වය දතයුතු. මේ ආදීන් හෙවත් **ප්‍රත්‍යක්ෂ සිද්ධ-ආගම සිද්ධ - අනුමාන සිද්ධ** හෙයින් **අසඞ්ඛත ධාතු සඞ්ඛ්‍යාත නිර්වාණයා ගේ** පරමාර්ථ හෙයින් විද්‍යමානත්වය දතයුතු.

(තවද විසතාරාර්ථින් ටීකාව බලා දත යුතු.)

මේ දුඃඛ නිරෝධ නිර්දේශ වර්ණනාව ය.

දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාව

දුඃඛනිරෝධගාමිනී ප්‍රතිපදා නිර්දේශයෙහි "**කතමං දුක්ඛ-නිරොධ ගාමිනී පටිපදා අරියසච්චං**"[2] යනාදීන් වදාරන ලද අෂ්ට ධර්මයෝ පෙර ස්කන්ධ නිර්දේශයෙහි[3] (සංස්කාර ස්කන්ධයෙහි) අර්ථ වශයෙන් ද ප්‍රකාශ කරන ලදහ. (එහෙත් මාර්ග වශයෙන් නොකියන ලදහ.)

මෙහි වනාහි එකවට පවත්නා ඒ ආර්ය්‍යධර්මයන් ගේ ප්‍රතිපක්ෂ ධර්මයන් නැසීම් ආදි ප්‍රවෘත්ති ආකාරයෙන් විශෙෂෝ බොධය පිණිස කියම්හ. (පෙර **විඤ්ඤාණස්කන්ධ නිර්දේශයෙහි** කී **ලෞකික** කුශල-චිත්තොත්පාදයෙහි ස්ථිතීහු නා නා **ක්ෂණිකවැ** ම උපදනාහු ය. සෙස්සෝ එහි ද එකවට උපදනාහ.)

---

[1]පටි: ස: ම: මහාවග්ග 6 බුරුම [2]ව: ප: සච්චවිභඞ්ග 81

සම්මාදිට්ඨි ආදින් සැකෙවින් මෙසේ ය.

1. **සම්මාදිට්ඨි** චතුස්සත්‍ය ප්‍රතිවෙධය පිණිස පූර්භාග ප්‍රතිපදා පූරණ වශයෙන් පිළිපන්නා වූ (ආර්‍ය්‍ය මාර්ග ප්‍රතිවෙධ සඞ්ඛ්‍යාත යෝග කර්මයෙහි යෙදුණු) යෝගීහු ගේ **නිර්‍වාණාලම්බන** වූ අවිද්‍යානුශය සමූලඝාත කරන (සෘජුව අවිද්‍යාව නසන) හෙයින් විද්‍යා නම් වූ ප්‍රඥා චක්ෂුස **සම්මාදිට්ඨි** නම. එය අවිපරීත දැකීම **ලක්ෂණය යැ.** චතුස්සත්‍යය ප්‍රකාශ කිරීම එහි **කෘත්‍යයැ** අවිද්‍යාන්ධකාර විධ්වංසනය කිරීම **වැටහෙන ආකාරය සි.**

2. **සම්මාසඞ්කප්ප** එසේ මාර්ග සම්‍යක් දෘෂ්ටියෙන් සම්පූර්ණ දෘෂ්ටි ඇත්තානු ගේ ඒ හා සම්ප්‍රයුක්ත වූ කාම සංකල්පාදි මිථ්‍යා-සංකල්ප සමූලඝාත කරමින් සිත නිර්‍වාණාලම්බනයෙහි අනිනිරෝපණය (නැංවීම) කරන්නේ **සම්මාසඞ්කප්ප** නම්. එය සිත මනාව නිවන් අරමුණට නැංවීම **ලක්ෂණය යැ.** සිත නිවනෙහි ඇලවීම එහි **කෘත්‍යය යැ.** කාමසංකල්පාදි මිථ්‍යාසංකල්ප ප්‍රහාණය **වැටහෙන ආකාරය සි.**

3. **සම්මා වාචා** එසේ සම්‍යක් දෘෂ්ටි, සම්‍යක් සංකල්පයෙන් ද යුක්ත වූවහුගේ ඒ හා සම්ප්‍රයුක්ත වූ චතුර්විධ වාග් දුශ්චරිතය සමූලඝාත ප්‍රහාණය කරමින් මිථ්‍යා වචනයෙන් විරමණය **සම්මාවාචා** නම්. එය සම්ප්‍රයුක්ත ධර්මයන් මනාකොට නුවණින් ගැනීම **ලක්ෂණඝාට** ඇත්තේය. මිථ්‍යා වචනයෙන් වෙන්වීම එහි **කෘත්‍යය යැ.** මිථ්‍යා වචනයාගේ ප්‍රහාණය **වැටහෙන ආකාරය සි.**

4. **සම්මාකම්මන්ත** ඒ මිථ්‍යා වචනයෙන් වෙන්වූවහුගේ ඒ සම්‍යක් වචනය හා සම්ප්‍රයුක්ත වූ ප්‍රාණ වධාදි මිථ්‍යා **කර්මාන්ත** සමූලඝාත කරමින් කාය දුශ්චරිතයෙන් විරමණය **සම්මාකම්මන්ත** නම්. එය තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන් මනාව නගා සිටුවීම **ලක්ෂණය යැ.** මිථ්‍යා **කර්මාන්ත**යෙන් වැළකීම එහි **කෘත්‍යය යැ.** මිථ්‍යා කර්මාන්ත බැහැර කිරීම **වැටහෙන ආකාරය සි.**

5. **සම්මා ආජීව** ඒ යෝගීහු ගේ ඒ සම්මාවාචා, **කර්මාන්ත** දෙකෙහි විශුද්ධිය වූ ඒ හා සම්ප්‍රයුක්ත වූ කුහන - ලපනාදීන් සමූලඝාත කරන මිථ්‍යා ආජීවයෙන් වෙන්වීම වූ යම් විරතියෙක් වේ නම් එය **සම්මාආජීව** නම්. එය සම්ප්‍රයුක්ත ධර්මයන් පිරිසිදු කිරීම **ලක්ෂණයැ.** සඳ්‍යාජීවයා ගේ (බුද්ධපතිකුෂ්ඨ නො වූ මනා ආජීවයා ගේ පැවැත්මට හේතුවන හෙයිනි.) පැවැත්ම එහි **කෘත්‍යය යැ.** මිථ්‍යාජීවිකා ප්‍රහාණය **වැටහෙන ආකාරය සි.**

6. **සම්මා වායාම** (අනතුරුවැ ඒ **සම්මාවාචා- සම්මා-කම්මන්ත- සම්මා ආජීව** සඞ්ඛ්‍යාත **සීල භූමියෙහි** සිටියහු ගේ) සියලු අකුසල් නසන කුසීත බව සිඳින වීර්‍යය **සම්මා වායාම** නම්. එය උත්සාහ කිරීම **ලක්ෂණය යැ.** නූපන් අකුසල් නිපදවීම, උපන් අකුසල් පහකිරීම, නූපන් කුසල් ඉපදවීම, උපන් කුසල් රැකීම ද එහි **කෘත්‍යයැ.** මිථ්‍යාව්‍යායාමය ප්‍රහාණය **වැටහෙන ආකාරය යි.**

7. **සම්මා සති** මෙසේ ව්‍යායාමය ඇත්තහු ගේ අශුභාදීන්හි ශුභාදි ආකාරයෙන් වැටහෙන සුභාවය බැහැර කරන්නා වූ චිත්තයා ගේ නුමුළා බව **සම්මාසති** නම. ආලම්බනයා ගේ යථා-සුභාවය වැටහීම එහි **ලක්ෂණය යැ.** එහි නුමුළා බව **කෘත්‍යය යැ.** මිථ්‍යා සමෘති ප්‍රහාණය **වැටහෙන ආකාරය යි.**

8. **සම්මා සමාධි** ඒ සමෘතිය හා සම්ප්‍රයුක්ත වූ මිථ්‍යා සමාධිය නසන චිත්තෛකාග්‍රතාවය **සම්මාසමාධි** නම්. එය අවික්ෂේපය **ලක්ෂණය යැ.** මනාව පිහිටීම එහි **කෘත්‍යය යැ.** මිථ්‍යාසමාධි ප්‍රහාණය කිරීම **ඵලය යි.**

මේ දුඃඛ නිරොධ ගාමිනී ප්‍රතිපද, නිදේශයෙහි ක්‍රමය යි.

මෙසේ මේ සත්‍ය නිදේශයෙහි ජාත්‍යාදීන් ගේ විනිශ්චය දතයුතු.

---

(9) චතුරාර්‍ය සත්‍යය දැනගන්නා ඥානයාගේ **කෘත්‍යය වශයෙන්ද විනිශ්චය**

(i) **අනුබොධ ඥානය**

(ii) **ප්‍රතිවෙධ ඥානය** යි ඥානය දෙපරිදි වේ.

(i) **නිරොධ-මාර්ග සත්‍යයන්** අනුශ්‍රවාදි වශයෙන් මෙතෙහි කිරීමේදී කාමාවචර මහා කුසල චිත්තයෙහි උපදනා ප්‍රඥා චෛතසිකය **අනුබොධ ඥානය යැ.** එය ලෞකික යැ.

(ii) **ප්‍රතිවෙධ ඥානය** ලොකොත්තරයැ. එය නිවන් අරමුණු කොට **දුඃඛ සත්‍යය** පිරිසිඳින, **සමුදය සත්‍යය** ප්‍රහාණය කරන, **නිරොධ සත්‍යය** සාක්ෂාත් කරන, **මාර්ග සත්‍යය** වඩන මාර්ග චිත්තයෙහි උපදනා ප්‍රඥාවයි. ප්‍රදීපය අඳුරු නැසීමය, තෙල් සිදුවීමය, එළිය පැතිරුවීමය, පහන් වැටිය දැවීමය, යන කෘත්‍ය සතරක් එකවට කරන්නාක් මෙනි.

ඒ මෙසේයි:- **යො බො භික්ඛවෙ දුක්ඛං පස්සති, දුක්ඛ සමුදයම්පි සො පස්සති. දුක්ඛ නිරොධම්පි පස්සති. දුක්ඛ නිරොධ ගාමිනි පටිපදම්පි පස්සති**[1] යමෙක් දුක දකිනම් ගේ දුක්ඛ සමුදය ද (ප්‍රහාණය කිරීම් වශයෙන්) දකී. දුක්ඛ නිරොධය ද (සාක්ෂාත් කිරීම් වශයෙන්) දකී. දුක්ඛ නිරොධගාමිනී ප්‍රතිපදාව ද (පිළිපැදීම් වශයෙන්) දකී යයි කියයි. මින් **එකක්** දක්නේ පෙර පසු නොවී එකවට සියල්ල දකී. මේ ඥාන කෘත්‍ය විස්තරය **ඥාන දර්ශන විශුද්ධියෙහි** මතු පළ වේ. ලෞකික ඥානයෙහි පරිඝට්ටන අභිභවන වශයෙන් (ශුද්ධ සංස්කාර ප්‍රයෝග වශයෙන්) මෙහි **දුඃඛ ඥානය** සක්කාය දෘෂ්ටිය වළකයි **සමුදය ඥානය** හේතු-ඵල පරම්පරාවගේ අවිච්ඡේද වශයෙන් දැකීමෙන් **උච්ඡේද දෘෂ්ටිය වළකයි.**

විභංග:- "ලොක සමුදයං බො භාවච්ච යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යා ලොකෙ නත්ථිතා සා නහොති"[2] 'භාවච්චය! ලොක සමුදයය තතු සේ සම්‍යක් ප්‍රඥාවෙන් දක්නහු ගේ ලොකයෙහි නාස්තික දෘෂ්ටියෙක් වේ නම් ඒ පහවේ යයි, වදාළ හෙයින් සමුදය දැනීමෙන් හෙතු - ඵලයන් ගේ අවිච්ඡේදය වන හෙයින් **උච්ඡේද දෘෂ්ටිය** සිදේ.

"ලොක නිරොධං බො භාවච්ච පෙ- පස්සතො යා ලොකෙ අත්ථිතා සා නහොති"[2] භාවච්චය! ලොක නිරොධය සම්‍යක්ප්‍රඥාවෙන් දක්නහුගේ ලොකයෙහි අස්තිභව සඞ්ඛ්‍යාත ශාස්වත දෘෂ්ටියක් වේ නම් එය ප්‍රහීණ වේ' යයි වදාළ හෙයින් **නිරොධය** දැනීම 'හෙතු නිරොධයෙහි ඵල නිරොධය වේ' යයි දන්නා හෙයින් **ශාස්වත දෘෂ්ටිය** ප්‍රහීණ වේ.

"නත්ථි අත්තකාරෙ නත්ථි පරකාරෙ නත්ථි පුරිසකාරෙ"[3] (යනාදීන්) තමා කළ කර්මාදියට විපාක නැත. මෙරමා කළ කර්මාදියට විපාක නැත, පුරුෂයා කළ කර්මාදියට විපාක නැත, යනාදි අත්තකාරාදිය ප්‍රත්‍යක්ෂ සේ දක්නා හෙයින් ඒ මාගී ඥානයෙන් **අක්‍රිය දෘෂ්ටිය** ප්‍රහීණ වේ.

"නත්ථිහෙතු නත්ථි පච්චයො සත්තානං සංකිලෙසාය අහෙතු අප්පච්චයා සත්තා සංකිලිස්සන්ති නත්ථි හෙතු- පෙ- විසුද්ධියා අහෙතු අප්පච්චයා සත්තා විසුජ්ඣන්ති"[3] සත්ත්වයන් ගේ කෙලෙසීමට හෙතු ප්‍රත්‍යය නැති. අහෙතු අප්‍රත්‍යය වැ සත්ත්වයෝ කෙලෙසෙති. සත්ත්වයන් ගේ විශුද්ධියට ද හෙතු ප්‍රත්‍යය නැති අහෙතු අප්‍රත්‍යයෙන් සත්ත්වයෝ විශුද්ධ වෙති' සි යනාදි **අහෙතුක දෘෂ්ටිය** ද (මෙහි අක්‍රිය දෘෂ්ටියෙන්ම ගැනේ.) (විශුද්ධි) **මාගී දර්ශනයෙන්** ප්‍රහීණ වේ.

---

[1]සං: නි: සච්චසංයුත්තක 108 [2]යං: නි: නිදානසංයුත්ත 163
[3]දී: නි: සීලක්ඛන්ධවග්ග 48

තවද ක්‍රමයෙනි:- **'දුකඛ සත්‍ය ඥානය, සමුදය සත්‍ය ඵලය වූ දුකඛ සත්‍යයා ගේ අද්ධුවාදි භාවය දකිනුයි' ඵලයෙහි වරදවා ගැනීම වලකා.**

(1) 'ඊශ්වරයා ලොකය පවත්වයි, පිළියෙළ කරයි, නසායයි' **ඊශ්වර නිර්මාණවාදීහු** කියති.

(2) 'ප්‍රධානයෙන් (ප්‍රකෘතියෙන්) ලොකය පහළ වෙයි. එහිමෑ නැවත ඇලේය' යි **ප්‍රකෘතිවාදීහු** කියති.

(3) 'කාලය භූතයන් මවයි, කාලය සත්ත්වයන් නසයි කාලය නිදන්නවුන් පුබුදුවයි. එහෙයින් කාලය ඉක්මවිය නොහේ' ය යි **කාලවාදීහු** කියති.

(4) කටුවෙහි තියුණු භාවය මෙන් ද, ගිවුළු ඵල වටවන්නාක්-මෙන් ද, මෘග - පක්ෂි - සරීසෘපාදීන් නා නා අයුරින් විසිතුරු වන්නාක්-මෙන් ද, **සවභාවයෙන්** මෑ ලොකය හටගනී. ප්‍රකෘතියෙන් මෑ විනාශ වේ' ය යි **සවභාවවාදීහු** කියති.

(5) 'පරමාණූන්ගෙන් ලොකය පවතී' ය යි **ආජීවකයෝ** කියති. (එද සවභාවවාදයෙහි මෑ ඇතුළත් වේ.)

(6) 'සියල්ල පූර්ව කර්ම හෙතුවෙන් වේය' යි **පුබ්බෙකතහෙතුවාදීහු** කියති.

(7) 'නොසිඳෙන හුයක ඇමුණූ නොබිඳෙන මැණිකක් සේ ලොකය නියත යැ. මෙහි කිසිවකු ගේ පුරුෂ කාර්‍ය්‍ය නැතැයි' **නියතිවාදීහු** කියති.

(8) 'ප්‍රජාව කැමති සේ පවතී. කැමති සේ නවතී. කැමති සේ සැප දුක් විඳී. එහෙයින් ලොකය ඉච්ඡානුරූපවැ වේ' ය යි **යදිච්ඡාවාදීහු** (අධිච්චසමුත්පන්නයෝ) කියත්.

මෙකී **අකාරණවාදී** සංඛ්‍යාවට **ප්‍රධානාදිය** ඇතුළත් වේ. සමුදය දර්‍ශනයෙන් ඒවා වළක්වයි.
තවද -

නිරෝධඥානය, රාම-උදදකාදීන්ට (ආළාරකාලාම, උදදක-රාම පුත්‍ර) මෙන් අරූපලොකයෙහි ද, (නිගණ්ඨ) **නාථපුත්‍රාදීන්ට** මෙන් අසංඥසත්ත්වයෙහි ද[1] **මොක්ෂය යි** ගැනීම වළක්වයි.

---

[1] ලොකප්පදීපකා යන්නට නෙවසඤඤානාසඤඤායතනයැයි ද මතයෙකි.

(ආදි ශබ්දයෙන්, ප්‍රධාන සඞ්ඛ්‍යාත ප්‍රකෘතිහු ගේ හෙවත් අව්‍යක්තයා ගේ මහත්වාදිභාවයෙන් අප්‍රකාශ භාවය හෝ 'මම අනෙකෙක්මි. ප්‍රකෘතිය අනෙකකැ යි' මෙසේ පැවති ප්‍රකෘති-පුරුෂ දෙදෙනා අතර දැනීමෙන් ආත්ම- සුඛ- දුඃඛ- මොහයන් විභාග කොට නො ගැන්ම වැළකූ කල්හි කිපරිද්දෙන් ප්‍රකෘතිය නො පවතී නම් ඒ **විමොක්ෂයයි** ගන්නා **කපිල මතය** ද,

බුඩි- සුඛ- දුඃඛ- ඊප්සා- ද්වේෂ- ප්‍රයත්න- ධර්මාධර්ම- සංස්කාර යන නවවිධ ආත්ම ගුණයෙන් විප්‍රයුක්ත වූවහු ගේ **විමොක්ෂය** වේය යන **කණාද** මතය ද,

පරබ්‍රහ්මයා හා සහවාසය, සමීපවැ පැවැත්ම, **එකීභාවයට** පැමිණීම **විමොක්ෂය** යන **මිථ්‍යාවිමොක්ෂය** ද වළක්වයි.

මාගී ඥානය තෙමේ:- ඉන්ද්‍රිය පිනවීමය, පුත්‍රමුඛ දර්ශනය යනාදිය හැර අපවර්ගයක් නැතැයි ගන්නා **කාමසුඛල්ලිකානු යොගය** ද,

'අනසන වෘතය, කෙස් ඉගිල්ලීම ආදි තපස්චරණය ද නග්න ශීල- ගොශීල- කුක්කුර ශීලාදීන් **ආත්ම**තාපනයෙන් මොක්ෂය වේය, යන **අත්තකිලමථානුයොගය** ද යන මොවුන්ගේ වශයෙන් පැවති අවිශුද්ධි මාර්ගයෙහි විශුඬි මාර්ගය යි' උපාය මාර්ගයෙහි වරදවා ගැනීම ද වළක්වයි.

එහෙයින් වදාළහ.

ලොකෙ ලොකප්පහවෙ - ලොකසමුදයමෙ සිවෙ ච තදුපායෙ
සම්මුයහති තාව නරෝ - න විජානාති යාව සච්චානි[1]

'සත්ත්වතෙමේ සත්‍යයන් අවබොධ නොකරනතාක් **සංස්කාර ලෝකයෙහි ද,** සංස්කාර ලෝකයාගේ **හෙතුවෙහි ද,** සංස්කාර ලෝක නිරෝධය වූ **නිර්වාණයෙහි ද,** නිර්වාණාධිගමයට උපාය වූ **මාර්ගයෙහි ද** මුළා වේ.

මේ ඝෘත්‍ය වශයෙන් විනිශ්චය යි.

---

[1]සං: ව්: විභඞ්ගඨකථා 61.

(10) **අනනගීතයන්ගේ ප්‍රභෙද හෙයින් මෙසේ යි.**

තෘෂ්ණාව ද අනාශ්‍රව ධර්මයන්ද හැර සෙසු එක් අසූ (81) ත්‍රෛභූමික ධර්මයෝ **දුඃඛ සත්‍යයෙහි** ඇතුළත් වෙති.

ආධ්‍යාත්මික, බාහිර ආයතනයෙහි **කාම** – භව – විභව තෘෂ්ණාවශයෙන් පැවති සතිස් (36) තෘෂ්ණා විචරිතයෝ **සමුදය සත්‍යයෙහි** ඇතුළත් හ. (ඒ ඒ භවයෙහි හසුරුවන හෙයින් විචරිත නම්.)

මෙහි **බුද්ධාවතුල්ලු විනඩ්ගයෙහි**[1] ආ නයින් කාල විභාගය නො ගෙන මේ කියන ලදී. කාල විභාගයද සමග ගතහොත් අටතුරාසියයක් (108) වේ.

නිරෝධ සත්‍යය කිසිදු සංස්කාර ධර්මයක් හා මිශ්‍ර නො වන හෙයින් එකෙක් මැයි.

මාගී සත්‍යයෙහි

(1) **සම්‍යක්දෘෂ්ටියෙහි විමංසිධිපාදය, පඤ්ඤින්ද්‍රියය, පඤ්ඤාබලය, ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය යන බොධිපාක්ෂික** ධර්මයෝ ඇතුළත් වෙති.

(2) **සම්‍යක් සංකල්පය** දැක්වීමෙන් **නෙක්ඛම්ම, අව්‍යාපාද, අවිහිංසා,** යන ත්‍රිවිධ විතර්කයෝ ම දක්වන ලදහ.

විභාග:– ලෞකික ක්ෂණයෙහි, අලොභ – මෛත්‍රී – කරුණා වශයෙන් සම්ප්‍රයොග වන හෙයින් වෙන වෙන මැ වේ.

මාගීක්ෂණයෙහි, ලොභ – ව්‍යාපාද – විහිංසා සමුච්ඡේද වශයෙන් එකවට පවත්නා හෙයින් එකෙක් මැයි.

කාමවිතර්කයෙහි දෙව දැක ඒ නසන පිණිස ප්‍රතිපන්නයාහට උපන් (මාගීයෙහි) විතර්කය **නෙක්ඛම්ම විතක්ක** නම් වෙයි. සෙසු දෙ විතර්කය ද එසේ මැයි.

විශෙෂ:– අශුභධ්‍යානය පාදක කොට ඉපද වූ මාගීයෙහි විතර්කය **නෛෂ්ක්‍රම්‍ය විතර්ක** නම් වේ.

මෛත්‍රීධ්‍යානය පාදක කොට ඉපද වූ මාගීයෙහි විතර්කය **අව්‍යාපාද විතර්ක** නම් වෙයි.

කරුණා ධ්‍යානය පාදක කොට ඉපද වූ මාගීයෙහි විතර්කය **අවිහිංසා විතර්ක** නම් වේය, යි (**විභඞ්ග අට්ඨකථාහි**[2] කී හෙයින් නානා මාගීක්ෂණ වශයෙනුදු ගන්නේම ය යනු සත්‍යයි.)

(3) **සම්‍යක් වචන** නිදර්ශනයෙන් **මුසාවාද, වෛරමණි** ආදි චතුර්විධ වාක් සුචරිතය සංග්‍රහ වේ.

---

[1] වි: ප: 295 [2] සං: වි: විභඞ්ගඅට්ඨකථා 82

(4) **සම්‍යක් කර්මාන්ත** නිදර්ශනයෙන් **පාණාතිපාතා වෙරමණි** ආදී ත්‍රිවිධ කායසුචරිතය සංග්‍රහ වේ.

(5) **සම්‍යක් ආජීව** මුඛයෙන් **අලෙපච්ඡතා- සන්තුට්ඨිතාවෝ** සංග්‍රහ වෙති. මේ සියලු **සම්‍යක් වචන, සම්‍යක් කර්මාන්ත, සම්‍යක් ආජීවයන්** ආර්‍යයන් කැමතිවන සිල් හෙයිනි.

(භවාන්තරයෙහි පවා ආර්‍යයන් ජීවිත හේතුවිනුදු ව්‍යතික්‍රමණය නො කරන හෙයිනි.)

ඒ ශීලය ද **ශ්‍රද්ධා** හස්තයෙන් පිළිගතයුතු හෙයින් ශීලයා ගේ විද්‍යමානත්වයෙන් **ශ්‍රද්ධෙන්ද්‍රිය, ශ්‍රද්ධාබල, ප්‍රීත්‍යුත්පාදයෝ** ඇතුළත් වූවාහු ය. (ප්‍රීත්‍යුත්පාදය ශ්‍රද්ධානුගුණ හෙයිනි.)

(6) **සම්‍යක් ව්‍යායාමය** ගැනීමෙන් **සතර සම්‍යක්ප්‍රධාන් වීර්‍ය, වීර්‍ය ඉන්ද්‍රිය, වීර්‍ය බල, විර්‍යසම්බොජ්ඣඞ්ග** යන මේ ධර්මයෝ සංග්‍රහ වෙති.

(7) **සම්මාසතිය** ගැනීමෙන් **සතරසතිපට්ඨාන, සතීන්ද්‍රිය, සතිබල, සතිසම්බොජ්ඣඞ්ග** යන මෙතෙක් ධර්මයෝ ගැනෙති.

(8) **සම්මාසමාධිය** ගැනීමෙන් **සවිතක්ක- සවිචාර, අවිතක්ක-විචාරමත්ත, අවිතක්ක- අවිචාර,** යන ත්‍රිවිධ **සමාධිත්‍රය ද, චිත්ත-සමාධිය, සමාධින්ද්‍රිය, සමාධිබල, ප්‍රීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා සම්බොජ්ඣඞ්ග** යෝ ද ගැනෙති.

විභාග:- චිත්තසමාධි නම් චිත්තනිර්‍යාදය යෑ. "**චිත්තං පජානාති චිත්තස්ස ඨිතත්තා චිත්තස්ස විමුත්තත්තා චිත්තං පජානාති**" යි මෙහි මෑ චිත්ත ශීර්‍ෂයෙන් සමාධිය වදාළ හෙයින් සමාධි ශීර්‍ෂයෙන් චිත්තය ද කියයුතු වෙයි.

විශෙෂ:- චිත්තනිර්‍යාද භාවනාවෙහි සමාධිය ද බලපවත්වන හෙයින් වීමංසිර්‍යාදිය මෙන් ඉර්‍යාදය යි නො කියා **චිත්තසමාධි**-යයි කියන ලදී.

ප්‍රීති, පස්සද්ධි, උපෙක්ඛා, සම්බොජ්ඣඞ්ගයන් සමාධි නොවතුදු සමාධියට උපකාර වන හෙයින් ගන්නා ලදී. "**ප්‍රීති මනස්සකායෝ පස්සම්භති. පස්සද්ධකායෝ සුඛං වෙදෙති. සුඛිනෝ චිත්තං සමාධියති.**[1]

'ප්‍රීති සිත් ඇත්තහු ගේ කාය දරථ සංසිඳෙයි. සන්සුන් දරථ ඇත්තේ කායික සැප විඳියි. සැප ඇත්තහු ගේ සිත සමාධිමත් වෙය' යි වදාළ හෙයින් **ප්‍රීති - පස්සද්ධි** සමාධියට උපකාරයහ.

---

1 දී: නි: සීලක්ඛන්ධවග්ග 57

උපෙක්ඛාව ද සමාධියට උපකාරවන හෙයින් හා සමාන කෘත්‍ය ඇති හෙයින් ද සමාධියෙහි ඇතුළත් වී.

අනනුගීතයන් ගේ ප්‍රභෙද විනිශ්චයයි.

---

(11) **උපමා වශයෙන්**:- උසුලා යායුතු බැවින් ද, පෙළන හෙයින් ද, **දුඃඛ සත්‍යය** බරක් වැනි ය.

ඒ ඒ භවයෙහි ඉපදීම් සඞ්ඛ්‍යාත පීඩාවට හෙතුවන හෙයින් **සමුදය සත්‍යය** බර ඉසිලීමක් මෙනි.

සංසාර ප්‍රවෘත්ති දුක සංසිඳුවන හෙයින් **නිරොධ සත්‍යය** බර බහා තැබීමක් මෙනි.

පැවැති දුක සංසිඳුවීමට හෙතුවන හෙයින් **මාර්ග සත්‍යය** බර බහාතැබීමේ උපායක් මෙනි.

තවද පීඩාකරන හෙයින් **දුඃඛ සත්‍යය** රෝගයක් මෙනි.

ප්‍රභව ලක්ෂණ හෙයින් **සමුදය සත්‍යය** රොග නිදානය මෙනි.

නිරොධ සත්‍යය රෝග සංසිඳීම මෙනි.

දුඃඛ හේතුව නසන උපාය හෙයින් **මාර්ග සත්‍යය** බෙහෙතක් මෙනි.

තවද බාධක හෙයින් **දුඃඛ සත්‍යය** දුර්භික්ෂයක් මෙනි.

ප්‍රභව හේතු හෙයින් **සමුදය සත්‍යය** අධික වර්ෂාවක් හෝ නියඟක් මෙනි.

ශාන්ති ලක්ෂණ හෙයින් **නිරොධ සත්‍යය** සුභික්ෂයක් මෙනි.

දුඃඛ හේතුව නසන හෙයින් **මාර්ග සත්‍යය** සුවෘෂ්ටියක් මෙනි.

තවද වෛරීය, වෛරය, වෛර සංසිඳීම්ය, වෛර සංසිඳුවන උපාය යැ යන විසින් ද,

විෂ වෘක්ෂය, විෂ වෘක්ෂමූලය, මූල සිඳීම්ය, මූල සිඳින උපාය යැ යන විසින් ද,

භයය, භයට හෙතු ය, භය නැතිවීම් ය, භය සංසිඳුවන උපායයැ, යනු විසින් ද,

මෙතෙරය, සැඩ පහරය, එතෙරය, එතෙරවීමේ උපායයැ යනු විසින් ද මේ උපමා පිළිවෙළින් යෙදෙති.

(මෙහි අනිෂ්ටාදි සඞ්ඛ්‍යාරූප පෙරකී සේ මැයි.)

මේ මෙකී උපමා වශයෙන් විනිශ්චයයි.

---

(12) චතුෂ්ක වශයෙන්:-

මේ චතුරාර්‍ය සත්‍ය ධර්මයන් අතුරෙහි
(1) දුඃඛවූ ආර්‍ය සත්‍ය නොවූ ධර්මයෙකුදු ඇත්.
(2) ආර්‍ය සත්‍යවූ දුක් නොවූ ධර්මයෙකුදු ඇත්.
(3) දුක් වූද ආර්‍ය සත්‍යවූද ධර්මයෙකුදු ඇත්.
(4) දුක් නොවූ ආර්‍ය සත්‍ය නොවූ ධර්මයෙකුදු ඇත්.
සමුදය සත්‍යාදියෙහිද මේනය මැසි.

විභාග:- පෙරකී චතුෂ්කයෙහි (1) මාගීඕඝ හා මාගීඕඝ සම්ප්‍රයුක්ත චිත්ත-චෛතසික ධර්ම ද ඵල සිත් සතර ද **"යද-නිච්චංතං දුක්ඛං"**[1] **සි** 'යමක් ඇතිවැ නැතිවේ නම් ඒ දුකයැයි' වදාළ වචනය පරිදි සංස්කාර දුඃඛ වන හෙයින් **දුක් වේ. ආර්‍ය සත්‍ය නොවේ.** (පරිඤ්ඤෙය්‍ය - පහාතබ්බ - අසච්ඡික - නීරුද්ධ භාවයක් නැති හෙයිනි.)

(2) නිරෝධය ආර්‍ය සත්‍යය වේ. දුක් නම් නොවේ. අන්‍ය සමුදය - මාගී සත්‍යද්වයය අනිත්‍ය හෙයින් ම, (සංස්කාර දුඃඛ හෙයින් **දුක් වේ.** (තථභාවයෙන්) පරිඤ්ඤෙය්‍ය අර්ථයෙන් **දුඃඛාර්‍ය සත්‍ය නොවේ**

ඒ මෙසේයි:- යම් ආර්‍ය සත්‍යයක් පිරිසිඳ දැනීම සඳහා බුදු සසුන්හි බඹසරවස් වෙසේ නම් ඒ සත්‍යයා ගේ පරිඤ්ඤෙය්‍ය කෘත්‍යභාවයෙන් ආර්‍ය සත්‍යය නොවේ. (ඒ සංස්කාර දුඃඛය පරිඤ්ඤෙය්‍ය සඞ්ඛ්‍යාත තථඅර්ථයෙන් **දුඃඛාර්‍ය සත්‍ය** නොවන හෙයිනි.)

(මේ වචනයෙන් **සමුදය- මාගී-** යන ආර්‍ය සත්‍යයෝ දෙදෙන **දුඃඛය හ. දුඃඛාර්‍ය සත්‍යයෝ නොවෙති. 'ආර්‍ය සත්‍යය හ. නදුඃඛයහයි'** කීවෙන් ආර්‍යසත්‍ය ශබ්දයාමැ පරකොට ඇති දුඃඛාදි ශබ්දයෝ පරිඤ්ඤෙය්‍යාදි භාවය කියති. එහෙයින් මැ ආර්‍ය සත්‍ය ශබ්දාපෙක්ෂක වූ දුඃඛ ශබ්දය සඳහා මාගී සම්ප්‍රයුක්තයන් හා ශ්‍රාමණ්‍ය ඵලධර්මයන් ගේ ආදි පදයෙහි සංග්‍රහ කරනලද. ආර්‍ය-සත්‍ය ශබ්දාපෙක්ෂක වූ දුඃඛ ශබ්දය සඳහා සතරවන පෙදෙහි සංග්‍රහ කරන ලදැයි දතයුතු. යනු- සත්‍යයි.)

3) තෘෂ්ණාව හැර උපාදානස්කන්ධ පඤ්චකය පරිසමාප්තාර්‍ථ-යෙන් **දුඃඛ හා ආර්‍ය සත්‍ය වේ.**

විශේෂ:- (තෘෂ්ණාව ද උපාදානස්කන්ධයෙහි ඇතුළත් වන හෙයින් එය වැළැක්ම පිණිසයැ තෘෂ්ණාව හැරයයි කීයේ)

[1] සං: නි: බන්ධසංයුක්ත 430

(4) චතුර්විධ මාගී සම්ප්‍රයුක්ත වූ චිත්ත චෛතසික ධර්ම හා මාගී-ඵල චිත්තයෝ ද, යම් ආර්යසත්‍යයක් පිරිසිඳ දැනීම සඳහා බුදුසසුන් වැද බඹසරවස් වෙසේ නම් ඒ සත්‍යයා ගේ පරිඥෙයයි අර්ථයෙන් **දුඃඛ ද නොවෙයි. ආර්යසත්‍ය ද නො වේ.**

මේ දුඃඛ සත්‍යයෙහි චතුෂ්කනයයි.

සමුදයාදියෙහි ද මෙසේ චතුෂ්ක වශයෙන් යෙදියයුතු. (මෙය **සත්‍යවිභඞ්ග අභිධර්ම භාජනියෙහි** විස්තර වේ.)

ඒ සැකෙවින් මෙසේයි:- සමුදය චතුෂ්කයෙහි

තෘෂ්ණාව හැර සෙසු ක්ලේශයෝ ද, තෘෂ්ණාව හා සම්බන්ධ වූ අවශේෂ විපාකස්කන්ධාදියෝ ද **"සමුදයො න අරිය සච්චං"** යන පූර්වපදයෙහි සංග්‍රහ වේ.

සමුදය නොවූ දුඃඛ සත්‍යය **අරියසච්චං න සමුදයො"** යන දෙවන පදයෙහි ඇතුළත්.

තෘෂ්ණාව **"සමුදයො චෙව අරියසච්චංච"** යන තුන්වන පදයෙහි ඇතුළත්.

මාගී සම්ප්‍රයුක්ත ධර්ම හා සතර ඵල චිත්තයෝ **"නෙව සමුදයො න අරියසච්චං"** යන සිවුවන පදයෙහි සංග්‍රහ වෙත්.

නිරෝධ චතුෂ්කයෙහි:- සංස්කාරයන් ගේ ක්ෂණ භඞ්ගය හා නිරෝධ සමාපත්තිය **"නිරොධො න අරියසච්චං"** යන පළමු පදයෙහි ද,

නිරෝධ සත්‍යයෙන් අන්‍ය වූ සත්‍යත්‍රය සාක්ෂාත් කර්තව්‍ය කෘත්‍ය නැති හෙයින් **"න නිරොධො අරියසච්චං"** යන දෙවෙනි පදයෙහි ද,

නිර්ණය **"නිරොධො චෙව අරියසච්චඤ්ච"** යන තුන්වන පදයෙහි ද,

මාගී සම්ප්‍රයුක්ත ධර්ම හා සතර ඵල ධර්මයෝ **"නෙව නිරොධො න අරියසච්චං"** යන සිවුවන පදයෙහි ද සංග්‍රහ වෙත්.

මාගී චතුෂ්කයෙහි:-

ආර්ය මාගීයෙන් අන්‍ය වූ මිථ්‍යා මාගීයෝ **"මග්ගො න අරිය සච්චං"** යන්නෙහි ද,

මාගී සත්‍යයෙන් අන්‍ය වූ සත්‍යත්‍රය **"න මග්ගො අරියසච්චං"** යන්නෙහි ද;

ආර්ය මාගාඞ්ග අට **"මග්ගො චෙව අරියසච්චඤ්ච"** යන්නෙහි ද,

ඵලචිත්තෛතසාදයෝ **"නෙව මග්ගො න අරියසච්චං"** යන්නෙහි ද, සංග්‍රහ වෙත්.

මෙසේ චතුෂ්ක වශයෙන් චතුස්සත්‍යයෙහි විනිශ්චය දතයුතුයි.

---

(13) ශූන්‍යතා වශයෙන්:

පරමාර්ථ වශයෙන් සියලු සත්‍යයෝ විඳින්නෙක, **කරන්නෙක, නිවන්නෙක, යවන්නෙකැ** යි මෙසේ සත්ත්වයකු නැති හෙයින් සත්‍ය ශූන්‍යතායෙන් ශූන්‍ය හෙයින් විඳීම ය, ක්‍රියාව ය, නිවීම ය, ගමනය යන ක්‍රියා මාත්‍රය හෙයින් බාහිර පරිකල්පිත **වෙදකාදීන්-ගෙන් ශූන්‍යයහ.**

ඉදෙක් තම තමා අයත් ප්‍රත්‍යයයෙන් පවත්නා කල්හි ව්‍යවහාර මාත්‍රයෙන් දුක් විඳියයි කිය යි.
එහෙයින් කියන ලදී.

"දුක්ඛ මෙවහි න හොවි දුක්ඛිතෝ
කාරකෝ න කිරියාව විජ්ජති
අත්ථි නිබ්බුති න තිබ්බුතෝ පුමා
මග්ගමත්ථි ගමකෝ න විජ්ජති[1]

'දුක් වේදනාව මැ ඇති, දුක් විඳින්නෙක් නැති, ක්‍රියාවක් ඇති, ක්‍රියාව කරන්නෙක් නැති, නිවීමෙක් ඇති, නිවීමට (නිවනට) පැමිණියෙක් නැති, මගෙක් ඇති, මග යන්නෙක් නැති,

තවද,

"ධුව-සුභ-සුඛත්තසුඤ්ඤං - පුරිමමයමත්තසුඤ්ඤමමතපදං
ධුව-සුඛ-අත්ත විරහිතෝ - මඝෝ ඉති සුඤ්ඤතා තෙසු"[1]

දුක්ඛ- සමුදය යන සත්‍ය වය **නිත්‍ය- ශුභ- සුඛ- ආත්ම** යන මොවුන්ගෙන් ශූන්‍යය. **නිර්‍ධාණය ආත්මයෙන් ශූන්‍යය. මාර්ගය නිත්‍ය- සුඛ- ආත්මයෙන්-** ශූන්‍යය. මේසේ දුක්ඛාදීන් ගේ ශූන්‍යත්වය දතයුතු.

විශෙෂ:- ක්ලෙශ අශුචි වගුරුවන හෙයින් පූති සත්‍ය වයය **අශුභය. නිරොධ- මාර්ග** සත්‍ය වයය අනාශ්‍රව හෙයින් **ශුභය.** දුක්ඛාදී තුන නිරොධයෙන් **ශූන්‍ය ය. නිරොධය** ද සෙසු **දුඃඛය, සමුදය, මාර්ගය** යන තුනින් **ශූන්‍යයි.**

දුක්ඛ සත්‍යයට පර්‍යාය වශයෙන් **සමුදය- මාර්ග** සත්‍ය භාවය ද, **සමුදය** සත්‍යයට **දුඃඛ- මාර්ග** සත්‍ය භාවය ද, මාර්ග සත්‍යයට **දුඃඛ-සමුදය** සත්‍ය භාවය ද සිද්ධ ය.

එහෙත් දුඃඛාදියට **නිරොධ භාවය** අසිද්ධ යි.

---

[1]සං: ච්: විභඞ්ගඨකථා 62

තවද මෙහි පුනර්භවය ගෙන දෙන තෘෂ්ණාවට පුනර්භවය වූ දුඃඛය යන ව්‍යවහාරය නැති හෙයින් හේතුව වූ **සමුදය සත්‍යයෙහි** ඵලය වූ **දුඃඛ සත්‍යය ද,** හේතුව වූ **මාර්ග සත්‍යයෙහි** ඵලය වූ **නිරෝධ සත්‍යය ද** නැති හෙයින් හේතුව ඵලයෙන් ශූන්‍ය යැ.

ප්‍රකෘතිවාදී **කපිලඍෂි** මතයෙහි ප්‍රකෘති භාවයෙන් සිටි මහත්වාදි විකෘතීන් ප්‍රලය අවස්ථාවෙහි ප්‍රකෘතියෙහි විලීනවැ එක්වැ බැඳී පවත්නා සේ නොව, දුඃඛ-නිරෝධයන්, සමුදය මාර්ගයන් ගෙන් ශූන්‍ය හෙයිනි.

දුඃඛ-සමුදය දෙදෙනාගේ ද, **නිරෝධ-මාර්ග** දෙදෙනා ගේ ද, එක්වැ පැවැත්මක් නැති හෙයින් ඵලය හේතුවෙන් ශූන්‍ය වේ.

'සූත්‍ර සංඛ්‍යාත හෙතූන් ගේ සමවායය මැ වස්තු සංඛ්‍යාත ඵලය (සමවෙතය) වන්නේ ය' ආදය **එක්වීම ම** දවි අණුකය වන්නේ ය.' යන **සමවායවාදී** මතය සේ නො වේ.

(විස්තර ටීකායෙන් දන්නේයි.)

එයින් කියන ලදී.

"තයම්ඛ නිරෝධ සුඤ්ඤං - තයෙන තෙනාපි නිබ්බුති සුඤ්ඤං, සුඤ්ඤං, ඵලෙන හෙතු - ඵලම්පි තං හෙතුනා සුඤ්ඤං"

මේ **චතුස්සත්‍යයන්** අතුරින් **දුඃඛ - සමුදය - මාර්ග සත්‍යත්‍රය** නිරෝධයෙන් ශූන්‍ය යැ. **නිරෝධය දුඃඛාදි** ත්‍රයයෙන් ශූන්‍ය යැ. **සමුදය** සත්‍යයෙහි **දුඃඛ** සත්‍යය ද, **මාර්ග** සත්‍යයෙහි **නිරෝධ** සත්‍යය ද, නැති හෙයින් හේතුව ඵලයෙන් ශූන්‍ය යැ. **එසේම දුඃඛයෙහි සමුදය ද, නිරෝධයෙහි මාර්ගය ද** නැති හෙයින් ඵලය හේතුවෙන් ශූන්‍යය යි,

මෙසේ ශූන්‍යතා වශයෙන් විග්‍රහවය දතයුතු.

---

(14) එකවිධාදි වශයෙන්:-

මේ චතුරාර්ය සත්‍යයන් අතුරින් සියලුම දුක සංසාර ප්‍රවෘත්ති භාවයෙන් **එකවිධ ය.**

---

[1]සං: වි: විභඞ්ගඨකථා 63

නාම- රූප වශයෙන් **ද්විවිධ** යැ.

කාම- රූප-අරූප භවයන් හි උත්පත්ති භව හෙද වශයෙන් **ත්‍රිවිධ** යැ.

ආහාර හෙදයෙන් **චතුර්විධ** යැ,
උපාදානස්කන්ධ හෙදයෙන් **පඤ්චවිධ** සි.

සමුදය, දුක්ඛය ප්‍රවර්තක භාවයෙන් **එකවිධ** යැ.
දිට්ඨි **සම්ප්‍රයුක්ත-විප්‍රයුක්ත** වශයෙන් **ද්විවිධ** යැ.

කාම තණ්හා- **භව තණ්හා**- **විභවතණ්හා** වශයෙන් **ත්‍රිවිධ** යැ.

සතර මාර්ගයෙන් ප්‍රහාණය කළයුතු හෙයින් මාර්ග හෙදයෙන් **චතුර්විධ** යැ.

රූපාදි පඤ්චස්කන්ධයෙහි අභිනන්දන වශයෙන්, (**රූපාදි ආරම්මණ** හෙදයෙන්) **පඤ්චවිධ** යැ.
රූප තෘෂ්ණාදි හෙදයෙන් **ෂඩ් විධයි.**

නිරෝධය, අසංඛ්‍යත ධාතු වශයෙන් **එක විධ** යැ.
ව්‍යවහාරයෙන් **සඋපාදිශේෂාදි** වශයෙන් **ද්විවිධ** යැ.

(**විශේෂ**:- කාමූපාදානාදි උපාදානයන් විසින් අරමුණු කිරීම් වශයෙන් ගන්නා ලැබේනුයි සකල පඤ්චකය **උපාදි** නම් වේ. ඒ ස්කන්ධ පඤ්චකයෙන් **නිස්සරණය** (නිර්‍වාණය) උපාදාන-ස්කන්ධ පඤ්චකයේ වරිම චිත්තය තෙක් ශෙෂවැ පවත්නේ **සෝපාදිශේෂ** නම්. ඉන් මත්තෙහි අනවශෙෂ වන හෙයින් **අනුපාදිශේෂ** නම්.)

කාම- රූප- අරූප භවත්‍රය සංසිඳුවන හෙයින් **ත්‍රිවිධ** වේ.
සතර මාර්ගයෙන් පැමිණිය යුතු හෙයින් **චතුර්විධ** වේ.

රූපාභිනන්දනාදි පඤ්චාභිනන්දන සංසිඳුවන හෙයින් **පඤ්චවිධ** වේ.
ෂට් තෘෂ්ණාකාය සංසිඳුවන හෙයින් **ෂට්විධ** වේ.

මාර්ග සත්‍යය, භාවෙතව්‍ය හෙයින් **එකවිධ** යැ.
ශමථ-විදර්ශනා හෙදයෙන් **ද්විවිධ** යැ.
විශේෂ:- **සම්මාදිට්ඨි - සම්මාසඞ්කප්පයෝ විදර්ශනායෙහ.**

සෙස්සෝ **සමථයහ.** සීලය ද සමථයට උපකාර හෙයින් සමථ-යෙහිමැ ගැනේ.

දර්ශන-භාවනා හෙදයෙන් හේ **ත්‍රිවිධ යැ.**

සීල-සමාධි-ප්‍රඥා ස්කන්ධත්‍රය හෙදයෙන් **ත්‍රිවිධ යැ.**

විශෙෂඃ- මේ ආර්‍ය්‍ය **අෂ්ටාඞ්ගික මාර්ග** ශීලස්කන්ධාදීන් ගේ එක දෙශයක් හෙයින් (ස ප්‍රදෙශ හෙයින්) නගරයක් බඳු ය. ඒ නගරයත් නිඃප්‍රදේශ වූ රාජ්‍යයෙන් සංග්‍රහ කරන්නා සේ මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග ය, නිඃප්‍රදෙශ (සියල්ල සංග්‍රහ) වශයෙන් **ශීලාදි ස්කන්ධ ත්‍රයයෙන් සංග්‍රහ** කරන ලදී.

එසින් වදාළහ.

"න බො ආවුසො විසාඛ! අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන තයො ඛන්ධා සඞ්ගහිතා. තිණ්ණං බො ආවුසො විසාඛ! බන්ධානං අරියො අට්ඨඞ්ගිකො මග්ගො සංගහිතො. යා වාචාවුසො විසාඛ! සම්මාවාචා යොච සම්මා කම්මන්තො යොච සම්මා ආජීවො ඉමෙ ධම්මා සීලක්ඛන්ධෙ සංගහිතා. යොච සම්මා වායාමො යා ච සම්මාසති යොච සම්මා සමාධි ඉමෙ ධම්මා සමාධික්ඛන්ධෙ සංගහිතා. යා ච සම්මාදිට්ඨි යොච සම්මා සඞ්කප්පො ඉමෙ ධම්මා පඤ්ඤක්ඛන්ධෙ සංගහිතා."[1]

'ආයුෂ්මත් විසාඛයෙනි! අටගින් යුත් ආර්‍ය්‍ය මාර්ගයෙන් මේ ස්කන්ධත්‍රයයෙක් සංග්‍රහ නොකරන ලදී. ඒ ස්කන්ධත්‍රයයෙන් මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය සංග්‍රහ කරන ලදී. **සම්මා වාචා - සම්මා කම්මන්ත - සම්මා ආජීව** යන මේ ධර්‍මයෝ **ශීලස්කන්ධයෙහි** සංග්‍රහ කරන ලදහ.

සම්මා වායාම - සම්මා සති - සම්මා සමාධි යන ධර්‍මයෝ **සමාධි ස්කන්ධයෙහි** සංග්‍රහ කරන ලදහ.

සම්මා දිට්ඨි - සම්මා සඞ්කප්ප ධර්‍මයෝ **ප්‍රඥා ස්කන්ධයෙහි** සංග්‍රහ කරන ලදහ.

මෙහි **සම්මාවාචාදි** තුන සමාන ජාති හෙයින් **ශීලස්කන්ධයෙහි** සංග්‍රහ කරන ලදි.

විශෙෂඃ- හුදෙක් මේහි පෙළෙහි **"සීලක්ඛන්ධෙ"** කියා සප්තමී විභක්තියෙන් දැක්වී. අර්‍ථය තෘතීයා (**කරණ**යෙන්) දතයුතු.

1ම: නි: මජ්ඣිමපණ්ණාසක 303

සම්මාවායාමාදි තුන අතුරින් **සමාධිය** තමා ගේ සවභාවයෙන් අරමුණෙහි එකඟ බැව්හි පිහිටන්ට අපොහොසත් වේ. එතෙකුදු වුවත් වීර්‍යයෙන් ප්‍රග්‍රහ කෘත්‍යය සිද්ධකරන කල්හි සමෘතියෙන් ද නුමුළා කෘත්‍යය සිද්ධකරන කල්හි ලබන ලද ප්‍රත්‍යය ඇතිවැ එකඟ බැව්හි පිහිටීමට සමර්ථ වේ

එයට මේ උපමාවෙකි.

'නැකැත් කෙළි කෙළීමට උඟනට පිවිසි යහලුවන් තිදෙනෙකුන් අතුරින් එකකු සුපිපි සපු රුකක් දැක අත ඔසවා මල් කඩා ගැනීමට නොහැකි වන්නේ නම් එකල දෙවැන්නා නැමී ඔහුට පිට දෙන්නේ ය. පළමුවැන්නා ඔහු පිට නැගී ද කම්පාවනුයේ නොහැකිවේනම් තෙවැන්නා උරහිස එළවන්නේ ය. මේසේ තෙතෙමේ එකකු පිට නැගී එකකු උරහිස එළී සිට රිසි සේ මල් තෙලා පැලඳගෙන නැකැත්කෙළි කෙළී,

මෙහි **උපමාන – උපමෙය** සංසන්දනය මෙසේ සි.

එක්වැ උඟන් ගිය යහලුවන් තිදෙනා මෙන් එක්වැ උපන් **සම්මාවායාම – සම්මාසති – සම්මා සමාධි** යන තුන් දහම් දතයුතු.

සුපිපි සපු රුක මෙන් විදර්‍ශනා අරමුණ දතයුතු. අත ඔසවා මල් නෙලීමට නොහැකි වූ පුරුෂයා මෙන් තමා **සවභාව**-යෙන් අරමුණෙහි එකඟ බැවින් පිහිටිය නුහුණු **සම්‍යක් සමාධිය ද,** පිටදී නැමුණු යහලුවා මෙන් සම්‍යක් **ව්‍යායාමය ද,** උරහිස එළවූ යහළුවා මෙන් **සම්‍යක් සමෘතිය ද,** දතයුතු. ඒ තිදෙනා අතුරින් එකකු පිට නැගී එකකු උරහිස **එල්බ** අනිකාට මල් තෙලා ගැනීමට හැකි වූවාක් මෙන් වීර්‍යයෙන් උත්සාහවත් කිරීම ද, සමෘතියෙන් නුමුළාවීම ද, සිද්ධ කල්හි ලැබූ උපකාර ඇති **සමාධිය** අරමුණෙහි එකඟවැ පිහිටීමට සමර්ථ වන හෙයින් සමාධිය තමා ගේ සවභාවයෙන් සමාධිස්කන්ධයෙන් සංග්‍රහ කරන ලදි. **ව්‍යායාම- සමෘති** දෙදෙන සමාධියට උපකාර වූ සුදුසු ක්‍රියා වශයෙන් සංග්‍රහ කරන ලදහ.

සම්මාදිට්ඨි – සම්මාසඞ්කප්ප දෙක අතුරිනුදු **සම්මාදිට්ඨිය** තමා සවභාවයෙන් මැ **අනිත්‍ය – දුඃඛ – අනාත්ම** යැයි ආලම්බනය නිශ්චය කිරීමට සමර්ථ නො වේ. එහෙත් **සම්මාසංඞප්පය** (විතර්කය) පැහැර පැහැර දෙන කල්හි අරමුණ නිශ්චය කිරීමට සමර්ථ වේ.

ඒ මෙසේයි:- රත් කරුවා කහවණුව අත්ලෙහි තබා සවීකාරයෙන් බලනු කැමැති වුව ද, ඇසින් මෑ පෙරළිය නොහැකි වේ. එහෙත් ඇඟිලි පුරුකින් පෙරළ පෙරළා ඔබිනොබ බැලිය හැකි වන්නා සේ **සම්මාදිට්ඨිය** (ප්‍රඥාව) සවිශකතියෙන් අනිත්‍යාදී වශයෙන් අරමුණ නිශ්චය කිරීමට අසමර්ථ වේ. අරමුණට හිත නැංවීම් ලක්ෂණ ඇති අරමුණ පහරන, නැවත නැවත පහරන කෘත්‍ය ඇති **විතක්කියෙන් අනිච්චං අනිච්චං** යි පහරන්නාක් මෙන් ද, **"අනිච්චං- බයතෙඪන, දුක්ඛං භයතෙඪන"** යනාදීන් පරිවර්තනය **කරන්නාක්** මෙන් ද, ගෙන දුන් අරමුණ මෑ නිශ්චය කිරීමට සමර්ථ වේ. එහෙයින් මේහිදු **සම්‍යක් දෘෂ්ටියමෑ 'දුක්ඛ - ඤාණං'** යනාදියෙහි සමාන වූ ප්‍රඥා ජාති හෙයින් **ප්‍රඥාස්කන්ධියෙන්** සංග්‍රහ කරන ලදී.

සම්‍යක් සංකල්පය වූකලී ප්‍රඥා සදෘශ ක්‍රියා වශයෙන් සංග්‍රහ කරන ලදී.

මෙසේ මේ ස්කන්ධත්‍රයයෙන් **ආර්‍ය - මාර්ගය** සංග්‍රහයට යේ. එහෙයින් ස්කන්ධත්‍රය **භෙදයෙන් ත්‍රිවිධ** යයි පෙරමෑ කී.

සොතාපන්නි මග්ග ආදි වශයෙන් **චතුර්විධ** වේ.

තවද සියලු සත්‍යයෝ **අවිතථ** - (අවිපරීත) අර්ථයෙන් ද (අභිඤ්ඤෙය්‍ය) විශිෂ්ට ඥානයෙන් දතයුතු. අර්ථයෙන් ද **එකවිධය හ.** (අභිඥුඛ කොට ප්‍රත්‍යක්ෂයෙන් දතයුතු බැවින් හෝ විශිෂ්ට ඥානයෙන් දතයුතු බැවිනි.)

එයමෑ ලෞකික- ලොකොත්තර භෙදයෙන් **ද්විවිධ යෑ.**

විශෙෂ:- **දුඃඛ - සමුදය** දෙක **ලෞකික යෑ. නිරොධ-මාර්ග** දෙක **ලොකොත්තරයි.**

අසංඛත - සංඛත භෙදයන් හෝ **ද්විවිධ යෑ.**

නිරොධය **අසංඛත යෑ.** සෙසු තුන **සංඛතයි.**

දර්ශනයෙන් ප්‍රහාතව්‍ය, භාවනාවෙන් ප්‍රහාතව්‍ය, අප්‍රහාතව්‍ය වශයෙන් **ත්‍රිවිධ යෑ.**

පරිඤ්ඤෙය්‍ය-පහාතබ්බ-භාවෙතබ්බ-සච්ඡිකාතබ්බ වශයෙන් **චතුර්විධ යෑ.**

චතුරාර්‍යසත්‍යයෙහි එකවිධාදි වශයෙන් විනිශ්චය මෙසේ දතයුතුයි.

---

(15) සභාග විසභාග වශයෙන්

සියලු සත්‍යයෝ **අවිතථ** භාවයෙන් ද, **ආනම්** ශූන්‍ය හෙයින් ද, ප්‍රතිවෙධයෙහි දුෂ්කර හෙයින් ද, ඔවුනොවුන් හා **සදෘශයෝ යැ.**

එයින් වදළහ.

"තං කිං මඤ්ඤසි ආනන්ද! සතතමං නුඛො දුක්කර-තරං වා දුරභිසම්භවතරං වා යො වා දූරතොව සුබුමෙන තාලවණ්ටගඟලෙන අසනං අතිපාතෙය්‍ය පොඛානුපොඛං අවිරාධිතං. යොවා සතධා භින්නස්ස වාලස්ස කොට්‍යා කොටිං පටිවිජ්ඣෙය්‍යාති.

එතදෙව භඤෙන දුක්කරතරඤෙවව දුරභිසම්භවතරඤව යො සතධා භින්නස්ස වාලස්ස කොට්‍යා කොටිං පටිවිජ්ඣෙය්‍යාති. අථඛො තෙ ආනන්ද දුප්පටිවිජ්ඣතරං පටිවිජ්ඣනති. යෙ ඉදං දුක්ඛංති යථාභූතං පටිවිජ්ඣනති. -පෙ- අයං දුක්ඛ නිරොධ ගාමිනී පටිපදාති යථාභූතං පටිවිජ්ඣනති ති"[1]

'ආනන්දය! එය කුම්කැයි හඟනෙහි ද යම් පුරුෂයෙක් දුරින්මැ කෙසිසිදුරකින් පළමු පළමු විදි හී පගිලියෙන් පසුව පසුව විදි හී තුඩ නො වරදවා ඊතලය විදින්නේ ය. යමෙක් හෝ සියක් භාගකොට ඉරනලද අස්ලොමක්හු ගේ එක් භාගයක් ගෙන හිතුඩ බැඳ එක් භාගයක් බටු පතෙක බැඳ උඩක සිට හී තුඩ බැදි (වාළ) අස්ලොම් කෙළවර විදින්නේ ය. මේ දෙකින් කවරක් දුෂ්කර ද සාධාලිය නොහේ ද

වහන්ස! සියක් වර පළනලද අස්ලොම් කෙළවරකින් අනික් අස්ලොම් කෙළවරක් විදීම අතිශයින් දුෂ්කර යැ. සාධාලිය නො හැකි ද වේ. ආනන්දය! මේ **දුකැයි ද, මේ දුක් ඉපදීමේ හෙතුවයැයි ද, මේ දුක් නැති කිරීමැයි ද, මේ දුක් නැතිකිරීමේ මගැයැ යි ද** යමෙක් තතු සේ ප්‍රතිවෙධ කෙරේ ද? හෙතෙමේ යටකී-සේ අස්ලොම් විදීමට ද වඩා අතිශයින් දුෂ්කර වූවක් කරන්නේ ය.

ඒ **චතුරාර්‍යසත්‍යයෝ** සවලක්ෂණ ව්‍යවස්ථා කිරීම් වශයෙන් **විසභාගයෝ ය. දුඃඛය, සමුදය** යන ප්‍රථම සත්‍ය ද්වයය ඖදාරික යැ. තිරිසනුන්ට ද දුක ද ආහාර තෘෂ්ණාව ද ප්‍රකට යැ. පීඩන ආයුහනාදි වශයෙන් මේ දුක යැ. මේ දුකට හේතුව

[1] සං: නි: සච්චසංයුත්තක 1095

යයි, යථාසද්භාවයෙන් අවගාහනය (තීරණය) කළ නො හැකි හෙයින් **ගැඹුරු බැවිනුදු, ලෞකික බැවිනුදු, සාශ්‍රව බැවිනුදු සභාග යැ.**

ඵල-හේතු භෙදයෙන්ද, පරිඤ්ඤය - පහාතමඛ බැවින් ද, **විසභාග සි.**

නිරොධ- මාර්ග යන පශ්චිම **සත්‍යමයය** ගැඹුරු බැවිනුදු, දුකසේ අවබොධ කළයුතු බැවිනුදු, ලොකොත්තර බැවිනුදු, ආශ්‍රවයනට අරමුණු නො වන බැවිනුදු **සභාග යැ.** ආලම්බන-ආලම්බනික භෙදයෙනුදු, සාක්ෂාත් කළයුතු, වැනිය යුතු බැවිනුදු යන භෙදයෙන් **විසභාග සි.**

දුඃඛ - නිරොධ ද්වයය ඵලභෙයින් සභාග යැ. **සඞ්ඛත-අසංඛත** භෙයින් **විසභාග සි.**

සමුදය - මාර්ග දෙක හෙතුබැවින් **සභාග යැ. එකුන්තිස අකුසල්** - **කුසල්** වන භෙයින් **විසභාග සි.**

දුඃඛ - මාර්ග දෙක සඞ්ඛත භෙයින් **සභාග යැ. ලෞකික-ලොකොත්තර** භෙයින් **විසභාග සි.**

සමුදය - **නිරොධ** දෙක නෙවසෙඛ නාසෙඛ භෙයින් **සභාග යැ.** අරමුණු ගැනීම් නො ගැනීම් බැවින් **විසභාග සි.**

මෙසේ මේ අයුරින් ද, නානා නයින් ද, නුවණැත්තේ **සිව්සස් ධමුන් ගේ සභාග විසභාග භාවය** දන්නේ ය.

මෙතෙකින් සුධී ජනයන් ගේ ප්‍රසාද පිණිස සළ සිංහල විශුද්ධි මාර්ගයෙහි ඉන්ද්‍රිය - සත්‍ය නිද්දේශ නම් වූ සොළොස් වන නිදේශය නිමියේ සි.

---

17 පඤ්ඤාභූමි නිද්දේශය

(පටිච්ච සමුප්පාදය)

සත්‍යනිද්දේශයට අනතුරුවැ **"ඤකඛ- ආයතන- ධාතු- ඉන්ද්‍රිය-සත්‍ය-ප්‍රතීත්‍යසමුත්පාදාදි හෙදගත ධම්මෝ භූමියහ*සි"** මෙසේ කියනලද මේ විදර්ශනා ප්‍රඥාවට භූමි වූ ධර්ම අතුරින් **පටිච්චසමුප්පාදය** හා ආදි ශබ්දයෙන් කී **පටිච්චසමුප්පන්න ධර්ම** ද (වර්ණනා කිරීමට) අවශ්‍යව්‍ය. එහෙයින් දැන් ඔවුන් ගේ වර්ණනා ක්‍රමය පැමිණියේ ය.

විශේෂ:- (පිය-පුත්‍ර සම්බන්ධය සේ **පටිච්චසමුප්පාද - පටිච්ච-සමුප්පන්න** සංඥාවෝ අන්‍යෝන්‍ය අපෙක්ෂකයෝ ය.)

මෙහි අවිද්‍යාදි ධර්මයෝ **පටිච්චසමුප්පාදයහ** යි දතයුත්තාහ.

එසින් වදාළහ.:- **"කතමොච භික්ඛවෙ පටිච්චසමුප්පාදෙ, අවිජ්ජා පච්චයා භික්ඛවෙ සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාම-රූපං, නාම-රූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං. සොකපරිදෙව දුක්ඛදෙමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයා හොති. අයං වුච්චති භික්ඛවෙ පටිච්චසමුප්පාදෙති."**☼

මහණෙනි! පටිච්චසමුප්පාදය කවරේ ද; මහණෙනි! අවිද්‍යා-වෙන් සඞ්ඛාර (සමුදය) වේ සඞ්ඛාරයෙන් විඤ්ඤාණ ද, විඤ්ඤාණ-යෙන් නාම රූප ද, නාම් රූපයෙන් සළායතන ද, සළායතනයෙන් ඵස්ස ද, ඵස්සයෙන් වෙදනාව ද, වෙදනාවෙන් තණ්හාව ද, තණ්හාවෙන් උපාදානය ද, උපාදානයෙන් භවය ද, භවයෙන් ජාතිය ද, ජාතියෙන් ජරා මරණ- සොක- පරිදෙව- දුක්ඛ-දෙමනස්ස උපායාස ද, සම්භව වේ. මෙසේ මේ හුදු දුඃඛස්කන්ධයා ගේ උත්පත්තිය වේ. මහණෙනි! 'මේ පටිච්ච-සමුප්පාදය' යි කියනු ලැබේ.

ජරා- මරණාදි ඵල ධර්මයෝ වනාහි **පටිච්චසමුප්පන්නයහ** යි දතයුත්තාහ.

---

* වි: ම: ඛන්ධනිද්දෙස ☼සං: නි: නිදානසංයුක්ත

එසින් වදාළහ: **"කතමෙ ච භික්ඛවෙ පටිච්චසමුප්පන්නා ධම්මා, ජරාමරණං භික්ඛවෙ අනිච්චං සංඛතං පටිච්ච-සමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධ ධම්මං, ජාති භික්ඛවෙ - පෙ - භවො උපාදානං- තණ්හා වෙදනා- එස්සා- සළායතනං- නාමරූපං- විඤ්ඤාණං- සඞ්ඛාරා- අවිජ්ජා භික්ඛවෙ අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධ ධම්මා, ඉමෙ වුච්චන්ති භික්ඛවෙ පටිච්චසමුප්පන්නා ධම්මාති."***

"මහණෙනි! පටිච්චසමුප්පන්න ධර්ම කවරේ ද? මහණෙනි! ජරා- මරණ (ශාස්වත නොවන හෙයින්) අනිත්‍යයෑ. (ප්‍රත්‍යයෙන් එක්ව හටගත් හෙයින්) සඞ්ඛතයෑ. (ප්‍රත්‍යයන්ට සුදුසු ප්‍රත්‍ය-යන් නිසාම එක්ව ම උපන් හෙයින්) පටිච්චසමුප්පන්න යෑ, ක්ෂය වන සුභාව ඇත්තේ යෑ, ව්‍යය වන සුභාව ඇත්තේ යෑ, විරාගවන සුභාව ඇත්තේ යෑ, නිරුඬවන සුභාව ඇත්තේ යි. (විස්තර මතු පළවේ.) මහණෙනි! ජාතිය, භවය, උපාදානය, තණ්හාය, වෙදනාය, ඵස්සය, සළායතනය, නාම-රූපය, විඤ්ඤා-ණය, සඞ්ඛාරය, අවිජ්ජාය යන මොවුහු අනිත්‍යයහ, සඞ්ඛතයහ, පටිච්චසමුප්පන්නයහ, ඛයධම්මයහ, වයධම්මයහ, විරාග ධම්මයහ, නිරොධ ධම්මයහ, මහණෙනි! මොහු **පටිච්චසමුප්පන්නධර්මයහ** යි කියනු ලැබෙත්.

විශේෂ:- **පටිච්චසමුප්පාද ධර්ම** අනුලෝම වශයෙන් ද, **පටිච්ච-සමුප්පන්න ධර්ම** ප්‍රතිලෝම වශයෙන් ද, දක්වන ලද්දේ ඒ **පටිච්ච-සමුප්පන්න ධර්ම නිපදනා පටිච්චසමුප්පද ධර්මයනට** අනතුරු කොට දැක්වීම සඳහා ය. මේ සූත්‍ර පදයන් ගේ සංක්ෂේප අර්ථය යි.

මෙසේ ප්‍රත්‍යය ධර්ම **පටිච්චසමුප්පාදයයි** ද, ඒ ඒ ප්‍රත්‍යයෙන් නිපන් (ප්‍රත්‍යයොත්පන්න) ධර්ම **පටිච්චසමුප්පන්නයයි** ද දතයුතු. මෙය කෙසේ දනහැකි ද? භාග්‍යවතුන් වහන්සේ ගේ වචනයෙනි.

ඒ මෙසේ යි:- බුදුහු පටිච්චසමුප්පාද- පටිච්චසමුප්පන්න දෙශනා සූත්‍රයෙහි මෙසේ වදාළහ. **"කතමොච භික්ඛවෙ පටිච්චසමුප්පාදෙ ජාති පච්චයා භික්ඛවෙ ජරා මරණං උප්පා-දවා තථාගතානං අනුප්පාදවා තථාගතානං ඨිතාව සාධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා ඉදප්පච්චයතා. තං තථාගතො අභිසම්බුජ්ඣති, අභිසමෙති, අභිසම්බුජ්ඣිත්වා අභිසමෙත්වා**

*සං: නි: නිදානසංයුක්ත

ආවික්ඛති, දෙසෙති, පඤ්ඤපෙති, පට්ඨපෙති, විවරති, විභජති, උත්තානි කරොති පඤ්ඤාති වාහ. ජාති පච්චයා භික්ඛවෙ ජරාමරණං, භව පච්චයා භික්ඛවෙ ජාති - පෙ - අවිජ්ජා පච්චයා භික්ඛවෙ සඞ්ඛාරා, ඉති ඛො භික්ඛවෙ යා තත්‍ර තථතා- අවිතථතා- අනඤ්ඤථතා- ඉදප්පච්චයතා. අයං වුච්චති භික්ඛවෙ පටිච්චසමුප්පාදොති''* මහණෙනි! පටිච්ච-සමුප්පාදය කවරේ ද? "ජාති නම් වූ ප්‍රත්‍යය හේතු කොට ගෙන ජරා මරණ වේ." යන යම් සවභාවයෙක් වේ නම්, ඒ **ධම්මට්ඨිතතා** සංඛ්‍යාත සවභාවයා ගේ හෝ හේතුහු ගේ එසේම වන බව ද, "ජාතිප්‍රත්‍යයෙන් ජරා මරණ නො වන්නේ නොවේ" යන **ධම්මනියාමතා** සංඛ්‍යාත මේ සවභාවයා ගේ **"නියත බව ද**, යන මේ **ඉදප්පච්චයතාව** (සවභාවය) තථාගතවරයන් ගේ උත්පාදයෙහි දු, අනුත්පාදයෙහි දු, සිටියේම ය (පවතීමැයි). බුදුන් උපන්ද, නො-උපන්ද හැමකල්හිම ජාතිය, ජරාමරණයට ප්‍රත්‍යය වේම ය. "ජාතිය ජරා මරණයට ප්‍රත්‍යය නො වෙයි" යනු නැත යන අර්ථ යි. (යනු සත්‍ය යි.)

'ජාතිප්‍රත්‍යයෙන් ජරා මරණ වේ' යන මේ **ඉදප්පච්චයතාව** (ප්‍රත්‍යය **සමුත්පන්න** ධර්මයන්ගේ ප්‍රත්‍යය සිටීම භාවය) **තථාගත-යෝ** යථා සවභාවයෙන් අවබෝධ කෙරෙති. නුවණින් සපරීක්ෂා කෙරෙති. **උද්දෙශයෙන්** සඳුට කොට වදාරති. එය අවසන් කොට **දෙශනා කෙරෙති නිද්දේශ** වශයෙන් ඒ අර්ථයම නොයෙක් ආකාරයෙන් හඟවති. එයම **ප්‍රතිනිද්දේශ** වශයෙන් විවරණය කෙරෙති. (බෙදා දක්වති) එයම හේතු උදාහරණ දැක්වීමෙන් **ප්‍රකට** කෙරෙති. "ප්‍රත්‍යක්ෂයකොට බලව් ය යි, **නිගමනය** කෙරෙත්. (සෙස්සද මෙසේ මැ යි.)

මෙසේ **'ජාති ප්‍රත්‍යයෙන්'** ජරා මරණ වෙයි, යන මේහි යම් සත්‍ය සවභාවයෙක්, යම් නොවරදින සවභාවයෙක් යම් අනන්‍ය සවභාවයෙක්, යම් ඉදප්පච්චයතාවයෙක් (ප්‍රත්‍යයසමුත්පන්න-භාවයෙක්) වේනම් මේයැ **පටිච්චසමුප්පාද** නම්.

විභාවනා :- ඨිතාවස්සාඛාතු = "ජාතිය ජරා - මරණයට ප්‍රත්‍යය වෙයි යන මේ සවභාවය වේ ම ය කිසිකලෙක ජාතිය ජරා-මරණයට ප්‍රත්‍යය නො වී නො සිටී, යනු අර්ථ යි. මේ සවභාවය තථාගතවරයන් ගේ ඉපදීමට පුළුවෙහි ද, මතුයෙහි ද, අප්‍රකටවැ පැවතී මධ්‍යයෙහි (උපන් කාලයෙහි) ප්‍රකට කෙරෙති. තථාගත-

*සං: නි: නිදානසංයුත්ත

යෝ නුපදවති. වැලි 'සවාභාවික වූම ජරා මරණය හැමකල්හිම ජාති ප්‍රත්‍යයෙන් වේය' යනු සවභාව සිද්ධ මැයි. හුදෙක් සවයම්භූඥතයෙන් අවබොධ කරන හෙයින් මේ ධර්ම **තථාගතයන්** අධිගතයයයි ප්‍රකාශ කරන හෙයින් **තථාගතයෝ** ධර්ම සවාමීහු යැයි යෙති. පෙර නො වූවක් උපදවන හෙයින් නො වේ.

ධම්මට්ඨිතතා = ප්‍රත්‍යය සමූහපන්න (ජරා-මරණ) යන් ගේ ප්‍රවෘත්තියට ප්‍රත්‍යය සමූහපාදය (ජාතිය) කාරණ වන හෙයින් කායෙෂ්ඨිපචාරයෙන් එයද ධම්මට්ඨිතතා නම් වී. (ප්‍රත්‍යය ධර්මය යි)

ධම්මනියාමතා = ප්‍රත්‍යය ධර්මය ප්‍රත්‍යය සමූහපනන ධර්මය නියම කිරීම ධම්මනියාමතා යි

මෙසේ "ජාතිප්‍රත්‍යයෙන් ජරා-මරණ වේ" යන මෙහි විපල්ලාස නැති හෙයින් එසේ අවබොධ කරනු ලබන සවභාවයාගේ හෝ හෙතුහු ගේ එසේම වීම **ධම්මට්ඨිතතා** යැ.

තවද ජාතිය ජරා මරණයන් ගේ උත්පාද- ස්ථිති- ප්‍රවෘත්ති- නිමිත්ත- ආයූහන- සංයොග- පළිබොධ- සමුදය- හෙතු- ප්‍රත්‍යය යි මෙසේ උත්පාදාදී භාවයෙන් ඒ ජාතිහු ගේ පැවැත්ම **ධම්මට්ඨිතතායි** (ඵලයෙහි හෙතුපවාරයෙනි.) ප්‍රත්‍යයන් විසින් ධරනු ලැබේනුයි ඵල **ධර්ම** නම්. එයට අයත් පැවැතුම් වශයෙන් එහි ඵලය පිහිටනුයි **ඨිති** නම්. ඒ ධර්ම සඞ්ඛ්‍යාත ඵලයාගේ පැවැත්ම හෝ **ධම්මට්ඨිති** නමු.

තවද **ධම්ම** නම් ප්‍රත්‍යය යැ. ඒ ප්‍රත්‍යයා ගේ ස්ථිතිය (සවභාවය) ඉන් අන්‍ය සවභාවයක ගේ නො වීම **ධම්මට්ඨිති** නමු. (ප්‍රත්‍යය යි.)

එයින් වදාළහ **"පච්චය පරිග්ගහෙ ඤාණං ධම්මට්ඨිති ඤාණං"** යි.* ප්‍රත්‍යය ධර්ම පරිග්‍රහ කිරීමේ ප්‍රඥව ධම්මට්ඨිති ඤාණ යයි. ඒ ධම්මඨිතියම (ප්‍රත්‍යයම) **ධම්මට්ඨිතතා** නමු.

'ජාතිප්‍රත්‍යයෙන් ජරා-මරණ වෙයි, යන මේ සවභාවයා ගේ හෝ හෙතුහුගේ' අන්‍යථාත්වයක් නැති හෙයින් ජාති ප්‍රත්‍යය නැතිව ජරා-මරණ නො වේ යයි මෙසේ දක්නා ලැබෙන ප්‍රත්‍ය- යාගේ අභාවයෙහි ඵලාභාවය වේ. යන නියාමතාව (ව්‍යවස්ථිත භාවය) **ධම්මනියාමතා** නමු."

ඵලය වූ ජරා-මරණයා ගේ ජාතිය ඇති කල්හි සම්භවය (හටගැනීම) හෙතුහු ගේ පැවැත්ම **ධම්මඨිතතා** යැ.

---

*ප: ම: ඤාණ කථා

හෙතුහු ගේ අභාවයෙහි නො පැවැත්ම වූ සවභාවය ගේ නියත බව **ධම්මනියාමතා** යැ. මෙසේ ඵලයෙන් හෙතුව ප්‍රකාශ කෙරේ.

(මේ සන්න- ටිකාවන්හි ආ විස්තාරයේ පිණ්ඩාර්ථයි.) මෙසේ "**ඨිතාවසාඛාතු**' යනාදීන් වදාරණ ලද **ඉදප්පච්චයතාව තථාගතානං** යථා සවභාවයෙන් **ප්‍රත්‍යක්ෂ** කිරීම් වශයෙන් අවබෝධ කෙරෙති.

මෙසේ පටිච්චසමුප්පාදය දෙශනා **කරන්නා** වූ **භාග්‍යවතුන් වහන්සේ තථතාදී** පදයිහය වචනයෙන් ප්‍රත්‍යය ධර්මය **පටිච්ච-සමුප්පාදය** යි වදාළ සේක.

එහෙයින් පටිච්චසමුප්පාද (ප්‍රත්‍යය) වූ ජාතිය පටිච්ච-සමුප්පන්න (ඵලය වූ ජරා-මරණයනට ප්‍රත්‍යයවීම **ලක්ෂණ** කොට ඇතතේ යැ.

ප්‍රවෘත්ති දුක්ඛයට අනුවැ පැවැත්ම **එහි කෘත්‍යය** යැ. නිර්‍යාණ-ගාමී මාර්ගයට විරුද්ධ වැ පැවැත්ම වැටහෙන **ආකාරය** යි.

මේ **පටිච්චසමුප්පාදයෙන්** - ඌනාධික නො වූ සුදුසු ප්‍රත්‍යය ධර්මයන් ඇතිකල්හි ම ඵලධර්මයන් ගේ හට ගැනීම වන හෙයින් **තථතා** නම.

(**නිදර්ශන** චක්ෂුඃප්‍රසාද - රූපාලම්බන - ආලෝක - **මනසිකාර** (පඤ්චවිචාරාවජ්ජන) යන් නිසා චක්ෂුර්විඤ්ඤාණය උපදනාක් මෙනි.)

සුදුසු ප්‍රත්‍යය ධර්මයන් ඒකීභාවයට පැමිණි **කල්හි** මොහොතකුදු ඒ ප්‍රත්‍යය සමවායයෙන් ඉපදීමට යොග්‍ය ප්‍රත්‍ය-යොත්පන්නධර්මයන් නො ඉපද නො සිටිනා බව **අවිතථතා** නම.

(චක්ෂු - රූප - ආලෝක - මනසිකාරයන් ගේ සමවායයෙහි සෞතවිඤ්ඤාණ නො උපදනා සේ) අන්‍යඵලධර්මයක් ඉපදීමට යොග්‍ය ප්‍රත්‍යයධර්මයන් ගේ සමවායයෙහි අන්‍යඵලධර්මයක ගේ නූප-දනා සවභාවය **අනඤ්ඤතථතා** නම්. යථොක්ත ජරාමරණාදි ධර්මයන්ට ප්‍රත්‍යය බව හෝ ප්‍රත්‍යය සමූහ බව හෝ **ඉදප්පච්චයතායැ** යි කියන ලදී. ඒ මේ **පටිච්චසමුප්පාදය** යැ.

ඉදප්පච්චයතා යන්නෙහි වචනාර්ථ මෙසේ යි. :— මේ ජරා-මරණාදීන් ගේ ප්‍රත්‍යයෝ **ඉදප්පච්චයෝහි**, ජාත්‍යාදියයි. **ඉදප්පච්චයම ඉදප්පච්චයතා** යැ. ඉදප්පච්චයන් ගේ සමූහය හෝ **ඉදප්පච්චයතා** යි.

මේ **ඉදප්පච්චය** ශබ්දය ජාත්‍යාදීන්හි නිරූඪ යැ. හෙතුවී හෙයිනි.

("i ඉමෙසං **පච්චයා** ඉදප්පච්චයා ඉදප්පච්චයං එව ඉදප්පච්චයතා, ii ඉදප්පච්චයානං සමූහෝ වා ඉදප්පච්චයතා") මෙහි ප්‍රථම අර්ථ විකල්පයෙහි සාමාන්‍යයෙහි ද, විතීය අර්ථ විකල්පයෙහි සමූහාර්ථයෙහි ද **තා** ප්‍රත්‍යය වී.)

මෙසේ පටිච්චසමුප්පාදය පිළිබඳව සාමතය දක්වා අනතුරුවැ මතානන්තර දක්වනි ආචාර්‍යපාදයෝ.

මතානන්තර 1 ඇතැම් ආචාර්‍යවරයෙක් උත්පාද මාත්‍රය **පටිච්චසමුප්පාද** යැයි යෙති.

ඒ මෙසේයි:- තීර්ථකයන් විසින් කල්පනාකරනලද ප්‍රකෘති-පුරුෂාදි කාරණ නිරපේක්ෂක වූ ඒ මූල කාරණයන් නිසා අවිපරීත කොට 'අනිත්‍යයෙන් අනිත්‍යයා ගේ උත්පාදය **පටිච්චසමුප්පාද-යයි** කියා යි' ඒ වනාහි "**උප්පාදෙ, භික්ඛවෙ, තථාගතානං**" යි කියන ලද 'සඞ්ඛත ලක්ෂණ වූ ප්‍රත්‍යයෙන් අන්‍ය වූ **එක් ආකාරයෙක් උත්පාදය**' යනු ඔවුන් ගේ **මතිමාත්‍රයෙකි**. ඉපදීම් **ලක්ෂණ** යෙන් මිදුණු එබඳු කිසිවක් නැතැයි **සැලකීමෙනි**. ඒ නො යෙදේ.

කවර හෙයිනයත් (i) උත්පාද මාත්‍රය පටිච්චසමුප්පාදය යි වදාළ දෙශනාවක් නැති හෙයිනි.

(ii) සූත්‍ර විරෝධ හෙයිනි.

(iii) ගම්භීර නය සම්භව නොවන හෙයිනි.

(iv) ශබ්ද හෙද හෙයිනි.

(ii) **"පටිච්චසමුප්පාදං වෝ භික්ඛවෙ දෙසිස්සාමි"*** මහණෙනි! තොපට පටිච්චසමුප්පාදය දෙශනා කරමි" යනාදී සූත්‍රයන්හි උත්පාද මාත්‍රය **පටිච්චසමුප්පාදය**යැ යි ප්‍රකාශ නොවේ.

"අථ ඛෝ භගවා රත්තියා පඨමං යාමං පටිච්චසමුප්පාදං අනුලෝම පටිලෝමං මනසාකාසි"† එකල බුදුහු රාත්‍රි ප්‍රථම යාමයෙහි **පටිච්චසමුප්පාදය** අනුලෝම - ප්‍රතිලෝම සේ මෙතෙහි කළහ.' ප්‍රථම බොධියෙහි ප්‍රත්‍යයාකාරයා ගේ ප්‍රත්‍යය බව මෙකෙහි කිරීමෙන් යුතුවැ විසූහයි, වදාළ හෙයින් උත්පාද මාත්‍රය නොවැ ප්‍රත්‍යය ධර්මයන් ගේ ප්‍රත්‍යය ශක්තිය වූ උපකාරක භාවය මෙතෙහි කිරීම එක් ප්‍රදෙශ විහරණයක් යැයි වදාළ සූත්‍රය හා විරෝධ වේ.

ඒ බව් **"යෙන භාහං භික්ඛවෙ විහාරෙන පඨමාභි-සම්බුද්ධෝ විහරාමි තස්ස පදෙසෙන විහාසිං"†** 'මහණෙනි! ඒ

*සං: නි: නිදාන සංයුත්ත ‡ම: ව: බොධිකථා
†සං: නි මහාවග්ග සංයුත්ත

මම යම් විහරණයකින් යුක්ත වෑ විසීම් නම් ඉන් එක් ප්‍රදේ-යක් ප්‍රත්‍යයාකාරය මෙනෙහි කිරීමෙන් යුතුවෑ විසීම්, උතුපාද මාත්‍රය බැලීමෙන් යුතුවෑ නොවේ යයි වදාළ හෙයිනුදු, තවද **"සෝ එවං පජානාති. මිච්ඡාදිට්ඨි පච්චයා පි වෙදයිතං, සම්මාදිට්ඨිපච්චයා පි වේදයිතං, මිච්ඡා සංකප්ප පච්චයා පි වෙදයිතං"*** 'මිථ්‍යාදෘෂ්ටි ප්‍රත්‍යයෙනුදු වෙදනාව වේ – සෙස්සෙහි ද අර්ථ මෙසේ යි.

'මිථ්‍යාදෘෂ්ටිසම්ප්‍රයුක්ත වෙදනා ද, මිථ්‍යාදෘෂ්ටි උපනිශ්‍රයෙන් උපදනා කුශලාකුශල වෙදනා ද, මිථ්‍යාදෘෂ්ටි කර්මයෙන් උපදනා විපාක වෙදනා ද, මිථ්‍යාදෘෂ්ටි ප්‍රත්‍යයෙන් උපදනේ නම්. සම්‍යක් දෘෂ්ටිය ද මෙසේමැ යි. මෙසේ වෙදනාවට මිථ්‍යාදෘෂ්ටිය එක් ප්‍රත්‍යයෙක. සම්‍යක්දෘෂ්ටිය ද එක් ප්‍රත්‍යයෙකැ යි වෙදනාවට ප්‍රත්‍යය සත්‍යශීනය කෙරෙමින් සිවිමි යි වදාළ හෙයින් උතුපාද මාත්‍රය පටිච්චසමුප්පාදය යි කියන්නේ **ප්‍රදේශ විහාර සූත්‍ර විරෝධ** වේ. වෙදනාවට ප්‍රත්‍යය ධර්ම මනසිකාර විභාවනය කී හෙයිනි. මින් වෙදනා ද ප්‍රත්‍යයොත්පන්න බව් ප්‍රකාශිත යැ. වෙදනාව ද පටිච්චසමුප්පාදයෙහි එක දේශයක් හෙයින් එද ප්‍රදේශ විහාරයෙකි.

(**විශේෂ**:- **අනුලෝමය සම්මර්ශනය** මෙනෙහි කිරීම ප්‍රථමාභිසම්බුද්ධ විහරණය යැ. එය සර්ව්ප්‍රකාරයෙන් ප්‍රත්‍යයාකාරය බැලීමයැ යි ඇතමෙක් කියති.)

එසේම **කච්චායන සූත්‍ර** විරෝධ වේ. **"ලෝකසමුදයං බෝ කච්චාන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතෝ යා ලෝකෙ නත්ථිතා සා නහොති"**† "කච්චානය! ලෝකසමුදයය (පඤ්චස්කන්ධය උපදවන අවිද්‍යාදි ප්‍රත්‍යය සමූහය) **නත්වූ** පරිදි විදර්ශනාඥානයෙන් දක්නහුට ලෝකයෙහි යම් (උච්ඡෙදදෘෂ්ටියෙක්) අභාවයෙක් වේ නම්, ඒ **නාස්තිත්වය** නොවේ" යැයි මෙසේ අනුලෝම **පටිච්චසමුප්පාදය** පඤ්චස්කන්ධයට ප්‍රත්‍යය වන බව් උච්ඡෙදදෘෂ්ටිය සිඳීම සඳහා වදාළ හෙයින් උත්පාද මාත්‍රය පටිච්චසමුප්පාදය නොවේ. උත්පාද මාත්‍රය දැකීමෙන් උච්ඡෙදදෘෂ්ටිය සමුදඝාතනය නොවේ. ප්‍රත්‍යයන් ගේ අවිච්ඡේද ප්‍රවෘත්තිය දැකීමෙන් උච්ඡෙදදෘෂ්ටිය සිදේ.

(**විශේෂ**:- අතීත හෙතු පඤ්චකය නිසා වර්තමාන ඵල පඤ්චකය ද, වර්තමාන හෙතු පඤ්චකය නිසා අනාගත ඵල

*ප: ම: මහාවග්ග †සං: නි: නිදානසංයුක්ත

පඤ්චකඝ ද, වේ' යැයි මෙසේ හෙතුත් ගේ නො සිද පැවැත්-මෙන් ඵලයන් නො සිද පැවැත්ම වත හෙයින් උත්පාද මාත්‍රය **පටිච්චසමුප්පාදය** යි කීම **කච්චායන සූත්‍ර** විරොධ යි)

(iii **තස්මිතිරොචායං ආනන්ද පටිච්චසමුප්පාදෙ ගම්භීරාව-භාසොච**''* 'ආනන්දය! පටිච්චසමුප්පාදය ගැඹුරු ය ගැඹුරුවැ වැටහේ' යැයි වදළ හෙයින් ගැඹුරු බව උත්පාදමාත්‍රයෙහි නැති.

(ගැඹුරු බව සිවිවැදෑරුම් වේ. එය පසුව විසතර වේ.)

මේ පටිච්චසමුප්පාදය චතුර්විධ නය ප්‍රතිමණ්ඩිතයැ යි **වණ්ණිත** යැ. එද උත්පාද මාත්‍රයෙහි නැති. මෙසේ ගම්භීර නය නො ලැබෙන හෙයින් උත්පාදමාත්‍රය පටිච්චසමුප්පාද නොවේ.

(iv) **ශබ්ද භෙද හෙයිනි.** යන මෙහි '**පටිච්ච**' ශබ්දය පූර්ව-ක්‍රියා වශයෙන් ගෙන එක කර්තෘකවැ යෙදූ කල වාක්‍යාර්ථය ගඟවා (පූර්වකාලාර්ථ ''පති පුබ්බ ඉ ගති යං'' යන ධාතුවෙන් 'ත්වා' ප්‍රත්‍යය වැ සිද්ධයි.) ''සම්භවපාදෙ'' යන අර්ථක්‍රියා කර්තෘමැ එයට ද කර්තෘ වේ.

''චක්ඛුඤ්චව පටිච්ච රූපෙ ච උපජ්ජති චක්ඛුවිඤ්ඤා-ණං''* යන්නෙහි 'චක්ඛුප්පසාදය ද, රූපාලම්බනය ද, නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී. **මෙහි** 'පටිච්ච- උපපජ්ජති, යන දෙකවම ''චක්ඛුවිඤ්ඤාණං'' යනු උකහා යැ. උත්පාද ශබ්දය උත්පාද **මාත්‍රයෙහි** වේනම් ''පටිච්ච'' ශබ්දය හා ඒකකර්තෘකත්වයක් නො-ලැබෙන හෙයින් ශබ්ද භෙදය වේ. යම් කිසි ව්‍යකත අර්ථයෙක් නො ලැබේ මෙසේ ශබ්ද භෙද වත හෙයිනුදු උත්පාද මාත්‍රය පටිච්චසමුප්පාද නොවේ.

තවද මතයෙකි:- නාම පදයක් වුව ඒ හා ''හොති'' යනාදි ක්‍රියා පදයක් යෙදී අර්ථය ප්‍රකාශ වත හෙයින් ''පටිච්ච-සමුප්පාදෙ'' යන්න ''හොති'' යන ක්‍රියා පදය හා යොදා 'පටිච්ච-සමුප්පාදය වේ' යැයි කියම්හ යි යේ නම් භෙද නො යෙදේ. එබඳු යොගයක් නැති හෙයිනි. ප්‍රතිඥා- පෘච්ඡා- නිගමන වශයෙන් කී කිසිදු නැනෙක නොයෙදෙන හෙයිනි.

ඒ මෙසේ යි:- ''**පටිච්චසමුප්පාදං වො භික්ඛවෙ දෙසිස්සාමි**''* ප්‍රතිඥා යි.

''**කතමො ච භික්ඛවෙ පටිච්චසමුප්පාදෙ**''* යනු පෘච්ඡා යි.

''**ඉමං වුච්චති භික්ඛවෙ පටිච්චසමුප්පාදෙ**''* යනු නිගමන-යයි. **මේ එකද** සූත්‍රයක් හා ''හොති'' යනු නො යෙදේ. එසේ

*සං: නි: දුකඛවගග *සං: නි: නිදානවගග

යෙදේ නම් 'උත්පාදයා ගේ ද (නැවත) උත්පාදය වේ' යන දෙෂය පැමිණේ.

තවද මහායෙහි:- **"ඉදප්පච්චයානං භාවෝ ඉදප්පච්චයතා"**යි ('මේ සංඛාරාදීන් ට ප්‍රත්‍යය වූ අවිද්‍යාදිය **ඉදප්පච්චය**' නමි. **"ඉමෙසං භාවෝ ඉදප්පච්චයතා"**) 'ඉදප්පච්චයන්ගේ භාවය ඉදප්පච්චයතා නමුදු. මෙසේ තා ප්‍රත්‍යය භාවාර්ථයෙහි වේ. (යම් ආකාරයකින් අවිද්‍යාදිය සංඛාරාදීන් ගේ පහළවීමට හෙතුවේ නම් ඒ අවිද්‍යාදීන්ගේ ප්‍රත්‍යය ආකාර විශෙෂයෙහි පටිච්චසමුප්පාද යන නාමය වේ යයි කියා යි.) එද නොයෙදේ. අවිද්‍යාදීන් ගේ හෙතුභාවය කී හෙයිනි.

ඒ මෙසේ යි:- **"තස්මා තිහ ආනන්ද! එසෙව හෙතු එතං නිදානං එස සමුදයෝ එස පච්චයෝ ජරා මරණස්ස යදිදං ජාති - පෙ - සංඛාරානං යදිදං අවිජ්ජා"** කි.* 'ආනන්දය! එහෙයින් මෙහි ජරා මරණයට මේ ජාතියම හෙතු යැ, මෙය ම නිදාන යැ, මෙය ම සමුදය යැ, මෙය ම ප්‍රත්‍යය යැ. — සංඛාරයන්ට යම් අවිද්‍යාවක් වේ නම් එයම හෙතුයැ යි මෙසේ බුදුහු දු ප්‍රත්‍යය ම හෙතු බව වදාළ හෙයින් ඔවුන් ගේ **විකාරය** ප්‍රත්‍යය යි නො යෙදේ.

කරුණු මෙසේ හෙයින් **"පටිච්චසමුප්පාද"** නම් ප්‍රත්‍යය ධර්මය යි කී වචනය මනාව කියන ලදුයි දතයුතු.

මෙසේ "පටිච්චසමුප්පාදෙ" යන පදයට ව්‍යුත්පත්ති මාත්‍රය බලා 'උත්පාද මාත්‍රයම පටිච්චසමුප්පාදය' යි කියා නම් මේ මතු කියන අර්ථය ගෙන ඒ සංසිදවිය යුතුයි.

බුදුහු වදාහි :-

(1) **"වෙඩා තතෝ පවත්තෙන - ධම්මසමූහෙ යතෝ**
ඉදං වචනං
තප්පච්චයෝ තතෝ යං - ඵලොපචාරෙන
ඉති වුත්තෙනා"☆

'යම්හෙයකින් තමා පිළිබඳ ප්‍රත්‍යයන්ගේ වශයෙන් පැවැති ප්‍රත්‍යයොත්පන්න ධර්ම සමූහයෙහි ලා "පටිච්චසමුප්පාද" යන මේ පදය දෙපරිද්දෙකින් කැමති වෙද්ද එහෙයින් ඵලධර්මයන් ගේ ඒ හෙතු ධර්ම සමූහය ඵලොපචාරයෙන් පටිච්චසමුප්පාදයැ යි වදාළහ.'

---

*දී: නි: මහාවග්ග ☆ වි: අට්ඨකථා

(i පවෙවතබ්බතොපටිවෙචා ච සො සහ උපපජ්ජනතො සම්භවපදෙ යි ද ii පටිවව වා කාරණසාමඤ්ඤංඅපචවකඛාය සහ උපපජ්ජන-තොඑවංනිව) යි කියා යි.

(**විසතර**:- මේ ප්‍රත්‍යය සමූහයා ගේ වශයෙන් පැවැති යම් **ප්‍රත්‍යයොත්පන්න** ධර්ම පුඤ්ජයෙක් වේ නම් එහි **''පටිවව-සමුප්පාදෙ''** යන මේ පදය දෙපරිද්දෙකින් කැමති වෙති.) ඒ වනාහි i නුවණින් අභිමුඛ කොට 'අවිද්‍යාදි ප්‍රත්‍යයෙන් **සංඛාරාදි ප්‍රත්‍යයොත්පන්න** වේ. (ප්‍රකෘති පුරුෂාදීන් නොවේ' යයි) යථා සද්භාවයෙන් දන්නා ලැබෙන්නේ ලොව් ලොව්තුරා ඛිත්සුව පිණිස පවතී. 'එහෙයින් ඒ ප්‍රත්‍යය සමුත්පන්න ධර්ම රාශිය දැනගැනීමට නුවණැත්තෝ **සුදුස්සෝහු**' යි **''පටිවව''** නම්. (හඟනට සුදුසු යන අර්ථයි.) ඒ 'ධර්ම රාශිය උපදනේ ද එකක් එකක් නුපදී. එක්වම උපදී. අහෙතුක වැ හෝ විෂම හේතුවෙන් හෝ නො ඉපදී මනාව උපදීනු යි' **සමුප්පාද** නම්, මෙසේ පටිවව වූයේ ද සමුපපාද වූයේ ද **ඒමනුයි පටිවව-සමුප්පාද** නම් වේ

තවද **අර්ථයෙකි** :- ii ප්‍රත්‍යය සංමිශ්‍රිය අභිමුඛකොට (එහෙයින්ම බැහැර නො කොට) සමග උපදනා හෙයින් ද, මෙසේත් **''පටිවව-සමුප්පාද''** නම්.

මේ පටිවවසමුපපන්න ධර්මයනට මේ අවිද්‍යාදි හෙතු සමූහය ප්‍රත්‍යය වේනුයි ප්‍රත්‍යය නම්. ඒ ප්‍රත්‍යය සමුත්පන්න ධර්මයනට ප්‍රත්‍යය වන බැවින් මේ පටිවවසමුපපාද ධර්ම සමූහයෙහි ඵල-ව්‍යවහාරයෙන් **පටිවවසමුප්පාද** සංඥාව වේයැයි දක්වයි.

නිදර්ශන :- සෙමට ප්‍රත්‍යය වූ ගුළය ලොකයා සෙමහ (ගුළ) යයි කියන්නාසේ ද, සැපයට හේතු වූ **බුද්ධානුපාදය සුඛය** යි (''සුඛො බුද්ධානං උපපාදෙ'') කියන්නා සේ ද දතයුතු.

තවද :-

(2) **''පටිමුඛමිතොනි වුතතො - හෙතු සමූහො අයං පටිවවානි සඞ්ගතෙ උපපාදෙතිච - ඉති වුතතො සො සමුප්පාදෙ''***

මේ හෙතු සමූහය (ඔවුනොවුන්ට) අභිමුඛවැ (ඔවුනොවුන්) **යන** හෙයින් (පටි + ඉවව =) 'පටිවව' යයි කියන ලදී. ඒ හෙතු **සමූහය** (**සඞ්ගතයන්**) තමා හා සහභාවයට ගිය ධර්මයන් උපදවන

*පටිවවසමුපපාද වි: අඨකථා

හෙයින් (සමුප්පාදය යි) (සම + උප්පාදෙ =) 'සමුප්පාදෙ' යි කියනු ලැබේ.

(**විභාග** :- (i) **සංඛාර - විඤ්ඤාණාදි** ඒ ඒ ඵලධර්මයන්-ගේ උත්පත්තිය සඳහා **අවිද්‍යාදි** එක් එක් හෙතුවක් දැක්වුව ද, ඒ අවිද්‍යාදි **එක** ධර්මයක් පමණක් ප්‍රත්‍යය නො වේ. වැලි සහජාත වූ (එක්ව උපදනා) අනික් චෛතසික ධර්ම හා වස්තු-ආලම්බනාදිය ද, යෝනිසො මනසිකාරාදිය ද, තණ්හා උපාදානා-දිය ද, සත **මේ හෙතු සමූහය තමහට අයත් සාධාරණ ඵල නිපදවන බැවින් ද,

(ii) ඉන් **එක** හෙතුවකුදු විකල බවට නො පැමිණීමෙන් (ඉන් එකකුදු අඩු වුවහොත් නියම ඵල නුපදවිය හැකි හෙයිනි.) සම්පූර්ණ බැවින් ද, එක්වැ පවත්නා ප්‍රත්‍යය (ධර්ම) **යන්** ගේ අඛණ්ඩයන් අතුරින් ඔවුනොවුන් (වීසින්) ඔවුනොවුන් ගේ **අභිමුඛ-**යට යනු ලබන හෙයින් ද "පටිච්ච" යයි ප්‍රත්‍යය සමූහය **කියනු** ලැබේ.

විශේෂ :- (i) මෙහි **''සාධාරණ ඵල නිපදවන හෙයින්''** යන්නෙන් කෘත්‍යය වශයෙන් ඔවුනොවුන් අභිමුඛවැ **සත** සේ කිහ.

(ii) **'විකල බවට නො පැමිණ්මෙන්'** යනුයෙන් ඔවු-නොවුන් අභිමුඛව යන සේ කිහ.

මේ හෙතු සමූහය ඔවුනොවුන් නොහැර පවත්නා ධර්මයන් උපදවන හෙයින් **'සමුප්පාදඝ'**යි කියන ලදී.

මෙහි "**ඔවුනොවුන් නො හැර පවත්නා**" යන්න රූප ධර්මයන්ගේ ද, සංග්‍රහය පිණිස යැ. නො එසේ වුව සමප්‍රයුක්ත ධර්ම යි කිය යුතු යැ. මෙසේ පටිච්ච වූයේ ද, සමුප්පාද වූයේ ද හේමනුයි **'පටිච්චසමුප්පාද'** නම්. 'අභිමුඛභාවට යනුයේ ද, එක්වැ උපදිනුයේ ද, පටිච්චසමුප්පාදය' යි වදාළහ.

තවද ක්‍රමයෙකි.

(3) **'පච්චයතා අයෙදිසඤ්ඤං-පටිච්ච යස්මා සහ ච ධම්ම**
අයමුප්පාදෙති තතොපි-එවම්ඛ භාසිතා මුනිනා''*

---

*පටිච්චසමුප්පාද වි: අට්ඨකථා

'මේ **අවිද්‍යාදි** ප්‍රත්‍යය සමූහය ඔවුනොවුන් නිසා (සහකාරී-කාරණභාවයෙන්) සමවැ (විසම නොවැ) **සඞ්ඛාරාදි** ප්‍රත්‍ය-යොත්පන්න ධර්මයන් උපදවන හෙයිනුදු (මෙසේත්) **පටිච්ච-සමුප්පාදය**' යි **භගවන්හු** වදාළහ.

විභංග:- **''අවිජ්ජා පච්චයා සංඛාරා''** යනාදින් **අවිද්‍යාදි** ශීර්ෂයෙන් දක්වන ලද ප්‍රත්‍යයන් අතුරින් යම් යම් ප්‍රත්‍යයක් **සඞ්ඛාරාදි** යම් ප්‍රත්‍යයොත්පන්න ධර්මයක් උපදවා නම් ඔවු-නොවුන් නැතිවැ ඔවුනොවුන් ගේ විකල බවක් ඇති කල්හි ඔවුහු ඉපදවීමට සමර්ථ නොවෙති. එහෙයින් ඔවුනොවුන් නිසා **එකවර** (ඉදිරි පසු කොවී) **ප්‍රත්‍යය** ධර්ම සමූහය ප්‍රත්‍ය-යොත්පන්න ධර්ම නිපදවන හෙයින් **පරමාර්ථ** ධර්ම ව්‍යවහාරයෙහි සමර්ථ **බුදුහු පටිච්චසමුප්පාදය** යි වදාළහ.

(**අවිද්‍යාදි** ශීර්ෂයෙන් කියන ලද ප්‍රත්‍යය රාශිය තෙමේ **සංඛාරාදි** ශීර්ෂයෙන් කියන ලද ප්‍රත්‍යය සමුත්පන්න ධර්ම රාශිය උපදවන්නේ එකෙක් සහජාත උපදවයි. එකෙක් වෙතනාව උපදවයි. යන මේ ක්‍රමයෙන් බෙදා ඉපදවීමක් නැති බැවින් ඒකෝක්ක දේස කොට නොවැ උපදවයි. හැමදෙනාම හැමදෙන උපදවන බැවින් එක්වැ උපදවයි නොහොත් සහජාත සමහරෙක් උපදයි. වෙතනාව සමහරෙක් උපදයි. කලෙක සහජාත උපදවයි. කලෙක වෙතනාව උපදවයි යනු නැති බැවින් පළමු පසුව යන පිළිවෙළ විසින් නොවැ උපදවයි. හැමදෙනාම සමගම උපදත් යනු සත්‍යයි.)

නිගමනය:- මෙහි මූල ගාථාවෙන් **පටිච්චසමුප්පාද** යන්නෙන් ප්‍රත්‍යයොත්පන්න ධර්ම සමූහය මුඛ්‍යාර්ථ හෙයින් ද, ප්‍රත්‍යය ධර්ම සමූහය ඵලෝපචාර හෙයින් ද, **පටිච්චසමුප්පාදයෝයි** කියන ලදී.

එසද 'පච්චතුම්හරහනති නං පණ්ඩිතාති පටිච්චුප්පජ්ජමානා චසහ සමමා ච උප්පජ්ජති, න එකෙකනතා, නාපි අහෙතුතෝ''යි පණ්ඩිතයන් විසින් හුවණින් දැන ගැනීමට සුදුසු හෙයින් පටිච්චයයි ද, උපදනාහු ද එකවර සමවැ උපදනා හෙයින් **සමුප්පාද** නමැති ද එක් අර්ථයෙකි.

''පච්චය සාමඤඤං පන පටිච්ච අපච්චක්ඛාය සහ උප්පජ්ජන්තීති සමුප්පාදෙ''යි ප්‍රත්‍යයන් ගේ සමූහය අනිමුඛ කොට (බැහැර නොකොට) ඔවුන් හා සහයොගයෙන් උපදනා හෙයින්ද, **පටිච්චසමුප්පාද** නමැයි දෙවන අර්ථයි.

මේ අවී දෙකින්ම **කියවෙනුයේ ප්‍රත්‍යයොත්පන්න** ධර්ම මැ සි. මොවුන් ගේ උත්පාදයට හෙතුවන හෙයින් හෙතුධර්ම ද, එලෙ-පවාරයෙන් (අමුඛ්‍යාර්ථයෙන්) **පටිච්චසමුප්පාදයෑ** සි කියනු ලැබේ.

ප්‍රත්‍යයොත්පන්න ධර්මයනට පෙරටුව සිට තමා හා එකී භාවයට පැමිණි ප්‍රත්‍යයොත්පන්න ධර්මයන් උපදවන හෙයින් හෙතුධර්ම සමූහය **පටිච්චසමුප්පාදය** සි මෙයින් කියන ලදී.

මෙසේ වදාළ බුදුහු :-

''පුරිමෙන සස්සතාදිනවභාවෝ පච්ඡිමෙන තු පදෙන
උච්ඡෙදාදි විභාගෝ - මයෙන පරිදීපිතෝ සුගතෝ''*යි

මෙහි **''පටිච්ච''** යන පූර්ව පදයෙන් **ශාස්වතාදි** දෘෂ්ටීන් ගේ අභාවය ද, පසුව කී **''සමුප්පාද''** යන පදයෙන් **උච්ඡේදදෘෂ්ටි** ආදීන් ගේ නැසීම ද, **''පටිච්චසමුප්පාද''** යන පදඛයෙන් අන්තඛය වර්ජිත **මධ්‍යම ප්‍රතිපද** සංඛ්‍යාත න්‍යාය ද වදාරණ ලදී.

විභාවනය:- සෙසු ප්‍රත්‍යයන් ගේ සමවායය හඟවන්නා වූ **''පටිච්ච''** යන පූර්වපදයෙන් කොළෙස්වට ආදි පවත්නා සඛභාව ඇති ධර්මයන් ගේ ප්‍රත්‍යය සමවායය අයත් පැවැතුම් ඇති බැවින් 'ආත්මය ද, ලෝකය ද, ශාස්වතයයි, පැවැති **ශාස්වත-වාදය' ද,** 'සත්ත්වයන් ගේ කෙලෙසීමට හෝ වොදනයට හෝ කිසි ප්‍රත්‍යයක් නැතැයි ද, අහෙතු අප්‍රත්‍යය වැ සත්ත්වයන් ගේ කෙලෙසීම - වොදනය වේයයි, ගත්තා **අහෙතු අප්‍රත්‍යය-වාදය' ද,** 'ප්‍රකෘති - අණු - කාලාදීන් - ලෝකය පවතීය, යන **විසම හෙතු වාදය' ද,** ඊශ්වර නිර්මාණාදී වශයෙන් පවත්නා **වශවර්තීති වාදය ද,** යන **අනන්තකිලේසානුයොගයට** හෙතු වූ මේ වාදයන් ගේ අභාවය දක්වන ලදී.

(එකී වාදයන් අනුවැ ප්‍රත්‍යය ධර්මයන් ගේ ඒකී භාවයෙන් කවර ඵලයෙක් වේදැයි හැඟෙන හෙයිනි.)

(විශේෂ:- මෙහි අහෙතු වාදය ගැනීමෙන්ම **සඛභාව - නියති - යදිච්ඡාවාද** ද සංග්‍රහ වේ.)

(චක්ෂුඃප්‍රසාදයම චක්ෂුර්විඥානයට **කාරණ** වේයයි ඇතමෙක් කියති. මේ ආදිය **විසමහෙතු** වාදය යි.

***වි:** අඨකථා

ඊශ්වර නිර්මාණවාදය ද අහෙතු වාදයෙහි ම ඇතුළත්.

"ධර්මයෝ සවතන්ත්‍රවැම පවතින්" යනු **වශවර්ත්තිවාදය** සි-කියති. (යනු පිටකයි) ධර්මයන් ගේ උත්පත්තිය භගවත "සමුප්පාද" යන දෙවෙනි පදයෙන් "**උච්ඡේදවාදය** ද," දෘෂ්ටියෙහි විපාක නැත, යන **නාස්තිකවාදය** ද 'කරතුදු පින් පව් නොකෙරෙයි, යන **අකිරියවාදය** ද ප්‍රහාණය වේ.

ඒ එසේමැයි:- පුළු පුළු ප්‍රත්‍යය වශයෙන් නැවැත නැවැත ධර්මයන් උපදනා කල්හි උච්ඡේදයක් කොයින් වේ ද? මෙයින් **සාමඤ්ඤලක්ඛණානුයෝග** ප්‍රහාණය වේ. සියලු **'පටිච්චසමුප්පාද'** යන වචන දෙකින් ම (ඒ ඒ හෙතු ප්‍රත්‍යයන් ගේ සමවාය (එක්වීමෙහි) යෙහි හෙතු - ඵල සංඛ්‍යාත සමවායය නොසිඳ ඒ ඒ ප්‍රත්‍යය සමුත්පන්න ධර්මයන් උපදනා හෙයින්) පෙර කී **ශාස්වත - උච්ඡේද** දෘෂ්ටි දෙකින් මිදුණු **මධ්‍යම ප්‍රතිපදාව** කියන ලදී.

ඒ මෙසේයි:- **කර්මවෘත්ත** - විපාකවෘත්තයන් වෙන් වෙන් සවභාව ඇති හෙයිනි. "යමෙක් කර්ම කෙරේ නම් හේම විපාක විඳියි" යන ශාස්වත දෘෂ්ටිය හා අනිකෙක් කර්ම කෙරෙයි අනිකෙක් විපාක විඳියි යන **උච්ඡේද දෘෂ්ටිය** සිදීම ද, 'කුශලාකුශල **සන්තති** ප්‍රවෘත්තියෙහි **කාරක** ව්‍යවහාරය ද, විපාකසන්තති **ප්‍රවෘත්ති**-යෙහි **වේදක** ව්‍යවහාරය ද, වේ.' (යම් චිත්තසන්තතියෙකැ කර්ම **නිපන්නේ** නම් එම සන්තතියෙහිම **විපාක** නිපදේ.)

ප්‍රත්‍යය සමුත්පන්න ධර්ම්‍යවහාර මාත්‍රයම **වන** හෙයින් සත්‍ර පුරුෂාදි ලොකව්‍යවහාරය පරමාර්ථ වශයෙන් නොගැන්ම ද වේ.

ලොකව්‍යවහාරය ඒ වූ පරිදි ගැනීම ද වේ.
මේ පළමු කොට පටිච්චසමුප්පාද යන වචනයෙහි අර්ථ සි
(**ටීකාහි** ආ දීඝ් විස්තර **මෙහි** නො දක්වී)

පටිච්චසමුප්පාදය දෙශනා කරන්නා වූ **භාග්‍යවතුන් වහන්සේ** විසින් **"අවිජ්ජා පච්චයා සංඛාරා"** යනාදි ක්‍රමයෙන් දෙශනා කරන ලද පාළි ධර්මයෙහි අර්ථ වර්ණනය කරන ආචාර්‍යවරයා විභජ්ජවාදීමණ්ඩලයට බැස, (විභජ්ජවාදීවැ) අට්ඨකථා ඇදුරන් අභිභවා නොනියා, සකසමය වූ **ස්ථවිරවංශාගත** ලබ්ධිය නොඉක්මවමින්, පරසමය වූ නිකායාන්තරිකයන් ගේ හෝ අන්‍ය ලබ්ධිකයන් ගේ හෝ වාදයන් පිඬු නොකරමින්, පාළි ධර්මයට අවමන් නොකරමින්, විනයට අනුකූල වෙමින් **පෙළෙහි** ආ සතර මහාපදෙස* හා

*අ: නි: චතුක්කනිපාත

අටුවාහි ආ **සතර මහාපදේස*** බලමින් පටිච්චසමුප්පාද **පාළි ධර්මය** දක්වමින් එහි **අවුවාව** සංග්‍රහ කෙරෙමින් නොහොත් හෙතු හා හෙතු ඵල සංග්‍රහ කෙරෙමින් ඒ ප්‍රතීත්‍යසමුත්පාද අර්ථයම නැවැත නැවැත පෙරළමින් නැවැත අන් ක්‍රමයකින් "**පුබ්බපොන අසඤ්ඤාණං**" යනාදීන් දක්වමින් අර්ථ වර්ණනා කළයුතු.

(ටීකා ග්‍රන්ථ සන්තයන්හි මතාන්තර සහිතවැ විසතර වේ.) සවභාවයෙන්ම පටිච්චසමුප්පාදයෙහි අර්ථ වර්ණනාව දුෂ්කර ය. එසින් කිහ පැරණියෝ;

"සිව්සස්- පිළිසඳ ද - සත්-‡ පිළිසමුපා යතදි
මෙ සතර දහම් දුදැසි යැ - දෙසුම ද ඉතා දුකර යැ"

එහෙයින් ආගම සංඛ්‍යාත පඨාන්පකරණය හා ප්‍රතිසම්භිදා මාර්ගය ආදීන් ද හැර සෙස්සන් විසින් ප්‍රතීත්‍යසමුත්පාද අර්ථ වර්ණනා කිරීම දුෂ්කරයි. එහෙයින්ම නුවණින් තීරණය කොට දැන,

"පිළි සමුපා වැනුම - මම අද දෙසනු රිසියෙම්
සමුදුර බට එකකුසේ - පිහිටක් ඉන් නොලබනෙම්"

එහෙත් කියන සේ දක්වනුවෝ මේ කියත්.

"ඉතිදු මෙසසුන නන් - දෙසුම් නය විසිතුරු වේ,
පෙරැදුරු වියකන්-† මගද - නොසිඳ නිසිසේ පවතී"

"ඉන් එදෙමග නිසා - මේ අරුත් වැනුම අරඹමි,
සදහම් රස කැමැතියෝ - අසව් නොවී විපිළිසර"

මෙද පෙරැදුරන් විසින් කියනලදී.

"යමෙක් අසා නම් මෙ අරුත් පිරික්සා
පෙරත් පසුත් හේ ලබනේ වෙසෙස් තැන්,
ලබා දැනුම් මේ දම්'රුත්ඊ විනිස්නෙන්
මරුන් නොදක්මෙන් නිවනත් ලබන්නේ"

මෙහි ආදියෙහිම පළමුකොට "**අවිජ්ජා පච්චයා සඞ්ඛාරා**" යනාදියෙහි මතු සඳහන් පරිදි

1 දෙශනා භෙදයෙන් ද
2 අර්ථ වශයෙන් ද

---

*සා: පා: **නීදාන** ‡ **සත්තමියා** ථපටිච්චසමුප්පාදය
† **ව්‍යාඛ්‍යාන** ඊ **දම් + අරුත්**

3 ලක්ෂණාදි වශයෙන් ද
4 එකවිධාදි වශයෙන් ද
5 අඩක පිරිසිදීම් වශයෙන් ද

විනිශ්චය දතයුතුයි.

දෙශනා හෙදයෙන් මෙසේ යි:- වැල් අදහා පුරුෂයන් සිවු දෙනකු ගේ වැල් ඇදීම මෙන් බුදුහු ද, පටිච්චසමුප්පාදය සිවු ආකාරයෙකින් වදාරත්.

(1) මුල සිට අග තෙක් ද,
(2) මැද සිට අග තෙක් ද,
(3) අග සිට මුල තෙක් ද,
(4) මැද සිට මුල තෙක් දැයි කියායි

විස්තර:- (1) ඔවුනතුරින් වැලේ මුල පළමු දුටුයේ එහි මුල කපා සියල්ල ඇදගෙන කම්මානයෙහි යොදවයි. එසේම **බුදුහු** කම්ම- විපාක- ක්ලෙස- වට්ටයන්ගේ මූලකාරණය වූ හෝ මූලම කී හෙයින් මූලය වූ **අවිද්‍යාව** පටන් පර්‍යවසානයෙහි වදාළ **ජරා මරණ** තෙක් දෙසත්.

ඒ මෙසේ යි:-

"ඉති ඛො භික්ඛවෙ අවිජ්ජා පච්චයා සඞ්ඛාරා - පෙ - ජාති පච්චයා ජරා මරණං*" යි 'මහණෙනි! මෙසේ අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර වේ. - පෙ - ජාති ප්‍රත්‍යයෙන් ජරා මරණ වේ' යයි මූල සිට අග තෙක් වදාරති.

(2) වැලේ මැද පළමු දුටු පුරුෂයා එය මැදින් සිඳ අග කොටස ගත්තා සේ **"තස්ස තං වෙදනං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති නන්දි යා වෙදනාසු නන්දි තදුපාදානං තස්සුපාදානපච්චයා භවො භව පච්චයා ජාති"*** ඒ වෙදනාව කැමැති වන්නා වූ, මමය මාගේ යැයි ගත්තා වූ, බලවත් සේ තෘෂ්ණාවෙන් ගැල සිටින්නා වූ, ඒ පුද්ගලයාහට තෘෂ්ණාව උපදී. වෙදනාවෙහි යම් තෘෂ්ණාවෙක් වේ නම් ඒ දැඩි ආසාව ඒ පුද්ගලයාහට උපාදානය වේ. උපාදාන ප්‍රත්‍යයෙන් භවය වේ. භව ප්‍රත්‍යයෙන් ජාතිය වේ, මෙසේ මැද පටන් අවසානය තෙක් දෙශනා කෙරෙති.

(3) වැලේ අග පළමු දුටුවෙක් ඒ අගින් ගෙන මුල තෙක් **ක්‍රමයෙන් ගත්තා** සේ බුදුහු ද **"ජාති පච්චයා ජරා මරණං**

*ම: නි: මූලපණ්ණාසක

"ඉතිඛෝ පනෙතං වුත්තං ජාති පච්චයා ජරා මරණං නෙ වා කථංවා එසා හොතීති. ජාති පච්චයා භනෙන ජරා මරණං. එවං නෙ එසා හොති ජාතිපච්චයා ජරා මරණන්ති භව පච්චයා ජාති - පෙ - අවිජ්ජා පච්චයා සඞ්ඛාරාති ඉති ඛෝ පනෙතං වුත්තං අවිජ්ජා පච්චයා නුඛෝ භික්ඛවෙ සඞ්ඛාරා නොවා කථංවා එසා හොතීති. අවිජ්ජා පච්චයා භනෙන සඞ්ඛාරා එවං නෙ එසා හොති අවිජ්ජා පච්චයා සඞ්ඛාරාති"* ජාතිප්‍රත්‍යයෙන් ජරා මරණ වේයැ යි මෙසේ මෙය කියන ලදී. ජාතිප්‍රත්‍යයෙන් ජරා මරණ වේද? නොවේද? මෙහිලා තොපට කෙසේ හෝ වැටහේද? සවාමීනි! ජාති-ප්‍රත්‍යයෙන් ජරා මරණ වේ. ජාතිප්‍රත්‍යයෙන් ජරා මරණ වේ. යයි මෙහි ලා අපට මෙසේ වැටහේ. භව ප්‍රත්‍යයෙන් ජාතිය වේ. = පෙ = අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංඝාර වේයයි මෙසේ කියන ලදී අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංඝාර වේද? නොවේද? මෙහිලා තොපට කෙසේ හෝ වැටහේද? සවාමීනි! අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංඝාර වේ. අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර වේ යයි මෙහි ලා අපට මෙසේ වැටහේ. මෙසේ අග සිට මූල තෙක් පටිච්ච සමුප්පාදය වදුරති.

(4) වැලෙහි මැද දුටු යේ එතැන සිට මූල තෙක් ගොස් සිදහත්තා සේ බුදුහු **"ඉමෙ ච භික්ඛවෙ චත්තාරෙ ආහාරා කිං නිදානා කිං සමුදයා කිං ජාතිකා කිං පභවා. ඉමෙව චත්තාරෙ ආහාරා තණ්හා නිදානා තණ්හා සමුදයා තණ්හා ජාතිකා තණ්හා පභවා. තණ්හා කිං නිදානා - පෙ - වෙදනා - එසො - සළායතනං - නාමරූපං - විඤ්ඤාණං - සංඛාරා කිං නිදානා - පෙ - සංඛාරා අවිජ්ජා නිදානා - අවිජ්ජා පභවා"†** මහණෙනි! මේ චතුර්විධ ආහාර කුමක් නිදාන කොට ඇත්තේද? කුමක් හෙතු කොට ඇත්තේද? කුමක් ජාති කොට - කුමක් ප්‍රභව කොට ඇත්තේද? මේ චතුර්විධ ආහාර තෘෂ්ණා නිදාන කොට ඇත්තේය. - පෙ - තෘෂ්ණාව කුමක් ප්‍රභව කොට ඇත්තේද? - පෙ - වෙදනා - ස්පර්ශ - ෂඩායතන - නාමරූප විඥාන - සංස්කාර - අවිද්‍යා ප්‍රභව කොට ඇත්තේයි. මෙසේ මැද සිට මූල තෙක්ද වදුරති. කවර හෙයින් මෙසේ වදුරති? යත්!

ප්‍රතීත්‍ය සමුත්පාදය සමන්තභද්‍රක හෙයින් හා නමාද දෙශනා විලාසයට පැමිණි හෙයිනි.

ප්‍රතීත්‍ය සමුත්පාදය සමන්තභද්‍ර යැ. පෙරකී ඒ සතර

*මී: නී: මූලපණ්ණාසක †සං: නී: නිදානසංයුක්ත

ආකාර දෙශනාවන් අතුරින් ඒ ඒ සූත්‍ර දෙශනා මාර්ග ප්‍රතිවෙධශ ප්‍රඥාව නොඉහොත් ප්‍රතීත්‍ය සමුත්පාදය පිණිස පවතී මැයි.

එසේම **චතුවෛශාරද්‍යයෙන් හා සතර ප්‍රතිසම්භිද ඥානයෙන්** ද යුක්තවූ හෙයින්ද (1) **ධර්ම** (2) **අර්ථ** (3) **ප්‍රතිවෙධ** (4) **දෙශනා** යන **චතුර්විධ ශාසන** භාවයම පැමිණීමෙන් දෙශනා විලාසයෙන් යුක්ත හෙයින්ද, **ඒ භාග්‍යවතුන් වහන්සේ** නා නා නයින් ධර්මදෙශනා කරන සේක.

විශෙෂ :- ඒ සිවු වැදෑරුම් දෙශනා අතුරින් මූල සිව පිළිවෙළින් අගතෙක් පටිච්චසමුප්පාද දෙශනාය සංස්කාරාදීන් ගේ පැවැත්මට කාරණ වූ අවිද්‍යාදියෙහි නොඉහොත් සංසාර ප්‍රවෘත්තියට අකාරණ වූ ප්‍රකෘති ආදිය කාරණයයි. වරදවා (මූලාවෙන්) ගත් වෙනෙය ජනයන් නුවණින් බලන්නා වූ **භාග්‍යවතුන් වහන්සේ** විසින් තම තමා ගේ ඵලානුරූප ප්‍රත්‍යයෙන් සංස්කාරාදීන් ගේ පැවැත්ම දක්වනු සඳහා ද, උත්පත්තික්‍රම දක්වනු සඳහා ද, වදාරණ ලදැ යි දතයුතු.

අගසිට මූල තෙක් (ප්‍රතිලෝම) දෙශනාව - "මේ සත්ත්ව ලොකයා එකාන්තයෙන් දුකට පැමිණියේ යැ, උපදනේ යැ, දිරන්නේ යැ, මැරෙන්නේ යැ, යනාදීන් දුකට පැමිණි ලොකයා බලන්නා වූ බොධිසත්ත්වයන් සම්බොධියෙන් පූර්භාගයෙහි ඒ ඒ ජරාමරණාදි ප්‍රත්‍යය සමුත්පන්න ධර්මයන් අවබොධ කරන විදර්ශනා ඥානය අනුගමනයෙන් අවබොධ කළ ජාත්‍යාදි ප්‍රත්‍යය ධර්මයන් ඵලානුසාරයෙන් සංඝාතනය කොට දැක්වීම සඳහා පවත්වන ලද්දීයැ යි දතයුතු.

මැද සිට මූලතෙක් පැවැති දෙශනාව - ආහාරයට නිදානය පිරිසිඳ දැනීම අනුව යාමෙන් අතීත අධ්වය හිමි කොට ඉදිරියෙහි ඵලවා නැවැත අතීත අධ්වයෙහි පවත් ගෙන හෙතුඵල ධර්මයන් ගේ පටිපාටිය මනාව දැක්වීම සඳහා පැවැත්විණැ යි දතයුතු.

(උපාදාන සංඛ්‍යාත තෘෂ්ණාව නිදාන කොට පවත්නා මනොසඤ්චේතනාහාරය ද, ඒ අනුසාරයෙන් (වර්තමාන) විඤ්ඤාන (ආහාර) ය තෙක් පවත්නා ධර්මයෝ ද, වර්තමානිකාධ්වයහ. සංස්කාර අවිද්‍යාවෝ අතීත අධ්වයහ.)

තවද **ජාති** සංඛ්‍යාත විඤ්ඤාණයට නිමිති වූ තෘෂ්ණාදිය අනාගතාධ්ව යැ. විඤ්ඤාණය වර්තමාන අධ්ව යැ. සංස්කාර-අවිද්‍යා

දෙක අතීතාධ්‍ව යැ. තෘෂ්ණාවෙන් උපදවනලද (මනෝ-සඤ්චේතනා) ආහාරය වර්තමාන අධ්‍ව යැ. තෘෂ්ණාදිය අතීතාධ්‍වයැ. සංස්කාර – අවිද්‍යා අතීත තරාධ්‍වයැ යි මෙසේ අතීත අධ්‍වය තෙක් පැමිණවීම වේ.

(නැවැත ඒ අතීත අධ්‍වයෙහි පවත් අනාගත අධ්‍වය තෙක් හෙතුඵල පටිපාටිය ද සුදුසු පරිදි ආහාරයන්ට නිදානය දැක්වීම ද මෙයින් අභිප්‍රේත යි.)

මෑද සිව අඟතෙක් පැවැති දෙශනාව වර්තමාන අධ්‍ව යෙහි අනාගත ධර්මයන් හටගැනීමට හෙතු වූ ධර්මයන් දක්වා හෙතු ඵල පරම්පරාව ප්‍රකාශ කරනු පිණිස යැ.

මේ සිවු වැදෑරුම් දෙශනාවන් අතුරින් අනුලෝම දෙශනාව – පැවැත්මෙහි මූලාවූවන්ට තමා පිළිබඳ ඵලයන්ට අනුරූප හෙතු දක්වනු සඳහාද, වට්ටදුක්ඛය උපදනා පරිදි දැක්වීම සඳහා ද, වදාළහ. මේ විශුද්ධිමාර්ගයෙහි ද එය අභිප්‍රේතයි.

ප්‍රශ්නයෙකි :- මෙහි අවිද්‍යාව පළමුව වදාළේ කවර හෙයින් ද? **කපිලාදි ප්‍රකෘතිවාදීන් ගේ** ප්‍රකෘතිය මෙන් අවිද්‍යාව ද අකාරණ ද? ලොකයට මූල කාරණය ද?

පිළිතුර :- අකාරණ හෝ මූලකාරණ නො වේ.

නිදර්ශන :- **"ආසව සමුදයා අවිජ්ජා සමුදයෝ"*** ආශ්‍රව හෙතුවෙන් අවිද්‍යාව හටගනියයි කී හෙයින්.

එහෙත් මෙහි අවිද්‍යාව මූල කාරණ කොට දැක්වීමේ හෙතුවක් ඇති.

ප්‍රශ්නය :- ඒ කවරේ ද?

පිළිතුර :- වෘත්ත කථාවට ශීර්ෂ (මූලකාරණ) වශයෙන් අවිද්‍යාව වදාළහ.

ඒ මෙසේ යි :- වෘත්ත (සංසාර ප්‍රවෘත්ති) කථාව වදාරන බුදුහු ධර්ම දෙකක් ශීර්ෂ කොට දක්වති. එනම් :- (1) අවිද්‍යාව හෝ ශීර්ෂ කෙරෙති.

ඒ මෙසේ යි :- "පුරිමා භික්ඛවෙ කොටි න පඤ්ඤායති අවිජ්ජාය ඉතෝ පුබ්බ අවිජ්ජා නාහොසි. අථ පච්ඡා සම්භවිති එවඤ්චේතං භික්ඛවෙ වුච්චති අථ ච පන පඤ්ඤා-

*ම: නි: මූලපණ්ණාසක

යතී ඉදප්පච්චයා අවිජ්ජා නි" 'මහණෙනි! මින් පෙර අවිද්‍යාව නොවී ය. ඉන් පසුව වීය යි අවිද්‍යාවේ පූර්ව කෙළවර නො පැනේ-ය යි මෙසේ මා විසින් කියනු ලැබේ. එතෙකුදු වුවත් ආශ්‍රව සමුදයයෙන් අවිද්‍යාව වේ යන මේ කාරණය පැනේය යි" අවිද්‍යාව භව ශීර්ෂ වශයෙන් වදාළසේ ය.

(2) භවතෘෂ්ණාව ද ශීර්ෂ කෙරෙහි.

ඒ මෙසේ යි :- **"පුබ්බා භික්ඛවෙ කොටි නප්පඤ්ඤායති, භව තණ්හාය ඉතො පුබ්බෙ භව තණ්හා නාහොසි අථ පච්ඡා සම්භවිති. එවංසෙඛතං භික්ඛවෙ වුච්චති අථව පන පඤ්ඤායති. ඉදප්පච්චයා භවතණ්හානි**" මහණෙනි! මින් පෙර භව තෘෂ්ණාව නො වීය, ඉන්පසු හටගත්තේ ය යි භව-තෘෂ්ණාවේ පූර්ව කෙළවර නො පැනේය යි මා විසින් කියනු ලැබේ. එතෙකුදු වුවත් භව තෘෂ්ණාවට මේ වේදනා සංඛ්‍යාත මූලකාරණය වේ. වෙදනා සමුදයයෙන් තෘෂ්ණා සමුදය වේ යන මේ කාරණය පැනේ' යැ යි භවතෘෂ්ණාව ශීර්ෂ වශයෙන් වදාළ සේ ය.

ප්‍රශ්නය යෙකි :- වරද කථාව වදාරන **බුදුහු** මේ ධර්ම දෙක මූල්කොට කවරහෙයින් වදාරත් ද?

පිළිතුර :- සුගති- දුර්ගතිගාමී කර්මයනට විශෙෂ හෙතු බැවිනි, දුර්ගතිගාමී කර්මයට විශෙෂ හෙතුව අවිද්‍යාවයි.

ඒ මෙසේ යි :- අවිද්‍යාවෙන් මඩනා ලද පෘථග්ජනයා ගින්-නෙන් තැවීමෙන් හා මුගුරින් තැලීමෙන් පීඩාවට පැමිණි මරණයට පමුණුවන ගවදෙන ඒ පීඩාතුර බැවින් ආස්වාදයක් (සැනසීමක්) නැතද තමනට අවැඩ දායක වූ ද; උණුදිය බොන්නා සේ කොලෙස් ගින්නෙන් තැවීමෙන් ආස්වාදයක් නැත්තේ දුගතියෙහි හෙළීමෙන් තවහට පීඩා එළවන්නා වූ ද, ප්‍රාණ ඝාතාදී වූ අනෙක විධ දුර්ගතිගාමී කර්මය අරඹ යි.

සුගතිගාමී කර්මයට විශෙෂ හෙතුව භවතෘෂ්ණාවයි.

භවතෘෂ්ණාවෙන් පෙළන ලද ප්‍රභූදුනා යථොක්ත ගවදෙන තමා පීඩාව දුරුකරන ආස්වාද සහිත මිහිරි සිහිල් ජලය ආශාවෙන් බොන්නා සේ කෙලෙස් පීඩා විරහයෙන් ආස්වාද-වත් වූ සුගතියට පමුණුවන තමාගේ දුගති දුක් පීඩා දුරුකරන, ප්‍රාණ ඝාතයෙන් වෙන්වීමාදී අනෙකාකාර වූ සුගතිගාමී කර්

කෙරේ දුකඛයෙහි අවිද්‍යාවට තෘෂ්ණාව අනුවතීක වේ. සැපයෙහි තෘෂ්ණාවට අවිද්‍යාව අනුවතීක වේ.

විශේෂ :- වත්තකථාවට යිමිවූ මේ ධම් අතුරින් බුදුහු එක් ධම්යක් මුල්කොට ද දෙශනා කරති.

ඒ මෙසේ යි. "**ඉති ඛො භික්ඛවෙ අවිජ්ජූපනිසා සංඛාරා සංඛාරූපනිසං විඤ්ඤාණං**"* 'මහණෙනි! මෙසේ අවිද්‍යාව කාරණ කොට සඛ්ඛාර වේ. සඛ්ඛාර කාරණ කොට විඤ්ඤාණ වේ' යනාදිය යි.

"තවද "**උපාදානියෙසු භික්ඛවෙ ධම්මෙසු අස්සාදානුපස්සි විහරතො තණ්හා පවඩ්ඪති තණ්හා පච්චයා උපාදානං**"‡ 'උපාදාන යන්ට අරමුණු වූ ධම්යන්හි ආස්වාද කිරීම් වශයෙන් සැප සොම්නසින් යුතුවැ බලමින් වසන්නහුට තෘෂ්ණාව වැඩේ. ඒ තෘෂ්ණාව හෙතුකොට උපාදාන සංඛ්‍යාත දැඩි තෘෂ්ණාව වේ යනාදියයි.

ඇතැම් සූත්‍රයෙකැ උභයමූලකව ද දෙශනා කෙරෙති.

"**අවිජ්ජා නීවරණස්ස හි භික්ඛවෙ බාලස්ස තණ්හාය සම්පයුත්තස්ස එවමයං කායො සමුදාගච්ඡති. ඉති අයංචෙව කායො බහිද්ධා ච නාමරූපං ඉත්ථෙතං මයං. මයං පටිච්ච එත්ථෙතා ඡළෙවායතනානි ච යෙහි ඵුට්ඨො බාලො සුඛ-දුක්ඛං පටිසංවෙදෙතී*ති**" මහණෙනි! අවිද්‍යාවෙන් මුවහ වූ තෘෂ්ණාවෙන් යුක්ත බාලයාට ඒ අවිද්‍යා තෘෂ්ණා යුක්ත බැවින් මේ කායය උපදනේ වෙයි. මෙසේ මේ කායය ද, බාහ්‍ය සඤ්ඤා හෝ ඡඩායතන ද, ඒ නිසා උපදනා ඛාර- ආලම්බන- දෙක ද, ඒ ඡඩායතනයෙන් උපදනා සපශීය ද උපදී. එයින් ම ඒ බාලයා සැප දුක් වේදනා විඳී." යනාදියයි.

(**විශෙෂ** :- අවිද්‍යාවෙන් වැසුණු හෙයින් ද තෘෂ්ණාවෙන් යුක්ත වූයේ වෙයි. මෙයින් අවිද්‍යා-තෘෂ්ණා නිශ්‍රිත සංඝස්කාරය ද, කාය ග්‍රහණයෙන් විඤ්ඤාණ- නාම රූප- සළායතනයන් ද, බාහ්‍ය වූ ඡඩායතන හෝ ආධ්‍යාත්මික බාහ්‍ය ආයතන ද, එයින් සපශීය ද, සපශීයෙන් වෙදනාව ද වේ යැයි කීමෙන් සපශීය වෙදනාවට විශෙෂ ප්‍රත්‍යය බව දක්වා අවිද්‍යා- තෘෂ්ණා මුල්කොට ඇති වෙදනා අවසන් කොට ඇති ප්‍රතීත්‍ය සමුත්පාදය වදළහ.)

මෙහි දැක් වූ ඒ ඒ දෙශනා අතුරින් "**අවිජ්ජාපච්චයා සංඛාරා**" යන මේ දෙශනාව මෙහි අවිද්‍යාවගේ වශයෙන් **ඒකඛම්මූලිකදෙශනාව** යයි දතයුතු.

---

*සං: නි: ආනාරවග්ග ‡සං: නි: දුකඛවග්ග

මෙහි මූල පටන් අගතෙක් ද, අග පටන් මූල තෙක් ද පැවති දෙශනය ද්වාදශාඞ්ගික ය. එහෙයින් නිසන්ධිවතුසඞ්ඛේපයෑ. මැද පටන් මූල තෙක් පැවති දෙශනය අෂ්ටාඞ්ගික ය, විසන්ධි නිසඞ්ඛේප යැ. මැද පටන් අග තෙක් පැවති දෙශනය ෂඩඞ්ගිකය. විසන්ධි නිසඞ්ඛේප යැ.

"සංයොජනියෙසු ඛෝ භික්ඛවෙ ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො තණ්හා පවඩ්ඪති තණ්හාපච්චයා උපාදානං"* යනාදීන් මධ්‍යයෙහි පටන් අගතෙක් පැවති දෙශනය පඤ්චාඞ්ගිකය. එකසන්ධි විසඞ්ඛේප යැ. මෙසේ මේ නෙ‍ෛයක් අඞ්ග වශයෙන් පටිච්චසමුප්පාද දෙශනය වේ.

"සුඛවෙදනියංභික්ඛවෙ එකඞ්ගං පච්චව උප්පජ්ජති සුඛා වෙදනා"*යි මෙහි එකාඞ්ගිකව ද වේ. (මේ ටීකාහි ආ විස්තරයෙකි.)

මේ දෙශනා භෙදයෙන් විනිශ්චය යි.

---

2. අර්ථ වශයෙන් = අවිද්‍යාදී පදයන්ගේ අර්ථ වශයෙන්.

ඒ මෙසේ යි :- (1) පුරන්නට (රැස්කරන්ට) නොනිසි බැවින් කායදුශ්චරිතාදිය අවින්දිය නම්. (නො ලැබිය යුතුය යන අර්ථ යි.) නො විඳිය යුතු ඒ කාය දුශ්චරිතාදිය විඳිනු යි අවිද්‍යා නම්.

(2) වින්ද යුතු කාය සුචරිතාදිය නො විඳිනු යි හෝ අවිද්‍යා නම්.

(3) සත්ත්වයන්ගේ රාශි බව ය. ආයතනයන්ගේ ආයතන බව ය. ධාතූන් ගේ ධ්‍රුව- සුඛ- සුභාදී ශූන්‍ය බව ය. ඉන්ද්‍රියයන් ගේ අධිපති බව ය, සත්‍යයන් ගේ තථ බව ය, යන අර්ථයන් නො දන දේ නුයි අවිද්‍යා නම (විදඤ්ඤණෙ යන ධාතු යි.)

(4) දුඃඛාදීන්ගේ පීඩනාදී චතුර්විධ අර්ථයන් නො දනදේනුගි අවිද්‍යා නම.

(5) අනාදියක් නැති සසර සියලු යොනි- ගති- භව- විඤ්ඤාණස්ථිති- සත්ත්වාවාසයන්හි සත්ත්වයන් දුවන්නු යි අවිද්‍යා නම- (ජවගතියං යන ධාතුයි.)

(6) පරමාර්ථවශයෙන් අවිද්‍යමානවූ ස්ත්‍රී- පුරුෂාදී සම්මුති ධර්මයන්හි දුවන්නුයි හෝ පරමාර්ථ වශයෙන් විද්‍යමාන වූ සත්කායාදීන්හි නො පවතීනු යි අවිද්‍යා නමු (මේ ව්‍යඤ්ජනාර්ථ වශයෙනි.)

---

*සං; නි; නිදානසංයුත්ත

සවභාවාදී වශයෙන් මෙසේ යි.-

(7) චක්ඛුර්විඤ්ඤාණාදීන් ගේ චක්ඛුඃප්‍රසාදාදී වස්තු හා රූපාදී ආලම්බන ද අවිද්‍යාදී පටිච්චසමුප්පාද ධර්ම හා සඞ්ඛාරාදී පටිච්ච සමුප්පන්නධර්මයන් ගේ ද ඒ ඒ සවභාවයන් මුවහ කරන බැවින් ද අවිජ්ජා නම්. යම් හෙතුවක් නිසා ඵලය වේ නම් ඒ ප්‍රත්‍යයයි. **පටිච්ච** යනු නොවෙන් ව නොහැර යන අර්ථ යි.

'එති' යනු උපදී ය යි ද, පවත්නී ය යි ද යන අර්ථයි.

තවද උපකාරක භාව ය ප්‍රත්‍යයාදී නම්. අවිද්‍යා ද, ප්‍රත්‍යය ද හේමනු යි අවිජ්ජා පටිච්ච නම. ඒ අවිද්‍යා ප්‍රත්‍යයෙන් (යනු අර්ථයි.)

සඞ්ඛාරා = තමාගේ ඵලයට සුදුසු සේ සකස් කෙරෙන්නු යි සංඝාරයෝ නම් වෙත්.

තවද :- අවිද්‍යා ප්‍රත්‍යයෙන් වූ සංඝාර ද, සංඝාර ශබ්දයෙන් ආ සංඝාරද යි සංඝාර විවිධ වෑ.

ඔවුනතුරෙන් **පුඤ්ඤාභිසංඛාර- අපුඤ්ඤාභිසංඛාර- ආනෙඤ්ජාභි සංඛාර** යන තිදෙන ද, **කායසංඛාර, වාක්-සංඛාර- චිත්තසංඛාර** යන තිදෙන ද යි මේ සය අවිද්‍යා ප්‍රත්‍යයෙන් වූ සංඝාර යි. ඒ සියල්ල ලෞකික කුසල්- අකුසල් චෙතනා මාත්‍රයෙක් මැ යි.

(**''සංඛාරො සංඛතෙ පුඤ්ඤ භිසඞ්ඛාරාදිභෙදපිච**
පඤ්ඤාභෙද කාය සංඛාරා'ද්‍යහි සංඛරණෙසුව'' යි)

සංඛත සංඛාරය, අභිසංඛත සංඛාරය, අභිසංඛරණක-සංඛාරය, පයොගාභිසංඛාරය යි මේ සතර සඞ්ඛාර ශබ්දගත සංඛාරයෝ යි.

විභාග :- **''අනිච්චා වත සංඛාරා''*** 'සියලු සංඝාරයෝ එකාන්තයෙන් අනිත්‍යයහ, යනාදීන් කියන ලද උත්පාදාදී **ලක්ෂණ** යුක්ත සියලු ධර්මයන් තම තමා අයත් ප්‍රත්‍යයෙන් වන හෙයින් **සඞ්ඛතසඞ්ඛාර** නම්.

කුශලාකුශල කර්මයෙන් නිපන් සියලු ත්‍රෛභූමක ධර්මයෝ **අභිසඞ්ඛතසඞ්ඛාර** නමැයි අර්ථකථාහි‡ කියන ලදහ. ඔහු ද **''අනිච්චාවත සංඛාරා''*** යනාදීන් කී සංඛාරයෙහිම ඇතුළති.

(වෙනම ඒවා ආ තැනක් පෙළෙහි නොපෙනේ.)

---

*සං: නි: බ්‍රහ්මසංයුත්ත ‡වි: අඨකථා

තෙභූමක කුශලාකුශල චෙතනාව වනාහි **අභිසංඛරණා සංඛාර** නම් එය **"අවිජ්ජා ගතියා භික්ඛවෙ පුරිස පුඤ්ඤභිසා පුඤ්ඤංචෙ සංඛාරං අභිසංඛරොති"*** අවිද්‍යාවෙන් මුළා වූ මේ පුරුෂ පුද්ගලයා (ඉදින්) පුණ්‍යාභිසංඛාරද රැස්කරයි. යනාදීන්හි ආ තැන් පැතෙයි.

කායික චෛතසික වීර්‍යය **ප්‍රයොගාභිසංඛාර** නම්.

එය **"යාවතිකා භික්ඛවෙ අභිසංඛාරස්ස ගති තාවතිකං ඤත්වා අක්ඛාහතං මඤ්ඤෙ අඤ්ඤ"**‡ 'ඒ කායප්‍රයොග වේග යාගේ ගමන යම් පමණ ද එපමණක් ගොස් අකුරෙහි පිහිටියාක් මෙන් සිටියේ ය, යනාදීන්හි ප්‍රයොගසංස්කාරය යැ. හුදෙක් මෙපමණක් ම නොවැ අන්‍ය වූ නොයෙක් සංස්කාරයෝද වෙති. **"සඤ්ඤාවෙදයිත නිරොධං සමාපජ්ජනස්ස ඛො ආවුසො විසාඛ! භික්ඛුනො වචීසංඛාරෙ පඨමංනිරුජ්ඣති. තතො කායසංඛාරෙ තතොචිත්තසංඛාරෙ"**? 'සඤ්ඤා – වෙදනා දෙදෙනා ගේ නිරොධයෙන් නිරොධසමාපත්තියට සමවදනා භික්ෂුවගේ (විතක්ක - විචාර) වචීසංඛාර පළමුවැ නිරුද්ධ වේ. ඉක්බිති කායසංඛාර (ආශ්වාස – ප්‍රශ්වාස) නිරුද්ධ වේ. ඉක්බිති චිත්තසංඛාර (සඤ්ඤා - වෙදනා) නිරුද්ධ වේ. මේ ආදී තන්හි සංඛාර ශබ්දයෙන් ආ සංඛාර අනෙකවිධ යැ, ඔවුනතුරින් සංඛත සංඛාරයෙහි ඇතුළත් නොවන සංඛාරයෙක් නැත්තේ ය.

විශෙෂ:- (වාක්හෙදකර ශබ්දය පිළියෙල කරන හෙයින් **චිතක්කී විචාරයෝ වචීසංඛාර** නම් වෙත්.

කරජ කායය වසින් සකස් කරන හෙයින් ආශ්වාස – ප්‍රශ්වාස **කායසඞ්ඛාර** යැ. සිත සකස් කරන සංඥා - වෙදනා දෙක **චිත්තසඞ්ඛාරයි.**

විතක්ක – විචාර දෙක හැර සෙසු **සම්පයුත්ත** චෛතසික **හෝ චිත්තසඞ්ඛාරයැ.**

ප්‍රථමධ්‍යානයෙන් නැඟී දවිතීය ධ්‍යානයට සමවදනා කල **විතක්කී – විචාර** නිරුද්ධ වේ.

ඉන්මතු චතුර්ථධ්‍යානයට සමවදනා කල ආශ්වාස – ප්‍රශ්වාස නිරුද්ධ වේ.

ඉන්මතු නිරොධයට සමවදනා කල චිත්තසඞ්ඛාර නිරුද්ධ වේ.

---

*සං: නි: රුක්ඛවග්ග ‡අ: නි: දුක්කනිපාත

?ම: නි: මූලපණ්ණාසක

"සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං" සඞ්ඛාර - පච්චය ශබ්දයන් පෙර කී සේයි.

(මින් මතු යට වර්ණනා නොකළ පද ම වර්ණනා කෙරේ.)

විඤ්ඤාණ = අරමුණු දැනගනීනුයි විඤ්ඤාණ ය.
නාම = අරමුණට අභිමුඛවැ නැමේනුයි නාමය.
රූප = ශීතොෂ්ණාදීන් පෙළේනුයි රූපය.
ආයතන = ආය ධර්මයන් පතුරුවන හෙයින් හෝ ආය කම්වූ සංසාර දුකට පමුණුවන හෙයින් හෝ ආයතනය.
ඵස්ස = ස්පර්ශ කෙරේනුයි ඵස්ස ය.
වේදනා = විඳිනුයි වේදනා ය.
තණ්හා = අරමුණෙහි ලැගේනුයි හෝ අරමුණ රැස්නේ හෝ තෘෂ්ණා ය.
උපාදාන = දැඩිවැ අල්ලා ගනීනුයි උපාදාන ය.
භව = විපාක භවය වේනුයි හෝ - කර්මභව - උපපත්තිභව- යන් වඩානුයි හෝ භවය.
ජාති = ඉපදීම ජාති ය.
ජරා = දිරීම ජරා ය.
මරණ = මේ චුතිය කරණ කොට සත්ත්ව ම්යෙන්නුයි මරණය.
සෝක = ශොචනය ශෝක ය.
පරිදේව = වැලපීම පරිදේව ය.
දුක්ඛ = ශරීරය පෙළානුයි දුඃඛය. (උත්පාද - ස්ථිති වශයෙන් දෙපරිද්දෙකින් කනීනුයි දුඃඛ ය.)
දෞමනස්ස = දූෂ්‍ය වූ සිත් ඇති බව දෞමනස්ස ය.
උපායාස = දැඩි චිත්ත පීඩාව උපායාස ය.

මෙසේ මේ අවිද්‍යාදි ප්‍රත්‍යයෙන් සියලු දුඃඛස්කන්ධයා ගේ භව ගැනීම වේ.

විශෙෂ :- "සම්භවනති" යන මේ පදය හුදෙක් ශෝකාදීන් කෙරෙන් පමණක් නොවැ සියලු සඞ්ඛාරාදි පදයන් කෙරෙහුදු යෙදිය යුතු.

නො එසේ වුව **'අවිජ්ජා පච්චයා සඞ්ඛාරා'** = අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයන හි කී කල කුමක් කෙරේද යි නො පැනේ. **සම්භවනති** = හටගනිත් යයි කී කල අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ හටගනිත්ය යි ප්‍රත්‍යය-ප්‍රත්‍යයසමුත්පන්න ව්‍යවස්ථාව කෙරේ. හැම තන්හිම මේ ක්‍රමය මැයි.

මේසේ අවිද්‍යාදි හෙතුවෙන් මේ හුදු දුඃඛ සමූහයාගේ සම්භවය වේ. ඊශ්වර නිර්මාණාදියෙන් නොවේ.

මේ අර්ථ වශයෙන් විනිශ්චය යි.

---

3 ලක්ෂණාදි වශයෙන් විනිශ්චය

අවිද්‍යාව - නො දැනීම ලක්ෂණ කොට ඇත්තේ යැ. සම්මුයුක්ත ධර්ම හෝ තත්සම්ප්‍රයුක්ත පුද්ගලයා මුළා කිරීම එහි කෘත්‍යය යැ. ආලම්බන සභාව මුවා කිරීම වැටහෙන ආකාරය කොට ඇත්තේ යැ. ආශ්‍රව ආසන්න කාරණ යි. **"ආසව සමුදය, අවිජ්ජා සමුදයෝ"*** යි වදළ හෙයිනි.

සංඛාර - සකස් කිරීම ලක්ෂණ කොට ඇත්තෝ සංඛාරයෝ යැ. රැස්කිරීම එහි කෘත්‍යය යැ. චේතනාව වැටහෙන ආකාරය යැ. අවිද්‍යාව ආසන්න කාරණ යි.

විඤ්ඤාණ - අරමුණු දැනීම විඤ්ඤාණයේ ලක්ෂණය යැ කාම රූපයනට පුරෝගාමී වීම එහි කෘත්‍යය යැ. පූර්ව භවය හා ගැළපීම වැටහෙන ආකාරය යැ. සංඛාර ආසන්න කාරණය යැ. වස්තු-ආලම්බන හෝ ආසන්න කාරණයි.

නාම - අරමුණට නැමෙන ලක්ෂණ ඇත්තේ නාමය යැ සිත හා සමග ද, ඔවුනොවුන් හා සමග ද, සම්ප්‍රයෝග කෘත්‍යය ඇත්තේ යැ. වෙන්වැ නො පැවැත්ම වැටහෙන ආකාරය යැ. විඤ්ඤාණය ආසන්න කාරණයි.

රූප - කුප්පනය (කිපීම) ලක්ෂණ කොට ඇත්තේ රූපය යැ. ඒ විසිරීම කෘත්‍යය කොට ඇත්තේ යැ. අව්‍යාකෘත භාවය වැටහෙන ආකාරය යැ. විඤ්ඤාණය ආසන්න කාරණයි.

සළායතන - ගැළපීම හෝ පැහිරීම ලක්ෂණ කොට ඇත්තේ ය. (ෂඩායතනයට) දර්ශනාදීන්ට කරුණු වීම එහි කෘත්‍යය යැ. යථායෝගයෙන් පඤ්චවිඤ්ඤාණධාතූන්ට වස්තු-වාර භාවයෙන් වැටෙන්නේ යැ. නාම-රූප ආසන්න කාරණයි.

ඵස්ස - අරමුණු සපර්‍ශී කිරීම ඵස්සයේ ලක්ෂණය යැ. ආලම්බන හා ගැටීම කෘත්‍යය යැ. වස්තු - ආලම්බන - විඤ්ඤාණ සංගමය වැටහෙන ආකාරය යැ. ෂඩායතන ආසන්න කාරණ යි.

වෙදනා - ආලම්බන රසානුභවන ලක්ෂණය ඇත්තී වේදනාව යැ. රූපාදි විෂය රස අනුභවය කෘත්‍යය යැ. සුව - දුක් වැටහෙන ආකාරය යැ. සපර්‍ශය ආසන්න කාරණ යි.

---

*මි: නි: මූලපණ්ණාසක

තණ්හා - භව දුඃඛ හෙතු භාවය **ලක්ඛණ** කොට ඇත්තී තෘෂ්ණාව යැ, ඒ ඒ ආලම්බන - භූමි - භවාදීන්හි ඇලීම කෘත්‍යය යැ. තෘප්තියකට නො පැමිණීම වැටහෙන ආකාරය යැ. වෙදනාව ආසන්න කාරණ යි.

උපාදාන - අරමුණ දැඩිවැ ගන්නා ලක්ෂණය ඇත්තේ උපාදානය යැ. තෘෂ්ණා - දෘෂ්ටි - අභිනිවේශ වශයෙන් නො-හැරීම එහි කෘත්‍ය යැ. කාමුපාදානය තෘෂ්ණා-දුඃඛභාවයෙන් හා ෂෙසු උපාදාන දෘෂ්ටි දුඃඛභාවයෙන් වැටහෙන ආකාර ඇත්තේ යැ. තෘෂ්ණාව ආසන්න කාරණ කොට ඇත්තේ යි.

භව - කම්-කම්ඵල **ලක්ඛණ** කොට ඇත්තේ භවය යැ. භව ගැන්වීම හා භවගැනීම එහි කෘත්‍යය යැ. කුශල-අකුශල-අව්‍යාකෘත වැටහෙන ආකාරය යැ. උපාදානය ආසන්න කාරණයි.

(ජාති ආදීන් ගේ ලක්ෂණාදිය යට **සත්‍ය නිද්දේශයේ** කී සෙයින් දත යුතුයි.)

මේ ලක්ෂණාදි විනිශ්චය යි.

---

4 එකවීධාදි වශයෙන්

අවිද්‍යාව - ආලම්බන සවභාවය හෝ ධර්ම සවභාවය නො දැනීම ය, නො දැකීම ය, එහි මුළාවීම ය, යනාදි සවභාව වශයෙන් **එකවීධ** යැ. (දුඃඛාදිය නො දැනීම් වශයෙන් හෝ දෘෂ්ටි විප්‍රයුක්ත වශයෙන් හෝ) **අප්‍රතිපත්තනිය** (අශුභාදියෙහි ශුභාදි වශයෙන් හෝ දෘෂ්ටි සම්ප්‍රයුක්ත වශයෙන් හෝ **මිථ්‍යාප්‍රතිපත්තනිය** යන මොවුන් ගේ වශයෙන් **ත්‍රිවිධ** යැ.

(සන්තයෙහි - අනුශයාවසථා මොහ සෙයින් අප්‍රතිපත්තනිය පඤ්චසථාන - දුශ්චරිතාවසථා මොහ වශයෙන් මිථ්‍යා ප්‍රතිපත්තියයි කිහු) එසේම **සසඞ්ඛාර - අසඞ්ඛාර** විභාගසම්ප්‍රයුක්ත මොහ වශයෙන් ද ද්විවිධ යැ.

සොමනස්ස - දෞමනස්ස - උපෙක්ඛා වෙදනා යොගයෙන් **ත්‍රිවිධ** යැ. **චතුස්සත්‍යඥාන** ගේ අප්‍රතිවෙධයෙන් **චතුර්විධ** යැ.

ඉති පඤ්චකයෙහි ආදීනව මුවහ කිරීම් වශයෙන් **පඤ්ච-විධ** යැ. **ෂඩ්මාරයෙහි** හා ෂඩාලම්බනයෙහි පැවැතීම් වශයෙන් **ෂඩ්විධයි**.

විශෙෂ :- මේ ෂඩ්විධත්වය ප්‍රතීත්‍ය සමුත්පාදයේ කියන ලද සියලු අරූප ධර්මයන්හි ලැබේ.

(2) **සඛ්ඛාර - සාසව - විපාක ධම්ම** ධම්මාදී බැවින් සංඝකාර **එකවිධ යැ.** (ආදි ශබ්දයෙන් නෙවසෙඛනාසෙඛ - සංයොජනියාදිය ද සංග්‍රහ වේ.) **කුසල - අකුසල** වශයෙන් **ද්විවිධ යැ.** එසේම **පරිත්ත - මහග්ගත; හීන - මධ්‍යම; මිච්ඡත්ත - සම්මත්ත; නියත - අනියත;** වශයෙන් ද ද්විවිධ වේ.

පුඤ්ඤාභිසංඛාර - අපුඤ්ඤාභිසංඛාර - අනෙඤ්ජාභිසංඛාර වශයෙන් **ත්‍රිවිධ යැ.**

චතුයෝනියෙහි ඇතුළත් සත්ත්වයන් උපදවන බැවින් **චතුර්විධ යැ. පඤ්චගතියට** පමුණුවන හෙයින් **පඤ්චවිධයි.**

(3) **විඤ්ඤාණ** - ලෞකික විපාකාදි භාවයෙන් **එකවිධ** යැ. (ආදි ශබ්දයෙන් අව්‍යාකෘත, සප්‍රත්‍යය සංස්කෘතාදි භාවයද ගැනේ.)

සහෙතුක - අහෙතුකාදි භාවයෙන් **ද්විවිධයැ.** (ආදි ශබ්දයෙන් සංස්කාර අසංස්කාරාදි භෙදය ගැනේ.)

භවත්‍රයෙහි ඇතුළත් වීම් වශයෙන් ද, **ත්‍රිවිධ වෙදනා** සම්ප්‍රයොගයෙන් ද, අහෙතුක - ද්විහෙතුක - ත්‍රිහෙතුක වශයෙන් ද **ත්‍රිවිධ** වේ.

චතුයෝනියෙහි පැවැතීම් වශයෙන් **චතුර්විධ යැ.**
පඤ්චගතියෙහි පැවැතීම් වශයෙන් **පඤ්චවිධයි**

(4) **නාම-රූප** - විඤ්ඤාණ නිශ්‍රය සහිත බැවින් ද, **සාමී** ප්‍රත්‍යය බැවින් ද **එකවිධ යැ.**

අරමුණු ගැනීම් නොගැනීම් වශයෙන් **ද්විවිධ යැ.**
අතීත - අනාගත - ප්‍රත්‍යුත්පන්න වශයෙන් **ත්‍රිවිධ යැ.**
චතුයෝනි වශයෙන් **චතුර්විධ යැ.**
පඤ්චගති වශයෙන් **පඤ්චවිධයි.**

(5) **ෂඩායතන** - විඤ්ඤනයා ගේ හා විඤ්ඤනසම්ප්‍රයුක්ත ධර්මයන් ගේ උත්පත්ති හා ප්‍රවෘත්ති ස්ථාන වශයෙන් **එකවිධ යැ.**

සතර මහා භූත ප්‍රසන්න භාවය, විඤ්ඤාදිභාවය වශයෙන් **ද්විවිධ යැ.**

(මෙහි ආදි ශබ්දයෙන් බාහිරායතන ද සංග්‍රහ වේ.)
සම්ප්‍රයුක්ත - අසම්ප්‍රයුක්ත - උභය විමුක්ත වශයෙන් **ත්‍රිවිධ යැ**
යෝනි වශයෙන් **චතුර්විධ යැ.**
ගති වශයෙන් **පඤ්චවිධයි.**

ඵස්සාදිය ද මේ **තයින්ම** එකවිධාදි වශයෙන් දතයුතු.

(6) **ඵස්සය** - ඵුසන භාවයෙන් හා ලෞකික සාසවාදි භාවයෙන් **එකවිධ යැ.**

පටිඝ සම්ඵස්ස - අධිවචන සම්ඵස්ස හෙදයෙන් ද, සහෙතුකාදි හෙදයෙන් ද **දුවිධ යැ.**

භවත්‍රය පර්‍යාපන්න හෙයින් ද, වෙදනාත්‍රය සම්ප්‍රයෝග හෙයින් ද, වෙදනාත්‍රය ප්‍රත්‍යය හෙයින් ද, අහෙතුක- විහෙතුක- ත්‍රිහෙතුක- හෙයින් ද **ත්‍රිවිධ යැ.**

යොනි වශයෙන් **චතුර්විධ යැ.**
ගති වශයෙන් **පඤ්චවිධයි.**

(7) **වෙදනාව** - අනුභවන ලක්ෂණයෙන් ද, ලෞකික හෙයින් ද, සාසවාදී බැවින් ද **එකවිධ යැ.**

පඤ්චද්වාරික - මනොද්වාරික හෙදයෙන් **දුවිධ යැ.**

සුඛාදි හෙතුයෙන් **ත්‍රිවිධ යැ. චතුර්විධ - පඤ්චවිධ** හෙද පෙරසේ මැයි.

ඡඩාලම්බන හෙදයෙන් **ඡඩ්විධ යි.**

(8) **තෘෂ්ණාව** - ලොක සමුදය භාවයෙන් **එකවිධ යැ.**
දිට්ඨි සම්පයුත්ත - විප්පයුත්ත හෙදයෙන් **දුවිධ යැ.**
කාම - භව - විභව තෘෂ්ණා වශයෙන් **ත්‍රිවිධ යැ.**
චතුර්ගී ප්‍රභෙද හෙයින් **චතුර්විධ යැ.**
රූපාභිනන්දනාදි භාවයෙන් **පඤ්චවිධ යැ.**
ඡඩ් තෘෂ්ණා කායයන් ගේ වශයෙන් **ඡඩ්විධ යි.**

(9) **උපාදාන** - දෘඪග්‍රාහ වශයෙන් **එකවිධ යැ.**
තෘෂ්ණා දෘෂ්ටි හෙදයෙන් **දුවිධ යැ.**
භවත්‍රයට උපනිශ්‍රය භාවයෙන් **ත්‍රිවිධ යැ.**
කාමූපාදානාදි හෙදයෙන් **චතුර්විධ යැ.**
පඤ්චගති සංචිත්‍රනයෙන් **පඤ්චවිධ වේ.**

(10) **භවය** - ලෞකික සාශ්‍රවාදි භාවයෙන් **එකවිධ යැ.**
කම්හව - උත්පත්තිභව හෙදයෙන් **දුවි විධ යැ.**
කාම - රූප - අරූප භව හෙදයෙන් **ත්‍රිවිධයැ.**
සතර උපාදානයනට ප්‍රත්‍යය හෙදයෙන් **චතුර්විධ යැ.**
පඤ්චගති සංචිත්‍රන හෙදයෙන් **පඤ්චවිධ යැ.**
කාම - කම්හවාදි හෙදයෙන් **ඡඩ්විධ යැ.**
සප්ත විඤ්ඤාණස්ථිති සංග්‍රහයෙන් **සප්තවිධ යැ.**

චතුරූපාදානකම්ම ප්‍රත්‍යය කම්ම භවාදී භෙදයෙන් **අෂ්ටවිධ යැ.**
කාම භවාදී භෙදයෙන් **නවවිධයි.**

(11) **ජාතිය** ඒ ඒ භවයෙහි ප්‍රථමාභිනිර්වෘත්තී බැවින් **එකවිධ යැ.**
රූප – සංඛාරකඛන්ධ සංග්‍රහයෙන් **ද්විවිධ යැ.**
භවත්‍රය පර්‍යාපන්න භෙයින් **ත්‍රිවිධ ශැ.**
යෝනි වශයෙන් **චතුර්විධ යැ.**
ගති වශයෙන් **පඤ්චවිධ යි.**

(12) මේ තයින්ම **ජරාමරණාදීන්ගේ** ද **එකවිධාදිභාවය** දතයුතු.

ඒ අඞ්ග ව්‍යවස්ථාන වශයෙන්:-

මේ ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි **"අඞ්ග දෙලසෙකැයි"** කී හෙයින් ශොකාදිය මෙන්වැ නතහොත් අඞ්ගාධිකවන හෙයින් ඒ ශොකාදීය අඞ්ගභාවයෙන් නො කියන ලදී. එමහත් එය භව-චක්‍රයා ගේ අවිච්ඡේද ප්‍රවෘත්තිය සඳහා කියන ලදී.

ඒ එසේ මැ යි:- ජරා මරණයෙන් පහරන ලද බාලයාට ම ඒ ශොකාදිය උපදී. **"අස්සුතවා භික්ඛවෙ පුථුජ්ජනො කායිකාය දුක්ඛාය වෙදනාය පුට්ඨො සමානො සොචති. කිලමති. පරිදෙවති. උරත්තාලිං කන්දති. සම්මොහං ආපජ්ජතීති*"** මහණෙනි, ආගම අධිගම නො දන්නා පෘථග්ජනයා කායික වූ දුඃඛ වෙදනාවෙන් ස්පර්‍ශ වූයේ සොවී, වෙහෙසේ, හඬයි, ලෙහි අත්සපා හඬයි, මුළාවට පැමිණේ" ඔවුන් ගේ යම්තාක් පැවැත්ම වේ නම් ඒතාක් අවිඤ්ඤාණ වේ. නැවත ද අවිද්‍යාවෙන් සංස්කාර වේය යි මෙසේ භවචක්‍රයා ගේ සම්බන්ධය වේ. එහෙයින් ඒ ශොකාදීන් ජරා මරණයන් හා එක්රාශිකොට පටිච්ච සමුප්පාද අඞ්ග දෙලසෙක්ම ස යි දතයුතු.

(**විශෙෂ**:- ජරාමරණයෙන් ම ශොකාදිය එකසංක්ෂෙප කළ හෙයින් ශොකාදීන්ට ද ජාති ප්‍රත්‍යය භාවය යෙදේ. (එහෙත් ශොකාදියට ජරා-මරණ ප්‍රත්‍යය භාවයෙන් ගැනේ නම් **අවිද්‍යාව** හා **එකසංක්ෂෙප** කවයුතු වේ. ද්වාදශාඞ්ග වීම් සඳහා යැ.)

ජාති ප්‍රත්‍යයෙන් ජරා මරණ හා ශොකාදිය ද වේ, යන මෙහි ජරා මරණ ශොකාදීන් අතුරෙන් **ජරාමරණ** ඒකාන්තික අඞ්ග භාවයෙන් ගන්නා ලදී.

එතෙකුදු වුවත් ශොකාදිය රූපභවාදියෙහි නැත්තුයි අනෙකාන්තික යැ. හුදෙක් ප්‍රකට ඵල වශයෙන් **අවිද්‍යාව** ගෙනහැර

---

*සං: නි: වෙදනාසංයුත්ත. සගාථකවග්ග

පැම පිණිස ගන්නා ලදී. එයින් අනාගතයෙහි ජාතිය ඇති කල්හි මතුයෙහි ප්‍රතිසන්ධියට හෙතු වූ අවිද්‍යාව දක්වන ලදනුයි **භවචක්‍රය** ගේ අවිච්ඡේද ප්‍රවෘත්තිය දැක්වීණැයි දතයුතු.

(තවද මහායෙහි:- ජරා-මරණ ද ශොකාදියට ප්‍රත්‍යය නො වූයේ නම් අඛණ්ඩ දෙළුස නො පිරෙන හෙයින් ජරා-මරණ ද **ශොකාදියට** ප්‍රත්‍යය වේ.

එසේ වත්නා "ජරා මරණ පච්චයා සොකාදයෝ සම්භවන්ති" යි නො වදාරා **"ජාති පච්චයා ජරා-මරණං ශොකාදයෝ ච සම්භවන්ති"*** යි වදාළේ කවර හෙයින් ද?

අන්‍ය බූ ද හේතූන් ගෙන් ශොකාදිය උපදනා හෙයින් හුදෙක් ජාති ප්‍රත්‍යය භාවයම් වදාළහ.) මේ මෙහි සංක්ෂෙප කථාව යැ.

මේ අඛණ්ඩ ව්‍යවස්ථා වශයෙන් විනිශ්චය යි.

මේ විභාග ක්‍රමය යැ.

(1) **අවිද්‍යාව** = සූත්‍රානුක්‍රම ක්‍රමයෙන් දුඃඛාදි සතර තන්හි නො දැනීම ය. **"කතමා ච භික්ඛවෙ අවිජ්ජා දුක්ඛෙ අඤ්ඤාණං‡"** යනාදීන් එය වදාළහ.

අභිධර්ම පර්‍යායයෙන් වනාහි **දුඃඛාදි** සතර තන්හි හා **පුබ්බන්තාදි** සතර තන්හි ද යි අට තන්හි නො දැනීම අවිද්‍යායැ යි වදාළහ. **"තත්‍ථ කතමා අවිජ්ජා දුක්ඛෙ අඤ්ඤාණං - පෙ - දුක්ඛනිරොධ ගාමිනියා පටිපදාය අඤ්ඤාණං, පුබ්බන්තෙ අඤ්ඤාණං, අපරන්තෙ - පුබ්බන්තාපරන්තෙ - ඉදප්පච්චයතා පටිච්ච සමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං?"** යි සූත්‍රානුක්‍රම ක්‍රමයෙන් සතර තැනෙක කී අවිද්‍යාව කෘත්‍ය වශයෙන් ද, ජාති වශයෙන් ද අට තැනෙක වදාළහ.

ඒ පාඨයෙහි **නිරොධ - මාර්ග** යන ලොකොත්තර සත්‍ය ද්වයය තබා **දුක්ඛය - සමුදයය** පුබ්බන්තාදිය යි යන සෙසු තන්හි ආලම්බන කිරීම වශයෙන් ද අවිද්‍යාව උපදී. මෙසේ ඇති කල්හිදු ආලම්බන ස්වභාවය මුවහ කිරීම් වශයෙන් අවිද්‍යාව මෙහි අදහස් කරන ලදී.

ඒ එසේ මැ යි:- අඛණ්ඩ හෙතොත්පන්න වූ ඒ **අවිද්‍යාව** දුක්ඛ සත්‍යය මුවහ කොට සිටී. දුඃඛයා ගේ පීළනාදි යථා ස්වභාවාර්ථය (ප්‍රත්‍යක්ෂයේ) ප්‍රතිවෙධ කිරීමට නො දේ.

---

*ම: ව: අභිසමෙඛාති කථා. ‡ සං: නි: නිදානවග්ග

ථේ: පා: අභිධම්මභාජනීය

එසේම සමුදය සත්‍යය, නිරොධ සත්‍යය, මාගී සත්‍යය, පූර්‍වාන්ත සංඛ්‍යාත අතීත සකඞ්ඛ පඤ්චකය, අපරාන්ත සංඛ්‍යාත අනාගත සකඞ්ඛ පඤ්චකය, පූර්‍වාන්තාපරාන්ත සංඛ්‍යාත අතීත අනාගත සකඞ්ඛ පඤ්චකය, නොහොත් පූර්‍වාන්ත අපරාන්තයන් ගේ අන්ත සංඛ්‍යාත වර්‍තමාන සකඞ්ඛ පඤ්චකය ද, ඉදප්පච්චයතා සංඛ්‍යාත ප්‍රත්‍යය ධර්‍ම හා ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්‍ම ද මුවහ කොට සිටී. (ප්‍රත්‍යක්ෂ කිරීමට නො දේ)

මේ **අවිද්‍යාව යැ.** මේ **සංඛාර** යැ යි **ප්‍රත්‍යක්ෂ** කොට යාථාවසරස **ලක්ෂණයෙන්** (ලක්ෂණ කෘත්‍ය වශයෙන්) ප්‍රතිවෙධ කිරීමට නොදේ.

(අවිද්‍යාව දුකඛාදීන් ආලම්බන කිරීම් වශයෙන් පවතී. යම් සේ නිරොධ මාගීයන් ආලම්බන කිරීමට **අසමර්‍ථ** වැ ඔවුන් දක්නා කැමැත්තවුන්ට තත් ප්‍රතිච්ඡාදක වශයෙන් අනිරොධ මාගීයෙහි නිරොධ-මාගී ග්‍රහණ කරණ වශයෙන් පවත්නී මාගී **නිරොධයන්** යාථාවසරස වශයෙන් ප්‍රතිවෙධ කරනට නො දෙද්ද, **එසේම** දුඃඛාදියෙහිදු තත් සභාවච්ඡාදන වශයෙන් පවත්නීය සි ද දන යුතුයි, යනු සත්‍යයි)

(2) **සඞ්ඛාරාඃ**- පුණ්‍යාභිසංස්කාරාදි තුනය. කායසංස්කාරාදි තුන දැ සි මෙසේ පෙර සංක්ෂේපයෙන් කී සය සංස්කාර යැ.

විස්තර:- මෙහි **පුණ්‍යාභි සංඛාරය** දන - සීල - භාවනාදි දශ **පුණ්‍ය** ක්‍රියා වස්තු වශයෙන් පැවැති කාමාවචර කුසල චෙතනා අවය භාවනා වශයෙන්ම පැවැති රූපාවචර කුසල චෙතනා පස දැ සි තෙළෙස් චෙතනාවෝ සි.

ප්‍රාණඝාතාදි දශ අකුශල වස්තු වශයෙන් පැවැති දෙළොස් අකුසල් චෙතනාවෝ **අපුණ්‍යාභිසංඛාර** නම්.

ආනෙඤ්ජාභිසංඛාර නම් **එසේම** භාවනා වශයෙන්ම පැවැති සතර අරූපාවචර කුසල චෙතනාවෝ සි. මේ ත්‍රිවිධ සංස්කාරයෝ එකුන්තිස් චෙතනාවෝ සි.

විශෙෂ:- (පුඤ්ඤාභිසඞ්ඛාර) සවිඝාතාත්මක අපුණ්‍ය ඵලයෙන් හා දුඃඛ සංක්ලේශයන්ගෙන් **පවිත්‍ර** කරන හෙයින් පුණ්‍ය නම්.

තව ද ඒ (පුණ්‍යය) කරන්නහු ගේ අධ්‍යාශය සම්පූර්‍ණ කිරීම් **අර්‍ථයෙන්** හෝ පූජ්‍යත්වය නිපදවානුයි හෝ **පුණ්‍ය** නම්. ඒ **පුණ්‍යයම්** තාම ගේ ඵලය (සතර **නාමස්කන්ධ** හා **කර්‍මජ** රූප **සකස් කෙරේනුයි පුණ්‍යාභිසංඛාර යැ.**

එයට ප්‍රතිපක්ෂ වූයේ අපුඤ්ඤාභිසංඛාර නම්.

සමාධි **ප්‍රතිපක්ෂ** වූ පඤ්චනීවරණයන් ඉතා දුර බැවින් නො සැලෙන හෙයින් **අනිඤ්ජන** නම. ඒ අනිඤ්ජන භාවය සකස් කෙරේනුයි **ආනෙඤ්ජාභිසංඛාර** නාම් වේ.

සෙසු **කාය** සඞ්ඛාරාදි තුනෙහි - කායද්වාරයෙහි පැවැති චෙතනාව **කායසංඛාර** යැ.

වචීසඞ්ඛාර - චිත්තසඞ්ඛාර ද මෙසේ මැ සි.

මේ ත්‍රිකය කම් රැස් කරන්නාවූ කෙණෙහි පුණ්‍යානිසංස්කාරාදීන්ගේ ද්වාර වශයෙන් හට ගැනීම දක්වනු සඳහා වදාරන ලදී.

විභංග:- කාය විඤ්ඤත්තිය උපදවා කායද්වාරයෙහි පැවැති කාමාවචර කුසල චෙතනා අට ය, අකුසල චෙතනා දෙළස දැ සි සම වීසති චෙතනාවෝ **කායසඞ්ඛාර** නමු.

ඒ චෙතනාවෝ ම වාක් විඤ්ඤත්තිය උපදවා වාක්ද්වාරයෙහි පැවැත්තාහු **වචීසඞ්ඛාර** නමු.

විශෙෂ:- අභිඤ්ඤ චෙතනාව මත්තෙහි විපාක විඤ්ඤාණයට ප්‍රත්‍යය නො වන හෙයින් - මේ කායසඞ්ඛාර - වචීසඞ්ඛාර විෂයෙහි පුරාණ අටුවාචාරීන් නො ගත්තා ලදී. (එහෙත් ඒ අභිඤ්ඤ චෙතනාව ද කුශල ධර්මයට හා විපාක ධර්මයට ඇතුළත් වේ.)

ඒ වූ කලී නො සිදින ලද අවිද්‍යා - තෘෂ්ණා ඇති සන්තානයෙහි ව්‍යාපාර සහිත වැ හටගත් හෙයින් අභිඤ්ඤ චෙතනාව ගේ කුසල බව හා විපාක දෙන සභාවය ඇති බව කියන ලදී. විපාක උපදවන බැවින් නො වේ. විපාක උපදවන්නේ නම් රූපාවචර විපාක ම ඉපදවිය යුතු. අන්‍ය භූමියෙකැ කර්මයක් අන්‍ය භූමියෙකැ විපාක නො උපදවන හෙයිනි. ධර්මසඞ්ගණී චිත්තුප්පාදකාණ්ඩයෙහි රූපාවචර විපාකය කර්ම සදෘශාලම්බනයම ගන්නේය සි කියන ලදී. රූපාවචර විපාකය කාමාවචර අරමුණක් නොගන්නේ සි. අභිඤ්ඤ චෙතනාව කාමාවචරාදි අරමුණු ගන්නේම වේ. එසේ හෙයින් විපාක නො දෙන්නේ සි.

කසිණයෙහි උපදවන ලද චතුර්ථධ්‍යාන සමාපත්තියේ ආනිසංසය මේ අභිඤ්ඤව යැ.

එහින් වදාළෙ. **"සො එවං සමාහිතෙ චිත්තෙ*"** යනාදිය මෙසේ සමාධි ඵලය වූ අභිඤ්ඤ චෙතනාව ඵලයක් (විපාකයක්)

---

* ම: නි: මූලපණ්ණාසක

නො දේ. **අභිඤ්ඤා චෙතනාව** (විපාක) විඤ්ඤාණයට ප්‍රත්‍යය නො වන්නා සේ **උදාසීන චෙතනාව** ද විපාක විඤ්ඤාණයට ප්‍රත්‍යය නො වේ. එහෙත් අවිද්‍යා ප්‍රත්‍යයෙන් වන හෙයින් සම විසි චෙතනාවෝ යි කියන ලදී.

කාය විඥප්ති – වාක් විඥප්ති නුපදවා මනොද්වාරයෙහි උපන් එකුන්තිස් චෙතනාවෝ ම **චේතනාසඞ්ඛාර** නමි.

මෙසේ මේ **කාය – වචී – චේතනා සඞ්ඛාර** යන ත්‍රිකය ද, පුඤ්ඤාභි-සඞ්ඛාරාදි ත්‍රිකයෙහි ම ඇතුළත් වේ යයි අර්ථ වශයෙන් ම පුණ්‍යාභිසංඛාරාදියට අවිද්‍යාව ප්‍රත්‍යය වන බව දත යුතු.

විඤ්ඤාණ:- අෂ්ටකාමාවචර කුශල චෙතනා කාය දුශ්චරිතයෙන් වළකින්නහුට **කායසඞ්ඛාර** වේ. වාක් දුශ්චරිතයෙන් වළකින්-නහුට **වචීසඞ්ඛාර** වේ. මනොද්වාරයෙහි උපදනා ඒ අට හා රූපාවචර ධ්‍යාන පස ද යි යන තෙලෙස් චෙතනා **චේතනාසංඛාර** වේ. මේ සියල්ල **පුඤ්ඤාභිසංඛාර ද, චේතනාසංඛාර ද** වේ.

ද්වාදස අකුසල චෙතනාවෝ **කායද්වාරයෙහි** පැවැත්තාහු **කායසංඛාර යැ.** වචීද්වාරයෙහි පැවැත්තාහු **වචීසංඛාර යැ.** මනොද්වාරයෙහි පැවැත්තාහු **චේතනාසංඛාර යි.**

ආනෙඤ්ජාභිසංඛාර චේතනාසංඛාර මැ යි.

මෙසේ විතීය ත්‍රිකය පූර්ව ත්‍රිකයෙහි ද ඇතුළත් වේ.

ප්‍රශ්නය කි – මේ ධර්ම අවිද්‍යා ප්‍රත්‍යයෙන් වේ යයි කෙසේ දත හැකි ද?

පිළිතුර:- අවිද්‍යාව ඇති කල්හි ම සංස්කාර වන හෙයිනි.

(ඒ එසේ මැ යි:- අවිද්‍යාව නැති කල්හි සංස්කාර නො වේ.)

විඤ්ඤාණ:- යම්කු ගේ දුඃඛාදියෙහි අවිද්‍යා සඞ්ඛ්‍යාත නො දැනීම පහ නො වූයේ ද, දුක්ඛාදියෙහි ද, පුබ්බන්තාදියෙහි ද අඥාන බැවින් සංසාර දුඃඛය සුඛ සංඥාවෙන් ගෙන එයට ම හෙතු වූ ත්‍රිවිධ වූ ම සංස්කාරයන් උපදවයි.

සමුදය නො දැනීමෙන් ද දුක්ඛයට හෙතු වූ තෘෂ්ණාව පිරිවර කොට ඇති, සුඛය, (සුභය යන්නාදීන්) සඤ්ඤා කරන ලද සංස්කාරයන් සැප හෙතු ය යි හඟනේ උපදවයි.

නිරොධ සත්‍යයෙහි හා මාගී සත්‍යයෙහි නො දැනීම හෙතු කොට ගෙන දුඃඛ නිරොධය නො වූ බ්‍රහ්ම ලොකාදි ගති විෂයෙහි දුඃඛ නිරොධය වන්නේ ය යි සංඥයෙන් දුඃඛ නිරොධයට මාගී නො වූ අනේක පසු බඹුන හිංසා ඇති **වාජපෙයාදි යාග ද,** අමරත්වය පිණිස **පඤ්චතාපනාදි** දුෂ්කර ක්‍රියා ද, දුඃඛ නිරොධයට හෙතු ය යි ගෙන ත්‍රිවිධ වූ ම සංස්කාර උපදව යි.

තව ද හේ අතීත් මාගී ඥානයෙන් (චතුස්සත්‍යය අවබොධ කිරීමෙන්) අවිද්‍යාව ප්‍රහීණ නො කළ හෙයින් විශෙෂයෙන් ජාති-ජරා - රොග - මරණාදී අනෙක ආදීනවයෙන් මිශ්‍ර වූ කුසල ඵල සඞ්ඛ්‍යාත දුඃඛය දුකයැ යි නො දැන එයට පැමිණීම පිණිස **කාය - වාක් - චිත්ත සංස්කාර** ප්‍රභෙද ඇති පුණ්‍යාභිසංස්කාර රැස් කරයි. දිව්‍යාපසරා කැමැත්තෙන් මරු ප්‍රපාතයකට පැනීම මෙනි. (අප්සරාවන් ලැබීමට කාරණ නො වූ පළඟතයෙන් හිම කරන්නා සේ සංස්කාර දුඃඛ වූ බැවින් සුවයට කාරණ නො වූ පින් කෙරේ. ජාත්‍යාදි ප්‍රපාත දුඃඛ ජනක හෙයින් පුණ්‍යාභිසංස්කාර මරු ප්‍රපාත සදෘශත්වය කියන ලදී)

සැපය යි සම්මත ඒ කුසල ලවයා ගේ අන්තයෙහි (චුතියෙහි) බලවත් පීඩා උපදවන විපරිණාම දුඃඛ බව ද, සවලප වූ ආස්වාද බව ද නො දන්නේ පලඟැටියා පහන් සිළුවෙහි හිම මෙන් ද මී පැණියෙහි ගිජු වූවකු මී වැකුණු කඩු මුවහත ලෙවීම මෙන් ද විපරිණාම දුඃඛ සවභාවය කොට ඇති පුණ්‍යාභිසංස්කාරය රැස් කෙරේ.

(**විශෙෂ:-** දිව්‍යාප්සරා කැමැත්තෙන් **පළඟ මුදුනෙන් පැනීම** කාමාවචර කුසලයන් හා ද, පලඟැටියා පහන් සිළුවට පැනීම හා මී පැණි වැකුණු **කඩු මුවහත ලෙවීම** රූපාවචර කුසලයන් හා ද ගළපා අර්ථ ගත යුතු.)

අනිෂ්ට විපාක ඇති පස්කම් සෙවීම් ආදියෙහි ආදීනව නො දැන සැපය යි වරදවා ගැනීමෙන් හා කෙලෙසුන් ගෙන් මැඩීමෙන් ළදරුවා ගුථ ක්‍රීඩා කරන්නා සේ ද, කිපි විෂ කැමෙහි ආදීනව නො සලකා මියනු කැමතිවැ විෂ කන්නාක් මෙන් ද, කාමාතුර බැවින් හා වෙෂාතුර බැවින් පාණාතිපාතාදියෙහි ආදීනව නො සලකා දෙළොස් අකුසල සඞ්ඛ්‍යාත **අපුණ්‍යාභි සංස්කාර** රැස් කෙරේ.

(**සංඝාතනය**:- ලොභමූලික අකුසලයනට **ගුප්තිලනය ද,** දෙෂ මූලික අකුසලයනට **ඒෂ බාධනය ද,** උපමාන වශයෙන් ගතයුතු.)

සංඝකාර දුඃඛ - විපරිණාම දුඃඛ සවභාවය **නිසිසේ** අවබොධ නො කිරීමෙන් සතර අරූපාවචර කුසල සංඛ්‍යාත **ආනෙඤ්ජාභි-සංඝකාරය ද** උපදවයි.

මංමුළා වූවකු පිෂාව නගරයකට අභිමුඛ මාර්ගයෙහි යන්නාක් මෙනි. (යක්ෂයන් මැවූ පුරයෙහි කාම ගුණ සමෘද්ධියෙන් සුඛය යන විපර්‍යාසයට හෙතුභාවය මෙන් උත්පාද - ව්‍යය **අති** දීඝ්‍ර සන්තාන බැවින් නො පෙනෙන්නා වූ විපරිණාම ඇති සංස්කාර දුඃඛ වූ ආරූප්‍ය විඤ්ඤයා ගේ නිත්‍යාදි විපර්‍යාසයට හෙතුභූය ඇති හෙයින් ආනෙඤ්ජාභිසංස්කාරය **පිෂාච නගරාභිමුඛ ගම-නට** සදෘශ කොට යෙදී.)

මෙසේ අවිද්‍යාව ඇති හෙයින්ම සංස්කාර වීම ද, අවිද්‍යා අභාව යෙහි නො වීම ද වන හෙයින් මේ සංස්කාරයෝ අවිද්‍යාවෙන් වෙති යි දත යුතු.

එහෙයින් වදාරන ලදී.

"අවිජ්ජා හික්ඛවෙ අවිජ්ජාගතො පුඤ්ඤාභිසංඛාරම්පි අභිසංඛරොති. අපුඤ්ඤාභිසංඛාරම්පි අභිසංඛරොති. ආනෙ-ඤ්ජාභිසංඛාරම්පි අභිසංඛරොති. යතො ච ඛො හික්ඛවෙ භික්ඛුනො අවිජ්ජා පහීනා විජ්ජා උප්පන්නා හොති අවිජ්ජා විරාගා විජ්ජුප්පාදා නෙව පුඤ්ඤාභි සංඛාරං අභිසඞ්ඛරොති*"**
"නුවණ නැති අප්‍රහීණ අවිද්‍යාවෙන් යුක්ත වූයේ පුණ්‍යාභිසංඝකාර ද රැස් කෙරේ. -පෙ- යම් හෙයකින් භික්ෂු හු ගේ අවිද්‍යාව ප්‍රහීණ වේ ද රහත් මග නුවණ උපදී ද? හෙතෙම අවිද්‍යා විරාගයෙන් විද්‍යාඋත්පාදයෙන් පුණ්‍යාභිසංස්කාර රැස් නො කරයි" කියායි.

වේවා! අවිද්‍යාව සංස්කාරයනට ප්‍රත්‍යය වන බව් පිළිගනිමු. එහෙත් පුණ්‍යාභිසංස්කාරාදී කවර සංස්කාරයකට අවිද්‍යාව කෙසේ ප්‍රත්‍යය වේදැයි කිය යුතු යැ.

විසඛර:- පුණ්‍යාභිසංස්කාරාදි නොයෙක් සංස්කාර වෙති. අවිද්‍යාව එකෙක්ම ය. එහෙත් සියලු සංස්කාරයනට අවිද්‍යාව එක ආකාරයකින්ම ප්‍රත්‍යය නො වේ. එහෙයින් මේ සංස්කාරයනට

*සං: නි: රුක්ඛවගග

මෙසේ ප්‍රත්‍යය වේයයි කිවමනායි. ඒ සඳහා මේ සියලු ප්‍රත්‍ය-යන් පිළිබඳ ප්‍රත්‍යය ස්වභාවය මෙහිලා දැක්වේ.

භගවත් බුදුහු වනාහි

1	**හෙතු පච්චය**	13	**කම්ම පච්චය**
2	**ආරම්මණ පච්චය**	14	**විපාක පච්චය**
3	**අධිපති පච්චය**	15	**ආහාර පච්චය**
4	**අනන්තර පච්චය**	16	**ඉන්ද්‍රිය පච්චය**
5	**සමනන්තර පච්චය**	17	**ඣාන පච්චය**
6	**සහජාත පච්චය**	18	**මග්ග පච්චය**
7	**අඤ්ඤමඤ්ඤ පච්චය**	19	**සම්පයුත්ත පච්චය**
8	**නිස්සය පච්චය**	20	**විප්පයුත්ත පච්චය**
9	**උපනිස්සය පච්චය**	21	**අත්ථි පච්චය**
10	**පුරේජාත පච්චය**	22	**නත්ථි පච්චය**
11	**පච්ඡා ජාත පච්චය**	23	**විගත පච්චය**
12	**ආසෙවන පච්චය**	24	**අවිගත පච්චය** යි* මෙසේ

සුවිසි ප්‍රත්‍යයක් වදාළහ.

1. **හෙතුප්‍රත්‍යය** :- **"හෙතු ච සෝ පච්චයෝ ච"** සුප්‍රතිෂ්ඨිත භාවයෙන් හෙතු නමුදු - උපකාර භාවයෙන් ප්‍රත්‍යය නමුදු වේ යයි **හෙතුප්‍රත්‍යය** නම්.

විශේෂ:- මෙසේ කිකල අධිපතිප්‍රත්‍යයාදි බවට පැමිණි හෙතුනු-ගේ ද ගැනීම වන හෙයින් ඒ වළකනු සඳහා **"හෙතු හුත්වා පච්චයෝ"** 'හෙතු වී ප්‍රත්‍යය වීම ය යි කී. එසේ කී කල ද **ඒ** දෙශයම වන හෙයින් **"හෙතු භාවේන පච්චයෝ"** හෙතු-භාවයෙන් ප්‍රත්‍යය වීමය යි කියන ලදී. (ආලම්බන ප්‍රත්‍යයාදි-යෙහි ද ප්‍රත්‍යය භාවය මෙසේ මැසි.)

විභාග:- මෙහි **හෙතු** යනු- **වචනාවයවය, කාරණය, මූලය** යන මොවුනට ව්‍යවහාර වේ. (ප්‍රතිඥ - හෙතු යනාදීන්හි නෛය්‍යායිකයෝ සාධනාවයවය හෙතුය යි කියති. ප්‍රතිඥ- හෙතු-උදාහරණ- උපනය- නිගමනයැ යි අනුමානාඞ්ග ප්‍රතීතිය සඳහා පඤ්චාවයවයක් ගැනේ. හෙතුව ද මින් එකෙකි.) ශාසනයෙහි **"යෙ ධම්මා හෙතුප්පභවා"**‡ යනාදීන්හි කාරණයෙනි වේ. **"තයෝ කුසල හෙතු තයෝ අකුසල හෙතු"**ද්

---

*ප: ප: පච්චයුද්දෙස ‡ම: ව: අනිච්චමේඛාධි කථා

දධ: ප: හෙතුගොචඡක

යනාදීන්හි මූලය හෙතු යයි ගැනේ. එය මේ **"හෙතු පච්චයෝ"** යන්නෙහි අනිප්‍රෙත ය. මූල ශබ්දය මෙන් හෙතු ශබ්දය ද පිහිටීම් අර්ථය කියා. (භූමියෙහි පිහිටා උඩට ඕජාව අදනා මූලින් වෘක්ෂය ස්ථිරවැ සිටීම හා වැඩීම වන්නා සේ කම් නිදාන වූ හෙතුවින් කර්මය ස්ථිරවැ පිහිටුවා ඵලය වැඩීමට පමුණුවන හෙයින් **හෙතු** නම්.)

පච්චය :- යන්නෙහි මේ වචනාර්ථය. **"පතිච්ච එතස්මා එතීති"** ඒ නිසා එයින් ඵලය හට ගනීනුයි ප්‍රත්‍යය නම්.

බැහැර නොකොට එක්වැම පවතීය යන අර්ථයි.

එයින් කිහ. අට්ඨකථාහි **"යෝ හි ධම්මෝ යං ධම්මං අපච්චක්ඛාය නිරුජ්ඣති වා උප්පජ්ජති වා සෝ තස්ස පච්චයෝ"*** යි යම් උපකාරක ධර්මයක් යම් ඵල ධර්මයක් නොහැර සිටී නම් හෝ උපදී නම් හෝ ඒ හෙතු ධර්මය ඒ ඵල ධර්මයට ප්‍රත්‍යය යි කියා ය.

ලක්ෂණ වශයෙන් වනාහි උපකාර කිරීම ලක්ෂණ කොට ඇත්තේ ප්‍රත්‍යය ය. එහෙයින් ම යම් ධර්මයක් යම් ඵල ධර්මයක ගේ පැවැත්මට හෝ නිපැත්මට උපකාර වේ නම් ඒ උපකාරක ධර්මය ඒ ඵල ධර්මයට ප්‍රත්‍යය වේ යයි කියනු ලැබේ.

පච්චය- හෙතු- කාරණ- නිදාන- සම්භව- පභව යනාදි ශබ්දයෝ අර්ථයෙන් එකෙක් මැයි. වචනයෙන් මතු වෙනසි.

මෙසේ මූලාර්ථයෙන් හෙතු ය, උපකාරාර්ථයෙන් ප්‍රත්‍යය යි සුප්‍රතිෂ්ඨාර්ථයෙන් උපකාරක වූ ධර්ම ශක්තිය හෙතු ප්‍රත්‍යය යි සැකෙවින් කියයි.

මහානෙත්තිපකරණයෙහි :- (1) සාලි බීජාදිය හැල් ආදි ඒ ඒ ද්‍රව්‍යයන් ගේ හැල් ආදි භාවය සිදු කරන්නා සේ ද, **නිල්** මැණික් ආදිය ද, නීලවර්ණාදිය ද නීල ප්‍රභාදිය සිදු කරන්නා සේ ද, **හෙතු ප්‍රත්‍යය** තමා හා සම්ප්‍රයුක්ත ධර්මයනට සුදුසු සේ කුසලාදි භාවය සිද්ධ කෙරේ'ය යි රෙවතාචාර්‍යයෝ කියති.

විචාරණය :- හෙතු ප්‍රත්‍යය කුසලාදි භාවය සිද්ධ කෙරේ නම් **කුසල් - අකුසල් හෙතු** ඒ හෙතුවෙන් නිපන් රූපයා ගේ කුසලාකුසල භාවය සිදු කිරීමට සමර්ථ නොවේ. එසේම **අව්‍යාකෘත හෙතුව ද** අව්‍යාකෘත හෙතුවෙන් නිපන් රූපයා ගේ අව්‍යාකෘත භාවය සිදු කිරීමට සමර්ථ නොවේ. එහෙත් ඔවුන්ට

*වි: අට්ඨකථා

හෙතු ප්‍රත්‍යය නො වන්නේ නො වෙයි. (හෙතු ප්‍රත්‍යය වේමැ යි.) එහෙයින් වදාළහ. **"හෙතූ, හෙතු සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානං ච රූපානං හෙතු පච්චයෙන පච්චයෝ"*** "ලොභාලොභාදී හෙතූහු ඒ හෙතු සම්ප්‍රයුක්ත චිත්ත චෛතසික ධර්මයනට හා එයින් නිපන් රූපයනට ද හෙතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙති"යි කියාසි.

අහෙතුක (විපාක-ක්‍රියා) චිත්තයන් ගේ හා රූප ධර්මයන් ගේ ඒ අව්‍යාකෘත භාවය සිදු කරන හෙතු නැත ද සවභාවයෙන් ම අව්‍යාකෘත භාවය සිද්ධ යැ.

කරුණු මෙසේ හෙයින් සහෙතුකයන්ගේ ද, කුසලාදිභාවය හෙතු ප්‍රතිබද්ධ නො වැ යොනිසො මනසිකාරාදි ප්‍රතිබද්ධයැ යි දත යුතු.

ඒ මෙසේ වදාළහ. **"යොනිසො හිකඛවෙ මනසිකරොතො අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා ච කුසලා ධම්මා අභිවඩ්ඪන්ති‡"** "නුවණින් මෙනෙහි කරන්නා හට නූපන් කුසල් උපදී. උපන් කුසල් වැඩේ" ය යි කියා සි.

මෙසේ කුසලාදිභාවය (සම්ප්‍රයුක්ත හේතූන් නිසා නො වැ) යොනිසො මනසිකාරය ප්‍රතිබද්ධ බව සැබෑ යැ.

(මේ කුසල භාවය මෙන් ම අකුසල - අව්‍යාකෘත භාවය ද, හෙතු ප්‍රතිබද්ධ නො වන බව මෙයින් මැ සිද්ධ සි.)

(2) **මොහ මූලික** දෙසිතෙහි මොහය අන්‍ය හෙතුවක් හා නො යෙදී හුදකලාව යෙදුනු හෙයින් ඒ මොහයා ගේ අකුසල භාවය සවයංසිද්ධ වූවා සේ හෙතූන්ගෙන් (අන්‍ය) ඒ හේතූන් හා සම්ප්‍රයුක්ත වූ ධර්මයන් ගේ කුසලාදි භාවය සවයංසිද්ධ නො වැ හෙතු ප්‍රතිබද්ධ වේ ය යි තව ද ආචාර්‍ය්‍ය මතයෙකි. ඒ නො යෙදේ. කවර හෙයින්ද යත්:-

කුසලාදීන් හා සම්ප්‍රයුක්ත හෙතූන් ගේ සවභාවයෙන් ම කුසලාදිභාවය වේ නම්, සෙසු සම්ප්‍රයුක්ත ධර්මයන් ගේ කුසලාදි භාවය ද හෙතු ප්‍රතිබද්ධ වේ නම්, අලොභය කුසල් හෝ වෙයි. අව්‍යාකෘත හෝ වෙයි. එහෙත් අලොභය සවභාවයෙන් කුසල් වී නම් කුසල සවභාවයෙන් අව්‍යාකෘත නො වේ. අලොභ සවභාවය අදොෂ සවභාවය නො වන්නාක් මෙනි.

---

*ප: ප: පච්චය නිද්දෙස ‡අ: නි: එකකනිපාත

මෙසේ හෙතුහු කුසල - අව්‍යාකෘත යන දව්සවභාවය වන හෙයින් එසේ ම දව්සවභාව වූ ශ්‍රද්ධාදී සම්ප්‍රයුක්ත ධර්මයන් ගේ හෙතුන් පිළිබඳ වූ කුසලාදිභාවය සිද්ධ කරන අන්‍ය ධර්මයක් සොයන්නා සේ (සවභාවයෙන් කුසලාදි කෝ වන හෙයිනි.) හෙතුන් ගේ ද කුසලාදි භාවය සිද්ධ කරන අන්‍ය ධර්මයක් සෙවිය යුතු ය.

(එසේ සොයන කල හෙතුන් කෙරෙහි මෙන්ම සම්ප්‍රයුක්තයන් කෙරෙහි ද කුසලාදිභාවය **යොනිසෝ මනසිකාර** ප්‍රතිබද්ධ ය හෙතු ප්‍රතිබද්ධ නො වේ යනු අභිප්‍රාය වෙයි.)

නිගමනය:- මෙසේ හෙතුන් කුසලාදි භාවය සිද්ධ කිරීම් වශයෙන් මූලාර්ථය නො ගෙන, අරමුණෙහි සුප්‍රතිෂ්ඨිත භාව සාධන වශයෙන් මූලාර්ථය ගත් කල කිසිදු විරෝධයෙක් නො වේ.

ඒ එසේ මෑ යි:- ලබන ලද හෙතු ප්‍රත්‍යය **ඇති** ධර්මයෝ මනා වැ **පිහිටි** මුල් ඇති වෘක්ෂයක් මෙන් සථිර වූවාහු සුප්‍රතිෂ්ඨිත වෙති.

අහෙතුකයෝ නිලබීජකාදි' නම් ඇති සෙවෙල් මෙන් සුප්‍රතිෂ්ඨිත නො වෙත්. (නිලබීජක-නම් සියෙනීනලී යනු සත්‍යයි.)

මෙසේ පොළොව යටට ඇදුණු මුල් ගසෙහි **ඕසසු** කොටස් සථිරවැ සිටීමට උපකාර වන්නා සේ ආලම්බනයෙහි කා වැදී තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන් සුසථිරවැ පිහිටීමට උපකාර වන ලොභාදි ධර්මයෝ හෙතු ප්‍රත්‍යය නම් වෙති.

(ලොභාදියෙහි ඇති අරමුණෙහි නො සැලී පිහිටන සවභාවය හෙතු ශක්තිය යි කියනු ලැබේ.)

---

2. ආලම්බන ප්‍රත්‍යය.

චිත්ත-චෛතසික ධර්මයන්ට ආලම්බන කළ යුතු (එල්විය යුතු) බැවින් උපකාරක ධර්මය ආලම්බන ප්‍රත්‍යය යැ.

"රූපායතනං චක්ඛුවිඤ්ඤාණ ධාතුයා = පෙ = යං යං ධම්මං ආරබ්භ යෙ - යෙ ධම්මා උප්පජ්ජන්ති චිත්ත චෙතසිකා ධම්මා. තෙ - තෙ ධම්මා තෙසං - තෙසං ධම්මානං ආරම්මණ පච්චයෙන පච්චයෝ*" රූපායතනය චක්ඛු විඤ්ඤාණයට ද -පෙ- රූපාදි යම්-යම් ධර්මයක් අරමුණු කොට චිත්ත-චෛතසික යම්-යම් ධර්මයෙක් උපදිත් නම් ඒ ඒ (ආලම්බන) ධර්මයෝ ඒ - ඒ චිත්ත-චෛතසික ධර්මයන්ට ආලම්බන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ" ය යි

---

*ප: ප: පච්චයනිද්දෙසය.

අවසන් කළ හෙයින් රූපාදි භෙදයෙන් ෂඩ්විධ වූ **ඝට්ටන - අසංඛත - පඤ්ඤත්ති** යන ධර්මයන් අතුරෙන් **ආලම්බන ප්‍රත්‍යය** නො වන ධර්මයෙක් නැති.

නිදර්ශන:- දුර්වල පුරුෂයකු දණ්ඩක් හෝ රොද්දක් හෝ එල්ල නැගිට්ටා සේ ද, සිට්ටා සේ ද චිත්ත-චෛතසික ධර්මයෝ රූපාදි අරමුණෙකෑ එල්ල උපදින්නාහු ද, සිට්ටාහු ද වෙති. එහෙයින් චිත්ත-චෛතසිකයනට අරමුණු වූ සියලු ධර්ම ම ආලම්බන ප්‍රත්‍යය වේ ය සි දත යුතු සි.

---

3. අධිපති ප්‍රත්‍යය.

තමා හා සම්ප්‍රයුක්ත ධර්මයනට ඊශ්වරත්වයෙන් **උපකාරක** ධර්ම අධිපති ප්‍රත්‍යය යැ. (තමා රිසි සේ යෙදවීම යැ මෙහි අධිපති ප්‍රත්‍යය නම්.) ඒ (1) සහජාතාධිපති (2) ආලම්බනාධිපති වශයෙන් ද්විවිධ යැ.

(1) "තත්‍ථ ඡන්දාධිපති ඡන්දසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානං ච රූපානං අධිපති පච්චයෙන පච්චයෝ*" 'ඔවුනතුරින් **ඡන්දාධිපති** නෙමේ ඡන්දය හා සම්ප්‍රයුක්ත ධර්මයන්ට හා තත් සමුට්ඨාන රූපයන්ට ද අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.'

(**"ඡන්දවතෝ කිං නාම න සිජ්ඣති"** 'ඡන්දය ඇත්තාහට කිමෙක් නම් සිද්ධ නො වේ ද' සි යනාදියෑ පූර්ව අභිසංස්කාරයන් ගේ උපනිශ්‍රය ලැබ උපදනා චිත්තෝත්පාදයෙහි ඡන්දාදීහු පුරෝගාමී වැ ජ්‍යෙෂ්ඨ වැ සම්ප්‍රයුක්ත ධර්මයන් තමන් වශයෙහි පවත්වති. සම්ප්‍රයුක්ත ධර්මයෝ ද ඒ ඡන්දාදීන් ගේ වශයෙහි පවත්නාහු හීනාදිභාවයෙන් ඒවාට අනුවර්තක වෙමින් පවතිත්.)

මෙසේ **ඡන්ද - චිත්ත - විරිය - විමංසා** යන ධර්ම සතර ප්‍රත්‍යයෑ සි දතයුතු.

විශේෂ:- එකවට බොහෝ දෙන අධිපති නො වන බැවින් සතර එක් වැ අධිපති ප්‍රත්‍යය නො වේ.

(හෙතු දෙක තුනක් එකවට හෙතු ප්‍රත්‍යය වන හෙයින් **"හෙතු හෙතු සම්පයුත්තකානං*"** යි කිවා සේ **අධිපති අධිපති සම්පයුත්තකානං"** යි නො කියා **"ඡන්දාධිපති ඡන්දසම්පයුත්තකානං"** යි කී යේ එක් වරෙකැ එනක් ම අධිපති වන හෙයිනි.

---

*ප: ප: පච්චයනිද්දෙස

යම් කලෙක ඡන්දය ධුර කොට ඒ ඡන්දය ජ්‍යෙෂ්ඨ කොට චිත්තය පවතී නම් එකල ඡන්දය ම අධිපති වෙයි. සෙස්සෝ අධිපති නො වෙති. සෙසු චිත්තාදීන් විෂයෙහි ද මෙසේ මැ සි.

(2) **ආරම්මණාධිපති**- යම් ධර්මයක් ගරුකොට අරූප ධර්මයෝ පවතිත් නම් ඒ ගරු කළ ධර්මය ඔවුන්ට **ආලම්බනාධිපති-ප්‍රත්‍යය** වේ.

එයින් වදාළහ, **"යං යං ධම්මං ගරුං කත්වා යෙ-යෙ ධම්මා උප්පජ්ජන්ති චිත්ත චෙතසිකා ධම්මා, තෙ-තෙ ධම්මා තෙසං-තෙසං ධම්මානං අධිපති පච්චයෙන පච්චයෝ*"** 'යම් - යම් ආලම්බන ධර්මයක් ගරුකොට චිත්ත චෛතසික යම් - යම් ධර්ම කෙතෙක් උපදිත් නම් ඒ ඒ ගරු කොට ගත්තා ලද ධර්ම ඒ ඒ ගරු කරන ධර්මයනට ආලම්බන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.'

---

4. අනන්තර ප්‍රත්‍යය.

5. සමනන්තර ප්‍රත්‍යය.

අතුරු නැති සේ උපකාරක ධර්මය අනන්තර ප්‍රත්‍යය යැ.

මනාකොට අතුරු නැති බැවින් උපකාරක ධර්ම **සමනන්තර** ප්‍රත්‍යය සි. මේ ප්‍රත්‍යය ද්වයයෙන් **අත්‍ථානන්තරභාවය** අනන්තර ප්‍රත්‍යය යැ.

කාලානන්තරභාවය සමනන්තර ප්‍රත්‍යය යනාදීන් බොහෝ විසතර කෙරෙති. ඒ අසාර යැ. මේ වූ කලි චිත්ත නියමය ම කෙටු භාවයෙන් කියන ලදී.

චක්ඛු විඤ්ඤාණ අනන්තරා මනොධාතු* = චක්ඛු විඤ්ඤාණයට අනන්තර වූ මනොධාතු යැ. **මනොධාතු අනන්තරා මනොවිඤ්ඤාණ ධාතු*** = මනොධාතුවට අනන්තර වැ මනෝ විඤ්ඤාණ ධාතු යැ සි යනාදියෙහි **යම්** චිත්ත නියමයෙක් වේ නම් එය ඒ - ඒ පුරී-පුරී අනන්තරොත්පාද චිත්ත නියමය අනුව වේ. අන් පරිද්දෙකින් නො වේ. එහෙයින් තම-තමාහට අනතුරුව සුදුසු චිත්තොත්පාද ඉපදවීමේ සමර්ථ වූ ධර්මය **අනන්තර ප්‍රත්‍යය යැ.** යමක් අනන්තර ප්‍රත්‍යය වේ නම් එය ම **සමනන්තර ප්‍රත්‍යය යැ සි.** මේ ප්‍රත්‍යයවයෙහි ව්‍යඤ්ජන මාත්‍රය වෙනසි. **උපචය - සන්තති** දුකයෙහි මෙන් ද, **අධිවචන - නිරුත්ති** දුකයෙහි මෙන් ද සි කියා සි. (උපචය - සන්තති පදයන්ගේ ද, අධිවචන - නිරුත්ති පදයන්ගේ ද අර්ථ එකෙක් මැ සි) අර්ථ වශයෙන් වෙනසෙක් නැති.

---

*ප: ප: පච්චයනිද්දෙස

පෙර කී සේ පූර්ව-පශ්චිම චිත්තයන් ගේ අතුරෙක් නැත්ම-නු යි අනන්තර නම් වේ. සවහනක් නැති බැවින් මකාව අතුරක් නැත්තේ සමනන්තර නම් වේ. යට සඳහන් පරිදි අප්පානන්තර භාවය අනන්තර ප්‍රත්‍යය යි ද, කාලානන්තර භාවය සමනන්තර ප්‍රත්‍යයැයි ද කී **රෙවතඝට්ඨිර** මතය නිරස්න කරනුවෝ

"නිරොධා වුට්ඨහන්තස්ස නෙවසඤ්ඤානාසඤ්ඤායතන-කුසලං ඵලසමාපත්තියා සමනන්තර පච්චයෝ*" නිරොධ සමාපත්තියෙන් නැගිටින්නහුට ඒ නිරොධ සමාපත්තියට පූර්ව-යෙහි වූ නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල චිත්තය නිරොධයෙන් නැගිටීමේ දී උපදනා අනාගාම් ඵල චිත්තයට හෝ අර්හත් ඵල චිත්තයට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ ය යි වදාළ සේක.

"යම්කිසි අන්‍යධර්මයකට අවකාශ නො තබා තමාට අනතුරුවැ ම උපදනා පරිදි දෙවන චිත්තයට උපකාර වන ධර්මය සමනන්තර ප්‍රත්‍යය යැ.

පෙර කී නිරොධ සමාපත්තියෙන් නැගිටින්නහු ගේ සත් දවසකට පෙර නිරුද්ධ වූ නෙවසඤ්ඤානාසඤ්ඤායතන චිත්තය නිරොධයෙන් නැගිටීමේ දී උපදනා ඵල චිත්තයට රූප ඝන්නතින්ගෙන් අතරක් ඇති වීම නිසා ද, කාලයෙන් අතරක් ඇති වීම නිසා ද සමනන්තර ප්‍රත්‍යය නො වේ ය" යනු **රෙවත ඝට්ඨිර මතය යි.** එය පෙර කී පඬිත පාඨය දක්වා බැහැර කෙරෙති.

(තව ද මල් පිපෙන රැකක් කඩ රෙද්දෙකින් වෙලූ කල වෙලුම නිසා නො පිපෙතත් ඒ ඉවත් කළ කල මල් පිපෙන්නා සේ භාවනා බලයෙන් වැළකූ හෙයින් උපදිනු සමර්ථ වූ ද චිත්තය නූපදිතත් එය නැවැත්වූ කෙණෙහි උපදනා හෙයින් ද ධර්මයන් ගේ ප්‍රවෘත්ති මාත්‍රය ම නිසා කාලය යි ගැනෙන හෙයින් නිරොධයෙන් නැගෙන්නහු ගේ නෙවසඤ්ඤානාසඤ්ඤායතන චිත්තය හා ඵල සමාපත්ති අතර අරූප ධර්මයන් ගේ පැවැත්මක් නැති හෙයින් **කාලානන්තර භාවය** නො වේ.)

රූප ධර්ම ප්‍රවෘත්තිය අරූප ධර්මයනට නිත්‍ය සන්තාන හෙයින් අවීචනන්තර භාවය ද නො වේ. එක ඝන්නතියෙහි පූර්ව පශ්චිමයන් මධ්‍යයෙහි පවත්නා තත් ඝන්නති පර්‍යාපන්න වූ යේ ම අනන්තර වේ. නෙවසඤ්ඤානාසඤ්ඤායතන ඵල සමාපත්තින් මධ්‍යයෙහි එබඳු අතරක් නැති හෙයින් ජවනානන්තර ජවනය මෙන් ද, භවඞ්ගානන්තර භවඞ්ගය මෙන් ද, ඔවුන් ගේ අනන්තර භාවය

*ප: ප: පච්චයනිද්දෙස

සිදු යෑ. අඤ්ඤසන්තාන ප්‍රතිසන්ධි-චුතීන් පිළිබඳ වෑ ද මෙසේ මෑ යි. (ටීකාහි මේ පිළිබඳ මතා විස්තාරයෙකි.) මෙසේ කාලයෙන් හෝ රූපයෙන් අනන්තර සමනන්තර ප්‍රත්‍යය භාවයට බාධාවක් නැති බව් දත යුතු.

හුදෙක් ප්‍රත්‍යුත්පන්න ධර්‍ම තමාගෙන් වෙන් කරන අනන්තර ධර්‍මයක් ඇති නො වන සේ උපකාරක ධර්‍මය **අනන්තර ප්‍රත්‍යය** යෑ.

ප්‍රත්‍යුත්පන්න ධර්‍මයන් තමා හා ඒකී භාවයට් පැමිණියා සේ මනාකොට අතුරු නැති වෑ ඉපදීමේ සමර්‍ථ බව **සමනන්තර ප්‍රත්‍යය** යි.

---

6. සහජාත ප්‍රත්‍යය:- තමා හා එකවට උපදනා අන්‍ය ධර්‍මයන් ගේ ඉපදීමට එක් වෑ ඉපදීම් වශයෙන් උපකාරක ධර්‍ම **සහජාත ප්‍රත්‍යය** යෑ. ආලෝකයට ප්‍රදීපය මෙනි. මේ උපමාවෙන් උත්පාද ක්ෂණයෙහි ප්‍රකට වූ ප්‍රත්‍යය භාවයෙන් සිති ක්ෂණයෙහි ද ප්‍රත්‍යය භාවය වේ. නො එසේ වුව මේ උපමාව නො ගැළපේ. ප්‍රදීපය ආලෝකයා ගේ ඉපදීමට මෙන් ම පැවැත්මට ද උපකාර වන හෙයිනි. (ප්‍රත්‍යුත්පන්නයනට සහජාත භාවයෙන් උපකාර වීමේ ශක්තිය සහජාත භාවය යි.) ඒ සහජාත ප්‍රත්‍යය අරූප සකාර්‍යාදීන් ගේ වශයෙන් සවැදැරුම්.

ඒ මෙසේ යි:- **චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤං, සහජාතපච්චයෙන පච්චයෝ. චත්තාරෝ මහාභූතා - පෙ - ඔක්කන්තික්ඛණෙ නාම-රූපං අඤ්ඤමඤ්ඤං, චිත්ත-චෙතසිකා ධම්මා චිත්ත සමුට්ඨානානං රූපානං, මහාභූතා උපාදා රූපානං, රූපිනෝ ධම්මා අරූපිනං ධම්මානං කිඤ්චි කාලෙ සහජාත පච්චයෙන පච්චයෝ කිඤ්චි කාලෙ න සහජාත පච්චයෙන පච්චයෝ***

(1) වෙදනාදි සතර අරූප සකාර්‍ය ඔවුනොවුන්ට සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

(2) සතර මහාභූත ඔවුනොවුන්ට ද,

(3) (පඤ්චවොකාර භවයෙහි) ප්‍රතිසන්ධි **ක්ෂණ**යෙහි සතර නාම සකාර්‍ය හා හෘදය වස්තු රූපය ඔවුනොවුන්ට ද,

(4) චිත්ත-චෛතසික ධර්‍ම චිත්තජ රූපයන්ට ද,

(5) සතර මහා භූත කර්‍මජ රූපයන්ට ද,

---

*ප: ප: පච්චයනිද්දෙස

(6) හෘදය වස්තු රූපය අරූප ධර්මයන්ට ද, ප්‍රතිසන්ධි කාලයෙහි **සහජාත ප්‍රත්‍යය** වේ. ප්‍රවෘත්ති කාලයෙහි සහජාත ප්‍රත්‍යය නො වේ.

(**විශේෂ** :- ප්‍රතිසන්ධි ක්ෂණයෙහි නාම-රූප ධර්ම පරලොවින් මෙලොවට අවුත් **මේ** කුස ආදියට පිවිසෙන්නාක් මෙන් **වත** හෙයින් ප්‍රතිසන්ධි ක්ෂණය **ඔක්කන්තික්ඛණයයි** කියනු ලැබේ.

මේ **රූපිනෝ ධම්මා** යනු හෘදය වස්තු රූපය සඳහාම කියන ලදී. ප්‍රවෘත්ති කාලයෙහි **අරූප විපාක සතර ද, විපාකවිඤ්ඤාණය ද,** හැර සෙසු පන්සැත්තෑ සිත් ද, දෙපනස් චෛතසික ද, යන මෙතෙක් ධර්ම ඒ සිත් හා උපදනා රූපයනට සහජාත ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධි ක්ෂණයෙහි **චිත්ත**ජ රූප නැති හෙයිනි.

පූර්වෝක්ත පට්ඨාන පාඨයෙහි **"අඤ්ඤමඤ්ඤං"** යනු තුනක් හා යෙදේ. තුනක් හා නො යෙදේ. එහි විශෙෂය නම්:- අරූපය ම ප්‍රත්‍යය හා ප්‍රත්‍යය සමුත්පන්න වේ. රූපය ම ප්‍රත්‍යය ද ප්‍රත්‍යය සමුත්පන්න ද වේ. නාම-රූප ප්‍රත්‍යය ද ප්‍රත්‍යය සමුත්පන්න ද වේ.

අරූපය ප්‍රත්‍යය වේ. රූපය ප්‍රත්‍යය සමුත්පන්න වේ. රූපය ම ප්‍රත්‍යය හා ප්‍රත්‍යය සමුත්පන්න වේ. රූපය ප්‍රත්‍යය වේ. අරූපය ප්‍රත්‍යය සමුත්පන්න වේ යනුයි.)

---

7. **අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය** – ඔවුනොවුන් ගේ නිපැත්මට හා පැවැත්මට උපස්තම්භක භාවයෙන් උපකාර වන ධර්ම **අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය** යි. ඔවුනොවුන්ට උපස්තම්භක වන්නාවූ ත්‍රිදණ්ඩ මෙනි. (මුල කොන් මදක් ඇත් කොට අග කොටස් එකිනෙකට හේත්තු වන සේ තුබූ දඬු තුන නො පෙරළී සිටීමට ඔවුනොවුන්ට උපකාර වන්නා සේ ය.) චාමාගට උපකාර වන්නාහට උපකාර වීම මෙහි ලක්ෂණය යි.

විශෙෂ :- අන්‍යොන්‍ය වශයෙන් උපකාර වන ධර්මයෝ ඒ ධර්මයනට සහජාත වශයෙන් ද උපකාර වෙති. එහෙත් සහජාත වශයෙන් උපකාර වන ඇතැම් ධර්මයෝ ඒ ධර්මයනට අන්‍යොන්‍ය ප්‍රත්‍යය නො වෙති.

මෙය අරූපස්කන්ධාදී වශයෙන් ත්‍රිවිධ වේ.

(1) **"චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤං පච්චයෙන පච්චයෝ.** (2) **චත්තාරෝ මහාභූතා.** (3) **ඔක්කන්තික්ඛණේ නාම-රූපං අඤ්ඤමඤ්ඤං පච්චයෙන පච්චයෝ"***

(1) සතර **නාම ස්කන්ධ** ඔවුනොවුන්ට ප්‍රත්‍යය වේ.

(2) සතර මහාභූත ඔවුනොවුන්ට ද,

(3) ප්‍රතිසන්ධි ක්ෂණයෙහි සතර නාම **ස්කන්ධ** හා හෘදය වස්තු රූපය ඔවුනොවුන්ට ද ප්‍රත්‍යය වෙති.

විශෙෂ:- මෙහි **අඤ්ඤමඤ්ඤං** යන දෙකින් ප්‍රත්‍යය හා ප්‍රත්‍යයොත්පන්නය ද යන දෙක කියා වේ. (අඤ්ඤං + අඤ්ඤං= අඤ්ඤමඤ්ඤං. මකාරය සන්ධියෙනි.)

---

8. නිශ්‍රය ප්‍රත්‍යය.

පිහිටීමට ආධාරකාරණයන් උපකාරක ධර්මය **නිශ්‍රය** ප්‍රත්‍යය යැ. ගස් ආදියට පොළොව මෙන් ද, චිත්‍රකර්මාදියට වස්ත්‍රාදිය මෙන් ද, පෘථිවී ධාතුව සෙසු ධාතූන්ට ද, චක්ෂුරාදිය චක්ෂුර්විඥානාදියට ද, ආශ්‍රිත **ස්කන්ධාදිය** සෙසු **ස්කන්ධාදියටද** නිශ්‍රය වේ.

ඒ නිශ්‍රය ප්‍රත්‍යය **"චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤං නිස්සය පච්චයෙන පච්චයෝ."*** යනාදීන් සහජාත ප්‍රත්‍යය විෂයෙහි කී සෙයින් දත යුතුයි.

විශෙෂ:- එහි සවන කොටස වෙනසි. ඒ මෙසේයි. **"චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා - සොත-ඝාණ - ජිව්හා කායායතනං කායවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං නිස්සය පච්චයෙන පච්චයෝ. යං රූපං නිස්සාය මනොධාතු ච මනෝ විඤ්ඤාණ ධාතු ච වත්තන්ති තං රූපං මනොධාතුයා මනෝ විඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං නිස්සය පච්චයෙන පච්චයෝ."***

"චක්ඛායතනය චක්ඛු විඤ්ඤාණ ධාතුවට ද, තත් සම්ප්‍රයුක්ත ධර්මයනට ද, නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. **සොත** - ඝාණ - ජිව්හා - **කායායතන** - කාය **විඤ්ඤාණ** ධාතුවට ද, තත් සම්ප්‍රයුක්ත ධර්මයනට ද, නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. යම් (හෘදය) රූපයක් නිසා මනෝ ධාතු - මනොවිඤ්ඤාණ ධාතු පවතී නම් ඒ රූපය මනොධාතු - මනෝ විඤ්ඤාණ ධාතූන්ට ද, තත් සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද, **නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය** වේ. (එහි

---

*ප: ප: පච්චයනිද්දෙස

"රූපිනෝ ධම්මා -පෙ- කඨම්භාවිකාලෙ" යනාදී පාඨය වෙනුවට මෙහි මෙසේ යෙදේ.)

නිශ්‍රය ප්‍රත්‍යය (1) **සහජාත නිශ්‍රය ප්‍රත්‍යය**

(2) **පුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යය** යි ද්විවිධ වේ.

(1) **සහජාත නිශ්‍රය ප්‍රත්‍යය** – සහජාත ප්‍රත්‍යය මෙනි.

(2) **පුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යය** – පෙර **'චක්ඛායතනං'** යනාදී පඨ්‍යාන පාඨයෙහි කී පරිදි තමාගෙන් පසුවැ උපදනා ධර්මයනට පිහිටීමට උපකාරවීම් සභාවයයි.

---

9. උපනිශ්‍රය ප්‍රත්‍යය.

හෙතුව හා සම්බන්ධ පැවැතුම් ඇති හෙයින් තමා (හෙතුව) ඵලය විසින් ආශ්‍රිත වූයේ (ප්‍රතික්ෂේප නොකරන ලද්දේ) **නිශ්‍රය** නම්. බලසම්පන්න වූ නිශ්‍රය **උපනිශ්‍රය යැ.** බලවත් ආශයසය උපාශයසය මෙනි. එහෙයින් බලවත් කාරණ භාවයෙන් උපකාරක ධර්මය **උපනිශ්‍රය ප්‍රත්‍යය යැ.**

එය (1) **ආලම්බනොපනිශ්‍රය** යැ.

(2) **අනන්තරොපනිශ්‍රය** යැ.

(3) **ප්‍රකෘතොපනිශ්‍රය** යි ත්‍රිවිධ වේ.

(1) **"දානං දත්වා සීලං සමාදිසිත්වා – තං ගරුං කත්වා පච්චවෙක්ඛති*"** 'දන් දී, සිල් සමාදන් වැ ඒ ගරු කොට ප්‍රත්‍යවෙක්ෂා කෙරේ.'

"පුබ්බෙ සුචිණ්ණානි ගරුං කත්වා පච්චවෙක්ඛති*" 'පෙර තමා **පුරුදු කළ යහපත් ධර්ම** ගරු කොට අරමුණු කෙරේ.'

"ඣානා වුට්ඨාය ඣානං ගරුං කත්වා පච්චවෙක්ඛති*" 'ධ්‍යානයෙන් නැගී සිට ධ්‍යානය **ගරු කොට** ප්‍රත්‍යවෙක්ෂා කෙරේ'

"සෙක්ඛා ඵොත්‍රිභූං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති*" සෝතාපන්නයෝ (ඒ මාර්ගඵල) **ඵොත්‍රිභූ සිත** ගරු කොට ප්‍රත්‍යවෙක්ෂා කෙරෙති'.

"වොදානං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති*" 'සකදාගාමී-අනාගාමීහු වොදානය **ගරු කොට** මෙනෙහි කෙරෙති'.

"සෙක්ඛා මග්ගා වුට්ඨහිත්වා මග්ගං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති*" 'සෝතාපන්නාදීහු මාර්ගයෙන් නැගී **ඒ මාර්ගය**

---

*ප: ප: ආරම්මණුද්දෙස

ගරු කොට ප්‍රත්‍යවෙක්ෂා කරත්' මේ ආදි ක්‍රමයෙන් **ආලම්බනොපනිශ්‍රය** ආලම්බනාධිපතිය හා නො වෙනස් වැ බෙදන ලදී.

යම් අරමුණක් ගරු කොට චිත්ත - චෛතසික ධර්ම උපදී නම් ඒ ආලම්බනය (නියමයෙන්) ඒ චිත්ත-චෛතසික ධර්මයනට ආලම්බනයන් අතුරින් බලවත් ආලම්බනය වේ. මෙසේ ගරු කොට ගැනීමෙන් එය **ආලම්බනාධිපති ප්‍රත්‍යය** ද වේ.

බලවත් වූ හෙතුභාවයෙන් ආලම්බනොපනිශ්‍රය වේ. මේ විශෙෂය යි.

(2) බලවත් සේ **අනන්තර** වීම් **අනන්තරොපනිශ්‍රය** යැ. හෙද **අනන්තර ප්‍රත්‍යය** මෙනි.

"පුරිමා පුරිමා කුසලා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ඛන්ධානං උපනිස්සය පච්චයෙන පච්චයෝ*" 'පූර්ව-පූර්ව කුශල ස්කන්ධ පසු වැ පසු වැ උපදනා කුශල ස්කන්ධයනට උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ' යනාදි ක්‍රමයෙන් **අනන්තර ප්‍රත්‍යය** හා අවිශෙෂයෙන් බෙදන ලදී.

විශෙෂ:- මාතිකා නික්ෙෂපයෙහි **"චක්ඛු විඤ්ඤාණ ධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං අනන්තර පච්චයෙන පච්චයෝ‡"** 'චක්ෂු විඤ්ඤාණ ධාතුව තත් සම්ප්‍රයුක්ත ධර්ම ද, මනෝ ධාතුවට හා තත් සම්ප්‍රයුක්ත ධර්මයනවද අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ' යනාදි ක්‍රමයෙන් අනන්තර ප්‍රත්‍යයට ද,

"පුරිමා .. පෙ - උපනිස්සය පච්චයෙන පච්චයෝ‡" යි (අර්ථ පෙර කී සේ යි.) යනාදීන් උපනිශ්‍රය ප්‍රත්‍යයට ද ආ හෙයින් නික්ෂෙපයෙහි විශෙෂ ඇති. පූර්ව නය අව්‍යාකෘත ධර්ම වශයෙන් ද, දෙවන නය කුශලාදි වශයෙන් ද, ප්‍රවෘත්ත හෙයින් නික්ෂෙපයෙහි විශෙෂය ඇති. ඒ නික්ෂෙප විශෙෂය ද අර්ථ වශයෙන් ඒකී භාවයට යේ. එසේ ඇති කල්හිදු තම තමාට අනතුරුවැ සුදුසු චිත්තෛතසිකොත්පාදයක් ඉපදවීමෙහි සමර්ථ බැවින් **අනන්තර ප්‍රත්‍යය** බව ද, පූර්ව-පූර්ව චිත්තෛතසිකොත්පාදය පශ්චිම-පශ්චිම චිත්තෛතසිකොත්පාදයට බලවත් වන හෙයින් **අනන්තරොපනිශ්‍රය** බව ද දතයුතු.

විශෙෂ :- හෙතු ප්‍රත්‍යයාදිය අතුරින් යම් යම් ප්‍රත්‍යය කැතිවැ ද සිත් උපදී.

---

*ප: ප: පඤ්ඤාවාර ‡ප: ප: පච්චයනිද්දෙස

එහෙත් අනතුරු සිතක් නැතිවැ සිත් නූපදනා හෙයින් ඒ බලවත් ප්‍රත්‍යය යැ. මෙසේ ඒ ඒ සිතට අනතුරුවැ සුදුසු සිත් ඉපදීම් වශයෙන් **අනන්තර ප්‍රත්‍යය** ද, බලවත් උපකාර වශයෙන් **අනන්තරූපනිශ්‍රයය** ද දත යුතු.

(3) **ප්‍රකෘතොපනිශ්‍රය.** (ප්‍රකෘත + උපනිශ්‍රය = ප්‍රකෘතොපනිශ්‍රය) මෙහි ප්‍රකෘත නම් - තමා සතන්හි නිපදවන ලද ශ්‍රද්ධා-ශීලාදිය හෝ උපභොග කරනලද භොජන-සෘතු ආදිය හෝයි.

ප්‍රකෘතියෙන් (ප්‍රත්‍යයානන්තර රහිත බැවින්) හෝ බලවත් උපනිශ්‍රයම **ප්‍රකෘතොපනිශ්‍රය** යි. ආරම්මණ - අනන්තරයන් හා මිශ්‍ර නොවූයේ **ප්‍රකෘතොපනිශ්‍රය** යැ යන අර්ථයි. "ශ්‍රද්ධාව (මෙලොව පරලොව සැප ලැබේ. යන ආදහිම) නිසා ශ්‍රද්ධාව උපනිශ්‍රය කොට දන් දේ; සිල් රකී; සමාපත්ති උපදවයි. සීල-ශ්‍රැත - ත්‍යාග - ප්‍රඥ නිසා දන් දේ; සිල් රකී; පෙහෙවස් රකී; ධ්‍යාන - විදර්ශනා මාර්ග - අභිඥ - සමාපත්ති උපදව යි. ශ්‍රද්ධා-ශීල - ශ්‍රැත - ත්‍යාග - ප්‍රඥවෝ, ශ්‍රද්ධා - ශීල - ශ්‍රැත - ත්‍යාග - ප්‍රඥවනට උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ*" යයි යනාදි ක්‍රමයෙන් අනෙක ප්‍රකාරයෙන් ප්‍රභෙද දත යුතු. මෙසේ මේ ශ්‍රද්ධාදි ය ප්‍රකෘත වූවෝ ද, බලවත් කාරණයෙන් උපනිශ්‍රය ද වෙත්ය යි **ප්‍රකෘතොපනිශ්‍රය** නම්.

10. පුරෙජාත ප්‍රත්‍යය.

ප්‍රත්‍යයසමුත්පන්නයනට ප්‍රථම ඉපිද පැවැතීමෙන් (වර්තමාන භාවයෙන්) උපකාරක ධර්ම **පුරෙජාත ප්‍රත්‍යය** යැ මේ වූ කලී රූප ධර්ම වශයෙන් ම ලැබේ. ප්‍රත්‍යයොත්පන්නයෝ අරූප ධර්මයෝ මැ සි.

(කලින් හටගෙන පසු වැ හටගන්නා ගස්-වැල් වලට උපකාර වන පොළොව මෙනි.) ඒ පුරෙජාත ප්‍රත්‍යය පඤ්චවාරයෙහි පඤ්ච වස්තු - පඤ්චාලම්බන වශයෙන් ද, සියලු තන්හි හෘදය වස්තු වශයෙන් ද **එකොළොස් වැදෑරුම්** වේ.

මෙසේ හෙද; (1) **වස්තුපුරෙජාතය** (2) **ආලම්බන පුරෙජාතය** යි දෙවැදෑරුම් වේ. ඒ සියල්ල නිෂ්පන්න රූප මැ සි.

"චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං පුරෙජාත පච්චයෙන පච්චයෝ. සොතායතනං - ඝාණ - ජිව්හා - කායායතනං රූප - සද්ද - ගන්ධ - රස - ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්ත-

*ප: ප: පච්චයනිද්දෙස

කානං ච ධම්මානං පුරෙ ජාතපච්චයෙන පච්චයෝ. රූප-සද්ද - ගන්ධ රස - ඵොට්ඨබ්බායතනානං මනොධාතුයා, තං සම්පයුත්තකානං ච ධම්මානං පුරෙජාත පච්චයෙන පච්චයෝ. යං රූපං නිස්සාය මනෝ ධාතු ච මනෝ විඤ්ඤාණ ධාතු ච වත්තන්ති තං රූපං මනෝ ධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං පුරෙජාත පච්චයෙන පච්චයෝ. මනෝ විඤ්ඤාණ-ධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං කඤ්චි කාලෙ පුරෙජාත පච්චයෙන පච්චයෝ. කඤ්චිකාලෙ න පුරෙජාත පච්චයෙන පච්චයෝ''*

'පළමු උපන් චක්ඛායතනය චක්ඛු විඤ්ඤාණ ධාතුවට ද, තත් සම්ප්‍රයුක්ත ධර්මයනට ද වසතු පුරෙජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. (සොත - කායායතන ද, රූප - ඵොට්ඨබ්බායතන ද මෙසේ මැ සි.) රූප - ඵොට්ඨබ්බායතන මනෝ ධාතුවට ද, තත් සම්ප්‍රයුක්ත යනට ද පුරෙජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. යම් (හෘදයවස්තු) රූපයක් නිසා මනොධාතු - මනෝ විඤ්ඤාණ ධාතු පවතී ද; ඒ (හෘදයවස්තු) රූපය මනෝ ධාතු - මනෝ විඤ්ඤාණධාතූන්ට හා තත් සම්ප්‍රයුක්තයනට ප්‍රවෘත්ති කාලයෙහි පුරෙජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධි කාලයෙහි පුරෙජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය නො වේ' මෙද **වස්තු පුරෙජාතයි.**

රූපායතනාදි පස චක්ඛු විඤ්ඤාණාදියට හා තත් සම්ප්‍රයුක්ත ධර්මයනට **ආලම්බන පුරෙජාත** ප්‍රත්‍යය වේ.

විශෙෂ:- චක්ෂුරාදි වස්තූන් ගේ හා රූපාදි ආලම්බනයන් ගේ ගැටීමෙන් චක්ෂුර්විඤ්ඤාණාදිය උපදී. එසේ වනුයේ ඒවා කලින් ඉපිද ඒතෘක් පැවැති නිසා ය. එසේ ඔවුන් ගේ කලින් ඉපිද පැවැත්ම ම පුරෙජාත ප්‍රත්‍යය බව යැ.

---

11. පශ්චාජ්ජාත ප්‍රත්‍යය.

පළමු උපන් රූප ධර්මයනට උපස්තම්භක වීමෙන් උපකාර වන්නා වූ අරූප ධර්මයෝ පශ්චාජ්ජාත ප්‍රත්‍යයෝ සි. ගිජුළිහිණි පැටිවුන් ගේ ශරීරවලට පසු වැ ඇතිවන ආහාර ආසා චෙතනාව මෙනි. (මින් මනොසඤ්චෙතනාහාර වශයෙන් පවත්නා අරූප ධර්මයන්ගෙන් රූප කායයට උපස්තම්භක බව දැක්වී'' මේ ටීකා වචන සි)

''පච්ඡාජාතා චිත්ත චෙතසිකා ධම්මා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස පච්ඡාජාත පච්චයෙන පච්චයෝ*'' පසුවැ උපන් චිත්ත-

---

*ප: ප: පච්චය නිද්දෙස

චෛතසික ධර්ම පළමු උපන් මේ රූප කායඤ්ච පශ්චාජ්ජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. (රූප ධර්ම හා ආරූප විපාක සහර ද හැර සෙසු චිත්ත චෛතසික ධර්මයෝ පශ්චාජ්ජාත ප්‍රත්‍යය සි.)

12. ආසෙවන ප්‍රත්‍යය.

ප්‍රගුණභාවයෙන් තමහට අනතුරුවැ උපදනා සඵජාතීය ධර්මයන්ට පුර දු බලවත් බැවින් උපකාරක ධර්ම ආසෙවන ප්‍රත්‍යය යැ. උද්ග්‍රහණ කළ ග්‍රන්ථාදීන් ගේ ප්‍රථම-ප්‍රථම උද්ග්‍රහණ ශ්‍රවණ ධාරණාදිය මෙනි. එය කුසල ජවන, අකුසල ජවන, ක්‍රියා ජවන යයි ත්‍රිවිධ වේ. (කුසල, අකුසල, ක්‍රියා ජවනයෝ සඵජාතීය ජවනයනට ආසෙවන ප්‍රත්‍යය වේ. විපාකයන් ගේ නිරුත්සාහ ශාන්ත භාවයෙන් ආසෙවන ප්‍රත්‍යය නොවේ)

"පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං ආසෙවන පච්චයෙන පච්චයා. පුරිමා පුරිමා අකුසලා -පෙ- පුරිමා පුරිමා ක්‍රියාබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං ක්‍රියාබ්‍යාකතානං ධම්මානං ආසෙවන පච්චයෙන පච්චයෝ"*

'අනන්තරාතීත පළමු පළමු කුසල ජවනයෝ පසුව-පසුවැ උපදනා කුසල ජවනයනට ආසෙවන ප්‍රත්‍යය වෙති. පළමු-පළමු අකුසල් -පෙ- පළමු-පළමු උපදනා ක්‍රියා ජවනයෝ පසුවැ-පසුවැ උපදනා ක්‍රියා ජවනයනට ආසෙවන ප්‍රත්‍යය වෙත්.

විශෙෂ:- සමාන ජාතික වූ ම පූර්ව-පූර්ව ජවනයෝ පසුවැ-පසුවැ උපදනා ජවනයනට වාසනා වශයෙන් ආසෙවන ප්‍රත්‍යය වෙති.

13. කර්ම ප්‍රත්‍යය.

සිත මෙතෙය වීම් සඞ්ඛ්‍යාත ක්‍රියා (ආයූහන) භාවයෙන් සම්ප්‍රයුක්ත ධර්මයනට උපකාර වූ චෙතනාව **කර්ම ප්‍රත්‍යය** යැ.

විභාග:- කාය විඥප්ති - වාක් විඥප්තිහු කාය-වාක් ප්‍රයෝග-යන් ගෙවන්නාහේ චෙතනාව ද (ආයූහන) පිළියෙල කිරීම් වශයෙන් සිත මෙතෙයවා එයින් ඒ චෙතනාව උපන් ක්‍රියා භාවයෙන් විශිෂ්ට වූ සන්තානයෙහි සෙසු ප්‍රත්‍යය සමාගමයෙහි පවත්නා වූ විපාකයන්ට හා කර්මසමුත්ථාන රූපයන්ට ද ඒ සන්තානය විශෙෂ වූ ක්‍රියා භාවයෙන් උපකාර වේ. ඒ ක්‍රියා භාවයා ගේ ප්‍රවෘත්ති හෙයින් විපාකයන් ගේ හා කර්මසමුත්ථාන

*ප: ප: පච්චයනිද්දෙසය.

රූපයන් ගේ ප්‍රවෘත්තිය අනික් පරිද්දෙකින් නොවේ. සහජාත-යනට ක්‍රියා භාවයෙන් උපකාර වේය යනු කියනුම කිම! (කායඃඛ – චිත්තඃඛ – චිත්තඃඛයන් මෙහෙයවන්නාක් මෙන් පවත්නා චිත්ත ප්‍රයෝගය වූ චෙතනාව **කර්ම ප්‍රත්‍යය යි.**

ප්‍රභේද. එය (1) **නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය.**

(2) **සහජාත කර්ම ප්‍රත්‍යයැ යි** විවිධ යැ.

(1) **"කුසලාකුසලං කම්මං විපාකානං ඛන්ධානං කටත්තා ච රූපානං කම්මපච්චයේන පච්චයෝ.** (2) **සහජාතා චේතනා සම්පයුත්තකානං ඛන්ධානං තං සමුට්ඨානානං ච රූපානං කම්මපච්චයේන පච්චයෝ"***

(1) කුශලාකුශල (චෙතනාව) කර්මය, විපාකස්කන්ධයන්ට හා තත් සමුත්ථාන රූපයන්ට කර්මප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. (මේ නානාක්ෂණික කර්මප්‍රත්‍යය යි)

(2) සහජාත චෙතනාව තත් සම්ප්‍රයුක්තයනට හා තත් සමුත්ථාන රූපයනට කර්මප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. (මේ සහජාත කර්මප්‍රත්‍යය යි.)

(**නිදර්ශන**:- කලින් සකස් කළ සාලි බීජය මනු අඛ්කුරොත්පාදකයට උපකාර වන්නාක් මෙනි. (තමා පැවැති අවස්ථාවෙන් පසුවැ රූපාරූප ධර්මයන් උපදවන චෙතනාව **නානාක්ෂණික කර්මප්‍රත්‍යය යැ** තමා උපදනා කෙණෙහිම රූපාරූප ධර්මයන් උපදවන චෙතනාව **සහජාත කර්මප්‍රත්‍යය යි.**)

14. විපාක ප්‍රත්‍යය.

නිරුත්සාහ ශාන්ත භාවයෙන් එබඳු වූ ම සත්සුන් බවට උපකාර වන්නා වූ ධර්ම සමූහය **විපාක ප්‍රත්‍යය යැ.**

විශේෂ:- චිත්ත-චෛතසිකයන් ගේ ශාන්ත භාවය **කෙලෙශ**-ප්‍රහාණයෙන් ද, **වෙග මන්ද** භාවයෙන් ද වේ. ධ්‍යාන ලාභීන් ගේ හා ආර්‍යයන් ගේ සිත් කෙලෙශ ප්‍රහාණයෙන් ශාන්ත වේ. විපාක චිත්තයන් ගේ ශාන්ත භාවය වෙග මන්ද භාවයෙන් වේ. 'නිරුත්සාහ ශාන්ත භාවයෙනැ'යි කියේ එහෙයිනි.

තවද:- ඒ විපාක ප්‍රත්‍යය ප්‍රවෘත්ති කාලයෙහි විපාක චිත්තයෙන් උපදනා රූපයන්ට ද, ප්‍රතිසන්ධියෙහි කර්මජ රූපයන්ට ද, ප්‍රතිසන්ධි-ප්‍රවෘත්ති දෙක්හිම තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද ප්‍රත්‍යය වේ.

---

*ප: ප: පච්චයනිද්දෙස

"විපාකාබ්‍යාකතෝ එකෝ ඛන්ධෝ තිණ්ණන්නං ඛන්ධානං චිත්තසමුට්ඨානානං ච රූපානං විපාකපච්චයෙන පච්චයෝ -පෙ- පටිසන්ධික්ඛණේ විපාකාබ්‍යාකතෝ එකෝ ඛන්ධෝ තිණ්ණන්නං ඛන්ධානං කටත්තා ච රූපානං, තයෝ ඛන්ධා එකස්ස ඛන්ධස්ස මෙ ඛන්ධා මිනන්තං ඛන්ධානං කටත්තා ච රූපානං විපාක පච්චයෙන පච්චයෝ. ඛන්ධා විත්ථුස්ස විපාකපච්චයෙන පච්චයෝ"*

'විපාක අව්‍යාකෘත වූ එකම නාම සඤ්ඤයෙක් සහජාත වූ නාම සඤ්ඤ තුනට ද, විපාක චිත්තයෙන් හටගත් රූපයන්ට ද, **විපාක ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය** වේ. -පෙ- ප්‍රතිසන්ධි **ක්ෂණයෙහි** විපාක අව්‍යාකෘත වූ එක් නාම සඤ්ඤයෙක් සහජාත තුන් නාම ස්කන්ධයනට හා ප්‍රතිසන්ධි කර්මජ රූපයනට ද, තුන් නාම ස්කන්ධයෝ එක් නාමස්කන්ධයකට ද, නාමස්කන්ධ දෙකක් නාම ස්කන්ධ දෙකකට ද, කර්මජ රූපයනට ද, විපාක ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙති. පඤ්ච වොකාර භවයෙහි ප්‍රතිසන්ධි නාම ස්කන්ධයෝ හෘදය වස්තු රූපයට ද විපාක ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්.'

---

15. ආහාර ප්‍රත්‍යය.

රූප-අරූප ධර්මයනට් උපස්තම්භක භාවයෙන් (රැකුල්-දීමෙන්) උපකාරක කබළීකාරය, ඵස්සය, මනොසඤ්චේතනාය, විඤ්ඤාණය යන සතර ආහාර ප්‍රත්‍යය යැ. (රූප – අරූප වශයෙන් ආහාර දෙකොටසෙකි.)

විශෙෂ :– ජනකත්වය ඇත ද ආහාරයන් ගේ ප්‍රධාන කෘත්‍යය උපස්තම්භකත්වය යි.

විස්තර :– ජනකත්වය ඇත ද අරූපාහාරයන්ගේ ද, ආහාරජ රූප සමුට්ඨාපක රූපාහාරයන් ගේ ද, උපස්තම්භකත්වය වේ. ජනකත්වය නැති කල්හි දු චතුසමුට්ඨානික රූපොපස්තම්භක රූපයාගේ ද, උපස්තම්භකත්වය වේ. එහෙත් උපස්තම්භකත්වය නැති කල්හි ආහාරයන් ගේ ජනකත්වය නැත්නුයි උපස්තම්භකත්වය ප්‍රධානයි.

(තවද 'ආහාර ද උපදනේ ම අව්වෙජ්ද විසින් උපස්තම්භනය කෙරෙමින් ම උපදීනු යි' උපස්තම්භක බවම ආහාර බවම යැයි උපස්තම්භක අර්ථයෙන් යැයි කීහු.)

"කබළීකාරෝ ආහාරෝ ඉමස්ස කායස්ස ආහාරපච්ච-

---

*ප: ප: පඤ්ඤවාර

යෙන පච්චයෝ. අරූපිනෝ ආහාරා සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං ආහාරපච්චයෙන පච්චයෝ"* 'කබලීකාරාහාර සඞ්ඛ්‍යාත (ඕජාව) රූපාහාරය මෙම කයට ආහාර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. අරූපී ආහාර තත් සම්ප්‍රයුක්ත අරූපී ධර්මයනට ද, එයින් උපදනා (චිත්තජ) රූපයනට ද, ආහාර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

විශේෂ:- **"පටිසන්ධික්ඛණෙ විපාකාඛ්‍යාකතා ආහාරා තං සම්පයුත්තකානං ඛන්ධානං කටත්තා ච රූපානං ආහාර පච්චයෙන පච්චයෝ"*** 'ප්‍රතිසන්ධික්ෂණයෙහි විපාක අබ්‍යාකත ආහාර (අරූපී ආහාර) සම්ප්‍රයුක්ත ධර්මයනට ද, තමන් හා උපදනා කර්මජ රූපයන්ට ද, ආහාර ප්‍රත්‍යය වේ. මෙහි රූපාහාරය රූප ධර්මයන්ට ආහාර ප්‍රත්‍යය වේ. අරූපාහාරයෝ රූප ධර්මයන්ට ද ප්‍රත්‍යය වෙති. එය ද චිත්ත සමුට්ඨාන රූපයනට පමණක් නොව ඇතැම් කලෙක කර්මජ රූපයනට ද ප්‍රත්‍යය වන බව ප්‍රශ්න වාරයෙහි වදාළහ.

හැල් බීජයෙන් හැඟෙන අංකුරය පෘථිවි - අප් - රසාදිය ලැබීමෙන් වැඩෙන්නා සේ කර්මයෙන් උපදනා රූපයෝ ඍතු-ආහාර ප්‍රත්‍යය ලැබී පවත්නෝ (වැඩෙන්නෝ) වෙති.

(**විසඳුම**:- කබලීකාරාහාරය තමා පිහිටි රූප කලාපයෙහි අන්‍ය රූපයන්ට ද, අන්‍ය රූප කලාපයන්ට ද ප්‍රත්‍යය වන චතුසමුට්ඨානික ඕජාව වූ කබලීකාරාහාරය චතුසමුට්ඨානික රූප පුඤ්ජය වූ මේ කය ට උපස්තම්භක වීම් වශයෙන් අවිච්ඡින්න ප්‍රවෘත්තියට උපකාර වේ. **එස්ස - මනොසඤ්චෙතනා - විඤ්ඤාණ** - යන අරූපාහාර තුන **එකූන්අනූ චිත්තය, දෙපනස් චෛතසිකය** යන සම්ප්‍රයුක්ත ධර්මයන්ට හා චිත්තජ රූපය, ප්‍රතිසන්ධිකර්මජ රූපය යන මොවුන්ට ආහාර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

විශෙෂ:- මෙහි කබලීකාරාහාරය නමින් බාහිර ඕජාව හා චතුසමුට්ඨානික ඕජාවම ගැනේ. එහෙත් කබලකොට අනුභව කළ ආහාරය ම ආහාර ප්‍රත්‍යය වීමට සමර්ථ වේ. බාහිර ඕජාව එයට සමර්ථ නො වේ. එහෙයින් මෙහි ආහාරය යි නො කියා විශෙෂ-යෙන් කබලීකාරාහාරය යි වදාළ හ.

රූපාහාරයෙහි ජනක-උපස්තම්භක යන ශක්ති දෙක ම ඇත්තේ යැ. බාහිර ඕජාව ආහාරජ රූපයනට ජනක ප්‍රත්‍යය වේ එය කර්මජ - චිත්තජ - ඍතුජ රූපයනට උපස්තම්භක වේ. ඒ ත්‍රිජ රූපයන්හි ඕජාව චතුසමුට්ඨානික රූපයනට උපස්තම්භක වේ.

*ප: ප: පඤ්හවාර

නොහොත් එක් කලාපයෙකැ ඕජාව ඒ කලාපයේ රූපයන්ට ජනක ප්‍රත්‍යය වේ. අන්‍ය රූප කලාපයන්ට උපස්තම්භක ප්‍රත්‍යය වේ.

---

16. ඉන්ද්‍රිය ප්‍රත්‍යය. අධිපති අර්ථයෙන් උපකාර වන්නා වූ ධර්මයෝ **ඉන්ද්‍රිය ප්‍රත්‍යයයෝ** සි.

ඒ මෙසේ සි:- තමා හා සම්බන්ධ ධර්මයන් තම තමා **අයත්** කෘත්‍යයන්හි තම තමා අයත් සවභාවය නො ඉක්ම තමහට **අනුකූල** කරවීම් වශයෙන් ඊශ්වරත්වය පැවැත්වීම යැ මෙහි සවභාවය. ස්ත්‍රී-පුරුෂ-ඉන්ද්‍රිය දෙක හැර සෙසු විසි ඉන්ද්‍රියයෝ ඉන්ද්‍රිය ප්‍රත්‍යයයෝ සි.

"චක්ඛුන්ද්‍රියං චක්ඛුවිඤ්ඤාණධාතුයා -පෙ- සොත - ඝාණ- ජිව්හා - කායින්ද්‍රියං කාය විඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්ත- කානඤ්ච ධම්මානං - ඉන්ද්‍රිය පච්චයේන පච්චයෝ. රූපජී- විතින්ද්‍රියං කටත්තාරූපානං ඉන්ද්‍රිය පච්චයේන පච්චයෝ. අරූපිනෝ ඉන්ද්‍රියා සම්පයුත්තකානං ච ධම්මානං තං සමුට්ඨා- නානං ච රූපානං ඉන්ද්‍රිය පච්චයේන පච්චයෝ*" 'චක්ෂුරින්ද්‍රිය චක්ෂුර්විඥාන ධාතුවට හා තත් සම්ප්‍රයුක්ත ධර්මයනට ද **ඉන්ද්‍රිය ප්‍රත්‍යයයෙන්** ප්‍රත්‍යය වේ.

රූප ජීවිතින්ද්‍රියය කර්මජ රූපයනට ද ඉන්ද්‍රිය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. සෙසු අරූප ඉන්ද්‍රියයෝ සම්ප්‍රයුක්ත ධර්මයනට හා තත් සමුත්ථාන රූපයනට ද **ඉන්ද්‍රිය ප්‍රත්‍යයයෙන්** ප්‍රත්‍යය වේ.

ප්‍රශ්නවාරයෙහි:- **"පටිසන්ධික්ඛණේ විපාකාබ්‍යාකතා ඉන්ද්‍රියා තං සම්පයුත්තකානං ධම්මානං කටත්තා ච රූපානං ඉන්ද්‍රිය පච්චයෙන පච්චයෝ"** සි 'ප්‍රතිසන්ධි ක්ෂණයෙහි විපාක අව්‍යාකෘත ඉන්ද්‍රියයෝ ඒ හා සම්ප්‍රයුක්ත සකන්ධයනට ද, කර්මජ රූපයනට ද ඉන්ද්‍රිය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙති' සි වදරන ලදී.

විස්තර:- අධිපති ප්‍රත්‍යය තම් සෙසු ධර්මයන් ගේ ප්‍රවෘත්තිය වළකා තමහට අවනත කරගැනීම් වශයෙන් බල පැවැත්මේ ශක්තී විශෙෂයෙකි. ඉන්ද්‍රිය ප්‍රත්‍යය තම් දර්ශනාදි කෘත්‍යයෙහි චක්ෂුර්විඥානාදිය ද, ජීවිතයෙහි කර්මජ රූපයන් ද, සෙසු තාම ඉන්ද්‍රිය ධර්මයන් තත් සම්ප්‍රයුක්ත ධර්මයන් හා එයින් උපදනා රූප විෂයෙහි ඒ ඒ කෘත්‍යයෙහි ද, චක්ෂුඃප්‍රසාදාදියට අනුවර්තක වීම් වශයෙන් (අනුවැ) පැවැත්ම සි.

---

*ප: ප: පට්ඨාන නිද්දෙස ‡ප: ප: පඤ්හවාර

චක්ෂුරින්ද්‍රියාදි පඤ්චප්‍රසාද ද, ජීවිත රූපය ද, නාම ජීවිතෙන්ද්‍රිය ද, සුඛ වෙදනාදී පඤ්ච වෙදනා ඉන්ද්‍රිය ද, ශ්‍රද්ධාදී අෂ්ට නාම ඉන්ද්‍රිය ද, චක්ෂුර්විඤ්ඤාණය හා තත් සම්ප්‍රයුක්ත ධර්ම ද, කර්මජ රූප ද, සම්ප්‍රයුක්ත ධර්ම ද, තත් සමුත්ථාන රූප ද තමහට අනුවැ පැවැත්වීමෙන් ඒ ඒ කෘත්‍යයන්හි යෙදෙන සේ ඊශ්වරත්වය පැවැත්ම ඉන්ද්‍රිය ප්‍රත්‍යය ස්වභාවය යි.)

රටවැසියාගේ තම තමා අයත් කෘත්‍යයෙහි යෙදීමට රජු ගේ ඊශ්වරත්වය උපකාර වන්නාක් මෙනි.

විශෙෂ:- ස්ත්‍රී-පුරුෂ භාව රූපඛය කර්මාදි අන්‍ය ප්‍රත්‍යයෙන් උපදනා රූපයන්ට තම ස්වරූපය වූ ස්ත්‍රීභාව-පුරුෂභාව ගන්වන හෙයින් ඉන්ද්‍රිය වෙතත් සෙසු ප්‍රත්‍යයන් සේ ජනකත්වයෙන් හෝ උපත්ථම්භකත්වයෙන් හෝ අනුපාලකත්වයෙන් හෝ නො පවතින හෙයින් ඉන්ද්‍රිය ප්‍රත්‍යය නො වේ.

(ඉන්ද්‍රිය ප්‍රත්‍යයයෝ තමා හා බැඳී සිටින රූප – අරූප ධර්මයනට සෑම අවස්ථාවන්හි ම අනුපාලකත්වයෙන් උපකාර වෙති.)

17. ඣාන ප්‍රත්‍යය. ලක්ෂණ - ආලම්බන වශයෙන් උපනිධ්‍යායන (අරමුණු බැලීම්) අර්ථයෙන් උපකාරක වූ දිවිපැවැත්ම යෙහි සුඛ-දුඃඛ-වෙදනා ක්ෂය හැර සෙසු කුසලාදිභෙද වූ සිත්හි පවත්නා **විතක්ක - විචාර - ප්‍රීති - එකාග්‍රතා - සෞමනස්‍ය - දෞර්මනස්‍ය - උපෙක්ෂා** යන සත් ධ්‍යානාඞ්ග **ඣාන ප්‍රත්‍යය යැ.**

විශෙෂ:- විපැවැත්මසුසුණෙහි වූ උපෙක්ඛා - එකග්ගතා ඣානාඞ්ග නො වේ.

"ඣානඞ්ගානි ඣානසම්පයුත්තකානංච ධම්මානං තං සමුට්ඨානානංච රූපානං ඣානවචනෙන පච්චයෝ*" 'විතක්කාදී ඣානාඞ්ග ඒ හා සම්ප්‍රයුක්ත ධර්මයනට හා තත් සමුත්ථාන රූපයනට ඣාන ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ' යැ යි වදළහ.

(**විස්තර**:- තමා හා සම්ප්‍රයුක්ත චිත්ත-චෛතසික ධර්මයන් හා කර්මජ රූපයන් අනිත්‍යාදි ලක්ෂණයෙහි හා කසිණාදි ආලම්බනයෙහි මනාවැ නැංවීම ය, පිරිමැදීම ය, පිණවීම ය, වැඩීම ය, මනාවැ පිහිටුවීම ය, යන මොවුන් ගේ වශයෙන් පවත්නා විතක්කාදි ධර්ම හා සෞමනස්ස - දෞමනස්ස - උපෙක්ඛා වෙදනාවෝ ද, **ඣාන ප්‍රත්‍යයෝ සි.** අරමුණු පිරිමැදීම් වශයෙන් ද පච්චනීක ධර්ම දැවීම් වශයෙන් ද **මහග්ගත ලෝකුත්තර** සිත්හි යෙදේ.)

*ප: ප: පච්චයනිද්දෙස

ප්‍රශ්න වාරයෙහි:- **"පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතා නි ක්ඛානඛන්ධානි සම්පයුත්තකානං ඛන්ධානං කටත්තාරූපානං ක්ඛානපච්චයෙන පච්චයෝ*"** 'ප්‍රතිසන්ධි ක්ෂණයෙහි ප්‍රතිසන්ධි සිත් එකුන්විස්ස ය. චෛතසික පන්තිස ය. යන මොවුන් හා සම්ප්‍රයුක්ත වූ විතර්කාදි පස සම්ප්‍රයුක්ත **සකන්ධයතට** හා කර්මජ රූපයනට ධ්‍යාන ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ'යැයි ද වදාරණ ලදී.

18. මාර්ග ප්‍රත්‍යය. කුශල පක්ෂයෙන් හෝ අකුශල පක්ෂයෙන් හෝ තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන් සුගති - දුර්ගති - නිර්වාණයන්ට අභිමුඛ කිරීම් වශයෙන් උපකාර වන්නා වූ ධර්මයෝ **මාර්ග ප්‍රත්‍යයයෝ** යි.

(ඔහු **සම්මාදිට්ඨි** ආදී අට හා මිච්ඡාදිට්ඨි ආදී සතර දැ යි දෙළොසෙකි.) **"මග්ගඛන්ධානි මග්ගෙ සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානං ච රූපානං මග්ගපච්චයෙන පච්චයෝ‡"**

'එකී මාර්ගාඞ්ගයෝ මාර්ගසම්ප්‍රයුක්ත ධර්මයනට හා තත් සමුත්ථාන රූපයනට මාර්ග ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ' යැ යි එසින් වදාළහ.

මෙහි මාර්ග සම්ප්‍රයුක්ත ධර්ම නම් සහෙතුක සිත් එක් සැත්තැවය, චෛතසික දෙපනසය යන මොහු ය. තත් සමුත්ථාන රූප නම් එම මාර්ගාඞ්ග සම්ප්‍රයුක්ත සහෙතුක චිත්තජ රූපය, සහෙතුක ප්‍රතිසන්ධි කර්මජ රූපය යන මොහු ය.

මාර්ගාඞ්ග නම්:- පඤ්ඤා - විතක්ක - විරතිත්තය - විරිය - සති - එකග්ගතා - දිට්ඨි යන චෛතසික තවය යි.

ප්‍රශ්න වාරයෙහි:- **"පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතානි මග්ගඞ්ගානි තං සම්පයුත්තකානං ඛන්ධානං කටත්තානං ච රූපානං මග්ගපච්චයෙන පච්චයෝ"***

'ප්‍රතිසන්ධි ක්ෂණයෙහි විපාක අව්‍යාකෘත වූ මාර්ගාඞ්ග සම්ප්‍රයුක්ත සකන්ධයනට හා කර්මජ රූපයනට මාර්ග ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.'

විශෙෂ:- ප්‍රත්‍යය වාරයෙහි කී "තං සමුට්ඨානානං රූපානං" යන්නෙන් ම කටත්තා රූපානං යන්නෙන් කී අර්ථය දක්වන ලදී. එහෙත් මෙහි සවරූපයෙන් ගැනීම සඳහා කියන ලදී. පෙර කී ධ්‍යාන ප්‍රත්‍යය හා මේ මාර්ග ප්‍රත්‍යය දෙපස් විඤ්ඤාණයෙහි හා අහෙතුක චිත්තයන්හි නො ලැබේය යි දත යුතු.

*ප: ප: පඤ්හවාර. ‡ප: ප: පච්චය නිද්දෙස

19. සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය:- සමවැ හෝ එක්වැ හෝ ඒකවසනුක - ඒකාලම්බන - ඒකොත්පාද - ඒකනිරෝධ ගත සම්ප්‍රයුක්ත භාවයෙන් උපකාරක ධර්මයෝ **සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයයෝ** යි.

"වත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤං සම්පයුත්ත පච්චයේන පච්චයෝ*"

'අරූපී සතර නාම ස්කන්ධ ඔවුනොවුන්ට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ'

(**විභාග**:- පෙර කී ඒකවසනුකාදි ලක්ෂණ සතරින් ම යුක්ත වන නාම **ස්කන්ධයෝ** (චිත්ත - චෛතසික) අරූප ධර්මයෝ මැ යි. එහෙයින් එකවට උපදනා චිත්ත - චෛතසික ධර්මයෝ තමන් තමන් අන්‍යයන් හා සම්ප්‍රයුක්ත වීම හා අන්‍යයන්ගේ සම්ප්‍රයුක්ත බව තමන් ලැබීම ද ඇති හෙයින් ඔවුනොවුන්ට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ද, සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයෝත්පන්න ද වෙති.

20. විප්‍රයුක්ත ප්‍රත්‍යය:- පෙර කී ඒකවසනුකාදි බවට නො පැමිණීමෙන් රූපී ධර්මයනට උපකාර නො වන අරූපී ධර්ම ද, අරූපීනට උපකාර නො වන රූපී ධර්ම ද **විප්‍රයුක්ත ප්‍රත්‍යයෝ** යි. මේ වෙන් වෙන් වැ පැවැත්ම ය. ඒ විප්‍රයුක්ත ප්‍රත්‍යය ය (1) **සහජාත** (2) **පච්ඡාජාත** (3) **පුරෙජාත** වශයෙන් ත්‍රිවිධ ය.

(1) **"සහජාතා කුසලා ඛන්ධා චිත්තසමුට්ඨානානං රූපානං විප්පයුත්තපච්චයේන පච්චයෝ‡"** 'එකවට උපදනා කුශල-ස්කන්ධ චිත්තසමුත්ථාන රූපයනට **විප්‍රයුක්ත ප්‍රත්‍යය** වේ. (2) **"පච්ඡාජාතා කුසලා ඛන්ධා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස විප්පයුත්ත පච්චයේන පච්චයෝ‡"** පසුවැ උපන් කුශල ස්කන්ධ පළමු උපන් මේ කයට විප්‍රයුක්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

විභාග:- කුසල් සිත් එක්විස්ස ද, අකුසල සිත් දෙළොස ද, ඔවුන් හා සම්ප්‍රයුක්ත චෛතසික ද ඒ හා උපදනා රූපයනට **සහජාත විප්‍රයුක්ත** වේ.

පසුවැ උපදනා වේදනාදි කුශල ස්කන්ධයෝ පඤ්චවොකාර භවයෙහි කර්මාදි ප්‍රත්‍යයෙන් උපදනා මේ රූප කායයට **පශ්චාජාත විප්‍රයුක්ත** ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

විශෙෂ:- නිර්වාණය අරූප ධර්මයනට ප්‍රත්‍යය නො වන්නා සේ ම රූප ධර්මයනට ද විප්‍රයුක්ත ප්‍රත්‍යය නො වේ

---

*පා: ප: පච්චය නිද්දෙස ‡ප: ප: පඤ්ඤාවාර

තව ද සහජාත විප්‍රයුක්ත විභඞ්ගයෙහි **"පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතා ඛන්ධා කටත්තා රූපානං විප්පයුත්ත පච්චයෙන පච්චයෝ*"** 'ප්‍රතිසන්ධි ක්ෂණයෙහි විපාක අව්‍යාකෘත සකඛ කර්මජ රූපයනට විප්‍රයුක්ත ප්‍රත්‍යය වේ.' සඤ්ඤ වස්තුවට ද, වස්තු සකඛියනට ද විප්‍රයුක්ත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේය යි වදාරණ ලදී.

(3) පුරෙජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය චක්ෂුරින්ද්‍රියාදි වස්තු වශයෙන් ම දත යුතුයි. ඒ මෙසේ යි. **"පුරෙජාතං චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණස්ස - පෙ - කායායතනං කායවිඤ්ඤාණස්ස විප්පයුත්තපච්චයේන පච්චයෝ. වත්ථු විපාකාබ්‍යාකතානං ක්‍රියාබ්‍යාකතානං ඛන්ධානං - පෙ - වත්ථු කුසලානං ඛන්ධානං වත්ථු අකුසලානං ඛන්ධානං විප්පයුත්ත පච්චයෙන පච්චයෝ*"** 'පළමු උපන් චක්ඛායතනය චක්ෂුර්විඤ්ඤාණය ද, -- පෙ - කායායතනය කායවිඤ්ඤාණය ද, පුරෙජාත විප්‍රයුක්ත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. හෘදය වස්තුව විපාක අව්‍යාකෘත සකඛියනට ද, හෘදය වස්තුව කුශල සකඛියනට ද, හෘදය වස්තුව අකුශල සකඛියනට ද විප්‍රයුක්ත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. මේ **පුරෙජාත විප්‍රයුක්ත** ය.

21. අඝනි ප්‍රත්‍යය:- තමා ගේ අසතිබවයෙන් (පැවැත්මෙන්) පවත්නා වූ ම ධර්මයනට උපස්තම්භක වීමෙන් උපකාරවත ධර්මය **අඝනි ප්‍රත්‍යය** යැ.

විශෙෂ:- මෙහි උපස්තම්භක වීමෙනැයි කියේ **"අත්ථි පාපං කම්මං කතං" "අත්ථි පුග්ගලෝ අත්තභිතාය පටිපන්නොතා‡"** යනාදියෙහි කී නිබ්බත්තිලක්ඛණ අත්ථි භාවය නිවාරණය සඳහා යැ. තව ද ජනකත්වය ඇත ද උපස්තම්භකත්වය මෙහි අසතිබවය යි ගැනේ.

මේ අසතිබවය ද වස්තු - ආලම්බන - සහජාත - ආදීන්ට සාධාරණ වූ අසතිබවයෙන් උපකාරත්වය යි දත යුතු

එය **අරූපක්ඛන්ධ - මහාභූත - නාමරූප - චිත්ත චෙතසික - මහාභූත - ආයතන - විඤ්ඤාණරූප** වශයෙන් සත් ආකාරයෙකින් මාතෘකා තබන ලදී.

ඒ මෙසේ යි:- **"චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඝසමඝසීසං අත්ථි පච්චයෙන පච්චයෝ. චත්තාරෝ මහාභූතා - පෙ - ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඝසමඝසීසං, චිත්ත - චෙතසිකා -**

*පෘ: ප: පච්චය නිද්දෙස. ‡පුග්: ප: මාතිකා

ධම්මා චිත්ත සමුට්ඨානානං රූපානං, මහාභූතා උපාදා රූපානං, චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණ ධාතුයා - පෙ - කායායතනං, රූපායතනං - පෙ - ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං අඤ්ඤ පච්චයේන පච්චයෝ*"

රූපායතනං - පෙ - ඵොට්ඨබ්බායතනං මනොධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං.

යං රූපං නිස්සාය මනා ධාතු ච මනොවිඤ්ඤාණ ධාතු ච වත්තන්ති තං රූපං මනොධාතුයා ච මනාවිඤ්ඤාණ ධාතුයා ච තං සම්පයුත්තකානං ච ධම්මානං අඤ්ඤ පච්චයේන පච්චයෝ*"

(1) සතර අරූපස්කන්ධ ඔවුනොවුන්ට අසනි ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

(2) සතර මහාභූත ඔවුනොවුන්ට ද,

(3) අවක්‍රාන්ති ක්ෂණයෙහි නාම-රූප ඔවුනොවුන්ට ද,

(4) චිත්ත - චෛතසික ධර්ම චිත්ත සමුත්ථාන රූපයන්ට ද,

(5) මහාභූත උපාදාය රූපයනට ද,

(6) චක්ඛායතනය චක්ඛු විඤ්ඤාණ ධාතුවට ද, -පෙ- කායායතනය, රූපායතනය -පෙ- ඵොට්ඨබ්බායතනය කාය විඤ්ඤාණ ධාතුවට ද, තත් සම්ප්‍රයුක්ත ධර්මයනට ද, අසනි ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. රූපායතනය -පෙ- ඵොට්ඨබ්බායතනය මනොධාතුවට ද, තත් සම්ප්‍රයුක්ත ධර්මයනට ද,

(7) යම් රූපයක් නිසා මනොධාතුව ද, මනොවිඤ්ඤාණ-ධාතුව ද පවතිත් නම් ඒ රූපය මනොධාතුවට ද, මනො-විඤ්ඤාණ ධාතුවට ද, තත් සම්ප්‍රයුක්ත ධර්මයනට ද **අසනි ප්‍රත්‍යය-යෙන්** ප්‍රත්‍යය වේ.

මේ සත් ආකාර අසනි ප්‍රත්‍යයන් අතුරෙන් (1) සිට (5) දක්වා සහජාත වශයෙන් ද,

(6) පුරෙජාත වශයෙන් ද

(7) සහජාත - පුරෙජාත වශයෙන් ද අසනි ප්‍රත්‍යය දක්වන ලදී.

මෙසේ මේ පාඨයෙහි සහජාත - පුරෙජාත වශයෙන් ම අසනි ප්‍රත්‍යය දක්වන ලදී.

විශෙෂ:- පච්ඡාජාත- ආහාර- ඉන්ද්‍රිය- වශයෙනුදු අසනි ප්‍රත්‍යය ලැබෙතුදු එය මෙහි නො වදාළහ. සාවශෙෂ දෙශනා

* ප: ප: පඤ්ඤවාර

හෙයිනි. එහෙත් හෙතු දැක්වීම සඳහා ප්‍රශ්න වාරයෙහි වදාළ **"සහජාතං, පුරෙජාතං, පච්ඡාජාතං, ආහාරං, ඉන්ද්‍රියං."** සහජාත යැ, පුරෙජාත යැ, පච්ඡාජාත යැ, ආහාර යැ, ඉන්ද්‍රිය යැයි නික්ෂෙප කොට සහජාත විෂයෙහි **"එකෙකා ඛන්ධෝ තිණ්ණං ඛන්ධානං තං සමඞ්ගීනානං ච රූපානං අත්ථි පච්චයෙන පච්චයෝ"*** 'එකම විඤ්ඤාණස්කන්ධය වෙදනාදි සෙසු නාමස්කන්ධ තුනට ද, එයින් නිදහන රූපයනට ද **අත්ථි ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය** වේ' යනාදීන් දෙශනා කරන ලදී. පුරෙජාත අත්ථි ප්‍රත්‍යයෙහි **"චක්ඛායතනං චක්ඛු විඤ්ඤාණධාතුයා"*** යනාදීන් චක්ඛායතනාදීන් ගේ වශයෙන් නිද්දේශ කොට දක්වන ලදී පච්ඡාජාත අත්ථි ප්‍රත්‍යයෙහි පශ්චාජ්ජාත චිත්ත-චෛතසික-ධර්මයන් පුරෙජාත මේ කායයට පච්ඡාජාත ප්‍රත්‍යය වශයෙන් නිද්දේශ කරන ලදී. ආහාර ප්‍රත්‍යයයෙහි **"කබළීකාරෝ ආහාරෝ ඉමස්ස කායස්ස අත්ථි පච්චයෙන පච්චයෝ"*** 'කබළීකාරාහාරය මේ ශරීරයට අත්ථි ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ'ය යි ද,

ඉන්ද්‍රිය ප්‍රත්‍යයයෙහි **"රූපජීවිතින්ද්‍රියං කටත්තා රූපානං අත්ථි ප්‍රච්චයෙන පච්චයෝ"*** රූප ජීවිතින්ද්‍රියය කර්මජ රූපයනාට අත්ථි ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේය යි නිද්දේශ කරනලදී.

විශෙෂ:- මේ ආහාර - ඉන්ද්‍රිය ප්‍රත්‍යය දෙක ප්‍රත්‍යය වන ප්‍රත්‍යයොත්පන්න ධර්මයන් ගේ සහජාතාදි වශයෙන් භෙද නැති. තවද මෙය කුසල - අකුසල - විපාක - ක්‍රියා - රූප වශයෙන් ද පඤ්චවිධ වේ.

විශෙෂ:- නිර්ඝණය අත්ථි ප්‍රත්‍යය නො වේ. කාල විමුක්ත හෙයින් හා නාස්තිභාවයක් නො ලැබෙන හෙයිනි. අත්ථි ප්‍රත්‍යය වනුයේ ප්‍රත්‍යුත්පන්න භාවය නිසාම ප්‍රත්‍යයවන ධර්මයයි. (ටීකා-ගත විස්තාරය බලනු.) තවද අත්ථි ප්‍රත්‍යය වන ධර්මයන් අතුරින් නාම ධර්ම සහජාත - පච්ඡාජාත වශයෙන් ද, රූප සහජාත - පුරෙජාත වශයෙන් ද ප්‍රත්‍යය වේ.

---

22. නාස්ති ප්‍රත්‍යය:- තමනට අනතුරුවැ උපදනා අරූපී ධර්මයන් ගේ පැවැත්මට අවකාශ දීමෙන් උපකාර වන්නා වූ අනතුරු වැ නිරුඬ වූ චිත්ත - චෛතසික ධර්මයෝ **නාස්ති ප්‍රත්‍යයහ.**

---

*ප: ප: පඤ්හවාර

එයින් වදාළහ. **''සමනන්තර නිරුද්ධා චිත්ත චෙතසිකා ධම්මා පච්චුප්පන්නානං චිත්ත චෙතසිකානං ධම්මානං නත්ථි දූරත්තා පච්චයෙන පච්චයෝ''*** 'සමනන්තර නිරුද්ධ වූ චිත්ත-චෛතසික ධර්‍ම ප්‍රත්‍යුත්පන්න වූ චිත්ත - චෛතසික ධර්‍මයනට **නාස්ති-ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.**' (මෙහි විභාගය හා ප්‍රත්‍යය ක්‍රම ද අනන්තර ප්‍රත්‍යය සේයි)

23. විගත ප්‍රත්‍යය:- ඒ නාස්ති ප්‍රත්‍යය වූ ධර්‍මයෝ ම පහව යෑම් වශයෙන් උපකාරවන හෙයින් **විගත ප්‍රත්‍යය** නම් වෙති.

එහෙයින් ම **''සමනන්තර විගතා චිත්ත චෙතසිකා ධම්මා පච්චුප්පන්නානං චිත්තචෙතසිකානං ධම්මානං විගත පච්චයෙන පච්චයෝ''*** යි වදාළහ අර්‍ථ සුගමයි.

විශෙෂ:- නාස්තිභාවය නම් නිරෝධාසන්නතයෙහි ශූන්‍ය බවයි. විගතභාවය නම් නිරෝධ ප්‍රත්‍යය බවයි. (යනු සන්නසි.)

---

24. අවිගත ප්‍රත්‍යය:- අස්ති ප්‍රත්‍යය වන ධර්‍මයෝ ම අවිගත භාවයෙන් උපකාර වන හෙයින් **අවිගත ප්‍රත්‍යය** නම් වෙති.

විශෙෂ:- වෛනෙයාධ්‍යාශය වශයෙන් හා දෙශනා විලාශ වශයෙන් මෙසේ වදාළ බව මුත් **අස්ති - අවිගත** දෙක්හි වෙනසෙක් නැති. අහෙතුක දුකය වදාරා හෙතු විප්පයුත්ත දුකය වදාළාක් මෙනි. අස්තිභාව සඞ්ඛ්‍යාත සභාවයෙන් උපකාරකභාවය අස්ති ප්‍රත්‍යයයේ සභාවය යි. පහ නොවීම් සඞ්ඛ්‍යාත නිරෝධයට නො පැමිණීමෙන් උපකාරකභාවය අවිගත ප්‍රත්‍යයයේ සභාවයයි යනු (ටීකා මතයයි.)

අස්ති - නාස්ති ප්‍රත්‍යය දෙක වදාරා එපමණකින් නේරුම් ගත නොහැක්කවුනට නේරුම් ගැනීමේ පහසුව සඳහා **අවිගත-විගත ප්‍රත්‍යයෑ** යි අන් අයුරකින් වදාළහ (යනු අට්ඨ කථා නය යි.)

ප්‍රත්‍යය විභාගය.

(1) මේ සුවිසි ප්‍රත්‍යයන් අතුරින් **ආලම්බන - අනන්තර - සමනන්තර - උපනිශ්‍රය - පුරෙජාත - ආසෙවන - සම්ප්‍රයුක්ත - නාස්ති - විගත** යන ප්‍රත්‍යය නවය අරූප ධර්‍මයනට ප්‍රත්‍යය වේ.

*ප. ප: පච්චය නිද්දෙස

පශ්චාජාත ප්‍රත්‍යය රූප ධම්මයනට ප්‍රත්‍යය වේ.

සෙසු තුදුස් ප්‍රත්‍යයයෝ රූප - අරූප දෙකට ම ප්‍රත්‍යය වෙත්.

(2) **හෙතු - අනන්තර - සමනන්තර - ආසෙවන - පච්ඡා-ජාත - කම්ම - විපාක - ඣාන - මග්ග - සම්ප්‍රයුක්ත - නත්ථි - විගත** ප්‍රත්‍යයයෝ අරූප ධම්මයෝ යැ.

පුරේජාත ප්‍රත්‍යය රූප ධම්ම සි.

ආලම්බන - උපනිශ්‍රයමය ය ප්‍රඥප්ති හා රූප ධම්ම සි.

සෙස්සෝ රූපාරූප ධම්මයෝ වෙත්.

(3) **අනන්තර - සමනන්තර - ආසෙවන - නත්ථි - විගත** ප්‍රත්‍යයයෝ අතීත කාලිකයෝ ය. **ආලම්බනාදීසු ති - ආලම්බනෝපනිශ්‍රය** දෙක ත්‍රෛකාලික ද කාල විමුක්ත ද වේ.

කම්ම ප්‍රත්‍යය, අත්ථි - ප්‍රත්‍යුත්පන්න වශයෙන් ත්‍රිකාලික වේ.

සෙසු **පඤ්චොස** ප්‍රත්‍යුත්පන්න යැ.

(4) **අනන්තර- සමනන්තර අනන්තරූපනිශ්‍රය- ප්‍රකෘ-තූපනිශ්‍රය - ආසෙවන- නානාක්ඛණික කම්ම- නත්ථි- විගත ප්‍රත්‍යය** ද ජනකම වේ. උපස්තම්භක නො වේ.

පශ්චාජාත ප්‍රත්‍යය උපස්තම්භක වේ. ජනක නො වේ.

සෙස්සෝ ජනක ද, උපස්තම්භක ද වෙති.

මේ ප්‍රත්‍යය වශයෙන් විභාගය සි.

ප්‍රත්‍යය විනිශ්චය.

අවිද්‍යාව. මේ සූවිසි ප්‍රත්‍යයයන් අතුරින් අවිද්‍යාව

(1) පුණ්‍යාභිසංස්කාරයනට දෙපරිද්දෙකින් ද

(2) අපුණ්‍යාභිසංස්කාරයනට අනෙකාකාරයෙන් ද

(3) අනෙඤ්ජාභිසංස්කාරයනට එක් ආකාරයෙකින් ද ප්‍රත්‍යය වේ. ඒ බව:-

"පච්චයෝ හොති පුඤ්ඤානං - දුවිධා, නෙකධාපන
පරෙසං, පවිභීමාකං ඣා - එකධා පච්චයා මතා"

යන්නෙන් හෙළිවෙයි.

විසතර:- (1) පුණ්‍යාභිසංස්කාරයනට **ආලම්බන** ප්‍රත්‍යය යෙන් ද, **උපනිශ්‍රය** ප්‍රත්‍යයයෙන් ද සි **දෙපරිද්දෙකින්** ප්‍රත්‍යය වේ.

ඒ මෙසේ යි:- අවිද්‍යාව ක්ෂය - ව්‍යය වශයෙන් සතරමණ්ඩලය කරන කල්හි කාමාවචර පුණ්‍යාභිසංස්කාරයනට **ආලම්බන** ප්‍රත්‍යය යෙන් ප්‍රත්‍යය වේ.

අනිෂ්ට චිත්තක්ෂණයන් සමෝහ සිත් දැන ගන්නා කල රූපාවචර පුණ්‍යාභිසංස්කාරයනට ද, **ආලම්බන** ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

අවිද්‍යාව ඉක්මවීම පිණිස දානාදී කාමාවචර පුණ්‍යක්‍රියා වසතු පුරන්නහුට ද **උපනිශ්‍රය** ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

අවිද්‍යාවෙන් මුළා වූ හෙයින් **කාම** - රූප - භව සම්පත්තීන් **පතා** ඒ කාමාවචර - රූපාවචර **පින්** කරන්නහුට එසේම **උපනිශ්‍රය** ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

(2) **අපුණ්‍යාභිසංස්කාරයනට** අනෙකාකාරයෙන් ප්‍රත්‍යය වන්නේ මෙසේ යි.

(i) **අවිද්‍යාව** අරමුණු කොට (රාග - දිට්ඨි - විචිකිච්ඡා - උද්ධච්ච-දෞමනස්ස යන මොහු අවිද්‍යා සම්ප්‍රයුක්තයහ.) රාගාදීන් උපදනා කල්හි අවිද්‍යාව **ආලම්බන** ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. (ii) රාගාදිය ගරු කොට ආස්වාදනය කරන කල්හි **ආලම්බනාධිපති - ආලම්බනොපනිශ්‍රය** වශයෙන් ප්‍රත්‍යය වේ.

(iii) අවිද්‍යාවෙන් මුළාව (ආදීනව නොදැන) ප්‍රාණවධාදිය **කරන්නවුන්ට උපනිශ්‍රය** ප්‍රත්‍යයයෙන් ද, විතීය ජවනාදියට **අනන්තර - සමනන්තර - අනන්තරූපනිශ්‍රය - ආසේවන-නත්ථි - විගත** ප්‍රත්‍යයයෙන් ද, (vi) යම්කිසි අකුසලයක් කරන්නහුට **හෙතු - සහජාත - අඤ්ඤමඤ්ඤ - නිස්සය - සම්පයුත්ත - අත්ථි - අවිගත** ප්‍රත්‍යයයෙන්ද යි මෙසේ නොයෙක් ආකාරයෙන් ප්‍රත්‍යය වේ.

(3) **ආනෙඤ්ජාභිසංස්කාරයනට, උපනිශ්‍රය** ප්‍රත්‍යයයෙන් එක් ආකාරයෙකින් ප්‍රත්‍යය වේ. ඒ උපනිශ්‍රය භාවය පුණ්‍යාභිසංස්කාරයෙහි සමතික්‍රම භව ප්‍රාර්ථනා වශයෙන් කී සෙයින් දතයුතු

ප්‍රශ්නයෙකි :- මේ හුදු අවිද්‍යාව සංස්කාරයනට ප්‍රත්‍යය වේ ද නැතහොත් එයට සහකාරී අන්‍ය ප්‍රත්‍යයෝත් වෙද්ද?

හුදෙක් **අවිද්‍යාවම සංස්කාරයනට** ප්‍රත්‍යය වේ ය යි කීකල **ඒකකාරණ** වාදය වේ. (නවද අන්‍ය ප්‍රත්‍යයෝත් වෙත් නම් කුමක් හෙයින් **අවිජ්ජාපච්චයා සඞ්ඛාරා** යි එකම කාරණයක් **නිද්දේශ කිරීම** යෙදේ ද?)

පිළිතුර:- නො යෙදෙන්නේ නො වේ. කවරහෙයින් ද?

"එකං න එකහේතූ ඉධ - නානෙකමනෙකතොපි නො එකං
ඵලම් සි අත්ථීපන - එකහෙතුඵල දීපනෙ අප්පොා" යි

මේහි එක ඵලයෙක් එක හෙතුවකින් නො වේ.

අනෙක ඵල එක හෙතුවකින් නො වේ, එක ඵලයෙක් අනෙක හෙතුවකින් නො වේ, අනෙකඵල අනෙක හෙතූන් ගෙන් ම වේ. එහෙත් එක හෙතුවකට ඵල එකක් දැක්වීමේ ප්‍රයෝජනයෙක් ඇත්තේ ය.

ඒ මෙසේ යි:- ඍතු-බීජ-සලිල ආදී අනෙක කාරණයෙන් නොයෙක් රූප-ගන්ධ-රසාදී අඞ්කුර සඞ්ඛ්‍යාත අනෙක ඵල උපදී. එහෙත් **"අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං"*** යනාදීන් එක එක හෙතු-ඵල දැක්වීමේ ප්‍රයෝජනයෙක් ඇත්.

විස්තර:- බුදුහු දෙශනා විලාශ වශයෙන් හෝ- චෙතෙය පුද්ගලාධ්‍යාශය වශයෙන් හෝ (ඒ දෙකින්ම හෝ)

(1) කිසි නැනෙක ප්‍රධාන බැවින් ද,

(2) කිසි නැනෙක ප්‍රකට බැවින් ද,

(3) කිසි නැනෙක අසාධාරණ බැවින් ද, එකම හේතුවක් හෝ ඵලයක් හෝ වදාරති.

(1) **නිදර්ශන**:- **"ඵස්සපච්චයා වෙදනා"** යන තන්හි ප්‍රධාන හෙයින් එකම හෙතුවක් හා ඵලයක් වදාළහ.

ඒ මෙ සේ යි: සපර්‍ශයට නිසි වෙදනාව නියම කරන හෙයින් ඵස්සය වෙදනාවේ ප්‍රධාන හේතු ව ය. එසේ ම වෙදනා, සපර්‍ශයෙන් නියම කරන හෙයින් වෙදනාව සපර්‍ශයේ ප්‍රධාන ඵලය යැ.

(**"සුඛ වෙදනියං හි (ඉතිකඛ්වෙ) ඵස්සං පටිච්ච උප්පජ්ජති සුඛා වෙදනා"**‡ 'සුඛවෙදනීය සපර්‍ශය නිසා සුඛවෙදනා උපදී' යනු පූර්‍වපක්‍ෂයට නිදර්ශන යැ.

"චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං තිණ්ණං සංගතිඵස්සා ඵස්ස පච්චයා වෙදනා"‡ 'චක්ෂුඃ ප්‍රසාද-රූපාලම්බනයන් නිසා චක්ඛු විඤ්ඤාණය උපදී. ඒ චක්ඛුප්පසාද-

---

* ප: ප: පච්චයවාර ‡ ම: නී: උපරිපණ්ණාසක

රූපාලම්බන-චක්ඛුවිඤ්ඤාණ තුන නිසා ඵස්සය වේ. සුඛී ප්‍රත්‍යයෙන් වේදනා වේ, මෙසේ අන්‍ය ප්‍රත්‍යය සාමාන්‍යයෙනුදු සුඛී වශයෙන් වේදනාව සනිටුහන් වන හෙයින් විතීය පඤ්ඤයට නිදර්ශන වේ. මෙසේ කාරණ-ඵලවිශෙෂයෙන් හෝ ඵල-කාරණ විශෙෂයෙන් හෝ නිශ්චය වේය කි කියන ලදී.)

(2) **"සෙම්හසමුට්ඨානා ආබාධා"** යන තන්හි ප්‍රකට බැවින් එකම හෙතුව දැක්වී.

විසෙසෙ:- ව්‍යාධිය කර්මයක් නැතිවැ නො වෙතත් කර්ම-ආහාර- ඍතු- ආදිය අප්‍රකට හෙතු හෙයින් සෙමට ප්‍රතීකාර කිරීමෙන් රොගය සංසිඳෙන හෙයින් ප්‍රකට හෙතුව ගෙන වදාළහ.

(3) **"යෙ කෙචි භික්ඛවෙ අකුසලා ධම්මා සම්භවා තෙ අයොනිසො මනසිකාරමූලකා"*** 'මහණෙනි! යම් අකුශල ධර්ම කෙනෙක් වෙත් නම් ඒ සියල්ල අයොනිසොමනසිකාරය මුල් කොට ඇත්තාහයි' අසාධාරණ හෙයින් එකම හෙතුව වදාළහ.

වස්තු-ආලම්බනාදිය කුසල්-අකුසල් දෙකට ම සාධාරණ වුව ද අයොනිසොමනසිකාරය අකුසලයට අසාධාරණ හෙතු යැ.

මෙසේ සෙසු වස්තු-ආලම්බන-සහජාත ධර්මාදි සංස්කාරයනට හෙතු ඇතද **"සංඛතලක්ඛණෙසු භික්ඛවෙ ධම්මෙසු අස්සාදානුපස්සිනො තණ්හා පවඩ්ඪති තණ්හා පච්චයා උපාදානං උපාදාන පච්චයා භවො"*** 'සංඛෝජනීය ධර්ම යන්හි ආස්වාද වශයෙන් බලන්නහුට (අවිද්‍යා බලයෙන් ආදීනව නො පැතෙන හෙයින්) තෘෂ්ණාව වැඩේ. තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් උපාදාන වේ. උපාදාන ප්‍රත්‍යයෙන් කර්ම භව (සංස්කාර) වේයයි ද' **"අවිජ්ජා සමුදයා ආසව සමුදයා"** 'අවිද්‍යාව ඇති හෙයින් ආසව වේ' යයි ද වදාළ හෙයින් සෙසු තෘෂ්ණාදී හෙතු ඇත ද සංස්කාරයනට අවිද්‍යාවම ප්‍රධාන හෙතුවයි.

"අවිජ්ජා භික්ඛවෙ අවිජ්ජාගතො පුඤ්ඤාභිසඞ්ඛාරම්පි අභිසඞ්ඛරොති"* 'මහණෙනි! 'අඥානතෙම අවිද්‍යාවට පැමිණියේ පුණ්‍යාභිසංස්කාර ද රැස් කෙරේ' යයි වදාළ හෙයින් ප්‍රකට හෙතු බැවින් ද (අඥානයා අකුසල් කෙරෙයි දන්නා ලබනුව කළ බැවින් යනු සත්‍යයි.) දක්වන ලදැ යි දතයුතු. ක්ෂීණාශ්‍රවයනට අවිද්‍යා

* සං: නි: නිදානසංයුත්ත

නැති හෙයින් සංඝකාර නූපදී. සෙස්සනට අවිද්‍යාව ඇති හෙයින්ම ත්‍රිවිධ සංඝකාරම උපදනා හෙයින් අවිද්‍යාව සංඝකාරයනට අසාධාරණ හෙතුවයි.

මෙසේ **"අවිජ්ජාපච්චයා සඞ්ඛාරා"** යනාදී හැම තන්හි ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි ප්‍රධාන හෙයින් ද, ප්‍රකට හෙයින් ද, අසාධාරණ හෙතු හෙයින් ද, එකි එකී හෙතු ඵලයන් දැක්වීම බොධනෙය්‍යයන් ගේ (වශයෙන්) ධම්මාවබොධ සඞ්ඛ්‍යාත ප්‍රයෝජනය සඳහා යැ.

ප්‍රශ්නයෙකි:- (මෙ සේ වන්නා) එකාන්තයෙන් අනිෂ්ට ඵල දායක වූ සාවද්‍ය වූ අවිද්‍යාව පුණ්‍ය - අනෙඤ්ජාභිසංඝකාරයනට ප්‍රත්‍යය භාවය කෙසේ යෙදේ ද?

කොසඹ බිජුවටින් උක් නූපදිනු?

පිළිතුර:- ප්‍රත්‍යයොත්පන්න ධම්මයනට විරුද්ධවූ ද, අවිරුද්ධ වූ ද, සදෘශවූ ද, අසදෘශවූ ද ප්‍රත්‍යයය සිද්ධ වේ. ඒ ප්‍රත්‍යය සමුත්පන්න ධම්මයෝ විපාකයෝ ම නො වෙත්.

මෙ සේ වන හෙයින් කෙසේ නො යෙදේ ද? යෙදේ මැයි. හුදෙක් ප්‍රතීත්‍ය සමුත්පන්න ධම්මයනට ප්‍රතීත්‍ය සමුත්පාද ධම්මයන් ගේ ධම්මතාව විචිත්‍ර හෙයින් නියම නැති.

විසඳුම:- සභාව ධම්මයන් ගේ සථිතිය, සභාවය, කෘත්‍යය, යනාදියට විරුද්ධ වූ ද, අවිරුද්ධ වූ ද, ප්‍රත්‍යය ලොකයෙහි සිද්ධ යැ.

ඒ මෙ සේ යි:- පූර්ව චිත්තය පශ්චිම චිත්තයට සථාන විරුද්ධ ප්‍රත්‍යය යි. (දෙ සිතක් එකවට නො පවත්නා හෙයිනි.) පූර්ව ශිල්පාදී ශික්ෂණය පසුවැ පවත්නා ශිල්පාදී ක්‍රියාවනට සථාන විරුද්ධ යැ.

අරූප්‍ය වූ කර්මය කර්මජ රූපයනට සභාව විරුද්ධ ප්‍රත්‍යය යි. (කර්මය ආයූහන සභාව යැ. රූපය රූපන සභාව යැ. කර්මය සාලම්බන සභාව යැ. විපාකය අනාලම්බන සභාව යැ.) මධුර සභාව ඇති ක්ෂීරාදිය අම්ලසභාව වූ දධි ආදියට (ඔවුනොවුනට) සභාව විරුද්ධ ප්‍රත්‍යය යි.

ආලොකය චක්ෂුර්විඥානයට කෘත්‍ය වශයෙන් විරුද්ධ ප්‍රත්‍යය යැ. (ආලොකයට අවභාශන කෘත්‍යය ඇති බැවින් හා චක්ෂුර්විඥානයට විජානන කෘත්‍යය ඇති හෙයිනි.) ගුළාදිය ආසවාදියට කෘත්‍ය වශයෙන් විරුද්ධ ප්‍රත්‍යය යැ. (සකුරු ආදීන්හි පරිශ්‍රම දුරු කරන කෘත්‍යය ඇතත් ඉන් පෙරන ආසවාදියැ මදන කෘත්‍යය ඇති හෙයිනි.)

චක්ෂුරූපාදීහු චක්ෂුර්විඤ්ඤාණාදියට සහාන හෙයින් අවිරුඬ ප්‍රත්‍යය යැ. (චක්ඛුපසාදෙ - රූපාලම්බනාදිය ඇති කල්හි චක්ෂුර්-විඤ්ඤාණය උපදිනා හෙයිනි.)

පූර්ව්‍වජවන පශ්චිම ජවනයට සභාවයෙන් හා කෘත්‍යයෙන් අවිරුඬ ප්‍රත්‍යය යැ.. (පූර්ව්‍ව ජවනය හා පශ්චිම ජවනය ද, එක සභාවය හා අනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වන හෙයින් කෘත්‍ය-යෙන් සමවැ පවත්නා හෙයිනී)

විරුද්ධ - අවිරුඬ ප්‍රත්‍යයන් මෙන් ම **සදෘශ - අසදෘශ** ප්‍රත්‍යය ද වේ.

ඒ මෙසේ යි:- සදෘශවූ ම සෘතු ආහාර සඛ්‍යාතා රූපය රූපයට ප්‍රත්‍යය වේ. (හැල් වී ආදිය හැල් කරල් ආදියට ප්‍රත්‍යය වේ.)

අසදෘශ වූ රූපය අරූපයට (නාමයට) ප්‍රත්‍යය වේ. අරූපය ද රූපයට ප්‍රත්‍යය වේ. ගව ලොම් හා පැරණි එළු ලොම් හී තණට ද, ගව අඟ බට වලට ද, දී-තලපිටි සකුරු එක් කොට ලූයේ භූතෘණයට ද ප්‍රත්‍යය වේ. (භූතෘණ යනු වෙණු යනු සත්‍යයි.) (සුවඳ තණ විශෙෂය යනු දීපිකා හි.)

ආදි ශබ්දයෙන් සෙවෙල් උණරු හැල් වලට ද, කොවලු දෙන අශ්වයනට ද, ප්‍රත්‍යය වේ.

(**විරුඬ‘විරුඬ** ප්‍රත්‍යය යනු **විරුඬ - අවිරුඬ** එකී එකී ප්‍රත්‍යය ගෙන කීහ. **සදෘශ‘සදෘශ ප්‍රත්‍යය** යනු එක් වැනි නො එක් වැනි විසින් රැස් කොට ගෙන කීහ යනු සත්‍යයි.)

මෙසේ අපර චිත්තාදී ධර්මයනට පූර්ව චිත්තාදිය- විරුඬ-අවිරුඬ, සදෘශ-අසදෘශ ප්‍රත්‍යය වන හෙයින් ඒ අපරචිත්තාදී ප්‍රත්‍යය සමුත්පන්න ධර්මයෝ පූර්ව චිත්තාදී ප්‍රත්‍යය ධර්මයන් ගේ විපාකම නො වෙති. (විපාක ද වෙති. අවිපාක ද වෙත්.)

(එසේ දුඃඛවිපාක වූ අවිද්‍යාව ගේ අදුඃඛ විපාක ඇති පුඤ්ඤ-ආනෙඤ්ජාභිසංඛාරයනට ප්‍රත්‍යයත්‍වය නො යෙදෙන්නේ නො වේ)

(කරුණු මෙසේ හෙයින් අවිද්‍යාව ගේ විපාකත්‍වය නො වතුදු අවිද්‍යාව සාවද්‍ය බැවින් තත් විරුඬ නො වූ ද, තත්සදෘශ වූ ද අපුඤ්ඤාභි සංඛාරයටම ප්‍රත්‍යය වෙයි. සෙස්සවුනට ප්‍රත්‍යය **කොට**වෙයි යන මේ ප්‍රසඬගය වළකනු පිණිස විරුඬාදී පුළෝකත්ත විස්තරය කියන ලදී.)

තවද මේ අවිද්‍යාව විපාක වශයෙන් ඒකාන්ත අනිෂ්ට ඵල ඇත්තේ සභාව වශයෙන් සාවද්‍ය වන හෙයින් මේ සියලු පුණ්‍යාභිසංඝකාරාදියට සුදුසු පරිදි සථාන-කෘත්‍ය සභාව-විරුඬ-අවිරුඬ-ප්‍රත්‍යය වශයෙන් ද, සදෘශ-අසදෘශ ප්‍රත්‍යය වශයෙන් ද, ප්‍රත්‍යය වේ ය සි දතයුතු.

නිශ්චය:- **අවිද්‍යාව,** පුණ්‍ය - ආනෙඤ්ජාභිසංඝකාරයනට සථානාදීන් විරුඬ ප්‍රත්‍යය වේ. අපුණ්‍යාභිසංස්කාරයනට සදෘශ ප්‍රත්‍යය වේ. සෙස්සනට අසදෘශ ප්‍රත්‍යය වේ. 'අවිද්‍යාව ගේ ඒ ප්‍රත්‍යය සභාවය ද, දුඃඛාදියෙහි නො දැනීම් සඞ්ඛ්‍යාත ඒ අඥාන සභාවය ප්‍රහීණ නො වූ තැනැත්තේ දුඃඛාදියෙහි හා පූර්ව්වාන්තාදියෙහි ද, අඥාන බැවින් සංසාර දුඃඛය සුඛය යන සංඥාවෙන් ගෙන ඒ සංසාර දුකට හේතුවූ ත්‍රිවිධ සංඝකාරයන් ම රැස් කෙරේ' යනාදී ක්‍රමයෙන් කියන ලද්දේ මැයි.

මේ තවද ක්‍රමයෙකි.

"චුතූපපාතෙ සංසාරෙ - සඞ්ඛාරානඤ්ච ලක්ඛණෙ
යො පටිච්ච සමුප්පන්න - ධම්මෙසු ච විමුය්හති

අභිසඞ්ඛරොති සො එතෙ - සඞ්ඛාරෙ තිවිධෙ යතො
අවිජ්ජාපච්චයා තෙසං - තිවිධානං අයං තතො"

(1) 'චුතියෙහි ද උත්පත්තියෙහි ද, සංසාරයෙහි ද, සංඝකාරයන් ගේ ලක්ෂණයෙහි ද, ප්‍රතීත්‍යසමුත්පන්න ධර්මයෙහි ද මුළාවන තැනැත්තේ මේ ත්‍රිවිධ සංඝකාරයන් රැස්කරන හෙයින් ඒ ත්‍රිවිධ සංඝකාරයනටම මේ **අවිද්‍යාව ප්‍රත්‍යය** වේ."

ප්‍රශ්න:- මේවායේ මුළා වූයේ කෙසේ ත්‍රිවිධ සංඝකාර රැස් කෙරේ ද?

පිළිතුර:- චුතියෙහි මුළාවූයේ සියලු භවයෙහි සත්ත්වයන්-ගේ හෙදය මරණය සි චුතිය තතු සේ නො ගෙන 'සත්ත්වයා මැරෙයි, සත්ත්වයා අන්‍ය දෙහයකට සංක්‍රමණය වේ යයි' යනාදීන් විකල්පනය කෙරේ.

(2) උත්පත්තියෙහි මුළාවූයේ ඒ ඒ භවයෙහි සත්ත්වයන් ගේ ප්‍රථම ප්‍රාදුර්භාවය උත්පත්තිය සි නො ගෙන සත්ත්වයා උපදී. 'සත්ත්වයා ජීර්ණ ශරීරය හැර දමා පරලොව අභිනව ශරීර ප්‍රාදුර්භාවය (උත්පත්තිය) ලබායැයි' විකල්පනය කෙරේ.

('දිරූ-වස්ත්‍රය හැර පියා අලුත් වස්ත්‍රයක් ගන්නා සේ මිනිසා මෙහි දිරූ ශරීරය හැර පියා සැප කැමැතිවා අලුත් ආත්මයක් ගනී*යයි ඒ සඳහා කී.)

---

* භගවත් ගීතාහි 2 අධ්‍යාය. "වාසාංසි ජීර්ණානි" යනාදි ශ්ලෝක ආශ්‍රයෙනි.

(3) **සංසාරයෙහි** මුළාවූයේ

"ඛන්ධානංච පටිපාටි ධාතු ආයතනානංච
අබ්බොච්ඡින්නං වත්තමානං - සංසාරොති පවුච්චති"

'ස්කන්ධ-ධාතු-ආයතනයන් ගේ නො සිඳෙනසේ පවත්නා පටිපාටිය සංසාරය යි' කියනු ලැබේ යැයි මෙසේ වර්ණිත **සංසාරය** ඒ වූ පරිදි නොගෙන මේ සත්ත්වයා මේ ලොකයෙන් **පරලොව** යයි පරලොවින් මෙලොව ඒ යයි ආදීන් කල්පනා කරයි.

(4) **සංස්කාරයන් ගේ** ලක්ෂණයෙහි මුළාවූයේ රූපාදීන් ගේ රූපත්වාදී සාමාන්‍ය ලක්ෂණය, ඵස්සාදීන් ගේ ඵුසනාදී සාමාන්‍ය ලක්ෂණය යන සාමාන්‍ය ලක්ෂණය ද, අනිත්‍යාදී සාමාන්‍ය ලක්ෂණය ද නොගෙන සංස්කාරයන් ආත්ම වශයෙන් ද, ආත්මප්‍රතිබද්ධ වශයෙන් ද, නිත්‍ය- සුඛ- ශුභ- වශයෙන් ද විකල්පනය කෙරේ.

(5) **ප්‍රතීත්‍ය සමුත්පන්න** ධර්මයෙහි මුළාවූයේ,

'අවිද්‍යාදී ප්‍රත්‍යයයෙන් සංස්කාරාදීන් ගේ ප්‍රවෘත්තිය නොගෙන (කපිලාදීන් මෙන්) ආත්මය දනී' යයි ද, (කණාදාදීන් මෙන්) ආත්මය සාමාන්‍ය ස්වභාවයෙන් නොදනිතත් බුද්ධි ගුණයෙන් යුක්තවූ කල දනීය යි ද, පරලොව සැප දුක් විඳින්නේ කුසල් - අකුසල් තෙමේ ම කරයි. අනුන් ලවා ද කරවයැ යි ද (අන්‍යයෙක් නොවේ යයි) ගනී.

ප්‍රතිසන්ධියෙහි උපදින්නේ ම විඤ්ඤාණාදිය ඉපදවීම් වශයෙන් ද, ඊශ්වරාදීන් ගේ ඊප්සාවශයෙන් ද, කාලාදීභාවයෙන් ශරීර සම්පාදනය කරන්නාහු ඉන්ද්‍රියයන් සම්පාදනය කෙරෙත් යයි ද ඒ ආත්ම නම් වූ සත්ත්වතෙමේ චක්ෂුරාදී ඉන්ද්‍රියයෙන් යුක්ත වූයේ සැපයී කෙරේ. විඳියි, ආසා කෙරෙයි, ගනියි, භවයෙන් භවය ගළපයි හෙතෙමේ නැවැත භවාන්තර ගත වේ යයි කියා ද සියලු සත්ත්වයෝ නොසිඳිය හැකි වූ වන් සේ පෙර පසු නියමය අනුවැ ගටහැනීම් සඞ්ඛ්‍යාත මනුෂ්‍ය- දිව්‍ය- බ්‍රහ්ම ගති වශයෙන්- ජාති වශයෙන් පිළිවෙළින් නියතයෙන් පිරිනැමෙනි යි ද විකල්පනය නොරේ.* අවිද්‍යාවෙන් මුළාවූ ඒ පුද්ගලයා මෙසේ විකල්පනය කෙරෙමින්, පොළොවෙහි හැසිරෙන අන්ධයකු, මගට ද, නොමගට ද, ගොඩට ද, වළට ද, සම බිමට ද, විෂම බිමට ද, පැමිණෙන්නා සේ පුණ්‍යාභිසංස්කාර ද, අපුණ්‍යාභිසංස්කාර ද, ආනෙඤ්ජාභිසංස්කාර ද, රැස් කෙරේ.

---

* මේ මක්ඛලිගොසාලවාදයය

එහෙයින් කියන ලදී.

(1) **යථාපිනාම ජවවඤ්ඤා - නරෝ අපරිනායකෝ**
එකදා යාති මහොහන - කුම්මහොහනාපි එකදා

(2) **සංසාරෙ සංසරං බාලෝ - තථා අපරිනායකෝ**
කරොති එකදා පුඤ්ඤං - අපුඤ්ඤම්පි ච එකදා

(3) **යදා ච ඤාපඤා සෝ ධම්මං සච්චානි අභි සමෙඝසති**
තදා අවිජ්ජූපඝමා - උපසහොතා චරිඝසති.

(1) තමා අත ගෙන මඟ - දක්වන නියමුවකු නැති,
දැ-අඳ මග ද නො මගද - කලින් කල හැසිරෙන සේ

(2) මෙ සසර සැරිසරන - නියමුවකු නැති අඳ බල්,
කලින් කල පින් පව් - කරනුයෙ හතු නො දනුමෙන්

(3) දහම් දැන නතු සේ - සිවුඝස් පිළිවිද යෙහෙන්
අවිදු මුලු සුන් කැරුමෙන් - උපසම සිරින් හැසිරේ.

මේ **"අවිජ්ජා පච්චයා සඞ්ඛාරා"** යන්නෙහි විසතර කථාවයි.

---

2 **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං,**

මෙහි **විඤ්ඤාණය චක්ඛුවිඤ්ඤාණාදී** වශයෙන් **ඡඩ්විධ වේ.**

එහි චක්ඛුවිඤ්ඤාණය, කුසල විපාකය, අකුසල විපාක යයි දිවිධ යැ.

සොත ඝාන- ජිව්හා- කාය විඤ්ඤාණ ද එසේම කුසල-අකුසල විපාක වශයෙන් බෙදේ.

මනො විඤ්ඤාණය කුසල-අකුසල විපාක **මනොධාතු** (සම්පටිච්ඡන) **දෙක යැ.**

අහෙතුක මනොවිඤ්ඤාණ ධාතු (සන්තීරණ) **තුන යැ.**

සහෙතුක කාමාවචර විපාක සිත් අට යැ. රූපාවචර විපාක සිත් පස යැ.

අරූපාවචර විපාක සිත් සතර දැයි දෙවිසි වැදෑරුම් වේ.

මෙසේ මේ ඡඩ් විඤ්ඤයෙන් දෙතිස් සියලු ලෞකික විපාක විඤ්ඤ සංග්‍රහ වේ.

විශෙෂ :- ලොකොත්තර විපාක වට්ටකථාවට නො යෙදෙන් හෙයින් නො ගැනේ.

ප්‍රශ්නයෙකි:- මෙකී තෘක් විපාක විඤ්ඤාණය සංස්කාර ප්‍රත්‍යයෙන් වේශ යි කෙසේ දත හැකි ද?

පිළිතුර:- කම් රැස් කිරීමක් නැති වැ විපාක නො වන හෙයිනි ඒ මෙ සේ යි. මේ දෙවිසි විඤ්ඤාණයම විපාක මැයි. හෙද කම් රැස් කිරීමක් නැති කල නො උපදනේ යි.

(**විශෙෂ :-** යම් ප්‍රකාරයෙකින් කරන ලද කම්ය ඵල දෙන යෙහි සමර්ථ වේ ද ඒ ප්‍රකාරයෙන් කරන ලද්දේ උපචිතය යි කියනු ලැබේ)

විසඳුම:- කම් රැස් කිරීමක් නැතිවැ විපාක උපදනේ නම් සියල්ලන්ට සියලු විපාක ඉපදුන මනා ය, බ්‍රහ්මාත්මයෙහි සිටියවුනට ඝ්‍රාණ විඤ්ඤාදිය ද, කාමාවචර විපාකාදියදැයි මෙසේ ඒ ඒ විපාකයට අනවකාශසථානයෙහි සිටියවුනට ද, සියලු විපාක ලැබීම් වශයෙනි. එ සේ සියල්ලනට සියලු විපාක නූ පදනා හෙයින් සංස්කාර ප්‍රත්‍යයයෙන් මේ විඤ්ඤාන වේ යයි දතයුතු.

එසේ වන්නා කවර සංස්කාර ප්‍රත්‍යයෙන් කවර විඤ්ඤාන වේද? යත්

කාමාවචර පුණ්‍යාභිසංස්කාර ප්‍රත්‍යයෙන් කුසල විපාක චක්ඛුවිඤ්ඤාණාදි පස ද, එක් මනොධාතුවක් (කුසල විපාක සම්පටිච්ඡනය) ද, මනොවිඤ්ඤාණ ධාතු (කුසල විපාක සන්තීරණ) දෙක ද, කාමාවචර මහා විපාක අට දැයි සොළොස් විපාක වේ.

එයින් වදාළහ **"කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකං චක්ඛු විඤ්ඤාණං උප්පන්නං හොති - පෙ - සොත - ඝාන - ජිව්හා - කායවිඤ්ඤාණං, විපාකා මනොධාතු උප්පන්නා හොති. සොමනස්ස සහගතා මනෝ විඤ්ඤාණ ධාතු උප්පන්නා හොති, උපෙක්ඛා සහගතා මනොවිඤ්ඤාණ ධාතු උප්පන්නා හොති, සොමනස්ස සහගතා ඤාණසම්පයුත්තා, සොමනස්ස සහගතා ඤාණසම්පයුත්තා සඞ්ඛාරෙණ, සොමනස්ස සහගතා ඤාණවිප්පයුත්තා - සොමනස්ස සහගතා ඤාණවිප්පයුත්තා සඞ්ඛාරෙණ, උපෙක්ඛා සහගතා ඤාණසම්පයුත්තා - උපෙක්ඛා සහගතා ඤාණසම්පයුත්තා සඞ්ඛාරෙණ, උපෙක්ඛා සහගතා ඤාණවිප්පයුත්තා - උපෙක්ඛා සහගතා ඤාණවිප්පයුත්තා සඞ්ඛාරෙණාති."***

---

* ධ: ප: විත්තවිභත්ති

'කාමාවචර කුශල කර්මය කළ හෙයින්, රූස් කළ හෙයින් විපාක වූ චක්ඛුවිඤ්ඤාණය උපදී, සොතවිඤ්ඤාණාදිය ද එසේ මැයි. විපාක මනොධාතු සම්පටිච්ඡන විඤ්ඤාණය ද, සොමනස්ස සහගත මනොවිඤ්ඤාණ ධාතුව (සොමනස්ස සහගත සන්තීරණය) ද උපදී. සොමනස්ස - ඤාණ සම්පයුත්ත අසඞ්ඛාර-සසඞ්ඛාරද්වය ද මෙසේ මැයි. (සුගමයි.)

(**උපචිතත්තා-යන්නට** ආසෙවන ලද බැවිනැයි සමහරු අර්ථ කියතැයි ද ආසෙවන නො ලද ප්‍රථම ජවනයට විපාක දීනය නො පැමිණෙන බැවින් ඒ නො මැනැවි යි යනු ද සත්‍යයි.)

රූපාවචර පුණ්‍යාභිසංස්කාර ප්‍රත්‍යයෙන් **රූපාවචර විපාක පස** ලැබේ. එයින් වදාළහ. **තස්සෙවරූපාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා, උපචිතත්තා, විපාකං විඤ්ඤාණං එවමේකි -පෙ- පඨමජ්ඣානං -පෙ- පඤ්චමජ්ඣානං උපසම්පජ්ජ විහරති''*** ඒ රූපාවචර කුශල කර්මය කළ හෙයින්, රූස්කළ හෙයින් විපාක වූ -පෙ- පඨමජ්ඣාන සිත ද -පෙ- පඤ්චමජ්ඣාන සිත ද, සන්තානයෙහි ඉපදවීම් වශයෙන් පැමිණ වාසය කෙරේ, මේ සේ පුණ්‍යාභි සංස්කාර ප්‍රත්‍යයෙන් එක්විසි වැදෑරුම් විපාක විඤ්ඤාණය උපදී. අපුණ්‍යාභි සංස්කාර ප්‍රත්‍යයයෙන් අකුසල විපාක චක්ඛුවිඤ්ඤාණාදී පස ද, එකම මනොධාතුව (සම්පටිච්ඡන) ද, මනොවිඤ්ඤාණ ධාතුව (සන්තීරණ) දැයි මේ සේ සත් වැදෑරුම් විපාක විඤ්ඤාණය උපදී.

එයින් වදාළහ. **අකුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකං චක්ඛුවිඤ්ඤාණං උප්පන්නං හොති. සොත- ඝාන-ජිව්හා- කාය විඤ්ඤාණං- විපාකා මනොධාතු- විපාකා මනෝ විඤ්ඤාණධාතු උප්පන්නා හොති''*** යි (අර්ථ පෙර කී සේ ය)

අනෙකප්‍රාභිසංස්කාර ප්‍රත්‍යයයෙන් සතර අරූප විපාක වේ. එයින් වදාළහ. **තස්සෙව අරූපාවචරස්ස කුසලස්ස කම්මස්ස-කතත්තා උපචිතත්තා විපාකං සඤ්ඤාක්ඛන්ධං රූපසඤ්ඤානං සමතික්කමා -පෙ- ආකාසානඤ්චායතන සඤ්ඤාසම්පයුත්තං -පෙ- විඤ්ඤාණඤ්චායතන -පෙ- ආකිඤ්චඤ්ඤායතන -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතන සම්පයුත්තං සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරතීති''***

'ඒ අරූපාවචර කුශල කර්මය කළ හෙයින් රූස්කළ හෙයින්ම සම්ප්‍රකාරයෙන් රූපසංඥාව ඉක්මවීමෙන් ආකාසා-

* ධ: ප: චිත්තවිභත්තේ

නඤ්චායතන සහගතවූ විපාකවිඤ්ඤාණය ද, විඤ්ඤාණඤ්චා-යතන- ආකිඤ්චඤ්ඤායතන- නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඥා-වෙන් යුක්තවූ සුඛ-දුඃඛ ප්‍රහාණයෙන්- චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේයැ' යි කියාගි.

(මෙ සේ සතර අරූපාවචර වශින් චතුර්විධ විපාක විඥානය වේ. මෙහි ආකාශාදී ආලම්බන වශයෙන් නානාත්වය තබා චතුර්ධ්‍යාන වන බැවින් චතුර්ධ්‍යාන වේය යි කීහු.) මෙසේ සංස්කාර ප්‍රත්‍යයයෙන් යම් විඥානයෙක් වේ නම් ඒ දැන ඒ විඥානයා ගේ ප්‍රවෘත්තියද දත යුතු. මේ සියලු විඥාන ප්‍රවෘත්ති-ප්‍රතිසන්ධි වශයෙන් දෙපරිද්දෙකින් වේ.)

මොවුනතුරින් දෙපස් විඤ්ඤාණය, මනොධාතු ද්වය, සෞම-නස්‍ය සහගත අහෙතුක මනොවිඤ්ඤාණ ධාතුව (සෞමනස්‍ය සන්තීරණ) ය, යන තෙළෙස පඤ්චවඤකඛය ඇති භවයෙහි සුදුසු සේ ප්‍රවෘත්තියෙහි මැ පවතී. සෙසු එකුන්විස්ස තුන් භවයෙහි සුදුසු බැවින් ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි දෙක්හි පවතී.

ඒ මෙසේ යි:- කුසල විපාක වූ චකඛුවිඤ්ඤාණාදී පස, කුසල විපාකයෙන් හෝ අකුසල විපාකයෙන් ඉපිද ක්‍රමයෙන් මිහි කිරීමට පැමිණි චක්ෂුරාදී ඉන්ද්‍රිය ඇත්තාහුට ඒ චක්ෂුරාදී ඉන්ද්‍රිය-යනට හමුවූ ඉෂ්ටවූ හෝ ඉෂ්ට මධ්‍යස්ථවූ හෝ රූපාදී ආලම්බනය අරභයා චක්ෂුරාදී ප්‍රසාද ඇසුරු කොට දර්ශන- ශ්‍රවණ- ආඝ්‍රාණ-රසාස්වාදන- සපර්ශන කෘත්‍යයන් සිද්ධ කෙරෙමින් පවතී. අකුසල විපාක පසද එසේ ම පවතී.

විශෙෂ:- හුදෙක් අකුසල විපාකයනට අනිෂ්ටවූ හෝ අනිෂ්ට මධ්‍යස්ථ වූ හෝ අරමුණ වේ. මේ දසයම නියත වූ ද්වාර-ආලම්බන- වස්තු- සථාන ඇත්තාහු නියත කෘත්‍යය ඇත්තෝම වෙති. ඉක්බිති කුසල-විපාක චකඛුවිඤ්ඤාණාදියට අනතුරුවැ කුසල විපාක මනොධාතුව (සම්පටිච්ඡන) ය ඔවුන් ගේ ම අරමුණ ඇරබැ හෘදය වස්තුව නිසා සම්පටිච්ඡන කෘත්‍යය සාධමින් පවතී.

අකුසල විපාක චකඛුවිඤ්ඤාණාදියට අනතුරුවැ අකුසල විපාක ද එසේ මැ යි. මේ මනොධාතුව වනාහි අනියතද්වාරා-ලම්බනය නියත වස්තු හා සථාන ද නියත කෘත්‍යය ද ඇත්තේ වේ. සෞමනස්‍යසහගත අහෙතුක මනොවිඤ්ඤාණ ධාතුව කුසල විපාක මනොධාතුවට අනතුරුවැ ඒ මනොධාතුහු ගේ ම අරමුණ ඇරබැ හෘදය වස්තුව නිසා සන්තීරණ කෘත්‍යය සිද්ධ කරමින් ද

ඡඩ්ඩාරයෙහි බලවත් අරමුණෙහි කාමාවචර සත්ත්වයින්ට බෙහෙවින් ලොභසම්පයුත්ත ජවන් අවසන්හි භවාඞ්ගචිත්ත සිද ගෙන ජවනයෙන් ගත් අරමුණෙහි තදාලම්බන වශයෙන් ද වරක් හෝ දෙවරක් හෝ පවතීය සි **මජ්ඣිම නිකායඨකථාහි** කියන ලදී.

අභිධම්ම අට්ඨවාහි* තදාරම්මණය දෙ වරක් ම උපදීය සි කියන ලදී.

විශෙෂ:- මේ සිත ජවනයන් ගත් අරමුණ ගෙන **පවත්නා** හෙයින් තදාලම්බනයයි ද, ජවනයන් පිටිපස **පවත්නා** හෙයින් **පිටිසිහවඞ්ගය** යි ද නම් දෙකක් ලබයි.

මේ සිත ද අනියතවාරාලම්බන හා නියත වසතු හා අනියත සථාන- කෘත්‍යය ඇති යේසි.

(අභිධම් අට්ඨවාහි **"අනියතාරම්මණ- ඨාන- කිච්චා- භුට්ඨා පවත්තනතෝ*** 'අනියත ආලම්බන හා **සථාන** - කෘත්‍ය ඇතිවැ **පවතීය**' යි වාර පරාමශීනය නොකොට කියන ලදී.) මෙසේ තෙළෙස් විඤ්ඤණ පඤ්චවොකාර භවයෙහි ප්‍රවෘත්තියෙහි ම වේය සි දනයුතු.

සෙසු එකුන්විසි විඤ්ඤණ අතුරින් කිසිවක් තම්හව සුදුසු ප්‍රතිසන්ධියක් ඇති **කල්හි** නො පවත්නේ නො වේ. (පවතී.)

ප්‍රවෘත්තියෙහි කුසල-අකුසල විපාක **අහෙතුක මනොවිඤ්ඤාණ ධාතු** (සන්තීරණ) **මය ය,** පඤ්චවාරයෙහි කුසල-අකුසල මනොධාතු වයඟට අනතුරු වැ සන්තීරණ කෘත්‍යය ද, ඡඩ්ඩාරයෙහි පෙර කී සේ තදාරම්මණ කෘත්‍යයය ද, තමා දුන් පිළිසඳින් මත්තෙහි භවාඞ්ගොපච්ඡේදක චිත්තොත්පාදයක් නැති කල භවාඞ්ගකෘත්‍යය ද, අන්තයෙහි චුති කෘත්‍යයදැයි කෘත්‍ය සතරක් සිද්ධ කරමින් **නියතවසතුක වැ අනියතවාරාලම්බන- සථාන - කෘත්‍යය ඇතිවැ** පවතී.

කාමාවචර සහෙතුක සිත් අට කී තැනින්ම සඳෙරෙහි තදාරම්මණ කෘත්‍යය ද, තමා දුන් පිළිසඳින් මත්තෙහි භවඞ්ගුපච්ඡේදක චිත්තොත්පාදයක් නැති කල භවාඞ්ගකෘත්‍යය ද, කෙළවර චුතිකෘත්‍යය දැයි මේ තුන් කෘත්‍යයක් සාධමින් **නියත වසතුකවැ අනියතවාර - ආලම්බන - කෘත්‍යය** ඇතිවැ පවතී.

---

*සමොහ විනොදනී

රූපාවචර පඤ්ච හා අරූපාවචර සතර ද තමා දුන් පිළිසඳින් මත්තෙහි භවඞ්ගුපච්ඡේදක චිත්තොත්පාදයක් නැති කල්හි භවාඞ්ගකෘත්‍යය ද, අවසන චුති කෘත්‍යය දැයි දෙතිසක් සාධමින් පවතී. ඔවුනතුරින් **රූපාවචර පඤ්ච නියත වඤ්චු-ආලම්බන** හා **අනියතඤ්ඨාන කෘත්‍යයන.** **අරූපාවචර සතර** නියත අවස්තුකය, **නියතාලම්බනය,** අනියතඤ්ඨාන හා කෘත්‍යය ඇතිවැ පවත්නීය යි,

මෙසේ දෙතිස් වැදෑරුම් විඤ්ඤාණය ප්‍රවෘත්තියෙහි ද සංඝකාර නීසා පවතී. ඒ ප්‍රවෘත්තියෙහි දෙතිස් විපාක විඤ්ඤාණයට ඒ ඒ පුණ්‍යාභි සංස්කාරාදිය **නා නා ක්ෂණික කර්ම ප්‍රත්‍යයෙන් ද, ප්‍රකෘත්‍යුපනිශ්‍රය ප්‍රත්‍යය** යෙන් ද ප්‍රත්‍යය වේ.

මෙසේ ප්‍රවෘත්තියෙහි විඤ්ඤාණය දක්වා ප්‍රතිසන්ධියෙහි ද දක්වන්නාහු "සෙසු එකුන් විසි විඤ්ඤාණ අතුරින් කිසිවක් තමහට සුදුසු ප්‍රතිසන්ධියක් නොදී නො පවතී" යයි පෙර කී වචනය ඉහා සැකෙවින් කී හෙයින් **නො** දත ගැක්ක. එහි විසතර දැක්වීම සඳහා,

(1) ප්‍රතිසන්ධි **කෙතෙක්** ද?

(2) ප්‍රතිසන්ධි සිත් **කෙතෙක්** ද?

(3) කවර සිතකින් කවර භවයෙකැ ප්‍රතිසන්ධි වේ ද?

(4) ප්‍රතිසන්ධියට අරමුණ කුමක් ද? යන මේ ප්‍රශ්න විසඳිය යුතු ය.

(1) අසඤ්ඤසත්ත පටිසන්ධිය ද සමග **පටිසන්ධි වීස්සෙකි.**

(2) පටිසන්ධි සිත් **එකුන් විස්සෙකි.** ඒ පෙරැ කී සේයැ.

විශෙෂ:- ප්‍රතිසන්ධි කෙතෙක් ද? ප්‍රතිසන්ධි සිත් කෙතෙක් දැයි ද දෙවරක් විවාළේ (භවයෙන් භවය ගැලපීම ප්‍රතිසන්ධිය ඇ.) එය අවිත්තකව ද වන හෙයිනි.)

(3) i **අකුසල විපාක මනොවිඤ්ඤාණ ධාතුවෙන්** (උපෙක්ඛා සහගත සන්තීරණයෙන්) සතර අපායෙහි පිළිසඳ දේ.

ii **කුසල විපාක (අහෙතුක) මනොවිඤ්ඤාණ ධාතුවෙන්** මිනිස් ලොව ජාත්‍යන්ධාදීන් ගේ උපත වෙයි. ජාත්‍යන්ධ- ජාති-බධිර- ජාති උම්මත්තක- ජාතිඒළමූග- නපුංසකද, ආදී ශබ්ද-යෙන් මම්මනද ගැනේය යි ඇතැමෙක් කියති. ඇතැම් අහෙතුක

සත්ත්ව කෙනෙක් අවිකල ඉන්ද්‍රියවැ මදක් **විචාරණ** සුභාව ඇති වෙත්ය යි එබන්දන් ද ආදි **ශබ්දයෙන්** සංග්‍රහ වේය යි කෙනෙක් කියත්.

iii **සහෙතුක කාමාවචර විපාක අතෙන්** කාමාවචර දෙවියන් ගේ ද, මිනිස් ලොව **පිහැනියන්** ගේ ද පිළිසඳ වේ.

iv **රූපාවචර විපාක පස** රූපාවචර බ්‍රහ්ම ලොකයෙහි ද

v **අරූපාවචර විපාක සතර** අරූපාවචර ලෝකයෙහි ද පිළිසඳ දේ. (ඒ ඒ භවයෙහි පිළිසඳ දෙන සිතම එයට සුදුසු පිළිසඳ ය.)

(4) සැකෙවින් පිළිසඳට **අතීතාලම්බනය- පච්චුප්පන්නාලම්බනය- නවත්තබ්බාලම්බනය යි** ආලම්බන තුනකි.

අසංඥ ප්‍රතිසන්ධියට ආලම්බනයෙක් **නැති.**

විඤ්ඤාණඤ්චායතන- නෙවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධියට අතීතාලම්බනයම වේ. දස කාමාවචරයනට අතීත හෝ වර්තමාන හෝ අරමුණු වේ. සෙසු රූපාවචර ප්‍රතිසන්ධිනට හා ප්‍රථම-තෘතීය ආරූප්‍ය ප්‍රතිසන්ධිනට **නවත්තබ්බාලම්බනය** අරමුණු වේ.

මෙ සේ තුන් අරමුණෙහි පවත්නා ප්‍රතිසන්ධි සිත් අතීතා-ලම්බන වූ හෝ නවත්තබ්බාලම්බනය වූ හෝ චුතියට **අනතුරුවැමෑ** පවතී.

විශෙෂ:- පච්චුප්පන්නාලම්බන චුති සිත් නැති.

එනෙසින් අතීත- නවත්තබ්බාලම්බන වශයෙන් දෙයාකාර අරමුණු අතුරින් එක්තරා එකක් අරමුණු කොට ඇති චුතියට අනතුරුවැ අතීත- පච්චුපන්න- නවත්තබ්බ අරමුණු අතුරින් එක්තරා එකක් අරමුණු කොට ඇති ප්‍රතිසන්ධියෙහි සුගති-දුගති වශයෙන් පවත්නා ආකාරය දතයුතු,

ඒ මෙසේ යි:- (1) කාමසුගතියෙහි සිටි පව්කම් කොට මර ඇඳ හොත්තහුට **ඒ පව්කම් හෝ කර්මනිමිති** හෝ මනොවාරයෙහි හමුවීමට යේ. ඒ අරමුණු කොට නිපන් තදුලම්බන අවසන් කොට ඇති ජවන වීථියට අනතුරුවැ භවාඞ්ගවිෂය අරමුණු කොට චුතිචිත්තය උපදනේ යි. ඒ නිරුද්ධ වූ කෙණෙහි එයට අනතුරුවැමෑ ඒ ජවනවීථියට හමුවූ කර්මය හෝ කර්ම නිමිත්ත හෝ අරහයා මාඝියෙන් නො සිඳී කෙලෙස් බලයෙන් **නමනලද** දුගති **පරියාපන්න** ප්‍රතිසන්ධි චිත්තය උපදී.

මේ අතීතාලම්බන චුතියට අනතුරුවැ අතීතාලම්බන ප්‍රතිසන්ධිය යැ.

(2) අනිකකුට මරණාසන්නයෙහි යට කී සේ අකුශල කර්මයෙන් නරක ආදියෙහි ගිනිදැල් වණී ආදී දුගති නිමිති මනොචාරයට එළඹ සිටී. අනතුරුවැ දෙවරක් භවාඞ්ගය ඉපිද නිරුද්ධ වූ කල ඒ අරමුණ ඇරැබැ එක් ආවජ්ජන සිතක් ද, මරණයට ආසන්න බැවින් මඳ වූ වේග ඇති ගෙයින් ජවන් පසක් ද, තදුරම්මණ දෙකක් දැයි වීපි සිත් තුනක් උපදී. අනතුරු වැ භවාඞ්ග විෂය අරමුණු කොට එක් චුති සිතක් උපදී. මෙතෙකින් එකොළොස් චිත්තක්ෂණයක් ඉක්මියේ වෙයි. අනතුරු වැ චිත්තක්ෂණ පසක් ආයු ශෙෂ වූ එම ආලම්බනයෙහි ම පටිසන්ධි චිත්තය උපදී.

මේ අතීතාලම්බන චුතියට අනතුරුවැ ප්‍රත්‍යුත්පන්නාලම්බන ප්‍රතිසන්ධිය යැ.

(3) අනිකකුට මැරෙනකල පඤ්චවාරයන් අතුරින් එක් වාරයෙකැ රූපාදී අරමුණක් හමුවීමට යේ, ඕනව පිළිවෙළින් උපන් මොග්ගල්ලාන ගේ අවසන්හි මරණය ආසන්න බැවින් මඳ වූ වේග ඇති ගෙයින් ජවන් පසක් හා තදුරම්මණ දෙකක් උපදී. අනතුරුවැ භවාඞ්ග විෂය අරමුණු කොට එක් චුති සිතෙක් වේ. මෙතෙකින් භවාඞ්ග දෙකෙක, පඤ්චවාරාවජ්ජනය, චක්ඛුවිඤ්ඤාණය, සම්පටිච්ඡනය, සන්තීරණය, මොග්ගල්ලාන, ජවන් පසය, තදුරම්මණ දෙක ය, චුති සිතයැ යි පසළොස් චිත්තක්ෂණයෙක් ඉක්මියේ වේ. අනතුරුවැ එක් චිත්තක්ෂණයෙකැ ආයු ශෙෂ වූ එම ආලම්බනයෙහි ප්‍රතිසන්ධි සිත උපදී.

මෙද අතීතාලම්බන චුතියට අනතුරුවැ පච්චුප්පන්නාලම්බන ප්‍රතිසන්ධිය යැ.

මේ චූකලී අතීතාලම්බන සුගති චුතියට අනතුරුවැ අතීතපච්චුප්පන්නාලම්බන දුගති ප්‍රතිසන්ධිය පවත්නා ආකාරය යැ.

---

(4) දුගතියෙහි සිටි මරණාසන්න කාලයෙහි රැස් කරනලද නිවැරැදි කර්ම ඇත්තහුට පෙර කී සේ ඒ නිවරද කර්මය හෝ කර්ම නිමිත්ත හෝ මනොචාරයෙහි අරමුණු බවට පැමිණියේ යයි, මෙ සේ අකුශල පක්ෂයෙහි කුශල පක්ෂය බහා සියල්ල පෙර කී සේ දතයුතු යි.

මේ **අතීතාලම්බන දුගති චුතියට අනතුරුවැ** (කම්-නිමිත්ත වශයෙන්) **අතීතවූ ද** (මාතෘකුක්ෂි ආදී වශයෙන්) **පවවුප්පනාලම්බනවූ ද සුගති ප්‍රතිසන්ධිය පවත්නා ආකාරය යැ.**

(5) සුගතියෙහි සිටි රූස්කළ නිවරද කම් ඇත්තහුට (**"තානිස්ස කම්මං සමයෙ ඔලම්බනතීති"**) 'ඒ කම් ඔහුට ඒ ප්‍රතිසන්ධි-ක්ෂණයෙහි වැටහේයයි' වදාළ හෙයින් **මරණ** මඤ්චකයෙහි හොත්තහුට රූස්කළ පරිදි කුශල කම්ය හෝ **කම්** නිමිත්ත හෝ මනොවාරයෙහි **ආපාථගත** වේ. හෙද **රූස් කළ කාමාවචර** නිවරද **කම්** ඇත්තහුට මැයි.

එහෙත් රූස් කළ මහදහන **කම්** ඇත්තහුට **කම්** නිමිත්තම අරමුණු වේ. ඒ කම්නිමිත්ත අරමුණු කොට නිපන් තදුලම්බන අවසන් කොට ඇත්තා වූ හෝ ශුද්ධ වූ **ජවන** චිත්තයට හෝ අනතුරුවැ භවාඞ්ගවිඡය අරමුණු කොට චුති සිත උපදී.

එය **නිරුද්ධ** වූ පසු ඒ **ආපාථගත** කම්ය හෝ **කම්** නිමිත්ත හෝ අරහයා තො සිදිනාලද කෙලෙස් බලයෙන් නමතලද සුගති **පරියාපන්න ප්‍රතිසන්ධි** සිත උපදී.

මේ **අතීතාලම්බන චුතියට අනතුරුවැ අතීතාලම්බන වූ හෝ** (කසිණ නිමිත්තාදී වශයෙන්) **නො කියහැකි වූ හෝ අරමුණු ඇති ප්‍රතිසන්ධිය යැ.**

(6) අනිකකුට මරණාසන්න කාලයෙහි කාමාවචර කුශලකම් වශයෙන් මනුෂ්‍යලෝකයෙහි මාතෘකුක්ෂි වර්ණාදී වශයෙන් හෝ සදෙව් ලොවැ උයන්- විමන්- කප්රුක් ආදී වර්ණ වශයෙන් හෝ සුගතිනිමිත්ත මනොවාරයට හමුවීමට පැමිණේ. ඔහුට දුගති නිමිත්තෙහි කී සෙයින් ම චුති සිතට අනතුරුවැ ප්‍රති-සන්ධි සිත උපදී.

මේ **අතීතාලම්බන චුතියට අනතුරුවැ පවවුප්පනා-ලම්බන ප්‍රතිසන්ධිය සි.**

(7) අනිකකුට මරණ කාලයෙහි තෑයෝ දරුව! 'මේ ඔබ පිණිස බුද්ධ පූජා කෙරේ. සිත පහදව යි, කියා මල් දම්, කොඩි ආදී වශයෙන් **රූපාලම්බනයක්** හෝ, ධම්ශ්‍රවණ - තූර්‍යවාදනාදී වශයෙන් **ශබ්දාලම්බනයක්** හෝ, සුවඳ-දුම් ආදී වශයෙන් **ගන්ධාලම්බනයක්** හෝ, 'දරුව! මේ රස විඳුව තා පිණිස පිදිය යුතු දෑය' යි කියා මී-පැණි ආදී වශයෙන් **රසාලම්බනයක්** හෝ, **'දරුව! මේ සපශී කරව, තා පිණිස පිදිය යුතු දෑය'** යි

විඤ්ඤාණඤ්චායතනය ආදී **සප්තමාලම්බනයක්** හෝ, පඤ්චද්වාරයෙහි එළවද්ද? ඔහුට එසේ ආපාථගත වූ ඒ රූපාදී ආලම්බනයෙහි පිළිවෙළින් උපන් වොට්ඨපනය ගේ අවසන්හි මරණය ගේ ආසන්න භාවයෙන් මඳ වූ වේග ඇති හෙයින් ජවන් පසක් හා තදාලම්බන දෙකක් උපදී. ඉක්බිති භවාඞ්ග විෂය ආලම්බන කොට එක් චුති සිතක් ද වේ. අවසන්හි ඒ එක් චිත්තක්ෂණයක් පවත්නා ආලම්බනයෙහි ප්‍රතිසන්ධි සිත උපදී.

මේ අතීතාලම්බන චුතියට අනතුරුවැ ප්‍රත්‍යුත්පන්නා-ලම්බන ප්‍රතිසන්ධිය සි.

(8) අතික් පඨවි කසිණ ධ්‍යානාදී වශයෙන් ලැබූ මහද්ගත ධ්‍යාන ඇති සුගතියෙහි සිටියහුට මරණාසන්න කාලයෙහි කාමාවචර කුශල කර්මය, කර්ම නිමිත්තය, ගති නිමිත්තය යන මොවුන් අතුරින් එකක් හෝ පඨවි කසිණාදී නිමිති ඇති මහද්ගත සිතක් හෝ මනොද්වාරයෙහි ආපාථගත වේ.

චක්ඛු-සොතයන් අතුරින් එකෙකැ කුශලොත්පත්තියට නිමිති වූ බුද්ධදර්ශන ධර්මශ්‍රවණාදී ප්‍රණීතාලම්බනයක් හෝ හමු-වීමට යේ. ඔහුට පිළිවෙළින් උපන් වොට්ඨපනාවසානයෙහි මරණයට ආසන්න බැවින් මඳ වූ වේග ඇති හෙයින් ජවන පසක් උපදී.

(**විශේෂ**:- මහද්ගත ගතිකයනට තදාලම්බන නූපදී.) එහෙයින් ජවනානන්තරවැ භවාඞ්ග විෂය අරමුණු කොට එක් චුති සිතක් උපදී. එයට අනතුරුවැ කාමාවචර මහද්ගත සුගතීන් අතුරින් එක්තරා සුගතියෙකැ ඇතුළත් එළඹ සිටි ආලම්බන අතුරින් එක්තරා අරමුණක ප්‍රතිසන්ධි සිත උපදී.

මේ නවකර්මව්‍යාලම්බන සුගති චුතියට අනතුරුවැ අතීත-ප්‍රත්‍යුත්පන්න-නවකර්මව්‍යාලම්බනයන් අතුරින් එක්තරා අරමුණක් ඇති ප්‍රතිසන්ධියයි.

(**විසඳුම**:- නවකර්මව්‍යාලම්බන (පඨවිකසිණාදී) රූපාවචර චුතියෙන් කර්ම-කර්මනිමිත්තාලම්බන වශයෙන් කාමාවචර ප්‍රති-සන්ධිය වේ. ගතිනිමිත්ත හා චක්ඛු - සොත - ද්වාර ආලම්බන වශයෙන් ප්‍රත්‍යුත්පන්නාලම්බනික කාමාවචර ප්‍රතිසන්ධිය වේ.

පඨවිකසිණාදී වශයෙන් නවකර්මව්‍යාලම්බනික රූපාවචර ප්‍රතිසන්ධිය වේ. නිසුණු ඉගුළු අනස්හි විඥානාපගමයෙන්

නවකතාව්‍යාලම්බන අරූපාවචර ප්‍රතිසන්ධි වේ. ආකාසානඤ්චා-යතන- ආකිඤ්චඤ්ඤායතන වශයෙන් අතීතාලම්බන අරූපාවචර ප්‍රතිසන්ධි වේ.

විශේෂ: අරූපාවචර චුතියට අනන්තර වූ රූපාවචර ප්‍රති-සන්ධි නැති. මේ අනුසාරයෙන් අරූප චුතියට ද අනතුරුවැ ප්‍රතිසන්ධි දතයුතු.

මේ අතීතනවකතාව්‍යාලම්බන සුගති චුතියට අනතුරුවැ අතීතනවකතාව්‍යප්‍රත්‍යුත්පන්නාලම්බන ප්‍රතිසන්ධිය පවත්නා ආකාරය සි.

(නිගමනීය:- මෙසේ ආලම්බන වශයෙන් එකවිධ වූ කාමාවචර සුගති චුතියෙන් දවිවිධ දුගති ප්‍රතිසන්ධිය යැ.

දුගති චුතියෙන් විවිධ සුගති ප්‍රතිසන්ධිය යැ.

කාමාවචර සුගති චුතියෙන් (විවිධ-එකවිධ) විප්‍රකාරවූ ම කාම-රූප-අරූප ප්‍රතිසන්ධි වශයෙන් පඤ්චවිධ සුගති ප්‍රතිසන්ධිය යැ.

රූපාවචර චුතියෙන් එසේ ම පඤ්චවිධ වූ ප්‍රතිසන්ධිය යැ.

විවිධ ආරූප චුතියෙන් වෙන් වෙන් වැ දෙකක් දෙකක් වූ කාම-අරූප්‍ය ප්‍රතිසන්ධි වශයෙන් අටවැදෑරුම් ප්‍රතිසන්ධිය යැ යන මොහු දක්වන ලදහ.

දුගතියෙහි සිටි පව්කම් කළහුව වනාහි පෙර කී සේ ඒ පාපකර්මය හෝ කර්මනිමිත්ත හෝ ගතිනිමිත්ත හෝ මනොද්වාර-යෙහි හෝ පඤ්චද්වාරයෙහි අකුසල් ඉපැත්මට හේතු වූ අරමුණ ආපාථගත වේ. එකල ඕහට පිළිවෙළින් චුති චිත්තාවසානයෙහි දුගති පඨම්‍යාපන්න වූ ප්‍රතිසන්ධි චිත්තය ඒ ආලම්බන අතුරින් යම් කිසි ආලම්බනයෙකැ උපදී.

මේ අතීතාලම්බන දුගති චුතියට අනතුරුවැ අතීත ප්‍රත්‍යුත්පන්නාලම්බන ප්‍රතිසන්ධිය පවත්නා සැටි යැ.

විශේෂ:- එකවිධ දුගති චුතියෙන් විවිධ දුගති ප්‍රතිසන්ධිය දක්වනු සඳහායැ මේ කියේ.

මෙ තෙකින් එකුන් විසි වැදෑරුම් වූ මැ විපාක විඤ්ඤාණ ගේ ප්‍රතිසන්ධි වශයෙන් පැවැත්ම දක්වන ලදී.

මෙසේ කාමාවචර සුගති චුතියට අනතුරුවැ දුගති ප්‍රතිසන්ධි දෙකෙක.

දුගති චුතියට අනතුරුවැ සුගති ප්‍රතිසන්ධි දෙකෙක.

කාමාවචර සුගති චුතියට අනතුරුවැ කාම- රූප- අරූප ප්‍රතිසන්ධි පසෙක.

රූපාවචර චුතියට අනතුරුවැ සුගති ප්‍රතිසන්ධි පසෙක.

විවිධ අරූප චුතියට අනතුරුවැ කාම-අරූප ප්‍රතිසන්ධි අටෙක.

දුගති චුතියට අනතුරුවැ දුගති ප්‍රතිසන්ධි දෙකෙකැයි ප්‍රතිසන්ධි සූවිස්සෙක් වේ.

පිළිසඳ පවත්නේ - කැමිනි *දෙපරිදි වන්නේ
රූ මුසු ඇ බෙයින්† ඒ - දෙපරිදි ඇ බෙයින් වේ"

ඒ මෙසේ යි:- මේ එකුන් විසි වැදෑරුම් විපාක විඤ්ඤාණය ප්‍රතිසන්ධියෙහි පවත්නේ කර්මයෙන් දෙපරිද්දෙකින් පවතී.

විභාග:- මේ විපාක විඤ්ඤාණය උපදවන තමහට සුදුසු සේ පවත්නා කර්මය නානාක්ෂණික කර්මප්‍රත්‍යයයෙන් ද, උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් දැයි දෙ පරිද්දෙනි.

එයින් වදාළහ. **"කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා"**‡ යනාදීන් නානාක්ෂණික කර්මප්‍රත්‍යයයෙන් ද,

කුසලාකුසලං කම්මං විපාකස්ස උපනිස්සය පච්චයෙන පච්චයෝ"? යි උපනිශ්‍රය ප්‍රත්‍යය ද (කීහ) මෙ සේ පවත්නා ඒ විපාක විඤ්ඤාණයා ගේ රූප මිශ්‍රාදි භෙදයෙන් **විප්‍රකාරාදි** භෙදය ද දත යුතු.

ඒ මෙසේ යි:- ප්‍රතිසන්ධි වශයෙන් එක් ආකාරයකින් පවත්නා මේ විපාක විඤ්ඤාණය (නිශ්‍රය ප්‍රත්‍යය වූ) රූපය හා මිශ්‍ර-අමිශ්‍ර භෙදයෙන් **විවිධ** වේ. කාම භව-රූප භව-අරූපභව-භෙදයෙන් **ත්‍රිවිධ** වේ.

අණ්ඩජ- ජලාබුජ- සංසෙදජ- ඔපපාතික- යොනි වශයෙන් **චතුර්විධ** වේ.

ගති වශයෙන් **පඤ්චවිධ** වේ.

විඤ්ඤාණස්ථිති වශයෙන් **සප්තවිධ** වේ,

සත්ත්වාවාස වශයෙන් **අෂ්ටවිධ** වේ. මෙහි අසඤ්ඤ සත්ත්වය නැති.

---

* කර්මයෙන් † භෙදයෙන් ‡ වී: ප: පටිච්ච සමුප්පාද විභඞ්ග
? ප: ප:

තවද -

"මූසු බව බෙයින් දෙවෙ* - සබවුදු† ඉන් දෙකෙක් වේ.
මූසු බව හා අඩුයෙන් දසක දෙකෙක් තුනෙක් හෝ"

විභාග:- රූප මිශ්‍ර ප්‍රතිසන්ධි විඤ්ඤාණය භාව භේදයෙන් ද්විවිධ වේ.

මේ මිශ්‍ර-අමිශ්‍ර ප්‍රතිසන්ධි විඤ්ඤාණයන් අතුරින් අරූපභවය හැර සෙසු තන්හි රූපය හා මිශ්‍ර වූ ප්‍රතිසන්ධි විඤ්ඤාණය උපදී. හෙද රූප භවයෙහි ස්ත්‍රී-පුරුෂ ඉන්ද්‍රිය නම්වූ භාව රූප නැතිවැ උපදනා හෙයින් ද, කාම භවයෙහි ජාති නපුංසක ප්‍රතිසන්ධිය හැර සෙසු තන්හි ස්ත්‍රී-පුරුෂ භාව සහිතවැ උපදනා හෙයින් ද සභාවයැ, අභාවයැයි **ද්විධ** වේ.

එහි භාවරූප සහිත ප්‍රතිසන්ධිය ද ද්විධ වේ.

ඒ මෙසේ යි:- ඒ සභාවක ප්‍රතිසන්ධියෙහි ද ස්ත්‍රීභාවය පුරුෂ භාවය යන මොවුනතුරින් එක්තරා භාව රූපයක් හා මිශ්‍රව ඉපදීම් වශයෙනි.

ඒ රූප මිශ්‍ර ප්‍රතිසන්ධිය හා ඔමක හෙයින් දශක දෙකෙක් හෝ තුනෙක් වේ. පෙර කී මිශ්‍ර - අමිශ්‍ර විකයෙහි පළමු කී රූප මිශ්‍ර ප්‍රතිසන්ධි විඤ්ඤාණය ඒ හා උපදනා වස්තු-කාය දශක වශයෙන් දශක දෙකක් හෝ වස්තු-කාය-භාව දශක වශයෙන් තුනක් හෝ අඩු වශයෙන් උපදී.

විශෙෂ :- මේ ද්විවිධ- ත්‍රිවිධ දශකයන් හැර අනික් රූප පිරිහීමෙක් නැති, මෙයට අඩු වූ රූප මිශ්‍ර ප්‍රතිසන්ධියෙක් නැති, මෙ සේ ඒ (ඔමක) ඇවත් පිරිසෙයින් රූප මිශ්‍ර ප්‍රතිසන්ධිය, අණ්ඩජ- ජලාබුජ යෝනීන්හි එදවස් උපන් එළුපැටවකු ගේ රොමයෙකින් නහාගත් (තලතෙල්)- පහන් හිතෙල් බිඳක් පමණ වූ කලල රූපය නමින් උපදී. එහිදු යෝනීන් ගේ ගතිවශයෙන් සම්භව (ඔවගන්නා භාව රූප) භෙදය දතයුතු-

නිරයද බුමුවු‡ හැර - අන් දෙව්යනට මූල කී,
තුන් යොනදි නො වේ සෙසු තුන් - ගතියෙහි සිවු යොන මැවේ.

එහි යොනි වශයෙන් සම්භව භෙදය මෙසේ යි.

නරකයෙහි ද, භූම්‍යසථ දෙව්යන් හැර සෙසු දෙව්යන් විෂයෙහි ද, පළමු කී අණ්ඩජාදි ත්‍රිවිධ යොනීහු නො වෙති,

---

* දෙකෙක් වේ. † සවභාවයෙනුදු ‡ භූමාවු දි යොනියෙහි

එහි ඔපපාතිකයෝ මෑ වෙති. එසේ ම නිජ්ඣාමතණ්හික ප්‍රෙත විෂයයෙහි ද, පළමු කී ත්‍රිවිධ යොනීහු නො වෙති. එහිදු ඔපපාතිකයෝ ම වෙති. සෙසු තිරශ්චීන්- ප්‍රෙත- මනුෂ්‍ය යන ගති තුනෙහි ද, පෙර කී භූමාට්ඨ දෙවියන් විෂයයෙහි ද, අණ්ඩජාදී සිවු යොනීහු මෑ වෙති.

එහිද,

"රූ බිමෑ රූ තිසෙක - තෙවෙක-දෙයොත'ග* උකවින්†
සම සැත්තෑ රූවේ අඩුවෙන් තිසෙක් හෝ වේ"

ඔපපාතික යොනිවූ රූපාවචර බ්‍රහ්ම විෂයෙහි චක්ඛු- සොත- වත්‍ථු දශක වශයෙන් කම්ජ රූප තිසෙක, ජීවිත නවක කලාප වශයෙන් නවයෙක් දැයි ප්‍රතිසන්ධි විඤ්ඤාණය සමග රූප එකුන්සාලිසෙක් උපදී. ඒ රූපී බ්‍රහ්මයන් හැර සෙසු සංසෙදජ- ඔපපාතික- යෝනීන්හි උඩත් පිරිසෙයින් චක්ඛු- සොත- ඝාණ- ජීවිතා- කාය- වත්‍ථු- භාව දසක වශයෙන් සැත්තෑවෙක් වේ. (යටත් පිරිසෙයින් කාය- භාව- වත්‍ථු දසක තුන වේ.) ඒ සැත්තෑව දෙවියන් විෂයෙහි නිත්‍යයෙන් වේ. ඒ චක්ඛු ආදී දශකයෙහි වණ්ණ- ගන්ධ රස- ඔජා- පඨවී- ආපෝ- තෙජෝ- වායෝ- චක්ඛු- ජීවිත- යන මේ දසයක් වූ රූප පුඤ්ජය චක්ඛු දසක නම් වේ. සෙසු දසක ද මෙසේ මැයි.

(විශෙෂ:- සොත- ඝාණ- ජීවිතා- කාය- හදය- භාව- රූප මතු වෙනසි.)

යටත් පිරිසෙයින්, ජාත්‍යන්ධ- බධිර- අඝාණක- නපුංසක යන මොවුනට ජීවිතා- කාය- වත්‍ථු දශක වශයෙන් රූප තිසෙක් උපදී.

උත්කර්ෂී අපකර්ෂීයන් ගේ අතුරෙහි සුදුසු සේ විකල්පය දතයුතු, (මේ පිළිබඳ ටීකාවෙහි මතාන්තර ඇතුළු විස්තරයෙක් එයි.) මේ යටිත්පිරිසෙයින් කී අර්ථය පාළිය හා යෙදෙන සේ ගළපා දත යුතු.

("කාමධාතුයා උපපත්තිභවෙ කස්සචි එකාදසායතනානි පාතුභවන්ති, කස්සචි දසායතනානි - කස්සචි අපරානිපි දසායතනානි - කස්සචි නවායතනානි - කස්සචි සත්තා-

* සංසෙදජ ඔපපාතික යොනි දෙකෙහි † උත්කර්ෂට වශයෙන්

යතනානි''* කාම භවයෙහි සංසෙදජ ඔපපාතිකයනට පරිපූර්ණායතන වශයෙන් (ශබ්දවර්ජිත) එකාදස ආයතනයෙකි, අක්ඛියාහට චක්ඛායතන වර්ජිත දස ආයතනයෙකි, බිහිරාට සොතායතන වර්ජිත දස ආයතනයෙකි, අන්ධ බධිරයාට චක්ඛුසොත ආයතන වර්ජිත නව ආයතනයෙකි, ගබ්හසෙය්‍යකයනට රූප- ගන්ධ- රස- කාය- ඵොට්ඨබ්බ- මන- ධම්මායතන වශයෙන් සපත ආයතනයෙකැයි කියන ලදී.

විශෙෂ:- **''අඝාණකො ඔපපාතිකො නාම නත්ථි''**† අඝාණක ඔපපාතිකයෙක් නැතැයි කී හෙයින් හා පෙර කී ධම්මහදය විභඞ්ගපාඨයෙහි **''අඤ්ඤායතනානි පාතු භවන්ති''** යි නො කී හෙයින් ද එය සාධාරණි.

එසේ වේනම් එහි ''කස්සචි අපරානිපිදඝායතනානි පාතුභවන්ති'' යි ඝ්‍රාණවර්ජිත ඔපපාතිකයා සඳහා කිවමනා ය, එසේම 'කස්සචි අඤ්ඤායතනානි පාතු භවන්ති'' යි චක්ඛු-සොතඝාණ විකල වූ ඔහු සඳහා කියයුතු වේ.

එසේම, අන්ධ'ඝාණක- බධිර'ඝාණකයන් සඳහා ''කස්සචි අපරානිපි නවායතනානි පාතු භවන්ති'' යි දෙවරක් කිවයුතු වේ.

තවද මෙහි **'යථාපිරිසෙසින්'** යි කියේ සතර අපායෙහි සංසෙදජයන් පිණිසය යනු මහ අටුවා මතය යි. (සංසෙදජ-උපපාදුක මිනිස්සු වනාහි පරිපූර්ණායතන ඇතියෝ මැ වෙති යනු සත්‍ය යි.)

එහෙයින් අපායෙහි ජාත්‍යන්ධයාහට	රූපකලාප	සයෙක	(6)
ජාති බධිරයාහට	,,	,,	(6)
ජාති අඝ්‍රාණකයාහට	,,	,,	(6)
ජාති නපුංසකයාහට	,,	,,	(6)
ජාත්‍යන්ධ බධිරයාහට	,,	පසෙක	(5)
ජාත්‍යන්ධ අඝ්‍රාණකයාහට	,,	,,	(5)
ජාත්‍යන්ධ නපුංසකයාහට	,,	,,	(5)
ජාති බධිරඝ්‍රාණකයාහට	,,	,,	(5)
ජාති බධිරනපුංසකයාහට	,,	,,	(5)
ජාත්‍යන්ධ බධිරඝ්‍රාණකයාහට	,,	සතරෙක	(4)
ජාත්‍යන්ධ බධිරනපුංසකයාහට	,,	,,	(4)

යි ද දතයුතු.

---

* වි: ප: පටිච්ච ස: † සමෙමාහ විනොදනී

මෙසේ නැවත ද,

චුති පිළිසඳුන් බද - කඳ'රමුණු ගතිහෙ වෙයින්*
පි විතැකි විසැරියෙන්† - සම විසම බව් දන්නේ''

විසර්ජන :- මිශ්‍ර - අමිශ්‍ර භෙදයෙන් විවිධවූ ප්‍රතිසන්ධිය පිළිබඳ අනතුරුවැ ඉපිද නිරුඬ වූ චුතියෙක් වී නම් ඒ චුති - ප්‍රතිසන්ධීන් ගේ මේ සකඬ - ආලම්බනාදීන් හා භෙද - අභෙද විශෙෂය මෙ සේ දතයුතු යනු අර්ථයි.

කෙසේ ද! කිසිකලෙක චතුස්කඬ ආරුප්‍ප චුතියට අනතුරුවැ චතුස්කඬවූ ම අරමුණු හෙයිනුදු අභින්නාවූ ප්‍රතිසන්ධිය වේ.

(ඒ අරුතලයෙන් සැවැ එහිම උපදනවුන් සඳහා මේ කී.)

විශෙෂ :- අරූපභවයෙන් සැවැ යට - යට අරුතලයෙහි හෝ රූපාවචරයෙහි හෝ නූපදී. මතු අරුතෙලහි ද කාම භවයෙහි ත්‍රිහෙතුක ප්‍රතිසන්ධිකාවද උපදී.

කිසිකලෙක (අමහග්ගත බහිබාරම්මණ) ප්‍රථම-තෘතීයා'-රූප්‍ය චුතියට අනතුරුවැ (මහග්ගත අඣ්ඣත්තාරම්මණ) විතීය-චතුර්ථාරූප්‍ය ප්‍රතිසන්ධිය වේ. මේ අරූප භූමියෙහි ක්‍රමය යැ.

කිසිකලෙක චතුස්කන්ධ වූ ආරුප්‍ය චුතියට අනතුරුවැ පඤ්චස්කන්ධ වූ කාමාවචර ප්‍රතිසන්ධිය වේ.

කිසිකලෙක පඤ්චස්කන්ධ වූ කාමාවචර චුතියට ද, රූපාවචර චුතියට ද අනතුරුවැ චතුස්කන්ධ වූ ආරුප්‍ය ප්‍රතිසන්ධිය වේ.

මෙසේ අතීතාරම්මණ චුතියට අනතුරුවැ පච්චුපන්නාරම්මණ ප්‍රතිසන්ධිය වේ.

ඇතැම් කාමසුගති චුතියට අනතුරුවැ ඇතැම් දුගති පටිසන්ධි වේ.

අහෙතුක චුතියට අනතුරුවැ සහෙතුක ප්‍රතිසන්ධි වේ.

දුහෙතුක චුතියෙන් තිහෙතුක ප්‍රතිසන්ධි වේ.

උපෙක්ඛා සහගත චුතියෙන් සොමනස්ස සහගත පටිසන්ධි වේ.

---

* ඛන්ධ-ආලම්බන-ගති-හෙතු වෙදනා
† ප්‍රීති විතර්ක විචාරයෙන්

අප්‍රීතික චුතියෙන් සප්‍රීතික ප්‍රතිසන්ධි වේ.

අවිතක්ක චුතියෙන් සවිතක්ක ප්‍රතිසන්ධි වේ.

අවිචාර චුතියෙන් සවිචාර ප්‍රතිසන්ධි වේ.

අවිතක්ක - අවිචාර චුතියෙන් සවිතක්ක - සවිචාර ප්‍රතිසන්ධිය වේ යැයි ඒ ඒ කීවාක්‍යට විපරීත වශයෙන් යෙදෙන යෙදෙන පරිදි යෙදිය යුතු.

(විස්තර සුගමයි, මේ චුතියට අනතුරුවැ ප්‍රතිසන්ධි ස්කන්ධ - ආලම්බන - ගති - හෙතු - වෙදනා - පීති - විතක්ක - විචාර හෙදයෙන් වන සේ කී මැයි.)

"මෙ සේ ලද පසැති - මෙ දම් මතු බවතුරු සේ
හේ ඉන් බවතුරු නොසේ - නො වේ ඉනුදු අහේතෙන්"

මෙ සේ මේ ලබන ලද ප්‍රත්‍යය ඇති මේ රූපා'රූප ධර්ම-මාත්‍රය භවාන්තර ගත වේ. ප්‍රතිසන්ධි විඤ්ඤාණය ඒ පූර්ව භව-යෙන් භවාන්තර සංක්‍රමණය නො වේ. ඒ අතීත භවයෙන් හෙතුවක් නැතිවැ පහළ වන්නේ ද නො වේ.

විස්තර:- මේ කීසේ ලබන ලද අවිද්‍යාදී ප්‍රත්‍යය ඇති (මේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය) රූපා'රූප ධර්මමාත්‍රය ඉපදීම් වශයෙන් භවාන්තර ගත වේ. බාහිර පරිකල්පිත (ආත්මයෙක් නැති) සත්ත්වයෙක් හෝ ජීවයෙක් හෝ භවාන්තර ගත නො වේ. ඒ විඤ්ඤාණය ගේ ද අතීත භවයෙන් මේ භවයට සංක්‍රමණයෙක් නැත්. අතීත භවයෙහි හේතුවක් නැතිවැ මේ භවයෙහි පහළ-වීමෙකුදු නැති. (මෙය මනුෂ්‍ය චුතියෙන් හා ප්‍රතිසන්ධියෙන් ප්‍රකට කෙරේ.)

ඒ මෙසේ යි:- අතීත භවයෙහි ක්ෂය වූ ආයුසංස්කාර ඇතිවැ හෝ තමා ගේ හෝ මෙරමාගේ හෝ උපක්‍රමයෙකින් ආසන්න මරණ ඇතියහු ගේ සියලු අඞ්ගප්‍රත්‍යඞ්ග සන්ධි බන්ධනයන් සිදුනා මාරණාන්තික වෙදනා නැමැති ශස්ත්‍ර ප්‍රහාරයන් නො-ඉවසිය හැක්කහු ගේ සිරුර අවිවෙහි බහාලූ අලුත් තල්පතක් සේ ක්‍රමයෙන් වියළෙන කල චක්ෂුරාදි ඉන්ද්‍රියයන් නිරුද්ධවැ ගිය කල්හි කායින්ද්‍රිය, ජීවිතින්ද්‍රිය, මනින්ද්‍රියයන් හෘදයවස්තු ප්‍රදේශ මාත්‍රයෙහි පිහිටි කල්හි එකෙණෙහි ශෙෂ වූ හෘදය වස්තුව ඇසුරු කළ විඤ්ඤාණය, මාතෘඝාතකාදී **ගරුකර්මය**, නැවත නැවත සමාසේවිත **ආචිණ්ණ කර්මය**, **ආසන්නකර්මය**, පූර්ව භවයෙහි

කරන ලද අපරාපරියවෙද්‍ය වශයෙන් එළඹ සිටි **කම්මනිකාමීය** යන මොවුන් අතුරින් එකක් ලබනලද අවිද්‍යාදී අවශෙෂ ප්‍රත්‍යය ඇති සඞ්ඛාර සඞ්ඛ්‍යාත **කම්ම** හෝ ඒ කම්ම විසින් එළවන ලද **කම්ම නිමිත්තය, ගතිනිමිත්තයැ යි** කියන ලද විෂය අරභයා පවතී. (අතීතයෙහි කල්ප කොටි ශතසහශ්‍ර මත්තක. යෙහිදු කම්මයෝ විපාක කාලයෙහි අවුත් කම්ම හෝ කම්ම නිමිත්තයන්වැ වැටහෙති. (යනු සත්‍යයි) ගති නිමිත්ත නම් උපදනා සථානයෙහි යම් කිසි වණ්ණයෙකි. මෙ සේ පවත්නා ඒ විඤ්ඤය තෘෂ්ණා-අවිද්‍යා අප්‍රහීණ බැවින් අවිද්‍යාවෙන් මුවහ කළ ආදීනව ඇති ඒ කම්මාදී විෂයෙහි තෘෂ්ණාව ප්‍රතිසන්ධි සථානයට අභිමුඛකොට තමයි. චුති චිත්තයට ආසන්න ජවන් සිතෙහි පැවැති වෙතනාව හෝ සහජාත ඵස්සාදී **චෛතසික** හෝ ප්‍රතිසන්ධියට සථානවූ කම්මාදී විෂයෙහි විඤ්ඤය බහාලන්නාක් මෙන් වේ. ඒ ප්‍රතිසන්ධි විඤ්ඤය චුති-ප්‍රතිසන්ධි තදුසන්න විඤ්ඤයන් ගේ සන්තති වශයෙන් (පෙළගැසීම් වශයෙන්) පවුණු වන ලද එකම ඇත්තේ තෘෂ්ණාව විසින් නමනු ලබන්නේ සංස්කාරයන් විසින් බහාලනු ලබන්නේ මෙතෙර ගෘහ බඳනා-ලද රැහැනක එල්බ සිටි තැන හැර ඇල ඉක්ම එතෙර පිහිටන පුරුෂයකු සේ පළමු භවයෙහි පැවැති නිශ්‍රය වස්තු රූපය පඤ්චවොකාර භව වශයෙන් ආස්වාදනය කරමින් හෝ චතු වොකාර භව වශයෙන් ආස්වාදනය නො කෙරෙමින් හෝ ආලම්බනාදී ප්‍රත්‍යය ශක්තීන් හෙතු කොට ගෙන පවතී.

මෙහි පූර්ව චිත්තය මේ භවයෙන් ගිළිහෙන හෙයින් චුතිය යි ද, පශ්චිම චිත්තය අන්‍ය භවයක් හා ගළපන හෙයින් ප්‍රතිසන්ධිය යි ද කියනු ලැබේ.

ඒ ප්‍රතිසන්ධි චිත්තය පූර්ව භවයෙන් මෙහි පැමිණියේ නො-වෙයි. පූර්ව භවයේ ප්‍රතිසන්ධි ජනක කම්ම මරණාසන්න ජවන් සිත් හා සම්ප්‍රයුක්ත සංස්කාරය නාමීම් වශයෙන් පැවැති තෘෂ්ණාවය **කම්මනිමිත්තාදී** විෂයය යන හෙතුන්ගෙන් නොරවැ පහළ නො වූ යේ යයි දතයුතු.

(**විසතරඃ**- මෙ සේ තෘෂ්ණාවෙන් නැම්මය යනාදීන් නැම්-මය, බහාලීමය, පූර්වනිශ්‍රය හැරීමය, අපර නිශ්‍රය ගැනීම් ය, නිශ්‍රය රහිත නො පැවැත්මය, යන මොහු සන්තති වශයෙන් එකම විඤ්ඤාණයාගේ අවස්ථා භෙදයෝ යි. මෙයින් '**තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති අනඤ්ඤං**'* යි "ඒ මේ එකම

* එකචිත්තාභාවේ

විඤ්ඤාණය භවයෙන් භවයට දුවයි, සැරිසරයි, අනිකක් නොවේ යයි" පැවැති මිථ්‍යාවාදය බැහැර කෙරේ.

මෙහි උපමාන උපමේය සංසන්දනය

මෙහොර ගසෙහි බැඳි අත්ත මෙන් පූර්භව (ආත්ම භාව) ය පිළිබඳ කර්මාදී ආලම්බන දතයුතු.

පුරුෂයා මෙන් විඤ්ඤාණය ද, ඔහුගේ ඇළ ඉක්මවන රිසිය සේ තෘෂ්ණාව ද, ඇළ ඉක්මවන ප්‍රයෝගය සේ බහාලන චෙතනාදී සංස්කාරය ද, ඒ පුරුෂයා එතෙර පොළොවෙහි පිහිටන්නේ එතෙර බැඳි රැක් ආදියක් ආස්වාදනය කරන්නා සේ පඤ්චොපාදාන භවය ද, ආස්වාදනය නොකරන්නා සේ චතුරුපාදාන භවය ද, සවකීය බලයෙන් පොළොවෙහි පිහිටන්නා සේ ආලම්බණ සම්ප්‍රයුක්ත ධර්මයෙක්ම පැවැත්ම ද දතයුතු.

"සිත්පරපුරමුත් - එකත් නනත්* නොවන බවැ
පිළිගොස - පහත් ඇතත් - නිදසුන් වෙතියි දන්නේ"

තවද මේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය පූර්ව භවයෙන් මේ භවයට නොඒමෙහි ද, ඉකුත් භවයෙහි පැවැති හෙතූන් නිසා උපන් බව්හි ද, ප්‍රතිඝෝෂ- ප්‍රදීප- මුද්‍රා- ප්‍රතිබිම්බ යන මේ ආකාර ධර්මයෝ නිදර්ශන වෙති,

මෙ සේ ප්‍රතිරූපය, ප්‍රදීපය, මුද්‍රාවය, ඡායාවය යන මොවුහු ශබ්දාදි හෙතූන් නිසා පවතින්.

ඒ එසේ මැයි:- ප්‍රතිරූපය ශබ්දය නිසාද, ප්‍රදීපය අන්‍ය ආලෝකයක් නිසා ද, මුද්‍රාව සීල් එක නිසා ද, ප්‍රතිරූපය ආදර්ශාදිය අභිමුඛවීම නිසා ද තුබූතන්හි තිබියදී ම වේ,

මොවුන් ගේ ප්‍රත්‍යය - ප්‍රත්‍යුත්පන්න භාවය ඇතිකල්හි සන්තානබන්ධ භාවය ප්‍රකට නොවේ. ඔවුන් ගේ එකත්ව නානාත්ව භාවය පරාමර්ශනය නොකොට අතීත භවයෙන් අනාගමනය හා අතීත භවයෙහි වූ හෙතුවෙන් උපන් බව මෙයින් ප්‍රකට කෙරේ. ශබ්දය බැහැර අනුනාදය පවත්නා තැනට නොගොස් එය පැවැත්මට හෙතුවන්නේ ය. ශබ්දයට පෙරැ ප්‍රතිරූපය නොවූ හෙයිනි. මෙසේ ම මේ ප්‍රතිසන්ධි චිත්තය ද පූර්භවයෙන් මේ භවයට ආයේ ද නොවේ. පූර්ව භවයෙහි හෙතූන් විනා උපදනේ ද නොවේ.

---

* එකත්ව - නානාත්ව

මේ වූනි – ප්‍රතිසන්ධි සිත්හි ද, පරම්පරා සම්බන්ධයෙහි ද එකත්ව යෙකුදු නැති.

පරම්පරා සම්බන්ධය ඇති හෙයින් නානාත්වයෙකුදු නැති.

නිදර්ශන:– පරම්පරා සම්බන්ධයෙහිත් **එකානන්තයෙන් එකත්ව**-යෙක් වේ නම් කිරෙන් දී ගව **නොගනී**, එසේ ම **එකානන්ත නානාත්වය** වේ නම් දී, කිරි අයත් නොවේ. (ක්ෂීර සවාමීයාට දී අයත් නොවේ.) බීජ-අඞ්කුරාදී හෙතු හා හෙතුසමුත්පන්න ධර්මයන්හි ද මෙසේ මැයි, මෙසේ පවත්නා සියලු ලෞක-ව්‍යවහාරය අසිද්ධ වේ. හෙද අනිෂ්ට ය, එහෙයින් මේ සන්තාන ඛද්ධ හෙතු – හෙතුසමුත්පන්නයන් ගේ **ඒකානන්ත එකත්වය** හෝ **නානාත්වය** නොගත යුතු.

(**විශේෂ**:– මෙහි **එකාන්ත එකත්වවාදය** ප්‍රතික්ෂේප කළ හෙයින් **"සයං කතං සුඛ දුක්ඛං"** 'සුව දුක් තෙමේ ම කෙළේ ය' යන **ශාස්වත ග්‍රහණය** ප්‍රතිෂේධ කෙරේ.

එකාන්ත නානාත්වය ප්‍රතිෂේධ කළ හෙයින් **"පරං කතං සුඛ දුක්ඛ"** 'මෙරමා සුවදුක් කෙළේ ය' යන **උච්ඡේද දෘෂ්ටිය ද "අඤ්ඤෝ කරොති අඤ්ඤෝ පටිසංවෙදෙති"** 'අනිකෙක් කෙරේ අනිකෙක් විපාක විඳී' යන මේ **දෘෂ්ටිය ද** වළකා එයින් කෘත ප්‍රනාශය හා අකෘතාගමනය ද නිවෘත්ත වේ.

හෙතු – හෙතු සම්භූතපදාන වචනයෙන් **අධිච්චසමුප්පන්න වාදය** වළකා, මෙයින් ම **නියතිසඞ්ගතිවාදය** ද නිරස්ත ය.

ප්‍රශ්නයෙකි:– මෙසේ නොගොස් ම ඉපදුම් ඇතිකලැ මේ මිනිසත් බවෙහි පැවැති සකල නිරුද්ධ වූ බැවින් ඵලයට ප්‍රත්‍යය වූ **කර්මය** ද ඒ ඵලය උපදනා තැනට නොයන හෙයින් ද, කර්මය කළ තැනැත්තහු කෙරෙන් **අනිකක්** ගව ඒ ඵලය වන්නේ නොවේ ද?

ඵලය අනුභව කරන්නකු නැතිකල්හි ඒ ඵලය කවරකුහට වේ ද? එහෙයින් මේ විධානය නොමැනැවි නොවේ ද?

පිළිතුර:– "පරපුර නිපන් පල – අන්හට අනෙකකින් නොවැ
බිජුවට සකස් කළ සේ – මේ අරුතට නිදසුන් වේ',

විඤ්ඤාණ:- එක් සන්තතියෙකැ කර්මය නිපන් පෙළෙහි ම උපදනා ඵලය ඒ එකම සන්තතියෙහි නියමයෙන් ම එකතිය ද, නානාතිය ද වැළකූ හෙයින් කර්මය සකස් කළහු කෙරෙන් අනිකක්හට විපාකය වේ යයි හෝ ඒ කර්මයෙන් අන්‍ය හෙතුවකින් (අනිකකු කළ කර්මයක් හෙතුකොට ගෙන) ඒ විපාකය වේ යයි නෝ කිවයුතු නොවේ. මේ අදහසට අඹ බිජු ආදිය වතු මධුරාදියෙහි යොදා කළ සංස්කාරය (සකස්කිරීම) සාධක යැ.

නිදර්ශන:- වතුමධුරයෙහි ලා සකස් කළ අඹ බිජුවට සෘතුජ රූප පරම්පරාවෙහි ලබන ලද ඵල විශෙෂ ඇතිවැ කාලාන්තරයෙකින් ආම්‍රාදි ඵල උපදනේ අන්‍ය බීජයන් ගේ ඵල නූපදනේ යි. අනික් බිජුවෙක කළ මධුර රස ගැන්වීම් ආදී ප්‍රත්‍යයයෙන් නූපදනේ යි. ඒ බිජුවට ද, ඒ සකස්කිරීම් ද, ඵල ස්ථානයට ද නොපැමිණේ.

උපමාන - උපමෙය සංසන්දනය:- සකස් කළ බීජයන් මෙන් කර්මය කළ සත්ත්වයා ද, සකස් කිරීම මෙන් කර්මය ද, බීජයා ගේ අඞ්කුරාදි පරපුර මෙන් සත්ත්වයා ගේ ප්‍රතිසන්ධි විඤ්ඤාණාදී සන්තතිය ද, එයින් හටගත් ඵලයා ගේ මිහිරි බව ඒ සකස් කිරීමෙන් වූවාක් මෙන් කර්ම කළා වූ සත්ත්වයා ගේ ම ඒ කර්මයෙන් විපාකය ඉපදීම ද දතයුතු.

අනිකකුදු ඇති:- ළදරු කල පුහුණු කළ ශිල්පශාස්ත්‍රාදිය ද' යෙදූ ඖෂධාදිය ද, කාලාන්තරයෙහි වැඩුණු කල ද එම වෘද්ධ ශරීරයෙහි ඵල දීම ද මෙයට සාධක යැ. ළදරු සිරුරෙහි කළ ශිල්පාභ්‍යාස - ඖෂධ ප්‍රයොග වෘද්ධ ශරීරයට සන්තති පර්‍යාපන්න හෙයින් පිහිටන්නේ යි. නීරොග බව් සාධන්නේ යි. ඒ විද්‍යාභ්‍යාසාදිය නැති කල නොපිහිටන හෙයින් අන්‍ය හෙතුවකිනුදු නොවන්නේ යි. මේ සේ නාම-රූප සන්තති වශයෙන් පවත්නා ප්‍රතිසන්ධි සඞ්ඛ්‍යාත ඵලයන් කර්ම රැස්කළ සන්තතියටම මුත් අනිකකට නොවේ. එසේ ම සකස් කළ කර්ම හෙතුවෙන් ම මුත් අනික් හෙතුවකිනුදු නොවේ. අන්‍යසන්තානගත කර්මහෙතුවකිනුදු නොවේ.

තවද ප්‍රශ්නයෙකි:- ඵල අනුභව කරන්නෙකු නැතිකල ඵලය කවරෙකුට වේ ද?

(විපාක විඳින්නකු නැති කල විපාකය කවරෙකුට වේ ද? යනු අසය යි.)

පිළිතුර:-"පල ඉපදුණු මතින් - බුදුනෙකැයි බැවහර වේ,
පල හවගැනුමෙන් ම රැකැ - පල ගනිතැයි කියන වැනි"

විසඳුම:- රැකයයි ව්‍යවහාරයට කාරණ වූ (රැකනම් වූ) රූප ධර්මයන් ගේ එක් අවයවයක් වූ ගෙඩිය හවගැනීමෙන් ගන්න පලගනීය යි කියන්නා සේ දිව්‍ය මනුෂ්‍ය නම් වූ සත්ත්වයන් ගේ එක දෙශයක් වූ අනුභව කිර්ම නම් වූ සුවදුක් විපාකය (ඵලය) ඉපැද්මෙන් ම දෙවියෙක් හෝ මිනිසෙක් හෝ සැප වළඳයි සැපතට පැමිණෙයි. දුකට පැමිණේයැ යි කියනු ලැබේ.

(මෙ සේ මේ සත්ත්ව සන්තතියෙහි කුසල - අකුසල චෙතනා උපපත්තියක් ඇති කල පින් පව් කෙරේය යි කර්ත්‍රව්‍යවහාරය ද, ඒවායේ ඵලොත්පත්තිය (විපාක) ත් ඇතිකල එම සන්තානය සැප දුක් විඳිය යි උපභුඤ්ජක ව්‍යවහාරය ද, වන හෙයින් මේ සන්තානයෙහි අනුභව කරන්නා වූ අන් කිසිවකු ගෙන් අවියෙක් නැති.)

ප්‍රශ්නයෙකි:- මෙ සේ වන්නා මේ සංස්කාරයෝ විද්‍යමාන-වූවෝ ම ඵලයට ප්‍රත්‍යය වෙද් ද? අවිද්‍යමාන වූ වෝ ඵලයට ප්‍රත්‍යය වෙද් ද?

පිළිතුර:- විද්‍යමානවූවෝ ඵලයට ප්‍රත්‍යය වෙත් නම් ඒ සංස්කාරයන් ගේ වර්තමානක්ෂණයෙහි ම විපාක විය යුතු ය, අවිද්‍යමානවූවෝ ඵලයට පැමිණ ප්‍රත්‍යය වෙත් නම් කර්මය කිරී-මට පෙර ද විපාක විය යුතු ය. පසුව ද විපාක විය යුතු, නිතරම ද විය යුතු, එහෙයින් (ඕනවට මේ සේ පිළිතුරු දිය යුතු.)

කෙළෙන් මේ පස වේ - නිතර පල දෙනු නොද වේ
ඇපවී ණය ගැනුම මෙහි - නිදසුන් ලෙසින් දන්නේ"

විසඳුම:- මේ සංස්කාර කළ හෙයින් තම - තමා ගේ ඵලයට ප්‍රත්‍යය වනු විනා විද්‍යමාන බැවින් හෝ අවිද්‍යමාන බැවින් හෝ නො වේ.

එසින් වදළහ, "කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකං චක්ඛුවිඤ්ඤාණං උප්පන්නං හොති"* 'කාමාවචර කුශල කර්මය කළ හෙයින් රැස්කළ හෙයින් විපාකය වූ චක්ඛුවිඤ්ඤාණය උපන්නේ වේ" යනාදියයි ඒ සංස්කාර

*ධ: ස: චිත්තවිභත්තියි

තමහට සුදුසු ඵලයට ප්‍රත්‍යය වෑ නැවත ඵල උපදවන්නේ නොවේ, දෙතලද විපාක ඇති හෙයිනි.

මේ අර්ථය හැඟවීමට මේ ඇපවීම් ආදිය නිදර්ශන වේ යයි දතයුතු.

ඒ මෙසේ යි:- ලෙව්හි යම්කිසිවෙක් යම් කිසි වස්තුවක් ඒ වෙනුවට දීම සඳහා ඇප වී බඳුවක් හෝ ගනී, ණයක් හෝ ගනී, ඔහු ගේ ඒ ක්‍රියා මාත්‍රය ම ඒ වස්තු දීම සඳහා ප්‍රත්‍යය වේ. හුදෙක් ඒ ඇපවීම් ආදී ක්‍රියාව විද්‍යමාන බව හෝ අවිද්‍යමාන බව හෝ කරුණු නොවේ, ඒ ණය ගෙවීම් ආදියෙන් මත්තෙහි ණය දරන්නේ ද නොවේ. ණය ගෙවීම් ආදිය කළ හෙයිනි.

මෙසේ කළ හෙයින් ම සංඝකාරයෝ තමා ගේ ඵලයට ප්‍රත්‍යය වෙති, සුදුසු සේ විපාක දෙනයෙන් පසු මතුයෙහි ද විපාක දෙන්නෝ නොවෙති. මෙතෙකින් රූප මිශ්‍ර - අමිශ්‍ර වශයෙන් දෙපරිද්දෙකින් පවත්නා ප්‍රතිසන්ධි විඤ්ඤනයා ගේ සංඝකාර ප්‍රත්‍යයෙන් පැවැත්ම දක්වන ලදී.

දැන් ඒ දෙතිස් විපාක විඤ්ඤනයා ගේ මූළාව දුරුකිරීම පිණිස මේ කියා,

"පිළිසඳ හා පවත්* - විසින් බව යොන් ඇති
සකර යමකට යම් සේ - පසවෙද එසේ දන්නේ"

(මෙහි භව තුනෙකි, යොනි සතරෙකි, ගති පසෙකි, විඤ්ඤාණස්ථිති සතෙකි, සත්ත්වාවාස නවයෙකි,)

මේ භවාදියෙහි මේ සංඝකාර ප්‍රතිසන්ධියෙහි ද, ප්‍රවෘත්තියෙහි ද, යම් විපාක විඤ්ඤනයකට ප්‍රත්‍යය වේ නම් යම් ආකාරයකින් ප්‍රත්‍යය වේ නම් ඒ එසේ දතයුතු යැ යන අර්ථයි.

කෙසේ ද? යත්:- පළමුවැ පුණ්‍යාභිසංඝකාරයන් අතුරින් අට කාමාවචර චෙතනා භෙදය වූ පුණ්‍යාභිසංඝකාර නොවෙනස්වැ 'ත්‍රිහෙතුක කර්මය ත්‍රිහෙතුක විපාක දේ' යනාදී ක්‍රමයෙන් සාමාන්‍යයෙන් කාම සුගති භවයෙහි තව විපාක විඤ්ඤාණයට ප්‍රතිසන්ධි කාලයෙහි නානාක්ෂණික කර්මප්‍රත්‍යයයෙන් ද, උපනිශ්‍රය ප්‍රත්‍යයෙන්ද යි දෙපරිද්දෙකින් ප්‍රත්‍යය වේ.

---

* ප්‍රවෘත්ති

රූපාවචර කුසලචෙතනා පස වූ පුණ්‍යාභිසංඝස්කාර රූප භවයෙහි ප්‍රතිසන්ධි කාලයෙහි ම පඤ්චවිධ විපාක විඤ්ඤාණයට ඒ දෙපරිද්දෙන් ම ප්‍රත්‍යය වේ.

යට කී කාමාවචර පුණ්‍යාභිසංඝස්කාර සුගති කාමභවයෙහි උපෙක්ඛාසහගත අහෙතුක මනෝ විඤ්ඤාණ ධාතුව (උපෙක්ඛා සහගත සන්තීරණ) හැර සත් අහෙතුක විපාක විඤ්ඤාණයට **කර්මාවරණික කම්ම** ප්‍රත්‍යයෙන් හා උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රවෘත්ති යෙහි ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධියෙහි ප්‍රත්‍යය නො වේ. හේම රූප භවයෙහි චක්ඛු- සෝත- සම්පටිච්ඡන- සන්තීරණ- යන පස් විපාක විඤ්ඤාණයට එසේ ම ප්‍රවෘත්තියෙහි ප්‍රත්‍යය වේ, ප්‍රතිසන්ධියෙහි නො වේ. දුගීති කාම භවයෙහි අහෙතුක විපාක විඤ්ඤාණ අට එසේ ප්‍රවෘත්තියෙහි ප්‍රත්‍යය වේ, ප්‍රතිසන්ධියෙහි ප්‍රත්‍යය නො වේ.

විශේෂ:- (එහි) නිරයෙහි මහමුගලන් තෙරුන් තරක චාරිකාදියෙහි ඍද්ධියෙන් වැසි වස්වා නිරු ගිනි නිවා මොහොතක් ධර්මදේශනා කරන කල්හි ඒ කාමාවචර පුණ්‍යාභිසංඝස්කාර අට පරිත්ත විපාකයට ප්‍රත්‍යය වේ. මහා ඍද්ධි ඇති කාල සුපණ්ණාදී තිරිසනුන් හා ප්‍රේතයන් විෂයෙහි ද ඉෂ්ටාලම්බන ලාභීම ය.

ඒ කාමාවචර පුණ්‍යාභිසංඝස්කාර අට කාම සුගතියෙහි සොළොස් කුශල විපාක විඤ්ඤාණයනට එකසේ ම ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි දෙක්හි ම ප්‍රත්‍යය වේ.

(**විශෙෂ**:- ප්‍රතිසන්ධි විපාක නවයට ප්‍රතිසන්ධියෙහි ද, සියල්ලට ප්‍රවෘත්තියෙහි ද ප්‍රත්‍යය වේ.)

සියලු කාමාවචර – රූපාවචර පුණ්‍යාභිසංඝස්කාර රූපභවයෙහි (යට කී කාමාවචර පස ද රූපාවචර පස ද යන) දස විපාක විඤ්ඤාණයට ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි දෙක්හි ම ප්‍රත්‍යය වේ.

(**විශෙෂ**:- කාමාවචර පස ප්‍රවෘත්තියෙහි ද, රූපාවචර පස ප්‍රවෘත්ති – ප්‍රතිසන්ධි දෙක්හි ම ද ප්‍රත්‍යය වේ.)

දෙළොස් අකුසල චෙතනා වූ අපුඤ්ඤාභි සංඝස්කාර කාම-දුගති භවයෙහි එක් විපාක විඤ්ඤාණයකට ප්‍රතිසන්ධියෙහි ද, සයකට ප්‍රවෘත්තියෙහි ද ප්‍රත්‍යය වේ.

උපෙක්ඛා සහගත අකුසල විපාක සන්තීරණය හැර අනික් සයට ප්‍රවෘත්ති කර්මාවරණයේ අභාදශ අකුශලය ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධියෙහි ප්‍රත්‍යය නො වේ.

සත් අකුසල විපාක විඤ්ඤාණයට ම ප්‍රත්‍යය වන බැවින් සඳෙනකුට ප්‍රවෘත්තියෙහිදු එකකුට ප්‍රවෘත්තියෙහි හා **ප්‍රතිසන්ධි** යෙහි ද ප්‍රත්‍යය වේ කාම සුගති භවයෙහි එම අකුසල විපාක සතට ම එසේම ප්‍රවෘත්තියෙහි ප්‍රත්‍යය වේ, **ප්‍රතිසන්ධියෙහි** නො වේ.

රූපභවයෙහි චතුර්ධ (චක්ඛු සොත- සම්පටිච්ඡන- සන්තීරණ,) අකුසල විපාක විඤ්ඤාණයනට ප්‍රවෘත්තියෙහි ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධියෙහි නො වේ.

විශේෂ:- ඒ වූකලි රූප භවයෙහි අනිෂ්ට රූප දර්ශන ශබ්ද ශ්‍රවණ නැති හෙයින් කාම භවයෙහි වේ. කාමාවචර දිව්‍ය ලෝකයෙහි ද අනිෂ්ට රූප ශබ්ද නැති, පූර්ව **නිමිති** වශයෙන් මලානීක මල්මාලාදී අනිෂ්ටාලම්බන වශයෙන් කිසිකලෙක ලැබේ.

ආනෙඤ්ජාභිසංඛාරය අරූප භවයෙහි සතර **විපාක** විඤ්ඤාණයට එසේම ප්‍රවෘත්ති - ප්‍රතිසන්ධීන්හි ප්‍රත්‍යය වේ.

මෙ සේ **සංඛාර** කාමාදී භවත්‍රයයෙහි ප්‍රතිසන්ධි - ප්‍රවෘත්ති වශයෙන් යමකට ප්‍රත්‍යය වේ නම්, යම් සේ ප්‍රත්‍යය වේ නම් එසේ ද දතයුතු.

යොනි ආදියෙහි පැවැත්ම ද මේ නයින් ම දතයුතු, **මේ** ලෙශ මාත්‍රයෙකි, මොවුනතුරින් පුණ්‍යාභිසංඛාර, කාම-රූප භවයන්හි පිළිසඳ දී තමා සියලු විපාක උපදවයි.

එසේම අණ්ඩජාදී සතර යෝනියෙහි ද, දිව්‍ය මනුෂ්‍ය දෙගතියෙහි ද, සියලු කාම සුගති සඞ්ඛ්‍යාත **නානත්තන කායා-නානත්තසඤ්ඤීවිඤ්ඤාණට්ඨිතියෙහි ද,** ප්‍රථමධ්‍යානභූමි සඞ්ඛ්‍යාත **නානත්තකායා එකත්තන සඤ්ඤී විඤ්ඤාණට්ඨිතියෙහි ද,** ද්විතීය ධ්‍යාන භූමි සඞ්ඛ්‍යාත **එකත්තකායානානත්තන සඤ්ඤී විඤ්ඤාණට්ඨි-තියෙහි ද,** තෘතීයධ්‍යාන භූමි හා **වෙහප්ඵල සඞ්ඛ්‍යාත එකත්ත-කායා එකත්තසඤ්ඤී විඤ්ඤාණ ට්ඨිතියෙහිද යි** සතර විඤ්ඤාණ ස්ථිතියෙහි ද (අසංඥ සත්ත්වාවාසයෙහි වනාහී මේ **පුණ්‍යාභි** සංඛාරය රූප මාත්‍රයම සංස්කරණය කරන හෙයින්) සතර සත්ත්වාවාසයෙහි ම ප්‍රතිසන්ධි දී තමා ගේ සියලු විපාක දනවයි

එහෙයින් මේ පුණ්‍යාභිසංස්කාරය භවත්‍රයෙහි ද, චතුර්යෝනි-යෙහි ද, දෙගතියෙහි ද, සතර විඤ්ඤාණ ස්ථිතියෙහි ද, සතර

සත්ත්වාවාසයෙහි ද එක්විසි විපාක විඤ්ඤාණඤ්චායතනට **නානාක්ෂණික කර්ම-ප්‍රත්‍යයෙන්** හා උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් හා ප්‍රත්‍යය වේ.

(**නිගමය** - කාමාවචර- රූපාවචර එක්විසි කුශල විපාක විඤ්ඤාණයන් අතුරින් තුදුස් දෙනෙකුන්ට ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති දෙක්හි ම ප්‍රත්‍යය වේ. සත්දෙනෙකුන්ට ප්‍රවෘත්තියෙහි ම ප්‍රත්‍යය වේ.)

අපුඤ්ඤාභිසංඛාරය එකම (කාම) භවයෙහි ද, සතර යොනියෙහි ද, නරක- තිරිසන්- ප්‍රේත, ගති තුනෙහි ද, 'කානත්තකාණා එකත්ත සඤ්ඤිදි' යන එකම විඤ්ඤාණ ස්ථිතියෙහි ද එබඳු එකම සත්ත්වාවාසයෙහි ද ප්‍රතිසන්ධි වශයෙන් විපාක දේ.

මෙ සේ අපුඤ්ඤාභි සංස්කාර මෙකී තැන් තන්හි සත්ත විඤ්ඤාණයනට ප්‍රතිසන්ධි-ප්‍රවෘත්තීන්හි නානාක්ෂණික කර්ම ප්‍රත්‍යයෙන් හා උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් හා ප්‍රත්‍යය වේ.

ආනෙඤ්ජාභිසංඛාරය එකම අරූප භවයෙහි එකම ඔපපාතික යොනියෙහි ද, එකම දෙවගතියෙහි ද, **ආකාසානඤ්චා-යතනාදී** විඤ්ඤාණස්ථිති තුනෙහි ද, ආකාසානඤ්චායතනාදී සතර **සත්ත්වාවාසයෙහි** ද ප්‍රතිසන්ධි වශයෙන් විපාක දේ.

මෙසේ එකම භවයෙහි, එකම යොනියෙහි, එකම ගතියෙහ, **විඤ්ඤාණ** ස්ථිති තුනෙහි, සතර **සත්ත්වාවාසයෙහි, සතර විඤ්ඤාණ-යනට කර්මප්‍රත්‍යයයෙන් හා උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන්** හා ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති දෙක්හි ප්‍රත්‍යය වේ,

"පිළිසඳද පැවැතුම් - විඤ්ඤාණ බව ඇති මේ
සකර යමකට යම් සේ - පසවෙද එසේ දන්නේ"

මේ **'සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං"** යන්නෙහි විසතර කථාවයි.

---

3. **විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාම රූප වේ** යන පදයෙහි:-

(1) නාම රූප විභාග හෙයින් ද

(2) භවාදීන්හි පවත්නා ආකාරයෙන් ද

(3) සංග්‍රහ හෙයින් ද

(4) ප්‍රත්‍යය නය හෙයින් ද, වීනිශ්චය දතයුතු ය.

(1) නාමය ද + රූපය ද = නාම-රූප නම්. අරමුණට අභිමුඛභෑ නැමෙන හෙයින් වෙදනාදී ස්කන්ධත්‍රය **නාම** නම්.

සතර මහාභූත ද, සතර මහා භූත නිසා **පවත්නා** සුවිසි උපාදා රූප ද **රූප** නම්, මොවුන් ගේ විභාගය ස්කන්ධ නිදේශයෙහි කියන ලදී. මෙසේ මෙහි පළමු කොට විභාග වශයෙන් නාම-රූපයන් ගේ විනිශ්චය දතයුතු යැ.

(2) භවාදීන්හි පැවැතීම් වශයෙන් මෙ සේ යි,

(i) **නාමය** එකම අසංඥ සත්ත්වාවාසය හැර සෙසු සියලු භව- යොනි- ගති විඤ්ඤාණ ස්ථිති (සෙසු) සත්ත්වාවාසයන්හි වේ.

(ii) **රූපය,** කාම-රූප භව දෙක්හි ද, සිව් යොනියෙහි ද, පස් ගතියෙහි ද, පළමු සතර විඤ්ඤාණ ස්ථිතියෙහි ද, අරූප සත්ත්වාවාසය හැර සෙසු සත්ත්වාවාස පසෙහි ද පවතී. මෙ සේ පවත්නේ ද මේ නාම-රූප දෙක්හි අභාවක ගබ්භ සෙය්‍යකයනට ද, අණ්ඩජයනට ද, ප්‍රතිසන්ධි ක්ෂණයෙහි වසතු- කාය- දශක වශයෙන් රූපයන් හෙන් කලාප සන්නති දෙකක් හා අරූප සකන්ධ තුනක් ද පහළ වෙති. මෙ සේ රූප ධර්ම විස්සක් හා අරූප ධර්ම තුනක් දැයි තෙවිසි ධර්ම කෙනෙක් විඤ්ඤාණ ප්‍රත්‍යයයෙන් වන නාම-රූපයෝ යැයි දතයුතු.

විශෙෂ:- අගණිත ගහණයෙන් එක රූප කලාපයකින් දෙක්හිම පවත්නා (ශුද්ධාෂ්ටකය හා ජීවිතින්ද්‍රිය යන) නවය හැර සෙසු රූප එකොළොස ය, නාම ධර්ම තුන දැයි තුදුස් ධර්ම කෙනෙක් වෙති. සභාවකයනට භාව දසකය ද බහා තෙතිසක් ද, අගණිත ගහණයෙන් (සමාන රූප අටළොසක් හැර) පසළොසක් ද වේ.

ඔපපාතිකයන් අතුරෙන් බ්‍රහ්ම කායිකයින් ගේ ප්‍රතිසන්ධි ක්ෂණයෙහි චක්ඛු- සොත- වසතු දශකයන් ගේ ද, ජීවිත නවකයා ගේ ද වශයෙන් රූපයෙහි සන්නති ශීඝ්‍ර සතරක් ද, අරූපස්කන්ධ තුනක් ද, පහළ වේ.

එහෙයින් විසතර වශයෙන් ඔවුන් ගේ රූප රූප වශයෙන් එකුන් සාලිස් රූප හා අරූප ස්කන්ධ තුනදැයි දෙසාලිස් ධර්ම කෙනෙක් විඤ්ඤාණ ප්‍රත්‍යයයෙන් වන නාම-රූපයෝ යැයි දතයුතු. අගණිත ගහණයෙන් රූප කලාප සත්විස්සක් හැර සතළොස් ධර්ම කෙනෙක් වෙති.

(ප්‍රතිසන්ධි ක්ෂණයෙහි විකාර රූප නැති, එහෙත් ලක්ෂණ රූප ඇත ද පරමාර්ථ හෙයින් ඔවුන් තෝ පිළිපන් හෙයින් ඔවුනුදු වර්ජනය කරනු සඳහා රූප රූපයැ යි කීහ. එසෙයාදිය සංස්කාර සකඬ හෙයින් එකක් සේ ගැනේ.) කාම භවයෙහී භාව සහිතවැ පරිපූර්ණ ආයතන ඇතිවැ උපදනා සෙසු ඔපපාතිකයනට හෝ සංසෙදජයනට හෝ ප්‍රතිසන්ධි ක්ෂණයෙහි රූපකලාප සත්තති මූල සතක් ද, අරූපස්කඬ තුනක් ද පහළ වේ.

විසතර වශයෙන් රූප රූපයෙන් චකඛු- සොත- ඝාණ- ජිව්හා- කාය- භාව- වත්ථු- දශක වශයෙන් සැත්තෑවක් හා අරූපස්කඬ තුන දැයි නෙ සැත්තෑවෙකැ යන මේ නාම-රූප ධර්ම විඥන ප්‍රත්‍යයයෙන් වේ යයි දතයුතු. අගහිත ගහණයෙන් රූප සත්තති ශීඝ්‍ර සයකින් සූපනස් ධර්මයන් හැර එකුන් විස්සක් උත්කර්ෂ වශයෙන් ද, අපකර්ෂ වශයෙන් ඒ ඒ රූප කලාප විකල වූවන්ට ඒවායේ වශයෙන් පිරිහෙලමින් සංක්ෂෙපයෙන් ද, විසතරයෙන් ද ප්‍රතිසන්ධියෙහි **විඤ්ඤාණප්‍රත්‍යයයෙන් නාම රූප** සඞ්ඛ්‍යා දතයුතු.

විශෙෂ:- අරූපීනට අරූප ස්කඬ තුනම ද. අසංඥ සත්ත්වයනට රූපයෙන් ජීවිතින්ද්‍රිය නවකය පමණක් ද වේ.

මේ ප්‍රතිසන්ධියෙහි ක්‍රමය යැ.

ප්‍රවෘත්තියෙහි (ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය අභාර කාලයෙහි) රූප පවත්නා සියලු තන්හි ප්‍රතිසන්ධි චිත්තයා ගේ **ස්ථිතික්ෂණ** යෙහි ප්‍රතිසන්ධි සිත හා පැවැති තෙජෝ ධාතුවෙන් (ඍතුවෙන්) උතුඤමුඬාන ශුද්ධාෂ්ටකය පහළ වේ.

විශෙෂ:- ප්‍රතිසන්ධි සිත රූප නූපදවයි. ප්‍රපාතයෙකැ වැටුණහු මෙරමාව පිණිට වීමට අපොහොසත් වන්නාක් මෙන් හෘදය වසතුව දුර්වල හෙයින් රූප ඉපදවීමට එය පොහොසත් තෝ වේ. ප්‍රතිසන්ධි සිතෙන් මත්තෙහි ප්‍රථම භවාඞ්ගයේ පටන් එ චිත්ත සමුඬාන ශුද්ධාෂ්ටකය ද, ශබ්දය උපදනා කල්හි ප්‍රතිසන්ධියෙන් මත්තෙහි පැවැති ඍතුවෙන් ද, චිත්තයෙන් ද, ශබ්ද නවකය ද උපදී.

කබළීකාරාහාරය නිසා ජීවත් වන ගබ්භසෙය්‍යක සත්ත්වයන් ගේ ශරීරයෙහි :-

''මව බුදුන් බත්-පැන් - ඇ යම් බොජුනෙක් වෙද?
මව් කුස නොත් එ බිලිඳු - එයිදී ඉන් යැපෙනුයේ'' යි

කි හෙයින් මව අනුභව කළ ආහාරයෙන් අනුගත ශරීර-යෙහි ආහාර සමුඨාන ශුද්ධාෂ්ටකය උපදී.

ඔපපාතිකයනට සියල්ලට පළමු තම්ා මුව වැකුණු කෙළ ගලන කල ආහාර සමුඨාන ශුඛාෂ්ටකය උපදී.

මෙ සේ මේ ආහාර සමුඨාන ශුඛාෂ්ටකය (ඍතු- චිත්ත-සමුඨාන අෂ්ටක දෙක ය) උත්කෂී හෙයින් ඍතු- චිත්ත-සමුඨාන ශබ්ද නවක දෙකදූ යි සවිසි රූපයෙක් වේ.

පෙර කම් සමුඨාන රූප කලාප දෙකෙහි සිට කලාප සත දක්වා එක එක චිත්තයා ගේ තුන් තුන් ක්ෂණයෙහි උපදනා කියන ලද සැත්තෑ කොටස හා මෙහි කි චිත්ත සමුඨාන, ඍතු සමුඨාන දෙ කොටසෙහි වූ සවිසි කොටස දූයි සඟවූ වැදූරුම් රූපය ද, එහි වූ අරූපස්කන්ධ තුන දූයි සංක්ෂෙපයෙන් නවාතූ ධම් ද ශබ්දය අනියත හෙයින් ඒ දෙ කොටස හැර සත් අනූ ධම් ද යෙදෙන යෙදෙන පරිද්දෙන් සියලු සත්ත්වයන් ගේ **විඤ්ඤාන ප්‍රත්‍යයෙන් වන නාම - රූප** යයි දතයුතු.

නිදන්නාවූ ද, ප්‍රමාදවන්නාවූ ද, කන්නාවූ ද, බොන්නාවූ ද, ඒ සත්තව් දහවල් ද රෑ ද මේ **සත් අනූ නාම - රූප ධම්යෝ විඤ්ඤාන ප්‍රත්‍යයයෙන්** පවතිත්.

ඔවුන්ට ඒ විඤ්ඤාය ප්‍රත්‍යය වන බව මත්තෙහි **වණ්ණනා** කරමු.

මෙකී ඒ කම්ජ රූප සියලු භව- යොනි- ගති- විඤ්ඤාණට්ඨිති-සත්තාවාසයන්හි සියලු රූපයනට පළමු පිහිටන්නේ තමුදු තිසමුඨානික රූපයෙන් උවතඹ නො ලදහොත් බොහෝ කලක් පැවැතීමට පොහොසත් නො වේ. ඒ තිසමුඨානික රූප ද කම්ජ රූපයෙන් උවතඹ නො ලැබ පැවැත්මට නො හැකි වේ.

ඒකාන්තයෙන් වාතයෙන් පහරන ලදුවත් සිවු දිගට විහිදුවා අග එක් තැන් කොට තැබූ බට දඬු මිටි සතරක් සේ ද, රළු වේගයෙන් පහළ මහ මුහුදෙහි එක් තැනෙක පිහිටි බුන් තැවක් සේ ද ඔවුනොවුන් පිහිට ලැබම මේ කම්ාදී චතු සමුඨානික රූප කලාපයෝ නො වැටී පිහිටා වම්යක් හෝ දෙ වම්යක් හෝ -පෙ-

ශතවර්ෂයක් හෝ ඒ සත්ත්වයින් ගේ ආයුඃක්ෂය හෝ පුණ්‍යක්ෂය හෝ වනතාක් පවතින්.

මෙ සේ **භවාදීන්ගේ පැවැතීම් වශයෙන් ද විනිශ්චය** දතයුතු.

---

(3) **සංග්‍රහ වශයෙන්**:- අරූප භවයෙහි ප්‍රවෘත්ති- ප්‍රතිසන්ධි දෙක්හි ද, පඤ්චවොකාර භවයෙහි ප්‍රවෘත්තියෙහි ද (දෙපස් විඤ්ඤාණ හා රහතුන් ගේ චුති චිත්තය ද, රූප නොඋපදවන හෙයින්) සෙසු **විඤ්ඤාන ප්‍රත්‍යයයෙන් සම්ප්‍රයුක්ත නාමය වේ.**

අසංඥ සත්ත්වයෙහි ප්‍රතිසන්ධි - ප්‍රවෘත්ති දෙක්හි ම **කර්ම-විඤ්ඤාන ප්‍රත්‍යයෙන් රූපයම වේ.** පඤ්චවොකාර භවයෙහිදු ප්‍රවෘත්තියෙහි විඤ්ඤාන ප්‍රත්‍යයෙන් රූපයම වේ. පඤ්චවොකාර භවයෙහි ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි දෙක්හි ම විඤ්ඤාන ප්‍රත්‍යයෙන් නාම-රූප දෙකම ද වේ. ඒ සියල්ල නාමය ද, රූපය ද, නාම - රූප දෙක ද නාම රූපයැ යි මෙසේ එක දෙශයකින් සඵරූප එකශෙෂ කොට **විඤ්ඤාන ප්‍රත්‍යයයෙන් නාම - රූප වේය සි** දතයුතු.

ප්‍රශ්නයෙකි:- අසංඥ සත්ත්වයෙහි විඤ්ඤාණයක් නැති හෙයින් විඤ්ඤාන ප්‍රත්‍යයයෙන් රූප වේය යනු අයුක්ත වේ ද?

පිළිතුර - ඒ අයුතු නො වේ.

කවර හෙයින් ද?

"නම්-රූ දෙකට හේ* - විනැණෙක් වෙද ඒ මෙහි
විවා-අවිවා දෙ බෙයින් - කිවෙන් මේ මෙහි යුතු මැයි"

නාම-රූපයට හෙතු වූ මේ විඤ්ඤාණය විපාක විඤ්ඤාණය, අවිපාක විඤ්ඤාණයැ යි දෙ පරිද්දෙකින් දන්නා ලදී. එහෙත් මේ අසංඥ සත්ත්වයෙහි කර්ම සමුත්ථාන නෙයින් පඤ්චවොකාර භවයෙහි ප්‍රවෘත්ත වූ **අභිසංඛාර විඤ්ඤාන ප්‍රත්‍යයයෙන් රූපය වේ,** එ සේ ම පඤ්චවොකාරයෙහි ප්‍රවෘත්තියෙහි කුශල - අකුශල - ක්‍රියා චිත්තලක්ෂණයෙනි ද කර්ම සමුත්ථාන රූපය වේය යනු යුක්ත මැයි.

මෙ සේ **සංග්‍රහ වශයෙන් විනිශ්චය** දතයුතු.

---

* හෙතු

(4) **ප්‍රත්‍යය නය වශයෙන්**

(i) විපාක විඤ්ඤාණය නාමයට නව ආකාරයකින් ප්‍රත්‍යය වේ.

(ii) ප්‍රතිසන්ධි ක්ෂණයෙහි වසනු රූපයට නව **ආකාරයකින්** ප්‍රත්‍යය වේ.

(iii) සෙසු රූපයට අට ආකාරයකින් ප්‍රත්‍යය වේ.

(iv) අභිසංස්කාර විඤ්ඤාණය කර්මජ රූපයට එක් ආකාරයකින් ප්‍රත්‍යය වේ.

(v) සෙසු භවාඞ්ගයෙහි පවත් සියලු විඤ්ඤාණය **ඒ ඒ නාම-**රූපයට සුදුසු සුදුසු පරිදි ප්‍රත්‍යය වේ.

විභාග:- (i) ප්‍රතිසන්ධියෙහි හෝ ප්‍රවෘත්තියෙහි හෝ **විපාක** සඞ්ඛ්‍යාත යම් නාමයක් රූප මිශ්‍ර වූ හෝ මිශ්‍ර නොවූ හෝ **විපාක** නාමයට ප්‍රතිසන්ධිකවූ හෝ තදන්‍යවූ හෝ විපාක විඤ්ඤාණය **සහජාත- අඤ්ඤමඤ්ඤ- නිස්සය- සම්පයුත්ත- විපාක- ආහාර- ඉන්ද්‍රිය- අත්ථි- අවිගත**- වශයෙන් **නව ආකාරයෙකින් ප්‍රත්‍යය වේ.**

(ii) වසනු රූපයට ප්‍රතිසන්ධියෙහි **සහජාත- අඤ්ඤමඤ්ඤ- නිස්සය- විපාක- ආහාර- ඉන්ද්‍රිය- විප්පයුත්ත- අත්ථි අවිගත**- වශයෙන් නව ආකාරයෙකින් ප්‍රත්‍යය වේ.

(iii) වසනු රූපය හැර සෙසු රූපයට මේ නවවිධ ප්‍රත්‍යය-යන් අතුරින් අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය හැර සෙසු **අට ආකාර-යෙන් ප්‍රත්‍යය වේ.**

(iv) අභිසංස්කාර විඤ්ඤාණය අසංඥ සත්ත්ව රූපයට හෝ පඤ්චවොකාර භවයෙහි කර්මජ රූපයට හෝ සූත්‍රානුතික පර්‍යායයෙන් **උපනිශ්‍රය** වශයෙන් **එක ආකාරයකින්ම ප්‍රත්‍යය වේ.**

(v) අවශෙෂවූ ප්‍රථම භවාඞ්ගයෙහි පවත් සියලු විඤ්ඤාණය **ඒ ඒ නාම-රූපයට සුදුසු පරිද්දෙන් ප්‍රත්‍යය වේ යයි** දතයුතු.

විශෙෂ:- විස්තාර වශයෙන් ඒ විඤ්ඤාණයා ගේ ප්‍රත්‍යය නය දක්වන කල සියලුම පඨාන කථාව විස්තාර කළ යුතු වන බැවින් එය ආරම්භ නො කරමු.

ප්‍රශ්නයෙකි:- **'ඒ විඤ්ඤාණ පච්චයා නාම රූපං'** යන වචනයෙහි ප්‍රතිසන්ධියෙහි එන නාම-රූප විඤ්ඤාණ ප්‍රත්‍යයයෙන් වේය යි කෙසේ දන්නේ ද?

පිළිතුර:- අභිධර්ම පාළි නය විසිනුදු යුකත් විසිනුදු දතයුතු යි.

ඒ මෙසේ යි:- අභිධර්මී පෙළෙහි **"චිත්තානු පරිවත්තිනෝ ධම්මා*** චිත්තය අනුවැ පවත්නා ධර්මය" යනාදී බහු ප්‍රකාරයෙන් වෙදනාදීන්ට විඤ්ඤාණය ප්‍රත්‍යය වේය යි සිද්ධ යැ.

යුකති වශයෙන් වනාහි මෙහි දක්නාලද චිත්තජ රූපයෙන් නො දක්නාලද ප්‍රතිසන්ධි කර්මජරූපයට විඤ්ඤාණය ප්‍රත්‍යය වේය යි සිද්ධ ය.

ඒ එසේ මැයි: සිත පහන් කල ද නො පහන් කල ද එයට අනුරූප වූ රූප උපදනාහු දක්නා ලැබෙනි, දක්නා ලද දෙයින් නො දක්නා ලද්දාවූ ද ප්‍රතිසන්ධි රූපයට විඤ්ඤාණය ප්‍රත්‍යය වේය යි දතයුතුයි.

යුකති හෙයින් ඝාඩකයෙකින් එය සථිර කෙරේ. චිත්ත සමුට්ඨාන රූපයට් විඤ්ඤාණය ප්‍රත්‍යය වන්නාක් මෙන් කර්ම සමුත්ථාන රූපයට විඤ්ඤාණයා ගේ ප්‍රත්‍යය භාවය පට්ඨානයෙහි මෙසේ ආයේ යැ.

"අබ්‍යාකතෝ ධම්මෝ - පෙ - තයෝ ඛන්ධා"† යනාදී විසිනි, (විසතර බෙහෙවැ.)

මෙ සේ ප්‍රත්‍යය නය වශයෙනුදු මෙහි චිනිශ්චය දතයුතු.

මේ 'විඤ්ඤාන ප්‍රත්‍යයයෙන් නාම - රූප වේ" යන්නෙහි විසතර කථාවයි.

---

4 **නාම - රූප ප්‍රත්‍යයයෙන් ෂඩායතන වේ**; මේ පදයෙහි

නම නම් කදු තුන යැ - **රූ** නම් බූ-වනැ දතු,
එක් සෙත් කළ **එනම්**-රූ - පස වේ එවැනි ඔහුට මැ"

විසතර:- ෂඩායතනයට ම ප්‍රත්‍යයවූ මේ නාම - රූප අතුරින් නැමය නම් වෙදනාදී ස්කන්ධ තුන යැ. රූප නම් සත්-සනතතියෙහි ඇතුළත් සතර මහාභූත යැ. ෂඩ්වසතු යැ. ජීවිතින්ද්‍රියයැ යි මෙසේ නියමයෙන් යෙදෙන පරිද්දෙන් වේ.

---

* ධ: ප: නිකෙතිපඛණ්ඩ † ප: ප: පඤ්ඤාවාර

(මෙහි වෙදනාදී ස්කන්ධත්‍රය යි කීයේ විඤ්ඤාණය - මෙයට පෙර නාම-රූපයනට ප්‍රත්‍යය භාවයෙන් කී හෙයිනි.)

(සහාර මහාභූතයනට ද ෂඩ්වස්තූනට ද - ජීවිතේන්ද්‍රියට ද සුදුසු සේ **සහජාත- පුරේජාත- ඉන්ද්‍රියාදී** ප්‍රත්‍යයයෙන් ෂඩායතනයට ම එකාන්තයෙන් ප්‍රත්‍යය වන බව් සඳහාය යි වීකාහි කී.)

(රූපායතනාදියට සහජාත නිශ්‍රය අනුපාලකාදී භාවය නැති හෙයින් මෙහි නො ගැනේ)

විශේෂ:- ඒ නාම-රූප යනු නාම ද + රූප ද + නාම - රූප ද= නාම - රූප යැ යි, මෙසේ එකශෙෂ කරන ලදුයේ ෂඩායතනද + ෂඩායතන ද = ෂඩායතනයැ යි මෙ සේ එක ශෙෂ කරන ලද්දට ම ප්‍රත්‍යය වේය යි දතයුතු. ඒ මෙ සේ යි. අරූප භවයෙහි නාමය ෂඩායතනය (මනායතනය) ට ප්‍රත්‍යය වේ. එහෙයින් ම විභඩගයෙහි **"නාමපච්චයා ඡට්ඨායතනං"*** යි වදළහ.

ප්‍රශ්නයෙකි:- නාම-රූපය ෂඩායතනයට ප්‍රත්‍යය වේය යි කෙසේ දත හැකි ද?

පිළිතුර:- නාම-රූප ඇති කල්හි ම ෂඩායතන වන හෙයිනි,

ඒ එසේ මැයි:- ඒ ඒ නාම ද, රූප ද ඇති කල ඒ ඒ ආයතනය වේ. නැති කල නො වේ. යනු ව්‍යතිරේකයෙන් කියන ලදී. ඒ ෂඩායතනයන් ගේ නාම-රූප ඇති කල වන සුලු බව ප්‍රත්‍යය තයෙහි ම මතු ප්‍රකාශ වේ.

එහෙයින්:- "පිළිසඳැ පවත්හි ද - යමක් යමකට පස වෙද,
යම් ලෙසකිනුදු පස වෙද - පඬිහු එ මෙ සේ දතයුතු"
මෙ කියනුයේ එහි විසතාරය යි,

'නම්මැ අරූ බෙවෙ - පිළිසඳැ පැවැතැ නමට ම,
සත් අයුරින්, ස අයුරින් - පස වෙ යටත් පිරිසෙයින්"

ඒ මෙ සේ යි:- ප්‍රවෘත්තියෙන් පළමුවැ ප්‍රතිසන්ධියෙහි යටත් පිරිසෙයින් **සහජාත- අඤ්ඤමඤ්ඤ- නිස්සය- සම්පයුත්ත- විපාක- අත්ථි- අවිගත ප්‍රත්‍යයයෙන් සත් පරිද්දෙකින් නාමය ෂඩායතනයට ප්‍රත්‍යය** වේ.

තවද මේ නාම අතුරින් කිසිවක් **හෙතු ප්‍රත්‍යයයෙන්** ද, කිසිවක් **ආහාර ප්‍රත්‍යය** යෙන් ද, මෙ සේ **අන් අයුරින් ද ප්‍රත්‍යය** වේ. **ඒ** වශයෙන් උත්තරීය අපරාපරීය ද දතයුතු.

---

* වි: ප: පටිච්ච සමුප්පාද විභඩග

ප්‍රවෘත්තියෙහි ද විපාකය කී නයින් ම ප්‍රත්‍යය වේ.

සෙසු **අවිපාක** නාමය යටත් පිරිසෙයින් යට කී ප්‍රත්‍යයයන් අතුරින් **විපාක** ප්‍රත්‍යය හැර **ෂට්ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය** වේ.

විශෙෂ:- මේ අවිපාක නාම අතුරින් අලොභ- අදේස- අමොහ- සඞ්ඛ්‍යාත කිසි නාමයෙක් හේතු ප්‍රත්‍යයෙන් ද, සඵශී- වෙදනාදී කිසි නාමයෙක් ආහාර ප්‍රත්‍යයෙන් ද, යන **මේ** ආකාර යෙන් අන් අයුරකිනුදු ප්‍රත්‍යය වේ. ඒ හෙතු ප්‍රත්‍යාදීන් ගේ වශයෙන් උත්කර්ෂී-අපකර්ෂීය දතයුතු.

(**විභාග**:- පෙර කී ප්‍රත්‍යය භාවයෙන් අමොහය හෙතු ප්‍රත්‍යයවැ අෂ්ටඛා ප්‍රත්‍යය භාවය ද, ඉන්ද්‍රිය ප්‍රත්‍යය වීමෙන් නවඛා- ප්‍රත්‍යය භාවය ද, මාර්ග ප්‍රත්‍යය වීමෙන් දසඛා ප්‍රත්‍යය භාවයද සි උත්කර්ෂී ද, ඔවුන් එකිනෙක පිරිහීමෙන් අපකර්ෂීය ද දතයුතු. මෙහි **හෙතු- ඉන්ද්‍රිය- මාර්ග ප්‍රත්‍යය** වනුයේ **අමොහයම ය.** සෙස්ස ද මෙ සේ ම යෙදිය යුතු. මේ ප්‍රතිසන්ධියෙහි ය. ප්‍රවෘත්තියෙහි ද විපාකයා ගේ සහජාතාදී වශයෙන් ප්‍රත්‍යය හෙදය පෙර කී සේ ම උත්කර්ෂී - අපකර්ෂියෙන් වේ, අවිපාකයෙහි ද හෙතු ප්‍රත්‍යය ආහාර ප්‍රත්‍යය වශයෙන් උත්කර්ෂීය ද, ඔවුන්ගේ ම පිරිහීමෙන් අපකර්ෂීය ද දතයුතු.)

"සෙසු බෙවෙ පිළිසඳෙහි - නම් මනසට පෙරැ සේ,
සත් අයුරින්, සෙස්නට - ස අයුරින් පස වනුයේ"

අරූප භවයෙන් අන්‍ය පඤ්චවොකාර භවයෙහි ද ඒ විපාක නාමය හෘදය වස්තු සහායවැ **මනායතනයට** යට කී සේ අවකර්ෂී- යෙන් **සත්** පරිද්දෙකින් ද ප්‍රත්‍යය වේ. සෙසු චක්ඛායතනාදියට සතර මහාභූත සහායවැ **සහජාත- නිස්සය- විපාක- විප්පයුත්ත- අත්ථි- අවිගත**- වශයෙන් **සයාකාරයෙකින් ප්‍රත්‍යය** වේ. සෙස්ස පෙර කී සේ දතයුතු.

"පවත්නිදු පෙරැ සේ - පස වෙ විවා-විවාහට
අවිවා-අවිවා වනට - ස පරිද්දෙකින් පස වේ"

විභාග:- පඤ්චවොකාර භවයෙහි ප්‍රතිසන්ධියෙහි මෙන් ප්‍රවෘත්තියෙහි ද විපාක නාමය විපාකවූ මනායතනයට යටත්- පිරිසෙයින් සත් ආකාරයකින් ප්‍රත්‍යය වේ, එසේ ම, විපාක නාමය සෙසු චක්ඛුරාදී පඤ්චායතනයට - සතර මහාභූත සහායවැ **සහජාත- නිස්සය- විපාක- විප්පයුත්ත- අත්ථි- අවිගත**- වශයෙන් සය ආකාරයකින් ප්‍රත්‍යය වේ.

විශෙෂ:- මේ විපාක නාමයන් අතුරින් ඇතැම් විපාකයෙක් හෙතු ප්‍රත්‍යය වශයෙන් ද, ඇතැමෙක් ආහාර ප්‍රත්‍යය වශයෙන් ද යි මෙ සේ අන් අයුරිනුදු ප්‍රත්‍යය වේ. ඒ වශයෙන් උත්තමී-අපකෂී භාවය දත යුතුයි.

"එහි මැ සෙසු සක් ඇ - පසට විවා පැවැත්මෙහි
පස වේ සිවු අයුරක්හි - අවිවා නමුදු මෙ ලෙසේ"

ඒ පඤ්චවොකාර භවයෙහිම ප්‍රවෘත්තියෙහි වක්ඛායතනාදී පඤ්චායතනයකට චක්ඛුප්පසාදාදී වස්තූන් නිශ්‍රය කොට පැවැත්තා වූ ද විපාක නාමය **පච්ඡාජාත- විප්පයුත්ත- අත්ථි- අවිගත-** යන සතර ආකාරයෙන් **ප්‍රත්‍යය වේ.** මේ විපාක නාමය මෙන් අවිපාක නාමය ද එසේ ම ප්‍රකාශ කරන ලදී. එහෙයින් කුශල-අකුශල- ක්‍රියා වශයෙන් ත්‍රිවිධවූ ඒ නාමය ද, ඒ වක්ඛාදී පඤ්චවිධ ආයතනයනට සතර ආකාරයකින් ප්‍රත්‍යය වේය යි දතයුතු.

මෙ සේ රූපයට පළමු කාමය ම ප්‍රතිසන්ධියෙහි ද, ප්‍රවෘත්තියෙහි ද යම් යම් ආයතනයකට ප්‍රත්‍යය වේනම් ඒ ආකාරයෙන් දතයුතු.

"මෙ අරූ බෙවෙහි රූ - අයතුන්* එක්හව වත්
එකතින් පස නො වේ මැයි, - පස්කඳ ඇති බෙවෙහි නම්

රූවතුරින් වත් රූ - පිළිසඳැ මනට සපරිදි,
සිව්බූ පසට සිව් විදි - සඳැ-පවතහිදු පස වේ"

විසර්ජන:- රූප අතුරින් වසතුරූපය ප්‍රතිසන්ධියෙහි සවැනිවූ මනායතනයට **සහජාත- අඤ්ඤමඤ්ඤ- නිස්සය- විප්පයුත්ත- අත්ථි- අවිගත-** ප්‍රත්‍යයයෙන් **සය ආකාරයෙන් ප්‍රත්‍යය වේ,**

සතර මහාභූත අවිශෙෂයෙන් ප්‍රතිසන්ධි - ප්‍රවෘත්ති දෙක්හි ම උපදනා ඒ ඒ ආයතනයන් ගේ වශයෙන් වක්ඛායතනාදී ඒ ඒ ආයතනයට **සහජාත- නිස්සය- අත්ථි- අවිගත-** ප්‍රත්‍යයයෙන් **සිවු ආකාරයෙකින් ප්‍රත්‍යය වේ.**

(ප්‍රතිසන්ධියෙහි අණ්ඩජ - ජලාබුජයනට පඤ්චායතන අතුරින් කායායතනයට ද සෙස්සවූනව යථායොගයෙන් සෙසු ආයතනයනව ද ප්‍රත්‍යය වේ.)

"මෙ පසට තොවිදි දිව් - පස වේ අහර පැවැතෙහි,
පස මැ මනසට සපරිදි - වත් රූ එයට පස් විදි"

---

* ආයතන

විඤ්ඤාණ:- චක්ඛාදි පඤ්චප්‍රසාදයනට ප්‍රතිසන්ධියෙහි ද, ප්‍රවෘත්තියෙහි ද, රූප ජීවිතෙන්ද්‍රියය අත්‍ථි- **අවිගත**- **ඉන්ද්‍රිය**- ප්‍රත්‍යය වශයෙන් **තුන්** පරිද්දෙකින් ප්‍රත්‍යය වේ. ආහාර රූපය ද, **අත්‍ථි- අවිගත ආහාර** වශයෙන් තුන් පරිද්දෙකින් ප්‍රත්‍යය වේ.

ඒ වනාහි ආහාරය නිසා ජීවත්වන සත්ත්වයින් ගේ ශරීරයෙහි ඔජාව පැතිරී ගිය කල්හි ප්‍රවෘත්තියෙහි මැයි, ප්‍රතිසන්ධියෙහි ප්‍රත්‍යය නො වේ. චක්ඛායතනාදී ඒ පඤ්චායතන (සවැනි මනායතනයට) චක්ඛු- සොත- ඝාණ- ජිව්හා- කාය විඤ්ඤාණ සඞ්ඛ්‍යාත මනායතනයට **නිස්සය- පුරෙජාත- ඉන්ද්‍රිය- විප්පයුත්ත- අත්‍ථි- අවිගත**- ප්‍රත්‍යය වශයෙන් **සයංකාරයකින් ප්‍රවෘත්තියෙහි ප්‍රත්‍යය වේ.** ප්‍රතිසන්ධියෙහි නො වේ.

විශෙෂ:- පඤ්චවිඤ්ඤාණය හැර මනායතනයට වසනු රූපය **නිශ්‍රය- පුරෙජාත- විප්‍රයුක්ත- අත්‍ථි- අවිගත**- වශයෙන් **පස් ආකාරයකින් ප්‍රවෘත්තියෙහි ප්‍රත්‍යය වේ.** ප්‍රතිසන්ධියෙහි නො වේ. මෙ සේ රූපයම ප්‍රතිසන්ධියෙහි ද, ප්‍රවෘත්තියෙහි ද, යම් යම් ආයතනයකට යම් යම් අයුරකින් ප්‍රත්‍යය වේ නම් එසේ දතයුතු.

"නම්-රූ දෙක'තුරින් - යමක් යමකට යම් සේ
පස වෙද? හේ දෙතන්හි මැ - පඬිහු නිසි සේ දතයුතු"

ඒ මෙ සේ යි:- ප්‍රතිසන්ධියෙහි පඤ්චවොකාර භවයෙහි **වෙදනා- සඤ්ඤා- සඞ්ඛාර** යන සතක්ඛ තුන හා හෘදය වසනු රූපයද යි කියන ලද නාම-රූපය, මනායතනයට **සහජාත- අඤ්ඤමඤ්ඤ නිස්සය- විපාක- සම්පයුත්ත- විප්පයුත්ත- අත්‍ථි- අවිගත**- ප්‍රත්‍යයාදීන් ප්‍රත්‍යය වේය යි දත යුතු. මේ මෙහි ලෙශ මාත්‍රයෙකි.

විශෙෂ:- කිනයින්ම යොදූ ගත හැකි හෙයින් මෙහි විස්තර නො දැක්වී

මේ **'නාම-රූප ප්‍රත්‍යයයෙන් ෂඩායතනය වේ'** යන්නෙහි විස්තර කථාවයි.

---

5. **ෂඩායතන ප්‍රත්‍යයයෙන් ස්පර්ශ වේ** යන මෙහි:-

"සක් පැහැසුම්* ඇ - සැකෙවින් ස පහසෙක් වේ
සකර පසින් විතැණ සේ - විතරින් එ වේ දෙතිසෙක්"

---

* චක්ඛුසම්ඵස්ස

ඒ මෙසේ යි:- සැකෙවින් ෂඩායතන ප්‍රත්‍යයයෙන් සපශී වේ යන මෙහි **චක්ඛුසම්ඵස්සය, සොතසම්ඵස්සය, ඝාණසම්ඵස්සය, ජිව්හාසම්ඵස්සය, කායසම්ඵස්සය, මනොසම්ඵස්සය** යි මෙසේ ඵස්සයෝ ස දෙනෙක් ම වෙති.

විඤ්ඤාණ වශයෙන් චක්ඛුසම්ඵස්සාදී කුසල විපාක පස ද, අකුසල විපාක පසදැ යි දසයෙක් වේ. සෙසු දෙවිසි ලෞකික විපාක සම්ප්‍රයුක්තවූ දෙවිසි ඵස්සයදැ යි මෙසේ සඞ්ඛාර ප්‍රත්‍යයෙන් යි විඤ්ඤාණය මෙන් දෙතිසෙක් වේ.

මෙසේ දෙතිස් ඵස්සයට ප්‍රත්‍යය වූ මේ ෂඩායතන අතුරින්

"මනස ඇ අද ඇති* - අයතුන් සදෙන සක් ඇ,
රිසියෙත් බැහැරි සය හා - අද ඇති සය නැණැතියෝ"

(1) ඒ **"ෂඩායතන ප්‍රත්‍යයෙන් සපශීය වේය"** යන මේ පදයෙහි ඇතැම් (මහා විහාර වැසි) ආචාර්‍ය්‍ය කෙනෙක්

"මේ උපාදින්න කථා ප්‍රවෘත්තියැ යි (**නානත්ත** දෘෂ්ටියෙන් යුක්ත කම්යෙන් තමා ගේ ඵලභාවයෙන් ගන්නා ලද වෘත්ත දුඃඛය පිළිබඳ කථාවයැ යි) ගෙන මෙහි සඩ්ඝාතනියෙහි ඇතුළත් වූ ම ප්‍රත්‍යය ද, ප්‍රත්‍යය සමුත්පන්නය ද දක්වති.

විඤ්ඤාර:- "සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං යි" කී පරිදි කම්යෙන් නිපන් විඤ්ඤාණයැ - නාම රූපයැ - සළායතනයැ - ඵස්සයැ - වෙදනායැ යන ප්‍රත්‍යය ද, ප්‍රත්‍යයසමුත්පන්නය ද එකම සන්තතියෙහි ඇතුළත් විපාකය යි කැමැති වෙති. එසේවන්නා **"ෂඩායතන පච්චයා ඵස්සෝ†"** යි අභිධර්ම භාජනියෙහි පෙළ අනුවැ අරූප භවයෙහි ෂඩායතනය ද, පඤ්චවොකාර භවයෙහි ෂඩායතන ද එක්කොට **"ෂඩායතනංච + සළායතනංච = සළායතනං"** යි එකදෙශයකින් සවරූප එකශෙෂ කොට සවැනිවූ මනායතනය සමග අධ්‍යාත්ම චක්ෂුරාදී ආයතන ෂඩායතන යි කැමති වෙත්. එහෙයින් ම පෙර කී සේ "ෂඩායතනං ච + සළායතනං ච = සළායතනං" යි ව්‍යවහාර වේ. ඒ අනුව කම්යෙන් නො නිපන් (අනුපාදින්නක) රූපාදී බාහිරායතන සය ද, ඵස්සයට අරමුණු වේය යි ද, ඒවා චක්ඛාදිය මෙන් සඩ්ඝාතනියෙහි ඇතුළත් කම්කෙලෙශ නිමිත්තෙන් පැවැත්මෙන් ඵස්සයට ප්‍රත්‍යය නො වේයැ යි ද මේ ආචාර්‍ය්‍ය වාදයෙහි නො ගැනේ.)

---

* අධ්‍යාත්මික † වි· ප: පටිච්චඅමුප්පාද විභඞ්ග

(2) **දෙවන ආචාර්ය වාදයෙහි:-** "ප්‍රත්‍යයොත්පන්න ධර්මයම සවඤ්ඤාතියෙහි ඇතුළත් වේය යි ද, ප්‍රත්‍යය ධර්මය හිඤ්ඤාඤ්ඤාතියෙහි වේය යි ද කියා, යම් යම් ආයතනයෙක් එඤ්ඤයට ප්‍රත්‍යය වේ නම් ඒ සියලු ආයතනයම් ගෙන බාහිර වූ රූපාදී ආයතන ද ඇතුළත් කොට ඒ මනායතනය ද, බාහිරවූ රූපායතනාදිය සමඟ ඒ අධ්‍යාත්මවූ ඝ්‍රාණායතනයම් සළායතනයැ යි කැමති වෙති. හෙද "ඝ්‍රාණායතනංච + සළායතනංච + සළායතනංච= සළායතනං" යි සවන මනායතනය ද, අධ්‍යාත්මායතන සය ද, බාහිරායතන සය ද යි, මේ ඝ්‍රාණායතන + සළායතන + සළායතන ශබ්දයෙන් එකශෙෂ කළ කල **සළායතනයැ** යි කියාම ව්‍යවහාර යව යේ යැයි කැමති වෙති.

(මෙහි අජ්ඣත්තායතන ෂට්කය සවඤ්ඤාති පඤ්ඤාපන්න කම්මයෙන් නිඤ්ඤාත්තවූයේ එබඳු සංග්‍රහයකට ප්‍රත්‍යය වෙයි, රූපාදීහු වනාහි පිටත්හි අනුපාදිඤ්ඤාවූවාහු ඤාණයට ආලම්බන වෙත් නමුදු චක්ඛුරාදීන් මෙන් සවඤ්ඤාති පඤ්ඤාපන්න කම්මජෙලඝ නිම්ත්තයෙන් ප්‍රවෘත්තවැ ඤාණයට ප්‍රත්‍යය නො වෙත් නුයි **ප්‍රථමාචාර්ය්‍යවාදයෙහි** අගෘහීතයහ. **ද්විතීයාචාර්ය්‍යවාදයෙහි** වනාහි යම් යම් ප්‍රකාරයකිනුදු ප්‍රත්‍යය් භාවයක් ඇති කල්හි දුරුකරන්ට නො පිළිවන්හු යි ගෘහීතයයි දතයුතු යනු සත්‍යයි.)

ප්‍රශ්නයෙකි:- සියලු ආයතනයන් ගෙන් එක් ඤාණයෙක් හෝ එක ආයතනයකින් සියලු ඤාණ හෝ නො වේ. එසේ වන්නා **"සළායතන පච්චයා ඵස්සෝ."** යි එකවචනය කෙසේ යෙදේ ද?

පිළිතුර:- අනෙකායතනයෙන් එක් එඤ්ඤයක් හෝ එක ආයතනයෙකින් සියලු එඤ්ඤ හෝ නො වේ, නොයෙක් ආයතනයන් ගෙන් එක එඤ්ඤයෙක් වේ.

ඒ මෙ සේ යි:- චක්ඛු සම්ඵස්සය චක්ඛ්වායතනයෙන් ද, රූපායතනයෙන් ද, චක්ඛු විඤ්ඤාණසම්ප්‍රයුක්ත මනායතනයෙන් ද, ඒ හා යෙදුණු සෙසු චෛතසික සම්ප්‍රයුක්ත ධර්මායතනයෙන් ද උපදී. සෙසු සොත සම්ඵස්සාදිය ද එසේ සුදුසු සේම යෙදිය යුතු.

මෙසේ,

"එක ම පැහැසුම*නන් - අයතුන් කෙරෙන් වේයැ යි,
පැහැසුම් **එක** බයින් මෙහි - දෙසුවෝ එතතු දතුවෝ"

---

* ඤාණය

යි කීහ. "සළායතන පච්චයා ඵස්සෝ" යන මේ එකවචනයෙන් නිද්දේශය නොයෙක් ආයතනයෙන් එක් ඵස්සයෙක් වේය යි දක්වනු පිණිස බුදුහු වදාළහ.

ආයතනයන් අතුරින් –

"එයින් සක් ඇ පස – සවිදි, මනස එක් විවා
නවවිදි වේ, බැහැරි සය – පස බැවිහි යුතු සේ වී"

විභාවිනී:– චක්ඛායතනාදී පස චක්ඛුසම්ඵස්සාදී පස්වැදෑරුම් ඵස්සයට **නිස්සය- පුරෙජාත- ඉන්ද්‍රිය- විප්පයුත්ත- අත්ථි- අවිගත** වශයෙන් **සය ආකාරයෙකින් ප්‍රත්‍යය වේ.**

එකම විපාක මනායතනය කුසල විපාකාදී අනෙක හෙද ඇතිවැ මනොසම්ඵස්සයට **සහජාත- අඤ්ඤමඤ්ඤ- නිස්සය- විපාක- ආහාර- ඉන්ද්‍රිය- සම්පයුත්ත- අත්ථි- අවිගත-** වශයෙන් **නවප්‍රකාරයකින් ප්‍රත්‍යය වේ.**

තවද බාහිර ආයතනයන් අතුරින් රූපායතනය චක්ඛුසම්ඵස්සයට **ආරම්මණ- පුරෙජාත- අත්ථි- අවිගත-** වශයෙන් සතර ආකාරයෙන් ද, ශබ්දායතනාදිය සොතසම්ඵස්සාදියට ද එසේ ම සතර – සතර ආකාරයෙන් ද ප්‍රත්‍යය වේ.

මනොසම්ඵස්සයට වනාහි ඒ රූපායතනාදිය ද, ධම්මායතනය ද, ප්‍රත්‍යුත්පන්න ධම්මායතනයට ඇතුළත් රූප ද, ආලම්බන ප්‍රත්‍යය මාත්‍රයෙන් ම ප්‍රත්‍යය වේ.

මේ **'ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වේ'** යන්නෙහි විභාවිනී කථාවයි.

---

6. **'ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනා වේ'** යන්නෙහි

සක් පහස් දුනු* ඇ – වෙයින් සයෙකි දෙර හෙයින්
ඒ සිත් සැපි යුතු බෙයින් – එකුන් අනූවෙකැයි දතු.

මෙහි **"චක්ඛුසම්ඵස්සජා වේදනා සොත -පෙ- ඝාණ- ජිව්හා- කාය- මනෝ සම්ඵස්සජාවේදනා"**† යි චක්ඛු සම්ඵස්සජ- වේදනාය, සොත- ඝාණ- ජිව්හා- කාය- මනොසම්ඵස්සජ වේදනා යැ යි මෙසේ ද්වාර වශයෙන් වේදනා සයක් ම කියන ලදී. ඒ වේදනා සදෙන ප්‍රභේද වශයෙන් එකුන් අනූවක් විත්තයන් හා සම්ප්‍රයුක්ත හෙයින් එකුන් අනූ වැදෑරුම්ය යි දන්නා ලදී.

---

* චක්ඛුසම්ඵස්සාදී † වි: ප: පටිච්චසමුප්පාදවිභඞ්ග

"එ වෙයින් අතුරිනුදු - විවා සින් හා සැපි යුතු,
දෙනිසක් වෙයින් පැ - මුනිදුසඳ මෙහි රිසි වී"

"එහි පස් දෙරැ පසට - පස වේ අට අයුරෙකින්,
සෙසුවනට වේ එක් විදි - මුනි දෙරැ පළමු කී සේ"

විභාග:- පඤ්චද්වාරයෙහි චක්ඛුප්පසාදාදීන් වසනු කොට ඇති පස් වෙදනාවනට චක්ඛුසම්ඵස්සාදී සපඤ්ච - **සහජාත- අඤ්ඤ- මඤ්ඤ- නිස්සය - විපාක- ආහාර- සම්පයුත්ත- අත්ථි- අවිගත-** වශයෙන් **අට අයුරෙකින් ප්‍රත්‍යය වේ.**

("මෙහි සම්ප්‍රත්‍යේෂණ සම්ප්‍රයුක්ත වෙදනාවට චක්ඛුස්සපඤ්චාදී වූ පස් දෙන අනන්තරාදී ද්‍රව්‍යය වෙත් තමුදු අනන්තරාදීන් උපනිශ්‍රයෙහි අන්තර්ගත වන බැවින් සන්තීරණ තදාලම්බනයට ද සාධාරණ වූ උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් **"එකාඛා පච්චයා හොන්ති"** යි කියන ලදැයි දතයුතු" යනු සත්‍යයි.)

මනෝද්වාරයෙහි තදාලම්බන වශයෙන් පැවැති කාමාවචර විපාක වෙදනාවනට සහජාත මනෝසම්ඵස්සය පෙර සේම **සහජාතාදි අටඅයුරින් ප්‍රත්‍යය වේ.** පටිසන්ධි - භවාඞ්ග - චුති වශයෙන් පැවැති ඒ කාම - රූප - අරූප - ත්‍රෛභූමික **විපාක** වෙදනාවනට සහජාත මනෝ සම්ඵස්ස සඞ්ඛ්‍යාත ඒ ඵස්සය එ සේ ම අට ආකාරයකින් ප්‍රත්‍යය වේ.

මනෝවාරයෙහි තදාරම්මණ වශයෙන් පැවැති කාමාවචර විපාක වෙදනාවට මනෝවාරාවර්ජන සිතෙහි පැවැති මනෝ සම්ඵස්සය උපනිශ්‍රය වශයෙන් එක් ආකාරයකින් ම ප්‍රත්‍යය වේ.

මේ **ඵස්ස පච්චයා වේදනා** යන්නෙහි විභාග කථාවයි.

---

7. **'වෙදනා ප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ'** යන්නෙහි:-

"රූ තණ* ඇ බෙයින් - මෙහි සතණෙක් දැක්වී
එකෙකී පැවැති අයුරින් - තුන් තුන් බෙයින් දතුයේ"

විභාග:- 'සිවු පුතු ය, බමුණු පුතුය යි, පියා නමින් පුතා හඳුන්වන්නාක් මෙන් **රූපතෘෂ්ණාය- ශබ්දතෘෂ්ණාය- ගන්ධ- තෘෂ්ණාය- රසතෘෂ්ණාය- ස්පර්ශතෘෂ්ණාය- ධර්මතෘෂ්ණාය.** යි අරමුණේ නමින් විභඞ්ගයෙහි ෂඩ්විධ තෘෂ්ණාවෙක් දක්වන ලදී. නැවැතැ ඒ තෘෂ්ණා අතුරින් එක එක (පැවැති ආකාරයෙන්)

---

* තෘෂ්ණා

කාමාසවාද වශයෙන් පවත්නා ආකාරයෙන් **කාමතෘෂ්ණා** යැ. ශාස්වත දෘෂ්ටි වශයෙන් පවත්නා ආකාරයෙන් **භවතෘෂ්ණා** යැ. උච්ඡේද දෘෂ්ටි වශයෙන් පවත්නා ආකාරයෙන් **විභවතෘෂ්ණා**යැ යි ත්‍රිවිධ වේ.

විශේෂ:- ඇසට අරමුණු වූ රූපාලම්බනය කාමාස්වාද වශයෙන් ආස්වාදනය කරමින් පවත්නා කල එය කාම තෘෂ්ණාව යැ. ඒ ආලම්බනයම සදාකාලික ය, සථිරය යි ශාස්වතදෘෂ්ටි සහගත වූයේ භවතෘෂ්ණාව යැ. එයම උච්ඡේදයට - විනාශයට පැමිණෙන්‍ය යි මෙසේ දෘෂ්ටි සහගතවූයේ විභව තෘෂ්ණාවයි.

මෙහි කාමතෘෂ්ණාව ලෝභ මූලික සිත් අටෙහි ද, භව - විභව තෘෂ්ණා එහි ම දෘෂ්ටි සම්ප්‍රයුක්ත සතරෙහි ද යෙදේ.

ශබ්ද තෘෂ්ණාදියෙහි ද මෙසේ මැයි. මෙසේ තෘෂ්ණාව අවලෝස් වැදූරුම් වේ.

එය නැවැතැ අධ්‍යාත්ම රූපාදියෙහි අවලෝභ යැ. බාහ්‍ය රූපාදියෙහි අවලෝභයැ යි සතිස් වැදූරුම් වේ. මේසේ අතීත සතිස යැ, වර්තමාන සතිස යැ, අනාගත සතිසයැ යි **අමෝ-රාශියක් (108) ක් තෘෂ්ණා** වේ. එය සැකෙවින් රූපාදී ආලම්බන වශයෙන් සයෙක, කාමතෘෂ්ණාදී වශයෙන් තුනෙකැයි දතයුතු.

මේ ලෙව්හි සත්ත්වයෝ පුත්‍ර ප්‍රේමයෙන් කිරිමවට **සත්කාර කරන්නා** සේ රූපාදී අරමුණු නිසා උපදනා සැප වේදනාවෙහි ආස්වාදයෙන් රූපාදී අරමුණු ලබා දෙන චිත්‍රකාරා-දීනට ද, ගී කියන්නනට ද, සුවඳ දෙන්නනට ද, **අරක්කැම්-යනට** ද, රෙදි වියන්නනට ද, රසායනාදී බෙහෙත් **දෙන** වෙදුනට ද, මහත් සත්කාර කෙරෙත්.

එහෙයින් මේ සියලු අවෝරාසියක් තෘෂ්ණාව වෙදනාව නිසා වේය යි දතයුතු.

"විවා සුව විදුම ම - මෙහි අදහස් කරනුයේ
එක අයුරෙකින් ඒ මේ - එහෙයින් **තණමට පස වේ**"

වෙදනාව තෘෂ්ණාවට **එකම උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.**

(ආලම්බන ප්‍රත්‍යය තෙම උත්පාද්‍යමානං. හට ආලම්බන මාත්‍රය ම වෙයි. උපනිශ්‍රයයෙහි ආලම්බනොපනිශ්‍රය සංගෘහීත ය, එහෙයින් මෙහි **එක් අයුරින් ම** වේය යි කිහු, යනු සත්‍යයි.)

"දුක්පත් සුවපතෘ - සුවපත් වැඩියක් පතා
මැදහත් බව් සත් බැව්න් - සුවමැයැ යි ඒ පැවැසේ"

"එයින් තුන් විදුම මැ - තණට පස වතුයෙන් මෙහි
වෙයින් පසයෙන් තණයැ යි - ලෝ හිමියා වදහළේ"

"වෙයින් පස වතුදූ - අනුසය කෙළෙස් නැතහොත්
තණ නොපවතිනුයෙන් ඒ - රහත්නට නොම වනුයේ"

දුක් ඇත්තේ සුව පත යි, සුව ඇත්තේ වැඩියක් පතයි, උපෙක්ෂාව ඥානත හෙයින් සැපය යි කියන ලදී. එහෙයින් මේ සුඛ - දුඃඛ - උපෙක්ෂා යන ත්‍රිවිධ වේදනාව ම තෘෂ්ණාවට ප්‍රත්‍යය වන හෙයින් වෙදනා ප්‍රත්‍යය යෙන් තෘෂ්ණා වේය යි බුදුහු වදළහ. වෙදනා ප්‍රත්‍යයවතුදු රහත්නට අනුසය නැති හෙයින් වෙදනාව තෘෂ්ණාවට ප්‍රත්‍යය නොවේ. අනුසය නැතිවැ නොපවත්නා හෙයිනි.

වෙදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ යන්නෙහි විසතර කථාවයි.

---

8. **තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදාන වේ.** යන්නෙහි

උපාදාන සතරෙකි, ඔහු

(1) අර්ථ විභාගයෙන් ද,

(2) උපාදාන ධර්මයන් ගේ සංක්ෂේප වශයෙන් ද,

(3) විසතරයෙන් ද,

(4) ක්‍රම වශයෙන් ද, විසතර කරනු ලැබේ.

කාමූපාදාන යැ, දිෂ්ටූපාදාන යැ, සීලබ්බතූපාදාන යැ, අත්තවාදූපාදානයැ යි මෙහි **සතර උපාදානය** දතයුතු.

(1) මේ අර්ථ විභාගය යැ. කාම නම් රූපාදී (ආලම්බන) වස්තු යැ. එය දැනිව ගැනීම් වශයෙන් ආස්වාදනය කළ අධික තෘෂ්ණාව කාමූපාදානය යි, තවද කාමය ම උපාදාන වූයේ කාමූපාදානය යි, කීකල කැමති වන්නා උපාදානය යැ. (ඒ නම් කාමතෘෂ්ණාව යැ. කෙලෙස කාමය කාමූපාදානය යි, මේ දෙක්හිම උපාදාන ශබ්දය කර්තෘසාධනයැ දැනිවැ ගන්නා උපාදානය යැ.)

දැඩිව ගැනීම උපාදානය යි, මෙහි උප ශබ්දය **"උපායාස"** යනාදි යෙහි මෙන් දැඩිභාවයෙහි වැටේ, දැඩි ආයාසය උපායාසය යි. එසේ ම දිට්ඨියම උපාදාන වූයේ දිට්ඨුපාදානය යැ, තවද 'දිට්ඨිය දැඩිව ගනිනු යි' හෝ දිට්ඨුපාදානය යැ.

නිදර්ශන:- ආත්මය ද, ලෝකය ද, ශාස්වතයැ යි කී කල පළමු පැවැති දෘෂ්ටිය, පසුවැ පසුවැ උපදනා දෘෂ්ටිය දැඩි කොට ගනී. **"නත්ථි දින්නං"** 'දුන් දෙයට විපාක නැත' යනාදී දශ වස්තුක නාස්තික දෘෂ්ටිය හෝ දිට්ඨුපාදාන නම්. ගොශීල - ගොව්‍රතාදීන් බලවත් සේ ගැනීම සීලබ්බතුපාදානය යැ.

විශේෂ:- ගොශීලාදිය සමාදාන වශයෙන් ගැනීම **සීල** නම් වේ. එම අව්‍යතික්‍රම වශයෙන් **ව්‍රත** නම් වේ. තවද මේ ආකාරයම සීලය යි. අතරතුර කරන ගොක්‍රියා ව්‍රතය යි, මේ ගොශීල - ව්‍රතාදිය සහචරිත වූ දැඩි කොට ගැනීම **සීලබ්බතුපාදානය යි.**

බලවත් සේ ආත්මය යි පැතෙම්මට ද, ගැනීමට ද, කරුණු වූ දෘෂ්ටිය **අත්තවාදුපාදානය යි.** ආත්මය යන වචන මාත්‍රය හෝ ඒ කරණ කොට දැඩිවැ ගන්නා හෙයින් හෝ **ආත්මවාදෝපාදාන** නම් වේ. මේ **උපාදානයන් ගේ අර්ථ විභාගය යි.**

(2) ධර්ම සංක්ෂේප වශයෙන් මෙ සේ යි.

කාමුපාදානය නම් **"තත්ථ කතමං කාමුපාදානං, යෝ කාමෙසු කාමච්ඡන්දෝ, කාමරාගෝ, කාමනන්දි, කාමතණ්හා, කාමසිනේහෝ, කාමපරිළාහෝ, කාමමුච්ඡා, කාමජ්ඣෝසානං ඉදං වුච්චති කාමුපාදානං"*** 'පඤ්චකාම විෂයයෙහි ඇලීම ය, කැමැතිවීම් වශයෙන් රැඳීම ය, නන්දන (සතුටුවීම්) වශයෙන් කැමැතිවීම ය, ආසාකිරීම් වශයෙන් කැමැතිවීම ය, සෙනහ කිරීම ය, දැවීම ය, මුසපත් වීම ය, ගැලීම ය, යන මේ කාමුපාදානයැ යි' ආ හෙයින් සැකෙවින් තෘෂ්ණාව ගේ දැඩත්වය යැ. ඒ වූ කලී පළමු තෘෂ්ණාව ගේ උපනිශ්‍රය ලැබ දැඩි බවට පැමිණි පසු උපදනා තෘෂ්ණාව මැ යි.

මත භෙදයෙකි:- අදුරෙහි බඩු සෙවීම පිණිස සොරා ගේ අත දිගු කිරීම මෙන් නො ලද විෂය පැතීම **තෘෂ්ණා** නමැ යි ද, ඒ සොරා ගේ ම බඩු ගැනීම මෙන් හමු වූ අරමුණ ගැනීම **උපාදානය යැ** යි ද කිසි කෙනෙක් කියති.

---

* ධ: ප: නික්ඛේපඛණ්ඩ

තෘෂ්ණාව විෂයාභිකාංක්ෂා භාවයෙන් **අලෝභ** භාවයට **ප්‍රතිපක්ෂ** යැ. තෘෂ්ණා දූසඞ්ගයට පැමිණි අත්‍රිප්තාව හෙයින් **උපාදානය** සන්තුෂ්ටියට **ප්‍රතිපක්ෂ** යැ. එසේ ම **තෘෂ්ණාව** අප්‍රාප්ත විෂය ප්‍රාර්ථනය හෙයින් **පර්‍යේෂණා දුඃඛ මූල** යැ. **උපාදාන** ය සම්ප්‍රාප්ත විෂය ග්‍රහණය හෙයින් **ආරක්ෂා දුඃඛ මූලය**යැ යි යෙති.

විශේෂ:- සෙසු උපාදාන සැකෙවින් **දෘෂ්ටිමාත්‍රය** මැයි.

(3) **විඤ්ඤාණ** වශයෙන්:- පෙරැ කී සේ රූපාදීන් පිළිබඳ අවෝරුහියක් හෙදගත තෘෂ්ණාව ගේ දැඩි බව **කාමූපාදානය** යැ.

දශ වස්තුක මිථ්‍යා දෘෂ්ටිය **දිට්ඨූපාදානය** යැ.

එයින් වදාළහ, **"නත්ථි කතඤ්ඤං දිට්ඨූපාදානං, නත්ථි දින්නං, නත්ථිසිට්ඨං, නත්ථිහුතං - පෙ - සච්ඡිකත්වා පවෙදෙන්ති යා එව රූපාදිකි, විපරියෙසගාහෝ ඉදං වුච්චති දිට්ඨූපාදානං"*** යි දුන් දෙයෙහි විපාක නැත, මහායාගාදියෙහි ඵල නැත, ආමන්ත්‍රණය කොට දීමෙහි ද, ආගන්තුක වශයෙන් පැමිණිය වුනට දීමෙහි ද, මඞ්ගල ක්‍රියා පිළිබඳ වූ දීමනාවෙහි ද විපාක නැත.

දශ කුශල කර්මපථ, අකුශල කර්මපථ වශයෙන් පැවැති සුකෘත දුෂ්කෘත කර්මයන් ගේ ඵල විපාක නැත. (මේ සේ ම පෙරැ කී දානාදීන්හි ද, ආනිසංස ඵල හා විපාක ඵල නැතැයි කීවා වේ.) පර ලොව සිටියනට මේ ලොව නැත. මේ ලොව සිටියනට පර ලොව නැත.

(එහිම උච්ඡේද වන හෙයින් පර ලොව සිටියහුට මේ ලොව ඊමෙක් නැත.)

(මව් පියනට කළ මනා නො කළ මනා උවටැන් හා පීඩා ආදියෙහි ඵල නැත.)

පළමු භවයෙන් චුතවැ දෙ වන භවයෙහි උපදනා සත්ත්වයෙකුනෙක් නැත.

අනුලෝම ධර්මානුධර්ම ප්‍රතිපත්තියට පිළිපන් හෙයින් සම්‍යක්ගත වූ සම්‍යක් ප්‍රතිපන්න වූ ධාර්මික ශ්‍රමණ බ්‍රාහ්මණයෝ නැත.

---

* ඛ: ප: නිකෙඛපඛණ්ඩ

මේ ලෝ පර ලෝ තුමූම විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂයෙන් දැන ප්‍රකාශ කිරීමට සම්‍ය වූ **සම්බුදු බුදුවරයෝ** කෑගැයි කියයි. මේ සේ යම්බදු දෘෂ්ටියක් (විපරීත ග්‍රහණයක්) ඇත්තම් ඒ **දිට්ඨුපාදානය** යි.

ශීල-ව්‍රතයන් ගෙන් ශුද්ධිය වේයැ යි පරාමර්ශී ග්‍රහණය **ශීල-ව්‍රතොපාදානය** යි. එයින් වදාළහ. **"තත්‍ථ කතමං සීලබ්බතුපාදානං. සීලෙන සුද්ධි, වතෙන සුද්ධි. සීලබ්බතෙන සුද්ධීති යා එවරූපා දිට්ඨි - පෙ - විපරියෙසග්ගාහෝ ඉදං වුච්චති සීලබ්බතුපාදානං*"** එහි සීලබ්බතුපාදානය කවරේ ද. ශීලයෙන් ශුද්ධිය, ව්‍රතයෙන් ශුද්ධිය, ශීල ව්‍රතයෙන් ශුද්ධිය යි යම් විපරීත ගැනීමෙක් වේ නම් එය **ශීලව්‍රතොපාදානය** යි.

විංශති වත්‍ථුක සක්කාය දිට්ඨිය ආත්මවාදෙපාදාන නම්. එයින් වදාළහ, **"තත්‍ථ කතමං අත්තවාදුපාදානං ඉධ අස්සුතවා පුථුජ්ජනෝ - පෙ - සප්පුරිස ධම්මෙ අවිනීතෝ - පෙ - අත්තතෝ සමනුපස්සති - පෙ - විපරියෙසග්ගාහෝ ඉදං වුච්චති අත්තවාදුපාදානං"*** එහි ආත්මවාදෙපාදානය කිම්? මේ ලෝක-යෙහි ආගම අධිගම රහිත හෙයින් අශ්‍රැතවත් පෘථග්ජන තෙම --පෙ - සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණේ රූපය ආත්මය යි ගනී, - පෙ - එබදු විපර්‍යාස ග්‍රහණය **ආත්මවාදෙපාදාන ග්‍රහණය** නම්. (මේ පිළිබඳ විස්තර **මජ්ඣිම නිකාය** මූල පර්‍යාය සූත්‍ර, **ධම්මසඞ්ගණී අට්ඨකථාව** දතයුතු.)

මේ ධර්ම සංක්ෂෙප විස්තරයයි.

---

(4) **ක්‍රම වශයෙන්,**

මෙහි ක්‍රමය

(i) උත්පත්ති ක්‍රමය

(ii) ප්‍රහාණ ක්‍රමය

(iii) දෙශනා ක්‍රමය යි ත්‍රිවිධ යැ. 'කැති හෙයින් තෝ දන්නා ලද අග ඇති සංසාරයෙහි මොහු ගේ පළමු උපතය යි' කැති හෙයින් ක්ලෙශයන් ගේ (නිෂ්පර්‍යාය වශයෙන්) මුඛ්‍ය හෙයින් උත්පත්ති ක්‍රමයක් නැති. පර්‍යාය යෙන් වත්‍තාහි බෙහෙවින් එක් අත් බැවෙකැ ආත්ම දෘෂ්ටිය පෙරටු කොට ඇති ශාස්වතඋච්ඡෙද-දෘෂ්ටි වශයෙන් අභිනිවෙශය (ගැනීම) වේ.

---

* චි: ප: බුද්ධකවත්‍ථුවිභඞ්ගය

අනතුරුවැ මේ ආත්මය ශාස්වතයැ යි ගන්නාහට ආත්ම-වීශුඝ්ධිය පිණිස ශීල-වුත්තොපාදානය වේ. මේ ආත්මය උච්ඡේද වේය යි ගන්නා පර ලොව අපෙක්ෂා නැත්තාහට කාමූපාදානය උපදී.

මේ සේ පළමු ආත්මවාදෙපාදානය ද අනතුරුවැ දිට්ඨි-සීලබ්බත- කාමූපාදාන ද වේ. මේ එක් අත්බැවෙකැ ඔවුන් ගේ **උත්පත්ති ක්‍රමය සි.**

(**විශෙෂ**:- ප්‍රකෘති - අණු ආදීන් ගේ ශාස්වතග්‍රාහ පූර්ඛගම කොට ඇත්තාවූ ද, ශරීරයා ගේ උච්ඡේදග්‍රාහ පූර්ඛගම කොට ඇත්තාවූ ද, ඒ ශාස්වත - උච්ඡේද ග්‍රහණයට සවාමි වූ ශාස්වත වූ හෝ උච්ඡේද වූ හෝ කිසියම් ආත්මයක් ඇතැ යි එබඳු ආත්ම ග්‍රාහයෙක් වන්නේය යි කිසි කලෙක මෙහි **බෙහෙවින්** යැ යි කියන ලදී. මේ ආත්ම දෘෂ්ටිය අවී වශයෙන් සකඬි ආලම්බන කොට ඇත්තේ ම දතයුතු. භවරාග ජවන චීථිය සියල්ලට පළමු පවත්නා නමුදු පිළිසිඳ ගත්තහුට භව නිකාන්තිය පවත්නා බැවින් ද, ඒ භව රාගය තෘෂ්ණා දෘඪතාව නො වේ ය යි සිතා කාමූපාදානය සියල්ලට පළමු උපදීය යි නො කීහ.)

(ii) **ප්‍රහාණ ක්‍රමය,** සතර උපාදාන අතුරින් **සොතාපත්ති මාර්ගයෙන්** ප්‍රහීණ වන හෙයින් **දිට්ඨුපාදානාදී තුන පළමු ප්‍රහීණ වේ. අනාගාමිමාර්ගය හෙයින් කාමූපාදානය** පසුවැ ප්‍රහීණ වේ.

(**විශෙෂ**:- තෘෂ්ණා යැ, කාමූපාදානයැ යි විභාග නො කළ කල මේ සියලුම තෘෂ්ණාව කාමූපාදානය යි දතයුතු. විභාග කළ කල්හිදු කාම රාගයෙන් භින්න වූ දෘඪතාවට පැමිණි **තෘෂ්ණාව කාමූපාදානය සි.** එය **අනාගාමිමාර්ගය සි** කීහ.)

(iii) **දෙශනා ක්‍රමය,** මහාවිෂය වන බැවින් ද, ප්‍රකට හෙයින් ද කාමූපාදානය පළමුව වදාළහ.

ඒ මෙ සේ යි:- ලොභමූලික සිත් අතෙහි යෙදී පැවැත්-මෙන් ද, ප්‍රකට බැවින් ද, මේ චතුරුපාදානයන් අතුරින් කාමූපාදානය පළමුවැ වදාළහ.

(සිත් සතරෙක පවත්නා බැවින්) සෙසු තුන පසුවැ වදාළහ. ලොකයා බෙහෙවින් පඤ්චකාමයෙහි ඇලෙන හෙයින් කාමූපාදා-නය ප්‍රකට යැ. සෙසු උපාදාන එසේ ප්‍රකට නො වේ. කාමූපාදාන

ඇත්තේ ද වසනුකාමය ලැබීම සඳහා සැප-දුක් කමියෙන් වේය යි නො ගෙන දිළුම්ඛගලාදී වශයෙන් පවත්නා කොතුහල මඛලාදිය බොහෝ කොට ඇත්තේ වේ. ඒ කාමූපාදානය ඇත්තහුට පසුවැ දිට්ඨුපාදානය වේය යි සෙස්ස පසුව කීහ.

ඒ දිට්ඨුපාදානය ද සීලබ්බත - අත්තවාද වශයෙන් විවිධ වේ. ඔවුනතුරින් ගොක්‍රියා - කුක්කුර ක්‍රියාදිය දැක ද දතහැකි හෙයින් සීලබ්බතුපාදානය පළමුවැ වදුළහ. සූක්ෂම හෙයින් අත්තවාදූපාදානය පසුවැ වදුළහ. මේ මොවුන් ගේ දෙශනා ක්‍රමය යැ.

ඔවුනතුරින් කාමූපාදානයට තෘෂ්ණාව **උපනිශ්‍රය** ප්‍රත්‍යය වශයෙන් එක් අයුරින් ද, තෘෂ්ණාවෙන් අභිනන්දිත විෂයයෙහි උපදනා හෙයින් සෙසු තුනට **සහජාත- අඤ්ඤමඤ්ඤ- නිස්සය- සම්පයුත්ත- අත්ථි- අවිගත- හෙතු** වශයෙන් සත් පරිද්දෙකින් හෝ **උපනිශ්‍රය** ද සමග අට අයුරෙකින් ද ප්‍රත්‍යය වේ.

විශෙෂ:- උපනිශ්‍රය ප්‍රත්‍යය වන කල සහජාත ප්‍රත්‍යය නො වේ.

මේ **'තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් උපාදාන වේ'** යන්නෙහි විස්තර කථාවයි.

---

9. **'උපාදාන ප්‍රත්‍යයයෙන් භවය වේ'** යන්නෙහි

(1) අත්ථි වශයෙන් ද
(2) ධම්ම වශයෙන් ද
(3) සාත්ථක වශයෙන් ද
(4) හෙද වශයෙන් ද
(5) සංග්‍රහ වශයෙන් ද
(6) යම් උපාදානයෙක් යම් භවයකට ප්‍රත්‍යය වේ නම් ඒ වශයෙන් ද දතයුතු.

(1) අත්ථි වශයෙන්:- **"භවතීති = භවෝ"** වේ නුයි භව නම්. මින් **කම්ම භවය, උපපත්ති භවය** යන දෙක ම කියන ලදී.

ඉන් කම්ම භවය එලූපචාරයෙන් ද, උපපත්ති භවය මුඛ්‍යාර්ථයෙන් ද වේ.

එයින් කියා:- **"භවෝ දුවිධෙන, අත්ථි කම්මභවෝ අත්ථි උපපත්ති භවෝ"*** යි භවය දෙපරිදි වේ. කම් භවයෙකුදු ඇත්, උපපත්ති භවයෙකුදු ඇත්, එහි **කම්මයමෑ කම්ම භවයෑ. උපපත්තියමෑ උපපත්ති භවයෑ.** මෙහි 'උපපත්තිය වේය' යි භව නම් වේ. (විපාකසඤ්ඤායෝ යි) කම්ය විපාකසඤ්ඤයනට කරුණු වන හෙයින් එලෝපචාර වශයෙන් භව නම් වේ. **"අත්තනෝ ඵලං කරොතීති කම්මං"** යි කියේ එහෙයිනි.

නිදර්ශන:- බුද්ධොත්පාදය සැපයට කරුණු වන හෙයින් බුද්ධොත්පාදය **"සුඛෝ බුද්ධානං උප්පාදෝ"** යි කීවාක් මෙනි.

මෙසේ අර්ථ වශයෙන් විනිශ්චය දතයුතු.

(2) **ධර්ම වශයෙන්**

කම් භවය සැකෙවින් චෙතනා හා චෙතනා සම්ප්‍රයුක්ත අභිධ්‍යාදි ධර්මයෝ යි.

එයින් කියා: - **"තත්ථ කතමෝ කම්මභවෝ පුඤ්ඤාභිසංඛාරෝ. අපුඤ්ඤාභිසංඛාරෝ ආනෙඤ්ජාභිසංඛාරෝ. පරිත්තභූමකෝ වා, මහාභූමකෝ වා, අයං වුච්චති කම්මභවෝ*** 'එහි කම්භවය කිම්? කාමාවචර භූමික වූ හෝ මහග්ගත භූමික (රූපාවචර භූමික අරූපාවචර භූමික) වූ හෝ පුඤ්ඤාභිසංඛාරය ද, අපුඤ්ඤාභිසංඛාරය ද, ආනෙඤ්ජාභිසංඛාරය ද, කම් භව නම්. **"සබ්බං භවගාමි කම්මං කම්මභවෝ"** සියලු භවගාමී කම්ය කම් භවය යි.

විභාවනය:- මෙහි පුඤ්ඤාභිසංඛාරය කාමාවචර කුසල චෙතනා අට හා රූපාවචර පඤ්ච යි තෙළෙස් සිත්හි වූ චෙතනා යි. අපුඤ්ඤාභිසඞ්ඛාර නම් දෙළොස් අකුසල චෙතනායි. සතර අරූපාවචර කුසල් සිත්හි චෙතනාව ආනෙඤ්ජාභිසංඛාර නම්.

විශෙෂ:- මෙ සේ පරිත්ත භූමකය, මහග්ගත භූමකය යි කීමෙන් ඒ චෙතනාවන්ගේ ම විපාක සඤ්ඤය කියන ලදී. **සියලු භවගාමී කම්ය යි** කීමෙන් ඒ චෙතනා සම්ප්‍රයුක්ත **අභිධ්‍යාදිය** ආවය ගාමී හෙයින් ඔවුන් ගේ කම්භවය කියන ලදී. එහෙයින් ම **කම්** භව පර්‍යාපන්න බව පර්‍යාය යෙන් කියේ වෙයි. නිෂ්පර්‍යාය (මුඛ්‍යාර්ථ) යෙන් **චෙතනාව** ම කම් භවය යි.

කම්යෙන් නිපන් සඤ්ඤායෝ උපපත්ති භව නමුදු. ප්‍රභෙදයෙන් වනාහි ඒ භව වැදැරුම් වේ.

---

* වි: ප: පටිච්චසමුප්පාද

ඒ මෙසේ යි:- **තත්ථ කතමෙ උපපත්තිභවෙ, කාම-භවෙ රූපභවෙ- අරූපභවෙ- සඤ්ඤාභවෙ- අසඤ්ඤා-භවෙ- නෙවසඤ්ඤානාසඤ්ඤාභවෙ- එකවොකාරභවෙ- චතුවොකාරභවෙ- පඤ්චවොකාරභවෙ අයං වුච්චති උපපත්තිභවෙ''*** එහි උපපත්ති භවය කවරේ ද? එකොළොස් කාමාවචර භවය, සොළොස් රූප භවය, සතර අරූප භවය, (අසඤ්ඤසත්තය) අසඤ්ඤා භවය, (නෙවසඤ්ඤානාසඤ්ඤායතනය) නෙවසඤ්ඤානාසඤ්ඤාභවය (සෙසු එකුන් තිස) සඤ්ඤා භවය යි. (අසඤ්ඤසත්ත සඞ්ඛ්‍යාත) එක වොකාර භවය, (චතුස්කන්ධ යුක්ත අරූපභව සඞ්ඛ්‍යාත) චතුවොකාර භවය (පඤ්චස්කන්ධ යුක්ත සෙසු කාම-රූප භව) පඤ්චවොකාර භවය. (වොකාර නම් ස්කන්ධ යැ.) (මෙ සේ භවය තුන් තුන් වශයෙන් චේතනය අධ්‍යාශය අනුවැ බෙදන ලදුවත් ඒ තුන් කොටසට ඇතුළත් වනුයේ එකම භූමි යැ.)

තවද මේවායේ භවයයැ යි ගැනෙනුයේ ඒ ඒ භූමීන්හි උපදනා උපාදාන සකන්ධයෝ යි. ඒ අවීචියෙහි පටන් පරනිර්මිත-වශවර්තිය තෙක් වූ කාම භූමි ය.

රූප රාගයෙන් යුත් බ්‍රහ්මපාරිසද්‍යයෙහි පටන් අකනිෂ්ඨක-යෙන් පරිච්ඡින්න වූ උපාදාන සකන්ධ රූප භව යැ. අරූප තෘෂ්ණා යෙන් ගන්නා ලද ආකාසානඤ්චායතනයෙහි පටන් නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනයෙන් පිරිසිඳින ලද උපාදින්නසකන්ධ **අරූප භව යැ.** සංඥුවත්හු ගේ හෝ සංඥා ඇති භවය (කාම භව හා අසඤ්ඤසත්තය හැර සෙසු රූප භව ද, නෙවසඤ්ඤානාසඤ්ඤා-යතනය හැර සෙසු අරූපභව ද) **සඤ්ඤා භව නම්.**

සඤ්ඤා නැත්තහු ගේ හෝ සඤ්ඤා නැති භවය **අසඤ්ඤා භව නම්.** ඕදාරික සංඥාව නැති බැවින් ද, සූක්ෂම සංඥා ඇති බැවින් ද **නෙවසඤ්ඤානාසඤ්ඤා භව නම්. එක** ම රූපසකන්ධයක් ඇති භවය **ඒකවොකාර භව යැ.** චතු-පඤ්චවොකාර ද එසේ මැ යි. නාමසකන්ධ සතර ඇත්තේ **චතුවොකාර භව යැ. පඤ්ච-සකන්ධය** ම ඇත්තේ **පඤ්චවොකාර භවය යි.** මෙ සේ ධර්ම වශයෙන් විනිශ්චය දතයුතු.

(3) **සාඵලික වශයෙන්**

මේ භව නිද්දේශයෙහි පුණ්‍යාභිසංඝස්කාරාදිය කීවා සේ පෙර සංඝස්කාර නිද්දේශයෙහි ද පුණ්‍යාභිසංඝස්කාරාදිය ම කියන ලදී.

---

* වි: ප: පටිච්චසමුප්පාද විභඞ්ග

එ සේ වත්නා පෙර කී **'අවිජ්ජා පච්චයා සංඛාරා''*** යන්නෙන් පූර්ව සංස්කාර නිර්දේශයෙහි අතීත භවයෙහි කර්ම වශයෙන් මේ භවයෙහි ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය හෙයින් සංස්කාර කියන ලදී.

මේ **''උපාදාන පච්චයා භවෝ''** යන්නෙන් කියන ලද සංස්කාර වර්තමාන භවයෙහි කර්ම වශයෙන් ආයති භවයෙහි ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වන බැවින් නැවැත සංස්කාරයන් කිම සාර්ථක මැයි.

විශේෂ:- පෙර කී තන්හි **''තත්ථ කතමෝ පුඤ්ඤාභිසංඛාරෝ කුසලා චේතනා කාමාවචරා''*** යනාදීන් කුසල චේතනාදි වශයෙන් කියන ලදී. මෙහි 'සියලු භවගාමී කර්මය යි' කී හෙයින් චේතනා සම්ප්‍රයුක්ත අභිධ්‍යාදීහු ද ගැනෙති.

තවද පෙර විඤ්ඤාණයට ප්‍රත්‍යය වූ ම කර්මය සංඛාරය යි කියන ලදී. දැන් අසංඥ භවයෙහි උපදනා කර්මය ද භවයැ යි කියන ලදී. කෙසේවින් කුමට යැ? පෙර පුණ්‍යාභිසංස්කාරාදිය ම වූ කුශලාකුශල ධර්ම කියන ලදී. මෙහි උපපත්ති භවය ද සංග්‍රහ වන හෙයින් කුශලාකුශල අව්‍යාකෘත ධර්මයෝ කියන ලදහ. එහෙයින් සම්ප්‍රකාරයෙන් මේ නැවැත කිම සාර්ථක මැයි.

මෙ සේ **සාර්ථක වශයෙන්** විනිශ්චය දතයුතු.

---

(5) **භෙද හෙයින්**

උපාදාන ප්‍රත්‍යයයෙන් වත්නා වූ භවයා ගේ භෙද වශයෙන් ද, **මෙ සේ යි**:- කාමූපාදාන ප්‍රත්‍යයයෙන් කාම භවයෙහි උපදවත්නා වූ යම් කර්මයක් කරනු ලැබේ නම් එය **කර්ම භව** නම්. එයින් නිපදවන ලද **සකෘත් උපපත්ති භවය යි.** රූප අරූප භව යන්හි ද මෙ සේ මැ යි.

විශේෂ:- කාමූපාදාන ප්‍රත්‍යයයෙන් උපදවන යම් කර්මයක් **කෙරේ නම්** එය කර්ම භව යැ. **එයින් නිපත් සකෘත් උපපත්ති භව**- **යයි.** ඒ කාම භවයෙහි ඇතුළත් සංඥ භව යැ, පඤ්චවොකාර භව යැ **යන දෙකක් ද**, රූප **කර්ම** භව යැ, **උපපත්ති** භවයැ යි රූප භව දෙකක් ද, ඒ රූප භවයෙහි ම ඇතුළත් වූ සඤ්ඤී භව- අසඤ්ඤී භව- **එක** වොකාර භව- පඤ්ච වොකාර භව- යන මොවුන් ද, අරූප **කර්ම** භව යැ, **උපපත්ති** භවයැ යි අරූප භව දෙකක් ද,

---

* වි: ප: පටිච්චසමුප්පාද විභඞ්ග

එහි ම සඤ්ඤා භව- නෙවසඤ්ඤානාසඤ්ඤා භව- වතුවොකාර භව යන මොවුන් ද, ඇතුළත් වූ භවයන් සමග කාම භව දෙක යැ, රූප භව දෙක යැ, අරූප භව දෙකයැ යි භවයෝ සදෙනෙක් වෙති.

එසේ ම (කාමූපාදාන ප්‍රත්‍යයයෙන් භවය සයක් වන්නා සේ) දිට්ඨුපාදාන- සීලබ්බතූපාදාන- අත්තවාදූපාදාන යන තුන් උපාදාන ප්‍රත්‍යය භෙදයෙන් අනාගත භවයන් හා **සූවිසි භව කෙනෙක්** වෙති.

(5) **සංග්‍රහ වශයෙන්**:- කම් භවය උපපත්ති භවය ද **එක්** කොට කාමූපාදාන ප්‍රත්‍යයයෙන් අනාගත භවයන් සමග **එක්** කාම භවයෙක, එසේ ම **එක්** රූප භවයෙක, **එක්** අරූප භවයෙකැ යි **භව තුනෙකි.** සෙසු උපාදාන ප්‍රත්‍යයයෙහුදු එසේ ම තුන් - තුන් භවයෝයැ යි මෙ සේ උපාදාන ප්‍රත්‍යයයෙන් සංග්‍රහ ගෙයින් අනාගත භවයන් සමග **භව දෙළෙසෙකි.** තව ද උපාදාන වශයෙන් භෙද නො කොට උපාදාන ප්‍රත්‍යයයෙන් වූ කාම භවයට පමුණුවන කම්ය කම් භවයැ. එයින් නිපන් සකඹ උපපත්ති භව යැ. රූප අරූප භවයෙහි දු මෙම නය යි.

මෙ සේ උපාදාන ප්‍රත්‍යයයෙන් අනාගත භවයන් සමග කාම භව දෙක යැ, රූප භව දෙක යැ, අරූප භව දෙකයැ යි **අනෙක්** ආකාරයකින් සංග්‍රහ කිරීමෙන් භව සයෙකි. තවද කම් භව උපපත්ති භව භෙදය නො ගෙන අනාගත භවයන් සමග කාම - රූප - අරූපයැ යි **භව තුනෙක්** වේ.

එ සේ ම කාම භවාදී භෙදය නො ගෙන කම්භව - උපපත්ති භව වශයෙන් **භව දෙකෙක්** වේ.

කම්භව - උපපත්තිභව භෙදය ද නො ගෙන උපාදාන ප්‍රත්‍යය යෙන් භවයැ යි කී භව වශයෙන් **එකෙක්** වේ. මෙ සේ උපාදාන ප්‍රත්‍යයයෙන් භවයා ගේ සංග්‍රහ වශයෙන් විනිශ්චය දතයුතු.

(6) **"යං යස්ස පච්චයෝ හොති චෙව"** යි යම් උපාදානයෙක් යම් භවයකට ප්‍රත්‍යය වේ **නම්** එයිනුදු විනිශ්චය දතයුතු.

ප්‍රශ්න:- කවර උපාදානයෙක් කවර භවයකට ප්‍රත්‍යය වේ ද?

පිළිතුරු:- යම්කිසි උපාදානයක් යම්කිසි කුශලයකට හෝ අකුශලයකට හෝ ප්‍රත්‍යය වේ මැයි.

ඒ මෙසේ යි:- පුහුදුන් තෙමේ උමතුවකු මෙනි. හෙතෙම මේ යුතු යැ, මේ අයුතුයැ යි නො විචාරා යම්කිසි උපාදානයක ගේ වශයෙන් යම්කිසි භවයක් පතා කාමාවචරාදී යම්කිසි කර්‍ම-යක් කෙරේ මැයි.

මතභෙද:- ගොසිල- අජසිල- කුක්කුර සීලාදී ශීල - ව්‍රත සමාදානයෙන් ගෙරින්- එළුවන්- බල්ලන් සමග උපදිනා යි ද එහෙයින් ඔවුනට ධ්‍යාන නැතැ යි ද ශීල-ව්‍රතොපාදානයෙන් රූප-අරූප භව නො වේය යි සමහර ආචාර්‍යවරයෝ යෙති. ඔවුන් ගේ වචනය නො ගත යුතුයි.

නිර්ණය:- සිතලු උපාදානයෙන් සිතලු භවය වේය යි ගත-යුතු. පෙර කී හෙද ප්‍රත්‍යය වන හෙයින් රූප-අරූප භවයන්හි උපැත්ම ද විය හැක්ක.

විභාග:- මේ ලෝකයෙහි අනුශ්‍රව (=ඇසීම්) වශයෙන් හෝ (මිනිස් ලොව කාමය සමෘද්ධිය දෙව්ලොව එයට වැඩියක් සමෘද්ධි තරයැ යි මෙසේ) දුටු දැය අනුවැ සිතීමෙන් හෝ මේ කාම තම් මිනිස් ලොව ක්ෂත්‍රිය මහාසාර කුලාදියෙහි ද, කාමාවචර සදෙව් ලෙවිහි ද, සමෘද්ධිය යි සිතා ඒ ලැබීම පිණිස අසද්ධර්‍මයන් (පුරාණ- භාරත- රාමායනාදිය) ඇසීම් ආදියෙන් රවටන ලදුවැ මේ කර්‍මයෙන් කාම සමෘද්ධ වේය යි සිතා කාමූපාදාන වශයෙන් කාය දුශ්චරිතාදිය හෝ කෙරේ ද? හෙතෙම දුසිරිත් පිරීමෙන් අපායයෙහි උපදී.

තවද මෙ ලෙවිහිදී ලැබෙන කාමයන් (රාජ්‍ය සම්පත් ආදි වස්තූන්) පතමින් ලැබූ වසතුව හෝ රැකීමට කාමූපාදාන වශයෙන් කාය දුශ්චරිතාදිය කෙරේ. හෙතෙම ඒ දුසිරිත් පිරී-මෙන් අපායයෙහි උපදී. ඔහු ගේ එහි ඉපදීමට හේතු වූ ඒ කර්‍මය කර්‍ම භව යැ. ඒ කර්‍මයෙන් නිපන් සකල උපපත්ති භවය යි, සඤ්ඤා භව - පඤ්චවොකාර භවය ද එයට ම ඇතුළති.

අනෙකෙක් සද්ධර්‍ම ශ්‍රවණාදීන් වඩනා ලද නුවණ ඇතිවැ මේ කර්‍මයෙන් කාම සමෘද්ධ වේයැ යි සිතා කාමූපාදාන වශයෙන් කාය සුචරිතාදිය කර යි, හෙතෙම එසේ සුචරිත පිරීමෙන් දෙව් ලොව හෝ මිනිස් ලොව හෝ උපදී. ඔහු ගේ එහි ඉපදීමට හේතුවූ **කර්‍මය කර්‍ම භව යැ. ඒ කර්‍මයෙන් නිපන් සකල උපපත්ති භවය යි, සඤ්ඤා භව- පඤ්චවොකාර භවයෝ ද,** එයට ම ඇතුළත් වෙති. මේ සේ කාමූපාදානය සුගති - දුර්ගති වශයෙන් ප්‍රභෙද සහිත සඤ්ඤා භව- පඤ්චවොකාර භව වශයෙන්

ඒක දෙශයකින් ඇතුළත් භවයන් සහිත කාම භවයට ප්‍රත්‍යය වේ.

අනෙකෙක් **රූප-අරූප භවයන්හි** ඒ කාම භවයට වඩා (කාමය) සමෘඩතරයැ යි අසා හෝ අනියමින් සලකා හෝ **රූප-අරූප සමාපත්ති** උපදවා ඒ සමාපත්ති බලයෙන් රූප-අරූප බ්‍රහ්ම ලෝකයන්හි උපදී. ඔහුට එහි ඉපදීමට හේතුවූ කර්මය **කර්ම භව යැ.** එහි උපන් **ස්කන්ධ උපපත්ති භ-ය යි. සඤ්ඤී-භව- අසඤ්ඤී භව- නෙවසඤ්ඤීනාසඤ්ඤී භව- එක වොකාර භව- චතුවොකාර භව- පඤ්චවොකාර භවයෝ ද** එහි ම ඇතුළත් වෙති. මෙ සේ කාමූපාදානය ප්‍රභෙද සහිතවූ සඤ්ඤී භවාදී වශයෙන් අනාගත භවයන් සහිතවූ **රූප-අරූප භවයන්ට ද ප්‍රත්‍යය වේ.**

අනෙකෙක් මේ ආත්මය දැන් පවත්නා කාමාවචර භවයෙහි හෝ රූප - අරූප භවයන් අතුරින් එක්තරා එකෙකැ හෝ උච්ඡේදයට පැමිණියේ 'සියලු වට දුක් උච්ඡේදයට (=විනාශයට) පැමිණීම් වශයෙන් මතා කොට උච්ඡේද වේයැ' යි උච්ඡේද දෘෂ්ටිය ගෙන එයට පමුණුවන කර්ම කෙරේ. ඔහු ගේ ඒ **කර්මය කර්ම භව යැ. ඒ කර්මයෙන් උපන් ස්කන්ධ උපපත්ති භවය යි.** සඤ්ඤීභවාදිය පෙර කී සේ එයට ම ඇතුළත්ය.

මෙ සේ දිට්ඨි - උපාදානය (ප්‍රභෙද සහිත) සඤ්ඤී භවාදී අනාගත භවයන් සහිත **කාම - රූප - අරූප** යන **ත්‍රිවිධ භවයට ම ප්‍රත්‍යය වේ.**

විශෙෂ:- මේ උච්ඡේද දෘෂ්ටියෙහි ඇතුළත් දශ වස්තුක මිථ්‍යා දෘෂ්ටීන් අතුරින් කාම භවයෙහි **'නත්ථි දින්නං' 'නත්ථි-යිට්ඨං'** යන **උච්ඡේද වාද දෙක ද,** රූප භවයෙහි **'නත්ථි හුතං'** යන තෘතීය **උච්ඡේද වාදය ද,** අරූප භවයෙහි සෙසු සප්තවිධ **උච්ඡේද වාද ද** යන මොවුන් ගේ වශයෙන් **උච්ඡේද දෘෂ්ටිය වේ.**

අනෙකෙක්:- මේ ආත්මය දැන් පවත්නා 'මේ කාමාවචර සම්පත්ති භවයෙහි හෝ රූප - අරූප - භවයන් අතුරින් එකෙකැ හෝ සුවපත් වේයැ, යි පහවූ දුහ ඇති වේයැ' යි ආත්මවාද වශයෙන් දැඩිවැ ගෙන ඒ භවයනට පමුණුවන කර්ම කෙරේ. ඔහු ගේ ඒ කර්මය **කර්ම භව යැ. එයින් නිපත් සකන්ධ උපපත්ති භවය යි,** සඤ්ඤී භවාදිය ද එයට ම ඇතුළත්ය.

මෙ සේ **අත්තවාදූපාදානය** සප්‍රභෙද අනාගත භව සහිත **ත්‍රිවිධ භවයට ප්‍රත්‍යය වේ.**

විභාවනා:- මෙහි 'කාමාවචර සම්පත්ති භවයෙහිය' යි කියන ලද්දේ **ප්‍රථම දෘෂ්ටධර්ම නිර්වාණවාද වශයෙනි.** සෙස්ස ඉතිරි දෘෂ්ටධර්ම නිර්වාණවාද වශයෙන් කියන ලදි.

විශෙෂ:- පෙළෙහි රූපාවචර ධ්‍යාන වශයෙන් මෑ මතුයෙහි සතර දිට්ඨධම්ම නිබ්බාන වාදයෝ ආහ. එතෙකුදු වුවත් දෘෂ්ටි ගතිකයා යම් කිසිවක් ගෙන යම්කිසි ප්‍රකාරයකින් අභිනිවෙශ (=දෘෂ්ටි වශයෙන් ගැනීම) කෙරේ යැ යි. අරූප භව ග්‍රහණය කරන ලදී.

තවද අරූප ධ්‍යාන චතුර්ථ ධ්‍යානයෙහි සංග්‍රහ වන බැවින් හෝ අරූප භවය ගත්තා ලදී. (මේ ටීකාගත විභාග යි.)

අනෙකෙක් මේ ශීල-ව්‍රත කාමාවචර මේ භවයෙහි හෝ රූප - අරූපභවයන් අතුරින් එක්තරා භවයෙකැ හෝ පුරන්නහුට සැප සම්පූර්ණ වීමට යේයැ යි. ව්‍රතොපාදාන වශයෙන් එයට පැමිණීමට සුදුසු වූ කම් කෙරේ. ඔහු ගේ ඒ කම්ය **කර්ම භවයැ.** ඒ කම්යෙන් නිපන් **සඤ්ඤි උපපත්ති භවය යි.** සඤ්ඤිභවාදිය එයට ම ඇතුළත් වේ. මෙ සේ සීලබ්බතූපාදානය ප්‍රභෙද සහිත සාන්තොගධ වූ තුන් භවයට ප්‍රත්‍යය වේ.

මෙහි පිළිවෙළින් නො කියා **සීලබ්බතූපාදානය** අන්‍යයෙහි කිම අත්තවාදූපාදානය මෙන් බෙහෙවින් සමුදාචාර නැති හෙයින් හෝ එය අත්තවාදූපාදාන නිමිත්තෙන් වන හෙයින් හෝ යි.

ප්‍රශ්නයෙකි:- මේ උපාදාන අතුරින් කවර උපාදානයෙක්, කවර භවයකට, කෙසේ ප්‍රත්‍යය වේ ද?

පිළිතුර:- "රූපාරූප භවයට - උපදන්* උපනිසා පස†
‡කාමභවයට **ඒ සහජාදී** - ඇ නන් බෙයින් **පස වේ**"

විභාග:- මේ කාමාදී **චතුර්විධ උපාදානය** රූප - අරූප භවයන්ට ද, කාම භවයෙහි (ඇතුළත් කම් භවයෙහි) කුශල-අකුශල කම්යට ද, උපපත්ති භවයට ද, උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. කාම භවයෙහි තමා හා සම්ප්‍රයුක්ත අකුශල කම් භවයට **සහජාත- අඤ්ඤමඤ්ඤ- නිස්සය සම්පයුත්ත- අත්ථි-**

---

* උපාදාන † උපනිශ්‍රය ප්‍රත්‍යය ‡ කාමභවයට ඒ සහජාත

අවිගත- හෙතු ප්‍රත්‍යය ප්‍රභෙදයෙන් සහජාතාදි වශයෙන් ප්‍රත්‍යය වේ.

විශේෂ:- හෙතු ප්‍රත්‍යය ප්‍රභෙදයෙන්හෑ යි කීමෙන් මෘගී ප්‍රත්‍යය ද සංග්‍රහ වේයැ යි කියන ලදී.

ඒ මෙ සේ යි:- දිටසි උපාදානාදිය සහජාත වූ අකුශල කර්‍ම භවයට මාගී ප්‍රත්‍යය වන හෙයින් සහජාතාදී ප්‍රත්‍යය අතුරින් හේතු ප්‍රත්‍යය හැර මාගී ප්‍රත්‍යය ගෙන සත් පරිද්දෙකින් ප්‍රත්‍යය වේ.

සියලු උපාදානයෝ ම අනන්තරවූ කර්‍ම භවයට **අනන්තර- සමනන්තර- අනන්තරූපනිස්සය- නත්ථි- විගත- ආසෙවන** ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙති. අනන්තරයට උපනිශ්‍රය වශයෙන් ද ප්‍රත්‍යය වේ. විප්‍රයුක්තය හට උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

මේ **'උපාදාන ප්‍රත්‍යයයෙන් භවය වේ'යැ යි** කීමෙහි විසතර යි.

---

10. **'භව ප්‍රත්‍යයයෙන් ජාති වේ'** යනාදීන්හි ජාති ආදීන් ගේ විනිශ්චය **සත්‍ය නිද්දේශයෙහි** කී නයින් දත යුතුයි. ආදි ශබ්දයෙන් **ජරා-මරණාදි** සියල්ල සංග්‍රහ කරන ලදී.

විශේෂ:- මෙහි භව යන්නෙන් කර්‍ම භවය අභිප්‍රේත යැ. ජාතියට ප්‍රත්‍යය වන්නේ එය යැ. උපපත්ති භවය නො වේ. ඒ කර්‍ම භවය ද **කර්‍ම ප්‍රත්‍යය, උපනිශ්‍රය ප්‍රත්‍යය** යන දෙ-ආකාරෙකින් ප්‍රත්‍යය වේ.

ප්‍රශ්නයෙකි:- භවය ජාතියට ප්‍රත්‍යය වේයැ යි කෙසේ දත හැකි ද?

පිළිතුර:- වාඛ්‍ය ප්‍රත්‍යයන් ගේ සමත්වය ඇති කල්හි ද හීන-ප්‍රණීතතාදි භෙදය දක්නා ලැබෙන හෙයිනි.

විස්තර:- පිතෘ-මාතෘන් ගේ ශුක්‍ර – ශ්‍රෝණිතාදී වාඛ්‍ය ප්‍රත්‍ය-යන් ගේ සමත්වය ඇති කල්හි ද යමක (නිඹුල්) දරුවන් ගේ ද හීන-ප්‍රණීතතාදී විශෙෂ පැනේ. භෙද හැම කල්හි ම හැම සත්ත්වයන් ගේ ම එක සේ නො වන හෙයිනි. භෙද අභෙතුක නො වේ. තවද ඒ හීන-ප්‍රණීතතා විශෙෂය උපදවන්නා වූ සත්ත්වයන් ගේ අධ්‍යාත්ම සන්තානයෙහි අනෙක් කාරණයක් නැති හෙයින් කර්‍ම භවය ම හෙතු කොට ඇත්තේ ය.

එයින් වදාළහ:- **"කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතාය"*** 'කර්මය සත්ත්වයන් හීන ප්‍රණීතතාදි භාවයෙන් බෙදයැ' යි කියායි. එහෙයින් භවය (කර්මය) ජාතියට ප්‍රත්‍යය වේය යි දතයුතු යි.

නවද ජාතිය නැති කල්හි ජරා-මරණ හෝ ශොකාදි ධර්ම හෝ නො වන හෙයින් ද, ජාතිය ඇති කල්හි ම ජරා මරණ දුකින් පහර ලද බාල ජනයානට ජරා - මරණ හා සම්බන්ධවූ හෝ ඤාති ව්‍යසනාදි ඒ ඒ දුඃඛ ධර්මයෙන් පහර ලද්දහුට **ජරා-මරණ** ප්‍රතිබද්ධ නො වූ හෝ ශොකාදිය වන බැවින් ද ජාතිය **ශොකාදියට ද ප්‍රත්‍යය වේය යි** දතයුතු.

මේ **ජාතිය උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන්** (ලෙසයෙන්) එකම ප්‍රකාරයකින් ම ප්‍රත්‍යය වේ

විශෙෂ:- මේ උපනිශ්‍රය ප්‍රත්‍යය, ප්‍රත්‍යයන් ගේ මහා-ප්‍රදෙශය යි.

මේ **'භව ප්‍රත්‍යයයෙන් ජාති වේ'** යන්නෙහි විස්තර කථාවයි.

මේ **පටිච්චසමුප්පාද** දෙශනායෙහි **ශොකාදිය** අවසානයෙහි වදාළ හෙයින් **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා යි** මෙ සේ භව චක්‍රයේ ආදියෙහි වදාළ අවිද්‍යාව ශොකාදීන් හා සිද්ධ වූවා වෙයි.

ජාතිය ශොකාදියට පමණක් ප්‍රත්‍යය නො වේ එ සේ ශොකාදියට ප්‍රත්‍යය වීමෙන් ඒ ශොකාදිය හා බැඳී සිටින අවිද්‍යාවට ද ජාතිය ප්‍රත්‍යය වේ.

එහෙයින් ම:-

"සෝ ඇ හෙයින'විදු - වෙතැයි සිදුමුල නොම දත්,
†කරු-විදු නැති මෙ බවසක - දෙලොස් පරිදි සුත් බැවින්
අගමග දක්වා නිතින් - සබඳ නො සිඳ පවත්නේ"

ප්‍රශ්න:- මේ පටිච්චසමුප්පාද දෙශනායෙහි ශොකාදියෙන් අවිද්‍යාව කෙසේ සිද්ධ වූවා ද?

පිළිතුර:- මෙහි **සොක- දෙමනස්ස- උපායාසයෝ** අවිද්‍යාව නැතිව නො පවතින්. (අවිද්‍යාව සමගම පවතින්.) පරිදෙවය (වැලපීම) ද මුළා නොවූවහුට නො වේ. එහෙයින් පළමු ශොකාදිය ඇති කල්හි කාමාශ්‍රව සමුදයයෙන් අවිද්‍යාව වේය යනු සිද්ධ යැ.

---

* ම: නි: උපරිපණ්ණාසක † කාරක - වෙදක

තවද ක්‍රමයෙනි:- **"ආසව සමුදයා අවිජ්ජා සමුදයෝ"*** 'ආශ්‍රව සමුදයයෙන් අවිද්‍යා සමුදය වේ'ය යි වදාළහ.

ඒ මෙසේයි:- වසනු කැමැත්තා ගේ වියෝගය ඇති කල්හි ශෝකය කාමාශ්‍රව සමුදයයෙන් වේ.

එයින් වදාළහ:-

"තස්ස වෙ කාමියානස්ස - ජන්තුජාතස්ස ජානතුනෝ
තෙ කාමා පරිභායන්ති - සල්ල විද්ධොව රුප්පති"†

"වත්කම් පතන ඒ - සඳ ඇති සත් තමා ලද
එ වත්කම් පිරිහෙන කල - හුලකින් විදි ලෙස පෙළේ"

වසනු කැමැත්තෙහි ඇළුණු සිත් ඇති එ හෙයින් ම කෙලෙස-කාම වශයෙන් උපන් ඡන්දය ඇති ඒ සත්ත්වයා ගේ වසනු කැමැත්ත පිරිහෙන්නේ වී නම් හුලකින් විදියකු සේ ශෝකාදීන් පෙළේ.

තවද **"කාමතො ජායතී සොකෝ"‡** කාම හේතුවෙන් ශෝකය උපදනේ ය යි වදාළහ.

මේ සියලු ශෝකාදිය ඒ දිට්ඨි ආශ්‍රව සමුදයයෙහුදු වේ. එහෙයින් වදාළහ.

"තස්ස අහං රූපං මම රූපන්ති පරියුට්ඨාඨාසිනෝ රූප විපරිණාමඤඤථා හොති උප්පජ්ජන්ති සොකපරිදෙව දුක්ඛ දෙමනස්සුපායාසාති"? "මම රූපය වෙමි. මා ගේ රූපය යි දෘෂ්ටියෙන් නැඟී සිටින්නා වූ ඒ පුද්ගලයා හට රූපයා ගේ ප්‍රකෘතිය හැරීම ය, අන් අයුරකින් වීම ය, යන්නාදීන් සොක-පරිදෙව- දුක්ඛ- දෙමනස්ස- උපායාසයෝ උපදිත්."

මෙසේ දිට්ඨි-ආසව හේතුවෙන් උපදනා සේ භවාසව හේතු වෙන් ද සොකාදිය උපදී.

එයින් වදාළහ:- **යෙපි තෙ දෙවා දීඝායුකා වණ්ණ-වන්තො සුඛ බහුලා උච්චෙසු විමානෙසු චිරං දීඝමද්ධානං තිට්ඨන්ති තෙපි තථාගතස්ස ධම්මදෙසනං සුත්වා භයං සන්තාසං සංවෙගමාපජ්ජන්ති"+** දීඝායුෂ්ක වර්ණවත් සුව බහුල දෙවියෝ උස්වූ දිව්‍ය විමානයන්හි බොහෝ කලක් සිටියාහු ද; ඔවුහු ද තථාගතයන් වහන්සේ ගේ ධර්ම දෙශනාව අසා බියට තැති

*ම: නි: මූලපණ්ණාසක † ම: නිද්දෙස ‡ ධ: ප:
? සං: නි: බන්ධසංයුත්ත + අ: නි: චතුක්කනිපාත

ගැනීමට සංවේගයට පැමිණෙති. පස් පෙර නිමිති දැක මරණ බියෙන් තැතිගත් දෙවියනට මෙනි.

භවාශ්‍රව හෙතුවෙන් මෙන් අවිද්‍යාශ්‍රව හෙතු කොට ද මේ ශොකාදිය උපදී.

එහෙයින් වදාළහ. **"ස ඛො සො භික්ඛවෙ බාලො දිට්ඨෙව ධම්මෙ නිච්ඛං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙතීති*"** මහණෙනි! ඒ අඥාන තෙමේ අවිද්‍යාව හෙතුකොට ගෙන එයට අනුකූල කථා ඇසීම, කම්කටොලු දැකීම, මරණ කාලයෙහි එළඹ සිටි පාපකර්මය සිහි කිරීම නිදාන කොට ඇති ශොකාදී වූ දුක් කෙරේ" ය සි කියායි.

මෙ සේ ආශ්‍රව සමුදයයෙන් උපදනා මේ ශොකාදිය අවිද්‍යා-වට හේතු වූ ආශ්‍රවයන් සිදුව කෙරේ. ආශ්‍රව සිදුව කල්හි ප්‍රත්‍යය භාවයෙන් වන හෙයින් අවිද්‍යාව ඔබ වේය සි දත යුතු. ප්‍රත්‍යය ඇති කල්හි වන හෙයින් අවිද්‍යාව සිදුව කල්හි නැවැතෙ 'අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාර වේ. සංස්කාර ප්‍රත්‍යයෙන් විඥාන වේ' ය සි මෙ සේ හෙතු-ඵල පරම්පරාව ගේ අවසානයෙක් නැත්තේ ය. එහෙයින් හෙතු-ඵල පරම්පරා සම්බන්ධයෙන් පවත්නා වූ දෙළොස් අංගයක් ඇති භව චක්‍රය නො දත් ආදි ඇත්තේ යැ යනු සිදුව සි.

ප්‍රශ්නයෙකි:- එසේ වත්නා **"අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාර වේ" ය සි** මේ මූල මාත්‍ර කථනය විරුද්ධ නො වේ ද?

පිළිතුර:- මේ ආදි භාවය කීමෙක් නො වේ. ප්‍රධාන ධර්මය කීමෙකි.

විස්තර:- **කම්** කෙලෙස- **විපාක** යන ත්‍රිවිධ වෘත්තයට ම අවිද්‍යාව ප්‍රධාන යැ. සත්ත්වයකු ගේ හිස ගැනීමෙන් අන්‍යවූ ද සත්ත්ව ශරීරය ගැනීම මෙනි. සෙසු කෙලෙස් වට හා කම් වට ද බාලයා භාන්පසින් පෙළයි. අවිද්‍යාව සිදපි කල සෙසු **කම්ම- කිලෙස- විපාකවට්ටයෝ ද** සිදෙත්. සත්ත්ව යීතිචෙඡදනයෙන් වෙළා සිටි බාහුවේ මිදීම වන්නාක් මෙනි.

එසින් වදාළහ:- **අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සංඛාරනිරොධොති†** 'අවිද්‍යාව නිරවශෙෂ කොට නිරුද්ධ කිරීමෙන් සංස්කාරයන් ගේ නිරොධය වේ' යනාදිය මෙ සේ අවිද්‍යාව තමා සතන්හි ඉපදවීම් වශයෙන් ගත්තාහට සංසාර බන්ධනය ද

*ම: නි: උපරිපණ්ණාසක † ම: ව: අභිසමෙබොධි කථා

එය නිරවශෙෂයෙන් මුදන්නාහට සංසාර විමොක්ෂය ද වන හෙයින් ඒ ත්‍රිවිධ වෘත්තයට ප්‍රධාන ධර්මය කීමය මේ. එය මූල ධර්මය කීම නො වේ. මෙ සේ මේ භව චක්‍රය නො දන්නාලද ආදි ඇත්තේය යි දතයුතු.

ප්‍රශ්නය:- මේ භව චක්‍රය කරන්නෙක් හෝ විඳින්නෙක් හෝ නැත්තේ ද?

පිළිතුර:- අවිද්‍යාදි කාරණයෙන් සංස්කාරාදීන් ගේ පැවැත්ම වන හෙයින් ඒ අවිද්‍යාදියෙන් අන්‍යවූ බ්‍රහ්ම- මහා බ්‍රහ්ම- ශ්‍රෙෂ්ඨ- සත්ත්වජීවිත- ප්‍රජාපති ආදි ලොක නිර්මාතෘයෑ යි තර්කයෙන් කල්පනා කොට ගන්නා ලද සංසාරය කරන්නෙක් හෝ භිතාභිත දෑ කියන්නා වූ සුව දුක් විඳින මේ මාගේ ආත්මයෑ යි සලකන ලද ආත්මයෙක් හෝ නො වෙයි. මෙ සේ කාරකවේදක රහිතය යි දතයුතු.

මෙහි අවිද්‍යාව ඉපිද නස්නා සුලු බැවින් නිත්‍ය භාවයෙන් ද, කෙලෙසන බැවින් හා කෙලෙසෙන ධර්මයනට ආලම්බන හෙයින් ශුභ භාවයෙන් ද, උදය-වය දෙක්හි පෙළෙන හෙයින් සුඛ භාවයෙන් ද, ප්‍රත්‍යය ප්‍රතිබද්ධ පැවැතුම් ඇති හෙයින් ආත්ම භාවයෙන් ද ශූන්‍ය යැ. සංස්කාරාදි අඞ්ග ද එසේ ම ශූන්‍ය යි.

තවද අවිද්‍යාව ආත්මය නො වේ. ආත්මය පිළිබැඳි ද නො වේ. ආත්මයෙහි නො වේ. ආත්මය ඇත්තක් නො වේ. සංස්කාරාදි අඞ්ග ද එසේ මැ යි. එහෙයින් මේ භව චක්‍රය අවිද්‍යාදි ද්වාදශාඞ්ගයන් ගේ ශූන්‍යත්වයෙන් ද්වාදශවිධ ශූන්‍යතායෙන් ශූන්‍යය යි මෙ සේ දතයුතු.

(ධ්‍රුවාදි චතුර්විධ ශූන්‍යතාව ද, ආත්ම ශූන්‍යතාදි චතුර්විධ ශූන්‍යතාව ද, එකකින් එකක් කොට ගෙන ද්වාදශාඞ්ග ගත ශූන්‍යතාවෝ ද්වාදශවිධ වෙත්නු යි **'ද්වාදසවිධ සුඤ්ඤතා සුඤ්ඤං'** යැ යි යොදනු යනු සත්‍ය යි.)

තවද:-

''අවිදු-තණ දෙමුල යැ - ඉකුත් ඇ තුන් කල් වේ
දෙක-අට-දෙකැයි බව සක - දෙලොසඟ කෙමෙන් දන්නේ''

ඒ භව චක්‍රයේ **අවිද්‍යාය- කාණ්ඩයෑ** යි ධර්ම දෙකක් මූල යැ යි දතයුතු.

විඤ්ඤාණ:- (පූර්‍වාන්තයෙන්) අතීත සකල **කොට්ඨාසයෙන්** ප්‍රත්‍යුත්පන්න විපාකය එළවන හෙයින් **අවිද්‍යාව මූලය වේ. වේදනාව අවසානය යැ.** (අපරාන්තය) අනාගත ස්කන්ධ කොට්ඨාසය හා ගළපන හෙයින් **තෘෂ්ණාව මූලය වේ. ජරා-මරණ අවසානය** වේ යැ යි මේ සේ **මූල වශයෙන් භව චක්‍රය ලිවිධ වේ.**

විශෙෂ:- මෙහි අවිද්‍යා මූල භව චක්‍රය **දිට්ඨි චරිතයා ගේ** වශයෙන් වදාරන ලදී. පසුවැ කී **තෘෂ්ණා** මූල භව චක්‍රය **තෘෂ්ණා චරිතයා ගේ** වශයෙන් වදාරණ ලදී.

ඒ මේ සේයි:- දෘෂ්ටි චරිතයන්ට අවිද්‍යාව ද, තෘෂ්ණා චරිත-යන්ට **තෘෂ්ණාව** ද සසර පැවැත්ම කරයි.

නවද උච්ඡේද දෘෂ්ටිය නිරවශෙෂයෙන් ප්‍රහාණය කිරීම පිණිස අවිද්‍යාමූලක පළමුවන භව චක්‍රය වදාළහ. ප්‍රත්‍යක්ෂ වශයෙන් දතයුතු විඤ්ඤාදි ප්‍රත්‍යුත්පන්න ඵල ධර්‍මයන් ගේ හටගැන්මෙන් (අප්‍රත්‍යක්ෂවූ) අවිද්‍යාදි හේතූන් ගේ නො සිඳ පැවැත්ම ප්‍රකාශ කරන හෙයිනි.

උපන්නාවූ විඤ්ඤාදීන් ගේ ජරා-මරණ ප්‍රකාශ කරන හෙයින් ශාස්වත දෘෂ්ටිය නිරවශෙෂයෙන් ප්‍රහීණ කිරීම සඳහා **තෘෂ්ණා** මූලක දෙවන භව චක්‍රය වදාරණ ලදී.

නවද ක්‍රමයෙකි:- ගබ්භසෙය්‍යක සත්ත්වයන් ගේ වශයෙන් පළමුවන අවිද්‍යාමූලක භව චක්‍රය වදාරන ලදී. **"සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං" "විඤ්ඤාණ පච්චයා නාම රූපං"** යනාදීන් ධර්‍මයන් ගේ පිළිවෙළ නො ඉක්ම පැවැත්ම දක්වන හෙයිනි.

"උපාදාන පච්චයා භවෝ, භව පච්චයා ජාති" යනාදීන් උපපත්ති ස්කන්ධයන් එකවට පහළ වීම දක්වන හෙයින් **ඔපපාතික** සත්ත්වයන් ගේ වශයෙන් පසුවැ කී තෘෂ්ණා මූලකය වදාරන ලදී.

ඒ භව චක්‍රයා ගේ **අතීත- වර්‍තමාන- අනාගතය** යි කාල තුනෙක් වේ. ඒ කාල අතුරින් පෙළෙහි සවරූපයෙන් ආ පරිද්දෙන් **අවිද්‍යාය, සංඛාරය,** යන **අඞ්ග දෙක අතීත කාලික යැ. විඤ්ඤාණය** මුල් කොට **භවය** අවසාන කොට ඇති **අඞ්ග අට වර්‍තමාන කාලික යැ. ජාතිය, ජරා-මරණ** යන **අඞ්ග දෙක අනාගත කාලික යැ** යි දතයුතු.

"*හේ පල-හේ පෙරටු - තෙ සඳ† සිවු බේ සඟහැති
විසියුරු‡ අරුති බව සක - තිවට බෙමේ නො නැවැතී"

තවද:- **සඞ්ඛාර** + (**පවිසඤ්ඤි**) **විඤ්ඤාණ** අතරැ එක් **හේතු-ඵල** සන්ධියෙකි. **වෙදනා** + **තෘෂ්ණා** අතරැ එක් **ඵල-හේතු** සන්ධියෙකි. **භව** + **ජාති** අතරැ එක් **හේතු ඵල** සන්ධියෙකැ යි මේ සේ මේ භව චක්‍රය හේතු පූර්ණ, ඵල පූර්ණ, හේතු පූර්ණ, වශයෙන් ත්‍රිසන්ධියෙක් ඇතැයි දතයුතු.

තවද සන්ධීන් ගේ මූල-අග පිරිසිදීමෙන් **සංග්‍රහ සතරෙක්** වේ.

ඒ මෙ සේ යි:- **අවිජ්ජා - සඞ්ඛාර** එක් සංක්ෂේපයෙක.

විඤ්ඤාණ- නාම- රූප - සළායතන- ඵස්ස- වෙදනා දෙවෙනි සංක්ෂේපය යැ.

තෘෂ්ණා- උපාදාන- භව- තෙවෙනි සංක්ෂේපය යැ.

ජාති- ජරා - මරණ සතර වන සංක්ෂේපය යි මෙ සේ මේ භව චක්‍රය **සංක්ෂේප සතරක්** ඇත්තේ ය යි දත යුත්තේ යි.

"අයු කල හේ පසෙකි - දැන් කල පල පසෙක් වේ,
දැන් කල්හි ද හේ පසෙකි - මතු කල පල පසෙක් වේ"

මේ විසි ආකාර අර හේතුකොට **විසි වැදෑරුම් අර ඇත්තේ ය යි** දතයුතු.

විඤ්ඤාර:-ඒ ගීයෙහි අතීතයෙහි හේතු පස යැ යි කීයේ පෙළෙහි කී **අවිද්‍යා-සංඛාර,** යන මේ හේතු ධර්ම දෙක ද, (ඒ අවිද්‍යා-යෙන් යුක්ත වූ අඥාන තෙමේ තෘෂ්ණා වශයෙන් ආලම්බනයෙහි පිපාසිත වේ. තෘෂ්ණාවෙන් පෙළුණේ දැඩි වූ තෘෂ්ණා දෘෂ්ටීන් ගැනීම කෙරේ. ඕනව උපාදාන ප්‍රත්‍යයයෙන් භවය වේ. එහෙයින්) **තෘෂ්ණා- උපාදාන- භව-** යන තුන ද ගැනීමෙනි.

එයින් වදාළහ. **"පුරිම භවභවඞ්ගම්හි මොහෝ අවිජ්ජා, ආයූහනා සංඛාරා, නිකන්ති තණ්හා, උපගමනං උපාදානං, චෙතනා භවොති ඉමෙ පඤ්චධම්මා පුරිමභවභවඞ්ගම්හි ඉධ පවිසඤ්ඤා පවවයා"**ති පෙරැ ජාතියෙහි කළ කම් භවයෙහි (ඉකුත් ජාතියෙහි කම් කරන කල්හි) දුඃඛාදි චතුරාර්‍ය සත්‍යය නො දැනීමෙන් මුළාවූයේ කම් කෙරේ නම් එය **අවිද්‍යාව** යැ. දානාදී ක්‍රියාවන් සකස් කොට කරන්නා වූ චෙතනාව **සංඛාර** යැ.

---

* හේතුඵල † ත්‍රි සන්ධි ‡ විසි + අයුරු ද්‍ධ ප: ම:

ආලම්බන ගෙයින් ඇලී ම **තෘෂ්ණාව යැ.** අරමුණ දැඩි-කොට ගැනීම **උපාදාන යැ.** පරිත්‍යාගාදි වශයෙන් පවත්නා චෙතනාව **භව යැ** යන මේ පඤ්ච ධර්මයෝ පූර්ව භවය ඇති කල්හි මෙහි ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වෙති.

එහි **පූර්වකර්ම භවයෙහි** යනු පූර්ව ආත්ම භාවයෙහි වූ පූර්ව කර්ම භවයෙහි නොහොත් පූර්ව ආත්ම භාවයෙහි වූ කර්ම භවය ඇති කල්හි (ඉකුත් ජාතියෙහි කර්ම කරන කල්හි) යැ යනු යි.

මොහය අවිද්‍යාව යැ. = දුඃඛාදි චතුරාර්ය්‍ය සත්‍යය, නො දැ-නීම් වශයෙන් ආලම්බන ප්‍රතිවිජ්ඣන කරන මූළාවෙන් යුක්තවැ යම් කර්මයක් කෙරේ නම් ඒ මූළාව **අවිද්‍යාව** යි.

ආයූහන චෙතනා සංඛාර යැ. = ඒ කුශල - අකුශල කර්ම කරන්නහු ගේ යම් පූර්ව - පූර්ව චෙතනාවෙක් වේ නම් එය ආයූහන සංඛාර නම්.

ඒ මෙසේ යි:- 'දනක් දෙමි යි' සිතක් උපදවා මසක් මුළුල්ලෙහි හෝ අවුරුද්දක් මුළුල්ලෙහි දානොපකරණ පිළියෙළ කරන්නා හට උපන් **පූර්ව චෙතනා** යි.

එහෙත් ප්‍රතිග්‍රාහකයන් අතෙහි දාන වස්තුව පිහිටුවන්නහුට උපදනා චෙතනාව ම **කර්ම භව** නමැ යි කියනු ලැබේ.

තවද එක ආවර්ජන සිතක් ඇති චිත්ත වීථියක ප්‍රථම ජවන් සයෙහි **චෙතනාවෝ ආයූහන සංඛාරයහ.** සත් වැනි ජවන යෙහි වූ චෙතනා භව නම් වේ.

එසේ පැවැති යම් කිසි චෙතනාවක් හෝ **භව නම්.** තත් සම්ප්‍රයුක්ත සඵස්පර්ශාදි චෛතසික හෝ අභිධ්‍යාදිය හෝ **ආයූහන සංඛාර** නම්. (මේ පටිසම්භිදා පාළියෙහි ආ සේ යැ.)

ඇලීම තෘෂ්ණා යැ = කර්මයක් කරන්නකුට ඒ කර්මය ගේ ඵලය වූ උත්පත්ති භවයෙහි යම් ආසාවක්- ප්‍රාර්ථනාවක් වේ නම් එය තෘෂ්ණාව යි. (චාතුර්මහාරාජිකාදි දෙවියෝ 'දීර්ඝායුෂ්කයහ' 'සුඛ බහුලය හ' යනාදිය ඇසීමෙන් උපදනා තෘෂ්ණාව උත්පත්ති භව ප්‍රාර්ථනාව යි.)

දැඩිවැ ගැනීම උපාදාන යැ = කර්ම භවයට ප්‍රත්‍යය වූ (මෙ නම් කර්මයක් කොට අසුවල් නම් තැන කාම සේවනය කරමි. උවෙජදයට පැමිණෙන්නෙමි. මේ ආදි කෙයින් පැවැති) අරමුණ

දැඩි කොට පරාමර්ශනය කිරීමෙක්, අරමුණ දැඩි කොට ගැනීමෙක් දෘෂ්ටි වශයෙන් දැඩි කොට ගැනීමෙක් වේ නම් ඒ උපාදානය යි.

වෙතනා භව යැ = පෙර සඞ්ඛාර ලක්ෂණයෙහි ත්‍රිවිධ අර්ථ විකල්පයෙහි ම කියන ලද ආයූහනයා ගේ අවස්ථායෙහි වදාළ **වෙතනාව භව නම් වේ** යැ යි මෙසේ අර්ථ දත යුතු යි.

ඉදානි ඵල පඤ්චකං = දැන් ඵල පසෙකැ. **විඤ්ඤාණයෙහි** පටන් **වෙදනාව** අවසන් කොට පෙළෙහි ම ආ **ඵල පස යි.**

ඒ මෙසේ යි:- **"ඉධ පටිසන්ධි විඤ්ඤාණං, ඔක්කන්තිනාම-රූපං, පසාදෙ ආයතනං, ඵුට්ඨෝ ඵස්සෝ, වෙදයිතං වෙදනා ඉති ඉමෙ පඤ්ච ඛන්ධා ඉධූපපත්තිභවසම්පුරෙක්ඛතස්ස කම්මස්ස පච්චයා"*** මේ භවයෙහි ප්‍රතිසන්ධි ය **විඤ්ඤාණ යැ.** මවු කුසට වදනාක් මෙන් වීම **නාම-රූප යැ,** ප්‍රසාදය **ආයතන යැ,** ස්පර්ශය **ඵස්ස යැ,** අරමුණු රස විඳීම **වෙදනා යැ.** මෙසේ මේ පඤ්චඛන්ධය මේ ප්‍රත්‍යුත්පන්න භවයෙහි (පෙර භවයෙහි කළ කර්මයා ගේ) ප්‍රත්‍යයෙන් වේ.

එහි-ප්‍රතිසන්ධි විඤ්ඤාණය = ඉක්ම ගිය අනාදුරු භවය හා වර්තමාන භවය ගැළපීම් වශයෙන් උපන් බැවින් යම් සිතක් පටිසන්ධිය යි කියා නම් ඒ සිත යැ මෙහි **විඤ්ඤාණ නම්.**

මවු කුසට වදනාක් මෙන් වීම = මවුකුස පිළිසිඳ ගත්තා විගස රූපා'රූප ධර්මයන් අවුත් පිවිසෙන්නාක් මෙන් වීම **නාම-රූප නම්.**

ප්‍රසාදය ආයතන යැ = යම් චක්ෂුරාදි පඤ්චායතන වශයෙන් කියන ලදී.

ස්පර්ශය ඵස්ස යැ = අරමුණ හැපෙමින් උපදනා ස්වභාවය **ස්පර්ශ නම්.**

අරමුණු රස විඳීම වෙදනා යැ = ප්‍රතිසන්ධි විඤ්ඤාණය සමග හෝ ෂඩායතන ප්‍රත්‍යය කොට ඇති ස්පර්ශය සමග හෝ උපන්නා වූ විපාක වෙදනාව (වෙදයිතය) මෙහි **වෙදනා ය** යන අර්ථයි.

ඉදානි හෙතවෝ පඤ්ච = දැන් හේතු පස නම් **තෘෂ්ණා පස යැ.**

තණ්හා-උපාදාන - භව යැ යි පෙළෙහි සවරූපයෙන් ම ආහ එහෙත් (කර්ම) භවය ගත් කල එහි පූර්ව භාගය වූ සංස්කාර

---

* ප: ම;

(වෙතනා) හෝ තත් සම්ප්‍රයුක්ත සපර්‍යාදී සංස්කාර හෝ ගන්නා ලැබේ.

තණ්හා - උපාදාන ග්‍රහණයෙන් ඒ තෘෂ්ණා - උපාදාන හා සම්ප්‍රයුක්ත වූ (යම් අවිද්‍යාවකින් මුළා වූවෙක් කුශල අකුශල කර්ම කෙරේ නම් ඒ) **අවිද්‍යාව** ගන්නා ලද්දේ මැ යි. මෙසේ **වර්තමාන හේතු පස** වේ.

එයින් වදාළහ. **"ඉධ පරිපක්කත්තා ආයතනානං මොහෝ අවිජ්ජා. අයූහනා සංඛාරා නිකන්තී තණ්හා. උපගමනං උපාදානං චෙතනා භවෝ ඉති ඉමෙ පඤ්චධම්මා ඉධ කම්ම-භවස්මිං ආයතිං පටිසන්ධියා පච්චයා"*** මේ භවයෙහි ආයතන මුහුකුරා ගිය හෙයින් මුළාවීම **අවිද්‍යා** යැ. පුණ්‍යභාග චේතනා **සංස්කාර** යැ. කැමති වීම **තෘෂ්ණා** යැ. අරමුණු දැඩි කොට ගැනීම **උපාදාන** යැ. පරිත්‍යාගාදී චේතනාව **භව** යැ. මෙසේ මේ පඤ්ච ධර්මයෝ මේ **කර්ම භවයෙහි මතු ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වෙති.**

ඒ පාඨයෙහි - "මේ භවයෙහි ආයතන මුහුකුරා ගිය හෙයින් (බාලයා ගේ චිත්ත ප්‍රවෘත්තිය භවාඞ්ග බහුල වැ පවත්නා හෙයින් භවාන්තර ජනක කර්මායූහනයට සමර්ථ නො වන හෙයින්) මුහුකුරා ගිය චක්ඛාදි ආයතන ඇත්තහු ගේ කුශලා'කුශල කර්ම කරන කාලයෙහි පැවැති මූලාව (අවිද්‍යාව) දක්වන ලදී. සෙස්ස ප්‍රසිඛ අර්ථ ඇති යේ යි.

'ආයතිං එල පඤ්චකං' මතු භවයෙහි ඵල පසෙකි = විඤ්ඤාණාදි පස යි. ඒවා **ජාති** ශබ්ද ග්‍රහණයෙන් ම ගන්නා ලදී. වැලි **ජරා-මරණය** තම් ඒ විඤ්ඤාණාදීන් ගේ ජරාව හා මරණය යි.

එයින් වදාළහ. **"ආයතිං පටිසන්ධි විඤ්ඤාණං, ඔක්කන්තී නාම - රූපං, පසාදෙ ආයතනං, ඵුට්ඨෝ එස්සෝ, වෙදයිතං වෙදනාති ඉමෙ පඤ්චධම්මා ආයතිං උපපත්ති භවස්මිං ඉධ කතස්ස කම්මස්ස පච්චයා"**

'මතු භවයෙහි ප්‍රතිසන්ධිය **විඤ්ඤාණ** යැ, මවු - කුසට බැස ගැන්ම **නාම - රූප** යැ, ප්‍රසාදය **ආයතන** යැ, සපර්‍යාය **ස්පර්ශ** යැ, අරමුණු රස විඳීම **වේදනා** යැ, යන මේ පඤ්ච ධර්මයෝ අනාගත උත්පත්ති භවයෙහි මේ අත් බැව්හි කරන ලද

* ප; ම:

කම්මයා ගේ ප්‍රත්‍යයෙන් වෙති, මෙ සේ මේ භව චක්‍රය **විංශති ආකාර ඇත්තේ** වේ. මෙහි පූර්ව භවයෙහි **පඤ්ච කම්ම** සමාහාරය හ. වර්තමාන භවයෙහි **පඤ්ච විපාක** ධර්මය හ. වර්තමාන කාලයෙහි **පඤ්ච කම්ම** සමාහාරය හ. අනාගත කාලයෙහි **පඤ්ච විපාක** ධර්මය හ යි ධර්මයෝ දශ දෙනෙක් **කම්මය** හ. දශ දෙනෙක් විපාකය හ යි මෙ සේ සප්තාන ද්වාරයෙක්හි **කම්ම වෘත්තය** ය. **සප්තාන** වශ යෙක්හි විපාකය **විපාක වෘත්තය**. කම් සංක්ෂේපය, විපාක සංක්ෂේපය. කම් භවය, විපාක භව ය. කම් ප්‍රවෘත්තිය, විපාක ප්‍රවෘත්තිය. **කම්** සන්තතිය, විපාක සන්තතිය. ක්‍රියා ය, ක්‍රියා ඵල ය යි කියා යි.

විභාවනය:– කම්මය ම විපාක සමාහරණය (=වැඩීම) කරවන හෙයින් කම් සමාහාර නම්.

සඞ්ඛාර – භව (සඞ්ඛ්‍යාත) කම් යැ. එයට උපකාරක අවිජ්ජා-තණ්හා- උපාදාන කම් සමාහාරය ඇ.

ප්‍රතිසන්ධි දායක භවය කම් නම්. එයට උපකාරක ආයූහන සඞ්ඛාර වූ අවිද්‍යාදිය කම් සමාහාරය යි. මෙ සේ කම්මය ද, කම්-සමාහාරය ද කම් සමාහාරය යි එක ශෙෂ වශයෙන් හෝ කම් සමාහාර ග්‍රහණය දත යුතු යි.

අවිද්‍යාදිය කම්මයාට සහාය බැවින් ද කම් සදෘශත්‍ව යි හෝ කම්මයට උපකාරත්‍ව යි. කම්මය යි කියත්‍ව ලැබේ.

අවිද්‍යාදිය හා විඤ්ඤාණාදිය ද කම්ම, විපාකය, කම් විපාක යැ යි මෙ සේ සංක්ෂේප කරත්‍ව ලැබේත්‍වයි හෝ සංක්ෂේප නම්. **සංක්ෂේප** භාව සාමාන්‍යයෙන් හෝ එකවචන වී ය යි දතයුතු.

තවද සංක්ෂේප ශබ්දය භාගාධිවචන හෙයින් කම් භාගය හෝ කම් සංක්ෂේප නම්. (මේ ටීකාගත විස්තර ය.)

වටට තුනක් ඇති භව චක්‍රය නොනැවතී භ්‍රමණය වේ. යන මෙහි **සංඛාර** භව දෙදෙන **කම්මවටට** යැ. **'අවිද්‍යා-තණ්හා- උපාදාන කිලෙසවට්ට** යැ. **විඤ්ඤාණ- නාම- රූප-සළායතන- ඵස්ස- වේදනා විපාක වට්ටය** යි. මේ තුන් වට්ටයෙන් **තුන් වටක් ඇති** මේ භව චක්‍රය **යම්කාක් කෙලෙස්වට නො සිඳේ නම් ඒ තාක් නො සිඳෙන ප්‍රත්‍යය** ඇති හෙයින් නො නැවැතී නැවැතැ පරිවර්තනය (භ්‍රමණය) වේ ය යි දතයුතු.

මෙ සේ බමන්නා වූ ඒ **භව චක්‍රය** තෙමේ:-

(1) **සත්‍යප්‍රභව** හෙයින් ද,
(2) **කෘත්‍ය** හෙයින් ද,
(3) **වාරණ** හෙයින් ද,
(4) **උපමා** හෙයින් ද,
(5) **ගම්භීර** හෙයින් ද,
(6) **නය** හෙයින් ද,
සුදුසු සේ දතයුතු වේ.

(1) **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා** - යන්තෙහි අවිද්‍යා ප්‍රත්‍යයෙන් වන සංස්කාර චිතීය (සමුදය) සත්‍යය ප්‍රභව කොට ඇති චිතීය සත්‍ය යැ. (ආශ්‍රව සහිත කුශලා'කුශල කර්මය වෙතනා-වෙතනා සම්ප්‍රයුක්ත වශයෙන් වෙනසක් නො කොට සමුදය සත්‍යය යැ යි සත්‍ය විභඞ්ගයෙහි වදාළ හෙයිනි.)

සංස්කාරයන් ප්‍රභව කොට ඇති **විඤ්ඤාණය, චිතීය සත්‍යය ප්‍රභව කොට ඇති ප්‍රථම** (දුඃඛ) **සත්‍ය යැ.**

විඤ්ඤාණාදීන් ප්‍රභව කොට ඇති **නාම - රූපාදි** විපාක වෙදනාවන් අවසාන කොට ඇති අවයව, **ප්‍රථම සත්‍යය ප්‍රභව කොට ඇති ප්‍රථම සත්‍ය යැ.**

වෙදනාව ප්‍රභව කොට ඇති **තෘෂ්ණාව, ප්‍රථම සත්‍ය ප්‍රභව කොට ඇති චිතීය සත්‍ය යැ.**

තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් වන උපාදානය, **චිතීය සත්‍යයෙන් නිපන් චිතීය සත්‍ය යැ.**

උපාදානය ප්‍රභව කොට ඇති **භවය, ද්විතීය සත්‍යයෙන් නිපන් ප්‍රථම - චිතීය සත්‍ය මය යැ.**

භවය ප්‍රභව කොට ඇති **ජාතිය, චිතීය සත්‍යයෙන් නිපන් ප්‍රථම සත්‍ය යැ.**

ජාතිය ප්‍රභව කොට ඇති **ජරා මරණ, ප්‍රථම සත්‍යයෙන් නිපන් ප්‍රථම සත්‍ය යැ යි** මෙ සේ මේ **භව චක්‍රය සත්‍ය ප්‍රභව** හෙයින් සුදුසු සේ දත යුතු යි.

(2) මේ භව චක්‍රයෙහි අවිද්‍යාව රූපාදි ආලම්බනයන්හි ධර්‍ම ස්වභාවය වැසී මෙන් සත්ත්වයන් මුලා **කෙරේ.** සංස්කාරයන් ගේ පහළ වීමට ද **ප්‍රත්‍යය වේ.**

එසේ ම **සංඛාර** ද සහජාත සංස්කාරයනුදු **රැස් කෙරේ.** විපාක විඤ්ඤාණයට **ප්‍රත්‍යය** ද **වේ.**

විඤ්ඤාණය ද ආලම්බන **විජානනය කෙරේ.** නාම-රූපයනට **ප්‍රත්‍යය** ද වේ.

නාම-රූප ද ඔවුනොවුන් හට **උපකාරකකම** වේ. ෂඩායතනයට **ප්‍රත්‍යය** ද වේ.

ෂඩායතනය ද තම තමන් විෂයක වූ රූපාලම්බනාදියෙහි පවතී. **ස්පර්ශයට ප්‍රත්‍යය** ද **වේ.**

ස්පර්ශය ද අරමුණ **ස්පර්ශ කෙරේ.** වේදනාවට ප්‍රත්‍යය ද වේ.

වේදනාව ද ආලම්බන රසය **අනුභව කෙරේ.** තෘෂ්ණාවට **ප්‍රත්‍යය** ද **වේ.**

තෘෂ්ණාව ද ඇලිය යුතු ධර්මයන්හි ම **ඇලේ.** **උපාදානයට ප්‍රත්‍යය** ද වේ.

උපාදානය ද උපාදානයට ගෝචර ධර්මයන් **දැඩි කොට ගැනීම කෙරේ.** **භවයට ප්‍රත්‍යය** ද වේ.

භවය ද නානා (පඤ්චවිධ) ගතීන්හි **වික්ෂේපය කරයි.** **ජාතියට ප්‍රත්‍යය** ද වේ.

ජාතිය ද **සකල්ලකනුදු උපදව යි.** (ඒ ස්කන්ධයන් අභිනව ප්‍රාදුර්භාව වශයෙන් පවත්නා හෙයිනි.) **ජරා-මරණයට ප්‍රත්‍යය** ද වේ.

ජරා-මරණ ද ස්කන්ධයන් ගේ මිහි කිරීමෙන් බිඳීම් භාවයෙහි **සිටී.** භවානන්තරයෙහි **පහළ වීමට ප්‍රත්‍යය** ද වේ. (ශොකාදීන්ට කාරණ වන හෙයිනි.) මෙසේ සියලු පදයන්හි **දෙ පරිද්දකින් පවත්නා කෘත්‍ය වශයෙන්** මේ භව චක්‍රය සුදුසු පරිදි දත යුතුයි.

(3) **දුෂ්ටි වාරණ වශයෙන්:-** මේ භව චක්‍රයෙහි **"අවිජ්ජා-පච්චයා සඞ්ඛාරා"** යන්නෙහි සංස්කාර ප්‍රත්‍යයොත්පන්නය යි දැක්වූ හෙයින් **ඊශ්වරාදි කාරකයෙක් ඇත යන දෘෂ්ටිය වලක්වා යි.**

සංඛාර පච්චයා විඤ්ඤාණං යන්නෙන් භවයෙන් භවයට ආත්ම සංක්‍රමණය වන්නේ ය යන **මිථ්‍යා දෘෂ්ටිය වලක්වයි.**

විඤ්ඤාණ පච්චයා නාම-රූපං යන්නෙන් ආත්මය සි කල්පනා කරන ලද වස්තූන් නාම රූපය යි හෙද දක්නා හෙයින් **සන සංඥාව වළක්වයි.**

නාම-රූප පච්චයා සළායතනං යනාදීන් **ආත්මය** ද දනී, සපශී කෙරේ, විඳී, ආශා කෙරේ, දැඩිවෑ අල්වා ගනී, වෙයි, උපදී, දිරයි, මියෙයි, යනාදි දශීන වළකයි. (ආදි ශබ්දයෙන් ශොකාදිය ද ගැනේ.) මෙ සේ මිථ්‍යා දෘෂ්ටි වළකන හෙයින් ද මේ **භව චක්‍රය සුදුසු පරිදි දත යුතු යි.**

(4) **උපමා වශයෙන්** - **අවිද්‍යාව** කර්‍මාභාවාදි **සාමාන්‍ය ලක්ෂණ වශයෙන්** ද, අනිත්‍යාදි සාමාන්‍ය ලක්ෂණ වශයෙන් ද ඒ ඒ ධර්‍මයන් නො දක්නා හෙයින් **අන්ධයකු වැනි ය**

අවිද්‍යා ප්‍රත්‍යයයෙන් වන සංස්කාර (දුර්ගතිපතනියට හෙතු වන හෙයින්) **අන්ධයා ගේ පැකිලීම මෙනි.**

සංස්කාර ප්‍රත්‍යයයෙන් වන විඤ්ඤාණය (භවාන්තරයට පමුණුවන හෙයින්) **පැකුළුණහු ගේ හීම මෙනි.**

විඤ්ඤාන ප්‍රත්‍යයයෙන් වන නාම-රූප වැටුණහු ගේ ගඩ-හට ගැනීම මෙනි.

නාම-රූප ප්‍රත්‍යයයෙන් වන ෂඩායතන ගඩ පැසවා බිඳීමට හවගත් බිබිලි **මෙනි.**

ෂඩායතන ප්‍රත්‍යයයෙන් වන ස්පර්ශය ගඩ හවගත් බිබිලි **ඇටීම මෙනි.**

ස්පර්ශ ප්‍රත්‍යයයෙන් වන වේදනා ඝට්ටනයෙන් හටගත් **දුක මෙනි.**

වේදනාවෙන් වන තෘෂ්ණාව දුකට **ප්‍රතීකාර කැමැත්ත මෙනි.**

තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් වන උපාදාන ප්‍රතීකාර කැමැත්තෙන් **අසක්ප්‍රාය ප්‍රතීකාර ලැබීම මෙනි.**

උපාදාන ප්‍රත්‍යයයෙන් වන භවය ගත්තා ලද නො සැප **බෙහෙත් ආලෙපය මෙනි.**

භව ප්‍රත්‍යයයෙන් වන ජාතිය නො සැප ආලේපනයෙන් **ගඩ විකාර පහළවීම මෙනි.**

ජාති ප්‍රත්‍යයයෙන් වන ජරා-මරණ ඉදිමීම්, පූයාභව ගැනීම් ආදියෙන් ගඩ බිඳීම මෙනි.

තවද **උපමාවෙකි:-** මෙහි අවිද්‍යාව 'දුඃඛාදිය දැනීමට නොපිළිපැදීම ය, වරදවා පිළිපැදීම ය, යන මෙයින් සත්ත්වයන් මැඩ-පියන හෙයින් **ඇසෙහි පටලයක් මෙනි. ඒ අවිද්‍යාවෙන්** මඩනා ලද බාලයා පුනර්භවය ගෙන දෙන සංස්කාරයන් ගෙන් තමා ම පෙළේ. **කොෂකාර කෘමියා** (පට පණුවා) තමා ම කළ **කොෂයෙහි වෙළෙන්නාක් මෙනි.**

සංස්කාරයෙන් උපසන්ධිභූතය ලද **විඤ්ඤාණය** පඤ්චවිධ ගතියෙහි පිහිට ලබා. මහ ඇමතියන්හු අරක් ගන්නා ලද **රාජ කුමාරයකු රාජ්‍යයෙහි පිහිටන්නාක් මෙනි.**

උත්පත්තියට නිමිති වූ කර්මාදි ආලම්බනයෙන් පරිකල්පිත හෙයින් **විඤ්ඤාණය** ප්‍රතිසන්ධියෙහි දෙව - මනුෂ්‍යාදි අනෙක ප්‍රකාර නාම-රූප නිපදවයි. **මායාකාරයා මවා පාන්නාක් මෙනි.**

නාම-රූපයෙහි පිහිටි **ෂඩායතනය** වැඩීමට - පත් පිරීමට මහත් බවට පැමිණේ. **මනා බිමෙහ පිහිටි වන ලැහැබක් මෙනි.**

ආයතනයන් ගේ ගැටීමෙන් **සඵර්ශය උපදී.** ගිනි ගාතා දඬු ගැටීමෙන් වන ගින්න මෙනි.

සඵර්ශයෙන් පහළහුට **වේදනා** වේ. **ගින්නෙන් පහරන ලද්දහුට දුඃඛය මෙනි.**

විඳින්නාහට **තෘෂ්ණාව** වැඩේ. **ලුණු දිය බොන්නහුට පිපාසය මෙනි.** තෘෂ්ණා ඇත්තේ භවයෙහි අභිලාෂ කෙරේ. **පිපාසා ඇත්තහුට දැනෙහි දිසිය මෙනි.** (ඒ තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් ගැනීම ඔහු ගේ උපාදානය යි.) **උපාදානයෙන් භවය ගනී.** ආමිස ලෝභයෙන් බිලිය ගන්නා මත්ස්‍යයා **මෙනි.**

භවය ඇති කල **ජාතිය** වේ. **බීජය ඇති කල අංකුරය මෙනි.**

උපන්නහුට අවශ්‍යයෙන් **ජරා-මරණ** වේ. **හටගත් වෘක්ෂයා ගේ වැඩීම මෙනි.**

මෙසේ **උපමායෙනුදු** සුදුසු පරිදි **මේ භවචක්‍රය** දතයුතු.

---

(5) **ගම්භීර හෙයින්:-** භාග්‍යවතුන් වහන්සේ පටිච්ච සමුප්පාදය, අජ්ජ- ධම්ම- දේශනා- ප්‍රතිවේධ වශයෙන් ගැඹුරු-බව් නිසා **"ගම්භීරොවායං ආනන්ද පටිච්චසමුප්පාදෝ, ගම්භීරාවභාසෝ ච"*** "ආනන්දය, මේ පටිච්චසමුප්පාදය ගැඹුරු යැ.

---

* දී: නි: සීලක්ඛන්ධවග්ග

ගැඹුරුවැ මැ වැටහේ" ය යි වදාළ සේක. මේ සේ ගම්භීර භෙද වශයෙන් ද **භව චක්‍රය** දත යුතු යි.

විඤ්ඤාණ:- ජාති ප්‍රත්‍යයයෙන් ජරා - මරණ නො වන්නේ නො වේ. වන්නේ මැ යි. ජාතිය හැර අනිකකින් ජරා-මරණ නො වේ. මෙ සේ ජාති ප්‍රත්‍යයයෙන් වන්නේ ය යි (මෙ සේ ජාති ප්‍රත්‍යයයෙන් වන බව) දත නො හැකි බැවින් ජරා-මරණ ප්‍රත්‍යයයෙන් හට ගෙන ඒ හා එක්වැ පැවැත ඒ අනුවැ ම මතු මත්තෙහි පැමිණීම් සඞ්ඛ්‍යාත තත්ත්වය අවබොධ කිරීමට දුෂ්කර හෙයින් ගැඹුරු යැ. එසේ ම ජාතිය ගේ භව ප්‍රත්‍යයයෙන් හටගැනීම් ආදි අර්ථය ද ගම්භීර යැ.

(මෙහි ජාති ප්‍රත්‍යයයෙන් ජරා-මරණ නො වන්නේ නො-වේ යනුයෙන් **අවිතථාර්ථය** දක්ව යි. ජාතිය හැර අනිකකින් ජරා-මරණ නො වේ යනුවෙන් **අනන්‍යථාර්ථය** දක්ව යි. මෙ සේ ජාති ප්‍රත්‍යයයෙන් වන්නේ යැ යන්නෙන් **තථාර්ථය** දක්ව යි.

එහෙයින් ප්‍රත්‍යය ධර්ම ප්‍රත්‍යයොත්පන්න ධර්මයනට ප්‍රත්‍යය භාවයෙහි **තථ, අවිතථ, අනඤ්ඤථ** වේ ද? එසේ ම ප්‍රත්‍ය-යොත්පන්න ධර්ම ද ප්‍රත්‍යය ධර්ම ඇති කල්හි ම වන බව දක්වයි. සෙස්සෙහි ද මෙ සේ මැ යි.)

එසේ ම ජාතිය භව ප්‍රත්‍යයයෙන් සම්භූත සමුදාගතාර්ථය ද, - පෙ - සංස්කාර අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සම්භූත සමුදාගතාර්ථය ද ගැඹුරු යැ.

මෙ සේ මේ **භව චක්‍රය** අර්ථ හෙයින් ගැඹුරු යැ. මේ මෙහි අර්ථ ගම්භීරතා යි.

හේතු - ඵලය අර්ථය යි කියනු ලැබේ.

එයින් වදාළහ. **"හෙතුඵලෙ ඤාණං අත්ථපටිසම්භිදා"*** හේතු-ඵලයෙහි ඤාණය අර්ථ ප්‍රතිසම්භිදා යැ.

යම් ආකාරයකින් යම් අවස්ථාවෙකින් සිටි අවිද්‍යාව ඒ ඒ සංස්කාරයනට ප්‍රත්‍යය වේ නම් ඒ ආකාර දුරවබොධ බැවින් අවිද්‍යාව ගේ සංස්කාරයනට ප්‍රත්‍යයාර්ථය ගම්භීර යැ. සංස්කාරාදීන් ගේ ද විඤ්ඤාණාදියට ප්‍රත්‍යයාර්ථභාවය ද එසේ මැයි. (අවස්ථා විශෙෂවත් ධර්මයෝ ඒ ඒ අවස්ථා විශෙෂයෙන් යුක්තවැ ඒ ඒ කෘත්‍යයන් සාධන්නට සමර්ථ වෙත් යනු සත්‍ය යි.)

---

* වි: ප: පටිසම්භිදාවිභඞ්ග

එහෙයින් මේ භව චක්‍රය **ධම්ම ගම්භීර යැ.**

හේතු ඵල **ධම්ම** යනු නම්. එහෙයින් වදාළහ. **"හෙතුමෙහි ඤාණං ධම්මපටිසම්භිදා"*** හේතුවෙහි පවත්නා ඥාණ **ධම්ම-පටිසම්භිදා යැ.**

මේ මෙහි **ධම්ම ගම්භීරතා යැ.**

දෙශනා ගම්භීරතාව :- ඒ භව චක්‍රය විනෙය ජනයන්-ගේ චතුඃසත්‍යාවබෝධයට අනුරූප සේ ඒ ඒ කාරණයෙන් අනුලෝම - ප්‍රතිලෝමාදි ඒ ඒ ප්‍රකාරයෙන් පැවැත් විය යුතු හෙයින් **දෙශනාව ද ගම්භීර යැ.** ඒ දෙශනා ප්‍රකාරයෙහි **සම්මෝහනාඤ්ඤය** විනා අන්‍ය ඥානයෙක් පිහිට නො ලබා.

එහෙයින් ම මේ භව චක්‍රය **අනුලෝමයෙන්** (ආදියෙහි පවත් අන්තය තෙක්) ද, කිසියම් **සූත්‍රයෙකැ ප්‍රතිලෝමයෙන්** (අන්ත යෙහි පවත් ආදිය තෙක්) ද කිසියම් **සූත්‍රයෙකැ අනුලෝම ප්‍රතිලෝමයෙන් ද,** කිසි **සූත්‍රයෙකැ** මැද පවත් **අනුලෝම දශයෙන් ද, ප්‍රතිලෝම වශයෙන් ද, කිසි සූත්‍රයෙකැ නිදාන චතුඃ සංක්ෂෙප කොට** (ආදියෙහි පවත් අනුලෝම දෙශනා වෙන් ද, අන්තයෙහි පවත් ගෙන ප්‍රතිලෝම දෙශනා වෙන්) ද **කිසි සූත්‍රයෙකැ විසඥි නිදාන සංක්ෂෙප කොට ද, "ඉමෙ චත්තාරෙ ආහාරා කිං නිදානා"**† යනාදීන් **මධ්‍යයෙහි පටන් ප්‍රතිලෝම දෙශනාවෙහි ද, "චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං තීණිපි සඞ්ගති එවෙසා එවස-පච්චයා වෙදනා"**‡ යනාදීන් මධ්‍යයෙහි පටන් අනුලෝම දෙශනා-වෙන් ද, කිසි සූත්‍රයෙකැ එකසඥි විසංක්ෂෙප කොට ද **"සංයොජනියෙසු හිකඛවෙ ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතා තණ්හා පවඩ්ඪති තණ්හා පච්චයා උපාදානං"**? යනාදීන් දෙශනා කරන ලදී.

මෙ සේ මේ භව චක්‍රය **දෙශනා වශයෙන් ද ගම්භීර යැ.**

තවද මේ **භව චක්‍රයෙහි අවිද්‍යාදීන්** ගේ යම් සවභාවයෙක් වේ නම් යම් සවභාවයකින් අවිද්‍යාදිය අවිපරීත කොට සවිලක්ෂණ වශයෙන් ප්‍රතිවෙධ කරන ලද්දේ වේ නම්, අවිද්‍යාදීන් ගේ අශුන අදශීනාදි ඒ සවභාවය නුවණින් අන්‍යයන් විසින් නො බැස්ස හැකි බැවින් **ගැඹුරු යැ.** මෙ සේ මේ භව චක්‍රය **ප්‍රතිවෙධ වශයෙන් ගම්භීර යැ.**

---

* වි: ප: පටිසම්භිදා විභඞ්ග

† සං: නි: ආහාරවග්ග

‡ සං: නි: නිදානවග්ග

? සං: නි: නිදානසංයුත්ත

ඒ මෙසේ යි:- (1) **මේ භව චක්‍රයෙහි මේ අවිද්‍යාව ශූන්‍යයට ප්‍රතිපක්ෂ** භාවය වූ **අඤ්ඤාණාජ්ඣය,** අරමුණු ප්‍රත්‍යක්ෂ කිරීමට ප්‍රතිපක්ෂ වූ **අදස්සනාජ්ඣය,** සත්‍යයන් තතු සේ ප්‍රතිවෙධ කිරීමට බාධක සභාවය වූ **සත්‍යයන් ගේ අසම්පතිවෙධාජ්ඣය** යන **ත්‍රිවිධ අජ්ඣයෙන් ගම්භීර යැ.**

(මේ කරුණෙන් **අඤ්ඤාණ නම්, මේ කරුණෙන් අදස්සන නම්,** මේ කරුණෙන් **සත්‍යාසම්පතිවෙධ** නමැ යි ඒ ත්‍රිවිධ සභාවයන් දුෂ්ප්‍රතිවෙධ බැවින් **ගම්භීර යැ.** මෙ නමින් ම මතුයෙහි ද යොදන්නේ යි යනු සත්‍ය යි.)

(2) **සංස්කාරයන් ගේ** කෘතීයන් සකස් කරන බව ය. පූර්ව භාගයෙහි දැනැදී වූ වස්තූන් පිළිලෙළ කරන බව ය. අපුණ්‍යාභි සංස්කාර වශයෙන් රාගයට අනුකූල බව ය. පුණ්‍යාභිසංස්කාර වශයෙන් රාගයට ප්‍රතිපක්ෂ බව ය යන මේ **අජ්ඣය ගම්භීර යැ.**

(රාගයට අප්‍රතිපක්ෂ බැවින් රාගප්‍රවර්ධක බැවින් සියලු අපුණ්‍යාභිසංස්කාරය ම රාග නම් වේ. ඉතරය තත් ප්‍රතිපක්ෂ බැවින් විරාගය යි දතයුතු.)

(3) **විඤ්ඤාණයා ගේ** ආත්ම සභාවයෙන් ශූන්‍ය බව ය, අව්‍යාපාරාපී ය, අසංක්‍රමණාපී ය ප්‍රතිසන්ධි වශයෙන් පහළ වන බව ය යන **මේ අජ්ඣය ගම්භීර යැ.**

(4) **නාම රූපයා ගේ** එක්වැ ඉපදීම යැ, අමිශ්‍රවැ පැවැත්ම ය නාමයන් නාමයත් හා එක්වැ මිශ්‍රව පැවැත්ම ය නාමය අරමුණෙහි නැමෙන බව ය. රූපය විකාරයට පැමිණෙන බව ය යන මේ **අජ්ඣය ගම්භීර යැ**

(5) **ෂඩායතනයා ගේ** දර්ශනාදියෙහි අධිපති බව ය, ලොක බව ය, ද්වාර බව ය, ක්ෂෙත්‍ර බව ය, විෂයී බව ය යන **මේ අජ්ඣය ගම්භීර යැ.**

(6) **ස්පර්ශයා ගේ**- අරමුණු ස්පර්ශ කිරීම් බව ය, අරමුණෙහි ගැටෙන බව ය, වස්තු ආලම්බන විඥානයන් එක්වන බව ය වස්තු ආලම්බන විඥානයන් එළඹ සිටින බව ය යන මේ **අජ්ඣය ගම්භීර යැ.**

(7) **වේදනාව ගේ**- අරමුණු රස විඳීම කෘත්‍ය කොට ඇති බව ය, සැප දුක්හි මැදහත් බව ය, සත්ත්වයකු නො වන බව ය, අරමුණු රස විඳීම ලක්ෂණ කොට ඇති බව ය යන මේ **අජ්ඣය ගම්භීර යැ.**

(8) **තෘෂ්ණාව ගේ**- අරමුණෙහි සතුටු වන බව ය, අරමුණ ගිල ගන්නාක් මෙන් තදින් එහි ලොල් වන බව ය, අරමුණ කරා යන බව ය, අරමුණෙහි වෙළෙන බව ය, ගහක් මෙන් දිගට යන බව ය, පවස් ඇති බව ය, සමුද්‍රය මෙන් පිරවිය නො හැකි බව ය යන මේ **අර්ථය හම්ගිර යෑ.**

(9) **උපාදානයා ගේ**- අරමුණ දැඩිවැ ගන්නා බව ය, (කාමෝපාදානය) කැමැතිවීම් වශයෙන් ගන්නා බව ය, (දිට්ඨි-උපාදාන ය) නිත්‍යාදි වශයෙන් ගන්නා බව ය, (සීලබ්බතූපාදානය) ආත්මාදි වශයෙන් ගන්නා බව ය. (අත්තවාදූපාදානය) ගත් අරමුණ ඉක්මවාලිය නො හැකි බව ය යන මේ **අර්ථය හම්ගිර ය.**

(10) **භවයා ගේ**- පුඤ් භාගයෙහි දානාදි වසතු සම්පාදනය කිරීම් වශයෙන් කම් රැස් කරන බව ය, කම් සකස් කොට පිළියෙළ කරන බව ය, **යොනි- ගති- ස්ථිති- සත්ත්වාවාසයන්හි** බහා ලන බව ය යන මේ **අර්ථය හම්ගිර යෑ**

(11) **ජාතිය ගේ**- සඤ්ඤයන් ගේ (අපරිපූර්ණභවයෙන්) පහළ වන බව ය, පරිපූර්ණභවයෙන් ආයතනයන් ගේ) උපදනා බව ය, මවු කුස වදනාක් මෙන් උපදනා බව ය, **සඤ්ඤයන් ගේ** පහළවීම් වශයෙන් උපදනා බව ය, ස්කන්ධයන් ගේ ප්‍රකට සේ පහළ වන බව ය යන මේ **අර්ථය හම්ගිර යෑ.**

(12) **ජරා-මරණයා ගේ**- ක්ෂය බව ය, ව්‍යය බව ය, බිඳෙන බව ය, **අන්‍යථාත්වයට** පැමිණෙන බව ය, යන මේ **අර්ථය හම්ගිර යෑ.**

මේ භව චක්‍රයෙහි ප්‍රතිවෙධ ඵලයෙන් ගැඹුරු බව සි.

---

(6) **නය භෙදයෙන්**

(1) සමාන භාවය වූ **එකත්ත නය යෑ**

(2) අසමාන භාවය වූ **නානත්ත නය යෑ**

(3) නිරුත්සාහ භාවය වූ **අව්‍යාපාර නය යෑ**

(4) අවිද්‍යාදි ධර්මයන් ගේ මේ සවභාවය සි කියන ලද **එවං ධම්මතා නය යෑ** යි අර්ථ නය සතරෙකි.

මෙ සේ මේ භව චක්‍රය නය භෙදයෙන් ද සුදුසු පරිදි දතයුතු.

(1) ඒ චතුර්විධ නය අතුරින් එකත්ව නය මෙ සේ යි. බීජයේ අඞ්කුර- පත්‍ර- සකඨ- ශාඛා- පලාශාදී භාවයෙන් වෘක්ෂ භාවයට පැමිණීම මෙන්, **'අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාරය වේ' 'සංස්කාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණය වේ'** යැ යන මෙ පරිද්දෙන් සන්තතිය නො සිඳ පැවැත් ම **ඒකත්ත නය යැ.**

විස්තර:- ඒ එකත්ව නය අවිපරීත කොට දක්වන්නේ හේතු-ඵල ධර්මයන් ගේ ගැළපීමෙන් හේතු - ඵල පරම්පරාවේ නො සිඳ පැවැත් ම ඇති සැටි අවබොධ කරන හෙයින් **උච්ඡේද දෘෂ්ටිය** සිඳී.

ඒ සන්තතිය ගේ නො සිඳ පැවැත් ම විපරීත කොට දක්නේ හේතු - ඵල ධර්මයන් ගේ ගැළපීමෙන් වන්නා වූ හේතු - ඵල පරම්පරාව නො සිඳ පැවැත් ම හේතු - ඵල භෙදයක් නො කොට එකත්වය යි ගැනීමෙන් **ශාශ්වත දෘෂ්ටිය දැඩි කොට ගනී.**

(2) අවිද්‍යාදීන් ගේ තම - තමා පිළිබඳ **ලක්ෂණ** විනිශ්චය කොට දැකීම **නානාත්ව නය නම්.**

විස්තර:- එය ලක්ෂණ ව්‍යවස්ථානයෙන් අවිපරීත කොට දක්නේ අනිත්‍ය ධර්මයන් ගේ ඉපැත්ම දක්නා හෙයින් **ශාශ්වත දෘෂ්ටිය** හරී.

ඒ **ලක්ෂණ** ව්‍යවස්ථානය විපරීත කොට දක්නේ එකම සන්තානයෙකැ (පරම්පරාවෙකැ) පතිත වූ හෙතු - ඵල ධර්ම සමූහයක ගේ භින්න සන්තානයෙකැ පැවැති හෙතු-ඵල පරම්පරාවක් මෙන් නානාත්වයෙන් ගන්නා හෙයින් **උච්ඡේද දෘෂ්ටිය** දැඩි කොට ගනී.

(3) සංස්කාර 'මා විසින් ඉපද විය යුතු' යැ යි අවිද්‍යාවට හෝ **විඤ්ඤාණ** 'අප විසින් ඉපදවිය යුතු' යැ යි සංස්කාරයනට හෝ මෙ සේ මේ ආදී ව්‍යාපාරයක් (උත්සාහයක්) නැති බව **අව්‍යාපාර නය** නම්.

විස්තර:- එය අවිපරීත කොට දක්නේ ඊශ්වරාදි කාරකයකු අවිද්‍යමාන බව අවබොධ කිරීමෙන් **ආත්ම (නිර්මාණ) දෘෂ්ටිය දුරු කෙරේ.** ඒ අව්‍යාපාර නය විපරීත කොට දක්නේ උත්සාහය නැති කල්හි දු අවිද්‍යාදි සවභාවයම වූ නියම වශයෙන් සිදුධ යම් හේතු සවභාවයෙක් වේ නම් ඒ හේතු භාවය වටහා නො ගැනීමෙන් **අක්‍රිය දෘෂ්ටිය දැඩි කොට ගනී.**

(4) **එවංධම්මතා නය:-** **කිරි** ආදිය හේතු කොට ගෙන දී ආදී ඵලය ලැබීම වන්නාක් මෙන් **අවිද්‍යාදී** ප්‍රත්‍යයන් හෙතු කොට **සංඛාරාදි** ඵලයන් ගේ ලැබීම වේ. සංස්කාරාදීන් විනා අන්‍ය ඵලයන් ගේ ලැබීම නො වේය යි මෙසේ වූයේ **එවං ධම්මතා නය** නම් වේ.

එවංධම්මතා නය අවිපරීත කොට දක්නේ ප්‍රත්‍යයට අනුරූප පරිද්දෙන් ඵලය ඇති සේ අවබොධ කරන හෙයින් **අහේතුක දෘෂ්ටිය ද, අනිය දෘෂ්ටිය ද** බැහැර කෙරේ.

ඒ විපරීත කොට දක්නේ ප්‍රත්‍යයට අනුරූප සේ ඵල-ප්‍රවෘත්තිය වටහා නො ගෙන අනියම් හේතුවකින් අනියම් ඵල-යක් නො වීම වටහා නො ගැනීමෙන් **අහෙතුක දෘෂ්ටිය හා නියති වාදය** දුනි කොට ගනී.

මෙ සේ මේ **භව චක්‍රය** වේ.

මේ **භව චක්‍රය** ඉතා ගැඹුරු හෙයින් නුවණින් බැස ගත නො හේ. නානා නයින් ගහණ හෙයින් ඉක්ම වීමට දුෂ්කර ය. සමාධි නැමැති උතුම් හන ගලෙහි මනාව මුවහත් කළ මාඝාතන නැමැති කඩුවෙන් හෙන සක් මඬලක් මෙන් නිතොර මැඩ පියන්නා වූ **භව චක්‍රය** නො පළා සසර බිය සිහිනෙනුදු ඉක්මෑ වූ කිසිවෙක් නැති.

බුදුහු මෙ සේ වදළහ.

"ගම්භීරොවායං ආනන්ද! පටිච්චසමුප්පාදෝ, ගම්භීරාව-භාසෝ ච එතස්සවානන්ද ධම්මස්ස අනනුබෝධා අප්පටිවෙධා එවමයං පජා තන්තාකුලකජාතා, ගුළා ගුණ්ඨිකා ජාතා, මුඤ්ජබබජ භූතා, අපායං, දුග්ගතිං, විනි-පාතං, සංසාරං නාතිවත්තති"* 'ආනන්දය! මේ පටිච්ච-සමුප්පාද ධර්මය ගැඹුරු ය. ගැඹුරුව ම වැටහෙන්නේ ය. ආනන්දය! මේ පටිච්චසමුප්පාද ධර්මය නො දැනීමෙන් අවබොධ නො කිරීමෙන්, මෙ සේ මේ ප්‍රජාව අවුල් වූ සූවටක් බදුවැ, වඩු කිරිල්ලක ගේ කැදැල්ලක් බදු වැ, මුදු තණ - බබුස්තණ බදුවැ දුකට ගති වූ ස්වභාවැ පතිත වන අපාය ද, සසර ද, නො ඉක්ම වයි.'

---

* දී: නි: සීලඛන්ධවග්ග

එහෙයින් තමිහට ද, මෙරමා හට ද, ඒත වැඩ පිණිස පිළිපන්නේ සෙසු කිස තබා **ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයෙහි** වැර වඩන්නේ ය.

"මේ සසුන නැණැතියෝ - ගැඹුරු පිළිසමුපැනී*
පිහිට ලබනසෙ නිරතුරු - සිහියෙන් වැර වඩත්වා"

හුදී ජනයා ගේ ප්‍රසාද සඳහා කළ විශුද්ධිමාර්ගයෙහි විදර්ශනා-භාවනාධිකාරයෙහි **ප්‍රඥාභූමි නිර්දේශ නාම** සතළොස් වන පරිච්ඡේදය යි.

---

* පටිච්චසමුප්පාදයෙහි

18. දිට්ඨි විසුද්ධි නිද්දේසය

මේ විදර්ශනාවට භූමි වූ (සඝාඩ්ඛායතනාදී) ධර්මයන්හි වාවොදහත කිරීම් වශයෙන් **උද්ග්‍රහණයෙන් ද,** අර්ථාවබෝධය පිණිස නැවැතැ-නැවැතැ විචාරීමෙන් **පරිපුච්ඡා** වශයෙන් ද, ශ්‍රුතමය ඥානය උපදවා **ශීල විශුද්ධිය, චිත්ත විශුද්ධියද** යි මූලික විශුද්ධි දෙක සම්පාදනය කළ යුතුය යි (මා විසින්) පෙර කියන ලදී.

එහි සුපරිශුද්ධ වූ **ප්‍රාතිමෝක්ෂ සංවරාදී** චතුර්විධ පාරිශුද්ධි ශීලය **ශීල විශුද්ධිය යැ.** එ ද **ශීල නිද්දේශයෙහි** විස්තර කරන ලද්දේ මැයි.

උපචාර සමාධි සහිත අෂ්ට සමාපත්ති **චිත්ත විශුද්ධිය යැ.** හෙද චිත්ත ශීර්ෂයෙන් **සමාධි නිද්දේශයෙහි** සවිස්තාරයෙන් විස්තර කරන ලද්දේම ය.

එහෙයින් **ශීල විසුද්ධි - චිත්ත විසුද්ධි** දෙක එහි විස්තර කළ නයින්ම දත යුතුය.

දිට්ඨි විසුද්ධිය,
කඞ්ඛාවිතරණ විසුද්ධිය,
මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිය,
පටිපදා ඤාණදස්සන විසුද්ධිය,

ඤාණදස්සන විසුද්ධිය යන මේ **පඤ්ච විසුද්ධිය** ශරීරය යි; යමක් ගැන කියන ලද ද, **පඤ්චඋපාදානක්ඛන්ධ** (**පටිච්චසමුප්පාද**) **නිද්දේශයට** අනතුරුවැ දැන් එය මෙහි දක්වනු ලැබේ.

ඒ විශුද්ධීන් අතුරින් නාම - රූපයන් ගේ ඇති සැටි දැකීම **දිට්ඨිවිසුද්ධිය යි.** (නාම - රූපයන් බෙදා තතු සේ දැකීමෙන් දෙ සැට මිථ්‍යා දෘෂ්ටියෙන් මිදෙන හෙයින් ඒ **දිට්ඨිවිසුද්ධිය යි** කියනු ලැබේ.) ඒ සම්පාදනය කරනු කැමැති සමථයානික (සඋපචාර අෂ්ට සමාපත්තියෙහි පිහිටා විදර්ශනා වඩනු කැමැති) යොගාවචරයා විසින් පළමු කොට නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානය හැර සෙසු රූපාවචර - අරූපාවචර ධ්‍යානයන් අතුරින් එක්තරා ධ්‍යානයකින් නැගී **චිත්තාදී** ඒ ඒ ධ්‍යානාඞ්ග හා ඒ හා යෙදුණු **ඵස්සාදී** ධර්මයන් ද **ලක්ඛණ- රස- පච්චුපට්ඨාන-පදට්ඨාන** වශයෙන් පිරිසිඳ ගත යුතුයි.

එසේ පිරිසිඳ ගෙන මේ සියලු ධ්‍යානාඞ්ග හා සම්ප්‍රයුක්ත ධර්මයන් ද අරමුණට අභිමුඛවැ **නැමෙන නෙයින් නාමය යි**

ව්‍යවස්ථා විනිශ්චය) කටයුතු යි. (රූපය හා **මිශ්‍ර නොකොට** සිටෙන්නේ නැඹිය යුතුයි) අනතුරුවා, පුරුෂයෙක් ඇතුළු ගෙයි සිටියකු දැක ලුහුබැඳ යන්නේ සිටියා ගේ වාසස්ථානය යම්සේ දක්නේ ද? එමෙන් මේ යොගාවචර තෙමේත් ඒ නාමය නුවණින් පරීක්ෂා කරනුයේ මේ නාමය කුමක් ඇසුරු කොට පවත්නේ දැයි නැවැතැ-නැවැතැ සොයනුයේ එයට නිශ්‍රය වූ **හෘදය රූපය** දකී.

ඉක්බිති හෘදය රූපයට නිශ්‍රය වූ **සතර මහා භූතයන් ද,** සතර මහා භූතයන්ට නිශ්‍රය වූ සෙසු සුවිසි **උපාදාය රූප ද** යි මෙ සේ අටවිසි රූපයන් නුවණින් දැක මේ සියලු රූප රූපපතය වන (විකාරයට පැමිණෙන) අර්ථයෙන් **රූපය** යි පරිග්‍රහ කෙරේ.

ඉක්බිති අරූපිණට නැමෙන ලක්ෂණය ඇත්තේ **නාමය** යි ද, රූපපත විකාරවීම් ලක්ෂණය ඇත්තේ **රූපය** යි ද, සැකෙවින් නාම-රූප දෙක විනිශ්චය කෙරේ.

(මෙසේ **අරූප** මුඛයෙන් සමථයානිකයා ගේ විදර්ශනාවට බැස ගැනීම දක්වා දැන් **රූප** මුඛයෙන් **ශුද්ධ විදර්ශනායානිකයා** දක්වන්නාහු මේ කියති.)

ශුද්ධ විදර්ශනායානිකයා හෝ මේ සමථයානිකයා පෙර චතු ධාතු ව්වත්ථානයේ කී 'ඝනබ්ධ ලක්ෂණය **පෘථිවී** ධාතු යැ' යනාදීන් ඒ ඒ ධාතු පරිග්‍රහ මුඛයන් අතුරින් එක්තරා මුඛයකින් සංක්ෂේපයෙන් හෝ විස්තාරයෙන් හෝ **පෘථිවී** ආදි සතර ධාතූන් පරිග්‍රහ කෙරේ.

අනතුරුවා ඒ යෝගියා හට ඇති සේ (තමා) කෘත්‍ය හා ලක්ෂණ වශයෙන් ධාතූන් ප්‍රකට වූ **කල්හි පළමු** කොට **කර්මජ** වශයෙන් හටගත් කේශයෙහි පඨවි ආදි ධාතු සතර ද, වණ්ණය, ගන්ධය, රසය, ඕජාවය, ජීවිතය, කායප්‍රසාදය යි මෙ සේ **කාය දශක** වශයෙන් රූප දශකයක් ද, **කර්ම සමුත්ථාන රූපයෙහි භාව රූපය** ඇති හෙයින් ඒ කෙශයෙහි ම **භාව දශක** වශයෙන් දශකයෙක් ද, ඒ කෙශයෙහි ම **ආහාර සමුත්ථාන** ශුද්ධාෂ්ටකය, **ඍතු සමුත්ථාන** ශුද්ධාෂ්ටකය, **චිත්ත සමුත්ථාන** ශුද්ධාෂ්ටකය ද යි අන්‍ය වූ **සුවිසි රූපයක් ද** යි මෙ සේ **කර්ම- චිත්ත- ඍතු- ආහාර** වශයෙන් හටගත් කේශාදී සුවිසි කොටස්හි එකක් පාසා කර්මජ රූප විස්සය. චිත්ත- ඍතු- ආහාරජ සුවිස්සද යි රූප සුසැලිස බැගින් (වේය යි මෙ සේ දෙතිස් කොටස් අතුරින්) මේ සුවිසි කොටසෙහි **එක් දහස් සපනසක්** (1056) රූප වේය යි ද දකී.

දෙතිස් කොටසින් ඉතිරි අට කොටස් අතුරින් **සෙද-අසසු- බෙල- සිඛිණාණිකා** යන සතරෙහි උතු-චිත්ත සමුඵාන ඔජඨමක රූප දෙක - දෙකදැ යි කොටස් සොළස බැගින් රූප 64 ක් ද, **උදරිය- කරීස- පුබබ- මුතත** යන සතර කොටසෙහි **උතුසමුඵාන** ශුඛාෂ්ටකය බැගින් කොටස් 32 ක් දැ යි රූප (64 + 32 = 96) සයානූවෙක් වේ.

මේ පළමු කොට **වතතිංසාකාරයෙහි** කොටස් ක්‍රමය යි. මෙ සේ දෙතිස් කොටසෙහි රූපයෝ (1056 + 96 = 1152 ක්) **එක් දහස් එක්සිය දෙපනසෙක්** වෙති. මේ දෙතිස් කොටස ප්‍රකට වූ කල්හි අනිකුදු **තෙජෝ** කොටස් සතර ද, **වායු** කොටස් සයද යි දසය ප්‍රකට වේ.

ඒ **තෙජෝ** කොටස් සතර අතුරින් **අසිත- පිත- ඛායිත-සායිත** ආහාර පැසවන **කම්ජ තෙජෝධාතු** කොටසෙහි පිහිටි ඔජඨමක රූපය ද, ජීවිතේන්ද්‍රියදැ යි **නව** රූප කෙනෙක් වෙති. එසේ ම **චිත්තජ ආශ්වාස - ප්‍රශ්වාස** කොටසෙහි ද, ඔජඨමක රූපය ද, ශබ්දයදැ යි රූප නවයෙක් පහළ වේ. සෙසු තෙජෝ කොටස් තුනෙහි ද, වායෝ කොටස් පසෙහිදැ යි යන අට කොටසෙහි ජීවිත නවක කලාපය හා චිත්ත- ඍතු- ආහාර තුනින් හවගත් ඔජඨමක රූප කලාප තුන - තුනදැ යි **තෙතිස් රූපයක්** ප්‍රකට වේ.

විඤ්ඤාර:- තවත- දිරවත- දවත තෙජෝ කොටස් තුන ද, උද්ධඞ්ගම වාතය, අධොගම වාතය, කුවජ්ඡය වාතය, කොට්ඨාසය වාතය, අඞ්ගමඞ්ගානුසාරී වාතය, යන මේ වාත කොටස් පසදැ යි (3 + 5=8) අට තෙජෝ- වායෝ ධාතු කොටස් අතුරින් එකක් පාසා නව කලාපයක් හා ඔජඨමක තුන-තුන බැගින් ගෙන සූවිස්සෙකැ යි (9 + 24 = 33) තෙතිස්-තෙතිස් රූප ප්‍රකට වේ. මෙ සේ ඒ දස කොටස්හි (18 + 264 = 282) **දෙසිය අසූ දෙකක්** රූපයෝ වෙති.

මෙසේ ඒ යෝගීනට විසතර වශයෙන් **පඨවි** කොටස් දෙවිස්ස යැ. ආපෝ කොටස් **දස යැ**. තෙජෝ කොටස් **සතර යැ**. වායෝ කොටස් **සය** දැ යි **දෙසාලිස්** (42) ආකාරයෙන් මේ භූත රූප **සතර** ද උපාදාය රූප **සුවිස්ස** ද, ප්‍රකට වූ කලැ චකඛු-සොත- ඝාන- ජිව්හා- කාය- හදයවත්ථු යන මේ **ෂඩ් වසතු** හා **චකඛු- සොත-ඝාන- ජිව්හා- කායවිඤ්ඤාර** යන **විඤ්ඤාර** දෙක දැ යි

මොවුන් ගේ වශයෙන් චක්ඛු- සොත- ඝාන- ජිව්හා- කාය **දසක පස** ද හදයවත්ථු **දසකයද** යි අන්‍ය වූ **සැට රූප** කෙනෙක් ප්‍රකට වෙති.

(මෙහි අවිනිභෝග **අට** යැ, ජීවිතින්ද්‍රිය යැ, චක්ඛුපසාදයද යි මේ **චක්ඛු දසකය යි. සොත දසකාදියෙහි** ද, සොතපසාදාදිය හා **වත්ථු දසකයෙහි** හදයවත්ථුව ද **විශෙෂ** යි.)

ඒ යෝගී තෙමේ යට කී සියලු රූප රූපපන **ලක්ඛණ**යෙන් එක්කොට මේ රූපය යි නුවණින් බල යි.

මෙසේ නුවණින් හන්නා ලද රූප ඇති ඒ යොගීහට චාර වශයෙන් අරූප ධර්ම ප්‍රකට වේ.

ඒ මෙසේ යි:- (1) දෙපස් විඤ්ඤාණ යැ. (සම්පටිච්ඡන වයය **පඤ්චවාරාවජ්ජනය** යන) මනොධාතු ත්‍රය යැ. සෙසු අට සැටක් මනොවිඤ්ඤාණ ධාතුද යි **එක් අසූවක් ලෞකික සිත්** වේ.

ඒ එක් අසූ සිත්හි අවිශෙෂයෙන් සහජාත **එසස යැ, වෙදනා යැ, සඤ්ඤා යැ, චෙතනා යැ, ජීවිතින්ද්‍රිය යැ, එකග්ගතා යැ, මනසිකාර යැ** යන මේ චෛතසික සත ප්‍රකට වේ.

විශෙෂ:- **ලොකොත්තර** මාර්ග - ඵල සිත් අට ඒ ශුද්ධ විදර්ශනායානික වූ හෝ සමථයානික වූ හෝ **යොගියාහට පරිග්‍රහ** නො වේ. අවබොධ කිරීම් වශයෙන් නො පැමිණ හෙයිනි. ඒ **යොගී** තෙමේ ඒ සියලු **අරූපී ධර්ම** නැමෙන ලක්ෂණයෙන් එක් කොට මේ **නාමය** යි දනී.

මෙසේ එක් යොගාවචරයෙක් **චතුධාතු** ව්‍යවස්ථාන කිරීම් වශයෙන් විස්තර සේ **නාම-රූප** දෙක විනිශ්චය කෙරේ.

(2) අනෙක් යොගාවචරයෙක් චක්ඛු ධාතු ආදී **අටළොස් ධාතු** වශයෙන් ව්‍යවස්ථා කෙරේ.

ඒ මෙසේ යි:- මේ සත්තෙහි මහණ තෙම මේ අත්බැව්හි **චක්ඛුධාතුව** ඇතැයි ද, -පෙ- **මනොධාතුව** ඇතැයි ද, ධාතූන් ආවජ්ජනා කොට (ලෝවැස්සා චක්ඛුයැ යි ගත්තා සුදු - කළු මණ්ඩලයෙන් විසිතුරු වූ දිගු-පුළුල් ඇස් වළෙහි තහර හුයින් බඳනා ලද මස් පිඬ නො ගෙන) **ඔකාසනිද්දේශයෙහි** උපාදාය රූපයන් අතුරෙහි කී ආකාර ඇති **චක්ඛුපසාද** රූපය **චක්ඛු ධාතුය** යි ව්‍යවස්ථා කෙරේ.

එයට නිශ්‍රය වූ **පඨවි- ආපෝ- තේජෝ- වායෝ** යන සතර **මහා භූතයන්** පිරිවර වූ **වණ්ණ- ගන්ධ- රස- ඔජා** යන සතර රූප ද, පරිපාලක වූ **ජීවිතින්ද්‍රිය රූපයද** යි මේ සහජාත රූප නවය ද, එහිම පිහිටි කාය දශකය ද, **ඉත්ථීභාව-පුරිසභාව** දශක අතුරින් **එකක්ද** යි මේ **විසි කම්ජ රූප ද, ආහාර-චිත්ත- උතු** යන ත්‍රිවිධ සමුට්ඨාන වශයෙන් ඔජට්ඨමක තුන බැගින් සුවිසි **අනුපාදින්නක (අකම්ජ)** රූපද යි මෙසේ (චක්ඛුපසාද රූපය හැර) සෙසු තෙපනස් (9 + 20 + 24 = 53) රූප වේ. ඒ සියලු රූපය **චක්ඛු ධාතුය** යි ව්‍යවස්ථා නො කෙරේ. **සොත ධාතු** ආදියෙහි ද මේ ක්‍රමය මැයි.

කාය ධාතුවෙහි ඒ තෙපනසින් චක්ඛුදශකාදීන් හැර සෙසු **තෙසාලිසක්** (9 + 10 + 24 = 43) රූප වේ. ඇතැම් **ආචාරයෝ කෙනෙක් කාය-විඤ්ඤත්ති** සමුට්ඨාන කලාප ශබ්දය සමග නවයක්-නවයක් කොට පන්සාලිසකැ යි යෙති. මෙසේ මේ පඤ්චප්‍රසාද යන් හා ඔවුනට ගොචර වූ **රූප- ශබ්ද- ගන්ධ- රස- ඵොට්ඨබ්බ** පසද යි යන රූප දශය **දශ ධාතුහු** වෙති. සෙසු සොළොස් **සුඛුම රූපයෝ ධම්ම ධාතු** නම් වෙත්.

චක්ඛුප්පසාදය නිසා රූපය අරමුණු කොට පැවැති සිත **චක්ඛුවිඤ්ඤාණ ධාතු** නමැයි මෙසේ දෙපස් (10) **විඤ්ඤාණය පඤ්චවිඤ්ඤාණ ධාතු** නම්.

මනොධාතුත්‍රයය එකම **මනොධාතුව යැ.** සෙසු අට සැවක් සිත් **මනොවිඤ්ඤාණ** ධාතු නම්. මේ සියලු එක් අසූ-වක් ලෞකික චිත්තයෝ **සත්ත විඤ්ඤාණ ධාතු** නම් වෙත්.

මේ එක් අසූවක් චිත්තයෙහි සම්ප්‍රයුක්ත වූ ඵස්සාදී චෛත-සිකයෝ ද **ධම්ම ධාතු** නම් වෙති යි මෙසේ මෙහි චක්ඛුරාදි පස හා **රූපාදී පසඳ** යි සම්පූර්ණ **රූප දසය** හා ධම්මධාතුවට අයත් ධම්මයන් අතුරින් සොළොස් **සුඛුම රූපද** යි යන අඩ **එකොළොස්** ධාතුහු **රූප නම් වෙති.** (**ධම්මධාතු** සඞ්ඛ්‍යාත **ධම්මාලම්බනයට** අයත් දෙපනස් **චෛතසික** හා **නිබ්බාණය** නාම නෙයින් මෙහි නො ගැනේ.)

චක්ඛු- සොත- ඝාණ- ජිව්හා- කාය විඤ්ඤාණ ධාතු ය, මනො ධාතු ය, මනොවිඤ්ඤාණ ධාතු ය යන **සත** හා **ධම්ම-ධාතුවෙන්** අඩක් වූ **දෙපනස් චෛතසිකය, නිබ්බාණය** යන මේ අඩකින් අවක් වූ **නාම ධාතුද** යි මෙසේ අවලොස් ධාතු වශයෙන් **නාම-රූප** විනිශ්චය කෙරේ.

(3) අනෙක් යොගාවචරයෙක් **මාදශ ආයතන** වශයෙන් **නාම-රූප** විනිශ්චය කෙරේ.

ඒ මෙසේ යි:- **චක්ඛු ධාතුවෙහි** යට කී සේ **තෙපනස්** රූප හැර පිහා **චක්ඛුප්පසාද** මාත්‍රය ම **චක්ඛායතනයැ යි** ව්‍යවස්ථා කෙරේ. එහි කී තයින් ම සොත- ඝාණ- ජිවහා- කාය ධාතූන් චක්ඛු- සොත- ඝාණ- ජිවහා- කායායතන වශයෙන් ද, ඔවුන්ට විෂය වූ රූපාදිය රූප- ශබ්ද- ගන්ධ- රස- සප්‍රෂ්ටව්‍යායතන වශයෙන් ද ව්‍යවස්ථා කෙරේ.

මෙසේ අඩි එකාදශ රූප **රූපායතනයැයි ද,** ලෞකික සපත විඤ්ඤ ධාතු **මනායතනයැ යි ද** ව්‍යවස්ථා කෙරේ.

ඒ සිත් හා සම්ප්‍රයුක්ත **ඵස්සාදී චෛතසික** හා සෙසු සූක්ෂම රූප ද, **ධර්මායතනය යි** ව්‍යවස්ථා කෙරේ

මෙසේ අඩ එකොළොස් **ආයතන** රූපය යි ද, එකාඩි ආයතනයෙක් **නාමය** යි මෙසේ **මාදශායතන** වශයෙන් **නාම** - රූප ව්‍යවස්ථා කෙරේ.

(4) අනෙක් **යෝගියෙක්** එයිනුදු සංක්ෂෙප කොට **සඤ්ඤ** වශයෙන් මෙනෙහි කෙරේ.

ඒ මෙසේ යි:- මේ ශාසනයෙහි **භික්ෂුනෙමේ** මේ සිරුරෙහි **කර්මජ** ආදීන් හටගත් **පෘථිවි** ආදී **සතර ධාතු යැ,** ඒ ධාතු නිශ්‍රිත වර්ණ- ගන්ධ- රස- ඔජා, යන **සතර යැ.** චක්ෂුප්‍රසාදාදී **පඤ්චප්‍රසාද යැ, හෘදයවස්තු රූප යැ, භාව රූප යැ, ජීවිතේන්ද්‍රිය රූප යැ** චිත්ත- ඍතු දෙකින් නිපන් **ශබ්දයද** යි මේ **සතළොස්** රූපයෝ **අනිත්‍යාදී වශයෙන් බැලීමට සුදුසු වූවාහු කර්මජ** ආදීන් නිපන්නාහු රූපජන්න සවභාවයෙන් යුක්ත හෙයින් **රූප-රූප** නම් වෙති. **කාය විඥප්තිය, වාග් විඥප්තිය, ආකාශ ධාතුය, රූපයා ගේ ලඝුතා- මෘදුතා- කර්මණ්‍යතා යැ උපචය- සන්තති- ජරතා- අනිත්‍යතා යැ** යන මේ දස රූපයෝ අනිත්‍යාදි වශයෙන් බැලීමට සුදුසු නො වෙති, රූපයන් ගේ ආකාර-විකාර හා අතර පිරිසිදීම් මාත්‍රය වූ හෙයින් **නිෂ්පන්න රූපයෝ ද** නො වෙති. රූපජන්න ලක්ෂණ යුක්ත නො වූයෙන් **රූප-රූපයෝ ද** නො වෙත්. එතෙකුදු වුවත් රූපයන් ගේ ආකාර විකාර හා රූපාන්තර පරිච්ඡේද මාත්‍ර හෙයින් **රූපයැ යි** ගණනට යෙති යි මෙසේ මේ සත්විසි රූපය **රූපඛන්ධ යැ,** පෙර කී එක් අසූවක් ලෞකික සිත් හා සම්ප්‍රයුක්ත වෙදනාව **වෙදනා ඛන්ධ යැ,** ඒ හා සම්ප්‍රයුක්ත සංඥාව **සංඥා ඛන්ධ යැ,** සෙසු ඵස්සාදී සංඛාර **සංඛාර ඛන්ධ යැ,** චිත්තය

විඤ්ඤාණ ස්කන්ධය යි. මෙසේ රූපස්කන්ධය **රූප** යැ, සතර අරූපස්කන්ධ **නාමයැ යි පඤ්චස්කන්ධ** මුඛයෙන් **නාම - රූප** ව්‍යවස්ථා කෙරේ.

විභාග:- මෙහි **ආකාර** ග්‍රහණයෙන් **විඥප්ති** මයය හා **උපචයාදී ලක්ෂණ** සතර ද, **විකාර** ග්‍රහණයෙන් **ලහුතාදි ත්‍රයය** ද, **පරිච්ඡේද** ග්‍රහණයෙන් **ආකාස ධාතුවද යි** මේ **අනිච්චතාන රූප දසය** මෙහි අනිත්‍යාදී වශයෙන් විදර්ශනාවට නො නැගේ. එහෙත් **මෙකී ලක්ෂණ** මාත්‍රයෙන් රූපය යි කී, (යනු ටීකා මතයි.)

(5) අනෙකෙක් මෙහි රූපපන ලක්ෂණයෙන් යුත් සියලු පඨවී ආදී **සතරමහාභූතරූප** ද, ඒ ඇසුරු කොට පවත්නා සෙසු **උපාදා රූප සුවිස්සද** යි මෙසේ මේ අත්බැව්හි **රූපය** සැකෙවින් ඉගෙන, එසේ ම **මනායතනය** ද, ධර්මායතනයෙහි එකදෙශයක් වූ දෙපනස් **චෛතසික** ද, **නිබ්බාණය** ද, නාමයැ යි ඉගෙන මේ නාමය ද, මේ රූපය ද **නාම-රූපයැ යි** කියා සැකෙවින් **නාම-රූප** ව්‍යවස්ථා කෙරේ.

සුඤ්ඤතාදී ඒ ඒ **විමොක්ඛ** මුඛයෙන් **රූප පරිග්‍රහ** කොට **අරූප පරිග්‍රහ** කරන ඒ **යෝගීනට** ඉතා සියුම් හෙයින් **අරූපය** මනාව නො වැටහේ නම් එයින් විශ්‍යය බැහැර **නො** කොට රූපය ම නැවැතැ - නැවැතත් මෙතෙහි කළයුතු. නුවණින් විමසිය යුතු, පිරිසිඳ දතයුතු, විනිශ්චය කළ යුතුයි.

ඒ මෙසේ යි:- **යම්** - යම් පරිද්දෙකින් ඒ යෝගීනට රූපය විශුද්ධවැ නිරවුල්වැ පිරිසිඳුවැ වැටහේ නම් ඒ-ඒ පරිද්දෙන් ඒ රූපය අරමුණු කොට පවත්නා **අරූප** (නාම) **ධර්මයෝ** තුමූ ම ප්‍රකට වෙති.

නිදර්ශන:- කැඩපතින් මුහුණ බලන ඇස් ඇතියකු එය අපිරිසිදු හෙයින් මුහුණ නො පෙනේ නම් එය බැහැර නො දමා නැවැතැ-නැවැතැ පිරිසිදු කොට මුහුණ බලන කල පිරිසිදු හෙයින් මුඛ නිමිත්ත තෙමේ ම ප්‍රකට වේ.

තවද:- තල තෙල් කැමැතියකු තල පිටි භාජනයක බහා දිය ඉස වරක් දෙකක් මිරිකී මෙන් තෙල් නො ලැබුණු පමණින් එය ඉවත නො දමා නැවැත - නැවැත ද, උණු දිය ඉස මඬින කල මුහුට තෙල් ලැබේ.

ජලය පිරිසිදු කරනු කැමැතියකු ඉඟිනි ඇට ගෙන කළය තුළ අත බහා වරක් දෙකක් ගැටූ පමණින් දිය පහත් නො වූව ද, ඉඟිනි ඇට බැහැර නො කොට නැවැතැ-නැවැතැ ගවන

කල තුනී මඩ යට ගැසී ජලය මතුව පැහැදීමෙන් ඔහුට පිරිසිදු ජලය ලැබෙයි. එසේ ම ඒ භික්ෂුව විසින් ධුරනික්ඛෙප නොකොට රූපය ම නැවැතැ-නැවැතැ සනමඝීනය කවයුතු ය මෙනෙහි කළ යුතු ය. පරිග්‍රහ කවයුතු ය. විනිශ්චය කවයුතු යි. ඕහට රූපය යම් යම් පරිද්දෙකින් මතුව ප්‍රසන්නවැ නිරවුල්වැ පිරිසිදුවැ වැටහේ නම් ඒ ඒ පරිද්දෙන් මඩ මතුයෙහි ජලය පිරිසිදු වන්නා සේ ඒ අරූප ධර්ම සනමඝීනය කරන්නා වූ ඥන-යට ප්‍රතිපක්ෂ වූ කෙලෙසයෝ යටට බසිත්. සිත ප්‍රසන්න වේ. ඒ රූප ධර්මයන් අරමුණු කොට ඇති අරූප ධර්මයෝ තුමූ ම ප්‍රකට වෙත්.

මෙසේ අන්‍යවූ ද **උක්- සොර- ගෙඩි- දී- මස්-** යන උපමාවන් ගෙන් ද, මේ අර්ථය ප්‍රකාශ කළ යුතු ය.

උක් පැණි ලබනු කැමැත්තා යන්ත්‍රයෙහි උක් බහා වරක් දෙකක් යන්ත්‍රය කරකැවීමෙන් නො නැවැතී පැණි ලැබෙන තාක් නැවැතැ-නැවැතැ කරකවන්නාක් මෙන් ද,

බඩු පැහැර ගත් සොරකු ගෙන වරක් දෙකකින් තතු දත නො හැකි වූ පමණින් නො හැර නැවැතැ-නැවැතැ පෙළා තතු දැනගන්නාක් මෙන් ද,

වල් ගරකකු දමනය කරන්නා රියෙහි බැඳ වරකින් දෙක-කින් නො නැවැතී නැවැතැ-නැවැතැ උත්සාහ කොට දමනය කරන්නාක් මෙන් ද,

වෙඩරු නිපදවන්නකු මෝරු බදුනෙහි බහා වරකින් දෙකකින් නො නැවැතී නැවැතැ නැවැතැ පෙළන්නාක් මෙන් ද,

මාලු පිස බුදිනු කැමැත්තකු වරක් දෙකක් ගිනි දල්වා නො නැවැතී පැසෙන තුරු නැවැත-නැවැතැ ගිනි දල්වන්නාක් මෙන් ද, පෙර කී සේ රූප පරිග්‍රහ කළයුතු.

මෙසේ සුවිශුද්ධ **රූප** පරිග්‍රහය ඇති ඒ යොගාවචරයා හට **අරූප ධර්මයෝ සපර්‍ය වශයෙන්** හෝ **වේදනා** වශයෙන් හෝ **විඤ්ඤාණ** වශයෙන් හෝ වැටහෙත්.

ඒ මෙසේයි:- 'පෘථිවී ධාතුව කැකුළු බව **ලක්ෂණ** කොට ඇත්තේ ය. යනාදී ක්‍රමයෙන් ධාතූන් පරිග්‍රහය කරන්නා වූ ඇතැම් **යොගියකු** හට **සපර්‍ය** පළමු කොට අරමුණු වේ. ඒ

සපශී සම්ප්‍රයුක්ත වේදනාව වේදනා ස්කන්ධ යැ, සංඥාව සංඥා ස්කන්ධ යැ, එසස හා චේතනා සංස්කාර ස්කන්ධ යැ, සිත විඤ්ඤාන ස්කන්ධයැ යි වැටහේ.

එසේම 'කෙශයෙහි කැකුළු බව පඨවී ධාතු යැ. - පෙ - ආශ්වාස - ප්‍රශ්වාස දෙක්හි පඨවී ධාතුව කැකුළු බව ලකුණු කොට ඇතැයි' යන අරමුණෙහි පළමුව හෙන සපශීයැ. ඒ හා යෙදුණු වේදනාව වේදනා ස්කන්ධ යැ - පෙ - සිත විඤ්ඤාන ස්කන්ධයැ යි වැටහේ. මෙසේ අරූප ධර්මයෝ සපශී වශයෙන් වැටහෙත්.

එකක් හට පෘථිවී ධාතුව කර්කශ ලක්ෂණය ඇත්තේ ය. ඒ පෘථිවී ධාතු අරමුණෙහි රස අනුභව කරන වේදනාව වේදනා ස්කන්ධ යැ. ඒ හා යෙදෙන සංඥාව සංඥා ස්කන්ධ යැ. ඒ හා යෙදෙන සපශීය ද, චේතනාව ද, සංස්කාර ස්කන්ධ යැ. ඒ හා යෙදුණු සිත විඤ්ඤාන ස්කන්ධයැ යි වැටහේ.

එසේ ම කෙශයෙහි පඨවී ධාතුව කැකුළු බව ලකුණු කොට ඇත්තේ ය. - පෙ - ආශ්වාස- ප්‍රශ්වාසයෙහි පඨවී ධාතුව කැකුළු බව ලකුණු කොට ඇත්තේ ය. ඒ අරමුණු කොට පවත්නා රසානුභව කරන වේදනාව වේදනා ස්කන්ධ යැ. - පෙ - නත් සම්ප්‍රයුක්ත චිත්තය විඤ්ඤාන ස්කන්ධයැ යි වැටහේ. මෙසේ වේදනා වශයෙන් අරූප ධර්මයෝ වැටහෙත්.

අනෙකක් හට 'පෘථිවී ධාතුව කර්කශ ලක්ෂණය ඇත්තේය' යි අරමුණු දැනගන්නා විඤ්ඤාණය විඤ්ඤාන ස්කන්ධ යැ. ඒ හා සම්ප්‍රයුක්ත වේදනාව වේදනා ස්කන්ධ යැ. සංඥාව සංඥා ස්කන්ධ යැ. එස්සය ද, චේතනාව ද, සංස්කාර ස්කන්ධයැ යි වැටහේ.

එසේ ම කෙශයෙහි පඨවී ධාතුව කර්කශ ලක්ෂණය - පෙ - ආශ්වාස - ප්‍රශ්වාසයෙහි පෘථිවී ධාතුව කර්කශ ලක්ෂණය යි අරමුණ දැන ගන්නා විඤ්ඤාණය විඤ්ඤාන ස්කන්ධ යැ, ඒ හා සම්ප්‍රයුක්ත වේදනාව වේදනා ස්කන්ධ යැ, සංඥාව සංඥා ස්කන්ධ යැ සපශීය ද, චේතනාව ද, සංස්කාර ස්කන්ධය යි වැටහේ. මේසේ විඤ්ඤාන වශයෙන් අරූප ධර්මයෝ වැටහෙති. මේ උපායයෙන් මේ 'කර්මයෙන් හටගන්නා කෙස්ගී පෘථිවී ධාතුව කර්කශ ලක්ෂණ යැ, යනාදී ක්‍රමයෙන් දෙසෑලිස් ධාතු කොටස්හි සතර - සතර ධාතු වශයෙන් සෙසු ඔකුඛ ධාතු ආදී රූප පරිග්‍රහ මුඛයන්හි සියලු නය හෙදය අනුවැ ගොස් අවී ඉංජනා කළ යුතු ය.

මෙසේ සුපරිශුද්ධ **රූප** පරිග්‍රහ ඇත්තාවූ ම ඒ යොගී තව් **අරූප** (නාම) ධර්මයන් **ඵස්ස- වේදනා- විඤ්ඤාණ** යන තුන් ආකාරයෙන් ප්‍රකට වන හෙයින් ම සුපරිශුද්ධ **රූප** පරිග්‍රහ ඇත්තහු විසින් ම **නාම** පරිග්‍රහය පිණිස යොග කටයුතු යි. එසේ නැත්තකු විසින් නො කට යුතුයි.

විශෙෂ:- **රූප** ධර්ම එකක් හෝ දෙකක් හෝ එළඹැ සිටි කලැ රූපය හැර **අරූප** පරිග්‍රහය ආරම්භ කෙරේ නම් කමට-හනින් පිරිහේ. පඨවී කසින භාවනාවෙහි කී, මහතොට නුපුරුදු පළුතයෙහි වැසි දෙනක මෙනි. එහෙත් සුපරිශුද්ධ **රූප** පරිග්‍රහ වශයෙන් **අරූප** පරිග්‍රහය පිණිස උත්සාහ වඩන යොගියාහට කර්මස්ථාන වැඩීමට ද, විශෙෂ වැඩීමට ද, මහත් බවට ද, පැමිණේ. ඒ යොගාවචර තෙමේ මෙසේ ඵස්සාදීන් ගේ වශයෙන් එළඹ සිටි කල්හි සතර අරූපස්කන්ධ **නාමය යි ද**, ඔවුන්ට අරමුණු වූ සතර මහාභූත හා සතර මහාභූත නිසා පවත්නා සුවිසි උපාදාය රූප **රූපය යි ද** විනිශ්චය කර යි.

මෙසේ අටළොස් **ධාතු** යැ දෙළොස් **ආයතන** යැ. පඤ්ච **ස්කන්ධ** යැ යන සියලු ත්‍රෛභූමක ධර්ම කඩුවකින් සුමුගුවක් විවෘත කරන්නකු මෙන් ද යමක (දෙබැ) තල්කඳක් පළන්නකු මෙන් ද, **නාමය** ද, **රූපය** ද, දෙ පරිද්දෙකින් නියම කෙරේ. **නාම-රූප** මාත්‍රයෙන් මත්තෙහි අන්‍ය වූ සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ දෙවියෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ නැතැයි, නිෂ්ඨාවට පැමිණේ.

ඒ යොගී තෙමේ මෙසේ යථාසභාව (ඇතිසැටිය) වශයෙන් **නාම - රූප** නියම කොට මනසේ සත්ත්ව ය, පුද්ගල ය යන මුළාව දුරු කරනු පිණිස, නුමුළා බවිහි සිත පිහිටුවීම පිණිස, බෙහෝ සූත්‍රාගත වශයෙන් 'මේ ධර්ම සභාවය නාම රූප මාත්‍ර-යක් ම වේ. සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නැත්තේය' යි මේ අර්ථ සංසන්දනය කොට විනිශ්චය කෙරේ.

එයින් කියා:-

"යථාපි අඞ්ග සම්භාරා - හොති සද්දෝ රථෝ ඉති
එවං ඛන්ධෙසු සන්තෙසු - හොති සත්තොති සම්මුති"

"අව-යව රැස නිසා - **රියයැ යි** සඳක් වත සේ
රූ ඇ කඳු ඇති බැවින් - **සතෙකැයි** වහර පවතී',

තවද **"සෙය්‍යථාපි ආවුසො කණ්ඨං ච පටිච්ච වලලිං ච පටිච්ච මත්තිකඤ්ච පටිච්ච තිණං ච පටිච්ච ආකාසෝ පරි-**

වාරිතෝ අගාරනෙඤ්ඤව සඞ්ඛා ගච්ඡති එවමෙව ඛො ආවුසො අසීං ච පච්චව නහාරූං ච පච්චව මංසඤ්ච පච්චව චම්මං ච පච්චව ආකාසො පරිවාරිතෝ රූපන්තෙව සඞ්ඛං ගච්ඡති"*

ඇවැත්නි! කෘෂ්ඨය නිසා ද, වැල් නිසා ද, මැටි නිසා ද, තණ නිසා ද, අහස පිරිවරන ලද්දේ **ගේයැ** යි ව්‍යවහාර වන්නා සේ ඇට නිසා ද, නහර නිසා ද, මස් නිසා ද, සම නිසා ද, අහස පිරිවරන ලද්දේ **ශරීරය** මැ යැයි ව්‍යවහාරයට යේ. අනිකකුදු කියන ලදී.

"දුක්ඛමෙව හි සම්භොති - දුක්ඛං තිට්ඨති වෙති ච
නාඤ්ඤත්‍ර දුක්ඛා සම්භොති - නාඤ්ඤත්‍ර දුක්ඛා නිරුජ්ඣති.'

"ලොවැ දුක ම උපදී, - දුක ම පවතී, වැනැසේ,
දුකින් පිට අන් කිසිවක් - නූපදනේ, නො වැනැසේ"

මෙසේ නොයෙක් සිය ගණන් **සූත්‍රානුසාරයෙන්** නාම-රූප ම දක්වන ලදී. සත්ත්වයෙක්, පුද්ගලයෙක්, නො දක්වන ලදී. යම්සේ අකුරු- සක්- මැදිරි- රියැ ඉස් ආදී අවයව සමූහය එක් **ආකාරයෙකින්** සිටි කල **රථය** යන ව්‍යවහාර මාත්‍රය වේ ද? පරමාර්ථ වශයෙන් **එක්** එක් අවයවයක් පිරික්සන කල්හි රථයෙක් නම් නැත්තේ ද? දැව ආදී ගෘහොපකරණ එක් ආකාරයෙකින් අහස පුරා සිටි කල **ගේයැ** යි ව්‍යවහාර මාත්‍රයෙක් වේ ද? පරමාර්ථ වශයෙන් ගෙයෙක් නම් නැත්තේ ද?

යම් සේ ඇඟිලි - මහපට ඇඟිලි ආදිය එක් ආකාරයෙකින් සිටි කල **මිට** යන ව්‍යවහාර මාත්‍රය වන්නේ ද? දෙණ - තත් ආදියෙහි **වීණා** යන ව්‍යවහාරය ද, ඇත් - අස් ආදීන්හි **සෙනා** යන ව්‍යවහාරය ද, පවුරු- ගේ- දෙරටු- ආදියෙහි **නුවර** යන ව්‍යවහාරය ද, කඳ- අතු- කොළ- ආදිය එක් අයුරිකින් සිටි කල **රුක** යන ව්‍යවහාරය ද යම්සේ වේ ද? පරමාර්ථ වශයෙන් එකී **මිට** ආදී බැවහර නො වේ ද? එසේ ම **පඤ්චොපාදානක්ඛන්ධයන්** ඇති කල්හි සත්ත්ව යැ, පුද්ගල යැ, යන ව්‍යවහාර මාත්‍රය වේ. පරමාර්ථ වශයෙන් රූපාදී එක - එක ධර්මයක් පිරික්සන කල **අසී** යන මානය ද, අහං (මම) යන ආත්ම වාදය ද ගැනීමට වස්තු වූ කිසි සත්ත්වයෙක් නැති. හුදෙක් පරමාර්ථ වශයෙන් නාම - රූප මාත්‍රයක් ම ඇත්තේයැ යි මෙසේ

* ම: නි: මූලපණ්ණාසක

නුවණින් බලන්නහු ගේ දැකීම යථාභූත දර්ශන (ඇති සැටි දැකීම) නම් වේ. යමෙක් වනාහි මේ යථාභූත දර්ශනය හැරපියා සත්ත්වයෙක් ඇතැයි ගනී නම් හෙතෙම ඒ 'සත්ත්වයා ගේ විඤ්ඤාණය' හෝ 'භවයෙන් භවයට යන්නේ යැ' යන අවිඤ්ඤාණය හෝ අනුදන්නේ යි. අවිඤ්ඤාණය අනුදන්නේ **ශාශ්වත** දෘෂ්ටියෙහි වැටේ. විඤ්ඤාණය අනුදන්නේ **උච්ඡේද** දෘෂ්ටියෙහි වැටේ.

කවර හෙයිනයත්:- කිරි මැ දියෑ යි ද, **කිරි** අනිකෙක, දී අනිකෙකැයි ද, නො ගෙන කිරෙහි පරපුර වූ දීගෙහි මෙන් ඒ ආත්මයා ගේ පරපුරෙහි වූ අනික් ආත්ම භාවයක් නැති හෙයිනි. සත්ත්වයා ශාශ්වතයැ යි ගන්නා හෙතෙම භවයෙහි නිලීන වේ. සත්ත්වයා උච්ඡේද වේයැ යි ගන්නේ අතිධාවනය කෙරේ. (යුක්තිය ඉක් ම යේ.)

එයින් වදාළහ.

"භික්ඛවෙ දිට්ඨතෙහි පරියුට්ඨිතා දෙවමනුස්සා ඔලීයනති එකෙ. අතිධාවනති එකෙ චක්ඛුමන්තොව පස්සන්ති. කථඤ්ච භික්ඛවෙ ඔලීයනති එකෙ. භවරාගා භික්ඛවෙ දෙවමනුස්සා භවරතා භවසම්මුදිතා. තෙසං භව-නිරොධාය ධම්මෙ දෙසියමානෙ චිත්තං න පක්ඛන්දති. නප්පසීදති. නාසන්තිඨති. නාධිමුච්චති. එවං ඛො භික්ඛවෙ ඔලීයනති එකෙ. කථඤ්ච භික්ඛවෙ අතිධාවනති එකෙ. භවෙනෙව ඛො පනෙකෙ අට්ටියමානා හරායමානා ජිගුච්ඡ-මානා විභවං අභිනන්දන්ති. යතො කිර භො අයං අත්තා කායස්ස භෙදා උච්ඡිජ්ජති. විනස්සති. න හොති පරම්මරණා එතං සන්තං එතං පණීතං එතං යාථාවන්ති. එවං ඛො භික්ඛවෙ අතිධාවනති එකෙ. කථඤ්ච භික්ඛවෙ චක්ඛු-මන්තො පස්සන්ති. ඉධ භික්ඛවෙ භික්ඛු භූතං භූතතො පස්සති. භූතතො භූතං දිස්වා භූතස්ස නිබ්බිදාය විරාගාය නිරො-ධාය පටිපන්නො හොති එවං ඛො භික්ඛවෙ චක්ඛුමන්තො පස්සන්ති."*

"මහණෙනි! **ශාශ්වත - උච්ඡේද** යන දෘෂ්ටි දෙකින් මැඩුණු දෙව් මිනිසුන් අතුරින් සමහරෙක් ශාශ්වත වශයෙන් භවයෙහි නිලීන වෙති. සමහරෙක් උච්ඡේද වශයෙන් අතිධාවනය කෙරෙත්. ඇති තතු පිරිසිඳ දන්නා නුවණැස් ඇත්තේ පරමාර්ථ සත්‍යය දකී.

---

* ඉ: පා: දුතියවග්ග

මහණෙනි! ඇතැමෙක් කෙසේ නිලීන වෙත් ද? ඇතැමෙක් කෙසේ අතිධාවනය කෙරෙත් ද? මහණෙනි! ඇතැම් දෙව් මිනිස් කෙනෙක් භවයෙහි ඇලුනාහු භවයෙහි සතුටු වූවාහු වෙති. ඔවුනට භවය නැසී කිරීම පිණිස ධර්මදේශනා කරන කල්හි සිත එහි නො පිවිසේ. නො පැහැදේ. නො පිහිට යි. නිශ්චයට නො පැමිණේ. මහණෙනි! මෙසේ ඇතැම් දෙව් මිනිස්සු භවයෙහි ඇලෙති.

මහණෙනි! ඇතැම් දෙව් මිනිස් කෙනෙක් උච්ඡේද වශයෙන් කෙසේ අතිධාවනය කෙරෙද් ද? ඇතැම් කෙනෙක් භවයෙන් ම පිහිත වන්නාහු ගර්හාවට පැමිණියාහු පිළිකුලට පැමිණියාහු විභව සඤ්ඤාත උච්ඡේදය කැමැති වෙති. යම් හෙයකින් මේ ආත්මය කඩුන් මරණින් පසු උච්ඡේදය වේ ද? විනාශ වේ ද? මරණින් මතු නො වේ ද? මේ විභවය ඥානත යැ, ප්‍රණීත යැ, ඇති සභාවයැ යි මෙසේ උච්ඡේදය පිළිගනිති. මහණෙනි! මෙසේ ඇතැම් කෙනෙක් උච්ඡේද වශයෙන් අතිධාවනය කෙරෙති.

මහණෙනි! නුවණැස් ඇත්තෝ ම කෙසේ දකිත් ද? යත්:- මහණෙනි! මේ ශාසනයෙහි භික්ෂුතෙමේ පඤ්චුපාදානක්ඛන්ධය පඤ්චුපාදානක්ඛන්ධය සේ දකී. පඤ්චුපාදානක්ඛන්ධය පඤ්චුපාදානක්ඛන්ධය සේ දැක භූත සඤ්ඤාත පඤ්චුපාදානස්කන්ධයේ කලකිරීම පිණිස නො ඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේ. මහණෙනි! මෙසේ ඇස් ඇත්තෝ දකිත්. යම්සේ දරුයන්ත්‍රය ශූන්‍ය වූයේ නිර්ජීව වූයේ උත්සාහ නැත්තේ වේ ද? එනකුදු වුවත් දැව යැ රැහැන් යැ යන මේවා එකතු වීමෙන් යන්නේ වේ ද? සිටින්නේ වේ ද? උත්සාහ ඇත්තක්හු සේ ව්‍යාපාර ඇත්තක්හු සේ වැටහේ ද? එසේ මේ නාම-රූප දෙක ද සිස් වූයේ ජීවයක් නැත්තේ උත්සාහ නැත්තේ වේ. එතෙකුදු වුවත් ඔවුනොවුන් එකිනෙකාවයෙන් යන්නේ ද සිටින්නේ ද වේ. වෙෂ්ටා සහිත-ව්‍යාපාර සහිත වූවක් මෙන් වැටහෙන්නේ ද වේ.

විශේෂ:- පඤ්චුපාදානස්කන්ධය තමා පිළිබඳ ප්‍රත්‍යයයෙන් නිපන් බැවින් හා පරමාර්ථ වශයෙන් විද්‍යමාන හෙයින් ද, **භූත** නම් වේ ඇති සභාවයෙන් හෝ සවලක්ෂණයෙන් හෝ සාමාන්‍ය ලක්ෂණයෙන් හෝ විද්‍යමානය යන අර්ථ යි. 'අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාර වේ' යනාදී තත් සභාවයෙන් හෝ විද්‍යමාන වේ යනු ද අර්ථයෙකි.

එසින් කීහ පැරැණියෝ -

නාමඤ්ච රූපඤ්ච ඉධත්ථි සච්චතෝ
න හෙත්ථ සත්තෝ මනුජෝ ච විජ්ජති
සුඤ්ඤං ඉදං යන්ත මිවාභිසඞ්ඛටං
දුක්ඛස්ස පුඤ්ජෝ තිණකඨ සාදිසෝ

"නම්-රූ මැයි පරමත් ලෙස ඇත්තේ
දෙව්-මිනිසා'දි සතෙක් මෙහි නැත්තේ,
දුක් පිඬ මැයි මෙය ලී තණ වැන්නේ
සුන් යැ එසින් සැකැසූ* යතුරක් සේ†

හුදෙක් මේ නාම-රූප දෙක දැරූ යන්ත්‍ර උපමාවෙන් පමණක් නොවැ අන්‍යවූ ද නළ කලාපාදි උපමාවන්ගෙහුදු පළ කළ හුතු ය.

ඒ මෙසේ යි:- බට මිටි දෙකක් එකිනෙක නිසා පවත්නා කල එකක පවැත්මට එකක් වහල් වේ. එකක් වැටෙන කල දෙක ම වැටේ. එසේ ම පඤ්චවොකාර භවයෙහි නාම - රූප දෙක උනුන් නිසා පවතී. එකක් එකකට උපස්තම්භක වේ. මරණ වශයෙන් එකක් වැටෙන කල අනික ද වැටේ.

එසින් කීහ පැරැණියෝ -

යමකං නාම-රූපඤ්ච - උභෝ අඤ්ඤඤ්ඤ නිස්සිතා
එකස්මිං භිජ්ජමානස්මිං - උභෝ භිජ්ජන්ති පච්චයා.

"දෙ බැ නම් රූ දෙක - උනුන් ඇසිරි කරනේ
ඉතෙකක් බිඳුණු සඳ - බිඳේ පසවූ එ දෙක ම"

තවද දඹුයෙන් පහළ බෙරය නිසා සද්දය පවත්නා කල බෙරය අනිකෙක, සද්දය අනිකෙක, බෙරය හා ශබ්දය අමිශ්‍ර යැ. බෙරය ශබ්දයෙන් ශූන්‍ය යැ. ශබ්දය ද බෙරයෙන් ශූන්‍ය යි.

එ පරිද්දෙන් ම වඤ්චා යැ, වාර යැ, ආලම්බන යැ, යන රූප-යන් නිසා නාම ධර්මයන් පවත්නා කල රූපය අනිකෙක. නාමය ද අනිකෙක් මැයි. නාම-රූප දෙක උනුන් හා අමිශ්‍ර යැ. නාමය රූපයෙන් ශූන්‍ය යැ. රූපය ද නාමයෙන් ශූන්‍ය යි. එහෙත් බෙරය නිසා පවත්නා ශබ්දය මෙන් රූපය නිසා නාමය පවතී.

---

* සංස්කරණය කළ † යන්ත්‍රයක්

එසින් කිහ -

න චකඛුතෝ ජායරෙ එසසපඤචමා
න රූපතෝ තෝ ච උභින්නමන්තරා
හෙතුං පටිචච පභවන්ති සඞඛතා
යථාපි සදෙදා පභවාය භෙරියා

න සොතතෝ ජායරෙ එසසපඤචමා
න සදදතෝ තෝ ච උභින්නමන්තරා

- පෙ -

න ඝාණතෝ ජායරෙ එසසපඤචමා
න ගන්ධතෝ තෝ ච උභින්නමන්තරා

- පෙ -

න ජිවහතෝ ජායරෙ එසසපඤචමා
න රසතෝ තෝ ච උභින්නමන්තරා

- පෙ -

න කායතෝ ජායරෙ එසසපඤචමා
න එසසතෝ තෝ ච උභින්නමන්තරා

- පෙ -

න වත්‍ථු රූපා පභවන්ති සඞඛතා
නවා'පි ධම්මායතනෙහි නිගඝතා
හෙතුං පටිචච පභවන්ති සඞඛතා
යථාපි සදෙදා පභවාය භෙරියා.

"ඇසින් පහස් ඇ පස නූපදින්නේ
රුවින් ද ඒ දෙක් අතුරින් තෝ වේ මැ සී
නීසා ම හේ සංඛත දම් උපද්දී
ගැසූ බෙරින් සද්දය සේ උපත්නා"

"කනින් පහස් ඇ පස* නූපදින්නේ
සදින් ද ඒ දෙක් අතුරින් තෝ වේ මැ සී,
නීසා ම හේ සංඛත දම් උපද්දී
ගැසූ බෙරින් සද්දය සේ උපත්නා"

"නාසෙන්† පහස් ඇ පස නූපදින්නේ
ගඳින් ද ඒ දෙක් අතුරින් තෝ වේ මැ සී"

- පෙ -

---

* එසස- වෙදනා- සඤඤා- චෙතනා- චිත්ත යන පඤච ධර්ම
† නාසාසෙන්

දිවින් පහස් ඇ පස නූපදින්නේ
රෑයෙන් ද ඒ දෙක් අතුරින් නො වේ මැ යි

- පෙ -

කයින් පහස් ඇ පස නූපදින්නේ
නො වේ පහස්නෙන් එදෙකින් නො වේ මැ යි,

- පෙ -

නො වස් රුවින්* සංකත දම් උපද්දී
නො නික්මෙ දම් ආයතනෙන් ද ඒ දම්†
නිසා ම හේ සංකත දම් උපද්දී
ගැසූ බෙරින් සද්දය සේ උපන්නා

තවද මේ නාම-රූප දෙකින් නාමය නෙද නැත්තේ යැ, තමා නෙදින් පැවැත්ත නො හේ. නො කා යි. නො බොා යි. නො බෙණේ. ඉරියව් නො පවත්ව යි. රූපය ද නෙද නැත්තේ යැ. තමා නෙදින් පැවැත්ත නො හේ ඒ රූපයට කනු කැමැති බවෙක් නැති. බොනු කැමැති බවෙක් නැති. බණනු කැමැති බවෙක් නැති. ඉරියවු පවත්වනු කැමැති බවෙක් නැති. නාමය නිසා රූපය පවතී. රූපය නිසා නාමය පවතී. නාමයට කනු කැමැති බවක් ද, බොනු කැමැති බවක් ද, බණනු කැමැති බවක් ද, ඉරියව් පවත්වනු කැමැති බවක් ද, ඇති කල රූපය කා යි, බොා යි, බෙණෙ යි, ඉරියව් පවත්ව යි.

මේ අර්ථය ප්‍රකට කිරීමට මේ උපමාවක් එළවත්:- ජාත්‍යන්ධ-යෙක් ද, පිළෙක් ද ගමනක් යනු කැමැත්තාහු ජාත්‍යන්ධයා යහළුව! 'මට පයින් යා හැකි යැ. එහෙත් මාර්ගයෙහි සම විෂම බව් බැලීමට ඇස් නැත්තේයැ' යි පිළාට කීයේ ය. පිළා ද යහළුව! 'මම ඇසින් බැලිය හැක්කෙමි, එහෙත් යාමට හා ඊමට පා නැත්තෙමි වෙමි' යි අන්ධයාට කීය. ජාත්‍යන්ධයා තුටු-පහටුවැ පිළා දසරුවෙහි තබා ගත. පිළා ද අන්ධයා ගේ උරහිස හිඳ වම හරුව, දකුණට යව, දකුණ හරුව, වමට යව යි කීය යි. මෙහි ජාත්‍යන්ධයා ද නෙද නැත්තේ යැ. දුබල යැ. තමා නෙදින් ද බලයෙන් ද නො යේ. පිළා ද නෙද නැත්තේ ය. දුබල ය. තමා නෙදින් ද, බෙලෙන් ද, යා නො හැක්ක. ඔහු දෙදෙන උනුන් නිසා ගමන කෙරෙත්මැ යි.

---

* හෘදය වස්තු රූපයෙන් † එස්ස පඤ්චම ධර්ම

එමෙන් ම නාමය ද තෙද නැත්තේ තමා තෙදින් නූපදී. ඒ ඒ ක්‍රියාවන්හි නො පවතී. රූපය ද තෙද නැත්තේ තමා තෙදින් නූපදී. තමා අයත් ඒ ඒ ක්‍රියාවන්හි නො පවතී.

එතෙකුදු වුවත් ඔවුන් උනුන් නිසා උපැත්ම හෝ පැවැත්ම නො වන්නේ නො වේ. උපදනේ ද පවත්නේ ද වේ. එසින් කී.

න සකෙන බලෙන ජායරෙ
නො පි සකෙන බලෙන තිට්ඨරෙ
පරධම්මවසානුවත්තිනො
ජායරෙ සඞ්ඛතා අත්තදුබ්බලා

පරපච්චයතො ච ජායරෙ
පරආරම්මණතො සමුට්ඨිතා
ආරම්මණපච්චයෙහි ච
පරධම්මෙනිච්මෙ පභාවිතා

යථාපි නාවං නිස්සාය – මනුස්සා යන්ති අණ්ණවෙ
එවමෙව රූපං නිස්සාය – නාමකායො පවත්තති

යථා ච මනුසෙස නිස්සාය – නාවා ගච්ඡති අණ්ණවෙ
එවමෙව නාමං නිස්සාය – රූපකායො පවත්තති

උභො නිස්සාය ගච්ඡන්ති – මනුස්සා නාවා ච අණ්ණවෙ
එවං නාමඤ්ච රූපඤ්ච – උභො අඤ්ඤඤ්ඤ නිස්සිතා.

තමා බෙලෙන් නම්-රූ නූපදින්නේ
තමා බෙලෙන් ඒ දම් නැ සිටින්නේ
පරා අයත් දම් වසයෙන් පවත්නා
තුමූ දුඛුල් සංකත දම් උපද්දී

අනෙක් දහම් හේ පසයෙන් උපද්දී
අනෙක් දහම් එල්බ නැගී සිටින්නේ
තමා කෙරෙන් අන් දෙපසක්* ලැබීමෙන්
පවත්නි මේ සංකත දම් උපද්නා

නැව නිසා මිනිසා – සමුදුර ගමන් යන සේ
රූ-කය පිහිට ලැබුමෙන් – නමුකය† යෙහෙන් පවතී

---

* ජනක ප්‍රත්‍යය හා ආලම්බන ප්‍රත්‍යය දෙක † නාමකය

මිනිසා නිසා නැව - සමුදුර එතෙර වන සේ
නමුකය පිහිට ලැබුමෙන් - රූ කය යෙහෙන් පවතී

මිනිසා නැව උනුන් - ඇසිරින් මුහුදු යන සේ
නම්-රූ දෙක උනුන් - ඇසිරින් යෙහෙන් පවතී.

මෙසේ නාමා නයින් නාම-රූප විනිශ්චය කරන යෝගීහු ගේ සත්ත්ව සංඥව මැඩ නුමුළා බව්හි සිටි නාම-රූපයන් ගේ යාථාවදර්ශනය (ඇති තතු දැනීම) දිටසි විසුද්ධිය සි දතයුතු. නාම-රූප ව්‍යවස්ථානය යි ද, සංඝකාර පරිවෙජ්දය යි ද මේ දෘෂ්ටි විශුද්ධියට ම නම් වේ.

හුදී ජනයන් ගේ ප්‍රමොදය පිණිස කළ විශුද්ධි මාර්ගයෙහි ප්‍රඥා භාවනාධිකාරයෙහි දිටසි විසුද්ධි නිදේශ නම් වූ අටළොස් වන පරිවෙජ්දය යි.

19. කඩඛාවිතරණ විසුඩි නිදේශය

"මේ නාම-රූපයන් ගේ ම ප්‍රත්‍යය පිරිසිඳීමෙන් තුන් කල්හි පැවැති සැක දුරු කර සිටි ඤාණය කඩඛාවිතරණ විසුඩිය යි."

එය ලබනු කැමැති **භික්ෂු තෙම** දක්ෂ වෛද්‍යවරයකු රෝගයක් දැක එහි නිදානය සොඟන්නා සේ ද, අනුකම්පා ඇති පුරුෂයකු ළිපියෙකැ වැටී හුන් ළදරුවකු දැක මේ කවරකු ගේ පුතෙක්දැ යි ඔහු ගේ මවුපියන් සොඟන්නා සේ ද, ඒ නාම-රූපයන් ගේ **හේතු-ප්‍රත්‍යය** සෙවීමෙහි නියුක්ත වේ.

(1) හෙතෙම මුලදී ම මෙසේ සලකයි:- 'මේ නාම-රූප සියලු තන්හි සියලු කල්හි සියල්ලනාට සමවැ නො පැමිණෙන හෙයින් අහෙතුක නො වේ.' 'නාම-රූප දෙකින් මත්තෙහි ඊශ්වරාදී මැවුම් කරුවකු නැති හෙයින් ඊශ්වරාදී හෙතුවකිනුදු හට නො ගැනේ' එහෙයින් ම මෙයට හෙතු-ප්‍රත්‍යය ඇත මැනවැ, ඒ හෙතු-ප්‍රත්‍යය කවරේදැ යි, කියා යි. හෙතෙම මෙසේ නාම-රූපයනට හෙතු-ප්‍රත්‍යය සලකා පළමු කොට රූපකායයට මෙසේ හෙතු-ප්‍රත්‍යය පරීක්ෂා කර යි.

මේ කය උපදනේ උපුල්, පියුම්, හෙළපියුම්, හෙල්මැලි, ආදීන් ගේ අභ්‍යන්තරයෙහි නූපදී. මුතු මැණික් ආකරයක හෝ නූපදී. වැලි ආමාශය (නො පැසුණු අහර බොක්ක) පක්වාශය (පැසුණු අහර බොක්ක) යන මොවුන් අතරෙහි උදර පටලයට පිටු පා පිට කටුව පෙරටු කොට අතුණු-අතුණුබහන් පිරිවරා තෙමේත් දුගඳ- ජුගුප්සා- පිළිකුල් වූයේ එසේ ම දුගීන්ධ-ජුගුප්සා- පිළිකුල් වූ අතිශයින් සම්බාධ වූ සථානයෙහි කුණු මස්-කුණු කුණප- කුණු කොමු- ගම්දෙර ගවර වල- අසුචි වළය යනාදී තැනෙකැ පණුවකු සේ උපදී.

එසේ උපදනහුට **අවිද්‍යා යැ, තෘෂ්ණා යැ, උපාදාන යැ, කර්ම යැ,** යන මොහු උපදවන හෙයින් **හෙතුහු** වෙති. ආහාරය, උපස්තම්භක (උවටැන් කරන) හෙයින් **ප්‍රත්‍යය** වේ. මෙසේ මේ පඤ්ච ධර්ම හෙතු-ප්‍රත්‍යය වේ. ඔවුනතුරින්දු **'අවිද්‍යා- තෘෂ්ණා- උපාදාන** යන තුන ළදරුවකුට මව මෙන් මේ කයට **උපනිශ්‍රය**

වේ **කර්මය** පුතාට පියා මෙන් **ජනක** වේ. **ආහාරය** ළදරුවාට කිරිමව සේ **සන්ධාරක** (ධරා සිටින්නේ) වේ' ය යි මෙසේ රූපකායයට ප්‍රත්‍යය පරිග්‍රහ කොට න වත **"චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං"*** 'චක්ෂුඃප්‍රසාදය ද, රූපාලම්බනය ද, නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී' යනාදී ක්‍රමයෙන් නාම කායයට ප්‍රත්‍යය පරිග්‍රහ කෙරේ. මේසේ ප්‍රත්‍යය වශයෙන් නාම රූපයන්ගේ ප්‍රවෘත්තිය දැක මේ නාම-රූප දැන් සේ ම අතීතයෙහි ද හෙතු-ප්‍රත්‍යය නිසා පැවැත්තේ ය. මත්තෙහිදු හෙතු-ප්‍රත්‍යය නිසා පවත්නේය යි දකී. මෙසේ බලන්නා වූ ඒ යොගාවචරයා ගේ **පුඵ්ඵානන්ත සඞ්ඛ්‍යාත අතීත ඛන්ධ පඤ්චකය** අරභයා **'මම අතීත කාලයෙහි සිටියෙමි ද, නො සිටියෙමි ද, කවරෙක් වැ සිටියෙමි ද, කෙබන්දෙක් වැ සිටියෙමි ද, කවරෙක් වැ සිට කවරෙක් වූයෙමිද සි"** පස් ආකාරයෙකින් කියන ලද **විචිකිච්ඡාව ද** අපරාන්ත සඞ්ඛ්‍යාත **අනාගතාධ්වය** අරභයා **අනාගත කාලයෙහි මම වන්නෙමි ද, නොවන්නෙමි ද, කවරෙක් වන්නෙමි ද, කෙබන්දෙක් වන්නෙමි ද, කවරෙක් වැ කවරෙක් වන්නෙමිද සි'** කියන ලද පස් ආකාර **විචිකිච්ඡාව ද** දැන් වර්තමාන සන්තති පඤ්චකය අරභයා **මම වෙමි ද, නො වෙමි ද, කවරෙක් වෙමි ද, කෙසේ වෙමි ද, මේ සත්ත්ව තෙම කොහි සිට මෙහි ආවේ ද, නැවැතැ කොහි යන්නේද' සි** මෙසේ සවැදෑරුම් **විචිකිච්ඡාවද සි** මේ කාලත්‍රය පිළිබඳ **සොළස් ආකාර විචිකිච්ඡා** ප්‍රහීණ වේ.

(2) අනෙකෙක් **නාමකායයට සාධාරණ- අසාධාරණ** වශයෙන් **දෙ ආකාර** ප්‍රත්‍යය බලයි. රූපයට **කර්මාදී වශයෙන් චතුර්විධ ප්‍රත්‍යය** බල යි.

විභාවනී:- නාමයට සාධාරණය, අසාධාරණයැ යි ප්‍රත්‍යය දෙකෙකි. **චක්ෂුරාදී සදෙශ** හා **රූපාදී සාරම්මණ** ද නාමයට **සාධාරණ ප්‍රත්‍යය සි.**

'කුශල- අකුශල- විපාක- ක්‍රියා භෙදයෙන් සත්ප්‍රකාර වූ නාමය චක්ෂුරාදී ද්වාරයෙන් රූපාදී සාරම්මණෙහි පවත්නා හෙයිනි. **මනසිකාරාදිය අසාධාරණ ප්‍රත්‍යය සි.**

ඒ මෙසේ සි:- **යොනිසො මනසිකාර- සද්ධාසීලශ්‍රවණාදිය** කුශලයට ම අසාධාරණ ප්‍රත්‍යය යැ.

---

*සං: නි: නිදානවග්ග

අයොනිසෝ මනසිකාර- අසද්ධම්මශ්‍රවණාදිය එයට විපරීත වූයේ අකුසලයට අසාධාරණ ප්‍රත්‍යය යැ. **කම්ම අවිද්‍යා- ගති-කාලාදිය** විපාකයට අසාධාරණ ප්‍රත්‍යය යැ. **භවාඞ්ගාදිය** ක්‍රියා චිත්තයට අසාධාරණ ප්‍රත්‍යය යි.

විශෙෂ:- කම්ම, කම්මනිමිත්තය, ගතිනිමිත්තය, යන තුන චුති-ප්‍රතිසන්ධි විපාකයට ප්‍රත්‍යය වේ. කාලාදිය යි කී ආදි ශබ්දයෙන් සත්පුරුෂ සෙවනාදී චතුශ්චක්‍රක සම්පත්තීන් ගේ හෝ සංග්‍රහය වේ. භවාඞ්ගය, පඤ්චවාරාවජ්ජන- මනොවාරා-වජ්ජන දෙකට ද, සන්තීරණය වොත්ථපනයට ද, වොත්ථපනය ක්‍රියාවනට ද ප්‍රත්‍යය වේ. පරිත්ත ක්‍රියාවෝ යථායොගයෙන් පරිත්ත මහද්ගත ක්‍රියාවනට ද ප්‍රත්‍යය වෙති. අතීතය ආවජ්ජන වය වර්ජිත සියලු ක්‍රියාවනට ප්‍රත්‍යය වේ. (යනු ටීකා යි.)

රූපයට **කම්ම යැ, චිත්ත යැ, ඍතු යැ, ආහාරයැ** යි **චතුර්විධ ප්‍රත්‍යය** වේ. ඔවුනතුරින් 'කම්ම අතීත වූයේ ම **කම්මසමුට්ඨාන** රූපයට ප්‍රත්‍යය වේ. හෙද උත්පත්ති ක්ෂණයෙහි මැයි. ඍතු- ආහාර දෙදෙන ඍතුජ - ආහාරජ රූපයනට සිති ක්ෂණයෙහි ප්‍රත්‍යය වේ' ය යි මෙසේ ඇතැම් යෝගියෙක් නාම-රූපයනට ප්‍රත්‍යය පරිග්‍රහ කෙරේ. හෙතෙම මෙසේ ප්‍රත්‍යය වශයෙන් නාම-රූපයන් ගේ පැවැත්ම බලා **'මේ නාම - රූප වර්තමානයෙහි පවත්නා සේ අතීතයෙහි ද ප්‍රත්‍යය වශයෙන් පැවැත්තේ ය. අනාගතයෙහි ද ප්‍රත්‍යය වශයෙන් පවත්නේය'** යි නුවණින් බල යි. මෙසේ බලන ඒ යොගීහට ත්‍රිකාල-යෙහි ම කී පරිද්දෙන් **විචිකිච්ඡාව** ප්‍රහීණ වේ.

(3) අනෙක් යොගියෙක් මෙසේ **නාම-රූප සඞ්ඛ්‍යාත සංඛාරයන් ගේ ජරාවට පැමිණීම ද, ජරාවට පැමිණිය-වුන් ගේ භඞ්ගය ද දැක 'මේ සංඛාරයන් ගේ ජරා මරණය උත්පත්තිය ඇති කල්හි වේ. ජාතිය කම්මභවය ඇති කල්හි ද, භවය උපාදානය ඇති කල්හි ද, උපාදානය තෘෂ්ණාව ඇති කල්හි ද, තෘෂ්ණාව වෙදනාව ඇති කල්හි ද, වෙදනාව ඵස්සය ඇති කල්හි ද, ඵස්සය ෂඩායතනය ඇති කල්හි ද, ෂඩායතනය නාම-රූප ඇති කල්හි ද, නාම රූප විඤ්ඤාණය ඇති කල්හි ද, විඤ්ඤාණය සංඛාර ඇති කල්හි ද, සංඛාර අවිද්‍යාව ඇති කල්හි ද වේය යි මෙසේ ප්‍රතිලෝම පටිච්චසමුප්පාද වශයෙන් නාම-රූපයන් ගේ ප්‍රත්‍යය නිගමය කෙරේ.** එකල ඔහු ගේ **විචිකිච්ඡාව** කියන ලද පරිදි ප්‍රහීණ වේ.

(4) අනෙක් **යොගීයෙක්**- මෙසේ **"අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර වේය"** යි පෙර **පටිච්චසමුප්පාද** නිර්දේශයෙහි විස්තර කළ සේ **අනුලෝම පටිච්චසමුප්පාද** වශයෙන් නාම-රූප යන් ගේ ප්‍රත්‍යය පරිග්‍රහ කෙරේ. එකල ඔහු ගේ **කාංක්ෂාව** ප්‍රහීණ වේ.

(5) අනෙක් **යොගීයෙක්** පූර්ව කර්ම භවයෙහි මොහය **අවිද්‍යා යැ.** කුශලා'කුශල කර්ම රැස් කිරීම **සංස්කාර යැ.** පඤ්ච-කාමයෙහි ඇලීම් සඤ්ඤාත නිකන්තිය **තෘෂ්ණා යැ.** දැඩිවැ ගැන්ම **උපාදාන යැ.** අභිසංස්කරණ චෙතනාව **කර්මභවයැ** යි, 'මෙසේ පූර්ව කර්ම භවයෙහි මේ පඤ්ච ධර්මයෝ වර්තමාන ප්‍රති-සන්ධියට ප්‍රත්‍යය වෙති. මේ (වර්තමාන) ප්‍රතිසන්ධිය **විඤ්ඤාණය,** මවු කුසට වැදගැන්ම **නාම-රූප** යැ. පඤ්චප්‍රසාදය **ආයතන** ය. ආලම්බන සපර්ශය **ඵස්ස** යැ. විඳීම **වේදනා** යැ. මේ **පඤ්ච-ධර්මයෝ මේ වර්තමාන උත්පත්ති භවයෙහි පූර්වයෙහි කළ කර්මයා ගේ ප්‍රත්‍යයයෙන් වෙති.** මේ භවයෙහි චක්ෂුරාදී ආයතන-යන් මනිකිරීමට හිය හෙයින් මෝහය **අවිද්‍යා** යැ. - පෙ - චෙතනා **කර්මභවයැ** යි **මේ පඤ්ච ධර්මයෝ මේ කර්ම භවයෙහි මතු ප්‍රතිසන්ධි භවයට ප්‍රත්‍යය වෙති** යි. **මෙසේ කර්මවට්ට-විපාක-වට්ට** වශයෙන් නාම-රූපයන් ගේ **ප්‍රත්‍යය පරිග්‍රහ කෙරේ. එහි කර්මවට්ට** ය; **දිට්ඨධම්මවේදනීය** යැ, **උපපජ්ජවේදනීය** යැ, **අපරාපරිය වේදනීය** යැ, **අහෝසි කර්මයැ** යි විපාක දෙන කාල වශයෙන් සතර ආකාර යි.

විඤ්ඤාර:- ඒ කර්ම අතුරින් එක් ජවන චිත්තයෙකැ ඉපදී සිත් සතින් කුසල් හෝ අකුසල් හෝ **ප්‍රථම ජවන චෙතනාව දිට්ඨධම්ම වේදනීය කර්මය** යැ. එය මේ අත්බවහි ම විපාක දේ. එසේ විපාකයට නො පැමිණියේ **අහෝසි කර්ම** වේ.

ඒ මෙසේ යි:- **අහොසි කම්මං නාහාසි කම්මවිපාකො. න භවිස්සති කම්ම විපාකො. නත්ථි කම්ම විපාකො*"** 'කර්ම වී, කර්ම විපාක නොවී, මතු කර්ම විපාක නො වේ. දැන් කර්ම විපාක නැතැ යි' මේ ත්‍රික වශයෙනි.

කුශලා'කුශල වශයෙන් අර්ථ සිද්ධිය කරන, සත් වැනි ජවන චෙතනාව **උපපජ්ජවේදනීය කර්ම** නම්. ඒ කර්ම අනතුරු (දෙවෙනි) අත්බවහි ප්‍රතිසන්ධි විපාකය දේ. එසේ නො පොහොසත් යට කී සේ **අහෝසි කර්ම** වේ මේ දෙතුරෙහි වූ ජවන

* ප: ම:

වෙතනා පස **අපරාපරිය වේදනීය** කම්මේ. ඒ කම්ම අනාගතයෙහි අවකාශ ලද යම් තැනෙකැ විපාක දේ. සංසාර ප්‍රවෘත්තිය ඇති තාක් ඒ **අහොසි කම්ම** නම් නොවේ

තවද විපාක දෙන ක්‍රම වශයෙන් සිව්වැදෑරුම් කම්මෙකි. ඒ **ගරුක- ඛබ්බහුල- යදාසන්න- කටත්තාකම්ම** වශයෙනි. එහි ගරුක- අගරුකයන් අතුරින් අකුශල පක්ෂයෙහි **මාතෘඝාතකාදී** ආනන්තර්‍යය කම්මයක් හෝ කුශල පක්ෂයෙහි ප්‍රථම ධ්‍යානාදී **මහද්ගත කම්මයක්** හෝ වේ නම් ඒ **ගරු කම්ම** නම්. එය ප්‍රථම කොට විපාක දේ.

එසේ ම බහුල-අබහුල කම්මයන් අතුරින් යමක් **බහුල** වේ නම් එය පළමු කොට විපාක දේ.

මරණාසන්න කාලයෙහි කළ කම්මය **ආසන්න කම්ම** යි. (මරණාසන්නයෙහි සිහි කළ කම්මය හෝ **යදාසන්න** ය.) ඒ මතු භවයෙහි පළමු කොට විපාක දේ.

මෙයින් අන්‍ය වූ නැවැතැ නැවැතැ ලබන ලද ආසේවන ඇති කම්මය **කටත්තා කම්මය** යි. පෙර කී කම්මයන් නැති කල මේ විපාක දේ.

අනන්තරූපජනක යැ, **උපඤ්ඤාපනක** යැ, **උපපීඩක** යැ, **උපඝාතක** යැ යි කෘත්‍ය වශයෙන් චතුර්විධ කම්මයෙක් වේ. ඔවුනතුරින් ජනක කම්මය කුසල් ද වේ. අකුසල් ද වේ. එය ප්‍රතිසන්ධියෙහි ද, ප්‍රවෘත්තියෙහි ද රූප-අරූප විපාක උපදව යි.

උපඤ්ඤාපනක කම්මය විපාක ඉපදවිය නොහේ. අන්‍ය-කම්මයෙකින් උපන් සුව-දුක් විපාකයනට රුකුල් දීම් වශයෙන් **උපඤ්ඤාපනක** වේ. **උපපීඩක කම්මය** ද අන්‍ය කම්මයකින් උපන් විපාකය (සුව-දුක්) වැළැක්වීම් වශයෙන් පෙළයි. **උපඝාතක කම්මය** ද කුසල් ද අකුසල් ද වේ. එය අනික් දුර්ල කම්ම කෘ තමා ගේ විපාකයට අවකාශ කෙරේ. මෙසේ කම්මයෙන් අවකාශ කළ කල්හි එහි විපාක උපදනේ නම් වේ. මෙසේ මේ දෙලොස් වැදෑරුම් කම්මයන් ගේ කම් හෙදය හා විපාක හෙදය ද **බුදුවරයන් ගේ කම්විපාකඥානයට** ම තතු සේ ප්‍රකට වේ. එය ශ්‍රාවකයන් හා අසාධාරණ වේ.

(විදර්‍ශීකයා විසින් කම්මානන්තරය ද, විපාකානන්තරය ද, ලෙස මාත්‍රයකින් එත් ණන යුතු ය. එහෙයින් මුඛ මාත්‍රයක් දැක්වීමෙන් මේ කම්-විපාක ප්‍රකාශ කරන ලදී.)

මෙසේ මේ **මාදශවිධ කර්මීය** කම් වෘත්තයෙහි බහා නාම-රූපයතව ප්‍රත්‍යය පරිග්‍රහ කෙරේ. හෙතෙම මෙසේ **කර්මවට්ට-විපාකවට්ට** වශයෙන් ප්‍රත්‍යය හෙයින් නාම-රූපයන් ගේ පැවැත්ම බලා මේ දැන් පවත්නා සේ අතීතයෙහි කර්මවට්ට-විපාකවට්ට පැවැත්තේ ය. අනාගතයෙහිදු කර්මවට්ට-විපාක-වට්ට වශයෙන් ප්‍රත්‍යය විසින් පවත්නේය යි මෙසේ **කර්මීය ද, කර්මවිපාකය ද, කර්මවට්ටය ද, විපාකවට්ටය ද, කර්ම ප්‍රවෘත්තීය ද, විපාකප්‍රවෘත්තිය ද, කර්මසන්තතිය ද, විපාක සන්තතිය ද, ක්‍රියා ද, ක්‍රියාඵල ද,** වශයෙන්

කම්මං විපාකා වත්තන්ති - විපාකෝ කම්මසම්භවෝ
තස්මා පුනබ්භවෝ හොති - එවං ලෝකෝ පවත්තති

"කැමින් විඤ්ඤාණය පවතී - විඤ්ඤාණය කැමින් උපදනේ,
එයින් පුන බව වේ - මෙසේ සත්ත්ව ලෝ පවතී."

යැයි දකී. මෙසේ නුවණින් දක්නා ඒ යෝගී හට පූර්වාන්තාදිය නිසා පෙර කී සේ 'මම් වීම්දැ යි' යනාදී නයින් කියන ලද **සොළොස් වැදෑරුම් විචිකිච්ඡාව** ප්‍රහීණ වේ.

සියලු භව- **යෝනි- ගති- ස්ථිති- සත්ත්වාවාසයන්හි** හෙතු-ඵල සම්බන්ධ වශයෙන් පවත්නේ නාම-රූප මාත්‍රය ම යැ යි වැටහේ. ඒ යොගාවචර තෙම හෙතුවෙන් මත්තෙහි කාරණ-යක් නො දක්නේ විපාක පැවැත්මෙන් මත්තෙහි විපාක විඳින්නකු නො දකී. 'කාරණය ඇති කල්හි කාරකය යි ද, විපාක ප්‍රවෘත්තිය ඇති කල්හි ඵල විඳින්නේය, යි ද ව්‍යවහාර මාත්‍රයෙකින් පණ්ඩිතයන් ව්‍යවහාර කෙරෙති' යි මෙසේ මේ යොගී තෙමේ මනා නුවණින් මෝහවට දකී.

එයින් කීහ **හැරුණියෝ**:-

කම්මස්ස කාරකෝ නත්ථි - විපාකස්ස ච වේදකෝ
සුද්ධධම්මා පවත්තන්ති - එවෙතං සම්මදස්සනං

එවං කම්මවිපාකෙ ච - වත්තමානෙ සහෙතුකෙ
බීජරුක්ඛාදිකානංව - පුබ්බාකොටි න ඤ්ඤති

අනාගතෙපි සංසාරෙ - අප්පවත්තනං න දිස්සති
එතම්පඨමතඤ්ඤුඤ්ච - තීහාකාරෙහි අසයං වසී

සත්ත සඤ්ඤං ගහෙත්වාන - සස්සතුච්ඡෙදදස්සිනෝ
ඛාසඤ්ඤිං ගණ්හන්ති - අඤ්ඤමඤ්ඤං විරොධිතා

දිට්ඨබන්ධන බද්ධා තෙ - තණ්හාසොතෙන වුය්හරෙ
කණ්හාසොතෙන ථීයන්ති - න තෙ දුක්ඛා පමුච්චරෙ

එවමෙතං අනිඤ්ඤසුඛ - භික්ඛු බුද්ධස්ස සාවකෝ
ගම්භීරං නිපුණං සුඤ්ඤං - පච්චයං පටිවිජ්ඣති

කම්මං නත්ථි විපාකම්හි - පාකෝ කම්මෙ න විජ්ජති
අඤ්ඤත්‍රමඤ්ඤං උභෝ සුඤ්ඤං - නව කම්මං විනා ඵලං

යථා න සූරියෙ අග්ගි - න මණ්ඩිඔහි න ගොමයෙ
න තෙසං බහි සෝ අත්ථි - සම්භාරෙහි ච ජායති

තථා න අඤ්ඤා කම්මස්ස - විපාකෝ උපලබ්භති
බහිද්ධාපි න කම්මස්ස - න කම්මං තත්ථ විජ්ජති

ඵලෙන සුඤ්ඤකං කම්මං - ඵලං කම්මෙ න විජ්ජති
කම්මං ච ඛෝ උපාදාය - තතෝ නිබ්බත්තතී ඵලං

න හෙත්ථ දෙවෝ න බ්‍රහ්මා - සංසාරස්සත්ථි කාරකෝ
සුඤ්ඤධම්මා පවත්තන්තී - හෙතුසම්භාරපච්චයා

"කම් කරනුවෙක් නැති - විඳා විඳිනෙක් නොද ඇති,
හුදු දහම් පවතින්නේ - මේ මැයි දැකුම් තතු සේ"

"මේ ලෙසින් සහේතුක - කම් හා විඳා ඇති කලැ,
බිජුවට රුක් ලිය සේ - මුල් කොණ නො දක්නේ වේ"

"මතු කල සසරෙහි ද - කෝ පැවැත්මෙක් නො දිස්නේ,
මේ අරුත නො දැක තොටුවෝ - මිසදිටු වසඟ වූවෝ"

"සත් සත් ගෙන සහස් - වත* උසිදු† දිටු ගැත්තෝ,
එකිනෙක විරුදු බව් ඇති - දෙසැටක් කුදිටු ගත්තෝ"

"කුදිටු බැම් බැඳුණෝ - තණ‡ සැඩ පහර ගිල්වත්,
තණ හෝ වාරදී වැටුණෝ - සසර දුකින් නො මිදෙනෝ"

"මෙසේ මෙ නියත තතු - දතු බුදු සැව මහණතෙමේ,
ගැඹුරු සියුම් අත් බැවින් - සුන්‖ පය දහම පිළිවිදි"

"කම් විඳායෙහි නැත් - කම්හිදු විඳා නැත්මැයි,
ඒ දෙක උනුන් සුන් වේ - කම් නැත* විඳා නැත්තේ,

"ඉරු හිරුකැන්මිණෙහි - ගොම සුන්නෙහි ද ගිනි නැත්,
ගිනි ඉන් බැහැර ද නො වේ - මොවුනතුරෙහි මෑ වනුයේ"

---

* ඡාඤ්චත † උවෙජ්ද ‡ තාඅඤ්ඤා ද තාඅඤ්ඤා සැඩ පහර
‖ ආත්ම භාවයෙන් ශූන්‍ය වූ * කෂීය නැති කල්හි

"කම් ඇතුළත විටෘ - නො ලැබේ කැමින් පිටත ද,
විටෘ ඇතුළත එලෙසින් - කම් නො ලැබේ කිසි ලෙසින්"

"පෙලෙන්* කම් සුන් වේ - කම්හිදු පලය නැත්තේ,
එතෙකුදු වුව කම් ඇසිරූ - විටෘ පලය උපද්දී"

"දෙව්යෙක් බඹෙක් හෝ - මේ සසර කරන්නෙක් නැති,
හේ† පස නිමිත්තෙන් මෙහි - හුදු දම් මතු පවත්නේ,

විශෙෂ:- බීජයෙන් වෘක්ෂයැ, වෘක්ෂයෙන් නැවැතැ බීජයැ යි මෙසේ වෘක්ෂ බීජ සන්තතිය අනාදිකාලික හෙයින් පූර්ව කොටිය නොඇතෙන්නා සේ 'කම්ප්‍රත්‍යයයෙන් විපාකයැ විපාක ප්‍රත්‍යයයෙන් නැවැතැ කම්යැ යි කම් විපාක සන්තතිය අනාදිකාලික හෙයින් පූර්වකොටිය නො පැනේ.

මෙසේ **කම්මවට්ට-විපාකවට්ට** වශයෙන් නාම-රූපයන්ගේ ප්‍රත්‍යය පරිග්‍රහ කොට අතීතාදී කාලත්‍රයයෙහි විච්කිවජ්ජාව ග්‍රහණ කළ ඒ යෝගීහට සියලු අතීත- අනාගත- ප්‍රත්‍යුත්පන්න ධර්මයෝ චුති පටිසන්ධි වශයෙන් ප්‍රකට වෙති. **අනුපද ධර්ම වශයෙන් නො වේ.**

ඒ යොගීහු ගේ ඒ ප්‍රඥාව නාම-රූප පරිග්‍රහ කිරීම හා නාම-රූපයන් ගේ ප්‍රත්‍යය පරිග්‍රහ කිරීමද යි මෙසේ ක්‍රමයෙන් පරිවෙජ්ද වශයෙන් දත් හෙයින් **ඤාතපරිඤ්ඤා නමු.**

ඒ යොගී මෙසේ දනී. අතීත භවයෙහි කම්ප්‍රත්‍යයයෙන් උපන් සඤ්ඤයෝ ඒ භවයෙහි ම නිරුද්ධ වූහ. අතීත කම්ප්‍රත්‍යයයෙන් මේ (වර්තමාන) භවයෙහි අනික් සඤ්ඤ පහළ වූහ. ඒ අතීත භවයෙන් මේ භවයට ආ එක ද ධර්මයකුදු නැත්තේ ය. මේ භවයෙහි ද කම්ප්‍රත්‍යයයෙන් නිපන් සඤ්ඤයෝ මේ භවයෙහි ම නිරුද්ධ වන්නාහ. පුනර්භවයෙහි අනික් සඤ්ඤ පහළ වන්නාහ. මේ භවයෙන් පුනර්භවයට එක ද ධර්මයෙක් නොයන්නේ යැ. එහෙයින් ධර්මයන් ගේ භවාන්තර (අන්‍ය භවයකට) සංක්‍රමණයෙක් නම් නැත්තේ යැ කියා යි.

නිදර්ශන:- ගුරු මුඛයෙන් හැදෑරූ මන්ත්‍රාදිය අතවැසියා ගේ මුඛයට නො පිවිසේ එහෙත් ඒ නො පිවිසීමෙන් අතවැස්සා ගේ මුඛයෙහි හැදෑරීම නො පවත්නේ නො වේ. පවත්නේ මැයි. දූතයා බී මන්ත්‍රාදකයා රෝගියා ගේ උදරයට නො වදී. ඒ

---

* ඵලයෙන් † හෙතු ප්‍රත්‍යය ‡ ශුද්ධධාතු මාත්‍රය

නො වැදීමෙන් ඔහු ගේ රෝගය නො සන්සිඳෙන්නේ නො වේ. සන්සිඳේමැ සි. මුහුණෙහි වූ අලඞ්කාර විධානය කැටපත් තලාදියෙහි මුඛප්‍රතිබිම්බයට නො පැමිණේ. ඒ නො පැමිණීමෙන් කැටපත් ආදියෙහි අලඞ්කාර විධානය නො පැතෙන්නේ නො වේ. පැතේ මැ සි. එක් ඉඟන් වැටියක පහන් සිළුව අනික් පහන් වැටියෙහි සංක්‍රමණය නො වේ. එහෙත් ඒ හේතුවෙන් ඒ පහන් වැටියෙහි පහන් සිළුව නො දැල්වෙන්නේ නො වේ. දැල්වේමැ සි.

මෙසේ ම අතීත භවයෙන් මේ භවයට ද, මේ භවයෙන් පුනර්භවයට ද කිසිදු ධර්මයෙක් සංක්‍රමණය නො වේ. එහෙත් අතීත භවයෙහි **ඛන්ධ- ආයතන- ධාතු**- ප්‍රත්‍යයයෙන් මේ භවයෙහි ද, මේ භවයෙහි **ඛන්ධ- ආයතන- ධාතු** ප්‍රත්‍යය-යෙන් පුනර්භවයෙහි ද **ඛන්ධ- ආයතන- ධාතු** නූපදින්නාහු නො වෙති. උපදිනාහුමැය සි දනී.-

යථෙව චක්ඛුවිඤ්ඤාණං - මනොධාතු අනන්තරං
න වෙව ආගතං නාපි - න නිබ්බත්තං අනන්තරං

තථෙව පටිසන්ධිම්හි - වත්තතෙ චිත්තසන්තති
පුරිමං භිජ්ජති චිත්තං - පච්ඡිමං ජායතී තතො

තෙසං අන්තරිකා නත්ථි - වීචි තෙසං න විජ්ජති
න චිතො ගච්ඡති කිඤ්චි - පටිසන්ධි ච ජායති.

"මනදෑ* අනතුරුහි - සක්විතැණින්† නො ආයේ
එතෙකුදු එයම්‡ අනතුරු - නො නිපන්නේ ද නො ද වේ"

"එ මෙන් පිළිසඳෙහි ද - සිත් පරපුර පවත්නේ
පළමු සිතදී බුන් අනතුරු - පිළිසඳ සිත උපද්දී"

'ඔවුනතුරු·|· කිසිවක් - නැති ඉන්* අතුරු නැත්මැ සි
මින්☼ කිසිවක් එහි✻ නොයේ - පිළිසඳ සිත ද උපදී"

මෙසේ වුනි - පටිසන්ධි වශයෙන් දක්නාලද සියලු ධර්ම **ඇති** ඕනට සම්භාරයෙන් නාම-රූපයන් ගේ ප්‍රත්‍යය පරිග්‍රහ ඥානය

---

* (මනොධාතු) පඤ්චවාරාවජ්ජනය † (සක්විතැණ +) ඉන් = පඤ්චද්වාරාවජ්ජනයෙන් ‡ ඒ පඤ්චවාරාවජ්ජනයට දී වුනි සිත ·|· වුනි ප්‍රතිසන්ධි අතර * වුනිසිතට හා ප්‍රතිසන්ධි සිතට අතර ☼ වුනි සිතින් ✻ ප්‍රතිසන්ධි සිත

සවිර ඔවට පැමිණියේ වේ. **සොළොස් වැදෑරුම් කඞ්ඛාව ප්‍රහීණ වේ.** හුදෙක් ඒ මතු නො වේ. (සත්තරිකඞ්ඛති) යනාදී ක්‍රමයෙන් පැවැති අට වැදෑරුම් සැකය ද, ප්‍රහීණ වේ. **දෙසැට දෘෂ්ටිහු** විෂකම්හණය වෙති.

විශෙෂ:- බුද්ධ- ධම්ම- සංඝ- ශික්ඛා- පුබ්බන්ත- අපරන්ත- පුබ්බන්තාපරන්ත – **පච්චයි සමුප්පාදධම්ම** යන මේ අට තැන යි.

මෙසේ නාමා නයින් නාම-රූපයනට ප්‍රත්‍ය පරිග්‍රහයෙන් තුන් කල්හි කාංක්ෂාව ඉක්ම සිටි ඤාණය **කඞ්ඛාවිතරණ** විසුඬි ය යි දත යුතු. **යථාභූතඤාණ** ය යි ද එයට ම නම්.

විසඳර:- යව කී **සොළොස් විචිකිච්ඡාව** ද, බුදුන් කෙරෙහි සැක කරයි, යනාදී අට තැන්හි **විචිකිච්ඡාව** ද, **දෙ සැට දෘෂ්ටිය** ද ඉක්ම සිටි හෙයින් **කඞ්ඛාවිතරණ විසුද්ධි** යැයි ද, ධම්ම නම් ඵලය, එයට ප්‍රත්‍යය වූයේ ධම්සථිති යැයි (ප්‍රත්‍යය ධම්මයයි) ඒ ප්‍රත්‍යය ධම්මයන් පිරිසිඳ දන්නා හෙයින් **ධම්මට්ඨිතිඤාණ** යැයි ද, සංඝාර ධම්මයන් ගේ යථාසභාවය වූ අනිත්‍යාදිය දන්නා හෙයින් **යථාභූතඤාණ** යැයි ද **සම්‍යක් දර්ශන** යැයි ද මෙයට ම නම්. එයින් වදුළහ.

"අවිජ්ජා පච්චයා, සඞ්ඛාරා පච්චයසමුප්පන්නා, උභොපෙතෙ ධම්මා පච්චයසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ ඤාණං ධම්මට්ඨිතිඤාණන්ති"* 'අවිද්‍යාව හෙතාදි වශයෙන් සංඝාරයනට ප්‍රත්‍යය වේ. සංඝාර ප්‍රත්‍යය සමුත්පන්න වේ. 'මේ අවිද්‍යා ද ආශ්‍රවාදී ප්‍රත්‍යයයෙන් උපදනා හෙයින් ප්‍රත්‍යය සමුත්පන්න වත හෙයින් අවිද්‍යා සංඝාර දෙකම ප්‍රත්‍යය සමුත්පන්න යයි ප්‍රත්‍යය පිරිසිඳ දැනීම් වශයෙන් පැවැති ඥානය **ධම්මට්ඨිති ඥානය** නම් වේ.

ප්‍රශ්නය :- අනිත්‍ය වශයෙන් මෙතෙහි කරන්නේ කවර ධම් කෙනකුන් තතු සේ දනී ද? දකී ද?

උත්තරය:- අනිත්‍ය වශයෙන් මෙතෙහි කරන්නේ නිමිත්ත සඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධය තතු සේ දනී, දකී. ඒත සංඥ ප්‍රවෘත්තියට වසතු හෙයින් නිමිත්ත නම් වේ. **එහෙයින් සම්‍යක් දර්ශනය** යි කියයි.

ප්‍රශ්නය :- ඔහට සම්‍යක් දර්ශනය කෙසේ වේ ද?

---

* ප: ම:

උත්තරය:- සංස්කාර විෂයෙහි නිත්‍යතා ලෙශයකුදු නැති හෙයින් **අනිත්‍ය** වශයෙන් බලන්නාහට තතු සේ වැටහේ. **එහෙයින් සම්‍යක්දර්ශනය** වේ.

ප්‍රශ්නය:- කෙසේ ප්‍රත්‍යක්ෂයෙන් දත් දේ අනු වැ යෑමෙන් සෙ‍ස් ධර්මයෝ අනිත්‍ය වශයෙන් දක්නා ලද්දේ වෙත් ද?

උත්තරය:- වර්තමාන සන්තතියෙහි මෙන් අතීත - අනාගත **සන්තති**-යෙහි ද ත්‍රිලක්ෂණ වශයෙන් එළවා **සියලු සංස්කාර අනිත්‍යය** යි මනාව දර්ශනය වේ.

ප්‍රශ්නය :- සැකය කොතැන්හි ප්‍රහීණ වේ ද?

උත්තරය:- **බුද්ධාදී අට තන්හි ද, ෂෝඩශ** (16) **විචිකිච්ඡාස්ථාන** යෙහි ද- **මාෂෂ්ටිදෘෂ්ටියෙහි ද,** පිහිටි **කාංක්ෂාව** ප්‍රහීණ වේ. (විසඳාර ටීකාහි වේ.)

ප්‍රශ්නය :- දුඃඛ වශයෙන් මෙනෙහි කරන්නේ කවර ධර්ම කෙනෙක් තතු සේ දනී ද? දකී ද?

උත්තරය:- දුක් වශයෙන් මෙනෙහි කරනුයේ උපාදාන **නම්** වූ **සන්තති** ප්‍රවෘත්තිය කෙලෙශාභිසංස්කාරයන් විසින් පවත්-වන හෙයින් අතිශයින් දුක්යැ යි දැනීම - දුකිම (වැටහීම) වේ. සෙස්ස ද මෙසේ යි.

ප්‍රශ්නය :- **අනාත්ම** වශයෙන් මෙනෙහි කරන්නේ කවර ධර්මයන් තතු සේ දනී ද? දකිද?

උත්තරය:- අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නේ නිමිත්ත ප්‍රවෘත්තිය යි කියන ලද අධ්‍යාත්ම වූ ද, බාහිර වූ ද, සියලු **සප්‍රත්‍යය** නාම - රූප ධර්මයන් තතු සේ දනී, දකී, සෙස්ස ද මෙසේ මැ යි. මෙහි කාංක්ෂා ප්‍රහීණ වේ,

ප්‍රශ්නය :- **යථාභූතඥානය, සම්‍යක්දර්ශනය, කඞ්ඛාවිතරණය** යන මේ ධර්මයෝ **නානාර්ථයෝ** වෙද්ද? නානා ව්‍යඤ්ජන-යෝ වෙද්ද? නොහොත් එකාර්ථ වෙද්ද? ව්‍යඤ්ජනයෝ ම නා නා වෙද්ද?

උත්තරය:- **යථාභූතඥානය, සම්‍යක්දර්ශනය, කඞ්ඛාවිතරණය,** යන මෙහු **එකාර්ථයෝ** යැ. ව්‍යඤ්ජන ම වෙනසි. මේ නුවණින් යුක්ත වූ විදර්ශක තෙමේ **බුදු සස්නෙහි** ලබන ලද ආශ්වාස (=ප්‍රතිෂ්ඨා) ඇත්තේ නියත ගති ඇත්තේ **සුලෝතාපන්න** නම් වේ.

විසඳුම:- පරමාර්ථ වශයෙන් ශාසනයෙහි ආශ්වාසය නම් **ආශ්‍රය ඵලය** යි ප්‍රතිඥා නම් **ආයෂ්මාර්ගය** යි. මේ යොගී තෙමේ **මාර්ග - ඵලාධිගම** තෙක කෙළේ ද ඒ අධිගම උපාය වූ ප්‍රතිපත්තියෙහි සිටී හෙයින් ලබන ලද ආශ්වාස ප්‍රතිඥා ඇත්තකු මෙන් වේ ය යි (මෙසේ) කියන ලදි.

ඒ මෙසේයි:- නොපිරිහුණු **කඞ්ඛාවිතරණවිසුද්ධි** ඇති විදර්ශක තෙමේ ලෞකික **සීල - සමාධි - ප්‍රඥාසම්භාරයෙන්** යුක්ත හෙයින් මත්තෙහි **මාර්ග-ඵලාධිගමය** තෙක කෙළේ ද සුගති පරායණ ම වේය යි **නියත ගතිකයෑ යි** කියන ලදී. එහෙයින් **චුල්ලසෝතාපන්න** නම් වේ. **සෝතාපන්නයා ද** අපාය දුගති විනිපාත ක්ෂය කළ හෙයිනි.

තවද **දිට්ඨිවිසුද්ධි** සමධිගමයෙන් ලබ්ධාශ්වාස නම් වේ. ඒ මෙසේ යි:- නාම-රූප පරිවෙජ්දයෙන් ස්කන්ධ- ධාතු- ආයතනයන් සවභාව-සරස වශයෙන් සලකා ශාසනයෙහි **ධම්මූපසංහිතප්‍රමොද්‍ය ප්‍රතිලාභයෙන්** ලබන ලද ආශ්වාස ඇත්තේ වෙයි.

කඞ්ඛාවිතරණවිසුද්ධි සමධිගමයෙන් **ලබ්ධප්‍රතිඥ වේ.** ඒ මෙසේ යි:- හෙතු ප්‍රත්‍යය සහිත **නාම-රූප** දර්ශනයෙන් මඩනා ලද දිට්ඨිකණ්ටක ඇත්තේ **අහෙතුක-විසම හෙතු** වාදයන් මැඩ-පියන ලද්දේ තම තමා පිළිබඳ ප්‍රත්‍යයයෙන් ම ධර්ම ප්‍රවෘත්තිය දැන ශාසනයෙහි පිහිටුවන ලද ශ්‍රද්ධා ඇත්තේ **ලබ්ධප්‍රතිඥ නම් වේ. නාම-රූප** වවස්ථානයෙන් **දුඃඛසත්‍යය ද, ධම්මට්ඨිතිඤාණයෙන් සමුදය සත්‍යය ද,** එය ම මැන භාගයෙහි **අනිත්‍ය** වශයෙන් මෙනෙහි කිරීමාදී ක්‍රමයෙන් **මාර්ගසත්‍යය ද,** විශිෂ්ට ඥානයෙන් දැන නාම-රූප ප්‍රවෘත්තියෙහි දුඃඛභාවය දැක අප්‍රවෘත්තිය වූ **නිරෝධ** (නිර්වාණ) **යෙහි** එකාන්න නැමුණු අදහස් ඇති බැවින් ලෞකික ඥානයෙන් ම **චතුරාර්ය සත්‍යයන්** අධිගත හෙයින් අපායෝනපත්තියට අභව්‍ය වූයේ **සෝතාපත්ති භූමියට*** භව්‍ය උත්පත්ති ඇත්තේ වන්නේය යි ද **නියත ගතිකය යි ද, චුල්ලසෝතාපන්නය යි ද** එයින් කියන ලදී. යනු (ටීකායි)

ඉන් නිබඳ සිහි ඇති - සැක දුරු කරන* රිසි ඇති
මහණ සැමයුරු **නම් රූ** - පස† පිරිගෑ‡ කරන්නේ

සාධු ජනයන් ගේ ප්‍රමොදය පිණිස කළ විශුද්ධිමාර්ගයෙහි ප්‍රඥා භාවනාධිකාරයෙහි **කඞ්ඛාවිතරණ විසුද්ධි නිර්දේශ** නම් වූ එකුන් විසිවන පරිවෙජ්දය යි.

---

* කඞ්ඛාවිතරණයෙහි † ප්‍රත්‍යය ‡ පරිග්‍රහ

20 මගඟාමගඟ ඤාණ දස්සන විසුද්ධි නිද්දේශය

ඔභාසාදි දස උපක්කිලෙසයන් ගෙන් මිදුණු මේ විදර්ශනා ප්‍රඥාව ආර්ය මාර්ගයට පුළුන්‍නාග වූ මාර්ගය සි ද, මේ ඔභාසාදී උපක්කිලෙස ආර්ය මාර්ගය සි හැනීම අමාර්ගය සි ද, මෙසේ මාර්ගය ද, අමාර්ගය ද පිරිසිඳ දැන සිටි නුවණ මාර්ග'මාර්ග-ඤාණදර්ශන විශුද්ධි නම.

ආරබ්ධ විදර්ශකයා හට අවභාසාදිය ඇති කල්හි මාර්ග-අමාර්ග දැනගන්නා නුවණ සමභව වන හෙයින් එය සම්පාදනය කරනු කැමැති යොගාවචරයා විසින් අතීතාදී භෙදභින්න සියලු සංසකාර ධර්මයන් කලාප වශයෙන් මෙනෙහි කිරීම් සඛ්‍යාත **නය විදර්ශනාව** පිණිස පළමු කොට ක්‍රමයෙන් යොග කට යුතු සි. ආරබ්ධ විදර්ශකයාහට ඔභාසාදිය සමභව වූ කල්හි **මාර්ගාමාර්ග-ඤානය** වේ. විදර්ශනාවට ද වකඛුදසකාදී කලාප සන්නර්ශනය මුල් වේ. එහෙයින් මෙය **කඞ්ඛාවිතරණ විසුද්ධියට** අනතුරු කොට උදෙසන ලදී.

තවද ක්‍රමයෙකි:- **තීරණපරිඤ්ඤාව** පවත්නා කලැ මගඟා-මගඟඤාණය උපදී. තීරණ පරිඤ්ඤාව ද ඤාත පරිඤ්ඤාවට අනතුරුවැ උපදී. එහෙයිනුදු **ඒ මාර්ගාමාර්ග ඤානදර්ශන විශුද්ධිය** සම්පාදනය කරනු කැමැත්තාහු විසින් කලාප සන්නර්ශනයෙහි පිළිවෙළින් යොග වැඩිය යුතුසි. මේ ඒ පිළිබඳ විනිශ්චය සි.

ඤාතපරිඤ්ඤා යැ, තීරණපරිඤ්ඤා යැ, පහානපරිඤ්ඤා-යැ සි ලෞකික පරිඥා තුනෙකි.

එයින් වදුලහ. **"අභිඤ්ඤෙය්‍යපඤ්ඤා ඤාතඤ්ඨෙන ඤාණං, පරිඤ්ඤෙය්‍යපඤ්ඤා තීරණට්ඨෙන ඤාණං, පහාතබ්බපඤ්ඤා පරිච්චාග-ට්ඨෙන ඤාණන්ති"*** යි 'රූපපත ලක්ෂණය ඇත්තේ රූපය'' යනාදි ඒ ඒ ධර්මයන් පිළිබඳ සවලක්ෂණය දන්නා නුවණ **අභිඤ්ඤෙය්‍ය-පඤ්ඤා** නම. ඒ සව ලක්ෂණය දැන ගන්නා හෙයින් **ඤාණ** නම්. "රූපය අනිත්‍ය යැ'' යනාදීන් සාමාන්‍ය ලක්ෂණය පිරිසිඳ දැන ගන්නා නුවණ **පරිඤ්ඤෙය්‍ය පඤ්ඤා** නම. එයම සන්නර්ශනාවියෙන් **ඤාණ** නම්. නිත්‍යසංඥදිය ප්‍රහාණය කිරීම පිළිබඳ දැන ගන්න නුවණ **පහානපඤ්ඤා** නම. එය නිත්‍යසංඥදිය පරිත්‍යාග (බැහැර) කිරීම් අර්ථයෙන් **ඤාණ** නම්."

* ප: ම: පරියඤ්ඤානිද්දේශ

විසර්ජනය:- 'රූපය රූපත්ව (බිඳීම්) ලක්ෂණයෑ, වේදනාව විඳීම් ලක්ෂණ යෑ, යනාදීන් **ඒ ඒ ස්කන්ධ- ධාතු- ආයතනාදීන්** ඒ ඒවාට අයත් ලක්ෂණයන් පිළිබඳවැ (ඇති සැටියෙන්) සැලකීම් වශයෙන් පැවැති ප්‍රඥාව **ඤාතපරිඤ්ඤා** යැ..

'රූපය අනිත්‍ය යැ, වේදනාව අනිත්‍ය යැ' යනාදී ක්‍රමයෙන් ඒ රූපාදී ධර්මයන්ගේ ම අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්ම යැ යන සාමාන්‍ය (සියල්ලට සාධාරණ) ලක්ෂණයට නඟා පැවැති සැටියෙන් වූ ලක්ෂණ ත්‍රයය අරමුණු කොට ඇති විදර්ශනා ප්‍රඥාව **තීරණපරිඤ්ඤා නම්**.

ඒ ත්‍රෛභූමක ධර්මයන් කෙරෙහි ම නිත්‍ය සංඥාදිය දුරු කිරීම් වශයෙන් පැවැති 'උණු බව නො හැර ම උණු දිය අරමුණු කරන්නා සේ' ලක්ෂණය නො හැර ම ස්කන්ධයන් අරමුණු කරන ලක්ෂණාලම්බනික විදර්ශනා ප්‍රඥාව **ප්‍රහාණ පරිඤ්ඤා නම්**.

ඒ ත්‍රිවිධ පරිඥ අතුරින් සඞ්ඛාර පරිච්ඡේදයේ (**නාම-රූප** පරිග්‍රහයේ) පවත් ප්‍රත්‍යය පරිග්‍රහය දක්වා පැවැති ප්‍රඥාව **ඤාත-පරිඤ්ඤාවට** භූමිය යි.

(**මතභෙද**:- ස්කන්ධාදිය ද විදර්ශනාවට භූමි හෙයින් සියලු **ස්කන්ධාදිය** විභාරණය සංස්කාර පරිච්ඡේදය යි ඇතැමෙක් **යෙති**.)

නාම-රූප පරිග්‍රහයේ පවත් ප්‍රත්‍යය පරිග්‍රහය නොක් මේ අතුරෙහි ත්‍රෛභූමක ධර්මයන්ගේ තම තමා අයත් **ලක්ෂණ** ප්‍රතිවේධයට ම අධිපති බව වේ.

චක්ඛුදශකාදී **කලාප** සම්මර්ශනයෙහි පවත් උදයව්‍යයානුදර්ශනය නොක් **තීරණ පරිඤ්ඤාවට** භූමිය යි. මේ අතුරෙහි **'නාමය නමන ලක්ෂණ** යැ, රූපය රූපත්ව **ලක්ෂණ** යැ' යනාදීන් සාමාන්‍ය ලක්ෂණය ප්‍රතිවේධයට ම අධිපති බව වේ.

භඞ්ගානුදර්ශනයේ පවත් මත්තෙහි **ප්‍රහාණපරිඤ්ඤාවට** භූමිය වේ.

විසර්ජනය:- ඒ **තීරණ - ප්‍රහාණ** පරිඥ දෙක ම **'නමන ලක්ෂණය නාමයැ' 'රූපත්ව ලක්ෂණය රූපයැ යි'** මෙසේ **නාම-රූපයන්** ගේ **සාධාරණ ආකාරය** සැලකීම් වශයෙන් පවත්නා හෙයින් එක් ආකාරයෙකින් **තීරණ පරිඤ්ඤා** ද, දිට්ඨි-කඞ්ඛාවන් **විෂ්කම්භණය** වන හෙයින් **ප්‍රහාණ** පරිඥ ද ලැබේය යි **තීරණ - ප්‍රහාණ**-යෙහිදු ආධිපත්‍යය වේය යි කියත්. උත්කෘෂ්ට වශයෙන් දිට්ඨි විසුද්ධියට සංඛාර පරිච්ඡේද බව වත්නාක් මෙන් **ලක්ෂණා**-ලම්බනික විදර්ශනාවට ම **තීරණ - ප්‍රහාණ** කෘත්‍ය භාවය දතයුතු.

එසේ කල්හි ත්‍රිවිධ ප්‍රඥාවෝ ම ව්‍යවස්ථිත වෙත්. මෙහි ප්‍රඥාව අනිත්‍යාදි ලක්ෂණ තීරණය කරන නෙයිනි. (සත්‍යාගත විස්තරය)

ඒ භඞ්ගානුපස්සනාවේ පවත් අනිත්‍යාදී වශයෙන් සංස්කාර සනමශීනය කරන්නේ නිත්‍ය යැ (ශාස්වත යැ) යි පැවැති මිථ්‍යා සංඥාව දුරු කෙරේ. (සංඥා ශීර්ෂයෙන් දිඹි චිත්තයා ගේ ග්‍රහණය වේ.) දුඃඛ වශයෙන් සනමශීනය කරන්නේ සුඛ සංඥාව දුරු කෙරේ. අනාත්ම වශයෙන් බලන්නේ ආත්ම සංඥාව දුරු කෙරේ. එසේ අනිත්‍යාදී වශයෙන් බැලීමෙන් සංඝකාරයන් කෙරෙහි කළකිරෙණ නුඹුය යි කියන ලද සප්‍රතිඝ තෘෂ්ණාව දුරු කෙරේ. සංඝකාරයන් කෙරෙහි නො ඇලීම් වශයෙන් බලන්නේ රාගය දුරු කෙරේ. නිරෝධානුපස්සනාවෙන් (සංඝකාර නිරුද්ධ වන හෙයින් පුනර්භවයෙහි නූපදනා සේ) බලන්නේ සංස්කාරයන් ගේ සමුදය (තෘෂ්ණාව) දුරු කෙරේ. පටිනිස්සඟ්ගානුපස්සනාවෙන් (සංඝකාරයන් නැවැතැ නො ගන්නා පරිද්දෙන් දුරු කරන්නේ) ග්‍රාහය දුරු කෙරේයැ යි මෙසේ නිත්‍ය සංඥාදීන් ප්‍රහාණය සිද්ධ කරන යම කි සපතඅනුපස්සනාවන් ගේ අධිපති බව වේ.

මෙසේ මේ ත්‍රිවිධ පරිඥාවන් ගේ සංස්කාර පිරිසිදීම ද, ප්‍රත්‍යය පරිග්‍රහය ද, සිද්ධකළ හෙයින් මේ යොගියා විසින් ඥාත පරිඥාව ම අධිගත වේ. අනික් තීරණ - ප්‍රහාණ පරිඥා ද අවබෝධ කළ යුතු වේ.

එයින් වදාළහ:- **"යස්මා තීරණ පරිඤ්ඤාය වත්තමානාය මඟඟා'මඟඟ ඤාණං උප්පජ්ජති. තීරණ පරිඤ්ඤා ච ඤාත-පරිඤ්ඤානන්තරා තස්මාපි තං මඟඟා'මඟඟ ඤාණදස්සනවිසුද්ධිං සම්පාදෙතු කාමෙන කලාපසම්මසනෙ තාව යොගො කත්තබ්බා"*** "තීරණ පරිඥාව ඇති කල්හි මඟඟාමඟඟඤාණය උපදී. තීරණ පරිඤ්ඤාව ද ඤාත පරිඤ්ඤාවට අනන්තරුවැ වේ. එහෙයින් ඒ මඟඟාමඟඟඤාණදස්සනවිසුද්ධිය සම්පාදනය කරනු කැමැති යොගියා විසින් කලාප සනමශීනයෙහි පිළිවෙළින් යොග වැඩිය යුතු ය" කියා සි. මේ ඒ පිළිබඳ පාළි ධර්මය සි. **"කථං අතීතානාගත පච්චුප්පන්නානං ධම්මානං සංඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං*"** 'ඒ කලාප සනමශීනය කෙසේ ද? අතීත - අනාගත - පච්චුප්පන්න ධර්මයන් එකට සංග්‍රහ-

* ඵ: ම: පරිඤ්ඤානිද්දේශ

කොට (ඔකුළුවා) අතීතාදී වශයෙන් මතු දැක්වෙන සේ විනිශ්චය කිරීමේ ප්‍රඥව අනිත්‍යාදී වශයෙන් සනමශීන (තීරණ) ය කිරීමේ ඤාණය වේ.

විභාග:- 'අතීත - අනාගත - පච්චුපන්න වූ හෝ - අධ්‍යාත්ම වූ හෝ - බාහිර වූ හෝ - ඔළාරික වූ හෝ - සුඛුම වූ හෝ - හීන වූ හෝ - ප්‍රණීත වූ හෝ - දුර වූ හෝ - ළඟ වූ හෝ යම් කිසි රූපයක් වේ නම් ඒ එකොළොස් වැදෑරුම් සියලු රූපය අනිත්‍ය වශයෙන් ව්‍යවසථා කෙරේ. ඒ එක් සනමශීනයෙකි. දුඃඛ වශයෙන් ව්‍යවසථා කෙරේ. එද එක් සනමශීනයෙකි. අනාත්ම වශයෙන් ව්‍යවසථා කෙරේ. එද එක් සනමශීනයෙකි. (විදශීනා ඤනයෙකි.)

යම්කිසි වෙදනාවක් - පෙ - යම් කිසි විඤනයක් - පෙ - අනාතම වශයෙන් මෙනෙහි කෙරේ නම් ඒ එක් සනමශීනයෙකි.

චක්ෂුව - පෙ - ජරා මරණ - අතීතානාගතපච්චුපපන්න වූ හෝ - පෙ - අනිත්‍ය හෙයින් ව්‍යවසථා කෙරේ නම් එක් සනමශීන යෙකි. දුඃඛ වශයෙන් ව්‍යවසථා කෙරේ නම් එක් සනමශීනයෙකි. අනාතම වශයෙන් ව්‍යවසථා කෙරේ නම් එක් සනමශීනයෙකි.

අතීත - අනාගත - ප්‍රත්‍යුපපන්න වූ රූපය ක්ෂය වන අර්ථයෙන් අනිත්‍ය යැ. භය වන අර්ථයෙන් දුඃඛ යැ. අසාර අර්ථයෙන් අනාතමයැ යි සංක්ෂෙප කොට ව්‍යවසථා කිරීමෙහි ප්‍රඥව සනමශී-නයේ ඤනය යි. වෙදනාව - පෙ - විඤනය, චක්ෂුව - පෙ - ජරා-මරණ - පෙ - සනමශීන ඤනය යි.

අතීත - අනාගත - ප්‍රත්‍යුතපන්න රූපය - අනිත්‍ය යැ, ප්‍රත්‍යයන් විසින් සකස් කරන ලද්දේ යැ. ප්‍රත්‍යයෙන් භව ගත්තේ යැ, ක්ෂය සවභාව ඇත්තේ යැ. ව්‍යය සවභාව ඇත්තේ යැ. විරාග සවභාව - නිරොධ සවභාවය ඇත්තේ යැ යි සංක්ෂෙපයෙන් ව්‍යවසථා කිරීමේ ප්‍රඥව සනමශීන ඤනය යි.

ජාති ප්‍රත්‍යයයෙන් ජරා - මරණ වේ. ජාතිය නැති කල්හි ජරා-මරණ නො වේ, යැ යි සංක්ෂෙප කොට ව්‍යවසථා කිරීමේ ප්‍රඥව සනමශීන ඤනය යි. භව ප්‍රත්‍යයයෙන් ජාතිය වේ. 'භවය (කර්මය) නැති කලැ ජාතිය නොවේ ය යි ද - පෙ -'අවිද්‍යා ප්‍රත්‍යය යෙන් සංස්කාර වේ. අවිද්‍යාව නැති කලැ සංස්කාර නොවේ ය යි ද සංක්ෂෙප කොට ව්‍යවසථා කිරීමේ ප්‍රඥව සන්මශීන ඤනය යි අතීත කාලයෙහි ද, අනාගත කාලයෙහි ද අවිද්‍යා ප්‍රත්‍යයයෙන්

සංස්කාර වේ යයි ද, අවිද්‍යාව නැති කලැ සංස්කාර නොවේ ය යි ද සංක්ෂේප කොට ව්‍යවස්ථා කිරීමේ ඥානය සන්තීරණ ඥානය යි. ඒ සන්තීරණයෙහි ඤාණය දක්නා ලද අර්ථයෙන් ඤාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමුදු. අතීත – අනාගත – පච්චුප්පන්න ධර්මයන් ගේ දැනීම සංක්ෂේප කොට ව්‍යවස්ථා කිරීම සන්තීරණයෙහි ඥානය යි. එහෙයින් කියන ලදී.

මෙහිදු "චක්ඛුං – පෙ – ජරාමරණං" යන මේ පෙය්‍යාලයෙන් ඛන්ධාරම්මණයන් හා සමග සඳහන් පැවැති ධර්ම ගැනේ. (විසාර ස්කන්ධ නිද්දේශාදියෙහි යැ.)* **පඤ්චුපාදානක්ඛන්ධ යැ, අට්ඨාරස ධාතු යැ, ඡඩාලම්බන යැ, ඡළේව විඤ්ඤාණ යැ, අට්ඨ සඵස්ස යැ, අට්ඨ වෙදනා යැ, අට්ඨ සඤ්ඤා යැ, අට්ඨ චේතනා යැ, අට්ඨ තණ්හා යැ, අට්ඨ විතක්ක යැ, අට්ඨ විචාර යැ, අට්ඨ ධාතු යැ, දස කසිණ යැ, දෙතිස් කොට්ඨාස යැ, දෙළොස් ආයතන යැ, අටළොස් ධාතු යැ, දෙවිසි ඉන්ද්‍රිය යැ. තුන් ධාතු යැ, නව භව යැ. ධ්‍යාන සතර යැ, අප්පමඤ්ඤා සතර යැ, සතර සමාපත්ති යැ, දෙළොස් පටිච්ච සමුප්පාදඞ්ග යැ,** යන මේ ධර්ම රාශිය සංක්ෂේප කරන ලදැ යි දතයුතු

විශේෂ:- මෙතෙක් දැක්වූ විස්තාරයෙහි ආදි කර්මිකයා ගේ විදර්ශනා මනසිකාර පහසුව සඳහා **"යං කිඤ්චි රූපං"** යනාදීන් පඤ්චස්කන්ධය අතීතාදී වශයෙන් විභාග කොට පළමු වැ ගන්නා ලදී. ඒ ස්කන්ධයන් ම ඛන්ධාර-ආලම්බනයන් හා ඛන්ධායත්හි පැවැති ධර්ම වශයෙන් විභාගය ලබන හෙයින් එයට අනතුරු වැ ඡඩ් වාරාදී වශයෙන් දශ ෂට්කයෝ දැක්වූහ. තව ද ත්‍රිවිධ ලක්ෂණයන් අතුරින් අනාත්ම ලක්ෂණය දුඃඛ විභාගය කරන හෙයින් ඒ විභාගය පිණිස ඡඩ් ධාතූහු ගන්නා ලද හ.

ඉක්බිති ශාස්තෘන්වහන්සේ ගේ ආත්මනිර්විශේෂ-ශය ධ්‍යානයන් නිසා වන හෙයින් එයට අනතුරු වැ දස කසිනය ගන්නා ලදී. අනතුරු වැ දුඃඛානුපස්සනාවට පරිවාර වශයෙන් පිළිකුල් ආකාර වශයෙන් දෙතිස් කොටස්හු ගන්නා ලද හ. පළමුවෙන් ස්කන්ධ වශයෙන් සැකෙවින් ගත් ධර්ම සංක්ෂේප-විස්තර නොවූ ද ක්‍රමයෙන් මෙතෙහි කළ යුතු බව දක්වනු පිණිස දෙළොස් ආයතන ද, අටළොස් ධාතු ද, ගන්නා ලදහ. මේ ආයතන – ධාතු යන ධර්මයන්, ශූන්‍ය බව යැ. නිරාත්මයෝ බව යැ, ජීවයී රහිත බව යැ, යන මොවුන්

* ප: ම: අභිඤ්ඤාඥානිද්දේශ

ඇති කල්හිදු ධර්මසවභාවයෙන් අධිපති බැවින් පැවැත් ම දැක්වීමෙන් අනාත්ම ලක්ෂණ විභාගවනු පිණිස දෙවිසි ඉඳුරෝ දක්වන ලදහ. මෙසේ අනෙක හෙද භින්න මේ ධර්ම, භූමිත්‍රයයට ඇතුළත් බැවින් ත්‍රිවිධ වේය යි දක්වනු පිණිස ධාතු ත්‍රය දක්වන ලදී. මෙසේ නිමිති දක්වා පැවැත් ම දක්වනු පිණිස කාමාදි නව භවය දක්වන ලදී.

මේ කී තාක් අභිඥෙය විෂයෙහි පැවැති මනසිකාර කෞශල්‍ය යෙන් යුක්තවූවහු විසින් සියුම් වූ මහදහන විෂයෙහි මනසිකාර පැවැත්විය යුතු බව් දක්වනු පිණිස ධ්‍යාන- අප්‍රාමාණ්‍ය · ආරූප්‍යයෝ ගන්නා ලදහ. (මෙහි ධ්‍යාන නම් පෙරකී ධ්‍යාන- යෙන් ශෙෂ වූ රූපාවචර ධ්‍යාන යැ.) මෙ කී තාක් ධර්ම, ප්‍රත්‍යය- ප්‍රත්‍යය – සමුත්පන්න විභාගයෙන් බෙදා, මෙනෙහි කටයුතු බව් දක්වනු පිණිස වාදස පටිච්චසමුප්පාදඞ්ගයෝ ගන්නා ලදහ. ප්‍රත්‍යයාකාර මෙනෙහි කිරීමෙන් ත්‍රිලක්ෂණය සුවසේ විභාග වන හෙයින් පසුව ගන්නා ලදී.

මෙසේ සන්නමගීතය කටයුතු සේ ගන්නා ලද මේ ධර්මයෝ ස්කන්ධාදි කොටස් වශයෙන් පස්විසි වැදෑරුම් වෙති. ප්‍රභෙද හෙයින් අගණිතගහණයෙන් ගෙන එක්සිය අට අනුවෙක් වේ. මෙය අභිඥෙය නිර්දේශයෙහි මෙසේ වදළහ.

"සබ්බං භික්ඛවෙ අභිඤ්ඤෙය්‍යං"* යනාදී විසිනි. "මහණෙනි! සියල්ල දතයුතු ය මහණෙනි! දතයුතු සියල්ල කිම? මහණෙනි! චක්ඛුපසාදය දත යුතු ය. රූපාලම්බනය දතයුතු ය. චක්ඛුවිඤ්ඤාණය දතයුතු ය චක්ඛුසම්ඵස්සය දත යුතු ය. චක්ඛුසම්ඵස්ස ප්‍රත්‍යයයෙන් උපදනා සැප වූ හෝ දුක් වූ හෝ මැදහත් වූ හෝ වෙදනාව දතයුතු ය.

සොතය ද -පෙ- ඝාණ ය ද -පෙ- ජිව්හා ය ද -පෙ- කාය ද -පෙ- මනොය ද -පෙ- ධර්ම සංඥා ද- මනොසම්ඵස්ස ප්‍රත්‍යයයෙන් උපදනා සුඛ වූ හෝ දුක්ඛ වූ හෝ අදුක්ඛමසුඛ වූ හෝ වෙදනාව දත යුතු ය. රූපය -පෙ- විඤ්ඤාණ යැ. චක්ඛුපප- සාදයැ -පෙ- චිත්ත යැ, රූප යැ -පෙ- ධර්ම යැ. චක්ඛුවිඤ්ඤාණ යැ. -පෙ- මනොවිඤ්ඤාණ යැ. -පෙ- චක්ඛුසම්ඵස්ස යැ -පෙ- මනොසම්ඵස්ස යැ චක්ඛුසම්ඵස්සජවෙදනා යැ.-පෙ-මනොසම්ඵස්සජ වෙදනා යැ. රූපසඤ්ඤා යැ -පෙ- ධම්මසඤ්ඤා යැ. රූපය අරමුණු කොට උපන් චෙතනා යැ -පෙ- ධර්මයන් නිසා හටගත්

*ප: ම: අභිඤ්ඤෙය්‍ය නිද්දෙස

වෙතනා ය, රූප තෘෂ්ණා ය -පෙ- ධම්ම තෘෂ්ණා ය, රූප විතර්ක ය -පෙ- ධම්මවිතර්ක ය, රූප විචාර ය -පෙ- ධම්මවිචාර ය, පඨවිධාතු ය -පෙ- විඤ්ඤාණ ධාතු ය, පඨවිකසිණ ය -පෙ- විඤ්ඤාණ කසිණය, කෙස් ය -පෙ- මත්ථලුඞ්ග ය, චක්ඛායතන ය -පෙ- ධම්මායතන ය, චක්ඛුධාතු ය -පෙ- මනෝවිඤ්ඤාණ ධාතු ය, චක්ඛින්ද්‍රිය ය -පෙ- අඤ්ඤතාවින්ද්‍රිය ය, කාම ධාතු ය, රූප ධාතු ය, අරූපධාතු ය, කාම භව ය, රූප භව ය, අරූප භව ය, සඤ්ඤාභව ය, අසඤ්ඤි භව ය, නෙවසඤ්ඤානාසඤ්ඤි භවය, එකවොකාර භවය, චතුවොකාර භවය, පඤ්චවොකාර භවය. පඨමජ්ඣානය -පෙ- චතුත්ථජ්ඣාන ය, මෙත්තා චෙතෝ විමුත්තිය -පෙ- උපෙක්ඛාචෙතෝ විමුත්තිය, ආකාසානඤ්චායතන සමාපත්තිය -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය යන ධම්මයෝ ද දහයුතු වෙත්. අවිද්‍යාව දහයුතු ය -පෙ- ජරා-මරණ දහයුතු ය, (ඒ අභිඤ්ඤෙය්‍ය ධම් පටිසම්භිදා මාගී අභිඤ්ඤෙය්‍ය නිදේශයෙහි විසතර කොට වදාළ හෙයින් මෙහි එය පෙය්‍යාලයෙන් සංක්ෂෙප කරන ලදී.)

විශෙෂ:- මෙසේ සැකෙවින් දක්වන ලද මේ ධම් රාශියෙහි වදාරන ලද **අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය** ය ආදී ලොකොත්තර ධම් සතමශීතයට නො එළඹෙන හෙයින් මේ සත්මශීතඤ්ඤා-වසථාවෙහි නො ගත යුතුයි. එහෙත් සත්මශීතයට එළඹෙන ධම්යන් අතුරින් යෝගීහට යම් යම් ධම්යක් ප්‍රකට වේ නම් සුවසේ පරිග්‍රහ කට හැකි වේ නම්, ඒ ධම්යන් විෂයෙහි ඒ යොගියා විසින් සත්මශීතය ආරම්භ කවයුතු යි. (පසු වැ නො වැටහෙන ධම් ද උපායයෙන් වවහා ගෙන නිරවශෙෂයෙන් සත්මශීතය කවයුතු යි.)

තවද (1) **"අනිත්‍ය වශයෙන් ව්‍යවසථා කෙරේ"** යනාදීන් පළමුවන ලක්ෂණ ව්‍යවසථාපන වාරය ද

(2) **"ක්ෂය වන අර්ථයෙන් දුඃඛ ය"** යනාදිය දෙවන හෙතු වාරය ද

(3) **"අනිත්‍යය ප්‍රත්‍යයයන් විසින් කරන ලද්දේ ය"** යනාදිය ලක්ෂණයට හෙතු කියන හෙයින් හෙතුප්තිඨාපන වාරය ම එයට හෙතු පිහිටුවීම සඳහා (සංඛතය) ප්‍රත්‍යයයන් විසින් කරන ලද්දේ ය, යනාදිය ද කියන ලදී. එසේ ප්‍රත්‍යය-යෙන් නිපන් ධම් නිරුඬ වන සුභාවය ඇත්තේ යි. නිරුඬ

නො වන්නෙක් නැති. ඒ යට කී ස්කන්ධ පඤ්චකාදී වාරයන් අතුරින් මතු ස්කන්ධ වශයෙන් සම්මර්ශනය ගේ ආරම්භ විධානය කියනු ලැබේ.

"යං කිඤ්චි රූපං අතීතානාගත පච්චුප්පන්නං -පෙ- සබ්බං තං රූපං අනිච්චතො වවත්ථපෙති එකං සම්මසනං"* මෙහි මේ නිස්සුතෙම 'යම්කිසි රූපයකැ යි මෙසේ අනියම-යෙන් දක්වන 'ලද සියලු රූපය අතීතාදී ත්‍රිකයෙන් හා අජ්ඣත්තිකාදී ඒක සතර වශයෙන්දැ යි භූමි අවකාශ, පුද්ගල-අවකාශ වශයෙන් එකොලොස් අවකාශයකින් පිරිසිඳ සියලු රූපය අනිත්‍යාදී වශයෙන් ව්‍යවස්ථා කෙරේ. එනම් අනිත්‍යයැ යි විදර්ශනා කෙරේ.

ඒ මෙසේ යි: **"යං කිඤ්චි රූපං අතීතානාගත පච්චුප්පන්නං -පෙ- අනිච්චං ඛයට්ඨෙන"*** 'යම් රූපයෙක් අතීත වේ ද (ඉපිද නිරුඩ්ධ වී ද) ඒ රූපය අතීතයෙහි ම ක්ෂය වූයේ ද? මේ භවයට නො පැමිණියේ ද? එහෙයින් (**ක්ෂය**ාර්ථයෙන්) **අනිත්‍ය යැ.** මතු අනතුරු භවයෙහි යම් රූපයෙක් උපදී ද හෙද එහි ම **ක්ෂය**ට පැමිණේ. එයින් තුන්වන භවයට නො පැමිණේය යි **ක්ෂය**ාර්ථයෙන් **අනිත්‍ය යැ** ප්‍රත්‍යුත්පන්න වූ යම් රූපයෙක් වේ නම් එය ද මේ භවයෙහි ම **ක්ෂය** වේ. මෙයින් දෙවන භවයට නො පැමිණේය යි **ක්ෂය**ාර්ථයෙන් **අනිත්‍ය යැ.** යම් අධ්‍යාත්ම (සඞ්ඝනනානාගත) රූපයෙක් වේ නම් හෙද අධ්‍යාත්මයෙහි ම **ක්ෂය** වේ. බහිර්ධා රූප ඛවට නො යේය යි **ක්ෂය**ාර්ථයෙන් **අනිත්‍ය යැ**. යම් බාහිර රූපයෙක් වේ නම් හෙද බැහැරදී ම **ක්ෂය** වේ. අධ්‍යාත්ම රූප ඛවට නො යේ ය යි **ක්ෂය**ාර්ථයෙන් **අනිත්‍යයැ.** ඕදාරික රූපය ද, සියුම් රූපය ද, හීන රූපය ද, ප්‍රණීත රූපය ද, දුර වූ රූපය ද, සන්තික වූ රූපය ද යන ඒ සියලු රූපය ම එහි ම **ක්ෂය** වේ. දුර රූප ඛවට නො යේය යි **ක්ෂය**ාර්ථයෙන් **අනිත්‍යයැ යි** මෙසේ සත්‍යාකාර-නය කෙරේ. මේ අතීතාදී එකොලොස් අවකාශසථ රූපය ම **"අනිච්චං ඛයට්ඨෙන"** යි මේ සම්මර්ශනය ගේ වශයෙන් එක් සම්මර්ශනයෙක.

ඒ සියලු රූපය ම භය**ාර්ථ**යෙන් දුක් වේ. **"දුක්ඛං භයට්ඨෙන"** යි සම්මර්ශනය කෙරේ. 'මම විනාශ වෙමි. 'මා සතු දෙය විනාශ වේය' යි සිතන්නා වූ අප්‍රතිඥ කෙලෙස් ඇත්තහුට භය උපදී. **සිඟාලපම සූත්‍රය**‡ දෙසූ කල දෙවියන්ට ද

---

* **ප: ම: ඤාණ කථා** ‡ **අ: නි: චතුක්ක නිපාතය**

හය උපන්නාක් මෙනි. (යමක් අනිත්‍ය නම් එය හය සහිත බැවින් දුක් වේ.)

යමක් දුක් වේ නම් එය අසාර **අවියෙන් අනාත්ම** වේ. **"අනත්තා අසාරට්ඨෙන"** යි එසින් වදළහ. ආත්මය යි ද, තමහට වසඟ වූවෙක් ඇතැයි ද, කාරකයෙක් ඇතැ යි ද, විඳින්නෙක් ඇතැයි ද, තමහට වසඟ වන සුලුය යි ද, මෙසේ සලකන ලද **ආත්ම** සාරයක් ඇතැයි **කල්පනා කරනු** ලැබේ ද, හෙද ඒකාන්තයෙන් අනිත්‍ය ය. දුඃඛ ය. (එහෙයින් ම) එයට තමා පිළිබඳවූ ද, අනිත්‍යභාවය හෝ උත්පාද-ව්‍යය දෙක්හි පෙළීම හෝ වැළකීමට නො හැකි වේ. ඔහු ගේ **කාරකාදී** භාවයෙක් කොයින් වේ ද?

එසින් වදළහ.

"රූපංච හිදං භික්ඛවෙ අත්තා අභවිස්ස න ඉදං රූපං ආබාධාය සංවත්තෙය්‍ය"* 'මහණෙනි! රූපය ආත්ම වේ නම් එය ආබාධ පිණිස නො පවත්නේය" යි. මේ වශයෙන් එක් සන්මශීනයෙක. එය හෙදයෙන් එකොළොස් වැදෑරුම් වේ. වෙදනාදී සෙසු සකඬ සතරෙහි ද මේ ක්‍රමය මැයි. **මෙසේ** රූපසකඬයෙහි අහෙද හෙයින් ත්‍රිවිධ සන්මශීනය හෙදයෙන් තෙතිස් වැදෑරුම් වේ.

මෙසේ පඤ්චසකඬ වශයෙන් **සන්මශීන** හෙද **එක්සිය** පන්සැවෙක් (33 × 5=165) වේ. ඛාරමට්ඨාදියෙහි ද මේ **තයින්** ම යථායොගයෙන් සන්මශීන හෙද දත යුතු යි. තවද **අන්‍යවූයේ නියමයෙන්** සඬ්ඛතාදී හෙදයට යන හෙයින් එයට පර්‍යාය දැක්වීම පිණිස හෝ නානාප්‍රකාරයෙන් මනසිකාර ප්‍රවෘත්තිය දැක්වීම පිණිස හෝ **"රූපං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චං සඬ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මං"**† යි 'අතීත- අනාගත- පච්චුප්පන්න වූ ඒ රූපය ඇතිවැ නැති වන හෙයින් අනිත්‍ය ය. හෙතුප්‍රත්‍යයයෙන් කරන ලද්දේ ය' ප්‍රත්‍යයයෙන් නිපන්නේ ය, **ක්ෂය වන** සුභාවය **ඇත්තේ** ය, ව්‍යය වන සුභාවය ඇත්තේ ය, එහෙයින් (ආශාව) සිදෙන සුභාවය ඇත්තේ ය. නිරුද්ධවන සුභාව ඇත්තේය' යි කැවැතැ පාළිය වදරන ලදී.

වේදනාදියෙහි ද මේ ක්‍රමය මැ යි. ඒ යොගී පඤ්චස්කඬයෙහි එකී **අනිත්‍ය- දුඃඛ- අනාත්ම** සන්මශීනයා ගේ සථිර භාවය පිණිස **"කතමෙහි චතූහාරීසාය ආකාරෙහි අනුලොම-**

* සං: නි: නිදානසංයුත්ත | † ම: මහාවග්ග

ඛනතිං පවිලහති කතමෙහි චතූහාලීසාය ආකාරෙහි සම්මතතනියාමං ඔකකමතී* යි කවර සතලිස් ආකාරයෙකින් ආර්‍යමාර්ගඵලයට අනුලොම් වූ ඥානක්ෂාන්තිය පිළිලබා ද -පෙ- ආර්‍ය්‍ය මාර්ගයට බසී ද' යන මේ පෘච්ඡා විභඞ්ගයෙහි බෙදා දැක්වීමෙහි

''පඤ්චක්ඛන්ධෙ අනිච්චතො -පෙ- පඤ්ඤාතො සම්මතතනියාමං ඔකකමතීති''*

පඤ්චස්කන්ධයන්

1 අනිත්‍ය වශයෙන්	15 පභඞ්ගු වශයෙන්	29 විභව වශයෙන්
2 දුඃඛ ,,	16 අද්‍ධුව ,,	30 සාසව ,,
3 රොග ,,	17 අතතාත ,,	31 සඞ්ඛත ,,
4 ගණ්ඩ ,,	18 අලෙන ,,	32 මාරාමිස ,,
5 සල්ල ,,	19 අසරණ ,,	33 ජාතිධම්ම ,,
6 අඝ ,,	20 රිතත ,,	34 ජරාධම්ම ,,
7 ආබාධ ,,	21 තුච්ඡ ,,	35 ව්‍යාධිධම්ම ,,
8 පර ,,	22 සුඤ්ඤ ,,	36 මරණධම්ම ,,
9 පලොක ,,	23 අනත්ත ,,	37 සොකධම්ම ,,
10 ඊති ,,	24 ආදීනව ,,	38 පරිදෙවධම්ම ,,
11 උපද්‍දව ,,	25 විපරිණාමධම්ම ,,	39 උපායාසධම්ම ,,
12 භය ,,	26 අසාර ,,	40 සංකිලෙසධම්ම ,,
13 උපසග්ග ,,	27 අඝමූලක ,,	
14 චල ,,	28 වධක ,,	

යන මෙකී සතලිස් ආකාරයෙන් අනිත්‍ය වශයෙන් බලන්නේ අනුලොම ඤාන්තිය පිළි ලබ යි. පඤ්චස්කන්ධයන් ගේ අනුත්පාද නිරොධය, නිත්‍ය යැ, නිර්‍ව්‍යාණය යි දක්නේ ආර්‍ය්‍ය මාර්ගයට බසී, යනාදී ක්‍රමයෙන් අනුලොම ඤාණය විස්තර කරන්නහු විසින් ප්‍රභෙද හෙයින් කියන ලද සත්මශීනයන් ගේ වශයෙන් ද, මේ පඤ්චස්කන්ධයන් සත්මශීනය කෙරේ.

ඒ මෙසේ යි.

(1) ඒ යොගී තෙමේ එකී එකී සඤ්ඤය අනිත්‍ය බව අනන්තකොට ඇති හෙයින් (අශාස්වත හෙයින්) ද, පූර්‍ව - අපර කොටි ඇති හෙයින් ද **අනිත්‍ය** හෙයින් සත්මශීනය කෙරේ.

(2) උත්පාද-ව්‍යය දෙකින් කෙණෙහි - කෙණෙහි පෙළෙන බැවින් ත්‍රිවිධ දුඃඛයට හා සංසාර දුඃඛයට වසඟ හෙයින් **දුක්ඛ** වශයෙන් සත්මශීනය කෙරේ.

---

* ප: ම: පඤ්ඤාවශන

(3) සුදුසු ප්‍රත්‍යයයෙන් යැපිය යුතු බැවින් ද, සියලු රොග-යන්ට මූල බැවින් ද **රොග** වශයෙන් ද

(4) ත්‍රිවිධ දුඃඛතා සඞ්ඛ්‍යාත රුජාවෙන් යුක්ත හෙයින් ද, කෙලෙස් තැමෑති අසුචි වහනය වන බැවින් ද, උත්පාදය, ජරාය, භඞ්ගය යන මෙයින් ද, ඉදිමීම ය, පැසවීම ය, බිඳීම ය, යන මෙයින් ද යුක්ත හෙයින් **ගඩක්** වශයෙන් ද,

(5) පීඩා උපදවන හෙයින් ද, ඇතුළත විදින හෙයින් ද, (ආර්‍ය්‍ය මාර්ගයෙන් මුත්) බැහැර කළ නො හැකි හෙයින් ද **ශූල** වශයෙන් ද,

(6) ගැරහිය යුතු හෙයින් ද, අවැඩ එළවන හෙයින් ද, අඝ වස්තු හෙයින් ද **අඝ** (පාප) වශයෙන් ද,

(7) පරවශ බව් කරන හෙයින් ද, ආබාධයට පිහිට හෙයින් ද, **ආබාධ** වශයෙන් ද,

(8) වශයෙහි නො පවත්නා හෙයින් ද, (නහමක් දිරව නහමක් මියව) 'නො දිරව - නො මියව යි' මේසේ කළ විධාන-යෙහි නො පිහිටන හෙයින් ද **පර** වශයෙන් ද,

(9) ව්‍යාධි-ජරා-මරණයන් ගෙන් බිඳෙන හෙයින් **පලෝක** වශයෙන් ද,

(10) තොයෙක් ව්‍යසන පමුණුවන හෙයින් **ඊති** වශයෙන් ද,

(11) නො දන්නා ලද්දාවූ ම මහත් අනර්ථ පමුණුවන හෙයින් ද, සියලු උපද්‍රවයනට වස්තු හෙයින් ද **උපද්දව** වශයෙන් ද,

(12) සියලු භයට ආකර හෙයින් ද, දුක් සංසිදුවීම වූ නිවනට ප්‍රතිපක්ෂ හෙයින් ද භය වශයෙන් ද,

(13) තොයෙක් අනර්ථ ලුහුබඳනා ලද හෙයින් ද, දෙඝයන් විසින් අරමුණු වශයෙන් සැරිය යුතු හෙයින් ද, රාග දෙඝාදීන් අනේක දෙඝයන් ඇලී තිබෙන හෙයින් රාගාදීන් හා ඇලීම් අර්ථයෙන් ද, ඉවසනු නො හැකි හෙයින් ද **උපසග්ග** වශයෙන් ද,

(14) ව්‍යාධි-ජරා-මරණයන් ගෙන් ද, ලාභාදී අෂ්ට ලෝක ධර්මයෙන් ද වලනය වන හෙයින් **චල** වශයෙන් ද,

(15) උපක්‍රමයෙන් ද, සභාවයෙන් ද භඞ්ගයට පැමිණෙන සුලු හෙයින් **පභඞ්ගු** වශයෙන් ද,

(16) සියලු අවස්ථාවෙහි (වෘක්ෂ ඵලයක් මෙන්) හෙන සුලු බැවින් ද, ස්ථිර භාවයක් නැති හෙයින් ද **අද්ධුව** වශයෙන් ද,

(17) ජරා-මරණාදි දුකින් හා අපායාදී දුකින් ආරක්ෂා නො කළ හැකි බැවින් ද, ක්ෂෙම බව නො ලැබිය හැකි හෙයින් ද, **අනාථාන** වශයෙන් ද.

(18) ආරක්ෂාස්ථාන සොයනවුනට දුකඛාදීන් ආරක්ෂා වීමට ස්ථාන නො වන හෙයින් ද, ඇලුනවුනට ද ආරක්ෂාස්ථාන නො වන හෙයින් ද **අලෙන** වශයෙන් ද,

(19) පැමිණි ජාත්‍යාදී භය නැසීමෙන් නිශ්‍රිතයනට පිහිට වීමට අසමර්ථ හෙයින් **අසරණ** වශයෙන් ද.

(20) අඥාන ලොකයා විසින් ඇතැයි සලකන ලද ධ්‍රුව - සුභ - සුඛ - ආත්මභාවයෙන් ශූන්‍ය හෙයින් **රිත්ත** වශයෙන් ද,

(21) රික්ත හෙයින් ම අල්ප බැවින් ද, ලාමක බැවින් ද **තුච්ඡ** වශයෙන් ද.

(22) ස්වාමීය, නිවාසීය, කාරකය, වෙදකය, අධිෂ්ඨායිකය, යන ආත්ම භාවයෙන් හිස් බැවින් **සුඤ්ඤ** වශයෙන් ද.

(23) තමා ද ස්වාම්කාදි ස්වභාවයෙන් වියුක්ත හෙයින් **අනත්ත** (අනාත්ම) වශයෙන් ද,

(24) භවයෙහි පැවැත්ම දුක් හෙයින් ද, දුඃඛය ආදීනව හෙයින් ද, නොඉක්ත් නිතර බැගෑ බැවින් පවතින හෙයින් ද (ආදීනව යනු දුඃඛී මනුෂ්‍යයාට නමෙකි. ආදීනව සාදෘශ හෙයින්) **ආදීනව** වශයෙන් ද.

(25) ජරා-මරණ දෙකින් පෙළෙන හෙයින් **විපරිණාම ධම්ම** වශයෙන් ද.

(26) දුර්ගන්ධ හෙයින් ද, **එළයක්** මෙන් පහසුවෙන් බිඳිය හැකි හෙයින් ද **අසාර** වශයෙන් ද.

(27) පවට මුල්වන හෙයින් **අඝමූලක** වශයෙන් ද,

(28) මිත්‍රයකු වැනි සතුරකු මෙන් විශ්වාස ඝාතක (විශ්වාස යෙහි තබා සිටිනවුන් නසන) හෙයින් **වධක** වශයෙන් ද,

(29) **නිත්‍ය - සුඛ - ශුභ - ආත්ම** සඤ්ඤාන වැඩීම් නැති හෙයින් **විභව** වශයෙන් ද.

(30) ආශ්‍රවයනට හෙතු බැවින් **සාශව** වශයෙන් ද.

(31) ප්‍රත්‍යයයෙන් නිපදවන ලද හෙයින් **සඞ්ඛත** වශයෙන් ද.

(32) මෘත්‍යුමාර - කෙලෙසමාරයනව ගොදුරුවන හෙයින් **මාරාමිස** වශයෙන් ද.

(33) ජාතිය සවභාව කොට ඇත්තවුන් වශයෙන් ද.

(34) ජරාව සවභාවකොට ඇත්තවුන් වශයෙන් ද.

(35) ව්‍යාධිය සවභාවකොට ඇත්තවුන් වශයෙන් ද.

(36) මරණය සවභාව කොට ඇත්තවුන් වශයෙන්ද.

(37) ශොකය සවභාව කොට ඇත්තවුන් වශයෙන් ද

(38) පරිදෙවය සවභාව කොට ඇත්තවුන් වශයෙන් ද.

(39) උපායාසය සවභාව කොට ඇත්තවුන් වශයෙන්ද.

(40) තෘෂ්ණා- දෘෂ්ටි- දුශ්චරිත- සංකෙලෙශයනව විෂය වන හෙයින් **සංකෙලෙශ** වශයෙන් දැ යි මෙසේ ප්‍රභෙද වශයෙන් කියන ලද අනිත්‍යාදි **සන්නමශීතයා** ගේ වශයෙන් සන්නමශීතය කෙරේ. යට කී සතලිස් විදශීනාවෝ අනිත්‍යාදී අනුපස්සනා තුනෙහි අන්තගීත වෙත්. එහි ඇතුළත් බව දක්වනු පිණිස මේ කියනු ලැබේ.

මේ කලාප සන්නමශීතයෙහි හෝ නය විදශීනාවෙහි

(1) අනිත්‍ය වශයෙන් ද

(2) පලොක ,,

(3) චල ,,

(4) පභඞ්ගු ,,

(5) අද්‍රුව ,,

(6) විපරිණාමධම්ම ,,

(7) අසාරක ,,

(8) විභව ,,

(9) සඞ්ඛත ,,

(10) මරණධම්ම වශයෙන් දැ යි එකී එකී **සකඞ්ගයෙහි** දසය දසය බැගින් පඤ්චස්කන්ධයෙහි පනස් අනිත්‍යානුපස්සනාවෙකි.

(1) **පර** වශයෙන් ද

(2) **ඛීණ** ,,

(3) **තුච්ඡ** ,,

(4) **මුසාධම්ම** ,,

(5) **අනත්ත** වශයෙන් දැ යි එකෙකි ස්කන්ධයෙහි පසක් පසක් බැගින් අනත්තානුපස්සනා පස් විස්සෙක් වේ.

සම සතලිස් අනුපස්සනා අතුරින් සෙසු 'දුඃඛ වශයෙන්, රෝග වශයෙන්, ගණ්ඩාදී පස් විස්සෙහි එකෙකි ස්කන්ධයෙහි පස් විස්ස බැගින් පඤ්චස්කන්ධයෙහි දුඃඛානුපස්සනා එක්සිය පස් විස්සෙක් වේ. මෙසේ අනිත්‍යාදී තුන් අනුපස්සනාවන්හි ඇතුළත් වූ දෙසියයක් හෙද ඇති සන්නමාර්ගයෙන් පඤ්චස්කන්ධය සන්නමාර්ගය කරන්නා වූ ඒ යෝගී හට නය විදර්ශනා සඞ්ඛ්‍යාත **අනිත්‍ය-දුඃඛ - අනාත්ම** යන ත්‍රිලක්ෂණ සන්නමාර්ගය සිදුර වේ.

මේ නය විදර්ශනාව යි.

මේ පිළිවෙළින් පෙළෙහි ආ තයින් සන්නමාර්ගාරම්භ විධානය වේ. මෙසේ නය විදර්ශනාවෙහි යෝග කරන්නා වූ ඒ යෝගී හට නය විදර්ශනාව සිද්ධ නො වේ නම් ඒ යෝගීහු විසින් මතු දැක්වෙන නව ආකාරයෙන් ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය තියුණු කරයුතුයි.

ඒ මෙසේ යි,

(1) උපනුපන් සංස්කාරයන් ගේ ක්ෂයය ම දකී.
(2) ඒ ක්ෂය දර්ශනයෙහි ආදරය කිරීමෙන් සපය යි.
(3) සතත ක්‍රියාවෙන් සම්පාදනය කෙරේ.
(4) ආවර්ජනාදී සත්ප්‍රාය ක්‍රියාවෙන් සපය යි.
(5) සමාධිහු ගේ නිමිති ගැනීමෙන් ද.
(6) සප්තබෝධ්‍යඞ්ගයන් අනුවැ පැවැත්මෙන් ද.
(7) කායයෙහි හා ජීවිතයෙහි හා නිරපෙක්ෂ බව ළඟවයි.
(8) එහි ද නෛෂ්ක්‍රම්‍යයෙන් මැඩ
(9) භාවනාවන් ගේ අතරැ අවිවේඡදයෙන් (කඩ නො කර) යයි''

මෙසේ කියන ලද නව ආකාරයන් ගේ වශයෙන් ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් තිවුණු කොට පඨවි කසිණ නිර්දේශයෙහි කී සෙයින් ආවාස - ගොචර - භස්ස - පුග්ගල - භෝජන - ඍතු - ඉරියාපථ - යන සප්ප අසත්ප්‍රායයන් දුරු කොට සප්පා සත්ප්‍රායයන් සෙවනය කරමින් කලෙක රූප ද, කලෙක අරූප ද සන්නමාර්ගය කට යුතු යි. රූපය සන්නමාර්ගය කරන්නහු විසින් රූපයා ගේ උත්පත්තිය බැලිය යුතු. (පළමු ආගමානුසාරයෙන් බලන ලද්ද පසු වැ (විදර්ශනා) අනුක්‍රමයෙන් විදර්ශනාව බලවත් වූ කල ප්‍රත්‍යක්ෂයෙනුදු බැලිය යුතු.)

විභාවනාව:- රූපය සන්නමාර්ගය කරන්නහු විසින් රූපයන් ගේ උත්පත්තිය බැලිය යුතු යි. මේ රූපය කර්මාදී සතර කාරණයෙකින්

නිපදේ. ඒ මෙසේ යි:- කාමාවචරාදි භූමි වශයෙන් ද, අණ්ඩජාදි යෝනි වශයෙන් ද භින්න වූ සියලු සත්ත්වයන්ට උපදනා රූප පළමු කොට කර්මයෙන් උපදී. ප්‍රතිසන්ධික්ෂණයෙහි ගර්භාශයෙහි සත්ත්වයනට **ජීවිතින්ද්‍රිය ය, අවිනිභෝග රූපය, හෘදය වස්තු රූපය,** යන **වස්තු දශකය** ද,

ජීවිතින්ද්‍රිය ය, අවිනිභෝග රූපය ය – කාය ප්‍රසාදය යන **කාය දශකය** ද,

ජීවිතින්ද්‍රිය ය, අවිනිභෝග රූපය, භාව රූපය යන **භාව දශකය** ද ත්‍රි සන්තති වශයෙන් **වස්තු දශක, කාය දශක, භාව දශකයන්** ගේ වශයෙන් රූප තිසක් උපදී. ඒ රූප ද ප්‍රතිසන්ධි චිත්තයා ගේ උත්පාදක්ෂණයෙහි උපදී. එසේ ම ස්ථිති-භඞ්ගක්ෂණයන්හි ද උපදී.

ඒ නාම රූප දෙකින් රූපය දනිමි (ලැබිවෑ) නිරෝධ වේ. (සතළොස් චිත්තක්ෂණයක් ආයු ඇති හෙයිනි.) ගුරු **පරිවර්තී** (ප්‍රමාද වැ පෙරළෙන සුලු) වේ.

චිත්තය වනා නිරුද්ධ වේ. (ලඝුපරිවර්තී වේ.) එයින් වදාළහ. **"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං ලහුපරිවත්තං යථයිදං චිත්තං"***

"මහණෙනි! සිත යම් සේ වනා පෙරළේ ද? එබඳු අන් එක ද ධර්මයකුදු නොම දකිමි සි' කියාසි. රූපය ධරමාන කල්හි ම භවාඞ්ග චිත්තය සොළොස් වරක් ඉපිද නිරුද්ධ වේ.

විශෙෂ:- චිත්තයා ගේ උත්පාදක්ෂණය, ස්ථිතික්ෂණය, භඞ්ගක්ෂණය යන තුන ම එක සමානය. (සම ප්‍රමාණ වේ) රූපයා ගේ උත්පාද භඞ්ගක්ෂණ සැහැල්ලු වේ. සමප්‍රමාණ යැ. ස්ථිතික්ෂණය මහත් වේ. සිත් සොළසක් ඉපිද නිරුඬ වන තාක් පවතී.

විසඳුම:- ප්‍රතිසන්ධි සිත උපදනා කෙණෙහි ම ඉපිද පැවැති (එහෙයින් ම පුරෙජාත වූ) හෘදය වස්තු රූපය නිසා දෙවන භවාඞ්ග සිත උපදී. ඒ දෙවෙනි භවාඞ්ග සිත හා ඉපිද පැවැති පුරෙජාත හෘදය වස්තුව නිසා තුන්වන භවාඞ්ග සිත උපදී. මේ නයින් ආයු ඇතිතාක් චිත්ත ප්‍රවෘත්තිය දතයුතු. මරණාසන්න වූවහුට එකට පැවැති පුරෙජාත වස්තුරූපය නිසා සොළොස් චිත්තක්ෂණයක් උපදී. ඔපපාතික සත්ත්වයනට- වකුඹු

* අ: නි: එකකනිපාත

දසක- සොතදසක- ඝාණදසක ජිව්හාදසක- කායදසක- භාව-දසක- වත්ථුදසක වශයෙන් (සත්තති ශීඝ්‍ර වශයෙන්) රූප සැත්තෑවක් පවතී.

විශෙෂ:- අසඤ්ඤසත්ත පටිසන්ධියෙහි චිත්තප්‍රවෘත්ති නැති. මේ කර්ම වශයෙන් රූප ප්‍රවෘත්තියෙහි **කර්මය, කර්ම සමුත්ථානය, කර්මප්‍රත්‍යය චිත්තසමුත්ථානය, කර්මප්‍රත්‍යය ආහාරසමුත්ථානය, කර්මප්‍රත්‍යය ඍතුසමුත්ථානය** යි මේ රූප විභාගය දත යුතු.

මෙහි **කර්ම** නම් කුශල-අකුශල චේතනා යි.

කර්මසමුත්ථාන නම් විපාක වූ වෙදනාදී සකන්ධ හා චක්ඛුදීශ-කාදී සම්සෑන්තෑ රූපය යි. (ජීවිත නවකය ද මෙයට ම ඇතුළත්)

කර්මප්‍රත්‍යය ද කුශලා'කුශල කර්මයෙන් උපත්තම්භක ලද එම විපාකස්කන්ධය හා කර්මජ රූප මැයි.

කර්මප්‍රත්‍යය චිත්තසමුත්ථාන නම්- විපාක චිත්තයෙන් උපන් රූපය යි.

කර්මප්‍රත්‍යය ආහාර සමුත්ථාන නම්: කර්මසමුත්ථාන රූපයන්හි පවත්නා ඔජාව අනික් ඔජඨමක රූපයක් උපදවයි. ඒ කර්ම සමුත්ථාන වූ ද, ආහාර සමුත්ථාන වූ ද, ඕජාව අනික් ඔජඨ-මක රූපයක් උපදව යි. මෙසේ සදෘශ සන්තති වශයෙන් සතරක් හෝ පහක් රූප කලාප සවතා කෙරෙයි.

කර්ම ප්‍රත්‍යය ඍතු සමුත්ථාන නම්:- කර්මජ තෙජෝ ධාතුව තැන්පත් වූයේ උතුසමුත්ථාන ඔජඨමක රූපකලාපය උපදව යි, ඒ උතුසමුත්ථානයෙහි ද ඍතුව (තෙජෝ ධාතුව) අනික් ඔජඨමකයක් ද යි මෙසේ සමාන සන්තති වශයෙන් රූප කලාප සතරක් පහක් උපදවා. මෙසේ පළමුකොට කර්මජ රූපයන් ගේ නිපැත් ම බැලිය යුතු.

කර්මජ තෙජෝ ධාතුව නම්:- ආහාරාදිය දිරවන උෂ්ණ ය යි.

චිත්තජ රූපයන් අතුරෙහිදු - **චිත්තය, චිත්තසමුත්ථානය, චිත්තප්‍රත්‍යය, චිත්තප්‍රත්‍යයආහාරසමුත්ථානය, චිත්තප්‍රත්‍යය ඍතුසමුත්ථාන** ය යි මෙසේ විභාග දත යුතු.

එහි **චිත්ත නම්:**- එකුන් අනූ (89) චිත්තයෝ යි. ඔවුනතු-රින් - දෙනිස් චිත්ත කෙනෙක් - රූප - ඊර්ෂ්‍යාපථ විඥප්ති යන මොවුන් උපදවති. සවිසි සිත් කෙනෙක් රූප - ඊර්ෂ්‍යාපථ උපදවති. එකුන් විසි (19) සිත් කෙනෙක් රූප උපදවති. සොළොස් සිත් කෙනෙක් කුන ම නුපදවත්.

විඤ්ඤාණ:- කාමාවචර කුසල් අට යැ. අකුසල් දෙළොස යැ, (මහා ක්‍රියා අට යැ, මනොද්වාරාවජ්ජන යැ, හසිතොත්පාද යැ,) ක්‍රියා දශ යැ, පඤ්චමධ්‍යාන කුශල ක්‍රියා දෙක ය යන මේ සිත් දෙතිස් රූප ද ගමනාදි ඉරියවු ද, කාය – වාග් විඥප්ති ද, උපදවයි.

රූපාවචර කුසල් හා ක්‍රියා සිත් දශ ය, අරූපාවචර කුසල් ක්‍රියා අට ය, ලොකොත්තර සිත් අට යැ. යන මේ සවිසි සිත් රූප ද, ඉරියවු ද, උපදව යි. (විඥප්ති නූපදවයි)

කාමාවචර මහා විපාක අට හා සන්තීරණ දෙක යැ, රූපාවචර විපාක පස යැ, (සමපටිච්ඡන දෙක හා පඤ්චද්වාරාවජ්ජනය) මනොධාතු ත්‍රික යැ, සොම්නස් සහගත සන්තීරණ යැ යන එකුන්විසි සිත් රූප උපදව යි. (ඊර්ෂ්‍යාපථ විඥප්ති නූපදව යි.) දෙපස් (10) විඤ්ඤාණය, ප්‍රතිසන්ධි චිත්තය; රහතුන් ගේ චුති චිත්තය, අරූප විපාක සතර ය යන සොළොස් සිත් රූප ද, ඉරියවු ද, විඥප්ති ද නූපදව යි.

විශේෂ:- දෙපස් විඤ්ඤාණ සම් දුම්ල හෙයින් ද, ප්‍රතිසන්ධි චිත්තය වසතු දුම්ල හෙයින් ද රූප නූපදව යි.

මේ සිත් අතුරින් රූප උපදවන සිත් උත්පාද **ක්ෂණයෙහි** ම රූප උපදව යි. සථිති **ක්ෂණයෙහි** හෝ භඞ්ග **ක්ෂණයෙහි** හෝ රූප නූපදව යි. දුම්ල හෙයිනි. උත්පාද **ක්ෂණයෙහි** අනන්තර ප්‍රත්‍යය ලැබීමෙන් සිත බලවත් වේ.

ප්‍රතිසන්ධි චිත්තයා ගේ උත්පාද ක්ෂණයෙහි උපන් රූපය ප්‍රතිසන්ධි චිත්තයෙන් මතු සොළොස් වන චිත්තය සමග නිරුද්ධ වේ. ප්‍රතිසන්ධි චිත්තයා ගේ සථිති ක්ෂණයෙහි උපන් රූපය සතළොස් වන චිත්තයා ගේ සථිති ක්ෂණයට පැමිණ නිරුද්ධ වේ.

සංසාර ප්‍රවෘත්තිය හෝ චිත්ත ප්‍රවෘත්තිය හෝ ඇති තාක් මෙසේ මෑ යි.

චිත්තජ රූප නම්:- සද්ද නවකය, කාය – ද්වාග් විඥප්ති දෙක ය, පරිච්ඡේද රූප ය, ලහුතා – මුදුතා – කම්මඤ්ඤතා (විකාර) රූප ය, උපචය-සන්තති යන දෙක දැ යි සතළොස් රූප **චිත්ත සමුට්ඨානයෝ යි.**

චිත්ත ප්‍රත්‍යය කොට ඇති රූප නම් **"පඨමා ජාතා චිත්ත චෙතසිකා ධම්මා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස පඨමජාත පච්චයෙන පච්චයෝ"*** 'පසු වැ උපන් චිත්ත චෛතසික ධර්

* ප ප: පච්චය නිද්දෙස

පළමු උපන් මේ ශරීරයට පශ්චාජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ යනාදීන් කියන ලද චතු සමුට්ඨානික රූපය යි.

චිත්ත ප්‍රත්‍යය කොට ඇති ආහාර සමුට්ඨාන රූප නම්:- චිත්ත සමුට්ඨාන රූපයන්හි සිතියට පැමිණි ඕජාව අනික් ඔජට්ඨමකයක් උපදව යි. මෙසේ දෙ තුන් ප්‍රවෘත්තියක් ගළප යි.

චිත්ත ප්‍රත්‍යය කොට ඇති ඍතු සමුට්ඨාන නම්:- සිතින් උපන් රූපය සිතිති ප්‍රාපත වූ යේ අනික් ඔජට්ඨමකයක් උපදව යි. මෙසේ දෙ තුන් ප්‍රවෘත්තියක් ඝට යි. මෙසේ චිත්තජ රූපයන් ගේ උත්පත්තිය දත යුතු.

ආහාරජ රූප විෂයෙහිදු (1) **ආහාරය ද,** (2) **ආහාර සමුට්ඨානය ද,** (3) **ආහාර ප්‍රත්‍යය ද** (4) **ආහාර ප්‍රත්‍යය ආහාර සමුට්ඨානය ද** (5) **ආහාර ප්‍රත්‍යය ඍතු සමුට්ඨානය යි** මේ විභාග දත යුතු.

මෙහි ආහාර නම්:- කබළීකාරාහාරය යි.

ආහාර සමුට්ඨාන නම්:- උපාදින්නක වූ කම්ජ රූප ප්‍රත්‍යය ලැබ ඒ කම්ජ රූපයෙහි පිහිටා සිතිති ප්‍රාපත ඕජාව විසින් උපදවන ලද ඔජට්ඨමක රූපය ද, ආකාසධාතුව ද, ලහුතා - මුදුතා - කම්මඤ්ඤතා රූප ද, උපචය - සන්තති රූප දැ යි තුදුස් වැදෑරුම් රූපය යි,

ආහාර ප්‍රත්‍යය නම්: "කබළීකාරාහාරය මේ රූප කඨට ආහාර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ" යයි මෙසේ කියන ලද චතු සමුට්ඨාන රූපය යි.

ආහාර ප්‍රත්‍යය ආහාර සමුට්ඨාන නම්:- ආහාර සමුට්ඨාන ආහාර රූප විෂයෙහි තැන්පත් වූ ඔජාව අනික් ඔජට්ඨමක රූපයක් උපදවා යැ යි මෙසේ දස දෙලොස් වරෙක ප්‍රවෘත්තිය ගළපයි. මේ ආහාර ප්‍රත්‍යය ආහාර සමුට්ඨානය යි. **එක්** දවසක් වැළඳූ ආහාරය සත් දවසක් මුළුල්ලෙහි මේ ශරීරයට උපස්තම්භක වේ. මව බුදින ලද ආහාරය දරුවා ගේ සිරුරෙහි පැතිරී රූප උපදව යි. සිරුරෙහි ගැල්වූ ආහාරය ද රූප උපදව යි.

කර්මයෙන් උපන් ආහාරය උපාදින්නක ආහාරය නම්. හෙද තැන්පත් වූ යේ රූප උපදව යි. ඒ උපාදින්නක ආහාරයෙහි ඔජාව ද අනික් රූපයක් උපදවා යැ යි මෙසේ සතර පස් ප්‍රවෘත්තියක් ගළප යි.

ආහාර ප්‍රත්‍යය ඍතු සමුත්ථාන නම්:- ආහාර ප්‍රත්‍යයයෙන් නිපන් තෙජෝ ධාතුව තැන්පත් වූවා ඍතුසමුත්ථාන වූ ඔජට්ඨමක රූපය උපදවා (ඒ වනාහි උතුපචචය ආහාරය මෙන් දස දෙලොස් වාරයෙක රූපකලාප ඝවනාව වේ ය යි ටීකාහි කී.)

විභාග:- මේ ආහාර ප්‍රත්‍යය ඍතුසමුත්ථාන රූප විෂයෙහි ආහාරය ආහාර සමුත්ථාන රූපයන්ට **ජනක ප්‍රත්‍යය** වේ. සෙසු කම් - චිත්ත - ඍතු - සමුත්ථාන රූපයන්ට **නිස්සය - ආහාර - අත්ථි - අවිගත** ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

විශෙෂ:- ආහාරයාගේ නිඃශ්‍රය ප්‍රත්‍යය භාවය පඨානයෙහි නැති. එහෙත් 'ආහාර ප්‍රත්‍යයයෙන් පවත්නා රූපයන් ආහාර ප්‍රත්‍යය නම් වේ, යයි සූත්‍රානුනිකයින් කියන ලදැ යි දත යුතු. මත්තෙහි උතුනිස්සය දැක්වීමෙහි ද මේ ක්‍රමය මැ යි. මේ **ආහාරජ** රූපයන් ගේ නිපැත්ම ය.

ඍතුජ රූපයන් අතුරෙනුදු **ඍතු ද, ඍතුසමුත්ථාන ද, ඍතුප්‍රත්‍යය ද, ඍතුප්‍රත්‍යය ආහාරසමුත්ථාන ද** යන මේ විභාගය දත යුතු.

(1) මෙහි **ඍතු නම්**:- කර්මාදි චතුඃසමුත්ථාන තෙජෝ ධාතු ය. හෙද උෂ්ණ ඍතුය, ශීත ඍතුය යි දෙ ආකාර වේ. ශීත **උෂ්ණ** යනු එකම තෙජෝධාතුහු ගේ අඩු-වැඩි බව යි.

(සපශී වූවහු ගේ ශරීර උෂ්ණයට වඩා අඩු වූයේ ශීතය යි ද- එයට වැඩි වූයේ **උෂ්ණය** යි ද සම්මත යි.)

ඍතුසමුත්ථාන නම්:- (කර්මාදී) චතුඃසමුත්ථාන වූ ඍතුව උපාදින්නක ප්‍රත්‍යය ලැබ සථාන ප්‍රාප්ත වූයේ ශරීරයෙහි රූප උපදව යි.

විශෙෂ:- ඍතු සමුත්ථාන ඍතුව (තෙජෝධාතුව) උපා- දින්නක නො වූයේ ද රූප උපදව යි. එහෙත් මෙහි 'ඉන්ද්‍රියබද්ධ ඍතුහු ගේ උපාදින්නකයෙන් වෙන්වැ රූප ඉපදවීමක් නැති හෙයින් උපාදින්නක ප්‍රත්‍යය ලැබයැ යි කියන ලදී (ටීකා)

ඒ ඍතුසමුත්ථාන රූප ය- සද්ද නවක කලාප ය, ආකාස ධාතු ය, ලහුතා- මුදුතා- කම්මඤ්ඤතා ය, උපචය- සන්තති- රූපය යි පසළොස් වැදෑරුම් වේ.

(3) **ඍතුප්‍රත්‍යය නම්**:- ඍතුව (තෙජෝධාතුව) කර්මාදී චතුඃ සමුත්ථානික රූපයන් ගේ පැවැත්මට ද, විනාශයට ද ප්‍රත්‍යය

වේ. පෙර කී පසළොස් වැදෑරුම් ඍතුජසමුට්ඨාන රූපයට ද, අන්‍ය වූ කර්මාදීන් උපන් රූපය ද යන සහාග රූපයට සහාග ඍතුව උපසහජාත ප්‍රත්‍යය වේ. 'විෂමාග ඍතුව තමාට සුදුසු රූප ඉපදවීමේදී පෙර පැවැති රූප චිත්තාශ කරන්නාක් මෙන් වේ' (ඝනු ටීකායි.)

ඍතු ප්‍රත්‍යය ඍතු සමුට්ඨාන නම්:- ඍතුවෙන් හටගත් තෙජෝ ධාතුව සජීති ප්‍රාප්ත වූවා අනික් ඔජාෂ්ටමකයක් උපදවයි. එහි ඍතුව ද අනික් ඔජාෂ්ටමක රූපයක්ද යි මෙසේ දීර්ඝ කාලයක් අනුපාදින්නා පක්ෂයෙහි සිට ද ඍතු සමුට්ඨානය පවතී මැයි.

විඤ්ඤාර:- අන් තන්හි කී පරිදි දස දෙලොස් වාරයට ද වඩා දීර්ඝ කාලයක් ඍතුන් ගෙන් සහාග සන්තති වශයෙන් ප්‍රත්‍යය ලැබ උපාදින්නකයන් ඇසුරින් ද, සදෘශ රූප පරම්පරාව පවත්වයි. මෙහි 'අනුපාදින්නක පක්ෂයෙහි සිටයැ" යි කීයේ මසින් වෙන් වූ- කෙස්- ලොම්- නිය ඉනි- තලකැලල් ආදී වශයෙන් ජීවමාන ශරීරයෙහි ද, මෘත ශරීරයෙහි ද, උපදවන හෙයිනි. (ටීකා)

ඍතු ප්‍රත්‍යය ආහාර සමුට්ඨාන නම්:- ඍතුවෙන් උපන් සථාන ප්‍රාප්ත තෙජෝ ධාතුවෙහි ඔජාව අන්‍ය වූ ඔජාෂ්ටමක රූපයක් උපදවයි. එහි ඔජාව ද අන්‍ය ඔජාෂ්ටමකයක් දැයි මෙසේ දස දෙලොස් වාරයෙකැ ප්‍රවෘත්තිය ගළපයි.

ඒ රූප කලාපයෙහි ඍතුව (තෙජෝ ධාතුව) ඍතු සමුට්ඨාන රූපයනට **ජනක** ප්‍රත්‍යය වේ. සෙසු කර්මාදීන් සමුට්ඨාන රූපයනට **නිශ්‍රය- අඝනී- අවිගත** වශයෙන් ප්‍රත්‍යය වේය යි මේ ඍතුජ රූප හවගැනීම දැක්ක යුතු යි.

විශෙෂ:- මෙසේ රූපයන් ගේ හට ගැනීම දක්නේ කලෙකැ රූප සන්මර්ශනය කෙරේය යි කියනු ලැබේ. නවද රූපයන් ගේ හටගැනීම දක්නේ ක්ෂණික වැ රූපය චිත්තාශ වන හෙයින් චිත්තාශය ද දකී. එහෙයින් උදය-ව්‍යය දැකීම වේ.

රූප සන්මර්ශනය කරන්නා රූපයන් ගේ හට ගැනීම දක්නා සේ අරූප සන්මර්ශනය කරන්නා අරූපයන් ගේ හට ගැනීම ද දැක්ක යුතු ය.

ඒ වූකලී එක් අසූ ලෞකික චිත්තයන් ගේ වශයෙන් මැයි. (ලොකොත්තර සිත් අට මෙයට විෂය නො වේ.)

විඤ්ඤාර:- මෙහි **නාම** නම් පූර්ව භවයෙහි රැස් කරන ලද කුශල-අකුශල කර්ම වශයෙන් නිපන් **මහා විපාක** අට යැ,

මහද්ගත විපාක (රූපාරූප) **නව යැ, උපෙක්ඛාසහගත සන්තීරණ දෙක යැ** යන මේ එකුන් විසි (19) විපාක සිත් ප්‍රතිසන්ධියෙහි ඒ ඒ භව වශයෙන් උපදී. (ඒ උපදනා ආකාරය **පවිචවසමුප්පාද නිදේශයෙහි** කී පරිදි දතයුතු.) ඒ එකුන්විසි චිත්තය ම **ප්‍රතිසන්ධි** චිත්තයට අනතුරු චිත්තයෙහි පවත් **භවාඞ්ග** වශයෙන් ද, **ආයුෂ කෙළවර චුති** වශයෙන් ද උපදී. ඔවුනතුරින් කාමාවචර විපාක චිත්තය චක්ඛුරාදී පඤ්චද්වාරයෙහි (බලවත්) අතිමහන්ත ලම්බනයෙහි ද, මනොද්වාරයෙහි විභූතාලම්බනයෙහි ද මහා විපාක අට යැ, සන්තීරණ තුන යැ යන එකොළොසින් එකක් තදුලම්බන වශයෙන් ද පවතී.

ප්‍රවෘත්ති කාලයෙහි චක්ඛුඃප්‍රසාදය නො නට හෙයින් ද, රූප ආලම්බන වීමෙන් ද, ආලෝකය ඇසුරු කොට පැවැති (පඤ්චද්වාරාවජ්ජන) මනසිකාරය හෙතු කොට ඇති චක්ඛුවිඤ්ඤාණ චිත්තය සම්ප්‍රයුක්ත ධර්මයන් සමග උපදී.

උපදනා රූපය හා නිරුද්ධවන රූපය ද, කිසිවකට ප්‍රත්‍යය නො වන හෙයින් සථිති ප්‍රාප්ත වක්ඛුඃප්‍රසාද රූපයෙහි සථිතිප්‍රාප්තවූ ම රූපාලම්බනය ගැටේ. ඒ ගැටුණු කල දෙවරෙකැ (භවාඞ්ගචලන - උපවෙජ්ජ වශයෙන්) **භවාඞ්ගය** ඉපිද නිරුද්ධ වේ. අනතුරුවැ එම ආලම්බනයෙහි ම **ක්‍රියා මනොධාතුව** (පඤ්චද්වාරාවජ්ජනය) ඒ රූපාලම්බනයෙහි ම ආවජ්ජන කෘත්‍යය සාධමින් උපදී. අනතුරුවැ එම රූපය ම බලමින් කුසල විපාක වූ හෝ අකුසල විපාක වූ හෝ **චක්ඛු විඤ්ඤාණ** චිත්තය ද, අනතුරුවැ ඒ රූපය පිළිගනිමින් විපාක **මනොධාතුව** (සම්පටිච්ඡන චිත්තය ද) උපදී.

අනතුරුවැ ඒ රූපය ම මනා කොට තීරණය කරමින් විපාක අහෙතුක **මනොවිඤ්ඤාණධාතුව** (සන්තීරණ චිත්තය) ද, අනතුරුවැ එම රූපාලම්බනය ම විනිශ්චය කරමින් උපෙක්ඛා සහගත ක්‍රියා අහෙතුක **මනොවිඤ්ඤාණධාතුව** (උපෙක්ඛා සහගත මනොද්වාරාවජ්ජනය) ද උපදී. අනතුරුවැ කාමාවචර කුශල-අකුශල-ක්‍රියා චිත්තයන් අතුරින් එක් සිතක් මූර්ඡාදී-කාල-මරණාසන්න කාලයන්හි පස් වරක් හෝ ප්‍රකෘති කාලයෙහි සත්වරක් නෝ දෙවෙනි (මොඝ) වාර වශයෙන් උපෙක්ඛා-සහගත අහෙතුක (උපෙක්ඛා සහගත මනොද්වාරාවජ්ජන) චිත්තය හෝ **ජවන** වශයෙන් උපදී. අනතුරුවැ කාමාවචර සත්ත්වයන්ට ඔට කී එකොළොස් තදාරම්මණ චිත්තයන් අතුරින් ජවනයනට

සුදුසු සේ යම් කිසි චිත්තයක් **තදුරම්මණ** වශයෙන් උපදී. සෙසු **සොතාදී** සිවු දෙරෙහි ද මේ ක්‍රමය මැයි.

විශේෂ:- මනොවාරයෙහි මහද්ගත (රූපාරූප) චිත්ත ද උපදී. මෙසේ සදෙරෙහි චිත්ත ප්‍රවෘත්තිය දැක්ක යුතු. මෙසේ අරූපයන් ගේ ඉපදීම බලත්කාවූ යොගාවචර තෙමේ කලෙකැ අරූප සත්මශීනය කෙරේ. මෙසේ කලෙකැ රූප ද, කලෙක අරූප ද, නුවණින් විමසා ත්‍රිලක්ෂණයට නගා උදය-ව්‍යය ඥානානුක්‍රමයෙන් පිළිපදනේ ප්‍රඥාභාවනාව සම්පාදනය කෙරේ. අනික් යොගාවචරයෙක් රූප සප්තක- අරූප සප්තක වශයෙන් ත්‍රිලක්ෂණයට නගා සංස්කාර ධර්මයන් සත්මශීනය කෙරේ.

ඒ රූප සප්තක - අරූප සප්තක අතුරින් අරූප සප්තකයෙහි ආදාන නික්ඛේප වශයෙන් සත්මශීනය කෙරේ.

(1) එහි ආදාන නම් ප්‍රතිසන්ධි යැ, නික්ඛේප නම් චුතිය යි. යොගාවචර තෙමේ මෙසේ ආදාන-නික්ඛේප වශයෙන් භවූරුදු සියයක් පිරිසිඳ සංඝකාර ත්‍රිලක්ෂණයට ආරොපණය කෙරේ.

ඒ මෙසේ යි:- ප්‍රතිසන්ධි - චුති අතර පැවැති සියලු සංඝකාර (රූප) යෝ උත්පාද නිරුද්ධ වශයෙන් පවත්නා හෙයින් ද, ජරා-මරණ දෙකින් පෙරළෙන හෙයින් ද, තාවකාලික (ක්ෂණික) හෙයින් ද, නිත්‍ය ස්වභාවයෙන් නො පවත්නා හෙයින් ද අනිත්‍ය යි.

උපන් සංඝකාර ස්ථිතියට පැමිණෙන හෙයින් ද, ස්ථිතියෙහි පැවැති සංස්කාර ජරාවෙන් (දිරීමෙන්) පීඩිතවන හෙයින් ද, ජරාවට පැමිණි සංස්කාර ඒකාන්තයෙන් බිඳෙන හෙයින් දැ යි මෙසේ නිරතුරු වැ පෙළෙන හෙයින් ද, ඉවසීමට දුෂ්කර හෙයින් ද, සඝර දුකට පිහිටවන හෙයින් ද, සැපයට ප්‍රතිපක්ෂ හෙයින් ද දුක් වේ.

විශෙෂ අර්ථයෙකි:- උපන් සංස්කාර ස්ථිතියට නො පැමිණෙත්වා ස්ථිතියට පැමිණියාහු නො දිරත්වා, දිරුවාහු නො බිඳෙත්වා, යි මෙසේ මේ කී ස්ථිති-ජරා-භෙද (අවස්ථා තුනෙකි.) කිසිවකු ගේ වශයෙහි නො පවත්නා හෙයින් ශූන්‍ය යි. එසේ ශූන්‍ය හෙයින් ද, වශයෙහි නො පවත්නා හෙයින් ද, ස්වාමි වූවක්හු නැති හෙයින් ද, වශයෙහි පවත්නකු නැති හෙයින් ද, පර පරිකල්පිත ආත්මයක් නැති හෙයින් ද අනාත්ම යි. මෙසේ ආදාන-නික්ඛේප වශයෙන්

සියක් වසකින් පරිවෙජද කළ රූපයෙහි අනිත්‍ය - දුඃඛ අනාත්ම හෙයින් ත්‍රිලක්ෂණයට නගයි.

(2) එසින් මත්තෙහි වයොවුඩභූ ගමන වශයෙන් ආරොහණය කෙරේ. ඒ වනාහි වයස් වශයෙන් වැඩුණු රූපයා ගේ අසතඔගමය බැලීම් වශයෙන් ත්‍රිලක්ෂණයට නැඟීම යි.

ඒ මෙසේයි:- ඒ යොගීතෙමේ එම අවුරුදු සියය ප්‍රථම වයස යැ, මධ්‍යම වයස යැ, පශ්චිම වයස යැ යි තුන් වයසින් පිරිසිඳී. එහි මූල තෙතිස් වස ප්‍රථම වයස යැ. මැද සූතිස් වස මධ්‍යම වයස යැ. අග තෙතිස් වස පශ්චිම වයස යි. මෙසේ තුන් වයසින් පිරිසිඳ 'ප්‍රථම වයසෙහි පැවැති රූපය මධ්‍යම වයසට නො පැමිණ එහි ම නිරුද්ධ වේ' 'එහෙයින් ඒ රූපය අනිත්‍ය යැ. යමක් අනිත්‍ය නම් ඒ දුක යැ. යමක් දුක් නම් ඒ අනාත්ම යැ යි' විදර්ශනා වඩයි.

මධ්‍යම වයස්හි පැවැති රූපය ද පශ්චිම වයසට නො පැමිණ එහි ම නිරුද්ධ වේ. එහෙයින් එද අනිත්‍ය යැ, දුක් යැ, අනාත්ම යැ යි විදර්ශනා කෙරේ. පශ්චිම වයස්හි පැවැති රූපය ද මරණ යෙන් මත්තෙහි යාමට සමර්ථයකු නැති හෙයින් හෙද අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්ම යැ යි ත්‍රිලක්ෂණයට නඟ යි. මෙසේ තුන් වයසින් **වයොවුඩභූ ගමන** වශයෙන් ත්‍රි ලක්ෂණයට නඟා නැවැත්තෝ:-

"මන්ද බ්‍රඩා ව වණ්ණා ව - බලා පඤ්ඤා ව භායනා,
පබ්භාරා ව පවඩ්කා ව - මොමූහා සයනා දස" යි

(1) මන්ද දශක, (2) ක්‍රීඩා දශක, (3) වණ්ණී දශක, (4) බල දශක, (5) ප්‍රඥ දශක, (6) භායනදශක, (7) පබ්භාර දශක, (8) ප්‍රවඩ්ක දශක, (9) මොමූහ දශක, (10) ශයන දශක යන මේ දශක වශයෙන් **වයොවුඩභූ ගමන** වශයෙන් ත්‍රිලක්ෂණට නඟ යි.

(1) එහි හවුරුදු සියයක් ජීවත් වන්නහු ගේ මූල දස හවුරුද්ද **මන්ද දශකය යි**, එකල හේ මන්ද- චපල කුඩා ළදරුවෙක් වේ.

(2) ඉක්බිති හේ බෙහෙවින් ක්‍රීඩාවෙහි ඇලෙන හෙයින් **ක්‍රීඩා දශකයට** පැමිණේ.

(3) අනතුරු වැ හේ ශරීර වර්ණය ප්‍රසන්න වැ වර්ණවත් බවට පැමිණෙන හෙයින් **වර්ණ දශකයට** පැමිණේ.

(4) අනතුරු වැ හේ ශරීර ශක්තියෙන් වැඩි දැඩි බවට පැමිණෙන හෙයින් **බල දශකයට** පැමිණේ.

(5) එයින් මතු ඔහුට නුවණ ස්ථිර වැ පිහිට යි. සවභාව යෙන් නුවණ තැත්තාට ද එකල මඳ වූ ද නුවණ උපදී. ඒ **ප්‍රඥා දශකය** යි.

(6) ඉන් මතු පෙර කී දෑ පිරිහෙන හෙයින් **පරිහාණි දශකය** යි.

(7) අනතුරු වැ ඔහුගේ සිරුර ඉඳිරියට නැමීමෙන් **පරිභාර දශකයට පැමිණේ.**

(8) අනතුරු වැ ඔහු ගේ සිරුර නගුල් කොතක් සේ වක්වන හෙයින් **ප්‍රවඩක දශකයට** පැමිණේ.

(9) පසු වැ ඔහු ගේ සිහි නුවණ පිරිනි මුළාවන හෙයින් **මොමූහ දශකයට** පැමිණේ.

(10) අවසන්හි හේ නිතර ශයන පරායණ හෙයින් **ශයන දශකයට** පැමිණේ.

ඒ යොගී තෙමේ මේ දශ දශක වශයෙන් **වයෝ වුඩ්ඪ ගමනයෙන්** ත්‍රිලක්ෂණයට නගනු පිණිස මෙසේ සලකයි. ප්‍රථම මඳ දශකයෙහි පැවැති රූප දෙවෙනි දශකයට නො පැමිණ එහිම නිරුද්ධ වෙයි. -පෙ- නවම දශකයෙහි පැවැති රූප දශම දශකයට නො පැමිණ එහි ම නිරුද්ධ වෙයි. දශම දශක-යෙහි පැවැති රූප දෙවන භවයට නො ගොස් මෙහි ම නිරුද්ධ වේ. එබැවින් එය ද අනිත්‍යය යැ, දුක් යැ, අනාත්මයැ යි ත්‍රිලක්ෂණයට නග යි. මෙසේ දශක වශයෙන් වයෝවුඩ්ඪ ගමනයෙන් ත්‍රිලක්ෂණයට නග යි.

නැවැතැ එම වෘ සියයම වෘ පඤ්චක වශයෙන් විසි කොටසකට බෙදූ වයෝවුඩ්ඪ ගමන වශයෙන් ත්‍රිලක්ෂණයට නග යි. ඒ මෙසේ යි. පළමු පස් වසෙහි පැවැති රූප දෙවෙනි පස් වසට නො පැමිණ එහි ම නිරුද්ධ වෙයි. එහෙයින් එය අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්ම යි. දෙවෙනි පස්වසෙහී පැවැති රූපය- තුන්වැනි -පෙ- එකුන් විසිවැනි පස් වසෙහි පැවැති රූපය, විසිවැනි පස් වසට නො ගොස් එහි ම නිරුද්ධ වේ. විසිවැනි පස් වසෙහි පැවැති රූප මරණයෙන් මතු යෑමට අසමර්ථ යැ. එහෙයින් එය ද අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්ම යි.

මෙසේ විසි කොටස් වශයෙන් වයොවුද්ධත්ව ගමනයෙන් තිලකුණට නගා නැවැතැ පස්විසි කොටසක් කොට සිවුවස් සිවුවස් වශයෙන් තිලකුණට නග යි. නැවැතැ තෙතිස් කොටසක් කොට අවුරුදු තුන-තුන වශයෙන් ද, පනස් කොටස් කොට අවුරුදු දෙක-දෙක වශයෙන් ද, සියක් කොටස් කොට එක්-එක් වර්ෂය වශයෙන් ද, එක් අවුරුද්දක් වස්සාන - හෙමන්ත - ගිම්හාන වශයෙන් තුන් කොටසක් කොට එක එක ඍතු වශයෙන් වස්සාන ඍතුවෙහි සිවි මස පැවැති රූපය හෙමන්ත ඍතුවට නො පැමිණ එහි ම නිරුද්ධ විය. හෙමන්තයෙහි පැවැති රූපය ගිම්හාන ඍතුවට නො පැමිණ එහි ම නිරුද්ධ විය. එහෙයින් එය අනිත්‍ය යැ, දුක යැ, අනාත්මයැ යි ත්‍රිලක්ෂණයට නග යි. නැවැතැ එක් වසක් ඡට ඍතු වශයෙන් සය කොටසක් කොට වස්සානයෙහි දෙමස පැවැති රූපය සරදයට නො පැමිණ එහි ම නිරුඬ විය. සරදයෙහි පැවැති රූපය හෙමන්තයට ද, හෙමන්තයෙහි පැවැති රූපය සිසිරයට ද, සිසිරයෙහි පැවැති රූපය වසන්තයට ද, වසන්තයෙහි පැවැති රූපය ගිම්හයට ද, ගිම්හයෙහි පැවැති රූපය නැවැතැ වස්සානයට ද නො පැමිණ එහි ම නිරුඬ විය. එහෙයින් අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්මයැ යි මෙසේ ත්‍රිලක්ෂණයට නගයි. නැවැත එක් මසක් කාළ පක්ෂ- ශුක්ල පක්ෂ වශයෙන් ගෙන කාල පක්ෂයෙහි පැවැති රූපය ශුක්ල පක්ෂයට නො පැමිණ මැදියම් පැවති රූ පසුයමට නො පැමිණ එහි ම නිරුද්ධ වේයැ යි ත්‍රිලක්ෂණයට නග යි.

නැවැතැ එක් දවසක් රෑ-දවල් වශයෙන් බෙදූ රෑ පැවැති රූපය දවාලට නො පැමිණ එහි ම නිරුඬ වෙයි. අනතුරුවැ ඒ රෑ-දවල් ද පූර්‍වාහ්නාදි වශයෙන් ස කොටසක් කොට පෙරවරු පැවැති රූ, මධ්‍යාහ්නයට නො පැමිණ - මධ්‍යාහ්නයෙහි පැවැති රූ සායාහ්නයට නො පැමිණ - සායාහ්නයෙහි පැවැති රූ පෙරයමට නො පැමිණ- පෙරයම පැවැති රූ මැදියමට නො පැමිණ මැදියම් පැවති රූ පසුයමට නො පැමිණ එහි ම නිරුඬ වේයැ යි තිලකුණට නග යි.

නැවැතැ එම රූපය ම ඉඳිරියට යාම යැ, පෙරළා ඊම යැ, ඉඳිරි බැලීම යැ, ඔබ්නොඬ බැලීම යැ, අත් පා හැකිලීම යැ, දිග හැරීම යැ යන මොවුන් ගේ වශයෙන් ද සලක යි. ඉඳිරියට යාමෙහි පැවැති රූපය පෙරළා ඊමට නො පැමිණ එහි ම නිරුඬ විය. අත් පා හැකිලීමෙහි පැවැති රූපය අත් පා දිග හැරීමට නො පැමිණ එහි ම නිරුඬ විය. එහෙයින් අනිත්‍ය යැ, දුක යැ, අනාත්මයැ යි තිලකුණට නග යි.

නැවැතැ එක් පියවරක් උඩරණ- අතිහරණ- විතිහරණ- වොස්සජ්ජන- සන්තීරණ සන්නිරුම්හන වශයෙන් සය කොටසක් කෙරේ.

විස්තර:- පය භූමියෙන් නැඟීම උඩරණ නම්, පය ඉදිරියට යැවීම අතිහරණ නම්. කණු - කටු සපිරීන් ගෙන් කිසිවක් දැක පය ඔබ්නොඔ යැවීම විතිහරණ නම්. පය යටට හෙළීම වොස්සජ්ජන නම්. පොළොවෙහි පා තැබීම සන්තීරණ නම්. නැවැතැ පය උදුරන කලැ පෘථිවිය සමග පෙළීම සන්නිරුම්හන නම්.

ඔවුනතුරින් පා උඩරණයෙහි පඨවී-ආපෝ ධාතුවය හීන වූවා වේ යි. සෙසු තෙජෝ-වායෝ ධාතු වය වැඩිවැ බලවත් වේ. අතිහරණ විතිහරණ යන්හි ද එසේ මැ යි.

වොස්සජ්ජනයෙහි තෙජෝ-වායෝ ධාතු වය අඩුවැ හීන වේ. පඨවී-ආපෝ ධාතු වය අධිකවැ බලවත් වේ. සන්තීරණ සන්නිරුම්හනයන්හි ද එසේ මැ යි. මෙසේ සය කොටසක් කොට ඔවුන් ගේ වශයෙන් ඒ **වණ්ණාවුඩ්ඪාභාගම රූපය** තිලකුණට නග යි.

ඒ මෙසේ යි:- පා එසවීමෙහි පැවැති ධාතූහු ද, ඔවුන් නිසා පැවැති රූප ද යන මේ සියලු ධර්මයෝ පා ඉදිරියට එළවීමට නො පැමිණ එහි ම නිරුඬ වෙති. එහෙයින් අනිත්‍යය හ. දුඃඛය හ. අනාත්මය හ එසේම අතිහරණයෙහි පැවැති රූප ධර්මයෝ විතිහරණයට ද -පෙ- සන්නිරුම්හනයට ද, නො පැමිණ එහි ම නිරුඬ වෙති. මෙසේ ඒ ඒ තන්හි උපන් රූපයෝ අනික් අනික් කොටසකට නො පැමිණ ඒ ඒ තන්හි ම පවී-පවී වැ සැකි සැකි වැ ඔධි-ඔධි වැ රත්යකඛලෙකැ බහාලූ තල මෙන් 'තව-තව' යන හඬ ඇති වැ මෙන් බිඳෙති. එහෙයින් අනිත්‍යය හ. අනිත්‍ය හෙයින් දුඃඛය හ. දුක් හෙයින් අනාත්මය හ යි. මෙසේ පවී-පවීගත සංස්කාර විදර්ශීකා වඩන්නා හට රූප සම්මර්ශනය සුබුම වේ.

ඒ සුබුම බවට මේ උපමාවෙකි:- දරහුළු - තණහුළු ආදියෙහි පුරුදු වූ පහන්ඹළු නො දුටු පසල් දනව් වැස්සෙක් නුවර අවුත් ආපනයක් තුළ දැල්වෙන පහනක් දැක, මේ මනාප වූ දැය කිම් ද යි, එක් මිනිහකු විමාළේ ය. මෙහි මනාප නම් කිම් ද? මේ පහන නම. තෙල් හා වැටිය ක්ෂය වීමෙන් මේ පහන ගිය මග පවා නො පැනේය යි ඒ මනියාට කී නුවර වැස්සා මෙසේ ද කී. මෙහි ලා 'මෙද ඔෂදුරික යැ. මේ වැටිය කෙමෙන් දනු ලබන

කලැ තුන්වන-තුන්වන භාගයෙහි දැල්ල අනික් ප්‍රදෙශයකට නොපැමිණ නිරුඬ වේ. ඕනට අනිකා මෙසේ ද කී. "මෙද ඔඳාරික යැ" මේ පහන් වැටියෙහි අඟුලක් - අඟුලක් පමණ පෙදෙසෙහි, අඩ අඟුලක්-අඩ'අඟුලක් පමණ පෙදෙසෙහි, හුයෙහි හුයෙහි, අංශුවෙහි, අංශුවෙහි දැල්ල අනික් අංශුවකට නොගොස් නිරුඬ වේ. එහෙයින් අංශුව හැර දැල්ලක් පැනවීමට නොහැක්කා සේ ඒ යොගියා ගේ වර්ණ සියයේ තුන්වන කොටස පිරිසිදි (වයොවුඩ්ඪගාමී) රූපයෙහි ත්‍රිලක්ෂණ ඵලවීම යි, පුරුෂයා ගේ අඬඟුල අතරෙහි දැනුම මෙන් යොගීහු ගේ දස වසින් - පස් වසින්- සතර වසින්- තුන් වසින්- දෙ වසින්- එක් වසින් යන මේ නයින් පිරිසිදින ලද රූපයෙහි ත්‍රිලක්ෂණය ඵලවීම යි. අඬඟුල් - අඬඟුල් අතරැ දැල්ල අනික් - අනික් අඬඟුලකට නොගොස් නිරුඬ වේ. යන පුරුෂයා ගේ දැනීම මෙන් යොගියා ගේ එක් - එක් ඍතු වශයෙන් එක් වසක් තුනට හෝ සයට බෙදූ සිවු මසින් දෙ මසින් පිරිසුන් රූපයෙහි තිලකුණු ඵලවීම දතයුතු. හුයෙහි- හුයෙහි දැල්ල අනිකකට නොගොස් නිරුඬ වේ යන පුරුෂයා ගේ දැනීම මෙන් යොගීහු ගේ කෘෂ්ණ-ශුක්ල පක්ෂ වශයෙන් ද, රැ දවල් වශයෙන් ද එක රැ දවලක් සකොවසකට බෙදූ පූර්‍වාහ්ණාදි වශයෙන් පිරිසුන් රූපයෙහි තිලකුණු නැගීම ද, අංශුවෙහි - අංශුවෙහි දැල්ල අනිකකට නොපැමිණ නිරුඬ වේ යන පුරුෂයා ගේ දැනුම මෙන් යොගීහු ගේ අභික්‍රමාදී වශයෙන් ද, උද්ධරණාදී එක් - එක් කොට්ඨාස වශයෙන් ද, පිරිසුන් රූපයෙහි තිලකුණු නැගීම ද දතයුතු.

ඒ යොගී මෙසේ නානා අයුරින් වයොවුඩ්ඪගාමී රූපයෙහි තිලකුණු නගා නැවත ද එම රූපය විභාග කොට ආහාරමයාදී වශයෙන් සිවු කොටසක් කොට එක් - එක් කොටසෙහි තිලකුණු නගයි.

(3) **ආහාරමය රූප** වශයෙන්: ආහාරමය රූපය ක්ෂුධා සුභිත කාල වශයෙන් ප්‍රකට වේ.

ඒ මෙසේ යි:- ක්ෂුධා කාලයෙහි උපන් රූප මලානික වේ. කලානත වේ. දැහිය කණුවක් මෙන් ද, අහුරැ පැසෙක සැඟවුණු කවුඩකු මෙන් ද දුර්ණිම්ති වෙයි. නපුරැ වැ සිටී. සුභික්ෂ (ආහාරයෙන් පිරුණු) කලැ උපන් රූප තෘප්ත වෙයි, ප්‍රණීත වෙයි, මෘදු වෙයි, සිනිදු වෙයි, මනා පහස් ඇති වේ.

ඒ යොගීතෙම එය පරිග්‍රහ කොට බඬ සා කලැ පැවැති රූප බඬ පිරි කලට නොපැමිණ ඒ සා කල ම නිරුඬ වේ, බඬ පිරි

කලෑ පැවැති රූප ද, බඹ සෘ කලට නො පැමිණ එකල ම නිරුද්ධ වේ, එහෙයින් ඒ රූප අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්ම යැ යි මෙසේ එහි තිලක්ඛණට නගයි.

(4) **ඍතුජ රූප වශයෙන්**:- ඍතුජ රූපය ශීත උෂ්ණ වශයෙන් ප්‍රකට වේ.

ඒ මෙසේ යි:- උෂ්ණ කාලයෙහි පවත්නා රූප මලානික වේ, ක්ලාන්ත වේ, දුර්වර්ණ වේ. ශීත කාලයෙහි පවත්නා රූප තෘප්ත වේ, ප්‍රණීත වේ, මෘදු වේ. සුව පහස් ඇත්තේ වේ, සිනිඳු වේ. ඒ යෝගි තෙමේ ඒ රූප පරිග්‍රහ කොට උෂ්ණ කාලයෙහි පැවැති රූපය ශීත කාලයට නො පැමිණ එහි ම නිරුද්ධ වේ. ශීත කාලයෙහි පැවැති රූපය ද උෂ්ණ කාලයට නො පැමිණ එහි ම නිරුද්ධ වේ. එහෙයින් එය අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්ම යැ යි මෙසේ තිලක්ඛණට නගයි.

(5) **කර්මජ රූප වශයෙන්**:- කර්මජ රූප ආයතන සඞ්ඛ්‍යාත ද්වාර වශයෙන් ද ප්‍රකට වේ.

ඒ මෙසේයි:- චක්ෂුර්ද්වාරයෙහි, චක්ෂුර්දශක - කාය දශක - භාව දශක වශයෙන් කර්මජ රූප තිසෙක් වේ. ඔවුනට උපසර්ජනීභූත ඍතු - චිත්ත - ආහාර සමුත්ථාන ශුද්ධාෂ්ටක තුන - තුන වශයෙන් සූචිසි රූපය දැ යි සූපනසෙක් වේ. ශ්‍රෝත්‍ර - ඝ්‍රාණ - ජිහ්වා ද්වාර - යන්හි ද එසේ ම සූපනස බැගින් වේ. කාය ද්වාරයෙහි කාය භාව දශක වශයෙන් ද, ඍතුසමුත්ථානාදී වශයෙන් දැ යි රූප සූසාලි-සෙක් වේ. මනෝද්වාරයෙහි හෘදයවස්තු දශකය, කාය දශකය, භාව දශකය, යන මොවුන් ගේ වශයෙන් ද ඍතුසමුත්ථානාදී වශයෙන් ද, සූපනසෙක් ම වේ.

(මනෝද්වාරය නම් සාවජ්ජන භවාඞ්ග යැ. එයට නිශ්‍රය බැවින් හදවත සඳහා නිශ්‍රිත ව්‍යවහාරයෙන් **'මනෝද්වාරේ'** යි යුහු. 'යම් තැනෙක මනෝද්වාරෝත්පත්තිය ද හේ මනෝද්වාර නමැ යි'' යනු සත්‍ය යි.) ඒ යෝගීතෙමේ ඒ සියලු රූප පරිග්‍රහ කොට චක්ෂුර්ද්වාරයෙහි පැවැති රූපය ශ්‍රෝත්‍ර ද්වාරයට නො පැමිණ එහි ම නිරුද්ධ වේ. ශ්‍රෝත්‍රද්වාරයෙහි පැවැති රූපය ඝ්‍රාණද්වාරයට ද, ඝ්‍රාණද්වාරයෙහි පැවැති රූපය ජිව්හාද්වාරයට ද, ජිව්හාද්වාරයෙහි පැවැති රූපය කායද්වාරයට ද, කායද්වාරයෙහි පැවැති රූපය මනෝද්වාරයට ද, නො පැමිණ එහි ම නිරුද්ධ වේ. එහෙයින් එය අනිත්‍ය යැ, දුඃඛ යැ - අනාත්ම යැ යි මෙසේ එහි තිලක්ඛණට නගයි.

(6) **චිත්ත සමුට්ඨාන වශයෙන්**:- චිත්ත සමුට්ඨාන රූපය සෝමනස්ස - දෞමනස්ස කාලයෙහි පැවැතීම් වශයෙන් ප්‍රකට වේ.

ඒ මෙසේ යි:- සෝමනස්සින් යුත් කලෑ උපන් රූප සිනිඳු වේ මෘදු වේ, ප්‍රණීත වේ, සුඛ සහගී ඇත්තේ වේ. දෞමනස් කලෑ උපන් රූප - ම්ලාන වේ, කලාන්ත වේ, දුම්මණී වේ.

ඒ යෝගී තෙම ඒ රූප පරිග්‍රහ කොට සෝමනස් කලෑ පැවැති රූපය දෞමනස් කලට නො පැමිණ එහි ම නිරුඬ වේ. දෞමනස් කලෑ පැවැති රූපය සෝමනස් කලට නො පැමිණ එහි ම නිරුඬ වේ. එහෙයින් අනිත්‍ය යෑ, දුඃඛ යෑ, අනාත්ම යෑ යි මෙසේ එහි ත්‍රිලක්ෂණයට නගයි. මෙසේ චිත්ත සමුට්ඨාන රූප පරිග්‍රහ කොට එහි ත්‍රිලක්ෂණයට නගන යෝගීහට මේ අර්ථය ප්‍රකට වේ.

"ජීවිතං අත්තභාවෝ ච - සුඛදුක්ඛා ච කේවලා
එකචිත්තසමායුත්තා - ලහුසෝ වත්තතේ ඛණෝ

චුල්ලාසීති සහස්සානී - **කප්පං** තිට්ඨන්ති යේ මරූ
තත්තේව තේපි නිරුඣන්ති - දවිහි චිත්තේහි සමාහිතා

යේ නිරුඬා මරන්තස්ස - **තිට්ඨමානස්ස** වා ඉධ
සබ්බේව සදිසා ඛන්ධා - ගතා අප්පටි සන්ධිකා

අතීතා රා ච යේ භග්ගා - යේ ච භග්ගා අනාගතේ
තදන්තරා නිරුඬානං - වෙසම්මං නත්ථි ලක්ඛණේ

අනිබ්බත්තේන න ජාතෝ - පච්චුප්පන්නේන ජීවති
චිත්තභඞ්ගා මතෝ ලෝකෝ - පඤ්ඤත්ති පරමත්ථියා

අනිරුඬගතා භග්ගා - පුරේජාතාපි අනාගතේ
නිබ්බත්තා යේපි තිට්ඨන්ති - ආරග්ගේ සාසපූපමා

නිබ්බත්තනලක්ඛණේ ධම්මානං - භඞ්ගා තේසං පුරක්ඛතෝ
පලෝකධම්මා තිට්ඨන්ති - පුරාණේහි අමිස්සිතා

අදස්සනාතෝ ආයන්ති - භඞ්ගා ගච්ඡන්ති **දස්සනං**
විජ්ජුප්පාදෝව ආකාසේ - උප්පජ්ජන්ති වයන්ති ච

* දිවිය, අත්බව් හා – සුව-දුක් දහම් මත් වේ.
එක් සිත් සැණක් පැවැතේ – එ සැණ ද ඉතා ලුහු වේ.

සුවාසූ දහසක් – කප් සිටින දෙව්යෝවත්
උපන් සිත හා නසිනෙන් – දෙසිත් සැණෙකින් නො සිටින්.

මැරෙනහු සෙ දිවමත් – සතත් නැසෙන පස්කඳ
පිළිසඳ නො යනුයෙන් මතු – සම වේ සියල නැසුමෙන්

අනතුරුව ද නැසුණු – අනාකල ද නැසෙන සුලු
දෙ අතුරු පැවැතැ වැනැසෙන – සකරන් ලකුණු නො වෙනසි

නො උපනෙන් නූපනී – වත්මන් සිතින් දිවමනි
සිත්නව† මළ හි පරමත් – දිවමන්තම් වහරමත්‡

බුන්දම්ථ නො සැඟවිණි – අනාකලැ පිඬුවෙක් නැති
හිදි අඟැ අබැටක් ලෙසින් – වත්මන් සකර පැවැතේ

නිපන් එ සකර දම් – වැනැසුම් පෙරටු කොට ගෙන
පැරැණි දම් හා නුමුසුවැ – වැනැසෙන සුලුවැ සිටුනේ

කිසි තැනෙකින් නො ඒ – නැසුණෙ ද නො දැක්මට යේ
අහසෙහි නැගි විදුලි සේ – සකර උපදී වැනැසේ

මෙසේ ආහාරමයාදී රූපයෙහි තිලකුණු අරවා නැවැතැ ධර්මතා රූපයෙහි තිලකුණු අරව හි.

(7) **ධර්මතා රූපය නම්:**- පිවත (අනින්ද්‍රිය බඳ වූ) යකඩ- ලෝහ- සුදු ඊයම්- කළු ඊයම්- රන්- රිදී- මුතු- මැණික්- වෙරළු- සක්- කළුගල්- පබළු- රතුකැට- මැසිරි ගල්- පොළෝ- පහණ- ගල්- තණ- රුක්- ලිය ආදී ප්‍රභෙද ඇති හටගන්නා කප පවන් ගෙන උපදනා රූපය හි. එය මේ යොනී හට අශොක අඬකුර වශයෙන් ප්‍රකට වේ.

ඒ මෙසේ :- අශොක අඬකුර රූපය ආදියෙහි ම තුනී රත් පැහැය. තැවැතැ දෙතුන් දිනක් ඇවැමෙන් මදක් රත් වේ.

---

* ජීවිතෙන්ද්‍රිය – වෙදනා – විඤ්ඤාණයන් තබා අවශිෂ්ට ධර්මයෝ සංඥ යැ යි ද සම්භරැ යෙති. (මේ සත්‍ය මත යැ.) එහෙත් ජීවිතය ආයුඃ ප්‍රමාණ යැ යි ද – ආත්ම භාවය උෂ්ම යැ යි ද වෙදනා විඤ්ඤාණ යැ යි ද ගණයියෙහි සඳහනි.

† චිත්ත ඛඬගයෙන් ‡ සම්මුති මාත්‍රය ථ නිරුඬ ධර්

අතතුරුවැ තරුණ පත් බදු වණී වේ. අතතුරුවැ මේරු පත් බදු පැහැවේ. ඉක්බිති කොළ පත් පැහැය වේ. අතතුරුවැ නිල් පත් පැහැ වේ. එතැන් පවත් වණීදී වශයෙන් සමාන සවභාව ඇති රූපය හෙතු - ඵල පරම්පරා නොසිඳ පවත්නේ භවුරුද්දකින් පමණ පඬුවන්වැ තටුවෙන් ගැලවී බිම හෙයි. ඒ යොගී තෙමේ ඒ පරිග්‍රහ කොට තුනී රතු කල පැවැති රූපය තද රතු කාලයට නොපැමිණ නිරුඬ වේ. තද රතු කල පැවැති රූපය මද රතු කාලයට ද පෙ- පඬුවන් පත් කල පැවැති රූපය තටුයෙන් ගිලිහී වැටෙන කාලයට නොපැමිණ නිරුඬ වේ. එහෙයින් එය අනිත්‍ය යැ. දුඃඛ යැ. අනාත්ම යැ යි මෙසේ එහි තිලකුණට නගා මේ නයින් සියලු ධම්මතා රූපය සන්මර්ශනය කෙරේ. (මේ දුඃඛය වනුයේ ඒ ගැන ඇලුම් ඇත්තහුට යැ.)

මෙසේ රූප සප්තක වශයෙන් පළමුකොට තිලකුණට නගා සංස්කාර සන්මර්ශනය කෙරේ.

අරූප සප්තක වශයෙන් මෙසේ යි.

කලාපතෝ ගමකතෝ - ඛණතෝ පටිපාටිතෝ
දිට්ඨුග්ඝාටතෝ මාන - සමුග්ඝාටනතෝ පිවා
නිකන්ති පරියාදානා - සත්තා'රූප විපස්සනා

අරූප ධර්ම (1) කලාප හෙයින් ද,
(2) ගමක හෙයින් ද,
(3) ක්ෂණික හෙයින් ද
(4) පටිපාටි හෙයින් ද
(5) දෘෂ්ටි උද්ඝාටන හෙයින් ද
(6) මාන සමුද්ඝාටන හෙයින් ද
(7) නිකන්ති පරියාදාන හෙයින්ද යි සත් පරිද්දෙකින් විදර්ශනා කරන්නේ යැ.

මෙහි (1) කලාප නම්:- ඵස්ස- වේදනා- සඤ්ඤා- චේතනා- චිත්ත- යන ඵස්ස පඤ්චක ධර්මයෝ යි. කලාප වශයෙන් සන්මර්ශනය කරන පරිදි "**ඉධ භික්ඛු ඉති පටිසංචික්ඛති යෙ ඉමේ කෙසා අනිච්චා- දුක්ඛා- අනත්තාති සම්මසනෙ උපනෙති ඵස්සපඤ්චමකා ධම්මා. යෙ ච ලෝමා -පෙ- මුත්ත- දුඛා අනිච්චා දුක්ඛමනත්තාති**"* 'මේ සසුනෙහි යොගී

* ප: ම:.

නිස්සුතෙම මේ කේස අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්මයැ යි සන්නමශීනය කිරීමෙහිදී උපන් එසස පඤ්චමක නාම ධර්මයෝ අනික් - අනික් කොටසකට නො පැමිණ පුරුක් - පුරුක්වැ කොටස් - කොටස්වැ රත් කබලෙක ලූ තල සේ තව - තව යන අනුකරණයෙන් විනාශ වෙති. එහෙයින් අනිත්‍යය හ, දුඃඛය හ, අනාත්මයහ යි සන්නමශීනය කෙරේයැ යි මෙසේ සලක යි මේ **විශුද්ධි කථාවෙහි** ක්‍රමය යි.

ආයුෂ්මංශ කථාවෙහි* යට රූප සප්පාකයෙහි සත් තැනෙක කී රූපය අනිස යැ, දුක යැ, අනතයැ යි පැවැති සිත ද අනිස යැ, දුක යැ, අනතයැ යි අනික් සිතකින් සන්නමශීනය කරන්නේ 'කලාප වශයෙන් සන්නමශීනය කරන්නේ නමැයි කියන ලදී. ඒ අභිශයින් යුක්ත වේ. එහෙයින් සෙසු යමකාදිය ද ඒ නයින් ම බෙදන්නෙමු.

(රූප සප්පාක සන්නමශීනය රූප ධර්මයන්හි සත විනිහෝගකොට පැවැත්තේ යැ. ඒ විෂයෙහි වූ අරූප ධර්ම සන්නමශීනය අභිශයින් අනිත්‍ය ලක්ෂණය ප්‍රතිවෙධය පිණිස පවතිය යි අභිශයින් යුක්ත යැ. එහෙත් එහි නො කී කෙශාදිය සන්නමශීනය කොට ඒ විෂයෙහි පැවැති අරූපධර්ම සන්නමශීන කර්මස්ථානය අභිනව වන හෙයින් අනිත්‍ය ලක්ෂණ ප්‍රතිවෙධයට පහසු නො වේ. පෙර පැවැති සන්නමශීන විෂය හැර අනික් සන්නමශීන විෂයයක් ගත් හෙයිනි යනු ටීකා යි.)

(2) **යමක වශයෙන්** :- මෙහි ඒ යොනී තෙම පෙර කී ආදුන - නිකෙඛප රූපය අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්ම යැ යි සන්නමශීනය කොට; ඒ සන්නමශීනය කළ චිත්තය ද අනික් සිතකින් අනිත්‍ය- දුඃඛ- අනාත්ම වශයෙන් සන්නමශීනය කිරීමෙන් රූපා'රූප යුගළ වශයෙන් විදශීනා වැඩීම ද යමක වශයෙන් සන්නමශීනය කිරීම යි.

වයොවුඩ්ඪගාමී **රූපය** ද, ආහාරමය රූපය ද, උතුමය රූපය ද, **කර්මජ** රූපය ද, **චිත්ත සමුට්ඨාන** රූපය ද, ධර්මතා රූපය ද, අනිත්‍ය- දුඃඛ- අනාත්ම වශයෙන් සන්නමශීනය කොට ඒ සන්නමශීනය කළ චිත්තය ද අනික් සිතකින් සන්නමශීනය කෙරේ නම් ඒ යුගළ වශයෙන් සන්නමශීනය කිරීම නම් වේ. මේ යමක වශයෙන් සන්නමශීනය කිරීම යි.

---

* අ: නි: චතුක්කනිපාත

(3) **ක්ෂණික වශයෙන්**:- ඒ යොගී තෙමේ- ආදීන නිඝෙපය අනිත්‍ය- දුඃඛ- අනාත්ම වශයෙන් සන්මශීනය කොට ඒ රූප විදශීනා කළ පළමු වන සිත ද අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්මයැ යි සන්මශීනය කොට ඒ සිත ද අනිත්‍යාදී වශයෙන් සන්මශීනය කොට මෙසේ දෙ වන, තුන් වන, සතර වන සිතද යි සිත් සතරක් සන්මශීනය කිරීම ක්ෂණික වශයෙන් සන්මශීනය කිරීම නම් වේ. නැවැතැ වයොවුඩ්ඪගාමී රූපය, ආහාරමය රූපය, උතුමය රූපය, කම්ජ රූපය, විත්ත සමුඵාන රූපය, ධම්මතා රූපය, අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්මයැ යි සන්මශීනය කොට ඒ ප්‍රථම විත්තය දෙ වැනි සිතින් ද, දෙ වැනි සිත තුන්වැනි සිතින් ද, තුන් වැනි සිත සතර වැනි සිතින් ද, සතර වැනි සිත පස් වැනි සිතින් ද. සන්මශීනය කෙරේ. මෙසේ රූප පරිග්‍රහ විත්තයෙහි පටන් සතර-සතර සිතක් සන්මශීනය කිරීම ක්ෂණික වශයෙන් සන්මශීනය කිරීම නම් වේ.

(4) **පවිපාටි වශයෙන්**:- ආදීන නිඝෙඛප වශයෙන් සන්මශීනය කළ රූපය අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්මයැ යි විදශීනා වඩා ඒ විදශීනා වැඩූ පළමු සිත අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්මයැ යි ද, දෙ වෙනි සිත විදශීනා වැඩූ තුන් වන සිත දැයි මෙසේ පිළිවෙළින් - දස වැනි සිත අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්මයැ යි එකොළොස් වන සිතින් සන්මශීනය කෙරේ.

මෙසේ සෙසු වයොවුඩ්ඪගාමී රූපය ද -පෙ- ධම්මතා රූපයද යි සෙසු රූපයන් විදශීනා වඩා ඒ විදශීනා කළ සිත් ද, දස වන සිත තෙක් අනිත්‍යාදී වශයෙන් සන්මශීනය කෙරේ. මෙසේ විදශීනා පිළිවෙළින් මුළු දවසම සන්මශීනය කිරීමට වටනේ යැ. දස වැනි සිත තෙක් විදශීනා වැඩීමෙන් රූප කම්ඨානය ද අරූප කම්ඨානය ද ප්‍රගුණ වේ. එහෙයින් දස වැනි සිත තෙක් සන්මශීනය කළ යුතුයැ යි කියන ලදී. මෙසේ සන්මශීනය කිරීම පිළිවෙළින් සන්මශීනය කිරීම නම් වේ.

(5) **දිඨි උග්ඝාටන වශයෙන් ද**

(6) **මාන උග්ඝාටන වශයෙන් ද**

(7) **නිකන්ති පරියාදාන වශයෙන්ද** යි යන මේ තුනෙහි වෙන ම සන්මශීනයෙක් නැති.

ඔට රූප සප්පායයෙහි රූපය ද, මේ අරූප සප්පායයෙහි අරූපය ද විදශීනා වඩා ඒ නාම-රූපයන් ගෙන් මත්තෙහි අනික් සත්ත්වයකු නො දකී. එසේ සත්ත්වයකු නො දුටු තැන් පටන්

සත්ත්ව සංඥාව උගුළුවන ලදී. සත්ත්ව සංඥාව උගුළුවා හළ සිතින් සංඝස්කාර පරිග්‍රහ කරන්නහුට ම දෘෂ්ටිය නූපදී. දෘෂ්ටිය නූපදනා කලැ දෘෂ්ටිය උගුළුවන ලද්දී නම් වේ. දෘෂ්ටි උද්ඝාටිත සිතින් සංඝස්කාරයන් සන්මර්ශනය කරන්නහුට මානය නූපදී. මානය නූපදනා කල මානය සමුද්ඝාටිත නම් වේ. මානය සමුද්ඝාටිත සිතින් සංඝස්කාර පරිග්‍රහ කරන්නා හට තෘෂ්ණා නූපදී. තෘෂ්ණා නූපදනා කල්හි නිකන්තිය (සියුම් තෘෂ්ණාව) ක්ෂය වෙයි. මේ **පළමු විශුද්ධි කථාවෙහි** කියන ලද ක්‍රමය යි.

ආයුෂ්මංශ කථාවෙහි:- "දිට්ඨුග්ඝාටනතෝ, මානසමුග්ඝාටනතෝ, නිකන්තිපරියාදානතෝ" යි දෘෂ්ටිය උගුළුවන හෙයින් ද, මානය නැසීමෙන් ද, නිකන්තිය ක්ෂය කිරීමෙන්ද යි මාතෘකා තබා මේ ක්‍රමය දැක්වී. "මම විදර්ශනා කරමි විදර්ශනාව මාගේය යි" මෙසේ (සත්කාය දෘෂ්ටියෙන්) ගන්නවුන් ගේ ආත්ම දෘෂ්ටිය නො සිදේ. "සංඝස්කාරයෝ ම සංඝස්කාරයන් විදර්ශනා කෙරෙති. අනිත්‍යාදී වශයෙන් විනිශ්චය කෙරෙති, පරිග්‍රහ කෙරෙති, පිරිසිඳිතියැ යි ගන්නහුට වනාහි දෘෂ්ටිය උද්ඝාටිත වේ."

"මම මනාව විදර්ශනා කරමි. මාගේ විදර්ශනාව මැනැවැ යි" ගන්නහු ගේ මාන නො නැසේ. එතෙකුදු වුව "සංඝස්කාරයෝ ම" සංඝස්කාරයන් විදර්ශනා කෙරෙති. සන්මර්ශනය කෙරෙති. විනිශ්චය කෙරෙති. පරිග්‍රහ කෙරෙති. පිරිසිඳින්යැ යි" ගන්නහු ගේ මානය සමුද්ඝාටිත වේ.

මට විදර්ශනා කළ හැකියැ යි' විදර්ශනාව ආස්වාදනය කරන යොගීහු ගේ නිකන්ති නම් වූ සියුම් තෘෂ්ණාව ක්ෂය නො වේ. 'සංඝස්කාරයෝ ම සංඝස්කාරයන් විදර්ශනා කෙරෙති. සන්මර්ශනය කෙරෙති. විනිශ්චය කෙරෙති. පරිග්‍රහ කෙරෙති. පිරිසිඳින්යැ" යි ගන්නාවූ යොගීහු ගේ සියුම් තෘෂ්ණාව ක්ෂය වේ. සංඝස්කාර ආත්මවේ නම් ආත්මය යි ගන්නට වටී. අනාත්ම වූ සංඝස්කාර ආත්මය යි තීර්ථකයන් විසින් ගන්නා ලදී. එහෙත් ඒ සංඝස්කාර තමා වශයෙහි නො පවත්නා හෙයින් අනාත්ම යැ ඇතිවැ නැති වන අර්ථයෙන් අනිත්‍ය යැ. ඉපදීම් – වැනැසීම් දෙක්හි පෙළන හෙයින් දුක්යැ යි ද දක්නහුගේ දෘෂ්ටිය උද්ඝාටිත වේ.

තවද සංස්කාර නිත්‍ය නම් නිත්‍යයැ යි ගන්නට වටී. අනිත්‍යවූ ම සංස්කාර තීර්ථකයන් නිත්‍යය යි ගන්නාලදී.

එහෙයින් ඒ සංස්කාර ඇතිවැ නැති වන හෙයින් අනිත්‍ය යැ, උත්පාද-ව්‍යය දෙක්හි පෙළන හෙයින් දුක් යැ, වශයෙහි නො පවත්නා හෙයින් අනාත්මයැ යි දක්නා යොගීහු ගේ මානය සමුද්ඝාටනය වේ.

තව ද සංස්කාර සැප වේ නම් සැපය යි ගන්නට වටී. එහෙත් දුක් වූ ම සංස්කාර නොවුවත් විසින් සැපයැ යි ගන්නා ලදී. එහෙයින් ඒ සංස්කාර උත්පාද-ව්‍යය දෙක්හි පෙළන හෙයින් **දුක් යැ,** ඇති වැ නැති වන හෙයින් **අනිත්‍ය යැ,** වශයෙහි නො පවත්නා හෙයින් **අනාත්ම යැ.**

මෙසේ සංස්කාර **අනාත්ම** හෙයින් දක්නහුගේ ආත්ම දෘෂ්ටිය සමුද්ඝාටනය වේ. අනිත්‍ය හෙයින් දක්නහුගේ මාන සමුද්ඝාටනය වේ. **දුක්** වශයෙන් දක්නහුගේ නිකන්ති පරියාදානය වේ. මෙසේ **මේ** විදර්ශනය තම තමා ගේ **ස්ථානයෙහි** ම සිටියේ වේය යි මෙසේ අරූප සප්තක වශයෙන් ද ත්‍රිලක්ෂණයට නගා සංස්කාර සම්මර්ශනය කෙරේ. මෙතෙකින් ඒ යොගීහට රූප කර්මස්ථානය ද, අරූප කර්මස්ථානය ද, ප්‍රගුණ වේ.

විශේෂ:- යට කී සේ පිළිවෙළින් විදර්ශනා වැඩීමෙහි නියුතු යොගීහු ගේ අනත්තානුපස්සනාව යම් කලෙක තියුණු වැ, ශූර වැ, විශද වැ, පවතී නම්, ඉතිරි දෙක එයට අනුවර්තක වේ නම් එකල ඒ යෝගී විසින් දෘෂ්ටි උද්ඝාටනය කරන ලදී. සියලු දෘෂ්ටිහු ආත්ම දෘෂ්ටිය මුල් කොට වෙති. අනත්තානුපස්සනාව **ආත්මදෘෂ්ටියට** සෘජු වැ ප්‍රතිපක්ෂ යි. අනිත්‍ය සංඥාව තියුණුවැ ශූරවැ විශදවැ පවත්නා කල ඉතිරි දෙක එයට අනුවර්තක යැ. එකල මේ යොගී මාන සමුද්ඝාටනය කෙරේ. අනිත්‍ය බව ඇති කල්හි ම "මේ නිත්‍ය යැ මේ ධ්‍රුව යැ යි" මාන වශයෙන් ජල්පනය නො වේ. **බ්‍රහ්මයා ගේ** මෙනි. අනිච්චානුපස්සනාව ම නිත්‍ය ග්‍රාහයට සෘජු ප්‍රතිපක්ෂ යි. දුක්ඛානුපස්සනාව **නිස්සරණවැ** ශූරවැ විශදවැ පවත්නා කලැ ඉතිරි දෙක තදනුවර්තක යැ. එකල නිකන්තිය ප්‍රහීණ කළා නම් වෙයි. සුඛ සංඥාව ඇති කල ම තෘෂ්ණාග්‍රාහය වේ. දුක්ඛානුපස්සනාව ද **නිකන්ති ප්‍රතිපක්ෂ** යි. මෙසේ ත්‍රිවිධ අනුපස්සනාවන් ගේ කෘත්‍ය විශෙෂ වශයෙන් දෘෂ්ටි උද්ඝාටනාදිය වේ.

(ටීකාගත විස්තර) මෙසේ අරූප සප්තක වශයෙන් තිලකුණට නගා සම්මර්ශනය කෙරේ. ඒ යොගී තෙමේ මේ නයින් රූප-අරූප කර්මස්ථානය පුහුණු වූයේ නම් වේ. මෙසේ පුහුණු

වූ රූප-අරූප ධර්මයන් ඇති යෝගී තෙමේ භඞ්ගානුපස්සනාවෙහි පවත් පහාන පරිඤ්ඤා වශයෙන් සියලු ආකාරයෙන් පැමිණිය යුතු අවලෝස් මහා විදර්ශනාවෙන් මෙහිදී පළමු කොට එක දෙශයක් ප්‍රතිවෙධ කිරීමෙන් එයට ප්‍රතිපක්ෂ වූ ධර්ම විෂ්කම්භණය කෙරේ.

විස්තර:- අවලෝස් මහා විදර්ශනා නම් අනිච්චානුපස්සනාදී ප්‍රඥයි.

ඒ මෙසේ යි:-

(1) අනිච්චානුපස්සනාව වඩන යෝගී නිත්‍ය සංඥාව දුරු කෙරේ.

(2) දුක්ඛානුපස්සනාව වඩන්නේ සුඛ සංඥාව ද

(3) අනත්තානුපස්සනාව වඩන්නේ ආත්ම සංඥාව ද

(4) නිබ්බිදානුපස්සනාව වඩන්නේ නන්දිය (සප්‍රීතික තෘෂ්ණාව) ද

(5) විරාගානුපස්සනාව වඩන්නේ රාගය ද

(6) නිරෝධානුපස්සනාව වඩන්නේ සමුදය ද

(7) පටිනිස්සඞ්ගානුපස්සනාව වඩන්නේ ආදානය (භව-තෘෂ්ණාව) ද

(8) ඛයානුපස්සනාව වඩන්නේ ඝන සංඥාව (ඝනනති-සමූහ- කෘත්‍ය- ආරම්මණ වශයෙන් එකත්වයෙන් ගැනීම) ද

(9) වයානුපස්සනාව වඩන්නේ සංස්කාරයන් ගේ රැස්-කිරීම ද

(10) විපරිණාමානුපස්සනාව වඩන්නේ ධ්‍රුව සංඥාව (ස්ථිර වශයෙන් ගැනීම) ද

(11) අනිමිත්තානුපස්සනාව වඩන්නේ නිත්‍ය නිමිත්ත ද

(12) අපණිහිතානුපස්සනාව වඩන්නේ ප්‍රණිධිය (සුඛ වශයෙන් ගැනීම) ද

(13) සුඤ්ඤතානුපස්සනාව වඩන්නේ ආත්ම වශයෙන් අභිනිවෙශය ද

(14) අධිපඤ්ඤාධම්මවිපස්සනාව (සංස්කාර අනිත්‍යාදී වශ-යෙන් දක්නා ඥාණ) වඩන්නේ තෘෂ්ණා - දෘෂ්ටි වශයෙන් දැඩිවැ ගැනීම ද

(15) යථාභූත සුඤ්ඤදර්ශනය වඩන්නේ සමෝහානිනිවේශය ද

(16) ආදීනවානුපස්සනාව වඩන්නේ ආලය වශයෙන් දැඩිවැ ගැනීම ද

(17) පටිසඞ්ඛානුපස්සනාව (සංස්කාරයන් මිදීමේ උපාය ඥනය) වඩන්නේ අපපටිසංඛය (අවිද්‍යාව) ද

(18) විවට්ටානුපස්සනාව වඩන්නේ කාම සංයෝගාදී කෙලෙස ප්‍රවෘත්තියෙ ද දුරැ කෙරේ.

මේ අටළොස් මහා විදර්ශනාවන් අතුරින් අනිත්‍යාදී ලක්ෂණ ත්‍රය වශයෙන් මේ යොගියා විසින් සංස්කාර දක්නා ලද හෙයින් අනිත්‍ය- දුඃඛ- අනාත්මානුදර්ශනය ප්‍රතිවෙධ කරන ලද්දේ වෙයි.

"යා ච අනිච්චානුපස්සනා, යා ච අනිමිත්තානුපස්සනා, ඉමෙ ධම්මා එකට්ඨා ව්‍යඤ්ජනමෙව නානා"* 'යම් අනිච්චානුපස්සනාවක් යම් අනිමිත්තානුපස්සනාවක් වේ නම් මේ ධර්ම එකාර්ථ යැ. ව්‍යඤ්ජන ම වෙනසි.

එසේ ම **"යා ච දුක්ඛානුපස්සනා යා ච අප්පණිහිතානුපස්සනා ඉමෙ ධම්මා එකට්ඨා ව්‍යඤ්ජනමෙව නානා"*** 'යම් දුක්ඛානුපස්සනාවක් යම් අප්පණිහිතානුපස්සනාවක් වේ නම් මේ ධර්ම එකාර්ථ යැ, ව්‍යඤ්ජන ම වෙනසි. **"යා ච අනත්තානුපස්සනා - යා ච සුඤ්ඤතානුපස්සනා ඉමෙ ධම්මා එකට්ඨා ව්‍යඤ්ජනමෙව නානා"*** 'යම් අනත්තානුපස්සනාවක් - යම් සුඤ්ඤතානුපස්සනාවක් වේ නම් මේ ධර්ම එකාර්ථ යැ, ව්‍යඤ්ජනම වෙනසි යි වදරන ලදී. එහෙයින් ම ඒ අනිමිත්ත - අප්පණිහිත- සුඤ්ඤතානුපස්සනාවෝ ද ප්‍රතිවෙධ කරන ලද හ. අධිපඤ්ඤාධම්ම විපස්සනාව සියලු විදර්ශනාවේ ම ඇත්තී ය. (එහෙයින් එක දෙශයකින් ප්‍රතිලබ්ධ වේය යනු ආශය යි.)

යථාභූත ඥනදර්ශනය කඞ්ඛාවිතරණ විසුද්ධියෙන් ම සංග්‍රහ කරන ලදී. (එය මුලදී ම සිද්ධ යැ යනු ආශය යි) එහෙයින් අධිපඤ්ඤාධම්මවිපස්සනාව හා යථාභූත ඥන දර්ශනය ද ප්‍රතීවෙධ කරන ලදී. සෙසු නිබ්බිදානුපස්සනාදී දස විදර්ශනාවන් අතුරින් කිසිවක් (එකදෙශයක්) ප්‍රතිවෙධ කරන ලද්දේ වෙයි. කිසිවක් ප්‍රතිවෙධ නො කරන ලද්දේ වෙයි.

---

* ප: ම:

(අනිච්චානුපස්සනාව සිද්ධ කල්හි නිරෝධානුපස්සනා ද, ඛයානුපස්සනා ද, විපරිණාමානුපස්සනා ද එකදෙශයකින් සිද්ධ වේ. දුඃඛානුපස්සනාව සිද්ධ කල්හි- නිබ්බිදානුපස්සනාව ද, ආදීනවානුපස්සනාව ද සිද්ධ වේ.

අනත්තානුපස්සනාව සිද්ධ කල්හි ඉතිරි අනුපස්සනාව සිද්ධ වේ. යනු ටීකායි. ඔවුන් ගේ විභාගය පටිපදාඤාණදස්සන විසුද්ධියෙහි මතු ප්‍රකාශ කරමිහ.)

විශේෂ:- ප්‍රතිවෙධ කරන ලද විදර්ශනාඥාන සඳහා මෙසේ ප්‍රගුණ කළ රූපා'රූප කර්මස්ථාන ඇති යෝගී මතු භඞ්ගානුපස්සනාහි පවත් පහාන පරිඤ්ඤා වශයෙන් සිදුවූ ආකාරයෙන් පැමිණිය යුතු අවලෝස් මහා විදර්ශනාව පළමුවෑ මෙහි ම එකදෙශයක් ප්‍රතිවෙධ කරන්නේ එයට ප්‍රතිපක්ෂ ධර්ම පහ කෙරේය යි එහෙයින් කියන ලදී.

සම්මසන ඤාණයා ගේ පර තෙරට ගොස් (වළා පහවීමෙන් අහස මෙන් ද, මඩ- මල- බැහැර වීමෙන් ජලය මෙන් ද, කිලිටු පහවීමෙන් රන් මෙන් ද,) කෙලෙස් පහවීමෙන් ඤාණයා ගේ පාරිශුද්ධිය වන හෙයින් ඒ යෝගී තෙම මෙසේ අනිච්චානුපස්සනාදියට ප්‍රතිපක්ෂ වූ නිච්චසඤ්ඤාදිය පහකිරීමෙන් විසුද්ධ ඤාණය ඇතිවෑ නොයෙක් ආකාරයෙන් කෙලෙසෙන සඞ්ඛාරයන් පිළිබඳ ත්‍රිලක්ෂණය මෙනෙහි කිරීමෙන්- සැලකීම් වශයෙන් සම්මසන ඤාණයා ගේ පර තෙරට ගොස් නය විදර්ශනා සඞ්ඛ්‍යාත කලාප සන්තතීන ඥානයට අනතුරුවෑ **'ප්‍රත්‍යුත්පන්න ධර්මයන් ගේ විපරිණාමානුපස්සනාවෙහි පැවැති ප්‍රඥාව උදයව්‍යයානුදර්ශනයෙහි ඤාණය'** යි කියන ලදී. ඒ උදයව්‍යයානුදර්ශනයට පැමිණීම පිණිස යොග (උත්සාහ) පවත් ගනී.

එසේ පවත් ගන්නේ ද, සැකෙවින් පවත් ගනී. මේ ඒ පිළිබඳ පාළිය යි. **"කථං පච්චුප්පන්නානං ධම්මානං විපරිණාමානුපස්සනෙ පඤ්ඤා උදයබ්බයානුපස්සනෙ ඤාණං ජාතං රූපං පච්චුප්පන්නං. තස්ස නිබ්බත්ති ලක්ඛණං උදයො විපරිණාම ලක්ඛණං වයො. අනුපස්සනා ඤාණං. ජාතා වෙදනා සඤ්ඤා-සඞ්ඛාරා-විඤ්ඤාණං- ජාතං චක්ඛු ජාතො තථෝ පච්චුප්පන්නෙනා. තස්ස නිබ්බත්ති ලක්ඛණං උදයො. විපරිණාම ලක්ඛණං වයො. අනුපස්සනා ඤාණන්ති"*.**

---

* ප: ම: ඤාණකථා

ඒ මෙසේ යි. සන්තති පවත්තුපපන්න වූ හෝ ඛණ පවත්තුපපන්න වූ හෝ ධර්මය පිළිබඳ විපරිණාමානුපස්සනාඥානයෙහි නුවණ උදය-ව්‍යයානුදර්ශීනයෙහි ඥානය යි. උපන් රූපය පවත්තුපපන්න ය. ඒ රූපයා ගේ හටගැනීම් ලක්ෂණය උදය ය. පෙළීම් සඞ්ඛ්‍යාත විපරිණාම ලක්ෂණය ව්‍යය ය. අනුපස්සනාව ඤාණය යි.

ජාත වේදනාව පවත්තුපපන්න ය. ඒ වේදනාව ගේ නිබ්බත්ති ලක්ෂණය උදය ය. විපරිණාම ලක්ෂණය ව්‍යය ය. යනාදී විසින් යෙදිය යුතු සඤ්ඤා- සඞ්ඛාර- විඤ්ඤාණද යි මෙසේ පඤ්චස්කන්ධය පිළිබඳව වේ. හටගත් චක්ඛුව පවත්තුපපන්න ය. ඔහු ගේ නිබ්බත්ති ලක්ෂණය උදය ය. විපරිණාම ලක්ෂණය ව්‍යය ය, අනුප්පස්සනාව ඤාණ ය, යනාදීන් ආයතනයන් පිළිබඳව ද,

අවලෝස් ධාතු, ඣාවිස්සති ඉන්ද්‍රියයන්හි ද මෙසේ ම යෙදිය යුතු. ජාත වූ භවය පවත්තුපපන්න ය, ඒ භවයා ගේ හටගැනීම් ලක්ෂණය උදය ය, විපරිණාම ලක්ෂණය ව්‍යය ය, අනුදර්ශනාව ඥානය යි.

(හුදෙක් කලාප සතරමහාභූතාදියෙහි ජාති- ජරා- මරණ යි-යෙන් ජාති- ජරා- මරණවත් ධර්ම කියන ලදී. මේ උදයව්‍ය-යානුදර්ශන නිර්දේශයෙහි- 'හටගැනීම් පවත්තුපපන්න ය, ඒ ජාතිහු ගේ හටගැනීම් ලක්ෂණය උදය ය. විපරිණාම ලක්ෂණය ව්‍යය ය, යනාදී නයින් කියන කල ජාති- ජරා- මරණවත් ධර්මයන් ගේ නිපන් බව ද, අනුදක්නා ලද්දක් මෙන් වේය යි එය බැහැර කිරීමට පටිච්චසමුප්පාද අඞ්ග අතුරින් භවය අවසන් කොට දෙශනා කරන ලදී. යනු ටීකා යි.)

ඒ යෝගී (මේ පාළි නයින්) උපන් නාම රූපයන් ගේ නිබ්බත්ති ලක්ෂණය ජාතිය. (උත්පාදය) අලුත් ආකාරය උදය යි. විපරිණාම ලක්ෂණය ක්ෂයය, භඞ්ගය ව්‍යය ය යි ද නුවණින් බලයි.

ඒ යෝගී තෙමේ මෙසේ දැනගනී, මේ නාම-රූප උත්පත්ති යෙන් පෙර නූපන් නාම-රූපයන් ගේ රැසෙක් හෝ පිඹු වූවෙක් හෝ නැත්තේ ය. උපදින්නා වූ නාම-රූපයන් ගේ රැසකින් හෝ පිඹකින් හෝ ඊමක් නැත්තේ ය. නිරුද්ධ වන්නා වූ නාම-රූපයන් ගේ ද දිශානුදිශාවන්ට යාමෙක් හෝ නැත්තේ ය. නිරුඬ වූ නාම-රූපයන් ගේ ද එක් තැනෙක රාශි වශයෙන් ද, පිඹු වශයෙන් ද, නිධාන වශයෙන් ද පිහිටා සිටීමෙක් නැත්තේ යි.

නිදර්ශන:- විඤ්ඤාණය වර්තන කලැ උපදනා ශබ්දය උපදින්නට පෙර රැස් වීමෙක් නැත්තේ යැ, උපදනේ ද පිණ්ඩයකින් ආයේ නො වේ. නිරුද්ධ වන්නේ ද දිශානුදිශාවන්ට ගමනෙක් නැත්තේ යැ. නිරුද්ධ වූයේ ද නැතෙකැ රැස්වැ නො සිටී. එහෙත් විඤ්ඤාණය ද, උපවිඤ්ඤාණය (වාදන උපකරණය) ද, පුරුෂයා ගේ එඟට සුදුසු ව්‍යායාමය ද, නිසා පෙර නොවූ ශබ්දය ඇතිවෙනී. හවගෙන තස්නේ යි.

එසේ ම 'සියලු රූපා'රූප ධර්මයෝ පෙර නො වූවෝ ඇති වෙත්. ඇති වැ විනාශ වෙත්, යැ යි මෙ සේ සැකෙවින් උදය-ව්‍යය මෙනෙහි කොට, නැවැතැ මේ උදය-ව්‍යය ඥානය ම විභඞ්ගයෙහි **"අවිජ්ජා සමුදයා රූප සමුදයෝ"*** යි වදාළ පරිදි පඤ්චස්කන්ධ වශයෙන් බෙදා, **"අවිජ්ජා සමුදයා රූප සමුදයෝ - තණ්හා සමුදයා - පෙ - කම්ම සමුදයා - පෙ - ආහාර සමුදයා රූප සමුදයෝ"*** 'අවිද්‍යාව ගේ උත්පත්තියෙන් රූප ඉපදීම වේ. තෘෂ්ණාව ගේ ඉපදීමෙන් රූප ඉපදීම වේ. කර්ම සමුදයයෙන් රූප සමුදය වේ. ආහාර සමුදයයෙන් රූප සමුදය වේ, යැ යි මෙසේ ප්‍රත්‍යයයන් ගේ සමුදයාවයෙන් රූප ස්කන්ධයා ගේ උදය ය බල යි.

නිබ්බත්ති ලක්ෂණය (රූප කලින් නො තිබී අලුතෙන් ම උපදනා බව) බලන්නේ ද, රූප ස්කන්ධයා ගේ සමුදය බලයි.

විස්තර:- 'අතීත භවයේ පැවැති අවිද්‍යා - තෘෂ්ණා - කර්ම යන ප්‍රත්‍යයයන් නිසා මේ භවයෙහි ඇති වූ රූපයන් ගේ ආහාරයා ගේ සහයෝගයෙන් සන්තති වශයෙන් පැවැත්ම වේ ය යි' මෙසේ ප්‍රත්‍යය වශයෙන් ද - පෙර කී සේ මේ රූපයෝ කලින් නො තිබී උපදනාහු යැ යන්නාදී නිබ්බත්ති ලක්ෂණයා ගේ බැලීම් වශයෙන් ද යි මේ ආකාරයෙන් **උදයය** බලන්නේ යි.

(රූපයන් ගේ පැවැත්මට ප්‍රත්‍යය වන කර්මාදී අතුරින් බලවත් **කාරණ** හෙයින් කබලීකාරාහාරය ම මෙහි ගන්නා ලදුවත් ඒ ගැනීමෙන් ම ප්‍රවෘත්තියට සාමාන්‍ය ප්‍රත්‍යය වූ සෘතු - චිත්ත යෝ ද ගන්නා ලද්දාහු මැ යි. එහෙයින් චතුසමුට්ඨානික රූපයා ගේ ප්‍රත්‍යය වශයෙන් උදයය දක්වන ලද්දේ වෙයි. (ඝනු ටීකා යි.)

---

* වි: ප: පටිච්ච සමුප්පාද විභඞ්ග

(අතීතකාලී ඥානයෙන්) අවිද්‍යාව ගේ අනුත්පාද නිරෝධයෙන් අනාගත රූප නිරෝධය වේ. (ප්‍රත්‍යය නැති කල්හි රූපයෝ ගේ අභාවය වන හෙයිනි.) එසේ ම තෘෂ්ණා නිරෝධයෙන් ද – පෙ – කර්ම නිරෝධයෙන් ද, (කබලීකාර) ආහාර නිරෝධයෙන් ද අනාගත රූප නිරෝධය වේ ය යි' මෙසේ ප්‍රත්‍යය නිරෝධාදීයෙන් රූපසඤ්ඤා ගේ ව්‍යය බල යි. (මේ ප්‍රත්‍යය වශයෙන් ව්‍යය බැලීම යි.) විපරිණාම ලක්ෂණය බැලීමෙන් ද, රූපයෝ ගේ ව්‍යය බල යි. රූපස්කන්ධයා ගේ ව්‍යය බලන යොගීතෙමේ මේ අවිද්‍යා – තෘෂ්ණා – කර්ම – ආහාර – නිරෝධයෙන් ද විපරිණාම ලක්ෂණයෙන් ද යි මේ පස් ආකාරයෙන් බල යි.

එසේ ම 'අවිද්‍යා සමුදයයෙන් වේදනා සමුදය වේ' ය යි ප්‍රත්‍යය සමුදයාදීයෙන් වේදනාස්කන්ධයා ගේ සමුදය බල යි තෘෂ්ණා සමුදයෙන් ද, කර්ම සමුදයෙන් ද, ඵස්ස සමුදයෙන් ද වේදනා සමුදය වේ ය යි ප්‍රත්‍යය සමුදයාදීයෙන් වේදනාස්කන්ධයා ගේ සමුදය බල යි. නිබ්බත්ති ලක්ෂණය බලන්නේ ද වේදනාව ගේ උදය බලයි. මෙසේ වේදනාස්කන්ධාදී ගේ උදය බලන්නේ මේ පස් ලකුණු බලයි අවිද්‍යා තෘෂ්ණා- කර්ම- ඵස්ස නිරෝධයෙන් වේදනා නිරෝධය වේය යි මෙසේ ප්‍රත්‍යය නිරෝධයෙන් වේදනාස්කන්ධයා ගේ ව්‍යය දකී. විපරිණාම ලක්ෂණය ද බලන්නේ වේදනාස්කන්ධයා ගේ ව්‍යය බල යි. මෙසේ වේදනා ස්කන්ධයා ගේ ව්‍යය බලන යොගී මෙකී පස් ලකුණු බලයි.

අවිද්‍යා- තෘෂ්ණා- කර්ම- ඵස්ස සමුදයයෙන් සංඥා සමුදය වන්නේය යි ද සංඥාව ගේ නිබ්බත්ති ලක්ෂණය ද බලන්නේ යි. අවිද්‍යා- තෘෂ්ණා- කර්ම- ඵස්ස නිරෝධයෙන් සංඥා නිරෝධය වන්නේය යි සංඥාව ගේ නිරෝධය ද විපරිණාම ලක්ෂණය ද බලන්නේ යි.

අවිද්‍යා- තෘෂ්ණා- කර්ම- ඵස්ස සමුදයයෙන් සංස්කාර සමුදය වන්නේය යි ද සංස්කාරයන් ගේ නිබ්බත්ති ලක්ෂණය ද අවිද්‍යා- තෘෂ්ණා- කර්ම- ඵස්ස නිරෝධයෙන් සංස්කාරනිරෝධය වන්නේය යි සංස්කාර නිරෝධ ලක්ෂණය ද විපරිණාම ලක්ෂණය ද බලන්නේ යි. අවිද්‍යා- තෘෂ්ණා- කර්ම- නාම-රූප සමුදයයෙන් විඥාන සමුදය වන්නේය යි විඥානයා ගේ සමුදය ද නිබ්බත්ති ලක්ෂණය ද බලන්නේ යැ. අවිද්‍යා- තෘෂ්ණා- කර්ම- නාම-රූප නිරෝධයෙන් විඥාන නිරෝධය වන්නේය යි. විඥානයා ගේ නිරෝධය ද විපරිණාම ලක්ෂණය ද බලන්නේ යැ. මෙසේ එක් එක් ස්කන්ධයෙහි (උදය-ව්‍යය වශයෙන්) දසය දසය බැගින් ගෙන සම්මසනඤ්ඤ ආකාරයෙන් උදය-ව්‍යය කියන ලදී.

ඒ **සම පනස්** ආකාරයා ගේ වශයෙන් මෙසේත් රූපයා ගේ උදය වෙයි. මෙසේත් රූපයා ගේ ව්‍යය වේය යි ප්‍රත්‍යය වශයෙන් බලයි.

මෙසේ රූපය නිපදී. - මෙසේ රූපය වැනැසේය යි **නිබ්බත්ති ලක්ඛණය** ද, **විපත්ති** ලක්ඛණය ද බල යි. මෙසේ ප්‍රත්‍යය වශයෙන් ද, **ක්ෂණ** වශයෙන් ද විස්තර වශයෙන් මෙනෙහි කෙරේ.

විශෙෂ:- පඤ්චස්කන්ධයන් අතුරෙන් ඒ ඒ ස්කන්ධයට සාමාන්‍ය ප්‍රත්‍යය වශයෙන් අවිද්‍යා- තෘෂ්ණා- කර්ම තුන දැක්වේ. විශෙෂයෙන් ආහාරය රූපස්කන්ධයට ද, ඵස්සය වෙදනා- සංඥා- සංස්කාර ස්කන්ධයන් තුනට ද, නාම-රූප විඥාන ස්කන්ධයට ද ප්‍රත්‍යය වේ.

විභඞ්ග:- **"විඤ්ඤාණ පච්චයා නාම - රූපං"** යි පටිච්ච සමුප්පාදයෙහි විඤ්ඤාණය නාම-රූප ප්‍රත්‍යය වශයෙන් කීවේ නිබ්බත්ති (ජනක) හෙතු වශයෙනි. **මහාපදාන - මහානිදාන සූත්‍රයන්හි*** හා අභිධර්මයෙහි (පට්ඨානයෙහි) **නාම - රූප පච්චයා විඤ්ඤාණං"** යි අන්‍යෝන්‍ය ප්‍රත්‍යය දෙශනායෙහි වදාළේ යි. ඒ වූකලී ප්‍රවෘත්ති හෙතු වශයෙනි. ඔවුන් ගේ **නිරොධයෙන්** රූපාදීන් ගේ නිරොධය වේ. (මේ ටීකා වචන යි.)

නාම-රූප ධර්මයන් ගේ උදය හා ව්‍යය **ක්ෂණික** වශයෙන්ද, සන්තති වශයෙන් ද, **අනුත්පත්ති** වශයෙන්ද යි තුන් ආකාර ඉගෙකින් වේ. අරූපස්කන්ධයන් ගේ උදය-ව්‍යය බැලීම සන්තති වශයෙන් වේ **ක්ෂණික** වශයෙන් නො වේයැ යි කෙවි වාදයෙකි. එහෙත් ප්‍රත්‍යය වශයෙන් උදය-ව්‍යය බැලීමෙහිදී අතීතාදී විභාගය නො ගෙන සාධාරණ හෙයින් අවිද්‍යාදී ප්‍රත්‍යයයෙන් වෙදනාව ලැබෙන බව බල යි.

වැලි උත්පාදය නො බල යි. අවිද්‍යාදීන් ගේ අභාවයෙහි ඒ වෙදනාව ගේ අනුත්පාදය බල යි. භඞ්ගය නො වේ. **ක්ෂණ**-වශයෙන් උදය-ව්‍යය දැකීමෙන් ප්‍රත්‍යුත්පන්නයන් ගේ උත්පාදය ද, ව්‍යයය ද දකිය යි අන්‍යයෝ කියති. ඒ යුක්ත යැ.

ඒ මෙසේ යි:- සන්තති වශයෙන් රූප-අරූප ධර්මයන් උදය වශයෙන් ද, ව්‍යය වශයෙන් ද, මෙනෙහි කරන්නාහට පිළිවෙළින් භාවනාව බලවත් වූ කල්හි **ඥානය තීක්ෂණ** - විශද භාවයට පැමිණීමෙන් **ක්ෂණ** වශයෙන් උදය - ව්‍යය වැටහේය යි කියා යි. මේ වනාහි පළමු කොට ප්‍රත්‍යය වශයෙන් උදය-ව්‍යය

---

* දී: නි: මහාවග්ග

මෙනෙහි කරනුයේ අවිද්‍යාදී ප්‍රත්‍යය ධර්ම හැරපියා උදය-ව්‍යයවන් වූ **ස්කන්ධයන්** ගෙන ඔවුනට ප්‍රත්‍යය වශයෙන් උදය-ව්‍යය දර්ශන මුඛයෙන් **ක්ෂණ** වශයෙන් ද උදය-ව්‍යය මෙනෙහි කර යි. ඔහු ගේ නුවණ **තීක්ෂණ** වැ විශද වැ පවත්නා කල්හි රූප-අරූප ධර්ම **ක්ෂණයක්** පාසා උපදනවුන්ව ද බිඳෙනවුන්ව ද වැටහේ (යනු ටීකාගත විස්තරයෙකි.)

මෙසේ මෙනෙහි කරන යෝගීහු ගේ "මෙසේ මේ ධර්මයෝ **පෙරැ** නොවී හටගනිති. පෙරවී වැනැසෙත් යයි" නුවණ අතිශයින් විශද වේ. මෙසේ අවිද්‍යාදී ප්‍රත්‍යය වශයෙන් ද, උත්පාදාදී **ක්ෂණ** වශයෙන් ද, දෙ පරිද්දෙකින් උදය-ව්‍යය බලන ඒ යෝගීහට **දුඃඛාදි සත්‍ය** හෙදය, **අනුලෝමාදි ප්‍රතීත්‍ය සමුත්පාද** හෙදය, **එකත්වාදිනය** හෙදය, **අනිත්‍යාදි ලක්ෂණ** හෙදය, යන මෙහු ප්‍රකට වෙති.

විශෙෂ:- ඒ යෝගී යම් නුවණක්න් 'අවිද්‍යාදීන් ගේ සමුදය-යෙන් ස්කන්ධයන් ගේ සමුදය වේ. අවිද්‍යාදීන් ගේ නිරොධයෙන් **ස්කන්ධයන්** ගේ **නිරොධය** වේය යි' දකී නම් මේ දැකීම ඒ යෝගීහු ගේ ප්‍රත්‍යය වශයෙන් උදය-ව්‍යය දැකීම යි. යම් නුවණ-කින් **නිබ්බත්ති** ලක්ෂණ - විපරිණාම ලක්ෂණ දකී නම් ඒ දැකීම **ක්ෂණ** වශයෙන් උදය ව්‍යය දැකීම යි.

"අවිජ්ජා සමුදයා රූපසමුදයෝ, අවිජ්ජානිරොධා රූප නිරොධෝ"* යනාදීන් අවිද්‍යාදීන් ගේ සමුදයයෙන් හා නිරොධ-යෙන් රූපස්කන්ධාදීන් ගේ සමුදය හා නිරොධය වන්නාක් මෙන් **නිබ්බත්ති** ලක්ෂණය හා විපරිණාම ලක්ෂණය බලන්නේ **ස්කන්ධයන්** ගේ උදය-ව්‍යය බලන්නේය යි වචන හෙදය නො කොට කියන ලදී. (යනු ටීකා යි.)

විභාග - උත්පත්තිලක්ෂණයෙහි ම **නිබ්බත්ති** ලක්ෂණය ද, භඞ්ගලක්ෂණයෙහි ම විපරිණාම ලක්ෂණය ද වන හෙයින් මෙසේ ප්‍රත්‍යය විසින් ද, **ක්ෂණ** විසින් ද, දෙපරිද්දෙකින් උදය-ව්‍යය බලන්නා වූ ඒ යෝගීහට ප්‍රත්‍යය වශයෙන් උදය දැකීමෙන් **සමුදයසත්‍යය** ප්‍රකට වේ. **ස්කන්ධාදීන්** උපදවන අවිද්‍යාදී ප්‍රත්‍යය අවබෝධ වන හෙයිනි. ජාති දුඃඛය අවබෝධ වන හෙයින් **ක්ෂණ** වශයෙන් උදය දර්ශනයෙන් **දුඃඛසත්‍යය** ප්‍රකට වේ. ප්‍රත්‍යය ධර්මයන් ගේ අනුත්පාද නිරොධයෙන් ප්‍රත්‍යය වත් (ප්‍රත්‍යයෙන් උපදින) ධර්මයන් ගේ අනුත්පාද නිරොධය අවබෝධ

* වි: ප: පටිච්චසමුප්පාද විභඞ්ග

වන හෙයින්, ප්‍රත්‍යය වශයෙන් ව්‍යය දර්ශනයෙන් **නිරෝධ-සත්‍යය** ප්‍රකට වේ. මරණ දුක අවබෝධ වන හෙයින් **ක්ෂණ** වශයෙන් ව්‍යය-දර්ශනයෙන් **දුඃඛ සත්‍යය** ම ප්‍රකට වේ.

මෙසේ මේ යෝගීහුට උත්පත්ති වශයෙන් හා **ක්ෂණ** වශයෙන් උදය-ව්‍යය දැකීම වූ මේ ලෞකික **සම්මාදිට්ඨිය මාර්ගය** යි, **මාර්ගසත්‍යය ද** ප්‍රකට වේ. 'ප්‍රදීපය තමා ද ප්‍රකාශ කරන්නා සේ' ආර්‍ය්‍ය මාර්ගය තමා ද ප්‍රකට වේ. ඒ ප්‍රකට භාවය ද මොහාන්ධකාර විගමනයෙන් වේ. තවද ඒ යෝගීහුට ප්‍රත්‍යය වශයෙන් උදය දර්ශනයෙන් අනුලෝම පටිච්චසමුප්පාදය ප්‍රකට වේ. 'මේ අවිද්‍යාව ඇති කල්හි මේ සංස්කාරය වේය යි' මෙසේ අවබෝධ වන හෙයිනි. මේ අවිද්‍යාදී ප්‍රත්‍යය ධර්ම නිරෝධයෙන් මේ සංස්කාරය නිරුද්ධවේ ය යි අවබෝධ වන හෙයින් ප්‍රත්‍යය වශයෙන් ව්‍යය දර්ශනයෙන් ප්‍රතිලෝම ප්‍රතීත්‍යසමුත්පාදය ප්‍රකට වේ. තවද **ක්ෂණ** වශයෙන් උදය-ව්‍යය දර්ශනයෙන් ප්‍රතීත්‍යසමුත්පන්න ධර්ම ප්‍රකට වේ. **සංඛාර ලක්ඛණය** අවබෝධ වන හෙයිනි.

ඒ මෙසේ යි:- සංස්කාර ධර්ම උදය-ව්‍යය දෙකින් යුක්ත වේ. ඒ සංස්කාර ධර්මයෝ ද පටිච්චසමුප්පන්නයෝ ය. තවද ඒ යෝගීහට ප්‍රත්‍යය වශයෙන් උදය-ව්‍යය දර්ශනයෙන් **එකත්තනය** ප්‍රකට වේ. හෙතු-ඵල සම්බන්ධයෙන් සන්තානය නො සිඳ පවත්නා බව අවබෝධ වන හෙයිනි. එකල්හි උවෙඛද දෘෂ්ටිය මනාව බැහැර වේ. **ක්ෂණ** හෙයින් උදය දර්ශනයෙන් **නානාත්තනය** ප්‍රකට වේ.

ඒ මෙසේ යි:- උත්පාද- ස්ථිති- භඞ්ග වශයෙන් අලුත් අලුත් නාම-රූප ධර්මයන් ඉපදීම අවබෝධ වන හෙයිනි. එකල **මනාසේ ශාශ්වතදෘෂ්ටිය** දුරු වේ.

තවද ඒ යෝගීහට ප්‍රත්‍යය වශයෙන් උදය-ව්‍යය දර්ශනයෙන් **අව්‍යාපාරත්තය** ප්‍රකට වේ. නාම-රූප ධර්මයන් ගේ තමා වශයෙහි නො පවත්නා බව අවබෝධ වන හෙයිනි එකල්හි මනාකොට **ආත්මදෘෂ්ටිය** පහවේ. ඒ යෝගීහට ප්‍රත්‍යය හෙයින් උදය දර්ශනයෙන් **එවං ධම්මත්තානය** ප්‍රකට වේ ප්‍රත්‍යයට අනුරූප හෙයින් ඵලයා ගේ උත්පාදය අවබෝධ වන හෙයිනි. එකල මනාකොට ද **අක්‍රිය දෘෂ්ටිය** දුරු වේ. ඒ යෝගීහට ප්‍රත්‍යය වශයෙන් උදය දර්ශනයෙන් **අනාත්ම ලක්ඛණය** ප්‍රකට වේ. සංස්කාර ධර්මයන් ගේ උත්සාහ රහිත බව හා ප්‍රත්‍යය

පිළිබඳ පැවැතුම් ඇතිබව අවබොධ වන හෙයිනි. **ක්ෂණ** හෙයින් උදය-ව්‍යය දර්ශනයෙන් **අනිත්‍ය ලක්ෂණය** ප්‍රකට වේ. ඇතිවැ නැති වන බව අවබොධ වන හෙයින් හා පූර්‍වාන්ත අපරාන්ත විවේකය අවබොධ වන හෙයිනි

දුඃඛ ලක්ෂණය ද ප්‍රකට වේ උදය ව්‍යය දෙකින් නැවැතැ නැවැතැ පෙළෙන බව අවබොධ වන හෙයිනි. **සභාව-ලක්ෂණ** ද ප්‍රකට වේ. උදය-ව්‍යය දෙකින් පිරිසිදිනා ලද බව අවබොධ වන හෙයිනි. **පඨවි - ඵස්සාදී** සභාව ලක්ෂණයෙහි සඞ්ඛත ලක්ෂණයා ගේ ද **තාවකාලික** (පරිත්ත කාලික) බව ද ප්‍රකට වේ. උදය ක්ෂණයෙහි ව්‍යයයා ගේ ද, ව්‍යය ක්ෂණයෙහි උදයයාගේ ද අභාවය අවබොධ වන හෙයිනි.

මෙසේ ප්‍රකට වූ **සත්‍ය ප්‍රතීත්‍ය සමුත්පාද-නය අනිත්‍යාදි ලක්ෂණ** ඇති ඒ යොගීනට 'පෙර නූපන් විරූ මේ ධර්මයෝ උපදිති. උපන් නාම රූප ධර්මයෝ නිරුද්ධ වෙත්ය යි' නිත්‍ය-යෙන් අලුත්වූවන්වැ ම සංස්කාරයෝ වැටහෙති. හුදෙක් නිත්‍ය නවකයන් වැ තොවැ හිරූ උදා වන කල්හි තණ අග පිණිබිඳු මෙන් ද, දිය බුබුලක් මෙන් ද, දඬුයෙන් දියෙහි ඇඳි ඉරක් මෙන් ද, හිදි අග වැටුණු අබැටක් මෙන් ද, විදුලිය ගැසීමක් මෙන් ද, සුවලප කලක් සිටින්නන්ව ද, ඉන්‍ද්‍රජාල - මරීචි - සුවප්න-අලාතචක්‍ර - ගන්ධර්‍වනගර - ඵේණ - කදලි ආදියක් මෙන් ද, අසාර වේය යි ද (නිස්සාර වේය යි) වැටහෙති.

මෙපමණකින් මේ යොගීහු විසින් "ව්‍යය ධර්‍ම වූයේ ම උපදී. උපන් නාම-රූප ධර්‍ම සමූහය විනාශයට පැමිණේය" යි මේ ආකාරයෙන් **සම්මසන ලක්ෂණ** ප්‍රතිවෙධ කොට පැවැති **උදය-ව්‍යයානුපස්සනා** නම් වූ පළමු වන තරුණ විදර්‍ශනා ඥානය ලබන ලද්දේ වේ. **ආරබ්ධවිදර්‍ශකය යි** කිණිමට යේ.

විශෙෂ: - කලාප සම්මර්‍ශනාදී වශයෙන් පැවැති සම්මර්‍ශන ඥානය නිෂ්පර්‍යායයෙන් විදර්‍ශනා නම නොලබ යි. **උදය-ව්‍යයානුදර්‍ශනාදි** වශයෙන් පැවැති ඥානය ම විදර්‍ශනා ඥාන නම ලබ යි. එහෙයින් **ආරබ්ධවිදර්‍ශකයායය යි** ගණනට යේයැ යි කියන ලදැ යි යනු ටීකා යි.

අනතුරුවැ මේ තරුණ විදර්‍ශනාවෙන් පටන් ගත් විදර්‍ශනා ඇති ඒ යොගීනට **දස විදර්‍ශනොපක්ලෙශයෝ** උපදිත්.

ඒ විදර්ශනොපක්ලෙශයෝ මාර්ග-ඵල ප්‍රතිවෙධ කළ ආර්ය්‍ය-ශ්‍රාවකයාට ද, සීලවිපත්ති ආදීන් විප්‍රතිපන්න පුද්ගලයාහට ද නූපදිති. සම්‍යක් ප්‍රතිපත්ති ඇති විදර්ශනා භාවනාවෙහි යෙදුණු ආරබ්ධ විදර්ශක වූ කුලපුත්‍රයාහට ම උපදිත්. ඒ දශ විදර්ශනොප-ක්ලෙශයෝ නම් (1) අවභාසය (2) ඤාණය (3) ප්‍රීතිය (4) ප්‍රශ්‍රබ්ධිය (5) සුඛය (6) අධිමොක්ෂය (7) වීර්‍ය්‍ය (8) සමාධිය (9) උපෙක්ෂාව (10) නිකන්තිය යන මොහු යැ.

(ඔභාසෝ පීති පස්සද්ධි - අධිමොක්ඛෝ ච පග්ගහෝ
සුඛං ඤාණමුපට්ඨාන - මුපෙක්ඛා ච නිකන්ති ච)

එහෙයින් වදාළහ.

**කථං ධම්මුද්ධච්චවිග්ගහිතමානසං හොති? අනිච්ච-තො මනසිකරොති ඔභාසෝ උප්පජ්ජති, ඔභාසෝ ධම්මොති ඔභාසං ආවජ්ජති, තතෝ වික්ඛේපෝ උද්ධච්චං, තෙන විග්ගහිතමානසෝ අනිච්චතෝ උපට්ඨානං යථාභූතං නප්ප-ජානාති. දුක්ඛතෝ -පෙ- අනත්තතෝ උපට්ඨානං යථා-භූතං නප්පජානාති. තථා අනිච්චතෝ මනසිකරොතෝ ඤාණං උප්පජ්ජති - පෙ - පීති - පස්සද්ධි - සුඛං - අධි-මොක්ඛා - පග්ගහෝ - උපට්ඨානං - උපෙක්ඛා - නිකන්ති - උප්පජ්ජති. නිකන්ති ධම්මොති නිකන්තිං ආවජ්ජති, තතෝ වික්ඛේපෝ උද්ධච්චං, තෙන උද්ධච්චෙන විග්ගහිතමානසෝ අනිච්චතෝ උපට්ඨානං යථාභූතං නප්පජානාති, දුක්ඛතෝ -පෙ- අනත්තතෝ උපට්ඨානං යථාභූතං නප්පජානාතීති"*

කෙසේ විදර්ශනොපක්ලෙශයෙන් විරොධයට පැමිණි සිත් ඇතිවේ ද

අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නහුට ඔභාසය උපදී. ඔභාසය මාර්ගධර්මය යි සිතා ඒ ආලොකය **නිර්‍වාණයැ** යි හෝ **මාර්ගය** යි හෝ **ඵලය** යි හෝ ආවර්ජනා කෙරේ. ඒ හේතුකොට ගෙන වූ වික්ෂෙපය උද්ධච්ච නම්. ඒ උඛච්චයෙන් මඛතාලද සිත් ඇති යොගී තෙම අනිත්‍ය හෙයින් වැටහීම තතු සේ නො දනී. දුක් වශයෙන් -පෙ- අනාත්ම වශයෙන් වැටහීම තතු සේ නො දනී. එසේ ම අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන යොගීහට ඤාණය උපදී. ප්‍රීතිය, පස්සද්ධිය, සුඛය, අධිමොක්ෂය, වීර්‍ය්‍යය, සතිය, උපෙක්ෂාව, නිකන්තිය උපදී. නිකන්තිය **නිවන** යැ **මග** යැ **ඵලය**යැ යි ආවර්ජනා කෙරේ. ඒ අමාර්ගය මාර්ග ධර්මය යි ගැනීමෙන් පහළවන වික්ෂෙපය උද්ධච්ච නම්. ඒ උඛච්ච-

* ප: ම: යුගනද්ධ කථා

-යෙන් මඩතාලද සිත් ඇත්තේ අනිත්‍ය හෙයින් වැටහීම තතුයේ නො දනී. දුක් හෙයින්- අනාත්ම හෙයින් වැටහීම තතුයේ නො දනී යැ කියා සි.

විසඳර:- ඒ දශ විදර්ශනොපක්ලේශයන් අතුරෙන්

(1) **අවභාස නම්**:- විදර්ශනා චිත්තයෙන් උපදනා එක්තරා ශරීරාලොකයෙකි ඒ උපන් කල්හි ඇතැම් යොගාවචරයෙක් "පෙර මට මෙබඳු ආලොකයෙක් නූපන්නේ යැ. ඒකාන්තයෙන් මාර්ගයට පැමිණියෙමි ඵලයට පැමිණියෙමි" යි අමාර්ගයම මාර්ගයයි ද අඵලයම ඵලය යි ද ගනී. එසේ ගන්නහු ගේ විදර්ශනා භාවනාව අමාර්ගයට වැටුණේ වෙයි. හෙතෙම තමා ගේ මූල කර්මස්ථානය (විදර්ශනාව) හැර ආලොකය ම ආස්වාදනය කෙරෙමින් හිඳී.

විශෙෂ:- ඒ ආලොකය ඇතැම් භික්ෂුවකට තමා උන් පර්‍යඞ්කය පමණ තැන එළිය කෙරෙමින් උපදී. කිසිවකුට ඇතුළු ගබ පමණ ද, ඇතැමෙකුට ගැබින් පිටත ද, කිසිවකුට සියලු විහාරය ද, ගව්වක්- අඩ යොදුනක්- යොදුනක්- දෙ යොදුනක්- තුන් යොදුනක් පමණ ද, කිසිවකුට පොළොවෙහි පවන් අකනිට්ඨ බ්‍රහ්මලොව තෙක් ද, එකාලොක කෙරෙමින් උපදී. **භාග්‍යවතුන් වහන්සේට** දසදහසක් සක්වළ ආලොක කෙරෙමින් උපන්නේ සි.

ආලොකයා ගේ වෙනස් බව පිළිබඳවැ මේ කථාවෙකි **"සිතුල්පව් වෙහෙර** දෙ බිති ගෙයක් තුළ (ගඟී භිත්තිය හා පිටත පිළ වටා සිටි භිත්තිය) තෙරහු දෙ දෙනෙක් හුන්හ. එදින කරුවල පොහෝ දිනය සි. දිගුන් වැසි වලාකුළින් වැසුණු මැදුම් රෑ චතුරඞ්ගසමන්නාගත අඳුර පවනී. එකල එක් තෙර නමෙක් සවාමීනි! මට දැන් දැගැබ් මලුයෙහි සිංහාසනයෙහි පස්වණක් මල් පැතේය සි කී. ඕහට අනික් තෙර නම ඇවැත්නි! ඒ ආශ්චර්‍ය්‍ය නො වේ. මට දැන් මහ මුහුදෙහි යොදුනක් තැන මස් කැස්බන් බොහෝ පෙනෙතැයි කී. මේ විදර්ශනොපක්ලේශය බොහෝ සේ සමථ විදර්ශනාලාභීන් හට වේ.

හෙතෙම සමාපත්ති බලයෙන් විෂ්කම්භිත ක්ලේශයන් ගේ නො හැසිරීමෙන් 'මම රහත්මි සි" සිත් උපදව සි. **උස්වැලි නම්** තැන වසන, **මහානාග නම්** තෙරුන්ට මෙනී. මෙහි **'හැවක්'** වැසි **මහාදත්ත තෙරුන්ට** මෙන් ද, සිතුල්පව්වෙහි 'නිකපෙනෙක' ප්‍රධන්ගෙහි වැසි **චුල්ලසුමන** තෙරුන්ට මෙන් ද වේ. මේ ඒ පිළිබඳ එක් කථා වස්තුවෙකි.

තලගුරු වෙහෙරැ **ධම්මදින්න** නම් සිවු පිළිසිඹියා පත් මහ රහත් තෙර **කෙතෙක්** විසූහ. උන් වහන්සේ බොහෝ භික්ෂු-සංඝයාට අවවාද දෙන සේක. එක් දවසක් තමා දිවාසථානයෙහි වැඩහිඳ අප ඇදුරු උස්වැලි වැසි, **මහානාග** සථවිරයන් වහන්සේ ගේ මහණකම මුදුන් පැමිණියේ ද නැද්දැ යි ආවජ්ජනා කරන සේක් උන් වහන්සේ පුහුදුන් බව දැක මා තෙ ගියකල පුහුදුන්වෑමැ කළුරිය කිරීම වන්නේය යි දැන අහසට සෑඹියෙන් පැන නැගී දිවා ථානයෙහි වැඩහුන් තෙරුන් සමීපයෙහි බැස වැඳ වත් දක්වා එකත්පසෙක වැඩහුන් සේක. ඇවැත්නි! තෙ කල්හි ආයේ කිම්දැ යි විචාළ කල සවාමීනි! ප්‍රශ්න ඇසීමට ආයෙමියි කීහ. ඇවැත්නි! 'විචාරව දන්නෙම් නම් කියම්' යි කී කල ප්‍රශ්න දහසක් විචාළහ.

තෙරුන් වහන්සේ විචාළ විචාළ ප්‍රශ්න තෙ පැකිල විසඳු සේක. එකල සවාමීන් වහන්සේ ගේ ඤුණය ඉතා තියුණු ය. නුඹ වහන්සේ කවර දෑ මේ ධර්මය අවබොධ කළ සේක්දැ යි විචාළ කල ඇවැත්නි! මෙයින් සැට වසකට පෙරය යි කීහ. සවාමීන්-වහන්සේ සමාධියට ද සමවදනා සේක්දැ යි විචාළ කළ එය අපට බරෙක් තෙ වේය යි වදාළහ. සවාමීනි! එසේ වන්නා එක් ඇතකු මවනු මැනැවැ යි කීහ. තෙරුන් වහන්සේ සවි සුදු ඇතකු මැවූහ. සවාමීනි! දැන් මේ ඇතා කන් නිශ්චල කොට තබා නගුට දික් කොට ගෙන සොඬ මුවෙහි බහා බිහිසුණු සේ කෑගසමින් ඔබ අභිමුඛයට එන ලෙසක් කළ මැනැවැයි කීහ. තෙරුන් වහන්සේ එසේ කොට වේගයෙන් තමා වෙත එන ඒ ඇතා ගේ බිහිසුණු අයුරු දැක නැගිට පැන යන්නට සැරසුණු සේක. රහත් තෙරුන් වහන්සේ උන් වහන්සේ ගේ සිවුරු කොන අල්වා ගෙන සවාමීනි! රහතුන්ට තැති ගැනීමෙක් වේදැ යි ඇසූසේක. උන් වහන්සේ එකල තමා පුහුදුන් බව් දැන 'ඇවැත් ධම්මදින්නයෙනි! මට පිනිව වෙව යි' කියා පාමුල උක්කුටිකයෙන් හුන්සේක. සවාමීනි! නුඹ වහන්සේට පිහිටවීම සඳහාම ආම්, තහමක් සිතනු මැනැවැයි කමටහනක් වදාළසේක. තෙරුන් වහන්සේ කමටහන් ගෙන සක්මනට නැගී තුන් වැනි පියවරෙහි අග්‍රඵලය වූ අර්හත්වයට පැමිණිසේක.

විශෙෂ: තෙරුන් වහන්සේ ඉෂ්ඨ චරිතයෙකි. එබඳු භික්ෂූහු ආලෝකයෙහි කම්පාවෙති.

(2) **ඤාණය** නම් විදර්ශනා ඥානය යි. නාම-රූප ධර්මයන් ප්‍රමාණ කරන - විචාරණය කරන ඒ යෝගී නිසැඟවට හරන ලද වජ්‍රායුධය මෙන් නො පැකිළෙන වේග ඇති තියුණු ඉතා විශද වූ විදර්ශනා ඥානය උපදී.

(3) **ප්‍රීතිය** නම් විදර්ශනා ප්‍රීතිය යි. එකල ඒ යෝගීහට **බුද්ධිඛ** ප්‍රීතිය, **ඛණ්ඩිඛ** ප්‍රීතිය, **ඔඛක්කනතිඛ** ප්‍රීතිය, **උදෙවඛ** ප්‍රීතිය, **එරණ** ප්‍රීතිය යි මේ පස් වැදෑරුම් ප්‍රීතිය මුළු ශරීරය පුරමින් උපදී.

(4) **ප්‍රශ්‍රබ්ධිය** නම් විදර්ශනා පස්සද්ධිය මැ යි. එකල රාත්‍රී සථානයෙහි හෝ දිවා සථානයෙහි හෝ හුන්නා වූ ඒ යෝගී හට - **කාය** චිත්ත දෙක්හි විඩාවක් හෝ- බර බවක් හෝ කර්මණ්‍ය බවක් හෝ- අකර්මණ්‍ය බවක් හෝ- ගිලන් බවක් හෝ- වඛක බවක් හෝ නො වේ. එකල ඒ යෝගීනු ගේ කාය-චිත්තයෝ උද්ධච්චය සංසිදීමෙන් සංසිදුනාහු වෙති. පීත-මිද්ධය දුරුවීමෙන් සැහැල්ලු වෙති. දිඹි - මාත සංසිදීමෙන් මෘදු වෙති. සෙසු නීවරණ සංසිදීමෙන් කර්මණ්‍ය වෙති. අශ්‍රද්ධාදිය සංසිදීමෙන් නො ගිලන් වෙති. මායා-සාඨෙය්‍ය සංසිදීමෙන් සෘජු වෙති. මේ පස්සද්ධි ආදියෙන් අනුගෘහීත කාය-චිත්ත ඇති ඒ යෝගීතොමේ එකල අමානුෂ නම් වූ රතිය අනුභව කෙරේ. එසින් කීහ.

"සුඤ්ඤාගාරං පවිඨස්ස - සන්තචිත්තස්ස භික්ඛුනෝ
අමානුසිරතී හොති - සම්මා ධම්මං විපස්සතෝ"

"යතෝ යතෝ සම්මසති - ඛන්ධානං උදයබ්බයං
ලභතී පීති පාමොජ්ජං - අමතං තං විජානියා"

"ජන සුන් ගෙට පිවිස - විදසුන් වඩන නීසි සේ
සන්සුන් සිතැති මහණුට - නො මිනිස් පිති සුව වේ

පස් කඳු උඳු වැය - නත් අයුරින් සිමිදුමින්
ලබන පී හා පමොදය - අමාඟැ යි දන්නෝ යෙති"

මෙසේ ඒ යෝගීහට (මනුෂ්‍යත්වය ඉක්ම සිටි) ඒ අමානුෂ රතිය (ඇල්ම) සිඳ්ධ කරන්නා වූ ලහුතාදීන් හා යුක්ත වූ **පස්සද්ධිය** උපදී.

(5) **සුඛය** නම් විදර්ශනා සුඛය යි ඒ යෝගීහට එ සමයෙහි මුළු සිරුර තෙමේම ඉතා ප්‍රණීත වූ කිසි කලෙක නො වූ විර සුඛයෙක් උපදී.

(6) **අධිමොක්ෂ** නම් විදර්ශනා චිත්ත සම්ප්‍රයුක්ත වූ බලවත් ශ්‍රද්ධාව යි. ඒ යෝගීහට එ කල්හි චිත්ත-චෛතසික ධර්මයන් අතිශය ප්‍රසන්න භාවයට පමුණුවන ඉතා බලවත් ශ්‍රද්ධාව උපදී.

(7) **ප්‍රග්‍රහ** නම් වීර්‍යය යි. ඒ යෝගීහට එ කල විදර්ශනා චිත්තය හා සම්ප්‍රයුක්ත වූ ළිහිල් නො වූ ඉතා දැඩි ද නො වූ මනා කොට ගන්නාලද වීර්‍යය උපදී.

(8) **උපට්ඨාන** නම් සතිය යි. ඒ යෝගීහට විදර්ශනා චිත්තය හා සම්ප්‍රයුක්ත වූ මනාවැ එළැඹැ සිටි මනාවැ පිහිටුවන ලද ඉන්ද්‍රියයක් බලවූ ද, නිශ්චල පණින රාජයකු බලවූ ද සතිය උපදී. ඒ යොගී යමක් යමක් ආවර්ජනා කෙරේ නම් ආභොග-මනසිකාර - ප්‍රත්‍යවෙක්ෂා කෙරේ නම් ඕහට ඒ ඒ නාම-රූපාදී කාරණය අනුවැ පැන විනිවිද ගොස් දිවැස් ඇත්තහුට පරලොව සේ සිහියට වැටහේ.

(9) **උපෙක්ෂාව** නම් විදර්ශනොපෙක්ෂාව හා- ආවර්ජනොපෙක්ෂාව යි. ඒ යොගීනට සියලු නාම-රූප ධර්මයන් උදය-ව්‍යය වශයෙන් මනාවැ පරීක්ෂා කිරීමෙන් ඒ පිළිබඳ මධ්‍යස්ථ-භාවයෙන් පැවැත්තේ විදර්ශනා උපෙක්ෂාව ද බලවත්ව උපදී.

විශේෂ:- ඒ විදර්ශනා උපෙක්ෂාව නම් අවි වශයෙන් එසේ පැවැති සංස්කාරයන් ගේ උදය-ව්‍යය මනාවැ වැටහීමෙන් මධ්‍යස්ථාකාරයෙන් පැවැති තත්‍රමජ්ඣත්තතා උපෙක්ෂාවමැ ය. මනොවාරාවර්ජන චිත්තය හා සම්ප්‍රයුක්ත වූ චෙතනාව ආවර්ජන-යෙහි මධ්‍යස්ථවැ පැවැත්මෙන් ආවර්ජන උපෙක්ෂාය යි කියනු ලැබේ. හෙද ඒ ඒ තැන් ආවර්ජනය කරන ඒ යෝගීනට වුහුටු වප්‍රාග්‍රුධන මෙන් වියළි පත්‍රපුටයෙක බහාලූ රත් කළ යහුලක් මෙන් ද ශූරවැ තීක්ෂණවැ පවතී.

(10) **නිකන්ති** නම් විදර්ශනා චිත්තසම්ප්‍රයුක්ත සියුම් තෘෂ්ණා යි මෙසේ ඔනාසාදීන් ප්‍රතිමණ්ඩිත විදර්ශනාවෙහි ආලය කරමින් සියුම් වූ ශාන්තාකාර වූ නිකන්තිය ඒ යෝගීහට උපදී. විදර්ශනා භාවනාව අතිශයින් පැවැති හෙයින් ඉතා සියුම් හෙයින් ඒ නිකන්තිය කෙලෙසෙකැ යි පිරිසිඳ දැකීමට ද නො හැකි වේ.

ඔහාසය විදර්ශනාවට අලඞ්කාරයක් වන්නාසේ ම ඒ ප්‍රඥාවින් අතුරින් එකක් උපන් කල්හි ඒ යෝගී මට මෙයින් පෙර මෙබඳු සඤ්ඤායෙක් නූපන්නේ ය. මේ බඳු ප්‍රීතියෙක්- පස්සද්ධියෙක්- සුඛයෙක්- අධිමොක්ෂයෙක්- ප්‍රග්‍රහයෙක්- උපඨානයෙක්- උපෙක්ෂාවෙක්- නිකන්තියෙක් නූපන්නේ ය. 'ඒකාන්තයෙන් මාගීයට පැමිණියෙමි, ඵලයට පැමිණියෙමි සි' අමාගීය ම **මාගී** යැයි ද, අඵලය ම **ඵල** යැයි ද ගනී.

අමාගීය මාගීයයි ද, අඵලය ඵලයැයි ද ගන්නා ඒ යෝගීහුගේ විදර්ශනා විපිරිස වුත්ක්‍රාන්ත නම් වේ. ඒ යෝගී තමා ගේ ඒ විදර්ශනා කම්මට්ඨානය හැරපියා නිකන්තිය ම (ඒ ඔහාසාදියෙහි සියුම් ආසාව ම) ආස්වාදනය කරමින් හිඳී.

මේ දස උපක්ලෙශයන් අතුරෙන් **ඔහාසාදිය** උපක්ලෙශ වස්තු හෙයින් උපක්ලෙශය යි කියන ලදී. අකුශල හෙයින් නො වේ.

එහෙත් **නිකන්තිය** උපක්ලෙශය ද, උපක්ලෙශ වස්තු ද වේ. මේ වස්තු වශයෙන් උපක්ලෙශ දශයෙක් ම වේ. ඒ **තෘෂ්ණා- දෘෂ්ටි- මාන** ග්‍රාහ වශයෙන් සමතිසෙක් වේ.

ඒ මෙසේ යි:- මට ආලොකයෙක් උපනැ යි ගන්නාහට **සත්කායදෘෂ්ටි** වශයෙන් ගැනීම වේ. මතා ආලොකයෙක් උපනැයි ගන්නාහට **මාන** වශයෙන් ගැනීම වේ. ආලොකය ආස්වාදනය කිරීම් වශයෙන් **තෘෂ්ණාව** උපදී. මෙසේ ආලෝකයෙහි දෘෂ්ටි- මාන- තෘෂ්ණා වශයෙන් ගැනීම් තුනෙකි. සෙසු සඤ්ඤාදියෙහි ද මෙසේ මැ යි. මෙසේ ග්‍රාහ වශයෙන් සමතිස් උපක්ලෙශ වේ. මොවුන් ගේ වශයෙන් අදක්ෂ අව්‍යක්ත යෝගී තෙම ඔහාසාදී නිමිත්තෙන් කම්පා වේ. වික්ෂිප්ත වේ. ඔහාසාදීන් අතුරෙන් එකක් එකක් ම මේ මාගේ යයි ද, මේ මම වෙමැ යි ද, මේ මාගේ ආත්මයැ යි ද තෘෂ්ණා- මාන- දෘෂ්ටි වශයෙන් බල යි.

එයින් කිහ පැරැණියෝ, 'යම් ඔහාසාදියක් නිසා සිත කම්පා වේ නම් ඒ ඔහාස නිමිත්තෙන් ද, සඤ්ඤා- පීති- පස්සද්ධි- සුඛ- නිමිත්තෙන් ද කම්පා වේ. අධිමොක්ෂ නිමිත්තෙන් ද- ප්‍රග්‍රහ- උපඨාන- උපෙක්ෂා වශයෙන් බැලීමෙන් උපෙක්ෂා නිමිත්තෙන් ද, නිකන්ති නිමිත්තෙන් ද කම්පා වේ එහෙත් දක්ෂ- පණ්ඩිත- ව්‍යක්ත- බුද්ධිමත් යෝගී තෙමේ ඔහාසාදිය උපන් කල්, මට මේ ආලොකයෙක් උපත. ඥෙද වැලිත් අනිත්‍ය ය

සඞ්ඛත යැ. පටිච්චසමුප්පන්න යැ. ක්ෂය වන සුලු යැ. ව්‍යය වන සුලු යැ. නැසෙන සුලු යැ. නිරුද්ධ වන සුලුයැ යි මෙසේ එය පරීක්ෂා කෙරේ.

තවද මේ ආලෝකය ආත්මය වේ **නම් ආත්මය** යි ගන්නට වටනේ යි. වැලි අනාත්මවූ ම මේ ආලෝකය ආත්මය යි ගන්නා ලද්දේ යැ. ඒ ආලෝකය තමා වශයෙහි නො පවත්නා හෙයින් **අනාත්ම** යැ. ඇතිවැ නැති වන අර්ථයෙන් **අනිත්‍ය** යැ. උදය-ව්‍යය දෙක්හි පෙළෙන **අර්ථයෙන් දුක්ඛය** යි, අරූප සප්තකයෙහි (යව) කී නයින් සියල්ල විස්තර කටයුතු. ඔහාසයෙහි මෙන් සෙස්සෙහි ද මෙසේ බැලිය යුතු. ඒ යොගී තෙමේ මෙසේ **පරීක්ෂා** කොට "ඒ ඔහාසය මාගේ නො වේ" යි ද "ඒ ඔහාසය මම් නො වෙමි යි ද, ඒ මාගේ ආත්මය නො වේ" ය යි ද බල යි.

එසේ ම – "ඒ ඤාණය ද – පෙ – ඒ නිකන්තිය ද මාගේ නො වේ. ඒ මම නො වෙමි. ඒ මාගේ ආත්මය නො වේය" යි බල යි. මෙසේ බලන්නේ ඔහාසාදියෙහි කමපා නො වේ. තැති නො ගනී.

එහිත් කීම පැරණියෝ :- මේ ඔහාසාදී දශ උපක්ලේශ තුවණින් පුරුදු කළ යොගී තෙමේ ඒ ආලෝකාදියෙහි ධර්මය යි පැවැති වික්ෂේප දැනීමෙහි දක්ෂ වූයේ වික්ෂේපයට නො පැමිණේ. ඒ යොගී තෙමේ මෙසේ වික්ෂේපයට නො ගොස් ඒ සමතිස් වැදැර ම් උපක්ලේශ ප්‍රහාණය කොට ඔහාසාදී ධර්මය මාර්ගය නො වේ. එනෙත් ඒ උපක්ලේශයෙන් මිදුණු විදර්ශනා ඥානය පිළිබඳ විදර්ශනා ඥානය ම මාර්ගයයිද, අමාර්ගය ද ව්‍යවස්ථා කෙරේ මෙසේ ඒ යොගීහු ගේ මේ මග යැ මේ නො මගයැ යි මාර්ගය ද, අමාර්ගය ද දැන සිටි නුවණ **"මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධිය යි"** කියනු ලැබේ.

මෙතෙකින් ඒ යොගියා විසින් සත්‍ය තුනෙක් ව්‍යවස්ථා කරන ලදී.

ඒ මෙසේ යි. **දිට්ඨිවිසුද්ධියෙහි** නාම-රූප ව්‍යවස්ථාපනය කිරීමෙන් පළමු කොට **දුඃඛසත්‍යය** ව්‍යවස්ථා කෙළේ යැ.

කඞ්ඛාවිතරණ විසුද්ධියෙහි ප්‍රත්‍යය පරිග්‍රහණයෙන් **සමුදය සත්‍යය** ව්‍යවස්ථා කෙළේ යැ.

මේ **මග්ගාමග්ග ඤාණ දස්සන විසුද්ධියෙහි** මතාවැ මාර්ගය ව්‍යවස්ථා කිරීමෙන් **මාර්ග සත්‍යය** ව්‍යවස්ථා කෙළේ යි. මෙසේ ලෞකික ඥානයෙන් ම ත්‍රිවිධ සත්‍යයන් ව්‍යවස්ථා කෙළේ වෙයි.

මෙසේ සාධුජනයා ගේ ප්‍රමෝදය පිණිස කළ විශුද්ධි මාර්ගයෙහි ප්‍රඥාභාවනාධිකාරයෙහි **මාර්ගාමාර්ගඥානදර්ශන විශුද්ධි** නම් වූ විසි වැනි පරිච්ඡේදය නිමියේ යි.

21. ප්‍රතිපදඥානදර්ශනවිශුද්ධි නිද්දේශය

"උදය-ව්‍යය ඥානයෙහි පටන් සංඛාරෝපෙක්ඛාඥානය තෙක් පැවැති අෂ්ටවිධ ඥානයන්ගේ වශයෙන් විදර්ශනා වාරයා ගේ ම්ඛාක ප්‍රාප්තියෙන් ඒ අට වැනි සංඛාරෝපෙක්ඛා ඥානය ශීඛා ප්‍රාප්ත විදර්ශනා නම් වේ. නව වැනි සත්‍යානුලෝමිකඥානය ද සමඟ මේ නවය ප්‍රතිපදඥාන දර්ශනවිශුද්ධි නම් වේ."

ඒ මෙසේ යි:- මෙහි ඔභාසාදී දශ විදර්ශනොපක්ලෙශයන් ගෙන් මිදුණා වූ විදර්ශනා චිත්ත ව්‍යියට බැස ගත් හෙයින් **විදර්ශනාය සි** කියන ලද.

(1) **උදයව්‍යයානුදර්ශනඥානය**
(2) **භඞ්ගානුදර්ශනඥානය**
(3) **භයතුපට්ඨානඥානය**
(4 **ආදීනවානුදර්ශනඥානය**
(5) **නිර්විදානුදර්ශනඥානය**
(6) **මුඤ්චිතුකම්‍යතාඥානය**
(7) **ප්‍රතිසඞ්ඛ්‍යානුදර්ශනඥානය**
(8) **සංඛාරෝපෙක්ඛාඥානය** දැ යි මේ අෂ්ට ඥානයෝ දතයුතු වෙත්.
(9) **සත්‍යානුලෝමික ඥානය** යනු **අනුලෝම ඥානයට** නමෙකි.

විභාවර:- උදය ව්‍යය දැනීම් අර්ථයෙන් හා ප්‍රත්‍යක්ෂ හෙයින් දැකීම් අර්ථයෙන් ද **ඥාන දර්ශනය සි.** එයම ප්‍රතිපක්ෂ ධර්මයන්-ගෙන් විශුද්ධි වූ හෙයින් **ඥාන දර්ශන විශුද්ධි නම් වේ.** (එයම) මෙයින් ආර්‍ය්‍ය මාර්ගයට පිළිපදිනුයි. **ප්‍රතිපදඥාන දර්ශන විශුද්ධි ය සි** කියන ලදී.

ඒ වූකලී උපන් මාත්‍ර වූ ප්‍රගුණ නොවූ නුවණ සඳහා කියන ලදී. ප්‍රගුණ වූයේ නිත්‍ය සංඥාදීන් ගේ ප්‍රහාණයෙන් සිද්ධ වූ ප්‍රහාණ පරිඥාවට අධිෂ්ඨාන වූයේ වෙයි. ඒ අධිගම-යෙන් අවලෝස් මහා විදර්ශනාවන් අතුරින් ඇතැම් විදර්ශනාවක් අධිගත වේ. උදය-ව්‍යයයන් ප්‍රත්‍යක්ෂයෙන් ප්‍රතිවෙධ නොකොට

සාමාන්‍යාකාරය නො වේය යි තීරණ මාත්‍රයෙන් අනිශයින් ප්‍රතිපක්ෂ ධර්මයන් ගේ ප්‍රහාණය සම්භව වේ. ප්‍රතිපක්ෂ ප්‍රහාණය නැති කල ඥානයන් ගේ වජ්‍රයක් සේ නො නසන ලද වෙගත්වය ද, තීක්ෂ්ණ විශදත්වය ද, කොයින් වේ ද? එහෙයින් ප්‍රගුණ භාවයට පැමිණි උදය-ව්‍යය ඥානය ප්‍රහාණ පරිඥා පාඤ්ඤික වූයේ ම දතයුතු. (ඇතැ ටීකායි) එහෙයින් ඒ **අනුලෝම ඥානය** සම්පාදනය කරනු කැමැති යොගී විසින් උපක්ලේශ විනිර්මුක්ත වූ **උදය-ව්‍යයඥානය** ආදිකොට ඇති මේ අෂ්ටවිධ ඥානයෙහි යොග කටයුතු යි.

ප්‍රශ්නයෙකි:- නැවැතැ **උදය-ව්‍යය ඥානයෙහි** යෙදීම කුමක් පිණිස ද?

පිළිතුර:- ත්‍රිලක්ෂණය සැලකීම පිණිස යි.

විසඳුම:- යට කී දශ උපක්ලේශයන්ගෙන් කිලිටි වී මොට වූ **උදය-ව්‍යය ඥානය** යථා සභාවයෙන් අනිත්‍යාදී ත්‍රිලක්ෂණය සලකා ගැනීමට අසමර්ථ යැ. උපක්ලේශ විනිර්මුක්ත වූයේ ම සමර්ථ වේ. එහෙයින් ම ලක්ෂණ සැලකීම පිණිස මෙහිදී නැවත ද යොග වැඩිය යුතු.

විශේෂ:- ලක්ෂණ කුමක් මෙතෙහි නො කිරීමෙන් කුමකින් වැසුණු හෙයින් නො වැටහේ ද යත්- **අනිත්‍ය ලක්ෂණය** උදය-ව්‍යය මෙතෙහි නො කිරීමෙන්, සන්තතියෙන් වැසුණු හෙයින් නො වැටහේ. **දුඃඛ ලක්ෂණය** සංස්කාරයන් නිතර පීඩා කරන බව මෙතෙහි නො කිරීමෙන් සතර ඉරියව්වෙන් වැසුණු හෙයින් නො වැටහේ. **අනාත්ම ලක්ෂණය** නා නා ධාතූන් වෙන්කොට මෙතෙහි නො කිරීමෙන් ඝනයෙන් වැසුණු හෙයින් නො වැටහේ.

උදය-ව්‍යය මෙතෙහි කොට සන්තතිය ඉගිලවීමෙන් **අනිත්‍ය ලක්ෂණය** යථා සභාවයෙන් වැටහේ. සංස්කාරයන් නිතර පෙළෙන බව් මෙතෙහි කොට ඉරියව්වෙන් වැසුණු බව ඉගිළ වූ කල **දුඃඛ ලක්ෂණය** යථාසභාවයෙන් වැටහේ. පෘථිව්‍යාදී නානා ධාතූන් විනිර්භෝග-කොට ඝනය බිඳීම කළ **කල්හි අනාත්ම ලක්ෂණය** යථා-සභාවයෙන් වැටහේ.

විසඳුම:- අන්‍යෝන්‍ය සම්බන්ධ රූප - අරූප ධර්මයන් එකක් වශයෙන් ගැනීම වූ **සමූහ ඝනය** ද, ඒ ඒ ධර්මයනට ප්‍රතිනියත **කෘත්‍ය** භෙදයෙන් එකත්වයෙන් ගැනීම වූ **කෘත්‍ය ඝනය** ද, ඒ

ඒ ආලම්බන සහිත ධර්මයන් ආලම්බන භෙදයෙන් එකක්වයෙන් ගැනීම වූ **ආලම්බන ඝනය** දැ යි ඝනය ත්‍රිවිධ වේ. මොහු හැම දෙන ම වෙන් වෙන්වැ ධාතු ආදී වශයෙන් වැටහෙන කල්හි අතින් පිරිමදින ලද පෙත පිඬක් සේ විනාශයට් යෙති යි ප්‍රත්‍යය ලාභයෙන් පවත්නා ශූන්‍ය ධර්මමාත්‍රයැ යි තතු සේ **අනාත්ම ලක්ෂණය** අනිශයින් ප්‍රකටවැ වැටහේ.

නැවැතැ මෙහි **අනිත්‍යය, අනිත්‍ය ලක්ෂණය, දුඃඛය, දුඃඛලක්ෂණය; අනාත්මය, අනාත්ම ලක්ෂණය** යි මේ විභාගය දතයුතු. ඔවුනතුරින් **අනිත්‍යය නම්** ස්කන්ධ පඤ්චකය යි. කුමක් හෙයින් ද යත්:- විනාශය, අන්‍යථාත්වය යන සභාවය ඇති හෙයිනි. ඇතිවැ නැති වන හෙයින් හෝයි (මෙහි පූර්ව කයින් ජාති ජරා- මරණ සභාවයෙන් ද, දෙවන කයින් මිහිකිරීම්- ව්‍යයවීම් සභාවයෙන් ද අනිත්‍යය දැක්වූහ.

උත්පාද-ව්‍යය අන්‍යථාත්වය (ජාති- ජරා- මරණ) යන මේ **අනිත්‍ය ලක්ෂණය යි.** ඉපිද නැතිවීමය යි කියන ලද ආකාර විකාරය හෝ **අනිත්‍ය ලක්ෂණය යි.**

"යදනිච්චං තං දුක්ඛං"* 'යමක් අනිත්‍ය නම් ඒ දුකැ යි' ඔදුළ හෙයින් එම ස්කන්ධ පඤ්චකය ම නිරන්තරයෙන් පෙළන හෙයින් **දුක් නම් වේ.** ඒ නිතර පෙළෙන ආකාරය **දුඃඛ ලක්ෂණය යැ.**

"යං දුක්ඛං තදනත්තා"* 'යමක් දුක් නම් ඒ අනාත්මය යි' වදුළ හෙයින් ඒ ස්කන්ධ පඤ්චකයම වශයෙහි නො පවත්නා හෙයින් **අනාත්ම නම්,** ඒ වශයෙහි නො පවත්නා ආකාරය **අනාත්ම ලක්ෂණය යි.**

මේ යොගී තෙමේ මෙකී ලක්ෂණ හා ලක්ෂණයෙන් යුත් පඤ්චස්කන්ධය ද යන මේ සියල්ල උපක්ලෙශයෙන් මිදුණු වීර්යයට පිළිපන් විදර්ශනා සඛ්‍යාත **උදය-ව්‍යයානුදර්ශනඥානයෙන්** යථා සභාවයෙන් සලකයි. මෙසේ සලකා නැවැතැ නැවැතැ **අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්මය යි** රූප - අරූප ධර්මයන් (තරුණියෙහි කිරන්නාක් මෙන් නිශ්චය කරන- තීරණය කරන ඒ යොගීනට ඒ විදර්ශනා ඥානය තියුණුව පවතී. සංස්කාරයෝ සැහැල්ලුවැ වැටහෙති.

---

* සං: නි: ඛන්ධසංයුත්ත

විදර්ශනා ඥානය නියුණුවැ පවත්නා කල්හි සංස්කාරයන් සැහැල්ලුවැ වැටහෙන කල්හි ඉපදීමට හෝ සිටියාට හෝ පැවැත්මට හෝ සංස්කාර නිමිත්තට හෝ නො පැමිණේ. ක්ෂය-ව්‍යය හෙද සඛ්‍යාත නිරෝධයෙහි සමාහිත පිහිට යි. සංස්කාර යන් මෙසේ ඉපිද මෙසේ නිරුද්ධ වෙතියි දක්නා වූ යොගීහට පෙර කීසේ උදයය හැර ව්‍යයයම මෙනෙහි කරන කල්හි **'භඞ්ගානුපස්සනා නම්'** විදර්ශනා ඥානය උපදී.

එහෙයින් කියන ලදී.

"කථං ආරම්මණපටිසඞ්ඛාභඞ්ගානුපස්සනෙ පඤ්ඤා විපස්සනෙ ඤාණං. රූපාරම්මණතා චිත්තං උප්පජ්ජිත්වා නිරුජ්ඣති. තං ආරම්මණං පටිසඞ්ඛා තස්ස චිත්තස්ස භඞ්ගං අනුපස්සති අනුපස්සතීති කථං අනුපස්සති? අනිච්චතො අනුපස්සති, නො නිච්චතො. දුක්ඛතො අනුපස්සති, නො සුඛතො. අනත්තතො අනුපස්සති, නො අත්තතො. නිබ්බින්දති, නො නන්දති. විරජ්ජති, නො රජ්ජති. නිරොධෙති නො සමුදෙති. පටිනිස්සජ්ජති, නො ආදියති. අනිච්චතො අනුපස්සනෙනා නිච්චසඤ්ඤං පජහති. දුක්ඛතො අනුපස්සනෙනා සුඛ සඤ්ඤං අනත්තතො අනුපස්සනෙනා අත්තසඤ්ඤං -නිබ්බින්දනෙනා නන්දිං- විරජ්ජනෙනා රාගං- නිරොධෙනෙනා සමුදයං. පටිනිස්සජ්ජනෙනා ආදානං පජහති. වෙදනාරම්මණතා -පෙ- ඤාණාරම්මණතා -පෙ- සඞ්ඛාරාරම්මණතා -පෙ- විඤ්ඤාණාරම්මණතා -පෙ- චක්ඛාරම්මණතා පෙ- ජරා-මරණාරම්මණතා චිත්තං උප්පජ්ජිත්වා නිරුජ්ඣති. -පෙ- පටි-නිස්ස ජනෙනා ආදානං පජහති."*

රූප-වෙදනාදී අරමුණු ක්ෂය-ව්‍යය වශයෙන් දැන ඒ ආලම්බන චිත්තයා ගේ ද භඞ්ග වශයෙන් දක්නා ප්‍රඥාව විදර්ශනා ඥානය නම් වේ.

ඒ මෙසේ යි:- රූපාලම්බන භාවයෙන් සිත ඉපිද බිඳුණු කලැ ඒ අරමුණ දැන ඒ චිත්තයා ගේ භඞ්ගය අනුව බල යි. කෙසේ ද? යත්:- අනිත්‍ය හෙයින් (අනුවැ) බල යි නිත්‍ය හෙයින් නො බල යි. දුක් හෙයින් (අනුවැ) බල යි. සැප හෙයින් නො බල යි. අනාත්ම හෙයින් (අනුවැ) බල යි ආත්ම හෙයින් නො බල යි. කළකිරෙ යි. සතුටු නො වේ. නො ඇලෙ යි. නො රුදෙ යි. නිරුද්ධ කෙරෙ යි. නුපදව යි. දුරු-

* ප: ම: ඤාණකථා

කෙරෙ යි. නො ගනී. අනිත්‍ය හෙයින් බලන්නේ නිත්‍ය සංඥාව දුරු කෙරේ. දුක් හෙයින් (අනුවැ) බලන්නේ සුඛ සංඥාව දුරු කෙරේ. අනාත්ම හෙයින් (අනුවැ) බලන්නේ ආත්ම සංඥාව දුරු කෙරේ. කළකිරුණේ සතුට දුරු කෙරේ. නො ඇලුණේ රාගය දුරු කෙරේ. නිරුද්ධ කරනුයේ සමුදය දුරු කෙරේ. අත හරිනුයේ ආදානය දුරු කෙරේ. වෙදනාරම්මණයෙහි -පෙ- සංඥාරම්මණයෙහි -පෙ- සඞ්ඛාරාරම්මණයෙහි – විඤ්ඤාණාරම්මණයෙහි වක්ඛාරම්මණයෙහි -පෙ- ජරා-මරණාරම්මණයෙහි සිත ඉපදී බිඳෙ යි. -පෙ- සමුදය දුරු කරන්නේ ආදානය දුරු කෙරේ.

ඒ ධර්ම සමූහය දන්නා අර්ථයෙන් **ඤාණ** නම්. සම්ප්‍රකාර-යෙන් දන්නා අර්ථයෙන් **ප්‍රඥා** නමු. එහෙයින් **"ආරම්මණ පටිසඞ්ඛානභඞගානුපස්සනෙ ඤාණඤ්ච විපස්සනෙඤාණං"** යි කිය යි.

එහි පදයක් පාසා අර්ථය මෙසේ යි:- **ආරම්මණ පටිසඞ්ඛා**= යම් අරමුණක් ක්ෂය-ව්‍යය වශයෙන් දැන

භඞගානුපස්සනෙපඤ්ඤා= ඒ ආලම්බනය **ක්ෂය**-ව්‍යය වශයෙන් බැලීමෙන් උපන් ඤාණයා ගේ යම් භඞගයෙක් වේ නම් ඒ භඞගය අනුව බැලීමෙන් උපන් ප්‍රඥාව **විදර්ශනා ඥානය** යි කියන ලදී.

ඒ මෙසේ යි:- **රූපාරම්මණතා චිත්තං උප්පජ්ජිත්වා භිජ්ජති**= රූපය අරමුණු කොට ඇති සිත ඉපිද බිඳේ. නොහොත් රූප-රම්මණ භාවයෙහි සිත ඉපිද බිඳේ.

තං ආරම්මණං පටිසඞ්ඛා = ඒ රූපාලම්බනය ක්ෂය වශයෙන් ව්‍යය වශයෙන් දැක

තස්ස චිත්තස්ස භඞගං අනුපස්සති = ඒ රූපාලම්බනය **ක්ෂය**-ව්‍යය වශයෙන් දක්නා ලද සිතෙහි භඞගය අන්‍ය සිතකින් බල යි.

එහෙයින් **"ඤාතං ච ඤාණං ච උභො විපස්සති = දක්නා ලද අරමුණ ද, ඒ අනුපස්සනා වශයෙන් දක්නා ලද ඤාණය ද** යන දෙක ම **ක්ෂය**-ව්‍යය වශයෙන් බලායැ යි පැරැණියෝ කිහ.

එහි **අනුපස්සති** යනු (අනු-අනුපස්සති) **අනිච්චානුපස්ස-නාදි** නොයෙක් ආකාරයෙන් නැවැතැ-නැවැතැ බල යි. යන අර්ථ යි.

එහෙයින් කිහ:- **අනුපස්සතීති කථං අනුපස්සති අනිච්ච-තො අනුපස්සති** = කෙසේ බලා ද අනිත්‍ය වශයෙන් බල යි. යනාදිය කී.

එහි භඞ්ගය නම් අනිත්‍යය පිළිබඳ අන්තිම කෙළවර ය. එහෙයින් ඒ භඞ්ගය අනුව බලන යොගී තෙමේ සියලු සංඝකාර ජාතය අනිත්‍ය වශයෙන් අනුව බල යි. නිත්‍ය වශයෙන් නො බල යි.

අනතුරුව අනිත්‍යය දුක් වන බැවින් දුකඛය **අනාත්ම** වන හෙයින් ඒ සංස්කාර ගතය දුක් වශයෙන් අනුව බල යි. සැප වශයෙන් නො බල යි. අනාත්ම වශයෙන් අනුව බල යි. **ආත්ම** වශයෙන් නො බල යි.

යම් හෙයකින් යමක් **අනිත්‍ය දුකඛ - අනාත්ම** නම් එය **තෘෂ්ණා - දෘෂ්ටි** ආදී වශයෙන් අභිනන්දනය නො කට යුතු යි. යමක් අභිනන්දනය නො කට යුතු නම් එහි නො ඇලිය යුතු යි. **එහෙයින් භඞ්ගානුපස්සනානුසාරයෙන් අනිත්‍යය, දුඃඛය, අනාත්මය** යි දක්නා ලද සංස්කාර ජාතයෙහි කළකිරේ. සතුටු නො වේ. නො ඇලේ. නො රැඳේ ඒ යෝගී තෙමේ මෙසේ නො ඇලෙන්නේ පළමු **නෝ** ලෞකික ඥානයෙන් ම රාගය නිරුද්ධ කෙරේ. සමුදය නො කෙරේ. තෘෂ්ණාව නූපදවයි යන අර්ථ යි. නොහොත් මෙසේ විරක්ත වූ යේ දක්නා ලද සඞ්ඛාර ජාතය මෙන් නො දක්නා ලද අතීතාදී සඞ්ඛාර ද **අනුමානඥාන** වශයෙන් නිරුද්ධ කෙරේ. සමුදය නො කෙරේ. **නිරොධ** වශයෙන් ම මෙනෙහි කර යි නිරොධය ම බල යි. සමුදය නො බල යි යන අර්ථ යි. මෙසේ පිළිපන් ඒ යොගී තෙමේ සංස්කාරයන් දුරු කෙරේ. නො ගනී.

නිර්ණය:- මේ අනිත්‍යාදී අනුපස්සනාව තදඞ්ග වශයෙන් සකඞ්ඛාදී අභිසංඛාරයන් සමග කෙලෙසුන් **පහ** කරන හෙයින් **පරිච්චාගපටිනිස්සග්ගය** යි ද, සංස්කාර ධර්මයන් ගේ දෙස් දැකීමෙන් ද, සංස්කාර ධර්මයනට විපරීත වූ නිර්වාණයෙහි තන්නිත්‍ය භාවයෙන් පක්ඛන්දනය වන හෙයින් ද **පක්ඛන්දනපටිනිස්සග්ග-යයි** ද කියනු ලැබේ.

එහෙයින් ඒ අනිත්‍යාදී අනුපස්සනාවෙන් යුක්ත වූ භික්ෂු තෙමේ පෙර කී තදඞ්ගාදී ක්‍රමයෙන් කෙලෙසුන් දුරු කෙරේ. **නිර්වාණයට ද** පිවිසේ. ඉපදවීම් වශයෙන් කෙලෙසුන් ඇද නො ගනී. දෙස් නො දැකීම් වශයෙන් සංස්කාරාරම්මණයන් නො ගනී. **"පටිනිස්සජ්ජති නො ආදියති"** යි එහෙයින් කිය යි.

දැන් ඒ යොගීහු ගේ ඒ අනිත්‍යානුදර්ශන ඥානයෙන් නිත්‍ය සංඥාදී ප්‍රහාණය වන ධර්මයන් දැක්වීම පිණිස **"අනිච්චතො අනුපස්සනෙනා නිච්ච සඤ්ඤං පජහති"** යනාදිය කියන ලදී. (අර්ථ පෙර කී සේ මැ යි) මෙහි තන්හි නම් සප්‍රීතික තාෂණා යි.

විශෙෂ:- මෙහි අනිත්‍ය ග්‍රහණය සංඥා ශීර්ෂයෙන් නිර්දේශ කැ. සෙස්සෙහි ද මෙසේමැ යි.

'වත්ථුසඞ්කමනාවෙව - සඤ්ඤාය ච විවට්ටනා
ආවජ්ජනා බලඤ්චව - පටිසඞ්ඛා විපස්සනා
ආරම්මණාඤ්ඤෙනාපි - උභො එකාවජ්ජනා
නිරොධෙ අධිමුත්තතා - වයලක්ඛණවිපස්සනා
ආරම්මණඤ්ච පටිසඞ්ඛා - භඞ්ගඤ්ච අනුපස්සති
සුඤ්ඤතො ච උපට්ඨානං - අධිපඤ්ඤාවිපස්සනා
කුසලො තීසු අනුපස්සනාසු - චතසේසා ච විපස්සනාසු
තයො උපඤානෙ කුසලතා - නානාදිසිසු න කම්පතීති'

'පූර්ව වස්තුවෙන් අපර වස්තුවට සංක්‍රමණය ද, සංඥා පෙරැළීම ද, ආවර්ජිතා බලය ද **ප්‍රතිසඞ්ඛාවිදර්ශිනා යැ.**

අරමුණට අනුවැ යාමෙන් අතීත අනාගත සංස්කාරයන් ඒකාකාර භාවයෙන් විනිශ්චය කිරීම ද, භඞ්ගානුඛ්‍යානා නිරෝධ-යෙහි අධිමුක්ත බව ද **ව්‍යයලක්ෂණවිදර්ශිනා යැ.**

පූර්ව වූ රූපාදී අරමුණු දැනැ ඒ අරමුණෙහි භඞ්ගය බැලීම ද, සංස්කාරයන් ශූන්‍ය වශයෙන් වැටහීම ද **අධිප්‍රඥාවිදර්ශිනා යි.**

අනිත්‍යාදී ත්‍රිවිධ අනුපස්සනාහි ද, නිර්විදාදී චතුර්විධ විදර්ශනාහි ද දක්ෂ වූ යොගීතෙමේ **ක්ෂය- ව්‍යය- ශූන්‍යතා** යන ත්‍රිවිධ උපස්ථානයෙහි දක්ෂ බැවින් නොයෙක් මිථ්‍යාදෘෂ්ටීන්හි කම්පා නො වේ.

ඝාථාවන්හි විශෙෂාර්ථ මෙසේ යි:- **වත්ථුසඞ්කමනා** = (විදර්ශනා-වට ප්‍රවෘත්ති සථාන ඔසින් රූපාදී ආලම්බනය වස්තු නම්. එසේ රූපයා ගේ භඞ්ගය දුක නැවැතැ ඒ භඞ්ගය දක්නා ලද සිතෙහි ද භඞ්ගය දැකීම් වශයෙන්) පළමු වස්තුවෙන් අන්‍ය වස්තුවකට සංක්‍රමණය වීමෙන්; **සඤ්ඤාය ච විවට්ටනා** = (උදයය හැර ව්‍යය-යෙහි) විදර්ශනා ප්‍රඥාව මනාව පිහිටීමෙන්. **ආවජ්ජනාබලඤ්චව**= (රූපාලම්බනයා ගේ භඞ්ගය දුක නැවැතැ ඒ භඞ්ගය අරමුණු කරන චිත්තයාගේ ද භඞ්ගය දැකීම පිණිස) ආවර්ජිතා කිරීමෙහි සමර්ථ බව. **පටිසඞ්ඛාවිපස්සනා** = මේ ආරම්මණ පටිසංඛා විපස්සනා නම් වේ.

ආරම්මණාභියෙනාපි උභො එකවවත්ථනා=(ප්‍රත්‍යක්ෂ වශයෙන් දක්නා ලද) අරමුණු අනුව යාමෙන් (වර්තමාන ස්කන්ධ පඤ්චකය බිඳෙන්නා සේ) අතීතයෙහි ද, අනාගතයෙහි ද සංස්කාර බිඳේ ය යි දිළු - අදිළු දෙදෙනා ගේ **ක්ෂණ** භඞ්ගාදී එක සවභාවයෙන් විනිශ්චය කිරීම යැ.
එයින් කිහ පැරණියෝ:-

"සංවිජ්ජමානමනි විසුද්ධ දස්සනෙ
තදනවයං නෙති අතීත'නාගතෙ
සබ්බෙපි සඞ්ඛාරගතා පලොකිනො
උස්සාවබින්දුසුරියෙව ලඝතෙ"

"වර්තමාන ස්කන්ධයන් ගේ භඞ්ග දර්ශනය ප්‍රත්‍යක්ෂයෙන් පරිශුද්ධව පවත්නා කල්හි ඒ ඥානයට අනුව අතීත වූ ද, අනාගත වූ ද, ස්කන්ධයන් ගේ භඞ්ග ඥානය පවතී. සියලු සංස්කාර ධර්මයෝ ම හිරු නැගි කල තණ අග පිණි බිඳු සේ විනාශ වන සුලු වෙන්" ය යි දකී.

නිරොධෙ අධිමුත්තතා = (මෙසේ දෘෂ්ට වූ ද, අදෘෂ්ට වූ දැ යි දැවිවිධ සංස්කාරයන් භඞ්ග වශයෙන් ඒකාකාරයෙන් ව්‍යවස්ථා කොට ඒ භඞ්ග සඞ්ඛ්‍යාත) නිරෝධයෙහි ම අධිමුක්ත බව (ගරු කොට ඇති බව, එයට නැමුණු බව, අවනත බව, අභිමුඛ බව) යැ.

විශෙෂ:- මෙහි නිරෝධ නම් සංස්කාර නිරෝධය යැ, අසඞ්ඛත ධාතුව (නිර්වාණය) නො වේ.

වයලක්ඛණවිපස්සනා = විපරිණාම ලක්ෂණ භඞ්ගානුදර්ශන විදර්ශනාව යි.

"ආරම්මණසඋව පවිසඞ්ඛා භඞ්ගසඋව අනුපස්සති = (භඞ්ගානුදර්ශන වශයෙන්) රූපාදී අරමුණ දැන (ඒ ආලම්බනයාගේ භඞ්ගය දැක ඒ භඞ්ගය ආලම්බන කළ චිත්තයාගේ ද) භඞ්ගය දකී. **සුඤඤතො ච උපඨාති** = (මෙසේ භඞ්ගය අනුව බලන ඒ යෝගී හට සංස්කාරයෝ ම බිඳෙති. සංස්කාරයන් ගේ භෙදය ම මරණ යැ. අන්‍ය වූ කිසි ආත්මයෙක් නැත්තේ ය යි) ශූන්‍ය හෙයින් ම හැඟීම වේ.

එයින් කිහ පැරණියෝ:-

ඛණ්ඩා නිරුජ්ඣනති න චජ්ජ අඤ්ඤදූ,
ඛණ්ඩානභෙදූ මරණන්ති වුච්චති,
තෙසං ඛයං පස්සති අප්පමත්තො
මණ්ඩංව විජ්ඣං වජිරෙන යොනිසො.

'සකඛයෝ නිරුද්ධ වෙත්. **සකඛියන්** හැර අනිකෙක් **නැති**. ස්කන්ධ හෙදය මරණය යි කියනු ලැබේ. ඒ ස්කන්ධියන් ගේ (වැටහෙන) භඞ්ගය අප්‍රමත්තවූයේ වප්‍රයෙන් මැණිකක් විදිනා කළ එහි සිදුර දක්නා සේ නුවණින් බල යි.

අධිපඤ්ඤා විපස්සනා = ('රූපාලම්බනයෙහි සිත ඉපිද නිරුද්ධ වීම ආරම්මණ පටිසඞ්ඛ්‍යා යි' මෙසේ කී) **ආලම්බන ප්‍රතිසඞ්ඛ්‍යා ඥාණ ද,** (ඒ චිත්තයා ගේ භඞ්ගය බලා යි කී) **භඞ්ගානුපස්සනාව ද,** (සංස්කාර ම බිඳේ සංස්කාරයන් ගේ හෙදය ම මරණය, අන් කිසිවෙක් නැතැ යි' කී තන්හි) **ශූන්‍ය වශයෙන් වැටහීමද යි** මේ තුන් ආකාරයෙන් කියන ලද **අධිපඤ්ඤා විපස්සනාවෙන්.**

"කුසලෝ තීසු අනුපස්සනාසු = අනිත්‍යාදී ත්‍රිවිධ අනුපස්සනාහි දක්ෂ වූ යොගී තෙමේ

චතසෝසා ච විපස්සති = **නිබ්බිදා**- විරාග- නිරෝධ පටිනිස්සග්ග යන සතර අනුපස්සනාහි ද,

තීසු'පඤ්ඤාසු කුසලතා = ඛය- ව්‍යය- ශූන්‍ය වශයෙන් ද, මේ ත්‍රිවිධ වූ උපස්ථානයෙහි දක්ෂ ද වේ.

විශේෂ:- ඛය-ව්‍යය වශයෙන් උපස්ථානය **අනිත්‍ය** හෙයින් ද, භය වශයෙන් උපස්ථානය **දුඃඛ** හෙයින් ද, ශූන්‍යතා වශයෙන් උපස්ථානය **අනාත්ම** හෙයින් ද **වේ**. (ටීකා)

නානාදිට්ඨීසු න කම්පති = ශාස්වත දෘෂ්ටි ආදී නානාප්‍රකාර දෘෂ්ටීන්හි කම්පා නො වේ.

මෙසේ අකම්ප්‍ය වූ ඒ යොගී තෙමේ නිරුද්ධ නුවූයේ ම නිරුද්ධ වේ. නො බිඳුනේ ම බිඳේය යි පැවැති මනස්කාර **ඇත්තේ** බිඳෙන දුර්ලභ භාජනයක් මෙන් ද, විසිරෙන සියුම් රජසක් මෙන් ද, බිඳින තල මෙන් ද, සියලු සංස්කාරයන් ගේ උප්පාද - ඨිති පවත්නා නිමිත්ත හැර හෙදය ම දකී.

නිදර්ශන:- **ඇස් ඇති** පුරුෂයකු පොකුණු තෙරෙකැ හෝ ගං තෙරෙකැ හෝ සිට මහත් පොද ඇති වැස්සක් **වස්නා** කල දිය පිට මහත්-මහත් බුබුළු නැඟි-නැඟී, වහ-වහා බිඳෙන්න වුන් දක්නා සේ ඒ යොගී තෙමේ සියලු සංස්කාරයෝ බිඳෙන්-බිඳෙන් ය යි දකී. මේ බඳු යොගියා සඳහා බුදුහු මෙසේ වදාළහ.

"යථා බුබ්බුලකං පස්සෙ - යථා පස්සෙ මරීචිකං
එවං ලොකං අවෙක්ඛන්තං - මච්චුරාජා න පස්සති"*

'දිය බුබුලක් - මිරිඟු දියක් දක්නා සේ ලොකය බලන යොගී මරහු නො දකී' (අජීවියට පැමිණේ.) මෙසේ සියලු සංස්කාරයෝ බිඳෙත් බිඳෙත් යයි එක්වන් බලන ඒ යොගීහු ගේ ශාස්වත දෘෂ්ටි ප්‍රහාණයෑ, ජීවිතනිකන්ති පරිත්‍යාග යෑ, සතත භාවනාවෙහි යුක්ත ප්‍රයුක්තතා යෑ, පිරිසිදු ආජීවතා යෑ, කෘත්‍යාකෘත්‍යයෙහි ව්‍යාවෘත නො වීම යෑ, නිසිවකට භය නැති බව යෑ, ක්ෂාන්ති - සුරත භාව ලාභ යෑ, අධිකුශල ධර්මයෙහි අරතිය හා කාමගුණ රතිය සහනතා යෑ, යන මේ **අටඅනුසසක් දකී.** මේ උතුම් අට අනුසස් දැක ඒ භඞ්ගය බලන සුලු යොගී තෙමේ **නිවණට** පැමිණෙනු පිණිස ගිනි ගත් වසුන-ශීර්ෂ ඇතියකු සේ සංස්කාරයන් ගේ භඞ්ගය සන්තර්ජනය කෙරේ.

භඞ්ගානුපස්සනා ඤාණය නිමි.

---

(3) මෙසේ සියලු සංස්කාරයන් ගේ ක්ෂය- ව්‍යය- භෙද සංඛ්‍යාත නිරෝධය අරමුණු කොට පැවැති **භඞ්ගානුපස්සනාව** ආසෙවනය කරන- වඩන- නැවැතැ නැවැතැ වඩන ඒ යොගීහට සියලු **භව- යොනි- ගති- විඤ්ඤාණට්ඨිති- සත්තාවාසයෙහි** බිඳෙන සංස්කාරයෝ, සුවසේ ජීවත්වනු කැමැති බියසුලු පුරුෂයක් හට සිහ- වග- දිවි- වලස්- තරස්- යක්- රකුස්- සැඩ-ගොන්- සැඩබලු- බිදුණු **මද** ඇති ඇත්- ගොරසප්- හෙණ-මඬුලු- සොහොන්- යුදබිම්- දිළිඳෙන අහුරුවළ ආදිය මෙන් මහා භයවැ වැටහෙත්.

ඉකුත් සංස්කාරයෝ නිරුද්ධ වූහ. වර්තමාන සංස්කාරයෝ නිරුඬ වෙත්. අනාගතයෙහි උපදින සංස්කාරයෝ ද මෙසේ ම මතු නිරුඬ වන්නාහ යි බලන්නා වූ ඕහට **භයතුපට්ඨාන** නම් ඤාණ උපදී.

මේ එහි උපමාවෙකි:- එක් මාගමක ගේ පුත්තු තුන්-දෙනෙක් රාජාපරාධයක් කළහ. රජ ඔවුන් හිස් සිඳීමට නියොග කෙළේ ය. ඕ තොමෝ පුතුන් හා වධස්ථානයට පැමිණියා ය. එකල ඇය ගේ දෙටු පුතා ගේ හිස සිඳ, මද්දුමයා ගේ හිස සිඳීමට සූදානම් වූහ. ඕ තොමෝ, 'වැඩිමලා ගේ හිස සින්දේ යැ'

* ධ: ප: ලොකවඝ

මද්දුමයා ගේ හිස ද සිදිය යි' බාලයා, කෙරෙහි ආලය හැරියා ය. මෙ තෙමේ ද අන්ක් දෙදෙනා මෙනැ යි කියා යි.

ඒ උපමාහි:- ඒ සත්‍රිය දෙවු පුතා ගේ සිදි හිස දැකීම මෙන් යොගීහු ගේ ඉකුත් සංස්කාරයන් ගේ නිරොධය දැකීම ද, මද්දුමයා ගේ හිස සිඳිනු දැකීම මෙන් වත්මන් සංස්කාර නිරොධය දැකීම ද, මේ ද මොවුන් වැනිය යි බාලයා ගේ ආශාව හැරීම මෙන් අනාගතයෙහි ද උපදනා සංස්කාරයෝ බිඳෙන්යැ යි අනාගත ධර්මයන් ගේ නිරොධය දැකීම ද දතයුතු. මෙසේ බලන්නා වූ ඒ යොගීහට මෙ තැන **භයතුපඨාන ඤාණය** උපදී.

තවද උපමාවෙකි: මියන දරුවන් ඇති එක් මාගමක් දරුවන් දස දෙනකු වැදුවා ය. ඔවුනතුරින් නව දෙනෙක් මළහ. එකෙක් දැන් අතෙහි මැරේ. අනෙකෙක් කුසෙහි ද සිටී. ඕ දරුවන් නව දෙනෙකුන් මළ කළැ දස වැන්නා මියන්නහු දැක කුසහොත් දරුවා මළවුන් හා සමය යි ඔහු කෙරෙහි ආලය හැරියා ය.

ඒ උපමාහි ද, ඒ සත්‍රිය ගේ දරුවන් නව දෙනෙකුන් ගේ මරණය සිහිකිරීම මෙන් ඒ යොගීහු ගේ අතීත සංස්කාර පිළිබඳ නිරොධය සිහිකිරීම ද, අනාදරුවා මියනු දැකීම මෙන් වර්තමාන සංස්කාර නිරොධය දැකීම ද, කුසහොත් දරුවා ගේ ආලය හැරීම මෙන් අනාගත සංස්කාර නිරොධය දැකීම ද දතයුතු යි. මෙසේ බලන්නා වූ ඒ යොගීහට **එකෙණෙහි භයතුපඨාන ඤාණය** උපදී.

ප්‍රශ්නයෙකි:- භයතුපඨාන ඤාණය බාද? නො බාද?

පිළිතුරු:- නො බා යි. බිය වන ආකාරයෙන් නුවණ නූපදනා හෙයිනි.

විශේෂ:- ඒ ඤාණය වනාහි "ඉකුත් සංස්කාරයෝ නිරුද්ධ යහ. වර්තමාන සංස්කාරයෝ නිරුඬ වෙත්. අනාගත සංස්කාර-යෝ නිරුද්ධ වන්නාහ."යි මෙසේ තීරණ මාත්‍රයෙක් මැයි.

ඒ මෙසේ යි:- ඇස් ඇති පුරුෂයෙක් නුවර දොර අහුරු වළවල් තුනක් දැක තෙමේ නො බයි. හුදෙක් මෙහි යම් යම් කෙනෙක් වැටෙත් නම් ඔහු හැම දෙනම බොහෝ දුක් අනුභව කෙරෙත්ය යි තීරණ මාත්‍රයෙක් ම ඔහට වේ. එසේ ම පිළිවෙළින් තුබූ කිහිරි හුලෙක, යහුලෙක, රන් හුලෙකැ යි හුල් තුනක් දක්නා ඇස් ඇත්තෙක් තෙමේ නොබා යි. හුදෙක් යම් යම් කෙනෙක්

මේ හුල්වල හෙත් නම් ඔහු හැම දෙතම බොහෝ දුක් අනුභව කෙරෙන්ය යි තීරණ මාත්‍රයෙක් ම වේ. මෙසේ **භයතුපට්ඨාන-ඤාණය** නො බා යි. හුදෙක් ඒ යොගීහට අහුරු වළවල් තුනක් වැනිවූ ද, හුල් තුනක් වැනිවූ ද ත්‍රිවිධ භවයෙහි "අතීත සංස්කාර යෝ නිරුද්ධයහ. වර්තමාන සංස්කාරයෝ නිරුද්ධ වෙත්. අනාගත සංස්කාරයෝ නිරුද්ධ වන්නාහ" යි තීරණ මාත්‍රය ම වේ. හුදෙක් ඒ යොගීහට සියලු භව- යොනි- ගති- ඕති- නිවාසගත සංස්-කාරයෝ ව්‍යසන ප්‍රාප්තයන්වැ- ප්‍රතිභය සහිතයන්වැ භය වශයෙන් වැටහෙති. එහෙයින් **භයතුපට්ඨානය** යි කියනු ලැබේ.

මේ ඒ පිළිබඳ පාළිය යි:- **අනිච්චතෝ මනසිකරොතෝ කිං භයතෝ උපට්ඨහති. අනිච්චතෝ මනසිකරොතෝ නිමිත්තං භයතෝ උපට්ඨාති. දුක්ඛතෝ මනසිකරොතෝ පවත්තං භයතෝ උපට්ඨාති. අනත්තතෝ මනසිකරොතෝ නිමිත්තඤ්ච පවත්තඤ්ච භයතෝ උපට්ඨාති*** යනු යි. 'අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන යොගීහට කුමක් භය වශයෙන් වැටහේ ද? අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට නිමිත්ත භය වශයෙන් වැටහේ. දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට ප්‍රවෘත්තිය භය වශයෙන් වැටහේ. අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට සංස්කාර නිමිත්ත ද, භව ප්‍රවෘත්තිය ද භය වශයෙන් වැටහේ.'

විභාග:- එහි නිමිත්ත නම් සංස්කාර නිමිත්ත යැ. අතීත-අනාගත- ප්‍රත්‍යුත්පන්න වූ **සංස්කාරගතට** ම මේ **නමෙකි.**

ඒ මෙසේ යි:- අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන යොගී තෙමේ සංස්කාරයන් ගේ මරණය (භඞ්ගය) ම බල යි. එහෙයින් ඒ යොගීහට සංස්කාර නිමිත්ත භය වශයෙන් වැටහේ. **ප්‍රවෘත්තිය** නම් රූප-අරූප භවයන් ගේ ප්‍රවෘත්තිය යි. දුක් වශයෙන් මෙනෙහි කරන්නේ සුඛ සම්මතවූ ද ප්‍රවෘත්තිය නිතර පෙළන බව ම දකී. එහෙයින් ඒ යොගී භව ප්‍රවෘත්තිය ම භය වශයෙන් දකී. අනාත්ම වශයෙන් මෙනෙහි කරන යොගී තෙමේ ප්‍රවෘත්ති-නිමිති යන මේ දෙක ම ශූන්‍ය වූ ගමක් මෙන් ද, මිරිඟු දියක් මෙන් ද ගඤ්ඤි නගරයක් මෙන් ද රිකන යැ, තුච්ඡ යැ, ශූන්‍ය යැ, අසාමික යැ, අපරිනායකයැ යි දකී. එහෙයින් ඒ යොගීහට නිමිත්ත පවත්ත යන දෙකම භය වශයෙන් වැටහේ.

භයතුපට්ඨාන ඤාණය නිමියේ යි.

---

* ප: ම: විමොක්ඛකථා

(4) ඒ **භයතුපට්ඨානා ඤාණය** සෙවූනා- වඩන- බහුලවැ කරන ඒ යොගීහට සියලු භව- යොනි- ගති- ඨිති- **සත්තාවාස**-යන්හි සංස්කාරයන් ගෙන් වන අනර්ථයෙන් ආරක්ෂාවෙක් නැති. ඒ අනර්ථය දුරු කිරීමට ලැගෙන තැනෙක් නැති, යා යුතු තැනෙක් **නැති**, **රක්ෂා** කරන තැනෙක් නැතැ යි පැනේ. සියලු භව- යොනි- ගති- ඨිති- නිවාස ගත වූ සංස්කාරයන් අතුරින් එක සංස්කාරයෙක්හිදු ප්‍රාර්ථනාවෙක් හෝ දෘෂ්ටි වශයෙන් දැඩිවැ ගැනීමෙක් හෝ නො වේ. තුන් භවය සාලඟුරින් පිරි අඟුරු වළවල් මෙන් ද, සතර මහාභූත (**කර්කමූඛ**- පූතිමූඛ- **අග්නිමූඛ**- **සර්පමූඛ**) ආශීවිෂයන් සතර දෙනකුන් මෙන් ද, **පඤ්චස්කන්ධ**-යෝ නගා ගත් කඩු ඇති වධකයන් පස්දෙනකුන් මෙන් ද, චක්ෂුරාදී ආධ්‍යාත්මික ආයතන සය ආත්ම - **ආත්මීය** භාවයෙන් ශූන්‍ය හෙයින් ශූන්‍ය ග්‍රාමයක් මෙන් ද, බාහිරායතන සය ගම් පහරන සොරුන් මෙන් ද, සපත විඳුන සතිනිහු ද, නව **සත්ත්වාවාස**යෝ ද, රාගාදී එකොළොස් ගිනිතෙන් ඇවිල ගත්ත වුන් මෙන් ද, දිළිලෙන්නවුන් මෙන් ද, ගිනිසිළු ඇත්තවුන් මෙන් ද, සියලු සංස්කාරයෝ ගඩ මෙන් ද, රොග මෙන් ද, හුල් මෙන් ද, අඝයන් මෙන් ද, ආබාධයන් මෙන් ද වූවාහු ආස්වාද රහිතයන්වැ නීරසයන්වැ මහත් ආදීනව රැසක්වැ වැටහෙති.

ඒ මෙසේ යි:- සුවසේ ජීවත්වනු කැමැති බියසුලු පුරුෂ-යකු හට රමණීය සේ පිහිටි වණඹ මෘගයන් ඇති වන ගහණයක් මෙන් ද, ව්‍යාඝ්‍රයන් ඇති ගුහාවක් මෙන් ද, කිඹුලන් හා රකුසන් සහිත විලක් මෙන් ද, ඔසවා ගත් කඩු ඇති සතුරකු මෙන් ද, විෂ සහිත බොජුනක් මෙන් ද, සොරුන් ඇති මාර්ගයක් මෙන් ද, ගිනි ගත් ගෙයක් මෙන් ද, යොදන ලද සේනා ඇති යුද්ධ බිමක් මෙන් ද වැටහේ. ඒ පුරුෂතෙම ව්‍යාල සහිත වන ගහණාදීන්ට පැමිණ බිය පත්වැ සංවිග්නවැ හටගත් ලොමුදහ ගැනීම් ඇතිවැ හාත්පසින් ආදීනව දක්නා සේ මේ යොගීතෙමේ **භඞ්ගානුපස්සනා** වශයෙන් සියලු සංස්කාරයන් භය වශයෙන් එළැඹ සිටි කල්හි හාත්පසින් නීරස වූ ආස්වාද රහිත ආදීනවය ම දකී. මෙසේ බලන්නා වූ ඒ යොගීහට **ආදීනව ඤාණ** නම් ඤාණයක් උපන්නේ වේ.

එයින් වදාළහ.

"කථං භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං? උප්පාදෙ භයතෝ භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං. පවත්තං භයතෝ, නිමිත්තං භයතෝ, ආයූහනා භයතෝ,

පවිසන්ති භයතෝ, ගති භයතෝ, නිබ්බත්ති භයතෝ, උපපත්ති භයතෝ, ජාති භයතෝ, ජරා භයතෝ, ව්‍යාධි භයතෝ, මරණං භයතෝ, සොකෝ භයතෝ, පරිදෙවෝ භයතෝ, උපායාසෝ භයතෝ භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං.

(2) අනුප්පාදෙ ඛෙමන්ති සන්තිපදෙ ඤාණං. අප්පවත්තං -පෙ- අනුපායාසෝ ඛෙමන්ති සන්තිපදෙ ඤාණං.

(3) උප්පාදෙ භයං, අනුප්පාදෙ ඛෙමන්ති සන්තිපදෙ ඤාණං.

(4) උප්පාදෙ දුක්ඛන්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං, පවත්තං -පෙ- උපායාසෝ දුක්ඛන්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං.

(5) අනුප්පාදෙ සුඛන්ති සන්තිපදෙ ඤාණං.

(6) උප්පාදෙ දුක්ඛං, අනුප්පාදෙ සුඛන්ති සන්තිපදෙ ඤාණං, පවත්තං -පෙ- උපායාසෝ දුක්ඛං අනුපායාසෝ සුඛන්ති සන්තිපදෙ ඤාණං.

(7) උප්පාදෙ සාමිසන්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං.

(8) අනුප්පාදෙ නිරාමිසන්ති සන්තිපදෙ ඤාණං, අප්පවත්තං -පෙ- අනුපායාසෝ නිරාමිසන්ති සන්තිපදෙ ඤාණං.

(9) උප්පාදෙ සාමිසං, අනුප්පාදෙ නිරාමිසන්ති සන්තිපදෙ ඤාණං, පවත්තං -පෙ- උපායාසෝ සාමිසං අනුපායාසෝ නිරාමිසන්ති සන්තිපදෙ ඤාණං.

(10) උප්පාදෙ සඞ්ඛාරාති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං, පවත්තං -පෙ- උපායාසෝ සඞ්ඛාරාති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං

(11) අනුප්පාදෙ නිබ්බානන්ති සන්තිපදෙ ඤාණං.

(12) උප්පාදෙ සඞ්ඛාරා, අනුප්පාදෙ නිබ්බානන්ති සන්තිපදෙ ඤාණං, පවත්තං -පෙ- උපායාසෝ සඞ්ඛාරා අනුපායාසෝ නිබ්බානන්ති සන්තිපදෙ ඤාණං.*

---

* ප: ම: ඤාණකථා

මේ දශ වස්තුක දෙළොස් වාරයකින් සැරිසුණු අඤ්ඤ-
ව්‍යතිරෙක වූ මේ ආදීනව ඤාන පදභාජනය නියන ලදී.

භයතුපට්ඨානයෙහි ප්‍රඥව කෙසේ ආදීනවයෙහි ඤානය වේද?

(1) ඉපදීම භයෙකැ යි භයතුපට්ඨානයෙහි ප්‍රඥව ආදීනව-
යෙහි ඤානය වේ. සංඝකාර ප්‍රවෘත්තිය භයෙකැ යි, සංඝකාර
නිමිත්ත භයෙකැ යි, ආයූහන සඞ්ඛ්‍යාත ප්‍රතිසන්ධියට හෙතු වූ
කර්ම භයෙකැ යි, ප්‍රතිසන්ධිය භයෙකැ යි, නිරයාදී පස් ගතිය
භයෙකැ යි, නිපැත්ම භයෙකැ යි, උපප්‍රාප්තිය භයෙකැ යි,
ජාතිය භයෙකැ යි, ජරාව භයෙකැ යි, ව්‍යාධිය භයෙකැ යි,
මරණය භයෙකැ යි, ශොකය භයෙකැ යි, පරිදෙවය භයෙකැ යි,
උපායාසය භයෙකැ යි, භයතුපට්ඨානයෙහි ප්‍රඥව **ආදීනවයෙහි**
ඤාන නම් වේ.

(2) අනුත්පාදය ක්ෂෙමය යි ශාන්තිපද සඞ්ඛ්‍යාත **නිර්වාණ-**
යෙහි ඤානය වේ. අප්‍රවෘත්තිය, අනුපායාසය ක්ෂෙමය යි ශාන්ති-
පදයෙහි ඤානය වේ.

(3) උත්පාදය භය යැ, අනුත්පාදය ක්ෂෙමය යි. ශාන්තිපද
යෙහි ඤානය වේ.

(4) උත්පාදය දුඃඛය යි භයතුපට්ඨානයෙහි ප්‍රඥව ආදීනව-
යෙහි ඤානය වේ. ප්‍රවෘත්තිය -පෙ- උපායාසය දුක්ඛ යි භයතු
පට්ඨානයෙහි ප්‍රඥාව ආදීනවයෙහි ඤානය වේ.

(5) අනුත්පාදය සුඛය යි ශාන්තිපදයෙහි ඤාණය වේ.
අප්‍රවෘත්තිය - අනුපායාසය සුඛය යි ශාන්තිපදයෙහි ඤානය වේ.

(6) උත්පාදය දුඃඛය, අනුත්පාදය සුඛයැ යි ශාන්තිපද-
යෙහි ඤානය වේ.

(7) උත්පාදය සාමිසයැ යි භයතුපට්ඨානයෙහි ප්‍රඥව
ආදීනවයෙහි ඤානය වේ. සංස්කාර ප්‍රවෘත්තිය- උපායාසය
සාමිසය යි භයතුපට්ඨානයෙහි ප්‍රඥව ආදීනවයෙහි ඤානය වේ.

(8) අනුත්පාදය නිරාමිසය යි නිර්වාණයෙහි ඤානය යි.
අප්‍රවෘත්තිය- අනුපායාසය නිරාමිසය යි ශාන්තිපදයෙහි ඤාණය
වේ.

(9) උත්පාදය සාමිසය, අනුත්පාදය නිරාමිසයැ යි ශාන්ති-
පදයෙහි ඤානය වේ.

(10) උත්පාදය සංස්කාරයන සි භයතුපඨානයෙහි ප්‍රඥව ආදීනවයෙහි ඥනය වේ. (සංස්කාරයන් ගේ) ප්‍රවෘත්තිය, උපායාසය සංස්කාරයන සි භයතුපඨානයෙහි ප්‍රඥව ආදීනවයෙහි ඥනය වේ.

(11) අනුත්පාදය නිර්‍වාණය සි. ශාන්තිපදයෙහි ඤණය වේ. අප්‍රවෘත්තිය- අනුපායාසය නිර්‍වාණය සි ශාන්තිපදයෙහි ඥානය වේ.

(12) උත්පාදය සංඝාරයන. අනුත්පාදය නිර්‍වාණය සි ශාන්තිපදයෙහි ඥනය වේ. ප්‍රවෘත්තිය -පෙ- උපායාසය සංස්-කාරයන අනුපායාසය නිර්‍වාණය සි ශාන්තිපදයෙහි ඥානය වේ.

සංග්‍රහ ගාථා

"උපපාදඤව පවත්තඤව - නිමිත්තං දුක්ඛතන්ති පසසති
ආයූහනං පටිසන්ධිං - ඤණං ආදීනවෙ ඉදං"

"අනුපපාදං අපපවත්තං - අනිමිත්තං සුඛන්ති ච
අනායූහනාපපටිසන්ධි - ඤණා සන්තිපදෙ ඉදං."

"ඉදං ආදීනවෙ ඤණං - පඤචවඨානෙසු ජායති
පඤචඨානෙ සන්තිපදෙ - දසඤණෙ පජානාති
දිව්‍යානං ඤාණානං කුසලතා - නානාදිසීසු න ගමපති".

ඉපදීමය, පැවැත්මය, නිමිත්තය, ආයූහනය, ප්‍රතිසන්ධිය, දුක්ඛ සි දකී. මේ ආදීනවයෙහි ඤණය සි. අනුත්පාදය, අප්‍ර-වෘත්තිය, අනිමිත්තය, අනායූහනය, අප්‍රතිසන්ධිය සැපය සි දකී. මේ නිර්‍වාණ (ශාන්තිපද) යෙහි ඤණය යැ.

ආදීනවයෙහි ඤණය - උපපාද - පවත්ති- නිමිත්ත - ආයූහන - පටිසන්ධි යන පස් තැනෙක උපදී.

ශාන්ති පදයෙහි ඤණය, අනුපපාද- අපපවත්ති- අනිමිත්ත- අනායූහන - අපපටිසන්ධි යන පස් තැනෙක උපදී. මේ දස ඤණයන් දන්නේ ආදීනව ඤණ, ශාන්තිපද ඤණ දෙකෙහි දක්ෂ භාවයෙන් නොයෙක් මිථ්‍යා දෘෂ්ටින් ගෙන් කම්පිත නොවේ.

ඒ දැනීම දන්නා ලද අර්ථයෙන් ඥත නම්. අනිත්‍යාදී ත්‍රිලක්ෂණ ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥ නමු. එහෙයින් **'භයතුපඨානෙ පඤඤෙ ආදීනවෙ ඤණං'** යි කියනු ලැබේ.

ගාථා විස්තරය:-

ඒ ගාථාහි **උප්පාදෙ** යනු පූර්ව භවයෙහි වූ කර්ම ප්‍රත්‍යයයෙන් මේ භවයෙහි උත්පත්තිය යි.

පවත්තන නම් එසේ උපන්නහු ගේ ප්‍රවෘත්තිය යි.

නිමිත්තන නම් සියලු සංස්කාර නිමිත්තන යි.

ආයූහන නම් මතු භවයෙහි ප්‍රතිසන්ධියට හෙතු වූ කර්ම යි.
පටිසන්ධි නම් මතු භවයෙහි පිළිසිඳීම යි.

ගති නම් යම් ගතියකින් ඒ ප්‍රතිසන්ධි වේ නම් ඒ ගති යි.
නිබ්බත්ති නම් පඤ්චස්කන්ධයන් ගේ පහළ වීම යි.

උපපත්ති නම් සම්පාප්තයා ගේ හෝ ප්‍රතිසන්ධියට ගියහු ගේ හෝ විපාකයන් ගේ පැවැත්ම යි.

ජාති නම් ජරාදියට ප්‍රත්‍යය වූ කර්මභව ප්‍රත්‍යයයෙන් හට ගැනීම යි.

ජරා, ව්‍යාධි, මරණාදිය ප්‍රකට යි.

විශෙෂ:- මේ උත්පාදාදී පස පමණක් ආදීනව ඥානයට වස්තු වශයෙන් කියන ලදී. සෙසු ගති – නිබ්බත්ති ආදිය එහට පරියාය වශයෙනි.

ඒ මෙසේ යි:- **නිබ්බත්ති-ජාති** යන දෙක **උත්පාදයා** ගේ ද, ප්‍රතිසන්ධිය ගේ ද පරියාය වචන යි.

ගති – උපපත්ති යන මේ දෙක **ප්‍රවෘත්තිහු ගේ** පර්‍යාය වචන යි.

ජරාදිය නිමිත්ත ශබ්දයා ගේ පර්‍යාය වචන යි

> උප්පාදඤ්ච පවත්තං ච – නිමිත්තං –පෙ– පස්සති
> ඉදං ආදීනවෙ ඤාණං - පඤ්චඨානානි ගච්ඡති'' යි

එයින් කියන ලදි.

අනුප්පාදෙ බෙමත්ති ඝනති පදෙ ඤාණං – යනාදිය ආදීනව ඤාණයට ප්‍රතිපක්ෂ වූ ඤාණය දැක්වීම සඳහා කියන ලදි.

විස්තර:- යට කී සේ **භයතුපට්ඨානඤාණයෙන්** ආදීනව දැක උද්වෙගයට පත් වූවන්ට අභය ද, නිරාදීනවය ද, ඇතැයි අස්වැසිලි දනවනු පිණිස කියන ලදි.

යම් හෙයකින් වනාහි ඒ යොගී හට උත්පාදාදී ධර්මයෝ භය වශයෙන් මැනැවින් වැටහුණාහු ද? ඒ යොගීහු ගේ සිත ඒ භයාදියට ප්‍රතිපක්ෂ **නිර්වාණයට** නැමේ.

(දුහයෙන් මැඩුණහු සීතලට නැමී ගන්නා සේ මැනැවින් ආදීනව දැක්මෙන් එකාන්තයෙන් මීදෙනු කැමැති වන බැවිනි, යනු ටීකායි.)

එහෙයින් භයතුපඨාන වශයෙන් සිඩ ආදීනව ඤනයා ගේ අනුසස් දැක්වීම සඳහා මේ කියන ලදැ සි දතයුතු.

මෙහි උත්පාදදී යම් භවයෙක් වේ නම් එය නියමයෙන් ම දුක් වේ. උත්පාදදිය වට්ටාමිස – ලොකාමිස – කිලෙසාමිසයෙන් තොර මිදුණු හෙයින් සාමිස මැ යි. යමක් ආමිස සහිත නම් එය සංස්කාර මාත්‍ර මැ යි. **එහෙයින් උපපාදෙ දුකඛනති භයතුපට්ඨානෙ පඤඤා ආදීනවේ ඤාණං** යනාදිය කියන ලදී. මෙසේ දුක් සැඟැවී ඇති කල්හිදු භයාකාරයෙන් ද, දුඃඛාකාරයෙන් ද, සාමිසාකාරයෙන් දැ යි ආකාර නානාත්වයෙන් පැවැතීම් වශයෙන් මෙහි නානාත්වය දත යුතු. **දසඤඤණ පජානාති** යනු ආදීනව ඤනය දන්නේ උත්පාදදී වසතුක පසක්ද, අනුත්පාදදී වසතුක පසක් දැ යි දස ඤාණයක් ප්‍රකාරයෙන් දනී. ප්‍රතිවෙධ කෙරේ, සාක්ෂාත් කෙරේ.

දවිනනං ඤාණානං කුසලතා = (ආදීනව ඤාණයා ගේ ද; සන්තිපද ඤාණයා ගේ ද යන මේ) දව්ඤනයා ගේ දක්ෂ බැවින්;

නානාදිසිසු න කමපති = පරම දෘෂ්ට ධර්ම නිර්වාණාදි වශයෙන් පැවැති දෘෂ්ටීන්හි නො සැලේ;

(සෙසු තය නොගැබුරු අර්ථ ඇත්තේ සි.

ආදීනවානුපසසනාඤාණය නිමි.

---

(5) ඒ යෝගී තෙමේ මෙසේ ත්‍රෛභූමක සියලු සංස්කාරයන් ආදීනව වශයෙන් දක්නේ සියලු භව- යොනි- ගති- විඤඤාණඨිති- සත්ත්වාවාසගත වූ බිඳෙන සුලු සියලු සංස්කාර ජාතයෙහි කළකිරෙයි. උකටලී වෙයි. නො ඇලේ. චිත්‍රකූට පර්වත පාදයෙහි ඇලුණු සුවර්ණ රාජහංසයා අපවිත්‍ර වූ සැඩොල් ගම්දෙර ගවර වලෙහි නො ඇලෙන්නාක් මෙනි. සිංහ ප්‍රපාතාදී සපත භිහා වීල්හි ම ඇලේ. එපරිද්දෙන් ම මේ යෝගී රාජහංස තෙමේ මහාකොට දක්නා ලද ආදීනව ඇති සහඛුර ත්‍රෛභූමක සංස්කාරගතයෙහි නො ඇලේ. භාවනාවෙහි ඇලුණු හෙයින් භාවනාභිරතියෙන් යුක්ත වූ යේ **සප්තානුදර්ශීනයෙහි** ඇලේ.

රන් මැදිරියෙහි බහා ලූ මෘගරාජ සිංහයා එහි නො ඇලී තුන් දනසක් යොදුන් විශාල වූ හිමවත ම ඇලෙන්නාක් මෙනි. මේ යොගී සිංහ තෙමේ ද කාමසුගති ආදී ත්‍රිවිධ සම්පත්ති භවයෙහි නො ඇලී ත්‍රිවිධ අනුපස්සනාභිමුඛ ඇලේ. සර්‍වඥ බවල සම්පාසථානයක් භූමියෙහි සිටගී වන්නා වූ ඍද්ධිමත් ආකාශචාරී ෂඩ්දන්ත හස්තිරාජයා නුවර මැද නො ඇලී හිමාලයෙහි සඳත් විල්හි ම ඇලෙන්නා සේ මේ යොගීවරවාරණයා ද සියලු ත්‍රෛධාතුක සංස්කාරයෙහි නො ඇලී ගව "අනුප්පාදෙ බ්‍රහ්මං" යනාදී කයින් අධිමුක්ති පූර්‍වක අර්‍පණ* දර්ශනයෙන් දක්නා ලද ඥාන්ති පදයෙහි ම ඇලෙයි. ඒ ඥාන්ති පදයෙහි නිම්න ප්‍රවණ ප්‍රාග්භාර සිත් ඇති වේ.

නිබ්බිදානුපස්සනාඤාණය නිමි.

---

(6) මේ **නිබ්බිදාඤාණය** පෙර කී **භයතුපට්ඨාන- ආදීනව ඤාණ දෙක** හා අර්‍ථ වශයෙන් එකෙකි. එහෙයින් කීහ පැරැණියෝ:-

"එකම **භයතුපට්ඨාන ඤාණය** නාම තුන ම ලබ සි. සියලු සංස්කාරයන් භය වශයෙන් දිටිනු සි. **භයතුපට්ඨාන** නම් වී. එම සංස්කාරයන්හි ම ආදීනව උපදවනු සි **ආදීනවානුපස්සනා** නම් වී. එම සංස්කාරයන්හි ම නිර්‍වේද කරමින් උපතැසි **නිබ්බිදානුපස්සනා** නම් වී යැ සි."

පෙළෙහි ද වදළහ.

"යා ච භයතුපට්ඨානෙ පඤ්ඤා, යා ච ආදීනවෙ ඤාණං, යාව නිබ්බිදා, ඉමෙ ධම්මා එකට්ඨා ව්‍යඤ්ජනමෙවනානා"† 'භයතුපට්ඨානයෙහි යම් ප්‍රඥාවෙක් වේද, ආදීනවයෙහි යම් නුවණෙක් වේද, යම් නිර්‍වේදයෙක් වේද, මේ ධර්‍මයෝ එකාර්‍ථයහ. ව්‍යඤ්ජනම වෙනසි' සි.

මේ නිර්‍වේද ඥානයෙන් කළකිරුණු, උකටලී වූ නො ඇලුණු, මේ කුලපුත්‍රයා ගේ සිත සියලු භව- යොනි- ගති- විඥානස්ථිති - සත්ත්වාවාස ගතවූ සහෙද සංස්කාරයන් අතුරින් එකද සංස්කාරයෙකැ නො ඇලේ, නො ලැගේ, නො බැඳේ, සියලු සංස්කාර ජාතයෙන් මිදෙනු කැමැත්තේ, නික්මෙනු කැමැත්තේ වේ.

---

*ටීකාහි ඛයදර්‍ශනයැයි කී ව්‍යතිරෙක දර්‍ශන යනු මැනවි.

† ප: ම: ඤාණකථා

ඒ මෙසේ යි:- දැල ඇතුළත වන් මසකු සේ ද, සපිම්බගත මැහියකු සේ ද, මැදිරියක ලූ වලිකුකුළකු සේ ද, දැඩි මළපුඩුවකට අසුවූ මුවකු සේ ද, අහිකුණ්ඨිකයකු ගේ අතට පත් නයකු සේ ද, මහමඩෙහි ගැලුණු ඇතකු සේ ද, ගරුඩ මුවගත කාගයකු සේ ද, රාහුමුඛගත චන්ද්‍රයා සේ ද, සතුරන් පිරිවරන ලද පුරුෂයකු සේ ද යි (මේ ආදීන් ඒ ඒ තැනින් මිදෙනු කැමැත්තන් නික්මෙනු කැමැත්තන් වන්නා සේ) ඒ යෝගිහු ගේ සිත ද සියලු සංඝකාර ජාතයෙන් මිදෙනු කැමැත්තේ, නික්මෙනු කැමැත්තේ වේ. මෙසේ සියලු සංස්කාරයෙහි ආලය පහවූ, සියලු සංඝකාර ජාතයෙන් මිදෙනු කැමැති ඒ යෝගීනට **මුඤ්චිතුකම්‍යතා ඤාණය** උපදී.

මුඤ්චිතුකම්‍යතා ඤාණය නිමි.

---

(7) මෙසේ ඒ යෝගී සියලු භව- යෝනි- ගති සත්ති- නිවාස- ගත සහෙදක සංස්කාරයන් කෙරෙන් මිදෙනු කැමැත්තේ සියලු සංස්කාර ජාතයෙන් මිදෙනු පිණිස නැවැත ඒ සංස්කාරයන් ම **පටිසඞ්ඛානුපස්සනා ඤාණයෙන්** තිලකුණට නගා පරිග්‍රහ කෙරේ.

ඒ මෙසේ යි:- ඒ යෝගී සියලු සංස්කාරයන් අනිත්‍ය ත්‍රික හෙයින් ද, තාවකාලික හෙයින් ද, උදය-ව්‍යය දෙකින් පරිච්ඡින්න හෙයින් ද, විනාශ වන හෙයින් ද, බිඳෙන හෙයින් ද, අස්ථිර හෙයින් ද, විපරිණාම ධර්ම හෙයින් ද, අසාරක හෙයින් ද, විභව හෙයින් ද, සංඛත හෙයින් ද, මරණ ධර්ම හෙයින්ද යි මේ ආදී කාරණයෙන් **අනිත්‍යයහයි** දකී.

නිතර පෙළෙන හෙයින් ද, දුකින් ඉවසන හෙයින් ද දුඃඛ වස්තු හෙයින් ද, රෝග හෙයින් ද, ගණ්ඩ හෙයින් ද, දුක් හෙයින් ද, ආබාධ හෙයින් ද, (ඊති) හිරිහැර හෙයින් ද, උපද්‍රව හෙයින් ද, භය හෙයින් ද, උපසර්ග හෙයින් ද, රක්ෂාස්ථාන නැති හෙයින් ද, නිලීනස්ථාන නැති හෙයින් ද, අසරණ හෙයින් ද, ආදීනව හෙයින් ද, දුකට මුල් හෙයින් ද, වධක හෙයින් ද, ආශ්‍රව සහිත හෙයින් ද, මාරාමිෂ හෙයින් ද, ජාතිස්වභාව ඇති හෙයින් ද, ජරාස්වභාව ඇති හෙයින් ද, ව්‍යාධි ස්වභාව ඇති හෙයින් ද, ශෝක ස්වභාව ඇති හෙයින් ද, පරිදේව ස්වභාව ඇති හෙයින් ද, උපායාස ස්වභාව ඇති හෙයින් ද, සංක්ලේශ ස්වභාව හෙයින්ද යි මේ ආදී කාරණයෙන් **දුඃඛයහයි** දකී.

අමනෝඥ හෙයින් ද, දුර්ගන්ධ හෙයින් ද, පිළිකුල් කටයුතු හෙයින් ද, **අමණ්ඩනාර්හ** හෙයින් ද, (අමණ්ඩනයෙන් අශුභ භාවය ප්‍රකට වන හෙයිනි.) විරූප හෙයින් ද, බිහත්ස හෙයින්ද යි මේ ආදී **කාරණයෙන්** දුඃඛ ලක්ෂණයට පරිවාර වූ **අශුභ හෙයින් දකී.**

පර වශයෙන් ද, පරිත්ත හෙයින් ද, තුච්ඡ හෙයින් ද ශූන්‍ය හෙයින් ද, අස්වාමික හෙයින් ද, අනීශ්වර හෙයින් ද, තමා වශයෙහි නො පවත්නා හෙයින්ද යි මේ ආදී කාරණයෙන් **අනාත්ම හෙයින් දකී.** මෙසේ දක්නා වූ ඒ යොගියා විසින් තිලකුණට නගා සංස්කාරයෝ පරිග්‍රහ කරන ලද්දාහු නම් වෙති.

විශේෂ:- මේ සංස්කාරයන් මෙසේ පරිග්‍රහ කරනුයේ ඒ සංස්කාරයන් ගෙන් මිදීම සඳහා උපාය සම්පාදනය කරනු පිණිස යැ.

මේ අර්ථට උපමාවෙකි:- එක් පුරුෂයෙක් මසුන් ඇල්ලීමට මස් කරප්පයක් ගෙන ජලයෙහි ඇවිදී. හේ කරත් මුවින් අත බහා දිය තුළ වූ සජීයකු ගෙළ ගෙන මසෙක් ගත්තා ලදැ යි' සතුටු වී මා විසින් මහා මසෙක් ලදැ යි, ඔසවා බලනුයේ සෝ-වැනි තුන දුක සජීයා හැඳින බිය පත්වැ ආදීනව දැක ගැනී-මෙන් කළකිරී ඉන් මිදෙනු කැමැතිවැ එයට උපාය යොදනුයේ නගුට අග සිට අත වෙළුම් හැර බාහුව ඔසවා භිස වටා දෙ-තුන් වරක් කරකවා ඌ දුබල කොට 'යා දුෂ්ට සජීයැ යි' දුරට දමා ගසා වහා වැ මියරට නැගී පින්වත! 'මහා සජී මුඛයෙන් මිදුනෙමි යි' ආ මඟ බලමින් සිටියේ යි.

(උපමාන උපමෙය සංසන්දනය) එහි ඒ පුරුෂයා මසෙකැ යි සජීයා ගෙන සතුටු වූ කාලය මෙන් මේ යොගියාගේ ද **ආදියෙහි ම** ආත්මය ලැබ සතුටු වූ කාලය ද, ඔහු කරත් මුවින් සජී භිස පිටතව ගෙන සෝවැනි තුන දැකීම මෙන් මොහු ඝන විනිභෝග කොට සංස්කාරයන් ගේ තිලකුණු දැකීම ද, ඔහු බිය වූ කාලය මෙන් මොහු ගේ **භයතුපට්ඨාන ඤාණය ද, අනතුරුවැ** ආදීනව දැකීම මෙන් **ආදීනවානුපස්සනා ඤාණය ද,** සජීයා ගෙන් මිදෙනු කැමැත්ත මෙන් **මුඤ්චිතුකම්‍යතා ඤාණය ද,** මිදීමට උපාය සෙවීම මෙන් **පටිසංඛානුපස්සනා ඤාණයෙන්** සංස්කාරයන් තිලකුණට නැගීම ද, දතයුතු. ඒ පුරුෂයා සජීයා භිස වටා සිසාරා දුබල කොට පෙරළා දෂ්ට කිරීමට අසමර්ථ කොට මොනවට මිදුණා සේ මේ යොගීතෙමේ තිලකුණට නගා සංස්කාරයන් බහවා දුබල කොට නැවැතැ **නිත්‍ය- සුඛ-**

ශූන- **අනත්ත** ආකාරයෙන් එළඹ සිටීමට අසමර්ථ බවට පමුණුවා මනා මිදුමෙන් මිදේ. එයින් මිදීමට උපාය සෙවීම සඳහා මෙසේ පරිග්‍රහ කෙරේය යි කියන ලදී.

මෙතෙකින් ඒ යෝගීහට **පටිසඞ්ඛා ඤාණය** උපන්නේ වේ.

එයින් වදාළහ. **"අනිච්චතෝ මනසිකරොතෝ කිං පටිසඞ්ඛාඤාණං උප්පජ්ජති. දුක්ඛතෝ -පෙ- අනත්තතෝ මනසිකරොතෝ කිං පටිසඞ්ඛාඤාණං උප්පජ්ජති? අනිච්චතෝ මනසිකරොතෝ නිමිත්තං පටිසඞ්ඛාඤාණං උප්පජ්ජති. දුක්ඛතෝ මනසිකරොතෝ පවත්තං පටිසඞ්ඛාඤාණං උප්පජ්ජති. අනත්තතෝ මනසිකරොතෝ නිමිත්තඤ්ච පවත්තඤ්ච පටිසඞ්ඛාඤාණං උප්පජ්ජති"*** යි.

"අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නාහට කිනම් පටිසඞ්ඛා ඤාණයෙක් (කුමක් දැන නුවණ) උපදීද? දුඃඛ හෙයින් -පෙ- අනාත්ම හෙයින් මෙනෙහි කරන්නාහට කිනම් පටිසඞ්ඛා ඤාණයෙක් (කුමක් දැන නුවණ) උපදී ද? අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නාහට සංඝාර නිමිත්ත ඇති පටිසඞ්ඛා ඤාණය උපදී. දුක් හෙයින් මෙනෙහි කරන්නාහට සංඝාර ප්‍රවෘත්ති ඇති පටිසඞ්ඛා ඤාණය උපදී. අනාත්ම හෙයින් මෙනෙහි කරන්නාහට නිමිත්ත ද, ප්‍රවෘත්තිය ද ඇති පටිසඞ්ඛා ඤාණය උපදී, යැ කියා යි.

විභාවර:- මෙහි **නිමිත්තං පටිසඞ්ඛා** - යනු සංස්කාර නිමිත්ත අඛ්‍රුව ය, තාවකාලික ය යි අනිත්‍ය ලක්ෂණ වශයෙන් දැන (පළමු කොට ඒකාන්තයෙන් දැන) පසුව ඤාණය උපදී ද? එක ක්ෂණිකව මුත් පෙර පසු වැ නූපදී. (එහෙත් ව්‍යවහාර හෙයින් **මනසැට පවිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං"**‡ සිත නිසා ද, ධර්මාලම්බනය නිසා ද මනොවිඤ්ඤාණය උපදී ය යි කීවා සේ මේ කියනු ලැබේ. නොහොත් පළමු උපන් ඤාණයන් අතුරෙහි පූර්ව ඥාන වශයෙන් ප්‍රතිසංඛ්‍යාන ක්‍රියාව ද තදනන්තර ඥාන වශයෙන් උත්පාද ක්‍රියාව ද යෙදිය යුතු යි. ඒ ඥානයෝ ද එකසන්තාන පතිත බැවින් එකත්ව නය වශයෙන් ගෘහීතයෝ යි. භෙද වශයෙන් ද අපෙක්ෂණය නො වෙත් යනු ඨීකා යි.)

මේ නයින් ම **පවත්ත - පටිසඞ්ඛා** යන පද දෙකෙහි අර්ථ ද දත යුතු යි.

පටිසඞ්ඛානුපස්සනා ඤාණය නිමි.

---

* ප: ම: විමොක්ඛකථා ‡ සං: නි: නිදානවග්ග

(8) ඒ යොගී තෙමේ මෙසේ **පවිසඛ්ඛානුපස්සනා ඤාණ-යෙන්** 'සියලු සංස්කාරයෝ ශූන්‍යයහ යි' පිරිගා කොට (පිළිගෙන) නැවතැ මේ-මේ සංස්කාර ධර්ම සමූහය ආත්මයෙන් හා ආත්මය පිළිබඳ ධර්මයකින් ද ශූන්‍යය යි මෙසේ දෙකොළවරක් ඇති ශූන්‍යතාව පිරිගනී.

ඒ යොගී තෙමේ මෙසේ ආත්මයක් නො ලැබෙන හෙයින් ම ප්‍රත්‍යක්ෂ හෙයින් ද, අනුමාන වශයෙන් ද, ආත්මයක් නො දැක තම තමා ගේ උපකරණ වශයෙන් සුව-දුක් සාධන භාව-යෙන් සිටි අන් කිසි සතකු හෝ නො දැක නැවතැ **"නාහං කුවචනි කස්සචි කිඤ්චනත්ථස්මිං, නව මම කුවචනි කිස්මිඤ්චි කිඤ්චනත්ථේ"*** 'මම කිසි තැනෙක්හි කිසිවකු ගේ කිඤ්චන භාවයෙකිම් නො වෙමි. මාගේ කිසි තැනෙකැ කිසිවකුට කිඤ්චන බවෙක් නැත්තේය යි' මෙසේ මේ ශූන්‍යතානුදර්ශන-යෙහි යම් **චතුක්කොටික** ශූන්‍යතාවක් කියන ලද නම් එය පරිග්‍රහ කෙරේ.

ඒ මෙසේ යි. (1) මේ **'නාහං කුවචනි'** යන්නෙන් කිසි තැනෙක්හි ආත්මය නො දකී.

(2) **'න කස්සචි කිඤ්චනත්ථස්මිං'** යන්නෙන් තමා ගේ ආත්මය අන් කිසිවකුට කිඤ්චන (පළිබෝධ) භාවයෙහි එළවිය යුත්තක් නො දකී.

විභාවර:- භ්‍රාතෘ ස්ථානයෙහි භ්‍රාතෘහු හෝ සහාය ස්ථානයෙහි සහායයා හෝ පරිෂ්කාර ස්ථානයෙහි පරිෂ්කාරය හෝ සලකා එළවිය යුත්තක්හු නො දකී යන අර්ථ යි.

(3) **"න ච මම කුවචනි"** යන්නෙහි **'මම'** ශබ්දය හැර පරයා ගේ ආත්මය ද කිසි තැනෙක නො දක්නේ ය. දැන් 'මම' ශබ්දය ගෙන

(4) **'න ච මම කිස්මිඤ්චි කිඤ්චනත්ථේ'** යන්නෙහි ඒ යොගී තෙමේ අන්‍යයා ගේ ආත්මය 'මා ගේ කිසි තැනෙක කිඤ්චන භාවයෙහි ඇතැයි, නො දකීය යි තමා ගේ භ්‍රාතෘ ස්ථාන යෙහි භ්‍රාතෘහු හෝ සහාය ස්ථානයෙහි සහායයා හෝ පරිෂ්කාර ස්ථානයෙහි පරිෂ්කාරය හෝ සලකා කිසි තැනෙක්හි පරයා ගේ ආත්මය මේ පරිෂ්කාරාදි කිඤ්චන භාවයෙන් එළවිය යුත්තක් කොට නො දකී යන අර්ථ යි. මෙසේ මේ යොගී

* අ: නි: තිකනිපාත

තෙමේ කිසි තැනෙක ආත්මය නො දකින හෙයින් ඒ ආත්මය පරහට කියඳුවන භාවයෙහි එළවිය යුත්තකු නොට නො දකී. (ආත්මය) තමා ගේ කියඳුවන භාවයෙහි එළවිය යුත්තකු කොට නො දකී. පරයා ගේ ආත්මය තමහට කියඳුවන භාවයෙහි එළවිය යුත්තකු කොට නො දකී.

මෙසේ මොහු විසින් **චතුකොටික සුඤ්ඤතාව** පරිග්‍රහ කොට තැවැතැ **සයාකාරයෙකින්** ශූන්‍යතාව පරිග්‍රහ කෙරේ.

ඒ මෙසේ ය:- චක්ඛුඤ (1) ආත්මයෙන් හෝ 2) ආත්මය පිළිබැඳි දැයින් හෝ (3) නිත්‍යයෙන් හෝ (4) සථිරත්වයෙන් හෝ (5) ශාසවතයෙන් හෝ (6) අවිපරිණාම ධර්මයෙන් හෝ ශූන්‍ය වේ -පෙ- මනස ශූන්‍ය යැ. රූපයෝ ශූන්‍යයහ. -පෙ- ධර්මයෝ ශූන්‍යයහ. චක්ඛු විඤ්ඤාණය ශූන්‍ය යැ. -පෙ- මනොවිඤ්ඤාණය, චක්ඛුසම්ඵස්සයැ සි මෙසේ ජරා-මරණය තෙක් ක්‍රමය පැමිණ්විය යුතු ය.

මෙසේ සය ආකාරයකින් ශූන්‍යත්වය පරිග්‍රහ කොට තැවැතැ **අට ආකාරයකින්** පරිග්‍රහ කළයුතු සි.

ඒ මෙසේ සි:- රූපය (1) නිත්‍යසාර-සාරයෙන් හෝ (2) ධ්‍රුව සාර- සාරයෙන් හෝ (3) සුඛසාර- සාරයෙන් හෝ (4) ආත්ම සාර-සාරයෙන් හෝ (5) නිත්‍යයෙන් හෝ (6) ධ්‍රුවයෙන් හෝ (7) ශාසවතයෙන් හෝ (8) අවිපරිණාම ධර්මයෙන් හෝ අසාර යැ. නිස්සාර යැ. සාරාපගත සි.

වෙදනාදිය ද මෙසේමැ සි. බව යැ, එරඹු යැ, දිඹුල් යැ, හෙළවරා යැ, එරබදු යැ, පෙණපිඬ යැ, දිය බුබුළ යැ, මිරිගු දිය යැ, කෙසෙල් කඳ යැ, මායා යැ යන මේවා යම්සේ අසාර වෙද්ද, නිස්සාර වෙද්ද, සාරාපගත වෙද්ද, එසේ රූපය -පෙ- ජරා-මරණය, නිත්‍ය සාරයෙන් හෝ -පෙ- අවිපරිණාම ධර්මයෙන් හෝ අසාර ද, නිස්සාර ද, සාරාපගත ද, වේය සි මෙසේ පරිග්‍රහණය කෙරේ.

ඒ යොගී මෙසේ අට ආකාරයකින් ශූන්‍යතාව පරිග්‍රහ කොට තැවැතැ **දස ආකාරයෙකින්** පරිග්‍රහ කෙරේ.

ඒ මෙසේ සි:- (1) ඒ රූපය රික්ත වශයෙන් (2) තුච්ඡ වශයෙන් (3) ශූන්‍ය වශයෙන් (4) අනාත්ම වශයෙන් (5) අනීශ්වර වශයෙන් (6) අකාමකාරී හෙයින් (7) අලබ්භනීය

හෙයින් (8) අවශවර්තනක හෙයින් (9) පර හෙයින් (10) විවිකත හෙයින් බලන්නේ යි. වෙදනා -පෙ- විඤ්ඤාණය රිකත හෙයින් -පෙ- විවිකත හෙයින් බලන්නේ යි. මෙසේ **දශ ආකාර-යෙන්** ශූන්‍යතාව පරිග්‍රහ කොට නැවැතැ **දෙලොස් ආකාරයකින්** පරිග්‍රහ කෙරේ.

ඒ මෙසේ යි:- (1) රූපය සත්ත්වයෙක් (2) ජීවයෙක් (3) නරයෙක් (4) මානවකයෙක් (5) සත්‍රියක් (6) පුරුෂයෙක් (7) ආත්මයක් (8) ආත්මය අයත් වසතුවෙක් නො වේ. (9) මම නො වෙමි (10) මාගේ නො වේ (11) අනෙකකු ගේ නො වේ (12) කිසිවකු ගේ නො වේ. වෙදනා **-පෙ-** විඤ්ඤාණය සත්ත්ව-යෙක් නො වේ -පෙ- කිසිවකු ගේ නො වේය යි, මේසේ දෙලොස් ආකාරයකින් ශූන්‍යතාය පරිග්‍රහ කොට නැවැතැ **තීරණ පරිඤ්ඤා** වශයෙන් **දෙසාළිස් ආකාරයකින්** ශූන්‍යතාය පරිග්‍රහණය කෙරේ රූපය අනිත්‍ය හෙයින්- දුක් හෙයින්- රොග හෙයින් ද- ගණ්ඩ- සල්ල- අඝ- ආබාධ- පර- පලොක- ඊති- උපද්‍රව- භය- උපසඟ- චල- පභඞ්ගු- අද්‍රුව- අතාණ අලෙන- අසරණ අසරණීභූත- රිත්ත- සුඤ්ඤ- තුච්ඡ අනිච්ච- අතස්සාද- ආදීනව- විපරිණාමධම්ම- අසාරක- අඝමූල- වධක- විභව- සාසව- සංඛත- මාරාමිස- ජාතිධම්ම ජරාධම්ම- ව්‍යාධිධම්ම- මරණ- ධම්ම- සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාස ධම්ම විසින් ද සමුදය- අත්‍ථඞ්ගම- නිස්සරණ හෙයින් ද දකී. වෙදනා -පෙ- විඤ්ඤාණය අනිත්‍ය හෙයින් -පෙ- නිස්සරණ හෙයින් දකී.

එයින් කිම:- රූපය අනිත්‍ය හෙයින් පෙ- නිස්සරණ හෙයින් බලන්නේ ශූන්‍ය හෙයින් ලොකය බලයි. වෙදනා -පෙ- විඤ්ඤාණය අනිත්‍ය හෙයින් -පෙ- නිස්සරණ හෙයින් බලන්නේ ශූන්‍ය හෙයින් ලොකය බල යි.

"සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු - මොඝරාජ සදා සතො
අත්තානුදිට්ඨිං ඌහච්ච - එවං මච්චුතරෝ සියා
එවං ලොකං අවෙක්ඛන්තං - මච්චුරාජා න පස්සති"*

මොඝරාජය! හැම කල්හි සිහි ඇති ව, සංස්කාර ලොකය ශූන්‍ය වශයෙන් බලව, ආත්මානු (සත්කාය) දෘෂ්ටිය සමුච්ඡේද වශ යෙන් නසා මේසේ මරුන් එතර කරන්නේ වෙයි, මේ හී සේ ලොකය බලන්නහු මාරයා නො දකී.

* සු: නි: පාරායනවග්ග

මෙසේ **ශූන්‍යතා** වශයෙන් දැක තිලකුණට නගා සංස්කාර-යන් පරිග්‍රහ වශයෙන් **සනමර්ශනය** කරනුයේ සංස්කාරයන් පිළිබැඳි විතාශය නිසා භය ද, සංස්කාරයන් ගේ සමපත්තිය නිසා ඇති වන ප්‍රීතිය ද, හැර සංස්කාරයන් කෙරෙහි උදාසීන වෙයි. මැදහත් වෙයි. 'මම වෙමි' යි කියා හෝ මාගේ ය යි කියා හෝ, **අත්ථාල** භාර්‍යාවක ඇති පුරුෂයකු මෙන් **මිථ්‍යාදෘෂ්ටි** වශයෙන් නො ගනී.

ඒ මෙසේ යි:- පුරුෂයක් හට ප්‍රිය මනාප භාර්‍යාවක් වූ. හෙතෙම ඇයගෙන් වෙන් වැ මොහොතකුදු නොම වසයි. ඇයට අතිශයින් මමාත්ත කෙරෙයි. හෙතෙම අන්‍ය පුරුෂයකු හා සිටින්නා වූ ද, හොත්තා වූ ද, කථා කරන්නාවූ ද, සිතාසෙන්නා වූ ද, ඇය දැක නො සතුටු සිත් ඇත්තේ කිපියේ ඉතා දෙම්නසක් විඳී. හෙතෙම පසු වැ ඇයගේ දෙස් දැක ඇය ගෙන් මිදෙනු කැමැත්තේ ඇය දුරු කරන්නේ ය. ඇය 'මගේ' ය යි නො ගනී. එතැන් පටන් ඇය යම් කිසිවකු හා යම් කිසිවක් කරනු දැක ද නො කිපෙන්නේ ය. දෙම්නසට නො පැමිණෙන්නේ ය. හුදෙක් එකාන්තයෙන් උදාසීන මැ වන්නේ යි මැදහත් මැ වන්නේ යි. එසේ ම මේ යොගී තෙමේ සවී සංස්කාරයන් කෙරෙන් මිදෙනු කැමති වැ **පටිසංඛානුපස්සනා ඤාණයෙන්** සංස්කාරයන් සම්මර්ශනය කරනුයේ මම යැ මාගේ යැ යි ගත යුත්තක් නො දැක භය ද, ප්‍රේමය ද හැර සියලු සංස්කාරයන්හි උදාසීන වැ මැදහත් වෙයි. මෙසේ දන්නා මෙසේ දක්නා ඒ යොගීහු ගේ සිත **තුන් භවයෙහි** ද, **සිව් යොනියෙහි** ද, **පස් ගතියෙහි** ද, **සපත විඤ්ඤාණස්ථිතියෙහි** ද, **නවසත්ත්වාවාසයෙහි** ද, හැකිලෙ යි, පැකිලෙ යි, වැතිරෙයි, නො පැතිරෙ යි. මැදහත් බව හෝ පිළිකුල් බව හෝ පිහිට යි.

යම් සේ මදක් තැම්මූණු පියුම් පතෙක දිය බිඳුහු හැකිලෙද් ද, පැකිලෙද්ද, වැතිරෙද්ද, නො පැතිරෙද්ද, ගින්නෙහි බහා ලූ කුකුළු පතක් හෝ **තඹර** වැලක් හෝ හැකිලේ ද, පැකිලේ ද, වැතිරේ ද, නො පැතිරේ ද, එසේ ඔහු ගේ සිත ද, තුන් භවයෙහි -පෙ- උපෙක්ෂාව හෝ පිළිකුල් බව හෝ පිහිට යි. මෙසේ ඒ යොගී හට **සංඛාරුපෙක්ඛාඤාණය** උපන්නේ වෙයි.

මේ **සංඛාරුපෙක්ඛාඤාණය** ශාන්තිපදය වූ **නිබ්බාණය** ශාන්ත වශයෙන් දකී. සියලු සංස්කාර ප්‍රවෘත්තිය භැරපියා **නිබ්බාණයට** වදී. **නිබ්බාණය** ශාන්ත සේ නො දකී නම් නැවැතැ නැවැතැ

සංස්කාරයන් ම අරමුණු කොට පවතී. සාමුද්‍රිකයාගේ දික් කවුඩා මෙනි.

ඒ මෙසේ යි:- සමුද්‍රතරණය කරන වෙලෙන්දෝ නැව් නහින්නෝ දිශා කාකයකු ගනිති. ඔවුහු වාත වේගයෙන් පහරන ලද නැව විදෙශයකට පැමිණ තෙරක් නො පැනේ නම් එකල දිශා කාකයා අත් හරින්. ඌ කුඹහසින් අහසට නැගී සියලු සතර දිග ද, සතර අනුදිග ද, අනු වැ ගොස් තෙරක් පැනේ නම් එයට අභිමුඛවැ ම යෙයි. එසේ නො දකී නම් නැවැතැ නැවැතැ අවුත් කුඹ ගසෙහි ම ලැගෙයි. එසේ ම **සංඝාරෝපෙක්ඛාඤාණය** ශාන්ති පදය වූ **නිබ්බාණය** ශාන්ත හෙයින් දකී නම් සියලු සංස්කාර ප්‍රවෘත්තිය හැර **නිබ්බාණයට** ම පනී. එසේ නො දකී නම් නැවැතැ නැවැතැ සංස්කාරයන් අරමුණු කොට පවතී. ඒ **විදර්ශනා ඥානය** කුලු අග පොළනු ලබන පිටි මෙන් ද, (කපු පොළන දුන්නෙන් පොළා) ඇට හරන ලද කපු පුළුනක් මෙන් ද, නානාප්‍රකාරයෙන් සංඝාරයන් පරිග්‍රහ කොට භය ද, නන්දිය ද, හැරපියා සංස්කාර පරිග්‍රහයෙහි මැදහත් වැ ත්‍රිවිධානුදර්ශනා වශයෙන් සිටී. මෙසේ සිටි **ඒ සංඝාරෝපෙක්ඛාඤාණය ත්‍රිවිධ විමොක්ෂ මුඛභාවයට** පැමිණ **සද්ධානුසාරී** ආදි **සප්තආර්‍යපුද්ගලභාවය** පිණිස ප්‍රත්‍යය වේ. ත්‍රිවිධ අනුපස්සනා වශයෙන් පවත්නා හෙයින් ශ්‍රද්ධා-සමාධි-ප්‍රඥා යන ත්‍රිවිධ ඉන්ද්‍රියයන් ගේ අධිපති වශයෙන් **ත්‍රිවිධ විමොක්ෂ මුඛභාවයට** පැමිණේ නම් වේ.

විභංග:- **අනිච්චානුපස්සනාව** බහුලවූවහුට **ශ්‍රද්ධෙන්ද්‍රියය** බලවත් වේ. **අනිමිත්තවිමොක්ෂ මුඛය** වේ. **දුක්ඛානුපස්සනාව** බහුලවූවහුට **සමාධින්ද්‍රියය** බලවත් වේ. **අප්‍රණිහිත විමොක්ෂ මුඛය** වේ. **අනත්තානුපස්සනාව** බහුලවූවහුට **ප්‍රඥෙන්ද්‍රියය** බලවත් වේ. **ශූන්‍යතා විමොක්ෂ මුඛය** වේ. මෙසේ **ත්‍රිවිධ ඉන්ද්‍රියයන්ගේ අධිපති** භාවයෙන් **ත්‍රිවිධ විමොක්ෂමුඛ** භාවයට යේ.

එහෙයින් වදාළහ:- **"තීණි ඛෝ පනිමානි විමොක්ඛමුඛානි ලෝකනියානාය සංවත්තන්ති. සබ්බසඞ්ඛාරෙ පරිඤ්ඤ වට්ටමතෝ සමනුපස්සනාය අනිමිත්තාය ච ධාතුයා චිත්ත සම්පක්ඛන්දනතාය සබ්බසංඛාරෙසු මනෝ සමුත්තාජනතාය අප්පණිහිතාය ච ධාතුයා චිත්ත සම්පක්ඛන්දනතාය සබ්බ ධම්ම පරතෝ සමනුපස්සනතාය සුඤ්ඤතාය ච ධාතුයා චිත්ත සම්පක්ඛන්දනතාය, ඉමානි තීණි විමොක්ඛමුඛානි ලෝකනියානාය සංවත්තන්ති"***

---

* ප: ප: විමොක්ඛ කථා

'ලොවින් (වට දුකින්) නික්ම යාම පිණිස මේ **විමොක්ෂ-මුඛයෝ** හිදෙනෙක් පවතිත්. සියලු සංඝකාරයන් උදය-ව්‍යය වශයෙන් පරිවෙජ්ද හෙයින් ද, **මතාව** බලන හෙයින් ද සමී-සංඝකාර නිමිති නැති හෙයින් අනිමිත්ත වූ **අසංඛත** ධාතුවෙහි අධිචිත්තයා ගේ අනුප්‍රවෙශය පිණිස ද, සියලු **සංඝකාරයන්** කෙරෙහි චිත්ත සමුත්තෙජනය පිණිස ද, රාග ප්‍රණිධින් ගේ අභාවයෙන් අප්‍රණිහිත ධාතුවෙහි චිත්තයා ගේ **අනුප්‍රවෙශය** පිණිස ද, සියලු සංඝකාර ධර්ම අනාත්ම හෙයින් බලනුවහට ආත්ම ශූන්‍ය හෙයින් ශූන්‍යතා ධාතුවෙහි චිත්තයා ගේ අනුප්‍රවෙශය පිණිස ද පවතිත්. මෙසේ මේ **ත්‍රිවිධ විමොක්ෂ මුඛයෝ** සසර දුකින් එතර වනු පිණිස පවතිත්.

විභාග:- **පරිවෙජ්ද වටුමතෝ** යනු උදය-ව්‍යය වශයෙන් පරිවෙජ්ද බැවින් ද, අවටින් මං සෙවීම් වශයෙන් පරිවටුම බැවින් ද යන අර්ථ යි.

ඒ මෙසේ යි:- අනිච්චානුපස්සනාව උදයයෙන් පූර්වයෙහි සංස්කාර නැතැයි පිරිසිඳ ඒ **සංස්කාරයන්** ගේ නිෂ්පත්තිය (ගතිය) සොයනුයේ ව්‍යයයෙන් මත්තට නොයෙන් මැ යි. මෙහි ම අතුරුදහන් වෙන්ය යි, **පරිවටුම** හෙයින් බල යි.

"මනොසමුත්තෙජනතාය" යනු සංස්කාරයන් ගේ සභාවය සැලකීමෙන් සංවෙගයට පැමිණි චිත්තය සම්‍යක් ප්‍රතිපත්තියෙහි තියුණු කරන පිණිස යන අර්ථ යි. දුක්ඛානුපස්සනාවෙන් චිත්තය සංවෙගයට පැමිණේ.

"පරතොඝමනුපස්සනතාය" යනු (මම නො වෙමි. මාගේ නො වේය යි මෙසේ) අනාත්ම හෙයින් මෙනෙහි කිරීම පිණිස යැ. මෙසේ මේ පදත්‍රය අනිත්‍යානුදර්ශීනාදි වශයෙන් කියන ලදී. එහෙයින් ම **"අනිච්චතෝ මනසිකාරතෝ කථං භයතෝ සංඛාරා උපට්ඨහන්ති"** 'අනිත්‍ය නෙයින් මෙනෙහි කරන්නාහට කෙසේ **භය** වශයෙන් සංස්කාරයෝ වැටහෙද්ද යි' කී ප්‍රශ්න විසඳීමෙහි ලා **අනිත්‍ය** හෙයින් මෙනෙහි කරන්නහුට **ක්ෂය** වශයෙන් සංස්කාරයෝ වැටහෙත්. **දුක්** වශයෙන් මෙනෙහි කරන්නහුට **භය** වශයෙන් සංඝකාරයෝ වැටහෙත්. **අනාත්ම** හෙයින් මෙනෙහි කරන්නහුට **ශූන්‍ය** හෙයින් සංස්කාරයෝ වැටහෙත්ය යි කියන ලදී.

විමොක්ඛ = මේ අනුපස්සනාවන් මුඛ වන්නා වූ ඒ **විමොක්ෂ-යෝ** කවරහු ද? නිත්‍ය නිමිති ආදිය ගේ අභාවයෙන් **අනිමිත්ත-**

විමොක්ඛය ද, තණ්හා ප්‍රණිධීන් ගේ අභාවයෙන් **අප්පණිහිත-විමොක්ඛය** ද, **ආත්ම** ශූන්‍යතායෙන් **සුඤ්ඤතා විමොක්ඛය** දැ යි මේ විමොක්ෂයෝ තිදෙන වෙත්.

එයින් වදාළහ:- **"අනිච්චතෝ මනසි කරොතෝ අධිමොක්ඛ බහුලෝ අනිමිත්ත විමොක්ඛං පටිලභති. දුක්ඛතෝ මනසි කරොතෝ පඝඨධි බහුලෝ අප්පණිහිත විමොක්ඛං පටිලභති. අනත්තතෝ මනසි කරොතෝ චෙදබහුලෝ සුඤ්ඤතා විමොක්ඛං පටිලභති"*

'අනිත්‍ය හෙයින් මෙනෙහි කරන යොගී අධිමොක්ෂය බහුල වූ යේ **අනිමිත්ත විමොක්ෂය** පිළිලබ යි. දුඃඛ වශයෙන් මෙනෙහි කරනුයේ සංසිදීම් බහුල වූයේ **අප්‍රණිහිත විමොක්ෂය** පිළිලබයි. අනාත්ම හෙයින් මෙනෙහි කරනුයේ **ආත්ම** ශූන්‍ය-තානුදර්ශන බහුල වූ යේ **ශූන්‍යතා විමොක්ෂය** පිළිලබ යි.'

විභාග:- එහි **"අනිමිත්ත විමොක්ඛා"** යනු අනිත්‍යානු-දර්ශිතයෙන් අනිමිත්ත වශයෙන් සංස්කාරයන් පරිග්‍රහ කොට විදර්ශිතා වඩන යොගීහු ගේ අනිමිත්තාකාරයෙන් **නිර්‍වාණය** අරමුණු කොට පැවැති **ආර්‍ය්‍ය මාර්ගය යි.**

ඒ මෙසේයි:- ඒ **ආර්‍ය්‍යමාර්ගය** අනිමිත්ත ධාතුවෙන් උපන් හෙයින් **අනිමිත්ත** නම් ද, කෙලෙසුන් කෙරෙන් මිදුණු හෙයින් **විමොක්ඛ** නම් ද වේ. මේ ක්‍රමයෙන් ම අප්‍රණිහිතාකාරයෙන් **නිර්‍වාණය** අරමුණු කොට පැවැති **ආර්‍ය්‍යමාර්ගය අප්‍රණිහිත-විමොක්ෂ** නම්. ශූන්‍යතාකාරයෙන් **නිර්‍වාණය** අරමුණු කොට පැවැති **ආර්‍ය්‍ය මාර්ගය ශූන්‍යතාවිමොක්ෂය** යි දතයුතු.

ප්‍රශ්නයෙකි:- **ආර්‍ය්‍යමාර්ගය** ත්‍රිවිධ **විමොක්ෂනාමය** ලබා නම් අභිධර්මයෙහි කුමක් හෙයින් **විමොක්ෂ දවසයෙක්** ආයේ ද?

"යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නියානිකං අපචයගාමිං දිට්ඨගතානං පහානාය පඨමාය භූමියා පතතියා විවිචෙවව කාමෙහි පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. අප්පණිහිතං -පෙ- සුඤ්ඤතං"*

'යම් කලෙක දෘෂ්ටීන් ගේ ප්‍රහාණය පිණිස (සෝවාන් ඵලයට පැමිණීම පිණිස) නියානික වූ ත්‍රෛභූමක වූ සංස්කාරයන් විධ්වංසනය කෙරෙමින් පැවැති ලොකොත්තර ධ්‍යානය වඩා ද

* ප: ම: විමොක්ඛකථා † වි: ප: ඣානවිභඞ්ග

කාමයෙන් (සමුච්ඡේද ප්‍රහාණයෙන්) වෙන්වැ **අප්පණිහිත** නම් වූ ද, **සුඤ්ඤත** නම් වූ ද ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද එහෙයින් මෙසේ **විමොක්ඛ** දෙකක් ම වදාරන ලදැ යි දත යුතු.

පිළිතුර:- **අභිඛම්ම පරියායෙන** ඒ විමොක්ෂද්වයක් (නිෂ්පර්‍යායයෙන්) විදර්‍ශනායෙන් මාර්ගඵලය සඳහා වදාරන ලදී.

විශේෂ:- අනිමිත්ත විපස්සනා ආගමනීය ස්ථානයෙහි සිට තමා ගේ මාර්ගයට නම් දෙන්නට නො පොහොසත් වේ. (සත්‍ය-යෙහි මේ පිළිබඳ මතාන්තර සහිත වැ විස්තර වේ.)

විස්තර:- විදර්‍ශනා ඥානය වැලිත් (**පටිසම්භිදාමග්ගයෙහි**) අනිත්‍යානුපස්සනා ඤාණය නිත්‍ය වශයෙන් අනිමිත්තවෙශය මුදන හෙයින් **සුඤ්ඤතාවිමොක්ඛ ය.** දුක්ඛානුපස්සනා ඤාණය සුඛ වශයෙන් අනිමිත්තවෙශය මුදන හෙයින් **සුඤ්ඤතාවිමොක්ඛ ය.** අනත්තානුපස්සනා ඤාණය ආත්ම වශයෙන් අනිමිත්තවෙශය මුදන හෙයින් **ශූන්‍යතාවිමොක්ෂය යි.** මෙසේ අනිමිත්තවෙශ මුඤ්චන වශයෙන් **සුඤ්ඤතාවිමොක්ඛයයි ද,** අනිත්‍යානුපස්සනා ඤාණය නිත්‍ය වශයෙන් පැවැති සංස්කාර නිමිත්ත මුදන හෙයින් **අනිමිත්ත-විමොක්ෂයයි ද,** දුක්ඛානුපස්සනා ඤාණය සුඛ වශයෙන් පැවැති සංස්කාර නිමිත්ත මුදන හෙයින් **අනිමිත්තවිමොක්ෂය යි ද,** අනත්තානුපස්සනා ඤාණය ආත්ම වශයෙන් පැවැති සංස්කාර නිමිත්ත මුදන හෙයින් **අනිමිත්තවිමොක්ෂය යි ද** මෙසේ නිමිත්ත මිදීම් වශයෙන් අනිමිත්ත විමොක්ෂය යි ද; අනිත්‍යානුපස්සනා ඤාණය නිත්‍ය වශයෙන් පැවැති තෘෂ්ණා ප්‍රණිධිය මුදන හෙයින් **අප්‍රණිහිතවිමොක්ෂය යි ද,** දුක්ඛානුපස්සනා ඤාණය සුඛ වශයෙන් පැවැති තෘෂ්ණා ප්‍රණිධිය මුදන හෙයින් **අප්‍රණිහිතවිමොක්ෂය යි ද,** අනත්තානුපස්සනා ඤාණය ආත්ම වශයෙන් පැවැති තෘෂ්ණා ප්‍රණිධිය මුදන හෙයින් **අප්‍රණිහිත-විමොක්ෂය** යි ද, මෙසේ ප්‍රණිධි මිදීම් වශයෙන් **අප්‍රණිහිත-විමොක්ෂය** යි ද කියන ලදී.

එහෙත් ඒ ත්‍රිවිධ විදර්‍ශනාඥානය සංස්කාර නිමිත්ත දුරු නො කරන හෙයින් නිෂ්පර්‍යායයෙන් **අනිමිත්තවිමොක්ෂ** නො වේ.

නිෂ්පර්‍යායයෙන් වනාහි **සුඤ්ඤතාවිමොක්ඛ ද, අප්පණිහිත-විමොක්ඛ ද** වේ. අභිධර්‍ම ක්‍රමයෙහි ඒ දර්‍ශන (ඥාන) යාගේ ආගමන වශයෙන් **ආර්‍යමාර්ගක්ෂණයෙහි විමොක්ෂයට නමන ලදී.** එහෙයින් නිෂ්පර්‍යාය භාවයෙන් **අප්පණිහිත යැ, සුඤ්ඤත යැ යි විමොක්ෂ** දෙකක් ම වදාරණ ලදැ යි දතයුතු.

මේ විමොක්ඛ කථා යැ.

'මේ **සප්ත** ආර්‍ය පුද්ගල විභාගය පිණිස ප්‍රත්‍යය වේය යි' කී හෙයින් මෙහි ඒ ආර්‍ය පුද්ගල විභාගය වේ. **සද්ධානුසාරී යැ, සද්ධාවිමුක්ත යැ, කායසක්ඛී යැ, උභතොභාග විමුක්ත යැ, ධම්මානුසාරී යැ, දිට්ඨප්පත්ත යැ, පඤ්ඤා විමුක්ත යැ,** යන මොහු **සප්ත** ආර්‍ය පුද්ගලයෝ යි. ඔවුන් ගේ එම විභාගයට මේ **සද්ධාරූපෙක්ඛා ඤාණය** ප්‍රත්‍යය වේ.

විසඳුම:- යමෙක් අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නේ ශ්‍රද්ධාව බහුල කොට ඇත්තේ ශ්‍රද්ධෙන්ද්‍රිය ප්‍රතිලාභය කෙරේ ද? ඒ ආර්‍ය පුද්ගලයා සෝවාන් මාර්ග ක්ෂණයෙහි **සද්ධානුසාරී** නම් වේ. සෙසු සත් මාර්ග - ඵලයන්හි දී **සද්ධාවිමුක්ත වේ.** යමෙක් දුඃඛ වශයෙන් මෙනෙහි කරන්නේ පස්සද්ධි බහුල වූයේ සමාධින්ද්‍රිය ප්‍රතිලාභය කෙරේ ද? ඒ ආර්‍ය පුද්ගල තෙමේ හැම තන්හි ම **කායසක්ඛී නම්** වේ.

අරූප ධ්‍යානයට පැමිණ අතීතාදියට පැමිණියේ **උභතොභාග-විමුක්ත නම්** වේ.

යමෙක් අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නේ වෙද (ඤාණ) බහුල කොට ඇත්තේ ප්‍රඥෙන්ද්‍රියය ප්‍රතිලාභය කෙරේ ද? ඒ ආර්‍ය පුද්ගලතෙම සෝවාන් මාර්ග ක්ෂණයෙහි **ධම්මානුසාරී** නම් වේ. සෝවාන් ඵලය පටන් අතීත්මාර්ග ක්ෂණය තෙක් සත්හි **දිට්ඨප්පත්ත** නම් වේ. අතීත් ඵලයෙහි **පඤ්ඤා විමුක්ත** නම් වේ.

මේ සඳහා **"අනිච්චතො මනසිකරොතො සද්ධින්ද්‍රියං අධිමත්තං හොති. සද්ධින්ද්‍රියස්ස අධිමත්තත්තා සොතාපත්ති මග්ගං පටිලභති. තෙන වුච්චති සද්ධානුසාරීති. තථා අනිච්චතො මනසිකරොතො සද්ධින්ද්‍රියං අධිමත්තං හොති. සද්ධින්ද්‍රියස්ස අධිමත්තත්තා සොතාපත්තිඵලං සච්ඡිකතං හොති. තෙන වුච්චති සද්ධා විමුත්තොති."*** යි වදාරන ලදී. (අවි කිඥේමැ යි.) තවද හෙතු-ඵල විශ්වාස කෙරෙමින් කෙලෙසුන් කෙරෙන් මිදුණේ **සද්ධාවිමුක්ත නම් වේ.** ඵලක්ෂණයෙහි (අරූපධ්‍යානයයකට අනතුරුවැ) මාර්ග-ඵල ප්‍රත්‍යවෙක්ෂා කෙළේනු යි **කායසක්ඛී නම් වේ.** දර්ශනාන්ත යෙන් (සොතාපත්ති මාර්ගයට අනතුරුවැ) සොතාපත්ති ඵලයෙහි පටන් අතීත් මාර්ගය තෙක් පැමිණියේනු යි **දිට්ඨප්පත්ත නම් වේ.** හැදහීමෙන් කෙලෙසුන් කෙරෙන් මිදුණේ **සද්ධාවිමුක්ත** නම් වේ. ධ්‍යානය පළමු සපයා කොට පසුවැ නිරෝධය (නිර්‍වාණය)

* ප: ම: විමොක්ඛකථා

ප්‍රත්‍යක්ෂ කරනුයේ **කායසක්ඛි නම් වේ.** සංස්කාර දුක් ය, නිරෝධය සුඛය සි දක්නා ලද්දේ ප්‍රකට කොට දක්නා ලද්දේ සාක්ෂී කරන ලද්දේනු සි **දිට්ඨප්පත්ත නම් වේ.**

මේ සඛානුසාරී ආදී සතර පදයන් අතුරින් ශ්‍රද්ධාව අනුවැ යේනුයි හෝ ශ්‍රද්ධාවෙන් අනුවැ යේනු යි **සඛානුසාරී නම්.** ප්‍රඥව අනුවැ යේනු යි (ධර්මයෙන්) ප්‍රඥවෙන් අනුවැ යේනු යි **ධම්මානුසාරී නම්.** අරූපධ්‍යානයෙන් ද, ආර්‍යමාර්ගයෙන්ද යි දෙකොටසින් මුක්තවූයේනු යි **උභතොභාගවිමුත්ත නම්.** (රූපකාය – නාමකාය වශයෙන් හෝ විෂ්කම්භන – සමුච්ඡේද වශයෙන් හෝ උභය භාගයෙන් හෝ උභය වාරයෙක මිදුණේ **උභතොභාග විමුක්ත යැ** යනු ටීකාවී සි.) අනිත්‍යාදි වශයෙන් ප්‍රකාරයෙන් දැන කෙලෙසුන් කෙරෙන් මිදුණේනු යි **පඤ්ඤා-විමුක්ත** නමැ යි මෙසේ වචනාර්ථ දතයුතු.

(සඛ්ඛාරුපෙක්ඛා ඤාණය සි.)

මේ සඛ්ඛාරුපෙක්ඛා ඤාණය පළමු කී (මුඤ්චිතුකාමාතා-පටිසඛ්ඛානුපස්සනා ඔත) ඤාණ දෙක හා අර්ථ වශයෙන් එකෙකි. (ප්‍රවෘත්ති ආකාරයෙන් වෙනසි.)

එහෙයින් කීහ පැරණියෝ:- **"ඉදං සඛ්ඛාරුපෙක්ඛාඤාණං එකමෙව තීණි නාමානි ලභති. භෙඛා මුඤ්චිතුකම්‍යතාඤාණං නාම ජාතං. මඤ්ඤ පටිසඛ්ඛානුපස්සනා ඤාණං නාම. අඤ්ඤතා ච සිඛාපත්තතං සංඛාරුපෙක්ඛා ඤාණං නාම"***

'එකම මේ සඛ්ඛාරුපෙක්ඛා ඤාණය යටැ **මුඤ්චිතුකම්‍යතා ඤාණ** නමැ සි ද, මැද **පටිසඛ්ඛානුපස්සනා ඤාණ** නමැ සි ද, අන්තයෙහි මධ්‍යකප්‍රාප්තවූයේ **සංඛාරුපෙක්ඛා ඤාණ** නම්දැ යි නම් තුනක් ලබ සි.

පෙළෙහි ද – **කථං මුඤ්චිතුකම්‍යතා පටිසංඛානතිඨනා පඤ්ඤා සංඛාරුපෙක්ඛාසු ඤාණං. පවත්තං -පෙ- නිමිත්තං -පෙ- උපායාසං මුඤ්චිතුකම්‍යතා පටිසඛ්ඛා සන්තිට්ඨනා පඤ්ඤා සංඛාරුපෙක්ඛාසු ඤාණං, උප්පාදෙ දුක්ඛන්ති -පෙ- භයන්ති ඝාමිසන්ති -පෙ- උප්පාදෙ සංඛාරාති -පෙ- උපා-යාසෙ සංඛාරාති මුඤ්චිතුකම්‍යතා පටිසංඛා සන්තිට්ඨනා පඤ්ඤා සංඛාරුපෙක්ඛාසු ඤාණං*** මුඤ්චිතුකම්‍යතා ඤාණය,

---

* **ප:** ම: විමොක්ඛකථා

පටිසඞ්ඛා ඤාණය, සන්තීරණා ඤාණය යන තුන කෙසේ සඞ්ඛාරුපෙක්ඛා ඤාණය වේද? පැවැත්ම ද, නිමිත්ත ද -පෙ- උපායාසය ද, මුඤ්චිතුකම්‍යතා ඤාණය, **පටිසංඛා ඤාණය, සන්තීරණා ඤාණය** යන තුන **සංඛාරුපෙක්ඛා ඤාණය** යි. උත්පාදය දුකයැයි ද, භයෙකැයි ද, සෘම්ෂයැයි ද -පෙ- උත්පාදය සංස්කාරයැයි ද -පෙ- උපායාසය සංස්කාරයැයි ද මුඤ්චිතුකම්‍යතා- පටිසංඛා- සන්තීරණා ඤාණය **සංඛාරුපෙක්ඛා ඤාණය** යි.

මුඤ්චිතුකම්‍යතා ද- පටිසංඛා ද- සන්තීරණා ද හේමනු යි **මුඤ්චිතුකම්‍යතා- පටිසංඛා- සන්තීරණා නම්.**

මෙසේ මාර්ගයට පූර්වභාගයෙහි නිර්වේදඥානයෙන් කලකිරුණු පුද්ගලයා ගේ උත්පාදාදීන් (ඡන්දරාග ප්‍රහාණයෙන්) හරිනු කැමැති බව **මුඤ්චිතුකම්‍යතා** නම. මිදීමට උපාය කරනු පිණිස මධ්‍යභාගයෙහි ප්‍රත්‍යවේක්ෂා කිරීම **පටිසඞ්ඛාඤාණ නම්.**

මිදීමෙන් අවසන්හි අපේක්ෂාව හැරීම් වශයෙන් මැදහත්වීම **සන්තීරණා නම්.**

ඒ සඳහාම - **"උත්පාදය සංඛාර යැ, සංඛාරයන් ගේ මැදහත් බව බැලීම සඞ්ඛාරුපෙක්ඛා යැ"** යනාදිය කී. මෙසේ මේ ත්‍රිවිධ ඥානය එකෙක්මැ යි. වැලි මේ පිළිවෙළින් ද එකක්මය යි දතමනා යැ.

"යා ච මුඤ්චිතුකම්‍යතා, යා ච පටිසඞ්ඛා, යා ච සඞ්ඛාරුපෙක්ඛා ඉමේ ධම්මා එකත්ථා ව්‍යඤ්ජනමේව නානා" යම් **මුඤ්චිතුකම්‍යතාඥානයෙක්** වේද, යම් **පටිසඞ්ඛාඤාණයෙක්** වේද, යම් **සංඛාරුපෙක්ඛාඤාණයෙක්** වේ ද මේ ධර්මයෝ එකාර්ථය හ. ව්‍යඤ්ජනයම වෙනසියි එහෙයින් කියන ලදී.

මෙසේ අධිගත **සංඛාරුපෙක්ඛාඤාණ** ඇති මේ කුල පුත්‍රයාගේ මස්තක ප්‍රාප්ත විදර්ශනාව වුත්‍থාන සංඛ්‍යාත මාර්ගයට යන හෙයින් **වුත්‍থානගාමිනී වේ.**

විශේෂ:- **සිඛාප්පත්තවිපස්සනා** යැයි ද, **වුත්‍থානගාමිනී** යැයි ද, මෙකී **සඞ්ඛාරුපෙක්ඛා ය, අනුලෝම ය, ගොත්‍රභූ ය** යන මේ ඤාණ තුනටම නම්.

ඒ සංඛාරෝපෙක්ෂා ඥානය (සිඛාවට) කෘත්‍ය වශයෙන්ද, ප්‍රවෘත්ති වශයෙන්ද, ලෞකික ඥානයන් ගේ මස්තකයට උත්තම

භාවයට පැමිණි හෙයින් **සිඛාප්‍රාප්ත නම් වේ.** වුඨානයට (නැගීමට) යන හෙයින් **වුඨානගාමිනී** නමුදු වේ.

ඒ මෙසේයි:- පිටත විදර්ශනාවට අරමුණු වූ අනිත්‍යාදි ලක්ෂණ **සතළොස්සකින්** සංඛ්‍යාත විසතුවෙන් ද, සවිඤ්ඤාණකයෙහි පවත්නා හෙයින් අජ්ඣත්තපවත්තය යි කියන ලද මිථ්‍යාදෘෂ්ටි ආදියෙන් හා ඒ අනුවැ පවත්නා කෙලෙසුන් කෙරෙන් ද නැගී සිටින හෙයින් **මාර්ග** වුඨානය යි කියනු ලැබේ. ඒ වුඨානයට යන හෙයින් **වුඨානගාමිනී නම.** මාර්ග හා සමාන කරනු ලැබේ යන අර්ථයි.

එහි අනිත්‍යාදි - වුඨානයන් හෙළි පෙහෙළි වීම සඳහා මේ මාතෘකාවය **අධ්‍යාත්මයෙහි පිවිස අධ්‍යාත්මයෙන් නැගී සිටී. අධ්‍යාත්මයෙහි පිවිස බාහිරයෙන් නැගී සිටී. බාහිරයෙහි පිවිස අධ්‍යාත්මයෙන් නැගී සිටී.**

රූපයෙහි පිවිස රූපයෙන් නැගී සිටී. රූපයෙහි පිවිස අරූපයෙන් නැගී සිටී අරූපයෙහි පිවිස අරූපයෙන් නැගී සිටී. අරූපයෙහි පිවිස රූපයෙන් නැගී සිටී.

එක ප්‍රභාරයෙන් සතළොස්සකින්යෙන් නැගී සිටී.
අනිත්‍ය විසින් පිවිස අනිත්‍ය විසින් නැගී සිටී. අනිත්‍ය විසින් පිවිස දුක් විසින් ද, අනාත්ම විසින් ද, නැගී සිටී. දුක් විසින් පිවිස දුක් විසින් ද, අනිත්‍ය විසින් ද, අනාත්ම විසින් ද නැගී සිටී. අනාත්ම විසින් පිවිස අනාත්ම විසින් ද, අනිත්‍ය විසින් ද, දුක් විසින් ද නැගී සිටී

කෙසේ ද යත්:- මේ ශාසනයෙහි ඇතැම් යොගාවචරයෙක් පළමු කොට ම අධ්‍යාත්ම සංස්කාරයන් විමසෙහි පිවිසෙයි. (විදර්ශනාව ආරම්භ කෙරේ.) පිවිස ඒ සංස්කාරයන් බලයි හුදු අධ්‍යාත්ම සංස්කාරයන්හි මාගී ව්‍යුත්ථානය නොවන හෙයින් පිටත්හිදු බැලිය යුතු වේ. එහෙයින් පරසන්තානත ගත ස්කන්ධයන් ද, අනින්ද්‍රියබද්ධ සංස්කාරයන් ද, අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්මයැ යි දකී. ඒ යොගී කලෙක සවිඤ්ඤාණය ද, කලෙක පරසන්තානය ද, සම්මර්ශනය කෙරේ. මෙසේ සම්මර්ශනය කරන ඒ යොගී අධ්‍යාත්ම ධර්මයන් සම්මර්ශනය කරන කාලයෙහි විදර්ශනාව මාර්ගය හා ගැළපේ නම් අධ්‍යාත්මයෙහි පිවිස අධ්‍යාත්මයෙන් නැගී සිටී නම් වේ. බාහිර ධර්මයන් සම්මර්ශනය කරන කලැ විදර්ශනාව මාර්ගය හා ගැළපේ නම් අධ්‍යාත්මයෙහි පිවිස

බාහිරයෙන් නැඟී සිටී නම් වේ. පිටත්හි පිවිස පිටතින් ද, අධ්‍යාත්මයෙන් ද නැඟී සිටීමෙහිදු මේ ක්‍රමය මැයි. අනෙක් යොගියෙක් ආදියෙහි ම රූපයෙහි පිවිසෙයි. පිවිස භූත රූප ද, උපාදාරූප ද රැසක් කොට දකී. හුදු රූප දර්ශන මාත්‍රයෙන් ම මාගී ව්‍යුත්ථානය නො වන හෙයින් අරූපය ද දැකිය යුතු වේ. එහෙයින් ඒ රූපය අරමුණු කොට උපන් වෙදනා- සංඥා- සංස්කාර- විඥාන යන මෙය අරූපයයි අරූපය සම්මර්ශනය කෙරේ. හෙතෙමේ කලෙකැ රූපය සම්මර්ශනය කෙරේ. කලෙක අරූපය සම්මර්ශනය කෙරේ. මෙසේ සම්මර්ශනය කරන ඒ යොගීහට රූප සම්මර්ශනය කරන කාලයෙහි විදර්ශනාව මාගීය හා ගැළපේ නම් මේ රූපයෙහි පිවිස රූපයෙන් නැඟී සිටී නම් වේ. අරූප සම්මර්ශනය කරන කාලයෙහි විදර්ශනාව මාගීය හා ගැළපේ නම් මේ රූපයෙහි පිවිස අරූපයෙන් නැඟී සිටී නම් වේ.

අරූපයෙහි පිවිස අරූපයෙන් නැඟී සිටීමෙහි ද රූපයෙහි පිවිස රූපයෙහි නැඟී සිටීමෙහිදු මේ ක්‍රමය මැ යි.

"යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මං."* යි 'උදය වන සුලු වූයේ ව්‍යය වන සුලුයැ යි' මෙසේ අභිනිවෙශ කොට එසේම ව්‍යුත්ථාන කාලයෙහි එක ප්‍රහාරයෙන් පඤ්චස්කන්ධ යෙන් නැඟී සිටී නම් වේ.

එක් යොගියෙක් ආදියෙහි ම අනිත්‍ය හෙයින් සංස්කාරයන් සම්මර්ශනය කෙරේ. අනිත්‍ය හෙයින් සම්මර්ශනය කළ මාත්‍රයෙන් ම ව්‍යුත්ථානය නො වන හෙයින් දුඃඛ හෙයින් ද, අනාත්ම හෙයින් ද, සම්මර්ශනය කළයුතු ම වේ. එහෙයින් දුඃඛ හෙයින්- අනාත්ම හෙයින් සම්මර්ශනය කෙරේ. එසේ පිළිපන්නහුට අනිත්‍ය හෙයින් සම්මර්ශනය කරන කල් වුඨානය වේ නම් මේ අනිත්‍ය විසින් පිවිස අනිත්‍ය විසින් නැඟී සිටී නම් වේ. දුඃඛ වශයෙන්, අනාත්ම වශයෙන් අභිනිවෙශ කරන කල ව්‍යුත්ථානය වේ නම් මේ අනිත්‍ය විසින් පිවිස දුක් විසින් අනාත්ම විසින් නැඟී සිටී නම් වේ.

දුඃඛ හෙයින් අනාත්ම හෙයින් අභිනිවෙශ කොට ශෙෂ ව්‍යුත්ථානයන්හිදු මේ ක්‍රමය මැයි.

මේ යොගීන් අතුරෙන් යමෙක් අනිත්‍ය හෙයින් ද, යමෙක් දුඃඛ හෙයින් ද, යමෙක් අනාත්ම හෙයින් ද අභිනිවෙශ කෙළේ නම් වුඨාන කාලයෙහි ද අනිත්‍ය හෙයින් වුඨානය වේ. තුන්

* ම: ව: අභිසමෙබාධිකථා

දෙතම **අධිමොක්ෂ** බහුලයෝ **වෙති.** ශ්‍රද්ධෙන්ද්‍රිය පිළිලබති. **අනිමිත්ත විමොක්ෂයෙන්** මිදෙති. ප්‍රථම මාර්ගක්ෂණයෙහි **සඛානුසාරීහු වෙති.** සෙසු සත් තන්හි ශුද්ධා **විමුක්තයෝ වෙත්.**

දුඃඛ හෙයින් වුඨානය වේ නම් තිදෙනම **පඤ්ඤාධූර බහුලයෝ වෙති. සමාධීන්ද්‍රිය පිළිලබති. අප්‍රණිහිත විමොක්ෂයෙන් මිදෙති.** සියලු තන්හි **කායසක්ඛීහු වෙති.**

අරූපධ්‍යානය මෙහිදී යමෙකුට පාදක වේ නම් හේ අතීත් ඵලයෙහි දී **උභතොභාග විමුක්ත වේ.** වැලි අනාත්ම හෙයින් වුඨානය වේ නම් ඔහු තිදෙනම **ප්‍රඥා බහුලයෝ වෙති. ප්‍රඥෙන්ද්‍රිය පිළිලබති ශූන්‍යතා විමොක්ෂයෙන් මිදෙත්.** ප්‍රථම මාර්ගක්ෂණයෙහි **ධර්මානුසාරීහු වෙති.** සතැනෙක **දිට්ඨප්පත්ත යෝ වෙති.** අතීත් ඵලයෙහි **ප්‍රඥා විමුක්තයෝ වෙත්.** දැන් පූර්ව භයතුපට්ඨානාදි ඤාණයන් ද, පසුවැ කී **ඔනුනු** ආදි ඤාණයන් ද සමග **වුට්ඨානගාමිනී විදර්ශනාව** ප්‍රකාශ කරනු පිණිස මේ දෙළොස් උපමාවෝ දතයුතු වෙත්. මේ ඔවුන් ගේ උද්ධානය යි.

"වගගුලී කණහසපෙපා ච – සරං ගොඝකඛි දූරකෝ
ඛුද්දං පිපාසං සීතූණ්හං – අඞ්කාරං විසෙන ච"

වවුලි යැ, කෘෂ්ණ සර්පියැ, ගෘහයැ, ගවයැ, යකිනියැ, ළදරු ගැ, ක්ෂුධා යැ, පිපාසා යැ, ශීත යැ, උෂ්ණ යැ, අඞ්කාර යැ, විෂයැ යි මේ උපමාවෝ **භයතුපට්ඨාන ඤාණයෙහි** පවත් ආකාරයෙන් සැදුණු ඤාණයෙකැ සිට ඇරැ දක්වන්නට වටිත්. (මෙතැන වනාහි) මේ **වුට්ඨාන ගාමිනී විදර්ශනායෙහි** ඒ උපමා ඇරැ දක්වන කල්හි **භයතුපට්ඨාන ඤාණයෙහි** පවත් **ඵල ඤාණය** දක්වා සියලු ඤාණකෘත්‍යය ප්‍රකට වේ. (එහෙයින් මෙහිම ඇරැ දැක්විය යුතු යැ යනු ආශය යි.)

(1) **වවුලි** – එක් වවුලියක් 'මෙහි මලක් හෝ ගෙඩියක් ලබම් යි' ශාඛා පසක් ඇති මී රුකෙකැ වසා එක් ශාඛාවක් පරාමර්ශනය කොට එහි ගතමනා කිසි මලක් හෝ ඵලයක් හෝ නො දුටුවා ය. එසේ ම දෙ වන ශාඛාව ද, තුන් වන- සිව් වන- පස් වන- ශාඛාවන් ද පරාමර්ශනය කොට නො දැක්කා ය. ඇය ඒකාන්තයෙන් මේ රුක ඵල නැත්තෙක. මෙහි ගතමනා කිසිවක් නැතැ යි ඒ රුකෙහි ආලය හැර යෑපී ශාඛාවට නැඟී වෙලෙප් අතුරින් හිස ඇද උඩ බලා අහසෙහි පියාඹා අනික් ඵල රුකෙක වැසුවා ය.

ඒ උපමානි යොගී වවුලිය **මෙන්** දතයුතු. පස් ශාඛා ඇති මීරුකා **මෙන්** පඤ්චුපාදානස්කන්ධය ද, එහි වවුලිය වැසීම මෙන් යොගියා ගේ පඤ්චස්කන්ධයෙහි අභිනිවේශය ද, ඇය ගේ එක එක ශාඛාව පරාමර්ශනය මෙන් යොගියා ගේ රූපස්කන්ධය සම්මර්ශනය කොට ගතමනා කිසිවක් නො දැක සෙසු ස්කන්ධ යන් සම්මර්ශනය ද, ඇය මේ රුක නිෂ්ඵලය යි රුකෙහි ආලය හැරීම **මෙන්** පඤ්චස්කන්ධයෙහි අනිත්‍ය ලක්ෂණාදිය දැකීම් වශයෙන් කළකිරුණු යොගීහු ගේ **මුඤ්චිතුකම්‍යතා- පටි-සඞ්ඛානුපස්සනා- සඞ්ඛාරුපෙක්ඛා** යන ඤාණ තුන ද, ඇය සෘජු ශාඛාවෙන් මත්තෙහි **නැගීම** මෙන් යොගීහු ගේ **අනුලෝම-ඤාණය ද,** භිස නගා උඩ බැලීම සේ **ගොත්‍රභු ඤාණය ද,** ආකාශයෙහි ඉහළ **නැගීම** මෙන් **මාර්ග ඤාණය ද,** අන් ඵල රුකෙක වැසීම මෙන් **ඵල ඤාණය ද** දතයුතු යි.

(2) **කාරණසම්:- පටිසඞ්ඛාන ඤාණයෙහි** කී සේ මැයි. මේ උපමාන- උපමෙය සංසන්දනය යි:- සප්පිය හැරීම මෙන් **ගොත්‍රභු ඤාණය ද,** මුදු හැර ආ මග බලන්නා සේ **මාර්ග ඤාණය ද,** මිදී අභය ස්ථානයෙහි සිටීම සේ **ඵල ඤාණය ද,** වේ. මේ මෙහි වෙනස යි.

(3) **ගාථා:-** ගෙහිමියා රෑ අහර කිස නිමවා යහනට නැගී නිදි ගත් කලැ ගෙය ගිනි ගත්තේ ය. හේ පිබිදී ගිනි දැක බියවී මේ ගින්නෙන් නො දැවී නික්ම යෙම් නම් මැනැවැ යි බලන්නේ මගක් දැක නික්ම වේගයෙන් නිර්භය ස්ථානයකට ගොස් සිටියේ ය. එහි ගෙහිමියා අහර ගෙන යහනට නැගී නිදීම සේ බාල පුහුදුනා ගේ පස්කඳෙහි 'මම යැ මාගේය' යි මමායනය ද, පිබිද ගිනි දැක බිය පත් කල මෙන් සම්‍යක් ප්‍රතිපත්තියට පිළිපැද තිලකුණු දැක **භයතුපට්ඨාන ඤාණය ද,** නික්මෙන මග සෙවීම මෙන් **මුඤ්චිතුකම්‍යතා ඤාණය ද,** මග දැකීම මෙන් **අනුලෝම ඤාණය ද,** නික්ම යාම සේ **ගොත්‍රභු-ඤාණය ද,** වේගයෙන් යාම සේ **මාර්ඤාණය ද,** අභය ස්ථාන යෙහි සිටීම සේ **ඵලඤාණය ද** දතයුතු.

(4) **ගව:-** එක් ගොවියකු රෑ නිදි ගත් කල ගාල බිදගෙන ගවයෝ පලා ගියහ. හේ අලුයම් එහි ගොස් බැලූ කල ඔවුන් පැන ගිය බව දැන පිය අනුවැ ගොස් රජුගේ ගොනුන් දිටි. මේ මාගේ ගෙරිහු යැයි සිතා ගෙනෙන්නා වූ ගෙතෙමේ අලුයම්හි "මේ මාගේ ගෙරීහු නොවෙති' රජු ගේ ගෙරිහු යැයි" හැඳින "මේ සොරෙකැ" යි මා රාජ පුරුෂයන් දැක අල්ලා පෙළන්නට

පෙරැ පලාගෙ මැසි බිය වැ ගොනුන් හැර වේගයෙන් පලා ගොස් බිය නැති තැනෙක සිටියේ යැ. ඒ උපමාහි – මාගේ ගෙරිහු යැ යි රජුගේ ගොනුන් ගැනීම සේ බාල – පෘථග්ජනයන්ගේ "මම යැ මාගේ යැයි ගැනීම ද අලුයම්හි රජුගේ හෙරිහු යයි හැඳිනීම සේ යොගීහුගේ තිලකුණු වශයෙන් **අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්ම යැ** යි සඤ්ඤයන් හැඳිනීම ද, භීත කාලය සේ **භයතුපඨාන – ඤාණය ද,** හැරුපියා යනු කැමැත්ත සේ **මුඤ්චිතුකම්‍යතා ඤාණය ද,** හැරුපීම සේ **ගොත්‍රභු ඤාණය ද,** පලා යාම සේ **මාර්ගය ද,** පලා ගොස් අභය ස්ථානයෙහි සිටීම සේ **ඵලය ද** දතයුතු.

(5) **යකිනි**:- එක් පුරුෂයෙක් යකින්නක හා සසඟ කෙළේය. ඕ රැ කල "මෙතෙමේ නිදි වන්නේ" යයි සිතා අමුසොහොනට ගොස් මිනීමස් කයි. හේ "මැය කොහිදැ" යි ලුහුබැඳ මිනීමස් කන්නිය දැක ඇය නොමිනිස් බව් දැන මා කන්නට පෙරාතුවැ ම පැන යම්" යි භීත වැ වේගයෙන් පලා ගොස් අභය ස්ථානයෙක සිටියේ ය. ඒ උපමාහි – මිනිසා ගේ යකින්න හා සහවාසය සේ සඤ්ඤයන් "මම යැ මාගේය" යි ගැනීම ද, සොහොනෙහි මිනීමස් කන්නිය දැක "මෝ යකින්නකැ" යි දැනීම මෙන් සඤ්ඤයන් ගේ තිලකුණු දැක අනිත්‍යාදි බව් දැනීම ද, බියපත් කල සේ **භයතුපඨානඤාණය ද,** පලා යනු කැමැත්ත සේ **මුඤ්චිතුකම්‍යතා ඤාණය ද,** සොහොන හැරීම සේ **ගොත්‍රභු ඤාණය ද.** වේගයෙන් පලා යාම සේ **මාර්ඤාණය ද,** අභය ස්ථානයෙහි සිටීම සේ **ඵල ඤාණය ද** දතයුතු.

(6) **ළදරු**:- දරු සොඬ එක් සත්‍රියක් පහයෙකැ මතු මහලේ හුන්නා ඇතුළු වීථියෙහි දරු හඬක් අසා 'ම පුතු කිසි-වෙක් පෙළාදැ' යි වේගයෙන් ගොස් තමා පුතුයැ යි හැඟීමෙන් පර පුතු ගත. ඕතොමෝ 'මේ පර පුතෙකැ යි' හඳුනා නැසින් ඔබ මොබ බලන්නී 'මෝ දරු සෙරකැ' යි කිසිවකු කියන්නට පෙරැ දරුවා එහි බස්වා පෙරලා වේගයෙන් පහයට නැඟී හුන්නා ය. **'එහි** තමා පුතුය' යි සඤ්ඤයෙන් පර පුතු ගැනීම සේ මම යැ - මාගේයැ යි පස්කඳු ගැනීම ද, **මේ පර පුතුය'** යි හැඳිනීම සේ නිලකුණු විසින් 'මම නොවෙමි' 'මාගේ නොවේය' යි හැඳිනීම ද, බියවීම මෙන් **භයතුපඨානය ද,** ඔබ මොබ බැලීම සේ **මුඤ්චිතුකම්‍යතා ඤාණය ද,** එහිම දරුවා බැස්වීම සේ **අනුලොම ඤාණය ද,** බස්වා ඇතුළු වීථියෙහි සිටි **කාලය** සේ **ගොත්‍රභු ද,** පහයට නැඟීම සේ **මාර්ගය ද,** තැග හිඳීම සේ **ඵලය ද** දතයුතු.

බුදු- පිපාසා- සීත- උණ්හ- අන්ධකාර- විස යන උපමා සදෙන ව්‍යුත්ථානගාමිනී විදර්ශනාවෙහි සිටියහුට **ලොකෝත්තර** ධර්මාභිමුඛවැ නිමිත්ත-ප්‍රවණ-ද්‍රාග්හාර භාවය දැක්වීම සඳහා කියන ලදහ.

(7) **බඩ** සයින් මඩනාලද සාගිනි ඇති පුරුෂයකු මිහිරි රස බොජුනක් පතන්නා සේ මේ යොගී තෙමේ සසර වට බඩ සයින් පෙළුණේ අමාරස වූ **කායගතාසති** බොජුන පත සි.

(8) පිපාසිත පුරුෂයකු වියළි ගෙළ මුවැතිවැ නොයෙක් **ද්‍රව්‍යයෙන්** යුක්ත පානයක් පතන්නා සේ මේ යොගී තෙමේ සසර වට පවසින් පෙළුණේ **අමෘත මහ** පානය පත සි.

(9) සීතලින් පෙළුණු පුරුෂයකු උණුසුම පතන්නා සේ සංසාරවට්ටයෙහි තෘෂ්ණා සෙනහ ශීතයෙන් පෙළුණේ කෙලෙස් තවන **මාහොෂධය** පත සි.

(10) උෂ්ණයෙන් පහරණ ලද පුරුෂයකු සිහිලස පතන්නා සේ සංසාර වට්ටයෙහි රාගාදී එකොළොස් ගින්නෙන් තැවුණු යොගී තෙමේ එකොළොස් ගිනි සංසිඳුවන **නිවන** පත සි.

(11) අන්ධකාරයෙන් මඩනා ලද පුරුෂයකු එළියක් පතන්නා සේ අවිද්‍යාන්ධකාරයෙන් වෙළා වටකරන ලද යොගී තෙමේ **ඤාණාලොක මාර්ගභාවනාව** පත සි.

(12) විෂ කැවුණු පුරුෂයකු විෂ නසන බෙහෙදක් පතන්නා සේ කෙලෙසයෙන් වළඳනා ලද මේ යොගී තෙමේ කෙලෙස් විස මඩනා අමාඔසු **නිවන** පත සි.

"තස්සෙවං ජානතෝ එවං පස්සතෝ තීසු භවේසු -පෙ- නවසු සත්තාවාසේසු චිත්තං පතිලීයති. පතිකුටති. පතිවට්ටති න සම්පසාරීයති. උපෙක්ඛා වා පාටිකුල්‍යතා වා සණ්ඨාති. සෙය්‍යථාපි නාම පදුමපලාසෙ ඒසකඋපොණෙ" යනාදිය එහෙයින් වදාරන ලදී.

සියල්ල පෙරැ කී සෙයින් ම දතයුතු සි. මෙතෙකින් ඒ යොගී **පතිලීනචර** නම් වේ.

"පතිලීනචරස්ස භික්ඛුනෝ
භජමානස්ස විවිත්ත මානසං,
සාමඤ්ඤමාහු තස්ස තං
යො අත්තානං භවෙන න දස්සයෙ"*

---

* මහා නි;

"නිබවේ ලොබසුන් බැවින් ස්තේ
හැකුළුම් යුතු මහණු ගේ මනා
පැවැතුම් නො දැකුම් එනිස්සයැ සි
පියසු මැනැවින් අරිදනෝ"

(කාමාදි භවත්‍රයෙහි තමා නො දක්වන, කාය විවේකාදීන් යුතු වූ ත්‍රිභවයෙහි නිරාලය හෙයින් නො විසුරුණු අදහස් ඇතිවැ එහෙයින් ම හැකුළුණු සිත් ඇති භික්ෂුව ගේ ඒ අදර්ශනය යොග්‍ය වූ සාමග්‍රිය පැවැත්මය යි බුදාදි ආර්යයෝ වදාරති.)

මෙසේ **සඞ්ඛාරුපෙක්ඛා ඤාණය** යොගිහු ගේ පහිලීනවර-භාවය නියම කොට මත්තෙහි **ආර්යමාර්ගය ගේ ද, බොධ්‍යඞ්ග-මාර්ගාඞ්ග- ධ්‍යානාඞ්ග- ප්‍රතිපදා- විමෝක්ෂ** යන මොවුන්ගේ ද, විශෙෂය නියම කෙරේ.

ඒ මෙසේ යි.

(1) **චූලනාගත්ථේරවාදයෙහි** – බොජ්ඣාඞ්ග සතෙක-සයෙකැයි ද, මාර්ගාඞ්ග අටෙක- සතෙකැයි ද, ධ්‍යානාඞ්ග පසෙක-සතරෙකැයි ද යනාදි විශෙෂය පාදක වූ ධ්‍යානය නියම කෙරේය යි යෙති.

(2) **මොරවැවේ වැසි මහාදත්ත ස්ථවිරයෝ**:- විදර්ශනා-වට අරමුණු වූ සකල නියම කෙරෙතැ යි යෙති.

(3) **ත්‍රිපිටක චූලාභය ස්ථවිරවාදයෙහි**:- පෙර කී උභය හෙදය ඇති කල්හි ද පුද්ගලයා ගේ අධ්‍යාශය නියම කෙරේය යි යෙති.

මේ තෙරවරුන් ගේ වාදයන් හෙන් මේ **පූර්වභාග ව්‍යුත්ථාන-ගාමිනී විදර්ශනාව ම** බොධ්‍යඞ්ගාදීන් ගේ **විශෙෂය නියම කෙරෙතැ** යි දතයුතු.

විභාග:- (1) ඒ බොධ්‍යඞ්ගාදි විශෙෂය නියම කිරීමෙහිලා මේ පිළිවෙළ කථාව සි: විදර්ශනා නියමයෙන් ධ්‍යානලාභී නොවූ **ශුෂ්කවිදර්ශකයාහට** උපන් මාර්ගය ද, සමාපත්තිලාභී යොගියා හට ධ්‍යාන පාදක නො කොට උපන් මාර්ගය ද, ප්‍රථමධ්‍යානය පාදක කොට ඒ පාදක ධ්‍යානයෙන් අන්‍යවූ ප්‍රකීර්ණක සංඝකාර යන් සන්තර්ශනය කොට උපදවන ලද මාර්ගය ද, ප්‍රථමධ්‍යානිකයෝ ම වෙති. මේ තුන් ප්‍රකාර මාර්ගයෙහි ම සපත බොධ්‍යඞ්ගයෝ ද, අෂ්ටමාර්ගාඞ්ගයෝ ද පඤ්චධ්‍යානාඞ්ගයෝ ද වෙත්.

(මේ මෙහි ශුෂ්ක විදර්ශකයාගේ ග්‍රහණය විදර්ශනා ග්‍රහණයා ගේ ඒකාන්තික භාවය දක්වන පිණිස යි. වුට්ඨානගාමිනිය හැර කෙවල පාදකධ්‍යානාදීහු නියම හේතු විය නො හෙති. වුට්ඨානගාමිනී වනාහි පාදකධ්‍යානාදීන් ගේ අභාවයෙහිදු ශුෂ්ක විදර්ශකයා ගේ මාර්ගය ප්‍රථමධ්‍යානික වීමට හේතු වේ. එහෙයින් වුට්ඨානගාමිනී බොධ්‍යඞ්ගාදි විශෙෂ නියමයෙහි ඒකාන්තික හෙතුව වේ යනු සත්‍ය යි.)

විසෙසෙ - ඒ ආර්‍ය්‍ය මාර්ගයන් ගේ **පුථුජ්ජනාන විදර්ශනාව** සොමනස්ස සහගතව ද, උපෙක්ඛා සහගතව ද වේ. ව්‍යුට්ඨාන කාලයෙහි (මාර්ගාසන්න කාලයෙහි) සඞ්ඛාරුපෙක්ඛා භාවයට **පැමිණ** උපෙක්ඛාසහගත ම වේ.

පඤ්චක නයෙහි:- දුතිය - තතිය - චතුත්ථ ජ්ඣානයන් පාදක කොට උපදවන ලද මාර්ගයෙහි පිළිවෙළින් ම ධ්‍යානය දුතියජ්ඣාන යෙහි චතුරඞ්ගික ද, තතියජ්ඣානයෙහි තිවඞ්ගික ද, චතුත්ථජ්ඣා නයෙහි දුවඞ්ගික ද වේ. මේ දවිතීයාදී ධ්‍යානත්‍රයයෙහි **විතක්කී සංඛලප** නැති හෙයින් මාර්ගාඞ්ග සතෙක් ම වේ. සතර වන ධ්‍යානයෙහි **ප්‍රීතිය** නැති හෙයින් බොජ්ඣඞ්ග සයෙක් වේ. මේ විශෙෂය පූර්භාගයෙහි මෙන් විදර්ශනා නියමයෙන් නො වැ පාදකධ්‍යාන නියමයෙන් ද, විදර්ශනා නියමයෙන් ද වේ.

ඒ පඤ්චක නයෙහි දුතිය - තතිය- චතුත්ථජ්ඣානයන් පාදක කොට උපදවන ලද මාර්ගී ඇත්තවුන්ට පූර්භාග විදර්ශනාව සොමනස්ස සහගත ද, උපෙක්ඛා සහගත ද වේ. වුට්ඨානගාමිනී ප්‍රඥව සොමනස්ස සහගත ම වේ.

පඤ්චම ධ්‍යානය පාදක කොට නිපදවන ලද මාර්ගයෙහි උපෙක්ඛා චිත්තෙකග්ගතා වශයෙන් ධ්‍යානාඞ්ග දෙකෙක් ම වේ. පීති සම්බොජ්ඣඞ්ගය නො යෙදෙන හෙයින් බොජ්ඣඞ්ග සයක් හා සම්මා සංකප්පය නො යෙදෙන හෙයින් මාර්ගාඞ්ග සතෙක් වේ. මේ විශෙෂය ද පාදකධ්‍යාන නියමය හා විදර්ශනා නියමය ද යන උභය නියමයන් ගේ වශයෙන් වේ. මේ ක්‍රමයෙහි පූර්භාග විදර්ශනාව සොමනස්ස සහගත හෝ උපෙක්ඛා සහගත හෝ වේ. වුට්ඨානගාමිනී විදර්ශනාව උපෙක්ඛාසහගත ම වේ. අරූපධ්‍යාන යන් පාදක කොට උපදවන ලද මාර්ගයෙහි ද මේ ක්‍රමය මැ යි. මෙසේ පාදකධ්‍යානයෙන් නැගී යම් කිසි සංඝකාරයක් සනමශීනය කොට නිපදවන ලද මාර්ගී ඇති යොගීහු ගේ ආසන්න ප්‍රදෙශයෙහි නැගෙන ලද සමාපත්ති නොමෝ ගොඩ වණියට භූමිවණිය මෙන් තමා හා සදෘශ කෙරේ.

(4) දවිතීය සථවිරවාදයෙහි යම් යම් සමවතකින් නැගී යම් යම් සමාපත්ති ධර්මයක් සම්මර්ශනය කොට මාර්ගය නිපදවන ලද නම් ඒ ඒ සමවත හා සමානම වේ. ඒ වාදයෙහි ද විදර්ශනා නියමය යට කී සෙයින් ම දතයුතු.

(3) තෘතීය සථවිරවාදයෙහි තම තමා ගේ අදහසට අනුරූප වශයෙන් යම් යම් ධ්‍යානයක් පාදක කොට යම් යම් ධ්‍යාන කෙතෙකුත් සම්මර්ශනය කොට මාර්ගය නිපදවන ලද නම් ඒ ඒ මාර්ගය ඒ ඒ ධ්‍යානය සදෘශම වේ ය යි කීහ ඒ නො යෙදේ.

විශෙෂ:- පාදකධ්‍යානයක් නැතිව අධ්‍යාශය මාත්‍රයකින් ම ඒ ඒ ධ්‍යානය හා සදෘශ භාවය සිද්ධ නො වේ.

ඒ මේ කාරණය (පාදකධ්‍යාන - සම්මර්ශිතධ්‍යාන ධ්‍යානොප නිශ්‍රය නැති වැ අධ්‍යාශය මාත්‍රයෙන් ම සිද්ධ නො වන බව) නාදකොවාද සූත්‍රයෙන් දක්වන ලදී. ඒ **නාදකොවාද සූත්‍රයෙහි*** සෝවාන් මෙහෙණගේ ද පරිපූර්ණ සංකල්පතාව වදරන බුදුහු උපනිශ්‍රය සම්පත්තිය ඇත්තහුගේ ම අධ්‍යාශය නියමය වන බව් හා අධ්‍යාශය පමණකින් සිද්ධ නො වන බව් වදාළහ. එසේ ම මෙහිදු දවිතීයධ්‍යානිකාදි මාර්ගයකට උපනිශ්‍රය ඇත්තහුට ම අධ්‍යාශ නියමය වේ. එහෙත් උපනිශ්‍රය නැතහොත් අධ්‍යාශය මාත්‍රයකින් ඵලොත්පත්තිය නො වේ. එහෙයින් මේ වාදයෙහි පාදක- සම්මර්ශන- ධ්‍යානොපනිශ්‍රය ඇති කල්හි ම එකාන්තයෙන් සිද්ධවන අධ්‍යාශ- නියමය ම කෙරේ යැ යි කියන ලදී.

මෙසේ පළමු කොට **සංඛාරොපෙක්ඛා ව්දර්ශනාව ඛොඩ්‍යඛග-මර්ශාඛග-ධ්‍යාන, ඛගයන්** නියම කෙරේ යැ යි දත යුතු.

මේ **සඛ්ඛාරුපෙක්ඛාව** ආදියෙහි පවත් කෙලෙස් විෂකම්හනය කරනුයේ දුකින් (සප්‍රයොගයෙන්) උත්සාහයෙන් විෂකම්හනය කිරීමට හැකි වී නම් **දුක්ඛාපටිපදා** නමු. විපර්‍යාසයෙන් **සුඛා-පටිපදා** වේ.

කෙලෙසුන් විෂකම්හනය කොට මාර්ග ප්‍රාදුර්භාවය සෙමෙන් කරන සංඛාරොපෙක්ඛාව **දන්ධාභිඤ්ඤා** නමු. විපර්‍යාසයෙන් **ඛිප්පාභිඤ්ඤා** වේ. මෙසේ මේ සඛ්ඛාරුපෙක්ඛාව ආගමනීයසථා-නයෙහි පවත් තමන් තමන් ගේ මාර්ගයට නම් දේ. එහෙයින් මාර්ග **දුක්ඛාපටිපදා- දන්ධාභිඤ්ඤා, දුක්ඛාපටිපදා- ඛිප්පාභිඤ්ඤා, සුඛාපටිපදා- දන්ධාභිඤ්ඤා, සුඛාපටිපදා- ඛිප්පාභිඤ්ඤා** යි සතර

* ම: නි: උපරිපණ්ණාසක

නාමයක් ලබ යි. ඒ මේ ප්‍රතිපදාව කිසි භික්ෂුවක් හට වෙන් වෙන් වශ යෙන් ද වේ. කිසි භික්ෂුවක් හට සතර මාගීයෙහි එක ම ප්‍රතිපදාවෙක් වෙයි. **බුදුන් ගේ** වූ කලී සතර මාගීය ම (**සුඛාපටිපදා**) **ඛිප්පා-භිඤ්ඤතාව** වී **ධම්ම සෙනාපති සාරිපුත්ත** **සථවිරයන්ට** ද එසේ මැ යි. **මොග්ගල්ලාන** **සථවිරයන්ට** ප්‍රථම මාගීය **සුඛාපටිපදා-ඛිප්පාභිඤ්ඤා** වී. මතු තුන **දුක්ඛාපටිපදා- දන්ධාභිඤ්ඤා** වී. ප්‍රතිපදාවෙන් අධිපතිභූ ද ඇතැම් භික්ෂූන්ට සතර මාගීයෙහි වෙන් වෙන් වශයෙන් වෙති. ඇතැම් භික්ෂුවක් හට සතර මාගීයෙහි ම එකෙක් ම වේ මෙසේ **සංඛාරුපෙක්ඛා ඤාණය** පටිපදා විශෙෂය ද නියම කෙරේ. **විමොක්ඛ විශෙෂය** නියම කරන අයුරු පෙරැ ම කියන ලදී.

නවද මාගීය වනාහි **සවරසයෙන් හෝ, ප්‍රත්‍යාණීකයෙන් හෝ, සවභාවයෙන් හෝ, ආලම්බනයෙන් හෝ, ආගමන-යෙන් හෝ** මෙසේ කරුණු පසකින් නම් ලබයි.

(1) ඒ මෙසේ යි:- **සංඛාරුපෙක්ඛාඤාණය** අනිත්‍ය හෙයින් සංස්කාර සන්තතිය කොට නැගේ නම් **මාගීය අනිමිත්ත විමොක්ඛ** වේ. දුකඛ හෙයින් සංස්කාර සන්තතිය කොට නැගේ නම් මාගීය **අප්පණිහිත විමොක්ඛ** වේ. අනාත්ම හෙයින් සංස්කාර සන්තතිය කොට නැගේ නම් මාගීය **සුඤ්ඤත විමොක්ඛය** වේ.

මේ සවරසයෙන් ලද නාම යි.

---

(2) මේ මාගීය **අනිවවානුස්සනාවෙන්** සංස්කාරයන් ගේ ඝන විනිභෝග කොට **නිත්‍ය නිමිත්ත යැ, ධ්‍රුව නිමිත්ත යැ, ශාස්වත නිමිත්ත යැ** යන මොවුන් දුරු කෙරෙමින් ආ හෙයින් **අනිමිත්ත නම්.**

දුක්ඛානුපස්සනාවෙන් සුඛ සංඥාව හැර (ප්‍රණිධිය) ප්‍රාර්ථනාව වියළවමින් ආ හෙයින් **අප්පණිහිත** නම්.

අනත්තානුපස්සනාවෙන් ආත්මයැ- සත්ත්වයැ- පුද්ගලයැ යන සංඥා හැර සංස්කාර ශූන්‍යතාවයෙන් දක්නා ලද හෙයින් **සුඤ්ඤතනාමැ යි මේ ප්‍රත්‍යාණීක** හෙයින් සිද්ධ නාම යි.

(3) මේ මාගීය රාගාදීන් වියුක්ත හෙයින් **සුඤ්ඤත** නම්. රූප නිමිති ආදීන්ගේ ද, රාග නිමිති ආදීන්ගේ ද, අභාවයෙන් **අනිමිත්ත** නම්. රාග ප්‍රාර්ථනා ආදීන් ගේ අභාවයෙක් **අප්පණි-හිතය** යි මේ මාගීයට **සවභාව** හෙයින් නම් වේ.

(4) මේ මාර්ගය ශූන්‍ය වූ අනිමිත්ත වූ අප්‍රණිහිත වූ **නිර්වාණය** අරමුණු කරන හෙයින් **සුඤ්ඤත ය, අනිමිත්ත ය, අප්පණිහිතය යි** කියනු ලැබේ. මේ මාර්ගයට ආලම්බන හෙයින් නම් වේ.

(5) **ආගමනය**- විදර්ශනාගමන ය, මාර්ගාගමනය යි දෙවිධ ය. ඒ දෙකින් **මාර්ගයෙහි** විදර්ශනාගමනය ලැබේ. **ඵලයෙහි** මාර්ගාගමනය ලැබේ.

ඒ මෙසේ යි:- අනත්තානුපස්සනාව සුඤ්ඤත ය. ඒ ශූන්‍යතා විදර්ශනාව ගේ මාර්ගය විදර්ශනාගමන වශයෙන් **සුඤ්ඤත ය.** අනිච්චානුපස්සනාව අනිමිත්ත ය. ඒ අනිමිත්ත විදර්ශනා මාර්ගය **අනිමිත්ත නම්**.

විශේෂ:- මේ අනිමිත්ත නාමය **අභිධර්ම පර්‍යායයෙන්** නොලැබේ. අභිධර්මයෙහි සවරසය නොගෙන ම ප්‍රත්‍යක්ෂික හෙයින් නාම ලාභය වන හෙයිනි. සවගුණාලම්බනයෙන් වන නාම ලාභය සවප්‍රධාන වේ. සවරසයෙන් ම නාම ලාභයෙහි සවී ධර්මයන් ගේ ශූන්‍යතාදි භාවය වේ. මාර්ග ව්‍යවස්ථානය නො වේ. එහෙයින් අභිධර්මයෙහි **කාරණ** වශයෙකින් අනිමිත්ත නාම ලාභය ඇති හෙයින් ප්‍රත්‍යක්ෂිකයෙන් නාම ව්‍යවස්ථාව ගන්නා ලැබේනුයි තදභාවයෙන් අනිමිත්ත ලාභය නො ලබ යි.

(මේ පිළිබැඳිවැ පුරාණ සන්නයෙහි විසතර ඇති.)

සූත්‍රානන්දේශනාව පර්‍යාය දෙශනා හෙයින් සූත්‍රානන්ත පර්‍යාය යෙන් සවගුණ මාත්‍රාලම්බනයෙනුදු නාමය ලැබේ. ඒ සූත්‍රානන්ත පර්‍යාය යෙහි **ගොත්‍රභූ ඤාණය** අනිමිත්ත වූ **නිර්වාණය** අරමුණු කොට අනිමිත්ත නම් වැ නෙමේ ආගමන ප්‍රතිපදා ස්ථානයෙහි සිට **මාර්ගයට** නම් දෙනා සි යෙති. (හෙද පර්‍යාය මාත්‍රයෙනි.) ඒ අනිමිත්තය හෙතුකොට ගෙන **මාර්ගය අනිමිත්තය යි** කියන ලදී. මාර්ගාගමනයෙන් **ඵලය** වන්හි **අනිමිත්තය,** යනු යෙදේමැ යි.

දුක්ඛානුපස්සනාව සංස්කාරයන් විෂයෙහි ප්‍රණිධිය විනාශවා ය හෙයින් සවරසයෙන් **අප්‍රණිහිත** නම් වේ. අප්‍රණිහිත විදර්ශනාවෙන් යුක්ත **මාර්ගය** විදර්ශනාගමනයෙන් **අප්‍රණිහිත** ය නම්. ඒ අප්‍රණිහිත මාර්ගයේ **ඵලය ද අප්‍රණිහිත** නම්. මෙසේ විදර්ශනාව තමා ගේ නාමය **මාර්ගයට** දෙයි. මාර්ගය **ඵලයට** නාමය දේ. මේ ආගමන හෙයින් නාම ලාභය යි. මෙසේ මේ **සංඛාරුපෙක්ඛාව විමොක්ෂ** විශෙෂය නියම කෙරේ.

සංඛාරුපෙක්ඛා ඤාණය නිමි.

(9) මේ **සංඛාරුපෙක්ඛා ඤාණය** ඇසිරිකිරීම- වැඩීම- බහුලවැ වැඩීම ඇති යොගීහට අධිමොක්ෂ සංඛ්‍යාත ශ්‍රද්ධාව ආසෙවනාදි භාවනා විශෙෂයෙන් කෘත්‍ය වශයෙන් අධික හෙයින් අනිශයින් බලවත්වැ උපදී. මොනවට රැකුල් ලත් (ප්‍රතිපක්ෂ ක්ලෙශයන් ම ඛපීමට සමර්ථ වූ) වීර්‍යය ඇති වේ. **ආලම්බනාභි**- මුඛ භාවයෙන් මනාවැ එළඹ සිටි සතිය ඇති වේ. **පස්සද්ධි**- සුඛයන් ගේ අතිශයවත් භාවයෙන් මනාවැ සමාහිත චිත්තය වේ. අනුලොමඤාණයා ගේ ප්‍රවෘත්තියට ප්‍රත්‍යය වීමට සමර්ථ හෙයින් අතිශයින් තීක්ෂ්ණ වූ **සංඛාරොපෙක්ඛාව** උපදී. ඒ යොගීහට දැන් දැන් **මාණීය** උපදීය සි කියයුතු කලැ **සංඛාරොපෙක්ඛාව** ත්‍රෛභූමක සංඛාරයන්හි **එල්බ අනිත්‍යයැ** සි හෝ **දුඃඛයැ** සි හෝ **අනාත්මයැ** සි හෝ සන්තීරණය කොට භවාංගයට බසී. භවාඞ්ගයට අනතුරුවැ සංඛාරොපෙක්ඛාව අනිත්‍යාදි වශයෙන් අරමුණු කළ සේම සංඛාරයන් **අනිත්‍යයැ** සි හෝ **දුඃඛයැ** සි හෝ **අනාත්මයැ** සි හෝ සන්තීරණය කොට අරමුණු කෙරෙමින් මනොද්වාරාවජ්ජන සිත උපදී. භවංගය පෙරළා උපන් ඒ ක්‍රියා සිතට අනතුරුවැ අතරක් නැතිවැ චිත්ත සන්තතිය නිරන්තර කොට පවත්වමින් පෙර සේ ම අනිත්‍යාදී වශින් සංඛාරයන් අරමුණු කොට **පරිකර්මය සි** කියන ලද පළමු වන ජවන් සිත උපදී. එයට අනතුරුවැ එසේම සංස්කාර යන් අරමුණු කොට **උපචාරයැ සි** කියන ලද දෙවන ජවන් සිත උපදී. එයට අනතුරුවැ එසේම සංස්කාරයන් අරමුණු කොට **අනුලොමය සි** කියන ලද තුන් වන ජවන් සිත උපදී. මේ ඒ සිත් වලට වෙන වෙන නම්. එහෙත් අවිශෙෂයෙන් ත්‍රිවිධ වූ ම මේ ජවන චිත්තය **ආසෙවනය සි ද, පරිකර්මය සි ද, උපචාරය සි ද, අනුලොමය සි ද** කියන්නට වටී.

විසඳුම:- කුමකට අනුලොම් වේ ද? යත්:-

සූචීභාග පශ්චිම භාගයන්හි වූ ධර්ම කොට්ඨාසයනට අනුලොම් වේ.

ඒ මෙසේ යි:- ඒ ජවන චිත්තය ප්‍රථම වූ උදය-ව්‍යයාදි අවවැදූරුම් විදර්ශනා ඥානයන්ට ලක්ෂණ ත්‍රය සන්තීරණය කිරීම වූ තථ කෘත්‍යය වන බැවින් **අනුලොම්** වේ. මත්තෙහි ද **සත්තිස් බොධිපාක්ෂික ධර්මයනට** තථ කෘත්‍යය සිද්ධ කරන බැවින් **අනුලොම් වේ.**

ඒ ඤාණය අනිත්‍ය ලක්ෂණාදි වශයෙන් සංස්කාරයන් ඇරඹූ පවත්නා හෙයින් **උදය-ව්‍යය ඤාණය** උදය ව්‍යයවත් සංස්කාරයන් ගේ ම උත්පාද ව්‍යය දිටිය සි ද, **භඞ්ගානුපස්සනා ඤාණය** ඒකාන්තයෙන් භඞ්ගය **ඇති** ධර්මයන් ගේ භඞ්ගය දිටිය සි ද, ඒකාන්තයෙන් භය සහිත වූයෙහි ම **භයතුපට්ඨාන ඤාණයට** භය සහිතවැ වැටහිණෙයි ද, **ආදීනවානුපස්සනාව** ආදීනව සහිත වූයෙහි ම ආදීනව දිටිය සි ද, **නිබ්බිදා ඤාණය** නිර්වේද කටයුත්තෙහි ම නිර්විග්න වය සි ද, **මුඤ්චිතුකම්‍යතා ඤාණය** මිදිය යුත්තෙහි ම මිදෙනු කැමැති වය සි ද, **පටිසංඛා ඤාණයෙන්** අනිත්‍යාදි වසින් පටිසඞ්ඛා (නුවණින් සැලකීම) කරන ලදුයි ද, **සංඛාරුපෙක්ඛා ඤාණයෙන්** උපෙක්ෂා කටයුත්තෙහි ම උපෙක්ෂිතය සි ද, **අථ** හෙයින් කියන්නාක් මෙන් මේ අට වැදෑරුම් ඤාණයන් ගේ තථ කෘත්‍යය ඇති බැවින් මතු **මාගීයෙහි ද සත්තිස් බොධිපාක්ෂිකධර්මයනට** ඒ සම්‍යක් ප්‍රතිපත්තියෙන් පැමිණිය යුතු බැවින් **අනුලෝම** වෙයි

නිදර්ශනයෙකි:- දූහැම් රජෙක් විනිශ්චයාසනයෙහි හුන්නේ ව්‍යවහාරික (අධිකරණ) ඇමතියා ගේ විනිශ්චය අසා අගතිගමනයට නොගොස් මැදහත්වැ එසේ වේවා සි අනුමෝදන් වනුයේ ඒ විනිශ්චයට ද පුරාතන රාජධර්මයට ද අනුලෝම් වෙයි.

උපමාන උපමෙය සංසන්දනය:- **අනුලෝම ඤාණය** රජු මෙන් ද, අටවැදෑරුම් ඤාණයෝ අධිකරණ ඇමතියන් මෙන් ද, **සත්තිස්බොධිපාක්ෂික ධර්මයෝ** පෞරාණික රාජ ධර්මයන් මෙන් ද, දතයුතු වෙති. එසේ වේවා! සි කියනුයේ ව්‍යවහාරික අමාත්‍යයන්ට ද, විනිශ්චයට ද, රාජධර්මයට ද, අනුලෝම් වන්නාක් මෙන් අනිත්‍යාදි වශයෙන් සංස්කාරයන් ඇරඹ උපන්නා වූ අට නුවණට ද, තථ කෘත්‍ය කරන බැවින් අනුලෝම් වෙයි. මතුයෙහි ද **සත්තිස් බොධිපාක්ෂිකධර්මයනට** අනුලෝම් වේ. එහෙයින් **සච්චානුලෝමික ඤාණය** සි කියනු ලැබේ. (ටීකාහි ද විශෙෂ විස්තර යෙකි.)

අනුලෝම ඤාණය නිමි.

අනුලෝම ඤාණය දක්වා එයට අනුවර්තක ව්‍යුත්ථානගාමිනී විදර්ශනාව දක්වනුවෝ, මේ අනුලෝමඤාණය සංස්කාරාලම්බනික වූ ව්‍යුත්ථාන ගාමිනී විදර්ශනාව ගේ කෙළවර වේ. සම්ප්‍රකාරයෙන්

වකාහි ගොත්‍රභූ ඥානය ව්‍යුට්ඨානගාමිනී විදර්ශනාවේ පර්‍යවසානය යි' දැන් ඒ පර්‍යවසාන වශයෙන් ආ ව්‍යුට්ඨානගාමිනී විදර්ශනාවේ නුවණලා වීම පිණිස මේ සූත්‍ර සංසන්දනය දතයුතු.

ඒ මෙසේ යි:- **සළායතන විභඞ්ග සූත්‍රයෙහි;**

"අතම්මයතං භික්ඛවෙ නිස්සාය අතම්මයතං ආගම්ම යායං උපෙක්ඛා එකත්තා එකත්තසිතා තං පජහථ තං සමතික්කමථාති"* 'මහණෙනි අතම්මයතාව (ව්‍යුට්ඨානගාමිනී විදර්ශනාව) නිශ්‍රය කොට අතම්මයතාවට පැමිණ යම් උපෙක්ෂාවක් එකසුවභාවයක් ඇත් ද, එක් අරමුණක් ඇති බව ඇසුරු කොට පවතී ද? ඒ උපෙක්ෂාව තදුලම්බන කෙලෙස ප්‍රහාණයෙන් දුරු කරව්, ඒ ඉක්මවව්, මෙහි ව්‍යුට්ඨානගාමිනී විදර්ශනාව **අතම්මයතාය යි** වදරන ලදුව.

අලගද්ද සූත්‍රයෙහි:- "නිබ්බිඳං විරජ්ජති විරාගා විමුච්චතීති"† 'සසර කළකිරුණේ නො ඇලේ. නො ඇල්මෙන් මිදේ' මෙසේ **ව්‍යුට්ඨානගාමිනී** විදර්ශනාව **නිබ්බිදය යි** වදරන ලදුව.

සුසීම සූත්‍රයෙහි:- **"පුබ්බෙ ඛො සුසීම ධම්මට්ඨිතිඤාණං පච්ඡා නිබ්බානෙඤාණං"**‡ 'සුසීමය! පූර්‍වයෙහි ධම්මට්ඨිතියෙහි (පටිච්චසමුප්පාදයෙහි) නුවණලා බව වේ. පසු වැ නිර්‍වාණඥානය වේ.' මෙසේ **ධම්මට්ඨිතිඤාණය යි** වදරන ලදී.

පොඨපාද සූත්‍රයෙහි:- "සඤ්ඤා ඛො පොඨපාද පඨමං උප්පජ්ජති පච්ඡා ඤාණං"? 'පොඨපාදය! සඤ්ඤාව (ව්‍යුට්ඨානගාමිනී විදර්ශනාව) පළමු වැ උපදී පසු වැ ඥානය උපදී.' මෙහි **සඤ්ඤාඥාන** යි වදරන ලදී.

දසුත්තර සූත්‍රයෙහි:- "පටිපදාඤාණං දස්සන විසුද්ධි පාරිසුද්ධි පධානියඞ්ගං"+ 'පටිපදා ඤාණ දස්සන විසුද්ධිය පාරිසුද්ධි පධානියඞ්ගය' යි මෙසේ ව්‍යුට්ඨානගාමිනී විදර්ශනාව පාරිසුද්ධිපධානියඞ්ගය යි වදරන ලදී.

---

* ම: නි: උපරිපණ්ණාසක
† ම: නි: මූලපණ්ණාසක
‡ සං: නි: දෙවපුත්තසංයුත්ත
? දී: නි: සීලක්ඛන්ධවග්ග
+ දී: නි: පාඨිකවග්ග

පටිසම්භිදාමග්ගෙහි:- **"යා ච මුඤ්චිතුකම්‍යතා යා ච පටි-සංඛානුපස්සනා යා ච සංඛාරුපෙක්ඛා ඉමේ ධම්මා එකත්‍ථා ව්‍යඤ්ජනමේව නානා"*** **මුඤ්චිතුකම්‍යතා ඤාණය ද පටි-සංඛානුපස්සනා ඤාණය ද, සංඛාරුපෙක්ඛා ඤාණය ද** යන මේ ධර්මයෝ එකාර්ථයහ. ව්‍යඤ්ජනය ම වෙනසි සි' මෙසේ **ව්‍යුත්ථාන ගාමිනී විදර්ශනාව** මේ නාම තුනින් වදාරන ලදී.

පට්ඨානයෙහි **"අනුලෝමං ගොත්‍රභුස්ස අනුලෝමං වොදනස්ස"†** 'අනුලෝම චිත්තය ගොත්‍රභූ චිත්තයට ද, අනුලෝමය වොදනයට ද' ප්‍රත්‍යය වේය සි මෙහි **අනුලෝම- ගොත්‍රභූ-වොදන** යන නම් තුනෙක් වදාරන ලදී.

රථවිනීත සූත්‍රයෙහි:- **"කිං පනාවුසෝ පටිපදාඤාණ-දස්සන විසුද්ධත්‍ථං භගවති බ්‍රහ්මචරියං වුස්සති"‡** 'ඇවැත්නි! ප්‍රතිපදාඥානදර්ශන විශුද්ධිය සඳහා භගවත්හු කෙරෙහි බඹසර වෙසේ දෑ'සි මෙහි **වුට්ඨානගාමිනී විදර්ශනාව ප්‍රතිපදාඥානදර්ශන විශුද්ධිය** සි වදාරන ලදී.

මේසේ **අනමතග්ගයනාදි** නොඑක් තන්හි මහාර්ෂි වූ සම්‍යක් සම්බුද්ධයෝ ඥානත වූ පිරිසුදු වූ **ව්‍යුත්ථානගාමිනීවිදර්ශනාව** වදාළහ. එහෙයින් මහත් භය ඇති සසර දුක් මඬින් නැගෙනු කැමැති උපන් පඬිබව ඇත්තේ එහි නිතර යොග කරන්නේ සි.

මෙසේ සාධුජනයා ගේ ප්‍රමොදය පිණිස කළ විශුද්ධි මාගීයෙහි ප්‍රඥා භාවනාධිකාරයෙහි **ප්‍රතිපදා ඥාන දර්ශන විශුද්ධි නම්** වූ එක් විසි වන පරිච්ඡේදය නිමියේ සි.

---

* ප: මූ: † ප: ප: ‡ ම. නි: මූලපණ්ණාසක

22. ඤානදස්සනවිසුද්ධි නිද්දේසය

මේ අනුලොමඤාණයෙන් මතුයෙහි **ගොත්‍රභුඤාණය** වේ එය මාගීය ආවජ්ජනා කරන **සඨානයෙහි** වූ හෙයින් **ප්‍රතිපද ඤාන-දස්සනවිසුද්ධිය ද, ඤානදස්සනවිසුද්ධිය ද** නො බෙජේ.

(එහෙයින් ම එය විඤඤාණ ධාතූන්ට විෂය දක්වන (දස්සනාදී-කෘත්‍යය කරන) **ක්‍රියා-මනොධාතුව** මෙන් මාගීයට ආවජ්ජන සඨානීය යි කියන ලදී. (සත්‍ය යි)

සවන සත්වන විසුද්ධීන් ගේ මධ්‍යයෙහි අබෙධාගාරික ම වේ. (උභය විසුද්ධි ලක්ෂණ නැති හෙයිනි)

එහෙත් වුඨානගාමිනී විදර්ශනාව ගේ අවසානය වූ විදර්ශනා-ශ්‍රොතස්හි පතිත වූ හෙයින් විදර්ශනායැ යි ගණනට් යේ.

ශ්‍රොතාපත්තිමාගීය, සකෘදගාමිමාගීය, අනාගාමි මාගීය, අර්හත් මාගීය, යන මේ සතර මාගීයෙහි ඤානය **ඤාණදස්සන විසුද්ධි** නම් වේ.

විභාවනාව:- ඔවුනතුරින් **ප්‍රථම මාර්ග ඤානය** සම්පාදනය කරනු කැමැති යොගීහු විසින් කළමනා අන් කිසිවෙක් නැති. හුදෙක් ඔහු විසින් කළමනා දෑ අනුලොමය අවසන් කොට ඇති විදර්ශනා උපදවන්නේ කෙළේම වේ. මෙසේ උපන් **අනුලොම ඤානය** ඇති ඒ යොගීහු ගේ ඒ **පරිකර්ම, උපචාර, අනුලෝම,** යන **අනුලොමඤාණ** තුනින් තමා බලයට් සුදුසු සේ මහත්-මහත් සත්‍යය වසා සිටි මොහාන්ධකාරය අන්තර්ධාන කළ කල්හි සියලු සංස්කාර ගතයෙහි සිත නො යව යි. සියලු සංස්කාර-යෙහි සිත නො සිටී, නො ඇලේ, නො රැඳේ, නො ලැගේ, නො බැඳේ, නෙළුම් පතැ හුණු දියත්තක් මෙන් හැකිලේ. පැකිලේ, පෙරැලේ, සියලු සංස්කාර නිමිත්තාලම්බනයෝ ද, සියලු විපාක ප්‍රවෘත්ති ආලම්බනයෝ ද, පළිබෝධ හෙයින් වැටහෙත්. ඒ යොගීහට ඒ සියලු නිමිත්තාරම්මණයන් හා පවත්තාරම්මණයන් හා **පළිබෝධ** හෙයින් වැටහුණු කල්හි **අනුලොමඤාණය** ආසෙවන විසින් උපන් අනතුරුවැ අනිමිත්ත වූ (සංස්කාර නිමිති නැති) සංස්කාර ප්‍රවෘත්ති නැති, සංස්කාරයෙන් වියුක්ත වූ, සංස්කාර විරෝධ වූ නිරෝධ වූ **නිවන** අරමුණු කෙරෙමින්, පෘථග්ජන ගොත්‍රය, පෘථග්ජන සංඛ්‍යාව

පෘථග්ජන භූමිය ඉක්මවන්නා වූ, ආර්‍ය්‍ය ගොත්‍රයට, ආර්‍ය්‍ය සංඛ්‍යාවට, ආර්‍ය්‍ය භූමියට පමුණුවන නිර්‍වාණාලම්බනයෙහි ප්‍රථමාවර්ජිතය වූ ප්‍රථමාභෝගය වූ, ප්‍රථම සමන්නාහාරය වූ, **මාර්ගයට අනන්තර- සමනන්තර- ආසෙවන- උපනිස්සය- නැති- විගත** යන සභාවාරයෙන් ප්‍රත්‍යය බව සිද්ධ කෙරෙමින් සිඛාප්‍රාප්ත වූ (විදර්‍ශනාව ගේ මස්තකය වූ) පෙරලා නොඑන (එක් වරක් ම උපදනා) **ගොත්‍රභූ** (චිත්තය) ඥානය උපදී.

එයින් කිහ. **"කථං ඛඞ්ගා වුට්ඨාන විවට්ටනෙ පඤ්ඤා ගොත්‍රභූ ඤාණං? උප්පාදං-අභිභුය්‍යතීති ගොත්‍රභූ. පවත්තං-උපායාසං අභිභුය්‍යතීති ගොත්‍රභූ, ඛඞ්ගා සංඛාර නිමිත්තං අභිභුය්‍යතීති ගොත්‍රභූ, අනුප්පාදං පක්ඛන්දතීති ගොත්‍රභූ, අප්පවත්තං -පෙ- අනුපායාසං නිරොධං නිබ්බාණං පක්ඛන්දතීති ගොත්‍රභූ. උප්පාදං අභිභුයිත්වා අනුප්පාදං පක්ඛන්දතීති ගොත්‍රභූ"***

"අසංඛත ධාතුවෙන් පිටත්හි සංස්කාරයෙන් වුඨානය වූ විවට්ටනයෙහි (නිපදවන්නහු ගේ) ප්‍රඥාව කෙසේ ගොත්‍රභූ ඤාණය වේ ද?

උත්පාදය මඩිනු සි ප්‍රවෘත්තිය- දැඩි ආයාසය මඩිනු සි **ගොත්‍රභූ නම්.** අසංඛත ධාතුවෙන් පිටත සංස්කාර නිමිති මඩිනුයි ද, අනුත්පාද (**නිර්‍වාණ**) යට වදිනුයි ද **ගොත්‍රභූ නම්.** සංස්කාරයන් ගේ නොපැවැත්ම- උපායාස නැති සංස්කාර නිරෝධය වූ **නිර්‍වාණයට** වදිනු සි **ගොත්‍රභූ** නම්." (සිංහල විසතර කළ යුතු සි.)

ඒ පාඨයෙහි එක ආවර්ජිතයෙන් එක් ජවන වීථියෙහි පවත්නා **අනුලොම-ගොත්‍රභූ** ඤාණයන් ගේ නන් අරමුණෙහි පවත්නා ආකාර දැක්වීමෙහි මේ උපමාවෙකි.

'මහ ඇලක් පැන එතෙර පිහිටනු කැමැති පුරුෂයෙක් වහා දිව ඇල මෙතෙර සිට වෘක්ෂ ශාඛායෙහි බැඳි එල්බෙන රැහැනක් හෝ යටක් ගෙන උඩින් පැන පර තීරයට නිම්න-ප්‍රවණ- ප්‍රාග්භාර වූ කය ඇතිවැ පර තීරයේ මතු භාගයට පැමිණ ඒ රැහැණ හෝ යට හෝ හැරපියා වෙවුලමින් පරතෙර පතිතවැ සෙමෙන් පිහිට සි.

---

* ප: ම: ඤාණකථා

මෙසේ මේ යොගාවචරතෙමේත් භව- යොනි- ගති- සත්ත්ව-නිවාසයන් ගේ පරතෙර වූ **නිවණ**ෙහි පිහිටනු කැමැත්තේ **උදයව්‍යයානුදර්ශනාදි** වෙගයෙන් දිවැ ආත්මභාව **නැමැති** වෘක්ෂ ශාඛායෙහි එල්වන්නා ලද රූප නැමැති රැහැන හෝ වේදනාදීන් අතුරින් එක් වෙදනාදී **නැමැති** දණ්ඩක් හෝ **අනිත්‍යයැ සි** හෝ **දුක්ඛයැ සි** හෝ **අනාත්මයැ සි** හෝ අනුලොම ආවජ්ජනයෙන් ගෙන ඒ නො හැරුම ප්‍රථම අනුලොම චිත්තයෙන් උඩ නැඟී දෙවෙනි අනුලොම චිත්තයෙන් පර තීරයට නිමිත්ත- ප්‍රවණ- ප්‍රාග්භාර සිත් ඇතිවැ තුන් වන අනුලොම චිත්තයෙන් පර තීරයේ මතුභාගයට පැමිණියෙක් මෙන් දැන් පැමිණිය යුතු **නිවනට** ආසන්නාව ඒ තුන් වන අනුලොම චිත්ත නිරොධයෙන් ඒ සංස්කාරාලම්බනය හැරපියා ගොත්‍රභූ සිතින් විසංඛාර වූ, පරතීර වූ, **නිබ්බානයෙහි** පතිත වේ. එක් වරක් ම ලද අරමුණෙහි ආසෙවන නො ලද බැවින් වෙවුලන ඒ පුරුෂයා සේ පළමු කොට සුප්‍රතිෂ්ඨිත නො වේ. ඉක්බිති **මහනුවණින්** පිහිටන්නේ වේ.

විශෙෂ:- මෙහි අනුලොමඤාණය සත්‍යය මුවහ **කරන** කෙලෙස් අඳුර දුරු කරන්නට පොහොසත් **වේ**. **නිබ්බානය** අරමුණු කිරීමට නො පොහොසති. ගොත්‍රභූඤාණය **නිබ්බානය** අරමුණු කිරීමට පොහොසති. සත්‍යය මුවහ **කරන** තමස දුරු-කරන්නට නො පොහොසති.

මේ එහිලා උපමාවෙකි:- එක් ඇස් ඇති පුරුෂයෙක් නක්ෂත්‍ර හා චන්ද්‍රයා ගේ යෝගයක් දැනගනිම් සි රාත්‍රි භාගයෙහි නික්ම සඳ දක්නා පිණිස උඩ බැලී ඔහට වලාගෙන් වැසුණු හෙයින් සඳ **නො** පැනිණි. එවේලෙහි එක් **වාතයෙක්** නැග ඝන-ඝන වලාපටලයන් පහ කෙළේ ය. අනෙක් වාතයෙක් නැඟී මධ්‍යම වලාපටලයන් පහකෙළේ ය. අනෙක් වාතයෙක් නැඟී සියුම් වලාහකයනුදු පහ කෙළේ ය. එක්බිති ඒ පුරුෂයා පහ වූ වලා ඇති අහසෙහි සඳ දැක නක්ෂත්‍ර යොගය දනී.

එහි තුන් වලාහකයන් මෙන් සත්‍යය මුවා කරන සථූල-මධ්‍යම- සූක්ෂ්ම කෙලෙසාඛ්කාරය දතයුතු. තුන් වාතයන් මෙන් තුන් අනුලොම චිත්තයෝ ද, ඇස් ඇති පුරුෂයා සේ ගොත්‍රභූ ඤාණය ද, සඳ මෙන් **නිවණ ද**, එකී එකී වාතයෙන් යථා ක්‍රම-යෙන් වලාහක විඛමනය මෙන් එකී-එකී අනුලොම චිත්තයා ගේ සත්‍යය ප්‍රතිච්ඡාදක කෙලෙසාඛ්කාරය දුරු කිරීම ද, වලා පහ වූ

අහසෙහි ඒ පුරුෂයා ගේ පිරිසිදු සඳ දැකීම මෙන් සත්‍යය ප්‍රතිවේධදක මොහාන්ධකාරය **නැසුණු** කල ගොත්‍රභූ ඤාණයා ගේ (විශුද්ධ) **නිර්වාණ** දර්ශනය ද දතයුතු.

විශේෂ:- තුන් වානය සඳ මුවහ කොට සිටි වලාපවලයන් නැසීමට ම සමර්ථ වනු විනා සඳ දක්නට නො **පොහොසත්** වන්නා සේ තුන් **අනුලෝමඤාණයෝ** සත්‍යය වැසූ මොහාන්ධකාරය ම දුරු කිරීමට සමර්ථ වෙති. **නිවන්** දක්නට අසමර්ථ වෙති. ඒ පුරුෂයා සඳ දැකීමට සමර්ථ වනු විනා වලා නැසීමට **නො** පොහොසත් වන්නා සේ ගොත්‍රභූඥානය **නිවන්** දක්නට පොහොසත් වේ. කෙලෙස් අදුර නැසීමට සමර්ථ නො වේ. එහෙයින් මේ ගොත්‍රභූ ඥානය මාර්ගයට ආවර්ජනය යි කියනු ලැබේ.

ඒ වූකලී ආවර්ජන නුවූයේ ම ආවර්ජන සථානයෙහි සිට 'මෙසේ උපදුව යි. මාර්ගයට සංඥ දෙන්නක්හු මෙන් නිරුද්ධ වේ. මාර්ගය ද ඒ ගොත්‍රභූ චිත්තය විසින් දුන් සංඥව නො හැරීම අතුරක් නැති ප්‍රබන්ධ වශයෙන් ඒ ගොත්‍රභූ ඥානය ලුහු බඳිනු ලබන්නේ නො විදිවිරූ නො පැළුවිරූ ලොභසහගතය ද, වෙෂ සහගතය ද, මොහසහගතය ද, විදිමින්-පළමින් උපදනෝ වේ.

එහි මේ උපමා යි:- එක් දුනුවායෙක් අට ඉස්බක් පමණ දුර සිට පුවරු සියයක් තබවා වසත්‍රයකින් මුහුණ වසා බැඳ හීයක් හයා වක්‍ර යන්ත්‍රයෙහි සිටියේ ය. අන් පුරුෂයෙක් වක්‍රයන්ත්‍රය බමවා යම් වේලෙකැ දුනුවායාට පුවරු සියය අභිමුඛ වේ නම් එතැලැ ඒ වක්‍රයෙහි දණ්ඩකින් සලකුණු දෙයි. දුනුවායා දඬුවෙන් කළ සලකුණු නො හැරැ හීය හැරපියා පුවරු සියය විදී.

උපමාන-උපමෙය සංසන්දනය මෙසේ යි:- එහි දඬු සලකුණ මෙන් ගොත්‍රභූ ඥානය ද, දුනුවායා මෙන් මාර්ග ඥානය ද, දුනුවායා ගේ දුනු දඬුවෙන් කළ සංඥව නො හැරැ පුවරු සියය විදීම මෙන් මාර්ගඥානයට ගොත්‍රභූ ඥානයෙන් දෙන ලද සංඥව නො හැර නිවන් අරමුණු කොට පෙර නො විදි පෙර නො පැළූ ලොභ- වෙෂ- මොහ **සහගතයන්** පැළීම ද, දතයුතු. හුදෙක් මේ මාර්ගය ලොභසහගතාදිය නිර්ඛෙධය (පැලීම) මැ නො කෙරේ. මුල් නැති සසරවට දුක්මුහුදු විසඳ යි. සියලු අපාය දොර වස යි සපත ආර්‍ය්‍ය ධනයට අභිමුඛ කෙරෙ යි. (අෂ්ටාඞ්ගික) මිථ්‍යාමාර්ගය හරි යි. සියලු (කෙලෙස්) සතුරු බිය සංසිඳුව යි. **සම්‍යක් සම්බුඩයන් ගේ** ඖරස පුත්‍රබවට පමුණුව යි.

අනෙක් නොයෙක් සිය ගණන් ආනිසංසයන් ගේ ප්‍රතිලාභය පිණිස වේ. මෙසේ **අනෙක** ආනිසංස දායක වූ සොවාන් මග හා සැපියුතු නුවණ **සොතාපත්ති මග ඤාණ** නම් වේ.

ප්‍රථම මාර්ගඥානය නිමි.

විශේෂ:- මේ මාර්ග ඥානයට අනතුරුවැ එම මාර්ගඥානයා ගේ විපාක වූ **ඵල-සිත්** දෙක තුනෙක් උපදී. තවද සතර ලොකොත්තර කුශල (මාර්ග) යන් අනතුරු විපාක ඇති හෙයින්ම **"සබ්බාධිමානඝාතාරහඤ්ඤමාහු"*** 'මාර්ගය තමා ගේ පැවැත්මට අනතුරුවැ ම ඵල උපදවන හෙයින් **ආනන්තරික සමාධිය** සි කිහු' යනු ද,

"දණ්ඩං ආනන්තරිකං - පාපුණාති ආසවානං ඛයාය" 'ආශ්‍රවයන් ගේ ක්ෂය පිණිස ලස්වැ අනතුරු ඵල දෙන මගට පැමිණේ' යනු ද එයින් කියන ලදී.

මතභේද:- ඇතැම් ආචාර්‍ය කෙනෙක් 'මාර්ගඥානයට අනතුරුවැ ඵල සිත් එකෙක්- දෙකෙක්- තුනෙක්- සතරෙක් හෝ උපදීය සි කියති. ඒ නො ගත යුතු සි. **අනුලෝමයා** ගේ ආසෙවනයෙන් කෙළවරැ ගොත්‍රභූ ඤාණය උපදී. **එහෙයින්** යටත් පිරිසෙයින් අනුලෝම සිත් දෙකක් විය යුතු ය. එකක් ආසෙවන ප්‍රත්‍යය නො ලබන හෙයිනි. එකාවර්ජිතවිපි නොමෝ **ජවන සිත් සතක් පරම කොට ඇත්තී වේ**

මෙහි අභිප්‍රාය:- එක් අනුලෝම සිතක් වුවහොත් ආසෙවන ප්‍රත්‍යය නො ලබන හෙයින් එක් අනුලෝමයෙක් නො වේ. යටත් පිරිසෙයින් අනුලෝම සිත් දෙකක් වත් විය යුතු හෙයින් තුන් වනුවැ ගොත්‍රභූ වේ. සතර වනුව **මාර්ග** වේ. එසේ වන්නා තව සිත් තුනකට ආයු ඇති හෙයින් **ඵල සිත්** තුනක් පමණක් උපදී. (සතරෙක් නූපදී. ආයු නැති හෙයිනි.) යමෙකුට අනුලෝම සිත් තුනෙක් වී නම් ඔහුට සතර වනුව ගොත්‍රභූ සිත ද, පස් වනුවැ **මාර්ග** සිත ද, වේ. **ඵලසිත්** දෙකෙක් වේ. ඵලසිත් දෙකෙක් හෝ තුනෙක් හෝ වේය සි කියේ එහෙයිනි.

තවද මතාන්තරයෙකි:- යමකුට අනුලෝම සිත් සතරෙක් වේ නම් ඔහුට පස් වනුවැ ගොත්‍රභූ සිත ද 'සවනුවැ මාර්ග සිත ද' වේ. එක් ඵල සිතෙක් වේය සි කියති. එය සාර වසින් නොගත යුතු සි.

---

* බු: පා: රතනසුත්ත

(අජීණ වීථියෙහි සතර වතුවැ හෝ පස් වතුවැ හෝ අජීණ වේ. ඉන් ඔබ්බෙහි නොවේ. 'භවාඞ්ගයට ආසන්න හෙයිනැ' යි කී හෙයිනි. එල සිත් දෙකක් ඉපදීමට අවකාශ නිබිය යුතු හෙයින් අනුලෝම සිත් තුනකට වඩා නූපදී.) මෙතෙකින් **ශ්‍රොතාපන්නයි ඵලසමඞ්ගියේ** දෙවන **ආර්‍යපුද්ගලයා** වෙයි. දිව්‍ය රාජ්‍ය- චක්‍රවර්තීරාජ්‍යාදිය ලැබීමෙන් ඉතා ප්‍රමාදවූයේ නමුදු සත් වරක් දෙවියන් අතරැ ද, මනුෂ්‍යයන් අතරැ ද දිවැ ඇවිද දුක් කෙළෙවර කිරීමට සමර්ථ වේ.

ඵලචිත්තාවසානයෙහි ඒ ආර්‍යයා ගේ සිත භවාඞ්ග වේ. ඉක්බිති භවාඞ්ගය සිදී මාගීප්‍රත්‍යවෙක්ෂා පිණිස මනොවාරාවර්ජන සිත උපදී. එය නිරුද්ධ වූ කලැ පිළිවෙළින් මාගී ප්‍රත්‍යවෙක්ෂා කරන ජවන් සතෙක් උපදී. නැවැතැ භවාඞ්ග වේ. පෙර සේ ම නැවැතත් ඵල ප්‍රත්‍යවෙක්ෂා ජවන් සතක්ද යි මෙසේ **මාගීය** ප්‍රත්‍යවෙක්ෂා කෙරේ. **ඵලය** ප්‍රත්‍යවෙක්ෂා කෙරේ. **ප්‍රහීණ ක්ලේශ** ප්‍රත්‍යවෙක්ෂා කෙරේ. **අවශේෂ ක්ලේශ** ප්‍රත්‍ය-වෙක්ෂා කෙරේ. **නිවන ද** ප්‍රත්‍යවෙක්ෂා කෙරේ.

විභාවර:- ඒ **සෝවාන්මග්ග** 'මම මේ මගින් එකාන්තයෙන් ආමි යි' **මාගීය** ප්‍රත්‍යවෙක්ෂා කෙරේ. අනතුරුවැ 'මා විසින් මේ අනුශස් ලබන ලදැ යි' **ඵලය** ප්‍රත්‍යවෙක්ෂා කෙරේ. අනතුරුවැ 'මාගේ මේ නම් ක්ලේශ පහවීය යි' **පහ වූ ක්ලේශ** ප්‍රත්‍යවෙක්ෂා කෙරේ. ඉක්බිති 'මේ ක්ලේශ ඉතිරිවීය යි' **ඉතිරි ක්ලේශ** ප්‍රත්‍යවෙක්ෂා කෙරේ. අවසනැ 'මා විසින් මේ ධර්මය ආලම්බන කිරීමෙන් ප්‍රතිවෙධ කරන ලදැ යි' අමෘත වූ **නිර්වාණය** ප්‍රත්‍යවෙක්ෂා කෙරේ. මෙසේ සෝවාන් ආර්‍යයාහට ප්‍රත්‍යවෙක්ෂා පසෙක් වේ. සෝවාන් වූවහුට මෙන් **සකදාගාමි - අනාගාමීන්ට** ද ප්‍රත්‍යවෙක්ෂා පස පස වේ. **රහත්හට** වනාහි අවශිෂ්ට කෙලෙසුන් ගේ ප්‍රත්‍යවෙක්ෂාවෙක් නැති. මෙසේ **එකුන්විසි ප්‍රත්‍යවෙක්ෂා ඤාණයක්** වෙති.

මේ උත්කෘෂ්ට පරිච්ඡේදයෙහි.

විශෙෂ:- ප්‍රහීණ- අවශිෂ්ට කෙලෙස ප්‍රත්‍යවෙක්ෂණය ශෛක්ෂයන්ට වන්නේත් වෙයි. නොවන්නේත් වෙයි.

ඒ එසේමැ යි:- ඒ අභාවයෙන් ම **මහානාම ශාක්‍යතෙමේ** සමහර කලෙකැ ම සිත ලොභ ධර්මයන් වැළඳ ගෙන සිටිනා බැවින් **භාග්‍යවතුන් වහන්ස!** "කවර ධර්මයෙක් මාගේ සන්තානයෙහි අප්‍රහීණද යි" බුදුන් වෙතින් විමාළේ යි. මේසේ මෙහිලා සියලු සූත්‍රය විසතර* හෙයින් දතයුතු.

---

* සං: නි: සොතාපත්තිසංයුක්ත

මෙසේ පස්වැනි **සොවාන්** ආර්ය්‍ය තෙමේ ඒ ආසනයේ ම හිඳ හෝ අන් කලෙක හෝ **කාමරාග - ව්‍යාපාද** තුනී කිරීමෙන් දෙවෙනි **ශ්‍රාමණ්‍යඵල** ප්‍රතිලාභය පිණිස යෝග කෙරේ. ඒ ආර්ය්‍යශ්‍රාවක තෙමේ **ශ්‍රද්ධාදී පඤ්චේන්ද්‍රියයන් ද, ශ්‍රද්ධාදී බල-යන් ද, සම්‍බොජ්ඣාදී බොධ්‍යඞ්ගයන් ද** රැස් කොට රූප-වේදනා සංඥා-සංස්කාර-විඤ්ඤාණයැ යන හෙද ඇති සංස්කාරගතය **අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්‍මයැ** සි නුවණින් පරිමර්දනය කෙරේ. නැවැතැ-නැවැතැ පරිවර්තනය කෙරේ. **උදය-ව්‍යයානු-දර්ශනඥානයෙහි** පවත් විදර්ශනා වීථියට බසී. මෙසේ පිළිපන් ඔහුට පෙර **උදය-ව්‍යය ඤාණාදිය** උපන් සේ කී නයින් ම සංස්කාරෝ-පෙක්ඛාව ගේ අවසානයෙහි එක් ආවර්ජනයෙන් **අනුලෝම ගොත්‍රභූ** ඤාණයන් උපන් කලැ ගොත්‍රභූ ඤාණයට අනතුරුවැ **ශකෘදාගාමි මාර්ගය** උපදී. ඒ ශකෘදාගාමි මාර්ග සම්ප්‍රයුක්ත ඥානය **සකදාගාමිඵලඥාන** නම් වේ.

ද්විතීය මාර්ගඥානය නිමි.

මේ දෙවෙනි මාර්ගඥානයට අනතුරුව ද යට කී සේ **ඵල** ඇත් දත යුතු යි. මෙතෙකිනුදු මේ තෙමේ **ශකෘදාගාමි නම්** සිවු-වැනි **ආර්ය්‍ය පුද්ගලයා** වේ. එක වරක් මේ ලෝකයට අවුත් දුක් කෙළවර කිරීමට සමර්ථ වූයේ වෙයි.

(**විශේෂ**:- **ශකෘදාගාමි** ආර්ය්‍යයෝ පස් දෙනෙකි.

(1) මේ **ලොව ශකෘදාගාමි ඵලයට පැමිණ මෙහිදීම රහත්වැ පිරිනිවෙන්නා යැ.**

(2) **මෙලොවැ ශකෘදාගාමිවැ දෙව් ලොවදී පිරි-නිවෙන්නා යැ.**

(3) **දෙව්ලොවදී ශකෘදාගාමිවැ දෙව් ලොව ම පිරි-නිවෙන්නා යැ.**

(4) **දෙව් ලොවදී ශකෘදාගාමිවැ මෙලොව පැමිණ පිරිනිවෙන්නා යැ**

(5) **මෙහිදී ශකෘදාගාමිවැ දෙව්ලොව ඉපිද** ආයු ඇතිතාක් සිට **නැවැතැ මේ මිනිස් ලොවැ ඉපිද පිරිනිවෙන්නා යැ** කියා සි. මේ පස් වැනි ආර්ය්‍යයා, මෙහි 'එක් වරක් මේ ලොවට එන්නා යනුයෙන් ගැනේ.)

ඒ ඵල සිතට අනතුරුවැ මග- පල- පැහුණු කෙලෙස්- සෙසු කෙලෙස්- **නිවන්** ප්‍රත්‍යවෙක්ෂණ කරන සිත් උපදී.

ඒ **ශක්‍රාදිගාමි ඵලසථ ආයුෂ්මතෝ** ඒ ආසනයේ ම හිඳ හෝ, එයට පසුවැ හෝ, **කාමරාග-ව්‍යාපාදයන්** නිරවශෙෂ ප්‍රහාණයෙන් තෘතීය භූමිය වූ **අනාගාමි මාර්ගයට** පැමිණීම පිණිස (විදර්ශනා) යොග කරයි.

ඒ ආර්‍ය්‍ය තෙමේ **ඉන්ද්‍රිය-බල-බොජ්ඣඞ්ගයන්** එකාග්‍රතා-යෙන් එක්රැස් කොට ඒ සංස්කාර ජාතය, **අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්මය යැ යි** විදර්ශනා ඥානයෙන් පිරිමදී. පරිවර්තනය කෙරේ විදර්ශනා වීථියට බසී.

මෙසේ පිළිපන් ඒ යෝගීහට යට කී සේ ම **සඞ්ඛාරුපෙක්ඛා ඤාණය ගේ** අවසන්හි එක් මනොද්වාරාවර්ජන සිතකින් **අනුලොම - ගොත්‍රභූ** (වොදන) සිත් උපන් කල්හි වොදනා-නන්තරවැ **අනාගාමි මාර්ග** උපදී. මේ මාර්ග සම්ප්‍රයුක්ත ඥානය, **අනාගාමිමග්ග ඤාණය යි** කියනු ලැබේ.

තෘතීය මාර්ගඥානය නිමි.

මේ තුන් වැනි **අනාගාමිමග්ගඤාණයට** අනතුරුව ද යට කී සේ **ඵල සිත් උපදී.** මෙතෙකින් මේ ආර්‍ය්‍ය පුද්ගල තෙමේ **අනාගාමී** නම් වූ **සවන ආර්‍ය්‍ය පුද්ගලයා** වේ.

විශෙෂ:- මේ ආර්‍ය්‍ය තෙමේ ඔපපාතිකවැ පඤ්චසුද්ධාවාස-යෙහි පිරිනිවෙනුයේ ඒ බඹලොවින් ප්‍රතිසන්ධි වශයෙන් මේ කාම ලෝකයට නො එන හෙයින් පෙරළා නො එනසුලුනු යි **අනාගාමී** නම් වේ.

එයින් මතු ප්‍රත්‍යවෙක්ෂණ සිත් පෙර කී සේ මැ යි. මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කොට ද, ඒ **අනාගාමී** ආර්‍ය්‍යශ්‍රාවක එම ආසනයෙහි සිට ම හෝ, පසු කලෙක හෝ **රූප රාග යැ, අරූප රාග යැ, මාන යැ, උද්ධච්ච යැ, අවිජ්ජා යැ** යන උද්ධම්භාගීය පඤ්ච සංයෝජනයන් ගේ නිරවශෙෂ ප්‍රහාණයෙන් සතර වන අර්හත් භූමියට පැමිණීම පිණිස (විදර්ශනා) යෝග කෙරේ. හෙතොමේ **ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ගයන්** එක් රැස් කොට ඒ සංස්කාර-ජාතයම **අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්මය යැ යි** ඥානයෙන් පිරිමදී. පෙරළයි. විදර්ශනා වීථියට බසී. මෙසේ පිළිපන් ඒ යෝගීහට

යට කී සේ ම **සංඛාරුපෙක්ඛා ඤාණාවසානයෙහි** එක් මනොවාරා-වජ්ජනයකින් මතු **අනුලොම- ගොත්‍රභු** (වොදාන) ඤාණයන් උපන් කලැ වොදානයට අනතුරුවැ **අර්‍හත්ත්වමාර්‍ගය** උපදී. ඒ මාර්‍ග සම්ප්‍රයුක්ත ඥානය **අරහත්තමග්ගඤාණයැ** සි කියනු ලැබේ.

චතුර්‍ථ මාර්‍ගඥානය නිමි.

මේ අර්‍හත්මාර්‍ගඥානයට අනතුරුව ද පෙර කී සේ ඵල සිත් දත යුතු සි. මෙතෙකින් මේ තෙමේ **අර්‍හත්** නම් වූ **අට වන ආර්‍යපුද්ගලයා** වේ. මහා ක්ෂීණාසව වූ, අන්තිම දෙහය දරන බහා තබන ලද ස්කන්ධාදී බර ඇති, සවකීය අර්‍ථයට පැමිණි, ක්ෂය කළ භව සංයෝජන ඇති, ස්කන්ධාදීන් ගේ ස්කන්ධාදී අර්‍ථයන් මොනවට දැනැ විමුක්ත වූ, සදෙවතා ලෝකයා ගේ අග්‍ර දක්ෂිණාවට සුදුසු වූ අට වන ආර්‍ය්‍ය පුද්ගලයා වේ.

මෙසේ **ශ්‍රොතාපත්ති මාර්‍ගය, සකදාගාමි මාර්‍ගය, අනාගාමි මාර්‍ගය, අරහත්ත මාර්‍ගය** යන මේ සිවු මඟෙහි නුවණ, **ඤාණදස්සන විසුද්ධි** නමැ සි කියන ලද වචනය, මේ ක්‍රමයෙන් පැමිණිය යුතු සතර **ඤාණ** වශයෙන් කියන ලදී. දැන් මේ චතුර්විධ ඥානයෙන් ඥානදර්ශන විශුද්ධියේ අනුභාව **දැන** ගැනීම පිණිස,

(1) පරිපූර්‍ණ බොධිපාක්ෂික භාව යැ,

(2) වුත්‍ථානයෙන් ද, බලයෙන් ද යුක්ත බව යැ,

(3) ඒ ඒ මාර්‍ගයෙන් ප්‍රහාණය කළමනා සංයෝජනාදිය ප්‍රහීණ කිරීම යැ,

(4) අභිසමය කාලයෙහි ඒ ඒ පරිඥාදී වශයෙන් කියන ලද කෘත්‍යයන් පිළිවෙළින් නතු සේ දැනීම යැ, යන මොහු අවශ්‍ය වෙත්.

(1) එහි **සතර** සතිපට්ඨාන යැ, **සතර සම්‍යක් ප්‍රධාන යැ, සතර ඉද්ධිපාදයැ, පසළු ඉන්ද්‍රියයැ, පසළු බලයැ, සප්ත බොජ්ඣඞ්ගයැ, අෂ්ට ආර්‍යමාර්‍ගයැ,** යන මේ සත්තිස් ධර්‍මයෝ **නිර්‍වාණාවබොධනාර්‍ථයෙන්** බෝධි නම් වූ **ආර්‍යමාර්‍ගයා** ගේ පක්ෂයෙහි වූ හෙයින් **බොධිපක්ඛිය** නම් වෙති.

විශෙෂ:- මෙහි පක්ෂයෙහි වීම නම් උපකාරක භාවයෙහි සිටීම සි.

විභාග:- සතිපට්ඨාන - කායාදී ඒ ඒ අරමුණෙහි අනුවැ පිවිසෑ, අනුවැ ගොස් එළඹ සිටින හෙයින් **පට්ඨාන** නම්. සතියම පට්ඨාන වූයේ **සතිපට්ඨාන** නම්.

ඒ සතිපට්ඨානයෙහි **කාය- වේදනා- චිත්ත- ධම්ම** යන මේ සතරෙහි පිළිවෙළින් අශුභ යැ, දුඃඛ යැ, **අනිත්‍ය** යැ, **අනාත්ම** යැ, යන මේ ආකාරයන් ගැනීම් වශයෙන් ද, ශුභ යැ, සුඛ යැ, නිත්‍ය යැ, ආත්ම යැ යන මේ සංඥාවන් ප්‍රහාණ කෘත්‍යය සිද්ධ කිරීම් වශයෙන් ද පවත්නා හෙයින් සිවු වැදෑරුම් භේදය වේ. එහෙයින් **සතර සතිපට්ඨානය සි** කියනු ලැබේ.

(කායාදී සතරෙහි අශුභාකාරාදී වශයෙන් ගැනීම, **පුඤ්ඤභාග සතිපට්ඨාන** වශයෙන් කියන ලදී. ශුභ සංඥාදී ප්‍රහාණ කෘත්‍ය සාධනය **මාර්ග සතිපට්ඨාන** වශයෙන් දතයුතු. ඒ මාර්ගයෙහි එකම සතිය ශුභ සංඥා ප්‍රහාණාදී සතර කෘත්‍යය ම සිද්ධ කිරීම් වශයෙන් පවතී යනු ටීකා සි.)

සම්මප්පධාන - මේ හේතු කොට අන්‍ය චිත්ත- චෛතසික ප්‍රධන් (වීර්‍ය්‍ය) කෙරේනු සි **පධාන** නම්. ශොභන වීර්‍ය්‍යය **සම්මප්පධාන යැ.** නොහොත් මේ හේතු කොට චිත්ත-චෛතසික ධර්‍ම මතෘව වීර්‍ය්‍ය කෙරේනු සි හෝ **සම්මප්පධාන යැ.**

තවද, කෙලෙස් නමැති විරූපභාව විරහයෙන් ශොභන වූයේම භිත සුව නිපදවීම් විසින් උත්තම භාවය එළවන බැවින් හෝ **සම්‍යක් ප්‍රධන්** නම්. මේ වීර්‍ය්‍යයට නම් වේ. මේ වීර්‍ය්‍යය, උපන් අකුශලයන් ගේ **ප්‍රහාණ කෘත්‍යය ද,** නූපන් අකුශල-යන් ගේ **අනුත්පාද කෘත්‍යය ද,** නූපන් කුශලයන් ගේ **උත්පාද කෘත්‍යය ද,** උපන් කුශලයන් ගේ **ස්ථිති කෘත්‍යය ද** සිද්ධ කරන හෙයින් සතර වැදෑරුම් වේ. මෙසේ සතර සම්‍යක් ප්‍රධානයෝය සි කියනු ලැබෙත්.

ඉද්ධිපාද - පෙරැ ඉඛ්විධ නිර්දේශයෙහි කී සේ, ඉටු වීම් අරුතින් **ඉද්ධි නම් වේ.** නිපදවීම් ප්‍රතිලාභ සම්පත්තියෙන් හෝ **ඉඩ් නම් වේ.**

යමකින් සම්ප්‍රයුක්ත ධර්‍මයෝ **නිෂ්පාදනය** වෙත් නම් හේ ඉඩ් නම්. මෙහි සමාධි- පධාන සඞ්ඛාර ප්‍රමුඛ **මාර්ගධර්‍ම ඉඩ් යසි.**

ඒ ඡන්දාදීහු 'තමා හා සම්ප්‍රයුක්ත ධර්‍මයන්ට පූර්‍වාඛ්‍යමාර්‍ථයෙන් හෝ, එල වූ ඒ ඍද්ධියට පූර්‍වභාග කරන අර්‍ථයෙන් ඍද්ධිහු ගේ

පාද චේතුයි හෝ ඍද්ධිපාද නම් වේ. ඒ ඍද්ධිපාදය, ඡන්ද- චිත්ත- විරිය- වීමංසා වශයෙන් චතුර්විධ වේ. එහෙයින් ඍද්ධි පාද සතරෙකැ යි කියන ලදී.

එසින් වදාළහ:- "ඍද්ධිපාද සතරෙක. **ඡන්ද ඉද්ධිපාද යැ, චිත්ත ඉද්ධිපාද යැ, විරිය ඉද්ධිපාද යැ, වීමංසා ඉද්ධිපාද යැ.**"* කියා යි මේ සතර **ලෝකොත්තර** ම වේ.

විශෙෂ:- 'ඡන්දය අධිපති කොට සමාධිය චිත්තයා ගේ එකාග්‍රතාවය ලබා නම් මේ ඡන්ද සමාධි යයි' කියනු ලැබේ. යනාදීන් වදාළ පරිදි ඡන්දාදී සතර අධිපතීන් ගේ වශයෙන් ප්‍රතිලබ්ධ ධර්ම ඇති එසසාදීහු ද ඍද්ධිපාදයෝ වෙති. මේ ලෞකික ඍද්ධිපාද යැ.

ඉන්ද්‍රිය - ශ්‍රද්ධා ප්‍රතිපක්ෂ වූ අකුශල ධර්මය, අවසත්තුක ප්‍රසාද ප්‍රතිරූපක වූ මිථ්‍යා දෘෂ්ටි යන අසසද්ධිය ද, පින - මිදුණු අකුශල සම්ප්‍රයුක්ත කොසජ්ජය ද, සම්‍යති විප්‍රවාසය වූ ප්‍රමාදය ද, තන් අරමුණෙහි සිත විසුරුවන වික්ෂෙපය ද, අරමුණෙහි මුළා බව නම් වූ සම්මොහය ද යන මොවුන් මැඩ පියන හෙයින් ඒ මැඩීම් අර්ථයෙන් **ඉන්ද්‍රිය නම්.**

බල - භෙර කී සේ අසසද්ධිය- කොසජ්ජාදීන් විසින් මැඩපිය නොහෙන අර්ථයෙන් ද, කම්පා නොවන අර්ථයෙන් ද ශ්‍රද්ධාදිය ම **බල නම්.**

මේ **ඉන්ද්‍රිය, බල** දෙක ම ශ්‍රද්ධාදි වශයෙන් පඤ්චවිධ වේ. එහෙයින් **පඤ්චේන්ද්‍රිය යැ, පඤ්ච බලයැ** සි කියනු ලැබේ.

බොජ්ඣඞ්ග - චතුරාර්‍යසත්‍ය ධර්මයන් අවබොධ කරන සත්ත්වයා හට අඞ්ගභාවයෙන් **සති** ආදී සත් දෙන **බොජ්ඣඞ්ග නම්** වෙති.

(යම් පුද්ගලයකු ලොකොත්තර මාර්ග ක්ෂණයෙහි උපදනා **සති** ආදී ධර්ම සමුදය කරණ කොට කෙලෙස් සන්තාන නිද්‍රාවෙන් නැගෙන හෙයින් ද, **චතුරාර්‍යය සත්‍ය ප්‍රතිවේධ** කරන හෙයින් ද, **නිර්වාණය** හෝ අවබෝධ කරන හෙයින් ද **මාර්ග ඥානය** තෙමේ **බෝධිය** සි කියනු ලැබේ. ඔහුට අඞ්ගවන හෙයින් **සති** ආදිය **බොජ්ඣඞ්ග නම්** වේ. (ටීකා මතය)

අරියමග්ග - සසරින් නික්මවන (ගෙනයන) අර්ථයෙන් **සම්මාදිට්ඨි** ආදී අට දෙන **මාර්ඞ්ග නම්** වෙති.

---

* **වි: ප: ඉද්ධිපාද විභඞ්ග**

මෙසේ මේ **සත්තිස් බෝධිපාක්ෂික ධර්මයෝ** මාර්ගයට පූර්ව භාගයෙහි නානා චිත්තක්ෂණිකයන් වෑ පවතිත්. ලෞකික විදර්ශනාව පවත්නා කල්හි **ආනාපාන-ඉරියාපථ-චතුසම්පජඤ්ඤ-පටික්කූලමනසිකාර පඨ භා- නවසීවථික පඨ** වශයෙන් තුදුස් පරිද්දෙකින් පරිග්‍රහ කරන්නහුට **කායානුපස්සනා සතිපට්ඨානය** ද, **නව ප්‍රකාරයෙකින්** වෙදනා පරිග්‍රහ කරන්නහුට **වේදනානුපස්සනා සතිපට්ඨානය** ද, **සොළොස් ආකාරයෙන්, සරාග-සදෝස- සමෝහ- සංඛිත්ත- මහග්ගත- සමාහිත- සඋත්තර-විමුත්ත** යන සප්‍රතිපක්ෂ පදයන් ගේ සොළොස් ආකාරයෙන් සිත පරිග්‍රහ කරන්නහුට **චිත්තානුපස්සනා සතිපට්ඨානය** ද, **නීවරණ- උපාදානක්ඛන්ධ- ආයතන- බොජ්ඣඞ්ග- සච්ච** යන පස් වැදෑරුම් පඨ වශයෙන් ධර්මයන් පරිග්‍රහ කරන්නහුට **ධම්මානුපස්සනා සතිපට්ඨානය** ද ලැබේ.

මේ අන්බැවිහි තමා සතන්හි නූපන් පරහට උපන් අකුශලය දැක 'යම් යම් පරිද්දෙකින් පිළිපන් ඔහුට මේ වධබන්ධනාදිය උපන්නේ නම් මම එසේ නො පිළි පදිම් සි' මෙසේ ඇති කල්හි ඒ අකුශලය මව නූපදිනු සි ඒ අකුසල් නූපදීමට වෑයම් කරන කල්හි **පළමුවන සම්‍යක් ප්‍රධානය** ද, තමා සතන්හි උපන් අකුසලයක් දැක ඒ අකුශල ප්‍රහාණය පිණිස වැයම් කරන්නහුට **දෙවන සම්‍යක් ප්‍රධානය** ද, මේ අන්බවිහි නූපන්විරූ ධ්‍යාන විදර්ශනාදියක් ඉපදවීමට වෑයම් කරන්නහුට **තුන්වන සම්‍යක් ප්‍රධානය** ද, තමා සතන්හි උපන් ධ්‍යානාදියක් නො පිරිහෙන සේ නැවැතැ නැවැතැ උපදවන්නහුට **සතරවන සම්‍යක් ප්‍රධානය** ද ලැබේ.

ඡන්දය ධුර (ප්‍රධාන) කොට කුශලය උපදවන කලැ **ඡන්දිද්ධි-පාදය වේ**. (සෙස්ස ද මෙසේ මැ සි) -පෙ- මිථ්‍යා වචනයෙන් වෙන් වන කල්හි **සම්‍යක් වාග් විරතිය** වේය සි මෙසේ පූර්ව-භාගයෙහි මේ **සතිපට්ඨාන- සම්මප්පධාන- ඉද්ධිපාදයෝ** නානා චිත්තයෙහි ලැබෙති.

විශේෂ:- මේ **ඡන්දිද්ධිපාද- සම්මාවාචාවන්** ගෙන් සෙසු ඉඩ්පාදයන් ද, සෙසු **විරතීන්** ද ලක්ෂණහාර වශයෙන් ලැබෙන බෙයින් කියන ලදී.

විසඟර:- මේ ධර්මයෝ **සතර මාර්ග** චිත්තයන් ගේ උත්පත්ති කාලයෙහි එක සිතෙහි ලැබෙති. **එල ක්ෂණයෙහි සතර සම්‍යක් ප්‍රධානයන් හැර අවශෙෂ තෙතිස් ධර්මයෝ ලැබෙති.** මෙසේ එකම චිත්ත ක්ෂණයෙහි ලැබෙන්නාවූ මොවුන් කෙරෙන් එක ම

නිවන් අරමුණු කරන **සතිය- කාය- වේදනා- චිත්ත- ධම්** විෂයෙහි **සුභ- සුඛ- නිවව - අනත්ත** සංඥාවන් ප්‍රහාණ කෘත්‍යය සිද්ධ කිරීම වශයෙන් **සතර සතිපට්ඨානය** යි කියනු ලැබේ. එකම **වීර්‍ය්‍ය-අනුත්පන්නානයන්ගේ අනුත්පාදාදී** කෘත්‍ය සාධන වශයෙන් **සතර සම්මප්පධානය** යි කියනු ලැබේ. මේ හැර, සෙසු **ඉද්ධිපාදාදී පස් ඇතොටසෙකි** හායන, වඩින්න නැති. **සති- වීර්‍ය** යන වසතු ධම් ද්වයය ම **කායානුපස්සනාදී** වශයෙන් සතරකට ද, **සම්මප්පධාන වශයෙන්** සතරකට ද බෙදේ. **ඉද්ධිපාදාදිය** වෙන වෙන වසතු ධම් නෙයින් අඩු වැඩියෙක් නොවේ.

නවද, ඒ **සත්තිස් බෝධිපාක්ෂික ධම්යන්** විෂයෙහි විශෙෂ විධියෙක් දක්වේ.

නවයක් එකවිධ යැ, එකක් දවිවිධ යැ, තැවැතැ එකක් චතුර්විධ යැ, එකක් පඤ්චවිධ යැ, එකක් අෂටවිධ යැ, එකක් නවවිධ යැ යි මෙසේ ඒ **බෝධිපාක්ෂික ධම්යෝ** ෂඩ්විධ වෙති

"නව එක් විදි එකෙක් - දෙවිදි සතර - පස් විදි,
අට විදි නව ටිදි බෙයින් - **බෝ පැකි දම් සවිදි වේ**"

විසතර:- **ඡන්ද, චිත්ත,** ඉඩිපාද වශයෙන් ද, **පීති, පසඹි, උපෙකඛා** බොජ්ඣඩග වශයෙන් ද, **සම්මා සඞකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව,** මග්ගඩග වශයෙන් ද යි මේ **නවධම් එක් එක් වැදූරුම් වේ.**

සද්ධාව - ඉන්ද්‍රිය, බල වශයෙන් **දෙපරිදි වේ.**
සමාධිය - සමාධින්ද්‍රිය, සමාධිබල, සමාධි සම්බොජ්ඣඩග, සම්මා සමාධි වශයෙන් **සිවු වැදූරුම් වේ.**

පඤ්ඤාව - ඉන්ද්‍රිය, බල, බොජ්ඣඩග, (ධම්මවිචය) **සම්මා දිට්ඨි,** (මග්ගඩග) **විමංසිද්ධිපාද** වශයෙන් **පස්වැදූරුම් වේ.**

සතිය - (සතර) **සතිපට්ඨාන, ඉන්ද්‍රිය, බල, බොජ්ඣඩග, මග්ග** වශයෙන් **අට වැදූරුම් වේ**

විරිය - සතර සම්මප්පධාන, ඉන්ද්‍රිය, බල, බොජ්ඣඩග, මග්ගඩග, ඉද්ධිපාද වශයෙන් **නව වැදූරුම් වේ.**

නවද:-

"නො මුසු බෝ පැකි දම් - එන් දම් වීසින් **තුදුසෙකි.**
කොටස් විසින් **සත්දි** - උකට බෙයින් **සත් නිසෙකි**"

මේ සියලු **බෝධිපාක්ෂික** ධර්ම **සති, විරිය, ශ්‍රද්ධ, චිත්ත, පඤ්ඤා, සඩ්ඛා, සමාධි, පීති, පස්සද්ධි, උපෙක්ඛා,** (සඩ්ඛපප) **චිත්තඤ්ඤා, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව** යැ යි අම්ශ්‍රවැ වසතු ධර්ම වශයෙන් තුදුසෙක් වේ.

විශෙෂ:- මේ ස්යල්ල **ප්‍රථම ධ්‍යානයෙහි** වේ. **දවිතීය ධ්‍යානික මාර්ගයෙහි සඩ්ඛපප විනා** නොලැබෙයි. **චතුර්ථ- පඤ්චම ධ්‍යානික මාර්ගයන්හි** ප්‍රීතිය ද නැති හෙයින් දෙළොසෙකි. **සතිපට්ඨාන සම්මප්පධානාදී** වශයෙන් කොටස් විසින් **සතෙකි.** ප්‍රභෙද හෙයින් **සත්තිසෙකි**. ඒ සුගම යැ. මෙද උත්කෘෂ්ට හෙයිනි. පෙර කී සේ අඩු වේ.

විශෙෂ:- **අධිපති සතර** එකවට නො ලැබෙන හෙයින් දෙතිසෙකුදු වේ. ඒ ධර්මයන් **සත්තිස්** වැදෑරුම් වනුයේ මෙසේ

"සිය කිස නිපදනෙන් - සිය රුවිනුදු පවත්නෙන්
අරී මඟ නීපන් කලැ - මේ සියලු දම් නිපදනේ"

එක් එක් ධර්මයක් එකවිධවැ සිට තමා අයත් ඒ ඒ කෘත්‍ය කරන හෙයින් ද, චිත්තභිඛ්පාදාදීන් අභෙදවැ සවරූපයෙන් පවත්නා හෙයින්ද ඒ **සත්තිස් ධර්මයෝ ම** ආර්‍ය්‍ය මාර්ගයෙහි සම්භව වෙති.

මෙසේ පළමු කොට මේ **ඥානදර්ශනවිශුද්ධියෙහි පරිපූර්ණ බෝධිපාක්ෂික** භාවය දතයුතු.

(2) **වුට්ඨාන බලසමාධියොගය** - නිමිත්තයෙනුදු, ප්‍රවෘත්තයෙනුදු නැගීම **වුට්ඨාන නම්. සමථ** - විදර්ශනා බලයෙන් සම්ප්‍රයුක්ත බව **බලසමාධියොග නම්.** වුට්ඨානය ද, බලසමාධියොගය ද වුට්ඨාන-බල-සමාධියොග නම් වේ.

විශෙෂ:- ලෞකික විදර්ශනාව සංස්කාර නිමිත්ත අරමුණු කොට ඇති හෙයින් නිමිත්තෙන් නො නැගිටියි. ප්‍රවෘත්ති කාරණ වූ සමුදය සමුච්ඡේද නො කරන හෙයින් (නො සිදින හෙයින්) විපාක ප්‍රවෘත්තියෙන් නො නැගේ.

විශෙෂ:- එහි නිමිත්තයෙන් නැගීම නම් සංස්කාර නිමිත්ත හැර **නිවන්** අරමුණු කිරීම යි. පැවැත්මෙන් නැගීම නම්- හෙතු නිරොධයෙන් ආයති විපාක ප්‍රවෘත්තිය මතු නූපදනා සවභාවයට පැමිණවීම යි.

නොනුභූ ඤාණය - සමුදය කෙලෙසය නො සිදින හෙයින් විපාක ප්‍රවෘත්තියෙන් නො නැගෙ යි. එහෙත් **නිර්‍වාණය** අරමුණු කරන හෙයින් සංස්කාර නිමිත්තෙන් නැගෙන හෙයින් එතෙකින් නැගීම වේ. එහෙයින් **"ඛනිඛ්ඛාවුඛානව්වටතෙන පඤ්ඤා නොනුභූ ඤාණං"*** බැහැර සංස්කාරයන් කෙරෙන් නැගීම ය යන පෙරළීමෙහි ප්‍රඥාව **නොනුභූ ඤාණය** යි කීහ.

එසේම "උත්පාදයෙන් පෙරළී අනුත්පාදය (නිර්‍වාණය) ට වදිනු යි" **නොනුභූ නම්.**

මෙසේ මේ සියල්ල දත යුතු. මේ **සතර මාර්ගඥානයෝ** අනිමිත්තාලම්බනික (නිර්‍වාණාලම්බක) හෙයින් සංස්කාර නිමිත්තෙන් නැගෙති. සමුදය සමුච්ඡේද කරන හෙයින් විපාක ප්‍රවෘත්තියෙන් නැගෙත්නු යි **උභතොවුට්ඨාන** (දෙකින් මිදුන්නාහු) නම් වෙත්.

එයින් වදාළහ:- **"නිමිත්ත- ප්‍රවෘත්ති දෙකින් නැගිපිමෙන් පෙරළා හඳින ප්‍රඥාව කෙසේ මාර්ගයෙහි ඥානය වේ ද? සෝවාන් මාර්ග ක්ෂණයෙහි පරිඥා- ප්‍රහාණ- සාක්ෂාත්ක්‍රියා- භාවනා- අභිසමය- වශයෙන් චතුස්සත්‍යය දර්ශනාවීමයෙන් සම්‍යක්දෘෂ්ටිය දෙසැට මිථ්‍යාදෘෂ්ටියෙන් නැගේ. අපායගාමී නීවරණ බැවින් තදනුවර්තක වූ විචිකිච්ඡාදී කෙලෙසයන් කෙරෙන් ද මිථ්‍යාදෘෂ්ටි ප්‍රත්‍යයයෙන් උපදනට සුදුසු සකඬ්ගියන් කෙරෙනුදු නැගේ. පිටත්හි සියලු සංස්කාර නිමිත්තයෙනුදු නැගේ. නිමිත්ත - ප්‍රවෘත්ති දෙකින් නැගිපිමෙන් පෙරළා හඳින ප්‍රඥාව මාර්ගයෙහි ඥානය යි"** කියා යි.

සිත **නිවනට** නැංවීම් අර්ථයෙන් **සම්මාසඬ්කප්පය** කාම සඬ්කල්පාදී ත්‍රිවිධ මිථ්‍යා සඬ්කල්පයෙන් නැගේ. තදනුවර්තක ක්ලේශයන් කෙරෙන් ද, ස්කඬ්ගියන් කෙරෙන් ද, බැහැර වූ සියලු නිමිත්තයන් කෙරෙන් ද, නැගේ. (යනාදිය මත්තෙහි ද එසේ ම යෙදිය යුතු.)

සම්ප්‍රයුක්ත ධර්මයන් මනා කොට නුවණින් ගැනීම් අර්ථයෙන් **සම්‍යක් වචනය** මුසාවාදාදී චතුර්විධ වාග් දුශ්චරිතයෙන් නැගේ. සම්ප්‍රයුක්ත ධර්මයන් මොනවට නැගිටුවීම් අර්ථයෙන් **සම්‍යක් කර්මාන්තය** ත්‍රිවිධ කාය දුශ්චරිතයෙන් ද, ආජීව පිරිසිදු කරන අර්ථයෙන් **සම්‍යක් ආජීවය** මිථ්‍යා ආජීවයෙන් ද, නගාසිටුවන අර්ථයෙන් **සම්‍යක් ව්‍යායාමය** මිථ්‍යාව්‍යායාමයෙන් ද, අරමුණු

* ප: ම: ඤාණකථා

එළඹ සිටීම් අර්ථයෙන් **සම්‍යක් සතිය** මිථ්‍යා සතියෙන් ද, අවික්ෂිප්තාර්ථයෙන් **සම්‍යක් සමාධිය** මිථ්‍යා සමාධියෙන් ද නගියි. තදනුවර්තක කෙලෙසුන් ගෙන් ද, සහකරුන් ගෙන් ද, තැගේ. බාහ්‍ය වූ සෙසු නිමිත්තයන් කෙරෙන් ද නැගේ. එහෙයින් **"දුභතො වුට්ඨානවිවටටනෙ පඤ්ඤා මග්ගඞ්ගං*"** යි කියනු ලැබේ.

ශෛක්ෂාදුඃඛතාමී මාර්ගක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් **සම්‍යක් දෘෂ්ටිය** -පෙ- අවික්ෂේපාර්ථයෙන් **සම්‍යක් සමාධිය**, ඖදාරික කාමරාග සංයෝජන කෙරෙන් ද, පටිඝසංයෝජන කෙරෙන් ද, ඖදාරික කාමරාගානුශය කෙරෙන් ද පටිඝානුශය කෙරෙන් ද, නගී.

අනාගාමී මාර්ගක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් **සම්‍යක් දෘෂ්ටිය** -පෙ- අවික්ෂේපාර්ථයෙන් **සම්‍යක් සමාධිය**, අනුසහගත කාමරාග සංයෝජනයෙන් ද, පටිඝසංයෝජනයෙන් ද, අනුසහගත කාමරාගානුශයෙන් ද, අනුසහගත පටිඝානුශයෙන් ද නැගේ.

අර්හත් මාර්ග ක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් **සම්‍යක් දෘෂ්ටිය** -පෙ- අවික්ෂේපාර්ථයෙන් **සම්‍යක් සමාධිය** -පෙ- රූපරාගයෙන් ද, අරූපරාගයෙන් ද, මානයෙන් ද, උද්ධච්චයෙන් ද, අවිද්‍යාවෙන් ද, භවරාගානුශයෙන් ද, මානානුශයෙන් ද, අවිද්‍යානුශයෙන් ද, නැගේ.

තදනුවර්තක කෙලෙසුන් ගෙන් ද, සහකරුන් ගෙන් ද නැගේ. බාහිර සියලු නිමිති ගෙන් ද නැගේ. එහෙයින් **"නිමිත්තප්පවත්තනී දෙකින් නැගීමෙන් පෙරළා හරින ප්‍රඥාව මාර්ගයෙහි ඥානය සි** කියනු ලැබේ.

ලෞකික අෂ්ට සමාපත්තීන් භාවනා කාලයෙහි සමාධි භාවනා හෙයින් **සමථ බලය** අධික වේ. අනිත්‍යානුපස්සනාදිය භාවනා කරන කාලයෙහි **විදර්ශනා බලය** අධික වේ. ආර්‍ය්‍යමාර්ග ක්ෂණයෙහි වනාහි ඒ **ශමථ-විදර්ශනා** ධර්මයෝ දෙදෙන සමවැ අන්‍යෝන්‍යයන් වැළඳ ගත්තාවූන් මෙන් පවතිත්. එහෙයින් මේ සතර ඤාණයෙහි ම **සමථ-විදර්ශනාබල සමායොගය** වේ.

එසින් වදාළහ. **"උද්ධච්ච සහගත කිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි නිරොධ ගොචරො. අවිජ්ජාසහගත කිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨහතො අනුපස්සනාඤාණ විපස්සනා නිරොධ ගොචරා**

ප: ම: යුගනද්ධකථා

ඉති වුට්ඨානගෙමිනා සමථ - විපස්සනා එකරසා හොනති. යුගනද්ධා හොනති. අසැඳුමසැඳුං නානීවත්තනති තෙන-වුච්චති වුඨානගෙමිනා සමථවිපස්සනා යුගනද්ධහොවෙතීති"*

'උදුබවය ප්‍රධාන කොට ඇති කෙලෙසයන් කෙරෙන් ද, උදුබවය සම්ප්‍රයුක්ත ස්කන්ධයන් කෙරෙන් ද නැගී සිටි යෝගීහු ගේ චිත්තයා ගේ එකාග්‍රතා ඇති, එහෙයින් ම අවික්ෂෙප වූ සමාධිය **නිවන්** අරමුණු කොට පවතී. අවිද්‍යා ප්‍රධාන කෙලෙසයන් කෙරෙනුදු, අවිද්‍යා සම්ප්‍රයුක්ත සංස්කාරයන් කෙරෙනුදු, නැගෙන්න හු ගේ අනුදර්ශනාර්ථයෙන් පවත්නා විදර්ශනාව නිරෝධය අරමුණු කොට ඇත්තේ යැ. මෙසේ වුඨානාර්ථයෙන් (නිමිත්තයෙන් ද, ප්‍රවෘත්තියෙන් ද නැගෙන හෙයින්) ශමථ - විදර්ශනා දෙදෙන එක කෘත්‍ය වෙති. යුගයෙහි බැඳියන් සේ සමවෙති. ඔවුනොවුන් නො ඉක්මවත්. වුඨානාර්ථයෙන් ශමථ විදර්ශනා යුගනද්ධවැ වඩා යැ යි' එයින් කී.

මෙසේ මෙහි **වුඨානබල සමාධෝභාග** දත යුතු යි.

---

(3) යම් සංක්ලේශ ධර්ම කෙනෙක් යම් නුවණකින් ප්‍රහාණය කළ යුතු වෙත් නම් ඒ සංක්ලේශයන් ගේ ප්‍රහාණය ද වේ.

ඒ මෙසේ යි:- මේ චතුර්විධ මාර්ගඥන අතුරින් යම් මාර්ගඥනයකින් ප්‍රහාණය කළ යුතු නම් ඔවුන් ගේ ප්‍රහාණය දතයුතු. ඒ ධර්මයෝ වනාහි යෙදෙන පරිද්දෙන් බඳින අර්ථයෙන් **සංයෝජන යැ,** කෙළෙසීම් අර්ථයෙන් **කෙලෙස යැ,** මසුරු සභාවයෙන් **මච්ඡරිය යැ,** විපරීත භාවයෙන් **විපල්ලාස යැ,** ගැට ගැසීම් අර්ථයෙන් **ගන්ථ යැ,** අයුතු ගතිය යන අර්ථයෙන් **අනර්ථ යැ,** වැගිරෙන අර්ථයෙන් **ආසව යැ,** යටපත් කොට තසන අර්ථයෙන් **ඔඝ යැ,** යොදන අර්ථයෙන් **යොග යැ,** සග මොක් මග වසන අර්ථයෙන් **නීවරණ යැ,** ධර්ම සභාව ය ඉක්මවා අනිකක් ගැනීම් අර්ථයෙන් **පරාමාස යැ,** දැඩිවැ ගැනීම් අර්ථයෙන් **උපාදාන යැ,** අප්‍රහීණවැ සන්තානයෙහි නැවැතැ - නැවැතැ හොවින අර්ථයෙන් **අනුසය යැ,** කිලිටි කරන අර්ථයෙන් **මල යැ,** යන මොවුන්-ද, අකුශල කර්මපථයන් ද, අකුශල චිත්තෝත්පාද සංඛ්‍යාත ධර්මයන් ද යෙදෙන යෙදෙන පරිද්දෙන් ප්‍රහාණය කරන්නාහු වෙත්.

---

* ප: ම: යුගනද්ධකථා

විඤ්ඤාණ -(1) එහි **සංයෝජන**- මෙලෝ-පරලෝ **සකඤ්ඤත්** ද, ඵලය හා **කම්ම**ය ද, දුක හා **සත්ත්ව**යන් ද, එකට බඳින බැවින් රූප රාගාදී දශ ධර්මයෝ සංයෝජන නම් වෙති යම්තාක් මේ රූපරාගාදිය පවතී නම් ඒතාක් මේ **ස්කන්ධ**යෑ, ඵල යෑ, දුඃඛ යෑ, යන මොවුන් ගේ අවිච්ඡේදය වේ. ඔවුනතුරිනුදු **රූපරාගය, අරූපරාගය, මානය, උද්ධච්චය, අවිජ්ජාය,** යන මේ පස රූපාරූප භවයෙහි හෝ **තෘතීය මාර්ගොත්පත්තියෙන්** මතුයෙහි හෝ නිපදනා ස්කන්ධයන් සංයෝජනය කරන හෙයින් **උද්ධම්භාගීය සංයෝජනයැයි ද; සත්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස, කාමරාග, පටිඝය** යන මොහු රූපාරූප භවයෙන් යට හෝ, **තෘතීය මාර්ගඵලයෙන්** යට නිපදනා ස්කන්ධාදිය හා බඳින හෙයින් **අධොභාගීය සංයෝජනයැයි ද** කියනු ලැබේ.

(2) **කිලේස** - තමා මැ කිලිටි වන හෙයින් ද, සම්ප්‍රයුක්ත ධර්ම කිලිටි කරන හෙයින් ද, **ලෝභයෑ, ද්වේෂයෑ, මෝහයෑ, මානයෑ, දිට්ඨියෑ, විචිකිච්ඡායෑ, ථීනයෑ, උද්ධච්චයෑ, අහිරිකයෑ, අනොත්තප්පය යෑ** යන මේ දහ ධර්මයෝ **ක්ලේශ ධර්ම** නම් වෙති.

(3) **මිච්ඡත්ත** - වරදවා විපරීත අදහසින් පවත්නා හෙයින් **මිථ්‍යා දෘෂ්ටි, මිථ්‍යා සඞ්කල්ප, මිථ්‍යා වචන, මිථ්‍යා කර්මාන්ත, මිථ්‍යා ආජීව, මිථ්‍යා ව්‍යායාම, මිථ්‍යා සතිය, මිථ්‍යා සමාධි** යන අෂ්ට ධර්ම මිථ්‍යාභාවයෙන් යුක්ත හෙයින් **මිච්ඡත්ත නම්. මිථ්‍යා විමුක්ති මිථ්‍යා ඥාන** හෝ සමග දශයෙක් ද වේ.

(4) **ලෞකික ධර්ම** - සකඤ්ඤත් ගේ පැවැත්ම ඇති කල අනුපරම ධර්මකම්වයෙන් (පින් - පව් විසින් අනික් ලෞකික ධර්ම නොසිදෙන හෙයින්) **ලාභ යෑ, අලාභ යෑ, අයස යෑ, යසයෑ, නින්දා යෑ, ප්‍රශංසා යෑ, සුඛ යෑ, දුක්ඛ යෑ** යන මේ අට දෙන සි.

(මෙහි කාරණොපචාරයෙන් ලාභාදී වස්තුක අනුනය තෘෂ්ණාව ගේ ද, අලාභාදී වස්තුක ප්‍රතිඝයා ගේ ද මේ ලෝක ධර්ම ග්‍රහණයෙන් ගැනීම කරන ලද්දා සි දත යුතු)

(5) **මච්ඡරිය - ආවාස මච්ඡරිය, කුල මච්ඡරිය, ලාභ මච්ඡරිය, ධම්ම මච්ඡරිය, වණ්ණ මච්ඡරිය** යි ආවාසාදිය අනුන් හා සාධාරණ බව නොඉවසන්නාකාරයෙන් පැවැති **මාත්සර්‍ය්‍ය පස** සි.

විපල්ලාස - අනිත්‍ය- දුඃඛ- අනාත්ම- අශුභ වස්තූන්හි මැ නිත්‍ය- සුඛ- ආත්ම- ශුභ වශයෙන් පැවැති **සඤ්ඤා- චිත්ත- දෘෂ්ටි විපර්‍යාසයෝ** තිදෙනා සි.

(7) **ගන්ථ** - නාම-රූප කායයන් භවයෙන් භවයෙහි ගැට ගසන අභිධ්‍යාදී **සතර යැ. එනම් අභිජ්ඣා - ව්‍යාපාද - සීලබ්බත පරාමාස - ඉදංසච්චාභිනිවෙස කාය ගන්ථයෝ** සතර දෙනා සි.

(8) **අගති** - **ඡන්ද යැ - දෝස යැ - මෝහ යැ - භය යැ** යන සතරින් යෙදී නො කටයුතු කිරීම හා කටයුතු නො කිරීම සි. මෙය ආර්‍යයන් විසින් නො යා යුතු හෙයින් **අගති නම්** වේ.

(9) **ආශ්‍රව** - අරමුණු හෙයින් ගොත්‍රභූ සිත දක්වා ද, භවාග්‍රය දක්වා ද වහනය වන හෙයින් හෝ, **සංවරණය** නො කළ චක්ෂුරාදී ද්වාරයෙන් කළ සිදුරු වලින් ජලය සේ වහනය වන හෙයින් නිති වැගිරීම් අර්ථයෙන් හෝ සසර දුක වහනය වන හෙයින් හෝ **කාමරාග - භවරාග - මිථ්‍යාදෘෂ්ටි - අවිද්‍යා** යන මොවුනට මේ නමෙකි.

(10) **ඔඝ** - භව සාගරයට ඇද හෙළන අර්ථයෙන් හා එතර වීමට දුෂ්කර අර්ථයෙන් ඔවුහු ම ඔඝය වැනිහු සි **ඔඝ නම්** වෙති.

(11) **යෝග** - ආලම්බන වියෝගයට හා දුඃඛ වියෝගයට (අවකාශ) නො දෙන හෙයින් ඔවුහු ම **යෝග නම්** වෙති.

(12) **නීවරණ** - කුශල චිත්තය විශෙෂයෙන් ධ්‍යාන චිත්තය ආදියෙහි වැළැක්ම ආවරණ යැ, කෙලෙශ වාසනයට පමුණුවා වැළැක්ම නීවරණ යැ, බිත්ති කවුළු ආදියෙන් මෙන් වැසීම ප්‍රතිච්ඡාදනය සි. කුශලාදීන් පිරිසිඳ දැක්ක නො දී පැවැත්ම මෙහි නීවරණ සි. ඒ වනාහි **කාමච්ඡන්දාදී** පඤ්චකය සි.

(13) **පරාමාස** - කායාදී ඒ ඒ ධර්මයා ගේ අශුභාදී සවභාවය ඉක්ම පරවශයෙන් (ශුභාදී වශයෙන්) තැකි සැටියක් දැඩිකොට ගැනීම් ආකාරයෙන් පවත්නා හෙයින් **මිථ්‍යාදෘෂ්ටිය** මෙ නම් වේ.

(14) **උපාදාන** - සම්භාරයෙන් පටිච්ච සමුප්පාද නිර්දේශයෙහි කියන ලද **කාමූපාදානාදී සතර සි.**

(15) **අනුශය** - බලවත්වැ ම උපන් බැවින් සර්‍වාර්‍යයෙන් **කාමරාගානුශය, පටිඝ - මාන - දිට්ඨි - විචිකිච්ඡා - භවරාග - අවිජ්ජානුශය යැ** යන මේ සතයි. (මොවුන් බලවත් බවට පැමිණි හෙයින්) නැවැතැ නැවැතැ කාමරාගාදීන් ගේ උත්පත්තියට හේතු භාවයෙන් අනු වැ ශයනය කරන හෙයින් **අනුශය නම්** වෙති.

(16) **මල** - තෙල් අදුන් කල්කයක් මෙන් තමාත් කිලිටු බැවින් ද, මෙරමාත් අශුද්ධ කරන හෙයින් ද, **ලොභ, දෙස, මොහ** යන තුන **මල** නම්.

(17) **අකුසල කම්මපථ** - අකුශල කර්ම භාවයෙන් ද, දුගතියට මාර්ග භාවයෙන් ද, **පාණාතිපාත- අදින්නාදාන- කාමෙසු මිච්ඡාචාර- මුසාවාද- පිසුනාවාචා- ඵරුසාවාචා- සම්ඵප්පලාප- අභිජ්ඣා- ව්‍යාපාද- මිච්ඡාදිට්ඨි** යන දශය **අකුශල කර්මපථ** නම් වේ.

(18) **අකුශල චිත්තෝත්පාද** - ලොභ මූලික **අකුසල** සිත් **අට යි, ද්වේෂ මූලික දෙක යි, මෝහ මූලික දෙකයි** යි මේ දෙළස යි. මෙසේ මේ සංයෝජනාදී ධර්මයන් මේ සතර මාර්ග ඥාන ධර්මයෝ යෙදෙන යෙදෙන පරිදි ප්‍රහාණය කරන්නෝ වෙති.

ඒ මෙසේ යි:- (පළමුව) **සංයෝජනයන්** අතුරෙහි **සක්කාය-දිට්ඨි- විචිකිච්ඡා- සීලබ්බතපරාමාස** ද, අපායට පමුණුවන සුලු **කාමරාග- ප්‍රතිඝ** යි මේ පසඳව ධර්මයෝ ප්‍රථම **මාර්ග ඥානයෙන්** (සෝවාන් මග ඤණින්) නැසිය යුතු වෙත්.

ඕදාරික වූ සෙසු **කාමරාග- ප්‍රතිඝයෝ චතුර්ථ සකෘදාගාමි මාර්ගයෙන් වධ්‍ය** වෙති. සූක්ෂම **කාමරාග - ප්‍රතිඝයෝ** තෘතීය **අනාගාමි මාර්ගයෙන් වධ්‍ය** වෙති. **රූපරාගාදී පස්දෙන** වතුර්ථ අර්හත් **මාර්ගඥානයෙන් වධ්‍ය** වෙත්.

කෙලශයන් අතුරෙන් **දිට්ඨි-විචිකිච්ඡා** දෙදෙන **ප්‍රථම ඥාන-වධ්‍යයන. මෙඝය** තෘතීය **මාර්ඥාන වධ්‍යයෝ. ලොභ- මොහ-මාන- ථින- උද්ධච්ච- අහිරික- අනොත්තප්ප** යන මොහු **චතුර්ථ මාර්ඥාන වධ්‍යයන.**

මිච්ඡත්ත ධර්මයන් අතුරින් **දිට්ඨි- මුසාවාද- මිච්ඡාකම්මන්ත-මිච්ඡා ආජීව** යන මොහු **ප්‍රථම මාර්ඥාන වධ්‍යයන. මිච්ඡා-සඞ්කප්ප- පිසුනාවාචා- ඵරුසාවාචා** යන මොහු **අනාගාමි මාර්ඥාන වධ්‍යයෝයි.**

විශේෂ:- මෙහි වාචා නම් චෙතනා යි.

සම්ඵප්‍රලාපය, මිච්ඡාව්‍යායාමය, මිච්ඡා සතිය, මිච්ඡා සමාධිය, මිච්ඡාවිමුක්තිය, මිච්ඡා ඥානය, යන මොහු **චතුර්ථ මාර්ඥාන වධ්‍යයන.**

ලොක ධර්ම අතුරින් **ප්‍රතිඝය තෘතීය මාර්ගඥාන වධ්‍යයෑ,** අනුනය සඤ්ඤාත **තෘෂ්ණාව චතුර්ථ මාර්ගඥාන වධ්‍යයෑ, යශසෙහි ද, ප්‍රශංසායෙහි ද** අනුනය චතුර්ථ මාර්ගඥාන වධ්‍යය සි සමහරු කියති. ලොභයෙහි ද, සුඛයෙහි ද අනුනය කාමරාගාශ්‍රිත හෙයින් **තෘතීය මාර්ගඥාන වධ්‍යෑ** සි කියත්. **මාත්සර්‍යය ප්‍රථම මාර්ගඥාන වධ්‍යසි.**

විචිකිච්ඡා අතුරින් අනිත්‍යයෙහි නිත්‍ය යැ, අනාත්මයෙහි ආත්මයැයි ද **සංඥා විපර්‍යාස - චිත්ත විපර්‍යාස - දෘෂ්ටි විපර්‍යාස - යෝ ද,** දුඃඛයෙහි සුඛයැ, අශුභයෙහි ශුභයයි ද **දෘෂ්ටි විපර්‍යාස - ය ද** යන මොහු **ප්‍රථම මාර්ගඥාන වධ්‍යයහ.** අශුභයෙහි ශුභය යන **සංඥා-චිත්ත** විපර්‍යාසයෝ **තෘතීය මාර්ගඥාන වධ්‍යයහ,** දුඃඛයෙහි සුඛය සි **සංඥා-චිත්ත** විපර්‍යාසයෝ **චතුර්ථ මාර්ගඥාන වධ්‍යයහ.**

ග්‍රන්ථ අතුරින් **සීලව්‍රතපරාමර්ෂ-. ඉදංසත්‍යාභිනිවේෂ - කාය ග්‍රන්ථයෝ ප්‍රථම මාර්ගඥාන වධ්‍යයහ. ව්‍යාපාදකාය ග්‍රන්ථය තෘතීය මාර්ගඥාන වධ්‍යය. අභිධ්‍යාකාය ග්‍රන්ථය චතුර්ථ මාර්ගඥාන වධ්‍ය සි.**

අගතීහු **ප්‍රථම මාර්ගඥාන වධ්‍යයහ.**

විශේෂ:- ඡන්දයින් මතු මාගීයෙන් ප්‍රහීණවතුදු තන්මූලක අකතව්‍ය කරණය ද, කතව්‍යයා ගේ අකරණය ද අපාය ගමනීය හෙයිනි.

ආශ්‍රවයන් අතුරින් **දිට්ඨාසවය, ප්‍රථම මාර්ගඥාන වධ්‍යය. කාමාශ්‍රවය තෘතීය මාර්ගඥාන වධ්‍යෑ. භවාශ්‍රව- අවිද්‍යාශ්‍රව - යෝ චතුර්ථ මාර්ගඥාන වධ්‍යයහ.** ඔඝ - යෝගයන්හි ද මෙසේමැ සි.

නීවරණ අතුරින් **විචිකිච්ඡා නීවරණය ප්‍රථම මාර්ගඥාන වධ්‍යෑ, කාමච්ඡන්ද - ව්‍යාපාද- කුක්කුච්ච යන තිදෙන තෘතීය මාර්ගඥාන වධ්‍යයහ. ථීන - මිද්ධ - උද්ධච්චයෝ චතුර්ථ මාර්ගඥාන වධ්‍යයහ.**

විශේෂ:- කෘතා'කෘත දුශ්චරිත- සුචරිතානු ශොචන වූ **කුක්කුච්චය තෘතීය මාර්ගඥානයෙන් ද,** ඖදාරික **කුක්කුච්චය ප්‍රථම මාර්ගඥානයෙන් ද වධ්‍යසි.**

මිථ්‍යා දෘෂ්ටි වූ **පරාමාසය ප්‍රථම මාර්ගඥාන වධ්‍යසි.**

උපාදාන අතුරින් සියලු ලෞකික ධර්මයන් ම වසතුකාම් වශයෙන් කාමය සි ආගත බැවින් රූපරාග- අරූපරාග ද

කාමූපාදානයෙහි වැටේ. එහෙයින් ඒ **උපාදානය චතුර්ථ මාර්ගඥාන-වධ්‍යයෑ.** සෙසු **දිට්ඨි- සීලබ්බත- අත්තවාද උපාදාන** තුන **ප්‍රථම මාර්ගඥාන වධ්‍යයි.**

අනුශය අතුරින් **දිට්ඨි - විචිකිච්ඡානුශය** දෙක **ප්‍රථම මාර්ග-ඥාන වධ්‍යයෑ කාමරාග - ප්‍රතිඝානුශය** දෙක **තෘතීය මාර්ග-ඥාන වධ්‍යයෑ මාන- භව- අවිද්‍යානුශය** තුන **චතුර්ථ මාර්ග-ඥාන වධ්‍යයි.**

මල අතුරින් **දෙස මලය තෘතීය මාර්ගඥාන වධ්‍යයෑ,** සෙසු **ලෝභ - මෝහ** මල දෙක **චතුර්ථ මාර්ගඥාන වධ්‍යයි. අකුශල කර්මපථ** අතුරින් **ප්‍රාණඝාත- අදත්තාදාන- කාම-මිථ්‍යාචාර- මෘෂාවාද- මිථ්‍යාදෘෂ්ටි** යන මොහු **ප්‍රථම මාර්ග-ඥාන වධ්‍යයහ. පිසුනාවාචා ඵරුසාවාචා- ව්‍යාපාද** යන තිදෙන **තෘතීය මාර්ගඥාන වධ්‍යයහ. සම්ඵප්‍රලාප- අභිධ්‍යා** දෙදෙන **චතුර්ථ මාර්ගඥාන වධ්‍යයහ. අකුශල චිත්තෝත්පාද අතුරින් දිට්ඨි-ගත සම්පයුත්ත සතර යෑ, විචිකිච්ඡාසම්පයුත්ත සිතය** යන පස **ප්‍රථම මාර්ගඥාන වධ්‍යයෑ. ප්‍රතිඝසම්ප්‍රයුක්තාදෙසිත තෘතීය මාර්ගඥාන වධ්‍යයි.**

විශෙෂ:- ප්‍රතිඝයා ගේ ඖදාරිකය චිත්තය මෘගීවධ්‍ය බව් යට කී සේ යි. මෙහි චිත්තෝත්පාද ග්‍රහණයෙන් මක්ඛ- පලාස-මායා- ඍෂ්‍යෙර්ෂ්‍ය- පමාද- ථීනමිද්ධ- සාරම්භාදිය ස ගෘහීතය යනු ටීකායි.

සෙසු **දිට්ඨි විප්පයුත්ත සතර යෑ, උද්ධච්චසම්පයුත්ත සිතද යි** යන පස **චතුර්ථ මාර්ගඥාන වධ්‍යයි.**

මේසේ යම්මෑ අකුශල ධර්මයෙක් යම් ආර්‍ය්‍යමාර්ග ඥානයෙකින් වද කළ යුතු නම් ඒ අකුශල ධර්මය ඒ මාර්ගඥානයෙන් ප්‍රහාණය කළ යුතු යි. එහෙයින් මේ **සංයෝජනාදීන්** මේ **මාර්ග ඥාන-යෝ** යෙදෙන යෙදෙන සේ ප්‍රහාණය කරන්නාහුයෑ යි කීහ.

ප්‍රශ්නයෙකි:- මේ **මාර්ගඥානයෝ** අතීත-අනාගත සංයෝජ-නාදී ධර්ම පහ කෙරෙද් ද? නැතහොත් වර්තමානයන් පහ කෙරෙද් ද?

පිළිතුර:- අතීතයන් නිරුද්ධ වූ හෙයින් අතීත අකුශල ප්‍රහාණය නිෂ්ඵල වේ. අනාගතයන් නූපන් හෙයින් එහි ව්‍යායාමය ද නිෂ්ඵල් යෑ, ප්‍රහාතව්‍යයන් ඇති කල ප්‍රහාණය අසම්භව-

වන හෙයින් ද, ව්‍යායාමය සමග ප්‍රහාතව්‍ය කෙලෙසයන් එක්වැ පවත්නා හෙයින් මාගී භාවනාව සකිලිටු වන හෙයින් ද, ප්‍රත්‍යුත්පන්නයන් ගේ ද ප්‍රහාණය නො වේ.

නිදර්ශන:- ආලෝක- අන්ධකාර දෙක එක්වැ පවත්නා කලැ ආලෝකය නො පවත්නා හෙයින් නිෂ්ඵල වන්නාක් මෙනි.

මතභේදයෙක්:- 'චිත්තවිප්‍රයුක්ත සංඝකාර ඇත' යනු සංඝකාර වාදීන් ගේ මති මාත්‍රයෙකි. එබන්දක් නැති එහෙයින් චිත්තවිප්‍රයුක්ත සංඝකාරාදීන් ගේ විප්‍රයුක්ත සංඝකාරයන් මෙන් කෙලෙසුන් ගේ විප්‍රයුක්ත බව හෝ වේ. ඒ එසේමැ යි. චිත්ත විප්‍රයුක්ත වූ ප්‍රත්‍යුත්පන්න කෙලෙසයක් නම් නැති. (අරූප ධර්මයෝ එකවඝුකාදී භාවයෙන් පවත්නා ක්ෂණ මාත්‍රවැ පඤ්ච පන්නයෝ ප්‍රත්‍යුත්පන්න නම් වෙති. ඔහු කෙසේ චිත්තය හා විප්‍රයුක්ත වෙද් ද? එහෙයින් කෙලෙසයන් ගේ විප්‍රයුක්තතා නැත යනු භාව යි.)

මේ අසථාන චොදනාවක් නො වේ. පාළියෙහි ම එන හෙයිනි. ඒ මෙසේ යි:- **'යවායං කිලෙසෙ පජහති අතීතෙ කිලෙසෙ පජහති. අනාගතෙ කිලෙසෙ පජහති. පච්චුප්පන්නෙ කිලෙසෙ පජහති''*** 'යමෙක් කෙලෙස් පහ කෙරේ නම් හෙතෙම අතීත කෙලෙස් පහ කෙරේ ද? අනාගත කෙලෙස් පහ කෙරේ ද? ප්‍රත්‍යුත්පන්න කෙලෙස් පහ කෙරේ ද? මෙසේ කියා නැවැත්ත **''භඤ්ඤි අතීතෙ කිලෙසෙ පජහති අසඤ්ඤතං අසඤ්ඤමෙති. අතීතං යං නත්ථි තං පජහති''*** "ඉදින් අතීත කෙලෙස් පහ කෙරේ නම් ඉක්ම ගිය හෙයින් අසන්‍යංගත කෙලෙස් අසන්‍යංගත කෙරේ. යම් අතීත කෙලෙසෙක් නැත්නම් එය ප්‍රහාණය කෙරේ.'' ය යි කියා, **''න අතීතෙ කිලෙසෙ පජහති''** 'අතීත කෙලෙස් ප්‍රහාණය නො කෙරෙ යි' කියා ප්‍රතික්ෂෙප කරන ලදී. එසේම **''භඤ්ඤි අනාගතෙ කිලෙසෙ පජහති තෙනහි අජාතං පජහති. අනිබ්බත්තං පජහති. අනුප්පන්නං පජහති. අනාගතං යං නත්ථි තං පජහති''** 'ඉදින් අනාගත කෙලෙස් ප්‍රහීණ කෙරේ නම් **නූපන්** කෙලෙස් **ප්‍රහීණ කෙරේ. හට නො ගත් කෙලෙස්** ප්‍රහීණ කෙරේ.' අනුත්පන්න කෙලෙස් ප්‍රහීණ කෙරේ. පහළ නො වූ කෙලෙස් ප්‍රහීණ කෙරේ. අනාගත වූ යමක් නැත්නම් ඒ නැත්තක් ප්‍රහීණ කෙරේය යි, කියා **''න අනාගතෙ කිලෙසෙ පජහති''*** 'අනාගත

---

* කථා: ප:

කෙලෙස් ප්‍රහීණ නො කෙරේය යි' ප්‍රතික්ෂෙප කරන ලදී. එසේම **"හඤ්චි පච්චුප්පන්නෙන කිලෙස පජහති නෙනඤි රතෙනා රාගං පජහති. දුට්ඨා දොසං- මූළ්හා මොහං- විනිබන්ධා මානං- පරාමට්ඨා දිට්ඨිං- වික්ඛෙපගතො උඛච්චං- අනිට්ඨං ගතො විචිකිච්ඡං- ථාමගතො අනුසයං පජහති. ඛණ්ඩ-සුක්කධම්මා යුගනද්ධා වත්තන්ති. සංකිලෙසිකා මගභාවනා හොති"*** 'ඉදින් ප්‍රත්‍යුත්පන්න කෙලෙස් ප්‍රහාණය කෙරේ නම් රාගයෙන් රත්වූයේ ම රාගය පහ කෙරේ. වෙෂයෙන් දූෂිත වූයේ වෙෂය පහ කෙරේ. මෝහයෙන් මුළාවූයේ මෝහය දුරු කෙරේ. මානයෙන් දැඩි සිත් ඇත්තේ මානය දුරු කෙරේ. මිථ්‍යානිනිවෙශ ඇත්තේ මිථ්‍යාදෘෂ්ටිය දුරු කෙරේ. වික්ෂෙප වූයේ උඛච්චය දුරු කෙරේ. නිශ්චයට නො පැමිණියේ විචිකිච්ඡාව දුරු කෙරේ. ස්ථිර අනුශය ඇත්තේ අනුශය දුරු කෙරේ. (කෘෂ්ණ - ශුක්ල) කුශල - අකුශල ධර්මයෝ යුගලවැ බැඳි එක්වැ පවතිත්. මාගීභාවනාව සකිලිටු වේ" ය යි කියා.

"න අතීතෙ කිලෙසෙ පජහති. න අනාගතෙ - න පච්චුප්පන්නෙන කිලෙසෙ පජහති"* 'අතීත කෙලෙස් පහ නොකෙරේ. අනාගත කෙලෙස්- ප්‍රත්‍යුත්පන්න කෙලෙස් පහ-නො කෙරේ' ය යි සියල්ල ප්‍රතික්ෂෙප කොට **"නෙනඤි නත්ථි මගභාවනා - නත්ථි ඵලසච්ඡිකිරියා - නත්ථි කිලෙසප්පහා-නං - නත්ථි ධම්මාභිසමයෝ"** 'එසේ වන්නා හා මාගී භාවනා නැති. ඵල ප්‍රත්‍යක්ෂ කිරීමෙක් නැති. කෙලෙස ප්‍රහාණයෙක් නැති. ධර්මාවබෝධයෙක් නැති යි' අවසන්හි **"නඤි නත්ථි මගභා-වනා -පෙ- නඤි නත්ථි ධම්මාභි සමයොනි"*** 'මාගී භාවනා නැත්තේ නො වෙයි. -පෙ- ධර්මාවබෝධය නැත්තේ නො වෙයි' කියා සතර තන්හි කළ ප්‍රතික්ෂෙපය ප්‍රතික්ෂෙප කර යි. කෙලෙස ප්‍රහාණය ඇති බව් ප්‍රතිඥා කොට හේ කුමක් මෙන්ද යි විවාළ කලැ මේ කියන ලදී.

නිදශීනයෙකි:- මේතාක් ගෙඩි හට නො ගත් තරුණ රුකෙක් වේ. එය පුරුෂයෙක් මුලින් සිදී නම් ඒ ගසෙහි ඒ හට නො ගත් ඵල නූපත්නාහු ම නූපදිනි. හට නො-ගත්තාහු ම හට නො ගනිති. පහළ නො වූවෝ ම පහළ නො-වෙත්. එසේම (ඵල හට නො ගත් රුකක් මුලින් සිදිකල මතු නූපදීමට නුසුදුසු වූ සිදීමෙන් ම නූපත් ඵල නැසුණවුන් වන්නා සේ) මාගීභාවනාව නො කළ කල ඉපදීමට සුදුසු

* කථා: ප:

කෙලෙස් මාර්ගභාවනාවෙන් නූපදින හෙයින් **ප්‍රහීණ** නම් වේ. කෙලෙස් ඉපදීමට උපනිශ්‍රය ම හේතු වේ. උපනිශ්‍රය ප්‍රත්‍යය වේ. ඒ උත්පත්තියෙහි ආදීනව දැක (අනුත්පාදයෙහි) **නිර්වාණයෙහි** සිත පිහිටයි. එසේ **නිවනෙහි** සිත පිහිටි හෙයින් ඉපදීම හේතු කොට වන්නා වූ කෙලෙස් නූපදනවුන් ම නූපදනා හෙයින් ප්‍රහීණ නම් වේ. **පහළ** නුවූවෝ ම **පහළ** නො වෙති. මෙසේ හේතු නිරෝධයෙන් දුඃඛ නිරෝධය වේ.

උපාදානසකඛියන් ගේ පැවැත්ම කෙලෙස් ඉපදීමට හේතු වේ. -පෙ- සංස්කාර නිමිත්ත කෙලෙස් ඉපදීමට හේතු වේ· ආයූහනය කෙලෙස් ඉපදීමට හේතු වේ. අනායූහනයෙහි (නිර්වාණයෙහි) සිත පිහිටි බැවින් පින් පව් රැස් කිරීම් හේතුවෙන් උපදනා කෙලෙස් වේ නම් ඒ හට නො ගත් කෙලෙස් ම හට නො ගනී. **පහළ** නො වූ කෙලෙස් ම පහළ නො වේ. මේසේ හේතු නිරෝධයෙන් ඵල නිරෝධය වේ.

මෙසේ වන්නා හා **මාර්ග භාවනා** ඇති. **ඵල ප්‍රතිවෙධය** ද ඇති. ක්ලේශ ප්‍රහාණය ද ඇති. ධර්මාවබෝධය ඇති. (මේ පරවාදීහට පිළිතුරු යැ.)

ප්‍රශ්න:- **"අජාතාඥෙව න ජායන්ති"** යන්නෙන් කුමක් දක්වී ද?

පිළිතුර:- භූමීන් ගේ වශයෙන් ලැබූ කෙලෙස් පහකිරීම දක්වන ලදී.

විසඳුම:- භූමි නම් විදර්ශනා ප්‍රඥාවට අරමුණු වූ උපාදානසකඛි පඤ්චකය යි පැවැත්මට සථාන වශයෙන් ලැබූ කෙලෙස භූමිලඬ නම්.

ප්‍රශ්න:- ඒ භූමිලඬියෝ, අතීත-අනාගතයෝ ද? නැතහොත් වර්තමානයෝ ද?

පිළිතුර:- ඒ කෙලෙසයෝ භූමිලබ්ධාපන්නයෝම ය. වර්තමානාදී උපපන්නයනට විධුර (ප්‍රතිපක්ෂ) හෙයිනි.

විසඳුම:- උපපන්න ධර්ම තෙමේ (1) වර්තමාන උත්පන්නය, (2) භූතාපගත (ඇතිවැ-නැතිවී) උත්පන්නය, (3) අවකාශකෘත උපපන්නය, (4) භූමිලබ්ධ උපපන්න යන මොවුන් ගේ වශයෙන් අනෙක විධ යැ.

ඔවුන් අතුරින් (1) උත්පාද- ජරා- භඞ්ගයෙන් යුතු වූ සියලු **නාම-රූප වර්තමාන උත්පන්න යැ.**

(2) ආලම්බන රස අනුභව කොට නිරුද්ධ වූ **අනුභූතාපගත** නම් වූ කුසල්-අකුසල් ද, උත්පාදාදී **ක්ෂණත්‍රයයට පැමිණ** නිරුද්ධ වූ කුශලාකුශලයෙන් පිටත් සෙසු සඞ්ඛතය ද **භූතාපගතෝත්පන්න** නම් වේ.

(3) **යානිඝ්ඝ තානි පුබ්බකතානි කම්මානි** 'ඔහු පෙර කරන ලද කර්ම' යනාදීන් කී කර්මය අතීතවූයේ ම අනික් විපාකයක් ප්‍රතිබාහණය කොට තමා ගේ විපාකයට අවකාශ කොට සිටින හෙයින් එසේ කරන ලද අවකාශ ඇති විපාකය ද මෙසේ අවකාශ කළ කල්හි ඒකාන්තයෙන් උපදනා හෙයින් අවකාශ-කෘත උත්පන්න යැ.

විභාවර:- විපාක දීමට අවකාශ කිරීම් වශයෙන් උපදවන-ලද අතීත කර්මය ද, එයින් උපදනට සිටී අනාගත විපාකය ද ඔකාසකතූපපත්තාය යි.

(4) ඒ ඒ භූමියෙහි (මනුෂ්‍ය-දිව්‍යාදී ආත්මභාව සඞ්ඛ්‍යාවා පඤ්චස්කන්ධයෙහි) තෝ නසනලද අකුශලය **භූමිලබ්ධෝත්පන්න නම්.** අසමූහත හෙයින් ම නැතැ යි තෝ කියා ගැකි බැවිනි.

මේ භූමි ලබ්ධයෙහි භූමිය කිම? භූමි ලබ්ධය කිමැ යි උපදනා සැණය පසිදුනා සඳහා භූමි **නම්** විදර්ශීනාවට අරමුණු වූ පඤ්චස්කන්ධ යැ. ඒ පඤ්චස්කන්ධයෙහි උපදනට සුදුසු කෙලෙස් සමූහය භූමි ලබ්ධ නම්. ඒ භූමි ලබ්ධය ද අරමුණු කිරීම් වශයෙන් තෝ වේ. අරමුණු කිරීම් වශයෙන් වනාහි සියලු අතීත - අනාගත සන්තතියන් අරමුණු කොට කෙලෙස් උපදී. රහතුන් ගේ පරිඥාත **සන්තතියන්** අරභයා කෙලෙස උපදී. **මහාකාත්‍යායන, උත්පල-වර්ණා** ආදීන් ගේ සන්තතියන් අරභයා සෞරෙය්‍ය සිටු, **නන්ද-මාතවක** ආදීන්ට කෙලෙස් උපන්නා සේ යැ. අන්‍ය සන්තාන-ගත කෙලෙස් ජාතය අන්‍ය සන්තානයෙකැ අරමුණු කිරීම් මාත්‍රයෙකින් භූමිලබ්ධ වන්නේ නම්, **පර සන්තතිපතිත** ඒ කෙලෙස් ජාතය අප්‍රහෙය බැවින් කිසිවෙක් භව මූලය පජහනය නෝ කරන්නේ යි.

වසනු (උත්පත්තිසම්භාන) වශයෙන් භූමිලබ්ධය යි දතයුතු.

යම් යම් භවයෙකැ හෝ සන්තානයෙකැ හෝ පරිඥාත භූමි වශයෙන් අපරිඥාත ස්කන්ධයෝ උපදින් නම් ඒ ඒ භවයෙහි

හෝ සන්තානයෙහි හෝ ඉපදීමෙහි පවත් ඒ ඒ සකාය විෂයෙහි සසරට මුල් කෙළෙස් රැස අප්‍රහීණ බැවින් අනුශයිත වේ.

ඒ **ක්ලේශ** ජාතය ප්‍රහීණ නො කළ හෙයින් **භූමිලබ්ධ** යි දතයුතු ඒ සකාය විෂයෙහි අප්‍රහීණභාවයෙන් අනුශයිත කෙලෙස්හු වෙද් ද? ඒ පුද්ගලයා ගේ **ඒ** සකාය ඒ කෙලෙසුන්ට වසඟ වෙති. අනුන් සන්තක වූ සකායෝ වසඟ නො වෙති. අතීත සකාය විෂයෙහි ද අප්‍රහීණ වූ අනුශයිත ක්ලේශයනට අතීත සකායෝ ම වසඟ වෙති. ප්‍රත්‍යුත්පන්න (වර්තමාන) සකායෝ වසඟ නො වෙති අනාගතාදියෙහි ද මෙසේමැ යි. එසේම කාමාවචර සකාය විෂයෙහි අප්‍රහීණ අනුශයිත ක්ලේශයනට කාමාවචර සකායෝ ම වසඟ වෙති. රූපාවචර – අරූපාවචර සකායෝ වස්තු නො වෙත්. රූපාවචර – අරූපාවචර සකාය විෂයෙහි ද මෙම නය යි.

සෝවාන් ආදීන් අතුරෙහි යම් යම් ආර්‍ය පුද්ගලයකු ගේ ස්කන්ධ විෂයෙහි ඒ ඒ වට්ටමූල අනුශය ක්ලේශ ජාතය ඒ ඒ **මගින්** ප්‍රහීණ වූයේ නම් ඒ ඒ ආර්‍ය පුද්ගලයා ගේ ඒ ඒ ස්කන්ධ ප්‍රහීණ වූ ඒ ඒ වට්ටමූල ක්ලේශයනට වසඟ නො වන හෙයින් භූමිය යන ව්‍යවහාරය නො ලබ යි.

සම්ප්‍රකාරයෙන් පුහුදුන් ගේ වට්ටමූල කෙලෙස් අප්‍රහීණ බැවින් කරනු ලබන චේතනා- චෛතසික භේද ඇති යම්කිසි කර්මයක් කුසල් හෝ අකුසල් වේ. මෙසේ අප්‍රහීණ අනුශය ඇති හෙයින් ඒ පුහුදුන්හට කර්ම-ක්ලේශ ප්‍රත්‍යයයෙන් සංසාර වෘත්තය පවතී. ඒ පුහුදුන් ගේ ඒ වට්ටමූලය රූපස්කන්ධයෙහි ම වේ. වේදනා ස්කන්ධාදියෙහි නො වේය යි ද, විඥානස්කන්ධයෙහි ම හෝ, රූපසකන්ධාදියෙහි නො වෙයි කියා හෝ නොකිය යුතු යි. අවිශෙෂයෙන් පඤ්චස්කන්ධයෙහි ම අනුශයිත හෙයිනි.

නිදර්ශන:- ගසෙකැ පෘථිවී ආදී රස මෙනි. මහා රුකක් පොළෝ තලයෙහි පිහිටා පෘථිවී රසය ද, ආපෝ රසය ද, මූල-කඳ- සාඛා- කුඛා සාඛා- වෙළෙප්- ළපලු- පත්‍ර- මල්- පල යන මොවුන් ගෙන් වැඩී අනස් කුස පුරා කලපාවසානය දක්වා බීජ පරම්පරාවෙන් රුක් පරපුර ගවමින් සිටී කලැ ඒ පඨවි රසාදිය මූලෙහිම ය, කඳ ආදියෙහි නො වේය යි හෝ; ඵලයෙහි ම ය, මූලාදියෙහි නො වේය යි හෝ නො කිය යුතු යි.

කවර හෙයින් ද යත්:- අවිශෙෂයෙන් සියලු මුල් අදියෙහි අනුගත හෙයිනැ යි දතයුතු.

යම් සේ ඒ රුකෙහි මල්-කොළ ආදියෙහි කළකිරුණු යම්කිසි පුරුෂයෙක් සතර දිසාගෙහි මඩුකටු තම් විෂ කටු ගසා ද? එකල ඒ ගස ඒ විෂයෙන් සපශී කරන ලදුවැ පෘථිවී රස ආපොරසයන් ක්ෂය වූ හෙයින් නො උපදනා සවභාවයට පැමිණ නැවැතැ රුක් පරපුර ඉපදවීමට අපොහොසත් වන්නා සේ සකාඛ ප්‍රවෘත්තියෙහි කළකිරුණු කුලපුත්‍ර තෙමේ ඒ රුකෙහි සතර අතින් විෂකටු යෙදීම මෙන් තමා සතන්හි **සතර මාර්ග භාවනා** ආරම්භ කරයි. එකල ඒ පුරුෂයා ගේ **ස්කන්ධ** පරපුර ඒ **සතර මාර්ග** නමැති විෂ සපශීයෙන් සසර-වට මුල් වූ අනුශය ක්ලෙශයන් ප්‍රහීණ වූ හෙයින් ක්‍රියාභාව මාත්‍රයට පැමිණි කාය කර්මාදී සියලු කර්මප්‍රභෙද ඇතිවැ මත්තෙහි නැවැතැ (භවය) නො උපදවන සුලු බවට පැමිණ භවානන්තර සන්තතිය ඉපදවීමට අපොහොසත් වේ. හුදෙක් අවසාන චුති චිත්ත නිරොධයෙන් දර නැති ගින්න මෙන් ප්‍රහීණ උපාදාන ඇත්තේ කිසිවක් නො ගන්නේ පිරිනිවේ. මෙසේ භූමියෙහි හා භූමි ලද්ධයෙහි විශෙෂය දතයුතු.

තවද **සමුදාචාරයෑ, ආරම්මණාධිගහගිතයෑ, අවිකඛම්භි-තයෑ, අසමූහතයෑ** යන මොවුන් ගේ වශයෙන් උත්පත්තිය චතුර්විධ හි.

ඔවුනතුරින් වර්තමාන උත්පත්තිය **සමුදාචාර උත්පන්න** නම්. චක්ෂුරාදියට අරමුණ ගමු වූ කල්හි භවාඞ්ගයෙහි ප්‍රවෘත්ත ජවන වාරයෙහි නො උපදනා වූ ක්ලෙශ ජාතය අරමුණ දැඩිකොට ගත් හෙයින් ම මෑත භාගයෙහි නියමයෙන් උපදනා බැවින් **ආරම්ම-ණාධිගහගිත උප්පන්නය සි** කියනු ලැබේ.

නිදර්ශන:- කැලණිගම පිඹු පිණිස හැසුරුණු **මහාතිස්ස** තෙරුන්ට විෂභාග රූප දර්ශනයෙන් උපන් ක්ලෙශ ජාතය මෙනි. (මහාතිස්ස තෙරණුවෝ දවල් නිමිත්ත ග්‍රහණය කළ අරමුණෙහි රාත්‍රියෙහි බලවත්වැ උපන් කෙලෙස් විෂකර්මභණය කොට රහත්වූහ)

සමථ - විදර්ශනා භාවනා දෙක අතුරින් එකකින් නො වැඩී කෙලෙස් රස චිත්තසන්තතියට නො නැගී නමුදු ක්ලෙශොත්පත්තිය වළක්වන හේතුවක් නැති හෙයින් **අවිකඛම්භිතුප්පන්න** නම් වේ.

ශමථ - විදර්ශනා වශයෙන් විෂ්කම්භණය කළ කෙලෙස් ද ආයතිමාගීයෙන් නොනැසූ හෙයින් (උපදනා සඟහාවය නොඉක්ම වූ හෙයින්) **අසමූහතූපපත්තිය යි** කියනු ලැබේ.

නිදර්ශන:- අහසින් යන අට සමවත් ලද තෙරුන්ට මල් පිපි රුක් ඇති උයනෙකැ මල් කෙලම්න් මිහිරි හඬින් ගායනා කරන මාගමක ගේ ගීත ශබ්දය ඇසීමෙන් උපන් කෙදිශ ජාතය මෙති.

ආරම්මණාධිග්ගහිතූපපත්ති යැ, **අවික්ඛම්භිතූපපත්ති** යැ, **අසමූහතූපපත්ති**යැ යන ත්‍රිවිධ උත්පත්තිය ම භූමිලබ්ධානුපත්තියෙන් ම එකට සංග්‍රහ වේය යි දතයුතු.

මෙසේ උක්ත ප්‍රභේද ඇති මේ උත්පත්තියෙහි **වනීමානය**, **භූම්‍යාපගතය**, **අවකාශකරණය**, **සමුදාචාරය** යි කියන ලද චතුර්විධ උත්පත්තිය මාගී වධ්‍ය නො වන හෙයින් **සතර මග** නුවණ අතුරින් කිසියම් නුවණෙකින් පහ කළ යුතු නො වේ.

'භූමිලද්ධය, **ආරම්මණාධිග්ගහිතය**, **අවික්ඛම්භිතය**, **අසමූහතය** යි කියන ලද ඒ චතුර්විධ උත්පත්තියා ගේ ඒ උත්පත්ති භාවය විනාශ කරමින් ඒ ඒ ලෞකික - ලෝකෝත්තර ඥාන උපදින හෙයින් සියල්ල ප්‍රහාතව්‍ය වේය යි' මෙසේ මෙහි යම් මාගීඥානයකින් යම් කෙලෙසයක් ප්‍රහාතව්‍ය නම් ඔවුන් ගේ ප්‍රහාණය ද දතයුතු.

ඒ මාර්ගාවබෝධකාලයෙහි පරිඥා - ප්‍රහාණාදි වශයෙන් කියන ලද කෘත්‍යය ද, අවිපරීත සභාවයෙන් දතයුතු.

ඒ මෙසේයි:- චතුරාර්‍ය සත්‍යයන් අවබෝධ කරන කාලයෙහි මේ සතර ඤාණයන් අතුරින් එක් එක් ඤාණයක ගේ **පරිඤ්ඤා**-**පහාන**- සච්ඡිකිරියා- භාවනායැ යි කියන ලද මේ සතර-සතර කෘත්‍යය තතු සේ දතයුතු යි.

පැරැණියෝ ඒ මෙසේ කීහ:- පහන ඉදිරි පසු නොවී එකවට වැටිය දැවීමයැ, අඳුරු දුරු කිරීමයැ, ආලෝකය පැතිරවීමයැ, තෙල් ක්ෂය කිරීමයැ යන කෘත්‍යය සතරක් කරන්නා සේ, මාගීඥානය ද පෙර පසු නොවී එක ක්ෂණයෙහි **දුක්ඛ** පරිඤ්ඤාභිසමය (පිරිසිඳ දැනීම්) වශයෙන් ද, **සමුදය** ප්‍රහාණාභිසමය වශයෙන් ද, **මාගීය** භාවනාභිසමය වශයෙන් ද, **නිරෝධය** ප්‍රත්‍යක්ෂාභිසමය වශයෙන් ද අවබෝධ කෙරේ.

නිර්ණය - 'නිර්වාණය අරමුණු කොට චතුරාර්ය සත්‍යයට ම පැමිණේ. චතුරාර්ය සත්‍යය ම දකී. චතුරාර්ය සත්‍යය ම ප්‍රතිවෙධ කෙරේය යි' මෙයින් කියන ලදී.

"යො ගිහිඝවෙ දුක්ඛං පස්සති, දුක්ඛ සමුදයම්පි සො පස්සති. දුක්ඛ නිරොධම්පි සො පස්සති, දුක්ඛනිරොධගාමිනි පටිපදම්පි සො පස්සති"* 'මහණෙනි! දුක දක්නා මහණතෙමේ **දුඃඛසමුදය ද, දුඃඛනිරෝධය ද, දුඃඛනිරෝධගාමිනිප්‍රතිපදාව ද** දක්නේය' යි එයින් වදළහ.

මේ ක්‍රමයෙන් දුඃඛසමුදය දක්නේ දුක ද දකී යනාදී සියල්ල නය විසින් දතයුතු.

තවද **"මහඟසමුඛිනිස්ස ඤාණං දුක්ඛපෙතං ඤාණං, දුක්ඛ සමුදයපෙතං ඤාණං, දුක්ඛනිරොධපෙතං ඤාණං, දුක්ඛ නිරොධ ගාමිනියාපටිපදායපෙතා ඤාණං."†** 'මාගී සම්‍යග්ඥානය ලබා ගත් ඤාණයෙක් වේ නම් ඒ ඤාණය **දුඃඛයෙහි ද වේ. දුක්ඛ සමුදයෙහි ද වේ. දුඃඛනිරෝධයෙහි ද වේ. දුඃඛ නිරෝධගාමිනී ප්‍රතිපදායෙහි ද** වේය' යි මෙසේ මේ **චතුරාර්ය සත්‍ය ප්‍රතිවෙධය** කාලානන්තරයෙකින් නොව එකවටම වේය යි දක්වන ලදී.

උපමාන උපමෙය සංසන්දනය:- පහන වැටිය දවන්නා සේ මාර්ගඥානය **දුක** පිරිසිඳ දැන ගනී. අඳුරු නසන්නා සේ **සමුදය** ප්‍රහාණය කෙරේ. එළිය පතුරුවන්නා සේ සහජාතාදී ප්‍රත්‍යය ඇති බැවින් **සම්මා සඞ්කප්පාදී මාර්ගය** වඩයි. තෙල් දවන්නා සේ කෙලෙස් ක්ෂය කරන **නිර්වාණය** අවබෝධ කෙරේය යි දතයුතු.

තවද ක්‍රමයෙකි:- ඉර උදාවන්නේම පෙර පසු නොවී සිවු කිසක් කරයි රූප ගතයන් ප්‍රකාශ කරයි. අඳුරු නසයි එළිය පතුරුවයි. සීතල සංසිඳුවයි. එසේම **මාර්ඥානය ද දුක** පිරිසිඳ දැන ගනී. **සමුදය** පහකෙරේ සම්‍යක් සංකල්පාදී **මාර්ගය** වඩයි. **නිර්වාණය** (ප්‍රත්‍යක්ෂ) අවබෝධ කෙරේ.

සංසන්දනය:- ඕරු රූප දක්වන්නා සේ මාර්ඥානය **දුක** පිරිසිඳ දනී. අඳුරු නසන්නා සේ **සමුදය** පහකෙරේ. එළිය දක්වන්නා සේ සහජාතාදී ප්‍රත්‍යය භාවයෙන් **මාර්ගය** වඩයි. සීතල සංසිඳුවන්නා සේ කෙලෙස් සංසිඳුවන **නිවන** අවබෝධ කෙරේය යි දතයුතු.

---

* සං: නි: සවච්ඡසංයුත්ත † ප: ම: මහාවග්ග

තවද:- නැව පෙර පසු නොවී එකවට මෙතෙර හැරීමයැ, සැඩ පහර සිඳීමයැ, බඩු ඉසිලීමයැ, පරතෙරට පැමිණීම යැ යි සිවු කිසක් කරන්නා සේ **මාර්ගඥානය** ද පෙර කී සේ සිවු කිසක් කෙරේ.

සංසඳනය:- නැව මෙතෙර දුරු කරන්නා සේ **මාර්ගඥානය දුක්ඛ** පිරිසිඳී. නැව සැඩ පහර සිඳින්නා සේ **මාර්ගඥානය සමුදය** නසයි. නැව බඩු උසුලන්නා සේ සහජාතාදී ප්‍රත්‍යය භාවයෙන් **මාර්ග** වඩයි. පරතෙරට පැමිණෙන්නා සේ **නිර්වාණ** ප්‍රත්‍යක්ෂ කරයි.

මෙසේ සත්‍යාවබෝධ කාලයෙහි එකවට සතර කෘත්‍යය වශයෙන් පවත්නා ඥාණය ඇති ඒ **මාර්ගයට** සොළොස් ආකාර-යෙකින් පිළිතාදී අවිපරීත ස්වභාවයෙන් එකවට චතුරාර්ය්‍යසත්‍යය ප්‍රතිවෙධ වේ.

ඒ මෙසේයි: **"කථං චතූහාකාරේහි චත්තාරි සච්චානි එක-පටිවේධානි. සෝළසහාකාරේහි තථලක්ඛණා චත්තාරි සච්චානි එකපටිවේධානි. දුක්ඛස්ස පීළනට්ඨෝ, සඞ්ඛතට්ඨෝ, සන්තාප-ට්ඨෝ, විපරිණාමට්ඨෝ තථට්ඨෝ. සමුදයස්ස ආයූහනට්ඨෝ, නිදානට්ඨෝ, සංයෝගට්ඨෝ, පලිබෝධට්ඨෝ, තථට්ඨෝ. නිරෝධස්ස නිස්සරණට්ඨෝ, විවේකට්ඨෝ, අසඞ්ඛතට්ඨෝ, අමතට්ඨෝ, තථට්ඨෝ. මග්ගස්ස නියානට්ඨෝ, හේතුට්ඨෝ, දස්සනට්ඨෝ, ආධිපතේයට්ඨෝ තථට්ඨෝ. ඉමේහි සෝළසහාකාරේහි තථලක්ඛණා චත්තාරි සච්චානි එකසංගහිතානි යං එකසංගහිතං තං එකත්තං. යං එකත්තං තං එකත්තා ඤාණේන පටි-විජ්ඣිතබ්බානි චත්තාරි සච්චානි එකපටිවේධානි"*** 'චතුරාර්ය්‍ය සත්‍යය අවිපරීතාර්ථයෙන් කෙසේ එක ප්‍රතිවෙධ වේ ද? සොළොස් අයුරෙකින් චතුරාර්ය්‍ය සත්‍යය එකකින් අවබෝධ වේ. **දුක්ඛයෙහි** පෙළීම් අර්ථය, සංඛතාර්ථ යැ, තැවීම් අර්ථ යැ, පෙරළීම් අර්ථ යැ තථාර්ථ යි. **සමුදයෙහි** රැස්කිරීම් අර්ථය, නිදුනාර්ථ යැ, සංයොගාර්ථ යැ, පලිබොධාර්ථ යැ තථාර්ථ යි. **නිරෝධයෙහි** (සසරින්) නික්මවන අර්ථ යැ, විවේකාර්ථ යැ, අසඞ්ඛතාර්ථ යැ, අමෘතාර්ථ යැ තථාර්ථ යි. **මාර්ගයෙහි** (සසරින්) ගෙන යන අර්ථය, හේතුවර්ථය, දර්ශනාර්ථ යැ, අධිපතිභාවාර්ථ යැ තථාර්ථ යි. මේ සොළොස් අයුරින් අවිපරීතාර්ථ-යෙන් **චතුරාර්ය්‍ය සත්‍යය** එකකින් ස ගෘහීත වේය යි' කියයි.

විශේෂ:- මෙහි එකකින් සංග්‍රහ වීම නම් තථාර්ථ විසිනි. තථාර්ථ නම් අවිපරීතාර්ථය යි, සත්‍යාර්ථය යි, විද්‍යමාන වූ ස්වභාවාර්ථය යි.

---

* ඵ: ම: සච්චකථා

විසජ්ජනා:- මාර්ගඥතාය මුඛ්‍ය හෙයින් නිර්වාණය ම අරමුණු කෙරෙතුදු දුඃඛාදීන්හි අවිපරීත සභාවය වූ සත්‍යාර්ථය වසාසිටි අවිද්‍යාව නසා ඒ සත්‍යාර්ථය තතු සේ අවබෝධ කෙරෙමින් පවතී. පසුවැ පීඩනාදී සොළොස් සත්‍යාර්ථ ආයතීයන් වහන්සේට හසුනාමලකයක් සේ ඇති සේ වැටහේ.

ප්‍රකරණයෙකි:- දුඃඛාදීන්ට අතිකුදු රෝග ගණ්ඩාදී අර්ථ ඇත ද කුමක් හෙයින් පීඩනාදී සතරක් ම කීයේ ද?

පිළිතුර:- සමුදයාදී සත්‍යානන්තර දර්ශන වශයෙන් ප්‍රකාශවන හෙයිනි.

විසජ්ජනා:- දුඃඛාදී සතරෙහි සභාවයෙන් යම් ආකාරයෙක් ප්‍රකාශ වේනම් ඒ පීඩනාදිය සතරක් ම වේය යි සොළසෙක්ම කියන ලදී. සෙස්ස නොකියන ලදී.

විශේෂ:- **"තත්‍ථ කතමං දුක්ඛෙ ඤාණං. දුක්ඛං ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා"*** එහි දුක පිළිබඳ ඤාණය නම් කිම? දුක අරභයා යම් ප්‍රඥාවක් උපදීද, යනාදී නයින් එකි එකි සත්‍යාලම්බන වශයෙනුදු **සත්‍යඤාණය** වදාරණ ලදී.

තවද **"යො භික්ඛවෙ දුක්ඛං පස්සති සමුදයම්පිස්ස පස්සති"**†. 'මහණෙනි! යමෙක් දුක දකී නම් හේ සමුදය ද දකී' යනාදී නයින් එක නිරෝධ සත්‍යය අරමුණු කොට සෙසු සත්‍ය-යන් කෙරෙහිදු කෘත්‍යය නිෂ්පත්ති වශයෙනුදු **සත්‍යඤාණය** වදාරණ ලදී.

මෙසේ පාළියෙහි වෙන් වෙන්වැ සත්‍යය අරමුණු කිරීම් වශ-යෙන් ද, කෘත්‍ය නිෂ්පත්ති වශයෙන් ද **සත්‍යඤාණය** වදාරණ ලදී.

ඒ දර්ශනවයය අනුරින් යම් කලෙක එකි එකී සත්‍යයක් අරමුණු කෙරේ නම් එකල **සමුදය** දර්ශනයෙන් සභාවයෙන් පීඩන ලක්ෂණ වූ **දුඃඛයා ගේ** ආයූහන සභාවය වූ සමුදයින් රැස් කරන ලද හෙයින් ද, සකස් කරන ලද හෙයින් ද, පිඬු කරන ලද හෙයින් ද, දුඃඛයා ගේ සඞ්ඛතාර්ථය ප්‍රකාශ වේ. **මාර්ගය** කෙලසුන් ගේ තැවීම් පහකරන හෙයින් ද, කෙලෙස් දහ නැති බැවින් ඉතා සිහිල් හෙයින් ද **මාර්ග** දර්ශනයෙන් දුඃඛයා ගේ සන්තාපාර්ථය ප්‍රකාශ වේ.

---

* ප: ම: මහාවග්ග † සං: නි: සච්චසංයුත්ත

නිදර්ශන:- ආයුෂ්මත් **නාග සේථේරයන්ට** අප්සරාවන් දැකීමෙන් සුන්දරිය ගේ අනභිරූප බව වැටහීම මෙනි.

අවිපරිණාම සභාවය ඇති නිරෝධය (**නිබ්බාණය**) දැක්මෙන් දුඃඛයා ගේ පෙරළෙන සභාවය ප්‍රකාශ වේය යි කිවයුත්තෙක් නැති.

එසේම සභාවයෙන් ආයූහන ලක්ෂණ ඇත්තා වූ සමුදයා ගේ නිදානාර්ථය දුඃඛ දර්ශනයෙන් ප්‍රකාශ වේ. නො සැප හෝජනයෙන් උපන් ව්‍යාධිය දැකීමෙන් හෝජනයා ගේ ව්‍යාධියට නිදාන බව වැටහීම මෙනි. සංයෝගයක් නැති නිර්‍වාණය දැකීමෙන් සංයෝගාර්ථය ප්‍රකට වේ. නියන්‍යාණ වූ මාර්ගය දැකීමෙන් පලිබොධාර්ථය ප්‍රකාශ වේ.

එසේම නිස්සරණ ලක්ෂණ නිරෝධයා ගේ විවේකාර්ථය අවිවේක වූ සමුදය දර්‍ශනයෙන් ප්‍රකට වේ. **මාර්ග දර්‍ශනයෙන්** අසඞ්ඛතාර්ථය ප්‍රකාශ වේ.

මේ යොගියා විසින් අනවරාග්‍ර සංසාරයෙහි **මාර්ගය** නො දන්නා ලද හෙයිනි. ඒ ආර්‍යමාර්ගය ද ප්‍රත්‍යය සහිත හෙයින් සඞ්ඛත නම් වේය යි අප්‍රත්‍යය වූ **නිර්‍වාණ ධර්මයා ගේ** අසඞ්ඛත භාවය ඉතා ම ප්‍රකට වේ. දුක් දැකීමෙන් ඒ නිරෝධයා ගේ අමෘත භාවය ප්‍රකට වේ. 'දුඃඛය විෂයෑ **නිර්‍වාණය** අමෘතයෑ සි' කියා යි.

එසේම නියන්‍යාණ (පැමිණවීම) ලක්ෂණ කොට ඇති මාර්ගයා ගේ දැකීමෙන් '**නිවනට** පැමිණීමට මේ සමුදය (තෘෂ්ණාව) හේතු නොවේ. මේ ආර්‍ය මාර්ගය හේතු වේය යි' මෙසේ හෙතුවාර්ථය ප්‍රකට වේ. **නිරෝධ** දර්‍ශනයෙන් දර්‍ශනාර්ථය ප්‍රකට වේ. අතිශයින් සියුම් වූ රූපයන් දක්නහුට මාගේ ඇස එකාන්තයෙන් ප්‍රසන්නය යි ඇසෙහි විප්‍රසන්න භාවය මෙනි කොයෙක් රෝගාතුර කෘපණයන් (දුඃඛිතයන්) දැකීමෙන් ඉසුරුමත් ජනයා ගේ උදුර බව ප්‍රකට වන්නා සේ, දුක දැකීමෙන් එයට ප්‍රතිපක්ෂ වූ අධිපති අර්ථය ප්‍රකට වේය යි මෙසේ මේ සත්‍යාර්ථ අතුරින් එක එකක් පීළන-ආයූහන- **නිස්සරණ**- නියාන වශයෙන් සවලක්ෂණයෙන් ද, ඉතිරි සඞ්ඛතාර්ථාදී තුන් තුන් අර්ථයන් ප්‍රකාශවන හෙයින් ද, එකි එකී සත්‍යයෙක්හි සතර සතර අර්ථ කියන ලදී.

විභාග:- දුඃඛයෙහි සංස්කෘතාර්ථ යෑ සන්තාපාර්ථ යෑ විපරිණාමාර්ථ යෑ යන තුන ද, සමුදයයෙහි නිදානාර්ථ යෑ සංයෝගාර්ථයෑ පලිබොධාර්ථ යෑ යන තුන ද, නිරෝධයෙහි විවේකාර්ථ යෑ,

අසංසඤ්ඤාර්ථ ය, අමෘතාර්ථ ය යන තුන ද; මාර්ගයෙහි හෙළිවර්ථ ය, දර්ශනාර්ථ ය, අධිපතිභාවාර්ථ ය යන තුනද යි පෙර කී සේ මේ සොළොස් අර්ථයෝ ප්‍රකට වෙති.

නිශ්චය:- මාර්ග ඤාණයෙහි මෙකී සියලු අර්ථයෝ ම දුඃඛාදීන් විෂයෙහි සිවු කෘත්‍යයක් ඇති එකම ඥානයෙන් ප්‍රතිවේධයට යෙති.

මතානතර:- 'චතුස්සත්‍යයන් නානා ඤාණයෙහි නානා ඥානයෙන් ප්‍රතිවේධ කෙරෙනැ යි' කියන්නවුනට පිළිතුරු වශයෙන් අභිධර්මයෙහි කථාවස්තු ප්‍රකරණයෙහි (**මොග්ගලී පුත්ත-තිස්ස** මහතෙරුන් වහන්සේ විසින්) වදාරන ලදී.

විස්තර:- පෙර කී පරිඥාදී සතර කෘත්‍යය අතුරින් පරිඥාව ද, ප්‍රහාණය ද, ප්‍රතිවේධය ද ත්‍රිවිධ වේ. භාවනා විවිධ වේ.

ඒ මෙසේ යි:- **ඤාත** පරිඤ්ඤාය, තීරණ පරිඤ්ඤාය පහාන පරිඤ්ඤායැ යි **පරිඤ්ඤා ත්‍රිවිධ** වේ. එහි 'අභිඤ්ඤාව දන්නා ලදය යන අර්ථයෙන් ඤාත නම් වේය යි' මෙසේ උදෙසා "යම් යම් ධර්මයක් අවබෝධ කරන ලද නම් ඒ ඒ ධර්මයෝ දන්නා ලදහයි" මෙසේ සැකෙවින් ද,

"සබ්බං භික්ඛවෙ අභිඤ්ඤෙය්‍යං, කිඤ්ච භික්ඛවෙ සබ්බං අභිඤ්ඤෙය්‍යං චක්ඛුං භික්ඛවෙ අභිඤ්ඤෙය්‍යං"* 'මහණෙනි! සියල්ල අවබෝධ කටයුතු යි. කවර සියල්ලක් අවබෝධ කට-යුතු ද? මහණෙනි! චක්ෂුඃප්‍රසාදය අවබෝධ කටයුතු යි, මේ ආදී නයින් විස්තර වශයෙන් වදාරන ලද්දේ **ඤාත පරිඤ්ඤා නමු**. ඒ ඤාත පරිඤ්ඤාව ගේ ප්‍රත්‍යය සහිත නාම-රූප විශෙෂයෙන් දැනීම පරිඥානන්තරයට විෂය කොට වන ආවෙණික භූමිය යි. 'පරිඥා ප්‍රඥාවය තීරණාර්ථයෙන් ඥානය යි.' මෙසේ උදෙසා **"යෙ යෙ ධම්මා පරිඤ්ඤාතා හොන්ති. තෙ තෙ ධම්මා තීරිතා හොන්ති"**† 'යම් යම් ධර්මයෙක්තෙක් පරිඥාත වෙත් නම් ඒ ඒ ධර්මයෝ තීරණය කරන ලද්දෝ වෙත්ය යි මෙසේ සැකෙවින් වදාරා **"සබ්බං භික්ඛවෙ පරිඤ්ඤෙය්‍යං කිඤ්ච භික්ඛවෙ සබ්බං පරිඤ්ඤෙය්‍යං චක්ඛුං භික්ඛවෙ පරිඤ්ඤෙය්‍යං"*** 'මහණෙනි! සියල්ල පරිඤ්ඤෙය්‍ය යැ, මහණෙනි! පරිඤ්ඤෙය්‍ය සියල්ල කවරේ ද? මහණෙනි! චක්ෂුඃප්‍රසාදය පරිඤ්ඤෙය්‍ය යැ, යන:දී නයින් විස්තර හෙයින් වදාරණ ලද්දේ **තීරණ පරිඤ්ඤා නමු**.

---

* සං: නි: සවච්ඡසංයුත්ත † ප: ම:

ඒ චක්ඛුද්දිශාදී කලාප සතමයීනයෙහි **පටන්** අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්ම යැ සි තීරණය කිරීම් වශයෙන් **පවත්නා** තීරණ ප්‍රඥාවට **අනුලෝම ඤානය** දක්වා ආවෙණික භූමිය සි.

'ප්‍රහාණ පරිඥාව කෙලෙස් බැහැර කරන හෙයින් ඤාණයයි' මේසේ උදෙසා **"යෙ යෙ ධම්මා පහීණා භොනති තෙ තෙ ධම්මා පරිච්චත්තා භොනති"*** 'යම් යම් ක්ලෙශ ධර්‍ම කෙනෙක් ප්‍රහීණ වෙත් නම් ඒ ඒ ක්ලෙශ ධර්‍මයෝ බැහැර කරන ලදහ' සි මෙසේ විස්තාර වශයෙන් කියන ලද අනිච්චානුපස්සනාවෙන් නිත්‍ය සංඥාව ප්‍රහාණය කෙරේ' යනාදී ක්‍රමයෙන් පැවැත්නී **පහාන පරිඤඤු නමු**. භඞ්ගානුපස්සනාවෙහි **පටන්** මාගීඤ්ඤතය දක්වා ඒ පහාණ පරිඤඤුවට භූමිය සි.

(නිෂ්පර්‍යායයෙන් පහාණ පරිඤඤුවම **මාගී ඤානය** වේය සි මාගීඤ්ඤන භූමිය සි කීහ යනු ටීකායි.)

මේ අභිසමයකාල කෘත්‍ය විචාරණයෙහි ලා මේ ප්‍රහාණ පරිඥාව ම අදහස් කරන ලදු.

තවද ඤාත- තීරණ- පරිඤඤුවන් ද, **පහාණ** පරිඤඤුව පිණිස ම පවත්නා හෙයින්, 'යම් ධර්‍මයක් ප්‍රහාණය කෙරේ නම් ඒ ධර්‍මය ම ඒ කෘත්‍යයෙන් දන්නා ලද්දේ ද, තීරණය කරන ලද්දේ ද වේය සි' මෙසේ පරිඥා ත්‍රයය ම මේ පර්‍යායයෙන් මාගීඤ්ඤතයා ගේ කෘත්‍යය සි දත යුතු සි.

පරිඤඤු මෙන් ප්‍රහාණය ද ත්‍රිවිධ වේ. **විෂ්කම්භන- තදඞ්ග- සමුච්ඡේද** ප්‍රහාණ වශයෙනි. ඒ ප්‍රහාණයන් අතුරින් සෙවෙල් සහිත දියෙහි බහාලූ කළයෙන් සෙවෙල් දුරුවීම මෙන් ඒ ඒ ලෞකික සමාධියෙන් නීවරණාදී විරුද්ධ ධර්‍මයන් විෂ්කම්භණය වීම **විෂ්කම්භණ ප්‍රහාණය සි.**

පෙළෙහි **"විකඛම්භනපපහාණං ච නීවරණානං පඨමජ්ඣානං භාවයතො"**† 'ප්‍රථම ධ්‍යානය වඩන පුද්ගලයා ගේ නීවරණ ප්‍රහාණය වේය' සි මෙසේ ධ්‍යාන බලයෙන් නීවරණයන් ගේ විෂ්කම්භණය (ඔබාලීම) කියන ලද්දේ ප්‍රකට බැවිනි.

ඒ එසේමැ සි:- නීවරණයෝ වනාහි ධ්‍යානයට පූර්‍ව භාගයෙහි ද, පසු භාගයෙහි ද වහා සිත නො මඩනාහු වෙති.

---

* සං: නි: සවවසංයුත්ත ‡ ප: ම:

විභාවනා:- ධ්‍යානයා ගේ පූර්වභාගය නම් ධ්‍යානය ලැබීම පිණිස පූර්වභාග ප්‍රතිපත්තිය යි. පශ්චාද්භාගය නම් ධ්‍යානය ලැබ අන්‍ය කෘත්‍යයෙකැ යෙදීම යි.

විශේෂ:- විතර්ක- විචාර- ප්‍රීති- සුඛ- රූප සංඥාදිය විතීය ධ්‍යානාදියට ප්‍රතිපක්ෂ - යැ. විතීය ධ්‍යානාදියට සමවදනා කෙණෙහි ම දුරු වේ. විතීය ධ්‍යානාදියට පැමිණි කෙණෙහි ම නීවරණයෝ විෂ්කම්භණය වෙති. එහෙයින් නීවරණයන් ගේ **විෂ්කම්භණය** ප්‍රකට යි.

රාත්‍රියෙහි මනාව දැල් වූ පහනකින් අන්ධකාරය දුරු වන්නා සේ විදර්ශීනාවට අවයව වූ ඒ ඒ ඤාණයෙන් කෙලෙසයන් ගේ ප්‍රහීණ කිරීම **තදඞ්ගප්‍රහාණය යි.** ප්‍රදීපයෙන් අන්ධකාර මෙනැ යි කී උපමායෙන් තදඞ්ග වශයෙන් කෙලෙස ප්‍රහාණය ප්‍රතිපක්ෂ ධර්ම ප්‍රහාණය යි.

ඝටයෙන් සෙවාල ප්‍රහාණය මෙන් විෂ්කම්භණ ප්‍රහාණය නීවරණයන් ගේ ප්‍රවෘත්ති මාත්‍රය වැළකීම යි. එහෙයින් ම විතීය-ධ්‍යානාදියෙහි විතර්කාදී ප්‍රහාණය පිළිබඳවැ ඒ නිදර්ශනය මනාවැ යෙදේ.

තවද **සීලවිසුද්ධි** ආදියෙහුදු **තදඞ්ග ප්‍රහාණය** මෙසේමැ යි.

විභාවනා:- **නාම-රූප පරිච්ඡේදයෙන්** පළමු කොට සත්කාය-දෘෂ්ටිය ප්‍රහීණ වේ. **ප්‍රත්‍යය පරිග්‍රහයෙන්** අහේතුක දෘෂ්ටි විෂම හේතු දෘෂ්ටීන් ගේ ද, **ඕඝලෝස්** වැදූරුම් කාඞ්ක්ෂා මලයන් ගේ ද ප්‍රහාණය වේ. **කලාප සම්මර්ශනයෙන්** මම යැ මා ගේ යැ යි සමූහ වශයෙන් ගැනීම ද ප්‍රහීණ වේ. **මාර්ග අමාර්ග ව්‍යවස්ථාන-යෙන්** අමාර්ගයෙහි මාර්ගයැ යන සංඥාව ද ප්‍රහීණ වේ. ස්කන්ධ-යන් ගේ **උදය දර්ශනයෙන්** උච්ඡේද දෘෂ්ටිය ප්‍රහීණ වේ. ස්කන්ධ-යන් ගේ **ව්‍යය දර්ශනයෙන්** ශාස්වත දෘෂ්ටිය ද, **භයතුපට්ඨාන ඤාණයෙන්** භය සහිත පඤ්චස්කන්ධයෙහි අභය සංඥාව ද, **ආදීනවානුදර්ශනයෙන්** පඤ්චස්කන්ධයෙහි ආස්වාද වශයෙන් පැවැති සංඥාව ද, **නිර්ඛිදානුපස්සනාවෙන්** වෘත්තයෙහි ඇලීම් සංඥාව ද, **මුඤ්චිතුකම්‍යතා ඤාණයෙන්** නො මිදෙනු කැමැති බව ද, **පටිසඞ්ඛා ඤාණයෙන්** ප්‍රතිසංඛ්‍යානයට ප්‍රතිපක්ෂ මොහ-යා ගේ ද, **සඞ්ඛාරුපෙක්ඛා ඤාණයෙන්** අනුපෙක්ෂණයෙන් වත නිත්‍යග්‍රාහයා ගේ ද, **අනුලෝම ඤාණයෙන්** මාර්ගසත්‍යාධිගමයට විලෝම වූ නිත්‍යාදිග්‍රාහයා ගේ ද ප්‍රහාණය වේ.

තවද අවලෝස් මහා විදර්ශීතාවත් අතුරින් **අනිච්චානුපස්සනාවෙන්** නිත්‍ය සංඥාව ද, **දුක්ඛානුපස්සනාවෙන්** සුඛ සංඥාව ද, **අනත්තානුපස්සනාවෙන්** ආත්ම සංඥාව ද, **නිබ්බිදානුපස්සනාවෙන්** නන්දි සඞ්ඛ්‍යාත තෘෂ්ණාව ද, **විරාගානුපස්සනාවෙන්** රාගය ද, **නිරෝධානුපස්සනාවෙන්** සමුදය ද, **පටිනිස්සග්ගානුපස්සනාවෙන්** දෘඪ ග්‍රාහය ද, **භයානුපස්සනාවෙන්** ඝන සංඥාව ද, **වයානුපස්සනාවෙන්** රැස් කිරීම ද, **විපරිණාමානුපස්සනාවෙන්** ධ්‍රුව (ස්ථිර) සංඥාව ද, **අනිමිත්තානුපස්සනාවෙන්** නිත්‍ය නිමිත්ත ද, **අප්පණිහිතානුපස්සනාවෙන්** සුඛ ප්‍රණිධිය ද, **සුඤ්ඤතානුපස්සනාවෙන්** ආත්මය ඇතැයි යන අභිනිවේශය ද, (දෘඪග්‍රාහය ද) **අධිපඤ්ඤාධම්මවිපස්සනාවෙන්** සාර වශයෙන් දැඩිකොට ගැනීම ද, **යථාභූතඤාණදර්ශනයෙන්** අතිශය මොහාභිනිවේශය ද, **ආදීනවානුපස්සනාවෙන්** ආලය වශයෙන් දැඩිකොට ගැනීම ද, **පටිසඞ්ඛානුපස්සනාවෙන්** අප්‍රතිසඞ්ඛ්‍යානය ද, **විවට්ටානුපස්සනාවෙන්** (නිවීම්ණ දර්ශනයෙන්) සංයෝගාභිනිවේශය ද ප්‍රහීණ වේ. මේ සියල්ල ම **තදඞ්ගප්‍රහාණය** මැ සි.

විශේෂ:- ඒ අවලෝස් මහා විදර්ශීතා අතුරින් **අනිච්චානුපස්සනාදි** සප්ත අනුපස්සනාවන් ගෙන් නිත්‍ය සංඥෙදීන් ගේ ප්‍රහාණය වන අයුරු **භඞ්ගානුපස්සනායෙහි** කියන ලද මැයි.

තවද **භයානුපස්සනා නම්** - ඝන විනිර්භෝග කොට **ක්ෂයාභී**යෙන් අනිත්‍යයැ යි මෙසේ ස්කන්ධයන් ගේ **ක්ෂයය** බලන්නහුගේ ඤානය යි. ඒ ඤානයෙන් ඝන සංඥාව ප්‍රහීණ වේ.

වයානුපස්සනා නම් - දිළු ආරම්මණ්‍යය අනුවැ යාමෙන් දිළුඅදිළු අරමුණු දෙක ම **ක්ෂණ** භඞ්ග වශයෙන් ඒක ව්‍යවස්ථා කිරීම ද, නිරොධයෙහි අධිමුක්ත බව ද, සංස්කාරයන් ගේ **නිරොධය දැක** එයින් මිදෙනු කැමැති අදහස් ඇති බව ද යන ව්‍යය **ලක්ෂණ** විදර්ශීතා යි. මෙසේ ප්‍රත්‍යක්ෂ වශයෙන් ද, අනුමාන වශයෙන් ද, සංස්කාරයන් ගේ භඞ්ගය දැක භඞ්ග නම් වූ එම නිරොධයෙහි ම මිදීම් වශයෙන් අදහස් ඇති බැවින් ඒ අධිමුක්ත ඤානයෙන් අභිසංස්කාරයා ගේ ප්‍රහාණය වේ.

ඒ මෙසේ යි:- යමක් පිණිස රැස් කරන්නෝ නම් ඒ සංස්කාරයෝ මෙසේ **ක්ෂය** වෙත් ය යි බලන්නාහට රැස් කිරීමට සිත නො කැමේ.

විපරිණාමානුපස්සනා නම් - ඔට කී රූප සප්තකාදීන් ගේ වශයෙන් ආදීන - නිකෙඛපාදී ඒ ඒ පරිච්ඡේද ඉක්ම

අත්‍යාකාර ප්‍රවෘත්ති දුක්ඛීම යි. නොහොත් උපන් සත්ත්වයා ගේ ජරාවෙන් ද, මරණයෙන්ද යි දෙයාකාරයකින් විපරිණාම දුක්ඛී-මයි. එයින් ස්ථිර භාවයෙන් ගැනීම ප්‍රහීණ වේ.

අනිමිත්තානුපස්සනා නාම - අනිත්‍යානුදර්ශනය මැ යි. එයින් නිත්‍ය නිමිත්ත ප්‍රහීණ වේ.

අප්පණිහිතානුපස්සනා නාම - දුඃඛානුදර්ශනය මැයි. එයින් සුඛ ප්‍රණිධිය (සුඛ ප්‍රාර්ථනාව) ප්‍රහාණය වේ.

සුඤ්ඤතානුපස්සනා නාම - අනාත්මානු දර්ශනය මැයි. එයින් ආත්මයක් ඇතැයි අභිනිවෙශය (දෘඪග්‍රාහය) ප්‍රහීණ වේ.

අධිපඤ්ඤාධම්ම විපස්සනා නාම - රූපාදී අරමුණු දැකීම ද, ප්‍රත්‍යවෙක්ෂා කිරීම ද, භඞ්ගය දැකීම ද, ශූන්‍ය වශයෙන් වැටහීම ද, නොහොත් ශූන්‍යතාව ද, එළඹ සිටී සිහිය ද අධිපඤ්ඤා විපස්සනා යි. මෙසේ කී රූපාදී අරමුණු දැන ඒ අරමුණෙහි ද, ඒ අරමුණු කොට පවත්නා සිතෙහි ද භඞ්ගය දැක සංස්කාරයෝ බිඳෙති. සංස්කාර-යන් ගේ ම මරණය වේ. අන්‍ය වූ කිසි සත්ත්ව පුද්ගලාදියෙක් නැතැ යි භඞ්ග විසින් ශූන්‍යතාව ගෙන පවත්නා විදර්ශනාව අධිපඤ්ඤා ද වෙ යි. සංස්කාර ධර්මයන්හි විදර්ශනා ද වේනු යි **අධිපඤ්ඤා-ධම්මවිපස්සනා නාමැ යි** කියනු ලැබේ.

ඒ අධිපඤ්ඤාධම්මවිපස්සනායෙන් නිත්‍ය සාරයක් නැති බව ද, ආත්මසාරයක් නැති බව ද මොනවට දක්නා ලද හෙයින් සාර-දෘෂ්ටිනිවෙශය (දැඩිකොට ගැනීම) ප්‍රහාණය වේ.

යථාභූතඤාණදස්සනය නාම - ප්‍රත්‍යය සහිත නාම - රූප පරිග්‍රහය යි. ඒ ඤාන දර්ශනයෙන් "මම අතීත කාලයෙහි වූ යෙම් ද?" යනාදී වශයෙන් පැවැති සොළොස් වැදෑරුම්වූ ද, "ඊශ්වරයකු-ගෙන් ලොකය හට ගැනේ" යනාදීන් පැවැතියා වූ ද සමෙමාහා-නිනිවෙශය ප්‍රහාණය වේ.

ආදීනවානුපස්සනා නාම - භයතුපඨාන වශයෙන් උපන් සියලු භවාදීන්හි ආදීනව දක්නා නුවණ යි. එයින් ඇලීය යුතු කිසිවක් නො පැනේය යි ආලයාභිනිවෙශය ප්‍රහීණ වේ.

පටිසඞ්ඛානුපස්සනා නාම - භවයෙන් මිදීමට කරන උපාය පටිසඞ්ඛා ඤාණය යි. එයින් අප්පටිසඞ්ඛා නම් වූ මොහය ප්‍රහීණ වේ.

විවට්ටානුපස්සනා නම් – සඞ්ඛාරුපෙක්ඛා ඤාණය හා අනුලෝම ඤාණය යි. ඒ මෙසේ යැ:– එකලැ ඒ යොගීහු ගේ සිත මඳක් නැමුණු පියුම් පතෙකැ දියත්තක් සේ සියලු සංස්කාර– යෙන් හැකිලෙ යි. පෙරලෙ යි. නැවැතැ නැවැතැ පෙරළේය යි කියන ලදී. එහෙයින් ඒ නුවණින් සංයොගාභිනිවෙශය ප්‍රහීණ වේ. කාමසංයොගාදී කෙලශාභිනිවෙශය – කෙලස ප්‍රවෘත්තිය ප්‍රහීණ වේ යන අර්ථ යි.

මෙසේ විස්තර වශයෙන් **තදඞ්ග ප්‍රහාණය** දතයුතු යි. පාළියෙහි තදඞ්ග ප්‍රහාණය නම් – නිර්වේධභාගීය විදර්ශනා සමාධිය වඩන්නහු ගේ මිථ්‍යා දෘෂ්ටිය තදඞ්ග වශයෙන් ප්‍රහීණ වේය යි සැකෙවින් කියන ලදී.

අකුණෙන් හෙණ පහර ලද රුකෙක මෙන් **ආයතීමාගී ඤාණයෙන්** සංයොජනාදී ධර්මයන් නැවැතැ නො පවත්නා සේ ප්‍රහීණ වීම **සමුච්ඡේද ප්‍රහාණය** නම් වේ. ඒ සඳහා "ක්ෂයගාමී– නම් ලෝකෝත්තර මාර්ගය වඩන යෝගීනට සමුච්ඡේද ප්‍රහාණය වේ" ය යි කියන ලදී.

මෙසේ මේ ත්‍රිවිධ ප්‍රහාණයන් අතුරින් සමුච්ඡේද ප්‍රහාණයම මේ **ඤාණදර්ශන විශුද්ධියෙහි** නොහොත් අනිසමය කාලයෙහි අධිප්‍රේත යි.

තවද ඒ යෝගීහට මාර්ගයට පූර්භාගයෙහි **තදඞ්ග – විෂ්කම්භණ** ප්‍රහාණයෝ ද ඒ **සමුච්ඡේද** ප්‍රහාණය ප්‍රයෝජන කොට පවත්නාහු යි. එහෙයින් ප්‍රහාණත්‍රය ම මේ ක්‍රමයෙන් **මාර්ගඤානයා ගේ** කෘත්‍යය යි දතයුතු.

නිදර්ශන:– සතුරු රජකු නසා රාජ්‍යයට පැමිණි රජකු විසින් රාජ්‍යයට පැමිණීමට පෙර කරන ලද පසුල්දැවූ මැඩීම් ආදිය ද රජහු විසින් ම කරන ලදැයි කියන්නාක් මෙනි.

විශෙෂ:– සාක්ෂාත් කිරීම ද ලෞකික සාක්ෂාත් කිරීම යැ, ලෝකෝත්තර සාක්ෂාත් කිරීම යැ යි දෙ පරිද්දෙකින් හිනහාවූයේ ද ලෝකෝත්තර සාක්ෂාත් කිරීම **දර්ශන – භාවනා** විසින් දෙපරිදි වන බැවින් **සාක්ෂාත් කරණය** ත්‍රිවිධ වේ.

ඒ මේසේ යි:– එහි 'ප්‍රථමධ්‍යානය ලැබුවෙම්, වසඟ කෙළෙම්, ඒ මා විසින් සාක්ෂාත් කරන ලදැ යි' යනාදීන් ආ සේ ප්‍රථම ධ්‍යානාදිය සපාගී කිරීම ලෞකික **සාක්ෂාත් කිරීම** යි.

විශේෂ:- (උූසනා) සපශී කිරීම නම් අධිගම කොට 'මෙය මා. විසින් අධිගතය සි' ප්‍රත්‍යක්ෂයෙන් ආලම්බන කිරීම් සඛ්‍යාත ඤාණයෙන් සපශී කිරීම සි. (මින් අනුමානයෙන් ආලම්බනය කිරීම වළකා.)

මේ සඳහාම **"සච්ඡිකිරියා පඤ්ඤා එස්සෙන ඤාණං"*** 'සාක්ෂාත් කිරීමේ ප්‍රඥාව සපශී කිරීම් අර්ථයෙන් ඥානය සි' උදෙසා **"යෙ යෙ ධම්මා සච්ඡිකතා හොන්ති තෙ තෙ ධම්මා එසිතා හොන්ති"*** 'යම් යම් ධම් කෙනෙක් ප්‍රත්‍යක්ෂ කරන ලදහු නම් ඒ ඒ ධර්මයෝ සපශී කරන ලදහ' සි සාක්ෂාත් ක්‍රියා **නිර්දේශයෙහි** කියන ලදී.

තවද තමා සතන්හි නූපදවාද යම් යම් ධම් කෙනෙක් හුදෙක් අපර ප්‍රත්‍යය ඇති ඤාණයෙන් දන්නා ලද්දාහු නම් ඒ ධර්මයෝ සාක්ෂාත් කෘතයහ. එහෙයින් **"සබ්බං භික්ඛවෙ සච්ඡිකාතබ්බං. කිඤ්ච භික්ඛවෙ සබ්බං සච්ඡිකාතබ්බං. චක්ඛුං භික්ඛවෙ සච්ඡිකාතබ්බං"*** 'මහණෙනි! සියල්ල සාක්ෂාත් කළ යුතු ය. මහණෙනි! සාක්ෂාත් කළයුතු සියල්ල කිම? මහණෙනි! චක්ඛුව සාක්ෂාත් කළ යුතු ය, යනාදීන් වදාරන ලදී.

තවද **"රූපං පඤ්ඤාය සච්ඡිකරොති. වෙදනා -පෙ- විඤ්ඤාණං පඤ්ඤාය සච්ඡිකරොති. චක්ඛු -පෙ- ජරා-මරණං අමතොගධං නිබ්බානං පඤ්ඤාය සච්ඡිකරොති. යෙ යෙ ධම්මා සච්ඡිකතා හොන්ති, තෙ තෙ ධම්මා එසිතා හොන්ති"*** 'රූපය දක්නේ ප්‍රත්‍යක්ෂ කෙරේ. වෙදනාව -පෙ- විඤ්ඤාණය ද දක්නේ ප්‍රත්‍යක්ෂ කෙරේ. චක්ෂුව -පෙ- ජරා-මරණය, අමෘතයට අනන්තගීත වූ නිර්වාණය දක්නේ ප්‍රත්‍යක්ෂ කෙරේ. යම් යම් ධම් කෙනෙක් ප්‍රත්‍යක්ෂ කරන ලද්දාහු නම් ඒ ඒ රූපාදී ධර්මයෝ ඥාන සපශීයෙන් සපශී කරන ලද්දාහු වෙති' සි අන්‍ය වූ ක්‍රම යෙකින් කියන ලදී.

ලෝකෝත්තර සාක්ෂාත් කිරීම, ප්‍රථම (සෝවාන්) මාර්ග **ක්ෂණ** යෙහි නිවන් අවබෝධ කිරීම **දර්ශන සාක්ෂාත් ක්‍රියා යැ.** සෙසු **ශෛක්ෂාදිඵලාදී** ආදී මාර්ග ක්ෂණයන්හි නිවන් අවබෝධ කිරීම **භාවනා සාක්ෂාත් ක්‍රියා සි.** ඒ දෙ වැදෑරුම් සාක්ෂාත් ක්‍රියාවෝ ම මේ අභිසමය කාලයෙහි අදහස් කරන ලදහ.

---

* ප: ම: ඤාණකථා

(ගොත්‍රභූ ඥානය එයට ද පළමු නිවන් දකී. අරමුණු කිරීම් වශයෙන් දුටුව ද, ක්ලේශ ප්‍රහාණාදී කර්තව්‍ය කෘත්‍යයන් නො කරන හෙයින් එය දර්ශනය යි නො කියන ලදී, යනු ටීකා යි)

එහෙයින් දර්ශනමාර්ගී - භාවනාමාර්ගී වශයෙන් **නිබ්බාණය** සාක්ෂාත් කිරීම මේ ලෞකික - ලෝකොත්තර ඥානයා ගේ කෘත්‍යය යි දතයුත්තේ.

විශේෂ:- (මෙයින් අමාර්ගී වශයෙන් පැවැති **නිබ්බාණය** (ප්‍රත්‍යවෙක්ෂා) සාක්ෂාත් කිරීම වළකයි යනු ටීකා යි)

"මේ භාවනා අභිමතා" යනු 'ලෞකික භාවනා යැ, ලෝකොත්තර භාවනා යැ යි' භාවනා දෙකෙක්ම අභිප්‍රේත යි. ඔවුනතුරින් ලෞකික- **සීල- සමාධි- ප්‍රඥාවන්** ගේ ඉපදවීම ද ඒ **සීල- සමාධි- ප්‍රඥාවන් හෙන්** තමා සතන්හි පුරුදුවීම් විසින් පැවැති සන්තාන වාසනාව ද **ලෞකික භාවනා යි**.

(යම් පමණෙකින් ලෞකික වූ **සීල** භාවනා (කාය භාවනා) **චිත්ත භාවනා - ප්‍රඥා භාවනාවෝ** උපදවනලද්දාහු ද එයින් ම සන්තානය ද **පරිභාවිත යැ** යනු ටීකායි.)

මේහි ලෝකොත්තර භාවනාව ම අභිප්‍රේත යි.

ලෝකොත්තර වූ **සීල- සමාධි- ප්‍රඥාවන් ගේ** ඉපදවීම ද, ඒ සීලාදීන් ගෙන් පැවැති සන්තාන වාසනාව ද ලෝකොත්තර භාවනා යි. මේ **ඤාණ දස්සන විසුද්ධියෙහි** ලා ඒ ලෝකොත්තර භාවනාව අභිප්‍රේත යි. සිවුවැදෑරුම් වූ ඒ ලෝකොත්තර මාර්ග- ඥානය **සම්මාවාචා- සම්මාකම්මන්ත- සම්මාආජීව** යන **සීලය ද, සම්මාවායාම- සම්මාසති- සම්මාසමාධි** යන **සමාධිය** ද, උපද- වයි. ඒ උපදවනුයේ සීලාදීන් සහජාතාදී ප්‍රත්‍යය හෙයිනි.

විශේෂ:- මෙහි ප්‍රඥාව තමාම නො උපදවන හෙයින් ආදි ශබ්දයෙන් **ප්‍රඥාව** (**සම්මාදිට්ඨි - සම්මාසඞ්කප්ප**) නො ගැනේ.

තවද මෙහි ඵලසීලාදීන් ගේ ගැනීම වේය යි ප්‍රඥාව ද ගැනීම යෙදේ. ඒ **මාර්ග-ඵලයෙන්** සමුච්ඡේද - **පටිපස්සද්ධි** වශයෙන් ක්ලේශ ප්‍රහාණයෙන් සම්භවිඤ්ඤත - **පටිපස්සම්භත** වශයෙන් පවත්නා ලෝකොත්තර ශීලාදියෙන් ආර්‍ය්‍ය පුද්ගල තෙමේ තමා සන්තානය පරිභාවිත කෙරේත්‍ර යි **ලෝකොත්තර භාවනාව මේ මාර්ගඥානයේ** කෘත්‍යය යි.

මෙසේ මාර්ගාවබෝධකාලයෙහි පරිඥාදී වශයෙන් කියන ලද සියලු කෘත්‍යය නතු සේ දතයුතු.

මෙතෙකින් –

"සීලෙ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ - චිත්තං - පඤ්ඤඤ්ච භාවයං" යි මෙසේ සංඛේපයෙන් ආගත වූ **ප්‍රඥාභාවනාව** පිළිබඳ විධානය දැක්වීම පිණිස–

"මූලභූතා දෙව විසුද්ධියෝ සම්පාදෙතබ්බා සරීරභූතා පඤ්ච විසුද්ධියෝ සම්පාදෙනෙනන භාවෙතබ්බා" යි මුල් වූ **සීලවිසුද්ධි- චිත්තවිසුද්ධින්** සම්පාදනය කොට සරීර වූ **දිට්ඨි- කඞ්ඛාවිතරණ- මග්ගාමග්ගඤාණ- පටිපදඤාණ- ඤාණ දස්සන** පඤ්ච විසුද්ධීන් සම්පාදනය කරමින් වැඩිය යුතු යැයි විස්තර කරන ලදී.

විශෙෂ:- මේ සප්ත විශුද්ධිය අතුරින් **සීලාදි විසුද්ධි සය** ලෞකික ය. **ඤාණදස්සන විසුද්ධිය** ලොකොත්තර යි. මෙතෙකින් **"කථං භාවෙතබ්බං"** (කෙසේ වැඩිය යුතුද) යි විවාළ ප්‍රශ්නය විසඳන ලද්දේ වේ.

මෙසේ සුධිජනයන් ගේ ප්‍රමොදාය පිණිස කළ **විශුද්ධි මාර්ගයෙහි ප්‍රඥාභාවනාධිකාරයෙහි ඤාණදර්ශන විශුද්ධි නිර්දේශ නම්** දෙවිසිවන පරිච්ඡේදය සම්පූර්ණ යි.

23. ප්‍රඥාභාවනානිසංස නිද්දේශය

'**ප්‍රඥාභාවනාවෙහි** ආනිසංස කවරේදැ යි' පෙර කී වචනයට මේ කියම්හ. මේ ප්‍රඥාභාවනාව **ශ්‍රාවක පාරමීඥානාදී** අනෙක ශත ආනිසංස ඇත්තී වෙයි. එහෙයින් එහි ආනිසංස දීර්ඝ කාලයෙකිනිදු කියා නිමකළ නො හේ. සැකෙවින් **සක්කායදිට්ඨි** ආදී නොයෙක් කෙලෙස් නැසීම යැ, **ආර්‍ය ඵල රස** අනුභව කිරීම යැ, **නිරෝධසමාපත්තියට** සමවැදීමට සමර්ථ බව යැ, **ආහුනෙය්‍යභාවාදී** සිඩියද්දැ යි මේ අනුසස් දතයුතු සි.

ඒ **ප්‍රඥාභාවනානිසංස** වාරයෙහි **නාම-රූප පරිච්ඡේදඥානයෙහි** පටන් කී සක්කායදිට්ඨි ආදීන් ගේ වශයෙන් නානාවිධ ක්ලේශයන් දුරු කිරීම ලෞකික ප්‍රඥාභාවනානිසංසය සි. **ආර්‍යමාර්ග-ක්ෂණයෙහි** සංයොජනාදී නානාවිධ ක්ලේශයන් ගේ නැසීම ලොකොත්තර **ප්‍රඥාභාවනාවේ ආනිසංසය** සි දතයුතු.

"ගිම්හවෙඝානුපතිතා - අඝනීව සිලුච්චයෙ
වායුවෙඝසමුද්ධූතෝ - අරඤ්ඤම්හි පාපකෝ

අඞ්ගාරං විය රවි - සතෙජුජ්ජලමණ්ඩලෝ
දීඝරත්තානුපතිතං - සබ්බානත්ථවිඛායකං

කිලෙසජාලං පඤ්ඤාග්ගි - විදධංසයති භාවිතා
සඤ්ඡිතිකමතොජඤ්ඤ - ආනිසංසම්මං ඉධ"

"බිහිසුණු වෙසින් හුණු - හෙනක් සේ ගල් පව්වෙකැ
සැඩ සුළඟින් පැනිරි ගත් - ළැවගක් මහා අරතෙව්.

සිය තෙද රැස් මඩුලු - සරාභිරු ගනදුර සේ
බෝ කල් අනුවැ පැවැතුණු - සියල් අනතුරු සැලසූ

වඩනලද නුවණින් - කෙලෙස් රැස වනසනුයෙන්
දිවුමන්හිම පසක් වූ - **මේ අනුසසැයි දන්නේ**"

හුදෙක් කෙලෙස් නැසීම මතු නොවැ **ආර්‍යඵලරසානුභවය ද ප්‍රඥාභාවනාවේ** ආනිසංසය සි. සෝවැන් ආදී **ශ්‍රාමණ්‍ය-ඵලය** (ආර්‍ය නම් වූ) මාර්ගයෙහි ඵල හෙයින් **ආර්‍යඵල නම්.** මාර්ගවීථියෙහි ද, ඵලසමාපත්තියෙන් ප්‍රවෘත්ති කාලයෙහිදැ යි ඒ ආර්‍යඵලරසානුභවය ද්විප්‍රකාර වේ. ඔවුනතුරින් මාර්ග වීථියෙහි **ආර්‍යඵලයෘ** ගේ ප්‍රවෘත්තිය දක්වන ලදී.

මනාහනතර:- සංයොජන ප්‍රහාණය විනා ආර්‍යමාර්ගයෙහි අන්‍ය ඵලයෙක් නැතැයි **අඞ්ගකයෝ** යෙති. ඔවුන් භගවනු පිණිස මේ සූත්‍රය දැක්විය යුතු.

"කථං පයොගපටිප්පස්සඬි පඤ්ඤා ඵලෙඤාණං. සොතාපත්ති මඟඤඞ්ගණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි මිච්ඡාදිට්ඨියා චුඩාති. තදනුවත්තිඤ කිලෙසෙඟි ච ඛන්ධෙඟි ච චුඩාති. ඛඞ්ගා ච සඞ්ඛනිම්මිත්තෙඟි චුඩාති. තං පයොගපටිප්පස්සඬධත්තා උප්පජ්ජති සම්මාදිට්ඨි මඟඤඞ්ගතං ඵලං"* පයොග පටිප්පස්සඬිය (යොගාවචර්‍යමාර්ගී නිමිත්තෙන් කෙලෙස් සංසිඳුවන ප්‍රඥව) ඵලයෙහි ඤාණය වන්නේ කෙසේ ද:- **සෝවාන් මාර්ඤණයෙහි නිවන්** දක්නා අර්ථයෙන් **සම්මාදිට්ඨිය** මිථ්‍යාදෘෂ්ටියෙන් නැගී සිටි සි. ඒ මිථ්‍යාදෘෂ්ටියට සම්ප්‍රයොග වශයෙන් ද, උපනිශ්‍රය වශයෙන් ද, අනුවතීක කෙලෙසුන් කෙරෙන් ද, සකාඞ්ඛයන් ගෙන් ද නැගී සිටි. බාහිර වූ සම්නිමිත්තයන් ගෙන් ද, නැඟේ. ප්‍රතිප්‍රශ්‍රබ්ධිය (ඒ මාර්ගයා ගේ ප්‍රයොගය සංසිඳුවන) **ඇයින් මාර්ගයෙහි** මෙන් **ඵලයෙහි ද සම්‍යක් දෘෂ්ටි** (සඞ්ඛ්‍යාත ප්‍රඥව) උපදී. මේ **ආර්‍යමාර්ගයේ ඵලය සි. සෝවාන් මාර්ඤණයෙහි නිවන්** අරමුණට නැංවීම් අර්ථයෙන් **සම්මාසඞ්කප්ප ද** සෙසු මාර්ගයන් ද විස්තර කළ යුතු සි.

"චත්තාරෝ අරියමඟා ච චත්තාරි ච සාමඤඤඵලානි ඉමෙ ධම්මා අප්පමාණාරම්මණා, මහඟඟතො ධම්මා අප්පමාණස්ස ධම්මස්ස අනන්තර පච්චයෙන පච්චයෝ"†

'සතර. **ආර්‍යමාර්ගී ද,** සතර **ශ්‍රාමණ්‍යඵල ද** යන මේ ධර්මයෝ අප්‍රමාණාලම්බනය. අප්‍රමාණ වූ **නිර්වාණය** අරමුණු කොට ඇති හෙයිනි. නෙවසඤඤා නාසඤඤායතන (මහග්ගතධර්ම) ය. නිරෝධයෙන් නැගිටින කල්‍ර **අනාගාමි, අර්හත්** (ආර්‍ය) **ඵලය** (අප්‍රමාණ ධර්මය) ට **අනන්තරප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය** වේ. මේ ආදී සූත්‍ර ද **ආර්‍යඵල** සවභාව ධර්ම වශයෙන් ඇති බව්හි සාධක සි.

ප්‍රශ්න: (මේ **ඵලසමාපත්තියෙහි** පැවැත්ම දැක්වීම සඳහා ය.)

(1) ඵල සමාපත්තිය නම් කිම?
(2) කවුරු එයට **සම්වදිද්** ද?
(3) කවුරු සම තො වදිද් ද?
(4) කවරහෙයින් සම්වදිද් ද?
(5) කෙසේ එයට සම්වැදීම වේ ද?

---

* ප: ම: ඤඤණකථා † ප: ප:

(6) කෙසේ සිටීම වේද?
(7) කෙසේ නැගිටීම වේද?
(8) ඵලයට අනතුරුවැ කුමක් වේද?

(1) **ආර්‍යඵලයා** ගේ නිරෝධයෙහි අප්‍රණාව (පිහිටීම) **ඵලසමාපත්ති** නම්.

(2) සියලු **ආර්‍යයෝ** තමන් තමන් ගේ **ඵලසම්වතට** සම්වදිති. අධිගත හෙයිනි.

(3) මතු **සකෘදාගාමී** ආදි ආර්‍යයෝ යට **සෝවාන්** ඵලාදියට සම නොවදිති. පූර්වඵලානන්තරභාවයට පැමිණීමෙන් සංසිදුණු හෙයිනි. යට **සෝවාන් ඵලාදියෙහි** පිහිටියාහු මතු **සකෘදාගාම්ඵලාදියට** නොසම්වදින්. අනධිගත හෙයිනි. (හුදෙක් තම තමා අයත් **ඵලයටම** සම්වදිති.) මේ මෙහි නිශ්චය යි.

මනසිකාර:- සම්හරු **'සොතාපන්න - සකෘදාගාමින්** සම නොවදිනැයි ද, මතු (**අනාගාමි - අරහත්**) දෙදෙන සම්වදිනැයි' ද යෙති. මේ දෙදෙනම 'සමාධියෙහි පරිපූරකාරී නෙයිනැ යි' එයට කරුණු එළවති. පෘථග්ජනයාහට ද තමා අධිගත ලෞකික සම්වතට සම්වැදිය හැකි හෙයින් **සෝවාන් - සකෘදාගාමියා** ඵලසම්වතට සම්නොවදිති යි යනු අකාරණ යි.

**නිදර්ශන:- කතමෙ දස ගොත්‍රභුධම්මා විපස්සනාවසෙන උප්පජ්ජන්ති. සොතාපත්තිමග්ගස්ස පටිලාභාය උප්පාදං පවත්තං -පෙ- උපායාසං බහිද්ධා සඛ්ඛාර නිමිත්තං අභිභුය්‍ය්‍ය තීති ගොත්‍රභු, සොතාපත්තිඵල සමාපත්තත්ථාය සකදාගාමි - අරහත්තඵලසමාපත්තත්ථාය -පෙ- සුඤ්ඤත විහාර සමාපත්තත්ථාය අනිමිත්තවිහාර සමාපත්තත්ථාය උප්පාදං -පෙ- බහිද්ධා සංඛාරනිමිත්තං අභිභුය්‍ය්‍ය තීති ගොත්‍රභු''*

'විදර්ශනා වශයෙන් කවර දශ ගොත්‍රභු කෙතෙක් උපදිද් ද? **ශ්‍රොතාපත්තිමාර්ග ප්‍රතිලාභය** පිණිස උත්පාදයැ පැවැත්මයැ -පෙ- දැඩි ආයාසයැ බාහිර සංඛාර නිමිත්තයැ යන මේ මැඩපියානුයි. **ගොත්‍රභු නම්. සොතාපත්තිඵල සමාපත්තිය පිණිස** ද -පෙ- **සුඤ්ඤත විරාග සමාපත්තිය පිණිස** ද, **අනිමිත්තවිරාගසමාපත්තිය පිණිස** ද, උත්පාදය -පෙ- බාහිර සඛ්ඛාරනිමිත්ත ද මැඩපියානු යි **ගොත්‍රභු නම්.** කරුණු මෙසේ හෙයින් සියලුම ආර්‍යයෝ තමන් තමන් පිළිබඳ **ඵලයම** සම්වදින්යැ යි මෙහිලා නිෂ්කාවට යා යුතු යි.

* ප: ම: ඤුණකථා

(4) මෙසේ රජකු රාජ්‍ය සුඛය **අනුභව** කරන්නා සේ දෙවියන් දිව්‍ය සුඛය අනුභව **කරන්නා** සේ **ආයෂ්මයෝ** ඉහතම් **කෙලෙස්** පිඬා දැහයන් සංසිඳුවා සුවසේ වසනු පිණිස **කාලය** පිරිසිඳ **කැමැති** කැමැති **කෙණෙහි** **ඵලසමවතට** සමවදින්. (එයට සමවැදීම ද, සමවතෙහි පිහිටීම ද, ඉන් නැගීම ද, කෙසේ **වේ** ද? යත්)

(5) **නිවනින්** අනෙක් අරමුණක් මෙනෙහි නො කිරීම ද, **නිවන** මෙනෙහි කිරීමදැ යි දෙ ආකාරයකින් ඒ **ඵලසමාපත්තියට** සමවැදීම වේ.

එසින් වදාරන ලදී:- **"දෙව බො ආවුසො පවවයා අනිමිත්තාය වෙතො විමුත්තියා සමාපත්තියා. සබ්බනිමිත්තානඤ්ච අමනසිකාරෝ. අනිමිත්තාය ච ධාතුයා මනසිකාරෝ"*** 'ඇවැත්නි! රූපාදී සියලු සංස්කාර නිමිති මෙනෙහි නොකිරීම යැ අනිමිත්ත ධාතු නම් වූ **නිර්වාණය** මෙනෙහි කිරීමයැ යි අනිමිත්ත මුඛයෙන් සමවැදිය යුතු **ඵලසමාපත්තියට** සමවැදීමට මේ කරුණු දෙකෙකි,

මේ වූනලි එයට සමවදනා පරිදිසි:- ඵලසමවතට සමවදනා කැමැති ආර්‍යශ්‍රාවකයා විසින් රහසිගතවැ නත් අරමුණෙන් වැළකි සිතින් උදයව්‍යයාදි වශයෙන් **සංස්කාරයෝ** විදර්‍ශනාවට නැගිය යුතු වෙත්. පැවැති අනුපූර්‍ව විදර්‍ශනා **ඇති** ඒ යෝගිහුගේ **සංස්කාරයන්** අරමුණු කොට ඇති වොදුන නම් (ගොත්‍රභූ) ඤනයට අනතුරුවැ ඵලසමාපත්ති වශයෙන් **නිවන්හි** සිත පිහිටයි. මෙහිලා ඵල සමවතට නැමුණු හෙයින් **ශෛක්ෂයාහට** ද **ඵලසමවත** උපදනේ යැ. **මාර්ගය** නො උපදනේ සි.

මතානතර:- සෝවාන්තෙමේ 'ඵලසමවතට සමවදිමි සි' විදර්‍ශනා පිහිටුවා (පවත්ගෙන) **සකෘදාගාමී** වේ. **සකෘදාගාමී** ද **අනාගාමී** වෝය සි කියන්නා වූ අභය ගිරි **වැස්සනට** මෙසේ කියයුතු. **එසේ** වත්නා හා **"අනාගාමී රහත් වෙයි. රහත්තෙමේ පසේබුදු වෙයි. පසේබුදු සළුඳු බුදු වෙයි"** කියාසි. එහෙයින් අභයගිරිවැස්සන් ගේ මතය නො යෙදේ. පෙර කී පාළි වශයෙන් ම **ප්‍රතික්ෂේප** කළ හෙයිනි. **ශෛක්ෂයාට** ද **ඵලයම** උපදී. **මාර්ගය** නො උපදී. ඒ **ශෛක්ෂයා ප්‍රථමධ්‍යානික මාර්ගය** අධිගතවී නම් **ප්‍රථමධ්‍යානික ඵලයම** උපදී. විතීයාදී ධ්‍යානයන් අතුරින් යම්

* **ම: නි: මූලපණ්ණාසක**

කිසි ධ්‍යානයක් අධිගත වී නම් ඒ දුතියාදිධ්‍යානික**ඵලයම්** උපදී. මෙසේ ඒ **ඵලසමාපත්තිය** වේ.

(6) **"නයෝ ඛෝ අවුසෝ පවවයා අනිමිත්තාය චෙතෝ-විමුත්තියා ඨිතියා සබ්බනිමිත්තානඤ්ච අමනසිකාරෝ අනි-මිත්තාය ධාතුයා මනසිකාරෝ පුබ්බව අභිසඞ්ඛාරෝති."***

'ඇවැත්නි! අනිමිත්ත චෙතොවිමුක්තියෙහි තොසිඳ පැවැත්මට ප්‍රත්‍යයයෝ තිදෙනෙක් වෙති. සියලු සංඝකාර නිමිති මෙනෙහි නොකිරීම ද, **අනිමිත්ත**ධාතුව මෙනෙහි කිරීම ද, කාලය පිරි-සිදීම ද යන තිදෙනා යි.

විශෙෂ:- මෙහි පළමුවැනි අභිසංඝකරණය නම් - සමවතට සමවැදීමට පළමුවැනි 'අසුවල් කාලයෙහි නැගී සිටිමි යි' කාලය පිරිසිදීම යි. එසේ පිරිසුන් කලැ යම්තාක් ඒ පිරිසුන් කාලය නොපැමිණියේ නම් ඒතාක් සිටීම වේ. මෙසේ **ඵලසමවතෙහි** සිටීම වේ.

(7) **"මෙ ඛෝ ආවුසෝ පවවයා අනිමිත්තාය චෙතෝ-විමුත්තියා වුට්ඨානාය සබ්බනිමිත්තානංච මනසිකාරෝ අනි-මිත්තාය ධාතුයා අමනසිකාරෝ"***

'ඇවැත්නි! අනිමිත්ත චෙතොවිමුක්තියෙන් නැගිටීමට මේ කරුණු දෙකෙක් වේ. සියලු සංඝකාර නිමිති මෙනෙහි කිරීමයැ, අනිමිත්ත ධාතුව මෙනෙහි නොකිරීම යැ යන දෙකයි, මෙසේ වදාළ හෙයින් ඒ **ඵලසමවත්හු ගේ** දෙ පරිද්දෙකින් නැගීම වේ.

විශෙෂ:- මෙහි සඒනිමිත්ත නම් - රූප නිමිත්තයැ, වෙදනා නිමිත්ත යැ, සඤ්ඤා නිමිත්ත යැ, සඞ්ඛාර නිමිත්ත යැ, විඤ්ඤාණ නිමිත්ත යැ යන මොහු යැ. හුදෙක් මොවුන් එකවට මෙනෙහි නොකෙරේ. එකම චිත්තවීථියෙක්හි නොලැබෙන හෙයිනි. සඒසංග්‍රාහික වශයෙන් මේ සියලු රූපාදි නිමිති කියන ලදී. එහෙයින් භවාඞ්ග සිතට **සඒ- සඒනිමිති- ගතිනිමිති** අතුරින් යම්කිසිවෙක් අරමුණු වේ නම් ඒ අරමුණ මෙනෙහි කරන පුද්ගලයාහට **ඵලසමවතින්** නැගීම වේය යි මෙසේ ඵලසමවත්හු-ගේ වුට්ඨානය දතයුතු.

(8) **ඵලසිතට** කවර සිතක් අනන්තර ප්‍රත්‍යය වේ ද? කවර සිතකට ඉඳ **ඵලසිත** අනන්තර ප්‍රත්‍යය වේද? **ඵලසිතට**

* ම: නි: මූලපණ්ණාසක

ඵලසිත ම අනන්තර ප්‍රත්‍යය වේ. භවාඞ්ගසිත හෝ අනන්තර-ප්‍රත්‍යය වේ.

මාර්ගසිත අනන්තර ප්‍රත්‍යය වූ **ඵලසිතෙක්** ඇති.
ගොත්‍රභුසිත අනන්තර ප්‍රත්‍යය වූ **ඵලසිතෙක්** ඇති.
නෙවසඤ්ඤානාසඤ්ඤායතනය අනන්තර ප්‍රත්‍යය වූ **ඵල-සිතෙක්** ද ඇති.

ඒ මෙසේ යි:- **මාර්ගවීථියෙහි ඵලචිත්තයට මාර්ගචිත්තය** අනන්තර ප්‍රත්‍යය වේ. පුළු පුළු **ඵලචිත්තයට** පසුවැ පසුවැ වූ **ඵලචිත්තය ඵලයෙන්** අනන්තර ප්‍රත්‍යය වේ. ඵලසමවත්හි පළමු ඵලචිත්තයට ගොත්‍රභූචිත්තය අනන්තර ප්‍රත්‍යය වේ. (මෙහි ගොත්‍රභූ නම් අනුලෝමඥානයයි.)

එයින් වදාළහ.

"අරහතෝ අනුලෝමං ඵලසමාපත්තියා අනන්තර-පච්චයේන පච්චයෝ. සෙඛානං අනුලෝමං ඵලසමාපත්තියා අනන්තරපච්චයේන පච්චයෝ"*

'රහතන් ගේ අනුලෝමය **ඵලසමාපත්තියට** අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. ශෛක්ෂයන් ගේ අනුලෝමය **ඵල-සමාපත්තියට** අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ යැ' කියා යි. යම් ඵලයෙකින් නිරෝධයෙන් නැගීම වේ නම් ඒ නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට අනන්තරය යි. එහි මාර්ගවීථියෙහි උපන් **ඵලය** හැර සෙසු සියල්ල **ඵලසමාපත්ති වශයෙන්** පවත්නේ වේ.

මෙසේ මේ **ඵලය** මාර්ගවීථියෙහි ඵලසමාපත්තියෙහි හෝ ඉපදීම් වශයෙන් වේ.

පවිපස්සද්ධදරථං - අමතාරම්මණං සුභං
වන්තලොභාමිසං සන්තං - සාමඤ්ඤඵලමුත්තමං

ඔජවන්තාන සුචිනා - සුඛේන අභිසඳිතං
යෙන සාතානිසාරේන - අමතේන මධුං විය

තං සුඛං තස්ස අරියස්ස - රසඤ්ඤුතමඤ්ඤතරං
ඵලස්ස පඤ්ඤං භාවෙත්වා - යස්මා විඳති පණ්ඩිතෝ

තස්මාරියඵලස්සේතං - රසානුභවනං ඉධ
විපස්සනා භාවනාය - ආනිසංසෝති වුච්චති.

---

* ප: ප: පඤ්ඨවාර

විඩා සංසිඳ වූ - **නිවන්** අරමුණු කළ සුබ
ලොබ වැනසුමින් සන්සුන් - උතුම් **ලොවුතුරු පලරස**

ඔදවත් සුපිරිසුදු - ඉ මිහිරි එපල සුවයෙන්
අමා රසයෙන් මුසු කළ - මියෙන් පිනායන සේ

අරීපල පිළිබඳ - රස වූ **එලොවුතුරු** සුව
ඒ **පැනබවුන්** වැඩුමෙන් - නුවණැතියෝ විඳින් මැයි.

ඉන් අරීපල රස - වැළඳුම මෑ මෙහි පිවිතුරු
විදසුන් බවුන් වැඩුමේ - අනුසස් යැයි වදලෝ

හුදෙක් **ආඝාඒලරසානුභවයම** නොවැ නිරොධ සමාපත්ති යට සමවැදීමෙහි සමර්ථබව ද මේ **ප්‍රඥාභාවනාවේ** ආනිසංසය යි දත යුතු. ඒ නිරොධසමාපත්තියේ සවරූප දැක්වීමට මේ ප්‍රශ්නයෝ වෙති.

ප්‍රශ්න:- (1) නිරොධසමාපත්ති කවරේ ද
(2) එයට කවුරු සමවදින් ද
(3) කවුරු නො සමවදිද් ද
(4) කවර හෙයින් සමවදිද් ද
(5) (නිරොධ සමාපත්තියට) කෙසේ සමවැදීම වේ ද
(6) කෙසේ සිටීම වේ ද
(7) කෙසේ නැගීම වේ ද
(8) නැගුණහු ගේ සිත කුමකට නැමුණේ ද
(9) මැරුණහු ගේ ද, සමවැදුණහු ගේ ද වෙනස කිම
(10) **නිරොධ** සමාපත්තිය සඞ්ඛත ද
(11) අසඞ්ඛත ද
(12) ලෞකික ද
(13) ලොකොත්තර ද
(14) නිෂ්පන්න ද
(15) අනිෂ්පන්න ද

පිළිතුරු:- (1) විදර්‍ශනානුගත අෂ්ටසමාපත්ති පිළිවෙළින් සමවැද ඒ ඒ සමාපත්තියෙහි ප්‍රතිපක්ෂ ධර්‍මයන් නිරුද්ධ කිරීම් වශයෙන් කායාදී ත්‍රිවිධ සංස්කාර පිළිවෙළින් නිරුද්ධ කිරීමෙන් පිරිසිදි කාලයෙහි චිත්ත - චෛතසික ධර්‍මයන් ගේ නො පැවැත්ම **නිරොධසමාපත්ති නම්**.

(2) අෂ්ටසමාපත්තිලාභී **අනාගාමීහු** හා **ක්ෂීණාශ්‍රවයෝ** සමවදිති.

නිදර්ශන:- **මිහි බලෙහි සමන්නාගතත්තා කායෝ ච සංඛාරානං පටිප්පස්සද්ධියා සොළසහි ඤාණචරියාහි නවහි සමාධිචරියාහි වසිභාවතා පඤ්ඤා නිරොධසමාපත්තියා ඤාණං**"*

'බලදෙකින් සමන්නාගත හෙයින් ත්‍රිවිධ සංස්කාරයන් සංසිඳුවීමෙන් **සොළොස් වැදෑරුම් ඤාණයන් ගේ පැවැත්මෙන් ද, නවසමාධීන් ගේ පැවැත්මෙන් ද, වශී භාවයට පැමිණි ප්‍රඥාව නිරෝධසමාපත්තියෙහි ඤාණය යි' කියන ලදී.**

(3) ශමථ - විදර්ශනා බලද්වයයෙන් යුක්ත වූ නිරෝධ සමාපත්තිය ළඟවන්නා වූ මේ සමපත්තිය අෂ්ටසමාපත්තිලාභී **අනාගාමීන්** හා **රහතුන්** හැර සෙස්සවුනට නැත්තේ යි. එහෙයින් ඒ **අනාගාමිභූ හා රහත්භූම** එයට සමවදිති. සෙසු පෘථග්ජනාදීහු සමනොවදිත්.

විභාග:- එ බලවය නම් කවරේ ද? එය මෙසේ විභාග කරනලදී. **සමථබලය - විදර්ශනා බලයයි** බල දෙකෙකි. එහි සමථබලය නම් **කාමච්ඡන්දය** ප්‍රකාශ කරන **නෙක්ඛම්ම සංකල්පයා ගේ** වශයෙන් චිත්තයා ගේ **අවික්ඛේපය** සමථබල නම්. **ව්‍යාපාදය** ප්‍රකාශ කරන **අව්‍යාපාද** වශයෙන් චිත්තයා-ගේ අවික්ඛේපය ද, **ථීන-මිද්ධය** ප්‍රකාශ කරන **ආලෝක සංඥා** වශයෙන් චිත්තයා ගේ එකාග්‍රතා සංඛ්‍යාත **අවික්ඛේපය ද, උද්ධච්චය** ප්‍රකාශ කරන **සමාධාන** වශයෙන් චිත්තයා ගේ **එකාග්‍රතාසංඛ්‍යාත අවික්ඛේපය ද, මිච්ඡාවිතක්ක** ප්‍රකාශ කරන ආනාපානසතියෙන් සිද්ධ වූ පටිනිස්සග්ගානු පස්සී ආශ්වාස-ප්‍රශ්වාස වශයෙන් චිත්තයා ගේ එකාග්‍රතාසංඛ්‍යාත අවික්ඛේපය ද **සමථබල** නම්. මේ **උපචාරඝ්‍යාන** වශයෙනි.

නවද ප්‍රථමධ්‍යානයෙන් නීවරණ **නිමිත්තෙන්** කම්පා නො වන හෙයින් සමාධිය **සමථබල** නම්. දවිතීයධ්‍යානයෙන් විතර්ක විචාරයන් ද -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතන **සමාපත්තියෙන්**-ආකිඤ්චඤ්ඤායතන සංඥායෙන් ද කම්පා නො වන හෙයින් **සමාධිබල** නම. උද්ධච්චනිමිත්තෙන් හා උද්ධච්චසම්ප්‍රයුක්ත මොහ-අහිරිකාදී කෙලෙස් හේතුවෙන් ද, උද්ධච්චසම්ප්‍රයුක්ත සතර සඤ්ඤායෙන් ද, කම්පා නො වන හෙයින් භ්‍රමණය නො වන හෙයින් නො සැලෙන හෙයින් **සමාධිබල** නම්.

---

* ප: ම: ඤාණකථා

විදර්ශනා බලය කිම්? අනිත්‍යානුපස්සනාව විදර්ශනා බල යි. දුක්ඛානුපස්සනාව -පෙ- අනත්තානුපස්සනාව- නිබ්බිදානුපස්සනාව- විරාගානුපස්සනාව- නිරෝධානුපස්සනාව- පටිනිස්සග්ගානුපස්සනාව (කෙලෙසුන් දුරලීම) **විදර්ශනා බල යි.**

රූපය අනිත්‍ය වශයෙන් බැලීම- රූපය පටිනිස්සග්ගානුපස්සනා වශයෙන් බැලීම **විදර්ශනා බලයි.** වේදනාව- සංඥාව- සංස්කාර- විඤ්ඤාණය- චක්ෂුව- ජරා-මරණය අනිත්‍ය වශයෙන් බැලීම, පටිනිස්සග්ගානුපස්සනා වශයෙන් බැලීම **විදර්ශනා බලයි.**

කවර අර්ථයෙන් විදර්ශනා බලය වේ ද?

අනිත්‍යානුපස්සනාවෙන් නිත්‍යසංඥයෙන් කම්පා නො වන හෙයින් **විදර්ශනාබල නම්.** දුක්ඛානුපස්සනාවෙන් සුඛසංඥාවෙන් කම්පා නො වන හෙයින් **විදර්ශනාබල නම්.** අනත්තානුපස්සනාවෙන් ආත්ම සංඥාවෙන් කම්පා නො වන හෙයින් **විදර්ශනාබල නම්.** නිබ්බිදානුපස්සනාවෙන් නන්දියෙන් (සප්‍රීතික තෘෂ්ණාවෙන්) කම්පා නො වන හෙයින් **විදර්ශනාබල නම්.** විරාගානුපස්සනාවෙන් රාගයෙන් නො සැලෙන හෙයින් ද, නිරෝධානුපස්සනාවෙන් සමුදයෙන් නො සැලෙන හෙයින් ද, පටිනිස්සග්ගානුපස්සනාවෙන් ආදානයෙන් නො සැලෙන හෙයින් ද, අවිද්‍යාවෙන් අවිද්‍යා සහගත කෙලෙසයෙන් හා තත් සම්ප්‍රයුක්ත වතුස්කන්ධයෙන් හා නො සැලෙන හෙයින් ද **විදර්ශනා බල නම්. මේ විදර්ශනා බලය යි.**

ත්‍රිවිධ සංස්කාරයන් සංසිඳවීමෙන් යන්නෙන්:- විතීර්ඨධ්‍යානයට සමවන්නහු ගේ විතර්ක-විචාර (වචීසංස්කාර) ඉෝ සංසිඳුනාහු වෙති. චතුර්ථධ්‍යානයට සමවන්නහු ගේ ආශ්වාස-ප්‍රශ්වාස (කාය-සංස්කාර) යෝ සංසිඳෙත්. සඤ්ඤාවෙදයිත නිරෝධයට සමවන්නහු ගේ සංඥා (චිත්තය) ද, වේදනා ද ඒ හා සම්ප්‍රයුක්ත සංස්කාර ධර්මයෝ ද සංසිඳෙත්. මෙසේ මෙකී ත්‍රිවිධ සංස්කාරයන් ගේ සංසිඳීම මෙයින් අදහස් කරන ලදී (මෙහි **තයො** යනු "තින්නං" යන අර්ථය දෙයි)

සොළසහි ඤාණචරියාහි = (සොළොස් ඤාණචරියාවෙන්) යන්නෙන් **අනිච්චානුපස්සනා- දුක්ඛානුපස්සනා- නිබ්බිදානුපස්සනා- විරාගානුපස්සනා- නිරෝධානුපස්සනා- පටිසංඛානුපස්සනා- පටිනිස්සග්ගානුපස්සනා- විවට්ටානුපස්සනා- සෝතාපත්තිමග්ග- සෝතාපත්තිඵල සමාපත්ති- සකදාගාමිමග්ග-**

සකදාගාමිඵලසමාපත්තිං- අනාගාමිමග්ගං- අනාගාමිඵලසමාපත්තිං- අරහත්තමග්ගං- අරහත්තඵලසමාපත්තිං යන මේ සොළොස් ඤාණවත්‍යාවෝ ගැනෙති.

විශේෂ:- අටවැදෑරුම් අනුපස්සනාවන් ගේ හා අටවැදෑරුම් මාර්ග-ඵල ඤාණයන් ගේ වශයෙන් මේ සොළොස් ආකාරයෙන් ඤාණයා ගේ පැවැත්ම වේ.

'නවවැදෑරුම් සමාධිවර්යාවන් ගෙන්' යන්නෙන් ප්‍රථමධ්‍යාන සමාධිවර්යා යැ -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්ති සමාධිවර්යාවැ යි මෙසේ අෂ්ටසමාපත්තීන් හා ඔවුන් ගේ උපචාර සමාධියද යි නවසමාපත්තීහු ගැනෙති.

විඤ්ඤාර:- ප්‍රථමධ්‍යාන ප්‍රතිලාභය පිණිස චිත්තීය ද, විචාරය ද, ප්‍රීතිය ද, සුඛය ද, චිත්තෛකාග්‍රතාවය ද වන්නේ යැ. මේ නව සමාධිවර්යාවන් ගෙන් ද,

වසී නම් පඤ්චවසීහු ය, **ආවජ්ජනවසී** යැ, **සමාපජ්ජන වසී** යැ, **අධිට්ඨාන** වසී යැ, **වුට්ඨාන** වසී යැ, **පච්චවෙක්ඛණ** වසී යැ යන මොහු යි.

විඤ්ඤාර:- ප්‍රථමධ්‍යානය ආවජ්ජනා කරන්නහු ගේ කැමැති තැනෙක - කැමැති **පමණ** කලක් - කැමැති තාක් ධ්‍යානාඞ්ග-යන්හි නිරන්තරයෙන් චිත්තය පැවැත්වීමට සම්බන්ධව **ආවජ්ජන වසිතාව** යැ.

ප්‍රථමධ්‍යානයට කැමැති තැනෙක - කැමැති කලක් - කැමැති-තාක් සමවැදීමට සම්බන්ධව **සමාපජ්ජනවසිතාව** යැ.

ධ්‍යානය සිටුවන්නට සම්බන්ධව **අධිට්ඨානවසිතාව** යැ.
ශීඝ්‍රවැ **නැගීමෙහි** සම්බන්ධව **වුට්ඨානවසිතාව** යැ.
ප්‍රත්‍යවෙක්ෂාකිරීමේ සම්බන්ධව **පච්චවෙක්ඛණවසිතාවයි.**

විශේෂ:- ප්‍රත්‍යවෙක්ෂාවසිතාව ආවජ්ජාවසිතාවෙන් ම සිද්ධ යැ. එහි ප්‍රත්‍යවෙක්ෂා ජවනයෝ ම ආවජ්ජනානන්තර වෙති.

විතීයධ්‍යාන සමාපත්තියට - නෙවසඤ්ඤානාසඤ්ඤායතන **සමාපත්තියට** සමවැදීමට සම්බන්ධව **සමාපජ්ජනවසිතාව යි.** (යනාදිය ද පෙර සේමැ යි) **මේය පඤ්චවිධ වසිතා නම්.**

විඤ්ඤාර:- මෙහි සොළසවිධ ඤාණචරියාවයැයි කියේ නිරවශේෂයෙන් දැක්වීම පිණිස යැ. එහෙයින් **අනාගාමිභාව**

අගින් මාගී ඵලයන් අනධිගත හෙයින් තුදුස් කෘණවරියාවෙක් වේ. එසේ වන්නා හා **ශකෘදාගාමිභට** දෙලොස් ඇත වයස්‍යාවක් ද, **සෝවාන්භට** දසඇතවයස්‍යාවක් ද කවර හෙයින් නො වේද යත්:- සමාධියට සතුරු වූ පඤ්චකාම ගුණික රාගය පහ නො වූ හෙයිනි.

ඒ ශකෘදාගාමි - ශ්‍රොතාපන්නයන් ගේ කාමරාගය අප්‍රහීණ හෙයින් ශමථ බලය සම්පූර්ණ නො වේ. ඒ අසම්පූර්ණ කල්හි ශමථ-විදර්ශනා බලඥයෙන් සමවැදිය යුතු වූ **නිරොධසමාපත්තියට** බල විකලත්වයෙන් සමවැදීමට නො හැකි වේ. **අනාගාමිහු ගේ** ඒ කාමරාගය ප්‍රහීණ වූ හෙයින් හෙතෙම පිරිපුන් බල ඇත්තේ වේ. එහෙයින් ඕනට **නිරොධසමාපත්තියට** සමවැදිය හැකි යැ.

එයින් වදාළහ. **"නිරොධා වුට්ඨහනාසා නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසලං ඵලසමාපත්තියා අනන්තරපච්චයෙන පච්චයෝ"***

'නිරොධයෙන් නැගිටින අනාගාම්හට නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසලචිත්තය අනාගාම්ඵලසමාපත්තියට අනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේය යි' මේ අනාගාම්හු ගේ නිරොධයෙන් නැගිටීම සඳහා ම කියන ලදී.

එහි **සම්පජ්ජනං** = සමවැදීම නම්, පඤ්චවොකාර භවයෙහි **අනාගාමි රහතුන් ගේ** නිරොධ සමාපත්තියට සමවැදීම යි ප්‍රථම ධ්‍යානාදි අනුපූර්ව සමාපත්ති ලැබෙන හෙයිනි.

විශෙෂ:- චතුවොකාර භවයෙහි ප්‍රථමධ්‍යානාදීන් ගේ උත්පත්තිය නැති හෙයින් (අරූප භවයෙහි) **නිරොධසමාපත්තියට** සමවැදිය නො හැකි යි. ඇතැම් ආචාර්‍යයී කෙනෙක් හෘදය වස්තු රූපය නැති හෙයිනැ යි යෙති.

(අරූප භවයෙහි නිරොධසමාපත්තිය වේ නම් චිත්ත-චෛතසික හෝ අන්‍ය රූපාදියක් හෝ නැති හෙයින් අවශ්‍යකම් වේ. **අනුපාදිශෙෂ නිර්‍වාණ** ධාතුවෙන් පිරිනිවියාක් බඳු වේ. හුදෙක් අඟ විකලත්වය නිසාම අරූප භවයෙහි නිරොධසමාපත්තිය නැති. යනු **ටීකා** යි.)

(4) කවර හෙයින් සම්වදිද් ද යත්:- සංස්කාර ධර්මයන් **කෙණෙහි** කෙණෙහි ඉපදීමෙහි ද, බිඳීමෙහි ද, උකටලීවැ 'මේ

* ප: ප:

ආතමයෙහි ම අවිත්තකඹෑ නිරොධයට (අනුපාදිශෙෂ පරිනිර්ිණ යට) පැමිණියවුන් මෙන් සුවසේ වසම්හ යි' සමවදින්.

(5) නිරොධ සමාපත්තියට සමවැදීම කෙසේ වේ ද? අන්‍යොන්‍ය උපකාරිත්වයෙන් ඒකීභාවයට පැමිණි ශමථ-විදශීනා වශයෙන් උත්කෘෂ්ට භාවයට පැමිණි කරන ලද පුථුකෘත්‍ය ඇති නෙවසඤ්ඤානාසඤ්ඤායතනය නිරුඬ කළ යොගාවචරයා ගේ නිරොධසමාපත්තියට සමවැදීම වේ.

විශෙෂ:- ශමථ වශයෙන් උත්කෘෂ්ට බවට පැමිණෙන්නේ නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ සිටී. විදශීනා වශයෙන් උත්කර්ෂ බවට පැමිණි යොගී තෙමේ **ඵලසමාපත්තියට** පැමිණේ. ශමථ-විදශීනා උභය වශයෙන් උත්කෘෂ්ට බවට පැමිණ පුථුකෘත්‍ය කොට නෙවසඤ්ඤානාසඤ්ඤායතනය නිරුඬ කරන **අනාගාමි** වූ හෝ **අර්හත්** වූ හෝ පුද්ගල තෙමේ නිරොධ සමාපත්තියට සමවදීය යි මේ මෙහි සංක්ෂෙපය යි.

මේ විස්තාරය යි:- **මේ සසුනෙහි නිරොධසමාපත්තියට** සම-වදිනු කැමැත්ත මහණ තෙමේ බත් කිස නිමවා අත් පා මනාවැ දෙවා විවෙක තැනෙක මනාව පැන වූ අස්නෙකැ පලග බැඳ කය ඍජු කොට පිහිටුවා සිහිය **කර්මස්ථානාභිමුඛ** කොට එළවා වැඩහිඳී. ඒ භික්ෂුව ප්‍රථමධ්‍යානයට සමවැදී එයින් නැගි ඒ ධ්‍යානයෙහි වූ සංඝකාරයන් අනිත්‍ය- දුඃඛ- අනාත්ම හෙයින් මෙනෙහි කිරීමෙන් විදශීනා වඩයි.

මේ විදශීනාව සංඝකාර පරිග්‍රාහක ඤාණ, ඵලසමාපත්ති ඤාණ, නිරොධසමාපත්තියැ යි ත්‍රිවිධ වේ. මොවුනතුරින් **සංඝකාර** පරිග්‍රාහක විදශීනාව **මෘදු** වූයේ හෝ **තීක්ෂ්ණ** වූයේ හෝ මාර්ගයට ආසන්න කාරණ වේ. **ඵලසමාපත්ති** විදශීනාව තීක්ෂ්ණවූයේම **මාර්ගභාවනාව** හා සදෘශ වූවා ම වේ. **නිරොධසමාපත්ති විදශී-නාව** ඉතා මෘදු නොවූයේ ද, ඉතා තියුණු නො වූයේ ද වටී. එහෙයින් මේ **අනාගාමි** වූ හෝ **රහත්** වූ හෝ **ආර්ය තෙමේ** ඉතා මඳ නො වූ ද, ඉතා තියුණු නො වූ ද විදශීනායෙන් ඒ ප්‍රථමධ්‍යාන සංඝකාරයන් විදශීනා කෙරේ.

ඉක්බිති විතීයධ්‍යානයට සමවැද එයින් නැගී එහි වූ සංස්කාරයන් එසේම විදශීනා කෙරේ. ඉක්බිති තෘතීයධ්‍යානඥට ද, -පෙ- ඉක්බිති විඤ්ඤාණඤ්චායතනයට ද සමවැද එයින් නැගී එහි වූ සංස්කාරයන් එසේම විදශීනා කෙරෙ. නැවැතැ ආකිඤ්චඤ්ඤායතනයට සමවැද එයින් නැගී

(අ) නානා බද්ධ අවිකොපනය
(ඉ) සංඝ පතිමානනය
(උ) සඤ්ඤ පකොසනය
(එ) අධිෂ්ඨාන පරිවෙජ්දය යන මේ සතර පුළුවන් කෘත්‍යයන් කෙරේ.

(අ) **නානාබද්ධ අවිකොපනය නම්** :- ඒ භික්ෂුව සමඟ එකාබද්ධ වූ පිරිකර හැර වෙන්වැ සිටි පා සිවුරු ආදිය හෝ ඇඳ-පුටු හෝ වසන ගෙය හෝ අන්කිසි පරිෂ්කාර ජාතයක් හෝ වේ නම් ඒ නානාබඩ පරිෂ්කාරයන් ගිනි- දිය- විෂ- සොර- මී ආදීන් ගෙන් විනාශ නොවන සේ අධිෂ්ඨාන කළ යුතු බව සි.

මේ ඉවතසේ යැ:- 'මේ මේ දෑය මේ සත් දවස ඇතුළත ගින්නෙන් නොදැවේවා.! ජලයෙන් නොඉල්පේවා. වාතයෙන් නොතැසේවා. සොරුන් පැහැර නොගැනේවා. මියන් නොකනු ලැබේවා සි' මෙසේ ඉටු කලැ ඒ සත් දවස ඇතුළත ඒ භෝගිහට කිසි උපද්‍රවයෙක් නොවේ, එහෙත් නොඉවත ලද්ද ගිනි ආදියෙන් නසී.

මහානාග තෙරුන්ට මෙනි:- මාතෘ උපාසිකාව ගේ ගමට පිඬු පිණිස වැඩි තෙරුන් මාතෘ උපාසිකාව කෑද පිළිගත්වා ආසනශාලාහි වඩා හිඳවූවා ය. තෙරහු නිරෝධයට සමවැද වැඩහුන්හ. උන්වහන්සේ වැඩ සිටියදී ආසන ශාලාව ගිනි ගත්තේ ය. සෙසු භික්ෂූහු තම තමන් හුන් අසුන් ගෙන පලා ගියහ. ගම්වැසියෝ තෙරුන් දැක 'අලස මහණෙකැ' යි කීහ. ගින්න තණ- උණ- දර- ආදිය දවා ගෙන තෙරුන් සිසාරා සිටියේ ය. මිනිස්සු කළයෙන් දිය ගෙනවුත් ගිනි නිවා අලු ඉවත් කොට පිරිබඩ ගන්වා මල් විසුරුවා වඳිමින් සිටියහ. තෙරුන් වහන්සේ පිරිසුන් කාලයෙහි නැගිට ඔවුන් දැක පළවූයෙමි යි, අහසට නැගී "පුවහු" දිවයිනට වැඩිසේක. මේයැ **නානාබඩ අවිකොපනය** නම්.

විශෙෂ:- එකාබද්ධ වූ හදනා පොරෝනා හෝ වැඩහුන් අසුන හෝ ඉටුවමනා නොවේ. ඒ සමාපත්ති වශයෙන් ම රැකේ. **ආයුෂ්මත් සඤ්ජීව සථවිරයන්ට** මෙනි. ආයුෂ්මත් සඤ්ජීව තෙරුන් ගේ සමාධි විෂ්ඨාර ඍද්ධිය වේ. ආයුෂ්මත් **සැරියුත් මහතෙරුන් වහන්සේ** ගේ සමාධි විෂ්ඨාර ඍද්ධිය වේය යි එයින් කී.*

* මේ ඉද්ධිවිධ නිදේශයේ විස්තර වී.

(ඉ) **සංඝපතිමානනය**:- සංඝයා ගේ බුහුමන බැලීම යි. ඒ භික්ෂුව එන තෙක් සංඝයා කමී නො කිරීම යි. මෙ බඳු බුහුමන ඒ භික්ෂුව ගේ පූජීකෘත්‍යය නො වේ. සංඝයා ගේ බුහුමන ආවජ්නා කිරීම වූකලි ඒ භික්ෂුව ගේ පූජීකෘත්‍ය යැ.

ඒ මෙසේ ය - 'මා සත් දිනක් නිරොධයට සමවැදී හුන්-කල සංඝයා ඤත්තිකම්දීන් අතුරින් කිසි කමීයක් කරනු කැමැති වේ නම් කිසි භික්ෂුවක් අවුත් මා කැඳවත් ම නැගී සිටිමි යි' ඉටිය යුතු. එසේ ඉඳා සමවන්නේ එකල නැගී සිටීමැ යි. එහෙත් එසේ නො ඉටා සමවන් කලැ සංඝයා රැස්වී ඒ භික්ෂුව නො දැක කොහිදැ යි විචාරා නිරොධයට සමවැදීය යි කිකල යා 'අසුවල් භික්ෂුව සංඝයා ගේ වචනයෙන් කැඳව යි' කිසියම් භික්ෂුවක් යැවී නම් ඒ භික්ෂුව ද ශ්‍රවණොපචාරයෙහි සිට 'ඇවැත්නි! සංඝයා ඔබට බුහුමන් කෙරේය යි' කී පමණින් ම නැගීම වේ. මෙසේ සංඝාඥව ඉතා ගරු යැ. එහෙයින් ඒ ආවජ්නා කොට තමා ම නැගිටිනා සේ ඉටා සමවැදිය යුතු.

(උ) **සත්ථුපක්කොසනය**:- මෙහි ද ශාස්තෘන් වහන්සේ ගේ ආමන්ත්‍රණය ආවජ්නා කිරීම එහි කෘත්‍යය යි. එහෙයින් හෙද ආවජ්නා කළයුතු.

'මා නිරොධයට සමවැද සිටිනා සත් දවස තුළ බුදුහු අවතීණී වසනුවෙහි ශික්ෂාපද හෝ පනවත් නම් එබඳු කරුණෙක හෝ දහම් දෙසත් නම් කිසිවකු අවුත් මා නො-කැඳවන තෙක් (කැඳ වූ කෙණෙහි ම) නැගී සිටිමි යි, මෙසේ ආවජ්නා කොට හුන් ඒ භික්ෂුව ගේ එකෙණෙහි නැගිටීම යි. එහෙත් යමෙක් එසේ නො කෙරේ නම් බුදුහු සංඝයා රැස් වූ කලැ ඒ භික්ෂුව නො දැක 'අසුවල් මහණ කොහිදැ යි' විචාරා නිරොධයට සමවැදීය යි කිකල යව! ගොස් මා වචනයෙන් අසුවල් භික්ෂුව කැඳව යි' කිසියම් භික්ෂුවක් යවත් නම් ඒ භික්ෂුව ද ගොස් ශ්‍රවණොපචාරයෙහි සිට 'බුදුහු ආයුෂ්මතුන්ට ආමන්ත්‍රණය කෙරෙතැ යි' කී කෙණෙහි ම නැගිටීම වේ. මෙසේ බුදු නිමන්ත්‍රණය ගුරු යැ. එහෙයින් එය ආවජ්නා කොට තමාම නැගිටින සේ ඉටා සමවැදිය යුතු.

(ඒ) **අද්ධාන පරිච්ඡේද**:- ජීවිතය පවත්නා කාලය පිරිසිදීම යි. ඒ මෙසේ යි:- මේ භික්ෂුව කාලය පිරිසිදීමෙහි මනසේ දෘඪ විය යුතු. තමා ගේ ආයු සංඛාරය සතියක් පවතීද්ෝ නො පවතීද්ෝ යි ආවජ්නා කොට ම සමවැදිය යුතු.

එසේ ආවජ්ජනා නොකොට සමවැදුණ ද නිරොධ සමාපත්තිය ඒ නිස්සුව ගේ මරණය වැළකීමට සමර්ථ නො වේ. නිරොධය ඇතුළත මරණය ද නොවන හෙයින් අතරම සමාපත්තීන් නැගිටීම වේ. එහෙයින් මේ අධිෂ්ඨාන පරිවෙජ්දය ද ආවජ්ජනාකොට ම සමවැදිය යුතු සෙසු දෑය ආවජ්ජනා නොකිරීමට ද වටී. මේ අධිෂ්ඨාන පරිවෙජ්දය වූකලි ආවජ්ජනා කවයුතුමැ යි.

ඒ යෝගී තෙමේ පෙර කී සේ ආකිඤ්චඤ්ඤායතනයට සමවැද එයින් නැගී මේ පූර්ණකෘත්‍යයන් කොට නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවදී. එකලැ සිත එක් වරක් හෝ දෙ වරක් හෝ ඉක්ම අවිත්තක වේ. නිරොධයට සමවදී. (නිරොධ නම් වූ **නිර්‍වාණය** සපගී කෙරේ.)

විශෙෂ:- ඒ නිස්සුව ගේ සිත විතනවාර දෙසකට වඩා කවර හෙයින් නොපවතී ද යත්? නිරොධය පිණිස ප්‍රයොග හෙයිනි. මේ මහණහු ගේ ශමථ-විදර්‍ශනා ධර්‍ම දෙක **සම** කොට අෂ්ටසමාපත්ති වශයෙන් නැගීම අනුයුක්ති නිරොධය පිණිස ප්‍රයොගයෙකි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමවනට ප්‍රයොග නොවන හෙයිනි. නිරොධයට ප්‍රයොග වන හෙයින් දෙසිත කින් මත්තෙහි සිත් නොපවතී.

යම් නිස්සුවක් ආකිඤ්චඤ්ඤායතනයෙන් නැගී මේ පූර්ණකෘත්‍යයන් නොකොට නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවදී නම් හෙතෙමේ මත්තෙහි ඒ පිරිසිදි කාලයෙහි අවිත්තක වන්නට නොපොහොසත් වේ. පෙරළා ආකිඤ්චඤ්ඤායතනයෙහි පිහිට යි. (නැවැතැ ආකිඤ්චඤ්ඤායතනයට සමවැද එයින් නැගී පූර්ණකෘත්‍යයන් කළමනා හෙයිනි.) මෙහිලා මහෙකැ නොගියවිරු පුරුෂයකු ගේ උපමාව යෙදේ. පෙර නොගිය විරු මහෙකැ යන පුරුෂයෙක් අතර මගැ දිය විලක් හෝ ගැඹුරු දිය කඳු රැලියක් හෝ ගැඹුරු මඩවලක් හෝ ඉක්ම සිටි සැඩ අවුලෙන් තැවුණු ගලකට හෝ පැමිණ ගඳනා පොරෝනා නොපටවා ම ඒ කඳුරට බැස පිරිකර තෙමෙන බියෙන් තැවැත ද තීරයෙහි පිහිටා. පාෂාණය හෝ ඇක්ම තැවුණු පා ඇතිවැ නැවැත ද මෙතෙර සිටියේ වෙයි. එහි ඒ පුරුෂයා නොපවන ලද ගඳනා පොරෝනා ඇති හෙයින් කඳුරට බට කෙණෙහි ම හෝ පහණ ඇක්මුණු කෙණෙහි ම හෝ පෙරළා අවුත් මෙතෙර සිටුනා සේ ඒ යෝගී ද පූර්ණකෘත්‍යයන් නොකළ හෙයින් නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවන් කෙණෙහි ම පෙරළා අවුත් ආකිඤ්චඤ්ඤායතනයෙහි පිහිට යි.

පෙරද ඒ මහ ගිය පුරුෂයෙක් එහැනට පැමිණ එක් සළුවක් තරවැ හැඳ අනෙක් සළුව අතින් ගෙන කඳුර ඉක්මවා. හුණු දහණ ඇක්මුණු පමණක් ම කොට ඇතට යන්නා සේ පූජා කෘත්‍යයන් කළ ඒ මහණ තෙවසඤ්ඤුතාසඤ්ඤුයතනයට සමවැද මත්තෙහි අවිඤ්ඤක වේ. නිරොධයට සමවැද වෙසේ.

(6) කෙසේ සිටීම වේ ද - මෙසේ සමවන් ඒ නිරොධ සමාපන්නිහු ගේ කාල පරිවෙජ්ද වශයෙන් ද අතරතුර ආයුක්ෂය යා, සංඛාර ගේ බුහුමන යා, ශාස්තෘ ආමන්ත්‍රණ යා යන මොවුන් ගේ අභාවයෙන් ද සිටීම වේ.

(7) කෙසේ නැගීම වේ ද - අනාගාම්හු ගේ අනාගාම් ඵලොත්පත්තියෙන් ද, රහත්හු ගේ අර්හත් ඵලොත්පත්තියෙන් ද, නැගීම වේ.

(8) නැගුණහු ගේ සිත කුමකට නැමුණේ වේ ද:- නිරොධ-යෙන් නැගෙන්නහු ගේ සිත **නිබ්බාණයට** නිමිත්ත වූයේ වේ.

එසින් වදාළහ:-

සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්තියා වුට්ඨිතස්ස බෝ ආවුසො විසාඛ භික්ඛුනෝ විවෙකනින්නං චිත්තං හොති. විවෙක පොණං විවෙක පබ්භාරං"*

'ඇවැත් විසාඛ! සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියෙන් නැගි භික්ෂුව ගේ සිත සම්භංස්කාරයන් කෙරෙන් විවික්ත හෙයින් විවෙක නම් වූ **නිබ්බාණයට** නැමුණේ වේ. විවේකයට ප්‍රවණ වේ. විවෙක ප්‍රාග්භාර වේ,

(9) මළහු ගේ ද, නිරොධසමාපත්තියට සමවන්නහු ගේ ද වෙනස කිම - යන්නෙහි අර්ථය සූත්‍රයෙහි මෙසේ වදාළහ.

"යවායං ආවුසො මච්චා කාලඞ්කතෝ තස්ස කායසඞ්ඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා. වචී -පෙ- චිත්තසඞ්ඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා ආයුපරික්ඛීණෝ උෂ්මා වූපසන්නා ඉන්ද්‍රියානි පරිභින්නානි. යවායං භික්ඛු සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නෝ තස්සපි කායසඞ්ඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා. වචී -මනෝ- සඞ්ඛාරා -පෙ- චිත්ත සඞ්ඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා ආයු අපරික්ඛීණෝ උෂ්මා අවූපසන්නා ඉන්ද්‍රියානි අපරිභින්නානි"*

---

* ම: නි: මූලපණ්ණාසක

'ඇවැත්නි විසාඛ! කළුරිය කළහු ගේ **කායසංස්කාරයෝ නිරුද්ධයහ. සංසිඳුණහ.** වාක්සංස්කාරයෝ ද, චිත්තසංස්කාරයෝ ද, **නිරුද්ධයහ. සංසිඳුණහ.** ආයුෂ (ජීවිතින්ද්‍රි) ය **ක්ෂය** වී. උෂ්මාව (**කර්මජතේජෝ ධාතුව**) **සන්සිඳිණ.** චක්ෂුරාදි ඉන්ද්‍රියයෝ **බිඳුණහ.**

සඤ්ඤාවෙදයිත නිරෝධයට සමවන් භික්ෂුව ගේ ද **කායසංඛාරයෝ නිරුද්ධයහ. සංසිඳුණහ.** වාක් චිත්ත සංඛාරයෝ ද **නිරුද්ධයහ. සංසිඳුණහ.** ආයුෂය **ක්ෂය** නො වී, උෂ්මාව **නොසන්සිඳිණ.** ඉන්ද්‍රියයෝ **නො බිඳුණහ.** (මේයැ ඔහු දෙදෙනා ගේ **වෙනස නම්.**)

(10-15) නිරෝධසමාපත්තිය සංඛත ද, අසංඛත ද යන ප්‍රශ්නයෙහිලා සංඛතයැ යි ද, අසංඛතයැ යි ද, **ලෞකිකයැයි ද ලොකොත්තරයැයි ද** නො කිය යුතු යි. කවර හෙයින් ද? සවභාවයෙන් (පරමාර්ථ හෙයින්) අවිද්‍යමාන හෙයිනි. එහෙත් නිරෝධසමවතට සමවන්නහු ගේ වශයෙන් ඒ නිරෝධ සමාපත්තිය සමවන්නී නම් වේ. එහෙයින් නිෂ්පන්නය යි කීමට වටී. අනිෂ්පන්නය යි කීමට නො වටී.

"ඉතිසන්තං සමාපත්තිං - ඉමං අරිය සෙවිතං
දිට්ඨෙව ධම්මෙ නිබ්බාන - මිති සඞ්ඛං උපාගතං
භාවෙත්වා අරියං පඤ්ඤං - සම්පජඤ්ඤානි **පණ්ඩිතා**
යසමා තසමා ඉමිස්සාපි - සමාපත්ති සමත්ථතා
අරියම්හෙසු පඤ්ඤාය - ආනිසංසොති වුච්චති"

"මෙසේ අරිහු සෙවි - දිටුදම්* න්වතැයි විසූ,
සත්† සමවත අරීතැණ - වඩා පඬිහු සමවිදින්
එබැවින් මෙසමවත් - සමවැදුමේ සමත් බව්
අරීමග සැපියුතු ‡ - පැණ අනුසසැයි පියසු"

ආහුණෙය්‍ය භාවාදී සිදුවිය යනු හුදෙක් **නිරෝධසමාපත්තියට** සමවැදීමේ සමර්ථ බව පමණක් මෙහි ආනිසංස නොවේ. **ආහුණෙය්‍යාදිභාව** සිදුවිය ද මේ **ලෞකොත්තර** ප්‍රඥාවේ ආනිසංසයැ යි දතයුතු.

විභාවනාර්ථ:- අවිශෙෂයෙන් චතුර්විධවූ ම **මේ ලොකොත්තර** ප්‍රඥාව වැඩූ හෙයින් භාවිතප්‍රාඥ වූ පුද්ගල තෙමේ සදෙවක ලොකයාට **ආහුණෙය්‍ය** (=දුරින් ගෙනවුත් දෙන දානයට සුදුසු) වේ. **පාහුණෙය්‍ය** (=ආගන්තුක දානයට සුදුසු) වේ. **දක්ඛිණෙය්‍ය**

---

* **දිට්ඨධම්මික** (=ඉහාතම්යෙහි) † සන්ත ‡ **සම්පයුත්ත**

(=පරලොව අදහා දෙන දානයට සුදුසු) වේ. **අසෘංඛලිකරණීය** (=දෙහොත් මුදුනෙහි තබා සියලු ලෝකයා විසින්) **අසෘංඛලි-කමීයට** සුදුසු වේ. **සකල ලෝකයා ගේ අනුත්තර පින්කෙත** වේ.

විශෙෂයෙන් මේ සතර මාගී අතුරින් පළමු වන **සෝවාන් මග නුවණ** වඩා මඳ වූ විදර්ශනාවෙන් සෝවාන් බවට පැමිණි **ශ්‍රද්ධාදී** මෘදු වූ ඉඳුරන් ඇත්තේ ම (දෙව් ලෝ මිනිස් ලෝ විසින්) සත් සුගති භවයෙකැ ප්‍රතිසන්ධි වශයෙන් සසර **ඇවිද** දුක් කෙළවර **කරන්නේ සත්තක්ඛත්තුපරම** නම් වේ. මධ්‍යම විදර්ශනාවෙන් ආගත වූ **ශ්‍රද්ධාදී** මධ්‍යම ඉන්ද්‍රියන් ඇතියේ කුල දෙක තුනක පිළිසිඳීම් **විසින්** සසර සැරිසරා දුක් කෙළවර **කරන්නේ කොලංකොල** නම් වේ.

තියුණු විදසුනෙන් ආගත වූ තියුණු **ශ්‍රද්ධාදී** ඉඳුරන් ඇත්තේ **එකම** ප්‍රතිසන්ධියක් ලැබ සසර දුක් කෙළවර කරන්නේ **එකබීජී** නම් වේ.

කලෙකැ දෙව් ලොව ද, කලෙකැ මිනිස් ලොවද යි මිශ්‍රක වශයෙන් සුගති භව සතෙකැ ඉපදීම **සත්තක්ඛත්තුපරමතාව යැ. කොලංකොලභාවය ද** මනුෂ්‍ය - දිව්‍ය ලෝකයන්හි මිශ්‍රවැ ඉපිද දුක් කෙළවර කිරීම යි. මෙහි කුල වශයෙන් ගැනෙණුයේ මහාසාරකුලමැ යි. හෙද කුල දෙක තුනකැයි කිව ද භව සය තෙක් ද ඉපදිය හැකියි. මිනිස් ලොව හෝ දෙව් ලොව හෝ **එකම** අත්බවක් **ලබා** දුක් කෙළවර කිරීම **එකබීජී යැ.** (මේ වූකලී ත්‍රිවිධ මාගීවිදර්ශනාවන් ගේ වශයෙන් නියමය වේ. මතු තුන්මග විදර්ශනා බලවත් වී නම් **එකබීජී** වේ. මධ්‍යම වී නම් **කෝලංකොල ද,** මඳ වී නම් **සත්තක්ඛත්තුපරම ද** වේ. මේ ටීකානුගත යි)

දෙවන (**සකෘදාගාමී**) මාගීප්‍රඥව වඩා එක් වරක් ම මිනිස් ලොවට අවුත් දුක් කෙළවර කරන්නේ **සකෘදාගාමී** වේ.

(මේ වූකලී **පස්වැදෑරුම් සකෘදාගාමීන් නොත්** අනතයා යැ. **ඒ** මෙසේ යි:- කෙනෙක් මෙහිම **සකෘදාගාමී ඵලය** ලබා මෙහිම පිරිනිවෙති. කෙනෙක් මෙහි සකෘදාගාමීවැ දෙව්ලොව ඉපිද එහිදී පිරිනිවෙති. කෙනෙක් දෙව් ලොව **සකෘදාගාමීව** එහිදී ම පිරිනිවෙති. කෙනෙක් දෙව් ලොවැ සකෘදාගාමීවැ මෙහි ඉපිද මෙහිදී පිරිනිවෙති. කෙනෙක් මෙහිදී **සකෘදාගාමීවැ** දෙව් ලොව **ඉපිද එහි** ආයු ඇතිතාක් සිට නැවැතැ මෙහි ඉපිද පිරිනිවෙති. **මේ පස්වැන්නා** මෙහි ගැනේ - ටීකා.)

තුන් වන මාගීප්‍රඥව වඩා **අනාගාමී** වේ. හේ ප්‍රතිසන්ධි වශයෙන් මෙහි නූපදනා හෙයින් එනම් වේ. ඒ අනාගාමී තෙමේ ශ්‍රද්ධාදී පඤ්චේන්ද්‍රිය ධර්මයන් ගේ අඩු වැඩි බැවින් **අනන්තරා-පරිනිබ්බායී යැ, උපහච්චපරිනිබ්බායී යැ, අසඞ්ඛාර පරිනිබ්බා-යී යැ, සසංඛාර පරිනිබ්බායී යැ, උඩ්ඪංසොත අකණිට්ඨගාමී-යැ යි** පස්වැදෑරුම් වේ. මේ කාමලෝකය හැර පිරිනිවෙන්නේ වෙයි.

විභාග:- අවිහාදීන් අතුරින් යම්කිසි ශුද්ධාවාසයෙකැ ඉපිද එහි ආයුඃප්‍රමාණයෙන් මධ්‍යයට නො පැමිණ පිරිනිවෙනුයේ **අනන්තරාපරිනිබ්බායී යැ,** ආයු මධ්‍යය පසු කොට පිරිනිවෙනු-යේ **උපහච්චපරිනිබ්බායී යැ,** නිරුත්සාහයෙන් මාගී උපදවා පිරිනිවෙනුයේ **අසංඛාරපරිනිබ්බායී යැ,** උත්සාහයෙන් මතු මාගී උපදවනුයේ **සසංඛාරපරිනිබ්බායී යැ,** උපන් ශුද්ධාවාස භූමියෙන් ක්‍රමයෙන් මතු-මතු ලොකයට යමින් අකණිට්ඨවාව නෙක් යන්නේ **උඩ්ඪංසොත අකණිට්ඨගාමී යැ,**

විශේෂ:- අවිහයෙහි - උපන් කෙණෙහි රහත්වැ පිරිනිවෙන්-නෙකැ, ආයු මධ්‍යයට නො පැමිණ පිරිනිවෙන්නෙක, ආයු මධ්‍ය-යෙහි පිරිනිවෙන්නෙකැ යි **අනන්තරාපරිනිබ්බායීහු තිදෙනෙක්** හා **උපහච්චපරිනිබ්බායී** එකෙක, **උඩ්ඪංසොත අකණිට්ඨගාමී** එකෙකැ යි පස් දෙනෙකි. ඔහු පස් දෙන අසංඛාර පරිනිබ්බායී පසෙක සසංඛාරපරිනිබ්බායී පසෙකැ යි දස දෙනෙක් වෙති. අතපසුදී තුනෙහි ද එසේ ම දසදෙනා බැගින් වෙති. අකණිට්ඨක-යෙහි උඩ්ඪංසොතඅකණිට්ඨගාමී හැර සතර දෙනෙකි. හෙද සසංඛාර - අසංඛාර හෙදයෙන් අවදෙනෙකැයි මෙසේ **අනාගාමී ආර්‍යයෝ අටසාලිස් දෙනෙක්** වෙති.

තවද අවිහාදී පිළිවෙළින් අකණිට්ඨකය තෙක් (පිළිවෙළින්) ගොස් එහිදී රහත්වැ පිරිනිවෙනුයේ **උඩ්ඪංසොතඅකණිට්ඨගාමී නම්** වේ. අකණිට්ඨකයට නො පැමිණ සුදසසීය තෙක් යට සිටු බඹලොවෙහි සැරිසරා පිරිනිවෙනුයේ **උඩ්ඪංසොත නම්. අකණිට්ඨ** යෙහි ම ඉපිද පිරිනිවෙනුයේ **න උඩ්ඪංසොත අකණිට්ඨගාමී යැ,** ඔට සතර සුද්ධාවාසයන්හි ඉපිද එහිම පිරිනිවෙනුයේ **න උඩ්ඪං-සොත - න අකණිට්ඨගාමී යැ,** මෙසේ උද්ධංසොත අකණිට්ඨගාමීහු සතර දෙනෙකි. මේ එකම වතුෂ්කයක් සේ ගැනිණි.

සිව් වැනි මාගී ප්‍රඥව වඩා කිසි කෙනෙක් **ප්‍රඥාවිමුක්ත වෙති.** කිසි කෙනෙක් **උභතොභාගවිමුක්ත වෙති.** කිසි කෙනෙක් **ෂඩභිඥ වෙති.** කිසි කෙනෙක් **ප්‍රතිසම්භිදා ප්‍රභේද-ගත මහාක්ෂීණාශ්‍රව වෙත්.**

ආර්‍යපුද්ගල භෙද:- පෙරැ කී ත්‍රිවිධ සෝතාපන්නාදියෝ **දුක්ඛාපටිපද දන්ධාභිඤ්ඤාදී** සතර ප්‍රතිපදා වශයෙන් දෙළෙසෙකි.

ඔහු තැවැතැ	**ශ්‍රද්ධා-ප්‍රඥාධුර** වශයෙන් සුවිස්සෙක.	24
සකදාගාමීහු	විමොක්ෂමුඛ තුන ප්‍රතිපදා වශයෙන්	
	සතර දෙනා බැගින් ගෙන දෙළෙසෙක	12
	(පෙරැකීසේ) අනාගාමීහු අවසාළිසෙක	48
රහත්හු	පඤ්ඤාවිමුක්ත දෙළෙසෙක	12
	උභතොභාග විමුක්ත දෙළෙසෙක	12
	ත්‍රිවිද්‍යක දෙළෙසෙක	12
	ෂඩභිඥක දෙළෙසෙක	12
	ප්‍රතිසම්භිදාප්‍රාප්ත දෙළෙසෙක	12
	ප්‍රත්‍යේකබුද්ධ සම්‍යක් සම්බුද්ධ දෙදෙනෙක	2
	මෙසේ සියලු ආර්‍යයෝ එක්සිය සසාළිසෙකි	146

එහෙයින්ම **"මහඟක්ඛණෙ පනෙතං ජටං විජටෙති නාම. එලක්ඛණෙ විජටිතජටො සදෙවකස්ස ලොකස්ස අග්ගදක්ඛිණෙය්‍යා හොති"** 'සතර වන මාගී ක්ෂණයෙහිම ජටා විජටනය කෙරේ නම්. එල ක්ෂණයෙහි සුදුසු සේ ජටා විජටනය කෙළේ සදෙවක ලොකයාට **අග්‍රදක්ෂිණාර්හ** වේය' යි මෙහි ආදියෙහි කියන ලදී.

අරී පැණ බවුතේ - මෙසේ තන් අනුසස් වේ
එහෙයින් නිසි නැණැතියෝ - එහි අබිරැති වඩත්වා

මෙතෙකින්:-

"සීලෙ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ
චිත්තං පඤ්ඤඤ්ච භාවයං
ආතාපී නිපකෝ භික්ඛු
සෝ ඉමං විජටයෙ ජටං"

යන ගාථායෙහි **සීල- සමාධි- ප්‍රඥා** මුඛයෙන් වදාළ **විශුද්ධිමාර්ගයෙහි** ප්‍රඥාභාවනානිසංස නිදේශය නම් වූ තෙවිසි වන පරිච්ඡේදය නිමියේ සි.

මෙතෙකින්:-

"ඇතුළතා බැහැරි වූ - අවුලින් වෙළුණි සත් ලෝ
එ **ගොයුම් ගොතු** වීවාරම් - මෙ කවර කෙරේ නිරවුල්."

"පිනිවා **සිල්හි සිත්** - නුවණ වඩනා පැණවත්
වැර පිරිහැරි* පැනැති යති - මෙ අවුල කෙරේ නිරවුල්"

(මෙ ගය මාතෘකා කොට මුල දී යමක් කියන ලද නම්)

මෙ ගයින් **මුනිඳු සඳ** - සිල් ඇ බෙයින් **නෙක** විදි
වදහළ අරුත් විසිතුරු - තතු සේ දැන් වනන්නෙම්

ඉදුලබ මහණුවම් - ලැබ **සමතැසුන් සසුනේ**
සිල් ඇතෙන් සඟා කළ - කෙමු'දු මග† පිරිසිදුවට

විසුදු මඟ රිසියෝ - වැර වඩනා යෝගියෝ
තතු සේ එය නො දන්නෝ - විසුදු බව් මිහි නො ලබත්.

ඔවුනට පමෝද බව් - වඩන සුවිසුදු විනිසැති
මහ වෙහෙර සඟ පරපුර - දෙසුන් නියසර ඇසුරින්.

විසුදු මඟ කියතෙම් - එ කියන ම-බස සතසා
එ විසුදු බව් කැමැතියෝ - හැම සුදනෝ අසත්වා!

එහි මේ කියන ලද්දේ වෙ යි.

මෙහි ද:-

සිල් ඇ බෙයින් යුතු - එ දහම් **අරුත්** විනිසය
මහ සඟ පසට සැපයූ - අවුවා නයෙහි දැක් වී.

ඉන් එ සියල් අරුත් - ගෙන බෙහෙවින් විනිස හා
සියල් සංකර දෙස්නෙන් - නිසි සේ මුදා පැවසි.

එ හෙයින් විසුදු බව් - රිසි පිරිසිදු නුවණ යුත්
යෝගී **විසුදු මඟ** මේ - අදර කළයුතු නො මඳින්.

විබෙදා දෙසන සෙව - **තෙර පරපුර** යසස් පුන්
මහ වෙහෙර යති පරපුරි - දුනු කරුණු නො කරුණු දත්

---

* පාරිහාරිය † ඛෙම - සෘජුමිගීය

විනේ අසරෙහි යුතු - පිවිතුරු සලේ පැවතුම්
පිහිටි සසුන් පිළිවෙත - **බදක් සඟපල්** තෙරපා.

කැත්- මෙත්- සුරත බව් - කුළුණු ඇ ගුණ පිරිපුන්
ඇරයුම බැතින් පිළිගෙන - ම විසින් කරන මෙ ගතින්

සසුන් පැවතුම් රිසි - යම් පින් රැසෙක් ලද **නම්**
එ පින් තෙදින් **ලෝ** වැසි - සව් සත සුව ලබන්වා!

ලෝ තරණ **අප** වග - සුව සොයන කුල පුතුනට
සිල් ඇ විසුදු බව්නය - දක්වමිනි මහ ඉසි වූ

නිලෝ දෙවූ **මහිමි ගෙ** - පිරිසිදු සිතැති එක් බදු
බුදු **නම** පවතිනා තුරු - ලොව **මෙ ගත** පවතීවා!

හුදී ජන ප්‍රමොදය පිණිස කළ
විශුද්ධි මාර්ගය නිමි.

අනුබුබ බුධඝොෂ **මහාසඵවිර** සඵාම්පාදයන් කළ **විශුද්ධිමාර්ග** නම් පාලි ග්‍රන්ථය **සිරිමංගල පරිවෙණාධිශ්වරව වැඩ විසූ රාජකීය පූජ්‍ය පණ්ඩිත මාතර ශ්‍රී ධම්මරතන මහාසඵවිර සඵාම්පාද** පදමූලයෙන්
ධම්ම ශ්‍රාසත්‍ර මකරන්ද ගාතීත

පණ්ඩිත බඹුවිම **නන්දාරාම සඵවිරයන්** කළ සිංහලානුවාදය සමාපත යි.

කතතු සරදිසසනං

ඔසසකකමාතං ලඛකාය – සාසතොදයමෙසයං
රාමඤඤදවිසයං ගනතවා'නීතසුඛොපසමපදෙ
ථෙරවංසාගතං සාධු – පටිපතතාදි සාසනං
ජොතයනතොා තථා වාසධුරං සමපාදනතතිකොා
ආරඤඤකධුතඞගාදි – පූරණෙ නිරතොා සදා
පඤඤුනනදෙ මහාථෙරොා – ආසි යොගීවරුතතමොා

තසස සිසසොසු යොා අගගොා – සදරඤඤනිවාසිකොා
සිරී සුමන ථෙරිනදෙ – යොගාභිරතමානසොා
විසසුතොාසි තතොා ලදධා – **පබබජජා සාසනෙ** මයා

තසසසිසසවරොා ථෙරොා – **පියරතනාභිධානවා**
ආබාලතොා මමං සමමා – සුතපෙමෙන පාලිතොා
අරඤඤදිරතොා සොාසි – **පබබජජාචරියොා** මම

පඤඤුනනදමහාථෙර පාදසෙව යසසිතොා
සිසසුතතමොාසි **විමලජොතිතථෙරාසභොා** සුභොා
යසස හතථෙ පිතා බුදධසාසනං මං සමපපයි.

තසස සිසොසාසි **සදධම්මවාවාපතීසමඤඤදිතොා**
සිරී සුමංගලතථෙරපාදෙ වාදී වරුතතමොා
"මහාතිථපුරෙ රමෙම – ගාමෙ වල්පොල සඤඤිතෙ
සිරිමංගලඞඛ්‍යාත පරිවෙණමධිසසරොා"
යොා මමං සිකඛිතොා සමමා – විනයාචාරවුතතිසු

තසස සිසසවරොා සාධු – සීලාදි ගුණමණඩිතොා
සොවණණමුදදිකා යුතත **පණඩිතොාපාධි** ලඤජිතොා
පධානාචරියොා තසස **ධමමවංස යතීසසරොා**
නෙකසතථනතරෙ භාසනතරෙ ච පිවකතතයෙ
පාරගුධමමසතථෙ මෙ – **ආචෙරතතමුපාගතොා**
සදධිං **තිපිටකෙ** වාචිසසරොා **පාඩිමුපාසිතොා**
මහාලෙඛකඣාණෙන – මානිතොා සංඝසංඝදෙ
අනිකාසාතීවුඩ්‍යතථෙ – නිරතොා සාධු පූජිතොා.

ව්‍යාඛ්‍යානුවාදරචනා - වසෙනානෙකධා බහු
ධම්මසඤ්ඤාතරෙනෙකවිසයෙ ගණ්ඨකාරකෝ

මහාමඛිඳත්ථෙරෙන - ආනෙත්වා ජම්බුදීපතෝ
ඛීණ-විපස්සනාකම්මට්ඨානෙසු ගුරුම්හිව
ථෙරනවයාණතා හත්ථසාරංව පරිපාලිතං
මහාවිහාරවාසිනං හිතත්ථාය යථාවිධි
ඨපිතං සංගහෙත්වාන - සීහලාඅනිරුත්තියා
විසුද්ධිමග්ගං යොගීනා මඟ්ගකඛායිං විසුද්ධියා

බුද්ධඝොස මහාථෙරෝ - ජම්බුදීපා ඉධාගතෝ
මාගධං පරිවත්තෙසි - සීහලට්ඨකථාහි ච
තෙනෙව සීහලානං සෝ - තස්සාධෙති යථිච්ඡිතං.

පරක්කමභුජෝ රාජා - සීහලානං හිතත්ථිකෝ
ව්‍යාඛ්‍යානං යමකාතස්ස - ගුළ්හවිත්ථාරතාදිනා
තථෙව **ඛුද්දසික්ඛානාඛ්‍ය** - පණ්ඩිතෙනානිසඞ්ඛතං
භාවත්ථම්පියථත්ථාවබොධනෙ නොපයුජ්ජති.

යථා'භිධම්මං බාලානං - සුබොධත්ථාය සාධුකං
සම්පාදෙසි සභාසාය - **අභිධම්මාදිවණ්ණකං**

තථෙව සාදරං තම්පි - ථෙරවංසකකමාගතං
විපස්සනාධුරං සම්මා - සම්පාදනමපෙක්ඛිතං
සීහලානං සොගතානං - හිතත්ථාය යථාක්කමං
විසුද්ධිමග්ගං සොධෙත්වා - සීහලං පරිවත්තයං
තස්මිං අනීසිතොයෙව - යොගාචාරරතෝ මතෝ
ථෙරිඳු සෝ යථාකාමං - ගන්ථාරඤ්ඤං යථාවිධි
විපස්සනාධුරං සම්මා - භාවයන්නානිදුක්කරං
තෙනෙව ජාතගෙලඤ්ඤු පයාතෝ නිධනම්පති

තස්සච්චයෙන තත්ථෙව - පධානාවෙරතං ගතෝ
නාඳුරාම සමඤ්ඤුතෝ - ගුරුපාසනලාලසෝ

තත්ථාවසිඨභාගොපි - පරිපූරෙතුම්චිත්තතා
තත්ථෙවපරිවෙණෙපපපධානාවරියෙනතු
තස්ස සිස්සෙන **වජිරවංසත්ථෙරෙන** යාචිතෝ

සම්බුද්ධපරිනිබ්බාණා - වෙමජ්ඣං සාසනායුතෝ
පුරණංචිසහස්සානං - **වස්සපඤ්චසතානච**
සරනෙනා **ධම්මගරුණෝපදෙසමනුවත්තිය**
නිබ්බානෙසිං ඉමං ගන්ථං - සීහලාතත්ථමෙසයං

නාම-රූපවයෙනෙව - ඝටිතං ජීවිතං යථා
ගණෙපාපුද්ධවයෙනායං - නිබ්බිතොඵලමාවහං

මහාජනස්සුගෙහාසෙන - වස්සෙසම්ං යෙව සාධුකං
ලඞ්කාරජ්ජසභායාපි - **රජ්ජභාසෙති** සම්මතා

තෙන සීහලභාසානිවුද්ධිකාමා යථාවිධි
භාසන්තරාගතානෙකසත්ථගන්ථෙපනෙකධා
සභාසං පරිවත්තෙනන්ති - රවයන්ති ච සබ්බසෝ

භාසානිවුද්ධියා වෙව - සොගතානං තථාධිතා
ඛීණ-විප්පසන්නාදීසු - පබොධඵලසිද්ධියා
උභින්නාමපිගන්ථෙසං - කිඤ්චිමත්තෙනාපකාරකෝ
භවෙය්‍ය තෙන තුස්සාම් - වායාමෝ සඵලොනි මෙ

සංසොධෙත්වානඤං සම්මා - සම්පාදෙත්වාන භූමිකා
උත්තරානන්දථෙරෙන - පණ්ඩිතෙන හිතොසිතා
දස්සිතානුග්ගහං ගන්ථාගාරවං සමුපාවහං
ගන්ථෙසම්ං සුධී පත්තාව - ලොකනාථෙබනාදිනා
තථෙව **විමලවංස** - ඤාණාදිතිලකාදිභි
පාරිවෙණික ආචෙර - සිසෙසභි ච විසෙසතෝ
කතූපකාරංසබ්බෙභි - සරාම් කතවෙදිකෝ.

ගන්ථසම්පාදනෙනායං - යං පුඤ්ඤං පසුතං මයා
සබ්බෙ තමනුමොදිත්වා - **උපජ්ඣාචරියාදයෝ**
නිබ්බාණමධිගච්ඡන්තු - යථාපත්ථිතබොධියා

නිබ්බාණපච්චයෝ භොතු

ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනම

අත්හළ. අසරණ, අනාථ ළමයින් සියලු දෙනාටම කෙසේ වෙතත් සුළු පිරිසකට හෝ රැකවරණය ලබාදීමේ කාරුණික, පින්බර හැඟීමෙන්. තායිවානයේ ප්‍රධාන සංඝනායක ත්‍රිපිටකවේදි බෝදාගම චන්දිම නාහිමියන් විසින් බණ්ඩාරගම, වීදාගම අක්කර 13 ක පමණ හිසංසල, රමණීය බිමි පියසෙක ධර්ම චක්‍ර ළමා පදනම ඇරැ ඔිණි. මෙම ළමා නිවාසය ප්‍රධාන කොට දැනට කෝටි දෙකකට ආසන්න මිල මුදල් වැය කොට ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිවී ඇත. මෙහි ළමයින් 100 කට පමණ පහසුකම් සහිතව ජීවත් වීමට ළමා නේවාසිකාගාරයක්, කෑම ශාලාවක්. පූස්තකාලයක්. කියවීම් ශාලාවක්, මුළුතැන්ගෙයක් හා ශ්‍රවණාගාරයක් ද බොදු සිත් සතන් පහන් කරවන බුරුමයේ සිට වැඩම වූ ශ්‍රී ලංකාවේ දී අතිශය දුර්ලභව දිටිය හැකි කිරිගරුඬ සමාධි බුදු පිළිම වහන්සේ සහිත රමණීය බුදු මැදුරක් සහ පරිපාලන ඒකකයන්ද ගොඩනගා ඇත.

පුණ්‍යායතනයක් ලෙස පාර්ලිමේන්තු පනතකින් සංස්ථාගත කරන ලද. ධර්ම චක්‍ර ළමා පදනම යටතේ පාලනය වන පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ළමා නිවාසයක් වන මෙහි පළමු අදියර උදෙසා පිළිසරණ විය යුතු පිරිමි ළමයින් 50 ක් පමණ නේවාසික වීමට කටයුතු යොදා ඇති අතර පියවරින් පියවර ඉදිරියේදී ළමයින් 100 දක්වා ඔඳවා ගැනීමට අදහස් කර තිබේ. මෙම දරුවන්ගේ ආහාරපාන. ඇඳුම්. පැළඳුම්, සෞඛ්‍ය, ක්‍රීඩා හා සෞන්දර්ය කටයුතු සඳහා අවශ්‍ය සියලු පහසුකම් ආයතනය විසින් සපයා දී ඇත. ළමයින් පිළිබඳ සැබෑ සෙනෙහසින් හා සුරක්ෂිතව කටයුතු කළ හැකි අධික්ෂණ මට්ටමේ උපදේශක මණ්ඩලයක් හා කාර්ය මණ්ඩලයක් මගින් ආයතනික වැඩසටහන් දෙනිකව ක්‍රියාත්මක කෙරේ.

පාසල් යන වයසේ පසුවන ළමයින් සියලු දෙනාම විධිමත් පාසල් අධ්‍යාපනයේ නියැලී සිටින අතර ඔවුන්ගේ දක්ෂතාව අනුව අනාගතයේදී වෘත්තීය පුහුණුවීම් ලබාදීමට හා උසස් අධ්‍යාපනය සඳහා යොමු කිරීමෙනුත්. පසුහාර වැඩසටහන් වලින් අහිමි සම්පත් පිළිබඳ පසුතැවිලි වීමට ඉඩ නොතබා උරුම සම්පතින් පුනර්ජීවනය ලබා රටට දැයට වැඩදායක දයාව, අනුකම්පාව අගයන ගුණගරුක විහිත පුරවැසියන් පිරිසක් බිහි කරලීම ආයතනයේ අපේක්ෂාවයි.

ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ පරමාර්ථ

- ශ්‍රී ලංකාවේ වරප්‍රසාද අඩු ළමයින්ගේ සමාජීය, අධ්‍යාපනික හා සංස්කෘතික වර්ධනය උදෙසා කටයුතු කිරීම.
- විශේෂයෙන්ම දිළිඳු, අනාථ සහ රෝගී තැනැත්තන්ට සහන, පෝෂ්‍යාහාර, ඇඳුම් පැළඳුම් හා නිවාස සැපයීම.
- සාමාන්‍ය ජනතාවගේ ශාරීරික, ආධ්‍යාත්මික සහ සමාජ යුහු සාධනය වැඩි දියුණු කිරීම.
- සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීමේ කාර්යය සඳහා කෙළින්ම හෝ වෙනත් සංවිධාන සමග සහයෝගිතාවයෙන් ආයතන පිහිටුවා පවත්වා ගෙන යාම.
- සංස්ථාවේ පරමාර්ථ හා සමාන පරමාර්ථ දරන, ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටවල පිහිටි වෙනත් ආයතන සමග සම්බන්ධතා පවත්වාගෙන යෑම.
- ජාතීන් අතර සමගිය, ජාත්‍යන්තර මිත්‍රත්වය හා අවබෝධය තහවුරු කිරීම, ප්‍රවර්ධනය කිරීම හා දිරි ගැන්වීම සඳහා තරුණ තරුණියන් අතර විනය හා ආත්ම විශ්වාසය පිළිබඳ හැඟීමක් ඇති කිරීම.
- ථෙරවාදී බෞද්ධ දර්ශනය හා පිවත මාර්ගය ආරක්ෂා කිරීම හා පතළ කිරීම.
- ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට වෘත්තිය හා අධ්‍යාපන පාඨමාලා පැවැත්වීම.
- තරුණ තරුණියන් ස්වයං රැකියාවල යෙදීය හැකි අන්දම පිළිබඳව ඔවුන් පුහුණු කිරීම සහ ප්‍රයෝජනවත් පුරවැසියන් වගයෙන් ස්ථාපනය වීම පිණිස ඔවුන්ට මුදලින් හෝ අන්‍යාකාරයකින් සහාය වීම.
- සංස්ථාවේ පරමාර්ථ වැඩි දියුණු කිරීමෙහිලා නිරතව සිටින නිස්සුන් වහන්සේලාට, ස්වේච්ඡා සේවකයින්ට හා තරුණ තරුණියන්ට ගිහිපත්ව පිටිනැමීමෙන්, මුදලින් හෝ අන්‍යාකාරයකින් ආධාර කිරීම.
- සංස්ථාවේ පරමාර්ථ වැඩි දියුණු කිරීමෙහිලා ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ, සාකච්ඡා, වැඩමුළු, පංති, විවාද, සම්මේලන හෝ වෙනත් කටයුතු ප්‍රවර්ධනය කිරීම, පිළියෙල කිරීම, සංවිධානය කිරීම හා පැවැත්වීම.
- පරිසරය ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම හා සම්බන්ධ කවර හෝ අංශයකට අදාළව, උපමාන ප්‍රවර්ධනය කිරීම, භාර ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

ඉහත සඳහන් පරමාර්ථ මුදන්පත් කර ගැනීම පිණිස අවශ්‍ය හිතකර හෝ ඒවාට ආනුශංගික වෙනත් සියලු ක්‍රියා කිරීම.

අනාගතය
දුර දක්නා නුවණින් ගොඩනංවමු
අපේක්ෂා මල් එල ගන්වමින්.

1. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක්.
2. අසරණ දක්ෂ සිසුන් උදෙසා ශිෂ්‍යත්ව ත්‍රිමයක්.
3. විදේශ භාෂා පුහුණු ඒකකයක්.
4. සිසුසැට කලා කුශලතා වර්ධනය කිරීමේ ව්‍යාපෘතියක්.
5. පෙර පාසලක්.
6. වැඩිහිටියන්ට රැකවරණය සැලසීමේ ආයතනයක්.
7. වෘත්තිය පුහුණු පාඨමාලාවක්.

DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.

May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.
Homage to Amita Buddha!

NAMO AMITABHA

南無阿彌陀佛

《斯里蘭卡文：VISUDDHIMAGGA, 清淨道論及註釋》
財團法人佛陀教育基金會 印贈
台北市杭州南路一段五十五號十一樓
Printed and donated for free distribution by
The Corporate Body of the Buddha Educational Foundation
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website: http://www.budaedu.org
Mobile Web: m.budaedu.org
This book is strictly for free distribution, it is not for sale.
නොමිලයේ බෙදාදීම පිණිසයි.
Printed in Taiwan
1,500 copies; October 2015
SR022 - 13510